සිතුවම් සහිත

පන්සිය පණස්

ජාතක පොත

2 වෙනි කාණ්ඩය

ප්‍රකාශකයෝ

ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගම

කොළඹ 11.

පන්සිය පණස්

ජාතක පොත

දෙවෙනි කාණ්ඩය

විද්‍යෝදය විශ්වවිද්‍යාලයයේ පුස්තකාලයාධිපති

පණ්ඩිත වේරගොඩ අමරමොලි

නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

විසින් සංශෝධිත යි.

තායිවානයේ තායිපේ එක්සත් සමුහ බෞද්ධ අධ්‍යාපන පදනමේ ප්‍රධාන අනුශාසක, තායිවානයේ තායිපේ ශ්‍රී රතනජෝති ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති, තායිවානයේ ප්‍රධාන සංඝනායක රත්මලාන ශ්‍රී විජයාරාමවාසී, බණ්ඩාරගම වීදාගම ධර්ම චක්‍ර ළමා පදනමේ සහ ලියෙන් සිං ළදරු පාසලේ නිර්මාතෘ, ත්‍රිපිටකවේදී ධර්ම කීර්ති ශ්‍රී බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි මෙම දහම් පොත තායිවානයේ එක්සත් සමුහ බෞද්ධ අධ්‍යාපන පදනම මගින් මුද්‍රණය කරවා ශ්‍රී ලංකාවට පරිත්‍යාග කරන ලදී.

ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම
වීදාගම,
බණ්ඩාරගම

Printed for free distribution by

The Corporate Body of the Buddha Educational Foundation

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org.tw

Website: http: //www.budaedu.org.tw

This book is strictly for free distribution, it is not to be sold.

නොමිලයේ බෙදාදීම පිණිසයි.

පටුන

අංකය	ජාතකය		පිටුව	අංකය	ජාතකය		පිටුව
89	අකතඤ්ඤු ජාතකය		226	160	ආදිච්චුපට්ඨාන	,,	356
115	අකාලරාවි	,,	277	412	ආදිත්ත	,,	783
472	අකිර්ති	,,	882 (ii)	19	ආයාචිත "භක්ත"	,,	57
125	අග්ගිදත්ත	,,	290	261	ආරාමදූසක	,,	498
391	අට්ඨිසේන	,,	732	46	ආරාමදූසක	,,	120
83	අත්ථස්සද්වාර	,,	215	157	ඉන්දගොත්ත	,	340
288	අනත්ත	,,	547	411	ඉන්ද්‍රිය	,,	778
62	අණ්ඩභූත	,,	150	78	ඉල්ලීස	,,	198
180	අනභිරත	,,	370	67	උච්ඡඞ්ග	,,	164
321	අනනුසොචිය	,,	614	206	උච්ඡට්ඨභත්ත	,,	407
65	අනභිරති	,,	159	479	උද්දල	,,	923
1	අපණ්ණක	,,	1	105	උදකවනී	,,	262
274	අභ්‍යන්තර	,,	521	264	උදපාන	,,	502
99	අසාතරූප	,,	255	444	උදයභද්ද	,,	879
27	අභිණ්හ	,,	73	291	උදුම්බර	,,	549
227	අභිතාබු	,,	441	162	උපසාළ්හක	,,	347
120	අඹ	,,	283	224	උපාහන	,,	437
334	අම්බචෝර	,,	635	135	උභයභ්‍රෂ්ට	,,	302
466	අම්බා	,,	859 (ii)	534	උම්මග්ග	,,	1547
337	අයකූට	,,	640	536	උම්මදන්ති	,,	1837
501	අයෝඝර	,,	1040	150	උරග	,,	324
165	අරක	,,	350	343	උරග	,,	649
338	අරඤ්ඤ	,,	641	145	එකපණ්ණ	,,	315
232	අරීතමෘත	,,	446	231	එකපාද	,,	445
513	අලම්බුසා	,,	1131	308	එකරාජ	,,	588
152	අලීනචිත්ත	,,	327	304	ක්ෂාන්තිවාදී	,,	577
201	අස්සක	,,	400	203	කක්කර	,,	403
368	අස්සඛකවතී	,,	687	319	කක්කාර	,,	611
76	අසංකිය	,,	186	405	කච්චානි	,,	762
176	අසදෘශ	,	363	209	කච්ඡප	,,	411
127	අසම්පදාන	,,	292	266	කච්ඡප	,,	505
61	අසාතමන්ත්‍ර	,,	146	173	කච්ඡප	,,	359
122	අසිලක්ඛණ	,,	286	7	කට්ඨහාරි	,,	29
406	අෂ්ටශබ්ද	,,	764	121	කටාහක	,,	284
353	අභිගුණ්ඨික	,,	666	13	කණ්ඩින	,,	45
364	ආචාරි	,,	679	29	කණ්හ	,,	77
24	ආජඤ්ඤ	,,	66	431	කණ්හදීප	,,	840

අංකය	ජාතකය		පිටුව
204	කන්දගලක	,,	404
311	කනවෙර	,,	592
392	කපි	,,	733
243	කපි	,,	461
363	කපොත	,,	678
42	කපොත	,,	114
260	කක්කටක	,,	496
345	කරණ්ඩක	,,	653
374	කරපත්ත	,,	698
166	කල්‍යාණධම්ම	,,	351
123	කලණ්ඩුක	,,	288
171	කලහසමුවසී	,,	357
303	කස්සපමන්දිය	,,	575
320	කාක	,,	613
383	කාක	,,	714
142	කාක	,,	311
136	කාක	,,	303
263	කාකොලූක	,,	501
56	කාඤ්චනක්ඛන්ධ	,,	138
461	කාම	,,	843 (ii)
221	කාමනීය	,,	434
290	කාම විලොපන	,,	549
286	කායවිච්ඡන්ද	,,	545
82	කාලකණ්ණි	,,	213
322	කාලබාහු	,,	617
471	කාලිඞ්ගබොධි	,,	877 (ii)
215	කාසාව	,,	425
241	කිංසුකොපම	,,	459
84	කිම්පක්ක	,,	216
252	කිරීටවච්ඡ	,,	484
384	කුක්කු	,,	714
435	කුක්කුට	,,	853
22	කුක්කුර	,,	61
314	කුටිදූසක	,,	601
273	කුටසාක	,,	521
108	කුඩ්ඩකපූව	,,	269
247	කුණ්ඩකකුච්ඡිසින්ධව	,,	470
524	කුණාල	,,	1251
70	කුද්දල	,,	169
333	කුනාතාති	,,	633
503	කුම්භ	,,	1050
396	කුම්භකාර	,,	741
403	කුම්මාසපිණ්ඩ	,,	753
292	කුමාරපත්ත	,,	551
258	කුරඞ්ග	,,	493
21	කුරුඞ්ගමිග	,,	60
200	කුරුඞ්ගමිග	,,	398
269	කුරු ධම්ම	,,	507
31	කුලාවක	,,	80
519	කුස	,,	1173
117	කුසනාලි	,,	280
88	කුහක	,,	224
97	කූටවාණිජ	,,	251
212	කූටවාණිජ	,,	414
427	කෘෂ්ණ	,,	831
196	කේළිසීල	,,	393
336	කේසව	,,	638
400	කොටසිම්බලි	,,	750
415	කොසම්බ	,,	787
126	කොසිය	,,	291
219	කොසිය	,,	431
530	ඛණ්ඩහාල	,,	1381
218	ඛත්තියවණ්ණ	,,	431
40	ඛදිරඞ්ගාර	,,	102
197	ඛන්ධකවත්ත	,,	394
79	ඛරස්සර	,,	206
15	ඛරාදිය	,,	50
151	ගග්ග	,,	326
199	ගඞ්ගා තම්	,,	397
409	ගංගාමාල	,,	771
335	ගජකුම්භ	,,	636
510	ගණ්ඩතින්දු	,,	1097
394	ගන්ධාර	,,	736
213	ගරහිත	,,	416
8	ගාමණි	,,	31
250	ගාමණිචණ්ඩ	,,	474
388	ගිජ්ඣ	,,	723
160	ගිජ්ඣ	,,	344
414	ගිජ්ඣ	,,	786
179	ගිරිදත්ත	,,	369

අංකය	ජාතකය		පිටුව
153	ගුණ	,,	330
236	ගුත්තිල	,,	451
354	ගුම්බිය	,,	667
220	ගුථපාණ	,,	432
193	ගෘහපති	,,	389
134	ගොධ	,,	301
318	ගොධ	,,	610
137	ගොධ	,,	305
440	ඝත	,,	866
344	ඝත	,,	652
129	ඝසත	,,	295
438	චකකවාක	,,	862
426	චතුද්වාර	,,	828
428	චතුපොසථ	,,	835
182	චතුමට්ට	,,	374
477	චඳකින්නර	,,	914
131	චඳුභාස	,,	297
498	චම්පෙය්‍ය	,,	1017
317	චමමසාටක	,,	609
490	චිතතසම්භූත	,,	976
294	චුල්ලකාලිඞ්ග	,,	553
458	චුල්ලකුණාල	,,	832 (ii)
52	චුල්ලජනක	,,	132
362	චුල්ලධනුඞිර	,,	676
347	චුල්ලධමමපාල	,,	656
216	චුල්ලනඳ	,,	426
469	චුල්ලනාරද	,,	871 (ii)
187	චුල්ලපදුම	,,	379
430	චුල්ලබොධි	,,	838
515	චුල්ල සුතසොම	,,	1144
4	චුල්ලසෙට්ඨි	,,	14
521	චුල්ලහංස	,,	1208
410	චෙතිය	,,	775
505	ඡද්දනත	,,	1064
502	ඡඳ	,,	1044
462	ජනසඣව	,,	849 (ii)
325	ජඹුක	,,	621
287	ජඹුඛාද	,,	546
504	ජයද්දිස	,,	1056
249	ජරූදපාන	,,	473
300	ජවක	,,	568
299	ජවනසකුන	,,	567
468	ජවන හංස	,,	866 (ii)
402	ජගර	,,	752
442	ජුණ්හ	,,	874
342	ජෙත	,,	647
63	තකක	,,	154
473	තකකාරි	,,	887 (ii)
433	තකකාරි	,,	848
484	තචඡසූකර	,,	949
5	තණ්ඩුලනාලි	,,	22
331	තද්ධරි	,,	632
58	තයො ධම්ම	,,	143
356	තචසාර	,,	669
37	තිත්තිර	,,	94
113	තිත්තිර	,,	274
312	තිත්තිර	,,	596
16	තිපල්ලත්ථ මිග	,,	51
425	තිත්වටූ	,,	822
172	තින්දුක	,,	358
245	තිලමුට්ඨි	,,	466
25	තීත්ථ	,,	67
376	තුණ්ඩිල	,,	703
328	තුෂ	,,	626
95	තෙලපතත	,,	244
239	තෙලොවාද	,,	457
511	තෙසකුන	,,	1103
223	ද්විතීය පලාස	,,	436
315	දද්දභ	,,	605
167	දද්දර	,,	352
309	දද්දර	,,	589
181	දධිවාහන	,,	371
389	දබබපුෂ්ප	,,	724
366	දරීමුඛ	,,	683
397	දළ්හධමම	,,	744
390	දසනනක[1]	,,	726
390	දසනනක[2] (සත්තුභසත්‍ර)ජ.		728
447	දසරථ	,,	889
487	දශබ්‍රාහමණ	,,	959
413	දිවි	,,	785

අංකය	ජාතකය	පිටුව	අංකය	ජාතකය	පිටුව
359	දීඝිති කෝසල ,,	672	419	පදමානවක ,,	803
169	දුතිය මක්කට ,,	355	254	පදුම ,,	487
175	දුද්දද ,,	362	189	පම්තුත්ථර ,,	384
112	දුබ්බච ,,	274	404	පරන්තප ,,	758
50	දුම්මේධ ,,	126	100	පරොසත ,,	257
118	දුම්මේධ ,,	280	98	පරොසහස්ස ,,	253
104	දුෂීල කාෂ්ට ,,	261	222	පලාස ,,	435
64	දුරජාන ,,	158	298	පලාස ,,	566
268	දුලුසි රජ ,,	507	358	පලාස ,,	671
253	දූත ,,	486	240	පාදඤ්ජලි ,,	458
470	දූත ,,	875 (ii)	445	පානීය ,,	884
6	දෙවධම් ,,	25	327	පීඨ ,,	625
386	ධම්මසොණ්ඩක ,,	718	302	පුචිමන්ද ,,	573
443	ධම් ,,	877	208	පුණ්ණනදී ,,	410
214	ධම්ධවජ ,,	417	53	පුණ්ණපාතී ,,	133
372	ධම්ධවජ ,,	695	380	පුෂ්පගන්ධ ,,	710
379	ධජවිහෙඨ ,,	709	130	පුෂ්පරත්ත ,,	296
401	ධූමකාරි ,,	750	143	පුෂ්පරත්ත ,,	312
49	නක්ඛත්ත ,,	125	424	පූතිමාංශ ,,	819
161	නකුල ,,	346	467	ඵන්දන ,,	864 (ii)
140	නංගුට්ඨ ,,	309	54	ඵල ,,	134
32	නච්ච ,,	86	217	පුටභත්ත ,,	428
39	නන්ද ,,	100	316	බ්‍රහ්මදත්ත ,,	607
373	නන්දියමෘග ,,	696	38	බක ,,	97
28	නන්දිවිසාල ,,	75	229	බක ,,	444
20	නලපාන ,,	58	293	බක ,,	552
516	නලිනී ,,	1149	393	බකබ්‍රහ්ම ,,	735
119	නංගුලීස ,,	282	116	බන්ධන මොක්ඛ ,,	278
282	නානාච්ඡන්ද ,,	539	195	බන්ධනාගාර ,,	391
96	නාමසිද්ධි ,,	249	133	බබ්බු ,,	299
432	නිග්‍රොධ ,,	843	107	බාහ්‍ය ,,	266
12	නිග්‍රොධ මිග ,,	38	124	බිළාර ,,	289
529	නිමි ,,	1357	437	බිළාර කොසිය ,,	857
367	නේරු ,,	686	371	බිළාල ,,	694
128	පක්ඛවගරු ,,	294	329	බාවෙරු ,,	629
501	පංචපණ්ඩිත² ,,	1044	284	භද්දඝට ,,	542
55	පංචායුධ ,,	136	459	භද්දසාල ,,	832 (ii)
482	පංචුපොසථ ,,	939	207	හරු ,,	408
508	පණ්ඩර නාග ,,	1084	496	හල්ලාටිය ,,	1007
101	පණ්ණික ,,	258	488	භික්ඛා පරම්පර ,,	963

අංකය	ජාතකය		පිටුව	අංකය	ජාතකය		පිටුව
80	භීමසේන	,,	207	77	මහාසුපින	,,	187
532	භූරිදත්ත	,,	1446	522	මහාහංස	,,	1221
59	භේරිවාද	,,	144	26	මහිලාමුඛ	,,	70
23	භොජජානීය	,,	64	271	මහිස	,,	518
44	මකස	,,	118	480	මහිස	,,	927
9	මඛාදේව	,,	32	489	මාතඞ්ග	,,	966
86	මඞ්ගල	,,	220	441	මාතුපොසක	,,	870
75	මච්ඡ	,,	183	17	මාලුත	,,	54
210	මච්ඡක	,,	413	306	මාංස	,,	583
281	මච්ඡද්වාර	,,	538	369	මිගාලොප	,,	690
436	මට්ටකුණ්ඩලී	,,	856	103	මිත්තවින්දක	,,	260
246	මණිකණ්ඨ	,,	468	357	මිත්තවින්දක	,,	670
340	මණිකුණ්ඩල	,,	644	191	මිත්තාමිත්ත	,,	387
188	මණිචොර	,,	382	110	මිතචින්තී	,,	271
278	මණිසූකර	,,	533	465	මිත්තාමිත්ත	,,	858 (ii)
34	මත්ස්‍ය	,,	89	255	මුදුපාණී	,,	488
18	මතකභත්ත	,,	55	66	මුදුලක්ඛණ	,,	161
310	මතරොදන	,,	590	30	මුනික	,,	79
385	මනොජ	,,	716	360	මුවපොතක	,,	673
378	මය්හ	,,	707	526	මූගපක්ඛ	,,	1314
168	මක්කට	,,	354	238	මූලපරියාය	,,	456
295	මහා අශ්වාරොහක	,,	558	361	මූසික	,,	674
478	මහා උක්කුස	,,	918	446	යුධඤ්ජය	,,	887
463	මහාකණ්හ	,,	851 (ii)	324	රථලට්ඨි	,,	620
395	මහාකපි	,,	738	147	රාජෝවාද	,,	320
507	මහාකපි	,,	1080	418	රාජෝවාද	,,	801
527	මහාජනක	,,	1333	141	රාධ	,,	310
434	මහා ධර්මපාල	,,	851	192	රාධ	,,	388
531	මහානාරදකාශ්‍යප	,,	1413	74	රුක්ඛධම්ම	,,	182
257	මහාපනාද	,,	491	474	රුරුමෘග	,,	895 (ii)
464	මහාපදුම	,,	853 (ii)	185	රුහක	,,	378
499	මහාපලොභන	,,	1026	270	රොම	,,	517
233	මහා පිංගල	,,	447	493	රොහන්තමෘග	,,	990
537	මහාබොධි	,,	1853	45	රොහිණී	,,	119
483	මහාමයූර	,,	944	11	ලක්ඛණමිග	,,	36
251	මහා මන්ධාතු	,,	482	346	ලටුකික	,,	655
485	මහාවාණිජ	,,	954	280	ලාභගරු	,,	537
91	මහාසාර	,,	230	90	ලිත්ත	,,	228
51	මහාසීලව	,,	128	93	ලොමහංස	,,	240
94	මහාසුදස්සන	,,	242	420	ලොමස කාශ්‍යප	,,	808

අංකය	ජාතකය	පිටුව	අංකය	ජාතකය	පිටුව
267	ලෝල ,,	506	377	සවණ්ණ කකීටක ,,	706
41	ලෝසක ,,	109	155	සවණ්ණ මයූර ,,	335
305	ලෝහ කුම්භී ,,	579	348	සවණ්ණ මෘග ,,	658
265	ව්‍යාඝ්‍ර ,,	503	132	සවණ්ණ හංස ,,	297
228	වච්ඡනක ,,	443	244	සංකප්ප ,,	462
35	වට්ටක ,,	90	256	සංකප්ප ,,	489
114	වට්ටක ,,	275	518	සංකිච්ච ,,	1166
382	වට්ටක ,,	713	429	සංඛ ,,	835
276	වඩ්ඪසූකර ,,	527	60	සංඛධමම ,,	145
2	වණ්ණුපථ ,,	9	514	සංඛපාල ,,	1137
415	මහගිරු[2] ,,	794	177	සඞ්ගාමාවචර ,,	366
350	වණ්ණාරොහ ,,	662	146	සඤ්ජීවක ,,	317
71	වරණ ,,	172	421	සක්වාද ,,	811
190	වලාහක ,,	385	36	සකුණ ,,	92
14	වාතමිග ,,	47	111	සකුණ ,,	272
259	වාතසෙන්ධව ,,	494	164	සකුණග්ඝි ,,	349
332	වාතර ,,	632	73	සච්චංකිර ,,	178
57	වානරින්ද ,,	141	174	සතතධමම ,,	361
47	වාරුණි ,,	121	495	සත්තිකුම්භ ,,	1002
178	වාලොදක ,,	368	448	සංවර ,,	894
226	විකණ්ණක ,,	440	158	සත්ථව ,,	341
381	විඝාත ,,	712	339	සන්ධිභෙද ,,	642
237	විතිච්ඡ ,,	455	234	සබ්බදාඨක ,,	448
156	විනීලක ,,	338	509	සම්බුලා ,,	1090
139	විරොචන ,,	307	506	සම්භව ,,	1074
92	විශ්වාස භොජන ,,	238	33	සම්මොදමාන ,,	87
330	විසය්හ ,,	630	163	සමිද්ධි ,,	348
69	විසවන්ත ,,	167	423	සමුග්ග ,,	816
198	වීරක ,,	396	460	සමුද්ද වාණිජ ,,	840 (ii)
326	වෘහච්ඡත ,,	622	289	සමුද්‍ර ,,	548
225	වෙණ්ණුපූත ,,	439	301	සය්හ ,,	570
48	වෙදබ්භ ,,	122	475	සරභමිග ,,	900
102	වෙරි ,,	259	390	දසන්තක[2] ,,	728
43	වෙළුක ,,	116	307	සස ,,	585
535	වෙස්සන්තර ,,	1800	68	සාකෙත ,,	166
365	ශ්වෙතකෙතු ,,	681	486	සාධීන ,,	956
272	ශතපත්‍ර ,,	519	194	සාධුසීල ,,	390
512	ශරභඞ්ග ,,	114	528	සාම ,,	1346
370	ශ්‍රී කාලකණ්ණි ,,	691	87	සාරම්භ ,,	224
184	ශීලානිසංස ,,	376	242	සාලක ,,	460

අංකය	ජාතකය		පිටුව	අංකය	ජාතකය		පිටුව
106	සාලික	,,	264	449	සුප්පාර	,,	898
476	සාලිකෙදාර	,,	909	285	සුපත්ත	,,	543
355	සාලිය	,,	668	313	සුබබව	,,	598
279	සාලොහිත	,,	536	81	සුරාපාන	,,	211
109	සිගාල	,,	270	481	සුරුචි	,	933
138	සිගාල	,,	306	407	සුලසා	,,	767
144	සිගාල	,,	313	416	සුලුසුව	,,	796
148	සිගාල	,,	321	248	සුව	,,	472
277	සිරි	,,	530	349	සුස්සොන්දිය	,,	661
186	සිරිකාලකණ්ණි	,,	379	159	සුසීම	,,	342
492	සිරිමඳ	,,	994	399	සුසීම	,,	748
491	සිවි	,,	984	154	සුහනු	,,	334
351	සීලපරිකඛ	,,	664	202	සුංසුමාර	,,	402
72	සීලව නාගරාජ	,,	175	149	සූකර	,,	323
85	සීලවීමංස	,,	218	211	සෙග්ගු	,,	413
283	සීලවීමංස	,,	541	275	සෙය්‍යංස	,,	525
296	සීලවීමංස	,,	562	3	සෙරිවාණිජ	,,	12
323	සීලවීමංස	,,	619	517	සෝනක	,,	1158
183	සීහචමම	,,	375	520	සොනනන්ද	,,	1197
10	සුඛවිහාරී	,,	34	205	සොමදත්ත	,,	405
375	සුචි	,	702	398	සොමදත්ත	,,	747
297	සුජාතා	,,	564	497	සොමනස්ස	,,	1011
341	සුජාත	,,	645	500	හත්ථිපාල	,,	1029
387	සුතනු	,,	720	494	හංස	,,	997
262	සුජාත	,,	499	422	හලින්දිය	,,	813
525	සුතසොම	,,	1278	417	හාරිත	,,	798
523	සුධාභොජන	,,	1235	352	හිරි	,,	665
235	සුනඛ	,,	450				

කළමෝවේද ඒ කතිකාවෙන් මිදී තොපට මම අසවල්තෙන උපතිම් කියා
පියා යන පිණිස ආමි, දූන් ඉන් මිදිතිමි එසේහෙයින් මම දෙව්ලොවට යෙමි
කීහ, එසඳ බිසව් කඳුළුධාරා වගුරුවමින් ස්වාමීනි නුඹවහන්සේ උදය රජ්ජුරු
වෝද නුඹවහන්සේගෙන් වෙන්ව මාවිසිය යෙන්නේ නැත. යම්සේ පෙර
නුඹවහන්සේ මා හා එක්ව වාසයවීනම දූනුත් එපරිද්දෙන්ම එක්වන නියා
යෙන් මට උගන්වා කතිකාවෙන් මිදී වැඩිය මැනවැයි කීහ. නැවත බිසවුන්ට
අනුශාසනා කරන්නාවූ ශක්‍රයෝ මෙසේ කියත් එඹල සොඳුර උදයභද්‍රාව
මේ ලෝකයෙහි සත්වයන් ආදී මධ්‍යම අන්තිමය යන මෙතුන් වයස ශීඝ්‍රව
වහනය කරන්නාවූ ගංගාවක් මෙන් නොනැවත වහාම ඉක්ම ගෙවෙන්
නේය, උපන්නාවූ සත්වයන්ට නොනැසී සිටීමෙක් නැත. බුදුන් ආදිකොට ඇති
සියළු සත්වයන්ගේ ජීවිතය අස්ථිරවන්නේය, සියල්ලවුන්ම රන්වන්වූ මටසිළු
ටුවූ ශරීරයෙක් ඇත්නම් එයින් නිරන්තරයෙන්ම ජරාවට පැමිණ නස්නේය.
ඒ කාරණාවෙන් උදයභද්‍රාවෙනි තොපින් මේ සියල්ලම පැමිණෙයි සිතා වහා
නොපමාව දසකුශල කර්මපථයෙහි යෙදෙව. තවද සොඳුර යම්එකම සත්ව
යක්හට මේ පෘථිවි මණ්ඩලය හා සියළු යසසෙක් පැමිණියේවීනම් එහි තෘප්ති
යක් සෑහෙයි යන්නක් නොසිතා පහනොවූ ක්ලේශ චිත්තයෙන් කළුරිය
කරන්නේය, එසේහෙයින් තෘෂ්ණාවෙහි තෘප්තියක් නැතිනියාව දනුව. තවද
මෑනියන් පුතනුවන්ටද පුතනුවන් මෑනියන්ටද පියානෝ පුතනුවන්ටද පුත
නුවෝ පියානන්ටද බෑනෝ නැගනියන්ටද නැගනියෝ බෑනන්ටද වල්ලභයා
ස්ත්‍රියටද ස්ත්‍රී වල්ලභයාටද ස්වාමියා වස්තුවටද වස්තුව සත්වයාටදැයි මේ සියල්
ලම මරණ කාලයෙහි පළමු වශයෙන් ඔවුනොවුන් නොලබා යාමෙන් ස්ථිර
යක් වීමක් නැතිබව දනුව, තවද මේ සංසාරයෙහි කපුටු ආදී තිරිසනුන්ගේද
මනුෂ්‍යයන්ගේද ආදීවූ සියළු සත්වයන්ගේද යන මේ දුර්ගති සුගති දෙක්හිම
සත්වයන්ගේ භෝජනද යසසද එක්ව කරන්නාවූ වාසයද ජීවිතයද යන මේ
සියල්ලම අස්ථිරයයි දැන අප්‍රමාදව දසකුශල කර්මපථයෙහි යෙදෙවයි කියා
මෙසේ මහබෝසතානෝ අවවාද කළාහ, බිසව්ද බොධිසත්වයන්ට අවවාද
කියන්නාහු දේවතාවෙනි තොප කීයේ ඉතා යහපත මේ සත්වයාගේ ජීවිකාව
නම් ස්ථිරනොවෙයි ස්වල්පය දුකින් මිශ්‍රව එසේ හෙයින් මම කසීරට හා සුරන්ධ
පුරය ඇර උදකලාව තපසට යෙමි කීහ. බොධිසත්වයෝ බිසවුන්ට අවවාද දී
දිව්‍යලෝකයටම ගියාහ. බිසව්ද දෙවන දවස් උදෑසන අමාත්‍යයන්ට රාජ්‍ය
පාවාදී තමන්ගේ එම නුවර සින්කළුවූ උයනෙහි ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව
ධර්මයෙහි හැසිර ආයුසංස්කාරයාගේ කෙළවර තිව්තිසා භවනයෙහි බොධි
සත්වයන්ටම පාදපරිචාරිකාව උපන්නාහ. සර්වඥයන් වහන්සේද මේ උදය
භද්‍ර ජාතක ධර්මදේශනා ගෙණහැර දක්වා වදාරා චතුසත්‍යය ප්‍රකාශකොට
පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක චතුස්සත්‍යයාගේ
කෙළවර ශාසනයෙහි උකටලීවූ භික්ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි
පිහිටියේක. එසමයෙහි උදයභද්‍රාදේවීනම් දූන් මේ රාහුල මාතාවෝය,
එසමයෙහි ශක්‍රදේවේන්ද්‍රයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන්
වහන්සේ දක්වා වදාළ සේක.

445
පානීය ජාතකය

තවද මේ ජාතකය ශාන්තවූ දාන්තවූ ගුණඇති බුදුරජාණන් වහන්සේ ක්ලේශ නිග්‍රහයක් අරභයා වදාළසේක.

එක්සමයෙක්හි සැවැත්නුවර වැසි පන්සියයක් පමණ පුරුෂයෝ සර්‍වඥයන් වහන්සේගෙන් බණ අසා මහණ උපසම්පදා ලැබ විහාර සීමා ඇතුළෙම වාසය කරන්නාහු මධ්‍යම රාත්‍රිවේලෙහි කාමවිතර්කයන් උපදවාහු මෙහි වත්මාන කථාව යටකියන ලද්ද හා සදෘශ වන්නේය, මෙහි බුදුන් නියෝගයෙන් අනඳසාමින් විසින් සඞ්ඝයා වහන්සේ රැස්කළ කල්හි බුදුහු පණවනලද ධර්‍මාසනයෙහි වැඩහිඳ භික්‍ෂු කෙණෙකුන් වහන්සේ උදෙසා සාමාන්‍යයෙන් වදාරණසේක් එම්බා මහණෙනි ක්ලේශයෝනම් ක්‍ෂුද්‍රයයි යන්නෙක් නැත, භික්‍ෂූන් විසින්නම් උපන්නාවූ ක්ලේශයන් එම විටම නිග්‍රහකටයුතුය පුරාතනයෙහි නුවණැත්තෝ අබුද්ධෝත්පාද කාලයෙහි පවා ක්ලේශනිග්‍රහකොට පසේබුදුවූවෝ වේදැයි වදාරා එක්තරා භික්‍ෂුකෙණෙකුන් වහන්සේ විසින් ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් රාජ්‍යය කරණ සමයෙහි කසීරට එක් ගමෙක්හි යාළුවෝ දෙදෙනෙක් පැන් ලබු දෙකක් ඇරගෙණ කුඹුරට ගොස් එක්තැනෙක තබා නියර ආදීවූ දෙය කොටා පැන් පිපාසවූ කල්හි පැන්තිබූ තැනට ඇවිත් පැන්බී යන්නේය එකල උන්දෙන්නා අතුරෙන් එකෙක් පැන්බොන පිණිස අවුත් තමාගේ පැන් නොනසන පිණිස අනිකාගේ පැන් ලබ්බෙන් පැන්බී මෙහෙකොට සවස ගෙට යන පිණිස ගොස් එක්තැනකින් නහා ගොඩනැගී සිට අද මාගේ කායද්වාරයෙන් කිසි පාපයක් පිරුනේදෝහෝයි සිතා පරීක්‍ෂාකොට සොරා පැන්බූ නියාව දැන කලකිරීමට පැමිණ මේ මාගේ තෘෂ්ණා වඩනේ මා අපායට දමාපියන්නක් මේය එසේහෙයින් ක්ලේශ නිග්‍රහ කෙරෙමි සිතා සොරා පැන්බීමම අරමුනුකොට විදර්‍ශනා වඩා පසේබුදු බවට පැමිණ තමන් විසින් ලබනලද ප්‍රත්‍යෙක බෝධිඥානය ආවර්ජනාකොට සිටියාහ. එකල බදවූ අනික් පුරුෂයා නහා ගොඩ නැගී සිට ඇයි යහළු ගෙට යම්හයි කීහ. එබසට පසේබුදුහු වදාරණසේක් තොපි ගෙට යව මට ගෙන් ප්‍රයෝජන නැත අපි පසේබුදුවූනමැයි වදාළසේක. එබසට ඒ පුරුෂයා කියන්නේ පසේබුදුහු නම් තොපසේ නොවෙතියි කීය, පසේබුදුහු වදාරණසේක් එසේකල පසේබුදුහු කෙබඳුදැයි වදාළසේක. ඒ පුරුෂයා කියන්නේ පසේබුදුන්ගේ දෑඟුල් මනා ඉසකෙස් වන්නේය, කසාය වස්ත්‍රය අඳින්නේය, උතුරු හිමාලයෙහි නන්දමූලක නම් පබ්භාරයෙහි වසන්නාහයි කීහ, එකල පසේබුදුන් අතින් ඉස පිරිමැද්දසේක ඒක්‍ෂණයෙහි ගිහිවෙස අන්තර්ධානව මනාවූ රත්වූ සිවුර දෙපට අඳනා ලද්දේමවිය, විදුලිය වන් පටිය බදනා ලද්දේමවිය, බඳුවද පෙත්තක් සමාන පැහැඇති පොරෝනා සිවුරද ඒකාංශයෙන්හි උරයෙහිමවිය. මේඝවර්‍ණවූ පාංශුකූල සිවුර කරලනලද්දේමවිය, මුත්වන්වූ මැටිපාත්‍රය වම්උරයෙහිම එල්වනලද්දේමවිය. මෙසේ ඒ පසේබුදුහු ආකාශයෙහිසිට ධර්‍මදෙශනා කොට නන්දමූලක පබ්භාරයට වැඩිසේක. එසේම අනිකුත් කසීගම්වැසි එක්

කොළොම් පුත්‍රයෙක් සල්පිල උන්නේ එක් පුරුෂයකු තමාගේ භාර්‍ය්‍යාව ඇර ගෙණයන්නාහු දැක උතුම්වූ රූ ඇති ස්ත්‍රියක ඉඳුරන්බිඳ ලෝභයෙන් බලා තැවතසිතන්නේ මේලෝභයමෙසේ මෙසේ වඩනේවීනම් මා නරකයෙහි එලන්නේයයි කලකිරී විදර්ශනා වඩා පසේබුදුබව ආකාශයෙහි සිට ධර්මදේශනා කොට නන්දමූලක නම් ගල්ලෙනටම වැඩිසේක. තවද කසීගම්වැසි දෙපුතු පියන් එක්ව ගමනක් නික්මුණාහු. එක් මහාවනයෙහි සොරු සිට දෙපුතුපියන් කෙණෙක් ලදුනම් පියා රඳවාගෙණ තාගේ පියා වස්තු ගෙණවිත්දී ගලවාගත සිට පුතු යවන්නාහ. පුතුරඳවාගෙණ පියා යවන්නාහ. දෙබෑකෙණෙක් ලදුනම් මලු රඳවාගෙණ බෑයායවන්නාහ. ගුරු ශිෂ්‍ය දෙදෙනෙකු ලදුනම් ගුරුන් රඳවාගෙණ ශිෂ්‍යයා අරින්නාහ. ශිෂ්‍යතෙම ශිල්පලෝභයෙන් වස්තු ගෙණවිත් දී ගුරුන් ගලවාගෙණ යන්නේය, එකල ඔහු දෙපුතුපියන් ඒ සොරු වන මුඛයෙහි සිටියා දැක ඔවුනොවුන්ට පියානෝය පුතනුවෝයයි නොකියම්හයි කථිකාකොට සොරුන්ට අසුව නොපි ඔවුනොවුන්ට කුමක් කියව්දැයි විචාළ කල්හි අපි කිසිනෑකමක් නැත්තම්හයි දැන බොරු කියා සොරුන්ගෙන් ගැලවී සවස නහා ගොඩනැගී සිට පුතනුවෝ තමන්ගේ ශීලය පරීක්‍ෂා කරන්නාහු තමන් කී බොරුව දැන මේ අකුශලය වඩනේ මා නරකයෙහි එලන්නේයයි මේ ක්ලෙශයට නිග්‍රහ කෙරෙමි විදර්ශනා වඩා පසේබුදුව ආකාශයෙහි සිට පියානන්ට ධර්මදෙශනාකොට නන්මූලක පබ්භාරයට වැඩිසේක. තවද කසීගම්වැසි එක්ගම්දෙටුවෙක් ප්‍රාණඝාත නොකරන්නේය, එකල බිලියම් කරණ පිණිස මහජනයා රැස්ව ගම්දෙටුවාට කියන්නාහු ස්වාමීනි අද බිලියම් කරණ දවසය එසේහෙයින් අප හැම ඌරන් මුවන් මරා බිලියම් කරම්හයි කීහ. එබසට ගම්දෙටුවානෝ කියන්නාහු පෙර නොප කරණ සැටියේ කරවයි කීහ. මනුෂ්‍යයෝද බෙහෝදෙන රැස්ව බොහෝ ප්‍රාණවධකළාහ. ගම දෙටුවානෝද බොහෝ මච්ඡමාංශ දැක මේ සත්වයෝ මෙතෙක් ප්‍රාණවධ කරන්නාහු මාගේ එකවචනයම නිසාම කළහයි කුකුස්ව කවුළුදෙර සිට විදර්ශනා වඩා පසේබුදුව ආකාශයට නැගී ධර්මදේශනාකොට නන්දමූල නම් පබ්භාරයට වැඩිසේක තවද කසීගම්වාසී ගම් දෙටුවෙක් සැණකෙළි පිණිස එක්වූ දනව්වාසීන්ට සුරාපානාදිය දී කෙළවයි අවසර දී ඔහු රා බී මත්ව ඔවුනොවුන් මරා දණ්ඩනයට පැමිණියාහ, එකල ගම්දෙටුවානෝ ඒ බව දැන සිතන්නාහු මා නොකීවොත් මොහු මෙතෙක් දුක් නොවිත්දේවේදැයි මෙපමණකිස් කුකුස්කොට විදර්ශනා වඩා ප්‍රත්‍යෙක බොධිඥානය උපදවා මහජනයාට ධර්මදෙශනාකොට ආකාශයට පැනනැගී නන්දමූලක පබ්භාරයට වැඩිසේක. මෙසේ කල්යාමකින් පසේබුදුහු පස්දෙනා වහන්සේ එක්ව පිඩුසිගන පිණිස බරණැස් නුවර දෙරට බැස මනාකොට හැඳ පෙරව ප්‍රසාදවනහවූ යාම ර්මෙන් පිඩුසිගා ඇවිදිනාසේක් රජගෙයි දෙරකඩට පැමිණිසේක. රජ්ජුරුවෝ උන්වහන්සේලා දැක මහා සතුටුව රජගෙට වඩාගෙණ ගොස් පය සෝධා සුවඳ තෙල් ගල්වා මධුරවූ ආහාර පාන වගීයෙන් සතප්පා එකත්පස්ව හිඳ ස්වාමීනි නුඹවහන්සේලා අභිවයෙහිම පැවිදි හොබනේය. මේ වයසේම මහණවනසේක් කාමයෙහි කෙසේ ආදීනවයක් දැක කුමක් අරමුණුකොට වූසේක්දැයි විචාළසේක. එකල ඔබ හැමත් වෙන් වෙන්කොට වදාරණසේක් එඹා රජ්ජරුවෙනි අපි දෙයාළු කෙණෙකුන්මෝ පැන් ලබු දෙකක් ඇරගෙණ ගොවිම්වරට ගියමෝ පිපාසකල එකෙක් ගොඩනැගී පැන් බොම්හ, එකල මම

මාගේ පැන් රක්නා පිණිස මිත්‍රයාගේ ලබ්බේ පැන් නොකියා බීපීමි, ඒ අකුශලයෙහි කලකිරීය, මා පැවිදිවූයේයයි වදාළසේක. අනික් පසේබුදුහු වදාරණසේක් රජ්ජුරුවෙනි මම පෙර ස්ත්‍රියක දැක ලෝභය උපදවා ඒ අකුශලයෙහි කලකිරී මෙබන්දක් නැවත මා කරා නොඑවයි කියා මා පැවිදිවූයේයයි වදාළසේක. තවද එක්කෙණෙකුන් වහන්සේ වදාරණසේක් පෙර අපි දෙපුතුපිය කෙණෙකුන්මෝ වනයෙහි සොරුන්ට අසුව උන් විචාළකල්හි අපි නොනැයම් හයි, බොරුකීහ, ඒ අකුශලයෙහි කලකිරී මෙබන්දක් මා කරා නොඑවයි කියා මා පැවිදිවූයේයයි වදාළසේක. තවද එක්කෙණෙකුන් වහන්සේ වදාරණසේක් මහරජ පෙර මම ගම්දෙටුවක්ව දේවතාවන්ට බිලිදෙන පිණිස සත්වයන්ට ප්‍රාණඝාත කරන්ට අනුදත්තෙමි, ඔහු හැමදෙනාම බොහෝ ප්‍රාණඝාත කළාහ. ඒ දැක මා නිසාවේද මෙතෙක් තිරිසනුන් නටුයේයයි ප්‍රාණඝාතයෙහි කලකිරී මතු මාකරා මෙසේවූ අකුශයලක් නොවවයි කියා මා මහණවූයේ යයි වදාළසේක. තවද එක්කෙණෙකුන් වහන්සේ වදාරණසේක් මහරජ පෙර මම ගම්දෙටුවක්ව සැණකෙළි දවසෙක බොහෝදෙනාට අනර්ථයට කාරණාවූ සුරාපානය බොන්නට අවසර දිනිමි, ඔහු ඇම රා බී මත්ව ඔවුනොවුන්ට හිංසා පීඩාකොට බොහෝදෙනා දණ්ඩනයට පැමිණියාහ. ඒ අකුශලය දැක නැවත මෙබන්දක් මා කරා නොඑවයි කියා මහණවූයේයයි වදාළසේක. රජ්ජුරුවෝ පස්දෙනා වහන්සේගේම ධර්මය අසා සතුටුව සිවුරු පිළිද බෙහෙත් පසද පිළිගැන්වූහ, උන්වහන්සේලාත් රජ්ජුරුවන්ට අනුමෙවෙනි බණ ධර්මදේශනාතොට නැවත වාසස්ථානයට වැඩිසේක. එදවස් පටන් රජ්ජුරුවෝ වස්තු කාමයෙහි කලකිරී ඇල්මක්නැතිව නොයෙක් රසයෙන් උතුම්වූ ආහාරය අනුභවනොකොට ස්ත්‍රීන් හා බැණ නොනැගීම නොකැඳවා ශ්‍රීයහන් ගබඩාවට වැද සුදුවූ භිත්තිය බලා කිසුනුපිරියම් කොට ධ්‍යාන උපදවා පඤ්චකාමයෙහි නින්දාකරන්නාවූ බොහෝ පසමිතුරන් ඇති පිළිකුල් දුගීඳවූ මේ කයට නින්දාවේවයි මෙබඳුවූ මම කාමයෙහි සෙව්නෙමි මෙබඳුධ්‍යාන සැපයක් නොලබම්ද, එ කාමයට නින්දාවේවයි කියමින් උන්හ, ඉක්බිත්තෙන් බිසව් රජ්ජුරුවෝ පසේ බුදුන්ගෙන් බණකථා අසා කලකිරුණාවූ සවරූපයෙන්ද අප හා සමඟ කථානොකොට යහන්නබඩාවට්වන්හ. මා පරීක්ෂාකරන්ට උවමැනවයිසිතා ශ්‍රීයහන්ගබඩාව දොරකඩට ගොස් කාමයට නින්දාකොට උදන්අනන්නාවූ රජ්ජුරුවන්ගේ බස් අසා රජ්ජුරුවෙනි කාමයට නින්දානොකරව, කාම සැපසේවූ සැපයෙක් ඇද්දැයි වර්ණනාකරන්නාවූ රජ්ජුරුවෙනි මේ කාමය නම් මහත් ආස්වාද ඇත්තේය, කාමයට වඩනාවූ එකද සැපයෙක් නැත, එසේවූ කාම සැපයට යමෙක් සිටියේවීනම් සත්වතෙම අපායට නොගොස් ස්වර්ගයෙහිම උපන්නේයයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ බිසවුන්ට රෑනැතිව නැගී සිටි යාවූ චණ්ඩාලිය කුමක් කියවුද, කාමයෙහි සැපයෙක් නම් කොයින්ද පෙරළෙන්නාවූ ස්වභාව ඇත්තේයයි නින්දා කරන්නාවූ මේ කාමය ස්වල්ප සැප ඇත්තේය, කාමයට වැඩිදුසකුන්නැත එසේවූවේ වී නමුත් ඒ සත්ව තෙම නරකයෙහි උපදනේය. තවද මනාකොට මුවහත් ගානාලද විෂ පෙවූ කඩුවක් යම්සේද ශස්ත්‍රයක් යම්සේද ළය එල්ලාව බැඳ එල්ලනලද්දේ යම්සේද කාමයන් එපරිද්දෙන්ම මහත් භය හා දුක් ඇත්තේය. තවද පුරුෂ ප්‍රමාණයවත් වැඩි හැඹුරුවූ සාලඟුරුවලෙක්හි හුනුවාවූ සත්වයෙකුට

දවසක් මූළුල්ලෙහි රත්කරණලද යකබලෙක්හි හුනු සත්ත්වයෙකුට යම්සේ දුක්ද කාමය නම් ඊටත් වඩා දුක් ඇත්තේය. හලාහල විෂයෙන් යම්සේ කකියන තෙලක් යම්සේද පිරීකිය තඹ ලෝහාදිය යම්සේ සත්ත්වයන් හුනුකල දුක්දේද මේ කාමය ඊටත් වඩා දුක් ඇත්තේයයි යනාදීන් බිසවුන්ට ධර්මදේශනාකොට අමාත්‍යයන් රැස්කරවා එඹා පින්වත් අමාත්‍යයෙනි, තොපි ඇම රාජ්‍යය පිළිපදුව මම මහණවෙමි කියා අමාත්‍යයන්ට රාජ්‍යය පාවාදී මහජනයා හඬමින් වළපමින් සිටියදී තැගීසිට අවවාදකොට ආකාශයෙන් උතුරු හිමාලයට ගොස් සිත්කළු තෙනක පන්සල් මවා ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ආයුෂයාගේ කෙළවර ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය. සර්වඥයන්වහන්සේ මේ පානීය ජාතකය ගෙණහැර දක්වා වදාරා එම්බා මහණෙනි ක්ලේශය නම් කුඩායයි නැත, සවල්පමාත්‍රයකුදුවුව නුවණැත්තන් විසින් නිග්‍රහකටයුතුයයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. ඒ ධර්මයන්ගේ කෙළවර පන්සියක් භික්ෂූන්වහන්සේ රහත්වූසේක. එකල පසේ බුදුන්වහන්සේ පිරිණිවිසේක. එකල බිසව් නම් දැන් මේ රාහුල මාතාවෝය, එකල රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

446
යුධඤ්ජය ජාතකය

තවද මේ ජාතකය සත්ත්වයන් ජාති කාන්තාරාදීන් තරණයට සාත්තුවක් වැනිවූ හෙයින් ශාස්තෘ නම් බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මහබිනික්මන් අරභයා වදාළසේක.

ඒ කෙසේද? යත්

එක්දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්වළුන් භික්ෂූන්වහන්සේ එම්බා ඇවැත්නි ඉදින් සර්වඥයන් ගිහිගෙයි වසනසේක් වීනම් සියළු චක්‍රවාට ගර්භයට නායකවූ සප්ත රත්නයෙන් සමන්විතව සෘඩියෙන් සමන්විතවූ පුත්‍රයන් දහසක් පිරිවරකොට ඇති සක්විති රජවනසේක. එසේවූ ශ්‍රී විභූතියක් හැර කාමයෙහි ආදීනව දැක මධ්‍යම රාත්‍රි වේලෙහි ඡන්න නම් අමාත්‍යයාගේ සහායෙන් කන්ථක නම් අශ්වරාජයාට නැගී මහබිනික්මන් නොආවා නම් ගංතෙරේදී මහණව සාවුරුද්දක් දුෂ්කරක්‍රියාකොට සර්වඥතාඥානයට පැමිණෙනසේකැයි බුදුන්ගේ ගුණකථාව කියමින් උන්සේක. එකල බුදුහු දිව්කණින් අසාවදාරා තුන්තරා ගමනින් එක්තරා ගමනකින් දම්සභා මණ්ඩපයට වැඩ ධර්මාසන මස්තකයෙහි වැඩහිඳ මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදූයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කීකල්හි එම්බා මහණෙනි බුදුහු දැන්මතු නොවෙයි පෙරත් මහබිනික්මන් නික්මුනෝවේදූයි වදාරා එක්තරා භික්ෂුකෙණෙකුන් වහන්සේ විසින් ආරාධිතවූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

යටගිය දවස බරණැස්නුවර තෙම උදය ජාතකයෙහි සුරුචිත නම චුල්ල සුතසෝම ජාතකයෙහි සුදස්සන නම, සොනන්ද ජාතකයෙහි

බ්‍රහ්මවඩ්ඪන නම, බණ්ඩහාල ජාතකයෙහි පුෂ්පතීම නම, මේ යුධඤ්ජය ජාතකයෙහි රම්ම නම් නුවරක්විය. එහි සබ්බදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි උන්ගේ දහසක් පමණ පුත්‍රයෝ වත්නාහ, ඔවුන් හැමදෙනාට වැඩිමාළු පුතනුවෝ යුධඤ්ජය කුමාරයන්ට යුවරජ දුන්නාහ ඒ යුධඤ්ජයකුමාරයෝ එක් දවසක් උදෑසනක්හේ උතුම්වූ රථයකට පැන නැගී මහත්වූ ශ්‍රී සමෘධියෙන් උයන්කෙළියට යන්නාහු ඒ මග තණ අග මකුළුදැල් ආදියෙහි මුතුදැල් ආකාරයෙන් එල්ලෙන්නාවූ පිනිබින්දු දැක යහළු රථාචායයී මේ කිමෙක්දැයි විචාරා දේවයන් වහන්ස මේ හිම කාලයෙහි වැටෙන්නාවූ තුසාර බින්දුයයි යනු අසා දිවාකළ උයන් කෙළි කෙළ සවස් වේලෙහි නැවත නුවරට එන්නාවූ පිණිබිඳු නොදැක රථාචායයීයා අතින් ඒ නොපෙණෙන්ට කාරණා කිම්දැයි විචාරා දේවයන්වහන්ස ඒ පිණිබිඳු ඉරනැගිකල්හි සිඳීබිඳී යන්නේයයි කීකල්හි මේ සත්ත්වයන්ගේ ජීවිත සංස්කාරයන් තණ අග රැඳි පිනිබිඳු පරිද්දෙන් අසම්රවන්නේයයි කලකිරීමට පැමිණ මා විසිනුත් ජාතිජරා මරණය යන මේ සියල්ලත් නොපෙණෙන තෙක් දෙමව්පියන් අනුදන්වා මහණවන්නට වටනේයයි තුසාර බින්දු අර මුණුකොට මේ භවත්‍රය ගිනිගෙණ දිලියෙන්නාවූ ගෙයක්මෙන් සිතා තමන්ගේ ගෙවගොස් මනාකොට සරහනලද ශාලාවෙහි උන්නාවූ තමන්ගේ පියානන් සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිට මහණවන්ට යාචඤා කරන්නාහු මෙසේ කියත්. මිත්‍රයන් හා අමාත්‍යයන් විසින් පිරිවරණලද රථොත්තමවූ දේවයන් වහන්ස නුඹවහන්සේ වැඳ දන්වම් මම මහණවනු කැමැත්තෙමි නුඹවහන්සේ අනුදැනවදාළ මැනවැයි කීහ, ඉක්බිති රජ්ජුරුවෝ ප්‍රතික්‍ෂෙප කොට වළකා කියන්නාහු එම්බා පුත තොපට ඉදින් පඤ්ච කාමයෙන් යමෙක් අඩුවීනම් මම ඒ සම්පූණී කොට ලම් යමෙක් තොපට හිංසා පීඩාවක් කරන්නේවීනම් එයින් මම වළකම් එසේහෙයින් තොපි මහණ නොවවයි කීහ, එබස් අසා කුමාරයෝ කියන්නාහු දේවයන්වහන්ස මට පඤ්චකාමයෙන් අඩුවෙකුත් නැත හිංසාවක් කරණ කෙණෙකුත් නැත. බල එකෙක් නම් ජරා මරණ මා කරා නොඑනතෙක් පළමුව මම මට ප්‍රතිෂ්ඨාවක් කරණා කැමැත්තෙමි, කෙසේවූ පිහිටෙක් ඇද්දැයි යතහොත් යම් ද්වීපයෙක් ජරාමරණ නැමැති සොරහු නෙරපාරීනම් එසේවූ නිවාණ නැමැති විපයට යනු කැමැත්තෙමි මා නොවැළකුව මැනවැයි කීහ. මෙසේ පියානෝ පුතනුවන් වළක්නාවූ පුතනුවෝ පියානන්ට යාචඤා කරන්නාහයි යනාදීන් බොහෝ ප්‍රත්‍යුත්තරකොට නැවත කුමාරයෝ කියන්නාහු රථොත්තමවූ දේවයන්වහන්ස කාමයෙන් මත්වූ කාමවශගයට පැමිණියාවූ ජරාවශගයට පමුණුවාද යම්සේ මම සර්‍වඥතාඥානය සමධිගම්ය කළ හෙත්නම් එපරිද්දෙන් මා නොවළකා මහණවන්ට අවසර දුනමැනවැයි කීහ. මෙසේ කීකල්හි රජ්ජුරුවෝ කිසිවක් මුවෙන් නොබැණ උන්හ. එකල කුමාරයන්ගේ මව් බිසව් පුතනුවන් පියානන් අතින් මහණවන්ට අවසර ඉල්වන නියාව අසා කුමක් කියව්ද දරුවෙනි කියමින් වියලුනාවූ හෘදයවස්තුව හා සුබ ඇතිව රන්සිව් ගෙයකට නැගී වහ වහා අධිකරණ ශාලාවට අවුත් පුතනුවන්ට යාචඤාකරන්නාහු එම්බා පුත තොපට යාචඤාකොට වළකා කියම්, මම තොප බොහෝ කාලයක් දැක දැක ඉන්නා කැමතියෙමි එසේහෙයින් පුත යුධඤ්ජය කුමාරයෙනි, තොප මහණ නොවවයි කීහ.

ඒ අසා කුමාරයෝ කියත්තාහු එම්බා මැතියෙනි තණ අග පිනිබින්දු යම්සේ ඉරුතැගි කල්හි සිඳී බිඳී විනාශයට පැමිණේද එපරිද්දෙන්ම සත්ත්ව යන්ගේ ආයුෂයත් විනාශයට පැමිණෙන්නේය. එසේහෙයින් මා නොවැ ළකුව මැනවැයි කීහ. බිසවු මෙසේ කීකල්හි නැවතත් යාච්ඤාකර පියා නන්ට කියන්නාහු රජොත්තමවූ රජ්ජුරුවන්වහන්ස සංසාර කාන්තාර යෙන් එතරවන්නාවූ මා වළකන මේ මාගේ මැතියන් වහා යානාවකට නැගී රජගෙට යන පරිද්දෙන් සම්මත කළ මැනවැයි කීහ. රජ්ජුරුවෝ පුතනුවන්ගේ බස් අසා බිසවුන්ට කියන්නාහු සොඳුර යව, තොප වහා රන් සිවිගේකට පැනනැගී රතිවර්ධන ප්‍රාසාදයට නැගෙවයි කීහ. බිසව් රජ්ජුරුවන්ගේ බසට සිවියනොගී සිවිගේකට පැනනැගී ස්ත්‍රීසමූහයා පිරිවරා ගොස් ප්‍රාසාදයට නැගී කුමකින් කුමක් වේද්දෝහෝයි විනිශ්චය ශාලාවේ දෙර බලබලා සිටියාහ. බොධිසත්ත්වයෝ මැතියන් ගියකල්හි නැවත පියා නන්ට යාච්ඤාකොට පියානන්වහන්සේ විසින් වැළකිය නොහී එසේවීනම් තොපගේ මනෝරථය මුදුන්පමුණුවා ගණුවයි අනුදත් කල්හි බොධිසත්ව යන්ගේ මල්වූ යුධිෂ්ඨිල කුමාරයෝද පියානන් වැඳ පියානන්වහන්ස මට පැවිද්ද අනුදන මැනවැයි අනුදන්වාගෙණ දෙබෑයෝම පියානන් වැඳ සමු ගෙණ පඤ්චකාමය ඇර මහජනයා පිරිවරා විනිශ්චය ශාලාවෙන් නික්මුණාහ. බිසව් යන්නාහු බොධිසත්ත්වයන් දුක මාගේ පුතනුවන් මහණවූ කල්හි මේ රම්‍ය නුවර සිස්වන්නේයයි අඬන්නාහ. එම්බා වටකොට සිටිනා ස්ත්‍රිනි සබ්බ දත්ත පියරජ්ජුරුවන් විසින් අනුදන්නාලද මාගේ පුතනුවෝ තපසට යන් නාහ. උන් තපසට ගියකල මේ රම්‍ය නුවර සිස්වන්නේය තොපි හැම වහා ගොස් වළකවයි කීහ. බොධිසත්ත්වයෝ තවම මහණව නොවූනාව දෙමව් පියන් වැඳ මලනුවන් යුධිෂ්ඨිල කුමාරයන් කැඳවාගෙණ නුවරින් පිටත්ව මහජනයා වළකා හිමාලයවනයට වැද සිත්කළුවූ තැනක පන්සල් මවා ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධ්‍යානාභිඥාවන් උපදවාගෙණ වනමුල් ඵලාඵල යෙන් ජීවත්වන්නාහු ආයුෂයාගේ කෙළවර බ්‍රහ්මලෝකයෙහි උපන්නා හුය. ඒ අර්ථය ප්‍රකාශකරන්නාවූ බුදුරජානන්වහන්සේ යුධඤ්ජය යුධිෂ්ඨි ලය යන කුමාරවරුන් දෙදෙන දෙමව්පියන් හැර මරහුගේ සංගමය සිඳ මහණවූවෝ වේදැයි වදාරා එම්බාමහණෙනි බුදුහු මහබිනික්මන් කළේ දැන් මතු නොවෙයි පෙරත් මහබිනික්මන් කළෝ වේදැයි වදාරා මේ යුධඤ්ජය ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි දෙමව්පිය දෙදෙන නම් දැන් මේ ශුද්ධෝදන රජ්ජුරුවන් හා මහාමායාදේවීය, එසමයෙහි යුධිෂ්ඨිල කුමාරයෝ නම් දැන් මේ ආයුෂ්මත් ආනන්දස්ථවිරයෝය, එසමයෙහි යුධඤ්ජය කුමාරයෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

447
දසරථ ජාතකය

තවද මේ ජාතකය ජේතවනාරාමයෙහි වසන්නාවූ සුන්දර ගතියක් ඇති හෙයින් සුගතනම්වූ සර්වඥයන්වහන්සේ, පියා මල සෝකයෙන් අඬන්නාවූ එක් කෙළෙඹිපුත්‍රයෙකු අරභයා වදාළසේක.

ඒ කෙසේද? යත්

ඒ කෙලෙඹිපුත්‍රයා පියා මලකල්හි සෝකයෙන් මඩනාලද්දේ කළමනා සියළු කර්‍මාන්ත හැර සෝකයම අනුව පවත්නේය. සර්‍වඥයන්වහන්සේ අළු යම් වේලෙහි මහාකරුණා සමාපත්තියෙන් නැගී ලොව බලාවදාරණසේක් ඒ පුරුෂයාගේ ශ්‍රොතාපත්ති ඵලයට උපනිශ්‍රය ඇතිතියාව දුටු දෙවන දවස් උදෑසනම සැවැත්නුවර පිඩුසිගා වළඳා කරණලද ආහාර කෘත්‍යය ඇතිසේක් භික්ෂූන් වහන්සේ යවා එකම භික්ෂුකෙණෙකුත් කැඳවා කෙලෙඹිපුත්‍රයාගේ ගෙට ගොස් ඔහු විසින් වැඳ එකක්පස්ව උන්කල්හි මිහිරිවූ කටහඬින් කථාකරණසේක් සෝකය කිම්ද උපාසකයයි වදාරා ඔහු විසින් එසේය ස්වාමීනි පියා කෙරෙහි කරණ ලද සෝකයෙන් මා පෙළෙන්නේයයි කීකල්හි එම්බා උපාසකය පුරාතනයෙහි නුවණැත්තෝ අෂ්ටලෝක ධර්‍මය තත්වහෙයින් දන්නාහු පියානන් කළුරිය කලකල්හි සවල්ප මාත්‍රයකුත් සෝක නොකොළෝ වේදැයි වදාරා ඒ උපාසකයා විසින් ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදළසේක,

ඒ කෙසේද? යත්

යටගිය දවස බරණැස්නුවර දසරථ නම් මහරජ්ජුරුකෙණෙකු අගති ගමනින් දුරුව දශරාජධර්‍මයෙන් රාජ්ජය කරන්නාහුය. ඒ රජ්ජුරුවන්ගේ සොළොස්දහසක් පුරාඟනාවන්ට නායක අග්‍රමහෙසිකා බිසව් පුතුන් දෙදෙනෙකු හා එකම දියනි කෙණෙකුත් වැදූහ. ඔවුන් අතුරෙන් වැඩිමාළු පුත්‍ නුවෝ රාමපණ්ඩිත නම්වෙති, මලනුවෝ ලක්ෂමණ කුමාර නම් වෙති, දිය තියෝ සීතා දේවීන් වන්නාහ. මෙසේ වයස ගිය බිසව් කළුරිය කළාහ. එකල රජ්ජුරුවෝ බොහෝ සෝකයට පැමිණ අමාත්‍යයන් විසින් සන්හිඳු වනලද්දාවූ බිසවුන්ගේ ආදාහනකෘත්‍යය කරවා අනික් බිසෝකෙණෙකුත් අග මෙහෙසුන් තනතුරෙහි තිබූහ. එකල ඒ බිසව්ද රජ්ජුරුවන්ට ප්‍රියවන්නා හුය. මනවඩවන්නාහු කල්යාම්කින් දරුගැබක් ඇතිව පුතනුකෙණෙකුන් වැදූහ. ඒ කුමාරයන්ට භරත කුමාරයෝයයි නම්තුබූහ. එකල රජ්ජුරුවෝ පුත්‍ර ස්නෙහයෙන් බිසවුන්ට කියන්නාහු සොඳුර තොපට වරයක් දෙමි ගණු වයි කීහ. බිසව් වරගත්තෝ කුමාරයන් සත්අටඇවිරිදි අවස්ථාවෙහි රජ්ජුරුවන් සමීපයට ගොස් දේවයන්වහන්ස නුඹවහන්සේ විසින් මට වරයක් දෙනලද්දේවේද දුන් මට ඒ දුනමැනවැයි කීහ. රජ්ජුරුවෝත් යහපත දේවීනි ගණුවයි කීහ. එකල බිසව් කියන්නාහු දේවයන්වහන්ස නුඹවහන්සේ විසින් මාගේ පුතනුවන්ට රාජ්ජය දුනමැනවැයි කීහ. එබසට රජ්ජුරුවෝ රැහැනිව අසුරගසා නැසීගියාවූ චණ්ඩාලිය මාගේ පුත්‍රයෝ දෙදෙනෙක් ගිණි කඳන්සේ දිලිසෙන්නාවූ ඔවුන් මරවා තිගේ පුතාට රාජ්ජය ඇරදෙනු කැමැත්තෙහිදැයි භයගැන්වූහ. බිසව් භයපත්ව ශ්‍රීයහන් ගබඩාවට වැද දෙවෙනි දවසෙක නැවත රාජ්ජය ඉල්වන්නාහුය, රජ්ජුරුවෝද බිසවුන්ට ඒ වරය නොදී සිතන්නාහු ගැනුතම් කෙළෙහිගුණ නොදන්නාහ. මිත්‍රද්‍රෝහිය තෝ මාගේ නැයෝයයි කියා සොරපතක් ගෙණ අත්ලස් හෝ දී මාගේ දරුවන් මරාපුනම් නපුරයි සිතා කුමරුන් දෙන්නා සමීපයට ගෙන්වා ඒ බව කුමාරවරුන්ට කියා දරුවනි තොපි මෙහි වසනකල අන්තරායෙක් වීනම් නපුරුයි, තෙපි දුරුරටකට හෝ වලකට හෝ ගොස් මාගේ

ඇවෑමෙන් අවුදින් තොපගේ කුලසන්තකරාජ්‍යය ගණුවයිකියා ලක්‍ෂණ පාඨකයන් ගෙන්වා තමන්ගේ ආයුසංස්කාරය විචාරා ඉදිරියෙහි දොළොස් අවුරුද්දක් පවතින්නේයයි අසා එම්බා දරුවෙනි මීට දොළොස් අවුරුද්දක් ගියකල අවුදින් සේසත් නංවා රාජ්‍යය කරවයි කීහ. කුමාරවරුත් යහපතැයි පියරජ්ජුරුවන් වැඳ සමුගෙණ අඬමින් වලපමින් ප්‍රාසාදයෙන් බටහ. එකල සීතාදේවී මමත් බෑනන්වහන්සේලා කැටුව යෙමි කියා පියානන් වැඳ සමුගෙණ අඬමින් වලපමින් නික්මුණාහ. මෙසේ තුන් බින් තෝම මහජනයා පිරිවරා නික්ම මහජනයා රඳවා අනුක්‍රමයෙන් හිමාලයට ගොස් සමෘද්ධවූ ජලාශ්‍රයන් ඇති සුලභවූ ඵලාඵලයන් ඇති ස්ථානයෙක්හි පන්සල් මවා ඵලාඵලයෙන් යපෙමින් වාසයකරන්නාහුය, එකල ලක්‍ෂණ පණ්ඩිතයෝ සීතාදේවීන්ටද රාමපණ්ඩිතයන්ටද ය වඥකරන්නාහු තුඹවහන්සේ අපට පිතෘස්ථානයෙහි සිටිසේක. එසේහෙයින් ආශ්‍රමයෙහි තුඹවහන්සේ රැඳුන මැනව ඵලාඵල ගෙණහැර තුඹවහන්සේ පෝෂ්‍යකරමුහයි ප්‍රතිඥ ගෙණ එදවස් පටන් ආශ්‍රමයෙහි රාම පණ්ඩිතයන් රඳවා තුමූ දේවීන් ඵලා ඵල ගෙණහැර පොෂ්‍යයකරන්නාහ. මෙසේතුන්බින්තොම පලාපලයෙන් ජීවත්ව වසනකල දසරථ රජ්ජුරුවෝ පුත්‍රස්නෙහයෙන් පෙළෙමින්ම නවවෙනි අවුරුද්දෙහි කාලක්‍රියාකළහ. එකල බිසවු රජ්ජුරුවන් ආදාහන කරවා ඉක්බිති මගේපුතනුවන් භරතකුමාරයන් රාජ්‍යාභිෂෙක කරන්ට වන්හ. එකල අමාත්‍යයෝ රාජ්‍යස්වාමීහු වල්හි වසන්නාහ. එසේහෙයින් භරතකුමාරයන්ට රාජ්‍යයනොලැබෙයි වැලැක්කාහ. එකල භරතකුමාරයෝ මාගේ බෑනන් වලින් ගෙණවුත් අභිෂෙකකරවමි පචකකුධ භාණ්ඩයෙනුත් ගෙන්වාගෙණ සිවුරඟසෙනග ගෙණ රාමපණ්ඩිතයන් වසන තැනට ගොස් නුදුරු තෙනක කඳවුරුබැඳ අමාත්‍යයන් කිපදෙනෙකු හා සමග ලක්‍ෂණ කුමාරයන්ද සීතාදේවීන්ද වල්ගිය වේලාවට ආශ්‍රමයට වැද පන්සල් දොර කඩ තබනලද රන්රුවක් වැනිව උන්නාවූ රාමපණ්ඩිතයන් සමීපයටගොස් වැඳ එකත්පස්ව සිටියාහුය. දසරථ රජ්ජුරුවන් මළනියාවකියා අමාත්‍යයන් හා සමග රාමපණ්ඩිතයන් පාමුල්හි වැටී ඇඬූහ. රාමපණ්ඩිතයෝ නොහැඬූහ, සොකමාත්‍රයක් නොකළාහ, භරතකුමාරයන් අඬා වලපමින් උන්කලට සවස්වේලේ වල්ගිය කුමාරවරුදෙදෙන පලාපල ඇරගෙණආහ. එකල රාමපණ්ඩිතයෝ කියන්නාහු මේ කුමාරවරුදෙදෙනම බාලයෝය සෝක සහනයකල නොහෙන්නෝයයි සිතා සතිකම තොපගේ පියානෝ මළෝයයි කීකල්හි සෝක ඉවසියනොහී ලයැපැලී මියයන්නා එසේහෙයින් උපායෙන් මුන්දියටබාවා මේ ප්‍රවෘත්තිය කියම්සිතා කුමාරවරුන් දෙදෙනා ඉදිරියේ එක්වන් පොකුණක්දක්වා තොපි ඇම ඉතාකල්යවා ආහෙයින් තොපට දඬුවමැයිකියන්නාහු ලක්‍ෂණකුමාරයන් හා සීතාදේවීන් හා දෙන් තම මෙසේඑව තොප පමාවූවාට දඬුවම්පිණිස කරවටක් දියටබැස සිටුවයි කීහ. එබස හා සමග ඔහු දෙදෙනම දියටබැස සිටියාහ කුමාර එකල පියානන් මළනියාව කියන්නාවූ රාමපණ්ඩිතයෝ එම්බා ලක්‍ෂණකුමාරයන් හා සීතාදේවීනි මේ භරතකුමාරයෝ දසරථරජ්ජුරුවන් මළහයි කියති කීහ ඔහු දෙදෙන පියානන් මළහයි කියන බස අසමින් විසංඥව දියපිට හුනහ, දෙවනිවත් තුන්වෙනිවත් නගාසිටුවා එපවත් කියා දියෙන් ගොඩනගා මදක් අස්වැසිලි ලත් කල්හි ඇම එක්ව අඬාවැලප උන්කල භරත කුමාරයෝ සිතන්නාහු මාගේ බෑනන්වහන්සේ ලක්‍ෂණ කුමාරයෝද මාගේ

නැගනියෝ සීතාදේවීද පියානන් මළනියාව අසා සෝකසන්තයකළනොහී විසංඥව ගියාහ. රාමපණ්ඩිතයෝ වනාහි නොහඬන්නාහුය සෝක නොකාරන්නාවූ උන් සෝක නොකරණ කාරණා විචාරන්නාහු රාමපණ්ඩිතයන් වහන්ස නොකටයුත්තෙහිද තුඹවහන්සේ සෝක නොකරන්නෝ කවර ආනුභාවයකින්ද? තුඹවහන්සේ පියානන් මළනියාව අසාත් සෝකයෙන් නොපෙලෙන්නට කාරණා කිම්දැයි විචාළහ. ඉක්බිත්තෙන් රාමපණ්ඩිතයෝ තමන් සෝකනොකරණ කාරණා කියන්නාහු එම්බල හරතකුමාරයෙනි ජීවත්වන්නාවූ සත්ත්වයෙකුගේ මරණ කාලයෙහි සෝකයෙන් අඬන්නාවූ කිසි සත්වයෙක් රැකගතනොහේද? සෝක සන්හිඳුවාගත නොහේද? එසේහෙයින් දූත් අෂ්ටලොකධර්මය සත්‍යහෙයින් කියන්නාහු මෙබඳුවූ නුවණැති ප්‍රාඥයක්හු මරණානතරයාගේ කෙළවර මළාවූ සත්වයක්හු මළැයි තමා තැවීමෙන් කිම්ද? කිසිම උපකාරනැති සෝකකිරීමෙන් කවර ප්‍රයෝජනද මළ හරත කුමාරයෙනි මේ මරණ තම් රන්රුවනට බඳුවූ රූ ඇති ළදරුයයිද කුමාරාදී කුල ඇත්තන්ද වැඩිහිටි ශක්තිසම්පත්ත යෝධයන්ද නුවණැත්තාවූ පෘථග්ජනයන්ද බුඬාදීවූ ප්‍රාඥයන්ද චක්‍රවර්ති ආදීවූ ඉසුරුමතුන්ද වස්ත්‍ර අන්නපාන නොලබන්නාවූ දිළිඳුයයියන මේ සියල්ලවුන් කෙරෙහි චෙතසක් නැත්තෝය ඒ සියල්ලෝම මරුහා කිසි ලැජ්ජාවක් නැතිව එහිම හෂ්මවන්නාහ. තවද මළ හරතයෙනි යම්සේ විලිකෂව ගියාවූ එලයෙන් විලික්ෂුනු නැත්පටන් තුවවුවෙන් දූත් ගිලිහෙයි කියා භය වේද එහි වැටීම ඒකානතයෙන් නියමද ජීවත්වන්නාවූ සත්වයාගේ ජීවිතයන් ඒකානතයෙන්ම අසවල් වේලෙහි අසවල් ඇසිල්ලෙක මියෙති නියමයක් කළනොහැක්කේය, තවද උදැසන දුටුවාවූ බොහෝ සත්වයෝ සවසට නොපෙණෙන්නාහ, සවස දුටු බොහෝ සත්වයෝ උදැසන නොපෙණෙන්නාහ, මරුමුඛයට පෙණෙන්නාහ, තවද මාගේ පියානෝය පුතනුයයි අඬන්නාවූ යම් සත්වකෙණෙක් තෙම ගතිමුඪවනෙමේ තමා පෙළෙන්නේය සවල්ප මාත්‍රයකුත් වැඩක් එලවාගත නොහෙන්නේය ඕහට අතික්වැඩකුත් කළ නොහෙන්නේය, මළාවූ සත්වයා ගෙන්වාගත නොහෙන්නේය. තවද යම් සත්වයෙක් අඬන්නේවීනම් ඒසේවූ සත්වතෙම කෘශවන්නේය, නපුරු ශරීර වර්ණ ඇතිවන්නේය, එසේහෙයින් තමාගේ කාය චිත්ත දෙකටම තාපනය කරණ විවරක්ම වන්නේය. ඒ ඇඬීමෙන් මළාවූ සත්වයා ජීවත්වන්නේත් නැත ඕහට ඇඬීමම වන්නේය. තවද යම් නුවණැති සත්වයෙක් තෙම තමා වසන්නාවූ ගෙය ගිනිගත්කල්හි මදකුත් මලීනකමක්නොවී සියදැස් ගණින් පැන්කළ සලා ගිනිනිවාද එපරිද්දෙන්ම නුවණැති සත්වතෙම නැංගාවූ සොකාග්නිය නිවනේය වානමුඛයෙන් අරණලද පුලුන් රැලෙක් යම්සේද නුවණැත්තෝ එපරිද්දෙන්ම සෝකය නසා දුරුකරන්නෝය. තවද යම්සත්වයෙක් තෙම පරලොවයන්නේ උදකලාවම යන්නේය ක්ෂත්‍රියාදී යම් කුශලයෙක් උපනහොත් උදකලාවම උපදනේය. එතන මාගේ මිත්‍රයෝය නෑයෝය මැතියෝය පියානෝයයි එක්ව සන්වාසය කරණ පමණක් විනා සියළුම සත්වතෙම කළාවූ කුසල් අකුසල් දෙකම ප්‍රාණප්‍රතිෂ්ඨාකොට ඇත්තේය. ඒ කාරණය හේතුකොටගෙණ බොහෝ ඇසූ පිරූ තැන් ඇති නුවණැති සත්වතෙම අෂ්ඨවිධවූ ලෝක ධර්මයද මෙලොව පරලොව දෙක්හි බලන්නේවීනම් ඕහට මහත්වූ සෝකයකුත් ශරීර තාපනය නො රන්නේය. තවද සත්වයාහට ලාභ, අලාභයද, අයශද, යසසද නින්දාවද, ප්‍රශංසාවද, සැපයද

අනැපයද, යත මේ සියල්ලම නිත්‍යබව සත්‍වයන්ගේ සවභාවධර්මයෙක් වන්නේය, එසේහෙයින් ශෝකතම් නොකටයුතු වන්නේය. තවද මල භරත කුමාරයෙනි නුවණැත්තා අඥවූ අඥාන සත්‍වයන්මෙන් ඇඬීම වැල පීම් සුදුසුනොවන්නේය. මම වනාහි මාගේ පියානන්ගේ ඇවෑමෙන් උන්ගේ තනතුරෙහිසිට දුගී මගී යාචකයන්ට දන්දීමද යසපිරිවර දෙන්ට නිස්සත්ව යසස්ද මාගේපියානන් අනුභවකළාසේම යසස් අනුභව කෙරෙමින් නෑයන් පොෂ්‍යය කෙරෙම් අවශෙෂවූ මාගේ පරිවාරජනයන් රකිමි ධාර්මිකවූ ශ්‍රමණබ්‍රාහ්මණයන් රක්‍ෂාවරණයෙන් රකිමි මෙතන කර්තව්‍යය දන්නාවූ ප්‍රාඥයන්ට සුදුසුවන්නේය. එසේහෙයින් මා ශෝකකරන්නේ නැතැයි කීහ, එකල සිටියාවූ පර්‍ෂත් රාමපණ්ඩිතයන්ගේ අනිච්චතාව ප්‍රකාශකර වන්නාවූ ධර්මදේශනාව අසා නිස්සෝකීවූහ. ඉක්බිති භරතකුමාරයෝ රාමපණ්ඩිතයන් වැඳ බරණැස්රාජ්ජය පිළිපැද්ද මැනැවැයිකීහ. රාමපණ්ඩිතයෝ කියන්නාහු එම්බල ලක්‍ෂණ කුමාරයන් හා සීතාදේවීන් කැඳවාගෙණගොස් රාජ්‍යානුශාසනා කරවයි කීහ. එබසට භරතකුමාරයෝ කියන්නාහු දේවයන්වහන්ස නුඹවහන්සේ යතුයි කීහ. රාමපණ්ඩිතයෝ කියන්නාහු මාගේ පියානන් වහන්සේ මට දොළොස් අවුරුද්දක් ගිය කල අවුත් රාජ්‍යයකරවයි කීසේක. මම දැන්ම ගියේවීනම් උන්වහන්සේට නොකීකරුවා නම් වෙයි, එසේ හෙයින් අනික් තුන් අවුරුද්දක් ගිය කල එම් කීහ. නැවත භරත කුමාරයෝ කියන්නාහු එසේකල මෙදෑතුරු රාජ්‍යය කරන්නෝ කවුරුදැයි කීහ, රාමපණ්ඩිතයෝ තෙපි රාජ්ජය කරවයි කීහ, භරතකුමාරයෝ අපි රාජ්ජය නොකරම්හයි කීහ, නැවත රාමපණ්ඩිතයෝ කියන්නාහු එසේවීනම් යම්තාක් මාගේ ඊමවේද ඒතාක් මේ මිරිවැඩිසඟළ රාජ්ජය කරවන්නේයයි තමන්ගේ මිරිවැඩිසඟළ පාවාදුන්හ. එකල ඔහු දෙන්නා හා භරතකුමාරයන් හා මිරිවැඩිසඟළ ඇරගෙණ රාමපණ්ඩිතයන් වැඳ සමුගෙණ මහජනයා පිරිවරා බරණැස්නුවරට ගොස් තුන්අවුරුද්දටම මිරිවැඩිසඟල තබා රාජ්‍යය කළාහුය. ඒ අමාත්‍යයෝ මිරිවැඩිසඟල පර්‍ය්‍යංකයෙහි තබා යුක්ති විචාරන්නාහු ඉදින් ඒ විනිශ්වය නපුරුවීනම් මිරිවැඩිසඟළ ඇරගෙණ ඉන් ඉන්වී වැදගන්නේය, ඒ සලකුණෙන් අමත්‍යයෝ නැවත විනිශ්වයකරන්නා මනාකොට විනිශ්වයකරණ ලද්දේ වීනම් නිශ්චලව තිබෙන්නේය. රාමපණ්ඩිතයෝද තුන්අවුරුද්දක් ඉකුත් වූකල වලින් නික්ම බරණැස්නුවරට ගොස් උයනට වැද උන්හ. ඒ බව දත් කුමාරවරහු අමාත්‍යයන් පිරිවරා උයනටගොස් සීතාදේවීන් අග්‍රමහේෂිකා කොට දෙදෙනාම අභිෂෙකකළාහ. මෙසේ අභිෂෙකයට පැමිණියාවූ මහ බෝසතානෝ සරනා පිළියෙළ කරණලද්දාවූ උතුම්වූ රථයට පැනනැගී සිටියාහු මහත්වූ පෙරහරින් නුවරටවැද පැදකුණුකොට සුචන්‍ද්‍රා නම් ප්‍රාසාද යෙහි මතුමාලට නැගී එතැන්පටන් සොළොස් අවුරුද්දක් දැහැමෙන් රාජ්ජයකොට සවර්ගලෝකය පිරුවාහුය. ඒ අර්ථය ප්‍රකාශකරන්නාවූ බුදුරජානන් වහන්සේ එම්බා මහණෙනි රන්මිරිගුබෙරක් හා සමානවූ ග්‍රීවයක් ඇති මහත්වූ බාහු යුග්මයක් ඇති ඒ රාම රජ්ජුරුවෝ දසදහසක් හා නැවත සසියයක් සම්බන්ධවූ සදසක් ඇතුළුවූ සොළොස දහසක් අවුරුදු ධර්මයෙන් රාජ්‍යයකළෝවේදැයි වදාරා මේ දසරථජාතකය නිමවා වදාළසේක, චතුස් සත්‍යයාගේ කෙළවර ශෝකාතුරවූ කෙළෙඹිපුත්‍රතෙම සෝවාන් ඵලයෙහි

පිහිටියාහ, එසමයෙහි දසරථ රජ්ජුරුවෝ තම් දූන් මේ ශුද්ධෝදන රජ්ජුරුවෝය, එසමයෙහි මවු බිසව් තම් දූන් මේ මහාමායා දේවිය, එසම යෙහි සීතාදේවීතම් දූන් මේ රාහුලමාතාවෝය, එසමයෙහි භරතකුමාරයෝ තම් ආනන්දස්ථවිරයෝය, එසමයෙහි ලක්‍ෂණ කුමාරයෝතම් දූන් මේ ශාරිපුත්‍රස්ථවිරයෝය, එසමයෙහි පෂීත් තම් දූන් මේ බුදුපිරිසය, එසමයෙහි රාමපණ්ඩිතයෝතම් ලොව්තුරා බුදුවූ මම්මවේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

448 සංවර ජාතකය

නිරවද පිරිසිදු ගුණ ඇති බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පසුබට වීර්‍ය්‍ය ඇති භික්‍ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද? යත්

සැවැත්නුවරවැසි කුලපුත්‍රයෙක් බුදුන්ගෙන් බණ අසා මහණව ආචාරී වත් උපාධ්‍යායවත්පුරන්නේ උභයමාතෘකා වනපොත්කොට පිරුණාවූ පස් වස් ඇතිව කම්සථාන ඉගෙණ වල්හි වාසයකෙරෙමින් ආචාර්‍ය්‍ය උපාධ්‍යයන් ගෙන් අවසරගෙණ කොසොල්රට එක්පසල්ගමකට ගොස් තමන්ගේ ශාන්ත දාන්ත ගුණයෙහි පැහැද ඒ ගම උපාසකවරුන්විසින් කොටදෙනලද පන් සල්හි වාසයකෙරෙමින් උපසථානකෙරෙමින් උපසථානවිඳ වස්වැස විදර්ශනා වඩා ඉතා ආයාසකොට වඩනාලද වීර්‍ය්‍යයෙන් තුන් කම්සථාන භාවනා කොට අපභාස මාත්‍රයකුත් උපදවාගනනොහී සිතන්නාහු ඒකාන්තයෙන් සර්වඥයන්වහන්සේ දෙසූ පුද්ගලයන් සතරදෙනා අතුරෙන් මම පාළිපරම වීමෙන් මෙහි දක්‍ෂවෙමි එසේහෙයින් මට වල්හි වාසයකිරීමෙන් කම්කිම්ද බුදුන්ගේ රූපශ්‍රී බල බලා මිහිරිවූ බණ අස අසා දවස් යවමිසිතා වීර්‍ය්‍යඇර එතනින් නික්ම අනුක්‍රමයෙන් ජේතවනාරාමයටගොස් ආචාරී උපාධ්‍යයන් සන්දිෂ්ටසම්භක්තයන් විසින්ද, ආකාරණය විචාරණලදුව තමන් කම්සථාන ඇර ආ නියාව කියා ඔවුන්ඇම විසින් මහණ තෝ කුමක්පිණිස කම්සථාන යෙදීමෙන් පසුබටදැයි නිග්‍රහකොට බුදුන් සමීපයට ගෙණගොස් බුදුන් විසින් මහණෙනි මේ භික්‍ෂූනු කුමක්පිණිස නොකමැතිකරවා ගෙණාහුදැයි කීකල්හි එපවත් අසා මහණ තෝ කුමක් පිණිස පසුබටවූවාවූ වීර්‍ය්‍ය ඇත්තෙහිවීද මේ ශාසනයෙහි වීර්‍ය්‍යනැත්තාවූ කුසීතපුද්ගලයක්හට අග්‍රඵල අරහත්වයෙක් නම් නැත, පටන්ගන්නාලද වීර්‍ය්‍යඇති මහණතෙම ධර්මය සාක්‍ෂාත් කළාත්

කරන්නේය, තෝ වනාහි පෙර වීර්‍ය්‍යී ඇත්තෙහිය අවවාද ක්‍ෂමායෙහි එම කාරණයෙන් බරණැස් රජ්ජුරුවන්ගේ පුතුන් සියයකට බාලමල්වන් නුවණැත්තන්ගේ අවවාදයෙහි සිට රාජ්ජයට පැමිණියෝවේදැයිවදාරා ඒ භික්‍ෂූන් විසින් ආරාධිතවූ බුදුරජානන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ පුතුන් සියයකට බාල සංවර කුමාරයෝයයි යන පුතනුකෙනෙක් වන්නාහුය. එකල රජ්ජුරුවෝ එකී එකී අමාත්‍යයෙකුට පාවාදී ශිල්ප උගන්වයි සම්මත කළහ. එසේ පාවා දෙන සංවර කුමාරයන්ට ආචාරිකමට බෝධිසත්ත්වයෝ සැලසුවාහුය. ප්‍රාඥවූ ව්‍යක්තවූ ඒ බෝධිසත්ත්වයෝ රාජකුමාරයන්ට පිතෘස්ථානයෙහි සිට හික්මවනුනාවූ අවශෙෂ අමාත්‍යයෝ රාජකුමාරවරුන් උගන්වා රජ්ජුරුවන් දක්නාහුය, රජ්ජුරුවෝ කුමාරවරුන්ට දනව් දී යවන්නාහුය එකල සංවර කුමාරයෝත් ශිල්ප ශාස්ත්‍ර ඉගෙණ නිමවා බොධිසත්ත්වයන් අතින් විචාරන්නාහු ආචාරීන්වහන්ස ඉදින් මාගේ පියානන්වහන්සේ මට ජනපදයක් දී යවනසේක්වීනම් කළමනා කිම්දැයිකීහ. මහබෝසතානෝ කියන්නාහු දරුව තෙපි දනව්ගම්දෙන්ට වන්කල ඒ නොගෙණ දේවයන්වහන්ස මම ඇමට බාලයෙම් මාත් ගියකල නුඹවහන්සේගේ ශ්‍රීපාද සෙවන සිස් වන්නේය එසේහෙයින් මම සමීපයෙහි වෙසෙම් කියවයි කීහ. ඉක්බිති එක්දවසක් සංවරකුමාරයන් වැඳ එකත්පස්ව සිටිකල්හි රජ්ජුරුවෝ කියන්නාහු පුත තොප ශිල්ප ඉගෙණ නිමියේදැයි කීහ. කුමාරයෝත් එසේය දේවයන්වහන්සැයි කීහ. එසේවීනම් පුත තොපට ජනපදයක් ඇරගණුවයි කීහ. කුමාරයෝ කියන්නාහු දේවයන්වහන්ස එසේකල්හි නුඹවහන්සේගේ සමීපය සිස්වන්නේය. මම සමීපයෙහි වෙසෙම් කීහ එබසට රජ්ජුරුවෝ සතුටුව යහපතැයි පිළිගත්හ. එදවස් පටන් රජ්ජුරුවන් සමීපයෙහි වාසය කෙරෙමින් බොධිසත්ත්වයන්වහන්සේ අතින් ආචාරීන්වහන්ස තවත් මා කළමනා කිම්දැයි විචාළහ, බොධිසත්ත්වයෝ කියන්නාහු රජ්ජුරුවන් අතින් පරණ උයනක් ඉල්වාගෙණ එහි අටගත් මල් හා ඵලාඵලයෙන් නුවර වැස්සන් ඉසුරුමතුන් සිත්ගණිමින් නැවත කළමනා කිම්දැයි ගුරුන් අතින් විචාළාහ, දරුව රජ්ජුරුවන්ගේ අන්තඃපුරයටත් වැටුප් පසිඳුවයි කීහ, කුමාරයෝත් එපරිද්දෙන්ම කළාහ, නැවතත් බොධිසත්ත්වයන් විචාරා රජ්ජුරුවන්ගෙන් අවසරගෙණ අන්තඃපුරයෙහි ඇතුන්ටද දූසි දසුන්ටද සියළු පාබල සෙන හටද නිරන්තරයෙන් වෘත්තිනොවරදවා නොපිරිහෙලා පසිඳිනාහ නොයෙන් රටවලින් ආවාවූ දූතයන් ආදීන්ට නවාතැන් ආදියද වෙළඳුන් ආදින්ගෙන් ගතමනා සුන්වත් ආදියද යන මේ සියල්ලම තමන්ගේ විධානයෙහිම තිබූහ. මෙසේ සංවර කුමාරයෝ බොධිසත්ත්වයන්ගේ අවවාදයෙහි පිහිටා සියළු අන්තඃපුර ජනයාද පිටිපුර වැස්සන්ද ගම්වල වැස්සන්ද ජනපද වාසීන්ද නොයෙක් තැනින් ආ ආගන්තුග ජනයාද උපස්ථාන කිරීමෙන්ද සංග්‍රහ වස්තුයෙන්ද සිත්ගෙණ සියල්ලවුන්ට මනාව වැඩව හැසිරෙන්නාහ, මෙසේ කල්යාමකින් මරණ මඤ්චකයෙහි සිටිකල අමාත්‍යයෝ දේවයන්වහන්ස

තුඹවහන්සේගේ ඇවෑමෙන් රාජ්‍යය කාට පමුණුවමෝදැයි විචාරා රජ්ජුරුවෝ කියන්නාහු එම්බා දරුවෙනි මාගේ දරුවෝ ඇමෝම අභිෂේකයට නිස්සාහ, එසේහෙයින් යම්කෙණෙක් තොපගේ සිතට ප්‍රියයෝ වීනම් තොප ඇමසිත් ගෙණ වෙසෙත්නම් උන්ට රාජ්‍යය පමුණුවයි කියා කාලක්‍රියාකළාහ, උන් කළුරියකළ කල්හි ආදාහන කෘත්‍යයකොට සත්වෙනි දවස් අමාත්‍යයෝ ඇම එක්ව යම්කෙණෙක් තොපගේ සිතට ප්‍රියයෝ වීනම් තොප ඇම සිත්ගෙණ වෙසෙත්නම් රාජ්‍යය උන්ට දෙවයි කීහ, එසේහෙයින් දූත් සංවරකුමාරයෝ ඇම සිත්ගෙණ වසන්නාහ, බන්ධු ජනයා පිරිවරකොට ඇති සංවර කුමාරයන් කාංචන මාලාවෙන් හෙබියාවූ සේසත් නංවා අභිෂේක කළාහ, සංවර රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ගේ අවවාදයෙහි සිට දැහැමෙන් රාජ්‍යය කළාහ, අවශේෂ කුමාරවරු තමන්ගේ පියාතන් මළබවත් සංවර කුමාරයන් අභිෂේක කළබවත් අසා උඟ ඇමට බාලයෝය එසේහෙයින් උන්ට රාජ්‍යය නොපැමිණෙයි ඇමට වැඩිමාළු තැනැත්තන්ට රාජ්‍යය පමුණුවම්හයි ඇවිත් පිටිනුවර රාජ්‍යය හෝ දෙව යුද්ධ හෝ කරවයි කියා සංවර රජ්ජුරුවන්ට අසුන්යවා නුවර වටලූහ. එකල සංවරරජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ට එපවත් කියා කළමනා කිම්දැයි කීහ, බෝධිසත්ත්වයෝ කියන්නාහු මහරජ තොපට බෑයන් හා යුද්ධයෙන් කම් නැත පියාතන් සන්තක වස්තුව සියක් කොටසට බෙදා එකුන් සියයක් පමණ මේ කුමාරවරුන්ට තොපගේ පියාතන් සන්තක වස්තු කොට්ඨාස ගණුව මම තොප හා කරණ යුද්ධයක් නැතැයි කියා සම්මත කළාහ. සංවර රජ්ජුරුවෝත් එපරිද්දෙන්ම කළාහ, එකල ඇමට වැඩිමාළු බෑනෝ උපෝසථ නම් කුමාරයෝ අවශේෂ කුමාරවරුන් තමන් සමීපයට කැඳවා එඹා මල්නි රජදරුවන් ඉක්ම පවතින්ට සමර්ත්ථ කෙණෙක් නම් නැත, මූයින් අපට බාලසිට මළනුවෝය, අපට සතුරුත් නොවී පියාතන් සන්තක වස්තුවත් එවා සටන් නොකෙරෙති කියා එවන්නාහ, අපි ඇමත් එකවිටම අභිෂේක කරන්නමෝ නොවම්හ, එකක්හට ඒ අභිෂේක කරම්හ. එසේ හෙයින් මූන්ටම රාජ්‍යය වන්නේය, යම්හ උන් සමීපයට ගොස් දැක රජ්ජුරුවන්ගේ අන්තඃපුරය උන්ට පාවාදී අපි අපගේ ජනපදවලට යම්හයි කීහ. එකල ඒ කුමාරවරු ඇමදෙනම යහපතැයි නුවර දොර අරවා සතුරු නොව නුවරට වන්හ. සංවර රජ්ජුරුවෝද උන් ඇමට සත්කාර සම්මාන අමාත්‍යයන් ලවා ගෙන්වා ගෙණ පෙරමඟට යවූහ. කුමාරවරුද මහත්පරකරින් පයින්ම රජගෙට ගොස් වැද සංවර රජ්ජුරුවන්ට ආදර දක්වා මිටිවූ අසුන්වල උන්හු සංවර රජ්ජුරුවෝ නගතලද දළපුඩු සේසත් ඇති සිංහාසනමස්තකයෙහි උන්හ. උන්නාවූ ඒ රජ්ජුරුවන්ගේ මහත්වූ යසස්ද ශ්‍රීසෞභාද වීය. බෑලූ බෑලූ දිසාව කම්පාවන්නේය, එකල උපෝසථ කුමාරයෝ සංවර රජ්ජුරුවන්ගේ ශ්‍රීසමෘද්ධියදැක අපගේ පියාතන්වහන්සේ තමන්වහන්සේගේ ඇවෑමෙන් සංවර කුමාරයන්ට රාජ්‍යය සිතාවත අප ඇමට ජනපදදී යවා මූන්ට නුදුන්නාහු නුවණැයිසිතා සංවර රජ්ජුරුවන් හා සමග කථාකරන්නාහු, මහ රජ්ජුරුවෙනි අපගේ පිය රජ්ජුරුවෝ එකුන් සියයක්පමණ කුමාරවරුන්ට ජනපදවලින් පූජාකොට යවන්නාහු තමන්ගේ ඇවෑමෙන් තෙමේ රාජ්‍යයට පැමිණෙන්නේයයි දැනම තොපට කුඩාවූ ජනපදයක් නුදුන්නේවන. තවද මහ රජ්ජුරුවෙනි

තොපි රාජ්ජය පතන්නාහු අපගේ පිය රජ්ජුරුවෝ තමන් ජීවමානව ඉන්නා කලම නැකුත. නොහොත් උන් ඇවෑමෙන් අමාත්‍යයන් හා ජනපද වාසීන් හා තොපගේ නෑයෝ තමන්ට වැඩ සඳහා රාජ්‍යයච් පැමිණවූහ. තවද සංවර රජ්ජුරුවෙනි තොපගේ කවරශීලව්‍රත සමාදානයකින් තොපකෙරෙහි හටගත් කවර ගුණයකින් මෙතනට රුස්වූ එකුන් සියයක් කුමාරවරුන් ආදි කොට ඇති සියළු නෑයෝ තොප ඉක්මයෙද්ද, තොප උන්ට පැවැත්තෝද ඒ මට කියවයි කීය. එබස් අසා සංවර රජ්ජුරුවෝ තමන් ගුණ කියන්නාහු එඹා රාජකුමාරයෙනි මම කිසි සත්‍වයක්හට ඔහුගේ යසස් දැක මේ සම්පත් මෝහට නොවේවයි මා සොම්නස් උනේ නැත, තවද, සමිත පාපි හෙයින් ශ්‍රමණනම්වූද මහත්වූ ශීලස්කන්ධයන් එෂණ ගවේෂණ කරණ හෙයින් මහණ නම්වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් දුටුකල පසක පිහිටුවා උන්ගේ පාදයන් වැඳ දන්නමුත් උන් ඇමට ධාර්මිකවූ රක්‍ෂාවරණගුප්තිය එලවම්හ් පූජාකරන්නාවූ මම්ම ඇමට සකස්කොට පූජාකෙරෙමින් තවද ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙබඳු ගුණ ඇති මා මෙසේවූ ගුණයක් ඇතැයි දැන මෙබන් දක් කරවයි මෙබන්දක් නොකරවයි අනුශාසනා කරන්නාහ. මමද මහා සෑඩිවූ ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ බස් අසා කිසිවක්ම නොකරම් මාගේ චිත්තය කුසලයෙහිම නිරත කෙරෙමි, තවද ඇතරුවන් අසරුවන් හැතින, යකවරුන් රථාචාරිවරුන් පාබලසෙනගද යන මේ සියල්ලන්ට නිරන්තර යෙන් දියයුතු යම්වස්තුවෙක් ඇත්නම් නොපිරිහෙලා දෙමි, තවද බෑනන් වහන්සේ මාගේ නුවණැති මන්ත්‍රණයෙහි දක්‍ෂ අමාත්‍යයෝද අවශෙෂ පිරිවර ජනයෝද ඇත. නුඹවහන්සේලා ඇම ප්‍රඥසම්පන්න පණ්ඩිතවරුන් තොලත් සේක අපගේ ආචාරී නුවණැත්තෝය උපායෙහි දක්‍ෂයෝය ළෟ රාජ්‍යයෙහි පිහිටුවූහ. තවද බෑනන් වහන්ස මා අභිෂෙක කළතැන්පටන් අපගේ රජ්ජුරුවෝ ධාර්මිකයෝය. උන්ගේ රට සාරපෝයෙහි වැසිවස්නෝය උන්රට සමෘද්ධබල ඇත්තේය. බරණැස්නුවර ආදීවූ බොහෝ රටවලින් ආඪ්‍යවූ වෙළඳවරුන් ඇවිත් මෙහි වසන්නාහ, එසේහෙයින් උන්ගෙන් මට ආරක්‍ෂා ඇත තවද හස්ති රත්නය අශ්වරත්නය මුතු මැණික් ආදිය හැර ගෙණ ඇවිත් නිරුපද්‍රතව වෙළඳාමුත් කරන්නාවූ වෙළඳනුත් බොහෝව බෑනන්වහන්ස මම මෙතෙක් කාරණයෙන් ඇමට බාලවත් මාගේ බෑනන් හැමම මැඩගෙණ රාජ්ජයට පැමිණියෙම් ඒ බව දනුවයි කීහ. ඉක්බිති සංවරරජ්ජුරුවන්ගේ ගුණ අසා උපොසථ කුමාරයෝ කියන්නාහු මල සංවර රජ්ජුරුවෙනි තොපි වනාහි එකුන්සියයක් පමණ වැඩිමාලු බෑයන් ආනු භාව මැඩ ධම්බලයෙන්ම පවතුව මෙතැන්පටන් තොපිම රාජ්‍යය කරව නුවණින්යෙදී වසව බන්ධුන්වත් හිතව වසව, තවද ඒ ගුණයෙන් සමෘද්ධවූ තෙපි අප එකුන් සියයක් ඇති ඥාති සමූහයා පිරිවරා සප්තවිධරත්නයෙන් සමන්විතවූ තව්තිසා වැසි දෙවියන් පිරිවරකොට ඇති ශක්‍රදේවේන්ද්‍රයන් අසුරයෝ ජයගත නොහෙන්නාසේ තොපත් එපරිද්දෙන්ම පරසතුරෝ ජයගත නොහෙන්නාහ, එසේහෙයින් තුන්සියයක් පමණ යොදුන් කසී රට දෙළොස් යොදුන් බරණැස්නුවර සැපසේ රාජ්ජය කරවයි කීහ. ඉක් බිති සංවර රජ්ජුරුවෝ එකුන් සියයක් පමණ තමන්ට වැඩිමාලු රජකුම රුන්ට මහත් සම්පත් දුන්හ. ඔහු ඇම්දෙනත් මසක් පෝයක් රජ්ජුරුවන් කෙරේ වාසයකොට මහරජ ජනපදවලින් සතුරෝ ඇත්නම් ඊට නිහඬ අපි

දනුම්හ. නුඹවහන්සේ රාජ්‍යය කළමැනවැයි කියා තමන්ගේ ජනපදවලටම ගියාහ. සංවර රජ්ජුරුවෝද බෝධිසත්වයන්ගේ අවවාදයෙහි සිට රාජ්‍යය පරිපාලනයකොට ආයුෂයාගේ කෙළවර දෙව්ලොව පුරමින්ගියාහ. සර්වඥයන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා මහණ තෝ මෙසේ අවවාදක්ෂමයෙහි දැන් කුමක් පිණිස වීර්‍ය්‍ය නොකරන්නෙහිදැයි වදාරා චතුස්සත්‍ය ප්‍රකාශකොට මේ සංවර ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර ඒ භික්ෂුතෙම සෝවාන් ඵලයෙහි පිහිටියේය. එදවස සංවර රජ්ජුරුවෝ නම් දැන් මේ මහණ වන්නේය, එසමයෙහි උපෝසථ කුමාරයෝ නම් සාරිපුත්‍රස්ථවිරයෝය, අවශෙෂ අටානුවක් කුමාරවරු නම් අසූමහ සව්වන් හා අනුරුද්ධස්ථවිරයෝය, එසමයෙහි රජ පිරිස නම් දැන් මේ බුදුපිරිස් වන්නාහ, එසමයෙහි සංවර කුමාරයන්ට අවවාද දුන් අමාත්‍යයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

449
සුප්පාර ජාතකය

තවද මේ ජාතකය සර්ව ධර්මයන් සර්වාකාරයෙන් පරොප දෙශ රහිතව ස්වයංභූඥානයෙන් දත්තාවූ සර්වඥයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනසේක් ප්‍රඥා පාරමිතාව අරභයා වදාළසේක.

ඒ කෙසේද? යත්

එක් දවසක් සවස්වේලෙහි සර්වඥයන්වහන්සේ ධර්මශාලාවට වැඩමපෙර මග බල බලා උන් භික්ෂූන්වහන්සේ ඇවැත්නි අනේ බුදුන්ගේ ඥානයෙක් යහපත් නියාව මහත්වූ ප්‍රඥා ඇතිසේක. තීක්ෂණ ප්‍රඥා ඇතිසේක, නිර්ව්‍යාජවූ ප්‍රඥා ඇතිසේක, ඒ ඒ උපායෙහි යෙදෙන්ට නිසි සර්වතොවිතප්‍රඥා ඇතිසේක, පොළොවසේ විපුලවූ ප්‍රඥා ඇතිසේක, සමුද්‍රයසේ ගැඹුරුවූ ප්‍රඥා ඇතිසේක, ආකාශයසේ පතලවූ ප්‍රඥා ඇතිසේක, සියළු දඹදිව උපන්නාවූ ප්‍රශ්නයන් බුදුන් ඉක්මයන්ට සමර්ථයෙක් නැත, යම්සේ සමුද්‍රයෙහි නැංගාවූ තරඟ ඉක්ම නොගොස් වෙරළාන්තයෙහිම භග්නවේද එපරිද්දෙන්ම කිසිවෙක් බුදුන් ඉක්ම යන්නෙක් නම් නැත පාදමූලයට පැමිණම භග්නවන්නේයයි බුදුන්ගේ මහත්වූ ප්‍රඥා පාරමිතාවන් වර්ණනා කොට කොට උන්සේක. බුදුහු එකල තුන්තරා ගමනින් එක්තරා ගමනකින් දම්සභාමණ්ඩපයට වැඩ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවක් කොට උනුදැයි විචාරා වදාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි එඹා මහණෙනි බුදුහු දැන්මතු නොවෙයි පෙරත් නුවණැත්තෝ තුමුහුකුරුනාවූ නුවණැති කලත් අන්ධව මහාසමුද්‍රයෙහි උදක සංඥවෙන් මෙනම් සමුද්‍රයෙහි. මෙනම් රුවක් ඇත්තේයයි දත්තෝවේදැයි වදාරා එක්තරා භික්ෂූකෙණෙකුන්වහන්සේ විසින් ආරාධිතවූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහමදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන්නාහුය. එනුවර හරුකච්ඡ නම් පටුනුගමකුත් ඇත්තේය. එකල අප මහබෝසතාණෝ හරුකච්ඡ නම් පටුන්ගම නියමුවන්ට නායකවූ නියමුවාට පුත්‍රව උපන්නාවූ දුටුවන්ට ප්‍රසාද එලවන්නාවූ රන්වන් ශරීර ඇත්තාවූ කුමාරයන්ට නම් තබන්නාවූ සුප්පාර කුමාරයෝය යි නම් තුබූහ. මෙසේ ඒ සුප්පාර කුමාරයෝ මහපෙරහරින් වැඩෙන්නාහු සොළොස් ඇවිරිදි වයසම ශිල්පයෙහි පරතෙරටපැමිණියෝ කල්‍යාමකින් පියානන්ගේ ඇවෑමෙන් නියමුවනට නායක කම් පැමිණ නියමු නායකකම් කරන්නාහු ප්‍රාඥයෝය, නුවණැත්තාහුය. උන් විසින් නැගි නැවක් නො නස්නේය.

මෙසේ කල්‍යාමකින් ලුණුදිය ගැසීමෙන් මහබෝසතාණන්ගේ ඇස් දෙකම නටුයේය. එතැන්පටන් නියමු දෙටුවෝ නියමුකම් නොකොට රජ්ජුරුවන් නිසා ජීවත්වෙමි සිතා රජ්ජුරුවන් සමීපයට ගොස් වන්නාහ රජ්ජුරුවෝත් බොධිසත්ත්වයන් වස්තු අගය කරන්නාවූ තනතුරෙහි පිහිටුවූහ. එතැන්පටන් බෝධිසත්ත්වයෝත් රජ්ජුරුවන්ගේ හස්තිරත්නය අශ්වරත්නය මුක්තාමාණික්‍ය රත්නය ලක්ෂණ බලා අගය කරන්නාහු එකල එක්දවසක් රජ්ජුරුවන්ට මගුලැත් තනතුරෙහි අඤ්ජන කූටය සේ කලුවූ ඇතකු ගෙණාහ, රජ්ජුරුවෝද ඒ ඇතු දැක සුප්පාර පණ්ඩිතයන්ට පාවයි කීහ. යහපතැයි ගෙණගොස් බොධිසත්ත්වයන්ට පෑහ. බෝධිසත්ත්වයෝ ඇතුගේ ශරීරය අතින් පිරිමැද බලා කියන්නාහු මේ තෙම මගුලැත්කමට නොනිසිය පසකුඹින් සිටිනේය. මේ ඇතුගේ මව් වදනගමනේ ඇකයෙන් රඳවාගත නුහුනුවනැ. එසේ හෙයින් මෙතෙම බිමවැටී පසකඹින් මිටිව ගියේයයි කීහ. ඒ බව ඇතු ගෙණා පුරුෂයන් අතින් විචාලාහු ඔහු ඇමත් පණ්ඩිතයන් කීයේ සැබවයි කීහ.

රජ්ජුරුවෝ එපවත් අසා සතුටුව පණ්ඩිතයන්ට කහවණු අටක් දුන්හ. තවද එක්දවසක් රජ්ජුරුවන්ට මගුල්අස් තනතුරටයයි අසකු ගෙණාහ. ඔහුත් රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්ට යවූහ. බොධිසත්ත්වයෝ අශ්වයාත් අතින් පිරිමැද මගුලස් වන්නට සුදුසු නොවෙයි. මොහු උපන් දවස් මව් මැලිවන. එසේහෙයින් මවගේ කිරි නොලදින් ඉඳුරා වැඩුනේ නොවෙයි කීහ. ඒ බව ගෙණා පුරුෂයන් අතින් විචාරා සැබවයි කීහ. ඒ බව අසාත් රජ්ජුරුවෝ කහවණු අටක් දුන්හ. තවද එක්දවසක් රජ්ජුරුවන්ට මගුල් රථයයයි රථයක් ගෙණාහ. රජ්ජුරුවෝ දැක පණ්ඩිතයන් සමීපයට යවූහ . පණ්ඩිතයෝ රථයද අතින් පිරිමැද කියන්නාහු මේ රථය සිදුරු ඇති ගසක්න් කරණලද්දේය. එසේ හෙයින් මේ රථය මගුල් රථයට සුදුසු නොවෙයි කීහ. ඒ බව විචාරා සැබෑම වූයේය. රජ්ජුරුවෝ ඒ අසාත් කහවණු අටක් දුන්හ. තවද එක්දවසක් මාහැගි පලසක් ගෙණාහ. ඒද පණ්ඩිතයන්ට පෑහ. අතින් පිරිමැද බලා මේ පලස මීයන්ගෙන් දෂ්ටයෙක් ඇතැයි කීහ. ඒ පරීක්ෂාකොට බලා දැක රජ්ජුරුවන්ට දැක්වූහ, රජ්ජුරුවෝ සතුටුව කහවණු අටක් දුන්හ. එකල පණ්ඩිතයෝ මොහුගේ නැගි කරණවැමියෙකුගේ දීමක් මෙන. එසේහෙයින් මේ කරණවැමියෙකුට ද එකකු වනැයි සිතා මෝහට උපස්ථානකොට ප්‍රයෝජන කිම්දැයි මා වසන්නාවූ ගමට යෙමියි හරුකච්ඡ නම් පටුනුගමට ගියාහ. මෙසේ ඒ බොධිසත්ත්වයන් වාසයකරණකල වෙළෙන්දු නැවක් සරහා කවරක්හු නියමු කරමෝදැයි කථාකරන්නාහු සුප්පාර පණ්ඩිතයන් නැගි නැවක් නොනස්නේය. උඟ තුමූත් නුවණැත්තෝය. උපායෙහි දක්ෂයෝය, ඇස් අන්ධවී නමුත් සුප්පාර පණ්ඩිතයෝ අපට උත්තමයෝයයි බොධිසත්ත්වයන් සමීපයට ගොස් අපට

නියමුකම් කළමැනවැයි කියා බොධිසත්ත්වයන් විසින් මම අන්ධයෙමි. කෙසේ නියමුකම් කෙරෙම්දැයි කී කල්හි ස්වාමීනි, අන්ධවූවත් නුඹවහන්සේම අපට උත්තමයෙකැයි නැවත නැවත යාච්ඤාකළ කල්හි යහපත දරුවෙනි තොප ඇම කී සලකුණෙන් නියමුකම් කෙරෙමියි ගිවිස නැවට නැගී නික්මුනු කල්හි නැව මහාසමුද්‍රයෙහි සත්දවසක් උපද්‍රව නැතිව ගොස් සත්වෙනි දවස් අකාල වාතයක් නගා නැව සාරමසක් මුළුල්ලෙහි පිවීසි සමුද්‍රයෙහිම ඇවිදුනා ඛුරමාලී නම් සමුද්‍රයට පැමිණවූයේය. ඒ සමුද්‍රයෙහි මත්ස්‍යයෝ මනුෂ්‍ය ශරීර ඇත්තාහුය, දියෙහි ගැලෙමින් ඉලිප්පෙමින් ඇවිදිනාහ. එකල වෙළඳුන් එම සත්ත්වයන් දැක බොධිසත්ත්වයන් අතින් සමුද්‍රයෙහි නම් විචාරන්නාහු මෙසේ කියත්. කරමුවාතට බඳුවූ නාසා ඇති මනුෂ්‍යයෝ යටවත් කුමුදුනාහ, උඩවත් කුමුදුනාහ, සුප්පාර පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේ අතින් විචාරම්හ, මේ මේ සමුද්‍රය කවර සමුද්‍රයක්දැයි කීහ.

මේ එසේ ඒ වෙළඳුන් විචාළකල්හි බොධිසත්ත්වයෝ තමන්ගේ නියමු ශාස්ත්‍රයෙන් බලා දැක කියන්නාහු වස්තු වෙළඳාම් පිණිස භරුකච්ඡ නම් පටුනු ගමින් ආවාවූ තොප ඇම නැව් නැගී පැමිණි මේ සමුද්‍රය ඛුරමාලීයයි කියති කීහ. ඒ සමුද්‍රයෙහි විදුරු උත්සන්න වන්නේය. බොධිසත්ත්වයෝ සිතන්නාහු ඉඳින් මම මුත්ට විදුරු සමුද්‍රයයි කීම්නම් මූ හැම වස්තු ලොභයෙන් බොහෝ විදුරු උකා නැව් නසාගන්නාහයි උන් හැමට නොකියාම නැව රඳවා උපායෙන් එක්යොතක් එලා මසුන් අල්ලන්නාසේ දැල්දම්මා විදුරු ගොඩනංවා නැවෙහි බහා නැව තුබුවායෙන් සවල්පවූ බඩුවක් දම්මවා නික්මුනුකල්හි ඒ සමුද්‍රය ඉක්මගොස් මත්තෙහි **අග්නිමාලී** නම් සමුද්‍රයට ගියාහ. ඒ සමුද්‍රයතෙම දිලියෙන්නාවූ ගිනිකඳුමෙන්ද මුදුන් පැමිණි ඉරුමඬලක් මෙන්ද රශ්මි පවතිමින් සිටියේය. ඒ සමුද්‍රය දැක වෙළඳහු විචාරන්නාහු යම්සේ ගිනිදළු පෙණේද? යම්සේ සූර්‍ය්‍යමණ්ඩලය පෙණේද? එපරිද්දෙන් මේ සමුද්‍රය පෙණෙන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේ අතින් විචාරම්හ. මේ සමුද්‍රය කවර සමුද්‍රයෙක්ද අපට කිවමැනවැයි කීහ.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු විදෙශිව ආවාවූ තොප ඇම පැමිණි මේ සමුද්‍රය අග්නිමාලීයයි කියති කීහ. ඒ සමුද්‍රයෙහි රත්රන් බොහෝකොට ඇත්තේයයි බොධිසත්ත්වයෝ එතතින් රත්රනුත් පෙර පරිද්දෙන් උපායෙන් නැවට නංවාගත්හ. නැවත ඒ සමුද්‍රයත් ඉක්ම දධිමාලි නම් සමුද්‍රයට පැමිණියේය, ඒ සමුද්‍රය දුටු වෙළඳහු විචාරන්නාහු කිරෙහි පැහැයක් යම්සේද? දියෙහි පැහැයද එපරිද්දෙන්ම වන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේ අතින් විචාරම්හ, මේ සමුද්‍රය කිනම්දැයි විචාළහ. බොධිසත්ත්වයෝ කියන්නාහු භරුකච්ඡ නම් පටුන්ගමින් නික්ම ධන සොයා ඇවිදිනාවූ තොප ඇම වෙළඳුන් විදෙශිව ආවාවූ මේ නැව පැමිණි සමුද්‍රය දධිමාලීයයි කියති කීහ. ඒ සමුද්‍රයෙහි රිදී බොහෝ වන්නේය, එයින් බබලන්නේය, එයින් උපායෙන්ම ගොඩනංවා නැවට නංවාගත්හ. නැව සමුද්‍රය ඉක්ම **කුසමාලී** නම් සමුද්‍රයට පැමිණියේය, වෙළඳහු ඒ සමුද්‍රය දැක විචාරන්නාහු ගිතණ වනයක්ද, නිල්ගස් හෝමයක් සේ ද මේ සමුද්‍රයත් ඉන්ද්‍රනීල මැණික් පරිද්දෙන්ම බබලන්නේය, සුප්පාර පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේ අතින් විචාරම්හ. මේ සමුද්‍රය කිනම්දැයි විචාළාහ. බොධිසත්ත්වයෝ කියන්නාහු භරුකච්ඡ නම් පටුන් ගමින් නික්ම වස්තු සොයා යන්නාවූ තොප ඇම වෙළඳුන් විදෙශිව ආවාවූ අය

මෙතනට පැමිණි මේ සමුද්‍රය කුසමාලී නමැයි කීහ. ඒ සමුද්‍රයෙහි ඉඳුනීල මාණික්‍ය බොහෝ වන්නේය, ඒද උපායෙන් නැවට නංවාගත්හ. නැවත ඒ සමුද්‍රයෙන් ඉක්මගෙණ නාලමාලී නම් සමුද්‍රයට පැමිණියේය, ඒ සමුද්‍රය වෙළඳහු දැක විචාරන්නාහු යම්සේ උනවනයෙක් බටවනයෙක් පෙණේද? එපරිද්දෙන් ම ඒ සමුද්‍රයත් පෙණෙන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේ අතින් විචාරම්හ. මේ සමුද්‍රය කිනම්දැයි විචාළාහ බෝධි සත්ත්වයෝ කියන්නාහු හරුකච්ඡ පටුන්ගමින් නික්ම වස්තු සොයා විදෙශව නැව්නැගී තොප හැම පැමිණි මේ සමුද්‍රය නාලමාලී නමැයි කීහ. ඒ සමුද්‍රයෙහි වෛඩූර්‍ය්‍ය මාණික්‍ය බොහෝ වන්නේය, බෝධිසත්ත්වයෝ ඒද උපායෙන් නැවට නංවාගත්හ. වෙළඳහු නාලමාලී සමුද්‍රය ඉක්ම ඔබට ගියකල වළබාමුඛ නම් සමුද්‍රය දුටහ. ඒ සමුද්‍රයෙහි ජලය ඒ ඒ ස්ථානයෙහි හාත්පසින් කඩාගෙණ යන කලක් පරිද්දෙන් යන්නේය. වියලී ගිය හෙබ සේ පෙණෙන්නේය. රළ නැගුකල්හි එක් පාර්ශ්වයකින් ප්‍රපාතවන්නේය, භයජනක ශබ්ද උපදනේය, කන්සිලිවන කලක් මෙන් ළය පැලී යන කලක් මෙන් සමුද්‍රය දැක වෙළඳහු භයින් ත්‍රාසනව බෝධිසත්ත්වයන් විචාරන්නාහු මගත්වූ භය උපදවන්නාවූ අමානුසිකවූ ඝොරවූ මහත් ශබ්ද ඇසෙන්නේය. යම්සේ ගැඹුරුවූ හෙප් පෙණේද? එපරිද්දෙන් භයජනකවූ ප්‍රපාත ඇති සමුද්‍රයෙක් පෙණෙන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේගෙන් විචාරම්හ. මේ සමුද්‍රය කිනාම් සමුද්‍රයෙක්දැයි විචාළහ.

බෝධිසත්ත්වයෝ කියන්නාහු එම්බා දරුවෙනි, තොප මේ පැමිණි සමුද්‍රය වළබාමුඛ නම, මේ සමුද්‍රයට පැමිණි කෙණෙකුන්තේ ආපසු යාමෙක් නම් නැත. මේ සම්පත හා නැව ගලා විනාශයට පමුණුවන්නේයයි කීහ. ඒ නැවෙහි සත්සියයක් පමණ නැංගාවූ මනුෂ්‍යයෝ ඇම්දෙනම මරණභයින් තැතිගෙණ අවීචිමහනරකයෙහි සත්ත්වයන් මෙන් එපරිද්දෙන් ඉතා බැගෑපත්ව එකපැහැර භයින්ම හඬන්ට පටන් ගත්හ එකල මහබෝසතානෝ මා ඇර අනික් මුන් ඇමටම සැපතක් කරන්නට සමර්ථ කෙණෙක් නැත. සත්‍ය ක්‍රියායෙන් මුන් ඇමට සැපයක් කරන්ට සිතා වෙළඳුන් තමන් සමීපයට කැඳවා එම්බා දරුවෙනි, මා වහා සුවඳ පැනින් නාවා අළුත් වස්ත්‍රයක් හඳවා තලියක් පැනින් සම්පූර්ණකොට සරහා නැව්හිස තබවයි කීහ වෙළඳහුත් වහ වහා එපරිද්දෙන් කළහ. බෝධිසත්ත්වයෝත් දෙඅතින් පිරුණු තලිය ගෙණ නැව්හිස සිට සත්‍යක්‍රියා කරන්නාහු යම් තෙනෙක්හි පටන් මම නැවමනාව දනිම්ද එතැන්පටන් මම මා සිහිකෙරෙම්ද ? දැන දැන එකමද ප්‍රාණියකු නැසූ නියාවත් නොදනිමි. පස්පවින් එකක්කළ නියාවත් නොදනිමි ඒ සත්‍යක්‍රියාව හේතුකොට ගෙණ මේ නැව සැපසේම සියනුවරට යෙවයි කියා තලියෙහි පැන් නැව්හිස වත්කළාහ. එක්ෂණයෙහි සාරමසක් මුළුල්ලෙහි සමුද්‍රයෙහි ඇවිදි නැව ආපස්සේ නික්ම ඍද්ධිමත් කෙණෙකුන්ගේ ඍද්ධ්‍යනුභාවයක්සේ එක දවසින්ම හරුකච්ඡ නම් පටුනුගමට ගියේය. ගොසිනුත් අටඉස්බක් පමණ තැන්ගොස් නැව ඇති තැනැත්තවුගේ ගේදොර සිටියේය. එකල බෝධිසත්ත්වයෝ වෙළඳුන්ට ඒ සම්පත් බෙදාදී තොප හැමට මෙතෙක් සම්පත් සෑහෙයි, මින්මතු යාත්‍රාවක් නොකරවයි අවවාද කොට දිවි පමණින් කුසල් කොට කාබුන් මරණින් මත්තෙහි දෙව්ලොව උපන්හ. සර්වඥයන් වහන්සේ මේ ධර්මදෙශනාව

ගෙණහැර දක්වා වදාරා මහණෙනි, බුදුනු පෙරත් නුවණැත්තෝම වේදැයි වදාරා මේ **සුප්පාර ජාතකය** නිමවා වදාළසේක. එකල තැවි තැගි පිරිස් නම් දැන් බුදුපිරිස් වන්නාහ. එසමයෙහි **සුප්පාර** පණ්ඩිතයෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

458
චුල්ලකුණාල ජාතකය.

තවද චුල්ල කුණාල ජාතකය මහා කුණාල ජාතකයෙහි පෙණෙන්නේය.

එකොළොස්වන නිපාතය නිමි.

දොළොස්වන නිපාතය දක්වමු.

459
භද්දශාල ජාතකය.

තවද හුදු ක්ෂාන්තියෙන් මවාලූ රුවක් වැනිවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ඥාති සංග්‍රහයක් අරභයා මේජාතකය දක්වනලද.

ඒ කෙසේද?යත්

එක්සමයෙක්හි අනේපිඬු මහසිටාණන්ගේ ගෙයි භික්ෂූන් වහන්සේ පන්සියයක්දෙනා වහන්සේටත් විශාඛාවන්ගේ ගෙයි පන්සියයක්දෙනා වහන්සේටත් නිරන්තරයෙන් දන්දෙන්නාහු කෝසල රජ්ජුරුවෝ එපවත් අසා භික්ෂූන් පන්සියයක්දෙනා පවරා නිරන්තරයෙන් දන්දෙන්නාහ. දන්දෙන පමණක් විනා විශ්වාස ඇදහිලිඇතිව නොදෙන්නාහ. භික්ෂූන්වහන්සේත් දන්පිළිගෙණ කුළුපග උපාසකවරුන්ගේ ගේවලින් අනේපිඬුමහසිටාණන්ගේ ගෙට ගොසින් හෝ විශාඛාවන්ගේ ගෙට ගොසින් වළඳා එනසේක. එක්දවසක් කොසොල් රජ්ජුරුවෝ මීහිරි දෙයක් දැක භික්ෂූන් වහන්සේට දෙවයි දානශාලාවට යවූහ. දානශාලාවට ගියෝ එකද භික්ෂූන් වහන්සේ කෙනෙකුන් නොදැක එපවත් රජ්ජුරුවන්ට කීහ. ඈයි භික්ෂූන්වහන්සේ මාගේ දානශාලාවේදී නොවළඳා මහළුවරුන් වහන්සේ ඔබ්බේදී වළඳන්ට කාරණා කිම්දැයි කියා ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේ අතින් විචාරන්නාහු ස්වාමීනි භික්ෂූන් වහන්සේ මාගේ ගෙයි නොවළඳන්ට කාරණා කිම්දැයි කීහ එවිට සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහරජ විශ්වාස නැත්තෙන් නොවළඳන්නේයයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු භික්ෂූන් වහන්සේ විශ්වාස ඇත්තේ කවුරුන් කෙරෙහිදැයි විචාළාහ. සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහරජ බන්ධූන් කෙරෙහි විශ්වාස ඇත්තාහ ඇදහිලි ඇති උපාසකවරුන් කෙරෙහි විශ්වාස ඇත්තාහ. සෝවාන් වූ කෙණෙකුන් කෙරෙහි විශ්වාස ඇත්තාහයි, වදාළසේක. එබස් අසා කෝසල රජ්ජුරුවෝ කියන්නාහු මම ශාක්‍යවංශයෙහි රාජකුමාරියකු ගෙණායෙම් දීයම්

බුදුන්ට නැවුනු සෙයින් භික්ෂූන් වහන්සේ මා කෙරෙහි විශ්වාසවත සේකැයි සිතා ශාක්‍යවංශයෙහි රජදරුවන්ට තමන්ගේ ශාක්‍යවංශය හා විශ්වාසවන්ට අභිප්‍රාය ඇත්තෙම් ශාක්‍යරාජ කුමාරිකාවක එවුව මැනවැයි පත්ලියා දූතයන් අත යවූහ. ශාක්‍යරජදරුවෝ ඒ පත් අසා අප ඉදිතෝ කෝසල රජ්ජුරුවන්ගේ සීමාවේය, එසේහෙයින් රාජකුමාරිකාවක පාවා නුදුනමෝ නුමුත් ද්වේෂය, පාවා දුනුමෝ නුමුත් ජාති භින්නවන හෙයින් එයින් කටයුතු නොවෙයි. කුමක්කර මෝදැයි විසෂපව උන්නාහු එවිට මහානාම නම් ශාක්‍ය රජ්ජුරුවෝ කියන්නාහු මූසුප්පු නොව් ඊට උපායෙක් ඇත. මාගේ කණ්මුණ්ඩ නම් කෙල්ලක් ඇත මටම ද වාසභඛත්තියා නම් දුවක් ඇත්තීය. ඈ මට ද දුව හෙයින් අනික් සැකයෙක් නැත. ඈ පාවා දෙම්හයි කථාකොට කෝසල රජ්ජුරුවන්ගෙන් ආ දූතයන්ට කියන්නාහු රජ්ජුරුවන් වහන්සේගෙන් අප හා විශ්වාසවූව මැනවැයි කියා අා කල රාජකුමාරිකාවක් පාවා දූනමැනව, පාවාදෙන්ට කුමන අමුත්තක්දැයි රාජ කුමාරිකාවක් ගෙණයවයි කීහ. එවිට දූතයෝ සිතන්නාහු ශාක්‍යයෝ නම් මහා මායම් දන්නාහ. කෙල්ලකගේ දුවක් පාවාදුන්නු නමුත් කාරණා නොවෙයි සිතා කියන්නාහු අපට පාවාදෙන්නාහු රාජකුමාරිකාවන් හා අප දූක්කදී කැවමැනව, එසේවීනම් පාවාගෙණ යම්හයි කීහ.

රජ්ජුරුවෝ එබසට සැකව උන්නාහ. එවිටත් මහානාම රජ්ජුරුවෝ තොපි ඇම සැක නොකරව. මම ඊට උපායක් දනිමි, මා බත්කන්නට සරසා උන්විට වාසභඛත්තියාවන් මාගේ දුවනියන් ගෙණවයි කියමි. ඒ වේලාවට සඤ්ඤාහරණයෙන් සරහා බත්කන්ට උන් වේලාවටත් බත්පිඩක් අනා පළමු කොට අනුභවකොට තොපි බත්කවයි කියමි, එවිට ප්‍රත්‍යන්ත රටකින් ගෙණා පතක මේ පත බලා වදාළමැනවැයි සවාමීනි කියා ඒ පත මා අතට දීලව, මම ඒ පත බල බලා ඉඳිමි. එතකොට මූ බත්කා පියති, එකල දූතයන්ට සැක නැතැයි කියා සනිටුහන්කොට දූතයන්ට කියන්නාහු මාගේ දරුවන් හා කැටිව කන්නට කුමන අමුත්තෙක්ද? යහපත වෙල්ල සරහවයි කියා වෙල්ල සරහවා බත් කන්ට ඉඳ මාගේ දුවනියන් වාසභඛත්තියාවන් ගෙණෙවයි කීහ. ඒ වේලෙහි සඤ්ඤාහරණයෙන් සරහා වෙල්ල ලඟ සිටුවූහ. මහානාම රජ්ජුරුවෝත් දියනියෙනි බත්කන්ට ඉඳුවයි කියා බත්කන්ට උන්කල තුමූ පළමුකොට බත්පිඩක් කටතුබූහ. ඒ වේලෙහි පළමු කී පරිද්දෙන් ප්‍රත්‍යන්ත ජනපදයෙන් ගෙණා පතෙක මේ පත බලා වදාළ මැනවැයි කියා මහානාම රජ්ජුරුවන් අතට දුන්හ.

රජ්ජුරුවෝත් ඒ පත බල බලා අම්ම, නුඹ බත්කන්නෙහි කිය කියා උන්හ. කුමාරිකාවන් පියානන් පළමුකොට බත්කෑ හෙයින් තුමූ බත්කා නිම වූහ. මහානාම රජ්ජුරුවෝත් බත් කා නිමවනතුරු පත බල බලා උන්නාහ. දූතයෝත් මහානාම රජ්ජුරුවන් අතත් කටත් බත්ගෑවී තිබෙන හෙයින් බත් කෑවීට නැගීසිටි හෙයිනුත් දූනගත නුහුනුවාහ, කැටුවම බත් කෑවූය, රාජ කුමාරිකාව තියාවට අමුතු නැතැයි සැකනැතිවූහ. මහානාම රජ්ජුරුවෝත් දුවනියන්ට දුනමනා බොහෝ දැසිදස් පරිවාරද රන්රුවන් ආදී වස්ත්‍රාභරණද යන සියල්ලම දී මේ මාගේ දුවූ වාසභඛත්තියාවන් ගෙණයවයි පාවාදුන්හ. අමාත්‍යයෝද රාජකුමාරිකාව ගෙණ ඉතාම උභයකුලපරිශුඬවූහයි කියා රජ ගෙට ගොස් රජ්ජුරුවන්ට පාවාදුන්හ. රජ්ජුරුවෝත් ඒ කුමාරිකාවන් රුවත්

රූසක් මත්තෙහි සිටුවා අභිෂේක ජලය වත්කොට අගමෙහෙසුය් තනතුරෙහි තුබූහ. බිසවුන් රජ්ජුරුවන්ට ප්‍රියව වාසය කරන්නාහ. නොබෝකලකින් පුතනුකෙනෙකුන් වැදූහ. ඒ වේලෙහි කෝසල රජ්ජුරුවෝ අමාත්‍යයකු කැඳවා කියන්නාහු මේ කුමාරයන්ගේ මූතුන්වූ මහානාම රජ්ජුරුවන්ගේ කිඹුල්වත්නුවරට ගොසින් උන්වහන්සේගේ අගමෙහෙසුන් බිසවුන් අතින් නුඹවහන්සේගේ දුවනියන්වහන්සේ පුතනුකෙණෙකුන් වැදූසේක. උන්වහන් සේට නුඹවහන්සේගේ රාජවංශයෙහි තිබියයුතු නමෙක්වේද එවමැනවැයි විචාරා එවූසේකැයි කීහ. එවිට බිසව් කියන්නාවූ වාසභඛත්තියාවෝ රජ්ජුරු වන්වහන්සේට ආදීම ප්‍රිය වල්ලභයහ, දූන් දිවූණෙක් වල්ලභ වන්නීය. ඉතා යහපතැයි කීහ. එවිට අමාත්‍යයෝ බිසවුන් වල්ලභවන්නීයයි කීබස් විඩූඩභ යයි කීවාසේ අසා සැවැත් නුවරට ගොස් කෝසල රජ්ජුරුවන්ට කියන්නේ ස්වාමීනි බිසවුන්වහන්සේ විඩූඩභකුමාරයෝයයි නම් තබන්ට කීසේකැයි කීහ.

එවිට කෝසල රජ්ජුරුවෝ ඒ වංශයෙහි තිබී ආ නමෙකැයි සිතා විඩූඩභ කුමාරයෝයයි නම් තුබූහ. ඒ කුමාරයෝත් රජපෙරහරින් වැඩෙන්නාහ. සෙසු බිසෝවරුන්ගේ රාජකුමාරවරු ඇත්තාහ, උන්ට උන්ගේ මූතුන් මින් තන්ගේ රජ්‍යයෙන් කෙළිනා ඇත් අස් රුව ආදීවූ කෙළින්ට නිසිදෑ එවත්නාහ. රාජකුමාරවරු ඒ ඇරගෙණ කෙළිනාහ. විඩූඩභ කුමාරයෝ මෑනියන්ට කියන්නාහු මෑනියන්වහන්ස නුඹවහන්සේගේ මෑනියන් පියානන් නැද්ද මට පඬුරක් නේවන්ට කාරණා කිම්දැයි කීහ. බිසව් කියන්නාහු පුත තොපගේ මූතුන්මින්නෝනම් ශාක්‍යවංශයේ රජදරුවෝය, උන්වහන්සේලාගේ නුවර මෙතනට ප්‍රත්‍යන්තව තිබෙයි. එසේහෙයින් දසවිට මිනිසුන් එවන්ට දුරු හෙයින් නේවන්නේයයි කීහ. ඒ අසා විඩූඩභ කුමාරයෝ කීයන්නාහු එසේ වීනම් මෑනියන්වහන්ස මම මාගේ මූතුන්මින්නන් දකින්ට යෙමි කීහ. ඊට බිසව් කියන්නාහු දූන් ගොසින් කවර ප්‍රයෝජනද පසුව යවයි ඒ කුමාරයෝත් තත්පරව යෙමි කීහ. බිසව් යහපත යවයි කියා ශාක්‍ය රජ්ජුරුවන්ට පත් ලියා පළමුකොට මිනිසෙකු අත යවන්නාහු ස්වාමීනි මම ආදවස් පටන් කිසි අවසරයක් නොපෑ සැපසේ වාසය කෙළෙමි. මේ කුමාරයෝ නුඹවහන්සේලා දකිනා පිණිස ඔබ එන්නාහ, මාගෙන් කිසි තොරතුරකුත් උන්ට නොනැඟුව මැනවැයි පත් යැවූහ. ශාක්‍යරජදරුවෝත් වැඩිමාලූ රජ්ජුරුවන් විනා බාල කුමාරවරුන් මෙතන රුඳු නුකල උන්ට ආදර සම්භාවනා කළමැනව, ඒ නියාවට වැඩිමාලූ රජදරුවන් විනා බාල කුමාරවරුන් එකහීම පිටිසර ගම්වලට යවා රජදරුවෝ අධිකරණ ශාලාවෙහි එක්ව උන්නාහ. විඩූඩභ කුමාරයෝත් පියා නන්ගෙන් අවසර ඉල්වාගෙණ බොහෝ සේනාවාහනයෙන් කිඹුල්වත් නුවරට ගොස් රජදරුවන් උන්නාවූ ශාලාවට වන්හ. රජ්ජුරුවෝත් විඩූඩභ කුමාර යන් දූක මුන්වහන්සේ තොපගේ මුතනුවන්වහන්සේයයි පෑවාහ.

විඩූඩභ කුමාරයෝත් වසට කැඩෙනතුරු වැඳ එකත්පස්ව සිට තමන්ට ආදර සම්භාවනා කරණ කෙණෙකුන් නොදූක කියන්නාහු ඇයි ස්වාමීනි නුඹ වහන්සේගේ බාල කුමාරවරු නැද්දැයි විචාළහ. එවේලෙහි මහානාම රජ්ජුරු වෝ කියන්නාහු කුමාරයෙනි බාල කුමාරවරු ඇත. තොප එන්නාට පළමු වෙන් පිටිසර පලාගියෝයයි කියා අස්වසා උන්කැටිව ආවාවූ පිරිසට හා පරවාර ජනයාට බත්වියදම් ආදීවූ දෙයද රාජකුමාරයන්ට දුනමනා පඬුරු පාක්කුඩම් යන සියල්ලම අඩුවක් නැතිව දෙවා රාජකුමාරයන් යවූහ. රාජ

කුමාරයෝත් කිසි සැකයක් නොසිතා රජ්ජුරුවන් දුන් පඬුරු පාක්කුඩම් ඇරගෙණ රජ්ජුරුවන් කරා ගියාහ. උන් හා කැටිව ආ සේවායෙක් ඒ ශාලාවේ ආයුධයක් තබා ගියේය. ආයුධය ගෙණයන්ට උඟ එන වේලාවට එක් කෙල්ලක් විඩූඩභ කුමාරයන් උන් පෝරුව කිරිපැනින් සඳුන් පැනින් සෝදන්නී අප හා සරි කෙල්ලකගේ පුතා උන් පෝරුව අපි සෝදම්හයි කිය කියා පෝරුව සෝදන්නීය. ඒ සේවකයා ඈ කියන්නාවූ බස් අසා නී කියන්නේ කිම්දැයි විචාරා තොරතුරු මුළුල්ලම ඈ අතින් විචාරාගෙණ මෙපවත් සැවැත් නුවර මුළුල්ලේම ප්‍රකාශකෙළේය. එපවත් කෝසලරජ්ජුරුවෝ අසා බිසවුන්ට තිබූතරමුත් ඇරගෙණ කුමාරයන්ටත් පරිවාර තරමට පඬිවියදම් තිබූහ. කෝසල රජ්ජුරුවෝ එක්දවසක් ජේතවනාරාමයට ගොස් සර්වඥයන්වහන්සේ වැඳ එකත්පස්ව ඉඳ කියන්නාහු ස්වාමීනි ශාක්‍ය රජදරුවන් ලඟට රාජකුමාරිකාවක් ඉල්වා යවා අපට තමන්ගේ කෙල්ලකගේ දුවක් එවූයයි කියා විඩූඩභ කුමාරයන් මැනියනුත් සිටි තරමින් පිරිහෙලා පරිවාර තරමට පඬි තරමුත් තිබුනියාව කීහ.

ඒ වේලෙහි සර්වඥයන්වහන්සේ වදාරණසේක් මහරජ ශාක්‍ය රජ්ජුරුවන් කෙළේත් කටයුතු නොවෙයි, එසේදවූවත් මහරජ පෙර රජදරුවෝ මණ්ඩශාල නම් කෙල්ලක සිටි තරමින් පිරිහෙලා නැවත අගමෙහෙසුන් තන තුරු දුන්නෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන්වහන්සේ මණ්ඩශාලජාතකය ගෙණහැර දක්වා වදාරා මහරජ මේ වාසභඛත්තියාවන්ගේ මැනියන් කෙල්ල පමණක් විනා මුත් තමුන් ද මහානාම රජ්ජුරුවන්මය, විඩූඩභ කුමාරයන් උපන්නේ නොපටය, එසේහෙයින් මවුපක්ෂය විනා පිය පක්ෂය රාජවංශය. එසේහෙයින් අඩුවක් නැතැයි රජ්ජුරුවන්ට කියා වාසභඛත්තියාවනුත් විඩූඩභ කුමාරයනුත් දෙන්නාම පළමු සිටි ස්ථානාන්තරයෙහි පිහිටුවා වදාළසේක. විඩූඩභ කුමාරයෝ සිතන්නාහු මා උන් පෝරුව කිරි පැනින් සඳුන් පැනින් සේදූ ශාක්‍යයන් ගල ලෝහිතයෙන් ඒ පෝරුව මමත් සෝදවම් සිතා ශාක්‍ය රජදරුවන් කෙරෙහි වෛර බැන්දුහ.

ඒ කෝසලරජ්ජුරුවන්ගේ බන්ධුලසේනාධිපතියයි යන සෙනෙවිරත් කෙණෙක් ඇත්තාහ. උන්ගේ බන්ධුලමල්ලිකා දේවී යයි යන බිරින්දක් ඇත්තාහ උන් වඳ හෙයින් බන්ධුලසේනාධිපතිතෙම වඳ තැනැත්තන් මාගේ ගෙයි ඉඳිනට කාරණා කිම්ද? තොප තොපගේ දෙමව්පියන්ගේ ගමට යවයි කීහ. බන්ධුල මල්ලිකාවෝත් යහපතැයි කියා දෙමව්පියන්ගේ ගමට යන්නාහු සර්වඥයන්වහන්සේ දැක වැඳපුදා අවසර ඉල්වාගෙණ යෙමියි ජේතවනාරාමයට ගොස් සර්වඥයන්වහන්සේ වැඳ එකත්පස්ව සිටියාහ. සර්වඥයන්වහන්සේ ඇයි මල්ලිකා දේවීනි කොයි යවුදැයි විචාළසේක. මල්ලිකාදේවි කියන්නාහු ස්වාමීනි බන්ධුලසේනාධිපති මිඬියට දරුවන් නැතැයි කියා මිඬියගේ දෙමව්පියන්ගේ ගමට යන්ට කිවුය. මිඬිය ගමට යන තැනැත්තී ස්වාමීන් දැක වැඳපුදා අවසර ඉල්වාගෙණ යන පිණිස ආමි කීහ සර්වඥයන්වහන්සේ වදාරණසේක් මල්ලිකා දේවීනි දරුවන් නිසාවීනම් ගමට නොගොස් තොපගේ ගෙට ආපස්සේ යවයි වදාළසේක. මල්ලිකාදේවීන් යහපතැයි තමන්ගේ ගෙට ගියහ. බන්ධුලසේනාධිපති තොප ආයේ ඇයිදැයි විචාරා සර්වඥයන්වහන්සේ දරුවන් නිසා වීනම් ගමට නොගොස් ගෙට යවයි කී හෙයින් ආමි කීහ. බන්ධුල සේනාධිපති සර්වඥයන්වහන්සේ විසින් කාරණයක් දක්නාලද්දේයයි කීයේය. බන්ධුල මල්ලිකාවෝ

නොබෝකලකින් දරුගැබ් ලැබ උපන් දොළ ඇතිව මට දොළෙක් ඇත්තේයයි දන්වූවාය. බන්ධුලයෝ කවර දොළෙක්දැයි කීකල්හි ස්වාමීනි විශාලා නුවරෙහි ගණ බන්ධනයෙන් රජකම්කරණ රජකුලයන්ගේ ස්නානය කරණ මගුල් පොකුණට බැස ස්නානයකොට බොන පැන් පානය කරණ කැමැත්තෙමි කීවාය. බන්ධුල සේනාධිපති මේ මට බැරි දෙයෙක්දැයි දහසක් නගන දුන්න ඇරගෙණ රථයට පැනනැගී මල්ලිකාදේවීනුත් රථයට නංවා විශාලානුවරට ගොස් ලිච්ඡවි රජ්ජුරුවන්ගේ වාසල්හි පඬියේ රථය ගසා නුවරට වන්හ. බන්ධුලමල්ලසේනාධිපතීන් හා කෝසල රජ්ජුරුවන් හා එක්ව ශිල්ප උගත්තාවූ ඇස් අන්ධව ඉඳිනා මහාලී නම් ලිච්ඡවි රජ්ජුරුකෙණෙක් ඇත්තාහ. ඒ රජ්ජුරුවෝ නුවර වාසලක ඉඳිනාහ. රථය අඬ අසා බන්ධුලසේනාධිපති මේ නුවරට අවුය, ලිච්ඡවි රජ්ජුරුවන්ට බොහෝ අනර්ථවන්නේයයි සිතූහ. බන්ධුල සේනාධිපතීන් නුවරට වැද උයනට ගොස් කඩුපත වෙවුල්වා උයන රැකවල සිටියවුන් හයගන්වා ගිය ගිය අත පලවා ලෝදූල් හිරස්ස රැසක් පොළුගසන්නාසේ සිඳහෙලා පොකුණට බැස මල්ලිකාදේවීන් ඉස්සෝධා නහවා පැන්පොවා රථයට නංවා රථය පැදගෙණ නුවරින් පිටත්ව නික්මුණාහ. උයන රැකවල සිටියෝ එපවත් ලිච්ඡවි රජ්ජුරුවන්ට කීහ. ලිච්ඡවි රජ්ජුරුවෝ කිපී සන්නාහ සන්නාඬව රථ පන්සියයකට පැනනැගී බන්ධුලසේනාධිපතීන් ලුහුබඳවා අල්වම්හයි නික්මුණාහ. මහාලී නම් රජ්ජුරුවෝ එපවත් අසා රාජකුමාරවරුනි බන්ධුලසේනාධිපතීන් තොප හැම විසින් අල්වාගත හැකි කෙණෙක් නොවෙති. පස්සේ නොයවයි කීහ. රාජකුමාරවරුන් තනි බන්ධුල සේනාධිපතියා අපට කුමක් කොට ගතහේද අප පන්සියයක් නොවේදැයි කියා රාජමානයෙන් බන්ධුලයා නැගී සුරුබුහුටිකම්නුත් පස්සේ නික්මුණාහ.

එවිට මහාලී නම් ලිච්ඡවි රජ්ජුරුවෝ කියන්නාහු තොපි හැම නොනැවත යනපසු බන්ධුලයා නැගි රථය පොළොව ගිලීසේ පෙණෙයි, ඒ දැක නොයවයි කීහ. නොනැවත යනපසු ඉදින් ඔබට ගියානම් අකුණක් ගැසූ අඬසේ ඇසෙයි. එවිට නොයවයි ඉන් ඔබට ගියානම් රථහිස්වල සිදුරු දුටුවිට රඳා යව යි කීහ. රාජකුමාරවරුන් අස අසාම නොනැවත නික්මුණාහ මල්ලිකාදේවී පස්සේ එන්නාවූ රථ දැක ස්වාමීනි රථ පන්සියයක් පස්සේ එති කීහ. එවිට බන්ධුලසේනාධිපතීන් බිරිඳ අතට අසුගේ රැන දී දහසක් නගාලන දුන්නට දන එබූහ. එවිට රථය රථ නාභිය දක්වා පොළොව් ගිලීන, ඒ දැකත් නොරඳා යන්නාහ. එවිට දුන්න ගෙණ අත දුනුදිය පොළාපූහ. එද අකුණක් ගැසූ අඬසේ ඇසින. ඒ අසාත් නොරඳා යන්නාහ. ඒ වේලෙහි හීයක් අතට ගෙණ ඇද මැඩ විද්දාහ. ඒ රථහිස් පන්සියයද රජදරුවන් පන්සියයද විදගෙණ පොළොව ගිලීන. ඒ දැකත් නොරඳා යන්නාහ. ඒ රථහිස්වල සිදුරු දැකත් නොරඳා යන්නාහ. ඒ වේලෙහි බන්ධුල සේනාධිපති කියන්නාහු තොපි ඇම දෙනම මළවුන් මාපස්සේ එන්නේ ඇයිදැයි කීහ. එවිට රාජකුමාරවරු කියන්නාහු මළවුන් මෙසේ සිටිනෝදැයි කීහ. එවිට බන්ධුල සේනාධිපති කියන්නාහු තොපි ඇම්දෙනාට පස්සේ රථයේ එන රජ්ජුරුවන් සන්නාහය මුදා උනාපියයි කීහ. එවිට යහපතැයි උනාපූහ. ඒ රජ්ජුරුවෝ සන්නාහය ඉතුවා හා සමග වැටී හුන්හ. බන්ධුලසේනාධිපති කියන්නාහු තෙපි ඇම්දෙනම තෙලසේම නුවරට ගොසින් අඹුදරුවන්ට කාරියකටයුතු කියා තමාගේ යාන්පිට ඉඳ සන්නාහය උනාපුව මැනවැයි කීහ. උනාපූවිටම රජදරුවෝ පන්සියයම මළාහ. බන්ධුල

සේනාධිපති සැවැත්නුවරට ම ගියාහ. මල්ලිකාදේවී සොළොස්වාරයෙක දෙන්න දෙන්නා නියායෙන් දෙතිස් දෙනෙකු වැදූහ. ඒ පුත්තු දෙතිස් දෙනම බලයෙන්ද රුවින්ද උසමහතින්ද පියානන් හා සමබල ඇත්තාහ. බන්ධුලසේනාධිපති දරුවන් දෙතිස්දෙනාට දස දස නියායෙන් සේවයන් ආණ්ඩුකර දුන්නාහ. බන්ධුල සේනාධිපතීන් හා පුත්තු දෙතිස්දෙනා හා සේනාව රාජසේවයට ගිය කල රාජාංඝනය උන්ට අවසර වන්නේය. මේ නියායෙන් දවස් අරණා කල්හි, එක් දවසක් බන්ධුලසේනාධිපතීන් රාජසේවයට එන කල්හි ඒ වෙලාවට එක් මිනිසෙක් තමා හිමි වස්තුවක් අහිමිකොට අල්ලස් කා අධිකරණ නායක යන් කළ අන්‍යාය යයි ඉස තබාගෙණ මොරගා බන්ධුල සේනාධිපතීන්ගේ පාමට අඬාහිත, බන්ධුලසේනාධිපතීන් යහපත විත්ති පසිඳුවාලමි කියා ආපස්සේ අවුත් අධිකරණ ශාලාවේ හිඳ යුක්තිය විචාරා හිමි තැනැත්තවුටම හිමි කළාහ. එතන සිටියාවූ බොහෝදෙනාම යුක්තිය පසුත්තියාව ඉතා යහපතැයි සාධුකාර දුන්නාහ.

කෝසල රජ්ජුරුවෝ මේ අරගලයත් විචාරා මෙපවත් අසා අද පටන් තෙපි අධිකරණ විචාරවයි බන්ධුලසේනාධිපතීන්ට සැලැස්වූහ. එතැන් පටන් බන්ධුල සේනාධිපතිම යුක්ති විචාරන්නාහ. පළමු අධිකරණ විචාළ අමාත්‍යයෝ තමන් ලබන අල්ලස් නැතිහෙයින් බන්ධුල සේනාධිපතීන් කෙරෙහි වෛර බැඳ රජ්ජුරුවන්ට කියන්නාහු බන්ධුල සේනාධිපතිහු නුඹවහන්සේගේ රාජ්‍යය ප්‍රාර්ථනාකරන්නාහයි නිරන්තරයෙන් කියා බන්ධුල සේනාධිපතීන් කෙරෙහි රජ්ජුරුවන් බිඳවාපූහ. රජ්ජුරුවෝත් බන්ධුල සේනාධිපතියා නිකම් අල්වා මරාගතහැකි එකෙක් නොවෙයි, උපායකින් මරන්ට උවමැනවැයි කියා තමන්ගේ යොධයන් කැඳවා කියන්නාහු තෙපි ඇම පිටිනුවරට ගොස් සොරුන් ගම් පහරණුවා බඳුකොට ගම්පැහැර සැඟවී ඉඳුව මම බන්ධුල සේනාධිපතීන් හා දරුදෙතිසත් ඔහුගේ පිරිවරත් එවාලමි. තෙපි ඇම සැඟවී ඉඳ උන් අල්වා මරාපියවයි කීහ. යෝධයෝත් යහපතැයි ගිවිස ගොසින් පිටිසර ගමක් පැහැරපූහ. එපවත් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් බන්ධුල සේනාධිපතීන් කැඳවා කියන්නාහු පිටිසර ගමක් සොරුන් පැහැරපූවා ඇසුම්හ. එබැවින් තොපිත් තොපගේ දරුවෝත් පිරිසත් ගොසින් එරට සොරුන්ගෙන් උපන් භය සන්හිඳුවා එවයි කියා යවූහ.

බන්ධුල සේනාධිපතීන් යහපතැයි ගිවිස දරුවන් දෙතිසත් කැඳවාගෙණ පසල්ගමට ගියාහ. සොරුන් බන්ධුල සේනාධිපතීන් එනි කියා අසා වල් නැංගාහ, බන්ධුල සේනාධිපති එගම මිනිසුන් සෙමෙහි තබා සැවැත්නුවරට නික්මුණාහ. ඒ යෝධයෝත් වලින් එළිබැස බන්ධුල සේනාධිපතීත් දරුවන් දෙතිස් දෙනත් අල්වා මැරූහයි නියාව කියා මල්ලිකාදේවීන්ට අස්නක් යවූහ. මල්ලිකා දේවී ඒ වේලාවට සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේ ඇතුළුවූ පන්සියක්දෙනාවහන්සේ ගෙයි වඩාහිඳුවා දන් දෙන්නාහ. එක් කෙල්ලක් එළගිතෙල් කළයක් ගෙණයන තැනැත්තී බිඳපූහ. සැරියුත් සවාමි මල්ලිකාදේවීනි නස්නා සුලුදෙය නස්නේය තොපි ඊට කනස්සළු නොවවයි වදාළසේක. ඒ වේලෙහි මල්ලිකා දේවී සවාමීනි මාගේ මේ තෙල් කළයට මුසුප්පු වන්නේද මේ මාගේ සවාමිපුත්‍රයානන් හා දරුවන් දෙතිස්දෙනා ද මරාපූ නියාවට ගෙණා පත නොවේදැයි ඉත තබාගත් පත පැවිට පවා මුසුප්පු නුවූ මම තෙල් කළයට මුසුප්පු වෙම්දැයි කීහ. සැරියුත් සවාමි සමාධිව උන්ට බණ වදාරා ජේතවනාරාමයට වැඩිසේක·

මල්ලිකා දේවීන් තමන් යෙහෙලියන් දෙතිස්දෙනා කැඳවා කියන්නාහු එම්බා තොප තොපගේ ස්වාමිපුත්‍රයෝ දෙතිස්දෙනා ම රජ්ජුරුවෝ නිස්කාරණයේ නසාපුසේක, තෙපි ඇම මැරවූ රජ්ජුරුවන් කෙරෙහි ද විස්මකම් කියා බිඳුවූවන් කෙරෙහි ද කතස්සල්ලක් නොව, ගිය ජාතියෙහි තම තමා කළ අකුසල් විපාක දින. කිසි වරදනොව මෙබන්දක් වූයේයයි සිතා ඉඳින පමණක්විනා කිසිකෙණෙකුන් කෙරේ කතස්සල්ලක් නොව මෛත්‍රී කරවයි අවවාද කීහ. එපවත් නුවරවාසී අසා නිරපරාධ බන්ධුලසේනාධිපති නුඹවහන්සේ විසින් නිෂ්කාරණයේ මරවා දමනලදැයි කීහ. රජ්ජුරුවෝත් සැබව නිරපරාධ බන්ධුල සේනාධිපතීන් හා දරුවන් දෙතිස්දෙනාත් මැරුයේ ඉතාම අයුක්තියයි හයින් බන්ධුලමල්ලිකාදේවීන් ඉන්නා තෙට ආහ. මල්ලිකාදේවීත් යෙහෙලියන් දෙතිස්දෙනාත් කැඳවාගෙණ රජ්ජුරුවන් වැඳ සිටියාහ. කෝසල රජ්ජුරුවෝත් කියන්නාහු මල්ලිකා දේවීනි තොපගේ ස්වාමිපුත්‍රවූ බන්ධුලසේනාධිපතීන් දරුවන් දෙතිස්දෙනාත් මා විසින් නිෂ්කාරණයේ මරවනලද; තොපි කැමති වරයක් ගණුවයි කීහ. මල්ලිකාදේවී යහපත ස්වාමිනී පසුව දන්වන්නෙම්වේද වැඩවදාරන්නේ යහපතැයි රජ්ජුරුවන් රජගෙට යවා තුමූ පසුව දවස් රජගෙට ගොස් ස්වාමීනි අපට කැමති වරයක් ගණුවයි වදාළසේක්වේද අප අපගේ ගම්වලට යන්ට අවසර දෙවා වදාරණසේ මැනවැයි කීහ.

රජ්ජුරුවෝත් යහපතැයි අවසර දුන්නාහ. මල්ලිකාදේවීත් යෙහෙලියන් දෙතිස්දෙනාත් උන් උන්ගේ දෙමවුපියන්ගේ ගම්වලට යවා තමූත් තමන්ගේ දෙමවුපියන්ගේ ගමට ම ගියාහ. ඉක්බිති කෝසලරජ්ජුරුවෝ එකියන බන්ධුල සේනාධිපතීන්ට බෑනා වූ දීඝකාරායන * නම් කෙනෙක් ඇති, උන්ට සෙනෙවිරත් ධුරය දුන්නාහ. ඒ දීඝකාරායනම් සෙනෙවිරත් තමාගේ මයිලනුවන් නිස්කාරණයේ මැරූසේකැයි රජ්ජුරුවන් කෙරෙහි වෛර බැන්දහ එසමයෙහි සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසනසේක. ඒ විහාරය වනාහි ධම්මචෙතිය ජාතකයෙහි විස්තාරවශයෙන් පෙණෙන්නේය. කෝසල රජ්ජුරුවෝත් සර්වඥයන්වහන්සේ වැඩහිඳිනා විහාරයට බණ අසන්ට යන්නාහු පඤ්චකකුධ භාණ්ඩය ද බිසවුන් ද සේනාවද ඇරගෙණ බණ අසන්ට ගියාහ. සෙනෙවිරද්දු රජ්ජුරුවන් බණ අස අසා ඉඳුන්දී සේනාවත් ඇරගෙණ සැවැත් නුවරට ගොස් පඤ්චකකුධ භාණ්ඩය විඩූඩභ කුමාරයන් අතට දී වාසල් අගුල්ලාගෙණ උන්හ.

කෝසල රජ්ජුරුවෝ පිටිපස්ස බැළුවාහු බිසවුන් හා බුලත් කවන කැනැත්තවූ විනා කිසි කෙණෙකුන් නොදැක සෙනෙවිරදුන් නිසාවූ දෙයෙකැයි සිතා ඉතිකින් මා නුවරට ගොස් කරන්නේ කිම්දැයි මාගේ බෑනන්වූ රජ්ජුරුවන් හිඳිනා නුවරට ගොස් සේනාව ඇරගෙණ සටනට යෙමි බෑනනුවන් හිඳිනා නුවරට යන්ටයයි නික්මුණාහ. රජ්ජුරුවෝ මඟ යමින් සිටයදී රෑව ගිය හෙයින් අතරමඟ ශාලාවක රදා බුලත් කවන්නහු පලමුකොට යවූහ. රජ්ජුරුවන් දුලක හෙයිනුත් දුරුමග ගෙවා පයින් ආහෙයිනුත් වටින් සුළං ගසන හෙයිනුත් ඒ ශාලාවෙහි වැදහෙව අලුයම් වේලාවට ප්‍රාණය නිරුධවිය. බෑන රජ්ජුරුවෝත් එතනට ආවාහ. බිසව් රජ්ජුරුවන් පාපිට අඩ අඩා හුන්හ. රජ්ජුරුවෝත් කෝසල රජ්ජුරුවන් ඒ ශාලාවෙහි ම ආදාහන කරවා මූත් වහන්සේ නටපසු සටනට යන්නේ කාටදැයි තමන්ගේ නුවරට ම ගියාහ.

* දීඝකාරායන - ධම්මපදට්ඨ කථා.

විඩූඩභ කුමාරයෝත් රජ්‍යශ්‍රීයට පැමිණ ශාක්‍යරජදරුවන් කෙරේ ඇති කනස්සල්ල සඳහන්කොට කිඹුල්වත්පුරයට ගොසින් මා උන් පෝරුව සඳුන් කිරිපැනෙන් සේදූ ශාක්‍යයන්ගේ ගෙල ලෙහෙයෙන් ඒ පෝරුව සේදුව මැනවැයි කියා සටනට යන්ට සේනාව සරහා නික්මුණාහ. ඒ වේලෙහි සර්වඥයන්වහන්සේ එදවස් අළුයම් වේලෙහි ලොව බලා වදාරණසේක් තමන් වහන්සේගේ ඥාති සමූහයා විනාශයට පැමිණෙන බව දැක වදාරා නෑයන්ට සංග්‍රහ කෙරෙමියි සිතා එදවස් පූර්වභාගයෙහි පිඩු පිණිස හැසිර විහාරයට වැඩ වළඳා ඉක්බිති ගඳකිළියට වැඩ සිංහසෙය්‍යාවෙන් සැතපී මඳක්කල් යවා සවස්වේලෙහි අහසින් වැඩ කිඹුල්වත් නුවර සමීපයෙහි එක් ඡායාවක් නැත්තාවූ වෘක්ෂයක් මුල වැඩඋන්සේක, එතනට නුදුරු තැන්හි විඩූඩභ රජ්ජුරුවන්ගේ සීමායෙහි ඝනපත් ඡායාව ඇති මහානිග්‍රොධ වෘක්ෂයකුදු ඇත්තේය, විඩූඩභ කුමාරයෝත් සර්වඥයන්වහන්සේ දැක ඇයි ස්වාමීනි මේ ඡායා සම්පන්න නුගගස තිබෙද්දී මෙවිට ඡායාවේ ඉදල්ගසමුල වැඩ ඉදිනේ ඇයිදැයි විචාළාහ. සර්වඥයන්වහන්සේ වදාරණසේක් මහරජ කිඹුල්වතින් හමන්නාවූ පවන ඉතා මිහිරියයි වදාළසේක.

රජ්ජුරුවෝත් සර්වඥයන්වහන්සේ බන්ධූන් කෙරෙහි කරුණාවෙන් වැඩහිඳිනා සේකැයි ආපස්සේ නුවරටම ගියාහ. මේ නියායෙන් තුන්වාරයක් අවුත් තුන්වාරයෙක බුදුන් දැක පලාගියේය. සතරවෙනි වාරයේත් ගමන් සැරහුහ. සර්වඥයන්වහන්සේත් මුන් නොනවත්නා කාරණය කවරේ දෝහෝයි පරීක්ෂාකොට පළමු එක් ජාතියෙක ශාක්‍යයන් එක්ව වළකට වසගැඩූවා දැක බැණ නොනැගී වැඩ උන්සේක. විඩූඩභ රජ්ජුරුවෝත් කිඹුල්වත් නුවරට ගොසින් ශාක්‍ය රජ්ජුරුවන් එක්හී මරා යටත්පිරිසෙයින් කිරිබොන දරුවන් දක්වාත් මැරුයේය. ධර්මශාලාවේ රැස්වූ භික්ෂූන්වහන්සේ සර්වඥයන්වහන්සේ බන්ධූන් කෙරෙහි ඇති කරුණාවක බලවත් නියායයි කිය කියා උන්තෙනට සර්වඥයන්වහන්සේ වැඩවදාරා මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන් මතු නොවෙයි. පෙරත් බන්ධූන් දුකින් ගලවා ගත්තෙමියි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේ ද? යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවෝ තමන්ගේ වඩුවන් කැඳවා කියන්නාහු සෙසු රජදරුවෝ බොහෝ කප් හිඳුවා මාලිගා නංවා ඉඳිනාහුය, මට එසේ නපුර, එක් කපක් හිඳුවා ඒකසථම්භ මාලිගාවක් ඉදිකරන්ට උවමැනවැයි කීය. වඩුවෝත් යහපතැයි ඊට නිසි දඬු බලා ඇවිදිනාහු කඳු මුදුනක ගස් කීපයක් දැක කපා ඒ ලී ලබාගත නොහැකි හෙයින් එපවත් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් උත්සාහකොට ඒ ලී බාවයි කීහ. ස්වාමීනි බැරියයි කීහ. එසේකල ඔබ්බෙක නිසි දඬුපත් ඇත්තේ කොයිදැයි විචාළාහ. ස්වාමීනි මඟුල් උයනේ මඟුල් සල්ගස් තසියයි කීහ. එසේවීනම් අනික් සල්ගසක් සලස්වා ගණුම්හයි ඒ ගස කපවයි කීහ. වඩුවෝ ගසමුලට ගොස් සඳුන් පසඟුල් දී පාන්ලා සඳුන් සුවඳ මල් පැතිත් පූජාකොට ගසයට මල්වළඳ එල්වා මන්ත්‍ර කියා කියන්නාහු මේ ගස වසන්නාවූ දේවතාවාතෙනි

රජ්ජුරුවන්ට ඒකසථම්භ මාලිගාවක් කරවන සඳහා මේ ගස කපම්හ, ඔබ්බ කට පලාගිය මැනවැයි කියා ගියාහ. ඒ ගස වසන දේවතාවාත් මේ ගස නැත්නම් මාගේ ජීවිතය ගියා සරියයි අඬ අඬා සිට මා කුමක් කියම් මේ මාගේ ගස ආශ්‍රය උන්නාවූ බොහෝ දේවතාවෝත් ඇත, උන්ට බොහෝ අද්දුවන් සැලසෙයි කියා රජ්ජුරුවන්වහන්සේට කියා මාගේ නෑයන්ට වන් නාවූ අලාභත් වලකා මාගේ ගසත් කැපියනොදී ගලවා ගණිම්. රෑ මධ්‍යම වේලේ රාත්‍රියෙහි රජ්ජුරුවන් වැදහෝනා ශ්‍රීයහන් ගබඩාවට වැද තමන්ගේ දිව්‍යානුභාවයෙන් මාලිගාව ඒකාලෝක කෙරෙමින් සිටියාහ. රජ්ජුරුවෝත් භයින් ත්‍රාසනව නැගීසිට, අඬ අඬා මාගේ ඉස්දෙර සිටියාවූ තොපි කවුරුදැයි විචාළාහ. දේවතාවා කියන්නේ තොපගේ උයනේ සල්ගස වාසයකරන්නාවූ භද්‍රශාල දිව්‍යපුත්‍රයා නම් මමයයි කීහ. ඇයි තොප මේ වේලේ මෙතනට ආයේ ඇයිදැයි කීහ. මා බොහෝ දවසක් උන්නාවූ සල්ගස කුමට කපව්දැයි විචාළාහ. ඇයි තොපි මා ඒකසථම්භ මාලිගාවක් ඉදිකරවන නියාව නොදනුද මාලිගාව ඉදිකරණ නිසා කපමි කීහ. මා ඉඳිනා ගස කපාපුවිට මාගේ ප්‍රාණයගියා හා සරියයි කීහ.

රජ්ජුරුවෝත් කියන්නානු මාලිගාව ඉදිකළ කල තොප අප හා එක්ව ඉඳුම්හයි කීහ. එසිට දිව්‍යපුත්‍ර කියන්නේ මෙවකට සැටදහසක් අවුරුදු මා මේ සල්ගස වසන්නේය. මීට පළමු මේ නුවර රජකම් කළ රජදරුවන්ගෙන් මේ ගස මල් පහන් පූජාකළාවූ කෙණෙක් විනා ගස කැපූ කෙණෙකුත් නැත. තොප තත්පරව මහගස කප්පන පසු තුරු ආදීකොට එකී එකී අත්තක් නියායෙන් කපා පසුව ගස කපවයි කීහ. එසේ කැපූකල මට සැපවන්නේයයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු මට කුමක්වේවා මාගේ ප්‍රාණ හා සරියයි කියා දූත් අත්තෙන් අත්ත කපන්ට කියන කාරණා කිම්දැයි අත් පා කන් නාසා ඉස කපන කල සැප කවරේද එකවිටම ඉස කපාපු කල පාසුද තොප එසේ කියන්ට කාරණා කිම්දැයි කීහ එවිට දිව්‍යපුත්‍රයා කියන්නේ මට කුමක් වේවා මා නිසා ඒ ගස වට සිටින්නාවූ බොහෝ පැලැටි ගස්වල ඉඳිනා මාගේ බොහෝ බන්ධුහුත් ඇත. මට කුමක් වෙතත් උන්ට දුකක් නොවන්නා පමණැයි සිතා මා කීයේයයි කීහ. එවිට රජ්ජුරුවෝ තමන්ට වන්නාවූ දුකට වඩා තමන්ගේ බන්ධුන්ට දුකට අඬතියි සමාධිව තොපගේ සල්ගසත් තොපට හලුම්හ, තෝපගේ නෑයන්ටත් කිසි ගහටයක් නැතිව ඉඳුවයි රජ්ජුරුවෝ ඒ සල්ගස දිව්‍යපුත්‍රයාටම කළාහ රජ්ජුරුවෝත් ඒ දිව්‍යපුත්‍රයානන්ගේ අවවාද යෙහි පිහිට දශරාජධර්මයෙන් රාජ්‍යයකොට පරලොව ගියහයි වදාරා මේ භද්දශාල ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද සථවිරයෝය, රජ්ජුරුවන්ට කන්නලව් කියා නෑයන් දුකින් ගලවා ගත්තාවූ භද්‍රශාල දිව්‍යපුත්‍රයා නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

460
සමුද්දවාණිජ ජාතකය

සමද හුදු ප්‍රඥවෙන් මවාලූ රුවක් වැනිවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්තසථවිරයන් පොළවට වන් නියාව අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්

මුගලන්සාමින් සැරියුත්සාමින් දෙදෙනාවහන්සේ දෙවදත්තසථවිරයන් ලඟ උන් පන්සියයක් භික්ෂූන්වහන්සේට බණ කියා ඇරගෙණ ගියසේක. කෝකාකාලිකයන්වහන්සේ දෙවදත්තසථවිරයන් වැදහෙව නිදනකල්හි නා කූමන මරනිද්දයි කියා විලුඹෙන් ලැමැද්දට ඇනලූ ගමනේ ලේ නගා ලෙඩින් වැදහෝනා ගමනේ නවමසකින් අනේ මට කිසි සරණයෙක් නැතිව අනාථ අසරණව ගියෙමි. සර්ඥයන්වහන්සේත් මා කෙරෙහි කලකිරුණුසේක. අසූමහසව්වන් වහන්සේත් මා කෙරෙහි කලකිරුණුසේක, මාගේ බෑනාවූ රාහුලසථවිරයන්වහන්සේත් මා කෙරෙහි කලකිරුණුසේක, මාගේ ශාක්‍ය වංශය හා කෝලිය වංශයෙහිත් මාගේ නෑයෝත් මා කෙරෙහි කතස්සළු වූහ, කවුරු මා කෙරෙහි කතස්සළුවූවත් මාගේ සර්ඥයන්වහන්සේත් මට අමෛත්‍රී නොකරණසේක, උන්වහන්සේ සරණයෙමි, උන්වහන්සේ දැක ක්‍ෂමා කරවාගණිමි සිතා තමන් ලඟ උන්නාවූ භික්ෂූන්ට කියන්නාහු භික්ෂූණි මා ඇඳපත්තෙක ලාගෙණ සැවැත්නුවරට ගොස් සර්ඥයන් දක්වයි කියා ඇඳපත්තෙක ලාගෙණ සර්ඥයන්වහන්සේ දකින්ට ජේතවනාරාමයට නික් මුණාහ. මෙපවත් අසා අනඳසාමීන් සර්ඥයන්වහන්සේට දැන් වූ සේක.

සර්ඥයන්වහන්සේ ආනන්දයෙනි දෙවදත්තසථවිරයෝ අප දක්ක නොහෙතියි වදාළසේක. භික්ෂූන්වහන්සේ ලවා උසුලවාගෙණ සැවැත් නුවරට අවුත් වන්හ. එපවත් අනඳසාමීන් අසා දෙවෙනිවත් සර්ඥයන්වහන් සේට දැන්වූසේක. සර්ඥයන්වහන්සේ ආනන්දයෙනි දේවදත්තසථවිරයෝ ජේතවනාරාමයට ආවූනුමුත් අප දක්ක නොහෙතියි වදාළසේක. දේවදත්ත සථවිරයන්වහන්සේ උසුලාගෙණ ජේතවනාරාමයෙහි වාසල සමීපයට ආකල ශරීරයේ දහ වැදගෙණ ඩාදිය සෙලවින. ඒ වාසල සමීපයේ පොකුණෙක් ඇත්තේය. ඒ පොකුණෙන් ස්නානයකොට යෙමි සිතා ඇඳ බාවයි බිම තබව පය බිම තිබූකලට පොලොවපැලී නරකයෙන් ගිනිදැල් ඇවිත් සිවුරක්පිට, අතික් සිවුරකින් වසන්නාසේ ශරීරය ගින්නෙන් වසා පොලොව ගලනකලට ගලහර ඇටදක්වා ගල පුකල දේවදත්තසථවිරයෝ මට බුදුන්ගේ සරණ විනා අන් සරණෙක් නැතැයි සිතාගාථාවක් කියන්නාහු.

ඉමෙහි අට්ඨීහි තමග්ග පුග්ගලං
දෙවාති දෙවං නරදම්මසාරථිං,
සමන්ත චක්ඛුං සතපුඤ්ඤ ලක්ඛණං
පාණෙහි බුද්ධං සරණං උපෙමි.

යන ගාථාව කිය කියා බුදුන්ගේ සරණ ගියාහ, බුදුන්ගේ සරණ ගියත් අවිචිමහ නරකයෙහි වැටුනාහ, දෙවදත්තසථවිරයන්ට පක්‍ෂපාතව සර්ඥයන් වහන්සේට නොයෙක් පරුෂ බිණූ පන්සියයක් පමණ මනුෂ්‍යයෝත් ඒ වේලෙහි අවීචිමහනරකයෙහි වැටුනාහ. දෙවදත්තසථවිරයන් හා එක්වූ මනුෂ්‍යයන් පන්සියයන් දෙවදත්තසථවිරයනුත් නරකයෙහි වැටුනු නියාව ධර්මසභාවේ රැස්වූ මහළුවරුන්වහන්සේ කිය කියා වැඩඋන්නෙනට සර්ඥ යන්වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාව කින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා දැන් මතු නොවෙයි පෙරත් තමන් හා එක්වූ අය ඇරගෙණ නරකයට ගියේවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්ඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේ ද? යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ ගම ඉදිනා වඩුවෝ දහසක් දෙනෙක් ඇත්තාහ. ඒ වඩුවෝ ඒ ගම මනුෂ්‍යයන්ට ඇඳ පුටු ගෙවල් දොරවල් ඉදිකරම්හයි කියා බඩුගෙණ කර්මාන්ත නොකරන්නාහ. මනුෂ්‍යයෝ වඩුවන් තමන්ට කර්මාන්ත නොකරණ හෙයින් අපගේ මිල දෙවයි කීහ. මිලත් දීගත නොහෙන්නාහ කර්මාන්තත් නොකරන්නාහ, මේ නියාවට කොටගත නොහී වික්ෂෙපව වනාන්තරයට ගොසින් මහපඩව්වක් ඉදිකොට ගඟඔස්සේ ගෙණවිත් තමන් ගේ අඹුදරුවන් අය පවුරු පඩව්වට නංවා වඩුවෝ දහසක් නැගී ගඟ ඔස්සේ පඩව්ව ගෙණගොස් සමුද්‍රයේ ලූහ. සමුද්‍රයෙන් යන්නාවූ අමෘත අඹ කොස් කෙහෙල් උක්දඹු වැල වරකා සයංජාත ඇල් ආදි නොයෙක් මධුර රසඵල යෙන් සජ්ජිතවූ දූවක් දැක ඒ දූව සමීපයට අවුත් මේ දූව මනුෂ්‍යවාසයෙක් දෝහෝ සිතා ඒ බලන්ට ශක්ති සම්පන්න පුරුෂයන් සත්දෙනෙකු ආයුධ සන්නද්ධකොට යවූහ. ඒ කියන දූවට පළමු එක් පුරුෂයෙකු එම දූවට බැස සැපසේ අභිප්‍රායානුකූල පරිද්දෙන් සයංජාත ඇල්සාලේ බත්කා උක්පැණි බී රිදීපටක් සමානවූ වැල්ලේ වැතිර සිතන්නේ මට ඇති සැප කවුරුන්ට ඇද්දැයි පිළිනැති පමණක් විනාය දඹදිව බොහෝ මනුෂ්‍යයෝ බඩ නිසා සී සා වැපිරීම් ආදියෙන් දුක්විඳිති. මට එසේවූ ආයාසයෙක් නැතැයි සිතා උදන් අනා වැදහොත් තෙනට පුරුෂයෝ සත්දෙන ගියාහු ඒ පුරුෂයා දැක යකෙක් දෝහෝයි සිතා විදින්ට ගිය දුනුපිට නගාගත් කලට පුරුෂයා කියන් නේ මා නොවිදුව මම යක්ෂයෙක් නොවෙමි කීහ.

එවිට පුරුෂයෝ සත්දෙන කියන්නාහු මනුෂ්‍යයෙක්වීනම් නග්නයෙන් ඉදීද දූලීරවූළු ආදීවූ දෙය මෙසේ දික්ව තිබේදැයි කීහ. පුරුෂයා කියන්නේ පඩව් නැගී ආ මම මෙතෙන රැඳිනිමි කීහ. එවිට පුරුෂයෝ කියන්නාහු මෙතන ඇති ඵාසු කිම්දැයි විචාළ ගමතේ මෙතනට වඩා නොයෙක් ඵලාඵල ඇති තෙනෙකුත්. රම්‍යවූ ස්ථානයකුත් යක්ෂ රාක්ෂ භය නැති තෙනෙකුත් මීට වඩා නැත. තොප ඇම විසින් කළමනා කටයුත්තක් ඇත මෙතෙන ඉතා රම්‍යව සිත්කළුවූ හෙයින් දේවතාවෝ මෙතෙනට ඇලෙන්නාහ. එසේ හෙයින් මලමුත්‍ර එලියෙ නොකොට වලක්සාරා එහි මලමූත්‍රකරව. ඒ විචරක් පිරිමසා ගතොත් මීට වඩා ඵාසුතෙනක් ඇත්තේ නොවෙයි. මෙසේ ඒ පුරුෂයා කීයේය. ඒ පුරුෂයෝ සත්දෙන පඩවූ නැගී මේ නියාවට වඩුවන් දැසත් තමන්ගේ අඹුදරුවනුත් පඩව්වෙන් ගොඩබාවා එකියත දූවේ ගෙවල් ඉදිකොට සැපසේ සයංජාත ඇල් හා නොයෙක් මධුර ඵලාඵල කා වාසය කරන්නාහු ඒ වඩුවන් දහසකට නායක වූ දෙදෙනෙක් ඇත්තාහ. ඉන් එක වඩුනායකයෙකුත් පන්සියක් වඩුවෝත් අනල්පසන්තෝෂයහ. ඉන් එක වඩු නායකයෙකුත් පන්සියේකුත් තෘෂ්ණාවසගයහ, විපියත් ඒ නියාවටම දෙමොනනමව ඉදිකොට වාසය කෙරෙමින් සිට නැතැක්දැය අප රා නො බොන්නේය රා බොම්හයි කියා උක්පැණින් පෙරූ රා ඉදිකොට බී මත්ව නොයෙක්තෙන මලමූත්‍රකොට කසලකළහ. දේවතාවෝ අපගේ මේ රම්‍යවූ ස්ථානය මලමුත්‍රකොටපූය සමුද්‍රයෙන් දිය උල්පවා ගලම්හයි කියා අව පස ළොස්වක දෙපෝයද සම්පූර්ණ චන්ද්‍රයා නැගිකල සමුද්‍රයෙන් දිය නගාලම්

හයි දේවතාවෝ කථාකළහ. එ කියන දේවතාවන්ගෙන් සත්පුරුෂ වූ දේවතාවෙක් සිතන්නේ මා වැනි සත්පුරුෂ එකකු ඉන්දදී මෙකියන මනුෂයෝ නොනයින්වයි සිතා තෙමේ සර්‍වාභරණයෙන් සැරසී උතුරු දිසාවෙහි සිට විමානය ඒකාලෝකකොට බබුළුවා සිට කියන්නේ එම්බල පුරුෂයෙනි දේවතාවෝ එක්ව කථාකරන්නාහු මේ දිවයින මලමූත්‍රකොට කසලකළහයි කියා සමුද්‍රයෙන් වතුරයවා ගලම්හයි කීහ. එසේ හෙයින් තෙපි ඇම අනික් තෙනකට යවයි කියා දේවතාවා කීයේය. ඉක්බිති පාපිෂ්ටවූ දේවතාවෙක් සර්‍වාභරණයෙන් සැරසී දකුණුදිගසිට කියන්නේ පුරුෂයෙනි තොප ඇම ලඟට දේවතාවෙක් ඇවිත් කුමක් කීදැයි එපවත් අසා තෙමේ කියන්නේ මූ කීයේ බොරුය. තෙපි ඇම මෙහිම සිත් අලවා වාසයකරවයි. සමුද්‍රයෙන් ජලය අවුත් කවරදා මේ දිවයින ගලාද ඒ බොරුය එහිම වාසයකරවයි කියා කීයේය ඒ දේවතාවා ගිය ඉක්බිති ලෝභී වූ වඩුනායකයා කියන්නේ පළමු දේවතාවා කීයේ අපි මෙතෙන නොයින්නා අභිප්‍රාය, පසු දේවතාවා කීයේ ඇත්තමය.

එසේහෙයින් අපිත් තොපිත් නොගොසින් මෙතෙන ඉඳුම්හයි කීහ. පණ්ඩිත වඩුනායකයා තමන්ගේ පන්සියය එක්කොට කියන්නේ එක් දේවතාවෙක් යන්ට කීය. එක් දේවතාවෙක් රඳන්ට කීය, දෙන්නා කීවායින් කවුරුන් කීවා ඇත්ත බොරු නොදනෙයි. අපගෙ නස්නේ කිම්ද පඬව්වක් ඉදිකොට තබන්නාහ. සමුද්‍ර ජලයෙන් මෙතෙන ගලා නම් පඬව්වට නැගී යම්හයි නොගලා නම් මෙතෙනම ඉඳුම්හ. එසේ හෙයින් පඬව්වක් ඉදිකරම්හයි කියා පඬව්වක් ඉදිකරන්නාහු රිටි පළු පත්ලා තබා ගත්හ. අනික් වඩුනායකයන් හා වඩුවෝ කියන්නාහු තාලියෙ ක්ෂුලුත් සොයන්නාසේ කිමෙක්දැයි කියා උන්කලට පසළොස්වක් දිනය පැමිණි ගමනේ චන්ද්‍රයා නැගිකලට සමුද්‍රයෙන් රළ අවුත් දන පමණ ගලාගණ ගියේය. එවිට පණ්ඩිත වඩුවානෝ තමන්ගේ පන්සියක් වඩුවනුත් අඹුදරුවනුත් පඬව් නැගී නික්මුනාහ. පඬව් නායකයානෝ ඉනිකිත් එන රළ එනන මෙතන ඉඳුම්හ කුණු සෝධාගෙණ පලාගියේයයි කියා උන්නාහ, දෙවෙනිව උකුල පමණ රළ ආය, තනමත්තක් පමණය, කරවටක් පමණයයි අවුත් තලෙක දෙ තලෙකැයි කියා සත්තලක් ගලා වඩුවෝ පන්සියයක් උන්ගේ අඹුදරුවනුත් මළාහුය. පණ්ඩිත වඩුවානන් හා වඩුවෝ පන්සියය සැපසේ නැව් නැගී ගැලවුනාහයි වදාරා මේ **සමුද්ද වාණිජජාතකය** නිමවා වදාළසේක. එසමයෙහි දකුණුදිග සිට නොයන්නට කී දේවතාවාතම් කෝකකාලික සථ්විරයෝය, එසමයෙහි පඬව්නැගී ගිය වඩුවෝ පන්සියය නම් බුදු පිරිසය, එසමයෙහි පණ්ඩිත වඩුවානෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

461
කාම ජාතකය.

තවද ත්‍රිභුවනාධිපතිවූ සර්‍වඥයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය දක්වනලද,

ඒ කෙසේ ද? යත්

සැවැත් නුවර වාසිවූ එක් බ්‍රාහ්මණයෙක් කුඹුරක් එළිකරන්ටයයි වල් කොටමි ගොස් වල්කෙටීය, සර්‍වඥයන්වහන්සේ එතනටගොස් ඇයි බ්‍රාහ්මණය

කුමක්කෙරේදැයි විචාරා වදාළසේක. බමුණු කියන්නේ ශ්‍රමණභවත් ගෞතම යෙනි කුඹුරක් එලිකරණ නියාවට වල්කොටමි කීහ. සර්‍වඥයන්වහන්සේත් යහපතැයි වැඩිසේක. වල්කොටා ගිනිලාපු දවස් වැඩ බ්‍රාහමණය කුමක් කෙරේදැයි විචාරා වදාළසේක, ශ්‍රමණභවත් ගෞතම්යෙනි වල් ගිනිලාපියමී කීහ, යහපතැයි කියා වැඩිසේක ගිනිලා කුඹුර එලිකරන්ටවන් දවස් වැඩ බ්‍රාහමණය කුමක්කෙරෙහිදැයි වදාළසේක. ශ්‍රමණභවත් ගෞතමයෙනි කුඹුර එලිකරමි කිය, යහපතැයි කියා වැඩිසේක, කුඹුර එලිකොට ඇල අමුණු බඳිනා දවස්වැඩ බ්‍රාහමණය කුමක්කෙරේදැයි වදාළසේක, ශ්‍රමණභවත් ගෞත මයෙනි ඇල අමුණු බඳිමි කීයේය, යහපතැයි කියා වැඩිසේක, ඇල අමුණු බැඳ නියර බඳින්ට වන, එදවසුත් වැඩ බ්‍රාහමණය කුමක් කෙරෙහි දැයි වදාළ සේක, ශ්‍රමණභවත් ගෞතම්යෙනි නියර බඳිමි කිය, යහපතැයි කියා වැඩි සේක, නියර බැඳ වපුරණ දවසුදු වැඩ බ්‍රාහමණය කුමක්කෙරේ දැයි වදාළසේක, ශ්‍රමණභවත් ගෞතමයෙනි කුඹුර වපුරමි කිය, යහපතැයි කියා වැඩිසේක. මෙසේ බ්‍රාහමණයාගේ කුඹුර වපුර ගොයම් ඇතිව කිරි වදින අවසථාවෙහි ගොයම් බලා ඇවිදිනේය සර්‍වඥයන්වහන්සේ එතනට වැඩ බ්‍රාහමමණය කුමක් කෙරේදැයි වදාළසේක.

ශ්‍රමණභවත් ගෞතමයෙනි ගොයම් බලා ඇවිදිමි කියා කියන්නේ ශ්‍රමණ භවත් ගෞතමයෙනි තොප ඇතුළුවූ භික්‍ෂූන්වහන්සේට ගොයම් දූ මැඩි දවස් දන්දෙමි කියා තමාගේ ගෙයි ගොසින් උන්නේය. ඒ බ්‍රාහමණයා සර්‍වඥයන් වහන්සේ එකාවත් දැකීමෙන් බලවත්වූ සිත විශ්වාසව ඇදහිලි ඇතිව ගෙයි ඉඳ සිතන්නේ සෙට ගොයම්දූ මැඩ ශ්‍රමණභවත් ගෞතමයන් ඇතුළුවූ භික්‍ෂූන්ට දන්දෙමි සිත සිතා රූ ගෙයි වැදහොත්තේය. එවේලෙහි මහත් මේඝයක් වැස අචිරවතී .ගඞ්ගාවෙන් වතුර ඇවිත් පැසීගිය කුඹුර ගොයම් එක ගසකුත් නොතබා ඇරගෙණ ගොස් මූද ලාපීය බ්‍රාහමණයාත් නිදානැගී කුඹුර බලන්ට ගොස් කුඹුර ගොයම් නොදැක ලෙයි බඩ අත්ගසා අඬා මොරගා බොහෝ විශෝෂ පයට පැමිණියේය. සර්‍වඥයන්වහන්සේ බ්‍රහමණයා විශෝෂපයට පැමිණි නියාව දැක වදූරා මූගේ සෝක සන්සිඳුවමි අළුත මහණවූ භික්‍ෂුකෙණෙකුන් කැඳවා ගෙණ බ්‍රාහ්මණයාගේ ගෙදොරට වැඩිසේක, බ්‍රාහ්මණයා සර්‍වඥයන්වහන් සේ දැක ශ්‍රමණභවත් ගෞතමයෙනි මට වූයේ මහා සෝකයෙක ඒ සෝක සන්හිඳුවාලන්ට ආවාහුවනැයි සමාධිව ඉඳිනා අසුන් පණවා වඩාහිඳු වූහ.

සර්‍වඥයන්වහන්සේ වදූරණසේක් ඇයි බ්‍රාහමණය විශෝෂපව උනුදැයි විචාරා වදාළසේක, බ්‍රාහ්මණයා කියන්නේ ශ්‍රමණ භවත් ගෞතමයෙනි මා කුඹුර එලිකරන්ට වන්නැන්පටන් තමන් එතනට එනහෙයින් මහත් දුකෙක් විචර දන්නේවේද, එසේ දැකත් කුඹුර ගොයම් පැසීතුබූ අවසථාවෙහි ඊයේ රූ අචිරවතී ගංගාවෙන් වතුර ඇවිත් ගොයම් එකගසකුත් නැතිව මූදට ඇර ගෙණ ගියේය. ගොයම් නොනැසී තිබුයේවීනම් දසක් ගැල්පුරා ධාන්‍යය ලබමි සෙට දවස් ගොයම් මැඩ තමන් ඇතුළුවූ භික්‍ෂූන්වහන්සේට දන් දෙන්ටයයි සිතා ඉඳ මා සිතුවා වූ සිතිවිල්ලක් නුවූහෙයින් විශෝෂපව උනිමි කීහ. ඒ වේලෙහි සර්‍වඥයන්වහන්සේ බ්‍රාහ්මණය නටමනාදෙය නස්නේය, ඊට සොකකිරීමෙන් කාරිය නැතැයි කාමසූත්‍රය ගෙණහැර දක්වා වදූරා ධර්‍මදේශනාකොට වදාළසේක. ඒ බ්‍රාහ්මණයාත් බණඅසා දසක් නයින් ප්‍රති මණ්ඩිතවූ සෝවාන් මාර්‍ගයට පැමිණියේය. එදවස් ධර්‍මශාලාවේ රැස්ව උන්

භික්ෂූන්වහන්සේ මෙසේ මහත්වූ සෝකයට පැමිණියාවූ බ්‍රාහ්මණයාගේ සෝක සංහිඳුවා බණ වදාරා සෝවාන් මාර්ගයට පමුණුවා වදාළසේකැයි කිය කියා වැඩඋන්තෙනට සර්වඥයන්වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි, පෙරත් මේ බ්‍රාහ්මණයාගේ සෝක සංහිඳුවූයෙම් වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ රාජකුමාරවරු දෙන්නෙක් ඇත්තාහ. ඉන් වැඩිමාලු පුතනුවන් යුවරජ තනතුරෙහි තබා බාල පුතනුවන් සෙනෙවිරත් තනතුරෙහි තැබූහ. එසමයෙහි රජ්ජුරුවෝ එක්තරා ව්‍යාධියකින් නටහ. උන්ට පසු රාජ්‍යවාසීහු වැඩිමාලූ කුමාරයන් රාජ්‍යයට තබා රාජ්‍ය කරන්ට වත්හ. ඒ රාජකුමාරයෝ මම රාජ්‍ය නොකරමි. මාගේ මලනුවන්ට රාජ්‍යය දෙවයි කීහ. අමාත්‍යයෝත් නුඹවහන්සේ වැඩිමාලූ රාජකුමාරයන්වහන්සේ සිටියදී මලනුවන්වහන්සේට රාජ්‍ය දියහැකිදැයි කීවත් මට රාජ්‍යය නොකැමැත්තේයයි නොගිවිස්සාහ. එසේවීනමුත් යුවරජ තනතුරට හෝ සෙනෙවිරත් තනතුරට හෝ සිටිය මැනවැයි කීහ. මට යුවරජ තනතුරත් එපයි සෙනෙවිරත් තනතුරත් එපයි මම මාගේ අභිප්‍රාය නියාවට ඇවිදිමි. මාගේ මලනුවන්ට රාජ්‍යය දෙවයි බාලකුමාරයන්ට රාජ්‍යය පමුණුවාපූහ. තුමූ පිටිසර ගමකට ගොස් සිටානකෙනෙකුන්ට බැලමෙහෙකොට සිටිනාහ. සිටානෝ කල්යාමෙකින් රාජකුමාරයන් නියාව දැන බැලමෙහෙකිරීම හැර රාජකුමාරයන් නියාවට සියලු වෘත්ති තබා රාජකුමාරයන් පෝෂ්‍ය කරන්නාහ. එසමයෙහි බරණැස්නුවර බදු එලවායයි මනුෂ්‍යයෝ එම සිටානන්ගේ ගමට ගියාහ.

සිටානෝත් රාජකුමාරයන්ට කියන්නාහු ස්වාමීනි නුඹවහන්සේ පෝෂ්‍යකරන්නාවූ අප අතිනුත් බදුඑලවන්නාහ, නුඹවහන්සේගේ මලනුවන්වහන්සේට කියා අපගෙන් එලවන්නාවූ බද්ද අරවා වදාළ මැනවැයි කීහ. රාජකුමාරයෝත් යහපතැයි රජ්ජුරුවන්ට කියා යවන්නාහු මේ සිටානන් විසින් මා පෝෂ්‍ය කරන්නාහ, උන්ගෙන් එලවන්නාවූ බදු ඇර වදාළමැනවැයි මලනුවන්ට කියා යවූහ. ඒ රජ්ජුරුවෝද යහපතැයි ඒ සිටානන්ගේ ගමින් එලවන්නාවූ බද්ද ඇරපූහ. සිටානන්ගේ බද්ද ඇරපූනියාව අසා සෙසු අසල ඇත්තෝත් රාජකුමාරයන්ට කියා රජ්ජුරුවන්ට කියා යවා බද්ද අරවාගත්හ. මෙම නියායෙන් වටගම්වල බද්ද අරවාගෙණ අඤ්ඤය බොහෝව එම ගම් අරින්ට තමන්ට උවමැනවැයි කියා යවා එම ගම තමන්ට අරවාගෙණ සිතන්නාහු මේ නති ගමින් කම් කිම්ද වට සෙසු ගම්වලත් අරවාගෙණ තෘෂ්ණාව වැඩි වැඩි සෙනෙවිරත් ධුරය ඕනෑයයි කියා යවූහ. යහපතැයි සෙනෙවිරත් ධුරය දුන්හ. සෙනෙවිරත් ධුරයත් ඇරගෙණ මෙයින් නොසෑහෙයි යුවරජ තනතුරු දුනමැනවැයි කියා යවූහ. යහපතැයි යුවරජ තනතුර දුන්නාහ. යුවරජ තනතුර ඇරගෙණ නැවත සිතන්නාහු මෙතෙක් නොසෑහෙයි රාජ්‍යය ඇරගණිමියි තෘෂ්ණා ලෝභයෙන් පසල්දනව්වාසීන් එක්කොටගෙණ බරණැස්නුවරට ගොස් නුවර වටලාගෙණ රාජ්‍යය අරින්නේය. යුධ හෝ කරන්නේයයි කියා යවූහ. රජ්ජුරුවෝ තමන්වහන්සේ ඇරපියා ගිය රාජ්‍ය නොවේද මට පැමිණියේ මලනුවෝ බැනන් මරාපූවයි යන අපකීර්තිය අසම්ද තමන්වහන්සේගේ රාජ්‍යය නුඹවහන්සේ ඇරගත **මැනවැයි බැනන් නුවර ගෙන්වා ගෙණ රාජ්‍යය පාවාදුන්හ. ඒ රාජකුමාරයෝ**

රාජ්‍යයට පැමිණ මලනුවන්ට සෙනෙවිරත් ධුරය දෙවා මෙසේ අතිලෝභ යෙන් මේ එකරාජ්‍යයෙන් දැන් මට ප්‍රයෝජන කිම්ද? තවද රාජ්‍ය දෙකක් තුණක් මා ලබන්නට නැතැයි කිය කියා සිතා උන්නාහ. එසමයෙහි ශක්‍රයෝ දන්පින් කරන්නෝ කවුරුදෝහෝයි දෙමව්පියන්ට උපස්ථාන කරන්නෝ කවුරුදෝහෝයි ධර්මිෂ්ටව වාසයකරන්නෝ කවුරුදෝහෝයි මනුෂ්‍යලෝකය බැලූවාහු මේ රජ්ජුරුවන් සිතන සිතිවිල්ල දැක උන්ගේ සිතිවිල්ලට දෙවනු වත් සෝක උපදවා නිග්‍රහකරවා එන්ට උවමැනවැයි බ්‍රාහ්මණ වේශයක් මවා ගෙණ වාසල්දොර සිට බ්‍රාහ්මණ මානවකයෙක් වාසල සිට දකින්නට අභිප්‍රාය ඇත්තෙමියි කියා යැවීය. රජ්ජුරුවෝත් කැඳවයි කියා ගෙන්වාගෙණ කිමෙක්ද? මානවකයැයි විචාළාහ.

ශක්‍රයෝ කියන්නාහු ස්වාමීනි තව දන්වන්නාවූ කටයුත්තක් ඇතැයි කීය. යහපතැයි මිනිසුන් බාවා කියවයි කීය. ස්වාමීනි නුඹවහන්සේට රාජ්‍ය තුණක් අරගෙණ දෙන්ට අභිප්‍රාය ඇතිව ආමි කීහ. රජ්ජුරුවෝ යහපතැයි සමෘධව රට කළමනා කිම්දැයි කීහ. සේනාව සමෘධ කරවාගත මැනවැයි කීහ. රජ්ජුරුවෝ යහපතැයි කියා ශක්‍රයන්ගේ ආනුභාවයෙන් මේ බමුණාට නවාතැනක් ලවා බත් බුලත් දෙවයි යන බසක් නොකීවාහ. ශක්‍රබ්‍රාහ්මණ යාත් යහපතැයි වාසලින් පිටත ගොස් තමන්ගේ ශක්‍රභවනයට ගියාහ. රජ්ජුරුවෝත් පසුව දවස් සේනාව සන්නාහකරවා ගෙණ ගමන් සරනා බ්‍රාහ්මණ මානවකයා කැඳවයි කීහ එවිට අමාත්‍යයෝ කියන්නාහු නුඹවහන් සේට රාජ්‍ය තුණක් දෙමි කී බ්‍රාහ්මණ මාණවකයාට බත් බුලත් දෙවාලව පඩියක් පිළියක් දෙවාලවයි අපට නුඹවහන්සේ වදාළ මෙහෙවරක් ඇද්දැයි කීහ. මට මතක නැතිව තොප ඇමට එසේවූ මෙහෙවරයක් නොකීම් කීහ. එසේ කල අප උන් දන්නේ කෙසේදැයි කීහ. එසේ වුවත් මේ නුවර යම් තෙනෙක ඉදිනම් පරීක්ෂා කරවයි කියා යවූහ. ගියෝ අපි එක තැනකත් නුදුටුම්හයි කියා ආවාහ.

රජ්ජුරවෝත් මා නිසා මෙසේවූ රාජ්‍ය තුණක් නොලද්දේයයි මහත් ශෝකයට පැමිණ ලය වියලී අක්මා පසු තදව උන්නාවූ සෝකාග්නියෙන් කල්යාමකින් රක්ත අතීසාර ඇතිව මළීම යයි යන බොහෝ වෙදවරු පිළියම් කොටගත නුහුනුවාහ. එසමයෙහි බෝධිසත්වයෝ බ්‍රාහ්මණ කුලයක ඉපද තක්සලානුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් අතින් ශිල්ප නිමවා ඉගෙණ බරණැස්නුවරට ඇවිත් රජගෙයි වාසල සිට රජ්ජුරුවන් ව්‍යාධි ඇති නියාව මම ගුණකෙරෙමියි කියා යවන්නාහු වෙදනකෙණෙක් වාසල් දොරකඩ සිට දකිනා අභිප්‍රාය ඇත්තෙමි කියා යවූහ. රජ්ජුරුවෝ කියන්නාහු මීට පළමු මම්මයයි යන වෙදවරු ඇවිත් පිළියම් කොටගත නුහුනුවාහ. තුමූ බාලදරුවෝද ව්‍යාධිය ගුණකරන්නේයයි අවියක් නිසා අඩුනම් උන්ට යම්තම් අවියක් දීලා යවාපියවයි කීහ. රජ්ජුරු වන්ට බෝධිසත්වයෝ කියන්නාහු මට වෙදුන්ට දෙන වැටුපෙන් කම් නැත. මම පිළියම් කෙරෙම්, උදක් බෙහෙදට මිල මාත්‍රයක් දෙත්වයි කීසේක. රජ්ජුරුවෝ ඒ අසා යහපතැයි කියා බෝධිසත්වයන් කැඳවා ගෙන්නූසේක. බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට වැද මහරජ නොබව මැනව මම නුඹවහන්සේට පිළියම් කරමි කීහ. එතකුදුවුවත් දේවයෙනි මෙම ව්‍යාධිය ඇතිවූ කාරණා මට කිවමැනවැයි කීහ. රජ්ජුරුවෝ කියන්නට ලජ්ජා ඇතිවූ

කාරණා මට කිවමැනවැයි කීහ රජ්ජුරුවෝ කියන්ට ලජ්ජා ඇතිව මැලිවූහ. බොධිසත්ත්වයෝ කියන්නාහු දේවයන්වහන්ස වෙදකම් කිම්ද? නිදන් දැක කරන්නට උවමැනව. නිදන් නො දැක කරණ වෙදකමින් ප්‍රයෝජන නැතැයි කීහ. රජ්ජුරුවෝත් යහපතැයි කියා බ්‍රාහ්මණ මාණවකයෙක් දුටුනියාවත් රාජ්‍ය තුණක් ඇරදෙමි කී නියාවත් මට සටනට යන්ට සේනාව සදන්ට කී නියාවත් බාහ්මණ මාණවකයා පසු නුදුටු නියාවත් මේ කාරණා බොධිසත්ත්වයන්ට කීහ. බොධිසත්ත්වයෝත් මූන්වහන්සේට මේ ව්‍යාධිය ඇති වූයේ ලෝභය මුල්කොටයයි දැන ඊට නිසි කරණා කියා ලෝභය සත්සිඳුවා ව්‍යාධිය සන්සිඳුවමි කියන්නාහු මේ තෘෂ්ණාව වනාහි මතුමත්තෙහි වඩා ගෙණ යන්නේවීනම් සතර අපායෙන් ඉස ඔසවාලිය නොහෙන්නේය. මෙසේ මහබෝසතානෝ රජ්ජුරුවන්ට අවවාදකොට නැවත ධර්‍මදෙශනා කරන්නාහු ඉදින් වස්තුකාම ක්ලෙශකාමය ප්‍රාර්ථනාකරන්නාවූ සත්ත්වයන්ට ත්‍රිවිධ කාමය ඔහුගේ අදහසවූ පරිද්දෙන් සමෘද්ධ වූයේ වීනම් සත්ත්වතෙම ඒ කාන්තයෙන්ම ඊප්සිතාර්ථය සිඩවූ හෙයින් බලවත්වූ සොම්නසට පැමිණෙන්නේය. නැවැත නැවත යම්සේ ග්‍රීෂ්ම කාලයෙහි අවුසුලගින් මිරිකුණාවූ සත්ත්වතෙම බලවත්වූ පැන් පිපාස ඇතිවේද එපරිද්දෙන්ම මතු මත්තෙහි රූපතෘෂ්ණාදිවූ ඒ කාමයෙන් මත් වූ සත්ත්වයාහට මතු මත්තෙහි වඩාගෙණ යන්නේය. යම්සේ වර්ධනයවන්නාවූ එලවස්සාගේ ශරීරය සමග ඉස්මුදුනෙන් පලාගෙණ නැගෙන්නාවූ අංදෙක වැඩීගණියේද එපරිද්දෙන් නුවණැත්තාවූ සත්ත්වයාහට අප්‍රාප්ත වස්තුවෙහි කාමතෘෂ්ණාවද පැවැත්තාවූ රූපශබ්දාදියෙහි කාම පිපාසාවද නැවත නැවත වැඩෙන්නීය.

තවද මේ පොලෝතෙලෙහි යම් සත්ත්වයෙක් ශාලි ව්‍රීහි ආදිවූ සප්ත විධ ධාන්‍යයෙන් සම්පූර්ණවූ ක්ෂෙත්‍ර වස්තු ද ඇතුන් අසුන් ගව මහිෂාදීන් ද දාසි දාසාදීන් ද අවශෙෂ මුක්තා මාණික්‍යාදිවූ දසවිධ රත්නයෙන් සම්පූර්ණවූ මුළුලොව කිසිවක්හට දී ගියේ වීනම් මෙපමණවූ සවිඥනක අවිඥනක වස්තු එක් සත්ත්වයක්හුගේ සිත්පුරා ලන්නට නොසෑහෙන්නේය. එසේහෙයින් මේ තෘෂ්ණාව නම් පඤ්චමහා ගඞ්ගාවෙන් අනවරථයෙන් වදනා ජලයෙන් මහාසමුද්‍රය පුරා උතුරවාලිය නොහැක්කාසේ කොතෙක් වස්තු ලදත් මෙතෙක් සෑහෙයි යන්නක් නැති හෙයින් පුරාලිය නොහැක්කේය. එසේ හෙයින් මේ කාරණය දන්නාවූ සත්ත්වයා විසින් තෘෂ්ණාවසඟනොව කාය සමාචාරාදිය පුරමින් ත්‍රිවිධ සුචරිතයෙහි හැසිර වාසය කටයුත්තේය.

තවද මේ ලෝකයෙහි රජදරුවෝ තමන්ගේ සේනාවාහනාදිවූ පරිද්දෙන් පරසතුරන් මැඩ මුළුපොළොව සාද, ජයගෙණ චතුස් සමුද්‍රය අවසානකොට ඇති දසදහසක් යොදුන් ජම්බුද්වීපයෙහි රාජ්‍යශ්‍රී අනුභව කෙරෙමින් වසන්නාහු සමුද්‍රය ඇතුළත රාජ්‍යය සෑහෙන්නේයයි එහි තෘප්තියකට නොපැමිණ මතුමත්තෙහි අන්‍ය දීපාන්තරවල රාජ්‍යය උවමැන වැයි ප්‍රාර්ථනා කරන්නාහ. එසේහෙයින් සත්ත්වයන්ට තෘෂ්ණාවසඟවූ සත්ත්ව යෝ කිසිලෙසකිනුත් පුරාලිය හැකි කෙණෙක් නොවන්නාහ. මහරජ්ජුරුවන් වහන්ස පුරුෂයෙක් ප්‍රමාණාතික්‍රාන්තවූ කාමය තමා විසින් සිහිකරන්නේවී නම් තෘප්තියකට නොපැමිණෙන්නේය. නැවත නැවත ඒ කාමය පැමිණෙන කැමැත්තේය. එසේහෙයින් වස්තුකාම ක්ලෙශකාමයෙහි තෘෂ්ණාව වඩුන් අඩු වෙක් නොවන්නේය. වස්තුකාම ක්ලෙශකාමයෙන් කයින් සුදුසුවූ ප්‍රතික්‍රියා කොට ඥාණයෙන් ආදීනව දැක යම්කෙණෙක් ප්‍රඥාවෙන් සම්පූර්ණවූද එබඳු

නුවණැත්තෝ තෘප්තියකට පැමිණියාහු නම් යම්හෙයකින් ප්‍රඥාවෙන් සම්පූර්ණ වූ පුරුෂයා කාමය නිසා බලවත්වූ පීඩාවට නොපැමිණෙන්නේය. එබඳුවූ පුරුෂයා තෘෂ්ණාව තමා වසඟයෙහි පවත්වාශන්ට අසමර්ථවන්නේය. එබඳුවූ ප්‍රඥාවන්තවූ පුරුෂතෙම මේ තෘෂ්ණාවෙහි ආදීනව දැක ගඞ්ගාමාලනම් ප්‍රත්‍යෙක බුඬාංකුරයානන් මෙන්ද, අඞ්මාශක නම් රජ්ජුරුවන් මෙන්ද තෘෂ්ණා වසඟභා යෙහි නොපවත්නේය. මහත්වූ ප්‍රඥාවෙන් යුක්ත බැවින් සමුද්‍රය සේ මහත්වූ සත්ත්වතෙම වහ්නිස්කන්ධයෙන් සමුද්‍රජලය තවා උනුකොටලිය නොහැක්කාසේ කෙලශකාම නමැති වහ්නීන් තවාලිය නොහැක්කේය.

යම්සේ චර්මකාරයෙක් වහන් නිපදවන්නේ ඒ චර්මයෙහි යම් යම් තෙතක නොගතයුතු වීනම් ඒ ඒ තැන් කපාහැර වහන්කොට විකිණී මෙන් වහනයට සුදුසුවූ මිල ලැබ පුත්‍ර දූරාදීන් පෝෂ්‍යයකොට සුඛිත මුදිතව වෙසේද, එපරිද්දෙන්ම නුවණැත්තාවූ සත්ත්වතෙම සොම්මර නිය නක් හා සමානවූ ප්‍රඥාවෙන් ඒ ඒ වස්තුකාම ක්ලෙශ කාමයන් කපා සිඳිමින් කාමයන්ගේ ඒ ඒ පරිච්ඡෙදය සිඳින්නේය. එසේහෙයින් ඒ ඒ කාමච්ඡෙදයෙන් පුරුදුවූ කාය වාක් මනඃ යන තුන්දොර අකුශල කාමයෙන් වෙන්වූ සත්ත්වයාහට සැපසේ සිඞවන්නේය. ඉදින් සත්ත්වතෙම සියළු කාය කර්මාදිය කාම පරිලාභයන් දුරුකොට සැපයෙහි පිහිටුවනු කැමැත්තෙහි වී නම් කිසිනුපිරියම් කිරීමෙන් භාවනාකොට ධ්‍යාන උපදවා සියළු කාමයන්හැර බ්‍රහ්මලෝකයෙහි උපදනේයයි මෙසේ ධර්මදේශනා කළහ. බොධිසත්ත්වයන් මේ කාරණයන් කියමින් සිටියදීම මහරජ්ජුරුවන්ගේ ධවලාතපත්‍රය අරමුණු කොට ඔදාතකසිණ සමාපත්තියෙන් යුක්තවූ ධ්‍යාන උපදනේය. රජ්ජුරුවෝ නීරෝගව සතුටුවූ සිතින් යහනින් නැඟීසිට කියන්නාහු මෙතෙක් වෙදවරු මටපිළියම් කරන්ට අසමර්ථවූහ. ප්‍රඥාවන්තාවූ මානවකයා තමාගේ ප්‍රඥා නමැති ඖෂධයෙන් මා නිර්ව්‍යාධි කෙළේයයි බොධිසත්ත්වයන් හා සමග මෙසේ කථා කළාහ. බමුණාතෙනි, තොප විසින් කාමයෙහි ආදීනව දක්වා කියන ලද්දාවූ ගාථා අටදහසක් වසනු වටනේය.

එසේහෙයින් තොපගේ වචනයට පූජාකොට අටදහසක් වස්තු දෙමි කීහ. ප්‍රයෝජන නැත 'රථකාරොච චම්මස්ස' යනාදීන් මේ ගාථාව කියමින් සිටියදීම වස්තුකාම ක්ලෙශකාමයෙන් මාගේ සිත වෙන්ව ගියේය. මම වූකලී පශ්චිම ගාථාව කියමින් සිටියදීම මාගේ ධර්මදේශනාවෙන් ධ්‍යාන ඉපදවීම් මහරජ්ජුරුවන්වහන්සැයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ වඩ වඩා සතුටුවූහ. මහබෝසතානන්ට ප්‍රශංසා කරන්නාහුය. නුවණැති පුරුෂයෙක් කර්මවට කෙලෙස්වට විවට යයි කියනලද ත්‍රිවිධ වෘත්ත දුක්ඛය උපද වන්නාවූ මේ තෘෂ්ණාව විශෙෂයෙන් පිරිසිඳ ක්ලෙශ විස්කම්භණය කොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ඉපදවීද, ඒ මානවකතෙම ඉතා යහපත්වූ අදහස් ඇත්තේයයි සියළු ලොව නුවණින් පිරිසිඳ දන්නාවූ තපස්වියකැයි වර්ණනා කළාහ. මහාබොධිසත්ත්වයෝද රජ්ජුර වන්වහන්ස ධර්මයෙහි හැසුරුණ මැන වැයි රජ්ජුරුවන්ට අවවාදකොට ආකාශයෙන් හිමාලවනයට ගොස් ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූ පමණින් බ්‍රහ්මවිහරණ භාවනාකොට බ්‍රහ්මලෝක යෙහි උපන්නාහ. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා චතුරා මිහණෙනි පලමුත් මේ බමුණා නිසෝක කෙළෙම් වේදැයි චතුරා කාම ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් දූන් මේ බමුණුය, නුවණැති මානවකවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

462
ජනසන්ථව ජාතකය

තවද හුදු සඬම්සෙන් මවාලූ රුවක් වැනිවූ තිලෝගුරු බුදුරජාතන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ට කී අවවාදයක් අරහයා මේ ජාතකය දක්වනලද.

ඒ කෙසේද? යත්,

කෝසල රජජුරුවෝ කාමයෙහි තෘෂ්ණා වසඟව කළමනා සියළු කට යුත්තෙහි විචාරයක් මදව සර්වඥයන් වහන්සේටත් කරණ බුද්ධොපස්ථානයෙහි ප්‍රමාදව වාසයකරන්නාහු, එක්දවසක් සර්වඥයන් වහන්සේගේ ගුණ සඳහන් කොට බුදුන් දක්නට ගියාහු සර්වඥයන් වහන්සේ කෝසල රජ්ජුරුවන් දැක ඈයි! මහරජ මෙතෙක් දවස් නුදුටුවිරුමෝනෑ යි විචාරා වදාළසේක. රජ්ජුරුවෝ ස්වාමීනි, අපරීක්ෂිතව උනිමි කීහ. සර්වඥයන් වහන්සේ මහරජ මාසේවූ තිලෝ ගුරු සර්වඥකෙණෙකුන් තොපගේ නුවර හිඳ දන්පින් කරවයි අනුශාසනා කර මින් ඉන්දදී තොපි දන්පින් නොකොට ප්‍රමාදව දවස් අරිනා. පමණක් මිසක් පෙර අබුද්ධොත්පාද කාලයෙහි උත්තමයෝ තමන්ගේ රාජ්‍යසීමායෙහි සියළු මනුෂ්‍යයන්ට අවවාදකොට කියා ඥානාධ්‍යාශයෙහි යොදා රාජ්‍යය සළෙව්වේදූයි වදාරා ඒ කෙසේ යි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද? යත්,

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ගේ අග්‍රමහෙසිකා බිසවුන් කුස පිළිබඳ දසළුකඩමසකින් වැදූහ. ඒ කුමාරයන්ට නම් තබන්නාහු ජනසන්ථව කුමාරයෝයයි නම් තබා ඒ රාජකුමාරයන් වැඩිවිය පැමිණ දිසාපා මොක් ආචාරීන් සමීපයට ගොස් උගතමනා ශාස්ත්‍රයන් ඉගෙණගෙණ තමන්ගේ නුවරට ආ ගමනේ පියානන් ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ දශරාජධර්මයට අකො ප්‍යව සදන්හල් කරවා මුළුනුවර දඹදිව සියළු යාචකයන්ට දවස සලක්ෂයක් ධන වියදම්කොට දන්දී රාජ්‍යය කරන්නාහු ජනසන්ථව රජ්ජුරුවෝ තුමූ දවස්පතා පඤ්චශීලය රැක පොහොය අටසිල්රැක සියළු මනුෂ්‍යයනුත් පඤ්චශීලයේද අෂ්ටාඞ්ගශීලයේද සියළු ගුණයෙහි පිහිටුවා ධර්මප්‍රීතියෙන් වාසයකරන්නාහු අමාත්‍යයෙනි, දෙමව්පියන් නැදිමයිලන් බෑබුන්හු ආදීවූ වැඩිමාලූ නෑයන්ට ආචාර සමාචාර කරව. දවස් දවස් පතා පඤ්චශීලය පොහොයෙන් පොහොයට අෂ්ටාඞ්ගශීලය රකුවයි මනුෂ්‍යයන්ට අවවාද කියා මනුෂ්‍යයන්ට කියන්නාහු සිරගෙය දොරහැර තියෙන්නේය. දම්ගෙඩිය දිරානිබෙන්නේය. එක්දවසක් රජ්ජුරුවෝ පොහොද පෙහෙව උඩුමාලෙ හුන්නාහු මුළු නුවර බෙරලවා මනුෂ්‍යයන් එක්කරවා රජ්ජුරුවෝ අවවාද වශයෙන් බණ කියන්නාහු මිනුෂ්‍ය යෙනි, පශ්චාත්තාප වන්නාවූ කාරණයෝ දශදෙනෙක් වන්නාහ.

ඒ කාරණා දසය නම් කෙසේද? යත්, තරුණ අවස්ථාවෙහි මනුෂ්‍යයෝ සේවාකම් හා වෙළඳම් ආදියෙන් වස්තු උපදවන්නාහ. ඒ වේලෙහි තමතමාගේ පැමිණි වියදමකට දී වස්තුවක් වයෝවෘද්ධ අවස්ථාවෙහි රැකෙන්ටයයි සොයා නොතිබූ නම් සම්පත් සොයා තබාගෙණ සැපසේ රැකෙන්නවුන් දැක තුමූ කිසි කටයුත්තකට අයොග්‍යවූ අවස්ථාවෙහි කිසි සම්පතක් නැතිව දුකඛිතව සිට අප විසින් මේ තියාවට වස්තු සොයා නොතිබූයේයයි පශ්චාත්තාපයට පැමි

ණෙන්නාහ. තවද යම් සත්ත්ව කෙනෙක් බාල අවස්ථාවෙහි තමන් උගතමනා ශාස්ත්‍ර ඉගෙණ තමන්ගේ ශාස්ත්‍ර බලයෙන් සැපසේ යම් සත්ත්වකෙනෙක් රැකෙත් නම් ශාස්ත්‍ර නූගත්තාවූ යම් කෙණෙක් ශාස්ත්‍ර උගත්තවුන් බලා අපිත් ශාස්ත්‍ර උගතුමෝ නම් මුන්සේම සැපසේ ශාස්ත්‍ර පැ රැකෙත්තමෝ වේදැයි පසු තැවිලිසට පැමිණෙන්නාහ.

තවද යම් සත්ත්වකෙණෙක් බොරු හා කේලාම් කියා අත්ලස් ඇරගෙණ තදපරුෂව වාසයකළෝ නම් මරණ පැමිණි අවස්ථාවෙහි අනේ අපි බොහෝ අත්ලස්ගෙණ තදපරුෂව වාසයකළම්හ. අපට කුමක් වේද්‍යෝහෝයි මරණාසන්න කාලයෙහි ඒ පුරුෂතෙම පසුතැවිලියට පැමිණෙන්නාහ. තවද යම් සත්ත්වකෙණෙක් ප්‍රාණඝාත අදත්තාදාන බොහෝ කළෝනම් මරණාසන්නයෙහි බොහෝ ප්‍රාණඝාත කළම්හ. අනුන් අඩ අඩා සිටියදීම අදත්තාදානයෙන් උදුරාගතුම්හ. කුමක්වේද්‍යෝහෝයි මරණාසන්න කාලයෙහි එසේ පුරුෂතෙම පසුතැවිලියට පැමිණෙන්නාහ. තවද යම් සත්ත්වකෙනෙක් බොහෝ ස්වාමික ස්ත්‍රී ඉන්දදී පරදාරාදීන් සේවනය කළෝ නම් මරණාසන්නයෙහි එසේ වූ පුරුෂයන් මම බොහෝ පරස්ත්‍රී සේවනය කෙළෙමියි පසුතැවිලියට පැමිණෙන්නාහ. තවද යම් සත්ත්වකෙණෙක් දන්පින් කරත් බොහෝ සම්පත් ඇතිවූවත් පරලොවට පිහිටක් වුවමැනවැයි සිතා දනක් පිණක් නොකොළෝ නම් එසේවූ පුරුෂයන් මරණාසන්නයෙහි මාගේ බොහෝ සම්පත් ඇතිව තිබෙද්දී පරලොවට ප්‍රතිෂ්ඨාවන පිණිස දනක් පිණක් නොකෙළෙමියි මරණාසන්න කාලයෙහි පසුතැවිලියට පැමිණෙන්නාහ.

තවද යම් සත්ත්ව කෙණෙක් තමාගේ දෙමව්පියන්ට අත්පා මෙහෙවරයක් නොකොළෝ නම් මරණාසන්නයෙහි මාගේ දෙමව්පියන්ට කිසි අත්පා මෙහෙවරයක් නොකෙළෙමි. එසින් පසුතැවිලියට පැමිණෙන්නාහ. තවද යම් සත්ත්වකෙණෙක්, මෙසේ කව මෙසේ මෙසේ ඉඳුවයි උගන්වන හෙයින් ගුරුන් හා සමානයෝය. උන්ට වන්නාවූ ඉෂ්ටානිෂ්ට කියන්නාවූ උන් කැමති අන්නපානාදියන් දෙන හෙයින් ඉෂ්ටදේවතාවෙකු හා සමානවූ පියානකෙණෙකුන් කීවා නොගිවිස උන්ට අක්‍රොශපරිභව බෙණේනම් එසේවූ පුරුෂයන් මරණාසන්නයෙහි මාගේ දෙවතාවෙකු හා මට හිතවූ පියාණන්ට අක්‍රොශ පරිභව බිණීම් කුමක්වේද්‍යෝහෝයි එසේවූ පුරුෂයන් මරණාසන්නයෙහි පසුතැවිලියට පැමිණෙන්නාහ. තවද යම් සත්ත්වකෙණෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දනක් පිණක් නොකොට අක්‍රොෂපරිභව බෙණේනම් එසේවූ පුරුෂයාත් උතුම්වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට මාගෙන් දනක් පිණක් නොකෙළෙමි. නිකම්ම අක්‍රොශ පරභව බිණීම් කියා එසේවූ පුරුෂයන් පසුතැවිලියට පැමිණෙන්නාහ. තවද යම් සත්ත්වකෙනෙක් සිල්වත් ගුණවත් තැනකට ගොස් තමාට ප්‍රතිෂ්ඨා පිණිස ස්වාමීනි, මා කළමනා කිම්ද ගැලවෙන නියායෙන් නිසි අවවාද මට කිවමැනවැයි නොකියා මෙහෙයෙන් නිකම් වාසයකළෝනම් එසේවූ පුරුෂයන් මරණාසන්නයෙහි සිල්වත් ගුණවත් තෙනින් නිසි අවවාදයක් ඉගෙණගත නුහුනුයෙමි. පසුතැවිලියට පැමිණෙන්නාහ. සර්වඥයන්වහන්සේ මහරජ ඒ ජනසන්ධව රජ්ජුරුවෝ තමාගේ අමාත්‍යයන් ඇතුළු නුවරවාසීන්ට දෙපෝයෙන් දෙපෝයට මෙසේ අවවාද කියන්නේවේදැයි වදාළසේක. ජනසන්ධව රජ්ජුරුවෝත් දැහැමෙන් සෙමෙන් රාජ්‍යයකොට පරලොව ගියහයි වදාරා මේ **ජනසන්ධව ජාතකය** නිමවා වදාළසේක. එසමයෙහි රාජ්‍යවාසී නම් දැන් බුදු පිරිසය. එසමයෙහි ජනසන්ධව රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

463
මහා කණ්හ ජාතකය

තවද හුදු සමාධියෙන් මවාලූ රුවක් වැනිවූ ත්‍රිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලෝකාර්‍ථචරියාවක් අරභයා මේ ජාතකය දක්වනලද.

ඒ කෙසේද? යත්,

එක්දවසක් ධම්සභාමණ්ඩපයෙහි රැස්වූ භික්‍ෂූන් වහන්සේ සර්‍වඥයන් වහන්සේ අඤ්ඤකොණ්ඩඤ්ඤ භික්‍ෂූන්වහන්සේ ඇතුළුවූ පස්වගමහණුන් නිසා අටසාළිස් යොත්නක් ගොසින් මහණකරවා වැඩිසේක. මහාකප්පින රජ්ජුරුවන් නිසා එක්සිය විසියොත්නක් කතරගෙවා වැඩිසේක. අලව් යක්‍ෂයා නිසා එතෙක් කතර තමන්වහන්සේම පාසිවුරු ගෙණගොසින් ඔවුන් නික්මවා වැඩිසේක. වෛනෙයජන කෙණෙකුන් නිසා ගොස් මහණකරවා ගෙණ වැඩිසේකැයි එසේහෙයින් සර්‍වඥයන් වහන්සේගේ පරොපකාරය යහපත් නියායයි කිය කියා උන්නෙනට සර්‍වඥයන් වහන්සේ වැඩවදුරා මහණෙනි මා එන්නාට පූර්‍වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදුරා එපවත් අසා දැන් මතු නොවෙයි. පළමුත් උත්තමයෝ තමන්ගේ උත්සාහයෙන් බොහෝදෙනා අපායට යන්නවුන් ගොඩලුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස්නුවර උසීරථ නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි කාශ්‍යප සම්මාසම්බුදු රජාණන්වහන්සේගේ ශාසනය බොහෝ කලක් පැවත එන අවදියෙහි පිරිහෙන්ටවන. සර්‍වඥයන් වහන්සේ නොකරන්ට කී අවවාද එක්විස්සක් කාරණායෙන් මනුෂ්‍යයන් විසින් සිත්ගෙණ මෙහෙණියන් හා එක්ව සම්භොගය කිරීමෙන් දරුවන් වදා ගිහින් හා සරිව වාසයකොට භික්‍ෂූන් වහන්සේ මහණ ධර්‍මය හළසේක. භික්‍ෂුණීන් වහන්සේත් තමන්වහන්සේගේ භික්‍ෂුණී ධර්‍මය අලසේක. උපාසකවරුත් තමන්ගේ උපාසක ධර්‍මය අළහ. උපාසිකාවරුත් තමන්ගේ උපාසිකා ධර්‍මය අළහ. බ්‍රාහමණයෝත් තමන්ගේ බ්‍රාහමණධර්‍මය අළහ. සියලු මනුෂ්‍යයෝත් දශකුශල ධර්‍මයන් හැර දශඅකුශල ධර්‍මය කරන්නාහ. එසමයෙහි මළ සත්ත්‍වකෙණෙක් නරකයෙහි උපදින්නවුන් විනා දිව්‍යලෝකයෙහි උපදිනා කෙණෙක් නැති නිසාව ශක්‍රයෝ දැන කාශ්‍යප සර්‍වඥයන් වහන්සේගේ ශාසනය පිරිහෙයි මනුෂ්‍යයන් භයගන්වා නික්මවමියි සිතා මාතලි දිව්‍යපුත්‍රයා කැඳවා මෙපවත් කියා ඔහු අස්නාම්බකු සා බළුවෙසක් මවාගෙණ ඇඹුල් කෙසෙල්ගෙඩි පමණ දළ මවාගෙණ දම්පට පසකින් එකියන බල්ලා පස්තැනකින් බැඳගෙණ ශක්‍රයෝ තුමූ වැදිවෙසක් මවාගෙණ බල්ලා අතින් ඇරගෙණ බරණැස්නුවරට පැමිණි ගමනේ එකියන බලු මෙනුවර නස්නේයයි මහත්කොට ශබ්ද පැවැත්වූයේය. බොහෝ මනුෂ්‍යයෝ ඇතුළුනුවරට වැද රජ්ජුරුවන්ට එපවත් කීහ. රජ්ජුරුවෝ එපවත් අසා එසේවීනම් වාසල් අගුළු ලවයි කියා වාසල් අගුළුලා ගත්හ. අටළොස් රියන් පහුර ශක්‍රයෝ තමන්ගේ ශක්‍රානුභාවයෙන් පැණ ඇතුළු නුවරට වැද වීථියේ බල්ලා ඇරයන්ට වන්හ. මනුෂ්‍යයෝ භයින් ත්‍රාසනව දෙරවල් අගුළුලාගත්හ. බලුත් රජ්ජුරුවන්

ලඟ සිට දසදහසක් යොදුන් දඹදිවට ඇසෙන නියායෙන් මහත්කොට හඬගෑසූයේය. රජ්ජුරුවන් ඇතුළුවූ බොහෝ මනුෂ්‍යයෝ භයින් ත්‍රසනවූහ රජ්ජුරුවෝ රාජධෛර්‍ය්‍ය උපදවා කියන්නාහු එම්බල වැද්ද. මේ කළුපැහැයක් හා මහත්වූ දළ ඇති තොපගේ බල්ලා කුමක් නිසා ගෙණවුද බලු කුමක් නිසා මොරගාදැයි විචාළාහ ඒ වැදිපුත්‍රයා කියන්නේ රජ්ජුරුවෙනි, මේ බලු තමාගේ බඩසාය හෙයින් මූ මුරගාන්නේයයි කීහ. එවිට රජ්ජුරුවෝ තමන්ට හා ඇතුළු නුවර ගෙයි සියල්ලවුන්ට ඉදිකළ බත් ගෙන්වාලූ ගමනේ එකකටින් කා මූර ගාන්නේය. එවිට රජ්ජුරුවෝ මූ මුරගාන්නේ කුමටදැයි විචාළසේක.

වැදිකියන්නේ බඩගින්නෙන් හඬයි කීහ. ඇතුන්ට අසුන්ට ඉදිකළ බත් ලූ ගමනේ එක්කටින් කා මූරගාන්නේය. රජ්ජුරුවෝ වැද්ද, තාගේ බලු මූරගාන්නේ කුමටදැයි විචාළේය. එවිට වැදි කියන්නේ බඩගින්නේ මූරගාන්නේයයි කීයේය. රජ්ජුරුවෝ බරණැස්නුවර බොහෝ මනුෂ්‍යයන්ට ඉදිකළ බත් ලූ ගමනේ එක්කටින් කා මූරගාන්නේය. රජ්ජුරුවෝ වැද්දවුට කියන්නාහු තොපගේ බල්ලා මූරගාන්නේ කුමටදැයි විචාළේය. එවිට වැදි කියනනේ බඩගින්නේයයි කීහ. රජ්ජුරුවෝ සිතන්නාහු මේ බල්ලා බල්ලෙක් නොවෙයි, මෙතෙක් බත් කා තෘප්තියකට නොපැමිණියේය. මහත් තේජස් ඇති යක්ෂයෙකැයි සිතා කියන්නාහු එම්බල වැද්ද, තොපගේ බල්ලාට බත් ලා තෘප්තිය කට පමුණුවාලිය නොහැක්ක, මූ මූරගාන්නේ උඟරන් මුවන් ගෝනන්ගේ මස් කන්ටද ඒ නැත්නම් මිනිමස් කන්ටදැයි විචාළේය. එවිට වැදි කියන්නේ මේ බල්ලා මූරගාන්නේ උඟරන් මුවන් ගෝනන් කන්ට නොවෙයි, මිනිසුන් කන්ටයයි කීයේය. එවිට රජ්ජුරුවෝ කියන්නාහු, තොපට වෛරී මනුෂ්‍යයන්ද අවෛරී මනුෂ්‍යයන්දැයි විචාළේය. එවිට වැදි කියන්නේ මට වෛරී මනුෂ්‍යයෝයයි කීයේය. තොපට වෛරී මනුෂ්‍යයෝ කවුරුදැයි රජ්ජුරුවෝ කීහ. යම් කෙණෙක් දුශ්ශීලයෝ වීනම් එසේවූ මනුෂ්‍යයෝයයි කීහ.

රජ්ජුරුවෝ මට එසේ කීමෙන් නොදැනෙයි, විස්තර වශයෙන් කියවයි කීහ. ශක්‍රයෝත් අසවයි මහරජ කියා කියන්නාහු යම් භික්ෂුකෙණෙක් සඟළ සිවුරු වැළඳ පටිබැඳ පාත්‍රය අතින් ගෙණ භික්ෂාටනය කෙරෙද්ද? එසේවූ භික්ෂූන් වහන්සේලා සීසෑම් වැපිරීම් ආදීවූ දෙය කොට ගිහින්සේ වාසය කෙරේනම් එසේවූ අලජ්ජීවූ භික්ෂූන් වහන්සේ කෙරෙහි වෛර ඇතියෙමි. මේ බල්ලා ලවා කවා මරවමි කීහ තවද යම් භික්ෂුණීකෙණෙක් සඟළ සිවුර පොරවා පටිය බඳිද්ද ? පාත්‍රය අතින් ගෙණ භික්ෂාටනය කෙරෙද්ද? එසේවූ භික්ෂුණීන් වහන්සේලා ලොකසවාදයෙහි යෙදී දරුවන් වදා වාසය කෙරෙත් නම් එසේවූ අලජ්ජී භික්ෂුණීන් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් තාපසකෙණෙක් මැලිවූ දන්තයන් හා රජස්වැකුණු ශරීරයෙන් හා අවුල්වූ ජටා ඇතිව තපස්කරන්නාවූ තාපසකෙණෙක් ගිහින්ට නයතුරුස්දී ගිහින් හා සරිව වාසය කෙරෙත්නම් එසේවූ තාපසයන් කෙරේ වෛර ඇත්තෙමි, මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් බ්‍රාහමණකෙණෙක් තමන්ගේ ත්‍රිවෙද හා යාග හෝම ආදීවූ දෙය උන්ගේ ඉෂ්ටානිෂ්ට දෙක නොබලා තුමූම සම්පත් නිසා මෙසේවූ යාගහෝමයක් කරම්හයි මනුෂ්‍යයෝ නොකියවාම කොට උන්ගේ සම්පත් ඇරගණිත් නම් වේවා තමන් හා යාගහෝම බ්‍රාහ්මණ ධර්ම්‍යෙහි නොපිහිටියෝ නම් එසේවූ බ්‍රාහ්මණයනුත් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් සත්ත්වකෙණෙක් තමන්ගේ දෙමව්පියන්ට අත් පා මෙහෙවර

නොකරත් නම් එසේවූ මනුෂ්‍යයනුත් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් සත්ත්වකෙනෙක් තමන්ගේ දෙමවුපියන්ට ආක්‍රොශ පරිභව කෙරෙත් නම් එසේවූ මනුෂ්‍යයනුත් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් සත්ත්වකෙනෙක් තමන්ගේ කුඩා මවුන් කෙරේද යාළුවන්ගේ බිරින්ද කෙරෙහිද, තමන් බිරින්දගේ මෑනියන් කෙරෙහිද, ගුරුන්ගේ බිරින්ද කෙරෙහිද, දෝෂ කෙරෙද්ද එසේවූ මනුෂ්‍යයනුත් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් බ්‍රාහ්මණ කෙනෙක් කඩුපලිහ ආදීවූ ආයුධ ගෙණ මංවල සිට මිනීමරා වස්තු උපදවද්ද සේවාකම්කොට නොකරණදෙය කරණ බ්‍රාහ්මණයනුත් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් සත්‍රියක් පරදූරාදීවූ බොහෝ නොකටයුතු කෙරේද එක් පුරුෂයෙකු දීලු සම්පත් ඒ ස්වාමිපුත්‍රයා අතුරෙ ඉඳ දිරවාගත නොහී අනික් පුරුෂයෙකු සම්පත්දෙමි කියන්නා ඒ පුරුෂයා කරා යේද එසේවූ සත්‍රිනුත් මේ බල්ලා ලවා කවා මරවමි කීහ.

තවද යම් පුරුෂයෙක් පස්පව් පුරා දශ අකුශල් කෙරේද එසේවූ පාපිෂ්ඨයා කෙරෙහින් මම වෛරයෙමි මේ බල්ලා ලවා කවා මරවමි කියා මෙසේවූ පුරුෂයන් කරා මෙහෙයා කඩා කන්නාක්මෙන් මනුෂ්‍යයන් භය ගත්වා ඉක්බිති ශක්‍රයෝ තමන්ගේ වැදිවේශය හැර ශක්‍ර ආත්මභාවයෙන් සිට රජ්ජුරුවන්ට ගාථා සතරකින් අවවාද කියා රජ්ජුරුවෙනි බුද්ධශාසනය පසු බස්නා දැක පෙරලා ශාසනය අභිවෘද්ධිකරුණු සඳහා ආමි කියා බොහෝ මනුෂ්‍යයන්ට අවවාද කොට ශක්‍රයෝ තමන්ගේ ශක්‍රභවනයටම ගියාහ. එතැන් පටන් මනුෂ්‍යයෝ තමන් කරන්නාවූ දශඅකුශල ධර්මය හැර දශකුශල ධර්මයෙහි සෙදී දානාධ්‍යාශයෙන් වාසයකරන්නාහ. භික්ෂු භික්ෂුණීන්වහන්සේලාත් සර්වඥයන්වහන්සේ වදාල ධර්මය නියාවට ප්‍රතිපත්ති පුරා අඛණ්ඩ ශීලය රක්ෂාකරන්නාහ. ශක්‍රයන්ගේ අවවාදයෙන් ශාසනය දාසක් අවුරුදු නිස්කලංකව පැවැත්තේයයි වදාරා මේ **මහාකණ්හ ජාතකය** නිමවා වදාලසේක. එසමයෙහි ශක්‍රයෝ නම් දැන් බුදුවූ මම්මයයි වදාලසේක.

464
මහාපදුම ජාතකය

තවද කොසිය ජාතකය සුධාභොජන ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. තවද මෙණ්ඩක ප්‍රශ්න ජාතකය උම්මග්‍ගවෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

තවද සධර්ම මහාකීර්තිවූ සර්වඥයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි **චිඤ්චාමානවිකාව** අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේ ද? යත්,

සර්වඥයන්වහන්සේ බුදුවූ පසු තීර්ථකයන්ට වන්නාවූ ලාභය පිරිහීන. තීර්ථකයෝ මේ භවත් ගෞතමයන් බුදුවූ තැන් පටන් අපට වන්නාවූ ලාභයෙක් ඇත්නම් පිරිහින. ඉදින් අභව්‍යකරවාපුමෝ නම් අපි ලබන්නාවූ ලාභ ලබන්නමෝ වේදැයි සිතා තීර්ථකයෝ ඇම එක තැනකට එක්ව කථාකරන්නාහු ඒ ශ්‍රමණ භවත් ගෞතමයෝ දුටු දවස් පටන් අප ලබන්නාවූ ලාභයෙන් පිරිහී ගියම්හ, යම් උපායකින් ගෞතමයන් අභව්‍ය කරවාපුමෝ නම් අපි ලාභ ලබන්නමෝ වේදැයි කීහ. ඉන් එක තීර්ථකයෙක් කියන්නේ ශ්‍රමණ

භවත් ගෞතමයන්ට කිලුටක් කියා අභව්‍ය කරන්ට උවමැනවැයි කියා එසේ වීනම් මේ ගම චිඤ්චමානවිකා නම් පරිබ්‍රාජිකාවක් ඇත්තීය. බැලුවන්ට ප්‍රසාද වඩන සිත්කළුය, ඈ නිසා ශ්‍රමණ භවත් ගෞතමයන්ට කිලුටක් උපදවා අභව්‍ය කරවා පිරිහෙලා පියම්හයි කථාකොට උන්නාහ, ඒ තීර්ථකයෝ උන්නාවූ ශාලාවට ආවාවූ චිඤ්චමානවිකාව තීර්ථකයන්ට වැඳ එකත්පස්සව උන්නාහ. තීර්ථකයෝ උන් වැඳිවිටත් බැනනොනැංගාහ, දෙවෙනිවත් වැඳලා සිටියාහ. ඒ වේලෙත් බැණනොනැංගාහ. තුන්වෙනිවත් බැනනොනැංගාහ, ඒ වේලෙහි චිංචමානවිකා විචාරන්නී ඇයි සවාමිනි මා විසින් කවර අපරාධයක් කරණලදද ද කවර වැරැද්දක් නිසා බැණනොනැගෙන්නේදැයි විචාළාහ.

එවිට තීර්ථකයෝ කියන්නාහු තොප විසින් කළ වැරැද්දෙක් නැත. ශ්‍රමණ භවත් ගෞතමයන් බුදුවූ දවස් පටන් අප ලබන්නාවූ ලාභයෙන් පිරිහුනු නියාව නොදනුදැයි කිවාහුය. දනිමි සවාමිනි කීහ. එවිට කියන්නාහු එසේ වීනම් උපායකින් බොහෝ මනුෂ්‍යයන්ට දැනෙන නියායෙන් කිළුටක් කියවයි කිය චිංචමානවිකාත් යහපතැයි තමාගේ ගෙට ගොස් සවස්වේලෙහි රතු කඩක් ඇඳ ජේතවනාරාමයට යන මග ඔස්සේ ගොස් රෑ තමාගේ තීර්ථකයන් ඉඳිනා ගෙයක ළඟ පාන්දෙර එතනින් පිටත්ව ජේතවනාරාමයෙහි ළඟ එනකෙණෙකුන් මෙන් අඟවා තමාගේ ගෙට යන්නීය. ඈ දුටු මනුෂ්‍යයෝ තොපි කොයියව්දැයි විචාළාහ. මා කොයියත් කිම තොපට ඇයි දැයි කියන්නීය. නැවතත් කොයිගොසින් එව්දැයි විචාළ කල කොයිගොසින් එත්කිම, තොපට ඇයිදැයි කියන්නී මේ නියායෙන් තුන් සාරමසක් ඇවිද බොහෝ දෙනාට සැක උපන් පසු තොපි කොයිගොසින් එව්දැයි විචාළකල්හි මම ජේතවනාරාමයෙහි බුදුන් ළඟ ශ්‍රීයහන්කුටියේ ළඟ එන නියායයි කියන්නීය. මෙසේ කියා බඩ කෝටුම්බියක් බැඳගෙණ ඒ බඩ වසා කඩක් බැඳ දැන් මාගේ දෙමසය තුන්මසය බුදුන් ද දරුවෝයයි කියා බස ප්‍රකාශකොට තනපුඩු කළුකොට ගෙරිඇටින් තවා අත පය උදුම්මවා දසමසක් ගියකලසේ බඩ මහත් කොට ගෙණ සර්වඥයන්වහන්සේ බණ වදාරමින් වැඩඋන් ධර්මශාලාවට ගොස් බණ පිරිස් මධ්‍යයෙහි සිට බුදුන්ට කියන්නී නුඹවහන්සේ බණ පිරිස් පිරිවරා ඉඳ බණ කියනසේක්ද මාගේ බඩ දරුගැබ මූකුරා දසඑකඩ මස පිරුණේය. මා වදන්ට ගෙයක් කොයිද? ඉසතෙල් පාත්තෙල් කොයිද? නුඹවහන්සේ දන්නේ මා හා කැටිව රාත්‍රියෙහි ක්‍රීඩාවෙහි සෙදෙන්නටමද? දරුවැදීමේ තොරතුරු නුඹවහන්සේ නොදන්නාසේක.

කෝසල රජ්ජුරුවන්ට කියාවක් මහ අනේපිඩු මහසිටානන්ට කියාවත් විශාඛා මහඋපාසකාවන්ට කියාවත් මා පෝෂ්‍යකරණ නියායෙන් පාවා නොදී කුමක් කරණසේක්ද නුඹවහන්සේ මම පොෂ්‍ය නොකළ මා දරු වදන්නේ කොතනදීදැයි කිව, සර්වඥයන්වහන්සේත් වදාරණ බණ තබා ගෙණ වදාරණසේක් නග තොපලා මාලා දන්නා පමණක්විනා අනික් දන්නෝ කවුරුදැයි වදාළසේක. එවිට කියන්නී නුඹහෙලා මාලා දන්නා පමණක් විනා අනික් දන්නෝ කවුරුදැයි කිව. සර්වඥයන්වහන්සේත් නිෂ්කාරණයේවූ අපඛ්‍යානයෙකැයි කරබාගෙණ උන්සේක. එවේලෙහි ශක්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණුවිය. ශක්‍රයෝ දිව්‍යපුත්‍රයන් සතර දෙනෙකු චිංචමානවිකාවත් බඩ බඳනාලද දරම්ටිය බැඳුම් කපාපියවයි කියා යවූහ. දිව්‍යපුත්‍රයෝ සතරදෙන මී වෙස් මවාගෙණ ගොස් දරම්ටිය කපාලූහ. සුලඟක් මවා බඩ වසා පෙරවිකඩත් පහකළාහ. එතන රැස්වූ

බණ පිරිස නිෂ්කාරණයේ බුදුන්ට සැලැස්වූ අපඛ්‍යානයක් බලවයි කැට මුගුරු ආදියෙන් මරා වාසලින් පිටත් කළහ. පොළොව පලාගෙණ අවීචි මහනරකයෙන් ගිනිකඳෙක් අවුත් නරකයට ගෙණ ගියේය. ධර්මශාලාවේ රැස්වූ භික්ෂූන්වහන්සේ චිංචමානවිකාවන් නිෂ්කාරණයේ බුදුන්ට අපඛ්‍යානය සලසා නරකයට ගියාවේදැයි කිය කියා උන්නෙතට සර්වඥයන්වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනදැයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි මහණෙනි පෙරත් චිංචමානවිකාවෝ බොරු කියා අභව්‍ය වූවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්.

ඉකුත්වගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳගෙණ දසඑකඩමසකින් වැදූහ. ඒ කුමාරයන්ට නම් තබන්නාහු පදුම කමාරයෝයයි නම් තබූහ උන් උපන් නොබෝ කලකින් බිසවුන් මළහ. උන් මළ පසු රජ්ජුරුවෝ අනික් බිසෝකෙනෙකුන් අග මෙහෙසුන් තනතුරට තුබූහ. ඒ බිසව් රජ්ජුරුවන්ට ප්‍රියව මනවඩති එසමයෙහි පසල් ගමෙක සොරුන් විසින් භයෙක් උපන, රජ්ජුරුවෝ ඒ සොරුන්ගෙන් උපන් භය අසා සංහිඳුවන්ට නික්මුණාහු බිසවුන්ට කියන්නාහු අපි සටනට යම්හ. තොපි මෙතන රඳවයි කීසේක. බිසව් කියන්නාහු මම මෙතෙන රැඳී නොසිඳිමි කැටිව එමි කීහ. රජ්ජුරුවෝ කියන්නාහු උප යන්නේ සටනටයි එසේහෙයින් තොප කැටිව කැඳවාගෙණයන්ට සේරුව නොවෙයිකියා තොපගේ දක්සැප දෙක දක්නට පදුම කුමාරයෝ දනිති කියා බිසවුන් රඳවා පදුමකමාරයන්ට නුවරත් පාවාදී සේනාව සන්නඩ කරවා පසල්ගමට සටනට නික්මුණාහ සොරුගෙන් උපන් භය සන්හිඳුවා පෙරලා නුවරට අවුත් නුවරලඟ කඳවුරු බැඳගෙණ උන්නාහ.

පදුම කුමාරයෝත් රජ්ජුරුවන් ආ නියාව අසා අලංකාරකොට නුවර සරහවයි අමාත්‍යයන්ට විධානකරවා තනියම රාජනිවාසයට ගොස් රාජනිවාසයේත් ඒ ඒ තැන කළමනා මේවරත් කරවා අගමෙහෙසුන් බිසවුන්වහන්සේ ඉඳිනාගෙට ගොස් වැඳලා සිටියාවූ මෑනියන්වහන්සේගේ ඵාසු අඵාසු කිම්දැයි විචාළසේක. බිසව් පදුම කුමාරයන් දැක පිළිබඳ සිත් ඇතිව මට අම්මැයි කියාද කියන්නේයයි මෙසේ අවුත් යානමත්තේ වැඳහිඳුවයි කීහ. පුදුමකමාරයෝ කියන සේක් මෑනියන්වහන්ස කටයුත දන්නා තැන්පටන් අන් සත්‍රියකට කෙලෙස් වසයෙන් මූණබැලූ විරූත් නැත. තුඹවහන්සේ මාගේ මෑනියන්වහන්සේය. පියානන් වහන්සේගේ බිසවුන්වහන්සේ හෙයිනුත් මෑනියන් වහන්සේය. එසේහෙයින් තුඹ වහන්සේ කෙතෙක් කීවත් මම එසේවූ අනාචාරය කරන්නේ නැතැයි කීහ. බිසව් බොහෝ යාච්ඤා කළාහ, කෙතෙක් යාච්ඤා කළත් තුඹ වහන්සේ හා අනාචාරයට මා යෙදෙන්නේ නැතයි කීහ. බිසවු කියන්නාහු මා කරා තොප නොආ පසු රජ්ජුරුවන් වහන්සේට කියා ඉස කප්පා ලම් කීහ. ඉස කප්පන්නේ මේ එක ජාතියකවේද තුඹ වහන්සේ ඉස කප්පන්නා තබා කැමති යම් වධයක්කරවුවමැනව. මා කනස්සල නැතැයි කියා පදුම කුමාරයෝ පිටත පලා ගියාහ. ඒ කුමාරයන් පලා යන්නා තමන්ගේ ඇඟ නබප්‍රහාරකොට තෙල් ගල්වා කිලුටුකඩක්

ඇඳගෙණ වැදහෙව, රජ්ජුරුවන්වහන්සේ මා විචාළසේක්වීනම් ලෙඩට වැද හෝනාසේකැයි කියවයි අන්තඃපුරවාසීන්ට උගන්වා වැදහොත්තාහ. රජ්ජුරුවෝත් නුවරට වැද නුවර ප්‍රදක්ෂිණාකොට රජගෙට වැද බිසවුන් කොයිදැයි විචාළාහ. අන්තඃපුරයේ ඇත්තෝ කීයත්තාහු ලෙඩව හෝනාසේකැයි කීහ. රජ්ජුරුවෝත් බිසවුන් ඉන්නා ගෙට ගොස් යානපිට ඉඳ තොපට අපාසු කිම්දැයි, බිසවු බැණනොනැඟී වැදහෙව කියත්තාහු සස්වාමික කෙණෙක් වීනම් මෙසේ ඉඳිමෝද අපට ස්වාමිකෙණෙක් ඇද්ද නුඹවහන්සේ ඇතිනියාව දත්තේ දුටුවිටයයි කීහ. එවිට රජ්ජුරුවෝ කියත්තාහු ඇයි තොපට ගහටකළෝ කවුරුදැයි කීහ. අනික් කවුරුද නුඹවහන්සේ මේ නුවර රැකවලට රඳවාගියෝ කාදැයි විචාළාහ. පදුම කුමාරයෝයයි කීහ.

එසේවීනම් තමන් කීවාම නොකළහයි කියා මාගේ ඇඟපත නසා ඉසකේපත අල්වා ඇතමැත ඇද කල ගහටයෙ විචර කියනපමණේ ඇද්දැයි කීහ. එවිට රජ්ජුරුවෝ කිපී යව ගොස් පදුම කුමාරයා අල්වාගෙණ ගෙණෙවයි කීහ. එවිට අමාත්‍යයෝ මේවර අසා ගෙණ පදුම කුමාරයන් අල්වාගෙණ පිටි තලහසා බැඳ තලා රත්මල්වඩම් කරලා ෂාවටව කියවා රජ්ජුරුවන් ලඟට ගෙණාහ අතරමග දුටු මනුෂ්‍යයෝ මේ කිමෙක්ද ස්වාමීනි නුඹවහන්සේටත් මෙසේවූ දෙයක් පැමිණියේදැයි අඬා දෙඩා බොහෝ මනුෂ්‍යයෝ එක්වූහ. පදුම කුමාරයන් ගෙණගොස් රජ්ජුරුවන්ට දැක්වූහ. රජ්ජුරුවොත් පදුම කුමාරයන් දැක මේ සොරුන් එලනප්‍රපාතයේ එලවයි කීහ. එවිට පදුම කුමාරයෝ කියත්තාහු පියානන්වහන්ස මම මෙසේවූ දෙයක් කළේ නැත. ගෑණුන්ගේ බසට නිෂ්කාරණයේ නොනසව මැනවයි කීහ. රජ්ජුරුවෝ කිපී මේ සොරාගේ බස් තබා සෙලින් එලවයි කීහ. එලවයි කී බස් හා සමග අන්තඃපුර වාසීන් හා අමාත්‍යයෝත් අඬා රජ්ජුරුවන්ට කියත්තාහු දේවයන්වහන්ස රාජ්‍යකරන්නාවූ රජදරුවන්වහන්සේ නම් පරීක්ෂාකාරී වූවමැනව ඇසූ ඇසූවන් පස්සේ නොයායුතුය. තීක්ෂණ කෝපී නොවියයුතුය. නිග්‍රහ කළවුන්ට නිග්‍රහකළයුත්තේය සංග්‍රහකළවුන්ට සංග්‍රහ කළයුත්තේය. ඡන්දයෙන් භයෙන් මෝහයෙන් වෙෂයෙන් උන්නාවූ බසට පරීක්ෂා කළමැනව පෙර රජදරුවන්සේ එකවිචර වරදට මසුරන් සියයක් දඩගන්නාසේ. උග්‍රව ද්වේෂකළ උන්ට නුවරින් පිටත යවනසේක. මේ නිග්‍රහ සැලසූනෙත් මැනය. පළමු රජදරුවන්වහන්සේ සමයෙහි මෙසේවූ නිග්‍රහයෙක් නැත. ගෑණියකගේ බස්ගෙණ ශීලයෙන්ද ආචාරයෙන් ද නිසිවූ රාජ්‍යයක් රක්නාවූ නුඹවහන්සේගේ පුත්‍රවූ පදුම කුමාරයන් වහන්සේ නිෂ්කාරණයේ නොනැසුව මැනවයි කීහ.

මෙසේ බොහෝකොට කන්නලව්වකින් රජ්ජුරුවෝ නොගිවිස පදුම කුමාරයන් මරවයි කීහ එවිට සොළොස්දහසක් බිසෝවරුත් අමාත්‍යයෝත් රාජ්‍යවාසීහුත් මහහඬින් හඬා සිටියාහ. එවිට රජ්ජුරුවෝ සිතන්නාහු රාජ්‍යවාසීන් හා අන්තඃපුරවාසීන් එකගිව පදුමකුමාරයන්ට ලැබී සිටින්නේය. මටත් බිසවුන්ටත් ලැබී සිටි එකෙකුත් නැත මූත් හැම විත් තමූන් නොමැරුවෝනම් නපුරයි රජ්ජුරුවෝත් චතුරංගිනිසේනාවත් ඇරගෙණ පදුම කුමාරයනුත් ඇරගෙණ සොරුන් එලන්නාවූ පර්වතයට නැඟී පදුම කුමාරයන් දෙපය අල්වා ඉස බිම බල්වා සොරුන් එලන්නාවූ ප්‍රපාතයෙහි එලූහ, ඒ පර්වතයේ වාසය කරන්නාවූ දේවතාවා පදුම කුමාරයෙනි තොපි නොබවයි කියා පියාන කෙණෙකුන් පුතනු

කෙණෙකුත් වඩත්නාසේ ලෙයිලා වඩාගෙණ පර්වතයේ ඉඳිනා නාරජ්ජුරුවන් පෙනගබ මින්තේ තුබූහ. ඒ නාගරාජයාත් පදුමකුමාරයන් නාගභවනයට ගෙණගොස් රාජ්‍යය සරියේ බෙදාදී අවුරුද්දක් රාජ්‍යයකොට සිතන්නාහු මෙතන ඉඳ කාරිය කිම්දැයි සිතා මනුෂ්‍යපථයට යෙමි කීහ. රජ්ජුරුවෝත් යහපතැයි බොධිසත්ත්වයන් විචාරන්නාහු මනුෂ්‍ය පථයෙන් කවර ගමෙක නොපි ගෙණගොස් ලන්නේදැයි කීහ. මා හිමාල වනයේ ලාපියවයි කීහ. යහපතැයි කියා නාරජ්ජුරුවෝත් පදුම කුමාරයන් හිමාලයවනයේ ලා ගියහ. බොධිසත්ත්වයෝ ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව නොබෝ දවසකින් පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවා හිමාලයවනයෙහි වාසයකරන්නාහ.

එක්තරා වල්වැද්දෙක් තමාගේ කාරියකට වලට ඇවිදිනේ පදුම කුමාරයන් වාසයකරන්නාවූ පන්සලට වැද පදුම කුමාරයන් දැක ඇඳිනගෙණ නුඹවහන්සේ පදුමකුමාරයන්වහන්සේදැයි විචාළාහ. එසේයයි කීසේක. ඒ වැදිත් තාපසයන් කෙරේ කීපදවසක් රඳා නුවරට ගොස් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ සැබෑදැයි විචාරා නියමදැන චතුරංගිණී සේනාව ඇරගෙණ හිමාල වනයට ගොස් සේනාව රඳවා අමාත්‍යයනුත් ඇරගෙණ පන්සලට ගියාහ. ඒ පන්සල දොරකඩ පිටසිට රන්පිළිමයක්සේ දොරකඩ උන්නාවූ බොධිසත්ත්වයන් දැක එකත්පස්ව උන්නාහ. අමාත්‍යයෝත් බොධිසත්ත්වයන් දැකවැඳ එකත්පස්ව උන්නාහ. බොධිසත්ත්වයෝ කියන්නාහු එම්බල මේ වනයෙහි මිහිරි පලාපල ඇත. යහපත්වූ මිහිරි පැන් ඇත, ගමන් ශ්‍රමදැහ නිවා කව බොව සැතපී ඉඳුවයි කීහ. ඒ අසා සහපිරිවරින් රජ්ජුරුවෝත් අමාත්‍යයෝත් බොධිසත්ත්වයන් හා කථාකරන්නාවූ තාලවෘක්ෂ ප්‍රමාණයකටත් උස්වූ මහත්වූ ප්‍රපාතයකින් මාගේ සිය අතින්ම එලාපියනලද එම්බා පුත පදුමකුමාරයෙනි තෙපි කෙසේ ජීවත් වූයේදැයි කියා නැවත කියන්නාහු මා අපරික්ෂිතව කළාවූ වරද ක්ෂමාකරවා පුත පදුම කුමාරය මා හා කැටිව නුවරට අවුත් දැහැමෙන් සෙමින් රාජ්‍යයකරවයි කීහ, එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු මහරජ්ජුරුවෙනි යම් මිනිසෙක් බිලියක මස්කැටියක් අමුනා දියයට දමාද ඒ බිලිය මත්ස්‍යයෙක් ගැල නැවත වමාරා ගැලවී ගියේද එමෙන් මමද දුකසේ ගැලවී දෙවනුව රාජ්‍යයට පැමිණෙද්දැයි මහරජ්ජුරුවෙනි කීහ.

ඒ වේලෙහි රජ්ජුරුවෝ කියන්නාහු ඒ කිම්ද? බිලියනම් කින්ද? මස් කැටියනම් කින්ද? බිලිය ගිලූ කුඩමස්සානම් කින්ද? ඒ මට නොදැනේයයි කිව මැනවැයි කීහ එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු මහරජ බිලියනම් පංචකාම නැමැති බිලියය. මස්කැටිය නම් හස්ති අශ්ව රථ පත්තිය යන සේනා නැමති මස්කැටියය. ඒ ගැලපියා වමාරා පලාගියාවූ කුඩමස්සානම් මමය. මහරජ්ජුරුවෙනි තෙපි ගැනියකගේ බස්ගෙණ මා පර්වතයෙන් එලාපුව. එදවස් මාගේ මෛත්‍රී බලයෙන් රැකිනිමි. එසේවූ මරණින් මිදුන මම නැවත රාජ්‍යලොභයෙන් වලවැටෙම්ද, මම රාජ්‍යයට නොයමි, තෙපි නොසින් දැහැමෙන් රාජ්‍යය කරවයි කියා යවූහ. රජ්ජුරුවෝත් අමාත්‍යයෝත් බොධිසත්ත්වයන් වැඳ අඬා වැලප නුවරට යන්නාහු බොධිසත්ත්වයන් එලූ පර්වතය ලඟට පැමිණියාහු පර්වතය දැක අමාත්‍යයන් අතින් විචාරන්නාහු එම්බා අමාත්‍යයෙනි මාගේ කිසි වරදක් නැත්තාවූ ගුණයෙන්ද ආචාරයෙන්ද ශීලයෙන්ද සමන්විතවූ පදුම කුමාරයන් නොලද්දේ කා නිසාදැයි විචාළාහ අමාත්‍යයෝ කියන්නාහු ස්වාමීනි

නොදන්නාසේක්ද තුඹවහන්සේගේ බිසවුත්වහන්සේ නිසායයි කීහ. ඒ වේලෙහි මාගේ නිවරදවූ පදුමකුමාරයන් නිෂ්කාරණයේ වරදලාවූ ඈ ගෙණෑවිත් මේ පර්වතයෙන් දමවයි කියා එතනම සිට ගෙන්වාගෙණ බිසවුත් පර්වතයෙන් එලවා නුවරට ගොස් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මීය පරලොව ගියාහයි වදාරා මේ මහාපදුම ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බිසව් නම් චිංචාමානවිකාය, රජ්ජුරුවෝ නම් දෙවදත්තස්ථවිරය, පර්වතයේ වසන්නාවූ දේවතාවා නම් ශාරිපුත්‍රස්ථවිරය, නාරජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරය, පදුමකුමාරවූ තාපසයෝ නම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

මිත්තාමිත්ත ජාතකය 465

තවද හුදු නුවණින් මවාලූ රුවක් වැනිවූ තිලෝගුරු බුදුරජාතන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ අමාත්‍යයකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද? යත්,

කොසොල් රජ්ජුරුවෝ එක් අමාත්‍යයෙකුට බොහෝ සම්පත්දී අධික කරුණා ඇත්තාහ, සෙසු අමාත්‍යවරු රජ්ජුරුවන් අමාත්‍යයාට අධික කරුණා ඇතිනියාව දැන නොයෙක් දෝෂ කියා බිඳුවාපුවාහ. රජ්ජුරුවෝ අමාත්‍යයාගේ දෝෂ පරීක්ෂාකොට කිසි දොෂයක් නැතිහෙයින් බුදුරජාතන් වහන්සේ කරාගොස් සවාමිනි මිත්‍රයාගේ යහපත හා අමිත්‍රයාගේ දොෂත් අසනු කැමැත්තෙමි කීහ. මහරජ පළමුත් තොපසේ රජදරුවෝ නුවණැත්තන් අතින් විචාළගමනතේ නුවණැත්තෝ විසඳූ කීවෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක,

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට පණ්ඩිත අමාත්‍යව උපන්නාහ. ඒ රජ්ජුරුවෝ එක්තරා අමාත්‍යයෙකුට අධික කරුණා ඇත්තාහ, සෙසු අමාත්‍යවරුත් ඒ අමාත්‍යකෙරෙහි ඉරිස්සාව බැඳ නොයෙක් දොෂ රජ්ජුරුවන්ට කියා බිඳවූහ, රජ්ජුරුවෝත්, ඒ අසා අමාත්‍යයාගේ දොෂ පරීක්ෂා කොට කිසි දොෂයක් නොදැක සිතන්නාහ, මිත්‍රයාගේ යහපතත් අමිත්‍රයාගේ දොෂත් පණ්ඩිත අමාත්‍යයාගෙන් අසනු කැමැත්තෙමි කියා ගෙන්වා විචාරන්නාහු මේ ලෝකයෙහි නුවණැත්තාවූ සත්වතෙමේ කෙසේවූ කාරියක් කරන්නාහු සත්වයා ඇසින් දැකවත් කණින් අසාවත් මේ මට අමිත්‍රයයි දැනගණීද ඒ මිත්‍රයයි දැනගණීද ඒ මිත්‍රයා දැනගන්නා පිණිස නුවණැත්තාවූ සත්වතෙමේ කෙසේ වීයයි කෙරේදැයි විචාළාහ. එබස් අසා රජ්ජුරුවන්ට අමිත්‍ර ලක්ෂණ කියන්නාහු බොධිසත්වයෝ මහරජ්ජුරුවන් වහන්ස මිත්‍ර ප්‍රතිරූපකවූ සත්වතෙමේ මිත්‍රයා දැක සන්තෝෂාකාරයක් නොදක්වා ද ඒ මිත්‍රයන්ගේ කථා පිළිගෙණ සතුටු නොවේද මිත්‍රයා තමා මූණබැලූ අවස්ථාවෙහි තෙමේ මූණබලාද මිත්‍රයාගේ කථාවට විරුද්ධවේද ඔහුගේ

සතුරන් භජනය කෙරේද මිත්‍රයාගේ බලවත් කාර්‍ය්‍යයකට වර්ණනා නො කෙරේද ඔහුගේ ප්‍රඥාවට ප්‍රශංසා නොකෙරේද මිත්‍රයාට අවැඩක්වූ කල්හි සතුරන්සේ සතුටුවේද වැඩක්වූකල්හි නොසතුටුවේද නොලදහැකි භෝජන යක් ලත්කල්හි මිත්‍රතෙම මෙසින් සවල්පදෙයවත් ලද්දේනම් යහපතැයි ඔහු සිහි නොකෙරේද යන මේ කාරණ සොළොස්දෙන අමිත්‍රයා කෙරෙහි සිටියාහ, නුවණැත්තාවූ සත්වතෙම මේ සොළොස් ආකාරයෙන් අමිත්‍රයා දැකත් ඔහුගේ ගුණ අසාත් අමිත්‍ර ලක්‍ෂණ දැනගන්නේයයි රජ්ජුරුවන්ට අමිත්‍ර ලක්‍ෂණ කීහ

නැවත රජ්ජුරුවන් විසින් නුවණැත්තාවූ සත්වතෙම කෙසේවූ කාරියක් කරන්නාවූ පුද්ගලයා ඇසින් දැකත් ඔහුගේ කාර්‍ය්‍ය අසාත් මේ මිත්‍රයායයි දැනගණ්ද ඔහු මිත්‍රතියාව දැනගන්ට කෙසේ උත්සාහ කෙරේදැයි විචාළ කල්හි මිත්‍රලක්‍ෂණ කියන්නාවූ බෝධිසත්වයෝ මහරජ්ජුරුවන්වහන්ස මිත්‍ර තෙම තමාගේ මිත්‍රයා අන්‍ය දෙශයකට ගියකල්හි ඇමවේලෙහිම සිහිකෙරේද බැහැර ගොස් ආ තැනැත්තහු දැක සතුටුවේද ඔහු කෙරේද මිත්‍රයන්ගේ මිත්‍රභජනය කෙරේද මිත්‍රයාගේ නුගුණ කියන්නාවුන් වලකා ගුණ කියන් නාවුන්ට ප්‍රශංසා කෙරේද තමාගේ රහස් මිත්‍රයාට කියාද ඔහුගේ රහස් තෙමේ සඟවාද මිත්‍රයාගෙන් සවල්පමාත්‍රවූදෙයක් ලද්දේ නම් ඊට වර්ණනා කෙරේද ඔහුගේ ප්‍රඥාවට ප්‍රසංශාකෙරේද මිත්‍රයාට වැඩක්වූ කල්හි සතුටුවේද අවැඩක්වූ කල්හි දොම්නස්වේද නොලද ආහාර පාන වර්‍ගයක් ලත් කල්හි මාගේ මිත්‍රතෙම මේ භොජනයෙන් සවල්පමාත්‍රයක් ලද්දේනම් යහපත් වන්නේයයි ඔහු සිහිකොට අනුභව කෙරේයි යන මේ කාරණ සොළස මිත්‍රයා කෙරෙහි මනාව සිටියේය, නුවණැත්තාවූ සත්වතෙම මේ මිත්‍රයා දැකත් ඔහුගේ කාර්‍ය්‍ය අසාත් මේ සොළොස්කාරණයෙන් මිත්‍රලක්‍ෂණ දැනගන් නේයයි මහබෝසතාණෝ රජ්ජුරුවන්ට මිත්‍රයාගේ ලක්‍ෂණ ප්‍රකාශකොට කීහ.

රජ්ජුරුවෝ මහබෝසතාණන්ගේ බසට සතුටුව මහත්වූ ඓශ්වර්‍ය්‍ය දුන්නාහ, ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ මේ ජාතක ධර්‍මදේශ නාව ගෙණහැර දක්වා වදාරා මෙසේ මහරජ්ජුරුවෙනි පෙරත් මිත්‍ර අමිත්‍ර දෙදෙනාගේ ලක්‍ෂණ දැනගන්ට සුදුසුවූ ප්‍රශ්න පහළවීය, එසමයෙහි නුව ණැත්තෝම ප්‍රශ්න විසර්ජනයකොට මෙයාකාරයෙන් මිත්‍ර අමිත්‍ර දෙදෙ නාගේ ලක්‍ෂණ දතයුතුයයි කීවෝ වේදැයි වදාරා මේ මිත්තාමිත්ත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි නුවණැත්තාවූ අමාත්‍යයෝ නම් තිලෝගුරු සම්‍යක්සම්බුදු රජවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

දොළොස්වන නිපාතයයි.

466
අම්බ ජාතකය

මෙවද එක්සමයෙක්හි ශාක්‍යකුලප්‍රදීප යාමානවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසන සමයෙහි දේව දත්තස්ථවිරයන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලද.

ඒ කෙසේද? යත්,

දේවදත්තස්ථවිරයන්වහන්සේ මම්ද බුදුවෙමි. මට භවත් ගෞතමයන්වහන්සේ ආචාරීන් නොවනසේක, උපාධ්‍යායත් නොවනසේකැයි කියා ආචාරීන්වහන්සේ ප්‍රත්‍යාඛ්‍යානයකොට ධ්‍යානාදීන් පිරිහුනුසේක. සංඝභේදකොට ක්‍රමයෙන් සැවැත්නුවරට වඩිනාසේක් ජේතවන දොරටුවෙන් පිටතදී පොළොව විවරවූ කල්හි අවීචියට වන්සේක, එසමයෙහි ධම්සභාවෙහි රැස්ව උන්නාවූ භික්ෂූන්වහන්සේ කථාවක් උපදවනසේක් ඇවැත්නි දෙවදත්තස්ථවිරයෝ ආචාරීන්වහන්සේ ප්‍රත්‍යාඛ්‍යානයකොට මහාවිනාසයට පැමිණ අවීචිමහ නරකයෙහි උපන්නෝ වේදැයි මේ කථාවක් උපදවා උන්සේක. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ තුන්තරාගමනින් එක්තරා ගමනකින් ධම්සභා මණ්ඩපයට වැඩවදාරා පණවන ලද බුද්ධාසන මස්තකයෙහි යුගන්ධර මුදුනෙහි දිලියෙන්නාවූ ළහිරු මඩලක්මෙන් දිලිහි දිලිහි වැඩහිඳ මහණෙනි දැන් කිනම් කථාවකින් යුක්තව උනුදැයි කිනම් කථාවක් කොට අඩාලවිදැයි විචාරා ස්වාමීනි තුඹවහන්සේ විසින් නොකියන්ට වදාළ රාජකථා චෝරකථා ආදිවූ එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ, දේවදත්තස්ථවිරයන් ආචාරීන්වහන්සේ ප්‍රත්‍යාඛ්‍යානයකොට ධ්‍යානයෙන් පිරිහී මහත්විනාසයට පැමිණ ජේතවන දොරටුයෙන් පිටතදී අවීචිමහ නරකයට වන්නියාව කිය කියා උනුම්හයි කී කල්හි මහණෙනි දැන් මතුනොවෙයි පෙරත් දේවදත්තස්ථවිරයෝ ආචාරීන් ප්‍රත්‍යාඛ්‍යානයකොට මහත්වූ විනාශයට පැමිණියෝ වේදැයි වදාරා භවාන්තර ප්‍රතිච්ඡන්නවූ මේ කථාව වදාරණසේක් ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර උසිරථ නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යකරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ පුරෝහිතධූරය දරන්නා අහිවාතක රෝගයෙන් නටුයේය. එක පුත්‍රයෙක් බිත්තිය බිඳගෙණ නික්මුණු තැනැත්තෝ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචරීන් සමීපයෙන් වෙදත්‍රය හා අවශෙෂවූ ශිල්ප ඉගෙණ ආචාරීන් වැඳ නික්ම දේශචාරිත්‍ර දැනගණිම්යි සිතා ඇවිදිනේ එක් ප්‍රත්‍යන්ත නුවරකට පැමිණියේය, ඒ නුවර නිසා මහත්වූ චණ්ඩාල ග්‍රාමයෙක් වූයේය. එසමයෙහි පුරණලද බොධිසම්භාර පාරමිතා ඇති අප මහබෝසතානෝ ඒ සැඩොල් ගම්හි වසන්නාහු ප්‍රාඥයෝය, ව්‍යක්තයෝය, නොකලට අඹ පලගන්වන්නාවූ මන්ත්‍ර දන්නාහුය. ඒ බෝධිසත්වයෝ උදෑසනම කදක් ඇරගෙණ ඒ සැඩොල් ගමින් නික්ම වනයෙහි එක් අඹ රුකක් සමීපයට ගොස් සත්පියවරක් මත්තෙහි සිට මන්තරය පිරුවා අඹ රුකට එක් පැන් අතලොස්සක් ගසන්නාහුය. එකෙණෙහිම අඹරුකින් පරණකොළ වැගිරී අළුත් දළු හා කොළ අටගන්නේය, මල්පිපී වැගිරෙන්නේය, අඹ මැලසි අටගෙණ එක්ෂණයෙහිම මුහුකුරා විලික්සව මධුර ඕජාවත්ව දිව්‍ය ඵල හා සමානව රුකින් වැගිරෙන්නේය. මහබෝසතානෝ අඹ අවුලා සෑහෙන පමණක් අනුභව කොට ඉතිරිදෙය කදපුරා ගෙට ගොස් ඒ අඹ විකුට පුත්‍රදාරාවන් පොෂ්‍යය කරන්නාහ. ඒ බ්‍රාහ්මණකුමාරයා මහබෝසතානන් නොකල අඹගෙණවුන් විකුණන තැනැත්තන් උන්ගේ භාර්‍ය්‍යාව අතින් විචාරන්නාහු ආචාරි කොයිදැයි විචාරා වනයට ගියහයි කී කල්හි

බෝධිසත්ත්වයන්ගේ ඊම බලමින් සිට එන්නාවූ බෝධිසත්ත්වයන් දැක පෙරමගට ගොස් අතින් කඳ ගෙණදින් ජිදුලේය. මහබෝසතානෝ ඒ මානවකයාගේ මූහුණ බලා භාර්‍යාවට කියන්නෝ සොඳුර මේ මානවකයා මන්ත්‍ර නිසා ආයේය. ඉදින් මා මෝහට මන්ත්‍ර දුනහොත් මොහු අත මන්ත්‍රය නොසිටිනේය. මේතෙම අසත්පුරුෂ එකෙකැයි කීහ. මානවකයාත් මම මේ මන්ත්‍ර ආචාරීන්ට උපකාරීව ලැබගණිම් සිතා එතැන් පටන් ගෙයි කළමනා කාරිය කරන්නේය. නිරන්තරයෙන් දර නෙණෙන්නේය, බත් මාළු පිසන්නේය මූවදොනා පැන් ආදිය දෙන්නේය, පාසෝධා පය තෙල් ගල්වන්නේය, එක් දවසක් මහබෝසතානන් විසින් දරුව මානවකය මා වැදහොත් ඇඳට ඇඳ පාළුවක් ගෙණවිත් දී ලවයි කී කල්හි ඇඳ පාළුවට කිසිවක් නොදැක සකල රාත්‍රියෙහි කලවය මත්තේම ඇඳ පය තබාගෙණ උන්නේය.

මෑතභාගයෙහි මහබෝසතානන්ගේ භාර්‍යාතොමෝ දරුවන් වදන අවස්ථාවෙහි කළමනා යම්ම කාරියෙක් ඇත්නම් සියල්ලම මානවකය කෙළේය. ඉක්බිත්තෙන් එක්දවසක් ඒ ස්ත්‍රී මහබෝධිසත්ත්වයන්ට කියන්නී ස්වාමීනි මේ මානවකයා ජාතිසම්පන්නව සිටත් මන්ත්‍රය නිසා උත්සාමයෙන් නොකළමනා මෙහෙවර අපට කරන්නේය. මොහු අත මන්ත්‍රයටත් සිත ඇත්තෙමියි කීය. ස්වාමීනි මෝහට මන්ත්‍රය දුනමැනවැයි කීහ එබස් අසා මහබෝසතානෝ යහපතැයි ගිවිස ඕහට මන්ත්‍රය දී කියන්නාහු දරුව මානවකය මේ මන්ත්‍රය ඉතා මාහැගිය. තට මේ මන්ත්‍රය නිසා මහත්වූ ලාභසත්කාර වන්නේය. රජ යුවරජ මහඇමතියන් ආදීන් විසින් තොපගේ ආචාරී කවුරුදැයි විචාළකල්හි මා නොහඟවා කියව, ඉදින් චණ්ඩාලයක්හු සමීපයෙන් මා විසින් මේ මන්ත්‍රය උගන්නාලද්දැයි ලජ්ජාව බ්‍රාහමණ මහාසාරයක් මාගේ ආචාරීයයි කීයෙහි වීනම් මන්ත්‍රයෙහි ඵල නොලබන්නේයයි කීහ. එබස් අසා මානවකයා කියන්නේ ස්වාමීනි නුඹවහන්සේ කුමක් නිසා සඟවම්ද යම්කිසි කෙණෙකුන් විසින් විචාළ කල්හි නුඹවහන්සේ මට ආචාරී නියාවත් කියමි කීයා වැඳ අවසර ඉල්වාගෙණ චණ්ඩාල ග්‍රාමයෙන් නික්ම මන්ත්‍රය පරීක්ෂාකොට ක්‍රමයෙන් බරණැස්නුවරට ගොස් මන්ත්‍රානුභාවයෙන් නොකල අඹ පලගන්වා ඒ අඹ අවුලා විකොට බොහෝ වස්තු ලද්දේය.

ඉක්බිත්තෙන් එක්දවසක් උද්‍යානපාලයා ඔහු අතින් අඹ මිලයට ඇර ගෙණ රජ්ජුරුවන්ට දුන්නේය. රජ්ජුරුවෝත් ඒ අඹ අනුභවකොට තා විසින් මේබඳු අඹ කොයින් ලබන ලද්දැයි විචාළාහ. දේවන්වහන්ස මේබඳු මානවකයෙක් අකාල ඵලයන් ගෙණවුත් විකුණන්නේය. ඔහු අතින් මා විසින් මේ අඹ ගන්නාලදැයි කීය. එබස් අසා රජ්ජුරුවෝ එසේවීනම් මෙතැන්පටන් ඔබක නොවිකුට මෙතනම ගෙණවුත් දෙන්නේය. රජ්ජුරුවන් විසින් මට සේවය කරවයි කීකල්හි යහපතැයි ගිවිස රාජසේවය කොට බොහෝ වස්තු ලැබ ක්‍රමයෙන් විශ්වාස විය. ඉක්බිත්තෙන් එක්දවසක් රජ්ජුරුවෝ ඒ මානවකයා අතින් විචාරන්නාහු මානවකය තෝ නොකල මෙසේ වර්ණ ගන්ධ රසයෙන් සමෘද්ධවූ අඹ කොයින් ලබන්නෙහිද? කිමෙක්ද තට නයෙක් ගරුඩයෙක් දෙවියෙක් දේද, මේ මන්ත්‍රානුභාවයෙන් ලැබීමෙක්දැයි විචාළහ. එබස් අසා මානවකයා කියන්නේ මහරජ්ජුරුවන්වහන්ස නාග සුපර්ණාදීන් අතුරෙන් මට කිසිවෙක් නොදෙන්නේය. මාගේ අනඝවූ මන්ත්‍රයෙක් ඇත. නොකල අඹ ලැබීම ඒ මන්ත්‍රයෙහි ආනුභාවයයි කීහ. එසේවීනම් අපිත් එක්දවසක් මන්ත්‍රය

බල බලම්හයි කීහ. යහපතැයි දේවයන්වහන්ස මන්ත්‍රානුභාව මම දක්වමි කීහ රජ්ජුරුවෝ දෙවෙනි දවස් මානවකයා සමග උයනට ගොස් මන්ත්‍රබල දක්වවයි කීහ. මානවකයාද යහපත් අඹරුකක් සමීපයට ගොස් සත්පියවරක් මත්තෙහි සිට මන්ත්‍රය පිරුවාහ. අඹරුකට පැන් අතලොස්සක් ගැසූයේය. එකෙණෙහි අඹරුක ක්‍රමයෙන් අඹ පලගෙන මහමේඝ මෙන් අඹවැසි වටුයේය. ඒ දැක සතුටුවූ ජනයෝ සාධුකාරනාද පැවැත්වූහ. සියදහස්ගණන් පිළිහිස් මුදුනේ නැටූහ. රජ්ජුරුවෝ අඹ අනුභවකොට ඔහට බොහෝ වස්තු දී මානවකය මෙබඳුවූ ආශ්චර්‍ය්‍යවත්වූ මන්ත්‍රයක් කවරෙක්හු සමීපයෙන් උගණිද්දැයි විචාළාහ. මානවකයා ඉදින් මම චණ්ඩාලයෙක්හු සමීපයෙන් උගතිමි කීයෙම් වීම්නම් මා ලජ්ජාකටයුතු වන්නේය. මටත් නින්දාකරන්නාහ. මන්ත්‍රය වූකලී මට ඉතා ප්‍රගුණ වන්නේය, දැන් නොනස්නේය, දිසාපාමොක් ආචාරීන්ගේ නම් කියම් සිතා බොරුවක් කියන්නේ තක්සලානුවර දිසාපාමොක් ආචාරීන් අතින් උගතිමි කියමින් ආචාරීන් ප්‍රත්‍යාඛ්‍යානය කෙළේය.

එකෙණෙහි මන්ත්‍රය අන්තර්ධාන විය. රජජුරුවෝ සොම්නස්ව ඒ මානවකයා කැඳවාගෙන නුවරට වැද නැවත එක්දවසක් අඹ අනුභව කෙරෙමියි කියා උයනට ගොස් මගුල්සලවට මත්තේ හිඳ මානවකය අඹ ගෙනෙවයි කීහ. ඒ මානවකයා යහපතැයි කියා අඹරුකක් සමීපයට ගොස් සත්පියවරක් මත්තෙහි සිට මන්ත්‍රය පිරුවම් සිතා මන්ත්‍රය නොවැටහෙනකල්හි අන්තර්ධානවූ නියාව දැන ලජ්ජාව සිටියේය. රජජුරුවෝ මේ මානවකයා පෙර පර්ෂත්මධ්‍යයෙහිම අඹ ගෙණවුත් අපට දෙන්නේය. ඝනවර්ෂාවක් මෙන් අඹ වැසි වස්නේය, දැන් දැඩිව ගිය එකක්හු මෙන් එම්හිතව සිටියේය. මීට කාරණා කිමෙක්දෝහෝයි සිතා ඔහු අතින් විචාරන්නාහු රජ්ජුරුවෝ මානවකය තොප පළමු අඹවිලිකුත් ඇරගෙණවිත් දුන්නේය.

දැන්වූකලී තට ඒ ආනුභාවසම්පන්නවූ මන්ත්‍රයෙන් මීඅඹ පහළ නොවේද කුමක් නිසා තෝ දැන් අඹ නොගෙණවුත් ඉඳිනෙහිදැයි විචාළාහ. එබස් අසා මානවකයා ඉදින් අද මම අඹ නොගෙන්වම් කියේවීනම් රජ්ජුරුවන්වහන්සේ මට කිපෙනසේක. බොරුවෙන් වඤ්චාකෙරෙම් සිතා රජ්ජුරුවන්වහන්ස අද මම නක්ෂත්‍රයෝගයක් පරීක්ෂාකොට සිටියෙමි. ඒ නක්ෂත්‍රමුහුර්තයක් ලදින්නම් තුඹවහන්සේට බොහෝ අඹ ගෙණවුත් දෙන්නෙම්වේදැයි කීය. එබස් අසා රජ්ජුරුවෝ මානවකය පෙර තෝ මෙතෙක් දවස් නක්ෂත්‍රයෝගයක් ලත් කල අඹඵල ගෙන්වාගණිම් නොකියන්නේය. මීට කාරණා කිමෙක්දෝහෝයි විචාරන්නාහු රජ්ජුරුවෝ මානවකය පෙර තෝ නක්ෂත්‍රයෝගයකුත් නොකියන්නෙහි නක්ෂත්‍ර මුහුර්තයකුත් නොකියන්නෙහිය. වර්ණයෙන් ගන්ධයෙන් රසයෙන් යුක්තවූ බොහෝ අඹ ගෙණවුත් දෙන්නෙහිය. මානවකය පෙරත් තව මන්ත්‍ර පිරවීමෙන් බොහෝ අඹ පලගත්තේය. එසේ මන්ත්‍රය පිරුවා අඹ පලගන්වන්නාවූ තෝ අදවූකල් කිසිවක් කොටගන්ට අසමර්ථවූයෙහිය. තාගේ මේ ස්වභාව කෙසේවූ ස්වභාවෙක්දැයි විචාළාහ. එබස් අසා මානවකයා රජ්ජුරුවන්වහන්සේ බොරුවෙන් වංචාකරන්ට නොපිළිවන් වන්නේය. මා විසින් ස්වභාවයම කීකල්හි රාජආඥා කරණසේක්වීනම් කොට පියනසේක. ඇත්තක්ම කියම් සිතා මහරජ්ජුරුවන්වහන්ස චණ්ඩාල පුත්‍රයෙක් දැහැමෙන් සෙමෙන් නොසඟවා ඇතිසැටියේ මට මන්ත්‍රය දීන. කොයිකෙණෙකුන් විසින් විචාරණලද්දවූ නමුත් තෝ මාගේ නාමගෝත්‍රය නොසඟව,

ඉදින් මාගේ තම්ගොත් සැගවූයේ වීනම් මන්ත්‍රය හැර පලායන්නේයයි මන්ත්‍රය නස්නාවූ ස්වභාවයද මට කීයේය. මහරජ්ජුරුවන්වහන්ස නුඹවහන්සේ විසින් මහජනයා මධ්‍යයෙහි විචාරණලද්දාවූ මම මකු ගුණෙන් මඩනාලදුව මේ මන්ත්‍රය සඟවා ඉදින් මාගේ බ්‍රාහ්මණ මහාසාරයක්හුගෙන් උගතිමි කියා බොරු කීමි. ඒ මා විසින් කියන්නාවූ බොරු නිසා මන්ත්‍රය නටුයේය. නටුවාවූ මන්ත්‍රය ඇති මම දූත් බැගෑව හඬමි කීහ.

එබස් අසා රජ්ජුරුවෝ මේ ලාමක වූ ස්වභාව ඇති මානවකයා මෙබඳු රත්නයක් නොබැලයේය. මෙබඳු උත්තම රත්නයකුත් ලත්කල්හි ජාතිය කමක් කෙරේදැයි කිපී කියන්නාහු එඬරු බමුරු ආදීවූ කොසොඹ එරබදු යම් කිසි වෘක්ෂයකින් මීයෙන් ප්‍රයෝජන විඳිනා සත්ත්වතෙම මී ලද්දේවීනම් වෘක්ෂ යම මී කැමැත්තාවූ පුරුෂයාහට උතුම් වන්නේයයි එසේහෙයින් ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍ර චණ්ඩාලාදීවූ යම් කිසි සත්ත්වයක්හු සමීපයෙන් යමෙක් ධර්‍මයෙක්වත් ධර්‍ම නිශ්‍රිතවූ කාරණයක්වත් යුක්තියක්වත් මන්ත්‍රයක්වත් උගත්තේ වීනම් ඔහට ඒ තෙම උත්තම පුරුෂ වන්නේය. එසේහෙයින් යම්බඳු ඒ පුරුෂයා දුකසේ ලබනලද්දාවූ උතුම් වූ මන්ත්‍රය අධික මානයෙන් නසාපීදැයි එසේවූ අසත්පුරුෂයාගේ සර්‍වස්වයහරාදී වශයෙන් කොල්ලකා උනපත්තෙන් දෙපත්ත හසුකොට පත්තේ පොත්ත පත්කට යතලෙස තලා සම් උපුටවා වධකොට බොටුව අල්වා නුවරින් පිටත්කරවා මෙසේවූ අසත්පුරුෂයා මේ නුවර විසීමෙන් කවර ප්‍රයෝජනදැයි කෝප කළහ. රාජපුරුෂයෝ එබස් අසා ඔහට කළමනා වධකොට තාගේ ආචාරීන් සමීපයට ගොස් උන් සිත්ගෙණ මන්ත්‍රය ලදහොත් නැවත මේ නුවරට එන්ට සිතිවිලි කරව ඉදින් මන්ත්‍රය නොලදහොත් මේ දිසාවත් නොබලවයි කියා ඔහු නැතිගැන්වූහ. ඒ මානවකයා අනාථ අසරණව සිතන්නේ ආචාරීන් වහන්සේ හැර මට අන්පිළිසරණක් නැත්තේය. උන්වහන්සේ සමීපයට ගොස් උන් සිත්ගෙණ නැවත මන්ත්‍රය ලදහොත් නැවත මන්ත්‍රය ඉල්වාගණ්මියි සිතා අඬමින් වලපමින් බෝධිසත්ත්වයන් වසන්නාවූ චණ්ඩාලග්‍රාමයට ගියේය.

ඉක්බිත්තෙන් එන්නාවූ ඔහු දැක මහබෝසතාණෝ භාර්‍යාව කැඳවා කියන්නාහු සොඳුර ඒ පවිටු පුරුෂයා මන්ත්‍රයෙන් පිරිහී නැවත එන්නාවූ බලවයි කීහ. මෙසේ බෝධිසත්ත්වයන් කියමින් ඉන්දදීම ඒ මානවකයා බෝසතාණන්කරා අවුත් වැඳ එකත්පස්ව උන්නේය. කුමක්නිසා ආයිදැයි මහ බෝසතාණන් විචාළකල්හි, ආචාරීන්වහන්ස බොරු කියා ආචාරීන් ප්‍රත්‍යාඛ්‍යානය කොට මහත්වූ විනාශයට පැමිණියෙමි කියා තමාගේ වරද බෝධිසත්ත්වයන්ට කියා නැවත මන්ත්‍රය ඉල්වන්නේ මෙසේ කීය. ආචාරීන්වහන්ස යම්සේ සත්ත්වයෙක් විසමතැන් සමකොට සිතමින් එක් වළෙක දූදරෙක නරාවලක නරක ප්‍රපාතයෙක වැටේද දණ්ඩෙක උලෙක යන සංඥයෙන් කෘෂ්ණ සර්පයෙකු පසින් මඩීද ගින්නෙහි පය තබාද එපරිද්දෙන්ම මමත් ප්‍රඥචක්ෂුස නැතිව අන්ධත්වයෙන් නුඹවහන්සේ වංචාකොට කීමෙන් අපරාධකෙළෙමි එසේ අපරාධ කොට මන්ත්‍රයෙන් පිරිහුනාවූ මම ප්‍රඥසම්පන්නවූ නුඹවහන්සේ නැවත පැහැද මට මන්ත්‍රය දුනමැනවැයි යාච්ඤාකෙළේය. එබස් අසා මහ බෝසතාණෝ කියන්නාහු දරුව තෝ කුමක් කියයිද, අන්ධවූ සත්ත්වයා කියන ලද සංඥවෙන් එප්වල ආදී වලහා යන්නේය. මා විසින් පළමුකොටම තට කියනලද්දේ නොවේදැයි දූත් කුමක් නිසා මා සමීපයට ආයිදැයි කියා මානවකයා නොසතුටුව කියන්නාවූ බෝධිසත්ත්වයෝ මෙසේ කීහ.

මාතවකය මම තාගේ රත්රන් ආදීවූ දෙය ආචාරිභාගයත් තොගෙණ දූහැ මෙන් මන්ත්‍රය දිනිමි. නොයිත් මට කිසිවක් නොදී දූහැමෙන්ම මන්ත්‍රය උගත් තෙණීය. ආචාරීන් ප්‍රත්‍යඛ්‍යානය කළහොත් මන්ත්‍රය සිත නොනිබී අපවත් වන්නෙහියයි මන්ත්‍රයේ තත්ඣය තට කීමි. ඉදින් තෝ සත්පුරුෂ ධර්මයෙක පිහිටියෙහි වීනම් මන්ත්‍රය තා හැර පළා නොයන්නේය. අඥතය තෝ දූකසේ ලබනලද නොලැබහැක්කාවූ මේ මන්ත්‍රය බොරු කියා නසාපීය. තා නුවණ නැතිහෙයින් අද මහත්වූ විනාශයට පැමිණියෙහිය. අඥනවූ මුසවූ අකෘතඥවූ බොරු කියන්නාවූ කායවාක් සමාචාරයෙක් නැත්තාවූ එබඳු සත්ඣයාහට අපි මන්ත්‍ර නොදෙන්නම්හ. තා අසත්පුරුෂ හෙයින් දූක්මත් මට අභිප්‍රා නොවෙයි. තට දෙන මන්ත්‍රයෙක් නම් නැත්තේය. කැමති යම් තෙනකට පළායවයි කියා අවසර දුන්නාහ. ඒ මාතවකයා මෙසේ ආචාරීන් විසින් යවනලද්දේ මට ජීවිත යෙන් ප්‍රයෝජන කිම්දූයි වලට වැද අනාථ මරණින් මෙළේය.

ශාස්තෘවූ බුදුරජාතන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි දූන් මතු නොවෙයි. පෙරත් දේවදත්තස්ථවිරයෝ ආචාරීන් වලහා මහත්වූ විනාශයට පැමිණියෝ වේදූයි වදාරා අඹ ජාතකය නිමවා වදාළසේක.

“එසමයෙහි මානවකයා නම් දූන් මේ දේවදත්තස්ථවිරයෝය. රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝය. එසමයෙහි චණ්ඩාලව උපන්නෝ නම් තිලෝ ගුරු සම්‍යක් සම්බුදුවූ මම්ම වේදූ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

467
ඵන්දන ජාතකය

තවද එක් සමයෙක්හි ත්‍රිභුවන ශේකරවූ තිලෝගුරු බුදුරජාතන් වහන්සේ රෝහිණී ගංතෙර වැඩහිඳ නෑයන්ගේ කලහයක් අරභයා මේ ජාතකය වදාළසේක. මෙතැන්හි වර්තමාන කථාව කුණාල ජාතකයෙහි මතු පහළවන්නේය. එසමයෙහි සර්වඥයන්වහන්සේ නෑයන්ට ආමන්ත්‍රණය කොට වදාරණසේක් මහරජ්ජුරුවෙනි,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි පිටිනුවර වඩුගමෙක් වූයේය. එහි එක් බමුණු වඩුවෙක් වලින් දඹු ගෙණවිත් රථ ඉදිකොට ජීවත්වන්නේය. එසමයෙහි හිමාලවන සමීපයෙහි මහත්වූ කොලොම්ගසක් වූයේය. එක් වලසෙක් ගොදුරු සොයා යමින් ඇවිදිනේ ඒ ගසමුල වැදහොත්තේය. ඉක්බිත්තෙන් එක් දවසක් මහත්වූ පවන් හමනට පටන්ගත් කල්හි එක් වියලි දණ්ඩක් බිඳී වැටෙන්නේ වලසාගේ පිටිකර වැටී තැළින ඒ වලසා බොටුව තැළීගිය හෙයින් භයින් ත්‍රාසනාව නැඟීසිට මදක්තැන් දිව නැවත සාරකැවී සිට තමා ආවාවූ මාර්ගය බලන්නේ කිසිවක් නොදක අන්‍යවූ සිංහයෙක්වත් ව්‍යාඝ්‍රයෙක්වත් මා පසුපස්සේ ලුහුබඳවාගෙණ එන්නේ නැත. මේ වෘක්ෂයෙහි අධිගෘහිත දේවතාවා මෙතන වැදහෝනා නොකමැත්තේයයි සිතමින් වන් නාට රට නිගණ්ඩ දනිමි සිනා අසථානයෙ වෛර බැඳ කොළොම් රුක සොඳු පිටත් පැහැර දේවතාවාගේ වෘක්ෂයෙන් පතකුත් නොකැමි අත්තකුත්

නොබිත්දෙමි අවශෙෂවූ සිංහ ව්‍යාඝ්‍රාදීවූ මෘග සූකර පසු ජාතීන්ගෙන් වෙසෙන්නා කැමැත්තෙහිය. මා මෙතන වැදහෝනා නොකැමැත්තෙහිය. මාගේ ශ්‍රෙෂ කවරේද අත් කීපදවසකින් තාගේ මුල් සහිතවූ රුක උදුරුවා කඩකඩකොට කපාපියම් වෘක්‍ෂදේවතාවා තැතිගන්වා ගියේය. බමුණු වඩුද මිනිසුන් කීපදෙනෙකු ඇරගෙණ රථයට නිසිවූ දඬු නිසා යානාවකින් එක් ප්‍රදේශයකට පැමිණ එක්තෙනක යානාව තබා වෑ පොරෝ ගත් අත් ඇතිව රථයට නිසිවූ දඬු පරීක්‍ෂාකෙරෙමින් කොලොන්රුක සමීපයට ගියේය. වලස් ඔහු දැක අද මා විසින් පසමිතුරාගේ පිට් දකින්ට වටනේයයි ගොස් කොලොන් ගසමුල සිටියේය. වඩුවාද ඈත මෑත බලමින් කොලොන්රුක සමීපයට නික්මුනේය.

ඒ වලසා යම්තාක් මේ වඩුතෙමේ මේ රුක ඉක්ම නොව යන්නේය. ඊට පළමුකොට ඔහට කියමියි සිතා පොරෝ ගත් අත් ඇතිව පුරුෂයෙක් මේ වනයට වැද සිටිනේය. මා විසින් විචාරණලද්දාවූ තෝ මට නොවලහා කියවයි මේ වනයෙන් කුමන දණ්ඩක් කැමැත්තෙහිදැයි විචාළේය. බමුණුවඩුවා පින්වත් වලසානෙනි ඉතා ආශ්චර්‍යයියෙක් වන්නේය. මීට පළමු ඒකාන්ත යෙන් වලසකු මනුෂ්‍යභාෂාවෙන් කථාකරන්නා දුටුවිරූ නැත්තේය. මේතෙම රථයට සුදුසු දඬු ලබන්නේය. මොහු අතින් විචාරම් සිතා සබඳ කාලසිංහය තෝ මේ විසම් වනයෙහි ඇවිදිනෙහිය මා විචාරණලද්දාවූ තෝ කියව රථයෙහි නිම්වලල්ලට කෙසේවූ දඬු තරම්දැයි විචාළේය. එබස් අසා වලස්තෙම මෙසින් මාගේ මතදෙල මූදුන් පැමිණෙන්නේයයි සිතා පින්වත්වූ පුරුෂය රථයෙහි නිම්වලල්ලට සල්ගසුත් සුදුසු නොවෙයි. කිහිරි මූරු තඹල ගසුත් සුදුසු නොවෙයි. කොලොම්දඬු සුදුසුවන්නේය. නිම්වලල්ට ඉත තරවන්නේයයි කීහ. එබස් අසා වඩුවා සොම්නසට පැමිණ ඒකාන්තයෙන් අද යහපත්වූ දවසක වනයට වනිම්යි සිතා තිරශ්චීනයෙක් රථයට සුදුසුවූ දඬු කියන්නේ ඉතා යහපතැයි විචාරන්නේ සතුටුව ඒ තොප විසින් කියනලද්දාවූ කොලොම්රුක කෙබඳුවූද කොලොම්රුක හැඳිනගණුමෝ නම් එපරිද්දෙන්ම මා විසින් විචාරණලද්දාවූ තෝ තඹු පරිද්දෙන් කියවයි කීහ.

ඉක්බිත්තෙන් ඔහට කියන්නාවූ වලසා යම් ගසක අතු එළි තිබේද නැමේද නොබිඳේද ඒ රුක කොලොම් නම් වෙයි. මේ කොලොම් දඬු රථදැවිය ටද සක්නැබට නිම්වලල්ටද රථයටදැයි සියල්ලටම කැපිම තැලීම ආදී වශයෙන් කම්ක්‍ෂම වන්නේයයි කියා මෙසේ කීය. වලසා සතුටුවූ සිත් ඇතිව සිටියේයයි වඩුවාත් ගස කපන්නට පටන්ගත් කල්හි එකෙණෙහි වෘක්‍ෂදේවතාවා සිතන්නේ මා විසින් මොහු ඇඟ කිසි දණ්ඩක් පතෙක් නොඑලන කලද මේ අසථානයෙ වෛර බැඳ මාගේ විමානය නසන්නේයයි කියා ඒ විමානය නට කල්හි මමත් නැසීම්. එසේහෙයින් එක් උපායකින් මිනිසුන් ලවා මොහු නසව පියම්යි සිතා වෘක්‍ෂදේවතාවා වනයේ ඇවිදින පුරුෂයකු මෙන් ඔහු සමීපයට අවුත් විචාරන්නේ පින්වත්වූ පුරුෂය තා විසින් යහපත්වූ වෘක්‍ෂයක් ලබනලද, මේ ගස කපා කුමක් කරන්නෙහිදැයි විචාළේය. රථයෙහි නිම්වලල්ලට කෙරෙම්යි කීකල්හි මේ වෘක්‍ෂයෙන් රථ කරන්නට තොපට කීවෝ කවුරුදැයි විචාළේය. එක් වලසකු විසිනැයි කීකල්හි මේ රුකින් රථකිරීම යහපතැයි කියන්නාවූ වලසා විසින් කී නියාව ඉතා යහපත් වන්නේය. වලසාගේ වනාහි කර සම උපුටාගෙණ සතලක් පමණ තැනයෙ පටන් බැන්දක් මෙන් නිම්

වලල්ල වටකොට සදලු කල්හි නිම්වලල්ල ඉතා ස්ථිර වන්නේය. බොහෝ වස්තු ලබන්නෙහිදැයි කීය. වලස්සම් කෙලෙස ලබම්දැයි කීකල්හි රුක්දෙවී කියන්නේ කිමෙක්ද නුවණැත්තෙහිද මේ රුක වූ කල්හි වනයෙහි පිහිටි බැවින් අන්තැනකට පලා නොයන්නේය. තෝ වූකලී මේ රුක රථයට යහ පතැයි යමක්හු විසින් කියනලද්දේවීනම් ඔහු සමීපයට ගොස් ස්වාමීනි නුඹ වහන්සේ විසින් දක්වනලද වෘක්ෂය කෙබඳු ස්ථානයකදී කපම්දැයි විචාකොට කැඳවාගෙණ වර, ඉක්බිත්තෙන් ඔහු සැකයක් නැතිව ආවාහු මෙතනදී කපවයි කියා හොස්ස දික්කොට කියන තැනැත්තහු සියුම් මුවහත් ඇති මහ පොරවකින් ඉස හා එක්කොට ඇන ජීවිතක්ෂයට පමුණුවා සම ඇරගෙණ උතුම්වූ මස් අනුභවකොට ගස කපාගණුවයි කියා වෛර පාකොට ගියේය වඩුවා රුක්දෙවියාගේ වචනය අසා අද මට මඟුල් දවසෙකැයි සතුටුව වලස් මරා කොලොම්ගසක් කපාගෙණ තමා වසන තැනටම ගියේය.

මේ කාරණය ප්‍රකාශකොට දක්වා වදාරා ශාක්‍ය කෝලිය රජදරුවන්ට අවවාද වදාරන්නාවූ සර්වඥයන්වහන්සේ වලසා කොලොම්ගස රුක්දෙවියා කෙරේ වෛරබැඳ ගස කපන්ට කීය. රුක්දෙවියා මා වසන්නාවූ විමානය නිෂ්කාරණයේ කප්පවා නසන්ට කාරණා කවරේදැයි වලසා කෙරේ වෛරබැඳ ඔවුනොවුන් හා නැසූද, එපරිද්දෙන් මනුෂ්‍යයන් අතුරෙන් යම් කෙණෙක් යම් කෙණෙකුන් සමග විවාද කළෝවීනම් ඔවුනොවුන්ට ජාත්‍යාදියෙන් සටා බැණ තමන්ගේ අඩුව අනුන්ට ප්‍රකාශකරණ හෙයින් මොනර නැටුන් නටන්නවුන් හා සමාන වන්නාහ. එසේහෙයින් මෙතනට රැස්වූ තොප ඇමදෙනාට වැඩෙක් වේවයි සමගිසතුටුව වාසයකරන්ට උවමැනවැයි කොලොම්ගස හා වලසුන් සේ නොවවයි අවවාද කියා නැවත වදාරණසේක් ශාක්‍ය කෝලිය රජදරුවෙනි තෙපි හැම සමගිව ස්ථිරකරව මේ සමගි බව ප්‍රඥාවෙන් වැඩියාවූ නුවණැත්තාවුන් විසින් පසස්නා ලද්දේය. සමගි බව නම් නිර්වාණපුරයට සැපසේ ගෙණ ගොස් පමුණුවන්ට සුදුසු රථයානාවක් හා සමානවන්නේය. එසේහෙයින් සුචරිත ධර්මයෙහි පිහිටියාවූ සත්වතෙම නිර්වාණයෙහිත් නොපිරිහෙන්නේයයි නිර්වාණ ධර්මදේශනාවෙහි කුළුගැන්වූසේක. රජ්ජුරුවෝ ධර්මදේශනාව අසා සමගිවූහ. ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා, වදාරා **ඵන්දන ජාතකය** නිමවා වදාළසේක. එසමයෙහි ඒ කාරණාව ප්‍රත්‍යක්ෂකොට දැක ඒ වනලැහැබ විසූ දේවතාවා නම් තිලෝගුරු බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

468
ජවනහංස ජාතකය

තවද එක්සමයෙක්හි ශාක්‍යකුල කල්ප ද්‍රැමවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසන සමයෙහි **දළ්හධම්මසූත්‍ර** දේශනාව අරභයා මේ ජාතකය දක්වනලද.

ඒ කෙසේ ද? යත්

මහණෙනි ධනුස්ශිල්පයෙහි ඉතා දක්ෂවූ කෘතහස්තවූ දැඩි දුනුගත්තාවූ දුනුවායෝ සතරදෙනෙක් සතරදිග සිටියාහු වෙද්ද එකල්හි පුරුෂයෙක් මම කෘතහස්තවූ දුනුවායන් සතරදෙන සතරදිගට ඊදඬු සතරක විදපු කල්හි

බිම්වැටෙන්ට පළමුකොට ඇරගෙණ එම්යි ආයෙහිවීනම් මහණෙනි තෙපි ඒ කිමෙකැයි සිතවූද, ජවසම්පන්නවූ ඒ පුරුෂතෙම උත්කෘෂ්ට ජවයෙන් සමන්විත වූයේයයි කියන්ට සුදුසුදැයි විචාළසේක. එසේය ස්වාමීනි අක්ෂණවේදී ආදී චතුර්විධ ධනුර්ධරයන් සතරදෙනා එකවිට ඔවුනොවුන්ට පසුනොව පෙරටුව සතරදිගට විදිනාලද්දාවූ ඊදඬු සතර යම් ජවසම්පන්න පුරුෂයෙක් බිම්වැටී යානොහී ගෙණවිත් ධනුර්ධරයන් පාමිට තබාලන්නා වීනම් ඒ පුරුෂයාගේ ජව ඉතා ශීඝ්‍රවන්නේයයි කීහ. එවිට සර්වඥයන්වහන්සේ වදාරණසේක් මහණෙනි යම්බඳුවූ ධනුර්ධරයන් විසින් විද්දාවූ ඊදඬු සතර ගන්නාවූ පුරුෂයාගේ ජව ඉතා ශීඝ්‍රද ඊට වඩා චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනාගේ ජවය ඉතා ශීඝ්‍රවන්නේය. ඒ පුරුෂයාගේ ජවය හා ඒ චන්ද්‍ර සූර්‍ය්‍යයන්ට පෙරටුව යාම දේවතාවෝ දුවන්නාහ. එහෙයින් යාම දේවතාවන්ගේ ජව චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ ජවයට වඩා ඉතා ශීඝ්‍රවන්නේය. ඒ පුරුෂයන් හා චන්ද්‍ර සූර්‍ය්‍යයන් හා යාම දේවතාවන්ගේ ආයුසංස්කාරය වහා ගෙවීයන්නේය. එසේහෙයින් මහණෙනි කුසලකරණයෙහිත් භාවනා මනස්කාරයෙහිත් අප්‍රමාදව මෙසේ හික්මිය යුත්තේයයි වදාළසේක.

මේ සූත්‍රය වදාළ දෙවෙනි දවස් ධර්මසභා මණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂූන්වහන්සේ කථාවක් උපදවනසේක් ඇවැත්නි බුදුහු තමන්වහන්සේගේ බුද්ධවිෂයෙහි සිට මේ සියලු සත්වයන්ගේ ආයුසංස්කාරය ස්වල්පකොට ප්‍රකාශකොට වදාරණසේක් පෘථග්ජන භික්ෂූන් අතිශයින් සංසාරභීතින් භයපත්වනසේක. සර්වඥයන්වහන්සේගේ බුද්ධ මහිමයක් යහපත් නියායයි මෙසේ වූ කථාවක් උපදවා උන්සේක. බුදුරජානන් වහන්සේ තුන්තරා ගමනින් එක්තරා ගමනකින් ධර්මසභාමණ්ඩපයට වැඩ පණවනලද බුද්ධාසන මස්තකයෙහි හිඳ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි මහණෙනි යම්බඳුවූ මම දැන් සර්වඥතාඥානයට පැමිණ ආයුසංස්කාරය ස්වල්ප නියාව ප්‍රකාශකොට වදාරා ධර්මදේශනා කෙළෙම් වීම්නම් ඒ තෙම ආශ්චර්‍ය්‍ය නොවන්නේය. මේ පරමායුසින් අහේතුකවූ හංස යෝනියෙහි ඉපද ආයුසංස්කාරය ස්වල්ප නියාව දක්වා බරණැස් රජ්ජුරුවන් ප්‍රධානකොට ඇති සියලු රාජපර්ෂද සංවේගයට පමුණුවා ධර්මදේශනා කෙළෙම් වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝධිසත්වයෝ ජවනහංස යෝනියෙහි ඉපිද අනූදහසක් හංසයන් පිරිවරණලද චිත්‍රකූට පර්වතයෙහි වසන්නාහ. බෝධිසත්වයෝ එක්දවසක් ජම්බුද්වීපයෙහි එක් විලෙක සහපිරිවරින් ගොස් සයංජාත ඇල් අනුභවකොට ආකාශයෙන් රන්කලාලක් අතුරන්නාසේ මහත්වූ පිරිවරින් බරණැස්නුවරට මතුමත්තෙන් මද වූ විලාස ගතියෙන් චිත්‍රකූට පර්වතයට යන්නාහ. එකල බරණැස් රජ්ජුරුවෝ බෝධිසත්වයන් දැක මුනුත් මා හා සමානවූ රජ්ජුරුකෙණෙකුන් වියයුතුයයි අමාත්‍යයන්ට කියා බෝධිසත්වයන් කෙරෙහි ස්නෙහ උපදවා, මල්ගඳවිලවුන් ගෙන්වා මහබෝධිසත්වයන් බලබලා සිට ආතත විතතාදී පඤ්චාංගික තූර්‍ය්‍යනාදයෙන් පූජාකළාහ. මහබෝසතානෝ ඒ රජ්ජුරුවන්

තමන්ට සත්කාර කරන්නවුන් දැක හංසයන් අතින් විචාරන්නාහු රජ්ජුරුවෝ මට මෙබඳුවූ සත්කාරයන් කරණ තැනැත්තෝ මාගෙන් කුමක් ප්‍රාර්ථනා කෙරෙද්දැයි විචාළාහ. ස්වාමිනි නුඹවහන්සේ හා සමග මිත්‍රබව කැමතිසේකැයි කීකල්හි එසේවීනම් රජ්ජුරුවන්ගේ හා අප හා සමග මිත්‍රබව වේවයි කියා රජ්ජුරුවන් හා සමග මිත්‍රධර්මය පිහිටුවා ගියාහ. ඉක්බිත්තෙන් එක්දවසක් රජ්ජුරුවන් උයනට ගියකල්හි තුමූ අනවතප්තවිලට ගොස් එක් පියාපතකින් පැන් හා එක් පියාපතකින් සඳුන්සුනු හා ගෙණවිත් රජ්ජුරුවන් පැතින් නහවා සඳුන්සුනු ශරීරයෙහි ගල්වා මහජනයා බල බලා සිටියදීම සහපිරිවරින් චිත්‍රකූට පර්වතයට ගියාහ.

එතැන්පටන් රජ්ජුරුවෝ බෝධිසත්වයන් දක්නා කැමතිව මාගේ යාළුවානෝ අදඑති අදඑති කියා පෙරමග බල බලා හිඳිනාහ. එසමයෙහි බෝධිසත්වයන්ගේ මල්වූ හංසපෝතකයෝ දෙදෙනෙක් ඉරු හා සමග දිවම්හයි මන්ත්‍රණයකොට බෝධිසත්වයන්ට අපි ඉරු හා සමග දිවම්හයි කීහ. බෝධිසත්වූ කියන්නාහු දරුවෙනි තොපි ඉරු හා සමග දිවන්ට අසමර්ථයව අතරතුරෙහිම නැසීයව. එසේ හෙයින් නොයවයි කියා වැලකූහ. හංසපෝතකයෝ දෙදෙන දෙවෙනිව තුන්වෙනිවත් ඉරු හා සමග දිවම්හයි බෝධිසත්වයන්ට යාච්ඤා කළහ. බෝධිසත්වයෝ දෙවෙනිව තුන්වෙනිවත් නොකළමනා දෙයයයි වැලකූහ. හංස පෝතකයෝ දෙදෙන තදගමින් ඇති හෙයින් තමන්ගේ බල නොදැන බෝධිසත්වයන්ට නොකියාම ඉරු හා සමග දිවම්හයි කියා ඉරු නැගෙන්නට පළමුකොටම ගොස් යුගඳුරු මුදුනෙහි උන්හ. මහබෝසතානෝ ඔවුන් දෙදෙනා නොදැක කොහිගියාද්දෝහෝයි විචාරා එපවත් අසා සිතන්නාහු මාගේ මල්වූ දෙදෙන ඉරු හා සමග දිවන්ට අසමර්ථයහ අතුරෙහි නස්නාහ. උන්ට ජීවිතදානය දෙමි සිතා ගොස් යුගඳුරු මුදුනෙහි උන්හ. මහබෝසතානෝ ඔවුනොවුන් දෙදෙන දැක තොප නිසා ආමි කියා හිරුමඬල නැගිකල්හි හංස පෝතකයෝ දෙදෙන ආකාශයට පැනනැගී හිරු හා සමග දිවන්ට පටන්ගත් කල්හි මහබොසතානෝත් ඉරු හා සමග දිවන්ට පටන්ගත්හ. ඔවුන් දෙදෙන අතුරෙන් ඇමට බාල මලනුවෝ පෙරවරුයෙන් භාගයක් දිව ආසන්නව ගියාහ. පියාසඬිවල ගිනි නැගෙන්නාවූ කලක් මෙන් වූයේය. ඒ මලනුවෝ බෝධිසත්වයන්ට ස්වාමීනි බැනන්වහන්ස දිවගත නොහමි කීහ.

එසඳ බෝසතානෝ මලඬ තොපි භය නොගණුව. තොපට ජීවිත දානය දෙමි කියා මැදිරියෙහි ලාගෙණ අස්වසාලා චිත්‍රකූට පර්වතයට ගෙණගොස් හංසමධ්‍යයෙහි පිහිටුවා නැවත දිවගෙණ ගොස් හිරු කරා පැමිණ දෙවනුව මලනුවන් හා සමග දිවූහ. ඒ මලනුවෝත් මධ්‍යාහ්න වේලා දක්වා හිරු හා සමග දිවන්ට අශක්ති වූහ. පක්ෂ සඬිවල ගිනි ඇවිලෙන්නාක් මෙන් දැහ වැදගත්තේය. ඉක්බිත්තෙන් බෝධිසත්වයන්ට කියන්නේ බැනන්වහන්ස දිවගත නොහෙමි මා රැකගත මැනවැයි කීහ. එබස් අසා මහබෝධිසත්වයෝ පළමු පරිද්දෙම්ම අස්වසා පියා මැදිරියෙන් ගෙණ චිත්‍රකූට පර්වතයටම ගෙණගියාහ. එකෙණෙහි හිරුමුදුනට පැමිණියේය. ඉක්බිත්තෙන් මහබෝසතානෝ අද මාගේ ශරීර බලය පරීක්ෂාකෙරෙමි සිතා එකවේගයෙන් දිව යුගඳුරු මුදුනේ හිඳ එයින් නැගී එක වේගයෙන් ඉරුකරා පැමිණ කලෙක ඉරුට පෙරත්තුව දිව කලෙක ඉරුට පසුව දිව සිතන්නාහු ඉරු හා සමග දිවීම ව්‍යර්ථ වන්නේය. නුනුවණින් උපදවා ගත්තාවූ ජවයෙක් වන්නේය. මේ ජවයෙන් ප්‍රයෝජන

කීත්ද බරණැස්නුවරට ගොස් මාගේ යහළු රජ්ජුරුවන්ට අතීයෙන් බම්යෙන් යුක්තවූ කථාකෙරෙමින් එම් සිතා බෝසතානෝ හිරු හා දිවන ගමන් වළකා ඉරුමුදුණෙන් පහනොවනතුරු සියලු සක්වළ කෙලවරින් කෙළවර සිසාරා දිව වේගයෙන් පිරිහෙලා නැවත සියලු දඹදිව කෙළවර සිසාරා දිව බරණැස්නුවරට පැමිණියාහ දෙළොස් යොදුන් සියලු නුවර හංසයන්ගෙන් ගැවසීගත්තාක්මෙන් විය. කිසි සිදුරක් නොපැණුනේය. ක්‍රමයෙන් වේග පිරිහෙන්ට පටන්ගත් කල්හි ආකාශය සිදුරු පෙණුනේය. මහබෝසතානෝ වේග පිරිහෙලා ආකාශයෙන් බැස සිවුමැදුරු කවුළුව අභිමුඛයෙහි සිටියාහ. රජ්ජුරුවෝ බොධිසත්වයන් දැක මාගේ යහළුවානෝ අවුයයි සොම්නසට පැමිණ බොධිසත්වයන් ඉඳිනට සවණ්පීඨයක් පණවා සබඳ හංස රජ්ජුරුවෙහි මාලිගාවට වැද මේ සවණ් පීඨයේ හිඳුව. තොපගේ දැක්ම මට ඉතා ප්‍රිය වන්නේය. මෙතනට පැමිණියාවූ තොපි මාගේ සියලු වස්තුවට නායකවෙව. එසේහෙයින් මාගේ රාජභවනයෙහි යම්කිසි වස්තුවෙක් ඇත්නම් ඒ සියල්ලම සැක නැතිව මට කියා අරගණුවයි කීහ.

එබස් අසා මහබෝසතානෝ මාලිගාවට වැද සවණ්පීඨයේ උන්නාහ. රජ්ජුරුවෝ ශතපාක සහස්‍රපාක තෛලයෙන් බොධිසත්වයන්ගේ පියාඅතුරුමැඩ තෙල්ගා රන්තාටිටුවේ මී හා විලඳ ලා අනුභව කරවා ගකීරා පැන් පොවා මියුරු පිළිසඳර කථාකොට සබඳ හංසරජ්ජුරුවෙහි උදකාලාව කොයි සිට අවුදැයි විචාළාහ. එබස් අසා මහබෝසතානෝ සියළු ප්‍රවෘත්තිය විස්තර වශයෙන් කීහ. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ බොධිසත්වයන්ට කියන්නාහු සබඳ හංස රජ්ජුරුවෙහි මට හිරු හා සමග දිවූ වේගය දක්වයි කීහ. රජ්ජුරුවෙහි ඒ වේගය දක්වන්ට නොපිළිවනැයි කීහ එසේවීනම් මට ඉරු හා සමග දිවූ වේගය හා අල්පවේගයක් දක්වුව මැනවැයි කීහ. යහපත මහරජ සාදෘශ්‍ය මාත්‍රයක් දක්වමි. අක්ෂණවේදී ධනුර්ධරයන් රැස්කරවයි කීහ. මහබෝසතානෝ ඒ අක්ෂණවේදී ධනුර්ධරයන්ගෙන් ඇමටම නායකවූ සතරදෙනෙකු තෝරා ගෙණ මාලිගාවෙන් බැස රාජාංගනයේ ගල්ටැඹක් සිහිටුවා තමන් කර මිණියක් බඳවාගෙණ ගල්ටැඹ මත්තෙහි හිඳ දුනුවායන් සතරදෙනා ගල්ටැඹ වැනිර සතරදිගට මුණලා සිටුවා මහ රජ්ජුරුවන්වහන්ස මොහු සතරදෙන එකවිටම අභිමුඛව සිට ඊ දඬු සතරක් විදිත්වයි මම ඊ දඬු සතර බිමවැටිය නොදීම ඇර ගෙණ අවුත් මේ දුනුවායන් සතරදෙනා පාමුල එලාලම් මා ඊදඬු ගෙණෙන පිණිස ගියනියාව ගණ්ඨාර නාදයෙන් දත මැනවැයි මම වූකලී තොපට නොපෙණෙන්නෙමි කියා ඔවුන් විසින් එක පැහැර විදහාලද ශරයන් ගෙණවුත් ඒ දුනුවායන් පාමුල හෙලා ගල්ටැඹ මුදුනේ උන්නාවූ තමන් දක්වා මහ රජ්ජුරුවෙහි මාගේ වේගය දක්නා ලද්දේදැයි කියා නැවත මහරජ්ජුරුවෙහි මාගේ මේ වේගය උත්තමත් නොවෙයි මධ්‍යමත් නොවෙයි සවල්පවූ ලාමක වේගයක මහරජ්ජුරුවෙහි අපගේ සවභාව වේගය ඉතා ශීඝ්‍රවන්නේයයි කීහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ බොධිසත්වයන් අතින් විචාරන්නාහු සබඳ හංසරජ්ජුරුවෙහි තොපගේ වේගයට වඩා ශීඝ්‍රවූ අනික් වේගයක් ඇද්දැයි විචාළාහ. එසේය රජ්ජුරුවෙහි අපගේ උත්කෘෂ්ටවූ වේගයට වඩා සියක් ගුණයෙන් දහසක් ගුණයෙන් මේ සත්වයාගේ ආයුසංස්කාරය වහා ගෙවෙන්නේයයි බිඳෙන්නේයයි විනාශයට යන්නේයයි ක්ෂණික නිරොධ වශයෙන් රූප ධර්මයන්ගේ භෙදය දක්වූහ. රජ්ජුරුවෝ මහබෝසතානන්ගේ ධර්ම

කථාව අසා මරණභයින් භයවත්ව සිහි එලවාගත නොහී බිම වැටී උන්නාහ. මහජනයෝ තැතිගෙණ රජ්ජුරුවන්ගේ මූණ පැන් ඉස සිහි එලවූහ. ඉක්බිත්තෙන් මහබෝසතාණෝ මහරජ්ජුරුවෙනි තොපි නොබව මරණානුස්මෘති භාවනාකරව. දසකුසල කම්හෙහි හැසිරෙව. දානාදී පින්කරව. අප්‍රමාදව වාසයකරවයි අවවාද කළහ. එබස් අසා ස්වාමිනි හංස රජ්ජුරුවන් වහන්ස තුඹවහන්සේ වැනිවූ නුවණැති ආචාරී කෙණෙකුන් හැර විසිය නොහෙමි. චිත්‍රකූට පර්වතයට නොගොස් මට ධර්මදේශනා කෙරෙමින් මට අවවාද ආචාරීව මෙහිම විසුව මැනවැයි යාච්ඤාකරන්නාවූ රජ්ජුරුවෝ සබඳ හංස රජ්ජුරුවන් වහන්ස මේ ලෝකයෙහි සමහර සත්වකෙණෙක් සමහර සත්වකෙණෙකුන්ට මෙබඳු ගුණයක් ඇත්තෝයයි අසා බස්මාත්‍රයකින්ම ප්‍රියවන්නාහ. සමහර සත්වකෙණෙකුන් දැකුම් ප්‍රේමය අත්‍යන්ත වන්නේය. කන්ට ආචාවූ සක්ෂයකු මෙන්ම වැටහෙන්නේය. සමහර කෙණෙකුන්ට සමහර කෙණෙකුන් දැකත් අසාත් දෙසැටියෙම ස්නේහ උපදනේය. එසේහෙයින් හංසරජ්ජුරුවන් වහන්ස මම තුඹවහන්සේ අනින් විචාරමි. කිමෙක්ද? තුඹවහන්සේ මා දැක බලමන් ස්නේහ ඉපදවූසේක්ද? මම වූකලී තුඹවහන්සේගේ ගුණ ඇසීමෙන්ම ප්‍රියසේක. දර්ශනයට පැමිණීම ඉතා ප්‍රියසේක්මය. මට ප්‍රියවූ දැකුම් ඇති තුඹවහන්සේ චිත්‍රකූට පර්වතයට නොගොස් මෙතන මා සමීපයෙහි විසුවමැනවැයි යාච්ඤා කළහ.

එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු මහරජ්ජුරුවෙනි අපි තොපගේ ගෙයි නිරන්තරයෙන් උපස්ථාන විඳ සම්භාවනා කරණලද්දුව වසම්හ. තොපි වූකලී කිසිකලෙක සුරාමදයෙන් මත්ව මස්කන පිණිස හංසරජ්ජුරුවන් පිසව ගෙණෙවයි ඉදින් කිවු නම් එකල තොපගේ සේවකයෝ මා මරා ඉදින් පිසුවාහු වීනම් එකල මම කුමක් කෙරෙම්දැයි කීහ. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ එසේවීනම් මම රා නොබොමියි බෝධිසත්වයන්ට ප්‍රතිඥා දෙන පිණිස කියන්නාවූ හංස රජ්ජුරුවෙනි තුඹවහන්සේට වඩා මට යමෙක් ප්‍රිය වීනම් එබඳුවූ ආහාරපාන වර්ජයට නිතුවේවයි යම්තාක් තුඹවහන්සේ මාගේ ගෙයි වසනසේක් වීනම් මම ඒතාක් රා නොබොමි ප්‍රතිඥා දුන්හ.

ඒ අසා මහබෝසතාණෝ කියන්නාහු මහරජ්ජුරුවෙනි තිරශ්චීන සත්වයන්ගේ සිත වක්‍රයෙක් නැත්තේය. එසේහෙයින් පක්ෂීන් ආදිවූ තිරශ්චීනයන්ගේ වචනය මිනාව දතහැක්කේය. මනුෂ්‍යයෝ වූකලී වඩාවංකයහ. එසේ හෙයින් ඔවුන්ගේ වචනය නොදතහැක්කේය. යම් පුද්ගලයෙක් පළමුකොට සතුටුව තොපි මාගේ නෑ තැනැත්තෝය, මිත්‍රයානෝය, ජීවිතය සමානවූ යහළුවෝයයි මෙසේ සිතද්ද පසුව කල්යාමකින් එම තැනැත්තෝ සතුරුවන්නාහ. එසේහෙයින් මනුෂ්‍යයන්ගේ සිත එක්විටක එක් සිතක් හෙයින් නොදතහැක්කේය. මහරජ්ජුරුවෙනි යම් පුද්ගලයෙක්හු කෙරෙහි ප්‍රේමවශයෙන් සිතන්නේ නම් තෙමේ දුරවසන්නේ නමුදු සමීපයෙහි විසිවානම් වෙයි. උදක් සමීපයෙහිම නොවෙයි එක්ව විසුවා නම් පුද්ගලයෙක්හු කෙරෙන් සිත වෙන්ව පවතීනම් ඒ තෙමේ සමීපයෙහි වසන්නේ වී නමුත් දුරම වසන්නේනම් වෙයි. තවද මහරජ්ජුරුවෙනි යම් යහළුවෙක් ස්නේහයෙන් ප්‍රසන්නවූ සිත් ඇත්තේ වේද එතෙම ප්‍රසන්නවූ සිත ඇලුනු බැවින් සමුද්‍රයෙන් එපිට වසන්නේ වී නමුත් සමීපයෙහි විසුවානම් වෙයි. යම් සත්වයෙක් වෛෂයෙන් දුෂ්ටවූ සිත් ඇත්තේ වීනම් ඒ තෙම සිතින් නොඇලුනු බැවින් සමීපයෙහි වසන්නේ

වීනමුත් සමුද්‍රයෙන් එපිට විසුවානම් වෙයි. තවද මහරජ්ජුරුවන්වහන්ස යම් කෙණෙක් වෛරී නම් උඟ තුමූ එක්ව උන්නාහු නමුත් බැහැර විසුවානම් වෙති. සත්පුරුෂවූ ප්‍රඥවත්කෙණෙක් දුරුව වසන්නාවූ වීනමුත් මෛත්‍රියෙන් පරිභාවිත සිත ඇම්වේලෙහිම ගුණය සලකා ස්නේහ උපදවන බව හේතු කොට සමීපයෙහි විසුවාහුනම් වෙති. තවද රජ්ජුරුවෙනි ඉතා බොහෝ කලක් සමීපයෙහි විසීමෙන් පියවූ තැනැත්තෝත් අප්‍රියවන්නාහ. එසේහෙයින් යම් තාක් අපි නොපට අප්‍රිය නොවමෝනම් ඊට පළමුකොට දන්වා අපි වසන තෙනට යම්හයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු හංස රජ්ජුරුවන් වහන්ස මෙසේ දෙහොත් මුදුනෙහි තබා යාච්ඤා කරන්නාවූ අපගේ මේ නමස්කාරය ඉදින් නුඹවහන්සේ කටයුත්තකැයි නොසිතනසේක්වී නමුත් නුඹවහන්සේට කැමතිවූ අපගේ බස් ඇත්තෙකැයි නොගිවිස්නාසේක් වීනම් කලින් කලට මෙතනට එන පිණිස යාච්ඤා කරම්හයි කීහ.

එබස් අසා මහබෝසතානෝ කියන්නාහු මහරජ්ජුරුවෙනි තොපි සැක යක් නොකරව. ඉදින් අප දෙදෙන ඔබූනොබූන් කෙරේ බලවත්වූ මෛත්‍රිය ඇතිව වසන්නවුන්ට ජීවිත අන්තරායෙක් නොවේනම් අපි දෙදෙන ඔබූනොබූන් දුටුමෝනම් යහපත්වන්නේය. එතකුදුවූවත් තෙපි මා දුන් අවවාදයම තමාගේ තනතුරෙහි තබා මෙසේ සවල්පවූ ජීවත්වීම ඇති ලෝකයෙහි අප්‍රමාදව දනාදීවූ පින්කම් කිරීමෙන් දශරාජධර්මය අකෝප්‍යකොට දැහැමින් රාජ්‍යයකොට වසව. එකල්හි මාගේ අවවාදය කරන්නාවූ තෙපි මා දක්නා නම් වෙයි කියා මෙසේ මහබෝසතානෝ රජ්ජුරුවන්ට අවවාදකොට චිත්‍රකූට පර්වතයට ගියාහ. ශාස්තෲවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි මෙසේ පෙරත් තිරිසන් යෝනියෙහි උපන්නාවූ මා විසින් ආයුසංස්කාරය දුර්වලතියාව දක්වා ධර්මදෙශනා කරණලදැයි වදාරා මේ ජවනහංස ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්දස්ථවිරයෝය. බාල මලනුවෝනම් මෞද්ගල්‍යායනස්ථවිරය. මැදි මලනුවෝනම් ශාරිපුත්‍රස්ථවිරය. සෙසු හංස සමූහයා නම් දැන් බුදුපිරිසය. ජවනහංස රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

469
චුල්ල නාරද ජාතකය

තවද එක්සමයෙක්හි ධර්මාධිපතිවූ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සම යෙහි ථුල්ල කුමාරිකා පලෝභනයක් අරභයා මේ ජාතය දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

සැවැත්නුවර වාසිවූ එකකුලයක පසළොස් සොළොස් වයස් ඇති එක් දුවක් උව. ඕතොමෝ බලවත්වූ රූප සෞන්දර්‍යයීයෙන් යුක්තය. අන්‍යකුල යෙන් ඈ විවාළකෙණෙක් නැත. ඉක්බිත්තෙන් මවුතොමෝ සිතන්නී මාගේ දුව වැඩිවිය පැමිණියාය. ඈ විවාළකෙණෙක් නැත. එසේහෙයින් ඇමිත අමු නා දමා මසකු බාගන්නාක්මෙන් මැ පාලා එක් භික්ෂුකෙණෙකුන්වහන්සේ පොළඹාගෙණ සිවුරුහරවා ඒ කුලපුත්‍රයා නිසා ජීවත්වෙම් සිතූහ. එසම යෙහි සැවැත්නුවර වාසිවූ එක් කුලපුත්‍රයෙක් ශාසනයෙහි ලදී මහණව

චුල්ලනාරද ජාතකය

උපසම්පදාවූ තැන් පටන් ශික්ෂාකාමීබවය හැර අලසව තුනූ සැරසීමෙන් යුක්තව විසූයේය. මහඋපාසිකාවෝ තමන්ගේ ගෙයි කැඳ අවුළුපත් ආදීවූ කන බොන දෑ සපයාතබා දොරකඩ සිට වීථිමධ්‍යයෙන් යන්නාවූ භික්ෂූන් අතුරෙන් රස තෘෂ්ණාවෙන් බැඳ ඇරගන්ට සුදුසු එක් භික්ෂුකෙණෙකුන් පරීක්ෂාකරණ තැනැත්තෝ මහපිරිවරින් යන්නාවූ ත්‍රිපිටකධාරී අභිධර්මධර භික්ෂූන්වහන්සේ අතුරෙන් ඇරගන්ට සුදුසුවූ කිසිකෙණෙකුන් වහන්සේ නොදැක උන්වහන්සේට පස්සෙහි යන්නාවූ ධර්මකථා ඇති පවනින් කාඩාදමනලද සඳවලා පටලය සමානවූ පාංශුකූල චීවරයන් දරන්නාවූ පිණ්ඩපාතික භික්ෂූන්වහන්සේ අතුරෙන් ඇරගන්ට කිසිකෙණෙකුන්වහන්සේත් නොදැක නුවණින් පිටක දක්වා අඳුන් හා කෙස් වටකොට තනා දුහුල්මයවූ අඳනයක් ඇඳ අන්බස්නාලද මටසිළුටුවූ සිවුර පෙරව ඉඳුනිල්මිණිවන් පාත්‍රයක් ගෙණ සිත්කළුවූ කුඩයක් ඉසටකොට ඇත මෑත බලමින් ප්‍රගල්භයෙන් යුක්තව එන්නාවූ එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ දැක මූන්වහන්සේ අරගන්ට පුළුවනැයි සිතා සමීපයට ගොස් වැඳ පාත්‍රය ගෙණ ගොස් ස්වාමීනි මේසේ වැඩිය මැනවැයි කියා ගෙට කැඳවාගෙණ ගොස් අස්නේ හිඳුවා කැඳ බත් ආදිය වළඳවා වළඳා ඉක්බිති ස්වාමීනි මෙතැන් පටන් ඇත මෑත නොගොස් මාගේ ගෙටම ආවමැනවැයි කීහ. භික්ෂූන්වහන්සේත් එතැන් පටන් ඒ ගෙටම ගොස් කල්‍යාමකින් බලවත් විශ්වාස ඇතිවූ සේක.

ඉක්බිත්තෙන් එක්දවසක් මහඋපාසිකාවෝ ඒ භික්ෂූන්වහන්සේට ඇසෙන තැන සිට මේ ගෙයි ප්‍රයෝජන විඳගන්නා පමණ වස්තු ඇරගෙණ ගේදොර පිරිමසාගෙණ ඇති වස්තු ප්‍රයෝජන විඳගන්ට සුදුසු මාගේ පුතෙක් වත් බෑනෙක්වත් නැතැයි කීවුය. ඒ භික්ෂූන්වහන්සේ උපාසිකාවන්ගේ බස් අසා කුමක් නිසා මෙසේ කියත්දැයි මදක් ළැය ඉපිල ගියාක්මෙන් වකිනාවූ සේක් ඒ බව දැන උපාසිකාවෝ දුවට කියන්නාහු මේ භික්ෂූන්වහන්සේ පොළඹා තොපගේ වශයෙහි පවත්වාගණුමැයි කීහ ඕතොමෝ එතැන්පටන් සැදී පැහැදී ස්ත්‍රීවිලාසය දක්වා භික්ෂූන්මහන්සේ පොළඹාගත. ස්ථූල කුමාරිකා යයි කීකල්හි ස්ථූලවූ ශරීර ඇතිහෙයින් ස්ථූල කුමාරිකායයි නොදත යුත්තේය. ඕතොමෝ ස්ථූලවේවයි දුර්වලවේවයි පඤ්චකාම කොට්ඨාසයෙන් යුක්තවූ රාගයෙන් ස්ථූල බැවින් ස්ථූල කුමාරිකායයි ව්‍යවහාර කරණලද්දීය. ඒ ළදරු භික්ෂූන්වහන්සේද කෙලෙස වශගව මම්වූකලී දැන් මේ සම්බුද්ධ ශාසනයෙහි පිහිටක් ලබන්ට අසමර්ථයෙමි සිතා විහාරයට ගොස් පාසිවුරු පාවාදී අසවල් තැනට පිළි එවයි කියා විහාරයට ගොස් පාසිවුරු ගනමැනවැයි කලකිරී සිවුරු හරණා කැමැත්තෙමි ආචාරී උපාධ්‍යායන් වහන්සේට කීයේය.

ඒ ආචාරී උපාධ්‍යායන්වහන්සේ ශාසනයෙහි උකටලීවූ ඒ භික්ෂූහු කැඳවාගෙණ සම්බුද්ධයන් වහන්සේ සමීපයට ගොස් ස්වාමීනි මේ මහණ උකටලීයයි දැන්වූසේක. සම්බුද්ධයන් වහන්සේ සැබෑද මහණ ශාසනයෙහි උකටලී වූයේදැයි විචාරා සැබෑ ස්වාමීනි කීකල්හි ශාසනයෙහි ඇලුම් නැති කරවූවෝ කවුරුදැයි විචාරා ස්ථූල කුමාරිකාවක විසිනැයි කීකල්හි මහණ පෙරත් මෝතොමෝ වල්හි වසන්නාවූ තාගේ බ්‍රහ්මචර්‍ය්‍යාවට අන්තරායකොට මහත්වූ අනර්ථකරවූය නැවත නැවත තෝ මෑ නිසා කුමට ශාසනයෙහි කලකිරී සිවුරු හරණා කැමැත්තෙහිදැයි වදාරා භික්ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ කසීරට මහසම්පත් ඇති බමුණු කුලයෙක ඉපිද උගතමනා සියලු ශිල්ප ඉගෙණ නිමවා කුටුම්බ සණ්ඨාපනය කළහ. ඉක්බිත්තෙන් බෝධිසත්ත්වයන්ගේ භාර්‍ය්‍යාතොමෝ එකපුත්‍රයකු වදා කාලක්‍රියාකළාය. බෝධිසත්ත්වයෝ උන් මළ පසු සිතන්නාහු මාගේ ප්‍රිය භාර්‍ය්‍යාවට යම්සේ මරණ පැමිණියේද, එපරිද්දෙන්ම මා කෙරෙන් මරණ ලජ්ජා නොවන්නේය. ඒකාන්තයෙන්ම මාකරා මරණ පැමිණෙන්නේය. එසේහෙයින් මට ගිහිගෙයි විසීමෙන් ප්‍රයෝජන කිම්ද? පැවිදිවෙමියි සිතා පඤ්චකාමය හැර පුතනුවන් කැඳවාගෙණ හිමාලය වනයට වැද තාවුස්වෙස් පැමිද්දේන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා වනමුල් ඵලාඵලයෙන් යැපෙමින් වල්හි විසූහ.

එසමයෙහි පසල්දනව්වැසි සොරු දනව්වට වැද ගම්පැහැර කොල්ලකා මිනිසුන් අල්වාගෙණ බඩුපොදි ඒ මිනිසුන් හිසමි තගා උසුලවා තමන් වසන තෙනකට ගෙන්වාගෙණ ගොස් නැවත ඒ මිනිසුන් පසල්දනව්වෙම ඇරලූහ. ඔවුන් අතුරෙන් විශිෂ්ටවූ රූ ඇති එක කුමාරිකාවක් කෛරාටික ප්‍රඥාවෙන් යුක්ත බැවින් සිතන්නී මේ සොරු අප අල්වාගෙණ ගොස් වාල් මෙහෙ ගණිති. එසේහෙයින් එක් උපායකින් පළායන්ට වටනේයයි සිතා ස්වාමිනි ශරීර කෘත්‍යය කරණු කැමැත්තෙමි. එසේහෙයින් මදක් ඉවත්වලා සිටිසමැනවැයි කියා සොරුන් වංචාකොට පලාගොස් වල ඇවිදිනා තැනැත්තී බෝධිසත්ත්වයන් තමන්ගේ පුතනුවන් පන්සල ලා ඵලාඵලයට ගියකල්හි පෙරවරු වේලෙහි අසපුවට පැමිණ ඒ තාපස කුමාරයන් කාම ක්‍රීඩාවෙන් පොළඹා ශීලභේදයකොට තම වශයෙහි පමුණුවා තොප වනයෙහි විසීමෙන් ප්‍රයෝජන කිම්ද? වර ගමට යම්හයි එහි රූප ශබ්දාදිවූ පංචකාම කොට්ඨාසයෝ සුලභවන්නාහයි කිව. තාපස කුමාරයෝ යහපතැයි ඇගේ බස් ගිවිස මා පියානන්වහන්සේ වනයෙන් ඵලාඵල ගෙණෙනාසේක. උන්වහන්සේ දැක පසුව දෙදෙනම යම්හයි කීවුය.

කුමාරිකා එබස් අසා සිතන්නී මේ බාලදරුවෝ කාර්‍ය්‍යාකාර්‍ය්‍ය නොදනිති. මුන්ගේ පියානන් මහලුකල පැවිදි විය යුතුය. උඹ අවුත් තොපි මේ කුමක් කෙරෙද්දැයි කියා මා තලා දෙපය අල්වා ඇද වලට දමති. එසේහෙයින් උන් එන්නාට පළමුකොට පළායෙමි සිතා තාපස කුමාරයන්ට කියන්නී මම පෙරෙන්තුව යෙමි. තොපි පසුව එව්යි කියා මාසලකුණු කියා ගියාය. ඒ තාපස කුමාරයෝ ඈ ගිය වේලෙ පටන් උපන්නාවූ දෞර්මනසින් පීඩිතව පෙර පරිද්දෙන් කිසිවතක් පිළිවෙතක් නොකොට ඉසවසා පෙරවාගෙණ ඇතුළ උපන් සිහිවිලිගෙණ සෝකාතුරව වැදහොත්හ. මහබෝසතාණෝ ඵලාඵල ඇරගෙණ අවුත් අසපුවටවැද ඇගේ පියවර සටහන් දැක මේ ස්ත්‍රීයකගේ පිය වර සටහන් වින්නේයයි මාගේ පුතනුවන්ගේ සිල්බිඳී ගියේවනැයි සිතමින් පන්සලටවැද ඵලාඵලකඳතබා පුතනුවන් අතින් විචාරන්නාහු මහබෝසතාණෝ තාපසකුමාරයෙනි තෙපි මෙතෙක් දවස් මා වනයට යාදී දරකඩා පැන් පෙරා ගෙණවුත් තබා ගිනිදල්වා තබව. අදමුකලී දරත් නොකැඩුව පැනුත් නොගෙණව ගිනිත් නොදැල්වුව, කිමෙක්ද? අද තොපි මන්ද එකක්හු මෙන් සිතිවිලි ගෙණ ඉඳුව මීට කාරණා කවරේදැයි විචාළහ ඒ තාපස කුමාරයෝ පියානන්ගේ

බස් අසා නැගී සිට පියානන් වැඳ ගෞරවයෙන් යුක්තව වල විසීමෙහි අභිප්‍රාය මදනියාව දන්වන්නාවූ පියානන්වහන්සෙ වනයෙහි වසන්ට නොකැමැත්තෙමි වල්හි විසීම ඉතාම දුක් වන්නේය. එසේහෙයින් රාජ්‍යයට යනු කැමැත්තෙමි. මම මෙයින් ගොස් යම් ජනපදයක වැස ජනපද චාරිත්‍රය දැනගත්තෙම් වීම් නම් එසේවූ ධර්මයෙකින් මට අවවාද අනුශාසනා කළමැනවයි කීහ. එබස් අසා මහබෝසතානෝ යහපත පුත නොපට දේශචාරිත්‍රය කියම් කියා අවවාද කරන්නාහු ඉදින් කොපි මේ වනයත් වනමූල් ඵලාඵලත් හැර මනුෂ්‍යවාසයට ගොස් වසනු කැමැත්තා නම් ජනපද චාරිත්‍රය මාගෙන් අසව. විෂ අනුභව නොකරව ප්‍රපාත නම් වෛරය දුරුකරව මඩෙහි නොගිලෙව සර්පයින් දුරු කරවයි කීහ. තාපස කුමාරයෝ සංක්ෂෙපයෙන් කියනලද වචනයෙහි අර්ථ දැනගතනොහී විචාරන්නාහු පියානන්වහන්ස තපස් කරන්නවුන්ට විෂනම් කවරේද; ප්‍රපාත නම් කවරේද, මඩ නම් කවරේද, ආශීර්විෂයෝ නම් කවුරුද ඒ මට කිය මැනවැයි කීහ.

එසඳ බොධිසත්වයෝ කියන්නාහු පුත ලෝකයෙහි පුෂ්පාසවාදිවූ ආසව සුරායයි කියති. ඒ තෙම සිත්කළු සුවඳැත්තේය. මනොඥවූය මධුරය දඹු වැල් මීයෙහි රසය හා සමාන වන්නේය එබඳුවූ සුරාව උත්තමයෝ බ්‍රහමචරියාවට විෂයෙකැයි කියති. පුත මේ ලෝකයෙහි ස්ත්‍රීහු නම් පඤ්චකාමයෙහි මුසඩුවන් වැන්න. නැවත වසඟකොට තමන්කෙරෙහි ගසින් වැටුනු පුළුන් පවනින් ගසා ගෙණයන්නාසේ ලදරුවන්ගේ සිත් පැහැරගෙණ යන්නාහුය. නාරද නම් තපස් වීනි බ්‍රහමචරියාවට ස්ත්‍රීහු නම් ප්‍රපාතයක් සමානයෝයයි කියන ලදහ ලාභය, කීර්තිය, සත්කාරය, පූජාය යන මෙතෙක් ඇත්නම් මේ තෙම බ්‍රහමචර්‍යාවට මඩෙකැයි කියන ලද, තවද පුත නාරද නම් තපස්වීනි මේ පෘථිවි මණ්ඩලයෙහි මහත්වූ යසපිරිවර ඇතිව මහත්වූ තේජස් ඇති රජදරුවෝ රාජ්‍යශ්‍රී අනුභවකෙරෙමින් වෙසෙති. එබඳුවූ ආශ්‍වර්යයෙන් හා අධිපති භාවයෙන් යුක්ත රජදරුවන් සමීපයේ රජ කුළුපගව නොවසව. බ්‍රහමචර්‍යාව කරන්නාවුන්ට ඒ රජදරුවෝ නම් සර්පයින් හා සමානයෝය.

තවද පුත ආහාර කැමතිව බත් අනුභවකරණ වේලෙහි ගෙයකට එළඹියොත් ඒ ගෙයි යහපත නපුර දතයුත්තේය. නිරවද්‍යයයි දැනුනු කල්හි එබඳුවූ ගෙන් ආහාර අනුභව කළ යුත්තේය. අනුන්ගේ ගෙටවැද බත් පැන් අනුභව කරන්නහු විසින් පමණ දැන බත් පැන් අනුභව කටයුත්තේය. පමණ දැන අනුභව කරන්නහු විසින් අන්‍යකුලයක ස්ත්‍රීරූපයෙහි සිත් නොඇලිය යුත්තේය. ඇස දල්වා ස්ත්‍රීරූපයෙහි සුභග්‍රහයෙන් නිමිත්තග්‍රහණය නොකට යුත්තේය. තවද ගොඩූද සුරාපාන මණ්ඩල ධූර්තවූ කෛරාටික ජනයෝය. අධිකරණය රන්රුවන් විකුණන තෙනය යන මේ සියළු ස්ථානයෙක්හි ගිතෙල් තලතෙල් පුරාගෙණ යානාවෙන් යන්නාවූ පුරුෂයෙක් විෂමවූ මාර්ගයක් වළහා යන කලක්මෙන් දුරින් දුරුකටයුත්තේයයි අවවාද කළහ. තාපස කුමාරයෝ පියානන් කියමින් සිටියදීම සිහි එලවාගෙණ පියානන් වහන්ස මට මනුෂ්‍යපථයෙන් කාම් නැතැයි කීහ. ඉක්බිත්තෙන් ඒ තපස් වීන්ට මහබෝසතානෝ මෛත්‍රී කරුණාදිවූ බ්‍රහ්මවිහාර භාවනා කීහ. ඒ තාපස කුමාරයෝ බෝධිසත්වයන්ගේ අවවාදයෙහි සිට නොබෝකල කින්ම පංචාභිඥා අෂ්ටසමාපත්ති ඉපදවූහ. ඉක්බිත්තෙන් දෙපුතුපියෝම නොපිරිහුනාවූ ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලෝකයෙහි උපන්හ. ශාස්තෲවූ

බුදුරජාණන්වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා මේ **චුල්ල නාරද ජාතකය** නිමවා වදාළසේක. එසමයෙහි කුමාරිකා නම් දූන් මේ ස්ථූල කුමාරිකාය, එසමයෙහි තාපස කුමාරයෝ නම් දැන් මේ උකටලී මහණය, එසමයෙහි පියතාපසයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

470
දූත ජාතකය

තව ද එක්සමයෙක්හි කරුණාධාර වූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන්වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසන සමයෙහි තමන්වහන්සේගේ ප්‍රඥා ප්‍රශංසාවක් අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

ධම්සභාවේ රැස්ව වැඩඋන්නාවූ භික්ෂූන්වහන්සේ කථාවක් උපදවන සේක් ඇවැත්නි දසබලධාරීවූ බුදුරජාණන්වහන්සේගේ උපායෙහි දක්ෂබවක් බලව. නන්ද කුමාරයන්ට දිව්‍යාප්සරාවන් දක්වා අර්හත්ඵල බෙදා දුන්සේක. චුල්ල පන්ථක ස්ථවිරයන්හට කඩරෙද්දක් දී සිව්පිළිසිඹියා හා සමග අර්හත් ඵල දුන්සේක, කම්මාර පුත්‍රයක්හට පියුමක් දක්වා අර්හත්ඵල දුන්සේක, මෙසේ අනේකප්‍රකාරවූ උපායෙන් සත්ත්වයන් විනයනය කළසේකැයි, මෙසේ කථාවක් උපදවා උන්සේක, ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ තුන්තරා ගමනින් එක්තරා ගමනකින් ධම්සභා මණ්ඩපයට වැඩ පණවනලද බුද්ධාසන මස්තකයෙහි යුගන්ධර මුදුනෙහි දිලියෙන හිරුමඬලක්මෙන් දිලිහි දිලිහි වැඩහිඳ මහණෙනි මං එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කීකල්හි මහණෙනි සර්වඥයන් මින් මෙබඳුවූ දෙයක් වන්නේයයි උපායෙහි දක්ෂවූයේ දැන් මතු නොවෙයි පෙරත් උපාය දැන්මෙහි දක්ෂයෝ වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ජනපදය රත්රනින් ශූන්‍යවිය, ජනපදය පෙරළා ඒ රජ්ජුරුවෝ වස්තු රැස්කරවන්නාහ, එසමයෙහි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ කසිරට එක්තරා ගමෙක බමුණු කුලයෙහි ඉපද වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් සිතන්නාහු පසුව දැහැමින් සිතා ඇවිද ගුරු පූජාවට වස්තුගෙණෙමියි සිතා ප්‍රතිඥකොට ශිල්පයට පටන්ගෙණ නොබෝ දවසකින්ම ශිල්ප නිමවා ඉගෙණ උගත් ශිල්ප ආචාරීන්ට වත පොත්දී ආචාරීන්වහන්ස තුඹවහන්සේට ගුරුපූජාවට වස්තුගෙණෙමියි කියා නික්ම දනව්වෙහි ඇවිදිනා තැනැත්තෝ දැහැමින් සෙමින් සොඳ මැණික් සතරක් ලැබ ආචාරීන්ට ගෙණයන තැනැත්තෝ අතරමග ගඟින් එතරවන සඳහා ඔරුවට නැංගාහ, බෝධිසත්ත්වයන් ඔරුවටනැගී නික්මුණු කල්හි ඔරුව පෙරළී ඒ මැණික් සතර දියෙහි වැටී ගියේය: එකෙණෙහි මහබෝසතාණෝ සිතන්නාහු ජනපදයෙහි රත්රන් දුර්ලභ වන්නේය. නැවත ආචාරීන්ට ගුරු පූජා සඳහා වස්තු සොයන්ට පටන්ගත් කල්හි ප්‍රපඤ්චවන්නේය, ඒකාන්ත යෙන් මේ ගඟාතීරයෙහිම උන්නෙම් විත්නම් යහපත් වන්නේය, මං මෙතන

උන්නියාව ක්‍රමයෙන් රජ්ජුරුවන්ට සැලවන්නේය. ඉක්බිත්තෙන් අමාත්‍යයන් එවන්නාහ. මම ඔවුන් හා සමග කථා නොකරමි. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ තුමූ එන්නාහ. මේ උපායෙන් රජ්ජුරුවන් සමීපයෙන් ආචාරි ධනය හැරගණිමියි සිතා ගංතෙර උතුරුසළුව පොරවාගෙණ සූත්‍ර උරය මතුපිට ලාගෙණ රිදීපටක් හා සමාන ඇති වැලිතලාවක්මත්තෙහි රන්පිළිමයක්මෙන් උන්හ. නිරාහාරව උන්නාවූ බොධිසත්ත්වයන් දැක මහජනයෝ කුමක් නිසා උන්සේක්දැයි විචාරන්නාහ, උන් කාරණා කිසිවක්හට නොකියති. දෙවෙනි දවස් දොරගම් වැස්සෝ බෝධිසත්ත්වයන් උන්නියාව අසා අවුත් විචාළාහ. ඔවුන්ට නොකීහ. ඒ සත්ත්වයෝ බොධිසත්ත්වයන් විඳිනා ආයාස දැක අඬා වැලප ගියාහ. තුන්වන දවස නුවරවැස්සෝ අවුය, සතරවෙනිදවස් නුවර ඉසුරුමත් ජනයෝ අවුය, සවෙනිදවස් සමාත්‍යයන් අවුය, ඔවුන් හා සමගත් කථා නොකළාහ. සත්වෙනිදවස් රජ්ජුරුවෝ භයපත්ව බොධිසත්ත්වයන් සමීපයට ගොස් බමුණානෙනි කුමක් නිසා මේ ගඟාතෙර නිරාහාරයෙන් උන්නුදැයි විචාළාහ. ඒ අසා මහබෝසතාණෝ රජ්ජුරුවන් හා සමග කථාකරන්නාහු කසීරට වාසීන්ට වැඩපසස්නාවූ රජ්ජුරුවන් වහන්ස ඉදින් තුඹවහන්සේට දුකෙක් උපන්නේ වීනම් ඒ උපන් දුක් සඳහා යමෙක් ඒ දුකින් ගලවා නොලා නම් ඔහට ඒ දුක් නොකිය යුත්තේය. යමෙක් සිතට උපන්නාවූ දුක් ඇතිව ඒකාන්තයෙන් ඒ දුක් තමාට කීකල්හි ඊට සුදුසු කාරණය දැහැමෙන් ලූකීන් මුදාද එබඳුවූ සත්ත්වයාහට තමාගේ ඇත දුක් කියයුත්තේය. තවද රජ්ජුරුවන් වහන්ස කැණහිල්ලන් පක්ෂින් ආදිවූ තිරිසනුන්ගේ බස් සැබවැයි අදහාගත නොහැක්කේය. උන්ගේ බසටත් වඩා මනුෂ්‍යයන්ගේ බස් දැනගත නොහැක්කේය. අදහාගත නොහැක්කේමය.

තවද මේ ලෝකයෙහි සත්ත්වයෝ මාගේ නෑයෝය. මිත්‍රයෝය. යහළුවෝයයි පළමු සතුටුව බලවත්වූ ස්නෙහ ඇතිව වෙසත්නම් පසුව නොබෝ කලකින් උන්ට සතුරු වන්නාහුය. යමෙක් තමාට උපන් දුක් නැවත නැවත විචාළ කල්හි දුක් කියන්නට සුදුසු අවස්ථාවෙහි දුක් කීයාද එසේවූ සත්ත්වයාහට සතුරුව සිටියෝ මිතුරු වෙති. හිතෛෂී සත්ත්වයෝ ඔහට සිතට උපන් දුක් තමාට උපන් දුකක් මෙන් සිතා දෙම්නසට පැමිණෙන්නාහ. එසේහෙයින් ධෛර්‍ය්‍ය සම්පන්න වූ පුරුෂතෙම තමාට උපන්නාවූ දුක් කියන්ට සුදුසු කල් දැන නුවණැත්තාවූ තමා හා එක්සිත්වූ පුරුෂයා හා නොකීයන්ට සුදුසුව රහසිගත කාර්‍ය්‍ය කියන්නේය. අර්ථවත්වූ මටසිළුටුවූ ප්‍රිය තෙපුලෙන් නැවත නැවත ඔහු හා සමග කථාකරන්නේය. ඉදින් යම් සත්ත්වයෙක් තමාට උපන් දුකක් තමාගේ හෝ අනුන්ගේ හෝ සමර්ථයෙන් සන්හිඳුවාලියනොහැක්කේයයි දන්නේවීනම් ඔහු විසින් මෙසේ සිතිය යුත්තේය. මේ ලාභාලාභාදිවූ ලෝකචාරිත්‍රය මට සඵල වන පිණිස උපන්නේ නොවෙයි. අෂ්ටලොක ධර්මයෙන් මිදුනාවූ එකද සත්ත්වයෙක්නම් නැත. එසේ කල්හි සැපම ප්‍රාර්ථනාකරන්නාහු විසින් මේ මට දුකක්ම සුදුසු නොවන්නේය. භය ලජ්ජා දෙකින් යුක්තව සත්ත්වයක්හු විසින් අනුන්ට දුක් කීම කළමනාදෙයක් නොවෙයි. එසේවූ කලී මට භය ලජ්ජා දෙක ඇතැයි තමා කෙරෙහි විද්‍යමානවූ භය ලජ්ජා පරීක්ෂා කරන්නාහු නුවණැත්තාවුන් විසින් තම තමාට උපන් දුක් අනික් කෙණෙකුන්ට නොකියා ජීවිත පරිත්‍යාගයට සුදුසුව නොතරන් දුකෙක් වී නමුත් එකල එහිම ඉවසිය යුත්තේය.

මෙසේ මහබෝසතාණෝ අනේකප්‍රකාරයෙන් රජ්ජුරුවන්ට ධර්මදේශනා කොට ගුරු පූජාවට වස්තු සිඟූ නියාව දක්වන්නාහු මහරජ්ජුරුවන්වහන්ස, මම මාගේ ආචාරීන්වහන්සේට ගුරුපූජා කරණු සඳහා මේ රට ගම් නියම්ගම් රාජධානිවල සිඟා ඇවිද බමුණු වෙළඳ ගොවී රාජපුරුෂාදිවූ සියල්ලවුන්ගෙන් රත්රන් මැණික් සතරක් ලදිමි. ජනේශ්වරවූ මහරජ්ජුරුවන්වහන්ස, මැණික් සතර ගඟින් මෙතරවන්ට ඔරුවට නැඟී ගමනේ ඔරුව පෙරළී ගඟවැටී ගිය. එසේ හෙයින් බලවත් සෝකාතුරම උනිමි. මහරජ්ජුරුවන්වහන්ස, නුඹවහන්සේ සමීපයෙන් ආවාවූ දූත පුරුෂයෝ මේ දුකින් මුදලන්ට අසමර්ථයෝයයි දැන උන්ට මෙපවත් නොකීමි. නුඹවහන්සේ වූකලී මා මේ දුකින් ගලවා ගන්මෙ සුදුසුසේකැයි මා සිතට බලවත්බව දැනීන. එසේහෙයින් නුඹවහන්සේට මෙපවත් යථාතත්වයෙන් කීමි. රජ්ජුරුවෝ මහබෝසතාණන්ගේ ධර්මකථා අසා ප්‍රසන්නවූ සිත් ඇතිව බමුණානෙනී තෙපි සැකයක් නොකරව, මම තොපගේ ආචාරීන්ට ගුරුපූජාවට දැනමානාදී වස්තු දෙමියිකියා බමුණානන්ගේ අපවත්ව ගිය මැණික් සතරට දියුණුකොට රත්මැණික් තුදුසක් දුන්හ. මහබෝසතාණෝ රජ්ජුරුවන්ට අවවාදකොට ආචාරීන්ට දුනමනා වස්තු දී දානාදීවූ පින්කම් කළාහ. රජ්ජුරුවෝත් බෝධිසත්වයන්ගේ අවවාදයෙහි පිහිටා දැහැමින් රාජ්‍යය කොට මිය පරලොව ගියාහ.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි දැන් මතු නොවෙයි. පෙරත් සර්වඥවරයෝ උපායෙහි දක්‍ෂයෝම වේදැයි වදාරා මේ දූත ජාතකය නිමවා වදාළසේක.

“එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝය. ආචාරී නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි බ්‍රාහ්මණ මාණවකව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

කාලිඞ්ගබෝධි ජාතකය
471

තවද එක් සමයෙක්හි පරහිත නිරතවූ තිලෝගුරු සම්‍යක්සම්බුදුරජානන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසනසේක් අනඳමහතෙරුන් වහන්සේ විසින් කරණලද මහත්වූ බෝධිපූජාවක් අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

ඒ කෙසේ ද? යත්,

වෛනෙය ජනයන්ට සංග්‍රහ පිණිස සර්වඥයන් වහන්සේ ජනපද චාරිකාව කළ කල්හි සැවැත් නුවර වාසීහු ගඳදුම් මල්පහන් ගත් අත් ඇතිව ජේතවනාරාමයට ගොස් පුදන්ට නිසි අන්තෙනක් නොලැබ ගඳකිළි දොරකඩ සලායන්නාහ. එසේ කරන්නාවූ පූජාවෙන් සත්වයෝ උදාරවූ ප්‍රීතිප්‍රමොදයට පැමිණෙන්නාහු නොවෙති. ඒ කාරණය දැන අනේපිඬු මහසිටාණෝ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයට වැඩි කල්හි ආනන්දමහතෙරුන් වහන්සේ සමීපයට ගොස් ස්වාමීනි, මේ විහාරය සර්වඥයන්වහන්සේ සැරිසරා වැඩිකල්හි කිසි පිහිටෙක් නැතිවෙයි. මනුෂ්‍යයන්ගේ ගඳදුම්මල්පහන් ආදියෙන් පූජාවට ස්ථානයෙක් නොවෙයි. ස්වාමීනි, යාවක්ද කෙරෙම් සර්වඥයන්වහන්සේට මෙපවත් දන්වා පිදියයුතු තැනක් නොලැබහැකි ද? යන නියාව දැන වදාළ මැනවැයි කීහ.

අනඳමහතෙරුන් වහන්සේ යහපතැයි ගිවිස බුදුන්ගෙන් විචාරණසේක් ස්වාමීනි කොපමණ චෛත්‍යයන් වේදැයි විචාළසේක. අනන්දයෙනි තුණෙක් වෙයි කීකල්හි ස්වාමීනි කවර තුණෙක්දැයි විචාළසේක. ශාරීරිකය, පාරිභොගිකය, උද්දෙසිකය යි කීකල්හි නුඹවහන්සේ ජීවත්ව ඉන්දදීම චෛත්‍යකරවන්ට පිළිවන්දැයි විචාළසේක්. ආනන්දයෙනි, ශාරීරිකය කරන්ට නොපිළිවන. ශාරීරික චෛත්‍යය සර්වඥවරයන් පිරිණිවි කල්හි වන්නේය. උද්දෙසිකය අවස්තුකය චිත්ත ප්‍රසාද මාත්‍රයකින් වන්නේය. සර්වඥයන් විසින් ප්‍රයෝජන විඳිනාලද මහාබොධිය බුදුන් ජීවත්වුවත් පිරිණිවියත් චෛත්‍යයම වෙයි වදාළසේක් ස්වාමීනි, නුඹවහන්සේ සැරිසරා වැඩිකල්හි ජේතවන මහවිහාරය කිසි පිළිසරණෙක් නැතිවෙයි. මනුෂ්‍යයෝ පිදියයුතු තැනක් නොලබති. මහාබොධියෙන් බිජුවටක් ගෙණවුත් ජෙතවන මහදෙරටුව සමීපයෙහි රෝපණය කෙරෙම්දැයි ස්වාමීනි දැන්වූසේක. යහපත ආනන්දයෙනි, රෝපණය කරව එකල්හි ජෙතවනයෙහි මාගේ නිරන්තර වාසයක් මෙන් වන්නේ වෙයි වදාළසේක.

අනඳමහතෙරුන් වහන්සේ අනේපිඩු මහසිටාණන් විශාඛාවන් කොසොල් රජ්ජුරුවන් ආදීවූවන්ව කියා ජෙතවන දෙරටුව සමීපයෙහි බොධිරෝපණය කරන්නාවූ ස්ථානයෙහි වළක් ගස්වා කසළ හරවා මුගලන් මහතෙරුන් වහන්සේට කියනසේක් ස්වාමීනි, මම ජෙතවන දොරටුව සමීපයෙහි බොධිරෝපණය කෙරෙමි ශ්‍රීමහා බොධියෙන් ඵලයක් ගෙණවුත් දුන මැනවැයි කීසේක. තෙරුන්වහන්සේ යහපතැයි ගිවිස ආකාශයෙන් බෝමැඩට ගොස් නටුවෙන් ගිලිහෙන්නාවූ ඵලයක් බිම වැටියනොදී සිවුරෙන් පිළිගෙණ ගෙණැවිත් දුන්සේක. අනඳ මහතෙරුන්වහන්සේ බොධිරෝපණය කරණ තෙන මහත් රන්කටාරයක් තබ්බවා යටින් සිදුරක් කරවා ගඳකලල් පුරවා බොධිඵලය රෝපණය කරව මහරජ්ජුරුවෙනියි කියා රජ්ජුරුවන් අතට දුන්සේක. රජ්ජුරුවෝ සිතන්නාහු රාජ්‍යය හැමකලම අප අත නොසිටින්නේය. මේ බොධිඵලය අනේපිඩු මහසිටාණන් ලවා රෝපණය කරවන්ට වටනේයයි සිතා ඒ බොධිඵලය අනේපිඩු මහසිටාණන් අත තුබූහ එසඳ අනේපිඩු මහසිටාණෝ ගඳකලල්පිට සවණී කටාරයෙහි එලූහ. ඒ බොධිඵලය සිටාණන් අතින් මුත් කෙණෙහිම සියල්ලවුන් බලාසිටියදී නගුලිසක් පමණ බෝරුක පණස්රියනක් පමණ උස නැංගේය. සතරදිගට ගියාවූ ශාඛා සතරය උඩට නැගි ශාඛාවයයි පස්වමහා ශාඛාව පණස්රියන් පමණ ඇත්තේය.

මෙසේ ඒ බොධිවෘක්ෂය ඒක්ෂණයෙහිම මල් නැතිව ඵලගන්නා වෘක්ෂයන්ට ජ්‍යෙෂ්ඨව සිටියේය. මහත්වූ ප්‍රාතිහාර්‍ය්‍යයි වූයේය. රජ්ජුරුවෝ අටෝරාසියක් පමණ රන්කලස රිදීකලස සුවඳමල් පුරා නිලුපුල් මල්මිටි ආදියෙන් හොබවා බොධීන්වහන්සේ පිරිවරා පූර්‍ණඝට පන්තියක් තිබ්බවූහ. සත්රුවන්මයවූ පිළිකඩක් කරවා රුවන්වැලි තැනවූහ. වටකොට පවුරක් බඳවා සත්රුවන්මයවූ දොරටුවක් කරවූය. සත්කාර ඉතා මහත්විය. අනඳ මහතෙරුන්වහන්සේ සර්වඥයන්වහන්සේ කරා එළඹ ස්වාමීනි, නුඹවහන්සේ විසින් ශ්‍රීමහාබොධීන්වහන්සේ සමීපයෙහි වැඩහිඳ සමවදින්නාවූ සමවත් මා විසින් රෝපණය කරණලද බොධිද්‍රුම සමීපයෙහි වැඩහිඳ මහජනයාට හිත වැඩ පිණිස සමවැද මැනවැයි ආරාධනා කළසේක. ආනන්දයෙනි, කුමක් කියෙහිද? ශ්‍රීමහාබොධිය සමීපයෙහි හිඳ සමවත් සමවත් සමවැද උන්කල්හි අන් ප්‍රදෙශයක් ධරන්ට අසමර්ථවන්නේ වේදැයි වදාළසේක. ස්වාමීනි, මහ

ජනයාට හිත සැප පිණිස මේ ප්‍රදේශයට සෑහෙන පරිද්දෙන් සමාපත්ති සැපයෙන් ඒ බොධිද්‍රැමමූලයෙහි ප්‍රයෝජන විඳ වදාළ මැනවැයි කීසේක. සර්‍වඥයන් වහන්සේ එක රාත්‍රියක් සමාපත්ති සැපයෙන් ඒ බොධිද්‍රැමය ප්‍රයෝජන විඳ උන්කල තෙරුන්වහන්සේ කොසොල් රජ්ජුරුවන් ප්‍රධාන කොට ඇති සියල්ලවුන්ට කියා මහත්වූ බොධි පූජාවක් කරවූසේක. ඒ බොධිය අනඳමහතෙරුන්.වහන්සේ විසින් රෝපණය කළ බැවින් ආනන්‍ද බොධියයි මේ නමින් ප්‍රසිඬ විය. එසමයෙහි දම්සභාමණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්‍ෂුන්වහන්සේ කථාවක් උපදවනසේක් ඇවැත්නි, ආනන්‍දස්ථවිරයෝ සර්‍වඥයන්වහන්සේ ජීවත්ව ඉන්දදීම බොධිපූජාවක් කරවූය. ඉතා මහත්වූ ගුණ ඇත්තෝයයි මෙසේ කථාවක් උපදවා උන්සේක.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ දම්සභාමණ්ඩපයට වැඩ මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කීකල්හි මහණෙනි දැන්මතු නොවෙයි. පෙරත් ආනන්‍දස්ථවිර පිරිවර සහිතව සතර මහත් විප්‍යෙහි මනුෂ්‍යයන් ගෙන්වා බොහෝ ගඳදුම් මල්පහන් ගෙණ බෝමැඩ බොධිපූජාවක් කරවූවෝ වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යිටගිය දවස කලිඟුරට දන්තපුරනුවර කලිඟුනම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරන්නාහුය. ඒ රජ්ජුරුවන්ගේ මහාකාලිඞ්ගය චුල්ලකාලිඞ්ගයයි පුත්‍රයෝ දෙදෙනෙක් වූහ. ඔවුන් අතුරෙන් ප්‍රධාන පුත්‍රවූ රාජකුමාරයන් විසින් පියරජ්ජුරුවන් ඇවෑමෙන් රාජ්‍යය කෙරෙතියි නිමිති පාඨකයෝ කීහ. මල්වූ කාලිඞ්ග කුමාරයෝ ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව භික්‍ෂාටනයෙන් ජීවත්වෙති. උන්ගේ පුතනුවෝ කාලිඞ්ගචක්‍රවර්ති රාජ්‍යය කෙරෙති කීහ මෑතභාගයෙහි වැඩිමහලු පුතනුවෝ පියානන්ගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණියාහ. මලනුවෝ යුවරජ තනතුරට පැමිණියාහ. යුවරජ්ජුරුවෝ සිතන්නාහු මාගේ පුතනුවෝ චක්‍රවර්ති රාජ්‍යයට පැමිණෙත්වයි කියා පුතනුවන් නිසා මත් කළහ. රජ්ජුරුවෝ උන්ගේ ඉසුරු සහනයකොට ගතනොහී සුලු කලිඟු කුමරුන් අල්වා ගෙණෙවයි වැඩෙහි හැසිරෙන්නාවූ එක් අමාත්‍යයෙකුහට නියෝග කළාහ. ඒ අමාත්‍යයා ගොස් යුවරජ්ජුරුවන්ට කියන්නේ කුමාරයන් වහන්ස, රජ්ජුරුවන්වහන්සේ නුඹවහන්සේ අල්වනු කැමතිසේක. නුඹවහන්සේගේ ජීවිතය රැකගත මැනවැයි කීහ. ඒ රාජකුමාරයෝ තමන්ගේ පේරුස් මුද්දත් සියුම්වූ පලසත් මහුල් කඩුවත් තුණම වැඩෙහි හැසිරෙන්නාවූ අමාත්‍යයන්හට දක්වා මේ සංඥාවෙන් මාගේ පුතනුවන්ට රාජ්‍යය පාවාදෙවයි කියා වලට වැද සිත්කළුවූ භූමිප්‍රදේශයෙක්හි පන්සලක් කොටගෙණ තවුස් පැවිද්දෙන් පැවිදිව ගංතෙර වාසය කළාහ. මද්‍ර රට සාගල් නුවර මද්‍ර රජුරුවන්ගේ දියනියෙනෙක් වූය. ඒ කුමාරිකාවන්ගේ ලක්‍ෂණ බලා නිමිත්තපාඨකයෝ කියන්නාහු මේ කුමාරිකාවන්වහන්සේ පැවිදිව සිඟා ජීවත්වනසේක. මුන්වහන්සේ බඩ උපන් කුමාරයෝ චක්‍රවර්ති රාජ්‍යයට පැමිණෙනසේකැයි කීහ. ඒ සියළු දඹදිව රජදරුවෝ එපවත් අසා එකපැහැර අවුත් නුවර වටලාගත්හ. මද්‍රරජ්ජුරුවෝ සිතන්න හු ඉදින් මම මේ කුමාරිකාවන් එක එක රජ්ජුරුකෙණෙකුන්ට පාවාදුන්නේ වීම්නම් සෙසු රජදරුවෝ කිපෙන්නාහ. එසේහෙයින් මාගේ දියනියන් රකිම්යි සිතා කුමාරිකාවන්

හා බිසවුන් හැරගෙණ අප්‍රසිද්ධ වේශයකින් නුවරින් පලාගොස් වලට වැද කලිඟු කුමාරයන්ගේ අසපුවට උඩුගඟ පන්සලක් කොටගෙණ පැවිදිව ඇවිලි ආහාරයෙන් ජීවත්වෙමින් ගංතෙර දවස් ඇරියාහ. දෙමව්පියෝ දියනියන් රකිම්හයි සිතා කුමාරිකාවන් පන්සල රඳවා ඵලාඵල පිණිස යන්නාහ. කුමාරිකාවෝ දෙමව්පියන් ගිය කල්හි නොයෙක් මල් ඇරගෙණ මල්පට ගොතා ගංතෙර පිහිටි ගිනිපෙති පන්තියක් මෙන් අටගත්තාවූ සුපිපි අඹ රුකෙක් ඇත. ඒ අඹ රුකට නැගී කෙළ මල්පට දියට දමන්නාහ. ඒ මල්පට එක් දවසක් ගොස් ගඟට බැස නාන්නාවූ කලිඟු කුමාරයන්ගේ හිස දූවටීගියේය. ඒ කුමාරයෝ මල්පට බලා මෙතෙම එක් ස්ත්‍රියක විසින් කරණලද්දේ යමක් වන්නේය. ඒද වැලිත් වෘද්ධ ස්ත්‍රියක විසින් කරණදෙයක් නොවෙයි. තරුණ කුමාරිකාවක විසින් කරණලද කර්මාන්තයෙක් වන්නේය.

එසේහෙයින් ඈ පරීක්ෂාකෙරෙමි සිතා කෙලෙශවසඟයෙන් උඩුගඟට ගොස් ඒ කුමාරිකාව අඹරුක හිඳ මිහිරි ස්වරයෙන් ගායනාකරන්නියගේ ගීතිකාශබ්දය අසා රුකමුලට ගොස් කුමාරිකාව දැක සොඳුර තෙපි කවුරුදැයි විචාළාහ. ස්වාමීනි, මම මිනුෂ්‍ය ස්ත්‍රියකිමි කී කල්හි එසේවීනම් ගසින් බැසපියවයි කී කල්හි ස්වාමීනි. මම රාජකන්‍යාවකිමි නුඹවහන්සේ කිවයි මා ගසින් බසින්නේ නැතැයි කීහ. සොඳුර මමත් රාජකුමාරයෙකිමි බැසපියවයි කීය. ස්වාමීනි, නොපිළිවන රාජකුමාරකිමි කියනබස් පමණකින්ම රාජකුමාරනම් නොවෙති. ඉදින් නුඹවහන්සේ ක්ෂත්‍රියෙක්වීනම් ක්ෂත්‍රිය මායම් කිවුව මැනවැයි කිවූය. එබස් අසා ඔවුනොවුන් දෙදෙන ක්ෂත්‍රිය මායම් කීහ. එසඳ රාජකුමාරිකාවෝ ගසින් බටහ. ඉක්බිත්තෙන් දෙදෙන ඔවුනොවුන් හා සමග වාසය කළහ. ඒ රාජකුමාරිකාවෝ දෙමව්පියන් ආකල්හි ඒ කුමාරයන් කලිඟු රජ්ජුරුවන්ගේ පුත්‍රබවත් නියාවත් වනයට වන් කාරණාත් විස්තර වශයෙන් කීහ. දෙමව්පියෝ යහපතැයි පිළිගෙණ කුමාරිකාවන් රාජකුමාරයන්ට පාවාදුන්හ. ඔවුන් දෙදෙන ප්‍රියසංවාසයෙන් වසන කල්හි රාජකුමාරිකාවෝ දරුගැබක් ලැබ දසමසක් අවෑමෙන් මහපින් ලකුණු ඇති පුත්‍රුවනක් වැදූහ. ඒ කුමාරයන්ට කාලිඟුකුමාරයෝයයි නම් තැබූහ. ඒ කුමාරයෝ වැඩිවිය පැමිණ පියානන් හා මුත්තනුවන් සමීපයෙන් සියලු සිල්ප ඉගෙණ නිමවූහ. ඉක්බිත්තෙන් ඒ කුමාරයන්ගේ පියානෝ පේරුස්මුද්ද හා පලසය මගුල්කඩුවය දී පුත, දන්තපුරනුවර අසවල් වීථියේ අපට වැඩෙහි හැසිරෙන්නාවූ අමාත්‍යයෙක් ඇත. ඔහුගේ ගෙයි යහන් මධ්‍යයට බැස මේ ලකුණු තුණ ඔහට දක්වා මාගේ පුත්‍ර නියාව කියව. අමාත්‍යතෙමේ තොප රාජ්‍යයෙහි පිහිටුවන්නේයයි කීහ. ඒ කුමාරයෝ දෙමව්පියන් හා මුතුන්මිත්තනන්ද වැඳ කුශලමයවූ සෘද්ධියෙන් ගොස් අමාත්‍යයාගේ යහනපිටට බැස තෙපි කවුරුදැයි විචාළ කල්හි සුලූ කලිඟුකුමාරයන්ගේ පුත්‍රයෙමි කියා පේරුස්මුද්ද ආදිවූ රුවන් තුණ දක්වූ අමාත්‍යතෙමේ එපවත් රාජපමිදට කීයේය. අමාත්‍යයෝ නුවර සරහා කුමාරයන්ට දළපුඩුසේසත් නැංවූහ.

ඉක්බිත්තෙන් කාලිඞ්ගභාරද්වාජ නම්වූ පුරෝහිත බ්‍රාහ්මණයෙක් දසවිධවූ චක්‍රවර්තිවත් කීයේය. ඒ රජ්ජුරුවෝ සක්විති වත්දසය පිරූහ. ඉක්බිත්තෙන් ඒ රජ්ජුරුවන්ට පසළොස්වක් දිනයෙහි රථකාරවිලින් චක්‍රරත්නයද, උපොසථ කුලයෙන් හස්තිරත්නයද, වලාහක කුලයෙන් අශ්වරත්නයද, වෙපුල්ල පමිනයෙන් මාණික්‍ය රත්නයද ආයේය. ස්ත්‍රීරත්නය, ගෘහපති රත්නය, පරිනායක රත්නයයි යන

තුණකුත් පහළවිය. එකල්හි රජ්ජුරුවෝ සියලු සක්වළගැබ රාජ්‍යයගෙණ එක්දවසක් සතිස් යොත්තෙක පැතිර සිටියාවූ පරිදින් පිරිවරණලදුව සඳමඬග යෙන් ධවලවූ කෛලාශකූටය හා සමානවූ හස්තිරත්නය පිටට පැනනැගී මහත්වූ ශ්‍රී විලාසයෙන් දෙමව්පියන් සමීපයට ගියාහ. ඉක්බිත්තෙන් රජ්ජුරුවන්ගේ හස්තිරාජයා සියළු සර්වඥයන්ට ජයභූමියවූ පෘථිවිමණ්ඩලයට නාභියක් හා සමානවූ මහ බෝමැඩට මතුභාගයෙන් යන්ට අසමර්ථවිය.

රජ්ජුරුවෝ නැවත නැවත අකුස්සෙන් කොටා ඇතු මෙහෙයවති. ඇත්රජ යන්ට අසමර්ථ විය. එසඳ රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයා රජ්ජුරුවන් හා සමග යන්නේ ආවරණයෙක් නම් නැත. කුමක් නිසා රජ්ජුරුවන් වහන්සේ ඇතු මෙහෙයන්ට අසමර්ථසේක්දැයි පරීක්ෂාකෙරෙමි ආකාශයෙන් බැස සියලු සර්වඥවරයන්ට ජයභූමි පර්‍ය්‍යඞ්ක පෘථිවිය නැබක් හා සමානවූ මහබෝමැඩ දුටහ. එකලට එතන රජ කිරියක් පමණ තැන සාවුන්ගේ දළි පමණ තණපතෙක් නම් නැත්තේය. ධවලවූ රිදීෂටක් හා සමානවූ වැල්ලෙන් ගැවසීගෙණ තිබෙන්නේය. හාත්පසින් තෘණලතා වනස්පතීහු බොධිමණ්ඩලය ප්‍රදක්ෂිණාකොට කරකැවී බෝමැඩට අභිමුඛව සිටිනාහ. පුරෝහිත බ්‍රාහ්මණ තෙමේ භූමිප්‍රදෙශය බලා සියළු සර්වඥයන් සකල ක්ලෙශයන් නසන්නාවූ ස්ථානයක් වන්නේය. මීට මතු පිටින් ශක්‍රාදීන් විසිනුත් යන්ට නොපිළිවන් වන්නේයයි සිතා කලිඟු රජ්ජුරුවන් සමීපයට ගොස් බෝමැඩ වර්ණනාකොට රජ්ජුරුවන්ට නමස්කාරකොට කීයන්නේ මහරජ්ජුරුවන්වහන්ස මේ භූමිප්‍රදෙශය සියලු සර්වඥවරයන් විසින් වර්ණනාකරණ ලද්දේය. පහවූ ක්ලේශාන්ධකාරය ඇති තරුණ සූර්‍ය්‍යාමෙන් බබලන්නාවූ සර්වඥවරයෝ මෙතැන්හි හිඳ බැබලූනාහ. මෙහි භූමිප්‍රදෙශයට තෘණලතා වනස්පතීහු දක්ෂිණාවෘතව කරකැවී නමස්කාරකොට සිටිනාහ. දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝනකඩ බොල් මහ පොළොවට නාභියක් හා සමානවූ අචල ස්ථානයක කප්මුල අටගත්තේය. නස්නාකල්හි පසුව නැසෙන්නේය.

මෙසේ අප විසින් ලක්ෂණ මන්ත්‍ර වශයෙන් අසනලද්දේය. චතුස් සමුද්‍රය අවසන්කොට ඇති පෘථිවියට නැබක් හා සමානවූ සියළු සර්වඥයන් කෙළෙස් පඳුරු කඩාදමන්නාවූ ස්ථානයෙක ආකාශයෙන් බැස නමස්කාර කළමැනව. පූජාසත්කාර කළමැනව. තවද රජ්ජුරුවන්වහන්ස චක්‍රවර්ති රජදරුවන්ගේ හස්තිරත්නයයි කියනලද උපොසථ කුලයෙහි උපන්නාවූ යම් පමණ හස්තිරාජයෙක් ඇත්නම් සියල්ලෝම වජ්‍රාංකුසයෙන් කොටා මෙහෙයතත් ඒකාන්තයෙන් ඒ බොධිමණ්ඩල ප්‍රදෙශ සමීපයට වියනොහෙන්නාහුමය, නුඹවහන්සේගේ මේ ඇත්රජ කාලවක කුලය ප්‍රධාන කොට ඇති ඇත්කුල අට හිස්ම විශිෂ්ටවූ උපොසථ කුලයෙහි උපන්නේය. මා කී බස් අදහනු සඳහාඑබඳු උත්තම හස්තිරාජයා විදුර එබූ අකුස්සෙන් කොටා මෙහෙයාලුව මැනව. නුඹවහන්සේ කොතෙක් උත්සාහ කළත් මෙපමණකිත් මත්තෙය ඇත්රාජයා ගෙණ නොමහෙයි කාලිඞ්ගභාරද්වාජ නම් බ්‍රාහ්මණතෙම කීයේය. එබස් අසා කලිඟු රජ්ජුරුවෝ මේ බමුණාගේ බස් සැබෑදෝ බොරුදෝහෝයි පරීක්ෂාකරණු පිණිස ඇතු මෙහෙයාලූහ. එසඳ ඒ ඇත්රජ කුඤ්චනාදකොට පසුබැස සොඬ ඔසොවා කර නමා ගරුභාරය උසුලාගතනොහෙන්නාහුමෙන් ආකාශයෙහිම් උක්කුටුකයෙන් හුන්නේය. ඒ ඇත් රජ්ජුරුවන් විසින් වීදුරු එබූ අකුස්සෙන් නැවත කොටන්ට වන් කල්හි වේදනාව ඉවසාගතනොහී කළුරිය කෙළේය. රජ්ජුරුවෝ වූකලී ඔහු

මළ නියාව නොදන්න ඇතුපිටම උන්හ. එකල කාලිඞ්ගභාරද්වාජ නම් පුරෝහිත බ්‍රාහ්මණයානෝ කියන්නාහු මහරජ්ජුරුවන්වහන්ස නුඹවහන්සේගේ ඇත් රජ නිරුද්ධව ගියේය. එසේහෙයින් නුඹවහන්සේ විසින් කෙනෙක් උත්සාහ කළත් මේ ඇතු පිටින් මෝමැඩ මත්තෙන් යන්ට නොපිළිවන. අනික් ඇතකු එන පරිද්දෙන් සිතුව මැනවැයි කීහ. ඒ රජ්ජුරුවන්ගේ කුශලානුභාවයෙන් අනික් ඇත් රජෙක් උපොසථකුලයෙන් අවුත් පිට පෑලූයේය. රජ්ජුරුවෝ ඒ ඇතුපිට උන්හ එකෙණෙහි මළ ඇත්රජ බිම හුනුයේය. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ආකාශයෙන් බැස බොධිමණ්ඩලය බලා ප්‍රාතිහාර්‍ය්‍යය දැක බමුණාන්ට සතුති කරන්නාහු බමුණානෙනි, සියළු පදාර්ථය හස්තාමලකයක් මෙන් දක්නා සුලුවූ ලොකොත්තරවූ සියල්ල දත්තාවූ සම්‍යක් සම්බුද්ධයෝ නම් තෙපියයි ප්‍රශංසා කළාහ. කාලිඞ්ගභාරද්වාජ නම් බමුණු ඒ අසන්නා ගුණ සම්භාවනා නොඉවසා තමන් යටත් තනතුරෙහි තබා සර්වඥයන් උසස්කොට වර්ණනා කළහ. මහ රජ්ජුරුවන් වහන්ස, අපි ශාස්ත්‍රය දැක කියන්ට සමර්ථ හෙයින් ශ්‍රැතබුද්ධ නම් වම්හ. සර්වඥවූකලී අතීත, අනාගත, වර්තමානයයි කියනලද කාලත්‍රය වර්තිවූ සියලු පදාර්ථය දක්නාහු වෙති, සර්වඥතාඥානයෙන්ම සියල්ල දනිති. ලක්ෂණයෙන් නොදනිති අපි වූකලී ආගම පුරුෂයම්හ. අපගේ ශිල්ප බලයෙන් දනුම්හ. ඒද වැලින් එකදෙශයක් දනුම්හ. සර්වඥයෝකලී සංස්කාර, විකාර, ලක්ෂණ, නිර්වාණ, ප්‍රඥප්තිය යන පඤ්චවිධ ඥෙයමණ්ඩලය කරතලාමලක ක්‍රමයෙන් දනිති.

මෙසේ අනෙකප්‍රකාරයෙන් සර්වඥගුණය වර්ණනා කළාහ. කලිඟු රජ්ජුරුවෝ සර්වඥගුණයෙහි පැහැද සොම්නසට පැමිණ සියළු සක්වළ වාසීන් ලවා ගඳදුම් මල් පහන් ගෙන්වාගෙණ මහබෝමැඩ සතියක් මුළුල්ලෙහි බොධි පූජා කරවූහ නැවත රජ්ජුරුවෝ මහබෝමැඩ අටළොස්රියන් පමණ උස ඇති රන්ටැඹක් සිටුවා ඊට වටකොට සත්රුවන්මයවූ කනකමිණි පරික්ෂෙපකරවා සත්රුවන්මයවූ වැලි තනවා පවුරු වලල්ලකින් වටකරවා සත්රුවන්මයවූ දොරටු කැරවූහ. දවසක් පාසා සැටයාලක් මල් රැස්කරවා බෝමැඩට මහත්වූ පූජාවක් කැරවූහ. මෙසේ බොධිපූජාව කරවා ගොස් දෙමව්පියන් කැඳවාගෙණ දන්තපුර නුවරට අවුත් දානාදී පින්කම්කොට ආයු කෙළවර ගොස් ත්‍රයත්ත්‍රිංශත් දිව්‍යලොකයෙහි උපන්හ. ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි, දැන්මතු නොවෙයි පෙරත් ආනන්ද ස්ථවිරයෝ බොධිපූජා කළෝම වේදැයි වදාරා මේ කාලිඞ්ගබොධි ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කලිඟු රජ්ජුරුවෝ නම් දැන් මේ ආනන්ද ස්ථවිරයෝය. කාලිඞ්ගභාරද්වාජ බ්‍රාහ්මණයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

472
අකීර්ති ජාතකය

තව ද එක්සමයෙක්හි ත්‍රිභුවන හෘදයානන්දකරවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවත්නුවර වාසිවූ සිවුදනපතිවූ පුරුෂයකු අරභයා මේ ජාතකකය වදාළසේක.

ඒ කෙසේද? යත්,

ඒ උපාසක තෙමේ සර්‍වඥයන්වහන්සේට ආරාධනාකොට සතියක් මුළුල්ලෙහි බුදුපාමොක් මහසඟ පිරිවරට මහදන්දී කෙළවර දවස් ආයශ්‍රී සඞ්ඝයාට සියලු පිරිකර දන් දුන්නේය. ඉක්බිත්තෙන් සර්‍වඥයන් වහන්සේ ඔහට සිවු වර්‍ණක් පමික් මධ්‍යයෙහි අනුමෙවෙනි ධර්‍මදෙශනා කරණසේක්. උපාසකය තාගේ පරිත්‍යාගය ඉතා මහත්වන්නේය. තා විසින් නොකටයුත්තක් නොකරණලද. මේ දානවංශය නම් පුරාතනයෙහි නුවණැත්තන්ගේ වංශයෙක් නම් වන්නේය. දානය නම් ගිහින් විසිනුත් ප්‍රව්‍රජිතයන් විසිනුත් දියයුතුවන්නේය. පුරාතන නුවණැත්තෝ තවුස් පැවිද්දෙන් පැවිදිව වල්හි වසන්නාවූ පැමිණි යාචකයන්ට සෑහෙන පමණක් දී තුමූ ප්‍රීති සැපයෙන් දවස් යැව්වෝ වේදැයි වදාරා ස්වාමීනි, මා විසින් දෙනලද්දාවූ සර්‍වපරිස්කාර දානය මහජනයාට ප්‍රකාශව දැනෙන හෙයිනුදු නුඹවහන්සේ විසින් වදාරණ ලද්දාවූ දානය අප්‍රකාශය අපට වදාළ මැනවැයි උපාසකයා විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ අසූකෙළක් සම්පත් ඇති බමුණු මහසල්කුලයෙහි උපන්හ. උන්ට අකීර්ති කුමාරයෝයයි නම් තුබූහ. ඒ කුමාරයන් පියවර ඔසවා ඇවිදින අවස්ථාවෙහි නැඟනී කෙණෙක් උපන්හ. උන්ට යසවතී යයි නම් තුබූහ. මහබෝසතාණෝ සොළොස් ඇවිරිදි වයසට පැමිණි කල්හි තක්සලා නුවරට ගොස් සියළු ශිල්ප ඉගෙණ නැවත ආවාහුය. ඉක්බිත්තෙන් ඒ බොධිසත්ත්වයන්ගේ දෙමව්පියෝ කාලක්‍රියා කළාහ. බොධිසත්ත්වයෝ උන්ට කළමනා සොහොන් පෙරහැර කරවා රත්නාවලෝකනය කරන්නාහු අසවල් තැනැත්තෝ මෙතෙක් සම්පත් රැකනබා මිය පරලොව ගියෝය. යන වචනය අසාලා කලකිරුණාවූ සිත් ඇතිව මේ වස්තුව පෙණෙන්නේය. වස්තු රැස්කළාහු නොපෙණෙති සියල්ලෝම සම්පත් හැර මිය පරලොව ගියාහ. මමවූකලී මේ සම්පත් කැටුවම හැරගෙණ යෙමි සිතා නැඟනියන් සමීපයට කැඳවා තෙපි මේ වස්තුව පිළිපදුවයි කීහ. නුඹ වහන්සේගේ අදහස් කවරේදැයි විචාළ කල්හි මම මහණවනු තැමැත්තෙමි කීහ.

බෑනන්වහන්ස නුඹවහන්සේ විසින් දමනලද කෙළ මම මුදුනෙන් පිළිගණිම්ද? මට මින් ප්‍රයෝජන නැත. මමත් මහණවෙමියි කීහ. බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට දන්වා නුවර බෙරලවන්නාවූ සම්පත්තියෙන් ප්‍රයෝජන ඇති කෙණෙක් අකීර්ති පණ්ඩිතයන්ගේ ගෙට එත්වයි කියා බෙරලවා සතියක් මුළුල්ලෙහි මහදන් පවත්වා වස්තු නොගෙවීන හෙයින් සිතන්නාහු මාගේ ආයුසංස්කාරය ගෙවී යන්නේය. මේ සම්පත් කෙළි කෙළී මෙන් ප්‍රයෝජන කිම්ද? කැමැති කෙණෙක් ඇරගණිත්වයි රුවන් පිරුණු ගබඩාවල දොර අරවා මා විසින් දෙනලද මෙය කැමති සැටියේ ඇරගණුවයි කියා රත්රුවන් සහිතවූ ගෙවල් හැර බඳුවූ වගීයා අඬ අඬා සිටියදීම නැඟනියන් කැඳවාගෙණ බරණැස් නුවර වාසල් දොරින් නික්මුනාහුය. යම් වාසල් දොරකින් නික්මුනාහු වීතම් ඒ අකීර්ති

වාරයයි මේ නමින් ප්‍රසිද්ධ විය. යම් තොටකින් ගඟට බැස එතරවූනම් ඒ තොටත් අකිර්ති තිත්ථයයි නම් විය. බොධිසත්ත්වයෝ නුවරින් නික්ම තුන් යොදුනක් පමණ තැන් ගොස් සිත්කළුවූ තැනක පන්සලක් කොටගෙණ නැගනියන් හා සමග තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූහ. බොධිසත්ත්වයෝ මහණවූ තැන් පටන් බොහෝ ගම් නියම්ගම් රාජධානිවල මනුෂ්‍යයෝ පැවිදි වූහ. මහපිරිවර හා මහත්වූ ලාභ සත්කාර උපන, බුද්ධොත්පාද කාලයක් මෙන් පැවැත්තේය.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ සිතන්නාහු මේ ලාභසත්කාරත් ඉතා මහත්වන්නේය. පිරිවරත් ඉතා මහත, මා විසින් උදසලාව වසන්නට වටනේයයි සිතා රාත්‍රිභාගයෙහි යටත්පිරිසෙයින් නැගනියන්ට නොදන්වා උදකලාව නික්ම ක්‍රමයෙන් සොලී රටට අවුත් කාවීර නම් පටුන්ගම සමීපයෙහි උයනක වැස පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ඉපදවූහ. එතැන්පටන් මහත්වූ ලාභසත් කාර උපන්නේය. ඒ සත්කාරයට පිළිකුල් කෙරෙමින් පැහැර ආකාශයෙන් ගොස් නාගදිපය සමීපයෙහි කාරදිවයිනට බටහ එසමයෙහි කාරදිවයින අහිදීප නම් විය. බොධිසත්ත්වයෝ එහි මහත්වූ කරගසක් ඇසුරුකොට පන්සලක් කොටගෙණ වාසය කළාහ. බොධිසත්ත්වයෝ එහි වසන නියාව කිසිකෙණෙකුන් නොදන්නාහ.

ඉක්බිත්තෙන් උන්ගේ නැගනියෝ බෑනන්වහන්සේ කොයිද්දෙහෝයි පරීක්ෂා කෙරෙමින් ක්‍රමයෙන් සොලී රටට ගොස් බොධිසත්ත්වයෝත් උන් විසූ තෙනම විසූහ. ධ්‍යාන උපදවන්ට අසමර්ථ වූහ බෝසතාණෝ වූකලී තමන් අල්පෙච්ඡ බැවින් කිසිතැනකට නොගොස් ඒ කරගස එල අටගත් කල්හි එල අනුභව කෙරෙමින් කොල අටගත් කල්හි කොල කඩාගෙණ පැන් පමණක්වත් කොට උයා අනුභව කෙරෙති. බොධිසත්ත්වයන්ගේ ශීලතේජසින් ශක්‍රයාගේ පාණ්ඩුකම්බලශෛලාසනය හුණුවිය. ශක්‍රයෝ මා මේ ස්ථානයෙන් චුතකරවනු කැමැත්තෝ කවුරුද්දෙහෝයි පරීක්ෂා කරන්නාහු අකීර්ති පණ්ඩිතයන් දැක කුමක් නිසා මේ තපස්වී උග්‍රතපස් කෙරෙද්ද ශක්‍රසම්පත් පතත්ද්දෙහෝයි නොහොත් අනිකක් පතත්ද්දෙහෝයි පරීක්ෂාකෙරෙමියි සිතා නැවත සිතන්නාහු මූතුමූ දුකසේ ජීවත්වෙති. පැන් පමණක් වත්කොට ඉවූ කරකොල අනුභව කෙරෙත්. ඉදින් ශක්‍රසම්පත් පතත්නම් තමන්ට ඉවූ කරකොල මට දෙති නැත්නම් නොදෙතියි සිතා බ්‍රාහ්මණ වේසයකින් බොධිසත්ත්වයන් සමීපයට ගියාහ. බොධිසත්ත්වයෝ කරකොල උයා බා තබා නිවී ගියකල අනුභවකෙරෙමියි. සිතා පන්සල් දොරකඩ උන්හ. එසඳ ශක්‍රයෝ බොධිසත්ත්වයන් ඉදිරියෙහි සිටියාහ. බොධිසත්ත්වයෝ ශක්‍රයන් දැක සොම්නස්ව ඒකාන්තයෙන් යාචකයක්හු දුටු හෙයින් මට වූයේ මහත් ලාභයෙක. අද මාගේ මනදෙළ මුදුන් පමුණුවා දන්දෙමියි කරකොල ඉවූ බඳුනිම්ම ඇරගෙන ගොස් මාගේ මේ දානය සර්වඥතාඥානයට කාරණා වේවයි තමන්ට නොතිබාම ශක්‍ර බ්‍රාහ්මණයාගේ භික්ෂාභාජනයෙහිම ලූහ. බමුණු දන් ගෙණ මදතැන් ගොස් අතුරුදන් විය. මහබෝසතාණෝත් ඔහට දන්දී නැවත කරකොල නූයා ප්‍රීතිසැපයෙන්ම දවස් යවූහ. දෙවෙනි දවසුත් එසේම කොල උයා පන්සල්දොර හුන්කල්හි ශක්‍රයෝ නැවැත බමුණුවෙසින් අවුත් සිටියාහ. නැවත බොධිසත්ත්වයෝ ඔහට දන්දී එසේම ප්‍රීතිසැපයෙන් දවස්යවා තුන්වෙනි දවසුත් දන්දී එසේම ප්‍රීතිසැපයෙන් දවස් යවා සිතන්නාහු අනේ මට වූයේ මහත්වූ ලාභයෙක, කරකොල නිසා මහත්වූ කුශලයෙක් මා විසින් රැස්කරණ ලද්දේයයි සොම්නසට පැමිණ තුන්දවසක් මූළුල්ලෙහි

නිරාහාරයෙන් දුම්ලවූ තැනැත්තෝ මධ්‍යාහ්න වේලාවේ පන්සලින් නික්ම තමන් දුන් දන් සලකමින් පන්සල්දොර උන්හ. ශක්‍රයෝ සිතන්නාහු මේ තපස්වී තුන්දවසක් මුළුල්ලෙහි නිරාහාරව දුම්ලව සිට දන්දෙන තැනැත්තෝ සතුටුසිතින්ම දන්දෙති. චිත්තයෙහි අන්‍ය තත්ත්වයෙක් නම් නැත්තේය. මම් මූන් මෙනම්දෙයක් පතා දන්දෙති නොදනිමි. විචාරා අදහස් දැනගණිමියි සිතා මධ්‍යාහ්න වේලාව ඉකුත්වූ කල්හි මහත්වූ ශ්‍රීසමෘද්ධියෙන් ලහිරුම්ඩලක් මෙන් බබලමින් අඩුත් මහබෝසතාණන් ඉදිරියෙහි සිට සිත්වත්වූ තාපසයෙනි මෙබඳු හුණුවූ සුලඟ පහරණ නැත්හි මෙබඳුවූ ලවන ජලයෙන් වටකරණලද ආරණ්‍යයෙහි හිඳ මනුෂ්‍ය සම්පත් ආදීවූ කවර සම්පතක් ප්‍රාර්ථනාකොට හුදකලාව හිඳ තපස් කරවුදැයි විචාළහ.

එබස් අසා මහබෝසතාණෝ උන් ශක්‍ර නියාව දැන මම මේ ශක්‍ර සම්පත් ආදිය පතන්නෙම් නොවෙමි. සර්වඥතාඥානය ප්‍රාර්ථනා කෙරෙමින් තපස් රක්‍ෂා කෙරෙමි. ප්‍රකාශකරන්නාවූ ශක්‍රදේවේන්ද්‍රයෙනි, යම්හෙයකින් නැවත නැවත ඉපදීම ද පඤ්චස්කන්ධයන්ගේ නැසීම ද සම්මෝහ මරණය ද යන මේ තුණ සත්ත්වයන්ට ඒකාන්තයෙන් දුක්වේද එසේහෙයින් යම්තෙනක මේ තුණ නැත්නම් එබඳු නිර්වාණය ප්‍රාර්ථනා කෙරෙමින් මේ වනයෙහි තපස් රක්‍ෂා කෙරෙමි. තමන් නිර්වාණයෙහි අදහස් ඇති නියාව ප්‍රකාශකොට කීහ. එබස් අසා ශක්‍රයෝ සතුටුවූ සිත් ඇතිව තුමූ සියලු භවයෙහි කලකිරුණාහුය. නිවන් පතා මේ වල හිඳ තපස් කෙරෙති. එසේ හෙයින් උන්ට වර දෙමි සිතා වර යෙන් ආරාධනා කරන්නාහු කාශ්‍යප ගොත්‍රයෙහි උපන් අකීර්ති පණ්ඩිත යෙනි තොප විසින් මනාකොට කියනලද්දවූ මේ සුභාසිත වචනය හෙතුකොට ගෙණ තොපට වර දෙමි සිතා ආමි. තොප සිතින් යම් වරයක් ගන්නා කැමැත් තා නම් වර දෙමි ගණුවයි කීහ.

එබස් අසා මහබෝසතාණෝ වරගන්නාහු ශක්‍රදේවේන්ද්‍රයෙනි ඉදින් තෙපි මට වර දෙනු කැමැත්තා නම් යම් ලෝභයක් හේතුකොටගෙණ දූදරුවෝය භාර්‍යාවෝය ධනධාන්‍යය අන්‍යවූ ප්‍රිය වස්තුවය යන මේ සියල්ල ලදින් සත්ත්වයෝ තෘප්තියකට නොපැමිණෙද්ද නැවත පුත්‍රාදීන් ප්‍රාර්ථනාකෙරෙද්ද එබඳුවූ ලෝභයෙක් මාගේ සන්තානයෙහි නොවැසෙවයි නූපදීවයි, මෙසේ ලෝභය නූපදිනා වර ගන්නා කැමැත්තෙමියි කීහ. එබස් අසා ශක්‍රයෝ සතුටුව නැවතත් මත්තෙහි වර දෙනු කැමතිවූහ. බොධිසත්ත්වයෝ වර ගන්නා කැමතිව කියන්නාහු, ශක්‍රයෙනි ඉදින් තෙපි මට වර දෙනු කැමැත්තා නම් සන්තානයෙහි අටගන්නාවූ යම් ක්‍රොධ චිත්තයකින් කිපියාවූ සත්ත්වයෝ ප්‍රාණවධ ආදිය කොට රජ්ජුරුවන්ගෙන් ඉස් කන් නාසා කැපීම් ආදි වශයෙන් දණ්ඩනයට පැමිණ හෝ ඒ විස අනුභව කිරීම් සෙලින් හෙලීම් කර වැල් ලීම් ආදී වශයෙන් නමා මැරීම් හෝ ක්‍ෂෙත්‍රවාස්තු රන්රුවන් ඇතුන් අසුන් ගෙරි මීවුන් කෙල්ලන් කොල්ලන් ආදීවූ සියලු සම්පතින් පිරිහී ගියෙද්ද, ඒ සියලු වස්තු නසාපියද්ද එබඳුවූ කෝපයෙක් මා සන්තානයෙහි නූපදීවයි.

තවද ශක්‍රයෙනි ඉදින් තෙපි මට වර දෙනු කැමැත්තාහම් අඥානවූ සත්ත්වයා ඇසින් නොදකිම්වයි අසවල්තෙන වෙසෙති යන්නාක් මා කණිනුත් නොඅසම්වයි එබඳු නුවණ නැති සත්ත්වයා හා සමග එකතැන නොවෙසෙම්වයි පසු පෙරත්තු කථාවකුත් නොකෙරෙම්වයි ඔහු බස් කිසිකලෙකත් මට ප්‍රිය නොවේවයි කීහ. එබස් අසා ශක්‍රයෝ කියන්නාහු බොධිසත්ත්වයෙනි අඥානවූ සත්ත්වයා තොපගේ මෑනියන් පියාතන් මරාපිද තොපට අන්‍යවූ කවර අනර්

යක් අවැඩක් කරපිද කවර වස්තුවකින් පැහැරගණිද, කුමක් නිසා අඥතවූ සත්ත්වයා දක්නා නොකමැත්තාද ඊට කාරණා කියවයි කීහ. එබස් අසා බෝධි සත්ත්වයෝ කියන්නාහු ශක්‍රයෙනි නුවණ නැත්තාවූ සත්ත්වතෙම අකාරණය කාරණයයි ගන්නේය. ප්‍රාණඝාතාදිය කොට ජීවත්වෙයි, අවැඩට සුදුසු කාරිය සිතන්නේය. ශ්‍රද්ධාධුර ප්‍රඥාධුරයෙහි නොයොදා අකාරියෙහි යොදන්නේය. ප්‍රාණඝාතාදීවූ දුශ්ශීල කර්මය සමාදන්ව පැවැත්ම යහපතැයි ගන්නේයයි කීහ. එබස් අසා සතුටුව නැවත ශක්‍රයෝ වර දෙමියි කී කල්හි බෝධිසත්ත්වයෝ වරගන්නාහු ශක්‍රයෙනි තෙපි මට වර දෙනු කැමැත්තානම් මෙලොව පරලොව දන්නා කාරණාකාරණ දන්නා නුවණැති සත්පුරුෂයා ඇමවේලෙහිම දකිම්වයි අසවල්තෙන උන්නේයයි මා සිය කණින් අසම්වයි ඒ සත්පුරුෂයා හා සමග එකතෙන වෙසෙම්වයි පසු පෙරත්තුව කථාකෙරෙම්වයි ඔහු කියන්නාවූ බස් මට ප්‍රියවෙම්වයි කීහ. එබස් අසා ශක්‍රයෝ කියන්නාහු අකීර්ති පණ්ඩිතයෙනි ඒ නුවණැති සත්පුරුෂයා තොපට ගමක් බිමක් කෙල්ලකු කොල්ලකු දීපිද නොහොත් තොප මහත්වූ ඓශ්වර්යකට පමුණුවාපිද කවර කාරණයකින් තොපි නුවණැති සත්පුරුෂයාගේ දැකීමම කැමැත්තාදැයි විචාළහ.

එසඳ බෝධිසත්ත්වයෝ කියන්නාහු ශක්‍රයෙනි නුවණැති සත්ත්වතෙම කාරණය කීකල එසේ කියේ කාරණයයි ගන්නේය. අකාරියෙහි නොයොදා කාරියෙහිම යෙදෙන්නේය. දානශීලාදීවූ සුචරිතයෙහි යහපතැයි ගන්නේය. මෙරමාත් මෙබඳුවූ කුශලකර්මයෙහි යොදන්නේය. කාරණයක් කීකල ඊට නොකිපෙන්නේය මෙසේ ඉඳුව සිටුව යනාදීන් අවවාද කළ කල එකී එකී අවවාද පිළිගන්නේය. එසේහෙයින් එබඳු සත්පුරුෂයා හා එක්වීම මේ කාරණයෙන් යහපත් වන්නේයයි කීහ. එබසට සතුටුව ශක්‍රයෝ නැවත වර ගන්ට කීහ. බෝධිසත්ත්වයෝ වර ගන්නාහු ශක්‍රයෙනි ඉදින් තෙපි මට වර දෙනු කැමැත්තාහු වීනම් මේ රාත්‍රිය ඉක්ම සෙටදවස් ඉර නැගි වේලෙහිම දිව්‍ය භොජනය පහළවේවයි ඒ දිව්‍යභොජනය පිළිගන්ට සුදුසුවූ යාචකයෝ මා සමීපයට අවුත් සිටත්වයි දන්දෙන්නාවූ මාගේ වස්තුව නොගෙවේවයි දන්දී පසුතැවිල්ලකටත් නොපැමිණෙම්වයි දෙමින් සිටත් සිත පහදවම්හයි ශක්‍රයෙනි මේ වරයත් ගණිමි කීහ. එබසට සතුටුවූ ශක්‍රයෝ නැවත වරගන්ට කීහ

බෝධිසත්ත්වයෝ වරගන්නාහු ශක්‍රයෙනි ඉදින් තෙපි මට වර දෙනු කැමැත්තා නම් තොප දූත් මා සමීපයට ආවාසේ මතු අතික් දවසෙක මා සමීපයට නොඑවුනම් මේ වරය ගණිමි කීහ. එබස් අසා ශක්‍රයෝ කියන්නාහු අකීර්ති පණ්ඩිතයෙනි දන්දීම් සිල්රක්ෂාකිරීම් ආදීවූ නොයෙක් පින්කොට බොහෝ ස්ත්‍රී පුරුෂයෝ මා දක්නා කැමතිව මනුෂ්‍යලෝකයෙන් අවුත් මා සමීපයෙහි උපදිති. එසේවූ මා දැක්මෙහි තොපට භය කවරේදැයි විචාළාහ. එබසට කියන්නාහු බෝධි සත්ත්වයෝ ශක්‍රයෙනි මෙබඳු දිව්‍යාභරණයෙන් සැරසී ලහිරුමඬලක් මෙන් දිලිහි දිලිහී සිටිනාවූ තොපගේ ශ්‍රී සමෘද්ධිය දැක තොපගේ ශක්‍රසම්පත් පතායෙම් වීම්නම් නිවන් සඳහා කරණ තපස් ශක්‍රසම්පත් නම් වෙයි. එසේහෙයින් ශක්‍රසම්පත් පතන්නාවූ මම නිවන් තකා කරන්නාවූ තපසෙහි ප්‍රමාදයට පැමිණියෙම්නම් වෙමි. තොපගේ දැක්මෙහි භය නම් මට මේ තපසෙහි ප්‍රමාදයට කාරණායයි කීහ. එබස් අසා ශක්‍රයෝ සතුටුව යහපත ස්වාමීනි මෙතැන්පටන් නුඹවහන්සේගේ සමීපයට නොඑමි ප්‍රතිඥා දී

බොධිසත්ත්වයන් වැඳ ක්ෂමාකරවා තමාගේ දිව්‍යලෝකයට ගියාහ. මහබෝසතාණෝ දිවිපමණින් එතැන්හිම වැස මෛත්‍රීකරුණාදීවූ බ්‍රහමවිහාර භාවනා කොට නොපිරිහුනාවූ ධ්‍යානයෙන් ගොස් බ්‍රහමලෝකයෙහි උපන්නාහ. ශාස්තෲවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා විදූරා මේ **අකීර්ති ජාතකය** නිමවා වදාළසේක.

එසමයෙහි ශක්‍රදේවේන්‍ද්‍රයෝ නම් දිවැස් ඇත්තන් කෙරෙහි අගතැන් පත්වූ මේ අනුරුද්ධස්ථවිරයෝය. එසමයෙහි අකීර්ති පණ්ඩිතයෝ නම් තිලෝගුරු සම්‍යක්සම්බුදුරජවූ මම්ම වේදූයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

473
තක්කාරි ජාතකය

තවද එක් සමයෙක්හි ලෝකානන්දකර තිලෝගුරු සම්‍යක් සම්බුදු රජාණන්වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසනසේක් **කෝකාලික** ස්ථවිරයන් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේ ද? යත්,

එක් වස්සාන සමයෙක අග්‍රශ්‍රාවක දෙදෙනාවහන්සේ භික්ෂුසඞ්ඝයා හැර විවේක වාසයෙන් වසනු කැමතිව සමීඳයන්වහන්සේද කෝකාලිකස්ථවිරයන් වහන්සේ වසනතැනට ගොස් වදාරණසේක් ඇවැත්නි කෝකාලිකස්ථවිරයෙනි තොප නිසා අපටද අප නිසා තොපටද යම්සේ සැපවූ විහරණයෙක් වේනම් එපරිද්දෙන් මේ තුන්මස මෙතැන්හිම වසනු කැමැත්තම්හයි වදාළසේක. එබස් අසා කෝකාලික ස්ථවිරයන්වහන්සේ වදාරණසේක් ඇවැත්නි මා නිසා තොපට සැපවූ විහරණය කවරේදූයි කීසේක. අගසව්වන් වදාරණසේක් ඇවැත්නි ඉදින් තොපි අග්‍රශ්‍රාවකදෙදෙනාවහන්සේ මෙතැන්හි වසනසේකැයි කිසිකෙණෙකුන්ට නොකීවානම් අපි සැපසේ වසම්හ. තොපි නිසා අපට ඵාසු විහරණයයි කීසේක. එසඳ කෝකාලික ස්ථවිරයන්වහන්සේ විසින් ඇවැත්නි තොපි දෙදෙනාවහන්සේ නිසා මට වන්නාවූ ඵාසු විහරණය කවරේදූයි කී කල්හි අපි තොපට වස් තුන්මස මුළුල්ලෙහි බණකියම්හ. සූත්‍රාභිධර්මදෙකත් වදාරම්හ. මේ තොපට අප නිසා වන්නාවූ ඵාසු විහාරය වේදූයි කීසේක එසඳ කෝකාලික ස්ථවිරයන්වහන්සේ එසේවීනම් ඇවැත්නි තොපගේ අදහස්වූ පරිද්දෙන් වසම්හයි අග්‍රශ්‍රාවක දෙදෙනාවහන්සේට උතුම්වූ සෙනසුන් දුන්සේක. ඒ දෙදෙනාවහන්සේ ඵලසමාපත්ති සැපයෙන් සැපසේ දවස් යවා එහි විසූසේක. ඒ දෙදෙනාවහන්සේ විහාරයෙහි වසන නියාව කිසිකෙණෙකුන් නොදන්නාහුය.

ඉක්බිත්තෙන් දෙදෙනාවහන්සේ වස්වැස අන්තයෙහි වප්මැදි පොහෝ දවස් පවරා ඇවැත්නි තොප නිසා සැපසේ විසුම්හ. සමීඳයන්වහන්සේ වඳින්ට යම්හයි කෝකාලික ස්ථවිරයන්ට කීසේක. තෙරුන්වහන්සේ යහපතැයි කීබස් පිළිගෙණ අගසව්වන්වහන්සේ කැඳවාගෙණ සමීප ගමකට සිඟා වැඩිසේක. අගසව් දෙදෙනාවහන්සේ වළඳා ඉක්බිති ගමින් පිටතට නික්මුනුසේක. කෝකාලික ස්ථවිරයන්වහන්සේ අගසව්වයන්වහන්සේට ගමන් පසුකොට නික්මවා පෙරලා අවුත් මනුෂ්‍යයන්ට කියනසේක් උපාසකවරුනි තොපි තිරිසනුන් හා සරිවේද, අගසව්වන්වහන්සේ තුන්මසක් මුළුල්ලෙහි මේ

සමීපයෙහි වසන නියාවත් නොදනුව. දූන් ඒ දෙදෙනාවහන්සේ පලාගියසේක්වේදැයි කීසේක. එබස් අසා මනුෂ්‍යයෝ කුමක්නිසා නුඹවහන්සේ නොකීසේක්දැයි කියා බොහෝ ගිතෙල් තලතෙල් ආදිවූ ගිලානප්‍රත්‍යය හා සිවුරු පිළි ආදිය ගෙණ දෑගසව්වන්වහන්සේ කරා ගොස් නමස්කාරකොට ස්වාමීනි අපට ක්ෂමාකොට වදාළමැනව අපි නුඹවහන්සේ අග්‍රශ්‍රාවක නියාව නොදනුම්හ. අද අපගේ කෝකාලික පින්වතුන්වහන්සේගේ වචනයෙන් දතුම්හ. අපට අනුග්‍රහ පිණිස මෙකී ගිලානප්‍රත්‍යය හා සිවුරු පිළි ආදිය පිළිගත මැනවැයි ආරාධනා කළාහ. එසඳ කෝකාලික ස්ථවිරයන්වහන්සේ සිතනසේක් දෑගසව්වන්වහන්සේ තමන් අල්පේච්ඡ බැවින් මේ සිවුරු පිළි ආදිය තමන්වහන්සේට නොගෙණ මට දෙනසේකැයි සිතා උපාසකවරුන් හා සමග ස්ථවිරයන් සමීපයට ගියසේක. දෑගසව්වන්වහන්සේ භික්ෂූන්වහන්සේගේ ශීල ශ්‍රැතාදී ගුණය නොගෙණ නොපැවරූ කුලයන්ට කියා විණවාගත් ප්‍රත්‍යයක් තමන්වහන්සේත් නොගත්සේක් කෝකාලික ස්ථවිරයන්වහන්සේටත් නොදෙවාපුසේක. ඉක්බිත්තෙන් උපාසකවරු ස්වාමීනි දූන් නුඹවහන්සේ මේ සිවුරු ආදිය නොපිළිගන්නාසේක් නම් නැවත වාරයෙක අපට අනුග්‍රහ පිණිස මෙතනට වැඩවදාළ මැනවැයි ආරාධනා කළාහ.

කෝකාලිකයන් වහන්සේ මේ ස්ථවිරයෝ තුමූ සිවුරු පිළි ආදිය නොගන්නාහ. මටත් නුදුන්නෝයයි දෑගසව්වන් කෙරෙහි ආඝාත බැඳිසේක් දෑගසව්වන්වහන්සේත් බුදුරජානන්වහන්සේ සමීපයෙහි මඳක්කල් වැස තමන්වහන්සේගේ නිත්‍ය පරිවාරවූ පන්සියයක් භික්ෂූන්වහන්සේ ගෙණ දහසක් භික්ෂූන් පිරිවරා සැරිසරා ඇවිදිනාසේක් කෝකාලික රටට පැමිණිසේක. උපාසකවරු පෙරගමන්කොට තෙරුන්වහන්සේලා කැඳවාගෙණ පළමු උන්වහන්සේ විසූ විහාරයටම ගෙණගොස් දවස්පාසා මහත්වූ සත්කාර සම්මාන කළාහ. බොහෝ ගිලානප්‍රත්‍යය හා සිවුරු පිළි ආදිය උපදනේය. දෑගසව්වන්වහන්සේ හා සමග ගිය භික්ෂූන්වහන්සේ සිවුරු පිළී බෙදා කැටුව ගිය භික්ෂූන්වහන්සේටම දෙනසේක. කෝකාලික ස්ථවිරයන්වහන්සේට නොදෙනසේක. දෑගසව්වන්වහන්සේත් කෝකාලික ස්ථවිරයන්වහන්සේට නොදෙනසේක.

ඉක්බිත්තෙන් කෝකාලික ස්ථවිරයන්වහන්සේ සිවුරු පිළි ආදිය නොලැබ කියනසේක් ශාරිපුත්‍ර මෞද්ගල්‍යායන දෙදෙන පවිටුඅදහස් ඇත්තාහ. පෙර උපාසක වරුන් දෙන්නාවූ ලාභය නොපිළිගෙණ දූන් පිළිගණිති. උන්ගේ සිත පුරාලන්ට නොපිළිවන, අනික් කෙණෙකුන්ගේ මූණ නොබලති. දුෂ්ටවූ අදහස් ඇත්තාහුයයි දෑගසව්වන්වහන්සේට ආක්‍රොශ පරිභව බණනසේක. දෑගසව්වන්වහන්සේ මේ ස්ථවිරයෝ අප නිසා බොහෝ අකුසල් කෙරෙති සිතා සහපිරිවරින් නික්මුණාහ. ස්වාමීනි අතිත් කීපදවසක් මෙහිම විසුවමැනවැයි ආරාධනා කරමින් සිටියදී නොරඳා වැඩපුසේක. ඉක්බිත්තෙන් ළදරු භික්ෂූ කෙණෙකුන්වහන්සේ කියනසේක් උපාසකවරුනි දෑගසව්වන්වහන්සේ මෙතන කොසේ වසනසේක්ද තොපගේ කුලූපග තෙරුන්වහන්සේ මුන්වහන්සේලා මෙතෙක විසීම නොකමැතිසේකැයි කීසේක. එබස් අසා උපාසකවරු කෝකාලික ස්ථවිරයන්වහන්සේ ගමෙහි විසීම නොකමැතිසේ කල ව.සිසමැකව උන්වහන්සේ ක්ෂමාකරවා හෝ රැඳවූව මැනව. නැත්නම් නුඹවහන්සේත් පලාගිය මැනවැයි කීහ. ඒ තෙරුන්වහන්සේ උපාසකවරුන්ට භයින් ගොස් අග්‍රසව්වූ දෙදෙනාවහන්සේ රඳවන්ට ආරාධන කළ

සේක. අග්‍රශ්‍රාවකයන් වහන්සේ ඇවැත්නි, තොප පළායවයි අපි නොරඳම්හයි කියා වැඩපුසේක. තෙරුන්වහන්සේ දූහසච්චන් වහන්සේ රඳවාගතනොහී විහාරයටම පෙරළා වැඩිසේක. ඉක්බිත්තෙන් උපාසකවරු තෙරුන් වහන්සේ අතින් ස්වාමීනි, දූහසච්චන් වහන්සේ රැඳවූසේක්දැයි විචාළාහ. උපාසකවරුනි රඳවාගන්ට නොපොහොසත් වීම්යි කීසේක. ඉක්බිත්තෙන් උපාසකවරු මේ පාපීවූ තැනැත්තන් වහන්සේ මෙහි වසනසේක් වීනම් ලජ්ජි ප්‍රියශීලි භික්ෂූන් වහන්සේ මෙහි නොවසණසේක. එසේහෙයින් මුන්වහන්සේ මෙතැන්හි ඉන්ද නොදී නෙරපියම්හයි සිතා ස්වාමීනි, නුඹවහන්සේත් නොවිසුව මැනව අප නිසා නුඹවහන්සේට ලැබෙන කිසිවෙක් නැතැයි කීහ තෙරුන්වහන්සේ උපාසකවරුන් විසින් කරණලද සම්භාවනාවක් නැතිසේක් පාසිවුරු ගෙණ ජේතවනයට ගොස් බුදුන් කරා එළඹ ස්වාමීනි, ශාරිපුත්‍ර මෞද්ගලයායනයෝ පවිටු අදහස් ඇති ඉතා ලාමකවූ ඉච්ඡාවන්ගේ වශයට පැමිණියාහයි කීසේක.

එසඳ සර්වඥයන් වහන්සේ වදාරණසේක් කෝකාලිකය, එසේ නොකියව ශාරිපුත්‍ර මෞද්ගල්‍යයන් කෙරෙහි සිත්පහදවාගණුව කෝකාලිකය දූහසච්චෝ ලජ්ජි ප්‍රියශීලීහුය යි සලකවයි වදාළසේක. කෝකාලික ස්ථවිරයන් වහන්සේ කියනසේක් නුඹවහන්සේ අග්‍රශ්‍රාවකයන්ගේ බස් අදහන් නම් මිස මම ප්‍රත්‍යක්ෂ කොට දිටිමි. මේ අග්‍රශ්‍රාවක දෙදෙන පවිටු අදහස් ඇත්තාහුය. සැඟවුනාවූ කායයී ඇත්තාහුය, දුශ්ශීලයයි කියා තුන් යලක් දක්වා සර්වඥයන් වහන්සේ විසින් වළකමින් සිටියදීම එසේම කියා හුනස්නෙන් නැගී ගියේය. උන්වහන්සේ නික්මුණු නොබෝකලකින් සකල ශරීරයෙහි අබ ඇට පමණ පොළනැගී ක්‍රම යෙන් බේළුව ඵල මාත්‍රාව බිඳී ලේ හා සැරව වැටෙන්ට පටන්ගත් කල්හි උන් වහන්සේ තතනමින් වේදනාවෙන් මත්ව ජේතවන දොරටුවෙහි වැදහොත් සේක. කෝකාලික ස්ථවිරයන්වහන්සේ විසින් දූහසච්චන් වහන්සේට ආක්‍රොශ පරිභව බණනලදැයි බ්‍රහමලෝකය දක්වා එකකෝලාහල විය. ඉක්බිත්තෙන් උන්වහන්සේගේ උපාධ්‍යායවූ තුදු නම් බ්‍රහමයෙක් ඒ කාරණය දැක ගොස් ස්ථවිර යන් වහන්සේ ක්ෂමාකරවම්යි සිතා අවුත් ආකාශයෙහි සිට කෝකාලිකයෙනි, තොප විසින් රෞද්‍රවූ කර්‍මයක් කරණලද, අග්‍රශ්‍රාවකයන් වහන්සේ කෙරෙහි සිත පහදවා ගණුවයි කීහ.

ඇවත්නි, තෝ කවරේදැයි විචාළසේක. මම තුදු නම් බ්‍රහමයෙකිම් කී කල්හි බ්‍රහ්මය, තෝ සර්වඥයන්වහන්සේ විසින් අනාගාමීයයි වදාරණ ලද්දෙහිය අනාගාමී නම්බ්‍රහ්මලෝකයෙන් මේ මනුෂ්‍යලෝකයට පෙරළා නොඑන්නාහුයයි කියනලද්දේ නොවේද? තෝ වූකලී කසළගොඩ ඇවිදිනාවූ පිසාචයෙක් වනැයි කියා බ්‍රහ්මයාට නිග්‍රහ කළසේක. ඒ බ්‍රහ්මයා තමාගේ බස් ගිවිස්වාගතනොහී තොපගේ බසින් ම තොපි ම පැසවෙයි කියා ශුද්ධාවාසයට ගියේය කෝකාලික ස්ථවිරයෝ කාලක්‍රියාකොට ගොස් පදුම නරකයෙහි උපන්හ. ස්ථවිරයන් එහි උපන් නියාව දැක සහම්පතී මහබ්‍රහ්මයා සර්වඥයන් වහන්සේට දැන්විය. සර්වඥ යන් වහන්සේගේ ගුණ කියනසේක් ධර්‍මසභාමණ්ඩපයෙහි රැස්ව හිඳ ඇවැත්නි කෝකාලික ස්ථවිරයෝ සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේට ආක්‍රොශ පරිභව බැණ තමන් මුඛය නිසා පදුම නරකයෙහි උපන්නේවේදැයි මෙසේවූ කථාවක් ඉපදවූසේක. සර්වඥයන් වහන්සේ ධර්‍මසභාමණ්ඩපයට වැඩ මහණෙනි මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා මෙනම්

කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි මහණෙනි. කෝකාලිකයන් තමන්ගේ බස් නිසා නටුයේත් මුඛය නිසා දුක්වූයේත් දැන් මතු නොවෙයි, පෙරත් තමන්ගේ මුඛය නිසා දුක්වූයේ නොවේදැයි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර **බ්‍රහ්මදත්ත** නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයා පිටතට නික්මුනු දළ ඇත්තේය. ඔහුගේ බැමිණිතොම බමුණකු හා සමග සංවාසය කරන්නීය. ඒ බමුණත් පුරෝහිතයාසේම මුඛයෙන් පිටතට නික්මුණු දළ ඇත්තේය. පුරෝහිත බ්‍රාහ්මණයා තමාගේ බැමිණිය නැවත නැවත වළක්වන්නේ වළකා ගතනොහී මට සතුරුව සිටියාවූ මේ බමුණා සිය අතින් මරන්ට නොපිළිවන උපායකින් මරවා පියමියි සිතා රජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නේ මහ රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේගේ මේ නුවර සියලු දඹදිව නුවරවලට වඩා නුවරෙක, නුඹවහන්සේත් අග්‍ර රජ්ජුරුවන් වහන්සේය. දකුණු වාසල් දොර සිටවූ නියා යහපත් නොවෙයි. අවලක්ෂණයයි කීහ. රජ්ජුරුවන් විසින් ආචාරීනි දැන් කළමනා කිම්දැයි විචාළ කල්හි මගුල්කොට නැකතින් දොර සිටවිය යුතුයයි කීහ. ඊට කළමනා කවරේදැයි විචාළ කල්හි පරණ දොර හැර අභිවෘද්ධි කරවූ දඹුගෙණ අධිගෘහිතවූ දෙවතාවන්ට බිලි දී ශුභ නක්ෂත්‍රයකින් දොර සිටුවන්ට යහපත් වන්නේයයි කීහ. එසේවීනම් එලෙසෙම කරවයි රජ්ජුරුවෝ විධානකළහ.

එසමයෙහි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ තක්කාරි නම් මානවකව ඒ පුරෝහිත බ්‍රාහ්මණයා අතුරෙහි ශිල්ප උගන්නාහ පුරෝහිත බ්‍රාහ්මණයා පරණ දොර හැර අලුත් දොරක් ගස්වා නිමවා රජ්ජුරුවන්ට දන්වන්නේ දේවයන් වහන්ස, දොර ගස්වා නිමවනලද සෙට නැකැත යහපත. ඒ නැකත නුගුළුවා බිලියම්කොට දොර සිටවිය යුත්තේයයි කීහ. ආචාරීනී බිලියමට මට කුමක් ලබද්දැයි විචාළකල්හි දේවයන් වහන්ස, මහානුභාවසම්පන්න දොරය, මහෙශාක්‍ය දෙවතාවා විසින් අධිගෘහීතය, එසේහෙයින් මුඛයෙන් පිටතට නික්මුණාවූ දළ ඇතිව මතු උභයකුල පරිශුද්ධවූ බමුණකු මරා ඔහුගේ මස් හා ලෙහෙයෙන් බිලියම්කොට දොර සිටුවන වළටහෙලා ඊමත්තේ දොර සිටවිය යුත්තේය. එකල්හි නුඹවහන්සේටත් යහපතක්, අභිවෘද්ධියක් වන්නේයයි කීහ. යහපත ආචාරීනි, එබඳුවූ බමුණකු මරා දොර සිටුවයි රජ්ජුරුවෝ විධාන කළාහ. ඒ බමුණු සතුටු සිත් ඇත්තේ අද මාගේ පසමිතුරා පිටුදකිමියි සිතා වේගවත්ව තමාගේ ගෙට ගොස් මුඛය රැකගතනොහී වහ වහා භාය්‍යාවට කියන්නේ තෙල පවිටු චණ්ඩාල සත්‍රා මෙතැන් පටන් තී කවරක්හු හා අභිරමණය කෙරේද? සෙට තීගේ වෛර පුරුෂයා මරා බිලියම් කෙරෙමියි කීය නිරපරාධවූ නැතැත්තවුන් කුමක් නිසා මරව්දැයි විචාළාය. රජ්ජුරුවන් වහන්සේ පිටතට නික්මුණු දළ ඇති වමරුසිත්වූ බමුණකුගේ මස ලෙහෙයෙන් බිලියම් කොට නුවර වාසල් දොර පිහිටුවන්ට විධාන කළාහ. තීගේ වෛර පුරුෂයා වමරුස පිටතට නික්මුණු දළ ඇත්තේය. ඔහු මරා බිලියම් කෙරෙමියි කීය. එබස් අසා බැමිණිතොම තමාගේ වෛර පුරුෂයාට කියා යවන්නී රජ්ජුරුවන් වහන්සේ පිටතට නික්මුණු දළ ඇති බමුණකු මරා බිලියම් කරණසේක්ල. සෙසු තා හා සමානවූ බමුණන් ඇරගෙණ සෙට උදෑසනම නුවරින් නික්ම පළායවයි කියා යවූහ. ඒ බමුණත් එලෙසම කෙළේය. ඒ බව නුවර ප්‍රකාශවිය. එසේ

හෙයින් කියාලූ නුවරින් වමරුසින් නික්මුණු දල ඇති සියලු බමුණන් පලා ගියාහ. පුරෝහිත බමුණාගේ සතුරා පලාගිය නියාව නොදැන උදෑසනම රජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නේ දේවයන් වහන්ස, අසවල්තෙන වමරුසින් නික්මුණු දල ඇති බමුණෙක් ඇත. ඔහු අල්වා ගෙන්වාගත මැනවැයි කීහ.

රජ්ජුරුවෝ මනුෂ්‍යයන් යවූහ. ඒ මනුෂ්‍යයෝ ඔහු නොදැක අවුත් ස්වාමීනි බමුණා පලාගියේයයි කීහ. එසේවීනම් අනිත් ගිය තැනක් පරීක්ෂා කරවයි. කී කල්හි සියලු නුවර පරීක්ෂාකොටත් නුදුටුවාහුය. ඉක්බිත්තෙන් ඉක්මන් නොවී නුවර පරීක්ෂා කරවයි කී කල්හි දේවයන් වහන්ස, පුරෝහිත බ්‍රාහමණයා හැර අන් එබඳු බමුණෙක් නැතැයි කීහ. පුරෝහිත බ්‍රාහ්මණයා මරන්ට නොපිළිවන් වේදැයි රජ්ජුරුවන් කී කල්හි දේවයන් වහන්ස, නුඹ වහන්සේ කුමක් කියනසේක්ද! පුරෝහිතයා නිසා අද මේ නැකතින් දොර නොසිටුවා නුවර අරක්ෂිත වන්නේය. අද මේ නැකත ඉගිල ගියහොත් මෙයින් නැකත් නොලැබෙති කීහ. අවුරුද්දක් මුළුල්ලේ නුවර දොර නැතුව තුබූ කල්හි සතුරන්ට අවසර පෙණෙන්නේය. එසේහෙයින් කවරක්හු වීනමුත් මරවා අන්‍යවූ ශාස්ත්‍රයෙහි නිපුණ බමුණකු ලවා බිලියම් කරවා දොර සිටුවම්හයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ කිමෙක්ද! ආචාරීන් හා සමාන බමුණෙක් ඇද්දැයි විචාළාහ. ඇත දේවයන්වහන්ස. ඒ ආචාරීන්ගේම අතවැසිවූ තක්කාරි නම් මානවකයෙක් ශාස්ත්‍රයෙහි නිපුණයහ. ඔහට පුරෝහිත තනතුරු දී දොර පිහිටුවා මගුල් කැරවුව මැනවැයි කීහ එබස් අසා රජ්ජුරුවෝ ඒ තක්කාරි පණ්ඩිතයන් කැඳවා සත්කාර සම්මානකොට පුරෝහිත තනතුරුදී මගුල්කොට දොර පිහිටුවන්ට විධානකළාහ. ඒ මහබෝසතාණෝ මහපෙළහරින් නුවරදොර පිහිටුවන තෙනට ගියාහ. පුරෝහිත බ්‍රාහ්මණයා රජාඥාවෙන් බැඳගෙණ ගෙණාහ. බෝසතාණෝ දොර පිහිටුවන තැන වලකැන වාරයෙ තිරයක් වට කොට අද්දවා ආචාරීන් හා සමග තිරය ඇතුළෙහි සිටියාහ. ආචාරී වළ බලා තමන්ට පිහිටක් නොලැබ සිතන්නාහු මා විසින් කාර්‍ය්‍ය සමාධිකරණලද, අඥාන බැවින් කට රැකගතනොහී වහා ගොස් දුෂ්ට ස්ත්‍රියට කීමි. මම මට වධ ඵලවම්යි කියා මහබෝසතාණන් හා සමග කථාකරන්නාහු මෙසේ කීහ;

තක්කාරි නම් පණ්ඩිතයෙනි, යම්සේ වල්හි වසන්නාහු මඬුවෙක් තමාගේ ඇඬීමෙන් තමා කන්නට සර්පයින් කැඳවන්නාක් මෙන් හඬාද! එපරිද්දෙන් මම නුවණ මදව නොකියයුත්ත බැමිණියට කීමි. ඒ කීම නිසා දැන් මේ වේලෙහිම මරණට පැමිණ සිටියෙමි. එසේහෙයින් මර්‍යාදාතික්‍රමණය කොට කියයුතු බස් නොකිය යුත්තන්ට කීම යහපත් නොවන්නේයයි බෝධිසත්ත්වයන්ට ආමන්ත්‍රණය කොට කීයේය. එබස් අසා බෝසතාණෝ කියන්නාහු ආචාරීන් වහන්ස, බහුභාණිකවූ පුද්ගලතෙමේ අන්දුබන්ධන රජ්ජුබන්ධන සංඛලිකබන්ධනාදියටත් හස්තපාදච්ඡේදනාදිවූ වධයටත් ශොකයටත් වාක්විලාප කොට මහත්ව හැඬීමටත් පැමිණෙන්නේය. දැන් නුඹවහන්සේ මේ කාරණය නිසා නුඹවහන්සේට නින්‍දා කෙරෙමින් සිටිසේක. මුඛය රැකගත නොහී ආචාරීව සිට නුඹවහන්සේ කී බසින් දැන් මේ වළ හෙලා මරන්ට කාරණාවූයේ වේදැයි කීහ. මෙසේ කියා නැවත බෝධිසත්ත්වයන් වහන්සේ කියන්නාහු ආචාරීන් වහන්ස, මුඛය රැකගතනොහී දුකට පැමිණිසේක් නුඹවහන්සේ මතු නොවෙයි, සෙස්සෝත් පැමිණියෝම වේදැයි දක්වා වදාළහ.

ඒ කෙසේ ද? යත්,

ඉකුත්ගිය දවස බරණැස්නුවර කාලී නම් වෙශ්‍යා ස්ත්‍රියක් උව, තුඩිල නම් මලෙක් විය, කාලී නම් ගණිකා පුරුෂයන්ගෙන් දවස දහසක් වස්තු ගන්නීය. තුඩිලයා වූකලී ස්ත්‍රීධූර්තව සුරාධූර්තව ඇවිදින්නේය. ගණිකාතොම ඔහට නිරන්තරයෙන් වස්තු දෙන්නීය. ලත් ලත් වස්තු නස්නේය. ඒ වෙශ්‍යා ස්ත්‍රී ඔහු නොයෙක් වාරයේ වලකාගත් ක්‍රීඩායෙන් වලකාගත නොහෙන්නීය. ඉක්බිත්තෙන් එක්දවසෙක ඒ තුඩිලයා දූකෙළ පැරද ඉණතුබූ කඩපමණක් දී කලාල් කඩරෙද්දක් හැඳගෙණ ගෙට ආයේය. ගණිකාව විසින් කෙල්ලන්ට මෙසේ නියෝග කරණලද තුඩිලයා ආකල්හි කිසිවක් නොදී ඔහු බොටුවෙන් අල්වා දම්මවයි කියනලද්දේය. ඒ කෙල්ලෝත් එපරිද්දෙන් කළාහ. තුඩිලයා දොරකඩ අඩ අඩා සිටියේය. ඉක්බිත්තෙන් සිටුපුත්‍රයෙක් නිරන්තරයෙන් කාලී නම් ගණිකාවට දහසක් ගෙණෙන තැනැත්තේ එදවස් තුඩිලයා අඩ අඩා සිටියාවූ දැක කුමක්නිසා අඬව්දැයි විචාළේය. ස්වාමීනි දූකෙළ පැරද මාගේ බුහු නැනියන් සමීපයට ආමි, උන්වහන්සේ මා කෙල්ලන් ලවා බොටුව අල්වා දොරට දමාපුසේකැයි කියා කීය. එසේවීනම් තොප මෙතන සිටුව නාගේ බුහුනැනියන්ට කියමී. ගොස් ගණිකාවට කියන්නේ තොපගේ මලනුවෝ කලල් කඩරෙද්දක් හැඳගෙණ දොරකඩ හඬ හඬා සිටියෝය. කුමක්නිසා උන්ට පිළි නොදෙව් දැයි විචාළේය. මම වූකලී නොදෙමි. ඉදින් තොපගේ ස්නේහයක් ඇත්නම් තොපි දෙවයි කීව. ඒ ගණිකාවගේ ගෙයි මෙසේ සිරිතක් වන්නේය. කෙසේද? යත් තමාට පඬුරු පිණිස ගෙණෙනලද දහසින් පන්සියක් තමාට වන්නේය. පන්සියයක් සුවඳ මල් ආදිය ඇරගන්ට මිල වන්නේය. ඒ ගෙට ආවාවූ පුරුෂයෝ ඇගෙන් ලබනලද පිළී හැඳ බත් බුලත් කා සුවඳ විලවුන් ගල්වා මල් පැලඳ රාත්‍රියේ වැස දෙවෙනි දවස් යන්නාහුය. තමන් පළමු ඇරගෙණ ආ පිළිම ඇඳගෙණ යන්නාහ. එසේහෙයින් ඒ සිටු පුත්‍රතෙම ඒ ගණිකාව දුන් පිළි හැඳ තමා අත පිළි තුඩිලයාට දෙවීය.

ඒ තුඩිලයා සිටුපුත්‍රයා දුන් පිළි හැඳගෙණ සතුටුව ඔල්වර ගසමින් රා බොන ගෙට වන්නේය. ඒ කාලීත් කෙල්ලන්ට විධාන කරන්නී සෙට මේ සිටු පුත්‍රයා යන වේලෙහි පිළී උදුරාගණුවයි විධාන කළාය ඒ කෙල්ලෝ ඔහු නික් මෙන වේලෙහි ඇතින් මෑතින් දිව අවුත් ඔහුගේ පිළී උදුරාගෙණ කුමාරයෙනි, දැන් පලායවයි කියා සිටුපුත්‍රයා නග්නකොට ඇරපූහ. ඒ තෙමේත් නග්නව නික්මුණු තැනැත්තේ මහජනයා නිසා පරිභව කරන්ට පටන්ගත්හ, ඒ තෙමේ ලජ්ජාව මා විසින්ම මට සොඳ සේ වූ අකාර්යයක් සලසාගත්තේය. මම්ම මාගේ මුඛය රැකගන්ට නුනුනුයෙමියි හැඬූයේය. මේ කාරණය ගෙණ හැර දක්වා සිටුපුත්‍රයාත් තමාගේ මුඛය රැකගතනොහී දුකට පැමිණිසේක. නුඹවහන්සේ කළ කාරිය සිටුපුත්‍රයාට කළ කාරිය හා සමාන වන්නේයයි සිතා මේ උදාහරණය ගෙණහැර දක්වා වදාළසේක. නැවත උදාහරණයක් දක්වන්නාවූ මෙසේ කීහ. බරණැස්නුවර එළු ගොපල්ලන්ගේ ප්‍රමාදයකින් ගොදුරු බිමදී එළුවන් දෙන්නෙකු පොර අන්ට පටන්ගත් කල්හි එක් කැරල පක්‍ෂියෙක් මොහු දෙදෙන දැන් නොබෝකලකින් ඔවුනොවුන්ගේ ඔළු පලාගෙණ මියන්නාහුය එසේහෙයින් වලකමි සිතා මයිලානෙනි, පොර නානුවයි කියා වලක වලකා සිටියදී ඔවුන් තමාගේ පොර අනිමින් සිටියදීම

පිටත් ඉසත් ඉන්දදීම යාච්ඤාකොට වළකාගත නොහෙන තැනැත්තේ එසේ වීනම් මා මරා යුධ කරවයි කියා දෙදෙනාගේ නලල් අතරට වන්නේය. එසඳ දෙදෙන බමුණොවුන්ගේ ඉස ඇනගත්තාහ, පක්ෂියා ගලක ලා ඇඹරූ කලක් මෙන් ගැටී තමා කළ අකාරණයෙන් විනාශයට පැමිණියේය. එසේහෙයින් මේ නුඹවහන්සේ කළ කාරියත් එබඳු වන්නේය. තවද බරණැස් වාසීවූ ගොපල්ලෝ ඵලගත් තල් ඇති තල්රුකක් දැක එකකු තල් කඩන පිණිස ගසට නංවා ඔහු තල් කඩා එළමින් සිටි කල්හි එක් කෘෂ්ණ සර්පයෙක් තුඹසින් නික්ම තල්ගසට නැගෙන්ට පටන්ගත්තේය. යට සිටි ගොපල්ලෝ දඬු ආදියෙන් ගසාත් ඔහු වළකාගත නුහුනුවාහුය. ඒ ගොපල්ලෝ සර්පයෙක් තල්ගසට නැගෙන්නේයයි ගසළඹ උන් තැනැත්තවුට කීහ. එතෙම භයින් ත්‍රාසනව මහ හඬින් හඬන්ට පටන්ගත්තේය. යට සිටි ගොපල්ලෝ සණවැහැරින් කරණලද තරකඩක් සතරකොනින් අල්වාගෙණ මේ කඩ මත්තට පැන පියවයි කීහ. ඒ තෙමේ භයින් පැනහෙන්නේ සතරදෙන අල්වාගෙණ සිටි සණවාපට මධ්‍යයේ වැටීහින, ගොපල්ලෝ සතරදෙන පුරුෂයා පවන් හා සමාන වූ වේගයෙන් පැන වැටිහුනු තැනැත්තවූ අල්වා රඳවාගත නොහී ඔවුනොවුන්ගේ හිසින්හිස පැහැර ඔළු පලාගෙණ ජීවිතක්ෂයට පැමිණියාහ. එසේහෙයින් ආචාරීන්වහන්ස නුඹවහන්සේත් එළු ගොපල්ලන් මෙන් කට රැකගත නොහී මහත්වූ විනාශයට පැමිණෙන්ට සිටිසේක්වනැයි මේ උදාහරණය ගෙණහැර දක්වා කීහ.

නැවත බරණැස්නුවර වසන්නාවූ එළුවන් මරා ජීවත්වන්නාවූ සොරහු රාත්‍රියෙහි එක් එළුවෙකු අල්වාගෙණ වලදී මස් කම්හයි සිතා ඔහු නාඩන පිණිස මුඛය බැඳ උණ කැලයක් අස්සේ තිබා දෙවෙනි දවස් ඔහු මරා මස් කන්ට යන්නාහු ආයුධ සඳහන් නැතිව ගියාහ. ඒ සොරු එළුවා මරා මස් අනුභව කරම්හ ආයුධය ගෙණෙවයි කියා කීහ. එකකු අතත් ආයුධ නැතිවිය සිතන්නාහු අයුධයක් නැතිව මූ මරා මස් ඇරගන්ට නොපිළිවන. එසේහෙයින් මොහු හැරපියව, අප හැමදෙනහට කුසල් ඇතැයි කියා එළුවා ඇරපුවාහ. එකල එක් කුළුපොත්තෙක් උණදඬු කපාගෙණ නැවත අවුත් ගෙණයෙම්යි සිතා උණදඬු කපන කැත්ත උණකැලය අස්සේ තබා ගියේය. එළුවා සොරුන්ගෙන් මිදීගියෙම්යි සිතා සතුටුව උණකැලය මුල කෙළනේය. පස්සා පයින් ගසා කැත්ත එළාපුයේය. සොරු කැත්ත වැටීගිය අඩ අසා පරීක්ෂාකොට දිව අවුත් එළුවා හා කැත්ත දැක සතුටුව ඒ කැත්තෙන් එළුවා මරා මස් කැවාහුය. ආචාරීන්වහන්ස එළුවාත් තමා කළ කාරියෙන්ම මෙළේය. නුඹවහන්සේ කට රැකගත නොහී එළුවා සේම දැන් මහත්වූ විනාශයට පැමිණිසේක් වේදැයි මේ උදාහරණයත් ගෙණහැර දක්වා කීහ. මෙසේද කීයා තමන් කට රැකගෙණ මිතභාෂීවූ සත්ත්වයෝ මරණ දුකිනුත් මිදෙන්නේ වේදැයි දක්වා කින්නර වස්තුව ගෙණහැර දැක්වූහ. ඒ කෙසේද?යත් බරණැස්නුවර වැසි එක් වැදිපුත්‍රයෙක් හිමාලය වනයට ගොස් උපායකින් කිම්පුරුෂ කින්නරාඞ්ගනා දෙදෙනෙකු අල්වාගෙණ අවුත් රජ්ජුරුවන්ට දුන්නේය. රජ්ජුරුවෝ පෙර නුදුටුවිරූ කිඳුරන් දැක වැදිපුත්‍රය මොවුන්ගේ ගුණ කවරදැයි විචාළාහ. දේවයන්වහන්ස මොහු මධුරස්වරයෙන් ගායනා කෙරෙති, ලීලෝපේතව නටති. මනුෂ්‍යයෝ මූසේ ගීකියන්ට නටන්ට නොදනිති කීහ. රජ්ජුරුවෝ වැදිපුත්‍ර

යාට බොහෝ වස්තු දී කිඳුරන් නටවයි ගී කියවයි විධාන කළාහ. කිඳුරෝ ඉදින් ගායනාකරන්නමෝ අක්ෂර සම්පූර්ණකොට ගායනා කරන්ට අසමර්ථ වූවමෝ වීනම් ගායනාව නපුරුවින්නේය. එසඳ අපට නින්දාකෙරෙති, මරති බොහෝකොට කියන්ට උගතුමෝනම් බොරු කියවෙන්නේයයි සිතා ඒ කිඳුරෝ දෙදෙන මුසාවාද භයින් නැවත නැවත කියමින් සිටියදී නොකීහ. නැටුම්නුත් නොනැටූහ.

එසඳ රජ්ජුරුවෝ කිපී මොවුන් මරා මස් පිස ගෙණවයි කියන්නාහු ඉදින් මොහු දේවතාකෙණෙක් වූනම් ගාන්ධර්වකෙණෙක් හෝ වූනම් නටති ගී කියති. මොහු වූකලී තිරශ්චීනයහ. වස්තු පතන්නාවූ වැදිපුත්‍රයා විසින් අර්ථාසා වෙන් මා සමීපයට ගෙණඑන ලද්දේය. මොහු දෙදෙනාගෙන් එකෙකු ගෙණ සවසට පිසව, එකෙකු සෙට උදෑසන පිසවයි විධාන කළාහ. එසඳ කින්නරාඞ්ගනාව සිතන්නී රජ්ජුරුවන්වහන්සේ කිප්සේක. ඒකාන්තයෙන් නිසැකව මරවනසේක. දූන් වූකලි කථාකරන්ට කල් වන්නේයයි සිතා කථාකරන්නී රජ්ජුරුවන්වහන්ස වරදවා කියන්නාවූ ලක්ෂයක් කථා නොවරදවා කියන එක බසකුත් නො අගනේය. එසේහෙයින් අපට ගී කියන්ට කී කල්හි බොහෝ කොට ගී කීම් නම් වරදවේද්දෝහෝයි යන භයින් නොකීවම්හ. නුඹවහන්සේ කෙරේ නිස්සාර කමකින් නොකිව නොවම්හයි කීහ. රජ්ජුරුවෝ කින්නරාඞ්ග නාවට සතුටුව කියන්නාහු යම්සේ කින්නරාඞ්ගනාවක් මා හා සමඟ ප්‍රිය තෙපුල් කථාකළාද ඈ හැර හිමාලයවනයට යවව. මේ කිම්පුරුෂයා වූකලී සෙට උදෑසනම මාලු පිසගෙණ එනපරිද්දෙන් මුළුතැන්ගෙට පාවා දෙවයි කීහ. කිම්පුරුෂයා රජ්ජුරුවන්ගේ බස් අසා රජ්ජුරුවන්වහන්සේ මා කථා නොකළ හොත් අවශ්‍යයෙන් මරණසේක.

දූන් වූකලී කථාකරන්ට කල් වන්නේයයි සිතා මහරජ්ජුරුවන්වහන්ස තෘණ භක්ෂණය කරන්නාවූ පසුජාතීහු මේඝනායකකොට ඇත්තාහ. මේ මනුෂ්‍යජාතීහු පස්ගව රසයෙන් ජීවත්වන හෙයින් පසු ජාතිය පිහිටකොට ඇත්තාහ. මම වූකලී නුඹවහන්සේ මට පිහිටකොට මාගේ භාර්‍යාව මා පිහිට කොට ඇත්තීය මම ඈට පිහිටවෙමි, අප දෙදෙනා අතුරෙන් එකෙක් එකෙකු මළ නියාව දූන මෙසේ මරණින් මිදී පසු හිමාලවනයට යන්නේය. ජීවත්ව හිඳ අප දෙදෙනා ඔවුනොවුන් හැර නොයම්හ. එසේහෙයින් නුඹවහන්සේ මේ කින්නරාඞ්ගනාව වනයට යවනු කැමැතියේක් වීනම් මා පළමුකොට මරා පසුව ඈ හිමාලයවනයට යවන්නේයයි කියා මෙසේද කියා මහරජ්ජුරුවන් වහන්ස අපි නුඹවහන්සේ කීවා නොකරණු කැමතිව මුවෙන් නොබැන උත්තමු නොවම්හ. කථාකිරීමෙහි දෝෂ දූක නොකීවම්හ. ප්‍රකාශකරන්නේ මහරජ්ජුරුවන්වහන්ස නින්දා නම් සැපසේ දුරුනොකොට යා නොහැක්කේය. මේ ලෝකයෙහි සත්ත්වයෝ නොයෙක් අදහස් ඇත්තාහ. යම් ශීලාදී ගුණයක් හේතුකොටගෙණ සමහර සත්ත්වකෙණෙක් ප්‍රශංසා ලබත්නම් එම ශීලාදී ගුණය හේතුකොටගෙණ සමහර කෙණෙක් නින්දා ලබති. අපි කිඳුරන් කථා නොකිරී මෙන් ප්‍රකාශ ලැබෙම්හ. මනුෂ්‍යයන් අතුරෙන් කථා නොකිරීමෙන් නින්දා ලැබෙම්හ. මේ නින්දා නම් දුරුකොටලියහැකි දෙයෙක් නොවෙයි. එසේ හෙයින්ම නුඹවහන්සේ ප්‍රශංසා ලබම්ද මහරජ්ජුරුවන්වහන්ස අසත්පුරුෂයා ප්‍රාණාතිපාතාදීවූ චිත්තයෙන්ද සත්පුරුෂයා ප්‍රාණාතිපාතාදීන් වළකන්නාවූ චිත්තයෙන්දූයි මෙසේ ලෝකවාසීවූ සියළු සත්ත්වතෙමේ වෙන් වෙන්වූ සිත් ඇත්තේයයි සියළු ලෝකවාසීවූ සත්ත්වයෝ තමතමන්ගේ හිතොත්කෘෂ්ට

චිත්තයෙන් සිත් ඇත්තෝ නම් වෙති. එතකුදුවූවත් අනුන්ගේ විනාශයෙහිත් අවිනාසයෙහිත් වෙන් වෙන්වූ සිත් ඇති බැවින් සිත් නැත්තාවුන් හාත් සමානයෝයයි සිත් ඇත්තවුන්හාත් සමානයෝයයි. එසේවූ චිත්තයෙන් දූන් නුඹවහන්සේගේ හෝ අනිකක්හුගේ හෝ චිත්තයෙහිම බන්ධන හෝ අනිකෙක් වසඟයෙහි නොපවත්තේය. එසේහෙයින් මේ තෙම මාගේ චිත්ත වසඟයේ නොපවත්තේයයි මට නොකිපිය මැනවැයි දේවයන්වහන්ස සියළු සත්ත්වයෝ තමන්ගේ චිත්ත වසඟයෙන් පැවත යන්නාහුයයි කිම්පුරුෂයා රජ්ජුරුවන්ට ධර්මදේශනා කෙළේය. රජ්ජුරුවෝ මේ තෙම නුවණැති කිම්පුරුෂයෙකැයි සතුටුව ප්‍රශංසා කරන්නාවූ කිම්පුරුෂ කින්නරාංඞගනා දෙදෙන පළමු කථා කරන්නට භයපත්ව මුඛයෙන් නොබැන හිඳ දූන් කථාකරන්ට සුදුසු වේලෙහි ධර්මයෙන් සුදුසු කථාකොට මරණින් මිදී සුවපත් වූහ.

එසේහෙයින් මේ ලෝකයෙහි සියළු සත්ත්වයන්ට තමතමන්ගේ මුඛයෙන් පිටත්වූ වචනයම හිත සැප එළවන්නේයයි ප්‍රශංසා කළාහ. මෙසේද කියා නැවත රජ්ජුරුවෝ කිඳුරන් මැදිරියක හිඳුවා ඔවුන් පළමු ගෙණා වැදී පුත්‍රයා කැඳවා කියන්නාහු කොල මොවුන් හැරගෙණ ගොස් පළමුවෙන් විසූ තෙනම ලාපියවයි ඇරපූහ. මහබෝසතානෝත් බැලුව මැනව ආචාරීන්වහන්ස මේ කිඳුරෝ වචනය රැකගෙණ යුක්තප්‍රාප්ත කාලයෙහි කියනලද යහපත්වූ බසින්ම මිදුනාහුය. නුඹවහන්සේ වූකලී කට රැකගත නොහී නොකියමනා දෙය කීමෙන් මහත්වූ දුකකට පැමිණිසේකැයි මේ උදාහරණය දක්වා ආචාරීන්වහන්ස නොබව මැනව නුඹවහන්සේට ජීවිතදානය දෙමි කියා අස්වැසූහ ඉක්බිත්තෙන් මහබෝසතානෝ ආචාරීන්වහන්ස නුඹවහන්සේ මා රැකගත මැනවයි ආචාරින්ට කියාලා තව නැකැත් වේලාව නොලැබුනේයයි කල්යවා මධ්‍යම රාත්‍රියෙහි මළ එළුවෙක් ගෙන්වාගෙණ බමුණා යම්තැනක පළාගොස් ජීවත්වයි කියා කිසිකෙණෙකුන් නොදන්නා පරිද්දෙන් යවාපියා එළු මසින් බිලියම්කොට නුවර වාසල්දොර පිහිටුවූහ. ශාස්තෲවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි දූන්මතු නොවෙයි පෙරත් කෝකාලිකයෝ තමන්ගේ මුඛය නිසා නටුවෝ වේදැයි වදාරා මේ තක්කාරි ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයා නම් දූන් කෝකාලිකස්ථවිරයෝය. එසමයෙහි තක්කාරි පණ්ඩිතයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

474
රුරුමෘග ජාතකය

තවද එක් සමයක්හි සරණාගත වජ්‍රපඤ්ජරවූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසනසේක් දෙව්දත් මහ තෙරුන්වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද? යත්

ඒ දෙවදත්තස්ථවිරයන්වහන්සේ අවශෙෂවූ භික්ෂූන්වහන්සේ විසින් ඇවැත්වූ දෙවදත්තයෙනි, සර්‍වඥයන්වහන්සේ තොපට බොහෝ උපකාරීසේක. තොපි සර්‍වඥයන්වහන්සේ නිසා ප්‍රව්‍රජ්‍යාලදුව තුන්පිටකය උගතුව ලාභසත්

කාරයට පැමිණියවයි කීකල්හි සම්ඥයන් විසින් මට තණකොන්දක් පමණකුත් උපකාරයක් නොකරණලද, මම්ම තුන්පිටකය උගත්මි මම්ම ලාභසත්කාරයට පැමිණියෙමි කීසේක. භික්ෂූන්වහන්සේ දම්සභාමණ්ඩපයෙහි වැඩහිඳ කථාවක් උපදවනසේක් ඇවැත්නි දෙවදත්තස්ථවිරයෝ කෙළෙහිගුණ නොදනිති. කළගුණට කණස්සල්ලෝයයි මෙසේම කථාවක් උපදවා උන්සේක.

ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ තුන්කරා ගමනින් එක්තරා ගමනකින් දම්සභාමණ්ඩපයට වැඩ පණවනලද බුධාසන මස්තකයෙහි යුගඳුරු මුදුනේ දිලියෙන්නාවූ ලහිරු මඩලක් මෙන් දිලිහි දිලිහී වැඩහිඳ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුද? කවර කථාවක් තොපට අඩාලවීදැයි විචාරා වදාළ කල්හි ස්වාමීනි නුඹවහන්සේ විසින් නො කියන්ට වදාරණ ලද්දාවූ රාජකථා චොරකථා ආදීවූ එක්තරා කථාවකින්ා යුක්තව උනුමෝ නොවම්හ. මේ දෙවදත්තස්ථවිරයන් කෙළෙහිගුණ නො දන්නා නියාවත් කළගුණ මකු කරණ නියාවත් කිය කියා උනුම්හයි කීකල්හි මහණෙනි, මේ දෙවදත්තස්ථවිරයන් අකෘතඥ වූයේ දැන්මතු නොවෙයි. පෙරත් අකෘතඥයෝමය. පෙර මා විසින් තමන්ට ජීවිතදානය දුන් කල්හි මාගේ ගුණ පමණකුත් නොදත්තේ වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අසූකෙළක් පමණ සම්පත් ඇති එක් සිටානකෙණෙක් පුතනුකෙණෙකුන් ලැබ උන්ට මහධන කුමාරයෝයයි නම් තබා ඉන් මාගේ කුමාරයෝ ශිල්පශාස්ත්‍ර උගණිත්නම් බලවත්වූ ආයාසයට පැමිණෙන්නාහුයයි කිසි ශිල්පයක් නොඉගැන්වූහ. ඒ සිටුකුමාරතෙම නැටීම් ගී කීම් කැම්බීම් ආදියෙන් මත්තෙ අනිකක් කටයුත්තක් කිසිවක් දැනගත නුහුනුයේය. ඔහු වැඩිවිය පැමිණි තැනැත්තහුට සුදුසු කුලයකින් කුමාරිකාවෙකු ගෙණවුත් පාවාදී කුටුම්බසංස්ථාපනය කරවා දෙමව්පියෝ කළුරිය කළාහ. ඒ සිටුකුමාර තෙම දෙමව්පියන්ගේ ඇවෑමෙන් ස්ත්‍රිධූර්ත සුරාධූර්තයන් විසින් පිරිවරණලදුව නොයෙක් ව්‍යසන මුඛයෙන් සියළු වස්තුව විසදන්කොටපියා නය ඇරගෙණ ඒ නය දීගතනොහී නය ඇත්තන් විසින් ඉල්වන්ට පටන්ගත් කල්හි සිතන් නේ මට ජීවත්වීමෙන් ප්‍රයෝජන කිම්ද? මෙම ආත්මභාවයෙන් අනිකකුසේව ගියෙමි. එසේහෙයින් ජීවත්වීමට වඩා මියයාම යහපතැයි සිතා නයපත් ඇත්තන්ට කියන්නේ තොපගේ නයපත් ඇරගෙණ එව. ගංඅස නිධාන කරණලද මාගේ කුලසන්තක වස්තු ඇත, ඒවා දෙමියි කීහ මනුෂ්‍යයෝ සැබවයි සිතා සිටුපුත්‍රයා හා ගංතෙරට ගියාහ. සිටුපුත්‍රයා මෙතන වස්තුය මෙතන වස්තුය කිය කියා නිධාන තිබූතෙනක් කියන්නාක්හුමෙන් ගොස් වැටි මියයෙමි සිතා ගඟ හුනුයේය. ඒ තෙමේ වඩවූ ජලප්‍රවාහයෙන් යටිගත් බලා යන්ට පටන්ගත් කල්හි බලවත්වූ බැගෑහඬින් හැඬූයේය. එසමයෙහි පූරණ ලද බොධිසම්භාර ඇති අප මහබෝසතානෝ රුරු මෘග යෝනියෙහි ඉපද පිරිවර හැර උදකලාව ගඩගාවක් සමීපයෙහි පිහිටි යාවූ සිත්කළුවූ සල්ගසින් මිශ්‍රවූ පිපි අඹවනයෙක වසන්නාහ. බොධිසත්වයන්ගේ ඇඟ යහපත්කොට මඩනාලද රත්පතක් හා සමානවූ පැහැ ඇත්තේය. දෑත දෙපය ලාක්ෂා

රසයෙන් ගල්වනලද්දවුන් මෙන් රතුවන්නේය. වාලධිය චාමර වාලධියක් මෙන් මහත්වන්නේය, අන්දෙක රිදී දම්දෙකක් හා සමානවූ පැහැ ඇත්තේය, ඇස්සහල ඔප්නැගූ ඉඳුමිණි වැටදෙකක් හා සමාන වන්නේය. මුඛය ඔප්නගා තබනලද රත්පලස්වටක් හා සමානවන්නේය. ඒ මහබෝසතාණෝ මධ්‍යම රාත්‍රියෙහි ඒ සිටුපුත්‍රයෝ බැගෑහඬ අසා මනුෂ්‍ය ශබ්දයක් මෙන් ඇසෙන්නේය. මා ජීවත්ව ඉන්දදී මේ තෙමේ නොමියේයයි එසේහෙයින් ඔහුට ජීවිතදානය දෙමියි සිතා වසන්නාවූ වනලැහැබින් නැගීසිට ගංතෙරට ගොස් පින්වත් පුරුෂය තෝ නොබව තට ජීවිතදානය දෙමියි අස්වසාලා ගඟ පීනාගෙණ ගොස් ඔහු පිට ඉඳවාගෙණ ගොඩට ගොස් තමන් වසන තෙන ලා එලා එල දී දෙතුන් දවසක් ගිය කල්හි පින්වත්වූ පුරුෂය මම මෙතනින් තොප ගෙණ ගොස් බරණැස් නුවරට යන මාර්ගයෙහි සිටුවමි සැපසේ පලායව බල එකක් කියමි. අසවල්තෙන රන්වන් මුවකු වසන්නේයයි වස්තුව නිසා රජ යුවරජ මහ අමාත්‍ය ආදීන්ට නොකියවයි කීහ.

ඒ තෙම යහපත ස්වාමීනි, කියා බොධිසත්ත්වයන්ගේ බස් පිළිගත්තේය මහබෝසතාණන් වහන්සේ ඔහුගෙන් ප්‍රතිඥා ගෙණ ඔහු තමා පිටට නංවා ගෙණ බරණැස්නුවරට යන්නාවූ මාර්ගයේ බා සිටුවා පෙරලා තමන් වසන වනයට වන්හ. ඒ පුරුෂයා බරණැස් නුවරට වන් දවස් මහරජ්ජුරුවන්ගේ ඛෙමනම් අගබිසව් අළුයම් වේලෙහි ස්වප්නයෙන් තමන්ට රන්වන් මුවකු බණ කියන්නා දැක සිතන්නාවූ ඉදින් මෙබඳු මුවෙක් නුවූයේ නම් මම ස්වප්නයෙන් ඔහු නොදකිමි. ඒකාන්තයෙන් එබඳු මුවෙක් ඇත්තේමය. එසේහෙයින් රජ්ජුරුවන්ට කියමි සිතා මහරජ්ජුරුවන් කරා එලඹ මහරජ්ජුරුවන් වහන්ස, මම රන්වන් මුවකුගෙන් බණ අසනු කැමැත්තෙමි. ඉදින් ඔහු ලදුමෝනම් ජීවත් වෙමි නැත්නම් මාගේ ජීවිතය නැත්තේ වේදැයි කීහ එබස් අසා රජ්ජුරුවෝ බිසවුන් අස්වසාලා ඉදින් මනුෂ්‍යලෝකයෙහි ඇත්නම් ලබන්නේ වේදැයි කියා බමුණන් කැඳවා ගෙන්වා රන්වන් මුවෝ මේ ලෝකයෙහි ඇද්දැයි විචාරා එසේය දේවයන්වහන්ස, රන්වන් මුවෝ ඇතිවෙති. බමුණෝ කී බස් අසා සරහා පිළිසෙල කරණලද ඇත්කඳ මත්තෙහි රන් කරඬුවේ දහසින් බඳ පියල්ල තබා යමෙක් රන්වන් මුවෙක් වසනතැන් කියිහිවීනම් ඔහට දහසින් බඳ පියල්ල හා සමග රන්කරඬුවද ඇතුද දෙනු කැමතිව රන්පත හා ගාථාවක් ලියවා අමාත්‍යයෙකු කැඳවා දරුව තෝ මෙසේ එව මාගේ කීමෙන් මේ ගාථාව නුවර වාසීන්ට කියවයි කියන්නාහු.

කස්ස ගාම වරං දම්මි නාරියො ච අලංකතා
කො මෙතං මිගමක්ඛාති මිගානං මිගමුත්තමං'යි

මේ ගාථාව කීහ. අමාත්‍යයා රන්පත ගෙණ සියළු නුවර ගාථාව ගෙණ කියවූයේය. ඉක්බිත්තෙන් සිටුපුත්‍රතෙම වනයෙන් අවුත් බරණැස්නුවරට වදිමින් සිට මේ ගාථාව අසා අමාත්‍යයා සමීපයට ගොස් මම රජ්ජුරුවන් වහන්සේට එබඳු මුවකු වසනතැන් කියමි. මා රජ්ජුරුවන්ට දක්වයි කීහ. එබස් අසා අමාත්‍යයා ඇතුපිටින් බැස ඔහු රජ්ජුරුවන් සමීපයට කැඳවාගෙණ ගොස් දේවයන් වහන්ස, මේ පුරුෂයා ඒ මුවා වසන තැනක් කියන්නේයයි දැන්වූහ. රජ්ජුරුවෝ පින්වත්වූ පුරුෂය සැබෑද ඒ මුවා වසනතැන් දනීදැයි විචාළාහ. සැබෑව මහරජ්ජුරුවන්වහන්ස, ඒ මුවා පැ කෙණෙක් ඇත්නම් උන්ට දූනමතං

වසතුව දුතමැනවැයි කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස ගම්වරයකුත් සබ්‍රාහරණයෙන් සැරහුනාවූ සත්‍රීනුත් මට අවශෙෂවූ සියළු සම්පත් දෙතසේක්වී නම් සියළු මුවන්ට උතුම්වූ රන්වන් මුවරජ්ජුරුවන් වසනතෙන මම නුඹවහන්සේට කියන්නෙම් වේදැයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ මිත්‍රද්‍රොහී පුරුෂයාට සතුටුව පින්වත ඒ මුවා කොයි වෙසේදැයි විචාරා දේවයන්වහන්ස, අසවල්තෙන වෙසෙයි කීයා දේවයන්වහන්ස ඒ රන්වන් මුවා මෙතන වසන්නේයයි අත ඔසවා කියන්නේ යම් වනලැහැබෙක සුපිපි අඹගස් හා සල්ගස් පිහිටියේද? යම් භූමිප්‍රදෙශයක රතිඳුගොව්වන් පිට පැහැසමවූ රන්වූ සුව පහස් ඇති තෘණජාතියෙන් ගැවසීගෙණ සිය වයස්ගිය සාවුන්ගේ යටිබඩ මෙන් ඉතා මෘලොක්ව තිබේද? එබදු සිත්කළු වනලැහැබ ඒ මුවා සිටිනේයයි දැන්විය.

රජ්ජුරුවෝ ඒ පුරුෂයාගේ බස් අසා අමාත්‍යයන්ට විධාන කරන්නාහු මේ මුවා පලායානොදී ආයුධගත් අත් ඇතිව පුරුෂයන් හා සමග වනලැහැබ පිරිවරා ගණුවයි විධාන කළාහ. ඒ මනුෂ්‍යයෝ එපරිද්දෙන් මුවා වටලාගෙණ ඔල්වරහඩ ගැසූහ. රජ්ජුරුවෝ මිනිසුන් කීපදෙනෙකු හා සමග එක්පසෙක සිටියාහ. ඒ මිත්‍රද්‍රොහී පුරුෂයාත් රජ්ජුරුවන්ට නුදුරු තෙතෙක සිටියේය. මහබෝසතාණෝ ඔල්වරහඩ අසා සිතන්නාහු මහසේනාවක ශබ්දයෙක් වන්නේය. මා විසින් ගලවනලද පුරුෂයා විසින් මට භය උපදවතැයි සිතමින් ඔත්තැනින් නැගීසිට සියළු පර්ෂද බලා රජ්ජුරුවන් සිටිතැන් දැක රජ්ජුරුවන් සිටි තැනින් මට වැඩෙක් වන්නේය. එතනින් යායුතුයයි සිතා රජ්ජුරුවන් අභිමුඛව සිටියාහ. රජ්ජුරුවෝ ඒ මුව රජ්ජුරුවන් තමන් කරා එන්නා දැක මේ ඇත්බල ඇති මුව රජ්ජුරුවෝ මහා වේගයෙන් මැඩගෙණ මා සමීපයට එන්නේය. එසේහෙයින් දුනුපිට හීය ලා උරපුරා හයාගෙණ මුවා භයගන්වා, ඉදින් පලායේ නම් දුබ්ලකොට අල්වාගණිම්යි සිතා දුන්න නගාගෙණ බොධිසත්ත්වයන්ට අභිමුඛයෙහි සිටියාහ එසඳ මුවරජ්ජුරුවෝ රජ්ජුරුවන්ට දුනුපිට හීය ලාගෙණ සිටියා දැක දුරසිට කියන්නාහු මහරජ්ජුරුවන් වහන්ස. එකක් බැලුව මැනව මා නොවිද්ද මැනව මේ මුවා මෙතෙන සිටීයේයයි නුඹ වහන්සේට කීවෝ කවුරුද? නරොත්තම රජ්ජුරුවන් වහන්ස, මා නොමරා ජීවග්‍රහයෙන් අල්වාගත මැනවැයි මධුරවූ මනුෂ්‍යභාෂාවෙන් කීහ.

රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්ගේ මියුරු බස කණ නැගී ඇදගත් දුන්න බාපියා ආදර ගෞරවයෙන් සිටියාහ. මහබෝසතාණෝ රජ්ජුරුවන් සමීපයට ගොස් මියුරු පිළිසඳර කථාකොට එකත්පස්සව සිටියාහ. මහජනයෝත් සියළු ආයුධ දමා අවුත් රජ්ජුරුවන් පිරිවරා ගත්තාහ. එකෙණෙහි මහබෝසතාණෝ රන් රාශියක් සලන්නාක් මෙන් මධුරස්වරයෙන් රජ්ජුරුවන් අතින් විචාරන්නාහු පින්වත්වූ රජ්ජුරුවනි, මේ මුවා මෙතන සිටින්නේයයි නුඹවහන්සේට කීවෝ කවුරුදැයි විචාළාහ. එකෙණෙහි පාපිවූ පුරුෂයා මඳක් ඉවත්වෙලා බස් ඇසෙනතෙන සිටියේය. රජ්ජුරුවෝ මේ පුරුෂයා තොප මට දැන්වීයයි කියන්නාහු පින්වත්වූ මුව රජ්ජුරුවනි, යම් පුරුෂයෙක් අපට නුදුරුතෙන මෙකියන කථා අසා සිටීනම් ඒ පවිටු අදහස් ඇති පුරුෂයා ඒ මුවරජ්ජුරුවෝ මෙතන සිටිනාහුයයි මට කීයයි කීහුය. එබස් අසා මහබෝසතාණෝ මිත්‍රද්‍රොහියාට නින්දාකොට රජ්ජුරුවන් හා කථාකරන්නාහු රජ්ජුරුවන් වහන්ස, මේ ලෝකයෙහි මිත්‍රද්‍රොහීවූ පුරුෂතෙම දියෙහි වැටී මියමින් සිටියදීත් ගොඩනැගීම යහපත් නොවන්නේය. දියෙහි යන දණ්ඩක් ගොඩනැගීම යහපත් වන්නේයා

කාෂට වූකලී අනෙකප්‍රකාරයෙන් සත්ත්වයන්ට උපකාරයට පැමිණෙන්නේය. මිත්‍රද්‍රොහි පුරුෂයා නොයෙක් පරිද්දෙන් සත්ත්වයන් විනාශයට පමුණුවන්නේය. එසේහෙයින් පුරුෂයාට වඩා දියෙහි යන දණ්ඩ ගොඩ නැගීම යහපත් වන්නේයයි පුරාතනයෙහි නුවණැත්තෝ කීහ. මා විසින් ඒ නුවණැත්තන් කීව, නොකරණලදැයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු රුරුමෘග රජ්ජුරුවෙනි, තොපි කවුරුන්ට නිඳුකරවූද පක්ෂීන්ට නිඳුකරවූද නොහොත් මනුෂ්‍යයන්ට නිඳු කරවූද මනුෂ්‍ය ජනයන්ට කියන්නාහු බස් අසා මට බලවත්වූ භය උපන්නේය. මම මට ඉසුරු නොව භය සන්තකවූවාක් මෙන් වීමියි කීහ. ඉක්බිත්තෙන් මහබොසතානෝ මහරජ්ජුරුවන් වහන්ස, මේ මෘග පක්ෂීන්ට නිඳු නොකරමි. මනුෂ්‍යයන්ට නිඳුකරමි. දක්වන්නාවූ චණ්ඩ ජලප්‍රවාහ ඇති උතුළුතුත් ඇදගෙණ යන්ට සමර්ථවූ මහත්වූ ගඞ්ගා ජලස්කන්ධයෙන් ඇර ගෙණ යන්නාවූ මහපුරුෂයෙකු මධ්‍යම රාත්‍රියෙහි ගඟසරස පීනාගෙණ ගොස් පිට ඉඳුව ගෙණ ගොඩලීම්ද? ඒ අසත්පුරුෂයා නිසා මහත්වූ භයක් පැමිණියේය. එසේ හෙයින් මහරජ්ජුරුවන් වහන්ස, අසත්පුරුෂයා හා සමග විසීම නම් බලවත් දුක්වන්නේයයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ ඒ පාපී පුද්ගලයාට කිපී මෙසේ බොහෝ උපකාරී කළාවූ මුව රජ්ජුරුවන්ගේ ගුණ මේතෙම නොදන්නේය. එසේහෙයින් මොහු විද මරාපියම් කියා දුන්න හයාගෙණ කියන්නාවූ යම් පුරුෂයෙක් මුව රජ්ජුරුවන් කළගුණ නොදත් මිත්‍රද්‍රොහීද අකෘතඥකාරීද? එසේවූ පුරුෂයා ගෙලෙහි පත්කඩ සතරකින් සදනලද ආකාශගාමීවූ ශරීරය දේශ දුරුකරන්නාවූ මේ හීයම ඒ පුරුෂයාගේ ලෙහි පිහිටුවම් ඒකාන්තයෙන් මිත්‍රද්‍රොහී පුරුෂයාද විද මරමි කීහ.

ඉක්බිත්තෙන් මහබොසතානෝ මා නිසා නොනසීවයි සිතා රජ්ජුරුවන්ට කියන්නාහු ජනප්‍රධානවූ රජ්ජුරුවන් වහන්ස, ඒකාන්තයෙන් සත්පුරුෂයෝ නුවණ නැත්තවුන්ට වේවයි වධකිරීමෙන් නැසීම ප්‍රශංසා නොකෙරෙති. එසේහෙසින් මේ පාපී පුරුෂයා කැමැති පරිද්දෙන් තමා ගෙටම නැගියේවයි යම් වස්තුවක් මෝහට දෙම් ප්‍රතිඥා කළසේක් වීනම් ඒ සියළු වස්තු මෝහට දුනමැනවැයි මාගේ මස් අනුභව කරණසේක් වීනම් මා මරා මස් අනුභව කළ මැනව. මා ඇරගෙණ කෙළනා කැමතිසේක් වීනම් එලෙස කළ මැනව, ඒ සියල්ලම නුඹවහන්සේට අනුකැපව පවතිමියි කීහ.

එබස් අසා රජ්ජුරුවෝ සතුටුවූ සිත් ඇතිව මහබෝසතානන්ට සතුති කරන්නාවූ රුරුමෘග රජ්ජුරුවෙනි මිත්‍රද්‍රොහීකළාවූ මනුෂ්‍යයාට යම්බඳුවූ තෙපි ද්‍රොහී නොකළාද එසේහෙයින් ඒකාන්තයෙන් තෙපි සත්පුරුෂ බුඩාදී මහොත් තමයන් අතුරෙන් එක්තරා එක්කෙණෙක. එසේහෙයින් තොපට මම සතුති කෙරෙමි. ඒ පවිටුවූ පුරුෂයාත් කැමති පරිද්දෙන් වසවයි මහබෝසතානන්ට වර දී තමාගේ ගෙට නැගීයෙවයි යම් වස්තුවක් ඔහට දෙම් ප්‍රතිඥාකෙළේවීනම් ඒ වස්තුව් දෙමියි මම තොපගේ ධර්මකථායෙහි පැහැද තොපට කැමතිපරිද්දෙන් ඇවිදිනා පිණිස අභයදානය දෙමියිමෙතැන් පටන් තෙපි නිර්භීතව වසවයි මහ බෝසතානන්ට වර දුන්හ. ඉක්බිත්තෙන් මහබෝසතානෝ මහරජ්ජුරුවන් වහන්ස,මනුෂ්‍යයෝනම් මුඛයෙන් අනිකක් කියති ක්‍රියාවෙන් අනිකක් කෙරෙති කියා රජ්ජුරුවන්ගේ සිත් පරීක්ෂාකරණ පිණිස කියන්නාහු රජ්ජුරුවන් වහන්ස. කැණහිලුන් හා පක්ෂීන්ගේ බස් උන් සෘජු බුඩි හෙයින් මනාව දත

හැක්ක මනුෂ්‍යයන් වංකබුද්ධි හෙයින් උන්ගේ බස් තිරිසනුන්ගේ බසට වඩා නොදතහැක්ක, සමහර සත්ත්වයෙක් සතුටුවූ අවස්ථාවෙහි මූ මාගේ නෑතැනැත්තේය. මිත්‍රයානෝය. යහළුවානෝයයි සිතත්තේ පසු කල්‍යාමකින් ජීවිත හරණය කරන්ට සුදුසු සතුරකු සමාන වන්නේයයි කීහ එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු මුවරජ්ජුරුවෙනි, සෙස්සන් සිතන්නාසේ මට එසේ නොසිතව, මමු වූකලී ඉදින් රාජ්‍යය ඇරපියන්නෑ නමුත් තොපට දුන් වරය උගුළුවා නොපියමි. මාගේ බස් අදහවයි කියා වර දුන්හ. මහබෝසතානෝ රජ්ජුරුවන් සමීපයෙන් වර ගන්නාහු තමන් ප්‍රධානකොට ඇති සියළු සත්ත්වයන්ට අභයදානයෙන් වර ගත්හ. රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්ට වර දී උන් නුවරට ගෙණගොස් නුවරත් මහබෝසතානතුන් සරහා බිසවුන්ට ධර්මදෙශනා කරවූ මහබෝසතානෝ බිසවුන් ආදී කොටඇති රජ්ජුරුවන්ට හා රාජපර්ෂදට මධුරවූ මනුෂ්‍යභාෂාවෙන් ධර්මදෙශනාකොට රජ්ජුරුවන්ට දශරාජධර්මයෙන් රාජ්‍යය කරන්ට අවවාද කොට මහජනයාට අවවාද අනුශාසනාකොට වනයට වැද මෘග සමූහයා විසින් පිරිවරණ ලදුව වාසය කළාහ.

රජ්ජුරවෝ සියලු සත්ත්වයන්ට අභය දුන්හ. නුවර බෙරලවා එතැන් පටන් මෘග පක්ෂීන්ට කිසිවෙක් අතක් දික්කොට ලන්ට සමර්ථවූයෙක් නම් නොවීය. මෘගසමූහයෝ මනුෂ්‍යයන්ගේ ගොයම් කති. කිසිවකුත් වළකාලිය නොහෙන්නේය. මහජනයෝ රාජාඞ්ගනයට ගොස් මුරගානාහු මහ රජ්ජුරුවන් වහන්ස. මුවෝ එක්ව ගොයම් කති. නුඹවහන්සේ ඒ ගොයම් කෑම වළකුව මැනවැයි මෙලෙස මුරගා කීහ. එබස් අසා රජ්ජුරුවෝ රාජ්‍යවාසීනි, ඉදින් ජනපදය නසින්මුත් රුරුමෘග රජ්ජුරුවන්ට අභයදී මිත්‍රද්‍රෝහී නො, කෙරෙමි. දනව් සහිතවූ වර මට නොවේ නුමුත් වර දී මම බොරු නොකියමි කීහ. මහජනයෝ රජ්ජුරුවන්ගේ බස් අසා නැවත කිසිවක් කොටගත නොහී වැළැක්කාහ. මේ කථාව ඇමතැනක පැතිරගියේය. මෙපවත් මහබෝසතානෝ අසා මෘගසමූහයා රැස්කරවා මෙතැන් පටන් මනුෂ්‍යයන්ගේ ගොයම් නොකවයි අවවාදකොට මනුෂ්‍යයෝ තම තමන්ගේ කුඹුරුවල පත් අදින්වයි අවවාද මනුෂ්‍යයන්ට කියා යවූහ. එබස් අසා මනුෂ්‍යයෝ බොධිසත්ත්වයන් කීලෙසම තම තමන්ගේ කුඹුරුවල පත් බැන්දූහ. ඒ පණි සංඥාවෙන් අද දක්වා මුවෝ ගොයම් නොකන්නාහ. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණ හැර දක්වා වදාරා මහණෙනි, දෙවදත්ත ස්ථවිරයෝ කෙලෙහිගුණ නොදත්තේ දැන්මතු නොවෙයි. පෙරත් නොදත්තෝම වේදැයි වදාරා රුරුමෘග ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි සිටුපුත්‍රයා නම් දැන් මේ දෙවදත්තස්ථවිරයෝය රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝය. එසමයෙහි රුරුමෘග රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

475
සරභමිග ජාතකය

ඒ වද එක්සමයෙක්හි ධර්මරාජන්වූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් තමන්වහන්සේ සංක්ෂෙපයෙන් විචාළ ප්‍රශ්නයක් දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ විසින් විස්තර වශයෙන් ප්‍රකාශ කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

කවර සමයෙක සර්වඥයන් වහන්සේ තෙරුන් වහන්සේගෙන් සංක්ෂෙප යෙන් ප්‍රශ්නයක් විචාළසේක්ද? යත් දෙවොරොහණයෙහිදී විචාළසේක. එහි මේතෙම සංක්ෂෙපයෙන් පිළිවෙළ කථාව වන්නේය. රජගහනුවරසිටානන්ගේ සඳුන් පාත්‍රය පිණ්ඩොල භාරද්වාජ නම් මහතෙරුන් වහන්සේ සෘද්ධියෙන් ගත් කල්හි සර්වඥයන් වහන්සේ තෙරුන්වහන්සේගේ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය වැළකූසේක. එසමයෙහි තීර්ථකයෝ ශ්‍රමණ භවත් ගෞතමයන් විසින් සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය වළකනලද දූන් තමන්වහන්සේ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය නොකරණසේකැයි සිතා ලජ්ජා වෙත් කරබැවාවූ තමන්ගේ ශ්‍රාවකයන් විසින් කිමෙක්ද? ස්වාමීනි, සෘද්ධියෙන් ගොස් පාත්‍රය නොගත්සේක්දැයි විචාළ කල්හි උපාසකවරුනි, සෘද්ධියෙන් ගොස් පාත්‍රය ගැන්ම අපට බැරෑරුම් නොවෙයි. ලාමකවූ දඬු පාත්‍රයක් නිසා අපගේ ඉතා සියුම්වූ ගුණය කවරකෙණෙක් පා ගිහින්ට ප්‍රකාශ කෙරෙද්දැ? යි සිතා නොගතුම්හ. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ තමන් වස්තු ලොභීවන්නාහ. නුවණ මඳ බැවින් සෘද්ධි දක්වා පාත්‍රය ගත්හ. සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය බැරියයි නොසිතව අපි වූකලී ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයන් තබා කැමැත්තෝ වීනම් ශ්‍රමණ භවත් ගෞතමයන් හා සමගත් සරියේ සෘද්ධි දක්වම්හ. ඉදින් ශ්‍රමණ භවත් ගෞතමයන් එක් ප්‍රාතිහාර්‍ය්‍යයක් කළෝ වීනම් අපි දෙකක් කරම්හ. තුන්වෙනිව ශ්‍රමණ භවත් ගෞතමයෝ ප්‍රාතිහාර්‍ය්‍ය කෙරෙත් නම් අපි ඊට සතරපස දියුණුව කරම්හයි කීහ.

එපවත් භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේට දන්වනසේක් ස්වාමීනි, තීර්ථකයෝ ප්‍රාතිහාර්‍ය්‍ය කරම්හයි කියා ඇවිදිති. ඊට කාරණා කිම්දැ?යි කීහ. මහණෙනි, තීර්ථකයෝ සැබැනොව ප්‍රාතිහාර්‍ය්‍ය කෙරෙත්වයි. මමත් ප්‍රාතිහාර්‍ය්‍ය කරන්නෙම් වේදැයි වදාළසේක. එබස් අසා බිම්සර රජ්ජුරුවෝ අවුත් බුදුරජානන් වහන්සේ අතින් ස්වාමීනි, ප්‍රාතිහාර්‍ය්‍ය කරන්නේ ඇද්දැ? යි විචාළාහ. එසේය මහරජ්ජුරුවෙනි, කීකල්හි ස්වාමීනි, ශික්ෂාපද පැණවූසේක් වේදැයි කීහ. මහරජ, ශික්ෂාපද පැණවූත් මා විසින් ශ්‍රාවකයන්ට පණවනලද. සර්වඥයන්ට වනාහි ශික්ෂාපදයෙක් නම් නැත. යම්සේ මහරජ, තොපගේ උයනේ පුෂ්ප ඵල ජාති අනුන් නොගත හැක්කේයයි වළකන බව විනා තොපගේ ආනුභාව නො වළකන ලද්දේයයි මෙයින් එපරිද්දෙන් දතයුතුයි වදාළසේක.

එසඳ බිම්සර රජ්ජුරුවෝ ස්වාමීනි, ප්‍රාතිහාර්‍ය්‍ය කරන්නේ කොයිද්දැයි විචාරා සැවැත්නුවර ගණ්ඩම්බ වෘක්ෂමූලයෙහිදීයයි වදාළ කල්හි අප විසින් එතන කුමක් කටයුතුදැයි විචාළාහ. මහරජ, තොප විසින් එතන කළමනා දෙයක් නැතැයි වදාරා දෙවෙනි දවස් වළඳා අනතයෙහි චාරිකාවෙහි නික්මුනු සේක. මනුෂ්‍යයෝ සර්වඥයන් වහන්සේ වඩනාසේක්දැයි විචාරන්නාහ. සැවැත් නුවර ගණ්ඩම්බ නම් වෘක්ෂමූලයෙහිදී තීර්ථකයන්ගේ මානමර්දනය කොට යමක ප්‍රාතිහාර්‍ය්‍ය කරණට වඩනාසේකැයි භික්ෂූන්වහන්සේ කියනසේක. මහජනයෝ එබස් අසා ආශ්චර්‍ය්‍ය ස්වරූපවූ ප්‍රාතිහාර්‍ය්‍යයක් වේද, ඒ ප්‍රාතිහාර්‍ය්‍ය දකුම්හයි තමන්ගේ ගෙවල් ඇර සර්වඥයන් හා සමග නික්මුණාහ. අන්‍ය තීර්ථකයෝ අපිත් ශ්‍රමණ භවත් ගෞතමයන් හා ප්‍රාතිහාර්‍ය්‍ය කරණ තැන්හි ප්‍රාතිහාර්‍ය්‍ය කරම්හයි උපස්ථායකයන් හා සමග බුදුරජානන් වහන්සේ පසුපස්සෙහි ගියහ. සර්වඥයන් වහන්සේ ක්‍රමයෙන් සැවැත්නුවරට ගොස් රජ්ජුරුවන් විසින් ස්වාමීනි, ප්‍රාතිහාර්‍ය්‍ය කරණසේක්දැ? යි විචාළ කල්හි මෙයින් සත්වන දවස් ඇසළ මස මැදිපොහෝ දියයෙහියයි වදාළ සේක.

මණ්ඩපයක් කෙරෙම්දැයි ස්වාමීනි, කිකල්හි මහරජ, තොප කරණ මණ්ඩපයෙන් මට ප්‍රයෝජන නැත. මා ප්‍රාතිහාර්‍ය්‍ය කරණ තැන ශක්‍රදෙවේන්‍ද්‍රයෝ දොළොස් යොදුනක් පමණ සත්රුවන් මණ්ඩපයක් කෙරෙති වදාළසේක. ඒ කාරණය නුවර ඝෝෂණය කරවම්දැ? ස්වාමීනි, විචාළාහ. රජ්ජුරුවෙනි, අඬගා කියවයි වදාළසේක. රජ්ජුරුවෝ ධර්‍ම ඝොෂකයා සරහා පිළිසෙල කරණලද ඇත්කඳ මත්තට නන්වා සර්‍වඥයන් වහන්සේ මෙයින් සත් දවසක් ගිය කල සැවැත්නුවර ගණ්ඩම්බ වෘක්‍ෂමූලයෙහිදී තීර්ථකයන්ගේ මාන මර්දනය කොට ප්‍රාතිහාර්‍ය්‍ය කරණසේකැයි දවස් පාසා ඝෝෂා කරවන්නාහ. තීර්ථකයෝ ගණ්ඩම්බ වෘක්‍ෂමූලයෙහි ප්‍රාතිහාර්‍ය්‍ය කරණසේක්ලයි කියා හිමියන්ට වස්තු දී සැවැත් නුවර වටකොට අඹගස් කප්පවාපූහ.

ධර්‍මඝොෂකයා පුණුපොහෝ දවස් උදෑසනම අද ප්‍රාතිහාර්‍ය්‍ය වන්නේයයි හඬගා ගී කීයේය. දෙවතානුභාවයෙන් සියළු දඹදිව දොර දොර සිට හඬ ගැවෑක් මෙන් වූයේය. යම්කෙණෙක් යන්ට සිතුද ඔහු හැම්දෙනම සැවැත් නුවර සිටියාවූ තම තමන් දුටුවාහ. දොළොස් යොදුනෙක පැතිර සිටි පර්ෂත් වූයේය. සර්‍වඥයන් වහන්සේ උදෑසනම පිඩු සිඟන්ට වන්සේක. රජ්ජුරුවන්ගේ ගණ්ඩම්බ නම් උද්‍යානපාලයෙක් කැත ඉදිච්ලිකන ගිය මඩුපුළුලක් පමණ ඇති මහත්වූ අඹඵලයක් දැක රජ්ජුරුවන්ට ගෙණයන්නෝ සර්‍වඥයන් වහන්සේ නුවර දොරදී දැක මේ සර්‍වඥයන් වහන්සේටම සුදුසුවන්නේයයි සිතාලා පිළිගැන්විය. බුදුරජානන් වහන්සේ අඹය පිළිගෙණ එතනම එක් තැනෙක හිඳ වළඳා ආනන්දයෙනි මේ ඇටය මෙතනම රෝපනය කරණු පිණිස උද්‍යානපාලයාට දෙව. මෙතන ගණ්ඩම්බ නම් වන්නේයයි වදාළසේක. තෙරුන් වහන්සේ එපරිද්දෙන්ම කළසේක. උද්‍යානපාලයා පස්පීරා රෝපනය කෙළේය. එකෙණෙහිම අඹඇටය පළාගෙණ මුල්බට නගුලිසක් පමණ රන්වූ අංකුරයක් නැගී මහජනයා බලබලා සිටියදීම පණස්රියන් පමණ උස ඇති කඳ හා දිග අතු ඇති උඩින් සියක් රියන් පණස් රියන් පමණ ඇති අඹරුකෙක් පහළ වූයේය. එකෙණෙහි ඒ වෘක්‍ෂයෙහි මල් හා ඵල අටගත්තේය. ඒ වෘක්‍ෂය භෘඞ්ග සමූහයන් විසින් පිරවරණ ලදුව ස්වර්ණවූ ඵලයෙන් හරිතව අහස්කුස පුරා සිටියේය. පවන් හමන්ට පටන්ගත්කල්හි විලිස්සුනු ඵල වැගිරෙන්නේය. පසුව එන්නාවූ භික්‍ෂුන්වහන්සේ අඹ වළඳා වැඩිසේක. සවස්වේලෙහි ශක්‍රදෙවේන්‍ද්‍රයෝ පරීක්‍ෂාකරන්නාවූ සර්‍වඥයන් වහන්සේ විසින් මණ්ඩප කිරීම අපට භාරකරණලදැයි දැන විශ්වකර්‍මයා යවා දොළොස් යොදුනක් පමණ නිලුපුල් මලින් ගැවසීගත්තාවූ සත්රුවන් මණ්ඩපයක් කරවූහ. එකෙණෙහි දසදහසක් සක්වළ දෙවියෝ රැස්වූහ.

සර්‍වඥයන් වහන්සේ තීර්ථකයන් මන්මැඩ ශ්‍රාවකයන් හා අසාධාරණවූ යමකප්‍රාතිහාර්‍ය්‍ය කොට බොහෝ ජනයා ප්‍රාතිහාර්‍ය්‍යයෙහි ප්‍රසන්නවූ නියාව දැන අහසින් බැස බුද්ධාසනයෙහි වැඩහිඳ ධර්‍මදෙශනා කළසේක. විසිකෙළක් පමණ ප්‍රාණීහු අමාමහ නිවන් දැක සසර සයුරෙන් ගොඩ නැඟැහ. ඉක්බිත්තෙන් සර්‍වඥයන් වහන්සේ පෙර බුදුහු ප්‍රාතිහාර්‍ය්‍ය කොට ඉක්බිත්තෙන් කොයි ගියාදෝහෝයි පරීක්‍ෂාකරණසේක් තව්තිසා භවනයට ගිය නියාව දැන බුද්ධාසනයෙන් නැගී දක්‍ෂිණ ශ්‍රීපාදය යුගන්ධර මුදුනෙහි තබා වාමශ්‍රීපාදයෙන් මහමෙර මැඩ පරසතු රුක්මුල පාණ්ඩුකම්බලශෛලාසනයෙහි වස්වැස වස් තුන්මස ඇතුළත මාතෘ දිව්‍යපුත්‍රයන් ප්‍රධානකොට ඇති දෙවියන්ට සප්තප්‍රකරණ

සංඛ්‍යාත අභිධර්ම පිටකය දෙසූසේක යමාමහ පෙළහරට රැස්වූ පර්ෂත් සර්වඥයන් වහන්සේ නොදක නොයම්හයි යමක ප්‍රාතිහාර්ය කළතැනම තුන්මසක් මුළුල්ලෙහි විසූහ. පවරණලද දවස් ලංවූ කල්හි මුගලන් මහතෙරුන් වහන්සේ ගොස් සර්වඥයන් වහන්සේට දැන්වූසේක. සර්වඥයන් වහන්සේ මුගලන් මහතෙරුන් වහන්සේ අතින් විචාරණසේක් දැන් ශාරිපුත්‍රස්ථවිරයෝ කොයි වෙසෙද්දැයි විචාරා වදාළසේක. ස්වාමීනි, උන්වහන්සේ යමක ප්‍රාතිහාර්යයෙහි පැහැද මහණවූ පන්සියයක් භික්ෂූන් වහන්සේ සමග සංකස්‍ය නම් නුවර වසනසේකැයි දැන්වූ සේක. මෞද්ගල්‍යායනයෙනි, මම මෙයින් සත්වන දවස් සකස්පුර දොරට බසිමි සර්වඥයන් වහන්සේ දක්නා කැමති කෙණෙකුන් සකස්පුර දොරට රැස්කරවයි වදාළසේක එබස් අසා තෙරුන් වහන්සේ යහපතැයි පිළිගෙණ අවුත් පර්ෂදට කියා සියලු පර්ෂත් සැවැත්නුවරින් තිස්යොදුනක් පමණ සකස්පුර දොර මද ඇසිල්ලකින් පැමිණවූවසේක. සර්වඥයන් වහන්සේ වස්පවරා ඉක්බිති ශක්‍රදෙවේන්ද්‍රයෙනි, අපි මනුෂ්‍යලෝකයට යම්හයි වදාළසේක

එබස් අසා ශක්‍රයෝ විශ්වකර්මයා කැඳවා සර්වඥයන් වහන්සේ මනුෂ්‍යලෝකයට වඩිනා පිණිස ඉණික්කරවයි කීය. විශ්වකර්මදිව්‍යපුත්‍රයා මහමෙර මුදුනේ හිණිහිස තබා සකස්පුරදොර හිණිපාමුලකොට හිණිතුනක් මවන්නේ මධ්‍යයේ මැණික්මයවූ හිණක් හා එක් ඇලයෙක රන්හිණක් හා අනික් ඇලයෙක රිදීහිණක් නියායෙන් හිණිතුනක් මැවූයේය. සත්රුවන්මයවූ වේදිකාවෙන් පරික්ෂිප්තය. සර්වඥයන් වහන්සේ ලෝකවිවරණ ප්‍රාතිහාර්ය කොට මධ්‍යයේ මැණික්මයවූ හිණින් බටසේක. ශක්‍රදෙවේන්ද්‍රයෝ පාසිවුරු ගත්හ. සුයාම නම් දිව්‍යපුත්‍රයා වල්විදුනාවක් ගත්තේය. සහම්පතී මහබ්‍රහ්මයා ධවලච්ඡත්‍රය දැරූයේය. දසදහසක් සක්වළ දෙවියෝ දිව සුවඳ මල් ආදිය පූජා කළාහ. සර්වඥයන් වහන්සේ දෙව්ලොවින් බැස හිණිපාමුල සිටිකල්හි පළමු කොටම සැරියුත් මහතෙරුන් වහන්සේ නමස්කාර කළසේක. අවශේෂ පර්ෂත් නමස්කාරකළාහ. එසමයෙහි සර්වඥයන් වහන්සේ සිතනසේක්, මහාමෞද්ගල්‍යායන ස්ථවිරයෝ ඍද්ධිවන්තයෝයයි ප්‍රසිද්ධවූහ. උපාලි ස්ථවිරයෝ විනයධරයෝයයි ප්‍රසිද්ධවූහ. ශාරීපුත්‍රස්ථවිරයන්ගේ වූකලී මහත්වූ ප්‍රඥාගුණය ප්‍රකාශය, මාහැර මුන් සාදෘශවූ නුවණැති කෙණෙක් නම් මේ ලෝකයෙහි නැත. එසේහෙයින් උන්ගේ ඥාණගුණය ප්‍රකාශ කෙරෙමියි සිතා පළමුකොට පෘථග්ජනයන් විෂයවූ ප්‍රශ්න විචාළසේක. පෘථග්ජනයෝම විසර්ජනය කළාහ.

ඉක්බිත්තෙන් සෝතාපන්න විෂයවූ ප්‍රශ්න විචාළහ. ඒ පැනම සෝවාන් හුම විසඳුසේක. පෘථග්ජනයෝ නොලද්දහ. සකෘදාගාමිය, අනාගාමිය, ක්ෂීණාශ්‍රවයෝය, මහාශ්‍රාවකයෝය යන මොවුන් විෂයකොට ප්‍රශ්න විචාළසේක. ඒ ප්‍රශ්න මාර්ගඵල ලද්දෝ නොදත්තාහ. මතුමත්තේ මාර්ගඵල ලද්දෝම විසඳූහ. අග්‍රශ්‍රාවකයන් විෂයෙහි විචාළ ප්‍රශ්නද අග්‍රශ්‍රාවකයන් වහන්සේම විසඳුසේක. අවශේෂයන් වහන්සේ නොදත්සේක. ඉක්බිති සැරියුත් මහතෙරුන්වහන්සේ විෂයෙහි ප්‍රශ්න විචාළසේක. ඒ පැන තෙරුන්වහන්සේම විසඳුසේක. සෙසු තැනැත්තෝ නොදත්සේක. මනුෂ්‍යයෝ සර්වඥයන් වහන්සේ හා සමග ප්‍රශ්න විසර්ජනයෙන් කථාකරන්නාවූ මුන්වහන්සේ කවරකෙණෙකුන් වහන්සේදැයි විචාරා දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේයයි යනු අසා අනේ මුන්වහන්සේ ඉතා මහත්වූ ප්‍රඥා ඇතිසේකැයි ප්‍රශංසා කළහ. එතැන් පටන් දිව්‍ය මනුෂ්‍යයන් කෙරෙහි තෙරුන්වහන්සේගේ මහත්වූ ප්‍රඥා ගුණය ප්‍රසිද්ධවිය.

එකල්හි සර්වඥයන් වහන්සේ තෙරුන් වහන්සේට ආමන්ත්‍රණය කොට වදාරණ සේක් තිදුකාතෙනි, මේ ලෝකයෙහි ස්කන්ධායතනාදිවූ ප්‍රත්‍යය සම්පන්න ධර්ම කෙණෙක් ඇද්ද ? ශ්‍රොතාපන්නාදිවූ බොහෝ යම් ශෛක්ෂ කෙණෙක් ඇද්ද ? උන් සම්බන්ධවූ මාගේ ඥාණගතිය මුහුකුරුවා පැවැත්තේය. මා විසින් විචාරණ ලද්දාවූ තෙපි විශෙෂකොට මේ කාරණය විසඳා කියවයි සර්වඥ විෂයෙහි ප්‍රශ්න විචාරා ශාරිපුත්‍රස්ථවිරයෙනි සංක්ෂෙපයෙන් කියනලද්දාවූ මේ ප්‍රශ්නයට අර්ථ කෙසේ විස්තර හෙයින් දක්ක යුතුදැයි විචාළසේක. සැරියුත් මහතෙරුන් වහන්සේ ප්‍රශ්නය ආදී මධ්‍යාවසාන කොට පරීක්ෂා කොට සර්වඥයන් වහන්සේ මා අතින් ශෛක්ෂ අශෛක්ෂ භික්ෂූහුගේ ආගමන ප්‍රතිපත්තිය විචාරණසේකැයි දැන ප්‍රශ්නයෙහි සැකනැතිව ආගමන ප්‍රතිපත්තිය නම් ස්කන්ධාදී වශයෙන් බොහෝ නයින් කියන්නට පිළිවන කවර ආකාරයකින් කියන්නාවූ මම සර්වඥයන් වහන්සේ සිත්ගෙණ කියන්ට සමර්ථයෙහෝයි අධ්‍යාශයෙහි සැකවූසේක.

සර්වඥයන් වහන්සේ ශාරිපුත්‍රස්ථවිරයෝ ප්‍රශ්නයෙහි සැකනැත්තෝය. මගේ අධ්‍යාශයෙහි වූකලී සැකවෙති. මා විසින් නය නුදුන් කල්හි කියන්ට අසමර්ථවෙති. එසේහෙයින් මොහු මාගේ අදහස් දැන කියත්නම් ස්කන්ධ වශයෙන් කියති සිතූසේක තෙරුන් වහන්සේට නයදීම හා සමග ඒ ප්‍රශ්නය සියක් නයින් දහසක් නයින් වැටහින. තෙරුන් වහන්සේ සර්වඥයන් දුන් නයෙහි සිට බුද්ධවිෂයෙහි ප්‍රශ්න විසඳූසේක. සර්වඥයන් වහන්සේ දෙලොස් යොදනෙක පැතිරසිටි පර්ෂදට ධර්මදෙශනා කළසේක. තිස්කෙළක් ප්‍රාණීහු සද්ධර්මාමෘත පානය කළාහ. සර්වඥයන් වහන්සේ පර්ෂද යවා සැරිසරා වඩනා සේක් ක්‍රමයෙන් සැවත්නුවරට ගොස් දෙවෙනි දවස් නුවර පිඩුසිඟා ඇවිද වළඳා ඉක්බිති භික්ෂූන් වහන්සේ විසින් වත් දැක්වූ කල්හි ගඳකිළියට වැඩිසේක.

සවස් වේලෙහි භික්ෂූන් වහන්සේ තෙරුන් වහන්සේගේ ගුණ කථනය කෙරෙමින් දම්සභා මඩපයෙහි ඇවැත්ති, ශාරිපුත්‍රස්ථවිරයෝ අගාධවූ අපාරවූ මහත්වූ ගම්භීරවූ ප්‍රඥා ඇත්තෝය. ස්කන්ධායතනාදියෙහි පැතිර පවත්නාවූ විශාල ප්‍රඥාඇත්තෝය. ජවනහංස ගතියක්මෙන් ශීඝ්‍රවපවතින ප්‍රඥා ඇත් තෝය. ජීර්ණපත්‍ර පුටයෙක්හි දිවස සන්තප්ත අයස්කයක්මෙන් අස්ඛලිතව පවත්නාවූ ප්‍රඥා ඇත්තෝය. අනන්තවිධපූර්වූ රාගවෙශාදී අකුශලධර්මයන් විසින් විනිවිද උන්මූලය කොට පවත්නා ඥාණගති ඇතිහෙයින් විනිවිද පවත්නා ඥාණ ඇත්තාහ. දසබලධාරීවූ බුදුරජාණන් වහන්සේ සංක්ෂෙපයෙන් විචාරණ ලද්දාවූ ප්‍රශ්න විස්තරහෙයින් විසර්ජනය කළෝවේදැයි මෙසේවූ කථාවක් ඉපදවූසේක. සර්වඥයන් වහන්සේ ගඳකිළියෙහි වැඩහිඳම ඒ කථාව දිව්‍යශ්‍රොත ධාතුවෙන් අසා වදාරා තුන්තරා ගමනින් එක්තරා ගමනකින් දම්සභා මඩප යට වැඩ පණවනලද බුද්ධාසන මස්තකයෙහි යුගඳුරු මුදුනෙහි දිලිහෙන ළහිරු මඬලක් මෙන් දිළිහි දිලිහී මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කවර නම් කථාවකින් යුක්තව උන්නුදැයි කවර නම් කථාවක් තොප විසින් අඩාලවීදැයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි මහණෙනි, දැන් මතු නොවෙයි. පෙරත් ශාරිපුත්‍රස්ථවිරයෝ සංක්ෂෙපයෙන් කියනලද වචනයෙහි අර්ථ විස්තර වශයෙන් කීවෝවේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණලද බෝධිසම්භාර ඇති මහබෝසතාණන්වහන්සේ සරභමෘග යෝනියෙහි ඉපිද වනයෙහි වසන්නාහ. බරණැස් රජ්ජුරුවෝ මුව දඩයමෙහි ලොල්හ ශක්තිසම්පන්නායහ, පුරුෂයකුකොට නොතකන්නාහ. ඉක්බිත්තෙන් එක්දවසක් රජ්ජුරුවෝ මුව දඩයමට ගොස් අමාත්‍යයන්ට විධාන කරන්නාවූ යමක්හු සිටිතෙනින් මුවෙක් පැනලා ගියේනම් ඒ මුවා ඔහු විසින් දියයුතුයයි විධාන කළාහ.

එසඳ අමාත්‍යයෝ සිතන්නාහු කිසිකලෙක ලැහැප් මැද සිටත් කොටුපත සිටත් සමීපයට පැමිණි මුවා මරවාපියති. එසේ හෙයින් යම්කිසි උපායකින් රජ්ජුරුවන්වහන්සේ සිටිතැනට මුවා පන්නම්හයි සිතා කථාවක් කොට රජ්ජුරුවන්ට මුවන් අනවරතයෙන් යන්නාවූ මංකඩ දුන්හ. ඒ මනුෂ්‍යයෝ මහත් ලැහැබක් වටලා දඬු මුගුරු ආදියෙන් බිම ගැසූහ. පළමු කොටම සරභ මෘගයා නැගී සිට තුන්යලක් ලැහැබ සිසාරා ඇවිද පළායන්ට අවසරයක් නොලදින් සෙසු දිග මනුෂ්‍යයන් උරයෙන් උරය දුනුමුවාවෙන් පැහැර අවසරයක් නැතිව සිටියා දැක රජ්ජුරුවන් සිටි තෙනින් පළායන්ට නිසි අවකාශයක් දුටුවේය. ඒ සරභමෘගයා දල්වූ ඇස වැලිගසන්නාක්මෙන් රජ්ජුරුවන්ට අභිමුඛව දිවගෙණ ආයේය. රජ්ජුරුවෝ ඔහු ශීඝ්‍රව පැනගෙණ එන්නාහු දැක හියක් විද වරදවාපූහ. සරභ මෘගයෝ නම් ඊ දඬු වළකන්ට සමර්ථයහ. සැරය අභිමුඛව එනකල්හි දිවන්නාවූ වේගය රඳවා සිට පින්ම තගන්නාහුය. සැරය පස්සෙන් එන්ට වන් කල්හි වේගයෙන් ඉදිරියට දිවපියන්නාහ. මුදුනෙන් එන කල්හි පිටතටම දිවපියන්නාහ. ඇලපිටින් එන කල්හි මදක් ඉවත්ව යන්නාහ. කුසමැදට වන්කල්හි පෙරලී වැටීයන්නාහ. සැරය ඉක්ම පළාගිය කල්හි පවනින් කඩාදමනලද වලාකුළු මෙන් පළායන්නාහ. ඒ රජ්ජුරුවෝ එදවස් මුවා පෙරලී හුනු කල්හි මා විසින් සරභ මෘගයා විදිනාලදැයි අඬගැසූහ. එසඳ සරභ මෘගයා නැගීසිට පවන් හා සමානවූ වේගයෙන් දිවගත්තේ, සේනාව බිඳී දිවන්නාහ. දැලෙහි සිටියාවූ අමාත්‍යයෝ සරභ මෘගයා දිවන්නා දැක එකතැන්ව පින්වත්නි කවුරුන් සිටිතැනින් මුවා පැනපීදැයි විචාරා රජ්ජුරුවන් සිටිතැනට පැනපුවයි කීකල්හි වෙහෙසා කියන්නාහු පින්වත්නි රජ්ජුරුවන්වහන්සේ මම මුවා විදිම්යි කියනසේක් මුන්වහන්සේ විද්දේ කවුරුද පින්වත්නි අපගේ රජ්ජුරුවන්වහන්සේ නොවරදවා විදිසේක්ද බිම නොවරදවා විදිසේකැයි මෙසේ අනේකප්‍රකාරයෙන් රජ්ජුරුවන්ට අපහාසකොට කෙළියාහ

එසඳ රජ්ජුරුවෝ සිතන්නාහු මේ මනුෂ්‍යයෝ මාගේ පමණ නොදැන මට නින්දාපරිභව කෙරෙති. දිවන්ට පිළිවන්වේදැයි සිතා මිරිකා පිළී හැඳගෙණ කඩුව අතින් ගෙණ පසින්ම සරභ මෘගයා අල්වම් වේගයෙන් දිව ගත්තාහ. ඉක්බිති දිවන්නාවූ ඔහු දැක තුන්යොදුනක් පසුපස්සෙහි ලුහුබඳවාගෙණ ගියාහ. සරභ මෘගයා දිවගෙණ ගොස් විලට වන්නේය. රජ්ජුරුවෝ වනයට වන්හ. සරභ මෘගයා දිවන්නාවූ මාගීයෙහි සැට රියනක් පමණ මහත්වූ නරාවලෙක් ඇත්තේය. ඒ වළ තිස්රියනක් පමණ දියෙන් පිරී තණ කැලයෙන් සැඟවුනේය. සරභ මෘගයා උදකගන්ධයෙන් ආඝ්‍රාණය කොටලා වළ නියාව දැක ඉවත්ව පළාගියේය. රජ්ජුරුවෝ වූකලී ඛමන්ට ඉවයක් නැතිහෙයින් එල්ලවව එන තැනැත්තෝ නරකප්‍රපාතයේ

වන්හ. සරභ මෘගයා මදක්තැන් ගොස් පසුපස්සේ එන්නාවූ රජ්ජුරුවන්ගේ පාදශබ්දය තමාට නෑසෙන හෙයින් කරකැවී බැලූතැනැත්තෝ රජ්ජුරුවන් නොදැක නරකාවාටයේ වැටුනේවනැයි දැක බලන තැනැත්තෝ ගැඹුරුවූ ජලයේ පිහිටක් නැතිව දුක්විඳිනාවූ රජ්ජුරුවන් කළ අපරාධ තමන්ගේ ලෙහි නොතබා අටගන්නාවූ කරුණාවෙන් මේ රජ්ජුරුවෝ මා බලා සිටියදී නොනසිත්වයි මේ දුකින් මේ රජ්ජුරුවන් ගලවමි සිතා පසුපස්සෙහි වළ මුවපිට සිට කියන්නාහු මහරජ්ජුරුවනි තොපි නොබව මම තොප මේ දුකින් මුදමි. තමාගේ ප්‍රිය පුත්‍රයක්හු ගොඩ නගන්ට උත්සාහ කරන්නාහු මෙන් රජ්ජුරුවන් ගොඩ නගන පිණිස ගලක් ගෙණ සරමකොට දිවපියැමී සිතා පසුපස්සෙහි ලුහුබඳවාගෙණ ආවාවූ රජ්ජුරුවන් සැටරියනක් පමණ නරාවළින් ගොඩනගා අස්වසාලා පිට හිඳුවාගෙණ වනයෙන් ගෙණ අවුත් සේනාවට නුදුරුතැන තබා සිටුවා උන්ට අවවාද දී පඤ්චශීලයෙහි පිහිටුවූ සේක.

එසඳ රජ්ජුරුවෝ මහබෝසතාතන් හැරයානොහී කියන්නාහු සවාමීනි සරභමෘග රජ්ජුරුවන්වහන්ස මා හා කැටිව බරණැස්නුවරට අව මැනව දෙළොස් යොදනක් පමණ බරණැස්නුවර රාජ්‍යය දෙමි. එහි රාජ්‍යශ්‍රී අනුභව කළ මැනවැයි කීහ. එබස් අසා මහබෝසතාතෝ කියන්නාහු මහරජ්ජුරුවනි අප තිරිසනම්හ අපට රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත. ඉදින් මා කෙරෙහි තොපගේ ස්නෙහයක් ඇත්නම් මා විසින් දෙනලද පඤ්චශීලය අඛණ්ඩකොට රක්‍ෂාකෙරෙමින් රාජ්‍යවාසීනුත් පඤ්චශීලයෙහි පිහිටුවා සුවරි තම යොදවයි අවවාදකොට වනයට වන්හ. ඒ රජ්ජුරුවෝ ඇස කඳුළු පුරාගෙණ බොධිසත්ත්වයන්ගේ ගුණ සිහිකෙරෙමින්ම සේනාව කරා පැමිණ මහසෙනග පිරිවරා නුවරට වැද මෙතැන්පටන් සියලු නුවරවාසීහු පන්සිල් රකිත්වයි කියා බෙරලැවූහ. මහබොසතාතන් තමන්ට කළ ගුණ කිසි කෙණෙකුන්ට නොකියා රසමසවුලෙන් යුක්තව හෝජනය සවස අනුභව කොට සරභා පිළියෙළ කරණලද ශ්‍රියහන් මසනකයෙහි අළුයම් වේලෙහි හිඳ මහබෝසතාතන්ගේ ගුණ සිහිකොට නැගීසිට යහන් පිට පලක් බැඳ හිඳ ප්‍රීතින් පිරුණාවූ සිතින් උදන් අනන්නාවූ මෙසේ කීහ. නුවණැති පුරුෂයා විසින් වීර්‍ය තබා නොපියා තමා කරන්ට පටන්ගත් කාරියෙහි නොකලකිරී වීර්‍යකොට නිෂ්ටාවම දක්ක යුත්තේය ඊට කරණා කවරේදයත්? මම වූකලී සැටරියනක් පමණ නරක ප්‍රපාතයෙන් ගොඩනැගීම කැමතිවීම් යම්ලෙසක සිතීම්නම් එලෙස විය.

එසේහෙයින් අනුන් දෘෂ්ටාන්තකොට නොපමාව කළ වීර්‍යයෙන් ගොඩනැංගාවූ මා ම දෘෂ්ටාන්තයට දකිමි දුකට පැමිණියාවුත් නුවණැති සත්ත්වතෙම සැපයට පැමිණීමෙහි අසිතියද නොපිස්නේය. ලෝකයෙහි සත්ත්වයන්ට මරණ අහිතය. ජීවත්ව හිඳීම හිතය. එතකුදු වුවත් ඒ සත්ත්වයන් විසින් නොසිතන මරණම සත්ත්වයන් කෙරේ පැමිණෙන්නේය. මම නරාවළ වැටෙමියි. නොසිතමි සරභ මෘගයා මරමි සිතමි. දැන් වූකලී මා සිතූදෙය නොසිතූදෙය විය. එසේ හෙයින් සියළු සම්පත්තීහු චින්තාමය නොවන්නාහ. නුවණැත්තාහු විසින් වීර්‍යකටයුතුය නොසිතූ දෙයක්ම සමෘද්ධවන්නේයයි මෙසේ ඒ රජ්ජුරුවන් ප්‍රීතිවාක්‍යයෙන් උදන් අනමින් සිටියදීම ඉරු නැංගේය. පුරෝහිත බ්‍රාහ්මණයා උදෑසනම සුඛ සෙය්‍යාව විචාරණ පිණිස අවුත් දොරකඩ සිටියේය. රජ්ජුරුවන්ගේ ගීතිකා ශබ්දය අසා සිතන්නේ රජ්ජුරුවන්වහන්සේ ඊයේ දවස් මුව දඩයමට ගිය

සේක. ගියාවූ රජ්ජුරුවන්වහන්සේ සරභ මෘගයා විද වරදවාපුසේක්වන, ඉක්බිත්තෙන් අමාත්‍යයන් විසින් නින්දාකරන්ට වන්හෙයින් මුවා මරා ගෙණෙමියි සිතා රාජාභිමානයෙන් ඔහු පසුපස්සෙහි ලුහුබඳවාගෙණ ගොස් සැටරියන් නරාවළෙක හුනුසේක්වන. කෘපාථවූ සරභ මුවරජ්ජුරුවන් විසින් රජ්ජුරුවන් වහන්සේගේ දෙස සිත නොබලා වලින් ගොඩනගන ලද්දේවන, එසේහෙයින් ප්‍රීතිවාක්‍යයෙන් උදන් අනනසේක්වනැයි මෙසේ ඒ බමුණා රජ්ජුරුවන්ගේ සම්පූර්ණවූ අර්ථ ඇති උදාන වාක්‍යය අසමාප්තකොට දන්නාලද දර්පණ තලය කින් මුඛය බලන්නාහට මුඛ ප්‍රතිබිම්බය පෙණෙන්නාක් මෙන් රජ්ජුරුවන් හා සරභ මෘගයා හා දෙදෙනා කළ කාර්‍ය්‍ය ප්‍රකාශකොට වැටහුනේය පුරෝහිත බ්‍රාහමණයානෝ එසඳ නියපිටින් දොරට ගැසූහ. රජ්ජුරුවෝ දොර අරවන්නෝ කවුරුදැයි විචාරා මම පුරෝහිත බ්‍රාහ්මණයයි කී කල්හි එසඳ උන්ට දොර හැර මෙසේ එව ආචාරීති කී කල්හි පුරෝහිත බ්‍රාහ්මණයෝ ඇතුළට වැද ''ජයතු භවං මහාරාජ'' යනාදීන් ආශීර්වාද කොට එකත්පස්ව සිට කියන්නාහු මහරජ්ජුරුවන්වහන්ස මම නුඹවහන්සේ වන යෙහිදී කළ කාර්‍ය්‍ය දනිමි නුඹවහන්සේ සරභ මෘගයා ලුහුබඳවාගෙණ ගියසේක් නරක ප්‍රපාතයේ හුනුසේක.

එසේහෙයින් නොපසුබටවූ වීර්‍ය්‍ය ඇති සත්පුරුෂ ගුණ ඇතිවූ ඒ රන්වන් මුවරජ්ජුරුවන් නුඹවහන්සේ ශ්‍රීයහත් මස්තකයේ හිඳ වර්ණනාකරණ සේක් වේදැයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ මේ බමුණානෝ මා හා සමග මුව දඩ නොගියහ. එතකුදුවුවත් සියළු පවත් දනිති. කෙසේ දැනයුතුද මූං අතින් විචාරමියි සිතා කියන්නාහු බමුණානෙනි තෙපි මා මුව දඩ යන දවස් කැටිව ගොස් එතන සිටියාද නොහොත් තොපට මේ පවත් කී කෙණෙක් ඇද්ද තොපගේ ඥානය ඉතා බලවත් ස්වරූප ඇත්තේය. එසේ හෙයින් සියල්ල නුවණැසින් දක්නා සුළුවූ සර්වඥකෙණෙක්දැයි කීහ. එබස් අසා බමුණු කියන්නාහු මම සියල්ල දන්නාවූ සර්වඥකෙණෙකුත් නොවෙමි. එතකුදුවුවත් අතුරු නොපිරිහෙලා සම්පූර්ණකොට කියනලද උදාන ගාථාවක් අසා එහි අර්ථය මට ප්‍රදීපාලෝකයක් මෙන් වැටහෙන්නේය. මහරජ්ජුරුවන්වහන්ස නුඹවහන්සේ මුව දඩ යන දවස් කැටිව ගොස් මා එතන සිටියෙත් නැත. මෙපවත් මට කී කෙණෙකුත් නැත. එතකුදුවුවත් නොවරදවා කියන ලද උදාන ගාථාවක් අසා මා බලවත්වූ ප්‍රඥා ඇතිහෙයින් ඒ ගාථාවෙහි අර්ථ විශෙෂයෙන් ප්‍රකාශකොට දැනගතිමි කීහ. රජ්ජුරුවෝ පුරෝහිත බ්‍රාහ්මණයන්ගේ බස් අසා සතුටුව බොහෝ සැපත් දුන්හ එතැන්පටන් රජ්ජුරුවෝ දානාදී පින්කමෙහි බලවත් ඇලුම් ඇතිවූහ. රජ්ජුරුවන්ගේ අවවාදයෙහි පිහිටා මනුෂ්‍යයෝ කුශලයෙහි ඇලුම් ඇතිව දවස් යවා මළාවූ සත්ත්වයෝ ස්වර්ගලෝකයෙහි උපන්හ. ඉක්බිත්තෙන් දවසක් රජ්ජුරුවෝ විදිමියි සිතා පුරෝහිත බ්‍රාහ්මණයානන් කැඳවාගෙණ උයනට ගියහ.

එකල්හි ශක්‍රදේවේන්ද්‍රයෝ බොහෝ අභිනව දිව්‍යපුත්‍රයන් හා දිව්‍යාඞ්ගනාවන් දැක මීට කාරණා කිමෙක්දෝහෝයි පරීක්ෂා කරන්නාහු සරභ මුව රජ්ජුරුවන් විසින් නරක ප්‍රපාතයෙන් නගා රජ්ජුරුවන් ශීලයෙහි පිහිටවූ නියාව දැන රජ්ජුරුවන්ගේ ආනුභාවයෙන් මහජනයෝ කුසල් කෙරෙති. එසේ හෙයින් දිව්‍යලෝකය අභිනව දිව්‍යපුත්‍රයන් හා දිව්‍යාඞ්ගනාවන් පිරෙන්නේයයි දුටහ. නැවත රජ්ජුරුවෝ ධූකලි විදින්ට ගියාහ. උන් සිත පරීක්ෂාකොට සිංහනාද කරවා සරභ මෘග රජ්ජුරුවන්ගේ ගුණ වර්ණනා කරවා මා ශක්‍ර නියාව දන්වා

ආකාශයෙහි සිට ධර්මදෙශනාකොට මෛත්‍රියෙහිත් පඤ්චශීලයෙහිත් ගුණ කියවා එම්සි සිතා උයනට ගියාහ. එසඳ රජ්ජුරුවෝ වූකලී විදිම් සිතා දුන්න හයාගෙණ් දුනුපිට තියලා උරපූරා හයාගත් ශක්‍රයෝ රජ්ජුරුවන්ටත් තමාටත් අතුරේ තමන්ගේ ආනුභාවයෙන් සරභ මෘග රූෂයක් දක්වූ කල්හි රජ්ජුරුවෝ මුවා දැක සැරය අත නොහෙළුවාහුය. ඉක්බිත්තෙන් ශක්‍රදේවේන්ද්‍රයෝ පුරෝහිත බ්‍රාහ්මණයන්ගේ ශරීරයෙහි අධිගෘහිතව කියන්නාහු රජ්ජුරුවෙනි මනාවූ පත්කඩින් සාදනලද මෙර මාගේ වීර්‍ය්‍යී තසන්නාවූ සැරය දුනුපිටලා උපපූරා ඇදගෙණ සිට දුන් පසුබැස සිටින්ට කාරණා කවරේදැයි ඇතියෙවයි සිතා තොප විසින් පහරණලද මේ සැරය වහා ගොස් ඒ සරභ මෘගයා විදීවයි උතුම් ප්‍රඥා ඇති රජ්ජුරුවෙනි සරභ මෘගයෝ නම් රජ්ජුරුවන්ට අග්‍රභොජන වෙද්ද එසේවූ සරභ මෘගයා බල බලා උපෙක්ෂාව පසුබැස සිටින්ට කාරණා කවරේදැයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු බමුණානෙනි රජ්ජුරුවන්ට සරභ මෘගයන් භොජනයකි ඒකාන්තයෙන් මමත් දනිම්මය. එතකුදු වුවත් මේ මුවරජ්ජුරුවන් පෙර මහට කළ උපකාර සිහිකොට යම්හෙයකින් උන්ගේ ගුණයට පූජාකෙරෙම්ද එසේහෙයින් මුවරජ්ජුරුවන් විද නොමරම් කීහ.

ඉක්බිත්තෙන් ශක්‍රදේවේන්ද්‍රයෝ කියන්නාහු මහරජ්ජුරුවෙනි මේ මුවෙක් නොවෙයි දිසනායකවූ රජ්ජුරුවෙනි අසරණයන්ට ජ්‍යෙෂ්ඨවූ මූ තුමූ ශක්‍රදේවේන්ද්‍රයෝය. එසේහෙයින් තෙපි ශක්‍රයන් මරා ශක්‍රදේවේන්ද්‍රව ඉඳින් රජ්ජුරුවෙනි මු තුමූ මාගේ යහළුවානෝයයි සිතා මේ සරභ මෘගයා මරන්ට නොසිතවූ තම තොපගේ පුත්‍රදාරාවන් හා සමග යමරජ්ජුරුවන්ගේ ආඥා පවත්නාවූ වේතරණී නම් නරකයට යන්නා වේදැයි තැතිගැන්වූහ. එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු බමුණානෙනි ඒකාන්තයෙන් මමය දනව්වැසි වාසීහුය පුත්‍රදාරාවෝය යහළු මිත්‍රයෝය යන මේ සියල්ලෝම යම රජ්ජුරුවන්ගේ ආඥා පවත්නාවූ වේතරණී නම් නරකයට යමෝමුත් මට ජීවිතදානය දුන්නාවූ මේ මුව රජ්ජුරුවන් ඒකාන්තයෙන් මරන්ට නොසිතම්. බමුණානෙනි වනයේ උදකළාව ගොස් සැටරියනක් නිරාවල හුනු කල්හි මේ මුව රජ්ජුරුවන් දුකට පැමිණියාවූ මා ගොඩනගා මෙබඳු ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටුවූහ.

එසේහෙයින් පළමු මට කරණලද්දාවූ උපකාර සිහිකරන්නාවූ මම දැන දැන මේ මුව රජ්ජුරුවන් කෙසේ මරම්දැයි කීහ. ඉක්බිත්තෙන් ශක්‍රදේවේන්ද්‍රයෝ පුරෝහිත බ්‍රාහ්මණයානන් ඇඟින් පහව ශක්‍රාත්මභාවය මවා ආකාශයෙහි සිට රජ්ජුරුවන්ගේ ගුණ ප්‍රකාශකරන්නාවූ රජ්ජුරුවෙනි මිත්‍රද්‍රෝහි නොව මිත්‍රයන් සතුටු කරවන්නාවූ තොපි දෙදෙව්ලොව දෙවියන්ට අධිපති ශක්‍රදේවේන්ද්‍රයානන් දෙවඟනක් හා සමග ක්‍රීඩා කරන්නාක් මෙන් සිත සතුටු කොට බොහො කලක් රාජ්‍යශ්‍රී අනුභව කරව. තවද රජ්ජුරුවෙනි සියල්ලවුන් කෙරෙහි වෛෂ නොකොට කොපී නොව නිරන්තරයෙන් මෛත්‍රියෙන් ප්‍රසන්නවූ සිත් ඇතිව ධාර්මිකවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් නිරන්තරයෙන් අමුත්තන් මෙන් සිතා පරිහරණය කෙරෙමින් උන්ගේ යාච්ඤාවෙන් යොග්‍ය කැමති වස්තු දී තොපගේ විභවානුරූප පරිද්දෙන් දන් පින් කොට කළාවූ කුශල කර්මයෙන් සතුටු සිත් ඇති සියල්ලවුන්ගෙන් ප්‍රශංසා ලැබ ආයු කෙළවර ගොස් ස්වර්ග ලෝකයෙහි උපදවයි මෙසේ ශක්‍රදේවේද්‍රයෝ රජ්ජුරුවන්ට අවවාද කොට තමන් වසන්නාවූ ත්‍රයඃත්‍රිංශත් දිව්‍යලෝකයටම ගියාහ ශාස්තෘවූ

බුදුරජාණන්වහන්සේ මේ ධර්‍ම දෙශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි දැන් මතු නොවෙයි පෙරත් ශාරිපුත්‍රස්ථවිරයෝ සංක්ෂෙපයෙන් කියනලද වචනයෙහි අර්ථය විස්තරවශයෙන් දැන කීවෝම වේදැයි වදාරා **සරභමෘග ජාතකය** නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය, පුරෝහිත බමුණානම් ශාරිපුත්‍රස්ථවිරයෝය. සරභමෘග රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

තෙරස නිපාතය නිමි.

---

476 සාලිකෙදර ජාතකය

සංස්කාර විකාර ලක්ෂණ නිර්‍වාණ ප්‍රඥප්තිය යන පඤ්චවිධ ඥෙය්‍යමණ්ඩලය ශ්‍රීහස්තයෙහි රේඛා සේ ආයතනයෙන් දක්නාවූ සමතැස් ඇති ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ එක් සමයෙක්හි සැවැත් නුවර ගොදුරුගම්කොට ජෙත නම් රාජකුමාරයන්ගේ උයන්හි අනේපිඬු මහසිටුහු විසින් කරවා පිළිගන්වනලද ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක් දෙමව්පියන්ට උපස්ථාන කරන්නාවූ භික්ෂූකෙණෙකුන්වහන්සේ අරභයා මේ ශාලිකෙදර ජාතකය දෙශනා කොට වදාළසේක.

මෙහි පිළිවෙළ කථාවස්තුව සාම ජාතකයෙහි කී නියායෙන් දතයුතුයි. බුදුහු වනාහි දෙමව්පියන්ට උපස්ථාන කරන්නාවූ එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ සමීපයට කැඳවා මහණෙනි ගිහින් පෝෂ්‍යකරන්නේ සැබෑදැයි විචාරා වදාළසේක. සැබව ස්වාමීනි දැන්වූ කල්හි තොපට කුමක් වේදැයි විචාළසේක එකල්හි භික්ෂූන්වහන්සේ විසින් ස්වාමීනි දෙමව්පිය දෙදෙනායයි කී කල්හි බුදුහු තුන්විටක් සාධුකාර දී මහණ පුරාතනයෙහි පණ්ඩිතවරහු තිරිසන්වූ ගිරායෝනියෙහි ඉපිද පවා ජරාවට පැමිණි දෙමව්පියන් කැදැල්ලේ වැදහොවා තුඩින් ගොදුරු ගෙණැවිත් පෝෂ්‍යය කෙළේ වේදැයි වදාරා ඒ භික්ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ බුදුරජාණන්වහන්සේ අෂ්ටාඞ්ග සමූපෙතවූ කුරවීක නාද පවත්නාවූ බ්‍රහ්මස්වර විහිදුවා ප්‍රාංශු ප්‍රච්ඡන්නාවූ සත්රුවන් නිධානයක් ගෙණහැර පානා පරිද්දෙන් භවයෙන් පිළිසන්ව තිබූ ඉකුත්වත් කථාව ගෙණහැර දක්වා වදාරණසේක් මහණෙනි.

මහණෙනි,

යටගිය දවස මගධරට රජගහනුවර මගධ නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි ඒ රජගහනුවරට ඉසානකොන සාලින්දිය නම් ගමෙක් විය. ඒ බමුණුගම ඉසානදිග මගධ ක්ෂෙත්‍රනම් වෙලෙක් විය ඒ යටකියනලද බමුණුගම කොසිකගොත්‍ර ඇති බ්‍රාහ්මණයාන කෙණෙකුන් ඒ වෙලින් දහසක් කිරි පමණ කෙතෙක් ගෙණ ඇල් වැපුරවූහ. ගොයම් පැලවගිය කල්හි වැට තරකරවා සමහරකෙණෙකුන්ට පණස්කිරි පමණ තැන සමහරකෙණෙකුන්ට සැටකිරි පමණතැනැයි පන්සියයක් පමණකිරි තමන්ගේ පොෂ්‍යයකාරයන්ට

පාවාදී අවශෙෂවූ පන්සියයක් කිරි පමණ තැන් බැලමෙහෙ පුරුෂයන්ට් පාවාදී තමහට වෘතති තබා රක්නාලෙස දුන්හ. ඒ පුරුෂද තමාගේ භාගයෙහි පැලක් තබාගෙණ රක්නේය. රාත්‍රිභාගයෙහි එහිම වසන්නේය. ඒ කෙතට ඊසානකොනයෙහි එක්තරා පාංශු පර්වතයෙක්හි මහත්වූ ඉඹුල්වනයෙක්හි නොයෙක් සියදහස් ගණන් ගිරවූ සමූහයා වසන්නාහුය. එසමයෙයි පූරණ ලද සමතිස් පෙරුම් ඇති දෙවනලද පඤ්චමහ පරිත්‍යාග ඇති ඥාතාර්ථචර්‍ය්‍යාදී වූ ත්‍රිවිධ චර්‍ය්‍යාවෙහි කෙළ පැමිණි මහබෝසතානෝ ඒ ගිරාසමූහයාට රජ කරන්නාවූ රජ්ජුරුවන්ට පුත්ව උපන්නාහ. ඒ මහබෝසතානෝ වැඩිවිය පැමිණියාහු විශිෂ්ට රූ ඇතිව මහත්වූ ශක්ති සම්පත්තවූ ගැල් නැබක් හා සා පමණ මහත ඇතිවූහ.

ඉක්බිති රජ්ජුරුවෝ මහබෝසතානන්ගේ ශරීර සම්පත්තිය හා විශාරදකම් දැක මම්ද ඉතින් වයෝවෘධව ගියහෙයින් දූර බැහැර නැගීයා නොහී දරුවෙනි මෙතැන් පටන් තෙපි මේ ගිරාසමූහයා පරිහරණය කරවයි බොධිසත්වයන්ට රාජ්‍යය පාවාදුන්හ. මහබෝසතානෝ රාජ්‍යය ලත් දෙවන දවස් පටන් පියානන් ගොදුරු පිණිස යානොදී ගිරවුන් විසින් පිරිවරණලදුව හිමාලයට ගොස් සයංජාත විල්හි තෙමේම තමාට අටගත් සාලිවනයෙහි සෑහෙන පමණක් ඇල් අනුභවකොට අන්තිම තුඩින් ගොදුරු ගෙණවුත් දෙදෙනා පෝෂ්‍යය කරන්නාහ. මෙසේ දවස් යවන කල්හි එක් දවසක් ගිරවූ මහබෝසතානන් සමීපයට අවුදින් ස්වාමීනි පෙර මෙසමයට මගධරට ක්ෂේත්‍රයෙහි ඇල් පැසෙන්නේයයි සිතා දූන්වූහ. එපවත් අසා බොධිසත්වයෝ ඇල් මෙවකට කවර වීවරදැයි පරීක්ෂාකොට එවයි ගිරවුන් දෙදෙනෙකු යවූහ ඒ ගිරාපෝතකයෝ දෙදෙන මගධක්ෂේත්‍රයට බස්නාවූ යටකියනලද බැලමෙහෙ කරන්නාවූ පුරුෂයාගේ ක්ෂේත්‍රභාගයට බැස ඇල් කා එක් ඇල්කරලක් කපා ගෙණ ඉඹුල්වනයට අවුදින් මහබොසතානන්ගේ ශ්‍රීපාදමූල හෙලා ස්වාමීනි හෙල ඇල්කෙත පැසුව්වර වේදැයි ෂැහ. මහබෝසතානෝද පසුදවස් සමූහ වසයෙන් නොයෙක් සියගණන් ගිරවුන් පිරිවරා ගොස් එම ක්ෂේත්‍රභාගයටම බටහ බැලමෙහෙපුරුෂද ඇල් කන්නාවූ ගිරවුන් දැක වළකම්යි ඇත මැත දිව වළකන්නේ වළකාගත නුහුනුයේය. මෙසේ ඔහු වැළකීයදීම ගිරවු ඇල් අනුභවකොට සෙසු ගිරවු සිස්මුඛයෙන් යන්නාහුය. ගිරාරජ්ජුරුවෝ වනාහී ඇල්කරල් එතිනෙක කඩාගෙණ බොහෝ ඇල්කරල් එක්කොට තුඩින් ගෙණ වුත් දෙමව්පියන්ට දෙන්නාහ.

මෙසේ බොධිසත්ත්වයන් හා ගිරව් එම කෙතට බැස ඇල් අනුභවකරන්ට පටන්ගත්හ ඉක්බිති ඒ පුරුෂතෙම ඉදින් ගිරවු මේ සැටියේ කීපදව සක් කෑවාහු ඊතම් කෙත්වතින් තිබෙන දෙයක් නැත. එකල්හි බමුණානෝ තවු කඩවා මානය කරන්නාය. එසේ හෙයින් කල්නොයවා ගොස් කීව මැනවැයි සිතා ඇල්කරල් අසරක් හා පමණ ශක්තිපමණින් අතිකුත් කිසි උපකරණයක් ඇරගෙණ ගොස් බමුණන්දැක වැඳලා එකත්පස්ව සිටිසඳ බමුණානෝ කිමෙක්ද පින්වත් පුරුෂය පුරාතන කෙත්වත පැසීගියෙ වේදැයි විචාළාහ. එපවත් අසා ඒ පුරුෂතෙම කෞෂික ගොත්‍රයෙහි උපන් බමුණානන්වහන්ස ඇල්කෙත පැසීගිය බව තෙල නුඹවහන්සේට පෑ කරල් අසරෙන් දැනවදළ මැනව එතකුදුවුවත් දැන් තුන්දවසක් පටන්ගෙණ නොයෙක් සියදහස්ගණන් ගිරව් කුඹුර නොපෙණෙනසේ වසාගෙණ ගිය ගිය අතින් ඇල් කන්ට පටන්ගත්හ. නොයෙක් පරිද්දෙන් උත්සාහකරන්නෙමුදු වළකාගත නොහී ඒ බව නුඹ

වහන්සේට කියන්ට ආමියයි කියා නැවත කියන්නේ, ස්වාමීනි ගිරා සමූහයා අතුරෙන් එක් ගිරවෙක් සර්වප්‍රාකාරයෙන් ඉතා ශොභමානවූ ශරීර වර්ණීනා ඇත්තේය. පබළු දලුවක් බඳුවූ මනාවූ තුඩකින් හා මනාව වටවත් යුවලැසින්ද ලාක්ෂාරසයෙන් අඟනා නඟාගත්තාක් බඳුවූ පායුගය කින්ද මොණරකරක් බඳුවූ ග්‍රීවයට කල රන් රේඛා තුණකින්ද දෙව්දුන්නක් බඳුවූ අනෙක වර්ණයෙන් ඉතා රිසියෙන්නාවූ පෙද ගොල්ලකින්දැයි මෙසේ සර්ව අඟින් හොබනාවූ සඳස් මොණරකු හා පමණ මහත ඇති ගිරවෙක් දෑවල් දෙවරු ඇල්කරල් කා යනකල කරල් මිටියක් කපාගෙණ යෙයි. ඔහු ඒ ගිරවුන්ට රජවනැම් සිතම් කිවුය. මෙසේ කියනලද පුරුෂයාගේ බස් අස අසා උන්නාවූ බමුණානෝ ඇල් ගොයම්හි අපෙක්ෂාවක් නැතිව ගිරා රජ්ජුරු වන් කෙරෙහි ස්නෙහ උපදවාගෙණ එම්බල පින්වත් පුරුෂය මල අටවනසේ දනීදැයි විචාළාහ. ඒ දනිමියි ස්වාමීනි කීය.

ඉක්බිති බමුණානෝ එසේවීනම් අස්ඉල අරගෙණ යහපත්කොට ලනු අඹරා සම්සේ ඒ පක්ෂිරාජයා නොවරදවා බැඳීයනලෙස උගුළු අටවා නොව රදවා බඳවා බඳුගෙණ වැලිත් ජීවිතය නොනසාම ගෙණෙවයි කීහ. එබස් ඇසූ ක්ෂෙත්‍රපාලනෙම් ඇල්නටු කඩවා මානය නොකළ බව යහපතැයි සතුටුව කෙත් වතට පළාගොස් බමුණානන් කී සැටියේ අස්වල් වටා පසුරු ඉදිකොට අද මෙතන බසිතියි සිතා ගිරාරජ්ජුරුවන් බස්නා තැන් සම්කොට සුලඟට ඇසි රෙණ පරිද්දෙන් උගුළු මල අටවා ගිරවුන් එන නියාව බල බලා පැලට වැදලා උන්නේය. ගිරා රජ්ජුරුවන්ද ගිරාසමූහයා පිරිවරා අවුදින් හොලුස්බව හේතු කොටගෙණ ඊයේ දවස ගොදුරු කා හල සඟියට බස්නාවූ සොරකම් ඇති මල පසුරු නොදුන ඇතුලෙහිම පයනබා බටහ.

එසඳ තමන්වහන්සේ බැඳුනුබව දැන මූළුලෝවාසීවූ සත්වයන්ට නැති ධෛර්‍ය වීර්‍ය හා විචාරණ ප්‍රඥාව තමන්වහන්සේ කෙරෙහිම ඇති හෙයින් සිතනසේක් ඉදින් මම දැන්ම බැඳීගියෙම් අඬාලීම්නම් මාගේ බන්ධුවර්ගයා ගොදුරු නොගෙණම නැගීයන්නාහ. එසේහෙයින් යම්තාක් ගොදුරු අනුභව කරණතෙක් ඉවසුව මැනවැයි සිතා ඉවසාගෙණ වැඩහිඳ ගිරවුන් ගොදුරු කා බඩපුරාගෙණ ඇත මෑත කෙළ ඇවිදින්ට වන් අවස්ථාවෙහි ඒ සලකුණෙන් ගොදුරු කා බඩ පුරාගත්හයි සිතා තමන්වහන්සේ බැඳුනු බව අඟවා තුන්යලක් බැගෑපත්ව හැඬූසේක. ඒ ශබ්දය හා සමග ඇම් දෙනම් හයින් ත්‍රස්තව යුගත් පවතින් පැනනැගී පරණලාසේ පළාගියහ. එපවත් දුටු ගිරා රජ්ජුරුවන්වහන්සේ මෙතෙක් මාගේ නෑසින් කෙරෙහි මා දයාවට කරනැවී බැලූ එකදකෙණෙක් නැත. හැමදෙනම සුවසේ ඇල් අනුභව කොට සිහිල් පැන් බී ගියහයි මම හුදකළාව මලෙහි බැඳිනිම් අනේ අපි පෙර ජාතියෙහි කෙසේ අකුසල් කෙළම්දෝහෝයි අතීතකාලවර්තීවූ කර්ම ප්‍රත්‍ය වේක්ෂාකොට ඇඬූහ. පැලේ උන්නාවූ ක්ෂෙත්‍රපාලද ගිරා රජහු බැඳී හැඬූ හඬද ගිරවුන් යුහුව ආකාශයට පැනනැගී අඬද අසා කුමකින් කුමක්දෝහෝයි පැලින් බැස උගුළු පලට ගොස් බැඳීගියාවූ ගිරාරජ්ජුරුවන් දැක යම් මේ ගිරාකෙණෙකුන් උදෙසා මල ඇටවීම්ද උගම නොවරදීම බැඳීගියාහුයයි මහත් වූ සොම්නසට පැමිණ ගිරා රජ්ජුරුවන් මලින් ගලවා සාලින්දය නම් බමුණු ගමට ගෙණගොස් බමුණන්ට දික්කළහ. බමුනෝද බලවත්වූ ස්නෙහයෙන් දෑතින් වඩාගෙණ ඇකයේ හිඳුවා මහබොධිසත්වයන්ට කථාකරන්නාහු, සබඳ ගිරා පෝතකයානෙනි අවශෙෂවූ ගිරව් තුමූ විවරක් සැපසේ කා නැගී

යන්නාහුය. තෙපි එනාහි කැමති විවර අනුභවකොට යන කල්හි කරල් මිරිය කූත් කඩාගෙණ යව සෙස්සන්ගේ බඩවිවරට තොපගේ බඩ මහතැයි සිතම්, එසේහෙයින් යන්නාවූ තෙපි මා කෙරේ වෛරයෙන් කන්නා කාපියා නො කන්නා කඩා පාලුකෙරෙම් ගෙණයව්ද නැත ගෙණගොස් පුරන්නාවූ ඉඹුල් වනයෙහි වැසි සාරමස රැකියන පිණිස කොටුගුලක් පුරව්දැයි විචාළාහ. එපවත් අසා මහබෝසතාණෝ මිහිරි මනුෂ්‍ය භාෂාවෙන් බමුණන් හා සමග කථාකරන්නාහු කෝසියගෝත්‍ර ඇති බමුණානන්වහන්ස තුඹ හා සම්ග මාගේ වෛරයකුත් නැත ඉඹුල්වනයේ ගෙණගොස් පුරන්නාවූ කොටුගුලකුත් නැත වැළි කුමක් පිණිසද? යත් තුඹවහන්සේගේ ඇල්කරල් ගෙණයන්නාවූ මම නයකිත් මිදී නයක් දෙමි. තව නිධානයකුත් කෙරෙමි ප්‍රශ්නකොට වදාළ සේක. මෙසේ මහබෝසතානන් නියුණු නුවණින් වදාරණලද වචනයෙහි කෞතුහලවූ සිත් ඇති ඒ බ්‍රාහමණයාණෝ සබඳ තුඹවහන්සේගේ නය දීමය. නයෙන් ගැලවීමය. නිධානකිරීමයයි යන තුන් පැනය අපට විසඳා කිවහොත් පාසබන්ධනයෙන් ගැලවනසේක් වේදැයි කීහ.

මෙසේ බමුණානන් විසින් විචාරණලද්දාවූ මහබෝසතාණෝ ප්‍රශ්න විසර්ජනයකොට වදාරණසේක්, බමුණානන්වහන්ස තව පියාපත් අටනොගත් නාවූ මාගේ බාලදරුවෝ ඇත්තාහු උන් තරුණව ඇත මෑත ගොදුරු කා ගෙණෙනතෙක් තුඩින් නොදුරු ගෙණ පෝෂ්‍යය කෙරෙමි. මෙසේ පෝෂ්‍යය කරණ ඒ මාගේ දරුවෝ මා වෘධව ගියකල තුමූ තුඩින් ගොදුරු ගෙණවුත් පෝෂ්‍යය කරන්නාහුය. එසේහෙයින් මතු බලා දෙන දෙය දෙන්නේවෙමි. ගිය යොවුන් ඇති ඉතා දුර්වලවූ මාගේ දෙමව්පිය දෙදෙන තවදක්වා විද්‍යමාන යහ. දෙමව්පියෝ මා බාලකල තුඩින් ගොදුරු හැර මා පෝෂ්‍යය කළාහුද ඒ කරණලද නයින් ගැලවෙන පිණිස මේ දූන් මම ගොදුරු ගෙණ උන් පෝෂ්‍යය කරන්නෙම් නයින් ගැලවෙන්නා නම් වෙමි. තවද බමුණානෙනි ඒ ඉඹුල්වන යෙහි වෘධව වගුල පියාපත් ඇති සයින් දුර්වලවූ ඇත මෑත ගොස් ගොදුරු කෑ නොහෙන මහළු ගිරව් ඇත උන්ට එනදවස් සසර වසන්නාවූ ඉෂ්ට විපාකය තකා කුසල් පිණිස දෙන්නෙම් නිධානකරන්නා නම් වෙමි. එද වැලිත් අනුගාමික නිධානයයි පුරාතනයෙහි බුධාදී සත්පුරුෂයන්ගේ බසයයි මේ ප්‍රශ්න තුණ විසඳා වදාළසේක.

ඉක්බිති කෝසික නම් බ්‍රාහ්මණයානෝ මහබෝසතානන් විසින් මිහිරිවූ මනුෂ්‍ය භාෂාවෙන් වදාරණලද ධර්මදේශනාව අසා සතුටුව මහබෝසතානන්ට සතුති කරන්නාහු, අනේ මේ පක්ෂිරාජතෙම අතිශයින් ධර්මිෂ්ට එකෙක්වන: ඒකාන්තයෙන්ම සමහර මනුෂ්‍යකෙණෙකුන්ටත් මෙබඳුවූ උත්තම ගුණයෙක් නැතැයි සතුටුව ගිරා රජ්ජුරුවනි නැවත නැවතත් තුඹවහන්සේගේ දර්ශනය අපට ඉතා ප්‍රියය. මෙතැන් පටන් තුඹවහන්සේගේ බන්ධුවර්ගයා හා සමග කැමති පරිද්දෙන් සංකා රහිතව ඇල් අනුභවකල මැනව් දහසක් කිරින් මහ බෝසතානන්ට පූජාකොට පසුවත් තුඹවහන්සේ දක්නා අභිප්‍රාය ඇත් තෙම් අතරතුරෙහි අවුදින් මට ධර්මදෙශනාකොට වැඩිය මැනවැයි ධර්ම ගෞරව යෙන් ආරාධනාකොට මෙසේ මහත්වූ යාච්ඤාවෙන් ප්‍රිය පුත්‍රයානකෙණෙකුන් පරිද්දෙන් මහබෝසතානන් මූණ බලා පය බැඳුන් උනා ශතපාක තෙලයෙන් පාදසම්බාහනය කොට තමන් ඇකයෙන් බඳපුටුවෙක්හි වඩාහිඳුවා රන්තැටි යෙන් මී හා විලඳ කවා ශක්කරා පැන් පොවා මහත්වූ ආදරයෙන් බලා

උන්හ. ඉක්බිති මහබෝසතාණෝ බමුණාණෙනි තොපගේ භවනයට පැමිණියාවූ මම තොප සමීපයෙන් කෑම් පීම් ඉඳිනා අසුන් මහත්වූ ආදර සම්භාවනා යනාදී නොයෙක් දෙයෙහි සිත් අලවා විසීමි. මෙසේ තොප සමීපයෙන් උපකාර ලද්දාවූ මම තොපට ඓහ ලෞකික සැපය පිණිස අවවාදයක් කෙරෙමි ඒ සිත එලවා අසවයි කන්යොමුකරව බමුණාණෙනි තොපගේ අනුවරවූ පුරුෂයන්ට පොහොනා පමණම මෙහෙයොද, කර්මාන්ත හැරගන්නා බව මුත් වධබන්ධනයක් නොකොටහැක්ක. තවද තොප කරා පැමිණි දුගී මගී යාචකයන්ට අදහස් දැන දන්දෙව.

තවද වෘද්ධවූ දෙමව්පියන්ට කළමනා අත්පා මෙහෙයෙහි ප්‍රමාදනොව පෝෂ්‍යය කරව යනාදීන් ධර්මදේශනා කළසේක. මෙසේ ශ්‍රීමහා බෝධිසත්ත්වයෝත් ධර්මදෙශනා කරත්. වර්ෂාකාලයෙහි පිරීගිය තටාකයන් පරිද්දෙන් ඒ මහබෝසතාණන්ගේ ධර්මදෙශනා නැමැති මේඝයෙන් පිරීගිය සිත් ඇති බමුණාණෝ පක්ෂීන් අතුරෙන් උතුම් ගුණ ඇති පක්ෂිරාජයෙක් මා විසින් දක්නාලද. ඒ කාරණයෙන් ඔහු මාගේ ගෙට ආ වේලේම මාගේ ගෙයි ශ්‍රීකාන්තාව හා මට නුවණ පහළවූවා. සදෘශය. එසේහෙයින් ගිරා රජ්ජුරුවෙනි තොපගේ මනාවූ සුභාෂිතය ඇසූ මම මෙතැන්හි බොහෝ කුසල් රැස්කෙරෙමියි ප්‍රතිනියත වූහ. මහබෝසතාණෝද තමන්වහන්සේට දුන් දහසක් කිරිය හැර අටකිරියක් පමණ තැන් සැහෙයි වදාළසේක. ඒ බමුණාණෝ යහපතැයි අටකිරියක් පමණ තැන් වෙන්කොට ටැන් හිඳුවා පාවාදී දෙහොත් මුදුනෙහි තබාගෙණ වැඳිය මැනව ස්වාමීනියි නුඹවහන්සේ නොදක අඬත්තාවූ දෙමව්පියන් අස්වසා වදාළ මැනවැයි සමුදුන්හ. මහබෝසතාණෝද සතුටුව කරල් කඩා තුඩින් ගෙණ ඉඹුල්වනයට ගොස් දෙමව්පියන් ඉදිරියේ තබා මෑනියන් පියාණන්වහන්ස නැඟීසිටිය මැනවැයි කීහ. එපවත් අසා සත්රුවනට පේව වැදහොත් සක්විති රජදරුවන් කණවැටීගිය සත්රුවන් හඬ සෙයින් පුත්රුවන කී හඬ අසා සිනාසී නැඟීසිටියාහ. එසඳ ගිරවුන් බොධිසත්ත්වයන් පිරිවරා ස්වාමීනි කෙසේ ගැලවී වදාළසේක්දැයි විචාළාහ.

බොධිසත්ත්වයෝ තමන්වහන්සේ ගැලවුනු බවද දහසක් කිරි පමණ ඇල්කෙතක් පූජාලත් බවද සියල්ලම විස්තර වශයෙන් වදාළසේක. බමුණාණෝද ගිරා රජ්ජුරුවන්ගේ අවවාදයෙහි පිහිටා හැම වේලෙහිම වදාරණලද ධර්මානුසරණයෙන් ඔදවැඩි සිත් ඇතිව තමන්ගේ ගෙයි බොහෝ බත් පැන් රැස්කොට හැමවේලෙහිම අතසේදුවන බත්ලූවනැයි සියළු ශ්‍රමණ බ්‍රාහ්මණයන් සන්තර්පණය කෙරෙමින් ගෙණ ගෙණා භාජන පුරා යාචකයන්ට දන්දෙමින් දවස්යවා මහ පින් රැස්කොට සඟපිරිවරින් දෙව්ලොව ගියාහයි යනාදීන් බුදුහු මේ ජාතක ධර්මදේශනාව තප්ත වෘත්ති ප්‍රකාරවූ ශූන්‍ය ඥනාදිවූ ඒ ඒ අභිඥනයෙහි චතුරාකාර වශයෙන් සංගෘහිතව දුක්ඛ සත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය, මාර්ගසත්‍යය, යන චතුස්සත්‍ය දේශනාව ප්‍රකාශකොට වදාළසේක. මේ චතුස්සත්‍යයාගේ කෙළවර දෙමව්පියන්ට උපස්ථාන කරන්නාවූ භික්ෂූන්වහන්සේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ පළමුවන මාර්ගඵලයෙයි පිහිටිසේක. තවද ධර්මදේශනාවට සම්ප්‍රාප්තවූ පිරිසටද මහත් වැඩවිය. මහණෙනි එකල්හි ගිරා සමූහයෝ දැන් බුදුපිරිසය, එසමයෙහි ගිරා රජ්ජුරුවන්ගේ දෙමව්පිය දෙදෙන නම් දැන් සුදොන රජ්ජුරුවන් හා මහාමායා දේවියයි යන දෙදෙනය, ගිරා රජ්ජුරුවන් බැඳූ ක්ෂෙත්‍රපාලයා නම් දැන් ඡන්න නම් අමාත්‍යයෝය, දහසක් කිරින් පූජාකළ කෝසික

බ්‍රාහ්මණයෝ නම් මාගේ මේ ශාසනයෙහි පස්පරිද්දෙකින් අගතැන්ලද අනඳ තෙරහුය. එකල ගිරා රජ්ජුරුවෝ නම් මෙකල තිලෝගුරු බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

477
චන්දකින්නර ජාතකය

සිවද ලෞකික ලොකොත්තරවූ සකල ධර්‍මසමූහයන් යථා ස්වභාව ලක්ෂණ ප්‍රතිවෙධ වශයෙන් මනාකොට දත්තාවූ ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ ප්‍රථම බොධියෙහි එක් සමයෙක්හි කිඹුල්වත් නම් තමන්වහන්සේගේ ජාතපුරය නිසා නිග්‍රොධාරාමයයි කියන ලද ආරාමයෙහි වැඩවසනසේක් තමන්වහන්සේගේ රජගෙයිදී යසෝධරා දේවීන් වහන්සේ අරභයා මේ චන්දකින්නර ජාතක ධර්‍මදේශනාව කොට වදාළසේක.

ඒ කෙසේද? යත්,

මේ ජාතකය වනාහි දූරෙනිදානයෙහි පටන් කියයුතුය. මේ දූරෙනිදාන කථාව දීපඞ්කර පාදමූල නිදානයෙහි පටන් සමතිස් පෙරුම් පුරා කෙළවර පාරමිතාධර්‍ම නැමති ඔටුන්නෙහි අග්‍රමාණික්‍යයක් බඳුවූ වෙස්සන්තර ජාතකයෙහි පුත්‍රදාරාදීන් පරිත්‍යාගයෙන් සත්වරෙක මහපොළව ගුගුරුවා දන්දී තුසීපුරයෙහි ඉපද සත්පණස් කෙළ සැටලක්ෂයක් අවුරුදු දෙවියන්ට ධර්‍මදෙශනා කොට දසදහසක් ලෝකධාතුයෙහි දෙවිබඹුන්ගේ ආයාචනය පස්බැලුම් බලා මවුකුස පිළිසිඳගත් බවද ලුම්බිනී වනොද්‍යානයෙහි මහාබ්‍රහ්මයා අතට බිහිව වැඩිවිය පැමිණ සියළු ලෝකධාතුයෙහි අසදෘශාභිෂෙක ප්‍රාප්තව උයන් කෙළියට යන සඳ දෙවියන් මවාලූ ජීර්‍ණ ව්‍යාධි මෘත යන තුන් පූර්‍ව නිමිත්ත දැක සසර කලකිරී සතරවැනි දෙවියන් මවාලූ මහණවේශය දැක මහණවීමෙහි උත්සාහ ඇතිව මහබිණික්මන් කළ බවද සාවුරුද්දක් සැරිසරා වෙසඟමස මැදිපොහොදවස බෝමැඩ විදුරසුන් අරා වැඩහිඳ බුදුව ක්‍රමයෙන් සත්සති ගෙවා අටවෙනි සතියෙහි මහබඹු ආයාචනයෙන් බරණැස ඉසිපතන නම් උයන්හි දම්සක් පවත්වා දෙව් බඹුන් විමසන පරිදි ක්‍රමයෙන් උරුවෙලාවට වැඩ දහසක් ජටිලයන් රහත්කොට බිම්සර රජහට දුන් පිළිත සඳහා රජගහනුවර සමීපයෙහි ලට්ඨිවන නම් උයනට ගොස් ඒ සමාගමයෙහි උරුවෙල කාශ්‍යපස්ථවිරයන්වහන්සේ විසින් කරණලද සිංහනාදය දක්වා අපණ්ණක ජාතකයෙහි කී නියායෙන් දතයුතුය.

එතැන් පටන් කාළුදායි ස්ථවිරයන් වහන්සේගේ ආරාධනාවෙන් කිඹුල්වත් පුරයටම වැඩිගමන හා වෙස්සන්තර ජාතකයෙන් දතයුතු. එකල්හි සර්‍වඥයන්වහන්සේ වනාහි පියරජ්ජුරුවන් වහන්සේගේ රජගෙට වැඩ වළඳන්ට පූර්‍වභාගයෙහි මහාධර්‍මපාල ජාතකය දේශනාකොට භක්තකෘත්‍යාවසානයෙහි යසෝධරා දේවීන්ගේ මාලිගාවෙහි වැඩහිඳ උන්ගේ ගුණය ප්‍රකාශ කරන්නෙම් චන්දකින්නර ජාතකය දේශනා කෙරෙමින් කරණලද සනිටුහන්ද අළුයම් රාත්‍රියේම කොට වදාළ ඉක්බිති සුද්ධොදනරජ්ජුරුවන් හා සමග පාත්‍රාධාතුව ගෙන්වාගෙණ අග්‍රශ්‍රාවකදෙදෙනා

හා සමග සඳ හිරු දෙදෙනා දැලයෙහි ලා ගමන්ගත් රුවන්මෙර සෙයින් බිම්බාදේවීන් වසන ප්‍රසාදයට නික්මුණුසේක. එදවසට බිසවුන් ප්‍රධානකොට සතළිස් දහසක් නලඟනාවෝ වෙසෙති. සතළිස්දහසක් නාටකස්ත්‍රීන් කෙරෙන් හුදු උභය පරිශුඩ ක්‍ෂත්‍රිය කන්‍යාවෝම එක්දහස් අනූවක් දෙනය. බිම්බාදේවීද බුදුන් තමන්ගේ භවනයට වඩනා නියාව අසා ඒ ක්‍ෂත්‍රිය කන්‍යාවන් හැමදෙනම කාසායවස්ත්‍රයෙන් හැඳ පෙරව අවමැනැවයි විධාන කළහ. උයින් එලෙසම අවුත් පිරිවරා සිටියාහ. බුදුහු වැඩවදුරා පණවනලද ආසන මස්තකයෙහි පලක් බැඳ වැඩඋන්සේක. ඉක්බිති හැමදෙනම එකපැහැර බුදුන් පාමුල්හි අඬා හුන්හ. බිම්බාදේවීන් වහන්සේද බුදුන්ගේ ශ්‍රීපාදයෙහි ජංඝාපරියන්තරය තරයේ අල්වා හඬා වැලප කෝප සන්හිඳුවා මයිල් රජ්ජුරුවන් කෙරෙහි මහත්වූ ආදර බහුමානයෙන් එකත්පසෙක උන්සේක. සුඩෝදන රජ්ජුරුවන්වහන්සේද බිම්බාදේවීන්ගේ ගුණ කියනසේක් ස්වාමීනි මාගේ යෙහෙලිතොම නුඹ කෙරෙහි ස්නෙහයෙන් මහබිණික්මන්කොට කාශායවස්ත්‍රයක් පෙරවිය යනු අසා තුමූ අඞගරාග නොගැල්වූ විරුය. නුඹ වහන්සේ එක්වේලේ වළඳති යනු අසා තුමූද එකභක්තයෙන් යැපෙන්නාහ.

තවද නුඹවහන්සේ බිම වැදහොති යනු අසා තුමූද බිම සයනය කරන්නාහ. තවද නුඹවහන්සේ මහණවූ බව අසා තෙසු රජදරුවන් එවූ පඬුරු නොගෙණ නුඹවහන්සේ කෙරෙහි ස්නෙහයෙන් වැන්දඹුව ජීවත්වූයේ ඉතා ආශ්චය්‍ය්‍යයයි සිතමි. ස්වාමිදරුවාණෙනි යනාදීන් යේලනියන්ගේ ගුණ බොහෝ කොට වර්‍ණනා කළසේක. එපවත් අසා බුදුහු මහරජ යම්බඳු මදක් වැන්දඹු වත් කෙලවර අත්බැව්හි මා කෙරෙහි ස්නෙහයෙන් කෙලශවශග නොවී අනුන් ප්‍රාර්‍ථනා නොකළබව ආශ්චය්‍ය්‍යී නොවෙයි. පෙර ගියදවස තිරිසන් යෝනියෙහි ඉපිද සවා මා කෙරෙහි ස්නෙහයෙන් ප්‍රාර්‍ථනා නොකළබව වේදැයි ධර්‍මදේශනාකොට මුඛ මාත්‍රයක් දක්වා වැඩහුන් කල්හි ඒ භවාන්තර ප්‍රවෘත්ති ඇසීමෙහි කුතුහල සිත් ඇති පියරජහු විසින් ආරාධිතවූ බුදුරජහු විසින් සාගර ජලයෙන් සැඟවී තුබූ මෙර පත්ලෙහි රුවන් වැල්ල තෙල වේදැයි ගෙණහැර පානාකලක් පරිද්දෙන් භවයෙන් පිළිසන්වූ ජාතක කථාව ගෙණ හැර දක්වනසේක්, මහරජ.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි පිරූ පාරමිතා ඇති මහ බෝසත් හිමාලය වනයෙහි සඳකිඳුරු යෝනියෙහි උපන. ඔහුගේ අඹුවද චන්ද්‍රානම්, මොහු දෙදෙනම රිදී පව්වෙහි වෙසෙති. එකල බරණැස් රජ්ජුරුවෝ ඇමතියන් අතට රාජ්‍යය පාවාදී කළුඳූ පිළිදෙකක් ඇඳ දුන්නය, මුගුරුය, අඩයටිය, කඩුවය, පාරවලල්ල යයි යන පඤ්චායුධයෙන් සන්නඬව හිමාලයවනයට වැද මුවන් මරා කා ඇවිදිනේ සුළු හොයකට පැමිණ හොය උඩ පාත මුවහසර බලා ඇවිදින්නේය. එහි රිදී පවුහි වසන්නාවූ සඳකිඳුරෝද වැසි සාරමස පර්‍වතයෙන් නොබැස හිඳිති. ගිම් සාරමස ඒ පර්‍වත පාදයෙහි ඇවිදිති. ඒ කාලයට යටකියනලද සඳකිඳුරු රජ්ජුරුවෝ තමන් කිඳුරාඞගනාව හා සමග පර්‍වතයෙන් බැස ඒ ඒ ස්ථානයෙහි සඳුන්හර කඩා ගා විලවුන් ගන්නාහුය. තවද මල්පට හඳනාවූ පොරෝනාවූ ලිය හෝ වැල්ලෙහි කෙළනාවූ මිහිරි ස්වරයෙන් ගී කියන්නාහු යට කියනලද්දවූ හොයට පැමිණ ඒ හොය වකෙක ගොඩ තුබූ වැල්ලකට

බැස දියවල මුල් කඩාදමා දියකෙළ නැවත මල්පට හැඳ පෙරව රිදීපටක් බඳුවූ වැලිතෙලෙහි මල්හසුන් පණවා එක් වස්කුලලක් පිඹිමින් ගී කිය කියා කුසුමා ඝන මස්තකයෙහි උත් කල්හි කින්නරාඞ්ගනා මිහිරි මල්දම් බඳුවූ මොලොක් අත් නැමීමෙන් නැගීමෙන් හෙලීමෙන් නුදුරුතැන්හි සිට ගී කිය කියා විසිතුරු නැටීමක් නටන්ට පටන්ගත්හ. එසඳ බරණැස් රජ්ජුරුවෝ ඒ ගායනා ශබ්දය අසා පියඝන් නොඇසෙනසේ සෙමෙන් අවුදින් ලියකිඳුරානන් උන් නියාවද නටමින් සිටි කිඳුරාඞ්ගනාවන් දැක පිළිබඳවූ සිත් ඇතිව මේ කිඳුරා විද දිවි තොරකොට මෑ හා සමඟ වාසය කෙලෙම් නම් යහපතැයි සිතා සැඟවී සිට කිඳුරාට හීයක් විද්දේය. ඒ ශරප්‍රහාරයෙන් වැහෙන්නාවූ ලෙහෙයෙන් මහත් වේදනාවෙන් මඩනාලදුව හඬන්නේය. සබඳ චන්ද්‍රිකාව මේ මාගේ ජීවිතය නවද ආයු ඇතිව තිබියදී සන්තතිවිච්ඡේදයෙන් නැසෙමියි සිතමි. එබැවින් මම තීගේ ක්‍රීඩා විනෝදයෙහි නොඇලෙමි ලද ශරප්‍රහාරයෙන් හා මාගේ ජීවිතය නොබෝකලකින් කඳ සඟවන්නේය කකිය කකියා කය කබලෙක ලූකල සෙයින්ද මුලින් සිඳ හෙලූ ගසක් සෙයින්ද තියන් සමයෙහි පැන්සිඳී වියලීගිය මල හෝකඳුරක් සෙයින්ද ක්‍රමයෙන් ජීවිත විනාශයට පැමිණෙනසේ බලව පර්වතයෙක්හි වසනලදුව ක්ෂණ ක්ෂණයෙහි වැහෙන්නාවූ වර්ෂා ජල ධාරාවක් සෙයින් කඳුළු වැහෙන්ට පටන්ගත්තේය.

වැලිත් මේ සෝක දුක්ඛය උදක්මාගේම ජීවිත අපේක්ෂාවෙම නොවෙයි. මා මළ කල්හි මාගේ වියෝග ශෝකයෙන් හඬා පෙර මා හා සමඟ එක්ව කෙළ ඇවිද ලියමඬුළු වනලැහැප් අතල ගල ගංහිස් ගිරිමුදුන් රුක්යට වැලිතලා දීවූ ඒ ඒ තැන්හි අඬා ඇවිදිනා තීගේ අදෝනා කම් අපෙක්ෂා කරන්නාවූ මම හඬන්නෙම් යනාදීන් මෙසේ ඒ බෝසත් අඬා මල් ඇතිරි මත්තෙහි සංඥාති විප්‍රයෝගීව අනික් ඇලයට පෙරලී වැදහොත්තේය රජද විදිනැනම සිටියේය. චන්ද්‍රිකා නම් කින්නරාඞ්ගනාතොම මහ බෝසත්හු මෙලෙස හඬනත් තමාගේ කෙළියෙහි ඇලී මත්වන ලද්දී බෝසත්හු විත් කෑ නියාවත් නොදන්නීය. එතකුදු උවත් මහබෝසත්හු විසංඥව වැදහොත් නියාව දැක ඇයි මාගේ නැටුම් නොබලා වැදහෝනට කවරදුක් උපන්දැයි පරීක්ෂාකොට බලන්නානු ප්‍රහාර මුඛයෙන් වැහෙන්නාවූ ලේ දැක ප්‍රියවූ ස්වාමිපුත්‍ර කෙරෙහි සෝක දරාගත නොහී ආක්‍රොශ බෙණෙමින් මහ හඬින් හඬන්ට වන්හ. සැඟවී සිටි රජ කිඳුරා මළේවනැයි හෙලින් බැස තී හඬන්ට කාරණා කවරේ දැයි මම තී පාදපරිචාරිකාකොට සොළොස් දහසක් පුරාඞ්ගනාවන්ට අගමෙහෙසුන් කෙරෙමියි යන ආකාර දූන්විය.

කින්නරාඞ්ගනාද ඔහු දැක මේ සොරහු විසින් විදිනා ලද්දේයයි භය සෝක දෙකින් වෙවුලමින් දිවගෙණ ගොස් පර්වත මුදුනට නැගී රජහට අවන්ට පටන්ගත්හ. ඒ කෙසේද? යත් යම් රජෙක් මාගේ කැමති සමණන් කිසිල් මැද විදපිද ඒ තෙම විත්කා ශරවේගයෙන් නැතිගත්තේ විසංඥව බිම වැදහොත්තේය. අනේ මා දිවගෙණ ගොස් ගල්මුදුනෙකලා මේ සා දුඃඛයක් උපදවනලද පාපිෂ්ටවූ තා වැනි ද්‍රෝහි මාගේ ස්වාමිපුත්‍රයානන් මා උදෙසා මැරීනම් මාගේ ස්වාමිපුත්‍රයාට පැමිණි මරණ දුක්ඛය තව වේවයි මට පැමිණියාවූ මේ ශෝකය තාගේ අඹුවන්ටද වේවයි, තවද පවිටුවූ රජ තාගේ මව්ද තා නොදැක සොහොන් වදීවයි, තවද දුෂ්ටවූ මහරජ තාගේ ප්‍රජාපතීතොම තමන් දරුවන් නොදැක නිරාවදීවයි යනාදීන් ඇවිලි අවවාද අඩන්ට

පටන්ගත්හ. රජ්ජුරුවෝද මෙසේ හඬන්නිය අස්වසන්නාවූ මහබෝසත්හු විත්කා අඬන වේලෙහි තම කියා හැඳුහෙයින් තම දූතද ගීතෙරමල් බඳු ඇස් ඇති මනාවූ හාවභාව ලීලාවිලාස ඇති චන්ද්‍රිකාව තෝ සෝක නොකරව, ඉදින් තෝ කැමතිවීනම් මටබිරින්දකොට සොළොස් දහසක් පුරාඞගනාවන් මධ්‍යයෙහි රජකුලෙහි ප්‍රසිඬවයි කීහ එපවත් අසා චන්ද්‍රිකාතොම අවලක්‍ෂණ තෝ මා නිසා නිරපරාධවූ මාගේ සමිණා මැරීද? ඔහු කෙරේ ස්නේහයෙන් අඬා මියන පමණක් මුත් තොපට පාදපරිචාරිකා වීමෙක් ඒකාන්තයෙන් නොවෙයි, තදකොට කීව.

මෙසේ කියනලදද ඒ චන්ද්‍රිකාවගේ වචන ඇසූ රජ්ජුරුවෝ හීරුක්ෂි ජාතිවූ පැවැත්තිය ඉදින් ජීවත්වනු කැමැත්තේ වීනම් තලීස්පතුරු හා තුවරලා ගොදුරුකොට වසන්නාවුන් තී සේ සමාන ජාති ඇති තිරිසතුන් රමණය කෙරෙමින් වැස වැලි තිට රජකුලෙහි සම්පත්තීන් ප්‍රයෝජන කිම්දූයි කියා කිඳුරාඞගනාවට සටා බැණ ඇ කෙරෙහි ආලය පසිඳ තැගී ගියාහ.

ඒ කිඳුරාඞගනාතොම රජහු නිරපෙක්‍ෂව පළාගිය නියාව දැන පර්වතයෙන් බැස මහබෝසත්හු සිපගෙණ ඔසවා පර්වතමුඳුනේ ලා බොධිසත්වයන්ගේ ඉස තමාගේ ඇකයෙහි තබාගෙණ අඬන්නී මාගේ ප්‍රියවූ සවාමිපුත්‍රයාණෙනි, පෙර නුඹ හා මා හා පර්වත ගුහාදියෙහි සිත්සේ ඔවුනොවුන් හා සතහමින් කෙළ ඇවිද දූන් නුඹ කෙරෙන් වියෝවූ මම කුමක් කියා ලය සතහම්ද? තවද හිමාලයෙහි පුෂ්පඵල පල්ලවයෙන් අලඞකෘතවූ වනලැහැබුන් හා පෙර අප කෙළ ඇවිදි සමන්ලියමඬුළු හා බලන්නෙම් තොප නොදැක කෙසේනම් ඉවසිය හෙම්ද? තවද සවාමිදරුවාණෙනි, නුඹ යෙහෙන් සැතපෙන පිණිස අතුරණලද තලිස් පතුරුවා කොල තිරී හා ගිරිහිසින් වැහෙන ගංහෝඇල කඳුරැලියෙහි පෙර අපි බැස නහන තොටවල ඉඳ කෙළනාලද වැලිතලා හා කඩාගොතා පලඳිනා මල් වඩම් හා ඉද්ද කෙළිලිය හොවිලි බලන්නාවූ මම කෙසේනම් ලැය සැනසෙම්ද? තවද පියකල් මහිමියනි, ඉතා දැකුම්කළු මනා බඳනාලද ඉඳුනිල් මැණික් කුලින් රත්ගිරි කුලයටද රත්ගල් කුලින් කෙලෙස් පව්වටද කෙලෙස් ගල්කුළින් සත්රුවන්කුළට පැන බැස සිත්සේ තොප හා සමග කෙළඇවිද දූන් තොපකෙරෙන් වියෝව කෙසේනම් ලය සැනසෙම්ද?

අනේ හිමියෙනි, යක්‍ෂ රාක්‍ෂ සිඞවිද්‍යාධරාදීවූ නානා භූතගණයන්ගේ වාසස්ථානවූද, තවද වන පොළඹමින් පිපිත් පිට තොළු තබා නත්හි නත්හි ලත පබළුපත් ඇදකමින් ඇවිදිනාලද නොයෙක් ජාතියෙහි ජලචර පක්‍ෂීන් කෙළිනාලදුව පස්පියුමෙන් කලල් ඕල්තටාක පංක්තියෙන්ද ආමූලාග්‍රව පිපී වැනී ගියාවූ නඳුන් සඳුන් දෙව්දුරු තුවරලා ආදීවූ නොයෙක් සුවඳ රුකින් ගැවසීගත් නොයෙක් සියදහස්ගණන් වනසට පංක්තියෙන්ද විරාජමානවූ ඉතා දර්ශනීයවූ පෘථිවිය නැමැති අඞගනාව විසින් පලඳනාලද මිණි කිරුළු අගක්මෙන් උස්ව ඉතා සෝභමානවූ මෙහි මච්චතයය පෙරතා හා සමග කෙළ ඇවිදිනාබව වැටහෙන බවමුත් ඉතිබ්බ තාගේ විරහශෝක දුක්ඛයෙන් හඬනලද්දාවූ මට අඳුරු ගෙයක් මෙන් නිස්සෝභව වැටහෙන්නේයයි යනාදීන් මහත්වූ ශෝකයෙන් හඬා මහබෝසතානන්ගේ ලෙහි අත්බා මළාවූයෙදෝහෝයි බලා මඳක් පණ සැලීසැලී තුබුවා දැක මහිමි තව ජීවතැයි දැන දෙවතාවන්ට උපාඛ්‍යානාකොට යන පණ ඇරදෙවාලම් සිතා කිමෙක්දෝහෝ මෙලෝ රක් නාවූ ලෝකපාල දෙවියෝ නැත්මදෝහෝ අනික් සක්වළ දෙවියෝ වෙසෙත් දෝහෝ නොහොත් මළාහුදෝහෝයි හඬා නැවත ඉදින් දෙවිකෙණෙක් මේ ලොව

ඇත්නම් මහිම්හට මේ පැමිණි දුක නොබලා හරිද්දැයි දෙවියන්ට උජ්ඣායනා කොට හැඬූහ. එකල්හි උතුම් ගුණ ඇති පතිවත්වූ ඈගේ ශෝකාග්නි වේගය සුවාසූදහසක් යොදුන් උඩතැගී සක්දෙව් රජහුගේ භවනය හුණුකෙළේය. ශක්‍රදේවේන්ද්‍රයෝ දහසක් නුවණැසින් ලොව බලනුවෝ මේ කාරණය දැක බමුණු වෙසක් ගෙණ ඇසිල්ලකින් අවුත් මහබෝසතානන් ඔත් ගල්මුදුනෙහි පෙණී කෙණ්ඩිකාවෙන් පැන් ගෙණ මහබෝසතානන් ඇඟ ඉසළූහ. එකෙණෙහි විෂ නැසී වණය සුවව කොතන විදිබවත් නොදතහැකිවිය. මහබෝසත් එවිට අනුන්ට වෙහෙසෙන්නට මළ වෙස්ලා වැදහොත් එකෙකු පරිද්දෙන් වහා සුව පත් වූයේය. චන්ද්‍රිකාවද එසඳ සුවපත්ව සිටි ප්‍රිය ස්වාමි දැක බලවත්වූ සොම්නසට පැමිණ ස්වාමීනි, යම්බඳු නුඹවහන්සේ මාගේ ප්‍රියකල්වූ ඇඟ අමාපැන් ඉස නිදුක්කොට මාගේ ඒ කළකම් දුරුකොට ප්‍රියවූ අප දෙදෙනා සමඟ කළසේක්ද එසේ නුඹවහන්සේගේ ශ්‍රීපාදය වඳිමි වැදහොත්තීය. ඒ ශක්‍රදේවේන්ද්‍රයෝද උන් දැක බලවත්වූ සොම්නසට පැමිණ මෙතැන්හි නොවසව, පර්වතයෙන් බැස මිනිසුන්ට විසය නැත නොවෙසෙත්වයි අවවාදකොට තමන්ගේ දිව්‍යලෝකයට ගියාහ.

චන්ද්‍රිකාද ස්වාමීනි, මෙසේවූ උපද්‍රව ඇති හෙතින් අපට ප්‍රයෝජන කිම්ද චන්ද්‍රපර්වතයට පැමිණි ගල්ගිරිකුළු මුදුන්වලද ගංසිහිල්වලද මල්මුවරදහල දියවලට බැස ස්නාන පානය කෙරෙමින් තුරුයපත්හි ඔවුනොවුන් සමඟ ප්‍රිය කථා කෙරෙමින් සැපසේ වසම්හයි පෙර විසූ චන්ද්‍රපර්වතයටම ගියාහයි යනාදීන් බුදුහු මෙ ජාතක දෙශනාව ගෙණහැර දක්වා වදාළසේක. මහරජ දූන්මතු නොවෙයි. පෙරත් මා කෙරෙහි ස්නෙහයෙන් අනුන් වසඟයට නොපැමිණියාදැයි ජාතකය නිමවා මහරජ එකල විදි බරණැස් රජ නම් දූන් දිවැස් ඇත්තන් කෙරෙහි අගතැන් ලත් අනුරුද්ධ මහතෙරුන්වහන්සේය, එකල චන්ද්‍රිකා නම් කින්නරාඞ්ගනාව යශොධරා නම් නොප තෙල යෙහෙළිය, එකල සඳකිඳුරු රජ නම් මෙකල තිලෝගුරු බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක. මේ චන්දකින්නර ජාතක දෙශනාව කුළුගන්වා වදාළසේක.

478
මහා උක්කුස ජාතකය

තවද ශ්‍රාවක ප්‍රත්‍යෙක බුද්ධවරයන්ට වැනි අසාධාරණවූ ඉන්ද්‍රිය ප්‍රතිවෘත ඥනාදීවූ ෂට් අසාධාරණවූ ඥනාදීවූ ගුණ ඇති සමන්තභද්‍රවූ ශාක්‍යකුල ප්‍රදීපාය මානවූ බුදුරජානන් වහන්සේ ශ්‍රාවස්ති නම් පුරය නිසා දෙව්රම්වෙහෙර වැඩවසනසේක් මිත්‍රගත්ත නම් උපාසයක්හු අරභයා මේ මහා උක්කුස ජාතක ධර්මදෙශනාව දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

ඒ සැවැත්නුවර ක්‍රමයෙන් සම්පත්තීන් පිරිගිය එක්තරා කුලයක එක් ව්‍යවස්ථිතවූ පුත්‍රයෙක් තමාගේ යහළුවා ලවා අන්‍යතරවූ කුලදුවක විචාරා වත් නාට උන්ගේ කිසි කටයුත්තක් උපන්කල පසිඳුවාදී ලන්ට සමර්ථවූ මිත්‍ර කෙණෙක් ඇද්දැයි විචාරා නැතැයි කී හෙයින් එසේවීනම් මිත්‍රකෙණෙකුන්

ඇතිකරන්ට කීයවයි කී හෙයින් ඒ අවවාදයෙහි පිහිටා පළමුකොට සතරවාසල් දොරටු ගොව්වන් සතරදෙනා හා සමගද මිත්‍රකෙළේය. ඉක්බිති ක්‍රමයෙන් ගම් රැකවල් ඇත්තහු හා සමග මිත්‍රධර්මය කෙළේය. තවද ක්‍රමයෙන් සේනානායක ඇමතිවරුන් හා සමග මිත්‍රධර්මය කොට ගොස් ඉක්බිති සෙනෙවිරදුන් හා සමග මිත්‍රව ක්‍රමයෙන් ගොස් යුවරජ්ජුරුවන් හා සමග අතිවිශ්වාසමීය.

එකල්හි මෙකී හැමදෙන එක්ව ඔහු ගෙණගොස් රජ්ජුරුවන්ට පාවා දුන්හ. ඉක්බිති අසූමහසව්වන් වහන්සේ හා මිත්‍රව අනඳමහතෙරුන් හා මිත්‍රව මෙකී ඇම දෙනාවහන්සේ ඔහු කැඳවාගෙණ ගොස් සර්ඥයන්ගෙන් මෛත්‍රී හැර දෙවූසේක. ඉක්බිති බුදුහු ශරණශීලයෙහි පිහිටුවා වදාළසේක. රජ්ජුරුවෝ මහත් ඉසුරු දුන්හ. මෙසේ ඒ උපාසකතෙම මිත්‍රගන්ධකයයි යන නමින් ප්‍රසිඬවිය. ඉක්බිති රජ්ජුරුවෝ ඔහු වසන පරිද්දෙන් මහත් ගෙයක් ලවා පෙරහැරින් මඟුල්කොට බිරින්ද ගෙණ ලැවූහ. රජ්ජුරුවන් ආදිකොට ඒ නුවර දොරටු ගොව්වන් දක්වා හැම මහජනයා ඔහට පඬුරු එවූහ. ඉක්බිත්තෙන් ඔහුගේ ප්‍රජාපතීතොම රජ්ජුරුවන් එවූ පඬුරු යුවරජ්ජුරුවන්ට යැවූව, යුව රජ්ජුරුවන් එවූ පඬුරු සෙනෙවිරදුන්ටද සෙනෙවිරදුන් එවූ පඬුරු ක්‍රමයෙන් උන් උන්ට භාරකළ සේනානායක වරුන්ටදැයි මෙසේම සියළු නුවර සිත්ගෙණ සත්වස යවා තමන් සමීපයට පැමිණි පඬුරු තොලත් දුප්පත් අවශෙෂවූ ජන යන්ට සත්කාර කොට සත්වෙනි දවස් බුදුන් පවරා පන්සියයක් භික්ෂූන් සමග බුදුපාමොක් සඟනට දන්දී වළඳා අනතයෙහි බුදුන් වදාරණලද අනුමෙවෙනි ධර්මදෙශනාව අසා එකියන දෙම්හල්ලෝම දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ පළමු වන මාර්ගඵලය ලත්හ.

එදවස් වේලෙහි දම්සභා මණ්ඩපයෙහි බුඬාසනය පිරිවරා වැඩහුන් භික්ෂු සඞ්ඝයාවහන්සේ ඔවුනොවුන් වහන්සේ බණවා ඇවැත්නි, මිත්තගන්ධ උපාසක තෙම තමන් අඹුවන් නිසා ඇගේ බස් ගිවිස සියළු මුළුනුවර වැස්සන් කෙරෙන් මෛත්‍රියලදින් ලෞකිකවූ මහසම්පත්තියට පැමිණ බුදුන් හා සමග ලොකො ත්තර සම්පත්තියට පැමිණියේවේදැයි ඔවුනොවුන් වහන්සේ කථාකොට වැඩ උන්සේක. එසඳ බුදුහු දම්සභාමණ්ඩපයෙහි පැවති කථාව දිවකණින් අසා වදාරා තුන්තරා ගමනින් එක්තරා ගමනකින් වැඩ පණවනලද බුඬාසන මස්තකයෙහි වැඩහිඳ මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාළසේක.

එකල්හි භික්ෂූන්වහන්සේ විසින් ස්වාමීනි, මිත්තගන්ධ උපාසකයන් තමන්ගේ සමවාසයෙන් මහත්වූ ලෞකික ලොකොත්තර සම්පත්තියට පැමිණි බව කිය කියා උනුම්හයි දන්වූ කල්හි බුදුහු මහණෙනි, දැන්මතු නොවෙයි. පෙරත් තිරිසන්යෝනියෙහි ඉපද පවා මැගේ බසින් බොහෝදෙනා මිත්‍රකොට පුත්‍රශෝකයෙන් මිදුනෝ වේදැයි වදාරා ඒ භික්ෂූන්වහන්සේ විසින් ආරාධිත බුදුහු පසින් වැසී තිබූ දූරහමැණිකක් ගෙණහැර පානා කලක් මෙන් භවයෙන් සැඟවීතුබූ අතීත කථාව ගෙණහැර දක්වනසේක්,

මහණෙනි,

යටගිය දවස මේ ජම්බුද්වීප තැමති ශ්‍රියාකාන්තාවගේ නලළපත් තිලක හරණයක් වැනිවූ බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ බරණැස් නුවරට පසල්දනව්වෙහි වසන්නාවූ මනුෂ්‍යයෝද දඩගිය යම්තැනක මස් තොලද්දැහුවීනම් එතන ගම්කොටගෙණ නැවත වල දඩ

හැවිද හූරන් ගෝණුන් මුවන් මරා මස්කාගෙණ අඹුදරුවන් රක්නාහුය. මෙසේ උන් කොටගත් ගමට නුදුරුතෙන මහ සයංජාත විලෙක් විය. ඒ විලට දකුණු පස එක් උකුස්සෙක් වාසයකරන්නේය. බස්නාහිර පස එක් උකුසුදෙනක් වාසයකරන්නේය. තවද ඒ විලට උතුරුපස සිංහරාජයෙක් වසයි. තවද නැගෙණහිර දිසාභාගයෙහි කරසුදු තඹවන්පියාපත් ඇති ලිහිණිරජෙක් වාසය කරන්නේය. ඒ විල මධ්‍යයෙහි වතාහි උස්ව තිබෙන්නාවූ ගොඩ කැස්බෑවෙක් වසන්නේය. මෙසේ වසත කල්හි උකුසුදේනුව සරණ විචාළේය. ඉක්බිති උකුසුදේනු තොම තොපගේ මිත්‍ර සහයෙක් ඇද්ද ? කුමකින්දැයි විචාළීය. එසඳ උකුසු නැත සොඳුරයි කීය. එසේ වීනම් සබඳ අපට උපන්නාවූ බියෙක් වත් දුකෙක්වත් ඇත්නම් එයින් හලවාපියන්ට සමත්වූ මිත්‍රකෙණෙකුන් ලැබීම මැනවැයි එවැනී මිත්‍රකෙණෙකුන් සොයාගණුම්හයි කීව. එළවින් අසා උකුසු සොඳුර, කවරකෙණෙකු මිත්‍රකොට ගණිම්දැයි විචාළේය. එකල උකුසු දේනුව නැගෙණහිරදිග වසන ලිහිණි රජ්ජුරුවන් හා උතුරුදිග වසන්නාවූ සිංහරජ්ජුරුවන් හා ද විලමැද වසන්නාවූ කැස්බා හා ද මිත්‍රසන්ථව කළ මැනවයි කීව.

එකල උකුසු ඈ කී බස් ගිවිස එකියන හැමදෙනා හා මිත්‍රධර්මකොට ඈ හා ද සංවාසකොට එම විල දිවයින් ගොඩෙක කොලොන්ගසක් විය. එද වට දියෙන් පරික්ෂිප්තවූයේමය. ඒ ගස කැදැල්ලක් බැඳ වාසයකරන්නාහුය මෑත භාගයෙහි දරුපැටවුන් දෙන්නෙකු ලද්දාහ. ඒ පැටවුන් පියාපත් අට නොගත්තතෙක් යට කියනලද දනව්වාසි සත්ත්වයෝ එකවසක් දඩ ඇවිද කිසිවකුත් නොලදින් සිසතින් ගොස් කම්කිම්ද? මේ විලින් කුඩමස්සන්වත් ඉබ්බන්වත් මරාගෙණ යම්හයි විලට බැස දිවයිනට ගොස් එම කොලොන් ගස යට වැදහොත් කල්හි මදුරුවන් කඩාකන හෙයින් උන් නෙරණ පිණිසයයි ගිනි මොලවා දුන්හ. එසඳ දුම් උඩනැගී පක්ෂිපැටවුන් ඇඟ වැදගත. එකල්හි පැටවු මූරගාන්ට පටන්ගත්හ. දනව්වාසී මනුෂ්‍යයෝ අසා ඔවුනොවුන්ට කියන්නාහු කොල පක්ෂිපැටවුන්ගේ අඬෙක, වහා නැගී සිටුව සුළුබඳුව සයින් වැදහොත් නොහෙම්ම තෙල පක්ෂීන් මරා අනුභවකොට වසම්හයි යනාදීන් කියමින් වහා නැගීසිට ගිනිමොළවා සුළුබඳින්ට පටන් ගත්හ. එසඳ උකුසුදෙන් උන් හැම්දෙනම කියන බස් අසා මූත් මාගේ දරුවන් මරාකන්නා කැමැත්තාහ. අපිද මෙසේවූ භයක් පැමිණිකල ගැළවෙන පිණිස මිත්‍රයන් සෙව්මෝද එහෙයින් සමතත් ලිහිණි රජ්ජුරුවන් කරා යවම් සිතා ගොස් සවාමීනි, තෙල දනවී වැසි ගැහැවියෝ සුළු බැඳගෙණ ගසට නැගී අප මරාගෙණ කන්ට සැදෙන්නාහ.

එබැවින් අපගේ දරුවන් හා අප ඇමට උපන් භය වහා දිවගොස් අපගේ මිත්‍රවූ ගිජුලිහිණි රජ්ජුරුමන්ට කිය මැනවැයි කීව. ඒ උකුසු මහත් වේගයෙන් උන් වසන තැනට ගොස් තමාගේ අඩින් අඬා තමා ආ බව අඟවා කරණ ලද අවකාශ ඇතිව සමීපයට එළඹ වැඳලා බැගෑපත්ව සිට කොල අ කරුණු කිම්දැයි විචාරණ ලද්දේය සියළු පක්ෂීන්ට උතුම්වූ ලිහිණි රජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේගේ සරණ ගියේ මා දැන් මතු නොවෙයි. බොහෝ දවසක් පටන් ගෙණමය. සවාමීනි, දැන් දනව්වාස භූතා දරුණුවූ ගැහැවී කෙණෙක් අප මරා කන්ට උත්සාහ කරන්නාහුය. එසේහෙයින් අපට පැමිණි මරණශෝක දුක්ඛය ගලවාපුවොත් යහපතැයි කීහ. එපවත් අසා ගිජුලිහිණි රජ්ජුරුවෝ ඔහු අස්වසන්නාහු සබඳ නුවණැත්තෝ කල් නොකල්හි

සැපයක්ම ප්‍රාර්ථනා කරන්නාවූ පැමිණි දුකකින් ගැලවෙන පිණිසම මිත්‍රයන් ඇතිකරන්නාහ. එබැවින් යහලු මේ ලෝකයෙහි උතුම්වූ ගුණ ඇති ආශ්චර්ය බඳු ගුණ ඇතියන්ටම සහනය කරන්නාහ. එසේහෙයින් තොප උතුම්වූ ආචාරශීල ඇත්තාවූන්ට මා විසින් සහනය විනාබව ආශ්චර්ය කවරේද? තොපි නොබව මේ දුකින් ගලවාලීම මට භාරයයි උකුස්සා අස්වසා, නැවත සබඳ මේතෙකට ඔහු ගසට පැණනැංගෝද නැද්දැයි විචාළාහ. ඉක්බිති නැවත සුළු බදිති කීය. එසඳ උකුසු රජ්ජුරුවෝ කියන්නාහු එසේවීනම් තෝ මාගේ යෙහෙළිය අස්වසා එන නියාව කියා යවූහ. එසඳ ගොස් එම ලෙසම කෙළේය. ඉක්බිති ලිහිණිරජ මේ රාත්‍රියදැයි නොසිතා මිත්‍රධර්මයට දිවි දී ඒ වේලෙහිම පිටත්ව කොළොම් ගසට නුදුරු තැන්හි මිනිසුන් ගසට නැගිබව බල බලා එක් ගසෙක සැඟවී උන්හ. එකල්හි මිනිසෙක් සුල ඇරගෙණ නැගී කසල්ලට ආසන්න විය. එකල්හි ලිහිණි රජ්ජුරුවෝ ගොස් දියෙහි හැලී පියාපතෙහි පැන් ගල්වාගෙණ කටිනුත් පැන්ගෙණ අවුදින් සුලමුණ ගසාලූහ. එසඳ සුළු ගිනි නිවීගියේය. එකල්හි නැවත මිනුෂ්‍යයෝ ගසින් බැස මේ කරන්නාවූ දුෂ්ට පක්ෂියාත් පැටවුනුත් මරා කම්හයි සුළු අවුලාගෙණ නැගෙන්ට වන් කල්හි පළමුසේම ගොසින් පියායෙන් කටෙන් දිය ගෙණවුත් නිවපීහ. මෙසේ ප්‍රයත්නය කරන්නාවුන්ට මධ්‍යම රාත්‍රිය ඉකුත්ව ගිය ඒ වැද්දේ ගිනි මෙලවීමෙන්ද සුළු ඇවිලීමෙන්ද මහත් පීඩාවට පැමිණියාහ. ගිජුලිහිණි රජ්ජුරුවෝද බලවත් වෙහෙස විඳ සුළු රැස් ගැසීමෙන් යටිබඩ පියාපත් දා තුනීව ගියේය. ඇස් රතුව එපවත් දුටු උකුසුදේනුව සැමියාට ස්වාමීනි නුඹවහන්සේ ඉතා පීඩාම ගියසේක. උන් සැතපෙන ලෙස කියාලා ගොස් වහා කැස්බානන්ට කිවමැනවැයි කිව. එසඳ යුහුව ලිහිණි රජ්ජුරුවන් ලඟට ගොස් ස්වාමීනි මහත්වූ අනුකම්පාවෙන් ආචාර ඇත්තවූන්ගේ ගුණ දැන මහත්වූ ආයාස විඳිනාලද, ඉතිබ්බ ආයාස නොවිඳ නුඹවහන්සේගේ ජීවිතය රැක ගන්නෙහියයි තෙපලීය. අපට නුඹවහන්සේ ජීවත්ව උන්හොත් දරුවන් පසුවත් ලැබගත හැක්කැයි කීයේය. මෙසේ කියතලද ඔහුගේ බස් අසා දුකෙහි සාංකාවක් නැතිව සිංහනාද කරණ ගිජුලිහිණි රජ්ජුරුවෝ එම්බල මම බොහෝ දවසක් මිත්‍රව උන් තොපට ආරක්ෂාව් කරන්නෙම් විඳිනා දුකෙහි සරුවක් නැත්තෙන් එම්බා යහළු මිත්‍රයන් පිණිස ජීවිතය හැරීම පුරාතනයෙහි පැවතඑන සත්පුරුෂ ධර්මයෙකැයි අභීත සිංහනාද පැවැත්වූහ. එසඳ උකුසුද ස්වාමීනි එසේ නමුත් මදක් සැතපීගතමැනවැයි කියා කැස්බානන් සමීපයට දිවගෙණ ගොස් නැගීසිටි යහළු කුමක් පිණිස අවුදැයි විචාළ හෙයින් අපට මෙබඳු භයෙක් උපන. ගිජුලිහිණි රජ්ජුරුවෝද පෙරයම පටන් උත්සාහ කරන්නාහු බොහෝ උත්සාහකොට පීඩාවගියහ. එසේහෙයින් උඹදෑ සමීපයට ආමි කියා නැවත කියනුයේ ජීවිතය කරන්නාවූ මම මිතුරාණෙනි සමහර මිත්‍ර කෙණෙක් යසසින්වත් ධනයෙන්වත් ප්‍රවේණි ධර්මයෙන්වත් ජීවිතයෙන්වත් පිරිහෙතත් මිත්‍රානුකම්පාවෙහි තත්පරව සිටිනාහුය. වැලි කීයේ කුමක් පිණිසදයත් මාගේ අඹුදරුවන්ටද මහත්වූ භයෙක් උපන. බොහෝ දවසක් නුඹ සරණකොට ආ අප හැම මේ දුකින් ගාලවූව මැනවැයි කීහ. එපවත් අසා කැස්බෑවානෝ සබඳ එසේය පෙර නුවණැත්තෝ ධනධාන්‍යාදී වස්තුවටද තමන්ගේ ජීවිතයට වඩා මිත්‍රයන්ට වැඩෙහි හැසිරෙති. එබැවින් මමද තොපට සහායව සිටිමි. තොපි නොබවයි අස්වැසූහ. ඉක්බිති නුදුරුතැනෙක ඔක්

කැස්බෑතන්ගේ පුතනුවෝ පියාතන් කියන බස් අා මිත්‍රයාතන් පිණිස මාගේ පියාතන් වහන්සේ වෙහෙස සෝක නොවිඳුනාසේක්වයි මම පියාතන්ට පැමිණි කටයුත්තක් නිෂ්පාදනය කෙරෙමි සිතා, පියාතන් වහන්ස නුඹ වහන්සේ බැණනොනැඟී හුනමැනවැයි දරුවෝ නම් පියාතන්ට වැඩෙහි හැසිරෙන්නාහුය. එසේහෙයින් මමද ගොස් උන් කීදේකට සහය වෙමියි කීහ. ඉක්බිති කැස්බා පුතා පියාතන්ට වැඩහැසිරීම නම් ඒකාන්තයෙන් සත්පුරුෂධර්ම බව නියතය. එතකුදුවුවත් දරුවෙනි මට මහත්වූ ශරීරයක් ඇති මා එතනට පැමිණි කල්හි ඒ දනව් වාසීහු උකුසුපැටියන් මැරිය නොහෙත් නම් එබන්දක් කෙරෙම්යි කියා එම මහ කැස්බෑවාතෝ සබඳ තෝ වහා පළායා මම එම් ඔහු අස්වසා යවා ගොස් දියෙහි වැඟී කිබිස පල්ලේ තිබූ කලල් මඩ හා සෙවෙල් ඇඟ ගල්වාගෙණ අවුදින් දිවයිනට නැඟී ගිනි නිවා වැදහොත්තේය. එකල සුලු බඳිමින් සිටියාවූ වැද්දෝ එතනට පැමිණි ඔහු දුක පක්ෂිපැටවුන්ගෙන් කම්නැත. මොහු මරා පළා කම්හයි කියා අල්වන්ට කලල් මඩ හා සෙවෙල් වැදගත් හෙයින් පෙරලාගත නොහී දුනු දඬු ආදියෙහි තිබූ වරලණු කඩා වටින් පිටින් බැඳ තවද ඔහු යන්ට පටන්ගත් කල්හි තමතමන් ඉනතිබූ කලුදෑ ආදිය වසා අල්වන කල්හි මහත් බල ඇති කැස්බා ඔවුන් හා සමග පොකුණුදියට ගියේය. එකල්හිද මාංස ලෝභයෙන් අත්නොහැර මහත් ගැඹුරු දියට යනතුරු තමන් හින පිළී ආදිය තෙමීගිය කල්හි ඔහු අතහැර ගොඩනැඟී මහත් ව්‍යායාමය කරන්නාහට රාත්‍රියෙහි නිදිමැරීමෙන් ක්ෂුධා පිපාස බලවත්ව නැවතත් ගිනිදල්වා ගසට නැඟෙන්ට උත්සාහ කරන්නාහ. එකල්හි උකුසුදෙන් සවාමීනී කැස්බෑතන්ටත් මොවුන් වළකාගතනොහී ආයාසවිය. සිංහරජ්ජුරුවන් කරා ගොස් මෙපවත් කියා බලවයි කිව. එබස් අසා යහපතැයි සිංහ රජ්ජුරුවන් කරා ගොස් තමාගේ පක්ෂිහඬින් හඬා ඔවුන් විසින් මේවේලේ කුමක් පිණිස අයිදැයි විචාළ කල්හි සවාමීනි චතුස්පාද ඇත්තාවූන්ට උතුම්වූ සිංහ රජ්ජුරුවන් වහන්ස නුඹගේ මිත්‍රවූ උකුසුධේනුව හා පැටවුන් කන පිණිස දනව්වැසි ගැහැවියෝ උත්සාහ කෙරෙති. ලිහිණී රජ්ජුරුවන් හා කැස්බෑතෝද තමන්ට පුළුවන් යත්නකොට වළකාගත නොහී නුඹවහන්සේ සරණ යන නිසා ආම් කීය. එබස් අසා සිංහ රජ්ජුරුවෝ සබඳ මිත්‍රයන්ට සහයවන බව අප වැන්නවුන්ට අවශ්‍යයෙන්ම වටනේය. එබැවින් නොපි යවයි ඔහු යවා අළුයම්වේලෙහි තමන් උන් තැනින් නික්ම නියපඳුරෙන් සියළු සිව්පාවුන් පළා නසන්නාවූ සිංහරාජතෙම ඔවුන් දිවයිනට පැමිණ මහත්කොට තුන්යලක් සිංහනාද කෙරෙමින් ඉදිරියට ආහ. එකල්හි මනුෂ්‍යයෝ සිංහරජ්ජුරුවන් දුක මහත්වූ මරණභයින් වෙව්ලා ඉස්ලූලූ අත දිවගත්හ. සිංහරජ්ජුරුවෝද ගසමුලට අවුදින් කිසිකෙණෙකුන් නොදක සිටියාහ. ඉක්බිති ගිජුලිහිණී රජ්ජුරුවෝද කැස්බෑතෝද ඇවිදින් වැඳලා සිටියාහ. සිංහරජ්ජුරුවෝද ඒ හැමදෙනාට මිත්‍රධර්මයෙහි අනුසස් දේශනාකොට මෙතැන්පටන් මිත්‍රධර්මය නොබිඳ රැක්කමැනවැයි අවවාදකොට තමන් වසන තැනට ගියාහ. සෙස්සෝත් තමන් වසන තැනටම නැඟී ගියාහ. ඉක්බිති උකුසුතෙම තමාගේ දරුවන් දිසාව බලාපියා සමාධිව මිත්‍රසමාගමයෙන් අපගේ මේ දරුවන් ලද්දේයයි සතුටුව උන්කල්හි උකුසුධේනුව සැමියා හා සමග මිත්‍රධර්මයෙහි අනුසස් ප්‍රකාශකොට කියන්නී, මේ ලෝකයෙහි යම් නුවණැත්තාහු විසින් මිත්‍ර

ධර්මයට යෝග්‍යවූ දුකෙහි අත්නොහරණා මිත්‍රයන් සෙවීම සියලු දිගින් අවුත් වැදගන්නාවූ ශරීරයට වන උපද්‍රව දුරුකරන්නාවූ දැඩි සන්නාහයක් වැන්න. ඊට දෘෂ්ටාන්ත කවරේදයි යතහොත් ස්වකීයවූ මිත්‍රයන්ගේ ලැබීමෙන් අපගේ දරුවන් හා සමග සතුටුවෙමින් උන්නාවූ අපගෙන්ම දකුව. තවද කාමගුණ යෙහි ඇළුම් ඇතිව ශෞර්‍යවීර්‍යයෙන් හා බලයෙන් යුක්තවූ මිත්‍රයන් යමෙක් භජනය කෙරේද එසේවූ සත්ත්වතෙම අපසේම මිත්‍ර පුත්‍ර කලත්‍රාදීන් හා සමග සුවසේ වසන්නේයයි අනේකපර්‍යායයෙන් මිත්‍රධර්මයෙහි ලා ගුණ කීහ. මහණෙනි මෙසේ අතිවිශ්වාසීවූ සතරදෙන මිත්‍රධර්මය නොබිඳ අතරතුරෙහි ඔවුන් කරා එළඹ සාධු සාමීචි වචනයෙන් සුවදුක් විචාරමින් ආයු පමණින් සිට කුසලාකුසල කර්මවූ පරිද්දෙන් සංසාර යාත්‍රාකළාහුය. යනාදීන් බුදුහු මේ මහා උක්කුස ජාතකය ගෙණහැර දක්වා වදාරා දැන්මතු නොවෙයි. පෙරත් මිත්තගන්ත උපාසකයෝ අඹුවන්ගේ අවවාදයෙහි පිහිටා සැපයට පැමිණියෝ වේදැයි මේ ජාතකය පූර්වාපරසන්ධි ගළපා වදාරා මහණෙනි එකල උකුසු දෙම හල්ලෝ නම් දැන් මේ මිත්තගන්තයන් හා ප්‍රජාපතී දෙදෙනාය. මහකැස්බා නන්ගේ පුතනුවෝ නම් දැන් මේ රාහුලකුමාරයෝය. පියකැස්බා නම් මුගලන් මහ තෙරහුය. ලිහිණිරජ නම් සැරියුත් මහතෙරහුය. එකල්හි සිංහරජ්ජුරුවෝ නම් මෙකල බුදුරජවූ මම්ම වේදැයි වදාළසේක.

479
උදදූල ජාතකය

තවද භූත භවිෂ්‍යත් වර්තමාන කාලත්‍රය වර්තිවූ සකල ධර්මසමූහයන් ප්‍රඥා නැමැති හස්ත යෙන් පිරිමැද සිටියාවූ බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා වංචා සිත් ගුණ හඟවන් නාවූ භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දේශනා කළසේක.

ඒ භික්ෂූන්වහන්සේද බුදුසස්නෙහි මහණව චීවර පිණ්ඩපාත සේනාසන ගිලානප්‍රත්‍යය යන සිවුපසය නිසා තුන්වැදෑරුම්වූ කුහකගුණ පුරණසේක. ඉක්බිති එක්දවසක් දම්සභාමණ්ඩපයෙහි වටින් රැස්ව හුන් භික්ෂූන්වහන්සේ ඔබ ගුණ කියනසේක් ඇවැත්නි අසෝ මහණ මෙබඳු නෛර්‍යාණික ශාසන යෙහි මහණව ජීවිතය නිසා නැතිගුණ අඟවා වෙසෙති යනාදීන් කථාකොට උන් කල්හි බුදුහු තුන්තරා ගමනින් එක්තරා ගමනකින් වැඩ වදාරා පණවන ලද උතුම්වූ බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ මහණෙනි මා එන්නාට පූර්වභාග යෙහි කෙසේවූ කථාවකින් යුක්තව හුනුදැයි විචාරා ඒ භික්ෂූන්වහන්සේ විසින් ස්වාමීනි අසෝ මහණ සිවුපසය නිසා කුහකව දවස්අරින පරිදි කියා උනුම්හයි දැන්වූ කල්හි මහණෙනි දැන්මතු නොවෙයි. පෙරත් ඔහුගේ පවත් එසේම වේදැයි වදාරා භික්ෂූන් විසින් ආරාධිතවූ සර්වඥයන්වහන්සේ

මහණෙනි,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පිරූ පාරමිතා ඇති අප මහබෝධිසත්ත්වයෝ ඒ රජ්ජු රුවන්ට පුරෝහිතව උපන්හ. ඔහු ඉතා පණ්ඩිතයහ, ව්‍යක්තයහ. එක්දවසක්

ඔහු උයන්කෙළියට ගියෝ ඉතා විශිෂ්ට රූ ඇති එක් වෙශ්‍යාවක දැක පිළිබඳ සිත් ඇතිව එරඟැන්ද්ද ගසයටදී ඈ හා සමග ලෝකසවාදරතියෙන් දවස්යවූහ. ඒ කාරණයෙන් ඈට දරුගර්භයක් ඇතිවිය. ඒ බව දැන ස්වාමීනි මට දරුගර්භයක් උපන්කල කෙසේවූ නමක් ලම්දැයි විචාළීය. එසඳ බෝධි සත්ත්වයෝ සිතන්නාහු වෙශ්‍යාව උපන් දරුවන්ට කුලක්‍රම, ගතවූ නම් තිබිය නොහැක්කැයි සොඳුර මේ එරඟැන්ද්ද ගසට වාතඝාත වෘක්ෂයයි කියති. ඊටම එහෙයින් මේ ගසයටදී ගැබගත් දරුවන්ට උද්දාලයයි කියා නම් තබවයි ඇඟිල්ලෙහි තිබූ පේරුස දී ඉදින් දුවක් වීනම් තෙල විකුට පෝෂ්‍යය කරව. පුතෙක් වීනම් වැඩිගිය තෙල හා සමග මට පෑ ලවයි කීහ. හෝතොමෝ මැතභාගයෙහිදී පුතනුකෙනෙකුන් වදා එම නම් ලා වැඩුව. ඒ තෙම මදක් වැඩීගෙණ අම්මෙ අපගේ පියානෝ කොයිදැයි විචාළේය. මේ නුවර රජ්ජුරුවන්ගේ පුරෝහිත බමුණානෝ නම් තොපගේ පියානෝ වේදැයි කීහෙයින් මා ත්‍රිවේදය හදාරන්ට උවමැනවැයි මැනියන් අතින් ඒ පේරුස් මුද්ද ද ආචාරීන්ට දුනමනා වස්තු කොටඨාශයද ඇරගෙණ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන්ගෙන් ශිල්ප ඉගෙණ එනුයේ ඒ තෙම තපස්වී සමූහයක් දැක මූන් හැමදෙනා අත මී වැඩිතරම් ශිල්පයෙක් ඇත්නම් උගණිමියි ශිල්ප ලෝභයෙන් හැමවීට වත් පිළිවෙත් කොට ආචාරිවරයන්වහන්ස නුඹ හැම දන්නා ශිල්පයෙක් ඇත්නම් ඉගැන්නුව මැනවැයි ඉල්ළු හෙයින් ඒ තපස්වීවරහුද තමන් දත් ශිල්ප විචර ඉගැන්වූහ. එතකුදුවූවත් ඒ පන්සියයක් දෙනා කෙරෙන් උන්ට වඩා නුවණැති කෙණෙක් නැත්තාහුය.

මෙසේ ප්‍රඥාවෙන් ඉතා අග්‍රව ඉක්බිති තපස්වීහු එක්ව ඔහු ආචාරී කළහ. ඉක්බිති ඒ ආචාරී තවුස්ව සෙස්සවුන්ට කියන්නේ පින්වත්නි තොපි ඈම වනමුල් පලාඵල ආහාරයෙන් නිරන්තරයෙහි වනයෙහී වසව මනුෂ්‍යපථයට කුමක් නිසා නොයාදැයි විචාළේය. එබස් අසා තෙසු තාපසවරු කියන්නාහු පින්වත මනුෂ්‍යයෝ නම් දන්දීලා බණ කියන්ට කියති ප්‍රශ්න කියවයි කියති. අපි ඊට භයේ මනුෂ්‍යපථයට නොයම්හයි කීහ. එපවත් අසා ඇදුරු තවුස් පින්වත්නී ඉදින් චක්‍රවර්ති රජෙක් වීනමුත් සිත්ගෙණ කථා කරන්ට මට භාරයයි පින්වත්නි යවමැනවැයි සෙස්සවුන් කැඳවාගෙණ දනව් සැරිසරා ඇවිදිනේ බරණැස්නුවරට ගොස් උයනෙහි රඳා නිඳා උදය නැඟී නුවර ගම දොරකට සිඟාවන්හ. මනුෂ්‍යයෝ බොහෝ දන්දුන්හ. එදවස් වළඳා පසු දවස් බරණැස්නුවරට සිඟාවන්හ. එදවස් නුවර වාසීහු දැක මහදන් දුන්හ. ඒ ගුණ දෙමුවූ උද්දාල තාපසයෝ ප්‍රාප්ත ජනයාහට අනුමෙවෙනි දෙසති පෑණ විසඳති බලාගීර් වචන කියති. මනුෂ්‍යයෝ බොහෝසේ පැහැද මහදන් දෙමින් පණ්ඩිත ගුණ ශාසනාකෙණෙක් අවුයයි නුවර මුළුල්ල ඇලලී ගියේය. එපවත් රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝද කොයි වෙසෙත්දැයි විචාරා උයනේ වෙසෙති යනු අසා අද මා උන් දක්නට ගියමැනවැයි කීහ. එකෙක් ගොස් රජ්ජුරුවෝ තොප දක්නට එති උද්දාල තාපසයන්ට කීහ. එපවත් අසා තෙසු තපස්වරුන් සමීපයට කැඳවා පිනිවත්නි රජ්ජුරුවෝද අප දක්නා සඳහා එති. එසේහෙයින් ඉසුරුමත්ව සිටි කෙණෙකුන් එකදවසක් සිත් පැහැරගත උවහොත් දිවිපමණකට රැකෙන්ට සැහෙන්නේය, එහෙයින් තෙපි හැම්දෙන සමහර කෙණෙක් වවුලු තපස් කරව. සමහරකෙණෙක් කෙලිල්ලෙන් ඇනගෙණ හිඳුව සමහරකෙණෙක් කටුයහනෙහි හොවින තපස් කරව, සමහරකෙණෙක් පඤ්ච

තපස් කරව, කිසිකෙණෙක් ජලපජීතකරවයි, එක්මොත්තමෙක් මන්ත්‍රසජ්ඣායනා කරවයි, මෙසේ අනුශාසනාකොට ඔසින් එලෙසම අනම්මතමට පටන් ගෙණ තන්හි තන්හි මුලු මුලුව උන්හ. තුමූද පණ්ඩිතවාදයෙන් දසපස්දෙනෙකු ඇරගෙණ යහපත්වූ දණ්ඩාසනයක් මත්තේ පොතක් තබාගෙණ පණවන ලද ආසනයෙහි පිටඅටුවක පිටදී අතවැස්සන්විසින් පිරිවරණලදුව උන්හ. එකෙණෙහි රජ්ජුරුවෝ සිවුරඟ සෙනග පිරිවරා පුරෝහිතයන් හා සමග උයනට අවුදින් තන්හි තන්හි හිඳ මිථ්‍යා තපස් කරන්නාවූ ඔවුනොවුන් දැක ඔහු අපාය භයින් මිදීගියෝවනැයි සතුටුව උද්දාල තපස්වීන්කරා ගොස් පිළිසඳර කථාකොට එකත්පසෙක හිඳ සතුටු සිත් ඇත්තාවූ පුරෝහිතයන් හා සමග කථාකරන්නේ, පුරෝහිතයෙනි වත් දතවූ ඇඳුම් දිවිසම්සැරූ ජටාධාරී මැලින් දත් ඇති එසේහෙයින්ම ඇඳීම් පැළඳීම් නැත්තාවූ මේ තපස්වීවරහු මනුෂ්‍යයන් හා කළමනා යම් අතුරෙන් මේ තපස්කිරීම කටයුතුයි දැන මේ තපස් වරණය කරන්නාහුය. ඒකාන්තයෙන් සසර දුකින් ගැලවෙන්නාහයි කීහ. එපවත් අසා පුරෝහිත ආචාරි මේ රජ අස්ථානයෙහි පහන්විය. මෙතැන්හි බැණ නොතැගී හිඳීම යුක්ත නොවෙයි සිතා කියන්නාහු මහරජ ඉඳින් ත්‍රිවෙදය ප්‍රගුණකොට, තවද අතිකුත් බොහෝ ඇසූ පිරූතැන් ඇත්තේ දසවිධවූ සුචරිතධර්මයෙහි නොහැසිරෙන්නාහුද චාරත්‍රයෙන් වදනා අකුශල් වැලකිය නොහෙද එබඳු සත්ත්වතෙම ඒ ත්‍රිවේද තබා දහසක් වේද හදාළේ වී නමුත් වේද බලයෙන් සසර දුකින් ගැලවීයානොහෙයි. ඉඳින් සසරින් ගැලවීම්නම් මේ මිථ්‍යා තපස්හැර පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ගුණයෙන් පුරුදු කළහු නම් සසරින් ගැලවෙන්නාහයි කීහ.

මෙසේ කියන ලද පුරෝහිතයන්ගේ බස්ඇසූ ආචාරී සිතන්නේ රජ්ජුරුවෝ එසේවේවයි තපස්වීහු සමූහය කෙරෙහි පහන්වූහ. මේ බමුණු තෙම සැපසේ කන්නාවූ ගොණෙකු සෙස්සට ගසා වැලකුවාක්මෙන්ද දීවැඩූ බත්තලියෙහි කසල්ලක් ලාපු පරිද්දෙන් ප්‍රසන්නව රජහු සිත් මැඩෙන පරිද්දෙන් කියන්නේ එසේහෙයින් ඔහු හා සමග කථාකොට බලමියි සිතා කියන්නේ ආචාරීනි දැන් තොප කියන වාදයෙහි භාවනාගුණ හා කායසඞ්ඛ්‍යාදමයයි කියා චතුස්සත්‍යක්‍රියා හැරගෙණ සහස්‍රවේදය හා හදාරණ ලද්දේත් ඒ වේද ශාස්ත්‍රය කරණකොටගෙණ ගෙයක් නොලැබ එන්නේ වේදයයි කී නියායයි කියේය. එපවත් අසා පුරෝහිතයෝ කියන්නාහු තවස්වීනි එසේ කී නියායෙහි හදාරණලද වේද ශාස්ත්‍රයෝ නිෂ්ඵල නොවෙත් මය. එපරිදි වදාරණලද වේදශාස්ත්‍රය කරණකොටගෙණ මෙලොව මහත්වූ කීර්ති හා යසසට පැමිණෙන්නාහුය. එතකුදු වූවත් ශීල සංයමය හා නොවරදුවා දැන කරණලද කසින පරිකර්මාදිවූ භාවනා මනස්කාරයන් ඇතිම ඉක්මුනාවූ සත්ත්වතෙම නිවන්පුරයට හැමිණෙන්නේයයි කීහ. එපවත් අසා උද්දාල තාපසයෝ සිතන්නාහු ඒකාන්තයෙන් මූත් හා ප්‍රතිපක්ෂව සිට ජයගත නොහැක්ක. දරුවෝයයි කීකල දරුවන් කෙරෙහි ස්නෙහ නොකරන්නාවූ සත්ත්ව කෙණෙකුන් විසින් දෙමව්පියන් නැ මල් බෑබුන් දරු මුණුබුරු ආදී බන්ධුහු පෝෂ්‍යය කළයුත්තාවෙති. එබැවින් මමද එරහැන්ද සෙවනැල්ලේදී තොප නිසා උපන් තොපගේ කුලවංසය

පරිපාලනය කරන්ට යෝග්‍යවූ පුත්‍රයෙම් කීහ. එපවත් ඇසූ පුරෝහිතයෝ සබඳ තෙපි මාගේ පුත්වූ උද්දාලයෝදැයි විචාරා තපස්වීන් පිසින් එසේයයි කීකල්හි මා විසින් තොපගේ මෑනියන්ට දෙන ලද සලකුණෙක් ඇත. ඒ දූන් කොයිදැයි විචාළාහ. ඉක්බිති උද්දාලයෝ පින්වතුනි මේ ඒ වේදැයි පේරැස් මුදුව පුරෝහිතයන් අතතුබූහ. පුරෝහිතයෝ මුන්ද ඇඳිනගෙණ නියමිතයෙන් තොප බමුණන් බව දනිමි. බ්‍රාහ්මණ ධර්මයද දනුහයි කියවයි. පින්වත්නි කෙසේවූයේ බමුණන්වෙද කෙසේවූයේ කේවල පුරුෂ නම් වේද කෙබඳුවූ ගුණයෙක් ඇත්තේ ධර්මිෂ්ටනම් වේද කුමක් පුරුදු කරණ ලද්දේ නිර්විගියා නම් වේදැයි විචාළාහ. එපවත් ඇසූ උද්දාල තපස්විහු විසින් පින්වත්නි නිරන්තරයෙන් දක්ෂිණාග්නිය ගර්භප්‍රත්‍යග්නිය අහවනියාග්නියයි කියනලද වහ්නිත්‍රය ඇරගෙණ ගිනි පූජාකිරීමද දරුසම්බහ සවර්ණසම්භාදී සේවනයද සමම්‍යාපාසය, වාජපෙය්‍යය, නිරග්ලය යනාදීවූ වෙදත්‍රයෙහි අනන්තගීතවූ යාග කිරීමෙහිද යන ගුණධර්මයෙහි පිහිටියාවූ සත්ත්වතෙම අභයප්‍රාප්තවූ බ්‍රාහ්මණ යයි කියා කියති. එපවත් ඇසූ පුරෝහිතයෝ උද්දාල තාපසයන් කී බ්‍රාහ්මණ ධර්මයට නින්ද කරන්නාවූ පින්වත්නි අග්නිහෝත්‍රයෙන්ද උදකාරෝහන යෙන්ද පසුඝාතයෙන්ද තොප කී බ්‍රාහ්මණ ධර්මයෙන් සසරට ගොදුරුවන බව මුත් සංසාර තරණයෙක් නම් නැත. වැලි කෙසේද? යත් යම් කෙණෙකුගේ චිත්තසන්තානයෙහි අධිවාස ක්ෂාන්තිය හා ශීලසංවරයයි යන දීවූ තේරස ධූත ගුණයෝ ඇත්නම් එබඳුවූ සත්ත්වතෙම ක්ලෙශ පරිනිබ්බාණයෙහි මිදී ගියනම් වන්නාහයි කීහ.

ඉක්බිති උද්දාල නම් තපස්බෝධිසත්ත්වයන් සංක්ෂෙපයෙන් කියන වචන යෙහි විගාහ ඉදුරා දැනගනතොහී පින්වත්නි වැලි බමුණුවීද උත්තම පුරුෂත් බඳ ක්ලෙශ නිර්වාණයට ධාර්මිකත්වයද කෙසේවීදැයි විචාළාහ. එපවත් අසා පුරෝහිතයෝ තත්වූ පරිද්දෙන් කියන්නාහු තපස්විනි බන්ධු මිත්‍ර කලත්‍රාදීන් කෙරෙහිද ක්ෂෙත්‍ර යනාදීවූ ගම් නියම්ගම් ආදීවූ නොයෙක් දෙයෙහිද ලග්න නොවී, තමද සත්ත්වසංස්කාරාදියෙහිද නිරාළව කායජීවිතයෙහිද වස්තුකාම ක්ලෙශ කාමයෙන් දුරුවූයෙ භවාක්ෂය කළා නම් වෙයි කීහ එපවත් අසා උද්දාල තපස්වී පින්වත්නි මේ ලෝකයෙහි රජ, බමුණු, වෙළඳ, ගොවීහුද නොයෙක් සැඩොල් කඹුරු ආදීහුද යන සියල්ලෝම සුරක්තව ඉක්මුනාවූ සන්තාන ඇතිව නිවන් පසක් කළාහුය. එසේ නිවී සැනසී ගියාවූ සත්ත්වයන් අතුරෙන් හීන මධ්‍යමොත්කෘෂ්ටතාදියක් නැත්මදැයි විචාළාහ. එපවත් අසා පුරෝහිත අචාරිහු තපස්විනි යථොක්තවූ රජ, බමුණු, වෙළඳ, ගොවි ආදීහුද නොයෙක් චණ්ඩාලාදීහුද රහත්වූ තැන් පටන් උත්තම අධම විභාග යෙක් ඇත්නම් නැවත ඒ එසේම නිවත්වද සැනහුනාට ක්ලෙශ පටලලාම්කා භාවයෙක් නැත්තේම වේදැයි කීහ. එපවත් අසා උද්දාල තාපසයෝ උත්තම වශයෙන් ඉදින් පුරෝහිතයෙනි ගුණයෙන් සුරුළුවද ජාති විශෙෂ යෙක් නම් තොපගේ වාදයෙහි උභයකුල පරිසුඬවූ සොත්තිසස නම් බමුණු කුලයෙක් නැසි ගුණෙන්මතු අධිකවූ චණ්ඩාලයන් හා සරණනියාවේදැයි කීහ. එපවත් ඇසූ පුරෝහිත ආචාරී උපමාවක් කියා සන්හිඳුවමි සිතන තපස්විනි රත්, නිල්, සුදු, රත් ආදී නොයෙක් පැ පිළියෙන් ගෙයක්වත් මඩපයක්වත් සෙවූකල ඒ සෙවනයම පැහැය පෙණෙන බව මුත් උඩසෙවූ නොයෙක් පිළියෙහි පැය සෙවනින් නොපෙණෙන්නේ වෙයි. එමෙන් මනුෂ්‍යයන් කෙරෙහි යම් හීන මධ්‍යමොත්කෘෂ්ටතාදී ජාති ඇත්තාහුද

ආයශ්‍ෂීමාගී ධ්‍යානයෙන් නිවන්පුර වත්තාවූ එතැන් පටන් ජාති ගොත්‍ර යෙන් ප්‍රයෝජනයෙක් නැත්තාහයි කීහ. එපවත් අසා උද්දාල තපස්වීහු නැවත උත්තරයක් කියන්ට අසමර්ථවී මත්තෙහි තමන්ගේ අසූරත්‍ව්‍ය සිත සිතා කරබාගෙණ වුන්හ එසඳ රජ්ජුරුවෝ පුරෝහිතයන් මූණ බැලූහ. පුරෝහිතයෝ රජ්ජුරුවන්ට කියන්නාහු මහරජ මේ සියලු තපස්වීවරුහු මිත්‍ය්‍යා තපස් ඇත්තාහුය. එබැවින් මුන් ඇමගේ පැළඹීම අතිකුත් බොහෝ තෙනක පැවැත්තේ වී නම් සියලු ජම්බුද්වීපය මිත්‍ය්‍යාදෘෂ්ටියම්කොට නසා පියති. එසේ හෙයින් තෙල ගණදෙටුවූ උද්දාල තපස්වීන් තපස්වේසය හරවා මට දෙවෙනි පුරෝහිත තනතුරෙහි තුබුව මැනව. සෙස්සන් මහණ වෙස් හරවා කඩුපලහදී සේවාකමෙහි සලස්වා ගත මැනවැයි කීහ. රජ්ජුරුවෝද යහපතැයි එලෙසම කළාහ. ඒ පන්සියයක් දෙන රජ්ජුරුවන්ට සේවකව උපස්ථාන කළායයි යනාදීන් බුදුහු මේ ජාතක ධර්මදේශනාව ගෙණ හැර දක්වා වදාරා දැන් මතු නොවෙයි පෙරත් මේ මහණ සොර තපස්කොට ඇවිද්දේ වේදැයි වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ උද්දාල ජාතකය නිමවා වදාළසේක මහණෙනි එකල උද්දාල නම් දැන් මේ මහණය, එකල රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය, එකල පුරෝහිතයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන්වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක.

480
මහිස ජාතකය

තවද කරුණාවට පුරාතුබූ ගෙයක් වැනිවූ චක්‍රවාටය පරියන්ත කොට ඇති උඩින් භවාග්‍රය දක්වා හිවීගැවසී සිටි අටවණක් බුදුපිරිස්ගෙන් එකී එකී සතක්හුගේ සිත සොළොස් ආකාරයෙන් පරීක්ෂා කොට සිත් හැඳින වදාරණ ලද තමන්ගේ බුද්ධකායට සැරහුනු ධර්මකාය ඇති බුදුහු එක් සමයෙක දෙව්රම් වෙහෙර වැඩ වසනුවෝ සස්නෙහි උකටලීව වසන්නා වූ සඟරුවන් අරභයා මේ **මහිස ජාතක** දේශනාව වදාළසේක.

මෙහි පිළිවෙළ කථාවස්තුව කුසජාතකයෙහි කී නියායෙන් දත යුතුය. එදවස් බුදුහු ධම්සභා මණ්ඩපයට ගොස් භික්ෂූන් විසින් නොකමැතිසේ ගෙණෙන ලද ඒ උකටලී සඟරුවන කැඳවා සැබෑද මහණ තෝ උකටලී වූයෙහිදැයි විචාරා සැබව ස්වාමීනි දැන්වූ කල්හි, කුමක් උදෙසාදැයි විචාළ කල්හි කෙලෙස් සඳහායයි දැන්වූකල එකල බුදුහු වදාරණසේක් මෙබඳුවූ බුදුසස්නෙහි මහණව කුමක් නිසා කෙලශ වසඟවීද? පෙර නුවණැත්තෝ නුබුදුවූ යෙහි බැහැවී පැවිද්දෙන් ගුණදම් පුරුදූ වූවෝද මනකල් කෙලෙස්කාම නසා උපන්පසයට සපථකොට හළෝවේදැයි වදාරා භික්ෂූන් විසින් ආරාධිත වූ බුදුහු භවයෙන් සැඟවී තුබූ ඉකුත්වත් කථාව ගෙණහැර දක්වනුවෝ,

මහණෙනි,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් සතර සඟරාවතින් දනය නොවරදවා දැහැමෙන් රජ කරණ කල්හි පිරූ පාරමිතා ඇති අපමහබෝසතාණෝ අසූකෙළ පමණ ධන ඇති බමුණුමහසල් කුලයක උපන. එව්හු රන්පිඩල්ලක් බඳුපැහැ ඇති හෙයින් කාංචන කුමාර යයි නම්තුබූහ. ඉක්බිති ඔහු පියවර තබා ඇවිදිනා කල අතිකුඩු දරු කෙණෙක් ඒ කුලයෙහි උපන්හ. ඔහට උපකඤ්චන කුමාරයයි නම් තුබූහ.

ඔහුද පියවර තගණ කල්හි අනිකුත් කෙණෙක යනාදී පිළිවෙලින් බෝසත්හු හා සම්ග සත්බෑ කෙණෙක්වූ මෙසේ ඒ සත් බෑයන්ට කිස්දෙවූන් නැගනි කෙණෙක් උපන්හ. ඈටද කඤ්චනදේවීයයි නම් තුබූහ. යව කියතලද මහ කඤ්චනකුමාරයෝ වැඩිවිය පැමිණ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි වේදත්‍රය ඇතුලු ශිල්ප ඉගෙණ නිමවා අවුත් දෙමව්පියන් දුටු කල්හි දෙමව්පියෝ ඕහට ගේදොර අඹුදරුවන් ඇතිකරණු කැමතිව දරු වනි අප හා සමානජාති ඇති කුල දුවක ගෙණහැර තොපට පාවාදී ගේමිදුල් වෙන්කරම්හයි කීහ. එපවත් අසා මැනියන්වහන්ස මට ගිහිගෙයි වාසයෙන් කම්නැත. වැලිකරුණු කිම්ද?යත් මේ තුන්භවය නම් ගිනිමෙන් වැටහෙන්නේය. රහත්ගෙයක්මෙන්ද ඉතා පලිරෝධය. අසුචිභූමියක් පරිද්දෙන් පිළිකුල තවද මාවිසින් සීනෙනුත් මෙවුන්දම් සෙවුනා දුටුවිරූ නැත. අනිකුත් නුඹ හැමගේ පුතුන් ඇතිබැවින් උන්හැමට ගෙදර තිල ඇතිකොට සම්පතෙහි පිහිටුව මැනවයි කියා නොගිවිසි කල්හි නැවතනැවත යාච්ඤාකොට කියත් මිත්‍රයන් යවා නොකමැත්තෙමි නොඉවසුව කල්හි එපවත් දුටු මිතුරන් විසින් ඈයි සබඳ කුමක් සඳහා පස්කම්රස අනුභව නොකෙරේදැයි විචාළ කල්හි සබඳ භවයෙහි රක්තමද කලද ගිහිගෙය හැර තපස්කරණු කැමැත්තෙමි කීහ. එපවත් අසා දෙමව්පියෝ සෙසු පුතුන්ටත් එලෙසම පැවරූහ. ඔයින් එසේම නොගිවිස්සාහ. කුමාරිකාවෝත් නොගිවිස්සාහුමය.

මෙසේ කල්යාමක් ගියකල්හි දෙමව්පිය දෙදෙන කළුරිය කළ කල්හි මහාකඤ්චන කුමාරයෝ දෙමව්පිය දෙදෙනාට කළමනා කටයුතුකොට අසූ කෙළක් පමණ ධන දිළිඳුන්ට දන්දී සබෑයන් හා නැගනියනුත් එකදසකු හා දෑසකත් එක් මිතුරෙක් ඇරගෙණ ගිහිගෙය හැර මහබිනික්මන්කොට හිමාල වනයට වැද එක පියුම් විලක් ඇසුරුකොට රමණීයවූ විල්දෙසෙක්හි පන්සල්කොට මහණව වනයෙහි පලාපල අනුභව කෙරෙමින් ශීල ගුණය පුරා වසන්නාහ, මෙසේ ඔව්හු හැමදෙනම පලාපල සඳහා වනයට ගියකල යම් තැනෙක ඵල ආදීවූ දෙය දුටුවොත් එතනට තෙස්සවුනුත් කැඳවාගෙණ තම තමන් දුටු ඇසූ දෙයක් ඔවුනොවුන්ට කියමින් පලාඵල කඩන්නාහුය. එසඳ ගමෙක කම්ාන්ත කරණ තැනකමෙන් මහත් වූ අරගල උපදනේය.

එකල්හි හැමදෙනාට ඇදුරුවූ ඒ මහාකඤ්චන තාපසයෝ සිතන්නාහු අපි ගිහිගෙය අසූකෙළක් පමණ ධන අළුයම දෑමූ කෙළපිඬක්මෙන් නිඥකොට අපි හැමදෙනාට කියා මෙතැන් පටන් මම පලාපල හැරදෙමි, තෙපි හැම පන් සලම ඉඳ මහණදම් පුරවයි කීන. ඉක්බිති උපකාංචන තාපසයෝ ආචාරීන් වහන්ස අපි හැම දෙනම නුඹවහන්සේ නිසා මහණවූම්හ. එබැවින් ආචාරීන් වහන්ස අපටත් පින්පිරුණ මැනව, නුඹද නැගනියෝද මෙහිම ඉඳ මහණදම් පිරුවමැනව, දූන් තවුසාද අප තගහුද එකලාව මෙකීනම් වේවයි අපිද අටදෙන එකි එකී කෙණෙක් මුරව ශයෙන් පලාපල ගෙණහැර දෙම්හ. තොපි තුන්දෙන එයින් පිටත්ව වසවයි ඔවුනොවුන් අතින් ප්‍රතිඥකොට අපි හැමදෙනාට ගණුම්හ. මෙසේ ඒ අටදෙනා සෙරෙන් එකි එකී කෙණෙක් තමන්ට පැමිණි වාරයෙන් ගොස් පලාඵල ගෙණවුත් එකොළොස් කොටසක් කෙරෙති. සෙස්සෝ ගොසින් තම තමන්ට පැමිණිතෙන කොටස හැරගෙණ වසන තැනට අවුත් තමතමන්ගේ පන්සල්වල ඉඳ වළඳ, යෙහෙන් මහණදම් පුරති නොකරුණෙහි එකද සමඟවීමක් නොබලන්නාහුය. වාරය පැමිණියේ

පලාපල ගෙණවුත් එක් මුළුයෙක්හි ගල් පෝරුවෙක් ඇත්තේ ය. එකොළොස් කොටසක්කොට ගෙඩිය සන්දි තමාගේ කොටසගෙණ වසන තැනට නැගීයෙයි. එසඳ සෙස්සෝද ගෙඩිය ගැසූ හඬින් නික්ම සෙමෙන් ආදරබහුමානයෙන් ගොස් තමන්ට පැමිණි කොටස් ගෙණ වසන තැනට ගොස් වළඳා මහණදම් පුරන්නාහුය. මෙසේ කල්යාමක් ගිය කල්හි ඒ තපස්විවරහු නෙළුඹල ගෙණවුත් අනුභව කරන්නාහු ය. ඝෝරවූ තපෝතේජසින් යුක්තව පසිඳුරන් අසුරුවා කිසුතු පිරියත් භාවනා කෙරෙමින් වසන්නාහුය. ඉක්බිති ඒ තවුස්ගණයාගේ ශීලතේජසින් සක්දෙව් රජහුගේ පඬුපුල්සල හසුන් හුණුවිය. එසඳ දෙව්රජ කල්පනා කරණුයේ එපවත් දැන දැන මේ තපස්වීහු කාමයෙන් විනිර්මුක්තයෝද්‍ෙ නොවේද්‍ෙහෝයි පරීක්‍ෂාකළ මැනවැයී සිතා තමන්ගේ ආනුභාවයෙන් බෝසතුන් උදෙසා තුබූ වැඩිකොටස තුන්දවසක් පිට පිට අතුරුදම් කොටපූහ. බොධිසත්වයෝ පළමු දවස් තමන්ගේ නෙළුඹල කොටස නොදැක සිතන්නාහු මගේ කොටස සඳහත් නොවී තිබුවෝවනැයි සිතා දෙවෙනි දවස් මා දෝෂයක් ඇතිහෙයින් නොතිබුවෝවනැයි සීතූහ. තුන්වෙනි දවස් කවර කාරණයක් හේතුකොට ගෙණ මාගේ කොටස නොතිබූදැයි සිතා ඉක්බිති මෙසේ තුන්දවසක් පිරිගිය කල්හි ඉදින් මාගේ දෝෂයක් ඇත්නම් සමාකරවා ගතමැනවයි සිතා හැම දෙනා රැස්වෙන ලෙසට ගෙඩිය සන්දූන්හ. එසඳ හැම රැස්ව ගෙඩිය ගැසූවෝ කවුරුදැයි විචාළාහ.

එසඳ බොධිසත්වයෝ මම යයි වදාළසේක. එසඳ ඉතිරියෝ කාරණා කිම්ද? වහන්සැයි පුළුවුත්හ. එසඳ ඇදුරු තවුස් කියනුයේ තුන්වෙනි දවස් පලාපල ගෙණාවෝ කවුරුදැයි පුළුවුත. එකල්හි එකෙක් නැගී සිට කියන්නාහු මමය ආචාරීනි වැඳ සිටියේය. කොටස් කරන්නාවූ තෝ මටත් කෙළෙහිද විචාළාහ. එසේය කොටස තිබීමි කීය. දෙවෙනිදා කවුරුදැයි විචාළසේක. අනිකෙක් නැගීසිට මමය වහන්සැයි කීය. මා සඳහත් කෙළේදැයි විචාළසේක. එසේය නුඹවහන්සේ සඳහා වැඩිතර කොටස තිබීමි කීය. අද වනාහි කවුරුදැයි විචාළකල, තවද අනිකෙක් නැගී සිට මමය වහන්සය කීය. මා සඳහත් කළේ නැද්දැයි විචාළකල නුඹට වැඩිතරම්කොට අභ්‍යාස දෙයෙක් නොවේදැයි කීහ. එපවත් අසා මහසත් පින්වත්නි දැන් මා නොලබන්නේ තුන්දවසෙක පළමු දවස් කොටස නොදැක කොටස කරණ තැනැත්තෝ මා නොසඳහන් වීයයි සිතමි. දෙවෙනි දවස් මාගේ දෝෂයක් ඇතැයි සිතමි. අද දවස් මාගේ දෝෂයක් ඇත්නම් සමා කරවා ගණිමියි සිතා ගෙඩිය සන්දිපත්ව තුලුන් රැස් කරවීමි සිතමි. නැවත තෙපි හැමදෙනාම මා උදෙසා නෙළුඹල කොටස කළම්හයි කිව මමද වැලි නොලදිමියි කරුණු කිම හෝ මේ සඟවාගෙණ කන්නන් දතමැනවැයි, පඤ්චකාමය හැර මහණවූවන් විසින් නෙළුඹු අලවිතර සැඟවීම නුසුදුසුයයි කීහ. එපවත් අසා සියලු තපස් ගණයාම කලකිරුණු සිත් ඇතිව නොසතුටුවූහ. එසමයෙහි ඒ අසපුයෙහි වනස්පති රුක් අරක්ගත් දේවතාවාද අවුදින් ඔවුන් හා සමගවුව, පෙර බොහෝ ඉක්මවීමෙන් දුක් සහනය කළනොහී ඇත්හල බිඳගෙණ වනයට අවුත් වන්හ. එක් ඇත්රජෙක් කලින්කල ඒ ඉසි ගණයාට අවුත් වැඳ වැඳ යන්නේය. එදවස් අවුදින් එකත්පසෙක සිටියේය. තවද පෙරම්නිසුන් අතට අසුව කෙළියෙහි සුරුවනලද එක්වරෙක්ද අහිගුණ්ඨිකයා අතින් ගැළවී වනයට අවුත් එම අසපුගාව, වනයෙහි වසන්නේය. එදවස් අවුත් ගණවැඳ එකත්පසෙක උන්නේය.

සක්දෙව් රජද තවුස්ගණ විමසම්යි සිතා ඔවුන් සමීපයෙහි අතුරුදම්වලා සිට ගත්තේය. එකෙණෙහි තවුස්ගණයාගෙන් උපකසුන් නම් මල් තවුස් වැඳ සෙස්සවුන්ට ඇදර දක්වා සිටි ආචාරිනි මම වනාහි සෙස්සවුන් ඉන්දදී මා පමණක් සුඛකොට ගන්ට ලැබේදැයි පුළුවුත, එසඳ එලෙසම වේවයි මහබෝසතු නුඳ අවසර දුන්සඳ ඒ තවුස්ගණ වැඳසිට ඉදින් මම නුඹසතු නෙළුඹල සඟවා කැම්තම් මට මෙසේවූ දෙයෙක්වෙත, පෙර අපමණ තමන් කුලවත්කම් කෙලෙස්කම් වියා අපිස්ව වලහෙයි. ඊට අනුරූපවූ සපථයක් කෙරෙත්. ඒ කෙසේද?යත් ආචාරිනි යමෙක් තොප සතු නෙළුඹල සඟවා කැ නම් ඇත් අස් ගව මහිසාදීවූ රන් රුවන් මුතු මැණික් ආදිවූ දෙයින් තන් සැපතින් පිරුණු ගිහිගෙයි ඉතා කන්කළුවූ තෙපුල් ඇති අඹුදරුවන් හා එක්වීම් ඕහට වේවයි දිවුලාහ. එපවත් අසා තවුස්ගණ කන් පියාගෙණ පින්වත තා විසින් දිවුට දිවුරුම ඉතා ඇසිය නොහැක්කැයි කියා තොප එබන්දක් නොකළේ නියමය. තෙපි සැක නැතිව එවුයයි අස්වැසූහ. එද තමා සපත් අස්න බැස උන්හ. ඉක්බිති ඔහු මල් තවුස් පෙර සේ නැගී සිට මහසත්හු වැඳ දිවුට. තමා සුඛකරණුයේ ආචාරිනි යමෙක් තොපසතු නෙළුඹල සැඟවූයේ වී නම් සපු දුනුකේ නා පනා සිහින්ගෙඩි සමන් ඉද්ද නොයෙක් මලින් සැදි සඳුන් කොකුන් ආදී ගඳවිලවුන් ගෙන් නන්වන් අලංකාරයෙන් හෙබි ගිහිගෙයි බොහෝ දරු සුරතල් බලා සැනහෙනුයේ මා සම්පත් ඉතා මහතැයි සතුටුව නැවත ඉන් කිසිවක් අඩුවූ කල මහ දෙම්නසට පැමිණ සිහිවිලි තැවූලී නැත්තවුන්ට ඇතුළත් වේවයි දිවුල. එසඳ ඉසිගණ දෙකන්පියා අහෝ තොප දිවුළු දිවුරුම ඉතා ගැඹුරුය. කණෙව ඉඳුවයි කීහ. එපවත් අසා ඔහු තම සපත් අස්නෙහි බැස උන්කල්හි ඔහු ඉක්බිති මල්ද ඒ සමාගම කැටුව සියල්ලෝම තම තමන් අදහස්වූ පරිද්දෙන් මෙම ලෙසට සපථකළහ.

තුන්වෙනි තවුස් සපථ කරණුයේ ඉදින් යමෙක් නුඹසතු නෙළුඹල සඟවා කැනම් බොහෝ වැදූරුම්වූ ධාන්‍යයන් ඇති බොහෝසේ තගුල් ඇති ගිහිගෙයි නීව සියළු පස්කම් ගුණයෙහි ඇලී අඹුදරුවන් හා සමග යස පිරිවරින් යුක්තව වෙසෙවයි දිවුළ සතරවෙනි තවුස් එම ලෙසම නැගී සිට සවාමීනි යමෙක් තොප සතු නෙළුඹල සැඟවීනම් ඒ තෙම සියලු පස්කම් ගුණයෙන් රජ්ජුරුවන්ට නායක තරම් වරගන්නා මහ යසපිරිවරින් යුක්තව සියළු සයුර ගසා සිටි පොළව රජකරවයි දිවුලේය. පස්වෙනි තවුස් එම ලෙසම නැගී සිට සවාමීනි නුඹවහන්සේගේ කොටස යමෙක් සඟවා කැ නම් ඒ තෙම කෙලෙසුන් නොපසඩ් බමුණකු නකත් මොහොත් උල්කාපාත අසනිපාත බිම් ලකුණු ආකාශ ලකුණු තිරිසනුන්ගේ රාවූ ආදීන් නාද දන්නා රජදරුවන් විසින් පුදන ලදුව දික්පතල යසස් ඇති පුරෝහිතයක්ව ගිහිගෙයි වෙසෙවයි දිවුළු. සවෙනි තවුස් එම ලෙසම නැගී සිටි තමා සුඛ කරණුයේ යමෙක් නුඹගේ නෙළුඹල සැඟවූයේ වී නම් වේදත්‍රය හදාරන්නාවූ එසේ හෙයින්ම පුහුණුකළ වේද ඇති තපස් ඇසිරුකළ ලෝවැස්සන් විසින් තැකිලි ඇති බමුණෙක් වේවයි දිවුළ. තමා පිරසිදුකොට බැණඋන. සත්වන මිතුරු තවුස් මෙලෙසම නැගී සිට ආචාරිනි යමෙක් නුඹ සතක නෙළුඹල සැඟවූයේ වී නම් මිනිසුන්ද බොහෝ ධාන්‍යයන්ද කැමතිසේ දඹුපැදෙන්නාවූද බොහෝ වැව් අමුණු දිය ඇත්තාවූද යන මේ සතරින් අඩුවක් නැති සක්දෙව් රජහු දුන් වරයක් මෙන් එක්කෙණෙකුන් විසින් නොසෙල්විය හැකි රජුන් සිත

අරයාලවාගත් හවුරුදු පතා සුවහස් නිමවන ගම් තෙරකට නායකව සැපත් අනුභවකොට කෙලෙස් නොමසිඳ මඩෙහි ගැලුනු ගම් ඌරකු සෙයින් කෙලෙස් නමැති කලලෙහි ගැලීම මරණයට පැමිණෙවයි දිවුලේය. අටවෙනි තවුස්ද නැගී සිට ඉදින් යමෙක් නෙළුඹල සඟවා කැයේ වී නම් නොයෙක් සැපතින් පිරුණාවූ ගමකට නායකව රජුන් විසින් කිසි බැසනයක් නොලදින් තමා සිත්වූ ලෙසම කෙළිනළුයෙන් සතුටු සතුටුව ගිහිගෙයි සැප විඳිත්වයි දිවුලේය. නැවත නවවෙනි තවුස් නැගීසිට තොමෝද සුඛකරණ නිසා යම් මිනහෙද ඇති රජෙක් සියළු පොළොව ජයගෙණ දහසක් බිසෝවරුන්ට නායක තනතුරෙහි තබා මහත් රජ සැපතින් අග්‍ර තැන්පත් කෙරේවයි තොපගේ නෙළුඹල සැඟවූකෙණෙකුන්ට එබඳු කත්කටුලු වේවයි කියා දිවුට තමා සුඛලූකොට තමන් හස්තෙහි බැළින. දසවෙනි සෙලි තවුස් නිඳු නැගී සිට මෙවෙනි වනෙහි මහත් ගුණදම් පුරා සමගම තවුස් කරන්නාවූ තාපස වරුන්ගේ කොටස් වශයෙන් තබන ලද උතුම් නෙළුඹල සඟවාගෙණ කට යුතු සලකාගත නොහී යමක් තොමෝ සැකනැතිව කැයේවීනම් සවාමිදරුවන් ඉදිරියෙහි බොහෝ සම්පත් සඟවාගෙණ කැවානත් වන්නීයයි දිවුළහ. මෙසේ ඇමදෙනා දිවුට තමන් පිරිසිදුකොට පැමිණී අසුන්වල මුවෙන් නොබැණ උන් කල්හි එතනට ආ රුක්දෙව්රජ තමා සුඛ කරණු සඳහා දිවුරන්නෝ ඉදින් තපස්වීනි මම ඒ නෙළුඹල සැඟවිම්නම් කජංගලා නම් නියම්ගම එක්කළු දෙර කම්ාන්ත කරන්නාවූ මහා විහාරයෙහි නේවාසික සඟරුවනක් වේවයි මෙසේ දවස්පතා නවකම් කරණුයේ කුසිවේයියි. පෙර දේවතාවා තමා කසුප් සම්මාසම්බුදුන් දවස කජංගලා නුවර යොත්තක් දිග ඇති සඞ්ඝාරාමයක නෙවාසික මහතෙරක්ව ඉපිද දවස්පතා නටබුන් කම්ාන්ත කරණුයේ වෙහෙර දික් හෙයින් එක්කන්නකින් වෙහෙර නටබුන් තැන් පිරිමසාගෙණ යන කලට අතික්කනෙත්නත් වැගිරගෙණයයි.

මෙසේ දවස්පතා නවකම් කරණුයේ කුසිවෙසිව මිය රුක්දෙව්රජව ඉපද එදවස් ඒ සමාගමයෙහි එක්වූයේ මෙලෙස සපථ කෙළේයයි දතයුතුයි. තවද ඇත්රජ තමා සුඛකරණු සඳහා සවාමීනි යමෙක් තුඹ සනනක නෙළුඹල සඟවා කෑනම් ඒ තෙම රම්‍ය වූ වනයෙන් රාජධානියට ගෙණගොස් සියගණන් කඹලා බැඳ දෙබල් කොලින් ඇන වක්අකුසු පහරදී දෙමාපට ඇගිල්ලෙන් සන්කොට නොයෙක් වධබන්ධනාදියට යොග්‍යවූ ගම් අතුමෙම්වයි පෙර තමා අනුභූත වූ දුක්ගී කළකිරී දිවුලේය. එපවත් දුටු වඳුරුද තමා සුඛ කරණු පිණිස නැගීසිට සවාමීනි යමෙක් නෙළුඹල සැඟවීනම් ඒ තෙම පාම්බට්ටින් විසින් ගොතා කරණලද වරාමල් වඩම් හා උඩුකන විදලුවා ලී හා අඳවන ලද කෝනම් ඇතිව ලීයකින් මරමරා නයින් මූබයට අද්දිදී සම්කෙළි කෙළවන කෙළිවානරවෙයි. තමා පූර්වානුභූතවූ දුක්කළකිරි දිවුලේ ය. මෙසේ ඒ තෙලෙස් දෙන දිවුළ කළ මහබෝසත් සිතන්නේ කිසිකෙණෙක් සේත් ඔහු හැමදෙනම නොනසනු දෙය නැසී ගියයි මා කෙරෙහි සැක කළාහුම්නම් නොයෙදෙයි මමත් සපථකොට සුඛවෙම් සිතා යමෙක් නොනැසුනු වස්තුවක් නැසීගියේයයි කීනම් ගොරබිම්සසර මලක්වැනි වූ පස්කම් ගුණයෙහි බැඳී ගිහිගෙයි ඉඳම මරණට පැමිණෙවයි දිවුලහ. මෙසේ හැමදෙනා සපථ කළකල දෙව්රජ මොහු අළුගම දුමූ කෙළපිඩ සෙයින් පස්කම් ගරහා සපථ කෙරෙති. ඒ කාරණය

විචාරම් සිතා සාද්‍රිසයෙන් සිට තපස්වීනි මේ සත්ත්වයෝ ගොවිකම් වෙළඳම් ආදිවූ නොයෙක් කම්කටුල් සෙවුනාවූ දිවි පෙමෙන් වටහති. එසේවූ දෙව් මිනිසුන් ඉතා ප්‍රිය වූ කාමගුණයන් මෙතම්හු කුමක් සඳහා නින්ද, කලහුදැයි පුළුවුත්හ. ඉක්බිති ඕහට පැණ විසඳන ඇදුරු තවුස්පාන කියන්නේ. දිව්‍ය නාගයකය ඒකාන්තයෙන් මේ පස්කම් ගුණ සඳහා සත්ත්වයෝ තුන්දොරින් පුරණලද දුසිරි ඇති බොහෝවූ දඬුපහර ගැසීමෙන්ද ලනුයෙන් බැඳීමෙන්ද සතුන්ට නොකම්කලුවූ අත්තානුවාද භය පරානුවාද භයද වධ භයද දුගීති භය යයි නොයෙක් දෙයෙහි බැහැවි ඉස් ඔසවාගත නොහෙන ඒ අකුශල කම් තත් ගොදුරුකොට වසනුයේ බොහෝ අකුසල් රැස්කොට කාබුන් මරණින් මත්තෙහි දුකින් අතුරු නැති අටමහනිරා අතුරෙහි අතුරු සිදුරු නැති සතුන් අතුරෙහි පැසී මහ දුක් අනුභව කරන්නේයයි පැණ විසඳ බණවදළේය. සක්දෙව්රජ එපවත් අසා භයවූ සිත් ඇත්තේ එවිට තත්වූ පරිද්දෙන් කියන්නේ, සවාමීනි මේ තපස්වීවරහු පඤ්චකාම ගුණයෙන් ඇලී වෙසෙද්දෝහෝ නොඇලී වෙසෙද්දෝහෝයි විමසනු සඳහා තුඹවහන්සේ සනනකවූ නෙළුඹල සගවාපීමි මේ හැම තවුසෝම පස්කම් හැරපියා මහණව එම්ගරහාම දිවුට හරණුවෝ පිරිසුදුවූ නිස්පාපීවූ ගුණඇත්තහුමයයි දතයුතුමයයි කීහ. මහ බෝසතානෝ ශක්‍රදේවේන්ද්‍රයෙනි අප හැම නොපගේ කෙළිනට සුදුසුවූ නාටක කෙණෙකුන් නොවත් මිතුරුකෙණෙකුන් නොවත් වැලි කුමක් නිසා නෙපි තපස්වීවරයන් වෙහෙසා කෙළියාදැයි විචාළාහ.

ඉක්බිති ශක්‍රදෙවේන්ද්‍රයෝ ආචාරීනි තුඹවහන්සේ මම පුළුවුත් සක විසඳූ හෙයින් ආචාරිසේක්මය, තවද මට සසරට පිටිවහල් බැවින් පිය තැන්පත් සේක්මය. එසේ හෙයින් නුවණැත්තෝ නම් සමාවීම බලකොට ඇත්තාහ. එබැවින් නුඹද මාගේ මේ එක වරදට කමාවන්නැයි කෂමා සාරවූහ. ඒ මහබෝසතානෝද තමන් ආදිවූ අටවැදෑරුම්වූ වදන්හි නොකලකිරෙණ සිත් ඇති බැවින් අපි එක දවසකුත් සමග පිරිසිදුවූ අදහස් ඇතිව මේ වෙනෙහි විසූමු. ඉතා මැනව කරණු කිම්ද?යත් ඉදින් පස්කම් ගුණයෙහි බැදී ගම විසුවෝවීනම් මේ නියා සක්දෙව්රජහු අප කරා නැගී නොයේමය. එහෙයින් පින්වතුන් අටදෙනා දෙව්රජහුකෙරේ කමාවන්නැයි සමාකරවූහ. එකල දෙව්රජ තවුස්ගණ වැඳ තමා අණපවත්නාවූ දෙව්ලොවට නැගීගියේය. ඒ තවුස් ගණයාද ධ්‍යාන උපදවා බඹලොව ගියාහ. බුදුහු දේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි පෙර පණ්ඩිතවරනු පසගුණ හෙයින් දිවුට හළුවෝවේදැයි වදාරා චතුසසත්‍යයෙන් දෙශනාව කුළුගන්වා ශාසනයෙහි උකටලී සඟහු පළමුවන පදෙහි පිහිටුවා වදාරා එකල ඉතිරියෝ සැබෑයෝ සැරියුත් මුගලන් මහකසුප් අනුරුත් පුණ්‍යතෙරහු ආනන්ද යන තෙරහු සදෙනය. එකල සත්බෑයන්ට නත්වූයේ උපුල්වන් මහසළුවිරිය, එකල දාසිතපස්නි, දූන් උත්තරාය, එදවස් තවුස් අද මේ චිත්‍ර නම් කෙළෙඹිපුත්‍රයාය, එකල රුක්දෙව්රජ නම් දූන් සාතාගිරි නම් යක්සෙනෙවිය, එද ඇත්නම් මෙද පාරලෙයය නම් ඇත්මය. එකල වඳුරා නම් දූන් මී පිළිගැන්වූ වඳුරාය. එකල ශක්‍රයෝ නම් මේ කාළුදායි ස්ථවිරයෝය. එකල ඇදුරු තවුස් නම් මෙකල බුදුවූ මම්මයයි වදාළසේකි.

481
සුරුචි ජාතකය

තවද ලොකොත්තම වූ කරුණාකරවූ සම්‍යක් සම්බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර නිසා මිගාර නම් සිටාණන්ගේ මෑණියන් විසින් කරවා පිළිගන්වන ලද හෙයින් මිගාර නමින් ප්‍රසිද්ධවූ විහාර ප්‍රාසාදයෙහි වැඩ වසනසේක් විශාඛාවන් ලබන ලද වර අටක් අරභයා මේ සුරුචි ජාතකය දේශනාකොට වදාළසේක.

ඒ කෙසේද? යත්,

එක් දවසක් විශාඛාවෝ දෙව්රටම ගොස් බණ අසා බුදුන් පිරිවර හා සමග පවරා ගෙට ආහ එදවස් රාත්‍රිහු ඇවෑමෙන් චාතුර්ද්වීපිකමහාමේඝය වස්නට පටන් ගත්තේය. බුදුහු භික්ෂූන්වහන්සේ කැඳවා සම්සේ මහණෙනි ජේතවනයෙහි වස්නේවීනම් එලෙසම සතරමහ ද්වීපයෙහිම වැසි වස්නේය. එසේ හෙයින් මහණෙනි මාගේ බුදු හමුයෙහි කෙළවර වස්නාවූ චාතුර්ද්වීපික මහා මේඝයෙහි තොප සිරුර තෙමනසේ ශරීරයෙහි වැසිවස්වා තෙමුනු භික්ෂුසඞ්ඝයාවහන්සේ හා සමග සෘද්ධි බලයෙන් ජේතවනයෙහිදී අන්තර්ධානව විශාඛාවන්ගේ ගෙදර දොරටුවේ පෙණී වදාළසේක. විශාඛාවෝද විස්මයපත්ව බුදුන්ගේ ඓශ්වර්යයක් ඉතා අරුම්වූයේය, සෘද්ධි බලයත් ඉතා අපූර්වූයේය. බුදුහු මහානුභාව ඇති හෙයින් දනපමණ කලවාපමණ උකුළුපමණ වතුර යෙමින් සිටියදී එක භික්ෂුකෙනෙකුන්වහන්සේගේත් සිවුරෙක්වත් පසයෙක් වත් තෙතමුනාහයි කියා කුලුපගවූ හෙයින් ඔද වැඩි සිතින් බුදුපාමොක් මහ සංඝයාවහන්සේ වළඳවා අන්තයෙහි බුදුන්කරා එළඹ ස්වාමීනි අට වරයක් ඉල්වමි කීහ.

එසඳ බුදුහු විශාඛාව සර්වඥයන් ඉක්මුණුවර ඇත්තාහුයයි වදාළසේක. විශාඛාවෝද ස්වාමීනී යමෙක් භික්ෂුසංඝයාට කැපවීනම් යමෙක් නිරවද්‍යවීනම් එබඳුවරයක් ඉල්වමි කීහ. එසේවීනම් කියවයි විශාඛාවෙනි අභිමත දෙයක් ඉල්වයි බුදුන් අවසර දුන් කල්හි විශාඛාවෝද ස්වාමීනි දිවි පමණින් සඟනට වස්වැසි සිවුරු දීමද ආගන්තුග බත් දීමද ගිලන්පස දීමද ගිලන්නුනට උපස්ථාන කරන්නට පසය දීමද ගිලනුන්ට බෙහෙත්පස බඩු දීමද සඟනට නිරන්තර කැඳ අවුලුපත් දීමද මෙහෙණින්ට නානකඩ දීමද ගමික බත් දීමදැයි මේ අට වරය ඉල්ලූහ. බුදුහු විශාඛාව කවර අර්ථසිද්ධියක් දැක බුදුන්ගෙන් අවසර ඉල්වූයේදැයි පුළුවුත් සඳ විශාඛාවන් විසින් එහි අනුසස් දුන්වූ කල්හි බුදුහු තුන්යලක් සාධුකාරදී අටවරය දෙවා වදාරා අනුමෙවෙනි දෙශනාකොට ජේතවනයට වැඩ වදාළසේක. ඉක්බිති එක් දවසක් බුදුන් පූර්වාරාමයෙහි වැඩවසන කල දම්සභාවෙහි වැඩ උන් භික්ෂූන් වහන්සේ ඔවුනොවුන් හා සමග ඇමැත්ති විශාඛා මහඋපාසිකාවෝ ගැණු ආත්මභාවයෙහි සිට බුදුන් සමීප යෙහි අටවරයක් ලදහ. උන්ගේ ගුණයෙන් ඉතා ආශ්චර්යයයි කථාකොට උන්කල්හි බුදුහු තුන්තරා ගමනින් වැඩවදාරා පණවනලද බුද්ධාසන මස්තක යෙහි වැඩහිඳ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා භික්ෂූන් විසින් එපවත් දුන්වූ කල්හි මහණෙනි දුන් මතු නොවෙයි පෙරත් මා සමීපයෙන් වරප්‍රසාද ලද්දීයයි භික්ෂුසංඝයා විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාරණසේක්,

මහණෙනි,

යටගිය දවස ප්‍රථම කල්පයෙහි මිථිලානම් නුවර සුරුචිනම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍ය කරණ කල්හි ඒ රජ්ජුරුවෝ පුතනු කෙනෙකුන් ලදින්

සුරුචිනම් කුමාරයෝයයි නම් තුබූහ. ඒ කුමාරයෝ වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොසින් නුවර සමීපයෙහි ශාලාවෙක සැතපී උන්හ. එකල බරණැස් රජ්ජුරුවන්ගේ පුතනුවෝ බ්‍රහ්මදත්ත කුමාරයෝ එලෙසම ගොස් සුරුචි කුමාරයන් බැසඋන් පුවරුවේම උන්හ. ඉක්බිති ඒ දෙදෙන ඔවුනොවුන්ගේ නාම ගොත්‍ර විචාරා විශ්වාසීව එක්වම ආචාරීන්ට දුනමනා වස්තු භාගය දී නොබෝ දවසකින් ශිල්ප නිමවා ආචාරීන් වැඳ සමුගෙණ එක්ව මගට අවුත් තමතමන් රටට යන මංසන්ධියෙහි සිට දෙදෙන ඔවුනොවුන් සිපගෙණ මතු මිත්‍රධර්මය නොනසා රක්නාපිණිස කතිකාවක් කරන්නාහු ඉදින් මාගේ පුතනු කෙණෙක් උපන්නාහුවීනම්ද තොපගේ දියනිකෙණෙක් උපන්නාහුද නැවත මාගේ දියනිකෙණෙක් පුතනුකෙණෙක් උපන්නාහුවීනම් ඔවුනොවුන් ආවාහ විවාහ කරම්හයි, ගැණ බැණ තමතමන්ගේ සියරටට ගොස් රාජ්‍යයෙහි පිහිටා රාජ්‍යකරන්නාහු සුරුචි මහරජ්ජුරුවන්ට පුතනුකෙණෙක් උපන්නාහුය. උන්ට එමතම තුබූහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට දියනිකෙණෙක් උපන්නාහ. උන්ට සුමෙධාදේවයයි නම් තුබූහ. සුරුචිකුමාරයෝ වැඩිවිය පැමිණ තක්සලා නුවරටගොස් ශිල්ප ඉගෙණඅවුත් පියාහට දුටහ. ඉක්බිති උන්ගේ පියානෝ පුතනුවන් රාජාභිෂෙක කරණු පිණිස මාගේ මිත්‍රවූ බරණැස් රජ්ජුරුවන්ගේ දියනිකෙණෙක් ඇත්තාහ. ඈ මෝහට ගෙන්වා අගමෙසුන් කරම්හයි කුමාරිකාවන් පිණිස බොහෝ පඬුරුදී ඇමතියන්යවා සරණ බැණවූහ. ඇමැත්තන යන්නාට පූර්වභාගයෙහි බරණැස් රජ්ජුරුවෝ බිසවුන් හා සමග කථාකරන්නාහු භද්‍රාව ස්ත්‍රීන්ට ඉතා දුක්නම් කවරේදැයි විචාළාහ. බිසවුද මහරජ සපත්නිරොසයයි යන දෙයෙක් ඇති ස්ත්‍රීන්ට ඊටවැඩි දුකෙක් නැතැයි කීහ. එසේවීනම් සොඳුර එකම එක දියනියන් දුකින්ගලවා ඈ තනිවම ඇරගන්නා කෙණෙකුන්ට දෙම්හයි සනිටුහන්කොට උන්හ.

ඉක්බිති ඒ ඇමතියන් අවුදින් කුමාරිකාවන් විචාළ කල්හි කුඩාවරුනී පෙරම අප සඟදහට ප්‍රතිඥා දුනුමෝය. එතකුදු උවත් ස්ත්‍රීගණයා මධ්‍යයට නොදෙම්හ. ඉදින් යමෙක් තනලම අගමෙහෙසුන්කොට තමන්ගේ දුක තබන් තේවීනම් ඔහට දෙන්නා කැමැත්තම්හයි කීහ. ඒ අමාත්‍යහුද එපවත් රජ්ජුරුවන්ට කියා යවූහ. නොහැක්ක අපගේ තුන්සියයක් යොදුන නුවරය එසේම මහත්වූ රට ඇත අපට යටත්පිරිසෙයින් සොළොස් දහසක් බිසෝවරුන් ඇත මැනවැයි නොයිවසූහ. සුරුචි කුමාරයෝ වනාහි සුමේධාවන්ගේ රූප සම්පත් නිය ඇසීමෙන් උන්කෙරෙහි බැඳීගොස් මට ස්ත්‍රී සමූහයාගෙන් කම්නැත තනිව විනමුත් උන්ම උවමැනවයි කියා දෙමව්පියන්ට කියා යවූහ. දෙමව්පියෝ උන්ගේ සිත් නොබිඳ බොහෝසම්පත්යවා මහපෙරහරින් ගෙනවා කුමාරයනට අගමෙහෙසුන්කොට රාජ්‍යාභිෂෙකයට පැමිණි ඔහුද සුරුචි රජ්ජුරුවෝයයි යන නමින ප්‍රසිද්ධව දැහැමෙන් රජකරන්නාහු ඒ සුමෙධා දේවීන් හා සමග ප්‍රියවූ සහවාසයෙන් විසූහ. ඒ බිසව් වනාහි දසදහසක් අවුරුදු ඒ රජගෙයි වසන්න දරු කෙණෙකුන් නොලද්දීය. ඉක්බිති නුවරවාසී සත්වයෝ රාජාඞගන යෙහි රැස්ව මහත්කොට මූරගෑහ. එසඳ රජ්ජුරුවන් විසින් මීට කාරණා කිම් දැයි විචාළකල මහරජ අනික් නුඹගේ දොෂයෙක් නැත. ප්‍රවේණි වංශය රක්නට සුදුසු දරු කෙණෙක් නැත්තාහ, ඒ කාරණයෙන් මූරගෑම්හ. තවද මහරජ නුඹ වහන්සේගේ ඇත්තේ එකබිසෝකෙණෙක, රජකුලෙහිනම් යටත්පිරිසෙයින්

සොළොස්දහසක් පුරඟනන් ඇති එසේහෙයින් මහරජ සත්‍රී සමූහයා ඇතිකළ මැනව ඉන් පින්වත් යම්කෙණෙක් දරුවන් ලබති කීහ. එපවත් අසා රජ්ජුරුවෝ තොපහැම් කුමක් කියව්ද, අනික්කෙණෙකුන් නොගෙණෙම්හයි ප්‍රතිඥා දී ගෙණවුත් දූන් බොරුකිය නොහැකි බැවින් සත්‍රීගණයාගෙන් අපට කම් නැතැයි කීහ. එපවත් අසා නුවර වැස්සෝ අනිකක් කිය නොහී පලාගියාහ. සුමෙධාදේවී එපවත් අසා රජ්ජුරුවෝතම් තමන් සත්‍යවාදී හෙයින් තමන්කළ ප්‍රතිඥාවට කැලලක් නොකෙරෙත් නමුත් මම වනාහී නාටක සත්‍රීන් ඇති කෙරෙම්යි රජ්ජුරුවන්ට මාතෘ සමානවූ අභ්‍යන්තරයෙහි සිටි තමන් රුචිවූ පරිද්දෙන් රාජ අඟනන් දහසක්ද ඇමතිඳුන් දහසක්ද සිටු අඟනන්ද චතුර්වර්ණ යෙන් නාටකසත්‍රීන් දහසක්දැයි සාරදහසක් ගෙණහැර රජගෙයි ලූහ. ඌද දසදහසක් අවුරුදු රජගෙයි වැස දූ පුත් කෙණෙකුන් නොලදහ. මෙම ක්‍රම යෙන් නැවත තුන්වාරයෙක සාරදහසක් සාරදහසක් බැගින් ගෙණන ලද්ද වූ සත්‍රීහු සොළොස් දහසක්වූ ඒ සොළොස්දෙනම එකී එකී කොටස් දසදහ සක් අවුරුදු නියායෙන් බිසවුන් හා එක්ව පණස්දහසක් අවුරුදු රජගෙයි වැස දූ පුත් කෙණෙකුන් නොලද්දූහ.

ඉක්බිති නුවර වැස්සෝ පෙරසේම එක්ව මහරජ නුඹවහන්සේගේ බිසෝවරු දරුවන් පතන්ට විධාන කළ මැනවැයි මුරගෑහ. රජ්ජුරුවෝද යහපතැයි ගිවිස එතැන්පටන් දරුවන් ප්‍රාර්ථනාකරවයි බිසෝවරුන්ට විධාන කළහ. ඒ බිසෝවරුද දරුවන් ප්‍රාර්ථනා කරන්නාහු තමන්ගේ නොයෙක් ඉෂ්ටදෙවතාවන්ට නමස්කාර කිරීමෙන්ද නොයෙක් ව්‍රත සමාදානයෙන් කිරී මෙන්ද දරුවන් පතන්ට පටන්ගත්හ. එසේද උපදනා දරුකෙණෙකුන් නැති හෙයින් රජ්ජුරුවෝ සුමෙධාදේවීන් කැඳවා සොඳුර තොපි දරුවන් ප්‍රාර්ථනා කරවයි කීහ බිසව්ද යහපතැයිගිවිස පණෙණරසි පොහොදවස් අෂ්ටාංගසමු පෙතවූ පෙහෙවස් ඉටාගෙණ ශ්‍රී යහන් ගබඩාවෙහි කැපවූ යහනෙක්හි ඉඳ තමන්ගේ ශීලය ආවර්ජනා කරන්ට පටන් ගත්තාය. සෙස්සෝ අජව්‍රත ගෝව්‍රත සමාදන්ව සඳුවෂාපරව ඌයනට පලාගියහ. ඉක්බිති සුමේධාදේවීන්ගේ ශීල තේජසින් ශක්‍රභවනය කම්පිත විය. ශක්‍රයෝ දහසක් නුවණැසින් බැලුවෝ සුමෙධාදේවීන් පුතුන්පතා ජේව උන් බව දැන උන්ට දරු කෙණෙකුන් දෙන මැනවයි එතකුදු උවත් එසේ මෙසේ දරුකෙණෙකුන් දෙන්ට බැරියයි සිතා සුදුසු දරුකෙණෙකුන් පරීක්ෂාකරන්නාහු නලකාර දිව්‍යපුත්‍රයා දුටහ. ඌද මහපින් ඇත්තාහ.

ඒ කෙසේද? යත්

පෙර ජාතියෙහි බරණැස් නුවර වසන්නාවූ කෙතකට යන්නාහු තෙමේ එක් පසේබුදු කෙණෙකුන්වහන්සේ දැක කම්කාර අය වපුරන්ට යැයුතු ව ළඟ පසේබුදුන් වහන්සේ ගෙට වඩා ගෙණ ගොස් වළඳවා පුතනුවන් හා සමග කථාකොට පසේබුදුන් වසන පිණිස දිඹුල්පා ඉඳුවා උනදඬු ඉරා ලංකොට බිත්ති බැඳ දෙරලීබාලා නවද සක්මනක් ඉදිකොට පසේබුදුන් වස්වසවා තුන් මසක් ශක්ති වූ පරිද්දෙන් දන්දී තුන්මස අන්තයෙහි තුන්සිව්රක් පිළිගන්වා යවූහ. මෙම ක්‍රමයෙන් සත්දවසෙක සත් පසේබුදුකෙණෙකුන්වහන්සේ ඒ පන්සල වස් වසවා තුන්සිවුරු දුන්හ. මෙසේ ඒ දෙපුතුපියෝ ආයු පමණින් සිට තව්තිසා දෙව්නුවර ඉපද අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සදෙව්ලොව සැපත් අනුභවකොට ඇවිදිනාහ. ඒ දේවතාවෝ එදවසට ආයු ගෙවී මත්තෙහි දිව්‍යලොකයට යන්ට සිටියාහ. ශක්‍රදේවේන්ද්‍රයෝ එපවත් දැන ඉන් එක් කෙණෙකුන්ගේ විමන්දෙරකඩට ගොස් සිටි කල්හි ඇවිත් වැඳලා සිටියවුන්ට

පින්වත්නී තොපි මනුෂ්‍යලෝකයට යාම වටනේය යි කීහ. එපවත් අසා මහ රජ මනුෂ්‍යලෝකය නම් ඉතා පිළිකුල මිනිස්ලොව සිටියාවූ දානාදීවූ පින්කම් කොට මේ දිව්‍යලෝකයෙහි උපනුම්හ. ඔබ ගොස් කුමක් කරමෝදැයි කීහ. එපවත් අසා ශක්‍රයෝ පින්වත්නි, දෙව්ලොව වින්ද යුතු සම්පත් මිනිස් ලොව වින්ද යුතු වෙයි. පස්විසි යොදුන් උස ඇති සත් රුවන් ප්‍රාසාදයෙහි වසව අසඞ්ඛ්‍යයක් අවුරුදු මහසම්පත් අනුභව කරවයි කීහ. එසේද යහපතැයි ගිවිස්සාහ. ශක්‍රයෝ උන් අතින් ප්‍රතිඥාගෙණ සෘෂි වේශයෙන් රාජෝද්‍යානයට ගොස් සත්‍රීන්ගේ මුදුනෙහි ආකාශයෙහි සක්මන් කරණ්නාහ. තමන් දක්වා කවර කෙණෙකුන්ට පුත්‍ර වරයක් දෙව්ද කවුරු දරුකෙණෙකුන් ගණ්ණුදැයි කීහ.

ඉක්බිති සත්‍රීහු සොළොස්දහසක්දෙන මැණික් වලල්ලෙන් සැරහුනු දෙතිස්දහසක් අත් එක පැහැර එසවූහ. ඉක්බිති ශක්‍රයෝ කියන්නාහු මම සිල්වත් කෙණෙකුන්ට දෙමි තොපගේ ශීලය කවරේද ආචාර කිම්දැයි කීහ. ඒ සත්‍රීහු ඔසවනලද අත් අකුලුවාගෙණ ඉදින් නුඹවහන්සේ සිල්වත් ගුණවත් කෙණෙකුන්ට දරුවන් දෙන්නා කැමතිසේක්වීනම් සුමේධා දේවීන්ට දුන මැනවැයි කීහ. එසඳ ශක්‍රයෝ ආකාශයෙන් ගොස් බිසවුන් වසන්නාවූ ප්‍රාසාදයෙහි සිවූ මැදුරු කවුළුව සමීපයෙහි අහස්හි සිටියාහ. එපවත් සුමේධාදේවීන්ට කීහ. බිසව්ද ආදර බහුමානයෙන් අවුදින් සැබෑද ස්වාමීනි නුඹවහන්සේ සිල්වත් කෙණෙකුන්ම දරුවන් දෙනසේක්දැයි විචාළාහ. ඉක්බිති ශක්‍රයෝ එසේය. තොපගේ ශීලගුණය කවරේදැයි විචාරා එසේවීනම් ඇසුවමැනවැයි තමන්ගේ ශීල ගුණය කියන්නාහු සෘෂින්වහන්ස මම සොළොස්දහසක් බිසෝවරුන්ට ප්‍රධානවන ලදුවද දසදහසක් අවුරුදු උදකලාව මේ සුරුචි රජහට අගමෙහෙසුන් තනතුරෙහි මේ රජගෙයි වසන් නෙම් කයින් වේවයි වචසින් වේවයි මනසින් වේවයි ඉස්ම නොපැවැත්තෙමි, මේ සත්‍ය වචනයෙන් දරුකෙණෙකුන් උපදින්වයි, තවද මාගේ ස්වාමිවූ මේ රජහුගේ මව්පිය දෙදෙන යම්තාක් ජීවත්ව උන්නාහුද ඒතාක් උන්ට සලකා රාත්‍රි දිවාභාගයෙහි අත්පා මෙහෙ කෙළෙමි, මේද එක් සත්‍යවචනයෙක. තවද සෘෂින්වහන්ස මේ රජහුගේ සොළොස්දහසක් බිසෝවරුන්ද එකියන ලද සම්පතනි සිතහැර සතුටුව බලන බව්මුත් එක් කෙණකුනුත් මට අප්‍රිය කෙණෙක් නැත්තාහුය. එසෙයින්ම උන්කෙරෙහි සම්පත්ති ඊර්ෂ්‍යා වේවයි කෝපයෙක් වේවයි කැලම නැති බව එක් සත්‍යවචනයෙක.

තවද සෘෂින් වහන්ස මගේ දැසිදස් ආදීන් කෙරෙහිද අනිකුත් වැටුප් වියදම් ලැබ ජීවත්වන්නාවූ සත්ත්වයන් කෙරෙහි මෛත්‍රීන් උන් පෝෂ්‍යතා පමණ මෙහෙවරයොදා හැම දවස්ම මොළොක් සිතින් ප්‍රිය චක්ෂුසින් බලා රකිමි. මේද එක් සත්‍ය වචනයෙක, තවද ශ්‍රමණයන් කෙරෙහිද සෙසු දුගී මගී යාචක යන් කෙරේද මෙකී සියල්ලවුන් කෙරෙහි මෙත් සිත් පතුරුවා කම්පලඅදනා හැම දවසක්ම ආහාරපාන වස්ත්‍රාදිය පිළිගන්වමින් සන්තර්පණ කෙරෙමි. මේද මාගේ එක් සත්‍යවචනයක. තවද සෘෂින්වහන්ස නිරන්තර වශයෙන් අඛණ්ඩ වූ පඤ්චශීලය රක්‍ෂා කරන්නෙම් මාස්පතා පක්‍ෂය සම්බන්ධි වූ තුදුස්වකද පසළොස්වකද සතවකද අටවකද පෑළවියද යන පොහෝදවස් නොවරදවා අෂ්ටාඞ්ගසමුපෙතවූ උපොසථශීලය මනාකොට රකිමි. මේද මාගේ එක් සත්‍ය වචනයෙක, මේ ආදීවූ නොයෙක් සත්‍ය වචනයෙන් මට මහපින් ඇති පුත්

රුවතක් උපදිතියි. ඉදින් වැඩිත් මෙයින් එකෙක් බොරුවීනම් මාගේ ඉස සත්කඩක්ව පැලීයේවයි ප්‍රතිඥකොට දරුවන් ඉල්වූහ. මේ ඒ බිසවුන් විසින් කියත්නම් තමන්නේ ගුණ මුඛ දහසකිනුත් කියා නිම්වාගත නොහැක්ක. එතකුදුළුවත් මෙවිතර කෙරෙමින් කියමින් සිටියදී ශක්‍රයෝ තමන්ගේ බොහෝ කෘත්‍ය කරණියන් ඇති හෙයින් උන්ගේ කථාසිත සැගී තොපගේ ගුණ ඉතා බලවතැයි වර්ණනා කරන්නාහු, මහත්වූ යසපිරිවරින් යුක්තවූ රජදුව මා සම්මුඛයෙහි යම්බඳුවූ තෝ ගුණයෙක් කීයෙහි වීනම් ඒ සෙයින් භද්‍රාව තොපට උභයකුල පරිශුඬවූ මහත්වූ යසපිරිවර ඇති කුලක්‍රමාගතවූ තොපගේ මේ ප්‍රවෙණි රජවංශය දිවුණක්ව රැකලන්ට සමත්වූ දීර්ඝායුෂ්ක පුත් රුවනෙක් උපදනේයයි පුත්‍රවර ප්‍රසාද දුන්හ. මෙසේ කියන ලද ක්‍රමයන්ගේ වචනය අසා ඒ බිසවී මහසොම්නසට පැමිණ උන්ගේවූ පරිදි විචාරන්නාහු අනංජන අමණ්ඩිතවූ සවරූප ඇති රජස්වගුල ඉසකේ හා සිරුරු ඇති නිරාලම්බනවූ ආකාශයෙහි වැඩසිටි මාගේ සිතට ඉතා ප්‍රියබස් කියන්නා වූ නුඹවහන්සේ දිව්‍යලෝකයෙන් ආවාවූ මහෙසාක්‍ය දෙවතාකෙණෙක්ද නැත. මහත්වූ සෘඬ්‍යානුභාව ඇති සෘෂිවරයානකෙණෙක්ද මෙතන පැමිණියාවූ නුඹ වහන්සේ කවුරුද මට එපවත් කිව මැනවැයි විචාළාහ.

එපවත් අසා ශක්‍රයෝ තමන්වූ පරිදි කියන්නාහු, රාජිණිය පන්සියයක් යොදුන් විවර උස ඇති සුධර්මා නම් දිව්‍ය සභාවට රැස්වතලද දේවතාවෝ යම් කෙණෙකුන්ට ආදරව වඳින්නම් ඒ සියලු දෙවියන් අතින් වැඳුම් ගන්නාවූ දහසක් නුවණැස් ඇති ශක්‍රදේවේන්ද්‍රයෝ නම් මමයයි කියා නැවත උන්ගේ ගුණ වර්ණනා කරන්නාහු, සුමෙධාව මේ සත්ත්ව ලෝකයෙහි යම් සත්‍රියක් නී කීවාසේම චාරත්‍රයෙන් පිරිසිදුවූ පැවතුම් ඇතිවේද නැදි මයිලන් දෙවියන්කොට සිතා සවාමියාහට පතිව්‍රතාවද තියුණු නුවණ ඇත්තීද එබඳු ගුණ ඇති මනුෂ්‍ය සත්‍රීන් දක්නා සඳහා අමානුසිකවූ මහෙශාක්‍ය දේවතාවෝ දැන් ආවෝ වේදැයි කියා තවද සුමෙධාව බොහෝ කාලයක් නිදුක් නිරෝගීව සුවපත්වන්නාවූ නී සතන්හි පුරුදු කරණ ලද උතුම්වූ ගුණයන් බොහෝ කලක් රක්‍ෂා කරන්නේ සොඳුර නී පූර්ව ජාතියෙහි පුරණ ලද සුචරිත බලයෙන්ම සියළු වස්තුකාම ක්ලෙශකාමයෙන් සමෘඬවූ උතුම් රජ කුලයෙහි උපන්නේය. එසේ හෙයින්ම මෙලෝ පරලෝ දෙක්හිම තොපි ජයග්‍රහණයක් ලබන්නෙහි මෙලොව මහත් යශෝ කීර්තියට පැමිණ මතු මේ සුචරිත බලයෙන් දිව්‍යලෝකයෙහි උපදනේ වේදැයි සොත්‍රකොට නී සේවූ උත්තමයන්ගේ දර්ශනය ඉතා ප්‍රියමය, එතකුදු වුවත් දිව්‍ය ලෝකයෙහි අපගේ බොහෝ කටයුතු ඇත, තෙපි අප්‍රමාදවවයි බිසවුන්ට අවවාදකොට තමාගේ දිව්‍යලෝකයට ගියේය. නලකාර දිව්‍ය පුත්‍රද චුතව අලුයම් වේලෙහි බිසවුන් කුස පිළිසිඳ ගත්තේය. ඒ බිසවී රජ්ජුරුවන්ට දැන කීහ.

මෙසේ දසඑකඩමසක් අවෑමෙන් පුතනු කෙණෙකුන් වැදූහ. ඒ කුමාර යන්ට මහාපනාද කුමාරයෝයයි නම් තුබූහ මියුළු බරණැස් දෙරට ඇත්තෝ අපගේ සවාමිපුත්‍රයානන්වහන්සේට කිරි මිළයයි එකී එකී කහවණුව රාජාඞගනයට දැමූහ. ධන ගොඩෙක්විය. රජ්ජුරුවෝ අපට නොකමැත්තේයයි ප්‍රතික්ෂෙප කළහ එතකුදු වුවත් ඔහුම වැඩුනු කල සවාමීහට නැසිය පිණිස වේවයි නොගෙණම සියරටට ගියාහ. ඒ කුමාරයෝද මහපෙරහරින් වැඩී සොළොස්හැවිරිදි වයසට පැමිණී සියලු ශිල්ප හෙවා ගත්ත. එකල සුරුචි රජ්ජුරුවෝ කුමාරයන් වයස්බලා බිසවුන් හා සමග

හඳුනාව අපගේ පුතනුවන් රාජාභිෂේකයට පමුණුවමනාකල රම්‍යවූ ප්‍රාසාදයක් කරවා අභිෂේක කරම්හයි කියා බිසවුන්ද ගිවිසිකල්හි වඩුවිද්‍යා ආචාරිවරුන් කැඳවා අපගේ මාලිගාවට නුදුරු තැන්හි ප්‍රාසාදයක් කරවයි කීහ. උන්ද යහපතැයි සුදුසු බිමක් පරීක්‍ෂාකරන්ට පටන්ගත්හ. ශක්‍රදේවේන්‍ද්‍රයෝ එපවත් දැන විශ්වකර්ම දිව්‍යපුත්‍රයා කැඳවා තෝ ගොස් මහාපනාදකුමාරයන්ට අයමින් විතරින් අඩ අඩ යොදුන් පමණ හා උසින් පස්විසි යොදුන් පමණ උස ඇති සත්රුවන්මය ප්‍රාසාදයක් මවා එවයි කියා යවූහ. එද වඩු ආචාරි වෙශයක් ගෙණ බිම බලමින් සිටි වඩුවන්කරා ගොස් තෙපි ඇම පෙරවරු බත්කාපියා එවයි කියා යවා තෙමේ රියන් දණ්ඩගෙණ බිමට ගැසීය. එකෙණෙහි උක්ත ප්‍රකාරවූ පස්විසියොදුන් උස ඇති සියක් මාල් ඇති දහසක් කුලුගෙවල් ඇති සත්රුවන්මය වේදිකා ඇති තමාගේ ආලෝකයෙන් සියලුදිග බබුලුවන්නාවූ බලන්නාවූ සත්ත්වයන්ගේ නෙත් සිත් පැහැර ගන්නාවූ සත්රුවන්මය ප්‍රාසාද යෙක් පහළ විය. මහාපනාද කුමාරයන්ට ප්‍රවේශ මගුල් අභිෂේක මගුල් එක්වම කළහ. ඒ මගුලෙහි දෙරට වැස්සෝ එක්ව මගුල් කරන්නාහු සත් හවුරුද්දක් යවූහ. රජ්ජුරුවෝත් උන් හැම නොම යවූහ. මෙතෙක් දෙනාට වස්ත්‍රාලංකාර කෑම්පිම් යන සියල්ලම රජගෙන්දුන්හ. මෙසේ සත්අවුරුද්දක් ඇවෑමෙන් උභයරාජ්‍යවාසීහු සවාමීනි මගුල්කරන්නාව අපට සත් අවුරුද්දක් නැගීගියේය. මගුල් සම්ප්‍රාප්තවන්නේ කවරදදැයි විචාළාහ.

ඉක්බිති රජ්ජුරුවෝ කුඩාවරුනි මෙතෙක්කල් මාගේදරුවන් සිනාසෙ වාගත නුහුනුවව. යම් දවසෙක සිපුද එද තොප තොපගේ රටට යවයි කීහ. ඉක්බිති මහජනයෝ නුවර බෙරලවා නළුවන් දසදහසක් රැස්කළහ. සත්සත් කොටසක් කොටසක්ව නොයෙක් ශෘංගාරය, කරුණාය, වීරය, අත්භූතය, භයානකය, හාස්‍යය, භයනරූපය, රුක්‍ෂ, ප්‍රාවතීයයි යන නව නෘත්‍ය ලක්‍ෂණයෙන් නෘත්‍ය දක්වන්නාහු මහාපනාද නම් රජහු සිනාසෙවාගත නුහුනු වූහ ඊට කාරණා කිම්ද? යත්. ඒ රජ්ජුරුවන් බොහෝ දවසක් දිව නළුවන් නැටීම දැක පුරුද්දන්ට මේ නැටීම් අප්‍රියයයි දතයුතුයි. එකල හඬුකණ්ණිය යන නෘත්‍යජ්‍යෙෂ්ඨයෝ දෙදෙනෙක් අපිම සිනාසෙම්හයි, බැහැවී රාජාඞගනයට ගොස් ඉන්ද්‍රජාලා පෙන්වයි ශ්‍රමණයන්ගේ අතුල නම් අඹගස සැටියට මවාපෑ එහි රුකවල්ගත් කුම්භාණ්ඩයන් සැටියට භයානකයන්ද මවා පෑ තෙමේ උන්ට සොරා යන එකකුසේ සෙමෙන් සෙමෙන් ගස මුලට ඇලීගොස් හූවටක් උඩදමා අත්තෙහි ඇඳා ඒ හුය ඔස්සේ නැගී අඹ කන්ට පටන්ගත. එකල රුකවල සිටි යක්‍ෂයෝ අල්වාගෙණ හස්තපාදදී අඟපසඟ සිඳදමූව.

එසඳ එහුගේ පිරිවර නළුවෝ මහත්වූ කම්පා ඇත්තාවුන්මෙන් ඒ කපා දමාපු අත් පා කන් නාසා කැබැලි එක තැන ගොඩකොට උපද්දවම්හයි පැන් ඉසළුහ. එකෙණෙහි ඒ තෙම මල් පටක් පෙරව නටමින් සිනාසෙමින් සිටියේය. එපවත් දැකත් මහාපනාද රජ්ජුරුවෝ සිනා නුහුනුවාහ. ඉක්බිති පඬුකණ්ණී නම් නාටකතෙම රාජාඞගනයෙහි මහත් දරසැයක් බැඳ රජ්ජුරුවන් සිනානොසෙනකල අපි ගිනිවැද මියම්හයි ගින්නට වැද ද සහපිරිවරින් ද ගියේය. එකල්හි අවශෙෂයෝ ඒ අලුගොඩ පැන් ඉසළුහ. එකල්හි පිරිවර හා සමග මල්පට හැඳ පෙරව නටමින් ගී කියමින් සිනාසෙමින් නැගී සිටියාහ. එකල රජ්ජුරුවෝ සිනා නුහුනුවාහ. එකල ශක්‍ර දේවේන්‍ද්‍රයෝ රජ්ජුරුවන් සිනාසෙවීය නොහී මනුෂ්‍යයන් විදිනා වෙහෙස කියා රජ්ජුරුවන් සිනාසෙවලා එවයි දිව නළුවකු යවූහ. එද ගොස්

රාජාඞ්ගනයෙහි අර්ධරඞ්ග නම් නෘත්‍යයක් දක්වියහ. ඒ කෙසේද? යත්. ශරීර යෙහි එක් අංශයෙක එක් අතෙක එක් ඇලයෙක එක්තනයෙක එක් ඇසෙක ‍ එක් බැමයෙක නලළින් සමාරෙකැයි ශරීරාඞ්ගයෙන් නටන්නේය. සෙස්ස නිශ්චලව සිටිනේය. මේ නෘත්‍ය දක රජ්ජුරුවෝ මඳක් සිපිහ. අවශෙෂයෝ තම තමන් බව නොදන රාජාඞ්ගනයෙහි සිනායෙන් වැතිර ගියාහ, එකල්හි මගුලද සමාප්ත විය. මෙසේ ඒ මහාපනාද රජ්ජුරුවෝ අසඞ්ඛ්‍යයක් අවුරුදු මුලුල්ලෙහි ඒ පස්විසියොදුන් උස ඇති සත්රුවන් ප්‍රාසාදයෙහි දිව්‍ය ශ්‍රී හා නොවෙනස්වූ රාජසම්පත් අනුභවකොට දනාදීවූ පින්කම්කොට ආයුපමණින් ගොස් දිව්‍ය ලෝකයෙහි උපන්නාහුයයි, බුදුහු සුරුචි ජාතකය ගෙණහැර දක්වා දන්මතු නොවෙයි මහණෙනි පෙරත් මා සමීපයෙන් විශාඛාව වර ලද්දීයයි පූර්වාපරසන්ධි ගලපා නිමවා වදාරා එකල්හි මහාපනාද රජ්ජුරුවෝ නම් දන් භද්දිය ස්ථවිරයෝය. එකල්හි සුමෙධා දේවිය නම් දන් විශාඛා මහ උපාසිකාවෝය. එසමයෙහි ප්‍රාසාදය නිර්මාණය කළ විශ්වකර්ම දිව්‍යපුත්‍රයා නම් දන් ලොවුතුරා බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා මේ සුරුචි ජාතක ධර්ම දෙශනාව මුදුන් කුළුගන්වා වදාළසේක.

482
පංචුපොසථ ජාතකය

තිවද අතීත අනාගත වර්තමාන ආධ්‍යාත්මික බාහ්‍ය ඖදාරික ස්ථූල සූක්ෂම හීන ප්‍රණීතදූර සන්තිකාදී සියලු ධර්ම සමූහයන් තමන්වහන්සේගේ අසාධාරණ ප්‍රඥාවෙන් සර්වප්‍රකාරයෙන් පිරිසිඳ දන්නාවූ සර්වඥයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසනසේක් එක් දවසක් පෙහෙවස් විසූ පන්සියක් උපාසකවරුන් අරභයා මේ පංචුපොසථ ජාතකය දෙශනාකොට වදාළසේක.

ඒ කෙසෙ ද? යත්,

එක් දවසක් බුදුහු උතුම් දම්සභායෙහි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාදීවූ සිවුවණක් පර්ෂද්මධ්‍යයෙහි පණවනලද අලංකෘතවූ බුඞාසන මස්තකයෙහි උදගිරි මුදුනෙහි බබලන්නාවූ තරුණ සූර්‍ය මණ්ඩලය සෙයින් දිළිහි දිළිහි ෂඩ්වර්ණ බුදුරැස් විහිදුවමින් වැඩහිඳ මොළොක්වූ සිතින් සිවුවණක් පර්ෂද් බලා වදාරා අද උපාසකවරුන් අරභයා ධර්මදේශනාවෙක් උපදනේයයි දන සිවුදැගඳින් පිරුණු සුවඳ කරඬුවක් හරණකලක් පරිද්දෙන් බැණ නැගී බස හා සමගම සියලු දම්සභාව මුඛ සුගන්ධයෙන් එක සුගන්ධ කෙරෙමින් උපාසකවරුන් බණවා කිමෙක්ද උපාසකවරුනි පෙහෙවූයේ ඇද්දැයි වදාළසේක. ඔහුද එසේය ස්වාමීනි දන්වූහ. එසඳ බුදුහු උපාසකවරුනි නොප ඇම විසින් කරණ ලද්දේ පුරාතනයෙහි පණ්ඩිතවරුන්ගේ සිරිතෙක්මය. ඒ පුරාතන පණ්ඩිතයෝද රාගාදී කෙලශයන්ගේ නිග්‍රහ පිණිස පෙහෙවස් විසුවෝවේදැයි වදාරා නැවත උපාසකවරුන් විසින් ආරාධිතවූ බුදුහු භස්ම ප්‍රච්ඡන්නවූ ජාත වෙදයක් ගෙණහැර පානාකලක්මෙන් භව ප්‍රච්ඡන්නවූ ඉකුත්වත් කථාව ගෙණ පානාසේක් උපාසකවරුණි,

පෙරටගිය දවස කසී කොසොල් මගධයයි යන රට තුනට මධ්‍යයෙහි මහ වනයෙක්විය. එකල පුරණළු සමතිස් පෙරුම් ඇති මහබෝධිසත්වයෝ මගධ රට බමුණු මහසල් කුලයෙක ඉපද වැඩිවිය පැමිණ වස්තුකාම ක්ලේශකාමයන් හැර ගිහිගෙන් නික්ම ඒ අඩවියට පැමිණ මහණව පන්සල්කොටගෙණ වසන්නාහුය. ඒ ආශ්‍රමයට නුදුරු තැන්හි එක් උණපඳුරෙක තම අඹුව හා සමඟ එක් පරවියෙක් වසන්නේය. තවද ආසන්නවූ එක් තුඹසෙක සර්ප රාජයෙක් වසන්නේය. තවද එම්තැනට ආසන්න වනලැහැබෙක කැණහිලෙක් වසන්නේය. තවද එතනම වනලැහැබෙක වලසෙක් වසන්නේය. මෙකී සතර දෙන කලින්කලට සෘෂිහුකරා එළඹ බණ කථා අසන්නාහු ඉක්බිති එක් දවසක් පරවි අඹුව හා සමග කසල්ලෙන් නික්ම ගොදුරු පිණිස යන්නාහු පස්සෙහි නික්මුණු පරවි ධෙනුව එක් උකුස්සෙක් ගසාගෙණ පළා ගියේය. ඈ අඬන අඬ අසා පරෙවියා නැවත ආපසු බැලුව උකුස්සා ගසාගත් බව දිට, ඒ උකුසුද අඹව අඬවාම ගෙණ ගොස් මරා කාපීය. ඒ පරවිද ඈ කෙරෙහි වියෝගයෙන්ද රාග නැමැති ග්‍රීෂ්මයෙන්ද මඩනා ලද්දේය. මේ රාගචෙතනාව තෙම අතිශයින් මිරිකන්ටවන. එසේ හෙයින් මූත්ට නිග්‍රහකොට ගොදුරට නොයමි සිතා ගොදුරු බිම හැර තාපසයන්කරා ගොස් රාග චෙතනාවට නිග්‍රහකරණු පිණිස පෙහෙවස් සමාදන්ව එකත්පසෙක ඔත්තේය. සර්පජනයා ගොදුරු සඳහා නික්ම පසල්ගමකට ගොස් ගෙරි තණකන බිමෙක ගොදුරු සොයා ඇවිදිනේය. එකල ගම්දෙටුවාගේ සර්වාඞ්ගයෙන් සුදුවූ මගුල් ගොණෙක් තණ කා එක් තුඹසෙක් මුල දන ඇන තුඹස අග අංමිටගාමින් කෙළනේය.

එසඳ ගොදුරු සොයමින් සිටි සර්පද ගෙරිගේ කකුල් ගැස්ම අසා තුඹසට ගොස් වදිමියි හයින් දුවන්නාවූ ගොණා පයින් මැඩපීය. ඒ සර්පද කිපී දෂට කෙළේය. වෘෂභරාජයාද එතනම ජීවිතක්ෂයට පැමිණියේය. ගම් වැස්සෝද ගොණා මළ බව අසා එක් පැතිර අවුත් ඉස තිබූ අතින් මොරගා ගොණුට සුවඳින් මලින් පූජාකොට වළලා පළා ගියහ. සර්පයාද උන්හැම නික්මුණුසඳ තුඹසින් පිටත්ව මම ක්‍රොධය නිසා මොහු ජීවිතයෙන් තොරකට මෙතෙක් දෙනාගේ ලෙයි ශෝකකෙළෙමි. දූත් වනාහි මේ ක්‍රොධය නිග්‍රහ නොකොට ගොදුරු නොකම් සිතා වැළකම එම ආශ්‍රම ප්‍රදෙශයට ගොස් ක්‍රොධයට නිග්‍රහ පිණිස පෙහෙවස් රැක එකත්පසෙක ඔත්තේය. කැණහිලාද ගොදුරු සොයමින් ගොස් වැදහොත් එක ඇතකු දැක මා විසින් නැතත් දවසකට ගොදුරු ලබන ලදැයි සතුටුව ගොස් සොඬ ඩැහැලිය එසඳ ස්ථම්භයක් ඩැහැලූකලක්මෙන් ආයාස විය. ඉන් ආශ්වාදයක් නොලැබ ඇතුගේ දළ මොලොක්දෝහෝයි දළ ඩැහැලීය. ගලක් ඩැහැලූකලක්මෙන් මහත් ආයාසවීය. ඉනුත් ආස්වාදයක් නොලැබීමෙන් යටිබඩ ඩැලීය. සැළිපල්ලක් ඩැලූකලක්මෙන් විය. ඉනුත් ආසවාදයක් නොලදින් නගුට ඩැලීය. සිවල්පල්ලක් ඩැලූකලක්මෙන් විය. ඉක්බිති ගොස් වර්චස් මාර්ගය ඩැලීය. එතන තෙල් කැවුමක් ඩැලූකලක්මෙන් මොළොක්ව වැටහින. එසඳ කැණහිලා සතුටුව ගොචර ස්නෙහයෙන් වර්චස් මාර්ගය ඔස්සේ කාගෙණ ගොස් ඇතුළු කුසට වන. මෙසේම ඒ තෙම ගෙයක් ඇතුළටවන් එකෙකු පරිද්දෙන් සකල මස් අනුහව කෙරෙමින් පිපාස කාලයෙහි ලේ බොමින් වැදෙනාකල අක්මා පපු අතුරහිඳ වැදහෙව එතෙම සිතන්නේ මට කෑම්පීමුත් මෙහිම ඇත. වැදෙනා තැනුත් මෙතනම ඇත, එහෙයින් ඔබට

ගොස් කුමක් කෙරෙම්දැයි එහිම ඇලී පිටත් නොහීම ඇතුළුකුස වසන්නේය මෙසේ කල්යාමෙකින් අවු සුළඟින් ඇත්කුණ වියලීගොස් පළමු කාගෙණවත් පුරුෂ මාර්ගය ඇස්වී ගියේය. එකල්හි කැණහිල් ඇතුළු කුසින් පිටතට මා නොදැක වෙහෙස විඳිනේ ශරීරයෙහි ලේ මස් නැතිව සුදුවගියාවූ ශරීර ඇතිව ශෝකයෙන් අතුරුවිය. ඉක්බිති එක්දවසක් නොකල් මහ මේඝයක් වටුයේය. එසඳ ඇත් කුණ තෙමී මොළොක්ව ගිය කල්හි පුරුෂ මාර්ගය මඳක් සිදුරු පෙණිත. කැණහිලාද ඒ සිදුරු දැක ඉතා බොහෝ කලක් යන්ට මං නො දැක වෙහෙසී උන්නේ සිදුර දකිමින් පලායෙමි සිතා එතනට ඉස දික්කොට ඉතා හැකිව තිබෙන්නාවූ සිරගෙන් අසුවූ එකෙකු වහා දිවන්ට කරණ උත්සාහය මෙන් යුහුව යත තැනැත්තහුගේ ශරීරයෙහි සියලු ලොම් ඒ පුරුෂ මාර්ගයට ම ඇරීගොස් තල් කඳක් මෙන් ලොම් නැති ශරීර ඇතිව නික්ම ඇත්රෝග ඇති ලොම් වැහැරගිය වසුපැටවකුසේම දුකින් ඇත් කුසින් නික්ම ඒ තෙම ලොභය නිසාය මට මේසා දුකක් පැමිණියේයයි සිතා ඉදින් මා ලොභයට නිග්‍රහ කළ මැනවැයි සිතා මාගේ පුරුදු තපස්වීන්ගේ ආශ්‍රමයට යෙමිය් ගොස් පෙහෙවස් සමාදන්ව එකත්පසෙක ඔත්තේය.

වලස්ද ගොදුරු සඳහා වනයෙන් නික්ම නවද ඉතා ගොදුරෙහි ලොභ වැළකිය නොහී මලය රට පසල් ගමකට අවුත් වන, ගම්වැස්සෝද කොල වල සෙක් ආවැයි දුනු තෙප් මුගුරුගෙණ ඔහු ගිය ලැහැබ වටකොට සිට ගත්තාහ. ඒ තෙම මහජනයා විසින් තමා නොයා දෙන පිණිස පිරිවැරූ බව දැක එක් අසකින් අවුර ඉරාගෙණ දිවන්නාහු ලුහුබැඳ දුනු දඬු ආදියෙන් තල තලා පස් සෙහි දිවනට වන්හ. ඒ තෙම පැලගස ඉසන් වැහෙනනාවූ ලෙහෙයෙන් තමා වසනතෙනට ගොස් මේ භය මට අතිජනතාව හේතුකොට ගෙණ පැමිණියේය. දැන් මා විසින් ඊට නිග්‍රහ කළ මැනවැයි ගොදුරු නොගෙණම ආශ්‍රමයට ගොස් පෙහෙවගෙණ එකත්පස්සව ඔත්තේය. ඒ තපස්වීද ජාතිමානයෙන් ධ්‍යාන උපදවාගත නොහෙන්නාහ, එකල්හි එක් පසේබුදුකෙණෙකුන් වහන් සේ සත්වානුග්‍රහය පිණිස ලොව බලන්නාහු ඒ මහබෝසත්හු අභිමානයෙන් වසඟව වසන බව දැන මේ මහා පුරුෂ තෙම එසේ මෙසේ ලාමක සත්ත්වයෙකු නොවෙයි, බුද්ධාංකුරයෙක ඉතුත් මෙම කල්පයෙහි ලොව්තුරා බුදු වන්නේය. එසේ හෙයින් මොහු අභිමාන නිග්‍රහකොට අභිඥා සමාපත්ති උපදවන ලෙසක් කෙරෙමයි, ඒ තපස්වී පන්සල ඉඳ උත්තර හිමවත් පසින් අවුත ඒ තපස්වීහු ඉඳිනා හල් අස්න මත්තේ වැඩඋන්නාහ. ඒ තපස්වීහුදු පනසලින් නික්ම. පසේබුදුන් තමන් හිඳිනා අස්නෙ හිඳිනා දැක තමන් ජාතිමාන බැවින් නො සතුටුව සමීපයට එළඹ අසුරගසා මුඹුවූ කාලකණ්ණිවූ චණ්ඩාලශ්‍රමණය කුමක් පිණිස මාගේ අස්නෙහි උන්නෙහිදැයි කීය.

ඉක්බිති පසේබුදුහු ඔහට සත්පුරුෂය, කුමක් සඳහා මානනිශ්‍රිතවීද? මමද එම්බා ප්‍රතිවෙධ කරණලද ප්‍රත්‍යෙක සම්‍යක්සම්බොධි ඥානය ඇත්තෙම්. තෙපද, මෙම කල්පයෙහි සියල්ලගෙවා දත්තාවූ ලොවුතුරා බුදුවන බුද්ධාංකුර කෙණෙකුව සමතිස් පෙරුම්පුරා වැටී ඇගේ ඇවිල දිලෙන්නාවූ පහන් සිලක් මෙන් මුදුන් පත්වූ පාරමීධර්මයන් ඇත්තව, මෙතැනපටන් මෙපමණ කලක් ඉක්මුණුකල බුදුවන්නාවූ තොපගේ බුදුවන අත්බැව් සිද්ධාර්ථ කුමාරයයි ක්‍රියා නාමගොත්‍රව උපදිනා කුලයද අග්‍ර ශ්‍රාවක ශ්‍රාවිකා උපස්ථායික ශ්‍රාවක සන්නිපතා දීවූ සියල්ලම විවරණදෙන ලොවුතුරා බුදුකෙණෙකු මෙන් වදෑරා පින්වත්නි, කුමක් සඳහා මත්වී තද ඵරුෂයෙහිද ඒ තෙම තොප වැත්තන්ට නුසුදුසුයය

අවවාද දුන්හ. මෙසේ කියතුත් උත්වහන්සේට වැඳීමක් කළෙත් නැත, මම කවරදා බුදුවෙම්දැයි විචාළේත් නැත්තේය. ඉක්බිති පසේබුදුහු පිත්වත තාගේ ජාති විශෙෂය හෝ මාගේ ගුණ මහත්තත්වය හෝ විභාග මින් දැනගත ඉදින් තෝ සපත්වූයේ වී නම් ආකාශයෙහි අපසේම ඇවිද බලවයි ආකාශයට නැගී තමන් ශ්‍රීපාද ධූවිලි ඒ තවුසානන්ගේ ජටා මඩුල්ලෙහි විසුරුවමින් පස්වණක් වලාපන්ති මිරිකාගෙණ හිමවතටම වැඩපිහ. ඒ පසේබුදුන් වැඩිකල තපස්වීහු මහත් සංවේගයට පැමිණ මේ මහණ මේසා මහත් බරවූ ශරීර ඇත්තේ පවත් මුඛයට දැමූ පුලුන්පෙදක් සෙයින් අහසට නැගී ගමත්ගත. මම එතාහි මාගේ නිෂ්කෘෂටවූ ජාතිමානයෙන් ඊතියා පසේබුදුන්ගේ ශ්‍රීපාදය වැඳගත නුහුනු යෙමි. කවර දවසෙක බුදුවෙම්දැයි විචාරාගත නුහුනුයෙමි. ජාතිය නම් තමා සත්ත්වයන්ට කුමක් කොටගතහේද මේ ලෝකයෙහි ශීල සංවරයම ඉතා ශ්‍රෙෂ්ඨ දෙයෙක්වන අතෝ මේ මාගේ අභිමානය වතාඟ් ඉදින් පළමුසේම වර්ධනය කෙළෙම් නම් මා නරකයෙහි එලාමූත් නොහරණේය.

එසේ හෙයින් ඉතිබ්බ මේ අතාර්ථාවහවූ අභිමානනිග්‍රහය කොට කිසුනු පිරියම් කොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා මිස නොනැගිටිම්යි පන්සලට වැද මාන නිග්‍රහ පිණිස පේව දඹුමැස්ස මත්තේ හිඳ මහ පිණැති විශිෂ්ටවූ නුවණ ඇති ඒ කුලපුත්‍රයානෝ මානනිග්‍රහ කොට කසිනුපිරියම් කෙරෙමින පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවාගෙණ පන්සලින් නික්ම සක්මන් මලූ කෙළ වර ගල් අස්න මත්තෙහි දෙසණ ඔජ නැගු දෑරගමැණිකක් සෙයින් වැඩ උන්හ. ඉක්බිති පරවියා ආදීවූ සතරදෙන සමීපයට එළඹ වැඳ එකත්පසෙක උන්නාහ. ඉක්බිති බොධිසත්ත්වයෝ පරවියාට කියන්නාහු සබඳ, මෙතෙක් දවස් තෝ මේ වෙලාවට ගොදුරු සොයත පමණක්මුත් මෙතනට නො ආවිරුයෙහිය ඇයිද පේවීදැයි විචාළාහ. එසේය, සවාමීනි, ඔහු විසින් කීකල ඉක්බිති බොධිසත්ත්වයෝ ආකාශචාරීවූ පරෙවියානෙනි, තෙපි මෙතෙක් දවස්සේම අද ගොදුරෙහි ඇලය නැතිව සාපිපාස දෙක ඉවසා පේවූවාහ, කවර අරමුණක් දැක පෙහෙවූදැයි විචාළාහ. එපවත් අසා පරෙවිතෙම තමාගේ පෙහෙවස් කරන්නාවූ කාරණා කියන්නේ සවාමීනි, මම පෙර මාගේ පරෙවි ධෙනුව හා සමග මේ වන ප්‍රදෙශ යෙහි කාමරති සන්තුෂ්ටයෙන් සිත් අලවා වසන්නාවූ ඒ මාගේ ප්‍රිය භාර්යාව මා නොකැමැත්සේ උකුස්සෙක් ගසාගෙණ කෑයේය. දූත් මම ඈ කෙරේ වියොග ශොකයෙන් මඩනා ලද්දෙන් සිත් කලුවූ රාග චෙතනාවෙන් පෙළෙමි. ඒ කාරණ යෙන දුඃඛදායකවූ රාගචෙතනාව නැවත තමා කරා නේවයි ඒ රාගචෙතනාවට නිග්‍රහකරණ පිණිස පෙහෙවස් කරන්නෙම් කීයේය.

මෙසේ පරෙවියා විසින් තමාගේ උපොසථාඞ්ගය සමාදානවූ කාරණා කී කල්හි ඉක්බිති බොධිසත්ත්වයෝ සර්පයා විචාරන්නාහු දෙදිවූ ඇති දළම ආයුධ කොට ඇති ඝොරවිෂ ඇත්තාවූ සර්පයා සාපිපාස සහනය කොට කවර අරමුණක් නිසා පෙහෙවීදැයි විචාළාහ.හෙද තමාපෙහෙවූ කාරණාකියන්නේ තපස්වීනි,එක් ගම්වැසි පුරුෂයක්හුගේ සවි ඇඟින් සුදුවූ ගමන් යනකල වෙව්ලන්නාවූ මොල් ලියක් ඇති මනොඥවූ අන්දෙකක් ඇත් ශක්තිසම්පන්න වෘෂභ රාජයෙක් තාමාගේ පයින් මා මිරිකාපිය. එසඳ අපිදු වහා කිපෙනසුළු ජාතියක් හෙයින් දිලිහි දිලිහී ඩැපීමි. ඒ විෂවේගයෙන් මඩනාලද්දේ එතනම මළේය. ඉක්බිති මහ ජනයෝ ඔහු මළ බව දැන අවුදින් හඬා වැලපු සුවඳින් මලින් පූජාකොට වළලා පස්වසාලා පළාගියාහ. ඒ කාරණය හේතුකොටගෙණ මෙතෙක් දෙනාගේ ලෙයි

ශොකය අටගත්තේ මාගේ ක්‍රොධය මුල්කොට වේදැයි ඒ ක්‍රොධයට නිග්‍රහ පිණිස පේවිම්කීය. ඉක්බිති බොධිසත්ත්වයෝ කැණහිලා අතින් විචාරන්නාහු සබඳ, අමුසොංහොත්වූ තමා සිත්කලුවූ මල මස් බොහොම තිබැදී ගෝචර අපෙක්‍ෂාවක් නැතිව පෙහෙවූයේ කවර කාරණයකින්දැයි විචාළාහ. එද තත්වූ පරිද්දෙන් කියන්නේ මම අමුසොංහොතෙහි සුලභ ගොදුරු ඇත මහත්වූ ලොභ යෙන් ගොදුරු සොයා ඇවිදිනෙම් එක් මහත්වූ ඇත් මිනියක් දැක සෙසු ඩැලිය හැකි තෙනක් නැති හෙයින් පුරුෂ මාර්ගීය ඔස්සේ කාගෙණ ගොස් ගිජුව ඇතු ළෙහි විසීමි. පසුව කල්යාමකින් තදවූ අව් සුලඟින් ඇත්කුණ වියලීගොස් වත් මග අස්වී අඳුරු ගබඩාවක ලා යතුරු ලූවාසේ මහත් ශොකයෙන් කෑ කැවිලි ඇඟ නොඇලී දිරා ජරාපත්ව නැවත කල්යාමකින් මහ වැස්සක් වැස ඇත්කුණ මඳක් පොඟාගිය කල්හි පළමු කා ගිය මාර්ගයෙහි සිදුරක් දැක මහත්වූ ආයාස යෙන් රාහු මුඛයෙන් ගැලවී ගිය සඳක්සේ පිටත්ව ආමි, පළමු ඇත්කුණෙහි මාගේ සිත තරයේම ඇලීත දූත් මා එහිම නොඇලුනද මා ශරීරයෙහි ලෝමයෝ එහිම ඇලී ගියහ. දූත් නිර්ලෝමවූ ශරීරයෙන් මහත්වූ විප්‍රකාරයට පැමිණිබව බැලූව මැනව මේසා දුකක් මට පැමිණියේ ලොභය නිසාවේදැයි ඊට නිග්‍රහ පිණිස පේව රකිම් කීය. ඉක්බිති බෝධිසත්වයෝ මඳක් අසල උන් වලසා විචාරන්නාහු සබඳ තෝ පෙර ලොවට තුඹස්දළුවේදී අහස්මි අනුභවකොට ඇවිදිනෙහි දූත් ගොචර ස්නෙහයක් නැතිව කුමක්නිසා පෙහෙව්දැයි විචාළාහ. එද තමා පෙහෙවූ පරිදි කියන්නේ, මම පෙර වසන්නාවූ වන ලැහැබ ගොදුරු මදැයි නිත්ද කොට අත්‍රිච්ඡාවෙන් මලයරට පසල්ගමකට ගොස් ගොදුරු සොයා ඇවිදිමින් සිටියෙමි. එකල්හි ගම්වැස්සෝ වටකොටගෙණ කැටිවාංචා මුගුරුවලින් තැලූහ. මම බිඳීගිය ඉසින් වැහෙන්නාවූ ලෙහෙයෙන් රැඳීගිය ශරීර ඇතිව නැවත මා පෙර විසූ වලටම අවුත් ඉඳබලා මෙසේ දුකක් මට පැමිණියේ අත්‍රිච්ඡතාම පිණිස වේදැයි ඊට නිග්‍රහකරණ පිණිස පෙහෙවස් රකිම් කීයේය.

මෙසේ මහබොධිසත්ත්වයන් විසින් විචාරණලද ඔහු සතරදෙනම තමන් ගේ පෙහෙවස් වර්ණනා කොට නැඟීසිට බොධිසත්ත්වයන් වැඳ ස්වාමීනි, නුඹ වහන්සේ මේ වේලාවටසෙසු ඵලාඵල අදහා යතසේක. අද නොඑසේව පෙහෙවූ සේක. ඊට කාරණා කිම්දැයි විචාළාහ. බොධිසත්ත්වයෝ උන් හැමදෙනාට තත්ත්ව වශයෙන් කියන්නාහු, එම්බා පින්වත්නි, සියළු කෙලෙසුන් නසා පසේ බුදුවූ මහොත්තමයෙක් අවුත් මේ ගල්පෝරුව මත්තෙහි වැඩහිඳ මා ගිය දවස පිරූ පාරමිතාධර්මයන්ද එත දවස වන්නාවූ නාමගොත්‍රයන්ද තවද පසක්කරන් නාවූ නවලොව්තුරා දහම්ද මේයයි විභාගකොට දෙශනා කෙළේය.

මෙසේ චිත්‍රකපිකවූ ඔහුගේ ශ්‍රීපාදය ජාතිමානයෙන් නො වැන්දෙමි. එසේ හෙයින් මෙබඳුවූ අපායමාර්ගයට පමුණුවන්නාවූ අනර්ථාහවූ අභිමානය නැවත මා කරා නොඑවයි ඒ මාන නිග්‍රහකරණ පිණිස පෙහෙවස් රකිමි, වදාළ සේක. මෙසේ උපාසකවරුනි, ඒ ශ්‍රී මහාබොධිසත්ත්වයෝ තමන් පෙහෙවූ කාරණාව වදාරා ඒ සතර දෙනාට අවවාදකොට උන් වසන තෙනට යවා පන් සලට වන්හ. ඉතිරියෝද කලින්කල අවුදින් මහබෝසත්හු වැඳ බණ අසා අවවාදවූ පරිද්දෙන් පිළිපදනාහ. මහබෝධිසත්ත්වයෝද නොපිරිහුණු ධ්‍යාන යෙන් බඹලොව වැඩියාහ. අවශෙෂවූ සතරදෙන බොධිසත්ත්වයන්ගේ අවවාද

යෙහි පිහිටා ස්වර්ග ලෝකයට ගියාහයි යනාදීන් බුදුහු මේ පංචුපොසථ ජාතකය ගෙණහැර දක්වා වදාරා උපාසකවරුනි පෙහෙවස් විසීම නම් පුරාතන ප්‍රඥවර යන්ගේ වංශයෙක් වේදැයි වදාරා පූර්වාපරසන්ධිගලපා උපාසකවරුනි, එකල පරෙවියා නම් දූත් දිවස් ඇත්තන් කෙරෙහි අග්‍රවූ අනුරුද්ධ ස්ථවිරයෝය. එසමයෙහි වලසා නම් දූත් මාගේ ශාසනයෙහි අනුබුද්ධ මහාකාශ්‍යප ස්ථවිර යෝය. එසමයෙහි කැණහිලා නම් දූත් මුගලන් මහතෙරහුය. එකල සර්පරාජයා නම් දූත් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි තවුසානෝ නම් දූත් ලොව්තුරා බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

483
මහා මයූර ජාතකය

තවද නානාප්‍රකාරවූ ධාතු ආයතන ප්‍රතීත්‍ය සමුත්පාද අභිධර්ම නිරුත්ති ප්‍රතිභාන ශීල සමාධි ප්‍රඥාවිමුක්ති විමුක්ති ඥාන දර්ශනාදිවූ අනෙකප්‍රකාරවූ ඥානගතිඇති සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජෝත්තමයානන් වහන්සේ එක්සමයෙක්හි ජේතවනාරාමයෙහි මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා යන සතර බ්‍රහ්මවිහරණයෙන් දවස් යවනසේක් ශාසනයෙහි උකටලීවූ භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ මහාමෝර ජාතකය දෙශනාකොට වදාළසේක.

ඒ කෙසේද? යත්

එක් සත්‍රියක් දැක සුභ නිමිත්ත ග්‍රහවශයෙන් බලා ලොභ උපදවා ශාසන යෙහි කලකිරී වත්පිළිවෙත්හි නිරපෙක්ෂවූ එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ නොකමැතිසේම බුදුන් කරා ගෙණගිය කල්හි බුදුහු මහණ නා උකටලීවූයේ සැබෑදැයි විචාරා සැබව ස්වාමීනි යි දූන්වූකල්හි මහණෙනි, තණ්හාරාගයනම් තොප බඳු ලඝු සත්ත්වයන් කෙසේ නම් නොපෙළාද? මහමෙර උපුටුවා පියන තරම්වූ යුගාන්ත වතපඩරාපත් නම් කුමට වළකීද? ඊට දෘෂ්ටාන්තර කවරේද? යත් පෙර සත්සියයක් අවුරුදු මුලුල්ලෙහි ක්ලෙශයන් අභ්‍යන්තරයෙහි සඟවා විසූ සුද්ධ සත්ත්වයන් පවා මේ ක්ලෙශයජේම අල්ලාපුයෙහිවේදැයි වදාරා ඒ භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

මහණෙනි,

යිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි පිරුපාරමිතා ඇති බෝධිසත්ත්වයෝ බරණැසට ප්‍රත්‍යන්ත ගමෙක මොණර කිකිළියක බඩ පිළිසඳගත්හ. ගැබිය මුහුකුරා ගිය කල්හි මැනියෝ ගොදුරු බිම බිජුවට ලා ගියාහ. මෙසේ උන නිරපෙක්ෂකව ගියද බිජුවට නම් මැනියන්ට සුවපත්ව උන්කල්හි නොනස්නා බව ධර්මතාවක් හෙයින් බිජුවට මුහුකුරා පැලීගියකල්හි රන්වන් මොණර පැටියෙක් පිටත්විය, ඔහුගේ දෑස මදට වැන්න තුඩ පබළුදළුවක් වැන්න. රත්රේඛා තුණෙන් ග්‍රීවාග්‍ර යෙහි සිසාරා පිට මස්සේ ගොස් වාලධිය කෙළවර දක්වා ගියේය. ඒ තෙම වැඩි විය පැමිණ මහගැල් සකක් සා පමණ ඇතිවිය එකල්හි සෙසු නිල්පැහැය ඇති මොණරු රැස්ව ඔහු රජකොට පිරිවැරූහ. ඒ තෙම එක් දවසක් පැන් වළකට ගොස් පොවා පැන් බොන්නේ දියෙන් තමාගේ රූපසම්පත්තිය දැක සිතන්නේ

මම සියලු මොණරුන්ට වඩා අධික රූපශොභා ඇත්තේය, ඉදින් මම මූන් හා එක්ව මනුෂ්‍යපථයෙහි වෙසෙත් නම් උපද්‍රවයෙක් වන්නේය. හිමාලය වනයට ගොස් පාසුතෙනක වෙසෙමි සිතා එතෙම එදවස් රාත්‍රියෙහි මොණරුන් ඇකිළ ගිය කල්හි කිසිවෙක්හටත් නොඅඟවා හිමාලයවනයට වැද පර්වත තුනක්ම හැර සතරවෙනි පර්වතයෙහි එක් වනයෙක්හි පියුම්විලේ ගැවසීගත් සයංජාත විලෙක් ඇත්තේය. ඒ විලට තුදුරුතැන්හි එක් ගල් පර්වතයක් නිසා පිහිටි මහ නුගගස අතුඅග සැඟවී ගියහ.

තවද එක් පර්වත භිත්තියෙක්හි උපන් පතින් කිසිකෙණෙක් නැඟී බැස්ස නොහැක්කාවූ සිත්කළුවූ ගල්ගුහායෙක්විය. බොධිසත්ව තෙම ඒ ගුහාභ්‍යන්තරයෙහි වසනු කැමතිව ඊට ප්‍රමුඛවූ පර්වත මුදුනෙහි සැඟවිත. ඒ ස්ථානය වනාහි බලලුන් සර්පයන් මනුෂ්‍යයන් ආදීවූ සියලු උපද්‍රවයෙන් ගැලවුනේය. බොධිසත්වයෝ මේ මට පාසුතැනෙකැයි සිතා සනිටුහන් කොට එදවස් පර්වත ගුහායෙන් නැඟී පර්වත මුදුණෙහි නැගෙණහිරට මූණලා හුන්නාවූ උදාකරන්නා හිරුමඬල දක තමන්ට දවල් ආරක්ෂාව පිණිස **උදේතයං චක්ඛුමා එකරාජා.** යනාදීන් පිරිත්කොට ගොදුරු බිමට බැස ගොදුරු අවුලාකා සවස අවුත් එම පර්වතමුදුනෙහි බටහිරට මූණලා උන්නාහු හසනාගිරි පර්වතයට යන්නාවූ හිරුමණ්ඩලය දක රාත්‍රියෙහි ආරක්ෂා පිණිස **අපෙතයං චක්ඛුමා එකරාජා.** යනාදීන් පිරිත්කොට මෙම ක්‍රමයෙන් ඒ ගුහාවේ වෙසෙති. ඉක්බිති එක් දවසක් එක් වැදිපුත්‍රයෙක් වල ඇවිදිනේ පර්වත මුදුනෙහි උන් නාවූ ඔහු දක තමා ගෙට අවුත් තමාගේ මරණාසන්නයෙහි පුතු සමීපයට කැඳවා සතරවැනි පර්වතය ගාවා වනයෙහි රන්වන් මොණරෙක් ඇත, ඉදින් රජ්ජුරුවෝ එබඳු මොණරකු විචාළෝනම් කියා ලවයි පුතාට කියා මෙළේය.

ඉක්බිති එක් දවසක් බරණැස් රජහුගේ ඛෙමා නම් අගමෙහෙසුන් බිසව් අලුයම් වේලෙහි සීනෙන් රන්වන් මොණරාන කෙණෙකුන් ධර්මදෙශනා කරන්නාද තමන් සාධුකාරදිදී බණ අසන්නාද දක නැවත නැඟීසිට යන නියාව දක රන්වන් මයුර රජ්ජුරු කෙණෙකුන් යන්නාහු අල්ලවයි කියමින් පිබිද එවිට සවප්නය නියාව දත ඉදින් සිනයක් දිටිමි, කීම්නම් රජ්ජුරුවෝ වැඩි ආදරයක් කරන්නාහු නොවෙති. ඉදින් දෙළගතිමි කිවහොත් සෙවාත්සාහ වන්නාහයි සිතා දෙළගෙණ ඔත්හ. ඉක්බිති රජ්ජුරුවෝ සමීපයට එළඹ සොඳුර, අපාසු කිම්දැයි විචාළාහ මහරජ රන්වන් මොණරාන කෙණෙකුගෙන් බණ අසන්නා කැමැත්තෙමි කීහ. එපවත් අසා රජ්ජුරුවෝ එසේවූ මොණරෙකු අප ලබන්නේ කොයින්දැයි විචාළාහ. මහරජ, ඉදින් නොලදහොත් මාගේ දිවි නැත්තේයයි කීහ.

එපවත් අසා ඉපිලඟී සොඳුර තොපි ශෝක නොකරව. ඉදින් තොපි කී තැනැත්ත ඇත්තේවී නම් ගෙන්වාදීලිය හැකැයි බිසවුන් අස්වසා ගොස් රාජාසනයට නැඟී පිරිවර ඇමැත්තන් කැඳවා පින්වත්නි බිසව් රන්වන් මොණරකුගෙන් බණ අසන්නා කැමැත්තාහ, මේ ලොව රන්වන් මොණරු ඇද්දැයි විචාළාහ. එපවත් අසා අමාත්‍යයෝ මහරජ, බමුණෝ දනිති කීහ. රජ්ජුරුවෝ බමුණන් ගෙන්වා විචාළාහ. එසඳ බ්‍රාහමණයෝ මහරජ, දියෙහි වසන්නාවුන්ගෙන් මස්කැස්බන් හා කකුළුවන්ගෙන් සමහරකෙණෙක් ඇත්තාහ. ගොඩවසන්නාවුන්ගෙන් මුවන් හා මොණරුන් වටුවන් ආදී තිරිසන්හුද, මනුෂ්‍යයන්කෙරෙහි කිසිකෙණෙක් රන්වන් ශරීර ඇත්තාහයි අපගේ වේද ශාස්ත්‍රයෙහි ලක්ෂණ

මන්ත්‍ර වශයෙන් දනුම්හයි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ තමන් අණසක පවත්නා තෙක් වැද්දන් රැස්කරවා රන්වන් මොණරකෙණෙකු දුටුවිරුදැයි විචාළාහ. සෙස්සෝ ඇමදෙනම නුදුටුවිරුහයි කීහ. ඉන් මේ කෙණෙක් පියා සමීපයෙන් ඇසිද ඒ තෙම රජ්ජුරුවන්ට කියන්නේ මහරජ මාත් දුටුවිරුනැත. එතකුදු වුවත් මා පියානෝ වනාහි අසෝනැත රන්වන් මොණරාණ කෙණෙක් ඇතැයි මියන ගමනේ මට කීයා මළහයි කීහ.

ඉක්බිති රජ්ජුරුවෝ සතුටුව සබඳ මාගේ බිසවුන්ගේ ජීවිතය තෙපි විසින් දුන්නාතම් වෙයි, වැළි ගොස් බැඳ ගෙණෙවයි ඔහට බොහෝ සම්පත් දී යවූහ. ඒ වැදි අඹුදරුවන්ට ඒ සම්පත් දීලා ක්‍රමයෙන් ඒ ස්ථානයට ගොස් බොධිසත්වයන් දැක උගුලු මල අටවා අද ඔහු බඳිමි උත්සාහකරන්නේ බඳු ගතනොහී මෙළේය. බෙමානම් බිසවිද අභිප්‍රාව නොලදින් ශොකයෙන් මළාය. රජ්ජුරුවෝද මොණරා නිසා මගේ ප්‍රිය භායසීාව මළහයි කිපී වෛර වසඟව හිමවත සතරවෙනි පර්‍වතයෙහි රන්වන් මයුරයෙක් වෙසෙයි ඔහු මස් කෑ කෙණෙක් ජරා මිළිපිළි නැතිවෙයි රන්පත ලියා පාඹුල් පෙට්ටියේ ලා මළහ. උන්ට ඉක්බිති අනික් රජ්ජුරු කෙණෙක්වූහ. උන්ද රන්පොත ලිවූ අකුරු කියවා මා අජරාමර වන්ට උවමැනවැයි සිතා මොණරා බඳන්ට උවමැනවයි එක් වැද්දකු යවූහ. එද දවස්පතා උත්සාහ කරන්නේ බඳුගත නොහී එහිම මෙළේය. මෙසේ රජපරම්පරා වශයෙන් අතික්‍රාන්තවිය. වැදි සදෙනෙකුන් එහි මළාහ. සත්වෙනි රජකු විසින් යවනලද වැදිපුත්‍රයා අදම බඳිමි උත්සාහ කරන්නේ බඳුගතනොහී උත්සාහකොට සත්අවුරුද්දක් මුළුල්ලෙහි වෙහෙසී සිතන්නේ කුමක්දෝ මේ මයුර රජ්ජුරුවන්ගේ පයමලේ නොබැඳෙන්ට කාරණා කවරේදෝහෝයි පරීක්‍ෂා කරන්නේ සවස උදසන පිරිත්බණන අඬ අසා මෙතන අඬන මොණරකෙණෙක් නැත්හ.

මේ බ්‍රහ්මචාරී වියයුතුය. ඒ බඹසරෙ ආනුභාවයෙන්ද බණන්නාවූ පිරිතෙහි ආනුභාවයෙන්ද මොහුගේ පය නොබැඳෙන්නේ වනැයි කාරණායෙන් දැනගෙණ පසල්දනව්වට ගොස් එක් සෙබඩ බඳුගෙණ යම්සේ ඔහු අසුරගසා එකල්හිද අතපිඩිගසාලු කල්හිද අඬානම් එලෙසට ඉක්මවාගෙණ මහබොධිසත්වයන් පිරිත්කොට බිමට බස්නාට පළමු උගුලුමල අටවා අසුරගසා සෙබඩ ඇඬවිය. පිරිතට උන් මයුර රජ්ජුරුවෝ ශබ්දය ඇසූහ. එකෙණෙහි සත්සිය යක් අවුරුදු සැඟවී තුබූ ක්ලෙශයන් පෙණය කොටගෙණ නැංගාවූ සර්පයෙකු මෙන් ඉගිල ක්ලෙශයෙන් ආතුරකොට පිරිත් කිරීම නොසඳහම්විය. ඒ තෙම වේගයෙන් පක්‍ෂප්‍රහාර කොට ගෙණ ඈ සමීපයට නොස් ආකාශයෙන් බස්නෝ මලෙහි පය එලාම බැස සත්සියයක් හවුරුදු නොසුවුනු මල ඇසීර එකෙණෙහිම පයබැඳීගත. ඉක්බිති වැදිපුත්‍ර උගුලු සමග එල්ලෙන්නාවූ මහබොධිසත්වයන් දැක සිතන්නේ මේ මයුර රජ්ජුරුවන් සත් පරම්පරාවෙක වැද්දෝ බඳුගත නොහී මළහ. මමද සත් අවුරුද්දක් ප්‍රයත්න කරන්නෙමුදු බඳුගත නුහුනුයෙමි. අද දවස් වනාහී මේ තෙම සෙබඩ කෙලශාතුරව මෙතෙක් දවස් පිරිත් බැණගතනොහී අවුත් මලෙහි බැඳී අධොශීර්ෂව එල්ලෙමින්මේ බඳුවූ සිල්වත්හට වෙහෙස දීමෙන් මට ප්‍රයෝජන කිම්ද? මෙබන්දක් අනිකක්හට පඬුරුකොට යාමත් යුක්තනොවෙයි. මුළුලොව වාසීහු මොහුට පඬුරට නිස්සාහ. රජ්ජුරුවන් දුන් සත්කාරයෙන් මට කම් කිම්ද? මොහු උනාඅරිමි සිතීය. නැවත සිතන්නේ මේ තෙම ඇත් හා බල ඇත්තේය. මා සමීපයට ගිය කල්හි මා මරණ්ට ගියහයි සිතා මරණ භයින් දිවන්ට උත්සාහ කරන්නේය. පය හෝ

පියා හෝ බිඳිත්තම් නොයෙදෙයි, එසේහෙයින් සමීපයට නොගොස් ඔහුට සැඟවී සිට මල කපාපියම්. එසේකල්හි තෙමේ තමාගේ රුචියෙන් අභිමත තැනකට පලායන්නේයයි සිතා සෙමෙන් සැඟවී සිට දුන්න නොගාගෙණ ඔලියාත ඉස දුනුපිට තබා මල ලනුව කපා විදිමි. දුන්න අදින්ට වන. මයුර රජ්ජුරුවෝද බැඳුනු කෙණෙහි කෙලශාතුරව බැඳුනු බව දැන ඒකාන්තයෙන් නිරුත්සාහවන්නෙයැයි දැන ඒ කොයිඅහෝයි ඇත් මැත් බලනුයේ දුන්න අදනහු දැක මා මරාපියා ගෙණයනු කැමැත්තේයයි භයින් ත්‍රාසනාව ජීවිතය ඉල්වන්නාහු, එම්බා වැද්දපුත්‍රය ඉදින් තෝ මා සම්පත් පිණිස බැඳුයෙහි වීනම් නොමරා අල්වාගෙණ රජ්පුරුවන්කරා ගෙණයා, එසේකල්හි තෝ බොහෝ සම්පත් ලබන්නෙයැයි කීහ. එපවත් අසා වැද්දපුත්‍රතෙමේ මයුර රජ්ජුරුවෝ තමන් විදිනා පිණිස ඊය සලාගනැයි සිතුවනැයි සිතා ඔහු අස්වසාලූව මැනවැයි කියන්නාහු, මයුර රජ්ජුරුවනි, මා විසින් ගිය දුනු පිට තබනලද්දේ තොප විද මරණු පිණිස නොවෙයි. වැලි කුමක් පිණිසද ? යත් තොප බැඳී එල්ලෙන්නාවූ මල ලනුව ච්චරක් කපාලන පිණිසය. එසෙහෙයින් ලනුව සපාසරණ ලද්දාවූ තෙපි සැපසේ අභිමත තැනකට වැද යවයි කීහ.

ඉක්බිති බොධිසත්වයෝ කියන්නාහු යම්බඳුවූ තෝ සත්වවගීයෙහි කැම් පිමහි පවා අපෙක්ෂාවක් නැතිව අල්වම් ලුහුබඳවා ඇවිද්දෙහිය. එසේ මහත්වූ උත්සාහයෙන් මලේ බඳගන්නා ලද්දාවූ මා කවරකාරණයෙන් මුදනු කැමැත්ති වීද? අද දවස් පාණාතිපාත කර්මයෙන් වැලකුණෙන්ද නැත සියළු සත්වයන්ට අභය දින් දැ? යි විචාළාහ. ඉක්බිති වැද්දපුත්‍ර කියන්නේ මයුර රජ්ජුරුවෙනි, යමෙක් ප්‍රාණඝාත කෙරේද, සියළු සත්වයනට අභයදේද, එසේවූ සත්වතෙමේ මෛත්‍ර චුතව ඉෂ්ටවිපාකයක් ලබේදැයි විචාරම් මට ඉදුරා කියවයි කීහ. එම්බල වැද්දපුත්‍රය, පණිවායෙන් වැළකා යමෙක් සත්වයනට අභයදේද, ඒ තෙම ඉහාත්මභාවයෙහි බොහෝදෙනාගෙන් ප්‍රශංසා ලද්දේ කාබුන් මරණින් මත්තෙහි සවගීලෝකයෙහි උපද්නේයැයි කියම කීහ.

ඉක්බිති වැද්දපුත්‍රතෙම අසත්පුරුෂ සමාගමෙහි තමා උච්ඡේද භාවයෙහි පිහිටි හෙයින් පෙර කියනලද අචෙලකාදීන්ගේ බස ගිව්ස ඔහු රහත්ව උන කිවාම නියමයයි අගතේ මයුර රජ්පුරුවෙනි, මෙ ලෝකයෙහි සමහර ශ්‍රමණ බ්‍රාහ්මණකෙණෙක් දෙව්යොය යන කෙණෙකුන් නැතැයි කියති. මෙලොව පවත්වන්නාවූ සත්වයන්ගේ ජීවිතෙන්ද්‍රිය තෙම අත්බව නිරුඩවන බව මුත් භවාන්තරයට යන්නේ නොවෙයි කියති. කරණලද්දාවූ සුචරිත දුශ්චරිතයන්ගේ ඉෂ්ටානිෂ්ට විපාකයද, භවාන්තරයට ගොස් එපාක දෙන්නාහු නොවෙයි. වැලිත් සත්වයන විසින් කරණලද්දාවූ දානමානාදී සුචරිතයෝ කුමක් නිසා තමන්ගේ අභිප්‍රාය තුරුපවූ පරද්දෙන කරණ ක්‍රියාවන් විනා අනික් කිසි ප්‍රයෝජනයෙන් නැතැයි කියන්නාහු, එසේ කියන්නාහු රහතුන්ගේ බස් ගව්ස බැඳිමස් කීයේය. එපවත් අසා මහබෝධි සත්වයෝ පරලොව ඇතිනියාව දෘෂ්ටාන්ත නා ලවාම කියවම්. උගුලෙටහ එලමින් සිටම කියන්නාහු, සබඳ, මනාවූ දශීන ඇති චන්ද්‍ර සූර්යයන් දෙදෙනා ආලෝක පතුරුවමින් ආකාශයෙහි මනා ගමන්කරන්නාවූ දුටු විරුයෙහිවේද? මේලෝකයෙහි මනුෂ්‍යයෝ චන්ද්‍ර සූර්ය විමානදෙක්හි දෙවියන් ඇතැයි කියද්ද ඔහු මේ ලොව මනුෂ්‍යයෝ දනගතනොහි මෙලොව කුශල්කොට එම් කුශලානුභාවයෙන් මෙලොව බැබලුම් කරණලද්දේ දෙවියෝදැයි විචාළහ

ඉක්බිති වැදිපුත්‍ර කියන්නේ සබඳ මයුර රජ්ජුරුවෙනි, චන්‍ද්‍ර සූර්‍ය්‍යයෝ දෙදෙන තමන්ගේ ආලෝකයෙන් සියලු දික් බබුළුවමින් ආකාශයෙහි ගමන්කරන් නාහුය, මේ ලෝකයෙහි මනුෂ්‍යයෝ ඔවුන් දේවතාවෝයයි කියා කියති කීහ. ඉක්බිති බොධිසත්ත්වයෝ එසේකල්හි වැදිපුත්‍රය, මේලොව දෙවියෝ නම් නැතැයි ජීවිතෙන්‍ද්‍රිය මේ ලොවින් මත්තේ නොයෙයි කියාද සුචරිත දුශ්චරිත සිත් තේයි ඉෂ්ටානිෂ්ට විපාකය නැතැයි කියාද අඥනයන් විසින් පැණවූයයි කියාද උච්ඡෙදවාදීන්ගේ හීන ව්‍රතය දූත්ම නැසීගිය නියාව එම චන්‍ද්‍ර සූර්‍ය්‍යා දීන්ගේ උපමාවෙන්ම දූන් වැලිකෙළි කොල්ලෝ නිරුත්‍යෙදවාදීවූ ඒ පැවැත්වූ විනා දත්දීම උතුමැයි පැණවූවොම නුවණැත්තහුයයි වදාළාහ. ඉක්බිති වැදිපුත්‍ර තෙම මහබොධිසත්ත්වයන් කියමින් සිටියදීම තමාගේ තියුණු නුවණින් පරීක්‍ෂා කොට මයුර රජ්ජුරුවනි තොප විසින් කියනලද්දාවූ මේ වචනය ඉතා සත්‍යය වචනයෙක වැලි කෙසේනම් දනතිශ්ඵලවේද එසේම සුචරිත දුශ්චරිතාදීන්ගේ ඉෂ්ටානිෂ්ට විපාකයෙක් නැත්තේ වී නමුත් කෙසේ දනය පරලොව සුඛදායක යෙක් අඥනයන් පැවැත්තවූවයි යන්නෙත් කෙසේදැයි කියා සමාධිව, නැවත මයුර රජ්ජුරුවනි කෙසේවූ සුචරිත ධර්‍මයන්කොට කිමෙක්හි ඇසිර කෙසේවූ කෙණෙකුන් භජනය කෙරේද කෙසේ ප්‍රගුණ කෙළේ නරකයට නොයෙද යම්සේ මම නරකයට නොයෙමනම් එලෙස මට අවවාදයන් දෙවා වදාළ මැන වැයි ආරාධනා කෙළේය.

එපවත් අසා මහබොධිසත්ත්වයෝ විචාරණලද ප්‍රශ්නයන් දහස්ගණන් නය වශයෙන් විසර්ජනය කරන්නට සමර්ථවූවද අතීකූත් ලොව ධාර්මික ශ්‍රමණ බ්‍රාහමණාදීන් ඇතිබව ඹහට කියමි සිතා සබඳ මේ ලෝකයෙහි ගිහිගෙය හැර මහණව උතුම්වූ කසාවසත්‍රයන් පෙරවමින් පෙරවරුවේලා ඇතුළත්හි ගෙපිළිවලින් සිඟන කල තමන් වසනතැනින් පිටත් වන්නාවූ සකලක්ලෙශ යන් නසා ප්‍රත්‍යෙකසම්බොධිඥනය සිඩ කළ පසේබුදු වරහු විද්‍යමානයහ. ඒ සාන්තවූ ප්‍රාඥවූ පසේබුදුන් කරා කලින් කල එළඹ තට ප්‍රිය දෙයක් විචාළෙ හිනම් ඔවුහු තවත් දත් නියායෙන් තා සිත්හි සැක දුරුකොට මෙලෝපරලෝ හඟවා මෙ කළෝ නරකයෙහි උපදිති, කුසල්කළෝ දිව්‍යලෝකයෙහි උපදිතියි කියන්නාහුයයි වදාළාහ. මෙසේ මහබොධිසත්ත්වයෝ මෙලෝ පරලෝ හඟවා බණ වදාරන් පිරූ පරමී ධර්‍මයන් ඇති ප්‍රත්‍යෙකබොධි සත්වතෙම ඉරුරැස් දැකීමෙන් පිපීගිය මූකල පියුම් කැකුලක්සෙයින් මූකුරාගිය නුවණ ඇතිහෙ යත් බණ අස අසා සිටියාසේම සංස්කාර ධර්‍මයන හැඳින ත්‍රිලක්‍ෂණවශයෙන් සම්මශීනය කෙරෙමින් ප්‍රත්‍යෙක සම්‍යක් සම්බොධිඥනය සමර්ගම කෙළේය. ඔවුහු පසේබුදුව සංසාරසාගරයෙන් මිදීමද මහබොසත්හු පාසබන්ධනයෙන් මිදීමද එක්‍ෂණයෙහිම විය.

එසඳ පසේබුදුහු සකලක්ලෙශ විධ්වංශනයකොට සසර කෙළවර සිටියා හුය. සකලශරීරයේ මැඩගෙණ පවත්නාවූ ප්‍රීතිවේගයෙන් උදන් අනන්නාහු මම මූකුරාගිය සැවයක් ගැලෙව්වා වූ සර්පරාජයකු පරිද්දෙන් විලිකුන පත් වගුරුවන්නාවූ නීලාදම රාජයකුමෙන්ද මාගේ දරුණු ක්‍රියාවන්ද හැර ක්ලෙශබන්ධනයෙන් ගැලවීගියෙම්වේදැයි උදන් අනා මම වනාහි සකලක්ලෙශයන් විනිර්මුක්තවූයෙම්වීම් මාගෙන් බැඳ සිටුවන ලද පක්‍ෂි ගණ ඇත්තාහ. උන් කෙසේ උනම්දෝහෝයි සිතා මයුර රජ්ජුරුවෙනි මාගේ නිවස්නෙහි බොහෝ බන්ධනගත පක්‍ෂි සත්වයෝ ඇත්තාහ, උන් කෙසේ උනම්දැයි විචාළාහ. තුමූ පසේබුදුව සිට මේ විතර උපායක් බොධිසත්වයන්

කුමක් සඳහා විචාළාහුද? යත්. පසේබුදුන්ට වඩා සර්වඥයන්වහන්සේට උපාය කෞශල්‍යඥනය මහත්වන්නේය. එසේහෙයින් විචාළහයි දතයුතු, ඉක්බිති බෝධිසත්ත්වයෝ සම්බුදුවූ නුඹවහන්සේ අරහත් මාර්ගඥනයෙන් කෙලෙසුන් කඩා ප්‍රත්‍යෙක සම්‍යක්සම්බොධිඥනය සමධිගම් කෙළේ ඇද්දැයි ඒ අරභයා යමක්කළ මැනව එකල්හි සියලු ජම්බුද්වීපයෙහි බන්ධනගත සත්ත්වයෝ හැම දෙනම මිදී යත්නාහයි කීහ. මෙසේ බුදුහු බෝධිසත්ත්වයන් දුන් උපදේශයෙහි සිට මම සංසාර බන්ධනයෙන් මිදී පසේබුදුකම් පසක් කෙළෙම්ද ඒ සත්‍යවචන යෙන් මාගේ ගෙයි ඒ බන්ධනගතවූ පක්ෂිකෙණෙක් ඇත්නම් ඒ සියල්ලම බන්ධන යෙන් මිදී තම්තමන් වසන තැනට නැගී යෙත්වයි සත්‍යක්‍රියා කළහ. ඉක්බිති පසේබුදුන්ගේ සත්‍යක්‍රියා බලයෙන් සියල්ලෝම බන්ධනයෙන් ගැලවී තුෂ්ටිරාව පවත්වා පලාගියාහ. තවද එකෙණෙහි යම් යම්කෙණෙකුන්ගේ ගෙයක යටත් පිරිසෙයින් බළලුන් දක්වා සියළු බන්ධයෙන් මිදී සැපයට පැමිණියාහ.

එසඳ පසේබුදුහු සත්‍ය ක්‍රියාවසානයෙහි අත ඔසවා මුදුන පිරිමදිනාහ. එකෙණෙහි ගිහිවෙස් අතුරුදන්ව ඉන්ද්‍රජාලයෙහි පෙණීගියාක් මෙන් මහණ වෙස් පහලව තුන්සිවුරු පාත්‍රධරව සැටවයස්පිරි මහාස්ථවිරයන්මෙන් උතුම්වූ ආකල්ප සම්පදාවෙන් වැඩසිට මයුර රජ්ජුරුවෙනි තෙපි මට මහත් ප්‍රතිෂ්ඨා වූවයි මයුර රජ්ජුරුවන්ට දෙහොත් මුදුනෙහි බැඳ තුන්විටක් පැදකුණු කොට වැඳ ආකාශයට නැගී පස්වණක් වලාකුළු මඩිමින් නන්දමූලක නම් පබ්භාරයට වැඩපීහ. මයුර රජ්ජුරුවෝද උගුලු යටගින් අහසට පැනනැගී ගොදුරුබිමට බැස ගොදුරුගෙණ තමන් වසන තැනටම ගියාහයි යනාදීන් මේ ජාතක ධර්ම දෙශනාව ගෙණහැර දක්වා චතුස්සත්‍යයන් ප්‍රකාශකොට වදාළ කල්හි ඒ උකටලීවූ භික්ෂූන්වහන්සේ රහත්වූසේක. මහණෙනි එකල්හි පසේබුදුහු ආනුපමණින් සිට පිරිනිවියාහ. තිරිසන්ව සිට බැඳු වැද්දන් පසේබුදුන් කරවන තරම් විසිතුරු ධර්මකථා ඇති රන්වන් මොනර රජ්ජුරුවෝ දැන් ලොවුතුරා බුදුහු මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

484
තච්ඡසූකර ජාතකය

තවද ශාස්වතොච්ඡේද දෘෂ්ටි ආදිවූ තෙසැට මිථ්‍යාදෘෂ්ටි ඇරගෙණ අපාය මාර්ග ප්‍රතිපන්නවූ අනේවා දහස්ගණන් සතුන්ගේ ඒ දෘෂ්ටිජාලයන් බිඳ තමන්වහන්සේ අමාමහනිවන්හි පිහිටුවාලනසේ දක්නාවූ සර්වඥ ස්වාමිදරුවෝ එක් සමයෙක්හි ජේතවනයෙහි වැඩවසනසේක් මහළු තෙර දෙදෙනෙකු වහන්සේ අරභයා මේ ජාතක දෙශනාව කොට වදාළසේක.

ඒ කෙසේ ද? යත්,

මහාකොසොල් රජ්ජුරුවෝ විනාහී බිම්බිසාර රජ්ජුරුවන්ට දියනියක් සරණපාවා දෙන්නාහු දියනියන්ට කසා නාන මිළ පිණිස කසීරට කෙළවරින් ගමක් දුන්හ. පසුව පසේනදී කොසොල් රජ්ජුරුවෝ තමන් බෑනනුවන් අජාතශත්‍රු රජහුමිසින් පියාකන් බිම්බිසාර රජ්ජුරුවන් මරාපූකල්හි ඒ ගම

උදුරාගත්හ. ඉක්බිති දෙමයිලෝ ගමනිසා වරින්වර යුධකරන්නාහ. මෙසේ යුධකරණකල්හි එක්දවසක් අජාතශත්‍රුවූ රජ්ජුරුවෝ ජයගෙණ කොසොල් රජ්ජුරුවන් ලුහුබඳවාගත්හ. එකල්හි පැරද අවුත් කෙසේ ජයගතහැක්කැයි අමාත්‍යයන් විචාළේය. එකල්හි ඇමතිවරහු මහරජ භික්ෂූන්වහන්සේ තම් ඉතා මන්ත්‍රණයෙහි දක්ෂසේක, එසේහෙයින් චරපුරුෂයන් යවා විහාරයෙහි ඒ ඒ තැන්හි භික්ෂූන්වහන්සේ කියන්නාවූ කථා පරීක්ෂාකොට අසුවොත් යහපතැයි කීහ. රජ්ජුරුවෝද යහපතැයි ගිවිස ඒ චරපුරුෂයන් කැඳවා තෙපි හැම විහාරයට ගොස් සැඟවීසිට යුධයට නිසිව කියන බසෙක් ඇත්නම් පරීක්ෂාකරවයි යවූහ. එසමයෙහි බොහෝ පුරුෂයෝ ජේතවනයෙහි මහණව වසන්නාහු ඇත. ඉන් මහලුතෙර දෙදෙනෙක් විහාර කෙළවර පන්සලෙක වසනසේක්, ඉන් එක්කෙණෙකුන්වහන්සේ ධනුග්ගහතිස්ස ස්ථවිරයන් වහන්සේයයි ප්‍රසිධව වසනසේක, එක්කෙණෙකුන්වහන්සේ දත්තක ස්ථවිර නම් වනසේක, ඒ දෙදෙනම රාත්‍රියේ සැතපී අළුයම්වේලෙහි පිබිද ගිනි දල්වා ධනුග්ගහතිස්ස තෙරුන්වහන්සේ ඇවැත්නි දත්තක ස්ථවිරයෙනි දන්නේ ඇද්දැයි බැණදූසේක ඔබ නොදනී වහන්සැයි වදාළසේක.

නැවත ද තප නම් තෙරුන්වහන්සේ විසින් ඇයි බැණවූ කරුණු කිම්දැයි විචාළ හෙයින් එවිට කියනසේක් ඇවැත්නි මේ කොසොල් නම් රජ ඉතා කෙළතොල්ලෙක්වනැයි මහසැළක් පමණවූ බත් උකා කාපියනසේ දන්නා බවමුත් කිසි සමර්ථයක් නැත්තේ යයි කීසේක, එපවත් අසා දත්තස්ථවිරයන් වහන්සේ විසින් ස්වාමීනි කුමක් පිණිසද එසේ වදාළේයයි විචාළහයි කියනසේක් ඇවැත්නි තමාගේ කුස්හි පණුවකු පමණ ඇති අජාතශත්‍රුහු විසින් පරදවනලදුව පලාගියේවේදැයි වදාළසේක, ඉක්බිති දත්තස්ථවිරයන්වහන්සේ විසින් එසේකළ ස්වාමීනි කළමනා කිම්දැයි විචාළසේක, එම්බා ඇවැත්නි දත්තස්ථවිරයෙනි සකට ව්‍යූහ පද්ම ව්‍යූහ චක්‍ර ව්‍යූහ වශයෙන් තුන්වන්නේය, ඉදින් අජාතශත්‍රුහු අල්වන්ට උවමනාවීනම් සකට ව්‍යූහ අල්වා ගණිතොත් යහපතැයි කීසේක. ඒ ත්‍රිවිධ ව්‍යූහ නම් කෙසේදැයි විචාළ කල්හි කියනසේක් උන්ගේ රාජසීමාන්තරයෙහි අසවල් පර්වතය ලඟ පාර්ශ්වයෙහි බල ශක්තිසම්පන්න බිල ඇති යෝධන් සඟවා සිටුවා උන්ට ඉදිරියෙහි චක්‍ර ව්‍යූහ නම් පස්සේතරම් මහත්කොට සේනාවක් සිටුවා උන් ඇවිත් යුධයෙහි ඉතා දක්ෂ නොවන්නාවූ ඒ මහසෙනඟ පරදවා සිටි පද්ම ව්‍යූහයට අවුත් වන්කල්හි පැරද පලා දෙවනත්වගියකල උයිත් දිනුම්හයි වඩ වඩා එහි වැඩි ගණනක් ලුහුබඳවාගෙණ අවුත් පළමු සඟවා සිටවනලද සකට ව්‍යූහ නම් යෝධයන් මධ්‍යයට අවුත් වැද කල්හි ඒ බව දැන පෙණෙමින් ගර්ජනා කෙරෙමින් පැන වැටී කෙමනක් ඇතුළටවන් මසුන්මෙන් අල්වා ගන්ට පුළුවනැයි කීසේක.

රජ්ජුරුවන් සිටුවන ලද පුරුෂයෝ එපවත් අසා රජහට කීහ. රජ්ජුරුවෝද මහසෙනඟ පිරිවරා ගොස් එලෙසම සටන් කොට බෑනනුවන් අජාතශත්‍රු රජ්ජුරුවන් අල්වාගෙණ කීපදවසක් දමේ තබා නිර්භයකොට නැවත මෙබන්දක් නොකරවයි අස්වසා දම්කපා තමන්ගේ වජිර කුමාරිකා නම් දියණියන් පාවාදී මහත් පිරිවර හා සමඟ උන්ගේ රට්ට යවූහ. එසමයෙහි කොසොල් රජ්ජුරුවෝ ධනුග්ගතිස්ස තෙරුන්වහන්සේගේ උපදේශයෙන් අජාතශත්‍රු රජ්ජුරුවන් අල්වාගත්තු ලැයි භික්ෂූන්වහන්සේ අතුරෙ කථාවක් ඉපිද ස්ථිරබවට පැමිණියේය. දම්සභාවෙහිද එම කථාකොට

භික්ෂූන්වහන්සේ උන්කල්හි සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ වදරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදරා භික්ෂූන් විසින් එපවත් දැන්වූ කල මහණෙනි දැන් මතු නොවෙයි පෙරත් ධනුග්ගහතිස්ස ස්ථවිරයෝ යුද්ධයෙහි දක්ෂයෝවේදැයි වදරා ඒ භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත් වත් ගෙණහැර දක්වා වදාරණසේක් මහණෙනි,

යටගිය දවස බරණැස්නුවර දොර සමීපයෙහි ගම වසන්නාවූ එක් වඩුවෙක් දඬු කපා ගිය තැනැත්තෝ වලක වැටීපියා උන් එක ඌරුපැටියෙකු දැක ගෙණවුත් තච්ඡසූකරයයි ඔහට නම් තබා පොෂ්‍යයකොට වැඩූහ. ඒ ඌරුද ඒ වඩුහට බොහෝ සහාය කරන්නේය, සොටින් දඬු පෙරලන්නේය, දළෙහි වෙලාගෙණ කලුහුය අල්වන්නේය, වෑ නියන් අතකොළු ඩැගෙණවිත් දෙන්නේය. මෙසේ ක්‍රමයෙන් වැඩිවයසට පැමිණියේ මහාබලඇතිව මහ ශරීර ඇතිවිය වඩුවාතෝද උන්ට පුත්‍ර ප්‍රෙම උපදවා මොහු මෙසේ ගමට යන කල්හි යමෙක් මරා කාපුනම් නපුරැයි සිතා මහවලට ගොස් ඇරපූහ, ඒ ඌරුතෙම මා උදකලාව මේවලවිසීම යුක්ත නොවෙයි නෑයන් සොයාගෙණ උන් හා එක්ව විසීම යුත්තේයයි සිතා වනලැහැබවල ඌරන් බලා ඇවිදිනේ බොහෝ ඌරන් දැක සතුටුව අනේ සබඳ නෑකෙණෙකුන් පරීක්ෂාකොට ඇවිදිනා වනලැහැබ පර්වත ගිරි කඳුරැලි ආදියෙහි බන්ධුවර්ගී කෙණෙකුන් දිටිම්ද? ඒ බන්ධුවර්ගීයා හා සමග බොහෝ මූල ඵලාඵලයන් සම්බන්ධිවූ සුලභ ගොදුරු ඇති සිත්කළුවූ මේ වනයෙහි සැප වූයෙන් ඔත් වැඩි සිත් ඇතිව කිසි භයක් නැතිව සුවසේ වෙසෙමි කීයේය. එපවත් අසා ඌරෝ කියන්නාහු තච්ඡසූකරයානෙනි අත්‍යතරවූ රක්ෂාස්ථානයක් පරීක්ෂාකරන්මුත් මෙතැන්හි වසම් නොසිතව වැලි ඊට කාරණා ඇතැයි කීහ.

ඌරුතෙම අපි මෙතෙක් දෙනා සමගව වසනකල්හි සතුරෝ නම් නැත්තාහ. ඌ කෙසේවූ සතුරුකෙණෙක්දැයි විචාළාහ. එකල්හි තත්වූ පරිද්දෙන් කියන්නාහු ශරීරයෙහි පියුම් සේ ඉරි ඇති දළම ආයුධකොට ඇති ශක්තිසම්පන්න ව්‍යාඝ්‍රයෙක් මේ වල ඌරන් මරා මස්කන්නේයයි කීහ. ඉක්බිති තච්ඡසූකරයෝ කියන්නාහු ඇයි කුඩාවරුනි, අප හැමගේ දළ නැත්තා නොවෙත් ඇඟබල නැත්තා නොවෙත් ඇමදෙන සමග උදකලා නැත්තහු මරාපිය නොවමෝදැයි කීහ. එපවත් අසා සතුටුව ඌරෝ කියන්නාහු අප ඇමගේ සිතසතුටුව කණට පියවූ බසෙක නුඹද කීයේය. එහෙයින් අපි ඇමදෙන එක්ක මරාපියම්හයි ඉඳින් අපි ඇම අතුරෙන් එකෙක් හයින් පලාගියේ නම් ඔහු අල්වාගෙණ මරාදමාපියා විනා නොහරුම්හයි ඇම දෙනම ජීවත්වමෝහයි කීහ. එසේ ඒ සූකරයෝ ඇමදෙනා එක්සිත්ව සිටිකල ඉක්බිති තච්ඡසූකරයෝ ඌ එන්නේ කවර වේලේදැයි විචාළාහ. එපවත් අසා තෙස්සෝ කියන්නාහු අද නිද්‍රා නැගියකුසේ අවුත් එකකු මරාගෙණ ගියේය, සෙට උදෑසනක්සේ එන්නේයයි කීහ. එද ඉතා යුධයෙහි දක්ෂය. එහෙයින්ම ජයභූමියක් අඳුනෙයි ඒ කාරණයෙන් එක් ප්‍රදෙශයක් පරීක්ෂාකොට වහා තෙපි ඇමදෙන ගොදුරු කා බඩ පුරාගණුව සම්මතකොට එම්බා කුඩාවරුනි, යුධය නම් සකට බ්‍යූහාදි වශයෙන් ත්‍රිවිධවන්නේයයි කියා ඉතා අළුයම් වන්නාට පලමු බොහෝ වේලේ පටන් ගෙණ සංවිධාන කරන්නාවූ මධ්‍යමයෙහි කිරි බොන ඌරු පැටියන් සිටුවා

උන්ගේ මවු පිරිවරා සිටුවා උන්ව වටකොට වඳ ඊරියන් සිටුවා උන්වටකොට ඌරුකාම්බන් සිටුවා උන්ට වට දළ මඳක් පිටතට නික්මුණු තරුණ ඌරන් සිටුවා කිරිබොන පැටියන් හා මොවුන්ට අතුරෙහි ඊරියන් හා ඌරු නාම්බන්ට අතුරෙහි තරුණ ඌරන්ට අතුරෙහි මහශක්තිසම්පන්නවූ ඌරන් විස්ස තිහ බැගින් මුලු මුලුකොට වටම සිටුවා ව්‍යාඝ්‍රයා පනින්නේ මහත් ඌරකු සිටි තැනට යයි නියම දන්නා හෙයින් මධ්‍යයෙහි තුමූ වැදසිට තමන් ගැල වෙක පිණිස එක් වළක් පිටිපස්සෙහි කනවා ව්‍යාඝ්‍රයා පිනූකල වැටිය පිණිස කුළුපිටි කන්නක සේ ඉසයට ගැණෙන නියායෙන් ගැඹුරුකොට වළක් කනවා පිනූ පෙරලා දූන නොරඳා පලායන සැටියේ පැන් වත්කොට මඩකොටලා වල දෙකට මධ්‍යයෙහි වළවල් තනවා පස් ගොඩකොට පිළක් සේ තනා සොටින් තලා තදකොට තබා ඒ තෙම ශක්තිසම්පන්නවූ ඌරන් ඇරගෙණ පළමු තැන්හි සිටුවනලද ඌරන් අස්වසා නොපි නොබවයි කිය කියා ඇවිදින කල්හි පාන්ව ඉරු පැනනැංගේය එකල්හි ව්‍යාඝ්‍රයාත් තමා පෙරහල ඇට මස් කා බී ජීවත්වන්නාවූ සොර තපස්වියා ආශ්‍රමයකෙරෙන් නික්ම පණිත මුදුනට නැගී සිටියේය, ඒ බව් දූක ඌරෝ ස්වාමීනි සතුරා ආයයි කීහ, එසඳ තච්ඡසූකරයෝ නොබව යමෙක් මේ කෙළේ නම් නෙපි ඌ කළ යම්මදෙය කොට නොබා දර්පණිතව සිටුවයි කීහ.

එකල්හි ව්‍යාඝ්‍රයා කිළිපොලා පනන ආකාර දක්විය. ඌරෝද කිළිපොලා පිනූවිටම මැඩගන්නා ආකාර දක්වූය. ව්‍යාඝ්‍රයාද ඌරන් දිසාව බලා වහා නාද කෙළේය. ඌරෝද ලක්ෂගණන් පැන් කළ එකවිට සලන්නාසේ උකු නැලූහ. ව්‍යාඝ්‍රයා දිය සලා අර ඇන්දේය, ඌරෝද සුළු දියකොට අර ඇඳලූහ, එකල්හි ව්‍යාඝ්‍රයා මේ ඌරෝ අද මෙතෙක් දවස්හි නොවන්නාහ, දූන් මට සතුරුව මා කළ යම් දෙයක් තුමූත් කොට එඩි දර්ප සහිතව සිටිනාහ. ඒ විධානකොට ඇවිදිනාවූ සේනානායකුන් ඇතිව අද මා උන්කරා යාම යුක්තනොවෙයි, මරණ භයින් තැතිගෙණ ආපස්සේ පලාගොස් කූට ජටිලයා ළඟට පලාගියේය. ඉක්බිති ඒ ජටිලතෙම ඇයි සබඳ අද පණිවාගෙන් වැළැක්කෙහිද සියලු සතුන්ට අභය දිනුද වැලි දෙදළ කැඩීගිය එකකු සෙයින් ඌරන් ළඟට ගොස් කිසි ගොදුරකුත් නැතිව බැගෑපත්ව අවුත් සොට අල්වාගෙණ කුමකට සිටීදැයි විචාළේය.

ඉක්බිති ව්‍යාඝ්‍රයා කියන්නේ තපස්වීනි මානේ දළ නැත්තේද නොවෙයි එතකුදු වුවත් එක් සිත්ව සමගව්ලා කළයම්ම දෙයක්කොට සුළුගන්වන කලක්මෙන් දර්ප සහිතව සිටිනාකල ඇත්හුරුමූළද උන් මධ්‍යයෙහි ඇත මෑත දිව පැන සක්මන් කරන්නාහු ආරෝහපරිණාහයෙන් සම්පන්නව එක් මහ ඌරකු දූක මොහු එක්වලා මා තනි තැනැත්තහු කා මරාපියද්දෝහෝයි මඳක් චකිතව ඇත් මෑත් බලා පළා ආමි කීහ. එබවත් අසා තාපසයෝ කියන්නේ එම්බල පැවැත්ත, එක ශක්‍ර කෙණෙක් බොහෝ අසුරයන් ජය ගත්හ, එකම එක උකුස්සෙක් බොහෝ පක්ෂීන් ගසාගෙණ කන්නේය, උදකලාවූවත් නොපවැනි ශක්ති සම්පන්න ව්‍යාඝ්‍රයෝ හීරුක ජාතිවූ බොහෝ සිවුපාවුන් මධ්‍යයට පැමිණ යාපත් කෙණකුන් මරා කන්නාහ, නොසිත් එබඳු මහ බල ඇති එකෙක් නොවෙයි කියේය, ඉක්බිති ව්‍යාඝ්‍රතෙම තපස්වීනි සමගව සිටගෙණ කිලි පෙළීම කුර ඇද්දීම ගර්ජනා කිරීම් ආදීවූ වික්‍රියාවන් ව්‍යාඝ්‍රයන් හා සදාභකොට සිටිනා ඌරෝ තනි ව්‍යාඝ්‍රයෙකු තමන් වසඟකොට ගනනොහෙද් ද? අද උන් ඇමගේ එබඳු ආකාරයෙක්

ඇත්තේයයි කීයේය, නැවත කූටජටිලයා ඔහු උත්සාහකොට කියන්නේ සබඳ මුලුසමගව එක් අදහස් ඇතිව එක ගොදුරුබිමට බැස ගොදුරු කා ආකාශයෙන් යන්නාවූ කුඹීල නම් පක්ෂි කෙණෙක් ඇත්තාහ, උන් අතුරෙන් යමෙක් පසුබටවීනම් එක් කන්නකින් පලාගියේ නම් උකුස්සා අසා ගෙණ පලායන්නේය, ව්‍යාඝ්‍රයන්ගේ ගතියත් එමතෙක්මය, ව්‍යාඝ්‍ර රජ්ජුරුවෙනි, තොප තමා බල නොදන්නා කෙණෙකුන් ද, වැලි ගර්ජනාකොට පිනූකල්හි දෙදෙනෙක් එකමඟ නොයන්නාහු නොවේ ද? උත්සාහ වැඩිකල්හි රූක්ෂවූ අදහස් ඇති කූට ජටිලයා විසින් උත්සාහවත්වූ ව්‍යාඝ්‍ර පළමුසේම සිතා නිශ්ශංකව ගොස් පර්වතය මුදුනෙහි සිටියේය. එසඳ ඌරෝ සවාමීනී සොරු නැවත ආයේ වේදැයි තච්ඡසූකරයාට කීහ.

ඒ තෙම තොපි හැම නොබවයි අස්වසා සැඟවී සිටිවළ දෙකට අතුරෙහි පළමු ඉදිකොට තුබූ වළ මත්තෙහි සිටගත්තේ එසඳ ව්‍යාඝ්‍රද මහත්වූ වේගයෙන් තච්ඡසූකරයාම ගණිමි පිනිය, ඔහු පය ඉදිරිවූ ගමන හා ශරීරය පෙරලී ඉදිරිහි තුබූ වළ වැටී ගියේය. ව්‍යාඝ්‍රයාද තමා උකාගත් වේගය දරා ගතනොහී පිලකඩගාවා කුලු පිටිකත්තක්මෙන් පයලාශන ලෙස කැත තිබූ පිටිවල වැටී බොටුව තමාගත, තච්ඡසූකරයා වේගයෙන් වහා නැගීසිට පැතලා ව්‍යාඝ්‍රයාගේ හින්මූල සන්ධියෙහි කෙරේ දළ අවුලවාගෙණ පත්ත දක්වා පලා හෙලා හඳවත ඩැ ඇද මැත වල හෙලාගෙණ කැව මේ සොරුයයි එසඳ වටින් එක්ව පළමු ආවාහු එකී එකී මස්කැටිය ඩැගත්හ. පසුවූවෝ ව්‍යාඝ්‍රයන්ගේ මස් නම් කුමන රසදැයි විචාළාහ. ඉක්බිති තච්ඡසූකරයෝ ගොඩනැගී ඌරන්දිසාව බලා ඇයි තවනොසමාදි ඇද්දැයි විචාළේය, එපවත් අසා ඌරෝ කියන්නාහු එක ව්‍යාඝ්‍රයෙකුවේද අප මරාපුයේ තව ව්‍යාඝ්‍රයන් දස දෙනකුටත් වඩා එක් සතුරෙක් ඇත්තේ නොවේදැයි කීහ, කවුරුදැයි විචාළ කල්හි සවාමීනි මේ ව්‍යාඝ්‍රයා ගෙණගිය මස් කා රස දැනගෙණ අප මරන්ට උත්සාහ වඩන්නාවූ කූටජටිලයෙක් ඇතැයිකීහ. එසේවීනම් ඔහු අල්වන්ට යම්හයි නික්මුණාහ. එකල්හි කූට ජටිල ව්‍යාඝ්‍රයා කල්යවා නෝඑනහෙයින් එන පෙරමග බල බලා සිටියේය, වේගයෙන් තමා කරා එන්නාවූ ඌරන් දැක ව්‍යාඝ්‍රයා මරාපියා මාත් මරන්ට එන සැටියයි වේගයෙන් දිවගෙණ ගොස් එක් දිඹුල් ගසකට පැන නැංගේය,

ඒ බව දැන ඌරෝ සවාමීනි ගසට පැන නැංගේ වේදැයි කීය, කුමන ගසක්දැයි විචාරා දිඹුල් ගසයයි කී කල්හි එසේ වී නම් තොපි ඇම ශෝක නොකරව, දැන් දක්මි අල්වාදීලමි තරුණ ඌරන් කැඳවා ගසමුල පස් කැත දමන්ට සම්මතකොට ඊරීයන්ලවා කටින් පැන් ගෙන්වා ගසමුල සලා බිම මොලොක් කොට පස් කැත දැමූ සේ දළ ඇති මහත් ඌරන් ලවා කටින් මුල් කඩා අරවා කෙලින් බට මහමුල් විවරක් තිබී කල්හි තෙසු ඌරන් තෙපි හැම ඉවත ගොස් වටරැකගණුවයි සම්මතකොට තුමූද නල දළින් ඇත කෙලින් බම මහමුලට ගසාලූහ, පොරවකින් පොලු ගසාලූ කලක්මෙන් මූල සිඳී ගියේය එකල්හි ගසා හා සමග වැටෙන්නාවූ කූටජටිලයා කටින් උඩදිම ඩැගෙණ මස් කා නිමවාපූහ. එවිට පසුවූවාහු මිනීමස් කුමන රසදැයි විචාළාහ. ඒ ඓශ්වර්‍ය්‍යීය බලාසිටි වෘක්ෂදේවතාවා සමගීවූ නැයන් ඇතිබව ඉතා උතුම ඊට දෘෂ්ටාන්තර කවරේද සිවුපාවුන් මරාකෑමේදක්ෂවූ ව්‍යාඝ්‍රද උපදේශදායකවූ මේ කූටජටිලයාද ඌරන්ගේ සපත්කමින් එකවිටමරාපියනලදැයි සාධුකාර දුන්හ. ඉක්බිති තච්ඡසූකරයෝ අනිකුත් සතුරුකෙණෙක් ඇත්නම් කියවයි කීහ.

එපවත් අසා උගරෝ නැත සවාමීනි කියා මහත් සන්තෝෂයෙන් කුල්නාද පවත්වා මෙසේවූ උපාය කෞශල්‍යඥනයෙහි දක්‍ෂවූ මහාවීර්‍ය්‍යී ඇත්තාහු රජකරම්හයි ඔවුනොවුන් හා කථාකොට පැන් සොයා ඇවිදිනාහු ඒ කූට ජටිලයාගේ පිරිත් පැන් සංඛ්‍ය දුටුහ. ඒ දක්‍ෂිණාවෘතවූ සංඛයෙන් පැන් පුරාගෙණ අවුත් තච්ඡසූකරයන් දිඹුල්කඳ මත්තෙහි සිටුවා අභිෂෙකජලය වත්කොට ඊරියක අගමෙහෙසුන් කළාහ. එතැන්පටන් දිඹුල්පෝරුවෙහි බඳපුටුව හා දකුණුසකින් අභිෂෙක කිරීම පැවැත්තේයයි යනාදීන් බුදුහු මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා දූන් මතු නොවෙයි ධනුග්ගහතිස්ස ස්ථවිරයෝ යුඩසංවිධානයෙහි ඉතා දක්‍ෂයෝයයි මේ ජාතකය පූර්වාපරසන්ධි ගලපා මහණෙනි, ඒ කූට ජටිලයා නම් දූන් ඒ දේවදත්ත ස්ථවිරයෝය, එසමයෙහි තච්ඡසූකර නම් ධනුග්ගහතිස්ස ස්ථවිරයෝය, එකල ප්‍රත්‍යක්‍ෂ කොට දැක ප්‍රශංසා කළාවූ දේවතාවා නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

485

මහාවාණිජ ජාතකය.

තවද රූපාදී පඤ්චස්කන්ධයෙහි ජවනහංස ගතියක් මෙන් ත්‍රිලක්‍ෂණ ගතව සිසුව දිවන්නාවූ ඥනගති ඇති අප මහ බුදුරජානන්වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් එම සැවැත් නුවර වසන්නාවූ වෙළඳුන් පන්සීයක් අරභයා මේ මහාවාණිජ ජාතකය දේශනා කොට වදාළසේක.

ඒ කෙසේද? යත්

ඒ වෙළඳහු වෙළඳාමට යන්නාහු බුදුන්ට මහදන්දී සරණශීලයෙහි පිහිටා නැවත සවාමීනි ඉදින් නීරෝගිව ආයේනම් නුඹවහන්සේගේ ශ්‍රීපතුල් දෙක බදිමෝවේදැයි පන්සියයක් පමණ ගැල් හා සමග නික්ම මහත්වූ කාන්තාරයකට පැමිණ නොසලකාම වැද පැන් නැතිව සයින් මුලාව ඇවිදින ඒ නාගපරිගෘහතවූ නුගගසක් දැක ගැල් මුදාහැර ඒ ගසමුල හුන්හ, ඉක්බිති ඒ වෙළඳහු ඒ ගස පැතෙයිලා ඇදගත්තාක්මෙන් කොළ පැන් පිරීතිබෙන් තාවූ ශාඛාව දැක සිතන්නාහු ගස ජලධාරාවක් මෙන් පෙණෙන්නේය, මෙහි නැගෙණහිර ශාඛාව කපම්හයි සනිටුහන්කොට එකකු ගසට නැන්වූහ, ඒ තෙම නැගෙණහිර ශාඛාව කපාපීය, තල්කඳක් සා පමණ දියකඳ වැහෙන්ට පටන් ගත ඉන් නහා පැන් බී දකුණු ශාඛාව කැපූහ. ඉන් නොයෙක් රස භෝජන පිටත්විය, ඒ අනුභවකොට පශ්චිම ශාඛාව කැපූහ, ඉන් සර්වාකාරයෙන් සැරහුනු ස්ත්‍රීහු පිටත්වූහ, උන් හා සමග අභිරමණය කොට උතුරුදිග ශාඛාව කැපූහ. ඉන් සත්රුවන් නික්මිණ, ඉන් සත්රුවන් ගෙණ ගැල්පන්සියය පුරාගෙණ සැවත් නුවරට නැවත අවුත් ගෙණා සම්පත් තැන්පත්කොට සඟවා තබා සුවඳපැන් පහන්ගත් අත්ඇතිව ජේතවනයට අවුත් බුදුන් වැඳ මලින් සුවඳින් පූජාකොට එකත්පස්ව සිට බණ කථා අසා දෙවෙනි දවස් මහ දන් දී සවාමීනි මේ දානයෙන් සම්පත් දුන්නාවූ වෘක්‍ෂදේවතාවාට පින්දෙම්හයි පින් දුන්හ, බුදුහු කරණලද භක්තකෘත්‍ය ඇතිසේක් කවර වෘක්‍ෂදේවතාවෙකුට පින් දෙව්දැයි විචාළසේක එසඳ

වෙළඳහු නුගගසින් සම්පත් ලත් නියාව දැන්වූහ. ඉක්බිති බුදුහු තෙපිවනාහි මත්‍රඥතාව හේතුකොටගෙණ තෘෂ්ණාවසඟ නොවී සම්පත් ලදුව පෙර පමණ නැති තෘෂ්ණාවසඟවූවෝ සම්පත්තීන්ද ජීවිතයෙන්ද පිරිහුණෝ වේදැයි වදූරා වෙළඳුන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාරණසේක් එම්බා උපාසකවරුනි,

යටගිය දවස බරණැස නුවණැති වෙළඳක්හු කරා නොයෙක් රටින් එක්වූ නොයෙක් වෙළඳහු පන්සියයක්දෙන ඒ බරණැස් නුවර නුවණැති සාත්තු නායකයට වෙළඳාමට නික්මුණාවූ මංමුලාව එම කාන්තාරයෙහි එම නුගගසමුලට පැමිණ මනෝඥවූ සිහිල් සෙවන උන්නාවූ ජලහරිතව තුබූ ඒ ගස දැක නැගෙණහිර ශාඛාව සිඳ එයින් වැහෙන්නාවූ නිර්මලවූ සිහිල් ජලයෙන් ස්නාන පානයකොට දකුණු ශාඛාව සිඳ ඉන් වැහෙන්නාවූ ඇල් සාලේ බත් රසමසවුලෙන් කුම්මායන් සුවඳ තෙල් හිරු යාදීන් සැපසේ අනුභවකොට නැවත පශ්චිම ශාඛාව සිඳ ඉනුත් එහිම අධිගෘහිතයන්ගේ ආනුභාවයෙන් දෙනලද උතුම් වස්ත්‍රාලංකාරයෙන් සැරහුනු සත්‍රීන් මවා දුන්නාහ. එහි අභිරමණය කොට නැවත උතුරු ශාඛාව සිඳ ඉනුත් නාගානුභාවයෙන් ලබනලද මුතුමැණික් ආදීන් සත්රුවනින් ගැල්පුරා ඉන් නිර්මිත කසී ආදී සළු ඇඳ සුවඳ විලවුත් ගෙණ තයින්ගේ ආනුභාවයෙන් දෙනලද උතුම් යහන්වල සැතපී මෙසේ තෘෂ්ණාවී පුරාගත නොහෙන්නාහු මොහයෙන් වළඳනාලද අඥතවූ වෙළඳහු පස්වෙති ගස මුලින් කපාපුමෝ නම් බොහෝ වස්තු වීමට වඩා ලබමෝවේදැයි ගස මුලින් කපන්ට පටන්ගත්හ. එකල්හී සාත්තුනායක වෙළඳ පින්වත්නි තොපට අභිවෘඩිවේවයි පූර්ව ශාඛාව තොප ඇමට පැන් දීන දකුණු ශාඛාව මිහිරි භොජනය දීන. පශ්චිම ශාඛාව අලංකෘතවූ සත්‍රීන් දීන. උතුරු ශාඛාව මුක්තාමාණික්‍යාදිවූ සප්තවිධ රත්න යන් දීන. එසේවූ උපකාරයට සිටි ගසට වරදනාබව සුදුසු නොවෙයි එම්බා සබඳින මිත්‍රද්‍රොහ සංඛ්‍යාතවූ අකුශලය ලාමක හෙයින් නුවණැත්තහු සැතපී උන් රුකින් අත්තක් කැඩීම මිත්‍රද්‍රොහයට අතුළතැයි නොකඩවන්නාහ.

එසේහෙයින් නොකළහැක්කැයි අනේක නියායෙන් දෙහොත් මුදුනෙහි තබාගෙණ වැඳ වළකතුත් ඒ තනි තැනැත්තන් බස නොගිවිස අඥතවූ බොහෝදෙන සහාසිකව පොරෝ ගෙණ ගස මුලින් කපන්ට නික්මුණාහ. මෙ බව දැක නාගරජ්ජුරුවෝ සිතන්නාහු පිපාසිතවූ මුන්ට පැන් දිනිම්. මියුරු දිව්‍යභොජනය දිනිමි. නැවත රුවන් පරික්ෂිප්තකරණලද එසේවූ මාගේ ගස මුලින් කපම්හයි පටන්ගත්හ. මොහු හැමදෙන ඉතා ලුබ්ධයාහ. සාත්තු නායකයා හැර මුන් හැම මරාපුවොත් යහපතැයි සිතා තයින් විධාන කරන්නාහු වහා හැමදෙන සන්නාහසන්නද්ධව ගැල්දෙටුවා හැර එකකුත් නොරඳා ඇත බිඳ ජීවිතක්ෂයට පමුණුවා දවා අලුමිටක්කොට පියවයි කීන. මෙසේ කියා ඉක්බිත්තෙන් සත්රුවන්මයවූ චඩාසන්නාහයෙන් සැරහී මැඩ හඟු දුනු ගත් තුන්සියයක් නාගභටයන් හා සමග පලඟ කඩුගත් දසදහසක් නාගයෝ නික්ම හැමදෙනා ජීවිතක්ෂයට පමුණුවා අවශෙෂවූ සත්රුවන්මය අතුරණලද ඇඳ පුටු හා කසීවස්ත්‍ර ආදීවූ නොයෙක් වස්තු සම්භාරයන් පන්සියයක් ගැල්වල පුරා සාත්තුවාහකයා සමග පන්සියයක් ගැල් පැදගෙණ බරණැසට අවුත් සියලු සම්පත් ඔහුගේ ගෙයි පටවා අවසර ඉල්වාගෙණ තමන්ගේ නාගභවනයට ගියාහ.

එසේහෙයින් තමහට හිතකැමති නුවණැති සත්පුරුෂයන් විසින් ලෝභ වසඟ නොවිය යුතුයි. තවද සත්ත්වයන්ගේ තෘෂ්ණාව නම් මෙලෝ පරලෝ දෙකින් වන්නාවූ වැඩ නැසීමට කාරණායයි යනාදීන් ධර්මදේශනාකොට මෙසේ උපාසකවරුනි, ලෝභ වසඟයට ඒ පන්සියයක්දෙනා නිෂ්කාරණයෙහි විනාශයට පැමිණියාහ. එසේ හෙයින් තෘෂ්ණා වසඟනුවූ යම් උත්තම පුරුෂ කෙණෙක් නුවණැති වෙළඳහු පරිද්දෙන් ලොවී ලොවිතුරා සැපතින් නොපිරිහෙන්නේයයි මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදුරා චතුස්සත්‍යය ප්‍රකාශකොට උපාසකවරුනි, එකල නාරජ්ජුරුවෝ නම් දැන් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. එකල සාත්තු නායක නම් දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

486
සාධීන ජාතකය

තවද සංසාර සාගරයට ක්ෂෙම නවුකාවක් වැනිවූ හිතවූ කලියුගකාල නැමැති විෂ වෘක්ෂයෙහි හටගත් අමා ඵලයක් වැනිවූ හිතවූ කලියුගකාල නමැති ගිතිවල පඥානැති සශ්‍රීකවූ පියුමක් බඳුවූ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජාතන්වහන්සේ එක් සමයෙක්හි සුලුපා මහපා චංක්‍රමණ රාත්‍රිස්ථාන දිවාස්ථානාදීන් විසිතුරුව සැදුම්ලද ජේතවන මහවිහාරයෙහි වැඩ වසනසේක් එක් දවසක් පෙහෙවූ බොහෝ උපාසකවරුන් අරභයා මේ සාධීන ජාතකය ධර්මදේශනාව කළසේක.

ඒ කෙසේ ද? යත්,

එක් සමයෙක්හි බුදුහු පෙරවරු දන්දී සවස්වේලෙහි ගඳ දුම් මල් පහන් ගෙණ දෙවුරමට ගොස් බණ අසන පිණිස බුඩාසනය පිරිවරා උන් උපාසක වරුන්ට ආමන්ත්‍රණයකොට උපාසකවරුනි, පෙර පණ්ඩිතවරහු තමන් සකසා වැසි පෙහෙවස්හි අනුසසින් මිනිස්කය නොහෙලා දිව්‍යලෝක යට ගොස් බොහෝ දවස් විසූයේ වේදැයි වදාරා උපාසකවරුන් විසින් ආරාධිතවූ බුදුහු ඉතුත්වත් දක්වනසේක්, උපාසකවරුණි.

යගිය දවස මිථිලානුවර සාධීන නම් රජ්ජුරුකෙණෙකුන් සතර සඟරාවතින් වියෝනොව දශරාජධර්මයට අකොප්‍යව රාජ්‍යය කරන්නාහුය. සතරවහසල් දොරය නුවර මැදය තමන්ගේ දොරය යන සතැන්හි සදන්හල් කරවා දවස ලක්ෂයක් ධන වියදම් කොට සියලු ජම්බුද්වීපයෙහි නගුල් වියදඬු උඩබඳවා සියළු සත්ත්වයන්ට දන් දෙන්නාහුය. තවද දමස්ෂතා පඤ්ච ශීලයද පෝහොය අටසිල්ද රක්නාහ. රාජ්‍යවාසීද ඒ රජහුගේ අවවාද යෙහි පිහිටා දනාදිවූ පින්කම්කොට මළ මළ යම්කෙණෙක් දිව්‍යලෝක යෙහි උපදනාහුය. මෙසේ සුදම්දෙව් සභාව පුරාගෙණ උන්නාවූ තරුණ දෙවියෝ ඒ සාධීන රජ්ජුරුවන්ගේ දන ශීලාචාර ගුණයෝ වර්ණනා කරත් නැඟ. එපවත් අසා පළමු දිව්‍යලෝකයෙහි උපන් දේවතාවෝත් රජ්ජුරුවන් දක්නා කැමති වූවාහුය. එසඳ ශක්‍රයෝ දෙවියන්ගේ අදහස් දැන රජ්ජුරුවන්

දක්නා කැමැත්තාදැයි විචාරා එසේයයි කීකල්හි මාතලී සඞ්ගහයකයා කැඳවා සාධින රජ්ජුරුවන් කැඳවාගෙණ එවයි විධාන කළහ. එසඳ යහපතැයි පිළිගෙණ සෙල සියයක් යොදුන් වෛජයන්ත නම් රථය යොදා, වේදේහ රටට නික්මින, එදවසත් පුණුපොහෝ දවස විය. එසඳ මාතලී දිව්‍යපුත්‍රතෙම මනුෂ්‍යයන් සවස බත්කා තමතමන්ගේ මිදුලුවල සැප කථාමෙන් යුක්තව උන්කල්හි යුගඳුරු මුදුනෙන් නැගෙන්නාවූ පුන්සඳ මඬල හා සමග රථය පදනට පටන්ගත. මනුෂ්‍යයෝ ඒ දැක අද දවස් දෙසඳෙක් නැඟේයයි කියමින් කථාකොට උන්කල්හි නැවත සඳමඬල පසුකොට රථය එන නියාව දැක ඒ තෙම සඳමඬලෙක් නොවෙයි රථයෙක එක් දිව්‍යපුත්‍රයෙක් පෙණෙයි. මේ මනොමය සෛන්ධවයන් යෙදූ දිව්‍ය රථය කාට ගෙණෙද්දෝහෝයි සමහර කෙණෙකුන් ආශ්චර්යයකින් යන්ට වන්කල්හි ඉන් කීසිකෙණෙක් අනික් කාට ගෙණෙද්ද? ධාර්මිකවූ අපගේ රජ්ජුරුවන් වහන්සේට යයි සතුටුව දෙහොත්මුදුණෙහි බැඳගෙණ යසපිරිවරින් යුක්තවූ අපගේ සාධින රජ්ජුරුවන්ට දිව්‍යරථයෙක් පහළවිය. පෙර මේ ලොකයෙහි නුදුටුවිරූ අපූර්වදෙයෙක අපගේ ශරීරයෙහි ලොමු ඉහගත්තේ බලවයි කීසමින් රථයට සුවඳින් මලින් පූජාකරන්ට පටන්ගත්හ.

මාතලී දිව්‍යපුත්‍රද මනුෂ්‍යයන් පූජාකරමින් සිටියදීම සත්යොදුන් මියුලුනුවර තුන් විටක් පැදකුණු කොට රාජමාරයට ගෙණගොස් රථය කරකවා රථයෙහි පසුභාගය මතුමාල්තලෙහි නැගෙණහිර සිව්මැදුරු කවුළු වට යොමුකොට නැගෙන්නට යෝග්‍යකොට තිබීය. එදවස් රජ්ජුරුවෝ දන්හල බලා මෙම ක්‍රමයෙන් දන් දෙවයි නියුක්තයන්ට විධානකොට පෙහෙවස් සමාදන්ව දිවාභාගය යවා සවස ඇමති මඬුලු පිරිවරා අලංකෘතවූ මාල්තලෙහි නැගෙණහිර සිවුමැදුර කවුළුවට අභිමුඛව ධර්මදානය දෙන කථාවෙන් යුක්තව උන්නාහ. එද මහත්වූ ඍද්ධ්‍යනුභාව ඇති මාතලී නම් දිව්‍යපුත්‍ර රජ්ජුරුවන් කරා එළඹ දික්පතල යසෝකීර්ති ඇති රජ්ජුරුවන් තව්තිසා භවනයෙහිවූ සුධර්මා නම් දෙව්සභාවෙහි පුරාඋන් ශක්‍ර රජ්ජුරුවන් ප්‍රධාන කොටඇති සියලු දෙවියෝ නුඹවහන්සේ දක්නා අභිප්‍රාය ඇත්තාහ. එසේ හෙයින් වහා අවුත් සිටිය මැනව, නුඹවහන්සේ දැක්මෙහි සතුටු දෙවියන් කරා මා හා සමග වැඩිය මැනවැයි ආරාධනා කෙළේය. මෙසේ ඔහු පැවරූ ඉක්බිති සාධින රජ්ජුරුවෝ රථයට නැංගාහ. එසඳ ඔහට දිව්‍ය ශරීරය පහළවිය. එකල්හි රථය ජනයා බලාසිටියදීම ආකාශයට නැගී තව්තිසා දෙව්නුවරට ගියේය.

එකල්හි දිව්‍යලෝකයට ගියාවූ රජ්ජුරුවන් දැක දෙවියෝ මහත්වූ සොම්නසට පැමිණ මහරජ නිදුක්ව සැපසේ ආබව ඉතා යහපතැයි නැවත සතුටුව වැඩිය මැනවැයි ශක්‍රයන් හා සමග වැඩහුන මැනවැයි පැවරූහ. ශක්‍රදේවේන්ද්‍රයෝද විශෙෂයෙන්ම සතුටුව සමීපයට ගොස් කැඳවා එක හස්නේ හිඳුවාගෙණ මහරජ කරණලද පුණ්‍ය වශීතාවන් ඇති දෙවතාවන් කරා නුඹවහන්සේ ඇවිත් පැමිණීබව ඉතා මැනවී, එසේ හෙයින් රාජොත්තමයාණෙනි සියලු වස්තුකාම කෙලශකාමයෙන් අනූනවූ තව්තිසා භවනයෙහි දිව්‍ය සම්පත්ති අනුභවකොට විසුව මැනවයි ඒ සාධින රජ්ජුරුවන්ට ආසනයෙන් නිමන්ත්‍රණයකොට ශක්‍රදේවේන්ද්‍රයන් විසින් රජ්ජුරුවන්ට දසදහසක් යොදුන් ශක්‍රභවනයද, අඩුතුන්කෙළ පුරඟනාවන්ද වෛජයන්ත ප්‍රාසාදය හා සමග සියලු ශක්‍රභවන සම්පත් දෙකක්කොට බෙදා දුන්හ. මේ සම්පත් අනුභව කරන්නාවූ මහබොධි සත්ත්වයන්ට මනුෂ්‍ය ගණනා

වෙත් සත්සියයක් අවුරුදු පිරීගියේය. ඒ ආත්ම භාවයෙන් දිව්‍යලොක යෙහි වසන කුසල් ගෙවින. ඒ කාරණයෙන් ශක්‍රයන් හා කැටුව කථාකරන් නාවූ බොධිසත්ත්වයෝ ශක්‍රදේවේන්‍ද්‍රයෙනි මේ දිව්‍යලොකයට පැමිණියාවූ මම පෙර තොපගේ මේ සූවිසි කෝටියක් පමණ කලුතාවකයන්ගේ නෘත්‍ය ගීත වාද්‍යාදියෙහි සිත් අලවා වාසය කෙරේනුයි, එසේවූ මම දුන් මේ දිව්‍යලොක යෙහි ඇලුම් නැත්තෙමි. කාරණා කිමහොත්? උච්ඡේද කර්ම වශයෙන් මරණ පැමිණියේද නැත මම සිහිමුලාව ගියෙම්දැයි විචාළාහ. ඉක්බිති ශක්‍රදේවේන්‍ද්‍ර යෝ වීර්‍ය්‍යවන්තවූ උතුම්වූ රජ්ජුරුවෙනි තොපගේ ආයු ගෙවී ගියෙත් නැත සිහිමුලා බවකුත් තොප කෙරෙහි නැත්මය, එතකුදු වූවත් බල එකෙක් ඇත්තේය, ඒ ආත්ම භාවයෙන් මේ දිව්‍යලෝකයෙහි වින්දයුතු කුසල් විපාක සවල්පවිය. එහෙයින් මහරජ තට අනභිරති උපනැයි කීහ. මෙසේ කියා නැවත දික්පතිවූ රජ්ජුරුවෙනි මම පෙර මේ ශක්‍රාත්මය පතා කුශලයක් කෙළෙම්නම් එම කුශලය දෙකක්කොට බෙදාපියා නුඹවහන්සේට දෙමි. ඒ මාගෙන් දෙනලද කුශලානුභාවයෙන් මේ නියා භවයෙහි අමානුසිකවූ දිව්‍ය සම්පත් අනුභවකොට විසුව මැනවැයි පැවරූහ.

ඉක්බිති ප්‍රතික්‍ෂෙප කරන්නාවූ ඒ බොධිසත්ත්වයෝ ශක්‍රදෙවෙන්‍ද්‍රයා නෙනි අනුන්ගෙන් පිරුලු වශයෙන් ඉල්වාගන්නා ලද්දාවූ ඉදෙලි කුනම් ආදී යාන වාහන වස්ත්‍රාභරණාදිය ද යන මේ සියල්ලම සතුටුවීටදී රුස්වූවිට උදුරා ගන්නා ලැබේද? එමෙන්ම අනුන් ගෙන් පිරුලු වශයෙන් දෙනලද්දාවූ සම්පත් නොකැමැත්තෙමි. ඊට කාරණා කිම්දයත්? තමා කරණලද කුසල් තමහට ආවේනිකවූ සම්පත් වන්නේයයි කීහ. තවද ශක්‍රදේවේන්ද්‍රයෙනි ඉෂ්ටවිපාක දායකවූ කුශලයක්කොට සුවපත් නො වේද පසුතැවිලිවේද එබඳු කුසල් කරණු සඳහා මනුෂ්‍යලෝකයට යම් වදාළාහ. එපවත් අසා ශක්‍රදේවේන්ද්‍රයෝ මාතලිය කැඳවා ගොස් සාධීන රජ්ජුරුවන් මිථිලාවෙහි උයනට රථයෙන් ගෙණගොස් තබා පියා එවයි විධාන කළහ. එයින් එලෙසට කෙළේය. රජ්ජුරුවෝ උයන්හි සක්මන්කරමින් සිටියාහ, උද්‍යානපාලයා දැක නත්ව විචාරා දැක ගොස් එවකට රජ කරන්නාවූ නාරදරජ්ජුරුවෝ ඒ බව දැන තෝ පළමුකොට ගොස් උන්වහන්සේටත් මටත් ආසන දෙකක් පණවාලවයි නියෝගකොට උද්‍යානපාලයා යවූහ. එසඳ එලෙස කෙළේය. රජ්ජුරුවෝ එලෙස අසුන් දැක කවුරුන්ටදැයි විචාළාහ,

උද්‍යාන පාලයා කියන්නේ එකක් නුඹවහන්සේටය එකක් අපගේ රජ්ජුරුවන්වහන්සේටයයි කීහ, එපවත් අසා සාධීන රජ්ජුරුවෝ මෙලොව කවරෙක් මා ඉදිරියෙහි අස්නක ඉන්ට ඒදැයි එක් ආසනයෙක ඉඳ එක් ආසනයක පය තුබූහ. නාරද රජ්ජුරුවෝද මහපිරිවරින් අවුත් රජ්ජුරුවන් ශ්‍රීපාදය වැඳ එකත් පසෙක ඉඳ රජ්ජුරුවෝද ඒ සාධීන රජ්ජුරුවන්ට සවෙනී මුණුබුරානෝය, මහබොධිසත්ත්වයෝ තමන්වහන්සේගේ කුශල බලයෙන් මෙතෙක් කල් දෙවූ සම්පත් අනුභව කළහ, එකල මනුෂ්‍යයන්ට පන්සියයක් අවුරුද්දට ආයුවතනේය, ඉක්බිති සාධීන රජ්ජුරුවෝ නාරද රජ්ජුරුවන් අත අල්වාගෙණ උයනේ සක්මන් කරන්නාවූ පුත නාරද රජ්ජුරුවෙනි මේ භූමිභාගය පුෂ්පූපග ඵලූපග වෘක්‍ෂයෝද සොභමානවූ රජ මෙල්පලාතිබෙන බිසෝකොටු වාරිමාර්ගාදියද, උභයපාර්ශවයෙහි නීල පීත මල් ගැවසී හඬා බස්නාවූ ගං හෝ ඇල කඳුරැලි ආදියද, තවද පියුම් මලින් ගැවසීගත් චක්‍ර වාකාදීන් කුල්නාද සිත් කළුවූ මේ පොකුණු පතස්විල් ආදීවූ මේ උද්‍යානයට වඩා සිටි යථොක්ත වනස්ට පන්තිහුද යන මේ සියල්ලම රජකරණ සමයෙහි

භූමිභාගාදි වස්තුහු මය. එසමයෙහි මා විසින් සලස්වා සිටුවනලද ඇපා මාපා යුවරජ සෙනෙවිරත් ලෙනා මහලෙනා ආදීවූ අමාත්‍යමණ්ඩලයාද, තවද මාණික්‍ය කුණ්ඩලාභරණාදියෙන් සැදුම්ලද උතුම් භාව භාව ලීලා කටාක්‍ෂයෙන් විරාජමානවූ අන්තඃපුර වනිතාවූ සියල්ලවුන් නොදක්නා මට බැලූ බැලූ සියලු දික්හි දිස්වගියාවූමෙන් වැටහෙන්නේය. උඹ තෝ විසින් කවරදික්හි දෙශයකට යවා පියන ලද්දූයි විචාළාහ. ඉක්බිති නාරද රජ්ජුරුවෝ මහරජ නුඹවහන්සේ මෙවකට දිව්‍යලෝකයට ගියේ සත්සියක් අවුරුදුය. ඒ නුඹවහන්සේගේ උපස්ථායකයෝ සියල්ලෝම මරුමුඛයට ගියෝය. ඉත් නුඹවහන්සේ සන්තක රාජ්‍යය අනුශාසනා කළමැනවැයි කීහ.

එපවත් අසා මහ බොධිසත්ත්වයෝ පුත නාරද රජ්ජුරුවෙනි, දහසක් යොදුන් ඇති වෛජයන්ත නම් ප්‍රාසාදයෙහි ශක්‍රයත් හා නොවෙනස්ව අර්ධ රාජ්‍යසම්පත්ති අනුභව කරන්නෙම් මා විසින් තව්තිසා වැසි සිංලු දෙවියන්ගේ කුශලයෙන් පහළවූ කනක රජතේන්ද්‍රිය ලෝහිතාංක මසාරගල්‍යාදී නොයෙක් දිව්‍ය විමානයෝ දක්නාලදහ, තවද ඒ අමානුසික දිව්‍යසම්පත් ඇරපියා කුසල් කරණ සඳහා ආයෙමි, එසේහෙයින් මටද රාජ්‍ය සම්පත්තියෙන් ප්‍රයෝජන නැත. පුත නාරද රජ්ජුරුවෙනි මනා ආචාර ව්‍රත ඇති උත්තමයෝ යම් මාර්ගයකින් නිවන්පුරයට වදිද්ද එසේවූ සම්‍යක් සම්බුද්ධයන් විසින් වර්ණනා කරණ වධබන්ධන රහිත සම්‍යක්දෘෂ්ටි පෙර දූරි කොට අෂ්ටාංගිකමාර්ගානුසාරයෙන් විසුද්ධපරම්පරාවෙන් පැමිණිය මනා ඒ නිවන් මාර්ගය පසක් කරණු කැමතියෙමි, එම බොධිසත්ත්වයෝ සර්වඥතාඥානයෙහි පැහැද බණවදාරා පුත නාරද රජ්ජුරුවෙනි සම්පත්තීන් මට ප්‍රයෝජන නැති සත්සියයක් අවුරුදු පිරිහී ගිය දූතය සත්දවසක් ඇතුළත දෙන්නා කැමැත්තෙමි වදාළසේක. නාරද රජ්ජුරුවෝද යහපතැයි එලෙසම දන් පිළියෙල කළාහ. මහබොධිසත්ත්වයෝ සත්දවසක් මුළුල්ලෙහි මහදන්දී සත්වෙනි දවස් කළුරියකොට තවුතිසා දෙව්ලොව උපන්නාහයි යනාදීන් බුදුහු මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා උපාසකවරුනි පෙහෙවස් නම් එසේ මෙසේ කටයුතු දෙයක්වේදැයි වදාරා මේ ජාතකය පූර්වාපරසන්ධිගලපා උපාසකවරුන්ගෙන් කිසි කෙණෙකුන්සොවාන් මාර්ගයෙහිද කිසිකෙණෙකුන් සකෘදාගාමි මාර්ගයෙහිද පිහිටුවා ජාතක ධර්මදේශනාව නිමවා වදාරා. එකල නාරද රජ්ජුරුවෝ නම් දූන් ආනන්ද ස්ථවිරයෝය, එකල උපඩ්ඪ රාජ්‍යය දුන් ශක්‍රයෝ අනුරුද්ධ ස්ථවිරයෝය, සාධින රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

487
දශබ්‍රාහ්මණ ජාතකය

තවද සතර සතිපට්ඨාන සූත්‍ර ධර්මයන් ආදීවූ සත්තිස් බොධිපාක්ෂික ධර්මයන් පුරුදුකළාවූ අප බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් අසදෘශම්භාදානය අරභයා මේ දශබ්‍රාහ්මණ ජාතකය දෙශනාකළසේක. එහි විස්තර අට්ඨනිපාතයෙහි සුචිර ජාතකයෙහි කී නියායෙන් දතයුතු.

ඒ කෙසේ දැ යත්,

කෝසල රජ්ජුරුවෝ බුදුන් ප්‍රධානකොට ඇති පන්සියයක් ක්ෂීණ ශ්‍රාවක භික්ෂූන්වහන්සේ තෝරා අසදෘශ මහාදානය දුන්හ. ඉක්බිති දම්සභාවේ රැස්ව වැඩඋන් භික්ෂූහු රජ්ජුරුවන්ගේ ගුණ කථාකරන්නාහු ඇවැත්නි කෝසල රජ්ජුරුවෝ දන් දෙන්නාහු මාහාඝී තැන් තෝරාගෙණ දුන්නෝ වේදැයි යනාදීන් කථාකොට උන්හ. බුදුහු ඒ අර්ථෝත්පත්තිකොටගෙණ පූර්වචාරය ප්‍රතිසංයුක්ත ධර්මකථාවෙක් උපදනේයයි දැන තුන්තරාගමනින් එක්තරා ගමනකින් දම්සභාවට වැඩ වදාරා පණවනලද උතුම්වූ බුද්ධාසනයෙහි වැඩහිඳ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා භික්ෂූන්වහන්සේ ස්වාමීනි කෝසල රජ්ජුරුවන්ගේ ක්ෂෙත්‍ර සුද්ධියක් දෙන ලද දානය වර්ණනාකොට උනුම්හයි දැන්වූ කල්හි මහණෙනි මා වැනි සර්වඥයන්හට උපස්ථායකව සිටියාවූ මොහු ක්ෂෙත්‍ර ඇඳින දන්දීම ආශ්චර්යනොවෙයි. පූරාතනයෙහි පණ්ඩිතවරහු නුබුදු හමුයෙහිත් දන් පිළිගන්ට යොග්‍යයන් තෝරගෙණ දන්දුන්නෝ වේදැයි වදාරා අතීත කථාව ගෙණහැර දක්වා වදාරණසේක් මහණෙනි.

යටගිය දවස ඉඳිපත්නුවර යුධිෂ්ඨිල ගෝත්‍ර ඇති කෝරව්‍ය නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ගේ අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නා විධුර වැනි නුවණැති විධුර නම් අමාත්‍යයාන කෙණෙක් ඇත්තාහ. ඒ රජ සියලු දඹදිව දානකෝලාහලයෙන්ම ක්ෂොභා කොට දෙන්නාහ. ඒ දන්ගෙණ අනුභව කරන්නාවුන්ගෙන් යටත්පිරිසෙයින් පඤ්චසීලය රක්ෂාකරන්නාවූ කෙණෙකුන් නැත, හැමදෙනම දුශ්ශීලය අනාචාරශීලී සත්ත්වයෝම දන් අනුභව කෙරෙති, එතෙම රජ්ජුරුවන්ගේ සිත් නොපහද්දී රජ්ජුරුවෝ ක්ෂෙත්‍ර සුධිය නෝරාගෙණ දෙන දානය මහත්ඵලඇත්තේයයි සිල්වතුන්ට දෙනු කැමතිව විධුර පණ්ඩිතයන් හා කථාකරමෙයි සිතා පසු දවස් උපස්ථානයට ආවාවූ විධුරපණ්ඩිතයන් තමන්ගේ ආසන මස්තකයෙහි ඉඳුවා ප්‍රශ්නකොට විචාළාහ, ඒ කෙසේද? යත් කුශලාර්ථිවූ යුධිෂ්ඨිල ගෝත්‍ර ඇති කෝරව්‍ය රජතෙම සබඳ විධුර පණ්ඩිතයන් වහන්ස සිල්වත්වූ බොහෝ ඇසූපිරූ තැන් ඇති මෛථුන ධර්මයෙන් විනිර්මුක්තව මනාවූ ආචාර ධර්මයන් ඇති යම් උත්තම කෙණෙක් ඇද්ද ඔහු මාගේ දානය අනුභව කළාහු වී නම් එනනට දෙනලද්දේ මහාඵල මහානිසංස ඇතිවන්නේය, එසේවූ දක්ෂිණාර්හ පුද්ගලයන්ට දන්දෙනු කැමැත්තෙමි. එසේවූ සමිත පාපිවූ ශ්‍රමණ බ්‍රාහමණ කෙණෙකු සොයා මට කියවයි කීහ එපවත් අසා විධුර පණ්ඩිතයෝ කියන්නාහු මහරජ සිල්වත් බොහෝ ඇසූපිරූ තැන් ඇති මෛථුනධර්මයෙන් වැලකී උත්තම බ්‍රාහ්මණ කෙණෙකුන් දුර්ලභය, තවද මේ ලෝකයෙහි බ්‍රාහ්මණයෝයයි ව්‍යවහාර කරන්නාවූ බ්‍රාහ්මණයෝ දස කොටසක් ඇත්තාහ, උන්ගේ විභාග මෙසේ ඇසුව මැනව, කෙසේද? යත් නොයෙක් බෙහෙත් බඩු රෙදිවල පොට්ටනි බැඳ මහත්වූ පයි ඇතුළේ ලාගෙණ ඖෂධය මෙමම රෝගයට ප්‍රත්‍යක්ෂයයි යනාදී මනුෂ්‍යයන්ට දෙමින්, තවද මේ ඖෂධය බහාලූ ජලයෙන් නශ්‍යකළකල මෙමම ව්‍යාධියට යහපතැයි සත්ත්වයන් ස්නානය

කරවා යක්ෂයන්ට මන්ත්‍ර පිරුවා වෛද්‍ය කෘත්‍යය කරන්නාමෙන් ඇවිදිනාවූ බ්‍රාහ්මණයෝත් ඇත. තවද මහරජ තමන්ගේ බ්‍රාහමණධර්මය හැර ඇතැම් බමුණු කෙණෙක් ජීවත්වනු පිණිස රාජ රාජ මහාමාත්‍යාදීන් කරා එළඹ කිංකිණිදැල් නම් තාලං ගෙණ ගී කියමින් ඉදිරියෙහි පස්සෙහි යන්නාහු කිසි විටෙක උන්ගේ මෙහෙකරුවන්මෙන් කී කී නොයෙක් මෙහෙවරයට යන්නාහ. තවද මහරජ සමහර බ්‍රාහමණ කෙණෙක් කමඩලාව ගෙණ සෙඹු වැල් ගෙණ රජදරුවන් අනුව ගොස් මේ වස්තුව දුන්නොත් විනා නැගී නොසිටිම්හයි ඉඳ ගම්වැද කැමති සම්පත් ඇරගෙණ රජදරුවන්ගෙන් කරවූ වර එළවනලද සහාසික නඩලූන්මෙන් ඇවිදිනාවූ බ්‍රාහමණ ජාතියකුත් ඇත්තාහ. තවද මහරජ දික්වූ කක්ෂ රෝමයන් ඇති මැලිවූ දත් ඇති දික්වූ නිය ඇති ධූල වගුල ඉස කෙස් ඇති දූගිය සෝතෙක්හි සිටි දූලි කනුවක් සෙයින් දෙර දෙර සිඟා ඇවිදිනාවූ යාචකයනුත් බ්‍රාහ්මණයයි කියති තවද මහරජ අරළු බුලු ඇඹුල අඹ දෙල් බෙලි ඩෙබර උක් මී ආදීවූ නොයෙක් වස්තූන් ඇරගෙණ විකොට ජීවත්වන්නාවූ වෙළඳුන් හා සමාන බමුණු ජාතියකුත් ඇත්තාහ. තවද මහරජ අවශෙෂවූ කෘෂි වණප්ජාදීවූ කර්මාන්තද එළු ගවයන් ඇතිකිරිමද තමන්ගේ කුමාරිකාවරුන් රන් රුවන් ආදීවූ බොහෝ සම්පත් ඇරගෙණ අනුන්ට පාවාදී තමන්ගේ පුතුන්පිණිස ඔබ්බෙන් ගෙන්වා ගැන්මද යන මේ නොයෙක් කෘත්‍යයන් කරන්නාවූ වෙළඳ ගොවීන් හා සදෘශ බමුණු ජාතියකුත් ඇත්තාහ.

තවද මහරජ ගාම පොරෝහිතව බොහෝ වෘත්තීන් මවාගෙණ විචාරණලද සත්වයන්ට තච්ඡෙද බන්ධනාදියට නැකැත්ලීම්ද ගොන් එළුවන් මරා මස් විකුට සම්පත් උපදවා ගන්නාවූ බ්‍රාහ්මණ ජාතියකුත් ඇත්තාහ. තවද මහණජ කඩු හා බැඳ පරාගෙන වෙළඳුන් යන මඟසිට ගෙණ උන් අතින් දස පන්සිය ගෙණ මරු කතරවලින් ගලවා ඇවිද ජීවත්වන්නාවූ ගොපොල්ලන් ගම් පහරණ සොරුන්වැනි බමුණෝත් ඇත්තාහුය. තවද මහරජ ලාපලාගෙණ සාවුන් ගොයින් මීවින්නන් ආදීවූ තිරශ්චීනයන්ද මස් කැස්බන් ආදීවූ ජලවර සතුන්ද මරා කා වැද්දන් හා සමානවූ බමුණු ජාතියකුත් ඇත්තාහ.

තවද මහරජ අනිකුත් ජාතියෙක් පාපප්‍රවාහයකොට අනුන් කළ පව් හැරපියම්හයි සම්පත් නිසාම සෝම නම් යාගයක් උපදවා රජ්ජුරුවන් සවණී යානෙක්හි හිඳුවා හෝමස්නානයකරවා යාගයට එකෙක් ඉම්ම ඒ පව් ගනිම් ස්නානය කරණ පැතින් තෙමී ඉඳිතේ එකල්හි ඒ රත්‍රන් ඇද්ද? ඒ රජ හත් පලන් වස්ත්‍රාභරණයද යාගයට හොත්තහුට පැමිණෙන්නේය. අවශෙෂවූවෝද ස්නානය කරවූ බමුණෝ බොහෝ වස්තු ලබන්නාහ. මෙසේද ජීවත්වූ බ්‍රාහ්මණ ජාතියෙක් ඇත්තාහ. මේ ආදීවූ ගුණයෙන් උපලක්ෂිතවූ බ්‍රාහ්මණයන්ට ආරාධනාකොට දක්වමෝදැයි විචාළාහ. එපවත් අසා පළමුව උන්ගේ චාරිත්‍ර නුසුදුසු බව දන්නාවූ ඒ කෝරව්‍ය රජ්ජුරුවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙනි ඒ තොප විසින් කියනලද අනේක භෙද ඇති බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණ ධර්මයන් වැලැක්කාහ. උන් ඇම කෙරෙහි ශීල සංවුතාදී උතුම් ගුණයන් නැති බව පළමුව දනිමි. එහෙයින් විධුර පණ්ඩිතයෙනි බමුණු ශ්‍රුතවූ උතුම්වූ ශීල ව්‍රත සමාදානයන් ඇති කෙණෙකුන් පරීක්ෂාකොට කියවයි කීහ. එකල්හි මහරජ මා විසින් නුඹවහන්සේට ව්‍යවහාර මාත්‍රයකින් බමුණෝයයි කියා මේ ලෝකයෙහි ප්‍රසිඬවූ බ්‍රාහ්මණ ජාතීන් විභාගකොට කියනලද. එතකුදු වූවත්

මහරජ සමිත පාපිවූ ඇසුපිරූ තැන් ඇති ගෞරවාර්හාදිවූ උතුම් ගුණ ඇති එසේයින්ම මෛථුන ධර්මයෙන් විනිර්මුක්තවූ ප්‍රතිවේධ කරණලද දුක්ඛ නිරෝධාදී බොහෝ සත්‍යයන් ඇති ඒකභක්තියෙන් යැපෙන්නාවූ බ්‍රාහ්මණ කෙනෙක් ඇත. ඔහු කවරහුත් ප්‍රත්‍යෙක සම්‍යක්සම්බුද්ධවරයෝ ඇත්තාහ. එසේවූ මහාත්මයන් නිමන්ත්‍රණයකොට දන්දුන්න මැනවැයි කීහ. එපවත් අසා රජ්ජුරුවෝද සබඳ විධුර පණ්ඩිතයෙනි එබඳුවූ අග්‍රදක්ෂිණෙය්‍ය වූ පුද්ගලවූ සමිත පාපිවූ පසේබුදුහු කොයි වෙසෙත්දැයි විචාළාහ. එසඳ මහ බෝධිසත්ත්වයෝ උතුරු හිමවත නන්දමූලක නම් පබ්භාරයෙහි වෙසෙති කීහ. ඉක්බිති රජ්ජුරුවෝ පණ්ඩිතයෙනි තොපගේ බලයෙන් ගෙන්වයි කීහ. මහ බෝධිසත්ත්වයෝද මහරජ එසේවීනම් නුවර සරහා සියලු නුවර සහ සියලු නුවර වාසීහු ශක්ති පරිද්දෙන් දන්දී ෂෙහෙව සිල්සමාදන්වයි විධානකොට බෙර ලැවූව මැනවයි තුඹවහන්සේද පරිවාර ජනයන් හා සමග පෙහෙවූව මැන වැයි කියා උදෑසනක්සේම බත් අනුභවකොට උපෝසථාඞ්ගය සමාදන්ව සවස දෑසමන් පිරිණූ සුමුගක් ගෙන්වාගෙණ රජ්ජුරුවන් හා සමග පසේ බුදුන්ගේ ගුණ සඳහන්කොට පසඟපිහිටුවා වැඳ උතුරු හිමවත ගන්ධමාදන පර්වතයෙහි වාසයකරන්නාවූ පසේබුදුන්වහන්සේට සෙටදවස් අපගෙන් දන් පිළිගන්නාසේක්වයි ආරාධනාකොට දෑසමන් මල් අටමිටක් ආකාශයට දැමූහ. ඒ මල් අටමිට ආකාශයෙන් ගොස් පන්සියයක් පසේබුදුන්ගේ මධ්‍යයෙහි හිත. ඔහුද ආවර්ජනා කරණසේක් මේ කාරණය දැක පින්වත් විධුර පණ්ඩිතයන් විසින් එවනලදුම්හ. එසේ මෙසේ සවල්පඑකෙක් නොවෙයි මහාබුද්ධාංකුරයෙක, මෙම කප ලොවුතුරා බුදුවන්නේය. එසේ හෙයින් උන්ට අනුග්‍රහ කළමැනවැයි ඉවසා වදාළසේක.

මහබෝධිසත්ත්වයෝද ගිය මල් නැවත නොආ සලකුණෙන් ආරාධනාව ඉවසූ බව දැන මහරජ සෙට පසේබුදුහු වඩනාසේක. ඔබ වැඩි කල්හි කළමනා සත්කාර සම්මාන ඉදුරා කළ මැනවැයි කීහ. දෙවෙනි දවස් රජ්ජුරුවෝ මතුමාල්තෙලෙහි මාහැඟි අසුන් පණවා දන්සපයා පෙරමග බල බලා උන්හ. පසේබුදුවරහු අනොතත්තවිලට බැස කරණලද ශරීර පිළිදැගුම් ඇතිව වේලා බලා පියුම්විල දිවන්නාවූ රාජ හංස සමූහයක්මෙන් ආකාශයෙන් අවුත් රාජාංගනයෙහිබැස පිළිවෙළින් වැඩසිටියාහ. ඉක්බිති රජ්ජුරුවෝද මහ බෝධිසත්ත්වයෝද සතුටුසිතින් වැඳ කැඳවාගෙණ ප්‍රාසාදයට නංවා වඩාහිඳුවා දක්ෂිණෝදකයදී ප්‍රණීතවූ ඛාද්‍ය භොජ්‍ය යෙන් වළඳවා භක්තකෘත්‍යාවසාන යෙහි දෙවෙනි දවසටයයි ආරාධනාකොට සත්දවසක් මහදන්දී සත්වෙනි දවස් පන්සියක්දෙනා වහන්සේට සර්වපරිෂ්කාර දානයදී වැඳ වැඳ සිටියාහුය. ඒ පසේබුදුවරහුද අනුමෙවෙනි දෙශනාකොට ආකාශයෙන් නන්දමූලක පබ්භාරයට වැඩිසේක. පිරිකරද කැටුවම ආකාශයෙන් නැගී ගියේය. යනාදීන් බුදුහු මේ ජාතකය ගෙණහැර දක්වා මහණෙනි කෝසල රජ්ජුරුවන් උපසථායකව සිට දන්දීම ආශ්චර්‍ය්‍ය නොවෙයි. පුරාතනයෙහි පණ්ඩිතවරහු බුදුන් නූපන්කලද දක්ෂිණෙය්‍යපුද්ගලයන් ඇඳින දන්දුන්නෝවේදැයි වදාරා මේ ජාතකය පූර්වාපරසන්ධි ගලපා මහණෙනි එකල කෝරව්‍ය රජ්ජුරු වෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. විධුර පණ්ඩිතයෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

488
භික්ඛාපරම්පර ජාතකය

තවද ශාක්‍යකුල තිලකවූ දසබල ධාරීවූ ගෞතම ගොත්‍රයෙහි උපන් සම්මාසම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනසමයෙහි එක් කෙලෙඹිපුත්‍රයක්හු අරභයා මේ භික්ඛාපරම්පර ජාතකය ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

ඒ කෙලෙඹි පුත්‍රතෙම ශ්‍රද්ධා ඇත්තේය. තුණුරුවන් කෙරේපැණවා බුදුන්ටද භික්ෂුසඞ්ඝයාටද නිරන්තරයෙන් සත්කාර සම්මාන කරන්නේය. ඉක්බිති එක් දවසක් සිතන්නේ බුද්ධරත්නයටද, සඞ්ඝරත්නයටද ප්‍රණීත භොජනය දීමෙන්ද සිහින් පිළි දීමෙන්ද බොහො සත්කාර කෙළෙමි. දැන් වනාහි ධර්‍මරත්නයට සත්කාර කළමැනවැයි සිතා ඒ තෙම බොහෝ ගඳ දුම් මල් පහන් ගෙන්වාගෙණ දෙව්රම් වෙහෙරට ගොස් බුදුන් වැඳ එකත්පස්ව ඉඳ ස්වාමීනි ධර්‍මරත්නයට සත්කාර කරණු කැමැත්තෙමි. ධර්‍මරත්නයට සත්කාර කරන්න වූත් කළමනා කවරේදැයි බුදුන් අතින් විචාළේය. ඉක්බිති බුදුහු ඉදින් ධර්‍ම රත්නයට සත්කාර කරණු කැමැත්තෙහි වී නම් ධර්‍ම භාණ්ඩාගාරිකවූ ආනන්ද ස්ථවිරයන්ට සත්කාර කරවයි වදාළසේක. එද යහපතැයි මුදුනෙන් පිළිගෙණ අනඳමහතෙරුන් වහන්සේට ආරාධනාකොට පසුදවස මහත්වූ පූජාසත්කාර යෙන් ගෙට වඩාගෙණවුත් මහත්වූ ආසනයෙක්හි වඩාහිඳුවා සුවඳින් මලින් පූජාකොට අනඝී රසමසවුලෙන් යුක්තවූ ආහාරය පිළිගන්වා මාහැඟිවූ පිළී තුන් සිවුරට සෑහෙන පරිද්දෙන් පිළිගැන්විය.

තෙරුන්වහන්සේද මේ සත්කාරය ධර්‍මරත්නයට කරණලද මට සුදුසු නොවෙයි විහාරයට ගෙණවුත් දම් සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේට සුදුසුයයි ඔබට පිළිගැන්වූසේක. ධර්‍මයට කරණලද සත්කාරය, ඒ සෙයින් සුදුසු නොවේ. ඒකාන්තයෙන්ම ධර්‍මස්වාමීවූ බුදුන්ට සුදුසුයයි පිළිගැන්වූසේක. බුදුහු තමන්වහන්සේට උත්තම කෙණෙකුන් නැතිහෙයින් පිඬු වළඳා සිවුරු පිළිගත්සේක. භික්ෂූන්වහන්සේ දම්සභාවෙහි කථාප්‍රවර්‍තනය කරණසේක් අසෝ කෙළෙඹි පුත්‍ර තෙම ධර්‍මරත්නයට සත්කාර කෙරෙමි කියා අනඳමහතෙරුන්වහන්සේට දන් දුන, ඔහු තමන්ට නුසුදුසුයයි ධර්‍මසේනාධිපති ස්ථවිරයන්ට දුන්හ. ඔහු තමන්ට නුසුදුසුයයි බුදුන්ට පිළීගැන්වූහ. බුදුහු තමන්වහන්සේට උත්තර කෙණෙකුන් නැතිහෙයින් ආහාරයත් පිළිගෙණ වළඳා සිව්රු පිළිගත් සේක. මෙසේ ඒ දානපරිත්‍යාගය සුදුසුතැනට පැමිණියේයයි කථාකොට උන් සේක. බුදුහු කථා ප්‍රබන්ධය අසා වදාරා තුන්තරාගමනින් එත්තරා ගමනෙක ධම්සභා මණ්ඩපයට වැඩ පණවනලද උතුම්වූ බුද්ධාසණ මස්තකයෙහි වැඩ හිඳ මහණෙනි මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කීකල්හි මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් පරම්පාරවශයෙන් නිසිතැනට පැමිණියේවේදැයි වදාරා ඒ භික්ෂූන් විසින් අරාධිතවූ බුදුහු ඉකුත්වත් කථාව ගෙණහැර දක්වා වදාරණසේක්

මහණෙනි,

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් සතර අගතියට නොගොස් දශරාජධර්‍මයෙන් වියෝනොව සතර සංග්‍රහවස්තූන් යෙදී දැහැමෙන් රජකරන්නාහුය. ඒ රජ්ජුරුවන්ගේ සභාශාලා ආදිය සිස්ව

ගියාක්මෙක් අයුක්ති පමුණුවන කෙණෙක් නැත්ල, එතකුදු වුවත් ඒ රජ තමාගෙන් අගුණයක් සොයාගන්ට උවමැනවැයි තමාගේ රජගෙයිද අන්තඃපුරයෙහිද ඇතුළුනුවරද පිටිනුවරද ගම්වලද නොයෙක් තැන් පරීක්‍ෂාකොට තමන්ගේ නුගුණයක් කියන කෙණෙකුත් නැති හෙයින් තමන් සතු දීප දීපාන්තරවල පරීක්‍ෂාකොට බලමි සිතා අමාත්‍යයන්ට රාජ්‍යය පාවාදී පුරෝහිතයා හා දෙදෙන තනිව අප්‍රසිද්ධ වේශයෙන් කසීරට ජනපදවල ඇවිදිනාහු තමන්ගේ නුගුණයක් කියන කිසිකෙණකුත් නොදුටු පසල්දනව්වෙන් එක් නියම් ගමකට ගොස් පිටත ශාලාවෙක උන්හ. එකෙණෙහි ඒ නියම් ගම්වැසි අසූකෙළක් ධන ඇති කෙළෙඹි පුත්‍රයෙක් ස්නානායකරන්ට තොටට යන්නේ ශාලාවෙහි උන් රන්වන්වූ සිවුමැළි ශරීර ඇති රජ්ජුරුවන් දුටු උපදනාලද බලවත්වූ ස්නෙහඇතිව ශාලාවට වැද' මෙසේ ඉඳුවයි කියා ගෙට දිවගෙණ ගොස් නොයෙක් රසමසවුලෙන් යුක්තව ආහාරය සම්පාදනයකොර මහපෙර හරින් බත්වසුන් ගෙන්වාගෙණ ශාලාවට නික්මුණාහ.

එකෙණෙහි හිමවත වසන්නාවූ පඤ්චාභිඥා අෂ්ටසමාපත්තිලාභීවූ තපස්වී කෙණෙක් එම ශාලාවෙහි උන්හ. ගඳපහන් පව්වෙන් අවුත් පසේබුදු කෙණෙකුත් එතැන්හිම උන්හ. කෙළෙඹි පුත්‍රයානෝ රජ්ජුරුවන්ට හස්ත ධොවනයදී තලියෙහි රසමසවුලෙන් යුක්තවූ ආහාරය පුරා රජ්ජුරුවන්ට දුන්හ. රජ්ජුරුවෝ ඒ ගෙණගොස් පුරෝහිතයාට දුන්හ. පුරෝහිතයෝ ගෙණ තපස්වීන්ට පිළිගැන්වූහ. තපස්වීන් තලියගෙණ දකුණතින් කමඩලාව පැන් ගෙණ පසේබුදුන් කරා ගොස් දකුණතින් පැන් වත්කොට පාත්‍රයෙහි බත් පුරාලූහ. ඒ පසේබුදුහු කිසිකෙණෙකුනුත් නොකැඳවාම කාත්නොවිචාරා වැළඳූහ. ඉක්බිති කෙළෙඹිපුත්‍ර සිතන්නේ මා විසින් රජ්ජුරුවන්ට දෙනලද රජ්ජුරුවෝත් පුරෝහිතයාට දුන්හ. පුරෝහිතයා තපස්වීන්ට දුන්හ තපස්වී පසේබුදුන්ට පිළිගැන්වූහ.

පසේබුදුහු කාත් නොවිචාරා නොබැණ ඉඳ වැළඳූග, මුන් මුන්ට දෙන්ට කිමෙක් ද්‍යෙහෝයි උන් නොබැණ ඉඳ වළඳන්ට කාරණ කවරේද්‍යෙහෝයි අනුක්‍රමයෙන් විචාරමි සිතා පළමුකොට රජ්ජුරුවන් කරා එළඹ, උතුම් වූ ප්‍රාසාදයෙහි කූටාගාරාභ්‍යන්තරයෙහි අතුරණලද සැපවූ ආස්තරණයක් ඇති ශ්‍රීයහන්හි සැතෙපෙන්නාවූ සිව්මැලි උතුම් රූ ඇති කිසිම දුකකට අයෝග්‍යවූ රජ්ජුරුවන් රමණීයවූ රාජ්ජය හැර නිරුදකවූ වනයක් හා සදෘශවූ පසල්ගම්කට පැමිණියාවූ නුඹවහන්සේ කෙරෙහි ප්‍රේම උපදවාගත්තාවූ මම රසමසවුලෙන් යුක්තව පවිත්‍රවූ සිනිඳුවූ ඇල්සාලේ බත පිළිගැන්වීමි. ඒ නුඹවහන්සේ අනුභව නොකොට බමුණන්ට දුන්සේක. මහරජ නුඹට නමස්කාර වේවයි ඒ කෙසේ ධර්මතාවෙක්දැයි විචාළාහ. ඉක්බිති රජ්ජුරුවෝ කියන්නාහු කෙළෙඹිපුත්‍රය මේ බ්‍රාහමණතෙම මට ශික්‍ෂා ඉගැන්වූ ආචාරීව සිටියේය. උභය ලෝකාර්ත්‍ථ සිද්ධකරන්නාවූ යම් කටයුත්තක් විචාරාගන්ට සුදුසුය. තව්ද මාගේ සියලු කාර්‍ය්‍යයෙහි ව්‍යාවෘතය, එසේ හෙයින් ගරුවූ ගුණ ඇති ආචාරීහට භොජනය දෙනු කැමැතිවීමි කීහ. ඉක්බිති කෙළෙඹි පුත්‍රයෝ පුරෝහිතයන් කරා එළඹ ගොයුම් ගෝත්‍ර ඇති පූජිතවූ පුරෝහිතයනි රජ්ජුරුවන් විසින් දෙනලද රාජභොජනය තපස්වීන්ට පිළිගන්වන්ට කාරණා කිම්දැයි විචාළාහ එසඳ බ්‍රාහමණයානෝ කියන්නාහු මම ගිහිගෙයි වැස පුත්‍රදාරාදීන් පොෂ්‍යයකොට අපමණසම්පත පිහිටා පඤ්චකාමානුභව කෙරෙමි, එහෙයින් මට භොජන

ප්‍රතිලාභ අරුම් එම්බල කෙළෙඹිපුත්‍රයානෙනි මහත්වූ වල වසන්නාවූ බොහෝ කලක් තපනිශ්‍රිතවූ ඉන්ද්‍රියයන් මැඩ භාවිතාකරණලද සුවසනාතාන ඇති උතුම්වූ තපස්විහට භෝජනය ලැබීම ආයාසයේ දක පිළිගන්වාපීමි කීහ ඉක්බිති කෙළෙඹිපුත්‍රතෙම තපස්වීන්කරා එළඹ දූවිලව නහරවැල් ඉපිලගිය සිරුර ඇතිව වැඩීගියාවූ කක්ෂ ලෝමයෙන් හා නිය ඇති මැලිවූ දත් ඇති රජස් ධූලී ගුළි ඉසකෙස් ඇති තපස්විනි හුදකලාව වසන්නාවූ තොපි ජීවිතයෙහි ශාංකාවක් නැති ජීවිතනිරපෙක්ෂවූ තොපට කවර ගුණයක් හේතුකොටගෙණ මේ භික්ෂූන් වහන්සේට පිළිගැන්වූදැයි විචාළාහ ඉක්බිති තපස්වී කියන්නාහු එම්බල කෙළෙඹි පුත්‍රය, කටුඅල මෙතල තල් කලන්කඳු මහඹිය අල ආදීවූ අල මුල් කැන ගෙණ නවද ගොඩනමු දියසිටිතැන ඇතිවූ කුඩා ගැරවුරු එල එයින් බිමට ගලපා හැරගෙණ කුලුවලින් පොලා හැර ගෙණ පැහැස පිසගෙණ, නවද ව්‍යංජන සඳහා කරපළා ආදීවූ ශාඛාජාතීද නෙළුම්මලද නිම්මීද සිංහ ව්‍යාඝ්‍රාදීන් කැහළ මස් කැබලිද කකාරාගෙණ ජීවිකා ප්‍රවෘත්තිය පිණිස සුවපිල් රෝධිව ජීවත්වෙමි. එසේ විසහැර හැක්කාවූ මම සහසථ පාවනයක් නැත්තාවූ රාග වෙෂ මොහාදී සකලකෙලශ විද්වංශනය කළ පසේබුදුන්වහන්සේට මා ලද්දාවූ භොජනය දීපියනු කැමති වීමි කීහ

ඉක්බිති කෙළෙඹිපුත්‍රයා පසේබුදුන් කරා එළඹ මිනාවූ ආචාර ව්‍රතවූ නිශ්ශබ්දව හිඳිනාසුලුවූ පසේබුදුන් විචාරමීයි, සෘෂින් විසින් දෙනලද රස මසවුලෙන් යුක්තව සිතිඳුම ආහාරය පිළිගෙණ කිසිකෙණකුතුත් මන්ත්‍රණය නොකොට නොබැණ ඉඳ වැළඳුයේය. ඒ කවර ධර්මිතාවෙක්දැයි විචාළාහ. ඉක්බිති පසේබුදුහු වදාරණසේක් කෙළෙඹිපුත්‍ර තපස්විද දකුණතින් පැන්ගෙණ වමතින් භොජනයගෙණ දක්ෂිණෝදකය පිළිගැන්වූහ. මෙතැන් පටන් ගෙණ මා අවසාන දක්වා ගුණෙන් උතුම් කෙණෙකුන්ට මේ භොජනය පරම්පරාවෙන පැමිණ අයේය එසේ හෙයින් මමද මට මෙතැන්හි ගුණයෙන් වැඩි කෙණෙකුන් නැතිහෙයින් නැවත දායකව සිටි තොපට හැම නිමන්ත්‍රණය කිරීමය, ප්‍රත්‍යනික පටිපදාවට ඇතුළත්ව පිණ්ඩ ප්‍රතිපිණ්ඩයට අතුළත්වන හෙයින් එක්විසි අන්වේෂණයට ඇතුළත් නුවූ හෙයින් නොබැණ ඉඳ වැළඳූම්හයි වදාළහ. එපවත් අසා කෙළෙඹිපුත්‍ර තෙම මහත්වූ සොම්නසට පැමිණ අද්දවස් මේ රජ්ජුරුවන් වහන්සේ මෙතනට පැමිණි බව ඉතා මැනව මම මීට පූර්වභාගයෙහි යම් තැනකට දුන් දානය මහා ඵල මහානිශංස වන්නේ යයි නොදන්මි. සබඳ රජ්ජුරුවෝ රාජ්‍යය ලෝභ ඇත්තාහ. බ්‍රාහ්මණයෝ කෘත්‍යාකෘත්‍යයෙහි ව්‍යාවෘතයහ සෘෂිවරහු ඵලාඵලයෙහි ලෝභයහ. මේ බුදුහු කිසිදෙයකත් අලග්නයහයි සියලු භවයෙන් මිදී නිවන් පසක් කළහ. සතුටුව උදන් ඇනීය.

පසේබුදුහු ඕහට ධර්මදේශනාකොට සවකීයවූ ස්ථානයකට වැඩපීහ. තපස්වීන් එසේම හිමාලයවනයම වැඩියාහ. රජ්ජුරුවෝ කීපදවසක් ඒ කෙළෙඹිපුත්‍රයානන් සමීපයෙහි වැස බරණැස්නුවරටම ගොස් දූසැමෙන් රාජ්‍යය කෙළේය. යනාදීන් බුදුහු මේ ජාතක දේශනාව ගෙණ හැර දක්වා මහණෙනි දූත් මතු නොවෙයි පෙරත් භික්ෂාව තිබීතැනට පැමිණියේවේදැයි පූර්වාපරසන්ධි ගලපා මහණෙනි, එකල කෙළෙඹිපුත්‍රයා නම් දූන් ධර්මියට සත්කාර කළ කෙළෙඹිපුත්‍රයාය. එකල රජ්ජුරුවෝ නම් දූන් ආනන්ද ස්ථවිරයෝය. පුරෝහිතයා නම් දූන් ශාරිපුත්‍ර ස්ථවිරය,

එකල්හි අභිඥාලාභි තපස්වීහු තම් දූත් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

පකිණ්ණක නිපාතය නිමි.

විංසති නිපාතයයි

489

මාතඞ්ග ජාතකය.

තවද එක්සමයෙක්හි සකල ලොව නායමානනීයවූ පුත්‍රමූර්තිධර ශ්‍රී තථාගතාදීවූ ගුණයෙන් යුක්ත අප බුදුරජානන් වහන්සේ නන්‍දවනාභිරාම ජේතවනාරාමයෙහි මෛත්‍රී කරුණා මුදිතා උපෙක්‍ෂාය යන සතර ආයසී බ්‍රහම විහරණයෙන් දවස් යවමින් වැඩ වසන සේක්, සකල ජන හෘදයඞ්ගම වූ මේ මාතඞ්ග ජාතකය උදේනිවංශයෙහි උපන් එක් රජතුමක්හු අරභයා වදාළසේක.

යම් සමයෙක්හි බුදුහු මේ ජාතකය දෙසූසේක්ද එසමයෙහි ආයුෂ්මත් පිණ්ඩොලභාරවාජ මහතෙරුන්වහන්සේ ධ්‍යාන සැපයෙන් වැඩහිඳිනට සුදුසු තැනකට යනු කැමතිසේක් ජේතවනාරාමයෙන් සුනිල් අහස උඩට නැගී පළමුත් බොහෝසේ දිවාවිහාරයට යන්නාවූ කොසඹෑනුවර උදේනි රජ්ජුරුවන්ගේ උයනට අවිනතවූ මහත්වූ ඍද්ධ්‍යානුභාවයෙන් බට සේක. දිව්‍යලෝක මනුෂ්‍යලෝකයෙහි බොහෝවූ රම්‍යස්ථාන වුවද උදේනි රජ්ජුරුවන්ගේ උයනට බොහෝසේ දිවාවිහාර සඳහා වඩිනට කාරණා කවරේද? යතහොත් මේ තෙරුන්වහන්සේ මීට පූර්වජන්මයෙහි එම කොසඹෑ නුවර රාජ්ජය කරණසේක් සුරඟනන් පරයන වරඟනන් හා සමග පූග පුන්නාගාදී තරුවර විරාජමාන මේ උද්‍යානයෙහිම කෙළ ඇවිදිමින් රාජ්‍ය ශ්‍රී අනුභව කෙළේය. ඒ පූර්වාසනාව හේතුකොටගෙණ බොහෝසේ මෙම උයනට පැමිණ ඵලසමාපත්ති සැපයෙන් වැඩ ඉඳිනාසේක. මෙපරිද්දෙන් සැපවිහරණයෙන් දවස්යවන තෙරුන් වහන්සේ එක්දවසක් උයනට වැඩ සුපිපි මල්පල්ලෙන් සැදි රුකක් මුල සමාපත්ති සැපයෙන් වැඩඋන්සේක. එකල්හි ඒ නුවර රජකරණ උදේනි රජතෙම ඇමතිමඬුළු හා සමග සතියක් පමණ සැණකෙළි කෙළිම්හයි කියා මහත් සිව්රඟසෙනඟ පිරිවරා උයනට ගොස් අවට රුකවල් ගන්වා අන්තඃපුර ස්ත්‍රීන් හා සමග උයන් කෙළිමින් රා මදයෙන් මත්වූයේ මගුල්සලවට උතුම් අඟනක ඇක යෙහි ඉසතබා වැදහොත්තේය. එසඳ නටමින් ගී කිය කියා බෙර වයමින් නොයෙක් විලාස දක්වමින් අවට සිටි බොහෝ පුරඟනෝ රජහු තරව නිදන නියාව දූන තමන් ගත් තූර්‍ය්‍යභාණ්ඩයන් සිටි සිටි තැන්හිම දමා වනසිරින් පොළඹන ලද්දූවූ කෙළනා බමරවැලින් යුත් ගස යුරුතුරු හිස්වල සපු නා පනා ඇසළ මුහුලු ආදී නොයෙක් මල් පල්ලෙන් සැදුනු වෘක්‍ෂ ශ්‍රෙණීන් බලවයි ඔවුනොවුන්ට දක්වමින් පහසු සුවඳැති මල් බිඳ පැළඳ පිය ගියසේ මත නෙත් සතුටු කරවමින් උයනෙහි කෙළිමින් යන්නාවූ සමාපත්තියට

සම්වැද සල්රුක මුල වැඩහුන් පිණ්ඩොලභාරවාජ මහතෙරුන්වහන්සේ දක වැද බණ අසන රිස්සෙන් අවසරගෙණ එකත්පස්ව උන්නාහ. තෙරුන් වහන්සේ ඔවුන්ට බණ දෙසූසේක. ඒ විගස මගුල්සලවටහි රජ්ජු ඉසතබා ඇකයෙහි උන් ලැඳූරි සත්‍රිතොමෝ එතැන්හි අන් කිසි කෙණෙකුන් නැති නියාව දූත රජහු පුබුදුවනු කැමතිව ඇකය හෙලෙව්වාය.

එසඳ රජතෙම පිබිදව අවට බලමින් ඒ චණ්ඩාල කෙල්ලෝ කොයි ගියාහුදැයි විචාළේය. එයිද කියන්නී දේවයන්වහන්ස ඔහු නුඹවහන්සේ ඇති නියාව දනිත්ද? යෞවන මදයෙන් මත්ව කෙළිමින් එක් මහණෙක්හු වටකොට උන්නාහයි අයසස් කීහ. එකල්හි ශ්‍රමණබ්‍රාහමණාදී උත්තමයන්ගේ ගුණයක් නොදන්නා ඒ රජතෙමේ දණ්ඩෙන් ගැසූ සර්පයෙක්හු මෙන් රොෂයෙන් තතනමින් ඒ තෙරුන්වහන්සේ දක සිත පහදවා ගත නොහෙනුයේ එම්බල සොර තවුස් වෙස්ගත් මහණ සාන්තදාන්තයෙමි කියා ලොවට අඟවා ඇවිද දූත් මේ යොවුන්පත් අඟනන් වෙහෙසෙමින් හුදකලාව මෙතැන්හි හුන්නෙහිදැයි නොයෙක් අක්‍රෝශ පරිභව බෙණෙමින් කියටියක් කියමි. රොෂයෙන් මඩනාලදුව අවටින් බොහෝ දිමිකදුලු හෙණෙමින් තෙරුන්වහන්සේගේ සියලඟ පැහැරූහ. මෙසේ ඒ රජහු තෙරුන්වහන්සේගේ ශරීරය දිමියන් කවා බොහෝ හිංසා පීඩා කරන්ට වන්කල්හි අසාධාරණවූ මහත් සෘඬි ඇතිව ආකාශයට නැගී පස්වණක් වලාමඬිමින් ජෙතවන දොරටුව සමීපයට බට සේක. එකෙණෙහි බුදුරජානන්වහන්සේ ඔවුන් එතැන්හි පත් කාරණා දන්නාසේක් වී නමුත් විචාරීමෙන් මතුකියන ජාතක ධර්මදේශනාවට අර්ථොත්පත්ති වන්නේ වේදැයි සිතා පිණ්ඩොලභාරචාජ සථවිරයෙනි, තොපි කොතැන්පත්ව කුමක් සඳහා මෙතනට සම්ප්‍රාප්තවූදැයි විචාළසේක. එසඳ තෙරුන්වහන්සේද තමන්වහන්සේ කොසඹෑනුවර උදේනි රජ්ජුරුවන්ගේ උයන්හි ඵල සමාපත්තියෙන් වැඩවුන් නියාවත් ඒ රජහු සුරා මදයෙන් මත්ව බොහෝ අක්‍රෝශ බැණ හිංසා පීඩා කෙරෙමින් දිමියන් කවා ගැහැට කරන්ට වන්සඳ අහසට නැගී ඒ රජුට අවවාදකොට මෙතැන් පත්වීමි බුදුරජානන් වහන්සැයි දන්වූසේකි. එකෙණෙහි ශාස්තෘ තිලෝගුරු බුදුරජතෙම මහණෙනි දැන් මතු මේ උදේනි රජතෙම ප්‍රව්‍රජිතයන් වෙහෙසුයේ නොවෙයි. පෙරත් ප්‍රව්‍රජිතවූ තපස්වී වරයන්ට හිංසා පීඩාකොට පෙළූයෙහි වේදැයි වදූරා උන්වහන්සේ විසින් ආරාධිතවූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

යටගියදවස බරණැස්නුවර බ්‍රහමදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි පූරණලද පාරමිතා ඇති අප මහ බොධිසත්ත්වයන් වහන්සේ බොධිසම්භාරය පූරණයකොට ඇවිදිනාසේක් මෙම බරණැස් නුවරට නුදුරු තැන්හි චඬාල කුලයෙක්හි උපන්නේය. ඔහට දෙමව්පියෝ මාතඬග කුමාරයෝ යයි නම් තුබූහ. ඒ තෙම මෑතභාගයෙහි ගැටවාකම් දන්නා වයසට පැමිණියේ නුවණින් තෙසු සත්ත්වයන්ට අග්‍රව සිටි හෙයින් මාතඬග පණ්ඩිතයයි ප්‍රසිඬවූයේක. එකල්හි බරණැස සිටානන්ගේ රුවින් අග්‍රප්‍රාප්තවූ දුවනි කෙණෙකුන් ඇත්තාහ. ඕතොමෝ මාණවකයන් දකීම මගුලැයි යන ලබ්ධියෙක සිටියාය. එවිට දිට්ඨමඞගලිකායයි යන නමක්

ඇති ඕතොමෝ මසකින් දෙමසකින් එක්වරෙක දසි දස් ආදී බොහෝ පිරිවරින් යානාවට නැගී උයන් කෙළියට යන්නීය. ඉක්බිති එක්දවසක් මහබෝධිසත්වතෙම කිසි කටයුත්තක් නිසා නුවරට වන්නේය ඇතුළු වාසල් දොරදී දිට්ඨමඞ්ගලිකාව දක ඉවත ශොකින් ඇලී ඇලී සිටියේය. දිට්ඨ මඞ්ගලිකාතොම තිරය අසු අස්සෙන් වටපිට බලන්නී ඒ මාතංග පණ්ඩිතයන් දක කවුරුදැයි විචාරා සවාමීනි චණ්ඩාල පුත්‍රයෙකැයි කී කල්හි ඕතොමෝ කලකිරී අනේ නොදක්කයුත්තක් දකපිමි. සුවඳ පැනින් ඉස් සෝධා නා උයන් කෙළියට යන ගමනුත් තබා නැවත ගෙට පලා අව ඈ හා සමඟ උයන් කෙළියට නික්මුණු බොහෝ ජනයෝ කොල දුෂට චණ්ඩාලය නා නිස තොමිලයේ අප හැම ලබන රා හා මස්දාබඳුහොඳද නැතිව ගියේයයි කෝපා යෙන් මඩනාලද්දහු ඒ මාතංග පණ්ඩිතයන්ට අතින් පයින් තලා දුර්වලකොට සිසන්න නැතිකරවා ක්‍රොධයෙන් තතනමින් පලාගියහ. ඒ මාතංග පණ්ඩිත යන් ඇසිල්ලක් කල් යවා සිහින් ලදින් මෙසේ සිතන්නේය.

දිට්ඨමංගලිකාවගේ පිරිවර ජනයෝද නිවරද නැනැත්තවූ නිස්කාරණ යෙහි මරා තලා ගියාහුය. උන් මට දුන වෙහෙසම මොවුන් සාමිදුවව සිටි දිට්ඨ මංගලිකාවන් ලදෙන් විනා නැගී නොසිටිමි. අධිෂ්ඨානකොට ගොස් ඇගේ පියවූ සිටනන්ගේ දොරකඩ වැදහොත්තේය. ඔහු මෙලෙසින් කුමන කාරණ යෙකින් මෙතැන්හි වැදහොත්තෙහිදැයි විචාළ කල්හි මාතංග පණ්ඩිතතෙම කියනුයේ අනික් කාරණයෙක් නැත. දිට්ඨමංගලිකා වන්ගෙන් මට ප්‍රයෝජන ඇත්තේයයි කීයේය. මෙලෙස කියා වැදහොත් බොධිසත්වයන්ට දවසෙක් ගියේය. මෙලෙසින්ම දෙදවසෙක තුන්දවසෙක සතර දවසෙකැයි ක්‍රමයෙන් මෙලෙස සත් දවසක් ඉකුත් වූයේය. එතකුදුවත් කිසි අකුශලය කින් උපන්නන් මෙකප බුදුවන මහබොධිසත්වයන් අධිෂ්ඨාන සිඬවන් නේය. එතකුදු වුවත් සත්වෙනි දවස් දිට්ඨමංගලිකාවන් ගෙණවිත් මාතංග පණ්ඩිතයන්ට දුන්හ. ඉක්බිති ඕතොමෝ නැගීසිටිය මැනමි සවාමීනී ගෙටයම් හයිකිව එසඳ බොධිසත්වතෙම කීයනුයේ සොඳුර තොපගේ පරිවාර ජනයා විසින් මරා තලා දුර්වල කරණ ලදිමි. එබැවින් පයින් යා නොහෙමී. මා ඔසවා ගෙණ පිටවතුරුවා ගෙණ යවයි කීහ. ඕතොමෝත් කීලෙසම පිටවතුරුවා ගෙණ නුවරවාසීන් බල බලා සිටියදීම නුවරින් නික්ම චණ්ඩාල ග්‍රාමයට ගියාය.

ඉක්බිති මහබොධිසත්වතෙම ඒ කුමාරිකාවගේ ජාතිසම්භෙදයකුත් නොකට සෙසු ව්‍යතික්‍රමයකුත් නොකොට කීපදවසක් ගෙයි වසවා ඉක්බිති මෙසේ සිතුයේය. මම වනාහී ඒ කුමරිකාව ලාභයෙන් යසසින් සියලු තරම්පදමින් අගතැන්පත් කෙරෙම් නම් ප්‍රව්‍රජිතවම්ද අන් පරිද්දෙකින් කළ නොහැක්කේයයි කියා මෙලෙසින් නිශ්චයකොට දිට්ඨමඞ්ගලිකා වන්ට කියනුයේ සොඳුර වලින් යම්කිසි දෙයක් ගෙණවුත් විනා තෙගෙ ණාවෝ නම් අපගේ ජීවිකාව නොපවත්නේය. මා එනකල් නොපි නොකලකිරී වස. මම වලට යෙමි කියා ගෙයි වසන්නවුන් නමන්කෙරේ උපෙකෂා කරවයි අවවාදකොට විලවගොස් ශ්‍රමණ ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව අප්‍රමාදව ධ්‍යාන භාවනා කරණුයේ සත්වෙනි දවස්හි අෂ්ටසමාපත්තීන් හා පඤ්චාභි ඥාවන් උපදවාගෙණ දන් වනාහි දිට්ඨමංගලිකාවන්ට සහයවන්ට පොහො සත්මි සිතා සෘඬියෙන් ආකාශයට නැගී සැඩොල් ගම්දෙරෙහි බැස දිට්ඨමංගලිකාවන්ගේ ගේ දොරට ගියේය. ඕතොමෝ මාතංග පණ්ඩිතයන් දුර එනී අසා මගෙන් නික්ම සවාමිපුත්‍රයානන් සමීපයට පැමිණ සවාමිපුත්‍ර

යානෙහි කුමක් හෙයින් මා අනාථකොටපැවිදිවූසේක්දැයි හැඬුව, ඉක්බිති බෝධි සත්ත්වතෙම සොඳුර තෙපි කිසි අඬුවක් නොසිතව, තොප පෙර සිටිය යසසටත් මඩා පමුණුවාලමි. බල එකෙක් ඇත. තොප කියනලද මාංගලික පණ්ඩිතවූ මාගේ ස්වාමිපුත්‍රයා නම් එසේ මෙසේ කෙණෙක් නොවෙයි. මාගේ ස්වාමිපුත්‍රයා නම් මහාබ්‍රහ්මයා යයි මෙපමණක් පර්ෂත් මධ්‍යයෙහි කියන්ට නොපිළිවන්දැයි විචාළ කල්හි එසේය ස්වාමීනී පිළිවනැයි මුලුල්ලෙහි ඈ කීවාය. එසේ වී නම් දූන් තොපගේ ස්වාමිතෙම කොතැන්හිදැයි විචාරණලද්දී බ්‍රහ්මලෝකයට ගියසේකැයි කියව කවර දවසෙක එන්නෙහිදැයි විචාළ කල්හි අදට සත්වෙනි දවස පසළොස්වක් දීනයෙහි සඳමඬල පළාගෙණ එනසේකැයි මෙසේ ඕහට කියා හිමාලවනයට වැඩිසේක. දිට්ඨමංගලිකාවෝ බරණැස්නුවර මහජනයා මැද ඒ ඒ තැන්හිදී මෙසේ කියන්නීය. මහජනයෝ කියන්නාහු අශ්වයකීයෙක මහා බ්‍රහ්මයා සමාන කෙණෙක් දිට්ඨමංගලිකාවන් ගෙණ ගියේය. ඒ එසේම වන්නේයයි අදහා ගත්තේය.

අප මහබෝසතානන් වහන්සේද පසළොස්වක් දීනයෙහි සඳමඬල අහස් මැද සිටිකල්හි බ්‍රහ්මාත්මභාවය මවාගෙණ සියලු කසීරටද දොළොස් යොදුන් බරණැස්නුවර ඒකාලෝකකොට චන්ද්‍රමණ්ඩලය පළාගෙණ බැස බරණැස්නුවර මත්තෙහි තුන්යලක් පැදකුණුකොට මහජනයා විසින් ගඳ දුම් මල් පහන් ආදීය පූජා ලබමින් සැඬොල් ගමට අභිමුඛවූසේක. බ්‍රහ්ම භක්ති ඇත්තෝ රැස්ව සැඬොල් ගමට ගොස් දිට්ඨමංගලිකාවන්ගේ ගෙය සුදු වස්ත්‍ර වලින් වසා බිම සිව්දෑගඳින් පිරිබඩලා මල් ඉස සුවඳ දුම් දී සුදු වියන් බැඳ මහත් යානාවක් පණවා සුවඳ තෙලින් පහන් අවුළුවා දොරකඩ රිදී පැහැ බඳු වැ ලිලා මල් ඉස ධජපතාකාදීය බැන්දාහුය. මෙසේ සරහනලද ගෙයි මහබෝසතානන්වහන්සේ බැස ඇතුළටවැද මදක්කල් යාන්මත්තෙහි හුන්සේක.

එකල්හි දිට්ඨමංගලිකාවෝ මල්වරවූවාහුය. ඉක්බිත්තෙන් අප මහබෝසතානන්වහන්සේ අංගුෂ්ඨයෙන් ඔවුන්ගේ නාභිය පිරිමැද වදාළසේක. ඒ වේලෙහි බඩගැබ පිහිටියේය. ඉක්බිත්තෙන් අප මහබෝසතානන්වහන්සේ දිට්ඨමංගලිකාවන්ට ආමන්ත්‍රණයකොට සොඳුර තොපගේ ගැබ පිහිටියේය. තෝ පුත්‍රයෙකු වදන්නීය. තෙපිද තොපගේ පුත්‍ර ලාභයෙන් 'යසසින් අගතැන් පත් වන්නේයි. තෝ පය සේදූ ජලය දඹදිව්රජදරුවන්ට අභිෂේක ජලය වන්නේය. තොප නහන ජලය වනාහි අමා ඖෂධවන්නේය. යමෙක්හු විසින් ඒ ජලය හිස්හි ස්නානකලහුද? ඔහු සියලු රෝගයෙන් මිදෙති කාලකන්නිය පහකෙරෙති. තොපගේ පාපිට හිසතබා වැඳහෝනාවූ දහසක් දෙති. එසේම ශබ්දය ඇසෙන තෙන සිට වඳනාහු සියයක් දෙති. ඇස් හමුවෙහි සිට වඳනාහු එක් කහවණුවක්දී වඳිති. ප්‍රමාද නොවවයි කියා අවවාදදී ගෙයින් නික්ම මහජනයා බලබලා සිටියදීම අහසට පැනනැගී සඳමඬලට වන් සේක. බ්‍රහ්ම භක්ති ඇත්තාහු රැස්ව සිටම රාත්‍රිය කල්යවා උදෑසනම දිට්ඨමංගලිකාව රන්සිවිගෙයකට නන්වා හිසින් ඔසවාගෙණ නුවරට වන්නාහු මහාබ්‍රහ්මයාගේ භාර්‍යාවෝයයි කියා ඔවුන් කරා එළඹ මහජන තෙම සුවඳ මල් ආදියෙන් පිදූයේය. ඔවුන් පාපිට හිසතබා වඳින්නට ලබන්නාහු දහසක් වීස්තු දෙන්නාහුය. ශබ්දය ඇසෙනතෙන සිට වඳින්ට ලබන්නාහු සියයක් දෙන්නාහුය ඇස් හමුයෙහි සිට වඳින්ට ලබන්නාහු එක කහවණුවක් දෙන්නාහුය. මෙසේ දොළොස් යොදුන් බරණැස් නුවර

ගෙණ හැසිරෙන්නාහු අටළොස් කෙළක් වස්තු ලද්දාහුය. ඉක්බිත්තෙන් දිට්ඨමංගලිකාවන් නුවර පරිහරණය කොට ගෙණවිත් නුවර මැද මහ මඩුවක් කරවා තිරයක් වට අදවා මහත්වූ ශ්‍රී විභූතීන් එහි විසීම කරවූහ. මඩුව සමීපයෙහි මහ වාසල් දොර සතකින් යුක්ත සත්බුමුපහයක් කරන්නට පටන්ගත්තාහුය. ඒ පාය මහත්වූ අභිනව කර්මාන්ත වූයේය. දිට්ඨමංගලිකාවෝ ඒ මඩුවෙහිදී පුත්‍රයා වැදූවාය. ඉක්බිත්තෙන් ඔහට නම්තබන්නාවූ දිනයෙහි බ්‍රාහමණයෝ රැස්ව මඩුවෙහිදී උපන් හෙයින් මණ්ඩව්‍ය කුමාරයයි කියා නමක් කළාහුය. ප්‍රාසාදය වනාහි දසමසකින් නිමියේය. එතැන්පටන් මහත්වූ යසසින් ඒ පහයෙහි වසනසේක. ඒ මණ්ඩව්‍ය කුමාරයාද මහත් පිරිවරින් වැඩෙනුයේ සත් අට ඇවිරිදි කල්හිම දඹදිව තෙලෙහි වසන්නාවූ උතුම් ආචාරීවරහු රැස්වූවාහුය. ඔහු ඒ කුමාරයාහට වේදත්‍රය ඉගැන්නුවාහුය. සොළොස් ඇවිරිදි වයසෙහි පටන් සොළොස් දහසක් බමුණන්ට නිබඳ දන් පැවැත්වූයේය.

ඉක්බිති එක් සැණකෙළි දවසෙක්හි බොහෝ කිරිබත් පිළියෙලකොට සොළොස් දහසක් පමණ බමුණන් මෙතෙක් දවස් බත් අනුභව කරණ සතරවෙනි වාසලෙහි දානශාලාවෙහි හිඳුවා රන්රස වැනි පැහැති අළුත් එලගිතෙලින් හා මී හා කණ්ඩ සකීරා මිශ්‍රවූ කිරිබත් අනුභව කරවමින් මණ්ඩව්‍ය කුමාරයෝ තමා සර්වාලංකාරයෙන් සැරහුනේ රන්මිරිවැඩි සඟලක් පය ලා සෝලු ලීයක් අතින් ගෙණ මෙසේ ගිතෙල් වත්කරව මෙලෙසින් අනුභව කරවමින් පරිවාර ජනයාට විධානකරවමින් ඇවිදිනේය. එකල්හි මාතංග පණ්ඩිතතෙම හිමාලය වනයේ පළමු විසූ ආශ්‍රමපදයෙහි වසන්නේ කිමෙක්දෝහෝයි දිට්ඨමංගලිකාවන්ගේ පවත් පුතනුවන්ගේ පවත් කිමෙක්දෝහෝයි දිවසින් බලනුයේ ඔහු වැඩිවිය පැමිණ නොමග පිළිපදිමින් පුණ්‍යක්ෂෙත්‍රවූ භික්ෂූන්වහන්සේට ධ්‍යානලාභී තාපසවරුන්ට ආදර බහුමාන නොකොට බ්‍රාහමණයන්ගේ ලබ්ධියම ඇදහිලිකොට ඇවිදිනේයයි දැක අදම ගොස් අනුශාසනා කොට ඒ මණ්ඩව්‍ය මානවකයන්ට යම් තැනෙක්හි දුන් දානය මහත්ඵල ඇත්තේය. එබඳු උත්තමයන්ට දෙවා මාගී විභාගකරවා එම් සිතා ආකාශයෙන් අනෝතත්ත නම් විලට ගොස් දැවටි කා මූව සෝධා රත්සිරියල් ගිරි මුදුනෙක්හි රත්වූ බඳු වදපැහැ පරයන දෙපට අඳනා සිවුරු ඇඳ එහි මත්තේ කායබන්ධනය බැඳ පාංශුකූලයෙන් කරණලද සඟළ සිවුරු ධරව මැටි පාත්‍රයක් අතින්ගෙණ ආකාශයෙන් අවුත් මණ්ඩව්‍ය කුමාරයන් බ්‍රාහමණයන්ට දන්දෙවමින් සිටි දානශාලාවේ සමීපයට බැස පිඩු සිඟනා කාරයෙන් සිටියේය. මණ්ඩව්‍ය කුමාරතෙම ඇත මෑත බලනුයේ ඒ මාතංග තාපසයන් දැක මෙසේ පිරූ පව් කසලගොඩ අධිගෘහිත ප්‍රෙතයෙකු බඳු මේ ප්‍රව්‍රජිතතෙම කොයිසිට මෙතැන් පත්වීදැයි දැනගන්නා පිණිස සමග කථා කරණ මණ්ඩව්‍ය කුමාරතෙම මෙලෙසින් කීය.

අනංජිත අමණ්ඩිත සවරූප ඇති වටින් එලෙන රෙදි ඇති පවුල් පරෙවීයාවූ කසලගොඩෙහි අධිගෘහිත ප්‍රෙතයක්හු මෙන් ලාමකවූ තෙපි කොයි සිට එව්ද? කසලගොඩවලින් හැරගත් රෙදි කරහි බහා සිටිනාහු දක්ෂිණාවන් පිළිගන්ට නොනිසිවූ තෙපි කොල කවරෙක්හිදැයි විචාළේය එබස් අසා මහබොධිසත්ත්වතෙම මොලොක්වූ සිත් ඇතිව මණ්ඩව්‍ය කුමාරයන් හා කථාකරණ බොධිසත්ත්වතෙම මෙලෙස පිළිවදන් දුන්නේයි. මහත්වූ යසසිරි ඇති මණ්ඩව්‍යකුමාරය තොපගේ මොනවට පිළියෙල කරණලද ගිතෙල් සකීරා ආදියත් මිශ්‍රවූ මේ ආහාරය පොහොසත්වූ පාපයට නම්නවූ සියළුසත්ත්වයෝම

මධුරවූ ඛාද්‍යයන් කමින් මියුරුවූ බොජුන් වළඳා අෂ්ටවිධ පානවර්ගයෙන් පිණත්තාහුය. යම්හෙයකින් කෙලෙස් සතුරන් මැඩපවත්නාවූ චණ්ඩාලයකු දෙරින් රැකසිට ලැබියයුතුවූ තෙනෙහි ආහාර ලැබෙද්ද? එබැවින් ජරා පිළිබඳවූ දිව්වැටින් ඇති තොපගෙන් කෙණෙසි ආහාරයක් පමණ පිළිගන්ට යෝග්‍යයයි දන්නෙහිද නොදන්නෙහිම එහෙයින් තොපගේ මධුර අන්න පානය ජාති සම්පන්න පොහොසත්හුම ලැබෙත්වයි ලාමකවූ චණ්ඩාලයන්ට කවුරු දෙද්ද? එහෙයින් තොපට අවශ්‍යව සිටි මට දිවි යැපෙන පමණක් ආහාර දුන්නොත් යහපතැයි හඟවා කීයේය ඉක්බිති මණ්ඩව්‍ය කුමාරතෙම ඕහට පිළිවදන් දෙනුයේ මෙලෙස කියන්නේයි. එම්බල චණ්ඩාලය මේ මධුර අන්නපානය ප්‍රශස්ත ජාතියෙහි උපන් බ්‍රාහමණයන් සඳහා ඇදහිලි සිත් ඇති මා විසින් මොනවට පිළියෙල කරණලද්දේය. එබැවින් අධමයානෙණි මෙතැන්හි කුමක් නිසා සිටියෙහිද ඉවතපලායව, කාරණා කිමෙකැයි සිතයි නම් අපවැනි උත්තමයෝ එසේම උතුම් ජාති ඇති බ්‍රාහමණයන්ට දෙතොත් විනා තොප වැනි චණ්ඩාලයන්ට නොදෙති, එබැවින් නොසිට පලායවයි කීයේයි. ඉක්බිති මහාබොධිසත්ත්වතෙම මෙලෙස කියන්නේයි. මණ්ඩව්‍ය කුමාරයෙනි සස්‍යඵල යන් කැමැති ගොවි ආදීහු වර්ෂාකාලයෙහි ගොඩ කුඹුරු වපුරන්නාහ. වැසි නැති කල්හි වලකුඹුරු අස්වද්දන්නාහ. ජලප්‍රවාහ භූමියෙහි හැමකල්හි වපුට එලදකින්නාහ.

එබැවින් මම දෘෂ්ටාන්ත කොට සියල්ලවුන්ටම දන් දෙව, දක්ෂිණාව පිළිගන්ට නිසි උත්තම මධුරාන්නපානාදිය දීමෙන් පිණවූයේ වී නම් දෙලොවින්ම සැප ලැබෙන්නේයයි කීයේයි. ඉක්බිති මණ්ඩව්‍ය කුමාරතෙම මෙලෙසින් බොධිසත්ත්වයන්ට පිළිවදන් උත්තර කීයන්නේ එම්බා අධමවූ ශ්‍රමණ යෙනි මේ ලෝකයෙහි පුණ්‍යක්ෂෙත්‍රයෝ තොපට වඩා මා විසින් දක්නා ලද්දේයි, එසේ හෙයින් මේ සොළොස් දහසක් පමණ බ්‍රාහමණයන් කෙරෙහි දනයම කුසල් බිජුවට වපුරමි. මොහු මුලුල්ලේම උතුම්වූ ජාති ඇත්තාහ. ආචාරයෙනුත් යුක්තයහ. එබැවින් මනාවූ කුශලක්ෂෙත්‍රය නම් මොහුමයයි කීයේය. නැවත බොධිසත්ත්වතෙම ඔහුගේ බස් වළකා පුණ්‍යක්ෂෙත්‍ර නම් මේයයි හඟවා කියනුයේ මෙලෙසින් කියා එම්බා මණ්ඩව්‍ය කුමාරයෙනි යම් කෙණෙකුන් කෙරෙහි මම්ම උතුම් ජාති ඇත්තෙමි. මොවුන් හැම කිමෙක් දැයි හෙලාදක්නා උඩඟභාවය ඇද්ද? නැවත විද්‍යාසම්පත්ති ආදියෙන් මම උත්තමයෙමි තමා උසස්කොට කියාද, රූපාදී විෂයෙහි ඇළුම් කෙරේද? තමාට නුරුස්නා කෙණෙකුන් කෙරෙහි වෛෂ කෙරේද? බලමද පුරුෂ මද යෙන් මත්වේද? කටයුතු වරදවා කියාද යන මෙතෙක් දෝෂයෝ යම් කෙණෙ කුන් කෙරෙහි වෙසෙද්ද? මේ සියල්ලෝම කුශලයට සුදුසුවූ ක්ෂෙත්‍රයෝ නොවෙති. තවද මණ්ඩව්‍ය කුමාරයෙනි යම්කෙණෙකුන් කෙරෙහි මම්ම උත්තමයෙමි යන ජාතිමදයෙන් සෙස්සන් හෙලාදක්වීම නොපවත්නේද? විද්‍යාදි වශයෙන් අධික මානය නැද්ද? රූපාදි අරමුනෙහි ලෝභ නොකරේද? සතුරා කෙරෙහිත් වෛෂනොකෙරේද? මම රූපසම්පන්නයෙමි, ශක්ති ඇත් තෙමි, ගර්ව නොකරේද? කටයුත්ත නොවරදවා කියාද යන මෙතෙක් උතුම් ගුණයෝ යමක්හු කෙරෙහි පෙණෙද්ද? මෙසේවූ උත්තමයෝ සුදුසු පුණ්‍යක්ෂෙත්‍රයෝයයි කීයේය.

ඉක්බිති ඒ මණ්ඩව්‍ය කුමාරතෙම මහබොධිසත්ත්වයන් කියනලද අවවාද කටයුත්ත පිළිනොගෙණ මහත්කොට කිපී මේ චණ්ඩාලතෙම අතිශයින් බොහෝ දොඩන්නේය, මේ චාසල රැකවල්හු කොයි ගියාහුද මේ චණ්ඩාලයා

මෙතනින් නෙරපියවයි විධාන කරණුයේ මේලෙස කියා, වාසල් තුනෙහි රැකවල සිටි උප්ජාතිය උපජ්ඣාය හඬකුක්ෂිය යන තුන්දෙන කොයිගියාහුදැයි විහා මෙසේ එවයි කියා හඬගෑයේය, ඔහුද ඇවිදින් කුමක්කරමෝදැයි ස්වාමීනි කීහ. එකල මණ්ඩව්‍යකුමාර කියනුයේ ඇයි සගයෙනි මේ චණ්ඩාලයා නුදුටු තොපගේ රැකවල් තුන හැර අනික් වැද්දහැකි තැනක් ඇද්දැයි විචාළේය. තැන ස්වාමීනි උන් කෙසේ ආ බව්වත් නොදනුම්හ, ඉන්ද්‍රජාලාදිය දන්නා මායාකාරයෙකු බවත් නොදැනෙයි නොහොත් අහසින් වෙස්වලාවට විද්‍යාධරයකු බවත් නොදනෙයි, අප රැකවලින් ආයේ නැත්තේය. එතකුදු වුවත් කලමනා කිමෙක්දැයි පිළිවිස්සාහ.

එම්ට මණ්ඩව්‍ය කුමාරතෙම කියනුයේ තව බලාසිටින්නේ කිමෙක්ද මේ චණ්ඩාලයාගේ මුහුණපිට අවුරා ගසා තලළ පැහැර උතපත්තෙන් හා මුගුරෙන් පිට හවුරා පැහැර බෙල්ල අල්වාගෙණ ගොස් වාසලින් පිටත් කොට පියවයි කීයේය. ඒ කෙණෙහිම බෝධි සත්වතෙම ඔවුන් සමීපයට නේනතුරුම ආකාශයට නැගීසිට මෙලෙස කියන්නේය. එම්බල මණ්ඩව්‍ය කුමාරයෙනි අප වැනි ශාන්තවූ සිත් ඇති තපස්වරයන්ට අක්‍රොශපරිභව බැණ නිග්‍රහ කරන්ට සිතන තෙපි තදගල් නියෙන් කඩන්නේය. යකඩ දතින් කඩන්නෙහිය. ගිනිගෙණ දිලියෙන අගුරු ගලන්නක්හු වැන්නෙහියයි කියා ඒ සොළොස් දහසක් බමුණනුත් මණ්ඩව්‍ය කුමාරයනුත් බලා සිටියදී අහස වලාකුළු මඩිමින් නැගෙණහිරට අභිමුඛව ගොස් එක් වීථියකට බැස පියවර සලකුණු නොමැකෙන ලෙස අධිෂ්ඨානකොට නැගෙණහිර වහසල් දොර සමීපයෙහි පිඬුසිගා යැපෙන පමණ මිශ්‍ර භොජයලැබ එක් ශාලාවෙක්හි හිඳ බත් අනුභව කෙළේය. නුවර අධිගෘහිත දෙවතා තොමෝ කිපී තමාගේ පමණ නොදූත අපගේ ආයයීයන් වහන්සේට වරදවා කීයෙහියයි සහතය කොට ගත නොගි යක්සෙන් හා සමග නුවරට බැස ඔවුන්ගේ ප්‍රධාන යක්ෂතෙම මණ්ඩව්‍ය කුමාරයන්ගේ හිස පිට කරකවාපුයේය.

සෙසු යක්ෂයෝද සොළොස් දහසක් බ්‍රාහ්මණයන්ගේ හිස් පිට කරකැවූහ. එතකුදුවත් බොධිසත්වයන් කෙරෙහි ඇදහිලි සිතින් ඔවුන් ගේම පුතනුවෝ වේදැයි වෙහෙස දුන් පමණක්මුත් නොමැරූහ මණ්ඩව්‍ය කුමාරයන්ගේ ඇසද කරකැවුනේය, හස්ත පාදයෝ දරදඬුව තදව ගියාහ. ඇස් දෙක පෙරළී කෙළින් සිටියේය. මිය ගොස් දැඩිව ගිය එකක්හු මෙන් වැදහොත්තේය. සෙසු බ්‍රාහ්මණයෝත් මුඛයෙන් කෙළ පෙරෙමින් ඇත මෑම පෙරලෙමින් එකවිට මහ පවතින් හුනු සල් වනයක් මෙන් වැටී හොත්හ. මෙපවත් දුටු පරිවාර ජනයෝ නුඹවහන්සේගේ දරුවන්ටවූ දෙය නුදුටුසේක්දැයි දිට්ඨමංගලිකාවන්ට දැන්වූහ. ඕතොමෝ වේගයෙන් අවුදින් මේ කිමෙක්ද දරුවෙනි අඩත තැනැත්තී තොපගේ හිස පිටට තැමූනේය. දැත දෙපය ඔක් නොවී අකම්ප්‍යව ගියේය. මළවුන් ඇස් පරිද්දෙන් ගැස් පෙරලී කළුරුවාව සැඟවුනේය. ඇයි දරුවෙනි තොපට මෙසේ කළෝ කවුරුදැයි කියමින් අඩා වැටිනිය. ඉක්බිති උන් සමීපයෙහි සිටි පරිවාර ජනයෝ කියන්නාහු දිට්ඨමංගලිකාවන් වහන්ස අනලංකෘත අමණ්ඩිත ස්වරූප ඇති කුණුරෙදි පෙරදිගත්තාවූ කසලගොඩ අධිගෘහිත ප්‍රේතයන් වැනිවූ එකෙක් කසලගොඩ රෙදිකඩවල් කරබඳගෙන මැටිපාත්‍රයක් අතින්ගෙණ මෙතැන්හි සිටියේය. මේ කුමාරයෝත් ඔහට අක්‍රෝශ පරිභව බිණූහ. එබැවින් මොවුන් විසින් කළ විකාර

යෙක් වන්නේ යයි කීහ. එබස් අසා දිට්ඨමඞ්ගලිකා තොම සිතන්නී සෙසු කෙණෙකුන්ට මෙසේවූ බලයෙක් නැත්තේය. මේ පැමිණියෝ මාතාඞ්ග පණ්ඩිතයෝ වන්නාහ. එතකුදුවූවත් සියළු සතුන් කෙරෙහි පතළ කරුණා ඇති උත්තමතෙම මෙතෙක්දෙනාට දුක්දී නොයන්නේය. එබැවින් කවර දිනෙක කෙසේ ගියාදැයි විචාරණ තෙනැත්ති මෙලෙසින් කියා, තරුණ මාණවකයාණෙනි, ඒ අලාමක ප්‍රඥා ඇති උත්තමතෙම කෙසේ ගියේද? මට ඒ කාරණය කියව. ඔවුන් ගියකල දුටුනු කල්හි ඒ කීවා වැරැද්දට ප්‍රතික්‍රියා කොට කළවරද ක්ෂමාකරවා ජීවිතය රැකගත්තොත් යහපතැයි කීහ.

එකල්හි එතැන්හි සිටි සැමට අයශස් ඇති දරුවෝ කියන්නාහු දේවීන් වහන්ස, අලාමකවූ ප්‍රඥා ඇති තාපසතෙම ආකාශයට පැනනැගී ගුවන්කුස ගමන් ගත් පුන්සඳ මඩලක්සේ යනුයේ නැගෙණහිර බලා ගියේයයි කීහ. ඔවුන් බස් අසා මාගේ වල්ලභයානන් වහන්සේ ගියතැන් පරීක්ෂා කෙරෙමියි පැන් පිරුණු රන්කළය හා මල්දාව ගෙණ දාසිදස් පිරිවරා මහජනයා විසින් පිරිවරණ ලදුව ඒ බොධිසත්වයන් පියවර සලකුණු ඉටත් කළ තැන් දැක ඒ අනුසාරයෙන් ගොස් වාසල්දෙර ශාලාවෙක්හි තිබූ පීඨයෙක්හිඳ මිශ්‍ර ආහාරය අනුභව කරන්නාවූ තාපසයන් දැක ගොස් වැඳ එකත්පස්ව සිටියාහ. බොධිසත්වයෝද දිට්ඨමඞ්ගලිකාවන් දැක පාත්‍රයෙහි මඳක් බත් ඉතිරිකෙළෝය. දිට්ඨමංගලිකාවන් කළයෙන් ගෙන්වාගෙණ ගිය පැනින් අතකට සේදූයේය. ඉක්බිති දිට්ඨමංගලිකා තොම මාගේ දරුවන් මණ්ඩව්‍ය කුමාරයන්ට මේ විප්‍රකාරය කෙසේ පැමිණියේදැයි විචාරන්නී මෙලෙස කියන්නී තාපසයන් වහන්ස, මදරුවන් කර ඇඹරුනේය. අතපය අවසඟව ගියේය, මළවුන්ගේ ඇස් පරිද්දෙන් ඇස් පෙරලී ගියේය. මේ විප්‍රකාරය දැක අඬා වැලප අප හැමට පිළිසරණව සිටි නුඹවහන්සේ ලඟට ආමි දූන්වූව.

එකල්හි මාතංග පණ්ඩිතතෙම කියනුයේ දිට්ඨමංගලිකාවෙනී මේලෝකයෙහි මහත් ආනුභාව ඇති යක්ෂයෝත් ඇත්තාහ. නුඹණැත්තවුන්ගේ අක්‍රොශ පරිභවයෙන් පහරණලද සාධුස්වරූප සෘෂිවරයෝත් ඇත්තාහ. මේ කාරණයෙන් මෙබඳු තපස මා ප්‍රධානකොට ඇති මහතුන්ට එබඳුවූ කෲර යක්ෂයෝම කී සැටි දන්නාහ. එසේ හෙයින් යක්ෂයන් විසින් තොපගේ දරුවන්ට කළ විප්‍රකාරයෙකැයි කීහ. එයද දිට්ඨමංගලිකාතොම කියන්නී යක්ෂයෝ ඉදින මදරුවන්ට මෙලෙස කෙළේ වී නම් නුඹවහන්සේ මා කෙරෙහි අනුග්‍රහයෙන් නොකිපූන මැනව, බ්‍රහ්මචාරීන් වහන්ස, පළමුත් දැනුත් මම නුඹපසානසේගේම සරණ ගියෙමි. එසේ වූවත් දූන් පුත්‍රශොකයෙන මඩනාලද්දෙමි, දුක්න පෙළෙමි කියා මත්තෙහි කාරණා කියනන් තාපසයන් වහන්ස, පළමුත් දැනුත් මාගෙන් වරදක් දොෂයක් නැති නියාව කිවමැනවැයි නැත්තේවේද මාගේ පුත නුවෝද නුඹවහන්සේගේ විශෙෂයක් දැනගණ වෙදත්‍රයෙහි පාරප්‍රාප්තව වෙද ශාස්ත්‍රමදයෙන් මත්වූයේද කටයුතු කාරිය නොදන්නෝ ක්ෂමාකළමැනවැය ස්වාමිනි කීහ. තවද එකෙක් ඇති තාපසයන් වහන්ස, මේ ලෝකයෙහි සත්වයෝ නම් මදකින්ම සම්පත් මදයෙන් හෝ ශාස්ත්‍රමදයෙන් හෝ ඉපිලෙන සුල්ලහ. එබැවින් සතතෙමේ මේ කාරණා හැකිය නොදී අකාරණයෙහි යොදන නේය. එසේ හෙයින් මේ මණ්ඩව්‍ය කුමාරයන් කළ වරද ක්ෂමා කළමැනව ඒ එසේමය, ප්‍රාඥයෝ නම් ක්‍රොධවසඟ නොවන්නාහ. ප්‍රාඥයන්ගේ ප්‍රවේණි ධර්ම

නියාවට ක්ෂමා කළ මැනවැයි දූන්වී, මෙසේ මවු විසින් ක්ෂමාකරවන ලබන්නාවූ බොධිසත්‍වතෙම එසේවීනම් යක්‍ෂප්‍රලය පිණිස අමෘතෞෂධයක් දෙමියි කියාදිට්ඨමඞ්ගලිකාවෙනි, නුවණැත්තාවූ තොපගේ මණ්ඩව්‍ය කුමාරතෙම මේ ඉඳුල්බත් අනුභව කෙරේවයි එයින් ප්‍රයෝජන කිමෙක්ද යතහොත් යක්‍ෂයෝත් ඕහට හිංසා පීඩා නොකෙරෙති. ඒ තෙමේත් නිරෝගි නිර්ව්‍යාධි වන්නේයයි කීයේය, දිට්ඨමඞ්ගලිකාවෝත් මහබොධිසත්‍වයන්ගේ බස් අසා අමෘතෞෂධ දෙව්වමැනව, ස්වාමීනි, කියමින් රන්මලාව තබාපෑහ. මහබොධිසත්‍වයෝද ඉඳුල්වූ කාඞ්බතුත් එහි බහා පළමුකොට තොපගේ දරුවන්ගේ මුඛයෙහි භාගයක් බහා සෙසු ඉඳුල්බත් සැලෙක්හි පැනෙහි කලතා සෙසු බ්‍රාහමණයන්ගේ මුඛයෙහි වත්කරව එකල්හි මොහු මුළුල්ලම ඒ විප්‍රාකාරයෙන් මිදී සුවපත් වන්නාහයි කියා ආකාශයට පැන නැගී හිමාලය වනයට ගියහ.

මව්ද ඉඳුල්බත් ගෙණ ගොස් කැවූය. එකෙණෙහි අයාසකල යක්‍ෂයෝ මොහු දෙවෙනිව සුවපත්කොට ගියෝය. එකෙණෙහිම මණ්ඩව්‍ය කුමාරයෝ වැලිපසිමින් නැගීසිට මෑනියෙනි, මේ කිමෙක්දැයි කීයේය දිට්ඨමඞ්ගලිකාවෝද කියන්නාහු තොප විසින් කළ දෙය තොප දන්නවාදැයි කියා රැහැණිවෙමින් දක්ෂිණාව පිළිගන්ට මෙසේ නිසි උත්තමයන්ට කළ අනාදරයෙහි විපාක දූන්ම දුටුයේදැයි හඟවා මාතඞ්ග පණ්ඩිතයන්ගේ ප්‍රවෘත්තිය කීව. එබස් අසා ඒ තෙම කලකිරීමට පැමිණියේ නැවතත් මෑනියෝ අවවාද දෙන්නාහුය. පුත, මණ්ඩව්‍ය කුමාරයෙනි, ලෝකයෙහි අඥාන බාලතෙම දනයට සුදුසු තැන් නොදනතේය, දක්ෂිණායභියන් දන්නා නුවණැත්තවුන් විසින් මේ දන් පිළිගැන්විය යුතුයයි මාතඞ්ග පණ්ඩිතයන් දක්වා පුණ්‍යක්ෂෙත්‍ර හඟවා දුශ්ශීලයන්ට වඩා ශීලවතුන් ගුණවතුන් ඇදීනදීම මහත්වූ විපාක ඇත්තේයයි ප්‍රකාශකොට මත් තෙහිද අවවාද කරණ දිට්ඨමඞ්ගලිකාතොමෝ මෙලෙස කීය.

මණ්ඩව්‍ය කුමාරයෙනි, තෙපි නුවණ මඳ හෙයින් කුශලක්ෂෙත්‍ර නොදනුව, තොප දන්නේත් ආදර කරන්නේත් කයින් වචසින් මනසින් කිළුටුවූ ස්වභාව ඇති චක්ෂුරාදි ඉන්ද්‍රිය දමනයක් නැති මහත්වූ රාග ඇති සත්‍වයන කෙරෙහිය. තවද නුවණැත්තවුන් වඤ්චාකරණ සමහර කෙණෙක් ජටා බැඳ දූලිකෙස් වඩා එකෙක්හු ගත් වෙස් එකෙක් නොගෙණ වෙස්ගෙණ ඇවිදිනාහු අඳුන් දිවිසම් ඇඳ නිය සහිතවූ සම් ඒකාංශකොට බහාගෙණ පිටත පෙණෙන වෙශය පරිද්දෙන් ඇතුළ සිතත් කසලපිරුණේයයි අඟවන්නාවුන් මෙන් ඇවිදිනාහ. සමහරුන්ගේ දූලි රැවුලු වැඩී සිටින මුඛය පරණලා ඉදුනුවටින් තත ඉවා සිටින පරණව ගිය වළවල් වැන්නේය. මෙපරිද්දෙන් නොයෙක් විසරු වෙස් ගෙණ තොපගෙන් දන් වළඳන බොහෝ ජනයා බව මොවුන්ගේ ජටාමඬුලු ආදීහු නුවණැත්තාවූ මොවුනුත් රැක්ක නොහෙති එහි භක්ති කළවුනුත් මෙලොවත් පරලොවින රැකල්ය නොහෙන්නාහයි මේ මිථ්‍යාලබ්ධි ගත්තවුනට අපහාසකොට නැවත සත්පතයෙහි සිටි මහතුන්ගේ ගුණ කියන මෑනියෝ තුමූ යම් කෙණෙකුන්ගේ සතන්හි ජනසවභාවවූ රාගය දූක කළකිරීම සවභාව කොට ඇති වෙෂයද සවභාවද ගවසා සිටිනා අෂ්ට වස්තුකවූ අවිද්‍යාවද යන මේ කෙලෙස් සතුරෝ නොපවතිත්ද යම් කෙණෙක් ක්ෂීණ රාගාදි ආශ්‍රවයන් ඇති හෙයින් පූජාර්හයෝද රහත්වූ ඔවුන් කෙරෙහි දුන්දනය මහත්ඵල මහානිසංස වන්නේයයි අවවාද කොට එබැවින් දරුවෙනි, මෙතැන් පටන් මෙබඳුවූ පාප යෙක් කිළුටුවූ සත්ත්වයන්ට දන්නොදී පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති ලාභීන්ට

ධර්මිෂ්ඨවූ ශ්‍රමණ බ්‍රාහමණයන්ටද පසේබුදුවරයන්ටද දන්දෙවයි කුශල විභාග යන් දක්වා මෙසේ එව දරුවෙනි, තොපගේ කුළුපගවූ බ්‍රාහ්මණයනුත් පැමිණි දුකින් ගොඩලා සුවපත් කරන්ට යම්හයි මාතඞ්ග පණ්ඩිතයන්ගෙන් ගෙණ, ඉඳුල්බත් ගෙන්වාගෙණ පැන්සලෙහි බිහා සොළොස් දහසක් බ්‍රාහ්මණයන්ගේ මුඛයෙහි පැන් වත්කරවූහ. එකින් එකාම වෙහෙසී වැදහොත්තන් මෙන් වැලි පිසිමින් නැගීසිටියාහ. එකෙණෙහි ඒ දෙශයෙහි සෙසු බ්‍රාහ්මණයෝ මොහු හැම චණ්ඩාලයගේ ඉඳුල් කෑහයි බ්‍රාහ්මණයන්ව රුවටූහ. මොහු මෙයින් ලජ්ජාවට පැමිණ බරණැස්නුවරින් නික්ම මෙජ්ඣ නම් නුවරට ගොස් මෙජ්ඣ නම් රජ්ජුරුවන්ට සේවය කොට විසූහ. මණ්ඩව්‍ය කුමාරතෙම ඒ නුවරවිසූයේය. එසමයෙහි වෙත්‍රවතී නුවර ගොදුරු ගම්කොට වෙත්‍රවතී ගංතෙර බ්‍රාහ්මණ කුලයෙන් ප්‍රව්‍රජ්ජිතව ජාතිමන්තය යන නමකින් යුක්තව ජාති නිමකොට වසන්නේය. ඒ මාතංග පණ්ඩිතයෝ තම්වූ මහබොධිසත්ත්වයෝද මොහු මාන බිඳිමි සිතා ඒ ගම් සමීපයට අවුදින් ඒ ජාතිමන්ත නම් තාපසයන්ගේ පන්සලට නුදුරුතෙන උඩුගඟ වසන්නේ එක් දවසක් උදෑසන දැවටි කා මේ දැවටිපොතු යටගඟ ස්නානය කරණ ජාතිමන්ත තාපසයන්ගේ ජටාමඬුල්ලෙහි පැලඳවයි අධිෂ්ඨාන කොට දියට දැමූයේය. දැවටිපොතු ඉරඋදයෙහි කිමිද උඩුකුරුවූ තාපසයන්ගේ ජටාවෙහි බැඳගෙණ රඳා ගියේය. ඒ තෙම ඒ දැක නසීව පලායව කාලකන්නි යයි මේ කොයි සිට ආ දෙයෙක්දැයි පරීක්‍ෂා කෙරෙමි සිතා උඩුගං බලා යනුයේ මහබොධිසත්ත්වයන් දැක තෙපි කවර ජාතියෙක කෙණෙක්දැයි විචාළේය. එතෙම කියනුයේ ස්වාමීනි, මම චණ්ඩාලයෙකිමි කීයේය.

ඒ අසා නැවත ජාතිමන්ත තාපස තෙම මේ ගඟ දැවටිපොතු දැමූයෙත් තෝදැයි විචාළේය. එසේය, මම යයි කීයේය. එකෙණෙහි පළමු පිළිවිසි තාපස තෙම නැසී යා පාලුව යා කාලකන්නිවූ චණ්ඩාලය මෙතන නොසිඳ යා ඉදින් වෙසෙහි නම් යටගඟ වසවයි කීයේය. එලෙසින් යටගඟ වසන්නාවූ ඔහු විසින් මුවසොධන වේලෙහි දැමූ දැවටිදඬුද ඔහුගේ අධිෂ්ඨානයෙන් උඩුගඟ බලාගොස් ඒ ජාතිමන්ත තාපසයන්ගේ ජටාවෙහි වැදගත්තේය. එකෙණෙහි ඒ තාපස තෙම පෙර පරිද්දෙන් නැසී යා පාලුව යා කාලකන්නිය පිරිහිස ඒ චණ්ඩාලයා ඉදින් මෙතැන්හි තෝ විසූයේ වීනම් සත්වෙනි දවස් තාගේ ඉස සත්කඩකට පැලීයන්නේයයි, එසඳ මහබොධිසත්ත්ව තෙම ඉදින් මම මොහු කෙරේ කිපී යෙම් වීම්නම් ශීලය නොරැක්කා නම් වෙයි. එබැවින් උපායෙන්ම මොහුගේ මානය බිඳිමි සිතා සත්වැනි දවස් හිරු නොනැගෙයි කියා හිරු උදාවීම වැලකූයේය. මනුෂ්‍යයෝ ගරුවීමෙන් කළකිරුණාවූ මේ කිමෙක්ද? භූත වෘතාපියෙක් හෝ සෘෂිකෙණෙකුන්ගේ සාපයෙක්දෝහෝයි සංකිවූ බොහෝ ජනයා ජාතිමන්ත නම් තාපසයන් ලඟට ගොස් ස්වාමීනි, නුඹවහන්සේද ඉරු උදාවිය නොදෙනසේකැයි විචාළාහ. එසඳ තාපසයෝ අප විසින් කළ දෙයෙක් නොවෙයි, යටගංහී චණ්ඩාලයෙක් වෙසෙයි, ඔහුගේ යම්කිසි ප්‍රයෝගයකින් වියයුතුයයි කීයේය. එබස් ඇසූ මනුෂ්‍යයෝ මාතංග පණ්ඩිතයන්ගේ ලඟට ගොස් ස්වාමීනි, නුඹවහන්සේගේ සැපය කිම්ද? හිරු නොනැගෙන්නේයයි කීහ එබස් අසා තාපසයෝ කියනුයේ එම්බා සගයෙනි, අතිකත් නිසා නොවෙයි, තොපගේ මේ නුවර ගොදුරු ගම්කොට වසන ජාතිමන්ත තාපසයන් හෙතෙම මට අක්‍රොශ කෙළේය, ඔහු ඇවිදින් ක්‍ෂමා කරවා ගත්කල්හි ඉරුමඬුල්ල උදාවන්නේයයි

කීහ. ඒ ඇසූ ජනයෝ කැවත ගොස් ජාතිමන්ත තාපසයන්ට මෙපවත් කියා මේ තාපසයන් ක්ෂමාකරවන්ට මැලි හෙයින් බලයෙන් ඇදගෙණ අවුදින් බෝධිසත්ත්වයන්ගේ පාදමූලයෙහි බැදහොවා ක්ෂමාකරවා මෙවිට ඉරු උදාකරවුව මැනවැයි කීහ. එවේලෙහි මාතඞ්ග පණ්ඩිතතෙම මෙසේ ඉරු උදාකළහොත් තොපගේ තාපසයන් ඉස සත්කඩක්ව පැලෙන්නේයයි කීයේය. එසේ කල කළමනා කිම්දැයි සත්ත්වයෝ විචාළාහ. එකෙණෙහි මාතංග තාපසතෙම උපායෙක් කරණු කැමැත්තෙම් මැටිපිඩක් ගෙන්වාගෙණ කරවටක් දියෙහි තාපසයන් සිටුවා උන් ඉසපිට මැටිපිඩ තිබූහ. ආනුභාවයෙන් රුඳවූ හිරුමඬලත් අළහ, හිරුරැස් වැදගත් පමණකීන් ඒ මැටිපිඩ සත්කඩක්ව පැලුනේය තාපස දියෙහි කිමිදියේය. ඒ මහබෝධිසත්ත්වයෝ මෙලෙසින් මේ තාපසයන් දමනෙහිලා පළමු මන්බිඳුනාවූ සොළොස් දහසක් බමුණෝ කොයි වෙසෙත්දැයි පරීක්ෂා කරණුයේ මෙජ්ඣ නම් රජහු සමීපයෙහි වෙසෙති දැන මොවුන් හැමදෙනාද දමනෙහි ලම් සෑඩියෙන් ගොස් නුවර කෙළවරෙහි එක් තෙනකට බැස පාත්‍රය ගෙණ පිඩුසිගා හැසුරුණේය, ඒ බ්‍රාහ්මණයෝ ඔහු දැක මේ තාපස දෙතුන් දවසක් මෙහි රුඳුනේවීනම් අප හැම මේ පා ගැවැසිය නොදෙන්නේයයි වේගයෙන් ඒ නුවර රජ්ජුරුවන් ලඟට ගොස් දේවයන් වහන්ස, ජනයන් වඤ්චා කරන්නාවූ සොරවූ එක් විද්‍යාධර තාපසකෙණෙක් මේ නුවරට ආයේය. ඔහු වහා ඇල්ලුව මැනවැයි බ්‍රාහ්මණයෝ පැමිණ කීහ.

රජ්ජුරුවෝත් යහපතැයි පිළිගෙණ මරණු පිණිස සේවකයන්ට විධාන කළහ. බෝධිසත්ත්වයෝ යපෙන පමණ පිඩුසිඟාගෙණ එක්තරා පිළිසුන්තෙනක පීඨයක් මත්තේ හිඳ බත් අනුභව කරන්නේය. මේසේ අනන්‍යවිහිතව බත් අනුභව කරණ බොධිසත්ත්වයන් රාජපුරුෂයෝ කඩුවෙන් පැහැර දෙකඩ කොට හෙළාපූහ. මහබෝධිසත්ත්වතෙම නොපිරිහුණු ධ්‍යානයෙන් ගොසින් බ්‍රහ්මලෝකයෙහි උපන්නේය. මේ ජාතකයෙහි බෝධිසත්ත්වතෙම ක්‍රොධය දමනුසුලුවිය. එසේ හෙයින් පරාජීවරණයෙහිම නිරතවූ හෙයින් ආත්ම රක්ෂාවෙහි සිත උපෙක්ෂා හෙයින් මේ අවසරයෙහි ජීවිත විනාශයට පැමිණියේය. නිරපරාධ තාපසයන්ට කළ හිංසාව නිසා කළකිරුණු දෙවියෝ සියලු මෙජ්ඣ රට එකහෙලා පහණ මැසි ගල් යනාදී අනෙකවිධ වෂ්‍රාවන් වස්වා රට නොරට කළාහ. එසමයෙහි සියලු රාජ්‍යවාසීන් හා රාජ්‍යය එකහෙලා නස්වා ප්‍රදෙශය මෙජ්ඣ අරණ්‍ය නම් වූයේය. ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ මේ ජාතකය ගෙණහැර දක්වා වදාරා මේ උදේනි රජතෙම දැන්මතු ප්‍රව්‍රජිතයන්ට වෙහෙස දුන්නේ නොවෙයි, පෙරත් ප්‍රව්‍රජිතයන් මෙලෙසින් නැසුයේවේදැයි වදාරා මේ ජාතකය පූර්වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක. එසමයෙහි මණ්ඩව්‍ය කුමාර නම් මේ උදේනි රජය, මාතඞ්ගපණ්ඩිත නම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

490
චිත්තසම්භූත ජාතකය

තවද එක්සමයෙක්හි සතරාමර ලොචන රසායනවූ පරදුක්ඛ දුකඛිතවූ කරුණානිධාන වූ අමයවාදීවූ සමන්තභද්‍රවූ සඬහිඳුවූ ගුණ

ගණාඞ්ගයෙන් සමන්විතවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ විවිධතරුවරාභිරාම ජේතවනාරාමයෙහි වැඩවසනසේක් ශ්‍රමණ රමණීයවූ මේ චිත්ත සම්භූත ජාතකය ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ සද්ධිවිහාරිකවූ සබ්‍රහමචාරී දෙදෙනෙක්හු අරභයා වදාළසේක.

ඒ දෙදෙනා මතාභි ඔවුනොවුන්ට ප්‍රයෝජන විඳිනා සැපත් ඇත්තාහු දෘඪ මිත්‍රව වාසයකෙළෙහිය. නැවත එක්වම ගොස් මහණවූ තැන්පටනුත් පිඬු සිඟා ඇවිදිනා තැනැත්තෝ එක්වම විහාරයට එත්නාහ, ඔවුනොවුන් ඇර ඉත්ට නොපොහොසත්හ. මේ දෙදෙනා වහන්සේගේ විශ්වාස ප්‍රවෘත්තිය දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන් ශාරිපුත්‍ර ප්‍රමුඛ භික්ෂූන්වහන්සේ වර්ණනා කොට වැඩඋන්සේක. එකෙණෙහි ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේද තුන්තරා ගම්තින් එක්තරා ගමනකින් දම්සභාමණ්ඩපයට වැඩ පණවන ලද බුද්ධාසනයෙහි ස්වර්ණපද්මානතරයෙහි වැඩ උන් රාජහංසයෙකු පරිද්දෙන් වැඩහිඳ මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදූයි විචාරා ඒ භික්ෂූන්වහන්සේ විසින් ස්වාමීනි නොකියන්ට වදාළ රාජ කථාදී එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. එසේද වූවත් මේ භික්ෂූන් දෙදෙනෙක්හුගේ විශ්වාසයක් යහපතැයි කිය කියා උනුමහයි දැන්වූ කල්හි එම්බා මහණෙනි, මේ භික්ෂූන් දෙදෙනාගේ එක ජන්මයෙහි විශ්වාස යෙහි අරුම කවරේද? පූර්වයෙහි නුවණැත්තෝ සතර පස් ජාතියකුත් පටන් ගත් විශ්වාසයම නොහැර පැවැත්තෝ වේදැයි වදාරා ඒ භික්ෂූන් විසින් ආරාධිත වූ බුදුහු ප්‍රච්ඡන්න කථාව ගෙණහැර වදාරණසේක් කඩතුරාවක් පහකොට චිත්‍රකර්මාන්තයක් ගෙණහැර පානා කලක් පරිද්දෙන් මේ අතික්‍රාන්ත කථාව ගෙණහැර දක්වා වදාළසේක.

හේ කෙසේද? යත්

යටගිය දවස අවන්ති රට උදේනි නුවර අවන්ති නම් මහ රජ්ජුරු කෙණෙක් රාජ්‍ය කෙරෙති. එකල්හි පුරණලද පාරමිතා ඇති මහබෝධි සත්ත්වතෙම ඒ නුවර සමීපයෙහි චණ්ඩාල ග්‍රාමයෙක්හි උපන්නේය. අනිකුත් එසේම පිණැති සත්ත්වයෙක් ඒ බොධිසත්ත්වයන්ගේ මලනුවන්ට පුත්ව උපන් නේය. ඔවුන් දෙදෙනාගෙන් එක්කෙණෙක් චිත්ත නම් වූහ, එක්කෙණෙක් භූත නම් වූහ දෙදෙනම සමගම එක කෙළි මඩුල්ලේ වැඩිවිය පැමිණියාහු චණ්ඩාල වංශ ධොවන නම්වූ ශිල්පයක් ඉගෙණ එක්කෙණෙක් උතුරුවාසල් දෙර ශිල්ප දක්වති. එක්කෙණෙක් නැගෙණහිර වාසල්දෙර ශිල්ප දක්වති. එකල එම නුවර යහපත් දැකීම් මගුලැයි ගෙණ ඉත්තාවූ දිට්ඨමඞ්ගලිකාවෝ දෙදෙනෙක් ඇත එයින් එක්කෙණෙක් සිටුදියනියෝය, එක්කෙණෙක් බැමිණි දියනියෝය, ඔහු දෙදෙන සිල්ප දක්වන්නාහු චණ්ඩාල පුත්‍ර දෙදෙන මුහුණ බලා කවුරුදැයී විචාරා චණ්ඩාල පුත්‍රයෝයයි යනු අසා නුදුටුමනාදෙයක් දුටුම් හයි දෙම්නස්ව පැමිණ සුවඳපැනින් නුවන් සෝධා ඒ කුමන උයන්කෙළිදැයි ආපස්සේ ගෙවල ගියාහ. කැටිව ගිය පිරිවර ජනයෝත් අප නොමිලයෙ ලබන රා මස් ඛාද්‍ය භොජ්‍ය කෑ නුදුන්නාහු චණ්ඩාලයෝයයි වාසල් දෙකෙහිම සිටි දෙදෙනා මරා තලා බොහෝ අනර්ථව්‍යසනයට පමුණුවා නිසන්ත කළහ. නැවත නොබෝ වේලකින් ඔහු දෙදෙන සීසන් ලදින් නැගීසිට ඔවුනොවුන්

සමීපයට වැද එක්ව සිට ඔවුන්ට පැමිණි දුක් මුළා ඔවුනොවුන්ට කියා හඬා වැලප කුමක් කරමෝදැයි සිතා සතිවූහත් කරත්තාහු මේ දුක් අපගේ චණ්ඩාල ජාතිය නිසා පැමිණියේය. එහෙයින් මේ චණ්ඩාල ක්‍රියාව හැර ජාතිය හඟවා ගෙණ බමුණුමාණවකයන් දෙදෙනෙක්හු මෙන් තක්ෂලා නුවරට ගොස් ශිල්ප ශාස්ත්‍ර උගණ්ණුම්හයි නියමයෙන් ශිවිෂ කථාකොට කී පරිද්දෙන් තක්ෂලා නුවරට ගොස් වෙස්වලා දිසාපාමොක් ආචාරීන්ට ධර්මාන්තෙවාසීව ශිල්ප උගන්ට පටන් ගත්හ. ජම්බුවීපයෙහි චණ්ඩාලයෝ දෙදෙනෙක් ජාතිය හඟවාගෙණ ශිල්ප ශාස්ත්‍ර උගණිති ප්‍රකාශ විය. ඔවුන් දෙදෙනාගෙන් චිත්ත පණ්ඩිතයෝ වහා ශිල්ප හදැරා නිමවූහ. සම්භූත නම් කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර නොනිමියේය. ඒ අවසරයෙහි එක්දවසක් ගම්වැසි පුරුෂයෙක් බමුණන්ට දතක් දෙමියි කියා ඇවිත් ආචාරීන්ට නිමන්ත්‍රණය කෙළේය.

එදවස්ම රාත්‍රියෙහි අතරමග ඇලකඳුරැලි වල පුරාගෙණ මහා වැස්සක් වැටූයේය. ආචාරීතෙම උදෑසනක්සේම චිත්ත පණ්ඩිතයෙනි, මේ දියබොරෙහි දත්කත්තට යා නොහැක්කෙම් තෙපි මේ බමුණු මාණවකයන් කැඳවාගෙණ එතනට නිසි මංගල වචනයෙනුත් කියා සාන්තිකොට තොප ලද දෙය අනුභවකොට අප ලද කොටසද ගෙණ එවයි කීයේය. එතෙම යහපතැයි ගිවිස බමුණනුත් කැඳවාගෙණ ගොස් මඳක් එතැන්හි හිඳ ස්නාන චන්දනාදිය පිණිස ගොස් බමුණන් එතදෑතුරෙහි දත්දෙන පුරුෂතෙම කිරිබත් පිස නිවෙන්තේයයි තුබූහ. බ්‍රාහ්මණයෝත් කිරිබත් නොනිවෙනතුරු අවුත් මන්ත්‍ර හදැරමින් පිළිවෙළින් උන්හ. මනුෂ්‍යයෝ තුමූද දක්ෂිණොදකයන්දී තලිවල නිවෙන්නට තිබූ කිරිබත් පිළිවෙළින් බමුණන් ලඟ තුබූහ. සම්භූත කුමාරතෙම මොවුන් අතුරෙන් ඉතා ගිජුහෙයින් සිහිලැසි සිතා වහා කිරිබත් පිඩක් හැරගෙණ මුවෙහි තුබුයේය. රත් යවටක් තබා ලූ පරිද්දෙන් මොහුගේ දිව හා තල්ලේ දැයේය. ඒ තෙම එයින් වෙව්ලමින් අතකට සලමින් චිත්ත පණ්ඩිතයන් බලා සිහි එලවාගත නොහී චණ්ඩාල භාෂාවෙන් එළුයයි යන බසක් කීයේය. චිත්තපණ්ඩිතයෝත් නොසලකා වහාම එම බසින් ගැලපිය කීයේය.

එකෙණෙහි තෙහූ මානවකයෝත් ඔවුන් මූණ බලා මේ කුමන භාෂාවෙක්දැයි විචාළාහ. චිත්ත පණ්ඩිතතෙම අභිවෘද්ධි වේවයි යල මඞ්ගල්‍ය වචනයෙකැයි කීයේය. එසේද වුවත් මාණවකයෝ එතනින් පිටත්ව මුලු මුලුවල ඉඳ පරීක්ෂා කරත්තාවූ චණ්ඩාල භාෂායයි දැන කොල දුෂ්ටවූ චණ්ඩාලයෙනි බ්‍රාහමණයම්හයි කියා අප වඤ්චාකළෘ වේදැයි රැහැණිවෙමින් දෑතින් දෙපයින් තලා මරා දුම්ල කළහ. මොවුන්ගෙන් සත්පුරුෂ එකෙක් පමණැයි වලකා එම්බා තොපගේ ජාතියෙහි දෙෂ නිසා පැමිණිදුකැයි අස්වසමින් මතු මෙබන්දක් නොකොට එක්තන්වූ ස්ථානයෙක්හි තපස්කොට ජීවත්වයි ඔවුන් එතනින් යවා මොවුන් චණ්ඩාල නියාව ආචාරීන්ට නොකියවයි කියා උගන්වා තමන් ගුරුන් ලඟටම ගියාහ. ඒ චණ්ඩාලයෝ දෙදෙනත් වලට වැද එක් පෙදෙසෙක්හි ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව නොබෝ දවසකින් එයින් චුතව නේරඤ්ජරා නම් ගංතෙරෙහි මෘගධෙනුවක කුස පිළිසිඳ ගත්තාහ. ඔහු දෙදෙනම මව් කුසින් බිහිවූ තැන් පටන් එක්වම ඇවිදිමින් පැයකුත් ඔවුනොවුන් ඇර වියෝ නොවන්තාහ. ඔහු එක් දවසක් ගෝචර ස්ථානයට ගොස් ගොදුරු අනුභව කොට රුක්මුලෙක සිහිල් වන තුඩින් තුඩ ඉසින් ඉස එක්කොට අල්වාගෙණ

එකම මුව පැටියක්හු මෙන් කථාකොට සිටියවුන් එක්තරා වැදිපුත්‍රයෙක් එකම තෙජ් පහරකින් දෙපලු කොට රූපාදි ජීවිතයෙන් වෙන් කළහ. ඔහු දෙදෙන එයින් චුතව නම්මදානම් ගංතෙර හැසිරෙණ උකුසු ධෙනුවක බඩ පිළිසිඳ කුසින් බිහිව ගෙණ එක්වම වැඩිවිය පැමිණ ගොදුරු අනුභව කොට ඇවිදිනාහු එක් දවසක් හිසින් හිස තුඩ එක්ව බඳ සිටියවුන් දැක උගුලු අටවා සතුන් බදනා එක් වැදිපුත්‍රයෙක් පක්ෂීන් දෙදෙනා එකවිටම ඒ බඳගෙණ මරාපුයේය එකල්හි එතනින් චුතව දෙදෙනාගෙන් චිත්ත පණ්ඩිත තෙම කොසඹෑ නුවර රජ්ජුරුවන්ගේ පුරෝහිත බමුණාට පුත්ව උපන්නේය සම්භූත පණ්ඩිත තෙම උත්තර පඤ්චාල නුවර රජ්ජුරුවන්ට පුත්ව උපන්. නේය. ඔහු දෙදෙනම නම් තුබූ දවස් පටන් ගෙණ ජාතිස්මරණඥාන ඇතිව පෙර උපන් ජාති දකිනාහ. ඔවුන් දෙදෙනාගෙන් සම්භූත පණ්ඩිත තෙම පිළිවෙළින් බොහෝ ජාති දක්ක නොහෙන්නේ සතරවන ජාතියක පමණ දකින්නේය. චිත්ත පණ්ඩිතයෝ සතර ජාතියකුත් නව් මෙයින් වඩා දකිනාහ.

මෙබඳු නුවණීන් යුක්ත වේදත්‍රයෙහිද නොයෙක් ශාස්ත්‍රයෙහිද දක්ෂවූ සොළොස් ඇවිරිදි වයසට පැමිණ ගේ හැර නික්ම හිමවත් පෙදෙසට වැද සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්තිලාභීව වසන්නාහ. සම්භූත පණ්ඩිතයෝද පියානන්ගේ ඇවෑමෙන් සියලු රජ ඉසුරට පැමිණියේ සේසත් නන්වා ආඥාචක්‍ර පවත්වමින් තමාගේ අභිෂෙක දවස්හී මහජනයා මධ්‍යයේ මංගල ගීතිකාවක් උදන් වශයෙන් කියනුයේ ගාථා දෙකක් කීයේ, ඒ අපගේ රජ්ජුරුවන් වහන්සේගේ මංගල ගීතිකාවයි, අන්තඃපුර ස්ත්‍රීහුද ගායනාවෙහි දක්ෂවූ ගාන්ධර්වීයෝද ඉගෙණ ගායනා කෙරෙති. මෙම ක්‍රමයෙන් සියලු නුවර වාසීහුද මෙයින්ම ගායනා කෙරෙති. චිත්ත පණ්ඩිතයෝද හිමාලයවනයෙහිම ධ්‍යානසැපයෙන් දවස්යවමින් වසනුයේ එක්දවසක් කිම්ද්‍රෝහෝයි මා මලනුවන් සම්භූත කුමාරයන් විසින් පියානන් ඇවෑමෙන් රාජාභිෂෙකය ලබන ලද්ද්‍රෝහෝයි දිවසින් පරීක්ෂා කරණුයේ රජ ඉසුරු ලද නියාව දැක රජ සැපතට හිම් වූයේය. නොබෝ දවසක බාලවයස සිටියෝය.

එබැවින් බණ කියා දැනට දමනය නොහැක්කැයි නියමකොට මහලුවූ කල්හි ඔහු කරා ගොස් දම්දෙසා මෙලොව පරලොව් දෙක හඟවා රජ ඉසුරෙන් සිත උමතු නොවන පරිද්දෙන් කොට පැවිදි කරවා ගණිම් සිතා පණස් අවුරුද් දක් කල්බලා හිඳ රජ්ජුරුවන් දරුබිරින්ද ආදීන් සමෘද්ධව වැඩුනු කල්හි සෘද්ධි යෙන් ආකාශයෙන් ගොස් රජහුගේ උයනෙහි මගුල්සලවට මත්තෙහි දිව්දළින් ඔප්නගා කරණලද රන්පිළියෙක් මෙන් හුන්නේය. එකෙණෙහි එක් ලදරුවෙක් ඒ නුවර රජ්ජුරුවන්ගේ උද්දාන ගායනාවෙන් ගායනා කෙරෙමින්ද රඳන් නේය. චිත්ත පණ්ඩිතයෝත් උන් කියන ගීතිකාවන් අසා ඔහු ලඟට කැඳවා, මෙසේ කියනුයේ, කීමෙක්ද දරුව උද්‍යාන පටන් මෙම ගී කියන්නේය, අනික් ගීයක් නොදනීදැයි විචාළේය. එතෙමද තපස්වීන් වහන්ස තවත් බොහෝ ගී දනිම් එසේද වුවත් අපගේ රජ්ජුරුවන් වහන්සේට ප්‍රිය ගීතිකා හෙයින් නැවත නැවතත් කිය කියා සිටිම්යි දන්විය. කිමෙක්ද දූන් මේ තොපගේ රජ්ජුරු වන්ගේ ගීයට උතුම්කොට අනික් ගීයක් කියන කෙණෙක් නැද්දැයි විචාළේය. නැත සවාමීනි ලදරුවා කීයේය. තෝ තමා මට අනික් ගීයක් ගායනා කරන්ට පොහොසත්දැයි කීයේය. ඒ තෙමද දනිම්නම් යම් අරුමයකින් ගායනා

කෙරෙම්දැයි කීයේය. එබැවින් තොපගේ රජ්ජුරුවන් තමන් දත් ගී දෙක ගායනාකොට උන්කල්හි තුන්වෙනිව තෝ මේ ගීය කියව, එකල්හි රජ්ජුරුවෝ තොප කෙරේ පැහැද බොහෝ ඉසුරු දෙති තොබා කියවයි කියා යවූසේක. ඒ තෙමේත් ගෙට ගොස් මෙපවත් මෑනියන්ට කියා අඳුන් තෙල් ගා සරහවා ගෙණ රජගෙයි වාරයට අවුත් එක් බාලදරුවෙක් නුඹවහන්සේ කීයන ගීයට උත්තරකොට අනික් ගීයක් කියමි කියා වාසල් දොර සිටීසයි කියා යවා රජ්ජුරුවන් විසින් එන්නේය කියා අවසර දුන්කල්හි ඇවිත් රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටියේය. එසඳ රජ්ජුරුවෝද තොපි අපි කියන ගීයට උත්තරකොට අනික් ගීයක් කරන්නෙහිදැයි විචාරණලද කල්හි එසේය. දේවයන්වහන්ස නුවරව සිත් හා අමාත්‍ය මණ්ඩලයා රැස්කරවූව මැනවැයි පමින් රැස් කරවා දෙවයන්වහන්ස නුඹවහන්සේ කියන ගී පළමුකොට කිවමැනව, ඒ අසා මම පසුව ප්‍රතිගායනා කෙරෙමි ලදරුතෙම කීයේය.

රජ්ජුරුවෝද යහපතැයි ගීවිස තමන් උදුන ගීතිකා දෙක සභාමණ්ඩලයෙහි ප්‍රකාශ කරණුයේ ''සබ් නගරං සඵලං'' යන ගාථාව කීහ. මේ ගාථාවෙහි අර්ථ කවරේද? යත් මේ ලෝකයෙහි විද්‍යමාන සියළු සත්ත්වයන් විසින් කරණ ලද කුශලකර්මයෙක් ඇත්නම් ඒ මුලුල්ලම විපාකදීම විනා තුච්ඡව සිස්වයන්නා වූ කුශලාකුශලයෙක් නම් නැත. ඊට දෘෂ්ටාන්තර කවරේද යතහොත් මේ ජාතියට සතරවන ජාතියෙහි චණ්ඩාලව ඉපිද සිල් රක්ෂාකිරීමෙහි විපාකයෙන් මෙවෙනි රාජ්‍යශ්‍රීයට පැමිණීන. සැපවිඳිමින් සිටියෙමි, එබැවින් කළ කුශල විපාකදීමුත් නොවැළකුනේයයි කීයා තමන් ප්‍රත්‍යක්ෂ ප්‍රමාණකොට නැවත අනික් ගීතිකාවකින් තමන්ගේ එකල මිත්‍රයාතන් සලකා මේ භවයෙහි කළ කුශලාකුසල විපාක දීමුත් නොවළකීයයි කියා මට දැනුනාසේම සැඩොල් කුලයෙහි ඉපිද එක්ව සිල්රැකි චිත්ත පණ්ඩිතයන්ට කෙලශය උපනිද්‍රෝහෝයි පූර්ව විශ්වාසය සඳහා දෙවෙනි ගීයකින් මේ අර්ථය ප්‍රකාශකොට කීයේය. බමුණු කුලයෙක්හි ඉපිද තපසට වැද පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා සතරවන ජාතියෙහි කළ මිත්‍රසන්තානය අද දවස්සේ සිතා දෘඪ විශ්වාසයෙන් ඒ නුවරට ඇවිත් චිත්ත පණ්ඩිත නම් මාගේ මිත්‍රයානෝ කොයි උපන්ද්‍රෝහෝයි යන අර්ථය ප්‍රකාශකරණ ගීතිකාදෙක අසා ඊට ප්‍රතිවචන ලදරුවන් අතින් කියා යවනුයේ කළ කුසලාකුසල දෙක පලදීම ඒකාන්තයයි තොප කීයේ සැබෑ වචනයෙක්ම වන්නේය.

එසේ හෙයින් තොපි යම්සේ රැකි ශීලයෙහි අනුසසින් සම්භූත නම් රජව සැපවිඳුද, එපරිද්දෙන්ම චිත්ත පණ්ඩිතයෝයයි යන නමින් ප්‍රසිද්ධව කාමයෙහි ආදීනවයන් දැක සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධ්‍යානලාභීව සැප විඳිමින් සිටියෙමි. එබැවින් අප දෙදෙනා සතරවන ජාතියෙහි කළ කුසල විපාක දෙමින් සිටියේය. එබැවින් මේ ප්‍රමාද චේදැයි යන අර්ථය හඟවා මේ ගීතිකාව පැවැත්තේය. එබස් අසා රජ්ජුරුවෝ තුමූ සතරවන ගාථාව කීයන ලදරුවෝද චිත්ත පණ්ඩිතයෝ මට බෑනෝය යන වචනය ඔවුන් තමන් කෙරෙන් ඇසූද නොහොත් අන්තැනකින් ඇසූද මේ ඇතිසැටියේ මට නොවළහා කියව, ගාථාවෝ මොනවට ගායනා කරණ ලදහ, මා සිත සැක පහවූයේය. එසේහෙයින් මේ ප්‍රියවචන කාරණා කියනුයේ තොපට ප්‍රිය පඬුරක් දෙමි. ඒ ලදරුවාහට ධන ධාන්‍යයෙන් සමෘද්ධවූ ගම්වර සියයක් දුන්හ. ඉක්බිති ලදරුතෙම පිළිවිසි වචනයට කාරණා කියනුයේ

දේවයන්වහන්ස තුඹවහන්සේ චිත්ත පණ්ඩිත නම් බැණ කෙණෙක් ඇතැයි මාගෙන් ඇසූයෙත් නැත. ඔබකින් අසූයෙත් නැත. එතකුදු වුවත් මා දර කඩන්ට ගිය තැනට නුදුරු තැන මගුල්සලවටෙහි එක් සෑමියෑණ කෙණෙක් හිඳ මා කියන ගී අසා සමීපයට කැඳවා තොප ගොසින් මේ ප්‍රීති ගීය නොබා කියාලව. එයින් සතුටුවූ රජ්ජුරුවෝ තොපට ප්‍රිය පඬුරු දෙති කියා මෙලෙස ඉගැන්වූ සැටියේම කියා දූන්වීමි. මාගේ සමජීයකින් කී දෙයක් නොවෙයි කීයේය.

එබස් අසා රජතෙම ඒ තාපසයෝ නම් මාගේ බෑනන් චිත්ත පණ්ඩිත යන් සැටිය, දූන් මම ගොසින් දක්ක යුතුයයි කැටිව යන පිණිස පිරිස් සැරහෙන්ට කියන්නාහු මෙලෙස විධාන කෙළේය. මොනවට සිහ සම් ව්‍යාඝ්‍ර සම් අතුට නගනලද රත්ධජ රිදීධජ ඇතිව මනාකොට පසස්නාලද සනනි සනතාන ඇති අජානීය සෛන්ධවයන් යොදනලද රථවරයන් සරහා ගෙන් වයි හද්‍ර සඬ මනුදී උත්තම හස්තීන් පිට රන් සැත් රන් පොරොදු හා මනාවූ ග්‍රීවාලංකාරයන් බහබ්වයි, මහාබෙර පණාබෙර මිහිගු බෙර යනාදීවූ හෙරි ජාතිය පවත්වයි සක්සින්නම් දහර යනාදීන් පිඹින්වයි සෙසු ඉදෝලි කූනම් ආදී යානවාහනන් සරහත්වයි මේ කුමරුවා විසින් කියනලද සෑමිහු යම් තැනෙක්හි වෙසෙත්ද එතනට දූන්ම යම්හයි කීයේය. එබස් අසා සිව්රඟ සෙනග සැරහී සම්භූත රජතෙම මනාවූ රථයකට නැගී වහා ගොස් උයන් දොර සමීපයෙහි රථය රඳවා පමණ ඇමති වරයන් කැඳවාගෙණ චිත්ත පණ්ඩි තයන් ලඟට ගොස් වැඳ එකත්පස්ව සිට තුටු පහටු සිතින් මෙලෙස කියන් නේය. තාපසයන්වහන්ස මේ පර්ෂත් මධ්‍යයෙහි යහපත් සුභාසිතවූ ගීතිකා වක් ඇසීමි, දෙවෙනිව මෙසේ සිලාචාරයෙන් යුක්තවූ සෑමීන් දුටිමි. එබැවින් අද බොහෝ ලාභයක් ලදිමි. පළමුවන අභිෂෙකයෙහි කියනලද උදාන ගීතිකාවෙහි පල ලදිමි දැක ඉතා සොම්නසට පැමිණියෙමි කීයේය. ඒ සම්භූත රජතෙම චිත්ත පණ්ඩිතයන් දුටුවේලෙහි පටන් මහත් සොම්නසින් උදන්අනා මාගේ වහන්සේ හිඳිනට අස්නක් පණවා පැන් ආදිය ගෙණෙවයි පය සෝදන්ට විධාන කෙරෙමින් මෙසේ කියා, සෑමින්වහන්ස අපි සත්කාර පූජිංගමව පූජාව නිත්තකොට අපි පිළිවිසුම්හ.

එබැවින් අප විසින් එලවන ආසනයක්ද බොන පැන් හා ඓනාදියද පිළිගන්නා සේක්වයි සෙසුත් අප විසින් පමුණුවන ලද පූජාවන්ද පිළිගන්ට සුදුසු හෙයින් ඉවසුව මැනවැයි ආරාධනා කෙළේයි. මෙසේ මිහිරි පිළිසඳර කථාකොට තුඹවහන්සේට අනික් කුමක් පමුණුවම්ද මාගේ සියළු ඉසු රෙන් පිරිණු මේ රාජ්‍යය සමව දෙකක් කොට භාගයක් පිළිගත මැනවැයි ඉසුරු පමුණුවන්නේ මෙලෙස කියා තාපසයන්වහන්ස තුඹ වහන්සේගේ සිත පිණවීම පිණිස භක්තිසම්පන්න සෝපානාදීන් අලංකාර යෙන් සිත්කළුවූ ප්‍රාසාදයන් කෙරෙත්වයි මෙබඳු ප්‍රාසාදයෙහි මතුමාලට නැගී යා තොප සර්වාභරණයෙන් සැරහුනු දෙවඟනන් හා සමාන වරඟනෝ භාව භාව ලීලාවයෙන් තුඹවහන්සේ පිණවත්වයි තුඹවහන්සේගේ මෙතෙක් දවසක් දුක්විඳිනා ශරීරයට අනුග්‍රහ පිණිස සැප විඳ්ද මැනවැයි මේ උත්තරපඤ්චාල නුවරද රාජ්‍ය දෙකක් කොට බෙදදෙමි එයින් හැර ගෙණ දෙදෙන සමගව රාජ්‍යශ්‍රී විඳුම්හයි කීයේය. එබස් අසා චිත්ත පණ්ඩි තයෝ ධර්මදෙශනා කරණුයේ මෙලෙසින් කියා සම්භූත රජ්ජුරුවෙනි අකුශල කර්මයාගේ විපාකද නැවත කුශල කර්මයාගේ විපාකද අපටම දූනුනු හෙයින් අනුන් විසින් කිවමැනවැයි නැවත එබැවින් දරුබිරින්ද

ගව මහිසාදි සම්පත්ද ප්‍රණීතා නොකෙරෙමි. දුකින් ගැලවෙන ලෙසක්ම්ය පැතිය යුතුයයි කියා මිත්තෙහි අවවාද කියනුයේ සම්භූත රජ්ජුරුවෙනි මේ ලෝකයෙහි මනුෂ්‍යයන්ට පරමායු අවුරුදු සියයෙක එහෙයින් කොට්ඨාස වශයෙන් දස අවස්ථාවෙක, ඉනුත් බාල දසකයෙන් ක්‍රීඩා දසක යටත් නොපැමිණ මියති. ක්‍රීඩාදසකයෙන් වර්ණ දසකයටත් නොපැමිණ මියති. එබැවින් ආයුකාලය පිරිසිඳී අවදියට නොපැමිණ අතරෙහි සිටිනා ලද ශංසක්මෙන් නසන්නේය. මෙසේම පළමුව මනාවූ ආයුෂය විශ්වාස කළ නොහැකි නියාව දැන දැන මේ නිසා උපදනා කවර කෙළියෙක් කවර සිනාවෙක් කවර සැපයෙක් ඇද්ද පඤ්චකාමසම්වාදයෙහි කවර නම් ඇල්මෙක් වේද ඒ නිසා සොයන්නාවූ අර්ථය නම් කවරේද එසේහෙයින් මේ සියල්ලම තමාගේ සිතින් මේ යහපතැයි වටහා ගැන්ම විනා මේ සසර සැපයක් නම් නැත්තේය තොපගේ රාජ්‍යශ්‍රීය හා දරුවන්ගෙන් කම් කිම්ද මම ඒ මලින් මිදීහොත් නැවත ඒ මලකුම්කැයි කරලාදැයි කීයේය. තවද රජ්ජුරුවෙනි මරතෙම අප යම්හෙයකින් ප්‍රමාද නොවෙයි යනු විශෙෂයෙන් දනිමි. ඒ හෙයින් මඩනාලද්දාවූ සත්ත්වයාට වස්තුකාම කෙලශ කාමයෙහි සිත් ඇලවීමෙන් කම් කිම්ද? පුත්‍රදාරාදී උපභොග පරිභොග සම්පත්තීන් කම් කිම්ද ? සංසාරයට නිසුකොට මෙලෙසින් දේශනා කෙළේය තවද කුශලාකුශලයෙහි විපාක තමන් දෙදෙනා විඳිනා සැටි යම් දෘෂ්ටාන්තකොට කියනුයේ රජ්ජුරුවෙනි සත්ත්වයන් කෙරෙන් ඉතා ලාමිකවූ යම් චණ්ඩාල ජාතියෙක් ඇද්ද එසේවූ සියල්ලන්ටම යටත්වූ ජාතියෙක අප දෙදෙනම පෙරකළ පවකින් උපනුම්හ.

ඒ කෙසේදැයි විස්තර හෙයින් දන්නා කැමැත්තාහු වී නම් මා කියන ලෙස් අස්වයි කියනුයේ සම්භූත රජ්ජුරුවෙනි අපි මීට සතරවන ජාති යෙහි අවන්ති රාජ්‍යයෙයි උදේනි නුවර සමීපයෙහි චණ්ඩාල ග්‍රාමයෙක ඉපිද එක්වම වැඩි ජාතිය කළ පරිභවයකින් කලකිරී අන්‍ය දෙශයකට ගොසින් එතැන්හිදීත් නින්දාවට පැමිණ ගිහිගෙයි කලකිරී මහණව සිල්රැක කලක් වාසය කොට එයින් මියගොස් නේරංජරා ගංතෙර දෙන්නම මෘග ජාතිව උපනුම්හ එයින් සැව අවුත් නර්මදා නම් ගංතෙර උකුසු යෝනියෙක්හි උපනුම්හ. එයින් අවුත් සංඛ්‍යාත කුශලයෙක්ම කළ මැනවැයි අනුශාසනා කරන්නාවූ පණ්ඩිතයෝ මෙසේ කියත්, සම්භූත රජ්ජුරුවනි මේ ජීවිතයතෙම අවශ්‍යයෙන් මරහු විසින් පැහැරගන්නා ලැබෙයි. එබැවින් ආයුෂයතෙම තණ අග පිණිබිඳුසේ සවල්පය නොපවත්නේය. නැවත ජරාවෙන් මඩනා ලද්දාවූ මේ සත්ත්වයාහට ඔවුනොවුන්ගේ රූපය නොනසන් වයි කියා ජරාව වලකන්ට බන්ධු මිත්‍රාදී කෙණෙකුන් නැතිහෙයින් රක්ෂාපපල යකුත් නැත්තේය. එහෙයින් පඤ්චාල දෙශවාසීවූ රජ්ජුරුවෙනි මා විසින් තොපට කියයුතු අවවාද නම් මෙපමණෙක. ඒ කවරේදැයි යතහොත් දුක්ඛ සම්භාර දෙන්නාවූ නරකාදී දුක්ඛය විපාකකොට ඇති ශරීර සොභාවෙක් විය නොදී වසාලන ධූලි සමූහයක් වැනිවූ මේ අකුශල කර්මයන් නොකොට ජාති ජරා මරණාදීන්ගේ දෝෂ දැක බ්‍රහ්මචර්‍යා වාසයකොට ක්ලෙශ නිග්‍රහකරන්ට උවමැනවැයි කීයේය. එකෙණෙහි රජතෙම කාමයන්ට මෙලෙසින් නින්දා කරණුයේ කිමෙක්දැයි කිපී මෙලෙසින් කියන්නේයි. තපස්විනි තොප විසින් යමක් කියනලද වී නම් ඒ තෙම සැබෑමය එතකුදු වුවත් පුරුදු

කරණලද වස්තුකාම ක්ලේශකාමයන් හැරපියා නොහෙමි. තවද මහත් පංකයෙක ගැලපියා ඇදගත නොහෙන ඇතෙක් තෙම රම්‍යවූ ප්‍රදේශයක් හා කැයුතු පල්ලව පත්‍රාදීන් දුර දැකත් යම්සේ පය ඇදගත නොහේද, එපරිද්දෙන් තපස් සමාධි ඇති බවත් සැප බල බලා මේ කාම නමැති පංකයෙන් ගොඩ නැගී එතනට පැමිණියා නොහෙමි. මෙසේ දෙමව්පියෝ දරුවන්ට වැඩක්වනු සඳහා අවවාද කෙරෙති. ඒ පිළිගත් උත්තමයෙක් තෙම අභිවෘද්ධිකාරණයෙන්ම දක්නේය. එලෙස නොකරන්නේ වී නම් දෙමව්පියන්ගේ වරදක් නොවේද. එලෙසින්ම නුඹවහන්සේ අවවාද කළත් මෙබඳු කාම පාසයෙන් ගැලවී ගත නොහෙමි. එතකුදු වුවත් මතු පලදෙයකවූ කුසල් කෙරෙමි කීයේය ඉක්බිති චිත්ත පණ්ඩිත තෙමේ මෙලෙසින් කියා, ඉදින් රජ්ජුරුවෙනි වස්තුකාම ක්ලේශකාමයෙහි ඇති ලොභය හැරගන්ට නොහැකි වී නමුත් දසරාජ ධර්මයෙහි යෙදී කුශල් කරව. තොපගේ රාජ්‍යයෙහි අන්‍යාවක් අයුක්තියක් නොපවැත්ත දෙව. ඒ ඒ ස්ථානයෙහි දන්හල් කරවා දනෝපකරණ සරහාගෙණ සතර දික්හිම දූතයන් යවා උත්තමවූ ශ්‍රමණ බ්‍රාහමණයන්ට ආරාධනාකොට ගෙන්වා අවිශෙෂ දුගී මගී යාචකයන්නුත් රැස්කරවා දන්දී ශක්ති පමණින් වස්ත්‍රාභරණාදී කැමති කැමති වස්තුවෙන් පිණවීම කරව. මෙලෙසින් චතුර්විධ බාද්‍ය භොජ්‍යයෙන් හා සේනාසනාදියෙන් සන්තර්පණය කොට සවර්ගපදප්‍රාප්ත කරව, රජ්ජුරුවෙනි රූප ශබ්දාදී වශයෙන් පිරිමින් බැඳගන්ට සමර්ථවූ මඳ මඳ සිනාමුසු බස් බිණීමෙහි සමර්ථ සුරඟනන් විලස් ගත් වරඟනන් හා සමග රජ ඉසුරු විඳිනා තොප ඓශ්වර්‍ය්‍යක් නිසා හෝ රාජලක්ෂ්මිය නිසා හෝ උපදනා රූපමානාදියෙන් නොපසොලොවන්නෙහි වී නම් ඒ කාන්තස්ථානයෙහි වන් පිරිමැද මෙම ගාථාව කිය කියා දවස් යරුවයි අවවාද දුන්හ.

ඒ ගාථාවෙහි අර්ථ නම් පෙර මීට සතරවන ජාතියෙහි චණ්ඩාල කුලයෙහි ඉපිද වැදහිඳිනා තණ පැලක් විවර නැති සෙයින් නිකම් ආකාශයේ හිඳ චණ්ඩාල කුල සත්‍රීවූ මව් තොම දරපලා කඩා වලටායන්නී එකල් බලු කුකුරුවනමැද අබ්භොකාසයෙහි වැදහොවා කිරිපොවා යන්නීයයි එතෙම කුකුරුවන් විසින් පිරිවරණලද්දේ කිසිවිටෙක බැල්ලගේ තනයෙනුත් කිරි බී වැඩී මෙසේවූ නීචවූ චණ්ඩාල කුලයෙහි ඉපිද අද රජවීමි තෙපි ගහ්‍යිා කරන්නවාදැයි පෙරවිදි නිසරු නොදනිදැයි යන අර්ථයි.

මෙසේ මහබොධිසත්ත්වතෙම ඒ සම්භූත රජහට අවවාද කොට රජ්ජුරුවෙනි තොපට කොතනකත් මා කී අවවාද සිතින් පිළිගෙණ මහණ වෙතත් නැතත් තොපගේ අභිප්‍රාවමය, එතකුදුවුවත් තමාගේ කුශලාකුශල කර්ම විපාක විඳිනා උත්තමයන් හෙයින් ඊට නිස්සක් සිතවයි කියා අහසට පැන නැගී ඒ රජහුගේ හිස පිස පස්බහමින් හිමාලය වනයෙහි සවකීය වාසස්ථාන යටම ගියේය. රජ්ජුරුවන් වහන්සේද චිත්තපණ්ඩිතයන් අහසින් යන නියාව බලා කළ අවවාදයෙහි ඇදහිලි ඇතිව සතර කළකිරි වැඩිමාලු පුතනුවන් කැඳවා රාජ්‍යාභිෂෙක කරවා තපසට යෙමි නික්මුණුසේක බොහෝ සිව්රඟ සෙනඟ පිරිවරා කැටිව යන්නවුන්ට අවවාද කියා වළකමින් හිමවතට අභිමුඛව නික්මුනේය මහබොධිසත්වයෝ සම්භූත රජ්ජුරුවන් තමන්ගේ සකල රාජ්‍යශ්‍රිය හැර තපසට එනනියාව දැන බොහෝ සෘෂිගණයා පිරිවරා ඉදිරියට අවුදින් රජ්ජුරුවන් කැඳවාගෙණ ගොස් තාපස කරවා කිසුණු පිරියම් භාවනා ඉගැන්වූහු ඒ සම්භූත නම් රජ තාපසයෝත් භාවනාකොට බොහෝ දවසකින් ධ්‍යානලාභීවූහ මෙසේ ඔහු දෙදෙන කාබුත් මරණින් මත්තෙහි බ්‍රහ්ම ලෝක පරායන වූහ, ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන්

වහන්සේ මේ ජාතක ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා එම්බා මහණෙනි පෙර නුවණැත්තෝ සතර පස් ජාතියෙහිත් මිත්‍රසන්ථවය නොහැර පැවැත්තෝ වේදැයි වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි සම්භූත රජ්ජුරුවෝ දැන් මේ ධර්මභාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයෝය, එසමයෙහි චිත්ත පණ්ඩිතයෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

491
සිවි ජාතකය

තවද එක් සමයෙක්හි නෛකගුණගණාධාර තපොධනාධිවාසඅචින්ත අවාච්‍ය අනන්ත ගුණ සමූහයන් සරහන දිගුන් ඇති ශාක්‍යසිංහවූ කරුණානිධානවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ නෛක කුසුම් තරු වර විරාජිත ජේතවන මහාවිහාරයෙහි චතුර්විධ ආර්‍ය්‍ය බ්‍රහ්ම විහරණයෙන් දවස් යවනසේක් ශ්‍රොත්‍රා ජනමනඃ ප්‍රසාද ජනකවූ මේ සිවි ජාතකය එක් බුදුකෙණෙකුන් විසින් දෙවරෙක ලැබ නොහැක්කාවූ අසදෘශ දානය අරභයා වදාළසේක.

මෙහි වර්තමාන කථාව අට්ඨකනිපාතයෙහි සොවීර ජාතකයෙහි විස්තර වශයෙන් ආයේය. ඒ අසදෘශ දානය දුන් සමයෙහි කොසොල් රජතෙම සත්වෙනි දවස් සර්වපරිෂ්කාර දානාදී අනුමෙවෙනි ධර්මදෙශනාවට ආරාධනා කෙළේය. බුදුරජානන් වහන්සේද පර්ෂත් චිත්තාධ්‍යාශය දිව්‍යසින් බලනසේක් මේ අවසර නොවෙයි සිතා ධර්මදෙශනා නොකොට විහාරයට වැඩිසේක. රජ්ජුරුවන් වහන්සේත් නිමවා අනතුයෙහි සවස ගඳදුම් මල්පහන් ගෙණ විහාරයට ගොස් බුදුන් වැඳ පූජාකොට බුදුරජානන් වහන්ස මේ සා දානපරිත්‍යාගයක් කළ මට සතරපදයකින් යුක්ත ගාථාවෙකින් අනුමෙවෙනි ධර්මදෙශනා නොකොට වැඩියේ ඇයිද ස්වාමීනි විචාළේය. බුදුරජානන් වහන්සේද පර්ෂත් අසුබ නෙයිනැයි වදාරා ධර්මදෙශනා කරණසේක.

> නවෙ කදරියා දෙවලොකං වජන්ති,
> බලා හවෙ නප්පසංසන්ති දානං
> ධීරො ච දානං අනුමොදමානො,
> තෙනෙව සො හොති සුඛීපරත්ථ.

යනාදීන් මේ ගාථාවෙන් ධර්මදෙශනා කළසේක. එකෙණෙහි ප්‍රසන්නවූ රජතෙම ලක්ෂයක් අගනාවූ සීවෙය්‍යක උතුරුසළුවකින් පූජාකොට නැවත නුවරටම ආයේය දෙවෙනි දවස් දම්සභා මණ්ඩපයෙහි රැස්වළුන් ශාරිපුත්‍ර ප්‍රමුඛ භික්ෂූන් වහන්සේ කථාවක් උපදවනසේක් ඇවැත්නි මේ කොසොල් රජතෙම සිව්පණස් කෙළක් වස්තු වියදම්කොට දන්දී තෘප්ති නුවූයේ බුදුරජානන් වහන්සේ බණ දෙසූ කල්හි ලක්ෂයක් අගනා සීවෙය්‍ය වස්ත්‍රයකින් පූජා කෙළේය. රජහු දානයෙහි අතෘප්තිත්තය ඉතා යහපතැයි ගුණ කියා උන්සේක. එකෙණෙහි ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ තුන්තරා ගමනින් එක්තරා ගමනකින් ධම්සභා මණ්ඩපයට වැඩ පණවනලද ආසන මස්තකයෙහි යුගන්‍ධර මුදුනෙක දිලියෙන ළහිරු මඩලක් මෙන් දිලිහි දිලිහී වැඩහිඳ සිව්වණක් පර්ෂත් බලා මහණෙනි, මා එන්නාට පූර්

භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදුයිවිචාරා ස්වාමීනි නුඹවහන්සේ නොකියන්ට වදාළ රාජ කථා චෞර කථාදීවූ දෙතිස් කථාවෙන් යුක්තව උනුමෝ නොවම්හයි එතැන්හි පැවතිලෙස දන්වූ කල්හි මහණෙනි බාහිර වස්තු දන්දීම අරුම නොවෙයි පුරාතනයෙහි නුවණැත්තෝ ජම්බුද්වීපයෙහි නගුල් උඩ බඳවා දවස සලක්ෂයක් වස්තු පරිත්‍යාගකොට දන්දෙන්නාහු බාහිර දානයෙහි තෘප්තියකට නොපැමිණ ප්‍රියයක් දුන් කෙණෙක් ප්‍රියයක් ලැබෙන්නේයයි පැමිණි යාචකයන්ට සිය ඇස් උපුටා දුන්නෝ වේදැයි වදාරා ඒ භික්ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේ ද? යත්,

යටගිය දවස සිවිරට අරිට්ඨපුර නුවරෙහි සිවිමහරජහු රජකරණ කල්හි පුරණලද පාරමිතා ඇති ශ්‍රීමහා බෝධිසත්වතෙම ඒ රජහට පුත්ව උපන්නේය. ඔහටත් සිවිකුමාරයයි කියා නම් තුබූහ. එතෙම වැඩිවිය පැමිණ අගති ගමන් හැර දශරාජධර්මයන්කොට දැහැමෙන් රජකරන්නේය සතර වාසල් දෙරය නුවර මැදය වසන ප්‍රාසාදය ඉදිරියෙහියයි යන මෙතැන්හි දන්හල් කරවා දවස සලක්ෂයක් බැගින් වස්තුවියදම් කොට මහදන් පවත්වන්නෝ අටවක තුදුස්වක පසළොස්වක දන්හලට ගොසින් තුමූම බලා දන්දෙති. මෙසේ එක් දවසක් පුණුපොයෙහි උදෑසනක්සේ නගන ලද ධවලාත පත්‍ර ඇති සිංහාසනයෙහි හිඳ තමන් දුන් දන් පරීක්ෂා කෙරෙමින් බාහිරවස්තුවෙන් මා නුදුන් දෙයක් නැත. එතකුදු වුවත් එයින් මා සිත නොපිරෙන්නේය. ආධ්‍යාත්මික දානයක් දෙන පරිද්දෙන් අද මා දන්සලට යන වේලෙහි මුතු මැණික් ආදී වස්තු නොයිල්වා මාගේ ශරීරයෙන් කිසි අවයවයක් කිසි යාචකයෙක් ඇවිත් ඉල්ලුයේ නම් රාජ්‍යාභිෂේකයට වඩා එම උතුම්කොට සිතමි. කිසි යාචකයෙක් මාගේ හෘදය මාංශය ඉල්ලුයේවීනම් කඩුවකින් ළයපලා හැර සහමුලින් පියුමක් උදුරාගන්නා පරිද්දෙන් උපුටාගෙණ ලේබින්දු වගුරව වගුරුවා හෘදයමාංස දන්දෙමි.

ඉදින් ශරීරයෙහි මස් ඉල්වීනම් තියුණුවූ සැතින්ම කපා මස් දන්දෙමි. ඉදින් ලේ ඉල්ලූයේ වී නම් සියලු ශරීරය යතෙහිලා පෙලාගෙණ භාජන පුරා දන්දෙමි. ඉදින් කිසිවෙක් අවුත් භවත මම නිවහල්වෙමි. මට මෙහෙකාරවයි කීයේ වීනම් සියළු රජවෙස් හැරපියා ඔහට ගැති මෙහෙ කෙරෙමි. ඉදින් කිසිවෙක් ඇස් ඉල්ලුයේවීනම් තල්ලොඳක් පරිද්දෙන් උපුටා ඇස් දන්දෙමි මිනිසුන් දියයුතු සියලු වස්තුවෙන් මා නුදුන් දනෙක් නැත. ඒ කෙතෙක් දුනත් මා සිත නොපිණන හෙයින් මේ සියලු ශරීරයට ප්‍රධානවූ ඇස්දෙක උපුටා දෙමි. මෙසේ කල්පනාකොට සොළොස් කළයක් සුවඳ පැනින් ඉස්සොධා නහා සියලු රාජාභරණයෙන් සැරහී අනගි රසමසවුලෙන් යුක්තව භෝජනය අනුභවකොට නොයෙක් ආකාරයෙන් සරහනහඳ ඇත්කඳ පිටට පැනනැගී නුවර සේසත් හා චාමර කෙරෙමින් සිවුරඟ සෙනඟ පිරිවරා දන්හලට අභිමුඛව නොයෙක් ශ්‍රී සෞභාග්‍යයෙන් ශක්‍රදේවේන්ද්‍ර විලාසයෙන් නික්මුනේය. එකෙණෙහි සක්දෙවිඳුතෙම මහබෝසතාණන්ගේ අදහස් දැන සිවිමහරජතෙම අද දවස් තමා ඇස්

ඉල්වා ආ යාචකයෙක් ඇත්නම් දෙමි නිශ්චය කොට දන්හලට නික්මුණේය කිමෙක්දෝහෝයි සිතූ පරිද්දෙන් ඇස් දියහෙද්දෝහෝයි නොදියහේද්දෝ හෝයි විමසනු කැමතිව ජරා දුර්වලවූ අන්ධ බ්‍රාහ්මණවෙසයක් ගෙණ දන් හලට යන මග උන්නත ස්ථානයෙක්හි රජ්ජුරුවන්ට අභිමුඛව "ජයතුභවං මහාරාජ"යි යනාදීන් අශීර්වාද කොට සිටියේය. සිවි රජ්ජුරුවන් වහන්සේද ඔහට අභිමුඛව ඇතු මෙහෙයා බ්‍රාහ්මණයානෙනි කුමක් ඉල්වූවේදැයි විචාළේය. එකෙණෙහි බමුණු කියනුයේ රජ්ජුරුවන්වහන්ස තොපගේ කීර්ති ඝෝෂාව දශදිශාන්තරයෙහි පැතිර සිටියේය. එබඳු කීර්ති ඇතියෙක් පින් නිසාමය සෙස්සවුන් විසින් සොටගත නොහැකි දනයක් දෙන්නට නිසියාවූ නෙපිමයයි දන අයිමි. එබැවින් නෙපි ඇස් දෙකක් ඇතියාහ. එක ඇසකුත් නැති මට එක ඇසක් වුවත් දෙවයි කියා යාච්ඤාකොට ඉල්වනුයේ මෙලෙස කියා කිසිවස්තුවක් දක්ක නොහෙන ඉතා වෘද්ධවූ ජරාජීර්ණවූ මම ඉතා දුරසිට ඇස් ඉල්වා ආමි මම ඇස්දෙකම නැතියෙමි. තොපට ඇස් දෙකම ඇතියේය

එබැවින් දනයෙහි ඇලුම් ඇත්තාවූ වී නම් අපි දෙන්නමෝම එකැස්ව ගියමෝ නම් යහපතැයි කීයේය එබස් අසා මහබෝධිසත්ත්වතෙම අද ප්‍රාසාදයෙන් පිටත්වන ගමනේම මෙසේවූ දනක් ඉල්වන කෙණෙක් ඇත්නම් යහපතැයි සිතමි. මාගේ මනදෙළ මුදුන්පත්ව සිටියේය. අද මට වූයේ මහාලාභයෙක පෙර නුදුන් විරූ දනයක් දෙමි සතුටූ සිත් ඇති රජතෙම මෙලෙසින් කියන්නේය. සබඳ යාචකය මෙලොව දනයකින් ඇස් දන්දීම උගහටයයි දන කවර කෙණෙකුන් විසින් අනුශාසනා කරණ ලදුව අනික් කිසි තැනකට නොගොස් ඇස් ඉල්වා මා සමීපයට ආයේ කවර නිශ්චයක් දැනදැයි විචාළේය. එකෙණෙහි ඒ අන්ධ බ්‍රාහමණද මහරජ්ජුරුවෙනි තොප කී කාරණය මා නිශ්චය කළේ මෙලෙසිනැයි කියනුයේ රජ්ජුරුවෙනි දෙදෙව්ලොව දෙවියන් අතුරෙන් යමක්හු සුජාතානන් අසුරකන්‍යාවට පති හෙයින් සුජම්පතියයි දෙවියන් කෙරෙහිම කියද්ද? මිනිස්ලොව මඝමානවකව දසපින් කිරියවත් පුරා ශක්‍රභවනයෙහි උපන් හෙයින් මඝවනායයි යෙද්ද මෙසේවූ ශක්‍රයන් විසින් සිවි රජ්ජුරුවන් ළඟට ගොසින් කිසිවක් ඉල්ලුවාහු වී නම් තුටූ පහටු සිතින් දෙති එබැවින් නොපමාව යවයි ඔහු විසින් අනුශාසනා කරණ ලදින් ඇස් ඉල්වා තොප සමීපයට ආමි කියා මත්තෙහි ආ කායයී සමෘද්ධ කළමැනවැයි ඇස් දන් ඉල්වනුයේ මෙලෙසින් කීයේය.

රජ්ජුරුවෙනි යාච්ඤාවන් අතුරෙන් මාගේ යාච්ඤාව නම් දනයෙහි ඇඳිලි ඇත්තවුන් විසින් නොලබනහැකි යාච්ඤාවෙක. එබැවින් නෙසුලාමක සත්ත්වයන් විසින් නොසිතිය හැක්කාවූ මේ ඇස් දන්දෙව උතුමානෙනි කීයේය. එකෙණෙහි මහාබෝධිසත්ත්වතෙම සබඳ බ්‍රාහමණය තෝ යම් කාරියක් කියා ආයිද යමක් පතන්නෙහිද ඒ සියල්ල සමෘද්ධවේවයි මත්තෙහි තොප සැපසේ දවස් හරණා පරිද්දෙන් මාගේ ඇස් දන් ඇරගණුව. තවද එකෙක් ඇත. එක ඇසක් ඉල්වා ආවාවූ තොපට මාගේ ඇස්දෙක දන්දෙමි. තොපගේ ශක්‍රයන්ගේ අනුභාවෙන් ඇස් දෙත්ම ප්‍රකෘතිවත් කොටගෙණ මහජනයා බලබලා සිටියදීම සෙසුත් කැමතිදෙයක් ඉල්වාගෙණයවයි කීයේය. එතැන්හිදී ඒ සිවිරජ්ජුරුවන්විසින් මෙපමණක් කියා මෙතැන්හිදී ඇස් උපුටා දන්දීම සුදුසු නොවන්නේයයි අන්ධ බ්‍රාහමණයාත් කැඳවාගෙණගොස් රජගෙයි සිංහාසනේ හිඳ සිවක නම්

වෙදුනත් කැඳවා හවත මේ ඇස්දෙක උපුටා මෙසේ දෙවයි කීයේය. ඒ විගස අපගේ රජ්ජුරුවන්වහන්සේ සිය ඇස් උපුටා බ්‍රාහමණයෙකුට දන් දෙන සේකැයි සියලු නුවර එකකෝලාහලවිය. ඉක්බිති සෙනෙවිරත් රජ යුවරජ මහ ඇමතියෝ මේ කිමෙක්දැයි කළකිරී රජ්ජුරුවන් ලඟට ගොස් දේවයන් වහන්ස නුඹවහන්සේ ඉතා අපරීක්ෂාකාරී කෙණෙකුන්වහන්සේය. එක යාචකයක්හු නිසා මෙලොව මෙතෙක් සත්‍වයන් මුහුණ නොබැලූය. නුඹවහන්සේට තරණලාව ඇති සැපතින් නැතිදෙයක් නම් නැත. එබැවින් ඉදිරියේ පැමිණෙන ජාති ජාරා මරණ නිසා භයගෙණ ආයුෂ ප්‍රාර්ථනාකොට ඇස් දන් දෙන්නාහුද නොහොත් මේ යෞවනය නොනැසී වර්ණ සමෘද්ධපවත්නා පරිද්දෙන් ඇස් දන් දෙන්නාහුදැයි විචාළාහුය.

එකෙණෙහි මහණෙනි මහබොධිසත්ත්වතෙම කාරණා කියනුයේ‘ එම්බා ඇමතියෙනි මම මෙ ඇස් දන් දෙනුයෙම් යසස් දෙනුයේ මුත් නොවෙමි මුක්තා මාණික්‍යාදි වස්තුවක් පතා දෙනුයේ මුත් නොවෙයි. වැලි කුමක් නිසාදැයි යතහොත් හැම සර්වඥ වරයන්ගේ බුද්ධකාරක ධර්මකෙණෙක් වන්නාහ. ඇස් ආදී පඤ්චමහ පරිත්‍යාගය නොකොට බුදුවූ මහාත්ම කෙණෙක් නැත්තාහුය. එබැවින් ඒ මහතුන් විසින් පුරුදුකරණලද සමත්‍රිංශත් පාරමිතා ධර්මයන් පුරා බුදුව සියලු සතුන් භව සාගරයෙන් ගොඩ නඟන පිණිස දෙන පමණක් විනා මේ ඇස් දෙක මට අප්‍රිය නොවන හෙයින් දෙන්න මුත් නොවෙමි. මෙතැන්හි තිබෙන්නේ ඇයිදැයි වෙෂයෙන් දෙන්නමුත් නොවෙමි. මේ ඇසටත් වඩා සර්වඥතාඥන නැමති ඇසම ප්‍රිය හෙයින් එම ප්‍රාර්ථනාකොට දෙමි කීයේය. මෙසේ මහබොධිසත්ත්වයන්ගේ බස් අසා ඇමතියන් කියන්ට කිසිදෙයක් නොවැටහී මුවෙන් නොබැන සිටි කල්හි සීවක නම් වෙදහු කැඳවා කියන්නාවූ බොධිසත්‍වතෙම සීවක නම් වෙදුනෙනි තොපි වෛද්‍යශාස්ත්‍රයෙහි සමර්ථය, මට ප්‍රිය මිත්‍රව සිටියව, එබැවින් මට කීකරුව තල්ලොඳක් උපුටා ගන්නා කලක් පරිද්දෙන් මාගේ ඇස් දෙක තියුණුවූ සැතින් උපුටා මා බල බලා සිතින් වටහමින් සිටියදී මේ බ්‍රාහ්මණයාගේ අත්හි පිහිටුවවයි කීයේය.

එකෙණෙහි සීවක නම් වෙදතෙම කියනුයේ දේවයන්වහන්ස, ඇස් දන් දීම නම් ඉතා උගහටය, එසේහෙයින් පරීක්ෂාකොට දුනමැනවැයි කීයේය. එකෙණෙහි සිවි රජතෙම කියනුයේ මා විසින් පළමු සලකුණු ලදුයේ බොහෝ කොට දෙඩා ප්‍රපඤ්ච නොකොට ඇස් උපුටවයි කීයේය. එකෙණෙහි වෛද්‍යතෙම සිතනුයේ මා විසින් රජ්ජුරුවන් වහන්සේගේ ඇස සැත් එලන්ට සට යුතු නොවෙයි සිතා නොයෙක් බෙහෙත් එක්කොට කරණ ලද වර්ණයක් නිලුපුලෙක්හි ගල්වා භාවිත කොට දකුණු නාසයට පොවාලූයේය. එකෙණෙහි ඇස බැම වැටී නහරවැලෙහි වල්බ සිටියේය. එකෙණෙහි වෙදතෙම පරීක්ෂා කළමැනව රජ්ජුරුවන් වහන්ස බොහෝ අශ්‍රිත ජනයන් බැලුවමැනව නැවතත් ඇස ප්‍රකෘතිමත් කොටලන්ට මට භාරයයි කීයේය. එවිටත් මහබොධිසත්ත්වතෙම නොගිවිස්සේමය ඇස් දෙකෙහි අධිකවූ වේදනා උපන්නේය. ඇහින් වැගෙන ලේ දහරින් අන්සලු තෙමුනේය, එකෙණෙහි රජ්ජුරුවන්ගේ අන්තඃපුර ස්ත්‍රීහුද අමාත්‍යයෝද සෙසු රාජසේවකයෝද රජ්ජුරුවන් පාදමූලයෙහි අඬාවැටී සියලු රාජභවනය එකකොලහල කෙරෙමින් ඇස් දන් දුනමැනවැයි එකපැහැර හැඬූවාහ. එකෙණෙහිත් රජතෙම වෙදනාව ඉවසා ප්‍රපඤ්ච නොකරවයි වෙදුට කීයේය. එකෙණෙහි ඒ

වෙද තෙමේද යහපතැයි දේවයන්වහන්සැයි කියා වමතින් ඇස අල්වා දකුණතින් සැතගෙණ ඇස එල්වා තිබෙන තහර සිඳ මහබෝසතානන්ගේ අත පිහිටුවාලූය, ඒ මහබොධිසත්ත්වතෙම වමැසින් දකුණැස බලා උපන් සමාධියෙන් පලමු ඇති වෙදනාව වලකා මෙසේ එවයි බමුණන් කැඳවා මාගේ ඇසටත් වඩා ශතගුණයෙන් සහස්‍රගුණයෙන් සමීඳ තමැති ඇසම ප්‍රියය එබඳුවූ සම්‍යක් සම්බෝධි හෙතුවේවයි කියා ප්‍රාර්ථනා කොට බ්‍රාහමණයාහට දන්දුන්නේය. ඒ තෙමේත් බොහෝ සත්ත්වයන් දක්කදී තමා ඇස්වලෙහි පිහිටුවාලූ පමණකින් ඔහුගේ ආනුභාවයෙන් පිපීගිය නිලුපුලක්මෙන් සැරහී සිටියේය. මහබොධිසත්ත්වතෙම ඔහුගේ ප්‍රකෘතිමත්වූ ඇල බලා මා විසින් දුන් දනය ඉතා යහපත ඇතුළත්හි උපන් ප්‍රීතියෙන් පිණාගිය සිරුරු ඇත්තේ අනික් ඇසත් එලෙසින්ම උපුටා දුන්නේය, ශක්‍රබ්‍රාහමණතෙම ඒ ඇසත් තමාගේ ඇස මත්තේ තබා ප්‍රකෘතිමත් කොට රාජභවනයෙන් නික්ම මහජනයා බල බලා සිටියදී නුවර රාජවිථිය ගෙවා අන්තර්ධානව දිව්‍යලොකයට ගියේය. රජ්ජුරුවන් වහන්සේගේද ඇස් වල දවස් ගණනකින් මස් පිරී සම්පූණීව රත්වූ පලස්වටක් මෙන් පිරුණු මස්පිඩින් යුක්තව සිතියම් රුවක්මෙන් ඇස තුඩු සරහාලූකලක්මෙන් වූයේය. වේදනාත් සංසිඳුනේය.

ඉක්බිති මහබොධිසත්ත්වතෙම අන්ධ මට මේ ඉසුරෙන් කම්කිමිදැයි ආමාත්‍යයන්ට රාජ්‍යය පාවාදී මඟුල් උයනට ගොස් පැවිදිව මහණදම් පුරම් සිතා අමාත්‍යයන් කැඳවා මේ සැටිය ඔවුන්ට කියා තොප විසින් කටයුතු නම් දැහැටි පැන් පමණක් දීලන්ට එකෙක්හු මා සමීපයේ සලසාලව ශරීර කෘත්‍යයට යන්නාවූ ස්ථානයෙහි රැණක් බැඳ සලකුණු කොටලවයි මෙපරිද්දෙන් කියා රථාචාරීහු කැඳවා රථය යොදවයි නියෝග කෙළේය. අමාත්‍යයෝ වනාහි රථයෙන් යානොදී සිවිගෙයකින් මොහු ගෙණ ගොස් පොකුණුතෙර හිඳුවා රැකවල් ලබා කලමනා විධානත් කොට සිය නුරවට වන්හ. ඒ අන්ධවූ සිවි රජතෙම පලක් බැඳ හිඳ තමාගේ දනය ආවර්ජනා කෙළේය. එකෙණෙහි ශක්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණුවූයේය. ඒ තෙම පරීක්‍ෂා කරණුයේ ඒ කාරණය දැක සිවිරජ්ජුරුවන්ට වරක්දී ඇස ප්‍රකෘතිමත් කෙරෙම්හ සිතා මහබොධිසත්ත්වයන් උන්නාවූ තැනට නුදුරු තැන ඇත මැත සක්මන් කෙළේය. එකෙණෙහි අන්ධ වූ රජතෙම පරීක්‍ෂා කොට ශබ්දය අසා ශබ්ද මෙතැන්හි කවුරුදැයි විචාළේය. ඒ තෙම කියනුයේ රජ්ජුරුවෙනි තොප සමීපයට පැමිණියාවූ මම දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රදේවේන්ද්‍රයෝ නම් මමය, එබැවින් මාගෙන් කැමති වරයක් ගණුවයි කීයේය. එකෙණෙහි රජතෙම ශක්‍රයෙනි මට බොහෝ මුතු මැණික් ආදීවූ සම්පත්ද සේනාවාහනද අපමණව ඇත්තේය, එබැවින් අන්ධවූ මට මරණය අභිප්‍රායයි කීයේය:

එකෙණෙහි ශක්‍රදේවේන්ද්‍ර තෙම සිවි රජ්ජුරුවෙනි මිනිස්ලොව ඇලය නැති හෙයින් මියනු කැමැත්තාහුදැයි විචාළේය. ඇස් අන්ධ හෙයින් මරණ කැමතියයි කීයේය. එබස් ඇසූ සක්දෙව් රජතෙම රජ්ජුරුවෙනි දනය නම් හුදක් පරලොවම විපාකදෙන්නේ නොවෙයි මෙලොවත් විපාක දෙන්නේයයි කීයේය. එබස් අසා මහබොධිසත්ත්වතෙම ශක්‍රයෙනි තෙපි මට ඇස් දෙනු කැමත්තාහු වී නම් අනික් උපම වෙකින් කම්නැත්තේය. මාගේ දනානුභාවයකින් මා ඇස් පහළ වෙතත් යහපතැයි කීයේය. ඒ ඇසූ ශක්‍රදේවේන්ද්‍ර එම්බා රජ්ජුරුවෙනි ශක්‍රයෙම් කියා අනුන් ඇස් දිය නොහැක්ක. තොප දුන්නාවූ දනයෙහි ඵල

යෙන්ම ඇස් ලබවයි කීයේය. එබස් අසා මාගේ දූතය ඉතා සඵලය මෙලොවම මෙසේ විපාකදෙන කල පරලෙව්හි කියනු නම් කිම්දැයි සන්තොසින් පිණා සත්‍යක්‍රියා කරන්නාහු මේ ලෝකයෙහි ඇති නොයෙක් යාචකයෝ අපමණව මා සමීපයට අවුත් අනවරතයෙන් ආධ්‍යාත්මික බාහ්‍ය කවර වස්තුවක් ඉල්වූ සමුත් දෙම්මැයි යන ලෝභයෙන් මෛතෙසුන් යාචකයෝ මට ප්‍රියවූද මේ සත්‍ය යෙන් මට ඇස් පහළවේවයි කියා අයැදියේයි. ඉක්බිති මේ සත්‍යක්‍රියාව හා සමඟ පළමුවන ඇස පහළවූයේය. ඉක්බිති දෙවෙනි ඇස පහළවන පරිද්දෙන් සත්‍යක්‍රියා කරණ සිවිමහරජතෙම යම් මේ අන්ධ බ්‍රාහ්මණයෙක් ඇවිදින් භවත තොපගේ ඇස දෙවයි ඇයදීම හා සමග මාගේ ඇස උපුටා දන්දී බොහෝ සොම් තසින් පිරුණු පමණක් විනා අනික් දෞම්නසක් නුවූයේය. මේ සත්‍ය යෙන් දෙවෙනි ඇසත් පහළවේවයි කීයේය. එකෙණෙහි දෙවෙනි ඇසත් පහළ වූයේය. මේ පහළවූ ඇස් දෙක ප්‍රකෘති ඇස් නොවෙයි එබැවින් දිව ඇස් පහළ වූයේය. බ්‍රාහ්මණයාහට දුන් ඇස් නැවතත් ප්‍රකෘතිමත් කරන්ට බැරිවන්නේය. නැසීගිය චක්ෂු ප්‍රසාදයට උපදනා දෙවෙනි සවභාව ඇසෙක් නම් නැත.

මේ පහළවූ ඇස්දෙක නම් සත්‍යපාරමිතාමයවූ ඇස්වන්නේය, එතකුදු වුවත් ඒ ඇස් පහළවීම හා ශක්‍රයන්ගේ ආනුභාවයෙන් සියලු රජපෂීත් අවුත් පිරිවරා ගත්හ. ඉක්බිති ශක්‍රදෙවේන්ද්‍රතෙම මහජනයා මධ්‍යයෙහි බොධිසත්ත්ව යන්ට සතුතිකරණුයේ සිවිරට වාසීන්ට වැඩක්ම සාදන්නාවූ රජ්ජුරුවෙනි, තොප විසින් මේ වචනයෝ ධම්යෙන් සත්‍යයෙන්ම කියනලද්දූහ. එබැවින් තොප දුන්නේ සාමාන්‍ය ඇස් වන්නේය, නැවත ලද්දේ දිවඇස් වන්නේය. එතෙම භිත්තියෙන් පිටත පර්වතයෙන් පිටත තිබූ වස්තු නොපැකිල දක්නේය. බොහෝකොට කියනුම කිම්ද? හාත්පසින් යොදුන් සියයක තුබූ කුඩා මහත් සියළු වස්තු දර්ශනය කරන්නේයි.

මෙසේ ඒ ශක්‍රදෙවේන්ද්‍රතෙම ආකාශයෙහි සිට මහජනයා මධ්‍යයෙහි මේ ගාථාවෙන් බොධිසත්ත්වයන් ලත් දිව ඇසෙහි තත්ත්වය අඟවා මෙයින් මත් තෙණින් කුශලයෙහි අප්‍රමාදවවයි මහබොධිසත්ත්වයන්ට අවවාද දී දිව්‍යලෝකය වම ගියේය. මහබොධිසත්ත්වයන් වහන්සේද මහජනයා විසින් පිරිවරණ ලද සේක් අසුරවිජයකොට ශක්‍රභවනයට වදනා ශක්‍රදෙවේන්ද්‍ර විලාශයෙන් මහත්වූ සත්කාර සම්මාන ලදින් නුවරට වැද චන්ද්‍ර නම් ප්‍රාසාදයෙහි මතුමහල්තලයට නැගිසේක. උන්වහන්සේ ඇස් ලත් නියාව සියලු රාජ්‍යයෙහි ප්‍රකාශවූයේය. බොධිසත්ත්වයන් දක්නා පිණිස බොහෝ පඬුරුපාක්කුඩම් ගෙණවුත් වත්හ. එකෙණෙහි මහාබොධිසත්ත්වතෙමේ මහජනයා රැස්වූ තැන්හි මාගේ දූතය වණීනා කෙරෙමියි සිතා රාජවාරයෙහි මහත්වූ මණ්ඩපයක් කරවා එහි නගන ලද දළපුඩුසේසත් ඇති රාජාසනයෙහි උන්නේ නුවර බෙරලවා සියලු ජනසමූහයා රැස්කරවා අවවාදකරණුයේ එම්බා සිවිරටවාසිවූ සත්ත්වයෙනි, මෙම ජන්ම යෙහි මට පහළවූ දිව ඇස්දෙක මෙතැන් පටන් දන් නොදී කිසිවක් අනුභව නොකරවයි කියා ධම්යෙන් අනුශාසනා කරණුයේ මේ ලෝකයෙහි යාචකයන් විසින් යාච්ඤාකරණලද කවරනම් උත්තමයෙක් තමහට ප්‍රියවූ ඉතා විශිෂ්ටවූ වස්තුවක් නොදීලා සිඟන්නේද එහෙයින් සියලු සිවිරටවාසීනි, මාගේ ප්‍රියවූ ඇස් දෙක දන්දී දෙවෙනිව ලත් දිවැස් බලව. මේ පහළවූ ඇස්තෙම භිත්තියෙන් පිටත පර්වතයෙන් පිටත වස්තු දකිනේය. හාත්පසින් යොදුන් සියයක් දර්ශනය කරන්නේය. එසේහෙයින් මේ ලෝකයෙහි උපන් සත්ත්වයන්ට දූතයට

වඩනා පරම ප්‍රතිෂ්ඨාවෙක් නැත්තේය. තවද සිවිරටවාසිනී මේ ප්‍රත්‍යක්‍ෂයෙන් දක්‍වා දූත් මේ අන්ධ බ්‍රාහ්මණයාහට මා ඇස්දෙක දන්දී මෙවැනි දිව්‍යස් දෙකක් ලදිමි. මේ දුටුවාවූ සිවිරට වාසීනි, පළමුකොට දන්දී පසුව අනුභව කරව මෙපරිද්දෙන් දානශීලාදී කුශලයන් කොට ස්වර්ගාපවර්ගප්‍රාප්තිය කරවයි. මෙසේ ධර්මදේශනාකොට එතැන්පටන් අඩමාසයක් පාසා පසළොස්වක් පොහෝයෙහි මහජනයා රැස්කරවා මේ ගාථා සතරින් ධර්මදේශනා කළහ. ඒ ඇසූ මහජනතෙම අප්‍රමාදව දානාදී කුසල්කොට දිව්‍යලෝකයෙහි සම්පත්තියම පරම ප්‍රතිෂ්ඨා කොට දුටහ. මෙසේ ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාතන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා මහණෙනි, පුරාතනයෙහි නුවණැත්තෝ බාහ්‍ය ධනයෙන් විනය නොවන්නාවූ පැමිණි යාචකයන්ට තමන්ගේ ප්‍රිය ඇස්දෙක පවා උපුටා දන්දුන්නෝ වේදැයි වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි සීවක නම් වෛද්‍යතෙම දැන් මේ ධර්මභාණ්ඩාගාරිකවූ ආනන්ද ස්ථවිරය; එසමයෙහි ශක්‍රදෙවේන්ද්‍ර නම් දැන් මේ දිව්‍යස් ඇත්තන් කෙරෙහි අග්‍රවූ අනුරුද්ධ ස්ථවිරය. එසමයෙහි සමග කුතූස් කළ පම්ත් නම් මේ බුදුපිරිස් වන්නාහුය. එසමයෙහි දානපාරමිතාව කුළුගැන්වූ සිවිරජ්ජුරුවෝ නම් දැන් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

492
සිරිමන්ද ජාතකය.

තවද එක්සමයෙක්හි ත්‍රෛලෝක්‍ය තිලකවූ අප බුදුරජාතන් වහන්සේ විසින් යම් මේ සිරිමන්ද ජාතක කථාවෙහි විස්තරය මහා උම්මග්ග ජාතකයෙහි විස්තර වශයෙන් කියන ලද්දේය. එයින් බලා දතයුතු.

493
රොහන්ත මෘග ජාතකය.

තවද එක් සමයෙක්හි පරහිත නිරත චිත්තසන්තාන ප්‍රසන්න මුඛතල ප්‍රතිභාරිත සමස්තලෝක සන්නිවාස ඇති අප්‍රති පුද්ගලවූ අපරිමෙය්‍ය ගුණ ගණාධාර ශ්‍රී ශාක්‍යසිංහවූ තිලෝගුරු බුදුරජාතන් වහන්සේ සාධුජන හෘදයානන්දකරවූ මේ රොහන්ත මෘග ජාතකය ලෝකලොචන රසායනායමානවූ වෙළුවනාරාමයෙහි මෛත්‍රී කරුණා මුදිතා උපෙක්‍ෂා යන සතර ආයසී බ්‍රහ්ම විහරණයෙන්දවස් යවනසේක් ආයුෂ්මත්වූ ආනන්ද මහතෙරුන් වහන්සේ කරණලද ජීවිත පරිත්‍යාගය අරභයා වදාළසේක. ආනන්ද මහතෙරුන්වහන්සේ ජීවිත පරිත්‍යාගය කළ පරිදි අසීති නිපාතයෙහි චුල්ලහංස ජාතකයෙහි නාලාගිරි දමනයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙසේ දෙවදත්ත ස්ථවිරයන් විසින් උත්සාහ කරණලද අජාසත් රජහු විසින් තමාගේ නුවණින් බුදුන් මරවා පියමී යන අදහසින් කිසි බුදුගුණයක් නොදන්නා නාලාගිරි මදැත්හු සොළොස් කළයක් රා පොවා මත්කොට යමගුරු අතටදී කල්පාන්ත මෙඝයක් මෙන් භයංකාර ස්වරූප ඇතියාවූ බුදුන්ගේ ඉදිරියට මෙහෙයනලද කල්හි තරු පිරිවැරූ පුන්සඳක් මෙන් මහණ පිරිවරා වඩනා බුදුන්ට මොහුගෙන් කිසි භයෙක්

වේදෝහෝයි සිතා බුදුන් පසුකොට ඇතු ඉදිරියට ගොස් පොළොව සැඹල් සකක් මෙන් පෙරළා පහරණතුරුත් ඉවත් නොව ජීවිත පරිත්‍යාගකොට සිටිකල්හි පැවති මේ ප්‍රවෘත්තිය එදවස් සවස්වේලෙහි රැස්වළුත් ශාරිපුත්‍ර ස්ථවිර ප්‍රමුඛ භික්ෂූන් වහන්සේ කිය කියා හිඳිනාසේක්, ඇවැත්නි ආනන්ද ස්ථවිරයෝ ශෛක්‍ෂ ප්‍රතිසම්භිදානයෙන් සිටත් දශබලධාරිවූ බුදුරජානන් වහන්සේට ජීවිතපරිත්‍යාග කළාහුවේදැයි ගුණවර්ණනා කෙරෙමින් වැඩ හුන්සේක. එකල්හි ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ තුන්තරා ගමනින් එක්තරා ගමනකින් දම්සභාමණ්ඩපයට වැඩ පණවනලද බුද්ධාසන මස්තක යෙහි ත්‍රිකූට වාලයෙහි පිහිටි රුවන් මෙරක්සේ දිලිහි දිලිහී වැඩහිඳ භික්ෂු පිරිසක් මුහුණ බලා මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදූයි විචාරා අනික් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ; ආනන්ද ස්ථවිරයන් ජීවිත පරිත්‍යාග කළපරිදි කිය කියා උනුම්හයි දැන්වූ කල්හි එම්බා මහණෙනි, මේ ආනන්ද ස්ථවිරයෝ දැන් මතු අපට ජීවිත පරිත්‍යාග කළෝ නොවෙති, පෙරත් ජීවිත පරිත්‍යාග කළෝවේදැයි වදාරා මුවෙන් නොබැණ වැඩළුත් කල්හි ඒ භික්ෂු සමූහයෙන් අදහස් දත් එක් භික්ෂුකෙණෙකුත් වහන්සේ විසින් පූර්වකථාව වදාළ මැනවැයි ආරාධිත වූසේක් ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත් ?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඔවුන්ගේ බිසෝතොමෝ ඛේමා නම්වූහ. එසමයෙහි පූරණලද පාරමිතා ඇති මහබෝධිසත්ත්වතෙම හිමාලය වන ප්‍රදෙශයෙහි මෘගව ඉපද ජාම්බෝනද සවර්ණයට බඳුවූ පැහැ ඇති ශෞභාග්‍යප්‍රාප්තවූ ශරීරයක් ඇති වීය. ඒ මහබෝධිසත්ත්වයන්ගේ මල්වූ චිත්ත නම් මෘග රජ්ජුරුවෝත් එසේම රන්වන්වූ ඡවිවර්ණ ඇතිවූහ. සුතනු නම් බාල නැගණි යෝත් විදුලිය කලඹක් මෙන් බබලන්නාවූ රන්වන්වූ ශරීරශෝභා ඇත්තාහ, බෝධිසත්ත්වතෙම තමින් රෝහන්ත නම් මෘග රජ්ජුරුවෝයයි ප්‍රකාශවූයේය. මෙතෙම හිමාලය පර්වතයෙහි පර්වත වලලු දෙකක් ඉක්මවා තුන්වන පර්වත වලල්ල අතුරෙහි රෝහන්ත නම් විලක් ඇසුරුකොට අසූදහසක් මුවන් පිරිවරා දැහැමින් දවස් හරණේය.

මෙතෙම අන්ධවූ ජරාජීර්ණවූ මව්පිය දෙදෙනා පෝෂ්‍යය කරන්නේය. ඉක්බිති කල්‍යාමෙන් බරණැස් නුවරට නුදුරුව වැදි පලෙක්හි වාසය කරණ වැදිපුත්‍රතෙම හිමාලය වන භූමියෙහි යන්නේ මහබෝධිසත්ත්වයන් දැක නැවත තමාගේ ග්‍රාමයටම අවුදින් කල්‍යාමකින් මියපරලොව යනුයේ තමාගේ පුත්‍ර කැඳවා ගෙන්වා එම්බා දරුවෙනි, අප දඩයම් කොට ඇවිදිනා වනයෙහි රන් වන්වූ මුව රජ්ජුරුකෙණෙක් වෙසෙති. ඉදින් යම්කාරියකින් රජ්ජුරුවෝ විචාළෝවීනම් මෙලෙස කියවයි කියා පරලොව ගියේයි. නැවත එක් දවසක් ඛේමා නම් දේවිතොම අලුයම් වේලෙහි ස්වප්නයක් දක්නී රන්වන් මුවරජෙක් ඇවිදින් ස්වර්ණ පීඨයෙහි හිඳ රත්මිණියක් ගසන කලක් මෙන් මිහිරිවූ කටහඬ විහිදුවා බණ දෙසන්නේ නම් මෝතොමෝ සාධුකාර දී බණ අසන්නී නම, ඒ ධර්මකථාව නොනිමවාම නැගී පලාගියේනම මෝතොමෝ මුවා අල්වව, නොහරුවයි කිය කියාම පිබිද ගියාය, පිරිවරා වැදහොත් පරිවාර ස්ත්‍රීහුද මුවන්ගේ ශබ්දය අසා වෙහෙසා කියන්නාහු කවුළු දොරවල් මොනවට වසනලද්දේය.

යටත්පිරිසෙයින් පවත් විවරකුත් යන එත අවකාශ නැතිවන්නේය. මූත් වහන්සේ මුවා නොහැර අල්වයි කියන සේකැයි සිතාසෙමින් කීහ. බිසවු තුමූ එකෙණෙහිම මේ සවප්නයක් වනැයි සිතා සවප්නයකැයි කීම්තම් රජ්ජුරුවන් වහන්සේ ආදර නොකරණසේක. ඉදින් දෙළකැයි කීම්තම් එබඳු රන්වන් මුව රජහු ගෙන්වන්ට උත්සාහ කෙරෙති සිතා ගිලන්වූ ආකාරයක් දක්වා වැද හොත්තීය, ඉක්බිති රජ්ජුරුවන් වහන්සේ දේවීන් වසන ශ්‍රීයහන් ගබඩාවට වැද සොඳුර, තොපට අපැසු කිමෙක්ද?යි විචාරා දේවයන් වහන්ස, අනික් අපැසුවෙක් නැත. එක්තරා දෙළෙක් උපන්නේය. ඒ දෙළ පසිඳෙන් විනා ජීවත්විය නොහෙමි කිව. බිසවුන් බස් ඇසූ රජ්ජුරුවෝත් කුමන දෙළෙක් ද? කුමක් කැමතියෑද?යි විචාළේය. බිසව් කියන්නාහු රන්වන් මුවරජහුගෙන් බණ අසන්නා කැමැත්තෙමි, දේවයන්වහන්සැ යි කිව.

එකල්හි රජ්ජුරුවෝද සොඳුර යමෙක් නැත්තම් එබඳු දෙයක් කිසාද දෙළ උපන්නේය. එබැවින් රන්වන් මුවකෙණෙක් මෙලොව ඇත්නම් වේද ? තොපට බණ කියන්නේය, එබැවින් නැති දෙය කෙසේ නම් ඒ ඉපදවිය හැකිදැයි කීයේය. එසඳ බිසව්තොම එසේවීනම් මේ වැදහොත් ගමන්ම වේදැයි කියා පිටිපෑලා සුසුම්ලමින් සෝකාතුරව වැදහොත්තීය. එසඳ රජතෙම දේවීනි හුදක් නොලබම් නොසිතව මෙලොව ඇත්නම් ලැබෙයි කියා ඔවුන් අස්වසා මතුමහලින් බැස අමාත්‍ය මණ්ඩලයා කැඳවා වේද ශාස්ත්‍රාවූ බමුණනුත් ගෙන්වා රන්වන් මුවන් ලොව ඇද්දැයි යනු අසා ඇතැයි කී කල්හි තමන්ගේ විජිතයෙහි වැද්දන් කැටිකොට රන්වන් මුවන් දුටුවිරුදැයි විචාළේය,

එබස් ඇසූ වැදිසමූහයා විසින් රන්වන් මුවෙකු දකිනා තබා ඇසුයේත් නැතැයි කී කල්හි ඔවුන් හැම්ගෙන් එකෙක් පළමු තමාගේ පියානන් මරණාසන්නයෙහි තමන් කැඳවා හිමාලවනයෙහි එබඳු තැනෙක්හි මෙබඳු රන්වන් මුවෙක් වන්නේයයි රජ්ජුරුවන්ට දැන්වූයේය. එසඳ සන්තුෂ්ටවූ රජතෙම ඒ මුවා ඉදින් ගෙණායේවීනම් තට බොහෝ සත්කාර කෙරෙමි නොවළහා ගෙණ වයි ඔහට උවමනා සැපතුත් දී මාගෝපකරණත් සපයා යැවූයේය. ඒ වැදිපුත්‍රයාත් ගමනට සමුගෙණ සිට දේවයන් වහන්ස, ඉදින් ඒ මුවා දැක අල්වාගන්ට බැරිවී නමුත් ඔහුගේ සම උපුටා ගෙණෙමි, ඒත් බැරිවී නම් ඔහුගේ ලොම් ගෙණෙමි, නුඹවහන්සේ සැකයක් නොසිතුව මැනවැයි කියා තමාගේ ගෙට ගොස් දූරුබිරින්දට වැටුප් වියදම් දී .පියානන් කී සලකුණෙන් නොවරදවා ගොස් රන්වන් මුවරජ්ජුරුවන් දැක කෙසේවූ තැනෙක මළ අටවා මොහු අල්වා ගත හැකි දෝහෝයි විමසනුයේ බැස පැන් බොන තොටෙහි අසරක් දැක වරමත්ද දැඩි කොට අඹරා මහාබොධිසත්ත්වයන් බැස පැන්බොනතැනෙහි උගුලක් ඇටවූයේය. ඉක්බිති දෙවන දවස් මහාබොධිසත්ත්වතෙම අසූදහසක් මුවන් හා සමග ගොදුරු අනුභව කොට මෙතෙක් දවස් බස්නා තොටින් පැන් බොම් සිතා බැස මළෙහි බැඳුනේය,වරමත්දබිඳපියම් සිතා තුන්යලක් උත්සාහ දක්වමින් අදිනේය. පළමු වර සමකැඩුනේය. දෙවෙනි වර සම තුන්වෙනිවිට නහරත් සිඳී ඇටයෙහිපැහැර ගියේය. එසඳ මළ සිඳගත නුහුනුයේ බද්ධාරාවයන් පැවැත්වූයේය. මුව සමූහතෙම තුන්මුලක්ව බෙදී දිවූයේය. ඒක්ෂණයෙහි චිත්‍රා නම් මුවරජතෙම තුන් ඇනියෙහිම බෝධිසත්ත්වයන් නොදැක මේ භය උපන්නේ මාගේ බෑනන් වහන්සේට වනැයි සිතා නැවත ආපස්සෙහි විල්තෙරට

අවුත් බැඳී සිටි බැතත් දුටුයේය. එකෙණෙහි බෝධිසත්ත්ව තෙම චිත්ත මෘගයානන් දැක මිලනුවෙනි මේ තැන්හි නොසිටුව මෙතක භයජනක ස්ථානයකැයි කියා විහා යවනු කැමිතියේ මෙලෙසින් කියන්නේයි, එම්බා චිත්තයෑන මුව රජ්ජුරුවෙනි මේතුන් මුලෙහි මුවෝ මරණින් තැතිගත්තාහු දිවපීහ. එබැවින් තෙපි මෙතැන්හි, සැකයක් පැකිලීමක් නොකොට රක්ෂාස්ථානයකට ඔද්දින් හා සමග පලායවයි මෙසේ කියනුයේ හුදක් තොප වැනියාම නොවෙයි. මේ අසූදහසක් මෘගයෝ මා සිටියාසේ තෝ රජකොට ගෙණ ජීවත්වෙති. එබැවින් එක්කෙණෙකුන් විසින් ජීවිතය නොහැර බොහෝ දෙනෙකුට වත් ප්‍රයෝජන සලකා ගැලවී පලායවයි කීයේයි.

එසඳ චිත්‍රානම් මුවරජතෙම කියනුයේ රොහනන්ත නම් මුව රජ්ජුරුවෙනි යම්හෙයකින් මේතෙක් මුව මුලු හැර මාගේ සිත තොප සමීපයට යනුයේද? එබැවින් තොප හැර මම නොයෙමි. මලෙහි බැඳිසිටියාවූ තොප හා එක්ව මාගේ සිතත් බැඳුනු හෙයින් මෙතැන්හිම ජීවිතය හරිතොත් විනා පලායානොහෙමි කීයේය. නැවත රොහනන්ත මෘගරාජතෙම කියනුයේ චිත්‍රානම් මෘගයානෙනි තෙපි ඉදින් මෙතැන්හිදී මළාවූනම් අඹවූ කිසි පිරිමැස්මක් නොලබන දෙමව්පිය දෙදෙනත් එතැන්හිම නැසීයෙති. එබැවින් මා කෙරෙහි ඇල්ම හැර පලා ගියේවීනම් දෙමව්පිය දෙදෙනත් රැකෙති. සෙසු මෘගයෝත් රැකෙන්නාහ. එබැවින් තෝ නොපමාව නැගීයවයි කීයේයි. එසඳ චිත්‍රනම් මෘගරාජ නැවත කියනුයේ රොහනන්ත මෘගරජ්ජුරුවෙනි, තොපි කියනුයේ ජීවිතය එක්තැනෙක තිබැදී ශරීරය එක්තැනෙක්හි තිබේද? එබැවින් තොප කෙරේ බැඳුනු සෙනෙහසය හා සමග ශරීරයත් මෙතැන්හි හරිමි. තොප හැර නොයෙමි කියා මහ බොධිසත්ත්වයන්ගේ දකුණැලය තමාගේ ඇගට වහල්කොට ඔරා සිටියේය. ඉක්බිති සුතනුනම් මෘගධෙනුවද මෘගයන්ගේ අන්තරයෙහි දෙබෑයන් නොදැක මේ භය පැමිණියේ අපගේ බෑනන්වහන්සේලාටයයි සිතා ඒසා මරණ භයක් නොකොට බෑනන් දෙදෙනාසමීපයෙහි පැමිණියේය. එන්නාවූ නැගනියන් දැක වළකන බෝධිසත්ත්වයන් පීරුක සවභාව ඇති මෘගධෙනුව උල්හිඳුවා කරණ ලද සොර උගුලෙක්හි බැඳී සිටිනෙමි, එබැවින් ස්නෙහපාසයෙහි නො බැඳී නැගනී තොපි ජීවත්වයි. දෙමව්පියන් ආදීවූ මෘගයූථයෝත් තොප නිසා රැකෙන්නාහ, එබැවින් මැත නොඅවුත් ගැලවී පලායවයි කීයේයි, එසඳ සුතනු නම් මෘගධෙනුව රොහනන්ත නම් මුවරජ්ජුරුවන් වහන්ස, වනයට ගොස් අනාථ යෙන් විඳිනා දුකට වඩා මෙතැන්හි නුඹවහන්සේ හා එක්ව මියයාම යහපත, එබැවින් දෙදෙනා මරණට හැර මා රැකුණේ නම් කිමෙක් දැයි කීය.

නැවත රොහනන්ත නම් මෘගරාජතෙම එලෙස නොකියව. දෙමව්පියන්ට වඩා උපකාරීහුත් ස්නෙහයුක්තාහුත් රැක්ක යුත්තාහුත් නැතැයි කියා අඹවූ කිසිපිහිටක් නැති දෙමව්පිය දෙදෙනාව පොෂ්‍යය කරණ සඳහා අපගේ කිය මත් ගිවිස ගැලවී පලායවයි කීයේයි, නැවත සුතනු නම් මෘගධෙනුව තොමෝ රොහනන්ත නම් මෘගරජ්ජුරුවෙනි, නුඹවහන්සේ මලෙහි බැඳී ඒ මළු සිඳපිය නොහී යම්සේ රැඳුනුසේක්ද? එපරිද්දෙන් මම සිඳපිය නොහැකි ස්නෙහ පාස යෙක් බැඳී කෙසේ නම් ගැලවීපියා හෙම්දැයි ප්‍රතිවචක දුන්නීය. ඒ මෘගධෙනුව එපරිද්දෙන් ප්‍රතික්ෂෙප කොට මහබොධිසත්ත්වයන්ගේ වම්නැළය විහල්කොට සිටියහ. එකල්හි වැදි පුත්‍රයාත් මුවන් ඉගිල දුම්න හඬ අසා මුවරජ්ජුරුමෝ බැඳීගිය වනැයි සිතා කැසපට කඩාගෙණ මුවන් මරණ තෙබක් අතින් ගෙණ වේගයෙන් අවුත් වැදගියේය. මහබොධිසත්ත්වයෝත් කප්තිප්සත් මෙත්

වැදනියාවූ ඔහු දැක මෙලෙස කියන්නේයි. රෞද්‍රවූ භයංකාර ස්වරූප ඇති අතට ගන්නාලද ආයුධ ඇති ඒ වැදි පුත්‍රතෙම කසාපාදයට පැමිණි තොප දෙදෙනත් මා හා සමග මරන්නේය. වහා නැගී යවයි කීයේය. එබස් අසා චිත්‍රනම් මෘගතෙම සිටි තැනින් නොසෙල් වූයේය. සුතනා නොමෝ සිටි පරිද්දෙන් සිට පිය නොහී මරණ භයින් තැති ගෙණ මදක් පලාගොස් මෙවෙනි මාගේ දෙබෑයන් වහන්සේ හැර කොයියෙම්දැයි තමාගේ ජීවිතයෙහි අංසාව හැර මරණ නලළ තබා ගෙණ නැවතත් අවුත් වම් ඇලයෙන්ම සිටියාය.

වැදිපුත්‍රයාද වේගයෙන් අවුදින් ඒ එක්ක සිටියාවූ මොවුන් තුන්දෙනා දැක මෙත්සිත් පතුරුවා මොවුන් තුන්දෙනා එක්කුසෙහි උපන්නාවූ තුන්බිහි කොණෙකුන් වියයුතුයයි සිතා මුවරජතෙම මළෙයි බැඳී රඳු නමුත් මොවුන් දෙදෙනා විශ්වාසයෙන් බැඳී රැඳීමය. ඉතා ආශ්චර්‍යය, මොවුන්ට මේ මුවරජ කුමක් වන්නේදෝහෝයි විචාරන්නාවූ වැදිපුත්‍රතෙම, මුවරජ්ජුරුවෙනි, බැඳීසිටියාවූ මේ තොප නිසා තමන්ට වන මරණෙහි භයකුත් නොකොට තොප ළඟම එළඹ සිටියාවූ මේ මෘගයෝ දෙදෙන තොපට කුමක් වෙද්දැ?යි විචාළේයි. ඉක්බිති මහබොධිසත්ත්වතෙම එම්බා වැදිපුත්‍රයාතෙනි, තමන් පණටත් නොසිතා මට දිවිපුදා සිටිනා මොහු දෙදෙන එක මෑනියන් වැදූ එකතැන්හි වැඩුනු මාගේ නැගනියන් හා මලනුවෝයයි කීයේය ඒ වැදිපුත්‍රතෙම මෙබස් අසා විශෙෂයෙන් සොම්නසට පැමිණියේය. මෘගරජ්ජුරුවෝත් මොහුගේ සිත තදනොවන නියාව දැන වැදිපුත්‍රයාතෙනි, හුදෙක් අප හැම මෘගමාත්‍රයෙකැයි සෙසුමුවන් හා සරිකොට නොසිතවයි කීයේය. එබසට අනතුරුව චිත්‍රනම් මෘගරාජ තෙම මෙබස් අසා විශෙෂයෙන් කියනුයේ මේ බැඳි සිට රොහනතා නම් මනොඥතම තෙම අසූ දහසක් මුවන්ට නායකය සීලාචාර ගුණයෙන් යුක්තය සියලු සත්ත්වයන් කෙරෙහි මෘදුවූ සිත් ඇති පිණෙහි ඇදහිලි ඇති අන්ධවූ දෙමවුපියන් දෙදෙනා පොෂ්‍ය කරන්නේය. ඉදින් මෙසේවූ මුවරජ්ජුරුවන් මරාපුයෙහි වීනම් එකවිටම අන්ධවූ දෙමව්පිය දෙන්නත් අප දෙබිත්තනුත් මේ මුවරජ්ජුරුවන් හා සමග අප පස්දෙනා මැරුවාහුනම් වන්නෙහිය. ඉදින් මේ එක මුවානන් නොමරා රැක්කෙහිවීනම් දෙමව්පිය දෙදෙනා ඇතුළුවූ අප දෙදෙනා රැක්කානම් වන්නේයයි යාච්ඤාකොට කීයේය.

ඔහුගේ බස් ඇසූ වැදිපුත්‍රතෙම නොබවමැනව ස්වාමීනියි කියා අස්වසනුයේ දෙමව්පියන් පොෂ්‍යය කරණ මුව රජ්ජුරුවන් දැන් මුදාහරිම් තොප දෙදෙනා හා සමග සැපසේ ගැලවෙන්නාවූ මුවරජ්ජුරුවන් දැක තොපි දෙදෙනා සමග සතුටුවෙත්වයි කීයේයි. මෙලෙස කියා නැවත කියනුයේ රජ්ජුරුවන් වහන්සේ විසින් දෙන ලද සැප කුමක් සාදාදීලිය හෙන්නේද, ඉදින් මෙසේවූ ධර්මිෂ්ටවූ මුවරජ්ජුරුවන් මැරීම් නම් පොළොව හෝ ගැලපියන්නේය. නොහොත් සෙනෙක් හෝ හිස වැටෙන්නේය. එබැවින් මොහු මුදා හැරපීම යහපතැයි මහබොධිසත්ත්වයන් සමීපයට ගොස් උගුල උදුරා හෙළා වරමනද සිඳ මුවරජ්ජුරුවන් සිපගෙණ දිතහස් වැදහොවා මොලොක් සිතින් සෙමෙන් සෙමෙන් මළ පයින් ගලවාහැර තහරින් තහරද මසින් මසද එක්කොට ගළපා පය ලේ සෝදාහැර මෛත්‍රී සිතින් නැවත නැවත පිරිමැන්දේය, එකෙණෙහි ඔහුගේ මෛත්‍රියෙහි ආනුභාවයෙන්ද බොධිසත්ත්වයන්ගේ පාරමිතානුභාව

යෙන්ද සියළුම තහර මස් සඬි ගැලපී පෙර පරිද්දෙන්ම ලොම්හි පිහිටියේය බැඳුනේය, අසවල් තැනයයි නොදැනුනේය. එසඳ මහබොධිසත්ත්වතෙම පළමු සේම සුවපත්ව සිටියේය, ඒ දුටු චිත්‍රනම් මෘගතෙම මහත් සොම්නසට පැමිණ වැදිපුත්‍රයාට සතුතිකරණුයේ, සබඳ වැදිපුත්‍රය,මේ හයින් මිදුනු මුවරජ්ජුරුවන් දැක යම්සේ මම සතුටුවීම්ද එපරිද්දෙන්ම සවකීයවූ ඤාතිවර්ගයා හා සමග සතුටුව වාසය කරවයි සතුතිකොට කියේය. ඉක්බිති බොධිසත්ත්වතෙම කිමෙක්දෝ මේ වැදිපුත්‍රතෙම මා අල්වනුයේ තමාගේ ජීවිත ක්‍රියාව නිසාම ඇල්වීදෝහෝ නො හොත් අනික් කෙණෙකුන්ගේ කීමෙන් ඇල්වීදෝහෝයි විචාළේය. එකෙණෙහි වැදිපුත්‍රතෙම කියනුයේ සවාමීනි මුවරජ්ජුරුවන් වහන්ස, බොහෝ මුවන් ඇති තැන මේසා කතරගෙවා ඇවිත් නුඹවහන්සේම ඇල්වුව මැනවැයි යනු ඇවටි යෙක් නැත්තේය. එතකුදුවුවත් බරණැස් රජ්ජුරුවන්ගේ ඛෙමා නම් අග මෙහෙසුන් ඛිසෝතෙම නුඹවහන්සේගෙන් බණ අසම් යන දොළෙක් උපදවා ගිලන්ව වැදහොත්තිය, එබැවින් රජ්ජුරුවන්ගේ නියෝගයෙන් ඇල්වීම් කීයේය.

එසේකල යාලු වැදිපුත්‍රය, තමාට ලැබෙන සැපත් නොසිතා මා මුදාහරා ණාවූ තොප විසින් ඉතා උගහටකාරියක් කරණලද එලෙස නොසිතා මාකැඳව ගෙණ හොස් රජ්ජුරුවන්ට දක්වා දේවීන්ට මාලවා බණකියවා තොපි බොහෝ සැපත් ලැබගණුවයි කීයේය. එකෙණෙහි වැදිපුත්‍රතෙම කියනුයේ සවාමීනි, මුවරජ්ජුරුවන් වහන්ස, මේලොව මහරජ්ජුරු නම් ඉතා චණ්ඩපරුෂයෝය ඉසුරු මදින් මත්ව කායර්‍යාකායර්‍ය නොසිතා ගෙණ ගොස් බැලූ කල්හි කුමකින් කුමක්වන බව නොදනෙයි.එබැවින් රජ්ජුරුවන්වහන්සේ දෙන සැපතින් මට කම් නැත.ඒහැම තොසිතාතොපි සැපසේ පළායවයි කියා සිතුටුසිතින් කීයේය. ඊට බොධිසත්ත්වතෙම සිතනුයේ මේ මට බොහෝ උපකාර කෙළේය. මාත් ඊට ප්‍රතිඋපකාරයක් කළමැනවැයි සිතා කියනුයේ, සබඳ වැදිපුත්‍රය මාගේ පිට පිරිමැදලවයි කීයේය එයින් එපරිද්දෙන්ම පිටපිරිමැදියේය. එසඳ රත්වන් ලොම් ඔහු අත පිරුණේය. සවාමීනි, මම මෙයින් කුමක් කෙරෙම්දැ?යි විචාළේය. ඊට මුවරජ කියනුයේ මේ ගෙණ ගොස් රජ්ජුරුවන්ටද බිසවුන්ටද පෑ රන් වන් මුවරජ්ජුරුවන්ගේ ලො/මැයි කියා මා සිටි සථානයෙහි සිට මේ ගාථාවෙන් දෙවියන්ට ධර්‍මදෙශනාකරවයි කියා 'ධම්මංචර මහාරාජ' යනාදීන් ගාථා උගන්වා පන්සිල් සමාදන්කරවා කුසල්හි නොපමාවවයි අවවාදකොට යවූසේක, වැදිපුත්‍ර තෙමද මහබොධිසත්ත්වයන් ආචාරීසථානයෙහි තබා තුන්යලක් පැදකුණුකොට සතර සථානයෙක්හි බැසහෙව වැඳ දෙහලද රත්වන් රෝමයන් නෙළුම් පතෙක්හි බහා බැඳගෙන බරණැසට අභිමුඛව නික්මුණේය. ඒ මුවෝ තුන් දෙනම මඳක්තැන් පසුකොට ගොස් ගොදුරු පැනුත්ගෙණ දෙමව්පියන් දෙදෙනා සමීපයට ගොස් වන්හ.

ඒ දුටු දෙමව්පියෝ දෙදෙන සෝක දුකඛයෙන් මිදී විචාරන්නාහු වැදි පුත්‍රයා අතට පැමිණ තොප මිදී ආගමන් මරු මුඛයට ගොස් දෙවෙනිව ආගම නක් වැන්නේය. බැඳුනු කලුම්ළින් කෙසේ නම් මිදුනාහුදැයි විචාළාහ, ගැලවුනු පරිදි කියන බොධිසත්ත්වතෙම දෙමව්පිය දෙදෙනා වහන්ස, කන්කළුවූ සිත් පැහැදගන්නාවූ සුලු බස් කියනසේ දන්නා මා චිත්‍රනම් මලනුවෝ තමන්ගේ සුභාසිත වචනවලින් මා මුද අළහ. සුනනා නම් මාගේ නැගනියෝද ප්‍රියවූ බස් බෙණෙමින් මා මුදනු පිණිස වැදිපුත්‍රයාහට යාච්ඤාකළාහ. ඔවුන්

දෙදෙනාගේ මධුර වචනයෙන් ප්‍රසන්නවූ වැදිපුත්‍රතෙමේ තමහට අතික් ලාභයක් නොසිතා මා මුදා හැරපුයේයයි දෙමව්පිය දෙදෙනාට කීයේය. එබස් අසා ඔහට දෙමව්පිය දෙදෙන ස්තුතිය කරන්නාහු සැපසේ මිදී ආ රොහණත මෘගවූ මපුතනුවන් දැක යම්සේ සතුටුවීම්ද එපරිද්දෙන්ම වැදිපුත්‍රයා තමාගේ දරුබිරින්ද හා සමග සතුටුව බොහෝ දවසක් වාසය කෙරේවයි කියා ප්‍රිය වචන පැවැත්තාහුය, මෙලෙසින් ඔවුනොවුන්ගේ වෙන්වීමෙන් පැමිණි දුකින් මිදී රොහන්ත නම් මෘගරජ්ජුරුවන් ඇතුළුවූ තුන්බින්නම මෘගයූථයන්ට අනුශාසනා කොට පෙර පරිද්දෙන් එහිම විසූහ. ඒ බොධිසත්ත්වයන් ගෙණෙන පරිද්දෙන් ගිවිස ගිය වැදිපුත්‍රයාද පෙර දුරිකොට ඔවුන් හැර දෙවැනිව ඔවුන් විසින් සතුටුව දෙනලද රන්වන් මෘග රෝමයන් ගෙණ හිමාලය ප්‍රතිබද්ධ වනයෙන් නික්ම බරණැස්නුවරටම ඇවිත් රාජභවනයට වැද රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටියේය, එකල්හි රජතෙම වැදිපුත්‍රයා මුහුණ බලා කියනුයේ කිමෙක්ද? කිසවුන්ගේ දෙළු පසිඳනා පිණිස රන්වන් මුවරජහු ගෙණ එම් කියා මෙලෙස බැරිවීනම් ඔහුගේ සමටුවත් ගෙණෙම් කියෙහි වේද දූන් එකී බස් විනා ගෙණා මෘගචර්මයක් තුදුටුමෝයයි විචාළේයි.

ඒ අසා වැදිපුත්‍රතෙම එසේ නොකියනුමැනව දේවයන් වහන්ස, තුඹ වහන්සේගෙන් අවසරගෙණ නික්ම පළමු අසා සිතකලද මග සලකුණු නොවදවාම ගොස් හිමාලය වනයෙහි තුන්වැනි පර්වත වලල්ලට වැද රොහණතනම් විල් සමීපයෙහි අසූදහසක් මුවන් පිරිවරකොට ඇති මුවරජ්ජුරුවන් දැක ඔවුන් පැන් බොන්නට බස්නා විල්තෙර උගුලක් අටවා ඒ මුවරජහු බඳුගතිමි. එතනට මා එන්නට පළමු ඔවුන් වැනිවූ මුවකුත් නොබැඳී සිට මුත් හා එක්ව මියම්හයි දිවිපුදා සිටියහ. ඒ දැක මිනිසුන්ටත් මෙසේවූ විශ්වාසයෙක් ආශ්චර්‍යයයි මුදාහැරපීම් කීයේය.

ඒ අසා රජතෙම ඔහු කොයිසැටි මෘගයන්ද? කෙසේවූ ආචාර සීලයකින් ධර්‍මයකින් යුක්තයෝද ඔවුන්ගේ සැටි කියවයි විචාළේය රජ්ජුරුවන් නැවත විචාළ කල්හි ඒ සැටි කියන්නාවූ වැදිපුත්‍රතෙම ඇසුවමැනව, දේවයන් වහන්සැයි කියා ඔවුන්වූ පරිදි කියන්නාහු ඔවුන්ගේ ශෘංගය රිදීදම්සේ ධවලය, විසිතුරුව හොබනා වාලසිය චමරදෙනුන්ගේ වාලධියක් වැන්නේය. පාදයෝ පබලුයෙහි පැහැ වැනිය. හා ඇස් සගල පස්පැහැ විහිදුවමින් ඉතා මන වඩන්නේය. මෙපරිද්දෙන් වර්ණනා කෙරෙමින් මහබොධිසත්ත්වයන්ගේ රන්වන් රෝමයන් ගෙණා බව රජ්ජුරුවන්ට දක්වා මෙබඳු සවරූප ඇත්තාහ. මෙබඳුවූ ධර්‍මයකින් යුක්තයහ. ඇස් නැති දෙමව්පිය දෙදෙනහට පොෂ්‍යය කරන්නාහයි දූත් වූයේය. මෙසේ වැදිපුත්‍රතෙම මොවුන් තුන්දෙනාගේ ගුණ වර්ණනා කොට ඒ මුවරජ්ජුරුවන්ගේ රෝමයයි ලෝමු දක්වා මාගේ ස්ථානයෙහි සිට ධර්‍මාචාර්‍ය ගාථාවෙන් ධර්‍මදේශනා කරවයි මට නියෝග කෙළේයයි කියා ඒ පරිද්දෙන් සවර්ණපීඨයෙහි හිඳ ධර්‍මදෙශනා කෙළේය. ඒ ඇසීමෙන් දෙළු සන්හිඳුනේය, රජ්ජුරුවෝත් ඒ වැදිපුත්‍රයාහට බොහෝ සැපත් දෙන්නාහු එම්බල වැදිපුත්‍රය තා කෙරෙහි සතුටුව ප්‍රසාද පිණිස මැණික් සියෙක්ද හෙවත් පන්සියයක් රත්රන්ද අනඝ කුණ්ඩලාභරණයක්ද දියබෙරලිය මලට බඳුවූ පැහැ ඇති සතරැස් ආසනයක්ද අසදෘශවූ රූපයන් ඇති බිරින්ද දෙදෙනකුද මඞ්ගල්‍ය වාෘෂභයන්හු ප්‍රධානකොට ඇති ගෙරින් සියයක්ද හෙවත් මේ සියල්ල ඇරගණුව බොහෝ උපකාරව සිටි නොප කී පරිද්දෙන් දසරාජ

ධර්මයෙන් රාජ්‍යයත් කෙරෙමි. තෙපිත් මෙතැන් පටන් පඳවි පිණිසවත් පව් නොකොට මා විසින් දෙනලද මේ සැපත් ගෙණ කෘෂි වණික් ආදියකොට සැපසේ ජීවත්වෙයි කියා ඔහට සමුදුන්නේය. ඒ තෙමේත් රජ්ජුරුවන්ගේ බස් අසා මට ගිහිගෙයි වාසයෙන් ප්‍රයෝජන නැත, පැවිදිවනු කැමැත්තෙමියි අවසරඉල්වාගෙණ රජ්ජුරුවන් දෙනලද සැපත් දරුබිරින්ද රුකෙනපරිද්දෙන් සලසා දී හිමාලය වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බ්‍රහ්මලෝකයෙහි උපන්නේය. රජ්ජුරුවෝත් මහබොධිසත්ත්වයන්ගේ අවවාදයෙහි සිට දනාදීවූ කුසල්කොට ස්වර්ගපදප්‍රාප්තවූහ. මහබෝධිසත්ත්වයන් රජ්ජුරුවන්ට කරවූ ධර්මය අවුරුදු දහසක් පැවැත්තේය. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ජාතක ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි, පෙරත් මේ ආනන්දස්ථවිරයෝ මා පිණිස ජීවිත පරිත්‍යාග මෙලෙස කළෝවේදැ''යි වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බොධිසත්ත්වයන් බැඳූ වැදිපුත්‍රයා නම් දැන් ඡන්න නම් අමාත්‍යයාය බරණැස් රජ්ජුරුවෝ නම් දැන් ශාරිපුත්‍රස්ථවිරයෝය. එසමයෙහි බිසව් නම් ඛෙමා නම් මෙහෙණින්නය, එසමයෙහි දෙමව්පිය දෙදෙනා නම් දැන් සුදසුන් මහ රජ්ජුරුවන් හා මහාමායාදේවීය, සුතනා නම් මෘගධෙනුව නම් දැන් උත්පලවර්ණාමහා ස්ථවිරීය, චිත්‍රා නම් මෘග රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝය, එසමයෙහි අසූ දහසක් මෘගයෝ නම් දැන් මේ ශාක්‍යවංශයෙහි බන්ධුහුමයා රෝහනන මෘගරජ්ජුරුවෝ නම් බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

494
හංස ජාතකය

තවද එක්සමයෙක්හි නිපුණ නානානය නිපුණ ගම්භීර ධීරාශ්‍රවණීය සද්ධර්ම මෘදඞ්ග භෙරිධ්වනියෙන් සමස්තලෝක සම්මෝහ නිද්‍රා පහරණ ප්‍රවීණ ශ්‍රී ශාක්‍යසිංහවූ ත්‍රිලෝගුරු බුදුරජාණන් වහන්සේ චක්‍රවර්තිරාජ සහස්‍රයන්ට උත්පත්තිස්ථානවූ රජගහ නුවර සමීපයෙහිවූ සකල ජන නයනානන්දරාම වේළුවනාරාමයෙහි සතරබ්‍රහ්ම විහරණයෙන් දවස් යවනසේක් ශ්‍රවණීයවූ මේ හංස ජාතකය ආනන්දස්ථවිරයන් වහන්සේ විසින් කරණ ලද ජීවිත පරිත්‍යාගය කෙළෙව්වේදැයි වදාළ බස් අසා භික්ෂූන් වහන්සේ විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බහුපුත්තක නම් රජ්ජුරුකෙණෙකුන් වහන්සේ දශරාජධර්මයෙන් රාජ්‍යය කරණසේක. ඒ රජහට ඛෙමා නම් අග බිසෝ කෙණෙක්ප්‍රියව මනවඩමින් දවස් හරින්නීය එසමයෙහි බොධිසත්ත්වතෙම රන්වන් හංසරාජව ඉපද අනූදහසක් හංසයන් පිරිවරා චිත්‍රකූට පර්වතයෙහි වසන්නේය. එසමයෙහි ඛෙමා නම් බිසෝතොම ස්වප්නයෙක රන්වන් හංස රජක්හු අවුදින් සිංහාසනයේ හිඳ මිහිරි කටහඬ විහිදුවා ධර්මදෙශනා කරන්නා දුට. නිඳ පුබුදු අවස්ථාවෙහි සිතන්නාවූ බිසෝතොම මෙබඳුවූ හංසරාජයෙකු

ගෙන් බණ අසනු කැමැත්තෙහි කිම් තම රජ්ජුරුවෝ එහි ආදරයක් නො කරති සිතා ගිලන්වූ ආකාර දක්වා යහනෙහි වැදහෙව රජ්ජුරුවන් විසින් දවූ දින් අපාසු කිම්දැයි දේව්නියි විචාළ කල්හි රන්වන් හංසයන්ගෙන් බණ අසනු කැමතියි එක් දොළෙක් මට උපන්නේය. රජ්ජුරුවෝත් ඒ රන්වන් හංසයන් ඇති තැන් විචාරා චිත්‍රකූට පර්වතයෙහි ඇතැයි යනු අසා මේ රන්වන් හංසයන් ගෙන්වන උපාය සිතන්නාහු රජ්ජුරුවෝ යම්තැනෙක් ගෝචර සම්පත්තවීනම් එතනට නොයෙක් දිගින් උත්තම මධ්‍යමාදීවූ පක්ෂීහු හඩා බස්නාහ. එබැවින් මෙතැන්හි තටාකයක් කරවිය යුතුයයි අමාත්‍යයන්ට විධානකොට එබඳු විලක් කරවා පඤ්චවිධ පද්මයෙන් සඤ්ඡන්න කොට වැටකොට හුරුඇල් ඇතිකරවා පක්ෂීන්ට ප්‍රියවූ යම්ම ගෝචරයක් ඇත්නම් ඒ සියල්ල ඇතිකරවා සමෘද්ධ කළහ. එසඳ පොකුණට සතරදිගෙහි පක්ෂීන්ට ක්‍රමයෙන් අභයදානයදී මේ විල දෙන ලද්දේයයි සෝෂාකරවන්නාහ. එතකුදුවුවත් එක් වැදිපුත්‍රයෙකු මල කුණුගෙණ විල්තෙරම හිඳිනා පරිද්දෙන් සම්මත කළහ.

මෙහි නොයෙක් දිගින් පක්ෂි බැස ක්‍රමයෙන් හංස රජ්ජුරුවන්ගේ නියෝගයෙන් මේ තටාකය බලනු පිණිස රන්වන් හංසයන් දෙන්නෙකු පළමු වෙන් බට නියාවද ඊ සිටි නොබෝ දවසකින් හංස රජ්ජුරුවන් බට නියාවද ඒ දැක රජ්ජුරුවන්ට දන්වා වැද්දවූ මළ ඇටවූවේලේ එසඳ මහබෝධිසත්ත්වයන් මළෙහි බැඳුනු ලෙසද සුමුඛ නම් හංසසේනාධිපතීහු භයින් යන හංසයන් තුන් මුලෙහි බලා නොදැක නැවත බෝධිසත්ත්වයන් සමීපයට ආ නියාවද යන මේ සියල්ලම මහා හංසජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. මෙහි බෝධිසත්ත්වතෙම උගුළුමළෙහි බැඳී එල්ලෙමින් කර දිගුකොට හංසයන් ගිය අත් බලනුයේ සුමුඛ නම් හංසයන් ආපස්සෙහි එන්නවුන් දැක මොහු විමසමි සිතා ළඟට පැමිණි කල්හි පිළිවිස්නාවූ මහබෝධිසත්ත්වයෝ ගාථාතුණක් කියා එම්බා සුමුඛයෙනි, මා මේ මළෙහි බැඳුනු හෙයින් තැතිගත්තාවූ පක්ෂීහු ඒ ඒ දිග ගියාහ. එබැවින් නොපිදු පමානොවී ගොසින් සිටුතැයි කියා මත්තෙහිදු කාරණා කියන බෝධිසත්ත්වතෙම සබඳ සුමුඛයෙනි, බොහෝදෙනා කළ දෙය තොපත් කළයුතු නොවේද; මෙතෙක් මාගේ බත්ධුහු මා උදකලාව හැර කිසි අපෙක්ෂාවක් නැතිව පලාගියහ. තෙපි කුමක් නිසා පසුබටදැයි කියා තවද පක්ෂිරාජයානෙනි, මරු මුඛයට පැමිණ සිටියවුන්ට ඤාතිමිත්‍ර සහායෙක් නැත. එබැවින් මළෙහි බැඳීසිටියාවූ මා හා කුමන විශ්වාසයෙක්ද? ආකාශයට වහ පැනනැගෙව තොප නිදුකින් වසන පිණිස උත්සාහ අඩු නොකරවයි කීයේයා. ඉක්බිති සුමුඛ නම් හංසරාජතෙම මඩපිට හිඳ කියනුයේ සබඳ ධෘතරාෂ්ට්‍ර නම්. හංස රජ්ජුරුවෙනි, මෙතෙක් දවසක් තොපට අනුවරව සිට අද තොප දුකට පැමිණි කල්හි මමත් මේ දුකට පැමිණියෙමි යන භයින් හැරපිම මිත්‍රධර්මයෙන් නොහැර කීකල මා රක්ක නම් කිමෙක්ද? එබැවින් රැකෙනත් තොප හා සමග දකිනා දෙයක යවයි යන බස් මට නොකියවයි කීයේය. මෙසේ සුමුඛ නම් සේනාධිපතීහු සිංහනාද කරණ කල්හි ධෘතරාෂ්ට්‍ර නම් හංසරජතෙම කියනුයේ සුමුඛයෙණි තෙපි යමක් කිවුද? ඒ සියල්ලම උත්තමවූ මහතුන්ගේ ගුණය. එබැවින් තොප හැර නොයන නියාව දනිමි. එතකුදුවුවත් තොප පරීක්ෂා කරණු පිණිස සිටුදැයි කියමි කීයේයි. මෙසේ මොවුන් දෙදෙනා කථාකරමින් සිටියදී වැදිපුත්‍රතෙම මුගුරක් අතින් ගෙණ වේගයෙන් අවුත් වන්හ. එකල දහසක්

පමණක් ධෘතරාෂ්ට්‍ර නම් කුලයෙහි හංස යූථයට සතර සංග්‍රහ වස්තුවෙන් අනුශාසනාකරණ හංසරජ්ජුරුකෙණෙක මෝහට ඉඳින් තොපි විනාශයක් කළාතම් මෙතෙක් හංසයෝ කිසි පිහිටක් නොලබන්නාහුය. යනාදීන් තුඩ නොසෑහෙන පරිද්දෙන් බොධිසත්ත්වයන්ගේ ගුණ කීයේය. එසඳ වැදිපුත්‍රතෙම එය ඇසී මෙන් මොලොක්වූ සිත් ඇතිබූයේය. ඔහුගේ ආකාර දත්තාවූ සුමුඛ නම් හංසතෙම නැවත අවුදින් හංසරජ්ජුරුවන් අස්වසමින් වහාගෙණ සිටියේය. ඒ දුටු වැදිපුත්‍රතෙම හංසරජ්ජුරුවන් සමීපයට වැද මෙලෙස කියනුයේ, හංසයන්ට නායකව අනුශාසනා කරන්නාවූ කිසි පියවර නැගීමක් නැති ආකාශයෙහි යෙමින් සිට පියවර පෙණෙන්නාවූ භූමියෙහි තිබෙන්නාවූ මළ කුමක්නිසා නුදුටුද කුමක්නිසා බැඳුනෙහිදැයි කීයේය. නැවත ඊට උත්තර කියන හංසරාජතෙම සබඳ වැදිපුත්‍රය මේ ලෝකයෙහි සත්ත්වතෙම කෙසේවූ නුවණැති සම්පූර්ණවූයේ වීනමුත් ඒකාන්තයෙන් විත්දයුතු අකුශලක් පැමිණි කල්හි පරිභවයට පැමිණෙන්නේය තමා අසුවනතුරුම මේ මළෙක්වේද දැලෙක්වේදැයි දැනගත නොහෙන්නේය. එබැවින් විත්ද යුත්තක් කවුරුන් විසින් වැළකිය හැක්කේදැයි කීයේය.

ඒ බොධිසත්ත්වයන් කී බස් අසා වැදිපුත්‍රතෙම විශෙෂයෙන් සන්තෝෂයට පැමිණ සුමුඛනම් සේනාධිපතිහු හා සම්මගකථාකරණුයේ සබඳහංසයානෙනි මේ හංසරජ්ජුරුවන් බැඳුනු වේලෙහි රන්වන්වූ පියා සහලක් ඇති මෙතෙක් හංසයෝ භයින්ත්‍රාසනාවූවාහු පවන් දුටු වළාකඩක් මෙන් ඒ ඒ දික්හි විසිර පළාගියහ. තොප මේ හුදකලාව කුමක් නිසා පසුබටවූවාද තවද භයින් දිවන ඒ පක්ෂීහු සැපසේ පියුම්කෙසුරු හා නෙළුම්දලි අනුභවකොටයන හංසසමූහයෙන් එක් කෙණෙකුත් මේ හංස රජ්ජුරුවන් කෙරෙහි අපෙක්ෂාවක් නොකොට පළාගියහ. තෙපි හුදකලාව මොවුන් අත්නොහැර සිටියව මොවුන් ඈඥ පැවැත්වූයේ තොප කෙරෙහිද නොහොත් ඔවුන් හැමගෙන් තොපට අවශ්‍ය බන්ධුව සිටියෝ මූවදැයි නොබැඳී සිට බැඳුනාවූ මොහු ඇසුරුකොටසිටි කාරණා කිමෙක්දැයි විචාළේය. එකෙණෙහි සුමුඛ නම් හංසතෙම සබඳ වැදිපුත්‍රයානෙනි, මේ පක්ෂිරාජතෙම මාගේ රජ්ජුරුවෝය. නැවත විශ්වාසයෙන් බැඳුකල මිත්‍රයානෝය. මාගේ ප්‍රාණය හා සමානයාලුවානෝය. මෙතෙක් කාරණයෙන් මාගේ ජීවිතය තිබූතෙක්ම වේලා මොහුගෙන් වෙන්නොවෙමි. ශරීරයෙන් වෙන්වූ බවක් විනා ප්‍රාණයෙන් අප දෙදෙනාටම එක ප්‍රාණයයි සිතමි කීයේය. එබස් අසා වැදිපුත්‍රතෙම ප්‍රසන්නවූ සිත් ඇතියේ ඉඳින් මේ සීලාචාර ගුණයෙන් යුක්තවූ හංසරජ්ජුරුවන් කෙරෙහි වැරද ගියේ මේ පොළවනොම විවරදී හැරගෙණ යන්නේය. එබැවින් මෙසේවූ අකාරිකොට රජ්ජුරුවන්ගෙන් ලබන සම්පත්තීන් මට ප්‍රයෝජන කිමෙක්ද මොහු මෙතැන්හි මුදාහැරපියමියි සිතා හංසයානෙනී සුවපත්වූ තොපි යම් හංස රජ්ජුරුකෙණෙකුන් නිසා ජීවිතය හරණ කැමැත්තාහුද එසේවූ තොපගේ යහලු හංසයානන් හරිමි, මෙතැන් පටන් හංස රජ්ජුරුවෝත් තොපට අනුකූලවෙත්වයි කීයේය. මේ ලෙස කියා ධෘතරාෂ්ට්‍ර නම් හංසරජ්ජුරුවන් උගුලු මළින් මුදාහැර විල්තෙරට ගොස් පය ලේ සෝදා සම් මස් නහර ආදී පිළිවෙළින් තිබා අතින් පිරිමැද්දේය. එකෙණෙහිවැදිපුත්‍රයාගේ මෛත්‍රී අනුසසිත්ද බොධිසත්ත්වයන්ගේ පාරමිතා අනුබලයෙන්ද මෙපරිද්දෙන් ප්‍රකෘතිමත්ව බැඳුනුතැන් මේයයි කියා නොදැනෙන පරිද්දෙන් වූයේය· එකෙණෙහිම සුමුඛ නම් හංසතෙම මහාබොධිසත්ත්වයන් සැපසේ සිටි

නියාව දැක සන්තෝෂයෙන් වැදිපුත්‍රයා මුහුණ බලා සබඳ උත්තම පුරුෂය මේ බන්ධනයෙන් මිදුනු හංස රජ්ජුරුවන් දැක යම්සේ අද මම සතුටුවීම්ද එපරිද්දෙන් සබඳ මිත්‍රයන් හා සමග තෙපිත් සතුටුවවයි සතුති කෙළේය. එබස් අසා වැදිපුත්‍රතෙම ප්‍රතිවචනය කොට සැපසේ වැඩියමැනව ස්වාමීනි කීයේය. එකෙණෙහි මහා බෝධිසත්ත්වතෙම කිමෙක්ද? පුරුෂයානෙනි, තොප නිසා මා මළෙහි බැඳුද නොහොත් අනික් කෙණෙකුන්ගේ නියෝගයෙන් බැඳුදැයි විචාළ කල්හි ඒ තෙමේත් බිසවුන්ට දොළෙක් ඇති නියාවත් ඒනිසා රජ්ජුරුවන් මෙතැන්හි විලකුත් කරවා මට කළ විධානවූ පරිද්දෙන් නියුක්තව සිටි බවද යන සියල්ල කීයේය.

එකෙණෙහි හංස රජ්ජුරුවෝ සිතන්නාහු අප වසන්නාවූ චිත්‍රකූට පර්වතයටම යාම යහපත්දෝහෝයි නොහොත් රජ්ජුරුවන්ගේ නුවරටම යාම යහපත්දෝහෝයි විමසන්නාහු ඉදින් මම නුවරට ගියෙම්වීම්නම් වැදිපුත්‍රයාත් බොහෝ සම්පත් ලබන්නේය. බිසවුන්ගේ දොළ පසිඳින්නේය. සුමුඛ නම් සේනාධිපතිහුගේ මිත්‍රධර්මයත් ප්‍රකාශවන්නේය. මාගේ ඥාණ බලයත් ප්‍රයෝජනවන්නේය. ඛෙමා නම් විලත් අභයදානය කොට දුන් ලබමි. එබැවින් නුවරට යාම යහපතැයි සනිටුහන් කොට සැපසේ අප දෙදෙනා කදෙක්හි තබාගෙණ රජ්ජුරුවන් සමීපයට ගෙණයව, එකෙණෙහි රජ්ජුරුවෝ අප හරණා කැමතිවූ නම් මුදාහැරපියති කීයේය. එබස් අසා වැදිපුත්‍රයා ස්වාමීනි හංස රජ්ජුරුවන්වහන්ස මෙලොව මනරජ්ජුරුවෝ නම් ඉතා චණ්ඩ පරුෂයෝය, ඉසුරු මදින් මත්ව කාර්‍ය්‍යාකාර්‍ය්‍ය නොසිතා ගෙණගොස් පැලූ කල්හි කුමකින්කුමක් වන බව නොදනෙයි, එබැවින් රජ්ජුරුවන් වහන්සේ දෙන සැපතින් මට කම්නැත. ඒ හැම නොසිතා තෙපි සැපසේ පලායවයි කියා සතුටු සිතින් කීයේය. ඊට බෝධිසත්ත්වතෙම කියනුයේ තොප වැනි රෞද්‍ර සිත් ඇත්තන්පවා මොලොක්කරවා ගතුම්හ. එසේහෙයින් කාරණාකාරණා දන්නාවූ රජ්ජුරුවන් සිත් අරවා ගැන්ම අපට භාරය තෙපි අමුත්තක් නොසිතා අප දෙදෙනා ගෙණයවයි කීයේය. එකෙණෙහි එතෙමද හංසයන් දෙදෙනා කදින් ගෙණගොස් රජ්ජුරුවන්ට දැක්වූයේය. ඔවුන් දැක සතුටුවූ රජ්ජුරුවෝ මහත් ආදරයෙන් හංසයන් දෙදෙනාම ස්වර්ණපීඨයෙක්හි හිඳුවා මී හා විලඳ කවා මීපැණි පොවා දෙහොත් මුදුනෙහි බැඳ බණ අසන පරිද්දෙන් ආරාධනා කෙළේය. හංස රජ්ජුරුවෝත් ඔවුන් බණ අසනු කැමති නියාව දැන පිළිසඳර කථාකරණ හංසරජතෙම රජ්ජුරුවෙනි, තොපට සැපකිම්ද? දුකෙක් නැද්ද ව්‍යාධි මදද වස්ත්‍රාභරණාදී සම්පත් සමෘද්ධ තොපගේ රාජ්‍යය දැහැමෙන් අනුශාසනා කරව්ද? කිමෙක්දැයි කීයේයි. එකෙණෙහි පිළිවදන් දෙන්නාවූ රජතෙම සබඳ හංසරජ්ජුරුවෙනි මට දුකෙක් නැත්තේය. රෝගපීඩාත් මද රාජ්‍යයත් දැහැමෙන් අනුශාසනා කෙරෙමි සැපයයි කීයේයි. නැවතත් හංසරජතෙම කිමෙක්ද තොපගේ අමාත්‍ය මණ්ඩලයා කෙරෙහි දොෂයක් නැද්ද? හිත පක්ෂපාතව වෙසෙත්ද? කිමෙක්ද? සතුරෝ තොප කෙරෙන් දකුණු දිගට නොයන ඡායාව මෙන් දුරුව යෙද්ද කිමෙක්දැයි කීයේයි. නැවත රජ්ජුරුවෝද කියන්නාහු මේ අමාත්‍ය මණ්ඩලයා කෙරෙහි කිසි දෝෂයෙක් නැත. අපක්ෂපාත කෙණෙකුන් නැත්තාහ. දකුණුදිගට නොවඩනා ඡායාවක් මෙන් සතුරන්ගෙන් වැඩෙන කෙණෙකුත් නැත්තේයයි කීයේයි. නැවතත් හංසරාජතෙම කිමෙක්ද? තොපගේ අගමෙහෙසුන් බිසව්

තොපට ජායාව මෙන් අනුකූලව වසන්නීද ජාතිගෝත්‍රාදියෙන් සමාන හෙයින් හික්ම තොපවත්නීද දරුවන්ගෙන්ද යසසින්ද රූපයෙන්ද සියලු ස්ත්‍රී ගුණයෙන් සම්පූර්ණව වසන්නීද කිමෙක්දැයි කීයේය. එකෙණෙහි රජතෙම කියනුයේ අගමෙහෙසුන් බිසව අප සමාන ගෝත්‍ර ඇති හෙයින් හික්ම සුශික්ෂිතව පැවැත්තේය. රූක්ෂ බසක් නොකියන්නීය. දරුවන්ගෙන් හා යසසින් හා රූපයෙන් අග්‍රවූව මාගේ සිත්සේම පවත්නීයයි කීයේය.

තවද හංස රජතෙම රජ්ජුරුවෙනි, මොනවට ඉපද වැඩුනාවූ රටට වැඩක්ම කරණ තොපගේ දරුවෝ ප්‍රඥයෙන් යුක්තවූවාහු ඒ ඒ ස්ථානයෙහි සමඟ සතුටුව වෙසෙත්ද. විරුඬ නොවන්නාහුදැයි කිමෙක්දැයි විචාළේය,එබසට ප්‍රතිවචන දෙන්නාවූ රජතෙම ධෘතරාෂ්ට්‍ර නම් හංස රජ්ජුරුවෙනි මා හා සමග ලෝකයෙහි ප්‍රසිඬවූ මාගේ දරුවෝ එක්සියයක් පමණ ඇත්තාහ. ඔවුන් ඇමට තුඹවහන්සේ මෙලෙස කරව මෙලෙස කරවයි කියා සැපතයෙහි හැසුරුව මැනව, ඔහුහැමදෙන තුඹවහන්සේගේ බසඉක්ම පැවැත්තෙහියයි කීයේයි. එබස් අසා මහබොධිසත්ත්වතෙම ඔවුන්ට අවවාද කරණුයේ රජකුමරුවෙනි ලෝකයෙහි යමෙක්තෙම ප්‍රශස්තවූ ජාතියෙන් හා ආචාරයෙන් යුක්ත ශිල්ප ශාස්ත්‍ර උගත මනාවූ වයස ඉගෙණ තමා යෝග්‍ය කොට නොගත්තේ වීනම් කල වැරද ගිය හෙයින් වෘඬ අවස්ථාවෙහි පැමිණි ආපදායෙහිදු කුමක් නම් සාධාගත හෙන්නේද එබැවින් පිහිට නොලැබ පසුබස්නේය. තවද නොහික්මුණු බැවින් කළයුතුවූ ප්‍රඥ ඇති හෙවත් යහපත් නුවණ ඇත්තාහට එකසණ පාසාණයක් මෙන් සිදුරු නොපෙණෙන්නේය. චඤ්චලවූ බුඬි ඇත්තාහට බොහෝ සිදුරු පෙණෙන්නේය.

එබැවින් සතුරන්ට අවසර පෙණෙන්නේය. නිශ්චලවූ බුඬි ඇතියේ ස්ථූලවූ මහත්වූ කාරියවිනා සූක්ෂමවූ නිපුණු කාරියක් දක්ක නොහෙන්නේය. කුමක් මෙන්ද රැහෙත එකෙක් නොහොත් රැ අඳුරෙහි වන් එකෙක් මහත්වූ රූපයක්ම දකිනේය. සූක්ෂමවූ රූපයකෙණෙක් දක්ක නොහෙත්මය. එබැවින් නුවණැස් ඇති එකෙක්ම ස්ථූලවූ කටයුතු දක්නේය. ඒ නුවණැත්තෙමේත් ශාස්ත්‍රාභ්‍යාශයෙන් හා පූර් වාසනායෙන් සිඬවන්නේය. එහෙයින් මේ ලදරු වයසම ශිල්ප ශාස්ත්‍ර උගණුව, තෙපින් දරුවන්ට එපරිද්දෙන් ශික්ෂාකරව රජ්ජුරුවෙනි,කියා නැවතත් මෙලොවින් අනුශාසනාකරණ බොධිසත්ත්වතෙම තවද රජ්ජුරුවෙනි මේ ලෝකය බ්‍රහමනිර්මිතය, ඊශ්වර කෘත්‍යය යනාදීන් අසාරවූ ලෝකායතනයෙහි සාරය දැනගත යුත්තේයයි යමෙක් සිතාද ඒ තෙම කිසි දනුමැතිකමක් සසරින් ගැලවෙන උපායක් නොදකිනේය. කුමක් මෙන්දයත් පර්වත දුර්ගයකට පැමිණ සරභ මෘගයෙක්තෙම එබඳු විෂමස්ථානයෙන් ගැලවීගත නොහෙන්නේය. ප්‍රපාතයෙහි වැටී අතරමග නැසීයන ගමනක් විනා ස්ථානයකට පැමිණියනොහේද එපරිද්දෙන් පරසමයම මිථ්‍යාදෘෂ්ටියක් ගෙණ කිසි නිවණට මඟක් දක්ක නොහැක්ක බොහෝකොට කීමෙන් කිම්ද අසාරයයි නොගෙණ සාරයම සාරයයි ගණුව, එබැවින් තොපගේ දරුවන් සාරවූ කටයුත්තෙහිම යොදවයි කීයේය. තවද රජ්ජුරුවෙනි උත්තමවූ රාජකුමාරවරුන් තබා හීනවූ ජාති ඇත්තේ නමුත් උත්ථාන වීර්‍යයෙන් යුක්ත ධර්මසම්පන්නද ආචාරශීලයෙහිද එසේවූ සත්ත්වතෙම රාත්‍රියෙහි ගිරිමුදුනෙක දිලිහෙන ගින්නක්මෙන් දිලිසෙන්නේය එසේහෙයින් තොපගේදරුවන් එලෙසට හික්මවාගණුවයි කීන.තවද රජ්ජුරුවෙනි මෙකී දෘෂ්ටාන්තලෙස තොපගේ

දරුවන් ශාස්ත්‍රයෙහිද ශිල්පයෙහිද තික්ෂ්ණවාගණුව මෙසේ නුවණැතිසෞභාග්‍යවූ කල්හි යසස් තේජස් සම්පත්ති ආදිය මොවුන්කෙරෙහි විශේෂයෙන් වර්ධනවන්නේය. කුමක්මෙන්ද සාරවූ ක්ෂෙත්‍රයෙහි වපුල බිජුවටින් බොහෝ ඵල ලැබෙන්නාක් මෙනැයි කියේයි. මෙසේ මහබොධිසත්ත්වයන් වහන්සේ සියලු රාත්‍රියෙහි රජ්ජුරුවන්ට ධර්මදේශනා කළසේක. බිසවුන් දෙළන් සංසිඳුනේය. මහබොධිසත්ත්වයන් වහන්සේද අරුණුනැගෙන වේලාවට රජ්ජුරුවන් ශීලයෙහි පිහිටුවා කුශල්කිරීමෙහි අප්‍රමාදවයි අවවාදදී සුමුඛනම් හංසසේනාධිපතීහු හා සමග උතුරු සිව්මැදුරු කවුළුවෙන් නික්ම චිත්‍රකූට පර්වතයට ගියේය. වැදිපුත්‍රයාද බොධිසත්ත්වයන්ගේ ප්‍රසාදයෙන් ලබනලද බොහෝ සම්පත්තියෙන් සමෘද්ධවිය. ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ මේ ජාතක ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදුරා එම්බා මහණෙනි, පෙරත් මේ ආනන්දස්ථවිරයෝ මට ජීවිත පරිත්‍යාග කළෝවේදැයි වදුරා පූර්වාපර සන්ධි ගළපා මේ හංස ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි වැදිපුත්‍රයානෝ නම් දැන් මේ ශාරිපුත්‍රස්ථවිරයෝය. එසමයෙහි බිසවුන් නම් දැන් මේ ඛෙමා නම් භික්ෂුණීය. එසමයෙහි හංස සමූහයානම් දැන් මේ ශාක්‍යවංශයෙහි රජදරුවෝය. එසමයෙහි හංසසේනාධිපති නම් ආනන්දස්ථවිරය. එසමයෙහි ධෘතරාෂ්ට්‍ර නම් හංසරජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

495
සත්තිකුම්භ ජාතකය

තවද එක්සමයෙක්හි නානානය නිපුණ අනෙකාධ්‍යාශය ශ්‍රවණීය මධුර වචනයෙන් දෙශනා නැමැති දිව්‍යඖෂධයෙන් සත්ත්වයන්ගේ සංසාර දුක්ඛ නැමැති රෝගය සමනය කෙරෙමින් ලෝකාභිවෘද්ධිය කොට රක්ෂාකරණලද මහාකරුණාවෙහි ඵලසැප විඳිනාහු තථාදි ගුණයෙන් යුක්තවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ශ්‍රොතෘ ජනමනඃ ප්‍රසාද ජනක ධර්මදෙශනාව මද්දකුච්ඡි නම් පර්වතප්‍රාන්තයෙහි මුවන්ට තබාදෙන අභය ඇති හෙයින් මිගදාය නම්වූ වනයෙහි චතුර්විධ බ්‍රහ්මවිහරණයෙන් දවස් යවමින් වැඩවසනසේක් දෙව්දත් තෙරුන් වහන්සේ අරභයා වදාළසේකි.

නිෂ්කාරණයෙහි බඩවෛර ඇති දෙවදත්තස්ථවිරයන් විසින් බුදුන් මරම් යන නුනුවණ සිත් ඇතිව ගිජුකුළුපව්ව මුදුනෙන් බුදුන් හිසට පෙරළූ ගල භූමියෙන් ගල්දෙකක් නැගී පිළිගත්තා කල්හි එයින් සිදී ඉවත පතන සිලාඛණ්ඩයක් බුදුන්ගේ පාදයෙහි පැහැර බලවත් වේදනා උපන් කල්හි බුදුරජානන් වහන්සේගේ දුක්ම පිණිස බොහෝ භික්ෂූන්වහන්සේ රුස්වන්ට වන්සේක. ඒ දැක බුදුරජානන් වහන්සේ එම්බා මහණෙනි මේ සෙනස්න ඉතා භයංකර විෂමස්ථානව තිබෙයි. රුස්වන්නා පමින් බොහෝ වන්නේය. එබැවින් මද්දකුච්ඡි නම්වූ ප්‍රදේශයට මා සිවිගෙයකට නගාවා වඩාගෙණ යවයි වදාළසේක. භික්ෂූහුත් එපරිද්දෙන්ම කළාහ. ජීවක නම් වෛද්‍යතෙම බුදුරජානන්

වහන්සේගේ පාදය ගුණ කෙළේය. බුදුරජාණන් වහන්සේ සමීපයෙහි රැස්වූ භික්ෂූහු කථාවක් පහළ කරන්නාහු ඇවැත්නි දේවදත්තස්ථවිරතෙම මේ පාපිවූ පවිටුවූ පක්ෂීදීනුත් යුක්තයයි කිය කියා උන්සේක. ශාස්තෘවූ ත්‍රිලෝගුරු බුදුරජාණන් වහන්සේ කුමක් කියමින් හුන්නාහුද මහණෙනි, විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි මහණෙනි, මේ දේවදත්තස්ථවිරයෝ දැන් මට පවිටුවූයේ නොවෙයි, පූර්වයෙහිත් පවිටුවූයේය. එසේම පවිටුවූ පක්ෂීදීන් යුක්තව විසුවෝ වේදැයි වදාරා මුවෙන් නොබැණ වැඩඋන් කල්හි භික්ෂූන් වහන්සේ විසින් මොහු පෙර පවිටු පරිදි කෙසේදැයි වදාළහොත් යහපතැයි ආරාධිතවූ සේක් ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

යටගිය දවස සකල සමෘද්ධින් නිරුත්තරවූ උත්තර පඤ්චාලනම් නුවර වීගතපුරි සඤ්චාර ඇති පඤ්චාල නම් රජෙක්තෙම රාජ්‍යශ්‍රීන් පිණනුයේ පවිත්‍ර චාරිත්‍ර ඇති මිත්‍ර අමාත්‍යයන් හා සමග රාජ්‍යපරිපාලනය කරන්නේය. එකල්හි පුරණලද පාරමිතා ඇති අනන්‍ය සාධාරණවූ මහා සත්ත්‍ව ඇති විවිධ තරු ෂණ්ඩ මණ්ඩිතාඛගතවණී ගුණ ඇති රමණීයවූ ආරණ්‍ය ප්‍රදේශයෙක්හි පාංශු මිශ්‍රවූ ආබණ්ඩි පර්වතයෙහි හටගත් කොළඉඹුල් වනයෙක්හි එක් ගිරාරජක්හට පුත්‍රව උපන්නේය. ඔහට සහෝදර මල්වූ දෙදෙනෙක් ඇත්තාහ. ඒ ගිරවුන් වසන පර්වතයට උඩ නොරුන් පන්සියයක් වසන්නාවූ චෝවර ග්‍රාමයෙක් වූයේය. ඒ පර්වතයට යට පන්සියයක් තාපසවරුන්ට නිබඳ වාසස්ථානවූ ආශ්‍රම පදයෙක් ඇත්තේය. ඒ ගිරාපැටවුන් පියාපත් හටගන්නාවූ කාලයෙහි ඒ පර්වතයට උඩු සුළඟත් යටසුළඟත් එක්ව භූමියෙහි තණපරඬලා ආදිය අහස්හි බමවමින් සුළන් ඇල්ලෙක් ගැසුයේය. එයින් පහරලදින් එක් ගිරාපැටවෙක් එතනට උඩු සුළඟ සොරුන්ගේ ගමෙහි ඔවුන්ගේ ආයුධ අතුරෙහි වැටුනේය. ඒ ගිර පෝතකයා අඩයටි මත්තෙහි වැටුනු හෙයින් ශස්ත්‍රකුම්භයයි ඔහට නම්තැබූහ. එම සුළඟින් ගිරාපෝතකයෙක් වැටෙනුයේ ඒ ස්ථානයට යටසුළඟ තපස්වීවර යන්ගේ ආශ්‍රම පදයෙහි සඞ්ඛ්‍යානුෂ්ඨානය එලවනලද මල්සමූහ ඇති වැලිතලා වෙක්හි මල් මත්තෙහි වැටුනේය.

එතැන් වසන තාපසවරහු දක මල්රුසෙහිදී දුටු හෙයින් පුෂ්පක යයි නම් තුබූහ. ශස්ත්‍රකුම්භ නම් ගිරවා තෙමේ සොරුන් අතුරෙහි වැජඹෙන්නේය. පුෂ්පක නම් ගිරවා තෙම තාපසවරු ලඟ වැඩෙන්නේය. මෙසේ දෙදෙනා වැඩෙන කල්හි රාජ්‍යය හිමිවූ පඤ්චාල රජතෙම එක්දවසක් සර්වාලංකාරයෙන් සැරහුනේ එසේම අලංකෘතවූ රථවාහනයකට නැගී මහත්වූ පිරිවරින් මුවදඩ යනුයේ නුවරට නුදුරු තැන්හි සමූලඝ්‍යාසනපල්ලව පුෂ්පහාර හරිත තරුවන රඤ්ජිත වනප්‍රදේශයකට පැමිණ ඒ රජතෙම තමාගේ සේනාවට නියෝගකර නුයේ යමක්හු සමීපයෙන් මුවා ගියේවීනම් ඔහට දඬයයි කියා සමමතකොට තුමූත් රථයෙන් බැස කොලින් මුවා කොට ඉදිකරණ කොටුපෙනෙහි හිය දුනු පිටලාගෙණ වේගවත්ව සිටියේය. එකෙණෙහි මුවන් පන්වනු පිණිස නියුක්ත පුරුෂයන් විසින් කැලෑ එලවන කල්හි එක්වේනි මෘගයෙක් නැගී යන මග සැක බලනුයේ රජ්ජුරුවන් සිටි තෙනම මදක් මිනිසුන් තුරල් නියාව බලා ඒ ස්ථානයෙන්ම පවනට බඳු වේගයෙන් පැනගෙණ දිවූයේය. එකෙණෙහි

අමාත්‍යයෝ කවුරුන් ලඟින් මුවා පලාගියේදැයි විචාරන්නාහු රජ්ජුරුවන් ලඟිනැයි යනු අසා රජ්ජුරුවන් සමඟ වෙහෙසෙමින් කෙලියාහ. රජජුරුවෝද අභිමානයෙන් ඇමතියන්ගෙන් වෙහෙසුන් ඉවසිය නොහෙනුයේ දුන්ම මුවා අල්වාගෙණ එමි රථයට පැනනැගී වහා රථය පදුවයි රථාචාර්‍ය්‍යයාට නියෝග කෙරෙමින් ගොස් මුවා ගිය හසරට බටුයේය. වේගයෙන් යන්නාවූ රථය සේවකයෝ ලුහුබඳවාගන්ට අසමර්ථවූහ. රජ්ජුරුවෝද රථාචාර්‍ය්‍යයා දෙවෙනි කොට ඇතියේ මධ්‍යාහ්න කාලයෙහි දක්වා දිවදිව විඩාව මුවා නොදැක නැවත එනුයේ ඒ සොරුන් වසන්නාවූ ග්‍රාමයට බටුයේය. නුදුරුවූ ස්ථානයක සිත්කළුවූ කඳුරැලියක් දැක රථයෙන් බැස සන්දනකොට ගොඩනැගී සිටියේය.

ඉක්බිති රථාචාර්‍ය්‍යතෙම රථයෙහි අතුරණලද පලසගෙණ සිත්කළුවූ රුක්සෙවනෙක්හි අතුළේය. විඩාවූ රජ්ජුරුවෝත් එහි ගොස් සැතපුනේය. එකෙණෙහි රථාචාර්‍ය්‍යයාත් රජ්ජුරුවින් පය මැඩ උන්නේය. රජ්ජුරුවෝත් නිදා පිබිද මෙපරිද්දෙන් නිදන්නෝත් වෙති. පුබුදින්නෝත් වෙති. ඒ ගම්හි වසන්නාවූ සොරහුද රජ්ජුරුවන්ට ආරක්ෂා පිණිස වනය වටකොට රැකවල් ගත්හ. සොරුන්ගේ ගමෙහි වසන්නාවූ ශස්ත්‍රකුම්බ නම් ගිරාතෙම ගමින් නික්ම රජ්ජුරුවන් වැදහෙව නිදන්නාවූන් දැක සිතනුයේ මූන් නිදනුයැදී මරවාපියා මොහු පැළඳගත් ආභරණ ගෙන්වාගණිමියි සිතා පති කොළඹ නම් සොරහු බත්පිසන තෙනට ගොස්වැද පතිකොළඹය වහාවර එක්තරා පුරුෂයෙක් එක් රුකක්මුලක විඩාව නිදන්නේය. නැගෙන්නා අස්වාහනයකින් යුක්තවූ තෙමේ ලඳරු බාලය, බහා පලඳනාලද කුණ්ඩලාභරණ ඇත්තේය. ජාම්බෝනද සවර්ණයෙන් හා පද්මරාගමාණික්‍යයෙන් කරණලද බොහෝ පැළඳගත් තලල්පටක් මුදුන්පත් හිරුමෙන් බබලන්නේය. මේ තෙම මධ්‍යාහ්න කාලයෙහි රුක්සෙවනයක රථාචාර්‍ය්‍යයාහු දෙවෙනිකොට ඇතියේ වැදහොත්තේය. මේ අවසරයෙහි මොහු මරා පැලඳි ආභරණ ගලවාගම්හයි කියා මේ වේලාවට ඔහු වැදහොත් ස්ථානය මධ්‍යමරාත්‍රියෙහි සොරකම්කරණ වේලක් මෙන් ජන විවික්තව මරණට අවසර පෙණී තිබුයේය. එබැවින් නොපමාව ඔහු මරා පැලඳී ආභරණ ගලවාගෙණ එම්හයි කියා වේගයෙන් ඔහුම දුවන්නේය. විටෙප්ති පතිකොළඹ ලඟ දිවන්නේය. ඒ තෙමේත් ඔහු බස් අසා වැල්පලින් නික්ම ගිරවා කීතෙනට ගොස් බලනුයේ ඔහු රජ්ජුරුවන් නියාව දැක භයින් තැතිගෙණ කිමෙක්ද ශස්ත්‍රකුම්භයෙනි නොපි විචරුගී දෙඩව්ද මේ ලෝකයෙහි රජ්ජුරුවෝ නම් දිලියෙන ගිනිසේ සිටියයුත්තාහ. එබැවින් ලංවන්ට කාරණා නොවන්නේයයි කීයේය.

ඉක්බිති ගිරවාතෙම එසේකල සබඳ පතිකොළඹය සොරුන් බී ඉතිරි සුරාවෙක් ඇත්නම් අනුභවකොට මත්වපියා මහත්කොට ගජිනා කරන්නෙහි මාගේ මැණියන් කොළඅතුවසාගෙණ නග්නයෙන් ඉන්දදීත් සොරකම්කරන්ට වැලි නොපට කැත කරන්නේ නොවේදැයි කිපී දොඩුයේය. රජ්ජුරුවෝත් ඒ වේලාවට පිබිද මනුෂ්‍යභාෂාවෙන් කියන බස් අසා මේ ස්ථානය ඉතා භය සහිතයයි රථාචාර්‍ය්‍යයාහට කියනුයේ සබඳ රථාචාර්‍ය්‍ය දුන් නැගීසිටුව මෙතනින් යාදුතුවන්නේය. එබැවින් රථය යොදාලව. මේ ග්‍රාමයෙහි මාගේ සිත් නැලෙන්නේය. අනික් ආශ්‍රමයකට යම්හයි කීයේය. රථාචාර්‍ය්‍යතෙම වහා නැගීසිට රථය යොදා වැඩියමැනව දේවයන්වහන්ස අන්‍යස්ථානයකටයම්හයි කීහෙයින් එකල්හි ශස්ත්‍රකුම්භ නම් ගි රවාතෙම රථයට පැනනැගී යන්නාවූ රජ්ජුරුවන් දැක

නොඉවසනුයේ මේ ස්ථානයෙහි වසන්නාවූ සොරදෙටුවාතත් ඇතුළුවූ සොරහු කොයි පලාගියාහුදැයි ඔවුන් නුදුටු බව හේතුකොටගෙණ පඤ්චාල දේශවාසීවූ රජතෙම ගැලවී යන්නේය. කොල වහා තික්ම ඔහු වටකරවා අල්වයි දුනු අඩ යටි තෝමර ආදිය ගෙණ වහා මොහුගේ ජීවිතය විනාශ කරව නොහරුවයි මෙපරිද්දෙන් සොරුන්ට අඬගා විධානකෙරෙමින් තමා නුසුදුසුතෙන වැඩිගත් ගුණය ප්‍රකාශ කළේය. මෙසේ මොහු මොරගාමින් ඈත මෑත දිවෙමින් සිටියදී ඒ පර්වතයට යටසුලඟ තාපසවරු වසන්නාවූ ආශ්‍රමපදයට පැමිණියේය. ඒක්ෂණයට තපස්විවරයෝ පලාපල පිණිස වනයට ගියාහ. පුෂ්පක නම් ගිරවා, පමණක් ආශ්‍රම පදයෙහි උන්නේය. ඒ තෙම රජ්ජුරුවන් දැක පෙරගමන් කොට සන්තොෂයෙන් ආදර දක්වා පිළිසඳර කථාකරණුයේ මහරජ්ජුරුවෙනි මෙතනට ආ තොපගේ ඊම යහපත්වන්නේය. පැමිණියාවූ තෙපි ආගන්තුග යයි නොසිතව. තෙපි මේ ස්ථානයට නායකයෙමියි සිතව. මෙතනින් යමක් කැමතියා නම් ඒ කිවමැනවැයි, තවද රජ්ජුරුවන් වහන්ස මේ විලිකුණු තිඹිරිද පියල්ලද නොහොත් මොරද මධුරවූඵලද විලිසුණු එරමිණියද යන සියල්ලද දඹුඑල්බෑයට බඳුවූ රස ඇතියාහ. මෙයින් යහපත් ඵලාඵල අමුත්තක් නොසිතා ඇරගෙණ අනුභව කළමැනවැයි පටිසන්ථාර කෙළේය.

රජ්ජුරුවෝත් මොහු බස් අසා පැහැද මේ පක්ෂිරාජතෙම ඉතා යහපත් එකෙක විශෙෂයෙන් ධාර්මිකය. පලමු අප දුටු ගිරවාතෙම රූපයෙන් මොහු වැනියේ නුමුත් අප දැකලා මොහු කොටව මරව යානොදෙවයි කියමින් සිටියදී මෙතනට දුකසේ පලා ආමිහයි කීයේය. එබස් අසා පුෂ්පක නම් ගිරවාතෙම සබඳ මහරජ්ජුරුවෙනි, ඒ තොප දුටු ගිරවා නම් එකම මෑනියන් කුස හෙව එක පියාතන්ට දාව එක් රුක්සිදුරෙක්හි වාසයකළ අපි දෙදෙනමෝමය. සහෝදර මල්බෑයමෝවම්හ. එතකුදුවුවත් ස්ථානවශයෙන් වෙන්වූම්හ. තුමූ තමන් සත්තිකුම්භ නම් වෙති. ඒ තෙම චණ්ඩපරුෂවූ සොරුන් ලඟ වැඩි වඩිනය වූයේය. මම වනාහි තමින් පුෂ්පක නම්වීමි. කරුණාගුණයෙන් තෙත්වූ සිත් ඇති තාපසවරුන් කෙරෙහි වැඩිවඩිනයවීමි. ඒ ගිරවාතෝ අසත්පුරුෂයන් විසින් එක්ව වැඩුනු හෙයින් එබඳු ගුණ ඇතිවූයේය. මම වනාහි සත්පුරුෂයන් ලඟ වැඩුනු හෙයින් මෙබඳුවූ ගුණ ඇතිවීමි. ඒ සත්තිකුම්භ නම් ගිරවාතන් සොරහු සොරකමින් අනාචාරයෙන් තදපරුෂ ගුණයෙහි හික්මවූහ. මා වනාහි මේ තාපසවරහු ශීලාචාර ගුණයෙන් හික්මවූහ එබැවින් ස්ථාන වශයෙන් ගුණ වසඟවූම්හයි කීයේය.

සොරු ලඟ වැඩුනු ගිරවාතෙම නොයෙක් වධබන්ධන හා සොරසම් වංචා ප්‍රයෝග නොයෙක් සාහසික ක්‍රියාවන් ඉගෙණ එතැන්හි උන්නේය. මම වනාහි මෙතැන්හි සබඳ පියබස් කීම්ද සුචරිත ධර්මයෙහි හැසිරීම්ද මෛත්‍රී පූර්වාංගමව විසීම්ද සීලසංසමයද ඉන්ද්‍රිය දමනයද පැමිණි අමුත්තන්ට ඉඳිනා අසුන්දීමය පයට පැන්දීමය යන මේ සියල්ලෙන් හික්මවන ලදින් මේ තපස්වීන් කෙරෙහි වැඩිනිමියි කීයේයි. ඉක්බිති ඒ ගිරවාතෝතුමූ රජ්ජුරුවන්ට ධර්මදෙශනා කරණුවෝ පඤ්චාලදෙශයට නායකවූ රජ්ජුරුවෙනි, මේ ලෝකයෙහි සත්පුරුෂවූ හෝ අසත්පුරුෂවූ හෝ යම් සත්වයෙක් භජනය කරන්නේවීනම් ඒ මල්වූ ආචාරීන්ගේ ගුණයම ශිෂ්‍යය හට පැමිණෙන්නේය. එබැවින් ඒ සිල්වතුන් ගුණවතුන් කෙරෙහි වැඩියාවූ ගුණ ඇතිවෙති. දුශ්ශීලයන් කෙරෙහි වැඩියන් එබඳු දුශ්ශීල ගුණයම් පුරුදුකොට අයහට පිහිටුවන්නාහ තවද රජ්ජුරු

වෙති යම් බඳුවූ හික්මුනාවූ හෝ නොහික්මුනාවූ හෝ එකෙක්හු යමෙක් මිත්‍ර කොටගෙණ වෙසේද එයිත් එබඳුවූ ගුණයටම පැමිණෙනුයි, සත්පුරුෂයන් හා එක්වූයේ සත්පුරුෂ ගුණයෙන් ප්‍රකාශවන්නේය. අසත්පුරුෂයන් හා එක් වූයේ අකාරියෙහි ඇසිරීමෙන් අයසට පැමිණෙන්නේය. එතකුදුවූවත් සත් පුරුෂ ගුණ ඇත්තවුන් හා එක්වීමෙන් අසත්පුරුෂ ගුණය නොපැමිණෙන් නේය. නොහික්මුණු අසත්පුරුෂයන් හා එක්වූ පමණකින් සත්පුරුෂ ගුණ ඇති උත්තමතෙම තමා පළමු හික්ම සුශික්ෂිතවූ හෙයින් අසත්පුරුෂයන් විසින් පසුව එක්වූ පමණකින් අසත්පුරුෂවූ පවිටු තැනැත්තන්ගේ ගුණ නොගන්නේය. ඊට දෘෂ්ටාන්ත කවරේද? මැටිභාජනයෙහි ලනලද සුවඳමල් තෙම මැටි සුවඳ කරන්නේය. මැටි සුවඳක් නොකරන්නේය. එපරිද්දෙන් හික්මුණු සත්පුරුෂතෙම නොහික්මුණු අසත්පුරුෂයන් හා එක්වුනු පමණ කින් නපුරට නොයන්නේය. තවද රජ්ජුරුවෙනි මේ ලෝකයෙහි යම් යම් ගුණයක් සෙවුනා එකෙක් තමා සෙවුනාවූ සත්ත්වයන් එබඳු ගුණයට වන් නේය. ඒ කුමක් මෙන්දයි විෂපෙවූ හීදඬු මිශ්‍රවූ හීකට්ටුව තෙම විෂනොපෙවූ සෙසු ඊදඬු සම්පර්ක වශයෙන් විෂභාවයට පමුණුවන්නේය. එපරිද්දෙනි.

තවද රජ්ජුරුවෙනි, යම් සත්ත්වයෙක් කුසතණ අගෙකින් කුණුමසක් පිරිමැද්දේවී යම් ස්පර්ශ ලද්දාවූ තණත් අපවිත්‍රවන්නේය. පූතිමාංසතෙම කැලම කුණප වන්නේය. එපරිද්දෙන්ම අඥාන සත්ත්වයා හා එක්වූ තැනැත්තෝත් අඥානව අසත්පුරුෂ බවට පැමිණෙන්නේය එතෙමේත් කැලම් අසත්පුරුෂ යයි කියේය. තවද යම් සත්ත්වයෙක් තුවරලා කස්තුරි කපුරු ආදිවූ සුවඳ පාත්‍රයෙක්හි වැසූයේද ඒ සුගන්ධය හා ස්පර්ශලත් පමණකින් පාත්‍රය සුවඳ වන්නේය. ඒ තෙමේ සුවඳ බැවින් සුවඳ වන්නේය. එපරිද්දෙන්ම යම් ශිල්පවූ යම් ධීරප්‍රඥ කෙණෙකුන් හා එක්වීද ඒ තෙමේත් ප්‍රඥවත් වන්නේය. එසේ හෙයින් සත්පුරුෂයන් හා එක්වීම භජනය කිරීම උත්තමයයි කියති. තවද මත්තෙහි අනුශාසනාකරණ පුෂ්පකනම් ගිරවාතෙම රජ්ජුරුවෙනි, යම්සේ ඒ පත්‍රපුටයෙහිම සිට තමා සුගන්ධ භාවිතා කරන්නාසේ මෙන් සත්පුරුෂයන් හා එක්වීම භජනයකිරීම උත්තමයයි කීහ. ඔහු ගුණ තමා කෙරෙහි පුරුදුකිරීම් වශයෙන් සත්පුරුෂයන් සෙවිය යුතුය. අසත්පුරුෂයන් දුරු කටයුතුයයි මෙසේ පක්ෂවීමට කාරණා කිමෙක්ද? යතහොත් අසත්පුරුෂතෙම තමා හා එක්වූවත් නරකයට ගෙණයන්නේය. සත්පුරුෂතෙම තමා හා එක්වූවත් දිව්‍යලොකසම්පත්තියට පමුණුවන්නේය. එබැවින් සත්පුරුෂයන් සෙවියයුතු යයි මෙපරිද්දෙන් ධර්මදෙශනා කෙළේය. රජ්ජුරුවෝත් ඒ ගිරවාතන්ගේ ධර්ම දෙශනාවෙහි ප්‍රසන්නවූහ. ඒ කියමින් සිටි නොබෝකලකින් තාපසවරහුත් ඵලාඵල ගෙණ ආහ තමන්ගේ තපෝවනයට ආ රජ්ජුරුවෝද තාපසවරුන්ට වැඳ උන්ගේ ඉරියව්වෙහි පැහැද මාගේ නුවරට වැඩිය මැනවැයි තපස්වීන් වහන්සැයි ආරාධනාකොට සියනුවරට වැද අමාත්‍යමණ්ඩලයා මධ්‍යයෙහි ගිරවා තන්ගේ ගුණ කථනය කොට එකල්හි ගිරවානන් කෙරෙහි ගත් ස්නේහයෙන් තමන්ගේ රාජ්‍යයෙහි කිසි තැනකත් ගිරවෙකු මැරිය නොහැක්කැයි ගිරවුන්ට අභයදානය දෙවූහ. ඉක්බිති තාපසවරහුත් රජ්ජුරුවන්ගේ ආරාධනා නිසා ඒ නුවරටම ආහ. රජ්ජුරුවෝද තමන්ගේ උයනෙහි පන්සල්කරවාදී සිවුපස යෙන් උපස්ථානකොට ස්වර්ගපදප්‍රාප්තවූහ ඒ රජ්ජුරුවන්ගේ පුත්‍රයානෝද අනතුරුව රාජ්‍යාභිෂෙකයට පැමිණ ඒ තාපසවරුන්ට උපස්ථාන කෙළේය.

මෙපරිද්දෙන් ඒ රාජවංශයෙහි රජ සත් පරම්පරාවෙක මේ දන්වැට පැවැත් වූහ. මහාබොධිසත්ත්වයෝත් ඒ වනයෙහි වාසයකොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා ශාස්තෘවූ බුදුරජාතන් වහන්සේ මේ ජාතක ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි පෙරත් දෙවදත්ත ස්ථවිරතෙම පාපිෂ්ටව එසේම පව්ටුවූ පිරිවර ඇතිවූයේවේදැයි වදාරා මේ ජාතකය පූර්වාපරසන්ධි ගලපා නිමවා වදාළසේක. එසමයෙහි සත්තිකුම්භ නම් ගිරවාතෙම දෙවදත්තස්ථවිරය, සොරහු දූත් මොහුට පිරිවර උපන් පමිත්වූහ. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරය. එකල්හි තාපසවරහු නම් දූත් මේ බුදුපිරිස් වන්නාහ. එකල්හි පුෂ්පක නම් ගිරවාතෙම දූත් මෙකල්හි බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

496
හල්ලාටිය ජාතකය

තවද එක්සමයෙක්හි සකල ලොක සත් නිවාස නෙක සුරාසුර චක්‍රමස්තකොත්තුංග පද්මායමාන මානනීය පද්මා ඇති අප බුද්ධරජාතන්වහන්සේ තදුනුයන් වැනි ජෙතවනාරාමයෙහි ආර්ය බ්‍රහ්මවිහරණයෙන් දවස් යවමින් වැඩවසනසේක් මේ චිත්‍රලලාස ජාතකය හල්ලාටිය ජාතකය මල්ලිකාදේවීන් අරභයා වදාළසේකි.

මල්ලිකාදේවීන්ට වනාහි එක්දවසක් රජ්ජුරුවන් හා සමග ශාසනයෙහි පැවති පොරක් නිසා ඔබරයක් ද්වෙශය රජ්ජුරුවෝත් කිපී නාවත ඒ දේවීන් හා තොලංවූය. එකෙණෙහි මල්ලිකාදේවීතුමූ රජ්ජුරුවන් මා කෙරෙහි කිපී නියාව බුදුහු නොදන්නාසේකැයි සිතූහ. මුන් සිතූ සිත දන්නා බුදුරජාතන් වහන්සේ දෙවෙනි දවස් භික්ෂුසඞ්ඝයා වහන්සේ විසින් පිරිවරණ ලදුව මහත්වූ බුදුසිරින් දිලියෙමින් පිඩුසිගා වන්සේක. ක්‍රමයෙන් රජ්ජුරුවන්ගේ මාලිගා දොරකඩට වන්සේක. රජ්ජුරුවෝත් ඉදිරියට අවුත් පාත්‍රය ගෙණ ශාස්තෘවූ ත්‍රිලෝගුරු බුදුරජාතන්වහන්සේ ප්‍රාසාදයේ මතුමහල්තලයට වඩාගෙණගොස් සිංහාසන මස්තකයෙහි වඩාහිඳුවා භික්ෂූන්වහන්සේත් පිළිවෙළින් වඩාහිඳුවා දක්ෂිණොදකය දී මධුරවූ අන්නපානයන් වළඳවා භක්තකෘත්‍යාවසානයෙහි රජ්ජුරුවෝත් එකත්පස්ව උන්නාහ එකෙණෙහි බුදුහු කිමෙක්ද? මහරජ මල්ලිකා දේවීන් නුදුටුවෝවනැයි වදාරා ස්වාමීනි ඕතොමෝ තමාගේ ඉසුරුමදෙන් මත්ව ඇවිදිනීයයි රජ්ජුරුවන් කීකල්හි කිමෙක්ද මහරජ තෙපි පෙර කිඳුරු යෝනියෙහි ඉපද පවා එක්දවසක් කින්නරාඞ්ගනාවගෙන් වෙන්ව විඳි විරහදුක් සිතමින් සත්සියයක් හවුරුදු හඬා වැලපී ඇද්දෙනී වේදැයි වදාරා ඒ ඒ රජ්ජුරුවන් විසිනුත් ස්වාමීනි බුදුරජාතන් වහන්ස පෙර මා කිඳුරුව ඉපද එක රැයක්වූ වියෝදුක සිනා ඇඹූ පරිදි කෙසේදැයි වදාළොත් යහපතැයි ආරාධිතවූසේක් ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේදැයි යත හොත් ;

යටගිය දවස බරණැස් නුවර හල්ලාටිය නම් රජෙක් දසරාජ දහමින් රජකරණුයේ එක්දවසක වනයෙහි ඇවිද උහුපාලහු මෘගමාංශය හා මී අනුභව කොට ඇවිදිම්යි යන සිතින් සනිටුහන් ඇතියේ රාජ්‍යය අමාත්‍යයන්ට පාවාදී

පඤ්චායුධ සන්නද්ධව ඉතා තික්මුණු කිණබල්ලන් විසින් පිරිවරණ ලදුයේ නුවරින් නික්ම ක්‍රමයෙන් හිමාලයවනයට වැද හිමවතින් වැටුනු ගංගා අනුව උඩුගංබලා යනුයේ යානොහැකි දුර්ගස්ථානයෙක්හිදී එම ගඟට වැටීහුනු කුඩාගඟක් දැක ඒ අනුසාරයෙන් ගංවැල්ලෙහි ගොස් මුවන් හා ඌරන් මරාගෙණ අඟුරු පැලහු මස් අනුභවකෙරෙමින් උස්ව තිබෙන රමණීයවූ වන හිසකට වැද ඒ ඒ දිගින් වැටෙන ගඟුල් ඇලි හා ගිරිකුලි සියන් බල බලා විස්මයපත්ව සිටියේය. ඒ සිත්කළුවූ ගඟ නොමෝද වතුර ආකල තනමත්තු පමණ දිය ගලා යත්තේය. සෙසු කල දන පමණ දිය යත්තේය. අනෙකප්‍රකාරවූ මස් කැලන් හා ඉදිබුවන් ආදී ජලතල සත්ත්වයන් හා හංස චක්‍රවාකාදී පක්ෂිහුත් සැරහෙත්නාහ.

නැවත ඉඳුනිල්වූ දිය කෙළවර රිදීපට හැඳුලුවාක් මෙන් සුදු වැලිතලාවෝ දෙපස වෙරජනාහ. මේ ගඟ දෙතෙරෙහි මල්බරින් පලබරින් නැමී සිටිනා අතුපතර අනෙකවිධවූ තුරු සමූහයෝ දෙවියන් හා වනදෙවීඳුන් මනනෙත් පොළඹමින් සැදී සිටිනාහ. ඒ මල්මුවරද රුස්බී මත්වූ බමරගණද සුපක් මීඅඹ තුඩුලා මත්ව කෙළිනා කොවුල් ගණ නොයෙක් පුෂ්පරසයෙන් හා ඵලරසයෙන් මත්ව රැවූ පිළිරැවූදෙමින් තුරුහිසට හඬාබස්නා ජීවංජීවක සැළලිහිණි ගිරා බොකල යනාදී පක්ෂීන්ගෙන් ගැවසුනේය. මධ්‍යාහ්න කාලයෙහි තුරු සෙවනැලි යට වැලිතලායෙහි ලැගුම්ගෙණ සිටිනා නොයෙක් මෘගජාතීන්ගෙන් සිත්කලුය. මෙසේ කාමදේවයාහට සරහනලද ආපන භූමියක් වැනිවූ හේමවත නම් ගංතෙරෙහි කිඳුරෝ දෙන්නෙක් ඔවුනොවුන් වැළඳ සිඹ සනහා අනෙකප්‍රකාර විලාප කියා හඬන්නාහ. වලපිනාහ. ඒ කෙණෙහි ඒ හල්ලාටික රජ්ජුරුවෝත් හේමවත නම් ගඟ ඔස්සෙහි ගදමහත් පවුවට නැගෙණුයේ ඒ වැලප සිඹ සනහා හඬන කිඳුරා හා කිඳුරාඞ්ගනා දැක මේ කින්නර යුගලය මෙපරිද්දෙන් හඬනුයේ කවර කාරණයෙක්දැයි පිළිවිසිමියි සිතා තමා හා කැටිව එන බල්ලන් මුණබලා මදක් අසුරුසන්ලූයේය. එකෙණෙහි සුශික්ෂිතවූ හෙයින්ම වැඩිගිය බල්ලෝ ඒ සලකුණෙන් ලැගහොත්නාහුය. ඒ රජතෙම ඔවුනොවුන් නිසොල්මන්ව ලීගත් නියාව දැන දුන්න හා ඊකට්ටුවද සෙසු ආයුධයන්ද සිටියාවූ රුකමුල වතුරුවා සෙමෙන් සෙමෙන් පියවර තබමින් ඒ කින්නර මිථුනය සමීපයට ගොස් කුමක්නිසා තොපි ඔවුනොවුන් වැළඳගෙණ ඇඬූදැයි විචාරණ හල්ලාටිය රජතෙම කියනුයේ කිඳුරෙනි මේ හේමවත නම්වූ ගංගාතීරයෙහි මෙසේවූ වසන්ත කාලයෙහි මෙබඳු රමණීයවූ වැලිතලාවෙහි මෙබඳු මල් පල්ලෙන් සැදුනු වනහිස්හි තොපි දෙදෙනම නොසතුටු සිත් ඇතියාවූ ඔවුනොවුන් වැළඳගෙණ ඉලව්ගත්තවුන් මෙන් විටෙක හඬව, විටෙක කෙළිමින් සෙමින් හිඳුවා මේ කවර කාරණයෙක්දැයි විචාරමි.

තවද කිඳුරෙනි, තොප දෙදෙනම යොවුන්පත් සත්‍රීන්ගේ රූපශ්‍රී පරදවන විලස් ඇතියාව මෙබඳු රූපශ්‍රීන් ඇති මිනිසුන්ගෙන් යම්තම් හෙදයක් ඇති තොපට මිනිස් ලොව සත්ත්වයෝ කෙසේ බැවහාර කෙරෙද්දැයි විචාලේයි.

රජ්ජුරුවන්ගේ බස් අසා කිඳුරුතෙම චකිතව මුවෙන් නොබැණ උන්නේයි. කින්නරාඞ්ගනා තොමෝ රජ්ජුරුවන් හා සමග කථාකරන්නී රජ්ජුරුවෙනි, සුපුෂ්පිත මලින් ගැවසීගත් මේ මල්‍යවත නම් පර්වතයද පඬරක නම් පර්වතයද චිත්‍රකූට නම් පර්වතයද සිහිල් මධුර පැන් හඬා බස්නා දෙළින් හා නදීආදීන්ද යන මේ ස්ථානයෙන් අසවල් තැනෙක සැප නොවිඳුම්හයි

යන තැනෙක් නැත්තේය. අප මිනිසුන් බඳුවූ රූ ඇති පමණක් විනා තිරිසන්ව උපන් කිඳුරෝයයි මිනිස් ලොව සත්ත්වයෝ කියත්නාහයි කීව.

ඉක්බිති භල්ලාටිය නම් රජතෙම පිළිවදන් දෙනුයේ කිම් පුරුෂයෙනි, තෙපි දෙදෙන බොහෝ අවුලා මූලාවෙක ගැසී දුක්විඳපු කෙණෙකුන්මෙන් විටෙක කිඳුරුතෙම කින්නරාව වැලඳගෙණ හඬන්නේයයි සිසිවිටෙක කින්නරාඞ්ගනා තොම කිඳුරා වැලඳගෙණ හඬන්නීයයි මෙපරිද්දෙන් ඒ ක්‍ෂණ ක්‍ෂණයෙහි වැලපුව ශෝක කරව කිමෙක්ද විඳිදුක් සිතා ඉදිරියේ වන දුක් සිතා හඬව්දැයි විචාළේය.

එකෙණෙහි කින්නරාඞ්ගනා තොම රජ්ජුරුවෙනි, තොප කී පරිද්දෙන්ම විඳිදුක් සිතායයි කියාත් කියහැක්කේය. ඉදිරියෙහි එසේවූ දුකක් පැමිණියේ නම් නපුරැයි යන සිතින් නැවෙන හෙයින් ඉදිරියේ සිතා අඬතියි කිය හැක්කැයි කාරණා කියන්නී, සබඳ පුරුෂයානෙනි, පෙර එක්දවසෙක රාත්‍රියෙහි ඔවුනොවුන් නොකමැතිකරවාම ක්‍ෂණ ක්‍ෂණයෙහි දුරදකිමින් ඔවුනොවුන් සිහින් සලකමින් වියොවින් රැයක් සැලසී ගියේනම් කෙසේ ඒ දුක් ඉවසමෝදැයි ඉදිරි සිතාත් අඬන්නම්හ. එබැවින් විඳිදුක් සිතාත් ඉදිරියෙහි දුකෙක් වේදෝහෝයි යන භයින් හඬම්හයි කියා ශාඛාග්‍රයෙහි උන්නීය. නැවත ඊට කාරණා පිළිවිස්නා රජතෙම සබඳ කිම් පුරුෂයානෙනි, යම් එක රාත්‍රියෙහි වියෝවට පැමිණ නැවෙමින් එතැන්පටන් නැසීගිය සම්පතට ශෝක කරණ ලද්දක් මෙන්ද දෙමව්පියන් මළහයි ශෝකගෙණ හඬනකලක් පරිද්දෙන් ඉතා බැගෑපත්ව තෙපි දෙදෙනම හඬව. මනුෂ්‍යයන්ට බඳු ආකාර ඇති කිඳුරනි, ඒ එක්රාත්‍රියෙහි වියෝවූයේ කුමක් නිසාදැයි කාරණා විචාළේය.

ඉක්බිති වියෝවූ පරිදි කියන්නාවූ කින්නරාඞ්ගනා තොම එම්බා රජ්ජුරුවෙනි, මේ වේගවූ ජලප්‍රවාහ ඇති දෙතෙර සිට නොයෙක් තුරුපෙළ ඇති යම් මේ ගඞ්ගාවක් තෙපි දකුද මෙසේවූ වර්‍ෂාකාලයෙහි රම්‍යවූ පර්වතස්ථලයෙහි සිරිවිඳ සවස්වේලෙහි ගඟින් එතරව මාගේ වල්ලභතෙම මා පසුපස්සේ එති. සිතා එකවර ගියේය. මම වනාහි මොවුන් එතරවූ නියාව නොදැන මල්යහන් අතුට සැතපී සැපවිඳිනා පිණිස පිපිගියාවූ අඟුණ මල්ද පිපී කැණිහිල්මල්ද රත්වන් හල්මලින්ද නිති ඉද්දමල්ද නොහොත් යොහොඹුමල්ද කඩන්ට වන්මි. කුමක්නිසාද යතහොත් මාගේ වල්ලභයාත් මල්පැලඳ මලින් සැරහෙන්නේය. මමත් මල්පැලඳ මල්රොන් පියයුරෙහි තවරා මොවුන්ට ලැගෙමි. මල් බඳිනා නිසා පසුවීමි. තවද මේ අකාල මේඝය නිසා මේ ඇසිල්ලෙහි වතුර එයි යන්නාක් නොදැනුනු හෙයින් මාගේ වල්ලභයාත් මල්සුවඳින් සැරහී සැප විඳුම්හයි යන ලෝභයෙන් මේ වනහිස පිපුනු රත්කරවූ මල්ද එරහැන්ද හෙවත් ඇසල මල්ද නිකමල්ද පලොල් මල්ද කඩනුයෙන් මඳක් පමාවීමි.

තවද රජ්ජුරුවෙනි, එම දවස් සුපිපි මල්ගස්වලින් නොමඳකොට මල් බිඳිනෙම් මෙසින් මල්වඩම් ගොතා මාගේ වල්ලභයාත් පලඳවා මමත් පැලඳ මල්යහනෙහි සැතපී මේ මලින් අඩමුකුලු මල් ගෙණ මුතුහර ලෙසින් අමුනා මාගේ සවාමිහුත් පලඳවා මමත් මුතුහර ලෙසින් පලඳිමි. ඉදිරියෙහි විඳිනා සැප පිණිස ලෝභයෙන් මල්බිඳින්ට පසුවීමි එබැවින් රජ්ජුරුවෙනි, අප සැරසෙන්නාවූ පුෂ්පාභරණයට කිනිහිරිමල් රත්රන් වියලලා පලුදල අක්ම පිසුම්රාමිණි විය. නිකමල් මට මුක්තාඵල විය. මෙපරිද්දෙන් පුෂ්පාභරණයෙන් සැරහී සැප විඳිම්හ. මම වනාහි කලුවැල් සඳුන්හර මේ ගඟ හස්න ගලතෙලෙහි ගඟා

එකෙණෙහි කාමයෙන් මත්වූ මාගේ වල්ලභයාත් සියලඟ සඳුන් තවරා සුරක් තවූ අඞ්ගප්‍රත්‍යඞ්ග ඇතිව හිඳිතේය. මමත් පියවුරු සඟලෙහි රත්සඳුන් තවරා මලින් සැරහී රජසිරි හා සමාන මොහු අභිරමණය කෙරෙමින් මේ විඳ ආ සැප ලෙසට එදවසුත් දවස්හරණ ලෙසට මල් සුවඳ ආදිය නිසා මාගේ ස්වාමීහු එතරවීයදී මම් පමාවීමි. එදතුරෙහි පර්වත දෙක අතුරෙන් හුනුමෙවන තම් නදී යෙහිදී වත වතුරෙන් හත්වැල්ලෙහි කැටිකොට තුබූ සුපිපි කිණිහිරි මල්ද සලල මල්ද පැහැරගෙණ යෙමින් ගඟ දෙතෙර ගලාගෙණ තික්මුනේය.

එකෙණෙහි ඇසිල්ලකින් කින්තරාඞ්ගනාතොම සබඳ පුත්‍රය, අපට අවුරුදු දසෙක් පරමායුස ඇත්තේය. මෙදතුරෙහි කිසි අනතරායකුත් නැත්තේය. කිසි රෝගයකුත් නැත්තේය මේ අවුරුදු දස මුලුල්ලෙහි දුකෙක් ඇති නුමුත් යත්තමෙක් වත්නේය. බොහෝසේම සැප ඇත්තේය. එබැවින් රාගයෙහි ඇලුම්තබා පියත පමණක්විනා සිතකින් ඔවුනොවුන් කෙරෙහි වෙන්වන්නේ නැත. එසේහෙයින් තිරිසනුන් කෙරෙන් අපසේම සැපවිඳිනාසේ දත්නේ නැත. තමත් විඳිනා සැප කියා රජ්ජුරුවන් කාමබන්ධනයෙන් උමතු කළාහ.

එබස් අසා භල්ලාටිය නම් රජතෙම මොහු තිරිසන්ව එකදවසක වියෝග යෙන්ම තැවී සත්සියයක් හවුරුදු හඬාවැලප ඇවිද්දේය. මම වනාහි තුන් සියයක් හවුරුදු කසීදේශයට නායකව රාජ්‍යශ්‍රී විඳිමින් ඒ ඒ සැපත් හැරපිය, නිෂ්ප්‍රයෝජනව වනයෙහි ඇවිදිමින් සිටියෙමි. මේ මා කරන්නේ කටයුත්තෙක් නොවෙයි කියා එයින් වැලක බරණැස්නුවරට අවුදින් පෙර පරිද්දෙන් රජ ඉසුරු විඳිමින් සිට රජ්ජුරුවන්වහන්සේ හිමවත් වෙතෙහි තුඹවහන්සේ දුටු ආශ්චර්‍ය්‍ය අමුතු කිමෙක්දැයි විචාළ අමාත්‍යයන්ට මේ කින්නර යුගලයාගේ ස්වරූප ආඥානාහෙයින් කියා එතැන්පටන් දනාදී පින්කම් කෙරෙමින් රාජ්‍යශ්‍රී අනුභව කෙළේය

මෙසේ පූර්වකථා දෘෂ්ටාන්තකොට දක්වා අනුශාසනාකරණ බුදුරජාතන් වහන්සේ කොසොල් රජ්ජුරුවනි, මේ තිරිසනුන්ගේ පවා ඔවුනොවුන් කෙරෙහි ඇති රාගය අසා දූත සමඟ සතුටුව කලහ නොකරව යම්සේ කිඳුරෝ තමන්ගේ අප්‍රමාදවීමෙන් සන්තොෂයට පැමිණෙද්ද එපරිද්දෙන් තෙපි හැම නොතැවෙව, සෝකයට නොපැමිණේවයි වදාළසේක

මල්ලිකාදේවී බුදුරජාතන්වහන්සේගේ දේශනාව අසා හුනස්නෙන් නැඟී දෙහොත් මුදුනෙහි බැඳ දසබලධාරීවූ බුදුරජාතන්වහන්සේට සතුතිකරන්නී බුදුරජාතන්වහන්සේ විසින් අනේකප්‍රකාරයෙන් දෙසනලද අර්ථ ඇති දේශනාව ප්‍රසන්නවූ සිතින් අසම්හ. මේ මධුරවූ ධර්මදේශනාව ඇසීමෙන් සිත දුක් නිවී ගියේය කන් ලැබීමේ ඵල ලබනලද සත්වයන්ට මෙලොවින් සැප ඵලවන්නේය බුදුරජාතන්වහන්ස බොහෝ කාලයක් ජීවත්වුව මැනවැයි සතුති කළාය කොසොල් රජජුරුවෝත් එතැන්පටන් මල්ලිකා දේවීනට සතුටුව දවස් අළුවාහ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාතන්වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදරා පූර්වාපරසන්ධි ගලපා මේ භල්ලාටිය ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කිම්පුරුෂයා නම් දූත් මේ කොසොල් රජ්ජුරුවෝය. එකල්හි කින්නරාඞ්ගනා නම් දූන් මේ මල්ලිකාදේවීය. එසමයෙහි භල්ලාටිය රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

497
සොමනස්ස ජාතකය

තවද එක්සමයෙක්හි සතරාමර තයන රසායන කමනීයානතන ශරීර කානතියෙන් මුළුලොව බබුළුවා දහම්රසයෙන් ලොව උතුරුවන තිලෝගුරු බුදුරජානන්වහන්සේ මේ සොම්නස් උපදවන සෝමනස්ස ජාතකය බහුවිධ තපොධනාධාර රුචිර තරුවරාඩ්යරාම ජේතවනාරාමයෙහි චතුර්විධ ඊර්යා බ්‍රහ්ම විහරණයෙන් දවස් යවනසේක් දෙව්දත් මහතෙරුන්වහන්සේ විසින් තමන්වහන්සේට වධයට කරණලද උත්සාහයක් අරභයා වදාළසේක.

එක් දවසක් ශාරිපුත්‍රස්ථවිර ප්‍රමුඛ භික්ෂූහු ධම්සභා මණ්ඩපයෙහි රැස්ව මේ දෙව්දත් තෙරුන්ගේ නුගුණ කිය කියා උන්සේක. බුදුරජානන්වහන්සේද තුන්තරා ගමනින් එක්තරා ගමනකින් ඒ ස්ථානයට වැඩ මහණෙනි, කවර කථාවකින් යුක්තව උනුදුයි විචාරා මෙබඳු කථාවක් කිය කියා උනුම්හයි කීකල්හි ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මහණෙනි, මේ දෙවදත්ත ස්ථවිරතෙම දන් මතු මට වධයට උත්සාහ කෙළෙ නොවෙයි. පූර්වයෙහිත් වධයට උත්සාහ කළෝම වේදැයි වදාරණ බසට අනතුරුව ඒ භික්ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේ ද? යත්,

යටගිය දවස කුරුරට උත්තර පඤ්චාල නුවර රේණුක නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි එසමයෙහි ඒ මහාකව්තවූ මහානුභාව සම්පන්න තාපසකෙණෙක් පන්සියයක් පමණ තාපසවරුන් පිරිවරා හිමාලය වනයෙහි වසනුයේ ලුණුඇඹුල් සෙවුනා පිණිස පන්සියයක් තාපසවරුන් හා සමග මනුෂ්‍යවාසයට බැස ගම් නියම්ගම් රාජධානියෙහි සැරිසරා ඇවිදිනේ උත්තර පඤ්චාල නම් නුවරට පැමිණ රජ්ජුරුවන්ගේ උයනෙහි සැතපී දෙවෙනි දවස් උදෑසන තවුස්ගණයා හා සමග පිඩු පිණිස හැසිරෙණුයේ රජගෙයි වාසලට පැමිණියේය. රජ්ජුරුවෝ තාපසවරුන් දැක ඔවුන්ගේ ඊර්යාපථයෙහි පැහැද අලඞ්කෘත කොට සරහනලද තුන්මහල් තලයට මේ තාපසවරුන් වඩාගෙණ ගොස් මධුරාන්නපාන වළඳවා ස්වාමීනී මහා රක්ෂිත තාපසයන්වහන්ස, මේ වර්ෂා සාරමාසය මා කෙරෙහි අනුග්‍රහයෙන් මේ උයනෙහි වාසය කොට වදාළ මැනවැයි ආරාධනා කොට ඔවුන් හා සමග උයනට ගොස් පන්සල් කරවාදී ශ්‍රමණ පරිෂ්කාරයද දී සියලු සංවිධානකොට දී නුවරට වන්නේය. එතැන්පටන් ඒ තාපසවරනු දවස දවස රජගෙට අවුදින් වළඳන්නාහුය.

මෙපරිද්දෙන් එහි වැස වර්ෂා කාලය ඉකුත්වූ කල්හි මහා රක්ෂිත නම් තාපසතෙම මේ දවසට හිමාලය වනය රමණීයවූ මධුර ඵලාඵල හා ඉතා සිහිල් තුරුසෙවනලු හා පිරිසුදුවූ වැලිතලා හා මනාවූ දෙළ කඳුරැලි ආදී ජලධාරාදී මෙකී සියල්ල හා ඒ ඒ ස්ථානයෙහි සුලභව ඇත්තේය. එවෙනි හිමවත් පෙදෙසට යම්හයි රජ්ජුරුවන්ට මෙපවත් කියා ඔවුන් විසින් කරණලද සත්කාර සම්මාන ඇතිව ඒ ස්ථානයෙන් නික්ම කාන්තාර මාර්ගය ගෙවා හිමවනට අභිමුඛව යෙමින් දවසෙක අතරමගදී මධ්‍යාහ්නවේලෙහි මගින් ඉවත්ව එක් ඝන ඡායා ඇති රුකක් මුල සුවපහස් ඇති ආස්ථරණය මතුයෙහි තාපස

වරුන් සමග උන්නේය. එකල්හි සෙසු තපස්වරු කථාවක් උපදවන්නාහු අපට මෙතෙක් දවස් උපස්ථාන කළ රජතෙමේ බොහෝ දවසක් ප්‍රාර්ථනා කොටත් වංශය රැකලන්ට නිසි දරුකෙණෙකුන් නොලදුයේය. ඉදින් දරුකෙණෙකුත් ඇත්තේ නම් ප්‍රවේණිය නොසිඳ පවත්නේය යන බසින් සතුති කළහ. රක්ෂිත තාපසයෝද මොවුන් හැමගේ බස් අසා මේ රජහට දරුකෙණෙක් ඉදිරියේ උපදිද්දෝහෝයි විමසනුයේ මතු දරුකෙණෙක් ඉදිරියේ උපදිනාහයි දැන මෙසේ කීයේය. එම්බා තාපසවරුනි, අමුත්තක් නොසිතව අද දවස් පහන්වන වේලාවට එක් දිව්‍යපුත්‍රයෙක් චුතව ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසව කුස පිළිසිඳගන්නේයයි කීයේය.

එබස් අසා එක් සොර තාපසයෙක් මෙලොව අනුන් වලහා කන උපායම සිතනුයේ දැන් වනාහි මේ රජකම් කෙරෙමියි සිතා සෙසු තාපසවරුන් පලායනනෙක් සොරලෙඩ ගසා වැදහෙව නැගී සිටුව යම්හයි කීකල්හි නැගීසිටිය නොහෙම් ආයාස බලවත්තැයි කීයේය. මහාරක්ෂිත තාපසයෝද මොහු රාජගුරුකම් කරම්හයි යන ලෝභයෙන් කළ වඤ්චානියාව දිවසින් පරීක්ෂාකොට ඒ දෙකම නොකියා යම් දවසෙක ආයේ එවුනම් එද පලායවයි කියා සෙසු තපස්විවරයනුත් ගෙණ හිමාලය වනයට ගියේය. ව්‍යක්ත වූ සොරාතෝද ඔවුන්හැම පලාගිය කල්හි නැගීසිට වේගයෙන් ආපස්සෙහි කතර හෙවා නුවරට අවුත් වාසල්දොර සිට මහාරක්ෂිත තාපසයන්ගේ අතවැසි තාපසකෙණෙක් ආහයි කියා යවා රජ්ජුරුවන් විසින් වහා එන්නේයයි කැඳවනුලදුව ප්‍රාසාදයේ මතුමහල් තලයට නැගී පණවනලද ආසනයේ උන්නේය. රජ්ජුරුවෝද ඒ තවුසානන් වැඳ එකත්පස්ව හුන්නේය. තාපසවරුන්ගේ සුවදුක් පිළිවිස ඉක්බිති නුඹවහන්සේ ආපස්සේ වහා පලාආයේ කුමණ කාරණයෙක්දැයි විචාරා එසේය මහරජ්ජුරුවෙනි තාපසවරහු සාපව උන්නාහුය. මම මීට පලමු කිසි සවරූපයකුත් නොලදුයෙමි, අතරමගදී එක් දවසක් මේ රජ්ජුරුවන්ගේ ප්‍රජාපාලනය කරණ දරුකෙණෙකුන් නැතියේයි, තාපසවරුන් සමග කථාකරණ බස් ඇසීමි, මම එපවත් අසා රජ්ජුරුවන්ට දරුකෙණෙක් උපදිද්දෝහෝයි නූපද්දෝහෝයි දිවසින් බලනුයෙම් මහත්වූ සෘද්ධි ඇති දිව්‍යපුත්‍රයක්හු දෙව්ලොවින් චුතව තොපගේ අගමෙහෙසුන් සුධර්මා නම් බිසවුන් කුස පිළිසිඳ ගන්නේයි දැක මෙපවත් නොදැන දරුගැබ නසාපු නම් නපුරැයි සිතා එපවත් තොපට කියන පිණිස ආමියි ඉදින් ආකාරිය සිඩ විය, යම්හ මහරජ්ජුරුවෙනි කීහ.

එකෙණෙහි මහරජ්ජුරුවෝ තාපසයන්වහන්ස, ආපස්සෙහි මෙතෙක් තැන් මා කෙරෙහි කරුණාවෙන් වැඩියේ වී නම් තමන් මා කෙරෙහි කරුණාවෙන් යන්ට බැරිදැයි කියා තුටුපහටු සිතින් ඒ ව්‍යක්තවූ තවුසානන් උයනට කැඳවාගෙණගොස් වසන පන්සල ශ්‍රමණපරිෂ්කාරාදිය සලසාදුන්නේය එතැන් පටන් තාපසතෙම දවස්පතා රජගෙට අවුත් රාජභෝජනය අනුභවකොට වාසය කරන්නේය. මේතෙම දිව්‍ය චක්ෂු තාපසයෝයයි මේ නමින් ප්‍රසිද්ධවිය.

එසමයෙහි පුරණලද පාරමිතා ඇති මහබෝසත්තෙම තාවතිංස භවනයෙන් චුතව අවුත් ඒ සුධර්මා නම් බිසවුන් කුස පිළිසිඳ ගත්තේය. මොහු දසඑකඩමසකින් මවුකුසින් බිහිවූයේය, සෝමහට නම් තබන්නාහු දෙමව්පියෝ සෝමනස්ස කුමාරයෝයයි නම් තැබූහ. මේතෙම කුමාරපිරිවරින් වඩනේය. ඒ රාජගුරුකම් කරණ කුහක තාපසයෝ තමන් වසන උයනෙහි එක්පෙදෙසෙක්හි

අනෙකප්‍රකාරවූ තම්පලා වම්බටු ආදියද ලීමැකරල් ලබු පුහුල් කරවිල ආදී වැල් දූසි මාළුවට තිසිවූ සියල්ලක් ඇතිකොට පලාකොළ ආදීවූ දෙය විකුණන්නවුන් අතට දී විකුණවා සම්පත් කැටිකරන්නේය. ක්‍රමයෙන් බෝධිසත්ත්වයන් සත් හැවිරිදි කල්හි පසල්දනව් ක්ෂොභයෙක්විය. එසඳ රජතෙම තමින් දිව්‍යචක්‍ෂු තාපසයන්ට කුමාරයන් පිරිවිස්නා පරිද්දෙන් පාවාදී පසල් දනව් වැසි සෙමෙහි තබන ලෙස ගියේය. ඉක්බිති එක්දවසක් ඒ සොමනස්ස නම් රාජකුමාරතෙම තාපසයන් දකිමියි කියා ඔහු වසන්නාවූ උයනට ගොස් ඒ තවුසානෝ එක් කාසාය වස්ත්‍රයක් හැඳගෙණ එක් කාසායයක් ගැටවටු කවාගෙණ ජටාව බැඳ ගෙණ දැතින් කළ දෙකක් හැරගෙණ තමාගේ එලවලු මලුව මත්තෙහි දුවතලද රිවිනි ආදියට පැන්වත්කරන්නවුන් දූක මේ සොර ජටාධරතෙම තමාගේ මහණදම් නොකොට පලා විකුට සම්පත් උපයන නිසා රිවිනි ආදිය ඇතිකරත් තේයයි කියා මොහු දුර දූකම ඇයි කුමක් කෙරෙයිද පලාකොළ ගොයියානති කියා වෙහෙසා ඔහු ලජ්ජා කරවා නොවැඳම නික්මුනේය.

එවිට කූට ජටිලතෙම සිතනුයේ මේ කුමාරතෙම මේ අවස්ථාවෙහිම මෙබඳුවූ ගුණ ඇතියේය. මඳක් වැඩිවයසට පැමිණියේ නම් කුමකින් කුමක් කරණ බවත් නොදනෙයි දූන්ම මොහු නසාපිය යුතුයයි සිතා රජ්ජුරුවන් පසල්දනව්ව සන්හිඳුවා නුවරට වඩනාකල තමාගේ ඉඳිනා ගල්පෝරුව ඉවත පෙරලා පැන්කළයත් කොතලයත් සක්මන්මළුවෙහි බිම ගසා බිඳ පන්සලෙහි තණ පරඬලාත් විසුරුවා කුමාරයන්ගෙන් ගහටවූ බඳුකොට සියලඟ තෙල් ගල්වාගෙණ පන්සලට වැද ඉසවසා පොරවාගෙණ මහත්වූ දුකට පැමිණියා, කොට හඟවා වැදහොත්තේය. රජ්ජුරුවෝ නුවර පැදකුණුකොට රජගෙට නොගොසින්ම මාගේ ස්වාමිවූ දිව්‍යචක්‍ෂු තාපසයන් දූක එම්යි පන්සල් දෙරට ගොස් ඒ තිබූසැටි දූක මේ කිමෙක්දෝ හෝයි ඇතුළු පන්සලට වැද මොහු වැද හොත් පරිදි දූක තාපසයන්ගේ පය මඳක් පිරිමදිමින් සුවදුක් විචාරණුයේ තාපසයන්වහන්ස ඉතා නොසතුටුව ශෝකයෙන් වැදහොත්තේය, කිමෙක්ද කවර කෙණෙක් හිංසාපීඩා කළෝද? කවර කෙණෙක් ආක්‍රොශ පරිභවකළෝද වදාළ මැනව තාපසයන් වහන්ස අද කවරක්හුගේ දෙමව්පියෝ හඬා වැළප ඉලව් ගණිද්ද අද කවරෙක් ඉස් කන් නාසා කැපීමට පැමිණ කැණහිල් ආදීන්ට බත්වේද්ද වදාළ මැනව දූන් ඕහට කළමනා නිග්‍රහ දන්නෙම් වේදූයි කීයේයි.

එබස් අසා කූට ජටිලතෙම කෙඳිරිගාමින් සෙමින් නැගීසිට රජ්ජුරුවන් මූණ බලා තොප දූක්මෙන් ඉතා සතුටුව ගියෙම් දවස් ගණනක් තොප නුදුටු හෙයින් මාගේ සිත ඉතා කලකිරුණේය. බොහෝකොට කීමෙන් කම්කිම්ද? ජේණක රජ්ජුරුවෝයයි යන තමින් ප්‍රසිඬවූ තොපවිසින් කිසි හිංසා පීඩාවකට නො පමුණුවන ලදිමි. තොපගෙන් වෙන්වූ දවස් ගණනකට තොපගේ පුත්‍ර වූ සොමනස්ස කුමාරයන් විසින් මෙබඳුවූ මේ පන්සල කසල කළ සැටි බැලුව මැනව, මේ පැන් වලින් බිඳ විසුරුවූ පරිදි බැලුව මැනව, මා විඳගත් ආයාස යෙන් සියලඟ තෙල් ගල්වාගෙණ මා හුන්සැටි බැලුව මැනව, යනාදීන් දක්වා රජ කුමාරයන්ගේ නුගුණ කීයේය. තවද රජ්ජුරුවෙනි, මෙපමණක්ම නො, වෙයි කොල සොරවූ තාපසය මෙහි සාමිට වසන්නෙහිදූයි හයගන්වමින් මා පන්සල් මලුවෙහි හෙලාගෙණ අතින් පයින් තලා මරා කළ ගහටයෙන් පණ

ශ්‍රමණක් තුබුයේවයි මෙපරිද්දෙන් නැති දෙයම ඇතිවන් කොට කියා ගිවිස්සූයේය. එකෙණෙහි රජ්ජුරුවෝද කිපී මාගේ ගුරුවරයන් කෙරෙහි කිසි සැකයක් නැතිව මෙසේ ද්‍රෝහිකළ නැතැත්තෝ මතුඅප කෙරෙහිත් භයක් සරුවක් නොකරන්නේය. මෝහට දැන්ම කියවියක් කියමි, කිපෙමින් ඔහට වධයට නියෝග කරණ රජතෙම අපරාධ කළවුන්ට නිග්‍රහ කරන්ටම සිටිනා වධකයෝත් පිළි හැඳ කණ රත්මල් ගන්වාගෙණ කෙවේරි හා කඩුවෙන් යුක්තවූ අත් ඇතිව වහාඑත්වයි කියා විධාන කළහ. විධානකළ පරිද්දෙන්ම වධකයන් ඇවිත් සිටි කල්හි රජතෙම වධකරණුයේ වහා ඇතුළු රජගෙටගොස් බිලියමට කුකුළකු ගෙණෙන පරිද්දෙන් සොමනස්ස කුමාරයන් ගෙණවිත් දන්ගෙඩියේ වැදහොවා ඉස කපා ගෙණවුත් පැලවයි නියෝග කෙළේය. ඒ නියෝග ලත් වධකයෝත් වේගයෙන් ගොස් මෑනියන් විසින් අලඞ්කෘතකොට සරහා තමන්ගේ ඇකයෙහි හිඳුවා කිරිමවුන් විසින් පිරිවරණ ලදුව වුත් කුමාරයන්ට මෙසේ කීවාහුයි.

රාජකුමාරයෙනි, තොපගේ පිය රජ්ජුරුවන් විසින් තොප හරණ ලද්දේය. තොපට වධකරන්ට මෙහෙවර අසාගෙණ ආම්හයි කී කල්හි රාජ කුමාරතෙම භයින් නැතිගෙණ මෑනියන්ගේ ඇකයෙන් නැගීසිට කඳුලු පිරුණු දෑසින් වධකයන් මූණ බලමින් රජ්ජුරුවන්ට දක්වා පසුව කැමැත්තක් කරවයි හඬමින් විලපමින් දෙහොත් මුදුනෙහි තබා යාච්ඤා කරමින් රජ්ජුරුවන්වහන්සේ ලඟට මා නොමරා ගෙණගොස් පැලවයි කීයේය. ඔහුගේ බස් ඇසූ වධකයෝත් රජ්ජුරුවන් ලඟට ගොස් පෑලූහ. කුමාරද රජ්ජුරුවන් දුර දැකම කියනුයේ ජනප්‍රධානවූ රේණුක නම් රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේගෙන් විධාන ඇසූ වාසල රැකවලෙහි සිටි නායක පුරුෂයෝ කඩු ගත් අත් ඇතිව රත් මල් රත්පිළියෙන් යුක්තව භයංකාර වේශයෙන් අවුත් වධකරන්නට යවයි සිටියාහ. එකෙණෙහි මමද කළ වරද විචාරා නිග්‍රහ කිරීම රාජධර්මයක් බැවින් මා කළ වරද කවරේද්දෝ හෝයි අසනු පිණිස ආමියි කීයේය.

මේ කුමාරයන් වධයට ගෙණෙන වේලෙහි නොයෙක් දූසි දස් ආදී පරිවාර ජනයෝද අන්තඃපුර පිටිපුරද සුධර්මා නම් මව් බිසවද නුවර වාසිහුද ඇමතියෝද නිරපරාධවූ රාජකුමාරයන් නොදෙම්හයි කියමින් එතන්හිරුස්වූහ එකෙණෙහි රජතෙම කියනුයේ ලොව කළමනා වරදින් තොප කෙළේ ඉතාම උග්‍රවූ දෙයකැයි දක්වනුයේ එම්බා කුමාරයෙනි, මේ මාගේ ගුරුවූ තාපසයන් වහන්සේ උදෑසන සවස දිනයෙහි ගැලී නැගෙමින් නැවත කුමුදුමින් දෙවේලෙහිම සන්ධ්‍යානුෂ්ඨානයන් කරන්නෙහිය. උදය සවස දෙවේලෙහිම ගිනිදෙවියා පිණවන්නෙහිය. මෙසේ වූ බ්‍රහ්මචාරීවූ තාපසයන් වහන්සේට ගොවිකම් කරණ ගෘහපතියානෙනියි තොප කීයේ සැබෑවීනම් මීට වඩා වැරදි ඇද්දැයි කියේයි. එකෙණෙහි රාජකුමාරතෙම දෙවයන්වහන්ස, ගොවිකම්කොට රැකෙන හෙයින් ගොවියානෙනි කීමනම් මාගේ වරද නැත්තේ වේදැයි කාරණා කියනුයේ දෙවයන් වහන්ස, මේ තාපසයා සැබෑ තාපස වීනම් තල් කඳත් ආදී වූ මුල් ජාතිහු ආදී පිළිගතයුතුවූ මේ සියල්ලම තිබෑදී මේතාපසවරතෙම තොප. මාව වතුපැල දෙර පිරිමසා රිවිනි ඇතිකොට විකුණුවා සම්පත් උපදවන්නේය එබැවින් බ්‍රාහමණවූයේ තමුත් කරණ ක්‍රියාවගෙණ ගෘහපතියයි කියමියි කියා ඉදින් නොඅදහතසේක් වීනම් සතරවාසල් දෙර අඞගානියෙහි එලවලු විකුණන්

තවුන් ගෙන්වා විචාළ මැනැයි ගෙන්වා බැලූහ. ඔවුනුදු සැබව රජ්ජුරුවන් වහන්සැයි මොහු අතින් පලාකොළ ආදීවූ මාලුගෙණ විකොට මිළ දෙම්හයි කියා කී කල්හි රජ්ජුරුවෝත් තමන්ගේ චරපුරුෂයන් එවා තාපසයන්ගේ පලා කොළ වත්ත පරීක්ෂාකරවා සැක අළහ රාජකුමාරයන්ගේ සේවකයෝද පත් සලට වැද මාළු විකොට රොක්කල කහවණු පියලිපිටින් ගෙණවුත් රජ්ජුරු වන්ට දැක්වූහ. එකෙණෙහි රජතෙම මහාබොධිසත්ත්වයන් නිවැරදි නියාව දූත කුමාරයෙනි, තොප කීයේ සැබෑමය. මොහු කරණුයේ සැබෑ තාපසෙක්වූ නම් තිසි එළාඑල කෙතෙක් තැද්ද ඒ හැම තිබෑදී ගොවිකම්කොට වසනකල ගෘහපතියයි තොප කීයේ වරදෙක් නොවත්තේයයි කීයේයි.

ඉක්බිති මහබොධිසත්ත්වතෙම මෙසේවූ නුවණ නැති රජ්ජුරුවන් සමීප යෙහි වසනු බලාත් හිමාලයවනයට ගොස් රම්‍යවූ ස්ථානයෙක්හි පන්සල්කොට විසීම යහපතැයි සිතා පෂීත් මධ්‍යයෙහිම මොහු නුගුණ ප්‍රකාශයෙන් කියා අදම ගොස් පැවිදිවෙමියි එතෙම පිරිසට නමස්කාර කොට මෙතැන්හි රැස්වූ ජනපද වාසීහුද අමාත්‍ය ගෘහපති ආදීහුද මා කියන්නාවූ බස් අසත්වයි ඒ කවරේදැයි යතහොත් මේ රජතෙම මේ අඥනවූ තාපසයාගේ බස්ගෙණ මා නිශ්කාරණ යෙහි නසන්ට වන්නේය. එබැවින් මේ නුවණ නැති රජු නිසා වසනු බලා පැවිදිවීම වහපතැයි මෙලෙස කියා තමන් නිවරදි පරිදි හඟවා නැවත රජ්ජුරු වන්ට අභිමුඛව දෙවයන්වහන්ස, හුනපඳුරෙක්හි වටින් හිවි ගැවසී මුල් බට කල්හි උසින් අතු පතර හෙවී සිටි කල්හි යම්සේ වෙන්කොටලිය නොහෙත්ද? එපරිද්දෙන් වසතුකාම කෙලශකාමයන්හි බැඳීගිය කල්හි තපසට පය ඇදය නොහැක්කේය. එබැවින් මාගේ පැවිදීවන පරිද්දෙන් අනුදන මැනවයි කීයේයි

එබස් අසා පියරජතෙම කියනුයේ රාජකුමාරයෙනි, ලද අවස්ථාවෙහි අපමණවූ සැපත් වීඳුව අදම මේ සියලු කුරුරට රාජ්‍යය ඉසුරුකරවා දිනිම් තොපි මහණ නොවවයි වැලකුයේය. එකෙණෙහි රාජකුමාරතෙම ජාතිස්මරණ ඥනයෙන් තමන්ගේ පූර්වජන්මයෙහි විඳි සැප දැක දෙවයන් වහන්ස, පෙර මා විඳපු සැපයෙන් නුඹවහන්සේ කෙරෙහි විඳියයුතුවූ කුමන සැපයෙක් ඇද්ද මම මීට පූර්ව ජාතියෙහි දිව්‍යලොකයෙහි ඉපද දිව්‍යවූ රූපයෙන්ද, දිව්‍යවූ රසයෙන්ද, දිව්‍යවූ ගන්ධයෙන්ද, දිව්‍යවූ ස්පර්ශයෙන්ද යන මෙයින් පිණාමින් දවස් හළෙම්. ඒ දුටු සැපයෙන් මෙහි කුමක් නම් ලැබ හැක්කද එබැවින් දෙවියන් වසන තැන් නිසා දිව්‍යලොකයෙහි සියළු ඓශ්වර්‍ය්‍ය විඳිනා ලද දහස් සුවහස් ගණන් පමණ ඇති බලා ඇස් ඇදගත නොහැකි උතුම් දිව්‍ය සත්‍රීහුද මා පිරිවැරූහ. එබැවින් මනා සැපයෙන් නොවිඳී සැපයෙක් නම් නැත. එසේදවුවත් අධර්මිෂ්ඨ පරිද් දෙන් අනුන් බස් ඔස්සේ යන අඥනවූ හිතයන් අහිතයන් නොදන්නාවූ නුඹ වහන්සේගේ රාජභවනයෙහි අපවැතියෝ කුමකැයි වාසය කෙරෙද්දැයි කීයේයි ඒ වේලෙහි ඒ රේණුක නම් රජතෙම තමන්ගේ පුතනුවන් සොමනස්ස කුමාර යන් ක්ෂමාකරණුයේ අලාමකවූ ප්‍රඥා ඇති කුමාරයෙනි, ඉදින් මම අනුන්ගේ බස්ගෙණ ඔස්සෙහි යෙම් නමුත් මෙවකට මේ එක වැරැද්ද ඉවසා ඉදින් මතු මෙබන්දක් දුටුවා විනම් එදවස් තොපට හැඟියක් කරවයි කීයේයි ඉක්බිති මහ බොධිසත්ත්වතෙම රජ්ජුරුවන්ට අවවාද කරණුයේ දෙවයන් වහන්ස, නොබලා අපරීක්ෂාකාරීව කරණලද නිශ්චයක් තීරණයක් නොකොට හුදක් දුටිය කරණ

ලද කටයුත්තක් තෙම ඉතානපුරුවන්නේයයි කුමක් මෙත්ද යත්? යම්සේ යහපත් බෙහෙදකුත් මාත්‍රාවශයෙන්වත් පාචන වශයෙන්වත් වරදවා කරණලද්දේ අනිෂ්ටවිපාක දේද එපරිද්දෙනි. තවද රජ්ජුරුවෙනි පරීක්ෂාකාරීව දිගදුර බලා කරණලද බෙහෙදක් මෙන් යහපත්වූ පලදෙන්නේය. තවද රජ්ජුරුවෙනි, මේ ලෝකයෙහි නොහොබනේ කවර වස්තුවද යතහොත් වස්තුකාම ක්ලේශකාමයෙහි සැප විඳිනා ගෘහස්ථ පුද්ගලයෙක් තෙම අලසව ප්‍රමාදවේනම් එයින් යහපත් නොවන්නේය. යම් ප්‍රව්‍රජිතයෙක්තෙම කයින් වචසින් මනසින් නොසන් හුන් වූයේනම් එයින් නොහොබනේය. යම් රජෙක් තෙම පරීක්ෂාකාරී නොව සිතූ කටයුත්ත යුහුව කෙරේද එයින් යහපතෙක් නොවෙයි යම් ප්‍රඥයෙක් නිෂ්කාරණයෙහි කිපෙනසුළුවීනම් එයින් යහපත් නොවන්නේය. දිසානායකවූ රජ්ජුරුවන් වහන්ස, එබැවින් රජදරුවෝ නම් වචන ශුඬව සිටිහෙයින් මම්ම කටයුත්තක් යුහුනොව පරීක්ෂාකාරීවම කරන්නාහ. අපරීක්ෂාකාරීව නොකරන්නාහ. පරීක්ෂාකාරීවූ රජහට සකල රාජ්‍යශ්‍රී යසස් තේජස් වඩනේය.

තවද රජ්ජුරුවන් වහන්ස ඉසුරුවසිටි රජහු විසින් යම් වරදක් කළාහට නිග්‍රහ කරතත් පරීක්ෂාකොට දුරදිග බලා කළ වැරැද්දට නිසි නිග්‍රහ කරන්නේය. අපරීක්ෂාකාරීව කිපී සිතටම නිග්‍රහ යෙදියයුතු නොවෙයි. කුමක් හෙයින්ද ඉසුරුව සිටියවුන් කාරණ ගහට ඒ තෙමේ නිවරදවී නමුත් විඳිනා පමණක් විනා කෙසේනම් වැලකිය හේද, එබැවින් යුහුව කළ කටයුත්තතෙම පසු තැවිලියටත් පසුවන්නේය. නුවණින් සිහිකොට කරණලද කටයුත්තෙන් පසු තැවිලියට පශ්චාත්තාපයට නොපමුණුවන්නේයි, එසේහෙයින් දේවයන් වහන්ස, මේ ලෝකයෙහි යම් සත්ත්ව කෙණෙක් මේ කළ යුතුය, මේ නොකළ යුතුයයි විභාග සිහි කටයුත්තතෙම පසු තැවුලියට නො පැමිණෙන්නේය යම්කටයුත්තක් කළේවීනම් එසේ කටයුත්තතෙම ප්‍රාඥයන් විසින් දෙලොවම හිතසැප එලවන්නේයයි ප්‍රශංසා කරණලද්දේය.

මෙලෙසින් රජ්ජුරුවන්ට අවවාද දී තපසට යන අභිප්‍රාව අඟවනුයේ දේවයන්වහන්ස, මට වධකරණ පිණිස නුඹවහන්සේගෙන් විධාන අසාත් මේ පුරුෂයෝ කඩු හා කෙටේරි ගත් අත් ඇතිව බිහිසුණු වේශයෙන් අවුදින් මැනියන්වහන්සේගේ ඇකයෙහි උන්නාවූ මා බිලියමට කුකුළකු ගෙණෙනා කලක් පරිද්දෙන් සල්ව සල්වා ගෙණාහ. එබැවින් ඉතා නපුරුවූ මරණ දුකට පැමිණ මාගේ නුවණ බලයෙන් එබඳුවූ උත්සාහයෙන් දෙවෙනිව මරණින් මිදිනිමි එසේ ලැබගත් ජීවිතය තපස් කිරීමෙන් සඵල කරණ සඳහා මා තපසට යන්ට අනුදනමැනවැයි කියේයි. මෙසේ මහාබොධිසත්ත්වයන් විසින් කියනලද කල්හි රජ්ජුරුවෝ බිසවුන් කැඳවා එම්බා සුධම්මා නම් දේවීනි තොපගේ පුතනුවෝ සොමනස්ස කුමාරයෝ අප කියන්නාක් නොගණිති. එතකුදු වුවත් තොප කෙරෙහි ඇදහිලි ඇති හෙයින් අවවාද කොට ගිවිස්වා තපසට යන ගමන් වලකා රාජ්‍යයට පමුණුවාලවයි කීයේයි. එබස් ඇසූ සුධම්මා නම් දේවීද කුමක් කියත් මාගේ පුතනුවන් තපසට යනු ඇත. මාගේ ප්‍රියවූ සොමනස්ස කුමාරයෙනි, මේ රාජ්‍යශ්‍රී නොතකා භික්ෂා ප්‍රවෘත්තියෙන්ම දවස් අරුව, පැවිදි වත් නාවුත් අජව්‍රත ගොව්‍රතාදීවූ නිෂ්ඵල මිථ්‍යා ව්‍රතයකට නොවැද යහපත්වූ සග මොක් සුව සාදන්නට නිසි උපදෙස දක්ක හැකි යහපත්වූ ලබ්ධියක් ගෙණ පැවිදිව එහි සිටත් අප්‍රමාදව ඉන්ද්‍රිය දමනය කොට ධ්‍යාන භාවනා වශයෙන්සිත්

වසඟකොටගෙණ අතින්දිතවූ බ්‍රහ්මලොකයෙහි උපදින්ට උත්සාහ කරවයි අවවාද දුන්නුයි. එසඳ රේණුක නම් රජතෙම සුධර්‍මානම් දේවීනි තොපි අවවාද දුන් නියාව ඉතා යහපත, පළමු මම පුත්‍රවියෝගයෙන් දුකට පැමිණෙන්නට සිටි මං නැවත දුක් දියුණු කෙළෙහිය. තොප අවවාද දුන් පරිදි ඉතාම අරුම යයි නොසතුටුවූයේයි. ඒවේලෙහි සුධර්‍මාතොමෝ එසේනොකිව මැනව රජ්ජුරුවන්වහන්ස රාගී කෙලෙස් දුකින් මිදුනු නිරවද්‍ය ජීවිතයන් ඇති ක්ලෙශ පරිනිර්‍වාණයෙන් පිරිනිවී උත්තමයන් ගියමග පිළිපදින්ට සිතන මාගේ දරුවන් කුමකැයි එයින් වලකන්ව උත්සාහ කෙරෙම්ද, මේ රාජ්‍යසම්පත්තියට වඩා ඒ තපසින් සිඬවන ප්‍රයෝජනය අඩුවීනම් වේද එයින් වැලකුවමනාමැයි කියා පිළිවදන් දුන්නීයි.

ඉක්බිති රේණුකනම් රජතෙම බිසවුන් කුමාරයන්ගේ තපස්ම අනුදන් හෙයින් තමන් විසින් වලකාගත නොහැකිහෙයිනුත් ඔහුගේ තපසට බාධාවක් නොකියා මත්තෙහි කාරණා කියනුයේ, මේ ලෝකයෙහි කටයුතු දන්නෝ බොහෝ ඇසූපිරූ තැන් ඇති නුවණ ඇති හජනය කටයුතු උත්තමයන් විසින් කියයුතු නම් කවරේදැයි උකටලීව හුන්නේයි. එකෙණෙහි මහබෝධිසත්ත්‍වතෙම දෙමව්පිය දෙදෙනාට නමස්කාරකොට මා දැන නොදැන කළ වරදෙක් ඇත්නම් ක්‍ෂමා කළ මැනවැයි කියා මහා ජනයා සිටි තැනටත් නමස්කාරකොට හිමාලයවනයට අභිමුඛව කැටුව ගියම නුෂ්‍යයන් වැලකී කල්හි දෙවියෝ මනුෂ්‍ය වෙෂයෙන් අවුත් බෝසතානන් වඩාගෙණ පර්‍වත වලලු සතරක් නිමවා හිමාල පර්‍වතය ලඟට ගොස් සිටුවාලූහ.

එකෙණෙහි විශ්වකර්‍ම දිව්‍යපුත්‍රයා විසින් මවාදෙන ලද පන්සලෙක්හි ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූයේය. එතැන්හි ඒ කුමාරතෙම සොළොස් ඇවිරිදි වනතුරු රාජභවනයෙහි කැටිව වැඩුනු කුමාරවරුන් හා පුරුෂවේෂයෙන් මහ බොධිසත්ත්‍වයන් පිරිවැරූහ. ඒ රාජ්‍යයෙහි ජනයෝත් ඝොර තපස්වීනු මරා තලා ජීවිතක්‍ෂයට පමුණුවූහ. මහබොධිසත්ත්‍වයන් වහන්සේ ධ්‍යාන භාවනා කොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බ්‍රහ්මලොකප්‍රාප්තවූහයි ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ මේ සොමනස්ස ජාතකය ගෙණහැර දක්වා වදාරා, මහණෙනි මේ දෙවදත්තස්ථවිරතෙම පෙර මට වධයට උත්සාහ කෙළේ වේදැයි වදාරා මේ ජාතකය පූර්‍වාපරසන්ධි ගළපා නිමවා වදාළ සේක. එකල්හි තවුසානෝ නම් දැන් මේ දෙවදත්තස්ථවිරයෝය. එසමයෙහි මව් බිසව තොම දැන් මේ මහාමායා දේවීය. එසමයෙහි මහා රක්‍ෂිත තාපසයෝ නම් දැන් මේ ශාරිපුත්‍රස්ථවිරයෝය. එසමයෙහි සොමනස්ස කුමාරයෝනම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

498
චම්පෙය්‍ය ජාතකය

තවද එක්සමයෙක්හි විවිධ විචිත්‍ර ප්‍රභාප්‍රබන්ධබන්ධුර කෘතාභිෂෙක ඇති ත්‍රෛලොක්‍යතිලකවූ ජනනයනරසායනවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ ශාන්තිසුඛ ජනක වූ මේ චම්පෙය්‍ය ජාතකය චම්පකාසොකනීපනාගපුන්නාගාදී තරුවර විරාජිත ශන්ත සුඛ ප්‍රමාණ මාණාති කෘත ජෙතවනාරාමයෙහි මෛත්‍රී කරුණා මුදිතො පෙක්‍ෂා යන සතර

ආයතිබ්‍රහ්මවිහරණයෙන් දවස් යවමින් වැඩවසනසේක් උපොසථශීලරක්‍ෂණයක් අරභයා වදාළසේක. එසමයෙහි ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ එම්බා උපාසකවරුනි සැපවිඳුම්හයි නොසිතා පෙහෙවස් රකිනාවූ තොප විසින් කළසේ ඉතා යහපත පුරාතනයෙහි නුවණැත්තෝ මහත්වූ භොගසම්පත්තිය හැර අවුත් උපොසථ සීලයම රක්කෝ වේදැයි වදුරා වැඩහුන් කල්හි උපාසක වරුන් විසින් ආරාධිතවූසේක් ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

යටගිය දවස අඟුරට අඟුනම් රජ්ජුරුවන් රාජ්‍යය කරණ සමයෙහි අඟු මගධ දෙරට අතුරෙහි චම්පානම් ගඟක්වූයේය. ඒ යට නාගභවනයෙහි චම්පෙය්‍යනම් නා රජ්ජුරුකෙණෙක් රාජ්‍යකෙරෙති. එසමයෙහි කිසිකලෙක මගධ රජ්ජුරුවෝ අඟුරට ගන්නාහ. කිසිකලෙක අඟු රජ්ජුරුවෝ මගධරට ගන්නාහ. මෙලෙස කල්යාමකින් එක්දවසක් මගධ රජ්ජුරුවන් හා යුධකොට පැරදගොස් අසකු නැගී දිවනුයේ අඟුරජ්ජුරුවන්ගේ යෝධයන් විසින් ලුහු බඳවනලදුව දියපිරී සිටි ඉතා ගැඹුරුවූ භයානක චම්පානම් නදියව පැමිණ සතුරන් අත මියයනවාට වඩා මේ දියට පැන මියයාම යහපතැයි සිතා ගඟට පැනපුයේය. එකල චම්පෙය්‍ය නම් නා රජ්ජුරුවෝත් දිය තුළෙහි රුවන් මණ්ඩපයක් නිර්මාණයකොට බොහෝ නාග පිරිවරින් යුක්තවූයේ මහාපානයක් බොමින් කෙළිමින් හුන්නේය. අශ්වයා තෙමේත් රජ්ජුරුවන් හා සමග දියෙහි කිමිද නා රජ්ජුරුවන්ගේ ඉදිරියට බටුයේය. එකෙණෙහි නා රජතෙම සර්වාභරණයෙන් සැරහුනු රජ්ජුරුවන් දැක ඔවුන් කෙරෙහි ස්නෙහ උපදවා තමන් උන් ආසන යෙන් නැගී තොබව රජ්ජුරුවෙහියි ඒ රජහු අස්වසා තමන්ගේ ආසනයෙහි හිඳුවා දියෙහි ගැලුනු කාරණා විචාළේය. රජ්ජුරුවෝත් ඇතිසැටියේම සටනෙහි පැරද සතුරන් අත මියනු බලාත් දියෙහි වැටී මියයනු යහපතැයි මේ ගඟට පැමිණී පරිදි කීයේයි. ඉක්බිති නා රජතෙම තොබව රජ්ජුරුවෙහි තොප අඟු මගධ දෙරට නායක කරවාලමි අස්වසා සතියක් මුලුල්ලෙහි බොහෝ සැප විඳ සත්වෙනි දවස මගධ රජ්ජුරුවන් හා සමග නාග භවනයෙන් නික්ම යුධාභිමුඛවූහ. එකෙණෙහි මගධ රජතෙම නා රජ්ජුරුවන්ගේ ආනුභාවයෙන් අඟු රජ්ජුරුවන් අල්වාගෙණ ජීවිත විනාශයට පමුණුවා රාජ්‍යදෙකටම නායක කරවා රාජ්‍යශ්‍රී විඳිනේය.

එතැන් පටන් කොට මගධ රජ්ජුරුවන්ගේත් නාග රජ්ජුරුවන්ගේත් විශ්වාසය ස්ථිරවූයේය. එබැවින් අවුරුද්දක්පාසා චම්පානම් ගංගාතීරයෙහි රුවන් මණ්ඩපයක් කරවා මහත්වූ පරිත්‍යාගයන්කොට බලි පූජා කරන්නේය. එසඳ නා රජතෙම මහත්වූ පිරිවරින් යුක්තව නාගභවනයෙන් නික්ම මගධ රජ්ජුරුවන්ගේ බලිපූජාව පිළිගන්නේය. මහජනයා නා රජ්ජුරුවන් එන විභූතිය හා මහිම ඓශ්වර්‍ය්‍යමත්ව බලන්නාහ. එසමයෙහි පුරණලද පාරමිතා ඇති මහබොධිසත්වතෙම එක්තරා දිළිඳු කුලයෙක්හි උපන්නේ ඒ රාජ පර්ෂත් හා සමග ගංතෙරට ගොස් නා රජ්ජුරුවන්ගේ සියලු අශ්වර්‍ය්‍ය දැක ලොභ උපදවා ඒමහා නාග සම්පත්තිය ප්‍රාර්ථනාකොට දන් දී සිල්රැක ඒ නිකානති වශයෙන්

ඒ චම්පෙය්‍ය නම් නා රජ්ජුරුවන් කාලක්‍රියාකළ සත්වෙනි දවස් මිනිස්ලොවින් චුතව ඒ නා රජ්ජුරුවන් වසනා ප්‍රාසාදයෙහි ශ්‍රීයහන් ගබඩාවෙහි යහන් මතුයේ ඕපපාතිකව උපන්නේය. සරීරතෙම දූසමත් දමෙක පැහැ ඇතිවූයේය. එතකුදුවූවත් මහත් වූ ශරීර ඇතිවූයේය. එසමයෙහි බොධිසත්ත්වතෙම තමාගේ වේෂය දැක කලකිරීමට පැමිණ මා විසින් කරණලද කුශලවිපාකතෙම සදිව්‍යලොකයෙහි සැප විඳුවන බලඇතියේය. කොටුවෙහි රැස්කර තබනලද ධාන්‍යරාශියක්මෙන් මාගේ බොහෝ කුසල් ඇතිව තිබැදී මේ අහෙතුක වූ තිරිසන්යෝනියෙහි උපන්මි. ජීවිතයෙන් මට කම්කිම්දූයි මියනු කැමති වූයේය. ඉක්බිති සුමන නම් මානවිකාතොම මොහු දැක මහානුභා සම්පන්න නාරජෙක් උපන්නේ යයි සන්‍තොෂයට පැමිණ සෙසු නාගමානවිකාවරුන්ට මොහු කාමයෙන් පෙළඹන පරිද්දෙන් රැස්වනු කැමතිව සලකුණු කළාය. ඒ සියලු මානවිකාවෝම සර්වාභරණයෙන් සැරහී විසිතුරු වස්ත්‍රයක් හැඳ එකාංශකොටගෙණ කන්වි තාලන් ආදීවූ තූර්‍ය්‍යභාණ්ඩගෙණ අවුත් වට කොටගෙණ නටමින් ගී කියමින් බෙර වයමින් සේවයකළාහ.

එසඳ ඕහට නාගභවනය ශක්‍රභවනය මෙන් වැටහුනේය. මියයාමෙහි සිත පසුබට වූයේය. ඒ නාගශරීරය අන්තර්ධානකොට සර්වාලඞ්කාරයෙන් සැරහී යහන මතුයෙහි පලක්බැඳ උන්නේය. ඉක්බිති එතැන්පටන් ඔහු යසස මහත් වූයේය. මෙසේ නාගභවනයෙහි සැප විඳිමින් බෙහෝ කලක් ඉකුත්වූ කල්හි මේ තිරිසන්ව විසීමෙහි කම්කිම්දූයි කලකිරීමට පැමිණ පෙහෙවස්රැක මෙයින් මිදී මිනිස්ලොව ඉපද චතුස්සත්‍යාවබොධයකොට සංසාර දුක්ඛයාගේ කෙළවර දකිම්යි සිතා එතැන්පත්කොට එම ප්‍රාසාදයෙහි ඉඳ පෙහෙවස් රකිනේය. එසඳ අලඞ්කෘතවූ නාග මානවිකාවෝ සර්වාභරණයෙන් සැරසී බොහෝසේ මොවුන් ශීල භෙදයට පමුණුවති. එතැන්පටන් බොධිසත්ත්වතෙම ඒ නාගභවනයෙහි උයනට ගොසින් පෙංහොය නොවරදවා අටසිල් රකිති. ඒ ස්ථානයටත් ගොසින් නාගමානවිකාවෝ නොයෙක් විලාශ දක්වමින් ඔහු රාගයෙන් පොළඹා ශීලභෙදය කෙරෙති

එකෙණෙහි මහබොධිසත්ත්වතෙම සිතනුයේ මෙතැන්හි සිල් රැක්ක නොහැකි බැවින් මනුෂ්‍යලොකයට ගොසින් පොහොයක් පාසා සිල්රැක ඉඳිම් නිශ්චය කළේයි. මෙලෙස සනිටුහන්කොට පොහෝදවස් නාගභවනයෙන් නික්ම එක් පසල් ගමකට නුදුරු තැන්හි මාවතක් සමීපයෙහි තුඹසක් මතුයෙහි දරණ වැලලාගෙණ මාගේ සමින් ප්‍රයෝජන ඇතිකෙණෙක් සම ඇරගෙණ ප්‍රයෝජන විඳිත්වයි මස් ආදීන් ප්‍රයෝජන විඳිනාකෙණෙක් එයින් ඇරගෙණ ප්‍රයෝජන විඳිත්වයි ඉඳින් මෑ කෙළවා රැකෙණු කැමති කෙණෙක් එලෙස කොට රැකෙත්වයි කියා ශරීරය දනට නතුකොට වැදහෙව පෙහෙවස් රකින්නේය. මාවත යනඑන සත්ත්වයෝ මොහු දැක දිව්‍යනාගයාන කෙණෙකැහි සිතා ගන්ධ පුෂ්පාදීන් පූජාකොට යන්නාහ. පසල් ගම්වැසි මිනිස්හුද මහානුභාවඇති නා රජ්ජුරුකෙණෙකැයි බොධිසත්ත්වයන් වැදහොත් තුඹස මධ්‍යකොට මණ්ඩපයක් කරවා වට වැලිමලුවක් කොට සුවඳ මල් ආදීන් පූජාකොට යෙති. මෙසේ නාගභවනයටයෙති. මෙපරිද්දෙන් සිල්රක්නාවූ මහබොධිසත්ත්වයන්ට බොහෝ කාලයක් ඉකුත්විය. එක්දවසක් සුමනා නම් අගමෙහෙසුන් නාගමානවිකාතොම දේවයන්වහන්ස නුඹවහන්සේ පොහොයක් පාසා මිනිස්ලොවට ගොස් සිල්රැක එනසේක. එලෙස යන පමණක් විනා මිනිස්ලොව තම් ඉතා

භය සහිතය ඉදින් නුඹවහන්සේට කිසි භයෙක් පීඩාවෙක් සැලසිනි නම් අපි කෙසේ දැනගනුමෝද ඊට කිසි සලකුණක් කිවමැනවැයි විචාළිය. ඉක්බිති මහා බොධිසත්ත්වතෙම මඟුල් පොකුණ සමීපයට මොහු කැඳවාගෙණ ගොස් එම්බා සොඳුර මා මිනිස්ලොව ගියකලට යම් කෙණෙක් දැක දඬු මුගුරු ආදියකින් පැහැර ගහට්යක් කළෝවී නම් මේ පොකුණෙහි පැන් කැළඹී අප්‍රසන්න වන්නේය. ඉදින් ගුරුළෙක් ගසාගෙණ ගියේනම් පොකුණෙහි පැන් කැකෑරී නැගෙන්නේය. එකෙණෙහි නයින් කෙළවා කන අහිගුණ්ඪිකයෙක් අල්වාගත්තේවී නම් මේ පොකුණෙහි පැන් ලේවන්ව තිබෙන්නේයයි සූවතා නම් මානවිකාවන්ට මේසලකුණු කියා තුදුස්වක් පෝය නොවරදවා ඉටාගෙණ නාගභවනයෙන් නික්ම ගොස් තුඹස මතුයෙහි ශරීර ශෝභාවෙන් අවට හොබවමින් වැද හොත්තේය. මොහු ශරීරය රිදී දමක්මෙන් ඉතා ධවලය. ඉස රත්හු පලස් වටක් මෙන් හොබනේය. මේ ජාතකයෙහි බොධිසත්ත්වයන් වහන්සේගේ ශරීරය නගුලිසක් පමණ ඇත්තේය. භූරිදත්ත ජාතකයෙහි කලවයක් සා ශරීර ඇත්තේය. සංඛපාල ජාතකයෙහි එක් දඬු ඔරුවක් පමණ ශරීර වූයේය.

මෙසේ ඒ බොධිසත්ත්වයන් ධර්මයෙන් දවස් යවන කල්හි බරණැස්නුවර වසන එක් තරුණ මාණවකයෙක් තක්සලානුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි නයින් අල්වා කෙළවන ආලම්බන යන මන්ත්‍රයක් ඉගෙන තමාගේ ගමට එනුයේ අතරමගදී තුඹස මතුයෙහි වැදහොත් නා රජ්ජුරුවන් දැක මේ නයා අල්වාගෙණ ගම් නියම්ගම් රාජධානියෙහි කෙළවා බොහෝ සම්පත් රැස්කෙරෙමියි සිතා දිව්‍යඖෂධයක් ගෙණ සපා මන්ත්‍රය ජපකොට ඔහු සමීපයට ගියේය. ඒ දිව්‍යමන්ත්‍රය ඇසූ වේලෙහි පටන් කණ ඇතුළෙහි රත්කරණ ලද යවුලකින් විදිනාක් පරිද්දෙන් වේදනා වූයේය. හිස්මුදුන කුළකින් පහරණ කල්හි පරිද්දෙන් වූයේය. එකෙණෙහි මේ කිමෙක් ද්‍රෝහෝයි පරීක්‍ෂාකරණු පිණිස දරණවැල අස්සෙන් හිස ඔසවා බලනුයේ අහිගුණ්ඪිකයා දැක මෙසේ සිතන්නේයි මාගේ විෂයතෙමේ ඉතා උග්‍රය ඉදින් මම් කිපී විෂවාතයක් හළෙම් නම් මොහුගේ ශරීරය ද හළුමිටක් වන්නේය. එකල්හි මාගේ ශීලය ඛණ්ඩවන්නේය. මොහු බලන්නට නොකැමැත්තේයයි අස්වසාගෙණ දරණවැල අස්සේ හිස සඟවාගෙණ මා දැනයට නතුකළ ශරීරයටම හැඟියක් කෙරේවයි කියා වැදහොත්තාහ. ඉක්බිති අහිගුණ්ඪික බ්‍රාහමණතෙම ඖෂධයක් සපා මන්ත්‍රය පිරවූයේය. මහබොධිසත්ත්වයන්ගේ ශරීරයට ගැසූයේය. ඖෂධයෙහි බලයෙනුත් මන්ත්‍රානුභාවයෙනුත් කෙලබිංදුව වැදගත්තැන් පුපුටිකා නැගෙණ කලක් පරිද්දෙන් මහා වේදනා වූයේය. ඉක්බිති තෙමේම වාලධිය අල්ලාගෙණ දිග වැද හොවා එළුකුරයට බඳු සටහන් ඇති හකවූ කරුවෙන් පෙරලා දුර්වල කොට හිස තරයේ අල්වාගෙණ මැඩලූයේය. එකෙණෙහි බොධිසත්ත්වයන්ගේ මුඛය දැල්වූනේය.ඉක්බිති මුඛයෙහි කෙළපුරා වත්කොට ඖෂධය ද සපා කෙළ ඉසිමින් මතුර දපමින් දළ බිඳීගියේය. එසඳ මුඛය ලෙහෙයෙන් පිරුණේය. එකෙණෙහිත් මහබොධිසත්ත්වතෙම ශීල භෙදයක් වේද්‍ෙ හෝයි මෙබඳු දුක් ඉවසමින් ඇස දල්වා බැලීම් පමණකුත් නොකෙළේය. ඒ විෂ වෛද්‍යතෙම නා රජ්ජුරුවන් දුර්වලකොට බල නැතිකරණු පිණිස නගුටෙහි පටන් ඇට සන්ධි කඩා හරනාක් මෙන් සියලු ශරීරය මැඩ අතමට කරකවාගෙණ නැවත පටහරිමින් කරකවමින් වෙහෙස දුන්නේය. නැවත දූනුදිය සදනා කලක් පරිද්දෙන්ම මැදියේය නගුට අල්වාගෙණ පිළි අපුලන කලක් පරිද්දෙන් බිමපහළේයයි කියා මෙතෙක්ආයාශයෙන් බොධිසත්ත්වයන්ගේ ශරීරය ලෙහෙයෙන් නැවරුණේය.

මෙද්ද ඉවසූ පමණක් විනා ඔහු කෙරෙහි ද්වේෂයක් නොයිපද වූයේය. ඉක්බිති ඒ විෂවාදීතෙම මොහු දුර්වලවූ නියාව දැන වැල් ගෙණවුත් පෙට්ටියක් සේ ඉදි කොට එහි බහා පසල්ගමෙක බොහෝ ජනයා මධ්‍යයෙහි කෙළවා විස්මය පත් කරන්ට වන්නේය. කෙළවන වේලෙහි ඒ විෂවාදී බමුණා විසින් රතු සුදු කළු රන්වන් මරාවන් යනාදී පැහැයෙහි යම් යම් පැහැයක් ගෙණ නටයි, කීකල්හි ඔහු කැමති පැහැය ගෙණ නටන්නේය. වට තුණැස්ව සිව්රැස්ව යනාදී යම් යම් ආකාරයක් කීයේ වීතම් ඒ ඒ ආකාර ගෙණ නටන්නේය. ඉතා කුඩාවූද ඉතා මහත්වූද මධ්‍යමවූද යම් යම් ප්‍රමාණයක් ගෙණ නටන්නට කීයේ වීතම් ඒ ඒ කුඩා මහත් වේශ ගෙණ නටන්නේය. නැවත පෙණගොප් එකෙක දෙකෙක තුණෙක යනාදීවශයෙන්ද සියයෙක දෙසියයෙක තුණ්සියයෙක දහසෙකයනාදී කී කල්හිදු එම තෙක් පෙණගොප් මවාගෙණ නටන්නේය. මහජනයෝ ඒ දැක. පැහැද විස්මයපත්ව අහිගුණ්ඩිකයාට බොහෝ මුතුමැණික් ආදී වස්තුව දුන්හ. එක දවස්ම කහාපණයෙන් දහසක් හා බඩු අගයෙන් දහසක් ලද්දේය. මේ අහිගුණ්ඩික බ්‍රාහමණතෙම මේ නයා කෙළවා දහසක් වස්තු උපදවාගෙණ හැරපීය මියි සිතූ නැනැත්තේ මේ දුස්පත් එක ගමෙහි මොහු කෙළවා මෙතෙක් සම්පත් ලත් බැවින් රජ මහඇමතී ආදීන් කෙරෙහි මහබොධිසත්ත්වයන් කෙළවා ක්‍රමයෙන් බරණැස් නුවර උග්ගසේන රජ්ජුරුවන් අභිමුඛයෙහි කෙළි පෑ පසුව ඇරපියම්සි සිතා නික්මුනේය. ඒ තෙම මඩුවෙක් මරා ගෙණැවිත් ලන්නේය, නාරජ්ජුරුවෝ දූන් මේ මළ පරඬලැයි සිතා කෑම් නම් නැවත නැවතත් මා නිසා මොවුන් මරන්නේයයි නොකන්නේය.

ඉක්බිති මොහුට විළඳ හා මී ගෙණැවිත් ලන්නේය. මහබොධිසත්ත්වයෝ ඉදින් මේ නොදුරු කෑ නම් මේ වේලාවෙහිම මරණයට පැමිණෙන්නේය. ගැලවෙන උපායෙක් නොපෙණේයි සිතා නොකන්නේය ඒ අහිගුණ්ඩික බ්‍රාහමණද මසක් විවරින් බරණැසට ලඟාව අමුදින් වාසල් සමීපයෙහි නියම්ගම්හි කෙළවා බොහෝ සම්පත් ලද්දේය. රජ්ජුරුවෝත් මේ නයාගේ විශෙෂ අසා මොහු කැඳවා අප ඉදිරියේ නයා කෙළවයි විධාන කෙළේය. ඒ තෙමේත් යහපත දේවයන්වහන්ස, සෙට පසළොස්වකෙහි නුඹවහන්සේට මේ නයා කෙළවා පාමියි කීයේය.

රජ්ජුරුවෝද අරුම්වූ නාරජ්ජුරු කෙණෙක් රාජාඞ්ගනයෙහි නටති. ඒ දක්නා පිණිස මහජනයා රැස්වෙත්වයි. නුවර බෙරපියකරවා දෙවෙනි දවස් රාජාඞ්ගනය අලඞ්කෘතකොට සරහා අහිගුණ්ඩික බ්‍රාහමණයා කැඳවා යවූයේය. ඒ තෙමේත් සැරහී මහ බොධිසත්ත්වයනුත් රුවන් ඔබා කරණ ලද පෙට්ටිකාවෙක්හි බහා ඒ සථානයට ගෙණවුත් විසිතුරුවූ ඇතිරියක් මත්තෙහි තබාකෙළිපානා පිණිසයයි සැරහී උන්නේය. රජ්ජුරුවෝද ප්‍රාසාදයෙන් බැස මහජනයා පිරිවරා රාජාසනයෙහි උන්නාහ. අහිගුණ්ඩිකද මහබොධිසත්ත්වයන් මෑත් කොටගෙණ නටවන්ට පටන්ගත්තේය. මහජනයාත් ඒ ආශ්චර්‍ය්‍ය නැටුම් දැක සිටිසේ සිටපිය නොහෙන්නාහු පිළී ඉස සිසාරමින් අත්පොලසන් දෙමින් ඔල්වරහඬ පවත්වමින් ඒ ඓශ්චර්‍ය්‍යයට පැමිණියාහ. බොධිසත්ත්වයන් මුඳුනෙහි සත්රුවනවැසිවස්නා කලක් මෙන් වූයේය. මහබොධිසත්ත්වයන් ඇල්ලූ දවස් පටන් මසක් පිරුණේය. මෙදැතුරෙහි බොධිසත්ත්වයෝ නිරාහාරයෙන්ම දවස් අළහ. එකල්හි සුමනානම් මානවිකාතොම මාගේ වල්ලභයානන් නාව නේන්ට කාරණා කිමෙක්ද ? දූන් මිනිස්ලොවට ගියාවූ මෝහට මසෙක් ඉකුත්

වූයේය. තවම හිමියා ලස්වනු කිමෙක්දැයි පොකුණුතෙරට ගොස් පළමු කී සලකුණු බලත්නී ලේවත්ව තිබූ පොකුණෙහි දිය දැක අහිගුණ්ඨිකයෙක්හු විසින් අල්වාගත් නියාව දැන ඒ කෙණෙහි නාගභවනයෙන් නික්ම බෝධිසත්ත්වයන් පෙහෙවස් ඉටා වැදහෝනා තුඹස සමීපයට ගොස් මොහු අල්වාගත් තෙන නොයෙක් වෙහෙස දුන් තැන ලේබින්දු වගුලතැන්හි දැක එතැන් සිට අඬාවැලප ක්‍රමයෙන් පසල්ගමට ගොස් විචාරා එපවත් අසා බරණැස් නුවරට ගොසින් රාජාඞ්ගනයේ පණීත් මධ්‍යයෙහි ආකාශයේ අඬඅඬා සිටියාය. මහබෝධිසත්ත්වයෝද ආකාශය බලා සිය රැලි විදුලියක්මෙන් දිලිසෙමින් සිටිනා නාගමානවිකාව දැක ලජ්ජාව ගොස් යුහුව පෙට්ටිකාවට වන්නේය. රජ්ජුරුවෝත් මේ කුමන කාරණයෙක් දැයි සිතා ඈත මෑත බලනුයේ ආකාශයේ සිටියාවූ නාගමාණවිකාව දැක විචාරන්නාවූ උග්ගසේන නම් රජතෙම කිමෙක්ද? සිස්වූ අහස සියරැලි විදුලියක්මෙන් සියරැස් විහිදුනාවූ ඔෂධී තාරකා මෙන්ද බබලන්නාවූ තෙපි කවුරුද? තව්තිසා දිව්‍යලොකයෙහි සිට ආ දෙව් දුවක්ද? නොහොත් නොමැදවූ රුසිරු දරණ ගාන්ධර්වීනිකායෙහි දෙව් දුවක්ද? තොප මනුෂ්‍ය ස්ත්‍රීයෙකැයි නොසිතමි. මොවුන්ගෙන් තෙපි කවර නම් ස්ත්‍රියෙක්දැයි විචාළේය.

එකෙණෙහි නාගමානවිකා තොම රජ්ජුරුවන් වහන්ස, බලවත් මාගේ කාර්‍ය්‍යයක් නිසා මෙතැන් පත්වූ මම තොප කියන දිව්‍යස්ත්‍රියෙකුත් නොවෙමි. ගාන්ධර්වනිකායෙහි දෙව්දුවකුත් නොවෙමි. මනුෂ්‍ය ස්ත්‍රියෙකුත් නොවෙමි. වැලි කවර කෙණෙකුදැයි සිතවු නම් රූපයෙන් යෑසින් ප්‍රසිද්ධවූ නාගකන්‍යාවක්මි කියා ශෝකාතුරව සිටියාය.

එකෙණෙහි ශොක කිමෙක්දැයි විචාරණ උග්ගසේන රජතෙම නාගාඞ්ගනාව තෙපිබඹන්නාවූ සිත් ඇත්තේය. අඬා වැලප සැලුම් තිබෙන ඇස් සඟලකින් අනවරතයෙන් කඳුලු බින්දු ගිලිහෙන්නාහ. මෙපරිද්දෙන් ශොක කරනට නොපගෙන් නැසුනේ කිමෙක්ද? යම්කිසිවක් ලොභ ඇවටීයෙහි දුකින් අඬන තෙහිදූස් මේ දෙකින් එකක් කියවයි විචාළේය. එකෙණෙහි තමාගේ අඬන කාරණා කියනනාගමානවිකා තොම දේවයන් වහන්ස, උරහිස් යන හෙයින් උරගයයි නම් ඇති නොයෙක් වෙනස පැහැයෙන් දක්වනලද ආභුභාළ ඇති මෙතැන්හි නටමින් සිටි නාරජ්ජුරුවෝ නම් මාගේ ස්වාමිපුත්‍රයෝය, මේ කෙම තිරිසන්ව ඉපදත් කුශලාධ්‍යාස ඇතියේ ඉසුරෙන් පිරුණු නාගභවනයෙහිදී සිල් රකිනට බැරියයි සිතා මිනිස්ලොව මහවතයේ අස තුඹසක් මත්තෙහි සිල්සමාදන්ව වැදහොත්තේය. පරහිංසාවෙහි වැළකී මොහු එක්තරා අලම්බයයි යන මන්ත්‍රයක් ඉගෙණ එක්තරා පුරුෂයෙක් තමාගේ ජීවිකාව පිණිස අල්වාගෙණ මෙබඳුවූ පරිභවයකට පමුණුවේය. දැන් වනාහි මාගේ ස්වාමිපුත්‍රයා මේ බන්ධනයෙන් මුදාහැර මාත් ශොකදුක්ඛයෙන් මුදාපුව මැනවැයි කියා යාච්ඤාකොට සිටියාය. ඉක්බිති උග්ගසේන රජතෙම කියනුයේ, එසේකල නාගමාණවිකාව තොපගේ ස්වාමිපුත්‍රයා නම් කුමසියයක් යොදුන් නාගභවනයට නායකව සිටිකල තමා ඇතිව වේද දහම් රැක්ක හැක්කේයයි සිතා එක විෂධූමයකින් මොහු නසා තමාගේ නාගභවනයටම පලානොගියේ ඈයිදැයි විචාළේය. ඊට ප්‍රතිඋත්තර කියන්නාවූ නාගමාණවිකා තොම රජ්ජුරුවන් වහන්ස, එක ධූමයකින් මේ නුවර දවා අළුකොට පියන්ට ශක්ති ඇත්තේ සැබැමය, එතකුදුවුවත් තමා රකින්ට පටන්ගත් ධර්මයන් එක් කටයුත්තකට පැමිණියයි කියා බිඳපියහොත් ඒ ධර්මය නම් නොවන්නේ වේදැයි කියා ඉටාගත් ශීලය බිඳීයේද්දෝයි යන භයින් ඔහට ගහටක් නොකළානුයයි කීයේය.

ඉක්බිති උග්ගසේන රජතෙම කිමෙක්ද නාගමාණවිකාව තොපගේ ස්වාමිපුත්‍ර
තෙම නිබඳව සිල්රකීද? යම්කිසි දවසෙක සිල්රකින්නේදැයි විචාළේය. එබස්
අසා නාගමාණවිකාතොම රජ්ජුරුවෙනි නිබඳව සිල්රකින්නේ නැත. මසක්
පාසා ශුක්ලපක්‍ෂ කෘෂ්ණපක්‍ෂ දෙක්හි පැමිණි තුදුස්වක පසළොස්වක් පොහෙ
ය නොවරදවා මිනිස්ලොවට අවුදින් සිල් රක්‍ෂා කරන්නේයයි කීවුය.

මෙලෙස කියා තමාගේ ස්වාමිපුත්‍රයාගේ යසස් දක්වන්නී රජ්ජුරුවන්
වහන්ස. මේ නාරජ්ජුරුවන් සෙසු නයින් හා සරිකොට නොසිතුව මැනව.
තෙසු මූන්ගේ ආශ්චර්‍ය්‍යය තබා මාසේම මොවුන් පඤ්චකාමයෙන් පිණවන
සොළොස්දහසක් පමණ නාගමාණවිකාවෝ ඇත්තාහ. මොහු හැමදෙන බහා
පලන් කුණ්ඩලාභරණයෙන් හා පුළුලුකලෙහි දෙනලද මිණිමෙවුල්දමින් හා
වෙන වෙනම මොවුන් සිත් ඇලවන්නාවූ භාවභාව ලීලාවෙන් යුක්තව නොයෙක්
අඞ්ගරාගයෙන්ද සුවඳැති මල් පළඳිමින් විසිතුරු වස්ත්‍ර හැඳ එසේම විසිතුරු
වස්ත්‍ර දසරුවෙහි ලා තමන් සිවුමැලි හෙයින් දියම ගොදුරුකොට ඇත්තාහ
මාගේ ස්වාමිපුත්‍රයානන් පිරිවරන්නාහ. එසේහෙයින් මෙබඳවූ වල්ලභයානන්
මේ බන්ධනයෙන් ගලවා හළ මැනව. නැසෙතත් බලාත්කාරයෙන් නොහරවා
මේ ආලම්බන පුරුෂයා ගිවිසිනා ගම්වර දීමෙන්ද මැණික් සියගණන් හා ගෙරි
සියගණන් දීමෙන්ද ගැලවුව මැනව, ඒ කුමක් පිණිසදැයි යතහොත්, ධර්මයට
ම නතුකරණලද ශරීරඇති නාගරාජතෙම මේ පුරුෂයාගේ අභිප්‍රාය පරණය
කොට පියනුහුනයෙමියි කලකිරෙති. ඒ නිසා මොහු ගිවිස්වා අරවාපුව
මැනවැයි අයද සිටියාය.

ඉක්බිති උග්ගසේන රජතෙම නාගමාණවිකාව තොප කී පරිද්දෙන්ම
මොහු ගිවිස්වා ගම්බිම් මුතු මැණික් ගවමහිසාදී මේ බොහෝ සැපත්දී ගලවන
ලද තොපගේ ස්වාමිපුත්‍රතෙම තොප හා සමග සිත්සේ හැසිරේවයි එලෙසින්
දූත් මොහු ගලවමි. නාගමාණවිකාව අස්වසා රජ්ජුරුවෝත් ආලම්බන බ්‍රාහ්ම
ණයා සමීපයට කැඳවා නාරජහු ගලවන පරිද්දෙන් තට මේ සැපත්දෙමි. හරු
ගණුවයි කියනුයේ, රෞද්‍ර ක්‍රියාවෙන් ජීවත්වෙන නැනැත්තාට ජීවත්වන
පිණිස මැණික් සියයක් හෙවත් එක්දහස් පන්සියයක් පමණ රත්රන්ද අනඝ
මණි කුණ්ඩලාභරණද දිවමලට බඳු පැහැ ඇති සිව්රැස් ආසනයක්ද අඥඝ
රූපශ්‍රී ඇති භාර්‍ය්‍යාවන් දෙදෙනෙකුද මඞ්ගල්‍ය වෘෂභරාජයක්හු ප්‍රධාන කොට
ඇති ගෙරින් සියයක්ද සෙසුත් ගම්බිම් දාසිදස් ආදී සියලු සැපත් දෙමි. මේ
සියල්ල ඇරගෙණ මේ නාරජ්ජුරුවන් මුදහැරපියවයි කීයේයි. ඉක්බිති ඒ අහි
ගුණ්ඩික තෙම රජ්ජුරුවන් වැඳ සිට දේවයන්වහන්ස නුඹවහන්සේ කී කල
කිසිවක් නැතිවත් මේ නාරජහු මුදහරින්ට මට බැරිනොවෙයිකියා පළමු තමා
සිටි ස්ථානයට පසුබැසගොස් නාරජ්ජුරුවන් පේළකාවෙන් මුදහලයේය.
එකෙණෙහි මහබෝධිසත්ත්ව තෙම එතන සරහන පිණිස රුස්කළ මල්ගොඩ
යටට වැද නාගවේශය අන්තර්ධාන කොට එකෙණෙහි පොළොව පලාගෙණ
පැනනැගී විලසින් සර්වාභරණයෙන් සැදි ශරීර සොභාවෙන් රාජාඞ්ගනය හොබ
වමින් අවුත් රජ්ජුරුවන්ට අභිමුඛවූයේ සුමනා නම් නාගමාණවිකාද ආකාශ
යෙන් බැස ස්වාමිපුත්‍රයා හා සමග රජ්ජුරුවන් සමීපයටගොස් වැඳ ඇඳිලිබැඳ
සිට කසි රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේට නමස්කාරවේවයි වැඩෙක්ම
වේවයි නුඹවහන්සේ මෙතැන්හි කළාවූ උපකාරයට මම කවර උපකාරයෙක්
කළහෙම්ද? එනකුදුවූවත් අපගේ නාගභවනයට ඇඳිහිලි ඇතිව වැඩිසේක් වී
නම් යහපතැයි ආරාධනා කෙළේය. ඒ චම්පෙය්‍ය නාරජ්ජුරුවන්ගේ බස් අසා

පිළිවදන් දෙන්නාවූ රජතෙම නාරජ්ජුරුවෙනි, මේ ලෝකයෙහි නොමිනිසුන් හා මිනිසුන් කරණ මිත්‍රසන්ථවය නම් හැඳිනගත හැක්කේ නොවෙයි. එතකුදු වුවත් තොප මෙසේ යාච්ඤාකරණ බැවින් තොප නාගභවනය දකින්ට යෙමියි කීයේයි. එකෙණෙහි නාරජතෙම තමා කෙරෙහි සැක නැතිවන පිණිස සපථ කරණුයේ රජ්ජුරුවන් වහන්ස, ඉදින් පවනෙක්තෙම පර්වතයක් උපුටා අහස බමවයි, ඉඳින් සඳ හිරු දෙදෙන භූතලයෙහි වැටෙත්වයි, සියලු ගඞ්ගාවෝ උඩු බලා යෙත්වයි; මේ සියල්ල වේ නමුත් මාගේ බසෙහි බොරුවෙක් නොවන්නේයි සපථකොට තවද මත්තෙහිදින් දිවුට දෙනුයේ රජ්ජුරුවන් වහන්ස; ඉදින් අහස පැලීයේ නමුත් සප්තසාගරය වියලීයේ නමුත් පොළොව කලාල් කඩක් මෙන් ඇකිලියේ නමුත් මහමෙරු පර්වතය පරඬලාපතක් මෙන් අහස් කුස වසත්නමුත් මාගේ බසෙහි බොරුවෙක් නොසැලසෙයි; ඇදහුව මැනවැයි කීයේය. මෙලෙස මොහු කීවත් රජතෙම අසමානජාති තිරිසනුන් හා මිනිසුන්ගේ විශ්වාසය සැක කෙරේමය. එතකුදු වුවත් තොපගේ බස් ඇදහිලි කොට පෙර නුදුටු හෙයින් අපූර්ව නාගභවනය දක්නට යෙමි කියා මත්තෙහිද කාරණයක් කියනුයේ – තොපි ඇම නම් සොරවූ විෂ ඇතිව වනා කිපෙනසුල්ලව; එසේ වුවත් මානිසා මේ බන්ධනයෙන් තොප මිදුනු හෙයින් උපකාර කරන්ටම සුදුසු වේදැයි කීයේයි.

ඉක්බිති නාරජතෙම නැවතත් සපත් කරණුයේ රජ්ජුරුවන් වහන්ස, මෙබඳු උපකාර යමෙක් නොදනුයේ වීනම් ඒ තෙම දරුණුවූ නිරාදුක් විඳුමය. කිසිකලෙකත් සිත සැකයක් නොලැබෙයි. සිරෙහි ගෙයි අසුවම මරණට පැමිණෙවයි, නැවතත් තර කළේයි. එවේලෙහි රජතෙම අදහාගෙණ නාරජහට සතුතිකොට තොපගේ මේ ප්‍රතිඥයෙහි උතුම් ගුණයෙන් පහන්වූ මම කුමක් පිණිස නොයෙම්දැයි සිවුරඟ සෙනඟ හා සමඟ නාගභවනයට වන්හ. එකෙණෙහි බොධිසත්ත්වයන්ගේ වියෝගයෙන් බොහෝදවසක් පීඩිතවූ උතුම් රූසිරි දරන්නාවූ නාගකන්‍යාවෝ රජහු සිත්ගණිමින් නටන්නට වන්හ.

මේ සියලු දිවඉසුරු වළඳමින් චන්‍දන කුංකුමාදියෙන් සුවඳ ගන්වන ලද පිටඇටු සහිත සිංහාසන මස්තකයෙහි ඉඳ නෘත්‍ය ගීත වාද්‍යයෙන් පිණා මදක් උන් කලට අනගි රසමසවුලෙන් යුක්ත භෝජනය එලවූහ. සොළොස් දහසක් පුරඟනන්ටද නෙසු රාජපර්ෂත්ටද එසේම අනගිවූ දිව්‍යභොජනය එලවූහ. මෙසේම සතියක් මුළුල්ලෙහි සිවුරඟ සෙනඟ හා සමඟ දිව්‍ය අන්නපානයන් අනුභව කොට දිව්‍යවූ රූප ශබ්ද ගන්ධ රස ප්‍රෂ්ටව්‍ය යන පඤ්චකාමාලම්බනයෙන් පිණා ශ්‍රීයහන්මස්තකයෙහි ඉඳ බොධිසත්ත්වයන්ගේ යසශ්‍රී වර්ණනාකොට නාරජ්ජුරුවෙනි සම්පත්තියක් හැර මිනිස්ලොවට ගොස් තපස් කරණුයේ කුමක්නිසාදැයි කියා නාගසම්පත්තිය වර්ණනා කරණ කසීරජතෙම, නාගරජ්ජුරුවෙනි තොප මේ ප්‍රසාද සමූහයෝ බැලූකල මුදුනෙන්පත් හිරුමෙන්ද, මෙඝමුඛයෙන් ගසනලද විදුලියක් මෙන් බබලන්නාහ. මෙබෙනි ප්‍රාසාදයක් මිනිස්ලොවනැතියේය. තවද නාරජ්ජුරුවෙනි, ජාම්බොනද සවර්ණමයවූ පාමුදු පාඩගම් පාසළඹ පාදජාල පාදාභරණාදිවූ ආභරණයෙන් සැරසී මනාවූ වස්ත්‍රයන් දසරුවේ ලා බහා තොප පිරිවරමින් සිටිනා සොළොස් දහසක් පමණ නාගමාණවිකාවෝ වෙන වෙන කියා ගෙවාගත නොහැකි රූප විලාසයන් ඇතියාවූ ප්‍රවාලාංකුර

යට බඳුවූ මුහුණු ඇති කිම්පුරුෂ විශෙෂයෙන් ආදි පක්ෂිගණයා විසින් දෙතලද රුවිපිළිරුව් ඇති මනාවූ බැස නහන තොටවලින් යුක්තය මෙබඳු සැපයකුත් මිනිස්ලොව ලද නොහැක්කේය. තවද නොයෙක් වෘක්ෂයන්ගෙන් ගැවසීගත් තොපගේ උද්‍යානප්‍රදෙශයෙහි කොස්ලිහිණියෝද, මයුරෝද, හංසයෝද මධුර වූ නාද ඇති කෙවිලි ගණයාද, ජීවංජීවක සැළලිහිණි ගිරා කොබෝ කැරල ආදීවූ පක්ෂීහුද, රුව් පිළිරුව් දෙමින් තුරු හිසින් තුරු හිසට පැන බස්නාහ සුපිපිමල් පල්ලෙන් සැදුනු අඹගස්ද සල්ගස් ඇසළ දඹ එරනැන්ද පළොල් ගස් ද නාගචම්පකාසොකවකුල සරලාදීවූ වෘක්ෂයෝද හිමත් ගිමත් වසන්ත යන තුන් සෘතුවෙහිම පුෂ්ප ඵල පල්ලවයෙන් සංජනනව මනනෙත් පොළඹමින් වොරදනාහ. තවද තොපගේ මේ පුෂ්කරණී සතයෝද පද්මෝත්පල සංජාත වූ එහි කෙළනා දිව්‍යවූ හංස චක්‍රවාකාදී ජලචර පක්ෂීන්ගෙන් හොබනාහ. එබැවින් විත්දයුතු සම්පත්තියෙක් වන්නේය. මේ මුළුල්ල හැර මිනිස්ලොවට ගොස් කුමක්ප්‍රාර්ථනාකොට තපස්කරවුදැයි විචාළේය. ඉක්බිති නාරජ්ජුරුවෝ ඊට කාරණා කියනුයේ ජනප්‍රධාන වූ රජ්ජුරුවෙනි මිනිස්ලොව හැර අනික් කිසිතැනෙකත් ඉන්ද්‍රිය දමනයකොට කෙලෙස්සතුරන් පරදවා පිරිසිදුවූ නිවන් සිඬකොටගත නොහැක්ක. එබැවින් මිනිස්ලොව ගොස් ජාති ජරා මරණාදී දුක් කෙළවරකොට ඇති නිවන්සම්පත් සාධනු කැමැත්තෙමි කියේයි.

ඉක්බිති එබස් ඇසූ උග්ගසේන රජ සතුටුව ඒකාන්තයෙන් බහුශ්‍රැතවූ නුවණ ඇති කාරණා කාරණාදන්නා උත්තමයෝ සෙවිය යුත්තාහ. භජනය කළ යුත්තාහ. එබැවින් තොපගෙන් ඇසූ කාරණා ගෙණ තොපගේ නාග මානවිකා සමූහයාද නාගසම්පත්තියද දැක මෙයින් මතු අපගේ රාජ්‍යයට ගොස් බොහෝ කුසල් කෙරෙමි කීයේය. ඒයහපතැයි ගිවිස පිළිවදන් දෙන්නා වූ රජ්ජුරුවෝද නුඹවහන්සේ කී කාරණය යම්කෙණෙක් සුගති දුගීනි මය යෙන් උත්තම අඬමසථාන දනිද්ද බොහෝ ඇසූපිරූ තැන් ඇති නිර්මල බුඬි ඇති උත්තම පුරුෂයෝ භජනය කටයුත්තාහ. එබඳුවුන්ගෙන් උපදෙශ ලැබ අප විදිනා මේ පඤ්චකාම සැපතුත් දැක කම්පල අදහා බොහෝ කුසල් කළ මැනවයි අවවාද දුන්නේය. ඉක්බිති උග්ගසේන රජතෙම මෙතන කල් බොහෝව ගියේය. අපගේ නුවරට යායුතුයයි කීයේයි. එකෙණෙහි නාරජ්ජුරුවෝද නුඹවහන්සේ නුවරට යායුතු බැවින් සියලු ප්‍රයෝජනයට නිසිවූ මුක්තා මාණික්‍යාදී සම්පත්තීන්ද රාජ්‍යවාසීන්ට උචමනා සැපත්ද සාමින්වහන්සේ කැමති පමණ ගෙණයන්වයි කියා තමන්ගේ බොහෝ සම්පත්තීන් දක්වනුයේ මේ නාගභවනයෙහි ඒ ඒ තැන රැස්කොට තිබෙන්නාවූ තල්ගස් උසප්‍රමාණය ඇති මැණික් ගොඩවල් බැලුව මැනව. එපමණව තිබෙන රත්රන් ගොඩවල් බැලුව මැනව. මේ සියල්ල ගෙන්වාගෙණ රත්මයවූ මාළිගා නන්වා ගත මැනව. රිදීමයවූ පවුරු බඳවාගත මැනව. නැවත නුඹවහන්සේගේ රාජාඞගනයෙහි වජ්‍රාකාලයෙහින් බොරනොවන පිණිස පත්මරාග මරකත වෛඩූර්‍ය්‍යාදියෙන් මිශ්‍රවූ දහස්ගණන් යාල මුතුවැලි ගෙන්වා අතුරපුව මැනව මෙපරිද්දෙන් නුඹවහන්සේගේ නුවර සප්තරත්නමය රුවන් මාළිගාවක්හි වාසයකොට සියලු ජම්බුවීපයෙහි රාජධානීන්ට අග්‍ර රාජධානිකොට බොහෝ වස්ත්‍රාභරණ ධනධාන්‍යයෙන් සමෘඬවූ කසී රාජශ්‍රී විඳින්ට වනැයි කීයේයි රජ්ජුරුවනුත් යහපතැයි ගිවිසි කල්හි තමන්ගේ නාගපර්ෂදටද විධානු

කරණුයේ; මේ රාජාඞ්ගනයෙන් යම් පමණ රන් රිදී මුතු මැණික් ආදි සම්පත් ගෙණයෙත්නම් නොවලකවයි බෙරලවා රජ්ජුරුවන්ට ගැල්දහසක් ගණනින් බොහෝ යවනපරිද්දෙන් සනිටුහන්කොට කීයේයි. රජ්ජුරුවෝත් අපමණ සම්පත් ලැබ නාගභවනයෙන් නික්ම බරණැස්නුවරටම ආයේය. එතැන්පටන් ජම්බුවීපයෙහි හිරණ්‍යසුවර්ණයෙන් විශෙෂයෙන් සම්පූර්ණ වූයේය. ශාන්තවූ බුදුරජානන්වහන්සේ පුරාතනයෙහි නුවණැත්තෝ නාගසම්පත් හැර පෙහෙවස් රක්කෝ වේදැයි වදුරා පූර්වාපරසන්ධි ගලපා මේ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි අහිගුණ්ඨිකයා නම් මේ දෙවදත්තස්ථවිරය, එකල්හි සුමනා නම් නාගමාණවිකාතොම දැන් මේ රාහුල මාතාවූ යශෝදරා දේවීන්වහන්සේය. එකල්හි උග්ගසේන රජ්ජුරුවෝ නම් මේ නුවණැත්තන් කෙරෙහි අග්‍රවූ ශාරිපුත්‍රස්ථවිරය, චම්පෙය්‍ය නාරජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

499
මහා පලෝභන ජාතකය

තවද එක්සමයෙක්හි සුරාසුරවර මකුට මණිරාජාසමාන ශ්‍රීපාද පද්ම ඇති භගවත් අර්හත් සම්‍යක් සම්බුදුරජානන්වහන්සේ සකලජනනයනාභිරාම ජේතවනාරාමයෙහි සතර ආර්‍ය බ්‍රහ්ම විහරණයෙන් දවස් යවමින් වැඩවසනසේක් මේ මහාපලෝභන ජාතකය ශීලවිශුද්ධියගේ කිළුටුවීමක් අරභයා වදාළසේක.

මෙහි වර්තමාන කථාව යටකියනලද චුල්ල පලෝභන ජාතකයෙහි විස්තරවශයෙන් එන්නේය. මෙහි වනාහි ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මෙවෙනි නෛර්‍යාණික ශාසනයෙහි පැවිදිව කෙලශවශයට පිළිපන් මහණ භික්ෂූහු නොකමැති පරිද්දෙන් ගෙණවුත් තෙසු භික්ෂූන්විසින් ආරාධිතවූයේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

යටගිය දවස බරණැස්නුවර රජකරණ කසී රජ්ජුරුවන්ට තිසි රජ බිජුවටක් නැතිව රාජ්‍යය මතු නොපවත්නේයයි නුවර වාසීන් උග්ඝෝෂණය කොට පැමිණි කියාවද, ඒ අසා රජ්ජුරුවන් අන්තඃපුරයෙහි සමෘද්ධකොට පුත්‍ර ප්‍රාර්ථනා කළ නියාව, වන මේ සියල්ල යටකියනලද චුල්ල පලෝභන ජාතකයෙහි විස්තර වසයෙන් දක්වියයුතු වන්නේය. උපන්නාවූ ඒ කුමාරයන්ට නම් තබන්නාහු අනිත්ථිගන්ධ කුමාරයෝයයි නම් තැබූහ. උපන් වේලෙහි පටන් ස්ත්‍රීජාතිය ඇසින් නොදකින්නේය. ඔවුන් අත නොසැතපෙන්නේය. එබැවින් දූළිරුවුලු ආදී වශයෙන් පිරිමි වෙස් ගෙණ තනය සඟවා වෙස්වලා කිරි පොවන්නාහ. බොහෝ ජනයාගෙන් ආකුලස්ථානයෙහි සිත් නැලවෙන හෙයින් උදකලාව ජනශූන්‍ය ස්ථානයෙක්හි ධ්‍යානාගාරයෙක්හිම වෙසෙති. ස්ත්‍රීන්ට ළංවිය නොදෙන්නේය. ඒ කුමක් හෙයින්දැයි යතහොත්? මීට පූර්ව ජන්මයෙහි බ්‍රහ්මලොකයෙහි වැස කාමයක්වත් කාම චෙතනාවක්වත් නොවිඳි හෙයින් පළමු සිටි ධ්‍යානචෙතනාවෙහි අභ්‍යාස වශයෙන් පඤ්චකාම සැපය පිළිකුල්කොට දක්වන්නේය. මුළල්ල දුටුවාවූ රජතෙම පුත්‍රශෝකයෙන් පෙළෙමින් දුකසේ ප්‍රාර්ථනාකොට එකදරුකෙණෙකුන් ලදිමි. ඒ තෙම වසනු

කාම් කෙලශකාමයෙහි ඇල්මෙක් නැත්තේය. ශෝකයට කවර කෙණෙකුත් කවර උපායකිත් මාගේ දරුවත් කාමයෙන් පොළඹවා රාජ්‍යශ්‍රීයට පමුණුවාපි යද්ද්‍යෙහෝයි මීට උපායක් දත්නාකෙණෙක් ඇත්නම් බොහෝ සැපත් දී ඉසුරට පමුණුවත්තෙම් වේදැයි කියා ශෝකාතුරව විසුයේය.

එකල්හි එම අන්තඃපුරයෙහි වර්ණයෙන් රූපයෙන් අසදෘශවූ නවයොවුන් පත් ලඳුරියක්තොම නැටීමෙන් ගී කීමෙන්ද සිනා හා අඬසි බැලීම් ආදී ස්ත්‍රී විලාශයෙන් පුරුශයන් බැඳගන්ට සමර්ථ තැනැත්තී රජ්ජුරුවන් ලඟට අවුත් දේවයන්වහන්ස, ඉදින් කුමාරයා මට වල්ලභ වෙයි යන නියමයක් ඇත්නම් මම මොහු කාමයෙහි පොළඹාදීලම්යි කීවාය. ඒ කුමාරිකාවගේ බස් අසා සතුටු සිත් ඇති රජතෙම නව යෞවනයෙන් මත්වූ කුමාරිකාව ඉදින් තොප කී පරිද්දෙන් මොහු කාමයෙන් පොළඹවා මොහුට කාම රසය උගන්වයි එලෙස සැරහෙන පරිද්දෙන් කුමාරිකාව එතනින් යවා ඒ අනිත්ථිගන්ධ කුමාරයන් වැඩෙන කුමාරයන්ට ඒ කුමාරි යම් පරිද්දකින් පොළඹන්නේ වීනම් එලෙස උන්ට අවසරකොට දෙවයි සම්මතකොට දෙවූයේය. ඕ තොමෝත් දෙවෙනි දවස් උදෑසනක්සේම දිව්දුහුල් හා සමාන සිහින් වස්ත්‍ර හැඳ එසේහෙයින් වස්ත්‍ර යක් කරට දමා පොළොව පලා නැගී නාගදේවියක් මෙන් තමන්ගේ යොවුන් පත් වයසට නිසිවූ ශෘංගාර විලාශ දක්වමින් දුටුවන් මනනෙත් අදිමින් වීණා වක් අතින් ගෙණ අනිත්ථිගන්ධ කුමාරයන්ගේ ශ්‍රීයහන් ගබඩාවට පිටත නුදුරුව සිට නිය අගින් වීණා තත් පහරමින් මිහිරිවූ කට හඬින් සමන්විත කාමනිශ්‍රිතවූ සිත්කළුවූ ගීතිකා කිය කියා සිටියාය. ඒ ගායනා කුමාරිකාවන් ගේ තන්ත්‍රීස්වරයෙන් ගීතස්වරයද නොඉක්ම පවත්නා මිහිරි ශබ්දය අසා බොහෝ කලක් සැඟවීතිබූ කාමරාගයතෙම නිදා පිබිදි කලක් පරිද්දෙන් සිත්හි පහළවූයේය. එකෙණෙහි අනිත්ථිගන්ධ කුමාරතෙම තමන් සමීපයෙහි සිටි පුරුෂයන් මුහුණ බලා මේ සිත්කළු වූ ප්‍රෙමණීයවූ කන්හි අමාවවන්නාක් බඳු මේ මධුර ශබ්දය කවුරුන්ගේ ශබ්දයෙක්ද? මේ කෙසේවූ දෙයෙක්දැයි විචාළේය.

එකෙණෙහි ඒ පුරුෂයෝද ඒම්බා රාජකුමාරයෙනි, මේ ලෝකයෙහි සත්ත්වයන් සිත් අලවන ක්‍රීඩානමුත් මේය, ස්ත්‍රීහුයයි කියන්නෙත් මොවුන්ට යයි ඉදින් මේ ගීතිකායෙහි තොපගේ සිත් ඇලේ නම් ශබ්ද රසයෙන් සැපවුව මැනවැයි කීවාහුය. ඒ අසා කුමාරතෙම ස්ත්‍රීයයි යන බසින් සමීපයට කැඳවා එසේවීනම් ධ්‍යානාගාරය සමීපයට අවුත් ගායනා කරන්ට කියවයි සම්මත කෙළේය. තොමෝත් භිත්ති සමීපයෙහි සිට ගායනාකොට ඔහුගේ සිත් තමාගේවසඟයෙහි ලාගෙණ සමීපයට කැඳවූ කල්හි ඕ තොමෝත් මාගේ මතදෙළ මුදුන්පත් වන්නේයයි සිත් ඇතිව පුලුලුකුල කෙළනා මිණිමෙවුල්දම් හා කොකුම්රාශ තැවරූ මතුයෙහි කෙළිනා මුතුහරින් හා කොපුලත ලෙලදෙන මිණිකොඩලින් යුක්තව ධ්‍යානලාභීන් වී නමුත් සිත් අවුල් කරණතරම් රූප විලාසන් ඇතිව ඒ ධ්‍යානාගාරයට වැද බොධිසත්ත්වයන් හා එක්ව සහපත්ව බොහෝ දවසක් පඤ්චකාම සැපනම් මේයයි නොදත් බොධිසත්ත්වයන් තමාගේ රූපයෙන්ද ශබ්දයෙන්ද ප්‍රෂ්ටව්‍යයෙන්දැයි යනාදී පස්කම් ගුණයෙන් බැඳගෙණ චිතයෙහි ලෝභ ඇත්තානු මලපයකින් බැඳගත් කලක් පරද්දෙන් තමා වසඟයෙහි ලාගෙණ කාමරසයෙන් උමතුකරවූව. ඒ රස දත් බොධිසත්ත්වතෙම මෙවෙනි රසයක් විදිනොත් මාමුත් අයික් සෙස්සවුන් විඳිතේ

කම් කිම්දැයි දුටු දුටු පුරුෂයන් කෙරෙහි ඊර්ෂ්‍යාව උපන්නේය. පළමු ස්ත්‍රීයක ඇසින් නොදක්නාවූ බෝධිසත්ත්වයන්ට පසුව පිරිමියකු ඇසින් නොදක්නා පරිද්දෙන් ද්වේෂ උපන්නේය. ඉක්බිති ඒ රාජකුමාරතෙම මේ කාමරසය මා මුත් අනික් පිරිමියෙක් නොවිඳුවයි යන ලෝභයෙන් තියුණුවූ කඩුවක් අතින් ගෙණ දුටු දුටු පිරිමින් මරා දෙකඩකරමින් ඇවිදින්නට වන්නේය.

ඉක්බිති දේවයන්වහන්ස, මේ රාජකුමාරතෙම නිරපරාධවූ සත්ත්වයන් මරමින් කාමයෙන් මත්ව ඇවිදින්නේයයි මොරගාමින් පැමිණියහ. ඉක්බිති ඒ ඇසූ රජ්ජුරුවෝත් අමාත්‍යයන් හා කථාකොට මොහු මැරිය නොහැක්ක. මාගේ රාජ සීමාව ඇතුළත ඉන්ට නොදෙවයි සම්මතකොට රටින් නෙරපූහ

එදවස් රාජකුමාරතෙම ඒ කියන භාර්‍ය්‍යාව කැඳවාගෙණ දුරුව වනගහනයක් ගෙවා ගොස් සමුද්‍රතිරයෙහි රම්‍යවූ ස්ථානයක පන්සලක් කොට ගෙණ වනමූල්ඵලාහාරයෙන් යැපෙමින් දෙදෙනම සමගව වසන්නාහ. එක්දවසක් රාජකුමාරයන් ඵලාඵල ගෙණෙන්ට වනයටයද්දී එක් සෘද්ධිවන්ත තාපස කෙණෙක් සමුද්‍ර මතුයෙහි ආකාශයෙන් යනුයේ පන්සලින් නැගෙණ දුම් සලකුණෙන් පිඩු සිඟන පිණිසයයි පන්සල් දොරකඩට බටුයේය. ඒ කුමාරිකාතොමෝත් තාපසයන් දැක පිණා විවික්තස්ථානයෙහි හෙයින් ඒ තාපසයන් කාමරතියෙහි බඳගෙණ තමාගේ වසඟයෙහි ලාගත. ඒ තාපසයෝත් බ්‍රහ්මචර්‍ය්‍යයෙනුත් සෘද්ධියෙනුත් පිරිහී එතනින් පය ඇදයානොහී සිටියේය. ඒ රාජකුමාරයෝත් මිහිරි ඵලාඵල අල මූල් ආදියත් බරහී කඳක් බැඳගෙණ සවස් වේලෙහි පන්සලට පැමිණියේය. ඒ තාපසයෝත් අනික් හසරක් නොදක්නා හෙයින් රාජකුමාරයන් දැක බයින් දිවගොස් සමුද්‍රයට වන්නේය. පළමු ආ පරිද්දෙන් අහස්කුසට නැගෙමියි උඩුකුරුවූයේය. දියෙහි ගැලෙන්නේය, ලුහුබඳවාගෙණ ගිය රාජකුමාරයෝත් මේ නියාව දැක මේ තාපසයෝ පළමු ආකාශයෙන් සෘද්ධියෙන් ආ කෙණෙක්වන මේ කුමාරිකාව දැක ධ්‍යානයෙන් පිරිහී පෙර පරිද්දෙන් යන්ට උත්සාහකොට යානොහෙන්නේයයි අනුකම්පාකොට තාපසයෙනි, නොබවයි අස්වසා පළමු නොපි මුහුදුදිය දෙබෙකොට දියමතුයෙන් ඇවිත් දුන් ස්ත්‍රීන් හා සමග කාමයෙන් බැඳීගියබවට පැමිණ පළමු පරිද්දෙන් දුන් දිය මතුයෙන් යා නොහී දියෙහිම ගැලෙමින් දුක්විඳිනෙහිය. එබැවින් මේ ස්ත්‍රීජාතියනම් උපක්‍රමවූ සත්ත්වයන් සසරින් ඉක්ම නැගීයානොදී එහිම ලග්න හෙයින් සලාවැටුමක් හා සමානයෝය. සත්ත්වයන් රූපශබ්දාදී ආලම්බනයෙන් වඤ්චාකොට යථාස්වභාවය දක්නා නොදෙන හෙයින් ඉන්ද්‍රජාලයක් වැන්නාහ. බ්‍රහ්මචර්‍ය්‍යාවගේ බිඳීම සුල්ලභ

තවද මේ ස්ත්‍රීහුනම් තමාලඟට පැමිණි උත්තමයන් අධමයන් නොතෝරා එකගුණ කරණහෙයින් ගින්නක් වැන්නාහ. ඇතුළත්හි කිඹුලුන් ආදී ගැවසීගත් පිටතින් සිදිනිබෙන හෙල්වල්මෙන් මෘදු බස් කීමෙන් මෘදු විලාශය දක්වීමෙන් යුක්තය. වස්ත්‍රාභරණාදීන් දීමෙන් පුරාලිය නොහැකි හෙයින් රසාතලයසේ දුෂ්පූරයහ. සුචි අසුචි නොහැර ඇදගෙණ යන ගඞ්ගාප්‍රවාහයන් මෙන් උත්තම අධමයන් නොතෝරා සමව පවත්නා ගුණ ඇත්තාහ මෙසේ නම් වසඟවූ සත්ත්වයන් සංසාරයෙහි නිමග්න කරණ ස්ත්‍රී වසඟය දුරුකටයුතුමය. යම්කෙණෙක් මේ ස්ත්‍රී ඡන්දයෙන් වේවයි ධනයෙන් වේවයි සිත්ගණිද්ද වසඟවෙද්ද එසේවූව මේ ස්ත්‍රී පිරිහෙලත්, කුමක්

මෙන් යත්; තමා පිහිටි ස්ථානයට පැමිණ යම් දෙයක් දවා භස්මකොට නසන ගින්නක්මෙනි. එබැවින් මේ සත්‍රිවසඟනොව තමාසිත් වසඟකොට ගන්ට උත්සාහ කළමැනවැයි රාජකුමාරතෙම තාපසයන්ට අවවාද කළේය. මේ රාජකුමාරයාගේ අවවාද ඇසූ තාපසතෙම තමා පළමුව පුරුදුව සිටි ධ්‍යාන උපදවාගෙණ ආකාශයට පැනනැගී ගියේය. ඒ දුටු අනිත්ථිගන්ධ කුමාර තෙම සසර කලකිරී පස්කම් ගුණයෙහිත් ලොභය හැර පැවිදිවීම්නම් යහ පතැයි සිතා බිසවුන් ගෙණවුත් මනුෂ්‍යස්ථානයෙහි පිහිටුවා නැවත වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව කාමවිරාග භාවනාකොට ක්‍රමයෙන් පඤ්චාභිඥ අෂ්ටසමාපත්තිලාභිව ධ්‍යානසුවයෙන් එම ආරණ්‍යයෙහිම බොහෝ දවසක් වැස නොපිරිහුනු ධ්‍යානයෙන් පූර්වජාතියෙහිත් පුරුදු බ්‍රහ්මලෝකයටම ගොස් උපන්සේක. ශාස්තෲවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ මහණෙනි මේ මාතුගාමයෝ නම් කෙසේවූ පිරිසුදු සතුනුත් කිලුටුකෙරෙති කියා මේ ජාතකය පූර්වාපර සන්ධිගලපා නිමවා වදාළසේක. මේ දේශනාවගේ අවසන්හි ශාසන යෙහි උකටලී මහණ අර්හත්ඵලයෙහි පිහිටා ගියේය. එකල්හි අනිත්ථිගන්ධ කුමාරයෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

500
හත්ථිපාල ජාතකය.

තවද එක්සමයෙක්හි ත්‍රිභුවනභවන ප්‍රදීපායමානනිය්‍යගුණ පරම්පරා විරාජිත ශ්‍රී ශාක්‍යසිංහ අප බුදුරජානන්වහන්සේ ශ්‍රාවස්තිපුර සමීපයෙහිවූ ප්‍රවුල තරුවර නිකර විරාජිත ජේතවනාරාමයෙහි වැඩවසනසේක් තමන්වහන්සේගේ මහාභිනිෂ්ක්‍රමණයක් අරභයා වදාළසේක.

ඒ කෙසේද ? යත්

යටගියදවස බරණැස්නුවර ඒසායුකාරීනම් රජකුමෙක් දසරාජ දහමින් රජකරණු වැලිකෙළියෙහි පටන් එක්ව වැඩී පුරෝහිත ධුරයට පැමිණි බ්‍රාහමණයා හා එක්ව සියසැපත් විඳිනේය. එතකුදුවූවත් ඔවුන් දෙදෙනාටම දරුකෙණෙක් නැත්තාහ මෙසේ සමවාසය කරන්නාවූ රජ්ජුරුවන් හා පුරෝහිත බ්‍රාහමණතෙම එක්දවසක් සැපවූ කථාවෙන් යුක්තව උන්නාහු එම්බා පුරෝහිත බ්‍රාහමණයානෙනි වස්ත්‍රාභරණ ධනධාන්‍යදියෙන් සමෘද්ධවූ මේ රාජසැපතෙහි පිහිටියාවූ අපට දරුමලුකෙණෙක් නැත්තාහ, සබඳ පුරෝහිතය ඉදින් තොපට පුතනුකෙණෙක් උපන්නාහුවීනම් මා සනතක රාජ්‍යයට හිමි වෙති මාගේ පුතනුකෙණෙක් උපන්නාහුවීනම් තොපගේ සම්පතටත් රාජ්‍යය වත් හිමිවන්නාහ. මෙසේ ඒ දෙදෙන ඔවුන් හා ගිවිස්වීම කළාහ. මෙසේ දෙදෙනා නියමකොට සැපසේ වසන කල්හි එකදවසෙක පුරෝහිත බ්‍රාහමණ තමාගේ ගමට ගොස් නැවත නුවරට එනුයේ දකුණුදිග වාසලින් නුවරට එනුයේ නුවරින් පිටත්ව යන බහුපුත්තික නම් එක් දිළිඳු ගැහැණිය යනවා දුටුවේය. ඇගේ කිසි රෝගපීඩාවක් නැති දරුවෝ සත්දෙනෙක් වූහ. එයින් එකෙකු අත සිඟාකන කබලය, එකකු අත වැඳෙනා කලාල් රෙද්දය

එයින් එකෙක් ඉදිරියෙහි එකෙක් පස්සේයෙයි, එකෙක් ඇඟිල්ල අල්ලා ගෙණයෙයි, එකෙක් ඇකයෙහි ඉඳිනේය, මෙසේ ඒ දරුවන් සත්දෙනා කැඳවාගෙණ යන ඒ දුක්ඛිත තැනැත්තී තොමෝ පුරෝහිත බ්‍රාහමණයා සමීප යෙන් යන්නීය; එකල්හි බමුණු ඈ අතින් විචාරන්නේ එම්බල භද්‍රාව මේ දරුවන්ගේ පියාතෝ කොයිද්දැ’යි විචාලේය, එකල්හි ඕතුමූ කියන්නී ස්වාමීනි මේ දරුවන්ගේ පියාතෝ මූයයි කියන්ට ජ්‍යයමකෙණෙක් නැත්තාහයි කීව, නැවත බමුණු කියනුයේ මෙබඳුවූ දරුවන් සත්දෙනෙකු තෝ කුමක් කොට කවර උපායකින් ලද්දේදැයි විචාලේය. එකල්හි ඒ දුක්ඛිතවූ ස්ත්‍රීතොම මේ කාරණයෙන් දරුවන් ලද්දෙමියි කියන්ට කිසි කාරණයක් නොදන්නී නුවර වාසල්දොර සමීපයේ මහත් නුග ගසක් දක්වා ස්වාමීනි පුරෝහිත බ්‍රාහමණයා නන්වහන්ස, මේ නුගරුකෙහි අධිගෘහිත දේවතාවා සමීපයෙන් ලදිමියි කීව.

එසඳ පුරෝහිත බමුණු ඈ කී බස් අසා යහපත තෙපි නික්මෙවයි ඒ දිළිඳු තැනැත්තිය යවා තුමූ රථයෙන් බැස ඒ නුග ගස මූලට ගොස් එක් අතකින් ගස අත්තක් අල්වාගෙණ ඇත මෑත සලා කියනුයේ පින්වත්වූ දිව්‍ය පුත්‍රය, රජ්ජුරුවන්වහන්සේ සමීපයෙන් කුමක්නම් නොබලත්නෙහිද තොපට අවුරුදු පතා දහසක් වියදම් කොට මහත්වූ පූජාවක් කරවතසේක. සියළු රාජ්‍යවාසීන් නොයෙක් පූජෝපකරණයෙන් එලවතසේක. එසේවූ උන්වහන්සේට දරුවන් නොදී කිසි පූජාවක්වත් පඬුරක්වත් දියනොහෙක දිළිඳු තැනැත්තියට කුමක්නිසා දරුවන් සත්දෙනෙකු දුන්නෙහිද? ඉදින් අප රජ්ජුරුවන් වහන්සේට පුතනුකෙණෙකුන් නුදුන්නෙහිවීනම් මිට සත්වෙනී දවස මුල් හා සමග උදුරුවා සුණුවිසිණුකරවා පියමි. රුක්දෙවියාහට මෙලෙස හයගන්වා නික්මුණේය. මෙසේ තමාගේ ගෙට ගොස් දෙවෙනි දවස් තුන්වෙනි දවස්යයි පත්තියෙන්ම දවස්පතා ඒ නුගරුකමූලට ගොස් මේ පරිද්දෙන් භයගන්වා කියා සවෙනිදවස් ඒ නුගරුකමූලට ගොස් පළමු පරිද්දෙන්ම අත්තක් අල්වා ගෙණ සොලවා කියනුයේ රුක්දෙවිය අද එක් රාත්‍රියක් පමණ සිටියේය. ඉදින් අද රාත්‍රියෙහි අපගේ රජ්ජුරුවන්වහන්සේට දරුවන් නුදුන්නෙහි වීනම් සෙට තොපට කියැවියක් දන්නෙම් වේදැයි භයගන්වා ගියේය.

මෙලෙස කියා පුරෝහිත බ්‍රාහමණයා ගියපසු ඒ රුක්දෙවියා විමසා ඔහු දෙවෙනිද කීසැටියේ ගසකපා මුල්උදුරා කඩකඩ කොට කපන නියාවද්දැක මේ බමුණු දරුවන් නොලද්දේවීනම් සෙටදවස මාගේ විමානය නසන්නේය. කවර උපායකින් ඔහට දරුකෙණෙකුන් දියහැකිද්දෝහෝයි සිතා සතර වරම් රජ දරුවන් සමීපයට ගොස් පුරෝහිතයා කීබස් ඔවුන් සතරදෙනාට කීයේය. ඔහු කියන්නාහු දිව්‍යපුත්‍රය, අපි ඔහට දරුවන්දෙන්ට අසමර්ථයම්හයි කීහ. කවද එතනින් ගොස් සාතාගිර හේමවත අටවිසි යක්‍ෂසේනාධිපතීන් ළඟට ගොස් මෙපවත් කියා ඔවුන් විසිනුත් දරුවන් දෙන්ට නොපිළිවනැයි කියා ඔවුන් හා සමග තව්තිසාභවනයෙහි ශක්‍රදෙවේන්ද්‍රයන් ළඟට ගොස් මේ සියලු ප්‍රවෘත්තිය කීයේය. පුත්‍රයකු ලැබෙද්දෝහෝ නොලැබේ දෝහෝයි බලා මහත් කුශල සම්භාර ඇති දිව්‍යපුත්‍රයන් සතරදෙනෙකු දුටුයේය. ඔහු වනාහි පූර්ව ජන්මයෙන් බරණැස්නුවර පේසකාරව සිට එයින්ලත් දෙයක් පස්කොටසක් කොට සතරකොටාසයක් අනුභවකොට පස්වැනිකොටස සතරදෙන එක්ව දන් දුන්නාහ. ඒ කුශලානුභාවයෙන් දිවිපමණින් ඉඳ එයින් මිය පරලොව

ගියාහු තව්තිසා භවනයෙහි උපන්නාහ. එයින් යාම නම් දිව්‍යලෝකයෙහි උපන්නාහයි මෙසේ අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සදෙව්ලොව දිවසැපත් වළඳ උඩු යටිව ඇවිදිනාහු එ දවස් තව්තිසාභවනයෙන් චුතව යාම නම් දිව්‍ය ලෝකයෙහි උපදින්ට සිටියාහ. එසඳ සක්දෙව්රජහු ඔවුන්කරා ගොස් නිදුක්නි තෝ ඇම විසින් මනුෂ්‍ය ලෝකයට ගොසින් ඒ සුකාරි රජ්ජුරුවන්ගේ අග මෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳනට වටනේයයි කීවුය. එවේලෙහි දිව්‍යපුත්‍රයෝ සතරදෙන සක්දෙව් රජහුගේ බස් අසා යහපත දෙවයන්වහන්ස. නුඹවහන්සේ වදළ බැවින් යම්හයි, අපට එක කුදුවත් රජකුලයෙහි ඉපදීමෙන් ප්‍රයෝජන නැත. පුරෝහිත බමුණන්ගේ ගෙයි ඉපද බාල අවස්ථාවෙහිම පඤ්චකාම සැපත් හැර පැවිදිව වසම්හයි කීහ. සක්දෙව් රජ්ජුරුවෝත් යහපත එසේ වේවයි කියා ඔවුන් අතින් ප්‍රතිඥා ඇරගෙණ අවුත් ඒ රුක්දෙවියාහට මෙකියන පවත් කීයේය.

එවේලෙහි දිව්‍යපුත්‍ර සතුටව සක්දෙව් රජහු වැඳ තමාගේ විමානයට ගියේය. පුරෝහිත බමුණු දෙවෙනි දවස් මහා සෙනග රැස්කරවා වැ පොරෝ උදළු යවුල් ආදිය ඇරගෙණ නුගගසමුලට ගොස් අත්තක් අල්වාගෙණ සිට පින්වත්වූ දිව්‍යපුත්‍රය, පුත්‍රවරයකට යාච්ඤා කරන්නාවූ මට අදින් සත්දවසක් ඉක්මුනේය. දැන් තොපගේ විමානය බිඳින්නෙම් අවදැයි කියේය. එකෙණෙහි ඒ වෘක්ෂයෙහි අධිගෘහිත දිව්‍යපුත්‍රතෙම මහත්වූ දිව්‍යානුභාවයෙන් වෙළෙප් අත රෙන් අඩිශරීරයක් දක්වා සිට මිහිරි කටහඬින් ඔහට ආමන්ත්‍රණය කොට සබඳ පුරෝහිත බ්‍රාහ්මණය, තෝ එකපුතෙකට යාච්ඤා කළාවූ තට දරුවන් සතර දෙනෙකු දෙමි කියා ඉක්බිති බමුණු කියන්නේ මට දරුවන්ගෙන් කම්නැත. අපගේ රජ්ජුරුවන් වහන්සේට දූනමැනවැයි කියා නැවතත් දේවතාවා කිය නුයේ මා දරුවන් දෙන්නේ තොපටමයයි කියන්ම, එසේ වීනම් මට දරුවන් දෙදෙනෙකු හා රජ්ජුරුවන් වහන්සේට දෙදෙනෙකු දූනමැනවැයි කීයේය.

එවේලෙහි දිව්‍යපුත්‍ර කියනුයේ බ්‍රාහ්මණය, දරුවන්සතරදෙනාම දෙන්නේ තටය, තොප දරුවන් ලබන පමණක් වීනා ඔහු ගිහිගෙයි බාලකල පැවිදිවෙතීයි කියා කීයේය. එබසට පුරෝහිත බමුණු කියනුයේ තෙපී වූකලී දරුවන් දීපියව පැවිදිවීම් අපට බාරවේදැයි කියා එසඳ දිව්‍යපුත්‍රතෙම ඔහට පුතුවරය දී තමා විමානයටම වන්නේය. එතැන් පටන් දෙවතාවාට මහත්වූ පූජාසත්කාර විය. දිව්‍යලොකයෙහි පේසකාර දිව්‍යපුත්‍රයන් සතරදෙනාගෙන් ප්‍රධාන දිව්‍යපුත්‍රතෙම පළමුවෙන් චුතව පුරෝහිත බමුණාගේ භාර්‍යාව බැමිණී දේවියකුස පිළිසිඳ ගත්තේය. ඔහු උපන් දවස් හස්තිපාල කුමාරයෝයයි නම් තබා පැවිදි නොවන පිණිස ඇත්ගොව්වන් හා කැටිව එක්ව වැඩෙන නියායෙන් ඇත්තලයන්ට පාවාදුන්හ. ඔහු පියවර තගා ඇවිදින අවස්ථාවෙහි දෙවෙන දිව්‍යපුත්‍ර දිව්‍ය ලොකයෙන් චුතව එම මැනියන් කුස පිළිසිඳගත. ඔහු උපන් කල්හි අශ්වපාල කුමාරයයි නම් තබා අස්ගොව්වන් එක්ව වැඩෙන නියායෙන් පාවාදුන්හ. තුන් වෙනි කුමාරයා උපන් කල්හි ගෝපාල කුමාරයයි නම්තබා ගොපල්ලන් හා කැටිව වැඩෙන නියායෙන් පාවාදුන්හ. සතරවෙනි කුමාරයන් උපන් කල්හි අජපාල කුමාරයයි නම් තබා එළුවන් රකින්නන්ට පාවාදුන්හ. මෙපරිද්දෙන් ඔවුන් වැඩී සතරදෙනම යහපත් ශරීරසෞන්දර්‍ය්‍යයට පැමිණිකල්හි රජ්ජුරුවන් හා පුරෝහිත බමුණු ඔවුන් පැවිදිවෙති යනසිතින් තමන්ගේ විජිතයෙහි තපස් චීවරයන් පිටත්කරවූහ. සියලු ඒසා මහත් කසීරාජ්‍යයෙහි එකද ප්‍රව්‍රජිතයෙක්

නුවූයේය. ඒ කුමාරයෝ වණ්ඩය පරාභවයහ. යම් යම් දිගකට ගියාහු විනම් ඒ ඒ දිගින් ගෙණෙන පඬුරු පාක්කුඩම් කොල්ලකන්නාහ. මෙපරිද්දෙන් කුමාර වරුන් වැඩෙන සඳ හත්ථිපාල කුමාරයන් සොළොසැවිරිදි වයසට පැමිණි කල්හි ශරීර සෞභාග්‍ය බලා රජ්ජුරුවන් හා පුරෝහිත බමුණු කියනුයේ කුමාරවරු වයසට පැමිණියෝය. ඔවුන්ට රාජාභිෂෙක කරන්ට කල කුමක් කටයුතුදෝ හෝයි කථාකොට මොහු සමෘද්ධාභිසික්ත කාලයෙහි පටන් ඉතා ඉසුරුමත්වෙති. ඒ ඒ තැනින් තපස්විවරයෝ බොහෝදෙන එති. ඔහු ඒ තාපසවරුන් දැක පැවිදිවෙති. ඔවුන් පැවිදිවූ කල්හි සියලු රාජ්‍යය සුභික්ෂිතව අලලන්නේය. එසේ හෙයින් පළමුකොට උන් පරීක්ෂා කොටපියා පසුව ඔහු රාජ්‍යාභිෂෙක කරම්හයි කියා රජ්ජුරුවන් හා පුරෝහිත බමුණන් හා දෙදෙන තවුස්වෙස් ගෙණ සිඟා ඇවිදිනාහු හත්ථිපාල කුමාරයන්ගේ ගේදොරට සිඟා ගියාහ. කුමාරයෝ ඔවුන් දෙදෙනා දැක ප්‍රීතින් ඔදවැඩියාවූ සිත් ඇතිව සමීපයට ගොස් වැඳ එකත්පස්ව මෙසේ කීයේය.

විශිෂ්ටවූ ශරීර වර්ණයන් ඇති ඉවත්කරණලද පාපයන් ඇති හෙයින් බ්‍රාහමණ නම්වූ ජටාමණ්ඩලයන් ඇති දඬුකෙණ්ඩි නම් භාරයන් දරන්නාවූ මැලි ඉඳුනාවූ දන්තයන් ඇති දූලි වැකුනාවූ ඉස්ඇති, තවද සුචරිතධර්මයෙහි ඇලුනාවූ සීලස්කන්ධාදීන් ගවේශනය කරණ හෙයින් සෘෂි නම්වූ කාසාවසත්‍රයන් දරන්නාවූ වැහැරීගිය චීවරයෙන් වටකොට ඇන්දාවූ තපස්වී කෙණෙකුන් බොහෝ කලකින් අද දිටිමි. එබැවින් ඉඳිනා අසුන්ද පාදෝනා දියද පයට තෙල්ද අන්න පානාදී සියල්ලම අපගෙන් නුඹවහන්සේ පිළිගනමැනවැයි පින්වත් තපස්වී වරයන්ට මෙකී පූජාවන් විචාරම්හ. පින්වත්නි, අපට අනුග්‍රහකොට මෙකියන දේ පිළිගණුවයි ආරාධනා කෙළේය. එපරිද්දෙන් හත්ථිපාල කුමාරතෙම තපස්වි වේශයෙන් ගිය රජ්ජුරුවන් හා පුරෝහිත බ්‍රාහමණයාහට ආරාධනා කෙළේය. එකල්හි පුරෝහිත බමුණු කියන්නේ එම්බා පුත හත්ථිපාල කුමාරයෙනි තෙපි අප කවුරුනැයි සිතව්දැයි විචාළේය. එසඳ ඒ කුමාර කියනුයේ නුඹවහන්සේ හිමාලය වනයෙකි වාසයකරණ තපස්විවරයන් වහන්සේ නොවේදැයි කියා නැවත බමුණු කියනුයේ පුත හත්ථිපාල කුමාරයෙනි, අපි තපස්විවරයෝ නොවම්හ. මූන්වහන්සේ නම් ඒ සුකාරිරජ්ජුරුවන්වහන්සේය. මමවූකලී තොපගේ පියවූ පුරෝහිත බ්‍රාහමණයෙමි කී කල්හි හත්ථිපාල කුමාරයෝ එසේ කල නුඹ වහන්සේලා කුමක් පිණිස සෘෂි වෙස් ගත් සේක්දැයි විචාළෝය.

එවේලෙහි ඔහු කියන්නාහු තොප පරීක්ෂාකොට ඉදින් අප දැක තපසෙහි ආශාවක් නොකළා නම් රාජාභිෂෙක කරණු පිණිස ආම්හයි කීහ. ඒ කුමාර ඔවුන් දෙදෙනාට කියනුයේ රාජ්‍යයෙන් මට ප්‍රයෝජන නැත්තේය. පැවිදි වීමෙහිම මාගේ අභිප්‍රාය කීහ. එකෙණෙහි ඔහු දෙදෙන කියන්නාහු හත්ථිපාල කුමාරයෙනි, තොප පැවිදිවීමට කල් නොවෙයි. දැන් තරුණ අවස්ථාවෙහි රාජ්‍ය සැප අනුභවකොට පසුව තපස් රක්ෂා කරවයි අවවාද කරණුයේ මෙලෙස කියා එම්බා පුත හත්ථිපාල කුමාරයෙනි, තෙපි දැන් ඉතා බාල වයස තපසට යන්නේ නම් ළදරු අවස්ථාවේ වෙදත්‍රයන් ඉගෙණ සම්පත් රැස්කොට සැපඅනුභවකොට ඒ වංශ රක්නට නිසි දරුකෙණෙකුන් ඉපද වයසට පැමිණි කල්හි ඔවුන් සැප තෙහි පිහිටුවා තුන්වයසින් කෙළවර වයස ගිහිසැප හැර වලටවැද තපස් කිරීම යහපතැයි බුඩාදී මහොත්තමයන් විසින් ප්‍රශංසා කරණ ලද්දේයයි කීහ. එසඳ

හත්ථිපාල කුමාරයෝ කියනුයේ නුඹවහන්සේ කියන්නාවූ වේදයෝ තම් අභිමතාර්ථයන් සාදලියහෙන භව හේතුකොටගෙණ සත්තනොවන්නාහ. මෙසේ සම්පත්ති ලාභයත් දුක මුල් පමණ විනා ලාභයක් නොවන්නේය. ජරාමරණාදියත් වලකාලිය නොහී පරලෙව්හි එලනෙම කුසලාකුසල කර්ම වශයෙන් වන්නේයයි කීකල්හි තැවත රජ්ජුරුවෝ මෙලෙස කියත්.

කුමාරයෙනි, තොප කීයේ සත්‍යවචනමය, එසේද වුවත් තොපගේ දෙමව්පිය දෙදෙන වයෝවෘඬයෝය. වර්ෂ සතයක් නිරෝගිව උන්නාවූ තොප ගෙත් අත් පා මෙහෙවර විදිනා කැමැත්තාහයි කියා එසඳ හත්ථිපාල කියනුයේ දේවයන්වහන්ස, නුඹ වහන්සේ කුමක් කියනසේක්ද අවුරුදු සියයක් නිරෝගිව උන්නාවූ මා දකින්ට මරු හා විශ්වාසයකුත් මේ සත්ත්වයා මෙතෙක් කලින් මියනු නිශ්චයකුත් ඇද්ද ජරාමරණාදීහු තම් තැවක් පැදගෙණ යන පුරුෂයෙක් මහත් උත්සාහයෙන් ප්‍රවාහයෙන් ගලවා තැවත එතරට පමුණුවාද එපරිද්දෙන්ම ජාති ජරා මරණාදීහු මරහු වසඟයට පමුණුවන්නාහු යයි මෙපරිද්දෙන් සියලු සත්ත්වයන්ගේ ජීවිත සංස්කාරය ක්ෂණභඞ්ගයයි දක්වා මහරජ නුඹවහන්සේ හා කථා කරමින් සිටියදීම ව්‍යාධි ජරා මරණාදීහු මා අභිභගන්නාහුයයි සියලු සත්ත්වයාට පරලොව තම් ඒකාන්ත කුසල් කිරී මෙහි ප්‍රමාදනුවුව මැනවැයි කියා රජ්ජුරුවන්ද පියාතන්ද වැඳ තමන්ගේ පිරිවර හැරගෙණ බරණැසට වන්නාහ. ඉක්බිති රාජකුමාරයෝ පිරිවර හා සමග තපසට නික්මුනේය. එසඳ බොහෝ ජනයෝ මේ ප්‍රව්‍රජ්‍යාව තම් රජ සැපතටත් වඩා ඉතා ප්‍රියදෙයක් වනැයි කියා නික්මුනාහ. ඒ නික්මුණු පර්ෂත් හා සමග ගංතෙරට පැමිණ ඒ ගඟ පළමුවන ජලප්‍රවාහය ඉකුත්ව අනික් ජලප්‍රවාහයක් පැමිණියේය.

මෙපරිද්දෙන් ක්ෂණක්ෂණයෙහි මේ ජලප්‍රවාහය ඉකුත්වන්නාක් මෙන් සත්ත්වයාගේ රූප වර්ණ ආයුසංස්කාරයත් මෙපරිද්දෙන් වහා යන සුලුයයි භාවනාකොට ධ්‍යාන උපදවාගෙණ සිට මෙසේ සිතුයේය. මේ සමාගමය ඉත මහත් වන්නේය. මාගේ මල්ලු තුන්බෑයෝද දෙමව්පිය දෙදෙනද රජ යුවරජ ආදීවූ සියල්ලෝම පැවිදිවන්නට එන්නාහ. බරණැස සිස්වන්නේය. එබැවින් ඒ සියල්ලෝම යම්තාක්කලකින් මෙතනට එද්ද ඒතාක් මෙතනම වෙසෙමි කැටිව ගිය පර්ෂදට අවවාද අනුශාසනා කෙරෙමින් එතැන්හිම විසුයේය දෙවෙනි දවස් රජ්ජුරුවන් හා පුරෝහිත බ්‍රාහමණයා හා දෙන්නා කථාකරන් නාහු හත්ථිපාල කුමාරයෝ වනාහි රාජ්‍යය හැර මහජනයා ඇරගෙණ පැවිදි වෙමි ගොසින් ගංතෙර ඉඳිනාහ. අශ්වපාල කුමාරයන් පරීක්ෂාකොට රාජ්‍යයට පමුණුවම්හයි ඔහු දෙදෙන තපස් වේසයෙන් ඔහුගේ දොරකඩට ගියාහ. අශ්ව පාල කුමාරයෝ වනාහි තාපසවරුන් දක මහත් සන්තෝෂයට පැමිණ තමන් ගෙන් ආසනොදකාදිය පිළිගන්වයි කීහ. ඔවුන් පෙරසේම අප කවුරුනැයි සිතව්දැයි විචාරා හිමවත වසන තාපසවරු නොවේදැයි කීයේය. පුරෝහිත බමුණු කියන්නේ අශ්වපාල කුමාරයෙනි තපස්වේශයෙන් එන්නමෝ තොප පරීක්ෂාකොට රාජ්‍යයට පමුණුවන පිණිස ආම්හ. අප තපස්වීවරයෝ නොවම්හයි කීකල්හි කුමාර කියනුයේ මාගේ බෑනන්වහන්සේ සිටියදී මට කුමක් සඳහා ජේසන පැමිණේදැයි විචාරා ඔවුන් විසින් තොපගේ බෑනෝ රාජ්‍යයෙන් තමන්ට ප්‍රයෝජනයෙක් නැතැයි පැවිදි වන්නට නික් මුණාහයි කීකල්හි දූන් මාගේ බෑනන්වහන්සේ කොයිදැයි විචාරා තපසට

ගොසින් ගංතෙර ඉඳිනාහයි කීබස් අසා පියාතන්වහන්ස, මාගේ බෑනන් දමාපු කෙලින් මට ප්‍රයෝජන නැතැයි මමත් තපසට යෙමි රාජ්‍යය නොකැමැත්තෙමි අඥාන නුවණනැති සත්ත්වයෝ මේ වස්තුකාම ක්ලේශකාමයන් හැරපිය නොහෙන්නාහ. මම වනාහී ගිහි කම්කටොලු හැර වලටයෙමි. පුරෝහිත බමුණන් හා රජ්ජුරුවන්ට කියන්නාහු අශ්වපාල කුමාරයෝ තුමූ මෙලෙස කියත්. උත්තමයානන්වහන්ස, කාමයෝ නම් එහි ගැලූනාවූ ශත්ත්වයෝ පය ඇදගෙණ යානොදෙන බව හේතුකොටගෙණ කලල මඩක් හා සාදෘසයහ. එහිම ලග්න කරණ හෙයින් ශෛවාලාති ජලයක් හා සාදෘසයහ. එද වැලීත් ලාමක සත්ත්වයන් විසින් මැඩපැවැත්විය නොහැක්කේය. එහි අනාගීතවූ ඒ කාම නැමැති පංකාදියෙන් එතරව නිවන් නැමැති පුරයට පැමිණ යානොහෙන්නාහ. මම් වනාහී නොදූත පෙර අස්ගොව්වන් කැටිව වැඩෙන්නෙමි මහ ජනයාගෙන් කොල්ලකෑම් මැරීම් තැලීම් ආදියෙන් බොහෝ පීඩාකොට අකුසල් රැස්කෙළෙමි. එබැවින් මේ සංසාරයෙහි සිට අකුසල් නොකොට සුචරිත ධර්මයෙහි හැසිරෙමි. මෙපරිද්දෙන් රජ්ජුරුවන් හා බමුණන්ට නුඹවහන්සේත් කුසල් කිරීමෙහි ප්‍රමාද නුවූව මැනවැයි අවවාද කියා දේවයන්වහන්සැයි කථා කරමින් සිටියදීම ව්‍යාධි ජරා මරණාදිය පැමිණෙන්නේය. කල්‍යාමෙන් ආයුෂ නොගෙවූව මැනවැයි රජ්ජුරුවන් හා පුරෝහිත බමුණන් වැඳ අවසරගෙණ තපොවනයට නික්මෙන්ට වන් කල්හි තපස් නම් රජ සැපටත් වඩිනා දෙයෙක් නිසා වේදැයි සොදනක් පමණ තෙන හිවි ගැවසී සිටිනා මහ පර්ෂත් ගෙණ ඒ අශ්වපාල බෑනවූ හත්ථිපාල කුමාරයන් උන් තැනටම ගියේය.

එසඳ ගියාවූ මලනුවන්ට ආකාශයෙහි පලක් බැඳ ඉඳ ධර්මදේශනාකොට අශ්වපාලයෙනි, මේ සමාගමය මහත්වන්නේය. ඒනාක් මෙතන ඉඳුම්හයි කීයේය. ඔවුන් යහපතැයි ගිවිස්වාහ. නැවත රජ්ජුරුවන් හා පුරෝහිත බමුණු දෙවෙනිදවස් ගෝපාල කුමාරයන් පරීක්ෂාකොට රාජ්‍යයට පමුණුවම්හයි පෙරසේම තාපස වේශයෙන් ගොස් ඔවුන් විසිනුදූ ආගන්තුග සත්කාර වින්ද මැනවැයි ආරාධනා කළ කල්හි අපි තාපසයෝ නොවම්හ නොප පරීක්ෂා කරණ පිණිස ආම්හයි සියලූ රජසිරි විඳ රජකරවයි කීහ. ඒ කුමාරයන් කියනුයේ මාගේ වැඩිමහලූ දෙබෑකෙණෙකුන් වහන්සේ ඉන්දදී පලමුව මට රාජ්‍යයට පැමිණෙන්ට කාරණා කිම්දැයි කියන්ම ඕහු දෙදෙනම රජඉසුරෙන් කම්නැතැයි තපසට නැගීයයි කීයෙන් ඔවුන් අළ රාජ්‍යයෙන් මට කම් කිම්දැයි මමද තපසට යෙමි. බොහෝ දවසක් මුලූල්ලෙහි මම පැවිදි වනු කැමැත්තේ වී නමුත් කිසි හසරක් නොදුක උනිමි. දැන්වූකලී අපවත්ව ගිය සරකෙක් සොයා ඇවිද්නා එකෙක් යම්සේ පියවර සටහන් දැක පාදනුසාරයෙන් ගෙරි සොයාගණීත්ද එමෙන් බෑනන්වහන්සේ තපසට ගියහ. හසර මා විසින් දක්වන ලද, එබැවින් ඔවුන් ගිය හසරින් මමත් යනු කැමැත්තෙමි කීයේය. එසඳ බ්‍රාහමණ කියනුයේ කුමාරයෙනි, නොපි එක් දෙදවසක් මෙතැන්හී රඳව අපගේ ශෝක සන්සිඳවාගන් කල තපසට යවයි කීහ. එවේලෙහි කුමාර කියනුයේ මහරජ, අද කළමනා කාර්‍ය්‍ය සෙට කෙරෙම් නොකිය යුතුය. අද කළමනා කටයුතු සෙට කෙරෙමියි ප්‍රාඥයෝ කල් නොයවන්නාහ, මරණයෙහි විශ්වාසයෙක්වත් නිශ්චයෙක්වත් නැත්තේයයි මෙසේ ගෝපාල කුමාරයෝ ඔවුන් දෙදෙනාට ධර්මදෙශනාකොට මා කැටිව

කාමාසාවෙන් කල්තොයවුව මැනවැයි ජාති ජරා මරණාදීහු වහා පැමිණෙත් නාහයි කියා පියානන් හා රජ්ජුරුවන් වැඳ යොදනක්තැන පැතිරසිටි ජනයා සමග නික්ම ඒ හත්ථිපාලකුමාරයන් හා දෙන්නා උන් ගංතෙරට පැමිණියේය. එහි ගියාවූ ගෝපාල කුමාරයන්ට හත්ථිපාල කුමාරයෝ අහස්හි පලක්බැඳ හිඳ ධර්මදෙශනා කෙළේය. මේපරිද්දෙන් තුන්දෙනා ඒ ගංතෙර තපස්රකින කල්හි නැවතත් රජ්ජුරුවන් හා පුරෝහිත බ්‍රාහ්මණයා හා දෙදෙන පළමු පරිද්දෙන්ම සෑම වෙස්ගෙණ අජපාල කුමාරයන් සමීපයට ගොස් ආගන්තුග සත්කාර කරවයි කිබස් අසා තෙපි අප තාපසවරුනැයි සිතවුද මූන්වහන්සේ නම් ඒ සුකාරි රජ්ජුරුවන්වහන්සේය. මම වූකලී තොපගේ පියවූ පුරෝහිත බ්‍රාහ්මණයෙමි. තොප පරීක්ෂාකොට රාජ්‍යයට පමුණුවන පිණිස ආම්හයි කී කල්හි ඔහු විසිනුත් මාගේ වැඩිමහලු තුන්බෑ කෙණෙකුන් සිටියදී මම පළමු කොට රාජ්‍යය කෙරෙම්දැයි එබාරා ඔහු රාජ්‍යයෙන් ප්‍රයෝජන නැතැයි කියා රජඉසුරු හැර තපසට ගියහයි කී කල්හි එසඳ අජපාල කුමරු කියනුයේ මාගේ බෑනන්වහන්සේලා දමාපු කෙල මම මුදුනෙන් කුමට පිළිගණිම්ද මමත් තපසට යෙමි කීයේය.

එවේලෙහි බමුණු කියනුයේ පුත, තොප ඉතා බාලවයස දප අතටම බාරය. එබැවින් වැඩිගියකල පැවිදිවයි කීයේය. එවේලෙහි කුමාර ඔවුන්ට කියනුයේ නොපි කුමක් නම් කියව්ද මේ සත්ත්ව බාල අවසථාවෙහි මියෙති කියාද මේ සත්ත්ව මධ්‍යම අවසථාවෙහි මියෙති කියාද, මේ සත්ත්ව වෘඩ අවසථාවෙහි මියෙති කියාද, ඒ ඒ සත්ත්වයන්ගේ හසනපාදදියෙහි ලියා තිබෙන ලිමෙක් සලකුණෙක් නැත්තෝය. එබැවින් මම අසවල් කාලෙක මියෙමි කියා නොදනිමි මරණයෙහි නියම්යෙක් නැති ඒ කාරණා හේතුකොටගෙණ දැන්ම ගොස් පැවිදි වෙමි කියනුයේ; මම වනාගී ලදරුවූ හාව භාව කටාක්ෂයෙන් යුක්තව නවවන විලාසයෙන් මත්ව ඇවිදිනාවූ දුනුකේ පෙත්තකට බඳුවූ ශරීරයෙන් දිගු පුලුල්වූ නෙත්සගලක් ඇති දිව්‍යස්ත්‍රියකගේ රූපයට අපහාස කරණ තරම් රූපශ්‍රී ඇති පුරුෂ සමාගමයකට නොපැමිණි පඤ්චකාම සැප අනුභව නොකරද ලදරු කුමාරිකාවක දෙමව්පියන් දෙදෙනා කෙරෙහි මහත් ශෝක පිහිටුවා මරණතෙමේ ඇරගෙණ ගියේය. මේ කාරණයෙන් දේවයන්වහන්ස මම ප්‍රත්‍යක්ෂකොට දිටිමි.

තවද මේතෙම ලදරුයහ. කියාද මනාවූ ජාති ඇත්තේයයි කියාද යහපත්වූ මුඛයක් ඇත්තේයයි බැලුවන්ට ප්‍රියකරුයයි කියාද රන්වන්වූ ශරීර වර්ණ ඇත්තේයයි කියාද මේතෙම මහත්වූ යසස් හා තේජස් ඇත්තේයයි කියාද, මේ මරණයතෙම නොබලා ඇරගෙණ යන්නේය. එබැවින් පළමුකොට මේ සියලු වසතුකාම කෙලශකාමයන් හැර පැවිදිවෙමි. පැවිදිවන්ට අවසර දුන මැනවැයි කියා තුඹවහන්සේ සිටිය මැනව කථා කිරීමෙන් කාලක්ෂෙප නොකළ මැනවැයි කියා රජ්ජුරුවන් හා පුරෝහිත බමුණන් වැඳ යොදනක්තැන පැතිර සිටි පනින් හා සමග නික්ම ඒ ගංතෙරටම ගියහ. හත්ථිපාල කුමාරයෝ ඒ පසුව ගිය මලනුවන්ටත් ආකාශයෙහි පලක් බැඳ ඉඳ බණ කියා මේ සමාගමය මහත්වන්නේයයි එතැන්හි රැඳුනේය. දෙවෙනි දවස් පුරෝහිත බ්‍රාහ්මණයා තෝත් තමන්ගේ ගෙයි පයඞ්ඛක බඩ ගනවී උන්නේ මෙසේ කීය. මාගේ රූපශ්‍රීන් අග්‍රවූ ජීවිතයටත් වඩා මට ප්‍රියවූ දරුවෝ සතරදෙන මේ සා මහත් සම්පත් හා රාජ්‍යය හැර පැවිදිවූව, දැන් මම වනාහී උදකලා වූයෙන් මනුෂ්‍ය කානුකයන් හා සදෘශවීමි. එබැවින් ගිහි සැපතින් මට

ප්‍රයෝජන නැතැයි තමාගේ භාර්‍ය්‍යාව කැඳවා කියනුයේ එම්බා සොඳුර, කඳු වෙළෙප් හා පලුපලලවයෙන් සංජනනාවූයේ වෘක්‍ෂයයි ව්‍යවහාර ලැබෙන්නේය, කපතලද අතුපතර ඇති වෘක්‍ෂතෙම කනුවයයි යන ව්‍යවහාරයට පැමිණෙන්නේය. එබැවින් මම වූකලී දරුවන්ගෙන් වෙන්වූයෙන් මනුෂ්‍ය කානුකනම් ව්‍යවහාරයට පැමිණියෙමි. එසේ හෙයින් පැවිදිවීමට කලැයි කියා තමාගේ සැට දහසක් බ්‍රාහමණයන් රැස්කරවා ඔවුන්ට කියනුයේ පින්වත්වූ බ්‍රාහමණයෙනි; මම මාගේ දරුවන් සමීපයට ගොස් පැවිදිවෙමි. තොපි හැම කුමක් කරවුදැයි විචාළේය. එකෙණෙහි බමුණෝ කියන්නාහු ආචාරීන්වහන්ස, නරකයනම් නුඹවහන්සේටම උනුවූයේ නොවෙයි නරකගිනි අපටත් උනුම්ය නුඹවහන්සේ කැටුවම ගොස් මහණවම්හයි කීහ.

එසඳ බමුණු තමාගේ අසූකෙළක් පමණ වස්තු බැමිණියට දක්වාදී යොත් තක් පමණ තැන් අතුරුනැතිව සිට බ්‍රාහ්මණ පෂිත් හා සමග නික්ම දරුවන් සතරදෙනා සමීපයට ගියාහ. එවේලෙහි හත්ථිපාල කුමාරයෝ පියානන් හා බමුණු පර්ෂදට ආකාශයට නැඟී පලක්බැඳ ඉඳ බණ කීයේය. එකෙණෙහි දෙවෙනිදවස් පුරෝහිතයාගේ භාර්‍ය්‍යාවවූ බැමිණිය සිතන්නී මාගේ දරුවෝ සතරදෙන සේසත් ඡත්‍රය හැර පැවිදිවම්හයි ගියාහ. වල්ලභයා නෝද පුරෝහිත සථානාන්තරය හා සමග අසූකෙළක් සම්පත් හැර ඔවුන් සමීපයට ගොස් මහණවූහ. මා උදකලාව කරණු කිම්ද? දරුවන් හා වල්ලභයා නත් ගියාවූ මාර්ගයෙන් යෙමි කියා පූර්වයෙහි පැවති කාරණයෙක් දක්වන නියාවට ගියදවස සයානූදහසක් පමණ සවර්ණහංසයෝ වර්ෂාකාලයට සෑහෙන පමණක් ගොදුරු රන්ගල්ගුහාවල්වල තබා පිටතට හිමහයින් නොනික්ම සාරමසක් එහිම වසන්නාහ. එකල්හි මහත්වූ මකුළුවෙක් ලෙනදොර දැල් බදිනේය ඒ සයානූදහසක් පමණ හංසයෝ ශක්තිසම්පන්න හංසයන් දෙන්නෙකුට දියුණුකොට ගොදුරු තබාදී වර්ෂාකාලය ඉකුත්වන කල්හි ඔවුන් දෙදෙනා ලවා ලෙනදොර දැල් බිඳුවා ඔහු ගියාවූ මාර්ගයෙන් අවශේෂ හංසයෝ නික්මෙන්නාහ. එපරිද්දෙන් දැන් මම මාගේ දරුවන් දක්වූ මාර්ගයෙන් යෙමි. නිශ්චයකොට බැමිණියන් රැස්කරවා කියන්නී එම්බා යෙහෙළනියෙනි, මම පැවිදිවෙනු කැමැත්තෙමි තොපි කුමක් කරව්දැයි විචාළිය. එසඳ බැමිණියෝ කියන්නාහු නරකයනම් නුඹවහන්සේටම නොවෙයි අපටත් සරිමය. එබැවින් අපිත් පැවිදිවම්හයි කියා තමතමන් පිරුණු සම්පත් හැර නික්මුණාහ.

මෙසේ යොදුනක් තැන පැතිර සිටි බැමිණියන් හා සමග හත්ථිපාල කුමාරයන්ගේ මෑනියෝ තුමූ දරුවන් සිටිය ඒ ගංතෙරට පැමිණියාහ. පෙර පරිද්දෙන් ඒ හත්ථිපාල කුමාරයෝ ධර්මදේශනා කළාහ. දෙවෙනි දවස් රජ්ජුරුවෝ පුරෝහිත බ්‍රාහ්මණයා කොයිදැයි විචාළාහ. දේවයන්වහන්ස, බමුණා හා බැමිණියන් හා දෙදෙන තමන්ගේ අසූකොළක් වසතුව හැර වෙනවෙනම යොදනක් යොදනක් පමණ තෙක ගැවසී සිටි පර්ෂත් හා සමග පුතනුවන් ගිය හසර සමීපයට ගියහයි කීකල්හි රජ්ජුරුවෝ කියන්නාහු අස්වාමික භාණ්ඩය නම් අපට පැමිණෙන්නේයයි කියා ඔවුන්ගේ ගෙවල සම්පත් රාජාඞ්ගනයෙහි ගොඩගසන්නේය. එකල්හි රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසව රජ්ජුරුවන් වහන්සේ කුමක් කරණසේක්දැයි විචාරා පුරෝහිත බ්‍රාහ්මණයාගේද අවශේෂ බමුණන්ගේ සම්පත් ගෙන්වනසේකැයි අසා පුරෝහිත බ්‍රාහ්මණයාගේ වස්තු ගෙන්වන්ට එතෙම කොයිදැයි විචාරා දේවයන්වහන්ස; ඒ බමුණා හා බැමිණිය

දෙදෙනාගේ පිරුණු සම්පත් හා දාසිදාස් ගවමහිසාදී සියලු වස්තුව හැර මහත් පිරිවර සමග තපසට ගියෝයයි යනු අසා බිසවු කියන්නාහු මේ රජ්ජුරුවෝ ලෝභයෙන් මුසාව කිසිවක් දන්නා නොහැක්කෝය. බමුණා විසින් දුරු කරණ ලද වස්තුව තමාගේ ගෙට ගෙන්වා ගන්නේය. මේ කාරණාව උපායකින් කියා ගිවිස්වමි සිතා මස්ලොඹුයෙන් මස්ගෙණ රාජාංගනයෙහි රැස්කරවා වටදැල් ඇද්දවූවාය. ආකාශයෙහි පක්ෂප්‍රහාර කරණ ගිජුලිහිණියෝ ගොඩකොට මාංශ අනුභව කරණ පිණිස බිමට බටහ. ඔවුන් අතුරෙන් නුවණැති ගිජුලිහිණියෝ දැල් ඇදතිබූ නියාව දැක මස් වමනයකොට දැල් අසුවලින් නොහැසි පලාගියාහ. නුවණනැත් පක්ෂීහු මස් ලදුව ලෝභයෙන් බඩගන්නා පමණක් නො මහත්වූ බඩ ඇතිව ඉදුරා පලායානොහෙන්නාහු දැලෙහි බැඳී උන්හ. එවැවූනු ලිහිණි යන්ගෙන් එකකු ගෙණගොසින් බිසවුන් අතට දුන්නාහ. බිසවුද එපක්ෂියා ඇරගෙණ රජ්ජුරුවන් සමීපයට ගොස් මහරජ මෙසේ වැඩිය මැනව. රාජාංගනයෙහි එක්ක්‍රියාවක් බැලුව මැනව සිව්මැදුරු කවුළුහැර දක්වන්නී මෙයින් මේ නුවණැති සමහර ලිහිණියෝ දැල් ඇදතිබූ නියාව බලා කෑ මස් වමාරා නිරාහාරයෙන් දැල් අස්සෙන් පලායන්නාහ. ලොභයෙන් මස් බඩපුරා අනුභව කොට හුනු ගිජුලිහිණියෝ මාගේ හස්තයට පැමිණියාහ.

එපරිද්දෙන් බමුණු වස්තුකාම කෙලශකාමයන් වමාරා කෙලෙස් නැමති දැලින් ගැලවීගියෙය. නුඹවහන්සේවූකලී ගිජුලිහිණියන් වමාරණලද වස්තුව නැවත අනුභවකරණ කලක් පරිද්දෙන් ගෙන්වනසේක. තෘෂ්ණා වසඟ වූ අඥනවූ පුද්ගලයෝ බුඩාදී මහෝත්තමයන් විසින් ප්‍රශංසා කරණලද්දාහු නොවෙත. බිසවුන් කීබස් අසා රජ්ජුරුවෝ තුමූ මහත්වූ සංවේගයට පැමිණියාහ. එකෙණෙහි රජ්ජුරුවන්ට භවත්‍රය ගිනිගෙණ දිලිහුනු කලක් පරිද්දෙන් භයානකව වැටහුනේ එවේලෙහි මේ සියලු රජ ඉසුරු හැර පැවිදිවන්ට වට නේයයි උපන්නාවූ සංවේග ඇති බිසවුන්ට සතුතිකරන්නාවූ රජ්ජුරුවෝ මෙලෙස කියත්. යම්සේ දියෙහි ගිලෙන්නාහු පුරුෂයෙකු ශක්තිසම්පන්නයෙක් අත හෝ කේසයන් හෝ අල්වාගෙණ ගොඩට පමුණුවාද යම්සේ මඩෙහි එරී ගියක්හු ඇද ගොඩලාගණිද්ද මංමුළාව ඇවිදිනාහු යම්සේ දයා ඇති පුරුෂයෙක් මහවතෙක ඇරසිටුවාලාද එපරිද්දෙන් මොහාන්ධකාරයෙන් මුළාව ඇවිදිනාවූම වස්තුකාම කෙලශකාම නැමති මලින් ඇද ගොඩ ගණිද්ද එමෙනැයි ඔවුන්ගේ ගුණකියා ඉක්බිති පැවිදිවනු කැමතිව අමාත්‍යමණ්ඩලය රැස්කොට අමාත්‍යයෙනි මම හත්ථිපාල කුමාරයන් සමීපයට ගොස් පැවිදිවෙමි. කැමති කෙණෙක් රාජ්‍යය කරවයි කීයේය.

එකල්හි අමාත්‍යයෝ දේවයන්වහන්ස නරකය නුඹවහන්සේට දුක්ද අපටත් දුක්ම නොවේදැයි කියා ඒසා මහත් රාජ්‍යශ්‍රීයක් හැර රජ්ජුරුවෝ තුන් යොදුනෙක පැතිර සිටි පිරිස් හා සමග හත්ථිපාල කුමාරයන් සමීපයට ගියහ. පළමු පරිද්දෙන්ම ගියාවූ පිරිසට හා රජ්ජුරුවන්ට ආකාශයෙහි පලක් බැඳ ඉඳ බණ කියා අවවාදකොට දෙවෙනිදවස් නුවර රැඳුනු සත්වයෝ රාජාංගනයට රැස්ව තමන් ආනියාව කියා යවා අවසර ලදින් රජගෙට ගොස් බිසවුන් වැඳ එකත්පස්ව සිටියාවූ දේවීන්වහන්ස මේ සියලු රාජ්‍යයත් අප ඇමක් ඇරගෙණ රැකගත සැපසේ රාජ්‍යය කළමැනවැයි කීහ. ඒ වේලෙහි බිසව් කියන්නාවූ මාගේ වල්ලභවූ රජ්ජුරුවන්වහන්සේ දොළොස් යොදුන් බරණැස්නුවර හා නොයෙක් වස්ත්‍රාභරණ ධන ධාන්‍යාදී සම්පත් හැර පැවිදිවන්ට ගියාහ.

මම ද සියලු සැපත් හැර තපසටයෙමි පින්වත්නි රාත්‍රින් දිනාදිකාලයෙහි නික්මෙන්නාවූ නිස්කාරණයේ නොගොස් සත්ත්වයන්ගේ ආයුසංස්කාරය ගෙවමින් යන්නාහ. පඨම වයසාදි තුන්දෙන මැද්ද දසීද කොටඨාසයද අනුක්‍රමයෙන් හරණා මිතු මිතුයෙහි දසයකට නොපැමිණ එහිම වන්නාය. එබැවින් දුරවන් මැඩීමෙන් ගිහිකමකටුල්ල මුහුකරණතුරු උදකලාව තපස් කරන්ට යෙමි කියා අමාත්‍යමණ්ඩලයාගේ භායසීවරුන් කැඳවා මම පැවිදි වෙමි නොපි කුමක්කරව්දූයි විචාරා දෙවයන්වහන්ස නුඹවහන්සේ තපසට යනකල අපි කුමකට රඳමෝද කැටුවමම යම්හයි කීකල්හි බිසව් යහපතැයි ගිවිස රජගෙයි රන්රුවන් මුතු මැණික් පිරුණු ගේවල දොර හරවා අසවල් අසවල් තෙන මහත්වූ නිධානයෝ තබනලදහයි රන්පත දැහිගුලෙන් ලියවා මේ වස්තුව අප විසින් දෙනලදය කැමති කැමති සැටියෙන් ප්‍රයෝජන විඳුවයි රන්පත මහල්තලයෙහි ටැම්ඹෙහි බඳවා නුවර බෙරහසුරුවා ඒ සා මහත් සම්පත් හැර එබිසව් නුවරින් නික්මුණාහ. එවේලෙහි එනුවර ඇලලුනේ මහජනයෝ එක්ව රජ්ජුරුවන්වහන්සේත් බිසවුන්වහන්සේත් රාජ්‍යය හැර තපසට නික්මුණුසේක අපි දූත් කුමක්කරමෝද්දෙහෝයි ඔවුනොවුන් හා කැටිව කථාකොට සම්පත් පිරුණු වෙනම ගෙවල්වල තබා දරුවන් අත් අල්වා වඩා ගෙණ තමන්ගේ ගෙවලින් පිටත්ව ගියාහ. සියලුම සල්පිල් සැදුවනම තිබුනේය. ගෙවල පිළිසන්ව තිබූ වස්තු තාස් මිදුල්වල කැටිකොට තබා නික්මුණාහ. ඔවුන් අතුරෙන් කරකැවී සම්පත් බලන කෙණෙකුත් නැත්තාහයි සියලු නුවර සිස්වූයේයයි ඒ බිසව් තුන්යොදුනෙක පැතිර සිටි පමිත් ඇර ගෙණ ගියෝය

හත්ථිපාල කුමාරයෝ ඒ ගිය ජනයාට ආකාශයෙහි ඉඳ බණ කියා මෙසේ දොළොස්යොදනෙක පැතිර හිව්ගැවසී සිටි මනුෂ්‍යයන් ඇරගෙණ හිමාලයට අභිමුඛව නික්මුණේය. හත්ථිපාල කුමාරයෝ දොළොස්යොදුන් බරණැස්නුවර සිස්කොට පැවිදිවෙමි වනයට නික්මුණාහ. බොහෝ සත්ත්වයන්ගේ යාමෙන් නැවත නොබෝ දවසකින් තිස්යොදුනක් තැන් අතුරු නැතිව පැතිර සිටින පමණ මහත් සමාගමය වූයේය.

එකල්හී සක්දෙව්රජ මනුෂ්‍යලෝකය බලා හත්ථිපාල කුමාරයන් තපසට හිමාලවනයට මහජනයා හා සමඟ වන්නේය ඔවුන් වසන්ට නිසි පන්සලක් බලන්ට වටනේයයි විශ්වකර්ම දිව්‍යපුත්‍රයාහට නියෝගකොට සතිස්යොදනෙක පමණ පන්සලක් කරවා ප්‍රව්‍රජිත පරිස්කාරයන් නිර්මිතකොට පන්සලෙහි දඹුමැසි කොල ඇතිරිලි පණවා දඬුකෙණ්ඩිකාත්, අඳුන්දිවිසම්, ජටාමඬුලු ආදී සියලු තවුස් පිරිකර පිළියෙලකොට එකි එකී පන්සලෙහි සක්මන් මලුයෙක ඒ සක්මන්කෙළවර වැතිරගෙණ සිටිනා අලම්බනඵලයෙක ඒ ඒ ස්ථානයෙහි නොයෙක් පැහැයෙන් යුක්තවූ මනාවූ සුවඳ වහනයකරණ මල්ගස්ද එසේම එකී එකී මලුකෙළවර ප්‍රසන්නවූ මිනාපවූ ජලයෙන් පිරුණු ලිදෙක් වන්නේය. ඒ ලිඳ සමීපයෙහි නොයෙක් මධුර රසයන් ඇති ඵලගෙණ සිටිනා එකී එකී වෘක්ෂයෙකැයි යනමේ සියල්ල දෙවතානුභාවයෙන්ම මැවූයේය. පන්සල් දොරකඩ ප්‍රව්‍රජිතපරිස්කාරය තබා යම්කෙණෙක් මහණවනු කැමැත්තාහු වීනම් ඔහු මේ සියල්ල සැපසේ ප්‍රයෝජන විඳිත්

එයි කියා දැහිඟුලෙන් භිත්තිය අකුරුලියා පන්සල්සමීපයෙහි චණ්ඩමෘගයන් දුරුකොට විස්කම් දෙව්පුත් දෙව්ලොවටම ගියේය. හත්ථිපාල කුමාරයෝ එක් පියවර සටහන් ඇති මගින් පන්සලට ගොස් භිත්තියෙහි අකුරු දැක අපි මහ නිනිෂ්ක්‍රමණකළ නියාව දැන සක්දෙව් රජහු විසින් පන්සල් මවනලද්දේ එතැයි ඇතුළට වැද තවුස්වෙස් ගෙණ කීප වරයෙකැසක්මන්කොට අවශෙෂ ජන සමූහයා සවස්වන කල්හි පැවිදි කරවාගෙණ අපට ආරක්ෂා සලස්වා විධානකරන්නාවූ ලදරුවන් ඇති ස්ත්‍රීන්ට මධ්‍ය පන්සල් සලස්වා ඊට අන තුරුව මැහැලි ගැහැණුන්ට පන්සල් සලස්වා ඉන් ඉන්බිති වඳ ස්ත්‍රීන්ට පන්සල් සලස්වා හාත්පසින් වටකොට පුරුෂයන්ට පන්සල් සලස්වා වසනකල්හි පසල් නුවරෙක රජෙක් බරණැස්නුවර රජදරුවෝ නැත්තාහයි නුවරට අවුත් රත්රුවන් මුතුමැණික් ආදියෙන් හා ධන ධාන්‍යවස්ත්‍රාභරණයෙන් පිරුණු නුවර දැක රජගෙයි උඩුමාලෙහි තැන තැන ගොඩකොට තිබෙන රත්රන් රාසීන් බලා මෙබඳු නුවර ඇර තපසට ගියේ ඒකාන්තයෙන් මේ රජසැපතටත් වඩා මහත් සැපතක් නිසාවේදැයි අපිත් ඒ තපසට යම්හයි එනුවරෙහි රුදනු සුරාසොඬුන් අතින් මග විචාරා හිමාලයවනයට ගියේය. මහබොධිසත්වයෝ ඒ රජ්ජුරුවන් තපසට ආ නියාව දැන පෙර මගටගොස් ආකාශයෙහි ඉඳ සරාජික පර්ෂදට බණ කියා පන්සලට ගෙණවුත් පැවිදිකරවා වාසයකරණ පරිද්දෙන් පන්සල් සලස්වා ඔවුන්ට නිසි කමටහන් දී වසන කල්හි අනිකුත් රජදරුවෝ සදෙනෙක් බරණැස බලන්ට අවුත් මහත්වූ ඓශ්වර්‍ය්‍යයට පැමිණ මේ සා සැපත් හැර තපසට ගියකල සවල්පවූ සැපත් ඇර අප යනබව ආශ්චර්‍ය්‍යනොවන්නේයයි හත්ථිපාල කුමාරයන් සමීපයට ගොස් මහණවූහ. සතිස්යොදනෙක පමණතැන් ඒ සා මහත් පන්සල් අතුරු නැතුව පිරුණේය. මේ සා ජනසමූහයා අතුරෙන් යම්කෙණෙක් කාමවිතර්කාදියක් සිතූනම් මහබොධිසත්වයෝ ඔවුන් සමීපයට ගොස් බණ කියා කිසුනු පිරියම් භාවනාකොට ඔහු කී පරිද්දෙන් යෙදී අෂ්ට සමාපත්ති උපදවා වසන්නාහ. ඔවුන් අතුරෙන් දෙකොටසෙක් බ්‍රහ්මලොක යෙහි උපන්නාහ. දෙකොටසෙක් සප්තකාමසවර්ගයෙහි ඉපිද සැපවිඳිනාහ. තපස්විවරයන්ට අත්පා මෙහෙවර කළ මනුෂ්‍යයෝ මිනිස්ලොව ක්ෂත්‍රිය බ්‍රාහමණාදී උතුම්කුලයෙහි ඉපිද සැපවිඳිනාහ. ඒ බොධිසත්වයන්ගේ අවවාදයෙහි නොපිහිටි සත්වයෝ නරකාදී සතර අපායෙහි ඉපිද දුක්විඳින්නාහ.

තවද මෙම තාම්‍රපර්ණීද්වීපයෙහි පඨවිචාල ධර්මගුප්ත ස්ථවිරය, කන්දර වාසී පුෂ්‍යදෙව ස්ථවිරය, මලියවාසී සඞ්ඝරක්ෂිත ස්ථවිරය, මලිය මහදෙව ස්ථවිරය, භග්ගුලවාසී මහාදෙව ස්ථවිරය, තරග්ගලවාසී මහාදෙව ස්ථවිරය කාලවල්ලි පබ්භාරවාසී ස්ථවිරය, මණ්ඩලවාසී නාගස්ථවිරය යන මහාස්ථවිර යෝද බුද්දල සමාගමය, භූගපක්ඛ සමාගමය, චුල්ලසුතසොම සමාගමය, අයෝඝර සමාගමය, හත්ථිපාල සමාගමයෙහිදී සියල්ලවුන්ට පසුව නික්මුණු පර්ෂත් වන්නාහයි, භාග්‍යවත්වූ බුදුරජානන්වහන්සේ බුදුව වැඩහිඳ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදුරා පූර්වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක. එකල්හි ඒ සුකාරි රජනම් දැන් සුදවුන් නම් රජය. ඒ රජුගේ පුරෝහිත බමුණානම් දැන් කාශ්‍යපස්ථවිරය. අජ කුමරානම් මේ අනුරුඬ ස්ථවිරය. එකල්හි ගොපාල කුමාර නම් මෞද්ගල්‍යායන ස්ථවිරය. එකල්හි අශ්වපාල කුමාර නම දැන් මේ

ශාරිපුත්‍ර ස්ථවිරය. එකල්හි පෂීත් නම් දූත් මේ බුදුපිරිසය. එකල්හි සතිස් යොදනෙක තැන්හි ගැවසී සිටිනා තාපස සමූහයාට ගණදෙටු හත්ථිපාල බොධිසත්ත්වයෝ නම් බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

අයොඝර ජාතකය

තවද එක්සමයෙක්හි භක්ති ප්‍රේමභාරාවනත සුරාසුරනර මකුට මණි කිරණ ශිශිරකර පරිචුම්බිතපාදපද්ම ඇති ත්‍රෛලොක්‍යාග්‍රතිලකවූ අප බුදු රජාණන්වහන්සේ සකලජන නයන රසායනවූ ජේතවනාරාමයෙහි චතුර්විධ බ්‍රහමවිහරණයෙන් දවස්යවමින් වැඩවසනසේක් මේ අයොඝර ජාතකය තමන්වහන්සේගේ දසපාරමිතාවන්ගෙන් නෛෂ්ක්‍රම්‍යපාරමිතාව අරභයා වදාළසේක.

ඒ කෙසේද? යත්

එක්දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්ව උන් ශාරිපුත්‍රප්‍රමුඛ භික්ෂුසඞ්ඝයා වහන්සේ විසින් මෙවෙනි සක්විතිරජසැපත් හැර මහබිනික්මන් කළසේ ඉතා යහපතැයි වර්ණනාකොට වැඩ උන්කල්හි තිලෝගුරු බුදුරජාණන්වහන්සේ තුන්තරාගමනින් එක්තරාගමනයකින් වැඩ ධර්මසභාමණ්ඩපයෙහි වැඩ හිඳ භික්ෂූන්වහන්සේගේ අඩාලකථාව විචාරා බුදුන් නෛෂ්ක්‍රම්‍යාභිනිශ්‍රිත කථාවක් කොට උනුම්හයි දූන්වූකල්හි මහණෙනි දූන් මතු නොවෙයි පූර්වයෙහි නුමූකල නුවණෙහි සිටත් සියලුම ගෘහසම්පත්තිය හැර අභිනිෂ්ක්‍රමණය කෙළෙම්වේදැයි වදාරා ඒ භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේකි.

ඒ කෙසේද? යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහමදත්ත නම් රජ්ජුරුකෙණෙක් දශ රාජධර්මයෙන් රාජ්‍යය කෙරෙති. ඔවුන්ගේ අගමෙහෙසුන් බිසව්ද පිහිටි දරු ගැබ් ඇත්තාහු දසමස් ඇවෑමෙන් රන්රුවක් හා සමාන පුත් රුවනක් වැදූහ. ඒ බිසවුන්ට පූර්වජන්මයෙහි වල්ලභයක්හු නිසා වෛරබැඳි සත්‍රියක් සපත්නි රොසයෙන් ප්‍රාර්ථනාකරන්නී වැදූ දරුවන් කම්මැයි ප්‍රාර්ථනාකළාය. ඒ සත්‍රී ඈ කෙරෙහි ක්‍රොධයෙන් ප්‍රාර්ථනාකොට යකින්නීව උපන්නීය. වෛර නොකළාවූ සත්‍රීතොමෝ රජ්ජුරුවන්ට අගමෙහෙසුන්ව ඉපිද මේ පුත්‍රයා වැදුව ඒ යකින්නී එදවස් කිසි අවසරයක් ලැබ භයානක වේශයෙන් අවුත් රජගෙට වැද බිසවුන් බලා සිටියදීම ඒ කුමාරයා ඇරගෙණ නික්මෙන්නටවන එකල්හි බිසවු යකින්නක් මාගේ දරුවන් ඇරගෙණ යන්නියයි මහ හඬින් ඇඬූහ. එකෙණෙහි යකින්නී කුමරුවාගේ අතුල්පතුල් තල්පත් උකකිලිල් ආදී යක් කඩා කන පරිද්දෙන් ලේ වගුරුව වගුරුවා මුරු මුරු යන අනුකරණ දක්වමින් අනුභවකොට දරු වැදූ බිසවුන්ට නොයෙක් හස්තවිකාර මුඛවිකාර භයගන්වා නික්මුණාහ. රජ්ජුරුවෝ එබස් අසා ඈසට විසය කෙණෙකුන් නොවන්නාවූ යකින්නට අප විසින් කුමක් කළ ඇද්දැයි කීහ. නැවත වාර යෙක බිසව් වැදූ කල්හි නරව රැකවල්ලාවූහ. එතකුවුවත් බිසවුන් දරුවන් වැදූ කල්හි පෙර පරිද්දෙන්ම යකින්නී අවසර ලැබ ගෙටවැද ඒ කුමාරයන් පෙරසේම බිසවුන් භයගන්වා අනුභවකළාය. තුන්වෙනි වාරයෙහි බිසවුන්

කුස මහාබෝධිසත්ත්වයෝ පිළිසිඳගත්හ. එකල්හි රජ්ජුරුවෝ මහජනයා රාජාඞ්ගනයට රැස්කරවා කියන්නාහු බිසවුන් වැදූ දරුවන් එක් යකින්නක් කන්නීය. මක්කරමෝදැයි විචාළේය; එක් පුරුෂයෙක් කියනුයේ යක්කු තල් පතට බන්නාහුය. දේවීන්වහන්සේගේ හස්තපාදාදීන්හි තල්පත් බඳින්ට වටනේයයි කීයේය. එක් පුරුෂයෙක් යකඩින් කරණලද ගෙට වදනට බන්නා එබැවින් යකඩ ගෙයක් කරවන්ට වටනේයයි කීයේය. එසඳ රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා යහපතැයි ගිවිස තමන්ගේ විජිතයෙහි ඇති කඹුරුන් රැස් කරවා ගෙයක් කරවයි නියොගකොට රැකවල් ලැවූයේය. එකල්හි ! ඇතුළු නුවර රම්‍යවූ භූමි ප්‍රදේශයෙක්හි ගෙයක් කරවන්නාහු භිත්තිස්ථම්භ සොපාන ආදීවූ සියලු ගෘහසම්භාරය යකඩමය වූයේය. ඒසා මහත්වූ ජනයා එක්ව රාත්‍රි දිනයෙහි කර්මාන්ත කරන්නාහු නවමසකින් ඒ ප්‍රසාදය කොට නිමවූහ. ඒ ගෙය තෙමේ නිරන්තරයෙන් දිලිසෙන ප්‍රදීපයන්ගෙන්ද වටසිටි රන්රිදී මුතුදූල් ආදියෙන්ද යුක්තය. එකල්හි රජ්ජුරුවෝ බිසවුන් ගර්භය මුහුකුරා නියාව දැන ගෙය සරසා බිසවුන් ගෙයිලා රැකවල් ලැවූහ. ඔතොමෝ නොබෝ දවසකින් මහත් පුණ්‍යශ්‍රීන් ඇති රන්රුවක් හා සමාන පුත්‍රුවනක් වැදූහ. ඔවුන්ට නම් තබන්නාහු යගෙයිදී උපන්හෙයින් අයෝඝර කුමාරයෝයයි නම්තුබූහ. ඒ කුමාරයන්ට කිරිමවුන් සලස්වා බිසවුන් ඇරගෙණ නුවර පැදකුණුකොට මහත් ශ්‍රීවිභූතියෙන් සරහනලද ප්‍රාසාදයට වන්නේය; ඒ යකින්නිද වෙසමුණුරජහට පැමිණිවාරයට පැන් ගෙණයන අතරමඟදී ජීවිත විනාශයට පැමිණියාය. මහබෝධිසත්ත්වයෝද ගෙයිදීම වැඩී සියලු ශිල්පයන් ඉගෙණ නිමවූහ.

එකල්හි රජ්ජුරුවෝ මාගේ පුතනුවෝ කොපමණවූ වයස් ඇත්තෝදැයි විචාරා සොළොස් ඇවිරිදි වයසට පැමිණියෝය. ඉතා බුහුටිහ; මහත් ශක්ති ඇත්තාහ. යක්ෂයින් සියදහස්ගණන් වී නමුත් වළකාලන්ට සමර්ථයෝයයි යනු අසා එසේවීනම් මාගේ පුතනුවන් රාජ්‍යයට පමුණුවම් සිතා සියලුනුවර එකමඟුල් ගෙයක් මෙන් සරහා බෝධිසත්ත්වයන් පිටත්කොට ගෙණෙවයි කීයේය. අමාත්‍යයෝත් යහපතැයි රජ්ජුරුවන් කීබස් මුදුනෙන් පිළිගෙණ දොළොස්යොදුන් බරණැස්නුවර සරහා සියලු හස්ත්‍යාලඞ්කාරයෙන් සරහනලද මඞ්ගල හස්තිහු ඇරගෙණ ඒ ගෙය සමීපයට ගොස් අයොඝර කුමාරයන් සර්වාභරණයෙන් සරහා ඇත්කඳෙහි හිඳුවා දෙවයන්වහන්ස, නුඹවහන්සේගේ කුලසතු නුවර පැදකුණුකොට ප්‍රියවූ පියරජ්ජුරුවන්සේ ගොස් දුට මැනව අද දවස්ම ඡේතච්ඡත්‍රය ලබනසේකැයි කීහ. මහ බොධිසත්ත්වයෝ වැඳ එකත්පස්ව හිඳ රජ්ජුරුවන්වහන්ස, මට මේ රාජ්‍යයෙන් කම්නැත්තේය. ප්‍රාඥයන් විසින් මැනවැයි ප්‍රශංසා කරණලද තපස්කරණ පිණිස සුදුසු ප්‍රදෙශයකට යනු කැමැත්තෙමි අවසර දුනමැනවැයි කීයේය. එකෙණෙහි රජ්ජුරුවෝ කිම්ද රාජකුමාරයෙනි මෙවෙනි රාජ්‍යසම්පත් හැර කුමක්නිසා තපස් කරන්ට යවුදැයි කීකල්හි දේවයන්වහන්ස, මම අමෙධ්‍ය නරකයක් හා සදෘශවූ මවුකුස දසඑකඩමසක් වැස බිහිවූයෙන් යක්ෂභයින් සොළොස් අවුරුද්දක් සිරගෙයි වසන්නෙම් පිටත බලාපිය පමණකුත් නොලදිම් ඔසුපත් නරක යෙහි එලුකලක්මෙන් වීමි. යකින්න ගැලවුනු පමණකින් ජරාමරණ දෙකින් මිදුනෙම් නොවෙමි. මරණතෙමේ කිසිවක්හු විසින් ජයගත නොහැක්කේය. යම්තාක් ජරාමරණ දෙක නොපැණේද ඒ තාක් පැවිදිව මහණදම් පුරම්.

රාජ්‍යයෙන් මට ප්‍රයෝජන නැත්තේයයි කියා රජ්ජුරුවන්ට ධර්මදේශනා කරන්නාවූ මහබෝධිසත්ත්වයෝ මෙසේ කියත්. කාසිරාජ්‍යයට ප්‍රධානවූ රජ්ජුරුවන් වහන්ස, මේ ලෝකයෙහි යම්සත්ත්වයෙක්තෙම දෙමව්පිය දෙදෙනාගේ ශුක්ලශ්‍රොණිත කොට්ඨාසයන් නිසා කලල අවස්ථාවට පැමිණ ඉනුත් දෙවෙනිව අර්බුදභාවයට මස්බිඹු සටහනට පැමිණ එයිනුත් ක්‍රමයෙන් ඝන භාවයට පැමිණ එයින් මත්තෙහි හස්තපාදාදී අවයව භාවයට පැමිණ නැවත කෙස් ලොම් නිය ආදී තරව පඤ්චකාමයට පැමිණ මෑනියන් අනුභව කරණ අන්න පානයෙන් එරණ ඕජස් බුදිමින් මව්කුස නරකාවාටයක් මෙන් වැස දුක්විඳ දසඑකඩමසක් ඇවෑමෙන් මව්කුසින් බිහිව බාලදසකය ක්‍රීඩාදසකය යනාදී දස අවස්ථාවට පැමිණෙන්නේය. යම්සේ පළමු පෙණී ඉක්බිති කඩ කඩ භාව යෙන් පවතින් හරණලදුව ඒ ඒ අත විසුරුවන ලද වලාකඩතෙම පළමු තිබූ ස්ථානයට නොපැමිණ ගිය ගිය අත නැසීයන්නේද එපරිද්දෙන්ම මේ සත්ත්ව තෙම අර්බුද අවස්ථාවෙන් කලල අවස්ථාවට නොපැමිණෙන්නේය. පේසි අවස්ථාවටත් නොපැමිණෙන්නේය. ගිය ගිය අවස්ථා වශයෙන් ගොස් නස්නා පමණක් විනා පළමු සිටි අවස්ථාවට නැවත නොපැමිණෙන්නේය. බාලදසකය ක්‍රීඩාදසක අවස්ථාවටත් නොපැමිණෙන්නාහු මතුමත්තෙහි අවස්ථාභෙදයට යන පමණක් විනා ඉකුත් ඉකුත් අවස්ථාවට දෙවෙනිව නොපැමිණෙන්නාහ. එබැවින් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා නොපසුබෑස මිරුමුඛයට යන්නාහු මේ ජීවිතයෙහි කවර විශ්වාසයක්කොට සැපයක් විඳුමෝද නුවණැසින් බැලූ කල්හි දුක්ම පෙණෙන හෙයින් කිසි දුකක් නැති නිවන් සාදන්නාවූ තාපසව වසන්නා කැමැත්තෙමි.

තවද රාජෝත්තමයානන්වහන්ස, යුධයෙහි දක්ෂවූ ශෞර්‍ය්‍යවීර්‍ය්‍යයෙන් ඇති භයානකවූ වේශයන් ඇති ගන්නාලද දතන්වෙස්නන් අව්ඇති මහ සිව්රඟ සෙනඟද සමහර රජදරුකෙණෙක් තමන්ගේ අර්ථශක්ති මිත්‍රශක්ති ප්‍රභු ශක්තියෙන් ජයගන්නාහ. එබඳුවූ ත්‍රිශක්තියෙන් යුක්ත රජදරුවෝ මරණහු ජයගත නොහෙන්නාහ එබඳු ත්‍රිශක්තියෙන් එසේම මහත්වූ චතුරංගිනී සේනාව වටකොට ගත්කල්හිදු ශෞර්‍ය්‍යවීර්‍ය්‍යයෙන් ඇති සත්ත්වයෝ ඒ සතුරන් අතින් ගැලවී යන්නාහ. ඔහුද මරහු අතින් ගැලවීගත නොහෙන්නාහ. තවද ත්‍රිවිධ ස්ථානයකින් බිඳී වැහෙන්නාවූ මද දල ඇති මත්ත හස්තීහු ශත්‍රුරජදරුවන්ගේ නුවරද සත්ත්වයන්ද මැඩ සුණුකරන්ට සමර්ථවූවාහු මරහු මඩනට අසමර්ථයහ. තවද හස්තමනාකොට හික්මෙනලද ශිල්ප ඇති විදුලිය ආලෝකයෙන් වුවත් ලකනොවරද විදින්නට සමර්ථ ශබ්දවේදි ශරවේදී ආදීවූ ධනුර්ධරයෝද අවශෙෂවූ සතුරන්මුත් ඒ මරහු විදින්ට නොහැක්කාහ. රජ්ජුරුවන්වහන්ස මේ ලෝකයෙහි සියලු ප්‍රත්‍යසමුත්පන්න ධර්මයන්ගෙන් නොනස්නා කිසිවෙක් නැත. අනොතත්තය ආදීවූ සද්දනතලාද යුගන්ධරාදී සප්තකුල පර්වතයෝද වින්ධ්‍යාටවි ආදී ලොකයෙහි සියළු වනයෝද සප්තසාගරයෝද මේ මහා පෘථිවියද යන සියල්ලම නස්නේය. කල්පාන්තයෙහි එක්ලක්ෂ අටසැටදහසක් යොදුන් මහමේරුපර්වතය වග්නිමුඛයෙහි දමනලද වෙඩරුපිඩක් දමන් විළිනව යන් නේය. විනාශකාලය පැමිණී කල්හි එකද සංස්කාර ධර්මයෙක් තතු සවභාවයේ සිටපිය නොනෙන්නේයයි සියල්ලම බිඳීම සවභාවකොට ඇත්තේය. එබැවින් ශීලසංරක්ෂණයෙහි දවසැරීම මාගේ අභිප්‍රාය, අවකාශ දෙවා වදාළමැනව. තවද මේ ලෝකයෙහි සත්ත්වයන්ගේ ජිවිත නම් සුරාධූර්තයන්ගේ වසත්‍රයක්මෙන්ද

නදීතීරයෙහි පිහිටි වෘක්ෂයක්මෙන්ද අස්ථිර වෘක්ෂයෙහි පිළිකුත් ඵලයෝ පවනින් හරණලද්දාහු යම්සේ වැටෙන්නාහුද එපරිද්දෙන්ම සත්ත්වයෝ ජරා නැමති පෘථිවියෙහි වැටී විනාශයට යන්නාහ. යම්සේ චන්ද්‍රතෙමේ කෘෂ්ණ පක්ෂයෙහි හානියට පැමිණ නැවත ශුක්ලපක්ෂයෙහි සොළොසකලා යුක්තව පිරේද එපරිද්දෙන්ම මනුෂ්‍යයන්ගේ ආයුෂය නොපිරෙන්නේය. එසේහෙයින් ගියාවූ වයස් ඇති ජරාවෙන් මඩනාලද්දාහුට සැපෙක්නම් නැත්තේය.

තවද යක්ඛූපිසස්හු මනුෂ්‍යයන් කෙරෙහි කිපියාවූ සත්ත්වයා බොහෝසේ ව්‍යසනයට පමුණුවන්නාහ. එසේ ඔහු මරනු නැසිය නොහෙන්නාහ. දේවයන් වහන්ස රජදරුවෝ වූකලී රාජද්‍රෝහ කළාවූන්ද මංපැහැරීම් සොරකම් ආදිය කළාවූන්ද ගෙන්වාගෙණ දොෂානුරූපවූ දණ්ඩනය කරන්නාහ. අඥාතී ජීවිත හානියට පමුණුවන්නාහ. එසේවූ රජදරුවෝ වූකලී මරුහට අධිපති කළ නොහෙන්නාහ. තවද මේතෙම ක්ෂත්‍රියජාති ඇත්තේය. මේ තෙම බ්‍රාහ්මණ ජාති ඇත්තේය. මේ තෙම නුවණ ඇත්තේය ප්‍රශස්තවූ ගුණ ඇත්තේයයිද ඔහු කෙරෙහි මරණය කිසි අපෙක්ෂාවක් නැතිව විනාශයට පමුණුවන්නේය. චණ්ඩවූ සිංහ ව්‍යාඝ්‍රයෝද අවශෙෂවූ ව්‍යාල මෘගයෝද බලාත්කාරයෙන් සත්ත්වයන් අඩව අඩවා කන්නාහ. එසේවූ ව්‍යාල මෘගයෝත් මරුහට බලාත්කාර කළ නොහෙන්නාහ තවද රහමැද චක්ෂුමොහනාදිය කරණ මායාකාරයෝද සියලු ජනයාගේ චක්ෂුමොහනය කරන්ට සමර්ත්ථබවමුත් මරහු මොහනය කරන්ට අසමර්ත්ථයහ. උග්‍ර විෂතේජස් ඇති සත්ත්වයෝද මනුෂ්‍යයන් දෂ්ට කොට නසන බවමුත් මරහු දෂ්ටකොට නැසිය නොහෙන්නාහ. එසේවූ ආශිර් විෂයෝ යමෙක්හු දෂ්ටකළාහු නම් මන්ත්‍රෞෂධාදියෙන් සත්ත්වයෝ ඔවුන්ගේ විෂබානාහ, ඔහු මරහුගේ විෂය හික්මවිය නොහෙන්නේය. දත්තිරය වෙතෙර ණිය භොජනයයි යන වෙදත්‍ර ජනයින්ගේ උග්‍රවූ විෂ වැදී නස්නාහ. ඔවුන් මරහුගේ ආඥා නැමති විෂය ඉක්මවිය නොහෙන්නාහ. සොරතම් විද්‍යාව හදාළ විද්‍යාධරයෝ ඖෂධ බලයෙන් සත්ත්වයන් අදෘශ්‍යයට පමුණුවන්නාහ. ඔහුද මරහු අදෘශ්‍යයට පැමිණවිය නොහෙන්නාහ. එබැවින් රජ්ජුරුවන් වහන්ස අජරාමර අමෘතවූ නිත්‍යවූ සුඛසවභාවවූ පරම මධුරවූ නිවන් සැපත් විඳිනා කැමැත්තෙමි. මේ රාජ්‍යසැපතින් මට ප්‍රයෝජන නැත්තේයයි කීයේය.

තවද දේවයන්වහන්ස යම් පුරුෂයෙක් ධර්මය රක්තේ වීනම් ඒකාන්ත යෙන් ඔහු රක්කාවූ ධර්මයම ඒ පුද්ගලයා රක්නේය. එසේ හෙයින් මොනවට පුරුදුකරණලද ධර්මය මෙලෝ පරලෝ දෙක්හි සැපයක් සාදාදෙන්නේය. මේ ධර්මයේ විපාක ඒ ධර්මචාරී පුරුෂතෙම කිසිකලෙකත් දුගතියට නොයන්නේය. තවද රජ්ජුරුවන්වහන්ස කුසලාකුසල දෙක සමවිපාකයයි සිතනසේක්වීනම් එසේ නොවෙයි අධර්මයෙහි හැසිරීම නරක තිර්‍යක් ප්‍රේතාදී සතරඅපායට පමුණු වන්නේය. කුසලය තෙමේ ශක්‍රසම්පත් බ්‍රහ්මසම්පත් ආදීවූ දිව්‍යමනුෂ්‍යලෝක සම්පත්තියට පමුණුවා කෙළවර නිරුපවූ සැපඵලවන්නේය නිර්වාණසම්පත්ති යට පමුණුවන්නේයයි යනාදීන් ගාථා සුවිස්සකින් පියරජ්ජුරුවන්ට ධර්ම දේශනා කොට පියරජ්ජුරුවන්වහන්ස මට රාජ්‍යසම්පත්තියෙන් ප්‍රයෝජන නැතැයි කථාකොට කාලක්ෂෙප නොකළමැනවැයි ජරාමරණාදීහු ක්ෂණක්ෂණ යෙහි සත්ත්වයා නොහැර පසුපස්සෙහි ලුහුබඳනාහ. එබැවින් නුඹවහන්සේ වැඩසිටිය මැනවැයි කියා අවසරගෙණ ගිනිගත් ගෙයකින් පිටත්වන්නාවූ වීරපුරුෂයක්හු මෙන්ද අලාගතසතම්බ බිඳගෙණ යදම කඩාගෙණ නික්මුණු

මත්තහස්තියෙකු මෙන්ද රන් රිදියක් බිඳගෙණ නික්මුණ සිංහපොතකයෙකු මෙන්ද වස්තු ක්ලේශකාම නමැති පඤ්ජරය හා ශ්‍රීකලා බිඳහැර දෙමව්පිය දෙදෙනාට නැවත වැඳ තාපසව නික්මුනෝය. එකල්හි මහබෝධිසත්වයන්ගේ පියරජ්ජුරුවෝද මටත් මේ රාජ්‍යයෙන් ප්‍රයෝජන තිම්ද පොප හා කැටිව වනයට යෙමි. සියලු රජසිරි හැර බෝධිසත්වයන් හා කැටිව නික්මුණාහ. රජ්ජුරුවන් නික්මුණු කල්හි බිසව්ද අන්තඃපුර සහිතවූද යුවරජ සෙනෙවිරත් ආදීහුද බ්‍රාහමණගෘහපති ආදීහුද සිටු අනුසිටු ආදී සියල්ලෝම තමතමන්ගේ ඒසා මහත් සම්පත් අලුසම දමූ කෙලපිඬක්කොට නොසිතා හැර අයෝඝර කුමාරයන් හා කැටිවම නික්මුනාහ. මහත්වූ ජනසමාගමය දොළොස්යොදුනක් තැන්හි ගැවසී සිටියෝය. මහබෝධිසත්වයෝ මහජනයා ඇරගෙණ හිමාලවනයට ගියෝය. එසඳ ශක්‍රදෙවේන්ද්‍රතෙම අයෝඝර කුමාරයන් තපසට නික්මුණු නියාව දිවසින් පරීක්ෂා කොට ගොස් ඔවුන්ගේ ක්ලේශනිග්‍රහයට අවවාදදී සවකීය ස්ථානයටම ගියේය. ඔවුහු සවකීය ස්ථානයට ඇවිත් තපස්කරන්නේය; මෙලෙස ඒ මහබෝධිසත්වයන්ගේ අවවාදයෙහි සිට ධ්‍යානභාවනාවෙන් නොපිහුනු ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලෝකයෙහි උපන්හ. තුන්වෙනි කොටස තාපසවරහු ඉන්ද්‍රිය දමනය කොටගනතනුනු හෙයින් සදිව්‍යලෝකයෙහි උපන්නාහ. මෙසේ ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ එම්බා මහණෙනි පූර්වජන්මයෙහිත් මහාභිනිෂ්ක්‍රමණය කළ පරිදි වේද, ආශ්චර්යයයි වදාරා පූර්වාපරසන්ධිගලපා මේ අයෝඝර ජාතකය නිමවා වදාළසේක එසමයෙහි දෙමව්පිය දෙදෙනා නම් සුදොවුන් මහ රජ්ජුරුවන් හා මහාමායා දේවීන් වහන්සේයි. එසමයෙහි දොළොස් යොදුනෙක පැතිර සිටි පිරිස නම් මේ බුදුපිරිසමවූයේය. එසමයෙහි අයෝඝර පණ්ඩිතයෝ නම් දැන් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

501 පංචපණ්ඩිත ජාතකය

පඤ්ච පණ්ඩිත ජාතකය උමන්දවෙහි පෙණෙන්නේය.

විංශති නිපාතය නිමි.

ත්‍රිංශති නිපාතය

502 ජනඳ ජාතකය.

තවද එක්සමයෙක්හි සමස්තප්‍රභද්‍ර ධර ධරිත පරමාර්ථ සංසාරභූත ගුණ ගණාඪ්‍ය කාමනිර්මූලිත කුසුමිතාර්ඝ්‍ය ධර්මපරායන ධර්මාධික සරණ ත්‍රෛලෝක්‍ය තිලක අප බුදුරජාණන්වහන්සේ සකලජන නයනාභිරාම ජේතවනාරාමයෙහි මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂාය යන සතර ආර්ය්‍ය බ්‍රහ්මවිහරණයෙන් දවස් යවමින් වැඩවසනසේක් ත්‍රිභුජන මනඃ ප්‍රසාද ජනකවූ මෙකී ජනඳජාතකය උපාසකවරුන්ගේ පෙහෙවස් රැකීමක් අරභයා වදාළසේක.

ඒ කෙසේද? යත්

එක්දවසක් බුදුරජාණන්වහන්සේ පෙහෙවස් රකිනා බොහෝ උපාසකවරුන්ද උපාසිකාවරුන්ද බණ අසනු පිණිස දම්සභාමණ්ඩපයට අවුත් රැස්ව උන්නාවූත් දක පෙහෙවස් සමාදන්වූද උපාසකවරුණි විචාරා එසේය

ස්වාමීනි දූන්වූ කල්හි පෙහෙවස් රක්කාවූ තොප ඇම විසින් කළසේ යහපතැයි වදාරා උපාසකවරුනි, පුරාතන නුවණැත්තෝ පූර්වාහ්ණ හෙවා සමාදන්වූ අඩපෙහෙවස් රැකීමෙහි විපාකයෙන් බොහෝ යසස් ලද්දාහු වේදැයි වදාරා අතීත ජාතකයට මුඛමාත්‍රයක් දක්වා වැඩහුන් කල්හි උපාසකවරහුද භවයෙන් ප්‍රච්ඡන්නවූ පූර්වකථාව අසනු කැමැත්තාහු ස්වාමීනි බුදුරජාණන් වහන්ස සිල් රැකීමෙහි අනුසස් අසා දනුමෝවෝය. එතකුදු වූවත් පුරාතන නුවණැත්තන් රක්නා ලද අඩ්ඪුපොසථයෙන් ලබන ලද අනුසස් වදාළනොත් යහපතැයි ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ භවයෙන් පිළිපන්නාවූ මේ කථාව හස්තාමලකයක්සේ තමන්වහන්සේගේ ඥානයට ප්‍රත්‍යක්ෂ හෙයින් ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේ ? යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් දස රාජදහමින් රාජ්‍යය කරන්නේය. සෙසු රජවරුන්ට වඩා ධර්මයෙහි ඇදහිලි ඇත්තේවිය. පන්සිල් රැකීම් පොෂහාය නොවරදවා පෙහෙවස් විසීමෙහි අප්‍රමාදවූයේ සෙසු අමාත්‍යාදීන්ටද රාජ්‍යවාසීන්ටද පන්සිල් රැකීම ආදීවූ දසකුසල් සමාදන් කරවන්නේය.

මේ රජහුගේ පුරෝහිත බමුණු වනාහි අනුන් පිට මස්කන්නක්හු මෙන් අල්ලස්කන සුලුය. මැදහත් නොවන හෙයින් සොරවූ අධර්මිෂ්ඨ අධිකරණ නායකවූයේ රාජසේවය කරමින් දවස රිනේය. එක් දවසක් රජතෙම පොහොදවසෙක්හි ඇමති ආදීන් කැඳවා පින්වත්නි උපොසථ සීලය සමාදන්වූදැයි විචාළේය. එදවස් පුරෝහිත බමුණුතෙම පෙහෙවස් සමාදන්නොව දවල් අත්ලස් ගෙණ හිමියන් අහිමිකිරීමෙන් අධර්ම යුක්ති කියා සේවයට ආයේය. එසඳ ඔහු අතිනුත් උපොසථශීලය සමාදන්වූද ආචාරීනි විචාළේ එසේය, පෙහෙවීම් දේවයෙනි, කීය. ප්‍රාසාදයෙන් බවූයේය. මොහු සිල්සමාදන් නොවූ නියාව දත් අතික් ඇමතියෙක් පෙහෙවීමියි දූන් තොප බොරු කීයේ ඇයිද ආචාරීනි කළසේ නොයෙදෙයි කියා නින්දා කෙළේය. එසඳ පුරෝහිත කියනුයේ මම උදෑසන බත් අනුභවකොට ගියෙමි. දූන් වනාහී නොස් මුවසෝදා සිල්සමාදන්' වන පමණක්වේද එතකුදුවූවත් බත් නොකා ව්‍රතය නොබිඳීමේ මට අඩපෝය රැකෙන්නේයයි කියා ගෙට ගොස් පිරිසිදුව සිල්සමාදන්විය. තවද එක්සමයෙක අමාත්‍යයා අධිකරණ ශාලාවෙහි උන් කල්හී ආචාරසීලයෙන් යුත් ගැහැණියක් තොම කල්හොස් වේලාව ආසන්න බැව් දූන මුවසෝධා පෙහෙවත්ට පටන්ගත එකෙණෙහි එක්තරා පුරුෂයෙක් මනාව විලිකුන් අඹකැණක් පුරෝහිත බමුණාටදී එතෙම සත්‍රිය පෙහෙවූ බැව් දූන් වේලාවට මෙපමණමුත් අනුභව කරවයි අඹකැණ දින. ඕතොමෝ අඹ අනුභව කොට සිල්සමාදන්වූවාය. බමුණා විසින් කරණලද කුසල් මෙපමණෙක් වූයේය. මෙතෙම කල්යාමකින් කළුරියකොට හිමාලවන ප්‍රදෙශයෙහි කොසිකි නම් ගඞ්ගාව සමීපයෙහි තුන් යොදුන් පමණ අයම්විතර ඇති එක් වනයෙක්හි රම්‍යවූ භූමිප්‍රදෙශයෙක ජනිතවූ සෞභාග්‍යප්‍රාප්ත රන්විමනෙක්හි කොඳු පලස් අතුට විසිතුරු කරණලද ශ්‍රීයහන් මස්තකයෙහි නිදා පුබුද්දක්හු මෙන් ගොස් උපන්නේය. විසිතුරු වස්ත්‍රාභරණයෙන් අලඞ්කෘතකොට සැරහුනාබලා ඇස් ඇදගත නොහැකි උතුම් රූ දරණ සොළොස් දහසක් පමණ දෙවඟනන් විසින් පිරිවරණ ලදුව රාත්‍රිභාග

යෙහි අපමණවූ දිව්‍යසම්පත් විඳිතේය. විමන් ප්‍රේතභාවය හේතුකොටගෙණ මොහට පූර්වජන්මයෙහි කරණලද කුසලකර්මය හා සාදෘශ්‍යවූ විපාකවූයේය. එහෙයින් අරුණු නැගී කල්හි අඹවනයට වන්කල්හිම මොවුන්ගේ ආත්මභාවය අන්තර්ධානව අසූ අතක් පමණ ආත්මභාවය පහළවන්නේය. සියලු ශරීරයම ගිනිගෙණ දිලියෙමින් සුපිපිමලින් ගැවසීගත් කැලරුක් වන්නේය. ඔහුගේ අත් දෙකෙහිම එකී එකී ඇඟිලි වන්නේය. එහි මහත් උදලු පමණ තියුණු නිය ඇත්තේය. ඒ නියෙන් තමාගේ පිට මස්පලා උපුටා කමින් මහත්වූ වේදනාවෙන් පීඩිතවූයේ මහත් බැගෑපත් හඬින් අඬමින් දිවාභාගයෙහි ප්‍රේතදුක් අනුභව කරන්නේය. හිරු අස්තයට ගිය කල්හි ඒ ප්‍රේතශරීරය හැර දිව්‍යශරීරයෙක් පහළවන්නේය. අලඞ්කෘතකොට සැරහුනාවූ දිව්‍යස්ත්‍රීහු කාම මදයෙන් මත්වූවාහු නොයෙක් විලාශයෙන් බබලමින් අනෙකප්‍රකාර තූර්යභාණ්ඩයන් ගෙණ මොහු පිරිවරන්නාහ. එතෙම මහත් දිව්‍ය සම්පත් අනුභව කෙරෙමින් නන්දන වනය සේ සිත්කලුවූ අඹවනයට සමීපයෙහි වෛජයන්ත ප්‍රාසාදය සේ සිත්කලුවූ තමාගේ ප්‍රාසාදයට නැංගේය.

මෙසේ පූර්වජන්මයෙහි අා මැදහත්ව අධිකරණ විචාළ පුරෝහිත බ්‍රාහ්මණතෙම එසමයෙහි පෙහෙවස් රකින්නාවූ ස්ත්‍රියකට දුන්නාවූ අඹ කැණෙහි අනුසසින් තුන්යොදුන් පමණ මධුර ඵල හරිත දිව්‍යවූ අඹඋයනක් ලද්දේය. අල්ලස්ගෙණ අධර්මයුක්ති කී පාපයෙන් වනාහි තමාගේ පිටමස් තෙමේම උපුටා කමින් දිවාභාගයෙහි මහදුක් විඳිතේය. අර්ධපොසථ රැකි අනුහසින් රාත්‍රියෙහි මහත් දිව්‍යසැපත් විඳිතේය. සොළොස් දහසක් පමණ දිව්‍යාඞ්ගනාවෝද නැටීම් ගීකීම් බෙර වැයීමෙන් මොහු සිත් පොළඹන්නාහ.

එසමයෙහි බරණැස් රජතෙම කාමයෙහි ආදීනව දැක ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඒ විමානප්‍රේතයා වසන කෞශිකී නම් ගඞ්ගාව අසල සිත්කලුවූ භූමිප්‍රදෙශයෙක්හි පන්සල්කොටගෙණ ඵලාඵල මූලඵල ආදියෙන්ම යැපෙමින් යෙහෙන් දවස් හරනේය. එකල්හි ඒ උඩුගඟ මහත් අඹවනයෙක්හි මහ දිය කළයක් සා අඹපලයක් ගඟදියෙහි වැටී ප්‍රවාහයෙන් ගෙණයනු ලබන්නේ ඒ තාපසයන් ජලස්නානය කරණ ගංතෙරට පැමිණියේය. ඒ තාපසතෙම මුව සෝදන්නේ ගංමැද එන්නාවූ අඹය දැක දිය පීනා ගොසින් ගෙණ තපොවනයට වැද ගිනිහල්ගෙයි තබා ශස්ත්‍රයෙන් පලා යැපෙන පමණක් අනුභවකොට සෙස්ස කෙහෙල්පතකින් වසාතබා නැවත නැවත එදවස් මුලුල්ලෙහි අන්‍යගොචරයෙක් නොසොයා එම අඹරස අනුභව කළේය. නැවත ඒ නිමාගිය කල්හි අන්‍යවූ ඵලයක් කෑ නුහුනුයේ අඹරස තෘෂ්ණායෙහිම බැඳී එම අඹ අනුභව කෙරෙමියි යන ලොභයෙන් ගංතෙරට ගොසින් ගඟ බලා විඩාවෙමින් අඹ නොලැබ මෙතනින් නැගී නොසිටිම් සතිටුහන්කොට එතැන්හිම උන්නේය. මෙතනට පෙර පරිද්දෙන්ම නිරාහාරව දවසෙක දෙදවසෙක තුන්දවසෙකැයි මෙම ක්‍රමයෙන් සදවසක් මුලුල්ලෙහි අව්සුලගින් වියලෙමින් බල බලා හිඳිනේය.

ඉක්බිති සත්වෙනි දවස් ගංතෙරෙහි අධිගෘහිත දෙවතාවූ තොම මේ තාපසයා මෙසේ නිරාහාරව ඉඳිතේ කුමණ කාරණයෙන්දැයි විමසන්නේ ඒ කාරණය දිව්‍යනුවණින් දැක මේ තාපස තෘෂ්ණා වසඟව සතියක් නිරාහාරව ගඟ බලාගෙණ හිඳිනේ මේ සිල්වත් තාපසයාහට අඹ ඵලයක් නොදීම යුක්ත නොවන්නේය ඉඳින් නොලද්දේවීනම් මෙතැන්හිම මියයන්නේය. ඔහු කැමති

අඹ පිළිගන්වමි අවුදින් ගඟට උඩ ආකාශයෙහි සිට තාපසයන් හා සමග කථා කරණු කැමති දිව්‍යාඞ්ගනාතොම මෙලෙස කියන්නී- බාහිත පාපයන් ඇති හෙයින් බ්‍රාහ්මණයයි යන නමක් ඇති තාපසයෙනි, කවර සිතිවිල්ලක් ඇත්තෙහිද කවර අභිප්‍රායක් ඇත්තෙහිද කුමක් පතන්නෙහිද කුමක් ගවෙසනය කෙරෙමින් මෙතැන්හි ජනවිවික්තව සමන්තාපදායෙක්වූ ග්‍රීෂ්මකාලයෙහි ගඞ්ගා බලාහුන්නෙහිදැයි විචාළීය. ඒ අසා පිළිවද තාපසතෙම දෙවතාදූව, මම වනාහි ආදීනවයක් දැක ඉසිවෙස් ගෙණ කොසිවෙස් ගෙණ කොසිතික නම් ගංතෙර පන්සල්කොට වසන්නෙම් එක්දවසක් මුවසෝධන පිණිස ගංතෙරට බටුයෙම් සම්සේ ජලයෙන් පිරුණු මනාව වටවූ ඝටයෙන් ඔරුඉද එපරිද්දෙන්ම මහත්ව විලික්ෂුණු පැහැයෙන් සුවඳින් යුත ආම්‍රඵලයක් දැක පිහිනා ගොසින් දෙයතින් මහත් තැතීන් ගෙණහැර ගිහිහල්ගෙහි තබා යපෙන පමණක් අනුභව කෙළෙමි. තවද මිටින් ගතහැකි මනා වටව මධ්‍ය ප්‍රදෙශයක් ඇති දෙවීදළව තැවත ඉත් තිබූ භාජන කෙහෙල්පතින් වසා තව නැවතත් සැතීන් කපා අනුභව කෙළෙමි. එදවස් මුලල්ලෙහි අන් ආහාරයක් නොසොයා එම අඹරස අනුභව කෙළෙමි. අඹ දිවග තිබූ පමණකින්ම සත්සියයක් රස නහරවැල් පිණා මාගේ ක්ෂුධාව නිවුයේය. පහවූ කාය චිත්ත පීඩා ඇත්තෙමි. ක්ෂුධාභොජනයෙන් පිණාගිය දෙව්පුතක් මෙන් සතුටුවීමි.

අනුභව කළ වේලෙහි පටන් මෙතෙක් දවස් අනුභව කළ කෙහෙල් වැල වරකා ආදිවූ ඵලයන් කෙරෙහි සවල්පවූවත් අස්වැසිල්ලකට නොපැමිණෙමි. ඒ සියලු ඵලාඵලයෝ දිවග තිබූකල්හි තිත්තව වැටහෙන්නේය. දිව්‍යාඞ්ගනාව යම්හෙයකින් අන්කිසිවක් අනුභව නොකොට අවු සලඟින් වියලී මරණයට අභිමුඛව සිටියෙමි. එහෙයින් එදවස් දියෙන් යන මධුරවූ රස ඇති ආම්‍රඵලය ගණිමි කියා මටම ලංකළ එකක්හු වැන්නෙමි සිතමි නැවත ආම්‍රඵලය නොලද් දෙම් නම් මාගේ ජීවිතය නොවන්නේයයි යනාදීන් මේ සියලු ප්‍රවෘත්තිය මේ ගංතෙරෙහි තපස් කරණ මාවිසින් ඇතිසැටියේම කියනලද්දේය.

තෙපිත් වැලි මා සමීපයෙහි අහස්හි සිට කථාකරණපරිදීන් තොපගේ ආඥානනත් මට නොවලහා කියව පඤ්චකල්‍යාණයෙන් සමන්විතවූ දිව්‍යාඞ්ගනාව තී කවරෙක්හිද මනාවූ මධ්‍යප්‍රදෙශයක් ඇති තෙනැත්තිය කවර කාරණයකින් තොපි මේ ස්ථානයට පැමිණියාද නැවත ඔප්නගා කරණලද රන්රුවක් සමානවූ ජවිවණීය ඇත්තිය. කඳුරැලියෙක්හි සැරපහරින් වැරද බමණ ධෙනුවක්බඳුවූ නොයෙක් විලාසයෙන් බලන බැලුම් ඇත්තිය. තවද දිව්‍යලෝකයෙහි දෙවියන් සතුටුකරවන දෙවඟනකද මිනිස්ලොව රූපාග්‍රප්‍රාප්ත මිනුෂ්‍ය ස්ත්‍රීහුද රූපයෙන් තොප අනුවයන්නාහ තවද දිව්‍යමනුෂ්‍ය ගාන්ධර්වයන් කෙරෙහි දැක්ක නොහැකි අසදෘශ රූප ඇති රත් කෙහෙල්කඳ බඳුවූ ඌරු යුගලයක් ඇති දිව්‍යස්ත්‍රිය තොපගේ නාමමාත්‍රයද බන්ධූන්ද මට නොවලහා කියවයි ඒ තාපසතෙම දෙවී දූව අතින් විචාළේය.

නැවත කියන්නාවූ දෙව්දූ තොම මෙසේ කියන්නී, බාහිත පාපයන් ඇති හෙයින් බ්‍රාහ්මණනම්වූ තාපසයෙනි, යම් මේ මිහිරි ජලයෙන් පිරුණු ගඞ්ගාවක් ඇසුරුකොට විසූද මෝතොමෝ බොහෝ කලක් මා විසින් අධිගාහිතව වසන ලද මෙතන තොම නොයෙක් නා පනා ඇසල සපු මුහුලු දුනුකේ වැටකේ බඳුවද කිතිහිරි සුරභි දෙඉද්ද දැසමන් පරසතු කොවිලාර මේ ආදි තරු ගණයෙන් ගැවසීගත් තීරප්‍රදෙශයක් ඇත්තීය. නොයෙක්දෙසින් හඬා බස්නා ගිරි

කදුරැලි ඇත්තීය. වර්‍ෂාකාලයෙහි දෙතෙර ගලා යන මහත්වූ ප්‍රවාහයෙන් යුක්තව එතකුදුවූවත් මේ සියල්ලම මා ප්‍රධානකොට පවත්නේය. තවද වැලිත් මෙයින් පිටත් දහස්ගණන් කුන්නාදීහුද මෙගඟට වදනාහ. ඉඳුනිල්මිණි කරඬුවට බඳු සුනිල්දියෙන් පිරුණු ජලප්‍රවාහාදිය නෙකල්හි පැතිර සිටින වනහිසින් සුපක්ව ගිලිහුනු අඹ දඹ දෙල් බෙලි උක් තල් පොල් කිතුල් යනාදී මේ ඵල ජාතීන් අනවරතයෙන් බොහෝකොට කීමෙන් කම් කිම්ද ගංතෙර සිටි යම් රුක්හි යම් ඵලයෙක් හිනිනම් ඒ සියලුම ඵලජාති මාගේ ජලප්‍රවාහය අනුව යන්නේයයි මෙසේ ආමුඵලය ගඞ්ගාප්‍රවාහයෙන් පැමිණි කාරණය ප්‍රකාශ කෙළේය.

තවද ලාමකවූ ප්‍රඥා ඇති තාපසයෙනි, මා කියන්නක් අසව කාමයෙහි ආදීනව දැක රජසිරි හැර තවුස්වෙස් ගත් තොප විසින් රස ආදියෙහි තෘෂ්ණා බැඳීම නුසුදුසු වන්නේය මෙයින් පැමිණි රස තෘෂ්ණාවෙක් ඇත්නම් වැලකුව මැනව, තවද මස්ලොභයෙන් පිරුණු සිරුරු ඇති රාජ තාපසයෙනි, යම් හෙයකින් මේ මිහිරි අඹ නොලදින් මරණ කැමතියාද එහෙයින් තොපගේ ඥණවෑඩි භාවයෙක් නැතැයි සිතමි. තවද තපසුන්ට නුසුදුසුවූ මේ තෘෂ්ණා බන්ධනය සදිව්‍යලෝකයෙහි දෙවියන් හා බ්‍රහ්මයෝද දිව්‍ය ඍෂිවරයෝද තොප නොකිවත් තමන්ගේ ආනුභාවයෙන් දන්නාහ. ඒ ඍෂිවතුන් විසින් මෙනම් තාපසයන්ගේ අධ්‍යාශය නපුරු නියායයි කියන තෙපුල් ඇසූ ඔවුන්ගේ පරවාරිකා මනුෂ්‍යයෝද දන්නාහ. එහෙයින් පව්කරන්නාහට රහසෙක් නම් නැත්තේයයි සිතා තාපසයන්ට පසුතැවිලි දක්වා කීයේය.

දෙවිදුවගේ බස් ඇසූ තාපසයෝද මේ මතු කියන වචනයන් කියන්නාහු- ත්‍රිවිධ සුචරිතධර්‍මයෙහි සවරූපද ශරීරයාගේ නැසීමද නාමරූපයන්ගේ චුතවීමද යම් ප්‍රාඥයෙක් දනිද යම්කිසි සතක්හු පරුපජීවිතයෙන් තොරකරණ පිණිස යත්න නොකෙරේද එසේවූ උත්තමයාට පාපවර්ධනය නොවන්නේය. තවද තපස්වී සමූහයා මුයින් කෙලෙස් තපන තපස්වී කෙණෙකැයි දන්නාලද්ද ලෝකවාසීන් විසින් මෙතෙම පාපයන් නසන්නේයයි දන්නාලද්ද යන මේ ආදි උතුම් ගුණ ඇති මා කෙරෙහි නුසුදුසුවූ නින්දාවචනයෙන් අපහාසකරණ තෙපි කිසි පාපයක් ද්වේෂයක් මා කෙරේ නැතිව නිබැඳී දෝෂාරෝපණය කරණ හෙයින් තොපි තොපට නිස්කාරණයෙහි පව් සොයන කෙණෙකැයි දෙවිදුවට අයුතුකොට කියා තවද මනාවූ මිණිමෙවුලෙන් හොබනා පුළුලුකුලු ඇති තෙනැත්තිය ඉදින් මම තොප විසින් අභිගෘහිත ගංතෙරෙහි නැසුනෙන් මෙසේ තපස්වී කෙණෙකුන් නිරාහාරව නැසී යාදී බලාහුනැයි මතු තොප අයසස් පැමිණෙන්නේ යනුත් වැලකුවයි කීහ. එසේහෙයින් පිළිවන්වූ ප්‍රාණ යක් නොරැකීමෙන් වන පවින් දුරුවව උතුම්වූ මී අඹ නොලදින් මාව තොප විසින් මළකල්හි සියලු ජනයෝ තොපට කරණ නින්දාවෙනුත් වලකුවයි කීහ. එබස් අසා දෙව්දූතොම මතු කියන කාරණයෙන් කියන නිසා මානුෂයන් විසින් නොඉවසියහැකි ඉවසන්ට යොග්‍යවූ රාජතාපසයෙනි, රස තෘෂ්ණාවක බැඳී තොප මෙතන උන්කාරණා දනිම් එසේහෙයින් මමත් තොප නතුවෙමි තොප කැමැති රසඅඹත් දෙමිකියා ඔබඳු තොපි ලාමකයන් විසින් හැරපියනොහැකි වස්තුකාම ක්ලේශකාමයන් හැර සීලාදී සුචරිත ධර්‍මයෙහි සිටියේ ද එසේ හෙයින් තොප කළසේ යහපත යම් කෙණෙක් පළමු මලකින් මිදී දෙවෙනිවත් මලක බැඳේනම එපරිද්දෙන් සමහර කෙණෙක් ධර්‍මය රකුම්හයි වැදත් අධර්‍ම

යෙහි හැසිරෙත් තම වැසිවලා පිල්ලකට වදනාමෙන් දවස දවස පාපයම වඩනේය. තෙපි වූකලී ඒ සා මහත් රජසිරි හැර ඉසිවෙස් ගත් තොපට මෙපමණ වරදෙක්වේද පැමිණියේයයි බොහෝ ගුණයේ සිත් සතුටුව ඒ දෙවිඳු වැඩිය මැනව උක් කැමැත්තවුන් උක් වෙතෙහි ලන කලක් පරිද්දෙන් අඹ කැමැති නුඹවහන්සේ එම අඹවනයට පමුණුවාලමි කියා ප්‍රියපුත්‍රයක්වූ වඩා ගන්නා මවකමෙන් තමාගේ පීන පියයුරු මත්තෙහි ඔහු වතුරුවාගෙණ දිය පිට ගමන්ගත් රාජහංසයෙකුමෙන් නිල්වූ අහස්හි පියවිගමන් ගොස් මේඝ මූඛට දිලියෙක විදුලිකලඹක් මෙන් තමාගේ රුසින් වනහිස් බබුලුවමින් අයම් විතරින් තුන්යොදුන් පමණ ඇතිව ඒ අඹඋයනෙහි තාපසයන් සිටුවා තැන තැන සිහිල් සෙවනළු බලා සතුටුව කෙළනා නොයෙක් පක්ෂිකුලත් බලව මනහර වැලිතලා බලව සුනිල් දියපිරි මේ ගඟ බලව යනාදීන් රම්‍යවූ අඹඋයන වර්ණනාකොට සතුටුකරණ දෙවිඳු පරිද්දෙන් කියන්නීය.

ඇතුළු සිතපත් සතුරන් නැසූ තාපසයෙහි මේ උයනෙහිම මල්මූවරද අනුභවකොට මත්ව බමන බමර කිගුමෙන් කම්දෙවියා කැඳවන්නාක්හු වන්නේය. තවද මෙහි වතුරු හිසින් තුරුහිසට පැන් බස්නා කොහ්ලිහිණියෝය· මයුරයෝය, ජීවංජීවක දණ්ඩමාණවකයෝය, පරපුටු කෙවිල්ලෝය, අටපා කෙවිල්ලෝය, කලුලිහිණියෝය, ඇත්ගිජුලිහිණියෝය, සැළලිහිණියෝය කෙවිලඩිගතෝය, හංසයෝය යන මේ පක්ෂීන්ගේ රුවුපිළිරුවින් මෙනන පත්වූ සතුන්ගේ සිත් පුබුදුවන්නේය. වනදෙවියන් පැලඳි කුණ්ඩලාභරණ වැනි සුරක්තව විලිකුන් පැහැයෙන් එලගෙණ සිටිනා සමහර වෘක්ෂයෝය පිපීසිටි අක් ඇති සමහර අඹතුරු හිසින් බස්නා රොන්පතරින් වසනලද, සමහර බිම්පෙදෙස් අලුත් පිදුරු කලවටිමෙන් ඔරජනේය.

තවද මේ වනයෙහි සැදුනු මලින් ගැවසිගත් වනුක්ද බක්ද බක්මීද සලලවෘක්ෂයද එතැන්පත් සතුන් උමතුකරවන්නාවූ විලිසුණු නොවිලිසුනු තල්කැන්බරින් මිරිකුණු තල්ගස්ද බෙහෙවැයි මෙසේ අඹවනය වර්ණනා කොට මතු ලබන ශීලයෙහි එල දක්ම අත්වන කාන්‍යක් පරිද්දෙන් තොපගේ ගුණානුභාවයෙන් පැමිණෙනලද මේ උයනෙ අඹ කැමැති පමණ අනුභව කොට තෘෂ්ණාව නිවාගන මැනවැයි කියා දෙවිඳු තමා වසන විමානයටම ගියාය.

ඒ තාපසයෝද තෘෂ්ණාව පුරා අඹ අනුභවකොට වෙණෙහි ඇවිදුන තැනැත්තෝ දහවල් දුක්විඳ විමාන ප්‍රේතයාද දැක හයින් කිසිවක් කියාගත නුහුනුයේ හිරුඅස්තයට ගියකල්හි දිව්‍යවූ නාටකස්ත්‍රීන් පිරිවරා දිවසැපත් විඳිනාහු දැක ඒ තාපසතෙම මෙලෙස විචාරන්නේයි-

රාත්‍රියෙහි මාලාභරණ පැලඳ මිණිවටුනු දරා අඩගඳාභරණ පැලඳ රත් සඳුන් ඇඟ තවරා සියලු දිව්‍යාභරණයෙන් සැරසුනු තොපි සර්වාභරණයෙන් සැරසුනු සොළොස්දහසක් පමණ දිව්‍යනාටකස්ත්‍රීන් පිරිවරා දිවසැප විඳිනාහුය. එසේවූ තෙපි දිවාභාගයෙහි අපමණ දුක්විඳුව, එහෙයින් තෙපි පූර්වජන්මයෙහි තමහට දුක් එලවන දරු තොපට පුරෝහිත තනතුරෙහි සිටියෙහි දුන් මේ රාත්‍රියෙහි සැපවිඳීම එකල්හි තොපගේ නියෝගයෙන් රක්නාලද අඩ්ඩුපොසථ යෙහි අනුසසින් පැමිණියේය. දවල් මේ දුක්විඳීම එසමයෙහි මාම කළ අකුසල යෙහි විපාකයෙන් පැමිණියේය. ඒ කෙසේදැයි යතහොත් එසමයෙහි නුඹ වහන්සේ විසින් අධිකරණ නායක ධූරයෙහි තබනලදිම්. යුක්ති විචාරන්නේ

ඒ ඇති යුක්ති අයගෙන් අල්ලස් ගෙණ ඈ මැදහත් යුක්ති කියා අල්ලස් ගැණීම් වශයෙන් අනුන්ට පිට මස් කා දුවල් කරණලද අධර්ම යුක්තියෙහි බලයෙන් මෙසේවූ දුක්විඳිනාවූ ප්‍රේතතෙම මෙලෙස කියන්නේය. ධර්මය දූත ප්‍රේතවූතය හදරා වස්තුකාමයෙහි බැඳුනෙමි. එසේහෙයින් එකල්හි බොහෝ දවසක් නුනුවණින් මෙරමාහට අහිත එලවන පාපයන් කෙළෙමි. යමෙක් අනුන් පිට මස්කා අන්‍යාය කෙරේද එතෙම මෙපරිද්දෙන්ම තමා ඇඟ මස් තෙමේම උපුටා කමින් ගිනිගෙණ දිලියෙන සිරුරු ඇතිව මහත් ප්‍රේත දුක් විඳින්නේ යයි මෙපරිද්දෙන් කියා තෙපි මෙතනට කෙසේ පැමිණියාදැයි විචාරණ ප්‍රේත තෙම රාජතාපසයන්වහන්ස, නුඹවහන්සේත් මේ කෙසේ ගොස් කෙසේ ආතියාදැයි විචාළේය.

ඒ තාපසද රාජ්‍ය ශ්‍රී අනුභවකෙරෙමින් සිට කාමයෙහි ආදීනව දැක තවුස්වෙස්ගත් තියාවද දියෙන් යන අඹඵලයක් ලැබ එහි වසඟවූ සිත් ඇති තියාවද ගඟ අධිගෘහිත දෙව්දුව විසින් මේ අඹවනයට පැමිණවූ නියාවද යනාදීන් සියලු මේ ආඥනන කීයේය. එකල්හි විමාන ප්‍රේතතෙම විචාරන්නේ කිමෙක්ද තාපසයන්වහන්ස, මෙහි රඳනා කැමතිසේක් විදැයි විචාළේය. එබස් ඇසූ තාපසයෝද මෙතැන්හි වසනු නොකමැතිවෙමි. පෙරමා තපොවනයෙහි පන්සලටම යනු කැමැතියෙමි කීයේය.

එකල්හි විමාන ප්‍රේතතෙම යහපත ස්වාමීනි වැඩිය මැනව. මමත් මෙතැන්පටන් නිරන්තරයෙන් ඵලාඵල නිසා දුක්ගෙණ තපස් කරණ පරිද්දෙන් දිව්‍යපමණින් මේ අඹඵල දන්දෙමි තාපසයා තමාගේ ආනුභාවයෙන් ඒ පන්සල බහා උකටලී නොව මෙහි විසුවමැනවැයි ප්‍රතිඥගෙණ නිරන්තර යෙන් අඹ ගෙණගොස් පිළිගන්වන්නේය. තාපසයෝත් ඒ අඹ අනුභවකොට දැහැමින් වැස කිසුනු පිරියම්කොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයෙහි උපන්නාහයි බුදුරජානන්වහන්සේද උපාසකවරුන්ට චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ ජාතක ධර්මදේශනාව ගෙණ හැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

මේ ධර්මදෙශනාවගේ කෙළවර බොහෝ සත්ත්වයෝ සෝවාන් සෙදගැමි යන මාර්ගඵලාදියෙහි පෙදී හවදුකින් මිදුනාහ. එසමයෙහි දෙව්දූ නම් උත්පලවර්ණ මහාස්ථවිරින් වහන්සේය. එකල්හි තාපසයෝ නම් බුදුවූ මම්ම යයි වදාළසේකි.

503
කුම්භ ජාතකය.

මවද එක්සමයෙක්හි භක්ති ප්‍රේමාතිභාරාවනත සුරාසුරවර මහොඝයන්ගේ මුදුනෙහි රැඳි කිරුළු කුළු මිණියෙන් සැදුම් ලද ශ්‍රීපාදයන් ඇති කරුණාමණි ප්‍රභාවූ සාක්‍යකුලතිලකවූ මාගේ ස්වාමි දරුවූ ත්‍රිලෝගුරු බුදුරජානන්වහන්සේ ජනනයනරසායන තරුගණොප ශොභිත ජෙතවනාරාමයෙහි වැඩවසනසේක් ශ්‍රොත්‍රපත රසායනවූ මේ කුම්භ ජාතකය විශාඛාවන්ගේ යෙහෙළිවූ සුරාපානය කළ පන්සියයක් පමණ ස්ත්‍රීන් අරභයා වදාළසේක්.

ඒ කෙසේද ? යත්,

එක්සමයෙක්හි සැවැත්නුවර රා බී කෙළනා කෙළියක් පිණිස නුවර බෙරහැසුරුවූහ. එකල්හි විශාඛාවන්ගේ යෙහෙළිවූ පන්සියයක් පමණ සත්‍රීහු තමන්ගේ වලලනයන් සැණකෙළි කෙළ ඉක්බිති තුබූ පමණකින් මත්ව යන තරම් තීක්ෂණවූ සුරාවක් සපයා සැණකෙළි කෙළම්හයි සියල්ලෝම විශාඛාවන් සමීපයට ගොස් විශාඛාවෙනි රා බී සැණකෙළි කෙළම්හයි කීහ.

එසඳ විශාඛාවෝ කියන්නාහු එම්බල යෙහෙළිනි මම මේ සුරායෙහි දෝෂ දක්නා බව හෙතුකොටගෙණ සුරාපාන නොකරම්හයි කීහ. ඔහු කියන් නාහු එසේවීනම් තුඹවහන්සේ බුදුරජානන්වහන්සේට දන්දී බණ අසුව මැනව, අපි රා බී සැණකෙළි කෙළම්හයි කීහ. විශාඛාවෝත් යහපතැයි ගිවිස සම්ඥයන්වහන්සේ පවරා දන්දී පස්වරු ගඳදුම් මල්පහන් ගෙන්වාගෙණ බණ අසනු පිණිස පන්සියයක් පමණ සත්‍රීන් විසින් පිරිවරණලද්දුව ජෙතවනාරාමයට නික්මුනාහ. ඒ පන්සියයක් පමණ සත්‍රීහුද ඔවුන් කැටිව ගොස් විශාඛාවන් වාසලින් ඇතුළට වදුන්ම ඒසත්‍රීහු එකී එකී දෙන තම තමන්ගේ කෙල්ලන් සඟවාගෙණ ගොස් දුන් සුරාව සඟවා බී විශාඛාව සමග ගොස් බුදුන් සමීපයට එළඹියාහ එසඳ විශාඛාවෝ ගෙණගිය ගඳදුම් මල්පහන් ආදියෙන් බුදුන් පුදා එකත්පස්ව උන්නාහ. සුරාපානය කොට කැටිව ගිය සත්‍රීන්ගෙන් බුදුන් ඉදිරියෙහි සිට රා මදින් මත්ව සමහරකෙණෙක් නටන්නටවන්හ. සම්හර කෙණෙක් ගායනා කරන්ටවන්හ. සමහරකෙණෙක් ඔබරකරන්නාහ. එවේ ලෙහි සත්‍රීන්ට සංවේග උපදනා පිණිස තමන්වහන්සේගේ භ්‍රෑ යුග්මයෙන් රුස්විහිදුවා වදාළසේක. ඒ නික්මුණාවූ රුස්මිකදම්බයෝ ලෝකාන්තරකය පරිද්දෙන් ඒකාන්ධකල කල්හි රා බී නවන්නට වත් පන්සියයක් පමණ සත්‍රීහු මරණභයින් තැතිගත්හ. ඒ කාරණය හේතුකොට ඔවුන්ගේ රා මද සිඳුනේය. භාග්‍යවත්වූ බුදුරජානන්වහන්සේ වැඩඋන් බුඩාසන මස්තකයෙන් අතුරු දන්ව මහමේරු පර්වත මස්තකයෙහි වැඩසිට ඒ සත්‍රීන්ට භවයෙහි කලකිරීමට වන පරිද්දෙන් ධර්මදෙශනා කොට වදාරණසේක් :-

කොනුහාසො කිමානන්‍දො නිච්චං පජ්ජලිතෙ සති,
අන්ධකාරෙන ඔනද්ධා පදීපං න ගවෙස්සථ.

යන මේ ගාථාව වදාළසේක. ඒ ධර්මදෙශනාවගේ කෙළවර ඒ පන්සිය යක් පමණ සත්‍රීහු සෝවාන්ඵලයෙහි පිහිටියාහ. බුදුහු නැවත ක්ෂණයෙහි වැඩ ගන්ධකුටිච්ඡායාවෙහි පණවනලද බුඩාසන මස්තකයෙහි සරාසිරුමෙන් දිලිහි දිලිහී වැඩඋන්සේක් ඉක්බිති විශාඛානොමෝ බුදුරජානන්වහන්සේට නමස කාර කොට විචාරන්නී ස්වාමීනී, මේ හිරි ඔතප් නසන්නාවූ සුරාපානය කවර දවසෙක ඇතිවීදැයි විචාළීය විචාළාවූ ඒ විශාඛාවන්ට සුරාපානය උපන්නාවූ පරිදි වදාරන්නාවූ බුදුරජානන්වහන්සේ මේ පූර්ව කථාව ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේදැයි යනහොත්, බරණැස බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරණ සමයෙහි කසීරට වසන සුර නම් වල්වැද්දෙක් බඩු සොයන පිණිස හිමාලයවනයට ගියේ ඒ හිමාලයප්‍රදෙශයෙයි එක් මහවෘක්ෂයෙක් මිනිස් පමණක් විවරදී තුන්බලයෙක් විය. ඒ බලතුන අතුරෙහි මහා සැළක් පමණ

වළෙක් වූයේය. ඒ වළතෙම වැසිවටහි දියෙන් පිරුණේය. ඒ ගසවට ඇඹුලු අරළු මිරිස් වැල් ඇදීවූ තුරු ලිය තිබී සිටියේය. ඔහුගේ එළජාතීහු තුවටුවෙන් ගිලිහී වළ අතුරෙහි පිරීසිටි පැනෙහි වැගිරෙත්තාහ එතනට නුදුරු තැන්හි සයංජාත හැල්වනයෙක් ඇත්තේය. එයින් ගිරවුන් කරල් කඩාගෙණ අවුත් ඒ ගසහිඳ බොහෝසේ කත්තාහ. ඔවුන් තුඩින් වගුල ඇල්කරල්ද වියට සාලටද ඒ ගස් සිදුරෙහි පිරීසිටි පැනෙහි වැටී සූයඊපාකයෙන් පැසෙන බව හේතුකොටගෙණ සාවුන්ගේ ලෙහෙවන් පැවූයේය. ග්‍රීෂ්මකාලයෙහි පිපාසිතව යිරා බොකල සැළලිහිණි ආදි පක්ෂි සමූහයෝ ගස්සිදුරෙහි තිබූ පැන් බී මත්ව බිම හී ගසමුල රා මදයෙන් සුහක් නිදා රා මද සන්හිඳුනු කල්හි උදව්ව අහසට පැනතැගී යත්තාහ අවශෙෂ රුක ඉඳ වඳුරෝ එපරිද්දෙන්ම පැන් බී මතව ගසමුල වැටී රා මද සිඳුනු කල එතැන්හි කෙළ ඇවිදිතාහ.

එකල්හි වනසුර නම් මල්වැදිතෙම මේ ප්‍රවෘත්තිය දැක ඒකාන්තයෙන් මේ විෂයෙක්වීනම් සියලු ප්‍රාණීහු මියයන්නාහ. දූත් වූකලී මේ පක්ෂිපටන් සියලු ප්‍රාණීහු මේ පැන් බී මූර්ඡාව නැගීයන්නාහ එසේහෙයින් මේ විෂනොවෙයි කියා තෙමේ බී මත්ව මස් කනු කැමතිවිය. සථානයෙහි ගිනිමොලවා ඒ පැන් බී මූර්ඡාව හුනු තිත් වටුවන් වලිකුකුළු දියකුකුළු ආදි පක්ෂීන් මරා අගුරෙහි ලා පලහා එක් අතකින් මස් කකා එක් අතකින් අහිතව දක්ව දක්වා තටින් තේය දෙතුන් දවසක් ඒ ගසමුල වැස එතනට නුදුරු සථානයෙක්හි වරුණ නම් එක් තාපසයෙක් වෙසෙයි. ඒ රා බී මත්ව කෙළනා වැදිපුත්‍රතෙම එක් දවසක් තාපසයන් සමීපයට ගොස් කථාකොට අවුත් නැවතත් දවසෙක්හි ඒ තාපසයන් සමීපයට යනුයේ මේ මධුරවූ රස ඇති පානය තාපසයන්ට ගෙණ යෙමි සිතා උණ නලේක පැනුත් පුරාගෙණ අගුරෙහි පැලහු මස් හා සමග පන්සලට ඇරගෙණ ගොස් තාපසයෙනි, පැන් මධුරව තිබුයේය ගෙණගිය රා මස් දෙදෙනම අනුභව කළාහ.

මෙසේ මේ සුරා නම් වැද්දා හා වරුණා නම් තාපසයන් විසින් පළමු කොට දක්නා ලද හෙයින් සුරායයි කියාද වරුණයයි කියාද නම්වූයේය. ඔහු දෙදෙනම කලක් එහි වැස මනුෂ්‍යපථයට එනු කැමැත්තාහ. මේ සුරාව කෙසේ ගෙණයමෝද්‍යෝහෝයි පරීක්ෂාකොට වන්නාට උපායෙක් ඇති හුන තලවල පුරාගෙණ පසල් දනව්වට ගොස් ක්‍රමයෙන් රාජධානියට ගොස් වැද පානගාරිකයයි යන අමුතු අයෙක් ආහයි රජ්ජුරුවන්ට කියායවූහ. රජ්ජුරුවෝ ඔවුන් ගෙන්වා දුටහ. දෙදෙනම තමන් ගෙණගියාවූ පැන් රජ්ජුරුවන්ට දුන්හ. රජ්ජුරුවෝද පැන් දෙතුන් වාරයක් බී මත්ව දෙතුන් දවසක් කල්යවූහ. ඉක්බිති රජ්ජුරුවෝ ඔවුන් අතින් තවත් මේ මධුර පැන් ලැබ හැක්කදැයි විචාළාහ. දේවයන්වහන්ස, හිමාලයෙහි ඒ කියන රුක වෙලෙප් සිදුරක තිබෙන ලද්දේ ඇතැයි දැන්වූහ. එසේවීනම් ගෙණෙවයි මෙහෙවර ඇසූ ඔහු දෙදෙන තමන් කියන සුරා පළමු ගෙණා සිදුරෙන් ගෙණවුත් දෙතුන් වාරයක් පෙවූහ. තවද එක්වාරයෙක ගෙණෙන්ට කී කල්හි හිමවත් පෙදෙස නිතියන්ට ඉතා දුරුහෙයින් වරින්වර යානොහෙම්හ. එතකුදුවුවත් ඒ මධුරවූ ජලය නිපදවන කාරණා දනුම්හ. රුක්සිදුරෙහි තුබූ අරළු තෙල්ලි වී ආදී සියලු සම්භාරයන් දැක විභාගකොටගෙණ ඒ ගසෙහි සුඹුලුත් ඇරගෙණ රාජධානියට අවුත් මහසැල බහා නුවරෙහි සුරාව ඇතිකළාහ. නුවර වැස්සෝ සුරාව අනුභවකොට රා මදයෙන් මත්ව කල්යාමකින් ප්‍රමාදවීම හෙතුකොට

ගෙණ සත්ත්වයෝ දිළිඳුවූහ. සුඛිත මුදිත සත්ත්වයන් නැතිවීමෙන් ඒ නුවර යකුන් කෙළි සිස්පිටියක් මෙන් නිශ්‍රීකවූයේය. පළමුවෙන් සුරාව මනුෂ්‍යපථයට ගෙණා ඒ වැදිපුත්‍රතෙමේම ඒ නුවරින් නික්ම බරණැස් නුවරට ගොස් වැද පානාගාරිකයෝයයි අපූර් වෙළඳකෙණෙක් ආහයි රජ්ජුරුවන්ට දක්වා යැවූහ. රජ්ජුරුවෝත් ඒ පුරුෂයන් තමා කරා ගෙන්වා ඒ තොප ඉදිකරන්නාවූ පානය නම් කෙසේවූ දෙයෙක්දෝ හෝයි වැටුප් වියදම් දුන්හ. ඒ රා සොඬහු දෙදෙන සුරාවට උවමනා සියලු සම්භාරයන් එක්කොට සුරාව ඉදිකළහ. එසඳ ඒ දෙෂ නොදන්නා නුවරවාසී සත්ත්වයෝ සුරාපානය කොට මත්ව කෘෂිවණිජ්‍යාදි කර්මාන්තයෙහි ප්‍රමාදවූහ. ඒ කාරණය හේතුකොටගෙණ සත්ත්වයෝ දිළිඳුවූහ. නුවර සැපත් පිරිහුමෙන් තටුයේය. පෙර පරිද්දෙන්ම සුරා ඉදිකරන්නාවූ පුරුෂතෙම බරණැස් නුවරින් නික්ම සාකෙත නුවරට පැමිණ ඒ නුවරදී රා ඉදිකොට සත්ත්වයන් පොවා ක්‍රමයෙන් ඒ නුවරද නටකල්හි ඉක්බිති සැවැත්නුවරට ගියාහ.

එකල්හි සැවැත්නුවර සබ්බමිත්ත නම් රජෙක්විය. ඒ රජ්ජුරුවෝද ඔහට සංග්‍රහකොට තොපට රා ඉදිකරන්ට කුමක් උවමනාදැයි විචාළ කල්හි සුරාවට තිසි තෙල්ලී අරළු ඇතුළුවූ සියලු උපකරණද සාල්පිටිද පන්සියයක් පමණ මහ සැලවල්ද උවමැනවැයි කීහ. ඔහු කී සියලු උපකරණයන් රජ්ජුරුවෝ දෙවූහ. ඔහු පන්සියයක් පමණ සැලවලෙහි රා තගා සැලවල් රක්නා පිණිස එකී එකී සැලක් සමීපයෙහි එකී එකී බළලකු තියායෙන් බැන්දවූහ.

සැලවලෙහි රා පැසී ඉතිර වැගිරෙණ කල්හි සැලපිටින් වැගිරෙණ රා පෙණ බොමින් මත්ව මූර්ඡාවහොත් බළලුන් කන් නාසාද වාලධියද යනාදීවූ අවයව මීයෝ ලියාකෑහ. ඒ රා මඩලෙහි රකවල්හෙණ සිටි පුරුෂයෝ බළල්ලු රා බී මළහයි රජ්ජුරුවන්ට දැන්වූහ. එබස් ඇසූ රජ්ජුරුවෝ මොහු දෙදෙන විෂ ඉදිකරණ දෙන්නෙක් වැනියි කියා උන් දෙන්නාගේම ඉස් සිඳුහ. ඔහු දෙදෙනත් රාදෙව අමා ගෙණෙවයි කිය කියා මළහ.

රජ්ජුරුවෝ ඔවුන් මරවා අනතුරුව රා සැලවල් ගසා බිඳුවයි කියා නියෝග කළාහ. ඒ විධාන ඇසූ මිනිසුන් යනකාලට රාමද සිඳුනු බළල්ලු උදුරව කෙළිමින් සිටියාහ තැවත ඔවුන් කෙළනාවූ දුටු පුරුෂයෝ අවුත් රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ එවේලෙහි සිතන්නාවූ ඒකාන්තයෙන් මේ විෂයෙක් වීනම් මේ බළල්ලු මියන්නාහුය. එක්තරා මධුර පානයක් වියයුතුයයි ඒ නොදමා පානයකරම්හයි සතිටුහන්කොට නුවර සරහා රාජාඞ්ගනයෙහි මණ්ඩප කරවා එහි තගතලද දළපුඩුසේසතින් යුක්ත සිංහාසන මස්තකයේ හිඳ ඇමතිමඩුලු පිරිවරා උත්සවයෙන්සුරාපානය කරන්ටයයි පටන්ගත්හ. එකල්හි ශක්‍රදෙවෙන්‍ද්‍රතෙම මිනිස්ලොව කවර සත්ත්වයෙක් දෙමව්පියන් නැදිමයිලන් බැබූන් සිල්වත් ගුණවත් ආදීන්ට උපස්ථාන කෙරේද කවර සත්ත්වයෙක් ත්‍රිවිධ සුචරිතයෙහි යෙදී වෙසෙද්ද කවර සත්ත්වයෙක් දානමානාදී සුචරිතයෙහි යෙදී වෙසේද්දෝ හෝයි දහසක් නුවණැස් යොමා බලනුයේ ඒ සබ්බමිත්‍ර නම් රජහු සුරාපානය කරන්ට උන්නා දැක මේ රජහු බීමෙහි පුරුදුව ගියේසම් ජම්බුවීපය හැම නස්නේය. එසේහෙයින් මේ රජ සුරාපානයෙන් වළකමියි සිතා රායෙන් පිරුණු කළයක් අත්ලෙහි තබාගෙණ බ්‍රාහමණ වෙශයෙන් අවුදින් ආකාශයෙහි සිට මේ කළය මිලයට ඇරගණුවයි මෙපරිද්දෙන් අඬගා කීයේය. එවේලෙහි සබ්බමිත්‍ර නම් රජතෙම ආකාශයෙහි සිට කියන සක්දෙව් රජහු දැක මේ බමුණු

කොයිසිට කෙසේ ආයේදැයි පිළිවිස්නා රජතෙම මෙලෙස කියන්නේය. බ්‍රාහ්මණ යාතෙනි, රාත්‍රියෙහිවූ දෙවෙනි පුන්සඳ මඬලක් මෙන් අහස බබලන්නේය. තොපගේ ශරීරයෙන් නික්මෙන රැස්කළඹ සියරැලි විදුලිය සොභාවක් මෙන් දිගුන් හොබනේය. එසේ හෙයින් තොපි තව්තිසා දිව්‍යලෝකයෙහි සිට ආ දිව්‍යපුත්‍රයෙක්ද නොවලහා කියව.

තවද කිසි පිහිටක් නැති ආකාශයෙහි පවත් අනුව යන වලාකඩෙක දෙවියන් මෙන් සිටිනෙහිය. සක්මන් කරන්නෙහිය. තොප විසින් මඩනාලද සෑඩිතෙම හසරක් නැතිව අහස්හි හැසිරෙණ දෙවියන්ට සමතල භූමියක් වැනි විය. නැවත ආකාශයෙහි පියවර දක්වමින් ඇවිද මේ කළය විකුණ ගණුවයි කියව මෙලෙස කියන තෙපි කවර දිව්‍යපුත්‍රයෙක්ද මේ කළයේ පිටියේ කෙසේවූ දෙයෙක්දැයි විචාළේය. එකල්හි ශක්‍රදෙවේන්‍ද්‍ර තෙමඑසේකල අසවයි සුරායෙහි දෙෂවූ සැටි මෙලෙස කියන්නේය.

රජ්ජුරුවෙනි, මේ කළය තෙල් පිරුණායි කියාත් නොසිතව නැවත තල තෙල් ආදියෙනුත් පිරුණේ නොවෙයි උක්පැනින් පිරුණේ නොවෙයි මීයෙන් පිරුණේත් නොවෙයි. එසේහෙයින් මේ යහපත් දෙයෙකැයි නොසිතව මේ කළ යෙහි පිරුණු සුරා ආදියෙහි දෙෂ අසවයි කියා විස්තර රසයෙන් දෙෂ දක්වන් නාවූ ශක්‍රදෙවේන්‍ද්‍රතෙම මතු කියන ක්‍රමයෙන් කියන්නේය. රජ්ජුරුවෙනි යම්සේ සුරාපානයක් කොට සම්භූමියෙහිත් පැකිල වැටෙන්නේ හිඳ නිරාලම්බ නවූ ආකාශයෙහි එල්බෙන්නේය. ප්‍රපාතයෙහිද මත්ව වැටෙන්නේය. ගල් දුදුරෙහිද කුණුමෝලෙහිද ගවරවලෙහිද සුචි අසුචි නොදැන හෙන්නේය. නෙ කැයුත්ත කනනේය. එසේදවූ දෙයින් පිරුණු මේ කළය විකුණමි ගණුව කවද යම්සේ සුරාපානයෙහි තමාගේ සිතට ඉසුරුණුයේ සුරාකළ ආදියි අනුභවා කොට නොදුරුබිම බලා ඇවිදිනා ගොණකුමෙන් කිසිවකවත් නොදැන භ්‍රාන්තව ඇවිදිද කිසිකෙණෙකුත් විසින් නොකියන ලදුව ඔවුන් සමීපයෙහි වැද ගීකියන් නේය. යන්ත්‍ර රූපයක් මෙන් විළිනැතිව නටනේය. නැවත මේ සුරාව බී උමතු වූයේ අත්පිළිදමා නග්නයෙන් ගම්හිද රාජවීථියෙහිද නැටූනමනාවූන් මැදෙහිද නුසුදුසු වදන කියමින් ඇවිදිනේය. කිසිවෙක් මේ දෙයින් මූර්ඡාවූයේ පතකද කැතතක්හු මෙන් බොහෝ වේලක් වැදහෝනේය. එසේවූ සුරායෙන් පිරුණු මේ කළය විකුණමි ගණුව.

නැවත සුරාවක් යම්සේ අනුභවකොට පහළගුරෙහි වැටී පැහෙන්නේත් වේද, නිදිමත්වූ නැන්හි කැණහිලුන් ආදීන් විසින් කනු ලබන්නේත් වේද? අකාරි කාරී මෙන් නොයෙක් වධ බන්ධනාදියත් පැමිණෙන්නේය. අසූචි වැකුණු සිරුරු ඇත්තේ නැළිනගමින් කටින් පෙණදමා බොහෝ දුකට පැමිණෙන් නේය. එසේවූ සුරා පිරුණු කළය ඇරගණුවයි කීයේය. තවද රජ්ජුරුවෙනි මෙතෙම අධමවූයෙන් රා මදයෙන් මත්ව මම උතුමයෙමි, අහංකාරයට පැමි ණෙන්නේය. ඇස් රත්ව කැළඹෙන්නේය. චතුසසමුද්‍රය අවසන්කොට ඇති භූමි මණ්ඩලයෙහිම මම පොහොසතිමි. මම්ම නායකයෙම් සිතන්නේය. අධිකවූ මාන්නයෙන් කලහ වඩා කේලාම් ආදිවූ ප්‍රිය ශූන්‍යවූ බස් කියන්නේය. නපුරුවූ පැහැඇතිව නග්නව කොකරුණෙහි ඇත මැත දිව විඩාවන්නේය. මෙබඳු ගුණ උපදවන සුරායෙන් පිරුණු මේ කළය විකුණමි ගණුව. තවද යම් මේ සුරාවක් අනුභවකළ සත්ත්වයෝ තමන්ගේ කුලයන් නසා වස්ත්‍රාභරණ ධනධාන්‍යාදී සම්පත්තියෙනුත් පිරිහී විනාශයට පැමිණෙද්ද යම්සේ සුරාවක් අනුභව කොට මත්වූයේ මෑනියන් පියානන්ටත් අක්‍රොශ කෙරේද රාගයෙන්

රත්ව තොලඟ වියයුතු තැදි බුහුක්ගේ හස්තග්‍රහණය කරන්නේය. තවද යම් මේ සුරාපානයක් කළ සත්‍රිහු තමන්ගේ ගෙයි දසයකුත් මට සාමිවයි කියා අල්වන්නීය. යම් මේ සුරාවක් අනුභවකොට මහත්වූ කුසලධර්මයෙහි පිහිටි ශ්‍රමණ බ්‍රාහමණයන්ටත් හිංසා පීඩාකෙරේද ඒ මුල්කොට නරකාදී සතර අපායට ගොස් බොහෝ දුක් විඳින්නේය. එසේවූ සුරායෙන් පිරුණු මේ කළය විකුණමි ගණුව. සුරාමදයෙන් මත්වූ සත්ත්වතෙම අනවරතයෙන් කයින් වචසින් මනසින් පවුම් කරන්නේය. එයින් නරකාදී දුක්ඛයට කාරණාවූ පව් රැස්කරන්නේය. මෙසේවූ සුරායෙන් පිරුණු කළය විකුණමි ගණුව යම් මේ සත්ත්වයෙකු බොහෝ මුතු මැණික් රන්රිදී ආදිය දෙම්හ. එක බොරුවක් කියා පියවයි කී කල්හි සක්විති රාජ්‍යයක් දෙතත් බොරු නොකියම්හයි සාහසිකව බොරු නොකියාද එසේවූ කෙණෙක් සුරාව පූකල්හි බොරුම කියන්නාහ නැවත තමාගේ කර්මාන්තකරණ යම් මෙහෙවරය වියයුත්තක් අකාරියෙහි නොමෙහෙවරෙහි යෙදීමෙන් තමාගේ සියලුකාරිය නසාගන්නේය. තවද ලජ්ජා හිරිඔතප් රක්නාසත්ත්වයෝද සුරාමදයෙන්මත්ව මුඛාපන්නදෙයක් බෙණෙමින්ලජ්ජාහිරි දෙක නසන්නාහ නැවත මේ සුරාපානයෙන්මත්ව චණ්ඩාලාදී නුසුදුස්සන් හා එක්ව කමින් බොමින් හුරුපැටවූන් මෙන් ඉස් පැත් නැති වස්ත්‍ර පහිතවත් දත්නාහ. මධුරාන්නපානයෙක්හි රස නොලැබ ගොඩලි ආදියෙහි දැමූ දඩුකොට්ට සේ වැදහෙව බොහෝ ආයාසයට පැමිණෙති. යම් මේ සුරාපානයෙන් මත්වූ සත්ත්වතෙම බුන්කඳට ඇති ඒ කුලින් පාරලත් ගෙරින්මෙන් කිසිවක් නොකාම වැදහෙන්නාහු එසේවූ සුරා පිරුණු කළය විකුණමි ගණුව තවද දසබෑ රජ දරුවෝ රාබී මත්ව පොළු මුගුරු ඔවුනොවුන් පැහැර ජම්බුද්වීපයෙහි තෙසැට දහසක් රාජධානියෙහි පැවති අණසකින් යුත් රාජ්‍යශ්‍රීයෙන් පිරිහුනාහුද එසේවූ සුරායෙන් මේ කළය පිරුණේය.

තව්තිසා දිව්‍යලෝකයෙහි පළමු දෙවියෝ සුරාපානයෙන් මත්ව සමුද්‍ර මධ්‍යයටද දමනලද්දාහු දිව ඉසුරෙන් පිරිහුණාහ. එසේහෙයින් සුරායෙහි මෙබඳු දෝෂ දත් නොප වැනි නුවණැත්තෝ කෙසේ නම් වෙද්දැයි මෙහි ඇතිසැටිය මා විසින් නොවලහාම කියනලදැයි සක්දෙව් රජතෙම කීයේය. මෙපරිද්දෙන් සුරාපානයෙහි දෝෂ ඇසූ සබ්බමිත්ත නම් රජතෙම සන්තුෂ්ටව ශක්‍රයාට මෙලෙසින් කීයේයි. යම්සේ මෙලෝ පරලොවින් මට හිතයට කාරණාවූ මෙතෙක් අවවාද කළාද එබැවින් මෑනිපියාතකෙණෙකුත් මෙන් හිතකැමතිවිය මෙසේ නුඹවහන්සේගේ මෙකී වචනය පරිද්දෙන් කෙරෙමි පිළිගෙණ මේ ප්‍රියතෙපුලට පඬුරකුත් දෙමි විධානකරන්නාහු වස්ත්‍රාභරණ ධන ධාන්‍යාදීයෙන් සමෘද්ධව ගම්වර පසක්ද දෙමි. කෙල්ලන් කොල්ලන් දෙසියයක්ද ගෙරින් පන්සියයක්ද ආජානීය සෛන්ධවයන් යෙදූ රථ දහසය නම් මේ සියල්ලම අර්ථකාමී නුඹවහන්සේටදෙමි ඇරගනමැනවැයි කීයේය.

එබස් අසා ශක්‍රදෙවේන්ද්‍රයෝ තමාගේ දිව්‍යාත්මභාවය මවා දක්වා තමන්වූ නියාව අඟවා ආකාශයෙහි සිට මට මෙකී ගම්වර සියල්ලම නොපටම වේවයි ඇත්, අස්, රථ සියල්ලද තෙපිම පිළිගණුව, බලඑකෙක් ඇත. මා කී අවවාද ලෙසට සුරාපානය ඇර ධර්මයෙහි ඇලී රසමසවුලෙන් යුක්තවූ ආහාරය අනුභවකොට කිරිතෙල් නොයෙක් පූජාපූපයෙහි පිණා කුසලයෙහිම යෙදෙවයි කියා තමන්ගේ දිව්‍යලෝකයට ගියාහ.

ඒ රජ්ජුරුවෝද සුරාපානය නොකොට රා සැලවල් බිඳුවා දන්දී සිල් රැක ඒ කුසලයෙන් ස්වර්ගපදප්‍රාප්තවූහු. එසේවූවත් ක්‍රමයෙන් දඹදිව සුරාපානය බොහෝ බවට පැමිණියේය. බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා වදාළසේක. එකල්හි සබ්බමිත්‍ර නම් රජ ආනන්දස්ථවිරයෝය. ඔහට අවවාද දුන් ශක්‍රදෙවේන්ද්‍ර නම් බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

504 ජයද්දිස ජාතකය.

තවද එක්සමයෙක්හි සත්ත්වයන් ජාතිකාන්තාරාදීන් නිස්තරණයකොට නිර්වාණක්ෂෙමභූමියට පමුණුවන හෙයින් ශාස්තෘ නම්වූ අචින්ත්‍ය අචින්ත්‍ය අවාච්‍ය අවේද්‍ය අනන්ත ගුණ ඇති අපමහ බුදුරජාණන් වහන්සේ මේ ජයද්දිස ජාතකය මව්පියන්ට උපස්ථානකළ එක් භික්ෂුවක්හු අරභයා වදාළසේක.

මෙහි වර්තමාන කථාව සාමජාතකයෙහි විස්තාර වශයෙන් එන්නේය. එකල සැදැහැ ඇත්තවුන් දුන් අන්නපානාදිය ගෙණ දෙමව්පිය දෙදෙනාහට දී පොෂ්‍යය කරණ මහණහු දැක සෙසු භික්ෂූහු එම්බා මහණ සැදැහැඇත්තවුන් දුන් දෙය ගෙණ ගිහියන් පොෂ්‍යය කිරීම නුසුදුසුයයි එකල්හිම වැලි බුදුරජාණන් වහන්සේ සමීපයට යයි ඔහු නොකමැති කරවා කැඳවාගෙණ දම්සභා මණ්ඩපයෙහි පණවනලද බුද්ධාසන මස්තයෙහි යුගන්ධර මුදුනෙහි දලියෙන ළහිරු මඬලක් මෙන් වැඩහුන් බුදුරජාණන් වහන්සේට දක්වා මෙපවත් දැන්වූහ. එවේලෙහි බුදුරජාණන් වහන්සේද කුරවීක නාදයට අපහාසකරණ මධුරවූ කටහඬ විහිදුවා වදාරණසේක් එම්බා මහණෙනි, මොහු පුරාතනයෙහි නුවණැත්තවුන්ගේ ප්‍රවේණි ධර්මයක එසේහෙයින්ම පුරාතනයෙහි උත්තමයෝ රත්කමින් විසිතුරු ශ්වේතච්ඡත්‍රයෙන් යුක්ත සියලු රජසිරි හැර ගොස් දෙමව්පිය දෙදෙනාහට උපස්ථාන කෙළේවේදැයි වදාරා වැඩහුන් බුදුරජාණන් වහන්සේගෙන් අසා ඒ කෙසේදැයි ස්වාමීනි, මහ සැපත්හැර දෙමව්පියන්ට උපස්ථාන කෙළේයයි ඒ භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ මේ අතීත කථාව ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

යටගිය දවස කම්පිල්ල දෙශයෙහි උත්තර පඤ්චාල නම් නුවර පඤ්චාල නම් රජ්ජුරුකෙනෙක් දසරාජ දහමින් රජකෙරෙති. එකල ඒ රජහුගේ අග මෙහෙසුන් දේවීතොම පිහිටි දරුගැබ් ඇතිව දසඑකඩමසකින් දරුකෙනෙකුන් වැදූහ මේ බිසවුන් පූර්වජන්මයෙහි සැතිරිවූ එක් ස්ත්‍රියක් තොම සිත් ඉතිර පවත්නා කෝපයෙන් තොප උප උපන් ජන්මයෙහි තොප වැදූ දරුකෙනෙකුන් කන්ට සමර්ථවෙම්වයි ප්‍රාර්ථනාකොට යකිණිව උපන්නීය. ඕතොමෝ මේ ජන්මයෙහි අවසරයක් ලදින් දරු වැදූ මැනියන් බල බලා සිටියදීම අලුත් මස් වැදැල්ලක් මෙන් වැදහොත් කුමාරයන් ගෙණ මුරු මුරු යන අනුකරණ කෙරෙමින් අනුභව කොට ගියේය. දෙවෙනි වාරයෙහිත් එපරිද්දෙන්ම කළහ.

තුන්වෙනි වාරයෙහි වනාහී ඒ යකිණිය දරු වදන සූතිකාගෘහයට වත් කල්හි ගෙය වටකොටගෙණ රැකවල් කළහ. ඒ දරුවන් වැදූ දවස් ඉකුත් කොට තැවත අවුත් දරුවන් අල්ලාගත. එකල්හි බිසෝ මහත්කොට හඬ තැගූහ. ආයුධයෙන් යුක්ත අත් ඇති රැකවල් සිටි පුරුෂයෝ බිසවුන් කී සලකුණෙන් යකින්න ලුහුබඳවාගත්හ. ඒ යකින්නීතොම දරුවන් කන්ට අවසරයක් නොලබන්නී දිවගෙණ ගොසින් දියයන සොරොව්වෙහි සැඟවී ගියාය. එදවස් දරුවෝද මැතියෝය යන සංඥාවෙන් යකින්නගේ තනය මුවෙන් ගත්තේය. එකෙණෙහි ඕතොමෝ පුත්‍රස්නෙහ උපදවා මිනිස් දරුවෝ දූයි යකින්න නොසිතා තමා වසන සොහොන සමීපයෙහි ගල්ලෙනෙක්හි තබා කිරිපොවා පොෂ්‍යය කරන්නීය

මෙසේ ක්‍රමයෙන් වැඩෙන කුමාරයාහට තමා කන මිනීමස් ගෙණහැර දුන ඒ තෙමේද මිනීමස් අනුභව කෙරෙමින් වැඩුනේය. එතැන්පටන් දෙදෙනම එක්ව අමුසොහොන් ආදියට ගොස් එක්වම මිනීමස් අනුභවකොට විසූහ. ඒ කුමරුවාද තමා මිනිස්බව නොදන්නේය. මම යකින්නගේ දරු වෙමි සිතාත් ආත්මභාව හැර අන්තර්ධානවන්ට නොපොහොසත් වූයේය. ඉක්බිති ඔහුගේ මව් යකිණීතොම අන්තර්ධානවන පිණිස එක් බෙහෙත් මුලක් මොහුට දුන්නීය. එතෙම බෙහෙත් මුලෙහි ආනුභාවයෙන් අන්තර්ධානව අනුන් ඇසට නොපෙණෙන්නේය. මිනීමස් කාගෙණ ඇවිදිනේය. යකිනීතොම වෙසමුණු රජහට මෙහෙකරණු පිණිස ගියේ එහිම කාලක්‍රියා කළාය. එනුවර පඤ්චාල රජ්ජුරුවන්ගේ බිසව්තොම සතරවෙනි වාරයෙහි අනික් දරුකෙණෙකුන් වැදූහ. ඒ උපන් කුමාරතෙම යකින්න මළහෙයින් කිසි උපද්‍රවයක් නැතිව වැඩෙන්ට වන්නේය. මැතියන්ට සැතිරි යකින්න ජයගෙණ උපන්හෙයින් ඔහට ජයද්දිස කුමාරයෝයයි නම් තැබූහ. එතෙම වැඩිවිය පැමිණියේ අෂ්ටාදශ ශිල්පයෙහිද සූසැටකලා ශිල්පයෙහිදැයි සියලු ශිල්ප ශාස්ත්‍රයෙහි අග්‍රප්‍රාප්තව සතුටුවූ දෙමව්පියන් විසින් දෙනලද රාජ්‍යයෙහි නගනලද සේසත් ඇති සිංහාසනයේ ඉඳ අභිෂෙක කෙළේය. දැහැමෙන් රාජ්‍යය පරිපාලනය කරන්නේය.

එකල්හි පුරණලද පාරමිතා ඇති අනන්‍ය සාධාරණොත්තම සුරගණ මණිරත්නාලඞ්කෘත අප මහ බොධිසත්වතෙම ඒ රජහුගේ අගමෙහෙසුන් දේවීන් කුස ප්‍රතිසන්ධිග්‍රහණය කෙළේය. මවුකුසින් බිහිවූ බෝසතානන්ට නම් තබන්නාහු අලීනසත්තු කුමාරයෝයයි නම් තැබූහ. ඒ කුමාරතෙම වැඩිවිය පැමිණ උගන්නා ලද ශිල්පශාස්ත්‍ර ඇත්තේ යුවරජ තනතුරට පැමිණියේය ඒ පළමු කියනලද යකින්නගේ පුත්‍රයාත් මා අනුන්ට නොපෙණෙන මැනවැයි මව්පියන් විසින් දෙනලද බෙහෙත් මුලද තමන්ගේ අතින් ලෂුකමින් වලදමා අන්තර්ධානවෙන්ට නොපොහොසත්වූයේ පෙණෙන්නාවූ ශරීරඇත්තේ අමුසොහොන්හි මිනීමස් කා ඇවිදිනේය මනුෂ්‍යයෝ ඒ දැක භයපත්ව ඇවිත් රජ්ජුරුවන්ට මොරගා පමුණන්නාහු දෙවයන්වහන්ස එක් මිනීසෙක් නොවලතී කිසිභයක් නැතිව මිනිසුන් සදෘශ්‍යමාන ශරීර ඇතිව මිනීවරා කා ඇවිදිනේය. මේ තෙම මෙපරිද්දෙන් පුරුදුව ගියේවීනම් භයනැතිව නුවරට වැද මිනිසුන් කන්නේය. පළමුකොට මොහු යම් උපායකින් අල්වාගත යුතුයයි දැන්වූහ. රජ්ජුරුවෝත් යහපතැයි ගිවිස ඔහු වහා අල්වවයි නියෝගකෙළේය. එකෙ

ණෙහි ඔදවැඩි සිත් ඇතිව පඤ්චායුධයෙන් සන්නද්ධ බල ඇතිව බොහු වසන සොහොන වටකොටගත්හ. ඒ යකින්නගේ පුත්‍රයාද ගහනවූයේ දරුණුවූ වෙෂ ඇත්තේ මරණභයින් තැතිගෙණ මුරගාමීන් මනුෂ්‍යයන් අතරටමහත්වූ වේගයෙන් අවුත්වන්නේය. රුකවල සිටියාවූ මනුෂ්‍යයෝ මේ යක්ෂයෙකැයි කියා මහත්වූ මරණභයින් ඔහු මගහැර දෙකක්ව බෙදී ගියාහ. එවේලෙහි යකින්නගේ පුත්‍රයාද ඒ ස්ථානයෙන් දිවගෙණගොස් විලට වැද ගියේ නැවත තමා වසන්නාවූ ඒ වනයෙන් මනුෂ්‍යපථයට නොබැස සත්ත්වයන් වසන්නාවූ කාන්තාර මාර්ගසමීපයෙක්හි වනය ඇසුරුකොට වසන්නේය. මග යන එන සත්ත්වයන් අල්වාගෙණ වනයටවැද එම සත්ත්වයන් මරාකනුයේ එක් නුග ගසක්මුල වාසය කෙළේය. ඉක්බිත්තෙන් එක්තරා ගැල් සාත්තුවෙක්ගෙන්වා යන බ්‍රාහමණයෙක් වනදෙරකඩ රුකවල් සිටියවුන්ට මිස්සෙන් දහසක්දී පන් සියයක් පමණ ගැල් හා සමග ඒ මාර්ගයට පැමිණි වේලෙහි ඒ වනලැහැබ සිටි යක්ෂතෙම මහහඬින් හඬා මනුෂ්‍යයන් ලුහුබඳවා ගත්තේය. ඔහු දකීමෙන් භයපත්වූ ජනසමූහයෝ ඔහු ඇසදල්වා බලන්ට භයපත්වූවාහුමුහුණින් හුනහ එවේලෙහි යකින්නගේ පුත්‍රයාද ගැල්සාත්තුනායක බමුණා ඇරගෙණ තීක් මූණු කල්හි වේගයෙන් තබතලද එක් පයක තීසුණුවූ හුලෙක් ඇනුනේය.

එවිට වනදෙරකඩ රුකවල සිටියවුන් ලුහුබඳවාගත් කල්හි බමුණා එතැන්හිම දමා මෙතෙක්කල් වසන රුක්මුල්හීම් ගොස් වැදහොත්තේය ඔහු එතැන්හි වැදහොත් සත්වෙනි දවස් ජයද්දිස රජ්ජුරුවෝ මුවදඩයමට යන්ට නියෝගකොට මහසෙනග පිරිවරා නුවරින් නික්මුණේ, එසඳ තක්සලානුවර සිට නන්ද නම් එක් බ්‍රාහමණයෙක් තමාගේ දෙමව්පිය දෙදෙනාහට උපස්ථාන කරණ පිණිස සම්පත් සොයනු කැමතියේය. සතාරහ නම්වූ ධර්මදූතය ජේත ගාථා සතරක් ඉගෙණගෙණ පඤ්චාලනුවරට එනුයේ රජ්ජුරුවන් නුවරදීම දුටුයේය. රජ්ජුරුවෝත් ඔහු අතින් සතාරහ ගාථා අසනු කැමතිව ඔහට තවාතැන්ද වැටුප් වියදම් දෙවා තුමූ මුවදඩගොස් යමක්හු සිටිකඩින් මුවාපලා ගියනම් ඔහට දඩයයි නියෝග කෙළේය.

ඉක්බිත්තෙන් එක් පසදනම් මුවෙක් ඉපිල රජ්ජුරුවන්ගේ අභිමුඛයට අවුත් ඔහුසිටිකඩින්ම දිවපුයේය. එවේලෙහි අමාත්‍යයෝ පරිහාසකොට දේව යන්වහන්ස යමක්හු සිටිකඩින් මුවා පලාගියනම් ඔහට දඩයයි පළමු නුඹවහන් සේ විසින් වදාරණලද්දේ වේදැයි කීහ. රජ්ජුරුවෝ එවේලෙහි රාජාභිමාන යෙන් ගර්හිතව කඩුව ඇරගෙණ මහත් වේගයෙන් ඒ මුවා පසුපස්සේ ලුහුබඳවා ගෙණ තුන්යොදුන් දිව කඩුවෙන් මුවා දෙකඩකොට ගසා එවේලෙහි සිතන් නාහු මම හොයින් අමාත්‍යයන්ට මුවා මැරුවයි කියන්නෙම් ඔහු අඳහාගෙනාග ණීයි මුවා කැදවාගෙණ එන්නේ ඒ මනුෂ්‍යයක්ෂයා හුන් ගස මුලට පැමිණ එහි මඳක් සැතපී යන්ට ආරම්භකලේය. එවේලෙහි ඔහට මනුෂ්‍ය යක්ෂයා කියනුයේ එම්බල පුරුෂය මට නෝ ගොදුරු වූයෙහියයි හුන් තැනින් නැගිසිටගොස් ජයද්දිස රජ්ජුරුවන් අත අල්වාගෙණ සිට මෙසේ කියා– ලුහුබැඳ මිනිසුන් අල්වාගන්ට අසමර්ථව නිරාහාරව පිපාසයෙන් පීඩිතවූ මට දුන් මේ සත්වැනි දවස්හි නෙපිම ඇවිදින් මට සම්ප්‍රාප්තවූවාද එසේ හෙයින් බොහෝ දවසකින් මා කැමති භෝජනය නිරායාසයෙන් තොමම්ම අවුත් පැමිණියේය. එබැවින් තෙපි කොබඳුවූ ජාති ඇති කෙසේමු කොහෙන්ද කොසිසිට ආ කෙණෙකුදැයි විචාලේය. එබස් අසා ඒ රජතෙම මෙලෙසින් කියන්නේය. සබඳ යක්ෂය මුවදඩ කෙළියෙහි ලොභයෙන් පමිත ප්‍රානතයක් පාසාද වනයක්පාසාද

ඇවිද විඩාවූ මම සාමාන්‍ය එකකු නොවෙමි. පඤ්චාල දෙශයට අධිපතිවූ ජයද්දිස නම් රජයෙමි. එබැවින් මෙපසද මෘගයා අනුභව කරව මා හැරපියවයි කීයේය. එකෙණෙහි මනුෂ්‍ය යක්‍ෂතෙම මෙලෙසින් කියන්නේයි රජ්ජුරුවෙනි තෙපි නුවණැතියේය මේ මුවා මටදී තෙපි ගැලවෙමි යන යම් මේ වෙළඳාමෙක් ගණුදෙනු කිරිමෙක් ඇද්ද ඉන් ප්‍රයෝජන කවරේද තොප අනුභවකල කල්හි මුවා කොයිවන්නේද බල එකෙක් ඇස දෙකක් කැටිව දෙවේලෙක් පිරිමැසී යන්නේය මෙලෙස තා බැඳි මරණභයින් දෙඩීම තොපවැනි ධිර පුරුෂයන්ට සුදුසු නොවන්නේයයි කීයේය. එබස් අසා ජයද්දිස රජතෙම නන්ද බ්‍රාහමණයාගෙන් බණ අසන්ටද ඔබනොස් අකාලයයි යන ප්‍රතිඥාවන් සඳහන්කොට නුවරට ගොස් එන පරිද්දෙන් අවසර ඉල්වනු කැමතියේ මෙලෙස කියා රජ්ජුරුවෙනි මරණට ලංව සිටි තොප අසම්බන්ධවූ යම් කටයුත්තෙක් පසුතැවිලිකර වාද ඒ කටයුත්ත ඇසූකල කී දුටු නියාගෙන් ගොස් එමි යන තොපගේ බස ඇදහිලිකොට අවසර දිය හැක්කේද? ගියමනා කායයී කව්රේදූයි විචාළේය.

ඊට කාරණා කියන රජතෙම මෙලෙස කියන්නේය. එසේවීනම් මා මුව දඩ එනකලට දුරසිට නන්දනම් බමුණෙක් සතාරහ ගාථා සතරක් ඉගෙණ මට බණ කියන පිණිසයයි ආයේය. මම එකෙණෙහි මුවදඩ ගොස් ආ කල බණත් අසා ධර්මයට පූජාකෙරෙමි. ඕහට ධනයෙහි ආසාවඩිනය කොට ආමි නැවත මෙයින් ගැලවී ගොස් ඒ කල නිශ්වය මුදා ආවනම් පළමු කී ලෙසට නොවරද වීමෙන් ඒ සැබවසත් රැක තෙලැබ හැකි ධම් නමැති ධනයකුත් ලදින් නැවත අවුත් තොපට කී සැබවසත් රැකි කල්හි මට බොහෝ ප්‍රයෝජන වන්නේය. මා මරණබිය කෙණෙකැයි නොසිතා මෙහි සැකයක් නොකොට අවසර දෙවයි කීයේය. එකෙණෙහි යක්‍ෂතෙම වත්තාවය බණ අසා මෙසේවූ ධනයකුත් දෙමී යන වචනයෙන් සිඩවූ තසින් මිදී සැබවස රැක්කයුතුයයි කියා අවසර දුන්නේය ඒ රජතෙම අභිත සිංහයෙක්හු මෙන් සැකයක් නැතිව සිට සබඳ යක්‍ෂය තෝ සැකයක් නොසිතා මම ගොසින් සියලු කාය්‍යී සම්බන්ධ කොට උදෑසනක්සේම එන්නෙම් වේදැයි එතනින් නික්මෙන සලකුණු කෙරෙමින් තමන්ගේ සේනාව කඳවුරු බැඳහුන් තෙනට ගෙස් මහසෙනග පිරිවරා නුවරට වැද නන්දනම් බ්‍රාහමණයා කැඳවා මහානඝී ආසනයෙක්හි හිඳුවා එකී යන සතාරහා ගාථා අසා සාරදහසකින් පූජාකොට යානාවකට නන්වා මොහු තක්ෂලා නුවරට ඇරලවයි මිනිසුන්ට පාවාදී බමුණා ගම්න්කරවා දෙවෙනිදවස් යක්‍ෂයාගේ ප්‍රතිඥාවට යනු කැමතියේ පුතනුවන් කැඳවා ලංකොට සිඹසනහා මෙලෙස අවවාද කරන්නේය. පුත, අලිනසත්තු කුමාරයෙනි, අදම තෙපි රාජ්‍යාභිෂෙක කොට දශරාජධම්ය කොප්‍ය නොකොට රාජ්‍යය කරව තොපගේරට මොහු සවජනයෝය, මොහු අපර ජනයෝය යන මමත්වයක් නොවේවයි හැමදෙනාම එක මැතියන් පරිද්දෙන් පැවත මෙලෝපරලෝ වැඩ සාදද්ද එපරිද්දෙන් රාජ්‍යය පරිපාලනය කරවයි කීයේය.

එබස් අසා අලීන සත්තු කුමාරතෙම කියනුයේ පියානන් වහන්ස, යම් හෙයකින් නුඹවහන්සේ යුහුව මට අභිෂෙක කරවා අවවාදත්කොට යනු කැමති සේක්ද, එබැවින් කුමක් කළසේක්ද ඉදිරියේ කුමක් කරණු කැමති සේක්ද එනකුදුවූවත් නුඹවහන්සේ හැර රාජ්‍යය නොකෙරෙමි රාජ්‍යටත් වඩ දෙමව්පියෝවේද රැක්ක යුත්තෝයයි කීයේය. එබස් අසා කාරණා කියන රජතෙම මෙලෙස කියන්නේ අලීනසත්තු කුමාරයෙනි, කයින් වචසින් මනසින්

තොප කළ නපුරකින් රටහැර යන්නෙම් නොවෙමි. අද උදැසන මුවදඬ ගොස් එන්නාවූ මා එක් යක්ෂයෙක් මස්කන පිණිස අල්වා ගත්තේය. එකල්හි මම මේ බ්‍රාහ්මණයාගෙන් බණ අසා ඔහට සත්කාරකොට එමි. යක්ෂයාහට ප්‍රතිඥ කොට ආමියි එබැවින් මා යායුතුය. තෙපි රාජ්‍යය කරවයි කීයේය.

එබස් අසා කුමාරතෙම මෙලෙස පියරජහට කියන්නේය. මෙබඳු ප්‍රිය පුත්‍රයන්හු ඇතිව ඉඳ ඒ යක්ෂයා ලඟට යන කල බලා ඉන්නෙම් මාගේ දිවි ලැබීමෙහි ඵල කවරේද? එබැවින් නුඹවහන්සේ යායුතු කාරියෙහි මම යන්නෙම් ඒ යහපතැයි ලෝවැසියන්ටම හැඟෙන්නේය. එබැවින් යක්ෂයා ලඟට මම්ම යෙමි. නුඹවහන්සේ සියලු රජසිරි විඳිමින් ප්‍රජාපාලනය කළමැනව, ඉඳින් මම්ම යෙමි සිතනසේක්නම් ඒ පව්ටුවූ යක්ෂයා අතින් ගැලවී ගැණීම බැරිය. එබැවින් මම ගියේනම් රට රකින්ට නුඹවහන්සේම යොග්‍යසේක. මෙලෙස මා කියන බස් නොගිවිස යනසේක් වීනම් ඒකාන්තයෙන් මමත් එක්වයෙමි. එසේ කල්හි රාජ්‍යයත් ප්‍රජාවත් පිරිහෙන්නේයයි කීයේය.

එබස් අසා පියරජතෙම කියනුයේ, දරුවෙනි අලීන සත්තු කුමාරයෙනි ඒ කාන්තයෙන් මේ තොප කීයේ සත්පුරුෂ ධර්‍මයෙක්මය. එතකුදුවූවත් මම ගොස් යක්ෂයා අතින් මියයාම යහපත, මාදිවි තිබැදි ඒ මාංස්පාදවූ ඔහු ලඟට තොප යැවීමට වඩා මරණ මට දුකැයි නොසිතෙමි. එබැවින් තොප රඳව මම යෙමි කීයේය. එබස් ඇසූ අලීනසත්තු කුමාරතෙම එසේ නොකියමැනව දේවයන්වහන්ස මාගේ ප්‍රාණය නුඹවහන්සේට දී නුඹවහන්සේගේ ප්‍රාණය මට ගෙණ ගණුදෙනු කරණ හෙයින් යන්නාවූ තම නුඹවහන්සේමය මේ රාජ්‍යය රකිනා නුඹවහන්සේනම් මමය. එලෙස ප්‍රාණය පරිවර්තනය කළ හෙයින් නුඹවහන්සේ යනසේක්වේද මා මරණට පැමිණෙන්නේය මේකාරණ යෙන් මාකෙරෙහි ස්නෙහ ඇතිසේක්නම් නුඹවහන්සේ රැඳුන මැනව මම්ම යෙමි රාජකුමාරයා කීයේය. එබස් අසා රජතෙම පුතනුවන්ගේ නුවණ බල පරාක්‍රම දන්නේ යහපත දරුවෙනි තොපිම යවයි ගිවිස්සේය.

එවිගස අලීනසත්තු කුමාරතෙම දෙම්ව්පියන් දෙදෙනා වැඳ ක්ෂමා කරවා අවසර ඉල්වාගෙණ අමාත්‍යමණ්ඩලයාහට අවවාදදී පඤ්චායුධ සන්නාධව රාජ්‍යවාසින් අඬ අඬා සිටියදී නුවරින් නික්මුනේය. එසඳ දෙම්ව්පියන්ද ඇමති දෙදෙනාද බුහුතනියෝද අගමෙහෙසුන් බිසවුද අමාත්‍යමණ්ඩලයාද පරිවාර යෝද හැම්සමඟ නික්මුනාහ. ඒ කුමාරතෙම නුවරින් නික්මුනු පියානන්අතින් මග විචාරාගෙණ මොනවට සිත තබාගෙණ නොයෙක් කාරණා කියා දෙමව් පියන්ද ඇමති මඬුලු ආදීවූ මහසෙනගද නුවරටම යවා යම් අභීත කේසරසිංහ රාජයක්හුමෙන් නිසසංකාව වනමාගීයෙහි නික්මුනේය. ඔහු යන්නාහු බලබලා සිට මැනියෝ සෝක දරාගත නොහී සවභාවයෙන් සිටියනොහී හඬා වැටී මූස පත්වූව, පියරජ්ජුරුවෝ දෑක ඉස තබා මහ හඬින් හැඬූහ. අගමෙහෙසුන් කුමාරිකාතොම මෙබඳු සවාමිපුත්‍රයකු කවරකලෙක ලැබේදැයි හඬමින් වැලපෙ මින් මූණින් සිඳි රන්ලියක්මෙන් වැටී හැඬූහ. ඊට අනතුරුව මහසෙනග රාජ කුමායන්ගේ ගුණ කියමින් හැඬූහ. ඔවුන් හැම්දෙනාගේ ශෝක තුනීවූ ඇසිල්ලකින් මාගේ දරුවන් ගියතෙන දුකෙක් නොවේවයි කියා පියරජජුරු වන් කළ ආශිර්වාද වචනයද නැගනියන්හා බිරිඳ විසින් කළ සත්‍යක්‍රියා වචනද මෙපරිද්දෙන් වූයේය ඒ කෙසේද සතුරාට අභිමුඛව යන දරුවන්ද

බලමින් දෙහොත් මුදුනෙහි තබාගෙණ සොමය වරුණය යනාදී ලොකපාල දෙවියන් ඉර සඳ දෙවියන් ප්‍රධාන කොට ඇති සියලු දෙවියන් මපුතුනුවන්ට අරක් ගණුව. තොප විසින් රක්නා ලද මේ රාජකුමරුවා තෙම ඒ මිනීමස් කන යකුගෙන් ගැලවී ඔහු විසින් අනුදන්නා ලදුව සිය නුවරට එවයි මේ අප කී සත්‍ය වචනයෙන් ඒ යක්‍ෂයාගෙන් ගැලවී වහා එවයි දරුවෙනී අඬගා කීහ.

දක්වන ලද්දේ සුවපත්වීද එපරිද්දෙන්ම මේ අලීනසත්තු කුමාරයෝත් දෙමව්පියන් යම්සේ බරණැස්නුවර වසන රාම නම් පුරුෂතෙම මව්පිය දෙන්නා තමාගේ ජීවිතය මෙන් සිතා රකිතේ වෙළඳම් පිණිස අඬකීතම් රජ්ජුරුවන්ගේ ජීවිතයෙහි කුඹවතී නම් නුවර වාලුකා පාසාණ වර්‍ෂාදී නවවිධ වරුසාවකින් නස්නා කල්හි දෙමව්පියන් දෙදෙනාගේ ගුණ සඳහන් කොට සිටි කෙණෙහි ඔහුගේ ධර්මයෙහි සතුටු දෙවියන් විසින් සියනුවර ගෙණැවිත් දෙමව්පියදෙදෙනා ඇසපියන් කෙරෙහි ඇති භක්තියෙහි විපාකද සක්දෙව් රජහු ආදී දෙවියන්ගේ ආනුභාවයෙන්ද ඒ යක්‍ෂයා අතින් මිදී සියනුවරටම එවයි අයදියේය. ඉක්බිති නැගනියෝ සත්‍යක්‍රියා කරන්නාහු සියලු සතුන් උපන් කෙණෙහිම සුවපත් කළහෙයින් අලීනසත්තු නම්වූ බෑනන් වහන්සේ කෙරෙහි ප්‍රකාශයෙහි වේවයි රහස වේවයි කියන්නා තබා සිතිය යුතුවූ දෙෂයකුත් නොදනිමි. මා විසිනුත් බෑනන්වහන්සේ කෙරෙහි සිතිනුත් අනාදරයක් නොකළෙත් සත්‍යය. මේ සත්‍යක්‍රියාව හේතුකොටගෙණ ඒ යක්‍ෂයා අතින් ගැලවී වහා අවමැනවැයි නැගනියෝ සත්‍යක්‍රියා කළහ. ඉක්බිති සත්‍යක්‍රියා කරණ භාය්‍යාතෙම මෙලෙස කියන්නී ස්වාමිපුත්‍රයානන් වහන්ස, මා ආද දවස් පටන් සිතින් ඇසිල්ලකුත් අප්‍රියනොව විසූයේද් මමත් ඔබවහන්සේ ඇර සිතිනුත් අන් පුරුෂයක්හු නොපැතිම්ද ඒ සත්‍යයෙන්ගියතැන්හි නුඹවහන්සේට දුකෙක් නොපැමිණෙවයි ඒ යක්‍ෂයාගෙන් මිදී වහා වැඩිය මැනවයි ස්වාමීනි, කිව. මෙලෙසින් බන්ධු මිත්‍රාදීන් හඬ හඬා සිටියදීම ඒ කුමාරතෙම පිය රජ්ජුරුවන් විසින් කියනලද මංසලකුණු නොව රදවා ඔහු වසන ස්ථානයට අභිමුඛව නික්මුණේය. ඒ වේලාවට යක්‍ෂයා සිතනුයේ රජ්ජුරුවෝ නම් බොහෝ මායම් දන්නාහ. කුමකින් කුමක් වන බවත් නොදන්නෙමියි සිතා වෘක්‍ෂයට නැගී රජ්ජුරුවන් එන පෙරමග බල බලා උන්නේය.

එවිගස රාජකුමාරයන් දුර එන්නාහු දක සිතනුයේ පියානන් වලකා පුත්‍රතෙම ආයේම වන්නේය. මින් මට භයෙක් නැත්තේයයි කල්පනා කොට ඔහට පිටිපෑලා හුන්නේය. එකෙණෙහි රාජකුමාර අවුදින් ඒ යක්‍ෂයාගේ අභිමුඛව භයක් චකිතයක් නැතිව ගොස් සිටියේය. එකෙණෙහි යක්‍ෂතෙම රාජකුමරුවා හා කථාකරණුයේ මස්හු පිරිසිටිනා වෘක්‍ෂස්ථල හා දික්වූ බාහු ඇති කුමාරයෙනි, රෞද්‍රවූ මිනීමස් කන මා වසන මේ ස්ථානයට තමා වසන්ට සැප කැමැත්තාවූ කවර නම් පුරුෂයෙක් දූන දූන වදනේද එබැවින් තොපි නොදූන ආවයි සිතමි. තොපි කවුරුද? කොයිසිට ආවුදයි විචාළේය. එකෙණෙහි තමා කරා ආ කාරණා කියන රාජකුමාරතෙම කියනුයේ මිනීමස් ගොදුරුකොට ඇති පොරිසාදයෙනී, තොපි මෙතැන්හි වසන නියාව නොදන්නෙම් නොවෙමි. දනිම්මය, සැබව ජීවිතය රක්නා මපියානන් වහන්සේ මා පැවරුවේ ආමි. එබැවින් මා අනුභවකොට උන්වහන්සේ කළ ප්‍රතිඥාව මුදවා තොපගෙන් උන්වහන්සේම මා පැවරුවේ ආමි කීයේය. ඉක්බිති ඒ යක්‍ෂතෙම කියනුයේ රජ්ජුරුවන්ගේ පුතනුවන් නියාව තොපගේ නුවණින් දනිමි. එතකුදුවූවත් පියරජ්ජුරු

වන්ගේ ජීවිතය ගලවා දී යකුට ගොදුරු වෙමියි සිය පයින් ආ තොප විසින් කෙළෙ උගහටිය නොසිතිය හැක්කේයයි කීයේය. ඉක්බිති රාජකුමාරතෙම මෙලෙසින් කියන්නේ සබඳ යක්ෂය, පියානන් පිණිස වේවයි මෑනියන් පිණිස වේවයි යම් කෙනෙක් ජීවිත පරිත්‍යාග කොට මරණ කැමති වේද්ද ඒ අරුම නොවන්නේය. ඒ කුමක් නිසාදැයි සිතිය නම් මෙලොවින් යසස්ලැබ මව්පියන්ට කළ උපකාරයෙහි කුශලයෙන් සවර්ගයෙහිත් සැප විඳිනේය. එබැවින් මව්පිය දෙදෙනාහට ජීවිත පරිත්‍යාග කිරීමෙන් දෙව්ලොව සැප කැමැත්තවුන් විසින් කළ හැක්කවිය. එහි බැරි කවරේදැයි කීයේය. එබස් අසා යක්ෂතෙම සබඳ රාජකුමාරයෙනි, නොබිය සත්ත්වයෙක් නම් නැත. තොපි කවරහෙයකින් භය නැත්තේදැයි විචාළේය. මෙසේ විචාළ යක්ෂයාහට මරණට තමන් නොබිය කාරණා කියනුයේ, මම වනාහී මෙතැන් පටන් වචසින් මනසින් රහසක් පවක් නොකළෙමි. එබැවින් පරලොව දුකට කාරණා නොදනිමි.

තවද යක්ෂයානෙනි, මරණ නම් ඒකාන්තය ශරීර අනිත්‍යයය මෙලොව සම්භස් ජාතිජරා මරණාදිය වන්නේද එපරිද්දෙන්ම පරලොවත් වන්නේය. එබැවින් මරණ නම් අසවල් ජාතියක නැතැයි යන නියමයක් නැති හෙයින මීට භය ගැණීමෙන් කිමෙක්දැයි කියා මේ හැම කීමෙන් ප්‍රයෝජන කිම්ද මේ ශරීරය හැරගෙණ තොප කැමැත්තක් කරගණුව මේ ශරීරය තොපට දෙන ලද්දේය. ඉදින් මේ ශරීරය මරාපියා දෙනුකැමැත්තේ නම් මේ ගස අගින් වැටී හෙම්. එකල්හි තොප කැමති මධුර මාංස රිසිසේ අනුභව කරවයි කීයේය. යක්ෂතෙම ඔහුගේ බස් අසා මෙතෙම මහා පුරුෂයෙක මොහු කා දිරවාලිය නොහැක්කේය. උපායකින් මොහු යවාපිය යුතුයයි සිතා කථාකරණුයේ මෙලෙස කීයේය. රාජකුමාරයෙනි, තොපගේ ජීවිතය පරිත්‍යාග කොට පිය රජ්ජුරුවන්ගේ ජීවිතය ගලවාදී කළ උපකාරය මටත් එක් ප්‍රයෝජනයක බැඳි වපින් දරකඩා කැමකොට ගිනිදල්වා එකල්හි තොප මරා මස් ගෙණ අඟුරුපිඩලං පලනා කන්නෙම් වේදැයි කීයේය.

එබස් අසා කුමාරතෙම ඔහු කී පරිද්දෙන් ගිනිකොට අඟුරු බස්වා යක්ෂයාහට ගොසින් කීයේය. ඒක්ෂණයෙහිම ගින්දල්වා ආ කුමාරයන් මුහුණ බලා මේ පුරුෂතෙම සිංහයෙක මරණයෙහි භය නැත්තේය. මා විසින් මෙතෙක් කල් මෙසේවූ අභීත පුරුෂයක්හු දුටුවයේ නැතැයි සන්තොෂයෙන් ලොමුදැගත් ශරීර ඇත්තේ නැවත රාජකුමාරයන් දිසාව බල බලා හුන්නේය. එකල්හි මොහුගේ ක්‍රියාව දුටු රාජකුමාරතෙම යක්ෂයානෙනි, දිග දුර නොබලා රෞද්‍රවූ ක්‍රියාව කරණ සවභාව ඇති තොප විසින් තව බලාහිඳිනේ කිමෙක්ද? වහා මේ ශරීරය මස්කොට ගෙණ අභිප්‍රාලෙස අනුභව කරයි කීයේය. එසඳ යක්ෂතෙම කියනුයේ රාජකුමාරයෙනි, කවර නම් සත්ත්වයෙක් ගුණධර්මයෙහි පිහිටි සබවස රකිනා හැකි ධෛර්යසම්පන්න පුරුෂයක්හු මරණේද ඉදින් මැරීනම් ඔහුගේ ඉස සත්කඩක්ව පැලියන්නේය. එබැවින් තොප වැනි ධාර්මිෂ්ඨ කෙණෙකුන් මරාපීම බැරියයි කීයේය. එබස් අසා අලීනසත්තු කුමාරතෙම කියනුයේ ඉදින් තෙපි මා මරණු නොකමැත්තේ වීනම් මා ලවා දර ගෙන්වාගණිද්ද මා ලවා මෙතෙක් යත්න කෙළේ කුමක් පිණිසදැයි විචාරා අවසර දැක පලායෙද්දෙයි සිතායයි යක්ෂයා කීකල්හි බොධිසත්ත්වතෙම දූත් තෙපි කෙසේ මා පරීක්ෂා කරණුවූද මම කිරිසන් අපායෙහි උපන්නෙමුත් සක්දෙව් රජහු විසිනුත් අඩුවක්

දක්නාලෙස නොකෙළෙමි. මාගේ දූතයෙහි බලයෙන් ඔහු ලවා මාගේ රූව සඳ මඬලෙහි අඳවා ගතිමි. එතැන්පටන් චන්‍ද්‍රතෙම ශශාංකයයි නම් ලද්දේයි. එසේ හෙයින් තිරිසන්ව පවා ශරීරමාංස දීමෙහි නොපසුබටවූයෙමි, මිනිසත්බව සිට කාරණා දැන ශරීරමාංස දීමෙහි කෙසේනම් භය ඇත්තෙම්දැයි කීයේය. එබස් අසා යක්‍ෂතෙම ප්‍රසන්නව අවසරදී යවනුයේ කුමාරයෙනි, රාහුගෙන් ගැලවුනු සඳමඬල මෙන්ද හිරුමඬල මෙන්ද පොරිසාද නම්වූ මාකෙරෙන් ගැලවුනු නොපි බන්ධුවර්ගයා නැමැති තරුකැලන් මැද බොහෝ දවසක් බැබලීමෙන් කඳුලුවැකි මුහුණින් යුක්ත නොප ගොස් දෙමව්පියන් සතුටුකරව අවශෙෂ බන්ධුමිත්‍රාදීහුද සතුටු කරවයි කියා අවසරදී යන පරිද්දෙන් සම්මත කෙළේය.

ඒ කාරණා පුරස්සර මහබෝධිසත්ත්වයෝද ඔහුගේ පාපාධ්‍යාශ නැමැති විෂ විනාසකොට දිවිගිම්යෙන් ප්‍රාණඝාතාදී පස්පව් නොකරණ ලෙස අවවාදදී පන්සිල්ගන්වා මදක් සිට මේ යක්‍ෂයෙක්ද්‍ෙ හෝයි විමසනුයේ යක්‍ෂයන්ගේ ඇස් ඔලිඳඇට සේම රත්ව තිබෙත්තේය. ඇසිපිය නොමරත්තේය. ඡායාව නොපෙණෙත්තේය. කිසිවෙක්හි භය නැත්තාහ. මේ සලකුණෙන් පිටත්ව හෙයින් මේ යක්‍ෂයෙක් නොවෙයි. මිනිසෙක්මයයි සිතා සනිටුහන්කොට තවද පරීක්‍ෂා කරණුයේ අපගේ පිය රජ්ජුරුවන් වහන්සේගේ වැඩිමාලු තුන්බෑ කෙණෙක්ම යකින්නියකු විසින් ගෙණයන ලදහුද එයින් දෙන්නෙකු අනුභව කොට එයින් කෙණෙක් දරුකොට වඩනලද්දහු වෙති. එබැවින් මොහු එසේ වියයුතුයයි නියමකොට සිතා මොහු ගෙණගොස් මපියාතන් වහන්සේට කියා රාජ්‍යයෙහි පිහිටුවමි සිතා භවත තෙපි යක්‍ෂයෙකිමි නොසිතව මපියානන්වහන්සේට වැඩිමහලු බෑයෝය. එබැවින් මා හා සමග වැඩිය මැනව කුලසතු රාජ්‍යයෙහි අභිෂෙකකොට සැපවත්වුව මැනවැයි කී කල්හි පොරිසාද තෙම තොපි කියන්නේ කිමෙක්ද මනුෂ්‍යයෙකු නොවෙත් උඹ යකින්නගේ දරුවත් උඹ නොපගේ බස් අදහා නොගණිමි කීයේය. එකල්හි අලීනසත්තු කුමාරතෙම කියනුයේ එසේවීනම් අසවල්තැන දිවස් ඇති තාපසකෙණෙක් වෙසෙති. එතනට යම්හයි යක්‍ෂයා කැඳවාගෙණ ගියේය.

එකෙණෙහි තාපසයෝද මොවුන් දෙදෙනා දුර එන්නවුන් දැක පියානන් හා පුතනුවන් මේ වනයෙහි කුමක්කොට ඇවිදිනා නියාදැයි කියන බසින්ම නෑදෑ බව හැඟවූයේය. එකෙණෙහි පොරිසාද තෙම එබස් අදහාගෙණ දරුවෙනි තෙපි නුවරටම යව මම එක ආත්මභාවයෙහිම දෙකඩව උපනිමි. මට රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත්තේය. මම පැවිදිවෙමි කියා තාපසයන් සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූයේය ඉක්බිති කුමාරයෝද ඔහු වැඳ සමුගෙණ නුවරට ආයේය. එකල්හි නියම් ගම්වාසීහුද දනව්වාසීහුද පඬුරුගෙණ පෙර මගට දිවූහ. ඇතරුවෝද අසරුවෝද පාබලසෙනගද දෙහොත් මුදුනෙහි තබා වදිමින් ආවඩමින් සිව්දිගින් රැස්වූහ. රාජකුමාරතෙම යක්‍ෂයා අතින් ගැලවී නුවරට ආයයි යනු අසමින් බොහෝ සත්වයෝ පෙර ගමන්කොට රැස්වූහ. රාජකුමාර තෙමෙත් මහජනයා පිරිවරා ඇවිදින් පිය රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටියේය. එකෙණෙහි පියරජතෙම සන්තොෂව පොරිසාදයා අතින් කෙසේ ගැලවුනාද දරුවෙනි විචාළේය. එසඳ කුමාරතෙම කියනුයේ පියානන්වහන්ස ඒ යක්‍ෂයෙකු නොවෙයි. නුඹවහන්සේගේ වැඩිමහලු බෑයන්වහන්සේයයි සියලු ප්‍රවෘත්තිය කියා සිටිකල්හි මෙබස් ඇත්තෙක්ම වීනම් ගොස් දැක්කයුතු වේදැයි නුවර බෙරපියකරවා අමාත්‍ය

මඩලින් හා සේනා වාහනින් පිරිවරණ ලදුව මහානුභාව ඇති තාපසයන් සමීප යට ගියාහ. එකෙණෙහි දිවැස් ඇති තාපසයෝ මොහු යකින්නිය විසින් ගෙණා තියාවද තොකා දරුකොට වැඩුනියාද මුත් යක්‍ෂයෙකිම් කියා දූපී උන් කීයාද සහෝදර බෑයන්වහන්සේ බවදූයි යන මේ සියල්ලම විස්තර වශයෙන් තාපසතෙම කීයේය.

එකල්හි ජයද්දිස රජතෙම් වැඩිය මැනව බෑයන්වහන්ස රාජ්‍යය කල මැනවැයි කීයේය. එතෙම් තොකමැතිම් මහරජයි කියා ගිවිස්සේය. එසේවීනම් අපගේ උයනෙහිම විසුව මැනව. මම සිවුපසයෙන් උපස්ථාන කෙරෙමියි ආරාධනා කෙළේය. පෝරිසාද තාපසද යහපතැයි ගිවිස්සේය. ඉක්බිති නුවරට යන ජයද්දිස රජතෙම බෑයන් විසූ තැන්හි ඒ තපොවනයට නුදුරු තැන්හි පථිත දෙකකට අතුරෙහි මහත් වැවක් කරවා බොහෝ කුඹුරු තනවා මහධන ඇති කුල දහසක් ගෙන්වා මහ ගමක් කරවා තාපසවරුන්ට සිව්පසයෙන් උපස්ථාන කලාහ. ඒ ගම චුල්ලකම්මාස්ස නම්වූ නියම්ගමවිය. බුදුරජාතන් වහන්සේ මේ ජාතක ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා පූර්‍වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක. ඒ චතුස්සත්‍යයාගේ අවසන්හි මාතුපොසකස්ථවිර තෙම සොවාන් පෙලෙහි පිහිටියේය. එසමයෙහි දෙමව්පිය දෙදෙනා නම් සුදවුන් මහ රජ්ජුරුවන් හා මහාමායා දේවීවුව. එසමයෙහි දිව්‍යතාපයයෝ නම් ශාරීපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි පෝරිසාද නම් යක්‍ෂතෙම් දූන් අංගුලිමාලස්ථවිරය. නැගනියෝ නම් දූන් උත්පලවණ් මහාස්ථවිරය. අගමෙහෙසුන් බිසෝ නම් රාහුල මාතා යශෝධරා දේවිය. අලීනසත්තු කුමාරයෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

505
ඡද්දන්ත ජාතකය.

තවද එක්සමයෙක්හි සත්ත්‍ව යන් ජාතිකාන්තාරාදීන් තරණය කොට නිර්‍වාණක්‍ෂෙමභූමියට පමුණු වන හෙයින් ශාස්තෘ නම්වූ පරාර්ථසාධක පරම කාරුණික පරමධීර පරම වීරත්‍වාදී ගුණගණාභරණ අප බුදුරජාතන්වහන්සේ තෙක තරුවරාභිරාම ජේතවනාරාමයෙහි මෛත්‍රී කරුණාමුදිතොපෙක්‍ෂාය යන සතර ආයර්‍ය බ්‍රහ්ම විහරණයෙන් වැඩවසනසේක් ලදුරි මෙහෙණින්නක් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද? යත්,

සැවැත්නුවර වසන එක් කුලදුවක් ගිහිගෙයි විසීමෙහි ආදීනව දැක පැවිදිව එක්දවසක් තෙසු මෙහෙණින්නන් සමගම බණ අසනු පිණිස ගොසින් අලංකෘත කොට සරහනලද අස්නෙහි හිඳ බණ වදාරන්නාවූ බුදුරජාතන් වහන් සේගේ අපමණ කුසලානුභාවයෙන් නිපන් උතුම් රූප සමෘද්ධියෙන් යුක්තවූ දෙතිස් මහා පුරුෂලක්‍ෂණ අසූඅනුව්‍යඤ්ජන කෙතුමාලාලංකාරයෙන් අලංකෘත කොට සරහනලද අස්නෙහි හිඳ විරාජමාන ආත්මභාවය බලා සසර ඇවිදීනාවූ මා විසින් මේ උත්තමයාට පාදපරිචාරිකාව විසූ කෙණෙක් ඇද්දෝ හෝ සිතුව. ඉක්බිති එවිගසම මෙහෙණින්නට ජාතිස්මරණඥානය පහළවිය මම මේ රුවින් අග්‍රප්‍රාප්ත මහා පුරුෂයාහට ඡද්දන්ත හස්තිරජව උපන් කාලයෙහි බිරින්දව උපනිමි. සම්ග මෙබඳු සැප ලදිමි. ජන්මාන්තරයෙහි මිදී සැප සලකන්නාවූහට

මහත්වූ ප්‍රීතිප්‍රමෝද්‍ය උපන්තෙනිය. ඒ ප්‍රීතියෙන් මහත්කොට සිනාසී මෙසේ සිතන්නී පාදපරිචාරිකාවගේ නම් නමාගේ වල්ලභයාහට හිත අදහස් ඇත්ත වුන් ඇත, අහිත අදහස් ඇත්තවුන් ඇත, මෙදෙකින් ඇත්රජව උපන් මහත් මයාහට කෙලෙස විසිම් දෝහෝයි සඳකම් කරන්නී එකල්හි යම්තම් දෙෂයක් සිත්හි තබා එක්සිය විසිරියන් දිගඇති ඡද්දනත නම් ඇත්රජහු සොනුත්තර නම් වැද්දක්හු යවා විෂපෙවූ සැරයකින් විදුවා ජීවිතවිනාශයට පැමිණවීම දුටුවාය. ඉක්බිති මැට ඒ කළ තදකම් සිතා මහත්ශෝක උපදවන්නේ හෘදය වසතුව හුණුවූයේය. ශෝක දරාගත නොහී ආශ්වාස ප්‍රශ්වාස සුසුම්ලමින් මහ හඬින් හැඬුව. එසඳ බුදුරජානන් වහන්සේගෙන් සිනාවක් පහළකොට සිනා සුනු කරුණු කිම්දැයි භික්ෂූන් වහන්සේ විචාරණලදසේක් එම්බා මහණෙනි, මේ බාල මෙහෙණීතොම පෙර එක් ජන්මයෙක්හි මටකළ තදකමක් සිතා හඬන්නී යයිවදාරා ඒ කෙසේදැයි වදාළහොත් යහපතැයි ආරාධිතවූ බුදුරජාතන්වහන්සේ භවයෙන් ප්‍රතිච්ඡන්නවූ මේ ජාතක කථාව ගෙණහැර දක්වා වදාළසේක.

යටගිය දවස හිමාලයපර්වත සමීපයෙහි සදත්දහනලාතම් මහවිල නිසා අටදහසක් පමණ සදත්කුලෙහි උපන් සෘද්ධිමත්වූ ආකාශයෙන් යන ගමන් ඇති ඇත්රැලෙක් විසූහ. එකල්හි පූරණලද පාරමිතා ඇති මහබොධිසත්වතෙම යූථපති ඇත්රජුට පුත්ව උපන්නේය. එතෙම රිදී පර්වතයක්සේ සර්වාංගයෙන් ධවලවූ ලාක්ෂාරසයෙන් තෙත්වූ මුඛයක් හා පාද ඇත්තේය එතෙම මැත භාග යෙහි වැඩිවිය පැමිණියේ අටඅසූරියන් පමණ උස ඇත්තේය. එක්සිය විසි රියන් පමණ දිගින් යුක්තය අටපණස් රියන් දිගඇති සොඬින් සමන්විතය ඔහුගේ දළ වතාහි වටින් පසොළොස්රියන් පමණය. දිගින් තිස්රියන් පමණය සවණක්රැස් විහිදෙන්නේය. තෙමේ අටදහසක් ඇතුන්ට නායකවූයේය. ඔවුන් පිරිවරා ගොස් පසේබුදුරජානන් වහන්සේට පූජාකරන්නේය. මේ ඇත්රජුට චුල්ලසුභද්‍රාය මහාසුභද්‍රාය යන ඇතිනියෝ දෙදෙනෙක් අගමෙහෙසුන් වූහ.

මෙසේ මේ ඇත්රජතෙම ඡද්දන්ත කුලයෙහි අටදහසක් ඇතුන් පිරිවරා ගුහායෙක්හි වසන්නේය. ඒ ඡද්දන්ත නම් විලතොම අයම්විතරින් පණස්පණස් යොදුන්පමණ ඇත්තේය. එවිලමැද යොදනක් පමණ ස්ථානයෙහි දියපරඬලා සෙවෙල් ආදිය කිසිකලෙකත් නැත්තේය. ඉඳුනිල්මිණිකැටසේ නිල්වූ ජලයම සිටිතේය. ජලයට අනතුරුව යොදනක්පමණක් පළලඇති හෙල්මැලිවනය වටා සිටිනේය. ඒ ජලය වටකොට යොත්නක් පමණ පළලඇති නිලුපුල් වනයම සිටිනේය. ඒ වටකොට යොදුන් පමණ පළලඇති රතුපුල්වනයය. ඊට අන තුරුව කියනලද හෙල්මැලි පියුම් ආදී මහාමිශ්‍රවනය යොත්නක් පමණ පළලය. ඒ මහා මිශ්‍රවනය වටා සිටි ඇතුන් පෝනා දියෙහි යොදුන් පමණ පළල ඇති රත්හැල් වනය පිහිටියේය, ජලාන්තරයෙහි නිල්මල් රත්වන් මල් සුදුමල් පිපෙන මනාවූ සුවඳැති පියුම් මලින් ගැවසීගත් කුඩා ගස් ඇති වනය යම්සේ ඒ වනයෝ දසදෙනම යොදුන් යොදුන් පමණ පුළුල ඇත්තාහ. ඉක්බිති යොදුන් පමණ පළල ඇති මහ මැ වනය ඊට ඉක්බිති යොදුන් පමණ පළල ඇති මුං වනය. ඊට අනතුරුව තියඹරා වනය. ඊට ඉක්බිති යොදුන් පමණ පළල ඇති කැකිරි වනය. ඊට ඉක්බිති යොදුන් පමණ පළල ඇති කොමඩු

වනය ඊට ඉක්බිති යොදුන් පමණ තැන්හි පුවක්කඳ සා දඹු ඇති උක්වනය ඊට ඉක්බිති ඇද්දල සා පමණ ඵල ඇති කෙහෙල්වනය, ඊට අනතුරුව සැල පමණ ඵල ඇති කොස් වනය, ඊට ඉක්බිති තියඹරා වනය ඊට ඉක්බිති ගිවුලු වනය, ඊට ඉක්බිති අඹවනය, ඊට ඉක්බිති සියලු වෘක්ෂයෙන් ගැවසිගත්තාවූ මහ මිශ්‍රවනය ඊට ඉක්බිති වටකොට මහත් හුණවනය පිහිටියේය. ක්‍රමයෙන් යොදුන් යොදුන් පමණ පළල ඇති මේ වනයෝ අටදෙන පිහිටියාහ. ඡද්දන්ත විල වටකොට පර්වතයෝ සත්දෙනෙක් පිහිටියාහ. මොවුන්ගේ පිටත කෙළවර පටක් පළමුවන පර්වතය චුල්ලකාල නම්, ඊට ඉක්බිති පර්වතය මහාකාල නම්, එයට ඉක්බිති පර්වතය උදකපාර්ශව නම්, ඊට ඉක්බිති චන්‍ද්‍රපාර්ශව පර්වතය එයට ඉක්බිති සූර්‍යපර්වතය ඊට ඉක්බිති මණිපාර්ශව පර්වතය පිහිටියේය. මෙසේ පර්වතයෝ සත්දෙන සදත්විල වටකොට සිටියාහ. ඇතුළු කෙළවර සිටි සවර්ණ පර්වතයතෙම උසින් සත්යොදුන් පමණ වූයේය. සදත් විල වටකොට පාත්‍රමෝවිටක්මෙන් සිටියේය, ඒ පර්වතයාගේ ඇතුළු පිට සත රත්මය විය. එයින් නික්මුණු රත්වන් රැස් පතර හෙතුකොටගෙණ සදතුවිල තෙම හැම හැමවිටම නැඟාවූ ළහිරු මඬලක්මෙන් බබලන්නේය.

ඉක්බිතිව සිටි පර්වතයතෙම උසින් සයොදුන් පමණ ඇත්තේය. තුන් වෙනි පර්වතය පස්යොදුන් පමණ උස ඇත්තේය. ඊට අනතුරුව පර්වතය උසින් සතර යොදුන් පමණය. ඊට ඉක්බිති පර්වතය තුන්යොදුන් පමණය. ඊට ඉක්බිති පර්වතය දෙයොදුන් පමණය. ඊට ඉක්බිතිව හැම පර්වතයන්ට කෙළවර පිහිටි චුල්ලකාල පර්වතය යොත්තක් පමණවූයේය. මෙලෙස පර්වත වලලු සත කින් පරික්ෂිප්ත ඡද්දන්ත විලට ඊසානකොනයෙහි දියමුසු පටන් පහරණා තෙන මහත් නුගගසෙක් පිහිටියේය. ඒ වෘක්ෂයාගේ කඳවට පස්යොදුන් පමණය. වෙලප දක්වා උසින් සත්යොදුන් පමණය සතරදිගට ගිය සාඛාවන් සයොදුන් සයොදුන් පමණ ඇත්තේය. උඩබලානැගි ශාඛාව දසයොදුන් පමණ ඇත්තේය. මෙසේ නිග්‍රොධ වෘක්ෂය මූලපටන් ශාඛාග්‍රය දක්වා උසින් තෙළෙස් යොදුන් පමණය. වෙලෙප දක්වා උසින් සත්යොදුන් පමණය සතර දිගට ගිය සාඛාවන්ගේ ඈත අතු අගට සතර දෙළොස් යොදුන් පමණය. මේ අටදහසක් අරළුවෙන් සැරහුනේය. මඩුලු ඉඳුනිල්මිණි පර්වතයන්මෙන් සොභා සම්පන්නව සිටියේය. ඡද්දන්තවිලට බස්නාහිර සවර්ණපාර්ශවයෙහි දෙළොස් යොදුන් රත්ගල්ගුහාවෙහි ඡද්දන්ත නම් හස්තිරාජතෙම වර්ෂාකාලයෙහි අට දහසක් ඇතුන් පිරිවරා සිටියේය. ග්‍රීෂ්මකාලයෙහි දියබින්දු මුසු පවන්විඳිමින් අට දහසක් ඇතුන් පිරිවරා නුගරුක අරලු අසු අස්නෙහි සිටිනාහ.

මෙසේ වනසිරි විඳිනා ඇත්රජුට සල්වනය මල්පිපී සිටියේය. මල් රොණින් තැවරුමෙන් රුක්මුල් සෙවනෙහි ගිමන්කල්හි දවස්හරණට සැපයයි දූන්වූහ. එකෙණෙහි ඇත්රජ තොසිතව සල්වෙනෙහි කෙළතට යම්හයි කියා ගොස් ඒ ඇත්රජතෙම පිපීසිටි මහසල්රුකක් දළින්පහළොත්නම් තැලෙයි සිතා කුම්භස්ථලයෙන් පහළේය. එකෙණෙහි යටසුළඟසිටි චුල්ලසුභද්‍රා නම් ඇතිනිය ඇඟ ලී දඩුමරාටු පරඬලා කුනු දිමි කැදලු ආදිය හුනුයේය. උඩුසුළඟ ට සිටි මහා සුභද්‍රාවන් ඇඟමල්රොන් සමග පෙති වගුළේය. එකෙණෙහි චුල්ල සුභද්‍රාතොම සිතන්නී මාගේ ස්නෙහඇති බිරිඳ ඇඟමස් කෙසරු රොන්සලා පෙතිවිසුරුවාපූහ. මාගේ ශරීරයෙහි මරාටුපරඬලා කුරුකුහුඹු කසල දූහයි

නිස්කාරණයෙහි වෛරබැඳීය. ඒ නැවතත් දවසක් ඇත්රජ්ජුරුවෝ නහනු පිණිස පිරිවර ඇතුන් හා ඇතිනි මුවත් සමග ගොස් ඡද්දන්ත විලට බටහ. ඉක්බිති නහඹු ඇතුන් දෙදෙනෙක් සොඬින් සුවඳහොට මිටිගෙණ කෙලෙස් කුළු මඩනා කලක්මෙන් උලා නැවූහ. එරජහු නහා ගොඩනැගී කල්හි අග මෙහෙසුන් ඇතින්නන් දෙදෙනා නැවූහ. ඔහු දෙදෙනෙක් ගොඩනැගී මහ බොධිසත්වයන් සමීපයෙහි සිටියාහ. ඉක්බිති අටදහසක් පමණ මතැත්හු සදන් විලට බැස දිය කෙළිකෙල ඒ විලින් නොයෙක් වර්ණයෙන් යුක්ත මල් ගෙණ විත් රිදී දාගැබක් සරහන කලක් පරිද්දෙන් මහබොධිසත්වයන් සරහා ඉක්බිති ඇතින්නන් දෙන්නා සැරහුය. එවිගස දියකෙළ ඇවිදිනා එක්ඇතෙක් සක්බුමු මහපියුමක් මා බල බලා සිටියදී තමන්ගේ ප්‍රියභාර්‍ය්‍යාවට දුන්නේය. මට නුදුන්නේයයි නැවතත් බොධිසත්වයන් කෙරෙහි වෛරවූවාය.

නැවත එක්දවසක් මිහිරි එලාඑල හා තෙලුඹුදූලි පොකුරු මී හා එක්ව යොදා පන්සියයක් පසේබුදුවරයන් වහන්සේ වළඳවන බොධිසත්වයන් දුක චුල්ල සුභද්‍රාවෝත් තමන් ලද එලාඑල හා පොකුරු මී පසේබුදුවරයන්වහන්සේට දන්දී ප්‍රාර්ථනාකරන්නී මේ ආත්මභාවයෙන් චුතව ගොස් මඩරාජකුලයෙහි ඉපද සුභද්‍රා රාජකන්‍යාව වැඩිවියපැමිණ බරණැස් රජහට අගමෙහෙසුන් ව ප්‍රිය වචන වඩන්නෙම්. ඒ රජුහට වසඟකොට කීවාකරණ පරිද්දෙන් මා නතුකරවාගෙණ ඔහට කියා එක් වැදිපුත්‍රයෙකු මෙහි වමක් පෙදෙසට යවා මේ ඇත්රජහු විෂපෙවූ සැරයකින් විද ජීවිත විනාශයට පමුණුවා සවණක් රැස් විහිදුනාවූ දළසඟළ ගෙන්වාගන්ට සමර්ථවෙම්වයි කියා ප්‍රාර්ථනාකළාය. එතැන් පටන් ගොදුරු නොකා ඊර්ෂ්‍යාවෙන් වියලී නොබෝකලකින් කාලක්‍රියා කොට මඩුරජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳගත්හ. උපන්නාවූ බිසවුන්ට සුභද්‍රායයි කියා නම්තුබූහ. ඉක්බිති ක්‍රමයෙන් වැඩිවයසට පැමිණිය. බරණැස් රජහට පාවාදුන්හ. ඕතොම රජහට ප්‍රියව මනවඩන්නී සොළොස්දහසක් පුරඟනන්ට ප්‍රධානව ජාතිස්මරණඥානය ලදින් වාසය කරන්නීය. මෝ තොමෝ එක්දවසක් මෙසේ සිතන්නී මාගේ ප්‍රාර්ථනාව සමෘද්ධවිය. දැන් වනාහි ඒ ඇත්රජහු විද හෙලවා දළසඟළ ගෙන්වා ගණිමි සිතා බොරුලෙඩ ගසා සියලු ශරීරයෙහි තෙල්ගල්වාගෙණ කිලිටූ වස්ත්‍රයක් ඇඳගෙණ ඔබලත් වෙසයක් දක්වා යහන් මතුයෙහි වැදහොත්තීය.

එකෙණෙහි රජතෙම් සුභද්‍රාදේවී කොයිදැයි විචාරා ලෙඩයයි යනු අසා ශ්‍රීයහන් ගබඩාවටවැද යහන් මතුයෙහි හිඳ පිට පිරිමදිමින් මෙලෙස පිළිවිසිතේයි. ජාම්බොනද සුවර්ණයට බඳුවූ රූ ඇති දේවීනි තොපගේ එබඳු ශරීරය පඬුවන් පැහැවගොසින් ශෝකාතුරවූයේය. පියුම්පෙත්තක්සේ විශාලවූ ඇස් සඟළක් ඇති තෙනැත්තීය මල්දමක්මෙන් මලානිකව ගියව. මීටකාරණා කිමෙක්දැයි විචාළේය. එබස් ඇසූ බිසවුතුමූ මෙලෙස කියන්නී රජ්ජුරුවන් වහන්සෙ සවප්නයෙන් දකීම්වශයෙන් මහත් දොළෙක් උපන්නේය. ඒ දොළ තෙමේද ලැබහැක්කාසේ නොවෙයි. එතකුදුවුවත් ඒ නොලද්දෙම්වීනම් ජීවිතයක් වැති බිසවුනී මේ මිනිස්ලොව ඇති යම් සැපතෙක් ඇත්නම් බොහෝව ඇත්තේය. එබැවින් තොප කී යම් දෙයක් පමුණුවාලමි. ශෝක නොකරවයි කීයේයි, එබස් ඇසූ බිසව්තොම රජ්ජුරුවන්වහන්ස මට උපන්නේ ඉතා ලැබිබ නොහැකි දොළකා. එබැවින් දැන් මම නොකියමි. නුඹවහන්සේගේ

විජිතයෙහි යම්පමණ වැදිකෙණෙක් ඇද්ද ඔවුන් හැම රැස්කලමැනව. එකල්හි මේ ඇති දෙළවූ නුඹවහන්සේට කියමි කියා වැදහොත්තිය. එසඳ රජතෙම යහපතැයි ගිවිස ශ්‍රීයහන් ගබඩාවෙන් නික්ම තුන්සියයක් පමණ යොදුන් කසිරට යම් පමණ වැදිපුත්‍රකෙණෙක් ඇද්ද එකකුත් නොවලහා රැස්කරවයි ඇමතියන්ට විධානකොට රාජ්‍යයේ බෙරලැවූහ. ඊසිට කීපදවසකින් සියලු වැදිපුත්‍රයෝ තමතමන්ගේ සක්තිවූ පරිද්දෙන් පඬුරුගෙණවුත් රැස්වූ නියාව රජ්ජුරුවන්ට කියා යවූහ. එසඳ රැස්වූ වැදිපුත්‍රයෝ සැටදහසක් පමණ ඇත්තාහ. රජතෙම ඔවුන් ආබව දැක කවුළුදොරෙහි සිට අතදිගුකොට බිසවුන්ට දක්වා මෙලෙස කියත්තේය. දේවිනි මේ රැස්වූ සැටදහසක් පමණ වැදිකමෙහි වෙන වෙනම සමර්ථයෝය. කවර කාරියක් නමුත් සාදදීලන්ට බුහුටිහුය. දඹදිව ඇති සියලු වනදුර්ග ගිරිදුර්ගාදියෙහි තත්වයන් දැන නොයෙක් මෘගපක්ෂීන්ගේ නම් සලකුණු ආදී තත්වයන් දනිති. නැවත මටම පුදනලද ජීවිතයන් ඇත්තාහයි එසේහෙයින් තමන්ගෙන් යම්කටයුත්තක් කරවනු කැමැත්තේවීනම් එම සාදදෙන්නාහයි කීයේයි. ඉක්බිති බිසව්තුමූ රජ්ජුරුවන් සමීපයෙහි වැදිපුත්‍රයන් නුදුරුතෙනට ගෙන්වා මෙලෙස කියන්නී, භාත්පසින් රැස්වූ බොහෝ වැදිපුත්‍රයෙනි සවණක් රැස්විහිදුනාලද දළසඟලක් ඇති ඇත්රජකු සීනෙන් දුටිමි. ඔහුගේ දළ ලදිම්නම් ජීවත්වෙමි. එලෙස නොලදින්නම් මාගේ ජීවිතය නොතිබෙන්නේයයි තමා දෙළපරිදි කීව.

එබස් ඇසූ වැදිපුත්‍රයෝ කියන්නාහු දේවීන්වහන්ස, නුඹවහන්සේ විසින් සිහිනෙන් යම්බඳු සවණක් රැස් විහිදුනාලද දළසඟලක් ඇති ඇත් රජෙක් දක්නාලදද එසේවූ ඇතකු අපගේ මුතුන් මීමුතුන් විසිනුත් දුටුවයි ඇසුවේනැත. අප විසින් කලමනා නොදක්නාලද, එබැවින් නුඹවහන්සේ දුටු සැටියේ වෙහෙසින් කීවමැනවයි කීහ. නැවතත් ලැබියනොහැකි දෙළකැයි හඟවා කියන වැදිපුත්‍රයෝ දේවීනි සතර දිගෙක සතර අනුදිගෙක උඩය යට යයි දසදිගෙක් ඇත. මෙයින් කවරදිගෙක ඇතැයි අනුමෝදනා වදාළ මැනවයි කීහ. මෙසේ කී කල්හි සුභද්‍රානොමෝ රැස්වූ වැදිසමූහයා බලා ඔවුන් අතුරෙන් පැතිර සිටිනා පතුල් ඇති බත්මුළුසේ සිටින කෙඩ ඇති මහත්වූ දනම්බුලු ඇති පලල්ව සිටිනා ඇලවර ඇති දලම කොරසැටිව තඹවන් දැලිරැවුලුඇති පිඟුවන් ඇස් ඇති අවලක්‍ෂණ සවරූප ඇති පිළිකුල්වූ වෙස් ඇති සියලු වැදිරැසට උස්ව පෙණෙන මහබෝධිසත්වයන්ට ජන්මාන්තරයෙන් වෛරීව සොනුත්තර නම් වැදි පුත්‍රයා දැක මේ කටයුත්ත සාධාදෙන්ට මෙතෙම නිසියයි රජ්ජුරුවන් අනුදන්ව ඔහු කැඳවාගෙණ සත්මාල් ප්‍රාසාදයෙහි මතුමාලට නැගී උතුරුදිග සිව් මැදුරු කවුළුව හැර හිමවතට අත දිගුකොට ඒ ඇත්රජු වසන තැන් දක්වන් නී මෙලෙස කියා වැදි පුත්‍රයානෙනි මෙනුවරට ඉදුරාම උතුරු දිගට බොහෝ ගම් නියම් ගම් ගෙවා නාගියකල්හි චුල්ලකාලය මහාකාලය යනාදී පර්වතයන් ඉක්මගිය කල්හි සත්වැනි සවර්ණපර්වතයෙක් ඇත. ඒ පර්වතය මුදුනෙහි පිපීසිටි නොයෙක් රුක්මුදුනෙහි මල්මීවරද බී කෙළනා බමර වැලන්ගේ මුමනා දීමෙන් කල්දෙවියාපස ගීතික සර්‍වාතයක් වැනිවිය. ගිරිහිස ගායනාකොට කෙළනා කිඳුරාඞ්ගනාවන් හා කිම්පුරුෂයන්ගෙන්ද රත්මොනරකැලන් ගෙන්ද සැරහුනේය. මෙලෙසින් දෙවියන්ගේ ක්‍රීඩා භවනයක් සමානවූ සත්යොදුන් උස ඇති පර්වත සිඛරයට පැනනැගී ඔහුගේ ප්‍රාන්ත භූමිය බලව. ඉක්බිති ඡද්දන්න විලද ඒ වටා සිටි



ඡද්දන්ත ජාතකය.

හෙල්මැලි ඇඹුලඋපුල රත්පියුම් හෙලපියුම් වනයෙන් සැදුම් ලත්තක් මෙන් සිටියවුන් දක්නෙහිය. ඉක්බිති උත් වනය අවසන්කොට සිටි මහ වනයත් බලමින් ඒ විලට ඉසානකොණයෙහි නිල්මහමේ කැලත් මෙන් දිලියෙන අට දසක් අරලු ඇති නුගගසක් දක්නෙහිය. ඒ රුක්මුල්හි රිදීපර්වතයක් බබලන්නාක් මෙන් සවර්ණක් රැස් විහිදිනා දළ සඟලක් ඇති ප්‍රතිහස්තීන් විසින් මැඩ පැමිණිය නොහැකි ඡද්දන්ත නම් හස්තිරාජතෙම ගිම්සමයෙහි සිහිල් පවන් විඳිමින් සිටියේය.

මේ ඇත්රජහු රියනිසට බඳුවූ මටසිලුටු දළසඟල ඇතිව පවනට බඳුවූ වේගයෙන් ගොස් ප්‍රතිහස්තීන් විසින් පහරණසුලු අටදහසක් පමණ ඇත්හු පිරිවරා රැකවල්ගෙණ සිටිනාහ. මෙතෙක් හස්තීහු පවනින් සෙල්ලුනු කල්හි මහත්කොට නාසාවාතයක් හරිමින් බිම අත් පැහැර ගුගුරමින් වනය එකනින් නාදකොට සොයන්නාහ. ඉදින් එසේවූ මිනිස්කෙණෙක් හමුවූනම් පැහැරණසුණු විසුණුකොට ධූලි පමණත් නොතබන්නාහයි කීය. එබස් අසා සොණුත්තර නම් වැදිපුත්‍රතෙම මරණ භයින් තැතිගෙණ දළ ගෙන්වීමෙන් ප්‍රයෝජන කිම් දැයි කියනුයේ දේවියන් වහන්ස, තුඹවහන්සේගේ රාජකුලයෙහි ජාම්බොනද සවර්ණමයවූ මුතු මැණික් විදුරු ආදිය ඔබා කරණලද බොහෝ ආභරණයන් ඇතිව තිබෑදී මේ දළකඩ පළඳනා ප්‍රයෝජන කිම් රට ඇති වැද්දන් මරණ පමණක්ම වේදැයි කීයේය

ඉක්බිති බිසව්තුමූ මෙලෙස කියන්නී වැදිපුත්‍රයානෙනි මම මීට පළමුවන පාතියෙහි මේ ඇත්රජුට අගමෙහෙසුන්ව මා බලාසිටියදී අනින් අගයෙහෙසිනී නෙතැත්තන්ට කරණ ආංවෙතික දූක ඊෂ්‍ර්‍යාවෙන් මඩනාලදින් සැපත්ති රොසයෙන් දුක්පත්වී වුනවද ඉදිරියෙන් සිදුවූ මම සිතට බොහෝ දුක් වැදීමෙන් වියලෙම්. එබැවින් මා සිතූ අභිප්‍රාය සාදදීලී නම් තොපට ධනධාන්‍යයෙන් සමෘධවූ ගම්වරපසකුත් දෙමි කියා තවද වැදිපුත්‍රය මම ඡද්දන්තහස්තීහු මරවා දළ ගෙන්වා ගන්ට පොකොසත් වේමැයි කියා පසේබුදුවරයන් වහන්සේට දන්දී ප්‍රාර්ථනා කෙළෙමි. මෙපමණමුත් සිතෙන් දුටුයෙත් නැත එබඳු දෙළුනුත් නැත. එනකුදුවූවත් මේ පැතූ ප්‍රාර්ථනාව සිඩවන්නේය. එසේහෙසින් යන්ට අයසයයි භයපත් නොවේයයි අස්වැසූහ. එකෙණෙහි සොනුත්තර නම් වැදි පුත්තෙම යහපත දේවීන්වහන්සැයි කී බස් මුදුනෙන් පිළිගෙණ මා යායුතු බැවින් ඒ ඇත්රජහු යන එන තැන් සිටිනා තැන් ඇලකුණු ඉඳුරා කිවමැනවැයි විචාරන්නේ මෙලෙස කියා දේවීන්වහන්ස, මේ වනස්ථානයෙනුත් කොතැන්හි බොහෝ වේලෙක් සිටිනේද කොතැන්හි වැදහෝනේද නාන්ට බස්නා හසර කවරේද කෙසේවූ තෙණෙක ස්නානය කරන්නේද? ඒමට කිවමැනවයි කීය. ඉක්බිති ජාතිස්මරණඥානයෙන් ප්‍රත්‍යක්ෂව දුටුසැටියේ මෙලෙස කියන්නී වැදිපුත්‍රයානෙනි නුගගසට නුදුරු තැන්හි සදත්විල්හි සිත්කලුවූ බැස නහනතොට ඇති නිර්මල ජලයෙන් හරිත පිපිමලෙහි හැසිරෙණලද බමරුන් ඇති ප්‍රදෙශයෙක් ඇත. එතැන්හි සිට බොහෝ වේලක් දිය කෙළනාහ. ඉක්බිති උපුල ඇඹුල ආදී මලින් සරහන ලද්දේ හෙලපියුම්යේ සුදුවූ තමාගේ ශරීරයෙහි පියුම් රොන් තවරා සතුටුවෙමින් සුභද්‍රා ඇතින්නිය පළමුකොට ලා අට දහසක් ඇතුන් පිරිවරා අවුත් නුගරුක් මුල්හි සැතපෙන්නේයයි කිව. එබස් ඇසූ සොණුත්තරතෙම මා ශරීරයෙහි ශක්ති දූන යහපත දේවීන්වහන්ස, මම ඒ ඇතා මරා දළ ගෙණෙමියි ගිවිස්සේය. ඉක්බිත්තෙන් ඕහට දහසින් බඳ

පියල්ලක් සතුටු පඬුරුකොට දී මෙයින් සත්වෙනි දවස් ගමනැයි ඔහු ගෙට යවා කඹුරන් ගෙන්වාගෙණ සගයෙන් අපට දසමුණෙක බඩුගන්නා සම්පයියක් ඉදිකරන්ට උවමැනවැයි වරපට වරමඳු ඇතුළුව සම්කුඩයක යන මෙයින් ප්‍රයෝජන ඇත්තේය. මේ සියල්ල වහා ඉදිකොට ගෙණෙවයි විධානකොට යවූහ. ඔහු දෙපක්‍ෂයේ ඇත්තෝම විධාන අසාගත් සැටියේම සියලු කර්මාන්ත කොට ගෙණවුත් දුන්හ. ඕතොමෝ මාගෝපකරණාදිය සපයන පරිද්දෙන් පරිවාර ජනයන්ට විධානකොට ගිනිදඬු ආදී උපකරණද අත්සුණු අග්ගලා ආදී මාගෝපකරණ පයියෙහි බැහුයේය. මේ සියල්ලම දසමුණෙක් පමණම බර වූයේය. සොණුත්තර නම් වැදිපුත්‍රද තමාගේ ගෙයි කලමනා විධානකොට සත්වෙනි දවස් අවුත් බිසවුන් වැඳලා සිටියේය. එවේලෙහි සුභද්‍රාතොම සබඳ වැදිපුත්‍රය සියලුම මාගෝපකරණ සපයා නිමවනලද. එබැවින් මෙ සියලු උපකරණ පසුම්බිය හැරගෙණෙවයි කිව. ඇතුන් පස්දෙනෙකුට බල දරන්නාවූ එතෙම ඒ පසුම්බිපයිය ඔසවා කිසිල්ල අස්සේ ගන්වාගෙණ සිස් අතින් සිටියාක් මෙන් සිටියේය.

එකෙණෙහි චූල්ලසුභද්‍රාව වැදිපුත්‍රයාගේ බිරිඳට වැටුප් වියදම්හුත් දී රජ්ජුරුවන්ට දන්වා සොණුත්තරනම් වැද්දට සමුදුන්නේය. එතෙමේත් රජ්ජුරුවන් වැඳ අවසර ගෙණ ප්‍රාසාදයෙන් බැස රථයකට නැගී මහත් පිරිවරින් නික්ම ක්‍රමයෙන් ගම් නියම්ගම් ගෙවා ගොස් දඹදිව්වැසියන් රඳවා ප්‍රත්‍යන්ත වාසීන් සමග මනුෂ්‍යපථය ඉක්ම වනයට වැද ඔවුනුත් රඳවා උදකලාවී යන්නේ තිස් යොදුන් පමණ ඉලුක් වනයට බැස එයින් ගෙවා වැලුක්වනය තණගහනය තලාවනයෙහි බටවනය කීහිරිවනය යනාදීවූ කටුලැහැබින් යුක්තවූ වන සයක්ද තව මේ කටුවනය මහ මිශ්‍රවනය බටවනය සින්බටවනය නයින් විසිනුත් විද පලායා නොහැකි මේ වනගහනයන්ද නොයෙක් මහත් වනයන්ද මහ උනවනයද මඩකලල්ද ජලදුර්ගයන්ද පර්වත ගහනයන්දැයි මේ අටළොස් ගහනයන්ටම පිළිවෙළින් පැමිණ ඉලුක්වනය නියුණු දැයින් ලූගෙණ තලා ගහනාදී වනයන් හුණලැහැප් සිඳිනා ශස්ත්‍රයෙන් සිඳ මහරුක් පොරවෙන් සිඳ හෙලා ඉතා මහත් ගස් නියනින් විදමකොට ගොස් මහඋණවනයෙහි ලැහැබට හිනක්බැඳ නැගීහුණදණ්ඩක් මුදුනෙහන් දමා එයින් ගොසින් අනික් උණදණ්ඩක් එයින් ඉදිරියට දමා මාරුකිරීම් වශයෙන් උණවනය මුදුනෙන්ම ගොස් කලල්මඩෙහි වියලි පෝරුවක් අතුට එයින් ගොස් නැවත අනික් පෝරුවක් ඉදිරියෙහි අතුට මෙපරිද්දෙන් පෝරු අතුට කලල්ගහනයන් ගෙවා ඔරුවක් කොට ජලදුර්ගයෙනුත් එතරව පර්වතප්‍රාන්තයට වැද දත්මුවිටකින් ගල් සැරයි වල වල වැද ගන්ට තිසිම කරණලද ගොකටුම යොතෙක්හි බැඳ උඩට දමා සිසිවෙස්හි පාකුල්වාගෙණ මකුලුවෙකු නැගෙන්නාක් මෙන් යොත ඔස්සේ නැගී විදුරු බැඳී අත්ඇති යදණ්ඩකින් පර්වතය විද වැ නියන් ගසා එහි සිට කොක්ක ඇදගෙණ නැවත පර්වතය මතුයෙහි පාකුල්වා එහි සිට වරමනඳක් බහා ඒ මාගෝපකරණ පසුම්බිය ගෙණ මදක් බැස යට කනුවෙහි බැඳ වම් අතින් යොත අල්වාගෙණ දකුණතින් මුගුරක්ගෙණ පැහුර කනුව උදුරාගෙණ නැවත නැංගේය.

මෙම ක්‍රමයෙන් උඩු යටිව දෙවාරයක් හා යටිකුරුව දෙවාරයක් බැගින් නැගී මෙම ක්‍රමයෙන් පර්වතය මුදුනට නැගී බස්නාකල් පෙරපරිද්දෙන්ම මුදුනේ කනුවක් ගසා පසුම්බියෙහි යොත බැඳ කනුවෙක ලා තමා ඇතුළුවූ පසිබෙහිඳ මකුලු හුයකින් බස්නා මකුළුවෙකු මෙන් හැර හැර බසින්නේය.

මෙපරිද්දෙන් සුභද්‍රා දේවීන්ගේ බස්ගෙණ නුවරින් නික්මුණුදා පටන් වනගහනයන් සතළොස්දෙනෙකු ගෙවා පර්වතවළලු සතක් පැන සත්වෙනි ස්වර්ණපර්වත මුදුනට නැගී හියවුර පිටබැඳ දුනු හීතල අතින්ගෙණ සදත්විල විසි තුරු සැරහිම් බලා පර්වත ප්‍රාන්තයෙහි කෙළනා කිඳුරගනන් කෝකිලාවන් ගිරා බොකළ සැළලිහිණියන් ආදී පක්ෂීන්ගෙන් සැදුම්ලද වනහිස් බලමින් අන තුරුව ඉඳුනිල්මිණි පර්වතයක් මෙන් හොබනා මහත් නුගරුක්මුල්හි අටදහසක් ඇතුන් පිරිවරා සිටි ඡද්දන්ත නම් ඇත්රජහු දක්නේ වරගනන් පිරිවරා කෙළනා පැන්තොටද ස්නානයකොට ඇවිත් බොහෝ වේලෙක්හි සිටිනා තැන්දූයි යන මේ මුළුල්ල බිසවුන් කී පරිද්දෙන් බලා පර්වත වළල්ලෙන් ඇතුළට බටුයේය.

මේ සත්අවුරුදු සත්මස් සත්දවසකින් සදත්විල සමීපයට ගොස් බෝධිසත්ත්වයන් වසන එක් පෙදෙසක් නියම්කොට මෙතැන් වළක් ගසා ඇත්රජහු විදූ ජීවිත විනාශයට පමුණුවා දළ කපාගණිමියි නිශ්චයකොට වනයට වැද වැම්පෝරු ආදී දරුසම්භාර සපයා ඇතුන් දියකෙළියට ගියකල්හි ඇත්රජහු මෙතෙක් දවස් ගොස් සිටිනාතැන උදැල්ලකින් සිව්රුස්කොට වළබිඳ කැත කැකිපස් බිජුවට හිස්නාක්මෙන් දියෙහි ඉසුරුවා වෙළෙහි වතුව ලා ඔබ්බා වැම් සිටුවා දව වන ඔබ්බා තුලාම් අතුට එහි පෝරු වනගසා මධ්‍යයෙහි හිදණ්ඩක් යන විතර සිදුරක්කොට අවකාශස්ථානයෙහි වැලිපස් කසල ආදිය නොදනෙනා පරිද්දෙන් පෝරුමත්තෙහි වසා තමා යන විතර මගක් ඉවතින් තබා පෙර පරිද්දෙන් වළ නිමි කල්හි උණුසනක්සේම ඉස තොප්පියක් බහා කසාකඩක් පෙරව විෂපෙරවූ සැර හා දුනු දුන්නක් ගෙණ වළට බැස සිටියේය.

ඒ මහා බෝධිසත්ත්වතෙම දෙවෙනි දවස් ඇත්මුළු හා සමඟ ගොස් දිය කෙළ ගොඩනැගී මෙතෙක් දවස් තමා සැතපී සිටිනා මහවිසල් මලුයෙහි වැදි පුත්‍ර මෙහෙයන පෝරුව මත්තෙහි සිටියාහ. ඇත්රජහු ඇඟෙන් වැහෙන දිය බින්දු නැබපෙදෙසින් එක්ව රිදණ්ඩක් යන විවර තිබෙනලද සිදුරෙන් වැදිපුත්‍ර යාගේ ඇඟෙහි වැටුනේය වැදිපුත්‍රතෙම ඒ සලකුණෙන් සිටිනතැන දැක මහ සැරයකින් විද්දේය. ඒ මහාබෝධිසත්ත්වයන්ගේ හියෙන් ගොස් පපුකැත් අතුනුබහන් සිඟ නාභියට පොරවකින් පැලූ කලක්මෙන් අහසට නැංගේය. සිදුරුව ගිය රිදී කලයකින් ලතුදිය වැහෙන කලක්මෙන් ලේ වැගුරුනේය. මහත්වූ වේදනාවෙන් ඉවසාගත නුහුනු ඇත්රජතෙම සියලු පර්වතය එකතින් නාදකෙරෙමින් තුන්යලක් කුඤ්චනාද කෙළේය. එකෙණෙහි අටදහසක් පමණ මතැත්හු එකවිට ගුගුරා පැනනැංගාහ. නැවත නැවත මේ කිමෙක්දෝ නෝයි විමසන ඇත්හු ඡද්දන්ත නම් ඇත්රජහු සැරපහර ලද්දේය. වේදනා වෙන් පීඩිත නියාව දැක ඉතිකින් සිටින්නේ කිම්ද පසමිතුරා අල්වම්හයි සහසී වෙරම්බවාතයෙන් ඇලලී ගිය අහස්කුස් දුවන වලාකුල් මෙන් සතරදිගය සතරඅනුදිගය යන අටදිස්හි විසිර තණපත් පරඬලාපත් පමණකුත් නොව ලහා සුණුවිසුණු කෙරෙමින් බලන්ට පටන්ගත්හ. එකෙණෙහි ඇත්සමූහයා ඒ ඒ දිග විසුරුණු බව දැන සුභද්‍රා නම් අගමෙහෙසුන් ඇතින්නිය විසින් ඇඟ වතුරුවා ගන්නා ලදින් මදක් සිට වේදනාව ඉවසාගතනොහෙන ඇත්රජ්ජු රුවෝ රිදණ්ඩ ආනැන් විමසනුයේ ඉදින් නැගෙණහිර ආදියෙන් ආයේනම් කුම්භස්ථලය බිඳගෙණ පයකඩින් නික්මෙන්නේය. ඇලක්විද අතික් ඇළය කින් පිටත්වන්නේය. මේ එලෙස නොව පෙකනිය පටන් විදගෙණ අහසට නැංගේය. එසේහෙයින් මේ රිදණ්ඩ පොළවෙන් නැංගයුතුයයි සලකා සිටිනැත

පරීක්‍ෂාකරණු යුතුයයි කැමතිව කවුරු දනිද්ද? මිනීස්කෙණෙක් විතම මෝ තොම මරාපියන්නීයයි උපන් මහාකරුණාවෙක් සුභද්‍රාවන් එතනින් පහ කරණු කැමතිව සොඳුර අටදඟසක් පමණ ඇත්තු මාගේ පසමිතුරා අල්වම් හයි අටදික්හි දිවපුවාහ. තොපි මෙතන කුමක්කරාදූයි කීයේය.

එබස් ඇසූ සුභද්‍රාතොම් දෙවයන්වහන්ස තුඹවහන්සේ දරා ඉමසා සිටි යෙම්. ඊට සමාකල මැනවැයි මහබොධිසත්ත්වයන් තුන්යලක් පැදකුණුකොට සතර තෙතක සිට වැඳ මේ දිග බලමි. අහසට නැගිකල්හි මහබොධිසත්ත්ව තෙම භූමිය පයින් පහලේය. එකෙණෙහි පෝරු ඉගුලුනේය. එසඳ රිදීදූමක් සේ ධවලවූ සොඬදිගුකොට විමසන්නාවූ මහබොධිසත්ත්වයන්ගේ අත බුඩාදීන්ගේ අහීත් ධවජයවූ කාසායවසත්‍රය පුෂ්කරාග්‍රයෙහි වැදිපුත්‍රතෙම තිබූයේය. එබඳු වේදනාවෙන් පීඩිතවූ මහබොධිසත්ත්වතෙම සිතනුයේ අර්හත් ධවජය නම් සත්කාර ගරුකාර කටයුතුය. එබැවින් මොහු මැරියයුතු නොවෙයි සිතා ඒ සොණුත්තරනම් වැදිපුත්‍රයා සොඬින් ඔසවා ඉදිරියෙහි සිටුවා මෙලෙස කථා කරන්නේය. රාගාදී කසටින් කිලුටුවූ ඉඳුරන් ඇති දැමීමක් සබවස් නැති යමෙක් කාෂාවසත්‍රය ධරාතම් වදුරෙක් පෙරවි සිංහචර්මයක් මෙන් ඊට යොග්‍ය නොවන්නේය. යම් පුද්ගලයෙක් රාගාදී කසල දුරුකෙළේද සිල් රැකීමෙහි භාවනා කිරීමෙහි අප්‍රමාදද, ඉන්ද්‍රිය දමනයෙන් හා සබවස රැකීමෙන් යුක්තද එසේවූ පුද්ගලතෙම බුඩාදීන් විසින් දැරියයුතු මේ අර්හත් ධවජය ධරන්නට නිසියයි කියා එතකුදුවුවත් මේ මැරියයුතු නොවන්නේය. ඔහු කෙරේ කෝප සිත් දුරුකොට සබඳ තොප මා විදිබව කීමෙක්ද තොපටම ප්‍රයෝජනයක් නිසා විද්දහුද නොහොත් අනික් කෙණෙකුන් විසින් මෙහෙයන ලද්දේද ඔවුන් සතුටු කරවන ලද්දේදැයි විචාළේය.

එකෙණෙහි වැදිපුත්‍රතෙම කියනුයේ ඇසුවමැනව ඇත් රජ්ජුරුවන් වහන්ස කසිරජ්ජුරුවන්ගේ සුභද්‍රානම් අගමෙහෙසුන් බිසවක් ඇත. ඕතොම සිහිනෙන් තොප දැක සවණක් රැස් විහිදෙනා මේ දළදෙකින් පලඳනාවක් කර වනු කැමැත්තෙමියි, දෙළ බැඳ රජ්ජුරුවන් වහන්සේට දන්වා එරට වැදිපුත්‍රයන් කැටිකරවා මාම නිසියයි තෝරාගෙණ මංසලකුණු කියා එවූහ. එබැවින් විද්දෙමියි කීයේයි. එබස් අසා මහබොධිසත්ත්වතෙම වැලි මේ චුල්ලසුභද්‍රාවන්ගේ මෙහෙවරක් නිසා වේදැයි තමාට මාගේ දළින් ප්‍රයෝජන නැත. මා මරවනු පිණිස මොහු එව්වේයයි ප්‍රකාශ කරන්නේ මෙලෙසකියා මාගේ පියානන් මුත්තනුවන් වහන්සේගේ දළ තොනස්නා පිණිස ගල්ගුහා ආදියෙහි තුබූ බැව් දැන මාගේ දළදෙකම ගෙණවයි තොපම එවන තැනැත්තී ඕ කළ යම්තම් වැරැද්දක් සිත්හි තබා තමා බැඳි වෛරම සිඩකොට මෙසේවූ රෞද්‍රක්‍රියාවකින් මුදුන්පත්කළාය එබැවින් ඕ නොමියනතෙක් වහා දළ කපාගණුවයි කීයේය එබස් ඇසූ වැදිපුත්‍රතෙම උන් තැනින් නැගීසිට කියත අතින් ගෙණ මහබොධිසත්ත්වයන් සමීපයට ගියේය. එතෙම අසූරියනක් පමණ උස ඇත්තේය. එසේ හෙයින් දළ තිබූ තෙතට අත දිගුකරණට නොහැක්කේය. ඉක්බිති මහබොධිසත්ත්වතෙම ශරීරය තමා ඉස මිටිකොට වැදහොත්තේය. එසඳ වැදිපුත්‍රතෙම මහබොධිසත්ත්වයන්ගේ රිදීදමක් සමාන සොඬමඬිමින් නැගී කෛලාශකූටයක් වැනි කුම්භස්ථලය පිට සිට කපෝලයෙහි මාංසය දතින් ඇත ඇතුළටකොට කුම්භස්ථලයෙන් බැස කියත ඇතුලු මුඛයෙහි පහරමින් කපන්ට වන්නේය. මහබොධිසත්ත්වයන්ට මහත්වූ වේදනාව උපන්නේය. මුඛයෙහි ලේ පිරුණේය,

වැදිපුත්‍රතෙම සත්සලව ඇත මැත ඇවිද කපාගත නොහෙත්තේය. එවිට මහ බොධිසත්ත්වතෙම කටින් ලේ දමා වේදනාව ඉවසා කිමෙක්ද සබඳ කපාගත නොහේදැයි විචාළේය. වැදිපුත්‍රද එසේය, ස්වාමීනි කීය. මහබොධිසත්ත්වතෙම සිහිඑලවාගෙණ එසේකල සබඳ මාගේ හොඬ ඔසවාගත්ට බල නැත්තේ දැයි කීවේය.

ඒ ඇසූ වැදිපුත්‍රතෙම කීලෙස කෙළේය. මහබොධිසත්ත්වයෝ සොඬින් කියත ගෙණ කෙළවූහ. දනතයෝ කිලිල්කඩක් මෙන් හැපුනාහ. ඉක්බිති බොධිසත්ත්වතෙම ලහට ගෙන්වාගෙණ සොඬින් අල්වාගෙණ සබඳ වැදිපුත්‍රය මේ දළ තොපට දෙන්නෙම් මට අප්‍රියයි සිතා දෙන්නමුත් නොවෙමි. ශක්‍රසම්පත් බ්‍රහ්මසම්පත් පතා දෙන්නමුත් නොවෙමි. මේ දළටත් වඩා දහසක් ලක්‍ෂයක් ගුණයෙන් සර්වඥතාඥානය නමැති දනතයෝම ප්‍රියයෝය එබැවින් මේ දානය බුදුබවට කාරණාවේවයි, දළදෙකත් දී සබඳ තෙපි කෙතෙක් දවසකින් මෙතනට අවුදැයි විචාරා සත්අවුරුදු සත්මස් සත්දවසකින් ආමි කී කල්හි එසේවී නම් මේ දළෙහි ආනුභාවයෙන් සත්දවසකින් බරණැස්නුවරට පැමිණේවයි කියා සත්‍යක්‍රියාකොට යවූයේය.

ඔහු ගිය ඉක්බිති අටදිග ගිය ඇතුන්ද අහසටනැගි ඇතින්නියද එන්ට පළමුවම බොධිසත්ත්වයෝ කාලක්‍රියා කළාහ. එසඳ දික්පාසා ගිය ඇත්හුද ඇතින්නියද සතුරා සොයා ඇවිද නොලදින් බොධිසත්ත්වයන් මිය වැදහොත් මහවිසල් මළුවට රැස්වූවාහු සියලුම ඇතුන්ම අඩාවැලප ඉලව්ගෙණ මහබොධිසත්ත්වයන් කුලුපග පසේබුදුවරයන් සමීපයට ගොස් ස්වාමීනි, පසේබුදුවරයන් වහන්ස, නුඹවහන්සේට ප්‍රත්‍යයදායක ඇත්රජතෙම විෂපෙවූ හීයකින් විදිනාලද්දේ කාලක්‍රියා කෙළේය. ඒ මිනිය දක්නා පිණිස වැඩියමැනවැයි දැන්වූහ. එසඳ පන්සියයක් පසේබුදුවරයෝ ආකාශයෙන් අවුත් මහවිසල් මලුවට බටසේක. එකෙණෙහි බලඇත්තු දෙනෙක් ඇත් රජ්ජුරුවන්ගේ ශරීරය දළින් ඔසවා පසේබුදුවරයන් වඳවා දරසෑයට වැඩූහ. පසේබුදුහු තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි ආදාහනස්ථානයෙහි ඉඳ පිරිත්බිණූසේක. අටදහසක් ඇත්තුද ආදාහනස්ථානයෙහි ගිනි නිවා අලු අස්කොට සුභද්‍රානම් ඇතින්නිය පළමු කොට ලා තමන් වසන ස්ථානයටම හඬමින් වැලපෙමින් ගියාහ. සොණුත්තර නම් වැදිපුත්‍රද ලොව අනිත් ඇත්කෙණෙකුන්ට නැතිහෙයින් ආශ්චර්‍ය්‍යවත්වූ ඒ දළදෙක්හි රත්වත්වූ රැසින් හාත්පසින් වනලැහැබ බබුළුවා සත්දවසක් ඇතුළතම බරණැස්නුවර සමීපයට පැමිණ මම ඡද්දනත නම් ඇත්රජහුගේ සවණක් රැසින් බබලනලද දළදෙකම ගෙණාමි නුවර සැරහුව මැනවැයි බිසවුන්ට කියායවා උන්විසිනුත් රජ්ජුරුවන්ට කියා යවා නුවර සැරහුකල්හි සොණුත්තර වැදිතෙමේ නුවරට වැද ප්‍රාසාදයට නැඟී දළදෙක බිසවුන්ට දී කියනුයේ බිසවුන්වහන්ස, නුඹවහන්සේට පූර්වජාතියෙහි ස්වාමීවූ ඇත්රජ්ජුරුවන් කළ මනා වරදක් සිත්හි තබා වෛරබැඳ මරන්ට සිතූ පසිද්දෙන් ඔළනියාව දන මැනව ඔහුගේ දළවේදැයි දුන්නේය. මහබොධිසත්ත්වයන්ගේ සවණක් රැස් විහිදී දළ සහල මිණිතල්වැට තබා තමාගේ කලවා මත්තෙහි තබාගෙණ පූර්වජාතියෙහි තමාගේ ස්වාමීහුගේ දළ බලමින් මෙබඳු රූපශ්‍රීන් දිලිහෙන ඇත්රජහු විෂපෙවූ හීයකින් විද ජීවිතක්‍ෂයට පමුණුවා මේ දළදෙක ගෙන්වාලද මා කළයේ නපුරයි සිතා බොධිසත්ත්වයන්ගේ ගුණ සිහිකරත් සිහිකරත් ශොකාග්නියෙන් දිලිහුනේය. එයින් හෘදයවස්තුව නැවී එදවස්ම කාලක්‍රියා,

කළාය. ඒ බැව්දත් බුදුරජානන් වහන්සේ සිව්වණක් පර්ෂත්මධ්‍යයෙහි වැඩහිඳ සිනාපහළකළසේක. ඒ බව දැක සර්වඥවරයෝ නම් නොකරුණෙහි සිනාපහළ නොකෙරෙති. නුඹවහන්සේ විසින් සිනාපහළකළ කරුණු කවරේදැයි සිව්වණක් පර්ෂත්ගේ අභිප්‍රායවූ පරිද්දෙන් ක්ෂීණාශ්‍රව භික්ෂූන්වහන්සේ විචාළසේක. සිනාසුනු කාරණා මදුරා බුදුරජානන් වහන්යේ එම්බා මහණ මේ ලඳුරි බාල මෙහෙණින්නතොම පෙර එක් ජන්මයෙක්හී මට පාදපරිචාරිකාව උපන්නී ස්නෙහසන්තොෂයෙන් සිනාසී තමා කළ තදකමක් දැක හඬාපූව. මේ කාරණ ය දැක සිනාපහළ කෙළෙම් කියා ඡද්දන්ත ජාතකය පූර්වාපර සන්ධි ගළපා නිමවා වදාළසේක. මේ දෙශනාව අසා බොහෝ සත්ත්වයෝ සෝවාන් සෙදගැමි අනාගාමි අර්හත්යන සතරමඟ සතර ඵලයට පැමිණියාහ. ලඳුරි මෙහෙණින්නතොම තමා වසන වෙහෙරට ගොස් ධ්‍යානභාවනා කොට රහත්වූහ. එසමයෙහි සොණුත්තරනම් වැදිපුත්‍රයා යවා ඡද්දන්ත නම් ඇත්රජහුගේ දළ කපා ගෙන්වා වෛර සිඬකළ සුභද්‍රා නම් දූත් මේ සිනාසී ඇඬු මෙහෙණින්න විජ්නී ය. එසමයෙහි බිසවුන් කී පරිද්දෙන් අටලොස් වනගහනයක් ගෙවා උඞ්නා වලඳු සතක් පැනගොස් ඡද්දන්ත නම් ඇත්රජහුගේ දළගෙණා සොණුත්තර නම් වැදිපුත්‍රයා දූත් දෙවදත්තස්ථවිර වන්නෝය. එසමයෙහි සිය අතින් දළ කපාදී ඔහුගේ මනොරථය සිඬකළ ඇත්රජ නම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

506
සම්භව ජාතකය.

තවද එක්සමයෙක්හි වෘන්දාරක වෘන්ද වන්දනීයය චරණාරවින්ද ඇති ශුද්ධාචාර සුඬාන්ත කරණ සුඬොදන නන්දන ශ්‍රී සමන්තභද්‍ර අප බුදු රජානන්වහන්සේ විවිධගුණ ගණාධාර තපොධනාධිවාස ජෙතවනාරාමයෙහි සතර ආයඊබ්‍රහමවිහරණයෙන් දවස් යවමින් වැඩවසන සේක් ශ්‍රවණ රමණීයවූ මේ සම්භව ජාතකය තමන්වහන්සේගේ අසාධාරණ ප්‍රඥාපාරමිතාව අරභයා වදාළසේක. එහි වර්තමාන කථාව මහා උම්මග්ග ජාතක යෙහි විස්තර වශයෙන් එන්නේය.

යටගිය දවස කුරුරට ඉඳිපත්නුවර ධනඤ්ජයකොරව්‍ය නම් රජෙක් දසරාජ දහමින් රාජ්‍ය කරන්නේය. ඒ රජහට සුචිරතර නම් පුරෝහිත බ්‍රාහ්මණයෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නේය. දානසීලාදී කුශලයෙහි යෙදෙන ඒ රජතෙම එක් දවසක් ධර්ම යාග නම් ප්‍රශ්නයක් කල්පනාකොට සුචීරත නම් බමුණානන් අස්නෙක්හි හිඳුවා ප්‍රශ්නය විචාරණුයේ මෙලෙස කියා ආචාරිනී මේ සත් යොදුන් පමණ ඉඳිපත්නුවරෙහිද තුන්සියයක් යොදුන් පමණ කුරුරටෙහිද ඇති සියලු ඓශ්වර්‍යයට පැමිණියෙමි. මෙබඳු ඉසුරෙන් සිටක් නව ගම් නියම්ගම් රාජධානි සැදුනු දසදහසක් යොදුන් දඹදිව එක්සත් කොට රජකරණ ලොභයෙන් දික්විජය කරන්නා කැමැත්තෙමි. ඒ තමාත් ධර්මයෙන් මුත් අධර්මයෙන් දිනනු නොකැමැත්තෙමි. එබැවින් අනීතිදිනමූ නොනස්නා ධර්මය රැස්කරණු කැමති මම යම් කටයුත්තකින් මෙලොවින් නිඳූ නොඅසම්ද? අයසකට නොපැමිණෙම්ද? එසේවූ අර්ථ ධර්ම දෙකම සිඬ

කරණු කැමැත්තෙමි. මෙසේ, සිඬකිරීමෙන් නරකාදියෙහි නිපද දිව්‍යමනුෂ්‍ය ලෝකයෙහි ඓශ්වර්‍ය්‍යයට පැමිණ සැපවිඳීමට කාරණවූ ධර්‍මයද ඔහුගේ විපාක මෙයවූ අත්ථයදැයි මේ දෙකට කාරණා කවරේදැයි විචාරම්. විචාළාවූ මට කිව මැනවැයි කියා බ්‍රාහ්මණයා අතීත් ධර්‍මයාග ප්‍රශ්නය විචාළේය. මේ ප්‍රශ්නය තෙමේත් ඉතා ගැඹුරය බුදුනුවණටම ගොදුරුය එබැවින ලොවීතුරා බුදු කෙණෙකුන් ගෙන් හෝ විචාළයුතුය. නොහොත් බොධිසත්ත්ව කෙණෙකුන් ගෙන් හෝ විචාළයුතුය. මෙසේ ගම්භීරාර්ත්ථයෙන් යුක්තවූ ප්‍රශ්නය සුචිරතනම් පුරෝහිත බමුණුතෙම කෙසේනම් විසඳත්ව සමඤ්වේද එතකුදුවුවත් පණ්ඩිත මානයක් නොකොට අපවැනි නුමූකල නුවණෙහි සිටිකෙණෙකුන් විසින් කිය හැක්කේ නොවෙයි. ඉදින් මේ පැනය විසඳත්තම් ගනඅඳුරෙහි දිලියෙන ගිනි කඳක්මෙන් නුවණින් දිලියෙන විධුරපණ්ඩිතයෝ නිශ්ශෝය අපටවූකල අඳුරු ගබඩාවකට වත් කලක් පරිද්දෙන් මේ පැනයෙහි අගෙක් මුලෙක් නොපෙණෙන්නේය. බරණැස් රජ්ජුරුවන්ට පුරෝහිත ධුරයෙහි සිටි විධුරපණ්ඩිත යෝම නිශ්ශෝයි දෙවෙනිවත් දූන්වූයේය.

එබස් ඇසූ රජතෙම එසේකල ආචාරීනී තෙසු කෙණෙකුන් යවා ප්‍රයෝජන නැත්තේය. තෙපිම ගොසින් ඒ විධුරපණ්ඩිතයන්ට ආරාධනාකොට මේ ධර්‍මයාග ප්‍රශ්නය විචාරා ඔවුන් විසින් අත්ථයනම් මේය දැහැමෙන් වර්‍ණනය කරන්නේය. මෙලෙසය ධර්‍මයනම් මේය ඒ නොනසා පවත්නේය, මෙලෙසය යන කාරණා විසඳ ප්‍රශ්න විස්සර්ජනය කළ කල්හි මේ පසලොස් දහසක් පමණ ජාමෙබානද සුවර්‍ණයෙන් ධර්‍මයට පූජාකරවයි කියා විධානකොට පඬුරුත් දී මාගෝපකරණත් සමෘද්ධකොට යන පරිද්දෙන් කියා විදුරපණ්ඩිතයන ප්‍රශ්න විසඳු පරිදි ලියාගෙණෙන පිණිස ලක්ෂයක්වටිනා රන් පතක් කරවාදී නැගෙන පිණිස වාහනයකුත් පරිවාරජනයන් සේනාවත් සලසා පඬුරු පාක් කුඩමූත් දී එකෙණෙහිම යැවූයේය. ආචාරීද ඉදිපත් නුවරින් නික්ම ඉඳුරා බරණැස්නුවර බලා ගොසින් යම්තැණෙක්හි නුවණින් ප්‍රසිද්ධව පණ්ඩිතවරහු වෙසෙද්ද ඒ ගම් නියම්ගම් රාජධානී ඔිමසමින් ක්‍රමයෙන් දඹදිව මුලුල්ලම විමසමින් කිසිතැනකත් මේ ප්‍රශ්නය විසඳන පණ්ඩිත කෙණෙකුන් නොදැක අනුක්‍රමයෙන් බරණැස් නුවරට හොස් එක් තෙනක්හි ලැගුම්ගෙණ පාත්වූ කල්හි සියලු පිරිවර භාර කිපදෙනෙකු හා සමග දහවල් බතට විදුර පණ්ඩිතයන් ගේ ගේ දෙරට ගොස් තමන් ආ නියාව කියායවූහ. ඔවුන්ගෙන් අවසර ලදින් ගෙට වැද අනුන්ගේ ඉඟිතාකාර දැනීමෙහි දක්ෂවූ භාරද්වාජ ගොත්‍ර ඇති සුචිරත නම් පුරෝහිත බ්‍රාහ්මණතෙම බත් කමින් විධුරපණ්ඩිතයන් දුටුයේය. ඔහු දෙන්නම එක ආචාරීන් කෙරෙහි ශිල්ප ඉගෙණ එක්කම වැඩුනාහ. එබැවින එක්ව ඉඳ බත් අනුභව්කොට ඉක්බිති සැපසේ ඉඳ කථාකරණුයේ කුමක් පිණිස අවුද ආචාරීනී විචාළේය.

ආ කාරණය කියන සුචිරත නම් බ්‍රාහ්මණතෙම මෙලෙස කියා සබඳ විධුර පණ්ඩිතයෙනි එක්දවසක් අපගේ කොරව්‍ය රජ්ජුරුවෝ මා අතින් ධර්‍ම යාගය නම් ප්‍රශ්නයක් විචාළසේ මම එහි අර්ත්‍ථ නොදැන බරණැස්නුවර රජ්ජුරුවන්ගේ පුරෝහිත ධුරයෙහි පිහිටි විධුරපණ්ඩිතයන් විනා මේ පැනය විසඳිය හෙනකෙණෙක් නැතැයිකීම්. එබස් අසා රජතෙම කියනුයේ ආචාරීනි තෙපිම ගොස් මේ පැනයෙහි අත්ථ විචාරවයි කියා සේනාවාහනයන් පඬුරුත් සේනා පාක්කුඩමූත් දී එවූයේය. එබැවින් මේ ප්‍රශ්නය විසඳුව මැනවැයි කීයේය

ඒ වේලාවට බමුණුතෙම මහජනයා සිත්ගෙණ අධිකරණ විචාරන්නේ මෝහට පැන විසඳීමෙහි අවසරයක් නැත. එතෙම ඊට කාරණා මෙලෙසින් කියන්නේ ය. බ්‍රාහමණයෙනි මහජනයාගේ නොයෙක් සිත් නමැති ගඞ්ගාවන් එකගුණ කරණුයෙම් මූ වසඟකෙරෙමි. එසේ හෙයින් ඔවුන් සිත් නමැති ගඞ්ගාවන්ට සමුද්‍රයසේ නොවී සිටිය නොහෙමි. එබැවින් අවසරයක් නැතිව කෙසේ නම් මේ ප්‍රශ්නය විසඳම්දැයි මෙලෙසින් කියා එතකුදුවුවත් මාගේ පුතනුවෝ පණ්ඩිතයහ, වියත්හ, බහුශ්‍රැතයහ, මටවඩා නුවණැත්තාහ. ඔවුන් සමීපයට ගොස් පිළිවිසුවවයි ඔහු යවනුයේ මෙලෙස කීයේය. මාගේ ඖරසපුත්‍රවූ භද්‍රකනම් පුතනු කෙණෙක් ඇත. ඔවුන් සමීපයට ගොස් විචාරව. මපුතනුවෝද තොප විචාළ අර්ථ ධර්ම දෙක කියති යවයි කීයේය. එබස් අසා සුචීරතනම් බ්‍රාහමණතෙම විධුරපණ්ඩිතයන් ගේ ප්‍රාසාදයෙන් නික්ම භද්‍රකනම් මානවකයා පෙරවරු බත් අනුභවකොට තමාගේ පර්ෂත් මධ්‍යයෙහි සකලෛශ්වර්‍ය්‍යයෙන් පිණමින් හුන් තැනට ගොස් ඔහු විසින් කරණලද සත්කාර සම්මාන ඇතිය හිඳ පිළිසඳර කථාකොට කුමක්නිසා අවුද ආචාරීනි විචාළකල්හී සුචීරතනම් පුරෝහිතතෙම කියනුයේ භද්‍රක මානවකයානෙනි තොපගේ පියානන් විධුරපණ්ඩිතයන් සමීපයට ප්‍රශ්නයක් විචාරණු පිණිස අපගේ රජ්ජුරුවන්වහන්සේගේ නියෝගයෙන් ඉඳිපත් නුවරසිට ආමි. ඒ විධුරපණ්ඩිතයෝ තමන් බොහෝ යුක්ති විචාරණ හෙයින් තොපගේ නුවණ ගුණ වර්ණනාකොට තොප සමීපයට එවූ හෙයින් ප්‍රශ්න විචාරන්ට ආමි කීයේය.

ඉක්බිති භද්‍රක නම් මානවකතෙම කියනුයේ සැබව් ආචාරිනි පෙර එසේම තිබුණු සිත්විලි ඇත්තෙමි දූන් වනාහි පරදාර කිරීමෙහි සිත් බැඳීගොස් අන්කිසි කාර්‍ය්‍යයෙක්හි නොයෙදී සිත වියවුල්ම තිබෙනහෙයින් තොපගේ ප්‍රශ්න විසඳිය නොහෙමි. එසේ වුවත් මාගේ මලනුවෝ සංජයකුමාරයෝ මේ ප්‍රශ්නය පමණක් විසඳා කියාලති. උන් සමීපයට යවයි කියා. තවද සුචීරතනම් බ්‍රහමණයාණෙනි යම්සේ පුරුෂයෙක් යහපත් මූවමස් කදක් ගෙණයනුයේ අතරමග ගොයෙකු දැක මස්කද දමා මහත් වේගයෙන් ගොයා ලුහුබැඳ යන්නේද, එපරිද්දෙන්ම මාගේ ගෙයි මාගේ වසගෙහි පවත්නා ප්‍රියවූ බිරිඳ ඉඳ දීත් අනුන්ගේ රක්‍ෂිත ගොපිත පරස්ත්‍රීන් අනුබැඳ ඇවිදිමි. එබැවින් අර්ථයද ධර්මයද විසඳා කියන්ට නොපොහොසත්මි. මාගේ මලනුවන් සමීපයට ගොස් විචාරවයි කීයේය. එකෙණෙහි පුරෝහිත බමුණු සංජයනම් මානවකයාගේ ගෙට ගොස් ඔවුන් විසින් කරණලද සත්කාර සම්මාන ඇතීයේ පිළිසඳර කථා කොට මදක් උන්නේය සංජය මාණවකද කුමක් නිසා අවුද ආචාරීනියි විචාළේය එකල්හි සුචීරතනම් පුරෝහිතතෙම ඉඳිපත් නුවරසිට කෞරව්‍ය රජ්ජුරුවන්ගේ නියෝගයෙන් ප්‍රශ්නයක් පුළුවුස්නා පිණිස බරණැසට අවුත් විධුරපණ්ඩිතයන් අතින් විචාළ නියාවද උන්ගේ කියමනින් දෙවෙනිව භද්‍රක නම් මානවකයා කරා ආ නියාවද ඔහු විසින් තොප සමීපයට එවූ විසින් ආමි යනාදීන් ආ කාරණා කීයේය. ඒ සංජය කුමාරයන් එකල්හි පරදාරය කොට ඇවිදිනේය. එබැවින් ඒ මානවකද කීයනුයේ – ආචාරීනි මමත් පරදාර සේවනය කොටම ඇවිදිමි. ස්ත්‍රීධූර්තකම් කරන්නෙමුත් ගඟක් පීනා එගොඩව පරස්ත්‍රීසම්පර්කය කොට එමි. එසේ උදෑසන සවස දූතිමෝරු කිඹුලුන්ගෙන් ගැවසීගත් ගඟ පිහිනීම මරහු ගලන්නාහු වැන්නෙමි. එබැවින් මාගේ සිත වියවුල්ව ප්‍රශ්නය

නොපව විසඳා කියන්ට නොහැක්කෙමි. එසේවුවත් සම්භවකුමාර නම්වූ මාගේ සත්හැවිරිදි මලනුවෝ අප ඇමට සතගුණයෙන් සහස්‍රගුණයෙන් නුවණින් අග්‍රයෝය. එසේහෙයින් උන් ලඟට ගොස් විචාරාගණුවයි කියා උදෑසන සවස මරහු ගලුවනු හෙයින් මේ ප්‍රශ්නය කියාගත නොහෙමි මාගේ මලනුවන් සමීපයට ගොස් විචාරවයි කීයේය. එබස් අසා සුචිරත නම් පුරෝහිත බමුණු කියන්නේ නොපගේ පියානන් ඇතුළුවූ තුන්දෙනාම කියාගත නුහුනු ප්‍රශ්නය මෙවිට කටින් කිරි නොහල බාලදරුවෝ කියාපියද්ද? මේ වනාහි නොප වැන්නවුන් කියාලිය හැකි දෙයක් නොවෙයි. ඉතා ගැඹුරුය, දුක්ෂමය, කියාලීම ආශ්චර්‍ය්‍යය. එබැවින් කියාගත නොහෙමි'යි නොකියා නිකම් දෙඩීමෙන් කම් කිම්ද? බැණනොනැගී වැදහිඳුවයි කීයේය. එබස් අසා සංජය කුමාරතෙම ආචාරීණි, සම්භව කුමාරයන් ළදරු බාලයයි නොසිතව. ඉදින් ප්‍රශ්නය සැක හැරගන්නා කැමැත්තා නම් මාගේ මලනුවන් සම්භවකුමාරයන් සමීපයට යවයි කියා ඔවුන්ගේ නුවණට ප්‍රශංසාකරණුයේ මෙලෙසින් කියා සුචිරත නම් පුරෝහිතයාණෙනි, යම්සේ උදාගිරි මුදුනෙන් අහස්කුසට වන් සඳමඬල තරුපතර සිරිපරයා දසදිගුන් හොබනේද, එපරිද්දෙන් මාගේමලනුවෝ සම්භවකුමාරයෝ නුවණ සිරින් බබලනුයේ මෙලොව ඇති සියලු නුවණැත්තන් මැඩ පවතිති. එබැවින් මහත් උත්තමයෝ බාලයෝවී නමුත් අනාදර කටයුත්තෝ නොවෙති. දැන ගොසින් අසව ධර්මදෙසා දැනැමෙන් උපදවනක්‍රම විචාරාගණුව ආචාරීනි කියා, තවද මත්තෙහි මොහු ගුණවණනුයේ පුරෝහිතයාණෙනි, යම්සේ සෑතුන් සඳහා කෙරෙන් වසන්තකාලයතෙම මල්පල්ලෙන් සැරහී සිටි සල්හි වනීා කාලයටත් වඩා බබලන්නේද? එපරිද්දෙන්ම සම්භවකුමාරයෝ ලොව ඇති කෙසු නුවණැත්තන්ටත් වඩා නුමුව බබලති. තවද ආචාරීනි, යම්සේ හිමාලයෙහි ප්‍රතිසුගන්ධයන් දරණ ගන්ධමාදන පර්වතයතෙම නොයෙක් කුළුපහරින් ගැවසුනේය. නොයෙක් සිද්ධවිද්‍යාධරයන්ට වාසස්ථානවූයේය. නොයෙක් දිව්‍ය ඖෂධයෙන් රුරහ රුකින් සැදුම් ලැබ දසදිගුන් සුවඳ කෙරෙමින් බබලන්නේය. එපරිද්දෙන් සම්භවකුමාරයෝද නුවණින් බබලන්නේය.

තවද මෙසේ රාත්‍රියෙහි ඝනාන්ධකාරයෙහි පර්වතමුදුනෙහි දිලියෙන ගිනිකඳක් මෙන් නුවණින් දිලියෙන සම්භවකුමාරයන් බාලයහයි නොසිතා ගොසින් ප්‍රශ්නය විචාරාගණුව. තවද ආචාරීනි, බාලවූ අජානීය සවිස්ධයා ජවයෙන්ම දැනගන්නාහ ශරීරමාංසයෙන් දැනගන්නෝ නොවෙති. වෘෂභරාජයාද භාරෝද්වාහනයෙන්ම දනිති. ආකාරයෙන් දැනගත හැක්කෝ නොවෙති. ධෙනුඹුරුල්ල දුටු පමණින් දන්නාහු නොවෙති. කිරිදෙව බැලීමෙන් දන්නාහ. එපරිද්දෙන්ම නුවණැත්තවුන් කථා කිරීමෙන් නුවණ විමසීමෙන් දැනගන්නාහ. උස මහත සැටියෙන්ම දැනගන්නාහු නොවෙති. එසේහෙයින් මාගේ මලනුවන් බිළිඳුයයි නොසිතා ගොසින් ප්‍රශ්න විචාරා උන්ගේ නුවණ තොරතුරු දනුවයි කියා මෙලෙසින් සම්භවකුමාරයන්ගේ නුවණ වණිතා කරන් කරන්ම වන් නාට ගොසින් විචාරා සාමර්ථ්‍යය දනහැක්කේවේද? ඒ නොපගේ බාල මලනුවෝ කොයිදැයි විචාළේය.

ඉක්බිති සංජය මානවකතෙම ප්‍රාසාදයෙහි සිව්මැදුරු කවුළුවහැර අතදිගු කොට බමුණානෙනි, මේ ප්‍රාසාදයට ඉදිරි වීථියෙහි සමවයසැති කුමරුන් හා සමග කෙළනා ජාම්බොනද සවණියට බඳුවූ ජවිවණ ඇති කුමරුවා නම් මාගේ

මලානුවෝය. නොපි ඔහු බාලයයි නොසිතා ගොසින් සැකවිචාරව. එතෙම් සම්ඥ විලාශයෙන් කියන්නේයයි දක්වූයේය. සුචිරතතම් බ්‍රාහමණතෙම සංජය කුමාරයන් බස් අසා ප්‍රාසාදයෙන් බැස කුමාරයන් සමීපයට ගියේය. එවේලාවට සම්භවකුමාරතෙම ඉතතිබූ කඩ කරට දමාගෙණ වැලිඅෝතක් අතින්ගෙණ සිටීයේය. සුචිරත නම් පුරෝහිත බමුණාතෝත් සමීපයට ගොසින් සිටියාහ. ඔහු ඇවිද්දින් ඉදිරියෙහි සිටියාහු දැක උත්තමයාතෙනි, කුමක්නිසා අා කෙණෙකුදයි විචාරා සිටිකල්හි සුචිරතතම කියනුයේ පුත සම්භව කුමාරයෙනි, මම මුලු දඹදිවෙහි පැතයක් විචාරණු පිණිස ගම් නියම්ගම් රාජධානියෙහි ඇවිදිතෙම මා විචාල ප්‍රශ්නය විසඳන්ට සමර්ථයක්හු නැති හෙයින් තොපිසමීපයට අාමි කී කල්හි, කුමාරතෙම කියනුයේ, මුලු දඹදිවෙහි නුවණැත්තවුන් විසින් කියාගත නුහුනු ප්‍රශ්නයක් විචාරණු මා සමීපයට අාහ.

එබැවින් මම නුවණින් වැඩිමහල්ලෙමි. හිරිඔතප් උපදවාගෙණ අත තුබූ වැලි දමා කරට දමාගත් කඩ ගැඳ විචාරව බ්‍රාහමණයාතෙනි, බුධවිලාශයෙන් මම ඒ ප්‍රශ්නය විසඳමි. සම්ඥ ප්‍රචාරණයෙන් පැවරූහ. එසඳ පුරෝහිත බමුණුතෙම ඉඳ්‍රපත්නුවරින් පිටත්වූ තැන් පටන් දඹදිව ඇවිදිනයාවද, සබඳ ධරණෑය නුවරට ඇවත් විධුරපණ්ඩිතයන් හා භද්‍රකාරතම මානවකයා හා සංජයමානවකයන් අතින් විචාලතෙන ඔවුන් කියාගතනොහී තොප ලඟට එවූ හෙයින් අාම් ප්‍රශ්නය විසඳවයි අාරාධනා කෙළේය. ඔහු විසිනුත් තමන්ගේ රජ්ජුරුවන් කියාලූ පරිද්දෙන් ප්‍රශ්නය කීකල්හි අහස්මැද පුනසඳ මඩලක්මෙන් මේ මහ බොධිසත්ත්වයානට ප්‍රශ්නයෙක් අප වැටහුනේය. එබැවින් අසව අාචාරීණි, ඍයා ධර්මයාග ප්‍රශ්නය විසඳුයේ මෙලෙසයයි කියන්නේය.

අාචාරීණි, මේ නිසා යම්කෙයකින් සියනුවරින් අවුද? එබැවින් සියල්ල දන් බුදුකෙණෙකුන දෙසන සැලක් පරිද්දෙන් විසඳන්නෙමි. තවද තොපගේ රජ්ජුරුවෝ මේ ප්‍රශ්නය යම්පරිද්දෙකින් අසා දනිත්ද එපරිද්දෙන කියා පිළිපැදීමද කොහොත් නොවරදවා කිරීමද යන දෙකම තොපගේ රජ්ජුරුවන්ටම භාරය මාගේ වනාහි වරදෙක් නැත. ප්‍රශ්නවූ පරිද්දෙන අර්ත්ථ කියමියි ධර්මයාග ප්‍රශ්නය විසඳා කියනුයේ මෙමෙලසින කියන්නේය. සුචිරත නම් පුරෝහිත බ්‍රාහමණයාතෙනි, ඉද්නු තොපගේ රජ්ජුරුවෝ අද දන්දෙම්හ, සිල්රකුම්හ, පෙහෙවස් වසම්හයි, විචාරණ ලද්දේවීනම තොපිත් රට අද ප්‍රාණඝාත කරම්හ. කාමසෙවාදය කරම්හයි තොප ක් දන්පින සෙට කරම්හයි කියෙතිවීනම් තොප බඳුවූ මහ අමාත්‍යයාකන කියේ කටයුතුයි නොගෙණ එබඳු ප්‍රසථාවෙහින් ප්‍රමාදයෙන දවස් නොයවා උපන් කුසල්සිත නොපිරහෙලා තොපගේ රජ්ජුරුවෝ කුසල්ම කෙරෙත්වයි එයේකල්හි අප ධර්ම දෙක නොහසා රක්නාතම් වෙයි කියා මත්තෙහිද මේ ප්‍රශ්නය මෙමලෙසින් ප්‍රකාශකරන්නේය. තවද සුචිරත නම පුරෝහිත බමුණානෙනි, තොපගේ රජ්ජුරුවන් විධුරපණ්ඩිතයන මේ ප්‍රශ්නය විසඳුයේ කෙසේදැයි විචාල කල්හි අධ්‍යාත්මිකයයි කියනලද රූප වෙදනා සංඥ සංඛාර විඥානයයි යන පඤ්චස්කන්ධයන් ඇතිව නැතිවන හෙයින් අනිත්‍ය නියාමද කියා මේ සියලු සංස්කාර ධර්මයෝම අසාරයහ. අස්ථිරයහ. එසිකල නොහැක්කැයි නත්වූ පරිද්දෙන් යම් දවසෙක නුවණැසින දුටුයේද? එකල්හි සියලු භවයෙහි කළකිරී නිර්වාණාභිමුඛව වන්නේයයි කිව.

අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ,
න හි නො සංගරන්තෙන මහාසෙනෙන මච්චුනා.

අප්පමාදො අමතපදං පමාදො මච්චුනොපදං,
අප්පමත්තා නමීයන්ති යෙ පමත්තා යථා මතා

යනාදීන් ගාථා දෙකකින් අවවාදකොට අධ්‍යාත්මික චිත්තය පිරිසිදු කොට ඇතුළත්හි කාමක්‍රොධාදී සතුරන් ජයගන්ට කියවයි ඔහු උගන්වා "අනිච්චා වත සංඛාරා උප්පාදවයධම්මිනො" යනාදී ගාථාවෙනුත් අනිත්‍යතාවයම ප්‍රකාශකොට මත්තෙහිද ප්‍රශ්නය විසඳනුයේ, අඥබාලව පෘථග්ජනයෙක් සිහි මුළාවියේ මිථ්‍යාදෘෂ්ටියයි කියනලද තොමහෙති යේද එලෙස නොකොට තොපගේ රජ්ජුරුවන්ද දශකුශල කර්මපථයයි කියනලද සත්පථය මතුපැමිණි යාවූ කුසල් කමැති ශරීරය නොසික්මවා උපකාරකළ වුන්ට ප්‍රත්‍යුපකාර කරන් නෑක්හු මෙන් උපකාරිවූ කුසලයම වර්ධනය කරන්ට කියව.

තවද කායවාක්කර්මනැ යන චාරත්‍රයෙන් සිඩ්විත අකුසල් දුරුකොට දාන සීල භාවනාදී සුචරිත ධර්මයම පරාද්‍රෂාරණලෙස තොපගේ රජ්ජුරුවන්ට උන්වව තවද උච්ඡේදදෘෂ්ටි ශාස්වතදෘෂ්ටි නමැති අතීර්ථයට අස්ථානයට තොපගේ ප්‍රජා වන් නොබස්වව. තොපිත් නොබසුවයි කියව. තවද ආචාරිණී අනාත්ව අචාඩෙක අනර්ථයෙක නොහා සිර සත්ත්වයන් තමා හා සාරුණ්‍යවෙන් සමානකොට දකින, පරිද්දෙන් දත්වවයි කියා මෙලෙසින් තොපගේ රජ්ජුරුවෝ ධර්මයාග ප්‍රශ්න යෙහි කියනලද අවවාද පරිද්දෙන් පවතිත් නම් යෙහෙක. යම් රජ්ජුරු කෙනෙක් මෙලෙස දාන පවතිත් නම් ඔහුගේ යසස පෙර දෙපෝයෙහි සඳමෙන් වර්ධනවන්නේය. මෙතෙම ශීලාදී ගුණයෙනුත් සෙස්සවුන් මැඩ බබලන්නේය. මෙසේ මහබොධිසත්ත්වතෙම අහස්කුස සඳමඩල දක්වන කලක් පරිද්දෙන් සර්වඥලීලාශයෙන් පුරෝහිත බ්‍රාහ්මණයාහට ප්‍රශ්න විසඳීම වශයෙන් දම්දෙසූහ.

මෙසේ බොධිසත්ත්වයන්ගේ ධර්මය ඇසූ බොහෝ ජනයෝ ඔල්වරහඬගසා මින් බොහෝ උලෙල පැවැත්තේය. එතැන්හි රැස්වූ ජනයා විසින් මහබොධි සත්ත්වයන් කෙරෙහි සන්තෝෂව ගලවාදමනලද හත්පලන් වස්ත්‍රාභරණයෙන් කෝටිගණන් සම්පත් රැස්වූයේය. රජ්ජුරුවෝද බොහෝ යසස් තනතුරු දුන්නාහ. සුචිරත නම් පුරෝහිත බ්‍රාහ්මණයාද පසළොස් දහසක් රත්රනින් පූජාකොට රන්පත දැහිගුලෙන් ප්‍රශ්නය විසඳූ පරිදි ලියා තමාගේ ඉඳිපත්නුවර එම ගොසින් ධර්මයාග ප්‍රශ්නය විසඳූපරිදි කීයේය.

රජ්ජුරුවෝද ධර්මයවූ පරිද්දෙන් පැවත සිය සෙන් හා සමග ස්වර්ගීපද පිරුහ. මෙසේ ශාස්තෘවූ බුදුරජාතන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි. තථාගතතෙම දැන්මතු නුවණැත්තෝ නොවෙයි. පෙරත් මහනුවණැතියේමයයි වදාරා ජාතකය පූර්වාපරසන්ධිගලපා නිමවා වදාළසේක. එකල්හි ධනඤ්ජයකෞරව්‍ය රජ්ජුරුවෝ නම් දැන් මේ භාණ්ඩාගාරික ආනන්දස්ථවිරයෝය. සුචිරත බ්‍රාහ්මණයා නම් දැන් මේ අනුරුද්ධස්ථවිර යෝය. එසමයෙහි විදුරපණ්ඩිතයෝ නම් දැන් මේ මහාකාශ්‍යප ස්ථවිරයෝය. භද්‍රකාරක මානවකයා නම් මෞද්ගල්‍යායන ස්ථවිරයෝය. සංජය කුමාරයෝ නම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

507
මහාකපි ජාතකය

තවද එක්සම්යෙක්හි අචින්ත්‍ය අවාච්‍ය අවේද්‍ය අතුල්‍ය අභේද්‍ය චරිත ඇති ශාස්තෘවූ ත්‍රිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජනානන්දජනක පුෂ්පාරාම ඵලාභිරාම වේළුවනාරාමයෙහි මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂාය යන චතුර්විධ බ්‍රහ්ම විහරණයෙන් දවස් යවමින් වැඩවසනසේක් සමස්තජනකර්ණ භූෂණායමාන මේ මහාකපි ජාතකය දෙවදත්තස්ථවිරයන් විසින් බුදුන් මුදුනට ගල්පෙරලීම අරභයා වදාළසේක.

ඒ දෙව්දත් මහතෙරුන් විසින් බුදුන් විදිනට දුනුවායන් යවා ධනපාල නම් හස්තිහුද මෙහෙයා අනතුරුව ගිජ්ඣකූට පර්වතමස්තකයෙහි සක්මන් කරණ බුදුන් හිසට පෙරලතලද මහත්වූ පාෂාණය පොළොවෙන් ගල්දෙකක් නැගී උඩ අහස්හිම රදවාගත් කල්හි දම්සභාවෙහි රැස්වූ භික්ෂූන් වහන්සේ බුදුගුණ වර්ණනාකොට දෙව්දත් මහතෙරුන් නුගුණ කිය කියා උන්කල්හි බුදුරජාණන්වහන්සේ තුන්තරා ගමනින් එක්තරා ගමනකින් වැඩ සුපිපි පියුමෙක වැදහුන්නාවූ රත්වන් හංසරාජයෙකු මෙන් ධර්මාසනාරූඪව වැඩහිඳ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුනුදැයි විචාරා ඒ භික්ෂූන් විසින් ස්වාමීනි. බුදුරජාණන් වහන්ස, නුඹවහන්සේ විසින් නොකියන් නට වදාළ රාජකථා චොරකථාදී දෙතිස්කථාවෙන් යුක්තව උනුමෝ නොවම්හ. එනකුදුවූවත් මේ දෙවදත්තස්ථවිරයන් විසින් බුදුන් මුදුනට පෙරලූ මහගල් පෑපිවියෙන් පාෂාණ දෙකක් නැගී අහස්හිම රඳවාගත්තේය. එබැවින් බුදුගුණ අප්‍රමාණයයි කිය කියා දෙව්දත් මහතෙරුන් නොකරුණෙහි වෛරබැඳ බුදුන් හිසට ගල් පෙරලූයේ නපුරැයි කිය කියා උනුම්හයි කීකල්හි මහණෙනි, මේ දෙවදත්තස්ථවිරතෙම දැන්මතු මෙලෙස කෙළේ නොවෙයි. පෙරත් හිසට ගල් පෙරලූයේම වේදැයි වදාරා ඒ කෙසේදැයි භවප්‍රච්ඡන්න කථාව ගෙණහැර දක්වා වදාළමැනවයි ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් දශරාජ ධර්මයෙන් රාජ්‍යය පරිපාලනය කරණකල්හි කසීදනව්වෙහි සීසා ජීවත්විත එක්තරා බමුණෙක් කුඹුරෙහි සසා ගොන්ගේ මුදාහැර නියර කොටන්ට පටන් ගත්තේය. ගොන් තණ කාගෙණ යන්නාහු කාලෙකාගෙණ යමින් ක්‍රමයෙන් මහවනයට වන්නාහ. එතෙම ගොන් නැතස්වේලා නොදක්නේයයි උදැල්ල තබාලා ඇවිත් නොදැක මහත් දොම්නසට පැමිණ ඔවුන් සොයමින් වනයෙහි ඇනමැන ඇවිදින්නේ හිමවත්පෙදෙස හා ඒකාබද්ධවූ වනයට වැද ආ අත් යන අත් නොදන්නේ සතියක් නිරාහාරයෙන් වල්මත්ව ඇවිද එක් තිඹිරිරුකකට නැගී තොවිලික්සුකු ඵල අනුභව කරණුයේ ඇඟ බලනැතිවූයෙන් අතුඅගින් ගිලිහී සැටඅතක් පමණ ගැඹුරු ඇති ලෝඇදිරිනරකය සේ බිහිසුණු මහත් නරක ප්‍රපාතයෙක හුනුයේය.

මොහු මැටුනු සදවසක්විවර ඉකුත්වූකලට වානර ජන්මයෙක්හිඉපද බෝධිසත්ත්වයන් වහන්සේ නොයෙක් ඵලාඵල කමින් ඇවිදින්නේ එම අතුඅගට පැමිණියේ අතිගම්භීර ප්‍රපාතයෙහිවැටී ක්ෂුධාවෙන්පෙළී කෙදිරිගාමින් හොත් පුරුෂයාදැක සියලු දුකට වඩා මෙරමා දුක් ඉවසිය නොහෙන ඒ මහසත්තෙම

නොයෙක් ජාතියෙහි පුරුදු කරුණාව මොහු කෙරෙහි බලා මතු බෝසතුන් සසර මහාවලින් ගොඩවන්නට පූර්වනිමිත්ත පානාසේ මිනිසෙකු විවර බර ඇති ගලක් ඉගබැඳගෙණ ගල්කුලෙක්හි සිට කිමට පැන නැවත උඩට පැන මෙපරිද්දෙන් අභ්‍යාසකොට එලෙස පුරුෂ ප්‍රමාණවලට පැමිණ ඒ පුරුෂයා ඇඟවහවාගෙණ වේග දතවා ගොඩට පැන විඩාව හෙස් එකියන පුරුෂයා කෙරෙහි නිශ්ශංකව උකුලෙහි ඉසතබා වැදහොත්තේය

එසඳ ඒ කෙලෙහිගුණ නොදන්නාවූ මිත්‍රද්‍රෝහිවූ පවිටු පුරුෂතෙම සිතනුයේ මම දවස්ගණනක් නිරාහාරහෙයින් කිසිබලයක් නැතියෙමි. වනයෙහි එලාඑල කෑමෙන් ශරීරයෙහි බල වඩාගත නොහැක්ක. මේ අසේව වැදහොත් වඳුරා මරා මස්කොට අනුභවකිරීමෙන් ශරීරයත් පුෂ්ටිකොටගෙණ මෙයින් මාගෝපකරණයකුත් සපයාගණිමි සිතා තමා දෙමව්පියන් මරාත් සැප උපදවාගතයුතුයයි සිතනුයේ නුදුරෙන්මතුවූ ගල්පැල්ලක් ඇරගෙණ බෝධි සත්ත්වයන් නිදමින් හොත්තාවූත් මුදුනේ පහලේය.

එවිට මහබෝධිසත්ත්වතෙම උතත්දූව අතුඅගකට පැන මේ කිමෙක්දෝ හෝයි විමසනුයේ අන්කිසි කෙනෙකුන් විසින් කළදෙයක් නොවෙයි. මේ පවිටු නෙකැත්තවූත් ගෙන්ම වීයයුතුයයි දැන එම්බල මිත්‍රද්‍රෝහිවූ දුෂ්ට බ්‍රාහ්මණය, තා දැන් ෂෂ්ටිපුරුෂප්‍රමාණවූ වළකින් ගොඩකැගීමි. තෝ දැන් ඊට වඩා හැඹුරු මිත්‍රද්‍රෝහි නමැති වළෙක්හි වැටුනේය. තා කළයේ නොයෙදෙයි කියා ඕහට නින්දාකොට ඉදින් මෙතක හැරපියා ගියෙම් නම් මේතන සිංහ ව්‍යාඝ්‍රාදීන්ට ගොදුරුවෙමින් මියන්නේය. නැවත මාගේ කරුණාවට සුදුසු නොවන්නේයයි සිතා එම්බල පුරුෂය, තා කෙරෙහි මම සැක ඇත්තෙමි. එබැවින් මම අතු අගින් අගට පැන තට මග පාමින් යෙමි කියා මොහු කැඳවාගෙණ වනයෙන් එළියට බහා මාවත සිටුවා නැවතත් ඇසවසා හුනු මස් වැදූල්ල අතින් ඔසවා ගෙණ තුරුහිසින් තුරුහිසට පැනගොස් තමන් වසන පර්වතප්‍රාන්තයට ගොසින් වන්හ. ඒ මිත්‍රද්‍රෝහි පුරුෂතෙමේත් මහබෝධිසත්ත්වයන් කෙරෙහි අපරාධ කොට එම පාපයෙන් ශ්වෙතකුෂ්ට ඇතිව ක්ෂුධාපිපාසාවෙන් පීඩිතවූයේ එම ආත්මභාවයෙහිම මනුෂ්‍යප්‍රෙත වූයේය. එතෙම මෙලෙසින් සත්අවුරුද්දක් මුලුල්ලෙහි දුකින් පෙළී ඇවිදිනේ ක්‍රමයෙන් බරණැස්නුවරට වැද මිගාචිරනම් උද්‍යානයට වැද පවුර ඇතුළත කෙහෙල්පත් අතුරව වේදනා මහත්ව වැදහොත්තේය.

එකල්හි බරණැස් රජතෙම උයනට ගොසින් රම්‍යවූ ප්‍රදේශයන් බලමින් ඇවිදිනාහු මේ මනුෂ්‍ය ප්‍රෙතයා දැක තෝ කවරෙක්හි ද කොයිසිට අයිද කුමන පාපයකින් මෙසේවූ දුක්විඳිනාහුදැයි මෙලෙස විචාරන්නේයි එම්බල පුරුෂය. තාගේ ශරීරය මැදිසකකස්සේ සුදුය. ඒ ඒ ස්ථානයෙහි ගඩපොල කරණකොටගෙණ පිපි කොබෝලීල මල්රූකක් වැන්නෙහිය. තොපගේ ශරීරය ඉතා දුර්වලය. වෙරඇට ඉපලී නහරබහන් ඉල්පුනේය. දුටුදුටුවන්විසින් ඉතාම පිළිකුල් කටයුතු වූයෙහිය. එසේහෙයින් තොපි යක්ෂයන්ගෙන් ප්‍රෙතයන් ගෙන් කවරෙක්හිදැයි විචාරා තවද පුරුෂය, තාගේ හස්තපාදයෝ ධවලයෝය. ඊටත් වඩා ඉසකේ සුදුය. නැවත තාගේ ශ්‍රවණීය කබුරුවත්ව කුෂ්ටකිලාශයෙන් නැවසුනේය. තවද පුරුෂය, තාගේ පිට ඇටපෙල දෙණෙනකල ඇට පෙළක් මෙන් ප්‍රකාශව උනුම්විව විරූපව තිබෙන්නේය. නැවත රජසින්

වැකුණු පාදයන් ඇත්තෙහිය. ඉතාම බැලිය නොහැකි තපුරුවූ පැහැ ඇති කිසි සැටියක් නැති ශරීරය වැඳූ මැතියන් පියානන් විසිනුත් දක්ක නොහැකි බැලිය නොහැකි පිළිකුල් සැටිය ඇති හෙයින් මෙබඳු කෙණෙකුන් නොප විනා පළමු මෙසේවූ කෙණෙකුන් නුදුටුවිරුැමි. මෙකියන සියලු කාරණයෙන් දරුණුවූ කවර පාපයක් කොට මේ දුක්විඳිනෙහිද යි නොමැරියයුතු කවර උත්තමයක්හට හිංසාපීඩාවක් කෙළෙහිදයි මොහු කළ අකුසල් විචාළේය.

ඉක්බිති මිත්‍රද්‍රෝහි බමුණුතෙම තමා මේ ජම්මයෙහි කළ අකුසලින් නොමිය දුක්විඳිනා නියාව කියා කළ අපරාධය ප්‍රකාශකරණුයේ මෙලෙස කියන්නේසි- බරණැස් රජ්ජුරුවෙනි, මෙලොව සැබැව කීම නුවණැත්තෝ ප්‍රශංසා කෙරෙති. එසේහෙයින් ඇතිසැටිය නොවරදවා කියනුයේ මෙලෙසින් කියා රජ්ජුරුවෙනි. බමුණුකුලයෙහි ඉපදත් ගොවිතැන්කොට ජීවත්වන්නෙම් එක්දවසක් අපවත්වගිය ගොන්ගෙයක් කැලෑ කාගෙණ ගිය හසර බලාගෙණ යන්නෙම් මහවනයට වැද එයින් වල්මත්ව ඇතුන් වලසුන්ගෙන් ගැවසීගත් කාන්තාරයට වැද සිංහ ව්‍යාඝ්‍රාදී භයින් ගැලවී ගැලවී ඇවිදිනෙම් ඵලභරිත නැමුනු අතුඇති තිඹිරිරුකකට නැගී ගැඹුරු වළකට නැමුනුයෙම් ෂෂ්ටිපුරුෂ ප්‍රමාණ වළෙහි ඉස බිමබලා පය උඩුකුරුකොට කිසිඑල්වීමක් නැතිව ගල් සැරස්සෙහි වැටීහිනීමි. එසේවූවත් දියපිරුණු වළ හෙයින් අස්පත් නොබිඳීම දුක්විඳිමින් පිරුණු සතියක් එහි ඉකුත්කෙළෙමි. ඉක්බිති ගොනගුල්යයි යන ව්‍යවහාර ඇති එක් වානරයෙක් නොයෙක් ඵල අනුභවකොට ඇවිදිනේ පලගත් තිඹිරි රුකට පැන අනුභව කෙරෙමින් වළට නැමුනු අතුඅගට පැමිණ එවේලෙහි ඇට සම මාත්‍රව සුදුමැලිව කන්වක ප්‍රමාණව වැදහොත් මා දැක මහත්වූ කරුණා උපදවා එම්බල පින්වත, මෙදුකින් පෙළෙන තෝ මනුෂ්‍ය යෙක්හිදයි විචාළේය. මමත් ඔහු බලා ඇඳිලිබැඳ කියනුයෙම් පින්වත්වූ වානරයානෙනි, මම වල්මත්ව අවුදින් මෙතැන්හි වැටුනෙම් එක් මනුෂ්‍ය යෙක්මි. මෙයින් මට ගැලවීමක් නැතැයි ප්‍රාණයට ආසා නැතිව වැදහොත් කලට කිසි දෛවයකින් නොපි මාවෙතට පැමිණියව නොපට වැඩක් වේවයි මට පිළිසරණ වේවයි යාච්ඤා කෙළෙමි. එකල්හි කරුණාපුරස්සරව වඳුරාතෝත් ගලක් ගිගබැඳගෙණ ගොඩදීම මදක් අභ්‍යාසකොට මා වැටුනු ප්‍රපාතයට පැන වෙසේ එව පුරුෂයානෙනි මාගේ පිටට නැගී කරසිපගෙණ තරයේ වැද හිඳුවයි සම්මිතකොට අනීනුත් අල්වාගෙණ ගොඩට පැන මෙසේ කීයේය.

සබඳ පුරුෂය, මාගේ ශරීරය විඩාව ආයාසය ඇත්තේය. එබැවින් මා සැතපී ගන්නාතුරු සිංහ ව්‍යාඝ්‍රාදී දිවි වලස් ආදීවූ සතුන් වලකා බලාහිඳුවයි කියා සැතපී නිදිමත්වූයේය එකෙණෙහි මාගේ නුනුවණින් පවිටු සිතිවිල්ලෙක් සීනනුයෙම් මේ වානරතෙම භූරත් ගෝනුන් මුවන් මරා කැයුතු සතෙකා එබැවින් මොහු මරා මස් අනුභවකෙළෙමිනම් ශරීරයෙහි බලත් ඇතිව ගනාති මාගීයට සමබලත් මින්මකොටගණිමැයි සිතමි. මෙලෙස සිතා ගලක් හැරගෙණ වානරයානන්ගේ ඉස්මුදුනෙහි පහළෙමි. ශක්ති නැත්තාවූ මා විසින් ගැසූ පහර දුර්වලවිය. එබැවින් ලේ වැකුණු ශරීර ඇති ඒ වානරතෙම අතුඅගට පැන කඳුලු පිරුණු ඇසින් මා සමීපය බලමින් මෙලෙස කියා- පින්වත්වූ පුරුෂය, මාගෙන් උපකාරයකුත් විඳ මෙලෙස තා කළසේ නොයෙදෙයි. එතකුදුවූවත් නොපි බොහෝකලක් දිගායුවයි කියා- අනේ පුරුෂයාණෙනි,

මෙසේවූ වලෙකින් තොප ගොඩලූ පරිදි මරහුගේ මුඛයෙන් ඇදගත්තාක් වැනිය. එලෙස උපකාර කළ මා කෙරෙහි මෙබඳු අපරාධයක් කළාවද? තොප කළගුණ නොදනෙයි. පව්ටුවූ තොප විසින් පාපයෙන්ම සිතනලද, එම්බල අධර්මිෂ්ඨවූ පුරුෂය, මම මේ අශ්වැටෙන මස්වැදල්ල හගවාගෙණ යම් වේදනාවක් විඳිම්නම් එසේවූ වේදනාවෙක් තොපට නොපැමිණේවයි ගිනි රොදකින් හුනවනයක් දවන කලක් පරිද්දෙන් තොපට බොහෝ සගසුවමොක් සැප නැසීමට හේතුවූ මේ මිත්‍රද්‍රෝහී පාපයනට විපාක නොදෙවයි කියා, දෙමව්පියන් දරුවන් කෙරෙහිද කාරුණ්‍ය ප්‍රේමයක් මෙන් මා කෙරෙහි මෛත්‍රී කොට, තවද කියනුයේ එම්බල පුරුෂය තා මෙතන හැරපියා යෙත්නම් මාගේ කාරුණාවට තරම් නොවෙයි. තොප ගොඩලීමෙහි ප්‍රයෝජනත් නොපෙණෙන්නේය. එබැවින් තොපැමිණි සතුරට කළාවූ පියපුතුය එනකුදුවුවත් තොප කෙරෙහි මාගේ විශ්වාසය නැත එබැවින් මා පසුපස්සෙහි බල බලා එවයි කියා එක් අතකින් මස්වැදල්ල ඇස වසාහිය නොහී වහාගෙණ අතුඅගින් අගට පැන පැන ගොසින් මහවනයකට බහා කියන වානරතෙම සබඳ පුරුෂය, සිංහ ව්‍යාඝ්‍රයන් විසින් වගුත් වලපුන්ගෙන් වන හයින් මිදුනෙහිය. මේ බරණැස්නුවර බලා යන මහවනය මෙසින් යන මිනිස් සහයක පලායවයි සම්මතකොට ඇස කඳුළු පිස පිස තමා වසන පර්වතප්‍රාන්තයට ගියේය.

මෙසේ වානරයානන් විසින් කරණලද සාපයෙන් පෙළෙන්නෙම් දුක්ඛාභිභූතව එව පාපාග්නියෙන් දනුලබන්නෙම් අධිකවූ පැන් පවස් ඇතිව ගං හෝ වැව් ආදියකට ගියෙම්වීම්නම් ඒ ජලය ගිනිගෙණ දිලියෙන්නාක් මෙන් වැටහෙන්නේය. කිසි ජලාශ්‍රයක් ලේ මුසු සැරවසේ පිළිකුල්ව පිය නොහැකි වන්නේය. ඉඳින් දියබින්දු ඇඟ වැදගත්නම් එපමණ බෙලිහෙඩි සා ගඩපෙළ නැගී පැසී සැරව පෙරලීදියෙන් ශරීරය තෙමෙන්නේය. මෙබඳු ශරීරය හැරගෙණ යම් ගම් නියම්ගම් රාජධානියකට එනිම් නම් දුටු දුටු ස්ත්‍රී පුරුෂයෝ දඬුමුගුරු ගෙණ ලුහුබඳවා ගසාගණිති. එකල්හි මේ සැරවයෙහි ගන්ධය කරණකොටගෙණ යට සුලඟ මිනිසුන් නොයන්නාහ මෙසේවූ මේ දුක්ඛයක් අවුරුද්දක් මුලුල්ලෙහි විඳිනෙම්. මේ සියල්ලම මම මේ ජාතියෙහි කළ පවින් දුන් මෙබඳු දුකකට පැමිණියෙම්. එබැවින් මේ රැස්වූ ජනයාහට හා රජ්ජුරුවන්වහන්සේට අවවාදයක් කියම් මේලෙසින් කියා–තොප බොහෝ දෙනාහට වැඩෙක් වේවයි මිත්‍රයන් කෙරෙහි විරෝධයක් ද්‍රෝහසිතක් නොසිතව මිත්‍රද්‍රෝහ පාපයන්ගෙණුත් ඉතා නපුරු අත්පිට විපාකදෙන පාපයෙන් මෙම ජාතියෙහි කුෂ්ට ඇතිවෙයි. ගඩපොළ කිලාස ඛුප්පිපාසාදී දුක්ඛයෙන් මොහු අත්නොහරණාහ. නැවත මිය පරලොව ගියකල්හි නරකාදී දුක්ඛයෙනුත් අපමණ දුක් විඳින්නේයයි තෙමේ තමා දෘෂ්ටාන්තකොට කීයේය මෙසේ රජ්ජුරුවන් හා සමග නැගී කළ පාපය ප්‍රකාශකොට කිය කියා සිටියදී පොළොව විවර දුන්නේය. එකෙණෙහි රත්පලසකින් වසනකලක්මෙන් ගිනිදැල් වසාගෙණ ඉන්සැව අවීචිමහනරකයෙහි උපන්නේය ඔහු පොළොව ගිලූකල්හි රජ්ජුරුවෝද සසර කලකිරී භයගණිම් සියනුවරටම වන්නාහ.

එසේහෙයින් මහණෙනි, මේ දෙව්දත්තතෙම දැන්මතු මා හිසට ගල් පෙරලූයේ නොවෙයි. පෙරත් ගල්පෙරලූයේම වේදැයි වදාරා මේ ජාතකය පූර්වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

මෙසේ මේ තිංසති නිපාතයෙහි උදකරක්ඛස ජාතකයතෙම මහා උම්මග්ග ජාතකයෙහි විස්තරවශයෙන් එන්නේයි.

508
පණ්ඩරනාග ජාතකය.

තාවද එක්සමයෙක්හි කරුණානිර පූරිතහෘදයකරුණාප්‍රණිධි ප්‍රාණය නිප්‍රාණාප් කරුණා වල්ලලරිවසනන කරුණානිධාන කරුණාප්‍රවාහ යනාදී සතුති නිකරවිරාජිත දිගන්තයන් ඇති ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ පාපතිභූත සමස්ත ජනභවන ජේතවනාරාමයෙහි සතර අංගයීබ්‍රහ්ම විහරණයෙන් දවස් යවමින් වැඩවසනසේක් අසනලද මනපිණවන මේ පණ්ඩරනාග ජාතකය දෙවදත්ත ස්ථවිරයන් පාදවහදයෙන් පොළොව ගිලීම අරභයා වදාළසේක.

එකල්හී බුදුරජානන්වහන්සේ දම්සභාවෙහි රැස්වූ භික්ෂූන් විසින් දේවදත්තයන්ගේ නුගුණ කිය කියා උන්කල්හි මහණෙනි, මේ දේවදත්තතෙම බොරු කියා දැන් මතු පොළොව් ගැලුනලද්දේ නොවෙයි. පෙරත් බොරු කීමෙන් පොළොවට වන්නේ වේදැයි වදාරා ඒ භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගීය දවස බරණැස්නුවර බ්‍රහමදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් දසරජ දහමින් රාජ්‍යය කරණකල්හි පන්සියක් වෙළඳහු නැව්නැගී යාත්‍රා කරන්නාහු සත්වෙනිදවස් නැව් දහව් නොපෙණෙන කල්හි කිසි උත්පාතය කින් නැව බිඳුනේ එකල්හි ගිය මේතෙක් වෙළඳුන්ගෙන් එකෙක්හු හැර සෙස්සෝ මත්ස්‍ය ගොදුරුවූහ. ඒ රැකුනාවූ පුරුෂතෙම දියවෙගයෙන් ඇවිත් කදම්බිය පට්ටන නම් තොටට පැමිණියේය. එතෙම මුහුදින් ගොඩ නැගී නග්නවේශයෙන්ම ඒ පටුන්ගම සිඟන්ට එන්නේය. එකල මිනුෂ්‍යයෝ මොහු දැක මේ තාපස අපිස්ස තොස් ගුණඇතියේය. පිළිබිඳුයයි යවත්පිරිසෙසින් පිළිත් නොහඳනේය. එබැවින් මහත් පින්කෙතක් ලදුම්හයි සන්තොසින් මධුරාන්නපාන ගෙණගොස් දෙති. එතෙම් එයින් තෘප්තවූයේ මා විසින් ජීවත් වන උපායක් ලබනලද්දේයයි සිතා සතුටුව වසන්නේය. හඳනා පොරෝණා පිළි ආදිය ගෙණාකල්හිත් නොසිවසන්නේය. එයින් නැවත නැවත පැහැද එතැන්හි පන්සලක් කරවාදී එහි වැසවූහ. එතෙම කදම්බියාචෙලයයි ප්‍රසිද්ධ විය. මහත්සත්කාර විඳිමින් වාසයකරන්නේය. එකල්හි එක් නාරජෙකුත් ගුරුළුරජෙකුත් මූත්ව උපසථානයට එති. එක්දවසක් ගුරුළුරජතෙම අචෙලයා ලඟට ගොසින් එකත්පස්ව සිට මෙලෙස කියන්නේය.

ස්වාමීනි තාපසයන් වහන්ස, අපගේ නෑයෝ නයින් අල්වම්හයි රසාතලයට වැද බොහෝ දෙන නසිති. මේ නයින් අල්වන උපාය අපි නොදනුම්හ. එයින් අල්වා නොහැකි එක් රහස් කටයුත්තෙක් ඇත්ල තොපි ඒ නාරජහු සමග ප්‍රිය කථාකරන්නාසේ කථාකොට ඒ තොරතුරු දැනගණුව යි කීයේය. ඒ තාපස තෙමේත් යහපතැයි පිළිගෙණ- ගුරුළුරජහු වැද අවසර ගෙණ ගිය කල්හි නැවත නාරජ්ජුරුවන්

ඇවිත් වැද අවසර ලැබ එකත්පස්ව උන්කල්හි උන් අතින් මෙලෙස විචාරන්නේය. සබඳ නාරජ්ජුරුවෙනි, ගුරුතෙම හැම අල්වනු පිණිසයයි ගොස් බොහෝදෙන නසිති. එබැවින් තොප හැම අල්වන කල්හි කෙසේවී නම් නැර අල්වාගත හැක්කදැයි විචාළේය. නාරජතෙම කියනුයේ වහන්ස මේ අපගේ නොකියයුතු රහස් කටයුත්තය. ඉදින් මේ රහස අපි සැලකළෙෝ නම් අපගේ නාකුලයෙහි නයින්ට මරණ අප විසින් කැඳවූවා හා සරිය. එසේහෙයින් නොකියම් කියා නැවත විචාරණුයේ කිමෙක්ද? තපස්වීන් වහන්ස, අප අතින් මේ රහස් විචාරාගෙණ අනික් කෙණෙකුන්ට කියන අභිප්‍රායෙක් ඇද්දැයි විචාළේය. තාපසතෙම කියනුයේ අනික් කෙණෙකුන්ට කියන අභිප්‍රායෙන් විචාළේ නොවෙම් මාගේ අභිමතයෙන්ම විචාළෙමි

එබැවින් මාගේ බස් අදහාගෙණ කිසි භයක් සැකයක් නැතිව කියව්යි විචාළේය. නා රජ්ජුරුවෝත් මදක් ඉද කථාකොට නොකියම් තාපසයෙනි කියා අවසරගෙණ නාගභවනයපම ගියේය. නැවත දෙවෙනි දවසුත් තාපස තෙම විචාළේය. නාරජ්ජුරුවෝත් නොකීවාහුය. තුන්වෙනි දවසුත් නාරජ්ජුරුවන් ඇවිත් දැක උන්කල්හි තාපසතෙම විචාරණුයේ කිමෙක්ද? නාරජ්ජුරුවෙනි, මෙවිතර කටයුත්තක් තුන්දවසක් විචාරණතුරුත් නොකියනුයේය. අප කෙරෙහි ආදර මදනියාවේදැයි කියා කීයේය.

එකල්හි නාරජතෙම කියනුයේ තාපසයෙනි, තොප කෙරෙහි අනික් නිරදරයකින් නොවෙයි. නුඹවහන්සේ යම්කිසි ප්‍රමාදයකින් කිසි කෙණෙකුන්ට කියාපුසේක්වීනම් නපුරැයි යන භයින් නොකියම් කීයේය. නැවත තාපස කියනුයේ තොප කියාලූ රහස්කටයුත්තක් තවද ඔබ්බෙහි කියාපියන්ට කිසි විශ්වාස නැතෙක් ඇද්ද? එබැවින් සැකනොකොට කියව්යි විචාළේය එකල්හි නාරජතෙම කියනුයේ තාපසයෙනි, තොප මෙසේම තත්පර පසුකියම් වැලින් අන්කෙණෙකුන්ට නොකියව්යි කියා තමන්ගේ රහස් කටයුත්ත ප්‍රකාශ කරණුයේ මෙලෙසින් කීයේය. වහන්ස අපි හැම මහත් මහත ගල් ගැල බරව වැදහොවුම්හ. ගුරුළුන් ආකල්හි කටදල්වා දත්පොංපිදෙමන් ගුරුළුන් දණ්ටකරනුවයස් වැදුම්හ. ඖළුන් අවුදින් අපගේ ඉස ඩැහැගෙණ උඩට නැගෙන්ට යන්න කෙරෙත්. බරව වැදහොත් අප සොලවන්ට උත්සාහකරණකල්හි මුහුදුදිය එක්ව යන්නෝය. ගුරුළුන් දිය ඇතුළෙහිම මියයන්නාහ. මෙලෙසින්ම බොහෝ ගුරුළුන නසිත ඉදන් අප හැම වැදහොත් කල්හි වාලධියෙන අල්වාගෙණ ඔයපා ඉස බිම බලා ඝඩතුබූ ගල් කටින් එලා සැහැල්ලූකොටගෙණ යෙත්නම උන්ගෙනු ගැලවිය නොහැක්ක. එතකුදුවුවත් මේ උපාය නොදත් හෙයින් ගුරුළුන්ගෙන් අපි හැම රැකෙම්හයි කියා තමන්ගේ රහස්වචනය මේ දුස්සිලවූ මේ තාපසයාහට කීයේය. මෙසේ කියා නාරජහු ගියකල්හි ගුරුළු රජ්ජුරුවෝත් ඇවිත් කදම්බියාවෙල නම නිගණ්ඨයා ලඟට වැද විචාරණුයේ කිමෙක්ද තාපසයෙනි නාරජ්ජුරුවන් අතින් රහස් කටයුත්ත විචාළදැයි කීයේය. තාපසතෙම එසේය. විචාළම කියා නාරජ්ජුරුවන් කී රහස්කටයුත්ත ගුරුළු රජ්ජුරුවන්ට රහස් වශයෙන් කීයේය, ඒ අසා ගරුඩරාජතෙම සිතනුයේ, අනීය නාරජහු විසින් කළයේ නොයෙදෙයි. තමන්ගේ නැයන් නස්නා උපාය අනුන්ට නොකිය යුතුවන්නේය. කිමෙක් දෙෂ ඔහුටම අතවම්. පක්ෂ ප්‍රහාරවාතයෙන් සමුද්‍රයෙහි දියදෙබ්බෙකොට රසාතලයට වැද මෙම පණ්ඩර නම් නාරජහු වාලධිය ඩැහැගෙණ ඉස යටිකුරුකොට ගැලපු ගල්ම වමාරමින් ආකාශයට පැණනැංගේය. පණ්ඩර නාරජතෙම ඉස යටිකුරුකොට එල්ලෙමින් මමම මටම භය උපදවාගතිමි. හඬනුයේ මෙලෙස කියා ප්‍රකාශවූ තෙපුල්

ඇති නොසඟවනලද මන්ත්‍රණ ඇති තුන්දෙරිත්ම නොහික්මුණ සවරූප ඇති මේ කියයුතුය මේ නොකියයුතුයයි පරීක්ෂාවක් නැති නුවණැත්තවූහු භයඅනුව පවත්නෝයයි කියා කීයේය. කුමක්මෙන්ද ප්‍රකාශ නොකළමිනා බස් කාගා අනාථයට පැමිණි පණ්ඩර නම් නාරජහු අනුව ගුරුළුරජ ගියාක් මෙනි. යම් නුවණැත්තෙක් සැඟවියයුතුවූ නිධානයක් මෙන් රැක්කයුතු රහස් කටයුත්ත ඔහු නුවණැතිවූවත් නුවත් භයක් ඔහු අනුවම පවතින්නේයයි කුමක් මෙන්ද? රහස් කටයුත්ත කී නොබෝකලකින් නාරජහු අනුව ලුහුබැඳි ගුරුළානන් මෙනි. අනුව පවත්නා මිත්‍රයාටත් මහත් සැඟවියයුතු රහස් කටයුත්ත ඔහු නුවණැතිවූවත් නුවත් නොකිය යුතුවන්නේය. එබැවින් මේ නිගණ්ඨයා නුව නැත්තෙකැයි විශ්වාස ඇත්තෙකැයි තපස්වියෙකැයි ජනයා විසින් පුදනලද එකෙක. ඉන්ද්‍රිය දමනයකළ එකෙකැයි සිතා මොහු කෙරෙහි නිස්සංකාව නොක්යයුතු රහස ප්‍රකාශ කෙළෙම්. එකී නොබෝවේලාවකින් මෙබඳු අනර්ථයෙක් පැමිණියේය. එසේහෙයින් නිසියයි දනුනත් නොනිසියයි දනුනත් රහස් නොකිය යුතුමය. දන් කටයුත්ත වරදවාගත් කල්හි බලා කුමක කළහැක්කේදැයි හැඬුයේය.

යම් සත්ත්වයෙක් කපටි සත්ත්වවෙස දරන්නාවූ අධමයකට භයින් වේවයි ඇල්මකින් වේවයි අන් කිසි දෝෂයකින් වේවයි රහස් කටයුත්තක් කීයේවී නම බාලවූ අඥාන තැනැත්තේ තමා සිටි ඉසුරෙන් පිරිහී දුක් නැමති ප්‍රපාතයෙහි පෙරළී පෙරළී එන්නේය. කිසි දුර්ජනයෙක් තමාගෙන ප්‍රස්තුතව නොකටයුත්තක් යටකරණුනිසා නොකියයුතු අනුන්ගේ කටයුත්තක් අසත්පුරුෂයන් මැදව මැදලා කියනතේද එසේවූ ලාමක තැනැත්තහු විෂඝෝර සර්පයෙකුකොට සිතා දුරින් දුරහැරිය යුතුවන්නේයයි කීයේය. එපරද්දෙන් අඩා අන් පිහිටක් නොලදන් ඕහටම යාච්ඤාකරණුයේ මෙලෙස කියා ගරුඬරජ්ජුරුවෙනි අපගේ නාගභවනයෙහි යහපත් ප්‍රාසාද උද්‍යාන පුෂ්කරණී ආදීවූ සැපද චතුර්විධ ඛාද්‍යය අෂ්ටවිධ පානවර්ගය කාශීවස්ත්‍රය චන්දන කුංකුමාදී අඞ්ගරාගයද මර්ජිත ගතහැකි සඟුවලඟ ඇති පවනබලරනලිය හා සමාන ලීලාවත් ඇති නාගකන්‍යාවන්ගෙන් වඳිනා සැපද නොයෙක් මල්‍යාභරණයෙන් සැරසීම්ද සිව්දෑගඳින් සිරුර සුවඳ කරමද යන මේ සියලු වස්තුකාම කෙලශකාමයෙන් අද තොරවූම්හ එ සැප අද්නා බැරියක් කියා එතකුදුවූවත් සබඳ ගරුඩරාජයාතෙනි තවම මා ප්‍රාණය ඇත හෙයින්ද යහපත නැයත්ට පිහිටවෙන්ට කල් වේදැයි කීයේය.

මෙසේ පණ්ඩරනම් නාරජතෙමේ ආකාශයෙහි ඉස බිම බලවා එල්ලමින් ගාථා අටක් කිය කියා ඇඬූහ. එකල්හි ගුරුළු රජතෙම නාරජ්ජුරුවන්ගේ හැඬීම් වැලපීම් අසා සබඳ නාරජ්ජුරුවෙනි, තොපගේ නොකියමනා රහස් කටයුත්ත ලපජාවට පිළි පමණක් නොහඳනා නියාවට සැබෑ තාපසයෙකැයි සිත් ඇතිව රහස් කියා දන් කුමකට තැවේදැයි නින්දාකරණුයේ මෙලෙස කීයේය. නාගරාජයාණෙනි මේ ලෝකයෙහි අචේලක තාපසයෝය. තොපිය මමය යන තුන්දෙනා අතුරෙන් කාට නින්දාකරව්ද? කවුරුන්ගේ වරදයයි සිතව්ද? තාපසයන් උපායෙන රහස් විචාරාගත් හෙයින් උගේ දෝෂත් නැත. මා සතුරුම සටිහෙයින් මාගේ දෝෂත් නැත, එබැවින් රහස් කී තොපගේම දෝෂය නොපම තොපට අවැඩකොට ගතුව. අප ඊට කළමනා කිමෙක්දැයි කීයේය. එ අසා පණ්ඩර නම නාගරාජතෙම මෙලෙස කියනුයේ, ගරුඩයාණෙනි මේ තාපසතෙම ශ්‍රමණයයි යන ප්‍රතිඥාවක් ගෙණ මට ප්‍රියක්හු මෙන් හඟවා වසනු

තේය. එබැවින් සිතින් සත්හුත් කෙණෙකැයි සිතා සැඟවී තිබූ රහස් සැක නැතිව මූත්ට කියාපිම් තොපි තීවාහේ දූත් බැගෑව අධමින් සිටියෙම් කියා තාපසයාහට නිඳා කෙළේයි. ඒ අසා ගරුඬරාජතෙම නාරජ්ජුරුවෙනි ලෝක යෙහි නොමියන සත්ත්වයෙකුත් නැත. උත්තමයන්ගේ වෙශගෙණ ඉන්නා උත්තමයෝත් ඇත. උත්තමයන්ගේ වෙශගත්තා අධමයෝත් ඇත. එබැවින් ප්‍රඥාවෙහි හොඳ ඇති නියා දූත දූත ඒ තාපසයාහට නිඳා කළයුතු නොවෙයි. තවද එකෙක් ඇත. මේතෙම බොරු තපසෙහි සිටියේ නමුත් අනුන්ට සබ වසින් ධර්මයෙන් ඉන්‍ද්‍රිය දමනයෙන් අවවාදකොට අෂ්ටසමාපත්ති මාර්ගඵලයයි කියනලද විශෙෂ ධර්මයන් කියත්තේය. එසේහෙයින් තපස්විහට නිඳා නොකරව තොපිම තොපට නිඳාකරව. අවෙලකයා වනාහි උපාය කෞශල්‍යඥත ඇති හෙයින් රහස් විචාරත්හයි. තවද නාරජ්ජුරුවෙනි, දෙමව්පිය දෙදෙනාට වඩා තන්වැනි අවශ්‍ය බන්ධුකෙණෙක් නැත. එසේවූ දෙමව්පිය දෙදෙනාටත් මන්ත්‍ර ණය බිඳීයෙයි යන සැකයෙන් නුවණැති සත්ත්වතෙම නොකියයි තෙසු බූත් කාදිමයිල් ආදීවූ බන්ධුන්ටත් නොකියත්තේ වේදැයි කීයේය.

මන්ත්‍රණය බිඳීයෙයි යන සැක ඇයි සත්ත්වතෙම බාල්‍යයේ මම තමා ළඟ සරණ රැකි ප්‍රියවූ බස් බණනවස් දන්නා විශිෂ්ටවූ රූඇති දරුමල්ලන් ලැබ ප්‍රියකරුවහුත් බිරිඳවත් සිත ඇති රහස් නොකිය යුතුය. එසේවූ රහස් මේ අවෙලකයා වනාහි විශ්වාසකොට කී තොපගේ මේ මරදැයි කියා මන්තෙහිද කාරණා කියනුයේ මෙලෙස කියා නාරජ්ජුරුවෙනි, සිත ඇති රහස් කටයුත්ත නිධානයක් මෙන් රැක්කයුතුය. කායසී නිෂ්පත්තිය දක්වා කිසිවෙක්හට නො කිය යුත්තේමය. ඉදින් කියත්නම්, සත්‍රීන්ට රහස් නොකිය යුතුය මිතුරු කැනැත්තවුන්ට රහස් නොකිය යුතුය. යමෙක් තමාගේ බඩ නිසා අසරුව සවුලකම් කොට ඉඳිනේද? ඕහටත් නොකිය යුත්තේය. තවද රහස් කටයුත් තක් යම්කෙණෙකුන්ට කීයේවීනම් දෙවෙනිව ඔහු කුමක් කීවත් රහස් බිඳියෙයි යන සැකයෙන් ඉවසන්නේ දාසයක්හු මෙන් යටත්ව පවත්තේය. තවද මොහුගේ රහස් කටයුත්ත යම් පමණ කෙණෙක් දනිත්නම් මොහුගෙන් සැලව යේඅඳෙහෝයි යන සැකයෙන් එපමණ කලකිරීම වන්නේය. එහෙයින් රහස් අනුන්ට නොකිය යුත්තේය. රහස් දහවල් නොකියන්නේවීම් නම් අඹගතඑලි නැතක උදකලාව සතරකත් මන්ත්‍රණය වීනා සකණකට යායුතු මන්ත්‍රණය නොකිය යුතුය. ඉදින් රෑ දවස රහස් කියානම් භිත්තියෙන් පිටත නොඇසෙන පරිද්දෙන් කියයුතු වන්නේය.

මෙසේ ලෝමයවූ පවුරුපදනමින් වාසල් ඇති කිසිතැනකින් පිටත්විය නොහැකි මහත් සල්පිල් හා ශාලාඇති වටදිග අගලය කලල් අගලය පාපොලම් අගලයයන ත්‍රිවිධවූ අගලින්සේමවූ නුවරෙක්හි ඇතුළත්හි නොයෙක් උපභොග පරිභොග වස්තුවෙන් පිණමින් ඇතුළෙන් පිටිනුවරටත් නොගොසින් පිටි නුව රින් ඇතුළුනුවරටත් නොවැද ඇතුළෙහී ඇති වස්තු ඇතුළෙහිම දිරත්තේය. එපරිද්දෙන්ම නුවණැත්තෝද එසේම තමා සිතඇති රහස් සිතෙහිම දිරවාගත පියත බව මුත් පිටතට නොහරණේයයි කීයේය. නාරජ්ජුරුවෙනි, යම්සත්ත්ව කෙණෙක් සඟවනලද රහස් ඇත්තේද නොවිසුරුවනලද හෙවත් නොහරණලද බස් ඇත්තේද මිනාවූ කටයුත්තක් ඇතිකල්හි සපිරවූ බුද්ධි ඇත්තේද එසේවූ සත්ත්වයා කෙරෙත් සතුරෝ තුමූම දුරුවන්නාහ. කුමක් මෙන්ද? විෂ ඝෝර සර්පයක්හු කෙරෙන් මනුෂ්‍යයන් දුරුවන්නාක් මෙනි.

එබැවින් රහස් කී තැනැත්තේම ජයගත්තේය. නාරජ්ජුරුවෙනියි කීයේය. මෙසේ ගුරුළුරජහු විසින් ධර්‍මදූත ජේන කථා කී කල්හි පණ්ඩරනම් නාරජතෙම කියනුයේ ගේ හැර තපසට වත් අචෙලතෙම නග්නවූයේ මුඩු හිස් ඇතියව තමාගේ බඩ පිණිස සොරකමින් දවස් හරණේය. ඔහු කෙරෙහි සැබෑ මහණෙකැයි යන සිතින් රහස් කටයුත්ත කීමි. එයින්ම අර්‍ථයත් ධර්‍මයත් නැසුනේය. වන්නාටය, ඒ එසේ නොදත සැලසිනි. තුමූත් කෙසේ කරන්නාවූ කෙබඳු සිලයක් ඇති කවරවූ නයකින් යුක්තව වසන කිසිමානයක් නැති කෙසේවූ උත්තමයෙක් තෙම දිව්‍යලෝකයෙහි ඓශ්වර්‍ය්‍යයට පැමිණෙන්නේ දැයි විචාළේය.

එසේ අසා ගුරුළුරාජතෙම කියනුයේ ආධ්‍යාත්මබාහ්‍යවූ හිරිඔතප් දෙකින්ද අධිවාසනා ක්ෂාන්තියෙන්ද යමෙක් යුක්තද? එසේවූ නොකියනසුළු කෝලාම් හැර තෘෂ්ණාදියක් නැතිව යන උත්තමතෙමේ ස්වර්ගලෝකයට පැමිණෙන්නේයයි කීයේය. මෙසේ ගුරුළුරජුගේ බස් අසා පණ්ඩර නාගරජතෙම තමාගේ ජීවිතදාන ඉල්වන්නේ මෙලෙස කියා, බිළිඳුවූ තමා වදාගත් දරුකෙණෙකුන් බලමින් සිඹ සනහා කුමරුවාගේ ශරීරස්පර්ශලත් මෑනියෝ පිණමින් මෑනියන් කෙරෙහි දරුවෝත් දරුවන් කෙරෙහි මෑනියෝවත් කිසිභයෙක් නැතිවෙද්ද? එපරිද්දෙන්ම තෙපි මා අල්වාගෙණ හිංසාවක් නොකොට දරුකෙණෙකුන් මෙන් වැඩුද? එබැවින් මොලොක්වූ සිත් ඇති මට ජීවිතදානය දෙවයි පක්ෂිරාජයානෙනි, කීයේය. ඉක්බිති ගුරුළුරජ ඕහට ජීවිතදානය දෙනුයේ මෙලෙස කියා නාරජ්ජුරුවෙනි, තොප මට දරුවූ බැවින් මෙවැනි භයින් තොප මිදීම් කවරහෙයිනැයි සිතයිතම් මේ ලෝකයෙහි අතවැසිය වදාගත් දරුවෝය වඩාගත් දරුවෝයයි තුන්දෙනෙක්ම වෙති සතරවෙනි දරුකෙණෙක් නම් නැත එබැවින් තොපි මාගේ දරුවෝමය, අභයදානය දිනිමි කියා ආකාශයෙන් බැස භූමියෙහි සිටුවා ගුරුළු රජතෙම මෙලෙස කියන්නේ නාරජ්ජුරුවෙනි, මෙතැන් පටන් සියලු භයින් මිදුනෙහිය. දියෙහි ගොඩෙහි කිසි භයක් නොවන පරිද්දෙන් අරගෙණ රෝගයෙන් පීඩිතඑකෙකුට වෙදෙකු පිළිසරණ වන්නාක් මෙන්ද, තොපට පිළිසරණවීමි. භයනොගෙණ පලායවයි අවසර දුන්නේය.

එදවස් නාරජතෙම තමාගේ නාගභවනයටම ගියේය. ගුරුළු රජතෙම තමාගේ ගුරුළු භවනයට ගියේය. ඉක්බිති ගුරුළු රජ සිතන්නේ පණ්ඩර නම්වූ නාගයාට ඇදිලිව හරණලද්දේය. දූත් ඔහුගේ සිතිවිලි විමසමි සිතා නාගභවනයට ගොසින් ගුරුළු රජ පියාසර කොට එපවත් දූන්වූයේය. ඒ දැක නාගරාජතෙම මා අල්වන්ට ගුරුළුරජතෙම ආවනැයි සිතා දහස් බඹ දිගඇති මහත් ආත්මභාවයක් මවා බොහෝ ගල් හා වැලි ගැල බරව නගුටියට දරණ වැල මිතුයෙහි මහත් පෙණගැබක් මවා වැදහෙව ගුරුළු රජ්ජුරුවන් භය ගන්නා ආකාරයෙන් දක්වා භයගැන්වූයේය. ඒ දැක ගුරුළුරජතෙම කියනුයේ බිජුවටින් උපදනා සතුරුවූ තොප හා සමඟ පළමු සන්තාන කළම්හ. දූත් තොපි දිවිදල සොල්වමින් භයගන්වා හොත්තව මේ භය කොයින් පැමිණියේ දැයි විචාළේය. එකල්හි නාරජතෙම මෙලෙස කියා නිර්භයවූ තපස්වීහු කෙරෙන් උපන් භයින් ජීවිත නැමිති මුල්සිඳිනට වන්නේය. එබැවින් පළමු සතුරු මිතුරු පමණක් විශ්වාස කළ නොහැක්කේයයි බැවහාර වන්නේය. යමක්හු ලයකැට්ව කරණු ලදුයේද එතෙම නියමයෙන් විශ්වාස නැතියේ

කෙලෙසවූවත් සිතින් නොඇලෙන්නේය. එබැවින් කොතෙකුත් අනුන්ට තමා විශ්වාස කරවියයුතුය. තමා සිතින් විශ්වාසයක් ඇදහිල්ලක් නොවියයුතුය ඔවුනොවුන් කෙරෙන් සැක නැතිව හැසිරෙන්නේවී නමුත් සිත සැක උපදවන්නේය. යම් යම් පරිද්දෙකින් සතුරා තමාගේ අභිප්‍රාය දැනගත නොහේද එපරිද්දෙන් දවස්හරින්ට ප්‍රාඥතෙමේ උත්සාහකරන්නේයයි නාරජතෙම මෙලෙස කීයේය. මෙසේ ඔවුනොවුන් හා සමග කථාකොට සතුටුවෙමින් සියුම් සිවිමැලි ස්වරූප ඇති දිව්‍යමානවක වේශයන් මවාගෙණ අත්වැල් බැඳගෙණ සමග කෙළිමින් සෙමින් රියහිස යෙදූ අසුන් දෙදෙනෙකුමෙන් ඒ කදම්බියාවෙලනම් අචේලකයාගේ පන්සලට සමග වන්නාහුයයි ගොසින් ගුරුළු රජ සිතනුයේ මේ නාරජතෙම අචේලකයාගේ ජීවිතය නොතිබෙන්නේය. දකින්ට වදින්ට නිසිඑකෙකුත් නොවන්නේයයි තුමූ ඊටතසිට නාරජ්ජුරුවන් ඒ අචේලකයා සමීපයට යැවූයේය. එකල්හි නාරජතෙම ඔහු දැක දුස්සිලවූ නග්නවීමම භොජනකොට ඇති බොරුකියන සුලූ සොරවූ තපස්වියානෙනි, නොපට අපි මද අප්‍රියයෝයයි අපහාස කෙළේය.

ඉක්බිති අචෙලකතෙම කියනුයේ නාරජ්ජුරුවෙනි, නොපට වඩා ඒකාන්තයෙන් ගුරුළුරජ්ජුරුවෝ මට ප්‍රියයෝය. එසේහෙයින් ඔහු කෙරෙහි ඇලුම්සිතක් දූත්ම මේ පාපකර්මය කෙළෙමි කීයේය. නග්නවූ මුඩුවූ දුස්සිලවූ තපස්විය, මෙලොව තපස්කරන්නාවූ සෙස්සෝ මෙලොවත් පරලොවත් බලා ප්‍රිය අප්‍රිය දෙපක්ෂයම සම්කොට දැක වසන්නේය. තෝ වනාහී මෙලොවත් ඉක්මුනාවූ සිල්වත්වූ තපස්වීවරයන්ගේ වේශයෙන් සිට නොසන්හුන් සිත් ඇත්තේය. මෙලොව සත්ත්වයන්ට වඤ්චාකොට ඇවිදිනා සොරෙක්හිය. තවද වෙස්පානා නාටකයක්හු මෙන් නොපි වනාහි ආර්යයන්ගේ වෙශ ගත්තෙහිය. එතකුදුවුවත් නෝ අනාර්යයෙහිය. නොසන්හුන් කාය වාක් මනඃ යන වාරත්‍රය සානනවූ සිත් ඇත්තාහු මෙන් පවත්නෙහිය. තපස්වීවරයන්ට කැලලක් වන්නෙහිය. අනාර්ය ස්වරූප ඇති නොප විසින් තපස්කෙරෙමි කීයා අකුසල්වේද රැස් කෙළේයයි කියා නින්දා කෙළේය. මෙසේ අචේලකයාහට නින්දාකොට සාප ලනුයේ මෙලෙසින් කීයේය. බොරු තපස්වියානෙනි නිරපරාධ වූ මට ද්‍රෝහ කිරීමෙන් මිත්‍රද්‍රෝහයත් සිඩවිය. නොකියන්ට කී රහස් ඔබට කීමෙන් කේළාමුත් සිඩවීය. මේ සත්‍ය වචනයෙන් නාගේ ඉස සත් කඩකට පැලීයෙත්වයි කියා ශාපකෙළේය. මෙසේ නාරජහු බල බලා සිටියදීම අචේලකයාගේ ඉස සත්කඩක්ව පැලුනේය. උන්නැන භූමිය විවරදුන්නේය. එතෙම පොළොව යට අවීචි මහනරකයෙහි වැටුනේය. නාරජ්ජුරුවෝ හා ගුරුළු රජ්ජුරුවෝ තමතමන්ගේ භවනයටම ගියාහ. එසේහෙයින් පින්වත්නි, යමෙක් සත්පියවරකුත් එක්ව මිත්‍රව විසීද එසේවූ මිත්‍රයාහට ද්‍රෝහ නොකළයුතුය. මේ ලෝකයෙහි මිත්‍රද්‍රෝහයට වඩා පාපයෙක් නැත. එබැවින්ම විෂඝෝර නාගරාජයා විසින් ශාප ලත ලද බොරු තපස්වීතෙම එකෙණෙහි නටුයේත්වද, මහණෙනියි වදාළසේක.

මෙසේ බුදුරජාණන්වහන්සේ මේ ජාතකය ගෙණහැර දක්වා වදාරා මහණෙනි මේ දේවදත්තස්ථවිරතෙම කියනලද බොරුවෙන් පෙරත් පොළොව පලාගෙණ ගියෝවේදැයි වදාරා මේ පණ්ඩරනාග ජාතකය නිමවා වදාළසේක. අචේලකතෙම දේවදත්තස්ථවිරය. නාරජතෙම සාරිපුත්‍රස්ථවිරය. එසමයෙහි ගුරුළුරජ් නම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

509
සම්බුලා ජාතකය

තවද එක් සමයෙක්හි ත්‍රෛලෝක්‍ය තිලකවූ සකලජනානන්දජනකායමාන සොබිසාර ඇති ජගදෙකමිත්‍ර මාගේ සවාමිදරුවූ බුදුරජාතන් වහන්සේ පරමරමණීය තරුවරාභිරාම ජේතවනාරාමයෙහි වැඩවසනසේක් මේ සම්බුලා ජාතකය කොසොල්රජහුගේ අගමෙහෙසුන් මල්ලිකාදේවීන් අරභයා වදාළසේක.

ඒ කෙසේද? යත්

මෙහි වර්තමාන කථාව කුම්මාසපිණ්ඩ ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය එතකදුවුවත් වර්තමාන කථාව සංක්‍ෂෙපයෙන් මෙලෙස දතයුතු එක්දවසක් මල්ලිකාදේවීතොම භාග්‍යවත් බුදුරජාතන්වහන්සේට දුන් කොමුපිඩු තුණෙහි විපාකයෙන් එදවස් කොසොල් රජහට අග්‍රමහෙසිකාස්ථානයට පැමිණ පුබ්බුට්ඨායිකාදී උතුම් පඤ්චකල්‍යාණයෙන් යුක්තව මහත්වූ ස්ථානොචිත ප්‍රඥා ඇති බුදුන්ට උපස්ථාන කිරීමෙහිද නිරන්තරව තමාගේ වල්ලභයාව කුලදේවතාකොට වසන්නීය. එකල්හි මල්ලිකාදේවීතොමෝ කෙබඳු ගුණයෙන් උත්තමයයි සියලු නුවර ප්‍රසිද්ධවීය.

ඉක්බිති එක්දවසෙක්හි දම්සභාමණ්ඩපයට රැස්වූ භික්ෂූන්වහන්සේ මෙසේවූ කථාවක් පහළකළසේක්, එම්බා ඇවැත්නි, මල්ලිකාදේවී මව්පියන් බැහුන් නැදිමයිලන්ට කළමනාවත්ද වල්ලභයාට කළමනා ආචාරද අඩුවක් නැතිව කරන්නීය වල්ලභයානන්ද මිතාකොට ඇත්තීය යනාදීන් මේ කථාව කොට උන්කල්හි සියලු සතුන් කෙරෙහි පතල කරුණා ඇති භාග්‍යවත් බුදුරජාතන්වහන්සේ සුගන්ධගන්ධමාදනසන්නිභ ශ්‍රී ගන්ධකුටියෙහි වැඩහිඳ භික්ෂූන් කෙරෙහි පැවති මේ ප්‍රවෘත්තිය දිව්‍යකණින් අසා අද මෙතැන්හි මාගේ එළඹීමෙන් සත්ත්වානුග්‍රහ වන්නේයයි දැන වදාරා අනන්‍ය සාධාරණ මහාසෘද්ධි ප්‍රාතිහාර්‍යයෙන් පණවනලද බුද්ධාසනමස්තකයෙහි තරුණරුණයෙන් දිලියෙන කනකගිරි සිඛරයක්මෙන් දිලිහි දිලිහි වැඩහිඳ සියලු දම්සභාමණ්ඩපය එක සුවඳපිඩක්සේ කෙරෙමින් අනොපමවූ බුද්ධලීලායෙන් තමන්වහන්සේගේ සශ්‍රීකවූ මුඛපද්මය විකාශකොට මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කෙබඳු කථාවෙකින් යුක්තව උනුදැයි විචාරා වදාරා ඒ භික්ෂූන්වහන්සේ විසින් බුදුරජාතන්වහන්ස, මේ මල්ලිකාදේවී කුලදෙටුවන් පුදන්නීය. පතිහුම දෙවතාකොට ඇත්තීයයි යනාදීන් මැගේ ගුණ කථා කිය කියා උන්නම්හයි දැන්වූ කල්හි මහණෙනි, මෝතොමෝ දැන් මතු පතිදෙවතාකොට විසුවා නොවෙයි. යටගිය දවස මෙලෙසම විසුවා වේදැයි වදාරා මුවෙන් නොබැන වැඩහුන් කල්හි භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුරජාතන්වහන්සේ භස්මයෙන් ප්‍රතිච්ඡාදක ජාතවේදයක් පානාකලක්මෙන් භවයෙන් සැඟවුනු ඒ කාරණය දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

බරණැස්නුවර බඹදත්නම් රජ තමාගේ පුත් සොත්ථිසේන නම් රජකුමරුවා වැඩිවයසට පැමිණියාහු යුවරජ තනතුරෙහි පිහිටුවා සම්බුලා රාජකුමාරිකාව ඔහට අගමෙහෙසුන්කොට පාවාදුන්නේය, ඕතොමෝ උතුම් රූ

දරන්නීය. විශිෂ්ටවූ ශරීරවර්ණ ඇතිවූය. අන්ධකාරයෙහිත් පහන් තැනීතැන
ලන පහනක්මෙන් බබලන්නීය. මෙසේ ඔවුන් දෙදෙන ප්‍රියසංවාසයෙන්
කලක් විසූ කල්හි කල්‍යාමකින් සොත්ථිසෙනනම් යුවරජහට අසාධ්‍යවූ කුෂ්ට
රොගයෙක් ඇතිවූයේය. එකල්හි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ දඹදිව ප්‍රසිද්ධ
බොහෝ වෛද්‍යවරුන්ගෙන්වා පිළිසම් කරවාත් සමනයකොට ගුණගතනොහී
අසාධ්‍යහයි අලහ. සොත්ථිසෙනනම් රජහුගේ ශරීරය එකල්හි පැලී පෙරලී
දිය බසින්ට පටන්ගත්තේය. එකල්හි ලජ්ජාව අනුන්ට පිළිකුල්වූ මෙබඳු ව්‍යාධි
යෙන් පෙළෙන්නාවූ මට රාජ්‍යයෙන ප්‍රයෝජන කිමෙක්ද මෙබඳු පිළිකුල්
ශරීරයෙන් රජසැපත් විඳුනා බලාත් වලටවැද අනාථ අසරණව මියයාම
යහපතැයි රජ්ජුරුවන්ට දන්වා තමන්ගේ මහත් සම්පත් හා අන්තඃපුර ස්ත්‍රීන්
හැර වලට නික්මුණුකල්හි සම්බුලානම් අගමෙහෙසුන්නොමෝ බොහෝ උපා
යෙන් රඳවන්ට උත්සාහකලදීත් නොවැලක වලදී නුඹවහන්සේට එලාඵල
ගෙණවුත්ලා පොෂ්‍යකෙරෙමියි කැටුව නික්මුණාය.

මෙසේ ඔහු දෙදෙන ගම් බිම් ගෙවා වලටවැද නිසිතැනක් බලා ඇවිදි
නාහු පලුපල්ලවාලඞ්කෘත ස්නිග්ධච්ඡායා සම්පන්න සුවිමලපුලිනතලයෙන
රම්‍යභූමිප්‍රදෙශයෙක්හි පන්සල් කොට වාසයකලාහ. එකල්හි රාජකන්‍යාද
ඔහු පන්සලින් බැහැර නොයවා මිහිරි එලාඵල ගෙණවුත්දී උපස්ථානකරන්නී
උදෑසනක්සේ නැගීසිට පන්සල ඇමද උනුපැන් සිසිල්පැන් ආදියද දැහැටිදඬු
ආදියද පිළියෙලකොට තබා වල්ලභයා නැගීසිටි කල්හි මුණ සෝධවා නොයෙක්
ඖෂධ ජාතීන් එක්කොට අඹරාතබා බෙහෙත්දියෙන නාවා ආලෙපකොට
මධුර එලාඵල ගෙණවුත් දී උපස්ථානකරන්නී උදෑසනක්සේ කළමනා වතාවත
කොට ස්වාමීනි, කළමනා අත්පාමෙහෙවර මම කෙරෙමි නුඹවහන්සේ
කනස්සලු නුවමැනවැයි කියා පසඟපිහිටුවා වැඳ එලාඵල ගෙණෙන පැසද
අල උදුරණ උලද අතු නමාගන්න දෙවිල්ලද ඇරගෙණ වලටගොස් මිහිරි
ඵලාඵල යන් පැසපුරා ඇරගෙණ අවුත් පන්සල එකතැනක තබා කළය
ගෙණ පැන්පුරා ගෙණවුත් නොයෙක් බෙහෙත් සුණු බෙහෙත් පැනින් ඒ රජහු
නාවා මධුර එලාඵල කවා සුවඳ පැන් පොවා දඹුමැස්සේ කොල අතුට
මොලොක්කොට ඔහු සැතපුනු කල්හි පය සෝධා මැඩ කළමනා උපස්ථාන
කොට පසුව තුමූ එලවැල කා එම ස්වපාර්ශවයෙහි සැතපෙන්නීය. මෙම ක්‍රම
යෙන් නිරන්තරයෙන් ස්වාමිපුත්‍රයාට උපස්ථාන කරන්නීය.

මෙසේ දවසරින එකුමාරිකා එක්දවසක් වලින් එලාඵල ගෙණෙන්නී
අතරමග ගල්කඳුරැල්ලියක් දැක කඳුරැල්ලෙහි ඉසතුබූ පැස තබා ස්නානය
කෙරෙමියි දියට බැස නහා අලුත් කසායෙන් ඇඟ උලා ගොඩනැගී වල්කැල
හැඳගෙණ කඳුරැල්ලි තෙර සිටියාය. ඇගේ ශරීරශොභාවෙන් සියලු වන
ලැහැබ රන්රැසින් නවරණකලක් පරිද්දෙන් එකාලොකවිය. එකල්හි දුනම
රාක්ෂයෙක් ගුවනින් යනුමෙයේ පවනාඹල රනලියට නිගා දුන තුනුසිරින්
වොරදනා එලඳ තුනුසිරි දැක ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇති රාක්ෂයා
මෙසේ කීයේය. හැසී සිටිනාවූ කරභ ප්‍රදෙශයන ඇති කරපරිචිත මධ්‍යම
ප්‍රදෙශයන් ඇති ජනසූන්‍යවූ මේ වනමධ්‍යයෙහි ගල්කඳුරැල්ලිය අස නහා ගොඩ
නැඟ් බව හේතුකොටගෙණ පවනඹල පල්ලවපත්‍රයක මෙන වලිනවීම ඇතිව
උදකලාව මෙතැන්හි සිටිනාවූ තොප කවරෙක්ද මා විසින් විචාරණලද ස්ත්‍රීය
නාගේ නාමගොත්‍රයද බන්ධුද නොවලහා ඇතිසැටිම කියව. සිංහ-ව්‍යාඝ්‍රයන්

ගෙන් ගැවසීගත් මේ වනප්‍රදෙශයෙහි සුවර්ණ රසධාරාවෙන් තවරණ කලස් පරිද්දෙන් හාත්පසින් බබුළුවමින් සිටියාවූ නිට නමස්කාර කෙරෙමි. දූතව රාක්ෂසව සිටි මා කළාවූ නමස්කාරය නිට වේවයි. නී කවරෙක්දැයි කීයේය. මෙපරිද්දෙන් රාක්ෂසයා විචාළසැටියේම කියමින් කියන්නී කසීරට බරණැස් නුවර රජහුගේ සොත්ථිසෙන නම් පුතනු කෙණෙක් ඇත්තාහ. ඔවුනගේ භාර්‍යාවූ සම්බුලාවෝ නම් මමය. වෙදෙහපුත්‍රවූ ඒ කුමාරයා මහත්වූ අසාධ්‍ය ව්‍යාධියකින් පීඩිතව තමාගේ සියලු රාජ්‍යශ්‍රීයද අන්තඃපුර සත්‍රීනද ඇර මෙ වනයට වැද රෝගාතුරවූයේ උදකලාව වසන ඔහට වන මූල වන ඵලාඵලයන සහ සිංහ ව්‍යාඝ්‍රයන් කා හල මස් ගෙණවුත් ලීමෙන්ද මීමැස්සන් වසන් හරණලද මී ගෙණවුත් ලීමෙන්ද යනාදීන් පොෂ්‍යකෙරෙමි. අද මා පලවැල නොගෙණ ගිය කල්හි කස්වක් නොලද්දන් හුනුවැල්ලෙහි කඩාලනලද පද්මයක් පරිද්දෙන් මිලානකවනසේකැයි බිසව් රාක්ෂයාට කීය

එකල්හි ඒ රාක්ෂස කියනුයේ අසාධ්‍යවූ ව්‍යාධියෙන් පෙළී අනාථ අසර, ණව මෙ වනයෙහි උදකලාව ඉන්නා ඒ රාජපුත්‍රයාගෙන් නිට ප්‍රයෝජන කිමද. මාගේ මේ විමානයෙහි නෘත්‍යගීත වාද්‍යයෙහි දක්ෂ නොයෙක් සියගණන් දළ නලූවන් පිරිවරණලද මාගේ අන්තඃපුරසත්‍රීන්ට අගමෙහෙසුන්කොට තබම් ඔවුන්ට ප්‍රධානව සියලු වස්තුකාමකෙලශකාමයන් අනුභවකරව. මෙතැන්පටන් නී රෝගයෙන් පීඩිතවූ ඔහු කෙරෙහි සතිවිලිනොසිතව මම නිට ස්වාමිපුත්‍රවෙම කීයේය.

එකල්හි සම්බුලාවෝ කියන්නාහු; රාක්ෂසය, මාගේ ස්වාමිහු රෝගාතුර හෙයින් දවාරාත්‍රියෙහි මම දුක් සිත සතා සෝක යෙදෙම. සපුරුවූ ශරීර වර්ණයන ඇති ලලකැලූ ඇඳීමෙන් සපුරා තුනුපහස් ඇති මා කවර සත්කළ සැටියක් දැනගෙයන් මෙලෙස කියයිද? විශිෂ්ට රූපයන් ඇති බොහෝ සිද්ධාංගනාවන් හා දිව්‍යසත්‍රීන් හා නාගකන්‍යාවෝ මෙ වනයෙහි සංචාරයකරන්නාහ. ඔවුන් අතුරෙන් තට ප්‍රියවූ සත්‍රියක් තබාගණුව මාගෙන් තට ප්‍රයෝජන කිමද මා නසා උත්සාහ නොකරව. මෙලෙස කීකල්හි ඈ කෙරෙහි පිළිබඳ සිතින නැවතත කියනුයේ-ජාම්බොනද ස්වර්ණයට බඳුවූ දිව දළින් ඔප්නැගූ රන්රුව කට බඳු උතුම රූ දරන්නාවූ කාන්තාව, මේ ලෝකයෙහි සත්ත්වයන්ට ප්‍රියකරුවූ යම වස්තුවක් ඇත්නම් සියල්ලම මාගේ බොහෝකොට ඇත්තේය මා හා සමග මාගේ භවනයට අවුත් ලෝකස්වාදරත්නයන් යෙදී වාසයකරව. ඉදින් මා කීවාට නොමැලිව නොඈයෙහි වනම දූතම බලාත්කාරයෙන් මාගේ විමානයට ගෙණ ගොසින් නී හා සමග වාසයකෙරෙම. එසේ ගෙණගිය කල්හිත් මා සිත්ගෙණ වාසය නොකළෙහිතම එකණටම නී ගොදුරුවන්නේයයි කීයේය. මෙසේ කියා ජවසනකින් යුක්ත රාක්ෂස ප්‍රකෘති ඇත පිටතට නික්මුණු මහත් දළ ඇති පාත්‍රවටසේ මහත්ව පිටතට නෙරසිටිනා ඇස් ඇති දූතව රාක්ෂසතෙම ඒ වන මධ්‍යයෙහි කිසි පිහිටක් නැතිව අසරණව සිටි ඒ රජදුව අත අල්වාගත්තේය. කෙලශගතව තමා අතගත් රාක්ෂසයා විසින් පෙළනලද සතුරා වසඟයට පැමිණි බිසව් තමාගේ වල්ලභයාම සිතා සෝකයෙන් හඬනනී මෙසේ කියා යම්බඳුවූ මේ රාක්ෂසයා මා අල්වාගෙණ අත්පා උන කිලිල්ලක්සේ කඩාකන්නේවී නමුත් ඒ මට දුක් නොවෙයි-වැලි දුක් කවරේද යතහොත්? මෙතෙක් වේලා මා නොගියේයයි රජ්ජුරුවෝ සිතන කල සම්බුලාව රාජසුබුමාලිය බලා ඇස් ඇඳගත නොහැකිනරම ඇත්තීය. බොහෝදවසක් මට දුක්ගත් හෙයින් කකස්සලූව

රෝගයෙන් පීඩිත මා හැර අන්පුරුෂයෙක් හා සමග ලොකස්වාද රතියෙන්ම ප්‍රමාදව මා අළුවාහුවනැයි සිතනසේක් වීනම් ඊට වඩනා මට දුකෙක් නැත්තේ යයි මෙලෙස කියා තවද ලොකපාල දෙවියන්ට උප්ක්‍ෂායනාකොට අඬන්නී මෙලෙස කියා ඒකාන්තයෙන් ලොකපාල දෙවිකෙණෙක් ලොව නැත්තාහ. ඔහු මේ සක්වල හැර පිටසක්වළකට ගියාහු වනුය. මේ ලෝකයෙහි ලෝක පාල දෙවතා කෙණෙක් ඇත්තම් මේ ජාතියට වල්ලභයා හැර රාග චිත්ත යෙන් අන්‍යපුරුෂයෙකු මුහුණ නොබැලූ ලේඛිත්තක විවරත් ප්‍රාණඝාතයක් නොකළ, මුසාවාදාදී දෝෂයෙන් වැළකී පතිව්‍රතා ධර්මයෙහි පිහිටි මා වැනියකට මේ රාක්‍ෂසයා කරණ දුරාචාරය නොවලකා බලාහිඳිනාහුද. ලොකපාල ශබ්දය විනා ඒකාන්ත දෙවතා කෙණෙක් මෙලොවෙහි නැත්මයයි මූරගා දෙවතා වන්ට යැදියාය.

මෙසේ ඒ සම්බුලා බිසවුන් ආරාධනාකොට දෙවියන්ට මූරගෑවේලෙහි ඇගේ ශීලානුභාවයෙන් හා පතිව්‍රතා ධර්මයෙහි ආනුභාවයෙන් සක්දෙව් රජහුගේ පඬුපුල්අස්න හුණුවිය. තමා නොකැමති පරිද්දෙන් අස්න හුණුවූ කල්හි මනුෂ්‍යලෝකය බලනුයේ මේ කාරණය නුවණැසින් දැක ඒක්‍ෂණයෙහි වජ්‍රායුධය හැරගෙණ භයානකවූ වේශයක් මවාගෙණ රාක්‍ෂසයාගේ ඉස්මුදුනෙහි සමීපව සිට මෙසේ කියා එම්බල රාක්‍ෂසය සම්බුද්ධවූ ආචාරයන් ඇති සියලු සත්‍රීන් කෙරෙන් උතුම්වූ ගුණ ඇති බොහෝ යසස් පිරිවර ඇති පතිව්‍රතාවූ මෙ රජදුව හා තෝ අසධර්මයෙහි යෙදුනේනම් වේවායි ගොදුරුකොට තෝ අනුභව කෙලේවීනම් වේවයි මේ වජ්‍රායුධයෙන් තාගේ හිස සත්කඩක්කොට පලා පියම් වහා රජදුව අතහැරපියවයි භයගන්වා කීයේය. මෙසේ සක්දෙව් රජහු බස අසා රාක්‍ෂසතෙමේ භයින් තැතිගෙණ බිසවුන් අතහැර බලාගෙණ සිටියේය. එවේලෙහි සක්දෙව්රජ්ජුරුවෝ සිතන්නාහු නැවතත් මේ රාක්‍ෂසයා මෙබන්දක් කලේවීනම් නපුරැයි ඒ දූතවයා දිවදම්න් මසා මතු නොඑන පරිද්දෙන් තුන්වන පර්වතය ඇතුලෙහි එලා ඉක්බිති සම්බුලාවන්ට අප්‍රමාදව පතිව්‍රතාධර්මය පුරවයි අවවාද දී තමාගේ දිව්‍යලෝකයට ගියේය. එවේලෙහි රාජකන්‍යාවද ඉරු ඇවැමට ගියකල්හි සඳපහන් ආලෝකයෙන් පන්සලට එන්නීය රජ්ජුරුවෝද ඇ එන ශබ්දය අසා මෝ අන්‍යපුරුෂ නිශ්‍රිතව ඔවුන් ඇරගෙණ ඇවිත් මා මරාපුතම් නපුරැයි සැඟවීසිටියේය. ඒ බව ප්‍රකාශකරන් නාවූ බුදුරජානන්වහන්සේ බුදුව වැඩහිඳ මෙසේ වදාළසේක.

එම්බා මහණෙනි, එදවස් චන්ද්‍රාලෝකයෙන් පන්සලට ගියාවූ ඒ සම්බුලා නම් බිසව් තමාගේ වල්ලභයා නොදක මහත්වූ ශෝක දුකින් පෙළෙන්නී යම්සේ පක්‍ෂිධේනුවක් තමාගේ පුතු කැදූල්ලෙහි තබා ගොචරග්‍රහණයට ගොස් එන වේලෙහි තුඩින් ගොදුරු ගෙණවුත් කැදූල්ලෙහි දරුබිලිඳුන් නොදක මහත්ශොකයට පැමිණේද එපරිද්දෙන් මේ කුමාරිකාද වල්ලභයා නොදක අඬ අඬා මූරගා ඇවිදිනී මෙසේ කියා- මේ ලෝකයෙහි සමිත පාපී ශ්‍රමණ කෙණෙක් වේවයි බාහිත පාපී බ්‍රාහමණ කෙණෙක් වේවයි ඇත්නම් ඔවුන්ට නමස්කාරකෙරෙමි ඔවුන්ගේ සරණයෙමි මාගේ රාජපුත්‍රයානන් වහා මා ඇස දක්වයි මෙසේ කිය කිය අඬ අඬා පන්සල වටකොට ඇවිදිනුය. තවද මහත් ශෝකයෙන් අඬඅඬා වැලප කියන්නී මේ වෙනෙහි වසන සිංහ ව්‍යාඝ්‍රාදී යම් චතුෂ්පාද ජාති කෙණෙක් ඇත්තාහුද තෘණලතා ජාතියෙහි වසන දෙවතා කෙණෙක් ඇත්තාහුද පර්වතගුහා ආදියෙහි වසන අල්පේශාක්‍ය මහේශාක්‍යවූ දැයි සියලු තලාට භූමාටු දෙවතාකෙණෙක් ඇද්ද ඔහු මාගේ වල්ලභයානන්

වහා ඇස දක්වූවාහුවීනම් ඔවුන්ට නමස්කාර කෙරෙමි. ඔවුන් සරණයෙමි. භාගීරථි ගඞ්ගා ආදිවූ සියගණන් ඒකදුරලි ගඞ්ගා ආදියෙහිද සප්තකුල පර්වත යෙහිද හිමාලය පර්වතයෙහිද අවශෙෂස්ථානයෙහිද අධිගෘහිත දෙවතාකෙණෙක් ඇත්නම් සොත්ථිසෙන නම්වූ මාගේ ස්වාමිහු වහාම ඇස දක්වවයි නිලොත්පල කලාපයකට බඳුවූ ශරීරවර්ණ ඇතිමහිමිසඳ මා ඇස දක්වත්වයි කියාආශ්‍රමපදය ට ඊකොට සම්බුලා අඬා ඇවිද්දී වේදැයි මහණෙනි වදාළසේක.

මෙසේ ඒ කුමාරිකාව ළය පැලී යන තරම් ශොකයෙන් අඬමින් වලපමින් දෙවියන් වැඳ බැගෑපත්ව අඬන බිසවුන් දැක සොත්ථිසෙන නම්වූ රජ්ජුරුවෝ සිතන්නාහු මේ බිසව් අතිශයෙන් බැගෑපත්ව අඬන්නාහ. මම මෙතන නියාව නොඇඟවීනම් ශොකයෙන් ළය පැලී යන්නේය. ඇගේ අභිප්‍රාය දනිමියි සිතා ගොස් පන්සල දොරකඩ උන්නේය. සම්බුලා තොමෝ වල්ලභයා දැක දෙපය ඉස තබාගෙණ අඬා වැලප දේවයන්වහන්ස, මෙතෙක් වේලා මා අඬමින් සිටියදී ප්‍රිය තෙපුල් පමණකුත් නොදී ඉන්ට මා කළ වරද කිම්ද? ස්වාමීනියි විචාළීය. එවේලෙහි එරජ කියනුයේ– එම්බා සොඳුර තෙපි මෙතෙක් දවස් මේ වේලාවට නොආ විරූහ. අදවූකලී ඉතාම රෑ බොහෝකොට මෙතනට පැමිණියව. ඒකාන්තයෙන් අද අන්‍ය සම්බන්ධයක් ඇතිව නොආයෙහිය මට වඩා තොපට ප්‍රියයෝ කවුරුද තෙපි කවරකෙණෙකුන් කෙරෙහි සංකිතව නොඅවුද ඒ මට කියවයි කීයේය. මෙසේ රජහු විචාළ කල්හි බිසව් තමන් වලදී දුටු ඇසූ සැටි කියන්නාහු ස්වාමිපුත්‍රයානන් වහන්ස, මම පලවැල ඇරගෙණ එන්නෙම් එක් දුනව රාක්ෂයෙක් දිටිමි. ඒ මාකෙරෙහි පිළිබඳ සිත් ඇතිව අවුත් මා අත අල්වාගෙණ සිට එම්බල මා කීවා නොකළෙහිවීන්නම් තීගේ හස්තපාදාදිය කඩා උනකිලිල්ල කණ කලක් පරිදි දෙන් මුරු මුරු යන අනුකරණයෙන් බිඳ කම් වහා මා සමග අභිරමණය කරවයි කීයේය.

එකල මම පලවැලට නොගොස් නුඹවහන්සේ කෙරෙහි ශොකයෙන් අඬා වැලප කියන්නෙම් එම්බල දුනවය තෝ දූත් මා කන්නෙහි වීනම් ඒ මට දුකැයි නොසිතමි. පමාවූහෙයින් මාගේ වල්ලභයානන්වහන්සේට අතික් සිපෙක් සිතිගියේනම් මට දුක් ඒයයි කියා එපරිද්දෙන් ඇඬිමි. තවද මම ඔහු අතින් මිදී ගිය නොහෙන්නෙම් දෙවතාවන්ට මෙලෙස උප්ක්ඛායනා කෙළෙමි. එවේලෙහි සක්දෙව්රජ භයානක වේශයක් ගෙණ භයගන්නාලද වජ්‍රායුධඇතිව ආකාශයෙහි සිට රාක්ෂසයා භයගන්වා අතගලවා ඔහු දිවදමින් මසා මතු නොඑනපරිද්දෙන් පර්වත තුන්වැනි වලල්ලෙහි එළා ශක්‍රදෙවේන්ද්‍ර තෙම දිව්‍යලොකයටම ගියේය. එකල්හි මම ශක්‍රයා නිසා ජීවිතදානය ලැබ මාගේ ජීවිතයටත් වඩා මට ප්‍රියව සිටි නුඹවහන්සේ ලදිමියි සම්බුලාවන් කී කල්හි සොත්ථිසෙන රජ්ජුරුවෝ කියන්නාහු එම්බා සොඳුර ගෑණුන් කෙරෙහි සබවසෙක් නම් අහසට පොළොවසේද සමුද්‍රයෙහි එතරට මෙතරසේද දුරින් දුරවන්නේය. ඒ හිමාලයවනප්‍රදෙශයෑවූකලී බොහෝවූ වල්වැද්දන්ගෙන් හා තාපසවරුන් සිඬවිද්‍යාධරයන්ගෙන් ගැවසීගත්තේය. තොප කියන බස් කවර කෙණෙක් අදහා ගණිත්දැයි කියන්නාවූ රජ්ජුරුවෝ සෙරවූ ස්වභාව ඇති ක්ෂණ ක්ෂණයෙහි නොයෙක් සිතිවිලි සිතන හෙයින් බහුබුද්ධිවූ මේ ස්ත්‍රීන් කෙරෙහි සැබෑ බසෙක්නම් නැත්තේය. ජලයෙහි ඇවිදිනාවූ මසුන්ගේ හසර මෙන්ද ආකාශයෙහි ඇවිදිනා පක්ෂීන්ගේ හසර මෙන්ද ස්ත්‍රීන්ගේ ස්වභාවය

කිසිකෙනෙකුත් විසින් නොදතහැක්කේයයි රජ්ජුරුවන් කී කල්හි සම්බුලා නම් බිසව් සත්‍යක්‍රියා කරන්නාහු- වල්ලභයානන්වහන්ස, නුඹවහන්සේ මා කී වචනය නොඅදහනසේක් වීනම් මාගේ සත්‍යක්‍රියා බලයෙන් නුඹවහන්සේට පිළියම් කෙරෙමියි කියා පැන්කළයක් පුරා ඉදිරියෙහි තබාගෙණ සත්‍යක්‍රියා කරන්නී මෙසේ කියා- මා ඵලාඵල ඇරගෙණ එන වේලෙහි ඒ දනව රාක්ෂසයා අවුත් මා අත අල්වාගෙණ සිට මෙලෙස කීයේයයි කියාද එකල්හි මාගේ යැදීමෙන් සක්දෙව්රජ අවුත් මා ගලවාගියේයයි යම් මේ වචනයක් කීම්ද ඒ මා කී බස් ඒකාන්තයෙන් සත්‍යවීනම් ඒ සැබෑවචනය දනුත් මා රකිනේය. පරලොවිනුත් ගලවන්නේය. නුඹවහන්සේ ඇර මට ප්‍රියවූ අන් පරුෂයෙකු නොදනිමි. මේ සත්‍යවචනය බලයෙන් පඤ්චවෛද්‍යකුලයා විසින් පිළියම් කළ නුහුනු උග්‍රවූ මේ අසාධ්‍යය දත්ම ගුණවේවයි කියා පැන්කළය ගෙණ රජහුගේ ඉස්මුදුනෙහි තැලූව, ඇගේ සත්‍යක්‍රියා බලයෙන් හා පතිව්‍රතා ධර්මයෙහි ආනුභාවයෙන් කළයෙහි පැන් ඉසනැමූ පමණකින්ම ඇඹුල් හා සෝධන ලද තඹමලයක් මෙන්ද පොකුරුපතහොත් දියත්තක් මෙන්ද ඒක්ෂණයෙහිම සංසිඳුනේය.

මෙසේ එබිසවුන්ගේ සත්‍යක්‍රියා බලයෙන් ව්‍යාධිය සංසිඳුවූ පසු එතන කීපදවසක් වැස වනයෙන් නික්ම බරණැසට ගොස් මඟුලුඋයනට වැද උන් කල්හි රජ්ජුරුවෝ ඔවුන් ආ නියාව අසා පිරිවර සමග උයනට ගොස් දක සතුටුව උයන සරහා සොත්ථිසෙන රජ්ජුරුවන් රාජ්‍යයෙහි අභිෂේක කොට සම්බුලාවන් අගමෙහෙසුන් තනතුරෙහි අභිෂේක දී නුවර සරහා මහත් පෙළහරින් පුතනුවන් රජගෙයි ලා තුමූ මඟුලුයනට වැද තවුස්ගෙණ වසන්නාහු නිරන්තරයෙන් රජගෙන් වළඳන්නාහ. එකල්හි රජකරණ සොත්ථිසෙන රජ්ජුරුවෝ තමන් හා එක්ව දුක්ගෙණ ඇවිදි සම්බුලාවන්ට අගමෙහෙසුන් තනතුරු පමණක් දී සෙසු කිසි වෘත්තියක් නුදුන්නාහ. එකල් රජ්ජුරුවෝ බිසවුන් ඇතිබවත් නොදන සෙසු සත්‍රීන් හා සමග සිත්අලවා කෙළිමින් සෙමින් අභිරමණයකොට ඇවිදිනාහ. සම්බුලාවෝද තමන් කෙරෙහි කිසි විචාරයක් නැතිහෙයින් දවසින් දවස ලජ්ජාවෙන් හා සපත්නිරොෂයෙන් දුබ්ලව පඬුවන් සිරුරු ඇතිව ඉපිලහුනු නහර බහනින් වෙලඳනලද ශරීරයක් ඇතිව වාසයකරන්නාහ. ශොකයෙන් දුබ්ලවූ ශරීර ඇති ඒ බිසව් එක්දවසෙක්හි රජගෙන් දන් අනුභවකරන්ට ආ මයිල් රජ්ජුරුවන් හා කරා වැද එකත්පස්ව උන්නීය. එකල්හි තාපසයෝද ඉතාම දුබ්ලවූ ශරීරයක් ඇති මිරිකුනාවූ චක්ෂුරාදී ඉඳුරන් ඇති බිසවුන් දක දුබ්ලවූ කාරණා විචාරන්නාවූ මෙසේ කියත්- රාජකුමාරිකාව, මේ බරණැස්නුවර රූ දවල් ඇත් සන්නාහ සෙන් සරහනලද ඇත්පිට සත්සියයක් පමණ යුඬක්‍රීඩාවෙහි දක්ෂවූ යෝධයෝ පවා යුඬසන්නඬව රැකවල්ගෙණ සිටිනාහ. අව්ධරා ඒ සොළොස්දහසක් පමණ ධනුර්ධරයෝ එසේම රැකවල්ගෙණ සිටිනාහ. මෙසේ සුරක්ෂිතවූ රැකවල් ගෙණ සිටිනා මෙනුවර කෙසේවූ සතුරුකෙනෙක් දක්නෙහිද? කයට සිතට ඇමවෙලේ භය උපදවන බඩ මෘගයන් ඇති වනයෙහි වාසයකොට ආ අවදියෙහි නොපගේ රූපශ්‍රීයද ශරීරසොභාවද ඉතාම යහපත. දන් මේ රාජ්‍යයට පැමිණ කවර කාරණාවෙකින් සුදුමැලි ශරීර ඇතිව දුබ්ලව ගියාද? ඒ කාරණ මට කියවයි කියා කීයේය. මෙසේ ඒ රජ්ජුරුවන් විචාළ කල්හි කුමාරිකා කියන්නී තාපසයානන්වහන්ස, නුඹවහන්සේගේ පුතනුවන්වහන්සේ පෙරසේ

මා කෙරෙහි ඇදහිලි නැති සේකැයි කියා ගැණුන්ගේ සවභාව කියන්නී පත්ම ගර්භයේ සියුම්වූ තුනුපහස් ඇති ස්වර්ණාභරණයෙන් සැරහුනු භාණ්ඩගතාදයට බඳුවූ මිහිරි කටහඬ ඇති සිත්කලු ස්ත්‍රීන්ගේ නෘත්‍ය ගීත වාද්‍යයන් බලා ඔවුන් කෙරෙහිම සිත්ඇලී වසනසේක. මෙසේ මා කෙරෙහි පෙරසේ නොසිතනසේක. තවද සවර්ණකෙයුරාභරණයෙන් ධරන්නාවූ මනාවූ පැහැඇති දිව්‍යාප්සරාවන් හා සදෘශවූ අතිනිඳිතවූ අඞ්ගප්‍රත්‍යඞ්ගයන් ඇති නොයෙක් සියගණන් ක්ෂත්‍රිය කන්‍යාවන් එක්ව යහපත්වූවාහු අනවකාශයෙන් සොත්ථිසෙන රජහු සිත් පොළඹන්නාහ.

ඉදින් තවුසානන්වහන්ස, මේ සොත්ථිසෙන නම් රජ්ජුරුවන් වහන්සේ කුෂ්ටරෝගයෙන් පීඩිතව වනයට වැද දුක්විඳිනාසේක් නම් මමද ඇවිද ඵලාඵල ගෙණවුත් ලා උණුපැන් සිහිල්පැන් තබා පොෂ්‍ය කෙරෙම්නම් එසේවූවිට සිහි වෙන්නේය. දැන් රාජශ්‍රීයෙහි පිහිටිසේක් මා නොහඳුනනසේකැයි කීව. එසේ හෙයින් රාජතාපසයන්වහන්ස, මේ සියලු රාජසම්පත්තීන් පිරුණු බරණැස් නුවරවන් වඩා වලම යහපතැයි සැපත්හි රොසයෙන් කීව. තවද යම් ස්ත්‍රියක් වස්ත්‍රාභරණ ධනධාන්‍යයෙන් සමෘද්ධවූ බොහෝ අන්නපානයන් ඇති ගෘහයෙහි වීධාන තමාගේ අහිපතීයේ සිටියේ නමුත් වල්ලභයා අප්‍රියනම් නම් සියලු සැපත් හැර මියයාම ඒ ස්ත්‍රියට උතුම් වන්නේය. තවද දිළිඳුවූ වැදහෝනා කලල් රෙද්දක් දෙවෙනිකොට නැති නිවුඩු සාල් නැලියක් පමුණ නැති දුක්ඛිත පුරුෂයෙකුත් තමාගේ භාර්‍ය්‍යාවට හිතපක්ෂවීනම් මෙබඳුවූ රාජ්‍යසැපතට වඩා ඒ බැගෑපත්බවම ස්ත්‍රියට උතුම් වන්නේයයි කියා තමාගේ ශොකයෙන් දුර්වලවන බව තාපසයන්ට කීකල්හි එබස් ඇසූ තාපසයෝ තමන්ගේ පුතනුවන් සොත්ථිසේන රජ්ජුරුවන් තමන් ලඟට කැඳවා එම්බා සොත්ථිසේනයෙනි තොපි රෝගයෙන් පීඩිතව වලවන් ගමනේ තොප අත්හැර වලට ගොස් තොප හා සමග දුක්විඳ තමාගේ සත්‍යක්‍රියා බලයෙන් යුක්තවම මෙසේ අසාධ්‍යවූ රෝගයෙන් ගොඩනගා රාජ්‍යය කරණලෙස සැපතෙහි පිහිටුවා තොපට උපකාරීව සිටි එබිසවුන් උන් සිටිතැන විවරකුත් නොදනුව තොප කළසේ නොයෙදෙයි. මිත්‍රද්‍රොහය යහපත් දෙයෙක් නොවෙයි කියා පුතනුවන්ට අවවාද කියන්නාහු, එම්බා සොත්ථිසේනයෙනි, ස්ත්‍රීන් කෙරෙහි වල්ලභයන්ට හිත පක්ෂකෙණෙක් දුර්ලභය වල්ලභයන් ගෙන් ස්ත්‍රීන් කෙරෙහි පක්ෂකෙණෙකුත් ලදනොහැක්ක තොපවූකලී පෙර ඔවුනොවුන් කෙරෙහි අතිශයින්ම විශ්වාසීය. ඒ කාරණය හේතුකොටගෙණ මුන් කෙරෙහි සත්පුරුෂ සවභාවයෙන් චිරාත්කාලයක් සැපසේ වසවයි අවවාද දී මඟුලුයනේ පන්සලටම ගියාහ.

ඉක්බිති පියරජ්ජුරුවන් අවවාද කියා ගියකල්හි තමන්ගේ අගමෙහෙසුන් සම්බුලා නම් බිසවුන් කැඳවා කියන්නාහු, එම්බා සොඳුර තොපට වඩා මට උපකාරී කෙණෙක් නැත්තාහ. මෙතෙක් කල් මා නොදත කළ වරද ක්ෂමාකරව. මෙතැන් පටන් සියළු මේ සැපත් හා රාජ්‍යයත් තොපට දෙමි. රාජ්‍යය බිසවුන්ට පාවාදී කියන්නාහු සම්බුලාවෙනි තොප රුවන් රැසෙක තෙසකින් අභිසෙව් දී අගමෙහෙසුන් තනතුරෙහි තිබීමි. එසේ මහත්වූ ඉසුරට පැමිණද ඊර්ෂ්‍යාවෙන් තෙපි මරණ සමාන දුක්ඛයට පැමිණියව. මෙතැන් පටන් මාගේ අන්තඃපුර ස්ත්‍රීහුද මා දූයි අප සියල්ලෝම තොපගේ අනුශාසනාවෙහි පිහිටා තොප කීවා කරම්හයි මෙතැන්පටන් තොප අභිප්‍රායවූ පරිද්දෙන් මේ රාජ්‍යය විචාරවයි කියා සියලු රාජ්‍යයම බිසවුන්ට පාවාදී එතැන් පටන්

සොම්සෙන රජ්ජුරුවන් හා බිසවුන් හා දෙදෙන සමගම ගෘහවාසයෙන් වැස දානාදීවූ සුචරිතයන් කොට කර්මවූ පරිද්දෙන් මියපරලොව ගියාහ. එකල්හි මගුලුයනෙහි වාසයකොට තපස් කළ තාපසයෝද පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලෝකයෙහි උපන්නාහයී මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා එම්බා මහණෙනි, මේ මල්ලිකාදේවීතොම දැන් මතු වල්ලභයා කුලදෙවතා කොට විසුවා නොවෙයි. පෙරත් මෝ තොම පතිහුම කුලදෙවතාවා කොට විසුවාවේදැයි වදාරා මේ ජාතකය පූර්වාපරසන්ධි ගළපා වදාළසේක. එකල්හි පතිව්‍රතාධර්මයෙහි පිහිටි සත්‍යක්‍රියා බලයෙන් අසාධ්‍යවූ ව්‍යාධියට පිළියම් කළාවූ ඒ සම්බුලාවෝ නම් මේ මල්ලිකා දේවී වන්නාහ. එකල්හි සොම්සේන රජ්ජුරුවෝ නම් දැන් මේ කොසලාධිපතිවූ කොසොල් රජ්ජුරුවෝ වන්නාහ. එකල්හි රාජ්‍යය පුතනුවන්ට පාවාදී මගු යනෙහි තපස්කළ තාපසයෝ නම් දැන් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

510
ගණ්ඩතින්දු ජාතකය

තවද එක්සමයෙක්හි ත්‍රිභුවනාභරණ ප්‍රවචනනාකරණ සමුද්ගපූරිත ගුණමණිකිරණ රංජිත නෛකවිධ තේජනයන් ඇති සියලු සතුන් කෙරෙහි පතළ කරුණා ඇති ලොකස්වාමීවූ ත්‍රිලෝගුරු බුදුරජානන් වහන්සේ ප්‍රවිතත තරුවරොපසොභිත ජේතවනාරාමයෙහි වැඩවසනසේක් රජදරුවන්ට දියයුතු අවවාදයක් අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාව රාජෝවාද ජාතකයෙහි විස්තර වශයෙන් ආයේය. අතීත කථාව මෙසේ දතයුතු.

යටගිය දවස කම්පිල්ලරට උත්තරපඤ්චාලනුවර පඤ්චාල නම් රජ්ජුරු කෙණෙකුන් ඡන්දයෙන් අගතියට ගොස් අධර්මයෙන් රාජ්‍යය කරන්නේය. ඒ රජ්ජුරුවන්ගේ යුවරජ සෙනෙවිරත් ආදීහු අධර්මයෙහි නිරතව දනව්වාසී සත්ත්වයන්ගෙන් අපමණ බදු පඬුරු නෙණ බොහෝ පීඩාකරන්නාහ. එකල්හි රාජ්‍යවාසී සත්ත්වයෝ රාජපුරුෂයන් කෙරෙහි භයින් තමන්ගේ අඹුදරුවන් ඇරගෙණ වල්වැද ඒ ඒ තැන්හි ඇවිදිනාහ, එකල පෙර මනුෂ්‍යාවාස තැන් අමනුෂ්‍යවාස කොට සත්ත්වයෝ ඒ ඒ තැන පැල්ගසාගෙණ ඉඳිනාහු රාජපුරුෂයන් කෙරෙහි භයින් දවල් දවස එහි වසන්ට නොපොහොසත්ව තමන්ගේ පැල් වටකොට කටුගසා අහුරා වලටවැද එහිත් සොරුන් කෙරෙහි භයින් රෑ දවස අවුත් ගෙයි ලැග පාන්වූ කල්හි අඹුදරුවන් ඇරගෙණ වල්වදිනාහ මෙසේ වසන්නාවූ සත්ත්වයන් දවල් දවස රාජසේවකයෝ දැක අල්වාගෙණ අතමිට තුබූ දෙය උදුරාගෙණ මරා තලා බොහෝ ගැහැට කරන්නාහ. රාත්‍රියෙහි සොරහුද සත්ත්වයන් උන් තැනින්තැන බලා අල්වාගෙණ බොහෝ ව්‍යසනයටපමුණු වන්නාහ. මෙපරිද්දෙන් සත්ත්වයන්ට කිසි අස්වැසිල්ලක් නැතිව මහත්වූ දුකින් පෙළෙමින් වසනකල්හි පුරණලද බොධිසම්භාරඇති මහබොධිසත්ත්වයෝ එනුවර සමීපයෙහි ගැටතිඹිරිගසෙක්හි දෙව්ව උපන්නාහ. එකල්හි එනුවර

රජ්ජුරුවෝ ඒ වෘක්ෂදෙවතාවාට අවුරුද්දක් පාසා දහසක් අගනා බලිපූජාවක් කරන්නාහ. මෙසේ පූජාවිඳ වසන ඒ දිව්‍යපුත්‍ර එක්දවසෙක්හි සිතනුයේ මේ රජතෙම රාජ්‍යවිචාරීමෙහි ප්‍රමාදව ඡන්දයෙන් අගතියට ගොස් සත්ත්වයන්ට දුක්දී වසන්නේය. ඒ කාරණයෙන් සියලු රාජ්‍යයම නස්නේය. රාජ්‍යවාසීනුත් මේ දුක්ඛයෙන් මුදා මොහුත් පරලොවින් ගලවා දැහැමින් රාජ්‍යය රකිනා ලෙස අවවාද දෙමියි දිව්‍යපුත්‍රතෙම රාත්‍රියෙහි රජු වැදහොත් ශ්‍රීයහන් ගබඩාවට වැද ඉස්දෙර සමීපයෙහි සිට තමාගේ ශරීරයෙන් රන්රැස් විහිදුවා ආකාශයෙහි සිටියේය. එවේලෙහි යහන ඔත් රජ්ජුරුවෝ ළහිරුකලඹක් මෙන් දිලිසෙන දිව්‍යපුත්‍රයා දැක මෙතැන්හි දිලිහි දිලිහී සිටිනාවූ තෝ කවරෙක්දැ යි විචාළ කල්හි, ඉක්බිති රුක්දෙව් කියනුයේ රජ්ජුරුවෙනි, අවුරුදු පතා තොපගෙන් බලිග්‍රහණය කොට මේ තිඹිරිගස වසන්නාවූ වෘක්ෂදෙවතාවා නම් මම්ය. තොපට අවවාද දෙන පිණිස ආමි කීයේය. එසඳ ඒ රජ කියනුයේ දිව්‍යපුත්‍රය, තෝ මට කෙසේවූ අවවාදයක් දෙයිදැයි විචාළේය. එවේලෙහි රජහට අවවාද දෙන දිව්‍ය පුත්‍රතෙම මෙලෙස කීය. රජ්ජුරුවෙනි, තෙපි රාජ්‍යධූරයෙහි ඉතාම ප්‍රමාදව රාජ්‍යය කරව ඒ කාරණාවෙන් තොපගේ සියලු රාජ්‍යය පරසතුරන් විසින් පැහැර කොල්ලකෑ කලක් පරිද්දෙන් විශෙෂයෙන් නටුයේය.

තවද රජ්ජුරුවෝ ප්‍රමාදව රට විචාරන්නාහු වීනම් තමන්ගේ රාජ්‍යවල ටත් හිමිනොවෙති. ඒ ආත්මභාවයෙහිම බොහෝ අනර්ථවලට පැමිණ පරලෙව් හිත් නරකාදී දුක් විඳිනාහ. ඒ රජ්ජුරුවන්ට විචාරීමෙහි මඳක් ප්‍රමාදවූ විට අනතඃපුර ස්ත්‍රීහුද ඇතුළුනුවර පිටිනුවර සත්ත්වයෝදැයි යන සියල්ලෝම උන් වහන්සේ රාජ්‍යධූරයෙහි ප්‍රමාදසේක. අප කළ මේ කටයුතු නොකටයුතු විචා රන්ට නුවූන්සේකැයි සෙවණාවෙන් දවස් යවා අකාරියෙහිම නිරන්තරව වසන් නාහ.

එබැවින් රජදරුවන් විසින් පමාවක් නැතිව රාජ්‍යය විචාළයුතුය. තවද රජ්ජුරුවෙනි, ස්මෘතියගේ අවිප්‍රවාසය නිර්වාණයට පිහිටවන්නේය. සිහි මුළාව විසීම මරණයට ඒකාන්තයෙන් පිහිටවන්නේය. කුසලකරණයෙහි ප්‍රමාද සත්ත්වතෙම විදර්ශනාදිය පුනරුත්පත්තිය සිඳගත නොහෙන්නේය සංසාර යෙහි ඉපදීමය යාම් වශයෙන් බොහෝ දුකට පැමිණෙන්නේය. අප්‍රමාදසීලී විදර්ශක පුද්ගලතෙම භවයෙහි ඉපදීම් නසා ජාතිදුක්ඛය සිඳිනේය. තවද රජ දරුවෙනි, ආරොග්‍යාදිවූ ජීවිත මදයයි කියනලද ත්‍රිවිධමදයෙන් ප්‍රමාදවූසත්ත්ව තෙම මනුෂ්‍යඝාතාදිවූ ත්‍රිවිධ දුශ්චරිතයෙහි නිරන්තරව සවකෘත්‍යයෙහි ප්‍රමාදව කර්තව්‍ය නොදන වසන්නාහු රජදරුවෝ හස්තපාදච්ඡේදය කිරීමෙන් හා සර්ව සංහරණය කිරීමෙන් හා ඥාති ධන ජීවිතාදී අනර්ථයක් කොට අරණලද්දේ ඉදින් ජීවත්වීනම් තමාගේ ජීවිකාවෘත්ති කොටගතනොහී සොරකම් කිරීම් මං පැහැරීම් ආදිය කරන්නේ දිළිඳුවීමෙන් පව්කරන්නේය. රාජ්‍යය විචාරීමෙහි ප්‍රමාදවූ බොහෝ රජදරුවෝද අවශෙෂවූ බොහෝ සත්ත්වයෝද රාජශ්‍රීයෙන් හා තමන්ගේ සැපතින් හා ජීවිතයෙන් පිරිහුනුබව ක්ෂාන්තිවාදී ජාතක සරභ ජාතක, චෙතියජාතකාදියෙන් අසා දතයුතු වන්නේය. රටට වැඩ හැසිරීමෙහි ප්‍රමාදවූ රජහුගේ සියලු ගවමහිස ධන ධාන්‍යාදී සම්පත් නස්නාහ. යසභොග පිරිහීමෙන් කායික චෛතසික දුක්ඛයට පැමිණෙන්නේයයි මෙලෙස කියා නැවත අවවාද කරන්නාවූ දිව්‍යපුත්‍රතෙම රජ්ජුරුවෙනි තොපගේ මේ රාජ්‍යය

විචාරීමෙහි ප්‍රමාදවූ පක්ෂග්‍රාහී බවද ප්‍රභූන්ගේ ගහටවිඳ දිළිඳු සත්ත්වයන් අවුත් මූරගෑකල්හි නොවිචාරීමද කටයුතු පරීක්ෂා නොකොට සහසිකීමද ගුණායුණු නොදූත්මද නීතියෙහි කොවිද නොවන බවද ප්‍රජාවට යම් දුකක් පැමිණි කල්හි සමකොට නොසිතීමද යන සියල්ල රාජධර්මයෙක් නොවන්නේය. එසේවූ රජ හට දරුවෝ ඉදින් ඇතිවූ නම් අධර්මිෂ්ට රජහුගේ පුත්‍රවූ මේතෙම මතු අපට කවර·වැඩක් කරන්නේද? ඔහට ශ්වේතච්ඡත්‍රය හා රජඉසුරු නොදෙම්හයි රාජ්‍යයට නොපමුණුවන්නාහ මෙපරිද්දෙන් ප්‍රවේණී රකිනා දරුවෝද ඔහට ඇති නොවන්නාහ. සියලු සැපතින් පිරිහුණු රජහු ඤාති මිත්‍රයෝද සුහෘදයෝද සිව්රඟසෙනඟද යන මොහු රජදරුවන් නම් සියලු ප්‍රජාවගේ දෙමව්පිය තන තුරෙහි සිටියාහ මෙරජ පක්ෂපාතීයයි සිතා මානය නොකරන්නාහ. පරීක්ෂා කාරී නොවන කටයුතු ඇති හිත පක්ෂමූලමාත්‍රයන් නොවිචාරා කටයුතු කාරිය නොදන්නා අඥාන මන්ත්‍රීගේ මන්ත්‍රණයෙහි පවත්නාහු පොරණ සැවපටයහැර යන සර්පයා මෙන් ශ්‍රීකාන්තාව ඔහු ඇර යන්නීය. තවද මෙකී සියලු දොෂයෙන් වැලකී කායචාරාදියෙන් අකුසල් නොකොට කරණ රාජ්‍යධුරයෙහි ප්‍රමාදනොව මේ වේලාවට මේවා කළමනා කටයුතුයයි පරීක්ෂාකාරීව දවසරිනාහු රජහට සියලු සැපත්හු පෙරමස සඳ සෙයින් දවසින් දවස වඩනාහ. මෙපරිද්දෙන් රජ හට අවවාද දී දිව්‍යපුත්‍ර කියනුයේ මහරජ තොපගේ දොෂ තොපි මේයයි නොදන්නේය. පිටිනුවර අප්‍රසිද්ධ වේශයෙන් ඒ ඒ තැන ඇවිද රජ්ජුරුවන්වහන්සේ මෙබඳු ගුණ ඇති සේකැයිවත් නුගුණ ඇති සේකැයිවත් කියන සත්ත්වයන්ගේ බස් අසා තත්වූ පරිද්දෙන් දැන රාජ්‍යය විචාරා වසවයි අවවාද දී අන්තර්ධාන වූයේය.

එවේලෙහි දිව්‍යපුත්‍රයා කී බස් අසා රජ්ජුරුවෝද කලකිරුණු සිත්ඇතිව දෙවෙනි දවස් රාජ්‍යය අමාත්‍යයන්ට පාවාදී පුරෝහිත බමුණා හා සමග වෙස් වලා නැගෙනහිර වාසලින් පිටත යොදනක්තැන් ගියේය. එතැන්හි එක්තරා පිටිසරවැසි මහලු පුරුෂයෙක් වලින් කටු හැරගෙණ ඇවිත් ගෙය වටකොට අවුරා දොරපිටින් අයා බැඳ තමාගේ බිරිඳහැරගෙණ වලටවැද සවස රාජපුරුෂ යන් ගෙවල් ඇර ගිය කල්හි තමාගේ ගෙයිදොරකඩ කටු ඇදදමන්නාවූ ඒ පුරු ෂයා පය කටුවෙක් ඇනුනේය. එවේලෙහි එතෙම පඤ්චාල රජහට අව අවා කටුහරිනේ යම්සේ මම මේ කටුවෙන් ඇනී දුක්විඳිනා ලදිම්ද එපරිද්දෙන් පඤ්චාලදෙශවාසී රජද සංග්‍රාම භූමියෙහි පැරද සතුරන්ගෙන් පැරද තියුණුවූ හීයෙන් විඳුනාලදුව මා සේම දුක් අනුභව කෙරෙත්වයි ඇවූයේය. එසඳ අප්‍රසිද්ධ වේශයෙන් රජහු හා සමග ගියාවූ පුරෝහිත බමුණු කියනුයේ, එම්බල මහලු පුරුෂය වයොවෘද්ධ හෙයින් තාගේ ඇස අඳුරුබව හේතුකොටගෙණ පය කටු ඇනගෙණ නිරපරාධවූ රජ්ජුරුවන්වහන්සේට නිෂ්කාරණයෙහි බෙණෙහි. කිමෙක්ද? තා යන මග කටු අවුලාදමා මග නතන්නේ රජ්ජුරුවෝදැයි විචා ළේය. එවේලෙහි පුරෝහිතයා කී බස් අසා මහලු පුරුෂ කියනුයේ බ්‍රාහමණය අධර්මිෂ්ඨව රජහු විසින් අනුශාසනා කරණලද මේ රාජ්‍යය විචාරයක් නැති බව හේතුකොටගෙණ අධර්මිෂ්ඨයෙන් ගන්නා කරවුවරයෙන් පෙළෙනලද රාජ්‍ය වාසීන් දවල් දවස රාජසේවකයන් විසින් බොහෝ වධබන්ධනයට පමුණුවන ලද්දවූ රාත්‍රියෙහිදු සොරුන් විසින් කොල්ලකා නොයෙක් ව්‍යසනයට පමුණු වන ලදුව දවල්දවස දොර පිටින් හයාබැඳ අඹුදරුවන් හා සමග වල්වැද සැඟවී

රෑදවස සොරුන් කෙරෙහි භයින් ගෙවලට අවුත් ගෙයිලගිත මම එසේම දවල් දවස වල හිඳ දූත් අවුත් දෙරකඩ ගැසූකටු හැරදමන වේලෙහි මා පය කටු ඇනුනේයයි කියා රජ්ජුරුවෝ දැහැමින් රාජ්‍යය කරත්නාහුවීනම් අමාත්‍ය සේවකාදීහු එපරිද්දෙන්ම ධර්මිෂ්ටයාහ. ඔවුන් ධර්මිෂ්ටවූවහොත් සත්ත්වයන්ට අන්‍යාය නොවදීනම් සත්ත්වයෝ වල්නොවැද තම තමන්ගේ ගෙයි සැපසේ දරුවන් උකුලෙහි නටවමින් විභවානුරූපවූ පරිද්දෙන් වසත්නාහු රජ්ජුරුවන් වහන්සේ නිසාවේද අප සැපසේ වසනනේයයි රජ දිවසුව විදීවයි ආවඩ වඩා ඉඳිනාහ. මේ රජහු එලෙස විචාරණකමක් නැති හෙයිනවේද ගේ නැතිව දෙර නැතිව අප දුක් විඳිනේයයි කියා තොපගේ රජ්ජුරුවන්ගේ ගහටයේ ඇවිදිනා හෙයින් වේද මේ කටු ඇනුනේයයි මෙලෙස රජ්ජුරුවන්ට දොෂාරොපණය කොට කීයේය.

එකල්හි රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා ආචාරිනී, මහලු පුරුෂයා කීයේ ඇත්තමය. අපගේ දොෂය, මෙතැන් පටන් දශරාජධර්මයෙන රාජ්‍යය කරම්හයි කියා නුවරට නික්මෙමයි කියත්ම, පුරෝහිත බමුණුද බොධිසත්ත්වයන්ගේ ආනුභාවයෙන් දේවයනවහන්ස, තැවතත් පරීක්‍ෂාකරමහයි කීයේය. ඒ රජ යහපතැයි ගිවිස අනික් මගකට යනුයේ අතරමග එක් දුකඛිත මැහැල්ලක් කියන මෙබඳු බස් ඇසුයේයි. එක්තරා වයොවෘඬ ස්ත්‍රියක් තමාගේ වැඩිවයසට පැමිණි දූත් දෙන්තෙකු ගෙහිම රඳවාගෙණ වලින් දර පලා ගෙණවුත් විකොට රකිත්නී එක්දවසක් වලට ගොස් පලා සඩත්නී කැලයෙන් අත වැරද පෙරලී බිම වැටී ඇඟ කඳුලු වැලින් ඇසකඳුලුත් පිස පිස රජ්ජුරුවනට ආක්‍රොශ කරත්නී මෙලෙස කියා, මේ අධර්මිෂ්ඨ බ්‍රහ්මදත්ත රජ කවර දවසේ විනාශයට යත්තේද, මේතෙම මලේ නම් සත්ත්වයෝ සැපසේ ඉඳිනාහ. එසේකල්හි මාගේ දරුවෝ සැපසේ රැකී හිඳිනාහු මාත් රැක සැපසේ තුමූත් රැකීගත්නාහ.

මේ පව්ටු රජහුගේ විජිතයේ ඉඳ දරුවෝත් මමත් දුක් විඳුම්හයි හඬ හඬා සිට මෙපරිද්දෙන් කියත්නාහු ඒ මැහැල්ලගේ බස් අසා පුරෝහිත කිය නුයේ වෘඬ තැනැත්තිය නී රජ්ජුරුවන්ට පරිභව දෙඩන්ට කාරණා කිම්ද? තොපගේ දරුවන්ට සැමියන් සරාලත්තෝ උත්වහත්සේද? යි විචාළේය. එවේලෙහි බමුණාට පිළිසර වැසි මැහැලි කියත්නී රට අවිචාරමත්ව කරවූවර ගැත්මෙත් හා රෑ දවස සොරුන්ගෙන් අනවකාශයෙන් පෙළෙන ලද රාජ්‍යවාසීන්ගෙන් මාගේ දරුවන් පිසවා කත්තෝ කවුරුද? කවර සත්ත්ව කෙණෙකුන් කයට සිතට සැපයෙක් ඇද්ද? ඉදින් මෙකියන දුක් නැතිව හිඳිත්නම් සැපසේ ගෙවදෙරව ඉඳිනාහු කුටුම්බසණ්ඨාපනයෙහි සිත් අලවා වෙසෙති. එසේකල්හි මාගේ දරුවෝත් ගෙවදෙරව රැකෙත්නාහු තුමූත් රැකී මාත් රකිනාහයි මෙපරිද්දෙන් ඈ කී බස් අසා රජ්ජුරුවෝ කියත්නාහු ආචාරිනී, මෑ කීයේ කාරණාමය නුවරට ගොස් මෙතැන් පටන් දැහැමෙන් රාජ්‍යය කරම්හයි නික්මුණු කල්හි අතරමග එක්තරා ගොවියකු කියන ශබ්ද යක් ඇසුවාහුයි, සානා ගොවියාගේ සාලීනම් ගොණෙක් සීවැල පය ඇනී යා නොහි එතනම වැටින. ඒ සානා ගොවියා රජහට අවා කියත්නේ, මේ ගොණා සිවැලින් මිදුනාලදුව පයබිඳී යම්සේ යානොහී වැදහොවීද? එපරිද්දෙන් මේ පඤ්චාල රජද යුද්ධයෙහි සතුරන් විසින් පරදවන ලද්දේ අඩයටියෙන් ඇමිනී මේ ගොණාසේම අනාථ අසරණව වෙදනාමත්ව මරණ බිම්හි වැටී වැද හොව වයි කියා මෙපරිද්දෙන් ඇඹුයේය. ඉක්බිති පුරෝහිත බමුණු කියනුයේ

කැෂිවලය තෝ ඉතා අඥතයෙහිය. සීසාතාවූ තෙමේම ගොණා පය සීවැලින් ඇත පය බිඳ කීයි අපරාධයක් නැති නිර්දෝෂී රජහට අවත්තෙහිය එබැවින් තෝ ඉතා අධර්මිෂ්ඨ එකෙකැයි කීය. එවේලෙහි ගොවියා කියනුයේ එම්බල පින්වත්වූ බ්‍රාහමණය, ප්‍රජාව රැකීමෙහි නිරාභිලාෂීවූ අධර්මයෙන් බදු පඬුරු ගෙණ සත්ත්වයන් පෙළන්නාවූ රාජ චෞර භයින් පීඩිතව මඳ වැසිල්ලක් නො ලබන දනව්වාසීන් ඇත. මේ රජහට දෙඩූවයි තොපි මට කණස්සලු නොවව. මාගේ වචනය ඇසූ පමණක් විනා අවශේෂ සත්ත්වයන් කියන අක්‍රොශපරිභව නොඇසූව බොහෝ සත්ත්වයෝ මෙපරිද්දෙන් පඤ්චාලරජහට පරිභවබෙණෙති තවද බමුණානෙනි, තෙපි මාගේ වැරැද්දෙන් ගොණා පය බිඳුනැයි කිවූ නම් එසේ නොවෙයි මාගේ සත්‍රිය දවල් බත් ඇරගෙණ එන්නී අතරමගදී දූක රාජ සේවකයන් විසින් බත් උදුරණලද්දේවන. ඒ කාරණයෙන් නැවත ඔතොමෝ ගෙට ගොස් දර පැන් සපයා මට බත් පිස ගෙණෙන්නී වන. දවල්වන කල් බත් නොලැබ ක්ෂුධාවෙන් පීඩිතව ඈ එන පෙරමග බල බලා ගොණාට අසඳා තනයේ පාර ගසාපීමි. ඒ ගොණා පය සැණෙකෙ ඇද සීවැල ඇනගත. මේ කාරණයෙන් මා විසින් පහරණලද්දේ නොවෙයි. අධර්මිෂ්ඨව රජකම්කරණ ඒ පඤ්චාල රජහු විසින් පහරණ ලද්දේයයි කීයේය.

එසේ ඔහු කී බස් අසා කීයේ කාරණාමය. මෙතැන් පටන් දූහැමින් සෙමෙන් රාජ්‍යය කරම්හ යි කියා යන්නාහු අතරමග ලැගුම්ගෙණ උදසන නික්මුනු කල්හි කුළුදෙනකගෙන් කිරිදොවමින් සිටි ගොපල්ලා ගොන් පයින් පැහැර කිරිමුට්ටියත් බිඳ ගොපල්ලාත් එලා ගෙණ දිවපුව. එකල්හි එඬෙරා වැලි පිස පිස නැගීසිට මෙලෙස කියන්නේ යම්සේ මේ දෙන් කිරිමුට්ටිය හා සමග ඇත එලාපුද එපරිද්දෙන් මේ පඤ්චාල රජහු යුද්ධභූමියෙහි තියුණු මුවහත් ඇති කඩු වෙත් දෙකඩකොට ගසත්වයි කියා අක්‍රොශ කෙළේය. එසඳ ඔහු කී බස් අසා බමුණු කියනුයේ පින්වත්වූ ගොපල්ල මෙ දෙන කිරිමුට්ටිය බිඳ තා ඇත එලා ගෙණ ගියාය. මේ රජහුගේ කවර දෙෂයක් දූක දෙඩීද? ඒ කාරණය මට කියවයි කීයේය.

එවේලෙහි කාරණා කියන ගොපලු පින්වත්වූ බ්‍රාහමණය, පඤ්චාල රජ ඡන්දයෙන් අගතියට ගොස් රාජ්‍යධූරයෙහි ප්‍රමාදව ජනපදවාසීන්ට බොහෝ පීඩා කරන්නේය. ඔහුගේ සේවකයෝ පසල්දනව්වට ගියාහුද පීඩාකරන්නාහ. එහෙයින් මමද ඒ සේවකයන් විසින් බොහෝ කොට කිරිගෙණෙවයි පෙළෙන ලද්දෙම් චණ්ඩවූ අණට අසුනොවන කිරි දෙවිය නොහෙන දෙනකගේ කිරි දෙවන්ට වනැයි කී කල්හි අප්‍රසිද්ධ වෙශයෙන් ගිය රජ්ජුරුවෝ බමුණාට කියන්නාහු ආචාර්යනී. මේ පුරුෂයා කීයේ කටයුතුමය. මෙතැන් පටන් එලෙස නොකරම්හයි කියා තමන්ගේ නුවරට අභිමුඛව නික්මුණාහ. මෙසේ ඔවුන් දෙදෙනා යන කල්හි අතරමග ගමෙක බදු එලවා සිටි එක් රාජපුරුෂයෙක් කඩු කොපුවට යහපතැයි කඹුරුවන් වස්සෙකු මරා සම උපුටා ගත්තේය. එසඳ ඒ වස්සාගේ මව්දෙන් පුතා කෙරෙහි ශොකයෙන් තණ නොකා පැන් නොබී අනවකාශයෙන් අඬ අඬා පුතු මැරුනෙන වටකොට ඉව ලලා මහත් ශොකයෙන් ඇවිදිනීය. එකල්හි ශොකයෙන් අඬමින් සිටි දෙන දූක ඒ ගම කෙළ ඇවිදිනා කුඩා කොල්ලෝ රජ්ජුරුවන්ට පරිභව බණින්නාහු යම්සේ මේ දෙන් තොමෝ දරු ශොකයෙන් නොකා නොබී අඬා ඇවිදීද? එපරිද්දෙන් මේ පඤ්චාල රජ දරු ශොකයෙන් ශොකාතුරව නොකා නොබී අඬා ඇවිදවයි කීහ.

ඒ කුමාරවරුන්ගේ බස් අසා කියන්නාවූ බමුණු පින්වත්වූ කුමාරයෙනි, ධෙනුව තණ පැන් නොකා අඬා ඇවිදින්ට රජ්ජුරුවන් කළ දෙෂ කවරේද? ඒ දෙෂ මට කියවයි කීයේය. මෙසේ විචාළ බමුණාට කාරණා කියන්නාවූ කෙළ ඇවිදිමින් සිටි කුමාරවරහු එම්බල බ්‍රාහමණය රජහුගේ අමැදහත්කමින් හා පූස්නා පමණ බලි ග්‍රහණයෙන් උපද්‍රවූ රූ දූවල් සොර සතුරු භයින් මූලාවූ දනව්වාසීහු එම රජහුගේ සේවකයන් විසින් ගහට කරණලදහ.

තවද මේ ධෙනුවගේ කඹුරුවන් පැහැ ඇති බාල වස්සා මරා බදු එළවී මෙහි සිටි පුරුෂයා සම උපුටා ගත්තේය. විචාරවත් කමෙක් ඇත්නම් අන්‍යාය මෙලෙස නොපවතී. ඒ කාරණයෙන් රජ්ජුරුවන් වහන්සේට අප දෙෂාරෝපණය කොට කීයේයයි කීහ. එසඳ රජ්ජුරුවෝ ආචාරීනි, බාලදරුවන් කීයේ කාරණායයි කියා නුවරට අභිමුඛව නික්මුනාහ. එකල්හි අතරමග දිය සුන් එක් පොකුණෙක මඬුවන් කපුටුවෝ තුඩින් බිද කන්නාහ. එවේලෙහි ඔවුන් දෙදෙනා එතන සමීපයට වන් කල්හිම බොධිසත්ත්වයන්ගේ ආනුභාවයෙන් මඬුවෝ කියන්නාහු තියුණු මුවත් ඇති යවුලට බදු කපුටුවන්ගේ තුඩින් බිදුනා ලද යම්සේ අපි කන ලදුමෝද එමෙන් පඤ්චාල රජහු යුධයෙන් පරදන ලද්දාහු අඩයටියෙන් ඇන දෙපලුකරත්වයි කියා කීහ.

ඒ අසා මඬුවා හා සමග කථාකරන්නාවූ බමුණු මෙලෙස කියා මණ්ඩූකයා මනුෂ්‍යලොකයෙහි රජදරුවෝ සියලු සත්ත්වයන් කෙරෙහි ආරක්‍ෂාව කරන්නාහු නොවෙති. එසේ හෙයින් මෙපමණකින් රජ්ජුරුවෝ අධර්මිෂ්ඨයෝයයි කීයේ අයුක්තියයි කීය. මෙසේ බමුණු කී බස් අසා මඬුවා කියනුයේ බමුණු ඉනාම පක්‍ෂග්‍රාහී එකෙක. සියලු රාජ්‍යය අල්ලා බොහෝ වධබන්‍ධනාදීයෙන් සත්ත්වයන් පෙළෙන ඡන්‍දයෙන් අගතියට ගොස් ප්‍රජාපාලකව හිඳිනා මේ රජහට මා කීයේ වැරද්දයයි ඉදින් බමුණ මේ රජ දශරාජධර්මයෙන් රාජ්‍යය කරන්නේවීනම් මේරාජ්‍යය වස්ත්‍රාභරණ ධනධාන්‍යයෙන් සමෘද්ධවන්නේය, වැඩ සස්‍යයෙන් යුක්ත වන්නේය. සියලු වැව් පොකුණු හෝ කඳුරැලි ආදිය ප්‍රසන්න ජලයෙන් පිරීසිටින්නේය. සත්ත්වයෝත් සුඛිත මුදිතවූවාහු බත් අනුභව කරණ කල්හි අග්‍රපිණ්ඩය ඇර කපුටුවන්ට දෙන්නාහ කපුටුවෝ බත් අනුභව කොට මෙලෙස ප්‍රාණවධ නොකරන්නාහයි යනාදීන් රජ්ජුරුවන්ගේ අමැදහත්කමින් මේ සියල්ල වන්නේයයි වෘක්‍ෂදෙවතාවාගේ ආනුභාවයෙන් කීහ. මෙසේ මඬුවා කී බස් අසා රජ්ජුරුවන් හා පුරෝහිත බමුණා හා දෙන්න ඔවුනොවුන් කථා කොට වල වසන තිරිසනුන් පටන් කොට සියල්ලෝම අපට පරිභව බෙණෙතියි කියා එතනින් වැලක නුවරට ගොස් එතැන්පටන් දශරාජධර්මයෙන් රාජ්‍යය කොට බොධිසත්ත්වයන්ගේ අවවාදයෙහි පිහිටා දානාදී සුචරිතයෙහි යෙදී සතර සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කොට විසූහයි භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ කොසොල් රජහට මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදරා මහ රජ්ජුරුවෙනි, රජදරුවන් විසින් තම් සතර මහවීථියෙහි එකපැතිර වන්නා වාකු වීථික මහා මෙඝයක් මෙන් සියලු සත්ත්වයන් කෙරෙහි සර්වසාධාරණව පැවත රාජ්‍යය කටයුතුයයි වදරා මේ ජාතකය පූර්වාපරසන්‍ධි ගලපා නිමවා වදාළසේක. එකල්හි රජ්ජුරුවන් දානධර්මයෙහි අප්‍රමාදව වසන ලෙස අවවාද දුන් වෘක්‍ෂ දෙවතාවා නම් මුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

තිංසති නිපාතයයි.

511
තෙසකුන ජාතකය.

තවද මෙ ජාතකය ජෙතවනාරාම යෙහි වැඩවසන්නාවූ තිලෝගුරු බුදු රජාණන් වහන්සේ විසින් කොසොල් රජ්ජුරුවන්ට අවවාද වශයෙන් වදාරණ ලදී.

ඒ කෙසේද ? යත්

එක්දවසෙක්හි බණ අසන පිණිස විහාරයටගියාවූ කොසොල් රජ්ජුරුවන්ට බුදුහු ආමන්ත්‍රණයකොට වදාරණසේක් මහරජ දරුවන් විසින් තම් ‍ෙස රාජධර්මයෙන් රාජ්‍යය කටයුතු වන්නේය. යම් සමයෙක්හි රජ්ජුරුවෝ අධර්ම කාරී වූවාහුනම් එසමයෙහි රාජපුරුෂයෝද අධාර්මිකවන්නාහ. යනාදීන් අවවාද කොට අපායට යාමෙහි ආදීනවද සුගතියටයාමෙහි අනුසස්ද වදාරා පඤ්චකාමය නම් සවප්නයට බඳුවූ උපමා ඇත්තේයයි යනාදීන් කාමයෙහි ආදීනව විස්තර වශයෙන් ප්‍රකාශකොට වදාරා තවද මහරජ ඔහු කෙරෙහි විශ්වාසයෙක් නම් නැත. අත්ලස් ගත් කෙණෙක් නම් නැත. යුධයෙක් නම් නැත.

එසේ හෙයින් සියලු සත්ත්වයෝම මරහු පරමප්‍රතිෂ්ඨාකොට ඇත්තේය. මිය පරලොව යන්නාවූ සත්ත්වයා තමා විසින් කරණ ලද්දාවූ කුශලකර්මයෙක් විනා අනික් පිහිටෙක් නම් නැත්තේය. ඒ කාරණයෙන් සවල්පවූ සැපයක් පිණිස කුශල කරණයෙහි ප්‍රමාදවන්ට නොවටනේය. අප්‍රමාදව ධර්මයෙන් රාජ්‍යය කරව පුරාතනයෙහි රජදරුවෝ අබුද්ධොත්පාද කාලයෙහි නුවණැත්ත වූන්ගේ අවවාදයෙහි පිහිටා දැහැමෙන් රාජ්‍යකොට දිව්‍යලොකයෙහිම සම්පූර්ණකොට ගෙණ ගියෝවේදැයි වදාරා ඒ කොසොල් රජ්ජුරුවන් විසින් ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත් ? එම්බා රජදරුවෙනි,

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරන්නාහ දෙවතාරාධනාකොට දූ දරුකෙණෙකුත් නොලත්හ. එක් දවසක් ඒ රජ්ජුරුවෝ මහත්වූ යසපිරිවරින් යුක්තව උයන්කෙළියට ගොස් දිවාභාගය උයනෙහි කෙළ සවස්වේලෙහි මගුල් සල්ගසමුල යහනක් අතුරුවා මදක්කල් එහි සැතපී නිදා පිබිද සල්ගසඋඩ බැලුවාහු පක්ෂි කැදැල්ලක් දැක දශීනය හා සමග මහත්වූ ප්‍රෙම උපදවා තරුණ පුරුෂයකු කැඳවා කියන්නාහු එම්බල මේ ගසට නැගී තෙල පෙණෙන්නාවූ කැදැල්ලෙහි කිසිවක් ඇති බව හෝ පරීක්ෂා කරවයි කීහ. ඒ පුරුෂයාද යහපතැයි සල්ගසට නැගී බැලූ තැනැත්තේ එහි බිජුවට තුණක් තිබුවා දැක දෙවයන්වහන්සැයි විචාළහ.

ඔහු කියන්නාහු දෙවයන්වහන්ස අපි නොදනුම්හ. වැද්දෝ දනිති කීහ. රජ්ජුරුවෝ වැද්දන් කැඳවා විචාළාහ. වැද්දෝ කියන්නාහු දෙවයන්වහන්ස මේ බිජුවට තුණෙන් එකෙක් බකමූහුණු බිජුවටය. එකෙක් ගිරා බිජුවටය. එකෙක් සැළලිහිණි බිජුවටයයි කීහ. රජ්ජුරුවෝ නැවත කියන්නාහු එකම කැදැල්ලෙහි පක්ෂි තුණ්දෙනෙකුගේ බිජුවට තිබේදැයි විචාළහ. වැද්දෝ කියන්නාහු එසේය, දෙවයන්වහන්ස, උපද්‍රවයක් නැති කල්හි මොනවට ලතලද බිජුවට නොනස්නේයයි කීහ. රජ්ජුරුවෝ කියන්නාහු මොහු මාගේ දරුවෝ

වන්නාහයි ඒ බිජුවට තුණම අමාත්‍යයන් තුන්දෙනෙකුට පාවාදී කියන්නාහු මා දරුවෝ නොපි ඇම සුරක්ෂිතකොට රකුව. බිජුවට පොත්තෙන් මාගේ දරුවන් බිහිවූකල මට කියව්යි සම්මත කළාහ.

ඒ අමාත්‍යයෝද ඒ බිජුවට මනාකොට රැක පලමුකොට බිඳුනාවූ බක මුහුණු බිජුවටය දැක වැද්දන් කැඳවා සත්‍රී පුරුෂ බව විචාරා ඒ වැද්දන් විසින් පරීක්ෂාකොට පුරුෂ බව කී කල්හි යහපතැයි රජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නාහු දෙවයන්වහන්ස, නුඹවහන්සේට පුතනුකෙණෙක් උපන්හයි කීහ. ඒ අසා රජ්ජුරුවෝ සතුටුව ඔහට බොහෝ වස්තු දන්දී අද පටන් මාගේ දරුවන් මනාකොට රකුවයි කීයා වෙස්සන්තර කුමාරයෝයයි නම් තබවයි කියා යැවූහ. ඒ අමාත්‍යයෑද එපරිද්දෙන්ම රක්‍ෂාකරන්නේය. ඒ සිටි නොබෝකල කීන් සැළලිහිණි බිජුවට බිඳුනේය ඒ බිජුවට රක්‍ෂාකරන්නාවූ අමාත්‍යයාද පලමු පරිද්දෙන් වැද්දන් ලවා පරීක්‍ෂාකරවා සත්‍රී බව අසා රජ්ජුරුවන් සමීපයට ගොස් දෙවයන්වහන්ස, නුඹවහන්සේට දියනිකෙණෙකුන් උපන්නාහයි කීහ. එබස් ඇසූ රජ්ජුරුවෝ සතුටුව ඔහට වස්තුදී කියන්නාහු මාගේ දියනියන්ට කුණ්ඩලීයයි නම් තබා මනාකොට රකුවයි කියා යැවූහ. ඒ අමාත්‍යයාද එපරිද්දෙන්ම පරිහරණය කරන්නේය.

එයින් කීපදවසක් ගිය කල්හි ගිරා බිජුවට බිඳුනේය. ඒ බිජුවට රක්නාවූ අමාත්‍යයාද වැද්දන් කැඳවා විචාරා පුරුෂ බව අසා අජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නේ දේවයන්වහන්ස, නුඹවහන්සේට පුතනුකෙණෙක් උපන්නාහයි කීහ. රජ්ජුරුවෝ ඔහට සතුටුව වස්තුව දී කියන්නාහු මාගේ දරුවන්ට ජම්බුක යයි නම් තබා මනාකොට රකුවයි කියා යැවූහ. ඒ අමාත්‍යයාද රජ්ජුරුවන් කී පරිද්දෙන්ම රක්‍ෂාකෙළේය. මෙසේ ඒ පක්‍ෂීහු තුන්දෙනම අමාත්‍යයන් තුන් දෙනාගේ ගෙයි රාජකුමාර පරිහරණයෙන් වැඩෙන්නාහ. රජ්ජුරුවෝද මාගේ පුතනුවෝය, මාගේදියනියෝයයි ව්‍යවහාරකොට කියන්නාහ. අමාත්‍යයෝ ඇම දෙන රජ්ජුරුවන්ගේ ක්‍රියාවෙක තිරිසනුන්ට මාගේ පුතනුවෝය, මාගේ දියනියෝය කියමින් ඇවිදිනාසේකැයි ඔවුනොවුන්ට කියා සිනාසෙන්නාහ. රජ්ජුරුවෝ එබස් අසා සිතන්නාහු මේ අමාත්‍යයෝ මාගේ මේ දරුවන්ගේ විවරදැයි ප්‍රඥාසම්‍පත්‍ය වෙයි නොදන්නාහ.

එසේ හෙයින් ඔවුන්ගේ විවර මූත් හැමට ප්‍රකාශ කෙරෙමියි සිතා ඉක්බිත්තෙන් එක් අමාත්‍යයකු සමීපයට කැඳවා කියන්නාහු එම්බල අමාත්‍යය තෝ වෙස්සන්තර නම් මාගේ දරුවන් සමීපයට ගොස් නුඹවහන්සේගේ පියානන්වහන්සේ නුඹවහන්සේ අතින් ප්‍රශ්නයක් විචාරණු කැමතිසේක. කවර දවසක ඇවිදින් විචාරණ සේක්දැයි පිළිවිසගෙණ එවයි කියා යැවූග. ඒ අමාත්‍යයාද වෙස්සන්තර නම් කුමාරයන් සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිට රජ්ජුරුවන් කී අසුන් කියේය. එබස් අසා වෙස්සන්තර කුමාරයෝ තමා වඩන්නාවූ අමාත්‍යයා කැඳවා කියන්නාහු එම්බා මාගේ පියානන්වහන්සේ මා අතින් ප්‍රශ්නයක් විචාරණ පිණිස එනු කැමතිසේක. උන්වහන්සේ ආ කල සත්කාර කරන්ට වටනේය. එසේහෙයින් කවරදා එන්ට කියමෝදැයි කීහ. අමාත්‍යයා කියන්නේ අදට සත්වෙනි දවස් එනසේක්වයි කියා වෙස්සන්තර කුමාරයෝද එබස් අසා අමාත්‍යයාට ඒ බව කියා යවූහ. ඒ අමාත්‍යයාද යහපතැයි ගිවිස ගොස් රජ්ජුරුවන්ට දන්විය. රජ්ජුරුවෝද සත්වෙනි දවස් නුවර බෙරපියවිකරවා චතුරඟිනී සේනාවගෙන් යුක්තව තමන්ගේ පුතනුවන්

වෙස්සන්තර නම් පක්ෂියාතත් වසන්නාවූ සථානයට ගියාහු වෙස්සන්තර කුමාරයෝද තමන් පොෂ්‍ය කරණ අමාත්‍යයාතන්ට කියා යටත්පිරිසෙයින් රජ්ජුරුවන්පටන් ගියාවූ දූසිදසුන්ට දක්වා මහත්සත්කාරකරවූහ. රජ්ජුරුවෝ වෙස්සන්තර නම් පක්ෂියාගෙන් බත් අනුභවකොට අවශෙෂ උන් උන් විසින් කරණලද සත්කාරවිඳ සවකීයවූ තමාගේ රජගෙටම ගොසින් රාජාඞ්ගන මධ්‍යයෙහි විසිතුරු මණ්ඩපයක් කරවා නුවරවාසීන් රැස්වනලෙස බෙරපිඝාවි කරවා තුමූ සර්වාභරණයෙන් සැරහී අමාත්‍යමණ්ඩලයා විසින් පිරිවරණ ලදුව මණ්ඩප මධ්‍යයෙහි සිංහාසනාරූඪව හිඳ වෙස්සන්තර කුමාරයන් කැඳවාගෙණ එවයි කියා එක් අමාත්‍යයකු යවූහ. ගියාවූ අමාත්‍යයාද ඒ වෙස්සන්තර පක්ෂියා තන් රන්පුටුවෙක හිඳුවාගෙණ රජ්ජුරුවන් සමීපයට ගියේය. පැමිණියාවූ ඒ පක්ෂියාතෝද පිය රජ්ජුරුවන්ගේ ඇකයේ නැගී හිඳ ප්‍රිය කථාවෙන් පිය රජ්ජුරුවන් හා කෙළ නැවතත් ගොසින් පළමු උන්නාවූ සවර්ණපීඨයෙහිම උන්හ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝද මහාජනයා මධ්‍යයෙහි රජදරුවන් විසින් පිළිපදනා රාජධර්මයන් විචාරන්නාහු මෙසේ කියත්. වෙස්සන්තර නම් පක්ෂිය, තෙති, තොපට වැඩෙක් වේවයි රාජ්‍යයකරන්නාවූ කැමති රජදරුවන් විසින් කවර කෘත්‍යයක් මනාකොට කරණලද්දේද උතුම්ද ඒ කාරණය මම තොප අතින් විචාරමි. ඒ මට තත්වූ පරිද්දෙන් කියවයි කීහ. මෙසේ විචාළ කල්හි වෙස්සන් තර කුමාරයෝ විචාළාවූ ප්‍රශ්නය නොකියාම පළමුකොට පිය රජ්ජුරුවන්ගේ ප්‍රමාද වශයෙන් චොදනා කරන්නාහු මාගේ පියාතන් වහන්ස බොහෝකලක් බරණැස් නුවරට අනුශාසනා කරණසේක් නුවර වැස්සන් විසින් මේ රජ්ජු රුවෝ තිරිසනුන්ට පුත්‍ර බැවහාර කෙරෙති කියා අපහාස කිරීම් හේතුකොට ගෙණ මෙබඳුවූ නුවණැත්තක්හු සමීපයෙහි ඉන්දදී ප්‍රශ්න නොවිචාරීමෙන් එකාන්තයෙන්ම ප්‍රමාද වාසයට තමන්වහන්සේ පැමිණ ශීලාදී ගුණයෙන් ප්‍රමාද වූවාහු මා අතින් අද විචාරණසේකැයි යනාදීන් රජ්ජුරුවන්ට චෝදනාකොට නැවත කියන්නාහු, රජ්ජුරුවන් වහන්ස, රජදරුවන් විසින් තම් රාජධර්මයන් තුන්දෙනෙකු කෙරෙහි පිහිටිය යුත්තේයයි කියා රාජධර්මයන් කියන්නාහු රජ්ජුරුවන් වහන්ස, රජදරුවන් විසින් පළමුකොට බොරු දුරු කටයුත් තේය. මුසාවාදදියෙන් යුතු රජදරුවන්ගේ රාජ්‍යයෙහි තෘණ වෘක්ෂ ලතාදී යෙහි ඕජා නැතිවන්නේය. ගොයම් ආදිවූ ශස්‍යයන් කරන්නාවූ භූමියෙහි ඕජා වද සත්රියනක් පාත බසින්නේය. එකල සත්ත්වයන් අනුභව කරන්නාවූ ආහාරයෙහිද තෙල් මී සකුරු ආදියෙහිද ඖෂධයෙහිද ඕජාවද ආනුභාවද නැත් තේය. එසේ ඕජා රහිතවූ භොජනය අනුභවකළාවූ සත්ත්වයෝ බොහෝව්‍යාධි ඇතිවන්නාහ.

තවද ඒ මෘෂාවාදීවූ රජ්ජුරුවන්ගේ රාජ්‍යයෙහි දිශයෙන් ගොඩින් වන් නාවූ යම් අයෙක් ඇත්නම් ඒද නූපදනේය. ඒ වසතු නූපන් කල්හි රජදරුවෝ දිළිඳු වන්නාහ. එකල රජදරුවෝ සේවකයන් ආදීන්ට සංග්‍රහ කළ නො හෙන්නාහ අසංගෘහිත රජදරුවන්ට සියල්ලෝම ආධාර නොකරන්නාහ. එසේහෙයින් පියාතන්වහන්ස, මේයේ නිරොජස්ක බොරු ජීවිත පිණිසත් නොකියයුතු වන්නේය සැබෑ බසතෙම මධුරවූ රස ඇත්තේය. එසේහෙයින්ම රසායනයක් වන්නේයයි රැක්ක යුත්තේය. තවද මේ මුසාවාදය නම් සත්ත්ව

යන්ගේ අවශෙෂවූ යම් ගුණයක් මකන්නේය. දෙවන ආත්මභාවයෙහි නරකොත්පත්තිය කෙළවරකොට ඇත්තේය. එසේහෙයින් මුසාවාදය වැලකියයුත්තේය. තවද පියානන්වහන්ස, රජදරුවන් විසින් නම් පළමු කොට කිපීම සවභාවකොට ඇති ක්‍රොධය වැලකියයුතු වන්නේය. ඒ කාරණ යෙන් අවශෙෂ සත්ත්වයන්ගේ කෝපය හා මුදුන් නොපැමිණෙන්නේය රජ්දරුවන්ට වච්නායුධ හෙයින් කිපී බැලූපමණකිනුත් සත්ත්වයන්ට විනාශ යට සමර්ථහෙයින් වහා මුදුන් පැමිණෙන්නේය. ඒ කාරණයෙන් අවශෙෂ සත්ත්වයන් විවරට වඩා අතිශයින්ම කෝපය දුරුකටයුතු වන්නේය, ක්‍ෂාන්ති යෙන්ද මෛත්‍රියෙන්ද දයාවෙන්ද යුක්ත එකම පුතෙකු ඇති මවක මෙන් ප්‍රියදර්ශනයෙන් ලෝකවාසීන්ට අනුශාසනා කටයුතු වන්නේය. අධිකවූ කෝප ඇති රජහට උපන් යසස එතෙම සථාවරකොටගත නොහෙන්නේය. තවද චුල්ල ධම්පාල ජාතකයෙහි මහාප්‍රතාප නම් රජතෙම තමාගේ ප්‍රියවූ පුත්‍රයා මරා පුත්‍ර ශෝකයෙන් ලයපැලී මළාවූ බිසවුන් කෙරෙහි නෙමේද ශෝකකොට ලයපැලී මිය තුන්දෙනම එකම සෝනට පැමිණියාහ. එසේහෙයින් රජ්ජුරු වන්වහන්ස, රජදරුවන් විසින් නම් පළමුකොට මුසාවාදය වැලකියයුත් තේය දෙවෙනිව ක්‍රොධය වැලකියයුත්තේය.

තවද රජ්ජුරුවන්වහන්ස, රජ්ජුරුවන් විසින් නම් එක්වන් ක්‍රීඩාශීලී නොවියයුතුය. සිහිපත් ඇතිවම රාජ්‍යය පාලනය කටයුතුය. කෙළියෙහි විදග්ධවූ චඤ්චලවූ සිත් ඇති රජතෙම අමඩ්‍යසනාව කටයුතු විචාරන්නේය. එතෙම තමහට උපන් යසස තිරකොට ගතනොහි නසාපියන්නේය. ඒ කුමක් මෙන්දයි යතහොත් සරභඞ්ග ජාතකයෙහි පුරෝහිතයාගේ බස් ගෙණ කිසවච්ඡ තාපසයන්ට ද්‍රොහකොට රාජ්‍යය හා සමග නැසී තුමූද සහපිරිවරින් ගොස් කුක්කුල නම් නරකයෙහි උපන්න. තවද මාතාඞ්ග ජාතකයෙහි මෙජ්ඣ නම් රජතෙම බමුණන්ගේ බස් ගිවිස මාතාඞ්ග තාපසයන්ට පීඩාකොට රාජ්‍ය වාසීන් හා සමග විනාශයට පැමිණ නරකයෙහි උපන්නේය. තවද ඝත ජාතකයෙහි දසබෑ රජ්ජුරුවෝ මෝහයෙන් මුළුව කණ්හදීප තාපසයන්ට පීඩාකොට වාසුදෙවකුලය නැසූහ. එසේහෙයින් අපරීක්‍ෂාකාරී රජදරුවෝ තමන්ට පැමිණි යසස් තිරකොටගත නොහෙන්නාහ. එසේහෙයින් පියානන් වහන්ස, රජදරුවන් විසින් නම් පළමුකොට මුසාවාදය දුරුකටයුතු වන්නේය. දෙවෙනිව ක්‍රොධය දුරුකටයුතු වන්නේය. තුන්වැනිව ක්‍රීඩාශීලීව රාජ්‍යය පරිපාලනයෙහි ප්‍රමාද බව දුරුකටයුතු වන්නේය.

ඉක්බිති ඒ තුන් කාරණා දුරුකොට සිට රාජ්‍යවාසීන්ට කළමනා අනුශාසනා කටයුතු වන්නේය. එසේ කිරීම රජදරුවන්ගේ ව්‍රතසමාදානයෙ කැයි පුරාතනයේ නුවණැත්තෝ කියන්නාහ. එසේහෙයින් පියානන්වහන්ස මීට පළමු ඉඳින් නුඹවහන්සේ රාගාදිවශයෙන් පශ්චාත්තාපයට නිසිවූ යම් අකුශල කර්මයක් කළසේක්වීනම් මෙයින් මම එබන්දක් නොකළමැනව. තවද රාජ්‍යයට වැඩපසස්නාවූ රජ්ජුරුවන්වහන්ස, ප්‍රමාදව වාසය ඇති රජහුගේ සියලුම භෝගයෝ විනාශයට පැමිණෙන්නාහ. ඊට කාරණා කිම්දයි යතයොත් පියානන්වහන්ස, ශ්‍රිය කාලකන්නිය යන මොවුන් දෙදෙනා අතුරෙන් ශ්‍රී තොමෝ කියන්නී යම් සත්ත්වයෙක්තෙම උට්ඨානවීර්‍ය්‍යී ඇතිව අප්‍රමාදව කුසල් කෙරේද පරසන්තක වස්තු දැක ලොභ නූපදවා එසේවූ සත්ත්වයා කෙරේ මම්

අභිරම්‍යණය කරන්නෙමියි කීව, එසේහෙයින් රජ්ජුරුවන්වහන්ස, නුඹ වහන්සේ සියල්ලවුන්ටම රක්‍ෂාස්ථානව කාලකන්නියට අවසරනොදී ශ්‍රීයම වාසස්ථානවූවමැනව. තවද කාසි රාජ්‍යයට අධිපතිවූ මහරජ්ජුරුවන්වහන්ස. ඒ පුරුෂතෙම ප්‍රඥාවෙන් හා වීර්‍ය්‍යයෙන් යුක්තවූයේ මහත්වූ අදහසින් නොරැන්ට පිහිටවූ පසම්තුරන් අල්වා තසන්නේ මුල් සිඳුනේ තම වෙයි. නොරුන් තමාන් තසන්නේ අක්සිඳුනේ තම් වන්නේය. මහරජ්ජුරුවන් වහන්ස, දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රදේවේන්‍ද්‍රයෝ පවා උට්ඨාන වීර්‍ය්‍යයෙහි අප්‍රමාදව දෙදෙව්ලොව දෙවියන් හා සමග කර්‍ණවටයක නම් ආශ්‍රම දේශයට ගොස් සරභඞ්ග ශාස්තෘන් කෙරෙන් ප්‍රශ්න විචාරා ධර්‍මය ඇසූහ.

කාශ්‍යප සර්‍වඥයන්වහන්සේගේ ශාසනය පසුබස්නාදක තමන්ගේ ආයුෂාවයෙන්ම මහජනයා නැතිගන්වා පසුබස්නා ශාසනය බොහෝ කලක් පවත්නා පරිද්දෙන් කළාහ. එසේහෙයින් දිව්‍යරජහු පවා උට්ඨාන වීර්‍ය්‍යයෙහි සිත ඇළුහ. තවද මහරජ්ජුරුවන්වහන්ස, චාතුර්මහාරාජික දිව්‍යලෝකයෙන් යට අණ්ඩජ, ජලාබුජ, සංසෙදජ, ඕපපාතික සඞ්ඛ්‍යාතවූ චතුර්විධ යෝනියෙහි උපන්නාවූ දෙවතාවෝද බ්‍රහ්මසමූහයෝද සදිව්‍යලෝකයෙහි දෙවියෝද යන මේ සියලු දෙවතාවෝ කුශල බලවත්වූ අදහස් ඇති එබඳුවූ රජදරුවන් හා සමාන ජීවිකාවෙන් ජීවත්වන්නාහ. එබඳුවූ කුශලයෙහි අදහස් ඇති රජ දරුවෝ දුන්නාදීවූ පින්කම්කොට දෙවියන්ට පින්දෙන්නාහ. ඒ දෙවතාවෝ ඒ පින් අනුමෝදන්ව දිව්‍ය සපිරිවරින් වැඩෙන්නාහ. එසේවූ දිව්‍ය ඓශ්වර්‍ය්‍ය යෙන් අභිවෘද්ධියට පැමිණියාවූ ඒ දෙවතාවෝ ඇමවේලෙහි වීර්‍ය්‍යකොට කුසල් කරන්නාවූ අප්‍රමාදවාසය ඇත්තාවූ එබඳු රජදරුවන්ට ධාර්මිකවූ රක්‍ෂාවරණ ගුප්තිය කෙරෙමින් ඡායාවක් මෙන් අනුව පවත්නාහ. පියානන්වහන්ස, නුඹවහන්සේ වූකලී දශකුශල ධර්‍මයෙහි අප්‍රමාදව අතිඤ්ඤිතවූ සියලු කාරිය කළමැනව. සියලු කාරියෙහි අප්‍රමාදව වීර්‍ය්‍යවත් වූවමැනව. පියානන්වහන්ස, නුඹවහන්සේ මා අතින් කවර කාරියක් කළ කල උතුම්දැයි යම් රාජධර්‍මයක් විචාළසේක් වීනම ඒ නුඹවහන්සේ විචාළ ඒ ක්‍ෂණයෙහි මා විසින් පළමුකොට මුසාවාදය දුරුකටයුතුයයි යනාදීන් යම් මේ ව්‍රතකොට්ඨාස කොටසක් කියන ලද්දාහු වීනම් එහිම පැවැත්ත මැනවැයි ඒ මා විසින් කියන ලද්දාවූ ආචාර ව්‍රතයම නුඹවහන්සේට අවවාද අනුශාසනා නොවන්නේය.

මෙසේ මේ ධර්‍මයෙහි පවත්නාවූ රජදරුවෝ තම් තමන්ගේ මිතුරන්ට සැප එලවන්ටත් සතුරන්ට දුක් එලවන්ටත් සමර්ථවන්නාහයි මෙසේ වෙස්සන්තර නම් පක්‍ෂිරාජයා විසින් රජ්ජුරුවන්ට ධර්‍මදේශනා කළ කල්හි සර්‍වඥ විලාශයෙන් ප්‍රශ්න විසර්ජනය කරණලදැයි මහජනයෝ ආශ්වර්‍ය්‍යවත්වූ සිත් ඇතිව දහස්ගණන් සාධුකාරනාද පැවැත්වූහ. රජ්ජුරුවෝ සොම්නසට පැමිණ අමාත්‍යයන් කැඳවා පින්වත්වූ අමාත්‍යයෙනි, මාගේ පුත්‍රවූ වෙස්සන්තර යන් මෙසේ කියන නැනැත්තන් විසින් කවරදෙයක් කරණලද්දැයි විචාරා දෙවයන්වහන්ස, අයකැමි අමාත්‍යයා විසින් කළමනාදෙය කරන්ට සුදුසුයයි කීකල්හි එසේවීනම් උන්ට අයකැමි තනතුරු දෙමි. වෙස්සන්තර පක්‍ෂීහු තනතුරෙහි පිහිටුවූහ එතැන්පටන් ඒ තනතුරෙහි සිට පියරජ්ජුරුවන්ට සියලු කාරිය විධාන කළහ. නැවත රජ්ජුරුවෝ කීපදවසක් ඉකුත්කොට පළමු පරිද්දෙන් කුණ්ඩලී නම් ලිහිණිය සමීපයට අමාත්‍යයන් යවා සත්වෙනිදවස් ඒ ලිහිණිය

වසන තැනට ගොසින් සත්කාර සම්මාන විඳ පෙරළා අවුත් පළමු පරිද්දෙන්ම මණ්ඩප මධ්‍යයේ හිඳ කුණ්ඩලී නම් ලිහිණිය ගෙන්වා සුවණ්ණපීඨයෙහි හිඳුවා රජ්ජුරුවෝ ධර්ම විචාරන්නාහු කුණ්ඩලී නම් ලිහිණිය මා විසින් විචාරණලද ප්‍රශ්නය කියන්ට හෝ සමර්ථයෙහිද, මා විචාළ ප්‍රශ්නයෙහි අදූ දූතගතයෙහිද රාජ්‍යය කරණු කැමැත්තාවූ රජදරුවන් විසින් කවර කාරියක් කළ කල උතුම්වේද? මාගේ දියනියනි, සියලු රාජධර්මයන් තත්වූ පරිද්දෙන් කියවයි කීහ. කවර කාරණයෙකින් මේ රජ්ජුරුවෝ වෙස්සන්තර නම් පක්ෂියා අතින් නොවිචාරා කුණ්ඩලී නම් ලිහිණිය අතින් මේ ප්‍රශ්නය විචාළෝද යත්? ස්ත්‍රී බැවින් විචාළහ. ස්ත්‍රී නම් සවල්පවූ ප්‍රඥාඇත්තාහ. එසේහෙයින් ඉදින් කියන්ට සමර්ථයෝ වීනම් ක්ෂණයි පරීක්ෂාකිරීම් වශයෙන් මෙසේ විචාරා ඒ කුණ්ඩලිය ගෙන්ම ප්‍රශ්නය විචාළාහ.

මෙසේ රජ්ජුරුවන් විසින් රාජධර්මය විචාළ කල්හි කුණ්ඩලී නම් ලිහිණි තොම කියන්නී පියානන්වහන්ස, නුඹවහන්සේ මෙසේ ස්ත්‍රීහු නම් නුවණ මඳහෙයින් කුමක් කියා කොටගන හෙද්දැයි පරීක්ෂාකිරීම් වශයෙන් විචාරති සිතමි. එසේහෙයින් මම නුඹවහන්සේට සියලු රාජධර්මය පද දෙකක්ම බහාලා කියමි කියාලා ප්‍රශ්න විස්සජ්ජනය කරන්නාවූ ලිහිණීතොමෝ මෙසේ කීව. පියානන්වහන්ස, යම් කාරණා පද වශයෙන් සියලු අභිජාත හා සිතසැප පිහිටියේ වීනම් එසේවූ කාරණා පදද්‍රව්‍යයෝ දෙදෙනෙක්ම වන්නාහ පෙර නොලබනලද ලාභයාගේ ලැබීමය. ලබනලද ලාභය නැසියනොදී පරිහරණය කොට රක්ෂා කිරීමය යන දෙක වන්නේය. පියානන්වහන්ස, නූපන් ලාභය උපදවුම් බැරි නොවන්නේය. උපන් ලාභය සොරුන් සතුරන් ආදීන්ගෙන් නැසීමට නොපමුණුවා රක්ෂා කිරීම බැරෑරුම් වන්නේය සමහර සත්ව කෙණෙක් මානයන උපදවාගෙනන් ප්‍රමාදවූයේ ප්‍රාණාතිපාතාදී අකුශලධර්ම යන් කරන්නේ ප්‍රසිඩවූ සොරකම් කරන්නේ රට කොල්ලකා ඇවිදිනේය. එකල්හි ඔහු රජදරුවෝ අල්වාගෙණ මහත්වූ විනාශයට පමුණුවන්නාහ. නොහොත් රූපාදීවූ පඤ්චකාම කොටඨාසයෙහි ඇලුම් ඇතිව ප්‍රමාදව නුනුවණින් වස්තු නිමාගිය කල්හි දුක්පත්ව බැගෑරෙදි හැඳගෙණ කබල්ගත් අත් ඇතිව දොර දොර සිඟා ඇවිද්නේය. එකල්හි ප්‍රව්‍රජිතයන්වහන්සේ ග්‍රන්ථධුර විදර්ශනා ධුරයෙහි යෙදී වාසය කිරීමෙන් ලාභසත්කාර උපදවා කවර කලෙකින් ප්‍රමාදව ගිහිභාවයට පැමිණෙනසේකැයි සමහර තපස් කෙණෙකුන්වහන්සේ ප්‍රථමධ්‍යානාදිය උපදවාත් සිහිමුලාවෙන් එබඳුවූ රූපාලම්භනයෙකැයි බැඳී ධ්‍යානයෙන් පිරිහෙනසේක. එසේහෙයින් උපන්නාවූ යසපිරිවර හා සම්පත් ධ්‍යානාදීන් ලැබ රක්ෂාකිරීමම දුෂ්කරවන්නේයයි සමහර සත්වකෙණෙක් ලාභසත්කාර උපදවා අප්‍රමාදව සිට කුශල කර්මයෙහි යෙදී වාසයකරන්නෝ වීනම් ඔහුගේ යශස ශුක්ලපක්ෂයෙහි කලාවෙන් කලාවට වැඩිගණ යන්නාවූ චන්ද්‍රමණ්ඩලය මෙන් අභිවෘධියට පැමිණෙන්නේය.

එසේහෙයින් මහරජ්ජුරුවන්වහන්ස, නුඹවහන්සේත් අප්‍රමාදව ප්‍රයෝග සම්පත්තියෙහි යෙදීසිට දැහැමෙන් සෙමෙන් රාජ්‍යකෙරෙමින් නුඹවහන්සේට උපන්නාවූ යශස් නොනසා රක්කමැනව මහරජ්ජුරුවන්වහන්ස, ද්‍යූතක්‍රීඩාවෙහි ලොල්නොවූ සොරාවික නොවන්නාවූ පූප සුරාගන්ධාදියෙහි ලොල් නොවන්නාවූ නුඹවහන්සේ සන්තක ධනධාන්‍යාදිය නස්නාවූ කාරණා කාරණා දන්නාවූ ධෛර්‍ය දෙකින් යුක්තවූ අමාත්‍යයන් දූත හැඳින භාණ්ඩාගාර

නොයෙක් කාරියෙහි යොදාගත මැනව. තවද පියාතන්වහන්ස, යම් අමාත්‍යයෙක් නුඹවහන්සේ සන්තක යම්කිසි ධනයෙක් ඇත්නම් ඒ සියලු වස්තුව නොනසා සුරක්ෂිත සුභොජන කොට තබන්නේ වී නම් එසේවූ පුරුෂතෙම නුඹවහන්සේට අමාත්‍යතම් වන්නේය. යම්සේ රථාචාර්යයෙක් මාගී [illegible]මතයෙක් ඇත්නම් වන්නාවූ පීඩා දුරුකරණ පිණිස සියලු වස්තුව හා සමග රථය නොනසා පරිහරණය කොටගෙණ කැමැත්තාවූ මාර්ගයෙන් ගොස් ක්ෂෙමභූමියට පැමිණ සුවපත්වේද්ද; එපරිද්දෙන් නුඹවහන්සේගේ අමාත්‍යයෙක් වස්තු සමග නුඹවහන්සේ රක්නට සමර්ථවූ නම් එසේවූ තැනැත්තේ නුඹවහන්සේට අමාත්‍යතම් වන්නේය. එබඳු පුරුෂයාගේ භාණ්ඩාර ගෙයි කාරිය කරවුව මැනව. පියාතන්වහන්ස, යම් රජ්ජුරුකෙණෙකුන් ගේ ඇතුලෙහි ඇවිදිනා දුක්පත් සුවපත් සත්ත්වයෝ රත්රන් හා වස්ත්‍රාභරණාදිය දීමෙන් සංග්‍රහ නුවූත්තාවූ වීනම් රජ්ජුරුවන්ගේ අන්තඃපුරයෙහි ඇතිව තුබූ රත්රුවන් ආදී වස්තු සංග්‍රහ නුවූත්තාවූ මනුෂ්‍යයන්ගේ වංශග්‍රහයෙන් මහත්වූ විනාශයට පැමිණෙන්නේය. ඇතුලෙ හිත වශයෙන් නිකල කථාවකුත් පිටතට විසතිණිවන්නේය. එසේ හෙයින් නුඹවහන්සේ මදකොට සිත් ගන්නාලද අන්තඃපුරවාසී ජනයන් ඇතිව මාගේ මෙතෙක් සම්පත් ඇතැයි නුඹවහන්සේම වස්තුව පරීක්ෂාකොට අසවල් තැන මෙතෙක් වස්තු නිධානයන් ඇත්ම ප්‍රත්‍යක්ෂකොටම කළමැනව. අසම් මුඛයේ අනුන් නිකල බස් අදහාගෙණ වස්තු සැඟවීමත් නොකල මැනව.

තවද පියාතන්වහන්ස. ඒ ඒ තැනින් උපදනා වස්තුයෙහි අයත් නොකරණලදදයි මේ සියල්ලත් නුඹවහන්සේම දතමැනව. යුධයෙහි හෝ වේවයි නවකර්මයෙහි හෝ වේවයි අන්‍යවූ රාජකාරිය හෝ වේවයි මොහු විසින් මෙතම් දෙයක් කරණලද මොහු විසින් මෙතම් දෙයක් නොකරණලදදයි මේ සියල්ලත් නුඹවහන්සේ දතමැනව. අනුන්ගේ බස් අදහා නොගතමැනව. තවද පියාතන්වහන්ස, රජදරුවන්වහන්සේ තම් ගම් පැහැරීම් උමංකැනීම් ආදීවූ නොයෙක් දෝෂ කොට නිග්‍රහයට සුදුසුවූ පුරුෂයා අල්වාගෙණ අවුත් දක්වාලූ අවස්ථාවෙහි ඔහුගේ දෝෂ විචාරා සුධකොට පුරාතන රජ්දරුවන් විසින් නියමකොට තබනලද දණ්ඩනය පරීක්ෂාකොට දෝෂානුරූපවූ නිග්‍රහය කරණසේක් යම් සත්ත්වයෙක් නුබුත්තාවූ පරසේනාව බිඳුවාදීලාද බුත්තාවූ සියලු සෙනග රඳවන්ට සමර්ථද නොලද්දාවූ රාජ්‍යයක් ඇරදීලන්ට යොග්‍යද ලද්දාවූ රාජ්‍යයක් ස්ථාවරකොට ලන්ට සමර්ථද යමෙක්හු විසින් ජීවිත පරිත්‍යාගකොට කාර්‍ය කරණලද්දේ වේද එබඳුවූ සංග්‍රහකරන්ට සුදුසුවූ පුද්ගලයාට සංග්‍රහ කරණසේ මහත් සත්කාර සම්මාන කරණසේක. එසේකල්හි රජ්ජුරුවන්වහන්සේගේ සියලු රාජකාරියෙහි අවශෙෂ සත්ත්වයෝත් කළමනා කාරිය ඒ කල සංග්‍රහ බලා නොපමාව කරන්නාහ.

රජ්ජුරුවන්වහන්ස, දනව්වාසීන් අභිවෘධියටත් රට රැක්මටත් නුඹවහන්සේ ප්‍රත්‍යක්ෂකොට දූතගෙණ සියලු රාජ්‍යමැස්සා හා දනව්වැස්සන්ට අවවාද අනුශාසනාකොට වදාළමැනව. නුඹවහන්සේගේ නියෝගයෙන් ඒ ඒ තැන්හි කාර්‍ය සාධකධුරයෙහි සිටිනා රාජපුරුෂයෝ අල්ලස් ගෙණ හිමියන් අහිමිකොට අහිමියන් හිමිකොට අධිකරණ යුක්තිය නැතිකොට නුඹවහන්සේගේ වස්තුවත් රටත් නොනසන්වයි මේකාරණාවෙන් අප්‍රමාදව නුඹවහන්සේම රාජ්‍යවාසීන්ගේ සියලු යුක්තායුක්ත විචාරා සියලු සත්ත්වයන්ට අවවාද අනුශාසනා කළමැනව.

පියාතන්වහන්ස, අපරීක්ෂාකාරී යුහුසුළුව කිසිකාරියකුත් නොකළ මැනව. පරීක්ෂා නොකොට ඡන්දයෙන් ද්වේෂයෙන් ලොභයෙන් යුහුසුළුව කරනලද්දාවූ කාරිය යහපත් නොවන්නේය. කුමක් හෙයින්ද? යත් එබඳුහු ඉක්මන්කාරීකොට අඳනාවූ සත්ත්වතෙමේ මෙලොව්හිත් පසුතැවිලිසට පැමිණෙන්නේය. අපාය දුක් අනුභව කෙරෙමින් පරලොව්හිත් තැවුලියට පැමිණෙන්නේය. එහෙයින් ඉසිලූ කාරිය ඉක්මන් නොවීමෙන් පරීක්ෂාකාරීව කළමැනව.

තව්ද පියාතන් වහන්ස, යම්කලෙක විනිශ්චය මණ්ඩලයෙහි උපන්නාවූ නුඹවහන්සේගේ සමීපයට ගෙනවුත් මොහු විසින් පුරුෂයෙකු මරනලද ඔං පැහැරීම් උම්කැනීම් ආදිය කරනලදැයි කියා සොරෙකු දක්වත්ද එකල නුඹවහන්සේව අනුන්ගේ වචනයෙන් බලවත්වූ අහිතවූ හෘදය ක්‍රොධවශයෙන් නොගෙණ මෙරමාට හිංසා පීඩා නොකළ මැනව, කුමක්හෙයින්ද? යත් නොසොර තැනැත්තාවූත් සොර තැනැත්තේයයි කියාගෙන එන්නාහ. එහෙයින් නුඹවහන්සේ නොසොර විරුද්ධවූ උභය පක්ෂයේ ඇත්තවූත් බස් අසා මනාකොට විචාරා සුඛකොට නුඹවහන්සේට ප්‍රත්‍යක්ෂවීමෙන් ඔහු සොර කීයාම දූත ඕනට කලමනා නිග්‍රහ කළමැනව. රජ්ජුරුමන්වහන්සේ විසින් කෝපය උපන් කල්හි ලය සිහිල් නොකොට අනුන්ට නිග්‍රහ නොකටයුත්තේය. යම්කලෙක බස් අසා මනාකොට විචාරා සුඛකොට නුඹවහන්සේට ප්‍රත්‍යක්ෂවීමෙන් ඔහු සොර කීයාව දූත ඕනට කලමනා නිග්‍රහ කළමැනව. රජ්ජුරුවන්වහන්සේ විසින් කෝපය උපන් කල්හි ලය සිහිල්කොට අනුන්ට නිග්‍රහ කටයුත්තේය. යම්කලෙක රජ්ජුරුවන්වහන්සේ ලය සිහිල්ව මොළොක් ගියේ නම් එකල්හි විනිශ්චය මණ්ඩලයේ හිඳ සියලු රාජකාරිය විමාළයුත්තේය. සිත කෝපයෙන් රළුව තිබුනු කල්හි කැකෑරිය පැනීත් මුබන්මතන නොපෙණෙන්නාක්හු මෙන් කාරණා කාරණා නොපෙණෙන්නේය. පියාතන්වහන්ස, අධික ක්‍රොධයහේතු කොටගෙණ වස්ත්‍රාභරණ ධනධාන්‍යාදීන් සමෘද්ධවූ බොහෝ රජදරුවෝ නානාවිධ රජ්ජුරුවන් පරිද්දෙන් මහත්වූ විනාශයට පැමිණියාහ.

තව්ද පියාතන්වහන්ස, මම පෘථිවීශ්වරයෙමි කියා මහජනයා කායදුශ්චරිතාදියෙන් අධර්මයෙහි නොයෙදුවමැනව. නුඹවහන්සේගේ විජිතයෙහි මනුෂ්‍ය සත් තිරශ්චීනයක් සත්පුරුෂයන්ට දුකොත්පත්තියක් නොවේවයි, යම්සේ අධර්මිෂ්ට රජදරුවන්ගේ ජීවිතයේ මනුෂ්‍යයෝ කායදුශ්චරිතාදියකොට නරකයෙහි උපදිද්ද එපරිද්දෙන් නුඹවහන්සේගේ රාජ්‍යාධිපතිත්වට නරකොත්පත්තිය නොකොට යම්සේ දුක්නොවිද්දද, එපරිද්දෙන් කළමැනව. පියාතන්වහන්ස, යම් රජ්ජුරුකෙනෙක් කිසිමෙක්හි සාංකාව නොකොට තමන්ගේ කාරිය සිහි කෙරෙද්ද, ඡන්දවශයෙන් යමක් කැමැත්තේවිකම් ඒ ඒ දෙය කෙරෙද්ද, සැර සවියක් නැති අන්ධයෙකු මෙන්ද, අකුස්ස නැති මහානාගහස්තියකු මෙන්ද වන්නාහ. අනන්තානුවාද හයින් නිර්භීතවූ ඒ රජ්ජුරුවන්ට සියලු වස්තුහු නස්නාහ. රජ්ජුරුවන්ට භොග ව්‍යසන විශෙෂයෙන් දුක්වන්නේය. එහෙයින් රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ මා විසින් යටකියනලද්දාවූ මේ සියලු රාජධර්මයෙහි පිහිටියමැනව. පියාතන්වහන්ස, මා විසින් කියනලද්දාවූ රාජකාර්‍යයෙහි දක්ෂව අලසනොවී කුසල්කොට සුරාපානාදිය දුරුකොට ඓහලෞකික පාරලෞකික වැඩි නොනසා සිල්වත්ව ආචාරසම්පන්නව දශරාජධර්මයෙහි

පිහිටා රාජ්‍ය කළමැනව. මහරජ්ජුරුවන්වහන්ස, දුශ්ශීලවූ සත්ත්වතෙමේ තමා නරකයෙහි මහත්වූ දුකට පමුණුවන්නේය. මෙසේ ඒ කුණ්ඩලී නම් ලිහිණීතොමෝ රජ්ජුරුවන්ට ධර්මදෙශනා කළාය.

රජ්ජුරුවෝ එබස් අසා සතුටුව ආමන්ත්‍රණයකොට කියන්නාහු පින්වත්වූ අමාත්‍යයෙනි, මාගේ දූවූ කුණ්ඩලීනිය මෙසේ කියන තැනැත්තිය විසින් කවුරුන් විසින් කළමනාකාරිය කරණලද්දැයි විචාරා දේවයන්වහන්ස, භාණ්ඩාගාරිකයා විසින් කළමනා දෙය කරණලද්දැයි කී කල්හි එසේවීනම් කුණ්ඩලී ලිහිණිය භාණ්ඩාගාරික තනතුරෙහි තුබූහ. එතැන්පටන් කුණ්ඩලීනියතොමෝ භාණ්ඩාගාරික තනතුරෙහි සිට පියරජ්ජුරුවන්ට කළමනාකාරිය කළාහ. තවද රජ්ජුරුවෝ කීපදවසකින් පළමු පරිද්දෙන්ම ජම්බුක පණ්ඩිතයන් සමීපයට දූතයන් යවා සත්වෙනි දවස් උන්ගේ ගෙට ගොස් මහසම්පත් අනුභවකොට පෙරළා අවුත් පළමුපරිද්දෙන්ම මණ්ඩප මධ්‍යයෙහි උන්හ. අමාත්‍යයා ජම්බුක පණ්ඩිතයන් සුවර්ණපීඨයේ හිඳුවාගෙණ ආයේය. ජම්බුක පණ්ඩිතයෝ පිය රජ්ජුරුවන් ඇකයේ හිඳ කෙළපියා ගොස් සුවර්ණපීඨයෙහි උන්හ. එකල උන් අතින් ප්‍රශ්න විචාරන්නාහු පුත ජම්බුකයෙනි, තොපගේ බෑනන් වෙස්සන්තර යන්නා බැණනියන් කුණ්ඩලීනීන් හා දෙදෙනා අතින් රාජධර්මය විචාළෙමි. ඔහු දෙදෙන තමතමන්ගේ ශක්තිවූ පරිද්දෙන් රාජධර්මය කීහ. උන් අතින් යම්සේ විචාළෙම්ද එපරිද්දෙන්ම පුත ජම්බුකයෙනි, තොප අතිනුත් විචාරමි. තෙපි මට උතුම් රාජධර්ම බලයන් කීයවයි කීහ.

මෙසේ රජ්ජුරුවෝ මහබෝසතානන් අතින් ප්‍රශ්න විචාරන්නාහු සෙසු දෙනා අතින් විචාළපරිදියේ නොවිචාරා විශේෂකොට විචාළහ. එකල්හි රජ්ජුරුවන්ට මහබෝසතානෝ එසේවීනම් රජ්ජුරුවෙනි, කන්යොමා අසව, තොපට සියලු රාජධර්මය කියමියි කියා දික්කළ අත දකුසින් බැඳි පියල්ලක් තබන්නාක්හු මෙන් ධර්මදෙශනාවට පටන්ගත්හ. මහරජ්ජුරුවෙනි, සත්ත්වලෝකයෙහි මහත්වූ අධ්‍යාශ ඇති පුරුෂයා කෙරෙහි පඤ්චවිධ බලයෙක් වන්නේය. ඒ පංචවිධ බලයෙන් කායබලය ඉතා මහත්වී නම් ලාමක වන්නේය. කවර කාරණයකින්ද? යත් අඥාන බල බැවිනි. ඉදින් කායබල මහත්වී නමුත් ඒ බලයට වඩා කැටකිරිලි බලය අධික වන්නේය. ඇත්බලය වූකලී අඥාන බල බැවින් මරණට ප්‍රාප්තවිය කැටකිරිලිතොමෝ තමාගේ ප්‍රඥා සාමර්ථ්‍යයෙන් හස්ති රාජයා ජීවිතක්ෂයට පැමිණවූව. එසේහෙයින් හැමතන්හි කායබලය ප්‍රයෝජන නැත. අඥානයන්ගේ කායබලය ආත්මබලය පිණිස වන්නේය. කායබලයට වඩා හිරණ්‍යසුවර්ණාදිවූ භොගබලයම ඉතා මහත් වන්නේය, ඒ භොගබලයට වඩා හෙදබවට නොපමිණුවන්නාවූ මන්ත්‍රණ ඇති සෞරවීයයී ඇති සත්හුන්නාවූ අමාත්‍ය මණ්ඩලයා ඇතිකල කියනලද බලය ප්‍රතියෝග්‍ය බැවින් පූර්වබලයට වඩා ඉතා මහත් වන්නේය. බ්‍රහ්ම වෛශ්‍ය ක්ෂුද්‍ර ය යි කියනලද ත්‍රිවිධකුලයන් ඉක්ම ක්ෂත්‍රියකුල වශයෙන් ජාතිසම්පන්නයෝම ප්‍රධානවන්නාහ. අන්‍ය සත්ත්වයෝ ප්‍රධාන නොවන්නාහ. යම් මේ චතුර්විධ බලයට වඩා නුවණැත්තාවූ සත්ත්වතෙමේ පැමිණෙන්නේවීනම් ඒ සියලු බලයම වඩා ප්‍රඥාබලයම ශ්‍රේෂ්ඨවන්නේය. ඒ ප්‍රඥාබලයෙන් යුක්තවූ සත්ත්වතෙමේ අභිවෘද්ධියට පැමිණෙන්නේය.

තවද පියාණන්වහන්ස, අප්‍රාඥවූ පුද්ගලතෙම මේ සප්තරත්නයෙන් සම්පූර්ණවූ පෘථිවී මණ්ඩලය ඉදින් ලද්දේවීනම් ඔහු නොකමැති පරිද්දෙන්ම බලාත්කාරයෙන් අන්‍යවූ ප්‍රඥසම්පන්නයෙක් ඒ රාජ්‍යභාරය පිළිපදනේය. අඥන සත්ත්වතෙමේ ලබනලද්දාවූ යශස රක්නට වේවයි කුසලසන්තකවූ රාජ පරම්පරාවෙන් ආවාවූ රාජ්‍යයට පැමිණෙන්ට වේවයි අසමර්ථවන්නේය. ජාති සම්පත්තිය නිසා කුශලසන්තක රාජ්‍යය ලැබත් සියලු රාජ්‍යශ්‍රීන් යුක්තවත් ජීවත්ව ගතනොහෙන්නේය. උපායෙහි දක්ෂ නුවූ බැවින් දුක්පත්වන්නේය. මෙසේ මහබෝසතාණෝ නොයෙක් කාරණයෙන් ප්‍රඥහෙතු ගුණ කියා ප්‍රඥවට ප්‍රශංසාකරන්නාහු මෙසේ කීහ. මේ ලෝකයෙහි උතුම්වූ ප්‍රඥ ඇති සත්ත්වතෙම බහුශ්‍රැත බැවින් කාරණාකාරණා හා යුක්තායුක්ති විශෙෂයෙන් නිශ්චයකරන්නේය. නැවත කීර්තිශොභාවටත් පැමිණෙන්නේය. ලාභසත්කාරයත් වඩනේය. දුක් උපන් කල්හි උපායෙහි දක්ෂ බැවින් නිර්භීතව සැපතටත් පැමිණෙන්නේය.

තවද පියාණන්වහන්ස, ප්‍රඥපුද්ගලයන් සේවනය නොකරන්නාවූ සත්ත්වතෙමේ ධර්මයෙහි බහුශ්‍රැතවූ පුද්ගලයාකරා පැමිණ ඔහුගේ බස් නොඅදහන්නේය. අර්ථානර්ථ කාරණා පරීක්ෂා නොකිරීමෙන් ප්‍රඥවිශෙෂයකට නොපැමිණෙන්නේය. යම් සත්ත්වයෙක් දශකුශලකර්මපථ විභාගයෙහි දක්ෂවූයේද වීර්‍ය්‍ය කරන්ට සුදුසු තැන්හි වීර්‍ය්‍ය කෙරේද නුකුසීතව ඒ ඒ කරන්ට නිසිතැන්හි ඒ ඒ කාරි කෙරේද එසේවූ පුද්ගලයාහට කර්මඵල සමෘද්ධවන්නේය. ලාභයශ සුඛාදීන්ට ආදරකරවූ දුශ්ශීල ක්‍රියාවන් යුක්තවූ පුද්ගලයන් සේවනයකරන්නාවූ කුශලකර්මපථය කරන්නාවූ කාලයෙහි කලකිරී උකටලීව කරන්නාවූ මෙබඳුවූ පුද්ගලයාහට කර්මවිභාග සිද්ධනොවන්නේය. දිව්‍යලොකොත්පත්තිය නොවන්නේය. අනිත්‍යභාවනාවූ පුද්ගලයාහට කර්මවිපාකය සමෘද්ධවන්නේය. මහත් ඓශ්වර්‍ය්‍යයටත් පැමිණෙන්නේය.

පියාණන්වහන්ස, යෙදියයුතු කාරණයෙහි යෙදීම් සංඛ්‍යාතවූ ප්‍රඥ කොට්ඨාශයද රැස්කරණලද වස්තුව රක්ෂාකිරීමද යන මේ දෙක හා පළමු මා විසින් කියනලද සියලු කාරණයන් සේවනය කළමැනව. මා කී අවවාද සිත තබාගෙණ නුඹවහන්සේගේ හෙයි වස්තුව රකිමින් ජීවත්වූව මැනව. නිෂ්කාරණයේ වස්තු නොනැසුව මැනව. නුවණැත්තාවූ පුද්ගලතෙමේ නිෂ්කාරණයේ වස්තු නොනැසුව මැනව. නුවණැත්තාවූ පුද්ගලතෙමේ නිස්කාරණයේ සියලු වස්තුව නසා පසුව දුගීබවට පැමිණෙන්නේය. යම්සේ උණපතු බටපතු ආදියෙන් කරණලද්දාවූ ගෙය මූලදක්වා දිර දිරා ස්ථම්භාදීවූ ප්‍රතිෂ්ඨාවක් නැති බැවින් වැටහේද, එපරිද්දෙන් අඥන සත්ත්වතෙමේ නිස්කාරණයේ වස්තුව නසා අපායෙහි ඉපිද මහත්දුක් අනුභවකරන්නේයයි මෙසේ මහබෝසතාණෝ මෙනෙක් කාරණයෙන් පංචවිධ බලයන් වර්ණනාකොට ඒ සියලු බලයන්ට වඩා සඳමඬලෙහි සාවා පානාක්මෙන් වර්ණනාකොට දූන් රජ්ජුරුවන්ට ගාථා දසයකින් අවවාදකරන්නාහු මෙසේ කීහ. උදෑසනක්සේ නැගීසිට දෙමව්පියන්ට දැහැටි පැන් දීම් ආදීවූ සියලු වතාවත් කොට කැඳ අවුලුපත් බුලත් ආදීවූ දෙය ශරීර පරිහරණය කෙරෙමින් මාතා පිතා උපස්ථාන කරන්නාවූ නුඹවහන්සේ ධර්මයෙහි හැසුරුණ මැනව, රජ්ජුරුවන්වහන්ස, දෙමව්පියන්ට මෙහෙකිරීම් සංඛ්‍යාතවූ කුශලධර්මය මේ මනුෂ්‍යලෝකයෙහිදී කොට පරලොව ස්වර්ගමොක්ෂ සම්පත්තීයට උත්සාහ කළ මැනව,

මහරජ්ජුරුවන් වහන්ස, දූන් දරුවන් අකුසලයෙන් වළකා කුසලයෙහි පිහිටුවා ශිල්ප උගන්වා වැඩිවිය පැමිණි කල්හි සුදුසුවූ කාලයන් හා ආවාහ විවාහකොට උන්උන්ට සුදුසුවූ ගව මහිෂ වස්ත්‍රාභරණාදිවූ වස්තු දීමෙන් දරුවන් කෙරෙහි හැසුරුණ මැනව. සාමාන්‍ය අන්තඃපුර ස්ත්‍රීන්ට හා බිසෝවරුන්ට සම්මානකෙරෙමින් උන් ඉක්ම නොපැවතී සියලු ඓශ්වර්‍ය්‍ය උන්ගේ විධානයට හරිමින් උතුම්වූ වස්ත්‍රාභරණාදිය දෙමින් අග්‍රමහෙෂිකාවන් හා අන්තඃපුර ස්ත්‍රීන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණ මැනව.

මහරජ්ජුරුවන් වහන්ස, සියලු විශ්වාසයෙන් හා අමාත්‍යයන් අවශෙෂවූ සියලු සත්ත්වයන්ට දාන ප්‍රියවචන අර්ථචර්‍ය්‍යා සමානාත්මතායයි කියනලද සතර සංග්‍රහ වස්තුවෙන් සංග්‍රහ කෙරෙමින් මටසිලුටුවූ ප්‍රියතෙපුල් බෙණෙමින් පරුෂ වාක් නොකීමෙන් මුසාවාදාදිවූ චතුර්විධ දුශ්චරිතයෙන් සියලු ජනයා නොසවා ඔවුන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණමැනව. මහරජ්ජුරුවන්වහන්ස හස්ත්‍යශ්වාදී වාහනයන්ට හා සේනාවට දියයුතු වැටුප් වියදම්ආදිවූ සියල්ල දීමෙන් සත්කාර සම්මානකිරීමෙන්ද හස්ත්‍යශ්වාදීන් වෑඩ අවස්ථාවෙහි කර්මාන්තයෙහි නොයොදා, ඔවුන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණමැනව. මහරජ්ජුරුවන්වහන්ස, ගම් නියම් ගම් වාසීන්ට තාඩන පීඩාදිවූ මර්දනය හා හොම්ද අයපඬුරු ගැණීම් ආදියෙන් පීඩා නොකරන්නාවූ තුඹවහන්සේ ගම් නියම්ගම් වැස්සන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණ මැනව. මහරජ්ජුරුවන්වහන්ස, රාජ්‍යවාසීන් හා ජනපදවාසීන්ට නිෂ්කාරණයේ පීඩා නොකොට උන් කෙරෙහි ක්‍රොධ සිත නොඅලවා ජනපීඩා නොකොට සියලු සත්ත්වයන්කෙරෙහි මෛත්‍රී පතුරුවන්නාවූ තුඹවහන්සේ රට වැස්සන් හා දනව් වැස්සන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණ මැනව. මහරජ්ජුරුවන් වහන්ස, ධාර්මිකවූ ශ්‍රමණ බ්‍රාහමණයන්ට චීවර පිණ්ඩපාත සේනාසන ගිලානප්‍රත්‍යයයි කියනලද චතුර්විධප්‍රත්‍යය දීමෙන් ඔවුන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණ මැනව.

රජ්ජුරුවන්වහන්ස, සියලු මෘගශූකරාදිවූ චතුෂ්පාදයන් හා පක්ෂි සමූහයන්ට අභය දීමෙන් මෘග පක්ෂීන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණ මැනව. මහ රජ්ජුරුවන් වහන්ස, සාමාන්‍යයෙන් සියල සත්ත්වයන් කෙරෙහි මෛත්‍රී පැතිරීමෙන් හැම දවස්ම ධර්මයෙහි හැසුරුණ මැනව. මනාකොට පුරුදුකරණ ලද්දාවූ දානශීලාදිවූ සමචර්‍ය්‍යාසංඛ්‍යාතවූ කුශලධර්මය සදිව්‍යලෝකයෙහි උපදවාමහත්වූ දිව සැපත් අනුභව කළමැනව. මහ රජ්ජුරුවන් වහන්ස; ශක්‍රදෙවේන්ද්‍රයන් ප්‍රධානකොට ඇති දෙවියන් හා සහම්පතී මහාබ්‍රහමයා ප්‍රධානකොට ඇති සියලු බ්‍රහමයෝ මනුෂ්‍යලෝකයෙහිදී කරණලද්දාවූ කායසුචරිතාදිවූ උත්තම සුචරිතයෙන් දිව්‍ය බ්‍රහමලෝක සංඛ්‍යාතවූ ස්වර්ගයට පැමිණ එහි යසස් සමෘද්ධිය අනුභව කරන්නාහ. එසේහෙයින් මහ රජ්ජුරුවන් වහන්ස, තුඹවහන්සේ ජීවිත පරිත්‍යාගකොටත් කුශල කර්මයෙහි අප්‍රමාදවුව මැනවැයි මෙසේ දශවිධවූ රාජ ධර්මය කියා මත්තෙහිත් අවවාද කරන්නාවූ මහබෝසතාණෝ මෙසේ කීහ.

මහරජ්ජුරුවන්වහන්ස, තුඹවහන්සේ මා විසින් කියනලද්දාවූ අවවාදය සිතතබාගෙණ හැමකල්හිම්තුවණැත්තාවූ සත්ත්වයන් සේවනයකොට කල්‍යාණ ගුණයෙන් සමන්විතවූ සියලු කාර්‍ය්‍යාකාර්‍ය්‍ය ප්‍රත්‍යක්ෂකොට දැන සියලු රාජධර්මයන් සම්පූර්ණකොට ඉගෙණ මාවිසින් අවවාදානුශාසනාවූ පරිද්දෙන් පිළිපැද්ද

මැනමැයි මෙසේ මහ බෝසතාණෝ ආකාශ ගඞ්ගාව ගෙණහැරපාන කලෙක් පරිද්දෙන් සපිඬු විලාශයෙන් රජ්ජුරුවන්ට ධර්මදෙශනා කළාහ. මහජනයෝ මහබෝසතාණන් වහන්සේ කෙරෙහි පැහැද වස්ත්‍රාභරණයෙන් පූජාකොට බොහෝ සත්කාර සම්මාන කළහ. දහස් ගණන් සාධුකාරනාද පැවැත්වූහ

ඉක්බිති රජ්ජුරුවෝ සතුටුව අමාත්‍යයන්අතින් විචාරන්නාවූ පින්වත්වූ අමාත්‍යයෙනි, මාගේ පුතනුවන් තරුණ ජම්බුඵලයක් හා සමානවූ තුඩු ඇති ජම්බුක පණ්ඩිතයන් මෙසේ මට අවවාදානුශාසනාකොට ධර්මදෙශනා කරණ, තැනැත්තන් කවුරුන් කළමනාදෙය කරණලදැයි විචාරා දෙවයන්වහන්ස සෙනෙවිරදුන් විසින් කළමනාදෙය කරන්ට සුදුසුයයි කී කල්හි එසේ වීනම් උන්ට සෙනෙවිරත් තනතුරු දෙම්යි කියා ජම්බුකපණ්ඩිතයන්ට සෙනෙවිරත් තනතුරු දුන්හ. එතැන්පටන් මහබෝසතාණෝ සෙනෙවිරත් තනතුරෙහි සිටපිය රජ්ජුරුවන්ට කළමනා කාර්‍ය්‍ය කළාහ. පක්ෂීන් තුන්දෙනාට මහත්වූ සත්කාර සම්මානවිය. ඔහු තුන්දෙනා මහරජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළහ. මහබෝසතාණන්ගේ අවවාදයෙහි සිට රජ්ජුරුවෝ දානාදිවූ පින්කම්කොට ආයු කෙළවර කාබුන් මරණින් මත්තෙහි ගොස් ස්වර්ගලෝකයෙහි උපන්හ අමාත්‍යයෝ රජ්ජුරුවන්ට කළමනා ආදාහන කෘත්‍යයකොට එපවත් පක්ෂීන් තුන්දෙනාට කියා නැවත ජම්බුකයන්ට කියන්නාහු ස්වාමීනි, ජම්බුක නම් පක්ෂිරාජයාණන් වහන්ස, රජ්ජුරුවන් වහන්සේ, තුඹවහන්සේට ධවලච්ඡත්‍රය නංවා රාජ්‍යයෙහි අභිෂේක කරන්ට වදාළසේක්යැයි කීහ. එපවත් අසා මහබෝසතාණෝ කියන්නාහු මා තිරිසන්ව සිටි හෙයින් මනුෂ්‍ය රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත. තෙපි හැම අප්‍රමාදව රාජ්‍යය කරවයි කියා මහජනයා ශීලයෙහි පිහිටුවා මෙපරිද්දෙන් විනිශ්චය කොට වසවයි කියා අධිකරණශාස්ත්‍රා රන්පත දැහිගුලෙන් ලියවා රාජ්‍යභාණ්ඩාගාරයෙහි ලවා සියලු සත්ත්වයන්ට අවවාද අනුශාසනාකොට වනයට වන්න.

ජම්බුක පණ්ඩිතයන්ගේ අවවාදය සතළිස් දහසක් අවුරුදු මුළුල්ලෙහි පැවැත්තේය. ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ රජ්ජුරුවන්ට අවවාද වශයෙන් මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා තෙසකුණ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්දස්ථවිරයෝය. කුණ්ඩලී නම් උත්පලවර්ණා මහා ථෙරිය. වෙස්සන්තර පක්ෂියා නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි ජම්බුක පණ්ඩිතයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

512
ශරභඞ්ග ජාතකය

තවද වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ විසින් මුගලන්මහතෙරුන් වහන්සේගේ පරිනිර්වාණය අරභයා මේ ජාතකය වදාරණ ලද්දේය.

ඒ කෙසේද ? යත්

එක් දවසෙක්හි සැරියුත් මහතෙරුන් වහන්සේ ජේතවනාරාමයෙහි වසන්නාවූ සර්වඥයන් වහන්සේ සමීපයට ගොස් ස්වාමීනි මා පිරිනිවන් පාන පරිද්දෙදන් අනුදැන වදාළ මැනවැයි අනුදන්වාගෙණ නාලක ග්‍රාමයට ගොස් ජාතොවරකයෙහි තමන්වහන්සේ උපන් ගබඩාවෙහිදීම පිරිනිවන් පෑසේක. උන්වහන්සේ පිරිනිවන්පෑ බව බුදුහු අසා වදරා ජෙතවනාරාමයෙන් නික්ම රජගහනුවරට වැඩ වෙළුවනාරාමයෙහි වැඩවසන සේක.

එකලැ මුගලන් මහතෙරුන් වහන්සේ ඉසිගිලි පර්වත සමීපයෙහිවූ කාලසිලා නම් ගල්ලෙන වසනසේක. තෙරුන්වහන්සේ එනාංහි සෘද්ධියෙන් කෙළ පැමිණිහට අගනැන්පත්වීම හේතුකොටගෙණ දිව්‍යලෝකාදියෙහිද නරක යෙහිද සත්ත්වයන් විඳිනා සැප හා දුක් දකිමින් සැරිසරා ඇවිදිනාසේක එසේ ඇවිදිනාසේකත් සර්වඥ ශ්‍රාවකයන් දිව්‍යලෝකයෙහි විඳිනා ඓශ්වර්‍ය්‍යද තීර්ථක ශ්‍රාවකයන් නරකයෙහි විඳිනා මහ දුක්ද දැක මනුෂ්‍යලෝකයට අවුත් අසවල් උපාසකයෝද අසවල් උපාසිකාවෝද අසවල් දිව්‍යලෝකයෙහි ඉපද සම්පත් අනුභව කරන්නාහ. තීර්ථක ශ්‍රාවකයන් අතුරෙන් අසවලාද අසවලීද අසවල් නරකයෙහි ඉපද දුක් අනුභව කරන්නාහයි යනාදීන් පින් කළ සත්ත්වයන් විඳිනා සැපද අකුසල්කළ සත්ත්වයන් විඳිනා දුක්ද මනුෂ්‍යයන්ට වදාරණසේක ඒ ඇසූ සත්ත්වයෝ සර්වඥ ශාසනයෙහි ප්‍රසන්නවන්නාහ· තීර්ථකයන් දුරුකරන්නාහ. එකල සර්වඥ ශාසනයෙහි මහත්වූ සත්කාර පවත්නේය. තීර්ථකයන්ගේ සත්කාර පිරිහෙන්නේය. එකල්හි තීර්ථකයෝ මුගලන් මහතෙරුන් වහන්සේ කෙරෙහි ආඝාත බැඳ සිතන්නාහු මොහු ඇතිතෙක් දවසට අපගේ උපස්ථායකයෝ බිඳෙන්නාහ. සත්කාරද පිරිහෙන්නාහ. එසේහෙයින් මොහු මරම්හයි කියා තෙරුන් වහන්සේ මරණ පිණිස සමණකුත්ත නම්වූ සොරෙකුට අත්ලස්. පිණිස මසුරන් දහසක් දුන්හ. ඒ සොරාද තෙරුන්වහන්සේ මරම්හයි කියා මහත්වූ පිරිවරින් යුක්තව කාලසිලායට ගියේය. තෙරුන්වහන්සේ මරණ පිණිස එන්නාවූ ඒ සොරහු දැක සෘද්ධිබලයෙන් ආකාශයට නැගී වැඩපුසේක. සොරුද එදවස් තෙරුන්වහන්සේ නොදැක පලාගොස් දෙවෙනි දවස තුන්වෙනි දවසයයි කියා පිට පිට සදවසක් ආහ. තෙරුන් වහන්සේද සදවසක්ම ආකාශයෙන් වැඩපුසේක. සත්වෙනි දවස් තෙරුන් වහන්සේ විසින් යට ජාතියෙහි කරණලද අපරාපර්‍ය්‍යවේදනීය කර්මයෙන් අවකාශ ලද්දේයි.

ඒ කෙසේද? යත්

තෙරුන් වහන්සේ යට ජාතියෙහි එක් කුලයෙක්හි ඉපද භාර්‍ය්‍යාවූ ස්ත්‍රියකගේ බස් ගිවිස දෙමව්පියන් මරණු කැමැතිව රථයකට නගාගෙණ වලට ගෙණගොස් සොරු වටලාගත්තාක් මෙන් හඟවා දෙමව්පියන් මරන්ට තලන්ට පටන්ගත්හ. ගුරු දෙදෙනද ඇස් අඳ බැවින් පුතනුවන් බව දැනගත නොහී සොරහුයයි යන සංඥාවෙන් කියන්නාහු එම්බා පුත සොරහු අප වටලාගෙණ මරන්නාහ. තෙපි ඔවුන්ට අසු නොවී වහා දිවපියවයි කීහ. පුතනුවන්ටම අඬන්නාහ. එකලැ පුතනුවෝ සිතන්නාහු මේ දෙමව්පියෝ දෙදෙනා මා විසින් මරමින් සිටිය දී මා කෙරෙහි ශෝකයෙක් අඬන්නාහ. එසේ හෙයින් මා කරණ

ලද්දේ යුක්ත නොවෙයි කියා සොරුන් පලාගියාවූ ආකාරකොට තුමූ දුර සිට එත්තාක් මෙන් හගවා දෙමව්පියන් අස්වසමින් සමීපයට අවුදින් මෑණියෙනි. පියාණෙනි, නොබව මැනවයි කියා අත පය හඹා සොරහු පලාගියෝයයි කියා නැවතත් ගෙටම කැඳවා ගෙණ ගොස් ලූහ.

ඒ කලාවූ අකුසල කර්මය මෙතෙක් කල් අවසර නොලදින් අළුයට තුබූ ගිනිපුපුරක මෙන් තිබී මේ අනන්තිම ශරීරය දක්වා ලුහුබඳිමින් අවුත් මේ ස්ථානයෙහිදී පැමිණියේය. තෙරුවන් වහන්සේවද ඒ අකුසල කර්මබලයෙන් ආකාශයෙන් යන්ට අසමර්ථ වූ සේක.

ඒ එසේමැයි නන්දෝපනන්ද දමන වෛජයන්තප්‍රාසාද කම්පන ආදියෙහි පවා සමර්ථවූ උන්වහන්සේ අකුසල කර්මබලයෙන් දුර්වලකොට ආකාශයෙන් යා නුහුණේය. එකල්හි සොරහුද තෙරුන් වහන්සේ අල්වාගෙණ ඇට සුණුවිසුණු කොට තලා පිදුරු බිස්සක් පරිද්දෙන් අකුලා මලහයි යන සංඥාවෙන් සොර දෙටුවා හා සමඟ පිරිවැරීත් ගියේය. තෙරුන් වහන්සේද සිහිඑලවාගෙණ ධ්‍යාන වෙෂ්ටනයෙන් ශරීරය වෙළාගෙණ ආකාශයට පැනනැගී සර්වඥයන් වහන්සේ සමීපයට ගොස් වැඳ ස්වාමීනි, මා විසින් ආයුසංස්කාරය හරණ ලදහ. පිරිනිවන් පාමියි එසේ හෙයින් පරිනිර්වාණයට අනුදැන වදාල මැනවැයි කියා අනුදන්වා ගෙණ ඒ ස්ථානයෙහිදීම පරිනිර්වාණය කොට වදාළසේක. ඒක්ෂණයෙහි සදිව්‍ය ලෝකය දක්වා එකකොලාහලව දෙවියෝ හැම එක්ව අපගේ ආචාරීන්වහන්සේ පිරිනිවන් පෑ සේක්ලයි කියා දිව්‍යසුවඳ දිවමල් සඳුන් සුණු සුවඳ දුම් ආදියද නොයෙක් සුගන්ධදාරු භාණ්ඩයන් ගෙණ ආවාහුය. එකුන් සියයක් රියන් පමණ සඳුන් දරසෑය වූයේය. සර්වඥයෝද තෙරුන් වහන්සේ සමීපයෙහි සිට ආදාහන කෘත්‍ය කරවා වදාළසේක. ආදාහන භූමිය හාත්පසින් යොදුනක් පමණ තැන් මල්වැසි වටුවූයේය. මනුෂ්‍යයන් අතුරෙහි දෙවියෝ යයි අතුරක් නැතිව සත්දවසක් මුළුල්ලෙහි සාධුක්‍රීඩාවෙන් යෙදී ආදාහන කළාහ. සර්වඥයන් වහන්සේ මුගලන් මහතෙරුන් වහන්සේගේ ධාතු පිණ්ඩවා වේළුවනාරාම දොරටුව සමීපයෙහි දාගැබක් බැන්දූ සේක. එදවස් දම්සභා මණ්ඩපයෙහි රැස්ව හුන් භික්ෂූන් වහන්සේ ඔවුනොවුන් වහන්සේට ආමන්ත්‍රණය කොට එම්බා ඇවැත්නි ශාරිපුත්‍රස්ථවිරයෝ සර්වඥයන් වහන්සේ සමීපයෙහිදී පිරිනිවන් නොපෑ හෙයින් බුදුන්ගේ සත්කාර සම්මාන නොලත්හ. මහා මොග්ගල්ලාන ස්ථවිරයෝ වනාහී සර්වඥයන් සමීපයෙහිදී පරිනිර්වාණය කළ හෙයින් මහත්වූ සත්කාර සම්මාන ලදහයි යනාදීවූ කථා කොට කොට උන්සේක.

එකල සර්වඥයන් වහන්සේ ඒ බව දිව්‍යකර්ණයෙන් අසා වදාරා තුන්තරා ගම නින් එක්තරා ගමනකින් වැඩ දම්සභා මණ්ඩපයෙහි පණවනලද බුද්ධාසනමස්තකයෙහි යුගන්ධර මුදුනෙහි දිලියෙන හිරු මඬලක් මෙන් දිලිහිදිලිගී වැඩහිඳ සත් හුන්ව උන්නාවූ භික්ෂූන් පිරිසද බලා වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උන්නුදැයි කිනම් කථාවෙක් නොපට අඩාල වීදැයි විචාරා වදාලසේක. එක්ව වැඩහුන් භික්ෂූන් අතුරෙන් එක්තරා භික්ෂු කෙණෙකුන් වහන්සේ හුනස්නෙන් නැගීසිට සුපිළිපන්නව හැඳ පෙරව ඵලභාරයෙන් නම්නවූ කදලි වෘක්ෂයක් පරිද්දෙන් බුදුන් දිසාවට බද්ධාංජලීව නැමී සිට කියන සේක් ස්වාමීනි ත්‍රිලෝගුරු බුදුරජාණන් වහන්ස, නුඹවහන්සේ විසින් නො කියන්ට වදාරණ ලද්දවූ දෙතිස් කථාවෙකින් යුක්තව උනුමෝ නොවම්හ. මොග්ගල්ලාන ස්ථවිරයන් නුඹවහන්සේගෙන් ලබන ලද සත්කාර මා හැකි

තියාව කිය කියා උතුම්හයි කීකල්හි සර්වඥවරයෝ වදාරණසේක් එම්බා මහණෙනි, මේ මුගලන් මහතෙරුන් සත්කාර ලද්දේ දැන් මතු නොවෙයි. පළමුත් ලද්දේම වේදැයි වදාරා ඒ භික්ෂූන් වහන්සේ විසින් අරාධිතවූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද ? යත්

එම්බා මහණෙනි, යටගිය දවස බරණැස් නුවර බ්‍රහමදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතානෝ පුරෝහිත බ්‍රාහමණයාගේ ගෙයි බැමිණිය කුස පිළිසිඳගෙණ දසඑකඩමසක් ඇවෑමෙන් මවුකුසින් බිහිවූහ. ඒක්ෂණයෙහි දොළොස් යොදුන් පමණ ඇති බරණැස් නුවර මුලුල්ලෙහි සියලුම ආයුධයෝ තුබූ ස්ථානයෙහිම දිලිහී ගියාහ. එකල පුරෝහිතයානෝ පුතනුවන් උපන් වේලෙහි ප්‍රාසාදයෙන් පිටත්ව ආකාශය බැලි තැනැත්තේ නක්ෂත්‍රයොගයක් දැක මේ නක්ෂත්‍ර යොගයෙන් උපන් හෙයින් මේ කුමාරයෝ සියලු ජම්බුවීපයේ දුනුවායන්ට අග්‍ර වන්නාහයි දැන උදෑසනක්සේම රජගෙට ගොස් රජ්ජුරුවන් අතින් කිමෙක්ද? දේවයන් වහන්ස, රාත්‍රි සෙය්‍යාව සැපසේවිසූදැයි විචාරා රජ්ජුරුවන් විසින් ආචාරීනි මට සැපයක් නම් කොයින්ද අද දවස් අපගේ මේ සියලු රජගෙයි ආයුධයෝ එකපැහැර දිලිහුනේය. ඊට කාරණා කිම්දැයි යනහොත් අද අපගේ ගෙයි කුමාරයෙක් උපන්නේය. එසේ හෙයින් මේ ආයුධ දිලිහුනේයයි කීහ.

එකල රජ්ජුරුවෝ ආචාරීනි, එසේ උපන්නාවූ කුමාරයාහට කිමෙක් වේදැයි කීහ. එකල පුරෝහිතයානෝ රජ්ජුරුවන් වහන්ස, ඕහට වන්නාවූ කිසි උපද්‍රවයක් නැත. බල එකෙක් නම් ඒ කුමාරයෝ සියලු ජම්බුවීපයෙහි දුනුවායන්ට අග්‍රවන්නාහයි කීහ. එකල රජ්ජුරුවෝ යහපත ආචාරීනි, එසේවී නම් කුමාරයන් සුරක්ෂිතකොට වැඩිවිය පැමිණි කල්හි කැඳවාගෙණ අවුත් අප දක්වාලවයි කිරි මිල පිණිස මසුරන් දහසක් දී යැවූහ. එකල පුරෝහිතයා මසුරන් දහස ගෙණ ගොස් කුමාරයන් පොෂ්‍ය කෙරෙමින් නම් තබන දවස් උපන් වේලෙහි සියලු ආයුධයන් දිලිහුනුබැවින් ජෝතිපාල කුමාරයෝයයි නම් තුබූහ. එකල කුමාරයෝද මහත් පෙරහරින් වැඩෙන්නාහු සොළොස් ඇවිරිදිකල උතුම්වූ රූපශ්‍රීයට පැමිණියාහ. ඉක්බිත්තෙන් පියානෝ පුතනුවන්ගේ රූපශ්‍රී දැක කියන්නාහු එම්බා පුත තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි ශිල්ප ශාස්ත්‍ර ඉගෙණ එවයි කීහ. එකල කුමාරයෝ පියානන් කීබස් යහපතැයි පිළිගෙණ ආචාරි භාගයට දහසින් බැඳිපියල්ලක් ගෙණ දෙමව්පියන්ට වැඳ සමුගෙණ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් ආචාරිභාගය දී ශිල්ප උගන්ට පටන්ගෙණ සතියක් ඇතුළත ශාස්ත්‍රයාගේ පරතෙරට පැමිණියාහ.

එකල දිසාපාමොක් ආචාරීද ජොතිපාල කුමාරයන් කෙරෙහි පැහැද තමන් සන්තකවූ ඛඩ්ගරත්නයද සඬි ඇති මැඩ හඟු දුන්නක්ද එසේම සඬි ඉයවුරක්ද තමන් ඇඟ බඳන ලද්දාවූ සන්නාහයක්ද නලල්පටක්ද දී කියන්නාහු එම්බා ජොතිපාල කුමාරයෙනි මම වෘඬව ගියෙමි. දැන් තෙපි මේ මානවකයන් හික්මවා ශාස්ත්‍ර උගන්වයි කියා පන්සියයක් මානවකයන් පාවා දුන්හ. බොධිසත්ත්වයෝද ඒ සියල්ලම ගෙණ ආචාරීන් වැඳ සමුගෙණ නැවතත් බරණැස් නුවරටම අමුත් වන්හ. ඉක්බිත්තෙන් දැක වැඳ සිටියාවූ කුමාරයන් වැඳ

පියාණෝ කියන්නාහු තොප විසින් ශිල්ප ශාස්ත්‍ර උගන්නා ලද්දේදැයි කීහ. එකල කුමාරයෝද එසේය. පියාණන්වහන්ස, මා විසින් සියලුම ශිල්ප උගන්නා ලදැයි කීහ. පුරෝහිතයෝද ඔවුන් කී බස් රජගෙට ගොස් දේවයන් වහන්ස, මාගේ දරුවන් විසින් ශිල්පශාස්ත්‍ර ඉගෙණ එනලද උන් විසින් කුමක් කරන්ට වටනේදැයි කීහ, රජ්ජුරුවෝ කියන්නාහු අපට උපස්ථාන කෙරෙත්වයි කීහ. එසේවී නම් දෙවයන් වහන්ස, කුමාරයන්ට වැටුප් දන වදාළ මැනවැයි කීහ.

රජ්ජුරුවෝ කියන්නාහු ආචාරිති කුමාරයෝ දවස දහසක් ලබත්වයි කීහ. පුරෝහිතයෝද ඒ බව යහපතැයි ගිවිස ගෙට ගොස් කුමාරයන් කැඳවා එම්බා පුත අද පටන් රජ්ජුරුවන්වහන්සේට උපස්ථාන කරවයි සම්මතකළහ, ජොතිපාල කුමාරයෝද එදවස් පටන් දවස දහසක් වෘතති ලැබ රජ්ජුරුවන්ට උපස්ථාන කරන්නාහ. එකල අවශෙෂ රාජසේවකයෝ එක්ව අපි හැම ජොතිපාල කුමාරයන් විසින් කරණ ලද කටයුත්තක් නුදුටු විරූම්හ. එසේ බව මිස දවස දහසක් වෘත්ති ලැබෙති. එසේ හෙයින් අපි ඇම උන්ගේ ශිල්ප දක්නා කැමැත්තම්හයි කීහ. රජ්ජුරුවෝ ඔවුන් ඇමදෙනාගේ බස් අසා පුරෝහිතයන්ට කීහ. ඔහු යහපතැයි ඒ බව ජොතිපාල කුමාරයන්ට කීහ. ඒ කුමාරයෝද කියන්නාහු යහපත පියාණන් වහන්ස, අදට සත්වෙනි දවස් මම ශිල්ප දක්වමි. රජ්ජුරුවන් වහන්සේ තමන්වහන්සේගේ සියලු දුනුවායන් රැස් කරණ සේක්වයි කීහ.

පුරෝහිතයෝද ඒ බව රජ්ජුරුවන්ට දන්වූහ, රජ්ජුරුවෝ නුවර බෙර පියවි කරවා සැටදහසක් පමණ දුනුවායන් රැස්කරවූහ. ඒ බව අසා සියලු නුවර වාසීහු ජොතිපාල කුමාරයන්ගේ ශිල්ප දකින්ට එන්වයි කියා නුවර බෙරපියවි කරවා රාජාඞ්ගනය අලඞ්කෘතකොට සරසා රජ යුවරජ ඇමති මඩුලු පිරිවරා උතුම්වූ සිංහාසනයේ හිඳ දුනුවායන් එකතැන් කරවා ජොතිපාල කුමාරයෝ එත්වයි කියා යවූහ. එකල කුමාරයෝද තමන්ගේ ගුරුන් විසින් දෙනලද දුන් තය ඉයවුරය සන්නාහය තලල්පටය යන මේ සියල්ලම යට ඉණ තබාගෙණ කඩුව ගෙන්වාගෙණ පියවි සවභාවයෙන්ම රජ්ජුරුවන් සමීපයටගොස් වැඳ එකත්පස්ව සිටියාහ. එකල දුනුවායෝ එක්ව ජොතිපාල කුමාරයෝ ධනුශ් ශිල්පය දක්වන්ට එන්නාහු දුනක් නොගෙණා හෙයින අප අතින් දුන්නක් ඉල්වන කැමැත්තෝවන අපි ඔවුන්ට දුනු නොදෙම්හයි ඔවුනොවුන් හා සමඟ කතිකාවක් කළාහුය. රජ්ජුරුවෝ ජොතිපාල කුමාරයන් සමීපයට කැඳවා එම්බා දරුවෙනි, ශිල්ප දක්වවයි කීහ. ජොතිපාල කුමාරයෝද යහපතැයි කඩ තුරාවක් වටකරවා කඩතිරය ඇතුළෙහි සිට සන්නාහසන්නද්ධව තලල්පටබැඳ මැඩහගු දුන්නෙහි පබලුවන්වූ දුනුදියක් තගා ඉයවුරපිට බැඳ කඩුව වම්උරයේ එල්වා විදුරු අක්ඇති නාරාවනයක් නියපිට තටවමින් කඩතිරය පහකොට පොළොව පලා නැගි අලංකෘතවූ නාගමානවකයෙකු පරිද්දෙන් ගොස් රජ්ජුරුවන්ට ආදර දක්වා සිටියාහ. ඒ බව දුටුවාවූ මහජනයෝ මුළු මුළුවගෙණ අත් පොළසන් දෙමින් ඔල්වරසන් දෙන්ට පටන්ගත්හ. එසඳ රජ්ජුරුවෝ සිල්ප දක්වව ජොතිපාල කුමාරයෙනි කීහ. කුමාරයෝ කියන්නාහු දෙවයන්වහන්ස නුඹවහන්සේගේ දුනුවායන් අතුරෙන් අක්ෂණ වෙධිය වාලවෙධිය ශබ්ද වෙධිය ශරවෙධීයයි යන සතර පක්ෂයෙහි දුනුවායන් සතරදෙනෙකු ගෙන්වූව මැනවයි කීහ. රජ්ජුරුවෝද යහපත ඒ බව දුනුවායන් සතරදෙනෙකු ගෙන්වූහ.

එකල බෝධිසත්ත්වයෝ රාජාඞ්ගනයෙහි සතරැස් පරිච්ඡේදය ඇතුළත මණ්ඩපයක් කරවා සතරකොන ඒ දුනුවායන් සතරදෙනා සිටුවා එකී එකී දුනුවායෙකුට තිස්දහසක් ඊදඬු ලවා ඊදඬු දෙන පරිද්දෙන් පුරුෂයන් සතරදෙනා ලඟ සිටුවා තුමූ විදුරු පිරූ අක්ඇති නාරාචනයක් අතින් ගෙණ මණ්ඩප මධ්‍යයෙහි සිට කියන්නාහු රජ්ජුරුවන්වහන්ස, මේ දුනුවායෝ සතරදෙන එකවිටම සැරයක් හැර මා විදින්වයි මම මොවුන් විසින් විදිනාලද සැරයන් වලකම්හ කීහ. රජ්ජුරුවෝද යහපත එපරිද්දෙන්ම කෙරෙත්වයි කීහ. එකල දුනුවායෝ කියන්නාහු රජ්ජුරුවන්වහන්ස, අපි අක්ෂණවෙධි වාලවෙධි ශබ්දවෙධි ශරවෙධි යයි යන දුනුවායෝ සතරදෙන වම්හ. ජෝතිපාල කුමාරයෝ තරුණ පුරුෂව සිටියාහ. එසේ හෙයින් අපි නොවිදුම්හයි කීහ.

එකල බෝධිසත්ත්වයෝ එසේ නොකියා තෙපි සමර්ථවීනම් මා විදපියවයි කීහ එකල ඔහු සතරදෙනම එකවිටම විදින්ට පටන්ගත්හ. බෝධිසත්ත්වයෝද විදින්නාවූ නාරාචනයෙන් සැරයන් ගසා එසේ මෙසේ නොවිසුරුවා බෝධි කොටුවක් පරිද්දෙන් තමන් වටකොට මූණයෙන් මූණය දණ්ඩෙන් දණ්ඩ පත් කඞින් පත්කඞද නොයික්මවා සරිකොට ගසා වගුරුවා ශරගෘහයක් කළාහ. එසේ දුනුවායන් ඊදඬු නිමාගිය බවදැන සරගබඩාව නොවිදම උඩට පැන රජ්ජුරුවන් සමීපයට ගොස් සිටියාහ. එකල මහජනයෝ අත්පොළසන් දී ඔල්වර හඬ ගසමින් තම තමන් වහන් පලන් වස්ත්‍රාභරණ බෝධිසත්ත්වයන් ඉදිරියට දමන්ට වන්හ.

මෙසේ දමන ලද්දවූ වස්තු අටළොස්කෙළක් වූයේය. එකල රජ්ජුරුවෝ ජෝතිපාල කුමාරයෙනි, මේ කිනම් ශිල්පයෙක්ද? යි විචාළාහ. රජ්ජුරුවන් වහන්ස, මේ ශර ප්‍රතිභාග නමැයි කීහ. නැවතද රජ්ජුරුවෝ අනිකුත් මේ ශිල්පය දන්නෝ ඇද්දැයි කීහ. කුමාරයෝ කියන්නාහු රජ්ජුරුවන් වහන්ස මේ සියලු ජම්බුද්වීපයෙහි මා හැර අනික් දන්නාකෙණෙක් නැතැයි කීහ. එසේවී නම් පුත අනික් ශිල්පයක් දක්වවයිකීහ එකල කුමාරයෝ කියන්නාහු රජ්ජුරුවන්වහන්ස මොහු සතරදෙනෙක් කැටව සතරකොණ සිටත් මා විදගත නුහුනවාහුය. මම වනාහී සතරකොණ සිටිය මොවුන් සතරදෙනාම එක ශරයෙන් විදිම් කීහ. එකල දුනුවායෝ සිටින්ට අසමර්ථවූහ. බෝධිසත්ත්වයෝ සතර සතරකොණ කෙහෙල්කඳ සතරක් හිඳුවා ගී පගිලියෙහි රත්පලස් හූයක් බැඳවා ඉන් එක් කෙහෙල් කඳකට විද්දාහ. එසැරයද කෙහෙල්කඳ විදගෙණ දෙවෙනි කඳය තුන්වෙනි කඳය සතරවෙනි කඳය දක්වා විද නැවතත් පළමු විදුන කෙහෙල්කඳ විදගෙණ මහබෝසතාණන්ගේ අත්හිම පිහිටියේය. කෙහෙල් කඳවල් රත්හුයින් වට කරණ ලදුව සිටියේය. එසඳ මහජනයෝ දහස් ගණන් ඔල්වරසන් හඬගැසූහ. රජ්ජුරුවෝද කිනම් ශිල්පයෙක්ද පුතැයි විචාළාහ දෙවයන් වහන්ස, චක්‍ර නම් ධනුස් විදමැනවැයි කීහ. රජ්ජුරුවෝ පුත අනිකුත් සිල්පයක් දක්වයි කීහ.

තවද බෝධිසත්ත්වයෝ ශරලබ්ධි නම්වූද ශරඅජ්ජුන නම්වූද ශරවෙනී නම්වූද ශරප්‍රාසාද නම්වූද ශරමණ්ඩපනම්වූද ශරසෝපාන නම්වූද ශරපුෂ්කර නම්වූද ශරපදුමවූද සිල්පයන් දැක්වීය. මෙසේ අන්‍යයන් හා සාධාරණ නොවන්නාවූද අසදෘශවූ මේ ධනුස් ශිල්පයන් දෙළොස් දෙන දක්වා නැවත අනුන් සාධාරණ නොවන්නාවූ මහවස්තූන් සත්දෙනෙකු පළාවිද්දේය. ඒ කවරේද? අටඟුල් පමණ ඝන ඇති දිඹුල් පෝරුවක්ද සතරඟුල් බොල දැති පියංගසු

හරයක් ද දුහුල් බොල ඇති තඹපටක්ද අටගල් බොලඇති යපටක්ද මෙපිටින් එපිටින් විද්දේය. එක්ව බැඳි පෝරු සියයක්ද විද්දේය. පිදුරු පිරූ ගැලක්ද වැලිපිරූ ගැලක්ද දඹුපිරූ ගැලක්ද යන මොවුන් ඉදිරියෙන් සැර විද පශ්චාත් භාගයෙන් නික්මවූයේය. පශ්චාත්භාගයෙන් විද දෙවෙනිව පූර්වභාගයෙන් නික්මවූයේය. දියෙන් සතර ඉස්බක්ද ගොඩින් අටඉස්බක් තැන්ද ශරය විද බැඳ එල්වාලූ බටුගෙඩිය සංඥාවෙන් ඉස්බක් පමණ උඩදී අස්ලොම පලා විද්දේය. මෙතෙක් ශිල්පයන් ඔහු දක්වමින් සිටියදී හිරු අස්තයට ගියේය.

ඉක්බිත්තෙන් ඔහට රජ්ජුරුවෝ සෙනෙවිරත් තනතුර දෙමැයි නියම කොට ජෝතිපාල කුමාරයෙනි, අද වෙලානොවෙයි සෙටදවස් සෙනෙවිරත් තනතුරු ගණුව දලිරැවුල කපා ස්නානයකොට එවයි කියා එදවස් වියදමට ලක්ෂයක් දුන්නාහ. බොධිසත්ත්වයෝත් මෙයින් මට ප්‍රයෝජන නැතැයි සතුටු පඬුරු පිණිස ඒ ඒ දෙනාගෙන් තමන්ලත් අටළොස්කෙළක් වස්තූන් දුන් දුන් උන්ටම දී මහත් පෙළහරින් නාන්ට ගොස් දලිරැවුලු කපා ස්නානයකොට සර්වාලංකාරයෙන් සැරහුනේය. ශ්‍රීසෞභාග්‍යයෙන් තමන්ගේ භවනයට වැද නොයෙක් රසයෙන් යුක්ත ආහාරය අනුභවකොට ශ්‍රීයහන් මස්තකයට නැගී වැදහොත් තැනැත්තෝ ප්‍රථමයාම මධ්‍යමයාම දෙක්හි සැතපී නිඳ පශ්චිමයාමයෙහි පිබිද උභරුබඩාසන බැඳ ශ්‍රීයහන් මස්තකයෙහි වැඩහිඳ තමන් දන්නාවූ ශිල්පයෙහි ආදියත් මධ්‍යයත් කෙළවරත් වෙනම බලා මාගේ ශිල්පයාගේ ආදිය අනුන්ගේ මියයාම පෙණෙන්නේය. මධ්‍යයෙහි වස්තුකාම ක්ලේශකාමයන්ගේ අනුභවය පෙණෙන්නේය. කෙළවර නරකොත්පත්තිය පෙණෙන්නේය. ප්‍රාණඝාත කිරීම් ක්ලේශ පරිභොග නිමිත්තකොටගෙණ අතිකම්නුවූ ප්‍රමාදයෙන් නරකයෙහි ප්‍රතිසන්ධිදෙන්නේය. රජ්ජුරුවන්වහන්සේ විසින් මට සෙනෙවිරත් තනතුරු දීමෙන් බෝවූ ඓශ්වර්‍ය වන්නේය. භාර්‍ය්‍යාවෝද දූදරුවෝද බොහෝ වන්නාහ. ක්ලේශවස්තු නමුදු විපුලත්වයට පැමිණියේය. පසුවට හැරලිය නොහැක්කේය දැන්ම ගිහිගෙන් නික්ම උදකලාවම වලටවැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වන්නට මට සුදුසුයයි යහන් මස්තකයෙහි නැගී සිට කිසිවක්හටත් නොහඟවා ප්‍රාසාදයෙන් බැස මහදොරකඩින් නික්ම උදකලාව වනයට වැද ගොධාවරී නම් ගංතෙර තුන්යොදුනක් පමණ ඇතිවූ දිවුලුවනයක්නිසා නික්මූනේය. බොධිසත්ත්වයන් තපසට නික්මුනු බව දැන ශක්‍රදේවේන්ද්‍රයෝ විශ්වකර්ම නම් දිව්‍යපුත්‍රයා කැඳවාලා විශ්වකර්මය, ජෝතිපාලකුමාරයන් ගෘහාභිනිෂ්ක්‍රමණය කෙළේය. මහත්වූ සමාගම වන්නේය ගොධාවරී නම් ගංතෙර ගිවුළුවනයෙහි පන්සලක් මවා ශ්‍රමණ පරිෂ්කාරයන්ද මවාදීලවයි කීයේය. ඒ විශ්වකර්ම දිව්‍ය පුත්‍රද ශක්‍රයන්ගෙන් ලත් මෙහෙවර නියාවට කෙළේය.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝද ඒ ස්ථානයට පැමිණ එක්පියවර සට හන් මාර්ගය දැක තපස්වින් වසන්නාවූ ස්ථානයක් වියයුතුයයි ඒ මාර්ගයෙන් ගොස් කිසිකෙණෙකුන් නොදැක පන්සලට වැද තවුස් පිරිකර දැක සක්දෙව්රජ මා තපසට නික්මුනුකල් නියාව දන්වනැයි සිතා හන්සළුව ගලවා රත්වැහැරි සිවුරු හැඳ පෙරව අඳුන් දිවිසන් ඒකාන්සයෙක්හි කොට දළම්ඹුලු බැඳ තවුස් පිරිකර කරට නඟා සැරයටියක් අතින්ගෙණ පර්ණශාලාවෙන් නික්ම සක්මන් මලුවෙහි කීපවිටක් ඇතමැත සක්මන්කොට තවුස් වේශයෙන් වනය හොබවමින් කීසුනු පැවිදිවූ සත්වැනි දවස් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවාගෙණ

වනමූල් ඵලාහාරයෙන් යපෙමින් උදකලාවම වාසයකරන්නාහ. එකල දෙමව් පියෝද ඉතා මිත්‍රයෝද අවශෙෂ ඥාතිමිත්‍ර වර්ගයාද යන මේ සියල්ලෝම බොධිසත්ත්වයන් නොදක්‍ක අඬමින් වැලපෙමින් ඇවිදින්නාහ. එකල එක් වැද්දෙක් කපිට්ඨනම්වූ වනයටගියේය. ආශ්‍රමයෙහි වසන්නාවූ බොධිසත්ත්වයන් දක ඇඳිනගෙණ ගොස් දෙමව්පියන්ට කීයේය. ඔහු රජ්ජුරුවන්ට දන්වූහ. රජ්ජුරුවෝද එබසසා යහපත උන් දක්නා පරිද්දෙන් යම්හයි කියා බොධිසත්ත්වයන්ගේ දෙමව්පියන් කැඳවාගෙණ මහජනයා පිරිවරා වනවරයෝ විසින් කියනලද මාර්ගයෙන් ගොස් ගොධාවරීනම් ගංතෙරට පැමිණියාහ.

බොධිසත්ත්වයෝද ඉදිරි යනකොට ඇති සියලුම පර්ෂත්ද ඍෂි ප්‍රව්‍රජ්‍යා වෙන් පැවිදිවූහ. බොධිසත්ත්වයෝ ඉසිගණයා විසින් පිරිවරණලදුව ඒ ස්ථාන යෙහිම වාසයකරන්නාහ. එකල බොධිසත්ත්වයන් එහි වසන බව සියලු ජම්බුද්වීපයෙහි ප්‍රකාශවූයේය. ජම්බුද්වීපවාසීහු රජදරුවෝ රාජ්‍යවාසීන් හා සමග අවුත් බොධිසත්ත්වයන් සමීපයෙහි බොහෝසේ මහණවන්නාහ. එකල මහත්වූ සමාගම්ය වූයේය. අනුක්‍රමයෙන් නොයෙක් දහස්ගණන් පමණ තපස්වී පර්ෂද වූහ. ඔවුන් අතුරෙන් යමෙක් තෙම කාමවිතර්කීයෙක් වේවයි ව්‍යාපාදවිතර්කී යෙක් වේවයි විහිංසාවිතර්කීයෙක් වේවයි විතර්කී කෙළේ වීනම් එකල මහබෝ සතානෝ ගොස් ඔහු ඉදිරියෙ ආකාශයෙහි හිඳ ධර්මදේශනා කරන්නාහ. කිසනු පිරියම්ද කරන්නාහ. ඔහුද බොධිසත්ත්වයන්ගේ අවවාදයෙහි පිහිටා සමාපත්ති උපදවාගෙණ වාසයකරන්නාහ. මෙසේ වසන්නාවූ තාපසවරුන් අතුරෙන් සාලිස්සරය මෙධිස්සරය පර්වතය කාලදෙවලය කිශවච්ඡය අනුසිස්සය නාරදය යි බොධිසත්ත්වයන් සමීපයෙහි ජ්‍යෙෂ්ඨවූ අනවැසි තපස්විවරුන් සත්දෙනෙක් වසන්නාහුය. එයින් මැනභාගයෙහි කපිට්ඨ නම්වූ වසන තපස්විවරයන් වසන්ට නොපොහොනා පරිද්දෙන් තපස්විවරයන්ගෙන් පිරුණේය ඉක්බිති බොධිසත්ත්වයෝ සාලිස්සර නම් තපස්වීන්ට කියන්නාහු එම්බා සාලිස්සරයෙනි මේ ආශ්‍රමය තපස්වි වනයට නොසෑහෙන්නේය. එසේහෙයින් තෙපි මේ ගණයා කැඳවාගෙණ පජ්ජොත නම් රජ්ජුරුවන්ගේ විජිතයෙහි ලම්බචූලක නම් නියම් ගම ගොදුරුගම් කොට වාසයකරවයි කීහ ඔහුද බොධිසත්ත්වයන් කී බස් මුදුනෙන් පිළිගෙණ නොයෙක් දහස්ගණන් තපස්වි සමූහයා කැඳවාගෙණ ඒ කීවාවූ ස්ථානයට ගොස් වාසයකරන්නාහුය.

තවද බොහෝ මනුෂ්‍යයන් අවුදින් මහණවීම හෙතුකොටගෙණ ඒ කපිට්ඨ නම්වූ වනය පළමු පරිද්දෙන් පිරුණේය. එකල මහබොධිසත්ත්වයෝ මෙධිස්සර තපස්වීන් කැඳවා කියන්නාහු එම්බා මෙධිස්සරයෙනි, තෙපි ඍෂි ගණයා කැඳවාගෙණ ගොස් සුරට්ඨාන නම් ජනපද සීමාවෙහි සාතොදිකා නම් ගංතෙර වසවයි කීහ. ඔහු එපරිද්දෙන් ගොස් වාසයකරන්නාහුය. මෙම ක්‍රමයෙන් තුන්වෙනි වාරයෙහි පර්වත නම් තපස්වීන් මහාවනයෙහි අඤ්ජන නම් පර්වතය නිසා වාසයකරවයි කියා යවූහ. සතරවෙනි වාරයෙහි කාලදෙවල නම් තාපසයන් දක්ෂිණපථයෙහි අවන්ති නම් රට ඝනසේන නම් පර්වතය නිසා වාසය කරවයි කියා යවූහ. නැවත පළමු පරිද්දෙන් කපිට්ඨ නම් වනය නොයෙක් දහස්ගණන් ඍෂිගණයා විසින් පිරුණේය. එකල කිසවච්ඡ තාප සයෝ එබස පිළිවිස දණ්ඩකී නම් රජ්ජුරුවන්ගේ විජිතයෙහි කුම්භවතී නම් නුවර සෙනෙවිරදුන් උපාසකකොට වාසය කරන්නාහ

නාරද නම් තාපසයෝ මධ්‍යදේශයෙහි අරඤ්ජගිරි නම් පර්වතාන්තයෙහි වාසය කරන්නාහ. අනුශිෂ්‍ය නම් තාපසයෝ වනාහි බෝසතානන් සමීප යෙහි වාසය කරන්නාහ. එකල දණ්ඩකී නම් රජ්ජුරුවන්ගේ රට ලබන ලද සත්කාර සම්මාන ඇති වෛශ්‍යාවක් තනතුරෙන් පිරිහුනුහ. ඕතොමෝ තමාගේ වෛශ්‍යාධර්මය ඇඳින, ඒ තැනැත්තී රජ්ජුරුවන්ගේ උයනට ගොස් කිසවච්ඡ නම් තාපසයන් දැක මෙතෙම කාලකන්නියෙක් වන්නේය. මොහුගේ ශරීර යෙහි පාපප්‍රවාහ කොට ඉස්සෝධා නහා යෙමි කියා දැහැටි දඬු කා ඇමට පළමු බොලවූ කෙළ දමන්නී කිශවච්ඡ තාපසයන්ගේ ජටාන්තරයට දමා දැහැටි පොතු ඉසට දමා තොමෝ ඉස්සෝධා නහා ගියාය.

රජ්ජුරුවෝද එදවස් කිසිකාරණයකින් ඒ වෛශ්‍යාස්ත්‍රිය සිහිකොට ඇගෙ පළමු ස්ථානාන්තරයෙහි පිහිටවූහ. එකල මෝහයෙන් මුසවූ වෛශ්‍යා ස්ත්‍රීතොම කාලකන්නිහුගේ ශරීරයෙහි පාපප්‍රවාහ කොට මේ යසස ලද්දේයයි සිතුව තවද ඊ සිටි නොබෝකලකින් රජ්ජුරුවෝ පුරෝහිතයන්ද තනතුරෙන් පිරිහෙළූහ පුරෝහිතයෝ වෛශ්‍යාව සමීපයට ගොස් විචාරන්නාහු එම්බල වෛශ්‍යාව, තෝ කවර කාරණයකින් නැවත තිගේ ස්ථානාන්තරයට පැමිණියේ දැයි විචාළාහ.

ඉක්බිති ඕතොමෝ කියන්නී රජ්ජුරුවන්ගේ උයනෙහි වසන්නාවූ කාලකන්නි තාපසයන්ගේ ශරීරයෙහි පාපප්‍රවාහ කොට ගියෙමි කීහ. ඔහුද එලෙස කොට ඉස්සෝධා නහා ගියහ. එදවස් රජ්ජුරුවෝ කිසි කටයුත්තක් නිසා ඔහු මතක්කොට පළමු පරිද්දෙන්ම තනතුරෙහි පිහිටවූහ. ඉක්බිත්තෙන් මෑතභාගයෙහි රජ්ජුරුවන්ගේ පසල්දනව් කුපිතවූයේය. රජ්ජුරුවෝ සිව්රඟ සෙනඟින් යුක්තව යුඬයට නික්මුනාහ. එකල මෝහයෙන් මුසවූ පුරෝහිත තෙම රජ්ජුරුවන්වහන්ස, නුඹවහන්සේ ජය කැමතිසේක්ද පරාජය කැමති සේක්දැයි විචාරා ජය කැමැත්තෙමි කී කල්හි නුඹවහන්සේගේ උයනෙහි කාලකන්නි තාපසයෙක් වෙසෙයි. ඔහුගේ ශරීරයෙහි පාපප්‍රවාහ කොට ගිය මැනවයි කීයේය. රජ්ජුරුවෝද ඔහු කීබස් ගිවිස මග යන්නාවූ සියලු සේනාවම උයනෙ වසන්නාවූ කාලකන්නිහුගේ ශරීරයෙහි පාපප්‍රවාහ කොට යෙත්වයි නියෝගකොට උයනට වැද ඇමට පළමුකොට දැහැටිපොතුද කෙළද තපස් වියාගේ ජටාන්තරයෙහිලා ඉස්සෝද නෑහ. රජ්ජුරුවන්ගේ සිව්රඟ සෙනඟ එපරිද්දෙන්ම කළාහ.

මෙසේ ඔවුන් හැමදෙනාම ගියකල්හි සෙනෙවිරදු තාපසයන් සමීපයට අවුත් ඒ බව දැක දැහැටි පොතු ආදිය හැර මනාකොට නහවා විචාරන්නාහු තාපසයන්වහන්ස, මෙසේවූ දුෂ්ටකම් කළාවූ රජ්ජුරුවන්ට කුමක්වේදැයි විචාරා තාපසයන් විසින් එම්බා උපාසකයෙනි, මාගේ වනාහි චිත්තාදූෂයක් මෙතෙකින් නැත. බල එකොක්නම් දෙවියෝ කිපී ගියාහ. එසේහෙයින් මීට සත්වෙනි දවස් මේ සියලු රටම නැසී නොරට වන්නේය. එසේහෙයින් තෙපි වහා අන්‍ය ස්ථානයකට යවයි කීහ. සෙනෙවිරදුද භයපත්ව වහා ගොස් රජ්ජුරුවන්ට දැන්වූය, රජ්ජුරුවෝ සෙනෙවිරදුන්ගේ බස් නො ගිවිස්සාහ. යහපතැයි සෙනෙවිරදුතුමත් ගෙයින් ගොස් පුත්‍රදාරාදීන් කැඳවා ගෙණ පලාගියාහ. එකල ශරභඞ්ග ශාස්තෘන්වහන්සේ ඒ බව දැන ලදරුවූ තාපසවරුන් දෙන්නෙක් යවා කිශවච්ඡ තාපසයන් යහනාවකට නංවාගත් සේක. ඉක්බිති රජ්ජුරුවෝද යුඬකොට සතුරන් ජයගෙණ නැවතත් ගිය

රටටම් ආහ. රජ්ජුරුවන් නුවරට පැමිණි කල්හි දෙවියෝ ඇම එක්ව පලමු කොට වැසිවැස්වූහ. වටුවාවූ වැසිදියෙන් සියලු කුනපයන් සුඩව පහවූකල්හි සුදුවැලි මත්තෙහි මල්වැසි වැස්වූහ. මල්වැසි මත්තෙහි මසුරන් වැසි වැස්වූහ. මසුරන් මත්තෙහි කහවණු වැස්වූහ. කහවණු මත්තෙහි දිව්‍යාභරණ වැස්වූහ.

එකල මනුෂ්‍යයෝ සොම්නසට පැමිණ රන්රත්‍රන් ආදිය උකන්ට වන්හ. එකල ඔවුන්ගේ ශරීරයේ අනේකප්‍රකාරවූ ගිනිගෙණ දිලියෙන්නාවූ මහත්වූ අව්වැසි වසින්ට වන. මනුෂ්‍යයෝ ආයුධයෙහි ඇනෙමින් කඩවිකඩව කැපූනාහ. ඔවුන් මත්තෙහි ගිනිගෙණ දිලීයෙන අඟුරුවැසි වසින්ටවන. ඊමත්තෙහි ගිනිගෙණ දිලිහෙන්නාවූ මහත් පර්වත කැට වසින්ටවන. තවද ඒ රාජ්‍යය මත්තෙහි සැටරියනක් පමණ උසපුරා සියුම්වූ වැලිවැසි වටුයේය. මෙසේ සැටයොත්තක් පමණ රාජ්‍යය විනාශයට පැමිණ අරාජිකවූයේය. මෙසේ මේ රට නටබව සියළු ජම්බුද්වීපයෙහි ප්‍රසිඬවූයේය.

එකල රාජ්‍යයට ආසන්නවූ රටවල කාලිඞ්ගය, අටඨකය, භීමරථය යී යන රජදරුවෝ තුන්දෙන පෙර බරණැස්නුවර කලාබු නම්වූ කසීරජ්ජුරුවන් ක්‍ෂාන්තිවාදී නම් තාපසයන් කෙරෙහි වැරද හිංසා පීඩා කොට පොළොව පළා ගෙණ වනැයි අසන්නේය. එසේම නාලිකීර නම් රජ්ජුරුවන්ද පන්සියයක් පමණ තාපසවරුන් බල්ලන්ලබා කවාද සහස්‍රබාහු අර්ජුන නම් රජ්ජුරුවෝද අඟීරස නම් තාපසයන්ට හිංසා පීඩා කොට විනාශයට පැමිණියයි අසනලද දණ්ඩකී නම් රජ්ජුරුවන්ද කිසවච්ඡ නම් තාපසයන්කෙරෙහි පාපප්‍රවාහකොට රාජ්‍යය හා සමග නටවයි අසනලද මේ රජදරුවන් සතරදෙනාම දහනවාගෙණ යාමද උපන්තැන් අපි නොදනුම්හ. ඒ කාරණය ශරභංග ශාස්තෘන්වහන්සේ ඇර වෙන අපට කියන්ට සමර්ථවූ කෙණෙක් නැත්තාහුය. එසේහෙයින් උන්වහන්සේකරා එලඹ විචාරම්හයි සිතා ඒ කාලිඞ්ගය, අටඨකය, භීමරථය යන රජදරුවෝ තුන්දෙන තමන්ගේ සේනාවාහන සම්පත්තියෙන් යුක්තව නික්මුණාහුය. එසේ යන්නාවූ රජදරුවෝ තුන්දෙන ඔවුනොවුන් පිටත්වූ බව නොදැන මන්සැස ගොසින් ගොධාවරී සමීපයෙහි උනුන් දැක තුන්දෙනම රථවලින් බැස එකරථයකට නැගී ගොධාවරී නම් ගංතෙරට පැමිණියාහුය.

එකෙණෙහි ශක්‍රදේවේන්ද්‍රයෝ පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි හිඳ ප්‍රශ්නයන් සිතා සතර තෝරා කියනොත් සරභඞ්ග ශාස්තෘන්වහන්සේට විනා අන් දෙව්කෙණෙකුන්ටත් මිනිස්කෙණෙකුන්ටවත් නොපිළිවන. එසේහෙයින් මේ ප්‍රශ්න සතර රජදරුවන් තුන්දෙනා විචාරන්ට යන ප්‍රශ්නයන් මම්ම විචාරමි කල්පනාකොට දෙදෙව්ලොව දෙවියන් විසින් පිරිවරණලදුව දිව්‍ය ලෝකයෙන් බටුයේය. එදවස්ම කිසවච්ඡ තාපසයන්වහන්සේත් කාලක්‍රියා කළසේක. ඒ තාපසයන්වහන්සේ ආදාහන කෘත්‍යය කරණ පිණිස සතර තෙනක වාසයකරණ නොයෙක් දස්ගණන් ඍෂිවරයෝ සඳුන්දරසෑය කොට ආදාහන කළාහුය. ආදාහන භූමියට හාත්පසින් අටයොත්තක් පමණ තැන් පරසතු මදාරාමල් ආදීවූ දිව්‍යකුසුම්වැසි වටුයේය. මහබෝධිසත්ත්වයන්වහන්සේද ඒ ආදාහනකෘත්‍යය කොට ඉක්බිති ආශ්‍රමයට වැද ඍෂිගණයා පිරිවරා වැඩ උන්සේක. ඒ රජදරුවන්ද ගඞ්ගාතීරයට පැමිණිකල්හි ගැස්සුම් පිඩුම් හඬද රථසක් හඬද ඇසූ මහබෝධිසත්ත්වයන්වහන්සේද අනුශිෂ්‍ය තාපසයන් කැඳවා

තෙල කවර ශබ්දයක්දැයි නියම දනුවයි කීහ. ඒ ඇසූ තාපසයෝද කලයක් ඇරගෙණ ගඟට ගියාහුය. රජදරුවන් දැක මෙසේ විචාළාහු එම්බා රථෝත්තම යෙනි, තොපි තුන්දෙනම හස්තාඞ්ග දග අවුල් හැර මෙබලාදෑම මුක්තාහාර කුණ්ඩලාභරණ ඔටුනු ආදීවූ සර්වාභරණයෙන් සැරසී නොයෙක් වළකොඩුක්කු තබා අඳිනාලද කෞම කෞශෙය්‍යකාදීවූ අනඝී වස්ත්‍රාලංකාර ඇතුව වෛඩූර්‍ය්‍ය මාණික්‍යයෙන් බැබලෙන මුතුලැල්ල බඳින විචිත්‍රවූ දළකඩම්ටි උරෙහි එල්වා මහත්වූ ප්‍රතාපයෙන් දිලිහි සිටුව, මෙසේවූ තෙපි කවුරුදැයි විචාළ බසට රජ දරුවෝ රථයෙන් බැස තාපසයන්වහන්සේට වැඳ සිට ඔවුන් අතුරෙන් අට්ඨක නම් රජතෙම කියනුයේ ස්වාමීනි තාපසයන්වහන්ස, මම අට්ඨක නම් රජය තෙල භීමරථ නම් රජය, මේ කාලිඞ්ග නම්වූ රජය, මෙසේ අපි තුන්දෙන වන ක්‍රීඩාවල් ජලක්‍රීඩාවන් පිණිස ආවමු නොවම්හ, වැලිත් ශීලසමාධි ග්‍රහණයෙන් යුක්තවූ ඍෂිවරයන් වහන්සේ වැඳ ප්‍රශ්න විචාරණ පිණිස ආම්හයි දැන්වූයේය.

එබසට තාපසයෝ කියන්නාහු රජදරුවෙනි, එන්ට සුදුසු තෙනටම ආහෙයින් මේ ගඟෙහි ප්‍රසන්නවූ සීතලජලස්නානය කොට ශ්‍රම දහ නිවාගෙණ ආශ්‍රම ප්‍රදෙශයට වැද තපස්වී සමූහයා වැඳ ශරභඞ්ග ශාස්තෘන්වහන්සේ අතින් ප්‍රශ්න විචාරවයි යනාදී පිළිසඳර කථාකොට පැන්කළය ඔසවාගෙණ කළයපිට පැන් පිසිමින් ආකාශය බැලූ තැනැත්තෝ දිව්‍යසමූහයා විසින් පිරිවරණලදුව ඓරාවණ නම් හස්තිරාජයා පිටින් බස්නාලදුව ශක්‍රදේවේන්ද්‍රයන් දැක උන් හා කැටිව කථාකරන්නාවූ තාපසයෝ මෙසේ කියත්. මහත්වූ ආනුභාව ඇති දිව්‍ය රජ්ජුරුවෙනි, අනන්ත ඍක්ෂ සංඛ්‍යාතවූ ආකාශයෙහි නභොමධ්‍යගතවූ පූර්ණ චන්ද්‍රමණ්ඩලය මෙන් බබලමින් සිටියව, මනුෂ්‍ය ලෝකයෙහි සත්ත්වයෝ තොප කවුරුනැයි දනිත්දැයි විචාළාහ.

ඒ ඇසුවාවූ ශක්‍රදේවේන්ද්‍රයෝ කියන්නාහු තපස්වීන්වහන්ස, දිව්‍යලෝක යෙහි දෙවියෝ යමක්හට සුජාතාවෝ අසුරගනාවට පති හෙයින් සුජම්පති යයි කියද්ද මනුෂ්‍යලෝකයෙහි සත්ත්වයෝ මාසමාතවකව පින්කම් කළ හෙයින් මඝවත් යයි කියාත් කියද්ද එනමින් ප්‍රසිද්ධවූ දෙදෙව්ලොව දෙවියන්ට අධිපති වූ ශක්‍රදේවේන්ද්‍රයෝ නම් මමය. එසේවූ මම ශීල්වත්වූ ඍෂිවරයන් වහන්සේ වැඳනන්නා පිණිසද සරභඞ්ග ශාස්තෘන්වහන්සේගෙන් ප්‍රශ්න විචාරණ පිණිසද ආම් කීහ.

ඉක්බිත්තෙක් අනුශිෂ්‍ය තාපසයෝ යහපත දිව්‍යරජ්ජුරුවෙනි, තෙපි පස්සේ එවයි කියා තුමූ පැන්කළය ගෙණ ආශ්‍රමයට වැද පැන්කළය තැන්පත් කොට තබා රජදරුවන් තුන්දෙනා හා ශක්‍රදේවේන්ද්‍රයන් ප්‍රශ්න විචාරණ පිණිස ආබව බොධිසත්ත්වයන්ට දැන්වූහ බොධිසත්ත්වයෝද ඍෂිගණයා විසින් පිරිවරණලදුව මහවිසල් මළුවෙහි උන්නාහුය. එකල රජදරුවෝ තුන්දෙන ගොස් තපස්විවරයන්ට වැඳ එකත්පස්ව උන්නාහුය. සක්දෙව් රජ්ජුරුවෝද ආකාශයෙන් බිමට බැස තපස්විවරයන් කරා එළඹ දෙහොත් මුදුනෙහි තබාසිට තපස්වීවරයන්ගේ ගුණ වර්ණනා කෙරෙමින් වැඳ සිට කියන්නාහු ස්වාමීනි, මෙතනට රැස්වූ මේ ඍෂිවරයන්වහන්සේලා බ්‍රහ්මලෝකය දක්වා ප්‍රසිද්ධවූසේක. මහත්වූ ආනුභාව ඇතිසේක. පඤ්චවිධවූ ඍද්ධිගුණයෙන් සමන්විතසේක. මේ මනුෂ්‍යලෝකයෙහි සත්ත්වයන් අතුරෙන් ශ්‍රෙෂ්ඨසේක. එසේ ආර්‍ය්‍යවූ නුඹවහන්සේලාට ප්‍රසන්නවූ සිත් ඇතිව නමස්කාර කෙරෙමි කියා තපස්වීසමූහයාට වැඳ

ෂට්ප්‍රකාරවූ දෙෂයන් වර්ජිතකොට එකත්පස්ව උන්නාහුය. ඉක්බිත්තෙන් තපස්විවරයන්ගේ යටිහුලගෙහි උන්නාවූ ශක්‍රදෙවෙන්‍ද්‍රයන් දැක අනුශිෂ්‍ය තාපසයෝ කියන්නාහු මනුෂ්‍යයන් දහසක්දෙනා විසින් සිතන්නාවූ කාරණා උදකලාම නුවණැසින් දක්නා හෙයින් සහස්‍ර නෙත්‍රහයි නම් ඇති ශක්‍රදෙවෙන්‍ද්‍රයෙනි, පැවිදිවූ බොහෝකල් ඇති ඍෂිවරයන්ගේ ශරීර ගන්ධය කයින් ගිලිහී යටි සුළඟෙහි යන්නේය, එසේ හෙයින්ද දිව්‍ය රජ්ජුරුවෙනි, මෙතනින් ඉවත් වෙලා ඉඳුව ඍෂිවරයන්ගේ ශරීරගන්ධය ශෙවදමාලාදීන් පරිභාවිතවූ බැවින් දුර්ගන්ධ වන්නේය. තෙපිවූ කල පවිත්‍රශීලීයව එසේහෙයින් මේ ශරීරගන්ධයෙන් නොපෙළන්නේයයි කීහ.

ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රයෝ කියන්නාහු සවාමීනී, පැවිදිවූ බොහෝකල් ඇති ඍෂිවරයන්ගේ ශරීරය ගන්ධයකින් ගිලිහී පවතිත් කැමති පරිද්දෙන් පවතීවයි නාසපුටයෙහි වැද ගණීවයි විසිතුරුවූ පුෂ්පයන් මෙන්ද විශෙෂවූ ගන්ධ ඇති මල්දමක් මෙන්ද ඒ නුඹවහන්සේලාගේ ශරීර ගන්ධය අපි කැමතිව මහ ශරීර ගන්ධයෙහි දෙවියෝ ප්‍රතිකූල ඇත්තෝ නොවෙති. දුශ්ශීලයන්ටම පිළිකුල් කරණ බව මුත් සිල්වතුන්ට දෙවතාවෝ පිළිකුල් නොකෙරෙති කියා සවාමිනී අනුශිෂ්‍ය තාපසයන් වහන්ස මම මහත්වූ උත්සාහයෙන් ප්‍රශ්න විචාරණ පිණිස ආමි. අවකාශකොට වදාළ මැනවැයි කීහ.

අනුශිෂ්‍ය තාපසයෝ එබස් අසා හුනස්නෙන් නැගී තපස්වී සමූහයාට සංඥකොට අවසර ඉල්වා දෙන්නාහු තපස්විවරුන් වහන්ස, සියලු සත්වයන්ට පෙරටුව දන් දුන් හෙයින් පුරින්දද නම්වූ සියලු දෙවියන්ට ජ්‍යෙෂ්ඨ බැවින් භූතපතී නම්වූ පරිවාර සමෘද්ධිය ඇති හෙයින් යසස්වී නම්වූ උත්කෘෂ්ඨවූ ඉසුරුමත්කම් ඇති බැවින් ඉන්‍ද්‍රනම්වූද සප්තවිධවූද ව්‍රතසමාදානයෙන් මතාකොට කළ බැවින් ශක්‍ර නම්වූද, පූර්ව ජාතියෙහි නම් වශයෙන් මඝවත්තු නම්වූද සුජාතා නම් අසුර කන්‍යාවට වල්ලභ හෙයින් සුජම්පතී නම්වූද ජනරඤ්ජනය කරණ හෙයින් රාජනම්වූද, අසුර සමූහයා මර්දනය කරන්නාවූ ශක්‍රදෙවෙන්ද්‍රයෝ ප්‍රශ්න විචාරණු කැමැත්තෝය. අට්ඨක නම් රජ ආදී රජදරුවන් තුන් දෙනා සංඛ්‍යාතවූ ශක්‍රදෙවෙන්ද්‍රයන් යන සතරදෙනා සිත්ගෙණ මෙතනට පැමිණියාවූ මේ ප්‍රාඥවූ ඍෂිවරයන්ගෙන් කවර කෙණෙක් සූක්ෂමවූ ප්‍රශ්න විස්සජ්ජනය කරන්ට නිස්සෝද මොවුන් ඇමදෙනා විසින් විචාළාවූ ප්‍රශ්න කියන්ට කිසි කෙණෙකුන් දනමැනවැයි කීහ.

ඒ අසා තපස්වී සමූහයා කියන්නාහු නිදුක්වූ අනුශිෂ්‍ය තාපසයෙනි තෙපි පොළොවෙහි සිට පොළොව නොදන්නා පරිද්දෙන් කියව. ශරභඞ්ග ශාස්තෘන් වහන්සේ හැර අන්‍යවූ කවර නම් සත්වකෙණෙක්තෙම මේ ප්‍රශ්නයන් කියන්ට සමර්ථවේදැයි කියා අනුශිෂ්‍ය නම් තාපසයෙන් මේ ශරභඞ්ග නම් තපස්වීන් වහන්සේ උපන් තැන් පටන් ග්‍රාමධර්මයන් උගන්වනසේක. රජ්ජුරුවන්ට ආචාර්‍යවූ පුරෝහිත බ්‍රාහ්මණයන්ගේ පුත්‍රයෙක ඉතා විනීතවූ සවරූප ඇතිසේක, එසේ හෙයින් උන්වහන්සේ ශක්‍රාදීවූ සතරදෙනාගේ ප්‍රශ්න විස්සර්ජනයකොට සැක දුරුකරණසේකැයි කීහ. මෙසේද කියා අනුශිෂ්‍ය තාපසයන්ට ආමන්ත්‍රණයකොට කියන්නාහු එම්බා නිදුකානෙනි, තෙපිම ශරභඞ්ග ශාස්තෘන් වහන්සේට නමස්කාරකොට තපස්වී සමූහයාගේ කීමෙන් ශක්‍රදෙවෙන්ද්‍රයන් විචාළාවූ ප්‍රශ්න කියන පිණිස අවකාශ ඇරදෙවයි කීහ, අනුශිෂ්‍ය තාපසයෝද ඒ බව යහපතැයි පිළිගෙණ ශරභඞ්ග ශාස්තෘන්වහන්සේට නමස්කාරකොට අවකාශ කරණ පිණිස කියන්නාහු කොණ්ඩඤ්ඤ ගොත්‍රයෙහි උපන්නාවූ ශර

භඞ්ග නම් තාපසයන් වහන්ස, ඍෂිවරයෝ ඇම එක්ව ප්‍රශ්න විස්සර්ජනය කරන්ට නුඹවහන්සේට ආරාධනා කෙරෙති. මේ ප්‍රශ්න විස්සර්ජනය නම් ඉතා බැරෑරුම් වන්නේය. ඥතාභිවෘඞ්වූ යමක්හු කරා පැමිණේනම් එතෙම මනුෂ්‍ය යන් කෙරෙහි සවභාවයෙක් වන්නේය. එසේ හෙයින් නුඹවහන්සේ හිරුදහස් සඳ දහස් පානා පරිද්දෙන් ප්‍රකාශකොට දිව්‍ය රජ්ජුරුවන්ගේ ප්‍රශ්න විස්සර්ජනය කොට වදාල මැනවැයි කීහ.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ අවසර දෙන්නාහු පින්වත්වූ තපස්වර යෙනි මා විසින් කරණ ලද අවසර ඇත්තාවූ ශක්‍රදෙවේන්ද්‍රයන් හා අවශෙෂවූ රජදරුවෝ මා අතින් ප්‍රශ්න විචාරත්වයි උදක් ඔවුන් විසින් මතුනොවෙති. දෙව් මිනිසුන් සහිතවූ ලෝකවාසීන්ගේ සිතින් සිතන ලද්දාවූ යම්කිසි ප්‍රශ්න යක් ඇත්නම් ඒ සියල්ලක් මා අතින් විචාරත්වයි මම වූකලී ඓහලෞකික නිඃශ්‍රිතවූ ඒ සියලුම ප්‍රශ්න මෙලෝපරලෝ දැනීමෙහි විශිෂ්ටවූගුණයෙන් ප්‍රත්‍යක්ෂ කොටම කියමි කියා සර්වඥප්‍රවාරණයෙන් පැවරූහ. මෙසේ බොධිසත්ත්වයන් කරණලද අවකාශ ඇති ශක්‍රදෙවේන්ද්‍රයෝ තමන් ප්‍රාර්ථිතවූ ප්‍රශ්න විචාරන්නාහු මෙසේ කීහ. කොණ්ඩඤ්ඤ ගොත්‍රයෙහි උපන්නාවූ ශරභඞ්ග ශාස්තෘන් වහන්ස, කුමක්නිසා සත්ත්වයා කිසිකලෙකත් ශෝක නොකෙරේද? කවර ධර්‍ම යක්හුගේ ප්‍රහාණීය ඍෂිවරයෝ වර්‍ණනා කෙරෙත්ද? මේ ලෝකයෙහි කවරක් විසින් කියනලද පරුෂවචනය සහනයකොටයුතුද ඒ කාරණය මට කියවයිකීහ.

එකල ශරභඞ්ග ශාස්තෘන් වහන්සේ ප්‍රශ්න විස්සර්ජනය කරණසේක් එම්බා ශක්‍රදෙවේන්ද්‍රයෙනි, සත්ත්වතෙම ක්‍රොධ නසා කිසිකලෙකත් ශොක නො කරන්නේය. මෙරමා විසින් තමාට කරණලද ගුණ මැකීමහුගේ ප්‍රහාණීය වර්‍ණනාකෙරෙති. හීනමධ්‍යමොත්කෘෂ්ටවූ සියල්ලවුන්ගේම ඍෂිවරයෝ පරුෂ වචනය සහනය කටයුත්තේයයි පුරාතනයෙහි නුවණැත්තෝ මේ ක්ෂාන්තිය උත්තමයයි කීහ.

ඒ අසා ශක්‍රදෙවේන්ද්‍රයෝ නැවත කියන්නාහු කොණ්ඩඤ්ඤ ගොත්‍රයෙහි උපන්නාවූ ශරභඞ්ගශාස්තෘන්වහන්ස, තමහට ශ්‍රෙෂ්ඨවූ තමා හා සරිසරි සමාන වූත් දෙදෙනාගේ පරුෂවචනය ඉවසන්ට පිළිවන්වන්නේය තමහට යටත්ව සිටි තැනැත්තවුන්ගේ පරුෂවචනය කෙසේ නම් සහනයකට හැක්කේද? ඒ මට කියවයි කීහ. නැවත ශරභංග ශාස්තෘන් වහන්සේ කියනසේක් ශක්‍රදෙවේන්ද්‍ර යෙනි, තමාට ශ්‍රෙෂ්ඨව සිටිතැනැත්තහුගේ පරුෂවචනය භයින් ඉවසිය යුතුය. සරි සාමාන්‍ය තැනැත්තහුගේ වචනය කාරණොත්තරිය ලක්‍ෂණ සාරම්භයෙහි ආදීනව දැක්වීමෙන් ඉවසිය යුතුය. යම් සත්ත්වයෙක් තමාට යටත්ව සිටි තැනැත්තහුගේ පරුෂවචනය ඉවසන්නේවීනම් ඒ ඉවසීම සත්පුරුෂයෝ උතුමැයි කියති කීහ. මෙසේ කී කල්හි නැවත ශක්‍රයෝ බොධිසත්ත්වයන්ට කියන්නාහු ස්වාමීනි, නුඹවහන්සේ විසින් පළමුකොට සියල්ලවුන් විසින් කියනලද පරුෂවචනය ඉවසීම පුරාතනයෙහි නුවණැත්තෝ උතුමැයි කියති කියා දැන් සත්ත්වයෙක් තෙමේ හීනවූ සත්ත්වයාගේ පරුෂවචනය ඉවසුවේවීනම් ඒ ක්‍ෂාන්තිය උතුමැයි කියනලදහ. එසේ කියන නුඹවහන්සේගේ විවිධවූ වචනයන් අතුරෙන් පළමු කී වචනයට පසුව කියන වචනය නොගැලපෙන්නේයයි කීහ. එවිට මහබොසතාතන්වහන්සේ කියනසේක් මෙතෙමහීනයයිදූනපරුෂවචනය සහනය කරන්නාවුන්ගේ වශයෙන් කියනලද සත්ත්වයන්ගේ රූප දර්‍ශන මාත්‍රාව කින් හීනොත්කෘෂ්ටභාවය දැනගත නොහැක්කේ වීනම් ඒ කාරණයෙන් පළමු සත්ත්වයන්ගේ අන්‍ය ස්ථානයෙක්හි සංවාසයෙහි රූප දකින මාත්‍රාවෙන්

ගීතොත්කෘෂටාදී භාවය දැනගත නොහැකි නියාව ප්‍රකාශකරණසේක් සොෘන නිසදෘතාදිවූ චතුර්විධවූ ඊෂ්‍යීාපථයෙහි පිළිපත්තාවූ ස්වභාවඇති ගීතොත්කෘෂට මධ්‍යම සත්ත්වයන් කෙසේ දැනගත හැක්කේද උතුම්වූ ගුණඇති සත්පුරුෂයෝ විරූපවූ ලාමක පුද්ගලයන්ගේ ස්වරූපයෙන් ඇවිදිනාහ. එසේහෙයින් සියල්ල වූත්ගේ පරුෂවචනය සහනයකටයුතුයයි මා විසින් කියන ලද්දේයයි කීහ.

ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රයෝ කාංශා රහිතව කියන්නාහු ස්වාමීනි. මේ ක්ෂාන්තිහුගේ අනුසස් අපට වදාළ මැනවැයි ආරාධනා කළාහ. ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ කියන්නාහු ශක්‍රදෙවෙන්ද්‍රයෙනි යුද්ධකරන්නාවූ රජදරුවන් සහිතවූ සේනාව වෛර සංසිඳීමකරන්නාවූ අප්‍රතිහතස්වභාව සංඛ්‍යාතවූ අභය නොබලන්නාහ. ක්ෂාන්තියෙන් යුක්තවූ සත්පුරුෂයෝ වෛර නැතිවීමෙන් බොහෝ අභිප්‍රතිලාභයට පැමිණෙන්නේය. එසේ හෙයින් ක්ෂාන්තිබලයට වෛරීහු සන්සිඳෙන්නාහයි කීහ. මහබෝසතානන් විසින් ක්ෂාන්තියෙහිලා ගුණ කී කල්හි අවශෙෂ රජදරුවෝ තුන්දෙන මේ ශක්‍රදෙවෙන්ද්‍රයෝ තමන්ගේ ප්‍රශ්න විචාරති. අප ප්‍රශ්න විචාරණ පරිද්දෙන් අවකාශ නොදෙති සිතූහ.

ඉක්බිත්තෙන් ශක්‍රයෝ ඔවුන්ගේ අභිප්‍රාය දැන තමන් සිතූ පරිද්දෙන් ප්‍රශ්න සතර තබා ඒ රජදරුවන්ගේ සැක විචාරන්නාහු ශරභංග ශාස්තෘන් වහන්ස, මා විසින් විචාරණලද ත්‍රිවිධවූ ප්‍රශ්නයන්ගේ විස්සර්ජනය සංඛ්‍යාතවූ නුඹවහන්සේගේ සුභාෂිතය පිළිගෙණ අන් ප්‍රශ්න කෙණෙකුන් විචාරමි. ඒ මට කියව මැනවැයි කියන්නාහු දණ්ඩකී නම් රජ්ජුරුවෝය. නාලිකී නම් රජ්ජුරුවෝය අජ්ජුන නම් රජ්ජුරුවෝය කලාබු නම් රජ්ජුරුවෝය යන මේ රජ දරුවෝ කෙණෙක්වූ නම් බලවත්වූ අකුශලකර්මයෙන් කළාවූ රජදරුවන්ගේ ගතිය මට කිවමැනවැයි සෘෂිවරයන්ට හිංසා පීඩා කළාවූ රජදරුවෝ කොයි උපන්නාදැයි විචාළාහ. ඉක්බිත්තෙන් මහබෝසතානෝ විචාළාවූ ප්‍රශ්න විසඳන්නාවූ ශක්‍රදෙවෙන්ද්‍රයෙනි, දණ්ඩකී නම් රජ්ජුරුවෝ කිසවච්ඡ තාපසයන්ගේ ශරීරයෙහි බොල් කෙළ වත්කොට දැහැටිදඬු ලීමෙන් පාපප්‍රවාහය කොට සුන් නවූ මුල් ඇතිව පෂීද් හා සමග සියලු රාජ්‍යය නසා යොදුන් සියයක් පමණ ඇති කප අටගත්ද, අටගත් හලු නරකයෙහි වැටී පැසෙන්නාහ. ඒ රජ්ජුරුවන්ගේ හිස් මුදුනෙහි මහත්වූ ගිනිපුපුරු වැගිරෙන්නේය,

යම් නාලිකී නම් රජ්ජුරුවන්ගේ අකුශල කර්මපථය කියන්නාහු සමිත පාපීවූ නිරපරාධ තපස්වීවරයන් පන්සියයක් දෙනා වන්ඩවාකොට කිණිබල්ලන් ලවා කවා මරවාපුද ඒ නාලිකී නම් රජ්ජුරුවන් ඒ අකුශල කර්මයෙන් මිය පරලොව ගොස් නරකයෙහි උපන් තැනැත්තන් සුනඛයෝ නොයෙක් නැතින් දිව අවුත් රැස්ව සල්ව සල්වා සකල ශරීරයෙහි මාංශය ඇට පමණක් තිබියදී අනුභව කරන්නාහ. නැවත අජ්ජුන නම් රජ්ජුරුවෝ පැවිදිවූ බොහෝ කල් ඇති ගෞතම් ගොත්‍රයෙහි උපන්නාවූ අංගීරස නම් තාපසයන් විෂපෙවූ හීයෙන් විද ජීවිතක්ෂයට පමුණුවා සතතිසුල නම්නරකයෙහි පා උඩුකොට වැටී මහදුක් අනුභව කරන්නේය. යම් කලාබු නම් කසී රජ්ජුරු කෙණෙක් නිරපරාධවූ ක්ෂාන්තිවාද තාපසයන් දෙපය හා කන් නාසා කප්පවා දුක්කම්කටුල්කොට තියුණු වෙදනා ඇති භයානකවූ අවීචි මහ නරකයෙහි ඉපද මහදුක් විඳිනාහ. එසේහෙයින් නුවණැත්තාවූ සත්ත්වතෙම යථොක්ත නරකය හා මීට වඩා ඉතා පාපිෂ්ටවූ අන් නරකවල දුක්කම්කටුල් අසා නරකභයින් භයපත්ව ශ්‍රමණ

බ්‍රාහ්මණයන් විෂයෙහි චතුර්විධ ප්‍රත්‍යය දානය දීමෙන් හා ධාර්මිකවූ රක්‍ෂාවරණ ගුප්තිය කිරීමෙන් හැසිරෙන්නේය. මෙසේ කරන්නාවූ ශ්‍රද්ධාවන්ත තෙම ස්වර්ග ලොකයෙහි ඉපද මහා සම්පත් අනුභව කරන්නේයයි යනාදීන් ප්‍රශ්න විස්සර්ජනය කළහ. ඒ රජ්ජුරුවන් සතරදෙනා අතුරෙන් නාලිකීර නම් රජ්ජුරුවෝ කලිඟුරට දන්තපුර නම් නුවර රාජ්‍යය කරන්නාහ.

එකල එක් ඝොරතපී නම් තාපසකෙණෙක් පන්සියයක් පමණ තාපසවරුන් පිරවරා හිමාලය වනයෙන් අවුදින් නාලිකීර නම් රජ්ජුරුවන්ගේ උයනට බැස බොහෝ ජනයාට ධර්මදෙශනා කෙරෙමින් උයනෙහි වාසය කරන්නාහ. එකල්හි ධර්මිෂ්ඨවූ තාපසකෙණෙක් උයනෙහි වෙසෙති. රජ්ජුරුවන්ට දන්වූහ. එකල රජ්ජුරුවෝ අධර්මිෂ්ඨයෙන්ම රාජ්‍යය කරන්නාහ. එසේවූ රජ්ජුරුවෝ අමාත්‍යයන් විසින් තාපසවරුන්ගේ ගුණ හා ධර්මය ප්‍රශංසා කරණ හෙයින් එක්දවසක් මමත් බණ අසමි කියා උයනට ගොස් තාපසවරුන් වැඳ එකත්පස්ව උන්නාහ. එකල තාපසයෝ රජ්ජුරුවන් හා පිළිසඳර කථාකරන්නාහු කිමෙක්ද මහරජ ධර්මයෙන් රාජ්‍යය කරවුද සත්ත්වයන්ට හිංසා පීඩා නොකරව්දැයි විචාළාහ. ඒ අසා රජතෙම කිපී මේ කූටතාපස ජටිලයා මෙතෙක් දවස් නුවර වැස්සන් ඉදිරියේ මාගේ නුගුණ කීයේ වන. යහපත ඊට නිගඩ දන්නෙම්වේදැයි සිතා තාපසවරුන්ට සෙට දවස් වන්නාවූ ප්‍රීතිප්‍රමෝද්‍යය පිණිස යයි ආරාධනාකොට උදෑසනක්සේ අපගේ ගෙදරට වැඩිය මැනවැයි පවරා තුමූ ගෙට ගොස් මනුෂ්‍යයන්ට කියා පරණ නානාවලින් අමෙධ්‍ය ගෙන්වා සැළුවල් පුරා තබ්බවා උදෑසනක්සේම තාපසවරුන් ආ කල්හි ඔවුන්ගේ භික්‍ෂාභාජනයන් ගෙණ අමෙධ්‍යයන් පුරවා ඉදිරියෙහි තබා රජගෙයි දොරවල් අගුළුවා මොහොල් දඬු යමුගුරු ආදිය ගෙන්වා ගෙණ තපස්විවරයන්ගේ හිස ගසා බිඳුවා කකුල් අල්වා පිටතට අද්දවා කිණ බල්ලන් ලවා කවා ඒ අකුශල බලයෙන් පැළුනාවූ පොළොවින් වැද සූනබ මහ නරකයෙහි උපන්නේය. එහි උපන්නාවූ රජහුගේ ශරීරය තුන්ගවුවක් උස ඇත්තේය.

ඉක්බිත්තෙන් මහත්වූ ඇතුන් සා පමණවූ බඩ ඇති පස්පැයෙන් යුක්තවූ බල්ලෝ ලුහුබඳවාගෙණ නවයොදුන් බොල ඇති ගිනිගෙණ දිලිසෙන්නාවූ යපොළොව මත්තෙහි එලාගෙණ කටපුරා මස්කැටි කඩ කඩා සල්ව සල්වා කන්නාහ. එකල ප්‍රශ්න විචාළාවූ ශක්‍රදෙවෙන්ද්‍රයන් හා රජදරුවන් ආදීකොට ඇති සත්ත්වයන්ට පොළොව දෙකක්කොට පලා නරකය දක්වා සත්ත්වයන් මහත්වූ භය උපන් නියාව දැන නැවත අන්තර්ධාන කොට පුවාහ.

තවද අජ්ජුන නම් රජ්ජුරුවෝද මහිංසක නම් රට කෙක නම් රාජධානියෙහි රාජ්‍යය කරන්නාහු මුවන් මරා අඟුරුමස් සා ඇවිදිනාහු එක් දවසක් මුවන් එන්නාවූ ස්ථානයෙහි කොටුපතක් බැඳ මුවන් එන පෙරමග බල බලා ඇලී සිටියාහ. එකල අංගීරස නම් තාපසයෝ රජ්ජුරුවන් උන් තැනට නුදුරු තැන අක්කර ගසකට නැගී පලාකොළ නෙලන්නාහු කඩාගත් අත්තේපලා නෙලා ගෙණ අතු බිම එලන්නාවූ වැටෙන්නා දැක එතනට පැමිණියාවූ මුවෝ පලා යන්නාහ. ඒ දුටුවාවූ අජ්ජුන රජ තෙම කිපී විෂපෙවූ හීයක් ගෙණ තාපසයන් විද්දේය. තාපසයන් වෘක්‍ෂයෙන් ගිලිහී වැටෙන්නාහු හිස මුදුනෙහි කරදෑ ඹබ හුලක් ගෙණ හුලමත්තෙහිම කාලක්‍රියා කළාහු ක්‍ෂණයෙහිම පොළොව දෙකක්ව පැළී ඒ අජ්ජුන නම් රජහු සත්තිසූල නම් නරකයෙහි ඉපදවූයේය. එකල රජහුගේ ශරීරය තුන්ගව්වක්

උස අත්තේය. එකල යම්පල්හු දිලියෙන්නාවූ ආයුධයෙන් ඇත ආය පර්වතයට තන්වන්නාහුය. ඔහු පර්වතමස්තකයෙහි සිටිකල්හි මහත්වූ පවනෙක් හමන්නේය, පවන්වේගයෙන් පර්වතමුදුනෙන් ගිලිහී එතෙම වැටෙන්නේය. එකල නව යොදුන් බොලයකබලින් තාඹතල්කඳක් සා පමණ දිලියෙන්නාවූ යවුලෙක් නැගෙන්නේය. වැටෙන්නාවූ සත්ත්වතෙම හිස් මුදුනෙන් උල ඇනෙමින් වැටී සිටිතේය. එකල යපොළොව දිලියෙන්නේය. ශරීරයද දිලියෙන්නේය. එකල අර්ජුන නම් රජතෙම මහහඬින් හඬමින් පැසෙන්නේය. බොධිසත්ත්වයෝ පොළොව විවරකොට ඒ නරකය දක්වා මහජනයා භයපත්වූ නියාව දැන අන්තර්ධාන කළාහ. කලාබු රජ්ජුරුවන්ගේ කථාව ක්ෂාන්තිවාද ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය

මෙසේ මහබෝසතානන් විසින් ඒ රජදරුවන් සතරදෙනා උපන්නාවූ ස්ථානය නියමකොට දැන්වූ කල්හි රජ්ජුරුවන්ගේ සැක දුරුව ගියේය. ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රයෝ අවශෙෂ ප්‍රශ්න සතරක් විචාරන්නාවූ ශරභඞ්ග ශාස්තෲන්වහන්ස, නුඹවහන්සේගේ සුභාෂිතය අනුමෝදන්ව අනිකුත් ප්‍රශ්න සතරක් විචාරමි ඒ මට කියමැනව, කෙසේවූ ප්‍රශ්නයෙක්දැයි යතහොත්, කෙබඳු සත්ත්වයා සිල්වතැයි කියද්ද කෙබඳු සත්ත්වයා නුවණැත්තේදැයි කියද්ද කෙබඳු පුරුෂයා කරා පැමිණියාවූ ශ්‍රීතොමෝ ඔහු හැර නොයෙද්දැයි විචාළේය. ඉක්බිති බොධිසත්ත්වයෝ ප්‍රශ්න විසර්ජනය කරන්නාහු එම්බා ශක්‍ර දේවේන්ද්‍රයෙනි, යම් සත්ත්වයෙක්තෙම කයින් වචසින් අකුසල් නොකෙරේද තමන් නිසා වේවයි අනුන් නිසා වේවයි බොරු නොකියාද එබඳු සත්ත්වයා සිල්වතැයි කියති. යම් සත්ත්වයෙක් තෙම අර්ථයෙනුත් පාලියෙනුත් ගැඹුරුවූ ගූඪවූ ප්‍රශ්න සිතින් සිතන්නේය. අර්ථ ප්‍රතිවේධ කොට හිරු දහස් සඳ දහස් නගා පාතා කලක් පරිද්දෙන් ප්‍රකාශකොට කියන්ට සමර්ථද අවැඩට නිසිවූ පාපකර්මයන් කෙරේද, දානශීලාදිවූ ඒ ඒ කාරණා කරන්ට සුදුසු අවස්ථාවෙහි නොපිරිහෙළා කෙරේද එබඳු සත්ත්වයා ප්‍රඥාවන්තයයි කියති. යම් සත්ත්වයෙක් ඒකාන්තයෙන් තමාට මෙරමා කළගුණ දැන යමෙක්හු විසින් තමාට ගුණ කරණ ලද්දේ වීනම් ඔහට ප්‍රත්‍යුපකාර කෙරේද කල්‍යාණමිත්‍රද දෘඪ භක්ති ඇත්තේද දුකට පැමිණියාවූ තමාගේ යහළුවාගේ දුක තමා ඇඟට ලා ගෙණ ඔහට පැමිණි කටයුතු සිය අතින් සකස්කොට කෙරේද එබඳුවූ සත්ත්වයා නුවණැත්තෝ සත්පුරුෂයයි කියති. යමෙක් මේ සියලු ගුණයෙන් යුක්තද හැදහැ ඇත්තේද මොළොක්ද සංවිභාගශීලීද යාචකයන් අදහස් දැන දන් දේද දැන ප්‍රියවචනාදිවූ සතර සංග්‍රහ වස්තුවෙන් සංග්‍රහ කරන්නාවූ මිහිරිවූ මටසිලුටුවූ තෙපුල් ඇති එබඳුවූ පුද්ගලයා කරා පැමිණියාවූ යසපිරිවර සංඛ්‍යාතවූ ශ්‍රීහු ඇර පළා නොයන්නේයයි කීහ.

මෙසේ මහබොධිසත්ත්වයෝ නභොමධ්‍යගත පූර්ණ චන්ද්‍රමණ්ඩලය ගෙණ හැර පාතා කලක් පරිද්දෙන් විසර්ජනය කළාහ. එකල ශක්‍රදේවේන්ද්‍රයෝ නැවත කියන්නාහු ශරභංග ශාස්තෲන්වහන්ස, නුඹවහන්සේගේ මේ ප්‍රශ්න විසර්ජනය සංඛ්‍යාතවූ සුභාෂිතය අසා සමාධිව අනිකුත් ප්‍රශ්නයක් විචාරමි. ඒ මට කිවමැනව නුවණැත්තෝ ශීල යසශ්‍රිය සත්පුරුෂ ධර්මය ප්‍රඥාවය යන මෙයින් කවර ධර්මයෙක් ශ්‍රේෂ්ඨතරයයි කියද්දැයි විචාළාහ. එබසට බොධිසත්ත්වයෝ කියන්නාහු එම්බා ශක්‍රදේවේන්ද්‍රයෙනි, තාරකාවන්ට අධිපතිවූ චන්ද්‍රයා මෙන් නුවණැත්තෝ සියලු ධර්මයන්ට වඩා ප්‍රඥාව ශ්‍රේෂ්ඨයයි කියති ශීල යසශ්‍රිය

සත්පුරුෂ ධර්මය ප්‍රඥාවය යන මේ සියල්ල නුවණැත්තෝම අනුව පවත්තේයයි කීහ. එබස් අසා ශක්‍රදේවේන්ද්‍රයෝ කියන්නාහු ශරභංග ශාස්තෘන්වහන්සේගේ සුභාෂිතය අසා සමාධිව අන් ප්‍රශ්නයක් විචාරමි. ඒ මට කිවමැනව, මේ ලෝකයෙහි සත්ත්වතෙම කෙබඳු ක්‍රියාවක් කරන්නේ කවර ධර්මයක් භජනය කරන්නේ කවර ප්‍රකාරයකින් කුසල්කරන්නේ මෙලොවෙහිදී ප්‍රඥාව ලැබේද ප්‍රඥාවට ප්‍රතිපත්ති මට කිවමැනවැයි දැනගන්නා කැමැත්තෙමි. කෙසේ කරන්නාවූ සත්ත්වතෙම ප්‍රඥාවනත වන්නේදැයි විචාළහ.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ කියන්නාහු එම්බා ශක්‍රදේවේන්ද්‍රයෙනි, යම් සත්ත්වයෙක් ප්‍රඥාව වඩිනවූ සූක්ෂම කාරණා දන්නාවූ සමර්ථවූ බහුශ්‍රැතවූ පුද්ගලයන් සේවනය පයුරුපාශනය කෙරේද පාලි උගණීද නැවත නැවත අර්ථ විචාරාද ගලකෙටූ අකුරක්මෙන්ද සවර්ණභාජනයෙක්හි බහාලද සිංහතෙලක් මෙන්ද මනාකොට පිහිටුවනලද සකස්කොට සුභාසිතය අසාද මෙසේ කරන්නාවූ සත්ත්වතෙම නුවණැති වන්නේය. යම් සත්ත්වයෙක් කාමකොට්ඨාශයන් ඇතිව නැතිවන්නාවූ අර්ථයෙන් අනිත්‍යහෙයින්ද දිෂ්ටධර්මසම්පරායික දුක්ඛයට වස්තු බැවින් දුක්ඛ හෙයින්ද අටඅනූවක් රෝග මුඛයෙන් කාමය නිසා උපදනා හෙයින් බලාදක්නාසුලුවූ ඒ ප්‍රඥාතෙමේ කාමයන්ගේ අනිත්‍යාදී බව දක්වන්නේ කාමය නිසා උපදනා දුක්ඛයන්ගේ කෙළවරක් නැත එසේ හෙයින් කාමයන් ප්‍රහාණයම සැපයයි පඤ්චකාමයෙහි ඡන්දය දුරුකරන්නේය. තවද ශක්‍රදේවේන්ද්‍රයෙනි, යම් පුද්ගලයෙක් මෙසේ වීතරාගී වූයේ තමා ආඝාත වස්තු වශයෙන් උපදනා ද්වේෂය දුරුකොට අප්‍රමාණ සත්ත්වයන් අරමුණුකොට පවත්නා බැවින් අප්‍රමාණවූ මමත් සිත් වඩා එසේවූ ප්‍රාඥතෙම සියලු සත්ත්වයන් විෂයෙහි පවත්නාවූ තාඩන පීඩනාදිවූ දණ්ඩන නොකොට අනින්දිතවූ නොපිරිහුනාවූ ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලෝකයෙහි උපදනේයයි යනාදීන් මහබෝසතාණන් විසින් කාමයෙහිලා ආදීනව කියමින් සිටියදීම රජ්ජුරුවන් තුන්දෙනා හා සමග ආවාවූ පෂීත්ගේද තදංගප්‍රහාණ වශයෙන් පඤ්චකාම ගුණයෝ ප්‍රහීණව ගියාහ

මහබෝසතාණෝ ඒ බව දැන රජ්ජුරුවන් ආදිකොට ඇති සත්ත්වයන්ට ප්‍රශංසාකරන්නාහු අෂ්ටක රජ්ජුරුවෝද භීමරථ රජ්ජුරුවෝද කාලිංග රජ්ජුරුවෝ යයි යන තුන්දෙනා හා සේනාවගේ කාමරාගය මාගෙන්ම ධර්මය අසා යම් හෙයකින් ප්‍රහීණවීද එසේහෙයින් තොප ඇමදෙනාගේ මෙතනට ඊම සඵල වීයයි කීහ. ඒ බව අසා රජ්ජුරුවෝ තුන්දෙන බොධිසත්ත්වයන්ට ස්තුති කරන්නාහු පරසිත් දන්නාසුලුවූ ශරභංග ශාස්තෘන්වහන්ස, නුඹවහන්සේගේ වචනය සත්‍යමය අප ඇමදෙනාගේ කාමරාගය තදඞ්ගප්‍රහාණය වශයෙන් ප්‍රහීණවිය. යම්සේ අප පැවිදිව නුඹවහන්සේ ලත් ගුණධර්මය ප්‍රතිවේධකරමෝ නම් එපරිද්දෙන් අප කෙරෙහි අනුග්‍රහකොට පැවිදිවීමට අවසර දුනමැනවැයි කීහ. එබස් අසා බොධිසත්ත්වයෝ ඔවුන් ඇම මහණවන පරිද්දෙන් අවසර දෙන්නාහු එම්බා රජ්ජුරුවෙනි, තොප ඇමගේ කාමරාගය තදඞ්ගප්‍රහාණ වශයෙන් ප්‍රහීණවිය. එසේහෙයින් තොප ඇම කෙරෙහි අනුග්‍රහකොට පැවිදිවීමට අවකාශ කෙරෙමි. මා ලත් ගුණධර්මයට පැමිණෙනු කැමැත්තාහු වීනම් එපරිද්දෙන් පැවිදිව ධ්‍යාන උපදවා බලවත්වූ ධ්‍යාන ප්‍රීතියෙන් තොපගේ ශරීරය ඇම වේලෙහිම පිණවයි කීහ. එබස් අසා රජජුරුවෝ බෝසතාණන් කීබස් පිළිගන්නාවූ පොළොව හා සමානවූ නුවණැති ශරභඞ්ග ශාස්තෘන්වහන්ස, නුඹ

වහන්සේ යමක් කියේවීනම් නුඹවහන්සේ විසින් කියනලද්දවූ සියලු අවවාදානුශාසනා නොපිරිහෙළා කරම්හ. නුඹවහන්සේ විසින් පැමිණෙනලද්දවූ ගුණධර්‍මය ලබමෝ නම් එපරිද්දෙන්ම පැවිදිව භාවනාකොට ධ්‍යාන උපදවා ප්‍රීතියෙන් කැමති පරිද්දෙන් ශරීරය පිණවා වාසයකරම්හයි කීහ.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ පිරිවර සහිතවූ රජදරුවන්ට ප්‍රව්‍රජ්‍යාව දී තපස්වී සමූහයාට කියන්නාහු පින්වත්වූ ඍෂිවරයෙනි, කිසවච්ඡ තාපසයන්ට විශෙෂකොට ආදාහන පූජා කරණලද, එසේහෙයින් තෙපි හැම තෙපි වසන්නාවූ ස්ථානයට කැමති පරිද්දෙන් ගොස් ඇම කල්හිම එකාග්‍රවූ සිත් ඇතිව ධ්‍යානයෙහි ඇලුම් ඇතිව මනාවූ ස්වරූප ඇති ඍෂිවරයෙනි. ප්‍රව්‍රජ්‍යාසිත්ට මේ ධ්‍යානයෙහි කරන්නාවූ ඇල්ම නම් ශ්‍රෙෂ්ඨවූ ඇල්මෙක් වන්නේ යයි කීහ.

ඒ තපස්විවරයෝද බොධිසත්ත්වයන්ගේ වචනය මුදුනෙන් පිළිගෙණ මහබෝසතානන් වැඳ අවසර ගෙණ තමන්වසන්නාවූ ස්ථානවලට ගියාහ. ශක්‍රදේවේන්ද්‍රයෝද හුනස්නෙන් නැගී මහබෝසතානන්ට ස්තුති කොට බඩාඤ්ජලිව සුයථිනමස්කාරයක් මෙන් වැඳ සමුගෙණ තමන්ගේ දිව්‍ය පර්ෂත් හා සමග දෙව්ලොවටම ගියාහ. ඒ බව ප්‍රකාශකොට වදාරන්නාවූ බුදුහු නුවණැත්තාවූ ශරභංග ශාස්තෲන් විසින් මනාකොට කියනලද්දවූ අර්ථ ව්‍යඤ්ජනයෙන් සමෘද්ධවූ උතුම් සුභාෂිත සංඛ්‍යාත මේ ධර්‍මය යම්කිසි සත්ත්වයෙක් අර්ථ වශයෙන් සිත්හි ලා ඇසුවේ වීනම් ප්‍රථමධ්‍යාන ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යානාදීවූ විශෙෂ කරන්නේය. නිර්වාණයට පැමිණියාවූ පුද්ගලතෙම මෘත්‍යුරාජයාගේ දර්ශනයට නොගියා නම් වන්නේයයි වදාළසේක. මෙසේ තිලෝගුරු බුදුරජානන් වහන්සේ අර්හත් ඵලයෙන් දෙශනාව කූළුගෙණ එම්බා මහණෙනි, මේ මෞද්ගල්‍යාන ස්ථවිරයන්ගේ ආදාහනයෙහිද මුතුමල් වැසි වටුයේ නොවෙයි. පෙරත් වටුයේම වේදැයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට පූර්වාපරසන්ධි ගලපා මේ ශරභඞ්ග ජාතකය නිමවා වදාළසේක.

එම්බා මහණෙනි, එදවස් සාලිස්සර නම් අනුශිෂ්‍යතෙම දැන් ශාරිපුත්‍ර ස්ථවිරය, එදවස් මෙණ්ඩිස්සර නම් තාපසතෙම දැන් මේ මහාකාශ්‍යප ස්ථවිරය, පබ්බත තාපසතෙම දැන් අනුරුද්ධස්ථවිරය, එදවස් දෙවල නම් තාපසතෙම දැන් මේ මහාකාත්‍යායන ස්ථවිරය, එදවස් අනුශිෂ්‍ය නමවූ ප්‍රධාන අනෙපාවාසික තෙම දැන් මේ ධර්‍මභාණ්ඩාගාරිකවූ ආනන්දස්ථවිරය, එදවස් කිසවච්ඡ තාපසයෝ නම් මුගලන් මහා ස්ථවිරය, එසමයෙහි ශරභඞ්ග ශාස්තෲවූයෙම් දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

513
අලම්බුසා ජාතකය.

මෙවද මේ ජාතකය ත්‍රෛලෝක්‍ය ප්‍රදීපායමානවූ බුදුරජානන්වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි පළමු අරණලද ස්ත්‍රියක කෙරෙහි ලෝභ උපදනා භික්ෂුවක්හු අරභයා වදාරණලද.

එහි පිළිවෙල කථාව ඉන්ද්‍රිය ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. එකල සර්‍වඥයන්වහන්සේ ඒ භික්‍ෂුව අතින් සැබෑද මහණ තා පුරාණ දුතිකාවක කෙරෙහි ලොභ උපදවතැයි විචාරා භික්‍ෂුව විසින් සැබෑව සවාමිනියි දන්වූ කල්හි එම්බා මහණෙනි මේ ස්ත්‍රිය දැන්මතු තට අනර්ථයෙදුයේ නොවන්නීය පළමුත් ඕතොම නිසා ධ්‍යානයෙන් පිරිහී තුන්අවුරුද්දක් මුළුල්ලෙහි මූසව විසංඥයම වැදහෙව සිහි ලැබගෙණ මහහඬින් හැඬූයේ වේදැයි වදරා එක්තරා භික්‍ෂුකෙණෙකුන් විසින් ආරාධිතවූ බුදුරජාතන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

එම්බා මහණෙනි,

යටගිය දවස බරණැස්නුවර බ්‍රහමදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ කසිරට බමුණුමහසැල්කුලයෙක ඉපිද වැඩිවිය පැමිණ සියලු ශිල්පයෙහි පර තෙරට පැමිණ ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වනප්‍රදෙශයකට වැද වනමූල් පලාපල යෙන් යැපෙමින් දවස් යවන්නාහුය. එකල එක් මුවදෙනෙක් තාපසයන් මූත්‍රා කෘත්‍ය කළාවූ ස්ථානයෙහි සම්භවයෙන් මිශ්‍රවූ තණ අනුභවකොට පැන් බී මෙපමණකින් තාපසයන් පිළිබඳ එක් දරුගැබක් ලැබ එතැන්පටන් කිසි තැනකට නොගොස් පන්සල සමීපයෙහිම ඇවිදින්නීය. බොධිසත්වයෝද පරීක්‍ෂා කරන්නාහු ඒ බව දන්නාහුය. ඒ මුවදෙන් නොමෝ කල්යාමකින් මනුෂ්‍ය කුමාරයෙකු වැදූහ. එකල තාපසයෝ කුමාරයන් කෙරෙහි පුත්‍ර ස්නේහය උපදවාගෙණ මනාකොට රක්‍ෂාකරන්නාහු ඉසිසිඞග තාපසයෝයයි නම් තුබූහ.

ඉක්බිත්තෙන් ඒ කුමාරයන් වැඩිවිය පැමිණි කල්හි තාපසප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිකොට තමන් වෘඬඅවස්ථාවෙහි තාපසකුමාරයන් කැඳවාගෙණ නාරිවාහන නම් වනයට ගොස් එහි පිපියාවූ මල්කැන් දක්වා කියන්නාහු එම්බා පුත, මේ හිමාලයෙහි මේ මල් හා සදෘශවූ ස්ත්‍රීහු නම් ඇත. ඔහු තමන්ගේ වසඟයට පැමිණියවුන් මහත්වූ විනාශයට පමුණුවන්නාහ. එසේහෙයින් උන්ගේ වසඟයට නොපැමිණියයුතුයයි අවවාදකොට කල්යාමකින් තුමූ නොපිරිහුනාවූ ධ්‍යාන උපදවා ධ්‍යාන ක්‍රීඩාවෙන් කෙළනාහු හිමාලයවනයෙහි වාසයකරන්නාහු ඝොර වූ තපස් ඇතිව විශෙෂයෙන් සංහිඳුවනලද පඤ්චෙන්ද්‍රියයන් ඇතිව වාසයකරන්නාහ. එකල උන්ගේ තේජසින් ශක්‍රභවනය උණුව ගියේය. ශක්‍රදේවේන්‍ද්‍රයෝ දිවැසින් පරීක්‍ෂාකොට ඒ බව දැක මේතෙම ශක්‍රාත්මභාවයෙන් චුතකළේවී නම් තපුර, එසේහෙයින් එක් දිව්‍යාඞගනාවක් යවා මොහුගේ ශීලය හෙද කරවමියි සිතා සියලු දිව්‍යලෝකය පරීක්‍ෂාකරන්නාහු තමන්ගේ අඩු තුන් කෙළක් පුරඞගනාවන් අතුරෙන් අලම්බුසා නම්වූ එක් ස්ත්‍රියක් දැක මේ දිව්‍ය ස්ත්‍රිය හැර මේ දෙදෙව්ලොව දෙවඟනන්ගෙන් අන් එකෙක් මේ තාපසයන්ගේ ශීලය හෙද කරන්නට සමර්ථ එකෙක් නැතැයි නිශ්චයකොට තමන් සමීපයට කැඳවා වක්‍ර නම් අසුරයා මැඬපැවති හෙයින් වක්‍හු නම් වූ ජයට පැමිණි අවශෙෂ දෙතිස් දිව්‍යපුත්‍රයන්ට ප්‍රීතිකෘත්‍යය සිඬකරණ හෙයින් පිතා නම්වූ ශක්‍රදේවේන්ද්‍රයෝ කියන්නාහු පුරුෂයන් කෙලශයෙන් මිශ්‍රකරණ හෙයින් මිශ්‍ර යන නම ඇති ඍෂිවරයන් පොළඹවන්ට සමර්ථවූ අලම්බුසා නම්

දිව්‍යාඞ්ගනාවන්ට ප්‍රධානවූ තවුතිසා දෙව්යෝ ඉසිසිඞ්ග තාපසයන් සමීපයට ගොස් ඒ තාපසයන් වසඟයට පමුණුවාගෙණ ශීල හෙද කරණු කැමැත්තෝ යයි කීහ. මෙසේ කියා තවද ශක්‍රදේවේන්‍ද්‍රයෝ කියන්නාහු එම්බල අලම්බුසාව, මේ තපස්වි උතුම් ව්‍රතසමාදානයෙන් හෝ බ්‍රහ්මචර්‍ය්‍යයෙන් යුක්තයෝය. දීර්ඝායුෂ්ක හෙයින් නිර්වාණ මාර්ගයෙහි ඇලුනාහුය. ගුණයෙන් වැඩිසිටියාහුය. එසේ හෙයින් යම්තාක් තුමූ අප මැඩ නැවත මේ ස්ථානයෙන් චුත කෙරෙත් නම් ඊට පළමු තෝ ගොස් උන් දිව්‍යලෝකයට එන්නාවූ මාර්ගය වලකයි කීහ. එබස් අසා අලම්බුසා නම් දිව්‍යාඞ්ගනා තොමෝ කියන්නී දිව්‍ය රජ්ජුරුවන් වහන්ස, මේ දිව්‍යලෝකයෙහි ඇත්තාවූ දිව්‍යාංගනාවන්ගෙන් තපස්වීන් වහන්සේගේ ශීලය හෙදකරණු සඳහා නුඹවහන්සේ මා ම දුටුසේක්ද අනික් කෙණෙකුන් නුදුටුසේක්ද මේ දිව්‍යලෝකයෙහි මට වඩා රූපශ්‍රීන් බබලන්නාවූ බොහෝදෙන ඇත. ඔවුන්ටත් වාරයක් පැමිවණේවයි ඔවුන් ගොස් ඉසිසිංග තාපසයන් පොළඹා ශීල හෙද කරවයි කීහ.

එබස් අසා ශක්‍රදේවේන්‍ද්‍රයෝ කියන්නාහු අලම්බුසාව, මේ තන්‍ෙදන වනෝද්‍යානයෙහි තිට වඩා අන්‍යවූ දිව්‍යාංගනාවෝ ඇත. ඔහු ගොස් ඉසිසිංග තාපසයන්ගේ ශීල හෙදකෙරෙත්වයි කියන්නාහු තී විසින් එබැවින් සබැවක්ම කියනලද්දේය. එසේද වුවත් සර්වාංගයෙන් හොබනාවූ අලම්බුසාව, තෝ යම්බඳු ස්ත්‍රීලීලාවක් දන්නෙහි වීනම් අවශෙෂ දිව්‍යාංගනාවෝ පුරුෂයන් කරා ගියාහු උන් පොළඹාගන්නාවූ උපාය තීසේ නොදන්නාහ. එසේ හෙයින් කල්‍යාණවූ අංගප්‍රත්‍යංග ඇති තැනැත්තිය සියලු ස්ත්‍රීන්ට තීම උතුම් හෙයින් තොම ගොස් තීගේ ශරීර වර්ණයෙන් හා රූපසම්පත්තියෙන් ඒ තාපසයන් තිගේ වසඟයට පමුණුවාගෙණ එවයි විධාන කළහ.

එබස් අසා අලම්බුසා තොම කියන්නී දිව්‍ය රජ්ජුරුවන්වහන්ස, මම නුඹවහන්සේ විසින් විධාන කරණලද්දෙන් ඒ තපස්වී සමීපයට නොයෙමි. ඒ තපස්වියා උග්‍රවූ තපස් තේජස් ඇත්තාහ. එසේහෙයින් මම උන්ගේ ශීල හෙදය කොට මා කෙරෙහි ඇල්වන්ට භය ඇත්තෙමි. මොහයෙන් ඍෂිවරයන් පොළඹා ශීල හෙදය කොට සංසාරයට පැමිණ වෘතනදුකඛ සංඛ්‍යාත නරක දුකඛයෙහි පිහිටියාවූ සත්ත්වයෝ මෙතෙකැයි ගණන් නැත. එසේ හෙයින් ඒ තාපසයන්ගේ ශීල හෙදය කෙරෙමියි සිතන්නාවූ මාගේ ශරීරයෙහි ලොම් භයින් කෙළින් නැගී සිටියේයයි කිව. මෙසේද කියා තමාගේ ශ්‍රියහත් ගබඩාවට ගොස් සර්වාභරණයෙන් සැරසී ඉසිසිංග තාපසයන් කෙලශ බන්ධනයෙන් බැඳ ශීල හෙදය කරණු සඳහා විශිෂ්ටවූ රූපශ්‍රීන් බබලන්නාවූ අලම්බුසා නම් දිව්‍යාංගනා තොමෝ ඉසිසිංග තාපසයන්ගේ පන්සලට ගියාය. මෙසේ ගොස් දෙගව්වක් පමණ දිග පුළුල ඇති හාත්පසින් රත්කරඹු වනයෙන් ගැවසීගත්තාවූ ඉසිසිංග තාපසයන් විසින් රක්නාලද වනයට වැද උදෑසන හිරු නැගෙන වේලෙහි අලම්බුසා නම් දිව්‍යාංගනා තොමෝ ඉසිසිංග තාපසයන් රාත්‍රියෙහි වීර්‍ය්‍යී වඩා උදෑසනම ජලස්නානය කොට පන්සල හිඳ මදක් ධ්‍යාන සැපයෙන් කල්යවා පන්සලින් නික්ම ගිනිහල්ගෙය අමදිනාවූ තාපසයන්කරා පැමිණ ස්ත්‍රීවිලාශය දක්වමින් ඒ තපස්වීන් අභිමුඛයෙහිසිටියාය. ඉක්බිත්තෙන් තාපසයෝ දැක විචාරන්නාහු මෙසේ කීහ. විසිතුරුවූ හස්තාභරණයෙන් සමන්විතවූ බහා පලඳනාලද මාණික්‍ය කුණ්ඩලාභරණයන් ඇති මේඝමුඛයෙහි ගසනලද විදුලියක් මෙන්ද ඔෟෂධි තාරකාවක් මෙන්ද බබලන්නාවූ තෝ

කවර දිව්‍යනිකායෙක්හි උපන්නාවූ දිව්‍යස්ත්‍රියෙක්ද? දිව්‍යාංගනාව, තෝ බාලාර්ක මණ්ඩලයක් බඳුවූ ශරීර ශෝභාවෙන් බබලන්නෙහිය. රන්වන්වූ සඳුන් විලවුන් ගල්වනලද ශරීර ඇත්තේය. ස්ත්‍රීමායමෙහි ඉතා දක්‍ෂයෙහිය. උතුම්වූ යෞවන අවස්ථාවෙහි පිහිටියෙහිය. මනාවූ සිඟුවලඟ ඇත්තෙහිය. ඉතා සිව්මැල්ලෙහිය. නිර්මලවූ අංගප්‍රත්‍යංගයන් ඇත්තෙහිය. තිගේ පතුල් දෙක සමහුම් ස්පර්ශ කරන්නේ ඇත් මැත් බලා සක්මන් කරන්නාවූ තෝ ඉතා ලීලෝපේත බැවින් විශේෂයෙන් ඇලීම් කටයුත්තෙහිය. මෙබඳුවූ උත්කෘෂ්ටවූ ස්ත්‍රී විලාසයෙන් සක්මන් කරන්නාවූ තිගේ පාදයෝ මාගේ සිත් පැහැර ගන්නාවූත් වැන්නෙහිය. තවද තිගේ ඌරුයුගලය ක්‍රමෝන්නත බැවින් ඇත් සොඬකට බඳුවූ උපමා ඇත්තේය. රන්පෝරුවක් මෙන් තිගේ නිතම්බප්‍රදේශය ඉතා විශාල වන්නේය. තිගේ නාභිමණ්ඩලය නිලුපුල් කෙමියක් මෙන් මනා පිහිටියේය. සූක්‍ෂමවූ කෘෂ්ණලෝමයෙන් ගැවසීගත් බැවින් දුරින් බලන්නාවූ සත්ත්වයන්ට අඳුන් මෙන් පෙණෙන්නේය. තිගේ පයෝධර යුග්මය තවු නැති මලෙහි එල්බෙන රන්තිඹිරිගෙඩි දෙකක් මෙන් මනාව හටගත්තේය. මලානිකය. නූස් නොම්පිය. ඉතා ප්‍රසාදවූහ. රන්පෝරුවක් මෙන් බබලන රන්වන් වටවූ පට ඉතා හොබනේය. තිගේ සවර්ණවූ ග්‍රීවය ඒ තිම්බුගයක්හු දික්ව වට ග්‍රීවය යම්සේ හොබිතම් එපරිද්දෙන්ම හොබනේය. නැවත රේඛාත්‍රයකින් විරාජමානවූ මදක් දික්වූ තිගේ කර රන්මිහිඟුබෙරක් මෙන් ඉතා විශේෂවත් වන්නේය. තිගේ අධරයුගලය අතිරක්තවූ ජිව්හා මෙන් විශේෂයෙන් රත්වන්නේය.

තවද තිගේ උඩුදත් යටිදත් නිර්දෝෂවූ හනුමස් කෙළවර පිහිටියේය. දූඩ් දණ්ඩෙන් මදනා ලද්දක්මෙන් නිර්මලව පිරිසිදුව ඉතා දර්ශනීය වන්නේය. තවද තිගේ දිගපුළුල්වූ නුවන් ඉතා නිල්වන්නේය, නුවන් කෙළවර ඔලිඳඇටයෙහි පැහැ සමානවූ රත්පැහැ ඇත්තේය. නැවත පස්පැහැ දිස්නාවූ තිගේ ඇස්සඟළ බලන්නාවූ සත්ත්වයන්ට බලා තෘප්තියට නොපැමිණෙන්නේය. තිගේ කේශකලාපය නොදික් නොලුහුඬුව පවතින් යුක්ත වන්නේය. චන්දන කාල්කයෙන් පරිභාවිතාකරණලද්දේය. නැවත සුවඳතෙල් ගල්වා රන්පනාවෙන් සනාගා මනාකොට ගවසනලද්දේය. බලන්නාවූ සත්ත්වයන්ට නොම ප්‍රසාද වන්නේය. මේ ලෝකයෙහි කෘෂි හෝ රක්‍ෂාවෙන් හා වෙළඳාමෙන් ජීවත්වන්නාවූ යම් සත්ත්වයෙක් ඇද්ද මේහිමාලයවනයෙහි කායවාක් සංයමය ඇත්තාවූ යම් පමණ තපස්වී කෙණෙක් ඇද්ද ඒ සියල්ලවුන් අතුරෙන් රූපයෙන් භාවභාවලීලාකටාක්‍ෂ මන්දස්මිතයෙන් තී හා සමාන එකකුත් නොදක්නෙම් තෝ කවරෙක්හිද කාගේ පුත්‍රයෙක්හිද තී කවුරුනැයි දනුමෝද්දූයි මෙසේ ඒ තපස්වී අලම්බුසා නම් දිව්‍යාංගනාව ස්ත්‍රිය නියාව දූත දූතන් පූජී ව්‍යවහාරයෙන් විචාළාහ.

මේ ඒ ඉසිසිංග තාපසයන් පාදතලයෙහි පටන් කේශාන්තය දක්වා තමාගේ රූපවර්ණනාදී කථාව කියා නිම්කල්හි තපස්වීන් තමාගේ රූපයෙහි බැඳී මූඪවූ නියාව දැන මෙසේ කීව. කාශ්‍යප ගෝත්‍රයෙහි උපන්නාවූ ඉසිසිංග තපස්වීන්වහන්ස, නුඹවහන්සේට වැඩෙක් වේවයි නුඹවහන්සේගේ සිත මා කෙරෙහි බලවත්ව ඇලුනු බැවින් විචාරන්ට කල්නොවෙයි මෙසේ අවමැනව අපි දෙදෙනා ඔවුනොවුන් වැළඳගෙණ පඤ්චකාමරතියෙන් අභිරමණයකරම්හ. නුඹවහන්සේ කාමානුභවය කරන්නාවුන් කෙරෙහි අග්‍ර උවමැනවැයි කීව. මෙසේ කියා අලම්බුසා සිතන්නී මේ තාපසයෝ මා මෙතක සිටිකල්හි සම්පයට

නොඑති. එසේහෙයින් මෙතනින් යන බඳු ගමනාකාරය දක්වමි සිතා තමා සත්‍රීමායමෙහි දක්‍ෂහෙයින් තාපසයන් කුපිතකොට පළමු තමා ආවාවූ මාර්ගය අභිමුඛයට නික්මුණාය.

එකල්හි ඉසිසිංග තාපසයෝ නික්මුණු දිව්‍යාංගනාව දැක ඕතොමෝ යන්නීවනැයි සිතා තමන්ගේ ගතිය සිඳ වේගයෙන් දිවගෙණගොස් කෙස්වැටිය අල්වාගත්හ. එසඳ ශොභනවූ අංගප්‍රත්‍යංග ඇති අලම්බුසා නම් දිව්‍යාංගනාව තමාගේ කෙස්වැටිය අල්වාගත්තාවූ තපස්වී පෙරලී සිට තරයේ වැළඳගත. එකෙණෙහි තපස්වීන්ගේ ධ්‍යාන අන්තර්ධානවිය. ධ්‍යානය පිරිහීමෙන් බ්‍රහ්මචර්‍ය්‍යා චනුත්චුතවූහ. ශක්‍රදේවේන්‍ද්‍රයන් විසින් යමෙක් පතනලද්දේවීනම් එකෙණෙ හිමසමෘද්ධවිය. ඉක්බිත්තෙන් ශක්‍රදේවේන්ද්‍රයන්ගේ ප්‍රාර්ථනාවදැක ඒදිව්‍යාංගනා තොමෝ තපස්වීගේ බ්‍රහ්මචර්‍ය්‍යා විනාශයෙන් හටගත්තාවූ ප්‍රීතිප්‍රමෝද්‍යය ඇත්තී ඒ තපස්වී වැළඳගෙණසිටම සන්තොෂ උපදවන්ට සමර්‍ථ බැවින් තුන්දහ වන සංඛ්‍යාතවූ තව්තිසා භවනයෙහි වසන්නාවූ ශක්‍රදේවේන්ද්‍රයන්වහන්සෑ අපි දෙදෙන සැතපෙන පිණිස පර්‍ය්‍යඞ්කයක් එවූසේක්වීනම් යහපතැයි සිතූහ. එසඳ දිව්‍යාංගනාවගේ අදහස් දැන ශක්‍රදේවේන්ද්‍රයෝ පිරිවර සහිත සවර්‍ණ පර්‍ය්‍යඞ්කයක් එවූහ. දහසක් කොහුපලස් අතුට ඊමත්තේ දිවඇතිරිලි පණසක් අතුරණලද්දවූ ශ්‍රීයහන් මස්තකයේ හිඳ අලම්බුසා නම් දිව්‍යාංගනා තොමෝ ඒ ඉසිසිංග තාපසයන් ලෙහිලා දරූහ. එකල ඇසිල්ලකින් මනුෂ්‍යගණනා වෙන් තුන්අවුරුද්දක් මුලුල්ලෙහි ඉසිසිංග තාපසයන් ලෙගි වැදහොවාගෙණ පර්‍ය්‍යඞ්කයේ හිඳ තුන්අවුරුද්දක් මුලුල්ලෙහි තපස්වී විසංඥවට පැමිණියහ. තුන්අවුරුද්දක් විසංඥව පසුව ලබන ලද සංඥා ඇතිව පිබිද ගියාහ. ඒ තපස්වීන් පුබුදින්ට පටන්ගත් කල්හි අතපය සැලෙන්නා දැක අලම්බුසාතොමෝ තපස්වීන් පුබුදින නියාව දැක පර්‍ය්‍යඞ්කය අන්තර්ධානකොට තොමෝත් අතුරු දන් වී සිටියාය.

එසඳ ඉසිසිංග තාපසයෝ ආශ්‍රම ප්‍රදේශය බලන්නාවූ කවරක්හු විසින් ශීල විනාශයට පමුණුවනලදින් අහෝයි සිතා මහහඬින් හඬා බාෂ්පධාරාවන් පැහැරූහ. නැවත ගිනිහල්ගෙය හාත්පසින් පිරිවරාගෙණ සිටියාවූ නිලීගත් පත් ඇති වෘක්ෂයන් හා කෙවිලි සමූහයෙන් විසිතුරු පිළිරුව් දෙනලද අභිනව පලුඑල්ලවයෙන් ගැවසීගත්තාවූ සුපිෂ්පිතවූ වනලැහැබ දැක විශෙෂයෙන් ශොකපත්ව මතුමත්තෙහි අඬන්නාවූ තපස්වී වාක්විලාපකරන්නාහු හොමයන් නොකළෙමි. මෙතෙක්දවස් මන්ත්‍රයන් නොපිරවීමි. ගිනිදෙවියාට පූජාන් පිරි හෙලීමි. මීට පළමු මාගේ සිත කෙලශකාමයෙන් කවරකෙණෙක් පොළඹා ගත්තුද වල්හි වසන්නාවූ ශ්‍රමණ තේජසින් රැස්කරණලද ධ්‍යානග්‍රහණය නොයෙක් රත්නයෙන් පිරුණාවූ මහනැවක් මහසමුද්‍රයෙහි අල්වාගෙණ ගසාපූ වාක් මෙන් යමෙක් නසාපූයේවීනම් එතෙම කෙසේ එකෙක්දෝහෝයි කියා ඇඬූහ. ඒ වාක්විලාප අසා අලම්බුසා සිතන්නී ඉදින් මම නොයෙම්නම් මේ තපස්වී මට දෙස්කරන්නාහ. එබැවින් මම මූන්ට මා විසින් ශීලභෙද කළ නියාව කියමි සිතා දෘශ්‍යමානරූපයෙන් සිට මෙසේ කීව. තපස්වීන්වහන්ස, නුඹවහන් සේගේ ශීලභෙද කරණ පිණිස ශක්‍රදේවේන්‍ද්‍රයන් වහන්සේගේ නියෝගයෙන් ආවාවූ මම මාගේ හාව හාවලීලාවෙන් නුඹවහන්සේ පොළඹා මාගේ වසඟයෙහි පමුණුවාගෙණ ශීලභෙදයට පැවණිවීමි මාගේ දිව්‍යශරීර ස්පර්‍ශයෙන් මත්වූ නුඹවහන්සේ මෙතෙක්කල් කිසිවක් දැනගත නුහුනුසේකැයි කීව. එබස්

අසා ඉසිසිංග තාපසයෝ පියාතන් දුන් අවවාද සිහිකොට මහත්වූ විනාශයට පැමිණියෙමියි අඬන්නාවූ කාශ්‍යප ගොත්‍රයෙහි උපන්නාවූ පියාතන්වහන්සේ පුත මේ හිමාලයවනයෙහි නාරිලතා කුසුම් බඳුවූ ස්ත්‍රීහු ඇත. ඔහු පුරුෂයන් තමාගේ වසඟයට පමුණුවා මහත් විනාශයට පමුණුවති. එබඳු ස්ත්‍රීන් දුටු ඔවුන්ගේ දර්ශනයට නොගොස් පලායවයි මා පියාතන් වහන්සේ මට අනුශාසනා කළසේක. නැවතත් මපියාතෝ මා කෙරෙහි අනුකම්පාවෙන් මට අවවාද කරණසේක් පුත මේ වෙනි ලෙහි පයෝධරයයි කියනලද මස්ගඩු දෙකක් ඇති තන්හියට පමුණුවති දුතගණුවයි කීසේක.

එසේවූඔ තාපසයෝ මා පියාතන්වහන්සේගේ බස් අදහාගෙණ උන් වහන්සේ කීවා නොකෙළෙමි දුන්වූ කල්හි කිසි මනුෂ්‍ය කෙණෙකුත් නැත්තාවූ මේ වනයෙහිද එකලාව ශොක කෙරෙමින් ඇවිදිමි. මාගේ ජීවත්වීමෙන් කවර ප්‍රයෝජනයෙක්ද මරණට හෝ පැමිණියෙමි. නැත්නම් මපියාතන්වහන්සේකීවා කොට තවුවාවූ ධ්‍යාන උපදවා වීතරාගී නොවෙමි සිතූහ. මෙසේ සිතූ ඉසිසිංග තාපසයෝ කාමරාගය දුරුකොට නැවත ධ්‍යාන ඉපදවූහ. එකල්හි තපස්වීන් ගේ තපස් තේජසින් වීර්‍ය්‍යයත් ධ්‍යානයත් ඉපදවූ නියාව දුත අලම්බුසා තොමෝ භයින් ත්‍රස්තව ඉසිසිංග තාපස කෙණෙක් ඇත ඔහු තමන් වසඟයට පැමිණිය වූන් මහත්වූ විනාශයට පැමිණියවූන් දෙපාඟ ඉස තබාගෙණ ක්‍ෂමාකරන්නී මහත්වූ වීර්‍ය්‍ය ඇති මහාඍෂීන් වහන්ස, මට නොකිපෙනු මැනව. ත්‍රායත්‍රිංශත් දිව්‍යලොකයෙහි අධිපතිවූ යසපිරිවර ඇත්තාවූ ශක්‍රදෙවෙන්ද්‍රයන් වහන්සේගේ බස්ගෙණ නුඹවහන්සේගේ ශීලභෙදය කළාවූ මා විසින් මහත් අවැඩක් කරණ ලද පළමු තපස් කරන්නාවූ නුඹවහන්සේ විසින් දිව්‍යලෝකයෙහි දෙවියන්ගේ ලය කම්පා කරණලද ඒ දෙවියෝ නුඹවහන්සේ තපස්කොට තමන්ගේ දිව්‍ය ලෝක සම්පත් උදුරාගණිති භයපත්වූහ.

දුන්වූකලී නුඹවහන්සේ ධ්‍යාන උපදවා බ්‍රහමලෝකයෙහි උපදිනාහෙයින් දිව්‍යලෝක සම්පත්තීන් ප්‍රයෝජන නැත්තෝ වේදැයි ඒ දේවතාවෝ සතුටු වෙති කීහ. ඉක්බිත්තෙන් ඉසිසිංග තාපසයෝ සොඳුර තිට ක්‍ෂමා කෙරෙමි කියා ක්‍ෂමාකොට සැපසේ තිගේ දිව්‍යලෝකයට යවයි කියා යවන්නාහු දිව්‍යාංගනාව නව්තිසා වැසි දෙවියෝත් ශක්‍රයෝත් සුවපත්වෙත්වයි තොපත් සුවපත් වෙත්වයි තොපිත් සුවපත්ව සැපසේ යවයි කීහ. එසඳ දිව්‍යාංගනා තො මෝතපස්වී දෙපය අල්වාගෙණ වැඳ පැදකුණුකොට දොහොත්මුදුනෙහි තබා ඒ ස්ථානයෙන් නික්ම දහසක් කොඳුපලස් හා පණ්‍යක් දිව ඇතිරිලි අතුරණලද එම සවණි පය්‍ය්‍යඞකායට පැනනැගී දිව්‍යලෝකයට ගියාය. ප්‍රදීපයක් මෙන්ද විදුලියක් මෙන්ද බබලමින් අවුත් වැඳලා සිටියාවූ දිව්‍යාංගනාව දැක සතුටු සිත් ඇති ශක්‍රදෙවේන්ද්‍රයෝ වරයක් දුන්හ

එසඳ අලම්බුසා තොමෝ ශක්‍රදෙවෙන්ද්‍රයන්ගෙන් වරන්ගන්නී දිව්‍ය රජ්ජුරුවන් වහන්ස, ඉදින් නුඹවහන්සේ වරයක් දෙනු කැමැත්තේවීනම් නැවත තපස්වී කෙණෙකුන් කාමයෙන් පොළඹනු පිණිස නොයම්වයි එබන්ද නිසා මතු මා නොයවුව මැනව, මෙබඳු වරයක් ගණිමි කියා මේ වර ගත. ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ උකටලීවූ භික්‍ෂූන් වහන්සේට මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ අලම්බුසා ජාතකය නිමවා වදාළසේක චතුස්සත්‍ය ධර්මදෙශනාවගේ කෙළවර උකටලී භික්‍ෂූන් වහන්සේ සෝවාන්ඵලයෙහි පිහිටිසේක. එසමයෙහි අලම්බුසානම් පුරාතන

දූතිකාය, ඉසිසිඞ්ග තාපසයෝ නම් මේ උකටලී මහණය, එසමයෙහි පිතෘ මහ තාපසයෝ නම් තිලෝගුරු සම්බුදු රජවූ මම්ම වේදෑශී තමන් වහන්සේ දක්වා වදාළසේක.

514
සංඛපාල ජාතකය.

තවද එක්සමයෙක්හි තිලෝගුරු ලෝකාලෝක දිවාකරවූ බුදුරජාතන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි පෙහෙවස් විසීමක් අරභයා මේ ජාතකය වදාළසේක. එකල්හි සර්ඥයන් වහන්සේ පෙහෙවස් විසූ උපාසක වරුන්ට ප්‍රශංසාකොට වදාරණසේක් එම්බා උපාසකවරුනි,

යටගිය දවස රජගහනුවර මගධ රජ්ජුරුවන් රාජ්‍ය කරණ සමයෙහි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් කිසවුන් කුස පිළිසඳ උපන්නාහුය. ඒ කුමාරයන්ට නම් තබන්නාහු රජ්ජුරුවෝ දුර්යෝධ කුමාරයෝයයි නම් තැබූහ. කුමාරයෝ වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් සමීපයෙන් ශිල්පශාස්ත්‍ර ඉගෙණ අවුත් දෙමව්පියන් දුටහ. එකල රජ්ජුරුවෝ පුතනුවන්ට රාජාභිෂෙක කොට තුමූ ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව එම උයනෙහි වාසයකරන්නාහ.

බොධිසත්ත්වයෝද දවස තුන්විටක් තමන්ගේ පියතාපසයන් සමීපයට ගොස් වැඳඑන්නාහ. එකල තාපසයන්ට මහත්වූ ලාභසත්කාර උපන්නේය. තාපසයෝ මට උපදනා ලාභසත්කාර මහත. එසේ හෙයින් මෙතන වසන්නාවූ මා විසින් කෙලශ නමැති ජය සිඳගත නොහැක්කේය. එබැවින් මාගේ පුතනුවන්ට නොකියාම අත්‍යසථානයකට යෙමි සිතා කිසි කෙණෙකුන්ට නොකියාම උයනින් නික්ම මගධරට රාජ්‍යය ගෙවා මහිංසක රාජ්‍යයෙහි සඞ්ඛපාල නම්වූ විලින් නික්මුණාවූ කනතපෙතන නම් ගංතෙර චන්‍දක නම් පර්‍වතය නිසා පන්සල් කොටගෙණ වසන්නාවූ කිසිනුපිරියම් කොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවාගෙණ වනමුල් ඵලාහාරයෙන් යපෙමින් වාසය කරන්නාහුය. එකල සංඛපාල නම්වූ විලින් නාරජ්ජුරු කෙණෙක් මහත්වූ යසපිරිවරින් යුක්ත කනතපේන නම් ගඟින් උඩනැගී අතරතුරෙහි තාපසයන්ගෙන් බණ අසන්නාහ. එකල තාපසයන්ගේ පුත්වූ රජ්ජුරුවෝ පියානන් ගිය අත් නොදන ඇත මෑත චරපුරුෂයන් යවා පරීක්ෂා කරවා අසවල් තැන වෙසෙති යනු අසා පියානන් දක්නා කැමතිව මහත් යසපිරිවරින් නික්ම ගං සමීපයට කඳවුරු බැඳ අමාත්‍යයන් කීපදෙනෙකු හා සමග ආශ්‍රම පදයට නික්මුණාහ. එකල සංඛපාල නම් රජ්ජුරුවෝ මහත් යසපිරිවර හා තාපසයන්ගෙන් බණ අසමින් හුන්නාහු එන්නාවූ රජ්ජුරුවන් දැක වහා නැගිසිට තාපසයන් වැඳ සමුගෙණ ගියාහ. රජ්ජුරුවෝද ඇවිත් පියානන් වහන්සේ වැඳ සුවදුක් විචාරන්නාවූ මේ රජ්ජුරුවෝ නම් කිනම් රජ්ජුරුකෙණෙක්දැයි විචාළාහ.

එකල තාපසයෝ පුත උඹ තුමූ සංඛපාල නම් රජ්ජුරු කෙණෙකැයි කීහ. බොධිසත්ත්වයෝද නාග සම්පත්තිය නිසා නාගභවනය කෙරෙහි ලොභ උපදවාගෙණ කීපදවසක් එහි වසයකොට පියානන්ට කීපදවසක් භික්ෂාව දෙවා නැවතත් තමන්ගේ සිය නුවරට අවුදින් නුවර වාසල් දොර දන්හල් සතර

රක් කරවා සියලු ජම්බුද්වීපය අලලමින් දන්දී සිල් රක්‍ෂාකොට පෙහෙවස් වසා නාගභවනය ප්‍රාර්ථනාකොට ආයුෂයාගේ කෙළවර නාගභවනයෙහි සංඛපාල නම්වූ නාරජවූහ. මෙසේ නාරජව උපන්නාවූ බෝධිසත්ත්වයෝ කල්යාමකින් සම්පත්තියෙහි විපිළිසරව කළකිරී එතැන් පටන් මනුෂ්‍යාත්මභාවය ප්‍රාර්ථනා කරන්නාහු පෙහෙවස් වසන්නාවූ බෝධිසත්ත්වයන්ගෙන් බොහෝ ශීලභෙද වන්නාහුය. බෝධිසත්ත්වයෝද එතැන්පටන් සෙණ නාගභවනයෙන් නික්ම කණ්ණපෙත නම්වූ ගඟට නුදුරුවූ එක් මාවතක් හා එක් පියවර සටහන් ඇති සුමුදුම්ගක් හා මෙමං දෙකට අතුරෙහි එක් තුඹසක් හොගයෙන් වෙළා ගෙණ පෙහෙවස් ඉටාගෙණ සමාදන්වනලද සිල් ඇත්තාවූ මාගේ සමින් ප්‍රයෝජන ඇතිකෙණෙක් මස් ආදිය ඇරගණීත්වයි කියා මාගේ ශරීරය දන මුඛයෙහි වියදම් කොට තුඹස මත්තෙහි වැදහෙව මහණදම් පුරන්නාහු තුදුස්වක් පසළොස්වක් පොහොයෙහි මනුෂ්‍යලෝකයෙහිදී පෙහෙවස් රැක පෑලවිය දවස් නාගභවනයටම යන්නාහ. මෙසේ ඒ බෝධිසත්ත්වයන් පෙහෙවස් සමාදන්වගෙණ එක්දවසක් තුඹසක් මත්තේ හොත් කලට ප්‍රත්‍යන්ත ජනපදවාසී වූ මනුෂ්‍යයෝ දෙළොස්දෙනෙක් දඩගොස් මස්ගෙණෙම්හයි වලට ගියාවූ ආයුධ අත් ඇතිව දිවාමානය මුළුල්ලෙහි වල ඇවිද කිසිවක් නොලැබ නැවත ගමට එන්නාහු තුඹස් මත්තෙහි වැදහොත්තාවූ බෝධිසත්ත්වයන් දැක අපි ගොස් සාවෙකු විවර නොලද්දම්හ. එසේ හෙයින්, මේ නාරජ්ජුරුවන් මරාපියා කම්හයි සිතා මෙතෙම මහත්වූ ශරීර ඇත්තේය. එසේ හෙයින් අප හැමවිසින් අල්වන කල්හි ගියේනම් තපුර යම් පරිද්දෙකින් නොයන්නේ වීනම් එසේම ඔහුගේ දරණ උලින් අමුනා දුම්ලකොට අල්වම්හයි උල් ඇරගෙණ ලඟට ගියාහ.

එකල බෝධිසත්ත්වයන්ගේ ශරීරය එක් දඹුඔරුවක් සා පමණ මහත ඇත්තේය. වටකොට තබනලද ඉද්දමල් දමකට බඳුවූ සොභාව ඇත්තේය. ඇස්දෙක ඔලිඳඇට බඳු පැහැ ඇත්තේය. ඇස් සමන්මල් වඩම්කට බඳුවූ ශ්‍රී ශරීර ඇත්තේය. ඒ එකල බෝධිසත්ත්වයෝ උල් ඇරගෙණ තමන් සමීපයට එන්නාවූ පුරුෂයන් දැක අද මාගේ මනෝරථය මුදුන් පැමිණෙන්නේයයි සිත තමන්ගේ ශරීරය දනමුඛයෙහි යෙදී වියත්‍යාධිෂ්ඨානය කොටගෙණ හොත්තාවූ මොහු මාගේ ශරීරය සෙල්ලයෙන් ඇත සිදුරුකරණ කල්හිත් ක්‍රොධයෙන් ඇස දල්වා නොබලමි. තමන්ගේ ශීලභෙදයෙහි භයින් සථිරවූ අධිෂ්ඨානගෙණ ඉස දරණවැල ඇතුළෙහි තබා හොත්තාහුය.

එකල ඒ පුරුෂයෝ බෝධිසත්ත්වයන් සමීපයට ගොස් වාලධියද අල්වා ගෙණ බිමහෙලා ගෙණ තියුණුවූ හුලින් අටතැනෙකින් ඇත කටුසහිත වේවැල යටයෙන් අමුනකලද සිදුරෙන් බහා අටතැනකින් කඩලාගෙණ අටකඳකින් උසුළුවාගෙණ යන මහත් වූ මාර්ගයට බටහ. බෝධිසත්ත්වයෝ ඒ පුරුෂයන් ගොස් උලින් අන්නා වේලෙහි පටන් කිසිවිටකත් කෝපයෙන් ඇස දල්වා නොබැලූහ. මෙසේ නාරජ්ජුරුවන් අට කඳකින් උසුලාගෙණ යනකල්හි එල්ලෙන්නා වූ ඉස බිම වැදගත්තේය. එකල්හි ඒ පුරුෂයෝ හිස බිම නොවැද ගන්නා පිණිසයයි මාවත් මධ්‍යයෙහි නාරජ්ජුරුවෝ හොවා දැඹිහුයක්ගෙණ නාසාපුටයෙන්ද අමුනා එහි ලනුවක් ඇදකොවා කඩකෙළවර බැඳ නැවත ඔසවා ගෙණ නික්මුණාහ එකල වැදෑරට මිථුලුනුවර වාසිවූ ආලාර නම් එක්කෙළෙඹි පුත්‍රයෙක් පන්සියයක් ගැල්පටවාගෙණ මහත්වූ එක් යානාවෙක්ද හිඳ මාගීයෙහි යන්නේය. ඒ පුරුෂයන් ගෙණයන්නාවූ බෝධිසත්ත්වයන් දැක ඔවුන්

සොළොස් දෙනාටම ගැල් අදනාවූ ගොන් සොළොස්දෙනෙකු හා සමග එකි එකී ගැලක්ද රන්මසුද ඔවුන් සොළොස්දෙනාටම අඳනට පොරෝනට නිසි පිළිද ඔවුන්ගේ ගෘහබන්ධුන්ටත් වස්ත්‍රාභරණාදියද දී මහබෝසතානන් ගලවාපූහ. බොධිසත්ත්වයෝද නාගභවනයට ගොස් ඉතාකල් නොයවා මහත්වූ යසපිරිවර සහිතව ආලාර නම් කෙළෙඹි පුත්‍රයා සමීපයට ගොස් නාගභවනයෙහි සම්පත් වර්ණනාකොට කෙළෙඹි පුත්‍රයා කැඳවාගෙණ ගොස් නාගභවනයෙහි තුන්සියයක් පමණ නාගකන්‍යාවන් හා සමග මහත්වූ සම්පත් දී දිව්‍යවූ කාමගුණයෙන් සන්තර්පණය කළහ.

එකල ආලාර නම් කෙළෙඹි පුත්‍රයාද එක් අවුරුද්දක් මුලුල්ලෙහි දිව්‍ය පඤ්චකාමය අනුභව කොට නාරජ්ජුරුවන්ට කියන්නේ නාරජ්ජුරුවන් වහන්ස මම මහණවනු කැමැත්තෙමි කියා තවුස් පිරිකර ඇරගෙණ නාගභවනයෙන් නික්ම හිමාලයවනයට ගොස් පැවිදිව බොහෝකලක් එහි වාසයකොට මෑතභාගයෙහි ඇවිදිනාහු බරණැස්නුවර රජ්ජුරුවෝ දැක ඊර්යාපථයෙහි පැහැද රජගෙට කැඳවාගෙණ ගොස් මනාකොට පණවනලද අස්නෙහි වඩා හිඳුවා අනෙකප්‍රකාර රසයෙන් යුක්තවූ ආහාරය වළඳවා තුමූ එකත්පස්ව එක් මිටි අස්නෙක හිඳ ඒ තාපසයන් හා සමග කථාකරන්නාවූ රජ්ජුරුවෝ මෙසේ කියත්. සුන්දරවූ විශිෂ්ටවූ රූපයක් ඇති පඤ්චප්‍රසාදයෙන් යුක්තවූ නෙත්‍රයුග්මයක් ඇති පින්වත්වූ තාපසයෙනි තෙපි බොහෝ සම්පත් හැර ගෘහවාසයෙන් නික්ම කවර කුශලයකින් අවුදින් ප්‍රාඥවූ තෝ මහණවූවයි අපි කෙසේ දනුමෝදැයි විචාළාහ එකල තාපස කියන්නේ එම්බා රජ්ජුරුවෙනි, මම එක්තරා කෙළෙඹි පුත්‍රයෙක්. මහත්වූ ආනුභාව ඇති සංඛපාල නම්වූ නාරජ්ජුරුවන්ගේ ඓශ්වර්ය්‍යී හා ඔවුන් කරණලද කුශලකර්මයෙහි විපාක මා හැගි නියාම දැක මම සැදැහැයෙන් කර්මඵල දැන මෙලෝ පරලෝ අදහා පවත්නා සිතින් මහණවීමි රජ්ජුරුවෙනි කීහ.

නවද රජ්ජුරුවෝ කියන්නාහු තපස්වීන් වහන්ස, තාපසවරුහු පඤ්චකාමය නිසාද එක්තරා භයක් නිසාද වෙෂයකින් බොරු නොකියන්නාහුය. එසේහෙයින් කාරණය මහත්වූ සොම්නස් උපදනේය. ඊට කාරණා විචාළාවූ මට කිවමැනවැයි කීහ. නැවත තාපසයෝ කියන්නාහු රජ්ජුරුවෙනි මම වෙළදාම් කරණ පිණිස යෑයි කියා පන්සියයක් ගැල් යොදාගෙණ යන්නෙම් ජනපදවාසිවූ මනුෂ්‍යයන් සොළොස්දෙනෙකු විසින් මහත්වූ ශරීරයක් ඇති නාරජ්ජුරුකෙණෙකුන් අට තඩකින් සතුටු සතුටුව ගෙණයන කල්හි රජ්ජුරුවෙනි මමද උන් සමීපයට පැමිණ භයින් ලොමුදැහැගත්තේ භොජ පුත්‍රයයි කියන ලද වැද්දෙනි මහත්වූ භයානක ශරීරයක් ඇති මේ නාරජ්ජුරුවන් කරණ කොටගෙණ කුමක් කරණලදදැයි විචාළාහ.

එබසට වැදි පුත්‍රයෝ කියන්නාවූ මහත් ශරීරයක් ඇති නාරජතෙම අප විසින් ගොදුරු පිණිස ගන්නාලදහ. විදෙහපුත්‍රවූ අලාරනම් කෙළෙඹි පුත්‍රයානෙනි මොළොක්වූ මිහිරි රස ඇති සවුලවූ මේ නාරජහුගේ මසට වඩනා අන්‍යවූ කිසි රසයක් නැත. එසේහෙයින් අපි මෙතනින් මොහු අපගේ ගෙදර ගෙණ ගොසින් ශස්ත්‍රයෙන් කඩකඩ කොට සපා සතුටු සතුටුව මස් අනුභව කරම්හයි එසේ හෙයින් අපි නයින්ට ශත්‍රුවම්හයි කීහ. එකල මම කියන්නෙම් එම්බා වැදිපුත්‍රයානෙනි මේ මහත්වූ ශරීරයක් ඇති නාරජ්ජුරුවන් ඉදින් අනුභව කරණ පිණිස ගෙණ යන්නාහු වී නම් නාරජ්ජුරුවන් පිණිස මම තොපට

කොත් සොළොස්දෙනෙකු සහිතවූ වසනුදෙමි. එසේහෙයින් තොපි මේ නාරජහු බන්ධනයෙන් උනාපියවයි කීමි. එකල වැදිපුත්‍රයෝ මට කියන්නාහු එම්බා කෙළෙඹිපුත්‍රයානෙනි අපි පෙර බොහෝ තසින් සෑ විරුම්හ. එසේහෙයින් මේ මහාපවූ නාරජ්ජුරුවන් අද අපට නොදුරුවන්නේය. එසේදවුවත් අද අපිතෝ කීවා කරම්හයි නාරජහු අරුම්හ. එසේකල්හි විදෙහපුත්‍රවූ ආලාරයෙනි, තෙපි අදහා මෙතැන් පටන් මිත්‍ර වන්නාදූයි කියා නාරජ්ජුරුවන් බිම තබා ලදරුවන්ගේ කණ තිබූ පෙත් අරිතකලක් මෙන් දුක් කොට සෙමෙන් සෙමෙන් උල් ඇදපීමි. එකල නාරජ්ජුරුවන්ගේ නාසාපුටයෙහි අවුලන ලද වැල තිබිය දීම නාරජ්ජුරුවන් හැර මේ නාරජතෙමේ වේදනායෙන් පීඩිතව එහෙයින් නොයන්නේය. මළකල ඇරගෙණ යම්හයි කියා එකනැනක සැඟවී උන්හ. එකල නාරජ්ජුරුවෝ නැගෙණහිර බලා මදක්තැන් ගොස් කඳුලු පිරුණාවූ ඇස් ඇතිව මා දිසාව බැලූයේය. එකල මමද ඔහු පස්සේ මදක් තැන් ගොස් ඇඳිලිබැඳ සිට කියන්නෙමි එම්බා නාරජ්ජුරුවෙනි මේ තොපට සතුරුවූ වැදි පුත්‍රයෝ ඉදින් තොප නැවත අල්වාගන්නාහු වීනම් ඉතා දුක්වන්නේය. එසේ හෙයින් තොපි වහා උන්ට නොපෙණී පලායවයි කීමි. එකල නාරජ්ජුරුවෝද නිල්වූ පාට ඇති සිත්කළු ජලතලාමෙන්ද මනාවූ තොටපතරින්ද අඹ දඹ ආදී වූ අනෙකප්‍රකාර වෘක්ෂජාතියෙන්ද සංඡන්නාවූ කානනපෙත නම්වූ ගඟට බටහ. එකල නාරජ්ජුරුවන්ගේ ශරීරය යම්තාක් වාලඩිය දක්වා දියබටනෙත වන සමනව ගියේය.

මෙසේ නාරජ්ජුරුවෝ දුකින්මිදී සතුටුවූ සිතින් නාලොවට ගොසින් වහ වහා පිරිවරගෙණ මා ඒ ගංතෙරින් නොයනතුරු මම ඉදිරිපිටට අවුදින් පියක්හු ඉදිරියෙහි කරන්නාවූ ප්‍රිය පුත්‍රයක්හු සෙයින් ලයටසිහිල්වූ කටටමිහිරි බස් කියන්නෙම් එම්බා ආලාර නම්වූ කෙළෙඹි පුත්‍රයානෙනි, මට මෑණි නමුත් තොපිමය පියානෝ නමුත්, තොපිමය මට ජීවිතදාන දුන්නොත් තොපිමය මට යහළුවානෝත් තොපිමය මමද තොපගේ සහයෙන් සෑඩියෙන් හා යසසට පැමිණීයෙමි. එසේහෙයින් තෙපි මට බොහෝ උපකාරිය මමද තොපට සත්කාර කරණු කැමැත්තෙමි. මහමෙර මුදුනෙහි පිහිටියාවූ තව්තිසා භවනයට බඳුවූ මාගේ නාලොව බලන්නට වැඩියමැනවැයි කියා ඒ නැරජතෙම නිමීලවූ මහන්වූ කුලුගෙවල් හා ගබඩා අනවරතයෙන් බලන්නාවූ සත්ත්වයන්ට ප්‍රසාද එලවන්නේය. නැවත මහරජ්ජුරුවෙනි සුවණිකෙයුරාභරණයන් පැලැන්දවූ අනෙකප්‍රකාර රත්නාභරණාලොකයෙන් බබලන්නාවූ නාග කන්‍යාවන් විසින් ගැවසී ගත්තේය.

මහරජ්ජුරුවෙනි මම ඒ නාරජ්ජුරුවන්ගේ නාගභවනය වණිනා කරන් කරන් බලවත්වූ සොම්නසට පැමිණ ඒ නාගභවනය දක්නා කැමතිවීම් එකල්හි ඒ සඞ්ඛපාල නම් නාරජ්ජුරුවෝ නාගභවනයට මා අත අල්වාගෙණ වහ වහා ගොස් දහසක් ටැම් ඇති අසදෘශවූ මහිම ඇති ප්‍රාසාද මතුමහල් තලයට පැනනැගී තමන් අගමෙහෙසුන් බිසෝ යම්තෙනක උන්නාහු වී නම් නාරජහු එතනට ගොස් සිටවූහ. මේ ප්‍රාසාදයට පැනනැගී කල්හි එක් සත්‍රයක් ජාතිමයවූ අනය මාණික්‍යයෙන් යුක්තවූ මාහැඟි වෛඩූර්‍ය්‍ය මාණික්‍යමයවූ ආසනයක් ඒ නාරජ්ජුරුවන් නොකියාම යුහුව ගෙණවුත් මා ඉඳිනා සඳහා අභිමුඛයෙහි තිබූහ. ඉක්බිත්තෙන් සඞ්ඛපාල නම් නාරජ්ජුරුවෝ මා අත අල්වාගෙණ සිට පින්වත්වූ කෙළෙඹි පුත්‍රයානෙනි, තෙපි මට දෙමව්පියන් අතුරෙන් එක්තරා කෙණෙක. එසේ හෙයින් මේ අස්නේ සැපසේ වැද හිඳුවයි කියා උත්තම ආසනයෙහි

සිදුවූහ. ජනප්‍රධාන රජ්ජුරුවෙනි, අනර්ඝවූ නාගකන්‍යාවක් ව හා ගොස් පැන ගෙණවුත් ප්‍රියභාර්‍ය්‍යාවක් ප්‍රියපුත්‍රයක්හුගේ දෙපය අල්වා ස්නේහයෙන් සෝදන කලක්මෙන් දෙපය අල්වා සේදූහ. අනර්ඝවූ නාගකන්‍යාවක් එක වහා රන් තලියකින් සූප ව්‍යඤ්ජනයෙන් යුක්තවූ මනෝහරවූ ආහාර ගෙණවුත් අනුභව කරණ පිණිස එලවූහ මහරජ්ජුරුවෙනි, මා උතුම්වූ රසමසවුලෙන් යුක්තවූ ආහාර අනුභවකොට උන්කල්හි ඒ නාරජ්ජුරුවන්ගේ අදහස් දැන සියගණන් නාගකන්‍යාවෝ ආතත විතතාදීවූ පඤ්චාඞ්ගික තූර්‍ය්‍යභාණ්ඩයන් ගෙණ නටමින් ගී කියමින් මට සේවය කළාහ. ඒ සේවයකොට ඉක්බිත්තෙන් සංඛපාල නා රජ්ජුරුවෝ අනෙකප්‍රකාරවූ දිව්‍ය පඤ්චකාමයෙන් පැවරූහ. මෙසේ පවරා නැවත කියන්නාහු ආලාර නම් මානවකයාණෙනි, මාගේ මේ තුන්සියයක් පමණ භාර්‍ය්‍යාවෝ මනාවූ සිහුවලග ඇත්තාහ. පද්ම පත්‍රයකට බඳුවූ ශරීර ඡවි ඇත්තාහ. මොවුන් හැමදෙන තොපට කැමති පරිද්දෙන් පඤ්චකාමයෙන් පොළඹනු සඳහා දෙමි. මොවුන් හැමදෙනාම තොපට පාදපරිචාරිකාකරවයි කියා තුන්සියයක් නාගකන්‍යාවන් හා සමග ඒ සංඛපාල නම් නාරජ්ජුරුවෝ මට මහත්වූ නාගසම්පත් දුන්හ. මහරජ්ජුරුවෙනි, මම ඒ නාගභවනයෙහි වැස අවුරුද්දක් මුළුල්ලෙහි දිව්‍ය පඤ්චකාම කොට්ඨාසය අනුභවකොට එසමයෙහි සුන්දරවූ මූඛ ඇති සංඛපාල නම් නාරජ්ජුරුවන් අතින් විචාරන්නෙම් මේ නාගසම්පත්තිය කවර කුශලයක් කොට කෙසේ ලබන ලදද මේ උතුම්වූ දිව්‍යවිමානයට කෙසේ පැමිණියාදැයි අවුරුද්දකින් මත්තෙහි විචාළේය.

නැවත මේ දිව්‍යසම්පත්තිය තොප විසින් කරණලද කුශලකර්මයක් නැතුව නිෂ්කාරණයේ නොලද. යම් කෙණෙකුන් විසින් තොපට පමුණුවාපි නෙයින් අනුන් සන්තකයෙන් ප්‍රයෝජන වීදුද නොහොත් තොප විසින්ම කරණ ලද කුශලකර්මයෙන් උපන්ද නොහොත් දෙවියන් විසින් දෙනලද්දේද නාරජ්ජුරුවෙනි, මේ කාරණය මම විචාළෙමි තොප විසින් මේ නාගසම්පත්තියට කෙසේ පැමිණෙනලද්දදැයි විචාළෙමි. එබස් අසා නාරජ්ජුරුවෝ කියන්නාහු ආලාර නම් මානවකයාණෙනි, මේ නාගවිමානය අනුන්ගේ පිරුඑවෙන් නොලබනලද මා සිය අතින් කරණලද්දේත් නොවෙයි දෙවියන් විසින් මට දෙනලද්දේත් නොවෙයි. වැලි කුමක් පිණිස ලබන ලද්දේද පූර්වජන්මයෙහි මා විසින් කරණ ලද්දාවූ දානශීලාදීවූ කුශලයෙන් ලබනලදැයි කීහ.

එබස් අසා නැවත විචාරන්නෙම් නාරජ්ජුරුවෙනි, මේ නාගසම්පත් ලබන්ට තොප විසින් පූර්වජන්මයෙහි කරණලද වත සමාදානය කවරේද? තොපගේ ශ්‍රේෂ්ඨවර්‍ය්‍යාව කවරේදැයි විචාළෙමි. එබස් අසා නාරජ්ජුරුවෝ කියන්නාහු ආලාරනම් මාණවකයාණෙනි, පෙර මම මගධදේශවාසීන්ට අධිපතිවූ මහානුභාවසම්පන්න දුර්යෝධන නම් රජව උපන්නෙමි. එසේ උපන්නාවූ මම මනුෂ්‍යලෝකයෙහි ජීවත්වීමම ඉතා සවල්ප වන්නේය. අනිත්‍යවන්නේය පෙරලෙන්නාවූ සවභාව ඇත්තේයයි දැන ප්‍රසන්නවූ සිත් ඇත්තෙම් සම්තපාප ශ්‍රමණයන්ටද බාහිතපාපී බ්‍රාහ්මණයන්ටද ආහාරපාන වස්ත්‍රයන් සකස්කොට විපුලකොට දීමෙන් සන්තර්පනය කරන්නෙම් සතරමංසන්ධියෙහි කරණලද පොකුණක්මෙන් මාගේ ගෘහය ඒ දුගීමගීන්ට පාසුවිහරණය කෙළෙමි. එතෙම මා විසින් කරණලද ව්‍රත නමුදුවෙයි රක්ෂාකරණලද බ්‍රහ්මචර්‍ය්‍යාව නමුදුවෙයි. මනාකොට මා විසින් කරණලද කුශලකර්මයෙහිලා විපාකයෙන් චිරස්ථායිවූ මේ

උද්‍යාන විමාන ආදියද අන්නපානාදියද නැටීම් ගීකීම් ආදී මේ සියලු යස පිරිවර සම්පත්තීන්ද ලබනලදැයි ඒ නාරජ්ජුරුවෝ නමස්කාර කරණලද කුශලකර්මයෙන් නාගසම්පත්තිය පහළවූ නියාව මට කීයේ වේදැයි තාපසයෝ කීහ.

එබසට රජ්ජුරුවෝ කියන්නාහු එසේකල තාපසයන්වහන්ස, කිසි ආනුභාවයක් නැති වැදිපුත්‍රයන්ට මහත්වූ ආනුභාව ඇති ඒ නාරජ්ජුරුවෝ කෙසේ අසුව අටතෙනකින් ඇනුම් කෑවුද මහත්වූ තේජස් ඇති දළම ආයුධ කොට ඇති නාරජ්ජුරුවෝ කිසි ආනුභාවයක් නැති එතිඹ සංඛ්‍යාතවූ වැදිපුත්‍රයන්ගේ අතට කුමක් නිසා ප්‍රාප්තවූදැයි විචාළාහ. තවද වැදිපුත්‍රයන් දුටුවූ අවස්ථාවෙහි නාරජ්ජුරුවෙනි, තොපට මහත්වූ භය උපන්ද නොහොත් තොපගේ ආනුභාව තොපකරා පැමිණියේද නොපගේ විෂ තේජස් දනත මුලයට නොපැමිණියේද දළම ඇති දළායුධ නම් නාරජ්ජුරුවෙනි, වැදිපුත්‍රයන්ට කුමක් නිසා අසුව දුක් අනුභව කළාහුදැයි මම විචාළෙමි. එබසට නාරජ්ජුරුවෝ කියන්නාහු එම්බා ආලාරයෙනි, වැදි පුත්‍රයන් දැක මට මහත්වූ භයක් උපන් නොත් නැත. මාගේ නාස බහුල මාත්‍රයකුත් පැවැත්ත එකෙක් නැත. එතකුදු වුවත් බුද්ධාදීන් විසින් ශීලය සමාධිය ප්‍රඥය ක්ෂාන්තිය මෛත්‍රී භාවනායයි කියනලද ධර්මයෝ මතුකොට විශෙෂයෙන් කියනලදහ. තවද සමුද්‍රයෙහි වෙලාය යම්සේ දක්ක නොහැක්කේවීනම් එපරිද්දෙන් ශීලයෙහි කෙළ පැමිණෙත්ව සිතන්නාවූ සත්පුරුෂයා විසින් ජීවිත පරිත්‍යාගකොට ශීලභෙදදිය නොකොට යුතුයයි බුද්ධාදී සත්පුරුෂයන් විසින් විශෙෂයෙන් කියනලදහ. එසේ හෙයින් එම්බා ආලාරයෙනි, මම තුදුස්වන් පසළොස්වක් පොහොයෙහි මිනුෂ්‍ය පථයෙහිම තුඹස මත්තෙහි වැදහෙව පෙහෙවස් රක්ෂාකෙරෙමි. එකල වැදි පුත්‍රයෝ සොළොස්දෙන තකර තතරව වැල්බැඳන් අරගෙණ අවුත් තියුණුවූ හුලින් කටුසහිතවූ වැලින් අමුනා කඩලාගෙණ මදක්නැන් ගොස් ඉස බිම හෙසෙන්නා දැක තියුණුවූ උලකින් නාසය විද වැලකින් අමුනා තඩ කෙලවර බැඳ වටකොටගෙණ යන කල්හි භාවනා කරන්නාවූ මම රක්ෂාකරන්නාවූ උපෝසථයට කොපයවේයි යන භයින් කෝපයෙන් ඇස් පමණක් දල්වා ඔවුන් දිසාව නොබලා දුක් අනුභව කෙළෙමි කීහ.

එබසට මම නාරජ්ජුරුවෙනි, මේ වැදිපුත්‍රයෝ එක්පියවර සටහන් ඇති මාර්ගයෙහිදී තපස්රකින්නාවූ තොප අල්වාගත්හ. කායබලයෙන්ද ශරීරවර්ණයෙන්ද ඓශ්වර්යයෙන්ද රූපයෙන්ද උතුම්වූ තොප කුමක් පිණිස ප්‍රාර්ථනා කොට සිල් රක්ෂාකරන්නේදැයි විචාළෙමි. එබසට නාරජ්ජුරුවෝ කියන්නාහු එම්බා යහළු ආලාරයෙනි, තපස් රක්ෂාකරන්නාවූ මම් දරුකෙණෙකුත් ප්‍රාර්ථනා කොට වේවයි ආයුෂයක් ප්‍රාර්ථනාකොට වේවයි තපස් රක්ෂාකරන්නෙම් නොවෙමි. මිනුෂ්‍යලෝකයෙහි උපදනා පිණිස මිනුෂ්‍යලෝකය ප්‍රාර්ථනාකොට මම තපස් රක්ෂාකරන්නේයයි කීහ එබසට මම කියන්නෙම් එම්බා නාරජ්ජුරුවෙනි, තෙපි ලේවන් මිනාරත්වූ ඇස් ඇත්තව, දිඝානාකාරව්‍යාප්ත ශරීර රශ්මීන් ඇත්තව, සර්වාභරණයෙන් සැරහුනව, මිනාකොට තබනලද දළිරවුලු ඇත්තව, සියලු වස්තුකාම කෙලශකාමයෙන් අනුභවකිරීමෙන් යුක්තව, එසේවූ නාරජ්ජුරුවෙනි, මිනුෂ්‍යලෝකය ප්‍රාර්ථනාකොට තොපගේ තපස් රක්ෂාකරන්නේ ලොවට කවරහෙයකින් උතුම්ද ඒ කාරණා විචාළාවූ මට කියවයි කීහ එබසට නාරජ්ජුරුවෝ කියන්නාහු එම්බා ආලාරනම් කෙලෙඹිපුත්‍රයානෙනි, මිනුෂ්‍ය ලෝකයකෙම් මේ නාලොවටත් කාරණයකින් වඩනේ නොවෙයි. බල එකෙක්

නම්, මනුෂ්‍යලෝකයේ පුණ්‍යයයි කියනලද නිර්වාණයද ශීලසමාධියද ඇත්තේය. එසේම මමද මනුෂ්‍යාත්මභාවයට පැමිණ උපදනාවූ ජාතියෙහිද මියන්නාවූ ජාතියෙහිද කෙළවර කරන්නා කැමැත්තෙම් මේ කාරණයෙන් මනුෂ්‍යලෝක යද උතුමැයි කීහ. එකල මම කියන්නෙම් එම්බා නාරජ්ජුරුවෙනි, ආහාරපාන වලඳින් උපස්ථානවිඳ අවුරුද්දක් මුලුල්ලෙහි තොප සමීපයෙහි වාසය කෙළෙම්. එසේ හෙයින් දැන් මනුෂ්‍යලෝකයට යනු කැමතිව නාරජ්ජුරුවන් මනුෂ්‍යලෝකය වර්ණනාකල හෙයින් මමද තපස්රකිනු කැමතිවීමි. එකල නා රජ්ජුරුවෝ කියන්නාහු එම්බා ආලාරයෙනි, තොපගේ දැකීම මට ඉතා ප්‍රියය එසේවුවත් මාගේ පුත්‍රදාරාවන් අතුරෙන්ද මා හිසා ජීවත්වන්නාවූ මේ නාග ලෝකයෙහි යම්කිසි සත්ත්වයෙකු විසින් තොපට අයෙන් බණනලද තොපගේ චිත්තාක්ෂෙපයක් කෙළේ ඇද්දැයි විචාළාහ. එකල මම කියන්නෙම් එම්බා නාරජ්ජුරුවෙනි, දෙමව්පියන් විසින් පරිජග්ගනය කරණලද පුත්‍රයන්ද මම ජිවිත් වඩා සැප වන්නේය. තොප විසින් මට දෙනලද වස්තු ඈදියද මාගේ සිත ඉතා පිණන්නේය. එසේහෙයින් මම තපස්වන්නා කැමතිව මනුෂ්‍යලෝක යට යෙමි කීමි. එකල නාරජ්ජුරුවෝ කියන්නාහු යහළු ආලාරයෙනි, තොප යන පසුව මාගේ සියලු වස්තුව එලවන්නාවූ ලොහිතාංක මාණික්‍යරත්නයෙක් ඇත. මාහැගිවූ මාණික්‍යරත්නයෙහි ලා එසේම තොප කැමති යම් පමණ වස්තු වක් රැස්කොටගෙණ ඒ මාණික්‍යරත්නය හැරපියව හරණවූත් අත්‍යස්ථානයකට නොහැර මා සමීපයට පියවයි කීහ.

එම්බා යහළුවූ නාරජ්ජුරුවෙනි, මම වස්තුවෙහි අභිප්‍රා ඇත්තෙම් නො වෙමි මහණවනු කැමැත්තෙම් කියා නවුස් පිරිකර ගෙණ නාරජ්ජුරුවන් හා සමග නාගභවනයෙන් නික්ම ඔවුන් රඳවා හිමාලයවනයට වැද මහණවෙම්දැයි කියා රජ්ජුරුවන්ට ධර්මදෙශනාකරන්නාවූ තාපසයෝ මෙසේ කීහ. එම්බා රජ්ජුරුවෙනි, මා විසින් මානුසිකවූ පඤ්චකාමයෝ අනුභවකරණලද පඤ්චකාම ගුණයෝ ආස්වාදවූ පෙරළීම ස්වභාවකොට ඇති ආදීනවය දැක මම සැදැහැ යෙන් තපස්වීමි. තවද රජ්ජුරුවෙනි, වෘක්ෂයෙහි පත්‍රයෝ විලික්ෂුණාහු වැටෙද්ද එපරිද්දෙන්ම ළදරුවූද මාඩ්ඩුද සත්ත්වයෝ මරණින් වැටෙන්නාහ. එසේහෙයින් නොවරද්දවූ නෛර්‍යාණික ප්‍රව්‍රජ්‍යාව උතුමැයි මහණවීයෙහි ගුණ දැකය, මා මහණවූයේ රජ්ජුරුවෙනි කීහ.

එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු තාපසයෙනි, එකාන්තයෙන්ම ප්‍රාඥවූ කාරණා කාරණා දන්නාවූ යම්කෙණෙක් ඒකාන්තයෙන්ම සේවනය කටයුත්තාහ. එසේහෙයින් මම තොප දැකීමෙන්ද තොප අතීත් නාරජ්ජුරු වන්ගේ ගුණ ඇසීමෙන්ද අතල්ප බොහෝ කුසල් කෙරෙමි කීහ. එකල රජ්ජු රුවන්ට උත්සාහ වඩවා කියන්නාහු තාපසයෝ රජ්ජුරුවෙනි, ඒකාන්තයෙන් බොහෝ ඇසූපිරූ තැන් ඇති කාරණා කාරණා දන්නාවූ නුවණඇති සත්ත්වයන් සේවනය කටයුත්තාහ. එමෙන් මා අතීත් නාරජ්ජුරුවන්ගේ ගුණාගුණ ඇසී මෙන්ද මම අප්‍රමාදව බොහෝ කුසල් කරවයි යනාදීන් රජ්ජුරුවන්ට ධර්මදේශ නා කොට එම උයනෙහි වස් තුන්මස වැස නැවත හිමාලයවනයට ගොස් දිව්‍යපම ණින් චතුර්විධ බ්‍රහමවිහාර භාවනාකොට බ්‍රහමලෝකයෙහි උපන්නාහ. සංඛපාල නාරජ්ජුරුවෝ දිවිපමණින් පෙහෙවස් රක්ෂාකළාහ. බරණැස් රජ්ජුරුවෝ දානාදිවූ දශකුශල කර්මයන් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

මෙසේ සර්වඥරාජෝත්තමයානන් වහන්සේ මේ සංඛපාල ජාතකය පූර්වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක. එකල්හි පියවූ තාපසයෝ නම් දැන් මේ කාශ්‍යපස්ථවිරයෝය. එකල්හි බරණැස් රජ්ජුරුවෝ නම් දැන් මේ ආනන්දස්ථවිර යෝය. සංඛපාල නාරජ්ජුරුවෝ නම් ත්‍රිලෝගුරු සම්‍යක් සම්බුද්ධරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

515
චුල්ලසුතසෝම ජාතකය

තවද මේ ජාතකය දෙව්රම් වෙහෙර වැඩවසන්නාවූ කරුණා නිධානවූ අසරණ සරණවූ ත්‍රිලෝගුරු බුදුරජාණන්වහන්සේ විසින් මහාභිනික්මන් අරභයා වදාරණලද මෙහි වර්තමාන කථාව මහාජනක ජාතකයෙහි කී පරිද්දෙන් දතයුතුවන්නේය. එකල සර්වඥ රාජෝත්තමයානන් වහන්සේ වදාරණසේක් එම්බා මහණෙනි,

යටගිය දවස බරණැස් රාජ්‍යයෙහි සුදර්ශන නම් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් වසන්නාහ. එකල අප මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන් ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ උපන්නාහ. ඒ කුමාරයන්ගේ මුහුණ පූර්ණචන්ද්‍රමණ්ඩලයකට බඳුවූ ශ්‍රී ශෝභා ඇත්තේය. ඒ කාරණය හේතුකොට ගෙණ ඔවුන්ට සෝමනස්ස කුමාරයෝයයි නම් තුබූහ. ඒ කුමාරතෙම වැඩිවිය පැමිණ කාරියාකාරියෙහි ඇසීමෙහි නිරතව ශ්‍රවණය ධනකොට ඇත්තේය. ඒ කාරණයෙන් සුතසෝම කුමාරයෝයයි නම්තුබූහ. ඒ සුතසෝම කුමාරයෝ සොළොස් ඇවිරිදි වයසට පැමිණ තක්ශලානුවරට ගොස් දිසාපාමොක් ආචාරීන්ගෙන් ශිල්පශාස්ත්‍ර ඉගෙණගෙණ අවුදින් පියානන්ගේ රාජ්‍යය ලැබ සුත සෝම රජ්ජුරුවෝයයි යන නමින් ප්‍රසිද්ධව දශරාජධර්මයෙන් රාජ්‍යය කරන් නාහ.

ඒ රජ්ජුරුවන්ගේ ආශ්චර්‍ය්‍යවත්වූ චන්ද්‍රදේවීයයි යන බිසවුන් ප්‍රධාන කොට සොළොස්දහසක් පමණ පුරාංගනාවෝ වන්නාහ. මෙසේ ඒ රජ්ජුරු වෝ කල්යාමකින් වැඩිවිය පැමිණියාවූ දූ දරුවන් ඇත්තාවූ ගෘහවාසයෙහි කලකිරි වලටවැද මහණවනු කැමතිව එක්දවසක් කපුවා තමන් සමීපයට කැඳවා කියන්නාහු එම්බල යහළු කපුව, යම් දවසෙක තෝ මා ඉසින් නරකෙස දුටුයෙහිවීනම් එකල මට කීයාලයි කියා මැනභාගයෙහි කපුවා විසින් නරකෙස දුක කීකල්හි එසේවීනම් යහළු උදුරා මා අල්ලේ ලවයි කියා කපුවා විසින් රන් හඬුවෙන් නරකෙස උදුරා අල්ලෙහි තිබූ කල්හි දුටුවාවූ මහබෝධිසත්ත්වයෝ මාගේ ශරීරය ජරාවෙන් මඩනාලදැයි මහත්වූ භයට්පත්ව නරකෙස අතින්ගෙණ ප්‍රාසාදයෙන් බැස මහජනයාට පෙණෙන්නාවූ ස්ථානයවූ පණවනලද රාජා සනයෙක්හි හිඳ සෙනෙවිරදුන් ප්‍රධානකොට ඇති අසූදහසක් පමණ අමාත්‍ය යන්ද පුරෝහිතයන් ප්‍රධානකොට ඇති සැටදහසක් පමණ බමුණන්ද මෙයින් අන්‍යරටවාසී සත්ත්වයන් බොහෝරැස්කරවා කියන්නාහු එම්බා මා හිස නරකෙස් හටගත්තේය. මම් මාගේ මහණවීම දකුවයි කියන්නාහු රජ්ජුරුවෝ සෙනෙවි රදුන් ප්‍රධානකොට ඇති මිත්‍ර අමාත්‍යයන් ඈදිබූ ගම් නියම්ගම් පමීදට දක්වම්.

මාගේ හිස තරකෙසක් හටගත්තේය. මහලුව ගියෙමි. එසේහෙයින් මම මහණ වනු කැමැත්තෙමි කීහ. එබස් අසා එකතට රැස්වූ පසිදින් එකෙක් විස්මයපත්ව කියන්නාහු දේවයන් වහන්ස, අවැඩට නිසිවූ මෙසේවූ බස් කුමට කියනසේක්ද අප හැමගේ ලෙහිලා හිඳුවනලද ශස්ත්‍රයෙක් සොළවන කලක් පරිද්දෙන් කුමකට කියනසේක්ද නුඹවහන්සේගේ සැටදහසක් පමණ පුරාංගනාවෝ නුඹවහන්සේ මහණවූ කල්හි කිසි පිහිටක් නැතිව අනාථ අසරණවන්නාහ. උන් හැම අනාථකොට නුඹවහන්සේ මහණවීම සුදුසු නොවෙයි කීහ.

ඉක්බිති බෝධිසත්ත්වයෝ කියන්නාහු ඔහු ඇම්දෙනම ලදරුවන්නාහ. තමන්ගේ කටයුත්තෙන්ම ප්‍රසිද්ධවන්නාහ. අන්කෙණෙකුන් රාජ්‍යයට පැමිණෙන කල්හි ඔවුන්ට ඔහු හැම පාදපරිචාරිකාවන්නාහ. මම වනාහි ස්වර්ගමාර්ගය ප්‍රාර්ථනා කෙරෙමි. එහෙයින් මම මහණවෙමිහයි කීහ. එකල අමාත්‍යයෝ බෝධිසත්ත්වයන් කී බසට ප්‍රත්‍යුත්තර කියාගතනොහී මවුබිසවුන් කරා ගොස් ඒ බව දැන්වූහ. එකල බිසව්ද වහ වහා නැගී සිට රජ්ජුරුවන් සමීපයට ගොස් සබඳ පුත තොප මහණවන්නා කැමැත්තේයයි කථාකරන්නාවූ බිසව් මෙසේ කියන්නාහ. එම්බා පුත්‍රය ගම්බඳුවූ තොපට මවුව මා විසින් දුකසේ ලබනලද එසේවූ මා අඬමින් වලපමින් සිටියදී මා කෙරෙහි කිසි අපෙක්ෂාවක් නැතිව තෙපි මහණවේදැයි කීහ.

බෝධිසත්ත්වයෝද මෙසේ අඬන්නාවූ මෑනියන්වහන්සේ සමග කිසි කථාවකුත් නොකළාහ. මෑණියෝ තුමූ හඬා වැලප එකත්පස්ව සිටියාහ. එකල අමාත්‍යයෝ පිය රජ්ජුරුවන් සමීපයට ගොස් ඒ බව දැන්වූහ. එකල පියානෝද පුතනුවන් සමීපයට ගොස් කියන්නාහු එම්බා සුතසෝම රජ්ජුරුවෙනි තෙපි අපට පුත්‍රව වෘද්ධවයසට පැමිණියාවූ අප අපෙක්ෂාවට යුතුකාලයෙහි පෝෂ්‍යය නොකොට අප හිස ගල්පෙරළන්නා පරිද්දෙන් අප හැර කිසි අපෙක්ෂාවක් නැතිව තෙපි මහණවවුද? මේ නම තොපගේ කුමක්සේවූ ගුණයෙක්දැයි කීහ. එබස් අසා මහබෝසතානෝ මුවෙන් නොබැණ උන්හ. නැවත පියරජ්ජුරුවෝ කියන්නාහු සුතසෝමයෙනි තෙපි දෙමව්පියන් කෙරෙහි ස්නෙහ නැත්තාවීනම් තොපගේ බාලවූ බොහෝ දරුවෝ ඇත. ඔහු තොපගෙන් වෙන්ව විසිය නොහෙන්නාහ. එසේහෙයින් උන් වැඩිවිය පැමිණි කල්හි තපසට යවයි කියන්නාහු එම්බා සුතසෝමයෙනි මිහිරිවූ කටහඬ ඇති බාලවූ බොහෝ දරුවෝ ඇත. ඔහු තොපගෙන් වෙන්ව කායිකවූද චෛතසිකවූද බොහෝ දුකට පැමිණෙන්නාහයි සිතමි. එසේහෙයින් ඔවුන් වැඩිවිය පැමිණි කල්හි තපසට යවයි කීහ.

එබස් අසා මහබෝසතානෝ කියන්නාහු පියානන්වහන්ස, උදක් දූ දරුවන් කෙරෙන් වෙන්වන්නෙම් නොවෙයි. නුඹවහන්සේ ප්‍රධානකොට ඇති සියලු සත්ත්වයන් කෙරෙන්ද අවශෙෂවූ සියලු ලෝකයෙහි සංස්කාර ධර්මයෙක් ඇත්නම් ඒ සියල්ලෙන්ද කලෙකින් වෙන්වීම නියතය එසේහෙයින් සියලු සංස්කාරයෙහි නිත්‍යයෙක් ධ්‍රැවයෙක් නැතැයි යනාදීන් මහබෝසතානෝ පියරජ්ජුරුවන්ට ධර්මදෙශනා කළාහ. පියරජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ගේ, බණ අසා කිසිවක් කියනොහී මුවෙන් නොබැණ උන්හ. එසඳ බෝධිසත්ත්වයන්ගේ සත්සිය යක් පමණ අන්තඃපුර ස්ත්‍රීන්ට එබව කීහ. ඔහුද වහ වහා ප්‍රාසාදයෙන් බැස බෝධිසත්ත්වයන් සමීපයට අවුදින් දෙපය ගොප්මස අල්වාගෙණ අඬන්ට වන්හ. දේවයන්වහන්ස නුඹවහන්සේගේ ලය නදව ගියේද නොහොත් අප හැම කෙරෙහි ස්නෙහ නැතිව ගියේද අප ඇම් ගමසේ අඬමින් වලපමින් සිටියදී

අප වැන්දඹුකොට මහණවන්නාවූ නුඹවහන්සේගේ ලය කරුණා මාත්‍රයකුත් නූපදතේ කුමක්නිසාදැයි කියා ඇඬූහ. බොධිසත්වයෝද පුරාංගනාවන් පාමුල්හි වැටී පෙරළී අඬන්නාහුගේ බැගෑපත් හඬ අසා කියන්නාහු එම්බා පුරාංගනාවෙනි තොප ඇම කෙරෙහි මාගේ නිශ්කරුණාවකුත් නැත. කරුණා ඇත්තෙම් මාගේ ලය තද කමෙක් නැත බල එකක් නම් සවගීය ප්‍රාර්ථනාකොට පැවිදිවෙමි; මෙම ප්‍රව්‍රජාතොම බුඩාදී මහොත්තමයන් විසින් උතුමැයි වර්ණනා කරණලද එසේහෙයින් තොප ඇම ආදිකොට ඇති සියලු සත්වයන් සංසාර කාන්තාරයෙන් තරණය කරණු පිණිස මහණදම් පුරමි. තොප ඇම ශෝක නොකරවයි අස්වැසූහ.

එකල අගමෙහෙසුන් බිසවුන්ට මෙපවත දුත්වූව බිසවුද දසඑකඩම්ස් පිරුණු දරුගැප් ඇත්තාහු වනා බොධිසත්වයන් සමීපයට අවුදින් කියන්නාහු රජ්ජුරුවන් වහන්ස, බැගෑපත්ව හඬන්නාවූ මා කෙරෙහි අපෙක්ෂාවක් නැතිව මහණවන හෙයින් නුඹවහන්සේගෙන් ලබනලද අගමෙහෙසුන්බව නපුරුකොට ලබන ලද්දේවත එසේහෙයින් වේද නුඹවහන්සේගේ දරුගැබ ඇති මා කෙරෙහි කිසි අපෙක්ෂාවක් නැතිව මහණවන්නේය. එසේදවුවත් රජ්ජුරුවන්වහන්ස, මාගේ කුක්ෂිගතවූ ගර්භයත් මුහුකුරා ගියේය. එසේහෙයින් යම්තාක් වදන් තෙම්වීනම් ඒතාක් ඉවසුව මැනව. දරුවන් වැදූකල මා විසින් වින්දයුතුවූ යම් දුකක් දක්නා ලද්දේවීනම් ඒතාක් ඉවසුව මැනවැයි කීයේය. එකල බොධිසත්වයෝ කියන්නාහු එම්බල සොඳුර දරුගර්භය මුහුකුරාගිය නියාඋම දනිමි. වදන්නාවූ තොපි වනාහි දුවකු හෝ පුතකු හෝ වදව, එයින් සැපසේ වදව, මම වනාහී ඒ පුතනුවන් හා සමග තොප හැර මහණවන්ට යෙමි තොපි ශෝක නොකරවයි කීහ.

බිසව් බොධිසත්වයන් කියන්නාවූ බස අසා ශෝක ඉවසා ගතනොහී දෑතින් ලෙහී අත්ගසා අද පටන් ගෙණ අපට ශ්‍රීයෙක්නම් කොයිදැයි වැගිරෙන්නාවූ කඳුලු පිසිමින් මහහඬින් හඬන්ට වන්හ. එකල බිසවුන් අස්වසන්නාවූ බොධිසත්වයෝ එම්බල භද්‍රාව කොබෝලීල මලට බඳුවූ නෙත්‍ර ඇති සොඳුර චන්ද්‍රදෙවීනී තොපි නොහඬව, ශෝක නොකොට ප්‍රාසාදයට නැගී යව. මමවනාහී මෙලොවින් තොප කෙරෙහි වේවයි අන් කිසි සත්ව කෙණෙකුන් කෙරෙහි වේවයි අපෙක්ෂාවක් නැතිව මහණවෙමි කීහ. බිසව් බොධිසත්වයන් කී බස් අසා සිටිනට අසමත්ව මතුමාලට පැනනැගී අඬමින් වැලපෙමින් උන්හ. එකල බොධිසත්වයන්ගේ වැඩිමහලු පුතනුවෝ අඬමින් උන්නාවූ මෑනියන් සමීපයට අවුදින් කියන්නාහු දෙවයන් වහන්ස, කවුරු නුඹවහන්සේ කෝපකරව්ද තව රෙක් නුඹවහන්සේ අප්‍රියකළෝද යනාදීන් විචාරන්නාහ. ඉක්බිති මලනුවන් සමීපයට කැඳවා රජ්ජුරුවෝ කියන්නාහු එම්බල මම මෑදිරියෙක්හි ලනලද වලි කුකුළකු පරිද්දෙන් උකටලීවූයෙමි. ගෘහවාසයෙහි නොඇලුම් මැඩගෙණ පවත්නේය. එසේහෙයින් මම අද මහණවෙමි. මේ රාජ්‍යය පිළිපදුවයි කියා රාජ්‍යය පාවාදෙන්නාහු එම්බා සොම්දත්ත කුමාරයෙනි මම ගිහිගෙයි උකටලීව ගියෙමි එසේදවුවත් මා තපසට අන්තරාවන් බොහෝ පෙණෙන්නේය. එසේහෙයින් මමද අද මහණවෙමි කීහ. ඒ ඇසූ සොමදත්ත කුමාරයෝ තමන් මහණවනු කැමතිව ප්‍රකාශකොට කියන්නාහු සුතසෝම රජ්ජුරුවන් වහන්ස නුඹවහන් සේට සිත්කළවූ ප්‍රව්‍රජ්‍යාව අදම වන පසු මමද නුඹවහන්සේගෙන් වෙන්ව වාසයකල නොහැක්කෙමි. එසේහෙයින් මමත් අද මහණවෙමි කීහ. එබස්

අසා ඒ බව ප්‍රතික්ෂෙප කොට වලකන්නාවූ බොධිසත්ත්වයෝ එම්බා මල දූත් මාගේ මහණවීමෙහි අභිප්‍රාය අසා තොපත් මහණවෙමි කීකල සියලු දස සොදුන් සුදශීන නම් නුවරද සියලු ජනපදවල්හිද සත්ත්වයෝ ලෙහි ගිනි ගත්තාහ. එසේහෙයින් අප දෙදෙනාම මහණවූ කල සියලු රාජ්‍යවාසීහු අනාථ අසරණ වන්නාහ. ඒ කාරණය හේතුකොට තෙපි මහණවිය නොහැක්ක මම මහණවෙමි කීහ.

එබස් අසා මහජනයෝ බොධිසත්ත්වයන්ගේ පාමුල්හිම වැටී මහ හඬින් හඬන්නාහු සුතසෝම රජ්ජුරුවන් මහණවූකල අපි කුමක්කරමෝදැයි මහ හඬින් ඇඬූහ. එකල මහබෝසතාණෝ කියන්නාහු තොපි හැම නොහඬව ශෝක නොකරව මම තොප නොබෝකලක් වාසය කොටත් තොප ඇමගෙන් යම් දවසක් වෙන්වෙමි කීයා උපන්නාවූ යම් සංස්කාර ධර්මයකින් නිත්‍යදෙයෙක් නැතැයි යනාදීන් ධර්මදෙශනා කරන්නාහු එම්බා දරුවෙනි මේ සත්ත්වයන්ගේ ජීවිතය නම් රදවුන්ගේ අලුපැන් පෙරන්නාවූ අලුවද්දෙහි බැඳි දියත්තක් පරිද්දෙන්ම සවල්ප ජීවිතය හා එසේම සවල්පවූ සංස්කාර ඇරගෙණ ඇවිදිනා සත්ත්වයන් විසින් කුසල්කිරීමෙහි ප්‍රමාදවන්ට නොවටනේය. එසේ හෙයින් අප්‍රමාදව කුසල් කරන්ට වටනේය. තවද අඥනවූ සත්ත්වයෝ ජරා මරණ හැත්තවූන් මෙන් අමේධ්‍යයෙහි ගිලුනාවූ ගාමසූකරයන් මෙන් පංකයෙහි ගිලුනාවූ සත්ත්වයෝ කුසල් කිරීමෙහි ප්‍රමාදව නරක තිරිසන් අපාය ප්‍රෙතඝායය කාලකඤ්ජ නම් අසුරනිකාය යන අපායවල වත්නී වඬිනය කරන්නෝය යනාදීන් මහබෝසතාණෝ මහජනයාට ධර්මදෙශනා කොට පුෂ්පක නම්වූ ප්‍රාසාදයට නැගී සත්වෙනි මාලේ සිට මඟුල්කඩුව ගෙණ කෙස්වැටිය කපා අතින් ගෙණ මහජනයාව කියන්නාහු මම තොප ඇමට අවැස්සකමක් නැත්තෙමි. එසේහෙයින් තොපගේ රාජ්‍යය තොපම පිළිපැද ගණුවයි කියා හිස්වෙලූව සහිතවූ කෙස් වැටිය කපා අතින්ගෙණ මහජනයා මධ්‍යයට දැමූහ.

දැමූ කෙස්වැටිය අතින් ගෙණ සත්ත්වයෝ බිම ඇත මැත පෙරළෙමින් මහහඬින් හඬන්ට වන්හ. ඒ ස්ථානයෙහි බොහෝ රජස් නැගෙන්ට වන්හ. එකල දුරව සිටියාවූ සත්ත්වයෝ දැක රජ්ජුරුවන් වහන්සේ කෙස්වැටිය කපා දැමූ සේක්වනැයි කීයා මහහඬින් හැඬූහ. එකල මහබෝසතාණෝ පරිවාර ජනයන් යවා සල්පිළින් නවුස්පිරිකර ගෙන්වාගෙණ කපුවා ලවා දැළිරැවුළු කපා කපා හරවා පලන්ආභරණ යහන් මත්තෙහි වගුරුවා රත්පට කඩදූවළු කපා ඒ කාසායවසත්‍රයකොට මැටිපාත්‍රයක් වම්උරෙහි එල්වා සැරයටියක් අතින් ගෙණ මතුමාලේ කිහිවිටක් සක්මන්කොට ප්‍රාසාදයෙන් බිමට බැස වීථිමධ්‍යයෙන් නික්මුණාහ. නික්මුණාවූ රජ්ජුරුවන් කිසිම කෙණෙක් ඇඳිනගත නුහුනුවාහ. ඉක්බින්තෙන් රජ්ජුරුවන්ගේ සත් සියයක් පමණ රාජකන්‍යාවෝ ප්‍රාසාදයට නැගී රජ්ජුරුවන් නොදැක පලන් ආභරණ දැක ප්‍රාසාදයෙන් බිමට බැස අවශෙෂවූ සොළොස් දහසක් පමණ පුරාංගනාවන් සමීපයට ගොස් තොපගේ ප්‍රිය වල්ලභයාණෝ සුතසෝම රජ්ජුරුවෝ මහණව ගියෝවේදැයි මහහඬින් හඬන්නාහු ප්‍රාසාදයෙන් නික්මුණාහ. එකල නුවරවාසීනුද රජ්ජුරුවන් මහණවූ නියාව දැන සියලු නුවර එකපැහැර ඇලලිනියේය. රජ්ජුරුවන් වහන්සේ මහණවගිය සේකැයි රජගෙයි දොරකඩ රැස්ව රජ්ජුරුවන් වහන්සේ මෙතනදැයි කීයා රජ්ජුරුවන් නිරන්තරයෙන් වසන්නාවූ ස්ථාන පරීක්ෂාකොට අඩා ඇවිදිනාහු මේ අපගේ රජ්ජුරුවන් වහන්සේගේ ප්‍රාසාදය රත්මලින් අවශෙෂවූ නොයෙක්

මලින්ද සුවඳ කැලල් ආදියෙන්ද සරහා සොළොස් දහසක් පමණවූ පුරාංගනාවන් පිරිවරණ ලදුව කෙළ ඇවිද්දාවූ ස්ථානය දක අඬන්නේය. මේ අපගේ රජ්ජුරුවන්ගේ අශෝකවනයද ඈමකල් කුසුම් ඵලලවයෙන්සැදී උන්වහන්සේ පුරාංගනාවන් හා සමග සිත්සේ කෙළ ඇවිදිනාවූ අවස්ථාවෙහි අභිප්‍රායානුකූලව ඇවිදිනා රම්‍යවූ භූමිප්‍රදේශය වන්නේය. හැමකල්හිම කුසුම්ඵලලවයෙන් සශ්‍රීකවූ උද්‍යානයෙහි සත්‍රී සමූහයා සමග කෙළ ඇවිදිනාසේක්ද මෙතෙම උන්වහන්සේ කෙළ ඇවිද්දාවූ උද්‍යානයෝ වන්නාහ.

යම්තැනෙක්හි අපගේ රජ්ජුරුවන් වහන්සේ ඥාතිසමූහයා සමගින් සිත්සේ කෙළ ඇවිදිසේක්ද රට සොභාවූ හැමකල්හිම සුපිෂ්පිතවූ මෙතෙම උන්වහන්සේගේ කිණිකිරිවනය වන්නේය. යම්තැනෙක්හි අපගේ රජ්ජුරුවන් වහන්සේ සත්‍රී සමූහයා සමගින් සිත්සේ කෙළ ඇවිදිසේක්ද මෙතෙම උන්වහන්සේ කෙළ ඇවිද්දාවූ පලොල්වනය වන්නේය. යම් තැනෙක්හි අපගේ රජ්ජුරුවන් වහන්සේ පුරාංගනාවන් හා සමගින් සිත්සේ කෙළ ඇවිදිනාසේක්ද එසේවූ උන්වහන්සේගේ කෙළියට යොග්‍යවූ හැම කල්හිම ඵලගෙණ සිටියාවූ මෙතෙම සිත්කලුවූ අඹ උයන වන්නේය. යම් කලෙක්හි අපගේ රජ්ජුරුවන් වහන්සේ සත්‍රී සමූහයා සමග සිත්සේ කෙළ ඇවිදිනසේක්ද එසේවූ නොයෙක් පත්මොත්පලයෙන්ද නොයෙක් පක්ෂිසමූහයා විසින්ද ගැවසී ගත්තාවූ මෙතෙම උන්වහන්සේගේ සිත්කලුවූ පොකුණු වන්නේයයි යනාදීන් නොයෙක් බැගෑපත් බස් කියමින් අඬා ඇවිද රාජාංගනයට රැස්ව අපගේ සුතසෝම රජ්ජුරුවන් වහන්සේ රාජ්‍යය හැර කාසායවස්ත්‍රධරව මහණව එකචාරීවූ හස්තිරාජයකු පරිද්දෙන් උදකලාවම ඇවිදිනාසේකැයි කියමින් තමන්ගේ ගෙපිරුණු සම්පත් හැර දූ දරුවන් අත අල්වාගෙණ බොධිසත්වයන් වසන්නාවූ ස්ථානයටම ගියාහ

එපරිද්දෙන්ම බොධිසත්වයන්ගේ දෙමව්පියන්ද දූ දරුවන්ද සොළොස් දහසක් පමණ පුරාංගනාවෝද මහබෝසතාණන් වසන්නාවූ ස්ථානයටම ගියාහ ජනපදවාසී සත්වයෝද එපරිද්දෙන්ම පසුපස්සෙහි ගියාහ. සියලු අන්තඃපුර පිටිපුර ගම් නියම්ගම් හිස්ව ගියාක්මෙන් විය. එකල බොධිසත්වයෝද දොළොස් යොදුන් පමණ තැන් පැතිර සිටියාවූ පිරිස් හා සමග හිමාලය වනයට අභිමුඛව නික්මුණාහ. එකල බෝසතාණෝ නික්මුණු බව දැන ශක්‍රදේවේන්ද්‍රයා විශ්වකර්ම දිව්‍යපුත්‍රයා සමීපයට කැඳවා කියන්නාහු එම්බා දරුව සුතසෝම රජ්ජුරුවෝ මහභිනික්මන් නික්මුණාහ.

උන්වහන්සේ වසන්නාවූ ස්ථානයක් ලබන්ට වටනේය. සමාගමය මහත එසේ හෙයින් තෙපි ගොසින් හිමාලයවනප්‍රදේශයෙහි ගංතෙර තිස්යොදුන් පමණ පළල ඇති ආශ්‍රම ප්‍රදේශයක් මවා එවයි යවූහ. විශ්වකර්මයාද ඒ කීවාවූ ස්ථානයෙහි ආශ්‍රම ප්‍රදේශයක්ද සැවුස්පිරිකරද පිළියෙලකොට එක්පියවර සටහන් ඇති මාර්ගයක්ද මවා දිව්‍යලෝකයටම ගියේය. බොධිසත්වයෝද එක් පියවර සටහන් මාර්ගයෙන් ගොස් ආශ්‍රමයට වැද පළමුව තුමූ මහණව පසුව අවශෙෂයන් මහණ කරවූහ. මෙසේ කල්යාමෙකින් බොහෝදෙනාගේ මහණ වීමෙන් තිස්යොදුනක් පමණ ආශ්‍රමයද පිරුණේය. විශ්වකර්මයා විසින් ආශ්‍රමය නිර්මාණයද බොදෙනාගේ මහණවීමද බෝධිසත්වයන්ගේ පන්සිල් රැකීමද හත්ථිපාල ජාතකයෙහි පිළිවෙළ වන්නේය මෙසේ මහබෝසතාණෝ යමෙක්හට කාම විතර්කයෙක් ව්‍යාපාද විතර්කයෙක් උපන්නේ වී නම් ඒ ස්ථානයට ආකාශයෙන් ගොස් ධර්මදේශනා කරන්නාහු එම්බා තාපසවරිණි

පලමු තොපගේ රතික්‍රීඩා ආදී කෙළියෙක් සිතාවෙක් ඇත්තම් ඒ සිහිනොකරව. තොප ඇම පඤ්චකාමයෝ නොම්රිකත්වයි සුදශීන නුවර ඉතා සිත්කලුය එසේහෙයින් එයින් තොපි සිහි නොකරව. එම්බා තපස්වරිනි වැලි කුමක්. කරාදැයි යතහොත් රෑ දවල් අප්‍රමාදව මෙත්සිත් ඇතිකරව, එසේ භාවනාකොට කුසල් කළාවූ සත්ත්වයන්ට වාසස්ථානවූ බ්‍රහ්මලෝකයට යවයි යනාදීන් අවවාද කරන්නාහ. ඒ තපස්වී සමූහයාද මහබෝසතාණන්ගේ අවවාදයෙහි සිට බ්‍රහ්ම ලෝකයෙහි උපන්හ. බොධිසත්ත්වයන්ද නොපිරිහුනු ධ්‍යානයෙන් පෂීන් හා සමග බ්‍රහ්මලෝකයෙහි උපන්නාහයි යනාදීන් තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා එම්බා මහණෙනි, දැන්මතු නොවෙයි බොධිසත්ත්වයෝ පළමුත් මහබිනික්මන් කෙළේ වේදැයි වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ චුල්ල සුතසෝම ජාතකය නිමවා වදාළසේක.

එකල්හි දෙමව්පියෝ දෙන්න නම් මේ සුද්ධෝදන රජ්ජුරුවන් හා මහා මායා දේවී වන්නාහ. අගමෙහෙසුන්වූ චන්ද්‍රදේවීතොම යසෝධරා ස්ථවිරා වන්නාහ. එදවස් වැඩිමහලු පුතනුවෝ නම් දැන් මේ රාහුල කුමාරයෝය. එදවස් කිරි මවු නම් ඛුජ්ජුත්තරාවෝය. එදවස් කුලවඩීන කපුවා නම් මෞද්ගල්‍යාන ස්ථවිරයෝය. එදවස් සෝමදත්ත කුමාරයෝ නම් ධර්මභාණ්ඩාගාරිකවූ ආනන්ද ස්ථවිරයෝය. එදවස් මහබිනික්මන් කළාවූ සුතසෝම රජ්ජුරුවෝ නම් තිලෝ ගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

චත්තාලීස නිපාතයයි.

---

516 නලිනී ජාතකය

මේ ජාතකය දෙව්රම්වෙහෙර වැඩ වසන්නාවූ තිලෝගුරු ත්‍රෛලොක්‍ය හද්‍රසට වූ බුදුරජාණන් වහන්සේ විසින් පුරාණ ද්විතිකා පලෝභනයක් අරභයා වදාරණ ලද.

ඒ කෙසේද? යත්

එක් දවසක් සමන්තහද්‍රවූ බුදුරජාණන් වහන්සේ දම්සභාමණ්ඩපයෙහි පණවනලද බුද්ධාසනමස්තකයෙහි වැඩහිඳ භික්ෂූන්වහන්සේ විසින්තමන් සමීප යට එලවනලද ඒ පුරාණ ද්විතිකා කෙරෙහි ලොභය කරණලද භික්ෂුහට ආමන්ත්‍රණය කොට සැබෑද මහණ, ශාසනයෙහි කලකිරී උකටලීවූයේද කා විසින් තෝ කලකිරවන ලද්දෙහිදැයි විචාරා වදාරා ඒ භික්ෂුහු විසින් සැබෑය, ස්වාමීනි පුරාණ ද්විතිකාව පිණිස ශාසනයෙහි කලකිරුණෙමියයි දැන්වූ කල්හි නැවත බුදුහු වදාරණසේක් එම්බල මහණ මේතොමෝම දැන්මතු තට අනර්ථකාරී නොවෙයි, පෙරත් තෝ ධ්‍යානයෙන් පිරිහී මහා විනාශයට පැමිණියෙහි වේදැයි වදාරා එක්තරා භික්ෂුකෙණෙකුන් වහන්සේ විසින් ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක. ඒ කෙසෙ ද? යත්,

එම්බා මහණෙනි,

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතානෝ ප්‍රසිඬවූ බමුණුමහසල් කුලයෙහි ඉපද වැඩිවිය පැමිණ සියළු ශිල්ප ශාස්ත්‍රයෙහි පරතෙරට පැමිණ ඍෂිප්‍රව්‍රජ්‍යා වෙත් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවාගෙණ හිමාලයවනයෙහි වාසය කරන්නාහ.

එකල එක් මුවදෙනෙක් ඒ තාපසයන් මූත්‍රකෘත්‍යය කළාවූ ස්ථානයෙහි තණ අනුභවකොට එපමණකින්ම තාපසයන් නිසා දරුගැබ පිළිසිඳ නිරන්තර යෙන් තාපසයන් කෙරෙහි ස්නෙහයෙන්ම දුර නොගොස් පන්සල සමීපයෙහිම තණ කා ඇවිද දසඑකඩමසක් යාමෙන් කුමාරයෙකු වැදූහ. එකල තාපසයෝ තමන් නිසා පිළිසිඳ වැදූ තියාව දූන කුමාරයන් වඩා වර්ධනය කොට ඉසිසිඞ්ග තාපසයෝයයි නම් තබා නොබෝ කලකින් මහණකොට කිසුනුපිරියම් ඉගැන් වූහ. එකල තාපසකුමාරයෝ නොබෝ දවසකින් ධ්‍යාන භාවනා කොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවානෙණ ධ්‍යානසැපයෙන් කෙළනාවූ ඝොරවූ තවුස් ඇතිව විශෙෂයෙන් වසතලද පඤ්චෙන්ද්‍රියයන් ඇත්තාහු වෙති. එකල තාපස යන්ගේ තෙජසින් ශක්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උන් නොකමැති පරිද්දෙන් කම්පිත වූයේය. එකල ශක්‍රදෙවේන්ද්‍රයෝ කිමෙක්දැයි දිවසින් පරීක්ෂාකොට එසේකල උපායෙන් මූගේ ශීලය හෙදකෙරෙමි සිතා තුන් අවුරුදු මුළුල්ලෙහි සියළු කසීරට වැසිවට නොදී නැවතූහ.

එකල සියළුම රාජ්‍යය ගින්නෙන් දැඟියාක් මෙන් වූයේය. ගොයම් බත් ඇතිනොවී මෙන් සායගැසීමෙන් පීඩිතවූ මනුෂ්‍යයෝ රාජාඞ්ගනයෙහි රැස්ව රජ්ජුරුවන්ට එකපැහැර උජ්ඣායනා කළාහ. එකල රජ්ජුරුවෝ සිව්මැදුරු කවුළුව හැර සිට කිමෙක්දැයි විචාළාහ. එවිට සේනාව කියන්නාහු දෙවයන් වහන්ස තුන් අවුරුදු මුළුල්ලෙහි වැසි නොවස්නාවූ නුඹවහන්සේගේ මේ සියළු කසීරට ගිනිගෙණ දැඟියාක් මෙන් වූයේය. මනුෂ්‍යයෝද අති දුක්ඛිතව ගියාහ. එසේ හෙයින් රජ්ජුරුවන් වහන්සේ වැසිවසින්ට උපදෙසක් කරවයි කීහ. රජ්ජුරුවෝද යහපතැයි සිල්සමාදන්ව ගෙණ පෙහෙවස් රක්ෂාකොටත් වැසිවස්වා ගනනුහුනුවාහුය. එකල ශක්‍රදෙවේන්ද්‍රයා මධ්‍යම රාත්‍රිවේලෙහි ඒ රජ්ජුරුවන් සැතපෙන ශ්‍රීයහන් ගබඩාවට වැද ඉරු දහස් සඳ දහස් නැංගාමෙන් ඒකාලෝක කෙරෙමින් ආකාශයෙහි සිටියාහ. එසේ සිටියවුන් දැක රජ්ජුරුවෝ තෙපි කවුරුදැයි විචාළාහ. එකල ශක්‍රයෝ දෙදෙව්ලොව දෙවියන්ට නායකවූ ශක්‍ර දෙවෙන්ද්‍රයෝ නම් මමයයි කීහ. නැවත රජ්ජුරුවෝ කුමක් පිණිස අවුදැයි විචාළාහ. ශක්‍රයෝ කියන්නාහු කිමෙක්ද රජ්ජුරුවෙනි තොපගේ රට වැසි නොවසීදැයි කීහ. එබසට රජ්ජුරුවෝ කියන්නාහු කිමෙක්ද ශක්‍රයෙනි තුන් අවුරුද්දක් නොවේද අපගේ රට වැසි නොවස්නේයයි කීහ. නැවත ශක්‍රයෝ කිමෙක්ද වැසි නොවස්නා කාරණා දන්නෙහිදැයි රජ්ජුරුවෙනි විචාළාහ. මා දන්නේ නැතැයි රජ්ජුරුවෝ කීහ. තවද ශක්‍රයෝ කියන්නාහු එසේවී නම් එම්බා රජ්ජුරුවෙනි ඉසිසිඞ්ග නම්වූ ඝොරවූ තපස් ඇති එක් තාපසයෙක් හිමාලයවනයෙහි වසන්නාහ. ඔහු නිරන්තරයෙන් වැසිවස්නා කල්හි කිපී ආකාශය බැලූහ ඒ කාරණයෙන් වැසි නොවස්නේයයි කීහ. තවද රජ්ජුරුවෙ

කියන්නාහු එසේකල ශක්‍රයෙනි දූත් මට කළමනා කිමෙක්දැයි කීහ. නැවත ශක්‍රයෝ ඒ තාපසයන්ගේ ශීලය හෙදකරන්ට යොදවයි කීහ. ඔහුගේ ශීලය හෙදකරන්ට කවුරු සමර්ථදැයි විචාළාහ. නැවත ශක්‍රයෝ කියන්නාහු එම්බල මහරජ නලිනී නම්වූ තොපගේ දූ ඊට සමර්ථය. ඈ තොප සමීපයට කැඳවා එම්බල පුත අසවල් තැනට ගොස් ශීලභෙදකොට එවයි කියා ඈ යවයි යනාදීන් රජ්ජුරුවන්ට අනුශාසනාකොට ශක්‍රයෝ තමන්ගේ ස්වකීය ස්ථානයට ගියාහ.

රජ්ජුරුවෝද දෙවන දවස් උදෑසන අමාත්‍යයන් හා සමග මන්ත්‍රණය කොට දියනියන් තමන් සමීපයට කැඳවා කියන්නාහු එම්බා නලිනී නම්වූ දියනියෙනි, මා සමීපයට එව. තොපගේ මේ රාජ්‍යයද සියලුම ජනපදවල්ද නියඟින් ගිනිගෙණ දැගිය කලක්මෙන් දුර්භික්ෂව නසින්නේය. එසේහෙයින් ඒ වැසි වට නොදෙන්නාවූ ඒ තාපසයන් තොපගේ වසඟයෙහි එලවාගෙණ ශීල හෙදකොට ක්ලෙශ බන්ධනයෙන් බැඳගෙණ එව. ඒ අනර්ථකාරිවූ තාපසයා මා සමීපයට වහා කැඳවාගෙණ එවයි කීහ. එබස් අසා නලිනී නම්වූ රාජකුමාරිකා තොම කියන්නී මහරජ්ජුරුවන් වහන්ස, දුක් කොසිවසියත් නොහෙමි. මග දූත යාමෙහි සමර්ථ නොවෙමි. එහෙයින් ඇතුන් ආදී භයානක මෘගජාතීන් ඇති වනයට කෙසේ නම් මම යෙම්දැයි කීහ. නැවත රජ්ජුරුවෝ කියන්නාහු එම්බා මාගේ දියනියෙනි තොප පයින් යන්නෙන් නැත. අන්නපානාදියෙන් සමෘද්ධවූ නිර්භයවූ තොපගේ ජනපදවලින් හස්තිවාහනාදියෙන් සුවසේ ගොස් ඉන් ඇත මනුෂ්‍යවාසස්ථානයෙහි පිළිසන්වූ ඉඳෙලිකූනම් ආදියෙන්ද ගං තෝ ඇති තැන්හි නැංවූ අඟුළු පහුරු ආදියෙන්ද තොපගේ ශරීරයෙහි ජීවිවණී ආදිය නොනසා නොම්රිකා ගොසින් තොපගේ විලාස දක්වා කාමරති බන්ධනයෙන් ඒ තාපසයන් තොපගේ වසඟයට පවත්වාගෙණ ශීලය හෙදකරවයි යනාදීන් දියනියන් හා සමග නොකියයුතු කමා රාජ්‍ය පරිපාලනය නිසා කීහ.

කුමාරිකාද පිය රජ්ජුරුවන් කී බස් අසා යහපතැයි පිළිගත්තීය. එකල්හි රජ්ජුරුවෝද යහපතැයි කියා කුමාරිකාවද මාගෝපකරණ පිණිස දියයුතු දෙය සියල්ලම සපයාදී අමාත්‍යයන් හා සමග නික්මවූහ. අමාත්‍යයෝද පසල්දනව් වට ගොස් ඒ ස්ථානයේ කඳවුරු බැඳ සෙනග රඳවා රාජකුමාරිකාවන් යහනාවෙහි ලාගෙණ වැද්දන් පානාලද මාර්ගයෙන් හිමාලයට ගොස් පූර්වාහ්නවේලෙහි තාපසයන්ගේ ආශ්‍රමපදයටද පැමිණියහ. එකල බොධිසත්ත්වයෝද තමන්ට පුත්වූ ඉසිසිඞ්ග තාපසකුමාරයන් පන්සල්හිම රඳා තුමූ ඵලාඵල නිසා වනයට ගියාහ. එකල්හි වැද්දෝ නලිනී නම්වූ කුමාරිකාව කැඳවාගෙණ ගොස් පන්සල සමීප පෙණෙන්නාවූ ස්ථානයෙහි සිට කුමාරිකාවට පන්සල දක්වා කියන්නාහු එම්බා කුමාරිකාවෙනි මේ කෙහෙළියයි කියනලද පෙණෙන්නාවූ පතාක ඇති අනෙකප්‍රකාර ආභූජපත්‍ර ඇති වෘක්ෂ ජාතීයෙන් වටකරණලද දුරට මේපෙණෙන්නාවූ නොඑක් ආසනය නිරන්තරයෙන් ගිනිදෙවියාට පූජාකරන්නාවූ මහත් සෘද්ධි ඇති ඉසිසිඞ්ග තාපසයන්ගේ ආශ්‍රමපදය නෙල පෙණෙන්නේයයි දැක්වූහ. අමාත්‍යජනයෝද වැල්නිය වේලෙහිම තුමූ ඇම පන්සලට ආරක්ෂාගෙණ රාජ කුමාරිකා රත්රත්මය වැහැරි අඳවා පෙරවා සියළු ස්ත්‍රී අලංකාරයෙන් සරහා හුයින් වෙළනලද පෙඳවටක් අතටදී පන්සල් මලුවට බාවා ඈම රැකවල් ගෙණ සිටියාහ. එකල කුමාරිකාවද පෙඳවටගෙණ කෙළිමින් සක්මන් කෙළවර බටහ.

ඒක්ෂණයෙහි ඉසිසිඞග තාපසයෝ පන්සල් දොරකඩ ගල්පෝරුයෙක්හි උන්නාහු එන්නාවූ කුමාරිකාව දැක භයින් ත්‍රස්තව පන්සලට වැද සිටියේය. එසේ කලත් කුමාරිකා පෙදවට ගෙණ කෙළිමින් පන්සල් දොරකඩ සමීපයට ගියාහ. එකල තාපසකුමාරයෝ සිතන්නාහු ඉදින් මේ යක්‍ෂයෙක්වීනම් පන්ස ලට වැදහයින් ත්‍රසනව එන්නාවූ මා අල්වාගෙණ මුරු මුරු යන ශබ්දපවත්වා මා කන්නේය. මේතෙම යක්‍ෂයෙක් නොවෙයි. තාපසයෙක් වන්නේයයි පන්සලින් පිටත්ව කථාකරන්නාහු එම්බල වෘක්‍ෂයෙක්හි අටගත්තාවූ යම් ඵලයෙක් දුරට දමන ලද්දෙන් තැවත සමීපයටම ඒද අත්හැර නොයේද එසේවූ සිත්කළුවූ මේ ඵලයතෙම කිනම් වෘක්‍ෂයෙක්හි ඵලයෙක්දැයි පෙදවට තමන් නුදුටු හෙයින් ඵලයෙක්මයයි යන සංඥාවෙන් මේ කිනම් ඵලයෙක්දැයි විචාළාහ.

රාජකුමාරිකාවද විචාළාවූ තාපසයන්ට කියන්නී එම්බා තාපසයෙනි ගන්ධමාදන සමීපයෙහි මාගේ පන්සලට මෙසේවූ ඵල ඇති බොහෝ වෘක්‍ෂයෝ ඇත. ඒ වෘක්‍ෂයන්ගේ අටගත්තාලද යම් ඵලයෙක් ඇත්නම් මෙසේ දුරදමන ලද්දේ සමීපයට එන්නේය. අත්ඇර නොයෙන්නේයයි කියා බොරු කීව. තාපස යෝද මේ කී බස් සැබවයි අදහාගෙණ ඒකාන්තයෙන් මූ තාපස කෙණෙක්යයි සිතා පිළිසඳර කථාකරන්නාහු පින්වත්වූ තාපසයන් වහන්ස පන්සලට අවුත් මෙසේ වැඳහිඳුවයි මේ පාද්‍යෙනා දියෙන් පයසෝධා මේ පිළියෙලකොට තබන ලද ආහාරයෙන් මිහිරිවූ ඵලාඵලද පිළිගෙණ මේ ආසනයේ හිඳ අනුභව කරවයි කීහ. රාජකුමාරිකා යහපතැයි පන්සලට වැද කොලඇතිරිලියෙක්හි උන්නේය. එකල ඉන්නාවූ කුමාරිකාවගේ රත්රත්මයවූ වැහැර උභයපාර්ශ්වය පහවූ කල්හි ලජ්ජාස්ථානය පිළිසන් රහිතවූයේය. එකල තාපසයෝ තමන් ස්ත්‍රීන්ගේ අඞගජාත නුදුටුහෙයින් පහවූ වස්ත්‍රයෙන් ශරීර අවයවත් දැක ඒකාන්තයෙන් මේ වණයෙක්මයයි සිතා විචාරන්නාහු එම්බා තාපසයෙනි තොපගේ මේ කලවා යුවල අතුරෙහි කලුවූ පැහැඇති මතාකොට පිළියම් කරණලද සිප්පිමුඛයකට බඳුවූ සටහන් ඇතිව පෙණෙන්නේය. කෙසේවූ වණයෙක්ද තොපගේ උත්තම මාඞගයයි කියනලද නිමිත්තස්ථාන නොපෙණෙන්නේය කිමෙක්ද ඒ තොපගේ ශරීර අභ්‍යන්තරයට වැදගියේ දැයි විචාළාහ.

එකල ඒ තාපසයෝ ස්ථානය මෙසේ වණයට ගොස් කණ්ඩුතිය ස්වභාව කොට ඇති නිරන්තරයෙන් මම සැපයක් නොලබමි. එසේහෙයින් පින්වත්වූ තෙපි කණ්ඩුතිය ගුණකරන්ට සමත්ජීවිතන් තොප විසින් ගුණ කරන්ට සුදුසු හෙයින් තොප සේ තපස්වීම් විසින් මාගේ දුක් දුරුකරවයි කීහ. තාපසයෝද ඈ කී බොරු බස් සැබෑවෙක්මයයි අදහාගෙණ ඉදින් තොපට මාගෙන් සැප යෙක්වීනම් එපරිද්දෙන් කෙරෙමි කියා ඒ කුමාරිකාවගේ ඇඳපෙරවගත් වැහැරි පහකොට ලජ්ජා ස්ථානය බලා කියන්නාහු එම්බා තාපසයෙනි තොපගේ මේ වණයතෙම ඉතා ගැඹුරුවූ ස්වභාව ඇත්තේය. ලේ සහිතය, කුණෙන් ගැවසී ගත්තේය. මද මද දුර්ගන්ධ ඇත්තේය. එසේහෙයින් මම මේ වණය යම්සේ ගුණව තොපට අතිශයෙන් ගුණයෙක් වේද එපරිද්දෙන් මේ වණය වෘක්‍ෂවලින් තිසි කොළපත් සුඹුළු ආදියගෙණ කෂායයෝගයක් කෙරෙමි කීහ. එබසට නලිනීතොම කියන්නී එම්බා තාපසයෙනි මන්ත්‍රයෝගයෙක් වේවයි අවශෙෂවූ ඖෂධයෝගත් තරයේ ඉවසන්නාහු නොවෙති. ඉදින් එසියල්ල නොයෙක් වාමකල මේ වණයට සැපයක් විරූනැත. එසේහෙයින් යම් තොපගේ අඞග

ජාතයෙක් මොළකී තම් එයින් සණ්ටණයකොට ඒ වණයට සැපයෙක් වේනම් එපරිද්දෙන් කරවයි කීහ.

එබසට ඉසිසිඞ්ග තාපසයෝද වෙදකමෙකැයි සිතා මෛථුන ධර්මයෙන් ශීලභෙදයක් වන්නේය, ධ්‍යානය පිරිහෙන්නේයයි නොදත ගැණුන් නුදුටුවිරූ හෙයින් මෛථුනධර්මයයි නොදන්නා හෙයින්ද බෙහෙදකැයි ඈ කී බස් ගිවිස මෛථුනයෙහි යෙදුනාහ. එකෙණෙහිම ශීලය බිඳුන, ධ්‍යානයෙන්ද පිරිහුනහ. මෙසේ දෙතුන්විටෙක සංසර්ගයෙහි යෙදී පන්සලින් පිටත්ව ජලස්නානයකොට ශ්‍රමදුන සංහිඳුවාගෙණ නැවත පන්සලටවැද තාපසකෙණෙක්යයි සිතා වසන්නාවූ සථාන විචාරන්නාහු මෙසේ කියත්. පින්වත්වූ තාපසයෙනි, තොපගේ ආශ්‍රමපදය මෙතනට කවරදිසාවෙක්හිද පින්වත්නි කිමෙක්ද තොපි මේ අරණ්‍යයෙහි සිත්අලවා වෙසෙද්දැයි කිමෙක්ද තොපට මේ වනයේ වනමුල් වනඵලාඵල සුලභව ලැබේද කිමෙක්ද පින්වත්වූ තොපට සිංහව්‍යාඝ්‍රාදී චණ්ඩමෘගයෝ හිංසා පීඩා නොකෙරෙද්දැයි විචාළාහ. ඉක්බිති රාජකන්‍යාතොම මෙසේ කීව. තපස්වීන්වහන්ස, මේ පන්සලට උතුරුදිසාභාගයෙහි ඛෙමාතම්වූ ගඞ්ගාවෙක්හි ලවනයෙන් සෑජුව පවත්නේය, ඒ ගඞ්ගාතීරයෙහි මාගේ සිත්කලුවූ ආශ්‍රමප්‍රදෙශය වන්නේය, පින්වත්වූ තපස්වීන්වහන්ස, නුඹවහන්සේ මාගේ ආශ්‍රමප්‍රදෙශය දුටුසේක්විනම් ඉතාම යහපත් වන්නේය.

තවද තපස්වීන්වහන්ස, මාගේ ආශ්‍රම ප්‍රදෙශයෙහි අඹගස් හා තල්ගස්ද ඇසළගස්ද දඹගස්ද එරහැන්දගස්ද සුපුෂ්පිතවූ පලොල්ගස්ද ඇත්තේය, හැමකල්හිම හාත්පසින් පිරවරා මධුර ශබ්දයෙන් ගායනාකරන්නාවූ කිම්පුරුෂ කින්නරාඞ්ගනාවන් විසින් විශේෂයෙන් ගායනාකරණලද්දේය. පින්වත්වූ තපස්වීන්වහන්ස, මාගේ ආශ්‍රම ප්‍රදේශයෙහි ප්‍රසාදවූ තල්කැලද බොහෝ වන්නේය. නැවත ඒ මා වසන්නාවූ ආශ්‍රමප්‍රදෙශය උතුම්වූ භූමිප්‍රදෙශය විසිතුරුවූ සවරූප ඇත්තේය. තවද තපස්වීන්වහන්ස, ඒ මාගේ පන්සල් සමීපයෙහි වර්ණ ගන්ධ රසයෙන් යුක්තවූ වෘක්ෂඵලයෙන් හා නොයෙක් සුවඳ මල් හා නොයෙක් වෘක්ෂලතාදියෙහි සුවඳ මූලජාතිද බොහෝවන්නේය, මාගේ ඒ ආශ්‍රමප්‍රදෙශයට බොහෝ වැදි පුත්‍රයෝ එන්නාහ, මා විසින් ඒ අසපුවෙහි ගෙණහැර තබතලද මධුර රස ඇති බොහෝ වනමුල් වන ඵලාඵල ඇත්තේය, ඒ වැදිපුත්‍රයෝ කල්යවා රඳාගියකල වනමුල් වන ඵලාඵල ඇරගෙණ යන්නාහුය, කැමැතිසේක් විනම් අවමැතව නොයනු කැමතිසේක් විනම් මම යෙමියි ඒ නලිනී නම්වූ රාජකුමාරිකාව මෙසේ කීව.

එබස් අසා තපස්විහු කියන්නාහු තඤස්වීනි, මාගේ පියාතන්වහන්සේ වනමුල් ඵලාඵල ගෙණනු සඳහා වනයට ගියසේක, දූන් නොබෝ කලකින් සවස් වේලාවට එනසේක, උන්වහන්සේ ඵලාඵල ගෙණාවිට උන්වහන්සේට මා කියා තෙපිත් අපිත් දෙදෙනම තොපවිසින් වර්ණනාකරණ අසපුවට එක්ව සැපසේ යම්හයි කීහ. ඉක්බිති තපස්වී කන්‍යා සිතන්නාහු තාපසයෝවූකලී තමන් වනයෙහි වැඩීවඩිනවූ බැවින් ස්ත්‍රීන්නියා නොදනිති මූන්ගේ පියානෝ මා දුටුවිටම ස්ත්‍රී නියාව දූත තොප මෙතැන්හි කුමක් කෙරෙද්දැයි දඬු කෙලවරින් ගසා මාගේ ඔලුව පලාපියන්නට නිස්සෝය, එසේ හෙයින් උන් එන්නාට පළමුකොට මා යන්ට වටනේය. මම අා කාරියත් සමෘද්ධව ගියේයයි

සිතා තපස්විනී තමා හා කැටිව නොයන්ට උපාය කියන්නී මෙසේ කීව. තපස්වීන්වහන්ස, මා විසින් කල්යවන්ට නොපිළිවන්නේය. උතුම්වූ සත්ත්ව සවභාව ඇති අත්‍යවූ බොහෝ බ්‍රාහ්මණ තපස්වීවරයන් හා රාජ තපස්වීවරයන් මාගේ පන්සලට යන්නාවූ මාර්ගය උභය පාර්ශවයෙහි වසන්නාහ, මම ඒ තපස්වීවරයන්ට නුඹවහන්සේ මා සමීපයට කැඳවාගෙණ එන්නකියාලා යෙමි නුඹවහන්සේ උඟ අතින් මා වසනතැන් විචාරා වඳුළමැනව, ඒ තපස්වීවරයෝ නුඹවහන්සේ මා සමීපයට කැඳවාගෙණ එතියි කීව. මෙසේ ඒ තපස්වී කන්‍යාතොම තමා එතනින් පලායන්ට උපායක් කියාකොට පන්සලින් නික්ම ඒ තපස්වී බල බලා සිටියදීම තෙපි එසේ සිටුවයි කියා පළමු තමා එතනට ආවාවූ මාර්ගයෙන්ම අමාත්‍යයන් සමීපයට ගියාය, ඒ අමාත්‍යයෝ තපස්වී කන්‍යාව ගෙණ පිරිස් රැකවල් සිටිතැනට ගොස් ක්‍රමයෙන් බරණැස්නුවරට පැමිණියාහ. ශක්‍රයෝත් එදවස්ම සතුටුව සියලුරට වැසිවැස්වූහ. ඉසිසිඞග තාපසයන්ගේද සකල ශරීරය ඒ තපස්වී කන්‍යාව එලාගිය බව හේතුකොට ගෙණ දහලපන්නේය, ඒ තපස්වී සැලෙමින් වෙවුලමින් පන්සලට වැද වැහැරි සිවුර පෙරවාගෙණ සෝකයෙන් වැදහොත්තාහුය. මහබෝසතානෝ සවස් වේලෙහි අවුත් පුතනුවන් නොදක කොහි ගියෝදැයි සිතා එලාඑල කඳතබා පන්සලට වැදහොත් තැන් දක පුත කුමක් කරව්දැයි කියමින් පිටපිරිමැද මසේ කීහ.

පුත තෙපි මෙතෙක්දවස් වලින් දර ගෙණවුත් තබව අද වූකලි තොප විසින් වනයෙන් දරත් නොගෙණාලද්දේය පැනුත් නොගෙණාලද්දේය ගිනිත් නොදල්වන ලද්දේය, කුමක් පිණිස මඳවූවාක්මෙන් සිතිවිලිගන්නා ලද්දේද පෙර තෙපි විසින් මා එන වේලාවට දර කඩාගෙණවුත් තබනලද ගිනිත් මොලවන ලද තපින සඳහා වන්නිකබල් ගිනිදල්වා තබනලද මා ඉඳිනා සඳහා අසුන් පණවා තබනලද පාද්‍යෝතාදිය එලවා තබනලද තෙපි මීට පළමුව මේ අසපු යෙහි කෙසේ විසීද තොපගේ හිතට කෙසේවූ දුර්මුඛයෙක් පැමිණියේද මෙසේ සෝකාතුරව මා හා සමග කථානොකොට වැදහොත් කාරණා මට කියව්යි කීහ.

ඉසිසිඞග තාපසයෝ පියානන්ගේ බස් අසා තමන් සෝකාතුරව වැද හොත් කාරණා කියන්නාහු මෙසේ කීහ. පියානන්වහන්ස මේ පන්සලට ආවාවූ තපස්විකෙණෙක් ජටාධරයෝය, ඉතා දර්ශනීයයෝය, ඉතා දුර්වල නොවන්නාවූ සථුලනොවන්නාවූ විශිෂ්ටවූ ශරීර ඇත්තේය, තමන්ගේ ශරීරාලෝකයෙන් සියලු ආශ්‍රම ප්‍රදේශය පිරවූයේය, ඉතා උස් නොවෙති, ඉතා මිටි නොවෙති, පියානන්වහන්ස, පින්වත්හුගේ බමරවැලයක් බඳුවූ ඉතා තිල්වූ කේශකලාපයෙන් තිල්වූ හිස මතාකොට ඔප්තනනලද ඉන්ද්‍රනීල මාණික්‍යයක්මෙන් සොභාමත්ව පෙණෙන්නේය. තවද ඒ තපස්වීන්ට දැළිරැවුළු හටනොගන්නේය, ඉතා බාල යෝය, පැවිදිවූ නොබෝකල් ඇත්තාහුය, තපස්වීන්ගේ කරඅතරෙ භික්ෂා භාජනය තිබෙන්නාවූ පත්පල්ලක් හා සමාන පලඳනාවෙක්ය, පළමු තමා නො දන්නා හෙයින් මුක්තාහාරය උදෙසා මෙසේ කීහ. නැවත ඒ තපස්වීන්ගේ ලෙහි මතාව හටගන්නාවූ ගාඩයෝ දෙදෙනෙක් රන්වූ පිඩු දෙකක් හා සමාන වූවාහු ප්‍රභාසම්පන්නව බබලන්නේය, පළමු තමා පයෝධරයන් නොහඳුනන හෙයින් ගඩදෙකයයි තනඝල සඳහා කීහ. තපස්වීන්ගේ මුඛය ඉතා දර්ශනීයය, දෙකන්ගෙඩි දෙකකුල් එල්ලෙන්නේය, සිංහරූපමය සවර්ණ කුණ්ඩලාභරණයන්

සඳහා මෙසේ කීය. එකල එල්ලෙන්නාවූ ප්‍රසාධනයෝ දෙදෙන ඇත්මැත් බලා ඇවිදුනා ඒ තරුණ තපස්වීන්ගේ දෙකණ හොබවන්නේය, තපස්වී ජටාබඳනාහු සූත්‍රයෙන් ප්‍රභා විහිදුනේය.

තවද ඒ තපස්වීගේ රත් නිල් සුදු රත්වන් පැහැ ඇති අතිකුත් ප්‍රසාද සතරෙක් ඇත්තේය, මේ එතයෙහි රත් රිදී පබළු ආදී මාණික්‍යමය පලඳනා සතරක් දක්වා කීහ. ඒ ප්‍රසාදනයෝ සතරදෙනෙක් තපස්වීන් ඇත් මැත් බලා ඇවිදින්ට පටන්ගත්කල වර්‍ෂාකාලයෙහි හඬන්නාවූ සියොත් ආදී පක්‍ෂිසමූහයා මෙන් නාද පවත්වන්නාහ. පියාතන්වහන්ස, අපි යම්සේ කෘෂ්ණමයවූ වැහැරි සිවුරුකොට දරමෝද ඒ තපස්වී එපරිද්දෙන්ම මෘදු තණ බබුස්තණ වැහැරි ආදියෙන් කරණලද සිවුරුකොට ඇඳ පෙරව ඇවිදිනාහු නොවෙති, රන්වන් වැහැරි සිවුරු දරන්නාහ, ඒ රන්වන්වූ වැහැරි සිවුර තපස්වීන්ගේ උතුම් පුළුලුකුලෙහි එල්ලෙන්නේය, අහස්හි ගසනලද සියරැලි විදුලිය මෙන් බබලන්නේය. තවද පියාතන්වහන්ස, ඒ තපස්වීන්ගේ නාභියෙහි යට කටි යෙහි බැඳ එල්වන ලද්දවූ අන්‍යවූ කිසි වර්ණභේදයක් නැති තවුනැති ඵල ජාති යෙක් ඇත්තේය, ඒ ඵලජාතිය සෙල්විමෙක් නැතිව මෙතෙමේ තමාටම අහව රනයෙන් කිලි කිලි යන අනුකරණයෙන් නාද පවත්නේය. පියාතන්වහන්ස, එතරුණ තපස්වීන්ගේ උකුලෙහි හුයින් අමුනාදමනලද වෘක්‍ෂඵලය කවර වෘක්‍ෂ යෙකැයි පළමු නමත් මේ ඵල නොඅඳුනන හෙයින් රන්රසුදැලින් බබලන්නාවූ මිණිමෙවුල් උදෙසා විචාළාහ.

තවද පියාතන්වහන්ස, ඒ තපස්වීගේ දලමඬුල්ල ඉතා දර්‍ශනීයය, සිය ගණන් රැලියෙන් ගැවසීගෙන අක්ඛබුරුව තිබෙන්නේය, මිනාවූ සුවඳ ඇත් තේය. ඒ තාපසයන්ගේ හිසදෙකක්කොට බෙදූ බඳනාලද ජටාවන්ගේ වශ යෙන් මිනාකොට විභාග කරණලද සවරූප ඇත්තේය, ඒ මානවකයන්ගේ දලමඬුල්ල යම්සේ බඳනාලද්දේවීනම් එපරිද්දෙන් නුඹවහන්සේ මාගේ දල මඬුල්ල නොබැඳිසේක, මාගේ දලමඬුල්ලත් එසේම බැන්දහොත් යහපත් වන්නේය. ඉසිසිඹග තාපසයෝ පළමු නමින් හිස්මුදුනෙහි පීරා දෙකක්කොට රොද වසා බඳනාලද කෙස්වැටියෙක් නුදුටුවිරූ හෙයින් දලමඬුලු ආකාරයෙන් බඳනාලද රත්රුවන් හුයින් මුසුවූ කෙස්වැටිය උදෙසා විචාළහ. පියාතන් වහන්ස, කලෙක ඒ තපස්වී වර්‍ණයෙන් ගන්ධයෙන් යුක්තවූ සවභාව ඇති ඒ දල මඬුල්ල විදා එලූනම් එකල පවනින් හමාබස්නාවූ නිලුපුල්මල් සුවඳක් යම්සේ සිත්කළුද එපරිද්දෙන් මාගේ මේ වනලැහැබෙහි පිහිටියාවූ මේ ආශ්‍රමප්‍රදේශය විශෙෂයෙන් මඩනාලද සුගන්ධයෙන් ඒකසුගන්ධ වන්නේය. පියාතන්වහන්ස, ඒ තපස්වීන්ගේ ශරීරයෙහි ගල්වනලද කල්කයෙන් ඒ ඉතා දර්‍ශනීය පඞ්කයක් බඳුවීය, එබඳු නොවන්නේය ප්‍රියවූ සුවඳවත්වූ ශරීරකල්කය පවනින් හමන ලද්දේය, වසන්ත සමයෙහි පිපි සුවඳවනයක්මෙන් සිත්කළුවූ සුවඳ පවත්නේය, ශරීරයෙහි ගල්වනලද සඳුන් සුවඳ විලවුන් නිසා කීහ.

තවද පියාතන්වහන්ස, ඒ තපවීන් විසිතුරුවූ සවරූප ඇති ප්‍රසාදවත වූ වෘක්‍ෂඵලයක් පොළොවට අත්ලෙන් බොහෝවේලක් ගසන්නාහ, එසේ ගසන ලද්දවූ වෘක්‍ෂඵලය ඒ තපස්වීන්ගේ අතට නැවත එන්නේය, ඒ වෘක්‍ෂඵලය කවර ඵලයෙක්දැයි ඒ තපස් කන්‍යාව අත්ලෙන් බිමටගසා කෙළනාවූ පෙදවට

උදෙසා විචාළහ. පියාතන්වහන්ස, තරුණ තපස්වීන්ගේ දන්තයෝ ඉතා දර්ශනීය වන්නාහ, මනාකොට මදනාලද සකක්මෙන් පිරිසිදුය සමව සිටියාහ, ඒ තපස්වී මුඛයදල්වා කථාකරන්ට වන්කල්හි ප්‍රසාදව සිත්අලවන්නාහ, ඒ තරුණ මානවකතෙම ඒකාන්තයෙන් ඒ දන්තයෙන් පලාකොල හා අලමුල් නොකෑයේය, අපගේ දත් වූකලී පලාකොල හා අලමුල් ආදිය කනබැවින් පලාවන්වන්නේය, පියානන්වහන්ස, තරුණ තපස්වීන්ගේකථා පරුෂනොවන්නේය නැවත කියන් මිහිරිවන්නේය, නොසෙළු බැවින් සෘජුවන්නේය, අවික්ෂිප්ත බැවින් අනුඹතවන්නේය, මනා බැවින් චපල නොවන්නේය, එසේවූ මධුරස්වර සංඛ්‍යාතවූ කටහඬත් මනෝරම වන්නේය, කුරවීකනාදයක්මෙන් මධුරවන්නේය, සිත්කළු වන්නේය, එසේවූ මධුරස්වර මගේ සිත විශෙෂයෙන් අලවන්නේය, නැවත ඒ තරුණ තපස්වී මධුරස්වර ඇත්තාහ, ඉතා බුහුටිබස් ඇත්තාහුත් නොවෙති, ඒකාන්තයෙන් හැදෑරීම් පිරවීම් ආදියෙහි බලවත්ව යෙදුනාවූත් නොවෙති. ඒ තපස්වී පළමු මට මිත්‍රවූවාහුවත, එසේහෙයින් උන් නැවතත් දක්නට මම බලවත්වී අභිලාෂ ඇත්තෙමි, තවද පියානන්වහන්ස, තරුණ මානවකයන්ගේ ඌරුයුවලය අතුරෙහි එක් වණයෙක් ඇත ඒ වණය එක්ක දිව්තිබෙන්නාවූ බෙලිතුඩක් මෙන් සිප්පි වැදගෙණ තිබෙන්නේය, හාත්පසින් මටසිලුටුවූ වන්නේය, මනාවූ සටහන් ඇත්තේය, පියුම් කැකුළක් හා සමානවන්නේය, ඒ තරුණ තපස්වීන්ගේ ඌරුයුගලයන් විදහා ඒ වනයෙන් මාගේ අඞ්ගජාතය මැඩගෙණ කටියෙන් පෙළුහ.

තවද පියානන්වහන්ස, ඒ තරුණ මානවකයන්ගේ ශරීරයෙන් නික්මෙන්නාවූ රශ්මිකදම්බයෝ ආකාශයෙහි ගසන්නාවූ සියරලි විදුලියක්මෙන් දිලිසෙති බබලති දීප්තිමත්ව පවතිති, ඒ තපස්වීන්ගේ අතුත් ඉතා මොළොක් වන්නේය, අංජනවණීවූ ශරීරලෝමයෙන් සමන්විතයෝය, ඒ තපස්වීන්ගේ හස්තයෝ නිත්‍යලක්‍ෂණයෙන් විචිත්‍රවූ ප්‍රවාලංකාරවූ හා සදෘශවූ වටමටවූ ඇඟිලි පෙති පතරින් සමන්විතව බබලති, එසද කක්කිලිත හඩ එල ආදිය නැති බැවින් දශීනීය මටසිලුටු ශරීර ඇත්තේය, උන්ගේ ශරීරයෙහි ලොම් ඉතා දික් නොවන්නේය, අගින් රත්වූ ඉතා දික්වූ නිය අතින් මා වැළඳගෙණ සිත් ඇලවමින් මට උපස්ථාන කළාහ.

තවද පියානන්වහන්ස, ඒ තපස්වීන්ගේ හස්තයුගලය පුළුන්පෙදක් මෙන් ඉතා මොළොක්වන්නේය, ඡවි ඇතිවන්නේය, රශ්මි විහිදෙන්නේය එබඳු හස්තතල යුගලයෙහි මනාවූ ස්පශීය මාගේ ශරීරයෙහි පතුරුවා මා බලබලා සිටියදී මේ මගින් පලාගියේය, ඒ තපස්වීන්ගේ හස්තස්පශීය දැන් මා මැඩ පවත්නේය. පියානන්වහන්ස, ඒ තපස්වී ගියවේලෙහිපටන් මාගේ ශරීරයෙහි, දැහගත, එසේහෙයින් දෙම්නසට පැමිණ වැදහොත්තෙමි. පියානන්වහන්ස, ඒකාන්තයෙන් තරුණ තපස්වී කෙණ්ඩිකදක් උසුලන කෙණෙකුත් නොවෙති, සියඅතින් දරකැඩුකෙණෙකුත් නොවෙති, ඒකාන්තයෙන් ඒ තපස්වී දණ්ඩක පොරවක් ඇන දරපැලූ කෙණෙකුත් නොවෙති, එසේහෙයින් උන්ගේ අත්ලෙහි කරගැට නැත්තේය. පියානන්වහන්ස, ඒ තපස්වීන්ව චලසෙක් වනසක් කොට පීය, ඒ තපස්වී මට කියන්නේ මා සුවපත්කරවයි කීවූය, මම උන් සුවපත් කෙළෙමි, උන්සිතසතුටුවූ කෙරීමෙන් මටත් සැපත පැමිණියේය. එසද ඒ තපස්වී කියන්නේ තපස්වීන්වහන්ස, නුඹවහන්සේ නිසා බලවත් සැපයට පැමිණි

සෙම්යි මට කිවුය. පියානන්වහන්ස, නුඹවහන්සේගේ මේ අභිනව පත්‍රයෙන් කරණලද කොල ඇතිරිලියවූකලී අද ඒ තපස්වීන් හා මා හා දෙදෙන ඔවුනොවුන් අල්වාගෙණ සැපසේ ඔබමොබ පෙරලෙන්නවුන් විසින් අවුල්වියවුල් කරණලද. පියානන්වහන්ස, ඒ තපස්වී හා මා හා දෙදෙන ඔවුනොවුන් හා අභිරමනය කොට ක්ලාන්ත ස්වරූප ඇතිව පන්සලින් නික්ම දියටබැස සිත් අලවා ක්‍රීඩා කොට සන්හුන්නාවූ ශරීර පීඩා ඇතිව නැවත නැවත මේ පන්සලට වදුම්හ. පියානන්වහන්ස, ඒ තපස්වී ගිය වේලෙහි පටන් අද මට මන්ත්‍රත් නොවැටහෙන්නේය, බ්‍රහ්මයාගේ චිත්තාරාධනාව පිණිස කළමනා හෝ මධුරාදීවූ යාග ක්‍රියාවක් මාගේ සිතට අභිප්‍රාය නොවන්නේය, පියානන්වහන්ස, ඒ තරුණ තපස්වී යම්තාක් නුදුටුයෙම් වීනම් ඒතාක් නුඹවහන්සේ විසින් ගෙණෙනලද වනමුල් වනඵලාඵල අනුභව නොකරමි. පියානන්වහන්ස, තපස්වී යම් දිසාවෙක වෙසෙත් නම් ඒ දිසාව ඒකාන්තයෙන් දක්නා සේක් වීනම් වහා මා ඒ දිසාවට පමුණුවාලුව මැනව. මම නුඹවහන්සේගේ පන්සල වැදහෙව නොම්යෙම්නම් ඊට පළමුකොට උන් වසන තැනට පමුණුවාලුවමැනව, පියානන් වහන්ස, ඒ තරුණ තපස්වීන්ගේ පන්සල වටකොට විසිතුරු පුෂ්පයෙන් හා වෘක්ෂසමූහයා විසින් ගැවසී ගත්තාවූ එසේම මධුර කුරවීකාදීවූ පක්ෂි සමූහයා විසින් රුවුපිළිරුවූ දෙනලද වනයෙක් ඇතැයි මා විසින් ඒ තපස්වීන්ගෙන් අසා දන්නාලදහ. එසේහෙයින් පියානන් වහන්ස, ඒ තපස්වී වසන්නාවූ දිගට නුඹවහන්සේ මා වහා පමුණුවාපිවමැනව, ඉදින් නුඹවහන්සේ මදක් ප්‍රමාදවූ සේක් වීනම් නොබෝකලකින් නුඹවහන්සේගේ පන්සලදී මා දිවිහරිමි, ඊට පළමුකොට මා ගෙණගොස් ඒ තරුණ තපස්වීන් වසන පන්සලට ලුවමැනවයි ඉසිසිඞග තාපසයෝ විලාපවසයෙන් මෙසේ කථාකෙරෙමින් පියානන්ට කීහ. මෙසේ වාක්විලාපකොට අඬන්නාවූ ඉසිසිඞග තාපසයන්ගේ බැගෑ හඬ අසා මහබෝසතානෝ, එක් ස්ත්‍රියක විසින් මූන්ගේ ශීලභෙදය කරණලද්දේවනැයි සිතා ඉසිසිඞග තාපසයන්ට අවවාද කරන්නාවූ මෙසේ කීහ.

පුත ඉසිසිඞග තාපසයෙනි, ගිණිදෙවියාට කරණලද පූජාවෙන් එකාලොකව බබලන්නාවූ ගාන්ධර්වයන් හා දිව්‍යප්සරාවන් විසින් නිරන්තරයෙන් සෙවුනාලද සෘෂීන්ගේ මෙබඳු ආශ්‍රම ප්‍රදෙශයෙහි වසන්නාවූ තෙපි යම් අරතිය කට පැමිණියාහුවීනම් එබඳු උකටලියට නුවණැත්තාවූ කුලපුත්‍රයෝ නොපැමිණෙන්නාහ. එසේහෙයින් එම්බා ඉසිසිඞග තාපසයෙනි, මේ ලොකයෙහි යම් කෙණෙකුන්ට මිත්‍රයෝ වන්නාහුත් වෙද්ද නොවන්නාහුත් වෙද්ද යම් කෙණෙකුන්ට මිත්‍රයෝ ඇත්නම් ඔහු ඥාතිමිත්‍රයන් කෙරෙහි ප්‍රේමකරන්නාහ. ඉසිසිඞග තාපසතෙම කවර සිතිවිල්ලකින් කවර නම් කාරණයෙකින් මේ අනර්ථකාරීවූ මාතුගාමයා කෙරෙහි මිත්‍රසංඥා කෙළේද මුවබඩින් ඉපිද වෙනෙහි වැඩී බැවින් කොයිසිට ආබවත් නොදන්නා හෙයින් තමා ආතැත් නොදන්නේය, ඥාතිමිත්‍ර මේ මාතුගාමයා මාගේයයි සිතාගන්ට කාරණා කවරෙක්දැයි නොසතුටුවූ සිත් ඇතිව කීහ.

මෙසේ කියා නැවත කියන්නාහු මේ ලෝකයෙහි නැවත නැවත සංවාස සත්ත්වයන්ට මිත්‍රයෝ එක්ව ගැළවෙන්නාහ, ඒ මෛත්‍රිය නැවත නැවත එක්වීම

නොකරන්නාවූ පුරුෂයාහට අසම්ගම සංඛ්‍යාතවූ සංවාසයෙන් නැසීයන්නේය. එසේහෙයින් පුත, ඒ තපස්වීහු දක්නා කැමැතිවීනම් ඒ තපස්වීන් හා සමග නැවත කථාකරණු කැමැත්තාවීනම් යම්සේ මනාව පැසීගියාවූ සශ්‍යයක් මහ වතුරෙක් අවුත් මුලිනුදුරාගෙණයේද එපරිද්දෙන්ම මේ තොපගේ තපස් සවභාව නස්නාවූද පුත, මේ මනුෂ්‍යලෝකයෙහි මේ යක්‍ෂණී සංඛ්‍යාතවූ භූතයෝ අනේකප්‍රකාර රූපයන් මවාගෙණ පිළිසන්වූ සවරූපයෙන් ඇවිද තමන්ගේ වසගයට පැමිණියාවුන් අල්වාගෙණ අනුභව කරන්නාහ. යක්‍ෂණියයි කියන ලද භූතයන් නුවණැත්තාවූ සත්ත්වතෙමේ සේවනය නොකරන්නේය, එබඳුවූ භූතයාකරා පැමිණ තපස්වීවරයෝ නිස්කාරණයෙකැයි දන්නාහ. එසේහෙයින් තෙපි ඒ යක්‍ෂණීය විසින් දක්නා ලදුව තොප දූක අල්වාගත් ගමනේ නොකා ඇරපූයේ තොපගේ පින්වේදැයි මහබෝසතාණෝ පුතනුවන්ට අවවාද කළාහ. ඉසිසිඞ්ග තාපසයෝ පියාණන්ගේ බස් අසා ඕතොමෝ යක්‍ෂණියක්ලයි ත්‍රස්තව ඈ කෙරෙහි පිළිබඳසිත් වලකා පියාණන්වහන්ස, මෙතැනින් මම ඈ කරා නොයම්යි මට ක්‍ෂමා කළ මැනවයි කියා පියාණන් ක්‍ෂමා කරවූහ. මහබෝසතාණෝත් ඉසිසිඞ්ග තාපසයන් අස්වසා පුත, තෙපි මෙසේවූ මෛත්‍රී කරුණා මුදිතා උපෙක්‍ෂායයි කියනලද චතුර්විධ වූ බ්‍රහමවිහාර භාවනාවන් කීහ. ඉසිසිඞ්ග තාපසයෝ මහබෝසතාණන්ගේ අවවාදයෙහි පිහිටා නැවත බ්‍රහ්මවිහාරභාවනා කොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්‍යසත්‍යය ප්‍රකාශකොට **නලිනී ජාතකය** නිමවා වදාළ සේක. චතුස්සත්‍ය ධර්මදෙශනාවගේ කෙළවර ශාසනයෙහි උකටලී භික්‍ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටිසේක. එසමයෙහි නලිනී රාජකුමාරිකා නම් දූන් පුරාණ දුතිකා වන්නීය, ඉසිසිඞ්ග තාපසයෝ තම් උකටලී මහණය, එසම යෙහි ඉසිසිඞ්ග තාපසයන්ට පියවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළ සේකි.

517
සෝනක ජාතකය

තවද විචිතොපචිත පාරමිතා ඇති ගෞතම ගොත්‍ර ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි දිව්‍ය-බ්‍රහ්ම ආර්‍ය ඊර්යාපථ විහරණයෙන් දවස් යවනසේක් මේ ජාතක ධර්මදෙශනාව තමන්වහන්සේගේ මහබිනික්මන් අරභයා වදාළසේක.

සර්වඥයන් වහන්සේ දම්සභාමණ්ඩපයෙහි රුස්ව නෛෂ්ක්‍රම්‍ය පාරමිතා වර්ණනාකෙරෙමින් වැඩහුන් මහාකාශ්‍යප ස්ථවිර ප්‍රමුඛ භික්‍ෂූන්වහන්සේ මධ්‍ය යෙහි පනවණලද බුඬාසනයෙහි යුගඳුරු මුදුනෙහි දිලියෙන ලහිරුමඬලක් මෙන් සවණක් ඝන බුඬරස්මීන් විහිදුවමින් වැඩහිඳ මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිකම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා සර්වඥයන්ගේ මහබිනික්මන් වර්ණනාකෙරෙමින් උනුම්හයි දන්වූ කල්හි මහණෙනි, සර්වඥයෝ

දක්මතු මහබිනික්මන් කළාහු නොවෙති, පෙරත් ගිහිගෙය ඇරගොස් මහණ වූවෝ වේදැයි වදාරා භික්ෂූන් වහන්සේ විසින් ආරාධිතවූ බුදුරජානන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යෙවකිය දවස මගධරට රජගහනුවර මගධ නම් රජ්ජුරුකෙනෙකුන් දන ප්‍රියවචනාර්ථචර්‍යා සමානාත්මතාය යන සතර සංග්‍රහ වස්තුවෙන් ජන රංජනය කරණ කල්හි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන් අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත්හ. ඔහට නම් තබන්නාවූ දෙමව්පියෝ අරිඳකුමාරයෝයයි නම් තුබූහ. ඒ බොධිසත්ත්වයන් උපන් දම පුරෝහිතබ්‍රාහ්මණයන්ටත් පුතනුකෙනෙක් උපන්හ ඔහට නම්තබන්නාහු සොනක කුමාරයෝයයි නම් තුබූහ ඒ දෙදෙන එක්ව සියලු දෘෂ්ටිභෙද ඇති සමය චාරිත්‍ර හා දෙශ චාරිත්‍ර දනගණුම්හයි අනුක්‍රමයෙන් ගම් නියම්ගම් රාජධානියෙහි සැරිසරා ඇවිදිනාහු බරණැස්නුවරට සම්ප්‍රාප්තව මගුල්උයන්හි රෑ සැතපී දෙවන දවස් උදැසන්හි නුවරට වන්හ. එදවස් නුවරවැසි සමහර සත්ත්ව කෙනෙක් බමුණන්ට දන්දී සාන්තිකරම්හයි කියා කිරිබත් ආදී දනොපකරණ සපයා ඉඳිනා අසුන් පණවා බමුණන් බලා උන්නාහුය, ඒ කුමාරයන් දෙදෙනා දක ගෙට කැඳවාගෙණගොස් අතුරණලද ආසනයෙහි ඉඳුවූහ. ඒ බොධිසත්ත්වයන්ගේ ආසනයෙහි සුදු වස්ත්‍රයෙක්ද සෝනක කුමාරයන්ගේ අස්නෙහි රත් පලසක්ද අතුරණලද්දේය, ඒ නිමිත්තන දක අද දවස මාගේ මිත්‍රවූ අරිඳම නම් කුමාරයෝ බරණැස්නුවර රජව මට සෙනෙවිරත්ධුරය දෙන්නේයයි දන ඒ සෝනකකුමාරයෝ කරණලද ආහාරකෘත්‍යය ඇතිව උද්‍යානයටම නැගී ගියාහුය.

ඉක්බිති එදවස් බරණැස් රජ්ජුරුවන් කළුරිය කළ දවසට සත්වන දවස වන්නේය, රාජ්‍යයට නිසි දරුවෙක් නැත්තාහ, එකල අමාත්‍යාදීහු ඉස්සෝධා නහා රුස්ව රාජ්‍යයට සුදුසු කෙනෙකුන් කරා යන්නේයයි මගුල්රථය සරනා තලල්පටය මගුල්කඩුවය මිරිවැඩි සඟලය සේසතය යන පඤ්ච රාජකකුධභාණ්ඩ යන් රථයෙහි තබා ගමන්ගත්සඳ උයනට ගොස් කරකැවී නැගෙන්නට සුදුසුව ගෙණ සිටියේය. එකල්හි ඉසවසා පෙරව මගුල්ශාලාව මත්තේ වැදහොත් ඒ බොධිසත්ත්වයන් සමීපයෙහි උන් සෝනක කුමාර තූර්‍ය්‍යඝෝෂාව අසා අරිඳම කුමාරයන්ට පුරස්සරව ආයේය. අද දවස් මුතුමු රජව මට සෙනවිරත් ධුරය දෙති, මට එනාහි ඒ ඓශ්වර්‍ය්‍යයෙන් ප්‍රයෝජන නැත්තේය, මූත් රජව නුවරට වන් කල්හි මෙයින් නික්ම මහණවෙමි සිතා පිළිසන් නැතෙක සිටියේය. එකල්හි පෙළහර ගෙන්වාගෙණ ගිය පුරෝහිත බ්‍රාහ්මණ උයනටවැද ශාලාවෙහි ඔත් බොධිසත්ත්වයන් දක ඔහුගේ ධෛර්‍ය්‍ය පරීක්ෂාකරණු පිණිස එකවිටම නොයෙක් තූර්‍ය්‍යනාද කරවීය. එකල මහබෝසතාණෝ පිබිද අතික් ඇලයට නැමී මදක්කල් වැදහොවා නැගී සලවමෙහි පලක් බැඳ උන්නාහුය. ඉක්බිත් තෙන් පුරෝහිත බ්‍රාහ්මණ බොධිසත්ත්වයන්ට නමස්කාරකොට සිට දේවයන් වහන්ස, රාජ්‍යය නුඹවහන්සේට පැමිණෙන්නේයයි කීයේය. ඔහු බස් අසා කිමෙක්ද නොප රජ්ජුරුවන්ගේ කුමාරකෙනෙක් නැද්දැයි බොධිසත්ත්වයන් වහන්සේ විචාළ කල්හි එසේය දෙවයෙනි, රාජකුමාර කෙනෙක් නැතැයිකී සඳ එසේනම් යනපතැයි පුරෝහිත බමුණන්ගේ බස් බොධිසත්ත්වයෝ පිළිගත්තාහුය.

ඉක්බිති ඒ පුරෝහිත බ්‍රාහ්මණයා ඇතුළුවූ අමාත්‍යයෝ බොධිසත්ත්වයන් එතැන්හිදීම අභිෂෙකකොට රථයට නන්වාගෙණ මහත්වූ පෙළහරින් නුවර පැදකුණුකරවා රජමැඳුරට ගෙණ ගියාහුය. ඒ අරිඳම රජ්ජුරුවෝ යස මහත්ව යෙන් මත්ව සෝනක කුමාරයන් සිහිනොකළාහුය. ඒ රජ්ජුරුවන් නුවරවවත් පසු සෝනක කුමාරයෝ සලවටෙහි ඉඳන් සල්ගසින් විලික්‍ෂ තුවටුයෙන් ගිලිහී ඉදිරියෙහි වැටිහුනුවාවූ පතක් දැක ඒ අරමුණුකොට සසර කලකිරී යම් සේ මේ පත්‍රය ජරාවට පැමිණගියේද එපරිද්දෙන්ම මාගේ ශරීරයද ජරාවට පැමිණෙන් නේය යනාදීන් සිහිකරමින් සිටිකල්හි ගිහිවෙස් අතුරුදන්ව මහණවෙස් පහළ විය, එකල්හි සෝනක නම් පසේබුදුරජානන්වහන්සේ ඉතිකිත් භවයෙහි උත් පත්තියක් නැතැයි යනාදීන් ප්‍රීතිවාක්‍ය පවත්වමින් පසේබුදුවරයන් වසන්නාවූ නන්දමූලක නම් ගල්ලෙනට වැඩවදාළසේක. මහබොධිසත්ත්වයෝද රාජ්‍යශ්‍රී විඳ මින් සාළිස් අවුරුද්දක් ගියකල්හි සිහිකොට මාගේ යහලු සෝනකකුමාරයෝ කොයිද්‍යෝහෝයි නොයෙක්වර විචාරා දිටිම් ඇසිම් කියන කෙණෙකුන් නොදැක සරහා පිළියෙල කරණලද මතුමාල්තලයෙහි නොයෙක් නළුනාටකාදීන් විසි පිරිවරණලදුව සිංහාසනයෙහි ඉඳ රාජ්‍යශ්‍රී විඳිමින් සෝනක කුමාරයෝ අසවල් තෙන වෙසෙති යමෙක්හුගෙන් යමෙක් අසා කීයේවීනම් ඔහට සියයක් රන්මසු දෙම්, යමෙක් දිටිම් කියාද ඔහට දහසක් දෙම් යන මේ අර්ථයෙන් යුක්තවූ ගාථාවක් බැඳ ප්‍රීතිවචනයෙන් කීයේය. එකල්හි එක් නාටකස්ත්‍රියක් ගාථාව රජ්ජුරුවන්ගේ මුඛයෙන් උදුරාගන්නාක්මෙන් ඉගෙණගෙණ ගායනාකළාය. ඇගෙන් අනිකෙකු අනිකෙකැයි සියලු අන්තඃපුර වාසීහුද යන සියල්ලෝම අපගේ රජ්ජරුවන් වහන්සේ එක්වන් ගායනාකරණ ප්‍රීති ගීතිකාවෙකැයි ඉගෙණ තුමූත් එක්වන් කියන්නාහුය. මෙලෙසින් දීඝායු නම් කුමාරයන් ප්‍රධානවූ බොහෝ දූ පුත් දරුවන් ඇතිව රාජ්‍යශ්‍රී විඳිමින් ඒ රජ්ජුරුවන්ට පණස් අවුරුද්දක් විවර ඉක්ම ගියේය.

ඒ කාලයෙහි සොනක නම් පසේබුදුරජානන්වහන්සේ රජ්ජුරුවන්ගේ අභිප්‍රාය දිවැසින් දැක අරිඳම නම් රජ්ජුරුවෝ මා දක්නා කැමැත්තාහුය, එහි ගොසින් ඔහට පඤ්චකාම විෂයෙහි ආදීනවද මහණදම් පිරීමෙහි ගුණද දක්වා උත් මහණවන ලෙස කෙරෙම් සිතා වදුරා පස්වණක් වලාකුළු මඬිමින් ආකාශ යෙන් අවුත් මගුල් උයනෙහි වැඩඋත්සේක. එදවස් සියලු ශිල්පනම් සත් ඇවිරිදි කුමරුවෙක් මැතියන් විසින් නික්මවන ලද්දේ මගුල්උයන සමීපයෙහි දරකෝටු අවුලමින් නැවත නැවත ඒ ගීතිකාව ගායනා කෙළේය, ඒ අසා පසේ බුදුරජානන්වහන්සේ ඔහු සමීපයට කැඳවා කිමෙක්ද කුමාරයෙනි අනිකක් නොකියා එකම ගියක් නැවත නැවත කියන්නෙහිය, අන් ගීයක් නොදන්නෙහි දැයි විචාරා වදාළසේක. සාමීනි, එතකුදුවුවත් අපගේ රජ්ජුරුවන්වහන්සේට මෙම ප්‍රිය හෙයින් නැවත නැවත කියම් කීහ. ඒ අසා පසේ බුදුරජානන්වහන්සේ තොපගේ මේ ගීතිකාවට ප්‍රතිගීයක් කියන කෙණෙකුන් දුටුවිරුදැයි විචාරා නුදුටුවිරීම් සාමීනි කීකල්හි රජ්ජුරුවන් වහන්සේ කරාගොස් පටිගීතය කියා එයිනම් තා උගන්වාලමියි වදාළසේක. එසඳ කුමරුවා විසින් යහපත සවාමීනි, වදාළමැනවැයි කීකල්හි ඒ පසේබුදුරජානන් වහන්සේ ප්‍රතිගීතයක් උගන්වා කුමාරයෙනි මේ ප්‍රතිගීතිකාව රජ්ජුරුවන් හා එක්ව කියව, රජ්ජුරුවෝ තොපට සමාධිව බොහෝ සම්පත් දෙති වහා නික්මෙවයි වදාළසේක,

එකල කුමාරතෙම යහපතැයි ගීතිකාව ඉගෙණ පසේබුදුරජාණන්වහන්සේ වැඳ ස්වාමිනි මම යම්තාක් රජ්ජුරුවන්වහන්සේ කැඳවාගෙණ එම්ද ඒතාක් මෙහිම වැඩඋන මැනවැයි ආරාධනාකොට වනා ගෙට ගොස් මෑනියන්වහන්ස, මා ඉස්සෝඩා තාවා සරහාලුව මැනවැයි, අදදවස් දිළිඳු බැවින් නුඹවහන්සේ මුදලම්. කියා මෑනියන් සතුටුකොළේය. එකල ඕහු බස් අසා සමාධිවූ මෑනියන් විසින් සරහා පිළියෙල කරණ ලදුව රජගෙයි වාරයට ගොස් ආයයීවාරපාලය, එක් කුඩා පුතෙක් නුඹවහන්සේ හා සමග ප්‍රතිගීතිකාවක් කියමියි අවුත් වාසල් දොර සිටියේයයි රජ්ජුරුවන්වහන්සේට දක්වාලුව මැනවැයි කීයේය. එබස් අසා දොරටුපාලයා වහ වහා ගොස් එපවත් රජ්ජුරුවන්ට කීයේය. එබස් අසා රජ්ජුරුවෝ ඔහු ගෙන්වාගෙණ දරුව තොපි මා හා සමග ප්‍රතිගීතිකාවක් කියව්දැයි විචාරා කියම් දේවයන්වහන්සැයි කී කල්හි එසේකල කීයවයි කීයේය. එබසට දේවයන්වහන්ස, නුවර බෙරපියවිකරවා මහජනයා රැස්කරවුව මැන වැයි කීයේය, ඒ බොහෝදෙනා මධ්‍යයෙහි කියම් කීයේය. රජ්ජුරුවෝත් එලෙසම කරවා විසිතුරු කොට සරහනලද මණ්ඩපයෙහි සිංහාසනයේ ඉඳ කුම රුවාද පුදුපු අස්නෙක හිඳුවා මෙවිට කියවයි කීහ. දේවයන්වහන්ස, නුඹ වහන්සේ පළමුකොට ගායනාකළ කල්හි පසුව මම පටිගීතය කියම් කීයේය. එබස් අසා සතුටුවූ රජ්ජුරුවෝ මාගේ ප්‍රිය මිත්‍රවූ සොනකකුමාරයෝ අසෝ නෙනක වෙසෙති. උන්ගේ වාසස්ථානයක්නු කෙරෙන් අසා මට කියන්නාවූ කවරක්හට රන් මසු සියයක් දෙම්ද නොහොත් අතත සොනක කුමාරයන් මම දිටිමි. දක අවුත් කියන්නාවූ කවරක්හට දහසක් දෙම්දැයි යනාදීන් අර්ථ ඇති උදන් ගීතිකාව පළමුකොට කීවාහුය.

ඉක්බිති ඒ පසුව සියලු කුමාරතෙම දේවයන්වහන්ස, නුඹවහන්සේ සොනක කුමාරයන් උන්තැනින් අසා ඇවිත් කී වුන්ට ඉදින් සියයක් දෙන සේක්වීනම් මට දෙවා වදාළ මැනවැයි ඉදින් දක ඇවිත් කී වුන්ට දසක් දෙන සේක් වීනම් එයිත් මට දෙවා වදාළ මැනව. කුමක් නිසාද යත් නුඹවහන්සේට සබඳවූ වැලිකෙළියෙහි පටන් එක්ව කෙළවැඩියාවූ සොනක නම් යහළුවා නම් නුඹවහන්සේට ප්‍රත්‍යක්ෂ කොට දන්ම දක්වාලම්. යනාදීන් අර්ථයෙන් උප ලක්ෂිත පටිගීතය කීයේය. ඒ අසා සතුටුව කුමාරයෙනි, කවර රටක කවර ජනපදයක මාගේ යහළු සොනක කුමාරයන් දුටුයෙහිද ඒ මට කියවයි කීයේය. ඔහට ප්‍රතිවචන දෙන්නාවූ කුමාරතෙම දෙවයන්වහන්ස, නුඹවහන්සේගේ රට නුඹවහන්සේගේ මගුල්උයනෙහි සෘජුව සලලව කඳඇති මේඝකුමයක් බඳුවූ තිල්වූ සොභාඇති සිත්සැළුවූ අතුපතර ඇති කඳවෙළෙප් හා මුලින් ඔවුනොවුන් හා හිවී සිටියාවූ වෘක්ෂමූලයෙහි කාමූපදානරහිතව ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය මුසාවාදය සුරාපානය කේලාමය ඵරුෂ වචනය සම්ඵප්‍රලාපය අභිද්‍යාව්‍යාපාදය මිථ්‍යාදෘෂ්ටියයි කියනලද එකොළොස් වැදෑරුම්වූ ගින්නෙන් දන්නාවූ සත්ත්වයන් කෙරෙන් වෙන්ව සියලු කෙලෙස් ගින්නෙන් නිවුණාවූ සිත් ඇති එ සොනක කුමාරතෙම ධ්‍යානභාවනාවෙන් යෙදී රන්පිළිමයක් මෙන් මගුල්සලවට මත්තේයයි කීයේය.

එබස් අසා සමාධිව රජ්ජුරුවෝ නුවර සිට උයනට මග තනවා චතුරංගිණි සේනාව විසින් පිරිවරණ ලදුව උද්‍යාන භූමිප්‍රදේශයට ගොස් නිවී සිත් ඇතිව උන් සොනක නම් පසේබුදුන් දක නොවැදම එකත්පස්ව හිඳ තමන්

ක්ලේශයෙහි තරව ඇලුන හෙයින් උන්වහන්සේට මේ මහණතෙම ඉසමුඬුව දෙපට පවුලක් පෙරවගෙණ මව්පියන් නැති වෘක්ෂමූලයෙහි දුක්ඛිත එකෙකු මෙන් සිතාගෙණ ඉඳිතේයයි කීහ. එබස් ඇසූ සොනක පසේබුදුන් වහන්සේ රජ්ජුරුවෙනි යම්කෙනෙක් නවලොවිතුරා දහම් තමාසිතින් ප්‍රතිවෙධ වශයෙන් දකීද? එතෙම දුක්ඛිත නම් නොවන්නේය. යමෙක් වනාහි දශකුශලධර්මය සන්තානයෙන් දුරුකොට අධර්මයෙහි පවතීද එතෙම දුක්ඛිත නම් වන්නේයි.

එසේහෙයින් රජ්ජුරුවෝ තමන්වහන්සේට කළ නින්දාව නොදන්නාක් මෙන් පිළිසඳර කථා වශයෙන් තමන්වහන්සේගේ නාමගොත්‍රාදිය වදාළසේක. එවිට රජ්ජුරුවෝ මෙතනට පැමිණිසාවූ නුඹවහන්සේට කිසි අපාසුවෙක් නැද්දැයි යනාදීන් විචාළාහුය. ඔහට ප්‍රතිවචන දෙන්නාවූ පසේ බුදුරජානන් වහන්සේ මහරජ මෙතන තබා කොයින් මට අපාසුවෙක් නැතැයි වදාරා ඒ රජ හට ශ්‍රමණ බ්‍රාහ්මණ නම් බණ කියනසේක් මහරජ අගාරියයි කියන ලද ගිහි ගෙය හැර මහණවූ නිෂ්පලිබොධවූ මහණහට ඇමවේලෙහිම සැපවන්නේය.

තවද එක්කොටුවෙක සැළිනාළි මලුපැස් ආදියෙහිද ධන ධාන්‍යාදීන් පටවාගෙණ තබා රකෙන්නාහු නොවෙති. වැලි කෙසේ රකෙන්නාහුද? යත් දෙපට පව්ලක් පෙරව මැටිපාත්‍රයක් අතින් ගෙණ නෙයි සපයන ලද ආහාරය නෙපිළිවෙළින් සිහානෙණ පරියෙෂණය පරිභොගය ආසයය ධ්‍යානයය පරිපක්වතාවයය ඵලය නිස්සන්ධනය සම්මක්ඛණයයි කියනලද වලාපටලයක් පරිද්දෙන් අග්‍රපටලයෙන්ද වෙන්වූ චන්ද්‍රයා පරිද්දෙන්ද වස්තුකාම ක්ලේශකාම යන් හැර මහණව ගම් නියම්ගම් රාජධානියෙහි භික්ෂාටනය කොට ඇවිදිනාවූ යම් භික්ෂුවක්හට සනතන්දි වශයෙන් කිසිතෙනෙක්හි ඇල්මෙක් නැද්ද එබඳුවූ මහණහට සතරවෙනිවත් කළමනා වන්නේය. යම් භික්ෂුවක්හට තුන් සිවුරු පාත්‍රවිනා උපාසක කුලයෙක්හි තබනලද චීවරාදී පරිස්කාරයක් නැති හෙයින් සියලු නුවර ගිනිගෙණද තමුත් ඔවුන්ගෙන් දැයුතු පරිස්කාරයක් නැතිහෙයින් ඒ මහණහට පස්වෙනිව පාසුවන්නේය.

තවද මහරජ යම් මහණෙක් සකුන ප්‍රවෘතීන් කායප්‍රතිබද්ධවූ චීවරාදී පරිස්කාරය හැර අන් තැනක තබනලද කිසිවක් නැතිහෙයින් සොරුන් වැද නුවර එකහී කොල්ලකාගෙණ යතත් ඔවුන්ගෙන් ගෙණයන දෙයක් නැද්ද එසේහෙයින් සවෙනිවත් භික්ෂුනට පාසුවන්නේය.

තවද මනාවූව්‍රතසමාදන ඇති මහණතෙම කැපීම් පෙරලීම් අනුවාපත් ආදී නරකරණලද පාංශුකූල චීවර පටි පාත්‍රාදී අෂ්ටපරිෂ්කාරධරව යන්නේ සොරුන් අයසුන්ගම් ගන්නවූන්කරා පැමිණත් මෙකී මහණ පිරිකරින් ඔවුන්ට කිසි ප්‍රයෝජනයක් නැති හෙයින් කිසි කෙණෙකුන් වාහකුලක් නැතිව කැමති තැනකට සැපසේ යන්නේය, මේ කාරණයෙනුත් ඔහට සත්වැනිවත් සැප වන්නේය. තවද මහරජ ගෙයහැර මහණව නිස්වනවූ කුළෙහි ගෙණහි අලග් නවූ මහණතෙම යම් යම් දිසාවකට යනු කැමතිවීනම් එකෙණෙහි ගමෙක බිමෙක දෙශෙක පිරිකරෙක යන කිසිවෙක්හි ඇල්මක් නොකොටම යන්නේය. ඒ කාරණයෙන් අටවෙනිවත් මහණහට භද්‍රවන්නේයයි යනාදී අර්ථයෙන් සමණභද්‍රනම් ගාථා අටෙකින් බණ වදාළසේක.

ඒ සොනක නම් පසේබුදුරජාණන් වහන්සේ අතිකුත් සමණ හද්‍රසියඳුන් ගණන්කුත් කියන්ට සමර්ථ සේක්මය. රජ්ජුරුවෝ වනාහි කාමයෙහි සක්ත හෙයින් උන්වහන්සේගේ කථාවිච්ඡේදය කොට මේ සමණභද්‍ර ගාථාවෙන් මට ප්‍රයෝජන නැත්තේයයි තමන් පස්කම් ගුණෙහි ගිජුබව ප්‍රකාශ කෙරෙමින් තපස්වීන් වහන්සේ, මානුසිකවූද දිව්‍යවූද වස්තුකාම ක්ලේශකාමයෝ මට ඉතා ප්‍රියහ. එසේ හෙයින් කවර කාරණයකින් එදෙළ සම්පත් ලැබේදැයි විචාළේය. පසේබුදුහු එම්බා මහරජ කාමයෙහි ගිජුවූ විෂයාස්වාදයෙහි සක්තවූ කාමයෙන් මත්වූ සත්ත්වයෝ කාමදුශ්චරිතාදීවූ නොයෙක් පව්කොට සවප්නයෙනුත් සැපයක් දක්ක නොහැකි දුගතියෙහි උපදනාහ. යම් සත්ත්වකෙනෙක් වස්තුකාම ක්ලේශකාමයෙන් අලුයම දමාපු කෙළපිඩක්මෙන් නිරපෙක්ෂව හැර ගිහිගෙන් නික්ම රාගාදීන් පැමිණෙන කිසිභයෙක් නැත්තාහු ගණසඞ්ගනිකාව හැර කාය විවේකයට පැමිණ වාසය කෙරෙද්ද එබඳුවූ ප්‍රව්‍රජිතයෝ දුගතියට නොයෙන්නාහුයයි වදූරා මහරජ මේ ලෝකයෙහි සමහර නුවණැත්තෝ උපමායෙනුත් කාරණා දැනගන්නාහ. එසේහෙයින් තොපට දෘෂ්ටාන්තයක් ගෙණහැර කියමි, අසවයි වදූරණසේක් භගීරතී නම් ගඞ්ගාප්‍රවාහයෙහි වැටී ඉල්පා යන්නාවූ ඇත් කුණපයක් නුවණ නැති කපුටුවෙක් දැක මා විසින් මහත් යානාවකුත් විපුලවූ ගොචරයකුත් ලබන ලද්දේයයි සතුටුව සම්ප්‍රාප්තව මේ මස් අනුභව කෙරෙමින් පැන් ගඟ බීමෙන් උභය පාර්ශ්වයෙහි වන සොභා දක්වමින් රූ දැවල් මෙහිම වාසය කෙරෙමින් නොගොස් කුණපයෙහිම උන්නේය. ප්‍රමාදවශයෙන් කුණපයෙහි ලොල්වූ කපුටුවා ඇත්කුණ හා සමග පක්ෂීන්ට අවිෂයවූ මහ සමුද්‍රයට ගංගාප්‍රවාහයෙන් ගොස් පැමිණ ඇත් කුණෙහි සම් මස් නහර සිඳී ඇටසැකිල්ල දියෙහි ගිලුනු හෙයින් ප්‍රහාරය කොට සතරදිගට ගොසිනුත් කිසි පිහිටක් නොලදින් විඩාව ජලතලයෙහි වැටී හුනුවාහු සමුද්‍රයෙහි දැතිමෝර ආදී මත්ස්‍යයෝ සල්ව සල්වා කැවාහුය. එපරිද්දෙන් මහරජ, තෙපිද අතිකුත් කාම්භෝගීවූ යම්කෙනෙක් වස්තුකාම ක්ලේශකාමයන් හැරපියා නොයෙද්ද ඔවුන් බුඬාදී උත්තමයෝ ඒ කපුටුවා හා සමාන නුවණ නැත්නාහුයයි කියති. මහරජ, මා විසින් මේ උපමාව දෘෂ්ටාන්ත වශයෙන් දක්වන ලද්දේය, ඉදින් මාගේ මේ අවවාදය පිළිගෙණ වස්තුකාම ක්ලෙශකාමයෙහි ලෝභය හලුයේවීතම් ස්වර්ගලෝකයට පැමිණෙන්නෙහියයි ඉදින් නොහලුයේ වීතම් කාබුත් මරණීන් මත්තෙහි නරකාදි අපායට යන්නේය.

ඒ උපමාවෙහි ගඞ්ගාව අනවරාග්‍ර සංසාරය වන්නේය, ප්‍රවාහයෙන් යන්නාවූ ඇත්කුණ පඤ්චකාම ගුණය වන්නේය, කපුටුතෙම අඥාන සත්ත්වයා වන්නේය, කපුටුතෙම මස් අනුභවකොට පැන් බී සතුටුවූ කාලය අඥානයාගේ විෂයාස්වාදයෙන් සතුටුවූ කාලය වන්නේය, කුණපයෙහි සක්තවූ කවුවාගේ වනසොභාව දුටු කාලය කාමතෘෂ්ණායෙන් යුක්තවූ අඥානයාගේ අටතිස්වැදෑරුම්වූ පඨවිකසිනාදී අරමුණු දක්නා කාලය වන්නේය, ඇත්කුණ ගොස් සමුද්‍රයට වන්කල පිහිටක් නොලැබ කපුටුවා දියෙහි හුනු කාලය කාමයෙහි ගිජුව පව්වූ නුවණ නැත්තාහුගේ කුශල ප්‍රතිෂ්ඨාවක් නොලදින් නරකොත්පත්ති කාලය වන්නේයයි මෙලෙසින් පසේබුදුරජාණන්වහන්සේ මේ උපමාව ගෙණහැර දක්වා අවවාද කොට නැවතත් අවවාද කරණු පිණිස මහරජ, අනුකම්පා ඇති

සත්ත්වතෙම අවවාද වශයෙන් වැඩ අවැඩ එකවරක් කියත්තේය, එයින් මත්
තෙහි නොකියත්තේය, ඉදින් වඩා කියේවීනම් සාමිදරුවක්හු ඉදිරියෙහි සිට
කියන්නාවූද යමෙකු මෙන් නිස්සාරවන්නේයයි යනාදීන් නොයෙක් අවවාද
අනුශාසනා කොට ඒ පසේබුදුරජාණන්වහන්සේ ආකාශයෙන් වැඩවදාළසේක.

මහබෝධිසත්ත්වයෝද පසේබුදුන් පෙණෙනතෙක් බලාසිට උන්වහන්සේ
ඈතට අවිෂයව වැඩිකල්හි සසර කලකිරී බ්‍රාහ්මණවංශයෙහි උපන්නාවූ මේ
මහණතෙම අසම්භින්න රාජවංශයෙහි උපන් මාගේ මස්තකයෙහි තමාගේ පාද
ධූලි වගුරුවමින් ගියේය, මා විසිනුත් මහණවිය යුතුයයි සිතා රාජ්‍යයෙන්
ප්‍රයෝජන නැත්තේය, අද දවස මම මහණවෙමි, මරණ අදවත, බෝ සෙට
වත, හෝ දැනගත නොහැක්කේය, මේ සසර සිට ඒ නුවණ නැති කපුටුවා
පරිද්දෙන් කාමවූ සැපය නොපැමිණෙමියි රාජ්‍යය පාවා දුන්න එබස් ඇසූ
අමාත්‍යයෝ දෙවයන්වහන්ස, නුඹවහන්සේගේ පුත්‍රවූ දීඝායු කුමාරයන්
වහන්සේ ගෙන්වාගෙණ අභිෂේක කැරුවුව මැනව. උන්වහන්සේ අපට රජකම්
කරණසේකැයි කීවාහුය. එසඳ රජ්ජුරුවෝ දීඝායු කුමාරයන් එතනට
ගෙන්වාගෙණ ඔහට ආමන්ත්‍රණකොට එම්බා කුමාරයෙනි, ධන ධාන්‍ය
මුක්තා මාණික්‍ය සංඛසිලා ප්‍රවාලාදී සියලු උපභොග පරිභොග වස්තුවෙන්
සමෘද්ධවූ සැටදහසක් ගමින් යුක්තවූ මේ මගධ රටද රන්සැත් රන්පොරෝදු
සන්නාහයෙන් සරහන ලද කෝල හා අකුස් ගත් අත් ඇතිව ඇත්රුවන්
විසින් නැගෙන ලද සැටදහසක් පමණ ඇත්තුද, සියලු අශ්වාලඞ්කාරයෙන්
සරහන ලද ශීඝ්‍රවූ ජව හා වේග ඇති ඇත්පට හා දුනු හියවුරෙන් උප
ලක්ෂිතවූ අසරුවන් විසින් නැගෙන ලද සැට දහසක් පමණ ආජානීය
සෛන්ධව අශ්වයන්ද, සිංහ සම් දිවි සම් වලස් සමින් කරණ ලද පිරියම්
ඇති නගනලද නොයෙක් ධජමාලාවන් ඇති සියළු රථාලංකාරයෙන් කරණලද
සැරහුම් ඇති සන්නාහසන්නද්ධවූ දුනුගත් අත් ඇති රථරුවන් විසින් නැගෙන
ලද සැටදහසක් පමණ රථයානාවන්ද, ප්‍රධානවූ වෘෂභරාජයක්හු විසින් උප
ලක්ෂිතවූ බඳුන්පුරා කිරි දෙන්නාවූ සැටදහසක් පමණ රතිදෙනුද විචිත්‍ර වස්ත්‍රා
භරණයෙන් සැරහුනාවූ බහාපැලඳ කුණ්ඩලාභරණ ඇති සියළු ස්ත්‍රීපලඳනා
යෙන් සැරහෙනලද සොළොස්දහසක් පමණ පුරාඞ්ගනාවන්ද යන මේ සියළු
ඓශ්වර්‍ය්‍ය පාවාගෙණ රාජ්‍යය කරව, මම තපසට යෙමි කීවාහුය.

එබස් අසා දීඝායුකුමාරයෝ මේ කිමෙක්ද පියාණන්වහන්ස, මා බාල
අවස්ථාවෙහිම මාගේ මෑනියන්වහන්සේ මළයි ඇසිමි, එසේහෙයින් නුඹවහන්සේ
හැර ජීවත්විය නොහෙමි, ඉදින් නුඹවහන්සේ තපසට යනසේක් වීනම් යම්සේ
වනයෙහි සමවිෂමවූ ගිරිදුර්ගයෙහි සඤ්චාරණය කරන්නාවූ හස්තිරාජයා අනුව
ඇත්පොව්වු තෙම පසුපස්සෙහි ගියේද, එපරිද්දෙන්ම නුඹවහන්සේගේ පාත්‍රය
ඇරගෙණනොකීකරුනොව කීකරුව නුඹවහන්සේපසුපස්සේ අවිදිමියි කීයේය.
එබස් අසා ඔහට දැහැමිව කාරණා කියන්නාවූ රජ්ජුරුවෝ යම්සේ වස්තුගවේ
ෂණය පිණිස ජලයාත්‍රාකරන්නාවූ වෙළඳුන්ගෙන් දුතිමෝර ආදී මත්ස්‍යයන්
විසින් හෝ උදකරාක්ෂසයෙකු විසින් හෝ දියසළාවෙන් නසනලද කල්හි ඒ
වෙළඳහු ව්‍යසනයට පැමිණෙන්නාහුය. එපරිද්දෙන් නොකීකරු දරුවෝද
මාගේ තපසට අන්තරාය කරන්නේය, එසේහෙයින් මේ දරුවන් විසින් සිත්
කලුවූ මාළිගාවට කැඳවාගෙණ යව, ඒ සවර්ණාලංකාරයෙන් අලංකෘතවූ නාටක

ස්ත්‍රීහු ශක්‍රදේවේන්ද්‍රයා පරිද්දෙන් මොහු සිත් ඇලවන්නාහුයයි මහබොධිසත්ත්වයෝ මෙලෙස කියා එතනදීම රාජකුමාරයන් අභිෂේක කරවා නික්මවා තුමූ උදකලාව උයනින් නික්ම හිමාලවනයට වැද සිත්කලුවූ ප්‍රදෙශයෙක්හි පන්සලක් කොට ගෙණ තබා ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවගෙණ වනමුල් ඵලාහාරයෙන් දවස් යවූවාහුය.

ඉක්බිති අමාත්‍යයෝ මහත්වූ රජපෙළහරින් දීඝායු කුමාරයන් නුවර ප්‍රදක්ෂිණා කරවා ප්‍රාසාදයට කැඳවාගෙණ ගියාහ. එකෙණෙහි සොළොස්දහසක් ඇති පුරාංගනාවෝ සර්වාභරණයෙන් විභූෂිතව පැමිණියාවූ රජ්ජුරුවන් දැක මනොඥවූ රූපශ්‍රීන් යුක්තවූ තෙපි දෙවතාකෙණෙක්ද නොහොත් ගාන්ධර්ව දිව්‍ය පුත්‍රයානකෙණෙක්ද නොහොත් ශක්‍රදෙවෙන්ද්‍ර කෙණෙක්ද තොපි කවුරුන්ගේ දරුකෙණෙක්ද තොප කවුරුදැයි දූතගණුමෝදැයි විචාළාහුය. එබස් අසා රාජකුමාරයෝ දෙවියකුත් නොවෙමි, ගාන්ධර්වයෙකුත් නොවෙමි, ශක්‍රදෙවරාජයෙකුත් නොවෙමි, කසී රජ්ජුරුවන්ගේ පුත්වූ දීඝායු කුමාරයෝ නම් මමය, අත් පා මෙහෙකෙරෙමින් මට උපස්ථාන කරව මම තොපි ඇමට වල්ලභවෙමි, ස්වාමිවෙමි කීවාහුය. එබස් අසා පුරාංගනාවෝ රජ්ජුරුවන්වහන්සේ කොයි ගියසේක්දැයි විචාරා ඔහු විසින් රජ්ජුරුවන්වහන්සේ වස්තුකාම ක්ලෙශකාම යන් නමැති පඞ්ක දුර්ගයෙන් නැගී ප්‍රව්‍රජ්‍යා නමැති ස්ථලයෙහි පිහිටා රාගාදී ක්ලෙශගණ්ඨක සහිතවූ මිථ්‍යාලබ්ධි නමැති සහරණ රහිතවූ සගමොක් මගට පැමිණිසේක. මම වනාහි ක්ලෙශකටුකයෙන් ගැවසීගත්තාවූ දෘෂ්ටිගහණයෙන් තිබිතවූ දුගතියට පමුණුවන්නාවූ ගෘහවාස නමැති මාර්ගයට පිළිපන්මි, රාජකුමාරයෝ කීයේය. එබස් අසා පුරාඞ්ගනාවෝ රජ්ජුරුවන්වහන්ස, තුඹ වහන්සේගේ ඊම යහපත්වන්නේය, රන්ගල්ගුහාවට සිංහරාජයෙකු පරිද්දෙන් අප ඇතුළුවූ මේ සියලු රාජ්‍යයට අනුශාසනාකොට වදාළමැනව. මෙවක් පටන් හැමදෙනාට තුඹවහන්සේ නායකය යනාදීන් නොයෙක් ප්‍රියවචන කියමින් නෘත්‍ය ගීත වාදිතාදිය පවත්වමින් සිත් ඇලවූවාහුයි, ඉක්බිති දීඝායුනම් රජ්ජුරුවෝ මහත්වූ රාජශ්‍රී විඳිනාහු රජඉසුරෙන් මත්ව පියරජ්ජුරුවන් සිහි නොකොට දශරාජධර්මයෙන් දිවිපමණින් රාජ්‍යයකොට කම්වූපරිද්දෙන් මිය පරලොව් ගියාහුයි, මහබෝධිසත්ත්වයෝ පඤ්චාභිඥාඅෂ්ටසමාපත්ති උපදවාගෙණ බ්‍රහ්මවිහාර භාවනාවන් කොට කාබුත් මරණින්මත්තෙහි බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුයයි තිලෝගුරු බුදුරජානන්වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි සර්වඥයන් මහභිනික්මන්කළේ දැන්මතු නොවෙයි පෙරත් මහභිනික්මන්කළෝ වේදැයි වදාරා ජාතකයෙහි පූර්වකථාවත් අපර කථාවත් සන්ධිගළපා සොනක ජාතක ධර්මදේශනාව නිමවා වදාළසේක. එසමයෙහි පසේබුදුහු පිරිනිවන් පෑවාහුය, එසමයෙන් පසුව රාජ්‍යප්‍රාප්තවූ දීඝායු කුමාරයෝනම් දැන් මේ රාහුල ස්ථවිරයෝය. පසේබුදුහුගෙන් බණ අසා තපසට ගියාවූ අරින්දම රජ්ජුරුවෝ නම් තිලෝගුරු බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

518
සඞ්කිච්ච ජාතකය

තවද දෙවාතිදෙව වූ කරුණානිධානවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජීවකයන්ගේ අඹඋයන්හි වැඩවසන සේක් සංකිච්ච ජාතක ධර්මදෙශනාව අජාසත් රජහුගේ පිතෘඝාතක කර්මය අරභයා වදාළසේක.

ඒ අජාසත් රජ වනාහි දෙවදත්තස්ථවිරයන්ගේ බස්ගිවිස පියරජහු මරවා සඞ්ඝභෙදකොට ඉක්බිති සඟපිරිසෙන් වෙන්වී ශොකයෙන් මහත් ව්‍යාධියකට පැමිණ සර්වඥයන්වැඳ ක්‍ෂමාකරවා ගණිමි, සිතා සියපයින් නැගීයන්ට ශක්තිමදව ඇඳ සිවිගෙයකින් සැවැත්නුවර ගිය දෙවදත්ත මහතෙරහු දෙව්රම්වෙහෙර දොරටු සමීපයෙහි පොළොව ගැළපු නියාව අසා දෙවදත්තමහතෙරුන්වහන්සේ සර්වඥයන්වහන්සේට ප්‍රතිපක්‍ෂව පොළවගැළී අවීචිමහනරකයට ගියසේක, උන්වහන්සේගේ බස් ගිවිස ධර්මරාජන්වූ මාපියාණන්වහන්සේ මා විසින් මරවනලදසේක. එසේහෙයින් මමත් නරකයට යම්දෝහෝයි භයින් ත්‍රස්තව ඒ සා මහත් රාජ්‍යශ්‍රීන් සිතට සැපයක්වේවයි රාත්‍රිදිනයෙහි නින්දක්වත් නොලබන්නේය. ඉදින් ඇසිල්ලකුත් නිදන්ටවත් නොලැබ එකෙණෙහිම ගිනිගෙණ දිලියෙන්නාවූ නවයොදුන් බොලඇති යපොළොවෙහි එලාගෙණ යම්පලුවන් විසින් ගිනිගෙණ දිලියෙන යහුල් සකල ශරීරයෙහි ගසා බානක් මෙන්ද භයානක වෙෂඇති ගිනිගෙණ දිලියෙන බල්ලන්විසින් කඩාකන්නාක් මෙන්ද දැක භයපත්ව මහහඬින් මූරගාමින් නැගීසිටිනේය. එකල්හි ඒ රජතුමාගේ නිදිවළකනු පිණිස සරත්කාලවූ බක්මස ආදී සාරමසද රැසින් යුක්තවූ මැදිපොහෝ දවසෙක මතුමහල්තලයෙහි ඇමතිගණ පිරිවරා නගනලද ධවලාතපත්‍රය සිංහාසනාමස්තකයෙහි හිඳ තමන්ගේ යසශ්‍රී බලා මා පියාණන් වහන්සේගේ ඓශ්වර්‍ය්‍යී මීටත්වඩා ඉතා බෙහෙව එබඳු ධර්ම රජ්ජුරුවන් වහන්සේ දෙව්දත් මහතෙරුන් නිසාම මරාපීමි යනාදීන් තමන් කළ අකුසල් සිහන්නාහට ශරීරදාහයක් ඉපිද සියල් සිරුරු ඩාහයෙන් තෙමීග, එසඳ කවරෙක් මා බුදුන් කරා කැඳවාගෙණ ගොස් දක්වද්දෝහෝයි පරීක්‍ෂාකොට ජීවකයන් විනා අනික් කෙණෙක් නැතැයි සලකා ඔහට තමුන් කැඳවාගෙණ බුදුන්කරායන්ට නිසිඋපදෙසක් කෙරෙමින් සගයෙනි මෙඝය හිමය ධූමය රජය රාහුය යන පඤ්චදොෂ රහිත චන්ද්‍රකාන්තීන් යුක්තවූ මේ රාත්‍රි තොමෝ සිත් කලූය යනාදීන් සතුටුනෙපුල්බැණ දූන් ශ්‍රමණ බ්‍රාහ්මණයන්කරා එළඹමෝදැයි සාමාත්‍යයෙන් විචාරා පූරණකාශ්‍යපාදීන්ට උපාසකවූ අමාත්‍යයන් විසින් ඔවුන් සදෙනාගේ ගුණ වෙන වෙනම කියම් කීකල්හි ඒ අමාත්‍යයන්ගේ බස් නොගෙණ ජීවකයෙනි තෙපි නොකියව්දැයි විචාරා ජීවකයන් විසින් සම්‍යක් සම්බුඬයාණන් වහන්සේගේ ගුණ කථනයකොට දේවයන්වහන්ස ඒ භාග්‍යවත්වූ ත්‍රෛලොක්‍යතිලකවූ සර්වඥයන්කරා එළඹුනමැනවැයි කීයේයි. එබස් අසා සතුටුවූ රජ්ජුරුවෝ සරහාගෙණෙනලද ඇත්වාහනයෙන් ජීවකයන්ගේ අඹඋයනට ගොස් බුදුන්කරාඑළඹ නමස්කාරකොට එකත්පස්ව ඉඳ සර්වඥයන් වහන්සේ විසින් සුවදුක් විචාරීම්වශයෙන් කරණලද පිළිසඳර කථා ඇතිව ඉහාත්මභාවයෙහිම දක්ක යුතුවූ ශ්‍රමණබවෙහි අනුසස් විචාරා සඞ්ඝේශ්වර චක්‍රවර්තිවූ සර්වඥයන් විසින් වදාරණලද උතුම්වූ ශ්‍රමණඵල සූත්‍රධර්මදෙශනාව අසා බුදුන් ක්‍ෂමාකරවා උපාසකබව ප්‍රකාශකොට එතැන් පටන් දන්දෙමින්

සිල්රකිමින් සර්වඥයන්කරා එළඹ මිහිරි බණ අසමින් කල්‍යාණමිත්‍රයන් හා එක්වීම හේතුකොටගෙණ එතැන්පටන් භයගැන්මක් තැතිගැන්මක් නැතිව අස්වැසිලි ලදින් සැපසේ සතරඉරියව්වෙන් දවස්යවන්නේය.

ඉක්බිති එක් දවසක් දම්සභාමණ්ඩපයට මහාකාශ්‍යපස්ථවිර ප්‍රමුඛවූ බොහෝ භික්ෂුසඞ්ඝයා වහන්සේ රැස්ව ඇවැත්ති අජාසත්රජතෙම පිතෘඝාත කර්මකොට භයපත්ව රාජ්‍යශ්‍රීයෙනුත් සිතට සැපයක් නොලැබ ඇමවේලෙහිම දුක්විඳිමින් දූත් කල්‍යාණමිත්‍රවූ සර්වඥයන්වහන්සේකරා එළඹ මිහිරි බණ අසමින් භයින් දුරුව ඉසුරුවිඳිතියි යනාදීන් කථාවක් කෙරෙමින් වැඩ උන් සේක. එකල ගඳකිළියෙහි වැඩඋන් සර්වඥයන්වහන්සේ දම්සභා මණ්ඩපයෙහි පැවති කථාව දිව්‍යකණින්අසා වදාරා දම්සභාමණ්ඩපයට වැඩ පණවනලද බුද්ධාසන මස්තකයෙහි උදයගිරිමුදුනෙන් පහළ ලහිරුමඩලයක්මෙන් සවණග් ඝනබුදුරැස් විහිදුවමින් වැඩහිඳ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවෙකින් යුක්තව උනුදුයි විචාරා භික්ෂූන්වහන්සේ විසින් භාග්‍යවතුන්වහන්ස අජාසත් රජහුගේ පිතෘඝාත කර්මය කියා කියා උනුම්හයි දූත්වූ කල්හි මහණෙනි මෙරජ දූත්මතු නොවෙයි පෙරත් පිතෘඝාත කර්ම නිසා දුකට පැමිණ මා නිසා සැප යෙන් විසුයේ වේදැයි වදාරා ඒ භික්ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ ලොකසවාමිවූ සර්වඥයන්වහන්සේ හිමගර්භයකින් චන්ද්‍රබිම්බයක් මත්කොට දක්වන කලක් පරිද්දෙන් ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

හේ කෙසේද? යත්,

ඉකුත්ගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් සතර සඞ්ග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනයකොට රාජ්‍යය කරන්නාහු බ්‍රහ්මදත්ත නම් පුතනුකෙණෙකුන් ලද්දාහුය, එකල්හි පුරණලද බොධිසම්භාරඇති අප මහ බෝසතානන්වහන්සේ රජ්ජුරුවන්ගේ පුරෝහිතබ්‍රාහ්මණයාගේ ගෙයි පිළිසිඳ දසළොස්මසකින් උපන්නාවූ ඔහට දෙමව්පියෝ සංකිච්ච කුමාරයෝයයි නම් තුබූහ ඒ රාජකුමාරයන් හා දෙදෙන එක්ව රජගෙයි වැඩෙන්නාහු ඔවුනොවුන්ට ප්‍රියමිත්‍රව වැඩිවියපැමිණ තක්සලානුවරටගොස් සියළු ශිල්පයන් ඉගෙණ නිමවා සියනුවරට අවුත් යුවරජ තනතුරෙහි පිහිටි බ්‍රහ්මදත්ත කුමාරයෝ එක් දවසක් උයන්කෙළියට යන්නාවූ පියරජ්ජුරුවන්ගේ යසශ්‍රී දැක එහි ලෝභය උපදවා මා පියානන්වහන්සේ මාගේ බෑනකෙණෙකුන් වැනිසේක. ඉදින් උන්වහන්සේ මිය යනතුරු රැක උනිම් නම් මට රාජ්‍යශ්‍රීය පැමිණෙන්නේය, මහලුකලට වැඩව ලද්දාවූ රාජ්‍යශ්‍රීයන් ප්‍රයෝජන නැත්තේය, එසේහෙයින් පිය රජහු මරා රාජ්‍යය ගණිමියි සිතා බොධිසත්වයන්ට එපවත් කීයේය. එබස් ඇසූ මහබොධිසත්වයන් විසින් පියානන් මැරීමනම් නරකයට පමුණුවන්නාවූ පාපයෙකැයි දෙතුන් වෙනුවත් වලකනලද්දේය. ඔහට නොකියා තමාගේ සමීපචාරීන් හා කථාකොට ඔවුනොවුන් විසින් මැනවැයි පිළිගත්කල්හි බොධිසත්වයෝ ඒ බව දැන මොවුන් හා එකතැන විසීමට යුතු නොවන්නේයයි සිතා තමන්ගේ දෙමව්පියන්ටත් නොඅඟවා උදකලාව පළමු හළදෙරින් පිටත්ව ක්‍රමයෙන් හිමාලයවනයටගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන්පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවාගෙණ වනමුල් ඵලාහාරයෙන් දිවිපවත්වමින් වාසය කළාහුය.

එකල්හි බ්‍රහ්මදත්ත කුමාරයෝද පියරජ්ජුරුවන් මරවා රාජ්‍යයෙහි පිහිටා ඓශ්වර්‍ය්‍යවිඳිනේය, එසමයෙහි රාජ්‍යවාසීවූ බොහෝදෙනා සංකිච්චකුමාරයෝ මහණවූවෝයයි, අසා නික්ම ගොස් ඒ බෝධිසත්ත්වයන් සමීපයෙහි මහණවූහ. බොධිසත්ත්වයෝ ධ්‍යානලාභීව ඒ තපස්වීගණයා විසින් පිරිවරණලදුව ඒ තපෝවනයෙහි වාසයකළාහුය. ඒ බ්‍රහ්මදත්ත කුමාරයයෝ නොබෝකලෙක් සැපසේ වැඩ පිතෘඝාතකර්මයෙන් භයපත්ව චිත්තාස්වාදයක් නොලදින් නරකයෙහි දුක් කම්කටුලට පැමිණියාහුමෙන් පීඩාවට පැමිණ මාගේ සංකිච්ච කුමාරයෝ මාපියානන්වහන්සේගේ මැරීමෙන් මා වළකාගතනොහී නැවතනුමූ නිර්දෝෂව මට නොහඟවාම පලාගියේය, ඉදින් නොගියේ නම් මේ අකුශලය මාකල නොදෙති, මේ භය දුරුකරන්ට උන් විනා අනික් කිසිකෙණෙක් නැත, ඔහු වසනතැන් දනිම් නම් කැඳවා ගෙන්වාගණිම්, කවරකෙණෙක් ඔවුන්ගේ පවත්කියත්දැයි සිත සිතා එතැන්පටන් අන්තඃපුරයෙහිද එකාවත් බොධිසත්ත්වයන්ගේ ගුණ කියන්නේය. මෙපරිද්දෙන් ඒ රජු දවස් යවන කල්හි රජ්ජුරුවෝ මා දක්නා කැමැතිව සිහිකරන්නාහුය. උන් ලඟටගොස් බණ කියා භය දුරුකොට එනු යුතුයයි සිතා තපසට ගිය පණස් අවුරුද්දක් විවරින් පන්සියයක් තපස්විවරයන් විසින් පිරිවරණ ලදුව ආකාශයෙන් අවුත් එනුවර සමීපයෙහිවූ මිගදා නම්වූ මගුල් උයනට බැස මගුල් සල්වට මත්තේ වැඩඋන්සේක. එකල උයන්ගොව්වා තපස්විවරයන් දැක නායක තපස්විවරයන්ගේ නම් විචාරා සංකිච්චපණ්ඩිතයන් වහන්සේයයි අසා තෙමේද ඇඳිනගෙණ ස්වාමීනි අපගේ රජ්ජුරුවන්හන්සේ කැඳවාගෙණ එනතෙක් මෙතනම වැඩඋනමැනව, අපගේ රජ්ජුරුවන්වහන්සේ නුඹවහන්සේ දක්නාකැමතිසේකැයි වැඳ අවසරගෙණ යුහුව රජගෙටගොස් රජ්ජුරුවන්දැකවැඳඑකත්පස්වසිට දෙවයන් වහන්ස නුඹවහන්සේගේ යම් තපස්වීකෙණෙකුන් වහන්සේගේ ගුණ එක්වන් කියනසේක්ද ඒ සංකිච්ච තාපසයන්වහන්සේ තපස්විගණයා පිරිවරණලදුව රත්රුවක්මෙන් මගුල්සලවට මත්තේ වැඩඋන්සේක. ඉදින් උන්වහන්සේ දක්නා කැමැතිසේක්වීනම් මා හා වැඩියමැනවැයි කීයේය.

එබස් අසා රජ්ජුරුවෝ සතුටුව එකෙණෙහිම මොනවට සරහනලදුව රථ යානාවකට නැගී අමාත්‍යමණ්ඩලයා විසින් පිරිවරණලදුව ගොස් උයන් දොරට පැමිණ තමන්ගේ මිණිකමින් විසිතුරුවූ චාමරයුගලය නලල්පටය මගුල්කඩුවය ඡේසතය රන්මිරිවැඩිසඟළය යන පඤ්චරාජ කකුධභාණ්ඩයන් රථයෙහි තබා සියලු පිරිවර රඳවා රථයෙන් බැස උයනට වැද බොධිසත්ත්වයන් කරා එළඹ සතුටුව පිළිසඳර කථාකොට එකත්පස්ව හිඳ සිත ඇති ප්‍රශ්න විචාරන්ට මේ කලැයි දැන සියලුතපස්විවරුන්ට නායකවූ සංකිච්චපණ්ඩිතයන් වහන්ස මා විසින් කුසලපථය ඉක්මා පිතෘඝාතකර්මය කරණලද්දේය, මෙබඳු අකුසලයක්කළාවූ සත්ත්වයෝ පරලොව කවරගතියකට ගොස් කෙසේවූ දුකකට පැමිණෙත්තාහුදැයි විචාළේය, ඔහුගේ බස් අසා මහරජ සොරුන් සතුරන් ගෙන් උපද්‍රව ඇති මාර්ගයහැර නිර්භය මඟින් ගියාවූ සත්ත්වතෙම යම්සේ සතුරන් ගෙන් වන ව්‍යසනයට නොපැමිණියේද, එපරිද්දෙන් අකුශලයෙහි යෙදී වාසය කරන්නාවූ සත්ත්වයෝ නුවණැත්තන් විසින් එයින් වළකා කුසලපථයෙහි පිහිටුවූ වන ලද්දාහු අගතියට නොයන්නාහුය.

මහරජතෙම පළමු මාගේ බස් නොගිවිස පියරජ්රුවන් මරා දූත් ශොකයෙන් පෙළෙමින් මහා ව්‍යසනයට පැමිණෙන්නේ වේදැයි ඕනට

අවවාදකොට මත්තෙහි ධර්මදේශනා කරන්නාවූ මහබොධිසත්ත්වයෝ මහරජ දූතාදී දසවිධකර්මපථයට ස්වර්ගමොක්ෂයට පැමිණෙනු කැමැත්තෙවුන්හට රජමාවතක් වන්නේය, දශවිධ අකුශල කර්මය නිරාමාවතක් වන්නේය. එබඳු අකුසල් කළාවූ සත්ත්වයෝ පරලොව නරකාදී අපායට යන්නාහුය, යනාදීන් ධර්මදේශනාකොට පිතෘඝාතකර්මය කළාවූ සත්ත්වයන් ඉපද දුක් විඳිනා නරකය පළමුකොට දක්වාලුවහොත් මේ රජ භයින් පැකිල ලයපැළී මිය යන්නේය, සිනා සියළු නරකවලඉපිද දුක්විඳිනා සත්ත්වයන් දක්වා පිතෘ ඝාතකර්ම විපාකය දක්වමි සිතා නරක දුක්පත්තීන් සෘද්ධ්‍යනුභාවයෙන් දක්වා කියන්නාහු සංජීවය කාලසූත්‍රය සංඝාතය රෞරවය මහාරෞරවය තාපය ප්‍රතාපය අවීචියයි කියනලද අටමහනරකයන්ද එකී එකී නරකයට සොළසක් සොළසක් ඔසුපත් නරකයන්දයි මේ සියළු නරකයන්ද එහි උන තලෙක්හි තඹ සුණු පුරාලුවාක්මෙන් හිවිගැවසී සිට පැසෙමින් දුක්විඳිනාවූ සත්ත්වයන් දක්වා පච්කලසත්ත්වයන්ට සන්තාපකරන්නාවූ අපමණදුක්ඛවේදනාවන් ඇතිහෙයින්ද දරුණුවූ කප අවගන්ද ගිනිදැල් ඇත්තාවූ ඉතාභයානකවූ ඇසුවන්ටත් දුටු වන්ටත් භයින් ලොමුදැහැගන්නාවූ හැමවේලෙහිම අපමණ දුක්ඛවේදනාවෙන් ඇති සිව්රැස් ආකාරඇති සතරමහාවාසලින් යුක්තවූ නවයොවුන් බොලඇති යබිත්තීන් වටා පරික්ෂිප්තවූ නවයොදුන් බොලඇති යකඩලින් වැසුනාවූ එප රිද්දෙන්ම යොදුන් බොලඇති යපොළොවින් සුක්තවූ හැමවේලෙහිම ගිනි ගෙණ දිලියෙන්නාවූ ඒ නරකවලින් ගිනිදැල් හාත්පසින් පිටත යොදුන් සිය යක්තැන් පැතිර සිටිනේය, මෙබඳුවූ ඝොරවූ නරකවල අකුසල් කළ සත්ත්වයෝ පැසෙන්නාහුයයි දක්වා තවද සංහිඳුවනලද ඉරෙන් ඇති තපස්වීවරයන්ට ආක්‍රොශ පරිභව බිණීමෙන් දරුණුවූ අකුසල් කළ පාපිසත්ත්වයෝ කායවාක් ව්‍යාතික්‍රමයෙන් තමන්ට වැඩ නසාගෙණ ඉන් යටව පා උඩුව නරකයෙහි වැටී කොටස් කොට තබනලද මත්ස්‍යයන් පරිද්දෙන් හිවි ගැවසීගෙණ සඞ්ඛ්‍යාපථාති ක්‍රාන්ත කාලයක්මුලුල්ලෙහිපැසෙමින් හැමවේලෙහිඇතුලෙන්පිටතින් ගිනිගෙණ දිලියෙන්නාවූ ශරීර ඇතිව එයින් පිටත්වනු කැමතිව දිවන්නාහු නැගෙණහිරි දිසාවෙන් දොර හැරීගියාක් මෙන් දැක එනතට යන්නාහුය. මෙමලෙසින් උතුරු දිගින් දකුණු දිගටද දකුණු දිගින් උතුරු දිගටදැයි සතරදිගට දිවමින් පිටත්ව යන්ට තිසි අවසරයක් නොලදින් ඉස තුබූ අතින් අඩමින් වලපමින් බොහෝ කාලයක් මුළුල්ලෙහි කියා ගෙවාලිය නොහැකි දුක් කම්කටුලු විඳින්නාහුය යි දුක්විඳිනා සත්ත්වයන්ද ඒ ඒ නරකයන්ද ක්‍රමයෙන් ගෙණහැර දක්වා එහි පැසෙන්නාහු සමහර සත්ත්වයන්ගේ විශෙෂ දක්වා කියන්නාහු එම්බා මහරජ මේ ලෝකයෙහි මහත්වූ කායබල ඇති ධනුශ්ශිල්පයෙහි දක්ෂවූ කෙණෙකුන් රාජ්‍යයට අධිපතිවූ සහශ්‍ර අර්ජුන නම් රජෙක් ප්‍රසිද්ධවීද ඒ රජ ගෞතම නම් ඍෂින් කෙරෙහි වරදවා පිළිපැද ඒ අනිෂ්ට විපාකයෙන් නරකයට පැමිණ අසහ්‍ය වෙදනා ඇති දුක් විඳිමින් සිටියේය.

තවද නික්ලෙශීවූ කිසවච්ඡ තාපසයන් විෂයෙහි අපරාධකොට දණ්ඩකී නම් රජතෙම එතැන් පටන් මුලින් උදුරණලද තල්ගසක් පරද්දෙන් රාජ්‍ය වාසීන් එක්ව විනාශයට ගොස් නරකයට වැද අද දක්වා පැසෙමින් දුක්විඳින්නේය. නැවත අපමණවූ යසපිරිවර ඇති මාතඞ්ග පණ්ඩිතයන් කෙරෙහි සිත් කළකිරවාගෙණ මෙඞ්‍ය නම් රජතෙම රාජ්‍යවාසීන් හා සමග අකුසල් විපාක

යෙන් නරකයෙහි ඉපද දුක්විඳිනේය. තවද මහතේජස් ඇති කණ්හපායී නම් සෘෂීන් කෙරෙහි අපරාධ කළාවූ අබ්වෙළුක නම් රජතෙම තමන්ගේ රජපිරිවර හා සමග නරකයට පැමිණ දුක්විඳිනේය. තවද චතුර්විධ සෘද්ධි ඇති චේතිය නම් රජද කපිල සෘෂීන්ට ඡන්දයෙන් පක්ෂපතිත බොරුකියා ඒ අකුසල විපාකයෙන් නරකයෙහි දුක්විඳිනේය. ඒ කාරණයෙන් මහරජ ඡන්දයෙන් බොරුකීම බුද්ධාදී උත්තමයෝ ප්‍රශංසා නොකරන්නාහ. නුවණැත්තාවූ සත්ත්වතෙම අනුන් කෙරෙහි නොගැටුනාවූ සිත් ඇතිව ඇමවේලෙහිම සැබව කියන්නේය තවද මහරජ දරුණුවූ පැවතුන් ඇති යම් සත්ත්වයෙක් ගුණයෙන් වයසින් වැඩී සිටියාවූ මව්පිය බෑබුන් තැදිමයිල් ආදීන්ට අක්‍රොශපරිභව බෙණේද? ඒ සත්ත්වතෙම සියළු බන්ධුජනයා කෙරෙන් වෙන්ව මූලජින්නව නරකයෙහි ඉපිද දුක් විඳිනේය. තවද මහරජ සියළු කෙලෙසුන් නසා කාමාදී ආශ්‍රවයන් කෙරෙන් වෙන්වූ විශිෂ්ටවූ ගුණ ඇති තපස්විවරුන් මරාද ඒ සත්ත්වතෙම කාලසූත්‍ර නම් නරකයෙහි ඉපද දුක්විඳිනේය. තවද මහරජ නුවණැති යම් රජෙක් අධර්මිෂ්ඨ රාජ්‍යවාසීන්ට පීඩාකෙරේද? එතෙම මිය පරලොව ගිය කාලයෙහි තාප නම් නරකයෙහි ඉපද අනෙවාදහස් මුළුල්ලේ ගිනිදූලින් වළඳනා ලදුව වහ්නිජලා අනුභව කෙරෙමින් කෙශාග්‍රයෙහි පටන් නඛාග්‍රය දක්වා ගිනිගෙණදිලියෙන්නාවූ තුන්ගවු පමණ උසඇති සිරුරු ඇතිව යමපලුන් විසින් කරණ ලද කම්කටුළු විඳිමින් කොහොලින් ඇන ඇන ඉක්මවන කල්හි දුකබවෙදනා ඉවසිය නොහී මූරගානා ඇතුන් පරිද්දෙන් බැගෑපත්ව අඬමින් දුක්විඳින්නේය. යනාදීන් අකුසල්කොට ඒ ඒ නරකයෙහි ඉපද දුක්විඳිනා සත්ත්වයන්ද නරකවල්ද සෘද්ධ්‍යානුභාවයෙන් පොළොව විවරකොට ඒ රජ්ජුරුවන් ප්‍රධානවූ සියළු සත්ත්වයන්ට ගෙණහැර දක්වා ඉක්බිති පිතෘඝාත කර්මාදිය කළාවූ සත්ත්වයන් ඉපද දුක් විඳිනා නරකයන් දක්වන්නාවූ මහබෝධිසත්ත්වයෝ මහරජ යම් සත්ත්වයෙක් සම්පත් ලෝභයෙන් හෝ කිපි සිතින් හෝ පියහු මරාද ඒ සත්ත්වතෙම කාලසූත්‍රනම් නරකයෙහි ඉපද ආයුපමණින් අපමණවූ දුක්විඳිනාහ. එයින් නැඟි ලෝකුඹු නරකයෙහි ඉපද පැසෙන්නාහුගේ සකලශරීරයෙහි සමගසා යමපලුන් විසින් ගින්නෙන් දිලිහෙන යපොළොව හෙලාගෙණ දිලියෙන්නාවූ යහුලක් ගසා බා ඕයුම් මුවහත් ඇති අඩයටි නෙප් ආදීවූ ආයුධයෙන් පැහැර සුණුවිසුණු කෙරෙති. කර්මබලයෙන් නැවත උපදින්නාහුය. එසේම ගිනිගෙණ දිලියෙන යහුලින් ගසා ඇස් කොට එම ලොහොකුඹුයෙහි කැකෑරෙන්නාවූ මූත්‍රාදියවලින් උකා අනුභවකරවා නලා බලා පිදුරුබිස්සක්මෙන අකුලා ලොහොදියෙහි කිමුදුවන්නාහ. නැවත දික්වූ දිලියෙන් යහුලින් ඔහු කට විවරකොට කකියන ලොහොගුලි ලොහොදිය සැත්දෙන් උකාගෙණ මුඛයෙන් බහන්නාහ. එකෙණෙහි ලොහොදිය ඔවුන්ගේ කට දවමින් දිව දවමින් උගුර දවමින් ලය දවමින් අක්මා පපුකැන් අතුනුබහන් බඩවැල් බඩදිව් ආදිය දවාගෙණ අධොභාගයෙන් නික්මෙන්නේය.

තවද මහරජ පිතෘඝාතක කර්මයකළ සත්ත්වයන් අසූන් පමණ ඇතිකළුවූ කඹුරුවන්වූ භයානකවූ ගිනිගෙණ දිලියෙන්නාවූ බල්ලෝද ලොහොතුඬු ඇති ගිජුලිහිණියෝදකපුටුසමූහයෝද රැස්ව ආයුධයෙන් පහරණාවූ පරිද්දෙන් සල්ව සල්වා ලේ වගුරුවා වගුරුවා මස් කඩාකමින් දුක් දෙන්නාහ. තවද මහරජ ගිනිගත් කලක් පරිද්දෙන් දන්නාවූ සුන්බුන් ශරීර ඇති ඒ පිතෘඝාතක කර්මය කළ සත්ත්වයා යමපල්හු ගිනිගෙණ දිලියෙන යමුගුරෙන් තලතල කා

ඇත් මැත් ලුහුබඳනාහ. මෙලෙසින් පියන් මැරූ සත්ත්වතෙම අනයව්‍යසනයට පැමිණ නොයෙක් දුක්කම්කටුල් විඳිනේයයි පිතෘඝාතක කළ සත්ත්වයා විඳිනා දුක් සම්ප්‍රකාරයෙන් රජ්ජුරුවන් හා පර්ෂදට හෙණහැර දක්වා හය උපදවා ඒ නරකය අතුරුදන්කරවා ඉක්බිති මවුන් මැරූවන් ඉපද දුක්විඳිනා නරකය දක්වන්නාවූ මහබෝධිසත්ත්වයෝ මහරජ මෙලෝකයෙහි මාතෘඝාතකළ සත්ත්වයෝ නරකයට පැමිණිකල්හි යමපල්ලහු ගිනිගෙණ දිලියෙන ලොහොරුහැනින් බැඳ වෙලා දිලියෙන්නාවූ ලොහො යතෙහිලා පෙළ පෙළා වැහෙන්නාවූ රුධිර යතින් හැර ප්‍රකෘතිමත්වූ ඔහු ගිනිගෙණ දිලියෙන්නාවූ යපොළොව උඩබලා හොවා ගෙණ කකියා ගිය ලොහොදිය පරිද්දෙන් කැකෑරෙන්නාවූ රුධිර පොවන්නාහ. මෙලෙසින් පෙළෙමින් බෝවාදහස් ගණන් දුක් විඳුවා නැවත ඉතා දුගඳ පිළිකුල් නොයෙක් පණුකැලනට ඔවස්වූ රුධිර පූයායෙන් යුක්තවූ කැකෑරෙන්නාවූ අසූචිවළෙහි එළන්නාහ.

එකල ඒ අසූචිවළෙහි වසන්නාවූ ලොහොතුඩු ඇති එක්දඬු ඔරුසා පමණ ඇති පණුවෝ එ සත්ත්වයාගේ සම් මස නහර ඇටමිදුලු ලියාකමින් සකල ශරීරය ගුල්ලන් විඳිනා දණ්ඩක් පරිද්දෙන් විත් කසිදුරුකොට බිඳින්නාහ. මෙලෙසින් සත්ත්වයන් දුක් විඳින්නාවූ ගුථ නරකයෙහි දුර්ගන්ධය හාත්පසින් සියක් යොදුන් තැන් පැතිර සිටිනේය. මෙබඳු ගුථ නරකයෙහි මාතෘඝාත කළ සත්ත්වයෝ අපරියන්ත වූ දුකඛවේදනාවන් විඳිනාහුයයි යනාදීන් මාතෘඝාත කළ සත්ත්වයාද නරකයද දක්වා ඒ රජ්ජුරුවන් ඇතුළුවූ සියළු සත්ත්වයන් හයගන්වා ඒ නරකය අන්තර්ධාන කොට ඉක්බිති මහරජ මේ ලෝකයෙහි යම් ස්ත්‍රී කෙණෙක් බෙහෙත් කෑම් ආදී යම් කිසි උපක්‍රමයකින් දරු ගැබ නසද්ද ඒ ස්ත්‍රීහු මූවහත් උඩුකොට අතුරු නැතිව තතන ලද කටු සොටිකර ආදී ශස්ත්‍රයෙන් ගැවසීගත් නරකයෙහි ඉපද නිරය පාලයන් විසින් ගිනිගෙණ දිලියෙන යමුගුරු ආදියෙන් පහරිමින් ලුහුබඳනාලදුව හයින් දුවමින් ගිනිගෙණ දිලියෙන සැත්මූවහත්හි කැපි කැපී කඩ කඩව දූවටි දූවටී දුක්විඳිමින් යමපලුන් විසින් මෙහෙයනලදුව ගැඹුරුවූ කැකෑරෙණ ක්ෂාරොදකයෙන් පිරුණාවූ වෛතරණී නදියෙහි වැටී අනයව්‍යසනයට පැමිණ විඳිනා දුක් හා නරක දුක් දක්වන්නාවූ සංකිච්ච පණ්ඩිතයෝ නවද බ්‍රහ්මදත්ත රජ්ජුරුවෙනි මේ ලෝකයෙහි මිත්‍ථ්‍යාචාරයෙහි යෙදී වාසය කළ ස්ත්‍රීපුරුෂයෝ වෛතරණී නරකයෙහි උභයපාර්ශ්වයෙහි සත්වයන්ගේ අකුශලයෙන් පහළවූ යොදනක් පමණ උස ඇති යකඩමයවූ වියත්දිග ඇති කටුවෙන් සංඡන්නවූ පාත් ඇගැමෙන් අවුලාග්‍රව ගිනිගෙණ දිලියෙන්නාවූ කොල ඉඹුල් ගස්වලට යමපලුන් විසින් ගොස් මෙහෙයනලදුව නැගෙන්නාවූ කල එහි බිලිකටුමෙන් ඒ කටු යටබලා නැමී සිටිනේය, එහි ඉරෙමින් කැපෙමින් සුන්බුන් සියල් සිරුරු ඇතිව ගස්මුදුනට නැගෙන්නාහ, එකල හයගන්වා බස්නට මෙහෙයූ කල්හි ඒ කටු උඩබලා නැමී යන්නේය, එසඳ ගිනිගෙණ දිලියෙන්නාවූ කටුවලින් ඉරෙමින් පැළෙමින් වැරළිශැවසීගත් සිරුරු ඇතිව බොහෝ දුක් විඳ අඬමින් මොරගාමින් බස්නාහ.

මෙම ලෙසින් ඒ නරකයෙහි ආයුපමණින් අපමණ දුක්විඳිමින් ඒ කොලඉඹුල් ගසින් යමපලුන් විසින් ගසා ඉස යටිකොට එලවනලදුව වැටෙන

කල්හි ඒ ඒ තැන පොළොව පලාගෙණ ඒ නිරය සතුන්ගේ අකුසල් බෙලෙන් ගිනිගෙණ දිළියෙන්නාවූ යවුල් පහළවින්නේය, එකෙණෙහි ඇනී අධොමාගීයෙන් නික්මුනාවූ උල්වල ඇමිණසිට අන්තසවරයෙන් අඬමින් රෑ දහවල් කැවිලි පෙවිලි යයි යන වචන මාත්‍රයකුත් නැතිව නේවාදහස් ගණන් මුලුල්ලෙහි දුක්විඳිමින් යමපලුන් විසින් එයින් ගෙණගොස් කැකෑරුණු ලොහොදියෙන් පිරුණු ලොහොකුඹුයෙහි එලනලදුව ඒ පරදාරිකවූ සත්වයෝ නොයෙක් දුක්විඳිනාහයි නිරාසතුන් හා නරකදුක් ඒ සරාජික පර්ෂදට ගෙණ හැර දක්වා භයගන්වා ඒ නරකය අතුරුදන්කොට ඉක්බිති යම් ස්ත්‍රියක් තමාගේ සවාමිපුත්‍රයාට හෙලාදූක ඉක්ම පවතීද නැදිමයිල් බෑබුණ් ආදීන්ට බැණදෙඩා කළමනා වතාවත් නොකිරීමෙන් හෙලාදකීද ඒ ස්ත්‍රීතොමෝ තාපනම් නරකයෙහි ඉපද එහි යමපලුන් විසින් දිළියෙන යපොළොව හෙලා ගෙණ යහුලින් කටදල්වා යදමින් බඳනාලදුව දිළිසෙන බිලිකටුවූ දිවෙහි අමුනා ඇද මැත්කොට තුන් ගව්වක් පමණ දිග ඇති සියුම් මුවහත් ඇති දිළිසෙන ආයුධයෙන් පහරණලදුව පහළ පහළනෙත එක් දඹුඹරු සා පමණ ලොහොතුඩින් යුක්තවූ පණුවන් විසින් ගැවසීගන්නාලදුව දුක්විඳිමින් නැවත එයින් ගොස් ප්‍රතාපනම් නරකයෙහි ඉපද දුක්විඳිනාවූ සත්වයන් හා නරකදුක්ඛයන් ගෙණහැර දක්වා ඉක්බිති තවද මහරජ මේ ලෝකයෙහි යම්සත්වයෙක් එළුවන් ඌරන් මුවන් ගෝණුන් ආදී මෘගජාතීන්ද මත්ස්‍යයන්ද මරා ජීවත්වෙද්ද යම්සත්වකෙණෙක් නොයෙක් සොරකම් කිරීම් බොරුකේලාම් කීම් ආදියෙන් ඔවුනොවුන් බිඳුවා ජීවත්වේද ඒ සත්වයෝ වෛතරණියෙහි ඉපද තෙප් අඬයටි යකුලු කඩු සොටිසර ආදියෙන් පහරණලදුව උඩු යටිව ක්‍ෂාරෝදකයෙහි වැටී දුක්විඳිමින් පැසෙන්නාහුය.

තවද යම් සත්වකෙණෙක් අත්ලස් ඇරගෙණ කුළුයුක්ති බැණ දුකඛිත සත්වයන්ට අලාභකොට ජීවත්වෙද්ද ඔහු නරක දුක්ඛයට පැමිණ කොක් නැහැවුය කැනහිල්ලුය ගිජුලිහිණියෝය. කපුටුවෝය යනාදීවූ බොහෝ තුඩු ඇති සතුන් විසින් සල්ව සල්වා මස්ලියා කනලදුව දුක්විඳිනාහ.

තවද යම් තත්ත්වකෙණෙත් සෙමුවන් පෑමුවන් දඩයම් කෙරෙද්ද සේවටුවන් ආදී පක්ෂීන් මරා ජීවත්වෙත්ද ඔහුද සංජීවාදී ඒ නරකයන්හි ඉපද අපමණ කාලයක් මුළුල්ලෙහි දුක්විඳින්නාහයි යනාදී ඒ ඒ නරක හා දුක් විඳිනාවූ සත්ත්වයන් ගෙණහැර දක්වා ඒ රජ්ජුරුවන් ඇතුළුවූ සියළු සත්ත්වයන් භයගන්වා ඒ නරකය අන්තර්ධානකොට–ඉක්බිති ලෝකවිවර නම් සෘධියක් කොට සදිව්‍යලෝකය හා එහි කුසල් කොට ඉපද සුවවිඳිනා ශක්‍ර බ්‍රහ්මාදී දෙවියන් දක්වා ඔහු අස්වසා මෙලෝ පරලෝ දක්වා ධර්මදේශනාකොට මහරජ මෙතැන්පටන් පසුතැවිලියට පමුණුවන්නාවූ කටයුත්තක් නොකරව යනාදී අවවාදකොට ධර්මදෙශනා කළහ.

එකල බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සංකිච්ච පණ්ඩිතයන්ගේ මධුර ධර්ම දෙශනාවන් අසා අස්වැසිලි ලදින් ධර්මාන්විතව වාසය කෙළේය. මහබෝධි සත්ත්වයෝද කිසිකලෙකත් එහි වාසයකොට තපස්වී සමූහයා විසින් පිරිවරණ ලදුව නමන්ගේ වාසස්ථානයට ගියාහුයයි සර්වඥයන්වහන්සේ අතීත කාලයෙහි මේ අජාසත් රජ්ජුරුවෝ මා විසින් ශොකයෙන් දුරකරණලද්දාහුමයයි වදාරා

ජාතකය පූර්‍වාපරසන්‍ධි ගළපා සංකිච්ච ජාතකය නිමවා වදාළරසේක. එකල බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ දූත් අජාසත්ත රජ්ජුරුවෝය, තාපස සමූහයා බුදුපිරිස් වූහ, එකල බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ සෝකදුක් සංසිඳවූ සංකිච්ච පණ්ඩිතයෝතම් ලොව්තුරා බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

සට්ඨි නිපාතයයි

519
කුස ජාතකය

තවද දසබලධාරීවූ සුරාසුරවර චක්‍රවාළ චූඩාමණිමරීචිසඥචය පරිචුම්ඹිත චරණයුගල ඇති සර්‍වඥයන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජෙත නම් රාජකුමාරයන්ගේ උයන්හි අතේපිඩුමහසිටාණන් විසින් සිව්පණස් කෙළක් ධන වියදම්කොට කරවා පිළිගන්වනලද රාත්‍රිස්ථාන දිවාස්ථාන චංක්‍රමණ මණ්ඩප මාලකාදීන් විරාජමානවූ පද්මෝද්පල කුවලයකුමුද්‍ර කෑලාර කුසුමොපශොභිත පුෂ්කරිණීන් රම්‍යවූ භූමිප්‍රදෙශ ඇති ජෙතවන මහවිහාරයෙහි බ්‍රහ්ම ආයර්‍ය ඊයඝිාපථ විහරණයෙන් දවස් යවනසේක් සස්නෙහි උකටලීවූ එක්තරා භික්‍ෂු කෙණෙකුන් අරභයා මේ කුස ජාතක ධර්‍මදෙශනාව වදාළ සේක.

ඒ කෙසේද යත්?

සැවැත්නුවර වසන්නාවූ එක්තරා කුලපුත්‍රයෙක් බුදුසස්නෙහි පෙදී මහණව එක්දවසක් සැවැත්නුවර පිඬුසිගා ඇවිදිනේය, සර්‍වාභරණ විභූසිත වූ එක් මාතුගාමයෙක් දැක සුභනිමිත්තග්‍රහණයෙන් බලා ක්ලේශවසගව ශාසනයෙහි ඇලුම් නැතිව දික්වූ නිය කෙස් හා ඉලුපුනු නහරබහන් කිළුටුවූ සිවුරු හා සුදුමැලිවූ සිරුරු ඇතිව වසන්නේය, යම්සේ දිව්‍යලෝකයෙන් චුතවන්නාවූ දිව්‍යපුත්‍රයන්ට පැලඳි මල් මලානිකවීමය දිවසළු කිළුටුවීමය. ශරීරය දුර්‍වර්‍ණයට පැමිණවීමය දෙකිසිල්ලෙන් ඩා වැගීමය දිව්‍යලොකයෙහි ආලය මදවීමය යන මේ පචපූර්‍වනිමිත්තයෝ පහළවෙද්ද එපරිද්දෙන්ම උකටලීවූ සිත් ඇතිව ශාසනයෙන් පිරිහෙනු කැමති භික්‍ෂූන්ටත් සැදැ නමැති මල් මලානිකවීමය සිල් කිලිටිවීමය නුගුණ පැතිරෙමින් විරූප බවට පැමිණීමය ක්ලේශ නමැති ඩා වැගීමය විවෙකස්ථානයෙහි නොඇලීමය යන මේ පචපූර්‍වනිමිත්තයො පහළවන්නාහ. ඒ මහණහටද එකියනලද පස් වැදූරුම්වූ ගුණයෝද පහළවූහ. එබව දැන සෙසු භික්‍ෂූන්වහන්සේ ඒ මහණ නොකමැතිකරවා බුදුන් සමීපයට කැඳවාගෙණගොස් ස්වාමීනි මූ ශාසනයෙහි උකටලීවූයයි දන්වූසේක.

එකල සර්‍වඥයන්වහන්සේ මහණ නා ශාසනයේ උකටලිවූයේ සැබෑදැයි විචාරා වදරා සැබෑය ස්වාමීනියි දන්වූකල්හි මහණ ක්ලේශවසගව නොපවතුව මේ මාතුගාමයෝ නම් පව්ටු සත්ව කෙණෙකැයි ඔවුන්කෙරෙහි පිළිබඳ සිත් හැර ශාසනයෙහි ඇලී වාසයකරව ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිත්නිසා තෙජස්වී වුත් පුරාතනයෙහි නුවණැත්තෝ තේජසින් පිරිහී නොයෙක්

ව්‍යක්තයට පැමිණියාහු වෙද්දැයි වදාරා භික්ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ පරදුක්ඛ දුක්ඛිතවූ කරුණා නිධානවූ ත්‍රිලෝගුරු බුදුරජාණන්වහන්සේ කඩතුරාවක් පහකොට විචිත්‍ර චිත්‍රකර්මාන්තයක් දක්වනකෙණෙකුන් පරිද්දෙන් භවයෙන් ප්‍රතිච්ඡන්නවූ ඉකුත්වත් කථාව කෘතයුග මිහමේඝයක් නැගී වස්නා කලක්මෙන් ගෙණහැර දක්වා වදාරණසේක්:-

යටගිය දවස මලල රට කුසාවතී නම් නුවර ඔක්කාක නම් රජ්ජුරුකෙණෙක් දශරාජ ධර්මයෙන් දැහැමෙන් රාජ්‍යය කරන්නාහ. ඔහුගේ සොළොස් දහසක් පුරාංගනාවන්ට ප්‍රධානවූ සීලවතී නම් අගමෙහෙසුන් බිසෝකෙණෙක්වූහ. පුත් දරුකෙණෙක් නැත්තාහ. එකල නුවර වැස්සෝ හා රාජ්‍යය වාසීන් හා පුරදෙරට රැස්ව රට නස්නේය විනස්නේයයි මහත්කොට කෝලාහල කළාහුය. ඒ කොලාහල ඇසූ රජ්ජුරුවෝ සීමැදුරු කවුළුව හරවා මා රාජ්‍යය කරමින් සිටියදී අන්‍යායක් කරණ කෙණෙක් නැත්තාහ කුමක් නිසා මොරගැවූදැයි විචාළාහ

එකල ඔවුන් විසින් සැබව ස්වාමීනි දෙවයන්වහන්ස අධර්මකාරී කෙණෙක් නැත වංශ පරිපාලනය කරන්ට නිසි දරුකෙණෙක් නැත්තාහ. අනික් කෙණෙකුන් අප රාජ්‍යය ඇරගෙණ අධර්මයෙන් රාජ්‍යය නසති ඒ කාරණයෙන් දැහැමෙන් රාජ්‍යය කරන්ට නිසි පුතනු කෙණෙකුන් පැතුව මැනවැයි කීහ. එසඳ රජ්ජුරුවෝද පුතනුවන් ප්‍රාර්ථනාකරන්නාවූ මාවිසින් කුමක් කටයුතු දැයි විචාළාහුය. දෙවයන්වහන්ස නුඹවහන්සේගේ තුන්වැදෑරුම්වූ නාටක ස්ත්‍රීන්ගෙන් පළමුකොට රැකවල් ඇතිව පිටත ඉන්නාවූ සුළු නළු මුළු රැකවල් හැර ස්ත්‍රියක් සිතසේ ඇවිදිනාව හැර වදාළ මැනව ඉදින් ඉන් එක්කෙණෙක් දරුකෙණෙකුන් ලද්දුනම් මැනව නැත්නම් ඉක්බිති අගමෙහෙසුන් බිසවුන්වහන්සේ හැර අවශෙෂ ස්ත්‍රීන් හළමැනව ඒකාන්තයෙන් මෙතෙක් දෙනා අතුරෙන් කුසල් ඇතිකෙණෙක් දරුකෙණෙකුන් ලබතියි කීවාහුය. එකල රජ්ජුරුවෝ ඔවුන්ගේ බසින් එලෙස කරවාත් දරුකෙණෙකුන් නොලදින් නොසතුටුවූහ.

නැවත නුවර වැස්සෝ රැස්ව කොලාහල කළාහ. ඒ අසා රජ්ජුරුවෝ තොප හැම කීමෙන් පුරාංගනාවන් රැකවල් හරවාත් එතෙක් දෙනාගෙන් දරුකෙණෙකුන් ලබන කෙණෙකුන් නැත. දැන් කුමක් කරමෝදැයි විචාරා ඔවුන් විසින් දෙවයන්වහන්ස මේ සියලු ස්ත්‍රීහු දුරාචාරීවූ කුසල් මද සත්ව කෙණෙක මොවුන්ට දරුපින් මද නැතැයි නුඹවහන්සේ නිරුත්සාහ නුවූව මැනව අගමෙහෙසුන්වූ සීලවතී දෙවීන්වහන්සේ සීලාචාර සම්පන්නසේක. උන්වහන්සේ රැකවලින් හළමැනව දරුකෙණෙක් ඇතිවෙතියි කීසඳ රජ්ජුරුවෝ එබස්පිළිගෙණ නුවරවැසියන් රැස්කරවා සීලවතී දෙවීන්වහන්සේ සර්වාභරණයෙන් සරසා මාලිගාවෙන් පිටත්කළාහුය. එකෙණෙහි බිසවුන්ගේ සීලානුභාවයෙන් ශක්‍ර දෙවෙන්ද්‍රයන්ගේ පාණ්ඩු කම්බල ශෛලාසනය උන්නොකමැති පරිද්දෙන් හුණුවිය.

එකෙණෙහි මීට කාරණා කිම්දෝහෝයි තමන්ගේ දහසක් නුවණැස් මෙහෙයා බලා සීලවතී දෙවීන් දරුවන් පතන නියාව දැන මා විසින් උන්ට

දරුකෙණෙකුත් දියයුතුයයි සිතා සියලු තව්තිසා භවනය බලාගෙණ ගොස් එයින් චුතව මත්තෙහි දිව්‍යලොකයට යනු කැමතිව සිටියාවූ බොධිසත්වයන් දැක ශක්‍රදෙවෙන්ද්‍රයෝ ඔහුගේ විමන්දොරට ගොස් සබඳ තොප විසින් මනුෂ්‍ය ලොකයට ගොස් ඔක්කාක රජ්ජුරුවන්ගේ අග මෙහෙසින් බිසවුන් කුස පිළිසිඳ ගතයුතුයයි කියා ගිවිස්වා අන් දිව්‍යපුත්‍රයෙකුත් එලෙසම ගිවිස්වා කවුරුත් බිසවුන්ගේ සීලභෙදය නොකෙරෙත්වයි සිතා තුමූ මහළු බමුණු වෙසක් මවාගෙණ රජ්ජුරුවන්ගේ මාලිගාදොරට ගියාහුය.

එසඳ රැස්වූ බොහෝදෙන ඒ ශක්‍ර බ්‍රාහ්මණයා දැක කුමක් නිසා තෝ මෙතනට ආයෙහිදැයි යනාදීන් පරිභවබැණ විචාළහ. ඒ අසා සක්‍රදෙවෙන්ද්‍රයෝද කුමැයි මට නින්දාකරව්ද? ශරීරය ජරප්‍රාප්ත පමණක් විනා රාගය තරුණ වන්නේය. ඉදින් සීලවතීදෙවීන් ලදිම්නම් ගෙණයෙමියි සිතා ආමි කියා තමන්ගේ ආනුභාවයෙන් හැමදෙනාට පෙරටුව සිටගෙණ පිටත්වූ බිසවුන් අත අල්වාගෙණ ඒ සියළු ජනයා නින්දා පරිභව කරමින් සිටියදී නික්මුනේය. එසඳ බිසව්ද මේ මහළු බමුණු මා ගෙණයන්නේයයි පිළිකුලෙන් පෙළී ලජ්ජාවට පැමිණියෝය. රජ්ජුරුවෝද බමුණු මාල්ලා විසින් ගෙනයන ලද බිසවුන් දැක නොසතුටුවූය ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍රයෝ බිසවුන් ඇරගෙණ නුවර වාසලින් පිටත්ව වාසල් සමීපයෙහි පණවනලද දඬුමැසි ඇති හරණලද දොරපැලලි ඇති පැල්පතක් මවා ඒ පැල සමීපයට ගියේය. එකල බිසව් මේ නුඹගෙ ගෙදරදැයි විචාරා බමුණු විසින් එසේය සොඳුර පළමු මම උදකලායෙමි දැන් අපි දෙදෙන මොවුම්හ; එහෙයින් මා සාල් මාලු ආදිය සිඟාගෙණ එනතෙක් මේ මැස්සේ වැදෙවැයි කියා බිසවුන් මොලකතින් පිරිමැද දිවපහස් පතුරුවා නිදිගන්වා දිවපහස් ලැබ විසංඥව නිදන්ට වන්සඳ තමන්ගේ ආනුභාවයෙන් බිසවුන් තව්තිසා භවනයට ගෙණගොස් සරහනලද දිව්‍ය විමානයෙක්හි අතුරණලද දිවයහන්හි සතපපාලූහ.

ඉක්බිති බිසව් සතියකින් පිබිද එහි දිව්‍යලොකයෙහි සම්පත් දැක මේ මා ගෙණායේ මිනිසෙක් නොවෙයි ශක්‍රවෙන්ද්‍රයෝවනැයි සිතා යහනින් නැඟී නොයෙක් දිවඟණවන් විසින් පිරිවරණලදුව පරසතුරුක මුල පඬු ඇඹුල්සල අස්නෙහි ඉඳ දිව ඉසුරු විඳිනාවූ සක්දෙව්රජහු කරාගොස් වැඳ එකත්පස්ව සිටියෝය.

එකල ශක්‍රදෙවේන්ද්‍රයෝ තොපට වර දනයක් දෙමි කැමති වරයක් ඉල්වා ගණැයි කීහ. එබස් අසා සතුටුවූ බිසව් දෙවයන්වහන්ස පුත්‍ර වරයක් දුනමැනවැයි ඉල්වූහ. එකල ශක්‍රදෙවේන්ද්‍රයෝ දෙවීනි එක්කෙණෙකුත් තබා දරුවන් දෙන්නෙකු දෙමි. බල ඉන් එක්කෙණෙක් නුවණැතිව රූ නැතිවෙති එක්කෙණෙක් රූ ඇතිව නුවණැතිවෙති. ඔවුන් දෙදෙනාගෙන් පළමුව කවුරුන් ලබන්නාවේදැයි විචාරා නුවණැති තැනැත්තන් පළමුව ලබන්නා කැමැත්තෙමි කී සඳ එබස් ශක්‍රදෙවේන්ද්‍රයෝ පිළිගෙණ එබිසවුන්ට කුසතණ මිටක්ද දිවසළුවක්ද දිවසඳුන් හරයක්ද පරසතු මදුරා මල්ද කොකනද නම් වීණාවක්ද දී බිසවුන් කැඳවාගෙණ අවුත් රජ්ජුරුවන්ගේ ශ්‍රී යහන් ගබඩාවට වැද රජ්ජුරුවන් හා එක් යහන්කරවා තමාගේ පය මහපට ඇඟිල්ලෙන් බිසවුන්ගේ පෙකනිය පිරිමැද පුරපුරවම නැගී ගියාහ. එකෙණෙහි පුරණලද

බොධිසම්භාර ඇති අප මහ බෝසතාණෝ තව්තිසා භවනයෙන් චුතව අවුත් සීලවතී දේවීන් බඩ පිළිසිඳගත්හ.

බිසවුත් තමන් දරුගැබ පිහිටිබව දත්හ. ඉක්බිති රජ්ජුරුවෝ පිබිද බිසවුන් දුක දේවීනි කවුරුන් විසින් ශෙතයනලදදැයි විචාරා ශක්‍ර දෙවේන්ද්‍රයන්යයි කීකල මේ කිමෙක්ද! මහළු බමුණෙකු නෙණගිය නියාව මම දිටිමි කුමක් කියා මට වළහා කිව්දැයි කිවුය, දේවයන්වහන්ස අදහාගත මැනව, ශක්‍රදෙවේන්ද්‍රයො මා හැරගෙණ දිව්‍යලොකයට ගියාහුයයි දෙවෙනි තුන්වෙනිවත් කියා ගිවිස්වාලියතොංගී ශක්‍රදෙවේන්ද්‍රයන් විසින් දෙනලද කුස තණ හා දිව සළු ආදිය පෑ ගිවිස්වා වන්තාට ශක්‍රදෙවෙන්ද්‍රයෝ තොප ගෙණ ගියෝය. දරුකෙණෙකුන් ලදුදැයි විචාරා එසේය දේවයන්වහන්ස දරුකෙණෙකුන් ලදිමි කිවුය. එබස් අසා සතුටුවූ රජ්ජුරුවෝ බිසවුන්ට ගබ පෙරහර දුන්හ.

ඉක්බිති ඒ බිසව්ද ක්‍රමයෙන් දස එකඩමසක් ඇවෑමෙන් පුතනු කෙණෙකුන් වැදූහ. ඒ කුමාරයාහට කුසකුමාරයෝයයි නම් තුබූහ, ඒ කුස කුමාරයන් පියවරනගා ඇවිදිනාකාලයෙහි අනික් දිව්‍ය පුත්‍රයෙක් දෙව් ලෙ වින් අවුත් බිසවුන් කුස උපන්හ. ඔහට ජයම්පතීයයි නම් තුබූහ. ඒ රාජ කුමාරවරු දෙදෙන මහත්වූ පෙරහරින් පෙරඩමස සඳසේම වැඩිවිය පැමිණි යාහ. මහාබොධිසත්වයෝ තමන් නුවණැතිහෙයින් සියළු සිල්පයන්ම ආචාරී කෙණෙකුන්ගෙන් නොඉගෙණ සියනුවණින්ම දන්න තිම වූහ, ඉක්බිති මහා බොධිසත්වයන් සොළොස් හැවිරිදි වයසට පැමිණිකල්හි පියරජ්ජුරුවෝ කුමාරයන් රාජ්‍යයෙහි අභිෂෙක කරණු කැමතිව බිසවුන් කැඳවා දේවීනි තොපගේ පුතනුවන් අභිෂෙක කරවා නාටක ස්ත්‍රීන් හා ඓශ්වර්‍ය්‍ය පාවාදී ජීවත්වන්නාවූ අපි රාජ්‍යයෙහි පිහිටියාහුගේ ශ්‍රී විභූතිය දකුම්හ. මේ මුළු දඹදිව යම් රජක්හුගේ දුවක කැමතිවේද උන් ගෙන්වා අගමෙහෙසුන් කරම්හ කවර රජ්ජුරුකෙණෙකුන්ගේ කුමාරිකාවක කැමැත්තෝද උන්ගේ අභිප්‍රාය දන කියවයි කීහ. බිසවුන් යහපතැයි ගිවිස කුමාරයන්ට මෙපවත් කියා අභිප්‍රාය විචාරාගෙණ එවයි කියා කම්මිත්තක යවූහ. ඒ ස්ත්‍රී ගොසින් බොධි සත්වයන්ට එපවත් කිවුය. ඒ අසා මහ බෝසතාණෝ මම රූ නැත්තෙමි රූප ශ්‍රීන් යුක්තවූ රාජකුමාරිකාවක් ගෙණෙන ලද්දෝවූ නම් මා දුක යකකු මෙන් විරූපවූ මොහුගෙන් මට කම් කිම්දැයි පලායන්නිය. ඒ අපට ලජ්ජා කටයුතු වන්නේද. එහෙයින් මට ගෘහවාසයෙන් ප්‍රයොජන නැත මා පිය දෙදෙනා ජීවත්වනතෙක් උපස්ථානකොට ගුරුදෙදෙනා ඇවෑමෙන් ගොස් මහණවෙමියි සිතා මහාබොධිසත්වයෝ තමන්ගේ මේ අදහස ඒ කම්මිත්තියට කිවුය. ඕතොමෝ ගොස් එපවත් බිසවුන්ට කිව. බිසවු එපවත් රජ්ජුරුවන්ට කීහ. ඒ අසා රජ්ජුරුවෝ නොසතුටුව නැවත කීපදවසකින් එමලෙසම කියා යවූය. බොධිසත්වයෝ නොකමැත්තේයයි තුන්යලක් වළකා සතරවෙනි වාරයෙහි දෙමව්පියන් කීවා නොකොට වරදවා පිළිපැදීම කටයුතු නොවෙයි. ඊට තිසි උපදෙසක් කෙරෙමියි සිතා මහා බොධිසත්වයෝ තරාල් දෙටුවකු කැඳවා බොහෝ රත්රන් දී එක් ස්ත්‍රීරූපයක් කොට ගෙණෙවයි කියා ඔහු නික්මවා තුමූ රත්රනින් ස්ත්‍රීරූපයක් කළෝය.

බොධිසත්ත්වයන්ගේ අභිප්‍රාය සිතූ පැතූලෙසම සිඩවන බැවින් ඒ රන් රුව කියා නිමවිය නොහැකි රූපශොභා ඇත්තේවිය. එකල මහ බොධිසත්ත්වයෝ ඒ රන්රුව සුරත් කොමු පිළියක් අඳවා ශ්‍රී යහන් ගර්භයෙහි සිටවූහ. ඉක්බිති බොධිසත්ත්වයෝ තරාල ඇදුරා විසින් ගෙණෙනලද රන්රුවට නින්දා කොට යව අපගේ ගර්භයෙහි තුබූ සුවර්ණරූපය ගෙණෙවයි සුවර්ණකාරයාහට නියොග කළේය. එසඳ ඒ ගොස් ශ්‍රී යහන් ගර්භයට වැද ඒ රන්රුව දැක කුමාරයන් වහන්සේ හා සමග ක්‍රීඩා පිණිස ආ දිව්‍යප්සරාවක් වනැයි සිතා අත දික්කරන්නටත් නොපොසත්ව බොධිසත්ත්වයන් කරාගොස් දෙවයන්වහන්ස බිසවුන්වහන්සේ තනිව වැඩසිටි සෙයින් වැද්ද නොහෙම්යි කීය. නැවත බොධිසත්ත්වයන් විසින් ඇදුර එරන්රුව සැකනැතිව හැරගෙණ එවයි කියායවන ලදුව නොස් ගෙණායේය. ඉක්බිති බොධිසත්ත්වයෝ බඩාලා ගෙණා රුව රන්රන් ගබෙහි ලා තමන් කළ රුව ආභරණ ආදීන් සරහා රථ යානාවෙක්හි තබා මෙබඳු රූපශ්‍රී ඇති කෙණෙකු ලදින් තම් පාවාගණිමි කියා රන්රුව මැතියන් සමීපයට යවූහ. ඒ දැක බසව් සතුටුව අමාත්‍යයන් රුස්කරවා සගයෙනි මපුතනුවෝ නම් මහපිණැත්තාහ. ශක්‍රදෙවේන්ද්‍රයන් විසින් දෙනලද කෙනෙක එහෙයින් සුදුසු කුමාරිකා කෙණෙකුන් ලැබෙති නෙපි හැම මේ රන්රුව පිළිසන් රථ යානාවෙක තබාගෙණ මුළු දඹදිව ඇවිදිමින් යම් රජ්ජුරු කෙණෙකුන්ගේ මෙබඳු රූ ඇති කුමාරිකාවක දුටු නම් ඒ රජහට මේරන්රුව දී ඔක්කාක රජ්ජුරුවන් වහන්සේ නුඹවහන්සේ හා සමග විවාහ සම්බන්ධයක් කරණු කැමතිසේකැයි කියා දවසක් නියමකොට එවයි නියොග කළාහුය.

එසඳ ඒ නියොගලද ඇමතියෝ මහපෙරහරින්ම ඒ රන්රුව හැරගෙණ ඇවිදිනාහු යම් නුවරකට පැමිණෙද්ද එහි සවස්වේලෙහි බොහෝදෙනා රුස්වන තෙනක ඒ රුව වස්ත්‍රාභරණ කුසුමාදීන් සරහා රන්සිවිගෙයෙක්හි තබා පැන්තොටට යන එන මගස සිටුවා තුමූ ඉවත්ව යනු එන්නන්බස් අසනු පිණිස සැඟවී සිටිනාහ. එකල බොහෝදෙන ඒ රුව දැක රන්රුවකැයි නොදන මනුෂ්‍යවූන් මෝ නොමෝ දිව්‍යප්සරාවක් මෙන් ඉතා හොබනීය මෝ නොමෝ කොයිසිට අවුදැයි කුමක් නිසා මෙතන සිටියෝද අපගේ නුවර මෙබඳු රූපශ්‍රී ඇති කෙණෙක් නැතැයි යනාදීන් ප්‍රශංසාකෙරෙමින් යන්නාහ. එකල අමාත්‍යයෝ ඉදින් මෙනුවර මෙබඳුවූ කුමාරිකා කෙණෙක් ඇත්නම් අසෝ රජ්ජුරුවන්ගේ අසෝ අමාත්‍යයන්ගේ දියනියන් වැනියෝයයි කියති. එලෙස නොකියේ ඒකාන්තයෙන් මෙබඳු රූ ඇතිකෙණෙකුන් මෙනුවර නැති හෙයිනැයි. ඒ රුව හැරගෙණ අනික් නුවරකට යන්නාහ. මේ ලෙස ක්‍රමයෙන් ගොස් මදුරට සාගලනුවරට පැමිණියාහුය.

එනුවර මදුරජ්ජුරුවන්ගේ දිව්‍ය ස්ත්‍රීන් හා සමානව උතුම්වූ රූපසොභාඇති දූ අටදෙනෙක් ඇත ඔවුන් අටදෙනාට වැඩිමාළු ප්‍රභාවතීගේ ශරීරයෙන් හැමවේලෙහිම බාලාකීරශ්මියට බඳුවූ පැහැ විහිදුණේය ඝනාන්ධකාරවූත් රාත්‍රියෙහි සතරරියන් ගෙයෙක්හි ප්‍රදීපාලොකයක් නැතිව ශරීරාලොකයෙන්ම එකාලොක වන්නේය. උන්ට කිරිමව්වූ කුදුනොමෝ ප්‍රභාවතීන්ට නහනපැන් ගෙණෙන පිණිස ස්ත්‍රීන් අටදෙනෙකුලවා රන්කළ අටක් ගෙන්වාගෙණ සවස් වේලෙහි පැනට යන්නීය. ඔක්කාක රජ්ජුරුවන්ගේ රන්රුව ගෙණා පුරුෂයන් විසින් මගසස සිටුවනලද රුව දැක ප්‍රභාවතීයයි යන සිතින් ලඟට ගොස්

මේ නොකීකරු දරුවෝ අප පැතට එවා තුමූ මේ වේලෙ පළමුකොට අවුදින් මෙතන සිටියෝය. රජකුලයට පරිභව උපදවන්නාවූ කෙල්ල ඉදින් රජ්ජුරුවන්වහන්සේ දත්සේක්වීනම් අප හැම නසාපියනසේකැයි කියාකිපී කොපු ලනෙහි පාරක් ගැසුව. එකෙණෙහි අත්ල පැලීයනකලක් පරිද්දෙන් වේදනාවට පැමිණ රත්රුවකැයි දූත ලජ්ජාව සිතාසෙමින් බලග මා කලදෙයක මම් මාගේ දියනියනැයි සිතා පහරක් ගැසීමි මෝ තොම මාගේ දරුවන්ගේ රුවට කුමක් අගීද මාගේ අතට අස්සවූ පමණකැයි තමා හා එක්ව බිසවුන්ට කියව එබස් අසා රාජපුරුෂයෝ මාගේ දියනියෝ මීටත් වඩා රූ ඇත්තාහයි කියන් නාහු තෙපි කුමක් කියව්දූයි විචාළාහුය.

එකල ඔවුන්ට මෙරත් රුව මද්දුරජ්ජුරුවන්ගේ දියනියන් ප්‍රභාවතීන්ගේ රූපශ්‍රීන් සොළොස්වන කලාවෙන් කලාවකුත් නොහඟනේයයි කුද කීව ඔහු එබස් අසා සතුටුව රජගෙයි වාසලටගොස් ඔකකාකරජ්ජුරුවන්ගෙන් ආ දූතයෝ වාසල සිටියාහුයයි මද්දුරජ්ජුරුවන්ට කියා යවූහ එබස් අසා මද්දු රජ්ජුරුවෝ උතස්නෙන් නැගීසිට ගෙණෙව ගෙණෙවයි වහා ගෙන්වාගණ දුවහ එකල දූතයෝ දෙවානන්වහන්ස අපගේ රජ්ජරුවන්වහන්සේ නුඹවහන්සේගේ සුවදුක් විචාළසේක. යනාදීන් කථාකොට කරණලද සම්භාවනාඇතිව රජ්ජුරුවන් විසින් කුමක්පිණිස අවුදූයි විචාළකල්හි අපගෙ රජ්ජුරුවන්වහන්සේගේ සිංහ ගර්ජනාවට බඳුවූ අභිතනාද ඇති කුසනම් කුමාරයෙක් ඇත, අපගේ රජ්ජුරුවන්වහන්සේ උන්වහන්සේට රාජ්ජයදෙනුකැමතිසේක් නුඹවහන්සේ සමීපයට එවූසේක. නුඹවහන්සේගේ ප්‍රභාවතී නම් කුමාරිකාවන්වහන්සේ මේ රත්රුව වියදමට ඇරගෙණදෙවා වදාළ මැනවැයි ගිවිස්සාහ. ඒ අසා මද්දුරජ්ජුරුවෝ මෙබඳුවූ මහරජ්ජුරුකෙණෙකුන් හා සමග විවාහ සම්බන්ධයෙක් වන්නේයයි සතුටුව මැනව මැනවැයි ගිවිස්සාහ. එකල දූතයෝ අපවිසින් කල් යැවිය නොහැකැයි වහාගොස් රාජකුමාරිකාකෙණෙක් ඇති නියාව අපගේ රජ්ජුරුවන්වහන්සේට කියම්හ. උන්වහන්සේම අවුත් කැඳවාගෙණ යනසේකැයි කිවූය. එරජ්ජුරුවෝත් යහපතැයි පිළිගෙණ දූතයන්ට ප්‍රසාදදී යවූහ. ඔහු ගොස් එපවත් රජ්ජුරුවන්ට හා බිසවුන්ට කිවූය. එපවත් අසා ඔක්කාක රජ්ජුරුවෝ මහපිරිවරින් කුසාවතී නුවරින් නික්ම ක්‍රමයෙන් ගොස් සාගල නුවරට පැමිණියාහ. එබව අසා මද්දු රජ්ජුරුවෝ සිවුරඟ සේනඟ පිරිවරා පෙර ගමන් ගොස් නුවරට කැඳවාගෙණ ගොස් මහත් සත්කාර සම්භාවනා කළාහුය. කීපදවසකින් ඔක්කාක රජ්ජුරුවන්ගේ සීලවතී දෙවීනොමෝ නුවණැති බැවින් කවුරු දතිද්දූයි සිතා රජ්ජුරුවන්වහන්සේ යෙහෙලනියන් දක්නා කැමැත්තම්හයි මද්දු රජ්ජුරුවන්ට කිවූය. රජ්ජුරුවෝත් මැනවැයි පිළිගෙණ දියනියන් කැඳවා යවූය, එසඳ ප්‍රභාවතී සර්වාභරණයෙන් සැරසී කිරිමවුන් විසින් පිරිවරණ ලදුව අවුත් නැන්දනියන් දැකලා සිටියාහ. සීලවතී දෙවි ප්‍රභාවතීන් දැක මේ කුමාරිකා යහපත් රූ ඇත්තීය. මපුතනුවෝ විරූප යහ ඉදින් උහු දිටවූ නම් එකදවසකුත් නොරඳා පලායන්නාහ. ඊට තිසි උපායක් කෙරෙමියි සිතා ඉක්බිති බිසව් මහරජ මාගේ යෙහෙලනියෝ මපුත නුවන්ට නිස්සහ එතකුළවත් අපගේ වංශපරම්පරාවෙන් පැවත එන චාරිත්‍රයෙක් ඇත. ඉදින් මූ ඒ වූලෙස පිළිපදින් නම් කැඳවාගෙණයම්හයි මද්දු රජ්ජුරුවන්ට කිවූය. ඒ අසා මද්දු රජ්ජුරුවෝ කවර ආචාරයෙක්දූයි විචාළහ,

අපගේ වංශයෙහි දරුගැබීයක් පිහිටතතොක් ස්ත්‍රීහු දුවල් සාමිපුත්‍රයා දකින්ට නොලබති. ඉදින් මුත් එලෙස පවතින් නම් කැඳවාගෙණ යමහයි කිවුය. ඒ අසා රජ්ජුරුවෝ දියතියෙහි එලෙස පවතින්ට පිළිවන්දැයි විචාළහ. ප්‍රභාවතී යහපතැයි ගිවිස්සහ. ඉක්බිති ඔක්කාක රජ්ජුරුවෝ මද්‍ර රජ්ජුරුවන්ට බොහෝ සම්පත් දී ප්‍රභාවතීන් කැඳවාගණ ගියහ. මද්‍ර රජ්ජුරුවෝත් මහ පෙරහරින් දියතියන් තික්මවූහ.

ඔක්කාක රජ්ජුරුවෝ ගොස් කුසාවතී නුවර දිව්‍යපුරයක්මෙන් සරහා බන්ධන ගත සියළු සත්වයන් මුදාහරවා පුතනුවන්ට ප්‍රභාවතීන් අග මෙහෙසුන්කොට අභිෂේක කරවා කුස රජ්ජුරුවන්ගේ ආඥවයයි අණබෙර ලවා සේසත් නැංවූහ.

දඹදිව සියළු රජදරුවෝ තමන් තමන්ගේ දරුවන් කුස රජ්ජුරුව වන්ට සේවය පිණිස එවූහ, එකල බොධිසත්වයෝත් තළුතාවකාදී මහත් පිරි වරින් යුක්තව අපමණවූ ඓශ්වර්‍ය්‍යයෙන් රාජ්‍ය ශ්‍රී විඳිනාහ.

එසඳ කුස රජ්ජුරුවන් හා ප්‍රභාවතී දෙවි හා දෙදෙනා දිවාභාගයෙහි ඔවුනොවුන් නොදක රාත්‍රියෙහිම දක්නාහ. ඒ ප්‍රභාවතීන්ගෙ ශරීර සොභාව මහාබොධිසත්වයන් තේජසින් සූර්‍ය්‍යාලොකයෙහි කද්‍යෝපැණියන්මෙන්ද දිවා චන්ද්‍රයාපරිද්දෙන්ද නිෂ්ප්‍රභාවිය. කුස රජ්ජුරුවෝත් ශ්‍රී යහන් ගබින් පහන් වන්නට පළමුව පිටත්වන්නාහ. මෙලෙසින් කලක් ගියසඳ ප්‍රභාවතීන් දුවල් දක්නා කැමැතිව මැතියන්ට කිවුය. මැතියෝත් ඔහු බස් අසා පුතනුවෙනි දරුකෙණෙකුන් ලබනකල් ඉවසුවයි නැවතුහ.

බොධිසත්වයෝ නැවත නැවතත් ඇවිටිලිකොට කිවුය. එකල මැතියෝ දක්නා කැමතිනොත් ඇත්හලට ගොස් ඇත්ගොව්වන් හා එක්ව සිටුව මම එතනට උන් කැඳවානෙණ එම් එකල ඇස්පුරාදැකපියව නොපවූ තියාව නොහහවයි කිවුය. බොධිසත්වයෝත් යහපතැයි පිළිගෙණ ඇත්හලට ගියාහුය. එකල්හි සීලවතීදේවී ප්‍රභාවතීන් ඇත්හලට කැඳවා ගෙණගොස් මේ අසවල් ඇතාය මේ අසවල් ඇතායයි නම් කිය කියා දක්ව දක්වා යනසඳ කුස රජ්ජුරුවෝ ප්‍රභාවතීන්ගේ පිට ඇත් ඉලත්තියක් ගැසූහ. එකල ප්‍රභාවතී රජ්ජුරුවන්වහන්සේට කියා තොපගේ අතකප්පාලම් යතාදින් කියා බිසවුන් ලවාත් කොප කැරවූය, එසඳ බිසවු ප්‍රභාවතීන්ගේ පිට අතින් පිරිමැද තම ඇත්හල කොල්ලෝතම් ඉතා චපලයෝය. නුඹවහන්සේට උරණවන්නේයයි යනාදීන් කියා අස්වසා රජගෙට ගියාහුය.

තවද කලෙකින් බොධිසත්වයෝ ප්‍රභාවතීන් දක්නා කැමැතිව පෙර පරිද්දෙන්ම මැතියන්ට කියා අස්සලට ගොස් අස්සලයක්හු පරිද්දෙන් සිට ප්‍රභාවතීන් දැක එතනදීත් අස්බෙට්ටක් ගැසූය. එදවසද කිපියාවූ ප්‍රභාවතීන් බිසව් සන්හිඳුවූය. ඉක්බිති කල්‍යාමෙන් ප්‍රභාවතී බොධිසත්වයන් දක්නා කැමත්වනැයි නැන්දනියන්ටකියා උන්විසින් වලකනුලදුව නැවතත් යාච්ඤා කොට බිසවුන් විසින් එසේවී නම් කුස රජ්ජුරුවෝ සෙට නුවර පැදකුණු කෙරෙති. තෙපි එවෙලාවට සීමැදුරු කවුළුවෙන් දකුවයි කියා දෙවන දවස් නුවර සරහවා රජ්ජුරුවන්ගේ මලනුවන් ජයම්පති කුමාරයන් රාජාභරණ

යෙන් සරහා මඟුලැතුපිට හිඳුවා බොධිසත්ත්වයන් ඇත්ගොව් වේශයෙන් පශ්චිමාසනයෙහි ඉඳුවා නුවර පැදකුණුකරවා ප්‍රභාවතීන් කැඳවාගණ සීමැද්‍රුරු කවුළුවෙන් බලමින් තොපගේ ස්වාමිපුත්‍රයාතන්ගේ ශ්‍රී විභූතිය බලවයි කිවුය. එකල ප්‍රභාවතී ජයම්පති කුමාරයන් දැක මට සුදුසු වල්ලභයාන කෙණෙකුන් ලදිමි සතුටුවූය. එදවස් ඇත්ගොවු වෙසින් පිටිපස උන් බොධිසත්ත්වයෝ සිත්වූ පරිද්දෙන් ප්‍රභාවතීන් දකිමින් හස්තවිකාර මුඛවිකාරයෙන් උසුළු විසුළු පෑ කෙළිය්හ.

එලෙස ඇත ගිය පසු තොපගේ ස්වාමිපුත්‍රයානන් දුටුදැයි ප්‍රභාවතීන් විචාරා ඔහු විසින් ස්වාමීනි දිටිමි පිටිපස්සේ උන් ඇත්ගොවු ඉතාම චපලය මට උසුළු විසුළු පෑයේය. එබඳුවූ නොහික්මුනු පිත්මද තැනැත්තවූ කුමක් පිණිස රජ්ජුරුවන්ට පිටිපස්සෙ ඉඳුවූදැයි කිවුය. එබස් අසා බිසව් දියනියෙනි රජ්ජුරුවන්ට ආරක්‍ෂා පිණිස සැලසූ ඇත්ගොව්වායයි වලහා කිව්ය. ඒ අසා ප්‍රභාවතී මේ ඇත්ගොව්වා ඉතා නිර්භීතාව රජ්ජුරුවන්ට රජ්ජුරුකෙණෙකැයි නොසිතති. මේ කිමෙක්ද කුස රජ්ජුරුවෝ තම් මූවතැයි ඒ කාන්තයෙන් උන් රූ නැති කෙණෙකුන් වියයුතුය. ඒ කාරණයෙන් මා නොදක්වති සිතා කුද කැඳවා යව මැනියනි කුස රජ්ජුරුවෝ ඇතුපිට ඉදිරියෙ උන් තැනැත්තෝද නොහොත් පිටිපස්සේ උන් තැනැත්තෝදැයි නියම දැනගෙණ එවයි කිවුය. එවිගස මම කෙසේ දැනගණිම්දැයි විචාළහ. කුදට පළමුයෙන් ඇතු පිට බට තෙනැත්තෝ රජ්ජුරුවෝය මෙලෙස සලකුණෙන් නියම දැනගෙණ එවයි කිවුය. ඒ නියෝග ලද කුදු ගොස් එක්තෙනක සිට පළමුකොට බොධිසත්ත්වයන් හා දෙවෙනිව ජයම්පති කුමාරයන් බට නිශාව දුට. එකල බොධිත්ත්වයෝ ඇත මෑත බලා දුරසිටි කුද දැක මෑ ආයේ මේ පරීක්‍ෂාකරන්ට යයි දැන ලඟට කැඳවා මේ තොරතුරු නොකියවයි කියා නික්මවූහ. ඕ ගොසින් පෙරආසනයේ උන්තෙනන්තෝම පළමුකොටම බටුයයිකියා ගිවිස්වා ලූහ. නැවත කල්යාමකින් බොධිසත්ත්වයෝ ප්‍රභාවතීන් දක්නා කැමැතිව මෑනියන්ට කිවුය. බිසෝ තවතාගත නොගී එසේවී තම් අප්‍රසිඬ වේශයෙන් උයනේ ගොස් සිටුවයි කිවුය. එබස් අසා කුස රජ්ජුරුවෝ උයනට ගොසින් මඟුල්පොකුණෙ සාරවටක් දියට බැස තෙලුම්පතක් ඉසවසාගෙණ තෙලුම් මලකින් මූනවසාගෙණ සිටියාහුය. බිසවුන් ප්‍රභාවතීන් උයනට කැඳවාගෙණ ගොස් සවස්වේලෙහි පුෂ්ප ඵල පල්ලවයෙන් සජ්ජිතවූ සපු දුනුකේ නා පතා සීතිද්දෑ බෝලිද්ද දෑසමන් ආදී ගස්ලියද ගිරා බොකල් ඈ පක්ෂීන්ද දක්වමින් මඟුල් උයන් ඇවිදගෙණ ඇගෙ සිත් පොලඹවමින් පොකුණුතෙරට ගියෝය. එකෙණෙහි ප්‍රභාවතී තොමෝ පස්පියුමෙන් ගැවසීගත් පොකුණ දැක නහනු කැමතිව පිරිවර හා සමඟ පොකුණට බැස කෙළිමින් මහබොධිසත්ත්වයන් මූන වසාගෙණ සිටි පියුමට අත දික්කලාය එකල්හි රජ්ජුරුවෝ තෙළුම්පත ඉවත් කොට මම කුස රජයයි ප්‍රභාවතීන් අත ඇල්ලූය ඔහුගේ මුඛය දැක යක්‍ෂයෙක් මා අත අල්වාගතැයි මුරගාමින් භයින් මූර්ඡාවගියාහ. එසඳ රජ්ජුරුවෝ අත ඇරපීහ. ඉක්බිති බිසෝ සිහිලදින් සිතන්නාහු මා අත ඇල්ලුවෝ ඉදින් කුසරජ්ජුරුවෝවීනම් ඇත්තලදී ඉලත්තියනුත් අස්සලදී අශ්බෙටියෙනුත් මූන් විසින්ම ගසතලදිමි. ඇතුයේ පශ්චිමාසනයෙහිද මා වෙහෙසවූවෙන් මූමය. මෙසේ විරූපවූ දුර්මුඛවූ වල්ලභයාගෙන් මට ප්‍රයෝජන කිම්ද ජීවත්ව උනිම්

කුසජාතකය

නම් මට වල්ලභයන් අරුම නොවන්නේයයි සිතා තමන් හා එක්ව ආ අමාත්‍යයන් යවා යානවාහන සරහව අද දවස්ම නික්මෙමි කීහ.

ඔහු එපවත් රජ්ජුරුවන්ට කීවාහුය. ඒ අසා රජ්ජුරුවෝ මූ යන්ට අවසර නොලද්දු නම් පැලී මියයන්නාහ. වන්නාට දූතව යෙත්වයි නැවත මාගේ බලයෙන් ගෙන්වා ගණිමි සිතා ගමන් අනුදත්හ. එකල්හි ප්‍රභාවතී පිරිවර හා මග පිය රජ්ජුරුවන්ගේ සාගල නුවරටම ගියෝය. ප්‍රභාවතී තොම ජාතියෙහි කළ ප්‍රාර්ථනාවෙන් නොකැමතිවිය. බොධිසත්ත්වයෝද පූර්වයෙහි කරණ ලද අකුශලබලයෙන් විරූපව ගියහ.

ඒ කෙසේද? යත්;

යටගිය දවස බරණැස්නුවරට නුදුරුගමෙක්හි වීථිදෙකක කෙළෙඹි කුලදෙකක් ඇත්තේ ඉන් ගෙයක පුත් දෙන්නෙක්වූහ. ඉක්බිති බොධිසත්ත්වයෝ බාල මලනුවෝහ.

අනික් කෙළෙඹි කුලයෙහි දියනි කෙණෙක්වූහ. ඒ කුමාරිකාව බොධිසත්ත්වයන්ගේ බෑනන්ට සරණගෙන්වූය. බොධිසත්ත්වයෝ වෙන ගෙයක් දෙරක් නැතිව බෑනන්ගේ ගෙයි වාසය කෙරෙති. ඉක්බිති එක්දවසෙක අතිරස කැවුම්පිස කිසි කටයුත්තක් නිසා වලගිය බොධිසත්ත්වයන්ට තිබා තුමූ දෙදෙන අනුභවකළහ.

එවේලෙහි සිහා වැඩි පසේබුදු රජකෙණෙකුන්වහන්සේ දැක බොධිසත්ත්වයන්ගේ බැදෑතියො උන්ට කැවුම් පසුව පිස දියහැක්කැයි සිතා බොධිසත්ත්වයන්ට තිබූ කොටස පිළිගැන්වූහ. බොධිසත්ත්වයෝ නොපසනාතකොටස කාපියා මාගේ කොටස දන්දෙන්ට කාරණා කිම්දැයි කිපී ලුහුබඳවා ගොසින් පසේ බුදුන්වහන්සේගේ පාත්‍රයේ තුබූ කැවුම් ඇරගත්තුය. එකල ස්ත්‍රී මැනියත් ගෙටගොස් සපුමල් පෙත්තක්සේ සතරන්වන්වූ අළුත්දැවූ ගිතෙල්ගෙණ පාත්‍රයෙහි පුරා සතුටුව සවාමීනි මා උපනුපන් ජාතියෙහි මාගේ ශරීරයෙන් ආලොක පැතිරෙවයි උතුම් වූ රූ ඇතිවෙම්වයි අසත්පුරුෂයා හා එකතෙන වාසයනොකෙරෙම්වයි කියා කළ ප්‍රාර්ථනාවශයෙන් ප්‍රභාවතී බොධිසත්ත්වයන් නොකමැතිවූය.

බොධිසත්ත්වයෝද පසේ බුදුන්වහන්සේගේ පාත්‍රයට කැවුම් කොටස පිළිගන්වා සවාමීනි ඉදින් යොදුන් සියයක උතත් මූන් මාගේ බලයෙන් ගෙන්වාගෙණ මට පාදපරිචාරිකා කරන්ට සමර්ථවෙම්වයි ප්‍රාර්ථනාකළෝය.

කිපී ගොස් පසේබුදුන්ගේ පාත්‍රයේ තුබූ කැවුම් හැරගත්හෙයින් මූබය විසුළුව ගියේය. මේ තෙම මොවුන්ගේ පූර්වක්‍රියාවන්නේය. බොධිසත්ත්වයෝ ප්‍රභාවතීන් ගිය නියාව අසා සොකයට පැමිණියහ. අවශෙෂ නාටක ස්ත්‍රීහු නොයෙක් ප්‍රකාරයෙන් සිත්තලවන්නාහු පොළඹාගතනුහුනුවහ.

ප්‍රභාවතීන් නැති රජගෙය කුසරජ්ජුරුවන්ට සිස්වූවාක්මෙන් වැටහෙන්නේය. මෙලෙසින් රාත්‍රියෙහි බොහෝ දුක් විඳ අළුයම නැගීසිට සාගල

නුවරට ගොස් ප්‍රභාවතීදෙවී කැඳවාගෙණ එම් කියා මා එතනෙක් රාජ්‍යය් පියානන්වහන්සේට වේවයි මලනුවන්ට වේවයි පාවාදීලීම්හම් නැවත ඇර ගැන්ම ආයාසවේදැයි සිතා මැතියන් සීලවතීදේවීන් සමීපයට ගොස් මැතියන් වහන්ස ධන ධාන්‍යාදීන් හරිතවූ ඇත් ඇණී අස්ඇණී රියබලයයි සිව්රඟසෙනගින් යුක්තවූ පඤ්චකකුධභාණ්ඩයන් ඇති සිඵලු උපභොග පරිභොග වස්තුවෙන් සමෘඩවූ මේ රාජ්‍යය ප්‍රභාවතී කැඳවානෙණ එතනෙක් පාවාගතමැනවැයි මැතියන්ට කියා අවසර ඉල්වූහ.

එබස් අසා බිසෝ බියපත්ව පුත ස්ත්‍රීහු නම් නොයෙක් වඤ්චා දනිති යනාදීන් අවවාද කියා මගදී අනුභවකරණ පිණිස අනගිරසයෙන් යුක්තවූ රාජ භෝජනය රන්මුඩමක පුරාදුන්හ. එසඳ මහබෝධිසත්ත්වයෝ මැතියන් තුන්යලක් පැදකුණුකොට පසඟපිහිටුවා වැඳ ජීවත්ව උහිම්තම් සැපසේ අවුත් දකිනෙම් වේදැයි කියා අවසර ඉල්වාගෙණ ශ්‍රීයහන් ගබඩාවට වැද දුහුමුගුරු අඩයටි කඩු කොන්ත යන පඤ්චායුධ සන්නද්ධව ගෙණ බත්මුඩම හා සමග කහවණුදහ සකුන් පසියෙහි ලාගෙණ කොකනද නම් වීණාව අතින්ගෙණ නුවරින් පිටත්ව මගට පිළිපන්ව මහත්වූ බලවීර්‍යය ඇති මහාබොධිසත්ත්වයෝ එදවස් දවල් බතට පණස්යොදුන් මගගෙවාගෙණ ගොස් බත අනුභවකොට පස්වරුභාගයෙහි තුබූ පණස්යොත්න ගෙවා ගොස් සවස්වේලෙහි සාගලනුවරට වන්හ. බෝධිසත්ත්වයන් එනුවරට වන්කෙණෙහි ප්‍රභාවතී උතස්නෙහි ඉඳ නොගී යහනෙන් බිමට බැසපුවා. එකල නුවරට වැද විඩාපත්ව යන්නාවූ බොධිසත්ත්වයන් දැක එක්තරා ස්ත්‍රියක් තමාගේ ගෙට කැඳවාගෙණගොස් ඉඳිනා අසුන්දී පයසොඩවා, සැතපී හුන්කල්හි බත්මාලු සපයා අනුභවකරවූය. එසඳ සතුටුවූ මහාබොධිසත්ත්වයෝ රන්මුඩම හා සමග කහවණුදස ඒ ස්ත්‍රියටදී ගෙණගිය පඤ්චායුධය එම ගෙයි තබා මා ගොස් ආයුතු තැනෙක් ඇතෙයි කියා වීණාව අතට ඇර ගෙණ ඇත්හලට ගොස් මේ රාත්‍රියෙහි සැතපෙන තෙනක් දෙව්නම් තොපට වීණාගායනා කෙරෙමි කියා ඇත්ගොව්වන් විසින් අනුදන්නාලදුව එක්තෙනක වැදහෙව මදක් නිදා පිබිද ගමන්විඩා සන්හිඳුවාගෙණ වීණාව නත් සරහා සියළු නුවර වාසී සත්ත්වයෝ මේ අසත්වයි සිතා ගීකියමින් වීණාගායනා කරන්නාහ.

එකල්හි බිමවැදහොත් ප්‍රභාවතීද ඒ ශබ්දය අසා මේ අනික් කෙණෙකුන්ගේ වීණාශබ්දයෙක් නොවෙයි ඒකාන්තයෙන් කුසරජ්ජුරුවන්වහන්සේ මා නිසා මේ නුවරට ආසේක්මයයි දන්නාහුය.

මදුරජ්ජුරුවෝ වීණාශබ්දය අසා ඉතා මිහිරිකොට ගායනාකරන්නේය. සෙට ඔහු කැඳවා ගායනාකරන්ට උවමැනවැයිසිතූහ. බොධිසත්ත්වයෝ මෙතන විසීමෙන් ප්‍රභාවතීන්දක්ක නොහැක්ක එහෙයින් අසථානයයි උදෑසනක්සේම ඇත්හලින් නික්ම සවස බත් අනුභවකළ ගෙත්ම පෙර බත් අනුභවකොට වීණාවගෙයි තබා මදුරජ්ජුරුවන්ගේ මගුල් කුඹලාගෙට ගොස් ඕනට අතවැසිව එකදවසින්ම මැටිගෙණහැර ආචාරීනි වලන් කෙරෙම්දැයි විචාරා එසේය කළමැනවයි කීසඳ මැටිපිඩක් හැරගෙණ සකෙහි තබා සක කරකැවූහ. එකවිට කරකවනලද ඒ සක ඉරමුදුනට එනතෙක්ම කරකැවිත මහාබොධිසත්ත්වයෝ නොයෙක් ප්‍රකාර ඇති කුඩා මහත් බොහෝවලන් රූතග කොට මේ රූ ප්‍රභාවතීන් විනා අනික් කව්රුත් නොදකිත්වයි අධිෂ්ඨාන කළාහුය.

මෙලෙසින් වලන් උකා වියළා පලහා කුඹල්හල පිරූය. එසඳ කුඹල් දෙටුවා නොයෙක් විසිතුරු අත්කම් දක්වා කරණලද වලන් ගෙන්වාගෙණ ගොස් රජ්ජුරුවන්ද්‍ක්විය. එකල මද්‍රරජ්ජුරුවෝ තුටුටුවීරුම වලන් දුක සතුටුව මේකලෝ කවුරුදැයි විචාරා කුඹලා විසින් මමය ස්වාමීනි කීකල්හි තොපගේ කර්මාන්ත මම නොදනිම්ද නොවලහා කියවයි තරව විචාළසඳ දෙව යන්වහන්ස මාගේ අතවැස්සා විසින් කරණලදැයි කීය. එඹල ඒ තට අතවැසි කමට නිසි එකෙක් නොවෙයි ඇදුරුකමට නිස්සෝය තෝ මෙතැන්පටන් උන් ගෙන් සිල්ප උගණුව තවද එතෙම මෙතැන්පටන් මාගේ දරුවන්ට කෙළි වලන් කෙරේවයි නියෝගකොට මේ ඕහට දෙවාලවයි බොධිසත්වයන්ට රන් මසුදහසක් යවා මේ කුඩාවලන් දරුවන්ට දෙවයි යවූහ.

කුඹලාද ඒ වලන් ඇරගෙණ අන්තඃපුරයෙට ගොස් කෙළිවලන් ගෙණාමිකියා යවූයේය එබස් අසා රාජකුමාරිකාවරු එනතට රුස්වූය ඒ කුඹලා විසින් වලන් බෙදනසඳ බොධිසත්වයන්ගේ ආනුභාවයෙන් ප්‍රභාවතීන් උදෙසා රූතගා කරණලද වලන්ම උන්ට දින. එසඳ ප්‍රභාවතී ඒ වළන්වල මහා බොධිසත්වයන්ගේ හා තමන්ගේ හා කුදගේ රූදුක මේ අතික්කෙණකුන් විසින් කළදෙයෙක් නොවෙයි කුසරජ්ජුරුවන් විසින්ම කරණලදැයි ස්පී මෙයින් මට ප්‍රයෝජන නැත. කැමතිකෙණකුන්ට දීපියවයි කිවූය එසඳ උන්ගේ නගුන් කිපිබව දුන මේ කුසරජ්ජුරුවන්වහන්සේ විසින් කළදෙය කැයි සිතච්ද මේ කුඹලා විසින් කළාය ඇරගණුවයි යනාදීන් කිවූය ඒ ප්‍රභාවතී තොම කුසරජ්ජුරුවන් එනුවර ගියබවද ඒවලන් උන්විසින් කළබවද ඔවුන්ට නොකීව. ඉක්බිති කුඹලා රජ්ජුරුවන්ගෙන් යවතලද මසුදහස ගෙණගොස් බොධිසත්වයන්ටදී සබද රජ්ජුරුවන්වහන්සේ නොපට සමාධිවූයේක මෙතැන් පටන් රාජකුමාරිකාවරුන්ටම තෙපි වලන් කරව මම ඒ ගෙණගොස්දෙමි කීයේය. ඒ අසා බොධිසත්වයෝ ප්‍රභාවතීය් මෙතනවසාන් දක්ක නොහැක් කැයි සිතා ඒ මසු දහස ඕහටමදී එතනින් ගොස් රජ්ජුරුවන්ට මගුල්මෙහෙ කරණ තලකරුවා ළඟට ගොස් ඕහට අතවැසිව තල්වැටක්කොට එහිම ජේස තය, රාහලය, රා ඔබමගෙනසිටි ප්‍රභාවතීන්ගේ රූපය යනාදී විසිතුරුවූ අත් කම් දක්වූය. තලකරුවා ඒ තල්වැට ආදී බොධිසත්වයන් විසින් කරණ ලද කර්මාන්ත විශෙෂය ගොස් දක්වීය.

රජ්ජුරුවෝ ඒ කර්මාන්ත විශෙෂයදුක මෙතල්වැට ආදිය කවුරුන් විසින් කරණලද්දේදැයි යනාදීන් පෙර පරිද්දෙන් විචාරා මසුදහසක්දී මෙතල් වැට ආදිය මාගේ කුමාරිකාවරුන්ට දෙවයි නියොග කළහ. ඒ කර්මාන්තයන් බෙදුදෙන තලකරුවාද බොධිසත්වයන් විසින් ප්‍රභාවතීන් උදෙසා කරණලද තල්වැට උන්ටම දුන්නේය. එසඳ ප්‍රභාවතී ඒ විසිතුරු රූපයන් දුක කුස රජ්ජුරුවන් විසින් කරණලද බව දුන කැමති කෙණෙක් ඇරගණුවයි බිමට දමූව ඒ දුක ඉතිරි කුමාරිකාවරුන් වෙහෙසතලද තලකරුවා රජ්ජුරුවන් විසින් දෙනලද මසුදහස ගෙණගොස් බොධිසත්වයන්ට දුන්නේය.

ඉක්බිති බොධිසත්වයෝ මෙයින් මට අසථානයයි සිතා ඒ රන් ඕහට දී එතනින් ගොස් රජ්ජුරුවන්ගෙ මාලාකාරයාට අතවැසිව නොයෙක් ප්‍රකාර ඇති මල්පණී ගොතා ප්‍රභාවතීන් පිණිස නොයෙක්රුවින් විසිතුරුකොට මල්

සුඹුලක්ද කලාහුය මල්කරුවාත් ඒ සියල්ල හැරගෙණගොස් රජ්ජුරුවන්ට දුන්නේය.

රජ්ජුරුවෝත් විශෙෂ කර්මාන්තය දක මේ ගෙතුවෝ කවුරුදයි විචාරා දේවයන්වහන්ස මා විසිතැයි කීකල්හි තොපගේ මල්ගෙතීම අපිතොද නුමෝද මේ ගෙතුවන් කියවයි තරයේ විචාරණ ලද්දේ අතවැස්සා විසින් ගොතන ලදයි කීයේය. එබස් අසා රජ්ජුරුවෝ එතෙම අතවැස්සෙක් තොවෙයි තොපට ඇදුරුකමට නිසිය ඔහු කෙරෙන් මල් ගෙතීම ඉගෙණගණුව ඔහුලවාම මෙතැන්සිට මාගේ දරුවන්ට මල්ගොතාලවයි සතුටුව මසුදහසක්දී මෙමල්කම් දරුවන්ට දෙවයි යවූහ.

ඒ මල්කරුවාද බොධිසත්වයන් විසින් ප්‍රභාවතීන් උදෙසා රූතගා කරණලද මල්සුඹුල උන්වම දුන්නේය ප්‍රභාවතීද ඒ මල්සුඹුලෙහි කුසරජ්ජුරුවන්ගේ හා තමන්ගේ හා තොයෙක් රූ දක කුසරජ්ජුරුවන් කළබව දැන කිපී බිමට දමූව. තෙපු තගු පෙරපරිද්දෙන්ම වෙහෙසූය. මල්කරුවාද මසුදහස ගෙණගොස් බොධිසත්වයන්ටදී එපවත් කීයේය. බොධිසත්වයෝ මෙයින් මට අසප්‍රතයයි එරත් ඕහටදී එතනින් රජ්ජුරුවන්ගේ අරක්කැමියා කරාගොස් ඕහට අතවැසිව දවසක් අරක්කැමියා රජ්ජුරුවන්ට මේවඩාගෙණ යමින් තමහට පිසන පිණිස බොධිසත්වයන්ට ඇටමුසු දඩමසක් අප දීලාගියේය බොධිසත්වයෝද ඒ ඇටය පිසපූය, මුළුනුවර සුවඳ පැතිරෙණසේ දුම්කරවූහ. එසඳ රජ්ජුරුවෝ සුවඳ අසා කිමෙක්ද මූළුතැන්ගෙයි අතික් මාළුවකුත් පිසද්දයි විචාරා අරක්කැමියා විසින් දෙවයන්වහන්ස අනික්පිසන මාළුවෙක් තැත් තේය. එතකුදු උවත් ඇටමුසු මසක් අප ඇමට පිසනලෙස අතවැස්සාටදීලා ආමීයි එහිසුවඳ වියයුතුයයි කීසඳ රජ්ජුරුවෝ ඒ ගෙන්වාගෙණ ඉන් සුහක් අනුභවකොට බැලූය එකෙණෙහි එහි රස සත්සියයක් පමණ රසනහරවල පැතිර සිටියේය. රජ්ජුරුවෝ එරසතෘෂ්ණාවෙහි බැඳී ඕහට මස්සෙන්දහසක්දී මෙතැන්පටන් තොපගේ අතවැස්සා ලවා මටත් මාගේ දරුවන්ටත් බත් මාළු පිස මාදරුවන්ට ඔහුවිසින් ගෙණදෙන්ට කියව තෝ අපව ගෙණෙවයිනියෝග කෙළේය. අරක්කැමි ගොස් බොධිසත්වයන්ට කීයේය. එබස් අසා බොධිසත්වයෝ දැන් මාගේ මනොරථය මස්තකප්‍රාප්තව ගියේයයි සතුටුව මෙතැන් පටන් ප්‍රභාවතීන් දකිම් සිතා ඕහට රන්දහසදී දෙවන දවස් බත්මාළු පිස රජ්ජුරුවන්වදී අරක්කැමියා අත යවා රාජකුමාරිකාවරුන්ට ගෙණයනවසුන් කද තුමූ හැරගෙණ ගොස් ප්‍රභාවතීන්ගේ මාලිගාවට තැංගේය. එසඳ ප්‍රභාවතී වසුන්කද ගෙණයන බොධිසත්වයන් දක මූන්වහන්සේ තමන්වහන්සේට තුසුදුසුව වහල් කළමනාදෙය කරණසේක ඉදින් මම දවස් ගණනක් බැණ නොදී නිතිම්නම් මූ මා කැමැත්තෝවතැයි සිතා අන්තෙතකට ගොස් මාදක මෙහි වාසයකරණසේක එනොකොට මෙහි ඇසිල්ලකුත් නොරඳා යනසැටියෙ බැණදෙඩා නික්මවමි සිතා දෙර අඩවලකොට ගෙණගොස් එක්අතකින් දෙර අල්වාගෙණ අගුළුකතුවේ වැතිරසිට කුසරජ්ජුරුවන්වහන්ස මෙබඳු වූ කාරියක් ඉදින් ජීවිතය යෙතමුත් නොකරණසේක එතකුදුවූවත් මා නිසා උදෑසනය සවසය මධ්‍යම රාත්‍රිය මධ්‍යාහ්නය යන විභාගයක් නැතිව දියදර සැපයීම් පිසීම් පෙවීම් ආදී හීනක්‍රියාවෙන් හා දුර්භොජන දුක්ඛසෙය්‍යාවෙන් දවස්

සවමින් මෙහි සිට දුක්නොවිඳ නුඹවහන්සේගේ කුසාවතී නුවරටම නැගීගොස් මා කෙරෙහි සිතිවිල්ලක් නොසිතා නුඹවහන්සේ වැනි සකුරු පුවක්සේ දැහැලී ගිය මුහුණුඇති යකින්නක අගමෙහෙසුන්කොටගෙණ රාජ්‍යය කළමැනව ඉදින් විරූපවූ නුඹවහන්සේ කොතෙක්කල් මි ඉඳ දුක් උනත් මම නොකමැත් තෙම් නොරඳා වහා නික්මුණුමැනවයි කිවුය. එකල්හි මහාබොධිසත්වයෝ ප්‍රභාවතීන්ගෙන් මෙච්චර කථාසම්භාෂණයක් ලදිමියි සතුටුව මුවපොල්ලත්ට බඳුවූ ඇස්ඇති හෙමාභරණ විභූෂිත ගාත්‍රඇති මනාවූ කටිප්‍රදෙශ ඇති අත්ක මින් විසිතුරුවූ වස්ත්‍රයෙන් සොභමානවූ දෙහ ඇති ප්‍රභාවතීනි නොපගේ රූප සෞන්දර්‍ය්‍යයෙන් පැහැරගන්නාලද සිත් ඇති ක්ලේශාන්ධකාරයෙන් වසනලදුව දික්විභාගයෙහි අසමර්ථහෙයින් කුසාවතීනම් රාජධානියට යානොඑම් ඒ රාජ්‍ය ශ්‍රීයෙන් මට ප්‍රයෝජන නැත්තේය මෙරටම වාසයකරමි කීහ.

බොධිසත්වයන් විසින් මේලෙස කීකල්හි මූ විපිලිසරව නැගීයෙති පරිභවකොට කියමින් සිටියදීම මා කෙරෙහි ඇලීම කථාකෙරෙති ඉදින් මූ මම කුසරජයයි අවුත් මා අත අල්වාගත්තුනම් කවුරු වලකත්දැයි ගෙට වැද දොර අගුළුගත්තුය.

බොධිසත්වයෝද වස්න හැරගෙණ ගොස් සෙසු රාජකුමාරිකාවරුන් බත්කැවූහ. ඉක්බිති ප්‍රභාවතී කුසරජ්ජුරුවන් විසින් සපයනලද ආහාරය ගෙණෙවයි කුදව විධානකොට ගෙන්වාගෙණ මේ බත් අනුභවනොකෙරෙමි නොප ලත් බත් මට දීපියා මේ බත් නොපි කාපියව කුසරජ්ජුරුවන්වහන්සේ මෙනුවරට ආ බව කාටත් නොහඟවවයි කිවුය එතැන්පටන් කුදන් ප්‍රභාවතීන්ගේ බත් කොටස තුමූ අනුභවකොට තමන්ගේ බත් ප්‍රභාවතීන්ට දෙන්නීය.

කුසරජ්ජුරුවෝ එතැන්පටන් ප්‍රභාවතීන් නොදක්නාහුය මාකෙරෙහි ප්‍රභාවතීන් ස්නෙහ ඇති නැති බව පරීක්ෂා කෙරෙමිසිතා එක්දවසක් රාජ කුමාරිකාවරුන් බත් කවා වලන් කදගෙණ යමින් ප්‍රභාවතීන්ගේ දොර සමීප යෙහි අඩි ඇන වලන් අඩවා පැකිල වැටිගී කෙඳිරිගාමින් ඔත්තාහුය. එකල ප්‍රභාවතී බොධිසත්වයන්ගේ කෙඳිරිගැවිලි අසා ගෙයි දොර ඇර බලා කද කර තබාගෙණ වැදහොත්තවුන් දැක මූන්වහන්සේ මුළුදඹදිවට අග්‍රරාජන්සේක. මානිසා රැදුවල් දුක්විඳිමින් සිව්මැලි බැවින් වසුන් කද බරින් මැඩී වැටී ගිය සේක. ඉදින් අමුත්තෙක් වීන්නම් මට මිටවඩා වැරැද්දෙක් නැත ප්‍රාණය ඇද්ද නැද්දැයි පරීක්ෂාකෙරෙමියි සිතා හය ගෙණගෙන් පිටත්ව බොධිසත්ව යන්ගේ සවාසය පරීක්ෂාකරණු පිණිස නැඹුරුව මුහුණ බැළුව එසඳ කුසරජ්ජු රුවෝ කෙලකටක් පුරාගෙණ ප්‍රභාවතීන් මුහුණට දැමූහ. එකල ප්‍රභාවතී බැණ දෙඩා ගොස් ගෙට වැද දොර අඩවලු කොට රජ්ජුරුවන්වහන්ස යමෙක් විරූපීව රූ ඇත්තන් ප්‍රාර්ථනාකෙරේද නොකමැති කැමතිවේද ඔහට අවැඩ වන්නේය යනාදීන් ප්‍රභාවතීන් විසින් නොයෙක්ලෙස බැණ දෙඩා පරිභව කළත් බොධිසත්වයෝ උත්කෙරේනොකලකිරී එඹා ප්‍රභාවතීනි මේ ලෝකයෙහි යම් පුරුෂයෙක් ලොකසවාදරතිවශයෙන් තමානොකමැතිවූද කැමතිවූද ස්ත්‍රිය ගෙන් දර්ශනය සපර්ශය සම්භාෂණය සම්භොගයයි යන මෙයින් එක්තරා

සන්තොෂ කාරණයක් ලැබද එසේ ලබනලද ලාභය මහාවූ ලාභයකැයි ප්‍රශංසාකරම්හ. තමා නොකමැතිවත් ස්ත්‍රිය කෙරෙන් ප්‍රීතියක් නොලැබීම නපුරුවන්නේය එහෙයින් තොපගේ දශීතලාභාදී ඓශ්වර්‍ය්‍යී විඳිමින් මෙහිම වාසයකෙරෙම් කීහ.

බොධිසත්වයන් මෙලෙස කී කල්හිත් ප්‍රභාවතී මදකුත් පසුනොබැස තදකොටම කියා මොහු පලවම් සිතා මඳකුත් ස්නේහරතිවශයෙන් නොකමැත්තාවුන් මා කෙරෙහි පිළිබඳ සිතින් කැමතිව යන්නාවූ තෙපි පිපාසාවෙන් පීඩිතව බොළඳකමින් කිහිරි උලක් ඇරගෙණ ගල්පොත්තක් කැන පැන්හැර ගන්නා කැමතියක්හුද සම්යෙන් පීඩිතව දලක් බැඳ සුලන් රඳවන්නක්හු හා සමානය යනාදීන් තදපරුෂ බස් කියා දෙඩුව.

එබස් අසා කුසරජ්ජුරුවෝ මනොඥවූ අංගප්‍රත්‍යංගාදී ස්ත්‍රීසෞභාග්‍ය යෙන් යුක්තවූ ප්‍රභාවතිනි අනෙක කෝටි වාටු නාටකස්ත්‍රීන් හා අනන්ත සාම න්තවක්‍ර මෞලිමාලලාලිත පාද පීඨ ඇති රාජ්‍යශ්‍රීද හැර පෙර තොප කෙරෙහි බැඳුනු සිතින් තොරටට පැමිණ දුක්විඳිමින් තොප හා සමග ප්‍රෙමාන්විතවූ කථා සම්භාෂණ මාත්‍රයකුත් නොලද්දවූ මම භාවභාව ලීලාකටාක්‍ෂ නිරීක්‍ෂණ මන්‍දස්මිත මධු මධුරභාෂිතාදි සෞභාග්‍යයෙන් යුක්ත කොමලාංග ඇති තොපගේ ලය ගලකින් කරණලදැයි සිතමි. තවද ප්‍රභාවතිනි තෙපි යම් පමණ කලක් කොපයෙන් රූෂටව බලන්නීද ඒතාක් මදුරජ්ජුරුවන්ගේ මේ භවනයෙහි දුක්විඳිමින් අරක්කැමිව වාසයකෙරෙම් යම්කලෙක්හි සිතාපනල කර ස්නිග්ධවූ නිරීක්‍ෂණයෙන් සතුටුව බලන්නෙහිද එකල චිත්තසන්තාපයන් දුරුකොට රාජ්‍යශ්‍රීයට පැමිණියාක්මෙන් වෙමි එහෙයින් සොඳුර මෙතැන් පටන් මෙබඳුවූතද බදකම් නොකරව යනාදීන් යාච්ඤාව කීවාහුය. එබස්අසා ප්‍රභාවතීතොම මෙතෙම විඳුරුමලාවෙහි බැඳුනු වානරයක්හු පරිද්දෙන් මා කෙරේ ඉතා ශක්තව කියන්නේය. උපදෙසකින් බොරුවක් කියා මෙසින් නික්මවම් සිතා මහරජ කුසරජ්ජුරුවන් වහන්සේ මට ස්වාමිවනසේක්ද නොවනසේක්දැයි නිමිත්තවිචාළනෙන ඒ නිමිත්තපාඨකයෝ නුඹවහන්සේසත් කඩක්කොට කැපූවක් උන්වහන්සේට අගමෙහෙසුන්වන්නේනැතැයි තරයේම කිවූය එහෙයින් නොයෙක් කාරණයෙන් නොකමැතිවූ මානිසා දුක්නොවිඳ නුඹවහන්සේගේ රටටම පලාගියමැනවැයි කිවූය. ඒ අසා කුසරජ්ජුරුවෝත් ඔවුන්ට කීබස් ප්‍රත්‍යූත්තරයෙන්ම පසුබස්වමින් සොඳුර මාවිසිනුත් නිමිත්ත විචාළනැන මාගේ රට නිමිත්ත පාඨකයෝ තොපවිනා උන්ට වල්ලභකෙනෙක් නැත්තාහයි තරයේම කිවූය. එකී නිමිත්තයෙනුත් මාදුටූ කාරණයෙනුත් මා විනා තොපට අනික් වල්ලභකෙනෙක් නැත. ඒ කාරණයෙන් තොපගේ තද මත් හැරපියවයි කීහ.

ප්‍රභාවතී කුසරජ්ජුරුවන්ගේ බස් අසා කවරලෙසකිනුත් මූත් ලජ්ජා වට පමුණුවාගත නොහැක්කේය යේවා නොයේවා මූගෙනුත් මට කාම් කිම්ද සිතා දොර අගුළු ලාගත්තුය. එකල බෝධිසත්වයෝ වලන්කද කරතබාගෙණ පලාගියාහුය.

එතැන්පටන් දකුමුත් නැතිව අරක්කැමිකම් කරමින් දුඹුලුව විසූ සිල් බත් කමින් බත්නිවන ඔරුවපිට සයනයකෙරෙමින් දරපලමින් පැන් ගෙණෙ

මිත් වලත් සෝදමින් උදෑසන කැඳ අවුළු දුවල බත් මාළු අවුළු පිසගෙණ
ගොස් කවමින් පොවමින් මධුරන්න පාන වස්ත්‍රාභරණාදියක් නැතුව කාම
තෘෂ්ණානුරාගයෙන් බැඳී බොහෝ දුක් විඳිමින් එක්දවසක් මුළුතැන්ගෙය
මිදුලෙන් යන්නාවූ කුදු දූක කැඳවා ප්‍රභාවතී කෙරෙහි භයින් නොඇසූකන්ව
යුහුවව යන සඳහාගොස් ඈ රඳවා කුද තොසිත් තීගේ සාමිදුවමෙන් තදව
ගියෙහිය. මෙතෙක් දවස් මුළුල්ලෙහි තොප හැම සමීපයෙහි වැසුව දුක් විචා
රීම් විවරකුත් නොලදුම්හ. සෙසු ලාභයෙක් කැළමවේද? එතකුදු උවත් ප්‍රභාව
තීන්ගේ තද මත්අරවා දක්වාලිය එව්දූයි විචාළීය. ඒ අසා කුදින් යහපතැයි
කීව එකල බොධිසත්‍වයෝ සතුටුව ඉදින් ඇත්සොඬක්මෙන් ක්‍රමොන්නතව
මටසිලුටුවූ ඌරුයුගලයක් ඇති ප්‍රභාවතී තොම තොපසමවායෙන් ප්‍රේමදෘෂ්ටි
යෙන් මා බැලූතම් වේවයි මහා සන්තොෂයෙන් යුක්තව ප්‍රියකථාවක් කළා
තම් වේවයි නොයෙක් ස්නේහයෙන් මන්දස්මිතයෙන් පවත්වා මා සෙවාපූනම්
වේවයි නවද මාදූක සතුටුව මා හා සිතාගේ යුතතව බැලුම් තම් වේවයි ඉදින්
තරුණාකීරශ්මින් ප්‍රවිකසිත සරසිරුහ සොඳර සමෘදු කොමලපාණී පල්ලව
යෙන් මාගේ ශරීරය ස්පර්ශකළාතම් සැපසේ මාගේ කුශාවතී නුවරට ගොස්
වත් දවස්ම මෙතිගේ කුද හැරයන පරිද්දෙන් හාර කෙයූර කනක කටක
නූපුරරසනා තැලි මුදු ආදී සර්‍වාභරණයෙන් තී සරහාලම් තෙපි ප්‍රභාවතීන්ට
කාරණා කියා මාගේ වසයට පමුණුවාලවයි කීන.

කුදුත් බොධිසත්‍වයන්ගේ බස්අසා දෙවයන්වහන්ස නුඹවහන්සේ
සැකයක් නොසිතුව මැනව කීපදවසකින් උන් නුඹවහන්සේගේ වසයට පමු
ණුවා මාගේ සාමාර්ථ්‍යය දක්වාලමියි බොධිසත්‍වයන්ට කියා නමා ගියකායයීය
සමෘද්ධකොටගෙණ ප්‍රභාවතීන් කරාගොස් උන්ගේ ගෙය කසළ අරින්නියක
මෙන් යටත්පිරිසෙයින් ගසාලන්ට නිසි කැටක් විවරකුත් ගෙයි නොතිබා
වනන් පටන් සියල්ලම දොරලා ගෙය හැමද කසළදමා දොරට පිටලා එළිපත්
පඩියගාවා උස්පුටුවක්ලා ඊට මිටිව ප්‍රභාවතීන්ට අස්නක් පණවා දියනියෙනි
මෙසේ අවමැනව ඉස බලම්නයි ප්‍රභාවතී මිටි අස්න පුටුවෙක ඉඳුවාගෙණ
තොමෝ උස්පුටුවෙක තමාගෙ දනදෙකින් උන්ගෙ ඉස වහල්කොටගෙණ
මදක් ඉසනියගා අනේ මුන්ගෙ ඉස උකුණෝ බොහොව ගියෝයයි කියමින්
තමාගේ ඉසින් උකුණන් හැරගෙණ ප්‍රභාවතීන්ගෙ අත්ලෙහිලා තොපගේ
ඉස උකුණන්ගේ විවර බලවයි යනාදීන් නොයෙක් කථාකොට බොධිසත්‍ව
යන්ගෙ ගුණ කියමින් මේ ප්‍රභාවතී තොමෝ කුසරජ්ජුරුවන්ගේ නුවර වසන
සමයෙහි එකුශරජ්ජුරුවන් වහන්සේගෙන් අන්නපාන වස්ත්‍රාභරණගන්ධමාලා
තාම්බූලාදී කිසි සත්කාරයකුත් මුත් නොලදූයි සිතමි කාරණා කිමයත් ස්ත්‍රීනු
තම් එක දවසකුත් ඇකයෙහි වැතිර ඔත් සවාමිපුත්‍රයාගේ සිත් නොකලකිරු
වති මේ කුසරජ්ජුරුවන් වනාහි අරක්කැම්ව තොප නිසා රජ්‍යශ්‍රීය හැර
අවුත් බැලමෙහෙකොට දුක් විඳිමින් සිටියදීත් සුවදුක් විචාරීමකුත් නොකරව
ඉදින් උන්වහන්සේ කෙරෙහි ස්නේහය නැතත් මුළු දඹදිවට අග්‍රරාජන්වූ මේ
කුසරජ්ජුරුවන්වහන්සේ මා නිසාම දුක්ගන්නාසේකැයි දූන උන්වහන්සේට
කිසි සත්කාරයක් කරන්ට උවමැනවයි කීව. එබස් අසා ප්‍රභාවතී කිපිසඳ කුදත්
නැගීසිට ප්‍රභාවතීන් කරවිය අල්වා ඇතුළුගෙටදමා තොමෝ පිටත්ව දොරවසා
දොර අදිනාලදුව ඈද අල්වාගෙණ පින්මඳ නොකීකරු තෙනැත්තිය තීගේ

රූව කාට කුමක් කෙරේද අපි තොපගේ රූපයෙන් කා බී රැකෙන දෙයෙක් ඇද්ද යනාදීන් දෙඩා බෝධිසත්ත්වයන්ගේ ගුණ වර්ණනා කෙරෙමින් නෙල ප්‍රභාවතිය අංරොහ පරිනාහයෙන් යුක්තවූ සිඩාංගනා ප්‍රතිභාගවූ විශිෂ්ටවූ රූ ඇත්තෙමියි තිගේ රූප සෞන්දර්‍ය්‍යයී හා ඒ රාජාධි රාජවූ කුසරාජෝත්තමයන් හා සමානකොට නොසිතව කුසරජ්ජුරුවන්වහන්සේ අපරිමිත බලවාහනද මහානුභාවද මුක්තාමාණික්‍ය සංඛසිලාප්‍රවාල කනක රජතාදි මහාධන ඇතිසේක තිමද ගලිත හස්තිරාජයෙකු පරිද්දෙන් කිසිවක්හු විසින් වැලකියනොහැකි කායබල ඇතිසේක. අන්නපාන වස්ත්‍රාභරණ ග්‍රාමක්ෂෙත්‍රාදී සියළු උපභොග පරිභොග වස්තුවෙන් සමෘඬවූ කාශිකොශලාදීවූ බොහෝ රාජ්‍යයට අධිපතිසේක. සකලජම්බුද්වීපයෙහි අනන්තරාජධානිවල ඒ ඒ රජදරුවන්ට අග්‍රරාජන්සේක ශත්‍රුජනනමැති මත්තහස්තීන් මධ්‍යයට වන් සිංහරාජයෙකු පරිද්දෙන් අභීත්‍ර සිංහනාද ඇතිසේක කුරවිකෙවිල්ලන්ට බඳුවූලීලොපෙත ගීතස්වර ඇතිසේක ගම්භීරොදාර මධුරශ්‍රවනීය්‍ය කමනීය්‍ය ප්‍රත්‍යනීය්‍ය මධුරස්වර ඇතිසේක ස්වයම්භූඥානයෙන් ප්‍රතිවෙධ කරණලද අක්ෂර ලිඛිත ගණිත ගාන්ධර්වාදීඅෂ්ටාදශ විද්‍යාස්ථානාදී අනෙක ශත ප්‍රභෙද ශිල්පයන් ඇතිසේක උභය කුල පරිශුඩ අත්‍යා සාධාරණ සුභගුණ මණිගණාකීර්ණ ඉක්ෂ්වාකුවංශ සම්භූතවූ කුසරජ්ජුරුවන්වහන්සේගේ ඇති ගුණ සලකා තොපගේ රූ ඇත්තෙම් යන තද මත් හැර උන්වහන්සේ කෙරෙහි සිතිදස පතුරුවාලවයි යනාදීන් බෝධිසත්ත්වයන්ගේ නොයෙක් ගුණ කියා අවවාදකළාය.

ඉක්බිති එබස් අසා ප්‍රභාවතීතොමෝ කෝපයෙන් දිලිහී කුදනෝ තිගේ පමණ නොදන ගර්ජනා කරන්නෙහිය අනට පැමිණියාවිනම් ස්වාමිදරුවන් ඇතිතියාව අඳුන්වාලමි යනාදීන් කියා කුද භයගැන්වූව, එසඳ කුදුන් එඹල තී රක්නා නිසා මෙතෙක්දවස් මුළුල්ලේ කුසරජ්ජුරුවන් මෙනුවරට ආනියාව තොපගේ පියානන්වහන්සේට නොකීම් වන්නාට අදදවස් රජ්ජුරුවන් වහන්සේට කියා තිව තිහඩ කියවන්නෙම් වේදැයි මහත්කොට කියා උන් භයගැන්වූව, ප්‍රභාවතී එසඳ භයින් වෙවුලා මැතියෙනි එසේ නොකියව මැනවැයි කියා කුද අස්වැසුව.

මහාබෝධිසත්ත්වයෝද ප්‍රභාවතීගේ දැකුමුත් නොලැබදුබෙහොජන දුකඛ සෙය්‍යාදීන් සත්මසක් මුළුල්ලෙහි දුක්විඳත් මැගේ දැකුම් විවරත් නොලබමි ඉතා තදපරුෂ ගත් හැඟිවූ මැගෙන් මට ප්‍රයෝජනකිම්ද මාගේ රටට ගොස් මව් පිය දෙදෙන දැක වාසය කරමියි සිතූහ.

එසඳ මනුෂ්‍යලොකය බැලූ ශක්‍රදෙවේන්ද්‍රයෝ කුසරජ්ජුරුවන් සත් මසක් මුළුල්ලෙහි දුක්විඳත් ප්‍රභාවතීන් දැක්කනොහී උකටලීවූ නියාවදැක ඇලැබෙන්ට කිසි කාරණයක්කෙරෙම් සිතා මදුරජ්ජුරුවන්ගෙන් ගිය දූතයන් බඳුකොට ප්‍රභාවතීතොම කුසරජ්ජුරුවන් හැරගොස් පියා පලාඅවුය වහා අවුත් උන් කැඳවාගෙණ යවයි සත්රජ්ජුරුකෙණෙකුන්ට වෙන වෙනම පත් අහුන් ඇතිව දූතයන් යවූහ. ඔවුන් දැක රජ්ජුරුවෝ සතුටුව වෙන වෙනම සිය සෙනඟ පිරිවරා සාගල නුවරට අවුත් වටලාගෙණ උනුන් දැක තොපි කුමක්නිසා අවුද තොපි කුමක්නිසා අවුදැයි ඔවුනොවුන් විචාරා ප්‍රභාවතීන් නිසා මදුරජ්ජුරුවන් විසින් කැඳවා යවූහෙයින් ආම්හයි යනු අසා මෙතෙම

තමාගේ එක දුව අප සත්දෙනාටම දේල මුගේ නොකටයුත්තක් බලව අප වෙහෙසුයේයයි දණ්ඩඝාතවිෂඝොර සජීයන් පරිද්දෙන් කිපී වෙත වෙතම අපට ප්‍රභාවතීන් හෝ දෙව යුධ හෝ සරවයි පත්අසුන් යවූහ.

ඒ අසා මද්දුරජ්ජුරුවෝ බලවත් භයපත්ව අමාත්‍යයන් කැඳවා කුමක් කරමෝද්දැයි විචාළහ. එකල අමාත්‍යයෝ දෙවයන්වහන්ස මේ රජදරුවෝ සත්දෙන ප්‍රභාවතීන් නිසාම අවුහ. ඉදින් නුදුනහොත් පවුරු පදනම් වාසල් බිඳගෙණ නුවරට වැදගෙණ ජීවිතක්ෂයට පමුණුවා රාජ්ජයහැරගණුම්හයි කියා සෙනාව සන්නාධකොටගෙණ යුධාභිමුඛව සිටිනාහ. වදින්නාට පළමුකොට ප්‍රභාවතීන් යවම්හයි කීවාහුයි.

එබස්අසා රජ්ජුරුවෝ එක්කෙණෙකුන්ට ප්‍රභාවතී පාවාදුනුමෝ තම් තෙස්සෝ යුධකරන්නාහ, එහෙයින් එක්කෙණෙකුන්ට දී සත්හිඳවිය නො හැක්ක මුළුදඹදිව අග්‍රරාජත්ව සිටි කුසරජ්ජුරුවන්හැරපියා අංගමනට විපාක දක්වම් මැ සත්කඩක්කොට කපා රජදරුවන් සත්දෙනාට දී පියා ගැලවෙම් වයි කීවුය.

එලෙස රජ්ජුරුවන් කීබස් රාජාංගනය මුළුල්ලෙහි ප්‍රකාශව ගියේය එපවත්ඇසූ පරිවාර ස්ත්‍රීහු ගොස් ප්‍රභාවතීන්ට කීහ. එබස් අසා ප්‍රභාවතී මරණ භයින් පෙරළි හඬමින් උතස්නෙත් නැගී ජාම්බොනද ස්වණීයට බඳුවූරන්වන් පැහැ ඇති රත්කමින් විසිතුරු වස්ත්‍රධාරීව නගුන් හා පරිවාර ස්ත්‍රීන් විසින් පිරි වරණ ලදුව මෑනියන්ගේ ගෙට ගොස් නමස්කාරකොට අඬ අඬා සිට මෑනි යන්වහන්ස මාගේ සඳුන් තුවරලා කස්තුරු කපුරු ආදී සුවඳසුන්නෙන් උලා ඔප්නගතලද ප්‍රියකරුවූ මනා ඇස් සඟලක් ඇති නිම්ලවූ කිසි කැලලක් නැති පෙම්බරවූ දළ කඩම්වූ ඇති කැඩපතින් බල බලා සරහතලද මාගේ මේ මුඛ බිම්බය මේසත් රජ්ජුරුවන් විසින් දමතලදුව වළාතිබෙන්නේවේද!

තවද මෑනියන්වහන්ස බමරවැල සලාමෙන් අක්බඹුරු සිනිඳු මො ලොක් දික්වූ සඳුන් සාන්ද්‍ර ජබාදු ආදීවූ සුවඳ ගන්වතලද මේ මාගේකෙස්වැටිය අමුසොහොන්හි දමත ලදුව උකුස්සෝ ගිජුලිහිණි ආදී පක්ෂි සමූහයෝ නිය යන්වහන්ස මාගේ සඳුන්තුවරලා කස්තුරු කපුරු ආදී සුවඳ සුන්නෙන් උලා ඔප්නගතලද ප්‍රියකරුවූ මනා ඇස් සඟළක් ඇති නිම්ලවූ කිසි කැලලක් නැති පෙම්බරවූ දළකඩම්වූ ඇති කැඩපත් බල බලා සරහතලද මාගේ මේ මුඛ බිම්බය මේ සත්රජ්ජුරුවන් විසින් දමතලදුව වළා තිබෙන්නේ වේද!

තවද මෑනියන් වහන්ස බමර වැලසලාමෙන් අක්බඹුරු සිනිඳු මොලොක් දික්වූ සඳුන් සාංද්‍ර ජබාදු ආදීවූ සුවඳ ගන්වතලද මේ මාගේ කෙස් වැටිය අමුසොහොන්හි දමතලදුව උකුස්සෝ ගිජුලිහිණි ආදී පක්ෂි සමූහයෝ නියපසුරෙන් බඳගෙණ ආකුල ව්‍යාකුලකොට ඇත මෑත අදින්නෝවේද!

තවද මෑනියන්වහන්ස පබලුදලු මෙන් රත්වූ නිය ඇති සාවුන් බඩ ලොම්ලෙස් මෘදු කොමල තුනුලොමින් ගැවසීගත් රත්සඳුන් ගල්වතලද මනො ඥවූ මාගේ හස්ත යුගලය මෙරජුන් විසින් කපාදමතලදුව කොක්නාවුන් එකානතයෙන් ඩැහැගෙණ යන්නෝ වේද!

තවද මැනියන්වහන්ස මාගේ මේ සුවර්ණතල ලළුලයට බඳුවූ උපමා ඇති මුඛ පද්මයෙහි ලොල්ව උඹබලා උන් සුවර්ණ චක්‍රවාක යුගලමෙන් නුහුනුවාවූ වටමටවූ සඳුන් කොකුමඟරා මුතුහරින් හොබනාවූ මෙමා තනයුගලය කපා වලදමනලද කල්හි මැනියන්ගේ තනයේ එලුනු බාල දරුවන් පරිද්දෙන් කැතකිල්ලූ එල්ලෙන්නාහු වෙද්ද!

තවද මැනියන් වහන්ස මෙමාගේ රන්පෝරුවක් මෙන් පලල්වූ කලාහඹාමෙලව මනොඥකොට කරණලද රත්රසුදලින් යුක්තවූ මෙවුල්දමින් සශ්‍රීකවූ කටිප්‍රදේශය මේ රජුන් විසින් කපා වලදමනලදුව කොක්නඹු ඩැහැගෙණ කැමති තෙතට ගෙණගොස් කන්නේ වෙද!

තවද මැනියන්වහන්ස බල්ලෝය, කොක්නහවුය, කැණහිල්ලූය යනාදීවූ දළ ඇති සත්ත්වකෙණෙක් ඇත්නම් ඒ සියලු සත්ත්වයෝ ප්‍රභාවතීන්ගේ ශරීරමාංශය නැමති රසායනය අනුභවකොට එකාන්තයෙන් අජරාමර වෙති සිතමි.

තවද මැනියන්වහන්ස මේ එක්වූ රජදරුවෝ ස්නෙහයෙන් ඉදින් මාගේ ශරීර මාංශය ලියාගෙණ ගියාහු නමුත් ඔවුන්ට යාඥාව කියාත් ඇට හැරගෙණ දෙමං අතුරෙක්හි දමාපුව මැනව.

තවද මැනියන්වහන්ස ඒ සොහොන් බිම මල්වතු කරවා එහි උඩු කිණිහිරි ගස් මෑ ඇතිකරවා හිමකාලයාගේ කෙළවර මැදින්මස පිපී වැනීගිය මල් ගෙන්වාගෙණ රන්පුමුගක් පුරා ඔරපිට තබාගෙණ මාගේ දියනියන් ප්‍රභාවතීන්ගේ ඡවිවර්ණය මෙබඳුයයි බල බලා මා සිහිකළ මැනවැයි යනාදීන් බලපාමින් මැනියන්ගේ සමීපයේම හිඳ ඇඬූය.

එසඳ මද්‍රරජ්ජුරුවන්ගේ නියෝගයෙන් වධකයා තමාගේ පොරවත් කොලඹුවත් ඇරගෙණ රජගෙට ආයේය. ඒ වධකයා ආබව රාජාඞගනයෙහි ප්‍රකාශවිය ඒ අසා ප්‍රභාවතීගේ මැනියෝ රජ්ජුරුවන් කරා අඬ අඬා ගොස් පොරව හා කොලඹුව දැක දෙවයන්වහන්ස මනාව හැඳුනු සිහුවලඟ ඇති මාගේ දියනියන් මේ පොරොවෙන් කපා බෙදා මේ සත් රජ්ජුරුවන්ට දෙවනසේක්දැයි විචාළාය.

ඉක්බිති රජ්ජුරුවෝ බිසවුන් ගිවිස්වමින් දේවීනි ප්‍රභාවතීන් කපා නොදී අනික් කුමක් කරවුද තොපගේ දියනියෝ සියළු දඹදිවට අග්‍ර රජ්ජුරුවන් විරූපයයි හැරපියා ගිය මග පාසටහන් නොනස්නා කල්මහි මරණය තලල තබාගෙණ අවුය දූන් තමාගේ රූ නිසා කරණලද ඊර්ෂ්‍යාවෙහි විපාක ලබන්නී වේදැයි කීහ.

එබස් අසා බිසෝ දියනියන් ලඟට ගොස් අඬමින් වලපමින් දියනියෙනි තොපට අමනාපයක් සිතිනුත් නොසිතන්නාවූ මාගේ බස් නොගිවිස තොප දූන් ලේ පෙර පෙරා සත්කඩක්කොට කපා මේ රජදරුවන්ට දෙන ලදුව යමපුරයට යන්නී වේද;

තවද මේ ලෝකයෙහි යම්සත්වයෙක් වැඩෙහි හැසිරෙණ හිතේසීන්ගේ කීම නොකරන්නේද එතෙම මෙබඳුවූ දුක් කම්කටුළු ලදුව නොයෙක් අනය

ව්‍යසනයටද පැමිණෙන්නේය. තවද රත්කම්න් තුදුල මාණික්‍ය මෙබලාදාම යෙන් විරාජමානවූ ප්‍රභාවතීනි ඉදින් තමා මෙයින් ආපස්සේ ගොස් උභයකුල පරිශුද්ධ අසම්භින්න සූර්ය වංශප්‍රසූත ශෞර්වීර්යවික්‍රමාන්විත කුශ රජ්ජුරුවන් හා එක්ව තොප හා සමාන රූපශ්‍රීන් ඇති දකුම්කටයුතුවූ කුමාර කෙණෙක් ලදහොත් අප ඇම ඇතුළුවූ බොහෝ ඥාතිවර්ගයා විසින් සත්කාර සම්භාවනා කරණලදුව සියළු දුක් දුරුකොට බොහෝ කාලයක් සැපසේ වාසයකරන්නී වේද;

තවද මාගේ සොඳුරුවූ දියනියෙනි යම් කුශ රජකුගේ මණි කනක රජතාදිවූ විචිත්‍රවූ කර්මාන්තයෙන් යුක්ත රාජභවනයෙහි සර්වාභරණයෙන් සැරහුනාවූ දිව්‍යාඞ්ගනාප්‍රතිභාග පුරාඞ්ගනාවන් විසින් වයනලද පඤ්චාඞ්ගික තූර්යනාද අනවරතයෙන් පවතීද මනාවූ ලක්ෂණාන්විත මඞ්ගල හස්තීහු ප්‍රධානකොට ඇති කෛලාසකූට ප්‍රතිභාග අනෙක ශත මතන හස්තීහු නාද කෙරෙද්ද.

තවද ප්‍රභාවතීනි රාජාඞ්ගනයෙහි උද්ධත මනාවූ ලක්ෂණයන් ඇති මඞ්ගල අශ්වරාජයා ප්‍රධානවූ ක්ෂීර සාගරයෙහි තරඞ්ග පරම්පරාවෙන් විරාජමානවූ නොයෙක් දහස්ගණන් අශ්වයෝ කුල්මතින් හේෂාරව පවත්නාහුද.

තවද යම් කුශාවතී රාජධානියෙක්හි ඒ ඒ ස්ථානයෙහි සර්වාභරණ විභූෂිත සිඞ විද්‍යාධරයන් වැනි නළු නාටක සමූහයෝ නොයෙක් ප්‍රභෙද ඇති තූර්යභාණ්ඩයන්ගෙණ හැමවේලෙහිම සුඛිතමුදිතව සේවය කෙරෙද්ද

තවද ප්‍රභාවතීනි කුශ රජ්ජුරුවන්ගේ යම් ගෘහොද්යාන විද්‍යුල්ලතා සශ්‍රීකව විරාජමානවූ සුවර්ණමයූර රාජයන් විසින් මිහිගු බෙරනඩින් මත්ව පවත්වනලද කෙකානාදයෝද කොස්ලිහිණියන් විසින් පවත්වනලද අනුරාග යෙන් හරිතවේද එබඳුවූ ශ්‍රී සෞභාග්‍යය හා ඓශ්වර්ය හා විශෙෂය ඇති ඒ කුශාවතී රාජධානියෙහි ඉසුරු හැර ඊට වඩා කවර සැපයෙක් කොයි ඇති හෙයින් මීට අවුද යනාදීන් ප්‍රභාවතීන්ට අවවාදවශයෙන් කුශාවතියෙහි විභූතිය වර්ණනාකොට ඉදින් ඒ කුශ රජ්ජුරුවෝ අද මෙතන වීනම් මේ සත් රජ දරුවන් මරා ලුහුබඳවා මාගේ දියනියන්ට පැමිණි මේ දුක් දුරුකොට කැඳවා ගෙණ යන්නෝය. කපුටු රැළක් කැටක්ගසා පලවා ලන්නාක්මෙන් තමන්ගේ වචන මාත්‍රයකින්ම සකල ශත්‍රුමර්දනය කරන්නාවූ ඉදින් සිතුව හොත් එක්සියක් රාජධානිනුත් හැරගන්ට නිසිවූ සමර්ථ ඇති විශිෂ්ටවූ ප්‍රඥානුභාව ඇති ඒ කුස රජ්ජුරුවෝ අද මෙනුවර වූනම් අප හැමට පැමිණි මේ දුකින් ගලවා යන්නාහුයයි යනාදීන් කුශරජ්ජුරුවන්ගේ බොහෝ ගුණ කථනය කළාහුය.

එකල්හි ප්‍රභාවතීතොමෝ කුශරජ්ජුරුවන්ගේ ගුණකියන්නාවූ මාගේ මෑනියන්වහන්සේගේ මුඛ නොසෑහෙන්නේය. එහෙයින් උන්වහන්සේ අරක්කැමි කම්කොට මේ ගම වසන බව මෑනියන්වහන්සේට කි ? නා මෑනියන්වහන්ස අනන්‍ය සාධාරණ ගුණ ගණාභරණ විභූෂිත ශෞර්වීර්ය බල පරාක්‍රම ප්‍රතාප ප්‍රඥාගුණ ඇති මේ සතුරන් තසා අපහැම රකින්ට නිසිවූ කුශ රජ්ජුරුවන්වහන්සේ අපට අළාරිකව මෙතනම වාසයකරණසේක. උන්වහන්සේ කැඳවම්දැයි විචාළාහ.

ඉක්බිති ප්‍රභාවතීහි මරණභයින් පීඩිතව තත්දෙඹවුද අඥානයෙන් මුසවූ ප්‍රලාප දෙඹවූද බොලඳකමින් කියමනා දෙයනබා අනිකක් කීයවූද තොප මේ කියන්නේ කිම්ද ඒ කුශ රජ්ජුරුවෝ ඉදින් මේ නුවරට අවුතම් අපට නොදැනෙන්ට කාරණා කිම්ද ඉදින් එත්තම් අපට කියා එවා තමන්ගේ සෙනාවාහනයන් පිරිවරා නේත්ද මැගේ කුමත තත් දෙඩීමෙක්ද යනාදීන් දෙඩූය.

එසඳ ප්‍රභාවතී මැනියන්වහන්සේ කුමක්කීමත් අදහානොගන්නා සේක. ප්‍රත්‍යක්ෂයෙන් දක්වාලා කියමි සිතා මැනියන්ගේ අත අල්වාගෙණ මතුමාලතලයට නැගීගොස් සීමැදුරු කවුළුව හැර පිටතබලා වලන් සොඩමින් සිටි බොධිසත්ත්වයන් දිසාවට අතදිගුකොට මැනියන්වහන්ස තොලෙ කුමාරිකාවරුන්ගේ අන්තඃපුර ආසන්නයෙහි මුළුතැන්ගෙහි මීදුලෙහි තරයේ කැසපටගන්වා අරක්කැම්වේශයෙන් හැඹුරුව සිට වලන් සොධනයෙක් කුශ රජ්ජුරුවන්වහන්සේයයි දැන්වූය.

එකල බොධිසත්‍වයෝ ප්‍රභාවතීන් නිසා සත්රජ්ජුරුකෙණෙක් මෙනුවර වටලාගත්තායයි අසා අද දවස් මාගේ මනොරථය මුදුන් පැමිණෙත්තේයයි මාගේ මේ ගමට ආ නියාව අද දවස් ප්‍රභාවතී දෙමව්පියන්ට කියන්නීය, ඒ අසා මා ගෙන්වාගෙණ උන් මට පාවාදෙති, එකල මා ගත් දුක් සාඵකවන්නේයයි වලන් සෝධා නැන්පත්කොට තබමි සිතා පැන් ගෙණවුත් වලන් සොධන්ට පටන්ගත්හ, එසඳ වලන් සොඩමින් සිටි රජ්ජුරුවන් දැක දියනියන්ට උරණව කොල තෝ චණ්ඩාල එකක්ද, අවශෙෂ හීනජාතියෙහි එකක්ද නොහොත් මෙබඳු රාජවංශය නසන්මෙයයි උපන් එකක්ද මද්‍ර රජකුලයෙහි උපන් තෝ සකල රාජ මෞලිමාණික්‍යකාන්තීන් බබලනලද පාදපීඨ ඇති තොපගේ වල්ලභවූ කුශ රජනු ලවා දැසක්‍රියා කරව්දැයි පරිභව බිණූය, ඉක්බිති ප්‍රභාවතීතොම මාගේ මැනියන්වහන්සේ මානිසා මේකුශරජ්ජුරුවන්වහන්සේ අවුත් මෙනුවර වසනබව නොදන්නාසේක්වනැයි සිතා මැනියන්වහන්ස මම චණ්ඩාල ස්ත්‍රියකුත් නොවෙමි, නෙසු හීනජාති එකකුත් නොවෙමි, නුඹවහන්සේගේ රාජවංශය නසන එකකුත්නොවෙමි, මේ ඉක්ෂවාකුරාජවංශයට නගනලද කෙතුවක් වැනි රජ්ජුරුවන්වහන්සේයැයි දනිම් ඉදින් නුඹවහන්සේ දැස කෙණෙකුනැයි නොසිතම් කියා බොධිසත්ත්වයන්ගේ ඓශ්වර්‍ය්‍ය වර්ණනා කරන්නාවූ ප්‍රභාවතීතොමෝ මැනියන්වහන්ස මේ කුශරජ්ජුරුවන්වහන්සේ ත්‍රිවිධ වෙද පාරප්‍රාප්ත සදාචාර නිරතවූ විසිදහසක් පමණ බ්‍රාහ්මණයන් මාලිගායෙහි මධුරාන්නපානයෙන් සන්තර්පණය කරවන සේක්ද.

තවද රන්පොරෝදු සන්නාහයෙන් සදනලද කනකගිරි සිඛරසුන්දරවූ ත්‍රිමද ගලිතවූ දසදහසක් පමණ හස්තීහු සතතයෙන් සැරහී සිටිද්ද යම් රජ්ජුරුවන්වහන්සේගේ ප්‍රචණ්ඩමාරුතයෙන් මෙහෙයනලද ශරත්කාලයෙහි මෙඝකූට නිකර සුන්දරවූ මනොඥ ලක්ෂණාන්විත රාජවාහන යොග්‍යවූ නොයෙක් අශ්වාලංකාරයෙන් සරහනලද විසිදහසක් පමණ අශ්වයෝ හැමවේලෙහිම සන්නද්ධව සිටිද්ද.

තවද යම් රජ්ජුරුවන්ගේ සුරලොකාවතීර්ණව සුන්දර විමානයක්මෙන් සොභමානවූ නගනලද ධවලාතපත්‍රයෙන් විරාජමානවූ සරහනලද සිංහාසන

යෙන් සශ්‍රීකවූ සුරසුන්දරී සමාන පුරසුන්දරීන් විසින් සලනලද චාරුචාමර නිකරකීර්ණවූ සියළු රථාලඞ්කාරයෙන් විචිත්‍රකොට සරහනලද එලවනලද මලෝලඹු මල්දම් රන්මිණි කිකිණිවලින් සොභමානවූ විසිදහසක් පමණ රථ නිරන්තරයෙන් සැදී සිටීද

තවද යම් රාජෝත්තමයකුගේ ධරණීතලාව තීර්ණනෙක වර්ණ ඇති අභ්‍රකූට සහස්‍රයෙන් සොභමානවූ ඝනගර්ජිතාකාර වෘෂභගර්ජිතා ඇති නිසානතමමැට එකස්බෙර ආදීන් සරහනලද පිටුඇති විසිදහසක් පමණ වෘෂභ රාජයෝ මත්තහස්තීන්මෙන් තප්ලා කුර ඇන සිටිත්ද.

තවද රක්ත නීල සෙවත කෘෂ්ණාදී අනෙක වර්ණෝජ්වලිත අනවරත යෙන් වැහෙන්නාවූ ක්ෂීර ධාරා සහස්‍රයෙන් සන්හිඳුවනලද ග්‍රීෂ්මසන්තාපයන් ඇති සක්තවූ තුඞ්ග තුරඞ්ග හඞ්ගාකාර ඇති විසිදහසක් පමණ දෙනුන් සනතයෙන් රජත ස්වර්ණමය භාජනපුරා ක්ෂීර දොහනය කෙරෙද්ද යනාදීන් ප්‍රභාවතී කුශරජ්ජුරුවන්ගේ යශො විභූතිය ප්‍රශංසාකොට මෙබඳුවූ ඓසවර්‍ය්‍ය ඇති රාජාධිරාජයා නුඹවහන්සේම දස්කොට සිතන පමණ විනා මම එලෙස නොසිතමි යනාදීන් බොධිසත්ත්වයන්ගේ ගුණ කථනය කළාහුය.

එකල බිසෝ මෝ නොමෝම අසම්භීතව කියන්තියයි එකාන්තයෙන් අදනාගෙණ මදුරජ්ජුරුවන් කරාගොස් එපවත් කීවුය. එබස් අසා රජ්ජුරුවෝ සුහුව ප්‍රභාවතීන් සාරාගොස් දියතියෙති කුශ රජ්ජුරුවන් මෙනුවරට ආයේ සැබෑදැයි විචාළාහ. එසඳ ප්‍රභාවතීන් එසේය පියානන්වහන්ස උන්වහන්සේ මෙනුවරට අවුත් රාජකුමාරවරුන්ට අරක්කැමිකම් කරන්නේ දැන් සත්මසෙ කැයි කීවුය, ඒ අසා මදු රජ්ජුරුවෝ උන්ගේ බස් අදනානොගෙණ කුද කැඳවා විචාරා නියමකොට දූන එඹල කොල්ල වෙස්වලා මුඩුවෙසින් පැමිණි විෂසොර සපීරාජයකු පරිද්දෙන් සකලභුවන සෙබරවූ විශිෂ්ට කායබල ඥාණබල ඇති ඒ කුශරජ්ජුරුවන් වෙස්වලා නොපනිසා මීට අවුත් සත්මසක් මුළුල්ලෙහි දුක් ගණිමින් සිටියදී අපට නොකියා කළදෑ එකාන්තයෙන් වැරැද්දේය යනාදීන් දියනියන්ට දොඩා වේගයෙන් ඉක්මන්ව බොධිසත්ත්වයන් කරාගොස් සුවදුක් විචාරා බඩාඤ්ජලීව සිට මහරජ්ජුරුවන් වහන්ස සත්මසක් මුළුල්ලෙහි දුක් ගණිමින් සිටියදී නුඹවහන්සේ වෙස්වලා අවුත් මෙගම සිටි බව නොදනුම්හ. ඒ අප නොදැනකළ අපරාධය ක්ෂමාකොට වදාළමැනවැයි යාචඤාකළහ.

එබස් අසා මහාබොධිසත්වයෝ ඉදින් මම තදකොට කීම්නම් මොහුගේ ලය පැලීයන්නේය. එහෙයින් අස්වසා කියමි සිතා වලත් අස්සෙහි සිට දෙව යන්වහන්ස මෙබඳුවූ මම සම්ප්‍රාප්තවූ රාජ්‍යශ්‍රීය හැර ප්‍රභාවතීන් කෙරෙහි බඩාභිලාෂයෙන් වෙස්වලා අවුත් අරක්කැමිකම්කෙරෙමින් දුක්වුනිම්ද මාකළ ඒ අකතීව්‍යයම අධිරාජ්‍යයන්ව සිටි මා බඳුන්ට නුසුදුසු හෙයින් මාගේම වැරදි විනා නුඹවහන්සේගේ වැරැද්දෙක් නැත්තේය, එහෙයින් මේ මා කළදෙයට නුඹවහන්සේම ක්ෂමාකොට වදාළමැනවැයි කීහ.

එසඳ මදුරජ්ජුරුවෝ මහාබොධිසත්වයන් විසින් ප්‍රියවචනයෙන් කියන ලද පිළිසඳර කථා ඇතිව සනෙතාෂ ප්‍රාප්තව ප්‍රාසාදයට ගොස් ප්‍රභාවතීන්

කැඳවා නුවණ නැති නැනැත්තිය මහාබලපරාක්‍රම ඇති කුස රජ්ජුරුවන් කර ගොස් ක්‍ෂමාකරවා ගණුව ක්‍ෂමාකරවා ගණුවයි කීහ.

එසඳ ප්‍රභාවතී පියරජ්ජුරුවන්ගේ බස් අසා නගුන් හා පරිවාර ස්ත්‍රීන් විසින් පිරිවරා බෝධිසත්ත්වයන් සිටි තෙනට ගියාය. කුශ රජ්ජුරුවෝද මෙහෙ කරමින් සිට ප්‍රභාවතීන් තමන් කරා එන නියාව දැන දැන් මම මැගේ මජ්බිඳ මාගේ පාපිට මඩෙහිම වැදහොවමි සිතා වලන්වල තිබූ පැන් බිම්තමා කල විටක් පමණතැන් පාගා බොරකොට බොරමඩයෙහි සිටියාහුය. එකල ප්‍රභාවතී ගොස් බෝධිසත්ත්වයන්ගේ පත්ලෙහි ඉසතබා මනපවතින් මුලින් උපුටා එලනලද සවර්ණ තාලස්කන්ධයක් පරිද්දෙන් මඩෙහි වැතිර තමාගේ සුරක්ත පල්ලවාභිරාමවූ මෘදුකොමලපාණියුගලයෙන් බෝධිසත්ත්වයන්ගේ තරුණාරුණ කිරණ සම්පර්කයෙන් ප්‍රවිකසිතවූ සන්ධ්‍යාරාග නිර්විශෙෂ ප්‍රභාසුර පාද පද්ම යුගලය අල්වාගෙණ මරණ භයින් පීඩිතව මහහඬින් හඬා හඬා දෙවයන් වහන්ස මාගෙන් වෙන්ව නුඹවහන්සේ විසින් රාජ්‍යශ්‍රීවිභූතිය හැර අපමණ දුක්ඛයෙන් යම් පමණ කලක් ඉක්මවනලද එපමණ කාලයක් මුළුල්ලෙහි මා විසිනුත් දුර්භෝජන දුක්ඛසෙය්‍යාදීන් හා ස්නානපාන රහිතවීමෙන් නුඹ වහන්සේ සේම දුකින්ම දවස් යවනලද්දේය. එහෙයින් මට නොකිපී ක්‍ෂමා කොට වදාළමැනව.

තවද මහරජ්ජුරුවන්වහන්ස මාගේ සත්‍යවචනයත් ඇසුවමැනව මම මෙතැන්පටන් දිවිහිමියෙන් කයින් වචසින් මනසින් අමනාපයක් නොසිතමි, නොකරමි ඉදින් මා මෙසේ යාච්ඤාවෙමින් සිටියදීමට ක්‍ෂමානොකොට මාගේ බස් නොපිළිගත්සේක් වීනම් දැන් මපියානන්වහන්සේ මෙසත් රජදරුවන්ට මා සත්කඩක්කොට කපාදෙනසේක. එහෙයින් මට ක්‍ෂමාකොට රැක්ක මැනවැයි යාච්ඤාකළහ.

එකල කුශරජ්ජුරුවෝ ප්‍රභාවතීන්ගේ බස් අසා ඉදින් සබඳ තෙපිම වේද දන්නා ඒ මට ඇයිදැයි කීම්නම් මූන්ගේ ලයපැළීයන්නේය, එහෙයින් මූන් අස්වසා කියමියි සිතා ප්‍රභාවතීනි තොප මෙලෙස යාච්ඤාවෙමින් සිටියදී කුමක් නිසා තොප කීවා කෙරෙම්ද තොප කෙරෙහි මාගේ මදකුත් කොපයෙක් කනස්සල්ලක් නැත්තේය, තවද තෙපි කිසිවකටත් නොබව. තවද කලණ ගුණයත් ඇති රාජපුත්‍රිය සත්‍යවචනයක් ඇති කියම් මමත් මෙතැන් පටන් කයින් වචසින් මනසින් අප්‍රියයක් නොකෙරෙමි මේ එක මද්‍ර රජකුලය තබා මෙබඳු නොයෙක් සියගණන් රාජකුලයන් මර්දනයකොට මා කැමති පරිද්දෙන් තොප ඇරගෙණයන්ට සමර්ථවූවත් මම තොප නිසා මාගේ රාජශ්‍රීය හැර ගීතක්‍රියා කෙරෙමින් මෙතෙක්දවස් මුළුල්ලෙහි දුක් වින්දෙමි. එබඳුවූ මා පෙණීසිටියදී තොපට කිසියම් භයකුත් නැත්තේයයි යනාදීන් ප්‍රභාවතීන් අස්වසා සියළු රජපිරිවරින් පිරිවරණලදුව ක්‍ෂත්‍රියමාන උපදවාගෙණ මා ජීවත්ව සිටියදී මාගේ භාර්‍ය්‍යාව අනිකෙක් ඇරයගෙණයෙතැයි කෙශර සිංහ රාජයකු මෙන් පැලඹෙමින් මේ සියළු සාගලනුවර වාසීහු මා මෙතනට ආ බව දතිත්වයි ඇත මෑත පැනමින් අභීතනාද පවත්වමින් අත්පොළසන් දෙමින් දූත් දූත් ඒ කොල්ලන් ජීවග්‍රහයෙන් අල්වාගෙණ එම් සියළු අන්තඃපුර වාසීන් අස්වසා තවද මණිකනක රජතාදී විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් විරාජ

මිණිතවූ නික්මුනාවූ විරාජමානවූ රථයානාවේක්හි හික්මුනා වූ කීකරු සියළු අශ්වාලඞ්කාරයෙන් සරහලද අශ්වයන් යොදව. දූත් උදක් ශත්‍රු මථනය කරන්නාවූ මාගේ බලපරාක්‍රම සාමාර්ථ්‍ය බලව යනාදීන් අභීතනාද පවත් වමින් ශත්‍රුමථනය කිරීමට භාරය තෙපි තොපගේ මාලිගාවට ගොස් ඉස්සෝධා නහා සැරසීගණ වැදහිඳුවයි ප්‍රභාවතීන් එතන නික්මවූහ. එකල මද්දු රජ්ජුරුවෝද කුසරජ්ජුරුවන්ට පිරිස්සරහන පිණිස අමාත්‍යයන් යවූය, එනියෝගලද අමාත්‍යයෝ ගොස් මුළුතැන්ගෙයි මිදුලෙහි වටතිරයක් බැඳ එවනලද ඒ මගුල්කපුවා විසින් කරණලද දැළි රැවුළු අන්දම් තිබීම් ඇතිව ඉස්සෝධා නහා සියළු රාජාභරණයෙන් සැරසී ඇමති මඬුළු ආදී දශ මේ නැත් පිරිවරා මාලිගාවට යෙමින් අත් පොලසන් දෙමින් සියළු අන්තඃපුර සත්වයන් බල බලා සතුටුවන පරිද්දෙන් අභීතනාද පැවැත්වූහ.

එකල මද්දුරජ්ජුරුවෝ මනාව හික්මවනලද රන්සැත් රන්පොරොදු රන්සන්නාහ කණී චාමරාදී සියළු හස්ත්‍යාලඞ්කාරයෙන් සරහනලද්දවූ තගනලද ධවලාතපත්‍ර ඇති මගුලැත් සරනා බොධිසත්ත්වයන් නැගෙන පිණිස යවූහ. එකල කුසරජ්ජුරුවෝ ඒ ඇතුපිටට පැනනැගී ප්‍රභාවතීන් පශ්චිම ආසනයෙහි හිඳුවාගෙණ චතුරඞ්ගිණී සේනාව විසින් පිරිවරණලදුව නුවර නැගෙනහිරි වාසලින් පිටත්ව කැනහිල් රැසක් මධ්‍යයටවන් කෙශර සිංහරාජ යකු පරිද්දෙන් යුධභූමියට වැද මම් කුසරජය, ප්‍රාර්ථනා කරණ, කෙණෙක් බසින් පහව යෙත්වයි කියා අසනිසම්පාත නිර්ඝොෂ ඝොරකොට තුන්යලක් සිංහනාද ස්වරයෙන් අභීතනාද පැවැත්තුන.

එසඳ කුශනරෙන්‍ද්‍ර සිංහයාගේ ඒ සිංහනාදය අසා භයපත්ව ඉස්ලූලූඅත පලාගොස් පළිත සතවන ගණනාදියටවන් මෘගසූකරාදීන් පරිද්දෙන් ශත්‍රු රජදරුවන් පිරිවරා සිටිනොයෙක් සියදහස්ගණන් ඝන ගර්ජනාකාර භීමනාද ඇති භීමසෙනානුකාරියොධාධිරූඪත්‍රිමදගලිත තරුණ කරුණාකරවාරනෙන්ද්‍ර සෙනාවද ප්‍රලයකාල ප්‍රවෘතෙනාදර චණ්ඩමාරුතා භිඝාත සින්ධු තුඞ්ග තරඞ්ග භංගානුකාරි රංගත්තුරංගානුසිතවූ යුඩම්ඞනාභිලාෂ ඇති දහස් ගණන් අසරුවන් විසින්ද උපලක්ෂිත අශ්වසේනාවනද වේරම්බ වාතයෙන් ප්‍රෙරිතව ඝොරනිර්ඝොෂ පවත්වමින් දිගාන්තරාභිධාවනය කරණ විද්‍යුල්ලතා සහශ්‍ර යෙන් සශ්‍රීකවූ මේඝකූටානුකාරිවූ රථාලඞ්කාරයෙන් සරහනලද විචිත්‍ර ධජ පතාකාභිකීර්ණ ගම්භිරචක්‍රධවනි ඇති ප්‍රචණ්ඩදෛරදණ්ඩ කොදණ්ඩ කාණ්ඩාභි ලක්ෂිත ප්‍රබල යොධාධිෂ්ටිත රථසෙනගද නානාවෙශ ග්‍රහණ භීෂණවූ දුර්ධරගජෞඝන පවනාතිපාතවෙග ඇති ඛඞ්ගමුද්ගර තොමර කුනත චාරු චාපබාණාදී විවිධායුධ ග්‍රහණාතිභීෂණ අනෙකකොටි පාබල සේනාවද්‍රූයි යනාදී මේ සේනාව මරණභයින් ත්‍රස්තව සිටපිය සිටියනොහී භයොන්මාද යෙන් මූර්ඡාවට පැමිණ ඔවුනොවුන් ඇඳිනගනනොහී සිය සෙනගම කොටා වටා දිවපැන විඩාපත්ව ඒ ඒ අත දිවපූහ.

එසඳ මේරුසාරවූ කුශරජ්ජුරුවෝ මන්දරපළිනයෙන් අලලනලද මහාසමුද්‍රය පරිද්දෙන් නිරායාසයෙන් තමන්ගේ සිංහනාද මාත්‍රයෙන් ඒ ශත්‍රුසාගරයමථනයකොට ප්‍රභාවතීන්ගේ පාණිග්‍රහණය පිණිස ආ සත්රජුන් ජීවග්‍රහයෙන් අල්වා ජයගෙණ සිටිසඳ ශක්‍රදෙවෙන්ද්‍රයෝ තමන්ගේ දහසක්නුව

ණැස් මෙහෙයා මනුෂ්‍යලොකය බලා ඒ රණධරණීමධ්‍යයෙහි ශත්‍රුරජදරුවන් සා සමග විජයශ්‍රී කාන්තාවගේ පාණිග්‍රහණයකළ අපගේ විසුඩශ්‍රී මහා බොධිසත්ත්වවූ කුශරාජාධි රාජොත්තමයා පරහිංසාවක් නොකොට සිංහනාද පමණකින් කැටක් ගැසූ කපුටුරුසක් පලවන පරිද්දෙන් නිරායාසයෙන් කරණලද ශත්‍රු සෙනා මර්දනය දැක සඤ්ජාත ප්‍රීතිප්‍රමොදයෙන් ප්‍රමුදිතව මේ උත්තම පුරුෂයාගේ විරූපතාව දුරුකොට උතුන් රූපසෞන්දය්‍යීයෙන් සරහන්ට උවමැනවයි සිතා තරුණාකී රශ්මීන් ප්‍රදෘනයක් මෙන් දීප්තිමත්ව විරොචනනම්වූ අෂ්ටවංක මාණික්‍යරත්නයක් තුෂ්ටිදෘනයෙන් ගෙණහැර උර ස්තලයෙහි පැළඳවූහ.

එසඳ මහාබොධිසත්‍වයෝ එසත් රජුන් අල්වා ඔවුනොවුන්ගේ උතුරු සළුවෙන් පිටිතල අයා බැඳගෙණ ඒ රණභූමියෙන් නොයෙක් ජයඝොෂා පවත්වාගෙණ මාණික්‍ය රත්නයෙහි ආනුභාවයෙන් දිවිදළින් ඔප්නගා කරණ ලද සවණී ප්‍රතිමාවක්මෙන් විරාජමානව අනන්‍යා සාධාරණ ශ්‍රී විභූතියෙන් යුක්තව සුරසෙන් පිරිවරා සුජාතාවන් හා ඓරාවණ වාහනාරූඪව අසුර විජයකොට අවුත් වෛජයන්ත ප්‍රාසාදයට වදනා ශක්‍රදෙවෙන්ද්‍ර විලාසයෙන් මාලිගාවට වැද මද්දුරජ්ජුරුවන් දැක මයිලනුවන්වහන්සේට විරුඩව අවුදින් නුවරවටලාගත් ශත්‍රු සේනාව මථනයකොට රජදරුවන් සත්දෙනා ජීවග්‍රාහ යෙන් ගණිනත් ගනමැනවයි කැමැත්තක් කළමැනවැයි කීහ.

එබස් අසා මද්දුරජ්ජුරුවෝ මහරජ්ජුරුවන්වහන්ස අප ඇමදෙනාටම ප්‍රධානව සිටිහෙයින් මොහු නුඹ වහන්සේටම සතුරෝය මරනත් තබනත් අරිනත් නුඹවහන්සේටම කැමැත්තක් කළමැනවැයි කීහ.

මද්දුරජ්ජුරුවන් විසින් මෙලෙස කී කල්හි මහාබෝධිසත්‍වයෝ මොවුන් මරාලබන්නේ කිම්ද? මුන්ව හැම මේනුවරට ආගමන් ව්‍යර්ථනොවේවයි ප්‍රභාවතීන්ගේ නගුන් සත්දෙනා මෙරජදරුවන් සත්දෙනාට දෙවාලම් සිතා දෙවයන්වහන්ස දිව්‍යාප්සරාවන් සමාන රූප සොභා ඇති නුඹවහන්සේගේ දූන් සත්දෙනා මෙරජදරුවන්ට පාවාදී මුන්හැම බැනකොටගන මැනවැයි කිවුය. එබස් අසා මද්දුරජ්ජුරුවෝ මහරජ්ජුරුවන්වහන්ස අපටත් උන්ටත් නුඹවහන්සේ ම ප්‍රධානසේක. ඉදින් කැමතිසේක්වීනම් දෙවාවදාල මැනවැයි කිවුය.

ඉක්බිති කුශරජ්ජුරුවෝ ඒ ක්‍ෂත්‍රිය කන්‍යාවන් සත්දෙනා සර්වාභරණයෙන් සරහා රජදරුවන් සත්දෙනා සර්වාභරණයෙන් සරහා රජදරුවන් සත් දෙනාට මහමඟුල් පාණිග්‍රහණය කරවා දුන්හ.

එසඳ රජදරුවෝ සත්දෙන ස්ත්‍රීරත්න ප්‍රතිලාභයෙන් අතිශයෙන් සතුටුව කුශරජ්ජුරුවන් වැඳ අවසර ඉල්වාගෙණ තම තමන්ගේ රාජ්‍යයටම ගියාහ.

ඉක්බිති උපාය කෞශල්‍යඥනය ඇති මහාබොධිසත්‍වයෝ කීපදවසක් එහි වාසයකොට මයිල් රජ්ජුරුවන්ගෙන් අවසර ඉල්වාගෙණ ප්‍රභාවතීන් කැඳවාගෙණ චතුරඞ්ගිණී සේනාව විසින් පිරිවරා මහත්වූ රාජානුභාවයෙන් සාගල නුවරින් නික්ම මනාව සරහා පිළියෙළ කරණලද්දාවූ නගනලද ධජලා

තපත්‍ර ඇති විචිත්‍ර චිත්‍ර කර්‍මාජ්වලිතවූ රථයානාවකින් ගොස් මාණික්‍යරත්න කාන්තීන් ප්‍රභාවතීන් හා විශිෂ්ටවූ රූපසෞන්දර්‍ය්‍යී සොභාවෙන් විරාජමානව විමාණස්ථව ගමන්ගත් සිඛ යුගලයක් පරද්දෙන් කුශාවතී රාජධානියෙහි සියළු සත්‍වයන්ට නෙත්‍රොත්සව කෙරෙමින් නුවරට වන්හ.

එසඳ බොධිසත්වයන්ගේ මෑනියෝ සීලවතීදෙවි කුශරජ්ජුරුවන් ප්‍රභාවතීන් කැන්දාගෙණ නුවරට ආහයි යනු අසා කැම් පීම් ආදී බොහෝ උපකරණ ඇරගෙණ මහපිරිවරින් පෙරගමන්කොට ගොස් දැක සතුටුව බොධිසත්වයන් කැඳවාගෙණ නුවර පැදකුණුකොට මාලිගාවට වැද රාජ්‍යශ්‍රීයෙහි පිහිටවූහ.

එතැන්පටන් ප්‍රභාවතීන් හා කුශරජ්ජුරුවන් හා දෙදෙන එකාත්මිකව සමග වාසයෙන් දිවි පමණින් දසරජදහමින් යුක්තව රාජශ්‍රී අනුභව කොට කෙළවර කර්‍මවූපරිද්දෙන් සංසාර යාත්‍රාව කළාහුයයි තිලෝගුරු බුදුරජානන්වහන්සේ ධර්‍මසභාමණ්ඩපයට රැස්වූ ශාසනයෙහි උකටලීවූ ඒ භික්ෂූන්වහන්සේ ප්‍රධානකොට ඇති සිව්වණක් පර්‍ෂදට මේ අතීත කථාව ගෙණහැර දක්වා ධර්‍මදෙශනාකොට වදාරා දුක්ඛ සත්‍යය සමුදය සත්‍යය නිරොධ සත්‍යය මාර්‍ග සත්‍යය යන චතුරාර්‍ය්‍ය සත්‍යයන් ප්‍රකාශකොට මේ ජාතක ධර්‍මදෙශනාව පූර්‍වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

චතුස්සත්‍ය ධර්‍මදෙසනාවගේ කෙළවර උකටලීවූ භික්ෂූන්වහන්සේ දහසක් නයින් හෙබියාවූ සෝවාන්පලෙහි පිහිටා තිවන් දුටුසේක.

එකල මව්පිය දෙදෙන සුඩොදන රජ්ජුරුවන් හා මහාමායා දෙවීවූහ, ජයම්පතිකුමාරයෝ නම් ධර්‍මභාණ්ඩාගාරිකවූ ආනන්‍දස්ථවිරයෝවූහ, එසමයෙහි කුදත් දූන් බුජ්ජුත්තරා නම් භික්ෂුණීවූහ, ප්‍රභාවතී තොමෝ රාහුලස්ථවිරයන්ට මව් බිම්මාදෙවිවූය, එසමයෙහි රජපිරිස් දැන් බුදුපිරිස්විය, ප්‍රභාවතී නිසා සත්මසක් දුක්ගෙණ සත්රජුන් මත්මැඩ සෙමෙහිනබා ප්‍රභාවතීන් ගෙණවුත් රාජ්‍යයකළ කුශරජ්ජුරුවෝ නම් තිලෝගුරු බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

520
සොණ නන්‍ද ජාතකය

ජාතිකාන්තාරාදීන් සත්වයන් එතර කොට නිර්‍වාණ ක්ෂෙම්භූමියට පමුණුවන හෙයින් ශාස්ත්‍රෘනම්වූ දෙවාතිදෙව සමන්තභද්‍ර ශාක්‍යසිංහ කරුණානිධාන සර්‍වඥයන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසනසේක් මේ සොණනන්‍ද ජාතකය දුප්පත්මව්පිය දෙදෙනෙක්හට උපස්ථානකරණ භික්ෂූන්වහන්සේ කෙණකුන් අරභයා වදාළසේක.

මෙහි වර්‍තමාන කථාව සාමජාතකයෙහි පෙණෙන්නේය එකල සෙනු භික්ෂූන්වහන්සේ ඒ නමට මහණ තෝ නෛර්‍ය්‍යාණිකවූ බුද්ධශාසනයෙහි මහණව සැදැහැයෙන් දෙනලද සිව්පසයගෙන ගිහීන් පොෂ්‍යකරන්ට කාරණා

කිම්දැයි දෙඩා ගතාකමැති පරිද්දෙන් බුදුන් සමීපයට කැඳවාගෙණගොස්දක්වා ස්වාමීනි මේ මහණ ගිහීන් පෝෂ්‍ය කෙරෙමින් වෙසෙයි. දැන්වූසේක. එඅසා සර්‍වඥයන්වහන්සේ මහණෙනි මේ භික්‍ෂුහට නොදෙඩව පුරාතනයෙහි නුවණැත්තෝ මුළුදඹදිවට පැමිණියාවූ රාජ්‍යශ්‍රීහැර මව්පියන් පෝෂ්‍ය කෙරෙමින් වාසයකළාහු වේදැයි වදාරා ඒ භික්‍ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ තිලෝගුරු සර්‍වඥයන්වහන්සේ විසින් අතීතකාලයෙහි පැවති කථාන්තරය පාංශුප්‍රතිච්ඡන්න ජාතිරත්නමාණික්‍යයක් ගෙණහැර දක්වන්නාක් පරිද්දෙන් වදාරණසේක් මහණෙනි,

යටගිය දවස බාරාණසීතොම බ්‍රහ්මවර්‍ධන නම් නුවරෙක් විය. එහි මනෝජනම් රජ්ජුරුකෙනෙක් දාන ප්‍රියවචන අර්‍ථචර්‍ය්‍යා සමානාත්මතාය යන චතුස්සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කරන්නාහුය. එනුවර අසූකෙළක් ධන ඇති එක්තරා බ්‍රාහ්මණ මහාසාරකුලයක දරුකෙණෙකුන් නැති බැමිණියකගේ කුසපිළිසිඳගෙණ ප්‍රසූතවූහ. උපන්නාවූ ඒ බෝධිසත්‍වයන්ට මව්පියෝ සෝණක කුමාරයෝයයි නම් තුබූහ. ඔහු පියවරනඟා ඇවිදිනාකල්හි අතික් බ්‍රාහ්මණයෙක් බඹලොවින් අවුත් බැමිණිය කුසඋපන්නාහුය, ඔවුන්ට නම් තබන දවස් නන්දකුමාරයෝයයි නම් තුබූහ. ඔහුන් දෙදෙන වැඩිවිය පැමිණ වේදත්‍රයෙහි පාරප්‍රාප්තව රූපශ්‍රීයෙන් අග්‍රප්‍රාප්තවූවන් දැක බමුණානෝ බෝධිසත්‍වයන් ගෘහවාසබන්ධනයෙන් බඳුම්හයි සිතා බැමිණියට එපවත් කීහ

ඒ අසා බ්‍රාහ්මණී සතුටුව එපවත් සෝණක කුමාරයන්ට කිවූය, එඅසා බෝධිසත්‍වයෝ මෑණියන්වහන්ස මට ගෘහවාසයෙන් කම්නැත, නුඹවහන්සේලාට මා ජීවත්වනතෙක් අත්පා මෙහෙකොට ඉක්බිති හිමාලයවනයට ගොස් මහණවෙමියි කීහ.

දෙමව්පිය දෙදෙන මොහු බාලකලම පඤ්චකාමගුණයෙහි ආලයහැර තපසට යනු කැමැත්තාහ මේ අවස්ථාවට පැමිණියාවූ අපි කැලමවෙද එසේ හෙයින් දරුවෙනි අපගේ ඇවෑමෙන් පැවිදිවෙනපසු දැන්ම එක්වලා මහණවම්හයි කථාකොට එපවත් රජ්ජුරුවන්ට කියා සියළු ධන ධාන්‍යාදී සමෘද්ධිය ශ්‍රමණබ්‍රාහ්මණ දුගීමගී යාචකයන් විෂයෙහි දාන පරිත්‍යාගකොට සියලුදාසි දස් පරිවාර නිදස්කොට බන්ධු වර්‍ගයාට දුනමනා සම්පත් බෙදාදී බමුණානෝය බැමිණිදෙවිය බෝධිසත්‍වයෝය නන්දකුමාරයෝයයි යන සතරදෙනම බ්‍රහ්මවර්‍ධනනම් නුවරින් පිටත්වහිමාලයවන ප්‍රදෙශයෙහි පස්පියුමෙන් විරාජමානවූ මස්කැස්බන් විසින් ගැවසීගත්තාවූ මනාවූ තීරානන්තර ඇති විලක් අසුරුකොට පුෂ්පඵල පල්ලවයෙන් සඤ්ඡන්නවූ සපුනා පනා තාලහින්තාල උක් පුවක් එල්කෙහෙල් ඈ තරුවරගණාකීර්‍ණරම්‍යවූ වනප්‍රදේශයෙහි අසපුවක්කොට ගෙණ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව එහිවාසය කළාහුය.

එකල බෝධිසත්‍වයන් හා මලනුවෝ දෙදෙනා උදැසනනැගීසිට පන්සල හා මළුව හැමද කසලදමා උණුදිය සිහිල්දිය ගෙණහැර දෙමව්පියන්ට දැවටී දඹු මුව දෙවනාදිය දී වලින් මධුරවූ පලාඵලගෙණ උන්අනුභවකරවා උණුදිය සිහිල්දියනබා ඉස්සොඩා නාවා ඉසකෙස් අවුලකඩා වියළමින් පිටමඩිමින් මව්පිය දෙදෙනහට උපස්ථානකරන්නාහ.

මෙලෙසින් කලක් ගියසඳ බොධිසත්වයන්ගෙ මල් නන්දපණ්ඩිතයෝ තමන්ගේ ඵලාඵල දෙමව්පියන් අනුභවකරවා රකිමියි සිතා ඊයේ පෙරවී දවස් ගෙණාතැතින්ම ලද යම් ඵලාඵලයක් පලමුකොට ගෙණවුත් අනුභවකරවති ඔවුන් අනුභවකොට මුවසොධා අටසිල් සමාදන්වන්නාහ.

සොණපණ්ඩිතයෝ දුරගොසින් මියුරු ඵලාඵලගෙණෙති. එකල මව්පිය දෙදෙන සොණපඩිතයෙනි තොපගේ මලනුවෝ ඵලාඵලගෙණවුත් දුන්නාහ. ඒ අනුහව කොට පෙහෙව සැතපීගතුම්හයි ප්‍රතික්‍ෂෙප කරන්නාහ, එපරිද්දෙන්ම නන්දනපඩිතයෝ දුටු ඵලාඵල ගෙණවුත් පලමුකොට වලඳවතියි බොධිසත්වයන්ගෙණ ඵලාඵල අනුභව නොකෙරෙති මෙසේ කීපදවසක්ම අනුභව නොකිරීමෙන් නිෂ්ප්‍රයෝජනවිය. එකල බොධිසත්වයෝ සිතන්නාහු මාගේ දෙමව්පියන් ඉතා සිව්මැලි බැවින් නන්ද පණ්ඩිතයන් විසින් තමන් අසුවූ නොවිලිකුන් ඵලාඵලයන් ගෙණහැමට පලමුකොට අනුභවකරවති මූ දීගටම මෙලෙස කෙරෙත් නම් මෙතන මුන්වහන්සේලා බොහෝ කලක් ජීවත්වන්ට කාරණා නොවන්නේයයි සිතා නන්දයෙනි මෙතැන්පටන් ඵලාඵල ගෙණකල මා එනතෙක් බලව අපි දෙදෙනම එක්වසිට අනුභව කරවම්හයි මලනුවන්ට කීහ.

බොධිසත්වයන් විසින් එලෙසකියන ලද්දවූ නන්දපණ්ඩිතයෝතමන්ටම කුශල්කැමතිව බොධිසත්වයන් කී බස් නොපිළිගත්හ. එසඳ නන්දයෝ මා කීව නොගිවිස අකාරියම කෙරෙතියි එහෙයින් මොහු මෙයින් නෙරපා දෙමව්පියන්ට උපස්ථානකෙරෙමියි සිතා නන්දයෙනි තොපි නොකීකරුව නුව ණැත්තන් කීබස් නොගිවිසුව මම තොපට ඇඹිසිටියෙමි එහෙයින් දෙමාපියන්ගේ කාරිය මට භාරය මම්ම මොවුන් පොෂ්‍යකෙරෙමියි තෙපි මෙහි වාසයනොකර අන්තැනකටයවයි අසුරුගැසූහ. එසඳ නන්දපණ්ඩිතයෝ බෑනන් විසින් නෙරණලදුව ඇසිල්ලකුත් රඳනොගී බෑනන්වැඳ අවසරඉල්වා ගෙණ ගොස් මව්පියන්ට මෙපවත් කියා තමන්ගේ පන්සලටවැද කිහුණු භාවනාකොට එම දවස්ම පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවාගෙණ ප්‍රීතිවාක්‍ය පවත්වා ඉදින් මම මෙරපල්ලේ රුවන්වැලි ගෙණවුත් බෑනන්වහන්සේගේ පන්සල් මළුවෙහි අතුට ක්‍ෂමාකරවාගන්ට සමර්ථයෙම් නොහොත් අනොතත්ත වලින් දියගෙණහැරදී ක්‍ෂමාකරගණිතත් නිස්සෙම් එයින්මට සුදුසු නොවන් නේය; ඉදින් බෑනන්වහන්සේ දෙවියන්ගේ පෙරත්තයෙන් ක්‍ෂමාකරණසේක් වීනම් එකලම බෑනන්වහන්සේගේ ගුණ සකල ලොකයෙහි පැතිර චන්ද්‍ර සූර්‍ය්‍ය යන් පරිද්දෙන් ප්‍රකාශවනසේකැයි සිතා ඒ නන්දපණ්ඩිතයෝ ඒක්‍ෂණයෙහිම ධ්‍යානභාවනාවෙන් ආකාශයෙන්ගොස් බ්‍රහ්මවර්ධනනම් නුවර මනොජ රජ්ජුරුවන්ගේ රාජාංඞගනයට බැස එක්තාපසකෙණෙක් දක්නාකැමතිව අවුයයි රජ්ජුරුවන්ට කියා යුවූහ. ඒ අසා රජ්ජුරුවෝ තපස්වීවරයන්ට මා දැකීමෙන් ප්‍රයෝජන කිම්ද අහරනිසා ආකෙණෙක් වනැයි සිතා බත් යවූහ. ඒ නොගන්නා හෙයින් සාල් පිළී වෙන වෙන යවා කිසිවකුත් නොගන්නා හෙයින් කුමක් නිසා අවුදැයි මිනිස් කෙණකුන් යවා විචාරා රජ්ජුරුවන්ට සේවය පිණිස ආමියනු අසා මට සේවයකරන්නෝ බොහෝය තමන්ගේ තපසම රක්‍ෂා කෙරෙත්වයි කියා යවූහ; ඉක්බිති නන්දපණ්ඩිතයෝ රජ්ජුරුවෝ කැමැති නම් සකල ජම්බුද්වීපයෙහි රාජ්‍යය ඇරදීලන්ට සමර්ථවෙමියි කියා යවූහ.

එබස් අසා රජ්ජුරුවෝ තාපසවරහුනම් නුවණැත්තෝය ඊට නිසි උපායක් දනිත්තම් යහපත්වේදූයි සිතා ඔහු කැඳවා ගෙන්වා ආසනයෙක්හි හිඳුවා, වැඳපුදා ආගන්තුග සත්කාරකොට පිළිසඳර කථාකෙරෙමින් මූළුදඹදිව රාජ්ජ්‍යය ඇරදෙන්ට පිළිවනැයිකීසේක්දූයි විචාළේය; එසේය මහරජ පිළිවනැයි කීසඳ කෙසේ ඇරගෙනදෙනසේක්දූයි සිතා ඔහු කැඳවා ගෙන්වා විචාරා මහරජ කිසිකෙණෙකුන්ගෙන් ඇට ලේ මැස්සක බොනවිවරලේ පොදකුත් නොසොල්ව තොපගෙන් කහවණුවක් විවරවත් හානියක් නොකොට මාගේ සෘද්ධ්‍යානුභාවයෙන් ඇරමදෙමියි කැමතහොත් ප්‍රපඤ්ච නොකොට දූත්ම නික්මෙවයි කීහ. එබස් ගිවිස රජ්ජුරුවෝ සිව්රඟ සෙනඟ පිරිවරා නන්දපණ්ඩිතයන් පෙරදැරිකොට නික්මූනාහුය ඉදින් සෙනාව ග්‍රීෂ්මයෙන් පීඩිතනම් නන්දපණ්ඩිතයෝ තමන්ගේ ආනුභාවයෙන් සීතලච්ඡායාව කරන්නාහුය ඉදින් වැසි වසීනම් වට නොදන්නාහ, මග කටු කනු ආදිය තමන්ගේ සෘද්ධ්‍යානුභාවයෙන් දුරුකොට හෙරිතලයක් මෙන් සමකොට තුබූ ආකාශයෙහි පත්කඩ සම්අතුට ගෙණපලක් බැඳහිඳගෙණ පළමුව නික්මෙන්නාහුය මෙලෙස සෙනාව හැරගෙණ කොසොල්රටට ගොස් නුවරට නුදුරුතන්හි කඳවුරුබැඳ හිඳ යුද්ධ හෝ කරව නොහොත් අපවසයෙහි පවතුවයි අසුන් යවූහ.

ඒ අසා කොසොල් රජ්ජුරුවෝ කිපී මමත් රජෙක් නොවේදූයි සියළු සේනාව සන්නද්ධකරවාගෙණ යුද්ධයට වැද උභයසෙනාව යුද්ධකරන්ට පටන් ගත්කල්හි නන්දපණ්ඩිතයෝ තමන්ගේ ආනුභාවයෙන් පත්කඩ සම්මහත් කොට මධ්‍යයේ අල්වාගෙණ දෙපක්ෂයේ විදි ඊදඬු කිසිකෙණෙකුන් ඇඟටත් වැද නොගන්නා සැටියේ නැවතූහ.

දෙසෙනාවෙහි ඊ දඬු නිමාගියකල්හි දෙපක්ෂයේ ඇත්තෝම ඔවුනොවුන් කෙරෙහි භයින් අත්සිටුවත් මිස කට හැක්කක් නැතිව සිටියාහුය. එසඳ නන්දපණ්ඩිතයෝ නොබව මහරජ යනාදීන් මනොජ රජ්ජුරුවන් අස්වසා කොසොල් රජ්ජුරුවන්කරා ගොස් මහරජ නොබව තොපට කිසිභයෙක් උපද්‍රවයෙක් නැත්තේය. තොපගේ රාජ්ජය තොපටවන්නේය මනොජ රජ්ජුරුවන්ට මිත්‍රව වසඟිවවයි කීවූය. එබස් අසා කොසොල් රජ්ජුරුවෝ යහපතැයි පිළිගත්හ. ඉක්බිති කොසොල් රජ්ජුරුවෝ නන්දපණ්ඩිතයන් කැඳවාගෙණ මනොජ රජ්ජුරුවන් කරාගොස් මහරජ කොසොල්රජ්ජුරුවන් තමන් වසඟත්වයෙහි පවත්වාගෙන ඒ රාජ්ජය උන්ටම පාවාදී දෙසෙනඟ පිරිවරා අඟු රටහැරගෙණ මගධරටයයි මෙලෙසින් සියළු ජම්බුද්වීපයෙහි රජදරුවන් සත් අවුරුදු සත්මස් සත්දවසකින් තමන්ගේ වසයට පමුණුවාගෙණ එක්සියක් රජදරුවන් පිරිවරා බ්‍රහ්මවඩ්ඪන නුවරට අවුත් ජයපානය අනුභවකොට ජය ක්‍රීඩාවට පටන් ගත්හ. එකල නන්දපණ්ඩිතයෝ රජ්ජුරුවන් වහන්සේට උත්සව ක්‍රීඩාවට සතියක් අවසරදී තුමූ උතුරුකුරු දිවයිනට ගොස් අහර සිඟාගෙණ අනුභවකරමින් හිමාලයෙහි රන්ගල්ගුහාවක විසූහ.

ඒ සත්වන දවස් මනොජරජ්ජුරුවෝ තමන්ගේ මහත්වූ ඓශ්වර්‍ය්‍ය විභූතියම දැක මේ ඓශ්වර්‍ය්‍ය මාගේ මව්පිය කිසිවක්හු විසින් දෙනලද්දේ නොවෙයි නන්දපණ්ඩිතයන් නිසාම පැමිණියේය, එසේවූ උන්වහන්සේ නොදකින මාගේ සත්දවසෙක මෙසේ මහත් යසසක් පමුණුවාලූ සබඳ පණ්ඩිතයන් වහන්සේ කොයිදූයි සිහිකළහ.

ඒ තාපසයොත් රජ්ජුරුවන් සිහිකළනියාවදැක හිමාලයෙන් අවුත් රජ්ජුරුවන්ගේ ඉදිරියෙහි සිටියහ. එකල්හි රජ්ජුරුවෝ මම මුන්වහන්සේ දෙවතාවන කෙණෙකුන්බවත් නොදනිමි ඉදින් මනුෂ්‍යයාන කෙණකුත් වීනම් සියළු ජම්බුද්වීපයෙහි රාජ්‍යයමුන්ට දෙමියි නොහොත් දෙවතාන කෙණෙක්ද නොහොත් ගාන්ධර්විකායෙහි උපන්සේක්ද නොහොත් සක්දෙව් රජෙක්ද නොහොත් මනුෂ්‍යානකෙණෙක්ද මෙබඳුවූ සෘද්ධ්‍යානුභාව ඇති නුඹවහන්සේ කවුරුණැයි දනිමෝදැයි විචාළහ. ඒ අසා තන්දපණ්ඩිතයෝ මහ රජ මම දෙවියෙකුත් නොවෙමි ගාන්ධර්විකායෙහි උපන් දිව්‍යපුත්‍රයකුත් නොවෙමි සෘද්ධ්‍යානුභාව ඇති මනුෂ්‍යයෙකිමි කීහ.

එබස් අසා රජ්ජුරුවෝ තපස්වින්වහන්ස මහා මේඝනගා වස්නාකල්හි වැසිවලකමින් ඉතා දරුණුවූ අවුසුලන් පහරණ කල්හි සෙවන කිරීමෙන්ද ශත්‍රුසෙනාව මධ්‍යයෙහි අන්‍යොන්‍යාශර වර්‍ෂාව නිවාරණ කිරීමෙන්ද සියළු ධන ධාන්‍ය වස්ත්‍රාභරණාදීන් සමෘද්ධවූ රාජ්‍යශ්‍රිය හැරදීමෙන්ද එක්සියක් රජදරුවන් අපට පිරිවරකරදීමෙන්ද කරණලද උපකාරයට සතුටූ හස්ති වාහනය සර්‍වාභරණ විභූසිතවූ භාව භාවලීලාකටාක්‍ෂ විලාශ ඇති නාටක ස්ත්‍රීහු සුරභිවනසුන්දර පවර ප්‍රසාදයන් දූඩි සියළු විභූතියද නොහොත් අඟුරට හෝ මගධරට හෝ අස්සකරට හෝ අවන්තිරට හෝ රාජ්‍යයෙන් භාගයක් හෝ දෙමි මෙයින් කැමති දෙයක් වදාළමැනවැයි නොහොත් රාජ්‍යශ්‍රී හෝ කළ මැනව කඩුපලඟගෙණ නුඹවහන්සේ ළඟ මම සෙවය කොට සිටිමියි කීහ.

එබස්අසා තන්දපණ්ඩිතයෝ මහරජ මට රාජ්‍යශ්‍රීයෙන් හෝ ජනපදයෙන් හෝ නුවරකින් හෝ සම්පත්තියකින් හෝ ප්‍රයෝජන නැත්තේය ඉදින් මා කෙරෙහි මෛත්‍රියක් ඇත්නම් මා කී දෙයක්කර කවරේදැයි යනහොත් අපගේ කිසියම් අපරාධයක් නිසා මෙහි නොවසවයි කොපකොට නෙරපූසේක. අපගේ බෑනන්වහන්සේ එතැන්පටන් ගෙණ පූර්‍වාචාරීවූ ඒ මවුපියන්ට අත්පා මෙහෙවර කිරීමෙන් කුශලසඤ්චය කරණ කල්හි සොණපණ්ඩිතනම් මාගේ බෑණන්වහන්සේ නොපගේ ආඥපවත්නා මෙරට වනප්‍රදෙශයෙක්හි මාගේ මව්පිය දෙදෙනා වහන්සේ පන්සලෙක්හි වාසයකරණසේක ඔවුන්. වහන් සේලාට අත්පා මෙහෙවර කිරීමෙන් පින්කොට ගන්ට අවසරයක් නොලදින් බමි නොප පිටිවහල්කොටගෙණ නොපගේ පෙරළත්තයෙන් මා බෑනන්වහන්සේ ක්‍ෂමාකරවාගන්නා කැමැත්තෙමි ඊට සහායවයි කීහ.

එබස්අසා රජ්ජුරුවෝ තන්දපණ්ඩිතයන්වහන්සේට සියළු ජම්බුද්වීපයේ රාජ්‍යය දෙමි කී මම මෙච්චර කටයුත්තක් කුමකැයි නොකෙරෙම්ද කෙතෙක් දෙනා විචර කැඳවාගෙණ යමෝදැයි විචාළහ. එකල තන්දපණ්ඩිත යෝ මහරජ නොප පන්සියයක් රජදරුවන් හා එපමණවූ බ්‍රාහ්මණයන් හා ගෘහපතීන් විචරක් පමණයයි කීහ.

එකල්හි රජ්ජුරුවෝ ඇත් අස් රිය පාබල සෙනඟයයි කියනලද චතු රඞ්ගිණී සෙනාව සන්නද්ධ කොට ධජපතාක තම්මැට තිසාන ආදිය හා බාද්‍ය භොජ්‍යාදි මාර්‍ගෝපකරණ දරුවන් හා සූවිසි අක්‍ෂෞහිණියක් සෙනාව විසින් පිරිවරණ ලදුව තන්දපණ්ඩිතයන් පෙරදැරිකොට නුවරින් නික්මුණාහ.

එසඳ නන්දපණ්ඩිතයෝ තමන්ගේ ආනුභාවයෙන් නුවරෙහි පටන් ආශ්‍රම පදය දක්වා අටඉස්බක් පමණ පලලින් මග කණු කටු ආදිය පහකොට තනා සරහා පිළියෙලකොට ආකාශයෙහි පත්කඩ සමඅතුට එහිවැඩහිඳ සරහන ලද ඇතුට නැගී යන්නාවූ රජවරුන් හා ධර්මාන්විත කථාකෙරෙමින් සියල්ල වුන්වම ශීතොෂ්ණාදී පීඩාවක් වැද්දනොදී ක්‍රමයෙන් කතරමග ගෙවා ගොස් ආශ්‍රම පදයට වදනා දවස් සොණපණ්ඩිතයෝ මාගේ මලනුවන් මා ලඟින් ගියේ මෙවකට සත්අවුරුදු සත්වස් සත්දවසකැයි සිහිකොට මේවකට උඹ කොතන වෙසෙත්දෝහෝයි දිවසින් බලා එක්සියයක් රජදරුවන් හා සුවිසි අක්ෂෞහිණියක් සේනාව විසින් පිරිවරණලද මනොජ රජ්ජුරුවන් මට පැරුත්තයට කැඳවාගෙණ එන්නාහුයයි දැක ඔවුන් හැම විසින් මාගේ මලනුවන්ගේ නොයෙක් පෙළහර හා ආනුභාවදක්නාලද මෙතනට අවුත් මාගේ කිසිවිශෙෂයක් නුදුටුවහොත් මාගේ විශ්වභාව විශෙෂය දැක මේ ඝොර තාප සයා තමාගේ කිසි ආනුභාවයක් නැතිව තිබැදී මහානුභාව සම්පන්නවූ අපගේ තපස්වීන් හා සමගන් ස්පර්ධාකෙරෙත්ලයි මා කෙරෙහි සිත නපුරුකොටගෙණ නින්දකොට අපායටගියාහු නම් නපුරුයි සිතාමොවුන්ට පළමුකොට සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වාලිය යුතුයයි සිතා කද හැරගෙණ අනොතත්තවිලින් පැන් ගෙනෙන්ට යන බඳුවන තමන්ගෙ කරසරියේ සතරඟුලක් නැන සිස්කෙරෙහි රඳවාලා කැටිව යන සැටයේ අධිෂ්ඨානකොට රජ්ජුරුවන්ගේ ඉදිරියෙහි ආකාශයෙන් නික්මුණාහුය එසඳ නන්දපණ්ඩිතයෝ එන්නාවූ බෑනන්වහන්සේ දැක ඉදිරියෙහි සිටියනො උන්නැතින් අනන්තර්ධානව හිමාලයවනයට ගියාහුය.

එසඳ මනොජරජ්ජුරුවෝ ආකාශයෙන් එන සොණපණ්ඩිතයන් දැක කොළොම් දඬෙන් කරණලද කද කරවැදනොගන්නා පරිද්දෙන් ආකශයෙහි රඳවාගෙණ එන්නාවූ නොපි කොයිසිට කොයියන්නාවූ කවුරුදැයි විචාළෝය, එබස් අසා බොධිසත්‍වයෝ මහරජ ශීලව්‍රත සමාදානයෙන් යුක්තව තාපසවෙසධාරීවූ මට සොණපණ්ඩිතයෝයයි කියති නොපගේ විජිතවූ මෙවෙනෙහි මධුර වනමුල් වනඵලාදීන්ගෙණ වයොවෘධවූ මව්පිය දෙදෙනාගට රූ දුවල් නොපමාව ඔවුන්ටම ගත් දුක් සිහිකොට එනයින් මිදී කුශල පුරා ගන්නා පිණිස පොෂ්‍යයකෙරෙමි කීහ.

එබස් අසා සොණපණ්ඩිතයන් හා මිත්‍රසන්ථව කරණු කැමතිව කෞශික ගොත්‍ර ඇති සොණපණ්ඩිතයන්වහන්ස නුඹවහන්සේගේ ආශ්‍රමයට යන්නා කැමැත්ත අපට මග කියාලුව මැනවැයි කීහ.

ඉක්බිති මහාබොධිසත්‍වයෝ පියවර සටහන් ඇති මංහසරක් මවා එම්බා මහරජ තෙල මංහසරින් ගියකල මේතෙනෙක්හි මේඝකූටයන් හා සමාතවූ ඝනවනච්ඡායා ඇති කොබෝලීල පළොල මිලිල අඹ දඹ නා පනා කෙහෙල් පුවගු නෙරළු මුහුළු ආදී පුෂ්පජාති එල එල්ලවයෙන් සඤ්ඡන්නවූ තරු වරගණාකීර්ණ වනසටයෙක් ඇද්ද? එතැන්හි කෞශික නම්වූ පියානන් වහන්සේ ඉඳ තපස්කරණසේක් එතෙම මාගේ තපොවනය වන්නේයයි රජ්ජුරුවන්ට මංසලකුණු කියා සොණපණ්ඩිතයෝ යුහුව අනොතත්ත විලට ගොස් පැන් ඇරගෙණ පළමුකොට පන්සලට අවුත් සපු දුනුකේ සීනිද්ද පළොල් මල් ආදීන් සුවඳ ගෙන්වා තැන්පත්කොට තබා ගෙය මළුව හැමද

පන්සල්දෙර පියාණන්ට උස්පුටුවකුත් ඊට පසුකොට මෑනියන්ට මිටිපුටුව කුත් පණවා පන්සලට වැද පියානන් වහන්සෙ එක්සියක් රජදරුවෝ මහ සිරි වරින් යුක්තව අපදක්නා පිණිස එන්නාහ ඔබවහන්සේ එළියට වැඩඋනමැන වැයි කීවාහුය, එඅසා කෞශිකතාපසයෝ පන්සලින් පිටත්ව පණවනලද අස් නෙහි ද මෑනියෝ මිටි අස්නෙ හිඳ උන්නාහුය.

ඉක්බිති බොධිසත්වයෝද මිටිඅස්නෙහි එකත්පස්ව උන්හ එකල නන්ද පණ්ඩිතයොත් බෑනන් ගියපසු මනොජ රජ්ජුරුවන් ප්‍රධානවූ එක්සියක් රජ දරුවන් කරුඅවුත් ආශ්‍රමයට නුදුරුතැනෙක්හි සෙනාව සන්නිවෙසකොට රූඳවූහ.

ඉක්බිති මනොජ රජ්ජුරුවෝ පැන්සනහා සම්භාරයෙන් සැරහී රජ දරුවන් පිරිවරණ ලදුව නන්දපණ්ඩිතයන් කැඳවාගෙණ සොණපණ්ඩිතයන් ක්ෂමාකරවනු පිණිස මහත් ශ්‍රී සෞභාග්‍යයෙන් යුක්තව ආශ්‍රමයට ගියාහ.

එසඳ මහබොධිසත්වයන්ගේ පියානන් වහන්සේ රජදරුවන් පිරිවරණ ලදුව ශක්‍රදෙවේන්‍ද්‍ර විලාසයෙන් එන්නාවූ මනොජ රජ්ජුරුවන් දැක පඤ්චාඞ්ගිකතූර්‍ය්‍ය මිහිගුබෙර තූර්‍ය්‍යයන් දහසක් කළාහ ආදිවූ නොයෙක් සොභාවන් පවත්වා සතපලල් මෙඝකූටයක්මෙන් විනිගීත විද්‍යුල්ලතා සශ්‍රීකවූ තරුණාකීරශ්මි ප්‍රතාපයක්මෙන් විරාජමානවූ තලල්පට ආදී නානාභරණයෙන් සැදී පැදී දුනු ඉයවුරෙහි සන්නඞව උදුනෙහි බහානබනලද නාඹජම්බොනද සවර්ණයට බඳුවූ සොභාඇති සහලගුරුරුසක්මෙන් තෙජස් දීප්තිමත්වූ මූබ සොභාවෙන් විරාජමානවූ නගතලද ධවලාධපත්‍ර ඡායාවෙන් දුරුකරණ සූර්‍ය්‍යකාන්ති ඇති උභය පාර්ශ්වයෙහී විහිදුවනලද චාමීකරුචාරුචාමරයන් ඇති විසිතුරු සන්නාහයෙන් සරහනලද සෙන්ධව සමාරූඪව නගන ලද ධවලාතපත්‍ර ඇති නොයෙක් රජදරුවන් පිරිවරණ ලදුව අකම්පසවභාව ඇති මහාසමුද්‍රයෙහි තරඞගපරම්පරාවන් පරිද්දෙන් අපමණවූ චතුරඞගිණී සෙනාව විසින් පිරිවරණලදුව අනුනවූ ශ්‍රීවිභූතියෙන් යුක්තව එන්නාවූ මූ කවරෙක්දැයි විචාළහ.

එසඳ මහාබොධිසත්වයෝ පියානන්වහන්සෙ එක්සියක් රජදරුවන් පිරි වරා සූවිසි අක්ෂෞහිණියක් පමණ සෙනාව පිරිවරණලදුව අසුරයන් පිරිවැරූ සුරෙන්ද්‍රයා විලාසයෙන් මුළුදඹදිවට අධිපති රාජන්වූ මනෝජරජ්ජුරුවෝ මාගේ මලනුවන් නන්දකුමාරයන්ගේ කීමෙන් මා ක්ෂමාකරවන පැරුන්නයට එන්නාහුයයි කිවුය එකල තාපසයන් මෙලෙස ඔවුනොවුන් කථාකරමින් ඉන්දදී මනෝජරජ්ජුරුවන් ප්‍රධානවූ එක්සියක් රජදරුවෝ සෘෂිවරයන් කරාගොස් නමස්කාරකොට සිටියාහ.

ඉක්බිති මනෝජරජ්ජුරුවෝ සෘෂිවරයන් පසඟපිහිටුවා වැඳ එකත් පස්ව ඉඳ කිමෙක්ද තපස්වීන් වහන්සෙ නුඹවහන්සේලාට සැපද රොගවැසෙත නැද්ද වනමූල ඵලාඵලාදිය ඇවිලි ආහාරය සුලභද මෙවනයෙහි වාසය කරන්නාවූ නුඹවහන්සේට මැසිමදුරු ආදිවූ නයි පොළොන් සිංහ ගව වලස් ආදී දුෂ්ටසත්වයන්ගෙන් පීඩානැද්දැයි යනාදීන් සුවදුක් විචාළහ.

එබස්අසා කෞශික තාපසයෝ මහරජ්ජුරුවෙනි අපට බලවත් ලෙඩ දුක් නැත්තේය, වනමුල් වන ඵලාහාරයන් සුලභය තවද මහරජ මැසි මදුරු දුක්ද සිංහ ව්‍යාඝ්‍රවලසුන්ගෙන් පීඩා දුකකුත් නැත්තේය, තවද මහරජ මේතපො වනයෙහි බොහෝවාකලයක් මුළුල්ලෙහි වාසයකරන්නාවූ අපට කිසිපීඩාව කුත් නැත්තේයයි කියා මහරජ තොපගේ ඊම යහපත් ගමනෙක් වේවයි මේ තපොවනයට පැමිණියාවූ තොපසියල්ලන් විසින් සත්කාරකටයුතු බැවින් ප්‍රධානයම්හ මේ තපොවනයෙහි යමකින් තොපට ප්‍රයෝජනයෙක් ඇත්නම් තොපගේ අභිප්‍රාය අපට කියව. තවද මහරජ දඹුවැල්බෑ මී හා සමානවූ මධුරරස ඇති රන්වන් තිඹිරියකටු එරමිණිය යනාදීවූ යහපත් ඵලාඵල යෙන්ද අනොතත්තවිලින් ගෙණවිත් සුවඳ කවා සිහිල්බස්වනලද මිහිරිපැන්ද යනමෙයින් කැමති දෙයක් අනුභවකරවයි යනාදීන් ආගන්තුග සාද කළහ.

ඒ අසා රජ්ජුරුවෝ තපස්වීන්වහන්ස නුඹවහන්සේ විසින් අපට අතිථි සත්කාර පිණිස දුන් ඵලාඵල ආදියෙක් ඇත්නම් ඒ සියල්ල අප විසින් පිළිගත්නාලද නන්දපණ්ඩිතයන් වහන්සේ යම් කටයුත්තක් කියනසේක්වීනම් ඒ වචනයත් ඇසුව මැනව. අපි ඇමදෙනමොත් අන්කිසිකාරියක් නැතිව නන්ද පණ්ඩිතයන් වහන්සේගේ කීමෙන් සොණපණ්ඩිතයන්ට පැරුත්ත කියා ක්ෂමා කරවන පිණිස ආම්හයි කීහ.

රජ්ජුරුවෝ එකල සකිසඳ නන්දපණ්ඩිතයෝ උනස්නෙන් නැගීසිට දෙමව්පියන්ටද සොණපණ්ඩිතයන්ටද නමස්කාරකොට රුස්වූ පිරිස අභිමුඛව අධිකරණරාජයන්වූ මනොජ රජ්ජුරුවන් ප්‍රධානව මේ එසියක් රජදරුවන් හා බ්‍රාහ්මණ ගෘහපතීන් ඇතුළුවූ මේ සියළුපෂීත්ද අතිකූත් මේ වනයෙහි ඇත් තාවූ සියළු දෙවියෝද මා කියන්නක් අසත්වයි දෙවියන්ට බඩාඤ්ජලීව සොණපණ්ඩිතයන් වහන්ස මම නුඹවහන්සේට මල්ව සිටි හෙයින් දක්ෂිණා බාහුව සමානයෙමි එසේහෙයින් මාකළ අපරාධය ක්ෂමාකළ මැනව බෑනන් වහන්ස වීයඹී ඇති නුඹවහන්සේ කුශලක්ෂෙත්‍ර මව්පිය දෙදෙනහට උපසථාන කොට කුසල්රුස්කරණුකැමතිවූ මානොවැළකූව මැනව. බෑනන්වහන්ස දෙමව් පියන්ට උපසථාන කිරීමනම් නුවණැත්තන් විසින් උතුමැයි ප්‍රශංසාකරණලද ඒ කුශලය නුඹවහන්සේ විසින් බොහෝ දවසක් කරණලද මෙතැන් පටන් ගෙණ මටත් උපසථානකරන්ට අවසරදීමෙන් සුරලොව සැප මටත් බෙදාදුන මැනවැයි කියා යාචඤාකළහ.

මේ ලෙස නන්දපණ්ඩිතයන් විසින් කීකල්හි මහාබොධිසත්වයන් වහන් සේත් මුන් විසින් කීබස් ඇමදෙනා විසින් ඇසුවා ඇත්තේ වේද; මුන්ගේ කීමෙන් මට පැරුත්තයට ආ හැමදෙනාම මා කියන්නක් ඇසුව මැනවැයි පෂීදව අභිමුඛව මහරජ කුලයෙහි බාල වෘඩ දුප්පත් පොහොසත් සියළු සත්ව යන්ගේ පොෂ්‍යය එකුලයෙහි වැඩිසිටි කෙණකුන්ට භාරවන්නේය. මේ ලෙස නොකොට ඒ සවභාව ධර්‍මය පිරිහෙලන්නාවූ වයී ජ්‍යෙෂ්ඨ සත්වතෙම නරකාදී සතර අපායට පැමිණෙන්නේය.

තවද මහරජ යම්සත්වයෙක් මව්පිය බන්ධූන් ආදී වයී ජෙෂ්ඨයන්ට අන්පා මෙහෙවර කිරීම් ආදීන් උපසථානකොට රැක්කේවීනම් එසේවූ සත්ව

තෙම මරණින් මත්තෙහි නරකාදී අපායට නොගොස් සුගතියට පැමිණෙන්නේයයි වදාළහ.

තවද මහරජ මැනියෝය පියානෝය බූනනියෝය යන මේසියල්ලෝම නැයෝයයි යන මේ හැමදෙනම ඒ ඒ වගීයට ජ්‍යෙෂ්ඨ නෑනෑත්තන්ට භාර වන්නාහ. යම්සේ නැවෙක්හි බොහෝ බඩු පටවාගෙන සමුද්‍රයෙහි යාත්‍රාකරණ කල බඩු හා මනුෂ්‍යයන් ඇතුළුවූ සියල්ලම නොනසා අභිමතාර්ථයට ගෙණයාම නැවියාට භාරවේද එපරිද්දෙන්ම මම මේ වංශයට ප්‍රධානයෙමි. එසේ හෙයින් මව්පියදෙදෙනානට පොෂ්‍යකිරීම මටභාරයයි මම්ම රකිමියි යනාදීන් මව්පියන් රැකීමෙහි අනුසස්කීමෙන් ධර්මදේශනා කළාහ.

එබස්ඇසූ හැම රජ්ජුරුවෝම සමාධිව අඥනාන්ධකාරයෙන් වැහෙනලද නුවණැස් ඇති අපි ඇම යම්සේ පර්වතාග්‍රයෙහි දීප්තිමත්වූ වහ්නිස්කන්ධය සියළු සතුන්ට ප්‍රකාශකෙරේද යම්සේ උදයපර්වතයෙහි පළමු සූයර්‍යාලොකය ඉෂ්ටානිෂ්ටවූ සියළු වස්තූන් ප්‍රකාශකෙරේද එපරිද්දෙන් සොණපණ්ඩිතයන් වහන්සේගේ ධර්මශ්‍රවණයකොට ජ්‍යෙෂ්ඨපචායන ක්‍රියායෙහි ඉෂ්ට විපාක ඇත්තේය යි යනාදී මනෝරජ්ජුරුවන් ප්‍රධානවූ සියළු සත්වයෝ සොණපණ්ඩිතයන්ට සතුතිකොට කුල්මත් වචනයන් පැවැත්වූහ.

මෙතෙක්කල් මුළුල්ලෙහි නන්දපණ්ඩිතයන්ගේ ප්‍රාතිහාර්‍ය දැක උන් කෙරේ ප්‍රසන්නවූ රජදරුවන් මහබෝධිසත්වයෝ තමන්ගේ නුවණ බලයෙන් තමන්ගේ වසඟයට පමුණුවා ගත්සේක. එහෙයින් මුන්වහන්සේ විනා මට අන් පිළිසරණෙක් නැත්තේය. මුන්වහන්සේට යාච්ඤාව අවසරයක් ලදිමිනම් යෙහෙකැයි සිතා දෙහොත්මුදුණෙහි බැඳ බෑනන්වහන්ස මෙලෙස මා යාච්ඤා කරමින් සිටියදී නොපිළිගන්නාසේක්වීනම් නුඹවහන්සේම මවුපිය දෙදෙනාට උපස්ථාන කළමැනවැයි මම නුඹවහන්සේට අත් පා මෙහෙවර කරමි සිතා කියා යාච්ඤාකළහ.

මහාබොධිසත්වයන් කෙරෙහි වෛරයෙක් වෛෂයෙක් නැත්තේය තවද රූක්‍ෂවූ බස් කීමෙන් මානනිග්‍රහ කෙරෙමියි කිපියාක්මෙන් පැවත නිහත මානීව මලනුවන් විසින් කියන යාච්ඤාව අසා සතුටුව ක්‍ෂමාකෙළෙමි මෙතැන්පටන් උපස්ථානකරන්ට ලැබෙවයි යනාදීන් කියා මත්තෙහිදු ඔහුගේ ගුණ කියන්නාහු මහාබොධිසත්වයෝ නන්දපණ්ඩිතයෙහි නෙපි ඒකාන්තයෙන් බුඩාදී සත්පුරුෂයන් විසින් දෙශනාකරණලද සඬර්මය යහපත්කොට දන්න හුය. එහෙයින් ඌඩකායවාක් සමාචාරයෙන් සොහමානවූ ගුණ ඇත්තෙහිය අතිශයින් මම තොපකෙරෙහි ප්‍රසන්නවීමියනාදීන් නන්දපණ්ඩිතයන් අස්වසා දෙමව්පියන් දිසාවට නමස්කාරකොට පින්වත්වූ නුඹවහන්සේලාත් මා කියන් නක් අසාවදාළ මැනව නුඹවහන්සේලා නිසා කිසිලෙසකිනුත් මටබැරැරුමෙක් නොවන්නේය එතකුදුවුවත් මාඋපස්ථානකරමින් සිටියදී මේනන්දපණ්ඩිතයෝ මෙතෙක්දෙනා පැරැත්තයට ඇරගෙණ අවුත් මට යාච්ඤාව නුඹවහන්සේලාට උපස්ථානකරන්ට අවසර ඉල්වති අප දෙදෙනම නුඹවහන්සේගේ පුත්‍රයම්හ මා විසින් නෙපි එක්කෙණෙක්ම උපස්ථානකරවයි කීම සුදුසුනොවෙයි අප

දෙදෙනාගෙන් කවුරු උපස්ථානකරන්ට අභිප්‍රායද තන්දයෝ කවුරුන්ට උපස්ථාන කෙරෙද්දැයි විචාළහ.

එකල සොණපණ්ඩිතයන්ගේ මෑනියෝ හුනස්නෙන්නැගී දරුවසොණපණ්ඩිතයෙනි තොපගේ මලනුවෝ බොහෝදවසක් අපහැමකෙරෙන් වෙන්ව විසූය. එසේදවුවත් බොහෝකලකින් දුටුවාවූ මූන්කෙරෙහි ස්නේහ ප්‍රකාශ කරන්ටත් නොපිළිබඳව සිටිහෙයින් නොහැක්කෙමි. ඉදින් තොපගේ අභිප්‍රායෙක් ඇත්නම් තොපගේ මලනුවන් ලංකොටගෙණ මුදුනෙහි සිඹසනහන්නා කැමැත්තෙමි කිවූය. එබස් අසා බොධිසත්වයෝ මෑනියන්වහන්ස මාතනස්සඑවෙතියි නොසිතා නුඹවහන්සේගේ පුතනුවන් ලංකොටගෙණ සනහාසිත ඇති සොකදුක්කබයෙක් ඇත්නම් දුරුකළමැනවැයි කිවූය. එසඳ බොධිසත්වයන්ගේ මෑනියෝ නන්දපණ්ඩිතයන් මහජනයා මධ්‍යයෙහි නන්දපණ්ඩිතයන් ලංකොටගෙණ දරුව සොණපණ්ඩිතයෙනි තොපගේ මලනුවන් බොහෝකලක් නුදුටු හෙයින් මාගේ ලය ඇසළමස මහපවනින් පහරණලද බෝගසෙකපලුපතක්මෙන් කම්පා වන්නේය. යම්කලෙක්හි රාත්‍රියෙහි සිහෙනුන් මේ නන්දපණ්ඩිතයන් අපගේ ආශ්‍රමයට ආනියාව දැක බලවත්වූ සන්තොෂයටපැමිණියමෝද ඒ තන්දයෝ දැන් අපගේ ආශ්‍රමයට ඒකාන්තයෙන් ආහෙයින් අපමණසන්තෝෂයට පැමිණියෙමි. ඉදිරියෙහිත් මේ තන්දයෝ යම්ලෙසකින් වෙන්වගියෝනම් සොකදුක්කබය දියුණුවන්නේය. මොහු දැක්ම තොපටත් මටත් පියාතන්වහන්සේටත් ප්‍රියය එහෙයින් මෙවක් පටන් තන්දයෝ තොපගෙන් අවසර ලැබෙත්වයි මෙතැන්පටන් තොපිතොපගේ පියාතන්වහන්සේට උපස්ථාන කරව තන්දයෝ මට පොෂ්‍යකෙරෙත්වයි බොධිසත්වයන්ට යාච්ඤාකොට කීහ.

ඒ අසා සොණපණ්ඩිතයන්වහන්සේ මෑනියන් බස් පිළිගෙණ නන්දයෙනි තොපවිසින් ප්‍රධානකොට්ඨාසය ලබනලදමව්නම් දරුවන් ප්‍රාර්ථනාකොට ඉෂ්ටදෙවතාවන්ට අයදිමින් කවරසෘතුයෙහි කවරමස කවරනකතක කවරදවසෙක උපන් දරුවෝ දිගාවෙද්ද සනාදීන් නකත්මොහොත් විචාරමින් දුක් විඳිති. නවද මෙලෙස සත්පුරුෂාකාරයෙහි නිරතවූ පුත්‍රලාභයට කාරණා ඇතිනැත්නම් මල්වරගෙණ සතරවෙනි වාරයෙහි ගර්භයාගේ පිළිසිඳීම වන්නේය එලෙස පිහිටි ගර්භොත්පත්තිය නිසා දොළදුක් උපදනේය උපන් ඒ දරුදොළනිසා සුවපත්වන්නේය දසඑකඩමසක් මූඑල්ලෙහි එදරුගැබ උසුලමින් ගබපෙරහර කෙරෙමින් වඳා කිරිපොවමින් අත් පා කන් නාසා ඇඹීමෙන් සිරුරුපිළියම් කිරීමෙන් ශීතොෂ්ණාදී උපද්‍රව වැද්දනොදී පොෂ්‍යකෙරෙමින් මාතෘසන්තකවූවත් යම්ධනයෙක් ඇත්නම් ඒසියල්ල ඔහු සන්තකකොට රැක්මෙන් කවාපොවා වඩා වර්ධනකොට ඉඳීම් සිටීම් ඇවිදීම් පැලඳීම් ආචාරසමාචාරයෙහි හික්මවමින් ඔහු යෞවන අවස්ථාවට පැමිණිකල්හි පරදාරාදී දොෂයෙන් විඳිනා උපද්‍රවයෙන් වළකමින් කිසියම් තැනකට ගියසඳ අවමනාකලට වෙලාවට නුදුටුවහොත් අඬා දොඩා වැලප සොකයෙන් පීඩාවිඳිමින් මේ ආදීනොයෙක් ආයාසයෙන් වඩා වර්ධනයකොට දරුපොෂ්‍යය කරන්නාහුය.

මෙලෙසින් නොයෙක් දුක්ගෙණ වර්ධනයකල මවුපියන්ට සත්වයෙක් අත්පා මෙහෙවරකිරීමෙන් ආදී පොෂ්‍යනොකොට අනාචාරිව පවතිද්ද ඒ සත්ව

තෙම නරකාදී සතර අපායට යත්තේ ය. තවද යම්සත්වයෙක් කෘෂිවණිජ්ජාදීන් ධනාර්ජනය කොට දෙමව්පියන්ට උපස්ථාන නොකෙරේද ඔහු සම්පත් වහා නැසෙන්නේය සුගතියට නොපැමිණෙන්නේය. තවද යම් සත්වයෙක් මවුපියන්ට උපස්ථානකෙරේද ඒ තෙම මෙලොව ජීවත්වනතෙක් සුඛිත මුදිතව සියල්ලන්විසින් නින්දා පරිභවයට නොපැමිණ සැපසේ ජීවත්ව සුගතියට පැමිණෙනේය. තවද නන්දයෙනි මේ ලොකයෙහි යම් සත්වයෙක් ශ්‍රමණ බ්‍රාහ්මණ මවුපිය බෑ බුන් නැදිමයිල් මේ ආදීවූ ඒ ඒ සත්වවිශෙෂයෙහි ශක්තිවූ පරිද්දෙන් බත් පිළී ආදී දීමය කන් කටුලූනොවූ බසින් යුක්තව බැණ නැගීමය ඔවුන්ගේ පැමිණි ලෙඩදුක් ආදිය සියළු කාරියෙහි උපෙක්ෂානොවී බැලීමෙන් වැඩෙහි හැසිරීමය ඒ ඒ තැන්හි වන්දනාමානන සම්භාෂණ පොෂණාදීවූ තමා තමා හා සමානකොට තැකීමය යන මේ සතර සංග්‍රහවස්තුවෙන් නොපවතිත්ද ඒ සත්වයාගෙන් මවුපියන්ට කිසි ප්‍රයෝජනයෙක් නැත්තේය මවුපියන් නිසා ඕහටද වැඩක් නැත්තේය ඔහුට සුගතියාමකුත් නැත්තේය එහෙයින් මවුපියන්ට උපස්ථානකරන්නාවූ සත්වතෙම සියල්ලවුන්ගෙන්ම මෙලෝප්‍රසංශාවද පරලෝ සුගතියද ලබන්නේය.

තවද නන්දයෙනි දරුවන් කෙරෙහි අනුකම්පා ඇති මවුපියෝ ශ්‍රේෂ්ඨ හෙයින් ප්‍රධානහෙයින් බ්‍රහ්මයා හා සමානයයිකියාද උත්තප්‍රකාර හෙයින් පූර්වාචාරීයයි කියාද ඉදින් දුරසථව උනත් උන්තැනින් කැඳවා ගෙන්වාගෙණ කරන්නාවූ සියළු සම්භාවනාවට යොග්‍යයයි කියාද බුඬාදී උත්තමයන් විසින් කියනලද ඒ කාරණයෙන් ප්‍රාඥවූ සත්වතෙම දෙමව්පියන් ආදීන්ට වැඳීම් පිදීම් අන්නපානාදී වස්ත්‍රාභරණාදිය දීමෙන් ඇඳපුටු ආදියදීමෙන් ඇඟ ඉලීම් ඉස්සේදීම් පයසේදීම් තෙල්ගෑවීම් ආදී උපස්ථානකිරීමෙන් නුවණැති සත්වයෝ කුසල් පුරාගෙණ මෙලොව ප්‍රශංසාවද පරලොව සවගෝත්පත්තියටද පැමිණෙන්නේයයි යනාදීන් මහබොධිසත්වයෝ නන්ද පණ්ඩිතයන්ට මහමෙරපෙරලන්නාක්මෙන් මනෝත්සාහයෙන් ධර්‍මදෙශනා කළහ. ඒ අසා මනොජරජ්ජුරවන් ප්‍රධානවූ සියලුසත්‍වයෝ සාධුකාරනාද පවත්වමින් සතුටුවූහ.

එකල මහාබොධිසත්වයෝ එහි සියළුසත්වයන් පන්සිල්හිපිහිටුවා දානාදී සුචරිතයන් පුරා අප්‍රමාදවවයි අවවාදකොට නික්මුනාහ. එකල මනොජ රජ්ජුරුවන් ප්‍රධානවූ සියළු රජ පිරිස දශකුශල ධර්‍මයෙහි පිහිටා සොණ පණ්ඩිතයන්ගේ අවවාද අනුශාසනාවූ පරිද්දෙන් දිවි පමණින් වාසයකොට මරණින් මත්තෙහි සවර්ගපදප්‍රාප්තවූහ.

සොණ නන්දපණ්ඩිතදෙදෙන ජීවිතාන්තය දක්වා දෙමව්පියන්ට උපස්ථානකොට ජීවිතාන්තයෙහි බ්‍රහ්මලොකයෙහිගොස්උපන්නාහුයයි තිලෝගුරු බුදුරජානන්වහන්සේ අතීතකථාව ගෙණහැරදක්වා දෙමව්පියන්ට උපස්ථාන කරන්නාවූ ඒ භික්ෂූන්වහන්සේ ප්‍රධානවූ සිව්වණක් පර්ෂදට ධර්‍මදෙශනා කොට මේ සොණ නන්ද ජාතකය නිමවා වදාළසේක.

එකල්හි මව්පියන්ට උපස්ථානකල භික්ෂූන්වහන්සේ සෝවාන්ඵලයෙහි පිහිටිසේක. එකල්හි මව්පියෝ දෙදෙන දැන්මේ සුඬොදනරජ්ජුරුවන් හා මාහා

මායා දෙවිවූ තන්දපණ්ඩිතයෝතම් දූත් ආනන්දසථවිරයෝය. මනොජරජ්ජුරුවෝතම් ශාරිපුත්‍ර සථවිරයෝය. සියක්රජදරුවෝ තම් අසූමහසව්වන් හා අවශෙෂ සථවිරවූහ. සූවිසිඅක්‍ෂොහිණියක් සේනාව දූත් බුදුපිරිස්වූහ. එසම යෙහි සොණ පණ්ඩිතයෝතම් දූත් ලොවුතුරු බුදුවූ මම්මවේදූයි තමන් වහන්සේ දක්වා වදාළසේක

සත්තති නිපාත වණ්ණනා

521
චූල්ලහංස ජාතකය

තවද ජාති කාන්තාරාදීන් සත්‍වයන් තාරණය කොට නිර්වාණ ක්‍ෂෙම භූමියට පමුණුවන හෙයින් ශාස්තෘනම්වූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසනසේක් ආයුෂ්මත්වූ අනඳ මහතෙරුන්වහන්සේ විසින් සර්‍වඥයන්වහන්සේ උදෙසා කරණලද ජීවිත පරිත්‍යාගය අරභයා මේ චූල්ලහංසජාතක ධර්‍මදෙශනාව වදාළසේක.

දෙව්දත්තෙරහු විසින් සර්‍වඥයන් නසන පිණිස මෙහෙයනලද්දූවූ දුනුවායන්ගෙන් පළමුගිය තැනැත්තවූ අවුත් මහානුභාවසම්පන්නවූ ලොකාග්‍ර ප්‍රාප්ත ශාක්‍යරාජවංශ ප්‍රසූත ඒ බුදුන් විෂයෙහි අපරාධයක් කරන්නා තබා කිපිසිතින් ආසන්නයට වැදන් නොහැක්කැයි යනාදීන් කීසඳ ඒ අසා දෙව දත්තසථවිරයෝ තොපට බැරිවී නම් මම්ම ඊට උපායක් කෙරෙමියි සිතා එතැන්පටන් උත්සාහකෙරෙමින් එක්දවසක් බුදුරජානන්වහන්සේ ගිජ්ඣකූට පර්‍වතප්‍රාන්තවූ පච්ඡිමච්ඡායාවෙහි සක්මන්කෙරෙමින් වැඩසිටි නියාව දූක පර්‍වතමස්තකයට පැනනැගී සක්මන්කරණ සර්‍වඥයන් මස්තකයෙහි ගල් කුළක්පෙරලා ජීවිතක්‍ෂයට පමුණුවාලමියි සිතා මහත් වටකුළුගලක් රූකුලක් දක්වා දණ්ඩකින් පෙරලා එළුවාහුය. එසඳ භූමියෙන් ගල්පර්‍වත දෙකක් පැන නැගී එගල පිළිගත්තේය එසඳ ඉන් ගල්ලැහැල්ලෙක් ඉපිරගොස් සර්‍වඥයන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි වැටී පිටිපත්ලෙහි ලේ ඉපදවා මහත්වූ වේදනාවට පමුණුවාලූයේය. එකල ජීවකයෝ සර්‍වඥයන්ගේ ශ්‍රීපාද බලවත්වේදනා ඇති නියා අසා සැත්කම්කොට දෙෂහැර ඖෂධයෙන් සමනය කළාහුය.

ඉක්බිති සර්‍වඥයන්වහන්සේ පලමුපරිද්දෙන් භික්‍ෂුසඞ්ඝයා පිරිවරා මහත්වූ සර්‍වඥවිලාසයෙන් පැලඹෙන්නාදූක දෙවදත්තසථවිරයෝ මහානුභාව සම්පන්නවූ මේ ශ්‍රමණභවත් ගෞතමයන්ගේ රූපශ්‍රීවිභූතිය දූක කවුරුන් කිසි උපද්‍රවයක් කොටගතනොහී එනි රජ්ජුරුවන්ගේ නාලාගිරිනම් ඇත්තෙම ඉතාම චණ්ඩය පරුෂය කර්කශය තුණුරුවන්හිගුණ නොදන්නා ඒ ඇතා ලවා ජීවිතක්‍ෂයට පමුණුවාලමියි සිතා එපවත් අජාසත් රජ්ජුරුවන්ට කියා ගිවිස්ස වූහ එකල රජ්ජුරුවෝ ඇත්ගොව්වන් කැඳවා ගෙන්වාගෙණ සබඳ සෙට්දවස් නාලාගිරියා රා පොවා ශ්‍රමණභවත් ගෞතමයන්වහන්සේ වඩනා වීථියෙහි ඇරපියූවයි නියෝග කළහ,

එසඳ දෙවදත්තස්ථවිරයෝ මෙතෙක් දවස් රා කී කළයක් බෝදැයි විචාරා අටකළයකැයි යනු අසා සෙට දවස සොළොස්කළයක් රාපොවා ඇත් කොල් සෙණ්ඩුආදීන් ඇන කුප්පා බුදුන් පිළිපන් වීථිය අභිමුඛයට මෙහෙයා ලව රජ්ජුරුවන්ට කියා තොප කැමති ස්ථානාන්තරයකට පමුණුවාලන්ට නිස්සෙමියි ඇත්තලයන්ට සම්මත කළහ.

ඒ කථාව සියළුනුවර ප්‍රකාශවූයේය. එකල තුණුරුවන් කෙරෙහි මමත්වය ඇති උපාසකවරහු බුදුන් කරා එළඹ සවාමීනි දෙවදත්තස්ථවිරයෝ අජාසත් රජ්ජුරුවන් හා එක්ව සෙට නුඹවහන්සේ සිහාවඩනා වීථියෙහි නාලාගිරි ඇතු අරවති එහෙයින් පාත්වූ දවස් සිහානොවැඩ විහාරයෙහිම වැඩහුන මැනව අප ඇම බුදුපාමොක් භික්ෂුසංඝයාවහන්සේට අහර විහාරයටම ගෙණ වුත් දෙම්හයි ආරාධනාකළාහ.

එකල සර්ඣඥයන්වහන්සේ යහපත සිහානොයම්හයි නොවරදූම බුඩ ඥානයෙන් බලනසේක් මම සෙට නාලාගිරියා දමනයෙහිලීමෙන් ප්‍රාතිහාර්‍ය්‍ය කොට තීර්ථකයන්ගේ මත්බිඳ රජගහනුවර නොසිගාම භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණලදුව වේළුවනාරාමයටම එමි. රජගහනුවරවාසී උපාසකවරහු බොහෝ බත් බඳුන් ගෙන්වාගෙණ වේළුවනාරාමයටම එති සෙට දවස් විහාර යෙදීම වැළඳීමවන්නේයයි සිතාවදාරා මේ කාරණය හෙතුකොටගෙණ උපාස කවරුන් කළ ආරාධනාව මුවෙන් නොබිණීමෙන් ඉවසා වදාළසේක. උපාසක වරහුත් ආරාධනාව බුදුන් ඉවසූනියාව දැන සෙට දවස් වැළඳීමට විහාරයට දන් ගෙන්වාගෙණ එම්හයි බුදුන්වැඳ අවසරගෙන නික්මුණාහ.

ඉක්බිති සර්ඣඥයන්වහන්සේ පෙරයම් දසපැයනෙක්ම භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවයයි යන සිව්වණක් පර්ෂදට අභිප්‍රායානුකූලවූ ධර්මදෙශනාකොට මැදියම් දසපැයදී දිව්‍යබ්‍රහ්මාදී දෙවියන්ගේ ප්‍රශ්නවිසර්ජනය කිරීමෙන් බණවදාරා අලුයම් දසපැය පලමුවන කොඨාසය සිංහසෙය්‍යාවෙන් සැතපී වැඩ හිඳ දෙවෙනිකොටස ඵලසමාපත්තියෙන් වැස තුන්වෙනි කොඨාසයෙහි මහා කරුණා සමාපත්තියට සමවැද සමාපත්තියෙන් නැගී මාගෙන් බණ අසා මාර්ග ඵලයට පැමිණෙන්ට නිස්සෝ කවුරුදෝහෝයි වෛනෙයජනබන්ධුන් බලාවදාළ සේක් නාලාගිරි දමනය නිසා සුවාසූදහසක් සත්වයෝ නිවන් දකින්නාහුයයි දැක ඒ රාත්‍රිය ඉකුත්ව අරුණුනැගිකල්හි සිරුරු පිළිදැගුම්කොට ආයුෂ්මත්වූ අනඳ මහතෙරුන්වහන්සේට නියෝගකොට රජගහනුවර අටළොස් විහාරයෙහි වසන ඇම භික්ෂුන් රැස්කරවා භික්ෂුසඞ්ඝයාවහන්සේ පිරිවරා සර්ඣඥරාජෝතන මයානන් වහන්සේ එදවස් රජගහනුවරට වන්සේක. එකල ඇත්ගොව්වොත් අජාසත් රජ්ජුරුවන් හා දෙව්දත් මහතෙරුන්වහන්සේ කීසැටියේ ඇතා රා පොවා කොල් ආදියෙන් ඇන කුප්පවා බුදුන් වඩනා ඉදිරියට ඇරපූහ.

එකල්හි ශ්‍රඩාසම්පන්න බෞඩයෝ අදදවස් බුඩහස්තිරාජයා හා තිරශ්චින හස්තිහුගේ යුඩයෙක්වන්නේල අනෝපමවූ බුඩානුභාවයෙන් කරන්නාවූ නාලාගිරි දමනය බලම්හයි සතුටුව මතුමහල් සඳලුගෙපල ආදියට නැගී බෝ දෙන රැස්ව සිටියාහුය.

තුණුරුවන් කෙරෙහි අශ්‍රද්ධවූ මිථ්‍යාදෘෂ්ටි ඇති සත්වයෝ නාලාගිරි ඇත් චණ්ඩය පරුෂයබුද්ධාදී උත්තමයන්ගේ ගුණයක් නොදන්නේය. එහෙයින් ඒ ඇත් ශ්‍රමණභවත් ගෞතමයන්ගේ රන්වන්වූරූපය කඩා සුණුකොට ජීවිත විනාශයට පමුණුවන්නේය අදසතුරු පිටුදකුම්හයි සඳලු ආදියේ බොහෝදෙන රැස්ව සිටියාහුය. මේ නියායෙන් රැස්වූ බොහෝ සමාගමය ඇති කල්හි නාලාගිරිහස්ති අභිමුඛව වඩනාවූ සර්වඥයන්වහන්සේ දැක කෝපයෙන් දිලිහී මනුෂ්‍යයන් භයගන්වමින් ගෙවල් විදදමමින් ගැල් කඩා වඩා දමමින් සොඬ ඔසවා කන්තලහා වාලධිය කෙලින් ඉදුවාගෙණ ප්‍රලයකාල ප්‍රවෘත්ති ප්‍රචණ්ඩ මාරුතයෙන් මුලින් උපුටාගෙණ යනලද පර්වතයක් පරිද්දෙන් මිරිකාගෙණ බුදුන්ගේ ඉදිරියට දිවමින් ආයේය. මෙලෙසින් එන්නාවූ ඔහු දැක සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේ ප්‍රධානවූ අසූමහසව්වන්වහන්සේ ස්වාමීනි මනුෂ්‍ය ඝාතක චණ්ඩපරුෂවූ නාලාගිරි හස්තියා මේ වීථියට පැමිණියේය. එතෙම බුද්ධාදීන්ගේ ගුණයක් නොදන්නේය එසේහෙයින් භාග්‍යවත්වූ සර්වඥයන්වහන්ස සුගතවූ සර්වඥයන්වහන්ස ඉවත්ව වැඩසිටිය මැනව අපි ඇම ඒ ඇත්හු දමන යෙහි ලන්ට සමර්ථයම්හයි වෙන වෙනම බලකියා යාච්ඤාකළසේක. එකල බුදුහු මහණෙනි තෙපි භයනොගණුව කෙළදහසක් ඇතුන්ට බලඇති මම එක නාලාගිරියා පමණක් සරුකෙරෙම්දැයි වදාරා ඉදිරියට වඩනාසේක.

එකල්හි සසර බොහෝ කාලයක් හිත විශ්වාසව කුසල්කොට වඩනා ලද මෛත්‍රිසිත් ඇති අනඳමහතෙරුන්වහන්සේ ස්වාමීනි පියන්හට පැමිණි කාරියක් ප්‍රධාන පුත්‍රයාට භාරවන්නේය. එහෙයින් මම ඔහු දමනයෙහිලම් වැඩසිටියමැනවයි ආරාධනා කළසේක. එකල්හි බුදුහු සාරිපුත්‍ර ස්ථවිරාදීවූ අසූමහසව්වන් වහන්සේට වෙන වෙනම ආමන්ත්‍රණයකොට එඹා මහණෙනි බුදුන්බලනම් අනෙකක එහෙයින් තොප ඇම සිටුවවයි වෙන වෙනම කියා හැම දෙනාවහන්සේම නැවතු සේක. එකල්හි අනඳමහතෙරුන්වහන්සේ බුදුන් කෙරෙහි බලවත්වූ ස්නෙහයෙන් ඉවත සිටිය නොහී මේ හස්තියා පළමුකොට මාමමරාවයි බුදුන් පිණිස ජීවිත පරිත්‍යාගකොට ගොස් ඉදිරියෙහි සිටිසේක. එකල බුදුහු ආනන්දයෙනි ඉවත්ව ඉදිරියෙහි නොසිටුවයි වදාළසේක. දෙවෙනිවත් අනඳ මහතෙරුන් වහන්සේ මේ ඇත් මිනීමරණ චණ්ඩපරුෂය කෝපයෙන් දිලිහී ප්‍රලයානලවෙගයෙන් එන්නේය. පළමුකොට මා මරා පසුව නුඹ වහන්සේ කරා ඒවයි කියා යාච්ඤාකොටකියා ඉදිරියෙහිසිටිසේක. තුන්වෙනිවත් පහවව ආනන්දයෙනි ඒ ඇතු දමනයෙහිලීම අපට භාරයයිවදාළදීත් ස්නෙහබන්ධනයෙන් බැඳී ඉවත්ව යා නොහී සිටිනා හෙයින් බුදුන්ගේ සෘද්ධ්‍යානුභාවයෙන් අනඳමහතෙරුන් වහන්සේ වැඩසිටි භූමිය කුඹල්සකක් මෙන් කරකැවී පසුව ගොස් භික්ෂූන්වහන්සේ මධ්‍යයෙහි සිටුවාලූකල්හි එකල්හි එක්ස්ත්‍රියක් නාලාගිරියා දැක මරණ භයින් භීතව දිවන්නී උකුලෙහි උන් දරුවන් ඇතුමත් සර්වඥයන්වහන්සේමත් අතුරේ දමාගියාය. ඒ ලුහුබැඳ ගෙණගිය ඇත් දරුවන් දැක කරකැවී ආයේය. එකල ඒ කුමරුවා ඇතු තමා ලඟට එන්නාදැක මහ අඬින් අඬන්ට පටන්ගත්තේය.

එසඳ සර්වඥයන්වහන්සේ පඤ්චමහාගංගා ප්‍රවාහය එක මුවදොරකින් සමුද්‍රයට වදනාකලක් පරිද්දෙන් සියලු සත්වයාකෙරෙහි පවත්නාවූ මෛත්‍රිය ස්වරඝෝෂය පවත්වා, එඹල නාලාගිරිය නා සොළොස්කළයක් රාපොවා ම

ක්‍රරවන්නාහු අනෙකක්හු පිණිස කළා නොවෙයි මාපිණිසකළාහුය. එහෙයින් තෝ නිස්කාරණයේ ඇත මෑත දිවපැන කකුල්වලට ආයාසනොකොට මෙහි එවයි වදාළසේක. එකල නාලාගිරිතෙම සර්‍වඥයන්ගේ මධුරස්වරය අසා දෑස දල්වා බුදුරජානන්වහන්සේ ද්වාත්‍රිංශත්වර මහාපුරුෂලක්‍ෂණයෙන් හා අසූ අනුව්‍යංජනබ්‍යාමප්‍රභා කේතුමාලාලංකාරයෙන් සමලංකෘතවූ ශාන්ත දාන්ත රූපශ්‍රීවිභූතිය දැක බුද්ධානුභාවයෙන් දිවෞෂධස්පර්‍ශයෙන් සංහිඳුවනලද විෂ තේජස් ඇති නාගරාජයෙකු පරිද්දෙන් මද පරිශේෂව භයට පැමිණ කළසේ වැරුදිද්දයි කලකිරී සොඬ බිමඑලා කන්නල නොසොල්වමින් අවුත් සර්‍වඥයන් වහන්සේගේ ශ්‍රීපාදයුගලයෙහි වැතිරගියේය.

එකල්හි සර්‍වඥයන්වහන්සේ දක්‍ෂිණශ්‍රීහස්තය දිකුකොට කුම්භස්ථලය පිරිමදිමින් නාලාගිරිය තෝ තිරශ්චීන හස්තියය මම බුද්ධවාරණයෙමි එහෙයින් මෙතැන්පටන් තද පරුෂනොවව සත්‍වයන් කෙරෙහි මෙත්සිත් පතුරුව එඹල නාලාගිරිය බුද්ධවාරණවූ සර්‍වඥයන්ට පීඩානොකර සර්‍වඥයන් විෂයෙහි අපරාධ කිරීම අපායදුක්ඛයට කාරණවන්නේය, සර්‍වඥයන් කෙරෙහි අපරාධ කළාහට ඒකාන්තයෙන් සුගතිගමනෙක් නැත්තේය. තෝ මෙතැන් පටන් සුරාමද යෙන් මත්ව ප්‍රමාදවශයෙහි යෙදී ප්‍රාණඝාතාදී අකුසල් නොකර ප්‍රමාදවශයෙන් යුක්තවූ සත්වයෝ සප්තකාමස්වර්ගයටත් නොයන්නාහුය නොප වනාහි එලෙස මාගේ අවවාද අනුශාසනායෙහ් පිහිටා පරහිංසා පරපීඩාදියක් නොකොට දිව්‍ය මනුෂ්‍යසංඛ්‍යාත සප්තකාමස්වර්ගයෙහි ඉපද සැපවිඳ සංසාරසාගරයෙන් ගොඩ නැගෙවයි යනාදීන් ධර්‍මදෙශනා කළසේක.

එකල මධුරවූ ධර්‍මදෙශනාව අසා නාලාගිරිහුගේ සකල ශරීරය පස් වණක් ප්‍රීතීන් පිණාගොස් ඉදින් ඒ ඇත් තිරිසන්ජාතියෙහි නොසිටි එකෙක් වීනම් සෝවාන්ඵලයටපැමිණෙන්නේය. මෙලෙසින් සර්‍වඥගන්ධහස්තිරාජයානන් වහන්සේ නාලාගිරි නම් තිරශ්චීන හස්තිහු රැස්වූ සියළුසත්‍වයන්ගේ සාධුකාර නාද ශතසහස්‍රයෙන් සියළුනුවර සතුටුකරවමින් දමනයෙහිලා පන්සිල්දී ධර්‍මදේශනාවසානයෙහි සුවාසූදහසක් සත්වයන් අමාමහ නිවන් දක්වා වදාළසේක.

එතනට රැස්වූ එනුවරවාසී රජයුවරජ ඇමතියෝද අන්‍යවූබොහෝ සත්වයෝම කුට කටක හාර කෙයුරවලයාදී අනෙකප්‍රකාර ආභරණාදියෙන් බුදුන්ව පූජාකළහ. ඒ ආභරණ රාශියෙන් ඒ ඇත් සැඟවීගියේය. එතැන් පටන් ඒ ධනරාසියෙන් පරික්‍ෂිප්තහෙයින් ඒ ඇත් ධනපාලය යන නමින් ප්‍රසිද්ධවිය.

ඒ ඇත් සදාචාරසුක්‍ෂිත ශ්‍රද්ධා බුද්ධිසම්පන්න උදියෙකු පරිද්දෙන් සර්‍වඥ රාජෝත්තමයානන්වහන්සේගේ ශ්‍රීපාද ධූලීන් ශුණ්ඩාග්‍රයෙන් හැරගෙණ තමා හිසමුදුනෙහි තවරමින් චක්‍රවර්ති රජෙක් සමීපයට පැමිණී චණ්ඩාලයෙකු පරිද් දෙන් වාලධියෙන් කැසපටගන්වමින් සොඬ අකුලවාගෙණ සර්‍වඥයන් දිසාවට අවනතව ඇකිලෙමින් පිටින් සෙමෙන් පසුබැස ගොසින් ඇස් අමුයෙහි සිට බුදුන්ට නමස්කාරකොට තමාගේ ඇත්හලට නැගීගියේය.

එතැන්පටන් ශාන්තදාන්තව කිසිවක්හට කිසි පීඩාවක් නොකරන්නේය. සර්වඥරාජයානන්වහන්සේත් සිහාවැඩි කාරිය සම්පාදනයකොට පූජා පිණිස දමණලද ධනරාසිය ඔවුනොවුන්ටම වේවයි ඉටාගෙණ අද මා විසින් බොහෝ ප්‍රාතිහාර්‍ය්‍යකරණලද එසේහෙයින් අද්දවස් මෙනුවර සිඟීම් සුදුසු නොවන්නේයයි සිතා කුල්මත්ව සතුටින් රුස්වූ තීර්ථකයන් මුහුණ දෙම්නස් දූලිගාමින් මානමර්දනයකොට ශාරිපුත්‍ර මහාමෞද්ගල්‍යාන මහාකාශ්‍යපස්ථවිර ප්‍රමුඛ ප්‍රවර නොයෙකභික්‍ෂුසංඝයා පරිවෘතව සංග්‍රාමභූමියෙහි විජයශ්‍රීකාන්තාව විසින් වලඳනා ලදුව සෝභමානවූ රාජෝත්තමයක්හු පරිද්දෙන් අනොපමවූ බුඬශ්‍රී විලාශයෙන් විරාජමානව සියළුසත්වයන්ගේ නෙත් සිත් සතුටුකරවමින් සවණක්සන බුදුරුස් විහිදුවමින් කුලගිරි පරම්පරායෙන් පරික්‍ෂිප්තව ගමන් ගත් මෙරුපර්වත විලාසයෙන් වෙළුවනාරාමයට වැඩවදාළසේක.

නුවරවැසි උපාසකයෝ ඛාද්‍ය භොජ්‍යාදී මධුර අන්නපාන ඇරගෙණ විහාරයට ගොස් බුදුපාමොක් මහාසංඝයාවහන්සේට මහදන්පැවැත්වූහ. එද වස් පසුබත්වේලෙහි ධම්සභාමණ්ඩපයට රුස්වූ ශාරිපුත්‍රස්ථවිර ප්‍රමුඛ ප්‍රවර භික්‍ෂුසඞ්ඝයාවහන්සේ ඇවැත්නි අද්දවස් රාබී ත්‍රිමදගලිතව අට්වාල වෙට්ට තම් පවුරුපදනම් වාසල් එලමින් සියලුසත්වයන් භයින් පලවමින් මූර්තිමත්වූ මෘත්‍යුහු පරිද්දෙන් බුදුන්කරා එන්නාවූ නාලාගිරිහු දැක සර්වඥගත් විසින් ආනන්දයෙනි ඉවත්වයි තුන්යලක් වදාරණ ලදුවත් ඉවතනොවී ඉදිරියෙහි සිට බුදුන් උදෙසා ජීවිතපරිත්‍යාග කෙරෙමින් ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් විසින් ඉතා දුෂ්කරක්‍රියාවක් කරණලද යනාදීන් අනඳමහතෙරුන්වහන්සේසේ ගුණ කථනය කෙරෙමින් වැඩහුන්සේක.

එකල ගඳකිළියෙහි සැතපුනාවූ සර්වඥයන්වහන්සේ ධම්සභා මණ්ඩප යෙහි රුස්වූ භික්‍ෂූහු ආනන්ද ස්ථවිරයන්ගේ ගුණ කථනයකෙරෙති මා විසින් එතනට යායුතුයයි සිතාවදාරා රත්ගල්ගුහාවකින් නික්මුණු කේසර සිංහරාජ යකු පරිද්දෙන් ගඳකිළියෙන් නික්ම තුන්තරාගමනින් එක්තරා ගමනකින් ධම්සභාමණ්ඩපයට වැඩ පණවනලද බුඬාසනමස්තකයෙහි යුගඳුරු මුදුනෙහි දිලියෙන්නාවූ හිරුමඬලක් පරිද්දෙන් සවණක් ඝන බුදුරුස් විහිදුවමින් වැඩහිඳ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනු දූයි විචාරාවදාරා භාග්‍යවතුන්වහන්ස අනික් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ ආනන්ද ස්ථවිරයන් විසින් බුදුන් උදෙසා කරණලද ජීවිත පරිත්‍යාග ප්‍රශංසාකරමින් උනුම්හයි දූන්වූ සඳ මහණෙනි මේ ආනන්දස්ථවිරයෝ දූන් මතු මා නිසා ජීවිත පරිත්‍යාගකළාහු නොවෙති යටගියදවස තිරිසන් යෝනි යෙහි උපන්නාහුත් මානිසා ජීවිත පරිත්‍යාගකළෝවේදූයි වදාරා ඒ භික්‍ෂූන් වහන්සේ විසින් ආරාධිතවූ සර්වඥයන්වහන්සේ හිමගර්භයක් පලා චන්ද්‍රබිම්බ යක් මැත්කොට දක්වන්නාක්මෙන් ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස මහිසනම් රට සකුල නම් නුවර සකුල නම් රජ්ජුරු කෙණෙක් දානාර්ථ ප්‍රියවචන සමානාත්මතා යන සතර සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කෙරෙමින් රාජ්‍යය කරන්නාහුය එසමයෙහි පුරණලද බොධි සම්භාර ඇති අපමහාබෝසතානෝ ධෘතරාෂ්ට්‍ර හංස රාජත්ව එකුලයෙහි

උපන්නාහුය, එකල එනුවරට නුදුරුවූ එක් වැදි ගමෙක්හි එක්තරා වැදිපුත්‍රයෙක් මළඅටවා පක්ෂීන් බඳා නුවරට ගෙණගොස් විකුණමින් ජීවිකාව කරන්නේය. එනුවරට නුදුරු තෙනෙක්හි වටින් දොළොස් යොත්තෙක් පමණ ඇති සීතලාමල ජලභරිත පස්පියුමෙන් සැදුනු හංස චක්‍රවාකසාරසකාරණ්ඩවාදීවූ නොයෙක් පක්ෂිසමූහයාට වාසස්ථානවූ මානස නම්වූ විලෙක් ඇත්තේය. ඒ විල්හි ඒ වැදි පුත්‍රතෙම සාමාන්‍යයෙන් පක්ෂීන්ට මළ ඇටවීය. එකල ඒ ධෘතරාෂ්ට්‍ර නම් හංස රජ්ජුරුවෝ සුමුඛ නම් සෙනෙවිරත් රජුන් ප්‍රධානවූ සයානූදහසක් හංස ශ්‍රේණීන් විසින් පිරිවරණ ලදුව චිත්‍රකූට පර්වතයෙහි රන් ගල් ගුහාවෙක වසන්නාහුය, ඉක්බිති එක්දවසක් හංස සමූහයෙන් හංසයෝ කීපදෙනෙක් ගොචරග්‍රහණය පිණිස ඒ ඒ තෙන ඇවිදිනාහුය, බොහෝවූ ගොදුරු ඇති ඒ මානස නම් විලට පැමිණ සිත්වූ පරිද්දෙන් ගොදුරු අනුභව කොට පිරුණාවූ චිත්‍රකූට පර්වතයට ගොස් ධෘතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවන් දැක දෙවයන්වහන්ස මනුෂ්‍යපථයෙහි අනෙකප්‍රකාරවූ ගොදුරු ඇති මානස නම් විලෙක් ඇත්තේය. එහි ගොදුරු අනුභවකරන්ට යම්හයි කීය.

එබස් අසා බොධිසත්වයෝ එම්බා හංසයෙනි! මනුෂ්‍යපථයනම් ඉතා භය සහිතය සැකකටයුතුය ඒ නොකමැත්තේයයි වළකාත් නැවත නැවත කියනලදුව ඉදින් නොපහැමට අභිප්‍රාය වීනම් යම්හයි ගිවිස පිරිවර හා සමග එවිලට ආකාශයෙන් බස්නාහු පය මලෙහිම එලාගෙණ බටුවාහුය. එකල බොධිසත්වයන්ගේ පය යපටකින් මැසූකලක් පරිද්දෙන් ඇසිර ගියේය. ඉක්බිති මළ කඩා ගණිමියි සිතා ඇදි ඇදී සේ පළමුකොට කකුලේ සම් කැඩී ගියේය, දෙවෙනිව මස් කැඩී තුන්වෙනුව ඇට කැඩී ඇටයෙහි ඇසිර සිට ලේ වැහෙන්නට පටන්ගෙණ බලවත්වූ දුක්ඛවෙදනා පැවැත්තේය. එකල බොධිසත්වයෝ ඉදින් මම බැගෑපත්ව ඇඬීම්නම් මාගේ බන්ධූහු භයපත්ව ගොදුරු නොකා දුකින් පැලීයන්නාහු දුර්වලව සමුද්‍රයෙහි වැටී යන්නාහයි බන්ධූන් කෙරෙහි කරුණාවෙන් දුක්ඛයෙන් වෙදනාව ඉවසා හංස සමූහයා කැමති පරිද්දෙන් කා බී කෙළින්ට පටන්ගත් කල්හි බොධිසත්වයෝ බඩරාවයෙන් මහනඬින් හැඬූහ, ඒ අසා හංස සමූහයෝ මරණ භයින් තැතිගෙණ තුන් මූලක්ව බෙදී චිත්‍රකූට පර්වතයට යන්නා ගියාහුයි.

මෙසේ ඒ හංසයන් නික්මුණුකල්හි සුමුඛනම් හංසසෙනාධිපති කිමෙක් දෝහෝයි මේ භය හංසරජ්ජුරුවන්වහන්සේට පැමිණියේවනැයි පරීක්ෂාකොරෙමියි වෙගයෙන්ගොස් පළමුවෙන් යන්නාවූ හංසසමූහයා අතුරෙහිද මධ්‍යයෙහි යන්නාවූ හංස සමූහයා මුළුල්ලෙහිද ඇමට පස්සේ නික්මුනාවූ හංස සමූහයා මුළුල්ලෙහිත් බොධිසත්වයන් නොදැක එකාන්තයෙන් මේ භය හංස රජ්ජුරුවන්ට පැමිණිවනැයි ශොකයෙන් පීඩිතව නැවත ආපස්සේ විලට එන්නාහු පය බැඳී ශොණ් ලෙහෙයෙන් වැකී ගියාවූ සිරුරු ඇතිව දුක්ඛයෙන් පීඩිතව මඩමත්තේ වැදහොත් මහබොධිසත්වයන් දුරදීම දැක මහරජ භයනොගතමැනව මම මාගේ ජීවිතය දීපියාතමුත් නුඹවහන්සේ මළින් ගලවාලමියි අස්වසා කියමින් සමීපයට බැස මඩමත්තේ වැඩඋන්හ. එකල සෙනෙවිරත් රජුගේ සිත් පරීක්ෂාකරන්නාවූ මහාබොධිසත්වයෝ සුමුඛනම් සෙනෙවිරදින්

මාගේ බන්ධුවූමේ අනූදහසක් පමණ හංසයෝ මා පාසබන්ධනයට අසුව මේසා දුකක් විඳිමින් සිටියදී කිත්ද කුමන්දයි යන බසක් විචරකුත් නොකියා අභිප්‍රායානුකූලවූ පරිද්දෙන් නික්මුණාහ පාස වසඟවූ මා කිසිඋපායකින් ගලවා ගන්තෝ නිසිවුව එසේහෙයින් කිසි සැකයක් නොකොට නොපිත් නොරඳා පලායවයි කීහ.

එකල්හි හංස සෙනාධිපති දෙවයන්වහන්ස නුඹවහන්සේ හැර මෙතනින් මම ගියෙම් නමුත් නොගියෙම් නමුත් මියත්තෙම් වෙමි සුවපත්වූ නුඹවහන්සේට සේවය කොට දුකට පැමිණි වේලෙහි ඇරපියා එකාන්තයෙන් නොයමි. නුඹවහන්සේ මරණපාසයෙන් බැඳුනුසේක. මම ස්නෙහපාසයෙන් බැඳී ගියෙමි.

එහෙයින් මියනත් එක්වමය ගැලවියතත් නුඹවහන්සේ හා එක්වයෙමියි ඉඳින් ඇරපියා ගොස් මාගේ ජීවත්වීමට වඩා නුඹවහන්සේ හා එක්ව රඳා මියයාම උතුම්වන්නේය. හංසරජ්ජුරුවන්වහන්ස මෙබඳුවූ දුකකට පැමිණ නුඹවහන්සේ ඇරපියා යාම අප වැන්නවුන්ට තරම්නොවෙයි එහෙයින් නුඹවහන්සේට යමක් පැමිණියේ වීනම් මමත් ඒ විඳිනා කැමැත්තෙමි යනාදීන් තමන්ගේ දෘඪමිත්‍රත්වය බොධිසත්වයන්ට ප්‍රකාශකොට කිවුය.

එකල බොධිසත්වයෝ එම්බා සුමුඛයෙනි තොප එලෙස කියන්ට කාරණ කිම්ද මළින් බැඳී සතුරන් අතට පැමිණියාහට මුළුතැන්ගෙට පැමිණීම විනා අන්සරණෙක් කොයින්ද එබඳු මරණ දුක්ඛයෙන් සතුරන් අතින් ගැලවී සිටියාවූ විශිෂ්ටවූ නුවණඇති තොපට කුමකැයි රුස්නේද තවද සුමුඛයෙනි අපගේ ඥාතිවර්ගයාටද ඇසුරුකළ අවශෙෂ පක්ෂීන්ටත් කවර වැඩෙක් කවර ප්‍රතිෂ්ඨාවෙක් දක්නෙහිද තවද රන්වන්වූ උභයපක්ෂයක් ඇති සුමුඛයෙනි මළෙහිබැඳි ජීවිතක්ෂයට පැමිණෙන්ට සිටි මානිසා තොපගේ ජීවිතය පරිත්‍යාග කිරීම අඳුරුගෙයෙක්හි අභ්‍යක්හු කළ දෙයක්මෙන් කවර අභිසිද්ධියක් දැක මරණ කැමැත්තෙහිදැයි කීහ.

එකල හංස සේනාපති මහාබොධිසත්වයන්ට පක්ෂිරාජයාණන්වහන්ස සත්පුරුෂ ධර්මයෙහි ප්‍රයෝජන කුමක් නිසා නොසලකනසේක්ද පුදන ලද්දාවූ ගුණධර්මය සත්වයන්ට ලෞකිකලොකොත්තරවූ අභිවෘද්ධිය දෙන්නේය. එහෙයින් මා විසින් පුදනලද ගුණ ධර්මයෙන් මෙලෝ පරලෝ දෙකින් මටවන වැඩ හා නුඹවහන්සේ කෙරෙහි ස්නෙහ පක්ෂපාතයක්ද දක්නෙම් ජීවිත විනාශයෙහි සැකයක් නැත්තෙමි කීහ.

ඒ අසා මහාබොධිසත්වයෝ එම්බා සුමුඛයෙනි යම් මිත්‍රයෙක් තමාගේ මිත්‍රයාට දුකක් පැමිණිකල්හි එදුකෙහි අත්නොහැර එක්ව විඳුනේ වීනම් එසේ කිරීම එකාන්තයෙන් බුද්ධ බොධිසත්වාදී උත්තමයන්ගේ සවභාව ගුණයෙක තොප විසින් උත්තමයන් ගුණධර්මයන් පුරණලද මාකෙරේ ස්නෙහ ඇති නියාව විශෙෂයෙන්දනිමියි මෙමළ එබු වැඩීමට කැමැත්තක් කෙරේවයි තොප විසින් කීබස මානිසා ජීවිතය දුන් නියාවම ඉතිකින් නික්මෙවයි. අනුදත් වේලෙහි පටන් නොරඳානික්මෙව තවද මෙබඳු දුකඛයට පැමිණිහෙයින් මාගේ

බත්වූවර්ගයෙහි ඇත්තන්ට යම් අඩුයෙක් පෙණුනේවීනම් ප්‍රඥාගුණ ඇති තොප ගේ සමවාසයෙන් කිසි අඩුවෙක් උන්ට නොපෙණෙත්තේය. එහෙයින් මෙතනින් වහා නික්මෙවයි කී සඳ නුඹවහන්සේ ඇර මම නොයම්යි යනාදීන් උත්තර ප්‍රත්‍යුත්තර වශයෙන් ඒ උත්තමයන් දෙදෙන කථා කෙරෙමින් සිටියදී මෘත්‍යුමාරයා පරිද්දෙන් වැදිපුත්‍රයා අවුත් ඒ හංසයන්ට පෙණුනේය. බොහෝ කාලයක් ඔවුනොවුන් කෙරෙහි හිත විශ්වාසීව ආ පක්ෂිරාජයෝ දෙදෙන මුගුරක් ඔසවාගෙණ වාත වේගයෙන් දිවන්නාවූ සතුරු දැක උන් තැනින් නොඉගිලීම මුවෙන් නොබැණ උන්හ. එකල්හි වැදිපුත්‍රයා මහත් වේගයෙන් පක්ෂිරාජයා කරා දුවන්නේ දුරදීම දෙන්නෙකු එකතැන දැක ඉගිල පලාගෙද්ගොහෝයි යන සැකයෙන් සෙමින් සිට සම්පසථව මළෙහි බැඳී උදකලාව නොපි නැගීයා නොගී උන්නාවූ ඔහු කෙරෙහි ස්නෙහයෙන් බැඳී ඇරපියයානොදී බල බලා ඉඳිනාවූද පක්ෂිරාජයන් දැක සුමුඛයන්ට ආමන්ත්‍රණ යකොට මම වනාහි මළෙහි බැඳුනුහෙයින් නොගියේය සාක්ෂාත් තොපට සතුරු මා එන නියාව දැකදැක තොප නොගොස් ඉඳිනට කාරණා කිම්ද මේ තොපට කුමක්වේද සෙසු පක්ෂීන් එක්ව පලායාදී උදකලාව නොපි උන්නේ කුමක් නිසාදැයි විචාළේය.

එබස් අසා සුමුඛ සෙනාපතීහු එම්බල ප්‍රාණඝාතකොට ජීවත්වන්නාවූ වැදි පුත්‍රයාණෙනි මූන්වහන්සේ මට රජසේක ජීවිත සමානවූ මිත්‍රයෙක ඒ කාරණයෙන් මාගේ ජීවිතාන්තය දක්වාත් ඇරනොයම් කීවාහුය. එබස් අසා වැදි මුන් තොපට රජ්ජුරුවනැයි කියව රජ්ජුරුවෝ නම් කාරියාකාරිය ඥානයෙන් යුක්තයහ. පරීක්ෂාකාරීයහ මෙලෙස නුවණැත්තාවූ තොපගේ මේ රජ්ජුරුවෝ කවරකාරණයක් නිසා අටවනලද්ද මළ නුදුටුවාහුද යසසින් නුවණින් වැඩසිටියවුන් විසින් තමන්ට පැමිණෙන්නාවූ ආපදාව පරීක්ෂා කට යුතු නොවේද එසේවූ තෙනත්තන් බැඳෙන්ට හේතුකවරේදැයි විචාළේය.

එකල වැදිපුත්‍රයාගේ බස් අසා සුමුඛනම් හංසසෙනාධිපතිද එඹාපුරුෂය! සත්වයන්ට විනාශකාලය පැමිණ සිටිකල්හි තමන්ට උපද්‍රව පිණිස සරහා තබන ලද්දාවූ දැල්මළ ආදීන්ගේ සමීපයට පැමිණි කල්හි නොපෙණෙන්නේය ඉදින් දුවත් කර්මප්‍රත්‍යය එකාන්තයෙන් පැමිණ සිටිකල්හි සොරමළ කවුරු වුවත් බැඳීයන්නේය යනාදීන් වැදිපුත්‍රයා හා සම්භාෂණය කිරීමෙන් ඔහුගේ ළය මොලොක් කොටගෙණ මහාබොධිසත්වයන්ගේ ජීවිතදානය ඉල්වන්නාහු සබඳ තොප හා කරණලද සම්භාෂණය අප දෙදෙනාහට අභිවෘද්ධි කාරණා වේද චිත්‍රකූට පර්වතයට ගොස් අපගේ ඥාතිසමූහයා හා සමග සතුටුව වාසය කරණු පිණිස අපදෙදෙනාගේ ජීවිතදානය දීපියා එව්දැයි විචාළහ.

ඒ අසා වැදිපුත්‍රතෙම හංස සෙනාධිපතීන්ගේ මධුරවූ ධර්මශ්‍රවණයෙහි බැඳී එම්බා හංසයාණෙනි තොප මා බැඳුයෙත් නැත්තේය තොපගේ වධයක් නොකැමැත්තෙමි වහා මෙතනින් පලාගොස් නිර්ව්‍යාධිව ජීවත්වයි කීයේය. එඅසා සුමුඛතෙම එඹා වැදිපුත්‍රයෙනි මේ හංස රජ්ජුරුවන්වහන්සේ හැර ජීවත්වන්නාවූ ජීවිකා ඇසිල්ලකුත් නොකැමැත්තෙමි ඉදින් එක්කෙනෙකුන් ගේ මස් පොහොනේ නම් මූන්වහන්සේ හැරපියා මාගේ මස් අනුභවකරව ඉදින් එලෙස කැමැත්තා නම් මූන්වහන්සේ උසමහතින් වයසින් වර්ණයෙන්

සමානයම්හ තොපගේ ලාභයට අඩුවකුත් නැත්තේය. එසේ හෙයින් මා හැර ගෙණ හංසරජ්ජුරුවන් හැරපියව ඉදින් උන්වහන්සේ මළින් මුදවා මාත්පලා යෙති යන්නක් නොසිතා පළමුකොට මාබැඳගෙණ පසුව මුන්වහන්සේහැරපියා එලෙස කළාතම් තොපගේ ලාභයත් අඩුවෙක් නැත්තේය මාගේ යච්ඤාවත් සමෘඬවන්නේය ධෘතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවන් හා මිත්‍රසංස්ථව වාසය කරණ ලද්දේවෙයි යනාදීන් කරණලද ධර්‍මදෙශනාව අසා ප්‍රසන්නව ගිතෙල බඟා ලතලද සියක්වර පොළුනලද කපුපුළුන් පෙදක් පරිද්දෙන් මොලොක්කරණ ලද සිත් ඇති මහාබොධිසත්වයන් හංස සෙනාපතීන්ට තුෂ්ටිදානයෙන් හර ණාවූ වැදිපුත්‍රතෙම එඹා සුමුඛසෙනාපතිනි තොප විසින් මට කන්නලවු කියා හරණලද්දාවූ මේ හංස රජ්ජුරුවන් දුක ඤාති මිත්‍ර බන්ධු පුත්‍රදාරාදීන්වූ සියළු හංසසමූහයෝ සතුටුවෙත්වයි තවද සුමුඛය මේ හංසරජ්ජුරුවන්ට යම්සේ එකාත්මිකවූ මිත්‍රවීද මේ ලෝකයෙහි කිසිකෙණෙකුන්ටත් එබඳු මිත්‍ර කෙ ණෙක් නැත්තාහ එහෙයින් තොපගේ මේ මිත්‍ර ධර්‍මය පරිපාලනය හෙතුකොට ගෙණ සන්තුෂ්ටවූ මම තොපට සබඳවූ හංස රජ්ජුරුවන් හරිමි කැඳවාගෙණ වහා ගොස් ඤාතිසමූහයාගේ කඳුළුමුසු මුහුණු සතුටු කරවමින් පැලඹෙවයි යනාදීන් කියා පක්ෂිරාජයන්ගේ සිත් සනහවා සෙනහසින් මොලොක්වූ සිතින් බොධිසත්වයන් කරා ගොස් බැඳුන් කපා වඩාගෙණ සිඹ සනසා විලින් ගොඩතැගී මියර පිට සිනිඳු මොලොක් ඊතණ මත්තෙහි ඉඳුවා මළ පුඩුව සෙමින් ගලවා වලදමා මහබොධිසත්වයන් කෙරෙහි බලවත් මෙත් සිත් පතු රුවා නෙලුම්පතකින් පැන් ගෙණවුත් පය සෝධා තැවත තැවත පිරිමැද් දේය එසඳ ඔහුගේ මෛත්‍රීබලයෙනුත් බොධිසත්වයන්ගේ පාරමිතා භාග්‍ය යෙනුත් පයවණයෙන් නහරින් නහරමාංසයෙන් මාංස හා සමින් සම හා ගැළපී පළමු පරිද්දෙන් ප්‍රකෘත්තිමත් වූයේ විය.

ඉක්බිති සුමුඛනම් හංසසෙනාධිපති සුඛිතමුදිතව උන් බොධිසත්වයන් දුක සංජාතවූ ප්‍රීතිප්‍රමොද්‍ය ඇතිව වැදිපුත්‍රයාහට ස්තුති කරන්නාහු එඹා වැදි පුත්‍රයානෙනි යම්සේ මම තොප විසින් මුදාහරණලද හංස රජ්ජුරුවන්වහන් සේ දුක සතුටුවීම්ද එපරිද්දෙන් තෙපිත් තොපගේ ඤාතිවර්‍ගයා හා සමග සතුටුවයි යනාදීන් කත්කළවූ මධුර වචනයෙන් සතුටුව තෙපුල් බැණ හංස රජ්ජුරුවන්ට අභිමුඛව මහරජ්ජුරුවන්වහන්ස මේ පුරුෂයා විසින් අපට බොහෝ උපකාර කරණලද මෙවනාහි අපගේ යාච්ඤාව නොඅසා අප හැරගෙණ ගොස් ක්‍රීඩාහංසයන් කොට යමෙකුටදීපුවේවීනම් බොහෝ සම්පත් ලැබෙන්නේය නොහොත් මරාපියා මස්විකුවත් බොහෝසම්පත් ලැබෙන්නේය තමාගේ ලාභය නොසලකා අපි කීවාම කෙළේය මොහු මෙරට රජ්ජුරුවන් කරා කැඳවාගෙණ ගොස් සුවපත් කරම්හයි දෙදෙන කථාකොට වැදි පුත්‍රය හට ආමන්ත්‍රණය කොට සබඳ තා මළඇටවූයේ කුමක් නිසාදැයි විචාරා ධන සම්පාදනයකොට මා රැකෙන පිණිසයයි කීසඳ එසේවීනම් අප ඇරගෙණ ගොස් දෙවයන්වහන්ස මූ ධෘතරාෂ්ට්‍ර නම් හංසරජ්ජුරුවෝය මූ උන් සුමුඛ නම් සෙනාධිපතියයි රජ්ජුරුවන්ට දන්වාලව අපඇම දුක සතුටුව රජ්ජුරු වෝ තොපට බොහෝ සම්පත් දෙතියි වැදි පුත්‍රයාහට නියෝගකළහ.

එඅසා වැදිපුත්‍ර ස්වාමීනි රජ්ජුරුවන් දැකීම් නොකමැත්තේය රජ්ජුරු වෝ නම් චඤ්චලවූ සිත් ඇත්තෝය චචනායුධයන නුඹවහන්සේලා ක්‍රීඩා හංස

යත් කොට රැඳුනා නමුත් මරාමස් අනුභවකළානු නමුත් ඊටවඩා අලාභයෙක් නැත්තේය එහෙයින් මම ධන නොකැමැත්තේය. තුඹවහන්සේලා සැපසේ වැඩපුවමැනවැයි කීය. එඅසා සුමුඛයෝ සබඳ භයනොගණුව රුදුවූ කෲරවූ ක්‍රියා ඇති ලෙයෙන් තෙත්වූ අත් ඇති නොපි පවා මධුරවූ මාගේ ධර්මකථා යෙන් මොලොක්කොට පා පිට එලා වසන කෙලෙම් රජදරුවෝ නම් මහපිත් මහනුවණැත්තාහ. සුභාෂිත දුර්භාෂිත වචනයන් දන්නාහුය. තෙපි අනි කක් නොසිතා වහා අප ගෙණගොස් රජ්ජුරුවන්ට දක්වාලවයි නියෝග කළහ.

එසඳ වැදිපුත්‍ර එසේවීනම් යහපතක් නපුරක් වීනමුත් මට නොකිපුණ මැනවැයි හංස රජ්ජුරුවන් හා සුමුඛයන් කදක හිඳුවාගෙණ ගොස් රජ්ජුරු වන් දක්වා දෙවයන්වහන්ස මූ සයානුදහසක් හංසසේනාව පිරිවරකොට ඇති ධෘතරාෂ්ට්‍ර නම් හංස රජ්ජුරුවෝය. මූ උන්ගේ සුමුඛනම් සෙනෙවිරද්දුය තුඹවහන්සේ වැඳ දක්වනු පිණිස බඳගෙණ ආමියි රජ්ජුරුවන්ට දැක්විය ඒ අසා රජ්ජුරුවෝ අතිශයින් ආශ්වර්‍ය්‍යයට පැමිණ එඹල වැදිපුත්‍රය මහත් වූ ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටි මේ හංස රජ්ජුරුවන් හා සෙනෙවිරදුන් තොප අපව කවර උපදෙසකින් පැමිණියාහුදැයි පිචාළහ.

ඉක්බිති වැදිපුත්‍ර ජනප්‍රධානවූ රජ්ජුරුවන්වහන්ස යම් තෙනෙක්හි මූළු මූළුව බැස ගොදුරු අනුභව කෙරෙද්ද ඒ ඒ ස්ථානයන්හි නියම දැන මළ අටවා පක්ෂීන්මරා විකොට ජීවත්වන්නාවූ මම මානසය නම් විලට බොහෝ හංස යන් ගොදුරු පිණිස බසිනා නියාව දැක මළ ඇටවීම් ඒ මලෙහි මේ හංස රජ්ජුරුවෝ බැඳුනාහ එකල අවශෙෂවූ හංසයෝ තමන්ගේ වාසස්ථානයටම ගියාහුය මේ සුමුඛ නම් සෙනාධිපති තුමූ මලෙහි නොබැඳී මේ හංස රජජුරු වන් කෙරෙහි ස්නෙහපාසයෙන් බැඳී යානොහි උන්නාහු මා දැක නොඉගිලි තමන්ගේ ස්වාමිපුත්‍රයානන් නිසා ජීවිත පරිත්‍යාගකොට තිරිසන්ව ඉපිදත් සම්හර මනුෂ්‍යයන් විසිනුත් කොටගත නොහැක්කාවූ දුෂ්කරක්‍රියාව ප්‍රකාශ කෙරෙමින් මා හා සමග කථාකොට මලෙහි බැඳී උන් හංස රජ්ජුරුවන්ගේ ජීවිතදානය ඉල්වූහ.

එකල මොහුගේ සුභාෂිත වචනයන් අසා සතුටුව හංස රජ්ජුරුවන් මලින් මුදා හංස රජ්ජුරුවන්ට කැමති පරිද්දෙන් නැගී යනලෙස අවසර දිනිම් එසඳ මා කෙරෙහි සතුටුව මේ සුමුඛනම් සෙනෙවිරත්තෙම තොපගත් ආයාසය ව්‍යර්ථනොවනලෙස අප ඇරගෙණ රජ්ජුරුවන්වහන්සේ කරා ගොස් දක්වාලව බොහෝ ලාභ ලබන්නෙහියයි යනාදීන් මූන්ගේ කීමෙන් ගෙණාමි මේ උත්තම ගුණඇති පක්ෂි උවමනා කෙණෙක් ඇතිවක් පටන් සත්ව ඝාතනය කොට ජීවත්වන්නාවූ මාගේ ලයපවා තමන් මධුරකථාවෙන් මොලොක්කොට ගත් කෙණෙක. මෙබඳු ආශ්වර්‍ය්‍යවත්කර පඬුරක් මා ඇතුළුවන් සියළු වැදි දන්ගෙන් පෙර ගෙණා කෙණෙක් වේවයි ඉදිරියෙන් ගෙණෙන කෙණෙක් වේවයි නැත්තාහ. එහෙයින් මේ අත්භූතවූ හංසයන් දැක වදාළමැනවැයි වැදි පුත්‍රද රජ්ජුරුවන්ට දැන්විය. එකල රජ්ජුරුවෝ මහබෝධිසත්වයන්ට මාහැඟි වූ සිංහාසනයක්ද සුමුඛයන්ට රත්බඳවෙළුවක් පණවා මොවුන් එහි ඉඳුවා රත්තැටියෙන් මී හා විලඳ හා සකීරා මුසු පැන් අනුභවකරවා සන්තර්පණය

කරවා නමස්කාරකොට ධර්මදේශනාවට මහාබොධිසත්වයන්ට ආරාධනා කොට මිටි අස්නක උන්නාහුය.

එකල හංස රජ්ජුරුවෝ මධුරවූ මනුෂ්‍යභාෂාවෙන් මහරජ පින්වත් වූ තොපට කිසි දුකෙක් නැද්ද ව්‍යාධි බාහුල්ලයෙක් නැද්ද තොපගේ මේ රාජ්‍ජය අන්නපාන වස්ත්‍රාභරණ ධනධාන්‍යාදීන් සමෘද්ධ තොපගේ රාජ්‍ජය සැපසේ රක්නෙහිද තොපගේ අමාත්‍ය සේවකාදීන් අතුරෙන් කිසි අමනාපයක් කරණකෙණෙක් නැද්ද යුධ ආදීවූ කිසිකාරියක් පැමිණි කල්හි තමන්ගේ ජීවිතයට නොසිතාත් තොපට වැඩෙහි ඇසිරෙද්ද තවද මහරජ අගමෙහෙසුන් බිසවු තොප හා සමාන ජාතිගොත්‍ර ඇතියෝද කීකරුව කන්කළුවූ බස් කීද්ද දූන් පුතුන් දරුවන් ආදීහු ශ්‍රද්ධා ඇත්තාහුද තොපගේ අභිප්‍රාය නොම්රිකා වෙසෙද්ද යනාදීන් සාම්චි කථාකීමෙන් සුවදුක් විචාළහ.

එකල රජ්ජුරුවෝ එසේය හංසරාජයන්වහන්ස මාගේ කයට කිසි දුකෙක් නැත්තේය ධනධාන්‍යාදීන් සමෘද්ධවූ රට දැහැමෙන් සෙමෙන් අනුශාසනා කෙරෙමින් අමාත්‍යාදීහුත් කිසි අමනාපයක් නැතිව මා පැමිණි කාරිය ඇරපියා සිද්ධකෙරෙති අගමෙහෙසුන් බිසවුන් රූප යෞවනාදීන් මා හා නොවෙනස්ව අභිප්‍රාය සැටියේම වාසය කෙරෙති යනාදී නමන්ගේ ඵාසු කීහ.

ඉක්බිති බොධිසත්වයන්ගේ සුවදුක් විචාරන්නාවූ රජ්ජුරුවෝ මහාජව වේග සම්පන්නවූ බොහෝ හංසයන් විසින් පිරිවරණ ලද්දාවූ ධෘතරාෂ්ට්‍ර හංස කුලයෙහි උපන්නාවූ නුඹවහන්සේ මේ සතුරා අතට කවරහෙයකින් පැමිණිසේක්ද මේ තෙම මලෙහි බැඳුනු අවස්ථාවෙහි ඔබට දණ්ඩකින් ලීයකින් ගසා ආඝාතයක් නොකෙළේද මෙවැදි කොල්ලෝනම් සතුන් අසුවූ අවස්ථාවෙහි පළමුකොට ගැසීම සවභාවධර්මකොට ඇත්තාහුය. මොහුගෙන් ආයාසයෙක් නුවූයේදැයි විචාළාහුය.

එසඳ බොධිසත්වයෝ මහරජ්ජුරුවෙනි මෙවැනිවූ අපදාවක් පැමිණි තෙනදීන් මෙතෙම විරුද්ධව නොපැවැත්තේය මේ වැදිපුත්‍රයා දැක මධුරවූ කථා ප්‍රවෘත්ති ඇති සථානොචිත ප්‍රඥායෙන් යුක්තවූ සුමුඛයෝ මොහු හා කථාකළහ. ඔහුගේ මධුරවූ කථා ශ්‍රවණයකොට ප්‍රසන්නවූ මේ වැදි පුත්‍රතෙම මා මලින් මුදා සැපසේ නැගීගිය මැනවැයි නියෝගකෙළේය. මෙතනට ඒමත් මෝහට අභිවෘද්ධි පිණිස අපගේ මේ සුමුඛයන්ම සිතනලද්දේයයි යනාදීන් මධුරවචනයෙන් කථාකළාහුය. ඒ අසා රජ්ජුරුවන්වහන්ස පක්ෂිත්ට ශ්‍රෙෂ්ඨවූ නුඹවහන්සේ ඒම මනානවනෙක් වේවයි නුඹවහන්සේගේ දැක්මෙන්ම සතුටුවීමියි මේ වැදින් බොහෝ සම්පත් ලැබෙන්නේහයි කියා අමාත්‍යයකුගේ මුහුණ බැලූහ. ඔහු විසින් කුමක් කෙරෙම්ද දේවයන්වහන්සැයි විචාළසඳ මේ වැද්දාවූ දළිරුවුළු අන්දන්නබා ඉස්සෝධා නහවා සුවඳ විලවුන් ගන්වා වස්ත්‍රාභරණාදීන් සරහාවා වහා ගෙණෙවයි කීහ.

ඒ නියෝග ලද අමාත්‍යයා විසින් සරහා ගෙණාසඳ ඔහට අවුරුද්දකට ලක්ෂයක් නියමවන ගම්වරයක් හා උභයපාර්ශ්වයෙහි මහා වීපියකින් සැරහුනාවූ ගෙයක් හා රථයානාවක් හා බොහෝ රත්රන්දී පිණවා ඉක්බිති

රජ්ජුරුවෝ හංස රාජයාන්වහන්සෙ අභිප්‍රාය සැපියේම වැද්දවුට සම්පත්තීන් පුරාලීමියි කීහ.

ඉක්බිති මහා බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට සතුටුව බණ කියා දශරාජ ධර්මයෙන් අනුශාසනා කළහ.

එකල බණ අසා සතුටුව රජ්ජුරුවෝ මහාබෝධිසත්වයන්ට බණට පූජා කෙරෙමින් ඡේසත් නංවා රාජ්ජය පාවාදෙන්නාහු මේ රාජ්ජයෙහි මා අයිතිවූ යම් වස්තුවෙක් ඇද්ද ඒ සියල්ල නුඹවහන්සේට ධර්ම පූජාකොට දිනිමියි මේ සියළු රාජ්‍ය සම්පත් කැමති කැමති කෙණෙකුන්ට දන් දෙතත් දූතමැතව රාජ්‍යයකරතත් අනුශාසන කළමැනව මම ආයුධගෙණ නුඹ වහන්සේට සේවාකම් කොට සිටිමියි කීහ.

එකල මහාබෝධිසත්වයෝ මෙතැන් පටන් මා සන්තක රාජ්‍යය නොබදු බදු ගැණීමෙන් ජන පීඩා නොකොට දැහැමෙන් රාජ්‍ය කළමැනවැයි රජ්ජුරුවන්ට පාවාදුන්හ. ඉක්බිති රජ්ජුරුවෝ මා විසින් හංස රජ්ජුරුවන්ගේ බණ කථා අසනලද වැද්දහු විසින් සුමුඛනම් හංස සෙනාධිපතීහු මිහිරි බණ කථා දන්නාහයි විශෙෂකොට ප්‍රශංසාකරණලද හෙයින් උන්ගෙනුත් බණ කථා අසනු කැමැත්තෙමියි කීහ.

එසඳ සුමුඛ නම් හංස සෙනාධිපති මහරජ නුඹවහන්සේ සියළු මනුෂ්‍යයන්ට නායකසේක. මූන්වහන්සේ සියළු හංසයන්ට නායකසේක. එසේවූ උත්තමයන් කථාකරන්නාවූ ස්ථානයට පැමිණියාවූ මම පෙරලා බන්ධනයට අසුඋනාහ. රජක්හු පරිද්දෙන් සෙල්විගත නොහෙමි. තවද මට ස්වාමීව සිටියවුන් හා කථාකරණ තැන්හි දාසව සිටියවුන් විසින් අතරතුරෙහි කථා කිරීම ස්වාමි පක්ෂපාත අපවැත්තවුන්ට ආචාරනොවන්නේය. එසේහෙයින් තුෂ්ණිම්භූතව උනිමියි කීහ.

එබස් අසා සතුටුවූ රජ්ජුරුවෝ නුඹවහන්සේ විශිෂ්ටවූ නුවණැතිසේ කැයි යනාදීන් ප්‍රසිඬවූ මේ කීර්ති ඝොෂව ඒ ස්ථානයෙහිම ප්‍රසිඬවිය. එසේ හෙයින් මේ මිත්‍රද්‍රොහිවූ අව්‍යස්ථිත සිත් ඇති කෙණෙකුන්ගේ ගුණය මෙසේ නොවන්නේය. එසේහෙයින් මෙසේවූ ස්වාභාවික උත්තම ගුණ ඇති කෙණෙකුන් මම නුදුටුමියි එසේ හෙයින් නුඹවහන්සේගේ මිහිරි කථාවෙහිද සතුටුව මට පැමිණි සන්තෝෂය බොහෝකලක් පවත්නා නියායෙන් දෙදෙනාම ඇම වේලෙහිම දක්නා කැමැත්තෙමි කීහ.

එබස්අසා රජ්ජුරුවන් කෙරෙහි පැහැද ප්‍රශංසා කරන්නාවූ හංස රජ්ජුරුවන්වහන්සේ මහරජ මිත්‍රයන් විසින් තමන්ගේ මිත්‍රයන්ට යම් උපකාරයක් කළයුතුවීනම් ඒ සියළු උපකාරය තොප විසින් කරණලද්දේය. අපිත් සැක නැතිවවම සියළු උපකාරය ලදුවෝ වූම්හ. එසේහෙයින් අප ඔවුනොවුන් කෙරෙහි ඇති භක්තිප්‍රේමය එකතැන උනත් වෙන්ව ගියත් අඩුවක් නොවන්නේය. තවද අප දෙදෙනාගේ වියෝගයෙන් අපගේ බන්ධුවූ හංස සමූහයාට බොහෝ දුක් පැමිණියේය. මහරජ ශොකයෙන් පීඩිතවූ ඒ බන්ධූන්ගේ ශොකදුරු කෙරෙමි අප නික්මවා පියන්නා කැමැත්තම්හයි පින්

වත්වූ මහරජ්ජුරුවන් දකීමෙන් බලවත්වූ සන්තොෂයට පැමිණියෙමියි යම් බන්ධු සඞ්ග්‍රහයෙක් ඇත්තම් ඒ ඤාති සමාගමයත් මට බලවත්වූ වැඩය එසේ හෙයින් මහරජ අප නික්මවා පියවයි කීහ.

එලෙස බොධිසත්වයන් කී කල්හි රජ්ජුරුවෝත් යහපත නික්මුණ මැනවැයි අවසර දුන්හ. එකල්හි මහාබොධිසත්වයෝ රජ්ජුරුවන්ට ප්‍රාණඝාතාදිවූ පඤ්චදුස්සීල කම් දුගතියට පමුණුවන්නේය යනාදීන් එහි ආදීනව හා ප්‍රාණඝාතාදීන් වැළකීමාදිවූ පඤ්චසීලයාගේ ඉෂ්ටඵලය ප්‍රකාශකොට කියා මහරජ සිල්රක්ෂාකරව දැහැමෙන් රාජ්‍යයකොට සතර සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජය කරවයි අවවාදකොට ඉක්බිති දෙවෙනි දවස් අරුණ නැගෙන වේලෙහි මී හා විලඳ ශකීරා පැන් අනුභවකොට රජ්ජුරුවන් හා බිසවුන් විසින් රත් තල් වැට දෙකක් හිඳුවාගෙණ සුවඳින් මලින් පූජා කොට නික්මෙන්නේ යහපතැයි අවසර දුන් කල්හි රජ්ජුරුවන් පැදකුණු කොට සීමැදුරු කවුළුවෙන් පිටත්ව මහත්ගමන් වේග ඇතිහෙයින් චිත්‍රකූට පර්‍වතයට ගොසින් බත්ධූන් දුටහ. එකල්හි නිදුක් නිරෝගිව සැපසේ අවුත් පැමිණි හංස රජ්ජුරුවන් හා සුමුඛයන් දැක ප්‍රීතියෙන් පිණාගියාහු ලබනලද පිහිට ඇති හංස සමූහයෝ සන්තොෂරාවයෙන් මත්ව කොකාඩවති පවත්වා ඉක්බිති හංසයෝ ස්වාමීනි සතුරන් අතින් කෙසේ ගැලවී ගිය සේක්දැයි විචාළේය.

ඒ අසා මහබොධිසත්වයෝ සුමුඛයන් නිසා ගැලවී ගියෙමි යනාදීන් බැඳුනු වේලෙහි පටන් රජ්ජුරුවන්ගෙන් අවසර ගෙනඑන වේලාව පටන් මේ දෙඅතුරෙහි පැවති යම් කාරියෙක් ඇත්තම් සියල්ලම වෙන වෙනම කීහ. ඒ අසා සතුටුවූ හංස සමූහයා සුමුඛනම් සෙනාපතීහුද අපගේ රජ්ජුරුවන්වහන්සේද වැදි පුත්‍රයාදැයි යන මේ හැමදෙනාම සුවපත්ව නිදුක් නිරෝගිව බොහෝකාලයක් පවතිත්වයි ස්තුති කළාහයි යනාදීන් බුදුරජානන් වහන්සේ මේ ජාතක ධර්‍මදෙශනාව ගෙණහැර දක්වා මහණෙනි මේ ලෝකයෙහි යම් කෙණෙක් මිත්‍රධර්‍මය අඛණ්ඩකොට රකිත්ද ඔවුන්ට සියළු අභිමතාර්‍ථය මේ හංස රජ්ජුරුවන්ගේ අභිමතාර්‍ථය සිඬවූවාක්මෙන් සමෘඬවන්නේයයි යනාදීන් අනඳමහතෙරුන් වහන්සේගේ ජීවිත පරිත්‍යාගය නිසා කථා ඉපදවූ භික්ෂුන්වහන්සේ ඇතුළුවූ සිව්වණක් පර්ෂදට මේ චුල්ලහංස ජාතක ධර්‍මදෙශනාව වදාරා මහණෙනි ආනන්දයෝ පෙරත් මා නිසා ජීවිතපරිත්‍යාග කළෝවේදැයි වදාරා පූර්‍වාපර සන්ධිගළපා මේ චුල්ලහංස ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි වැදිපුත්‍රයා නම් ඡන්නස්ථවිරයෝය එකල රජ්ජුරුවෝ නම් ශාරිපුත්‍රස්ථවිරයෝය තිරිසන්ව සිට ජීවිත පරිත්‍යාගකළ සුමුඛ නම් හංසයානෝ නම් මේ ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි අනූදහසක් හංසයෝ නම් දැන් මේ බුදුපිරිසය. මරන්ට බැඳගත් වැද්දවූ ඇතුළුවූ සියළුසත්වයාහට මෙලෝ පරලෝ දෙකින් වැඩකළ හංසරජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

522
මහා හංස ජාතකය

ඓහලෞකික පාරලෞකිකාර්ථයෙන් අනුශාසනාකොට සියළු සත්වයන් ස්වර්ග මොක්ෂ සම්පතට පමුණුවන හෙයින් ශාස්තෘ නම්වූ සර්වඥරාජෝත්තමයානන් වහන්සේ බිම්සර රජ්ජුරුවන් විසින් කරවා පිළිගන්වනලද වේළුවනාරාමයෙහි දවස්යවා වදාරණසේක් ආනන්ද මහ තෙරුන්වහන්සේ විසින් බුදුන් උදෙසාම ජීවිත පරිත්‍යාගය කිරීම අර්ථෝත්පත්තිය කොට මේ මහා හංස ජාතක ධර්මදේශනාව වදාළසේක.

මෙහි වර්තමාන කථාව යට චුල්ලහංස ජාතකයෙහි කථාව හා සදෘශ වන්නේය. මේ ජාතකයෙහි අතීත කථාව ගෙණහැර දක්වන්නාහු සර්වඥයන් වහන්සේ එම්බා මහණෙනි යටගිය දවස බරණැස්නුවර සංයම[1] නම් බරණැස් රජ්ජුරුවන්ගේ ඛෙමා නම් අගමෙහෙසුන් බිසෝකෙණෙක් වූය. එකල්හි පුරණලද බොධිසම්භාර ඇති මහාබොධිසත්වයෝ හංස ජාතියෙහි ඉපිද අනූ දහසක් හංසයන් පිරිවරා චිත්‍රකූට පර්වතයෙහි වසන්නාහ. ඉක්බිති එක්දවසක් ඛෙමා නම් බිසව් අළුයම් රාත්‍රියෙහි ස්වප්නයක් දක්නාහු රන්වන්හංසයෝ දෙදෙනෙක් අවුත් සිංහාසන මස්තකයේ හිඳ මිහිරිවූ කටහඬින් බණකියති. තුමූත් සාධුකාරදී බණඅසමින් ඉන්දදීම රාත්‍රියඉකුත්විය. හංසයෝ බණකථාව කියා සන්ධ්‍ය නොගළපා සීමැදුරු කවුළුවෙන් පිටත්ව නික්මුණාහුය. එකල බිසව් හංසයන් අල්වවයි කියමින් මහත් වේගයෙන් දෑත දික්කොට පුබුදිමින් දෑත දික්කොටගෙණ නැගීසිටියාහ. බිසවුන්ගේ මෙබස් අසා පරිවාරස්ත්‍රීහු හංසයෝ කොයිද කොයිදැයි කියා මදක්වෙහෙසූය. එවේලෙහි බිසවු මාදුටුයේ ස්වප්නයක් වේදැයි සිතා ඒකාන්තයෙන්ම මා නැත්තක් නොදකිමි. මේ ලෝකයෙහි රන්වන් හංසයෝ ඇත්තාහුය. ඉදින් මම ස්වර්ණහංසයන්ගෙන් බණ අසන්නා කැමැත්තෙමි. රජ්ජුරුවන්වහන්සේට දන්වීනම් අප විසින් රන්වන් හංසකෙණෙකුන් දුටු විරූ නැත තිරිසන්වූ හංසයොත් මනුෂ්‍යයන්ට දැනෙන ලෙස කථාවක් කෙරෙද්ද? මේ ඇත්තෙක් නොවෙයි කියා මං කීව සරුවක් නොකරණසේක. රන්වන් හංසයන්ගෙන් බණ අසන දොලෙක් උපනැයි කියන්නම් යම්කිසි උපදෙසකින් පරීක්ෂාකොට ගෙන්වනසේක එකල්හි මාගේ මනෝරථය සිඩවන්නේයයි ස්වප්න දුටුවේලෙහි පටන් බිසවුන් කිසිවක් නොකියා ගිලන් ආකාර දක්වා මං විචාළ කෙණෙකුන්ට ලෙඩා නියාව කීයවයි නියෝගකොට පරිවාර ස්ත්‍රීන්ට නියෝගකොට ලෙඩවී වැදහොත්තීය.

රජ්ජුරුවෝ සිංහාසනයේ උන්නාහු රාජසේවයට එනවේලෙහි බිසවුන් නොදැක ඛෙමා දේවී කොයිදැයි විචාරා ලෙඩහයි යනු අසා යුහුව උතස් නෙත් නැගී බිසවුන් සැතපුණු ගබඩාවට ගොස් යහනෙහි එක් ඇලයක ඉඳ අතින් පිට පිරිමදිමින් බිසවුනි කෙසේවූ අපාසුවෙක් දැයි විචාළහ.

එකල බිසව් දේවයන්වහන්ස මට අනික් අපාසුවෙක් නැත. දොලෙක් උපනැයි කිවූය. ඒ අසා රජ්ජුරුවෝ සමාධිව බිසවුනි යමක් කැමැත්තාහු නම් ඇසිල්ලකින් ගෙන්වාදීලම් කීහ.

---

1. සිං. සෙය්‍යංසක.

එකල බිසවු කැම්පිම් ආදි කිසිවක් නිසා උපන් දොලෙක් නොවෙයි නගතලද සේසත්යට පණවනවතලද සිංහාසන මස්තකයෙහි හිඳ බණ කියන්නාවූ සවර්ණහංසරජ්ජුරුකෙණෙකුන්ට සුවඳින් මලින් පූජාකොට සාධුකාරදීදී බණ අසන්නා කැමැත්තෙමි ඉඳින් බණ අසන්නට ලදිම්නම් යහපත. නොලදිම් නම් මාගේ ජීවිතය තිබෙන නොසිතුව මැනවැයි කීහ.

එකල්හි රජ්ජුරුවෝ ඉඳින් මනුෂ්‍යලෝකයෙහි ඇත්නම් ලබව නොලබමියි සෝක නොකරවයි බිසවුන් අස්වසා ශ්‍රියහන් ගෙන් පිටත්ව අමාත්‍යයන් හා සමග මන්ත්‍රණයකරන්නාවූ එම්බා අමාත්‍යයෙනි බෙමා නම් බිසවුන් රන්වන් හංසයකුගෙන් බණ අසන්නට ලදිම්නම් ජීවත්වෙමි නොලදිම් නම් රැකියා නොඑම් කියති කිමෙක්ද රන්වන් හංසයොත් ඇද්දැයි විචාළහ. එකල අමාත්‍යයන් විසින් දෙවයන්වහන්ස හිමාලයවනයෙහි චිත්‍රකූට පර්වතය ඇසුරුකොට රන්වන්හංසයෝ වෙසෙති මුඛ පරම්පරාවෙන් කියා එබස විචාරන් දනිමියි කීවාහ.

එකල රජ්ජුරුවෝ ඒ හංසයන් අල්වන්ට නිසි උපදෙසක් දනිද්දැයි විචාරා නොදනිමුය කීහෙයින් එකල්හි නුවණැති බමුණන් ගෙන්වාගෙණ රන්වන් හංසයන් චිත්‍රකූට පර්වතයෙහි වාසයකෙරෙති ඇසුම්හයි උන් අල්වා ගෙන්වා ගන්නා උපදෙසක් දනුදැයි විචාළහ. එකල බ්‍රාහ්මණයෝ මහරජ මිතිසුන් යවා ගෙන්වාගණුම්හයි ආයාස නොගත මැනවැයි උපදෙසයකින් හංසයන් මෙනුවර ආසන්නයට ගෙන්වාගෙණ ක්‍රමයකින් අල්වාගණුම්හයි කීහ.

කවර උපදෙසක්දැයි විචාළ මහරජ නුවරට උතුරුදිග තුන්ගව්වක් පමණ දිග පළල ඇති ඛෙමාතම් විලක් ඇතිකොට දියපුරවා නොයෙක් ධාන්‍ය ජාතීන් ඇතිකොට පංචවර්ණ පද්මයෙන් සජ්ජිතකරවා නුවණැති එක් වැද්දක්හට පාවාදී මනුෂ්‍යකෙණෙකුන් විල ආසන්නයට ආනොදී උදෑසන සවස විලසතර කොනයෙහි සිට ඛෙමා නම් විලට සියළු පක්ෂීන් ඇවිදින් කැමති සැටියේ ගොචර ග්‍රහණයකොට වාසය කළයුතුය. කිසි කෙණෙකුන් ගෙන් උපද්‍රව නොවන්නේයයි ඝෝෂාකරවුවමැනව. එසේකල්හි නොයෙක් පක්ෂීහු රැස්වෙති එරන්වන් හංසයොත් පරම්පරාශ්‍රැතියෙන් එවිල නිර්භය නියාව අසා සැකනැතිව එන්නාහුය. එකල හංසයන් මළිත්බැඳ ගෙන්වාගත මැනවැයි කීහ.

එබස් අසා රජ්ජුරුවෝ බමුණන් කීනෙනම කියතලද ප්‍රමාණ ඇති විලක් කරවා නොයෙක් ගොචරයෙන් සමෘද්ධකොට දක්ෂවූ වැද්දන්හට පාවාදී දහසින් බද පියල්ලක්දී ඔහු සනෙතාෂකොට තෝ මෙතැන් පටන් තාගේ ක්‍රියාවෙහි ඇවිද දුක්නොවිඳ නොපගේ අඹුදරුවන්ට උවමනා බත් පිළී ආදීවූ රැකීමත් මට භාරය නොපමාව තෝ ඛෙමා නම් විල රකිමින් මනුෂ්‍යකෙණෙකුන් ලංවියනොදී ඒ ඒ ස්ථානයෙහි ඛෙමා නම් විලට ආ පක්ෂි කෙණෙකුන්ට කිසි භයෙක් නැත්තේයයි ඝෝෂාකෙරෙමින් ඒ ස්ථානයෙහි වාසයකොට ආ පක්ෂිකෙණෙක් ඇත්නම් මට කියාලව රන්වන් හංසයන් ආනියෑද කී දවස් නට බොහෝ සම්පත් දෙමියි අස්වසා ඛෙමා නම් විල වැද්දහුට පාවාදුන්හ.

එවැදින් එතැන් පටන් රජ්ජුරුවෝ කී සැටියේ පිළිපැදත් විල රකිතේය. එතැන්පටන් ඛෙමාතම් විල රකිතහෙයින් වැද්දහුත් ඒ නමින් ප්‍රසිඬවීය. එතැන්පටන් අනේකප්‍රකාරවූ පක්‍ෂිසමූහයා එවිලට අවුත් ගොචර අනුභවකොට තමන් තමන්ගේ වාසස්ථානයට ගොස් ගොචර සම්පන්නවූ ඛෙමතම් විල නිරුපද්‍රවයයි වර්ණනාකොට කියන්නාහ. මෙසේ පැවැති පරම්පරා ඝොෂාව අසා පළමුවෙන් තෘණහංසයෝ අවුය උන්ගෙන් අසා පාණ්ඩු වර්ණහංසයෝ අවුය උන්ගේ කීමෙන් රත්සිරියෙලහි පැහැසමානවූ රත්වන් හංසයෝ අවුය. උන්ගේ බසින් සෙවතහංසයෝ අවුය උන්ගේ ඝෝෂායෙන් පාක හංසයෝ අවුය උන් ආ ඉක්බිති ඛෙමාතම් වැදි රජ්ජුරුවන්කරා ගොස් දේවයන්වහන්ස පංචවර්ණහංසයෝ අවුත් විල ගොදුරු අනුභවකෙරෙති පාක හංසයන් ආ බැවින් අතික් කිපදවසකින් සුවර්ණහංසයෝ එති එහෙයින් සැක නොකළ මැනවැයි කීයේය.

ඒ අසා රජ්ජුරුවෝ අනික් කිසි මිනිස්කෙණෙකුන් එවිල සමීපයට නොයායුතුය ඉදින් ගිය කෙණෙකු ඇත්නම් අත්පාකපමි නොහොත් ගෙවල් කොල්ලකෑම් ආදී ව්‍යසනයට පැමිණෙන්නේයයි බෙරලූහෙයින් කිසි මනුෂ්‍ය කෙණෙකුන්ගෙ සංචාරයෙක් නැත්තේය.

චිත්‍රකූටයට ආසන්නයෙහි රන්ගල්ගුහාවෙක පාකහංසයෝ වෙසෙති ඔහුන් මහත්වූ කායබල ඇත්තාහ. ධෘතරාෂ්ට්‍ර නම් හංසයන් හා ඔවුන්ගේ ශරීරවර්ණය විචරෙක් වෙනස ඇත්තෝය. එහෙයින් පාක හංසරජ්ජුරු වන්ගේ දියෙනිකෙණෙක් රන්වන් පෑ ඇත්තාහ. එසේ හෙයින් මාගේ දියනියෝ ධෘතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවන්වහන්සේටම සුදුස්සහයි උන්ට පාද පරිචාරිකා කොටගෙණ දෙකුලෙහි හංසයෝ ඔවුනොවුන්ට ඉතා විශ්වාසීව ඉඳිනාහුය.

ඉක්බිති එක් දවසක් බොධිසත්වයන්ගේ පරිවාර හංසයෝ පාක හංසයන්ට තෙපි හැම මෙතෙක් දවස් කොයි ගොසින් ගොදුරු අනුභවකළාහු දැයි විචාළාහ. එඅසා පාක හංසරජ්ජුරුවන්ගේ සේවක හංසයෝ බරණැස් නුවරට නුදුරුනෙත ඛෙමාතම් විල ගොදුරු ඉතා සුලභය. ඒගොස් ගොදුරු අනුභවකොට ආම්හ එව තෙපි හැම කොයි ඇවිදුද එවිල ඉතා සිත්කළුය හංසචක්‍රවාකසාරසාදී නොයෙක් පක්‍ෂීන්විසින් ගැවසීගත්තේය. පංචවර්ණ පද්මයෙන් හා නොයෙක් ධාන්‍යජාතියෙන් සමෘද්ධය. පඤ්චවර්ණ හංසයන් විසින්මනකරන්දග්‍රහණය කොට සන්තෝෂයෙන් කුල්නාලද්දේයයි සතරකොන සිට නිරන්තරයෙන් පවත්වන අභය ඝොෂා ඇත්තේයයි එසේහෙයින් එවිල සමීපයට ලංවෙන කෙණෙක් නැත. අනික් උපද්‍රවයෙක් කැලම නැත්තේය යනාදීන් එවිල ඇති ගුණ වර්ණනාකොට කීහ.

ඒ හංසයෝ තමන් ඇසූ ප්‍රවෘත්තිය සුමුඛනම් හංස සේනාධිපතීන්ට කිවූය. ඔහු එපුවත් හංසරජ්ජුරුවන්ට කිවූය. ඒ අසා සුවර්ණහංස රජ් ජුරුවෝ මනුෂ්‍යයෝ නම් බොහෝ මායම් හා උපාය දන්නාහුය. මෙතෙක් කල් මෙනම් විලෙක් නැත්තේය, කාරණයක් නිසා අමුතුව ඇතිකරණලද ඒකාන්තයෙන් අප හැම අල්වාගන්නා පිණිස කරණලද්දේවනැයි සිතා එම්බා

සුමුඛයෙනි එවිලතම් උදක් සෑදූහැයෙන් කලදෙයක් නොවන්නේය. මනුෂ්‍යයෝ තම් තීක්ෂණ මන්ත්‍රීව උපායක් දන්නාහ. එසේ හෙයින් එවිලට ගොසින් ගොදුරු අනුභවකරම්හයි නොසිතව නොප හැම මෙතෙක් දවස් ගොදුරු අනුභවකරණ තෙතටම ආලය කරවයි කීහ.

එතැන්පටන් සුවර්ණහංසයෝ බෙමා නම් විලට ගොස් ගොදුරු කන්නා කැමැත්තම්හයි දෙතුන්වැනිවත් සුමුඛ නම් සේනාපතීන්ට කිවූය. උයින් හංසයන් එවිලට යනුකැමතිව දෙතුන්වැනිව පෙරුන්න කියන නියාව බෝධිසත්වයන්ට කීහ.

එකල මහාබෝධිසත්වයෝ මාගේ බන්ධුහු මා නිසා පීඩා නොවී ඉන්වයි හැමදෙනම නන්පරවූ පසු යහපත නික්මෙන්වයි අනූදහසක් හංසයන් පිරිවරා එවිලට ගොස් ගොදුරු අනුභව කොට හංසක්‍රීඩා කෙළ නැවත චිත්‍රකූට පර්වතයටම ගියාහ.

බෙමාතම් වැදින් ඒ සුවර්ණහංසයන් ගොදුරු අනුභවකොට ගිය කල්හි එපවත් රජ්ජුරුවන්ට කීයේය. එඅසා සතුටුව රජ්ජුරුවෝ සබඳ බෙමය හංසයන් එකකු හෝ දෙන්නකු අල්වාගණින්නම් තට බොහෝ සම්පත් දෙමි කියා කී බසට සතුටුව පඹුරුදී වැද්දහු නික්මවූහ. එවැදින් සතුටුව විලට ගොස් තලියක ඉඳ හංසයන් ගොදුරු අනුභවකරණ තැන් පරීක්ෂා කරන්නේ බෝධිසත්වයෝ ගොදුරු අනුභවකිරීමෙහි සවභාවයෙන්ම ලොල් බවක් නැත්තාහුය. එහෙයින් මහාබෝධිසත්වයෝත් ගෙපිළිවලින් සිහා සපදානචාරිකාංගය පුරණ භික්ෂුකෙණෙකුන්වහන්සේ මෙන් විලට බැසපු තැන් පටන් පනතියෙන් ඇල් අනුභවකිරීමෙන් යෙති සෙසු හංසයෝ ඇනමෑනඇවිද කන්නාහ. මූ එදූක ලොළුපපචාරයක් නැතිව හැමදවස්ම පනතියෙන්ම කාගෙනයෙති. මූන් බඳගත හැක්කැයි සිතා දෙවෙනි දවස් හංසයන් විලට නොඑනතුරුම තාලියෙන් එතනට ගොස් නුදුරුනන්හි හංසයන්ගේ ඊම සැල සිදුරෙන් බලාගෙණ උන්නේය. එකල්හි මහාබෝධිසත්වයෝ අනූදහසක් හංසයන් පිරිවරා ඊයේ දවස් ගොදුරු අනුභවකළ සීමාවට බැස ගොදුරු කන්ට පටන් ගන්හ.

එකල්හි සැළසිදුරෙන් බලාගෙණ උන් වැදිපුත්‍රතෙම රූපයෙන් අග්‍රප්‍රාප්ත බෝධිසත්වයන් දැක මේ හංසරජ්ජුරුවෝ බන්ධුගැලක් සා පමණ මහත ඇත්තාහ. රත්වන්වූ පැයෙන් හා කරවට කොට රන් රේකා තුණක් පිට ඔස්සේ තුණක් ඇතුළුවූ රත් හිරින් පරික්ෂිප්තවූ මහබෝධිසත්වයෝ රත් පලස් හුසින් කරණලද සැළෙක් තුබූ රත් පිඩවලල්ලක්සේ ඉතා බබලන්නාහු මේ කාරණයෙන් මූන් හංසයන්ට රජ්ජුරුවන් වුවමැනව මූන්ම අල්වම් සිතූයේය

එකල හංසරජ්ජුරුවෝත් යපෙන වීවර ගොදුරු කා දිය කෙළිනා කල හංස සමූහයා පිරිවරණලදුව චිත්‍රකූට පර්වතයට ගියාහ. මේ නියායෙන් සත්දවසක් ගොදුරු අනුභවකළාහ. සත්වෙනි දවස් වැදිපුත්‍රතෙම කලුහස් හිලයෙන්ද ලනුවක් අඹරා උගුළු මළක්කොට සෙට හංසරජ්ජුරුවෝ අසවල් තෙනට බස්නාහුයයි තත්වයෙන් දැන දිය ඇතුළෙහි උගුළුමළ එබුයේය. දෙවෙනි දවස හංසරජ්ජුරුවෝ ඇවිදින් බස්නාවූ මළ ඇතුළෙහි පය ඔබාගෙණ බටහ.

එකල්හි බෝධිසත්ත්වයන්ගේ පය යපතකින් වෙළාගත් පරද්දෙන මළ බැඳි ඇසිර ගියේය. එසඳ මළ කඩාගණිමියි වේගඋපදවා ගසා ඇදලූයේය. රත්වන් සම ඉපිට ගියේය. දෙවෙනිවත් රත්වූ මාංස කැඩීගියේය. තුන් වෙනිව නහර කැඩී වෙන්ව ගියේය. සතරවැනිව මළගසලා ඇද්දහොත් පය කැඩී යනහෙයින් රජව සිටියවුන් විසින් අසථානයේ ජීවිත නසාගැන්ම කට යුතු නොවෙයි සිතා මළකැඩීමට උත්සාහනොකොට දුටුවක් දකිමියි වැදහුන් නාහුය. බලවත්වූ දුකඛවෙදනා උපන්නේය. එකල්හි මහ බෝධිසත්වයෝ ඉඳින් මම බඬරාවයෙන් බැගෑපත්ව හැඬීම්නම් මාගේ බන්ධුවර්ගයෙහි හංසයෝ භයින් ත්‍රස්තව ගොදුරු අනුභව නොකොට සාකුසින් ගොස් විඩාව සමුද්‍රයෙහි ගොස් වැටියන්නාහුයයි සිතා බන්ධුස්නෙහයෙන් දුකඛ වේදනාව ඉවසා උගුල ලීය. මැඩ ඔබාගෙණ ගොදුරුකන කෙණෙකුමෙන් ඉඳ හංසයන් ගොචර ග්‍රහණයකොට දියකෙළිනට පටන්ගත්කල්හි මහත්වූ ශබ්දයෙන් බඬරාව පැවැත්වූහ. ඒ භයානක ශබ්දය අසා සියලු හංසයෝම තුන්මුල්ලක්ව ආකාශ යෙහි නික්මුණාහ. සුමුඛ නම් සේනාධිපති මේ භය කවරකෙණෙකුන්ට පැමිණියේද්හෝයි මහත්වූ වේගයෙන් තුමූ තුන්මුලෙහි හංසයන් බලා මහබෝධි සත්වයන් නොදක ඒකාන්තයෙන් මේ භය හංස රජ්ජුරුවන් වහන්සේට උපන්නේවනැයි ආපස්සෙහි අවුත් බැඳීපියා උන් බෝධිසත්වයන් දක මහරජ භය නොකළමැනව මාගේ ජීවිතය දීපියා වීනමුත් තුඹවහන්සේ ගලවමි කියා අස්වසමින් සමීපයට බැස මඩපිට වැඩහුන්න. එකල්හි මහබෝධිසත්වයෝ මෙතෙක් හංසයන් බලායාදී උදකලාව මම ලඟට ආ වැද්දහු ආ වේලෙහින් හැරපියා නොයෙද්දෝනෝ යෙද්දෝන්නෝයි පරීක්ෂාකරණු පිණිස රන්වන්වූ ශරීර යක් හා සොඳ මුහුණක් ඇති සුමුඛයෙනි සියළු හංසයන් භයින් ත්‍රස්තව ඉස් ලූ ලූ අත පලායාදී තොපි උදකලාව පාසවසගවූ මා සමීපයෙහි කුමට ඉඳුද එහෙයින් සතුරන් අතට අසුව ගියාවූ මාගේ සහායෙක් පිටිවහලෙක් ඇතැයි නොසිතා සතුරන්ගෙන් ගැලවීසිටි තොපි ව්‍යර්ථයේ නොනැසී මෙතනින් වහා පලායවයි කීහ.

එබස් අසා සුමුඛයෝ හංස රජ්ජුරුවන් වහන්සේ මාගේ තරම් නොදන අනුප්පියභාණී මිත්‍රයකැයි නොසිතත සේක. ස්නෙහ පක්ෂපාත බව මුන්වහන්සේට දන්වමි සිතා හංසරජ්ජුරුවන්වහන්ස මියනත් රැකෙනත් එක්ව විනා දුකට පැමිණි තුඹවහන්සේ හැරපියා යෙති නොසිතා මිත්‍රද්‍රොහිවූ අසත්පුරුෂයන් හා මා සරිනොකළ මැනවැයි මම වනාහි බාල්‍යාවස්ථාවෙහි පටන් එක්ව වැඩි යහළුව සිත්සේ වාසයකොර බන්ධුත්වයකුත් ඇතිව සියළු හංස සේනාවට සෙනෙවිරත් ධුරය කෙරෙමින් සිටි තුඹවහන්සේ තනිව සතුරන්ට පාවාදීලා නැයන් මධ්‍යයට ගොස් හංසරජ්ජුරුවන්වහන්සේ කොයිදැයි විචාළ කල කුමක්කියම්ද? එසේ හෙයින් තුඹවහන්සේ කම්පාසයෙන් බැඳුනුසේක. මම ස්නෙහපාසයෙන් බඳවීමි. මියනත් රැකෙනත් එක්ව විනා තනිව යන්නේ නැතැයි කියා දැඩවූ මිත්‍රත්වය ප්‍රකාශකළහ.

මෙසේ හංස සේනාධිපතීන් අභීතනාදයක් පැවැත්වූ කල්හි හංස රජ්ජුරුවෝ කියන්නාහු එම්බා සුමුඛයෙනි තොපට සාමීව අතිවිශ්වාසීවූ මා දුකෙහිදී අත්නොහැර නම් එසේ කිරීම උත්තමයන්ගේ ගුණයෙක. තොප දැක දැක ඉන්නාවූ මට කිසි භයෙක් නැත්තේය. එසේද වීනමුත් මෙබඳු වැසනයට

පැමිණ ගිය මාගේ ජීවිතය තොප විසින් ගලවාගත නොහැක්කේය. අප දෙදෙනාගේ වියෝගයෙන් දුක්ඛයට පැමිණි බන්ධුන්ගේ සෝක නිවමින් වහා නික්මෙව යනාදී කථාකරණ කල්හි විල් කෙළවර සිටි වැදි හංසයන් තුන් මුලක්ව ආකාශයෙන් නික්මුණවුන් දැක කිමෙක්දෝහෝයි මළ දිසාව බැලූයේ උගුල යටෙහි බැඳී එල්ලෙන්නාවූ බෝධිසත්වයන් දැක බලවත්වූ සතුටුව කැස පට තරයේ ගන්වාගෙණ මුගුරක්ගත් අත් ඇතිව කල්පාන්ත වහ්නියක්මෙන් මැඩගෙණ විළුඹෙන් නික්මුනු මඩකැට් ගොස් ඉදිරියෙහි වැවෙන පරිද්දෙන් වේගයෙන් දිවෙමින් ගොස් හංසයන්ට ආසන්නවිය.

එකල වේගයෙන් එන්නාවූ වැද්දහු දැක සුමුඛනම් හංසසේනාධිපති හංසරජ්ජුරුවන්වහන්ස වැදි එන්නේය. නුඹවහන්සේ භයනොකළ මැනවැයි අස්වසා කියමින් අමෝරාගෙණ එන මුගුරෙන් හංසරජ්ජුරුවන් වහන්සේට ගසාපී නම් නපුරුයි යන විශ්වාසය ප්‍රකාශ කෙරෙමින් පිටිපස්සේ උන් තැනැත්තෝ බෝධිසත්වයන් ඉදිරියේ සිට මාගේ ඥානගුණවිචරිත්නුඹවහන්සේ ගැලවෙන නියාවන් උත්සාහ කරන්නෙමි. මාගේ උත්සාහයෙන්ම වහා ගැල වෙනසේක. එහෙයින් භයපත්නොකොට වැද්දහුනම මැනවැයි බෝධිසත්වයන් අස්වසා වැද්දහු ලඟට අභිමුඛව ගොස් මිහිරිවූ මනුෂ්‍ය භාෂාව විහිදුවා සබඳ තෝ කිනම්දැයි විචාරා රන්වන් හංසයානෙනි බෙමයයි කියන්නෝ මටයයි කී හෙයින් එකල සුමුඛයෝ යහලු බෙමා තා විසින් එබූ මලෙහි එසේ මෙසේ ලඝු හංසයෙකු බැඳුනයි නොසිතව අනූදහසක් හංසයන්ට රජවූ ධෘතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවන් වහන්සේය. නුවණින්ද ගුණයෙන්ද සමන්විතසේක. බොහෝ දෙනාට උපකාරීව සිටි හෙයින් මරාපියයුතු නොවනසේක. ඉදින් තෝ මූන්වහන්සේගේ පියාපත් ඇරගන්නා කැමැත්තෙහි වීතම් මාගේ ඇඟපත් උදුරාගන්වයි ඉදින් සම් මස් නහර ඇට ආදීන් කිසිවක් ගන්නා කැමැත්තෙහි වීතම් මාගේ ඇඟින්ම හැරගණුව. ඉදින් ක්‍රීඩාහංසයන් කරණු කැමැත්තෙහි වීතම් මාම සලසාගණුව. නොමරා විකොට සම්පත් ලබනු කැමැත්තෙහි වීතම් මා විකොටපියා හැරගණුව. ජාතිගොත්‍ර කුලවර්ණසණ්ඨානාදියෙන් මම සරි හෙයින් තොපට කිසි අලාභයෙක් නොවන්නේය. එහෙයින් ගුණ නුවණින් යුක්තවූ හංසරජ්ජුරුවන් වහන්සේ නොමරා හැරපූ නම් මෙලෝ පරලෝ දෙක්හි බොහෝ වැඩවන්නේය. ඉදින් මැරුයේවීතම් නරකාදී සතර අපා යට පැමිණ බොහෝ දුක්විඳිනෙහියයි යනාදීන් මිහිරිවූ කථා කියා වැද්දහුගේ සිත මොලොක් කොට නැවත බෝධිසත්වයන් දිසාවට නැමී ස්වාමීනි ඉතිකින් භය නොකළ මානවැයි අස්වසා කීහ.

සුමුඛනම් හංස සේනාධිපතීන් විසින් කියනලද සුභාසිතවූ බණ කථාව අසා සන්තෝෂයෙන් ලොමහඝේනින් ගමනයට පැමිණ සූයඝී දිව්‍ය පුත්‍රයාට නමස්කාර කරණ කෙණෙකුන් පරිද්දෙන් බලවත් ආදර ගෞරවයෙන් දෙනොත් මුදුනෙහි බැඳ තිරිසන්ව උපන් කෙණෙකුන් මනුෂ්‍යභාෂාවෙන් මිහිරිකොට මෙසේ කථාකරණකෙණෙකුන්මෙන් උපන් ජාතියට මාදුටුවිරූත් නැත්තේය. ඇසුවිරූත් නැති සබඳ මේතෙක් හංසයන් මුළුල්ලම ඇරපියාදීන් උදකලාව ඉඳ ජීවිත පරිත්‍යාගය කෙරෙමින් කියන්ට මේ හංසරජ්ජුරුවෝ තොපට කෙසේවූ බන්ධුත්වයක් ඇත්තාහුදැයි වැදි පුත්‍රයා විචාළේය.

එබස් අසා සුමුඛ නම් හංසසේනාධිපති මේ වැද්දහුගේ සිත මොලොක්වූයේය, දැන් වනාහී මොලොක්කොට ගන්නා පිණිස මාගේ ගුණය ප්‍රකාශ කෙමෙයි සිතා එම්බල වැදිපුත්‍රය මේ හංසරජ්ජුරුවන් වහන්සේ මා ඇතුළුවූ සියලු හංස සමූහයාට රාජයෙක. එසේම මට ස්වාමිව සිටියාවූ උන් වහන්සේට උදකලාව ව්‍යසනයට පැමිණියාදී අපසේවූ ස්වාමිපක්ෂපාත උත්තමයෝ ඇර නොයන්නාහ. එසේහෙයින් මම උන්වහන්සේ සමීපයෙහිම රඳා එක්ව දකිනා දෙයක් විනා තනිව ගැලවීයන්ට නොසිතමි කීහ.

එසඳ උන් විසින් කියනලද ධර්මාන්විතවූ කථාවන් අසා සන්තෝෂයෙන් ලොමහංසෝත්ගමනයට පැමිණියාවූ වැදි ඉදින් මම මෙබඳුවූ සීලාචාර ගුණ ඇති හංසරජ්ජුරුවන් මැරීම්නම් සතර අපායෙන් ගැලවීයා නොහෙමි. රජ්ජුරුවන් වහන්සේ බඳුගත් හංසයා ඇරපුවේ ඇයිදැයි කිපී මට කැමැත්තක් කරණසේක්වයි මම හංසරජ්ජුරුවන් සුමුඛ නම් හංස සේනාධිපතීන්ට සතුටු පඬුරුකොට අරිමියි සිතා ස්වභාවවූ මිත්‍රධර්මයන් රකිනා උතුම්වූ ගුණ ඇති සුමුඛ නම් සේනාධිපතිනී යම්බඳු තෙපි ස්වාමිව සිටි හංස රජ්ජුරුවන් නිසා ජීවිතය දෙමි ක්වුද ඒ ගුණයෙහි සන්තුෂ්ටවූ මම දෙදෙනාම බන්ධනයෙන් හරිමි. කඳුළුහුනු මුහුණින් අඬන්නාවූ බන්ධුන් සන්තුෂ්ට කෙරෙමින් දෙදෙනම වහා නික්මෙවයි කියා මොලොක්වූ සිතින් මහබෝධිසත්වයන් කරා ගොස් උගුල ලිහා තමා ඔඩමත්තේ බෝධිසත්වයන් ඉඳවා උගුල ලිහා මුදාහැර දැතින් වඩාගෙණ විලින් ගොඩ නැගී අලුත අටගත් සුවපහස් ඇති ඊතණ මත්තෙහි හිඳුවා බැඳීගිය මළ බාලදරුකෙණෙකුන්ගේ කනමැලියම් බැඳීගියාවූ ලනුවක් අදනා ස්නෙහ මැතිකෙණෙකුන්මෙන් සෙමෙන් මලපුඩු ගලවා හැර බලවත්වූ හිතසිතින් විලින් පැන් ගෙණවුත් ලේ සෝධානැර තැවන පය අතින් පිරිමැද ලූයේය. ඒක්ෂණයෙහි වැද්දහුගේ මෛත්‍රීන් හා බෝධිසත්වයන්ගේ පාරමිතා බලයෙන් සම්මස් නහර ගැලපී පය වණය සුවව නොබැඳුනු පය හා සරිව ගියේය.

එකල මහා බෝධිසත්වයෝ පය නොබැඳුනු වේලෙහි පරිද්දෙන් නිදුක්ව උන්හ.

එසඳ සුමුඛ නම් සේනාපතීන් තමන් හංසරජ්ජුරුවන් සැපයට පැමිණි නියාව දැන බලවත්වූ සන්තොෂයෙන් පිණා මේ වැදිපුත්‍රාහු විසින් අපට බොහෝ උපකාර කරණලද අප විසින් උපකාර කරණවුන්ට කළකිසි සංග්‍රහයක් නැත්තේය, ඉදින් මේතෙමේ රජ යුවරජ ඇමතිකෙණෙකුන්ට දෙන පිණිස අප ඇල්වීනම් ඔවුන්ගෙන් බොහෝ සම්පත් ලබන්නේය. නො හොත් තමා නිසා ඇල්වීනම් විකොට පියාත් ලබන්නේය. එසේ හෙයින් වැද්දාට උපකාර කරණු කැමතිව මේ කාරණය විචාරන්නාවූ හංසසේනාධිපති එම්බල වැදිපුත්‍රය තාගේ අභිප්‍රායෙන්ම හංසයන් බදන පිණිස මළ එබි නම් තොප විසින් දුන් අභයදානය සැපසේ පිළිගණුම්හ. ඉදින් අනුන්ගේ කීමෙන් බැඳුයෙහි වීනම් දැන් තොප විසින් ඇරපුකල අප බදුදෙම්හයි කියා අනුන් ගෙන් විඳපු යම් ප්‍රයෝජනයෙක් ඇත්නම් ඒ සියල්ල තොප නයවේදැයි කීහ

එබස් ඇසූ වැදිපුත්‍රතෙම සුමුඛයෙනි මාගේ ප්‍රයෝජනයක් තකා බැඳුයෙම් නොවෙමි. බරණැස්නුවර රජ්ජුරුවන් වහන්සේගේ අගමෙහෙසුන්

ඛිසවුන්වහන්සේ රත්වන් හංසයන්ගෙන් බණ අසන්ට දෙලක් අටගන්නේක. එනිසා මට බොහෝ ප්‍රසාදදී හංසයන් එකකු හෝ දෙන්නකු හෝ බඳුගෙණ එවයි කළ රාජ සමමතයෙන් බැඳීමියි කීයේය.

එකල හංස සේනාධිපති සබඳ එසේකල අප අරින්ට කටයුතු නොවෙයි යම්කෙණෙකුන්ට සේවකව සිටියා තම් උන්ටම ගෙණගොස් පාවා දෙව ඒ රජ්ජුරුවෝම අභිප්‍රාවක් කෙරෙති, එසේහෙයින් සැකනොකොට ඔබම ගෙණයවයි කීහ. එකල වැදි හංසරජ්ජුරුවන්වහන්ස රජදරුවන්ගේ දකීම යහපතැයි නොසිතූ.මැනව ඉසුරුව සිටියෝ නම් තුඹවහන්සේලා දක කෙළි හංසකොට රඳවා ගණිති මරවාපියා මස් හෝ අනුභවකරපියති. එසේ හෙයින් රජදරුවන් දකීමෙහි උත්සාහ නොකළමැනවැයි කීහ.

එකල සුමුඛනම් හංස සේනාධිපති එම්බා වැද්දනෙනි නොපසේවූ නද රූක්ෂකෙණෙකුන් පවා බණ කථාකිරීමෙන් මොළොක්කොට ගනිමි. විශිෂ්ටවූ පින් හා නුවණ ඇති රජදරුවන් මොළොක්කරවා ගැන්ම මට ආශ්වය්‍යී නොවන්නේය, රජදරුවෝ තම් නුවණ ඇත්තාහ. සුභාසිත වචනයෙහි එලඇති නියාව දනිති. ඒකාරණය හේතුකොටගෙණම රජ්ජුරුවන් කරාම අප ගෙණයන වේලෙහිත් බැඳලා නොගෙණ ගොසින් හංසරජ්ජුරුවන් වහන්සේට මැදිරියක් ඉදිකොට එලපියුමෙන් සදා මට කුඩා මැදිරියක්කොට එල රත්පියුමෙන් සදා මැදිරියෙක කදෙහි බැඳ අපදෙදෙනා එහි හිඳුවාගෙණ හංස රජ්ජුරුවන් වහන්සේ ඉදිරිකොට උස්කොට මා උන් මැදිරිය පසුකොට මදක් මිටිකොටගෙණ ගොස් ඒ රජ්ජුරුවන්ට පාවාලවයි කීහ.

එබස් අසා වැදිපුත්‍රතෙම මේ සුමුඛනම් හංසයානන් රජ්ජුරුවන් වහන්සේ දක මට බොහෝ සම්පත් දෙනු කැමැත්තෝවනැයි බලවත් සන්තෝෂයට පැමිණ කීසැටියේම කදෙක්හි සලසාගෙණ රජ්ජුරුවන් සමීපට නික්මුනේය. මෙසේ ගෙණයන්ට වන්කල්හි හංසරජ්ජුරුවන් වූ පාකහංස රජ්ජුරුවන්ගේ දියනියන් තමන්ගේ භාය්‍යාවූ හංස ධේනුව සිහිකොට ක්ලෙශ වසගවූ සොකයෙන් පීඩිතව එම්බා සුමුඛයෙනි අපට පැමිණි මේ දුකකයන්වඩා ලක්ෂණාන්විතවූ ඌරුමන්දයක් ඇති සවණීපත්‍රයෙන් සංඡන්න හෙයින් සුහෙමායයි කියනලද හංසධෙනුතොම අපටපැමිණි මේ දුක්ඛය අසා සමුද්‍ර යෙහි වැටීගිය සාමිපුත්‍රයා කෙරෙහි සෝකයෙන් වෙරළඹස්සේ අඬා අවිදිනා කොස්ලිහිණියක පරිද්දෙන් අඬාමියයි කියන මේ දුක්ඛය මා සහනය කළ නොහෙන්නේයයි කීහ.

ඒ අසා සුමුඛයෝ මේ හංසරජ්ජුරුවන් වනන්සේ අනුන්ට අවවාද අනුශාසනා කරන්ට නිසිවසිටියේක් ස්ත්‍රියකනිසා ක්ලේශවසඟව දියෙන් ගිනි තැගීකලක් පරිද්දෙන් වැටගොස් ගොයම් කන කලක් පරිද්දෙන් නම්දෛඩන සේක. එබඳුවූ මුන්වහන්සේ මාගේ බලයෙන් අස්වසමි සිතා අවවාදකරන්නේ සියළු හංසසමූහයාට ගණ ශාස්තෘවූ උතුම්වූ ගුණ ඇති හැමසත්වයන්ටම ප්‍රධා නව සිටි නුඹවහන්සේ එකහංසධෙනුවක නිසා සොකකිරීම නුවණැත්ත වුන්ට තරම්නොවන්නේය, තවද මහරජ ස්ත්‍රිජාතිහුනම් සුවඳ බඩුනනා තිබු සල්පිලෙක්හිද අමෙඩ්‍ය පිරුණු භූමියෙක්හිත් නොතොරා පවතිනා පවතක්

පරිද්දෙන් අඹ දඹ ආදීන්ඵලභරිත ගසක්යට උන් බාලදරුකෙනෙක් අමුවිලිකුත් ඵලමෙය අතට අසුවූදෙයක්ම ගෙණ නොතෝරා යම්සේ අනුභව කෙරෙද්ද? ඇස්නැති අන්ධයෙක් ආහාරයෙක්ගෙන අභිමුඛයෙහි තිබූ කල්හි යහපත නපුරයි නොතෝරා රසතෘෂ්ණායෙන් බැඳී අතට අසුවූ දෙයක්ම අනුභව කෙරෙද්ද? එපරිද්දෙන් මාතුගාමයෝත් ක්ලේශවසගව පුරුෂකෙණෙකුන් කැමැතිවූ නම් පොහොසත්හුද දුප්පත්හුද හීන ජාතීහුද උත්තම ජාතීහුද විශිෂ්ටවූ රූපශ්‍රී ඇත්තාහුද බලන්ට අප්‍රිය විරූපවූද යම්සත්වකෙණෙකුන් දැක නොතෝරා භජනය කරණ පාපී ගුණ ඇත්තාහ.

තවද මහරජ මේ ස්ත්‍රී ජාතීහුනම් සියල්ලවුන්ට සාධාරණ බැවින් සුරාපානසාලාවක්වැන්නහ. සියලු පුරුෂයන් වඤ්චාකොටපියන හෙයින් ඉන්ද්‍රජාලාවක් වැන්නහ, දුරසිට බැලූවන්ට අත අල්වාගතහැකි වස්තුවක්සේ පෙණී යම්පසළුවූයේ කිසිවක් නැත්තාවූ මිරිඟු ජලයක්මෙන් කිසිසවභාවිගුණය නැත්තාහ. තමන් වසගවූ කෙණකුන්ට හැමවේලෙහිම සෝක හා කාශශ්වාසාදීවූ රෝගයන් උපදවන හෙයින් අමනුෂ්‍ය කෙණෙකුන් වැනියාහ, මෘත්‍යුමාරයා විසින් පුරුෂයන් තමා සමීපයට බෙදාගෙණ එන පිණිස ගෙයි ගෙයි තබනලද පාස බන්ධනයක්වැනියහ, එසේවූ ස්ත්‍රීන් කෙරෙහි යම්පුරුෂයෙක් සකලව මමය මාගේ යයි සිතා නම් එතෙම මනුෂ්‍යයන්ගෙන් අධමවන්නේය, එහේහෙයින් කාරණා කාරණා දන්නාවූ නුඹවහන්සේ මේසා දුකකට පැමිණ ගියවේලෙහි ඉන්නැලවීයන්ට තිසි උපදෙශයක් නොසිතා නුවණ මදකෙණෙකුන්සේ ස්ත්‍රියක නිසා සොකකරණයේක, මෙ නුඹවහන්සේ කරණ කාරිය රා බී මත්ව අඩා වියරුහුනු රා සොඬක්හු කියන දෙයක්සේ විනා නුඹවහන්සේ වැනි උතුම් ගුණ ඇතියවුන්ට මේ අවසථාවෙහි මෙබඳුවූ බස්කීම තරම් නොවන්නේයයි රෑහැතිව කීයේය.

එකල මහ බොධිසත්වයෝ බලවත්වම ස්ත්‍රී වසගවූ සිත් ඇතිහෙයින් මෙතෙක් කාරණා කීවත් ඒ නොඅසාම එම්බා සුමුඛයෙනි මාතුගාමයන්ගේ ගුණ තොපට නොදැනෙන්නේය, නුවණැත්තෝ දන්නාහ, එසේහෙයින් ස්ත්‍රී ජාතීහු නම් ප්‍රථම කල්පයේ පහලවන්නාවූ සත්වයන්ට පළමුව ස්ත්‍රී ලිඟු පහලවූහෙයින් ප්‍රධානවූ ගුණ ඇතියහ. තවද යම් ක්‍රීඩාවිනෝදයක් ඇත්නම් ඒ හා කාම ගුණ රතිය යනාදී මේ සියල්ලත් උන් කෙරෙහි පිහිටියේය. තවද බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ආය්‍යී ශ්‍රාවක චක්‍රවර්ති ආදී දරු බිජුවටෙක් පහළවේනම් උන්ගේ කුස ඉපිද වැඩිවිය පැමිණෙන්නේය. එසේහෙයින් මෙතෙක් ගුණ ප්‍රයෝජන ඇති මාතුගාමයන් ලදින් කවර නුවණැති සත්වයෙක් තමාගේ ජීවිතය හරණේවීනමුත් උන්කෙරෙහි කලනොකිරෙන්නේය, එහෙයින් සුමුඛයෙනි සෙස්සෝ මතුනොවෙයි තොපත් ස්ත්‍රී වසගව ඇවිදිනා නියාව මමත් දනිමි. දූත් තොපට බය පැමිණී වේලෙහි ඒ අභිප්‍රාය ඇරීගියේද යම්කිසි සත්වකෙණෙක් ජීවිත සංසයවන්ට තිසිවූ සායකට පැමිණියා නමුත් ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳවූ සිත් ඇති සියලු දුක් සහනය කරන්නාහ, එහෙයින් ඉසුරුව සිටියෝ නොකටයුත්තෙහි අභිප්‍රායවීනම් ඒ කරන්නා කැමැත්තහ. එහෙයින් රජදරුවන් ආදී ආඪ්‍යකෙණෙක් තමන්ට පැමිණී ආපදාවක් දුරුකොට ලන්ට තිසිවූ මන්ත්‍රීවූ ඉන් මිත්‍රකෙණකුන් තමන්ගේ තනතුරුහා සරිකොට

තබා රකිනාහුය. එහෙයින් සුමුඛයෙනි තෙපිත් මාවිසින් ඉසුරෙහි පිහිටුවන්නු ලදුව ඒ කාරණයෙන් රජ්ජුරුවන්ගේ අරක්කැමියෝ අප මාංශය පිණිස මරම්හයි යම්සේ නොකියන්නම් එපරිද්දෙන් උත්සාහ කරවා දූත් අපට පැමිණි කාරිය විඳගිය උනගසක් එල ජාතිය හා එක්ව නැසෙන්නාසේ තෙපිත් නොනසී මාත් නොනසව කුමක්නිසාදැයි යතහොත් වැද්දහු විසින් මළින් ගලවා කැමති සැටියේ චිත්‍රකූට පර්වතයට පලායවයි මා හා සමග ඇරපියන ලදුවත් පලානොගොසින් රජ්ජුරුවන් දකිනා කැමත්තම්හයි නොපිම නැවත බන්ධනයට පැමිණියාවූ හෙයින් මේ භය නොප නිසා පැමිණෙන්නේය. ඉතින් මේ බන්ධනයෙන් යම්සේ ගැලවීයමෝනම් තිසි උත්සාහ කරතොත් විනා ස්ත්‍රීන්ගේ ගුණ කියම් කට නොසොල්වව යනාදීන් අවවාද කීහ,

මාතුගාමයන්ගේ ගුණ කියා සුමුඛයන් කිසි උත්තරයක් කියනොහී කරබා විලක්ෂපවූ නිසාව දූත උන්ගේ සිත්ගන්නා කැමැතිව මහබොධිසත්වයෝ සබඳ සුමුඛයෙනි නොපි මා මළෙබැඳීගිය වේලෙහි මාගේ උත්සාහයෙන් ගලවා ලම් සැකනොසිතව මැනවැයි කීවා නොවේද දූනුත් නොපගේ උත්සාහයෙන් ගැලවෙතොත් විනා මාගේ සමත්‍ථයෙන් ගැලවීයෙතියි නොසිතා අප දෙන් නාගේ ජීවිතය රැකීමෙහි උත්සාහකරව යනාදීන් මොළොක් බස්කීමෙන් සතුටුකළහ. එකල්හි සුමුඛයෝ මේ හංස රජ්ජුරුවන් වහන්සේ මරණට ඉතා භය ඇතිසේක. රජ්ජුරුවන් දුක බසක් කියාපියන විවරව අවසර ලදින් නම් ගලවාගන්ම මට කුමන අරුමයෙක්ද එසේ නෙයින් අස්වසම් පක්ෂිරාජයා නන්වහන්සේ භානොගන මැනව දන්නායම් උත්සාහයෙකින් ගලවාගැන්ම මට භාරයයි කියා මරණ සෝක දුරුකෙළේය.

මෙසේ ඒ හංසයන් දෙදෙනා පක්ෂීන්ගේ භාෂාවෙන් කරණ කථා කිසි වකුත් නොදූනම කඳෙහි හිඳුවාගෙන ගොස් බරණැස්නුවරට වැද්දහුවන් කල්හි රන්වන් හංසයන් දකිමින් විස්මයපත්ව දෙහොත් මුදුනෙහි බැඳ ප්‍රියවූ කථා කෙරෙමින් පිරිවරාගත් මහජනයා එක්ව රජගෙයි වාසලට පැමිණ ධෘතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවන් හැරගෙණ බෙමා තම් වැදි වාසල සිටියේයයි දන්වාලවයි කීහෙයින් දොරටුපාලයා ගොස් එපවත් රජ්ජරුවන්ට දූන්විය. ඒසඳ රජ්ජුරුවෝ බස අසමින් වහාගෙණෙවයි නියෝගකොට අමාත්‍යමණ්ඩලයා විසින් පිරිවරණලදුව නගතලද ධවලාතපත්‍ර ඇති රාජාසන මස්තකයෙහි උන්හ. බෙමාතම් වැදි හංසයන් කදින් ඇරගෙණ මතුමාල්තලයට නැංගාහු දුක රන්වන් හංසයන් බලා මාගේ මනෝරථය සමෘද්ධව ගියේයයි වැද්දහු කෙරේ සමා හිවූ රජ්ජුරුවෝ අමාත්‍යයන්හට මොහු සරහා ගෙණවයි විධානකළහ. ඒ නියෝගලත් ඇමති වැද්දහු කැඳවා ගෙණගොස් දූළි රවුළු අන්දම්තිබා සරහා ඉස්සෝධා නහවා චන්දන කුංකුම ආදිවූ සුවඳ ගල්වා වස්ත්‍රාභරණාදීන් සරහා රජ්ජුරුවන් දක්වාලූයේය. එකල්හි රජ්ජුරුවෝ වැද්දහුට අවුරුද්දෙන් ලක්ෂයක් බැගින් නිම්නගම්වර දෙළසක්ද මඞගල අශ්වයන් යොදනලද සියලු රථාලංකාරයෙන් සැරහුනු රථයානක්ද සියලු ගෘහොපකරණයෙන් සමෘද්ධ වූ ගෙයක් හා දූසි දස් පරිවාර ආදී බොහෝ සම්පත් දුන්හ.

බලවත් අභිප්‍රායෙන් දක්නා කැමතිව ගෙන්වාගත් හංසයන් හා කථා නොකොටම තුෂ්ට රුෂ්ට දෙක්හි සංග්‍රහ නිග්‍රහය එක්ෂණයෙහි කිරීම රජ්ජුරු

වත්ගේ ස්වභාව ගුණයක් හෙයින් මේසා ලාභයක් මට පැමිණියේ වැද්දනු නිසායයි වස්තුයෙන් පලමුකොට ඔහු සන්තුෂ්ට කළහ.

එකල වැදිපුත්‍රතෙම සමාධිව දෙවයන්වහන්ස මා විසින් එසේ මෙසේවූ හංසයකු බඳුගෙණ ආවායි නොසිතුව මැනව. මූ අනූදහසක් හංසයන්ට නායකවූ ධෘතරාෂ්ට්‍ර නම් හංස රජ්ජුරුවෝය; මූ උන්ගේ සුමුඛ නම් හංස සේනාධිපතියයි වෙන වෙනම තරම් කීවේය. එබස් අසා සතුටුවූ රජ්ජුරුවෝ එම්බා බෙමයෙනි අනූදහසක් පමණ හංසයන්ගෙන් මධ්‍යවර්තීව ඇවිදිනා හෙයින් බලවත්වූ ආරක්‍ෂා ඇතිව උත්තමවූ හංසරජ්ජුරුවන් කරා මළක් ඇරගෙණ හංස සමූහයාකරා මැද වැද කෙසේ බඳුගතිදූයි විචාළහ.

එබස් අසා වැදි පුත්‍රතෙම දවසක් මූළුල්ලෙහි ගොචරභූමිය බලා ඇවිදිනා මම උතුම්වූ ගුණ ඇති හෙයින් හැමදවස්ම එකතතනකට බැස පත්තියෙන් ගොදුරු අනුභව කොට යන හංස රජ්ජුරුවන්වහන්සේගේ ගමණ දැක සත්වෙනි දවස් ඒ අසරෙහි මළ ඔබා බඳුගතිමියි කීයේය. එබස් ඇසූරජ්ජුරුවෝ මේතෙම දොරකඩ සිට කියා එන්නෙත් ධෘතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවන් ගෙණාමියි කියා එවිට දූත් බැඳූසැටිය කියන තැනැත්තෝ මේ හංසරජ්ජුරුවන් බැඳූනියාව කියන්නේයයි එම්බා වැද්දනෙනි තොප ගෙණාසේ හංසයන් දෙන්නෙකුය කියන්නේ එක්කෙණෙකුන්ගේ කාරියය කිමෙක්ද අන්ද මන්දව කියයිද නොහොත් මට එකක්හුදී අනික්තෙනකට අනිකා දෙනුකැමතිව කියන්නෙහිදූයි විචාළහ.

එඅසා වැදිපුත්‍රතෙම දෙවයන්වහන්ස මාගේ චිත්ත විකෂෙපයකුත් නැත්තේය, මිත් එක්කෙණෙකුන් අනික් තෙනකට දෙන අභිප්‍රායකුත් නැත්තෙමි. එතකුදුවත් කරවට සිට පිට ඔස්සේ තික්ම විනිවිද සිට රෙබාමාත්‍රය කිත් සැරහුනු ඉරුරැස් කලඹක්සේ පදිවූනාවූ මේ හංස රජ්ජුරුවන් මළෙහි බැඳී දුකට පැමිණියා දැක ඉස්ලූලූ අත යන හංසයන් හා එක්ව නොගොස් බඩරාවය අසා මූගුරක් ගත් අත් ඇතිව සමීපයට එන්නාවූ මා දැකත් මූන්වහන්සේ ඇරපියා නොගොස් මා ඉදිරියට අවුත් මිනිස් කෙණෙකුන් කථාකරණ පරිද්දෙන් මිත්‍රධර්මයේ ගුණ කියා මාගේ ළය මොළොක්කොටගෙණ මේ හංසරජ්ජ්රුවන් ගැලවූසේකුත් මෙතනට කැඳවාගෙණ ඊමක්කෙළෙත් මේ සුමුඛ නම් හංසසේනාධිපතීන්ගේ කීමෙනැයි යනාදීන් උන්ගේ බොහෝ ගුණ කීයේය.

එබස් ඇසූ රජ්ජුරුවෝ සුමුඛයන්ගෙන් බණ අසනු කැමතිවූවාහුය වැද්දහුට සත්කාර කරණ කලින් ඉරුහස්තයට ගියේය යහපත් ආලෝක පැවැත්වූහ. එකල්හි රජදරුවෝ බොහෝසේ රුස්වූහ. බෙමා නම් බිසවුන් චුල්ලනාටකය මජ්ඣිම නාටකය තමන් හා සමාන ජාති ඇති නාටක ස්ත්‍රීන් හා යන තුන්පකෂයෙහි කාමිනීන්තත් පිරිවරණලදුව අවුත් රජ්ජුරුවන් දකුණු පාර්ශ්වයෙහි උන්හ. එකල රජ්ජුරුවෝත් සුමුඛයන් හා කථාකරණු කැමතිව ඇයි සුමුඛයෙනි මිහිරිවූ කථා දනිතියි යන තොප මූයෙන් නොබැණ ඉදිරියේ අසථාන භයින්ද කවර නිසාදූයි විචාළහ.

එබස් ඇසූ සුමුඛයෝ කසීදේසයට අධිපතිවූ මහරජ නුඹවහන්සේගේ පක්ෂීන් මධ්‍යයට පැමිණ අස්ථාන හයින් බැණ නොතැගෙම් නොවෙමි මා හා කථාකරවන්ට සුදුසු ප්‍රස්ථාවක් අවසරයක් බලා උනිමි කිවූය. එබස් අසූ රජ්ජුරුවෝ සුමුඛයන්ගේ බස් බොහෝ කරණු කැමතිව වෙහෙසෙන්නාවූ සුමුඛයෙනි නොබාම් කිසන්ට තොපට රකවල්ගෙණ සිටි රථසේනාව කොයිද සන්නාහසන්නබව කඩුපලඟ හා දුනු දඬුගත් සේනා සමෘද්ධයක්වත් රත්‍රන් රිදී මුතු මැණික් ආදී වස්තු සමෘද්ධයක්වත් අප දකිනා නැතිකල නොබම්යි කියන්ට කාරණා කිම්දැයි විචාළහෙයින් සුමුඛයෝ කියන්නාහු දෙවයෙනි අපට රැක වල් දහවල් ආදියකින් මේවයි ගෙවල් දොරවල් සම්පත් ආදී කිසිවකින් ආකාස චාරිව ඇවිදිනා අප හැමට ඉන් ප්‍රයෝජන නැත්තේය. තවද ධෘතරාෂ්ට කුල යෙහි හංසයෝ නුවණැත්තාහුයයි ඇසුයේ ඇත, ඒ කාරණය හේතුකොට ගෙණ බණ අසනු කැමතිව අප අල්වාගෙන්වූසේක. ඉදින් සබවසේ පිහිටි සේක්වීනම් කාරණා නිශ්‍රිතවූ බස් කියම්හ. බසවිචරකුත් රැකගත නොහී මෘෂාවාදීවූ නුඹවහන්සේට සුභාසිතවචනය ඇසීමෙන් ප්‍රයෝජන කිම්දැයි කීයේය. එබස් අසා රජ්ජුරුවෝ බොරුකියනි අධම ගුණ ඇත්තාහයි කුමක් නිසා මට කිව්දැයි විචාළහ.

එකල්හි සුමුඛ නම් හංස සේනාධිපතිතෙම එසේනම් ඇසුවමැනව මහ රජ නුඹවහන්සේ බ්‍රාහ්මණයන්ගේ කීමෙන් ඛෙමා නම් විලක්කරවා නිරන්තර යෙන් අභය ඝෝෂාකරවූසේක. එහෙයින් සියලු පක්ෂි ජාතිය විලට බැස ගොදුරු කා ගිය ස්ථානයෙහි ඉඳ විල නිරුපද්‍රවයයි කියති. ශෘතිපරම්පරාවෙන් ගෝචර ග්‍රහණය පිණිස පැමිණියාවූ අපි පාසබන්ධනයට අසුව ගියම්හ. එහෙ යින් පළමුකී අභයදූතයට මේ බොරුනොවේද මෙබඳුවූ බොරුවක් මුල්කොට ඇති ලෝභ තෘෂ්ණා සංඛ්‍යාත පාපකර්මයෙන් යුක්ත සත්වයෝ දිව්‍ය මනුෂ්‍ය සම්පත්තීන් ඉක්ම සයනය කළනොහැක්කාවූ නරකාදී අපායෙහි දුකට පැමි ණෙන්නාහ යනාදීන් කියා පක්ෂීන් මධ්‍යයෙහිම ලජ්ජාකාරවූයේය. එකල්හි රජ්ජුරුවෝ එම්බා සුමුඛයෙනි තොප මරා මස් කන පිණිස ගෙන්වූයෙම් නොවෙමි විශිෂ්ටවූ නුවණ ඇත්තාහයි අසා සුභාෂිතවූ මිහිරිකථාවන් අසන පිණිස ගෙන්වීමියි කීය. එබස් අසා සුමුඛයෝ මහරජ අපි මරු කරා ගෙණ ගියත් මරුකරා ඇවිත් පැමිණිසේවීනමුත් එහි නයක් නැත්තම්හ බණ අසන්නා කැමති කෙණෙක් ධර්මකථිකයන් මරානලා වධබන්ධනකොට නසන් නාහු දැයි එහෙයින් තොප විසින් කළේ යුක්තියෙක් නොවෙයි තවද යම් සත්ව යෙක් වනාහී සෙමුවන් පැමුවන් මැරීමද පක්ෂීන් පෑ පක්ෂීන් ජාතීන් මැරීමද අභයදූතයයි බසින් කියා භය ඉපදවීමද යනාදීවූ මේ කාරිය කරකනේවීනම් ඊට වඩිනා අනික් වැරැද්දෙක් නැත්තේය, මෙබඳුවූ සත්වයා උභය ලෝකාර්ථ සිඩියෙන් පිරිහෙන්නේයයි යනාදීන් ධර්මදෙශනා කළහ.

එබස් අසා සතුටුවූ රජ්ජුරුවෝ හංසයන් දෙදෙනා ඉඳිනා නියායෙන් විශිෂ්ටවූ ආසණපනවා අනුභවයට නිසි ගොදුරු එලවා යම්සේ මේ සුමුඛ නම් සේනාධිපති හංස රජ්ජුරුවන්ට සැපවේලේ සැපවිඳ දුක් වේලේ දුක් විඳී මෙන් ජීවිතය හා සමාන යහපත්වූද මනුෂ්‍යයන්ගෙනුත් මෙබඳුවූ ගුණ ඇති කෙණෙක් ඉසුරුව සිටි සාමින්ගෙන් වැටුප්වියදම් කාදිරවාගන්ට නිස්සහයන යනාදීන් ගුණ කීහෙයින් අමාත්‍යයන් විසින් ඒක්ෂණයෙහි සරහණලද රන්

කම්න් විසිතුරුවූ පා අවකින් උපලක්ෂිතවූ මෘදුකෝමල සිනිඳු පහස් ඇති පිරිසිදු කසීසළුවක් අතුරණලද පුටුයෙහි බොධිපත්වයෝ උන්හ, දිවිසම්න්වලදනා ලද රත්කම්න් විසිතුරු බඳවෙලුමෙක්හි සුමුඛයෝ උන්හ, කසීරටවාසී බොහෝදෙන රත්තැටිවලින් අනේකප්‍රකාරවූ රසයෙන් යුක්තවූ ආහාර ද මී හා විලඳ ශර්කරා පැන් ආදීන් එලවා සන්තර්පණය කළහ.

එකල්හි හංසරජ්ජුරුවෝ බරණැස් රජ්ජුරුවන් විසින් කරණලද ආදර හා සත්කාර දැක පිළිසඳර කථාකරන්නාහු මහරජ සුවදුක් කිම්ද තොපගේ රාජ්‍යය ධන ධාන්‍යයෙන් සමෘද්ධවූ අමාත්‍යසේවකාදීහු පක්ෂපාතව පැමිණි කාරියක් තමන්ගේ ජීවිතයට නොසිතා කෙරෙද්ද අගමෙහෙසුන් බිසවු රූපයෞවනාදියෙන් නොනැස්ව දූ පුත් දරුවන්ගෙන් සමෘද්ධව වෙසෙද්ද සනාය ක්‍රියාවක් නැතිව පරීක්ෂාකාරීව දෝෂානුරූප පරිද්දෙන් දුෂ්ට නිග්‍රහ ශිෂ්ටපරිපාලනය කෙරෙමින් දැහැමෙන් සෙමෙන් රාජ්‍යවාසීන් රැක ස්වර්ගමෝක්ෂ බාධක කටයුත්තෙහි යොදන්නාවූ දුර්ජනයන් දුරුකොට මෙලෝ පරලෝ වැඩ පසසන්නාවූ ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට උපස්ථානකරවුද ධර්මානුවර්තිතවූ වෘත්තියෙන් ජනරඤ්ජනය කරවුදැයි දීර්ඝදර්ශීව විපත් කාලයෙහි ආයුසංස්කාරාදී සියලු ප්‍රවෘත්තිය අනිත්‍යයයි මෙනෙහිකරවූ දරුපාදී ඇල්ම බන්ධනයෙහි සක්තව රාගද්වෙෂාදීන් විසඟයෙහි නොපවැත්තෙහිද පරලෝ සිස්නොකොට භය ඇතිව වාසයකරවුදැයි යනාදීන් මහබෝධිසත්වයෝ පිළිසඳර කථාවශයෙන් රජ්ජුරුවන්ට ධර්මදෙශනා කළහ.

ඒ අසා රජ්ජුරුවෝ හංසරජ්ජුරුවන් වහන්ස නුඹවහන්සේ විසින් විචාරණලද්දාවූ සියල්ලෙහිම විරෝධයක් නැතිව පවතිමින් සිටියෙමි. තවද ශ්‍රමණ බ්‍රාහ්මණාදී උත්තමයන් විෂයෙහි දානයද නිරන්තරවශයෙන් පඤ්චශීලාදීවූ සිල්රැකීමය දුගීමගීයාවක පුත්‍ර මිත්‍ර කලත්‍ර බන්ධුවර්ගාදී සියලු සත්වයන්ට උපභෝග පරිභෝගාදී වස්තුදීමය සැලසිත් නැතිව ඍජුවූ පැවතුම් ඇති බවය තද මසුරුනොවී මොලොක්බවය පෝයක් පාසා පෙහෙවස් රැකීමය කිපිපුලු නොවීමය. අනුන්ට හිංසා පීඩා නොකිරීමය සහනසීලිබව සර්වසාධාරණයයි කියනලද දශරාජධර්මයන්ට විරෝධියක් නොකොට මා කෙරෙහිම පිහිටියා දකිමි මේ කාරණය හේතුකොටගෙණ හැමවේලෙහි සතුටුව වාසය කෙරෙමි යනාදීන් මහාබෝධිසත්වයන්ට අභිනන්දනය කෙරෙමින් මේ සුමුඛ නම් හංසසේනාධිපති අපගේ සිත් භය නොදැන සභාමණ්ඩපයෙහි පරීක්ෂානොකොට කිපී දෙඩුය. එතෙම නුවණැත්තවුන්හට තරම් නොවන්නේයයි කීහ.

එබස් ඇසූ සුමුඛයෝ උනස්නෙන් නැගී බැස දෙපියායෙන් ඇඳිලිබැඳ මහරජ හංසරජ්ජුරුවන්වහන්සේ මලෙහිබැඳි දුක් විඳිනා දැක මාගේ සිතට බොහෝ දුක් පැමිණි හෙයින් යුහුසුළුව වරදවාකීම් දරුවන්ගේ වැරදි ඉවසන මව්පියන් මෙන්ද පොළොව පැකිල හුනුවන්ට පොළොවම පිහිටවූවාක් මෙන් නොදැන කීවාවූ අපට ක්ෂමාකල මැනවැයි යාවඤ්ඤා කළහ.

ඉක්බිති ඒ අසා රජ්ජුරුවෝ ප්‍රිය පුත්‍රයක්හු සනහන්නාවූ පෙම්බර මවක පරිද්දෙන් සුමුඛයන් දෝතින් වඩාගෙණ සිඹ සනහා රත්පුටුයෙහි හිඳුවා එබම්බා සුමුඛයෙනි තොපගේ ඍජුභාවයෙහි ප්‍රසන්නවූ මම තොපට ක්ෂමාකෙළෙමියි ක්ෂමාකොට මහබෝධිසත්වයන්ගේ ධර්මකථාවෙන් හා සුමුඛයන්ගේ

සෘජුභාවයෙන් අති ප්‍රසන්නව සතුටු ආකාරදක්වමින් හංසරජ්ජුරුවන් වහන්ස මාගේ මේ රාජභවනයෙහිද රාජ්ජයෙහිද යම් රත්‍රන් මුතු මැණික් වස්ත්‍රාභරණ යකඩ ලෝකඩාදීවූ සියලු ඓශ්වර්‍ය්‍යයෙන් යුක්තවූ රාජ්‍ය ශ්‍රී ධවලාතපත්‍රය හා සමග පාවාදෙමි. අද පටන් රාජ්‍යයකලමැනවැයි රාජ්‍යයෙන් පූජාකොට ආරාධනා කලහ.

ඒ අසා ධෘතරාෂ්ට්‍ර නම් හංසරජ්ජුරුවෝ බරණැස් රජ්ජුරුවන්ට ජන ප්‍රධානවූ රජ්ජුරුවෙනි ඒකාන්තයෙන් තොප විසින් සත්කාරසම්මාන කරණ ලද්දේ මොවුන් දුහැමෙන් ජීවත්වන්නාවූ අපට තොපි ආචාරීව එහෙයින් ආචාරීවූ තොප විසින් අනුශාසනා කරණලද්දවූ අප ඤාතිසමූහයා දක්නා කැමැත්තම්හයි කීහ.

මෙලෙස මහබොධිසත්වයන්ගේ ධර්මකථාව අසමින් සිතට ඇති සැක විචාරමින් රාත්‍රියෙහි කල්යවා සතුටුව අවසර දුන්හ.

මහාබොධිසත්‍වයෝ පංචශීලයෙහි පිහිටුවා කුසලකරණයෙහි නිෂ්ප්‍රමාද වවයි අවවාද අනුශාසනාකොට රජ්ජුරුවන් විසින් රන්තැටියෙන් එලවතලද මීහා විලඳ අනුභවකොට මී පැන් බී සන්තර්පිතවූහ. ඉක්බිති රජ්ජුරුවෝද බිස වූද බොධිසත්වයන් හා සුමුඛයන්ට සුවඳින් මලින් පූජාකොට රජ්ජුරුවෝ බොධිසත්‍වයන් කරඬුපියන්නේ හිඳුවාගෙණ ඔසවාගත්තාහ, බිසවූත් සුමුඛ නම් හංස සේනාධිපතීන් එපරිද්දෙන් ඔසවාගෙණ සිව්මැදුරුකවුළුවේ දොර හැර අරුණෝද්ගමනෙහි සැපසේ නැගීගිය මැණවැයි කියා ආශීර්වාදකොට ආකාශයෙහි හැරපූහ.

එකල මහබොධිසත්ත්‍වයෝ ආකාශයෙහි සිට දෙවෙනිව රජ්ජුරුවන්ට අනුශාසනාකොට සුමුඛයන් කැඳවාගෙණ චිත්‍රකූට පර්වතයට ගියාහුය.

එසඳ අනූදහසක් පමණ ඇති හංසසමූහයා රන්ගල්ගුහායෙන් පිටත මගබල බලා උන්නාහු ආකාශයෙහි පක්ෂප්‍රහාරකොට එන්නාවූ බොධිසත්ත්‍ව යන් හා සුමුඛයන් දුක පෙරගමන් කොට ගොස් පිරිවැරූහ.

එකල සමාධීන් කුල්නානාද පවත්වන්නාවූ හංස සමූහයා විසින් පිරිවරණ ලදුව චිත්‍රකූට පර්වතයට ගියාහුය. එපරිද්දෙන් මිත්‍රධර්මය අඛණ්ඩකොට රක්නා සත්‍වයන්ගේ සියලු අභිමතාර්ථය මේ හංස රජ්ජුරුවන්ගේ අභිමතාර්ථය සුමුඛ යන් නිසා යම්සේ සමෘද්ධවීද එපරිදෙන් කල්‍යාණමිත්‍ර සම්පත්තිය හේතුකොට ගෙණ සියලු අභිමතාර්ථය සිඬවන්නේය යනාදීන් සම්ප්‍රාප්ත පර්ෂදට මේ අතීත කථාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපරසන්ධිගලපා මේ මහා හංස ජාතකය නිමවා වදාළසේක.

එකල වැදිපුත්‍ර තෙම මෙකල ඡන්නස්ථවිරය බිසවු ඛෙමා නම් අග්‍ර ශ්‍රාවිකාය සංයම නම් බරණැස් රජ්ජුරුවෝ සාරිපුත්‍රස්ථවිරය අනූදහ සක් හංස පිරිස නම් දැන් බුදුපිරිස් වන්නාහ. සුමුඛයෝ නම් ධර්මභාණ්ඩා ගාරික ආනන්ද ස්ථවිරයෝය ධෘතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

523
සුධා භෝජන ජාතකය

ජාතිකාන්තාරාදීන් සත්ත්වයන් තරනයකරවා නිර්වාණක්ෂෙමභූමියට පමුණුවන හෙයින් ශාස්තෘනම්වූ සම්‍යක් සම්බුදු රජාණන්වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසනසේක් දන්දීමේ බලවත් අදහස් ඇති එක්තරා භික්ෂුකෙනෙකුන් අරභයා මේ සුධා භෝජන ජාතකය වදාළසේක.

සැවැත්නුවර එක්තරා කුලපුත්‍රයෙක් බුදුරජාණන්වහන්සේ ධර්මශ්‍රවණය කොට පහන් සිත් ඇතිව බුදුසස්නෙහි මහණව අඛණ්ඩකොට සිල්රක්ෂා කරන්නේ යෙහෙන්පමණ ධූතාංග ගුණයෙන් යුක්තවූයේ සබ්‍රංසරුන් වහන්සේ කෙරෙහි පවතින ලද මෙත්සිත් ඇතිව දවස තුන්වේලේ තුණුරුවන් විෂයෙහි කළමනා උපස්ථානයෙහි අප්‍රමාදවූයේ ආචාරසමාචාරයෙන් යුක්තවූ දානාධ්‍යාශය ඇතිව සාරණීයධර්මයන්පුරමින් තමන් විසින් ලබනලද ආහාරය පිළිගැන්වුම් දූක සුත්බත්ව දන්දෙන්නේමය ඔහුගේ දානාධ්‍යාශය ඇති නියාව භික්ෂූන් වහන්සේ කෙරෙහි ප්‍රසිද්ධව ගියේය.

ඉක්බිත් එක්දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්ව වැඩ උන්නාවූ මහා කාශ්‍යප ප්‍රමුඛ භික්ෂුසංඝයාවහන්සේ ඇවැත්නි අසවල් නම් මහණ දානාධ්‍යාශයෙන් යුක්තව ඉදින් පැන්සරළුවක් විවරවත් ලදක් එහිලොභයහැර සබ්‍රම් සරුන්වහන්සේට දන්දෙන්නේය. බොධිසත්ත්වයන්ගේ අධ්‍යාශය හා සමානවූ අදහස් ඇත්තේය යනාදීන් ඒ භික්ෂූන්ගේ ගුණ කථනය කෙරෙමින් උන්සේක. එසඳ ගඳකිළියෙහි සැතපී වැඩඋන්නා වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ භික්ෂූන්වහන්සේගේ කථා ප්‍රවෘත්තිය දිව්‍යකණින් අසා වදාරා මා ගිය කල බොහෝ සත්ත්වාභිවෘද්ධි වන්නේයයි දැන ධම්සභාමණ්ඩපයට වැඩ පණවනලද බුද්ධාසන මස්තකයෙහි පිපීවැනීගියාවූ රත්පියුම් වන මධ්‍යයෙහි පැමිණි ස්වර්ණ හංසරාජවිලාසයෙන්ද උදගිරි පර්වත මුදුනෙහි තෙවූනාවූ ළහිරුමඬලක් මෙන්ද සවර්ණක්ෂන බුදුරසින් සියල්ලෝධාතු එකලූකෙරෙමින් වැඩහිඳ තමන් වහන්සේ විසින් සාරාසංඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි සකසා පුරණලද සත්‍ය පාරමිතාවන් නැමැති සුගන්ධවාතයා විසින් සුවඳ ගන්වනලද ශ්‍රීමුඛයෙන් නික්මුනාවූ සුගන්ධයෙන් ධම්සභාමණ්ඩපය එකසුවඳකෙරෙමින් මහණෙනි මං එන්නාට පූර්වභාගයෙහි කවරකථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි දැන්වූකල්හි මහණෙනි මේ භික්ෂුතෙම පළමු දානාධ්‍යාශයක් නැත්තේය. තද මසුරුය තණ අග තෙල් බින්දුවක් විවරකුත් අන්කෙනෙකුන්ට නොදෙන්නේය. එකල මොහු මම දමනෙහිලා මසුරුසිත් හරවා දන්දීමෙහි අනුසස් කියා දානයෙහි පිහිටවීමි. එකල පැන්සරලුවක් ලැබත් දන්නොදී අනුභව නොකෙරෙමි මාගෙන් වරලද්දේය. ඒ කාරණ යෙන් දානාධ්‍යාශය ඇතිව දානයෙහිම ගැලී වාසයකරන්නේයයි වදාරා එක් භික්ෂුන්වහන්සේ විසින් ආරාධිතවූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජයකරණ සමයෙහි දාන ප්‍රියවචන අර්ථචර්‍යා සමානාත්මතායයි යන සතර

සංග්‍රහවස්තුවෙන් ජනරංජනය කරණකල්හි එක්තරා කෙළෙඹි පුත්‍රයෙක් ඉතා ප්‍රසිඬව අසූකෙළක් සම්පත් ඇත්තේය. එකල රජ්ජුරුවෝ ඕහට සිටුතන තුරු දුන්හ. එතැන්පටන් රාජ්‍යසම්මතව සියලුසත්‍වයන් විසින් පුදනලදුව වෙසෙමින් එක්දවසක් තමන්ගේ සම්පත් මහත්‍වයබලා මේ සමෘද්ධියට ජාති යෙහි මා විසින් කරණලද කාය දුශ්චරිතාදිය නිසා ලබනලද්දේ නොවෙයි සුචරිත ධර්‍මයෙන් ලබනලද්දේවෙයි මතුත් මට පිහිටක්කොටගත මැනවැයි සිතා රජ්ජුරුවන්කරාගොස් දේවයන්වහන්ස මාගේගෙයි අසූකෙළක් සම්පත් ඇත්තේය. ඒ ගෙන්වාගත මැනවැයි කීය. රජ්ජුරුවන් විසින් තොපගේ ධනය මට ප්‍රයෝජන නැත තොකැත්මැත්තෙමි කීය. මාගේ සම්පත් බෙහෙව ඉත් සම්පත් කැමතහොත් ඇරගණුවයි කීසඳ එසේවීනම් දේවයන්වහන්ස මාගේ සම්පත් දන්දෙනු කැමැත්තෙමියිකීය. රජ්ජුරුවන් විසිනුත් කැමැත් තක් කරවයි කියා අවසර දුන්හ. එකල්හි නුවර සතර වාසලය මධ්‍යයේය. තමන්ගේ ගෙදරයයි සදන්හල්කරවා දවස සලක්‍ෂයක් ධනවියදම් කරවා දුගී මගී යාචකාදීන් ශ්‍රමණබ්‍රාහ්මණයන් විෂයෙහි ජීවිතාන්තය දක්වා මහදන් පවත්වමින් මේ දානවංශය නොකඩවා පවත්වාලවයි තමන්ගේ දරුවන්ට අනු ශාසනාකොට ජීවත්වන්නේ එයින් සැවගොස් ශක්‍රදේවේන්ද්‍රව උපන්හ.

ඉක්බිති ඔහුගේ පුත්‍රතෙම පළමුපරිද්දෙන් දන්දී පින්කොට චන්ද්‍ර දිව්‍ය පුත්‍රව උපන්නේය.

ඔහුගේ පුත්‍රද සූර්‍ය්‍යදිව්‍ය පුත්‍රව උපන්නේය ඔහුගේ පුත්‍රද මාතලී දිව්‍ය පුත්‍රව උපන්නේය ඔහුගේ පුත්‍ර පඤ්චසිඛ දිව්‍යපුත්‍රවිය ඔහුගේ පුත්‍රවූ මච්ඡරිය කොසිය නම් සිටුපුත්‍රයෙක්ව තමාගේ අසූකෙළක් සම්පත්දැක ඒතෙම තමාගේ පිය මුතුන් ආදීහු නුවණනැත්තාහ දුකින් රැස්කරණ ලද ධන සමූහය නොදැන නැසූහ. මම වනාහි කිසිවක්හට කිසිවකුත් නොදී ඉඳුරා තබා රකිමියි සිතා දන්හල් ගිනිලා නසා තද මසුරුවූ සිත් ඇතිවිය. එකල සියලු යාචකයෝ ඔහුගේ දොරකඩ රැස්ව සිටාණන්වහන්ස නුඹ පියතුමන් මීමුතුන් ආදී සිටු වරුන් නොනසා පවත්වනලද දානවංශය නොනසා දන්දුනමැවයි අත් ඔසවා මහත්කොට කොලාහල කළාහුය එනුවරවාසී බොහෝදෙන එකොලාහලකළ ශබ්දය අසා මේ නුවණනැති මසුරුකෝසිය සිටාණෝ තමන්ගේ පරම්පරාවෙන් නොකඩකොට පවත්වන ලද දානවංශය නැසීයයි යනාදීන් නින්දාකළාහ.

එතෙම ලජ්ජාවට පැමිණ එතැන්පටන් තමන්ගේ ගෙදරට යාචක කෙණකුත් නොවදිනා නියායෙන් රැකවල් සැලැස්විය, එතැන්පටන් සියලුම යාචකයෝ කිසියම් දෙයක් නොලැබ ඔහුගේගෙය ඇසදල්වාත් නොබලන්නා හුය. එතෙම එතැන්පටන් ධනය රැස්කෙරෙමින් තෙමේත් අනුභව නොක රන්නේය පුත්‍රදාරාදීන්ටත් නොදෙන්නේය. කාඩිදෙවනකොට ඇති නිවුඩු සාලේබත් අනුභව කරන්නේය, තුඹවැල්සානුයින් වියනලද වක්කාරිකඩම අඳ නේය, පත්තුඩයක් ඉසව කරවාගෙණ ජරාගොන් යොදනලද දිරාගිය රථය කට නැගී ගමන්කරන්නේය මෙලසින් පාපීවූ අෂත්පුරුෂයා විසින් ලබනලද ධනය බල්ලන්ට පොල් නොපලා ලූකලක් පරිද්දෙන් නිෂ්ප්‍රයෝජන විය ඒ මසුරු සිටාණෝ එක්දවසක් රාජසේවයට යන්නේ අනුවැසි සිටාණන් කැඳවා ගෙණයෙමි සිතා ඔහුගේ ගෙට ගියේය එකල අනුවැසි සිටාණෝ තමන්ගේ

අඹුදරුවන් සමග ගිතෙල් ශකීරායෙන් සකස්කරණලද පැන් නොමුසු කිරිබත් අනුභව කෙරෙමින් උන්නාහ, සිටානෝ මසුරු කොසිය සිටානන් දැක උනස්නෙන් නැගී සිටාකන් වහන්ස මෙසේ මැඩිය මැනව මේ අස්නේ ඉඳ කිරිබත් අනුභවකළ මැනවැයි කීයේය. එසඳ මසුරු කෝසියසිඩානෝ කිරිබත් දැක මුබපිරුණුකෙල ඇතිව කනු කැමතිවත් අදදවස් මේ බත් කැයෙම්නම් මොහු මාගේ ගෙට ගිය වේලෙහි ප්‍රත්‍යුපකාර කළමැනවයිසිතා එහෙයින් නො කම්යිසිතා නැවත නැවත යාච්ඤාකරණලදුවත් දැන්බත්කාලා ආහෙයින් සාය මදය යනාදීන්කියා ප්‍රතික්ෂෙපකොට ඔහුබත් අනුභවකරණනෙක් බඩපුරා කෙලඋරාබොමින්බලාහිඳබත් කැඉක්බිති ඔහුකාසමග ගොස් රාජසේවයකොට නැවත තමන්ගේ ගෙට ගොස් කිරිබතෙහි කළ ලොභයෙන් පෙළෙමින් ඉදින් කිරිබත් අහුනවකරන්නා කැමත්තෙමියි කීතම් බොහෝදෙන කනු කැමතිවෙති බොහෝ සාල්ආදීවූදෙය නස්නේය එහෙයින් කිසිකෙණෙකුත්වත් නොකියම්සිතා රුදුවල් කිරිබතෙහි කළලොභයෙන් දුක්විඳිමින් කිසිකෙනෙකුත්වත් නොහගවා ඉවසාගෙණ දවස්යවන්නාහුය. ඉක්බිති කල්යාමෙන් දුක්ඛවේදනා ඉවසියනොහී සුදුමැලිව කිසිකෙණෙකුත්ටත් නොහගවාමැතහාගයෙහි දුර්වලව ඇඳ වැළඳ සිපගෙණ වැදහොත්තේය, එකල ඔහුගේ භාර්‍යාතොම සිටානන්කරා ගොස් අතින් පිට පිරිමදිමින් සිටානන්වහන්ස තුඹවහන්සේට කවර අළාහුවෙක්වීද කුමන අභිප්‍රායෙක් ඇද්දැයි විචාලාහ. තොපට යම් අළාහු ඇතිනියාය මට අළාහුයෙක් නැතැයි දෙඩමින් සිටිද්දී සිටානන්වහන්ස ඉතා සුදුමැලිව ශරීරය දුර්වලව ගියේය. තුඹවහන්සේට සිතිවිල්ලක් ඇද්ද නොහොත් රජ්ජුරුවන් වහන්සේගෙන් උදහසෙක් ඇද්ද නොහොත් දරුවන් විසින් අවඥවක් කරණ ලද්දේද නොහොත් තුඹවහන්සේට තෘෂ්ණාවෙක් වීද මට කිවමැනවයි යනාදීන් විචාලාය. ඒ අසා එසේය සොඳුර මට තෘෂ්ණාවෙක් උපන ඒ අතික්කෙණෙකුන්ට නොකියා රකින්ට පුළුවන්දැයි විචාරා උන් විසින් රක්කයුත්තෙක් වීනම් රකිමියි කීකල්හිද සම්පත් ලොභයෙන් නොකියා නැවත නැවත ඇවිටිලිකොට විචාරණ ලදුව එසේවීනම් සොඳුර එක් දවසක් අපගේ අතවැසි සිටානන්ගේ ගෙට යම් කිසිකටයුක්තක් නිසා ගොස් තෙල් ශකීරාමීයෙන් සකස්කරණලද කිරිබත් අනුභවකරන්නා දැක එතැන් පටන් එහිකළ තෘෂ්ණාවෙන් මෙවෙනි දුර්වලතාවතට පැමිණියෙමියි කීහ.

ඒ අසා සිටුදියනියෝ සත්පුරුෂවූ සිටානන්වහන්ස මා ඉන්දදී මෙවැනි දුර්වලතාවට පැමිණෙන්ට කාරණාකිම්දැයි බරණැස් නුවර වැසි සභයන්ට සෑහෙන පරිද්දෙන් කිරිබත් පිසන්ට පුළුවනැයි කිව ඒ අසා සිටානන් ඉසමුල මුගුරකින් පහරණකලක් පරිද්දෙන් බොහෝ දුක්ඛවේදනාවට පැමිණ තොපගේ විසාරද කම් පලමුත් දනුම්හ තොපගේ දෙමව්පියන් ගෙණා දායාදයෙක් ඇත්තම් පිසවාදෙවයි සිටුදියනියන්ට කීහ. එසේවීනම් එක වීථියක ඇත්තන්ට සෑහෙන පරිද්දෙන් පිසවා දෙමෝදැයි විචාරා ඊටත් කිපී ඔවුන්ගෙන් නිට ප්‍රයෝජන කිම්ද ඔහු කැමැත්තෝනම් තමත් තමන්ගෙන් සම්පත් වියදම්කොට කන්නාහුයයි කීසඳ එසේවීනම් දෙපිටින් ගෙවල් සතරක් විවර පිසම්දැයි විචාරා ඊටත් නොලැබෙනහෙයින් මෙගෙයි මිනිසුන් විවරට පිසෙදැයි විචාරා ඒ හැමදෙනා කැමෙන් මට ප්‍රයෝජන කිම්දැයි කීහෙයින්

නුඹවහන්සේ විවරට ඉදිකෙරෙම්දැයි නොහොත් එසේවීනම් අපගේ දරු මල්ලන් විවරට පිසමෝදැයි විචාරා ඔවුන්ගෙනුත් ප්‍රයෝජන කිම්දැයි නො ලබනහෙයින් නුඹවහන්සේටත් මටත් විවර පිසම්දැයි විචාරා නොපකෑමෙන් ප්‍රයෝජන කිම්දැයි කී හෙයින් නුඹවහන්සේට විවරට ඉදිකෙරෙම්දැයි විචාළ හෙයින් වන්නාටය මා විවරය මේ ගෙයිදී පිසන්ට වන්කළ බොහෝ දෙන කන්ට ප්‍රාර්ථනා කෙරෙති මට වනාහි සාල් නැළියක්ද කිරි සතර නැළියක්ද ශර්කරා අසුරක්ද ගිතෙල් මුළු තුනෙක්ද මී මුළු තුනෙක්ද පිසන්ට නිසි භාජන යෙක්ද දෙව මම වලට ගෙණගොස් පිස කම්යි කීවුය, සිටුදියනියෝත් එපරිද්දෙන් සපයා දුන්හ, ඒ සියල්ලම කුඩා කොල්ලකු අතට දී මේ හැරගෙණ ගොස් අසවල්තැන සිටුවයි සලකුණු කියා පළමුව ඔහු නික්මවා තුමූ උදකලාව ඉසවසා පෙරව අප්‍රසිද්ධවේසයෙන් ගොස් ගඟක් සමීපයෙහි එක් කැලෑබඩෙක උදුනක් බැඳ ගිනි දර පැන් ගෙණ තෙපි පලාගොස් දෙමංසන්ධියෙහි සිට යන එන කෙණෙකුන් ඇත්නම් සලකුණක් කරවා මා කැන්දූකළ එවයි ඔහු නික්මවා ගිනිමොලවා කිරබත් පිසන්ට පටන්ගත්තාහුය.

එක්ෂණයෙහි සක්දෙව් මහරජතෙම දසදහසක් යොදුන් අවට ඇති සර්වසමෘද්ධියෙන් සමන්විතවූ තව්තිසා භවනයද සැටයොදුන් පමණ දිගඇ ස්වර්ණ වීථියද පන්සියයක් යොදුන් උස ඇති සුධර්මානම් දිව්‍යසභාවද සැට යොදුන් පමණ උස ඇති පාණ්ඩුකම්බලශෛලාසනයද පණස්යොදුන් පමණ ඇති රන්මුතුදැලින් හොබනාවූ ධවලාතපත්‍රදෙකද පණස් ලක්ෂයක් පුරඟ නාංගෝද සරහා පිළියෙලකරණලද්දාවූ තමන්ගේ දිව්‍යාත්මභාවයද යනාදී උදාරවූ ශ්‍රී විභූතිය බලා කවර කුශලයක් කළහෙයින් මේ සම්පත් ලබන ලද්දැයි සිතා පරීක්ෂාකරන්නේ බරණැස සිටුපුත්‍රව ඉපිද පවත්වනලද දානයදැක ඉක්බිති මාගේ දරුමුණුබුරු ආදීහු කොයි උපන්නාහුදැයි බලන්නේ මපුතනුවෝ චන්ද්‍රදිව්‍යපුත්‍රව උපන්හ. ඔහුගේ පුතනුවෝ සූර්‍ය්‍යපුත්‍රව උපන්හයි යනාදින් සියල්ලවුන්ගේ උත්පත්තිය දැක පචසිඛදිව්‍යපුත්‍රයාගේ පුත්‍රතෙම කුමක් කෙරෙද්දැයි බලා තමන්ගේ දානවංශය නසාපු නියාව දැක මේ අඥාන සත්වයෝ තුමූත් අනුන්ටත් නොදී තද මසුරුව නරකාදී සතර අපායට යන්නෝයයි මෝහට අවවාදකොට මාගේ දානවංශය පවත්වා මොහු ශක්‍රභවනයෙහි උපදනා උපායක් කරවම් සිතා චන්ද්‍ර දිව්‍යපුත්‍රාදීන් කැඳවා මසුරු කොසිය සිටුතෙම අපගේ දානවංශයත් නසා දන්හල් ගිනිදල්වා තෙමේත් නොකා අනුන්ටත් නොදී දූන් කිරිබතක් අනුභවකරණු කැමැතිව ගෙයිදී පිසූකල අනුන්ටත් දීලූව මැනවැයි යන ලොභ සිතින් උදකලාව වලට ගොස් තෙමේම කිරිබතක් පිසන්නේය. මනුෂ්‍යලොකයට ගොස් ඔහු දමනෙහි ලා දානයෙහි විපාක ඔහට කියා එක විට ගොස් ඉල්ලුවෝතම් එතනදීම ලය පැළීයන්නේය මා පළමුව ගොස් කිරිබත් ඉල්වා උන්කල තෙපි හැමත් බ්‍රාහ්මණවේශයෙන් ඔහු කරා ගොස් ඔහට පෙණීසිට පින්වත්නි බරණැස් නුවර යන මග කවරෙක්දැයි විචාළාහුය. ඒ අසා මසුරු කොසිය සිටුතෙම තෝ උමතුවගිය එකෙක්ද බරණැස් නුවරට මගක් නොදනීද මගතබා මැත කුමට එවුද? ඇත පලායවයි යනාදීන් දොඩන්ට පටන්ගත්තේය ශක්‍රබ්‍රාහ්මණද ඔහුගේ බස් අසනකෙණෙකුන්මෙන් කුමක් කරව්දැයි ලඟට ගියාහ.

එකල සිටුද එඹල බමුණ නොබිහිරිව ගිය එකෙක්ද මැන නොඑව මැන නොඑවයි මහත්කොට මොරගාමින් සිටියදීම ඔහු සමීපයට ගොස් ඇයි තොප මොරගාහේ කුමක්නිසාද දුමුත් නැගෙන්නේය ගිනිත් පෙණෙන්නේය කිරිබතුත් පැසෙන්නේය බමුණන්ට දන්දෙන තෙනෙක් වියයුතුය බමුණන්ට දන් දෙනවිට ඉන් සුහක් ලැබෙම් මා කුමට නෙරනෙයිද්දැයි කීයේය. ඒ අසා මසුරා සිටානත් විසින් මෙනන බමුණන්ට දෙන දනෙක් නැතැයි කීය. එසේවීනම් කුමක්නිසා දෙබවුද තොප බත් අනුභව කරණ කල මමත් මදක් ලබම් කීයේය. ඒ අසා මම් තොපට මිත්බත් උලක් විවරත් නොනබමි මෙයින් සුහෙක මා විවරට විනා වඩානැත්තේය මාත් ඔබකින් ඉල්වා ගෙණාදෙයක තොපිත් ඔබකින් ඉල්වාගණුව මා මෙවක් පෙරටුව මා අනුන්ට බතක් විකිණීවිරුත් නැත අනුන්ගෙන් විකිණී ගත්විරුත්නැත මාගේ රැටය දවලට තිබීමකුත් නැත මෙතෙම මා විසින් ඉතා දුකසේ ලබන ලද්දේය ඉතාසවල්ප සාල්තැලියකින් පිසනලදහෙයින් දෙන්නෙකුට නොසෑහෙන්නේයයි යනාදීන් දෙඩුයේය, ඒඅසා ශක්‍රබ්‍රාහ්මණයෝ මම තොපට මිහිරි සොලොවක් කියව ඒ අසවයි ඔහු නවන මින් සිටියදී ඒ නෑසුනැත්ව එඹා සිටානෙනි මේ ලොකයෙහි යම් කෙණෙක් සවල්පමාත්‍රවූත් ආහාරයක් ලදින් භාගයෙන් භාගයක් වේවයි බොහෝ දෙයක් ලදින් බොහෝකොට වේවයි දුන් දෙයක් දනයමවන්නේය එහෙයින්ම කොසිය සිටානෙනි සෑහෙන පමණක් ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් විෂයෙහි දනපරිත්‍යාගකෙරෙමින් තෙපිත් අනුභවකොට මේ උතුම්වූ ප්‍රතිපත්තියෙන් ආයර්‍ය්‍යමාර්ගයට පැමිණියව යමෙක් උදකලාව තමාට පැමිණියාවූ ආහාරය අන්ටනොදී අනුභවකෙරේද එම උපළුපත් ජාතියෙහි කිසිකායික මානසික සැපයක් නොලබන්නේයයි යනාදීන් මධුර වචනයෙන් ධර්‍මදෙශනා කළහ.

ඒ අසා කොසිය සිටානෝ මදක් මොලොක්වූ සිත් ඇතිව බමුණානෙනි තොප කී බස් ඉතාම මැනවයි ප්‍රශංසාකොට කිරිබත පැසනතෙක් වැඩහිඳුවයි කියනලදුව ශක්‍රබ්‍රාහ්මණයානෝ එකත්පස්ව උන්නාහ.

ඉක්බිති චන්ද්‍ර දිව්‍යපුත්‍රයා බ්‍රාහ්මණවෙශයෙන් අවුත් ඔහු හා සමග කථාකොට ඔහු නවනමින් සිටියදීම මිහිරිතෙපුලෙන් එඹා කොසිය සිටානෙනි මේ ලෝකයෙහි සාපිපාසයෙන් පීඩිතවූ අමුත්තන් ඉන්ද දී උද කලාව අනුභවකෙරෙද්ද ඔහු විසින් කරණලද අතිථිසත්කාරද සම්පත් ඉපදී මෙහි කරණලද උත්සාහය නිෂ්ප්‍රයෝජන වන්නේය. පින්වත්වූ සිටානෙනි ඒ කාරණය හේතුකොටගෙණ මෙතැන් පටන් ශ්‍රමණ බ්‍රාහ්මණාදී දුගී මගී යාචකයන් විෂයෙහි ශක්තිපමණින් දනමානාදිය කෙරෙමින් තෙපිද සැපසේ අනුභවකොට ස්වර්‍ගමොක්ෂ දෙක අත්කොට ගණුවයි යනාදීන් අවවාද කීහ. එබස් අසා සිටානෝ නනනමින් දුකසේ කටහැර මදක් වැඩහිඳුවයි කීහ.

ඒ අසා චන්ද්‍රදිව්‍යපුත්‍රයා ශක්‍රදෙවේන්ද්‍රයන් සමීපයෙහි උන්හ.

ඉක්බිති සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයෝත් බමුණුවෙසක් ගෙණවුත් පැමිණ ඔහු හා කථාකොට නොයෙක් පරුෂවචනයන් කියා බැණ නවත්ව නවත්වා භාග්‍යවත් සිටානෙනි මේ ලෝකයෙහි යම් සත්‍වයෙක් සාදුකින් පීඩිතවූ අමුත්තන් දැක උදකලාව අනුභව නොකරන්නේය ඔහුගේ දනමානාදියද කෘෂි වණිජ්‍යාදී

නිසා කරණලද උත්සාහ වීයර්‍ය්‍යද සැබෑමවන්නේය. සාර්‍ථකවන්නේය ඒ කාරණයෙන් දානමානාදියක් කොට තෙපිත් අනුභවකොට සත්පුරුෂ ගුණයෙහි පිහිටවයි යනාදීන් සුභාසිත වචනයෙන් කීහ

සිටානෝ ඔහුගේද බස් අසා කෙඳිරිපරගාමින් මදක් වැඩහිඳුවයි නියෝගකළහ.

එකල සූයර්‍ය්‍යබ්‍රාහ්මණද ගොස් චන්ද්‍ර දිව්‍යපුත්‍රයා සමීපයෙහි උන්හ. ඉක්බිති මාතලී දිව්‍යපුත්‍ර අවුත් බෙණෙමින් දෙඩමින් එඹා පින්වත යම් සත්ත්වයෙක් යක්‍ෂ රාක්‍ෂසාදීන්ට බලිකර්‍ම්‍ය වරම් කියා බාහුකානම් ගංතෙර පයාගයනම් පොකුණය දෙනතිඹරුය යන තීර්‍ත්‍ථස්ථානයෙහි ගඞ්ගාප්‍රවාහයෙහිද යාගකෙරේද ඒ මෙකී තෙන ඔහුවිසින් කරණලද්දාවූ යාගය ඉදින් යාගයටම සැලසේනම් ඔහුගේ උත්සාහ වීයර්‍ය්‍යයත් ව්‍යර්‍ත්‍ථනොවේනම් ඉෂ්ටවිපාකයට කාරණාවීනම් යමෙක් ශ්‍රමණ බ්‍රාහ්මණ දුගී මගී යාචකයන් විෂයෙහි කරණලද සත්කාර සම්භාවනා සාර්‍ථකවෙති කිවමැනවයි නැවත ඒ කාරණයෙන් කොසිය සිටතෙති දානමානාදි සුචරිත කර්‍මකොට බුඩාදී උත්තමයන් විසින් පසස්නාලද සත්පුරුෂපථයෙහි පිහිටා සගනුව මොක් අත්පත්කරව. යමෙක් අඳුරු ගෙයෙක්හි හිඳ අපවිත්‍රයක් අනුභවකරන්නාක් පරිද්දෙන් කිසිකෙණෙකුන්ටත් නොදී උදකලාව අනුභව කෙරෙද්ද එතෙම කිසි කලෙකත් දිව්‍ය මනුෂ්‍යසම්පත්තියට නොපැමිනෙන්නේයයි යනාදීන් ධර්‍මදෙශනා කළහ. ඕහුගේ සුභාසිත වචනයන් අසා ඉක්මවිය නොහී පර්‍වතයකින් මඩනාලද කෙණකුන් පරිද්දෙන් තතනමින් මදක්වැද ඉඳුවයි කීයේය. මාතලී දිව්‍යපුත්‍රද ගොස් සූයර්‍ය්‍ය දිව්‍යපුත්‍රයානන් සමීපයෙහි උන්නේය.

ඉක්බිති පචශිඛ දිව්‍යපුත්‍ර අවුත් ඕහට පෙණී ඔහු වලකමින් සිටියදී පළමු පරිද්දෙන් කථාකොට එඹා භාග්‍යවත්වූ සිටානෙනි මේ ලෝකයෙහි යම් සත්වයෙක් මෙතනට පැමිණී දුගී මගී යාචකයන් බල බලා ඉන්දදී තෙමේ අනුභවකෙරේද එතෙම තරවූ යොත් ලනු ඇති අමුණනලද ගොදුරු ඇති මහත්වූ බිලීකටුව ගන්නාවූ මත්ස්‍යයෙකු වැන්නේය, ඒ කාරණයෙන් කොසිය සිටානෙනි පැමිණි යාචකයන්ට දානපරිත්‍යාග කෙරෙමින් මසුරුසිත් දුරුකොට සැපසේ අනුභවකොට අන්නපාන වස්ත්‍රාභරණාදිය දීමෙන් පුත්‍ර මිත්‍ර කලත්‍ර බන්ධුවර්‍ගයා පොෂ්‍යකෙරෙමින් සත්පුරුෂපථයෙහි පිහිටා දිව්‍ය මනුෂ්‍ය සම්පත් සාධාගණුවයි යනාදීන් මධුර වචනයන් කථාකළහ.

ඔහුගේ ධර්‍මය අසා මසුරු කොසිය සිටානෝ මසුරු බරින් පුරණලදුව දුක්ඛවෙදනාවෙන් පෙලී තතනමින් කෙඳිරිගාමින් මදක් වැදහිඳුවයි කීහ. ඒ අසා පන්සිළු දෙව්පිත් ගොස් මාතලී දිව්‍යපුත්‍රයන් සමීපයෙහි උන්නේය. මෙසෙයින් ඒ බ්‍රාහ්මණවෙශඇති දෙවියන් පස්දෙනා එක්තැන්ව උන්කල්හි කිරිබත් පැසීගියේය. එකල කොසිය සිටානෝ කිරිබත උදුනෙන් බනා තබා පත්කඩාගෙණ ඒවයි බමුණන්ට විධානකළහ.

බමුණෝ පස්දෙන උන්තෙනම වැදහිඳ දිව්‍යානුභාවයෙන් අනදික් කොට හිමාලය වනයෙන් මාලුවාපත් ගෙණාහ. ඒ දැක කොසිය සිටානෝ කිපී ඒ දමා කිහිරිපත් කඩාගණීවයි කීහ, ඔහුත් මනකුඩයක් පමණදිග පළලඇති

කිහිරිපත් ගෙන්වූහ. සිටාතෝද බමුණන් පස්දෙනට එකී එකී බත් හැන්දක් බැගින් ඔවුන් පස්දෙනාටත් දී සැළියේ බත් අඩුවක් නුදුටුවාහුය, තුමූ සැළිය පිටින් තිබාගෙණ කන්ට වැදළුත්හ, එක්ෂණයෙහි පංචසිඛ දිව්‍යපුත්‍රයාද නැඟී සිට බ්‍රහ්මණ වෙශයෙන් හුන්නාහු හැර බලු වෙසක් මවාගෙණ ඔවුන් ඉදිරියෙහි දියසලදින් නික්මුණාහුය, බමුණෝ තමතමන්ගේ බත් පතින් වසාගත්හ සිටාතෝත් සැළිය අතින් වැසූහ.

එසඳ සිටානන්ගේ පිරිඅත්ලේ වැදගත එකල බමුණෝ කෙන්ඩිකාවල පැන් ඇරගෙන පැන්හිස බත් අනුභවකරණ ආකාර දැක්වූහ, එසඳ සිටානන්ගේ අතට පැන් ඉල්වා නොලැබ නොපත් පැන් ගෙණවුත් අතසෝදපියවයි කී විසින් මා කිරිබත් දුන්කල මා අත පැන් වත්කළොත් කිම්දැයි කීහ. අපි ඔවුනොවුන් හා ගණුදෙනුනොකරම්හයි කීවාහුය, ඒ අසා සිටාණෝ මා අත සෝදපියා එනතෙක් මේ සැළිය බලවයි කියා ගඟට ගියාය. එකෙණෙහි බලුතෙම සැලියපුරා දිය සැලූයේය එසඳ සිටාතෝ දියසලන්නාවුන් දැක මහත් දඬුකඩක් හැරගෙණ භයගන්වමින් ලඟට ගියාහුය. එකෙණෙහි බලුතෙම ආජානීය සෛන්ධවයකුමෙන් මහත්වූ ශරීරයක් මවාගෙණ කලුය සුදුය රත්වන් කබුරුවන් යනාදී පැහැයෙන් යුක්තව උස්වෙමින් මිටිවෙමින් මහත් වෙමින් නොයෙක් ආකාරයෙන් භයවත්වා නැතිගන්වමින් ලුහුබඳවාගත්තේය.

එසඳ සිටානො මරණභයින් පීඩිතව මහ හඬින් මොරගාගණ බමුණන් කරා ගියාහුය, ඔහු ලඟවයන්නාහ. උන්නෙනින් නැඟීසිට බමුණෝ ආකාශයට පැනනැංගාහ.

එසඳ සිටාතෝ බමුණන් ඉර්ධියානුභාවයෙන් සිටියාහු දැක මහත් ඉර්ධියානුභාවඇති විශිෂ්ටවූ රූ දරන්නාවූ බ්‍රාහ්මණයෙනි මේ තොපගේ බලුතෙම මා භයගන්වමින් අ:නකප්‍රාකාරවූ සටහන් ඇති ආත්මභාවයක් දක්වන්නේය, ඊට කාරණා කවරෙක්ද තොපි හැම කවුරුදැයි විචාළේය.

එබස් අසා ශක්‍රදේවේන්ද්‍රයා ඔවුන් දසාවට අතදික්තොට මොහු චන්ද්‍ර සූර්‍ය්‍ය පුත්‍රදෙදෙනාය මෙතෙම මාතලී දිව්‍යපුත්‍රය මම වනාහී දෙදෙව්ලොව දෙවතාවන්ට අධිපතිවූ ශක්‍රදේවෙන්ද්‍රවෙම්යි මෙබඳුවූ බලුවෙෂයෙන් පෙණුනේ පංචශිඛදිව්‍යපුත්‍රයා යනාදීන් තම තමන්ගේ හැමගේ ඇතිස්වභාවය කියා පංචශිඛ දිව්‍යපුත්‍රයාගේ යස වර්ණනා කියන්නාහු එඹා සිටානෙනි මොහුගේ ප්‍රසාදය උදයකාලයෙහි මනාවූ ධවනිඇති ගැටපහවූ බෙරය යනාදී පඤ්චාංගිකතූර්‍ය්‍ය නාදයක් පත්වන්නාවූ සිය දහස්ගණන් දිව්‍ය නාටකස්ත්‍රීහු නෘත්‍ය ගීත වාද්‍ය පවත්වමින් මොහුපොබයන්නාහුය යනාදීන් අනේකප්‍රකාරයෙන් පංචශිඛ දිව්‍යපුත්‍රයාගේ ඓශ්වර්‍ය්‍ය වර්ණනා කළහ.

සිටාතෝද ඒ අසා විස්මයපත්ව මෙබඳුවූ දිව්‍යසම්පත් කුමක් කල කෙණෙක් ලබන්නාදැයි විචාළහ.

ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍රයෝ එඹ සිටානෙනි මේ ලෝකයෙහි යම් සත්ව කෙණෙක් දන සීලාදී ගුණ නොදන්නාහුද මසුරු සිත් ඇත්තාහුද ශ්‍රමණ

බ්‍රාහ්මණාදීන්ට නින්ද, පරිභව කෙරෙද්දද එබඳු පාපී සත්වයෝ දිව්‍යලෝක යෙහි නූපදනාහ, කාබුත් මරණින් මත්තෙහි නරකාදී අපායෙහිම උපදනා හුය යනාදී පාපී සත්‍වයන් උපදනා නරකාදී දුක් දක්වා සිටාතෙති යම් සත්‍ව කෙනෙක් දශකුශලධර්මයෙහි පිහිටා දන සංවිභාග සීලීව ශ්‍රමණ බ්‍රාහ්මණා දීන්ට දන මාතාදියකොට සුගතිය කැමතිවෙද්ද ඒ සත්වයෝ මිය පරලොව ගියකල්හි දිව්‍යලෝකයෙහි උපදනාහුය.

තවද සිටානන්ට කියන්නාහු දිව්‍යලෝකයෙහි සිට එන්නාවූ අපි ඇම තොපගේ මේ කිරිබත් නිසා ආමෝ නොවෙම්හ. තෝ වනාහි පූර්වජාතියෙහි අපට බත්ධුත්වයක් ඇත්තවද තද මසුරුව ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් විෂයෙහි කෝපීව පාපධර්මයෙහි ගැලී වාසයකරණුය, ඒ කාරණයෙන් තොපකෙරේ අනුකම්පායෙන් මේ කාලකන්නී සත්වතෙම පව්කොට නරකාදී අපායට යන් නේයයි එයින් වලකණු පිණිස අපි ආම්හයි කීහ.

ඒ අසා කොසිය සිටානෝ මොහු මට හිතකැමැත්තාහ, පව්කොට නරකාදී අපායට යන්නාවූ මා එයින් වලකා සවර්ගයෙහි පිහිටුවන නිසා ආ කෙනෙක්ලයි සතුටුව ඒකාන්තයෙන් මට හිත කැමති නුඹවහන්සේලා යමක් වදාළසේක්ද එපරිද්දෙන්ම පිළිපදිම් අද මේවේලේ පටන් මාගේ මාත්සර්යය සිත හැර සියලු පාපයෙන් දුරුව ඉදින් පැන් පමණකුත් අනිකෙකුන්ට දන විෂයෙහි නොදී අනුභව නොකෙරමියි කියා තවද ශක්‍රදිව්‍යරාජයානන් වහන්ස මාගේ ඇති සියළු සම්පත් මුළුල්ලම දනමුඛයෙහි යාචකයන්ට දී නිමවා ඉක්බිත්තෙන් වස්තුකාම ක්ලේශයෙහි ලොභහැර තපසට යෙම් යනාදීන් කීහ.

ශක්‍රදෙවෙන්ද්‍රයෝද සිටානන්ට ධර්මදෙශනා කොට අකුසල් කිරීමෙහි අනිෂ්ටවිපාක හා කුසල් කිරීමෙහි ඉෂ්ටවිපාක ප්‍රකාශකොට මසුරුසිත් හරවා දමනයෙහි ලා තෙසු දෙවියන් හා සමග දිව්‍යභවනයටම ගියාහුය,

ඉක්බිති කොසිය සිටානෝ නුවරට වැද රජගෙට ගොස් රජ්ජුරුවන්ට දන්වා නුවර බෙර පියවි කරවා රැස්වූ සියලු දුගී මගී යාචකයන්ගේ ගෙණ ගෙණා භාජන මුක්තා මාණික්‍ය සංඛ සිලා ප්‍රවාලාදී සත් රුවනින් පුරවාදී එද වස්ම ගිහිගෙයහැර නික්ම ගොස් හිමාලය පර්වතයට දකුණුදිග් භාගයෙහි පන්සලක් කොටගෙණ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ගෙණ වනමුල් ඵලා හාරයෙන්ජීවත්වෙමින් බොහෝකලක් වාසයකොට ජරාවට පැමිණියාහුය.

එකල සක්දෙව්රජහුගේ අසාය, ශ්‍රද්ධාය, හිරිය, සිරීයයි යන නම් ඇති දූ සතරදෙනෙක් වූහ, ඔහු සතරදෙන බොහෝවූ මල් සුවඳ විලවුන් හැර ගෙණ ජලක්‍රීඩාව පිණිස අනොතප්ත විලට ගොස් එහි දියකෙළ රත්ගල් තලා මුදුනෙහි උන්නාහුය එකල නාරද නම් බ්‍රාහ්මණ තාපස කෙනෙක් දිවා විහාරය පිණිස තව්තිසා භවනයට ගොස් නන්දනවන චිත්‍රලතා වනයෙහි දිවා විහාරය කොට පරසතුමදුරා මලක් කුඩයක් මෙන් ඡායාව පිණිස ඉසටකොට ගෙණ දිව්‍යඞ්ගනාවක උන්නාවූ සල්වට මුදුනෙන් තමන් වසන්නාවූ රත්ගල් ගුහාවට යන්නාහුය, එසඳ දිව්‍යඞ්ගනාවෝ නාරද තාපසයන් අත තිබූ මනාවූ ප්‍රබුද්ධවූ විශිෂ්ඨවූ දෙවියන් විසින් පලදනා ලබන්නාවූ අනික් මනුෂ්‍ය නාග යක්ෂාදීන්ට නොලැබෙන්නාවූ පරසතුමදුරා මල දක ජාඹොනද සවර්ණයට

බඳුවූ ඡවිවර්‍ණය ඇති උත්තමරූ දරන්නාවූ ඒ දිව්‍යප්සරාවෝ නැගීසිට උත්තම ගුණ දරන්නාවූ මහත්වූ තපස් තේජස් ඇති බ්‍රාහ්මණයන්වහන්ස නුඹ වහන්සේ විසින් එක්කෙනෙකුන්ට යයි නොඋදෙසන ලද්දෙවීනම් ඒ අපට දී අපගේ අභිප්‍රාය සිද්ධකොට එපරිද්දෙන් නුඹවහන්සේගේ අභිප්‍රායෙක් ඇත් නමුත් සිද්ධකොට ගනමැනව තවද මේ පරසතු මදුරා මල අපට දීමෙන් අපට පියවූ ශක්‍රදෙව රාජයානන් වහන්සේ පරිද්දෙන් අපගේ මනෝරථය පූරණය කළ මැනවයි කීහ.

ඒ අසා තාපසයෝ එම්බා දිව්‍යප්සරාවෙනි මේ මල මාගෙණා පමණක් විනා කිසිකෙනෙකුන් උදෙසන ලද්දක් නොවෙයි මාලාගන්ධ විලෙපනයෙන් ඇලකී හෙයින් මටත් ප්‍රයෝජන නැත්තේය, නෙපි හැම මා නිසා විවාද නොකොට මේ මල හැර ගෙණ නොප හැම්ගෙන් වැඩිමහළු කෙනෙක් පලඳින්වයි කීහ.

ඒ අසා දිව්‍යාඞ්ගනාවෝ තාපසයානන්වහන්ස නුඹවහන්සේ අප සතර දෙනාගෙන් යම් කෙනෙකුන්ට දෙනු කැමතිසේක්ද උන්ට දුනමැනවයි ඔහුම ප්‍රධාන වෙතියි කීවාහුය, ඉක්බිති නාරද තාපසයෝ දිව්‍යප්සරාවෙනි එසේ කොට විවාද වැඩීම තපස්විවරයන්ට සුදුසු නොවන්නේය, නොප හැම අතු රෙන් උත්තමකෙනෙකුන් තෝරණු කැමත්තානම් තොප හැමට පියවූ දෙදෙව්ලොව දේවතාවන්ට නායකවූ ශක්‍රදෙවෙන්‍ද්‍රයන්ම විචාරා නියම දැන ගණුවයි කීවාහුය.

ඒ අසා දිව්‍යාඞ්ගනාවෝ මල නුදුන් හෙයින් හා තොපගේ පියානන් අතින් විචාරා නියමදනුවයි කීහෙයින් තාපසයන්ට කිපී ශක්‍රදෙවෙන්ද්‍රයන් සමීපයට ගොස් පියානන්වහන්ස අප සතරදෙනාගෙන් ශ්‍රෙෂ්ඨ කවුරුදැයි විචාළාහුය. එසඳ බද්ධාජලීව සිට විචාළාවූ දිව්‍යප්සරාවන්ගේ බස් අසා භද්‍රා වෙනි තොපි සතරදෙනා රූපයෙන් වර්‍ණයෙන් වයසින් ඓශ්වර්‍ය්‍යයෙන් සමානය සවරෙක් තොප ඔවුනොවුන් හා විවාද ඉපදවූදැයි විචාළාහුය.

ඉක්බිති දිව්‍යප්සරාවෝ පියානන්වහන්ස දිව්‍යලෝක මනුෂ්‍යලෝකාදී යෙහි අසබලිතවූ ගමන් ඇති උතුම් තාපසධර්‍මයෙහි පිහිටියාවූ තපස්තේජස් ඇති නාරද නම් තාපසයානන්වහන්සේ ගඳමහන් පව්වෙහි අප සතරදෙනා දැක මෙලෙස කිවූය. ඉදින් නුඹවහන්සේ දක්නාසේක්වීනම් විශිෂ්ටවූ කෙනෙ කුන් කිවමැනවයි කීවාහුය.

ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රයෝ මොහු සතරදෙනා මාගේ දරුවෝය ඉන් මොවුන්ගෙන් එක්කෙනෙකුන් ගුණයෙන් විශිෂ්ටයයි කීනම් නෙස්සෝ කිපෙන්නාහුය මේ තෝරා කියන්ට නොපිළිවන මොවුන් හිමාලය වනයෙහි කොසිය තාපයන් සමීපයට යවම්යි ඒ තාපසයෝ මොවුන්ගේ විවාද සන් සිඳුවන්නාහුයයි සිතා දරුවෙනි මේ විවාදය මා විසින් විචාළ නොහැක්කේය. හිමාලය වනයෙහි කොසියනම් තපස්කෙනෙක් ඇත ඔහට මම සුධා භොජ නය යවම් තාපසයෝ අන්කෙණකුට නොදී අනුභවනොකෙරෙති ගුණවත් කෙනෙකුන්ටම දෙන්නාහුය තොපහැම් අතුරෙන් යමක් ලබන්නීද හේ තොම

උතුම්වන්නීයයි කියා ඔවුන් එතනින් නික්මවා මාතලී දිව්‍යපුත්‍රයා කැඳවා එඹල රථාචාරීනි හිමාලයවනයට දකුණුදික්භාගයෙහි ගඞ්ගාතීරයෙහි කොසිය නම් තපස්කෙණෙක් තපස්කෙරෙති ඌතුමූ අමනුෂ්‍යවාසයෙහි වසන හෙයින් කිසි අන්නපානාදියක් නොලබන්නාහුය මේ සුධා භොජනය ගෙනගොස් ඒ තාපසයන්ට දෙවයි විධාන කළහ.

ඒ නියෝගලත් රථාචාරීතෙම සුධාභොජනය ඇරගෙන දහසක්ම මනොමය සෛන්ධවයන් යොදන ලද්දාවූ දිව්‍යරථයට පැනනැගී ආශ්‍රමයට ගොස් තුමූ නොපෙණී උදය කාලයෙහි ශරීරකෘත්‍යය කොට ගිනිදෙවියාට පුදා සූය්‍යීදේවතාවාට නමස්කාර කරමින් සිටි තාපසයන් අතට සුධාභොජනය දුන්නේය. එසඳ කොසිය තාපසයෝ තමන් අතට දුවන්නාවූ ඒ සුධා භොජනය දැක ගිනිදෙවියා පුදා සූය්‍යීවාවනය කෙරෙමින් සිටියාවූ මා අතට දෙන ලද සකසේ සුදුවූ ඉතා පිරිසුදුවූ අසදෘශවූ දිවසුවඳ විහිදුනාවූ ආශ්චය්‍යී ස්වරූ පවූ පෙර නුදුටුවිරුවාවූ සුධාභොජනය ශක්‍රදෙවේන්ද්‍රයෝ ද්‍රෝහෝ නොහොත් අන්‍යවූ දෙවතාවෙක්ද මධුරවූ මේ අමෘතභොජනය මා අතට දුන්නෝ කවුරු දැයි යනාදීන් කථාකළහ.

ඒ අසා මාතලී දෙව්පුත්තෙම මා දෙදෙව්ලොව දේවතාවන්ටනායකවූ සක්දෙව් රජ්ජුරුවන්වහන්සේගේ නියෝගයෙන් සුධාභොජනය ගෙණාවාවූ මාතලී දිව්‍යපුත්‍රයායයි දනමැනව. මේ උතුම්වූ කිරිබත අනික් සැකයක් නො කොට අනුභවකළමැනව. නවද තපස්වීන්වහන්ස භොජනය අනුභව කළකල සාදුක්ද පැන්පිපාසය ගැන්මද නොඇල්මය කුසීතකම විඩාවයකොපයනැවත වෛරබැඳීමය ඔවුනොවුන් හා විවාද කිරීමය කේලාම්කීමය සීතපීඩාව උෂ්ණ පීඩාවය මැලිකමය කියනලද දෙළොස්වැදෑරුම්වූ නුගුණ දුරුකරන්නේය. ඒ කාරණයෙන් මේ සුධා භොජනය අනුභවකළමැනවැයි කීය.

එබස් අසා කොසියතාපසයෝ එම්බා මාතලී නම් දිව්‍යපුත්‍රයානෙනි පළමු මා විසින් ලබනලද ආහාරය අන්කෙණෙකුන්ට නොදී අනුභව නොකෙරෙමි යන ව්‍රතසමාදානය කරණලද්දේය. එනෙයින් අන්කෙණෙකුන්ට නොදී අනුභවකිරීම මට නොවටනේය, නවද උදකලාව අනුභවකිරීමද උත්තමයන් විසින් පසස්නාලද්දේ නොවෙයි. නවද ලබනලද ආහාරය අන්කෙණෙකුන්ට නොදී අනුභවකරන්නාවූ සත්‍වතෙම කිසිකලෙකත් සැපයක් නොලබන්නේ යයි යනාදී කීහ.

ඒ අසා මාතලී දිව්‍යපුත්‍රද තපස්වීන්වහන්ස නුඹවහන්සේ විසින් අනුන්ට නොදී අනුභවකිරීමෙහි කවර දොෂයක් දැක මේ ව්‍රතසමාදානය කරණ ලදැයි විචාළේය.

ඒ අසා කොසිය තාපසයෝ එම්බා දිව්‍යරථාචාරීණී මේ ලෝකයෙහි යම් කෙණෙක් සත්‍රීවධාදීවූ ප්‍රාණවධද මිත්‍රද්‍රොහිකම්ද පරදාරකර්‍මයද ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට නින්දා පරිභවයද තදා මසුරුකමයයි යන මෙකී දෙයින් යුක්තවූ මේ පස්දෙන අත්‍යන්තයෙන් අධම්තම්වෙති. ඒ කාරණයෙන් පැන් පමණක් ලදින් අන්කෙණෙකුන්ට නොදී අනුභව නොකෙරෙති. නවද මේ දානව්‍රතය සමාදන්වූතැන්පටන් නුවණැත්තාවූ බුඬප්‍රත්‍යෙකබුඬාදීවූ ශ්‍රාවකාදීන් විසින්

උතුමැයි පසස්නාලද දානය ස්ත්‍රීන්ට වේවයිපුරුෂයන්ටවේවයි දන්දෙම්මය මේ දානපරිත්‍යාගයෙන් යුක්තවූ සත්වයෝ ඇත්තාහ. පහවූ මසුරුසිත් ඇත්තාහ. මනාවූ සත්වධර්මයෙන් යුක්තයහයි උත්තමයන් විසින් උපසස්ථාන ලද්දේයයි කීහ.

එකල කොසිය තාපසයන් විසින් කියනලද සුභාෂිත වචනයන් අසා දිව්‍යපුත්‍රතෙම සතුටුව තාපසයන්ට පෙණෙන පරිද්දෙන් සිටියේය.

එකල ශක්‍රදේවේන්ද්‍රයන් විසින් නියෝගකරණලද ඒ දිව්‍යාඞ්ගනාවෝ සතරදෙන ආශ්‍රමයට ගොස් රන්වන්වූ ශරීරශොභාවෙන් දසදිගුන් බබුළුවමින් දකුණුදිග ආසාය; බටහිර සද්ධාය, උතුරුදිග හිරිය, නැගෙනහිර ශ්‍රීයයි සතර දෙන සතරදිසාවෙහි සිටියාය.

එසඳ කොසිය තාපසයෝ මනාවූ ශරීරශොභාවෙන් දසදිගුන්බබුළුවා වග්තිශිඛාවක්මෙන් දිලියෙන්නාවූ භාවහාවලීලා කටාක්‍ෂ මන්දස්මිතාදීවූ චතුරාගයෙන් යුක්තවූ ඒ දිව්‍යාඞ්ගනාවන් සතරදෙනා දැක උතුම්වූ සන්තොෂයට පැමිණියාවූ සර්වාභරණයෙන් සැරසී ඔසධිතාරකාවන් පරිද්දෙන් දීප්තිමත්වූ ශරීර ශොභාවෙන්ද මන්දමාරුතයෙන් ලෙලදෙන්නාවූසවර්ණතිලකාවකට බඳුවූ ශොභාව දරන්නාවූ ශරීර ඇති දිව්‍යාඞ්ගනාව පූර්වදිග්හි සිටියාවූ තෝ කවරෙක්හිද මට කියවයි විචාළහ.

ඒ අසා ශ්‍රීතොමෝ තාපසයන්වහන්සේ සියලු සත්වයන් දමනලද අලාමක සත්වයන් සෙවුනාවූ තවද තාපසයන්වහන්සේ මේ ලෝකයෙහි යම් සත්ව කෙණෙකුන්ට සැපකැමතිවීද ඒ සත්වතෙම සර්වකාමයෙන් සමන්විතව සන්තුෂ්ටවන්නේය, එහෙයින් මා ශ්‍රීකාන්තාවයි කියා දනාමැනව. සුධාභොජනයෙහි විවාදයක් නිසා නුඹවහන්සේ සමීපයට ආමියි උතුම්වූ ප්‍රඥාවිශෙෂ ඇති තපස්වීන්වහන්සේ සුධාභොජනය දීමෙන් මා උතුම්කොට තොරා වදාළ මැනවයි කීව.

ඒ අසා කොසියතාපසයෝ මේ ලෝකයෙහි හස්තිශිල්ප අශ්වශිල්පාදීවූ නොයෙක් ශිල්පද අක්‍ෂර ලිඛිත ගණිත ගාන්ධර්වාදී අනෙකප්‍රකාර විද්‍යාසර්ථානද ආචාරසීලයෙන්ද විශිෂ්ටවූ ප්‍රඥාවිශෙෂයෙන්ද යනමෙයින් යුක්තවූද කෘෂිවණිජ්‍යාදී ස්වකීයවූ කුලක්‍රියාවෙන් සමන්විතවූ සත්වයෝ තොපගේ පරම්මුඛතාවෙන් දිළිඳුබවට පැමිණෙන්නාහුය, ඒ තොපගේ අකාරියෙක. තවද මේ ලෝකයෙහි කුසීතවූ තමාගේ බඩ පමණ නොදන්නාවූ වංශයෙන් යටත්වූ විරූපීවූ දුර්ජනසත්වයෝද තොප හා එක්වීම් හේතුකොටගෙණ විශිෂ්ටවූ ආශ්චර්‍ය්‍ය හා යසසට පැමිණ වංශයෙන් ගුණයෙන් ගොත්‍රයෙන් ආචාර සමාචාරයෙන් සමන්විතවූ සත්පුරුෂයන් තමන්ට දාසත්වයෙහි පමුණුවන්නාහ එද තොපගේ නොදන්මෙක. ඒ කාරණයෙන් සබවස රක්නවුන් කෙරෙහි නොහැලෙන්නාවූ සත්වයන්ගේ ගුණ පරීක්‍ෂාකොට සෙවුනාවූ උත්තමයන් හෙළාදක්නාවූ තොප අඥානයයි දනිමි එබඳුවූ කිසි ගුණයක් දහමක් පුරුෂවිශෙෂයක් නොදන්නාවූ තොපි සුධාභොජනය තබා ඉඳිනා අස්නක් හා බීපියන පැන් විවරකුත් අපගෙන් නොලබව. තොපසේ අසත්පුරුෂයන්ට මාගෙන් දනක් නොදෙමි වහාමෙතනින් නැගීයවයි කීවාහුය.

එසඳ තාපසයෝ කීබස් අසා ශ්‍රීන්තාම බත් ලබන්නා තබා ක්‍ෂණමාත්‍රය් කුත් එතන සවභාවයෙන් සිටපිය නොගී අතුරුදන්වූහ.

ඉක්බිති කොසියතාපසයයෝ දකුණුදිගසිට චන්ද්‍රමරීචිසේ අතිපරිශුඬවූ දන්තපංක්තියෙන් හා පලඳනාලද මිණිකොඬලෙන් හා විසිතුරුවූ අඟු පලඳනාවෙන් හා අනෙකප්‍රකාරවූ දිව්‍යමයවූ සවර්ණාභරණයෙන් විරාජමානවූ ගොත්‍රඇති සරත්වලාකඩක් බඳුවූ ධවලවජ්‍රයන් දරන්නාවූ කුසතණින් කරණලද ගිනිසලක්මෙන් අතිරක්ත එල්ලව සහිතවූ හෝපලුමල් කැණක් කර්ණාවතංසකොට පලඳින්නාවූ භයින් ත්‍රස්තවූ මෘගාඞගනාවක්බඳුවූ නිරීක්‍ෂණ යන් ඇති දිව්‍යාඞගනා තෝ කවරෙක්හිද තීගේ වල්ලභයා කොයිද මේ වන මධ්‍යයෙහි භයනැතිව කුමක් පිණිස අවුදැයි විචාළාහුය.

ඒ අසා කොසිය තාපසයන් වහන්ස මේ සථානයෙහි මාගේ සවාමිපුත්‍ර යාන කෙණෙකුත් නැත්තාහුය. මමද ශක්‍රභවනයෙහි ජාතවූ ආසා නමින් ප්‍රසි ඬවූ දේවතාවක්මි අමෘතභොජනයෙහි ආසායෙන් නුඹවහන්සේ කරා ආමියි නුවනැත්තාවූ තාපසයන්වහන්ස මට අමෘතභොජනය දීමෙන්මා ශ්‍රෙෂ්ඨ කොට තබා වදාළමැනවැයි කිව.

එබස් අසා තාපසයෝ මේ ලෝකයෙහි වෙළඳහුද ධනාර්ජිව වස්තු ලොභයෙන් සමුද්‍රයාත්‍රා කෙරෙමින් සමහර කලෙක්හි නැව්නැගී නස්නාහ. සම හර කලෙක්හි නස්නාලද ධන ධාන්‍ය ඇතිව දුකසේ තුමූ පමණක් ගැලවීයන් නාහ. ඔවුන්ට පැමිණියාවූ විනාශයද අනී ආසාවෙන් වූහෙයින් තොප නිසාම වන්නේය. තවද කෘෂිකර්මාන්තයෙන් ජීවත්වන්නාවූ ගොවිකෙණෙක් වත් ආදිය ධාන්‍යලොභයෙන් සැව පුට රැකබලා බොහෝ ආයාසයට පැමිණත්. සමහරකලෙක්හි වැසි සුලං හැමීමය කොක්කත කලට්රෝගය වැසිනැතිවීමය යනාදී රෝගයෙන්ද මීයන් පලහැටියන් ගොළුබෙළුවන් ආදී නොයෙක් සත් ගැහැනියෙන් නස්නා ලදුව දුග්ගන්නාවූ සත්‍වයෝ ඉන්කිසි සස්‍ය ඵලයකුත් නොලබන්නාහුය, උන්ගේ ආසා විනාශයද තොප විසින් කරණලද්දේය. මේ ලෝකයෙහි සමහර සත්‍වයෝ පොහොසතුන්ට සේවාකම් කොට සම්පත් ලැබගණුම්හයි සතුරන් මධ්‍යයට වැද පුරුෂපරාක්‍රමය කෙරෙමින් සතුරන් අත නැසී ආශාචෙජදයට පැමිණ මහදුක්විඳ නස්නාහ, උන්ගේ විනාශයද තොප නිසාම වන්නේය.

තවද මේ ලෝකයෙහි යම් සත්‍වයෙක් තමන් විසින් රැස්කරන් නාවූ ධනධාන්‍යාදියද පුත්‍ර මිත්‍ර කලත්‍රාදීවූ බන්ධුවර්ගයාද යනමේ සියලු වස්තුකාම ක්ලෙශකාමයන් හැර දිව්‍යලෝක මනුෂ්‍යලෝක සැප කැමතිව රූක්‍ෂවූ අජවූතගොව්‍රතාදීවූ ව්‍රතසමාදානයන් කොට නුනුව ණින් නොමගගොස් මෙලොවත් පරලොවත් අනෙකප්‍රකාරවූ දුක්විඳ මිය පරලොව ගියකල්හිද අපායදුකඛයට පැමිණ තමන් විසින් ප්‍රාර්ථනාකරණලද දිව්‍යමනුෂ්‍ය සම්පත් තබා අනෙකප්‍රකාරවූ දුක් විඳිනාහ. එයින් තොප නිසාම වන්නේය. ඒ කාරණයෙන් ආසා නම් දිව්‍යාඞගනාව අපගෙන් අමෘත භොජනයක් ලැබෙම් යන අසාවෙක් ඇත්නම් හැර මෙතනින් වනාහි නැගී යවයි කියා ගවූහ.

එසඳ කොසිය තාපසයන්ගේ බස් අසා ඕතොමෝද සුධාව හැර එතැනදීම අතුරුදහන්ව ගියාය.

ඉක්බිති තාපසයෝ පශ්චිමදික්හි සඩාතම් දිව්‍යාඞ්ගනාව දැක අපමණවූ වස්ත්‍රාභරණ මාලාදිය හා සපිරිවරින් රන්ලියයකට බඳුවූ මනොඥවූ ශරීර ශොභාවෙන් දිලියෙමින් බටහිර දිසාවෙහි සිටියාවූ තෝ කවරෙක්හිදැයි විචාළහුය. ඉක්බිති ඒ දිව්‍යාඞ්ගනාතොම විශිෂ්ඨවූ ප්‍රඥාවිශෙෂ ඇති තාපසයන්වහන්ස උත්තම සත්‍වයන් විසින් සෙවුනාලද මම සඩාතමින් ප්‍රසිඩයෙමි මේ භෝජනයෙහි වාදයක් නිසා නුඹවහන්සේ කරා ආමි මට සුධාභොජනය දීමෙන් මා උතුම්කළ මැනවැයි කීව.

එබස් අසා කොසිය තාපසයෝ මේ ලෝකයෙහි සමහර සත්‍වයෝ කිසි කාලෙක්හි තොපහා සමගව කම්පල අදහා දන්දීමය සිල්රක්‍ෂාකිරීමය යන මෙයින් යුක්තව සත්පුරුෂ ධර්මයෙහි පිහිටා වාසයකෙරෙත් කිසිකාලෙක්හි එම සත්‍වයෝ තොපගේ වියොගයෙන් අදත්තාදානය මූසාවාදය තුලාකූට මානකූටය කේලාම්කීමය යනාදී අනේක ප්‍රකාරවූ දුශ්චරිතයෙහි හැසිරෙන්නාහ.

තවද ආචාරශීලයෙන් යුක්තවූ තමා හා සමානවූ කුලගොත්‍රාදී ඇති පතිව්‍රතාධර්මය අඛණ්ඩකොට රක්‍ෂාකරන්නාවූ කුලස්ත්‍රීන් කෙරෙහි ඇදහිල්ල හැර කළම්ඩියක් කෙරෙහිත් විශ්වාසයකරන්නාහ. ඒ කාරණයෙන් සියලු සත්‍වයෝ අසථානයෙහි උපදනා ශ්‍රද්ධාව නිසා පරදාරාදීවූ අනෙකප්‍රකාරවූ දුශ්චරිතයන් කරන්නාහ. එහෙයින් කුසල් දුරුකොට අකුසල්ම කරන්නෙනිය. මේ පරිද්දෙන් දුරාචාරීවූ තොපට ශුධාභොජනය දෙන්ට මාගේ අභිප්‍රායෙක් නැත මෙතැනින් වහා නැගී පලායායි යනාදීන් ඇති නුවණ කියා දෙඩූහ. එසඳ තාපසයන්ගේ බස් අසා එතනදීම අනතර්ධානව ගියාය.

ඉක්බිති කොසිය තාපසයෝ උතුරුදිගසිටි හිරී නම් දිව්‍යාඞ්ගනා දැක ඇය හා සමග කථාකරන්නාහු.

ග්‍රීෂ්ම සමයෙහි තවදූලි සේනෙක්හි අගපටන් මුලදක්වා හටගත් රත්තාඞ්කුරයෙන් සොභමාන මන්දමාරුතයෙන් සෙලවෙනලද කලුවැල්ලියක් සේ ලීලෝපේතව අරුණෝද්ගමනයෙහි දිලියෙන්නාවූ ලහිරුරැස් කලඹක් මෙන් උතුම්වූ රූ දරන්නාවූ අඩැස්බැල්මෙන් යුක්තවූ බැණනැගෙන්නාක් මෙන් සිත පෙරදූරිකොට සිටියාවූ තෝ කිනම් දිව්‍යාඞ්ගනාවක්දැයි විචාළහ

එබස් අසා හිරීනම් දිව්‍යස්ත්‍රීතොම තමාට වූපරිදි කියන්නී සෘෂින් වහන්ස හැමකල්හිම අලාමක සත්වයන් විසින් සෙවුනාලද්දාවූ සියලු සත්‍වයන් විසින් පූජ්‍යවූ මම හිරීනම් දිව්‍යස්ත්‍රීවෙමි, සුධාභොජනවිවාදයක් පිණිස නුඹවහන්සේ සමීපයට ආමියි ස්ත්‍රීජාතීන්ට ඉල්වීමනම් රහසිගතය හා ප්‍රකාශකරණ කලක්මෙන් ලජ්ජාඑලවන හෙයින් නුඹවහන්සේගෙන් නෙස්සත්මෙන් සුධාභොජනය ඉල්වන්ට අසමර්ථයෙමි කීව.

එපවත් අසා සතුටුවූ කොසිය තාපයයෝ කියන්නාහු රන්රුවකට බඳුවූ උපමා ඇති සුන්දරාඞ්ගිය තෝ සවභාවයෙන්ම සුධාභොජනය ලබනෙහිය

කාරණා කිමයත්? තෙස්සෝ විලීහැර ඉල්වූ බව නිසා සුධාභොජනය නොලද්දාහුය, නී වනාහි නොඉල්වූ බවම උතුම්ගුණයෙකැයි ප්‍රසන්නයෙකැවූ මමම නිට සුධාභොජනයෙන් ආරාධනා කෙරෙමි. සුධාභොජනය තබා මාගේ ආශ්‍රමප්‍රදෙශයෙහි විද්‍යමානවූ සියලුරසයෙන්ම සුධාභොජනයක් පිදියයුතු යයි යම් පමණක් නොකමැත්තෙහි වීනම් එපමණකින්ම තොප සන්තර්පණය කරවා ඉදින් අවශෙෂයෙක් ඇත්තම් මමත් අනුභව කරන්නෙම් වේදැයි කියා සුධාභොජනයෙන් පැවරූහ.

ඉක්බිති කොසිය තාපයන් විසින් ආරාධනා කරණලද හිරි නම් දිව්‍යාඞ්ගනාතොම මූලපටන් අග දක්වා සහ මල්පල්ලෙන් සැදුම්ලද අඹ දඹ නා පනා කැල මූරුගා ලොත්සුඹුළු වැටකේ දුනුකේ ඹකේ කරාකේ ආදීවූ පංචවිධ කෙතකාදීන් හා තවද ලුණුවරණ ඇසල කොහොඹ බක්මී සල් එල ගිරිත්තකොල වල්මහදඹ දියදඹ ඇසතු මී කල එරහැන්ද පලොල් සිඳුවර ආදීවූ මනාසුවඳ ඇති නොයෙක් ලියකතුන් විසින්පලඳනාලද රුක්රජුන් විසින් ප්‍රතිමණ්ඩිතවූ වනඝටපංක්තිවූහ. තවද එහි අනන්තරත්තරයෙහි කැමති තිඹරා ලබු කොමඩු ආදීවූ පලගෙණ මල්පිපෙන්නාවූ අපරන්නජාතීද මල් ගෙණ පලගත්තාවූ මුං මෑ ආදීද වරා පොර තිඹිරි ආදී ගොඩහමු ඌරුහැල් මහවී ස්වයංජාතසාලි ආදීන් සමන්විතවූ තීරානන්තරයෙහි පිහිටි කෙසෙල් ඇටකෙසෙල් අළුගත් සමන්විතවූ නොයෙක් පලිපංක්තින් හා තත්හි තන්හි සන්තාපනයට යොග්‍යවූ සුගන්ධසීතල හරනවූ ජලාශ්‍රයෙන් හා තවද උතුරුදිග අතිශයින් සොභමානවූ මස් සෙවෙල් ආදී අකක්ශවූ ශාන්තවූ නුපුන් මීරස ඇති බස් නට යොග්‍යවූ මනාකොට ඇති අනවරතයෙන් වගුල කුසුම් මූවරද පෙති පතරින් යුක්තව සුවඳවැකී තිබෙන්නාවූ ජලයෙන් පිරී ඇඹුල ඉපුල කල්හාර හෙල්මැලි ආදීන්ද විවිධවූ පද්මජාතීද ත්‍රිවිධවූ උත්පල ජාතීද යන මේ පද්ම ජාතිගන්ධයෙන් සැදුම්ලද මහත් බමර පියරුවින් අතිරම්‍ය සුලභ ගොදුරු ඇති කොස්ලිහිණියෝ මොනරුය ඇටිකුකුළුය විසිතුරු ජීවංජීවකයෝය ගිරා බොකලකුණාලක හංස චක්‍රවාක නොයෙක් පක්ෂිසමූහයන්ගේ සංචාරණයෙන් ඉතා ශොභමානවූ තවද නිර්භයවූ සුලභගොචරයන් ඇති සුං සුමාර මසුන් ලුහුල් මසුන් ඉස්සන් ආදී රෙහෙ මසුන් තෙලියන් කොරලුවන් ආදීවූ ලැහැල්බැඳ ඇවිදිනාවූ නොයෙක් මස්කැලන් ඇති ඉතා දැකුම්කළුවූ ඒ පුෂ්කරණියෙහි පැන්බොන පිණිස සියලු දිගින් අවුත් බස්නා සිංහ ව්‍යාඝ්‍ර වගවලස් කොනන්නශා ඝගවෙසනුත් හා ඇති ඇහුරුවල් මී රෙහෙමුව තිප්මුව සරහමුව කෙහෙල්මුව කොහොන සැට හුරුවල්බා මීවිනි සාවුය යන නො යෙක් ජාතියෙහි මුව ජාතීන් විසින් ගැවසීගත්තාවූ තවද ඒ පොකුණවට සිටි තුවටුවෙන් ගිලිහුනාවූ මලසුන්මෙන් මුවරදපෙති පතරින් සැදුම්ලද අතල ගල් මුදුනෙන් හිස බඩ සමූහයා පිරිවරා බැගෑ වී නැටුම්ගත් මත් මයුරමණ්ඩල යන්ගේ කෙකධවනියෙන් කත්කළුවූ අයි රම්‍යවූ භූමිභාග ඇති ඒ කොසිය නම් සෘෂිහුගේ ආශ්‍රමය සමීපයට වන එසඳ තාපසයෝ තමන් සමීපසළුවූ දහසක්වර දිවිදළින් ඔප්කල ජාම්බොනද ස්වර්ණරූපයක් මෙන් උතුම්වූ ඡවි වර්ණ ඇති තවද මෙඝකූටයෙක්හි හැසිරගිය විදුලියක්මෙන්ද නීලශාඛාවෙන් ප්‍රතිමණ්ඩිතවූ වෘක්ෂයක් පිරිමදිමින් තිල්වූ ගුවන්කුසට වන් පුන්සඳ මඩලක් මෙන් විරාජමානවූ හිරිනම් දිව්‍යාඞ්ගනාවට සතුටුව කොසිය තාපසයෝ සුවඳ

හොට බබුස්තණ ආදීන් මිශ්‍රව මදින් මදකොට ගොතා බඳනාලද හෙයින් නැතිවූ මුදුනෙහි අතුරණලද අඳුම් දිවිසම් ඇති තෘණ සගලක් අතුට සුන්‍ද රාඩකිය මේ ආසනය ඉතා සැපය මෙහි ඉඳුවයි බහුමානයෙන් නිමන්ත්‍රණය කළහ.

ඉක්බිති හිරීනම් දිව්‍යාඞගනා පණවනලද කොචජාසන මස්තකයෙහි බැසඋන.

එසඳ දළමඹුලු අඳුම්දිවිසමදුරූ ඒ තපස්වීවරතෙම වහා පොකුණට බැස අළුත් නෙළුම්පතකින් පැන්ගෙණවුත් දක්ෂිණෝදකයදී සුධාභොජනය පිළිගැන්වූහ.

එසඳ සුධාභොජනය ලැබීමෙන් සතුටුවූ ඒ දිව්‍යස්ත්‍රීතොම මෙතැන නුඹවහන්සේ විසින් පූජාලබනලද්දවූ මම දිව්‍යලොකයට යෙමි අවසර ඉල්වා ගෙණ තපස්වීන් විසින් අනුදන්නා ලදුව වණ්ණබන්ධනයෙන් මත්වූ හිරී නම් දිව්‍යාඞගනාතොම ඇසිල්ලකින් තවුතිසා භවනයට ගොස් තමා ප්‍රියවූ ශක්‍ර දේවේන්ද්‍රයන් සමීපයෙහි සිට මේ කොසිය තාපසයන්ගේ සුධාභොජනය ලදිමි නුඹවහන්සේද මට වහා ජයදෙවා වදාළමැනවැයි කීව.

එපවත් අසා ශක්‍රදේවේන්ද්‍රයෝ සතුටුව තමන් දෙදෙව්ලොව දේවතාවන් හා සමග ගුණෙන් උතුම්වූ ඒ දිව්‍යාඞගනාව සවර්ණ පීඨයෙක්හි වඩාහිඳුවා පූජාකළහ.

මෙසේ ඒ හිරීනම් දිව්‍යස්ත්‍රීතොම දිව්‍ය මනුෂ්‍යාදීන් විසින් ප්‍රාංජලි කරණලද මහත්වූ පූජාසත්කාර විදිමින් උදයගිරි පර්වතය මුදුනෙහි දිලියෙන් නාවූ සරද චන්ද්‍රමණ්ඩලයක් මෙන් සවර්ණමයවූ භද්‍රපීඨ මස්තකයෙහි උන.

මෙසේ ශක්‍රදේවෙන්ද්‍රයෝ සුවඳින් මලින් පූජාකොට සිතන්නාහු කොසිය තාපසයන්වහන්සේ අවශෙෂයන්ට සුධාභොජනය නොදී මැගේ ගුණයන් අපෙක්ෂාකොට සුධාභොජනය දුන්සේක්දෝහෝයි සිතා ඒ කාරණය දැනගෙණ එවයි නැවත මාතලී දිව්‍යපුත්‍රයා තපස්වීන් ලඟට යවූහ.

එසඳ මාතලී දිව්‍යපුත්‍රතෙම ශක්‍රයන්ගේ වචනය මුදුනෙන් පිළිගෙණ ජාම්බොනද සවර්ණමය රිය ඇස් ඇතිරන් රුවන්මයවූ කර්මාන්තයෙන් විසිතුරුවූ නවද සතරන්මයවූ අටමහල සොළොස් මහලයෙන් සැදුම්ලත් ලහිරුරැස් කලඹක්මෙන් දිලියෙන්නාවූ මුදුනෙහි කෙළනා සියක් සියක්යොදුන් ධජමාලා ඇති තම තමන්ගේ මූළු මුළු හා සමග දිවන්නවුන් වෛඩූර්‍ය්‍ය කර්මාන්තයෙන් විසිතුරුවූ නොයෙක් ජාති පර්‍ය්‍ය්‍යන්දට වෘෂභ සටාදිවූ විසිතුරු කර්මාන්තයෙන් සොභමානවූ මුදුනෙහි යොළසියයක් යොදුන් උස ඇති වෛජයන්ත නම් රථය තබා සුවසේ සුවසේ යන පිණිස තුබූ පලින් හා ඒ රථයෙහි විසිතුරු කර්ණචූලාලංකාරයෙන්ද රත්රසුදුල් උරසන් ආදිවූ සියලු අලංකාරයෙන් සරහනලද කැට සත්ධියක් නැතුව උදුබ්දමාත්‍රයකින් සම ගමන් කරන්නාවූ තරුණ හස්තිපොතකයන් හා සමාන බලඇති දහසක් පමණ මනොමය සෛන්ධවයන් යොදනලද උතුම්වූ ඒ රථයානට නැගී රථයෙහි චක්‍රනාදයෙන් හා අශ්වයන්ගේ හෙෂාරවයෙන් හා ආකාශයද වෘක්ෂපර්වතාදීන්ද

හිමාලයද සමුද්‍රයද පොළොවද යන සියල්ලද විශෙෂයෙන් කම්පාකෙරෙමින් ඇසිල්ලකින් අවුත් ආකාශයෙහි රඳවා තමා පෙර දිව්‍යමයවූ උතුරුසළුව එකාංශකොට බහාගෙණ බොහෝ ඇසුරුතැන් ඇති ආචාරසම්පන්නවූ තපස්වීන්ට නමස්කාරකොට ස්වාමීනි ආසාය සද්ධාය ශ්‍රීය යන තුන්දෙනා විවරට කවර ගුණයකින් වැඩි හිරිනම් දිව්‍යස්ත්‍රී සුධාභොජනය ලද්දීදැයි විචාරාගෙණ එවයි ශක්‍රදෙවේන්ද්‍රයන් වහන්සේ වදාළ මෙහෙවර ඇසුව මැනවයි කීව.

එපවත් අසා කොසියතාපසයෝ මාතලිය ශිල්ප ජාතිගොත්‍රාදීන් උත්තමයනුත් අධමයනුත් සෙවුනාහෙයින් ශ්‍රීකාන්තාව අන්ධඑකෙකැයි සිතමි ඇදිලිකළ මනා වස්තුව හැර අතිකක් අතිකක්ම ප්‍රාර්ථනාකරණ හෙයින් ශ්‍රද්ධාව විනාශකාරීයයි සිතමි, යම්හෙයකින් ධනර්ථිහු ආශාවෙජ්දයට පැමිණෙත්නම් ඒ කාරණයෙන් ආශාව අසත්‍යවාදියයි කියමි. ඒ කාරණයෙන් සුධාභොජනය ලැබීමට මොහු තුන්දෙනම අයොග්‍යයයි කියා හිරී නම් දිව්‍යාඞ්ගනාවගේ ගුණ කියන්නාවූ මාතලිය ප්‍රවේනිධර්‍මය රක්‍ෂාකරන්නාවූ කුලයෙහි වැඩෙන ලද යම් කුමාරිකා කෙණෙක් ඇත්නම් ඔහුද තවද වැන්දඹු ස්ත්‍රීහු ස්වාමීහු කෙරෙහි වසන්නාවූ තරුණ ස්ත්‍රීහුද යන මේ තුන්පක්‍ෂයෙහි ස්ත්‍රීජාතිහුද පුරුෂාන්තයෙහි උපන්නාවූ තමන්ගේ රාගොත්සන්නතාව මෙ අපට සුදුසු නොවෙයි කියා වාසනා සහිතවූ ඒසා මහත් තමන්ගේ රාග චෙතනාව ලජ්ජායෙන් වළකන්නාහුය.

තවද මාතලිය මූත්හරාදී නොයෙක් ආයුධ ප්‍රහාරයෙන් භයානකවූ සඞ්ග්‍රාම භූමියෙහි පැරද පලායන්නවුන් වැටෙන්නාවුන් යම් ලජ්ජාසම්පන්න කෙණෙක්ම පැරද පලායම්හයි යන අපකීර්ති විවරට රණමැදට වැටී හුනුම් හයි යන බස උත්තමයයි ලජ්ජාවෙන් දිවිපුද තමන්ගේ ස්වාමීහු සතුරන් අතින් ගළවන්නාන.

තවද මහාසමුද්‍රයෙහි මහත්වේග ඇති සියදහස් ගණන් තරඞ්ග පරම්පරාව යම්සේ වෙරළගැසී භග්නවේද එපරිද්දෙන්ම හිරී නම් වූ පාපක්‍රියාවෙහි ලජ්ජාකොට සත්වයන්ගේ සන්තානයෙහි අටගත් රාග ද්වෙෂ මොහාදීවූ අකුශල නමැති තරඟයන් භග්නවන්නාවූ සථානයෙකැයි යන බව නොපගේ ශක්‍රදෙවේන්ද්‍රයන්ට කියවයි කීහ.

මෙසේ තපස්වීන් විසින් වර්ණනාකරණලද හිරියගේ ගුණසංඛ්‍යාත ධර්‍මකථාව අසා මාතලී දිව්‍යපුත්‍රතෙම ස්වාමීනි නුඹවහන්සේ සමීපයෙන් සුධාභොජනයන් ලත්තැන්පටන් හිරී නම් මේ දිව්‍යස්ත්‍රීතොම ශක්‍රදෙවේන්ද්‍රයන් සමීපයෙන් රත්බඳ පුටුවක් ලදින් මහා පූජාසත්කාර ලද්දීය, එසේහෙයින් දෙවියන්ගේ නුවණටත් නුඹවහන්සේගේ නුවණවැඩියයි ස්තුති කෙළේය.

මෙසේ ඒ දෙදෙන කථාකෙරෙමින් සිටියදීම තාපසයන් ආයුගෙවී චුතවන සවභාවපහළවිය. එපවත්දත මාතලී දිව්‍යපුත්‍රතෙම ස්වාමීනි නුඹවහන්සේගේ ආයුසංස්කාරය ගෙවින මනුෂ්‍ය භූතව පිරියයුතු දානශීලාදීවූ සුචරිත ධර්‍මයෙන් මුදුන් පත්වූහ; එබැවින් මා විසින් ගෙණෙනලද ඉතා උතුම්වූ ප්‍රියවූ මනාපවූ රථයට නැගී වදාළමැනවැයි ශක්‍රදේවේන්ද්‍රයන්වහන්සේද ස්වකීය

ගොත්‍රවූ නුඹවහන්සේ දකිනා අභිප්‍රාය ඇතිසේක, එසේහෙයින් වහා අදම දිව්‍යලොකයට වහා වැඩියමැනවැයි කීහ.

ඒ වචනාන්තරයෙහිම කොසිය තාපසයෝ චුතව ඕපපාතිකව දිව්‍ය පුත්‍රව වෛජයන්ත නම් රථයෙහි පෙණීගියහ. ඉක්බිති මාතලීසංගාහකතෙම ඒ දිව්‍යපුත්‍රයානන් ශක්‍රදෙවේන්ද්‍රයානන් සමීපයට වඩා ගෙණගියේය.

ශක්‍රදෙවේන්ද්‍රයෝ තමන්ගේ සහගොත්‍රවූ තරුණ දිව්‍යපුත්‍රයා දැක සන්තොෂයෙන් පිණාගොස් තමන්ගේ දූවූ හිරි නම් දිව්‍යාංගනාව ඔහට අග්‍ර මහෙසිකාකොට පාවාදුන්කල්හි ඔහට ප්‍රමාණාතික්‍රාන්තවූ දිව්‍ය ඓශ්වර්‍ය්‍යය පැමිණියේය.

යනාදීන් සර්‍වඥයන්වහන්සේ භික්‍ෂූන්වහන්සේට මේ අතීතකථාව ගෙණහැරදක්වා එපරිද්දෙන්ම මහණෙනි අලාමක සත්වයන්ගේ ක්‍රියාවිශෙෂ යෙන් අභිප්‍රාය සිඬවන්නේයයි යනාදීන් ධර්‍මදෙශනාකොට පූර්‍වාපරසන්ධි ගලපා මේ සුධාභොජන ජාතක ධර්‍මදෙශනාව නිමවා වදාරා මහණෙනි එසම යෙහි හිරි දෙවතාද මෙසමයේ උපුල්වන් මහා ස්ථවිරීවූහ. කොසියතාපසයෝ තම් මේ දානපති භික්‍ෂුහුය. පචසිඛ දිව්‍යපුත්‍රයා නම් දිවසින් අග්‍රතැන්පත්වූ අනුරුඬ ස්ථවිරවූහ, මාතලී දිව්‍යපුත්‍රනම් ධර්‍මභාණ්ඩාගාරික අනන්ද ස්ථවිර යෝය. සූර්‍ය්‍යදිව්‍යපුත්‍ර නම් ධූතාඞ්ගයෙන් අග්‍රතැන්පත්වූ මහකසුප් මහතෙරහුය, චන්ද්‍රදිව්‍යපුත්‍රයෝ නම් වමන් සවුවූ මුගලන් මහතෙරහුය එසමයෙහි දිවාවිහාර පිණිස දිව්‍යලෝකයට ගොස් මදාරාමල්ගෙණා නාරද තාපසයෝ නම් දකුණත් සවුවූ සාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි මසුරුකොසිය සිටානන් දමනයෙහිලූ ශක්‍රදෙවේන්ද්‍රනම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

524

කුණාල ජාතකය

ත්‍රිභුවනෙක තිලකවූ සකලඥෙය සාගර පාරප්‍රාප්තවූ අනන්ත ගුණ ගණාධාර භුවනත්‍රය ගත සකලසත්ව හිතොපදෙශකවූ ජාතිජරා ව්‍යාධි මරණාදී සකල දුක්ඛසලිලාස සම්පූර්‍ණවූ සංසාර ජලනිධිගමන සමස්ත සත්වයා අමෘත මහා නිර්‍වාණ පුරප්‍රවෙශය කරන්නාවූ ලොවුතුරා බුදුහු කුණාල විල සමීපයෙහි පැළපස සැට යොදුන් උසඇති රන්සිරියෙල් ගලතලමුදුනෙහි කල්පස්ථායි සත්යොදුන් උසඇති සල්රුක් මුල වැඩඋන්සේක් ශාසනයෙහි ඇලුම් මදව වෙහෙස විඳිනාවූ පන්සියයක් භික්‍ෂූන් අරහයා මේ කුණාල ජාතක ධර්‍මදෙශනාව වදාළසේක.

මෙහි පිළිවෙළකථාව ශාක්‍යකොළිය දෙනුවර ඇත්තෝවනාහි කිඹුල් වත්නුවර හා දෙවුදුහැනුවරට අතුරෙහි රොහිණී නම් ගඞ්ගාව දෙනුවර ඇත්තෝ එක්ව අමුණුබැඳ ගොයම් කරන්නාහුය.

ඉක්බිති පොසොන්මස නියගෙන් ගොයම් මියන්ට වන්කල්හි තොප වත් අපවත් නොසෑහෙන්නේය, අපගේ ගොයම් එකදියවරකින්ම පැසෙන්නේය, එහෙයින් මේ දිය පලමුකොට අපට හැරපියවයි කීහ.

එබස් අසා කිඹුල්වත්පුර ඇත්තෝ තොප ගොයම් පැසවා අටුවපුරා ගත්කල්හි අපි රත්රන්රිදී මැණික් කාවණුගෙණ කඩගම්පැසගෙණ තොපගේ දොර දොර ඇවිදින්ට නොහැක්කම්හ. අපගේද ගොයම් එක දියවරකින් පැසෙන්නේය. එබැවින් අපට හැරපියවයි කීකල්හි කෝලියනුවර වැස්සෝ අපි නොදෙම්හයි කීහ, කිඹුල්වත ඇත්තෝද අපි නොදෙම්හයි කීහ, මෙසේ දෙපක්‍ෂයෙහි ඇත්තෝ ඔවුනොවුන් හා සමඟ කලහ වඩිනයකොට එකෙක් නැගීසිට එකෙකුට ගැසීය; එද පහරලැබ නැවත ඔහට ගැසීයයි යනාදීන් මෙසේ ඔවුනොවුන් මරා රජදරුවන්ට ජාතිසඝාත බණන්නාහු කොලියනුවර ඇත්තෝ කිඹුල්වත රජදරුවන්ට කොල නොපි කැනගිලූත් බල්ලන් මෙන් තඟුන් බූන් රක්‍ෂාකොටගෙණ විසුවවුන් හැරගෙණ ගර්ජනාකරාද උන්සේ වූවන්ගේ ඇතුන් අසුන් හා කඩුපලඟ ආදිය ඇතද අපට කුමක්කොට ගත එද්දූයි කීහ. ශාක්‍යරජදරුවන්ගේ ගොවීද නොපි දූන් අපට තිරිසනුන්මෙන් නිරාසව වදනා අත් නැති කොළොම් ගස් සිදුරෙහි වාසයකලාවූ කුෂ්ට කොල්ලන් හැරගෙණ භයගත්වවුද උන්ගේ ඇතුන් අසුන් හා කඩුපලඟ ආදිය අපට කුමක් කොට ගතහෙද්දූයි කීහ.

මෙසේ ඒ ගොවි දරුවෝ ඔවුනොවුන් හා වාදකොටගෙණ එකට යුත්තෙහි නියුක්ත අමාත්‍යයන්ට කීහ. ඔහුද රජදරුවන්ට ගොස් දැන්වූහ ඉක්බිති ශාක්‍යරජ්ජුරුවෝ තඟුන් බූන් හා විසුව වූන්ගේ බල හා ශක්ති දක්වම්හයි සටනට සැරහී නික්මුණාහ. කොලිය රජදරුවෝ කොළොම් ගස් සිදුරෙහි විසුවන්ගේ බලපෑමුත් නොහරිම්හයි කියා යුධයට නික්මුණාහ. මෙසේ ඒ දෙනුවර වාසීහු සවස් වේලෙහි ගංතෙරට අවුත් වන්හ.

එසමයෙහි භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර නිසා දෙවුරම වැඩවෙසෙමින් එදවස් ප්‍රාතඃකාලයෙහි සූවිසිකෙළ ලක්‍ෂයක් තයින් ප්‍රතිමණ්ඩිතවූ මහාකරුණා සමාපත්තියට සමවැද ලොව බලාවදාළසේක් උභය නගරවාසීන්ගේ සටන් දැකවදාරා තමන්වහන්සේ එතනට වැඩී කල මතු වන්නාවූ මහත් අභිවෘඩියක් දැකවදාරා සිරුරුපිළිදැග සැවැත්නුවර පිඩුසිඟා වළඳා ගඳ කිළියෙහි සැතපීවදාරා සවස්වෙලෙහි රත්ගල්ගුහාවෙන් පිටත්ව නික් මුණු කෙසර සිංහරාජයෙකු මෙන් තමන්වහන්සේගේ පාත්‍රාචීවර දරා තමන් වහන්සේම එතන පෙණිවදාරා දෙසෙනහමැද ආකාශයෙහි පලක්බැඳ වැඩහිඳ ඔවුනට භය උපදවන පිණිස නිල්කිසුණු සමවත් සමවැද තමන්වහන්සේ කෙශ ධාතුයෙන් නික්මුණාවූ නිල්රුස් පතරින් සියල්ලෝදැකුස් අන්ධකාරකොට භය උපදවා වදාළසේක.

මෙසේ අන්ධකාරයෙන් මූසවූ ඒ රජදරුවන්ට උදා ගල් තෙලෙන් අඳුරු බිඳ පහළවූ ලහිරුමඩලක්මෙන් තමන්වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් සවණක් සත බුදුරුස් විහිදුවා තමන්වහන්සේ දක්වා වදාළසේක.

එකල කිඹුල්වත් නුවර ඇත්තෝ සම්‍යක්‍ෂයන්වහන්සේ දැක අපගේ මේ විවාද කාරණය දැකදෝ ඥාති ශ්‍රෙෂ්ටවූ අපගේ ස්වාමිදරුවාණන්වහන්සෙ වැඩ වදාළසේක. අපි මුන්වහන්සේ වැඩසිටියදී අනික්කෙණෙකුන්ගේ ශරීරයෙහි ශස්ත්‍රප්‍රහාරයක්දීම අපවිසින් නොපිළිවන කොලියනුවර ඇත්තෝ අප පරද වන්වා කපන්වා දවන්වා කිසිවකුත් නොකරම්හ ආයුධ දැමූහයි කොලිය

නුවර අත්තෝත් එමලෙසම ආයුධ දමා දෙපක්‍ෂයෙහි ඇත්තෝ බුඩාලම්බක ප්‍රීතීන් ප්‍රාංජලීව සිටියාහ.

ඉක්බිති බුදුහු ආකාශයෙන් බැස ගංතෙර රම්‍යවූ ප්‍රදෙශයෙක්හි වැලි තලාවක් මත්තෙහි පණවනලද උතුම්වූ බුඩාසන මස්තකයෙහි අවරන් ගිරි තලාමුදුනෙහි බබලන්නාවූ සූය්‍යීමණ්ඩලය පරිද්දෙන් අනොපමෙය්‍යවූ බුඩ ශ්‍රීන් විරාජමානව වැඩහුන්සේක, ශාක්‍ය කොලීය රජදරුවෝ බුදුන් වැඳ පිරිවරා උන්හ.

ඉක්බිති බුදුහු දැන දැනම රජදරුවන් රැස්වූයේ කුමක් පිණිසදැයි විචාළසේක, ස්වාමීනි ගඞ්ගාවේ දියකෙළිනා පිණිස නොවෙයි සංග්‍රාමයක් අරභයා රැස්වූම්හයි දැන්වූකල්හි තොපගේ සටන් කුමක් පිණිසදැයි විචාළ සේක. ස්වාමීනි දිය දබරයකැයි කීහ, රජදරුවෙනි පැන් නම් කුමක් අගීදැයි වදාළසේක, ස්වාමීනි ජලය නම් අල්පාඝීවස්තුයෙකැයි කීහ.

ඉක්බිති බුදුහු පොළොව කුමක් අගීදැයි වදාළසේක, පොළොව අනඝී වස්තුවෙක් වේදැයි කීහ. නැවත රජදරුවෝ කුමක් අගීදැයි වදාළසේක. ස්වාමීනි රජදරුවෝ ඉතා අනඝීයෝයයි කීහ. බුදුහු වදාරණසේක් ස්වල්පාර්ඝවූ දියපිණිස මාහැගි රජදරුවන් ඔවුනොවුන් හා කලහ කොට නැසෙන්ට කාරණා කිම්දැයි තවද රජදරුවෙනි කලහයෙහි ආශ්වාදයෙක් කවර කලෙකත් නැත. තවද අසව රජදරුවනි නිස්කාරණයෙහි උපදවාගත් විවාදය පිණිස එක්තරා වෘක්‍ෂදෙවතාවෙකු හා වලහකු බැඳගත් බඩවෛරය සියලුකප මුළුල් ලෙහි පවතින්නේයයි කියා ඵන්දන ජාතක දෙශනාවකොට නැවතත් රජදරු වන්ට අනුන් කීවා කටයුතුයයි ගිවිසීම යුක්තනොවෙයි අනුන් කීවා ගිවිසීම හේතුකොටගෙණ එක් සාවකුගේබස් ගිවිස තුන්දහසක් යොදුන් පමණ හිමාලය වනයෙහි සියලු සිංහ ව්‍යාඝ්‍රාදී චතුෂ්පාද ජාතීහු මූදුබත්වන්ට පටන්ගත්තා හුය. එසේහෙයින් රජදරුවෙනි අන්‍යවචනයන් ප්‍රමාණකළයුතු නොවෙයි කියා දද්දභ ජාතකය දෙශනාකොට තවද රජදරුවෙනි දුර්වල සත්ව කෙණෙ කුන් මහත් බලඇත්තවුන්ගේ සිදුරුදක්නාහුය, කිසිකලෙක මහබලඇත්තෝ දුර්වලයන්ගේ අතුරක් දක්නාහුය, කෙසේද? යත්

එක්තරා කැටකිරිල්ලක් ත්‍රිමද්ගලිත හස්තිරාජයක් ජීවිතක්‍ෂයට පමුණුවාලූදැයි ලටුකික ජාතකය දෙශනාසළසේක, මෙසේ රජදරුවන්ගේ කලහ සන්සිඳුවන පිණිස ජාතක තුණක් දෙශනාකොට නැවත සමගිකරණ පිණිස රජදරුවෙනි සමගිවූ සත්වකෙණෙකුන්ට කිසි කෙණෙකුන් අවකාශයක් දක්කනොහොන්නාහුයයි වෘක්‍ෂධර්ම ජාතකයද නැවත සමගි සත්වයන්ගේ බිඳීම දත් වැදිපුත්‍රයෝ වටුවන් ජීවිතක්‍ෂයට පමුණුවා තමන්ගේ අභිමතය මුදුන්පත් කොළෝවේදැයි වට්ටක ජාතකයද යන ජාතක දෙක දෙශනාකොට උභය නගරවාසි රජදරුවන් සමග සතුටුකොට මෙසේ පඤ්චජාතක දෙශනාව කෙළවර ස්වසන්තාන වර්තීවූ දෙෂ මර්දනය කරණු පිණිස ලැවුගිනි නිවා බන්නා ආකාශගඞ්ගා ප්‍රවාහයක්සේ අත්තදණ්ඩසූත්‍රය දෙශනාකොට රජදරු වන් සතුටුකරවූ සේක.

එසඳ වගීශ්‍රේෂ්ඨවූ සර්වඥරාජෝත්තමයාණන්වහන්සේගේ එතැන්හි ප්‍රවර්තිතවූ ධර්මදෙශනාශ්‍රිතයෙහි ඇස් තබන මගුලට රැස්වූ රජදරුවෝ සතුටු සොම්නසින් පිණා ඉදින් සවාමිදරුවෝ මෙතනට නොවැඩිසේක්වීනම් අපි හැමදෙනාම ඔවුනොවුන් මරා ලේ ගඟක් කරම්හ. බුදුරජාණන් වහන්සේ නිසා අප දිවි ලද්දේයයි සතුටුව ඉදින් මූන්වහන්සේ ගිහිගෙයි විසූසේක් වීනම් දෙදහසක් කොදෙව් පිරිවරණ ලද සකල චක්‍රවාට ගර්භයෙහි අසදෘශාභිෂේක ප්‍රාප්තව නමන්වහන්සේ හා සමබල දහසක් පුතුන් ඇතිවනසේක, අපි හැමද පිරිවර රජදරුවෝවම්හ, එසේවූ සත්දවසකින් පහළවන්නාවූ සක්විති රාජ්‍යය හා කිඹුල්වත් පුරය වැනි ජයභූමිය හා සතළිස් දහසක් නළුවන් හා එක්ගව් දෙගව් තෙගව් සිව්ගව් පමණ මුවවිටි ඇති සංඛශ එලකය කුමුදය පුණ්ඩරීකය යන දියපොළොව දක්වා එරීසිටි සත්රුවන් නිධාන සතරක් හා සමග රාජ්‍යය හැරගොස් අප ඇමදෙනා කෙරෙහි කළ කරුණාවෙන් උතුම්වූ සර්වඥපදප්‍රාප්තවූසේක. දුනුදු රජසිරි හා සමග වසනසේක්වයි දෙනුවරවාසීවූ රජදරුවෝ එක්ව දෙසිය පණසක් දෙසිය පණසක් බැගින් පන්සියයක් රාජකුමාරවරුන්දුන්හ. බුදුහු ඒ පන්සියයක් දෙනා මහණකොටගෙණ හිමාලය හා ඒකාබද්ධවූ අඹදඹ කොළඹ කරඹ රඹ සපුනාපනා කොබොලීල පළොල් කිණිහිරි හෝපලු ඇසළඑරහැන්ද කණේරු දුහුමඩලාවැටකේ කරාකේ ඇතුළුවූ අමුලාග්‍රසංජාත මල්එල්ලෙන් සැදුම් ලද්දාවූ නොයෙක් ලිය කතුන්විසින් වැළඳි තුරුපතරින් ප්‍රතිමණ්ඩිතවූ ඒ ඒවෘක්ෂාග්‍රයෙහිඉඳ මකරන්ද පලපස අනුභවකිරීමෙන් මත්වැරාවකප්‍රතිරාවකදෙනලද ගිරා බොකල මොණර සැළලිහිණි සක්වාලිහිණිකුණාල චිත්‍රවිචිත්‍රවූ නොයෙක් ජාතියෙහි පක්ෂි සමූහයන්ගෙන් රමණීය මඬුලු යහන්හී සමහරතෙනෙක්හි සම් සුභ්‍රවාලුකාස්ථලයෙන් කිසිතෙනෙක්හි නොයෙක් ජාතියෙහි කුසුම් මූවරද පෙතිපතරින් සැදුම්ලද අතල හල්මුදුනෙහි සෙබඩ සමූහයා පිරිවරා බහවී නැවුම්ගත් මත්තමයුරයන්ගේ නාදයෙන් කන්කළුවූ තවද ඒ වනයෙහි ලතඹපලුපත් ඈ නොයෙක් ගොදුරු අනුභව කෙරෙමින් සවකීයවූ මෘගාංගනාවන් හා සමග බැහැවී ගමන්ගත් වරහ මෙහෙවර සමර රුරු එණී පාදදීවූ නොයෙක් ජාතියෙහි චතුෂ්පදයා විසින් සමරනවූ හංසචක්‍රවාකාද්‍යනෙකප්‍රකාර ද්විජගණෝප කූජිත ප්‍රසන්න සීතලා මල ජලභරිත පූර්ණවූ ඇඹුල ඉපුල කල්හාර හෙල්මැලි ආදීවූ නොයෙක් ජලකුසුමයෙන් සොභමානවූ තවද තීරානතයෙහි තුඩුන් සඳුන් කළුවැල් කපුරු දෙව්දුරු තුවරලා ආදීවූ වනසට පංක්තීන් විරාජමානවූ පුෂ්කරණිශතසහස්‍රයෙහි අනවරතයෙන් පිපීසිටිනා පඤ්චවණ්පද්මසුගන්ධයෙන් හා අහසින් අඩාබස්නා භෘංගසමූහයාගේ නාදයෙන් සොභමානවූ අතිරම්‍යවූ රළ නමැති අතින්ගෙණ බුඩපූජාවච උඩට ඉස්නාවූ මුක්තාතිලකාවන් බඳුවූ සිහිල් ජලබින්දුයෙන් දෙහයන් සොභමානවූ ඒ ඒ පර්වත ප්‍රාන්තයෙන් වැගිරෙන්නාවූ ස්ඵටික මාණික්‍ය ප්‍රභානිර්විශෙෂ සුවඳ මූවරද රොණින් වළඳනා නොයෙක් ඇලි සියගණනින් හෙබියාවූ ඇල හෝ කඳුරැලිය සිය දහස්ගණනින් හා ඇමකල්හි වසනෙනාද්‍යානයක්මෙන් සැදුම්ලද මහවනයට වැඩවදාරා ඒ පන්සියයක් දෙනා විසින් පිරිවරණලද බුදුහු දෙවෙනිදවස් පටන්ගෙණ දවසක් කිඹුල්වත් නුවරටය. දවසක් කොලිය නුවරටයයි කියා සිඟාවඩනාසේක. මෙසේ දෙනුවර ඇත්තෝ මහත් පූජාසත්කාර කරන්නාහුය. බුදුපාමොක් මහාසංඝයා දවස දවස මෙසේ වසනසඳ ඒ මහණවූ පන්සියයක් දෙනා

වහන්සේ නොසිතිත් මහණ වූහෙයිත්ද ශාසනයෙහි උකටලීවූසේක. උන් වහන්සේගේ අභිප්‍රාය දන්නා පිණිස පූර්වදූයිතිකාවූ ස්ත්‍රීහු කෙළෙස් පිළිබඳ ඒ ඒ අසුන් යවූහ. එකල ඒ දැක ඒ භික්ෂූන්වහන්සේ විදුරුලායේ ඇළුනාක් මෙන් පුරාණ දුතිකාවන් කෙරෙහි ශක්තව අතිශයෙන්ම උකටලීවූසේක. බුදුහු උන්වහන්සේලාගේ චිත්තාචාර පරීක්ෂාකරණසේක් අනභිරතොත්පාදය දැන මේ භික්ෂුහු මාබඳු සර්වඥකෙණෙකුන් හා එක්ව වසන්නාහුන් උකටලීවූහ, මුන්ගේ අනභිරතිය හරවන්ට කෙසේවූ ධර්මදේශනාවක් රම්‍යද්‍යොහෝයි පරීක්ෂා කරණසේක් කුණාල දෙශනාවන් නිසියයි දැන වදාරා ප්‍රභාතකාලයෙහි සිරුර පිළිදූගුම්කොට කයින්සිවුරු හා අතින් පාත්‍රයගෙණ කිඹුල්වත පිඩුපිණිස වැඩ ආහාරකෘත්‍යය නිමවාවදාරා පසුබත පන්සියයක්දෙනාවහන්සේ තමන්වහන්සේ සමීපයට කැඳවා මහණෙනි සිත්කළුවූ හිමාලයවනය දුටුවිරුදූයි වදාළසේක. ස්වාමීනි දුටුවිරූනැතැයි දැන්වූකල්හි හිමාලය වනචාරිකාවට එවුදූයි විචාරා වදාළසේක. ඉක්බිති භික්ෂූන්වහන්සේ ස්වාමීනි එබඳුසෘඩියක් අපට නැති හෙයින් කෙසේයමෝදූයි’ දැන්වූකල්හි ඉදින් කෙණෙක් කැඳවාගෙණ යෙත් නම් යවුදූයි විචාරා යහපත ස්වාමීනි දැන්වූකල්හි බුදුහු පන්සියයක් දෙනා වහන්සේ තමන්වහන්සේගේ සෘඩ්‍යානුභාවයෙන් හැරගෙණ පියුම්විලකට දුවන්නාවූ රාජහංස සමූහයක්මෙන් ආකාශයෙහි පැනනැගී හිමාලයවනයට ගොස් ආකාශයෙහි වැඩසිටිසේක්ම ආයාමවිස්තාරයෙන් තුන්දහසක් යොදුන් පමණ හිමාලයපර්වතයෙහි පිහිටියාවූ රන්පර්වත රිදීපර්වත මැණික්පර්වත ඉඟුල් පර්වත අජනපර්වත පාංශුපර්වත ස්ඵටිකපර්වතාදී නොයෙක් සුවාසූදහසක් රුවන් කුළුද ගඞ්ගා යමුනා අචිරවතී සරභූ යනාදීවූ පඤ්චමහා ගංගවන් හා කණ්ණ මුණ්ඩ රථකාර සිංහ ප්‍රපාත ඡද්දන්ත මන්දාකිනි කුණාලආදීවූ විල්ද තියගලා නම් අතලගල තවද පණසක් රුවන් ආකරයද යන සියලූ හිමාලය විස්තරයද නාක් එකවිටම පෙණීගියාක්මෙන් තමන්වහන්සේගේ ආනුභාවයෙන් පන් සියයක්දෙනාවහන්සේට දක්වා වදාළසේක.

මෙසේ ඒ බුදුන් විසින් පානා හිමාලයවනශ්‍රීය දුටුවාවූ පන්සියයක් දෙනා වහන්සේට පුරාතන භාර්‍යාවන් කෙරෙහි බඩාහිලාෂය තුනීව ගියේය.

ඉක්බිති සර්වඥයන්වහන්සේ ඒ භික්ෂූන්වහන්සේ හැරගෙණ ආකාශ යෙන් බැස හිමවත පශ්චිමභාගයෙහි සැටයොදුන් පමණ ගලතල මුදුනෙහි සත්යොදුන් උසඇති සල් රුක්මුල තුන්යොදුන් පමණ රන්සිරියෙල් ගලතල මත්තෙහි පන්සියයක් භික්ෂූන් පිරිවරණලදුව සවණක් ඝන බුදුරැස් විහිදුව මින් සමුද්‍රජලතලය නොබවන්නාවූ සහස්‍රරශ්මීන් විරාජමානවූ තරුණසූර්‍ය්‍ය මණ්ඩලය පරිද්දෙන් වැඩහිඳ අංගසමන්විතවූ කුරවිකානාද නිර්විශෙෂ බ්‍රහ්ම ස්වර විහිද මුඛසුගන්ධයෙන් සියලු හිමාලය එකසුගන්ධකෙරෙමින් භික්ෂූන්වහන් සේට ආමන්ත්‍රණයකොට මහණෙනි මේ හිමාලයවනයෙහි අතික් නොප නුදුටුවිරූ දෙයක් ඇත්නම් කියවයි වදාළසේක.

එසඳ විසිතුරු කෙවිල්ලෝ දෙදෙනෙක් දඬුකෝටුවක් දෙකෙළවර ඩැහැගෙණ කොවුල් රජක්හු ඊ හිඳවාගෙණ ගමන්ගත්සඳ ඉදිරියෙහිය පස් සෙහිය දැලයෙහිය යටයයි යනතැන්හි කෙවිල්ලන් අට අට දෙනා බැගින් අටසාළිසක් පමණ කෙවුලගනන් හාත්පසින් පිරිවරා ආකාශයෙහි නික්මුණා හුය. ඒ භික්ෂූන්වහන්සේ ඒ ආශ්චර්‍ය්‍යයදැක මේ කෙසේවූ පක්ෂිකෙණෙකුන්දූයි

විචාළසේක; ඉක්බිති සර්‍වඥයන්වහන්සේ මහණෙනි මෙද යටගියදවස මාගේ වංශයෙක පෙර අපවත් මෙලෙසම උපස්ථාන කළෝය, එකලට පක්ෂීහු බෙහෙව එකී එකී දිසාවෙහි පන්සියයක් පන්සියයක් බැගින් උපස්ථානකරන්නාහුය ඒ කුණාල රජවූ මා නොමිරිකෙන පිණිසයයි කෙවුලගතන් දෙදෙනෙක්හු විසින් දණ්ඩක් ඩැගෙණ එහිහිඳුවාගත්කල්හි පන්සියයක් පමණ පක්ෂිකන්‍යාවෝ ඉදිත් මූන්වහන්සේ ආසනයෙන් ගිලීහි වැටෙනසේක්වීනම් අපගේ පියායෙන් පිළිගණුම්හයි යටින් නික්මෙන්නාහුය. තවද පන්සියයක් පමණ කෙවුලගතෝ අව්ව වලකන පිණිස ආකාශය වියනක්මෙන් මුදුනෙන් එකාබඩව නික්මුණාහුය. තවද පන්සියයක් පමණ කෙවුලගතෝ අපගේ රජ්ජුරුවන් වහන්සේට සීත සුලං ග්‍රිෂ්ම රජස් පරඩලා ආදියෙන් පීඩාවෙක් නොවේවයි දලයෙහි බැඳි තිරමෙන් නික්මෙන්නාහුය; තවද පන්සියයක් කෙවුලගතෝ වනයෙහි හැසිරෙන්නාවූ ගොපලු වැදි වනකර්‍මකරාදීවූ වල්මී මියුලුන් සියල්ලන්විසින් කැට කැබිලි පොලු මුගුරු ලීදඬු ආදීන් වන්නාවූ උපද්‍රව වලකන පිණිස වෘක්ෂ පර්‍වත ලතාදීයෙහි නොගැසෙන පිණිසදූයි රුක වල්ගෙණ ඉදිරියෙහි නික්මෙන්නාහුය. තවද පන්සියයක් පමණ පක්ෂිකන්‍යාවෝ අඹ දඹ එල්කෙහෙල්ආදි නොයෙක් පලවැල නොයෙක් දිගින් ගෙණහැර ක්‍ෂුධාසන්තර්පණය කරවමින් මෙසේ තුන්දස් පන්සියයක් කෙවුලගතෝ ඒ කුණාල රජ්ජුරුවෝත් උයනින් උයනටද ගංතෙරින් ගංතෙරටද පර්‍වතයෙන් පර්‍වතයටද අඹවනයෙන් දඹවනයටද දඹවනයෙන් දෙල්වනයටද දෙල්වනයෙන් පොල්වනයටද පොල්වනයෙන් තල්වනයටද තල්වනයෙන් ඉඳිවනයටදූයි මෙසේ ඒ රම්‍යස්ථානයෙහි කුණාලරජ්ජුරුවන් සිත අසුරුවන පිණිස හැරගෙණ ඇවිදිනාහුය. ඒ කුණාල රජතෙම පක්ෂිකන්‍යාවන් විසින් පිරිවරණ ලදුව යථොක්තවූ සම්භාවනාවන් විඳිනේද හැමවේලෙහිම කෙවුලගතන්ට නීචකෙල්ලෙනි සෙර කෙල්ලෙනි ධූතීකෙල්ලෙනි අසත්පුරුෂකෙල්ලෙනි දුරාචාරකෙල්ලෙනි කෙළෙහිගුණ නොදන්නාවූ සියලුදිග අමන්නාවූ පවනක්මෙන් සිත් හුනු තැනටම යනසුළුවූ චණ්ඩාලකෙල්ලෙනි නැසීයව නැසීයවවැයි නොසතුටු බණන්නාහුයයිවදාරා මහණෙනි මම තිරිසන් නමුදු ස්ත්‍රීජාතිය කෙළෙහිගුණ නොදන්නාබවද බොහෝ වඤ්චාවන්හි නිපුණබවද අනාචාරසීලීබවද දූත උන්ගේ වසඟභාවයෙ ි නොපැවත මාගේ වසඟයෙහි පමුණුවා විසුයෙම් වේදූයි වදාරා භික්‍ෂූන්වහන්සේගේ අනභිරතිය තුනුකොට නොබැණ වැඩඋන්කල්හි–

එකල කැලිකෙවිල්ලෝ දෙදෙනෙක් යටකියනලද ක්‍රමයෙන් කෙවිලි රජහු දණ්ඩත් ඔසොවාගෙණ පළමු කියනලද ෂට්විධවූ දික්හි සතරදෙනා බැගින් පිරිවරණලදුව ඒ ස්ථානයට අවුත් වන්නාවුත් දූක ඒ පන්සියයක් දෙනාවහන්සේ පළමුපරිද්දෙන් මොහු සවුරුදූයි විචාළසේක. මහණෙනි යම් කලෙක මම කුණාලරජවීනම් එකල මාගේ මිත්‍රවූ පූර්‍ණමුඛනම් ධූසසකොකියලයි යනකෙණෙක් ඇත. මේ උන්ගේ වංසයයි වදාරා පළමු පරිද්දෙන්ම ඒ භික්‍ෂූන් ඒ උන්ගේ ප්‍රවෘත්තියද ඇසීමෙන් උත්සාහඇතිබව දූත මහණෙනි නොයෙක් ජාතියෙහි ජලජ කුසුමයෙන් විවිධවූ පද්මජාතියෙන් ත්‍රිවිධවූ උත්පල ජාතියෙන් සැදුම්ලද මේ කුණාලවිල වටාසිටි දෙල්එලකිඳි ඇසතු පියුම් තුරු නා කිණ ඇසළ බක්මී සපු දුනුකේ ආදීවූ නොයෙක් ජාතියෙහි තුරු

පතරින් සැදුම්ලද්දාවූ තවද යක්ෂ රාක්ෂස නාග සුපර්ණ ලියකිඳුරු සිඬවිද්‍යාධරාදීන් විසින්ද අතිගහනවූ මේ හිමවත් වනයෙහි අතිශයින්ම දුරවූ ශබ්ද ඇති මනොඥවූ ඇස්සගලක් ඇති සම්පූර්ණ මුඛයක් ඇති පූර්ණමුඛනම් ඵුස්ස කොකිල රජ්ජුරුකෙනෙක් වාසයකරන්නාහු මහණෙනි එකල ඵුස්සනම් කෙවිලි දූව කියනලද ක්‍රමයෙන් පණස් පණස් දෙනා බැගින් උභය යටය ඉදිරියෙහිය පස්සෙහි දලයෙහියයි යථොක්ත දසදිග රැකවල්ගෙණ නික්මෙන්නාවූ කෙවුල්ලෝ තුන්සියයෙක නොයෙක් ඵලාඵල ගෙණවිත් කවන්නාවූ කොවුල්ලෝ පණස්දෙනෙකැයි මෙසේ තුන්සිය පණසක් කෙවුල ගණනෝ පසුපස්සෙහි කෙවිලි දූ කුණාලරජ්ජුරුවන් මෙන් ආරාමයෙන් ආරාමයට උද්‍යානයෙන් උද්‍යානයට අඹවනයෙන් අඹවනයට දඹවනයෙන් තල්වනයට තල්වනයෙන් පොල්වනයට පොල්වනයෙන් දෙල්වනයට ගලින් ගලටද විලින් විලටද ගංතෙරින් හෝ තෙරටද වඩාගෙණගොස් ඔහුගේ චිත්ත ප්‍රීති වර්ධනය කෙරෙමින් දවස් යවන්නාහුය.

මෙසේ ඒ ඵුස්සකොකිල රජ්ජුරුවෝ කෙවුලගනනන්ගේ උපස්ථානවිඳම නැවත මෙබඳුවූ වස්තුසවාමීහු පොෂ්‍යකිරීම නොපබඳු කුලාඞගනාවන්ට සුදුසු යයි දවස්පතා ගුණකියමින් වාසයකරන්නාහුය' එක්දවසක් මිත්‍රවූ කුණාල රජ්ජුරුවන් දක්නාපිණිස සපිරිවරින් නික්ම එන්නාවුන් දුරදීම දැක කුණාල රජ්ජුරුවන්ගේ පක්ෂිකන්‍යාවෝ පෙරගමන්කොට අවුදින් ආදර දක්වා සවාමීනි මේ කුණාල රජ්ජුරුවෝ අතිශයින්ම පරුෂයහ. තදවූ තෙපුල්ඇති යහ රාත්‍රින් දිවාභාගයෙහිත් මෙලෙස නොයෙක් පරිද්දෙන් අපි උපස්ථාන කරන්නාවුත් අපි කිසිදවසෙකත් ප්‍රියවචනයකින් අස්වැසිලි නොලදුම්හයි කීවාහුය.

එපවත්අසා පූර්ණමුඛ රජ්ජුරුවෝ වන්නාට ඇසුබැවින් හැක්කේවෙයි. දූත් කෙවුලගනන් අස්වසා කුණාලරජ්ජුරුවන් කරා ගොස් පිළිසඳර කථා කොට ඉක්බිති කියන්නාහු.

සබඳ කුණාලරජ්ජුරුවෙනි උභතෝසුජාතවූ හෙවත් මනාවූ ජාතඇති සවාමිපුරුෂයන් කෙරෙහි මනාවූ පිළිපැදීම්ඇති උත්තමාඞගනාවන්ට එක්වන් බැණදෙඩීම් සුදුසුනොවෙයි මිථ්‍යාප්‍රතිපන්නවූ අනාචාරස්ත්‍රීන්ට ආචාරනබා කියයුතුමයයි සිතම්හයි කීහ.

මෙසේ කීකල්හි කුණාලරජ්ජුරුවෝ ඵුස්සකොකිල රජ්ජුරුවන්ට නොසතුටුව අනාචාරිවූ චණ්ඩාලය නැසීයව නැසීයව කොල සබඳ කවර නම් නුව ණැත්තෙක් ස්ත්‍රියකට යටත්ව පැවතුම් ඇත්තෙහිදැයි නොසතුටුව දෙඩනලද් දාවූ බස්අසන්නාවූ ඈතිකල කිසිවක් කියනොහී නැවැත්තාහ.

ඉක්බිති නොබෝදවසකින් ඵුස්සකොකිල රජ්ජුරුවන්ට ලේ අතීසාර යෙක් ඇතිවිය බලවත්වූ ශරීරවේදනාව උපයන මෙසේ අටවන නවවන අවස්ථාවට පැමිණිකල්හි ඒ රජු පිරිවර පක්ෂිකන්‍යාවෝ මෙතෙම අතිශයෙන් රෝගී විය. මොහුගේ ජීවිතය රැකෙන්නාසේ නොවෙයි ඉතිඹ මොහුගෙන් අපට කිම්දැයි ඔහු අත්හැර එකකුත් නොරඳා කුණාල රජ්ජුරුවන් කරා ගියාහ.

සමූහ වශයෙන් තමන්කරා එකපැහිර එන්නාවූ කෙවුලගතන් දැක දුරදීම චණ්ඩාල කෙල්ලනි තොපගේ සවාමිපුරුෂයෝ කොයිදැයි විචාළහ

එසඳ කොවුලගතෝ සවාමීනි අපගේ චූසසකොකිල රජ්ජුරුවන්ට ලේ ග්‍රහණියක් ඇතිව ජීවත්විය නොහෙන හෙයින් නුඹවහන්සේ අප රැක වදාරණසේක්දෝහෝයි සිතා නුඹවහන්සේ සමීපයට ආම්හයි කීහ.

එපවත් අසා කුණාල රජ්ජුරුවෝ ගිත්තටදැමූ ලුණු මෙන් කිපී සෙරවූ ධූර්තවූ අසත්පුරුෂවූ නුවණැති ලඝුවූ සිත්ඇති කෙළෙහිගුණ නොදන්නා සුළඟක්මෙන් වහා කරකැවෙන සුළුවූ චණ්ඩාලකෙල්ලෙනි නැසීයව නැසීවයයි බෙණෙමින් දෙඩමින් වහා නැගීසිට චූසසකොකිලයන් වසනතෙනට ගොස් සමීපයෙහි එළඹ සබඳ පූර්ණමුඛරජ්ජුරුවෙනි බණවා ගිලන් බැවින් මහත් ආයාසයෙන් මූහුණබැලූකල මමය කුණාලරජ්ජුරුවෝයයි වදාරා ඉක්බිති ලෙඩ තැනැත්තන් තුඩින් හා දෙපියාපයෙන් හා ඔලොඹා තමන්වහන්සේගේ ශරීරයෙහි වතුරුවාගෙණ හිඳ ව්‍යාධියට අනුරූපවූ නොයෙක් බෙහෙත් ගෙන්වා ගෙණ කවා පොවා ලෙඩින් ගොඩනගා සුවපත්කොට වදාළසේක.

ඉක්බිති පළමු අත්හැරගියාවූ උන්ගේ පක්ෂිකන්‍යාවෝ උන් නිරෝගි බව දැන පළමුසේම ඇවිත් උන් පිරිවරාගත්හ. කුණාලරජ්ජුරුවෝද කීප දවසක් මියුරු එලාඵල ගෙණකවා ශරීරයෙහි බලහිඳීගත්කල්හි සබඳ තෝ නිදුක්වූයෙහි සබඳ තාගේ පිරිවර ස්ත්‍රීන් හා සමග සුවසේ වසව මමද මාගේ වාසස්ථානයට යෙමි වදාළ සේක.

එසඳ පූර්ණමුඛ රජ්ජුරුවෝ සබඳ මේ මාගේ කොකිලාඞ්ගනාවෝ මා අතිශයින් ගිලන්වුව හැරපියා මූණ නොබලා පැලන එබඳුවූ ධූර්ත කෙල්ලන් ගෙන් මට ප්‍රයෝජන නැතැයි කීහ.

ඒ අසා බෝධිසත්ත්වයෝ තොපගේ සිතට නැගිපසු මමද මාදත් විවරක් ස්ත්‍රීන්ගේ නුගුණ කියාබලමි. එසේකල අසාබලවයි චූසසකොකිලයන් කැඳවා ගෙණ මහණෙනි මම හිමවත් පසක් යොදුන් පර්වත මුදුනෙහි එම යොදුන් පමණ සල්රුකක්යට තුන්යොදුන් රත්සිරියල්ගලතලමුදුනෙහි ගොසින් උන්හ

එක්පාශ්වයක චූසසකොකිල රජ සහපිරිවරින් බැසලන ඒසා මහත් සියළු හිමාලය වනයෙහි පර්වතස්ථදෙවියෝ අදදවස් කුණාලරජ්ජුරුවෝ මනෝ සීලාතලමස්තකයෙහි හිඳ සර්වඥවිලාසයෙන් ධර්මදෙශනා කෙරෙත්ල; ඒ ධර්ම දෙශනාව අසනු පිණිස රැස්වවයි ඔවුනොවුන්ට මහත්ඝොෂා පැවැත්වූහ,

ඒ ශ්‍රැත පරම්පරාවෙන් චාතුර්මහාරාජිකාදීවූ සදෙව්ලොව දෙවියෝද බොහෝසේ එතනට රැස්වූහ. බොහෝ නාග සුපර්ණාදීහුද හිමාලයවනයට ආසන්නව වනයෙහි වසන්නාවූ බූමාටුදෙවියෝද මහත්වූ උද්ඝොෂණය කළාහුය. අනදනම් ගිජුලිහිණිරජෙක් දසදහසක් පමණ ගිජුලිහිණියන් පිරිවරා ගෙණ ගිජුකුළු පව්වේ වසන්නේ මේ ධර්මදෙශනාකාලය අසා මම ඔහුගේ විසිතුරු ධර්මදෙශනාව අසමි. සහපිරිවරින් අවුත් එකත්පසෙක උන.

තවද දසදහසක් තපස්වීන් හා සමග අභිඥලාභිව ඒ හිමාලයවනයෙහි වසන්නාවූ නාරද නම් තපස්වී කෙණෙක් දෙවියන්ගේ උද්ඝෝෂණය අසා

මාගේ මිත්‍රවූ කුණාලරජ්ජුරුවෝ ස්ත්‍රීන්ගේ නුගුණ සංඛ්‍යාතවූ ධර්මදෙශනා වක් කෙරෙත්ල. මා විසිනුත් ඒ ධර්මදෙශනාව ඇසියයුතුයයි දසදහසක් තපස් වීන් හා සමග අවුදින් එකත්පසෙක උන්හ. සර්වඥයකෙණෙකුගේ දෙශනාවෙහි සන්නිපාතයක් මෙන් එදවස් මහා සමාගමවිය.

ඉක්බිත්තෙන් කුණාලනම් බොධිසත්ත්වයෝ ජාතිස්මරණඥානයෙන් ස්ත්‍රීන් දෙෂප්‍රතිසංයුක්තව ගියදවස බොහෝසේ තමන්ට දුටුවාවූ කාරණයෙන් පූර්ණමුඛ රජ්ජුරුවන්ට සාක්ෂිකොට කියන්ට පටන්ගත්තාහුය. සබඳ පූර්ණමුඛ යෙනි ගියදවස දඹදිව පියන් දෙදෙනෙකුඇති සවාමිපුරුෂයන් පස්දෙනෙකු ඇති ක්‍රිෂ්ණාතම් රාජකුමාරිකාවක් ඇති ඇගේ සවාමිපුරුෂයෝ පස්දෙනෙක් ඇත්තාහුය. ඒ කෙසේ ද? යත්;

යටගියදවස කසීරට බ්‍රහ්මදතත නම් රජ්ජුරුකෙණෙක් මහත්වූ සේනාවාහන ගෙණ කොසොල්රජ්ජුරුවන් මරා රාජ්‍යයගෙණ ඒ රජ්ජුරු වන්ගේ අගමෙහෙසුන් බිසවුන් තමන්ට අග්‍රමහෙසිකා කළහ. බිසවූ මෑත භාගයෙදි තමන්ට දියනිකෙණෙකුන් වැදූහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේද පළමු දූදරු කෙණෙක් නැතිහෙයින් දරුවන් දුක සමාධිව සොඳුර වරයක් දෙමි හැරගණුවයි අභිමත වරයකින් නිමන්ත්‍රණය කළහ.

බිසවුවරය හැරගත්තාකොටතබා ඒ කුමාරිකාවන් ක්‍රිෂ්ණා නම් තබා ඈ වැඩිවිය පැමිණිකල්හි එක්දවසක් බිසවු දියනියන් කැඳවා පුත තොපබාල කළ තොපගේ පියානන්වහන්සේ තොප උදෙසා කැමති වරයක් හැරගණුවයි වදාළසේක් තොප අභිප්‍රාය වරයක් දූන් ඇරගණුවයි කීහ.

ඉක්බිති ඒ ක්‍රිෂ්ණා නම් රාජකුමාරිකාතොම මට අවිද්‍යමානවූ කිසි වස්තු වෙක් නැත. කෙසේවූ වරයක් හැරගණිම්දෝහෝයි කල්පනාකොට තමා කෙලෙස්වසග බැවින් හිරි ඔතප් බිඳ සමත කෙණෙකුන් උවමැනවැයි මෑනි යන්ට කිව බිසව්ද රජ්ජුරුවන්ට එපවත් දැන්වූහ. රජ්ජුරුවෝද අභිප්‍රාය පුරුෂයෙක්හුම ඕ ලැබවයි නුවර බෙරපියවිකරවා පුරුෂයන් රැස්කරවූහ. ක්‍රිෂ්ණා නම් කුමාරිකාද මල් සුඹුගක් අතින්ගෙණ උතුරු සිවුමැදුරුකවුළුවෙහි සිට සර්වාලඞ්කාරයෙන් ප්‍රතිමණ්ඩිතව රාජාංගනයෙහි රැස්වූ හැම පුරුෂයන් බලා තමා රුස්නා එකෙකුත් නැතිහෙයින් බලාගෙණ සිටියාය. එදවසම පාණ්ඩව රාජගොත්‍රයෙහි අර්ජුන යන කුලය භීමසේනය. යුධිෂ්ඨිරය සහදෙවය යන රාජකුමාරයෝ පස්දෙන තක්සලානුවර දිසාපාමොක් ආචාරීන් සමීප යෙහි සකල ශාස්ත්‍ර ඉගෙණ නිමවා දේශාචාර පරීක්ෂා කරම්හයි දඹදිව ඇවිදි නාහු ක්‍රමයෙන් බරණැස් නුවරට පැමිණ ඇතුළු නුවර කොලාහලය අසා කිමෙක්දැයි විචාරා එපත් දැන අපිදු එතනට ගොස් බලම්හයි සවර්ණප්‍රතිමා බඳු උතුම්වූ රූඇති කුමාවරනු පස්දෙනම පිළිවෙළින් ගොස් සිටගත්හ. ඒ ක්‍රිෂ්ණාතොම පස්දෙනා කෙරෙහිම පිළිබඳසිත් ඇතිව මෑණියන් වහන්ස මේ පස්දෙනා අතරෙහිම අභිප්‍රාය ඇත්තෙමි කියා ඒ පස්දෙනාට මල්දම් එලුව. බිසවුද එපවත් රජ්ජුරුවන්ට කීවාහුය. රජ්ජුරුවෝ එපවත් අසා නොසතුටු වන් පළමුව වරදුන් හෙයින් වැලකියනොහී වන්නාට මොහු කවරකුන් පුත් දූයි විචාරා පාඩව රාජකුමරුවන් බව අසා සතුටුව මහත්වූ සත්කාර සම්මාන

කොට ඒ කුමාරිකාව රාජකුමාරවරුවන් පස්දෙනාට පාදපරිචාරි කාකොට පාවාදුන්හ

ඒ කුමාරිකාද යත්මහල්ප්‍රාසාදයෙහි පස්දෙනා හා සමග ක්ලෙශාභිරති යෙන් දවස් යවන්නීය, එකල එම ප්‍රාසාදයෙහි දෙරකඩ රුකවල්ගෙණ සිටියාවූ විසුළු මුහුණු ඇති බුත්කඳව ඇති බැවින් බඹරූපමෙන් ලෙහි තිබෙන්නාවූ මුහුණු ඇති පිලකු කෙරෙහි ප්‍රේමකොට ඒ රාජකුමාරවරුන් පස්දෙනා පිටත නික්මුණු වේලෙහි අවකාශලදින් ක්ලෙස වසගව උන් හා සමග දුරාචාරයෙහි යෙදී සමග ප්‍රියකරන්නී ස්වාමීනි නුඹවහන්සේ හා සමාන ප්‍රියකෙණෙක් නැත. මේ රාජකුමාරවරුන් පස්දෙනා මරාපියා උන්ගේ ගලලොහිතයෙන් නුඹවහන්සේගේ ශ්‍රීපාදය ධොවනා කැමැත්තෙමියි යනාදීන් කියන්නීය, අවශෙෂයන් අතුරෙනුත් වැඩුමාලු රාජකුමාරයන් එක්වූ කල්හි ස්වාමීනි මුත් සතරදෙනා විවරට නුඹවන්සේ මට ප්‍රියකරුසේක. මාගේ ජීවිතයත් නුඹවහන්සේ නිසා පරිත්‍යාග කරන්නා කැමැත්තෙමියි මාගේ පියරජ්ජුරුවන් වහන්සේගේ ඇවෑමෙන් රාජ්‍යය නුඹවහන්සේට මම දෙමියි යනාදීන් කථාකොට අවශෙෂවූ සතරදෙනා හා කැටුවත් එක්වූ කල් හිත් මෙලෙසම කියන්නීය. ඔහු වෙත වෙතම සිතනකල මෝ අප කෙරේම ස්නෙහ ඇත්තීය. මත්තෙහි අපට වන්නාවූ රාජ්‍යාභිවෘඩියත් මෑ නිසාම පැමිණෙන්නේයයි ඇය කෙරෙහි අතිශයෙන්ම වෙත වෙතම සෙනෙහස වඞනය කෙරෙති. මෙසේ දවස් යවන කල්හි ඇට ලෙඩෙක් ඇතිවිය ඉක්බිති රාජ කුමාරවරුන් පස්දෙන කෙරෙන් වැඩිමාලු අර්ජුන කුමාරයෝ ඉස ඔර තබාගෙණ උන්හ. තෙසු සතර බෑයෝ දෑත දෙපය මඩිමින් උන්හ. කුඳුදපාමුල සිටියේය.

එකල ඉස අල්වාගෙණ උන්නාවූ අර්ජුනකුමාරයන්ට ස්වාමීනි නුඹ වහන්සේ තරම් මට ප්‍රියකෙණෙක් නැත නුඹවහන්සේ මලුතෙනමියමි. ඉදින් සුවසේ උන්නෙම්වීනම් පියරජ්ජුරුවන් වහන්සේගේ අයාමෙන් රාජ්ජය නුඹවහන්සේට ගෙණදෙමියි ඉසින්සන් කරන්නී වැඩිමාලු රාජාකුමාරයන් සිත්ගත, අවශෙෂවූ සතර බෑයන්ටත් මෙම වචනයෙන් උන් උන් අල්වාගෙණ උන් හස්තපාදදීන් එලෙසම සංඥකොට පාමුල සිට කුදුට තොප මට ඉතා ප්‍රිය යේය. ඉදින් මෙලෙසින් මාගේ ජීවිතය තිබෙන්නේවීනම් තා කෙරෙහි ස්නෙහ නැයි දිවින් සංඥකලාය. මෙකී සදෙනම පෙර තමන් තමන්හාම වෙතවෙතම කථාකොට තුබූනෙයින් තම තමන්ට කල සංඥ මතුදන්හ. වැඩිමාලු අර්ජුන කුමාරයෝ වනාහි ඇගේ හස්තපාද ජිව්හා විකාරයන් දැක යම්සේ මට සංඥකලානම් මෙකුදු ඇතුළුවූ තෙස්සන්ටත් මෑ කෙළේ මේ සලකුණුමයයි දැන කුදු හා සමගත් මැගේ සම්බන්ධය ඇති නිසාවනැයි දැන මල්බෑයන් කැඳවා ගෙණ පිටතට නික්ම විචාරණසේක් පබපතිකාව විසින් මට ඉසින් කරණ සල කුණු දුටුදැයි විචාලසේක. ස්වාමීනි අප සතරදෙනම දුටුම්හයි කීහ. වන්නාට ඒ කාරණය දනුදැයි විචාරා නොදනුම්හයි කීකල තමන්වහන්සේට කල සංඥ යට කී පරිද්දෙන්ම ඒ සතරබෑයන්ට කියා තොප ඇමට හස්තපාදදීන් කල සංඥය දනුදැයි කියා ස්වාමීනි අපට එම කාරණමයයි වෙත වෙතම කීකල කුදුටකල ජිව්හා සංඥව දුටුදැයි විචාලසේක.

එසිදු අපි නොදනුම්හයි කීකල අප හැමටම සළ සංඥවෙක් ඇත්තම් ඕහටත් කෙළේ එම ලෙසමයයි වදුරා උන්හැම නොඅදහාගන්නා හෙයින් පිලා ගෙන්වාගෙණ විචාළසඳ එයින් තත්වූ පරිද්දෙන්ම කීයේය. මෙසේ ඒ රාජකුමාරවරහු පස්දෙනම ඇගේ අනාචාර ප්‍රවෘත්තිය ප්‍රත්‍යක්‍ෂකොට දැක අපබඳු ජාතිසම්පන්න උතුම් රූ ධරන්නාවූ පස්බෑකෙණෙකුන් කෙරෙහිද මෙබඳුවූ ඇදකුදුවූ විසුලුකුන වැකුණු සිරුරු ඇතිපිලූද හා සමග නිලීජ්ජීව අනාචාරයෙහි යෙදී වසන්නාවූ මිනීකුණෙහි ඉවලත් කැණහිල් බැල්ලකසේ අනාචාරසේවූ ස්ත්‍රීන් කෙරෙහි නුවණැති කවරෙක් ස්නෙහතබා වසන්නේයයි යනාදීන් ස්ත්‍රීන්ට නින්දාකොට තව අපට ගිහිගෙයි වාසය එතෙක් සෑහෙන්නේයයි පස්දෙනම පිටත්වූවාසේම ආපසු නොලබා හිමාලවනයට වැද ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව කිසුණු පිරියම් භාවනාකොට ආයුසංස්කාරයාගේ කෙළවර කර්‍මානුරූපවූ පරද්දෙන් සංසාර යාත්‍රාකළාහුයයි වදුරා එම්බා මහණෙනි ඒ අර්ජුන කුමාරයෝ නම් මෙදවස කුණාල රජව තමන් දුටු කාරණය ඵුස්සකොකිලයන්ට කියා නැවතත් අතීත භවයෙහි තමන්ම දුටු කාරණයක් කියන්නාවූ කුණාල රජ්ජුරුවෝ මහණෙනි යටගියදවස බරණැස්නුවර පණ්ඩිතපාලිනීයයි කියන එලකඩ පෙරව ශීලය රකින්නියකු සොහොනෙක්හි පන්සලක් කරවාගෙණ සතර දවසින් දවස බත් අනුභව කරන්නී බරණැස්නුවර නිසා ඒ සුසානපණී ශාලාවෙහි උග්‍රවූ තපස් කරන්නී බරණැස චන්ද්‍රසූර්‍ය්‍යයන් මෙන් ප්‍රසිඬවිය එනුවර යම්කිසි සත්‍ව කෙණෙක් කිඹිසපියා ජේවයි පැකිලපියා ජේවයි යම්කිසි වකිනයක් උපන් කල්හි නමො පණ්ඩිතපාලිනියයි කියති. මෙසේ ඇ සියළු රාජ්‍යවාසින් විසින් පූජ්‍යව වසන කල්හි එක්සමයෙක්හි සැණකෙළියක් කෙළින්ට පටන්ගත් කල්හි පලමුදවස්ම තරහල් දරුවෝ එක්ව එක්තෙනෙක්හි මණ්ඩපයක් කරවා රාමසවුලු කැටිකොට සඳුන් සුවඳ ආදීවූ දෙයින් විභවානුරූපවූ පරිද්දෙන් ඒ මණ්පයෙහිද සුරා බොන්නට පටන්ගත්කල්හි එක්තරා තරහල් දරුවක්හු අතින්ගත් රාඔඩමලීපිය වැටීගිය කල්හි නමොපණ්ඩිත පාලිනියයි කීහ. එප වත් අසා එම රාජමණ්ඩලයෙහි රා බොන්නවුන් අතුරෙන් එක් පණ්ඩිත පුරුෂයෙක් අඥනවූ කාලකන්නිය මලසිත් ඇති ස්ත්‍රීන්ට නමස්කාර කිරීම අඥනයන්ට සුදුසු කටයුත්තෙකැ කීහ.

මෙසේ කීකල්හි සබඳ එසේ නොකියව උතුම් ගුණඇති උන්වහන්සේට වරදවා කියා නරකයෙහි නූපදීවයි කියා ඉක්බිත්තෙන් පණ්ඩිත පුරුෂතෙම නුවණැත්තව තෝ බැන නොනැගෙවයි කීව.

නැවත වට්ටඞිකොට දහසක් දන තබයිතම් තා කියන ඒ පණ්ඩිත පාලිනියම යටසත්වන දවස් ඇගේ තවුස්වෙස් හරවා සර්වාලංකාරයෙන් සැරහී මෙම කමඩලුයෙහිදී රාඔඩමක් අතින්ගෙණ නටව නටවා රාබොනපරිද්දෙන් කෙරෙමියි කියා එඹල පැවැත්තව ස්ත්‍රී ජාතීහුනම් සම්රශීලි නොවන් නාහුයයි කීය.

එපවත් අසා ඒ පුරුෂතෙම එකාන්තයෙන් උන්ගේතපස් කාවිසිනුත් උගුලූවාපිය නොහැක්කැයි කියා ඉදින් එලෙස කරවාපීතම් දහසක් දෙමියි

ගිවිස්සේය. මෙසේ ඔවුනොවුන් හා සමග ගිවිස අනිකුත් තරාලුන් කිපදෙ නෙකු සාක්ෂිකොට පසුව දවස් තපස්වී වේසක්ගෙණ සොහොන් ලඟ ඇගේ පන්සලට නුදුරුතැන්හි සුශ්‍රිනමස්කාර කෙරෙමින් සිටියාහුය. ඕතොමෝ සිඟායන්නී ඔවුන්දුක මුන්වහන්සේ මහානුභාව ඇති තපස්වීකෙණෙකුන් වහන්සේ වනැයි සමීපයට එළඹ මමද ස්වාමීනි මේ ස්මශාන මධ්‍යයෙහි උග්‍රවූ තපස් නිශ්‍රිතව වසන්නා එකෙකිම් නුඹවහන්සේ ශාන්තගුණයෙහි පැහැද ආදරයෙන් වදිම් වැඳගෙණ ඔත්තීය. ඒ දුක හොරතවුස්තෙම ඈ හා කථා කරන්නක් ඈ දිසාව බලන්නාවක්වත් නමා ඉතා අපිස්බව අඟවනු පිණිස දෙවෙනි දවසුත් එලෙසම කෙළේය. තුන්වෙනිදවස් බහුමානයෙන් ඇවිත් වැඳලා සිටිකල්හි කියන්නේ කථා බොහෝනොකොට කරබාගෙණ නැගීයා යිකීය. සතරවෙනිදවස් වැඳලා සිටි තැනැත්තීට කිමෙක්ද භික්ෂාවෙන් යපෙ දූයියන බස් විචරකින් පිළිසඳර කථාකොට ඕතොමෝ තපස්වීහු කෙරෙන් සාමීචි ලදිමියි සතුටු සතුටුව ගියාය. පස්වෙනිදවස් ඇගේ සිත පැහැරගැන් මෙහි අභිප්‍රාය ඇතිව ඔහු විසින් බොහෝකොට පිළිසඳරකථා ලදින් එතැන් හිඳලා පලාගියාය. සවෙනිදවස් අවුත් වැඳලාඋන් තැනැත්තිය හා කථාකරන් නේ තඟණ්ඩ අද බරණැනුවර මහත්වූ ගීතවාදිත ශබ්දයක් උපන්නේය. ඒ කුමක්දූයි විචාළ ස්වාමීනි නුඹවහන්සේ දූත වදූරත්නේ නැත්තේවේද නුවර සැණකෙළියට පටන්ගත් හෙයින් කෙළනාවූ මනුෂ්‍යයන්ගේ කොළාහලයයි කිවුය ඉක්බිති ඒ අපෙක්ෂානැති කෙණෙකුන්ගෙන් පරිද්දෙන් ඉන් අපට කම්කිම් දූයි තඟණ්ඩ කීදවසකින් බත් අනුභවකළාදූයි විචාළේය. ස්වාමීනි සතරවෙනි දවසින් දවස බත් අනුභවකරන්නෙමියි කිව තොමෝද නුඹවහන්සේද කීදව සින් දවස අනුභවකරණසේක්දූයි විචාළාය. ඉක්බිති තරහල් තවුස්තෙම නිරන්තරව අනුභවකොට නොකැවාසේ දහවල් දවස තපස්සිටිහෙයින් තඟඩ සත්දවසින් දවස බත් අනුභවකරන්නෙම් සාවුරුද්දක් උග්‍රතපස් කෙළෙම්. ඉන්මා උපදවාගත් ගුණ විශෙෂයෙක් නැත. තඟ තෙපිද දෙළොස්අවුරුද්දක් ඝොරතපස් රැක කව ර ගුණ විශෙෂයක් උපදවාගතුදූයි විචාරා ඈ විසින් ස්වාමීනි මා විසින් උපදවාගත්තහුදූ අධිගම විශෙෂයෙක් නැතැයි කීකල තඟඩ පචකාම සම්පත් නැතිකල නෛෂ්ක්‍රම්‍ය සැපයක් නැතිකල පලකිම්ද තරක සන්තාපය ඇත්තේ අපටම්ද බොහෝදෙනා අනුභව කරන්නාවූ අතිශ යින් මධුරවූ පචකාමසැපය අනුභව කරම්හ මාගේ කුශලක්‍රියාගතවූ බොහෝ දෙනා ඇත. එබැවින් මම ගිහිසම්පත් අනුභවකෙරෙමි දුක්විඳගත නොහෙම් කීහ. එපවත් අසා චපලවූ සිත් ඇතිහෙයින් තමන්ගේ බොහෝදවසක් පූජ්‍යව සියළු සත්වයන් කෙරේ ආශ්චර්යවත්ව පැවැත්තාවූ ගුණධර්මයෙහි පවත්නා උත්තමත්වය පරීක්ෂාකොටගතතොගී උන්කෙරෙහි පිළිබඳ සිත් ඇතිව ආශ්චර්ය මමත් තපසෙහි ඉතා උකටලීවිමි. ඉදින් නුඹවහන්සේ නොහරණසේක්වී නම් මම නුඹට අඹුවෙමි කීව. එපවත් අසා තී නොහරිම්යි ප්‍රතිඥකොටමළෙක බැඳුනු මුවදෙනෙක්මෙන් වචන නමැති ඝොර මළෙහි බැඳුනු ඈ නුවරට ගෙණ වුත් දුරාචාරයෙහි යෙදී සුරාපාණමණ්ඩලයට ගොස් රාඹඩමක් ගෙන්වාගෙණ ගොස් එකට ඉඳ සුරා පූවාහුය.

අවනික්ෂිහු නෙනැත්තේ තමගිවිසි දහසක් වස්තුදින මෙසේ ඒ පණ්ඩිත පාලිනිය පසුව අපඩපාලිනීව ඔහු පිණිස ගභීයක් ලදින් දූ දරුවන් හා සමග

වැඩී පඤ්චකාමරසය අනුභවකළායයි එදවස් කුණාල රජ්ජුරුවෝ සුරාධූර්තවූ තරහල් දරුව ඉපද ඈ සපිරයිලිනොවත බව ලොවට ප්‍රකාශකෙළෙම් මමයයි තමන්ම දුටු කාරණය පුස්ස කොකිල රජ්ජුරුවන් ප්‍රධානකොට ඇති සියළු දෙව් මිනිසුන්ට ප්‍රකාශකෙළේයයි වදාරා-

තවද මහණෙනි යටගියදවස කසීරට බ්‍රහ්මදත්තනම් රජ්ජුරුකෙනෙක් කොසොල්රජ්ජුරුවන් මරා රාජ්‍යයගෙණ උන්ගේ දූරිඇති අගමෙහෙසුන් බිස වූත් බරණැස්නුවරට ගෙණවූත් උන්ගර්භණීබව දූනදූනම අගමෙහෙසුන්කළා හුය ඔහුද මූකළගබ ඇති රත්රුවක් හා සමාන පුතනුකෙනෙකුන්වදා සිතන් නාහු මේ බරණැස්රජනෙම මූන් වැඩිවයසට පැමිණියත් මාගේ පසමිතුරාගේ දරුවෝයයි මරාපියන්නාහුය අනුන්අත නැසෙන්නාහුය අනුන්අත නැසෙන් නාබලාත් මාගේ දරුවන් නිරායාසයෙන් නැසීයාම යහපතැයි සිතා කිරිමව කැඳවා අම්ම මේ දරුවන් රෙදිකඩක් අතුරලා අමූසොහොනෙහි වැදහොවා පියා එවයි කීව ඕද මෙලෙසමකොට ඉස්සෝඩා තභාපියා රජගෙට පලාඅව කොසල රජ්ජුරුවෝද මියගිය තමන් පුතනුවන්ට ආරක්‍ෂා දෙවතාව ඉපද එද වස් සෝතට වැද එදවස් පටන්ගෙණ රැකවල්ලාගත්හ. ඒ ආරක්‍ෂා දේවතා වානන්ගේ ආනුභාවයෙන් එළුගොපල්ලක්හුගේ එතැන්හි ගොදුරු කන්නාවූ එළුවන් අතුරෙන් එක් එළුදෙනෙක්තොම කුමාරයන් සතර කකුල් අස්සෙහි තබාගෙණ පුත්‍ර ස්නෙහ උපදවා දනබිම ඇනගෙණ කිරිපොවා මෙසේ දවස කට තුන් සතරවිටක් කිරිපොවා දුර නොගොස් වට ඇවිද දූවටි ගොදුරු කන්නීය. ඒ එළුගොපල්ලාද ඒ එළුදෙන කරන්නාවූ ක්‍රියාව දූක සමීපයට ගොස් පරීක්‍ෂාකරණුයේ වැදහොත් දරුවන් දූක පුත්‍රස්නෙහ උපදවාගෙන ගෙට ගෙණවූත් අඹුව අතට වැඩිය ඕද වඳහෙයින් තනයෙහි කිරි නැත්තේය එහෙයින් එළුදෙන්ම කිරපොවන්නීය. ඒ කුමාරයන් ගෙට ගෙණාවක් පටන් ගෙණ එළුදෙන්නු දෙතුන්දෙන්නෙකු දවසකට මියන්නාහුය. එපවත් දූන ගොපළුතෙම මේ දරුවන් ගෙට ගෙණවූත් වඩන්නටවත් නැත්පටින් මාගේ එළුදෙන්නු හැම මියන්ට වන්නාහුය. මූන්ගෙන් මට ප්‍රයෝජන කිම්දූයි සැළි යක් ඇතුළෙහිලා මලාවකින් වසා කඩබැඳ උඩුපිටියෙන්පැන් නොවදිනාසේද පිධානය නොහරණසේද තරකොට අල්වා ගඟ දියට හැරපිය.

මෙසේ දියෙන් යන කල්හි එම රජ්ජුරුවන්ගේ රජගෙයි කටුකොල් කම්මාන්ත කරන්නාවූ චණ්ඩාලයෙක් අඹුව හා සමග යටිගඟතොට වැව මූණ සෝධන්ට බටුවාහු සැළදූක වේගයෙන් දුවගොස් හැරගෙණඅවූත් ගොඩතබා පියන්පත ගලවා බලා ඒ කුමාරයන් දුටුයේය. අඹුද දූක පුත්‍රස්නෙහ උපදවාගෙන ගෙට ගෙණවූත් වඩාසත් අට ඇවිරිදි වයස්වූ තැන් පටන් ඒ වැඩූ දෙමව්පියන් හා කැටිව රජගෙට ගොස් පුරුදුව සොළොස් ඇවිරිදි වයසට පැමිණීකළ බොහෝසේ තනිවම ගොස් රජගෙයි කටුකොල් ආදීවූ දෙය කම්මාන්ත කරන්නේය, ඒ රජහුගේ අතික් අග මෙහෙසුන් බිසවුන්ගේ කුරගවීනම් දුවක් ඇත්තීය, ඕද උතුම්වූ රූ ධරන්නිය. කුමරාද සැඩොල්ගෙයි වැඩිවියද උතුම් රජකුලෙහි උපන් නෙයින් විශිෂ්ටවූ භාවභාව හා සශ්‍රීකවූ වචනයන් ඇත්තේ ඒ කුරගවීතොම ඒ කුමාරයන් දුටුතැන් පටන්ගෙණ පිළිබඳසිත් ඇතිව අතික්කෙනෙකුන් කෙරේ

මද ඇල්මක් මදව ඔහු කර්මාන්ත කරණතෙන අවුදින් සිටින්නීය මෙසේ ඔහු දෙදෙනම ඔවුනොවුන් එක්වන් දැකීමෙන් බඩාභිලාෂ ඇතිව ඇතුළු රාජභව නයෙහි මුවාතැන්හි ඉඳ දුරාචාරයෙහි පවත්නාහුමය. මෙසේ කල්යාමසක් පලාගියකල්හි පරිවාර ස්ත්‍රීහු රජ්ජුරුවන්ට දැන්වූ කල්හි රජ්ජුරුවෝ කිපී අමාත්‍යයන් රැස්කරවා මේ චණ්ඩාලපුත්‍රයා විසින් මෙබඳු නොකටයුත්තක් කරණලද මෝහට කෙසේවූ වධයක් කළයුතුදැයි විචාළහ. අමාත්‍යයන්ද මහ රජ මේ උග්‍රවූ අපරාධයෙක එසේහෙයින් මෝහට නොයෙක් නොකළමනා වධකොට පසුව මරාපුවහොත් යහපතැයි කීහ.

එක්ෂණයෙහි කුමාරයන්ගේ පියවූ ආරක්ෂා දෙවතාවාතෝ එකුමාරයන් මව්වූ තමන්ගේ පූර්වජාතියෙහි අඹුවූ බිසවුන් ඇඟ ආවේශවගෙණ රජ්ජුරුවන් කරා ගොස් මහරජ මේ දරුවෝ වැලින් චණ්ඩාලපුත්‍ර නොවෙති කොසල්රජ්ජු රුවන්ට දූව බඩින්ගෙණ එන් නුඹවහන්සේගේ මේ රජගෙයිදී වැදූ දරු වෝය එදවසම මාගේ දරුවන් මරාපියනසේක්දෝහෝයි සිතා මළහයි කියා වංචාකොට අමුසොහොනට දම්මපිම් එතනදී එළුගොපල්ලෙක් ගෙණගොස් පොෂ්‍යකෙළේය එතෙම තමාගේ එළුදෙනුන් මියනහෙයින් සැළියකලාදියෙන් යවාපීය. ඉක්බිති දියෙන් යන දරුවන් දැක අපගේ රජගෙයි කටුකොල්කරන් නාවූ චණ්ඩාලයා දැක හැරගෙණ පොෂ්‍යකරවීය.

එපවත් අසා ඉදින් නුඹවහන්සේ අදහනොගන්නාසේක්වීනම් හැම දෙනම ගෙන්වාලා විචාළමැනවැයි බිසවුන් ලවා දේවතාවා කියවීය.

එපවත් අසා රජ්ජුරුවෝ කිරිමවය එළුගොපල්ලාය චණ්ඩාල පුත්‍රයා යයි කියන තුන්පක්ෂයෙහි ඇත්තවුන් ගෙන්වාගෙණ විචාරා තත්ත්වයවූ පරිද් දෙන් අසා දූත ජාතිසම්පන්නවූ කුමාරකෙණෙකුනැයි සුවඳ පැන් සොළොස් කළයකින් ඉස්සෝධා නාවා ආභරණයෙන් සරහා රාජකුමාරිකාව උත්තම පාවාදුන්හ.

ගොපල්ලාගේ එළුවන් මළකාරණයෙන් රාජකුමාරයන්ට එළකකුමාර යෝයයි නම තුබූහ. ඉක්බිත්තෙන් බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ උන්ගේ පිය රජ්ජුරුවන් සන්තකවූ සේනාවාහාදීවූ නොපගේ පියානන් සන්තක රාජ්ජය ගණුවයි යවූහ.

ඒ ඒළකකුමාර රජ්ජුරුවෝද කුරඟවීනම් බිසව කැඳවාගෙණ මහපෙල හරින් ගොස් ප්‍රවේණි රාජ්ජයෙහි පදසළවූහ.

ඉක්බිත් බරණැස්රජ්ජුරුවෝ මේ තෙම අනාථව වැඩුනුහෙයින් කිසි ශිල්පයක් නොදන්නේයයි ඔහු ශිල්ප උගන්වන පිණිස ජලග කුමාරයෝයයි යන කෙණෙකුන්ට ආචාරී නනතුරදී ඔහුකරා යවීය. ඒ එළකකුමාර රජ්ජුරු වෝද උන් සමීපයෙහි උගන්නාලද ශිල්ප ඇතිව මාගේ ආචාරීයයි ගොවර යෙන් සෙනෙවිරත් තනතුර දිහ.

මැතභාගයෙහි කුරඟවීනම් බිසෝතොම ඒ ජලඟකුමාරයන් හා සමග සලසිතින් අතිචාරයීකෙළිනීය, ඉක්බිති ජලඟනම් සෙනෙවි රජද්දූ තමන්ගේ

ධනන්තෙවාසිකතම් අතවැස්සහු අත කුරඟවීතම් බිසවුන්ට වස්ත්‍රාභරණාදිය සොරායවන්නාය. ඒ ධනන්තෙවාසිකයා හා සමග අතිචාරය කළාය.

මෙසේ කුණාලරජ්ජුරුවෝ එකල ජලඟකුමාරව ඉපද තමන් ප්‍රත්‍යක්‍ෂ කොට දුටුවාවූ ඒ කුරඟවීතම් අඟනාවකගේ අනාචාරය එදවස් රැස්වූ පර්‍ෂදට ප්‍රකාශකොට කීවාහුය.

තවද තමන්ම ස්ත්‍රීන්ගේ නුගුණ ප්‍රකාශකොට කියන්නාහු යටගියදවස රජදරුවෝ කොසොල්රජ්ජුරුවෝ බරණැස්රජ්ජුරුවන් මරා රාජ්‍යයගෙණ ගර්භිණීදේවින් තමන්ට අගමෙහෙසුන්කොට තමන්ගේ නුවරටම ආවාහුය ඉක්බිති ඒ බිසව් දසමස් පිරුණුසඳ පුතනුකෙණෙකුන් වැදූහ. රජ්ජුරුවෝ තමන්ට දරුවන් නැති හෙයින් ඒ කුමාරයා පුත්‍රස්නෙහයෙන් වඩා සියළු ශිල්ප ශාස්ත්‍ර උගන්වා වැඩී සොළොස්වයසට පැමිණිකල්හි තොගේ පියා නත් සන්තක රාජ්‍ය ගණුවයි ප්‍රවෙණි රාජ්‍යය දී යවූහ. ඒ කුමරාද බරණැස් නුවර රාජ්‍යය කරන්නේය.

ඉක්බිති ඔහුගේ මව්බිසව් පුතනුවන් දක්නට යෙමියි කොසොල් රජ්ජු රුවන් අනුදන්වාගෙණ මහපෙළහරින් බරණැස්නුවරට යන්නී කොසොල් බරණැස් දෙරටට අතුරෙහි එක්තරා නියංගමෙක්හි ලැගුම්ගත්හ. ඒ ගම විශිෂ්ටවූ රූ ඇති පඤ්චාලචණ්ඩ නම් බ්‍රාහ්මණ කුමාරයෙකෙණෙක් ඒ බිසවුන්ට පඬුරුයවා ඒ බිසවුන්ට සිත් ඇත්ත ඇඟවූහ. බිසව්ද ඒ පඬුරුදක උන්ගේද ස්වරූපය දක පිළිබඳ සිත් ඇතිව උන් හා සමග ලොකස්වාදරතියෙහි යෙදී දවස් යවන්නීය. කීපදවසක් එහිම වැස බරණැස්නුවරට ගොස් පුතනුවන් දක උන්ගේද ස්වරූපය දක නැවත එම ගමට අවුත් එතනින් කීපදවසක් එහි වැස බ්‍රාහ්මණකුමාරයන් හා සමග අනාචාර ශීලීව දවස්යවා කොසොල් රටට අවුය මෙසේ ඒ බිසව් එතැන්පටන්කොට නොයෙක් කටයුතු කියාගෙණ රජ්ජු රුවන් දක්නටයෙයි අවසර ලදින් යන එනකල එමගම උන් හා සමග දෙපෝ යක් පමණකල් උන් හා සමග වැස යන්නී එන්නීයයි මේ අතීතකථාව ගෙණ හැරදක්වා සබඳ පූර්‍ණමුඛයෙනි ස්ත්‍රී ජාතිහුනම් දුස්සීලවූ බොරු කියන්නාවූ සුළුද නොයෙක් සඨප්‍රයෝග ඇත්තාහයි යනාදීන් තමන් ගියදවස පචාල චණ්ඩනම් බමුණුව ඉපද ප්‍රත්‍යක්‍ෂකොට තමන් දුටු ස්ත්‍රීන්ගේ නුගුණ දක්වා තවද කියන්නාහු සබඳ පූර්‍ණමුඛය යම්සේ පොළොව රන්රුවන් මුතු මැණික් ආදීවූ සත්රුවන්ද වෘක්‍ෂ පර්‍වතාදීද සියළු සුගන්ධ නොයෙක් දුර්ගන්ධ යන නොයෙක් උත්තමාධම වස්තූන්ට පිහිටවේද එමෙන්ම ස්ත්‍රීජාතිහුත් ක්ලෙශ වශයෙන් සියළු රජ බමුණු වෙළඳ ගොවි ආදී උත්තමයන්ද රදූ පදූ කෙවුළු ක්‍ෂ එනා ආදීවූ නොයෙක් අධමයන්ද යන සියල්ලන්ටම කාමරතිවශයෙන් පිහිටවන්නාහුය.

තවද සබඳ යම්සේ චණ්ඩවූ සිංහතෙම සතර පසුරෙන් හා මුඛය යන පචස්ථානයෙන් මෘගාදීන් තරකොට අල්වාගෙණ ලේ මස් අනුභව කෙරේද එපරිද්දෙන්ම මේ ස්ත්‍රීහුත් රූප ශබ්ද ගන්ධ රස ස්පර්‍ශය යන පස් ගැන්මෙන් කෙතරම් සර්‍වඥස පණ්ඩිතයන්වැනි වීරශීලී පුරුෂයනුත් අල්වාගෙණ ශීල සංවර නමැති ලොහිතමාංස භක්‍ෂණය කරන්නාහුය.

තවද සබඳ මහත්වූ අටවිමධ්‍යයෙහි පචායුධසන්තඩව සිටියාවූ සොරහු එතනට පැමිණියාවූ සත්වයන් පැහැර එලවා වස්තුවලුම්පනයකෙරෙද්ද එමෙන් ස්ත්‍රීජාතිහුද තමන් විෂයෙහි පවත්නාවූ රූපාදී පස්අරමුණෙන් පුෂ්ඨියන් පොළඹවා විද්‍යාමාතවූ උන්ගේ වස්තුව පැහැරගන්නාහුය. තවද සබඳ විෂ මිශ්‍රවූ රා අනුභවකල සුරාධූතීයන්ට වූ විෂපත්නියක් මෙන් පස්කම්නමැති විෂ රාගයෙන් පිරුණු ස්ත්‍රී වශගවූ පුරුෂයෝ කටයුතු නොකටයුතු දූතගත නොහී කළමනා කටයුතු විචරට නොකටයුත්තෙහිම බොහෝසේ ව්‍යාපෘත වන්නාහුය.

තවද පූර්ණමුඛයෙනි යම්සේ වෙළඳහු තමාගේ බඩුයෙහි වර්ණනාව කෙරෙද්ද එපරිද්දෙන්ම ස්ත්‍රී ජාතිහුද තමන්ගේ බොහෝ නුගුණ සඟවා නැති ගුණ වර්ණනා කෙරෙමින් විකපත කරන්නාහ.

ඉසසනම් මුවන්ගේ කරකැවී නැගෙන්නාවූ අඟමෙන් ලඝු ප්‍රවෘත්තිවූ සිත් ඇත්තාහුය. බොරුකීමම සවභාවකොට ඇතිහෙයින් දෙදිව්ඇති සර්පයින් වැන්නහ. බොරු අතට සඟවනලද අසුචිවලක්මෙන් වස්ත්‍රාලංකාරයෙන් පිළි සන්ව කෙළපැටිකොට ඇවිදිනා කසල පිරුණු වළක්මෙන් වැන්නාහ.

ලක්ෂගණන් ගඞ්ගාවෙහි ජලය අනවරතයෙන් වැදත් නොපිරෙන්නාවූ සමුද්‍රයමෙන් මේ ස්ත්‍රී ජාතිහුද මෛථුන සංවාසයෙන්ද දරුවන් වැදීමෙන්ද සැරහීමෙන්ද පුරාලිය නොහැකි සිත් ඇත්තාහ යම්සේ රාක්ෂසඳ මාංස අනු භවයෙහි ගිජුහෙයින් සම්පත්දීමෙන් වැලකියනොහැකිව මාංසයම ප්‍රාර්ථනා කරන්නේද එපරිද්දෙන්ම මේ ස්ත්‍රී ජාතිහුද ලොකාස්වාදරතියෙහි ගිජු බැවින් බොහෝ සම්පත් ඇත්තන් කෙරෙහි වැසඳු තද කාමාස්වාදයම ප්‍රියකොට ඇත්තාහ.

යම්සේ යමරජ තමා කරා පැමිණි සියළු සත්වයන්ගේ ගුණාගුණ පරීක්ෂා නොකොට මරුමුඛයට පමුණුවාද එපරිද්දෙන්ම මේ ස්ත්‍රී ජාතිහුද කුලගොත්‍ර ගුණ විශෙෂ පරීක්ෂානොකොට ක්ලෙශවසඟයෙන් සීල විපත්තියට පමුණුවා දෙවනුව නරකයෙහි උපදනාහුය. යම්සේ ගිනි ඇත්කුණු අස්කුණු මිනීකුණු බලු කුණු ගැරඬිකුණු ආදියෙන් භක්ෂණයකොට පියන්නේවීනම් උත්තම අධම යන්ගේ විපාකයක් නැතිව කෙලෙස් නමැති ගින්නෙන් භක්ෂණය කරන්නාහුය.

අසූචි භූමියත් පියුම් වනයත් නොහැර අමන්නාවූ පවනක් මෙන් චණ්ඩාල කුලපුත්‍රාදීන් කෙරෙහි කාමරතියෙහි එක්සිත්හ.

සිනෙරුපර්වතය ආශ්‍රයකළාවූ කපුටුවන් එක්පැයවූවාසේ තමන් කරා පැමිණි යම්කෙණෙකුන් තමන්වැනියාව කරන්නා හා අඹගස්වැනි එකසට හත් ඇතිවූ විෂවෘක්ෂයන්මෙන් සඳ ඵලිත බැවින් සහ මල්පල්ලෙන් සැදුම් බැලුවවුන්ට රම්‍යවූ දර්ශනය ඇතිව පෙණෙනහෙයින් වර්ණගන්ධයෙන් නොවෙ නස්ව අනුභවකළ සත්වයා වහා විභව විනාශයට පැමිණෙන්නාහ.

තවද පූර්ණමුඛය විභව ඇති ස්වාමීහු ජරාවෙන්මීරිකී රතික්‍රීඩාවට අයෝ ග්‍යකල්හි ඔහු සන්තක වස්තුව ගෙණ අනුන්ට යවා උන් හා සමග අතිචාර

යෙන් මිත්‍ර ප්‍රීතිකරත්තාහුයයි මෙසේ කුණාල බොධිසත්ත්වයෝ අනෙකප්‍රකාර යෙන් තමන්ගේ ධර්මවිලාසය දක්වා මත්තෙහිද ස්ත්‍රීන්ගේ නුගුණ දක්වන්නාහුය.

සබඳ මේ ස්ත්‍රී ජාතිහුතම් මුළුලොව බදනපිණිස මාරයා එලූ සොරමලක් වැන්නාහ. එසේහෙයින් එසේවූ ස්ත්‍රී ජාතීන් කෙරෙහි ලොභය කරන්නාවූ සත්ත්වයෝ මිරිඟුයෙහි ජලබුඩිකරන්නාවූ මෘගයන් වැන්නාහ.

තවද ශොකයට කාරණය හා රොගයට වාසස්ථානය හා උපද්‍රවයට මරුවැන්නහ තවද දඟගෙයක් වැන්නහ! මායමටගු හාවක්වැන්නහ එබඳුවූ ස්ත්‍රීන් කෙරෙහි විශ්වාසීවූ කෙණෙක් ඇත්තම් ඔහු සත්ත්වයන් කෙරෙහි අධම හයි යනු පුරාතනයෙහි සත්පුරුෂයන්ගේ වචනයෙක් වන්නේය.

සබඳ පූර්ණමුඛයෙනි මේ ලෝකයෙහි ස්ත්‍රීන්ගේ නුගුණ බොහෝවුවද බඹලොව හැර නෙසුතැන්හි ස්ත්‍රීන් ඇති හෙයින් නුවණැති පුරුෂයෙක් ස්ත්‍රීන්ගේ ප්‍රයෝජන විඳින්නේ චතුර්විධස්ථානයෙක්හි සුශික්ෂිතව රක්නේය.

ඒ කෙසේද? යත්

අනුත්ව පිරුළු වශයෙන් දෙනලද්දවූ රථය ප්‍රමාණාතික්‍රාන්තවූ වාහන යෙන් චක්‍රභංගය කෙරෙද්ද එසේම ගොන්ද පමණ ඉක්මවා ඉසිලීමෙන් නසා පියද්ද එසේම දෙනුන්ගේ අතිදෙහොනයෙන් වස් සතසාපියද්ද එමෙන් බන්ධු කුලයට ගොස් කල්යවන්නාවූ පතිනි අඹුවක වුවද පාපමිත්‍රසමවායෙන් චිත්ත දූශ්‍යකරන්නාහුයයි දූත නුවණැත්තෝ මේ සතරකාරායෙන් ස්ත්‍රිය දුරුනො හරින්නාහුය.

තවද සබඳ ස්ත්‍රීජාතිහු ස්වාමිපුරුෂයා දිළිඳුකලත් ලෙඩරෝගිකලත් යොවුන් සිඳුනුකලත් සුරාධූර්තිවූකලත් මෘත්‍යුකලත් සම්පත් සෙවීමෙහි සියළුම කටයුත්තෙහි නොසිඳනකලය යන අටවැදෑරුම්වූ තැන්හි ස්වාමීහු අරිනාහුය තවද සබඳ පූර්ණමුඛය ස්ත්‍රී ජාතීන්ගේ පාපක්‍රියාවෝ බොහෝදෙනය ඔහු කවූ රුදයත් ස්වාමීන් නොවිචාරාම පුෂ්පාරාම ඵලාරාමයට ගොස් එතැන්හි වෛර පුරුෂයන් හා කැටුව වාසයකොට අදම අත්ගසා වෘක්ෂදේවතාවාට යාග බලි කර්මාන්තාදිය කරන්ට ගියෙමි. ස්වාමීහු සන්හිඳුවන්නාහුය. තවද අසො හිත මිත්‍රයන්ගේ ගෙයි කියාලූ කටයුත්තෙක් ඇත දීලූනයෙක් ඇත ඉල්වා ගන්ට ගියෙමි යනාදීන් ස්වාමිපුරුෂයන්ට වඤ්චාකොට ගොස් වෛරපුරුෂ යන් කරා ලැගීසිත ඇති දුක් පහකොට එන්නාහුය කවුළුදොර ආදීයෙහි සිට ගෙණ තමාගේ අඟප්‍රත්‍යඞ්ගයන් බැහැර සිටියාවුන්ට දක්වන්නාහුය.

තවද උන්ගේ සතළිසක් පමණ ස්ත්‍රීලීලා ඇත්තෝය.

ඒ කෙසේද? යත්,

පුරුෂයෙකු හා කැටිව පලමුව මේ ආකාරය කලකල්හි අවකාශ ඇත්ත නැත්ත දූතගතමැනවැයි කථාකොට තබාගත් හෙයිනුත් කථාකෙලේද ඔහු සිත්ගතමැනවැයි යන අදහසින් ස්වාමිපුරුෂයා සමීපයෙහි සිට විජෘම්භනය කරන්නීය.

තවද යම්කිසි වස්තුවක් බිම එලාවේවයි හැරගන්නා පිණිස තැඹුරු වතකෙණකුන් පරිද්දෙන් තැමී පිටදිසාවට පානාහුය. යාම් ගීම් ඉඳීම් සිටීම් සක්මන්කිරීම් පලන් ආභරණ කැනීම් වශයෙන් විලාස දක්වන්නාහුය.

ලජ්ජා ඇත්තවුන්මෙන් වහා උතුරුසළුව පෙරව භික්ති කවුළු දොර ආදියෙහි ඇලෙන්නාහුය.

හස්තපාදාදියෙහි නියගින් ඊපාන්නාහුය. දණ්ඩෙන් බිම ඉරි අඳනාහුය. තමන්ගේ හෝ අනුන්ගේ හෝ දරුවන් වඩාගෙණ උඩට එසවීමය පාතට බැමය උන් හා සමග තමන්කෙළිවය තමන් හා උන් කෙළීමය ගැනීමය සැරහුම් හැරගැන්මය උන් කැවීමය තමන් කවාගැන්මය තවද බාලදරුවන් අතට යම්කිසි මලක් හෝ එලයක් හෝ දීලීමය නැවත එය ඉල්ලීමය උන් කෙළි පිණිස කළ කළ යම්දෙයක් තමන් පෙරලා කිරීමය. නැවත එම දරුවන්ගේ සුරතල්විඳ ස්නෙහයෙන් වදනලදනකමක් උසස්කොට කථාකිරීමය ඒ හැම සමග සිතඇත්ත අභවා සමීපයෙහි සිටි සොර පුරුෂයන්ගෙන් අා රහසියන්ට කියයුත්තක්කියාමය. බොහෝදෙනා මැදයෙහි කෙළි පිණිස ව්‍යාජ වශයෙන් බොරුයයි හඟවා ඇසිය යුතන සමනත්කොට කීමය නැවත විවේකීව ඇත්ත ඇතිසැටියේ කීමය නැටීම් වෙණවැයීම් බෙරගැසීමෙන් ගී කීමෙනැසිද, වැසි වස්නා දවසෙක පලමුකියා නබාගත් කටයුතු නියාවට වැස්සෙ තෙමී නා නා කැමතිව අඩාපියා ගිවිස්වාගෙණ සිඹැදුරුකවුළුයෙන් පිටත්ව සිටු කුමාරයා අනමාරුකරදී රාජකුමාරයා හා කැටිවතිය කුමාරිකාවමෙන් ඇඹීමෙන් හා කිසිලිඹසවාපැමෙන් පිටිතොල ඩැහැමෙන්ද බැම ඉස්සීමෙන්ද ඉසකෙහෙ බැඳීමෙන්ද පිළිම්දීමෙන්ද ඇදීමෙන්ද යටසින් එක්වත් බැලීමෙන්ද උකුල මදක් නටවා බැලීමෙන්ද රහසින්නාහය චලිතකිරීමෙන්ද කලවා පලල් කිරීමෙන්ද නැවත වහා අකුළුවා ගැන්මෙන්ද පයොධරයන් සෙලවීමෙන්ද පිළිසිපිලකොට පෙකෙනි පෑමෙන්ද අත්දික්කොට පෙරලා කැමෙන්ද දිව් ලෙලීමෙන් යනාදීන් දක්වනලද සතළිසක් පමණ වෛර ස්ත්‍රීවිලාසයෙන් පුරුෂයන්ට බැඳෙවන්නාහුය.

තවද පූණ්මුඛය ස්ත්‍රී ජාතීහු අවකාශ ලබනු පිණිස අසෝගමට නයදුන් වස්තුව ඉල්වාගෙණ එවයි කියාද අසෝකටයුත්ත පිරිමසාගෙණ එවයි කියා සවාමීහු යවනලද අවකාශ ඇතිව දුරාචාරයෙහි යෙදෙන්නාහුය. තවද සවාමීහු පිළිබඳව කෘෂිවණිජ්‍යාදීවූ කටයුත්තෙහි අවැඩක්ම නොකළමනා දෙයක්ම යොදන්නීය.

පිළිතරකොට ඇඳ පිටිපෑවැදළුව කොලාහලකොට සමීපයෙහි වැද හොත් මිනිසුන් පුබුදුවා පහත්ලවා ඉසරුජාය බඩරුජාය යනාදීන්වූ ප්‍රලාප කියා සවාමිහුගෙ ක්ලෙශරතිවිනාශය කරන්නීය. සවාමීහු සීතභොජන කැමති උණුභෝජනය එලවන්නීය. උණුකැමති සිහල්එලවන්නීයයි යනාදීන් ප්‍රත්‍යනීක ප්‍රවෘත්තිය. සවාමීහු දුකින් උපයනලද සම්පත් රා මස් මල් සුවඳ ආදීයෙහි කරණලද ලෝභයෙන්ම විසුරුවන්නීය. හැමවේලෙහිම අතිචාරීවූවන් කරා ගමන්ගෙණ සිටිනීය.

තවද සබඳ තොරඹුරක් ලදහොත් යටත්පිරිසෙයින් කුණු පණු හුණු ශරීර ඇතිකරගත් සාමුලින්ම නැති, දෙඅත් දෙපා සුන් සත්වයකුදු තොහ රණ බව පදුමජාතකයෙහි කී නියායෙන් දතයුතු.

යටත්පිරිසෙයින් ඉතා පිළිකුල්වූ පිළුන්කෙරෙහිම මහත්වූස්නෙහ යෙන් ත්‍රිජාතීන් වාසයකළතැන් බොහෝයේ ඇත.

ඒ කෙසේද? යත්,

සබඳ යටගියදවස බරණැස්නුවර කණ්ඩාරිනම් රජෙක්විය. එතෙම වස වත් දෙව්පුතුමෙන් අති මනෝහරවූ රූප සෝභා ඇත්තේ එතෙම හැම වේලෙහිම පස්කම් ගුණෙහි ඇලී වෙසෙයි. ඔහුගෙ විභවශක්තියත් දවස්පතා ඇමතියන් ගෙණහැර එලවනලද දහසක් සුවඳ කරඬුපාලා සුවඳ දරින් ගිති දල්වා රාජභෝජනය සපයා මේ වඩන්නාහුය. මෙරජහුගෙ අවර්‍ණනීයවූ රූප ඇති කින්නරාදෙවි නම් අගමෙහෙසුන් බිසවක්වූව. එරජුහු හා සමවයස් ඇති එකාචාරීවූ කුලෙහි සිල්ප උගත් පචලවණ්ඩ නම් පුරෝහිතයෙක් ඇතිවිය.

එරජ්ජුරුවන්ගේ ප්‍රාසාදය ගාවා පවුර ඇතුලෙහි කඳවෙලෙප් සහිතවූ පවුර මුදුනට එල්ලෙන්නාවූ ශාඛාපතර ඇති දඹරුකක් විය. එදඹරුක සෙව නැල්ලෙහි ඉතා පිළිකුල්වූ බැලිවනොහැකි ශරීරාවයවයන් ඇති සතර ගාතය කොරවූ පිලෙක් වසන්නේය. එක්දවසක් කින්නරාදෙවීද සීමැදුරු කවුළු යෙන් පිටත බැළුවාහු ඔහුදැක පිළිබඳ සිත්ඇතිව රාත්‍රිභාගයෙහි රජ්ජුරුවන් ක්ලෙශරතියෙන් සතපා යානට වැඩපිකල නිදිවරබලා සෙමෙන් නැගී සිට නොයෙක් රසමසවුලෙන් යුක්තවූ ආහාරය රන්තැටියෙහි පුරාගෙණ එකුතුරුපොට අස්සෙහි තබාගෙණ කඩරුතක් සීමැදුරු කවුළුයෙහි සිරිගම් පයෙහි බැඳ ප්‍රාසාදයෙහිම පලයට වැටීතිබෙන්නාවූ දඹ අත්තට බැස අත්ත ඔස්සේ ගොස් බිමට බැස පිලා බත්කවා ඌ හා සමග පාපක්‍රියායෙහි යෙදී පලමු බටුවාවූ ක්‍රමයෙන්ම ප්‍රාසාදයට නැගී ශරීරයෙහි වැකීගියකුණු පැටි කරණු පිණිස සඳුන් සුවඳින් ඇඟ උලා රජ්ජුරුවන් හා එක්යානේ පුරුදුව සැතපෙන්නීය. මෙම ක්‍රමයෙන් නිරන්තරම ඌ හා සමග නොකටයුත්තෙහි හැසිරෙන්නීය. රජ්ජුරුවෝද නොදන්නාහුය.

එකල එක්දවසක් රජ්ජුරුවෝ නුවර පැදකුණුකොට රජගෙට වන් නාහු එදඹසෙවනේ එල්ලේවැදහොත්නාවූ පැහැපත්වූ එපිලා දැක තමන්හැම වේලෙහිම ගොචර හෙයින් පුරෝහිතයන් මූණබලා බලව මනුෂ්‍යප්‍රෙතයකුගෙ සැටියෙක සබඳ මෙසේවූ ප්‍රතිකූලයන් හා සමග වාසයකරන්නාවූ ස්ත්‍රීන් මේ ලෝකයෙහි ඇද්දෝහෝයි කීහ, එපවත් අසා පිලා මහත්වූ අභිමාන උපදවා ගෙණ දෙනොත්මුදුනෙහි තබාගෙණ මේ දඹගස අධිගෘහිත දේවතාවානෙනි ඇසුව මැනව නුඹවහන්සේමය දන්නේයයි කීය.

පුරෝහිත බමුණානෝ ඔහු කළ ක්‍රියාව දැක සිතන්නාහු ඒ කාන්ත යෙන් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන්වූ බිසවුන් දඹගසින් අවුදින් මූ හා සමග

නොකටයුතු කරන්නාහුවනැයි දූත මහරජ රාත්‍රිභාගයෙහි බිසවුන් ශරීර පහස් කවරේදැයි විචාළේය. ඒ අසා රජ්ජුරුවෝ සබඳ අතික්කාරණයක් නොදනිමියි මධ්‍යම රාත්‍රියෙහි බිසවුන්ගේ ශරීරය සීතලයයි කීහ.

එසේවීනම් රජ්ජුවෙති තෙසු ස්ත්‍රීන් තබා තොපගේ අගමෙහෙසුන් කින්නරාදේවීම මුත් හා සමග ක්ලෙශ සංසර්ගය ඇත්තාහුයයි කීහ.

එසඳ රජ්ජුරුවෝ කිමෙක්ද පුරෝහිතය ඉතා සොභනවූ රූ ඇති උත්තමාඞ්ගනාව ඉතා පිළිකුල්වූ මොහු හා කෙසේ වෙසෙද්දැයි කීහ.

ඉක්බිති පුරෝහිතයෝ මහරජ මාගේ වචනයෙහි ඇදහිලි නොකරණ සේක්වීනම් මෙතැන් පටන් පරීක්ෂාකල මැනවැයි කීහ.

එසඳ රජ්ජුරුවෝ යහපතැයි ගිවිස එදවස් රෑ මෙහෙනිමවා බිසවුන් හා සමග සැතපී අදකලි මෙම පරීක්ෂාකරන්ම උවමැනවැයි පළමු නිදනවේලාවට නිදාපුකෙණෙකුන් මෙන් ඇඟවූහ. බිසවුද රජු නිදන්නේ කවරවිටකදෝහෝයි සිත සිතාම ඉදිනාහෙයින් නිදාපිවනැයි හැඟීසිට රත්තැටියේ බත් ඉත තබා ගෙණ කඩරැනෙන් එපිට බටුවාහුය. රජ්ජුරුවෝ දඹසෙවනැල්ල ගස හා සමග ඇලීසිටියාහ. පිලාතෙම බිසවුන්ට කිපී ඉතා කල්යවා එන්ට කාරණා කවරේ දැයි තමාගේ කොර අතින් කංසට ගැසීය. ඉක්බිති බිසවු ස්වාමීනි රජ්ජුරුවන් නිදාපියනතෙක් කල්යවීමියි නොකිපුන මැනවැයි යනාදීන් උන්ගේගෙයි ඇතිදා ඇති පාදපරිචාරිකාවකමෙන් ඔහු අස්වසා අවනතවූව ඒ ගැසූ පහර හා සමග බිසවුන්ගේ කණපලන් සිහමූබ කුණ්ඩලාභරණය රජ්ජුරුවන්ගේ පයසම්පයට පැතපීය රජ්ජුරුවෝ මෙතෙක් මට සෑහෙන්නේයයි ඉනිඹ උන්ගේ ඕලාරික ක්‍රියාව නොදක්වමි රජගෙට පලාආහ.

බිසවුද ඔහු හා සමග අතිචාරයෙහි යෙදී පළමුපරිද්දෙන්ම අවුදින් රජ්ජුවන් හා සමග සැතපෙන්නට උත්සාහකළහ. රජ්ජුරුවෝ තමන් සමී පයට වැද්දනොදී පසුව දවස් කින්නරාදේවින් මා විසින් දෙනලද සවර්ණා ලංකාරයෙන් සැරහීගෙණ එන්ට කියවයි විධානකළහ.

එසඳ බිසවු කුණ්ඩලාභරණය බඩල්ගෙදරයයි කියන්නාහුය. පසුව තප්පරවම එන්වකියවයි විධානකරණහෙයින් පලම් කුණ්ඩලාභරණයෙම්ම අවුත් සිටියාහුය. එසඳ රජ්ජුරුවෝ ඇයි සොඳුර තොපගේ කුණ්ඩලා භරණය කොයිදැයි විචාළාහුය. ස්වාමීනි කොතුරක් ඉගිලගියහෙයින් බඩාලූන් අතට ලැවීමියි කීහ.

එසඳ රජ්ජුරුවෝ බඩාලුන් ගෙන්වාගෙණ බිසවුන්ගේ ආභරණ තාගේ ගෙයි බොහෝදවසක් තබාගෙණ නොදෙන්ට කාරණා කවරේදැයි කීහ. එසඳ තරහල් හයින් ඇකිලී නොගත්මි ස්වාමීනි කීහ. රජ්ජුරුවෝ මෙයේ බිස වුන්ගේ ද්‍රෝෂ ගිවිස්වා චණ්ඩාලසොල්ල මෙවකට බඩල්ලු තොපට අපිමයයි තමන්වහන්සේ අතතුබූ කුණ්ඩලාභරණය ඉදිරියට දැමූහ. එවිට බිසවු කරබැහැ එබස්ද රජ්ජුරුවෝ පුරෝහිතයන් කැඳවා සබඳ තොප කීයේ සැබෑවයි උන් කෙරෙ පැහැද බසවුන්ට කිපී තෙල ගෙණගොස් ඉසකපා පියවයි සම්මත කළහ.

එසඳ පුරෝහිතයෝ බිසවුන් එමරජගෙයි එක්තෙනෙක්හි සඟවා ඉඳුරා රජ්ජුරුවන්කරා එළඹ මහරජ බිසවුන්කෙරෙහි නොකිපුනමැනවැයි සියලු ස්ත්‍රීන්ගේ නුගුණ මෙතෙක්මය. ඉදින් නුඹවහන්සේ ස්ත්‍රීන්ගේ නුගුණ හා නොයෙක් සටප්‍රයෝග දක්නා අභිප්‍රාය ඇතිසේක්වීනම් අප්‍රසිඬවේසයෙන් දනවු සැරිසරා ඇවිද පරීක්‍ෂාකරම්හයි කීහ.

රජ්ජුරුවෝද මැනවැයි ගිවිස මැතියන්ට රාජ්‍යය පාවාදී පුරොහිතයන් හා සමඟ අප්‍රසිඬවේෂයෙන් නුවරින් නික්ම යොදනක් පමණතැන් ගොස් මාවත සැතපී උන්කල්හි එක්කෙළෙඹිපුත්‍රයෙක් තමාගේ පුතුට එක් කුමාරිකාවක මහත් මඟුල්කොට පිළිසත් යානාවෙක්හි ඉඳුවාගෙණ මහපෙරහරින් යන්නේය එපවත් දුක පුරෝහිතයෝ මහරජ ඉදින් නුඹවහන්සේ කැමැතිසේක්වීනම් පෙරපුරුෂයන් හා නොහසලවිරූ කුමාරිකාව නුඹවහන්සේ හා සමඟ සතප්පාපියම් කීහ.

එපවත් අසා රජ්ජුරුවෝ සබඳ කුමක් කියයිදූයි මහපෙරහරින් එන් නියට කෙසේ අවකාශ ලැබේද නොපිළිවනැයි කීහ. එසඳ පුරෝහිතයෝ එසේවීනම් මාගේ සපත්කම් බැලුවමැනවයි කියා පෙරෙත්තුව ගොස් මගින් ඉවත්ව තිරයක් බැඳ රජ්ජුරුවන් තිරය ඇතුළේ හිඳුවා තුමූ මගවබැස දෙපය දික්කොට අඬමින් උන්නාහුය. ඉක්බිති කෙළෙඹි පුත්‍ර අඬමින් උන් බමුණානන් දුක කුමක් පිණිස අඬාදූයි විචාළේය.

පින්වත්නි මාගේ බිරින්ද ගර්භණීහ අප උදකලාහෙයින් උන්ගේ දෙමව්පියන්ගේ ගෙයි හැරලාපියන පිණිසයයි කැඳවාගෙණ මඟට ආකලට අතරමඟ විලිපහරින්ට වන. ඕතොමෝ තිරය ඇතුළෙහි මහත්වූ ආයාස විඳිනිය. කිසි හසකුත් නැත මාත් එතනට නොයානැක්ක එක ස්ත්‍රියක ලද්දෙත් යහපතැයි කීහ. වන්නාට බොහෝ ස්ත්‍රීහු අපනා කැටුව ඇත. ඉන් එක්කෙණෙකුන් ප්‍රසව කරතියි නොපි නොහඬවයි කීහ. ඒ අසා බමුණු තවද අපගේ කුලක්‍රමගතවූ චාරිත්‍රධර්මයෙක් ඇත කන්‍යාස්ත්‍රියක විසින් ප්‍රසවකළයුතුය එතමාත් උන්ට මහත්වූ වැඩෙහි කීහ. එපවත් අසා කෙළෙඹිපුත්‍රතෙම මුන්කීයේ සැබවයි සිතා මේ පූර්වනිමිත්තයෙන් අපගේ පුතනුවන්ට දරුවන් ලැබ ගෙදර සම්රවන්නේ යයි චතුර්වේදයෙහි නිෂ්පන්න බමුණු දුනමකීයේයයි සතුටුව තමාගේ යෙහෙලි කුමාරිකාවම ප්‍රසවකරවයි යවීය. ඕතොමෝ තිරය ඇතුළවන්නී මලවියා බඳු උතුම් රූ ඇති සශ්‍රීකවූ රූ ඇති රජ්ජුරුවන් දුන පිළිබඳසිත් ඇතිව රජ්ජුරුවන් හා සමඟ ව්‍යතික්‍රමයේ යෙදුනාය. රජ්ජුරුවෝද ඇගෙ අහිතව ක්‍රියාව පවා මෙසේවනැයි ඇ කෙරේ සතුටුව තමන්ගේ ලක්‍ෂයක් වටනා පේරුස ගලවා ඇඟිල්ලෙහි ලූහ ඉක්බිති කරණලද ව්‍යභිචාර ඇතිව පිටත්වූහ. ඇගෙන් කුමක්ද වදාපුදූයි විචාළහ. එසඳ ඕතොමෝ එසේය රත්රුවන් පුතනුකෙණෙකුන් වදාපුවයි කීහ. කෙළෙඹිපුත්‍රද ඇ කැඳවාගෙණ නික්මීන. පුරොහිතයොද රජ්ජුරුවන් සමීපයට ගොස් රජ්ජුරුවෙනි පෙර පුරුෂයන් හා නුපුරුදු කන්‍යාස්ත්‍රී කුමාරිකාවරුන්ගේ පාපක්‍රියාව මෙසේකල පුරාතන ස්ත්‍රීන්ගේසොරකම් කියනුම් කිම්දූයි රජ්ජුරුවන් සිතවම නංවා ඇඟිල්ලෙහි තිබූ පේරුස්මුන්ද නොදුක මහරජ ඇට දුන්කිසිවත් ඇද්දූයිවිචාළෝය එසේය පේරුස්මුන්දදෙන ලදූයි කීකල්හි එසෙර කෙල්ලට දෙන්ට කාරණ කවරේදූයි කීකල්හි ඒ සෙර

කෙල්ලට දෙන්ට කාරණ කවරේදැයි පස්සෙහි ලුහුබඳවාගෙණගොස් ඈ නැගී යත්තාවූ යාතාව අතින් අල්ලාගෙණ රැඳවූහ ඈයි මේ කුමක්දැයි විචාළ කල මේ කුමාරිකාවෝ බැමිණියගේ ඉස්දෙර තිබූ මුත්ද හැරගෙණ පලා අවුයයි කියා ලුහුබඳවාගෙණගොස් ඈ නැගීයත්තාවූ යාතාවේ තිබූ මුත්ද අම්ම මෙසේ දෙන් නැයි ඉල්ලූකල මුදුදෙන්තාවූ කුමාරිකාවෝ අනේ තාගේසොරතමකැයි ඕනට අඟවනු පිණිස බමුණාගේ අත්ල තියෙන් කණලාදුන්හ.

මෙසේ ඒ පඤ්චාලචණ්ඩ නම් පුරෝහිතයා නොයෙක් නොයෙක් උපායෙන් බොහෝ උපායෙන් ස්ත්‍රීන්ගේ ගුණ ඒ රජ්ජුරුවන් සිතට නංවා තවද ස්ත්‍රීන්ගේ නුගුණ පරීක්‍ෂාකරණු පිණිස දඹදිව ඇවිදිම්හයි කීහ.

එකාණ්ඩරීනම් බරණැස් රජ්ජුරුවෝ සඹද සියලු දඹදිව ඇවිදත් ස්ත්‍රීන්ගේ නුගුණ මෙසේ මෙසේම දක්කනැක්ක. ඉන් අපට ප්‍රයෝජන කිම්දැයි වැලකා නැවත බරණැස් නුවරට අවුත් මහජන ස්ත්‍රී ජාතීහු නම් මෙසේවූ පාප අදහස් ඇත්තාහුමයයි එසේ හෙයින් කින්නරාදේවීන් කෙරෙහි ක්‍ෂමාකොට වදාළ මැනවැයි පුරෝහිතයන් විසින් යාච්ඤාකරණලද රජ්ජුරුවෝ ක්‍ෂමා කොට තනතුරු පිරිකෙලා රජගෙන් පිටත්කොට අතික් බිසවක අගමෙහෙ සුන්කොට එපිලුද මරා නැර දඹගස රජගෙ දිසාවට නැමුනු අත්ත කප්පවා පුරෝහිතයන්ගේ අනුශාසනාවෙන් රජ්ජය අනුශාසනාකළහයි මෙසේ මහණෙනි කුණාල බෝධිසත්වයන් පඤ්චාලචණ්ඩ නම් පුරෝහිතව තමන් ප්‍රත්‍යක්‍ෂ කොට දුටු කාරණා ගෙණහැර දක්වා ස්ත්‍රීන්ගේ නුගුණ ප්‍රකාශ කළහ.

තවද යටගිය දවස අතික් බරණැස බකතම් රජ්ජුරු කෙණෙකුන් ධර්මිෂ්ඨයෙන් රාජ්‍යය කරන්නාහුය.

එකල එමනුවර නැගෙනහිරි වාසල්දෙරින් පිටත වීථියෙහි එක්දිළිඳු කුලයෙක්හි පඤ්චපාපා නම් එක් දුවක් ඇත්තීය. ඕතොමෝ පෙරත් දිළිඳු කුලයෙහි ඉපිද මැටි අනාගෙණ භිත්තියෙහි මැටිගසනකල්හි එක් පසේබුදු කෙණෙකුන්වහන්සේ වැඩවසන ප්‍රාග්භාරයෙහි වැලිමැටිලන පිණිස මැටි කෙසේ ලැබේදැයි ආවර්ජනා කරණසේක් බරණැස්නුවර සවමීපයෙහි ලැබ ගත හැක්කැයි දැන වදුරා ගැටවවූ ගන්වාගෙණ පාත්‍රය සිවුර අස්සෙ ධරා ඇට නුදුරු තෙනක වැඩහුන්සේක බත් උදෙසා වැඩිසේක්වනැයි අහරනැති බව ඇඟවුවද නොවැඩසිටිහෙයින් ඕතොමෝ කිපී බලන්නී මහණ තට මැටින් අරුමතියා වේදැයි මහත් මැටිපිඩක්ගෙණගොස් පාත්‍රයෙහි ලාපුව ඔබද එමැටි ගෙණගොස් තමන්වහන්සේ වසනතෙන වැලිමැටි ලා වදාළසේක. මෙසේ එපසේබුදුන්ට නොඅදහාත් මැටි පිළිගැන්වූ කුශල ඵලයෙන් දිව පහස් බඳු ශරීර පහස් ඇතිවිය කිපී බැළුහෙයින් මුණද නාසයද දැත දෙපයද යන පඤ්ච ස්ථානය විරූපවිය. ඒ කාරණය හේතුකොටගෙණ පඤ්චපාපයයි නම් තුබූහ.

එකල බක නම් බරණැස් රජ්ජුරුවෝ රාත්‍රිභාගයෙහි අප්‍රසිඩ වේසයෙන් නුවර පරීක්‍ෂාකරණු පිණිස පිටත්වූහ. රජ්ජුරුවෝ ඈගේ ගෙදරට පැමිණියා හුය. ඒ පඤ්චපාප නම් කුමාරිකාද කෙළිමුළුන් හා සමග කෙළින්නී රජ්ජුරු

වන් නොදැන ගොස් අත ඇල්ලුව රජ්ජුරුවෝද හස්තස්පර්ශයෙන් දිවපහස් වැදගත් කෙණෙකුන් පරිද්දෙන් සවභාවයෙන් සිටපියනොහී පහසෙහි ඇලුනාහු විරූපවූත් ඈ අත අල්වාගෙණ තෙපි කාගේ දියනිකෙණෙක්දැයි විචාරා දෙර වසත්තාවූ දුප්පත් කුලයෙන් එකකිම් කීකල අසවාමිකභාවය විචාරා නියම දූත මමනිට සවාමිපුරුෂවෙමියි ගොස් තීගේ දෙමව්පියන්ටතත්වූපරිද්දෙත්කියාලයි කීහ. ඔද දෙමව්පියන් කරා ගොස් එක් පුරුෂයාතකෙණෙක් මා කැමතිව විචාළහ. කලම්නා කිම්දැයි කීහ. එපවත් අසා ඈගේ දෙමවුපියෝ අනේ ඔහු අපටත් වඩා දුක්පත් එකෙකු නියාවේද වත්නාට තොපසේ වූවනුත් කැමතිවූ නම් ඉතාම යාපත්වේදැයි කීකල්හි ඕගොස් එපවත් රජ්ජුරුවන්ට කීකල්හි එදවස් රජ්ජුරුවෝද උත්ගේ ගෙයි සැතපී උදෑසන රජගෙට ගියාහ එතැන් පටන් නිරන්තර වසයෙන්ම අප්‍රසිඩ වේශයෙන් රජගෙන් පිටත්ව ඈය සමග සැතපෙත්නාහුය. අවසේස ස්ත්‍රියක මූණත් නොබලත්නාහුය මෙසේ කලක් ගියකල ඈගෙපියාට ලේග්‍රහණියක් ඇතිවිය ඒට බේත් වෙදවරුන් විචාළකල වෙදවරුන් කියත්නාහු පැන්නුමුසු කිරි මී ගිතෙල් සකීරා බහා පිසතලද කිරි බත් අනුභවකිරීමට මීට බෙහෙත්වේදැයි කීහ ඔහු තමන් දිළිඳුහෙයින් උපදවා ගත නොහී පාවපාපාවන්ගේ මැනියෝ පුත තොපගේ සමනෝ මෙබඳු කිරි බතක් අපට උපද වාලිය එද්දැයි විචාරා බලවයි කීහ. එබස් අසා ඕතොමෝ අම්ම අපට වඩා උන් දුප්පත් කෙණෙකුනැයි සිතෙයි එතකුදු උවත් විචාරා බලමි නුඹ සොකනොකරන්නෙහි අස්වසා රජ්ජුරුවන් එනවේලාවට දුර්මුඛවගෙණ උන්නීය. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ අවුදීන් දොම්නස් කරණු කිම්දැයි විචාළ කල්හි එපවත් කිව ඒ අසා අජ්ජුරුවෝ සොඳුර ඉසුරුමත් බේතක අනේ මේ කෙසේ ලැබගතඑමෝද්දෝහෝයි කියා නැවත සිතත්නාහු මට හැමදවස්ම මේ සැටියේම මෑනිසා ඇවිද්දිනාකල්හි අතරමග යම්කිසි උපද්‍රවයෙක් පැමිණියෙනු මුත් නපුර නවද මෑ අන්තඃපුරයට ගෙණගොස් තිබී නම් අපගේ රජ්ජුරුවෝ යකින්නක ගෙණවුත් අන්තඃපුරයේ රැඳවූහයි පුරවතිනාවා මා හා කෙළනා හුය එබැවින් සියළුනුවරවාසීවූ සත්වයන්ට මැගෙ ශරීර පහස්වූ පරිදි දක්වා නින්දවෙන් මිදීගෙණයායුතුයයි සිතා ඈට කියත්තාහු සොඳුර තොපි ඒට සොකනොකරව එබඳු කිරිබත් ගෙනම්කියා ඈ හා සමග රමණයකොට සැතපී පසු දවස් රජගෙට ගොස් යටකී පරිද්දෙන් කිරිබත් ඉදිකරවා පත්ගෙන්වා දෙමුලක් කොට බඳනාහු එක්මුලෙක බත් අතුරෙහි සිබාමාණික්‍යලා බත් මුළු දෙක හැරගෙණ පළමුසේම රෑ පලාගොස් සොඳුර අපි ඉතා දුක්පතුම්හ. මේ මහා ආයාසයෙන් සපයාගත් බත තොපගේ පියානැත්දෑ අද මේ මුලෙහිබත් කා සෙට මේ මුලෙහි බත්කත්වකියවයි මුළුදෙක වෙන වෙනම පැලා දුන්හ. උයිත් එලෙසම කියා පියානත්ට දුන්හ. මහත්වූ ඔජාසම්පන්නවූ බත හෙයින් සුඟක් අනුභවකොට සිත්නිවී ගියේය. අවශෙෂවූ බත් මැනියෝද තුමූද අනුභවකලාහ සිළුමිණී බහලූ බත්මුල පසුව දවසට තුබූහ.

රජ්ජුරුවෝද පසුදවස් රජගෙඩගොස් මුණව පැත්වඩා පලඳනට චූඩාමාණික්‍ය ගෙණවයි කීකල්හි සවාමීනි නුදුටුම්හයි කියා කීකල්හි වහා ඇතුළු නුවර රැකවල් ලවා පරීක්ෂාකරවයි කීකල්හි එලෙස පරීක්ෂාකොට නුදුටුව්හයි දූත්වූකල්හි එසේවීනම් පිටිනුවර යටත්පිරිසෙයින් දිළිඳුකුලවල පටන් සැළිවලුත් ආදියෙහිද පත බැඳි බත්මුළු ආදියෙහිද වහා පරීක්ෂාකරවයි කීහ.

මෙලෙස පරීක්‍ෂාකරන්නාහු එගෙයිම මැණික දුක ඇගෙ දෙමව්පියන් බැඳලා සොරුයයි ගෙණගොස් රජ්ජුරුවන්ට පෑහ. ඇගෙ පියාතෝ කියන්නාහු ස්වාමීනි අපි නොවෙයි අතිකෙක් බත් මුලෙහි ලා මැණික ගෙණගියේයයි කීහ

ඒ කවරෙක්දැයි විචාළකල අපගේ බෑනෙකැයි කීහ. දුන් ඒ කොයිදැයි විචාළහෙයින් ස්වාමීනි අපගේ දියණියො දතිති කීහ. එසේකල උන් විචාරා නියම දුත කියාලවයි සම්මතකළ කල්හි දියනියන් කැඳවා පුත තොපගේ ස්වාමිපුරුෂයා දනුදැයි විචාළ ඕතොම ස්වාමිනි රාත්‍රියෙහි අවුදින් රාත්‍රියෙහිම පිටත්වන හෙයින් අඳුනගත නොහෙම්කිව.

රාජපුරුෂයෝ එපවත් රජ්ජුරුවන්ට දැන්වූහ. එපවත් අසා නො දන්නා කෙණෙකුන් පරිද්දෙන් එසේවීනම් ඒ ස්ත්‍රිය රාජාගනය ඇතුලෙහි ලා අත පමණකට කවුළුවක්කොට නුවරවැස්සන් රැස්කරවා තිරයසිදුරෙන් අත ඇතුළට පොවා හසනස්පර්‍ශයෙන් සොරුන් අල්වාදෙන්ට කියවයි විධාන කළාහ අමාත්‍යයෝද එලෙසය කරම්හයි ඈ සමීපයට පලාගොස් ඇගේ රුව දුක නොසතුටුවූවාහු ඉතා පිළිකුල්ව අතින් නොල්ලාම වටකොටලාගෙණවුත් රාජාගනයෙහි තිරය ඇතුළට අතපොවන්ට සම්මත කළහ.

ඕතොමෝ ඇතුලෙහි සිට පෙවු පෙවූ අත අල්වා බලා ඒ නොවෙයි කියා අල්ලා හරිනීය ඇත අතපෙවූ යම් පුරුෂයෙක් ඇත්නම් දිවපහස් බඳු හස්ත පහසෙහි බැඳී ඇහ පලා නොයන්නාහුය ඉදින් මැට දඩ ඉනීනම් දඩ අපි දීත් මැනිසා වනල්වත් අපගෙහි පාදපරිචාරිකා කරම්හයි සිත සිතා යානොහී සිටිනාවුන් රාජපුරුෂයෝද දඹුගෙණ මරා ඉවත්කරවන්ට පටන් ගත්හ සෙනෙවිරත් ඈපා මාපා යුවරජ්ජුරුවන් ආදිකොට සියල්ලෝම වියරුහුනුවන්මෙන්වූහ සියළුම නුවරවාසීන් තේරීගියකල්හි ඉක්බිති රජ්ජුරුවෝ මාවිනා අතික් නෝරණ කෙනෙක් නැත. එසේවීනම් සොරහු මාතියාවේදැයි නැඟීසිට ගොස් තිරය අස්සෙන් අතපෙවූහ.

රජ්ජුරුවන්ගේ අතඅල්වාගෙණ දුන් අතපෙවූ නැනැත්තා සොරුයයි අල්වාගෙණ මහත්කොට අඩගෑව රජ්ජුරුවෝ ඇට අතදීලාම සිට අමාත්‍ය වරුන් කැඳවා හැමකුමක් සිතත්දැයි විචාළහ. අමාත්‍යවරහුත් තමන්සිතූ සිත් තත්වූ පරිද්දෙන් කීහ. එසඳ රජ්ජුරුවෝ එඹා අමාත්‍යවරුනි මැගෙ පහස පලමු නොදත්තාවූ නොපිහැම නින්දකෙරෙති යන සිතින් මාගේ අනතඃපුර යට ඇරගන්නා පිණිස මෙලෙස කෙළෙම් නෙපිහැමම කියව මෝ කාටනිස්සී දැයි විචාළහ. ස්වාමීනි නුඹවහන්සේට නිස්සීයයි කීහ.

ඉක්බිති ඈ සත්රුවන් රැසක් මත්තෙහි පිහිටුවා ත්‍රිවිධ සංඛයෙන් පැන්වත්කොට අගමෙහෙසුන් තනතුරෙහි තුබූහ.

ඇගේ දෙමව්පියන්ට මහඉසුරු දුන්හ ඒ පංචපාපා නම් බිසවු අග මෙහෙසුන් තනතුරෙහි තුබූනැන් පටන් ඒ රජ්ජුරුවන්ගේ අධිකරණයෙහි ඉඳීමෙක් කාරියා කාරිය විදීවිචාරීමෙක් නැත්තේය. අනතරවූ සොළොස් දහ සක් බිසොවරුන් කෙරෙහි එක්කෙණෙකුන්ගේ මූණන් අනුරාගයෙන් බලන ගුම්නෙක් නැත,

ඒ තෙසු ස්ත්‍රීහු සම්පත් නිරොෂයෙන් තොරතුරු පරීක්ෂා කරන්නාහුය. ඉක්බිති එක්දවසක් පංචපාපා නම් බිසවු රජදරුවන් දෙදෙනෙකුට අග මෙහෙසුන් වන බව සවප්නයෙන් ලක්‍ෂණයක් දැක රජ්ජුරුවන්ට දැන්වූහ රජ්ජුරුවෝ සවප්නයෙහි අඹීදන්නාවුන් ගෙන්වා බිසවු රාත්‍රිභාගයෙහි සවප්නයෙන් ඇලිඇතකුපිට ඉඳ සඳපිරිමදිනු දුටුල ඒ සවප්නයගැණ කියවයි විචාළහ.

ඒ නිමිත්තපාටකයෝ අවශෙෂවූ ස්ත්‍රීන්ගෙන් පළමුව අත්ලස් ඇරගත් හෙයින් සවප්නයෙවූ පරිදි තබා විරුඬකොට කියන්නාහු සවාමීනි බිසවුන් ඇලිඇතුපිට උන් බවනම් නුඹවහන්සේට මෘත්‍යුකාරණයට පූර්නිමිත්ත ඇතුපිට ඉඳ සඳ පිරිමැදිනම් නුඹවහන්සේගේ සතුරුවූ රජ්ජුරුවන් අතට අසුවන නිමිත්තයහයි කීහ.

එසඳ රජ හයපත්ව ඉතිඹකළමිනා කිම්දැයිවිචාළෝය. මහරජ ස්ත්‍රීවධ කළ නොහැක්ක. බල එතකුදුවුවත් බිසවුන් නැවකලා ගඟට හැරපූවොත් යහපතැයි කීහ. එපවත් අසා රජ්ජුරුවෝ කැම්පීම් ආදියහා වස්ත්‍රාලංකාරය හා සමග බිසවුන් නැව ඉඳුවා මධ්‍යමරාත්‍රියෙහි ගඟදියට හළහ. ඒ ගඟ දියෙහි යන්නාවූ බිසවු යටිගඟ නැවුතැගී දියකෙළිනාවූ පාවාරිය රජ්ජුරුවන් සමීපයට පැමිණියාය. ඉක්බිති ඒ රජ්ජුරුවන්ගේ සෙනෙවිරද්දු දියෙහි එන්නාවූ නැව දැක පළමුව නැව මාසන්තකයයි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ නැවෙහි තුබූ වස්තුවෙක් මා සන්තකයයි කීහ.

මෙසේ කථාකෙරෙමින් සිටියදී සමීපයට ඇවිත් වන් නැව උන් බිස වුන් දැක යකින්නකබඳු තෙපි කවුරුදැයි විචාළහ. ඉක්බිති බිසව් සිනාසී බක රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන්වූ පංචපාපිකා නම් මමයයි යනාදීන් සවප්නය දුටු තැන්පටන් සියඑකටයුතු පරිද්දෙන් රජ්ජුරුවන්ට කියව. පළමුවම ඇපංච පාපීයයි ප්‍රසිඬහෙයින් මුන් බිසවුන් නිසාවේදැයි අත අල්වාගෙණ එවූහ.

අත ඇල්ලු පමණ හා සමග ශරීරපහසෙහි රක්තව එරජද අගමෙහෙ සුන්කොට අතික් ස්ත්‍රියක මූණ නොබලා දවස් යවන්නේම ඒ පංචපාපීනොම පාවාරිය රජහට ජීවිතසමානවූහ. බකරජ්ජුරුවෝ එපවත් අසා මහත්වූ අභි මාන උපදවාගෙණ එරජහට අගමෙහෙසුන්වූවිය නොදෙමි සේනාව රැස්කරවා ගෙණ පාවාරිය රජ්ජුරුවන්ගේ නුවර මෙගොඩක නුවරක් කරවාගෙණ ඉඳ මාගේ බිරින්ද හෝ එවුවමැනව සටන් හෝ කළමැනවැයි අස්නදුන්හ. එපවත් අසා පාවාරිය රජද සටනට සැරසුනෝය. එපවත් දැක රජදරුවන් දෙදෙනා ගේ මන්ත්‍රීවරහු ඔවුනොවුන් හා කථාකරන්නාහු පළමු සසවාමිකහෙයින් මේ බිසව් බකරජ්ජුරුවන් සන්තකයහ නැවින් ලත්හෙයින් පාවාරිය රජ්ජුරුවන් සන්තකයහ ඒ කාරණය හෙතුකොටගෙණ එකි එකී රජ්ජුරු කෙණෙකුන්ගෙ ගෙයි සත් සත් දවස විසියයුතුයයි රජදරුවන් දෙදෙනා සමාධිව එතෙර මෙතෙරයන එතකල රජදරුවන් දෙදෙනා මදහෙයින් ඔරුපදිනා මාලු කබර කොරකෙව්ලා හා සමග ගංමධ්‍යයට පැමිණිකල්හි පපාක්‍රියායෙහි යෙදින්නියයි මෙසේ කුණාලරජ්ජුරුවෝ එකල බක නම් රජව ඉපද තමන් දුටු කාරණය ගෙණහැර දක්වා කීහ.

තවද පූර්ණමුඛය යටගියදවස බ්‍රහ්මදත්තනම් රජ්ජුරුකෙණෙකුන්ගේ පිංගියානිනම් අගමෙහෙසුන් බිසවු සීමැදුරුකවුළුව හැර බැලුවාහු මඟුල්අස් ගොව්වා දැක රජ්ජුරුවන් නිදාපිකල්හි සීමැදුරුකවුළුයෙන් බැස උඟ හා සමග අතිචාරයෙහි යෙදී නැවත ප්‍රාසාදයට අවුත් සළුන්සුවඳින් ඇඟලලා රජ්ජුරුවන් හා සමග සැතපෙන්නීය. ඉක්බිති එක්දවසක් රජ්ජුරුවෝ සිතන්නාහු මධ්‍යම රාත්‍රියෙහි බිසවුන්ගේ ශරීරය සීතලය පරීක්ෂාකළයුතුයයි සිතා එක් දවසක් නිදාපුකෙණෙකුන් පරිද්දෙන් ඇඟවූහ. එවිට සෙමෙන් නැඟීසිට යන්නාවුන් දැක උන් හා කැටිව ගොස් අස්සලයා හා සමග නොකටයුත්තෙහි යෙදෙන්නිය දැක නැවත අවුදින් යානට වැඩියහ. බිසවුද අවුත් සුළුයහන ඔත්හ. දෙවෙනි දවස් රජ්ජුරුවෝ අමාත්‍යමණ්ඩලයා මධ්‍යයෙහිම හොනාකටයුත්තක් ප්‍රකාශකොට ස්ත්‍රී ජාතීහු නම් මෙබඳු ගුණ ඇත්තෙහියයි කලකිරී ඇගේ වධ බන්ධනයට සුදුසුවූ වරද ක්ෂමාකොට තනතුරෙන් පිරිහෙලා අතික්බිසවක අග මෙහෙසුන්කෙළේයයි මෙසේ ඒ කුණාල බොධිසත්ත්වයෝ බ්‍රහ්මදත්තරජව තමන් දුටුකාරණය ගෙණහැරදක්වා අනන්තරවූ නොයෙක් කාරණයෙන්ස්ත්‍රීන්ගේ නුගුණ කියන්නාහු සබඳ ලඝුවස්තුවක් පිණිස ස්වාමිපුරුෂයන්ගේ ජීවිතවිනාසය කරන්නාහු දෙමව්පිය මල්බෑබුන්ආදීවූ සහෝදර බන්ධුන්පවා සැලගුණය සලකන්නාවූ ප්‍රාණයසමානවූ මහත්වූ අනුකම්පාඇති බොහෝදවසක් පුරුදු පුරුෂයන් හැර ඉදින් අවකාශයක් ලදුනම් ඔහු මැඩපවත්නාහ. තවද වඳුරන් මෙන්ද සුලඟින් සැලෙන අතුපතර මෙන්ද වහා පෙරලන්නාවූ ගැල්සකක් මෙන්ද වහාපෙරළෙන සුළුවූ වක්‍රවාසිත් ඇත්තාහ.

බොහෝදෙනා බැස ස්නානය පානයකරන්නාවූ ගංතොටක්මෙන්ද රා මණ්ඩලයක්මෙන්ද සන්ථාගාරයක්මෙන්ද සියළු සත්ත්වයන්ට සාධාරණයහ.

කෙනෙක් දවස් පුරුදු උවද රජ්ජුරුවන් සෙයින්ද සෂීයින් මතනුන් සෙයින්ද විශ්වාසනොකොට හැක්කැයි යනාදීන් කුණාල රජ්ජුරුවෝ සම්ඳ විලාසයෙන් අනෙකපර්‍යායයෙන් තමන් දුටුවාවූද ලොකයෙහි පැවත එන්නාවූද ස්ත්‍රීන්ගේ නුගුණ සංඛ්‍යාතවූ ධර්මදෙශනා කළහ.

මෙසේ කීකල්හි එතැන්හි රැස්වූ මහජනයා වදාළසේ යහපතැයි යනාදීන් දෙහොත්මුදුනෙහි බැඳ සියදහස්ගණන් සාධුකාරනාද පැවැත්වූහ.

එපවත් අසා එතැන්හි ඔබගේ බණඅසා අනඳනම් ගිජුලිහිණි රජ්ජුරුවෝ කුණාලරජ්ජුරුවන්ගේ ආදිමධ්‍යපරියොසාන වසයෙන් මනාකොට දෙශනාකළ ධර්මය අසා තවද තමන් දත් විතරත් සබඳ මේ සත්ත්වලෝකයෙහි මේ කිසි සත්ත්වයෙක් තමාගේ සත්බවද හේතුකොටගෙණ අනේකවිධ රත්නයෙන් පිරුණාවූ සතරමහා සාගරය කෙළවරකොට ඇත්තාවූ මේ පොළොනෙලෙහි රාජ්‍යශ්‍රීය යම් ස්ත්‍රියකට දුන්නේවීනම් ඔහු කෙරෙන් අවකාශයක් ලදහොත් එවැන්නවුන් ඉක්ම අතිකකුකරා ලැගෙන්නිය. තවද කුමාරඅවස්ථාව පටන් පුරුදුව ප්‍රියවූ ස්වාමිපුරුෂයන් කටයුත්තක් පිණිස ඉවත්වූ කල්හි ඔහු හැර අතිකක්හු හා ලැගීමක් ස්වභාවකොට ඇත්තාහ. තවද මේ ස්ත්‍රී මා කැමැත්තිවද මා දුටුකල්හි මෙනෙක්දවස් නුඹ කෙරෙ වියොව උන්නෙම් යනාදීන්

සස්නෙහ අඟවා සමීපයෙහි සිට අඬන්නිදවීනමුත් ස්ත්‍රීන්කෙරෙහි විශ්වාසය නොකොට හැක්ක. පළමු අතුට තිබූ කොල ඇතිරියද පළමුමිත්‍රායයි ගම්පහරණ සොරහුද අපට ඉසුරුදී ස්නෙහයෙන් රක්නානුයයි රජ්ජුරුවන්ද බාලයෙහි පටන් පුරුදුවූද පුතුන් දසදෙනෙකු වදාගෙන උන් අඹුවෝයයිද විශ්වාසය නොකොට හැක්ක. තවද සෙරයහ චපලය වක්‍රවූ අදහස් ඇත්තාහ. කිසිත් අභිවෘද්ධි කාරණ කාරණයක් නොදන්නාහ, හැමවේලෙහිම මිත්‍යාත් වඤ්චා කරණ සුළුය ඉදින් සැබවසක් කියත් නමුත් බොරුමුසුකොට මුත්නොකියත් නාහ. තණබිම නොළුඑබූ සරකට ඉදිරි ඉදිරියෙ තණ යහපත්සෙ වැටහෙන හෙයින් සියක්යාල පමණ බිම පසුකොටකොට කෙලවර නොළුඇත වලක්නා සේ සබඳ මේ ස්ත්‍රී ජාතීහුත් ගීතය උත්තමයයි යනාදීන්වූ සියළු සත්‍වයන් දූක මේ උතුම මේ උතුමැයි වැටහෙන හෙයින් එක්කෙණෙකුත්සේ ලැගීමෙන් කෙළ වර දූකම හරණාහ යනාදීන් ගිජුලිහිණී රජ්ජුරුවෝ තමන්ගේ ඥානබලයෙන් දත් විවරක් ස්ත්‍රීන්ගේ නුගුණ දෙශනාකළහ.

එසඳ නාරදනම් තපස්වීහු තමන්ගේ නුවණබලයෙන් ස්ත්‍රීන්ගේ නුගුණම දක්වන්නාහුය. යම්සේ දහසක් ගංගාවෙහි ජලය අනවරතයෙන් වදුත් නොපිරිහෙන්නාවූ සමුද්‍රය පරිද්දෙන්ද චතුර්වේදය හදාරන රිසිනොයන්නාවූ බමුණන් මෙන්ද අනේකවිධ රත්නයෙන් උපලක්‍ෂිතවූ සියලු පොළොව ජයගෙණත් පරතෙර පතන්නාවූ රජදරුවන් මෙන්ද ස්ත්‍රීජාතීහුත් පුරාලිය නොහැකි සිත් ඇත්තාහ. එකී එකී ස්ත්‍රියකට ශෞර්වීර්‍ය්‍ය ඇති මහත්වූ කාය බල හා ඥානබල අර්ථබල තන්ත්‍රබල ආදී සියලු වස්තුකාම ක්ලෙශකාමයන් අනූනකොට දීලන්ට සමර්ථවූ සැමියො අට අට දෙදෙනෙක් ඇත්ත මුත් නව වැනිය සොර සැමියා පතන්නීය.

තවද චෞරක්‍රියා ඇති බොහෝ සිතිවිලි ඇති ස්ත්‍රීන්ගේ සැබෑගුණයක් නොලබහැකි හෙයිනුත් ඡියෙහියන මසුන්මෙන් සවභාවය නොදත හැකි හෙයිනුත් තමන්ගේ වසඟත්‍වයට පැමිණියවුන් ක්ලෙශ නමැති ගඞ්ගාවෙහි ගලා මරණ හෙයිනුත් මහත්වූ වඤ්චාදන්නා හෙයිනුත් බ්‍රහ්මචර්‍ය්‍යාව විනාශ කරණ හෙයිනුත් ස්ත්‍රීජාතීන් දුරින්දුරුකළයුතුය. තවද යම්පුරුෂයකුකරා ප්‍රේමයෙන් වේවයි ධනලාභයෙන් වේවයි ලැගුනහොත් ගිනිපුපුරක් තිබූ තෙතින් දගෙණ නික්මුනාසේ කෙලෙස් නමැති ගින්නෙන් වනාම ඔහු දවන් නාහුයයි දූන නුවණැත්තෝ එකාරණයෙන් ස්ත්‍රීජාතිය දුරින්දුරුකරන්නාහුයි යනාදීන් තමන් දත් විවරක් නුගුණ කීහ.

ඉක්බිති බොධිසත්‍වයෝ නැවත වදාරණසේක් සබඳ යම් පණ්ඩිතවූ පුරුෂයෙක් සියුම් මුවහත් ඇති කඩුගත් සොරහු හාද මිනීකන රාක්‍ෂදූන් හාද උග්‍ර විසතේජස් ඇති සර්පයින් හාද කථාකරන්නේවීනමුත් ස්ත්‍රීන් හා මනාව කථා නොකරන්නේය.

තවද මහත්වූ තේජස් ඇති සර්‍වානොවිතප්‍රඥ ඇති බොහෝදෙනා විසින් සත්කාර සම්මාන ලබන්නාවූ ලොකපූජ්‍යවූ උත්තම පුරුෂයෙක්වීනමුදු ස්ත්‍රී වසඟවූයේ වීනම් රාහුමුවපත් සඳක්මෙන් නිෂ්ප්‍රභවන්නේයයි වදාරා නැවත

මේ ආදී නොයෙක් කාරණයෙන් සවර්ගමොක්‍ෂබාධකවූ ස්ත්‍රීවසඟයට නොපැමිණ හිරිඔතප් පිහිටුවා සත්පුරුෂධර්මයෙහි පිහිටි උත්තම පුරුෂතෙම ස්ත්‍රීවසඟ නොව විසුයේවීනම් සරාහිරුමෙන් ලොවබැලී සියලුදුක් නිවූ අතිසයෙන් සංනතවූ නිවන්පුරයට වැද සැනහෙන්නේයයි කුණාලරජ්ජුරුවෝ සර්වඥතාඥනයෙහි පැහැර අමාමහනිවන් මිලකොට දෙශනාව කුළුගෙණ වදාළහ.

එදවස් එකුන්දහසක් යොදුන් හිමාලයපර්වතයෙහි කින්නරොරග සිද්ධ විද්‍යාධරාදීහුද ආකාශකුහරය පුරාසිටි සදෙව්ලොව දෙවියෝද මහත්වූ සාධුකාරදී බොධිසත්වයන්ට ස්තුතිකොට වැඳ සමුදුන්හ.

අනදනම් ගිජුලිහිණි රජ්ජුරුවෝ නාරදනම් බමුණු තවුසාණොද ඵුස්ස කොවුල්රජද තමතමන්ගේ පිරිවර හා සමග සවකීය ස්ථානවලට ගියාහ.

බොධිසත්වයෝද තමන්ගේ පිරිවර හා සමග වාසස්ථානයට ගියහ. මෙසේ කුණාලනම් බොධිසත්වයන්ගේ ත්‍රිවිධකල්‍යාණයෙන් උපලක්ෂිතව දෙශනා කරණලද්දවූ ධර්මයෙහි පැහැද යථොක්තවූ සියලු දෙව්මිනිස් පර්ෂත් දිව්‍යලෝකයෙහිම උපන්නයි යනාදීන් බුදුහු ගාථාශතප්‍රතිමණ්ඩිතවූ මේ කුණාල දෙශනාව ගෙණහැරදක්වා එදවස් ඵුස්සකොවුල් රජ නම් උදායිස්ථවිරයයිද එකල්හි ගිජුලිහිණි රජ්ජුරුවෝ නම් මෙකල ආනන්ද ස්ථවිරයෝය එකල නාරද ඍෂි මෙකල දක්‍ෂිණශ්‍රාවකවූ ශාරිපුත්‍ර ස්ථවිරය එදවස් බුද්ධවිලාසයෙන් ධර්ම දෙශනාකල කුණාලරජ්ජුරුවෝ නම් දැන් ලොවුතුරා බුදුවූ මම්මවේදූයි වදාරා ජාතක දෙශනාවගෙ කෙළවර එපන්සියයක් දෙනාවහන්සේ නිසොසාකවූ සෝවාන් මාර්ගයෙහි පිහිටුවා ගෙණයන තමන්වහන්සේගේ ආනුභාවයෙන් වැඩි එපන් සියයක් දෙනාවහන්සේට ඉර්ධි දෙවාවදාරා අලුත පියාසර උගන්නාවූ ගුරුළු පැටවු සමූහයන් පස්සෙහිලාගෙණ ආකාසයෙහි ගමන්ගත් සෙලසිය යක් යොදුන් ගරුඩරාජයාසේ ඒ භික්‍ෂූන් පස්සෙහි ලාගෙණ ආකාශයෙන් නැවත මහාවනයට වැඩවදාරා ඒ පන්සියයක් දෙනාවහන්සේට කර්මස්ථානදී රහත්කොට රාජ අරහනත සමාගමයෙහි සතුටුව රැස්වූ දසසහශ්‍රී ලොකධාතු යෙහි දෙවියන්ට "ආචික්ඛිස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි" යනාදිවශයෙන් මහසමය දෙශනාව වදාළසේකි.

525
සුත සොම ජාතකය

තවද දීපඞ්කර පාද මූලයෙහි අත්පත් නිවන් හැර සත්වකරුණාවෙන් සසරට වැද ගින්නෙහි පැසී මිහිරිවූ කිරියොදයක්සේ සාරාසංඛ්‍ය කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි සසර නමැති ගින්නෙන් පැසී සර්වඥ නමැති අමායොදය ඉදිමිහිරිවූඅල්පහක්‍ෂනිරුදක චොර අමනුෂ්‍යාදිසසරකතරින් සාර්ථවාහකයෙක් යම්සේ සතුන් එතරකරේද එමෙන් ජාති ජරා ව්‍යාධි මරණසංඛ්‍යාත සසරමහ කතරින් සත්වයන් ගොඩලා නිවන් නැමති පටුන්ගමට පමුණුවන්නාවූ බුදුහු එක්සමයෙක්හි දෙව්රම්වෙහෙර වැඩවසනසේක්.

අඟුල්මල්තෙරන් අරහයා මේ ජාතකය දෙශනා කළසේක.

ඒ අඟුල්මල් තෙරුන්වහන්සේ උත්පත්තියද මහණවීමද අඞ්ගුලිමාල සූත්‍රයෙහි වදාළ ක්‍රමයෙන් දතයුතු උන්වහන්සේ වනාහි සත්‍යක්‍රියාබලයෙන් ස්ත්‍රීන්ගෙ දරුගැබ සුවපත්කොට එතැන් පටන් සුලභව ලබනලද ආහාරයක් ඇතිසේක් විවේකීව විදර්ශනාවඩා රහත්ව අසීති මහා ශ්‍රාවකයන්වහන්සේට ඇතුළත්වූසේක. එකල්හි ධම්සභාවෙහි වැඩහුන් භික්ෂූන්වහන්සේ ඔවුනොවුන් හා කථාකරණසේක් ඇවැත්නි අඞ්ගුලිමාලයන් වැනි හැමවෙලෙහිම ලේවැකුනු දත් ඇතිවණ්ඩනා දරුණුවූ සොරක්හුපවාඅදණ්ඩයෙන් අශස්ත්‍රයෙන් දමනෙලා වදාළසේක ලොවුතුරා බුදුන්ගේ ගුණයෙක් ඉතා ආශ්චර්යසේයයි බුදුන්ගේ ගුණ වර්ණනාකොට ධම්සභා මණ්ඩපයෙහි වැඩහුන්සේක.

බුදුහු ශ්‍රී ගන්ධකුටියෙහි වැඩහුන්සේක් ධම්සභාමණ්ඩපයෙහි පැවති කථාව දිව්‍යකණින් අසාවදාරා අනොපමෙයයවූ බුද්ධවිලාසයෙන් ධම්සභාවට වැඩ පණවනලද උතුම්වූ බුද්ධාසනමස්තකයෙහි පලක්බැඳ වැඩහිඳ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදූයි වදාරා භික්ෂූන්වහන්සේ විසින් ස්වාමීනි නුඹවහන්සේ නොකියන්ට වදාළ දෙතිස්කථාවන් අතුරෙන් එක්කථාවකිනුත් යුක්තව උනුමෝ් නොවම්හ. ඉතා තදපරුෂවූ අඞ්ගුලිමාල යන් නිරායාසයෙන් මහණකොට උන්ගේ ගුණය ඉරසඳසේ ලොකප්‍රසිද්ධකොට වදාළ පරිදි කිය කියා උනුම්හයි දැන්වූ කල්හි මහණෙනි උතුම්වූ සම්‍යක් සම්බොධියට පැමිණි අවස්ථාවෙහි මුන් දමනේ ලීම ආශ්චර්යයයි සිතව්ද පෙර මේ සර්වඥතාඥනය පිණිස සසර ඇවිදිනෙම් ලෞකික ඥනයෙහි සිට මොහු ඉක්ම වූයෙම්වේදූයි සර්වඥප්‍රවාරණයෙන් පවරා නොබැණ වැඩඋන්කල්හි ඒ අතීත කාලයෙහි වර්තිවූ ධර්මදෙනාශ්‍රවණයෙහි කෞතුහල සිත් ඇති ඒ භික්ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ බුදුහු හිමගර්භයක් පලා චන්ද්‍රමණ්ඩලයක් ගෙණහැර දක්වන්නාවූ කාලක්පරිද්දෙන් ඉකුත්වත්කථාව ගෙණහැර දක්වනසේක් මහණෙනි යටගියදවස කුරුරට ඉදිපත්නුවර කොරව්‍යනම් රජ්ජුරුකෙනෙක් දාන ප්‍රියවචන අර්ථචර්‍ය්‍යා සමානාත්මතායයි දක්වනලද සතර. සංග්‍රහවස්තුවෙන් සත්වයන් සිත්ගෙණ රාජ්‍යය අනුශාසනා කරන්නාහුය එකල පුරණලද පාරමිතා ධර්මයන් ඇති අප මහබෝසතානෝ එරජහුගෙ අගමෙහෙසුන් බිසව බඩපිළිසිඳ උපන්හ. වෙදත්‍රය හා ලොකසමයානන්තරයන් ඇසීමෙහි සතුවූ සිත් ඇති හෙයින් සුතසෝම කුමාරයෝයයි නම් තුබූහ.

ඉක්බිති සුතසෝම කුමාරයන් සිල්ප උගන්නා සඳහා තක්සලානුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට පත්කුඩයක්ද වහන්සඟළක්ද මසුරන් දහසක්ද දී යවූහ. ඒ කුමාරද තක්ෂලානුවරට යන මඟට පිළිපන්හ. එසමයෙහි බරණැස කාසීරජ්ජුරුවන්ගේ පුත්වූ බ්‍රහ්මදත්තකුමාරයෝද පියරජ්ජුරුවන් විසින් සිල්ප උගන්නා පිණිස යවනලදුව එම මඟට පිළිපන්හ.

එකල්හි සුතසෝමකුමාරයෝ සියක්යොදුන් මඟගෙවාගොස් තක්සලානුවර වාසල්දොර ශාලාවෙක්හි සැතපී උන්හ. බ්‍රහ්මදත්තකුමාරයෝද ගොස් සුතසෝම කුමාරයන් හා සමඟ එක අස්නෙහි උන්හ ඉක්බිති සුතසෝමකුමාර සබඳ මඟම්රිකුණෙහි කොයිසිට අවුදූයි පිළිසඳර කථාකළහ. එසඳ බරණැස්

නුවර සිට ආමි කීහෙයින් තෙපි කාගේ දරුකෙණෙක්දැයි විචාරා කසීරජහුපුත් බ්‍රහ්මදත්ත කුමාරයෝයයි කීකල්හි කවරකාරණයෙන් අවුදැයි විචාරා සිල්ප උගන්නා සඳහායයි කියා නැවත බ්‍රහ්මදත්තකුමාරයොත් සුතසෝම කුමාරයන්ගේ පවත් විචාරා දැන අපි දෙදෙන රාජකුමාරවරුම්හයි මිත්‍රත්‍වෙහළුපදවා ගෙණ එක ආචාරීවරකෙණෙකුත් සමීපයෙහි සිල්ප උගණුම්හයි සනිටුහන් කොට ඇතුළුනුවරට වැද දිසාපාමොක් ආචාරීන්කරා එළඹ ආචාරීන් වැඳ තමන්ගේ ජාතිය හඟවා සිල්ප උගන්නා පිණිස ආබව කීහ. ඒ බව අසා ආචාරීනුත් යහපතැයි ගිවිසිකල්හි ආචාරීන්ට දුනමනා වස්තුභාගය දී සිල්ප උගන්ට පටන්ගත්හ.

තවද එම මතුනොවෙයි ඒ දඹදිව ඒසියයක් රාජධානියෙහි රජදරුවන්ගේ අනිකුත් රාජකුමාරවරහු එම ආචාරීන් කෙරෙහි සිල්පඋගන්නාහ. ඒ එක්සියයක් රාජකුමාරවරුන් කෙරෙහි සුතසෝම කුමාරයෝ නොබෝ දවස කින්ම සිල්ප ඉගෙණ නිමවා තුමූ ජ්‍යෙෂ්ඨආචාරීව නැවත තමන්ගේ අතිමිත්‍රවූ බ්‍රහ්මදත්ත කුමාරයන්ට වහා සිල්ප ඉගැන්වූහ, අවසෙසවූ කුමාරවරුනුත් ක්‍රමයෙන් උගන්වා නිමවූහ. මෙසේ ඒ එක්සියයක් රාජකුමාරවරහු අඳුළුතැන් වනපොත්කොටදී ආචාරීන්වැඳ සමුගෙණ සුතසෝමකුමාරයන් පිරිවරා නික්මූනාහ. ඉක්බිති සුතසෝම කුමාරයෝ උන් උන් රටට යන්නාහු මංසන්ධිවලදී සිට කුමාරවරුන්ට අවවාදකරන්නාහු තෙපිහැම තොප තොපගේ රාජ්‍යයෙහි පිහිටිකල සාරපෝයෙ පෙහෙව පොහෝ දවස් ප්‍රාණවධ ආදිය නොකොට සතර සංග්‍රහ වස්තුයෙන් වියෝනොව රජකරවයි අවවාදදුන්හ. එක්සියයක් රාජකුමාරවරහුම යහපත ආචාරීන්වහන්සැයි මුදුනෙන් පිළිගත්හ. බොධිසත්ත්ව යෝද අඞ්ගලක්ෂණ දූත්මෙහි දක්ෂයෙහිත් මතු බරණැස්කුමාරයන් පිණිස දඹදිවට බියෙක් උපදන්නේයයි දැන උන් උදෙසාම ඒ ඒ රාජකුමාරවරුන්ට අනුශාසනාකොට යවූසේකැයි දතයුතු.

එකල එක්සියයක් රාජකුමාරවරහු තම තමන්ගේ රටට ගොස් පියරජ දරුවන්ට සිල්පදක්වා රාජ්‍යයෙහි පිහිටා තමනට කල අවවාදයෙහි පිහිටා රාජ්‍යයකරණ බවද දක්වා පඬුරු හා සමග සුතසෝම රජ්ජුරුවන්ට සන්දෙශ යවූහ.

බොධිසත්වයන්වහන්සේද වැලිත් අපගේ අවවාදයෙහි ප්‍රමාදනොවවයි නැවත රජදරුවන්ට කියායවනසේක.

ඉන් බොධිසත්වයන්ගේ අති විශ්වාසිවූ බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ මස් නැතිව බත් අනුභවනොකරන්නාහ. පොහෝදවසට පළමුදවස්ම මස්ගෙණ වුත් මුළුතැන්හෙයි තබන්නාහ. ඉක්බිති එක්දවසක් පොහෝදවස මෙහෙ වඩන්ටයයි ඇර තිබූ මස් අරක්කැමියාගේ ප්‍රමාදයෙන් රජගෙයි වඩන බල්ලො කාපීහ. අරක්කැමි මස්නොදැක කම්පාව රන්මිටක්ගෙණ අගාහි මුලුල්ලෙහි ඇවිදිනේ මස් නොලදින් මස්මාලුනැතිව බත් මේවැඩීම් නම් මාගේ මේ ජීවිතය නැත කුමකින් කුමක් කෙරෙම්දෝහෝයි සිතන්නේ උපදෙශයෙක් ඇතැයි පස්වරු අමුසොහොනට පලාගොස් ඇසිල්ලක මියගියමිනිසක්හුගේ කලවයෙහි මස් ලියාගෙණ යහපත්කොට පියරජ්ජුරුවන්ට මෙහෙවැඩිය රජ්ජුරුවෝද මස් බිතක්ගෙණ දිවූඅග තිබූකල්හි ඝන්දහසක් නහර ඉල්ප සියළු ශරීරය

පිණවා ගියේය. ඊට කාරණ කවරේදයත් ඒ රජ්ජුරුවෝ වනාහි අනතුරු අත්බව යක්ෂව ඉපිද බොහෝ මනුෂ්‍යමාංස අනුභවකළාහුය. මෙසේ පූර්වජාතිය කරණලද මාංශ භක්ෂණය හේතුකොටගෙණ එරජහට මිනීමස් ප්‍රියවිය. ඉක්බිති ඒ රජ්ජුරුවෝ මුවෙන් නොබැණ මේ අනුභවකෑලවීනම් මේ මස්වූ පරිදි මට නොකියතියන්තක් සිතා කෙළ හා සමග කාරා බිමට දැමූහ. ඉක්බිති අරක්කැමියා විසින් මහරජ නිර්දෝෂය සැකනොවී මේ නිමවා වැදැළමැනවායි කී කල්හි රජ්ජුරුවෝ සමීපයෙහි සිටි මිනිසුන් ඉවත්කොට මේ මස් යහපත් බව දනිමි. මේ මස් කෙසේවූ මසෙක්දැයි විචාළහ. ඉක්බිති අරක්කැමියත්තේ ස්වාමීනි ඊයේදවස මෙව්වැඩු මසේ මසමයයි කීය. එසේ මෙතෙක්දවස් මෙබඳු රසයෙක් නැතැයි විචාළහ. මහරජ අද යහපත්කොට පිසූහෙයින් රස වැඩියයි කීහ. එපවත් අසා අජ්ජුරුවෝ පෙරත් මෙම ලෙසම නොවෙද තා පිසන්නේයයි ස්වභාවය නොකියවීනම් දැන් තාගේ ජීවිතය නැතැයි කීහ. ඉක්බිති අරක්කැමි අභය ඉල්වාගෙණ තත්වූ පරිද්දෙන් නොවළහා කීහ. එසඳ රජ්ජුරුවෝ කාටත් නොකියවයි කියා පළවූ පිසන මස් නොඅනුභව කොට නිරන්තරයෙන් මිනීමස් පිස මේවඩවයි කීහ.

මහරජ නොලැබහැක්කැයි කීය. රජව සිටි අපට ලැබීම ආයාසය කිම්දැයි කියා සිරගෙවල් සතරෙහි බොහෝසත්වයෝ ඇත දවස ඉන් එකක්හුමරු මස්ගණැයි කීය. එද එතැන්පටන් ඉන්එකකු නියායෙන් මරා මේවඩන්නේය.

මෙසේ කල්යාමකින් සිරගෙයි මනුෂ්‍යයන් නිමාගියකල්හි ඉනිබ කළ මනා කවරේදැයි විචාළේය. අනරමග දහසින්බඳ පියලිඑලා යමෙක් ඇරගත් නම් ඔහු සොරයයි කියා අල්වාගෙණ මරාලවයි කියා මෙසේ කල්යාමක් ගිය කල්හි දහසින්බඳ පියලී අල්වන කෙණෙකුත් නැතිහෙයින් තවද කළමනා කිම්දැයි විචාළේය.

සවස ධූරය කරණවේලාවට නුවර අකුල්වා තිබෙන්නේය. එවෙලාවට කොවේ මාවේආදියෙහි සැඟවීසිට මිනිසුන්මරාමස්ගෙණැයිකීහ. එසඳ යහපතැයි ගිවිස සන්ධිවල සැඟවීසිට මිනිසුන් මරාලවයිකීය. සනවතුඹු මස්පිඩු ලියාගෙණ ඇටසැකිල්ල දමාපියා යන්නේය. ඒ ඒ තන්හි දමාපියාතිබෙන්නාවූ ශරීරයන් දැක දූන් මාගේ මැනියන් දුටිමි. පියාතන් දුටිමි මලනුවන් දුටිමි බෑනන් නැග නියන් බූනනියන් දුටුමි. එක්වත් මනුෂ්‍යයන් අඬනඅඬින් නුවරපැලීයන්නාක් මෙන් නුවරවැස්සෝ හයින් නැතිගෙණ අනේ මනුෂ්‍යයන් සිංහයන්ගෙණ කාදෝ ව්‍යාඝ්‍රයෙක් අනුභවකෙරේදෝහෝ යක්ෂයෙක් අල්වාගෙණ කාදෝ හෝයි මිනි වටින් පිටින් පෙරළා බලන්නාවූ ඇනකොටා ප්‍රහාර මුබදක්නාහු මේ මිනිසුන් මනුෂ්‍යයෙක් මරාකන්නේයයි දැන බොහෝ නුවරවාසීහු රාජාංගනයෙහි රැස්ව මුරගැහ. රජ්ජුරුවෝ කිමෙක්දැයි විචාරා මහරජ මෙනුවර මිනීමස් අනුභවකරන්නාවූ සොරෙක් ඇත. වහා පරීක්ෂාකරවා ඇල්ලුවමැනවැයි කීකල්හි කිමෙක්ද මම කෙසේ නුවර පරීක්ෂාකොට ඇවිදිම්දැයි කියා නොලැබුනු කල්හි ඉක්බිති නුවරවාසීහු රජ්ජුරුවෝ නුවර පරීක්ෂාවෙහි අපෙක්ෂාවෙක් නැත්තේයි කාලහත්ථි නම් සෙනෙවි රජුන්කරා ගොස් ස්වාමීනි මෙනුවර නොකටයුත්තෙක් පහළවිය. වහා සොරුන් පරීක්ෂාකොට ඇල්ලුවමැනවැයි කීහ. ඉක්බිති සෙනෙවිරදු එපවත් අසා සාම්පාව සත්දවසින් මත්තෙහි

සොරහු අල්වාදීලම් අස්වසා යවා තමන්ගේ අනුචරයන් ලඟටකැඳවා එපවත් කියා තොපි හැම ඒ ඒ ස්ථානයෙහි සැඟවීසිට සොරහු අල්වාදීලවයි තන්හි තන්හි රුකවල්ලැවූහ. එතැන්පටන් සෙනෙවිරදුන්ගේ යෝධයෝ ඒ ඒ ස්ථාන යෙහි සැඟවීසිට රාත්‍රියෙහි දිවාභාගයෙහි අප්‍රමාදව පරීක්‍ෂාකරන්ට පටන් ගත්හ. එකල්හි අරක්කැමි එක්වීථිකොටසෙක්හි සැඟවී සිටගෙණ එක්ස්ත්‍රියක කඩුයෙන් පැහැර එලා සනමස් ලියා පැස්පෙට්ටියෙ පුරන්ට පටන්ගත. ඉක්බිති රුකවල සිටියාවූ පුරුෂයෝ දැක අල්වාගෙණ පිටතල හයාබැඳ මිනී මරන්නාවූ සොරහු අල්වාගතිම්හයි මුරගාලූකල්හි ජනයෝ රුස්ව සොරහු අතින් පයින් පැහැර මස් පැස බොටුයෙහි බැඳ මර මරාගෙණගොස් සෙනෙවි රදුන්ට පාවාදුන්හ. ඉක්බිති කාලහස්තිනම් සෙනෙවිරදු අරක්කැමියා ඇඳින කම්පාව කම්කලමුග්ධය ස්ත්‍රීපුරුෂයන් මරන්නාවූ තෝ මේ මනුෂ්‍යමාංසය අනුභවකෙරෙයිද නොහොත් අතිකුත්මස් හා මිශ්‍රකොට වස්තුඋපදවයිද නැත. අතික්කෙණෙකුන්ගේ වචනයෙන් මරා අනේ පිණැත්තව මෙබඳුවූ දරුණු ක්‍රියාවක් කුමක් සඳහා කෙරේදැයි විචාළහ.

ඉක්බිති අරක්කැමිතෙම තත්වූපරිද්දෙන් කියන්නේ සාමිනි මරන්නාවූ මම මා අනුභවකරණ පිණිස මරන්නේමුත් නොවෙමි මිත්‍ර පුත්‍රකලත්‍රාදීවූ බන්ධු පොෂණය පිණිස මරන්නේමුත් නොවෙමි, වැලිකුමක්පිණිසදයත් ජගත් පාලවූ නුඹවහන්සේගේ මේ රජ්ජුරුවෝ මිනීමස් අනුභවකරන්නාහුය. උන්ගේ කීමෙන් මරම්යි කීයේය.

එපවත් අසා සෙනෙවිරද්දු මොහුවිසින් මේවචනය සැබෑ කීයේදෝ හෝයි නොහෝත් මරණභයින් බොරුකියාදෝහෝයි විමසනු පිණිස වත්නාට ඉදින් අරක්කැමියාට තෝ භක්තිසවාමීවූ රජ්ජුරුවන්ගේ මෙහෙවරින් මිනී මරන්නෙහි වීනම් සෙට උදෑසනක්සේම අනතඃපුරයට ගෙණගොස් රජ්ජුරුවන් සම්මුඛයෙහිලා විචාළකල්හි එපවත් අසා අරක්කැමිතෙම සෙනෙවිරත්නි නුඹවහන්සේට වඩ වඩා අභිවෘධියෙක් වේවයි ඉදින් සැබවටම නුඹවහන්සේ උදෑසන රජ්ජුරුවන් කරා ගියසේක්වීනම් තත්වූ පරිද්දෙන්ම කියාලම්යි කීයේය.

ඉක්බින්නෙන් සෙනෙවිරද්දු උඟගේ අභීත වචනය අසා බැඳුමෙන්ම රාත්‍රියෙහි වැදනොවා පහන්වූකල්හි අමාත්‍යවරුන්හාද නුවරවැස්සන්හාද කථාකොට ඇමදෙනම, එකවචනයෙහි පිහිටිකල්හි නුවර සිසාරා රුකවල් ලවා නුවර තමන් හස්තප්‍රාප්තකොට අරක්කැමියාගේ බොටුවෙහි මස්පැස බැඳ වාලා අල්වාගෙණ මර මරා රජගෙට බලාගෙණයන්ට පටන්ගත්හ. සියලු නුවර වාසීහු මහාහඬින් හඬානෙණ මහවතුරක් මැඩගෙණ නික්මෙන කලක් පරිද්දෙන් කැටිවම වැටුනාහ.

රජ්ජුරුවෝද ඊයේ දවස පෙරවරු මේ නිමවූවතම රුසයින් වැදහෙව අරක්කැමි දැන් ඒද්‍ගෙ දැන් ඒද්‍ගෙ හෝයි උන් බලාම්ඉඳම රාත්‍රිය යවා පහන්ව ගියකල්හි ඔහු නොඑනහෙයින් කාරණාකවරේදෝහෝයි සීමැදුරු කවුළුව හැර බලන්නාවූ නුවරවැස්සන්ගේ මහත් වූ කෝලාහලයද ඔහු බැඳලා ගෙණෙන තියාව දැක මෙතෙක් දවස් අප කළ නොකටයුත්ත ප්‍රකාශව ගියෙ

නියා වේදැයි භයපත්ව නැවත රාජධෛර්යී උපදවාගෙණ රජාසන මස්තකයෙ ගොසින් උන්හ.

එකල්හි සෙනෙවිරත් රජුකරා එළඹ කියන්නාහු මහරජ නුඹවහන්සේ අරක්කැමියා යවා ස්ත්‍රී පුරුෂයන් මරා මස්ගෙන්වාකන්නේ සැබෑදැයි විචාළහ

ඉක්බිති මහත්වූ තේජස් ඇති සෙනෙවිරදුන් විචාළවචන සඟවා කිය නොහී සැබෑය සෙනෙවිරත්නි මා කීවාකළ තැනැත්තහු අල්වාගෙණ හාස කරන්ට කාරණකවරේද නොපි සැපත්වූවොතින් සොරකුනොවෙද අල්වාපුව මැනවැයි භයගන්වා කීහ. එපවත් අසා සෙනෙවිරද්දු රජ තමාගෙ මූඛ යෙන්ම නොහඟවා කිය. මොහුගේ සහාය ක්‍රියාව ඉතා ආශ්චර්යය මොහු වලකා අවවාදයක් ගෙණහැරදක්වමියි මහරජ නොකළහැක්ක මිනීමස් කෑමෙන් වැළකුව මැනවැයි කීහ.

ඉක්බිති රජ්ජුරුවෝ සෙනෙවිරත්නි කුමක් කියවූදැයි මින් මම වැළැක්ක නොහෙමියි කීහ.

එකල්හි සෙනෙවිරද්දු එසේවීනම් මහරජ නුඹහන්සේගේ රාජ්‍ය යෙනුත් ජීවිතයෙනුත් පලක් නොවනසේකැයි කීහ.

එසේවත් මිනීමස්කෑහෙමි වැළැක්කනොහෙමි කීහ. එපවත් අසා සෙනෙවිරද්දු රජ්ජුරුවන් සත්හිඳුවාගත නොහැක්කැයි සිතා කථාවක් ගෙණ හැර දක්වන්නාහු.

මහරජ යටගිය දවස මහසමුද්‍රයෙහි මහාමත්ස්‍යයෝ සදෙනෙක්වූහ. උන් අතුරෙන් ආනන්දය තිමින්දය අජ්ඣාරොහය යන මස්සු තුන්දෙන පන් සියයක් පන්සියයක් යොදුන් දිග ඇත්තාහ. තිමිය තිමිඞ්ගලය තිමිරපිඞ්ගලයයි යන මස්සු තුන්දෙනා දසක් දසක් යොදුන් දිග ඇත්තාහ.

මෙම මස්සු පහනසෙවලම ගොදුරුකොට ඇත්තාහ. මොවුන් අතු රෙන් පන්සියයක් යොදුන් දිගඇති ආනන්දනම් මත්ස්‍යරජතෙම සමුද්‍රයෙහි එක් කන්තෙක වෙසෙයි. ඔහු දක්නා පිණිස බොහෝ මත්ස්‍යයෝ එක්වන්නා හුය.

එක්දවසක් ඒ මත්ස්‍යජාතීහු එක්ව කථාකරන්නාහු මේ සත්ව ලෝකයෙහි සියලු දිපද චතුෂ්පද ජාතීන්ට රජදරුවෝයයි කියා නැත්තාහ. මීට පළමු අපට රජදරුකෙණෙක් ඇත්තාහ. අපිදු අපට රජ්ජුරුකෙණෙකුන් ඇතිකොට වසම්හ. ඇමදෙන එකඅදහස්ව ආනන්දනම් මත්ස්‍යයා රජකළහ. එතැන්පටන් ගෙණ සවස උදෑසන සියළු මත්ස්‍යජාතීහු ඕහට උපසථානයට එන්නාහ.

ඉක්බිති එක්දවසක් ආනන්දනම් මත්ස්‍යරජතෙම පර්වතයෙහි ගල් සෙවෙල් අනුභවකරන්නේ සෙවෙල්කඳයයි යන සංඥාවෙන් නොදැකම කුඩා මත්සකු සපාපීහ. එක්ෂණයෙහි ඔහුගේශරීරය පිණාගියේය. ඒකා මාගේ මේ

මධුර රසයකැයි පරීක්‍ෂාකළමැනවයි සිතා මුඛයෙන් පිටත්කොට බලන්නේ මස්කඩ දැක මම මෙතෙක්කල් නොදත මී තියා රසයක් අනුභව නොකෙළෙමි මෙතැන්පටන්ගෙණ සවස උදැසන මසුන් මට උපසථානයට ආකල එක් මසෙකු දෙමසෙකු අප්‍රකාශව අනුභව කෙරෙමින් පසුව ප්‍රකාශව අනුභව කරන්ට පටන්ගත්තෙම් වීන්නම් එක්කෙණෙකුත් මාකරා නොඑළඹ සැඟවී පලායන්නාහුයයි සනිටුහන්කොට දවස්පතාම මත්ස්‍ය සමූහයාත් තමන් සමීපයට නික්මෙන අතපස්සෙහි යන මසුන්ගෙන් කීපදෙනෙකු අල්වාගෙණ කාපියන්නේය. මෙසේ කල්යාමකින් මත්ස්‍ය සමූහයෝ අඩුවන් අඩුවන් සිතන්නාහු මෙසේ භය අපගේ බන්ධු වර්ගයාට කෙසේ උපන්දෝහයි මන්ත්‍රණය කරන්නේ ඔවුන් අතුරෙන් එක් නුවණැති මසෙක් තිමා විචාරණ ප්‍රඥාවෙහි දක්‍ෂහෙයින් ආනන්දනම් මත්ස්‍යරජහුගේ කටයුත්ත මට අභිප්‍රාය නොවෙයි පරීක්‍ෂාකළ මැනවයි සිතා එක්දවසක් මසුන් උපසථානයට ගිය කල්හි තෙමේ මස් රජහුගේ කන්පතමුවාවෙහි සැඟවීගෙණ සිටියේය; එකල්හි ආනන්දනම් මස්තෙම මසුන් නික්මවා පස්සෙහි යන්නවුන් අල්වාගෙණ කෑය. ඒ කාරණය සැඟවීසිටි මසා දැක තෙස්සවුන්ට ගොස් කීය. සියලු මස්හු භයින් තැතිගෙණ එදවස්පටන් උන්කරා එනගමනක් නොකොට ගිය ගිය අත පලාගියාහුය.

ඒ අතද නම් මස්රජතෙම එතැන්පටන් මස්රස ලොභයෙන් අනික් ගොදුරක් අනුභව නොකරන්නේය. සයින් පීඩාව වෙහෙස විඳිමින් මත්ස්‍ය සමූහය මා හැර කොයි පලාගියේදෝහෝයි ඒ ඒ තැන බලා ඇවිදිනේ මැද මූද පර්වතයක් දැක ඒ මත්ස්‍යයො මා කෙරෙහි කළ භයින් මේ පර්වතය තියා වෙසෙද්දෝහෝයි සිතමි. පර්වතය පරීක්‍ෂාකොට බලමියි සිතා වාලධියෙන් හා ඉසින් පර්වතය වටාගත් කල්හි අනික් දිසාවෙන් වටකොටගෙණ අවුදින් ඉස කෙරේම පැමිණියාවූ තමාගේ වාලධිය දැක මේ මසෙකැයි යන සංඥාවෙන් මෙතෙම මා වංචාකොට පර්වතය ආශ්‍රයකොට වීසි තියාවේදැයි කිපී කිරිකිරියේ කන තැනැත්තේ පණස්යොදුන් තැන් අල්වාණෙන සපාකාපීය.

ඉක්බිති බලවත්වූ දුක්ඛවේදනා උපන සියළු මූහුද ලේ මූහුදක්සේව ගියේය. රුධිරගන්ධයෙන් සියළු මත්ස්‍ය සමූහයෝ ඇදකන්නට පටන්ගත්තාහු ඉසදක්වා කා නිමවාපුය. එද මහත්වූ ශරීරහෙයින් වැලකිය නුහුනුයේය. එතැන්හිම ජීවිතක්‍ෂයට පැමිණියේය. පර්වතයක් පරිද්දෙන් මහත්වූ ඇටගොඩ විය ආකාශයෙහි යන්නාවූ තපස්විවරහු දැක මෙ ලෙස මළාවූ මත්ස්‍යයාගේ ඇටගොඩයයිද මනුෂ්‍යයන් අතුරෙන් ප්‍රසිඬකල මහරජ සියළු ජම්බුවීපවාසීහුද ආනන්දනම් මස් රජතෙම ස්වකීය මාංශ තෘෂ්ණාවෙහි බැඳි මචඡ පර්‍යීද ක්‍ෂයට ගියකල්හි තෙමේ තමා ඇඟමස් කා මළේයයි දක්නාහුය.

එසේහෙයින් මහරජ ඒ ආනන්දනම් මත්ස්‍යායා පරිද්දෙන් රස තෘෂ්ණාවෙහි බැඳුනාවූ අඥාන සත්‍වතෙම එනදවස තමාට වන්නාවූ අනභිවෘඩිය දැන ගත නොහී තෘෂ්ණාවසඟව පුත්‍රදාරාදී බන්ධුවර්ගයා කෙරේද අද තමාට පැමිණියාවූ මහා යසශ්‍රියෙන්ද පිරිහී මහත් විනාශයට පැමිණෙන්නාහුය එබැවින් මහරජ මේ කාරණය අසා දැන මිනීමස් අනුභව කිරීමෙන් වැලකුන මැනව.

ඉදින් නොවලක්නාසේක්වීනම් ආනන්ද නම් මත්ස්‍යයා පරිද්දෙන්ම රාජ්‍ය සම්පත්තීන්ද පිරීහෙන්නේයයි යනාදීන් උදාහරණ ගෙණහැරදක්වා අවවාද කීහ,

එපවත් අසා රජ්ජුරුවෝ කාලහස්තිනම් සෙනෙවිරත්නි උපමාදන්නෝ නොපිම නොවෙයි මමත් දනිමියි කියා තමන් මිනීමස් කෑයෙහි ලොල් බැවින් වැළැක්කනොහී සෙනෙවිරදුන් ගිවිස්වන පිණිස උදාහරණයක් ගෙණහැර දක්වන්නාහු සෙනෙවිරත්නි යටගිදවස සුජාතනම් කෙළෙඹිපුත්‍රයෙක් මහත්වූ සම්පතීන් අඩ්‍යය එතෙම ලුණු ඇඹුල් සෙවුන පිණිස හිමාලවන යෙන් වැඩි පන්සියයක් තපස්වීවරයන් තමන්ගේ උයනෙහි වස්වා උපසථාන කරන්නේය. ඔහුගේ ගෙයි නිරන්තරව පණවනලද අසුන් දන්සැපවූවනම තිබෙන්නේය,

එතකුදුවූවත් ඒ තපස්වීවරහු කිසිදවසෙක බොහෝදෙනාට කුසලානු ග්‍රහ පිණිස දනව් සැරිසරා සිඟාවඩිති. සමහරද වසෙක ආකාශයෙන් හිමාලය වනයට ගොස් දඹදිවට සලකුණුවූ සියක්යොදුන්ඇති මහදඹගසින් මහදඹ ඵල ගෙණවුත් වළඳන්නාහුය, මෙසේ එක්දවසක් තපස්වීවරයන් දඹ ගෙණ වුත් වළඳන කල්හි සුජාතානම් සිටුදරු සවාමිදරුවන් මාගේගෙට නොවඩනේ තුන් සතර දවසෙක කොයි වැඩිසේක්දෝහෝයි සිතා කෙළ ඇවිදිනාවූ පුතු දූක ඇඟිල්ල ආල්ලාගෙණ ආරාමයට ගියේය. එකල්හි මැඩිමාළු තපස්වරුන් කට සෝදන්ට පැන්දී බලා තාපසයෝද දඹ අනුභව කරමින් උන්හ. සුජාත නම් කෙළඹිපුත්‍රයාද තාපසවරුන් දූක වැඳ එකත්පස්වහිඳ සවාමීනි වළඳන් නේ කුමක්දූයි විචාළේය. ඇවැත්නි දඹයයි කීය. එපවත්අසා බාලකුමාරතෙම දඹකම් ඇවිටිලිගත. ඉක්බිති වැඩිමාළු තාපසයෝ සුහක් ඔහට දුන්හ. ඒ අනු භවකොට උතුම්වූ රසතෘෂ්ණාවෙහි බැඳී දඹ මට දෙව දඹ මට දෙවයි ඉල්ලන්ට පටන්ගත. කෙළඹිපුත්‍රතෙම බණඅසමින් උන්නේය. පුත නොහඩව ගෙට ගියකල දීලියහැකැයි පුතු තලවා තපස්වීවරුවැඳ අවකාශ ඉල්වාගෙණ ගෙට ගියේය. ඒ දරුද ගියවේලෙහිපටන්ගෙන දඹපිණිස මොරගානේය. සෘෂි වරුද බොහෝ දවසක් මනුෂ්‍යපථයෙහි විසුම්හයි හිමාලයවනයට නැගීගියහ. සිටුදරුද එක්වන්ට පුතු අඩනා වලප්නා හෙයින් තපස්වීන්කරා එළඹ දඹ ඉල්වා දෙමී ආරාමයට ගියේය. තපස්වීවරුන් නොදූක මෙසේ කොටත් තලවා ගනනොහී කුමක්දෝහෝයි ඒ උයනෙහි අඹ දඹ වැල වරකා ගෙණ ඒ ශකීරු හා සත්කොට තම පුතුට මේ දඹයයි කියාදෙන්නේය. ඒ තෙම ඉන් සුහක් දිවග තබාලූකල්හි හලාහලවිෂයක්සේ දූනෙන හෙයින් කාරා බිමට දමා සත් දවසක් නිරාහාරව මළේය.

එසේහෙයින්සෙනෙවිරත්නි උතුම්රසයෙන් යුක්තවූමිනීමස් නොලදින් නම් මාගේ ජීවිතය නොරැකෙයි සිතමි කීහ.

ඉක්බිති කාලහස්ති නම් සෙනෙවිරත් අතිශයින්ම මේ රජ තෘෂ්ණාවෙහි ගිජුවිය අතිකුත් උදාහරණයක් ගෙණහැරදක්වා බලමි සිතමි. ඉදින් මහරජ මිනීමස්කෑමෙහි නොවැලකීසේක් වීනම් මි නියාවූ අමාත්‍ය මණ්ඩලයා කෙරෙන් මෙබඳු රාජ්‍යශ්‍රියකින්ද පිරිහෙනසේකැයි කියා අවවාද කරන්නාහු

යටගියදවස මෙම බරණැස්නුවර උපත්හිමින් පඤ්චශීලය රක්නාවූ උතුම්වූ සොත්ථියනම් බමුණුකුලයෙක් ඇත්තේය, ඒ කුලයෙහි ඒ පුතනුකෙණෙකුත් ඇතිකල්හි ඒ කුමාරතෙම දෙමව්පියන්ට ඉතා ප්‍රියතියාව ඉතා ව්‍යක්තය වෙදත්‍රය නිමවා දත්තේය, ඒ කුමාරතෙම සමවයස් ඇති එක්කෙළිමඩලයෙහි වැඩි කුමාරවරුත් සමග බොහෝසේ එක්ව ඇවිදිතේය, සෙසු කුමාරහු රා මස් අනුභවකරන්නාහුය. මේ කුමාරතෙම රා මස් වේවයි මස්වේවයි අනුභව නොකරන්නේය, ඉක්බිති සෙසු බාලයෝ සිතන්නාහු මේ තමා රා නොබොන හෙයින් අපට මිල නොදන්නේය. එසේ හෙයින් වංචාවෙන් රා පොවාපූ වොත් යහපතැයි දැන එක්ව දවසක් හැමදෙන රැස්ව සබඳ සැණකෙළි කෙළම්හයි කීහ. ඉක්බිති සොත්ථියකුමාරයෝ කියන්නාහු තොපි හැම රා බොව මම රා නොබොමි. එබැවින් උත්සවයෙහි මා එක්වීමෙන් ප්‍රයෝජන නැත තෙපි හැමදෙනම කෙළිව්යි කීහ. ඉක්බිති කුමාරවරහු සබඳ නුඹ වහන්සේට පානවගීය පිණිස කිරි ගෙන්වාගනමැනවැයි කීහ. රා බොන බවමුත් ක්ෂීරපානය කෙරෙමින් සැණකෙළි කෙළීයයි වරද කවරේදැයි යහ පතැයි කිවිස්සාහ. සෙසු ධූර්තයෝද සරහතලද උයනකට ගොස් නෙළුම්පත තීක්ෂණ රාමුළු බන්දවා තුබූහ. ඉක්බිති රාබොන වේලෙහි කුමාරයන්ට කිරි එලවූහ. ඉන් ධූර්තයෙක් පින්වත්ති මට පොකුරුම් ගෙණෙවයි කියා ඉන් රා මුලක් ගෙන්වාගෙණ පල්ලෙන් කුඩා සිදුරක්කොට මුඛඅල්වාගෙණ කට තබාගෙණ කටඋඩටකොට බොන්නට වන සෙස්සෝත් අපටත් පොකුරුම් ගෙණෙවයි කියා ගෙන්වාගෙණ රාමුල කටතබාගෙණ බොන්නට වන්හ, ඉක් බිති කුමාරයෝ මේ කුමක්දැයි විචාළහ. එවිට ධූර්තයෝ පොකුරුම්නම් මේ වේදැයි කීහ. එසේවීනම් මටත් ඉන් පුඟක් දෙවයි ඉල්වූ හෙයින් වැලි බොවයි රා මුලක් දුන්හ.

ඉක්බිති කුමාරයෝ පොකුරුම් සංඥවෙන් රාපූහ. ඉක්බිති ඕනට අඟු රෙන් පැලහු මස් දුන්හ. එසඳ අනුභවකළහ. මෙසේ කුමාරයන් නැවත නැවත බොන්නට පටන්ගත් කල්හි කුමාරද රාමත්විය. මත්වූබවදත් ධූර්තයෝ මේ පොකුරුම් නොවෙයි රායයි කීහ. එපවත් අසා කුමාරයෝ මෙතෙක්කල් මුළුල්ලෙහි රානම් මෙසේවූ රසයක් ඇතිනියා නොදන්නෙමි. ගෙණව රායයි කියා ගෙන්වාගෙණ පූහ.

මෙසේ කුමාරයන්ට රා පිපාසාව මහත්විය. ඒ බව දැන නැවත ඉල්වන්ම නැතැයි කියා නුදුන්හ. එසේවීනම් ඇතිතෙනකින් රා ගෙණෙවයිකියා ඇඟිල්ලේ තිබූ පේරුස ගලවාදුන්හ. මෙසේ එදවස් මුළුල්ලෙහිම උන් හැම හා සමග රාබී මත්ව ඇස් රතුකොටගෙණ සවස වෙවුලා වෙවුලා ගෙට්ගොස් වැදහොත් තේය. ඉක්බිති පියාතෝ රා පූ නියාව දැන කම්පාව රා මද සිඳීගිය කල්හි පුත උත්තම වංශයෙහි උපන්නාවූ තොපවිසින් රාබිව යුත්ත නොවෙයි මෙවක් පටන් එලෙස නොකරවයි අවවාද කීහ.

එබස්අසා මාණවකතෙම පියාතන්වහන්ස කුමක්කියනසේක්ද මීතියා රසයෙක් මෙතෙක්කල් නොදත්බව මාගේපවෙක. රායෙන් වැලැක්කනොහෙ මියි කීහ. පියාතෝ නැවත නැවතත් යාච්ඤාකොට නොවළකම්යි කීහෙයින් අපගේ වංශයටක් කැලලවිය සම්පත්තිය නැසෙන්නේයයි සිතා පුත් උතුම්වූ

කුලයෙහි ඉපද විසිතුරුවූ රුවින් අග්‍රප්‍රාප්තව නොකානොපියයුතු රාමස්කෑපු
වට අපගේ වංශයට යොග්‍ය නොවෙයි තෙපි රාබීමෙත් නොවලක් පසු අපගේ
ගෙන් පිටත්වයි පිටත්කරවා මුත් අපට නොනෑබව ලියවයි අධිකාරණ
සමමතයේ ලියවා තමන්ගේ කුලයෙන් පිටත්කරවූහ.

ඒ කුමාරද සප්තවිධවූ රසයන් අතුරෙන් උතුම්වූ රසයෙක ඊතියා රස
යක් නොලබන්නාවූ මට මධුර රසයෙන් අඹී රසයෙන් වංශ රසයෙන් ප්‍රයෝ
ජන කිම්දැයි යථොක්තවූ කිසිවෙක් අපෙක්‍ෂාවක් නැතිව රා මදයෙන් උපෙ
ක්‍ෂාවූයේ තමා කෙරේ නිරපෙක්‍ෂවූ දෙමව්පියන් කෙරෙන් නෙරණා ලදුව
මෑතභාගයෙහි කිසි පිටිවහලක් නැතිව රෙදිකඩක් ඇඳගෙණ ඔබ්බේ තුබූ
රා මස් තබා නුබේ තිබූ බත් විවරකුත් ලැබගත නොහී කබලක් අතින්ගෙණ
සිඟාකා ඇවිදිනේ කල්යාමකින් පිලකවැදහෙව ආනාථව මියගියේය, සෙනෙවි
රද්දු මේ කාරණය ගෙණහ.ර දක්වා ඉදින් මහරජ මා කී යමක් නොගිවිසි
යේක් වීනම් මේ රාජවාසීහු නුඹවහන්සේගේ රාජ්‍ජය හැරගණ ඒ රාසොඩ
මානවකයා මෙන් නුඹවහන්සේද මෙ රටින් නෙරණාහුයයි කීහ.

මෙසේ කීවද මිනීමස් කෑම වැලකිය නොහී රජ්ජුරුවෝ තුමූදඋදාහරණ
යක් ගෙණහැරදක්වන්නාහු සෙනෙවිරත්ති සියළු සමයානතර අපි දනුම්හ
එම්බා පෙර ගිය දවස පන්සියයක් තපස්වීවරහු ලුණු ඇඹුල් සෙවුනා පිණිස
මනුෂ්‍යපථයට අවුත් දනව් සැරිසරා ඇවිදිනාහු පළමුසේම සුජාතානම් කෙළඹි
පුත්‍රයන්ගේ ආරාධනාවෙන් ඔහුගේ උද්‍යානයෙහි අරම්කොට වෙසෙති ඒ දවස්
පතාම උපසථානකොට බණ අසා එන්නේය. ඉක්බිති දවස්ගණනක් තපස්වී
වරහු ඉවතහොස් සිහා වළඳ තමන්ගේගෙට නොඅා හෙයින් ආයයීයන් නො
වැඩිකරණු කිම්දෝහෝයි ගොස් වෙනෙරවීනම් බණ අසා එම්යි ගියේය. වැඳ
ගෙණ දෙවූ තවුසානන් සමීපයෙහි ඉඳ බණ අස අසා ඉරගලවැටී ගියකල්හි
ඇයි ඇවත ගියමනා කල්වේදැයි සවාමීනි අද මේ වේලෙහි වෙහෙර ලම් තපස්වී
සමූහයා වැඳ ඇතුළු පන්සල සමීපයෙහි වැද සැතපුනේය. පස්වීවරහු
ධ්‍යාන භාවනාවෙන් යුක්තව සක්මන් මළුව සිසාරා උන්හ. ඉක්බිති දෙදෙව්
ලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රදෙවේන්ද්‍රයෝ දේවතා සමූහයන් විසින් පිරි
වරණ ලදුව තමන්ගේ වල්ලභ ස්ත්‍රීන් සමග තපස්වීවරුන් වැඳ බණ අසන්ට
ආහ. ඉක්බිති එකල්හි දෙවියන්ගේ ශරීරාලෝකයෙන් සියළු ආරාමොද්‍යානය
ඒකාලෝකව බබලන්ට පටන්ගත් කල්හි පන්සළ් ඇතුළට වැදගිය රශ්මිදුක
සුජාතා නම් කෙළෙඹිපුත්‍රතෙම පන්සල් සිදුරෙන් බැලූයේ තපස්වීවරුන් වැඳ
සිටියාවූ ශක්‍රදෙවේන්ද්‍රයන් උන් පිරිවරා සිටි දිව්‍යස්ත්‍රීන් දුක දිව්‍යප්සරාවන්
දශීනයෙහි රාගරත්විය. ශක්‍රයෝද බණ අසා වැඳ සමුගෙණ තමන්ගේ දිව්‍ය
භවනයටම ගියාහ.

ඉක්බිති කෙලෙඹිපුත්‍රද තපස්වීවරුන් වැඳ සවාමීනි රාත්‍රිභාගයෙහි නුඹ
වහන්සේ වඳින්ට ආවෝ කවුරුදැයි විචාළේය. ඇවැත්නි ශක්‍රදෙවේන්‍ද්‍රයෝ
යයි කීහ. උන් පිරිවරා උන්නෝ කවුරුදැයි විචාළකල උන්ගේ දිව්‍යස්ත්‍රීයයි
කීහ.

එතෙම තපස්වීවරුන්වැඳ ගෙටගියවේලෙහි පටන්කොට මට දිවසරන්
දෙව මට දිවසරන් දෙවයි මූරගානේය. එපවත් අසා බන්ධුවගීයා අවුත් පිරී

වරාගෙණ අදෝනා මය මේ දරුවා බණ අසත්ව ගිය ගමනෝ යක් කෙනෙකුන් දූකපුතියා වේදැයි වටට අසුරුගන්ව වත්හ. ඉක්බිති කෙළෙඹි පුත්‍ර තෙමේ කොලතී තෙල අසුරුනොවෙයි මා ඉල්වත්තේය. දිව්‍යප්සරාවන් ගෙණවුත් මට දෙවයි කීය.

එපවත් අසා බන්ධුහු උතුම් රූ ඇත්තාවූ වෙශ්‍ය ස්ත්‍රීන්ද ඔහුතමාගේ අඹුදරුවන්ද සම්ලඞකාරයෙන් සරහාගෙණ ඇවිත් මොහු දිව්‍යස්ත්‍රියයි පැලූ කල්හි බලාපියා මූණ ඉවත්කොටගෙණ මොහු දිව්‍යප්සරාවෝ නොවෙතිය කියත්තෝයයි ප්‍රේත දූවදැයි කෑතව අවඡරාප්‍රතිබඩ වෙතතාව වලකාගත නොහෙන්නේය. දිව්‍යප්සරාවන් මට දෙවයි කියාම මියගියේය.

එපරිද්දෙන්ම කාලහත්තීනම් සෙනෙවිරද්දුහි උතුම්වූ රසඇති මිනීමස් නොලදිම්නම් මාගේ ඒ තපස්වරුන්ගේ ශ්‍රාවකවූ සුජාතානම් කෙළෙඹි පුත්‍රයා අජාතවූ දිව්‍ය ස්ත්‍රීන් පතා මලාසේ මියමියි කීහ.

එපවත් අසා කාලහස්තිනම් සෙනෙවිරද්දු මේ රජ අතිශයින්ම මාංස යෙහි පුලුඹවිය තවද අතිකූත් උපමාවක් කියා වලකාලිය හැක්කනම් උත් සාහකොට බලමි කාරණයක් ගෙණහැරදක්වත්තාහු ඇසුව මැනව මහරජ පෙර ඉකුත්කල චිත්‍රකූට පර්වතයෙහි රත්ගල් ගුහාවෙහි අනූදහසක් පමණ හංසයෝ වසත්තාහුය ඔහු වැසි සාරමස ගුහායෙන් පිටත්නොවත්තාහුය. ඉදින් පිටත්වූවාහු වීනම් පියායෙන් ගත් පැතින් පක්ෂ ප්‍රහාරකොටගත නොහී මුහුදුම වැටී මීයයත හෙයින් ඒ කාරණයෙන් හංසයෝ පිටත් නොවෙති දතයුතු.

වැලි කෙසේ ඒ සාරමස ජීවත්වෙද්දැයි සිතතොත් නියං සමයෙහි සයංජාත හැල්ගෙණ හැරගෙණ රත්ගල්ගුහාව පුරාගෙණ අනුභවකොට වසන්තාහුය. මෙසේ හංසයන් ගුහාව ඇතුළට වැද ඇකිලගිය කල්හි රථ සකක් සා පමණ මහත ඇති උන්නාභිමූඛනම් මකුළුවෙක් උයින් මසකට එකි එකී දැලක් නියාවට ගුහාවාරයෙහි දැල් බඳනේය. ඒබව දත් ධ්‍රතරාෂ්ට්‍ර හංසයෝ ඒ දැල් කඩත පිණිස තරුණ හංස පෝතකයන්ට ගොදුරු දෙකොටසක් තබා දෙන්නාහුය. මෙසේ වැසිසාරමස ඉකුත්වූකල්හි ඒ තරුණ හංසයා පළමුකොට ගොස් දැල සිඳිනේය එමගින් සෙස්සවුන් පිටත් වන්නාහුය.

මෙසේ වසතකල්හි එක්කලෙක පස්මසක් වැසි වටුයේය. එකල්හි සාර මසට ප්‍රමාණ දැන ගොදුරු ගෙණහැර පිරූ හංසයෝ සාරමස ඉකුත්වූ සඳ ගොදුරු නිමාගිය හෙයින් ඉතිබ්බ කළමනා කවරේද්‍යෙහෝයි ඔවුනොවුන් හා මන්ත්‍රණය කරන්නාහු ජීවත්ව උනුමෝනම් දරුවන් ලැබගණුම්හයි පළමුකොට බිජුවට තුඩින් පැහැරකෑවාහුය. ඉක්බිති අළුතගෑසූ පැටියන් කෑවාහුය. එසේත් මස නොනිමුණු හෙයින් පසුව මාළු හංසයන් කෑවාහුය.

මෙසේ පස් මස ඇවෑමෙන් වැසිනිමුනුකල්හි ඒ මකුළුවා පස්මසට ගුහා වාරයෙහි දැල් පසක් බැන්දේය. එකල්හි හංසයෝද සවකීය ජාතියෙහි මස් අනුභවකිරීමෙන් බදවූහයි දිවුණු කොටස ලැබසිට තරුණහංස දැල් පැහැර සතර කඩාපිග පස්වැනි දැල් සිඳගත නොහී එම බැඳී ගියේය. මකුළුවාද

හංසයා හිස පැහැර ලේපීය අනිකෙක්ද අවුදින් දූල කඩමීයි බැඳි එලෙසම මකුළුවා අතට මෙම ක්‍රමයෙන් සියළු හංසයෝ පසුව ජීවිතක්ෂයට පැමිණියහ.

මෙසේ සවජාති මාංසය අනුභව කිරීමෙන් බල මඳව එකදූල වීවරක් කඩාගත නොහී ධ්‍රතරාෂ්ට්‍ර කුලයෙහි හංසයෝ නැසීගියහයි කියනු ලොව පැවත්තේය.

එසේහෙයින් මහරජ ආකාශචාරීවූ රත්වන්වූ ශරීර ඇති උතුම්වූ ජාත ධ්‍රතරාෂ්ට්‍ර කුලයෙහි හංසයෝ තමන් පෙර නොකෑ විරූවූ සවකීය මාංසය අනුභවකොට විනාසයට පැමිණියාහුද මහරජ එමෙන්ම නුඹවහන්සේද නොකෑයුතු මිනීමස් අනුභව කිරීම හේතුකොටගෙණ මීනියා රජසැපතින් පිරිහෙලා වැලින් රටින් නෙරනාහුයයි කීහ. මෙසේ නොයෙක් පරිද්දෙන් උදාහරණ ගෙණහරදක්වා අවවාද කීවාද නොගිවිස රජ්ජුරුවෝත් තුමූත් අනික් උපමාවක් කියන්ට උත්සාහ කළාහ. එකල්හි නුවරවාසීහුද මඩලික මහාමාත්‍යාදීහු වහා එක්ව නැගීසිට සාමිනි සෙනෙවි රදුන්වහන්ස මේ තමාකරන්නේ කුමද මිනීමස්කන සොරහු ඇරගෙණ නුඹවහන්සේට කාරුණු කිම්ද මේ තෙමේ සබාව මිනීමස් කෑමෙන් නොවලකීනම් වහා රටින් නෙරපුව මැනවයි රජ්ජුරුවන් බසක් බැණනැග නුදුන්න.

රජ්ජුරුවෝද බොහෝදෙන කිපී ඇල්ලීකිය බවදූන හයින් ත්‍රස්තව නැවත බසක් කියනු නුහුනුවාහුය. තවද ඉක්බිති කාලහත්ථිනම් සෙනෙවිරජ්ජු තමන් උතුම්වූ ගුණ ඇතිහෙයින් සාමිනි මිනී මස් කෑමෙන් වැලෑක්මැන වැයි රජ්ජුරුවන් විචාරා වැලෑක්ක නොහෙම්යි කීහෙයින් මෙසේත් වලකා ගත හැකිඅෟහෝයි රජ්ජුරුවන්ගේ කුමාරවරුන්ද අන්තඃපුර ස්ත්‍රීන්ද සොළොස් දහසක් බිසෝවරුන්ද සර්වාලංකාරයෙන් සරහා ගෙණවුත් රජ්ජුරුවන්ට පෑ මහරජ නුඹවහන්සේගේ බන්ධුජනයාද පිරිවරා සිටි අමාත්‍ය මඬුල යාද මෙබඳුවූ රාජ්‍යශ්‍රීයක් බලා වදළමැනවයි රජ්ජුරුවෙනි තිකම් අනාථයේ නොතැසී මිනීමස් කෑමෙන් වැලකුන මැනවයි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ මේ සියලු රාජ්‍යශ්‍රිය විවරට මිනීමස් කෑම මට ප්‍රියයයි කීහ. එපවත් අසා සෙනෙවිරද්දු එසේවීනම් මෙනුවරින්ද රටින්ද නික්මුන මැනවයි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ මට සෙනෙවිරත්නි රාජ්‍යසම්පත්තියෙන් ප්‍රයෝජන නැත රටින් නික්මෙම්මය බල එකකුදු උවත් මට අඩුවෙක් තම් කඩුවෙක්මය කඩුව හා අරක්කැමියා විවරක් දෙවයි ඉල්වූහ. එසේද කඩුවකුත් මිනීමස් පිසන්ට සැලියකුත් අරක්කැමියාට පැසකනබා දී රටින් මරා නෙරපූහ. රජ්ජුරුවෝද අරක්කැමියා කැඳවාගෙණ නුවරින් නික්ම වනයටවැද එක් නුගරුකක් මුල වසන්නාහු අවට මාගීයෙහි සිට මිනිසුන් මරා අරක්කැමියාට ගෙනවුත් දෙන්නාහුය. අරක්කැමියා මිනීමස් පිස රජ්ජුරුවන්ට ලන්නේය. මෙසේ ඔහු දෙදෙන ජීවත්වන්නාහුය. මමය කොල! පෝරිසාදයායයි අඩගසා කඩුව ඉසවට සිසාරා පිනූකල්හි කවර කෙණෙකුත් සභාවෙන් පිටපිය නොහී මූණින් වැටී යන්නාහුය. එසේ වැටී හුනු මනුෂ්‍යයන් අතරෙන් අභිප්‍රාය කෙණෙකුත් අල්වාගෙණ ඉස යටිබැල්ලීකොට එල්වාගෙණගොස් අරක්කැමි යාට දෙන්නේය

පෝරිසාද නම් සොරෙක් මිනීමරා කත්තේයයි සියලු දඹදිව ප්‍රකාශ විය. සියළු සත්‍වයෝම බොහෝසේ වදිනාතැන් සොයන්නාහුය. වලගමන් නිස්ස වාරය කළහ. එසමයෙහි එක්දවසක් වනයෙහි කිසි මිනිස්කෙණෙකුන් නොලදින් අවුත් ලිපගිනිමොලවවයි කිව එපවත් අසා අරක්කැමිතෙම මස් කොයිද්දැයි විචාළේය. මසුන් දූන් දූන් ලබහැක්කයි කීය. එපවත් අසා අරක්කැමි ඉතිකින් මාගේ ජීවිතය නැත්තේවේද්දැයි භයින් වෙවුලා ලිප ගිනි මොලවා බඳුන උඳුනට නැගීය පොරිසාදයෝ කඩුවෙන් අරක්කැමියා දෙකඩ කොට ගසා එදවසම මස් අනුභවකොට එතැන්පටන් උදකලාවිය.

එකල්හි මහත්වූ සම්පත් ඇති බමුණෙක් පන්සියයක් ගැල්පුරාගෙණ වෙළඳාම කරණුයේ නැගෙනහිරින් බටහිරට යන්නේය. පොරිසාදයාගේ උපද්‍රව අසා ඒ අඩ සමීපයෙහි වසන්නාවූ මනුෂ්‍යයන්ට දූසක් වස්තුදී මේ වනාහි මිනීමරන්නා සොරුඅතින් මා ගලවාපියවයි ගිවිස්වාගෙණ එම මනුෂ්‍යයන් හා සමග මගට පිළිපන්නේය ඉස්සෝද නහාගඳ විලවුන් ගත්වාසඅීලඞ්කාරයෙන් සැරසීගෙණ ගොස් යොදන්ලද සැපයානකට නැගී ගැල්සාත්තුවා පෙරටුකරවා තමන් අල්ලස්දුන් පුරුෂයන් විසින් පිරිවරණ ලදුව හැමටම පසුබලා නික්මුනේය. පෝරිසාදයාද ගසක්උඩ නැගී යන එන්නවුන් බලන්නේ ගැල්සාත්තුයෙහි එන්නවුන් දූක එතෙක් මනුෂ්‍යයන් අතුරෙන් එක්කෙණෙකුන් කෙරෙහි ඡන්දයක් නැතිව බමුණා දුටුවේලේ පටන්ගෙණ උන්ගේ මස් කනු කැමතිව කෙලගැලම ඉදිනේය. එකල්හි සමීපවූ බැව් දූන ගසින් බැස පැමිණ මී මමය කොල පෝරිසාදයයි තමාගේ නම් කියා අඩගසා විදුලිය පටක්මෙන් කඩුව ඉස සිසාරා දිවන වේගයෙන් විළුම් පහරින් ඇස වැලිපුරන්නක්හු මෙන් දිවගෙණ ආය මූගේ ශබ්දය ඇසූ ගමන් හා සරියේම සෙනහඩ ඇසූ මුවපොල්ලන්සේ භයින් නැතිගෙණ මූණින් වැගිරතිය සත්‍වයන් අතුරෙන් නැගීසිටිනට සමත්වූ එකද සත්‍වකෙණෙක් නැත එකල්හි පෝරිසාද නම් සොර බමුණා පය වලළුකර කෙරේදී අල්වා පිටට දමාගෙණ ඉස් ගොප්මස පැහැර දිවගෙණ එනකල්හි නොබෝ වේලකින් සිහිලැබ නැගී සිටියාවූ මනුෂ්‍යයන් අතුරෙන් සමහරකෙළෙහිගුණ දන්නා කෙණෙක් පින්වත්නි අපි මේ සොරහු අතින් බමුණන් ගලවනු පිණිස දහස් ගණන් ගතුම්හ එසේවූ නැතදී අප මෙසේකල පුරුෂවික්‍රම කවරේද පිළිවන් වේවයි බැරිවේවයි සුහක් නැන් ලුහුබඳවා බලාලම්හයි පස්සේ වැටී හුන පෝරිසාදනම් සොර මදක්නැන් දිවපියා ආපස්සේ බැලූයේ පස්සේ එනකෙණෙකුන් නොදූක සෙමෙන් යන්ටවන එකල්හි පස්සේ ලුහුබඳවා දිවන්නාවූ මනුෂ්‍යයන් අතුරෙන් එක් ලදරු පුරුෂයෙක් ඇමදෙන පසු කොට පියා දිවගෙණ ගොස් පෝරිසාදයාට සමීපවිය සොරාද ඔහු දූක වේග උපදවා එක් වැටකඩක් පනන්නේ කිහිරිඋලක් පිටට පැනපිය ඒ කිහිරි උලද යටිපල්ලෙන් ගෙණ පිටිපල්ලෙන් නැංගේය. එද ලේ ගස ගසා දිවන්ට පටන් ගත්තේය. ඉක්බිත්තෙන් එලවූ ඒ පුරුෂතෙම වැගිරෙන්නාවූ ලේ දූක එම්බල කොල පෝරිසාදයා විදපීම් සනිකෙ නොබා දිව වහා එවයිකියා, අඩනැය ඔහු දුම්ලබව දන පසුපස්සෙහි ලුහුබඳවාගත්හ. සොරද ඒ බව දූන බමුණා ඇරපියා තෙමේ දිවගන අතිවාහකපුරුෂයෝද බමුණා ලත්නැන් පටන් සොරුගෙන් අපට කම්කිම්ද්දැයි කියා වැලක්කාහුය. පෝරිසාදයාද

තම්‍ා වසත නුගගසමුලට ගොස් අරලු අරණට වැදලා වැඳහෙව ආරාධනා කරන්නේ සවාමීනි වෘක්‍ෂදෙවතාතෙනි සත්දවසක් ඇතුළත මාගේ පය වණය සුවකොටපූසේක්වීනම් සියලු ජම්බුද්වීපයෙහි රජදරුවන්ගේ උගුරු සුත් ලෙයෙන් නුගකඳ සෝධා උත්ගේ බඩවැලින් කඳවෙලා පඤ්චමධුර මාංසයෙන් බිලියත්තෙමි යැදගත්හ.

මෙසේ ඔහු සත්දවසක් අනුභව නොකිරීමෙන් කය වියලී පය වණය සුවව ගියේය එතෙම දෙවියන්ගේ ආනුභාවයෙන් සුවවතැයි සිතා සතුටුව කීපදවසක් මිනීමස්කා ශරීරයෙහි බලලාගෙණ මට බොහෝ උපකාර කළාවූ දෙවතාවන්ට යඳියාච්ඤාදියෙන් මිදුන මැනවැයි සිතා කඩුව සරනා ගෙණ රජ්ජුරුවන් අල්වන්ටයෙමි නික්මීන. ඉක්බිති පූර්වජාතියෙහි එක්ව මිනීමස්කා ඇවිදි මිත්‍රයක්‍ෂයෙක් දූක මෙතෙම පෙරජාතියෙහි මාහා සමග මිනීමස්කා ඇවිදි මිත්‍රයායයි කියා ඇඳින සබඳ තෝ මා අඳුනේදැයි විචාළේය පෝරිසාදයෝ ඇඳිනගත නොඑම් කීහ. ඉක්බිති යක්‍ෂතෙම පෙරජාතියෙහි කළකටයුතු සිහිකැරවිය ඉක්බිති ඔවුනොවුන් ඇඳින පිළිසඳර කථාකොට යක්‍ෂයා විසින් කොයි උපනුදැයි විචාළකල්හි කසීරට රජකුලයෙහි ඉපද රාජ්‍යයෙහි පදසළුව මිනීමස්කැම පිනිසා රටින් නෙරීබවද නුගගසමූල වසන බවද කියා පය උල ඇනුනුබවද දෙවියන්ට ආරාධනාකළ බවද වනය සුවවූ බවද යාදිනියෙන් ගුණවූ බවද යාදිනියෙන් මිදෙන පිණිස රජදරුවන් අල්වන්ට යනබවද කියා සබඳ නොපින් මට මීට සහායවන්ට උවමැනවැයි කීය.

එසඳ යක්‍ෂතෙම මට ඉක්මන් කටයුත්තෙක් ඇත එසේහෙයින් නො පට සහායවන්ට අවකාශමද එතකුදුවුවත් මම වනාහි අනසීවූ පදලක්‍ෂණ දනිමි. මහා ආඥසම්පන්නවූ මන්ත්‍රයක් දනිමි ඒ මන්ත්‍රයතෙම කායශක්තියද පවන් හා සමාන ජවද තේජසද වඩන්නේයයි මන්ත්‍රයෙහි ආනුභාව වර්ණනා කොට මන්ත්‍රය අරගණැයි කීය.

සොරද යනපතැයි පිළිගෙණ යක්‍ෂයාද පෝරිසාදයන්ට මන්ත්‍රය දී අභිමත සථානයට නැගීගියේය පෝරිසාදයාද මන්ත්‍රය ඉගෙණ එතැන් පටන් ඌරන් තුඩ සීවැල් තිබුවාසේ මහත්වූ ශක්තිසම්පන්නව අතිසූරව සත් දවසක් ඇතුළත එක්සියයක් රාජධානියෙහි රජදරුවන් උයන් කෙළි ආදියට ගියකල්හි පවන් හා සමාන වේගයෙන් දිවගෙණගොස් මමයි පෝරිසාදයායයි අඬගසා බෙණෙමින් ගර්ජනාකෙරෙමින් භයගන්වා කකුල් අල්වාගෙණ භයගන්වා ඉස් යටි යටිබල්ලා දනඋතුසන්ධි තමාගේ දෙකරතිබෙන සේ මාගේ විලුඹෙන් කෙණ්ඩියෙහි ඉස්පහරණසේගෙන පවන්වේගයෙන් නුගගසමූලට ගෙණවුත් අඤ්ජලිකළ කලක්මෙන් අතුල්පත එක්කොට විද අමුනා පය මාපටඇඟිලි අක් බිමගෑවෙනසේ නුගගසමැද එල්වාගත් තේය. ඒ එක්සියයක් රජදරුවෝ ඉතා කොමලබැවින් වාතවේගයෙන් පහරණලද කටුකරඹු මඩදම්සේ සිත් මලානිකව කරකැවෙමින් එල්ලෙන්නා හුය. ඒ එක්සියයක් රාජධානියෙන් රජදරුවන් කෙරෙන් සුතසෝම රජ්ජුරු වන් බාලකල සිල්ප ඉගැන්වූ පිටසී ආචාරීන් සෙයිනුත් දඹදිව රජදරුවන්

හෙන් සිස්නුහුව මැනවැයි සිතාත් මේ කාරණා දෙක අපෙක්ෂාකොට අල්වා නොගෙණායේය. මෙසේ සුතසෝම රජ්ජුරුවන් හැර එක්සියයක් රජ දරුවන් අල්වා ගස උඩ බැඳ එල්වා ඉතිඹ බිලියම් කළමනාකලැයි සිතා මහත්වූ දරසැයක් බැඳ ගිනිඅඟුරු බස්නා පිණිස මොලවා ඇණ මස් පහ ළන්ට උලක් සස්මින් උන්නේය.

එතැන්හි වෘක්ෂදෙවතාවා එපවත් දැන මෙතෙම මා උදෙසා බිලියම් දෙමියි පටන්ගත්තේය. සුවකළ වණයකුත් නැත, දැන් වනාහි මෙසා මහත් විනාශයක් කරන්ට පටන්ගත්තේය. මේ වනාහි මා විසිනුත් වළකාගත හැක්කේ නොවෙයි. සතරවරම් රජදරුවන් කරා යමි සිතා සිවුමහා රාජ්‍ය යට ගොස් සතරවරම් රජදරුවන්ට එපවත් කීය. එපවත් අසා අප විසිනුත් වැළකිය නොහැක්කැයි ඔහු කැඳවාගෙණ ශක්‍රයන් සමීපයට ගොස් දැන්වූහ. ඒ අසා ශක්‍රදෙවේන්‍ද්‍රයෝත් ඒ මමත් වළකාලිය නොහෙමියි ඉටා සමර්ථ කෙණෙකුන් කියාලමි කියා කවුරුදැයි විචාළ හෙයින් දෙව් මිනිසුන් සහිතවූ ලෝකයෙහි කුරුරට ඉඳිපත්නුවර ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන්ගේ පුත්වූ සුතසොම රජ්ජුරුවන් විනා අනික් සමර්ථවූ කෙණෙක් නැත, ඒ සුතසොම රජ්ජුරුවෝ පෝරිසාදයනුත් දමනේලා ඒ සියයක් රජදරුවන්ගේ ජීවිත දානය දී සියලු ජම්බුවීපයෙහි ධර්ම නමැති අමෘත ජලයෙන් අභිෂෙක කරන් නාහුය. ඉදින් රජදරුවන්ගේ ජීවිතය ගලවනු කැමැත්තෙහි වීනම් සුතසෝම රජ්ජුරුවන් බිලියම් කළොත් විනා තොපි නොපිළිගණිමියි කියාලවයි කීය. දෙවතාවන් ශක්‍රයන්ගේ බස් යහපතැයි පිළිගෙණ එක්ෂණයෙහි අවුත් තපස්වී වේශයකින් පෝරිසාදයන්ට නුදුරුනෙන ගමන්කෙළේය. එකල්හි පෝරි සාදයෝ තපස්වීන්ගේ පාද ශබ්දයෙන් රජ්ජුරු කෙණෙක් ගැලවී නික්මුනෝ ද්‍යෝහෝයි බැලුයේ මහණ වේශයෙන් සිටි දෙවතාවා දැක තපස්වීවරයෝ නුමුත් රජදරුවෝමය, එසේහෙයින් මේ තපස්වීන් අල්වාගෙණ එක්සියයක් දෙනා සම්පූර්ණකොට බලිපූජා කෙරෙමියි සිතා කඩුවගෙණ තුන් යොත්තක් ලුහුබැඳත් අල්වාගතනොහී විඩාවගිය ශරීර ඇතිව මම පෙර මහවේගයෙන් දිවන ඇතකු අසකු වීනමුත් ඇසිල්ලකින් අල්වාගන්ට සමර්ථවූයෙම් දැන් මේ පියවිගමනින් යන්නාවූ තාපසයන් වෙර ඩා සොල්වා මහවේගයෙන් දිවත් අල්වාගත නොහෙම් ඊට කරණා කිම්දැයි සිතා ඉක්බිති තපස්වීවරයෝ නම් කීවා කෙරෙති. එසෙයින් මොනවට සිටුවයි කියා රඳවාගෙණ සිටි තැනැත්ත වුහු අල්වාගණිමියි කල්පනාකොට මහණ සිටුවයි කීයේය.

ඒ අසා දෙවතාවා මම වනාහි සිටියෙමි තො සිටින්ට උත්සාහ කරවයි කීහ. එබස් අසා පෝරිසාදතෙම එම්බල තපස්වීවරයෝ නම් ජීවිතය පිණිස බොරු නොකියන්නාහුය. තමා විසින් සිටුවයි කියන ලද්දෙහි සිටිපෑ පියා නික්මුණෙහිය ගමන් යෙමින් සිටත් සිටියෙමි කියන්නේය. මෙසේ වෙහෙසා කියන්ට මා අත තිබෙන මේ කඩුව කොස් පතක්කොට සිතයිදැයි තපස්වී භයගැන්වූයේය. ඉක්බිති දෙවතාවා එම්බා පෝරිසාදයෙනි මම කුසලධර්ම යෙහි පිහිටි හෙයින් සිටියානම් වෙමි. තොපගේ නාමගෝත්‍ර පෙරලී නමක් නොකෙරෙමි පාණාතිපාතාදී අකුසල්කොට මෙයින් චුතව නරකයෙහි උප දනු තොපගේ වූවත් සිටි තෝ දනිනුත් සසරින් ගැළවීමක් නැතිහෙයින්

සිටියත් ඇවිදිනා නම් වෙයි බුඩාදීවූ උත්තමයෝ කියත්තාහුය. ඉදින් මහරජ එකාන්තයෙන් බිලියම් කරණ කැමැත්තෝ නම් සුතසොම රජ්ජුරුවන් ඇර ගෙණවුත් බිලියම් කරව. උන් එක්කොටගෙණ බිලියම් කලාතම් එක්සියයක් රජ්ජුරුවන්ගේ ගල ලොහිතාදියෙන් බිලියම් කෙරෙමි කී සත්‍යවචනයෙන් හා බලි විධානයෝ සදිව්‍යලෝකයට පැමිණෙන්නා වේදැයි මෙසේ කියා දෙවතාවා තපස්වී වේශය අන්තර්ධාන කොට තමාගේ දිව්‍යවේශයෙන් තහොමණ්ඩලගත සූයර්‍යමණ්ඩලයමෙන් දීප්තිමත්ව සිටියේය. පෝරිසාදතෙම දෙවතාවන්ගේ කථාසවරූපයද දිව්‍යවේශයද බලා තෙපි කවුරුදැයි විචාළේය. ඔහු විසින් මේ නුග ගස වාසයකරණ දෙවතාවා නම් මමයයි යනු අසා මාගේ දෙවතාතන් සිය ඇසින් දුටුම්යයි සතුටුව සාමීවූ දිව්‍ය රාජයන්වහන්ස සුත සොම රජ්ජුරුවන් තොලබම් තොසිතා නුඹවහන්සේගේ විමානයට වන මැනවැයි කීයේය. එකෙණෙහි දෙවතාවාත් පෝරිසාදයන් බල බලා සිටියදීම නුගගසට වන්නේය. ඒ ඇසිල්ලෙහි ඉරත් බටුයේය, සඳත් නැංගේය, පෝරිසාදයෝද වෙදවෙදාඞගයෙහි දක්ෂව නක්ෂත්‍රයෝග නමත් දන්නා සෙයින් ආකාශය බලා සීට පුස නැකත ලැබෙන්නේය. සුතසොම රජ්ජුරුවෝ ජලස්නානය පිණිස උයනට යනතෙනදී උන් අල්වාගණිමියි සියලු ජම්බු විපවාසීවූ සත්වයෝ තුන් යෝත්තක් අවට රැකවල් ලවාගෙණ සිටිනා හෙයින් බලවත් ආරක්ෂා ඇත්තේය. එසේහෙයින් උයනට රැකවල් සැලසෙන්ට පළමුකොට පෙරයම් දසපැය ඇතුලත මිගාරචීර නම් උයනට ගොස් මගුල් පොකුණට බැස සිටිම් සිතා එපරිද්දෙන්ම ගොස් මගුල් පොකුණට බැස නෙළුම්පතකින් ඉස වසාගෙණ සිටියේය. ඒ පෝරිසාද රජ්ජුරුවන්ගේ ආනුභාවයෙන් පොකුණෙහි ඇති මත් කැස්බෝ තාක් පසුබැසගෙණ ගොස් දිය කෝල් බඩාලන් බැඳී සිටිනාහුය. මෙසේ තිරශ්චිනයන් දක්වා භය ඇති වන්ට පෝරිසාදයන්ගේ ආනුභාවයෙක් කෙසේ පැමිණියේද? යත් පූර්වයෙහි කුසලානුභාවයෙන් පහලවූයේ කෙසේවේදැයි යතහොත් ඒ පෝරිසාදයෝ පෙර කාශ්‍යප බුදුන් සමයෙහි බුදුපාමොක් භික්ෂුසඞ්ඝයාට කිරිපිඩු දන් දුන්හ. ඒ කුශලානුභාවයෙන් මහබල ඇතියේය. ගෙවල් කරවා භික්ෂුසඞ්ඝයාවහන්සේට සීත පීඩා දුරුකරණ පිණිස ගිනි කබල්ද දර පලන වැ පොරෝ ආදිය දන්දුන්නේය. ඒ කුශල බලයෙන් තේජස් ඇතිවූයේය. මෙබඳුවූ කුශල බල යෙන් තේජස් ඇතිවූයේය. මෙබඳුවූ කුශල බලයෙන් තේජස් ඇතිවූයේ පෝරිසාද රජ්ජුරුවන් උයනට යන්ට පැමිණි කල්හි පාන්වන්ට පූර්වභාගයෙහි ම තුන් යොදුනක් අවට රැකවල් ගත්තාහුය. ඉක්බිති සුතසොම රජ්ජුරුවෝත් පෙරවරු බත් මේ නිමවා සර්වාභරණයෙන් විභූෂිතව මඟුලැතු නැඟී සිවුරඟ සෙනග පිරිවරා උයනට යන්ට නුවරින් පිටත්වූයේ එකෙණෙහි තක්සලා නුවරින් නන්ද නම් බමුණානකෙණෙක් ගාථා සතරක් ඇරගෙණ එක්සිය විසි යොත්තක් කතර මග ගෙවා අවුත් නුවරට ආසන්නයෙහි ගමක ලැග දෙවෙනිදා ඉරුනැගි වේලෙහි නුවරට වදනේ නැගෙනහිරි වාසලින් පිටත්වූ රජ්ජුරුවන් දැක දකුණත ඔසවා "ජයතු භවං මහාරාජ" යනාදීන් ආශීර්වාද කෙළේය. ඒ ඒ දිග බල බලා එන රජ්ජුරුවෝ ගොඩමත්තේ සිට අත ඔසවා ස්තුති වචනය කල බමුණා දැක ඇතු වජ්‍රාංකුසයෙන් සන්කොට මෙහෙයා

සමීපව සිට එම්බල බ්‍රාහ්මණය තා උපන් වැඩි රට කවරේද? කවර කාරණ යක් නිසා මෙතනට අවුත් සිටියෙහිද? ඒ කාරණය මට නොවලහා කියව. කුමක් කැමැත්තෙහිද තා අභිප්‍රායානුකූල දෙයක් දුන් දෙමි කියා විචාළහ.

එබස් අසා බමුණු පෘථිවීශ්වරවූ රජ්ජුරුවන්වහන්සේ ඉතා දුරව ආහ. අර්ථ ඇති හෙයින් සාගරය සමානවූ කාශ්‍යප සර්වඥයන් විසින් වදාරණලද සතාරහ ගාථාවන් සතරදෙන තොප සුභාෂිත ඇසීමෙහි අභිප්‍රාය ඇතැයි යනු අසා හැරගෙණ තොප කරා ආමියි මෙලෝ පරලෝ දෙකින් අභිවෘද්ධි කරන්ට නිසි මධුරවූ අර්ථ ඇති ගාථාවන් අසව මහරජයි කීයේය. ඒ අසා රජ්ජුරුවෝ සතුටුව ආචාරීණී තොප කළද ඉතා යහපත උයනට ගොස් වූසස යෝගයෙන් ජලස්නානයකොට ආකල ඒ ගාථාවන් අසමියි කීය. තැවත බත් බුලත් ආදීවූ සියළු පොශ්‍යය බමුණන්ට කරණලෙස විධාන කොට ගොස් උයනට වන්නාහ.

උද්‍යානයන් අටළොස් රියන් උස පවුරෙන් වටකරණ ලද්දේය. එබඳුවූ පවුරෙන් පිටත කන්තලින් කත්තල ගසා වටාසිටි ඇත්සේනාවය, අශ්වසේනාවය, රථසේනාවය, පාබලසේනාවය,යී යන චතුරංගීණී සේනාව විසින් ඇලලී ගිය සමුද්‍රයක්මෙන් ඉතා බහලවූ සේනාසන්නිවේශයෙන් යුක්තවූයේය. සුත සොම රජ්ජුරුවෝත් උයන සුරක්ෂිතවූ පසු හාරකේයූර කිරීටාදී මහා ඇඟි ආභරණ ගලවා දූළිරවුළු අඳුම් කපා සරනාවා සඳුන් සුණු ආදියෙන් උලනලද සිරුරු ඇතිව මගුල් පොකුණට මහ පිරිවරින් බැස ජලස්නානය කොට ගොඩ නැගී දියසළුයෙන් සිටියාහුය, එකල්හි සුවඳ දුම් කවන ලද කසීසළු හා මාලාගන්ධ විලේපනාදිය එලවූ කල්හි පෝරිසාදයෝ සිතන්නාහු සර්වාභරණ යෙන් සැරහී ගියකල්හි රජ්ජුරුවෝ ඉතා බරවන්නාහුය. සැහැල්ලු වේලෙ හිම අල්වා ගෙණයෙමි පොරිසාද තෙම පොරිසාදයා නම් මමයයි අඬගසා පැන මසකු අල්වා ඉසයට සිසාරණ කලක් පරිද්දෙන් කඩුව තිරිප්පුකොට 'අහං මාරො පොරිසාදො'යි තමා තමන් කියා ගර්ජ්ජනා කෙරෙමින් පෙණෙමින් තමන්ට පෙර ප්‍රිටසී ආචාරීව සිටි රජ්ජුරුවන් හෙයින් තමුන් උතුම්වූ රාජ කුලයෙහි උපන් හෙයින් ආචාර පිණිස එක් ඇඟිල්ලක් තලළ තබාගෙණ දියෙන් ගොඩනැගී සුතසෝම රජ්ජුරුවන් කරා දිවත් එසඳ ඔහුගේ කෘෘරවූ භයංකාර නාදය අසා ඇත්තු ඇතුන්පිටම වගුලහ, අස්සු අසුන් පිටම වගු ලහ. රථ රථපිටම වගුලහ, බල ඇතිසේනාවද තම තමන්ගේ ආයුධ දමා මූණින් වැතිරගිය, පෝරිසාද සුතසෝම රජ්ජුරුවන් කරා එළඹ නැඹුරවැ ඔසවා කරහිඳුවාගෙණ වාසලින් යන්ට පමායයි අටළොස් රියන් පවුර පැන වැටී වැදහොත් මතනහස්තීන්ගේ කුඹින් කුඹට පෙළෙමින් අසුන් යටපසු කෙරෙමින් ඇත්පයට අසුවූ මලපරඬලාසේ රථ මැඩ සුණුවිසුණු කෙරෙමින් පවන් හා සමාන වේගයෙන් තුන් යොදුන් පමණ තැන් දිවගෙණ ගොස් සුතසෝම රජ්ජුරුවන් උදෙසා පස්සෙහි දුවන කෙණෙක් ඇද්දෝහෝයි බැළුයේ නොදුක එතැන් පටන් සෙමෙන් සිට යන්ට පටන්ගත. එසඳ සුතසෝම රජ්ජුග් සිබාව ඉනී කෙස් අගින් පැන් බින්දු තමාගේ පිට වැගි රෙන්න දුකා මෙ රජ මරණ භයින් භයපත්වඅඬන්නටවන, මා පිට වැගිරෙන්

නේ අඬන්නවුන් කඳුළු නිසා වේදැයි අනේ මරණයට නොබන්නාවූ එකද සත්ව කෙණෙක් නැතෙයි සිතා විචාරන්නාවූ නැතැත්තේ මෙසේ කියා සුතසෝම රජ්ජුරුවන්වහන්සේ නුඹවහන්සේ වැනි බොහෝ ඇසූපිරූ නැත් ඇති කාලත්‍රයවර්තිවූ බොහෝ කාරණාකාරණයන් සිතාපියන්ට සමර්‍ථවූ එසේහෙයින් සර්‍වතෝචිත ප්‍රඥාවෙන්යුක්තවූ නුවණැත්තාවූන් ඉදින් මේසත්ව ලෝකයෙහි නුනුවණින් යුක්තව යම්කිසි සෝකකාරණයක් හේතුකොටගෙණ අඬන්නාවූ නැතැත්තන්ට සමුද්‍රයෙහි නැව් නැගිවූවන්ට දිවයිනක් මෙන් පිහිට වන්ට නිස්සහ, එසේවූ නුඹවහන්සේ වැන්නක් මරණ භයින් අඬන්නා කල අඥානයෝ කෙසේ නම් නොහඬද්ද සුතසෝම රජ්ජුරුවන් අඬන්නාවූ තොපි තොපගේ ජීවිතය පිණිස අඬන්නාවූද නොහොත් අඹුදරුවන් කෙරෙහි සෝකයෙන් අඬවූද නැවත ධනධාන්‍යාදිවූ වස්තුයෙහි සෝකයෙන් අඬවූ දැයි විචාරණ ලද්දාවූ මට තත්වූ පරිද්දෙන් කියාලුව මැනවැයි විචාළේය.

එපවත් අසා සුතසෝම රජ්ජුරුවෝද මමද සියලු සංස්කාරධර්‍මයෙන් අනිත්‍යසේ ඒ කරණයෙන් දක්නෙම් මා පිණිස වේවයි පුත්‍රදාරාදීන් පිණිස වේවයි ධන ධාන්‍යාදී සම්පත් පිණිස වේවයි රාජ්‍ය පිණිස වේවයි සෝකයෙන් කරන්නෙම් නොවෙමි වැලි එතකුදු උවත් සවකියාදී ප්‍රවර්ත්තිවූ රාජ්‍යයෙහි ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටියාවූ මම පුරාතනයෙහි පැවතගෙණ එන සත්පුරුෂ ධර්‍මයක් පඬුරුකොට දුරදෙශයෙන් මා සමීපයට එතලද බමුණක්හු ජලස්නානය පිණිස නික්මුනෙන් අතරමගදී දැක ආකල අසමියි කියා ඔහට සත්කාර කොට දියකෙළියටආමියි ඒ මා විසින් කරණලද මන්ත්‍රණයට කැලලයෙක් දෝහෝයි සෝක කරණ බවමුත් අන්‍යතර වතුවක් සඳහා සෝක නොකරමි වදුරා ප්‍රශ්නකොට නැවත එම්බල පෝරිසාදය තක්සලානුවර සිට එක් වයෝ වෘඬ බමුණෙක් කසුප් සම්මාසම්බුදුන් දෙශනාකල ගාථා සතරක් පඬුරුකොට ඇරගෙණ මා සම්පයට ආය මමද ඔහට ආගන්තුග සත්කාරකොට ආකල අසමි ඔහු සත්හිඳුවා උයනට ජලක්‍රීඩාව පිණිස එනලද්දාවූ මා ඒ ඇසියනොදී තෙපි හැරගෙණ නැගී ආව, ඉදින් මා හැරපු නම් මාගේ සබාඛසට කැලලක් නොකොට් ගොස් ඔහුගේ ධර්‍මදෙශනා අසා සත්කාරකොට නැවත තොප කරා එමි වදාළසේක.

එපවත් අසා පෝරසාදතෙම කොරව්‍ය ශ්‍රෙෂ්ඨවූ රජ්ජුරුවෙති තෙපිමා බඳුවූ මිනීමරන්නාවූ සොරෙක් අතින් ගැලවී සියනුවරටගොස් අතිමධුරවූ ප්‍රියවූ ජීවිතය ලදින් ප්‍රණීතවූ ජීවිතය පඤ්චකාම සැප කැමැත්තන්තාවූ තෙපි පසමිතුරුවූ මා සමීපයට කෙසේනම් එවුද මෙතොප කියන්නා වචනය ඇද හිලි නොකරමියි කීයේය. එපවත් අසා ශ්‍රී මහා බෝධිසත්වයෝ රත්ගල්තලා මුදනෙක්හි ඉඳ සිංහනාද කරන්නාවූ ශෘගාල ශබ්දයෙහි සිට නිසංකවූ භාෂ්කරරශ්මි සිංහරාජයෙකු පරිද්දෙන් එම්බල පෝරිසාදය පාණාතිපාතාදීවූ පව්වූ ගුණයම සවභාව ධර්‍මයකොට වාසය කරන්නාවූ හීන ජාතීන්ගේ ජීවත් වීමට වඩා පිරිසිදු සීලයෙහි සිට මියන මරණ උතුමැයි මා ඇතුළු සියලු සත්ව යන්ගේ බස එබැවින් සබඳ මම ජීවිතය පිණිස බොරුකියන එකෙකිම් නොවෙමියි කියා නැවත තමන්වහන්සේගේ සපිරත්‍වය වදාරණ ලද්දාවූ බෝධි සත්‍වයෝ ඉදින් මන්ද මාරුතයෙන් වජ්‍ර පර්‍වතය සෙලවී වැටීහෙනමුත් චක්‍රවාට පර්‍වතයෙහි යාත්‍රා කරන්නාවූ චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා ආකාශයෙන් ගිලිහී

බිම වැටියේ නමුත් ගඞ්ගා යමුනා ආදිවූ සියලු ගඞ්ගාවෙන් ජලය උඩුගඟට නික්මෙතමුත් මාගේ වචනයෙහි බොරුයෙක් නැතැයි කීහ.

මෙසේ කීවෝතිනුත් පෝරිසාදතෙම බෝධිසත්ත්වයන්ගේ වචනයෙහි ඇදහිලි නොකෙළේය. එපවත් දැන බොධිසත්ත්වයෝ මේ තෙමේ මෙසේ කියයුතු මාගේ වචනය අදහා නොගන්නාහ, සපථයක් කොට මොහු ගිවිස්වා මාගේ සත්‍ය වචනය රකිමි, ඒ මහසත්තෙම තමා ඔහු කරපිටින් බිමට බස්වාගෙණ සපථය කොට වදාරණසේක්.

එබසට පෝරිසාදයා ඉදින් මම බොරුවක් කීම්නම් කඩුව හා බද පාරා වලලු ගත් නොයෙක් දහස්ගණන් යෝධසේනාව විසින් ගන්නාලද රුකවල් ඇති උතුම්වූ රාජ්‍යශ්‍රියෙන් නොවෙම්වයි මාගේ මගුල්කඩුවෙන්ද මට වැඩෙක් නොවේවයි ඉදින් නොපි මෙසේ කරණලද මාගේ සපථය අසා මාහ ලුහුවීනම් බමුණන්ට ආකල අසමි කී සත්‍ය වචනයත් රුක නොප සමීපයට එමි කී සත්‍ය වචනයත් රක්නා පිණිස නැවත නොපකරා එමියි වදාළසේක. එපවත් අසා පෝරිසාදතෙම මේ සුතසොම රජ්ජුරුවෝද රජදරුවන් විසින් නොකළමනා සපථයක් කරණලදුව හැර රජදරුවෝනම් ජීවිතයත් කඩුවත් ගෙණ බොරුවට නොදිවුරන්නාහ එසින් එබඳුවූ සපථයක් කරමින් සිරියදී මූන්වහන්සේ නොහරන්ට නොපිළිවන, එනසේක්වා, නොඑනසේක්වා, ආවොත් ආ සැටි යේ දකිමියි ඉදින් නොම ආවොත් මාත් රජක්හු බැවින් මාගේ දකුණුන ලෙයෙන් දෙවතාවා මාරුවට බිලියම් කෙරෙමියි සිතා මහරජ වෙහෙසන්ට නොකමැත්තෙමි වහා නුවරට ගොස් බමුණා හා සමග කරණලද මන්ත්‍රණයෙන් ගැලවීමටද කී බස බොරු නොකොට වහා පලා අවමැනවැයි සමුදිත.

එපවත් අසා සුතසෝම රජ්ජුරුවෝ සබඳ නෝ අමුත්තක් නොසිතා සතාරහ ගාථා සතර අසා ඒ ධර්‍ම කථිකයාට පූජාකොට එමියි වදාළසේක.

ඉක්බිති පෝරිසාද මහරජ නුඹවහන්සේ විසින් කරණලද්දේ රජදරුවන් නොකළමනා සපථයෙක, වැලින් සිහි ඇතිවූව මැනවැයි කීය. එපවත් අසා බොධිසත්ත්වයෝ සබඳ නෝ මා බාල අවස්ථාවෙහි පටන් පුරුද්දෙහි සිතා වකටවත් බොරුවක් නොකී බව දන්නෙහිවෙද්ද? දැන් වනාහි මම රාජ්‍යයෙහි පිහිටා ධර්‍මාධර්‍ම දෙක ඉඳුරා දන්නෙම් කැලම බොරු නොකියන්නෙම් වේද සෙට දවස තට බිලියමට අනුවෙමියි ඔහු ගිවිස්වා රාහුමුඛයෙන් ගැලවුනු උනු පණස් යොදුන් සඳ මඩලසේ නැවත අවුත් පෝරිසාදයා දමනෝලිම් නැමති උනුනුවූ අභිමානයත් ඇතිසේක් මහත්වූ කායබල ඇති හෙයින් වහා අවුදින් නුවරට පැමිණිසේක. රජ්ජුරුවන්ගේ චතුරංගිණී සේනාව සුතසෝම රජ්ජුරුවෝ නම් ඉතා පණ්ඩිතයෝය, ව්‍යක්තයෝය, මධුරවූ ධර්‍ම කථා ඇත්තාහුය. එක් දෙබසක් කියාපියන්ට අවකාශ ලද්දාහු වීනම් ඒ සොරහු අතින් යෙහෙන් ගැලවී එන්නාහුයයි කියා සිතාත් රජ්ජුරුවන් පෝරිසාදයාට දීපියා ආ නියා වේදැයි බොහෝදෙනා නින්දා කෙරෙත් ඡොහෝයි යන හයින්ද පිටි නුවරම කඳවුරු බැඳගෙණ හුන්නාහුය. දුර එන්නාවූ රජ්ජුරුවන් දැක සතුටුව පෙර ගමන්කොට ගොස් වැඳ ස්වාමීනි කෙසේ ගැලුනුසේක්දැයි පිළිසඳර කථා

කෙරෙමින් මවකොට පිරිවරාගත්හ. ඒ බොධිසත්ත්වයෝ එබඳුවූ චණ්ඩ පරුෂවූ සාහසික වූ ක්‍රියා ඇති පෝරිසාද පවා මාගේ ධර්ම කථා අසා මා පසුව යන ලෙසට අවකාශ දිනැයි වදාළසේක්.

ඉක්බිති ඇමැත්තෝ රජ්ජුරුවන් සර්වාභරණයෙන් සරහා ඇතු පිටට නංවා නුවරට වඩාගෙණාහ එකල්හි සියලු නුවරවාසීහු චන්ද්‍රකාන්තිය දුටු ක්ෂීරසාගරය මෙන් මහබෝසතානන් දැක සතුටුවූහ.

ඒ මහා බොධිසත්ත්වයෝද තමා ඉතා දම්සොඩ සෙයින්ද පලමුශ්‍රැත සන්තොෂයයි දඹදිව ප්‍රසිඩ නෙයින්ද දෙමව්පියන් දක්නට නොගොසින්ම් රජගෙට ගොස් බමුණා කැඳවා දුළ්‍රිරුවූළු අඳුම් තබා සුවඳ පැනින් ඉස්සෝධා නහවා ඇඟසුවඳ ගල්වා වස්ත්‍රාලඞකාරයෙන් සරහා තමන්වහන්සේට මේ වඩන රජ භොජනය අනුභව කරවා පසුව තමන්වහන්සේ මෙ තිමවා නගන ලද රත්පුඩු සේසත් ඇති මානැඟි රාජාසනයෙහි වඩා හිඳුවා ධර්ම ගෞරවයෙන් සුවඳින් මලින් පූජාකොට තමන්වහන්සේ මිටි අස්නෙක්හි වැඩහිඳ දෙනොත් මුදුනේ තබා ආචාරීනි නුඹවහන්සේ මට ගෙණා සතර ගාථා අසනු කැමැත්තෙමි ආරාධනා කළහ.

එසඳ මහබෝසතානන් විසින්ම ආරාධිතවූ තනද බ්‍රාහ්මණතෙම සුවඳින් අත උලාපසුම්බියෙහි තුබූ සිත්කළුවූ පොත අතට ඇරගෙණ දෑතින් අල්වාගෙණ කාශ්‍යප සර්වඥයන් දෙශනාකළ ක්‍රමයෙන්ම රූපමදය ඓශ්වර්‍ය්‍යමදය යෞවන මදය පුරුෂමදය යනාදීන්වූ මදමාන භංගය කරන්නාවූ තවද සංසාරවර්ත්ති සියලු සත්ත්වයන්ගේ රාගාදී වාදශාග්නියම මහ මේඝයක් බඳුවූ සසර ඉපදීම් නමැති තෘෂ්ණා දළුවට ග්‍රීෂ්ම කාලයක් බඳුව, තවද සංසාර වෘතතියෙහි අවිලිප්තව අමෘතමහා නිර්වාණයට පමුණුවන්නාවූ ඒ ගාථා සතර පොත බලා දෙශනා කොළේය.

ඒ කෙසේ ද? යත්,

සකිදෙව සුතසොම සබ්භි හොතු සමාගමො,
සතං සංගති පාලෙති නාසබ්භි බහු සංගමො.
සබ්භිරෙව සමාසෙථ සබ්භිකුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සෙයේ‍යා හොති න පාපියො.
ජීරන්ති වෙ රාජ රථා සුචිත්‍රා අථො සරීරම්පි ජරං උපෙති,
සතඤ්ච ධම්මො න ජරං උපෙති සන්තො හවෙ සබ්භි පවෙදයන්ති,
නභාචදූරෙ පඨවීචදූරෙ පාරං සමුද්දස්ස තදාහු දූරෙ,
තතො හවෙ දූරතරං වදන්ති සතංච ධම්මං අසතං ච රාජා.

යනාදි වශයෙන් බමුණානෝ තුමූ පොත කියවා මුවෙන් නොබැණ හුන්හ. එසඳ මහබොධිසත්ත්වයෝ ගාථා අසා එන ගමන සඵලයයි සතුටුව සිතන්නාහු මේ ගාථා සතර සාවක භාසිතයකුත් නොවෙයි, කවීන්ගේ බන්ධනයකුත් නොවෙයි, බුදුහු සර්වඥභාෂිතය. එබැවින් මීට පූජා මිල කවරේද්දෝහෝයි සිතන්නාහු ඉදින් මේ සතිස්ලක්ෂ

දසදහස් තුන්සිය පණස් යොදුන් චක්‍රවාටගර්භය භවාග්‍රය දක්වා සත්රුවන් පුරා දුනෝතිනුත් මෙතෙක් අගීද්‍යෝහෝයි සිතු සිතට දඹුවමටත් නොසෑහෙන්නේය. පූජාවේ අගේ කියනුම කිම්ද? එසේ හෙයින් එතකුදු උවත් මාගේ ආඥාව පවත්නාවූ තුන්සියයක් යොදුන් කුරුරට හා සත් යොදුන් ඉඳිපත් නුවර හා සියලු සම්පත්තිය දීපියන්ට පොහොසත්මි රාජ්‍යයට සුදුසුවූ කුසල් ඇද්දෝ හෝ නැද්දෝ හෝ ලක්‍ෂණ මන්ත්‍ර වශයෙන් පරීක්‍ෂාකොට වදූරණසේක් එබඳු භාග්‍යයක් නැති නියා දූත සෙනෙවිරත් ඇපා මාපා ආදී නොයෙක් තනතුරු බලා ඊටත් කුසල් නැති බව දූත සම්පත්තීන් කෙළක් වස්තුයෙහි පටන් පරීක්‍ෂාකොට සාරදූසක් පමණ මිනුරත් ලබන්ට සුදුසු කුසල් දූක දූසින් බැඳි පියලි සතරකින් පූජාකොට ආචාරීනි නෙසු දඹදිව රජදරුවන්ට මේ ගාථා දෙශනා කළ කල කෙසේ වස්තු ලැබේදූයි විචාරා මහරජ සියයක් සියයක් මසුරන් ලැබෙමි, එසේහෙයින් සතාරහ නම් වීයයි කී කල:-

එපවත් අසා මහබෝසතානෝ ආචාරීනි නොප ගෙණ ඇවිදිනා බඩු යෙහි අගය නොපි නොදන්නව, එසේහෙයින් මෙතැන් පටන් මේ ගාථාවෝ සහස්සරය ගාථා නම් වෙති. සාරදහසකින් පූජාකොට ඉක්බිති බමුණානන්ට සැප යානවක් දී ගෙට යවූහ. එසඳ සුතසෝම රජ්ජුරුවෝ සතාරහ ගාථාවට සහස්සාරහා පූජාකළානයි මහත්වූ සාධුකාර නාද පැවැත්තේය.

ඉක්බිති බොධිසත්ත්වයන් දෙමව්පියන්වූ රජදරුවෝ දෙදෙන එපවත් අසා තමන් සම්පතෙහි ලෝභබැවින් නොසතුටුවූ වන්නාහ. එද බොධිසත්ත්වයෝ බමුණා යවා තමන්වහන්සේ දෙමව්පිය දෙදෙනා කරා ගොස් වැඳලා එකත්පසෙක සිටිසේක. ඉක්බිති සොරහු අතින් ගැලවූනේ කෙසේදයි පිළිසඳර කථා මාත්‍රයෙකුත් නොකොට තමන් වස්තුලෝභී බැවින් ගාථා සතරක් අසා සාරදහසකින් පූජාකළේ සැබෑදූයි විචාළහ. එසඳ බොධිසත්ත්වයන් වහන්සේත් පියානන්වහන්ස මම වනාහි සියලු ගඟාවන්ගේ දිය වැදීමෙන් නොපිරෙන්නාවූ මහාසාගරය මෙන් යම් සත්පුරුෂ කෙණෙක් මා සමීපයට එලඹ මනාවූ භාසිතයක් කියන්නාහුවීනම් ඒ ඇසීමෙහි සතුටුවූ පමණක් මුත් සම්පත්තීන් ප්‍රයෝජනයක් නැත්තෙමි, ඊට කාරණා කිම්ද? යන් වස්තුව නම් සොරුන්ට සතුරන්ටත් දියටත් ගින්නටත් වස්තු ස්වාමි හටත් සර්වසාධාරණය, එසේ හෙයින් අනෛශ්‍යර්ණිකවූ සම්පත්තිය මනාවූ සද්ධර්මයට පූජාකොට අනුගාමික නිධානයක් නිධානකිරීම කෘතපුණ්‍යයන්ගේ ලක්‍ෂණයකැයි කියා දෙමව්පියන් අස්වසා වදාළසේක.

මෙසේද කියා මහබෝසතානන් වහන්සේ පියාණන් වහන්ස සම්පත් කාරණකොටගෙණ මට නින්ද, කාරණසේක්ද මම වනාහි බණ අසා නැවත නා සමීපයට එම්යි සොරහට සපථකොට නැගී ආම්යි. එබැවින් සබවසට දිවිපුදා ආයුතුමවෙයි. නුඹවහන්සේ සන්තකවූ මේ ඇත්, අස්, රථ, පාබල සෙනඟ, හා සමග වල්විදුනාවය, තලල්පටය, මගුල්කඩුවය, සේසතවජත්‍රය, මිරිවැඩිසඟලය,යි දක්වනලද පංචරාජ කකුධ භාණ්ඩද සියලු වස්තුකාම ක්ලේශකාමයෙන් සමෘද්ධවූ මේ රජ්‍යය අනුභවකළමැනවැයි පියරජහට රාජ්‍යය පාවා දුන්සඳ රජහුගේ ලය ඉපිලහුන, එසඳ මහත්වූ සෝකයෙන් කුමක් කියව්ද දරුවෙනි

හස්ති අශ්වාදී චතුරඞ්ගිණී සේනාව හා මහත්වූ ධනුර්ධර යෝධයන් ඇත්තේ මෙසේවූ ආපදාවෙහි අට පැමිණියාවූ තමාගේ ජීවිතය ගලවාගන්නා පිණිස වේද එසේහෙයින් සියළු කසී රාජ්‍යවාසීවූ සිව්රඟසෙනඟ සරහාගෙණ ගොස් අපට පසමිතුරුවූ සොරහු ජීවිතක්‍ෂයට පමුණුවම්හ. තොප ඔහු මරා යාතොහැක් කැයි කීහ. ඒ රජහුගේ සොළොස් දහසක් නාටක ස්ත්‍රීහුද අවශෙෂවූත් පරිවාර ජනයෝද කළු දුහුනු මුහුණු ඇතිව නැවත රජ්ජුරුවෝ පෝරිසාදයා සමීපයට යෙත්ලයි මහහඬින් හඬා යුගාන්ත වාතයෙන් පැහැර වගුරුවන ලද මහසල් වනයක් හෙයින් එකපැහිර මොරගාත්ට පටන්ගත්හ.

එසඳ මහබෝසතානෝ පියානන්වහන්ස ඒ පෝරිසාදතෙම නොමරා අල්වාගෙණ ගොසිනුත් මාගේ බස් ඇදහිලිකොට මාගේ ධර්ම්ශ්‍රවණයට බාධාවක් නොකොට නැවත එවුව ඒ ඉතා අරුමය, එසේහෙයින් ඔහු කරණලද විශ්වාසය සඳහන් කරන්නාවූ මම ඔහුට දුෂ්ටකමක්ද මාගේ බසට කැලක්ද නොකෙ ෟරම්මයයි දෙමව්පියන් අස්වසා මහරජ මම කරණලද මහත්වූ කුසල් ඇත්තෙම්, එසේහෙයින් චාතුර්මහාරාජිකාදිවූ සදිව්‍යලෝකයෙහි දිව්‍යමයවූ පඤ්චකාම සැපය තම් මට කොෂ්ටාගාරයෙහි පිරූ ධාන්‍ය සඤ්චයක්මෙන් මට ප්‍රත්‍යක්‍ෂව තුබූයේය. එසේහෙයින් රජ්ජුරුවන්වහන්ස කෘත කෘතනව සිටියාවූ අපවැන්නවුන්ට රාජ්‍යසම්පතතිනම් ඉතා ලාමකය එහෙයින් මම පෝරිසාදයා සමීපයට යෙමියි දෙමවුපිය දෙදෙනා වැඳ සමුගෙණ ගම් නියම්ගම් වැසි සියලු සත්‍වයෝද බලඇති සේනාවද අස්වසා සියලු සංස්කාර ධර්මයන් අනිත්‍යයයේ ධර්මදෙශනාකොට මහබෝසතානෝ සැබෑබසට දිවිපුදා එදවස්ම රජගෙයි ලැග දෙවෙනි දවස් අරුණෝදය නික්මුණුසේක. එසඳ පසුපස්සෙහි අඬාගෙණ හුනු අනාතඃපුර වන්නාවූ සියලු ජනයන් වලකාගන්ට නොපොහොසත්ව තමන් නික්මුණු මහවන අවුරා හිරි හැඳ මා කෙරෙහි සෙනෙහ ඇතිකෙණෙකු මේ ඉර පැනපියා නොඑව මැනවැයි වදාළසඳ සිල්වත්වූ මහතේජස් ඇති මහාබෝධිසත්ත්වයන්ගේ අණ ඉක්මවාපිය නොහිම මහහඬින් මොරගා සිංහ විජෘම්භණයෙන් නික්මුණු මහාබෝසතානන් බලබලා දර්ශනපථය ඉක්‍මත්වනතෙක් සිට හඬා වැලප නුවරට වන්හ. මහබෝසතානෝ තමන් නුවර වැඩි මගින් පෝරිසාදයා සමීපයට ගියහ. යන්නාවූ නැනැත්තන් වහන්සේද සුතසෝම රජ්ජුරුවෝ එත්වා නොඑත්වා රුක්දෙවියා යමක් මට කැමැත්තෙම්නම් තමා හැඟුනවක් කෙරෙවයි මේ රජදරුවන් මරාපියා පඤ්ච මධුර මාංශයෙන් බිලියම් කෙරෙම් දර සැයක් බැඳ අඟුරු බස්නා පිණිස ගිනි මොලවා මස් පලහන්ට උල් සසිමින් උන් නැනැත්තවුන් පිටිපස්සෙහි ගොසින් සිටිසේක. එසඳ පෝරිසාද පදසංඥවෙන් කරකැවී බැලූයේ දෙපෝමැදනැගී පුන්සඳමඬලක් සෙයින් දිලිසෙන්නාවූ මහබෝසතානන්ගේ මූණ දැක චන්ද්‍රකාන්තියෙන් පිපීගිය කෞමදයක් මෙන් සතුටු සොම්නසින් පිතා මහරජ නුවරට ගිය නුඹවහන්සේ කළමනා කටයුතුකොට වැඩිසේක්දැයි විචාරා එසඳ ශ්‍රීමහා බොධිසත්ත්වයෝද සබඳ ඓලෞකික පාරලෞකිකාර්ථ සිඞ් ප්‍රසවයකරන්නාවූ කසුප්සම්මාසම්බුදුන් දෙශනාකළ සතාරහ ගාථා සතර අසා සහස්සාරහ පූජාකොට සබවසට පූජාකොට නාකරා නැඟී එම්යි කියා ඉතිබ්බ තෝ මරා යාගය කරතත් මස්අනුභව කරතත් කරවයි වදාළසේක.

එපවත් අසා පොරිසාද මේ රජ්ජුරුවෝ කිසි භයක් නැතුව මා සම්මුඛයෙහි කථා කෙරෙති. ඒකාන්තයෙන් මෙවුන් ඇසූ බණෙහි ආනුභාවයක් වියයුතුයයි සිතා මමත් උන් අතින් අසා නිර්භය වියයුතුයි සිතා මහරජ දුම්රහිතව බස්නාලද සහ අඟුරෙහි පලහනලද මස් තෙමී හිරීය. එබැවින් මෙ දුරුච්තකය අඟුරුබවට කල පලහාකත් පිළිවම්වේද එතකට තොප ඇසූ සතරනා ගාථා මට කියව. අසන්නට අභිප්‍රායඇත්තෙමි කීය. එපවත් අසා මහබෝසතානෝ පොරිසාදතෙම තමාගේ පවිටු ගුණ සවභාවකොට ඇත්තේය. එබැවින් (මෙ දුරුච්තකයේ අඟුරු බට කල) මඳක් ඔහු තලවා නිග්‍රකොට ලජ්ජාකරවා පසුව කියමියි සිතා පොරිසාදය තෝ ඉතා අධම්මිෂ්ටයෙක. ඔබ පිණිස තෘෂ්ණාවට ගැතිව ඊනියා රාජ්‍යසම්පත්තියෙන්ද පිරිහුනෙහිද එසේ හෙයින් නිරන්තරයෙන් මලවැකුනු අත් ඇතිව අනුභවකරන්නෙහිය. එසේ හෙයින් තා කෙරෙහි සත්‍යවාදීගුණයෙක් නැත. අධර්මිෂ්ටවූ දරුණුවූ තට නවලෝකෝත්තර දහම් ඇසීමෙන් ප්‍රයෝජන කවරේද එම්බල ධම්‍ාධම්දෙක සමුද්‍රයෙහි එතරට මෙතරට සෙයින්ද රසාතලයට භවාග්‍රයසේයි සමනොවන්නේය. එසේහෙයින් පොරිසාදය සිංහතෙල් රඳත් කසුන් බඳුන සුදුසු උනබවමුත් මැටිබඳුන්හි රැඳවිය නොහොත්මය. එසේහෙයින්ම අපවැනි සත්තිස් බොධිපාක්ෂිකධර්මයන් පුරුදුකරන්නාවූ සවගීගාමීව සිටි මහත්මයන් විසින් අසා දූරු නවලොකොත්තර දහම් තොප වැනි අපායමාගී ප්‍රතිපන්නව සිටියාවූ තොප වැනි වූවන්ට ඇසීමෙන් කම් කින්දැයි වදාළසේක, එසේ නිග්‍රහකොට වදාළ මහබෝසතානන්ගේ මෛත්‍රීආනුභාවයෙන් කීපියානොහී තමාද ශිෂ්‍යභක්ති හෙයින් අනික් උපමාවක් ගෙණනැරදක්වන්නෙම් මහරජ සියලු දඹදිව්තලයෙහි රජදරුවෝ සජිාලඩකාරයෙන් සැරසී මහත්වූ බලඇති සෙනඟ පිරිවරා උතුම් පුරවලට පැනනැගී මුවදඩගොස් නියුණුවූ ශැරයෙන් මුවන් විද ජීවිතක්ෂයට පමුණුවන්නාවූ සමහරකෙණෙක් නොකන බවමුත් අනියා පිණිස පුරුෂයන් මරන්නාහු මෙදෙකින්ම පරලෙව්හී විපාක සරිය. එසේ හෙයින් නුඹවහන්සේ කුමක් පිණිස මාව අධර්මිෂ්ට කොට කියනසේක්ද ඉඳින් ඒ මෘගමාංශවජව මුවන් මරකන්නාවූ තෙසු රජදරුවෝ නිර්දෝෂයෝ වීනම් පුරුෂමාරණය කරන්නාවූ මමත් නිර්දෝෂවෙම්මයයි කීය. එපවත් අසා සුතසෝමරජ්ජුරුවෝ ඔහුගේ ලබ්ධිය බිඳ උදාහරණයක් ගෙණහැරදක්වන්නාවූ සබඳ පොරිසාදය රාජධර්මයන් රක්නා රජදරුවෝ ඇතුන් වලසුන් දිවියන් බල්ලන් බලලුන් ආදීවූ පස්නිය ඇති සතුන්ගේ මස් නොකන්නාහුය. යථොක්තවූ පස් ජාතියද තම තමන්ගෙ මස්ද නොකන්නාහු තෝ වනාහී පස්නිය ඇති නොකෑයුතු සවජාතියෙහිම මස් අනුභවකරන්නෙහි තිරිසන් සතුන් විවරටත් අධුවෙහිදැයි වදාළසේක. එපවත් අසා පොරිසාද බලවත් නිග්‍රහයට පැමිණ අනික් ග්‍රන්ථයක් නොදක්නේ තමා කළ පව්යට්කොට අනික් උදාහරණයක් ගෙණහැර කියන්නේ මහරජ නුඹවහන්සේ මා වැනි එකක්හු අතින් ගැලවීගෙණ සියලු පංචකාමසම්පත්තියෙන් සමෘඩවූ සවකියවූ භවනයට ගොස් පසමිතුරුවූ මා සමීපයට නැවත ආසේක. ඒ තමා රාජධම්යව ඇතුළත්දැයි කීය. ඉක්බිති මහබෝසතානෝ සබඳ රාජධම්යෙහි දක්ෂ කෙණෙක් මට වඩා මෙලෙව්හි නැත. දවස්පතා උදය රෙබාව නොවරදවා නැණෙනහිරක් සෙයින් දශරාජධම් නැමති රෙබාව නොවරදවා පවතීද සකලලොකයෙහි ව්‍යාප්තවූ කීර්ති ඝොෂා ඇත්තෙමි. එසේහෙයින් දශරාජ

ධර්මයට ඇතුළත්ව සීලයෙහි අනන්‍යගාමීව සබවසරක්නා පිණිස තොප වැනි චණ්ඩ සත්වයෙකු කරා නැගී ආමි ඉදින් මාගේ සබවසට කැලලෙක්වීනම් තොපවැනි පාපිෂ්ට තත්වයන්ටම නියමවූ තර්කයට යන්නෙම්වේද එසේ හෙයින් ලාමක ක්‍රියාවට ඇතුළත්නොවන පිණිස සබවසට දිවි දිමියි වදාළ සේක. ඉක්තිබිති පොරිසාදතෙම මහරජ වස්ත්‍රාභරණ ධන ධාන්‍යාදියෙන් පිරුණාවූ සියලු පොළොවද තුන්සෘතුවද කරණලද්දාවූ දිව් විමන් බඳුවූ උතුම්වූ ප්‍රසාදත්වයද සොළොස්දහසක් පමණ දෙවඟනන් බඳුවූ වරඟනන්ද අප්‍රමාණවූ ඇත් අස් රථ පාබල සෙනඟද ගවමහිසාදීවූ සම්පත්තියද තුන්වේලෙහි ගෙණහැර පමුණුවනලද රක්තවන්‍දනාදීවූ නොයෙක් ආහාරදැයි යන මේසා මහත් රාජසමෘද්ධිය හැර සබවසයෙහි කවර ආනිශංසයක් දැක සබවසට දිවිපිදුසේක්දැයි විචාළේය. එසඳ මහබෝසතාණෝ ලැව්ගිනි නිවා බස්නා ආකාශගංගා ප්‍රවාහයක්මෙන් විචාල බසට අනුරූපවූ ධර්මකථාවක් ගෙණහැර දක්වනසේක් සබඳ මේ පොළෝතෙලෙහි විද්‍යමානවූ යම්කිසි රසයක් ඇත් නම් ඒ සියලු රසයන් කෙරෙන් සත්‍යවචන නමැති රසයම උතුම ඊට කාරණා කිම්දයත් සබවසෙහිම සිටියාවූ ශ්‍රමණ බ්‍රාහ්මණාදීවූ හැම ජාති ජරා ව්‍යාධි මරණාදීවූ සකලදුක්ඛ නැමති සාගරය මෙන් එතරව සානතිපුරයටපැමිණෙත් නාහුයයි මෙසේ ඒ මහබෝධිසත්වයෝ සර්වඥතාඥානයෙහි පැහැර කඩාකන්ව ආ බලලකුට තමා අනතුඹු සතරන්සැරයටියකින් පහරදුන්නාසේ උතුම් ධර්මයෙන් නිඃශ්‍රිතවූ ඕහට ධර්මදේශනාකොට වදාළසේක.

එසඳ පොරිසාදතෙම බුඩප්‍රමුඛ ප්‍රබුඩමූවූ පද්මයන් පරිද්දෙන්ද නභො මධ්‍යගතවූ චන්ද්‍රමණ්ඩලය පරිද්දෙන්ද දහසක්වර වරදවලින් ඔප් නැගූ සතරන් කැටපතක් පරිද්දෙන් දිලියෙන්නාවූ මෛත්‍රිපූර්ණගමයට බඩා ස්මිතව ප්‍රකාශකෙරෙමින් කරණලදකථා ඇති මහබොධිසත්වයන් මූණ දැක මේසා අගුරු රැසක් හා සත්නාලද උල් ආදීවූ නොයෙක් කත්කටුල් බල බලා බණදෙශනාකරන්නාවූ චන්ද්‍රකාන්තිය දුටුසඳකැත් මිණක් සෙයින් මෛත්‍රීන් ආර්ද්‍රවූ මේ මුහුණෙහි කිසිත් චිත්තොත්ත්‍රාස මාත්‍රයකුත් නැත. කිමෙක්ද්‍රෝහෝ මේ සතරහා ගාථායෙහි අනුසස්දෝ නැත. සබවසයෙහි අනුසස්දෝ නො හොත් කවර ආනුභාවයක්ද්‍රෝහෝයි පිවාරම් සිතා මහරජ මෙබඳු මිනීමරණ සොරක්හු සමීපයෙන් ගැලවී මධුරවූ පංචකාම ගුණයෙන් ගැවසීගත් නුඹ වහන්සේගේ රජගෙටගොස් එබඳු රාජශ්‍රීය අපෙක්‍ෂානොකොට නැවත මාකරා ආසේක. එසේහෙයින් නුඹවහන්සේ මරණභය නැති සේක් කාරණා කිම්දැයි විචාළේය.

ඉක්බිති බොධිසත්වයන්වහන්සේ සබඳ මා විසින් බුඩාදීවූ සත්පුරුෂයන් විසින් ප්‍රශංසා කරණලද දාන ශීලාදී දශපුණ්‍යක්‍රියා වස්තු නොකඩකොට පුරණලද තවද පොරිසාදය දෙමව්පිය දෙදෙනාවහන්සේටද මනාකොට උපස්ථාන කරණලදිමි. තවද බන්ධුවර්ගී මිත්‍ර පුත්‍ර කලත්‍රාදීන්ද උන් උන්ගේ අභිප්‍රායානුකූලවූ පරිද්දෙන් පොෂ්‍යකරණලදිමි. එසේ හෙයින් සබඳ නිවන් පුරයට යන්නාවූ මග මාසේ එළිකළේනැත. ධර්මයෙහි පිහිටියාවූ මම කවර

කාරණයකින් මරණයටභයඳැයි ඉනිබඛ මාගේ මස් අනුභවකෙරෙම්යි නමුත් යාගකෙරෙයි නමුත් තා අගුණෙ කැයි වදාළසේක.

මෙසේ මහබෝසතාණන් බණවදාරාත් පොරිසාද සිතන්නේ මේ සුත සෝම රජ්ජුරුවෝ උතුම්වූ සත්පුරුෂධර්මයෙහි පිහිටියාය. ඥාණසම්පන්න යහ. මධුරභාසිතයහ. ඉදින් මොහු මරා යාගකෙලෙම්නම් මාගේ ඉස සත් කඩක්ව පැලීයන්නේය. නැවත පොළොව හෝ විවරදී ගැලීයන්නේයයි හයින් ත්‍රසථව මහරජ නුඹවහන්සේ වැනි සත්‍යවාදී රජක්හු යමෙක්මැරුයේ වීනම් හලාහල විෂයක් අනුභවකළාහම් වැන්නේයයි ගිනිගෙණ දිලියෙන යවටක් ගිලුවාවැන්නේයයි කීය.

නැවත සතරහා ගාථා අසනුකැමතිව ආදර ගෞරවයෙන් මහරජ සත්වලෝකයෙහි යම්කිසි සත්‍වකෙණෙක් බණ ඇසීමෙන් කුසලා කුසලවිපාක දන්නාවූ එබැවින් මමද නුඹවහන්සේගෙන් සතරහා ගාථා අනුකැමැත්තෙමි මාගේ සිතද දූන් දහමට ඇලෙයිකියා යාචඤකෙළේය.

ඉක්බිති මහබෝසතාණෝ දූන් වතාහි මොහුගේ ලය අර්ද්‍රවිය ඉනිබඛ බණකීමට මතාකලයි සිතා වදාරා සබඳ එසේවීනම් කන්යොමුකොට අසයි කියා තනබ්‍රාහ්මණයා කීලෙසම ගාථා සතර දෙශනාකොට තමන් සූක්‍ෂමවූ නුවණින් විනිවිද දන්නාවූ අර්ථ දක්වා වදාරණසේක.

සබඳ කල්‍යාණමිත්‍රයන් සමග එකවාරයක් කරණලද සමාගමය බොහෙ දවසක් ඓහලෞකික පාරලෞකිකාර්ථසිඞ් ප්‍රසවයකොට රැකලන්ව සමර්ථය යනු එකෙක. තවද අසත්පුරුෂයන් හා සමග සියක් අවුරුදු එකතැනක විසූ වත් දවසක් රැකලන්නට අපොසත යනුදු එකෙක.

තවද මහරජ සියලු ඉරියව්වෙහිම නුවණැති පණ්ඩිතවරු හා එක්වම වාසයකලයුතුමය. ඒ එසේමයයි සත්තිස් බොධිපාක්ෂික ධර්මයන් පුරුදුකරන් නාවූ සත්පුරුෂයන් හා එක්වූ සත්වතෙම එම ධර්මයතෙම උතුම්සේ දූක පුරුදු කරණලදුව සවුපසේ බුදුනැන් ලැබෙයි. එසේහෙයින් ඒ ධර්මය පුරුදුකරන් නාවූ සත්පුරුෂයන්ට සියලුලෙසින් සඵලවන්නේය.

තවද පොරිසාද රජ්ජුරුවෙනි රජදරුවන්ට අග්‍රවාහනයවූ මනාවූ කර්මාන්තඇති රථයය මෙසේ කිසිකලෙක දිරායෙද එමෙන්ම වාත්‍රිංශත් කුණපකොට්ඨාසයන් සමාධානවූ මේ ශරීරයද කලෙක ජරාවට පැමිණෙයි. වැලි ජරාවට නොපැමිණෙන්නේ කෙසේදයත් සත්පුරුෂවාසයෙන් පැමි ණෙන්නාවූ ගුණ ධර්ම ජරාප්‍රාප්ත නොවෙයි. කවරකාරණයෙන් දූයි යත් එසත් ධර්මය පුරුදුකළාවූ ජරාවූවද ජාති ජාතියෙහි ඒ ධර්මයගෙණ බොහෝ සම්පත්තියෙහි රූපයෙහි යෞවනයෙහි ඓශ්වර්යයෙහි ආධිපත්‍යයෙහි පිහිටුවනලද හෙයිනැයි දතුව.

ආකාශයට පොළොව සෙයින්ද සමුද්‍රයෙහි එතරට මෙතර සෙයින්ද ධර්මාධර්මදෙක එක්නොවෙතියි නුවණැත්තෝ කියති. අසත්පුරුෂ සමාගම යෙන් පිහිටියාවූ අධර්ම සමාදානයෙන් ඇත්තාහුද ඉදින් සත්පුරුෂ සමාග

මෙන් ලත් අවවාද පිළිගෙණ විසුවහොත් සසර සයුරෙන් එතරවියහැක්කැයි යනාදීන් සියලු වනදේවතාවන් ලවා සාධුකාර දෙවමින් ඹහට සතරහා ගාථා අර්ථ වදාළසේක.

මෙසේ මහබොධිසත්වයන් මිහිරිවූ කටහඬින් ධර්‍මදෙශනා කරත් කරත් තමාද ව්‍යක්ත බැවින් මේ භිම්යාතෝ මතුලොවිතුරු බුදුවන කෙණෙකුන් සැටියයි සිතත් සිතත් සියලුශරීරය පස්වණක් ප්‍රීතියෙන් පිණාගියේය. එසඳ මහබෝසතානන් කෙරෙහි මොළොක්වූ සිත් ඇතිව රුජ්ජය දුන් පියානන් සතුටුව ඇසින් බලා මම නුඹවහන්සේට දීපියන්ට සුදුසුවූ රන්රුවන් මුතු මැණික් ආදීවූ වස්තුවක් නොදත්මි, මේ මේ අර්ථ ව්‍යංජන සහිතවූ ගාථා අසා සතුටුවූයෙමි නුඹවහන්සේට ගාථාසතරට වර සතරක්දෙමි ගනමැනවැයි කියා එපවත් අසා මහාබොධිසත්වයෝ සබඳ තොපට වන්නාවූ මරණයත් නො වන්නේ හිතට වන්නාවූ මෙලෝ පරලෝ දෙක්හි වන්නාවූ අර්ථානර්ථ නො දක්නෙහිය. සබඳ මේ සත්ව ලෝකයෙහි මා ඇතුළුවූ සියලු සත්වයෝ මරණ ධර්‍මයෙන් විනිර්මුක්තවූ සත්වකෙණෙක් නැත. එහෙයින් නුවණැත්තාවූ සත්ව යෝද මරණ එකාන්තසේදැක මරණින් මත්තෙහි තමන්ට හිතකැමතිව පර ලෙව්හි සුවසඳහා පණිවාආදිවූ පස්පවින් වැළකෙන්නාහුය. මරණවත් මරණ මත්තෙහි වන්නාවූ සවර්‍ගාපාය දෙකත් අපෙක්‍ෂාව නැත්තෙහි මින් මට වැඩෙක් අවැඩෙක් වන්නේයයි නොසිතා අකුශලධර්‍මයෙහිම ව්‍යාපෘතව මිනී මරා අනුභවකරන්නෙහිය. එසේවූ නැනැත්තවූ විසින් දෙම්මැයි කී වරය තිර යයි සිතා හැරගැන්ම පණ්ඩිතකමට ඇතුළත් නොවන්නේවේදැයි වදාළසේක.

ඉක්බිති පොරිසාද කියන්නේ මහරජ ජීවිතය යෙත්වා නුඹවහන්සේට මාදුන් වරයට හානියක් කිසිකලෙකත් නොවේ, මා සැකනැතිව වරගන මැනවැයි කීය.

එසඳ බෝධිසත්වයෝ මේ තෙම ඉතා බුහුටිව කියන්නේය. එබැවින් එතිබ්බ වර ගතමනාකල එනකුදුළුවත් මිනීමස් නොකෑයුතුයයි යනවර පළමු කොට ගනිම්නම් බලවත්ව මිරිකෙන්නේය. එසේහෙයින් පළමුකොට අව ශෙෂවූ වරතුණ ගෙණ පසුව එකියන වරය ඉල්වාගණිමියි සිතා සබඳ උත්තම යෝ උත්තමයන් හා මිත්‍රධර්‍මයකෙරෙති. එසේම ඝෘවනානයන් එක්වන සුල්ලභ උත්තමජාති දෙපක්‍ෂයෙහි ඇත්තවුන් සමග වාසය ගංගානම් ගංගා වෙහි ජලයත් යමුනා නම් ගංගාවෙහි ජලයත් එක්වූවාසේ උතුම්වන්නේය. එබැවින් අවුරුදු සියයක් ජීවත්වන්නාවූ තමාගේ ඇසින් දක්නා අභිප්‍රාය ඇත් තෙම් ඒ වරය පළමුකොට දෙවයි. පොරිසාදයන්ගේ ජීවත්වීමක් කැමති උගවක්හුමෙන් තමන්වහන්සේ ඉතා ව්‍යක්ත බැවින් මාගේ ජීවිතය දෙවයි නොඉල්වා ඔහු අවුරුදු සියයක් ජීවත්වීම තමාදක්නේ තමාගේ ජීවිතය ඇවිති හෙයින්වේදැයි ප්‍රශ්නකොට අවුරුදු සියයක් ජීවත්වන්නාවූ තා දක්නා කැමැත්තෙමි. මෙකියන වරය පළමුකොට ඉල්ලූසේක.

එසඳ පොරිසාදයෝ මේ රජ්ජුරුවෝ තමන්සේ එබඳුවූ තමන්ගේ යශඓශ්වර්‍ය්‍යකින් පිරිහෙළා අල්වාගෙණ මරුකාපියන්ට සිතූ මා සුඛිසුවපත් වන්නා කැමැත්තමුහ. අනේ මූන් පරුෂ්‍යෙහිම සැරහුනුබවක් ඉතා යනපත්

නිසායයි සතුටුසිත් ඇත්තෙම් චක්ෂුවාකොට වරය ගත්බව නොදත වරදෙත් තාවූ තැනැත්තේ.

එසේය මහරජ උතුම්වූවද නුවණ ඇත්තවුන්ගේද සහවාසය යනු නුඹ වහන්සේ වදාළ ලෙසම උත්තමය අවුරුදු සියයක් ජීවත්වන්නාවූ මා සුවසේ දක වදාළමැනවැයි යන මේ පළමුවන වරය දිනිමියි ඇරගතමැනවැයි දීත. ඉක්බිති මහබොධිසත්වයෝ දෙවෙනි වරය ඉල්ලන්නාවූ මහරජ යම්සේ එක් සියයක් රාජධානියෙහි රජදරුවෝම පැමිණෙන ලද්දවූ අභිෂේක ඇත්තාවූ තම තමන්ගේ නමින් ඒ ඒ ස්ථානයෙහි පළමු සතුතිඝොෂා ඇත්තා හා මහත් ඓශ්වය්‍යීයෙහි පිහිටියාවූ ඒ රජදරුවන් රජෙකු විසින් මැරියහැක්කේ නො වෙයි. එහෙයින් එක්සියයක් රජදරුවන්ගේ ජීවිතය දානය දෙවයි දෙවෙනි වරය ඉල්ලූ සේක. ඉක්බිති පොරිසාදයෝ ඒ වරයත් නුඹවහන්සේට දිනිමියි මෙසේ දෙදෙනා කරණ කතාව රජදරුවෝ සමහරක් සමහරක් අසන්නාවූපුරා නොව අසන්නට කාරණ කවරෙදයත් පොරිසාදයෝ ගසට දුම්වැදගණිත්දයි යන භයින් මඳක් දුරුකොට දරසැය බැඳ ගිනිකළ හා එසේහෙයින් නුගගසට හා දරසෑයට අතුරෙහි දෙදෙනා කරණ අවස්ථාවෙන් සමහරක් අසා සතුටුව නොබෝකලකින් සුතසෝම රජ්ජුරුවන්වහන්සේ පොරිසාදයන්ද දමනය ලනසේක. නොබවයි අස්වැසුහ.

ඉක්බිති බෝධිසත්වයෝ තුන්වෙනි වරය ඉල්ලනසේක් මහරජ සියයක් රජදරුවෝ තා විසින් අල්වාගෙණ අතුල්තල විද නුගගස එල්ලනලද්දවූ තම තමන්ගේ ජීවිතයට සෝකයෙන් හැමවෙලෙහි මූණ හුනු කඳුලෙන් හඬන්නාහුය. එසේ හෙයින් බන්ධනනවූ ඒ රජදරුවන් උනාහැර උන් උන්ගේ රාජ්‍යයෙහි පිහිටුවාලුව මනා වරය තුන්වෙනිව ඉල්වම් වදාළසේක.

කුමක් පිණිසදයත් රජ්ජුරුවන්ගේ ජීවිත දානය දුන්ද වෛරයක් උන් හැම තමාට දස්කොට වෛතහිම රදවන්නාක් වත් නැත්තම් ජනපදවලට ගොස් විකොටපියන්නක් වත් කෙලෙම්නම් නපුරයි උන් උන්ගේ රාජ්‍යයෙහි පිහිටුවන්නාවූ තුන්වෙනි වරය ගත්සේකැයි දතයුතුය,

පොරිසාද යහපතැයි මහරජයි ගිවිස ඒ වරත් දීන.

ඉක්බිති සුතසෝම රජ්ජුරුවෝ හතරවැනි වරය ඉල්ලනසේක් මහරජ මේ දඹදිව එක්සියයක් රාජධානිය සම්බන්ධවූ නොයෙක් ගම් නියම් ගම්වැසි මනුෂ්‍යයෝ පොරිසාදන් අවුදින් අප අල්වන්නේය. දැන් අවුදින් අප අල්වන් නේයයි සිතා තා කෙරෙහිගත් භයින් රක්ෂාස්ථානගවෙසිව වන ගහනාදියවව සියලුරට ජනශුන්‍යව ගියාසේම ගියේය. එහෙයින් ඉතා ප්‍රතික්කූලවූ මිනී මස්කෑමෙන් වැලකුවයි කියා සතරවැනිව මේ වරය ඉල්ලම් වදාළසේක.

මහබෝසතානෝ මෙසේ වදාලකල අතින් අත පැහැර සිටියා සඹඳ සුතසෝමරජ්ජුරුවෙනි තොපි තමා කුමක් කියවුද මම ඒ වරය කෙසේ දී පියම්ද ඉදින් ගන්නා අභිප්‍රාය ඇත්තම් අනික් වරයක් පැහැරගණුව ඒකාන්ත යෙන්ම මේ මනුෂ්‍ය මාංශය මට ප්‍රිය මනාමය. මේ කාරණාකොට ඒනියාවූ රාජ්‍යශ්‍රියක් ඇර උදකලාව වනයට වන්මියි එසේහෙයින් මම ඉන්කෙසේනම් වැලැක්කහෙම්ද අනික් වරයක් ඉල්වාගණුවයි කියා.

ඉක්බිති මහබොධිසත්වයෝ මේතෙම මිනීමස් තමාට ඉතා ප්‍රියහෙයින් වැලැක්කනොඑම්. තමාගේ නුනුවණින් කියනබවමුත් අකුසලය මූත්ව මේ නිසා පිරෙණබවමුත් තෙසු මුත්ගේ අනාචාර ප්‍රවෘත්තියෙක් නැත. ඉදින් යම් කාරණයකින් මෙයින් වලකත් මා විනා කිසිකෙණෙක් නැත, යම් උපායකින් වලකම් සිතා ඕහට බණ වදාරණසේක් මහරජ තාබඳුවූ ලදරුවයස පිහිටි ඉතා විශෙෂවූ අතිමහත්වූ ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටියාවූ තෝ මෙමට ප්‍රියයයි පාපකර්‍ම්‍ය යෙහි ව්‍යාපෘතව මතුවත්තාහු දිව්‍ය මනුෂ්‍යලෝක සම්පත් හා නිවන් සම්පත් තීත් පිරිහී ඉතා භයානක ස්වරූප ඇත්තාවූ නරකයෙහි ඉපද අනේවා සුව හස් ගණන් අවුරුදු මුළුල්ලෙහි සතරඅපායෙන් ගොඩනැග්ගනොහී දුක් අනුභවකරත්තෙහි එහෙයින් මහරජ තමහට නොකැමැත්තවුන් විසින් තමාගේ කය තමාටම ප්‍රියවන බවමුත් අනික් වස්තුවක් ප්‍රියනොවන බව තාගේ නුවණිනුත් පරීක්‍ෂාකොට බලා එසේ හෙයින් තම තමාට නොසිතා ප්‍රියවස්තුයෙහි ලග්නව අකුසලය පුරා අපායභාක්වත්නෙහි එම්බල නුවණැති බවනම් ප්‍රියවූ වද යමෙක් අකුසල් පිරේනම් එහි චින්තාවනැර ඓහලෞකික පාරලෞකික සැපය සාධාදෙන්නාවූ පරම මධුරවූ කල්‍යාණකර්‍මයෙහි ඇසිරිය යුතුය. එසේ හෙයින් සවකීයාධිප්‍රත්‍ය ප්‍රවෘත්තවූ රාජ්‍යයෙහි පිහිටි තොප විසින් විදිතාලද ඒසා රාජ්‍යය සම්පත්තියකින් පිරිහෙලා නැවත මේ ජාතියෙහි චුතවූ තොප නරකයෙහි උපදවත්තව තිසිවූ තෘෂ්ණාවට වසඟනොව මතු දිව්‍ය මනුෂ්‍යලෝක සම්පත් සාධා තව සුදුසුවූ කුශලකර්‍මයෙහි යෙදී මිනීමස් කැමෙන් වලකුවයි බණවදාරා සතරවැනි වරය ඉල්ලූසේක.

මෙසේ මහබෝසතාතත් මෙලොව හහවා වදාළකල නරක භයින් ත්‍රස්තවම සුතසෝම රජ්ජුරුවන්ට දෙමි කී වරය නොදෙන්වත් නොපිළිවන. මිනීමස් කෑමෙන් වලකින්නටත් නොපිළිවන කුමක්කරම්දෝහෝයි කඳුළු පිරුණුවූ දෑසින්යුක්තව මහරජ මිනීමස් ඉතා ප්‍රියවනබව වදරා අනික්වරයක් ඉල්ලුව මැනවැයි මෙයින් වැලැක්ක නොහෙමියි ඇසීය.

බොධිසත්වයෝ එපවත් අසා වදාරණසේක් සබඳ යම් සත්වකෙණෙක් මෙමට ප්‍රියයයි ආත්මස්නෙහයහැර අකුශලකර්‍මයෙහි ව්‍යාපෘතව කාරණා කාරණා පරීක්‍ෂාකොට ගතනොහෙත්තාවූ ප්‍රියසේවනය පිණිස විෂමිශ්‍රවූ රා අනුභව කොට එතතම මියවැටෙත්තාවූ රා සොඬුන් පරලෙව්හි නරකයෙහි උපදනාහුය. තවද මහරජ මේ ලෝකයෙහි යම් සත්වකෙණෙක් නුවණින් පරීක්‍ෂාකොට සුරාපානාදීවූ ප්‍රියකාරණය කායික චෛතසිකවූ දුකට හේතුයයි නුවණින් දැන එබඳුවූ අභිව්‍යඤ්ජනයෙන් දුරුව උත්සාහයෙන් දන ශීලාදීවූ සුචරිතයෙහි යෙදෙත්තේය. එසේවූ සත්වතෙම තිත්තකටුකාදී ඖෂධ අනුභවයෙන් නිර්‍ව්‍යාධි වනස්ථායක්හුමෙන් තමාකළ සුචරිතයාගෙන් මෙලොවත් සුවවිඳ මිය පරලොව ගියකල්හිත් දිව්‍ය මනුෂ්‍යාදී සම්පතට පැමිණ සුවපත්වත්තේයයි වදාළසේකි.

එපවත් අසා පොරිසාදතෙම බැගෑපත්ව අඬත්වවත්ය. මහාපුරුෂයාණෙනි මේ මිනිස්මසෙහි කල ලොභයෙන් ජීවිතය හා සමකොට සිතත්තාවූ මව්පිය දෙදෙනාද මනොඥවූ වස්තුකාම ක්ලේශකාමයෙහිද ආලයහැර උදද

කලාව වනයටවැද මේ නියාවූ එබඳු මිනීමස් කෑමෙන් වැලකයෙමියි යන වරය කෙසේදීපියම්ද ඒ යට නොපිළිවනැයි කීයේය.

නැවත ඉක්බිති මහබොධිසත්වයෝ එම්බා පොරිසාදයෙනි නුවණැත්තාවූ උත්තමයෝ දෙබසක් නොකියාම සත්‍යවචනයම කියති. එබඳුවූ තොපිත් කැමති වරයක් ඉල්වාගණුවයි මට කියා දූත් මා ඉල්ලූ වරයට මැලිවව එසේ හෙයින් පලමු තොප කී බසට සරිනොවත්නාහයි කීහ.

නැවතත් පොරිසාදයානෙනි මිනී මසෙහි කල ලොභයෙන් කම් ප්‍රාප්තවූද බොහෝ අකුසල් අකිතීව අයසට පැමිණිපියා එබඳුවූ මනුෂ්‍යමාංශ භක්‍ෂණයකෙරෙමියි කෙසේ වරයක්දී පියම්දයි අඬමින් කීයේය.

ඉක්බිති බොධිසත්වයෝ පොරිසාදයෙනි යම් සත්වකෙණෙක් කැමති වරයක් දෙමි. යමෙකුට කීවාම නැවත මැලිවේනම් එසේවූ වරය නොදිය යුත්තේය. තොපි වනාහි මට සබඳ නොසැකකොට කැමතිවරයක් ඉල්වාමාගේ ජීවිතය හා ලයත් හැර සෙසු තොප ඉල්ලූ වරයක් දෙමි. නියතකොට මට කියා දෙතුන්වැන්ව ඉල්වියදීත් මැලිවීනම් සත්‍යවාදී කමෙක් නොවෙයි තවද මෙලෝකයෙහි සත්වයෝ හස්තපාදාදී අවයවය රැකගන්නා පිණිස සම්පත් දීපියන්නා හා ජීවිතය රැකගන්නා කැමැත්තේ හස්තපාදාදී අවයවයහැර පියන්නේය සත්‍යවචනය සංඛ්‍යාතවූ සුචරිත ධර්‍මයාගේ අනුසස් සිහිකරණ සත්වයෝ අවයව ධන ජීවිතය යන මේ සියල්ල හැර සුචරිතයම්පුරති රාජොත්තමයානෝ එසේ හෙයින් මට දෙමි කී වරය නොමැලිව වහාදී සත්‍යවචන කුසලය පුරාගණුවයි යනාදීන් නොයෙක් කාරණා කියා පොරිසාදයන් සත්‍ය වචනයෙහි පිහිටුවා ඉක්බිති මහබොධිසත්වයානෝ තමන් ගරුබව දක්වන්නාහු පොරිසාදයෙනි යමක්හු කෙරෙන් යමෙක් කුසලාකුසල ප්‍රකාශකවූ බණ කථාවක් උගත්තේද යම් උත්තමයෙක් යමක්හුගේ සිත සැකයේ දුරුකොට නිශ්ශංකාකෙළේද එසේවූ ආචාරියතෙම එබඳුවූ පුද්ගලයක්හට මුහුද නැව් නැගීගිය සත්වයෙක්හට පැමිණි දිවයිනක් පරිද්දෙන් පිහිටවන්නේය භයක් පැමිණිකල ගොස් ගැලවියන තැනක් පරිද්දෙන් පරමප්‍රතිෂ්ටාද වන්නේය. එබඳුවූ උත්තමයා හා කල මිත්‍රත්වය නුවණැත්තෝ නොදිරවත්තෝය. නොනසා රක්නේයයි යනාදීන් සබඳ පොරිසාදයෙනි යහපත් ගුණඇති ආචාරියකෙණෙකුන්ගේ බස් නොගිවිසිම කටයුතු නොවෙයි. මම තොප බාලකල ප්‍රිටසී ආචාරීව බොහෝ සිල්ප ඉගැන්වීම් දූන් බුඩවිලාසයෙන් සතරක්‍ෂ ගාථා කීමි එසේහෙයින් මාකීවා කරන්ට තොපි සුදුසු වන්නාහයි කීහ.

එබස්අසා පෝරිසාදයෝ සිතන්නාහු සුතසෝම රජ්ජුරුවෝ මට ආචාරීවත් සිටියාය. මා විසින් කැමති වරයක් ගණුවයි කීව වරයකුත් දෙනලද ඉතිකින් කලමනා කිම්ද එක්ජාතියෙක උපන්කල මියයාම ඒකාන්තයෙන්ම සැබව මිනීමස් නොකමී යන වරය දෙමියි කඳුළුධාරා වැහෙන මුහුණින් යුක්තව උණස්නෙන් නැගිට සුතසෝම රජ්ජුරුවන් ශ්‍රීපාදමූලයෙහි වැද වැතිර සබඳ සුතසෝම රජ්ජුරුවෙනි එකාන්තයෙන් ඒ මිනීමස් කෑමට ප්‍රියය. ඒ නිසා රාජසම්පත් හැරපියා මහවනයට වැදගියෙමි. ඒ නියාව දූනත් ඉන් වැලකයන්ට මට කිවුනම් නිරාහාරව ප්‍රණයයෙ නමුත් ඒ වරය තොපට දීපියෙමි මිනීමස් නොකමි කීහ.

ඒ අසා බෝධිසත්වයෝ සබඳ පොරිසාදයෙනි එසේමය සීලගුණයෙහි පිහිටා සත්වයාගේ මරණත් උත්තමයයි කියමි. මහරජ තොප විසින් මටද වරය දීපියන්ට වදාළද පටන් ආයසීමාගීයෙහි පිහිටායව එතකුදුවීතමුත් නැව තත් යාවක්‍ෂකෙරෙමි ඉදින් මා කෙරෙහිම තොපගේ මෛත්‍රියෙක් ඇත්තම් මහරජ පන්සිල් අරගණුවයි කීහ.

එබස්අසා පොරිසාදයෝ යහපතැයි සබඳ මට පන්සිල් දීලවයි කීකාම බෝධිසත්වයන් පසගපිහිටුවා වැඳ එකත්පස්ව උන්නේය. මහ බෝධිසත්වයෝත් එබඳු තද රූක්‍ෂගුණයෙන්යුත් මිනීමස්කා ඇවිදිනාවූ පොරිසාදයන් නොයෙක් බණකතා හා හෙතුකාරණා වචනයෙන් මොළොක් සිත් වචනයෙන් ඇතිකොට ඒ ජාතියෙහි අනුන්ගේ ජීවිතය නොනසනයේ පඤ්චශීලයෙහි පිහිටුවූහ. එකෙණෙහි එතනට රැස්වූ භූමාටු දෙවියෝ මහබෝධි සත්වයන් කෙරෙහි සමාධිව අවීචියෙහි පටන් භවාග්‍රයදක්වා ලොකකුහරය මුළුල්ලෙහි දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීන් පොරිසාදයන් මිනීමස්කෑම වලකාලන්ට නිසිකෙණෙක් නැත. අනේ සුතසෝම රජ්ජුරුවන් කළේ දුස්කරයෙක කළද ඉතා යහපතැයි වතලැහැබ එකකෝලාහල කෙරෙමින් තුඩ තුඩ සාධුකාර දුන්හ. භූමාටුදෙවියන්ගේ සාධුනාද ශබ්දය අසා චාතුර්මහාරාජිකාදී දිව්‍ය ලෝකයෙහි දෙවියන් ආදීවූ සදිව්‍යලෝකයෙහි දේවියන් ආදීවූ සියලු දෙවියන් හා සොළොස් බ්‍රහ්මලෝකයෙහි දෙවියෝ සාධුකාර දුන්හ. එදවස් සුතසෝම රජ්ජුවෝ පොරිසාදයන්ට බණකියා පඤ්චශීලයෙහි පිහිටුවා ලූහ. ඒ ආශ්චර්‍ය්‍ය දැක සමාධිවූ වෘක්‍ෂදෙවතාවාද විමානයෙහි සිට සාධුකාර දීන. ඒ වෘක්‍ෂදෙවතාවා දුන් සාධුකාර ශබ්දය අසා සුතසෝම රජ්ජුරුවන් කළසේ ඉතා දුෂ්කරය දෙවියන් විසිනුත් දමනේලිය නොහැකි සාහසිකක්‍රියා ඇති අපවිත්‍රවූහු දමනේලූ බව තුන්ලොවට ශාන්තිජල දුන්නා වැන්නයි යනා දීන් මහබෝසතානන්ට සතුතිකළහ. පොරිසාදද සුතසෝම රජ්ජුරුවන් වැඳ එකත් පසෙක සිටියේය. එසඳ බෝධිසත්වයෝ රජදරුවන් උනාපුවහොත් යහපතැයි කීහ.

එපවත් අසා පොරිසාදතෙම මම මේ රජදරුවන් ඇමදෙනාටම සතුරුව සිටියෙමි. එසේහෙයින් මා විසින් මුදනලද මේ රජ්ජුරුවෝ වටින් එක්වෙලා කොළ අපගේ සතුරා නොහැර අල්වවයි කියා මරාපුතම් කපුරැයි සිතා මා විසිනුත් සුතසෝම රජ්ජුරුවන්ගෙන් භාරගත් පඤ්චශීලය මාගේ ජීවිතය යතත් බිදපියැ නොහැක්කැයි සිතා මුන්වහන්සේ හා කැටිවගොසින්ම බිදියයුතුය. එසේකල්හි මට අභයවේවයි කියා මහබෝසතානන් වැඳ සාමිනි දෙදෙනම ගොසින් රජදරුවන් මුදම්හයි කීය.

එපවත් අසා මහබෝසතානෝ දෙදෙනෙම යහපතැයි කියා නුගගස ඡායාව අනතරයට ගොස් සිතනසේක් රජදරුවෝ තම් ඉතා දග්ධවූ මානඇත්තාහ. එසේහෙයින් මොහු විසින් අපි වෙහෙස ලදුම්හයි පොරිසාදයාද අල්වාගෙණ මරාපුතම් මාකළ වික්‍රමය මුදුන්පත්නොවූහ. ශාද්‍රෘස්‍ය හා එසේහෙයින් මේ රජ්ජුරුවන්ගෙන් ප්‍රතිඥගෙණ මිදියයුතුයයි සිතා වදාරණසේක් මහරජ්ජුරුවෙනි මේ පොරිසාද රජ්ජුරුවන් තොප හා මවිසින් මැලින් දූෂ්‍ය

වියනොහැක්කැයි ප්‍රතිඥා ඇරගෙණ පොරිසාදයන් ලඟට කැඳවා සබඳ රජ්ජුරුවන් උනාපියවයි වදාළසේක.

ඉක්බිති පෝරිසාදයෝ කඩුව අතින්ගෙණ එක් රජ්ජුරුකෙණෙකුන් බැඳ එල්වාලූ වැල් පොලුගසා පිය. එකල සත්දවසක් මුළුල්ලෙහි නිරාහාරව මහත්වූ වේදනාවෙන් සුලහෙහි එල්වනලද කටුකරඬු මල්දම් පරිද්දෙන් ඈත මෑත කරකැවිකැවී ආයාස විඳිමින් එල්ලෙන්නාවූ රජ්ජුරුවෝ බැම්ම කපනලදුව සිටපියන්ට අසමර්ථව මාතරූපයක්මෙන් බිමවැටීහුන්හ. එසඳ බෝධිසත්වයෝ මහත්වූ කරුණාවන් උපදවාගෙණ සබඳ එලෙස නිදියාව මිදිය නොහැක්කයි දෙවෙනිව රජ්ජුරුවන් පටන්ගෙණ තමන්වහන්සේ දෑතින් අල්වාගෙණ වැටියනොදී රඳව රඳවා වැල්කපවයි බැඳුම් කප්පවා තමන් වහන්සේ මහබල ඇතිහෙයින් ප්‍රියදරුවන් වඩාගන්නා පියාන කෙණෙකුන් පරිද්දෙන් සෙමෙන් ලෙහි වැදහොවා ගෙණ එකින් එකට බිමට බා සතප්පා තමන්වහන්සේ ඔවුන් අතුල්තල විදපූ වතසෝද දරුවන්ගේ කණ අවුනා ලූහු අදනා කලක් පරිද්දෙන් සෙමෙන් සෙමන් අතුල්තල අවුනාලූ වැල් ඇද්දමා ලේ සැරව හැර වණ නිදෙස්කොට සබඳ පෝරිසාදයෙනි ගසින් පොත්තක් උපුටාගෙණ ගලගාලා ගෙනෙවයි විධානකළසේක. පොරිසාදයෝද ඒ නුගගසින් පොත්තක්ගෙණ ගලගාලා දින. බෝධිසත්වයෝ ඒ ඇර ගෙණ සත්‍යක්‍රියාකොට අතුල්තලවල ගැලූසේක. එකෙණෙහි මහබෝසතානන්ගේ පිරුපාරමිතාවන්ගේ ආනුභාවයෙන් බේත්ගා ඇද අත අළමනා හා සමග සුවවැම සවසථවිය.

එකල පොරිසාදයෝ සාල් ඇරගෙණ දිය උළුකැන් පිස මහබෝසතානන් හා දෙදෙනා තෙසු සියක් රජදරුවන් දියඋළුකැන් පොවා සන්තර්පණය කොට පසුව දවස් නිදා නැගී මධ්‍යාහ්නවේලෙහිද දිය උළුකැන් පොවා තුන්වෙනිදවස් උළුකැන් සහිතවූ කැඳ පොවා මෙසේ තුන්දවසක් පරිහරණය කරණලද රජදරුවෝ නිදුක් නිරෝගිවූහ.

ඉක්බිති බොධිසත්වයෝ ඒ රජදරුවන් කැඳවා තොපගේ රට තැගී යන්ට ශක්ති ඇද්දැයි විචාරා වදාළසේක.

එකල රජදරුවෝත් ඉතින් පලායම්හයි කීහ.

ඉක්බිති බොධිසත්වයෝ පොරිසාද කැඳවා සියරටට යම්හයි වදාළහ, එපවත් අසා පොරිසාද රජ්ජුරුවෝ මහහඬින් හඬා බෝධිසත්වයන්ගේ ශ්‍රීපාදයෙහි වැටී හී සාමීනි නුඹවහන්සේ මේ රජදරුවන් ඇරගෙණ වැඩපුව මැනවැයි මම වනමුල් ඵලාඵලාහාරයෙන් ජීවත්වන්නෙම් මෙහිම වෙසෙමියි ඇඹුකල්හි සබඳ මේ වනයෙහි ඉඳ කරන්නේකිම්ද? අතිශයින්ම රමණීයවූ බරණැස්නුවරට යම්හයි වදාළසේක.

එපවත් අසා පෝරිසාදයෝ සාමීනි කුමක් වදාරණසේක්ද? ඉදින් මම රාජ්‍යයට ගියෙම්නම් නුවරවාසීහු මේ රජතෙම මාගේ මව මරා කෑයයි පියා මරාකෑයයි යනාදීන් මහත්වූ වෛර ඇත්තාහු මේ සොරහු අල්වාගෙණ

මරාපියව යනාදීන් ආක්‍රොශ පරිභව බෙණෙමින් මහත්වූ සරුපහානියට පමුණුවා කැවින් මුගුරෙන් ජීවිතක්‍ෂයට පමුණුවාපියන්නාහුය.

එසඳ නුඹවහන්සේ සමීපයෙන් ගන්නාලද පිරිසිදුවූ සීලයෙහි පිහිටි හෙයින් ජීවිතය පිණිස අනික් කිසිවක්හු මා විසින් මැරියනැක්කේ නොවෙයි.

එසේහෙයින් මා නුවරට යා නොහැක්ක. තවද මහරජ ප්‍රියවූ මිනීමස් කෑමෙන් වැලකුනාවූ මම කීපදවසක් ජීවත්වෙද්ද ඉතිඹ නුඹවහන්සේ දක්නට නොලැබෙම් වේදැයි මහහඬින් හඬා සාමිනි නුඹවහන්සේ වැඩපුව මැනව වැයි කීහ.

ඉක්බිති මහබෝසතාණෝ මහත්වූ කරුණාවෙන් ඔහුගේ පිට පිරිමැද සබඳ එහෙයින් තොප ඒ රාජ්‍යයෙහි පිහිටුවමින් සුතසෝම රජ්ජුරුවෝනම් මමය තොපවැනි තදපරුෂවූ සාහසිකක්‍රියා ඇති එකක්හු පවා දමනේ ලීම් එබඳුවූ මම බරණැස්නුවර ඇත්තන් සරුවක්කොට මා කීවා කරව්ද එසේ හෙයින් තොප ඒ රාජ්‍යයෙහි පිහිටුවාලියහෙම්මය. ඉදින් එසේකොටලිය නොහෙම්නම් මාසතු තුන්සියයක් යොදුන් කුරුරට හා සත්යොදුන් ඉඳිපත් නුවර ඇතුළුවූ සියළු රාජ්‍යසම්පත්තිය දෙකක්කොට බෙදාපියා එකක් දෙමි. එසේහෙයින් තොප මාකී වචනය කළ තැනැත්තන්ගේ තරම හා දින පුරා නනය සැපයෙහි පිහිටුවාලී මාම බඳුවූවන්ටම සුදුසුයයි ඔහු රාජ්‍යසම්පත්තීන් ලොභකරවනසේක්.

මහරජ තොපගේ මුළුතැන්ගෙයි අරක්කැමියන් විසින් මනාකොට දුරු මිරිස් ආදී නොයෙක් කුළුබඩු හා පිසන සුවඳකවනලද තෙල් හුරුමස්ද ගිරා ආදී පක්‍ෂි සතුන් තෙළ බැදීම් මැලවීම් ආදීවූ නොයෙක් රසමසවුලෙන් යුක්තවූ ශක්‍රයාගේ සුධාභොජනබඳුවූ රාජ භොජනය මේ නිමවමින් බලමද පුරුෂමද වර්ධනය කෙරෙමින් සැපසේ රාජ්‍යසම්පත්තිය අනුභවකරන්නා නබාලා කවර කාරණයක් හෙතුකොටගෙණ මෙම වනයෙහි වසන්නෙහිද.

තවද මහරජ නොයෙක් නොයෙක් දෙසයෙහි රජදරුවන් විසින් සරහා එලවනලද මාණික්‍යකුණ්ඩලාභරණාදීවූ නොයෙක් ආභරණ ආදියෙන් සැර හුනු නාගේ සොළොස්දහසක් බිසෝවරුන් ප්‍රධානකොට ඇති සියගණන් නාටකස්ත්‍රීහු ශක්‍රයා පිරවැරූ දෙවඟනන් මෙන් රාජ්‍යසම්පත්යෙහි පිහිටි යාවූ නා පිරිවරාගෙණ නොයෙක් ලීලා විලාසයෙන් සිත ඇති යම් උකටලී යෙක් ඇත්නම් දුරුකරන්නාහුය.

තවද මහරජ නානාප්‍රකාර වර්ණකම්බල හා සිංහ ව්‍යාඝ්‍රසම් අඳුන්දිවිසම් කෙහෙල් මුවසම් ආදීනොයෙක් සැප ආස්තරණයන් හා කොඳුපලස් බහා අතුරණලද ශ්‍රියහන් මස්තකයෙහි සැතපී තවද නගනලද ධවලාතපත්‍ර ඇති විශිෂ්ටවූ සිංහාසන මස්තකයෙහි ඉඳ රාජමණ්ඩලී මහාමාත්‍යාදීන් විසින් පිරි වරණලදුව රාජ්‍යානුශාසනය කිරීම තවද දෙවඟනන් බඳු වරඟනන් ගසන වයන පංචාඞ්ගික තූර්‍ය්‍යනාදයෙන් හා මනාවූ භාවහාවලීලා විලාසයෙන් යුක්ත චන්දිභට්ටාදීන් විසින් කියනලද ගීතිකා නාදයෙන් සිත්පිණවමින් කරණලද

උතුම්වූ රාජ්‍යශ්‍රී සම්පත් හැර උදකලාවම මේ වනයෙහි දුර්භොජන දුශ්ශය්‍යාවෙන් දුක්විඳ කිම්ද තවද තාගේ සිත්කළුවූ උද්‍යානයෙහි නඟන පුන්නාගාදී සනමල්පල්ලෙන් සැදී සිටි රුක්රජුන් හා අන්තරන්තරයෙහි සංචාරණය කරන්නාවූ නොයෙක් දිපද චතුස්පදජාතීන් හා පස්පියුමෙන් කළ නොයෙක් විල්පන්තියෙන් හා හංස චක්‍රවාකාදීවූ ජලචරපක්ෂීන්ගේ අති මධුරවූ පංචවර්ණ භෘඞ්ගසමූහයන්ගේ රමණීයවූ ඣංකාර නාදයෙන් උපලක්ෂිත මනහර උයන්කෙළියෙන් ග්‍රීෂ්ම ඍතුසම්භවන කෙරෙමින් වසන්නාවූ අතිශයින් රමණීයවූ බරණැස්නුවර රාජ්‍යය හැර වනයෙහි කුමන සැපයක් තකා රඳවූද? එසේහෙයින් සබඳ රාජ්‍යයට යව්යයි වදාළසේක.

එසේ මහබෝසතාණන් විසින් පෙර අනුභවකරණලද නොයෙක් පංචකාමගුණයෙන් යුක්තවූ රාජ්‍යසම්පත්ති සඳහන්කරවා වදාළකල පෝරිසාද රජ්ජුරුවෝ සිතන්නාහු මිනීමස්කෑම නමැති සැපයක් නැතිකල මුන් කී රාජ්‍යසම්පත්තියට වඩා සම්පත්තියක් නැත්තේ නියමය මේ සාමිදරුවානෝ සර්වප්‍රකාරයෙන් මම මෙලොව පරලොව දෙකින් මාකෙරෙහි හිත කැමතිව පළමුකොට මා කල්‍යාණ ධර්මයෙහි පිහිටුවා දෙවනුව පුරානුභූතවූ රාජශ්‍රීයෙහි පිහිටුවනු කැමතියෙක් මුන්වහන්සේ විනා මා රාජ්‍යසම්පත්තියෙහි පිහිටුවාලන්ට සමර්ථ කෙණෙක් මේ භූමිමණ්ඩලයෙහි නැත. එසේ හෙයින් උත්තම රාජේන්ද්‍රයාගේ සමවායෙන් පුරාතන සමරෙහි පිහිටුවා ගියමැනවැයි සිතත් සිතත් සකල ශරීරයෙහි මැඩගෙණ පවත්නාවූ ප්‍රීතිප්‍රමොදයෙන් මහබෝසතාණන්ගේ ගුණවර්ණනාකරන්නැයි මහරජ කෘෂ්ණපක්ෂයෙහි චන්ද්‍රමණ්ඩලය යම්සේ දවසින් දවසට හායනපක්ෂයට පැමිණේද එමෙන්ම අසත්පුරුෂයන් හා එක්වූ උත්තමයෝත් දවසින් දවස ශ්‍රීයානියට පැමිණෙන්නේය, ඒ එසේමය යම්බඳුවූ මම සත්‍යධර්මවූ අරක්කැමියා හා එක්වීමෙන් මිනීමසෙහි රසඳන කරණලද අකුශලකර්මයෙන් නුඹවහන්සේ සඳහා විනා මදකින් නරකයටගියෙම්වෙයි එහෙයින් මහරජ නුඹවහන්සේ වැනි ශුක්ලපක්ෂය හා එක්වූ මාවැනි කෘෂ්ණපක්ෂය සම්බන්ධිතවූ චන්ද්‍රමණ්ඩලයට ඉතිඹ ශුක්ලපක්ෂයෙහි වර්ධමානවූ චන්ද්‍රමණ්ඩලයක්මෙන් මහත් යසශ්‍රීන් වඩන්නෙම් බොහෝ කුසල්කොට මතු දිව්‍යලෝකයට යන්නෙම්වේදැයි යනාදීන් මහබෝසතාන්ගේ ගුණවර්ණනාකොට නැවතත් මහරජ යම්සේ ගොඩ වස්නා වැසිවට පමණ හා සමග මැටි වියලන පමණක්මුත් බොහෝකලක් නොපවතීද අසත්පුරුෂයන්ගේ සමාගමයත් බොහෝකලක් තට විපාක පවත්වාලන්ට අසමර්ථය. යම්සේ විල්හි වස්නාලද වැස්සෙහි ජලය බොහෝදවසක් සපිරමියර ඇතිහෙයිනුත් ජලාශ්‍රය ඇතිහෙයිනුත් බොහෝ දවසක් පවත්නේය. එසේහෙයින්ම ලෙසි මහත්වූ කරුණා ගුණ ඇති නුඹවහන්සේ බඳු මහාත්මයන් හා එක්වූ සත්වතෙම විල්හි වට වර්ෂාජලයමෙන් බොහෝකලක් පවත්නේයයි යනාදීන් අනෙකපරියායෙන් මහබෝසතාණන්ගේ ගුණ වර්ණනා කළහ.

ඉක්බිති ඒ ශ්‍රී මහාබොධිසත්ත්වයෝ පොරිසාදයන් හා සියක් රජදරුවන් කැඳවාගෙණ වනයෙන් පිටත්ව පසල්ගමකට අවුදින්වන්හ. එසඳ ඒ ප්‍රත්‍යන්තවාසීහු සුතසෝම රජ්ජුරුවන්වහන්සේ දැක යුහුව ඉඳිපත් නුවරට ගොස් කීහ.

එකල අමාත්‍යයෝ සිවුරඟසෙනඟ ගෙණවුත් රජ්ජුරුවත් පිරිවරා රැකවල්ගත්හ. එසඳ මහබෝධිසත්ත්වයෝ සිවුරඟසෙනඟ පිරිවරා බාරාණසී රාජ්‍යයට නික්මුණාහ. අතරමග දනව්වැසි සත්වයෝ බොහෝ පඬුරු පාක් කුඩම්ගෙණ රජ්ජුරුවන් පිරිවරා කැටුවම නික්මුණාහ, මෙසේම මහපෑීත් හා සමග බරණැස් නුවරට පැමිණිසේක.

එකල පෝරිසාදයන්ගේ පුතනුවෝත් රාජ්‍යකරන්නාහුය. සෙනෙවි රද්දු නම් කාලහත්තිනම් සෙනෙවිරද්දුමය, එකල නුවරවැස්සෝ සුතසෝම රජ්ජුරුවන්වහන්සේ පෝරිසාදයන් දමනෙහිලා කැඳවාගෙණ එනසේක්ලයි අසා නුවරට ඔහු වැද්ද නොදෙම්හයි වාසල්එලා ආයුධගත් අත් ඇතිව සටනට සැරහී සිටගත්හ.

මහබෝසතානන්වහන්සේ වහසලඑලාගත්බව දැන පෝරිසාදයන් හා සියක් රජදරුවන් දුරම රඳවා අමාත්‍යයන් ගණනක් හැරගෙණ වාසල්කරා ගොස් තමන්වහන්සේ වැඩිබව දන්වා යවූසේක. එපවත් අසා රජ්ජුරුවෝ හුනස්නෙන් නැඟීසිට වහා දෙරහැර රජගෙට වඩාගෙණෙවයි විධානකළහ.

ඉබිති බොධිසත්ත්වයෝ අරණලද දෙරින් නුවරට වන්සේක. රජ්ජුරුවෝද සෙනෙවිරද්දුද පෙර ගමන්කොට ගොස් ප්‍රාසාදයට වඩාගෙණවුන්දින් රාජාසනමස්තකයෙහි වඩා හිඳුවා බඩාඤ්ජලීව සිටියාහ. එසඳ ශ්‍රී මහා බෝධි සත්ත්වයන් වහන්සේද පෝරිසාද රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන්ද තෙසු අමාත්‍යවරුන්ද සමීපයට කැඳවා වදුරා රජ්ජුරුවන් නුවරට වැද්ද නොදෙන්ට කාරණා කවරේදැයි සෙනෙවිරදුන් විචාළසේක. එසඳ කාලහස්ති නම් සෙනෙවිරද්දු මහරජ ඒ රජ පෙර මෙනුවර රාජ්‍යකරන්නේ බොහෝ ස්ත්‍රී පුරුෂයන් මරාකා රජදරුවන් නොකළමනා දෙයක්ම කෙළේය. වැලි නුවරින් පිටත්වූවෙන් වනමධ්‍යයෙහි ඉඳන් මිනීමරා කන්නේ සිංහලු දඹදිවට සිදුරුම කෙළේය. එසේහෙයින් මෙබඳු පවිටුගුණයක් සවභාවකොට ඇත්තාවූ එකෙක් ඒ කාරණයෙන් නුවරට වැද්ද නොදෙම්හයි කීහ.

එපවත් අසා මහාබෝධිසත්ත්වයෝ වදුරණසේක් සෙනෙවිරත්නි දැන් රජ්ජුරුවෝ එබන්දක් නොකරති, කාරණා කිම්දැයියත්? මම උන් දමනේ ලා සීලයෙහි පිහිටුවා ප්‍රතිඥගතිමි. එසේහෙයින් ජීවිත පිණිස ප්‍රාණවධ ආදිවූ හිංසා පීඩාවක් නොකරන්නාහුය. මෙතැන්පටන් රජ්ජුරුවන් පිණිස තොප ඇමට භයෙක්වීනම් අපටභාරයයි වදුරා රාජපුත්‍රයානන්ට අවවාද වදුරණ සේක් රජ්ජුරුවෙනි, දරුවන් විසින් දෙමව්පියන්ට උපසථාන කළයුතුය යම්තාක් දෙමව්පියන්ට උපසථානකළවුන්ට වඩා පළමු දිව්‍යලෝකයට යන්නාවූ සත්වකෙණෙක් මේ ලෝකයෙහි නැත. ඉදින් වැලිත් දෙමව්පියන්ට දුශ්‍යවූ සත්වකෙණෙක් නරකයට යන්නාහු යනාදීන් රජ්ජුරුවන්ට අවවාදකීයා සෙනෙවිරදුන් බණවා කාලහසතිය තෝද රජ්ජුරුවන්ගේ අත්‍යනත මිත්‍රයෙහි රජ්ජුරුවන්ට සේවකයෙහිය. ඒ රජ්ජුරුවන් විසින්ම ඉතා මහත්වූ ඓශ්වර්‍යයෙහි පිහිටුවනලද එසේ හෙයින් තොප විසිනුත් රජ්ජුරුවන් වැඩෙහි හැසිරියයුතුයයි සෙනෙවිරදුන්වත් අවවාද කීයා බිසවුන්ද කැඳවා දේවිනි තොපිද කුලයෙන් අවුත් මේ රජ්ජුරුවන් සමීපයෙහි අගමෙහෙසුන්

තනතුරු ලදින් සමාන වයස්ඇතිව රජ්ජුරුවන්හා සමගව විසී එක්ව රාජ්‍යශ්‍රී අනුභවකරව් එහෙයින් තොප විසිනුත් කෙලෙහිගුණ දැන දෙවතාව විසීම උත්තමාංගනාවන්ට සුදුසුයයි යනාදීවූ නොයෙක් පරිද්දෙන් රජ්ජුරුවන්ටද සෙනෙවිරදුන්ටද බිසවුන්ටද ධර්‍මදෙශනාකොට නෙසුත් අමාත්‍යමණ්ඩලයා හා නුවරවාසීන්ටත් එම්බා රාජද්‍රොහකර්‍මතම් ඉතා බර දෙයක එසේහෙයින් තොප හැම විසිනුත් ඒ රජනට ඇගියනොනැක්කැයි කාරණා කිම්ද? යත් තොපගේ මේ රාජ්‍යයට ප්‍රවේණී රජය, නවද ලදරු වයස සිටියේය. මා අතින් සත්පුරුෂධර්‍මය අසා සතුටුව සතරවරයක්දී දශරාජධර්‍මයෙහි පිහිටියේය. එසේ හෙයින් ඔහු කෙරෙහි කිසිනොකටයුත්තක් නොසිතවයි නුවරවැස්සනුත් එම ලෙස අස්වසා ධර්‍මදෙශනා කළසේක. මෙසේ ඒ සර්‍වඥවිලාසයෙන් වදාරණලද කෘතොපකාර සංඛ්‍යාතවූ බණකථා අසා රජ්ජුරුවෝද, සෙනෙවිරදුද බිසවද නුවරවාසීවූ මහජනයෝද සතුටුව නුවර බෙරපියවිකරවා නුවර සරසවා සියලු නුවරවාසීන් රැස්කොට රජ්ජුරුවෝ ධර්‍මිෂ්ටයෙහි පිහිටියේල, ඉනිඹ තොප හැමදෙනා නොබවයි යනාදීන් නුවරසින් අසා මහරජ්ජුරුවන්වඩා නුවරව ගෙණෙම්හයි වැව්මියරක් බිඳගෙණ නික්මුණු මහවතුරක්මෙන් මහබෝසතානන් දැළිරුවුලු අඳුම්නබා සුවදපැන් සොළොස්කලයකින් ඉසසෝදා නහවා සත් රුවන් රැසක් මත්තෙහි සිටුවා දක්ෂිණාවෘත ශ්වෙතසංඛයෙන් මූද්ධාභිසෙකය කොට නුවර පැදකුණුකරවා රජගෙට වඩාගෙණගියහ. එසඳ ඒ රජ්ජුරුවන්ට අප්‍රමාණවූ ඓශ්වර්‍ය්‍යී ඇතිවිය පොරිසාද රජ්ජුරුවෝ සුතසෝම රජ්ජුරුවන් හා සියයක් රජදරුවන් හා මහත් සත්කාර සම්මානකළහ.

සුතසෝම නරේන්ද්‍රයානන්වහන්සේ විසින් පෝරිසාදයන් දමනෙහිලා රජයෙහි පිහිටුවාලූසේක්ලයි සියලු දඹදිව එකකොලාහලවිය.

මහාබොධිසත්වයෝ ඒ රජහුවිසින් කරණලද සත්කාර විඳිමින් මසක් පමණ එහි දවස්යවා වැස නැවත පෝරිසාදයන්කැඳවා සබඳ මෙතැන්හි මින් දත්හල් පසක්කරවා දුගී මගී වණිබ්බක යාචකයන්ට මහදන්දී දශරාජ ධර්‍මය අකෝප්‍යයක් නොකොට රාජ්‍යකරවයි අවවාදකොට ඒ රජ්ජුරුවන් දූතයන් දූක ඉනිඹ අප නියමනා කලැයි වදරා බලඇණිසේනාව පිරිවරණලදුව නුවරින් නික්මුණුසේක් පෝරිසාද රජ්ජුරුවන් විසින්ද පසුගමන්කොට නික්ම දෙමංසන්ධියෙහි සිට වැඳ සමුගෙණ වැළැක්කාහ.

තෙසු රජදරුවෝද මහබෝසතානන්වහන්සේ වැඳ සිපගැණීම ආදීවූ සාමීචිකොට මහබෝසතානන් විසින් දෙනලද යාන වාහනාදියට නැගී ක්‍රමයෙන් තම තමන්ගේ සියරටට පිවිසීය, මහබෝසතානන්වහන්සේ ඉඳිපත් නුවර වැස්සන් විසින් දිව්‍යපුරයක්මෙන් සරහනලදුව නුවර අසුරවිජය කොට ශක්‍රභවනයට වදනාවූ සක්දෙව්රජහු පරිද්දෙන් ඇතුළුනුවරටවැද නුවරතුන් විටක් පැදකුණුකොට ප්‍රාසාදයට නැගී දෙමව්පියන්ටවැඳ පැදකුණුකොට මිහිරිවූ පිළිසඳරකථාකොට එදවස්පටන් සතරසංග්‍රහවතින් වියෝනොව දූහැමෙන් රජකරණසේක් මෙසේ සිතූසේක.

කෙසේ ද? යත්

වෘක්ෂදෙවතාවා මට බොහෝ උපකාරීව සිටියේය. එසේහෙයින් ඔහට බලිකර්‍මයක් කළමැනවැයි නුහගසට නුදුරුනැන්හි මහවැවක් බඳවා බොහෝ

මිනුෂ්‍යයන් යවා එතැන්හි මහගමක් කරවූසේක. එගම මහත කොපමණද යත් මේ සත්වලෝකයෙහි පවත්නාවූ වස්තුවෙන් අසෝවස්තුවෙක් මෙහි නැතැයි නොකියන පරිද්දෙන් කස්තුරු කපුරු සඳුන් කළුවැල් ලමිහනකුල් පට්පිළී දෙවාංග මුතුමැණික් රත්රන් රිදී ආදීවූ නොයෙක් වස්ත්‍රාභරණයෙන් සුගන්ධාපන රත්නාපනාදීවූ අසූදහසක් සල්පිල් ඇත්තේය. ඒ නුගගහද සාඛා මණ්ඩලයෙහි පටන්ගෙණ සමතලකොට වට පවුරු බඳවා සතරදෙරින් යුක්ත කොට දවස්පතා සුවඳතෙල් පහන්නගා රසමසවුලෙන් යුක්තවූ ආහාරය රන්තලියෙහි පුදා කරණලද පූජාසත්කාර අපමණවිය. දෙවතාද මහ බෝසතානන්වහන්සේ කෙරෙහි අතිශයින් ප්‍රසන්නව සියලු උපද්‍රව නිවාරණය කෙරෙමින් රැකවල්ගත්තා. ඒගම වනාහි අකුශලකර්මයෙහි ව්‍යාපෘතවූ පාපි පුද්ගලයන් දමනේලූ තැන කරණලදහෙයින් කම්මාසසදම්ම නම් නියම්ගම වීයයි ඉරසඳ පවත්නාතෙක් ප්‍රසිද්ධකොට වදාළසේක. දැන් වර්තමානයෙහි එම කම්මසසදම්ම නම් නියම්ගම වැඩහිඳ–

චත්තාරො සතිපට්ඨානා, ඉධ භික්ඛු අජ්ඣත්තං කායෙ කායානුපස්සි විහරති, බහිද්ධා වා කායෙ කායානුපස්සි විහරති, අජ්ඣත්තබහිද්ධා වා කායෙ කායානුපස්සි විහරති, ආතාපි සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං.

යනාදීන් සතිපට්ඨානසූත්‍රදෙශනාව දශසහශ්‍රීලෝකධාතු උපුල්වා වදාළ සේකැයි දතයුතු. මෙසේ මහබෝසතානෝ සියළු ජම්බුද්වීපයෙහි රජදරුවන්ට අවවාද අනුශාසනාකොට තමන්වහන්සේද දශරාජධර්මයෙන් රාජ්‍යයකොට සහපිරිවරින් දෙව්ලොව වැඩිසේකැයි යනාදීන් බුදුහු මේ ජාතක ධර්මදෙනාව ගෙණහැරදක්වා වදාරා මහණෙනි, මොහු දැන්මතුනොවෙයි පෙරත් මේලෙස දමනයලූසෙම් වේදැයි පූර්වපරසන්ධිගලපා මහණෙනි එකල පෝරිසාදයෝනම් දැන් අංගුලිමාල ස්ථවිරයෝය. එසමයෙහි කාලහස්තිනම් සෙනෙවිරද්දු දැන් මාගේ ශාසනයෙහි ධර්මයට සෙනෙවිරද්දු දම්සෙනෙවි සැරියුත් මහතෙරහුය. එදවස් සතාරගාථා පඬුරක්කොට ගෙණවුත් මාසමීපයෙන් බොහෝ උපකාර කරණලද්දාවූ නන්ද බ්‍රාහ්මණ නම් ආනන්ද මහතෙරහුය. එකල වෘක්ෂදෙවතාවා නම් දැන් ධුතාංගධර තපොනිධානවූ මහාකාශ්‍යප ස්ථවිරයෝය. එදවස් උපදෙස දුයකවූ ශක්‍රදෙවේන්ද්‍රයෝනම් දැන් දිව්‍යස් ඇත්තවුන්කෙරෙහි අග්‍රවූ අනුරුද්ධ ස්ථවිරයෝය. නෙහු සියක් රජදරුවෝ නම් මේ බුදුපිරිසය. එදවස් දෙමව්පිය දෙදෙනාම මෙදවස් සුද්ධොදන මහාමායා දෙදෙනය, එකල ඒසා මහත් ලෝවැඩකලාවූ සුතසෝම රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

අසීතිනිපාත වණ්ණනා නිට්ඨිතා.

526
මූගපක්ඛ ජාතකය

තවද එක්සමයෙක්හි සකල ජනහිත විධායක විශුද්ධ බුද්ධි ඇති කරුණා නිධානවූ සම්‍යක්සම්බුද්ධ සර්‍වඥරාජොත්තමයාන් වහන්සේ සැවැත් නුවර නිසා දෙව්රම් වෙහෙර වැඩවසනසේක් මේ මූගපක්ඛ ජාතක ධර්‍මදෙශනාව තමන්වහන්සේගේ මහාභිනික්මන් අරභයා ගෙණහැරදක්වා වදාළසේක.

එක්දවසක් දම්සභාවෙහි රැස්වන්නාවූ භික්‍ෂූහු බුදුන්ගේ මහාභිනික්මනෙහි ගුණ කියා කියා උන්නාහුය සර්‍වඥයන්වහන්සේ එතැන්හි වැඩ මහණෙනි දැන් මා එන්නාට පූර්‍වභාගයෙහි මේ දම්සභායෙහි කවර කථාවකින් යුක්තව උන්නදැයි විචාරා නුඹවහන්සේගේ මහාභිනික්මනෙහි ගුණ කිය කියා උනුම්හයි කීකල්හි මහණෙනි, දැන් පුරණලද බොධිසම්භාර ඇති මා විසින් රාජ්‍යසම්පත්තිය හැර මහාභිනික්මන්කළ නියාව ආශ්චර්‍යයනොවෙයි මම එනාහි නුමුහුකළාවූ ප්‍රඥාඇතිකල්හිද දුන ශීලාදීවූ සමතිස් පෙරුම් පුරන්නේ මේ රජසැපත් හැර මහාභිනික්මන් කෙළෙම්වේදැයි වදාරා ඒ මහණුන් විසින් ආරාධිතවූ සර්‍වඥයන්වහන්සේ ඉකුත්වත් ගෙණහැරදක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

පෙර බරණැස්නුවර කසීනම් රජෙක් දැහැමෙන් රාජ්‍යයකරන්නේය. ඒ රජහුගේ සොළොස් දහසක් බිසෝවරුන් වූවාහුය. ඔහුන් අතුරෙන් එකද සත්‍රීයක්හට දුවෙක් හෝ පුතෙක් නූපන්නේය. නුවරවාසීන් කියන්නාහු අපගේ රජ්ජුරුවන්වහන්ගේ වංසය රක්‍ෂාකරන්නාවූ පුත්‍රයෙක් නැතැයි කුසජාතකයෙහි ආවාවූ ක්‍රමයෙන් රැස්ව රජහට කියන්නාහු පුතෙකු ප්‍රාර්‍ථනා කරවයි කීවාහුය. රජහුද ඒ සොළොස්දහසක් බිසෝවරුන්ට පුත්‍රයන් පතවයි කීයේය. ඒ ස්ත්‍රීහු චන්ද්‍රසූර්‍යයාදීන්ට වැඳීම් පිදීම් ආදීවූ උපසථානකොට ප්‍රාර්‍ථනා කරන්නාහුද දරුවන් නොලද්දාහුය. ඒ රජහුගේ සිලාචාරාදී ගුණධර්‍මයෙන් යුක්තවූ චන්ද්‍රනම් අගමෙහෙසුන් බිසවක් ඇත. ඒ බිසවුන්ට දරුවන් ප්‍රාර්‍ථනා කරවයි කීයේය.

එකල්හි ඒ චන්ද්‍රාදේවීතොම පෞර්‍ණමී දිනයෙහි පෙහෙවස් සමාදන්ව මිටි ආසනයක සැතපෙන්නී තමාගේ සීලය පරීක්‍ෂාකොට ඔතොමෝ සත්‍යක්‍රියා කරන්නී මම අඛණ්ඩකොට රක්‍ෂාකළ සිල් ඇත්තෙම්ද මේ සත්‍ය වචනය හෙතුකොටගෙණ මට දරුවෝ ඇතිවෙත්වයි මෙසේ සත්‍යක්‍රියා කළහ.

ඇගේ සීලානුභාවයෙන් ශක්‍රභවනය උණුආකාරයක් දැක්විය. සක්දෙව් රජතෙම පරීක්‍ෂාකොට ඒ කාරණය දැන චන්ද්‍රාදේවී පුතකුපැතීය ඇට සුදුසු පුතකු බලනුයේ බෝධිසත්වයන් දුටුයේය. එකල බෝධිසත්වයන්වහන්සේ විසිදහසක් අවුරුදු බරණැස රාජ්‍යකොට එයිනුත් චුතව ඔසුපත්නරකයේ උපන්සේක් අසූදහසක් අවුරුදු එහි පැසී තව්තිසාභවනයෙහි උපන්සේක.

ඒ දිව්‍යලෝකයෙහිද ජීවිතාන්තය දක්වා හිට එයින් චුතව මත්තෙහි දිව්‍යලෝකයෙහි උපදනා කැමතිවිය. ශක්‍රදේවේන්ද්‍රතෙම උන්වහන්සේ

සම්පයට ගොස් කියනුයේ යහළු තොප මිනිස්ලොව උපන්කල්හි තොපගේ පාරමිතාත් පිරෙන්නේය. මහජනයාට මහත්වැඩද වන්නේය. මෙකසීරජහුගේ මේ චන්ද්‍රා නම් අගමෙහෙසුන් බිසවුතොම පුතකු පතන්නී ඇගේ කුස පිළිසිඳ ගණුවයි කීයේය. එකල්හි මහබෝසතානන්වහන්සේ සක්දෙව්රජහුගේ වචනයත් පිළිගෙණ පන්සියයක් දිව්‍යපුත්‍රයන් හා සමග ඒ දිව්‍යලෝකයෙන් චුතව තමන්වහන්සේ ඒ චන්ද්‍රානම් අගමෙහෙසුන්කුස පිළිසිඳගත්සේක. සෙසුදිව්‍යපුත්‍රයෝද අමාත්‍යයන්ගේ භාර්‍ය්‍යාවන්ගේ කුස පිළිසිඳගත්තාහුය බිසවගේ කුස විදුරුපිරුවාක්මෙන් වූයේය. ඒ බිසව්තොම ගැබපිහිටිබැව්දැන රජහට දැන්වූවාහුය රජ ඒ බව දැන ගැබ්පෙරහැර දෙවූයේය. ඕතොමෝ පිරුණු දරුගැබ් ඇත්තීය පින්ලකුණු ඇත්තාවූ පුතකුවැදූවාය එදවසේම ඇමැත්තන්ගේ ගෙවලද පන්සියයක් කුමරුවෝ උපන්හයි කීකල්හි රජ ඇමතිගණ පිරිවරා මතුමහල්තලයෙහි උන්නේය. ඉක්බිති ඒ රජහට ඒ කුමාරයා උපන්බව කීවාහුය ඕහට එබස්අසාම පුත්‍රස්නෙහ උපන්නේය. ඒ ස්නෙහය සිවි ආදිය විනිවිදගොස් ඇට මිදුලු පැහැර සිටියේය. චිත්තාභ්‍යන්තරයෙහි ප්‍රීති උපන්නේය. ලයසිහිල් වූයේය. මාගේ පුත්‍රයාගේ ඉපදීමෙන් තෙපි සතුටුවූදැයි අමාත්‍යයන් විචාළේය එසඳ අමාත්‍යයෝ කුමක් කියනසේක්ද දේවයන්වහන්ස? අපි පෙරපිහිටක් නැත්තම්හ. දැන්වනාහි පිහිටක් ලදුම්හ. අප විසින් හිමිකෙණෙකුන් ලබන ලදැයි කීවාහුය. මාගේ පුත්‍රයාට පිරිවර උවමැනවයි එබැවින් අමාත්‍යකුලයෙහි උපන් කුමරුවන් මෙතෙකැයි බලා නියමදැන එවයි වහා සේන ගුප්තය යන අමාත්‍යයෙකුට නියෝග කෙළේය. ඒ අමාත්‍යතෙම පන්සියයක් කුමරුන් දැක අවුත් රජහට දැන්වීය. එසඳ රාජකුමාර සතුටුව පන්සියයක් කුමාරාභරණ ගමන්කරවා පන්සියයක් කිරිමවුන් ගමන්කරවී. ඉතා උසස් සත්‍රීන්ගේ ඇකයෙහි හිඳ කිරිබොන දරුවන් කර දික්වන හෙයින්ද ඉතා මිටි ස්ත්‍රීන්ගේ ඇකයෙහි හඳ කිරිබොන දරුවන්ගේ කර ලුහුඬුවන හෙයින් ඉතා වැහැරි ස්ත්‍රීයගේ ඇකයෙහි හිඳ කිරිබොන දරුවන්ගේ කලවා රිදෙන හෙයින්ද ඉතා තරවූ සත්‍රියගේ ඇකයෙහි හිඳ කිරිබොන දරුවන්ගේ කකුල් බකලවනහෙයින්ද ඉතාකලු ස්ත්‍රියගේ සරීරය සිහිල්වන හෙයින් හා එලලු ස්ත්‍රියගේ ශරීරය ඉතා උෂ්ණහෙයින්ද හුණු තන ඇති ස්ත්‍රියගේ කිරිබොන දරුවන්ගේ නාසා පැතලිවන හෙයින්ද සමහර ස්ත්‍රීන්ගේ කිරි ඇඹුල් රස හෙයින්ද සමහර ස්ත්‍රීන්ගේ කිරි කුළුරස ආදිවූ වෙන වෙන රස ඇති හෙයින්ද මෙකී සියලු දෙෂ ඇති ස්ත්‍රීන් හැර මධුරවූ කිරි ඇතිසේ තන සිටි සිවුසැටක් කිරිමවුන් බෝසතානන්ට තෝරාදී මහත්වූ සත්කාරකොට චන්ද්‍රා දේවීන්ටද වරයක් දුන්නේය. ඒ චන්ද්‍රාදේවීතොම ඒ වරය කැමැතිවිට ඇර ගණිමියි තොගෙණ තිබුවාය. ඒ කුමාරයාට නම තබන්නාවූ දිනයෙහි ලක්‍ෂණ කියනාවූ බ්‍රාහ්මණයන්ට බොහෝ සත්කාරකොට ඕහට මතු උපද්‍රවයෙක් ඇද්ද නැද්දැයි විචාළේය. ඔහු ඒ කුමාරයාගේ සාමුද්‍රිකා ලක්‍ෂණ සමෘද්ධිය දැක මහරජ්ජුරුවන්වහන්ස! මෙතෙම පින් ඇති කුමාරයෙක. මෝ එක දිවයිනක තබා සතරමහදිවයින රාජ්‍ය්‍යය කරන්ට සමර්ථවන්නේය. මෝහට වනාහි කිසි උපද්‍රවයක් නුදුටුම්හයි කීවාහුය. ඒ බමුණන් කී නිමිති අසා සතුටුවූ රජතෙම කුමාරයාට නම් තබන්නේ මොහු උපන් දවස්හි සියලු කසීරට තෙම වැසි වටහෙයින්ද තමාගේද ඇමති ආදීන්ගේද සිත් තෙමමින් උපන්

හෙයින් තෙමිය කුමාරයයි නම් තුබූවේය. ඉක්බිති එක්මැසි කුමාරයා සරහා රජහුගේ සමීපයට ගෙණගියාහුය. රජතෙම ප්‍රියවූ පුත්‍රයා බලා වඩාගෙණ ඇකයෙහි හිඳුවා සන්තොෂයෙන් සතහා උන්නේය. එකෙණෙහි සොරුන් සතරදෙනෙකු ගෙණාවාහුය. රජ්ජුරුවෝ ඔවුන් අතුරෙන් එකෙකුට කටු සැමිටියෙන් දහසක් පාරදෙවයි කීය. එකෙකු ඇල්කීලෙ ලවයි කීයේය. එකෙකුගේ අත් පා හරුවයි කීයේය. එකකු උල තබවයි නියෝගකෙළේය. මහබෝසතානෝ පියරජ්ජුරුවන්ගේ වධයෙදීම් අසා භයින් තැතිගෙණ මාගේ පියරජ්ජුරුවනන්වහන්සේගේ රාජ්‍යය නිසා නිරයගාමිවූ බොහෝ අකුසල්කොට නැසෙනසේකැයි සිතූසේක. දෙවෙනි දවස් උන්වහන්සේ සේසත යට සරහන ලද ශ්‍රීයහන් මස්තකයෙහි පිණවූවාහුය. ඒ කුමාර මදක් සැතපී පිබිදුනේය. ඇස්හයා සේසත බලන්නේ මහත් ඓශ්වය්‍යී දුටුයේය. සවභාවයෙන්ම අකුශලයෙහි භය ඇත්තාවූ ඔහට ඒ ඓශ්වය්‍යීය දක අධිකතරවූ භයඋපන්නේය. ඒ රාජකුමාරතෙම මම මේ රජගෙට කොතැන්ගිසිට ආයෙම්දැයි ජාතිස්මරණ ඥානයෙන් බලනුයේ දිව්‍යලෝකයෙහි සිට ආබව දැන එයින් ඈතත් බලනුයේ නරකයෙහි පැසුනුබව දුටුයේය. එයිනුත් ඈත බලනුයේ එමනුවර රාජ්‍යය කළබව දුටුයේය. තුමූම විසිඅවුරුද්දක් රාජ්‍යයකොට එකල්හී සිඩවූ අකුශලයෙන් අසූදහසක් අවුරුදු නරකයෙහි පැසුනෙමි. නැවතත් දැන් මේ සිරගෙහිම උපනිමි. මාගේ පියරජ්ජුරුවන් වහන්සේද ඊයේ දවස සොරුන් සතරදෙනෙකු ගෙණා කල්හි ඔවුන්ට කකීශවූ නෙපුල් කියනුයේ තමාත් නරකයෙහි ඉපදීමට සුදුසුවූ බස් කීයේය.

ඉදින් මම මතු රාජ්‍යය කෙරෙම්නම් නරකයෙහි ඉපද මහත් දුක් අනුභවකෙරෙමියි සිතින් සලකන්නානට මහත්වූ භය උපන්නේ. ඔහුගේ රන්වන්වූ ශරීරය අතින්පිරිමදිනාලද පියුමක්මෙන් මලානිකව නිශ්ශොභ වූයේය. මම සිරගෙන් කෙසේ මිදෙම්දැයි සිත සිතා හොත්තේය. පෙර ඔහට එක ජාතියෙක මව්වූ සේසත වසන එක් දෙව්දුවක් ඔහු අස්වසා එම්බල තේමිය කුමාරය! තොප නොබවයි කියා ඉදින් මේ රාජ්‍යසම්පත්තියෙන් මිදෙනු කැමැත්තේ වීනම් නොපිළුව පිළුවව, නොබිහිරිව බිහිරිවව, නොගොළුව ගොළුව, මෙතුන් අංග ඉටාගෙණ යම්සේ නුවණැතිබව නොහගවා අන්තඃපුර පිටිනුවර වාසීජනයාට අඥාන බව දක්වා මේ කාලකන්නි රජ ගෙන් නිකුත් කරවයි කියා නින්ද කරණ පරිද්දෙන් පවත්නෙහීවේද-එසේකල්හි තොපට නොකමැති රාජ්‍යය හැර තපසටයාමෙන් වැඩසිඩවන්නේයයි කීවාය. ඒ කුමාරතෙම දෙව්දුවගේ බස් අසා එම්බල දිව්‍යස්ත්‍රීය! තෝ මට වැඩ පිණිසම කීයෙහිද ඒ තොප කී පරිද්දෙන් කෙරෙමියි කියා තුන්අඟ ඉටාගෙණ ඒ වූපරිද්දෙන් පවත්තේය. එකල්හි පියරජ්ජුරුවෝ ඒ කුමාරයා උකටලී නොවන පරිද්දෙන් ඒ පන්සියයක් සැලැස්වූයේය. ඒ පන්සියයක් කුමරුවෝ කිරට අඬති, මහබෝසතානන් වහන්සේ අපායභයින් භයපත්වූසේක් රාජ්‍යය කිරීමට වඩා නිරාහාරව මියයාම උතුමැයි කිරට නොහඬනසේක. කිරිමව් එපවත් චන්ද්‍රාදේවීන්ට කීවාහ. චන්ද්‍රාදේවී රජ්ජුරුවන්ට දැන්වූවාය. රජ්ජුරුවෝ නිමිති දන්නා බ්‍රහ්මණයන් කැඳවා විචාළේය. බමුණෝ කියන්නාහු දෙවයන්වහන්ස! කුමාරයා කිරිබොනවේලා ඉක්මවා කිරිදෙන්ට වටනේය. එසේ කල්හි ඒ කුමාරතෙම අඬමින් තනය දැඩිකොට නෙමේම කිරි

බොනේයයි කීවාහුය. එතැන්පටන් ඒ කුමාරයාට වේලා ඉකුත්කොට කිරි දෙන්නාහුය. එසේ දෙන්නාහුද සමහර දවසෙක් වේලක කිරි නොදෙති, සම හර දවසෙක දෙවේලෙහිම කිරිනොදෙති, ඒ කුමාරතෙම එසේත් නොහ ඬන්නේය. එසේ කල්හි නොහඬන්නාවූ ඒ කුමාරයා මෑනියෝ හෝ මාගේ දරුවෝ සයින් පීඩිතහයි කිරි පොවති.

සෙසුදරුවෝ කිරි නොලත්කල්හි මහහඬින් හඬති. ඒ කුමාරතෙම එසේ නොහඬන්නේය, නොනිදන්නේය, අතපය නොදික්කරන්නේය, කථා නොඅසන්නේය, එසේකල්හි ඔහුගේ කිරිමවු පිළු අයගේ හස්තපාදයෝ මෙසේ නොවෙති, ගොළු අයගේ හස්තපාදයෝ මෙසේ නොවෙති, ගොළු අයගේ හනු කෙළවර මෙබඳු නොවෙයි, බිහිරි අයගේ කන්සිදුරු මෙසේ නොවෙයි, මේ වූකලී පාවාකොට ගත් දෙයක්වන, ඒ පරීක්ෂාකරම්හයි සිතා පළමුකොට කිරින් පරීක්ෂාකරම්හයි රෑ දවල් කිරි නොදෙති, ඒ කුමාරතෙම කිරිනොබී වියළෙන්නේත් කිරට නොහඬන්නේත් එසේ නොහඬනකල ඔහුගේ මෑනියෝ මාගේ දරුවෝ සාදුකින් පඞිතයෝය. ඔහට කිරිදෙවයි කියා දෙවන්නීය, මෙසේ අතරතුරෙහි කිරිනොදී අවුරුද්දක් මුළුල්ලෙහි පරීක්ෂාකරන්නාහු-මේ කාරණය දුටුවාහුය, නැවත පරීක්ෂාකරන්නාහු බාල දරුවෝ තම් පූපාපූපයට කැමැතිවෙති, ඉන් ඔහු පරීක්ෂාකරම්හයි පන්සියයක් කුමරුවන් ඔහුලඟහිඳුවා නොයෙක් පූපාපූපයන් එලවා ලඟතබා නොප කැමති අවුලක් ගණුවයි සැඟවී සිටියාහුය. එසේකල්හි සෙසු දරුවෝ විවාදකොට ඔවුනොවුන් පහරන්නාහු ඒ ඒ අවුළු ගෙණ අනුභවකෙරෙති, මහබෝසතා නන්වහන්සේ වනාහි එම්බා තේමිය කුමාරයෙනි! නොප නරකයෙහි දුක් කැමැත්තෝද මේ කැවුම් කැමැත්තෝදැයි කියා නරක හයින් හය පත්ව ඒ කැවුම් දිශාවද නොබැලූසේක.

මෙසේඅවුරුද්දක් පූපාපූපයෙන් පරීක්ෂාකොට එයිනුදුසිදුරක් නොදැක බාලදරුවෝ නම් එලාඵල කැමතිවෙතියි බොහෝ එලාඵල ගෙන්නා එයිනුදු පරීක්ෂාකළාහුය. සෙසු කුමරුවෝ සටන්කරන්නවුන් මෙන් එලාඵල උදුරා කති, මහබෝසතානන්වහන්සේ ඒ දිසාවත් නොබලනසේක. මෙසේ එලා එලයෙනුත් අවුරුද්දක් පරීක්ෂා කළාහුය. නැවත බාලදරුවෝ නම් කෙළිබඩු වට ප්‍රිය වෙති, රන්රන් රිදීයෙන් කරණලද ඇත් රූ අස් රූ ආදිය එලවා තුබුවාහුය, සෙසු දරුවන් උදුරාගන්නවුන් මෙන් කෙළිති; බෝසතානන් වහන්සේ එදිසාවත් නොබැලූසේක. මෙසේත් අවුරුද්දක් පරීක්ෂාකළෝය. බෝසතානන් සතර හැවිරිදි වයසට පැමිණිකල්හි සතර අවුරුදු කුම රුවෝ නම් භෝජනයට ප්‍රිය වෙතියි, එයිනුත් මොහු පරීක්ෂාකරම්හයි නොයෙක් ආහාර එලවූහ. සෙසු කුමරුවෝ පිඩු පිඩුකොට අනුභව කෙරෙති. මහබෝසතානන්වහන්සේ වූකලී නරක හයින් හයපත්ව එම්බා තේමිය කුමාරයෙනි! නොප අනර නොලත් ජාති ගණනෙක් නැත, මේ

එබඳුකොට සලකවයි අහර තුබූ දිශාවත් නොබැලූසේක. කිරිමව් තමන් සිත් නොසැහෙන්නත් තුමූම අතින්ගෙණ වළඳවූවාහුය. ඉක්බිති පස් හැවිරිදි කුමරුවෝ තම් ගින්නට භය ඇති හෙයින් මොහු විමසම්හයි නොයෙක් දොර ඇති මහත් ගෙයක් කරවා තල් කොළින් සොයා සෙසු කුමරුවන් හා සමග බෝසතානන්වහන්සේ ඒ ගෙමැද හිඳුවා ගේ ගිනි ලැවූවාහුය. සෙසු කුමරුවෝ හඬාගෙණ නික්මුණාහුය, මහබෝසතානන් වහන්සේ වනාහි නරක ගින්නෙන් පැසීමට වඩා මේ උතුමැයි නිරොධ සමාපත්තියට සමවත්තාක් මෙන් නිශ්චලව උන්සේක. ඉක්බිති ගිනි එන කල්හි එයින් පහකළාහුය, ඉක්බිති සාවිරිදි කල්හි සාවිරිදි කුමාරයෝ තම් මතැතුන්ට බාහි, ඇතුන් හික්මවා තෙසු කුමරුවන් පිරිවරා රජගෙයි මලුවෙහි හිඳුවා ඇතුන් මුදකි, ඔවුහු කුංචනාද කොට සොඬ බිම ගසා දිව එති, සෙසු කුමරුවෝ මහා භයින් භයපත්ව ඒ ඒ දිග දිවති, මහ බෝසතානන්වහන්සේ නරක භයින් භයපත්ව එහිම වැඩහිඳුනාසේක. හික්මුණු ඇත්තෙම උන්වහන්සේ සෙඹින්ගෙණ ඇත් මැත්කොට සොඬ මිරිකාම යන්නේය, සත්හැවිරිදි කාලයෙහි කුමරුවන් උන් බෝසතානන් සමීපයට දළ උපුටා මුඛ බැඳ සර්පයින් ඇරියාහුය, සෙසු කුමරුවන් මහ හඬින් හඬා දිව එති මහබෝසතානන්වහන්සේ නරක දුක් විඳීමට වඩා සර්පයාගේ මුඛයෙන් විනාශවීමම උතුමැයි නිශ්චලව හිඳිනාසේක. සර්පයෝ සියලු ශරීරය වෙලා මුදුන්හි පෙණකොට හිඳිති, එසේත් නිශ්චලවම උන්සේක.

මෙසේ අතරතුරෙහි පරීක්ෂාකරන්නෝත් සිදුරක් නුදුටුවාහුය.

ඉක්බිති අටහැවිරිදි කුමරුවෝ තම් නළුනාටක කැමැත්තෝයයි පන් සියයක් කුමරුවන් හා සමග ඔහු රාජාඞගනයෙහි හිඳුවා නළුනාටක පැවැත්වූවාහුය, කුමරුවෝ නැටුම් ආදීය දැක යහපතැයි යෙති, උපන් නොපට ඇසිල්ලකුත් සිනාවෙක් වත් සොම්නසෙක් වත් නැත්ම වේදැයි නරක දුක් සලකා නැටුම් නොබලා නිශ්චලව හිඳිනාසේක. මෙසේ අතර තුරෙහි පරීක්ෂාකොටත් සිදුරක් නොදැක නැවත මොහු කඩුවෙන් පරීක්ෂා කරම්හයි කුමරුවන් හා සමග රජගෙයි මලුවෙහි හිඳුවා ඔවුන් කෙළනා කල්හි එක් පුරුෂයෙකු යවති. ඒ පුරුෂතෙමේ දැවතසේ සුදුවූ කඩුවක් ඉස සිසාරමින් පැන පැන නාදකරමින් කසී රජ්ජුරුවන්ගේ එක් කාල කන්නි පුතෙක් ඇත්ල, ඒ කොයිද? ඔහුගේ හිස මේ කඩුවෙන් සිඳිමියි දිව ආයෑ ඔහු දැක සෙසු කුමරුවෝ මහහඬින් හඬා පලාගියාහ, බෝසතානෝ චූකලී නරක දුක් සලකා නොදන්නක්හු මෙන් නිශ්චලව උන්සේක. ඉක්බිති ඒ පුරුෂතෙම කඩුවෙන් ඉස පිරිමැද තොපගේ ඉස බොටුවෙන් කපමියි භයගන්වා චලිතකොට ගතනොහී පහවිය. මෙසේත් අතරතුරෙහි විමසා සිදුරක් නොදුටුවාහුය, දසඇවිරිදි කල්හි වනාහි මොහුගේ බිහිරිබව විමසම්හයි බෝසතානන්වහන්සේ නෝනා ඇඳ තිරයකින් වට කරවා සතරපිට සිදුරු සතරක් තබ්බවා ඔහු නොදක්වාම යට ඇඳ සක් පිඹින්නන් හිඳුවා එකපැහැර සක්පුඹවති, රජගෙට එකතින් නාදවන් නේය, අමාත්‍යයෝ ඇඳ සතරදිසාවෙහි සිට තිරයෙහි සිදුරෙන් බලා එක

දවසකුත් බොධිසත්ත්වයන්ගේ සිහි නැතිවීමක්වත් අතපය දිගුකිරීමක්වත් නුදුටුවාහුය, මෙසේ අවුරුද්දක් ගිය කල්හි නැවත අනික් අවුරුද්දක් එසේම බෙරහඬින් විමසන්නාහු, අතුරක් නුදුටුවාහුය. ඊට ඉක්බිත්තෙන් පාතින් පරීක්ෂාකරම්හයි රාත්‍රිභාගය අඳුරෙහි අතපය සොල්වන්නේ තොවේ දැයි කළය ඇතුළෙහි පහන් අවුළුවා සෙසු පහන් නිවා මදක් අඳුරෙහි ඉඳුවා කළයෙන් පාතගෙණ එකවිටම එළිකොට ඉඳීම් සිටීම් ඇත්තේ දෝහෝයි විමසති. මෙසේත් අවුරුද්දක් විමසන්නාහු ඔහුගේ මදකුත් අතපය සෙලවීම් නුදුටුවාහුය.

ඉක්බිති පැණියෙන් විමසම්හයි සියළු ශරීරය පැණිත් ගල්වා බොහෝ මැස්සන් ඇතිතෙනක පිණවා මැස්සන් උගුළවති, ඒ මැස්සෝ ඔහුගේ ඇඟ වසාගෙණ ඉදිකටුවෙන් විදිනාක්මෙන් විදිති, එතෙම නිරොධ සමාපත්තියට සමවන්නාක්මෙන් නොසැලෙන්නේය. එසේත් අවුරුද්දක් විමසන්නාහු ඔහුගේ සිදුරක් නුදුටුවාහුය, ඉක්බිති ඔහු තුදුස් අවුරුදුවූ කල්හි දූත් මේ තෙම මහත්වූයේය, පවිත්‍ර කැමැත්තේය, අපවිත්‍රයට පිළිකුල් කරන්නේය, එහෙයින් අසුචියෙන් විමසම්හයි එතැන්පටන් ඔහු නොනාවති අතපය පිරිසිදු නොකරවති, එතෙම මළමූත්‍රකොට එහිම සැතපෙන්නේය, දුගීඞයෙන් ඔහුගේ අතුනුබහන් පෙරලෙන කලක් මෙන් වූයේය. එකල්හි ඔහු ඇඟ මැස්සෝ වසාගෙණ කති, එම්බා තේමිය කුමාරයෙනි! තොපි මහත්ව ගියව හැමකල්හි කවරෙක් තොප අතපය පිරිසිදු කරන්නේද? තොපට ලජ්ජා නැත්තේ කිම්ද? කුමක්හෙයින් සැතපෙව්ද, නැගීසිට තොපගෙ සිරුරු පිළිදූගුම්කරවයි කියා නින්දාකෙරෙති, එතෙම එබඳු පිළිකුල් එබඳු අමෙධ්‍යයෙහි ගැළුනොද සියක් යොදනෙන් ඇත සිටියවුන්ගේ දුගීඞයෙහි ගඳින් බඩ පෙරලෙන තරම්වූ අමෙධ්‍ය නරකයෙහි දුගීඞය සලකා උපෙක්ෂාවූයේය. සෙමෙන් අතරතුරෙහි අවුරුද්දක් පරීක්ෂා කරන්නාහුය, ඔහුගේ සිදුරක් නදුටුවාහු, උෂ්ණයෙන් පීඩිතව වේදනා සහනයකොටගත නොහී චලිත වීමක් දක්වූයේ වීනම් යෙහෙකැයි සිතා ඉක්බිති ඔහු හොත් ඇඳයට ගිනි කබල් තිබුවාහුය. ඇඟ පෙළවෙන් බිබිතැංගේය, එහෙත් මහබෝසතානන් අවීචිමහනරකයෙහි ගිනිදැල් සියක් යොදුනෙහි පැතිරසිටිනේ ඒ නරකයෙහි ඉපද විඳිනා දුකට වඩා මෙදුක් සියක් ගුණයෙන් දහස් ගුණයෙන්ද ඉතා උතුමැයි ඉවසා නිශ්චලවූසේක.

ඉක්බිති ඔහුගේ මව්පියෝ ලය පැලීයන්නාක්මෙන් සෝකව මිනිසුන් පහකරවා ඔහු ඒ ගින්නෙන් පහකොට පුත තෙමියකුමාරයෙනි අපි තොපගේ නොපිළිබැව් ආදිය දනුම්හ, ඒ එසේමය; ඒ පිළිආදීන්ගේ පය මූව කන්සිදුරු මෙබඳු නොවෙයි, තොපවනාහි ප්‍රාර්ථනාකොට ලත් පුතෙක, අප නොනසව සියළු දඹදිවෙහි රජුන්ගේ සමීපයෙන් වන නින්දායෙන් අප මුදවයි යාචඤා කළාහුය, ඒ කුමාරතෙම ඔවුන් විසින් මෙසේ යාචඤාකරණලද්දේය. නොන සන්නක්හු මෙන් නිශ්චලවම හොත්තේය. ඉක්බිත්තෙන් ඔහුගේ මව්පියෝ අඬමින් එනතින් පහවයෙති, සමහරකලෙක පියරජ තනිවගොස් යාචඤාකරන්නේය, සමහරකලෙක මැනියෝ හෝ ගොස් යාචඤාකෙරෙති, මෙසේ අවුරුද්දක් මුළුල්ලෙහි විමසන්නාහුද අතරතුරෙහි ඔහුගේ සිදුරක් නුදුටුවාහුය, ඉක්බිති

සොළොස් වයස් පිරුණුකල්හි කොර අය වේවයි ගොළු බිහිරි අය වේවයි මුහුකළ වයස් ඇළුම් කටයුතු දෙයෙහි නොඇලෙන්නාහුද අප්‍රිය වස්තුවෙහි ප්‍රියවන්නාහුද නැත, මල් පිපෙන්නාක්මෙන් මෙතෙම ලෝක සවභාවයෙක, එහෙයින් මොහුගේ සමීපයට නාටක ස්ත්‍රීන් ගමන් කරවා පරීක්‍ෂා කරම්හයි සිතා ඉක්බිති දෙවගනන්බඳුවූ උතුම් රූ ඇති ස්ත්‍රීන් කැඳවා තොප අතුරෙන් යම් සත්‍රියක් කුමාරයෝ සතුටු කරවන්ටවත් ක්ලෙශබන්ධනයෙන් බඳින්ටවත් හැකිවේද ඕම ඕහට අගමෙහෙසුන් වන්නීයයි කියා කුමාරයා සුවඳ පැනින් නහවා දෙව්කුමරුවකුමෙන් සරහා දෙව්විමනක් බඳුවූ ශ්‍රී යහන්ගබඩාවෙහි මනාකොට තනවනලද යහන් මත්තට වඩා සුවඳ දම් මල් දම් දුම් සුවඳ ආදී යෙන් මුළු ගබඩාව එක සුවඳ පිඩක් මෙන් කොට ඉක්බිති ඒ නාටක ස්ත්‍රීහු ඔහුපිරිවරා නැටීම් ගීකීම් මියුරුබස් කීම් ආදීවූ නොයෙක් ආකාරයෙන් සිත් පොළඹවන්ට උත්සාහකළාහුය. තේමිය කුමාරතෙම තමා නුවණැති බැවින් එසේ නොයෙක් ආකාරයෙන් සිත්ගන්ට උත්සාහකරණ ස්ත්‍රීන් බලා මොහු මාගේ ශරීරයෙහි සුවඳපස් නොවින්දහෙත්වයි සුසුම් රඳවා මළ මිනියක්සේ දැඩිකෙළේය. එවේලෙහි ස්ත්‍රීන් පහස්වින්ද නොහී මේ කුමාරතෙම සම්ප්‍රකාර යෙන්ම දැඩිවූ සවභාව ගුණ ඇත්තෙම් ඒකාන්තයෙන් තද එකෙකැයි මව් පියන්ට දන්වූය. මෙසේ අතරතුරෙහි විමසන්නාවූ මව්පියෝ ඔහුගේ අතුරක් නුදුටුවාහුය.

මෙසේ සොළොස් අවුරුද්දක් මුළුල්ලෙහි සොළොස් මහා පරීක්‍ෂාවකින් හා නොයෙක් කුඩා පරීක්‍ෂාද කරන්නාහු දුතගත නුහුනුවාහුය. ඉක්බිති පියරජ්ජුරාවෝ කළකිරී නිමිත්තපාඨකයන් ගෙන්වා තොපි කුමාරයා උපන් දවස් මෙතෙම මහත් පිණැත්තේය. මෝයව උපද්‍රවයක් නැත්තේයයි කීවාය. එතෙම දැන් කොර ගොළු බිහිරි වූයේය. එහෙයින් තොපගේ කථා සම්නොවන්නේයයි කීවාහුය, එකල්හි බමුණෝ කියන්නාහු මහ රජ අප විසින් නොදත් දෙයක් නැත, එතකුදුවුවත් නුඹවහන්සේ විසින් පතා ලත් දරුවන් කාලකන්නියයි කී කල්හි නුඹවහන්සේලාට දොම්නස් උපදනේයයි සිතා නොකීවූහයි කීවාහුය. දැන් කුමක් කරමෝදැයි බමුණන් අතින් විචාළ කල්හි බමුණෝ කියන්නාහු මේ කුමාරතෙම මේ රජගෙයි වසන්නේ වීනම් නුඹවහන්සේගේ ජීවිතයට හෝ රාජ්‍යයට හෝ අගමෙහෙසුන් බිසවට හෝ උපද්‍රව වන්නේය. එසේහෙයින් අවමඟුල් රථයකට අවමඟුල් අසුන් යොදා එහි ඔහු හිඳුවා බස්නාහිර දොරින් නිකුත්කොට අමුසොහොනෙහි වළලන්ට යහපතැයි වටනේයයි කීවාහුය, රජතෙම උපද්‍රව අසා භයින් යහපතැයි ගිවිස්සේය.

චන්ද්‍රාදේවී එපවත් අසා රජහු කරා පැමිණ රජ්ජුරුවන්වහන්ස නුඹ වහන්සේ විසින් පළමුවෙන් මට වරයක් දෙනලද ඒ වරය දැන් මට දුනමැන වයි කීවාය. රජහු විසින් තොප කැමති වරය ගණුවයිකී කල්හි මාගේ පුත්‍ර යාට රාජ්‍යය. දෙවයි කීවාය, දෙවීනි තොපගේ පුත්‍රතෙම කාලකන්නියෙක, එහෙයින් රාජ්‍යය දිය නොහැක්කේයයි කීයේය. එසේහෙයින් මහරජ්ජුරු වන්වහන්ස දිවිහිමියෙන් නොදෙනසේක් වීනම් සත්අවුරුද්දකට දුනමැන වැයි ඉල්ලා එසේත් නොලැබ සාවුරුද්දකටය පස්අවුරුද්දකටය යනාදී ක්‍රම

යෙන් පසළොස් දවසක් දක්වා ඉල්වා එසේත් නොලැබ ඉක්බිති සත්දවස කට දෙවයි ඉල්වාගෙණ ඕතොමෝ රාජකුමාරයන් රාජකුමාරාභරණයෙන් සරහා තේමිය කුමාරයන්ගේ රාජ්‍යයයි නුවර බෙරලවා නුවර සරසවා පුත්‍රයා ඇතුපිට තබාගෙණ සේසත මුදුනට කරවා නුවර පැදකුණුකොට ආවාහු ඔහු ශ්‍රීයහන් මත්තෙහි සතප්පවා පුත තේමිය කුමාරයෙනි තොප නිසා සොළොස් අවුරුද්දක් නිදිනොලැබ හඩන්නාවූ මාගේ ඇස් විලුස්සගියේය. සෝකයෙන් ලය පැළෙන්නාක්මෙන් විය. තොප කොර පිළු ගොළු බිහිරි බැව් ආදිය නොවනබව දනිමි. තොප මා අසරණ නොකරවයි සියළු රාත්‍රිය මුළුල්ලෙහි යාච්ඤාකළාය, මෙම ක්‍රමයෙන් දවසින් දවස පස්දවසක් යාච්ඤාකළාය සවැනි දවස් රජතෙම සුනන්දනම් රථාචාර්‍යයා කැඳවා එම්බල රථචාර්‍යය! තෝ සෙට උදැසන අවමගුල් රථයක් අවගුමල් අසුන් යොදා කුමාරයා එහි තබාගෙණ බස්නාහිරි වාසල් දොරින් ගෙණගොස් අමුසොහොනෙක්හි සිව්රැස් වළක් කැන ඔහු ඒ වලෙහි ලා උදලු පිටින් ඔලුව තලා මරාපියා මුදුනෙහි පස්ඔබා ඉස්සෝද තහා එවයි විධාන කෙළේය, සවෙනි රාත්‍රියෙහිද යාච්ඤාකරන්නාවූ මෑනියෝ පුත තේමිය කුමාරියෙනි! කාසිරජතෙම සෙට තොප අමුසොහොනෙක්හි වළලන්ට නියෝගකෙළේය. සෙට මරණයට පැමිණෙව දරුවෙනි!යි කීවාය. ඒ අසා එම්බා තේමිය! තා විසින් සොළොස් අවුරුද්දක් කළ වීර්‍යය මුදුන් පැමිණෙන්නේයයි සිතන්නාවූ මහබෝසතාණන් වහන්සේට ප්‍රීති උපන්නේය. මෑනියන්ට ලය පැළෙන්නාක්මෙන් ශෝක උපන්නේය, එසේ කල්හිද මාගේ සිත මුදුන් පැමිණියේයයි මෑනියන්ට කථා නොකළසේක. ඉක්බිති ඒ රාත්‍රිය පහන්වූකල්හි උදෑසනම "සුනන්ද" නම් රථාචාර්‍ය තෙම රථය යොදාගෙණ දොරකඩ තබා ශ්‍රීයහන් ගබඩාවට වැද දේවීනි! මට නොකිපෙව, රජහුගෙන් නියෝග ලදින් ආමියි ඉවත්වුව මැනවයි පුතානුවන් සිප ගෙණ හොත් මෑනියන් පිටිඅත්ලෙන් ඉවත්කොට කුමාරයා මල්කලඹක් මෙන් වඩාගෙණ මාලිගාවෙන් බස්නට වන; මව් බිසව් ලෙහි අත්ගසාගෙණ මහ හඩින් මතුමහල් තෙලෙහි උත්හ; වැටීහුනු මෑනියන් දක මා බැණනොතැගිකල්හි ලයපැළී මිය ගියොත් අලාභය, බැණතැගෙම්ද්‍යෝහෝයි සිතා ඉදින් බැණතැගෙම්තම් සොළොස් අවුරුද්දක් ගත්දුක් සිස්වන්නේය. බැණ නොතැගෙන්නේය, දෙමව්පියන්ටත් මටත් පිහිටවෙයි ඉවසූසේක. ඉක්බිති රථාචාර්‍යයා සවාමිදරුවන් රථයෙහි ලාගෙණ බස්නාහි වාසල් දොරට අභිමුඛව පැද්දේය, රථසක එලිපතෙහි වැද ගියේය, මහබෝසතාණන් වහන්සේ රථසකයෙහි අඩ අසා මාගේ සිත මුදුන් පැමිණියේයයි ඉතා සතුටුවූසේක.

රථය නුවරින් නික්ම දෙවියන්ගේ මහිමයෙන් දොළොස් ගව්වක් ගිය කල්හි ඒ තැන සුපුෂ්පිත වන ලැහැබක් අමුසොහොනෙකැයි සිතා වළලන්ට මෙතැන යහපතැයි සිතා මාවතින් ඉවත්කොට රථය තබා රථයෙන් බැස බෝධිසත්ත්වයන් වහන්සේගේ ආභරණ පොදියක් කොට තබා උදැල්ල ගෙණ නුදුරු තැනක වළ කනන්නට පටන්ගත. එවේලෙහි සවාමිදරුවෝ උත්සාහ කරන්ට කලැයි සිතා සොළොස් අවුරුද්දක් අතපය නොසෙල්වූයෙමි, කිමෙක් ද්‍යෝහෝ මට අතපය වසඟ වේද්‍යෝ? හෝයි බලන පිණිස නැගී සිට වමතින් දකුණතද, දකුණතින් වමතද, දෑතින් දෙපයද මිරිකා රථයෙන් බස්නා කැමතිව එකෙණෙහිම රථයෙන් බැස ඔබ මොබ

සක්මන්කොට මෙසේම යෙම් තම් එකද සාරසියයක් ගව් යන්ට ශක්ති ඇත්තෙම්යි දැන ඉදින් මේ රථචාර්‍යයී තෙම මට විරුඬ වීතම් මැඬ පවත්වන්ට මට ශක්ති ඇත්තෝද්‍යෝ? හෝයි පරීක්‍ෂා කරණු පිණිස රථය පසු කෙළවර අල්වා පැටින් කෙළතා යහතාවක් සේ මත් උසුවා එබඳු ශක්ති ඇතැයි දැන සිටි ඒ බෝසතානන්ට ආභරණයෙන් සදම්යි සිත් උපන; මෝහට මිනිස් පලඳනාවෙන් කම් කිම්දැයි දිව පලඳනා හා සමග සක්දෙව් රජහුගේ නියෝගයෙහි විශ්වකර්‍මයා එවූයේය. ඒ අවුත් දහසක් සළුපටින් ඉස වෙළුම් බැඳ නොයෙක් නිර්මිත පලඳනාවෙන් සක්දෙව් රජහු මෙන් සරහා ගියේය.

ඔහු ගියපසු රථාචාරීහු වළ කණන තැන සමීපයට ගොස් රථාචාර්‍යයීයා හා සමග කථාකරණසේක් රථාචාර්‍යයීය! යුහුව කුමක් නිසා වළා කන්නීද? වළ කැන ගතයුතු අළු ජාතියක් පෙණෙන්නේ නැත, අමුතුව වළ සඟවාලිය යුතු දෙයක් පෙණෙන්නේත් නැත, මා විසින් විචාරණ ලද සබඳ! තෝ කිය; වළින් තට ප්‍රයෝජන කිම්දැ? යි විචාළසේක.

එබස් ඇසූ රථාචාර්‍යයීයා වළ සාර සාරා උඩ නොබලාම කසී රජහුගේ කොර පිළිවූ ගොළු බිහිරිවූ සිත්පිත් නැත්තාවූ පුතෙක් උපන, ඔහු වළලන පරිද්දෙන් නියෝග අසාගෙණ රථයකින් ගෙණහැර මෙතැන තබා වළ කනිම්යි කීය, එබසට එම්බල රථාචාරිය! මම ගොළු වූයේමුත් නොවෙමි, බිහිරි වූයේමුත් නොවෙමි, කොර පිළු වූයේත් නොවෙමි. ඉදින් සැක ඇත්තේ වීතම් රන් කෙහෙල් කඳක් වැනි මාගේ කලවා බලව, ඒරාවන යාගේ සොඬ වැනි මාගේ අත් සඟළ බලව! කුරවීක තෙපුල් වැනි මියුරු තෙපුල් අස! කොර පිළු ගොළු බිහිරිවූ පුතෙකු වළලන්ට රජහු නියෝගකළ බවමුත් මාගේ ලක්‍ෂණ සම්පත්ත දිව කුමරුවකු වැනි පුතනු කෙණෙකුන් වළලන්ට මපියානන් වහන්සේ නොවදාරණසේක් ඔබ නො කීවා කරන්නාවූ තෝ අධර්‍මයක් කරන්නෙහියයි සිතම්යි කීසේක. එබස් අසා රථාචාර්‍යයී තෙම කර ඔසවා බලන්නේ රුවින් අගපැමිණියාවූ ඒ කුමාර යන් දැක දේවතාවෙක් දෝහෝයි තෝරාගත නොහී විචාරන්නේ සවාමීනි! නුඹවහන්සේ ගාන්ධර්ව දිව්‍යපුත්‍රයාන කෙණෙක්ද? ශක්‍ර දේවේන්ද්‍ර කෙණෙක්ද? කාගේ පුතනු කෙණෙක්දැයි විචාළේය.

එබස් අසා ගාන්ධර්ව දිව්‍යපුත්‍රයෙකුත් නොවෙමි, සක්දෙව් රජත් නොවෙමි, යම් රජෙක්හුගේ පුතෙකු වළලන්ට ගෙණායේ වීතම් කසීරජ හුගේ පුත්වූ ඒ තා කියන "තේමිය" කුමාරයෝ නම් මමය. සැතපුනු රුකින් පතක්බිඳීම මිත්‍රධර්‍මය නොවෙයි, තට බත්දෙන රජ්ජුරුවෝ සැතපෙන රුක වැන්නේය. මම ඒ රුකෑ ශාඛාවක් වැන්නෙමි. තෝ ඒ රුක් සෙවනැ සැතපුණු එකෙක් වැන්නෙහිය, සැතපුණු පතක් බිඳින තැනැත්තහු මිත්‍ර ද්‍රොහි වන තම බත් පිළිදී රක්නා රජහුගේ පුත්වූ මට මේ සා මහත් අපරාධයක් සිතන්නාවූ තෝ කෙසේ නම් මිත්‍රද්‍රොහි නොවේදැයි වදාළ සේක. මෙසේ බෝසතාණන් කියන කල්හිත් අදහා නොගන්නේයයි, ඉක්බිති බෝසතානන් වහන්සේ මොහු මාගේ කථාව අදහවම්යි වත

දෙවියන්ගේ සාධුකාරයෙන් හා තමන්වහන්සේගේ කටහඬින් ඒ වනය එකනින් නාද කෙරෙමින් ගාථා දසයකින් මෙසේ මිත්‍රගුණ වදාළසේක.

එම්බල රථාචාර්යය! මේ ලෝකයෙහි යමෙක් තමාට වැඩකරන්නාවූ මිත්‍ර ජනයාට ද්‍රෝහ නොකෙරේද, හෙවත් හීන සිත් නැත්තේවේද, ඒ පුරුෂතෙම තමාගෙන් නික්ම අන් තැනකට ගියෙත් නිදුකින් බොහෝ කන බොන දෙය ලබන්නේද, ඔහු නිසා බොහෝ දෙනා ජීවත්වන්නාහුද වෙති. නැවත යම් දනව්වකට හෝ නියම්ගමකට හෝ වේද ඒ ගිය ගිය තන්හි බොහෝ ජනයාගෙන් පූජා ලබන්නේය.

තවද ඒ මිත්‍රද්‍රෝහිනොවන්නාවූ පුද්ගලයා සොරහුද මැඩපැවැත්තනොහෙන්නාහුය. අපරාධ ඇතත් රජදරුවෝද ඔහට අවමාන නොකොට වැහෙන්නාහු වෙති. තෙමේ සියලු සතුන් මැඩපවත්තේය. තමාගේ ගෙටද පවා කිපී සිත් නැතුවම එන්නේය. මහජනයන් උන් සභාවට පැමිණි කල්හිද මිත්‍ර ද්‍රෝහී ජනයාගේ ගුණ කියනු අසා තමාගේ ගුණයෙන් තෙමේ ඉතා සතුටු වන්නේය එබඳුවූ පුරුෂතෙම තමා සිත ක්‍රෝධ නැතියෙයින් අනුන්ට සත්කාරකොට තෙමේත් සත්කාරලබන්නේය. අනුන්ට ගෞරවකොට තෙමේත් උන්ගෙන් ගෞරව ලබන්නේය. තමාගේ ගුණ කථාව හා ස්තුති ඝොෂාව නොනසා රක්‍ෂාකරන්නේය. මිත්‍රද්‍රෝහි නොවන්නාවූ පුරුෂතෙම තමා උපකාරී හෙයින් පූජාකටයුත්තව පූජාකොට තෙමේත් සත්කාර ලබන්නේය. අනුන්ට ගෞරවකොට තෙමේත් උන්ගෙන් ගෞරවය ලබන්නේය. තමාගේ ගුණකථාව හා ස්තුති ඝොෂාව නොනසා රක්‍ෂා කරන්නේය.

බුද්ධාදීවූ මහතුමන්ට නමස්කාර කිරීමෙන් පරලොව තෙමේත් නමස්කාර ලබන්නේය. මහත් පරිවාර සම්පත්තියට හා කථාවට පැමිණෙන්නේය. මහත් ගිනිකඳක් මෙන් තේජසින් දිලිහෙන්නේය. දේවතාවකුමෙන් ශරීර වර්ණයෙන් බබලන්නේය. ඓශ්වර්යයෙන් නොපිරිහෙන්නේය. ඔහට ගෙරිසරක් බොහෝ වෙති, කෙතවන වපුල බිජු නොනැසී පලදෙන්නේය. බොහෝ දූදරුවන් පලදෙන්නේය, මිත්‍රද්‍රෝහි නොවන්නාවූ ඒ පුරුෂතෙම යම් කලෙක පර්වතයකින් හෝ ප්‍රපාතයකින් හෝ රුකකින් හෝ වැටුනොත් අතර පිහිටක් ලබන්නේය. යම්සේ හාත්පස හටගත් මුල් ඇසටු හා අරළු ඇති මහත් නුගරුකක් මාරුතය යම්සේ උදුරා හෙලිය නොහේද, එසේම මිත්‍රද්‍රෝහී නොවන්නාවූ ඒ පුරුෂයා සතුරෝ මැඩපැවැත්ත නොහැක්කාහුවෙති. එසේහෙයින් සුතනඳ තා විසිනුදු මිත්‍රද්‍රෝහී නොකොට යුත්තේයයි වදාළසේක. එකල්හි සුතනඳ නම් රථාචාර්යයා මෙසේ බණ වදාරන්නාවූ ඒ මහබෝසතානන් හැඳිනගත නොහී මේ කවරෙක්දැයි විමසනු පිණිස රථය බලා එහි තෙමිය කුමාරයනුත් ආභරණත් නොදක නැවත අවුත් බලන්නේ බෝසතානන් හැඳින පය වැඳගෙන නැගිට දෙහොත්මුදුනේ බැඳ කියනුයේ:-ස්වාමීනි රාජකුමාරයන්වහන්ස! නුඹවහන්සේ මාගේ බසින් දැන් නුවරට මා හා කැටිව වැඩියමැනව. නුඹවහන්සේගේ පියරජ්ජුරුවන්ගේ මාලිගාවට මා කැඳවා යමියි කීයේය. එකල්හි බෝසතානෝ එම්බල රථාචාර්යය! තා විසින් කියනලද ඒ රාජ්‍යයෙන්ද නෑයන්ගෙන්ද මට කම් නැත. රාජ්‍ය නම් අධර්මයෙන්ම ලැබෙන දෙයෙකැයි වදාළසේක. එබසට රථාචාර්යය

තෙම ස්වාමීනි! රාජකුමාරයන්වහන්ස! නුඹවහන්සේ මාගේ බසින් දූන් නුවර රට වැඩිසේක් වීනම් සත්රුවන් වැසි වස්නාක්මෙන් නුවර වැස්සෝද නුඹවහන්සේගේ මව්පිය දෙදෙනාද මට බොහෝ සතුටුපඬුරු දෙති, ඔහු මතු නොවෙයි අන්තඃපුර ස්ත්‍රීහුද රාජකුමාරයෝද බ්‍රාහ්මණයෝද වෛශ්‍යයෝද සතුටුව මට පඬුරු දෙන්නාහු වෙති. ඇතරුවෝද අසරුවෝද රථාචාරීහුද පාබලසෙනගද යන සියල්ලෝම සතුටු සිතින් මට පඬුරු දෙන්නාහු වෙති. ඔහු පමණක් නොවෙයි, බොහෝ දනව්වැස්සෝද රැස්ව පඬුරු දෙන්නාහු වෙති, එසේහෙයින් මා කෙරෙහි කරුණාවෙන් වැඩ වදාළ මැනවැයි යාච්ඤා කෙළේය. එබසට මහබෝසතාණන්වහන්සේ එම්බල රථාචාර්‍යය! මම මව් පිය දෙදෙනා විසින්ද හරණලද්දෙමි. නියම්ගම් වැස්සන් හා රටවැස්සන් විසිනුත් හරණලද්දෙමි. නැවත සියලු රජකුමරුවන් විසිනුත් හරණලද්දෙමි. මා සනාතක ගෙයකුත් එනුවරෙහි නැත්තේවිය. වර ඉල්වා දරුවන්ට රාජ්‍ය සම්පත්ති දෙන මෑනියන් විසිනුත් මම් හරණලද්දෙමි. එසේම ස්නෙහ ඇති පියරජ්ජුරුවන් විසිනුත් මම් නිරපෙක්ෂව හරණලද්දෙමි. එබැවින් හුදකළාව මේ වළට පැමිණියාවූ මම පැවිදිවනු කැමැත්තෙමියි වදාළසේක. මෙසේ තමාගේගුණ සිහිකරන්නාවූ බෝසතාණන්ට ප්‍රිය උපන්නේය. ඒ ප්‍රීති වේගයෙන් උදන් අනනසේක් එම්බා රථාචාර්‍යය! කල් බලා ක්‍රියා සිඩියට යුහුසුළු නොවන මනුෂ්‍යයන්ගේ ආශාඵලය සිඩවන්නේය. ඒ එසේමය, මම සොළොස් අවුරුද්දකින් සිඩවූ මනොරථය ඇත්තෙමි.

තවද එම්බල රථාචාර්‍යය! ඉතා ශීඝ්‍රනොව ක්‍රමයෙන් උපමායෙන් අභීසිඩිය කැමැත්තවුන්ට මනාවූ වැඩක්ම සිඩවන්නේය. ඒ එසේමය; කිසිභයක් නැතුව මේ ගිහිගෙයි බන්ධනයෙන් නික්මුණාවූ මම සමෘද්ධවූ මනොරථය ඇත්තෙමි. මාගේ අදහස මෙසේම දනුවයි වදාළසේක. එකල්හි රථාචාරීතෙම ස්වාමිනි, තෙමිය කුමාරයන් වහන්ස! ගොළු නොවන කිසිපැකිලීමක් නැති ලීලායෙන් යුක්ත මෙබඳු මධුර තෙපුල් ඇත්තාවූ නුඹවහන්සේ කවර හෙයකින් මව්පිය දෙදෙනාගේ සමීපයෙහිදී කථාවක් නොකළසේක්දැයි විචාළේය. එබසට බෝසතාණෝ එම්බා රථාචාර්‍යය! මම කලවා ආදීන්ගේ ශුෂ්කවීමක් නිසා කොරවූයේත් නොවෙමි, ශ්‍රොත්‍රප්‍රසාදය නැත්තෙන් බිහිරිවූයේ මූත් නොවෙමි, දිව නොපෙරලෙන්නේන් ගොළුවූයේත් නොවෙමි, එහෙකුදුවූවත් පෙර මේ බරණැස් නුවර රාජ්‍යයට පැමිණ විසි අවුරුද්දක් රාජශ්‍රී අනුභව කොට එහි කරණලද පව්න් නරකයෙහි ඉපද අසූදහසක් අවුරුදු පැසී මහ දුක් වින්දෙමි. පූර්වජාතිය සිහිකරන්නාවූ මම රාජ්‍යයෙහි අභිෂෙක කරන්නාහුයයි සිතා මව් පිය දෙදෙනා හා සමග කථා නොකෙළෙමි, එම්බල රථාචාර්‍යය එක්දවසක මාගේපියරජතෙම මා උකුළෙහි තබාගෙණ රාජ්‍යය අනුශාසනා කරණුයේ. එකෙණෙහි බැඳ එන්නාවූ සොරුන් සතරදෙනෙකු දැක එකකු මරවයි කීය, එකෙකු සිරගෙයි ලවයි කීය. එකෙකු ඇඟ සැතින් විද කාරම් ලවයි කීය. එකෙකු දිවස් උල තබවයි කීය. ඒ රජහු පවිටුවූ බස් ඇසුවාවූ මම නොගොළුව ගොළුවීමෙන්ද, නොපිළුව පිළු වීමෙන්ද මාගේ මළ මූත්‍රයෙහි නැවරී වාසය කෙළෙමි.

එම්බල රථාචාර්‍යය! මෙලොව සත්වයන්ගේ ජීවත්වීම තෙම මේ දුක්වූයෙන් බොහෝ කලක් පවත්නෙම් යෙහෙක. ඉදින් ස්වල්ප කාලයක් පවත්

තෙම් දුක් ණතාවී තමූත් යෙහෙකැයි, මෙමා වූකලී එසේ නොවන්නේය. ඉතා සවල්ප කාලයක්ම පවත්නේය. එතෙමේත් සසර දුක් නොහැර පවත්නේය. නෙවත් දුකින් මඬනා ලද්දේය, එහෙයින් මේ සවල්ප ජීවිකාව නිසා කවර කාරණයෙකින් ප්‍රාණඝාතාදීවූ අකුසල් කෙළේදැයි යනහොත් අනිත්‍යය දුඃඛය අනාත්මය යන තිලකුණු දැනගන්නා විදර්ශනා නුවණැති හෙයින්ද ශ්‍රොතාපත්ති ආදිවූ මාර්ග නූදුටු හෙයින් ද ඒ සත්වතෙම දුක්වූ සවල්ප ජීවිකාව නිසා ප්‍රාණඝාතාදී අකුසල් කරන්නේය, එසේහෙයින් ඒ දුකින් මිදෙම්හයි ඉතා සුහුසුලු නොවන්නාවූ සත් පථයෙහි පවත්නා ජනයන්ට ඉච්ඡාඵලය සිද්ධවන්නේය. ඒ එසේමය; සොළොස් අවුරුද්දකින් දූත් මාගේ මනොරථය සිද්ධවීම යයි වදාළසේක.

එකල්හි අති මධුරවූ බණ කථාව ඇසූ සුතනඳ නම් රථාචාර්යතෙම මේ රාජකුමාරතෙම මෙබඳු රජ ඉසුරු කුණපයක්මෙන් දමා තමා සිතාගත් අධිෂ්ඨානය නොබිඳ පැවිදි වෙමියි මේ මහ වලට වන. මා හට මේ දුක්ඛ ජීවිකාවෙන් කවර ප්‍රයෝජන ද මම ද මූන්වහන්සේ හා සමග මහණ වෙමියි සිතා තෙමිය කුමාරයන් වහන්ස නුඹවහන්සේට මතු වැඩෙක් සිද්ධවෙයි නුඹවහන්සේගේ මේ පැවිදිවීම මටත් කැමති වීමය. එබැවින් නුඹවහන්සේගේ සමීපයෙහි මමත් පැවිදිවනු කැමැත්තෙමි මාත් කැඳවාගත මැනවැයි කීයේය. මෙසේ ඒ රථාචාර්යයා විසින් යාච්ඤා කළ කල්හි බෝසතානෝ ද ඉදින් මම මුන් දූත්ම පැවිදිකෙළෙම් නම් මාගේ මව්පියෝද මෙතනට නොපැමිණෙති. එයින් ඔවුන්ට මහත් පිරිහීම වන්නේය. මේ රථයෙහි යෙදූ අශ්වයෝද රථයද ආභරණද බඩුද මෙතනම නැසෙන්නේය. තෙමිය කුමාර නම් එක් යක්ෂයෙකැයි රථාචාර්යතෙම ඔහු විසින්ම මරාකනලද එයින් දූත් නුඹවහන්සේ නුවරට නොආයේ යයි මට නින්දාවකුත් වන්නේයයි සිතා තමා නින්දාවෙන් මිදීම හා මව් පියන්ට මතු වන්නාවූ වැඩද නුවණින් සලකා උපායකින් ඒ රථාචාර්යයා නුවරට යන්ට ආ පමණක්මුත් මේ රජ්ජුරුවන්ගේ අසුන් හා රථයද දමනු නිසා ආයෙහි නොවෙයි එසේහෙයින් මේ රථය ගෙණගොස් රජ්ජුරුවන්ට දී නයින් මිදී වර. නය නැත්තාහුගේ පැවිදිවීම බුද්ධාදීවූ රුසිවරයන් විසින් පසස්නා ලදැයි වදාළසේක.

ඒ අසා රථාචාර්යතෙම ඉදින් මා නුවරට යාදී මූන්වහන්සේ අන් තෙනකට වැඩිසේක් වීනම් එපවත් අසා අවාවූ පියරජ්ජුරුවෝ මපුතනුවන් වහන්සේ මට දක්වවයි කියා නොදැක්වූවහොත් මට නිග්‍රහ කරන්නාහුවෙති. එබැවින් තමා ගුණ කියා ප්‍රතිඥකරන්නා කැමැත්තෙමියි සවාමිවූ තෙමිය කුමාරයන් වහන්ස! නුඹවහන්සේට වැඩෙක් වේවයි යම් හෙයකින් මම නුඹවහන්සේට කීකරුවීම්ද, එහෙයින් මා විසින් යාච්ඤාකරණලද නුඹවහන්සේද මාගේ වචනය කරන්ට සුදුසුසේක. යම්තාක්කලකින් මම නුඹවහන්සේගේ පියරජ්ජුරුවන්වහන්සේ කැඳවාගෙණ එම්ද, ඒතාක් නුඹවහන්සේ මෙතැන්හිම සිටියමැනව ඉදින් ඒ පියරජ්ජුරුවන් වහන්සේ අවුත් නොප දැක සතුටුසේක්වීනම් යෙහෙකැයි කීයේය. එබසට බෝසතානෝද එම්බල රථාචාර්යය

තෝමට යමක් කියන්නෙහිද, එය මමද කරන්නෙමි. ඒ එසේමය; මමත් පියානන් දක්නා කැමැත්තෙමි, එබැවින් එම්බා රථාචාර්‍ය්‍යය! තෝ නුවරට ගොස් යුහුව එනුවර මාගේ ඥාති සමූහයන්ට මා නිදුක් බවද කියා දෙමව්පියන්ට මාගේ බසින් නමස්කාරද කරවයි කියා රන් කෙසෙල් ගසක්මෙන් බරණැස් නුවර දිශාවට නැමී මව්පියන්ට පසඟ පිහිටුවා වැඳ රථාචාර්‍ය්‍යයාට මෙසේ අසුන් දුන්නේය. එනපුන් ගෙණ මහබෝසතාණන්ගේ පය වැඳ පැද කුණුකොට නුවර වැද මාලිගා දොරකඩට පැමිණියේය. එකල්හි චන්ද්‍රාදේවී තොම මාගේ පුත්‍රයාණන්ගේ පවත් කවරේදැයි සිවුමැදුරු කවුළුව හැර රථාචාර්‍ය්‍යයා එන පෙර මග බලන්නේ හිස් රථය ගෙණ එන්නාවූ රථාචාර්‍ය්‍යයා දැක මේ රථාචාර්‍ය්‍යයතෙම හිස් රථය ගෙණ එන්නේයයි කඳුලෙන් තෙමුනු මුහුණු ඇතිව විලාප කිය කියා අඬන්නී මේ රථාචාර්‍ය්‍යතෙම මාගේ පුත්‍රයා පසින්යට කොට එන්නේය. ඒ භූමිවර්ධිතවූ මාගේ පුත්‍රතෙම පොළව කැනපස්වසන ලද්දේය නැසුනේ වන ඒ එසේමය, මාගේ පුත්‍රයා නසා ආවාවූ මේ රථාචාර්‍ය්‍යයා දැක සතුරන් සතුටු වෙති සිතමියි යනාදී විලාප කිය කියා රථාචාර්‍ය්‍යයා අතින් විචාරන්නී එම්බා රථාචාර්‍ය්‍යය! මාගේ පුත්‍රතෙම කිමෙක්ද, සැබවින් ගොළුවෙක්මද, කොරෙක්මද, බිමකැන පසින් යටකරණලද වන්නේයයි විලාප කිය කියා හැඬීද, නොහොත් තමා ⟨නාමරවයි කියා කොර හැර අත පය ගසා හැඬීද! මේ සියල්ල නොවලහා කියවයි කීය. එකල්හි රථාචාරී තෙම ඉදින් තේමිය කුමාරයෝ ගොළු බිහිරි නොවන්නාහ, මිහිරි කථා ඇත් තාහ, බණ කියන්නාහුයයි කීම්තම් එසේවූව කවර හෙයකින් තෝ කැඳවා ගෙණ නොආවෙහිදැයි රජ මට කිපී නිග්‍රහයක් කෙළෙම්නම් නපුර එබැවින් පළමුකොට අභය ඉල්වමියි සිතා ඉදින් ආඥාවෙති! නුඹවහන්සේ මට අභය දෙනසේක් වීනම් තේමිය කුමාරයන්ගේ සමීපයෙහි මා දුටු දෙය නොවලහා කියන්නෙම් වේදැයි කීයේය.

එබසට චන්ද්‍රා දේවීතොම එම්බල රථාචාර්‍ය්‍යය! තට අභය දෙන්නෙමි තේමිය කුමාරයන්ගේ තා දුටු ඇසූ සියල්ලම නොවලහා කියවයි කීවාය, එකල්හි රථාචාර්‍ය්‍යතෙම කියනුයේ එම්බා චන්ද්‍රා දේවීන්වහන්ස! නුඹවහන් සේගේ පුත්වූ තේමිය කුමාරයන්වහන්සේ ගොළු බිහිරිව පිළුව උපන්කෙණෙකුන් වහන්සේ නොවනසේක. උන්වහන්සේ වනාහි නොපැකිලි පවත්නා මධුරවූ තෙපුල් ඇතිසේක. ලීලෝපෙතවූ ගමන් ඇතිසේක. එතකුදුවුවත් රාජ්‍ය සම්පත්තියට භයින් බොහෝ වංචාවෙන් දවස් හළසේක. ඒ එසේමය; පෙර මේ බරණැස් නුවර විසි අවුරුද්දක් රාජ්‍ජය කොට එපවින් නරකයෙහි අසූදහසක් අවුරුදු පැසී දූන් නුඹවහන්සේට පුත්‍රව උපන්සේක. ජාතිස්මරණ ඥානයෙන් ඒ අපායෙහි විඳිදුක් නොපසගේ ඒ තේමිය කුමාරයන්වහන්සේ සිහිකොට රජසිරි විඳීමට භය ගෙන මෙසේ මට රාජාභිෂේක කරතියි සිතා මව්පිය දෙදෙනාගේ සමීපයෙහි කථා නොකොට ගොළු බිහිරිකොර ආකාර පමණක්මුත් සම්පූර්ණවූ හස්තපාදාදී අවයව ඇතිසේක. යහපත්වූ ආරෝහ දෑක්වූ පරිනාහද ඇතිසේක. නොපැකිල පවත්නාවූ මධුරවූ තෙපුල් ඇතිසේක. සූක්‍ෂමවූ ප්‍රඥාද ඇතිසේක. දූන් වනාහි දිව්‍යලෝක ගාමී මාර්‍ගයෙහි වැඩසිටි සේක. ඉදින් එම්බා දේවයන්වහන්ස! නුඹවහන්සේගේ ඖරස පුත්‍රවූ ඒ තේමිය කුමාරයන්වහන්සේ දක්නා කැමතිසේක්වීනම් දූන් ඔහු වසන තැනට

තොප කැඳවාගෙණ යෙමියි කීයේය. ඒ තෙමියකුරාරයන් වනාහි රථාචාය්‍ර්‍යයා නුවරට ගමන් කරවා තෙමේ පැවිදිවනු කැමතිවිය. ඔහුගේ චිත්තාචාරය දැන සක්දෙව් රජතෙම විශ්වකර්‍මදිව්‍යපුත්‍රයා කැඳවා තොල! තෙමිය කුමාරයෝ පැවිදිවනු කැමැත්තෝය ඔවුන්ට පන්සලක්ද තවුස් පිරිකරද නිර්‍මාණයකොට දෙවයි කියා එවීය. ඒද මහත් වේගයෙන් අවුත් ඒ වනයෙහි තුන් යොදුන් තැන් පන්සලක් මවා රාත්‍රිස්ථාන දිවාස්ථාන ලින් පෙංකුණු ඵල රුක් ආදි යෙන් සමෘද්ධකොට සියළු තවුස් පිරිකරද මවා දෙව්ලොවටම ගියේය.

මහබෝසතාණෝද ඒ පන්සල දැක මේ සක්දෙව් රජහු විසින් කරණ ලද නිර්‍මාණයකැයි දැන පන්සලට වැද හන්සළු තබා සත වැහැරි පෙරවා අඳුන් දිවි සම් එකාංශයෙහි කොට දළමඹුලු බැඳ පිරිකර කද කරතබා සැරයටිය අතින් ගෙණ තවුස් වෙස් දරා ඔබිතොබ සක්මන්කොට ඉතා සැපය ඉතා සැපයයි උදන් අනමින් පන්සලට වැද දඬුමැස්සෙහි වැඩහුන්සේක. පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා සවස් වේලෙහි පන්සලින් නික්ම සක්මන් කෙළවර සිටිකරනසින් කොලකඩා ගෙණවුත් සක්දෙව් රජහු මවා දුන් බඳුනෙහි ලුණු නැති දියෙන් උයා අමාවක් මෙන් අනුභවකොට සතර මහාබ්‍රහ්මවිහාර යන් සිත්හි වඩා එතැන්හි වාසය කළසේක.

කසීරජහුද සුනන්දයාගේ බස් අසා මහාසෙන ගුත්ත නම් අමාත්‍යයා කැඳවා ගමන් සැරහීමට විධානකරණුයේ එම්බා සෙනගුත්තය! මේ දෙළොස් යොදුන් බරණැස් නුවර ඇති මංගල රථසංග්‍රාමික රථාදීවූ රථයානාවෝ ආජානීය සෛන්ධවයන් යොදා ධවජපතාක නංවා ගමනට සරහනු ලැබෙත්වයි නොයෙක් හස්තීහුද රුවන් සන්නාහලා රන් පෝරුද සදනු ලැබෙත්වයි නොයෙක් සිය දහස් ගණන් සක්සින්නන්ද හලම් මිහිඟු බෙර පනාබෙර පටා බෙර මද්දල ආදීවූ තූය්‍ර්‍ය ජාතීහුද මෙහි වයනු ලැබෙත්වයි මම වනාහි මාගේ පුත්වූ තෙමිය කුමාරයන් සමීපයට ගොස් උන්ට අවවාද කොට එතනදීම රුවන් රැසක සිටුවා අභිෂෙක දී කැඳවා එනු කැමැත්තෙමියි සියළු නියම් ගම් වැස්සෝද අන්තඃපුර ස්ත්‍රීහුද සියළු රජකුමරුවෝද වෛශ්‍යයෝද සියලු බමුණෝද යන සියල්ලෝමත් මා හා කැටිව යන ලෙස යානාවන් සදා රැස් වෙත්වයි. තවද සියළු ඇතරුවෝද අසරුවෝද රථාචාරීහුද පාබල සෙනඟය යන සියල්ලෝම තම තමන්ගේ යානාවන් සදා රැස්ව නෙත්වයි තවද මෙහි රැස්වූ නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, තම තමන් යානාවන් සදා වහා මෙතැන්හි රැස්වෙත්වයි මම වනාහි මාගේ පුත්‍රයාට අවවාද කරණු පිණිස දැන්ම යන්නෙමියි කීයේය.

මෙසේ ඒ රජුගෙන් නියෝගලද්දාවූ රථාචාරීහු ශීඝ්‍රව ජව හා මහත් බල ඇති සෛන්ධව ජාතියෙහි උපන් අශ්වයන් යොදා ධජ බැඳ සේසත් නගා රජු නැගීමට සුදුසු රථයක් මාලිගාදොරකඩ තබා රජහට දැන්වවූවාහුය. රජද රථාචාරීහට එම්බල පුරුෂය සවුරුවූ ගාත්‍රාඇති අශ්වයෝ ශක්තියෙන් පිරිහෙති කෘශවූ දෙන ඇති අශ්වයෝ ශක්තියෙන් පිරිහෙති එබඳුවූ අශ්වයන් නොගණුවයි කීයේය.

රථාචාරීහුද වර්‍ණයෙන් ජවයෙන් බලයෙන් යුක්තවූ මනා අශ්වයෝම අප විසින් යොදන ලද්දාහුයයි කීවාහුය. රජ ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශූද්‍රය

යත චාතුර්ංගිණියත්ද එයින් පිටත් අටලොස් ශ්‍රෙණි ජනයාද රැස්කරවිය. මේ සෙනග කැටිකරන්නාවූ රජහට තුන්දවසක් ඉකුත්විය. ඉක්බිති සතර වෙනි දවසෙහි ඒ අශ්වයන් යොදනලද රථ යානාවට නැගී අන්තඃපුර ස්ත්‍රීන්ද තමා හා සමග එන ලෙස නියෝග කොට වල්විදුනාවය, නලල්පටය, මගුල් කඩුවය, ශ්වේතඡත්‍රය, රත්මිරිවැඩිසඟලය යන පංචරාජ කකුධ භාණ්ඩයන් බෝසතාණන්ට අභිෂේක කරණ ලෙස ගෙන්වාගෙණ ඒ සුතනද තම් රථාචාර්ය්‍යයා ඉදිරිකොට මහසෙනග පිරිවරා බෝසතාණන් වසන තැනට පැමිණියෝය. එසේ මහත් තේජසින් දිලිහි දිලිගී අමාත්‍යමණ්ඩලය පිරිවරා තමන් වසන තැනට පැමිණි පියරජ්ජුරුවන්ට බෝසතාණන්වහන්සේ වදාරණසේක් කිමෙක්ද මහරජ ! තට නිදුක්ද රෝගපීඩාවෙක් නැද්ද, අපගේ මව්වූ සියළු රාජ ස්ත්‍රීහුත් නිරෝගිදැයි විචාළේය. එකල්හි රජද එම්බා පුත්‍රයාණෙනි ! මට කිසි දුකකුත් නැත්තේය, ශරීර පීඩාකරවූ කිසි ව්‍යාධියකුත් නැත්තේය තොපගේ මව්වූ සියළු රාජ කන්‍යාවෝද දූත් නිරෝගියයි කීයේය. නැවත බෝසතාණන්වහන්සේ වදාරණසේක්:- එම්බා මහ රජ්ජුරුවෙනි! කිමෙක්ද? නිරන්තරයෙන් සත්‍ය වචනය රක්ෂාකරන්නෙහිද පුරණලද දශරාජ ධර්මයන් ඇත්තේද තාගේ චිත්තය දත්දීමෙහි ඇලෙන්නාහුදැයි විචාළසේක.

එබසට මහරජතෙම එම්බා පුත්‍රයාණෙනි! මම මද්‍යපානයද නොක රන්නෙමි, මෙලොව පරලොව දෙක්හි අනර්ථ කරන්නාවූ රා මට ප්‍රිය නොවන් නේය. ඒ මතු නොවෙයි සත්‍ය වචනයෙහිද තොප විසින් විචාරණලද දශ රාජ ධර්මයෙහිද මාගේ සිත ඇලෙන්නේයයි කීයේය. නැවතත් බෝසතාණන් වහන්සේ එම්බා මහරජ්ජුරුවෙනි! කිමෙක්ද; තොපගේ රථ යනාදියෙහි යෙදියයුතුවූ අශ්ව වෘෂභාදීහු නිරොගිවෙත්ද තවද හස්ති අශ්වාදී වාහන සුවසේ පවත්නේද, ශරීරය පෙළෙන්නාවූ කාශශ්වාසාදිවූ ව්‍යාධිහු තොපට නැත්තාහුදැයි විචාළසේක.

ඔබසට රජතෙම කියනුයේ එම්බා තෙමිය කුමාරයෙනි! එසේය රථ ගැල් ආදියෙහි යෙදියයුතුවූ අශ්වයන් හා වෘෂභයෝ කිසි පීඩාවක් නැත්තා හුය හස්ති අශ්වාදිවූ වාහනද, නිදුකින් පවත්නේය. මටද ශරීර පීඩාකරවූ කිසි ව්‍යාධිකෙණෙක් නැත්තාහුයයි කීයේය. කිමෙක්ද, මහරජ සියළු පසල් දනව්ව සුභික්ෂද, බොහෝ ජනයා ඇත්තේද, රටමැද සියළු ගම් නියම්ගම්හි බොහෝ ජනයාගේ විසීම ඇත්තේද සියළු කොටු ගෙවල් හා රත්රුවන් ගබඩා ධනධාන්‍යන්යෙන් සම්පූර්ණව සුරක්ෂිතව තිබේදැයි විචාළසේක. එසේය තේමිය කුමාරයෙනි! සියළු ප්‍රත්‍යන්ත ජනපදයෝත් සුභික්ෂයෝය. ජනයාගෙන් සම්පූර්ණය, රටමැද සියළු ගම් නියම්ගම්ද නිරන්තරව වසන් නාවූ බොහෝ ජනයා ඇත්තේය, සියළු කොටු ගෙවල් හා ගබඩා ධනධාන්‍ය යෙන් පිරුණේයයි කීයේය.

එකල්හි බෝසතාණන් වහන්සේ රජහට නිඳින ලෙස අවසරය දෙනු කැමතිසේක. එම්බා මහරජ්ජුරුවෙනි මෙලොව පරලොව දෙකින් වැඩ සිඩ වන හෙයින් මෙතැන්හි තොපගේ ඊම යහපත් ඊමක් වන්නේය. කිසිසේත් නපුරු ගමනක් නොවන්නේය. එබැවින් යම්බදු අස්නෙක ඉන්නෙහිද එබඳු අස්නක් පණවන්වයි වදාළසේක. රජතෙම මහබෝසතාණන්වහන්සේ

කෙරෙහි ගෞරවයෙන් අස්නෙහි හුනුත්තේය එකල්හි මහබෝසතාණන් වහන්සේ එම්බා මහරජ මේ කොල ඇතිරි මත්තේ හිඳුව එසේ උන්නාවූ තොපගේ පාදයන් මේ පරිභොග ජලයෙන් ධොවනය කෙරෙත්වයි වදාළසේක. එසේ කීවත් ඒ මහරජ උන්වහන්සේ කෙරෙහි ගෞරවයෙන් ඒ කොල ඇතිරි මත්තෙහිත් නොහිඳ බිම උන්නේය. මහබෝසතාණන්වහන් සේද ඇතුළු පන්සලට වැද උයා තිබූ කරකොළ ගෙණවුත් එම්බා මහරජ්ජුරුවෙනි, මා විසින් උයා තබතලද ලුණු නැති කරකොළය ඒ අනුභව කරව ඒ එසේම්ය මෙතැන්හි ආවාවූ තෝ මා විසින් ආගන්තුක සත්කාර කටයුතු වන්නේයයි වදාළසේක.

එබසට රජතෙම කියනුයේ එම්බා තෙමිය කුමාරයෙනි මම මේ පලා අනුභව නොකරන්නෙමි. මේ අපගේ භෝජනයක් නොවන්නේය. මිහිරි මස් රසයෙන් තෙත්වූ සුවඳැති සාලේ බත් අපගේ භොජනයයි කීයේය. මෙසේ ඒ කරකොළ ප්‍රතික්ෂෙපකොට නැවතත් බෝසතාණන් කෙරෙහි ගෞරව යෙන් මඳක් අතින් ගෙණ එම්බා කුමාරයෙනි! තොපි මෙබඳු ආහාරය අනු භව කරන්නේදැයි බෝසතාණන් හා සමග ප්‍රිය කථා කිය කියා උන්නේය. එකෙණෙහි චන්ද්‍රාදේවීතොම අන්තඃපුර ස්ත්‍රීන් පිරිවරා ගෙණවුත් බෝසතාණන් පය අල්වා වැඳ කඳුළු පිරුණු ඇස් ඇතිව එකත්පසෙක උන්නාය. ඉක්බිති රජතෙම සොඳුර තොගේ පුත්‍රයාතන් අනුභව කරණ ආහාරය බලවයි මඳක් කරකොළ ගෙණ චන්ද්‍රා දේවීන් අතේ තිබුයේය.

එසේම සෙසු ස්ත්‍රීන් අතට දුන්නේය. ඒ සියල්ලෝම සාමීනි නුඹ වහන්සේ මෙබඳු හීන ආහාරයක් අනුභව කරණසේක්දැයි හින්දැකොට නැවත ඉතා දුෂ්කරයක් කරණසේකැයි කියා වැඳ වැඳ උන්නාහුය. එසඳ රජතෙම නැවතත් එම්බා තෙමිය කුමාරයෙනි! මේ වනමැද උදකලාව මෙබඳු ආහාරය අනුභවකොට වසන තොප දුටුවාවූ මට එක් ආශ්චර්‍ය්‍යයක් වැටහෙන්නේය. මෙබඳු ආහාර අනුභවකොට වසන්නාවූ තොපගේ ශරීරවර්ණය කවර හෙය කින් ප්‍රසන්න වන්නේදැයි විචාළේය.

එසේ විචාළාවූ රජහට ඒ ප්‍රකාශකොට වදාරන්නාවූ බෝසතාණන් වහන්සේ:-

එම්බා මහරජ්ජුරුවෙනි! මම සීලසමාදානයෙන් යුක්ත මෙතණ ඇතිරි යෙහි තනි තනිවම සයනය කරන්නෙමි. තොපට මෙන් කඩුගෙණ රැක වල සිටිනා රාජපුරුෂයෝද නැත්තාහ. ඒ සැපසෙය්‍යාව හෙතුකොට ගෙණ මාගේ ශරීර වර්ණය පහදනේය. මහරජ තවද අනිකුදු කාරණයෙක් ඇත. මහරජ මම ඉකුත් සැපතට ශොක නොකරන්නෙමි. මතු සැපතක්ද ප්‍රාර්ථනා නොකරන්නෙමි, දූත් කය යම්දෙයකින් යැපෙමි. එහෙයින් අපගේ ශරීරවර්ණය පහදනේය. මහරජ මෙලොව බාල ජනයෝ නැසුනු වස්තුවට සොකකෙරෙති, නොලත් වස්තුව ප්‍රාර්ථනා කෙරෙති, එහෙයින් තෘෂ්ණා ශොක දෙකින් තැවී වියලී දුර්වර්ණවන්නාවූ දෙහ ඇති සත්වතෙම මුලින් කපා අව්වට දමතලද නළ දඩක්මෙන් වන්නේයයි වදාළසේක. ඉක්බිති රජතෙම මෙතනදීම මොහු අභි ෂේක කොට නුවරට කැඳවාගෙණ යෙමියි සිතා බෝසතාණන්ට යාච්ඤාකර

ණුයේ එම්බා තෙමිය කුමාරයෙනි! බොහෝ ඇත්සෙනගද අස්සෙනගද රථ සෙනගද සන්නාහසන්නද්ධවූ පාබල සෙනගද හෙවත් සෞරවීයසී බලපරාක්‍රම ඇත්තාවූ යෝධයන් දිව්‍ය ප්‍රාසාදයේ මනෝහර මාලිගාද යන මේ සියල්ලත් දෙමි ඒ මතු නොවෙයි සර්වාභරණයෙන් සැරහුනාවූ බොහෝ ස්ත්‍රීන්ද දෙමි. නෘත්‍ය ගීතයෙහි දක්‍ෂවූ බොහෝ නාටක ස්ත්‍රීන්ද දෙමි. ඔහු තමන්ගේ රූප ශ්‍රීයෙන් හා නෘත්‍යගීතයෙන් හා තොපගේ සිත් පොළඹවන්නාහුවෙති. අසම භින්නවූ ක්‍ෂත්‍රිය වංශ ඇති රජදරුවන්ගේද තොපට රාජකුමාරිකාවන් ගෙණෙමි, එවුන් තොපට දකොට දරුවන් වැදූ කල්හි පසුව තොප පැවිදි වන්ට සුදුසු වන්නේය. එම්බා තෙමිය කුමාරයෙනි! තොපි පළමු යෞවන වයසෙහි යහපත් රූපශ්‍රී ඇතියව එබැවින් දූත් රාජ්‍යශ්‍රී අනුභවකරව උදක ලාව මේ වල්හි විසීමෙන් කුමක් සිඬකරව්දැයි කීයේය. එකල්හි ඔහට බණ වදාරන්නාවූ බෝසතානන්වහන්සේ එම්බා මහජ්ජුරුවෙනි! තරුණවූ පුරුෂයෝද මෛථුනයෙන් වැලකීම යයි කියනලද බ්‍රහ්මචරියාව රක්‍ෂාකරන්නේය එසේ බ්‍රහ්මචරියාව රක්‍ෂාකරන්නාහුගේම යෞවනය පවත්නේය. බාලවයස සිටියාහුගේ පැවිදිවීමෙක් ඇද්ද ඒ බුඬාදීවූ සෘෂිවරයන් විසින් පසස්නා ලද්දේය. එබැවින් මම බ්‍රහ්මචරියාව රක්‍ෂාකරන්නෙමි, තොපගේ රාජ්‍යයෙන් මට ප්‍රයෝජන නැත ඒ එසේමය; ඉතා බාලයන්වූ බොලඳ බසින් මෑනියෙනි පියානෙනියි ප්‍රිය තෙපුල් කියන්නාවූ මෑනියන් විසින් බෙහෙත් අනුභවකොට දෙවියන්ට යැද දුකින් ලද්දාවූ ප්‍රියපුත්‍රයන් ජරාවට නොපැමිණ බාලවයසම නැසුනාවුන් දූත් දක්නෙමි, මනාවූ රූපශ්‍රී ඇති ලදරුවූ කුමාරිකා වරුන්ද ජීවිත විනාශයෙහි කඩා දමූ උන කිළිල්සේ තරුණ වයසෙහිම නැසුනාවුන් දක්නෙමි. එබැවින් මෙලොව බාලවූද වෘඬවූද සියළු ස්ත්‍රීන් හා පුරුෂයෝ ඒකාන්තයෙන් මරණයට පැමිණෙන්නාවෙති. එසේ නියමයක් නැත්තාවූ මේ ජීවිතයෙහි නුවණැති කවර නම් පුරුෂයෙක් විශ්වාස කරන්නේද තවද රජ්ජුරුවෙනි වලදිය සිඳී මඬවායාමෙන් සියළු මත්ස්‍යයන්ගේ විනාශයක් මෙන් සත්වයා මච්කුස පිළිසිඳගත් තැන්පටන් රාත්‍රිදිවාභාගයෝ ඉක්මෙන්නාහු වෙති. ඔවුන්ගේ ඉක්මීමෙන් ආයුෂයදී දවසින් දවස ඉතා සවල්ප වන්නේය එසේ ගෙවී යාමක් ඇති කල්හි සත්වයාගේ කුමාර බවෙක් නම් කෙසේවන්නේදැයි කියා නැවතත් කාරණා දක්වන්නාවූ මහබෝසතානන්වහන්සේ එම්බා මහරජ්ජුරුවෙනි මෙලොව වැසිතෙම නිරන්තරයෙන් ව්‍යාධියෙන් ඉතා පහරණු ලබන්නේය. තවද මහරජානනි මෙලොව වැසිතෙම මරහු විසින් පහරණ ලබන්නේය, ජරාව පිරිවරකොට ඇත්තේය. මේ ක්‍ෂය වන්නාවූ රාත්‍රී දිවා භාගයෝද තුමූ පමණක් ක්‍ෂය නොව සත්වයාගේ ආයුෂය හා සමග ක්‍ෂය වෙති. එසේ වන කල තෝ කවර හෙයකින් මට අභිෂේක කරණු කැමැත්තෙහිද:-

යම්සේ මහරජ නූල් සැද බැඳී කල්හි යම් යම් භාගයෙක්හි වියනු ලැබේද එයින් ඉතිරිය යම්සේ සවල්ප වන්නේද සත්වයන්ගේ ජීවත්වීමත් එසේම දව සින් දවස සවල්ප වන්නේය, තවද යම්සේ පිරුණු ගම්වතුරෙන් සමුද්‍රය කරා යනුයේ කෙසගක් විවරත් ආපසු නොයේද එපරිද්දෙන් සත්වයන්ගේ ආයුෂයත් දවස් අවුරුදු වශයෙන් ගෙවී යනුයේ නැවත නොඑන්නේය. තවද යම්සේ මහරජ සැඩමනවතුරෙන් දෙගන් ඉවුරෙහි සිටි වෘක්‍ෂයන් මූල්

සෝධා එලාගෙණයේද එපරිද්දෙන් සත්වයෝද ජරා මරණ දෙකින් විනාශයට පමුණුවනු ලැබෙතියි වදාළ ඉක්බිති රජ්ජුරුවෝ බෝසතාණන්වහන්සේගේ බණකථා අසා ගිහිගෙයි විසීමෙහි උකටලීවීමෙන් මහණවනු කැමතිව නුවරට නොගොස් මෙතැනදීම පැවිදිවෙමියි ඉදින් මාගේ පුතනුවෝ නුවර යෙත් නම් මාගේ ඡේසත දෙමියි කියා ඔහු විමසනු පිණිස නැවත රාජ්‍යයෙන් ආරාධනා කරණුයේ දරුවෙනි මම තොපට ඇත් ඈණිද රථ ඈණිද සන්නාහ සන්නද්ධවූ අශ්වයන්ද සිත්කළුවූ සර්වාභරණයෙන් සැරසුනාවූ ස්ත්‍රීන්ද දෙමි, ඔවුන්කෙරහි තොපි මනාපවතුව තවද නෘත්‍යගීතයෙහිද දක්‍ෂවූ ස්ත්‍රීහු පඤ්චවිධ කාම කොට්ඨාසයෙන් හා සිත් අලවති මේ ජන ශූන්‍යවූ වල්හි විසීමෙන් තෝ කවර වැඩෙක් සිඩකෙරෙයිද. තවද පුත්‍රය තට සතුරුවූ රජදරුවන් ගෙන් සැරසුනාවූ රාජ කන්‍යාවන් ගෙණවුත් පාවාදෙමි. ඔවුන්ගෙන් දරුවන් ලැබ පැවිදිවේ. තවද පුත්‍රය මම තොපට සියළු ධාන්‍යයන් පිරුකොටු ගෙවල්ද මුතු මැණික් ආදීන් පිරූ ගබඩාද සෙනාවාහනද දෙමි. තවද පුත්‍රය ප්‍රිය තෙපුල් කියන්නාවූ මනා ස්ත්‍රීන් හා දාස ජනයා පිරිවරා රාජ්‍යශ්‍රී අනුභව කරව, මෙවනයෙහි විසීමෙන් කවර වැඩෙක් සිඩවේදැයි කීයේය.

නැවතත් රජහට තමා නොකමැති බව ප්‍රකාශකරන්නාවූ බෝසතාණන් වහන්සේ එම්බා මහරජ්ජුරුවෙනි වස්තුව නම් තමා මිය පරලොව යාමෙන් හෝ වස්තු නැසීමෙන් හෝ නියමයෙන් ක්‍ෂයවූන්නේය; එබඳු වස්තුවෙන් ප්‍රයෝජන කවරේද තමා විසින් ප්‍රාණයමෙන් රක්‍ෂාකරණලද ස්ත්‍රියද තමාට පළමුව මිය පරලොව යන්නී හෝ වෙයි. ඈට පළමුව තෙමේ හෝ පළමුව යනු ලබන්නේය. එබඳු ස්ත්‍රීන් හා විවාහ කිරීමෙන් ප්‍රයෝජන කවරේද:-

යම් යෞවනයෙක් ඒකාන්තයෙන් ජරාව විසින් මඩනා ලැබේද එබඳු යෞවනයෙන් ප්‍රයෝජනය කවරේද? එහි කවරසතුටුවීමෙක්ද? කවර ක්‍රීඩාවෙක්ද කවර ඇල්මෙක්ද ? කවර වස්තුසෙවීමෙක්ද ? මට දරුවන්ගෙන් හා භාර්‍ය්‍යාවන්ගෙන් කවර ප්‍රයෝජනයෙක්ද ? එම්බා රජ්ජුරුවෙනි! ඒ පුත්‍රදාරාදී බන්ධනයෙන්මිදුනෙමි, මාරතෙම මේ සත්වයන්ගේ විනාශයටප්‍රමාද නොවන්නේය. මමද යථොක්ත කාරණයෙන් මරහු පමානොවෙතියි දනිමි එසේ මරහුවිසින් මඩනාලද්දාවූ මට රාජ්‍ය සම්පත්තියෙහි කවර ඇල්මෙක්ද? වස්තුවෙහි කවර අභිලාෂයෙක්ද? තවද රජ්ජුරුවෙනි! හිරුරැසින්තැවී විලිස්නුණාවූ රාත්‍රියෙහි ආපොරස වැළඳි ලිහිල්වූ බන්ධනඇති ඵලයන්ගේ වැටීමමෙන් උපන්නාවූ සත්වයන්ට මරණය ඒකාන්තයෙන් පැමිණෙන හෙයින් නිරන්තරයෙන් භයං කර වන්නේය, උදාසන දුටු බොහෝ ජනයාගෙන් සවස සමහරෙක් නො දක්නා ලැබෙති. එබැවින් මහරජ්ජුරුවෙනි ! අදම මහත් වීර්‍ය්‍ය කටයුත්තේය. සෙට දවස් වන්නාවූ මරණය කවරක්හට දැනේද ඒ එසේමය, පන් විසිහය දෙතිස් කම්කටුල් අටානූවක් රොගාදී වශයෙන් මහසෙනග ඇති මරහු විසින් අසවල් දවස අසවල් මස අසවල් අවුරුද්දෙහියයි කළ ප්‍රතිඥාවෙක් නැත, තවද මහරජ්ජුරුවෙනි ! මෙලොව සොරකම් කොට ජීවත්වන්නාවූ ජනයෝ තමන්ගේ ජීවිතයත් නොසලකා වස්තුවම ප්‍රාර්ථනාකරන්නාහුවෙති. මම වනාහි ඒ ධනබන්ධනයෙන් මිදුනෙමි එම්බා මහරජ්ජුරුවෙනි! තොපිත් මා හා සමගම අවුත් ඒ බන්ධයෙන් මිදෙව මට වනාහි තොපගේ රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත්තේයයි වදාළසේක.

මෙසේ නිවන් අවසන්කොට බෝසතාණන්වහන්සේ ධර්මදේශනා කළ කල්හි අතිමධුරවූ ධර්මකථාව අසා රජ්ජුරුවන් චන්ද්‍රා දේවිය ප්‍රධාන කොට ඇති මේ සොළොස් දහසක් අන්තඃපුර ස්ත්‍රීන් හා අමාත්‍යයෝ පැවිදි වනු කැමැතිවූවාහුය. රජ්ජුරුවෝද මාගේ පුත්‍රයාණන් හා සමග පැවිදිවනු කැමැති කෙණෙක් පැවිදි වෙත්වායි නුවර බෙර හසුරුවා සියලු රන්රුවන් ගබඩා දොරඅරවා අසවල්තැන මහත් නිධාන ඇත ඒ කැමති කෙණෙක් ඇර ගණිත්වායි රන්පත්‍ර ලියවා මතුමහල්තෙලෙහි මැඹෙහි බැන්දවූහ. නුවරවැස්සෝද සල්පිල් සැදූවනම තබා දොර ඇරිවතිත්ම ගෙවල් හැර රජ්ජුරුවන් සමීපයට ගියාහුය. එකල පිය මහරජාණෝ මහජනයා හා සමග බෝසතාණන් සමීපයෙහි පැවිදිවූවාහුය. ශක්‍රයා විසින් මවාදෙනලද ආශ්‍රමපදය තුන්යොදුන් පමණවූයේය. මහබෝසතාණෝද පන්සල බෙදාදෙනසේක් ස්ත්‍රීහුනම් බාතසුලුවෙතියි ඔවුන්ට මැදපන්සලද පුරුෂයන්ට වටකොට පන්සල්ද දුන්සේක. සියලුතාපසවරු පෙහෙවස්සමාදන්වූ කල්හි බිම සිටම විශ්වකර්මයා විසින් මවාදෙනලද ගස්වල එලගෙණ අනුභවකොට මහණදම්පුරති. ඔවුන් කෙරෙන් යම් කෙණෙක් කාම විතර්කයක් හෝ ව්‍යාපාද විතර්කයක් හෝ විහිංසා විතර්කයක් හෝ සිතන්ද ? ඔවුන්ගේ සිත් දැන මහබෝසතාණන් වහන්සේ අහස වැඩහිඳ ධර්මදේශනා කරණසේක. ඔහු ඒ ධර්මදේශනාව අසා වහා පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවති. එකල අසවල් රටෙක රජ කරණ රජෙක් කසීරට රජ මහණවීයයි අසා බරණැස් රාජ්‍යය ගණිමියි නුවරට වැද සරහනලද නුවර දැක රජගෙයි මතුමහල් තලයට නැගී උතුම් සත්රුවන් බලා මේ වස්තුව නිසා වන එක් භයකින් ගියේයයි සිතා රාසොඬුන් කැඳවා රජ්ජුරුවෝ කවර වාසල් දොරකින් නික්ම ගියේදැයි විචාරා නැගෙනහිරි දොරිනැයි අසා තෙමේතේ එම දොරින් නික්ම මග සමීපයෙන් ගියේය. මහ බෝසතාණන් වහන්සේ ඔහු එති අසා වන කෙළවරට ඇවිත් අහස වැඩහිඳ බණදෙසා පිරිවර හා සමග ඔහු පැවිදිකරවූ සේක.

මෙසේ අනිකෙක අනිකෙකැයි රජදරුවෝ තුන්දෙනෙක් රාජ්‍යය හැර අවුත් මහණවූවාහුය, එසමයෙහි ඔවුන් ඇරගිය නුවරවල ඇත්තුද, අස්සුද වල්ව ගියාහුය. රථයන් එහිම දිරා ගියහ. ගබඩාවල කහවණු පන් සල් මලුයෙහි වැලිකොට විසුරුවාහුය. සියලු තාපසවරු අෂ්ටසමාපත්ති උපදවා ජීවිතයාගේ කෙළවර බඹලොව උපන්නාහුය. ඇත් අස් ආදීවූ තිරිසන් නුද ඒ තාපසවරුන් කෙරෙහි සිත් උපදවා දෙව්ලොව උපන්නාහුයයිමෙසේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා මහණෙනි මේ ජාතියෙහි මෙන් පෙරත් මහාබිනික්මන් කෙළෙම් වේදැයි වදාරා චතුස්සත්‍ය ප්‍රකාශකොට මේ තෙමිය ජාතක ධර්මදේශනාව නිමවා වදාළ සේක, එකල්හි සේසතෙහි වාසය කළාවූ දිව්‍ය ස්ත්‍රීන් නම් දැන් මේ ශාසනයෙහි උත්පලවර්ණා ස්ථවිරිය එකල්හි රථාචාර්‍ය්‍ය නම් දැන් ශාසනයෙහි ශාරීපුත්‍ර ස්ථවිරයෝය, එකල්හි තෙමිය කුමාරයන්ගේ මවුපිය දෙදෙනා නම් දැන් මේ බුධෝත්පාද කාල යෙහි මහාමායා දේවීන් හා සුදෝදන මහරජ්ජුරුවෝය, එකල්හි පර්ෂද්නම් දැන් බුධ පර්ෂද්ය, එකල්හි මූගපක්ඛ පණ්ඩිතයෝ නම් දැන් ලොවුතුරා බුදුවූ සම්‍යක් සම්බුධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේමය.

(මේ ලක්දිව මඬගල නම් වෙහෙර විසූ කුඩාතිස්ස නම් තෙරුන්වහන්සේද, මහවස නම් තෙරුන්වහන්සේද, කැටකඳුරු වෙහෙර විසූ පුස්සදේව නම් තෙරුන් වහන්සේද, මණ්ඩල විහාරයෙහි විසූ මහාරක්ඛිත තෙරුන් වහන්සේද, භගිරි වෙහෙර විසූ මහාතිස්ස තෙරුන්වහන්සේද, වමත් පව් වෙහෙර විසූ මහාසීව නම් තෙරුන්වහන්සේද, කාළුවෙල වෙහෙර විසූ මහා මලියදෙව තෙරුන්වහන්සේද යන මේ ස්ථවිරවරු බුද්දාල සමාගමයෙහිද මූගපක්ඛ සමාගමයෙහිද අයොඝර සමාගමයෙහිද හස්තිපාල සමාගමයෙහිද හැමටම පසුව තවුස් පැවිදිවූවාහුය. ඒ එසේමය, එයින් මඬ වෙහෙර වැසි මහානාග තෙරුන් වහන්සේද මහා මලියදෙව තෙරුන් වහන්සේද යනමේ දෙදෙනාවහන්සේ පිරිනිවන්පාන දවස් වදාරණ සේක් ඇවැත්නි! මූගපක්ඛ ජාතියෙහි බෝසතාණන් වහන්සේ හා සමග පැවිදිවූ තාපස පර්ෂද් අද නිමාවට පැමිණියාහුයයි කීවාහුය. ඇවැත්නි! අපි එකල්හි සුරාධූර්තයම්හ. සියල්ලවුන් තාපසවූ හෙයින් අප හා එක්ව රාබොන්නවුන් නොලැබ අපිත් පසුව ගොස් තාපසවූම්හ. දැනුත් ඇමට පසුව අධිගම ලදුම්හ. එබැවින් නුවණැති මහොත්තමයන් විසින් මඳකුත් පින්කිරීමෙහි පමානොවිය යුතුමයයි වදාළසේක.)

527
මහාජනක ජාතකය

තවද කරුණා නිධානවූ සියලු සත්වයන් ජාතිකාන්තාරාදියෙන් එතරලන හෙයින් ශාස්තෘනම්වූ සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

එක් දවසක් සවස්වේලෙහි දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩඋන් ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනාදී භික්ෂූන් වහන්සේ කථාවක් උපදවනසේක් ඇවැත්නි! සර්වඥයන් වහන්සේ සුද්ධෝදන රජ්ජුරුවන් වැනි පියාන කෙණකුන් හා යසෝධරාදේවීන් ප්‍රධානවූ අන්තඃපුරයක් හා සත්දවසකින් පැමිණෙන චක්‍රවර්තිරාජ්‍යය හා ගවු දෙගවු තුන්ගවු සතරගවු වට ඇති වාපොළව අවසන්කොට ගැඹුරු ඇති නිධාන් සැල් හා මේ නියාවූ රාජ්‍යශ්‍රීය අලුයම දැමූ කෙළ පිඩක් කොටත් නොසලකා මහබිනික්මන් කළ නියාව අපූර්වයයි යනාදීන් මහබිනික්මන් කථාව කියා කියා වැඩඋන්සේක. එබස් සර්වඥයන්වහන්සේ ගඳකිළියෙහි වැඩහිඳ දිව්කණින් අසාවදාරා අඳනා සිවුර ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනයෙන් ඇඳ ඊපිට රත්වන් පටිධාතුත් වහන්සේ බැඳ ස්වර්ණ පර්වතයක් බඳුවදමල්දම් සමූහයකින් වසන්නාසේ සුගත් මහා පංශුකූල චීවරය පෙරවා දම්සභා මණ්ඩපයට වැඩවදාරා පණවනලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ ධර්මාසනය සිසාරා වැඩහුන් භික්ෂූන්වහන්සේ බලා මේ භික්ෂූහු කපක් මුළුල්ලෙහි මා බැණ නොනැගී උත්තත් මට පළමු බසක් කියන කෙනෙක් නැත, එසේ හෙයින් මම පළමුකොට කථාවක් උපදවමි

සිතා "මහණෙනි! මා එන්නාට පූර්වයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි" විචාරා එක්තරා භික්ෂු කෙණෙකුන් වහන්සේ ඛඩාඤ්ජලීව දෙහොත් මුදුනෙහි තබා ස්වාමීනි! නොකියන්ට වදාළ දෙතිස් කථාවෙන් යුක්තව නූනුම්හ. සර්වඥයන් වහන්සේ මහබිනික්මන් කළ නියාව අපූර්වයයි කිය කියා උනුම්හයි දැන්වූසේක. එපවත් අසා වදාරා "මහණෙනි! මා දැනට බුදු වන ජාතියෙහි මහබිනික්මන් කිරීමෙහි අපූර්ව කිම්ද? පෙර නුමුහුකළ නුවණැති සමයෙහි පවා රාජ්‍යයහැර මහබිනික්මන් කළෙම්වේදැ"යි වදාරා භික්ෂූන් විසින් දැන් වනාහි අප සියල්ලන්ටම ප්‍රකාශය, අතීතයෙහි මහනිබික්මන් කළ නියාව ශ්‍රී බුද්ධයට මිසක් අපට නොදැනෙයි. එසේ හෙයින් වදාළොත් යහපතැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ හිමගර්භයක් මධ්‍යයෙන් චන්ද්‍රබිම්බයක් පානාක් මෙන් ඉකුත්වත් දක්වා වදාළසේක.

මේ කෙසේ ද? යත්,

ඉකුත්වගිය දවස වෙදෙහරට මියුලුනුවර මහාජනක නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අරිට්ඨජනකය පොළොජනකය යන රාජ කුමාරවරුන් දෙදෙනෙකු ලැබ දශරාජධර්මයෙන් රාජ්‍යය කරන්නාහු අරිට්ඨ ජනක නම් රාජකුමාරයන්ට යුවරජ තනතුරුදී පොළොජනක කුමාරයන්ට සෙනෙවිරත් තනතුරුදී දැහැමෙන් රාජ්‍යය කොට මහාජනක රජ්ජුරුවෝ කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියහ. එවිට අරිට්ඨ ජනක නම් යුව රජ්ජුරුවන් වහන්සේ රජ්‍යයට පැමිණ සෙනෙවිරත් ධුරයෙහි සිටි පොළොජනක නම් මල් රාජ කුමාරයන්ට යුවරජ තනතුරු දී දැහැමෙන් රාජ්‍යය කරණ සමයෙහි එක් අමාත්‍යයෙක් ගොසින් අරිට්ඨජනක රජ්ජුරුවන්ට කියන්නේ ස්වාමීනි! යුවරජ්ජුරුවන් වහන්සේ නුඹවහන්සේට වරදින්ට උත්සේකැයි බොරු කියා රජ්ජුරුවන් බිඳවීය. රජ්ජුරුවෝත් යුවරජ්ජුරුවෝ මට එසේ නොසිතති කියා නොගිවිස්සාහ. නැවතත් වරින්වර නුඹවහන්සේට වරදින්ට හා රාජ්‍යයට උත්සාහ කරණසේකැයි කියා බිඳවීය. රජ්ජුරුවෝ මූ කියන්නේ සැබවයි සිතා මල් යුවරජ්ජුරුවන් දඟගෙයි ලැවූහ. යුවරජ්ජුරුවෝ බොහෝ දුක්විඳ සිතන්නාහු මා විසින් මාගේ බෑයන්වහන්සේට නොකට යුත්තක් නොසිතා ඉන්දදීම මට මෙසේවූ දෙයක් පැමිණියේයයි සිතා දම් පුපුරුවන නිසා සත්‍යක්‍රියා කරන්නාහු මම රජ්ජුරුවන් වහන්සේට කයින් වචනයින් ද්‍රෝහයක් කරම්යි නොසිතී නම් මා මැසූ දම් පිපිරේවයි සත්‍යක්‍රියා කළහ. ඒවූ නියායෙන්ම දමත් පිපිරිණ, දොරත් ඇරණ, එවිට එතැනින් පලාගොස් පිටිසර ගමක ඉඳ එගම මනුෂ්‍ය යන් සිත්ගෙණ වාසය කරන්නාහ. රාජ්‍යය කරණ රජ්ජුරුවන් වහන්සේ යුවරජ්ජුරුවන් පිටිසර ගමක ඉඳිති අසා පිරිස් යැවූහ. එවිට එගම්වාසීහු අසල් ගම්වල මනුෂ්‍යයනුත් එක්කොටගෙණ අප ස්වාමීන් නිකම් උන්පසු සේවාකමට ඔබින් ආපසු ඉතිබ්බේ සේවාකම් කරනයි කියා රුස් පිරිස් කඩක්කව්වූ කොටගෙණ ගොස් මියුලුනුවරවටකොට ගත්හ. මියුලුනුවරිනුත් ඇත් අස් රථ වාහන පාබල සෙනග ඇති අමාත්‍යයෙක් තමාගේ පර්ෂද් හා සමග ගොස් යුවරජ්ජුරුවන් දක්වාගත යුවරජ්ජුරුවෝ රජ්ජුරුවන්ට කියා යවන්නාහු නුඹවහන්සේ මා හා පළමු සතුරුකමක් නැතිව ඉන්දදී නුඹ

වහන්සේ මා හා සතුරුවූසේක. එසේහෙයින් මමත් පළමු සතුරුකමෙක් නැතත් දූත් සතුරුවීමි. එසේහෙයින් මා හා කැටිව යුද්ධ කරන්නක්වත් රජ්‍යය දෙන්නක්වත් කළමැනවයි කියා යවූහ. අරිට්ටූජනක නම් රජ්ජුරුවෝ එපවත් අසා කෝපයෙන් කියා යවන්නාහු මාගේ අඎබල සේනාබලයෙන් අඩුවක් නැතිව ඉන්දදී මාගේ රාජ්‍යය කුමට දෙම්ද? යුද්ධ කෙරෙමි කියා යවා අමාත්‍ය මණ්ඩලය හා සේනාව සම්බන්ධකොට නික්ම සිට එකලට අග්‍රමහෙසිකාවන්ගේ දරුගර්භය මුහුකුරා තිබූයෙයින් ලඟට කැඳවා කියන්නාහු සටන් නම් චපලය දිනුම් පැරදුම් නොදනෙයි එසේ හෙයින් දිනා අවොත් ආතියාය සටනෙහි පරාජයෙක් වීනම් තෙපි ගර්භය ඉඳුරා රැකගෙණ තොප දන්නා තැනකට පලායවයි කියා චතුරංගිණී සේනාව ඇරගෙණ අරිට්ටූජනක නම් රජ්ජුරුවෝ නුවරින් පිටත්ව මල් රජ්ජුරුවන් හා ඒ සේනාවත් ඉදිරියට අවුත් දෙසේනාව යුද්ධ කළාහ. එවිට පොළෝජනක රජ්ජුරුවෝ අරිට්ටූජනක රජ්ජුරුවන් හා යුද්ධකොට අරිට්ටූජනක රජ්ජුරුවන් මරා රාජ්‍යයට පැමිණියාහ. එවිට අරිට්ටූජනක රජ්ජුරුවන්ගේ බිසව රජු මළ පවත් අසා බොහෝ සෝකයට පැමිණ උවමනා මුතු මැණික් ආදිවූ අනඝ සම්පත් පැසක ලාගෙණ ඊපිට කසළ නොයෙක්ද ලාගෙණ කිලිටි කඩක් ඇඳගෙණ නුවර උතුරු වාසලින් පිටත්ව තමුන් පළමු අදුනන රටක් ගමක් නැතිහෙයින් කාලචම්පායයි නම් පමණක් අසා එසේවීනම් ඒ නුවර යෙමි සිතා නික්මුණාහ. ඔබ පිළිසිඳි දරු ගර්භය නම් අප මහාබෝධිසත්වයෝය. උන්ගේ ආනුභාවයෙන් ශක්‍රයන්ගේ පඬු ඇඹුල් සලස්න නොකමැති වන තියාගෙන් උණුවිය. එවිට දහසක් නෙත්‍රයෙන් ලෝ බලා බෝධිසත්වයන්ගේ මවු බිසවුන් දුකට පැමිණි බව දැක එනතට මහලු වේසය කින් රථයක් ඇරගෙණ අවුත් කාලචම්පා නම් නුවරට යන්නෝ ඇද්දැයි කියා බිසවුන් කරා රථය ලංකෙළේය. බිසව් එසේවීනම් මම කාලචම්පා නම් නුවරට යෙමියි කීය. එවිට ශක්‍රයෝ රථයට නැගෙවයි කීහ. එවිට බිසවු කියන්නෝ ස්වාමීනි! මම ගරුවූ දරුගැබ් ඇත්තෙමි එහෙයින් රථයෙහි ඉදීම නොපිළිවන මේ පැස තිබන්ට අවසර දුනමැනව මම රථය පසු පස්සෙහි එමියි කීහ. එවිට ශක්‍රයෝ කියන්නාහු මා හා සමාන රථපදිනා රථාචාර්‍ය්‍යයෙක් මේ මුළු දඹදිව නැත. එහෙයින් තෙපි නොබා රථයට නැගෙව නිරායාසව රථය පැදලමි කියා බිසවුන් රථයට නංවාගෙණ පෙරවරු තිස් යොත්නක් ගොසින් ගඟක් සමීපයෙහිදී පලාබත්මුලක් බිසවුන්ට දී බිසවුන් බත් කෑ ඉක්බිති රථ මැදිරියෙහි තිබූ යහපත් දිව්‍යවස්ත්‍රයක් බිසවුන්ටදී යහනෙහි සැතපෙවයි කීහ. බිසවු ශක්‍රයන් කීලෙසම කොට යහනේ සැතපුනාහ එවිට ශක්‍රයෝ පස්වරු අනික් තිස්යොත්න ගෙවා කාලචම්පා නුවරට වන්හ. එවිට බිසව පිබිද මේ කවර නුවරෙක්දැයි විචාළහ. ශක්‍රයෝ කියන්නාහු කාලචම්පා නුවරයයි කීහ, එවිට බිසවු මේ කුමන ආශ්චර්‍ය්‍යයෙක්ද? අපගේ නුවරට මේ නුවර සැටයොත්නක්වුව මේ දූත් තිස් පැයක් දතුරෙහි ආයේ කෙසේදැයි කීහ එබස් අසා ශක්‍රයෝ ලඟ මගකින් ගෙණාමි කියා බිසවුන් නුවර වාසල සමීපයෙහි සිටුවා දෙව්ලොව ගියාහ. බිසවු වාසලින් ඇතුලට අවුත් ශාලාවකට වැද උන්නාහ. එසමයෙහි ඒ නුවර එක් ප්‍රසිද්ධ බ්‍රාහ්මණයෙක් තමා අකුරු කරවන පන්සියයක් මානවකයන් පිරිවරා ජලස්නානය කරන්ට යයි යන්නේ ශාලාවේ උන් බිසවුන් දිට

බිසවුත් දුටු ගමනේම බඩ උන්නාවූ බෝධිසත්ත්වයන්ගේ ආනුභාවයෙන් නැගණියෝය යන්නක් සිතා මාණවකයන් පන්සියයම මෑත රඳවා බමුණු මේ ශාලාවට වැද තෙපි කවුරුද? කෙසේ ආ ගමනෙක්ද? කවර නුවරෙක විසුවාහුදැයි විචාළේය. එවිට බිසවු කියන්නාහු මියුලු නුවර අරිට්ඨජනක රජ්ජුරුවන්ගේ අග්‍රමහේසිකා බිසව නම් මමය උන්වහන්සේ සටනේ නැසී ගිය හෙයින් දරුගර්භය රකිනා නිසා ආමි කීහ, එබස් බමුණු අසා මේ නුවර තොපගේ නෑසිය කෙණෙක් ඇද්දැයි විචාළේය. බිසවු නෑසිය කෙණෙක් නැතැයි කීහ. එවිට බමුණු මේ නුවර බොහෝ ශිෂ්‍යයන් අකුරු කරවා දිසාපාමොක් ආචාර්ය්‍යව ඉන්නා උදීච්‍ය බ්‍රාහ්මණ නම් මමය එහෙයින් තොපි සැකයක් නොසිතව තොපි හා තොපගේ ගර්භය රකිමි තෙපි නැකම් හඟවා බෑයන් වහන්සේයයි මාගේ පාපිට සෝකයෙන් අඩා වැටේවායි සැලැස්වූහ. බිසවුත් එලෙසම හඬා උන්හ. එවිට බමුනානෝත් ඇඬූහ. ඒ දැක වට සිටි අතවැස්සෝ මූ තුඹවහන්සේට කුමක් වේදැයි විචාළාහ. එවිට බමුණු කියන්නාහු පෙර විසොවට පැමිණි මාගේ නැගණියෝයයි කීහ. එවිට මිනිස්සුත් සලස්වා මුත් ඉස්සෝදා නනවා කවා පොවා ඇඳීම් පැලඳීම් සියල්ලෙන් අඩු නොකොට සලස්වවයි බැමිණියට කියා යැවූහ. බැමිණිත් එකී පරිද්දෙන්ම කළාය. බමුණුත් ඉස් සෝධා නහා නොබෝ වේලාවකින් ගෙටවුත් බිසවුත් කැටුව ඉඳුවා බත්කෑමෙන් නැකම් ඇඟවූහ. මේ නියායෙන් කල්යවන අවස්ථාවෙහි ආඥා තේජස් ගුණනුවණ ඇති බෝධිසත්ත්වයන්වහන්සේ උපන්සේක. ඒ උපන් ගමනේ මුතුන් රජ්ජුරුවන්ගේ නාමම මහාජනකයයි නම් තැබූහ.

ඒ කුමාරයෝත් බොහෝ කුමාරවරුන් හා එක්ව කෙළින්නාහ කෙළිමින් සිටි කුඩා කොල්ලන්ට ඇනලන්නාහ. කුඩා කොල්ලෝ නමන්ට රිදෙනා හෙයින් වැන්දඹු පුතෙක් මා මරයිදැයි කියති. එවිට බෝධිසත්ත්වයෝ මෑනියන් කරා ගොස් අම්ම කෙළිමඩලේ කෙළිනා කුඩා කොල්ලෝ මට වැන්දඹු පුතැයි කියති. මට නමා පියෝ ඇද්ද නැද්දැයි විචාළහ. එවිට බිසවු කියන්නාහු මේ සිටිනා බමුනානන් වහන්සේ තුඹගේ පියායයි කීහ. දෙවෙනි වාරයක කෙළිනා තැනකදීත් කෙළිනා කුමරුවන් වැන්දඹු පුතැයි බණන විසින් මෑනියන් වහන්සේ කරා ගොස් පුරතල්පෑ කිරිබොන පරිද්දෙන් තනය කටලානෙණ අම්ම! මාගේ පියානෝ අසවල්හුයයි නියම දැන විනා නොහරිමි කියා තනය ඩැගන්නාන. එවිට බිසවු ආයාස ඉවස ගතනොහී කියන්නාහු පිය රජ්ජුරුවන් සටනේ මළ නියාව පටන් ආදීවූ දෙය නත්වූ පරිද්දෙන් කීවාහ. කුමාරයෝ ඒ අසා එතැන් පටන් රාජ ධෛර්ය්‍යයෙන් කිසිකෙණෙකුන්ටත් නොහඟවා උගතමනා ශිල්ප ශාස්ත්‍ර ඉගෙන සොළොස් ඇවිරිදි වයසට පැමිණ රාජකුමාර මෑනියන් කරාගොස් මාගේ පිය රජ්ජුරුවන් වහන්සේගේ නුවර ඇර ගන්නා නියායෙන් පිරිස් ආණ්ඩුකරන්ට මුතුමැණික් ආදිවූ සම්පත් ඇද්දැයි විචාළහ එබස් අසා මෑනියෝ මුතුමැණික් ආදිවූ අනගි සම්පත් මා ගෙණාවා ඇතැයි කීවාහ. ඒ අසා කුමාරයෝ ඉන් භාගයක් දුන්නොත් වෙළඳාම් කොට වස්තු එක් කෙරෙමියි කීවාහුය. මෑනියෝ ඒ අසා කිසිත් පිටිවහලක් නැති සමුද්‍රයෙහි යන්නා බලාත් මාගේ බොහෝ සම්පත් ඇරගෙණ පිරිස් ආණ්ඩුකරවයි කීහ. එසේ කිවත් මෑනියන් කීබස් අසා නොගිවිස භාගයක් සම්පත් ඇරගෙණ

වෙළඳුන් සත්සියයක් හා කැටිව නැවක නැඟී යාත්‍රාවට නික්මුණාහ. එදවස් පොළෝජනක රජ්ජුරුවෝත් ගිලන්බවට පැමිණියාහ. මහාජනක රාජකුමාරයන් නැඟී වණ්ඩවූ පවන්වේගයෙන් සත්දවසින් සත්සියක් යොදුන් දිව මූද මධ්‍යයෙහිදී නැව නසින්ටවන් අවස්ථාවෙහි මස් කැස්බෝ නැව වට කොට ගත්තාහ. බොධිසත්වයෝ ඒ දැක එළඟිතෙල් හා සකීරා බඩපුරා කා පිළී සඟලක් තෙලින්තෙමා තරකොට ඇඳ එළඟිතෙල් ස්ම්භගයෙහි ගල්වා කුඹඅගට නැඟී මියුලු නුවර දිසාව බලා මත්ස්‍යයන් වලහා ඉස්ඹක් තැන් පැනපුවාහ. එදවසට මියුලුනුවර රාජ්‍යයකාරණ පොළෝජනක නම් රජ්ජුරුවෝ පැමිණියාවූ ව්‍යාධියෙන් පරලොව ගියාහ. එකල්හි බෝධිසත්වයන් සදවසක් සමුද්‍රයෙහි පීනා සත්වන දවස් ආකාශය බලා පිරුණුපෝය දැක ලුණු පැනින් කට සෝධා අටසිල් සමාදන්ව පීනන අවස්ථාවට මහා සමුද්‍රයෙහි දෙමවුපියන් රක්නාසිල්වන් ගුණවත් කෙණෙකුන්දීයෙහි වැටුනොත් එසේවූවත් හොඹලවයි කියා සතරවරම් දෙවියන් විසින් මහමූහුද රැකවලට සිටුවනලද මණිමෙඛලා නම් දිව්‍යස්ත්‍රී තමාගේ සම්පත් ඓශ්වර්‍ය්‍ය මදයෙන් පරක්කුව සදවා සත් මහමූහුද නොබලා සත්වැනි දවස් කිම්දෝහොයි සමුද්‍රය බැලූ තැනැත්තී බොධිසත්වයන් දැක එවිට සිතන්නී මා කෙළේ කිම් දැයි සදවසක් පීනන දැතුරේ නොබැලීම්යි ඉදින් මේ කුමාර සමුද්‍රයේ මළ නම් දෙවතාවෝ මා සමාගමයට වැද්ද නොදෙතියි කියා එසේ හෙයින් මා වහා උන්කරා යායුතුයයි සිනා බොධිසත්වයන් කරා අවුත් ආකාශයෙහි සිට කියන්නී කිසි පිහිටක් නැත්තාවූ සමුද්‍රයෙහි පීනා කොයි පරතෙරක් දක්ක හැකිදැයි දෙව්දුව කිව එවිට බොධිසත්වයෝ කියන්නාහු එම්බල දිව්‍යාඞ්ගනාව වීර්‍ය්‍ය කළවුන්ට සමෘද්ධ නොවන දෙයක් නැතැයි කියා පූර්‍වයෙහි කියන බස අසා වීර්‍ය්‍ය කොට පරතෙරක් දකිනතුරු වීර්‍ය්‍ය කෙරෙමි කීහ. ඊට දෙව්දුව කියන්නී මහා සමුද්‍රයේ පරතෙරක් දක්ක නොහැකි තැනදී වීර්‍ය්‍ය කිරීමෙන් තමාට පෙණෙන උවදුරක් විනා මිත් පෙණෙන සාඵකයෙක් නැත. මේ කුමන අඥනකමෙක්දැයි කිව එබස් අසා බොධිසත්වයෝ කියන්නාහු එම්බල දිව්‍යාඞ්ගනාව! වීර්‍ය්‍යකළවුන්ට නොසැදෙන දෙයක් නැත. වීර්‍ය්‍යය නොකොට මළකල ඇසූ කෙණෙක් අසවල් තැනැත්තේ යන්නම් වීර්‍ය්‍යයක්වත් නොකොට නැසීගියේයයි නින්දා කරන්නාන, එසේහෙයින් නින්දාවෙන් මිදෙනු නිසාත් අසවලා තමාට පිළිවන් විචර වීර්‍ය්‍යය කෙළේයයි වණන්නාවූ කීර්තිය හා යසස් නකාන් පසුව තමාට සිතෙනකල වීර්‍ය්‍යය නොකළා මිසක් නැත්නම් ගැලවීයෙමි සිතන පශ්චාත්තාපයෙනුත් මිදෙමි. එසේහෙයින් වීර්‍ය්‍යය කෙරෙමි කීහ. යම්කෙණෙක් තමාට පිළිවන් විචර වීර්‍ය්‍ය නොකොළෝ නම් අඥනයෝමුත් පින්මද මනුෂ්‍යයෝ නමුත් ඔව්හු මය. එසේහෙයින් මා හා කැටිව එකවිට පඩව් නැංගාවූ සත්සියයක් වෙළඳුන් එකසිම තමන්ගේ වීර්‍ය්‍යය මදහෙයින් මත්ස්‍යයන්ට බත්වයාදී මා කළාවූ වීර්‍ය්‍යබලයෙන් නොපසේවූ දිව්‍යස්ත්‍රියක් මා දුටුයේ වීර්‍ය්‍යානුභාවයෙන් වේද? එසේහෙයින් මා කළාවූ වීර්‍ය්‍යයෙන් පරතෙරක් දකින්නක් වත් මියන්නක්වත් වූවොත් විනා මාගේ වීර්‍ය්‍යය නොහරිමියි බොධිසත්වයෝ කීහ.

එබස් අසා බොධිසත්වයන් කී බසට දෙව්දුව සතුටුව තුන්විටක් සාධුකාරදී වීර්‍ය්‍යවන්තපුරුෂය! නොපසේවූවත් දැකීමම යහපත නෙපි කොයි

යන්ට උත්සාහ කරන්නහුදැයි කීහ. එබස් අසා බෝධිසත්ත්වයන් මියුලුනුවරට යෙමි කීහ. එබස් දෙව්දූ අසා තමාගේ පුතකු වඩාගන්නාක් මෙන් වඩාගණ උරෙහි සතපාගත. බෝධිසත්ත්වයෝත් සත්දවසක් නිදිවර්ජිතකොට පිනූ හෙයින් දෙව්දුවගේ උරමඩලේ වැදහෙව නිදාපුවාහ. දෙව්දූ බෝධිසත්ත්වයන් ඇරගෙණ ගොස් මියුලුනුවයර උයනේ මගුල් සලවට මත්තේ වැදහොවා උයන් දෙවතාවන්ගේ ආරක්ෂාව සලස්වා තමාගේ විමානයට ගියාය. ඊට පළමු පොළෝජනක රජ්ජුරුවන් සවගීසප්වන අවයියෙහි අමාත්‍යයෝ ගොස් රජ්ජුරුවන්ට කියන්නාහු දෙවයන් වහන්ස! නුඹවහන්සේ සීවලි නම් දියනියන් වහන්සේ මිසක් අනික් රාජකුමාරයෙක් නැත්තාහ. නුඹ වහන්සේගේ අයාමෙන් රාජ්‍යය කවුරුන්ට සලස්මෝදැයි විචාළහ. එබස් රජ්ජුරුවෝ අසා යම්සේ සීවලී බිසවුන්ගේ චිත්තාරාධනයකළ කෙණෙක් ඇත්තම්වත් නැත්තම් සිවුරැස්යානේ ඉස්දෙර පාමුල දැනගත කෙණෙක් ඇත්තම්වත් ඇත්තම් දසක්දෙනා නගාබාන මගේ දුන්න ඇදපු කෙනෙක් ඇත්තම්වත් සොළොස් මහ නිධානය තුබුනැන් දැනගන්නා කෙණෙක් ඇත්තම් වත් නැත් තම් දසක්දෙනා නගා බාන මාගේ දුන්න ඇදපු කෙණෙක් ඇත් නම් වත් සොළොස් මහ නිධානය තුබූනැන් දැනගන්නා කෙ ණෙක් ඇත්නම්වත් එසේවූවන්ට රාජ්‍යය දෙවයි කීහ. එබසු අසා අමාත්‍යයෝ සොළොස් මහා නිධානයට කිසි සංඥාවෙක් ඇද්දැයි විචාළාහ. එවිට රජ්ජු රාවෝ ඒ අසා යහපතැයි සොළොස් නිධානය තැබූනැන් සඟවා කියන් නාහු ඉරනැගෙන තැන නිධානයක ඉරබස්නා තැන නිධානයෙක ඇතුළේ නිධානයෙක පිටත නිධානයෙක මධ්‍යයේ නිධානයෙක නැගෙන තැන නිධානයෙක බස්නාතැන නිධානයෙක සල්ගස් අතරේ නිධාන සත රෙක අවටින් යොත්තක් මධ්‍යයෙහි නිධානයෙක දළගෙයි නිධානයෙක වලගෙහි නිධානයෙක කෙබුකෙහි නිධානයෙක සල්ගස් අග නිධානයෙකැයි මෙසේ සොළොස් මහා නිධාන තුබූ සථාන කියා පොළෝජනක රජ්ජු රුවෝ සවගීසප්වූහ. එවිට අමාත්‍යයෝ රජ්ජුරුවන්ට කළමනා ආදාහන කෘත්‍යය කොට ඉක්බිති දවස් රාජාඞගනයට රැස්ව ඇයි? රජ්ජුරුවන්වහන් සේ කී මානය කළමනාවේදැයි පළමුකොට සීවලී බිසවුන්ගේ අභිප්‍රාය දනමනාවේදැයි සිතා පළමුකොට උඩුමාලට නැගී සෙනෙවිරදුන් යැව්වාහ. සෙනෙවිරද්දු උඩුමාලට ගොස් තමන් ආ නියාව බිසවුන්ට කියා යවූහ. බිසවු සෙනෙවිරද්දු එන්නාහයි කියා යවූහ. සෙනෙවිරද්දු ඇවිත් ලඟ සිටියාහ ඒ වේලාවට බිසවු මූගේ ධෛර්‍ය බලන්නට උවමැනවයි සිතා සදල්ලවට දුවවයි කීහ. ඒ මානයට දිව ලඟට වැදින. පය අල්වවයි කියා පය අල්වා උන් සෙනෙවිරදුන්ගේ ලමැදට පයින් ඇන හෙලා බෙල්ල අල්වා ඉනින් පාතට දමාපීහ. එවිට සෙනෙවිරද්දු කරබාගෙණ මුදලිවරුන් උන් ගෙට ගියාහ. එවිට මුදලිවරු බිසවුන්ගේ අභිප්‍රාය දත්තේ ඇද්දැයි විචාළහ. එවිට සෙනෙවිරද්දු තමන්ටවූ ගැහැට නොකියා ඈ කුමක්දැයි යකින්නක් හා සමානය මා සමග කිසි කථාවකුත් නොකොට තොපි තොපගේ ගෙට පලායවයි කීහ.

එබස් අසා අමාත්‍යයෝ එසේවීනම් මම බිසවුන්ගේ සිත ලබමියි වෙන වෙන පිඹිසර පාරක ගියාහ. මේ නියායෙන් සත්දවසක් පලාගිය කල්හි

පුරෝහිත බ්‍රාහ්මණ අවුත් අමාත්‍යයන්ට මෙසේ කියා රජදරුවන් නැති රාජ්‍යය යහපත් නොවන්නේය. එසේහෙයින් පුස්රථය නුවර ඇර පින් ඇති කෙණකුන් දිසාවට රථය තෙමේම ගොස් සිටියේනම් උන් රාජ්‍යයට තබාගණුම්හයි කියා ඒ නියාවට පුස්රථය පිට සේසතය තලල්පටය රුවන් මිරිවැඩිය රුවන් වාමරය මගුල් කඩුවය යන පඤ්චකකුධ භාණ්ඩතබා රජදරුවන් ඇති රථයෙක් වීනම් ධුරය හා සිව්රඟ සෙනඟ ඉදිරියේ යන්නාහ, රජදරුවන් නැති රථය හෙයින් සිව්රඟ සෙනඟ හා ධුරය ඔස්සේ යනලෙස සලස්වා මන්ත්‍රය පිරුවා රථයට පැන් ඉස පින් ඇති කෙණෙක් ඇද්ද ඔවුන් කරායේවයි රථය අලහ. ඒ රථයත් රජගෙය තුන්විටක් පැදකුණුකොටඑත නින් පිටත්ව නුවර තුන්විටෙක ප්‍රදක්ෂිණාකොට නුවරින් පිටත්ව මගුල්උයන බලා නික්මිණ එවිට බොහෝ අමාත්‍යයෝ රථය තම තමන්ගේ ගෙය කරා එයි සිතූ සිතිවිල්ල ඇර රථය උයන බලා නික්මුණු හෙයින් පළමු ගොස් අභ්‍යාසය නිසා යෙයි රථය වලක්වයි අමාත්‍යවරු කීහ එබස් අසා පුරෝහිත බ්‍රාහ්මණ කියන්නේ කොයි යතත් නොවලක්වයි කීය. එවිට රථයත් උයනට ගොස් බොධිසත්‍වයන් වැදහොත් සලවට ගාවට ගොස් නුවරට මූණ ලා බොධිසත්වයන් දිසාවට පිටිපෑ සිටියේය. ඒ වේලාවට පුරෝහිත බ්‍රාහ්මණ ගොසින් බොධිසත්වයන්ගේ පය වසාතිබූ ඉතකඩ ඉවත්කොට පය ලක්‍ෂණ බලා මුළු දඹදිව රාජ්‍යය කරන්නට ලක්‍ෂණ ඇති නියාව් දූත නැවත මෙඩ යසීය බලන නිසා පඤ්චාඞගික තූර්‍ය්‍යනාදයෙන් එකහෙලා ධුරය කරවිය එවිට බොධිසත්වයෝ ඊට චකිතයක් නොවී දකුණු දසාවට නැමී වැදහොත්තාහ. එවේලෙහි බ්‍රාහ්මණ ගොසින් කියන්නේ සවාමීනී! නුඹවහන්සේට මේ මියුලු නුවර රාජ්‍යය පැමිණෙයි කීය. ඇයි මේ නුවර රාජ්‍යය කරණ රජ්ජුරුවෝ කොයිද්දැයි විචාළහ. අදින් සත්දවසය රජ්ජුරුවන් වහන්සේ සවර්‍ගස්ථ වූවාහු යයි කීය. එබස් අසා රජ්ජුරුවන්ගේ දරුකෙණෙක් නැද්දැයි විචාළාහ. සීවලී බිසවුන් මිසක් රාජකුමාර කෙණෙක් නැතැයිකීය. එබස් අසා යහපතැයි ගිවිස්සාහ. එවිට රුවන් රුසක්පිට සිටුවා ඉස් සෝධානහවා අභිෂෙක ආදීවූ කළමනා සිරිත් කරවා රථය පිට නංවා මහත්වූ පෙරහරින් නුවරට වඩාගෙණාහ. ඒ නුවරත් මහාජනක රජ්ජුරුවන්ගේ ආඥයයිකියා ආඥපතුරුවා රජගෙට වුන් වන; සීවලී බිසවුන් රජ්ජුරුවන් ආ පවත් අසා සෙස්සන්සේ රවටාපිය ඇතැයි සිතා තමන්ගේ මිනිසුන් අත වහා වඩිනේ යහපතැයි කැඳවා යවූහ. එබස් අසාත් ඊට වක්‍ෂවලව වහා නොගොසින් සෙමෙන් සිට මාලිගාවේ ඒ ඒ තැන සිතුවම් ආදීවූ දෙය බලබලා බිසෝ ගෙට ගියාය. බිසවුන් රජ්ජුරුවන්ගේ ආඥ තේජසින් උත්පල ඉඳගත නොගී නැගීසිට පෙර ගමන්කොට අවුත් අතදී තමන්ගේ වාසස්ථානයට ඇරගෙණ ගියාහ. රජ්ජුරුවෝ සත රුස් යානාව දූක ඉසතිබූ රන්ඉද්ද ගලවා බිසවුන් අතට දුන්හ. බිසවු ඒ රන්ඉද්ද ගෙණගොසින් ඉස්දෙර තිබුවාහ. එවිට රජ්ජුරුවෝ ඉස්දෙර දූත අමාත්‍යයන් අතින් තොපගේ රජ්ජුරුවන් සවර්‍ගස්ථවන ගමනේ කී දෙයෙක් ඇද්දැයි විචාළහ. සවාමීනි, සීවලී බිසවුන් අභිප්‍රාය ළත් යම් කෙණෙක් ඇද්ද? සතරුස් යානේ ඉස්දෙර පාමුල දූතගත් කෙණෙක් ඇද්ද? දහසක් දෙනා නගාලන බාලන දුන්නේ දුනුදිය ලූ කෙණෙක් ඇද්ද? සොළොස් මහා නිධානය දන් කෙණෙක් ඇද්ද? ඔවුන් රාජ්‍යයට පමුණුවයි කීසේක.

එබස් අසා සොළොස් නිධානයට කී නිධන් ලක්‍ෂණයෙක් ඇද්දැයි විචාළහ. එවිට අමාත්‍යයෝ නොදනෙත පමණක් විනා ලක්‍ෂණ කීසේකැයි කියන්නාහු ඉරුනැගෙන තැන නිධානයෙක බස්නාතැන නිධානයෙක ඇතුළෙහි නිධාකයෙක පිටත නිධානයෙක නැගෙනතැන නිධානයෙක බස්නාතැන නිධානයෙක සල්ගස් සතරේ නිධාන සතරෙක අවටින් යොත්තක් මධ්‍යයෙහි නිධානයෙක දළගෙහි නිධානයෙක වලගෙයි නිධානයෙක කෙබුකෙහි නිධානයෙක සල්ගස්අග නිධානයෙකැයි කියා මෙසේ සොළොස් මහා නිධානයට කී සළකුණු කීහ. එබස් රජ අසා සීවලී බිසවුන් මට ලැබුනු නියාව දන්නවාදැයි යාන ඉස්දෙරත් මේයයි කියා යාන පිට ඉඳ දුන්න ගෙන්වාගෙණ දහසක් දෙනා ඇදලන දුන්න ස්ත්‍රියක රොද්දක් අදිනාසේ යානපිට ඉඳම දුන්න දුනු දිය ලා දුන්න ඇද සොළොස් නිධානය පානා රජ්ජුරුවෝ තොපගේ රජ්ජුරුවන්ගේ ගෙට සිඟාඑන පසේබුදුකෙණෙකුන් වහන්සේ ඇද්දැයි විචාරා ඇතැයි අසා ඉර නැගෙනතැන නිධානය නම් පසේබුදුන් වහන්සේ ඇවිත් වැඩසිටිනා තැන නිධානය ඉරබස්නා තැන නිධානය නම් පසේබුදුන් වහන්සේට පසු ගමන්කොට රජ්ජුරුවන් වැලකුනු තැන නිධානය ඇතුළේ නිධානය නම් එළිපතින් ඇතුළත නිධානය පිටත නිධානය නම් එළිපතින් පිටත නිධානය මධ්‍යයේ නිධානය නම් එළිපත මධ්‍යයේ නිධානය සල්ගස් සතර මූල නිධාන සතර නම් සල්දණ්ඩින් යාන් කකුල් කළවිසින් යාන් කකුල් සතර යට නිධානය අවටින් යොත්තෙක නිධානය නම් යහන් කකුල් සතර මධ්‍යයෙහි නිධානය නැගෙන තැන නිධානය නම් ඇතු නැගෙන තැන නිධානය බට තැන නිධානය නම් ඇතුගෙන් බස්නාතැන නිධානය දළඅග නිධානය නම් ඇතුගේ දළ තිබූ ඡායායෙහි නිධානය වලග නිධානය නම් මඟුලසාගේ වල්ග ඡායායෙහි නිධානය කෙබුකෙහි නිධානය නම් මඟුල්පතස මධ්‍යයෙහි නිධානය සල්ගස අග නිධානය නම් මධ්‍යාහ්නවේලාවට ඡායා අග වැටුනු තැන නිධානයයි කියා මෙසේ සොළොස් මහානිධානය ලක්‍ෂණ කියා නිධාන සොළොසම උඩ නංවා අමාත්‍යයන්ට පෑ; තවද රජ්ජුරුවන් කී දෙයක් ඇද්දැයි විචාරා නැතැයි කියා අමාත්‍යයෝ මහා සන්තොෂයට පැමිණියාහ. රජ්ජුරුවෝ සදන්සැල් කරවා මහත්වූ දන පරිත්‍යාගය යාචකන්යට සලස්වා රාජ්‍යය කරන්නාහ. අවශෙෂ රජදරුවෝත් රජ්ජුරුවන්ගේ පණත් අසා සතුටුව පඬුරු පාක්කුඩම් එවා සිත්ගෙණ දවස් අරින්නාහ. එසමයෙහි රජ්ජුරුවෝත් තමන් මෑනියන් හා තමන්ට උපස්ථානකළාවූ දිසාපාමොක් ආචාරීන් හා දෙන්නාට බොහෝ පඬුරු පාක්කුඩම් යවා බොහෝ වාල්සරක් ගම්බිම් ආදිවූ වස්තු දී රැක්කාහ.

එක් දවසක් නුවරමුළුල්ලෙහි මහත්වූ අලංකාරයෙන් දිව්‍යපුරයක් මෙන් සරහා රජගෙයත් සුධර්මා නම් දිව්‍යසභාවමෙන් සරහා රජ්ජුරුවෝත් ශක්‍ර දෙවේන්ද්‍රයාමෙන් සැරහී සිංහාසනාරූඪව වැඩහිඳ ඒ ඒ දිසායෙහි අමාත්‍ය පර්ෂද් බ්‍රාහ්මණ පර්ෂද් ගෘහපති පර්ෂද් හා සොළොස් දහසක් නාටකස්ත්‍රීන් ඒ ඒ තැන සිට දක්වන්නාවූ නැටීම් ගී කීම් ආදිවූ හාව භාව උත්සව ක්‍රීඩා හා දහස් ගණන් අත් ඔසවා කියන්නාවූ වන්දිභට්ටයන්ගේ කීර්තිඝොෂාව හා ඒ ඒ තැන සිට ගසන්නාවූ ආතතය විතතය විතතාතතය ඝනය සුසිරය යන පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය ඝොෂාවෙන් මාළිගාව එකනින් නාදවිය. මෙසේ මහත්වූ රාජ ඓශ්වර්‍ය්‍යය හා ප්‍රතාපය දැක මේ සියල්ලම මං ලද්දේ සමුද්‍රය පීනා කළාවූ

වීර්‍ය්‍යයී බලයෙනැයි සිතා උදන් අනන්නාහු වීර්‍ය්‍යයී කලවුන්ට සියල්ලම සිද්ධවෙයි කියා පූර්වාචාර්‍ය්‍යවරයන් කියන්නාවූ බසෙහි සැක හරණා ලදැයි යමක් සිතුවොත් සිතුවක් නොවන නියාවත් මාගෙන්ම දනිමි. මා සිතුයේ වෙළඳාම්කොට අර්ථය උපදවා පිරිස් ආණ්ඩු රැස් කොට පිරිසට පඩිලවා යුද්ධ කොට රාජ්‍යය ඇරගණිමියි කියායි, ඒ සිතු සිතිවිල්ල නොවී මෙසේ ඇවිත් කුසල බලයෙන් කිසි ආයාසයක් නොවිඳ රාජ්‍යය ලදිමි කියා මෙලෝ පරලෝ දූත පසේබුදුන්වහන්සේට දන්දී වාසය කරන්නාහ.

එසමයෙහි සීවලී බිසවුන් රාජකුමාරකෙණෙකුන් වැදූහ. ඒ කුමාරයන්ට දීඝායු කුමාරයෝය යි නම් තබා ඒ කුමාරයන්ට සොළොස් ඇවිරිදි වයස්වූකල යුවරජ තනතුරු දී වසන සමයෙහි උයන්ගොව්වෙක් උයන්හි වූ පලවැල රජ්ජුරුවන්ට ගෙණගොස් පෑය. රජ්ජුරුවෝ දැක යහපතැයි අපි උයනට යම්හයි කීහ. යහපතැයි උයන්ගොව්වන් උයනට ගොස් නඳුනුයනසේ සරහා රජ්ජුරුවන්ට කියා යවීය. රජ්ජුරුවෝත් මහසේනාව පිරිවරා ඇතු සරහා ඇතුපිටට පැනනැගී ශක්‍රදෙවේන්ද්‍රයාමෙන් උයනට ගොස් උයන් දොර කඩ සිටි පලද අඹ රුකක්ද නොපලද අඹ රුකක්ද දැක පලද අඹගසින් අඹ ගෙඩියක් කඩා අනුභවකොට පසුව එනකල අඹකඩා කම්හයි සිතා රජ්ජුරුවෝ නික්මුණාහ. පස්සේ යන යුවරජ සෙනෙවිරද් ආදීවූ අමාත්‍යමණ්ඩලයා හා රැස් පිරිස් අඹ පොලු ගසා කඩාකෑමෙන් ගස අතුපතු බිඳුවාපූහ. නොපලද ගසට කිසිම හානියක් නොවී තුබුයේය. රජ්ජුරුවෝත් දවල් දවස උයන් කෙළ සවස්වේලෙහි රජගෙටයන්නාහු උයන් දොරකඩ සිඳී බිඳී පියා තුබූ අඹ ගස දැක අමාත්‍යයන් අතින් විචාරන්නාහු ඇයි යන වේලාවට ගස් දෙකම කිසි හානියක් නොවී දැන් මේ ගසට මෙසේ හානිවන්ට කාරණා කිම්දැයි විචාළහ. එබස් අසා අමාත්‍යයෝ කියන්නාහු දෙවයන්වහන්ස පලද වෘක්ෂය විනාශයට පැමිණියේය. නොපලද වෘක්ෂය කිසි හානියක් නුවූයේයයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ සිතන්නාහු සම්පත් ඇතිවීමෙන් වන්නාවූ හානි අඹගසට වූවාක්මෙනැයි සම්පත් නැතිව සැපසේ තපස් කොට ජීවත්වීම නොපලද අඹ ගස මෙනැයි කිසි හානියක් නොයෙදේයයි සිතා ගිහිගෙයි ඇලුම් හැර මහණ වීමෙහි ඇලීම ඇතිව රජගෙට අවුත් එක් අමාත්‍යයකුට කියන්නාහු තා විසින් එකවේලක බත් හා දුවටි දඹු පෙරු පැන් ආදීවූ දෙය ඇරගෙණ තෝම උඩු මාලට එවයි කියා සලස්වා මේ නියායෙන් සත්මසක් උඩුමාලෙන් පාතනොබැස තපස් රැක්කාහ. නුවරවාසීහු සවාමීනි! සත්මසක් දැතුරේ කෙළි සිනාවකුත් නැතුව උඩුමාලේ භාවනා කරණ කෙණෙකුමෙන් වැඩිහිදිනාසේක. මේ කිම්දැයි ඇලලී මියුලුනුවර මහත්වූ කොලාහලවීයයි කීහ. මහාජනක රජ්ජුරුවෝත් පසේබුදුන්ට පූජා සත්කාර කරණහෙයින් මහණවන අභිප්‍රාය ඇතිව රාජ්‍යයෙහි කලකිරී ශක්‍රභවනයක් හා සදෘශවූ රාජ්‍යයහැර කවරදෑ මහණවෙම්ද? වීථිපවුරු වාසලින් ශොභමාන මේ නුවර හැර කවරදෑ මහණ වෙම්ද? සප්තවිධ ධ්‍යානයෙන් හා ක්ෂෙත්‍රභූමි ආදීවූ දෙසින් සොභාවත්වූ නුවරහැර කවරදෑ මහණවෙම්ද? රත්රන් අමුරන් ආදීවූ සම්පත්තීන් පිරුණාවූ භාණ්ඩාගාර ගෙවල් හැර කවරදෑ මහණවෙම්ද? දිව්‍යස්ත්‍රීන් හා සමානවූ ස්ත්‍රීන්

හැර කවරදා මහණවෙම්ද? කසීපිළි පටපිළි පටකඩ දෙවාඹග ආදීවූ විසිතුරු පිළියෙන් සරහන්නාවූ යහන් හැර කවරදා මහණවෙම්ද? ධවලච්ඡත්‍රය හා සිංහාසන ආදීවූ දෙය හැර කවරදා මහණවෙම්ද? කළුවැල් තුරවලා කපුරු ආදීවූ නොයෙක් සුවඳ හැර කවරදා මහණවෙම්ද? උද්‍යාන පුෂ්කරණී පුෂ්පාරාම ආදීවූ විසිතුරු ස්ථාන හැර කවරදා මහණවෙම්ද? හස්ති, අශ්ව රථ, පාබල සේනාංග යන චතුරඞ්ගිණී සේනාව හැර කවරදා මහණවෙම්ද? දෝලි ඉද්දෝලි කූතම් ආදීවූ යාන වාහන හැර කවරදා මහණවෙම්ද? මේ කියනලද ඓශ්වර්‍ය්‍යයෙන් සමෘද්ධවූ මිථිලා නම් රාජධානිය හැර කවරදා මහණවෙම්ද? කවරදා තුන් සිවුරු පාත්‍රාධරව සැදී ආහාර ශෙවලින් සිඟා වළඳම්ද? කවරදා ඒ ඒ රුක්මුල හිඳ භාවනා කොට මහණදම් පුරම්ද? මේ නියායෙන් ද්වස්පතා සිත සිතා ඉන්නාහ.

එසමයෙහි මනුෂ්‍යයන්ගේ ආයුෂය දසදහසක් අවුරුදුය. ඒ රජ්ජුරුවන්ගේ ආයුෂයෙන් සත්දහසක් අවුරුදු ඉක්ම සිටියේය. එවිට රජ්ජුරුවෝ මෙහි ඉඳ කාරිය කිම්දැයි සිතා කාටත් නොහැඟවා තුන්සිවුරු පාත්‍ර වීථියට මිනිසුන් යවා ගෙන්වාගෙණ මගුල්කපුවා ගෙන්වා ඉසකේ කපා මහණවූහ. මේ නියාවට මහණව පාත්‍රය පිටබැඳ සැරයටිය අතින්ගෙණ සක්මන්කොට මටවූ සැපය සොඳනියායයි සිතා එමදා රෑ එතනම ලැග දෙවනදවස් මහබිනික්මන් කෙරෙමි සිතා ඉණින් පාතට බස්නා නියා ඉණිඉසට කියත. ඒ වේලාවට සීවලී බිසවුන් සත්සියයක් බිසෝවරුන් පිරිවරා සත්සියයක් දෙනත් තුමූත් සර්‍වාලඞ්කාරයෙන් සැරහී රජ්ජුරුවන් රඳවාගන්ට උඩුමාලට රජ්ජුරුවන් දකින්ට නික්මුණාහ. උඩුමාලට නැගෙන්නාහු මහණවේසයෙන් බස්නාවූ රජ්ජුරුවන් දැක ඇඳිනගතනොහී පසේබුදුනැයි සිතා වැඳලා උඩුමාලට පැන නැංගාහ. රජ්ජුරුවෝත් රාජාඞ්ගන මධ්‍යයෙන් නික්මුණාහ. සීවලී බිසවුත් රජ්ජුරුවන්ගේ කෙස්වැටිය හා ආභරණ හා සළු දැක එසේවීනම් සවාමීන් වනැයි සිතා වහ වහා බැස රාජාඞ්ගනයේ යන රජ්ජුරුවන් දැක ඉසකේ මුදා පිටව හෙලා ළෙහි අත්ගසා බිසෝවරුන් සත්සියය සමගම පා පිට අඬා වැටුනාහ. බිසවුත් මා හා සත්සියයක් බිසෝවරුන් හා අන්තඃපුරවාසීන් පිටිනුවර වාසීන් ඇතුළුවූ මෙතෙක්දෙනා හැර වඩිනේ කුමටද? වැරැද්දෙක් ඇත්නම් ඇඟෙ කරවන පමණක් විනා වඩිනේ ඇයිදැයි අඬ අඬා යාදීත් බොධිසත්ත්වයෝත් නොබලාම නික්මුණාහ. නුවරවාසී සියල්ලෝත් ඇලලී රජ්ජුරුවන් කරා අවුත් සවාමීනි! වැරද්දෙක් ඇත්නම් ඇතුළේ වුවත් පිටත වුවත් දැන් අපි පිරිමසා ලම්හ. නුඹවහන්සේ මිසක් මේ රාජ්‍යය කරන්ට නිස්සෝ කවුරුද? එසේහෙයින් නුඹවහන්සේ වඩිනේ කොහාටදැයි කීහ. එසේ කීවත් රජ්ජුරුවෝ නික්මුණාහ. බිසෝවරු අඬමින් වලපමින් රජ්ජුරුවන් හා කැටිව සීවලී බිසවුන් ප්‍රධානකොට ගියාහ. රජ්ජුරුවෝ බිසෝවරුන් අමාත්‍යයන් ආදීවූ සියලු ජනයන් පසුපස්සේ අඬ අඬා ආවත් බොධිසත්ත්වයෝ සිතන්නාහු පඤ්චකාම විෂයන් අනුභවකොට රාජ්‍යය කරන්නා බලාත් හිමාලය වනයෙහි තපස් කොට ජීවත්වීම මට රාජ්‍යයක් හා සමානයි සිතා නික්මුනාහ. මේ නියායෙහි රාජ්‍යයෙහි ඇල්ම නැතිව යන්නාවූ රජ්ජුරුවන් දැක සීවලී බිසවු අමාත්‍යයන්කැඳවා කියන්නාහු රජ්ජුරුවෝ රාජ්‍යයෙහි ඇල්මක් නැතිව නික්මෙන්නාහ. ඉදිරියේ මාලු ශෙවල් ගිනිලාපියවයි කීහ; අමාත්‍යයෝත්

එසේම මාලු ගෙවල් ගිනි ලැවූහ. සීවලී බිසවු රජ්ජුරුවන් කරාගොස් දෙවයෙනි' නික්මුණු මාවත ගිනි පෙණෙන්නේය. එසේහෙයින් මේ ගමන යහපත් නොවෙයි. බොහෝ සම්පත් නසිනා දැක දැක යන්නේ ඇයිදැයි කීහ. බෝධිසත්වයෝ සීවලී මාගෙන් නස්නේ කිම්දැයි කියා නික්මුණාහ. නැවත සීවලී බිසවු සතුරන්වන් තැනක්සේ අමාත්‍යයන්ලවා සටන් බෙරගස්වා ආයුධවල අලනා වළකා මනුෂ්‍යයන් ශරීරයෙහි අලනා හා ඒ ඒ තැන ගෙණ යන්ට වන්නාහ. එවිට සීවලී බිසවු නුඹවහන්සේ නික්මුණු පමණකට මේ ගම උනුන් කොටන්ට වන්න. එසේහෙයින් ඒ කියන හය සංහිඳුවා වැඩි සෝත් යහපතැයි කීහ. එවිට රජ්ජුරුවෝ එබි ඇල්මක් ඇතොත්වේද? මට ඒ උවමනාය මට ඉන් කම් කිම්දැයි නික්මුණාහ. නික්ම අඩගව්වක් පමණ තැන් ගියපසු මංසන්ධියක් දැක අමාත්‍යයන් අතින් මේ සන්ධිය කිනම් තැනෙක්දැයි විචාරා මේ මියුලුනුවර සීමාව මෙතනින් නිමියාය සවාමීනී කීවාහ. එවිට රජ්ජුරුවෝ මුන් ඇම රඳවමි සිතා තොප ඇම එන්නේ මාතකා උව එසේ හෙයින් මාගේ අණ ඇත්නම් මේ ඉරින් මෙපිට නේවයි සැරයටියෙන් ඉර ඇන්දාහ එවිට සීවලී බිසවු ඉර මඩයේ අඩා වැටී ඉර මකා නුඹවහන්සේගේ පුතනුවන්වහන්සේ දීඝායු කුමාරයන් වහන්සේට රාජ්‍යය පමුණුවා වැඩිය මැනවයි කීහ. රජ්ජුරුවෝ තෙපි අමාත්‍ය මණ්ඩලයා හා එක්ව රාජ්‍යය තකාගණුවයි කිය නික්මුණාහ.

එවිට මහාසේනා පසු පස්සේ එන්නාහු සීවලී බිසවුන් කැටිවම එන්නාහ. මේ නියායෙන් සැටයොත්තක් ගියපසු එසමයට නාරද නම් තාපස කෙණෙක් හිමාලය වනයෙහි ගල්ගුහාවෙක්හි සත්දවසක් ධ්‍යාන සැපයෙන් දවස් යවා සත්වන දවස් ධ්‍යානයෙන් නැගී මටවූ සැපය යහපතැයි සිතා මේ නියා සැපතක් තවත් පතන්නෝ ඇද්දැයි දිවසින් බලා මහාජනක රජ්ජුරුවන් තාපස වෙසය ඇරගෙණ එන්නවුන් දැක උන් කරා බැස රජ්ජුරුවෙනි! තොපි කවුරුද? කොයි යව්දැයි විචාරන්නාහු සවාමීනි, හිමාලය වනයට තපසටයෙමි. කී විසින් සේනා සමූඛයෙන් මේ තපසට ආ නියාවද? පඤ්චකාමයෙහි ඇල්ම ඇර තොපට තපස් කරන්ට සුවදැයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු දිව්‍යසම්පත් හා සමාන සම්පත් හැර ආ මට තපස්කරන්ට කුමන ආයාසදැයි කීහ. එවිට තාපසයෝ මෙසේ මෙසේ කළමැනවැයි අවවාද කියන්නාහු එක්වන් නිද්‍රාවද චක්ෂුව අලස වීම්ද උකටලී වීම්ද පමණ නොදන ආහාර වැළඳීමද වීර්‍ය්‍යකිරීමද පංචකාමයෙහි ඇල්ම් ඇරීම්ද යනාදීන් මේ කියන සියල්ලම නොවැද්දදී රැක්කොත් මිසක් තපසට උනනය. සංසාරයෙන් ගැලවී යන්ටත් උනකටයයි කීහ රජ්ජුරුවෝ එබස් අසා සතුටුව නුඹවහන්සේ කවුරුදැයි විචාළාහ. ඊට තාපසයෝ කියන්නාහු කාශ්‍යප කුලයෙහි උපන් නාරද තාපසයෝ නම් මමය, තොප ගන්නාවූ වේසය තොපට නිසිය. එසේහෙයින් උකටලී නොව සතර බ්‍රහ්මවිහාර පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බඹලොව ගියමැනවයි අවවාද කියා තමන් වසන්නාවූ ගල්ගුහාවට ගියාහ.

ඉක්බිති මිගාරජින නම් තාපස කෙණෙක් සත්දවසක් ධ්‍යානයෙන් ඉඳ ගොඩනැගී ලොව බලා බෝධිසත්වයන් දැක කියන්නාහු මියුලුනුවර රාජ්‍යශ්‍රිය හැර කුමක් නිසා අවුද? නුවරවාසීන්ගේ කලකිරීමක් නිසා මහණවූදැයි විචාළාහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු නුවරවාසින්ගේ හා මාගේ වැරැද්දක්

නොවෙයි, මම්ම පඤ්චකාමයෙහි ආදීනව දැක ප්‍රව්‍රජ්‍යාවේ ඇල්මකොට මහණ වීමියි කීහ. එබස් මිගාරජිත නම් තාපසයෝ අසා තොපගේ බස් බුදුන් රත්‍න ත්‍රයත් අභිප්‍රායතරම් බස්මයයි සතුටුවී කියන්නාහු තොපට මහණවන්ට උපදෙස් දෙනලද්දේ බුදු පසේබුදු රත්‍නත්‍රයත් විසින්ද කවුරු මේ උපදෙස් කීවෝදැයි විචාළාහ. රජ්ජුරුවෝ මිගාරජිත නම් තාපසයන්ට කියන්නාහු මම අනික් ගුරු උපදෙසයකින් මහණවූ ගමනෙක් නොවෙයි එක් දවසක් මහත්වූ පෙරහරින් උයනට ගියෙමි යමින් සිට උයන්දොරකඩ සමීපයෙහි පලඳගසක් හා නොපලඳ ගසක් දැක පලඳ ගසට වූ හානිය දැක මේ ගස පලඳ විසින් ගසට හානිවීය. ඇතුන්ට දළ නිසා හානිවෙයි, දිවියන්ට සම් නිසා හානිවෙයි, මනුෂ්‍යයන්ට සම්පත් නිසා හානිවන නියාව දැන මම පඤ්චකාමයෙහි ඇලුම් ඇර මහණවීමියි කීහ. එබස් තාපසයෝ අසා සතුටුව තමන්ගේ වාසස්ථානයට ගියහ. සීවලී බිසවුන් කැටුවම ගොස් ස්වාමීනි, නුඹවහන්සේ මහණවූකල මම කුමක් කෙරෙම්දැයි විචාරා තොපත් රාජ්‍ය සම්පත් හැර මහණවනුවයි කියා මේ නියායෙන් කථාකරණ කලට රුව ගිය. ඒ වේලෙහි සීවලී බිසවුන් සේනාවත් එක් තැනක කඳවුරු බැඳගෙණ උන්නාහ. බොධිසත්වයෝත් රුක් ගසක්මුල වැඩහිඳ මෛත්‍රීභාවනා කොට කය සතපාගෙණ නික්මුණාහ. සීවලී බිසවුන් සේනාව පස්සේ එන්ට සලවා තුමූ කැටිව නික්මුණාහ. මහාජනක රජ්ජුරුවෝත් ඒ වෙලාවට රුහැණී නම් නුවරට ගොස් වන්හ. ඒ වේලාවට එක් මිනිසෙක් දඩමස් කැටියක් අත මිලට අරගෙණ කම්පස්කොට පුළුස්සා ලවයි අරක්කැමියාට දීන, අරක්කැමිත් පුළුස්සා නිවෙන්ට තැබීය. ඒ වේලාවට එක් බල්ලෙක් අරක්කැමියාගෙන් අවසරයක් දැක ඒ දඩමස්කැටිය ඩැගෙණ දිවපීය, මිනිසාත් පසුපස්සෙහි දිව වැටී හුන්හ. බලුත් දිවන්නේ රජ්ජුරුවන් හා බිසවුන් ඇතුළු නුවරට වඩිනවුන් දැක දෙන්නා මධ්‍යයේ එලා දිවපීය. බොධිසත්වයෝ මස්කැටිය තමන් පාපිට එලාපි හෙයින් කැපය කියා වැලිපිස දඩමස් කැටිය පාත්‍රයේ ලාගත්හ. පැන් පාසුතැනකට ගොස් වළඳන්ට උන්කලට බිසව් කියන්නාහු ස්වාමීනි, පලමු රාජ්‍යකලමුත් දැන දැන බලු ඉඳුල් පිළිකුල් නොවී වළඳද්දැයි කිවුය. එබස් රජ්ජුරුවෝ අසා එම්බල කැපවූ ආහාරය හෙයින් එයම ප්‍රමාණයයි කියා සිතා වළඳා පාත්‍රා සෝධා අතකට සෝධාපුයේක.

එවිට බිසව් කියන්නාහු වංශවත් කෙණෙක් කීපවේලක සයින් උන්නත් බලු ඉඳුල් කද්ද? නුඹවහන්සේ රාජ්‍යයෙහි පිහිටා සිට කෙළේ කිම්දැයි කියන්නා එවිට රජ්ජුරුවෝ කියන්නා මිනිස් ඉඳුල් වුවත් බලු ඉඳුල් උවත් කැපයෙන් ලත්දෙයක් යහපතැයි කියා දෙන්නම ඇතුළු නුවරට වන්හ. ඒ වේලාවට කෙළිනා එක් කුමාරිකාවක් අතක වළලු දෙකක් හා එක් අතක එක් වළල්ලක් තබාගෙණ කෙළිනා විසින් වළලු දෙක ඇති අත අඬන්නේය, එක වළල්ලේ අත නාඬන්නේය, බොධිසත්වයෝ එය දැක සීවලී දෙවීනි, මා හා කැටීව ඊමෙන් බොහෝකොට නින්දාබස් උපදියි එසේ හෙයින් වැලි කෙළිනා කුඩා කෙල්ල ලවාම දෙස් කියවමි සිතා කෙළනා කුඩා කෙල්ල අතින් විචාරන්නාහු ඇයි තොපගේ එක් අතෙක වළලු අඬන්නේත් එක් අතෙක වළලු නාඬන්නේත් කුමක්දැයි විචාළහ. එවිට කුඩා කෙලි කියන්නී ස්වාමීනී, වළලු දෙක තිබු හෙයින් එක් අතෙක් අඬන්නේය, එක් අතෙක් එක වළල්ල නිසා නොහඬන්නේයයි කීහ. එසේහෙයින් රජ්ජුරුවන්වහන්ස, රාජ්‍යය ශේසතු

ඇරපියා ආපසු තනිව ගොස් තපස් කරතොත් විනා බිසවුන් හා සමග මේ කිම්ද? කීව එබස් අසා සතුටුව බිසවුන්ට කියන්නාහු බිසවුනි, නිසාම් අඥත මිනිසුන්ලවා මටනින්දා නොකරවා තොප මේ මගපලායවයි මගපෑ කියන්නාහු අදපටන් තොපි මට බිසෝකෙණෙක්ද නොවෙව තොපට මම ස්වාමිකෙණෙක්ද නොවෙමි කීහ. මේ මග පලායවයි කී බසට ඒ බිසවු පොරොත්තු කළතොගී එසේවීනම් නුඹවහන්සේ දකුණු මග ගිය මැනව මම වම් මග යෙමි කියා සිඟිත්තක් තැන් නික්ම නැවත සෝක ඉවසාගතතොගී මහට බැස රජ්ජු වත්ට කථාකෙරෙමින් එක්වමම නුවරට වන්හ.

වීථියෙහි සිඟාගෙණ යමින් සිටි කලට ඊවඩුවෙකුගේ ගෙදොරට පැමිණියාහ, ඒ ඊවඩුවා කාඩියේ ඊ දඬු ගල ගලා එක ඇසකින් ඊදණ්ඩ ඇද මඩිනවුන් දැක බොධිසත්ත්වයෝ විචාරන්නාහු ඈයි තා එක ඇසින් ඊදණ්ඩ ඇද අරනේ කුමක් නිසාදැයි විචාරන්නා ඊවඩු කියන්නේ දෑසින් බැලුවොත් නොපෙණෙයි එක ඇසින් බැලුවොත් පෙණෙයි කියා නැවත අවවාද කියන්නේ මෙසේ නුඹවන්සේත් තනිව තපස් කළ මැනවැයි අවවාද කීහ. බෝධිසත්ත්වයෝත් නුවර බත් සිඟාගෙණ පසු තැනකදී වළඳා පාත්‍රය සෝධා උරයේ බහාගෙණ සීවලී බිසවුනි, තොපි රඳවයි කියා නික්මුනාහ. එසේ කීවත් එක්වමම එන හෙයින් වනය සමීපයෙහිදී තණ පඳුරක් අතින් කඩා දෙකැබැලි කොට බිසවුනි, මේ කැඩු තණ දෙමිට එක්වේ නමුත් තොප හා මා එක්වීමෙක් නැත, තෘෂ්ණාව අලෙම් රඳවයි කීහ. එබස් අසා බිසවු සෝකයෙන් මූර්ඡාව මුණින් වැටුනාහ. ඒ ප්‍රස්තාවේදී රජ්ජුරුවෝ වනා වලට වැද ගැලවී යෙම් සිනා හිමාලය වනයට නික්ම අතරමඟ වන විස්තර බල බලා හිමාලය වන තුළට වැද අතික් තුන්දසක් අවුරුදු නාරද මිගාරජින තාපසවරුන් කී නිසාවට ඝොර තපස්කොට සතරබ්‍රහ්මවිහරණ යෙන්භාවනාකොට බඹලොව ගියාහ. එවිට සීවලී බිසවුන් පසු පස්සේ ආ අමාත්‍යයන් හා සේනාව සීවලී බිසවුන්ට පැන්ඉස සනතර්පණය කොට සම්භාවනා කළහ. සීවලී බිසවු නැගී සිට අමාත්‍යයන් අතින් ස්වාමීන් කොයිදැයි විචාළහ. අමාත්‍යයෝ කියන්නාහු නුඹවහන්සේ වේද කැටිව ආසේකැයි කියා අමාත්‍යයන් හා බිසවුන් සමග වන මුළුල්ල බලා නොදැක මහරජ්ජුරුවන් වියෝ වූයේ මෙතැනදීයයි එතැන දාගැබක් බඳවා නැවත මියුලු නුවරට එන්නාහු ඊවඩුවාගේ ගෙදොර දාගැබක් බන්දා වැලි කෙළිනා කෙල්ල දුටු තැන දාගැබක් බඳවා මස්කැටිය වැළඳු තැන දාගැබක් බඳවා මිගාරජින නම් තාපසයන් හා කථාකළ තැන දාගැබක් බඳවා නාරද නම් තාපසයන් අවවාද කී තැන දාගැබක් බඳවා මියුලුනුවර මඟුල් උයනට අවුත් දීඝායු කුමාරයන්වහන්සේ වොටුනු පළඳවා රජ්‍යයට සලස්වා අමාත්‍යයන් හා රජ්ජුරුවන් නුවරට යවා සීවලී බිසවු තුමූම මඟුල් උයනේ මහණව කිහුණු පිරියම් භාවනාකොට කාම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා දෙකල් ගළපා මේ මහාජනක ජාතකය නිමවා වදාළසේක.

මහණෙනි, එසමයෙහි මණිමේඛලා නම් දිව්‍ය ස්ත්‍රී නම් උපුල්වන් මහ සථවිරිය. එසමයෙහි මිගාරජින තාපසයෝ නම් සෘද්ධිවන්තයන් කෙරහි අග තැන්පත්වූ මුගලන් මහාසථවිරය, නාරද තාපස නම් නුවණැත්තන් කෙරෙහි අග්‍රවූ ශාරීපුත්‍ර මහාසථවිරය, වැලිකෙළි කුමාරිකා නම් දකුණත් සව්වූ ඛෙමා

මහාස්ථවිරීය, එසමයෙහි ඡවඩුවා නම් ධම්භාණ්ඩාගාරිකවූ ආනන්ද ස්ථවිරය, එසමයෙහි සීවලී බිසවු නම් යශොධර මහාස්ථවිරීය, දීඝායු කුමාරයෝ නම් රාහුල මහාස්ථවිරය, එසමයෙහි පියවූ අරිටු ජනක රජ්ජුරුවෝ නම් සුඩොදන මහරජ්ජුරුවෝය, මව් බිසවු නම් මෙකල මහාමායා දේවිය, පැමිණියාවූ රාජ්‍යශ්‍රිය හැර මහබිනික්මන් කළ මහාජනක රජ්ජුරුවෝ නම් දූන් දෙවාති දෙවවූ ශක්‍රාතිශක්‍රවූ සමන්තභද්‍රවූ තිලෝගුරු සම්මාසම්බුදුරජවූ මම්ම වෙම්දැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

528
සාම ජාතකය

තවද එක් සමයෙක්හි සතරාමර ලොක දිවාකර අප තිලෝගුරු සම්මා සම්බුදුරජාතන් වහන්සේ සකල ජනනන්දන නන්දන වන ප්‍රතිභාග සුන්දරතර තරු විරාජිත ජෙතවනාරාමයෙහි වැඩ වසනසේක් දුක් ගෙණ මවුපියන්ට උපස්ථාන කරණ එක් භික්‍ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද? යත්,

සැවැත්නුවර වනාසි අසූකෙළක් වස්තුවෙන් ආඪ්‍යවූ එක් සිටු කුලයක එක් පුත්‍රයෙක් ඇත්තේය. එතෙම මවුපියන්ට අතිශයින් ප්‍රිය මනාප වන්නේය. ඔහු මැන භාගයෙහි එක් දවසක් ප්‍රාසාද තලයට ගොස් සිම් මැදුරු කවුළුව හැර වීථිය බලන්නේ ගඳ දුම් මල් පහන් ගත් අත් ඇතිව බණ අසන පිණිස ජෙතවනාරාමයට යන්නාවූ මහාජනයා දැක මමද ගොස් බණ අසා එම් සිතා ගඳ දුම් මල් ආදිය ගෙන්වාගෙණ විහාරයට ගොස් සිවුරුපිළි බෙහෙත් පාන වගීයන් සඞ්ඝයා වහන්සේට පිළිගන්වා නැවත ගන්ධමාලා දීත් භාග්‍යවතුන් වහන්සේට පූජා කොට වැඳ එකත්පස්ව හිඳ බුදුරජාතන් වහන්සේගේ අතිමධුරවූ ධම්දෙශනා අසා කාමයෙහි ආදීනව හා ප්‍රව්‍රජ්‍යායෙහි ආනිශංස සලකා පිරිස් අතරෙන් නැගීසිට බුදුරජාතන්වහන්සේ කරා එළඹ පැවිදි ඉල්වා මව්පියන්ට අනුනොදුන් දරුවන් සවීඥයෝ මහණ නොකරෙති යනු අසා මවුපියන් කරාගොස් මහණවීමට අවසර ඉල්වා නොලැබුන හෙයින් සතියක් නිරාහාරව ඉඳ මවුපියන් අනුදන්වා ගෙණ බුදුරජාතන් වහන්සේ කරා අවුත් මහණවීමට ආරාධනා කෙළේය. එවිට බුදුරජාතන් වහන්සේ එක් භික්‍ෂුකෙණෙකුන් වහන්සේ කැඳවා මොහු මහණ කරවයි වදාළසේක. උන්වහන්සේද ඔහු මහණ කළසේක. එසේ මහණවූ උන්වහන්සේට බොහෝ ලාභ සත්කාර උපන්නේය. උන්වහන්සේ ආචාය්‍යී උපාධ්‍යායන්ට උපස්ථාන කොට සිත්ගෙණ ලබනලද උපසම්පදා ඇතිසේක් පස් අවුරුද්දක් ඇතුළත ශාසන ධම්ය පුහුණුකොට ගෙණ සිතනසේක් මම දැන් මෙහි ගණසඞ්ඝනිකා වෙන් යුක්තව වසන්නෙම් එසේ විසීම යහපත් නොවෙයි සිතා ආරණ්‍යයෙහි විදශීනාධුරය පුරණු කැමතිව උපාධ්‍යායයන්ගේ සමීපයෙන් කමටහන් ගෙන එක් පිටිසර ගමකට ගොස් ඒ ගම ගොදුරු ගම්කොට ආරණ්‍යයෙහි වාසය කෙළේය. එසේ වසන්නාවූ උන්වහන්සේ විදශීනාවට එළඹ දොළොස් අවුරුද්දක් උත්සාහ කොමත් ගුණ විශෙෂයක් උපදවාගත නොහැකිවූසේක.

උන්වහන්සේ මහණවූ තැන්පටන් උන්වහන්සේගේ මවුපිය දෙදෙනා කල් යත් යත් දුක්පත්බවට පැමිණියාහුය. යම් බදුවූ ඔවුන් සතු කෙත්වත් හෝ වෙළඳම් හෝ ඒ සියල්ලෙහි යම් යම් කෙණෙක් යෙදී සිටියාහු වෙද්ද? ඔව් මේ කුලයෙහි පුත්‍රයෙක් හෝ මල්බෑකෙණෙක් හෝ මේ සියල්ලම විචාරා ගන්ට නිසි හිමියෙක් නැතැයි කියා තම තමන්ට හස්තප්‍රාප්තදේ ගෙණ කැමති කැමති තැන්වලට ගියාහුය. දාසි දස් කම්කරු ආදීහු ගෙයි තුබූ හිරණ්‍ය සුවර්ණාදිය ගෙන ගියාහුය. එයින් මෑතභාගයෙහි ඒ දෙදෙනා විවරක් තේරී අතට පැන් මාත්‍රයකුදු දීලන්ට නිසි සහායක් නොලැබ විසූ ගේද විකොට අනාගාරික කරුණට පැමිණ කුණු වැකුණු කිළිටි කඩමාලු හැඳ කබල් ගත් අත් ඇතිව සිඟා කා ඇවිදිනාහුය.

එකල එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාම යෙන් නික්ම ගොස් ක්‍රමයෙන් උන්වහන්සේගේ පන්සලට වැඩිසේක, ඒ නේවාසික තෙරුන්වහන්සේ ආගන්තුක තෙරුන්වහන්සේට වත්සපයා සුවසේ හුන් කල ස්වාමීනි, කොතනක සිට වැඩිසේක්දැයි විචාරා දෙව්රම සිට යයි කී කල බුදුරජානන් වහන්සේගේ හා අසූමහ සව් ආදීවූ මහාසඞ්ඝයා වහන්සේගේද දුක්සැප විචාරා මවුපියන් පවත් විචාරණසේක් ස්වාමීනි, සැවැත්නුවර අසවල් සිටුකුලයෙහි ඇත්තෝ නිරෝගීහුදැයි කියා මව්පියන් දෙදෙනාගේ සුවදුක් විචාළසේක. එවිට ආගන්තුක තෙරුන්වහන්සේ කියනසේක් ඇවැත්නි, ඒ සිටුකුලයේ ඇත්තන්ගේ පවත් මා අතින් නොවිචාරවයි කීසේක. එවිට නෙවාසික තෙරුන්වහන්සේ ස්වාමීනි, එසේ වදාරන්ට කාරණා කවරහුදැයි විචාළසේක. එවිට ආගන්තුක ස්වාමීන්වහන්සේ කීයනසේක් ඒ කුලයාගේ වනාහි එකම පුත්‍රයෙක් ඇත්තේය එතෙම සසුන්වැද මහණවිය, ඔහු මහණවූකල් තැන් පටන් ඒ කුලයෙහි භවභොගාදිය ක්‍රමයෙන් පිරිහී මහත් පරිහානියට පැමිණියේය. දැන් ඔව්හු දෙදෙන පමණක් සිඟා කා ඇවිදිති කීසේක. එවිට නෙවාසික තෙරුන්වහන්සේ ආගන්තුක තෙරුන්වහන්සේ විදාළ වචනය අසමින්ම ස්වභාවයෙන් සිටපියනොහී කඳුළු පිරුණු ඇස් ඇතිව අඬන්ට පටන්ගත්සේක, ඇවැත්නි, කුමක් පිණිස හඬව්දැයි විචාළ කල කියනසේක් ස්වාමීනි, ඒ දෙදෙනා තම් මාගේ මව්පිය දෙදෙනය, මම ඔවුන්ගේ පුත්‍රයෙමියි කීසේක.

එවිට තෙරුන්වහන්සේ වදාරණසේක් ඇවැත්නී, තොපගේ මව්පියෝ තොප පැවිදිවූන නිසා විනාශයට පැමිණියෝය. එහෙයින් තොපි ගොසින් ඔවුන් පිළිදකුවයි කීසේක. එසේ කී කල්හි උන්වහන්සේ මෙසේ සිතූසේක. මම දොළොස් අවුරුද්දක් මුළුල්ලෙහි වීයසීකොටත් මාර්ගයක් හෝ ඵලයක් උපදවාගත නුහුනුයෙම්, එහෙයින් අභව්‍යවීමි, මේ ප්‍රව්‍රජ්‍යාවෙන් මට කවර ප්‍රයෝජනද? ගිහිව සිට මව්පියන් පෝෂ්‍යය කෙරෙමින් දාන සීලාදී කුශල් කොට ස්වර්ග පදප්‍රාප්තවෙමි සිතා ආරණ්‍යවාසය ඒ ආගන්තුක තෙරුන් වහන්සේට දී දෙවන දවස් එයින් නික්ම ක්‍රමයෙන් ගොස් සැවැත්නුවරට නුදුරුවූ දෙව්රම්වෙහෙර පිටිපසට පැමිණි සේක. එතැන්හි දෙමාර්ගයෙක් විය. එකෙක් දෙව්රමට යන මගය, එකෙක් සැවැත් නුවරට යන මගය, උන්වහන්සේ ඒ දෙමංසන්ධියෙහි සිට කිමෙක්ද? මම පළමුකොට මව්පියන්

දකින්ට යම්ද? නොහොත් බුදුන් දකින්ට යම්දැයි සිතා මා විසින් මව්පියන් බොහෝ කොට දුටුවිරූය. මෙතැන්පටන් වනාහි මට බුඩ දර්‍ශනය දුර්ලභ වන්නේය. අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ දැක ශ්‍රී සඬර්මදේශනාද අසා සෙට උදෑසන මම් මව්පියන් දක්නා පිණිස යෙමියි සිතා සැවැත්නුවරට යන මඟ හැර සවස්වේලෙහි ජේතවනාරාමයට පැමිණීසේක.

එදවස් වනාහි මාගේ සවාමිදරුවූ බුදුරජාණන් වහන්සේ මහකරුණා සමාපත්තියෙන් නැගී අළුයම් වේලෙහි ලොව බලා වදාරණසේක් එකී භික්ෂූන්වහන්සේ සෝවාන්වන්ට නිසි හෙතු සම්පත් ඇති නියාව දැක වදාරා ඔහු එනකල මාතුපොසක සූත්‍රයෙන් මව්පියන්ගේ ගුණ හා මව්පියන් රැකීමෙහි අනුසස් විසිතුරුකොට වදාළසේක. එකල ඒ භික්ෂූන් වහන්සේ සහ පිරිස් කෙළවර සිට බණ අසමින් මෙසේ සිතූසේක මම ගිහිව සිට මව්පියන් රක්‍ෂා කරන්ට හැකිවෙමියි සිතමි, ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ වනාහි ප්‍රව්‍රජ්ජිත පුත්‍රවම සිට උපකාර කටයුතුයයි වදාරණසේක. ඒ මම බුදුන් නොදැක ගියේ වීම්නම් ඒකාන්තයෙන් මෙබඳුවූ ප්‍රව්‍රජ්ජාවකින් පිරිහෙන්නෙමි, දැන් වනාහි ගිහිනොව පැවිදිව සිටගෙණම මව්පිය දෙදෙනා රක්‍ෂාකරමියි සිතූසේක. එතෙම එසේ සිතා එදවස් දෙව්රම්වෙහෙර වැස දෙවන දවස් උදෑසනම සැවැත්නුවරට පැමිණ කිම්ද? කැඳ ගණිම්ද? මව්පියයන් දකිම්දැයි සිතා දුප්පතුන් සමීපයට සිත් අතින් යන්ට සුදුසු නොවෙයි සිතා හුළුකැන් ගෙණ ඔවුන්ගේ පළමු විසූ ගෙදරටම ගියසේක ඒ වේලාවට මව්පියෝ කැඳ සිඟා ඇවිද වෙහෙසී භිත්තිය සමීපයට එළඹ වැටී හුන්නාහුය. ඔවුන් දැක උපන්නාවූ මහත් ශොකයෙන් කඳුළු පිරුණු ඇස් ඇතිව ඔවුන්ට නුදුරුව වැඩසිටිසේක. ඒ මව්පියෝ උන්වහන්සේ දැක හැඳිනගත නුහුනුවාහ.

ඉක්බිති උන්වහන්සේගේ මව්තොමෝ පිඩු පිණිස සිටි කෙණෙකු විය යුතුය යන සංඥවෙන් සවාමීනි නුඹවහන්සේට දියයුත්තක් නැත. අනික් තැනකට වැඩිය මැනවයි කීවාය. උන්වහන්සේ මෑනියන්ගේ බස් අසා ලපිරුණු සොක ඇතිව ඇස් පිරුණු කඳුළු ඇතිව එතනම වැඩසිටිසේක. දෙවනුව තුන්වනුව කීයනු ලබන්නේද වැඩසිටිසේක්මය.

ඉක්බිති උන්වහන්සේගේ පියානෝ මෑනියන්ට මෙසේකීහ. සොඳුර මෙතෙම තොපගේ පුතනුවන් විය යුතුය, ගොසින් බලා දැනගණුවයි කීහ. මෑනියෝ නැගීසිට ගොස් බලා ඇඳින පාමුල වැටී හැඬූවාහ. පියානෝද එසේම කළහ. තෙරුන්වහන්සේ මව්පියන් දැක සවභාවයෙන් සිටපිය නොහී කඳුළු පවත්වා හඬා ශොක ඉවසාගෙණ ශොක දුක් නොකල මැනවයි නැවත බත් ගෙණැවිත් අනුභව කරවා තමන්වහන්සේ පිඩු සපයා සමීපයට ගෙණ ගොස් නැවතත් බතික් පවරා ආහාර කෘත්‍යයකොට ඒ දෙදෙනා එක් තැනක හිඳුවා එතැන්පටන් උන්වහන්සේ මෙම නියායෙන් මව්පියන් පොෂ්‍යය කෙරෙති. තමන්වහන්සේට පැමිණි පක්‍ෂ බත් ලාබත් ආදිය මව්පිය දෙදෙනාට දී තමන්වහන්සේ පිඩුසිඟා ලද දෙයක් වළඳනසේක, වස්මාසික විසින්ද අන්කිසි විසින්ද ලබනලද වස්ත්‍රද එවුන්ට දෙනසේක.

සාම ජාතකය

ඔවුන් විසින් අදිනලද දිරාගිය කිලිටි කඩකැබලි ගොතා පඬු පොවා තමන්වහන්සේ පළඳිනසේක. ආහාර ලබන දවසටත් වඩා නොලබන දවස්වූහ. අඳනා පොරෝනාද ඉතා රළුවූහ. මෙසේ උන්වහන්සේ මව්පියන් පොෂ්‍යය කෙරෙමින්ම මැනභාගයෙහි කෘශවූ පඬුවන්වූ ශරීර ඇතිවූසේක.

ඉක්බිති උන්වහන්සේගේ සහාය භික්ෂූන්වහන්සේ ඇවැත්නි, තෙපි මීට පළමු ශරීර වර්ණයෙන් හොබනාහුය. දැන් පඬුවන්වූ ශරීර ඇතිවිය. තොපට එක්තරා ව්‍යාධියෙක් උපන්දැයි විචාළසේක්ලාය. ඇවැත්නි, මට ව්‍යාධියෙක් නැත, එක් පළිබොධයක් ඇතැයි කියා එපවත් වදාළසේක. එවිට භික්ෂූන්වහන්සේ කියනසේක් ඇවැත්නි, සද්ධාදෙය්‍යවිනිපාතය වළකන ලද තොප වනාහි සැදැ ඇත්තන් විසින් දෙනලද දෙය ගෙණ ගිහියන්ට දී රැකුම ඉතා නුසුදුසුයයි කීවාහුය. උන්වහන්සේ ඒ භික්ෂූන් වහන්සේලා කීවා අසා ලජ්ජාවෙන් ඇකිළගියසේක. එයින් කිසිකෙණෙක් නොසතුටුව බුදුන් කරා ගොස් ස්වාමීනි, අසවල් මහණතෙම සැදැහැතියන් දුන් දෙයින් ගිහින් රක්න්නේය කියා බුදුන්ට දැන්වූවාහුය.

සම්බුද්ධයන් වහන්සේ එකී භික්ෂුව කැඳවා සැබෑද? මහණ ගිහින් පුෂ් නේදැයි විචාරා වදුරා සැබැව ස්වාමීනි, තීකල සතරාමර ලොකදිවාකරවූ බුදු රජානන්වහන්සේ ඒ භික්ෂූන්වහන්සේගේ ඒ ක්‍රියාව වර්ණනාකරණ පිණිස තමන්වහන්සේගේ පූර්වචර්‍යාව ප්‍රකාශ කරණු කැමතිව ගිහින් රක්‍ෂාකරන් නාවූ මහණ, තෝ කවුරුන් රක්‍ෂාකෙරෙහිදැයි විචාරා වදාළකල ස්වාමීනි, මව්පිය දෙදෙනායයි කීහ එකල ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ ඔහුට ඒ මව්පියන් රැකීමට දැඩිඋත්සාහ උපදවන පිණිස සාධු! සාධු!! සාධු!!!යි තුන් විටක් සාධුකාරදී වදූරා තෙපි මා ගියාවූ මාර්ගයෙහි සිටියාහුය, පෙර මමද සසර සැරිසරණකල මවුපියන් රැක්කෙමියි වදාළසේක. ඒ භික්ෂූන්වහන්සේ මව්පියන් රැකීමෙහි දැඩි උත්සාහ ලත්සේක. ඒ කථා ස්වරූපය අසනු කැමති මහා සංඝයා වහන්සේ ස්වාමීනි බුදුරජානන්වහන්ස, නුඹවහන්සේ විසින් පෙර මවුපියන් රැක්ක පරිදි අසනු කැමැත්තම්හයි ආරාධනයකළ කල්හි සකලජන කර්ණරසායනයවූ මේ අතීත කථාව ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

යටගිය දවස බරණැස්නුවර පිළියක් නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි එම බරණැසට නුදුරු තැන ගඞ්ගාවෙක් විය. ඒ

ගඟ මෙතර පන්සියයක් ගෙවල් ඇති එක් වැදි ගමෙක් විය, ගඟ එතෙරත් එසේම පන්සියයක් ගෙවල් ඇති වැදිගමෙක්විය, එගම් දෙකෙහි ගම්මුදලියෝ දෙදෙනා බාලකලපටන් අති විශ්වාස හෙයින් මෙසේවූ කතිකාවක් කළාහුය ඉදින් අප කෙරෙන් එක්කෙණෙකුන්ට දුවක් වූවාද? එකෙක්හට පුතෙක් වීද? ඔහු දෙදෙනා ආවාහ විවාහ වෙත්වායි කතිකාකොට උන් ඉක්බිති බඹලොවින් බ්‍රහ්මයෙක් චුතව අවුත් ගඟ මෙතර ගම වසන නෙසාද ජ්‍යෂ්ඨයාගේ ගෙයි පුත්‍රව උපන, ඔහු උපන් ක්‍ෂණයෙහි දුහුලකින් පිළිගත් හෙයින් ඔහට දුකුල කුමාරයෝ යයි නම් තැබූහ. එසේම අනික් ගම්දෙටුවා ගේ ගෙයින් බ්‍රහ්මයෙක් අවුත් පිළිසිඳ දුවව උපන්නීය.

පරතෙර උපන් හෙයින් ඈට පාරිකා යයි නම්තැබූහ. ඔහු දෙදෙ ම රන්වන් ශරීරයෙන් හා ප්‍රසාදවහ රූප සෞන්දර්‍ය්‍යයෙන් යුක්තවූහ. වැදි කුලයෙහි ඉපදත් ප්‍රාණවධ නොකෙරෙති, මෑතභාගයෙහි සොළොස් ඇවි රිදිවූකල දුකුල කුමාරයන්ට මව්පියෝ මෙසේ කීහ. පුත නොපට කුමාරි කාවක් ගෙණැවිත් පාවාදෙමෝදැයි විචාළාහ. ඔහු බඹලොවින් ආ හෙයින් පිළිකුල්කොට දෙකණ අතවසා ගිහිගෙන් කම් නැත, මෙසේ වූ බස් නොකිව මැනවයි කීහ. තුන්විටක් කියතුදු නොඉවසූයේමය. පාරිකා කුමාරිකාවටද එසේම මවුපියෝ මැනියෙනි අපගේ යහලුවක්හුගේ පුත්‍ර යෙක් ඇත, එතෙම මනාවූ රූපසොභා හා රන්වන්වූ ඡවිවර්‍ණ ඇත්තේය. ඔහට නුඹ පාවාදෙමෝදැයි මව්පියන් කීකල ඕද බඹලොවින් ආ බැවින් එසේම කියා කණ වැසුවාය, දුකුල කුමාරයෝ රහසින් ඈට පතක් යවන්නෝ මෛථුනධර්‍මය කැමැත්තීනම් අනික් පුරුෂයෙකුගේ ගෙට යව මා මෛථුන ධර්‍මයෙහි ඇල්මක් නැතැයි කියා යැවූහ, ඈද එසේම දුකුල කුමාරයන්ට ග්‍රාමධර්‍මය කැමතිහොත් අනික් ස්ත්‍රියකු පාවාගත මැනවයි රහසින් පත් යැව්වාය, මවුපියෝ ඔහු දෙදෙනා නොකමැති පරිද්දෙන්ම ආවාහ විවාහ කළාහුය, ඔහු දෙදෙන කෙලෙස් මුහුදට නොබැස බ්‍රහ්මයන් දෙදෙනකුසේ එකතැන විසූහ, දුකුල කුමාරයෝ මසුන් හෝ මාංස හෝ නොමරති, යටත්පිරිසෙයින් මරා ගෙව ගෙණා මස්වත් නොවිකුණති.

ඉක්බිති මව්පියෝ පුත, තෙපි වැදිකුලයෙහි ඉපිදත් ප්‍රාණවධ නො කෙරෙති, ගෘහවාසයත් නොකමැත්තහු කුමක් නම් කරව්දැයි විචාළහ. එවිට දුකුලකුමාරයෝ මෑනියන්වහන්ස, පියානන්වහන්ස, නුඹවහන්සේලා අනුදන්නිහු නම් අදම මහණවෙමියි කීහ, එසේවීනම් යවයි කියා අවසර දුන්හ. ඔහු දෙදෙන මව්පියන් වැඳ නික්ම ගංතෙර හිමවතට පැමිණ යම් තැනකින් මිගසම්මත නම් ගඬගානොමෝ හිමවතින් බැස ගඬගාවට පැමිණී යාද ඒ ස්ථානයට ගොස් මහා ගඬගාව හැර මිගසම්මත නම් ගඬගාවට අභිමුඛ කොට නැගී ගියාහුය.

එකෙණෙහි සක්දෙව් රජුහුගේ පඬුඇඹුල්සලස්න උණුවිය. ශක්‍රයෝ ඒ කාරණය දැක විශ්වකර්ම දිව්‍යපුත්‍රයා කැඳවා දරුව, දුකූල පණ්ඩිතාදී දෙදෙන මහණවන්ට නික්ම හිමාලය වනයට ප්‍රවිෂ්ටවූය. තෝ ගොස් මිගසම්මත ගඞ්ගාවට අඩසතක් පමණ අතරේ ඔවුන්ට පන්සලක්ද තවුස් පිරිකරද මවාදී එවයි කීය. ඔහු යහපතැයි පිළිගෙණ මූගපක්ඛ ජාතකය යෙහි කී සැටියෙන්ම සියල්ල නිමවා අමනාප ශබ්ද ඇති චණ්ඩ මෘගයන් පහකොට එක් පියවර සටහන් මාර්ගයක් මවා දෙව්ලොව ගියෝය. දුකූල පණ්ඩිතාදි දෙදෙනා ඒ මාර්ගය දැක එයින් ගොස් අසුපුවට පැමිණියාහුය.

ඉක්බිති දුකූල පණ්ඩිතයෝ පන්සලට පැමිණ තවුස් පිරිකර දැක ශක්‍රයන් විසින්ම අපි දක්නා ලද්දමෝය. මේද ඔහු විසින් දෙන පිරිකරයයි දැනගත්හ. සළු මුදුහැර රත් වැහැරි සිවුරු හැඳ පෙරවැ අඳුන් දිවිසම් එකස් කොට ජටාමඬුල්ල බැඳ ඍෂි වෙස් ගෙණ පාරිකා කුමාරිකාවටද ප්‍රව්‍රජ්‍යාව දී දෙදෙනාම ලෞකික මෛත්‍රී භාවනා කරෙමින් එක පන්සල විසූහ. ඔවුන්ගේ මෛත්‍රී ආනුභාවයෙන් හා තපෝ තෙජසින් ඒ වෙනෙහි වසන් නාවූ සියලු මෘග පක්ෂීහු ඔවුනොවුන් කෙරෙහි මෙත් සිත් පතුරුවා වාසය කෙරෙති; නයින්ට ගොදුරුවූ මැඩියෝ පවා පෙණ නමැති ඡත්‍ර ඡායාවෙහි සැතපී සිත්සේ වාසය කෙරෙති, සිංහයන්ට ගොදුරුවූ ඇත්පොව්වෝ පවා තමන්ගේ හස්තයෙන් කෙසරයන් තනා ඇවිදිති, දිවියන්ට ගොදුරුවූ මුවෝ දිවියන්ගේ මූවට මුව දී සිත්සේ ඒ වෙනෙහි වාසය කෙරෙති, මධුර නාදයට කියපත්වූ නාගයෝ පවා මොණරුන්ගේ පිය ගැබෙහි වාසය කෙරෙති, මෙසේ වෙනෙහි වායය කරණ සියලු ප්‍රාණීහු ඔවුනොවුන් කෙරෙහි සැක නැතිව වෙසෙති.

පාරිකා තාපසිකා තොමෝ බොන පැන් නහන පැන් තබා අසපුව ඇමද සියලු කටයුතු කෙරෙයි; දෙදෙනාම පලාපල ගෙණැවිත් අනුභව කොට තමන් තමන්ගේ පන්සල්වල හිද මහණ දම් කෙරෙමින් වාසය කළෝය. ශක්‍රදේවේන්‍ද්‍රයෝ ඔවුන්ට උපසථානයට එති, එක් දවසක් ශක්‍රයෝ දිවැසින් බලනාහු ඒ දෙදෙනාගේම ඇස් අන්ධවීමට අනතරායක් දැක දුකූල පණ්ඩිතයන් කරා එළඹ වැඳ එකත්පසෙක හිඳ මෙසේ කීහ. ස්වාමීනි, නුඹ වහන්සේලාට එක් අනතරායක් පෙණෙයි, ඒ මතු රක්නා පිණිස පුත්‍රයෙක් ලබන්නට වටනේය, එහෙයින් ලෝකධර්මය සෙවනය කළ මැනවයි කීහ.

එවිට තාපසයෝ කියන්නාහු ශක්‍රදේවේන්ද්‍රය, මේ නොකියයුත්තක් කුමට කියාද? ගෙයි වසනකල පවා මේ ලෝකධර්මය නා නා පණුකැලන් වැකුණු දුර්ගන්ධ අසූචි රාශියක් මෙන් පිළිකුල්කොට හැර විවේක ජනාලයවූ හිමාලය වනයට පැමිණ වසී කළ පසිඳුරන් ඇති ඉසි වෙස් ධරා කෙසේ නම්

මෙසේවූ නොසිරිතක් කෙරෙම්දැයි කීකල එසේ නොකරතොත් පාරිකාවත් මල්වර කල අතින් නාභිය පිරිමැන්ද මැනවැයි කීහ, තාපසයෝ මැනවැයි ඉවසූහ, ශක්‍රයෝ වැඳ අවසර ගෙණ දෙව්ලොවට ගියෝය. තාපසයෝ එපවත් පාරිකා නම් තාපසිකාවට කියා ඈ උතුනි කල අතින් නාභිය පිරිමැත්දූහ.

එකල පුරණලද බොසම්භාර ඇති අප මහබෝසතානෝ දෙව්ලොවින් චුතව අවුත් පාරිකාවන් කුස පිළිසිඳගත්සේක. ඔහොමෝ දසමස් ඇවෑමෙන් රත්වන් පුතකු වැදූවාය. ජාම්බොනදී සුවර්ණයකට බඳු රූධරණ හෙයින් සාම කුමාරයෝ යයි නම් තුබූහ. මැතියෝද පර්වත අතරේ වසන කින්නරාඞ්ගනාවෝද ඒ සාම කුමාරයන්ට කිරිමව්කම් කෙරෙති, මව්පිය දෙදෙන බොධිසත්ත්වයන් නාවා කිරිපොවා පත්සල තිදිගත්වා පලවැල නිසා වල්ගිය කල්හි ඒ වෙනෙහි ලිය කිඳුරෝ අවුත් සාම කුමාරයන් වඩාගෙණ තමන් තමන්ගේ වාසස්ථානවූ පර්වතශිඛරමස්තකයෙහි ගෙණගොස් මෘදුවූ මල්යහන්හි පිට පිණවා සිරියලින් තිලකදී වෙනෙහි ඇති තන් කුසුම් සුවඳින් පූජාකොට පඤ්චාඞ්ගුල්සලස්න පිට හුත් දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ සක්දෙව් රජහට කරණ නෘත්‍ය ගීතයක්මෙන් සියලු සිව්පාවෝ එක්ව නොයෙක් සුවඳින් මලින් හා නෘත්‍ය ගීතයෙන් මහත්වූ පූජෝත්සව කොට පලවැල සොයා වල් ගිය දෙමව්පියන් පත්සලට එනකලැයි නියම දූත දෙවනුව සාම කුමාරයන් ගෙණවුත් පත්සල්හිම පිණවා යන්නාහ.

මේ නියායෙන් කෙළ ඇවිද ඒ වෙනෙහි සිව්පා සතුන් එක්ව ඒ ඒ තැන්හි විසිතුරුවූ පොකුණු ගං හෝ ඇල කඳුරු ආදී ස්ථානයන්හි හිඳ නොයෙක් කුසුමයන්ගේ සුගන්ධයන් හාත්පසින් ගෙණ එන්නාවූ පවනින් හා අති ධවලවූ වැලිතලාවලින් යුක්තවූ නොයෙක් වෘක්ෂ ඡායාවන්හි සිත්සේ කෙළ ඇවිද දවස් හැර සොළොස් ඇවිරිදිවූ කල්හි ඒ සාම කුමාරයන් සොළොස් වයසින් තවුස්වෙස්ගෙන්වා පලවැල නිසා යානොදී දෙමව්පිය දෙදෙනා තුමූම පලවැල ගෙණවුත් රක්ෂාකරන්නාහ.

මෙසේ එක් දවසක් දෙමව්පියෝ සාමයන් පලවැල වළඳවා පත්සල්හි සිටුවා පලවැල පිණිස වනයට නික්මුණු කල්හි නැංගාවූ අකාල මෙඝයෙක් ධාරානිපාතයෙන් වසින්ට පටන්ගත. ඒ තාපසයන් දෙදෙන ගසක් මුල තුඹසක් පිට සැක නැතිව සිටි කල්හි ඔවුන් ඇඟින්නෙමී බව ඩාදිය බින්දු ඒ තුඹස්කට ඔත් නා රජුගේ නාසාපුටයේ වැගුරුණේය. එක්ෂණයෙහි මහත්වූ විෂ තේජස් ඇත්තාවූ ඒ නාරජ කොපාග්නි වේගයෙන් දිලිහී විෂ ධූමයක් හැර ඒ දෙදෙනාගේ ඇස් සතරම අන්ධ කෙළේය, එකල්හි ඔහු දෙදෙනා කියන බස් මිස ඔවුනොවුන්ට නොපෙණෙන හෙයින් උන්ගේ අත අල්වාගෙණ අඬා වැලප ඇවිදිනාහුය.

මෙසේ ගුණවත්වූ දෙදෙනාහට එකවිටම ඇස් නටුයේ කවර අකුශලයකින්දෝහෝයි යනුහොත් මේ දෙදෙනා වහන්සේ එක් කලෙක වෛද්‍ය

කුලයෙහි ඉපද වෛද්‍ය ශාස්ත්‍රයෙහි නිපුණව මෙසේම ඇස් නොපෙනෙන මිනිසකුගේ ඇස් දෙක කුලී ගිවිස්වා ගෙණ වෙදකම් කොට නොබෝ දවස කින් ඇස් ගුණවූ කල්හි ගිවිසි පදම් නොදෙමියි කී නිසා තමත් අඹුවට කී තැන ඕ කියන්නී කුලී නොදෙත්නම් බෙහෙදක් ලා ඇස් අන්ධකරවයි කීහ. අඹුවන්ගේ බස් ගිවිස මායම් කියා ඇස බෙහෙදක් ලූ කල්හි පෙර සේම ඇස් අන්ධවූය. ඒ අකුශල බලයෙන් මෙතැන්හිදී ඒ දෙදෙනාගේ ඇස් අන්ධවූහයි දතයුතුයි.

එකල පන්සල උන් බෝධිසත්ත්වයෝ සවස්වනතුරු ගුරු දෙදෙනා එන පෙරමග බල බලා ඉඳ නොදුක මෙතෙක් කල් තබා එනුවත් දක දූත් මේ වේලාව වනතුරු නොඑන්නේ කවර උවදුරෙක් වීදෝහෝයි සිතමින් පන්සලින් පිටත්ව නොබෝ තැන් ගිය කල්හි ඔවුන් දෙදෙනා අඬනා හඬ අසා මව්පිය දෙදෙනාට හඬගෑ කල්හි ඒ ඇසූ දෙමව්පියෝ පුත්‍ර ප්‍රේමයෙන් අඬගා කියන්නා එම්බා පුත සාමයෙනි, මෙතැනට නොඑව, මේ වල උවදුරෙක් ඇත, ඉවත්ව සිටුවයි අඬගා කීහ.

එකල්හි බෝධිසත්ත්වයෝ වලින් දික් ලීයක් කඩාගෙණ අතට දික් කොට ලී කෙළවර අල්වාගන්ට කියා මව්පිය දෙදෙනා ළඟට කැඳවාගෙණ ඇස් නට පවත් විචාරන්නාහු ඒ නතු විශෙෂයෙන් අසා ඒ අසල තුබූ හුඹස දක මෙහි වසන්නාවූ විෂ ඝොර සර්පයකු විසින් හෙළු විෂ ධූමයෙන් ඇස් නටහයි නියම දන බොහෝ කම්පාව අඬ අඬා වැලප එක්ෂණයෙහි සිනා සුනාහුය, ඒ දෙදෙනා සිනාසුනු අඬ අසා එම්බා සාමයෙනි, අපගේ දුක් ඉවසිය නොහී අඬා වැලපෙමින් සිටි නොප මේ ක්ෂණයෙහි සිනාසෙන්ට කාරණා කිම්දැයි විචාළ දෙදෙනා වහන්සේට සිනාසුන කාරණය කියන සාමයෝ නුඹ දෙදෙනා වහන්සේ ළදරු වයසෙහිම මේ ලෙස ඇස් නට පසු මාගේ දිවි පවත්නාතෙක් කළමනා වතාවතින් හා පලාපලයෙන් කිසිත් අඩු නොව පොෂ්‍යයකොට බොහෝ කලක් දුක් ගණිම් යන සන්තොෂයෙන් සිනහ පහළ කෙළෙමියි දන්වා එතැනින් ගුරු දෙදෙනා පන්සලට කැඳවාගෙණ ගොස් ඉන්නා සිටිනා තැන් හා යන තැනට එල්බ යන වැල් බැඳ කළමනා කියමනා සියලු සත්කාර කොට දවස් යවා හිරු උදාකල්හි පන්සල්හි කළමනාවත් සපයා සුදුසු පලවැල වළඳවා දෙගුරුන් වැඳ පුදා වල්ගොස් පලවැල ගෙණවුත් පන්සල තබා ගඟට නොස් නහා ගිම් නිවා පැන් ගෙණවුත් පන්සල තබා දෙගුරුන් අතපය සෝධවා වඩා හිඳුවා පළමුව වළඳවා පසු තමන් වහන්සේ වළඳා මෙසේ නිරන්තරයෙන් මුව ගණ පිරිවරා වල්ඇවිද පලවැල ගෙණවුත් පන්සල්හි තබා මේ සැටියේ මව්පිය දෙදෙනා සියලු පොෂ්‍යයෙන් රකිනා කල්හි එකල බරණැස් නුවර රජ මුව දඩයෙහි ගිජුව මෙසේ අන්තඃපුර පිටිපුර සියලු රාජ්‍යය මව් බිසවුන්ට භාරකොට දුනු හී විවරක් ඇරගෙණ වනාන්තරයට වැද ක්‍රමයෙන් ගොස් ඒ සාමයන් හා දෙමව්පියන් ඉඳිනා පන්සලට ආසනයේ මිගසම්මත නම් ගඟගාව දක එහි බැස නා ගිම් නිවා එයින් නැගී සිට බලනුයේ ඒ පන්සල සිට ගඟට පැනට එන මුවන්ගේ පාද සලකුණෙන් මේ ගඟට පැනට බස්නා මුවන් වනැයි කල්පනාකොට කොටුපත කඩා සිට දුන්න

තරයේ ඇද විෂපෙවූ ශරයක් අතින්ගෙණ සැඟවී සිටගත් කල්හි එදවස් පලවැල සොයා ගිය සාමයන් පන්සල්හි පලවැල තබා කළයගෙණ මුව ගණ පිරිවරා පැන්තොටට බැස නහා වල්කැලෑ ඇඳ කළයට පැන් උකා ඔසවාගෙණ උරයේ තබන අතරෙහි කොටුපත කඩා සිටි රජ තමා උපන් තැන් පටන් මෙවැනි රූපයක් නුදුටුවිරූ හෙයින් කවුරුන් බවත් නොදන දෙවියෙක් දෝහෝ නාගයෙක් දෝහෝ සිඩ විද්‍යාධරයෙක් දෝහෝයි මොහු විදලා ඔබලත්වූ කල්හි විචාරා ගණිමි සිතා උරපුරා ඇද විෂපෙවූ සරය අළ කල්හි දකුණැලයෙන් වැදගෙණ වම් ඇලයෙන් නැගී සරය බිම සැඟවුනේය.

එකල්හි කැටිව සිටි මුවෝ මරණභයින් තැතිගෙණ ඒ ඒ තැන්හි දිව පූහ. ඒ ශර පහර ලත් සාමයෝ විත් කා වැටෙන වේලෙහිත් ගුරුන් උන් දිසාව සලකා එදෙසට හිස තමා කළයද සෙමෙන් බා තබා රත්පිළිමයක් මෙන් වැල්ලේ වැදහොත්සේක් මදක් සිහි එළවා විද්දාවූ ඒ පිළියක් රජ නොදක වදාරණසේක් උපන් තැන් පටන් මෙතැන් දක්වා නිරනතරයෙන් අඛණ්ඩ අශ්ඨාඞගශීලය රක්‍ෂාකොට දසපින්කිරියවත්පුරා මෛත්‍රීභාවනා කොට දවස් අරණා හෙයින් මට මේ වෙනෙහි සතුරුව හිඳිනාහු නැත, එසේවූ මාගේ මිනී මසින් ප්‍රයෝජනයකුත් නැතිව නිවැරදිවූ මා විදලා කුමට සැඟ වුනුද මට මේ සා දුකක් කුමකාට දුනවූ හ. කුමට පව් අත බැන්දදූයි යනාදීන් කීයත ලද්දාවූ නොයෙක් බැගෑ තෙපුල් අසා සිටි පිළියක් රජ සිතන්නේ මෙවිට එළිබැස පෙණී මිනේ බල අඟවා මොවුන් හා එක්ව කථා කෙරෙමියි කොටුපතින් එළිබැස සාමයන්ට කියන්නේ බරණැස රජකරණ පිළියක් රජ නම් මම ය, මුවදඩෙහි ගිජුව වනයට ආයෙම් තුඹවහන්සේ දක කවුරුන් බවත් දැනගත නොහී විද්දෙමි, නුඹවහන්සේගේ බැගෑපත්වූ අඳෙනා අසා ලඟට ආම්යි නොයෙක් සැබෑ බොරුවෙන් සාමයන් සිත් ගෙණ කියන්නාහ. නුඹ තුමාකා වුරුද? කාගේ නෑසිය කෙණෙක්ද? පැනට නුඹ තමා එව්වෝ කවුරුද? ඒ මට නොවලහා කීවමැනවයි කී කල්හි එසඳ සාමයෝ මම් මේ වෙනෙහි උපන්මි, ඇස් අන්ධවූ මව්පියන් රකිනා එකෙක්මි, ඉන් පැනට ආවාවූ මා විද්දේ ඉතා නොතරම්ය, මා මෙතන විත් කා ඔත් බව මාගේ මව්පිය දෙදෙනා නොදනිති, පමාවූහෙයින් අඩා වැලපෙති, පැන් පමණක් නොලැබ මසුන්සේ වියලෙති, ඇස් නටනෙක් පටන් දවසකට දෙවිටක් නාවමි, තුන්විටක් කවමි, අතපය සෝදාතෙල් ගා කොළපුන් පිට පිණවමි, දූන් වනාහි උන් දසවිටක් කීවත් පැන් ටිකක් දෙන්නෝ කවුරුද? කවුරු සතනද්ද? කෙසේ රැකෙද්දූයි යනාදීන් මව්පිය දෙදෙනාගේ දුක් ඉවසිය නොහී තමන්වහන්සේගේ දුක් නොසිතා දෙගු රුන්ගේ දුකට අඩ අඩා කියන්නාහු මෙතන මා විත් කා වැටී පමාවූ

හෙයින් පෙරමග බල බලා ඉඳ සොල්මන් අසා මාගේ බස් පමණක් නොඇසූ දෙමවුපියෝ වෙනෙහි ඒ ඒ තැන අඬා වැලප ඇවිද දුක් විඳිතියි සිතමි. අනේ මට විද්දවූ නිරිඳුනි, මාගේ දෙගුරුන් මූණත් නොබැලූය. මේ ලෝකයෙහි දුක් සැප දෙක පිරිමිත්වම නියමය, ඉනුත් දෙගුරුන් දුක් ඉතා බලවත මහත්වූ බල ඇති බ්‍රහ්මචාරීසේක. මේ විදින් මා මලොත් මව්පිය දෙදෙනත් මියත්මුත් රැකීයාමෙක් නම් නැත, අනේ දුක්තම් දෙගුරුන් නොදකිනා දුක්මයයි බැගෑපත්ව හැඬූසේක.

එකල්හි පිළියක් රජ සිතනුයේ මොහු මේ විදින් මෙළේ වීනම් මොහු ගේ ගුරු දෙත්නත් මියෙති, මෙසේ බ්‍රහ්මචාරීවූ තුන්දෙනෙක් මලොත් එකාන්තයෙන් නිරා වදින් මුත් අන් පිටිවහලෙක් නැතැයි හයින් තැතිගෙණ අවුත් ඒ සාමකුමාරයන් දක පින්වත්වූ සාමයෙනි, තොපගේ ශරීර වේදනා වට මුත් මව්පිය දෙදෙනාගේ දුකට නොහඬව කියා මාගේ දිවි ඇතිතෙක් නුඹ ගුරුදෙදෙනාටම කලමනා වතාවතින් අඩුවක් නොව රකින්නෙම්මයයි අස්වසා සතුටු සිත් ඇතිව සාම කුමාරයෝ ඉතා යහපත මාගේ දෙගුරුන් දිවි ඇතිතෙක් රකිම් කී තොපට නමස්කාරවේවා දියුණු දියුණ වැඩෙක් වේවා දුකක් නොවේවා මා ගුරු දෙදෙනාත් යෙහෙන් රැකෙත්වා යනාදීන් රජු කෙරෙහි මෛත්‍රී පතුරුවා ඉක්බිති ඒ රජුට කියන්නාහු මෙතැනැ විත් කා හුනු බවද දෙගුරුන් පා වැඳි බවද දෙවනු දක්ක නොහෙන බවද දෙමව්පියන්ට කියවයි පන්සලට සලකුණුද කියා ඔත්තාවූ සාමයන්ගේ ඒ පිළියක් රජහු බල බලා සිටියදීම යුගනෙත් වැසීගියේය. අනපය විසිර ගියේය. සාමයන්ගේ දිවි තැසීගියේය, යනාදීවූ අවමඞගලවේශය දක ඒ රජ මහා ශොක තැවුලියෙන් ඉස අත තබාගෙණ අඬා වැලප ඇවිදි කල්හි ඒ සාමයන්ට සත්වැනි ජාතියෙහි මව්වූ බහුසොදරී නම් දෙව් දූ දිවැසින් බලන්නී සාමයන් විත් කා වැල්ලේ හුනු බවත් නමන් එනතට නොගිය හොත් සාමයන්ගේ දිවි යන බවත් පිළියක් රජ ලපැලෙන බවත් සාමයන් ගේ දෙමව්පියන්ගේ ජීවිත විනාශවන බවත් දිවසින් දක ආකාශයට පැන නැගී සාමයන් ලඟට අවුත් ඒ රජහට හය ගන්වා නදින් මොලොකින් කටයුතුකාරිය කියා රජහට ඔවාදී දෙගුරුන් මෙතැන් පටන් රකුවයි රජ හට භාරකොට සාමයන් රැකවල් ලාගෙණ සිටියදී ඒ පිළියක් රාජ සාමයන් තොදමා තිබූ පැන් කලය තුමූද ඇරගෙණ අසඞඝතවූ ගමනින් පදසට හතින් පන්සලට එන්නවුන්ගේ එන වේගයෙන්ම දන ඇස් තට හෙයින් දනගතනොහි සාමයන්ගේ ගමනෙක් නොවෙයි සිතා දෙර කවුරුදයි විචාරා මම පිළියක් නම් රජයයි කී කල්හි තෙල පන්සල ඉඳ මිහිරිවූ පල වැල අනුභව කරවයි කී පසුව අනුභව කෙරෙමි කියා පන්සල ඉඳ කවා තිබූ පලවැල දක ඇස් ඇති කෙණෙකුන් කැඩූ පලවැලක්මෙනැයි රජ

කී බස් අසා එසේය, මපුතනුවූ සාමයන් ගෙණා පලවැලයයි මෑනියන් වහන්සේ කී කල්හි එසේය, මෑනියන්වහන්ස, මම ඔවුන් දුටිමි. මූවන් කෙරෙහි කළ ලොභයෙන් මුවකුට හළ ශරය ඒ තමන් විදි පවත් හා සාමයන් වැල්ලේ හුනු බවත් විශෙෂයෙන් සාමයන්ගේ දෙමව්පියන්ට කී කල්හි එසඳ ඒ ගුරු දෙදෙනා ඔවුන් පාමුල් අඩ ගී අනේ මාගේ සාමයන් අප දෙදෙනාගේ මසැස් පෙරලී දිවස් ලදුවාසේ ඇස් නට තැන් පටන් සියලු අත් පා මෙහෙයෙන් අඩුවක් නොව සුවපහස් දෙන්නාවූ මාගේ සාමයෝ කොයි ගියෝද අප දෙදෙනා ඇතුළුවූ සියළු සත්ත්වයන්ට නපුරක්ලෙස බසක් නොකියා සිතිනුත් නොසිතන උපන්තැන් පටන් තුඩ බොරුවක් නොවකා ප්‍රාණඝාතයක් නොකොට නිරන්තරයෙන් පඤ්චශීලය රක්‍ෂා කළාවූ මාගේ සාමයෝ කොයි ගියෝද්‍රෙහෝයි මෙතැන් පටන් කෙසේ රැකෙමෝදැයි ඇස් නවුයේ අදවේදැයි දිවිගියේත් අදවේදැයි යනාදීන් බැගෑපත්ව අඩනාලෙස රජ දූත තෙමේද බොහෝකම්පාවෙන් හඬා සාමයන් මළත් උන් සිටියාසේ සිගලු පලවැලයෙන් මම රකීනෙමි වේදැයි නොයෙක් ක්‍රමයෙන් අස්වසා කීවත් නොගිවිස අඬා වැලප ඉක්බිති ඒ මව්පිය දෙදෙනා කියන්නාහු රජ්ජුරුවෙනි, තොපගේ අත්පා මෙහෙය අපසිතට් නොතැගෙයි, අප රකු නම් අප අත සැරමිටිය අල්වාගෙණ සාමයන් ලඟට යවයි කී කල්හි එසඳ රජතෙම ඒ දෙදෙනා වහන්සේගේ සැරයටි අග අල්වාගෙණවුත් වැල්ලේ වැදහොත් සාමයන් ලඟ සිටුවා තෙල වැලි වැකි ශරීරයෙන් වැදහෝනා තොපගේ පුතනුවත් බලවයි අත අල්වා පෑ කල්හි කල්පාන්ත වහ්නියක් මෙන් ලෙහි වැදගත් මහත් ශොකාග්නියෙන් අඩා ගී ඒ මව්පිය දෙදෙනා සාමයෙන්ගේ සිරිපතුල්සුත් දෙක මෑනියෝ ඔර තබා පියානෝ ඉස ඔර තබාගෙණ නොයෙක් අඳෝනායෙන් අඩා වැලප ලෝකපාල දෙවියන්ට යැද ඉක්බිති මෑනියෝ සිතන්නාහු පණ තමා කඳ ඇද්ද්‍රෙහෝයි පරීක්‍ෂාකරණ මෑනියෝ ලෙහි අත තබා පණ කඳ සැඟවුනු බව දැන එසඳ සත්‍යක්‍රියා කරන්නාහු මාගේ පුතනුවූ සාමකුමාරයන් උපන් තැන් පටන් ජීවිතාන්තය දක්වා අඛණ්ඩවූ බ්‍රහ්මචරියාව රක්‍ෂාකෙළේ සැබෑවීනම් ඒ සත්‍යක්‍රියාවෙන්ද මහණවූ තැන් පටන් අද හිම්කොට අඛණ්ඩකොට රක්‍ෂාකළාවූ අෂ්ටාඞ්ග ශීලයෙහි ආනුභාවයෙන් මේ ජාතියෙහි පටන් නිවන් දකිනා ජාති දක්වා බුඩාදී රත්නත්‍රය විනා අන්‍ය සමයක් නොගණ්නුමෝද නිරන්තරයෙන් තිලකුණු සඳහන් කළමෝද යනාදීන් ඒ දෙදෙනා කළාවූ සත්‍යක්‍රියාවෙන්ද ඒ වෙනෙහි දෙවියන්ගේ ආනුභාවයෙන්ද සාමකුමාරයෝ සිහිලැබ වැදහොත් ඇලයෙන් දෙවන ඇලයට නැමුනු කල්හි පියානන් වහන්සේද මෙසේම සත්‍යක්‍රියා කළ කල්හි දෙවන ඇලයෙන් නැමී වැදහොත්හ. සත්වන ජාතියෙහි තමන්ට මව්වූ බහුසොදරී නම් දෙව්දුවගේ සත්‍යක්‍රියා බලයෙන්ද මව්පිය දෙදෙනාගේ ඇස් ලැබීමද සාමයන්ගේ දිවි ලැබීමද දිවයුරු උදුවීමද යන මේ තුන් කාරණය එකවිටම වූය.

එසඳ කුමාරයෝ අඬන දෙමව්පියන් අසා බිය ගෙණ උන් රජහට අවවාදානුශාසනා කොට පඤ්චශීලයෙහි පිහිටුවා මේ ජාතියේම දෙමව්පියන්ට උපස්ථාන කලවුන්ට දෙවියන් සහායවූ බවත් තමා ජීවිතය ලත් බවත් මව්පිය දෙදෙනා ඇස්ලත් බවත් ප්‍රත්‍යක්‍ෂකොට දුටුවෙදැයි රජහට අනුශාසනා කොට දශරාජ ධර්මයෙන් රාජ්‍යකොට රක්‍ෂාවෙන ලෙසට සමුදී නුවරට යවා තමන් වහන්සේද ජීවිතාන්තය දක්වා දසපින් කිරියවත් පුරා කම්වූ පරිද්දෙන් බ්‍රහ්මලෝකයෙහි උපන්නාහ. එසේ හෙයින් මේ ධර්මදේශනාව ශාස්තෘවූ බුදුරජාතන්වහන්සේ ගෙණහැර දක්වා වදාරා දෙමව්පියන් රක්‍ෂාකිරීම නම් නුවණැති පණ්ඩිතවූ මහෝත්තමයන්ගේ වංශයෙකැයි වදාරා ජාතකය නිමවා වදාළසේක. මේ දේශනාවගේ අවසානයෙහි දෙමව්පියන් රක්‍ෂාකළ භික්‍ෂූහු සෝවාන් පෙලෙහි පිහිටියාහුය.

එකල්හි පිළියක්රජ නම් ආනන්ද ස්ථවිරයෝය, දිව්‍ය ස්ත්‍රී නම් උපුල්වන් මහාස්ථවිරීය, ශක්‍රදෙවේන්‍ද්‍රයෝ නම් අනුරුද්ධ මහාස්ථවිරයෝය, පියානෝ නම් මහාකාශ්‍යප ස්ථවිරයෝය, මෑනියෝ නම් භද්දකාපිලානීය, සාම පණ්ඩිතයෝ නම් බුදුවූ මම්ම වෙම්දැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

529
නිමි ජාතකය

තවද එක්සමයෙක්හි දෙවාතිදෙව වූ ශක්‍රාතිශක්‍ර වූ බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ වන්‍දනීයාභි වන්‍දනීයවූ පූජනීයාභි පූජනීයවූ දසබලධාරීවූ ශාක්‍යසිංහවූ පරදුක්ඛ දුක්ඛිතවූ කරුණා නිධානවූ ලයට සෙනෙහැතිවූ සසරට ප්‍රතිපක්‍ෂවූ නිවණට දොර හළුවාවූ ස්වර්ගයට හිනි පෙති පෙලක් බඳුවූ අපායට අකුල් හෙළූ වියත්කම්හි අග්‍රතැන්පත්වූ අප තිලෝගුරු බුදුරජාතන් වහන්සේ මියුළුනුවර නිසා මුවදෙව් නම් අඹ උයන්හි වැඩ සැරිසරා ඇවිදිනාසේක් එක්තරා සිත්කළුවූ භූමි ප්‍රදේශයක් දැක පූර්ව චරිතය සඳහන් කොට සිනා පහළ කළසේක. ඒ දැක මහ අනඳ තෙරුන්වහන්සේ තරුගණ පිරිවරූ පුන්සඳක් සෙයින් සිව්වණක් පිරිස් මැද වැඩහිඳ නොකරුණෙක බුදුහු සිනහ පහළ නොකරණසේකැයි සිතා හුනස්නෙන් නැගීසිට වමත්පසින් දකුණත් පසට ගොස් උක්කුටුකයෙන් හිඳ දෙහොත් මුදුනෙහි තබා ස්වාමීනී සිනා පහළකළ කරුණු කිමෙක්ද? අසන්නා කැමැත්තම්හයි පුළුවුත්හ. එබස් අසා බුදුහු වදාරණසේක් එම්බා ආනන්දයෙනි, මේ භූමිප්‍රදේශය නම් මා පෙර මඛාදේව රජකල ධ්‍යාන කෙළි කළ විසූ තැනයයි මෙසේ අනඳ මහතෙරුන්වහන්සේ විසින් ආරාධිතවූ බුදුහු සිනා පහළකළ කරුණු වදාළ සේක. එබස් අසා අනඳ මහතෙරුන්වහන්සේ වදාරණසේක් ස්වාමීනි, ඒ විශේෂයෙන් අසන්නා කැමැත්තම්හයි ආරාධනා කළසේක. බුදුරජාතන් වහන්සේ යුගඳුරු මුදුනෙහි දිලියෙන සහස්‍ර කිරණයා සේ ප්‍රඥප්තවර බුද්ධාසනාරූඪව වැඩහිඳ බ්‍රහ්මඝොෂා විහිදුවා මේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යිටගියදවස වේදේහරට මියුලුනුවර මඛාදේව නම් රජ්ජුරුකෙණෙක් වූහ. ඒ රජ්ජුරුවෝ සුවාසූදහසක් අවුරුදු කුමාර කෙළි කෙළ සුවාසූදහසක් අවුරුදු යුවරජකම් කොට සුවාසූදහසක් අවුරුදු මහ රජකම් කරණ කල්හි මගුල් කපුවාට මෙසේ කීහ. යහලු කපුව, යම් දවසෙක තෝ මාගේ හිස නර කෙස් දුටුයෙහි වී නම් එකල මට කියවයි කීහ. මෑතභාගයෙහි කපුවා හිස නර කෙසක් දැක රජහට කියා රන්අඬුවෙන් උදුරා අත්ලෙහි තුබූකල නර කෙස් දැක මරණ ඇවිත් නළලට පැමිණියාක් වැනි වීයයි නුවණින් බලා දැන් මට මහණවන්ට කලැයි සිතා මගුල් කපුවාට ගම්වරයක්දී ජ්‍යෙෂ්ඨ පුත්‍රයා කැඳවා දරුව රාජ්‍යය පිළිගණුව, මම මහණවෙමියි කී කල තුඹවන්සේ මහණවන කාරණය කවරේදැයි විචාළ සඳ:-

උත්තමඞ්ගරුහා මය්හං–ඉමෙ ජාතා වයො හරා
පාතුභූතා දෙවදූතා –පබ්බජ්ජා සමයො මමනති.

යනාදීන් පුත, සත්‍වයන්ට හිස නරකෙස් හටගැණීම නම් මරණ ලංබව කියන්ට එන දේවදූතයන්වැන්න, එසේහෙයින් මාගේ හිස නරකෙස් හටගත. ඒ කාරණයෙන් මම ජරාවට පැමිණියෙමි, මහණවනු කැමැත්තෙමි. තෙපි රාජ්‍යය කරවු කියා අවවාදකොට නුවරින් නික්ම මූවදෙව් නම් උයනෙහිදී ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව අසූසාරදහසක් අවුරුදු සතර බ්‍රහ්මවිහාර භාවනා කොට නොපිරිහුණු ධ්‍යානයෙන් බඹලොව ගියහ.

ඒ මඛාදේව මහරජහුගේ පුත්‍රවූ රජ්ජුරුවෝද හිස නර කෙස් දැක මගුල් කපුවාට ගම්වරය දී දෙට පුත්හට රාජ්‍යය දී මූවදෙව් නම් උයනට ගොස් මහණව නොපිරිහුනු ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලෝක පරායණවූහ. මෙසේ ඔහුගේ පුත්‍රයායයි දෙදෙනෙක් අඩු සුවාසූදහසක් රජහු හිස නරකෙස් දැක මගුල්කපුවාට ගම්වරය දී දෙට පුත්හට රාජ්‍යය දී මෙම අඹ උයනෙහි පැවිදිව සතර බ්‍රහ්ම විහාර භාවනා කොට බඹලොව ගියපසු පළමුව උපන් මඛාදෙව නම් රජතෙම බඹලොව සිට තමාගේ වංශය බලන්නේ දෙදෙනෙක් ඌනු සුවාසූදහසක් රජහු පැවිදිව බඹලොව ගිය බව දැක සතුටුව මෙයින් මතු පවතීදැයි බලා නොපවත්නා බව දැන මාගේ ප්‍රව්‍රජ්‍යා වංශය මම්ම කඩ නොකොට පිහිටුවමියි සිතා එයින් චුතව මියුලුනුවර මහ රජහුගේ අග මෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ දසමසකින් මව් කුසින් බිහිවූයේය.

ඕහට නම්තබන දවස් නිමිත්ත පාඨකයෝ ලක්ෂණ බලා මහරජ්ජුරුවන් වහන්ස, මේ රජ කුමරුවා තුඹවහන්සේගේ වංශය රක්ෂාකිරීමට උපන්නෝය, තුඹවහන්සේගේ වංශය නම් පැවිදිවන වංශය මොහු ඉක්ම

තොම වන්නේයයි කීවාහුය. එබස් අසා රජතෙම කියනුයේ මේ රාජකුමාර තෙම මාගේ වංශයට රථ සකෙහි නෙමියක් මෙන් වංශය රකිමින් උපන් හෙයින් නිමිකුමාරයෝ යයි නම් තැබීය. ඒ නිමිකුමාරයෝ බාලකල පටන් දන් දෙමින් නිති පන්සිල් හා පොහොය පෙහෙවස් රකිමින් කුශල කරණ යෙහි අභිරති ඇතිව වෙසෙති.

ඉක්බිති පියරජ්ජුරුවෝ පලමුලෙසටම නරකෙස දුක මගුල් කපුවාට ගම්වරයදී නිමි කුමාරයන්ට රජ්‍යය දී අඹඋයනේ පැවිදිව බ්‍රහ්මලෝක පරායන වූහ. ඉක්බිති නිමි රජ්ජුරුවෝ දන්දීමෙහි ඇලුම් ඇතිහෙයින් නුවර සතර දොර හා නුවර මැදදූයි දන ශලා පසක් කරවා දවස පන්ලක්‍ෂයක් ධන විසඳා මහදන් පැවැත්වූහ. නිරන්තරයෙන් පන්සිල් හා පොහොය අටසිල් රක්ති, මහාජනයා දනාදී කුශලධර්මයෙහි සමාදන් කොට ස්වර්ග මාර්ගය කියා අනුශාසනා කොට නැවත නරක හයින් නැති ගන්වා ධර්මදේශනා කරනසේක ඒ රජ්ජුරුවන්ගේ අවවාදයෙහි සිට දනාදී පින්කම් කොට මළාවූ සත්ත්වයෝ දිව්‍යලෝකයෙහි උපදිති. එකල දෙව්ලෝ පිරී නරකාදිය සිස්වූ කලක් මෙන් විය එකල තව්තිසා දිව්‍යලෝකයෙහි දෙවියෝ සුධර්ම නම් දිව්‍යසභාවට රැස්ව අහෝ අපගේ ආචාර්යවූ නිමි රජ්ජුරුවන් නිසා බුදු නුවණින්දු පිරිසිඳ නොදතහැකි මේ සා දිව්‍යසම්පත්තියක් අපි ලැබ අනුභව කරම්හයි කියා ඒ මහත්මාතන්ගේ ගුණ වර්ණනා කලාහුය. මිනිස් ලොවද ඔබගේ ගුණ මුහුද පිට ඉසි තෙලිත්තක් මෙන් පතළේය. ඒ බව ප්‍රකාශ කොට වදාරණ බුදු රජාණන්වහන්සේ මෙ වදාළසේක.

අච්ඡේරං වත ලොකස්මිං – උප්පජ්ජන්ති විචක්ඛණා
යදා අහු නිමිරාජා – පණ්ඩිතො කුසලත්ථිකො
රාජා සබ්බවිදෙහානං – අදා දානං අරින්දමො
තස්ස තං දදතො දානං – සඞ්කප්පො උදපජ්ජථ
දානං වා බ්‍රහ්මචරියං වා – කතමංසු මහප්ඵලන්ති.

ඒ නිමි රජ්ජුරුවෝ පසළොස්වක් පොහෝ දිනෙහි සර්වාභරණ ගලවා ශ්‍රී යහනෙහි තබා පෙහෙවස් සමාදන්ව සැතපී පශ්චිම යාමයෙහි පිබිද පලක් බැඳ යහන්මතුයෙහි හිඳ මෙසේ සැකයක් සිතූය.
කෙසේවූ සැකයක්ද? යත්

මම වනාහි මහජනයාට නිතිපතා ප්‍රමාණාතික්‍රාන්තවූ මහදන් දෙමි, නිත්‍ය ශීල වශයෙන් පන්සිල් රක්‍ෂා කෙළෙමි, මේ දෙකින් දානයෙහි ඵල මහත්වේද්දෝහෝ ශීලයෙහි ඵල මහත් වේද්දෝහෝයි මෙසේවූ සැකයක් සිතා ඒ සැකය පසිඳපියනොහී උන්හ. එසේ සිතූ ක්‍ෂණයෙහි දෙලක්‍ෂ සතළිස් දහසක් යොදුන් ඝනකඩ මහබොල් පොළොව හුණු විය. සද්දනතලා

සත්කුල පව්වද හුණුවිය, කිරි මූහුද පබලු මූහුද වෛඩූර්‍ය්‍යී මූහුද එකපැහැර හුණුවිය, එක්ලක්‍ෂ අටසැට දහසක් දියුණුවූ තුන්ලක්‍ෂ සතළිස් දහසක් ගව් උස මෙරමුදුනෙහි පිහිටි දසදහසක් යොදුන් තව්තිසා දෙව්නුවර හුණුවිය, සක්දෙව්රජහුගේ එකපුණ්ඩරික නම් උයනෙහි පිහිටි සියක් යොදුන් උස ඇති පරසතුරුක මුල පැනතැගී දිග සැට යොදුන් පුළුල පණස් යොදුන් උස පසළොස් යොදුන් බඳුවද පෙක්තක බඳු පැහැ ඇති උන්කල තාභිය දක්වා ගැලීයන තැගිකල බෙර ඇසක් සේ සමවත පාණ්ඩුකම්බල ශෛලාසනය හුණුවිය, එවිට සක්දෙව්රජ අස්නෙහි හිඳපිය නොගී කාටවූ විපතක්දෝහෝයි දහසක් නුවණැස් ලා බලනුයේ මහබෝසතුන් සිත උපන් කුකුස් දැක උදකලාවම වහා අවුත් සියලු රාජභවනය එකාලොක කොට ශ්‍රී යහන් ගබඩාවට පැමිණ ආලෝක පතුරවා ආකාශයෙහි සිටියේය.

එවිට නිමි රජ්ජුරුවෝ ලොමු දැහැගත් ශරීර ඇතිව ශක්‍රයන් අතින් මෙසේ විචාරණුවෝ මේ සා වර්‍ණයකින් යුක්තව සිටියාවූ තෙපි මහානුභාව සම්පන්න දේවතාවෙක්ද? ගාන්‍ධර්‍වයක්ද ? නොහොත් ශක්‍රදේවේන්ද්‍රයාදැයි විචාළහ. එවිට ශක්‍රයෝ මහරජ භයනුවූව මැනව, නුඹවහන්සේගේ සිත උපන් සැක පසිඳන පිණිස ආවාවූ මම ශක්‍රයෙමි. මනුජේන්ද්‍රය නොපට කැමති පැනයක් මා අතින් විචාළ මැනවැයි කීහ. මෙසේ ශක්‍රයා විසින් අවකාශ ලත් මහරජ්ජුරුවෝ කියන්නාහු එම්බා භූතෙශ්වරවූ ශක්‍රදේවේන්‍ද්‍රය දානය, ශීලය යි කියනලද ද්විප්‍රකාර ධර්‍මයන් කෙරෙන් කවරෙක් මහත්ඵල දැයි විචාළසේක. එවිට ශක්‍රයෝ:-

හීනෙන බ්‍රහ්මචරියෙන-ඛත්තියෙ උපපජ්ජති
මජ්ඣිමෙන ච දෙවත්තං-උත්තමෙන විසුජ්ඣති.

යනු හෙයින් මහරජ හීනබ්‍රහ්මචරියාවෙන් රජව උපදනේය. මධ්‍යම බ්‍රහ්මචරියාවෙන් දෙවිව උපදනේය. උත්තම බ්‍රහ්මචරියාවෙන් පිරිසිදු වන්නේය. ඒ තීර්‍ත්‍ථායතනයෙහි මෛථුන විරතිය හීන නම් වෙයි, ධ්‍යාන යාගේ උපචාර මාත්‍රයක් මධ්‍යමවෙයි, අෂ්ටසමාපත්ති ඉපදවීම වනාහි උත්තම වෙයි, ඒ කාරණයෙන් බාහිර තාපසයෝ බඹලොව උපදනා හෙයින් ධ්‍යානය නිර්‍වාණයයි කියති, හෙවත් මේ ශාසනයෙහි වනාහි පිරිසිදු සිල් ඇති මහණ එක්තරා දිව්‍යනිකායෙක් පතානම් ඔවුන්ගේ බ්‍රහ්මචරියා චෙතනාව හීනහෙයින් හීන නම් වෙයි, ඔහු පැතූලෙස දිව්‍යලෝකයෙහි උපදනේය. පිරිසිදු සිල් ඇත්තහුගේ අෂ්ටසමාපත්ති ඉපදවීම මධ්‍යම වන්නේය. ඔහු බ්‍රහ්මලොක යෙහි උපදනෙය. පිරිසිදු ශීලයෙහි සිට විදර්‍ශනා වඩා රහත්වීම උත්තම වන්නේය. මේ කාරණයෙන් පිරිසිදු වන්නේයයි මෙසේ ශක්‍රයෝ කීහ. දානයට වඩා සතසහස්‍ර ගුණයෙන් සිල්රැකීම මහත්ඵල මහානිශංසය යි වර්‍ණනා කළහ.

තවද මහරජ අතීතයෙහි දුදීපය, සාගරය, සෙලය, මුචලින්දය, භගීරථය, උසිනරය, අට්ඨකය, අස්සකය, පඨඤ්ජුනය, යන මේ මහ රජදරුවෝද අනිකුදු ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී බෙහෝදෙනද අනෙක ප්‍රකාර දන්දී මරණින් මත්තෙහි කාමස්වර්ගයෙහිම උපන්හ.

යාමහනු නම් තාපසයෝය, සොමයාග නම් තාපසයෝය, මනොජව නම් තාපසයෝය, සමුද්‍ර නම් තාපසයෝය, මාඝ නම් තාපසයෝය, භරත නම් තාපසයෝය, කාලිකාරක්ඛිය නම් තාපසයෝය, අංගීරස නම් තාපසයෝය, කාශ්‍යප නම් තාපසයෝය, කිසවච්ච නම් තාපසයෝය, අකිත්ති නම් තාපසයෝය, යන මේ ඍෂිවරයෝ එකොළොස්දෙන සිල්රක්ෂා කොට දෙව්ලොව ඉක්ම බඹලොව උපන්නාහ.

තවද ශීලය මහත්බව හඟවන පිණිස කථාවක් දක්වන්නාවූ ශක්‍රයෝ මහරජ අතීතයෙහි උතුරු හිමවත සුවර්ණ පර්වත දෙකට අතරෙන් පැවැත්තාවූ බොහෝ දුරට ගියාවූ ගැඹුරුවූ ඉතා සියුම් වූ ජල ඇති හෙයින් යටත් පිරිසෙයින් මොණර පිලකුදු එහි බහාලූව සිඳනය කරණ හෙයින් සීදා නම්වූ ගඞ්ගාවක් වූවය. ඒ සීදා නම් ගංතෙර රන් පර්වතයෝ දිලිසෙන ගිනිදූලක් මෙන් ආලෝක කෙරෙති. ඒ ගඞ්ගාවගේ දෙගොඩ තුවරලා ආදි සුගන්ධ ද්‍රව්‍යයෙන් හා පුෂ්ප ඵල පල්ලව භාරධාරිත වෘක්ෂයෙන් සඤ්ඡන්න විය. මෙසේ සිත්කළුවූ භූම ප්‍රදේශයෙහි දසදහසක් ඍෂිවරයෝ වාසය කෙරෙති. ඒ සියල්ලෝ පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ලාභිහුමය, ඔවුන් කෙරෙන් කිසි කෙණෙක් සිඟායන වේලෙහි උතුරුකුරු දිවයිනට යෙති. කෙණෙක් මහදඹ ගෙණෙති, කිසි කෙණෙක් හිමාලයෙහිදීම මිහිරි පලාපලයන් ගෙණැවිත් වළඳති, සමහර කෙණෙක් දඹදිව ඒ ඒ නුවරවලටම ගොස් සිඟා වළඳති, ඉන් එක කෙණෙකුදු රස තෘෂ්ණාදියෙහි නොබැදී ධ්‍යාන සුවයෙන් දවස් අරිති, එකල්හි එක් තාපස කෙනෙක් ආකාශයෙන් බරණැස් නුවරට ගොස් මනාකොට හැඳ පෙරව පිඬු පිණිස හැසිරෙමින් පුරෝහිත බ්‍රාහ්මණයාගේ ගෙදොරට පැමිණිසේක. පුරෝහිත තෙම උත්වහන්සේගේ ඊර්යාපථයෙහි පැහැද ඇතුළුගෙට වඩාගෙණ ගොස් දන් වළඳවා එසේම කීප දවසක් උපස්ථානකොට විශ්වාස බවට පැමිණ ස්වාමීනි! නුඹවහන්සේ වසන තැන් කොයිදැයි විචාරා අසවල් තැනයයි කී කල්හි කිමෙක්ද? නුඹවහන්සේ තනිවම වැඩවසන සේක්ද? අතික් කෙණෙක් ඇද්දැයි කී කල පින්වත කුමක් කියාද? ඒ ආශ්‍රම පදයෙහි අසූදහසක් ඍෂිහු වෙසෙති, ඔවුහු සියල්ලෝම පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ලාභීහුයයි කීසේක.

එවිට උත්වහන්සේලාගේ ගුණ අසා ඕනට මහණවීමට සිත නැමී තැවත ස්වාමීනි මාද එතනට කැඳවාගෙණ ගොස් පැවිදිකරවා වදාල මැනවයි කීකල තාපසයෝ කියන්නාහු ඇවැත්නි! නුඹ රාජපුරුෂයෙක පැවිදි

කරණට නොහැකියයි කීකල එසේ වීනම් සවාමීනි අද මම රජ්ජුරුන්ව විචාරා අවසර ගණිමි, නුඹවහන්සේද සෙට මෙතනට වැඩිය මැනවයි කිවුය. තාපසයෝද ඉවසූහ, පුරෝහිතතෙම උදය බත් අනුභවකොට රජ්ජුරුවන් කරා ගොස් දේවයන්වහන්ස! මම මහණවන්නට තැමැත්තෙමි, අවසර දුන මැනවයි කීය. ආචාර්‍යයීයෙනි! කවර කාරණයක් පිණිස මහණ වන්නාහුදැයි විචාළ කල කාමයෙහි ආදීනව හා මහණ වීමෙහි ආනිශංසය දැකයයි කීය, එසේවීනම් තෙපි මහණව මා දක්වයි කීකල ඔහු යහපතැයි පිළිගෙණ ගොස් පුත්‍රදාරාවන්ට අනුශාසනා කොට සියලු සැපත් දක්වා දී තමන් ශ්‍රමණ පරිෂ්කාර ගෙණ තාපසයන් එන පෙර මග බලමින් උන්නේය, තාපසයෝද එසේම ආකාශයෙන් අවුත් ඇතුළු නුවරට පැමිණ ඔහුගේ ගෙට වැඩිසේක. ඔහු උන්වහන්සේ සකස්කොට වළඳවා සවාමීනි! මා විසින් කුමක් කටයුතුදැයි විචාළේය. උන්වහන්සේ ඔහු නුවරින් පිටතට ගෙණ ගොස් අත අල්වාගෙණ තමාගේ ආනුභාවයෙන් ඒ ආශ්‍රමයට ගෙණගොස් පැවිදිකරවා දෙවන දවස් බත් සිඟාගෙණ දී කසිත පරිකර්‍ම ඉගැන්වූසේක. ඔහු කීපදවසකින්ම පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා තෙමේම පිඩු සිඟා අනුභවකොට මෑත භාගයෙහි මම රජ්ජුරුවන්ට දුත් ප්‍රතිඥාවෙන් මිදෙමියි සිතා තාපසවරුන් වැඳ ආකාශයෙන් බරණැසට ගොස් සිඟමින් රාජද්වාරයට පැමිණිසේක. රජ්ජුරුවෝ තාපසයන් දැක ඇඳින ඇතුළු රජගෙට කැඳවා සත්කාර කොට සවාමීනි! කොතැන්හි වසනසේක්දැයි විචාළාහ. මහරජ උතුරු හිමවත්පස සුවර්‍ණ පර්‍වත අතරෙන් පවත්නා සීදා නම් ගංතෙරයයි කීසේක. කිමෙක්ද නුඹවහන්සේ පමණක් උදකලාව වසනසේක්ද? අනික් කෙණෙක් එහි ඇද්දැයි විචාළහ.

එවිට තාපසයෝ මහරජ කුමක් කියව්ද? අභිඥා සමාපත්තිලාභීවූ දසදහසක් තාපසවරු එහි වසන්නාහුයයි කීසේක. රජ්ජුරුවෝ ඒ තාපස වරුන්ගේ ගුණ කථා අසා හැමදෙනා වහන්සේටම දන් දෙනු කැමතිව ඒ තාපසයන්ට මෙසේ කීහ. සවාමීනි! මම ඒ සියලු ඍෂීන් වහන්සේලාට දන් දෙනු කැමැත්තෙමියි කී කල මහරජ මම කුමක් කෙරෙම්ද? ඍෂිවරයෝ රසයෙහි ගිජු නොවන හෙයින් මෙහි කැඳවාගෙණ එන්ට නොහැක්කෝයයි කී කල සවාමීනි! නුඹවහන්සේ නිසා ඒ සියලු තාපසවරුන් වළඳවමි, ඊට මට උපායෙක් කිවමැනවයි කිවුය. මහරජ එසේ උන්වහන්සේලාට දන් දෙනු කැමැත්තහු නම් මෙයින් නික්ම ගොස් සීදා නම් ගංතෙර වසමින් ඒ තාපසවරුන්ට දන් දෙවයි කීසේක.

එවිට රජ්ජුරුවෝ යහපතැයි පිළිගෙණ සියලු උපකරණ ගෙන්වාගෙණ චතුරඞ්ගිණී සේනාව හා සමඟ නික්ම තමන්ගේ රාජ්‍ය සීමාවට පැමිණියෝය, නැවත ඒ තාපසයෝ තමන්ගේ ආනුභාවයෙන් සේනාව හා සමඟ රජ්ජුරු

වත් සීඝ්‍ර නම් ගංතෙරට පමුණුවා ගංතෙර කඳවුරක් කොට ආකාශයෙන් තමන් වසන තැනට ගොස්දෙවන දවස් නැවත අවුය. ඉක්බිති රජ්ජුරුවෝ තාපසයන් සකස්කොට වළඳවා ස්වාමීනි! සෙට දවස දහසක් තාපසවරුන් කැඳවාගෙණ මෙතනටම වැඩිය මැනවයි කීහ. තාපසයෝ යහපතැයි කියා ඒ වචනය පිළිගෙණ ගොස් දෙවන දවස් භික්ෂාචාර වේලාවට තාපසවරුන් කරා ගොස් මෙසේ කිවුය, පින්වත්නි, බරණැස් රජ්ජුරුවෝ නුඹ වහන්සේලාට දන් දෙමියි අවුත් සීඝ්‍ර නම් ගංතෙර ඉඳ නුඹවහන්සේලාට ආරාධනා කළහ. ඒ රජ්ජුරුවන් කෙරෙහි කරුණාවෙන් කඳවුරට ගොස් ආහාර වැළඳුව මැනවයි කී කල යහපතැයි පිළිගෙණ හැමදෙනම ආකාශයෙන් ගොස් කඳවුරට නුදුරු තෙන බටසේක්ලාය රජ්ජුරුවෝ ඉදිරියට ගොස් කඳවුරට වඩාගෙණ ගොස් අසුන්වල වඩා හිඳුවා ප්‍රණීත ආහාරයෙන් සන්තර්පණය කොට ඔවුන් ඊර්යාපථයෙහි පැහැද සෙට දවසටද ආරාධනා කළහ. මේ ආකාරයෙන් දසදහසක් අවුරුදු දන්දුන්හ. දන් දෙමිනුත් එම ගංතෙරට නුවරක් කරවා ගොවිතැන් කර්මාන්ත කරවූහ.

මහරජ! ඒ රජ්ජුරුවෝ වනාහි අනික් කෙණෙක් නොවෙති, මම්මය. මෙසේ මම එකල දන්දීමෙන් ශ්‍රෙෂ්ඨව මහදන් දී දෙව්ලොව ඉක්මවා බ්‍රහ්ම ලොකයෙහි ඉපදීමට නොහැකි වීමි, මා දුන් දන් වළඳා සිල් රැකි තාපසවරු කාමලෝකය ඉක්ම බඹලොව උපන්නාහ. මහරජ මම දානයෙන් ශ්‍රෙෂ්ඨවීමී, ඒ තාපසවරු ශීලයෙන්ද ඉන්ද්‍රිය දමනයෙන්ද උපචාර සමාධියෙන්ද අර්පණා සමාධියෙන්ද කාය විවේක චිත්ත විවේකයෙන්ද යන මේ ආදී ව්‍රත සමාදාන යෙන්ද උත්තමවූහ, අතිශයින් ශ්‍රෙෂ්ඨවූහ.

තවද මහරජ! දසදහසක් තවුසන් අතරෙන් එක්කෙණෙකුදු කායවඬකා දියක් නැති හෙයින් හීනයයි නොහැර ජාති නොවිචාරා ඔවුන්ගේ ගුණයෙහි පැහැදි සිතින් ඉතා බොහෝවූ කලක් නමස්කාර කෙරෙමි, කුමක් නිසාද කිව හොත් සත්ත්වයා මේ කුශලකර්මය බන්ධුකොට ඇත්තේය. කර්ම පිළිසරණ කොට ඇත්තේයයි මෙසේ දාන ශීලාදී කුශල ධර්මයන් වර්ණනාකොට කියා මහරජ! දානයට වඩා ශීලය මහත්ඵල මහානිශංස වන්නේය. මහරජ! තෙපි වනාහි දාන ශීල දෙක සිතව් මේ දෙකෙහිම අප්‍රමාදව දන් දෙව සිල්රකුවයි අනුශාසනා කොට දෙව්ලොවටම ගියාහ. එසේ ගිය සක්දෙව් රජහු දැක ඒ දෙව්ලෝ වැසි දෙවියෝද, සතරවරම් රජහුද, බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වරයෝද මාතලී දෙව්පුත් ඇතුළුවූ සුදම්දෙව් සභාවට රැස්වූ දෙවියෝ හැමදෙනාම මහාරජාණෙනි! කොයට ගොස් ලස්වූදැයි පුළුවුත් කල්හි සක්දෙව්රජ කියන්නේ මිනිස්ලොව මියුලුනුවර රජකරණ නිමි මහරජාණන් සිත උපන් කුකුස් වත් පසිඳින්ට ගියෙමි කීහ, එබස් අසා හැමදෙවියෝ කියන්නාහු ඒ නිමි මහරජාණෝ අප ගුරුය, උන්ගේ අවවාදයෙහි සිට මිනිස්ලොවදී පින්

කොට දිවසැපත් ලදුම්හ, එසේහෙයින් උන් කරා ගොස් බණ අසා එන්ට යම්හයි කිවුය. එබස් අසා සක්දෙවුරජ කියන්නේ තොප හැම ඔබගියොත් අසුරයෝ අවුත් තොප හැමගේ විමන් පැහැර ගන්තුතම් අහෙතුය, ඒ නිමි මහ රජාතන් මොබ ගෙන්වාගෙණ බණ අසම්හයි කීහ. එබස් අසා හැම දෙවියෝ සතුටුව ගිවිස්වාහ.

සක්දෙව්රජ මාතලී දෙව්පුත් කැඳවා කියන්නේ මා නැගෙන පත් සියයක් යොදුන් නාරිවාහන නම් රථය සෙන්ධවයන් දහසක් යොදා දිව මල් දිව සුවඳ දිව සළු දිව්‍යාභරණ ගෙණ මිනිස්ලොව මියුළුනුවර රජ කරණ නිමි මහරජාතන් කරා ගොස් ගඳ දියෙන් නාවා දිවසළු හඳවා දිවමල් දිව අබරණ පලඳවා දහසක් දිවදුහුලින් හිස සිසාරා සරහා කැඳවාගෙණ එවයි කීය, ඒ අසා මාතලි දෙව්පුත් නාරිවාහන රථය දහසක් සෙන්ධවයන් යොදාගෙණ දිවමල් දිව සළු දිවඅබරණ ගෙණ තව්තිසා දෙව්ලොවින් අවුත් පැදුම් මුහුදින් නැගෙනා දෙපෝ මැද පුන්සඳක්සේ මියුලුනුවර තුන්විටක් පැදකුණු කොට නිමි මහරජාතන් පාකුස්හි රථය එලවා සිට කියන්නේ නිමි මහරජානෙනී! දෙදෙව්ලොව දෙවින්ට අධිපතිවූ නායක සක්දෙව් රජ තමන් නැගෙන පන්සියයක් යොදුන් නාරිවාහන නම් රථයෙහි දහසක් සෙන්ධවයන් යොදා දිවගඳ දිවසළු දිවමල් දිවපලඳනා පලඳවා දෙව්ලොව ගෙණයන්ට එවීය. නුඹ වහන්සේ සුවඳපැනින් නහා දිවසළු හැඳ දිවමල් දිවපලඳනා පැලඳ දහසක් දිවදුහුලින් හිස සිසාරා සැරහී රථයට නැගී අවමැනවයි කීය.

බෝසතානෝ මාතලී දෙව්පුත් අතින් එබස් අසා සතුටුව තමන්ගේ ඇමති මහජනයා කැඳවා කියන්නාහු දෙදෙව් ලොවට අධිපතිවූ සක්දෙව්රජ දෙදෙව් ලෝ වැසි දෙවියන් හා සමග අප අතින් බණ අසන පරිද්දෙන් දෙව්ලෝ ගෙණයන්ට තමන් නැගෙන නාරිවාහන නම් පන්සියයක් යොදුන් රථය දහසක් සෙන්ධයන් යොදා දිවසළු දිවමල් දිවඅබරණ දී මාතලී දෙව් පුත් එවීය, අප ඔබ ගොස් බණ කියා එනතෙක් අප තුමූ පිළිවෙළ නොවරදවා රකුවයි කියා සත්රුවන් ඔවුනුපුදා පමානොවී දන්දෙවයි දන්වැට පවත්වා සතතයෙන් පන්සිල් රැක පොහොය අටසිල් රැක වාසය කරවයි අවවාද දී මියුලු නුවර පැදකුණුකොට බොහෝ දෙනා කරණලද පූජාසත්කාර විඳ රන් ගල් ගුහාවකින් නික්මුණු කෙසර සිංහරාජයකුසේ දෙපෝමැද නැගී පුන් සඳක්සේ රථයට නැංගාහුය, රථය බොහෝදෙනා බල බලා සිටියදීම සුවණ්ණ හංස රාජයකුසේ ආකාශයට පැනනැගී ගමන්ගත් කල්හි මාතලී දෙව්පුත් කියන්නේ මහරජානෙනි! පින්කළවුන් වසන දෙව්ලොව බලා පදිම්ද? පව් කළවුන් වසන නරකය බලා පදිම්දැයි කීය, නිමි මහරජානෝ නරකය බලා පදුවයි කීහ, නරකයබලා පදුන්ම නිමි මහරජහට තුන්ගව් පමණ සිරුරවීය, ගව් පමණ මිණි ඔටුන්න විය, මාවැලිගඟ සා මුත්හරවිය, අභයගිරි වෙහෙර සා මිණි කොඬොල් විය, සැටගැලක් පමණ ආභරණ විය, දොළොස් යොදුන් දිවදුහුල් විය, හිසට රන් සේසත්විය. මෙසේ ශක්‍රවෙස් පහළවිය, මාතලී දෙව්පුත් රථය

නරකය බලා පදනේ පළමුකොට වෙතරණී නම් නරකය දක්වීය. ඒ නරකයෙහි දිග සැටයොදුන, පුළුල සැටයොදුන, ගැඹුර සැටයොදුන, ඒ නරකය සිසාරා ගිනිගෙණ දිලියෙන නවයොදුන් බොල යපවුරෙන් ක්‍ෂෙමවූයේය. මුදුනෙහි පියලතලද ගිනිගෙණ දිලියෙන නව යොදුන් බොල යපියන් පතින් ක්‍ෂෙම වූයේය. මේ නරකය කකිය කකියා තිබෙන ලෝදියෙන් පිරුණේය. මේ ලෝදියෙන් නැගෙන ගිනිමුදුනේ පියාලතලද නව යොදුන් බොල යකබල මත්තේ නව යොත්තක් වට ඇවිලෙන ගිනි නැගෙයි, මේ නරකයෙහි ලෝදිය අතරතුරෙහි ගවු පමණ යෙල ගවු පමණ සියුම් මුවහත්ඇති කඩුපත් වේරුණීත් ගැවසී ගත්තාහ. මේ නරකයෙහි අකුසල් කළවුන් පැසෙන පරිදි කෙසේද යත්? දෙසී තුන්සී කළ තණමිටියක් සෙයින් ඇට නහර කැඞී කැඞී බිඳි බිඳී පුත්පුත්ව යෙත්මය. නැවත කම්බලයෙන් ඉපද එම දියෙහි රළ ගැසීමෙන් උඩු යටිව පැසිපැසී පුත්පුත්ව යෙත්. මොවුන් මෙසේ මහ දුක් ගෙණ පැසෙන් නවුන් දක තිම් මහරජානෝ හයින් වෙව්ලා ගොස් මාතලිය, මේ නරකයේ මෙසේ දුක් ගෙණ පැසෙන නිරිසත්තු කුමන පව් කළෝදයි විචාළාහ. එබස් අසා මාතලී දෙව්පුත් කියන්නේ මහරජ, මේ නිරිසත්තුන් තමන් මිනිස්පිය ලත් කල්හි අනාචාසව තුබූ දැගැබ් පිළිම ගෙවල් කැලයේ වල් කොටා දූවුවන් හා කුසලාන් බුඩභොග කැවුන් හා අසුන්වල හිඳ නොබදු බදු කළවුන් අවුත් පැසෙන නරකයයි කීය.

ඒ නිරය අදිස්නාකොට නැවත ඔසුපත් නම් නරකය දක්වීය. ඒ නරකයෙහි දිග පණස් යොදුන, පුළුල පණස් යොදුන. ගැඹුර පණස් යොදුන, මේ නරකය සිසාරා ගිනිගෙණ දිලියෙන නවයොදුන් බොලයපවුරෙන් ක්‍ෂෙම වූයේය. මුදුනෙහි පියාලතලද නවයොදුන් බොල ගිනිගෙණ දිලියෙන යපියන් පතින් ක්‍ෂෙම වූයේය. මේ නරකයෙහි කඩිසිනි කෙණෙකුන්ගේ මහත කියත් රිය සක් හා ඇස් ඇත්තාහ. ගවුදිග දළ ඇත්තාහ, නාඹ ඇතුන් හා බඳ ඇත්තාහ, මේ නරකයෙහි පැසෙන පව්කළවුන් මේ සත්තු උනුන් වටලා ඇට නහර බිඳිති, නැවත නැවත කම්බලයෙන් උපදිත්. මොවුන් විඳිනා දුක් දක තිම් මහ රජානෝ මාතලිය, මොහු කුමන පව්කළ මිනිස්සුදැයි විචාළහ මහරජ මේ නිරිසතුන් තමන් මිනිස් පියලත් කල්හි සෙනසුන් දගැබ් බෝකොටු බඳවම්හයි කියාද, අම්බලම් ඒදඬු ලවම්හයි කියාද වස්තු සිඟාගෙණ ඒ ඒ තම් නැගු දෙය නොකරවා ලොභකොට තමන්ගෙන් දෙම්හයි කියා විකොට කෑවුන් පැසෙන නරකයයි කීය.

ඒ නිරය අදිස්නාකොට ලෝකුඹු නම් නිරය දක්විය. ඒ නරකයෙහි දිග දහසක් යොදුන, පුළුල දහසක් යොදුන, ගැඹුර දහසක් යොදුන, මේ නරකය සිසරා ගිනිගෙණ දිලියෙන නවයොදුන් බොලයපවුරෙන් ක්‍ෂෙමවූයේය. මුදුනෙහි පියාලතලද නව යොදුන් බොල යපියන්පතින් ක්‍ෂෙමවූයේය. මේ නරකයෙහි සතර දිසාවෙහි සතර මහා දොරකින් ක්‍ෂෙමවූයේය. මේ නරකය දහසක් යොදුන් පල්ලේ සිට මෝවිට දක්වා ගිනිගෙණ දිලියෙන ලෝදියෙන් පිරුණේය. මේ නරකයෙහි ලෝදිය රසදියසේ කකීය කකියා තිබෙයි, මෙසේවූ ලෝදිය වාතවේගයෙන් රළ ගැසූකල දඩ ඇවිල නැගෙන්නේය. අකුසල් කළාවූ සත්වයෝ මෙහි වැටී පැසෙන්නාහුය. උදුන් අත්පතලයක බහාලූ

වෛඩුරක්ගේද තුතුයෙක ලා කකියන ලද තඹදියක්නක්සේද දදා වීරි වීරී සුත්සුන්ව ගොසින් තැවත කම්බලයෙන් උපදිත්, මෙසේ මොවුන් විඳිනා දුක්දක නිමි මහරජානෝ මාතලිය, මොවුහු කුමන පව් කළ මිනිස්සුදැයි විචාළහ. මහරජ, මේ තිරිසතුන් තමන් මිනිස්පිය ලත් කුල්හි කුකුළක් වඩා මස් කා වල තොයෙක් සතුන් මරා මාලු පල හා අවුලූ කොට කා සුරාපානය කළවුන් පැසෙන තරකයයි කීය.

ඒ නිරය අදිස්නාකොට සීත නම් නරකය දැක්විය. ඒ නරකය දිග තුත්සියයක් යොදුන, පුළුල තුත්සියයක් යොදුන, ගැඹුර තුත්සියයක් යොදුන, මේ නරකය සිසාරා ගිනිගෙණ දිලියෙන නවයොදුන් බොලයපවුරෙන් සෂමවූයේය. මුදුනෙහි පියාලතලද ගිනිගෙණ දිලියෙන නවයොදුන් බොල යපියන් පතින් සෂමවූයේය, මෙහි බදුම් දියගේ තිල්වූදිය ඉතා සිසිලව බලවත්වූ දියෙන් පිරුණේය. මේ දියෙන් තැගෙන සීත මුදුනේ පියාලූ නව යොදුන් බොල යපියන් පතින් උඩ දහසක් යොදුන් හමයි, මේ නරකයෙහි පැසෙන අකුසල්කළෝ මේ දියෙහි රුළ ගැසීමෙන් උඩුයටිව ඇට නහර මස් සුන් සුන්ව විලල්ව වැගිරෙති. තැවත, තැවත කම්බලයෙන් උපදිත්, මොවුන් විඳිනා දුක් දැක නිමි මහරජානෝ මාතලිය, මොහු කුමන පව් කළ මිනිසුන්දැයි විචාළහ. මහරජ, මේ තිරිසතුන් තමන් මිනිස් පියලත් කල්හි දුතඩම් කරන්නවුන් ජීවිකාව නසා කඩතොට සිට අනුන් අත මිට තුබූ දෙය ගත්තවුන් හා ගෙවන්නා සොරකම් කළවුන් පැසෙන තරකයයි කීය.

ඒ නරකය අදිස්නා කොට සඞ්ඝාත නම් නරකය දැක්විය. ඒ නරකය දිග සත්සියයක් යොදුන, පුළුල සත්සියයක් යොදුන, ගැඹුර සත්සියයක් යොදුන, මේ නරකය සිසාරා ගිනිගෙණ දිලියෙන නව යොදුන් බොල යපියන් පතින් සෂමවූයේය. මේ නරකයෙහි බදුම් දියවැනි දියෙන් පිරුණේය, මේ දියෙහි වසන පණු කෙණෙකුන්ගේ මහත කියතහොත් යොදුන් විවර බඳ ඇත්තේය. එක් දඹු ඔරුසා නගුටු ඇත්තේය. ගව් දිග දළ ඇති පණුවන් ගෙන් ගැවසීගත්තේය. ඒ පණුවෝ නරකයෙහි හුනුවන් ලුහුබඳවාගෙණ ඇඟ මස් උදුරා කකා ඇට නහර බිඳකත්තාහුය. තැවත කම් බලයෙන් උපදිති, මෙසේ මොවුන් විඳිනා දුක් දැක නිමි මහරජාණෝ මාතලිය, මොහු කුමන පව් කළ මිනිස්සුදැයි විචාළ කල්හි මහරජ, මේ තිරිසත්හු තමන් මිනිස් පියලත් කල්හි වළ බිඳ උල් සිටුවා සක්පාත පටවා අටමල පටවා උගුළු සොරමල පටවා සතුන් මැරුවන් හා දාගැබ් මහබෝ පෙතිපිළිම තොවැඳ බණ තො අසා සිහත්නන් දෙර සිටියත් අත තොසලා උදෙක් පව්පුරා ඇවිදින් දුක්විඳිතියි කීය.

ඒ නිරය අදිස්නා කොට තාප නම් නරකය දැක්විය. ඒ නරකයෙහි දිග නවසියයක් යොදුන, පුළුල නවසියයක් යොදුන, ගැඹුර නවසියයක් යොදුන, ඒ නරකය සිසාරා ගිනිගෙණ නව යොදුන් බොල යපවුරෙන් සෂම වූයේය. මුදුනෙහි පියතලද ගිනිගෙණ දිලියෙන නවයොදුන් බොල පියන් පතින් සෂම වූයේය. මේ නරකයේ තඹ වැනි දියෙන් තැගෙන ගිනි නවසිය යක් යොදුන් දදා ඇවිල තැගෙයි. මේ නරකයෙහි පැසෙන අකුසල් කළ වුන්ගේ උස යොදුන් පමණ ඇත්තේය. මොවුන් පැසෙන පරිදි කෙසේද යත්? සතරගාතය එක්කොට බැඳලා ගිනිගත් දියව දමාලති, මේ දියෙහි

රළු ගැසීමෙන් විරි විරී සුත් සුත්ව ගොස් පැසෙති. මෙසේ දුක් විඳ පැසෙන් නවුන් දැක මාතලිය, මොහු කුමන පව් කළ මිනිස්සුදැයි විචාළහ. මහරජ, මේ නිරිසතුන් තමන් මිනිස් පිය ලත් කල්හි කුකුළන් සිලිබිලන් ආදී නොයෙක් පියාසරගත් සත්ත්වයන් මැරුවන් හා උකුණන් බුත්තවුන් හා ඇඳ මකුණන් බුත්තවුන් හා ඇඳ මකුණන්ට උණුපැන් වත්කළවුන් පැසෙන නරකයයි කීය.

ඒ නිරය අදිස්නාකොට අඟුරුමැල නම් නරකය දැක්විය. ඒ නරකයෙහි දිග පණස් යොදුන, පුළුල පණස් යොදුන, ගැඹුර පණස් යොදුන, මේ නරකය සිසාරා ගිනිගෙණ දිලියෙන නව යොදුන් බොල යපවුරෙන් කෂමවූයේය. මුදුනෙහි පියාලතලද නව යොදුන් බොල ගිනිගෙණ දිලියෙන යපියන් පතින් කෂමවූයේය, මේ නරකයෙහි පව් කළ වුන් පැසෙන පරිදි කෙසේද? යත්! ගින්නව ඉටි විරෙන්නාසේ මෙ නරකයෙහි අඟුරු අතරතුරෙහි දඬු මහ හඬින් හඬ හඬා දෙතින් අඟුරු තමන්ගේ ඉසින් කණින් ලාගෙණ විරි විරී සූත් සුත්ව යෙත්. මෙසේ විඳිත දුක් දැක තිමි මහරජානෝ මාතලිය, මොහු කුමන පව් කළ මිනිසුන්දැයි විචාළහ. එබස් අසා මාතලී දෙව්පුත් කියන්නේ මහරජ, මේ නිරිසතුන් තමන් මිනිස්පිය ලත් කල්හි සතුන් මරා ඇඟ මස්පලහා කෑවුන් හා අනුන් මස් ගෙටගෙණගොස් පිසවා කනකල මස්රස යහපතැයි කිව්වුන් හා වල යන සතුන් ඇඟ දැක තෙල් බොහෝකොට ඇතැයි කිව්වූන් පැසෙන නරකයයි කීය,

ඒ නරකය දිස්නාකොට දළකොස්මැලි නම් නරකය දැක්විය. ඒ නරකය දිග තුන්සියයක් යොදුන, පුළුල තුන්සියයක් යොදුන, ගැඹුර තුන්සියයක් යොදුන, නරකය සිසාරා ගිනිගෙණ දිලියෙන නව යොදුන් බොල යපවුරෙන් කෂමවූයේය. මුදුනෙහි පියාලතලද ගිනිගෙණ දිලියෙන නවයොදුන් බොල යපියන්පතින් කෂමවූයේය. මේ නරකයෙහි වසන කවුඩන්ගේ මහත කියත්. යොදුන් පමණ බඳ ඇත්තාහ. ගවු දිග තුඩු ඇත්තාහ, ගවු දිග පියාඇත්තාහ නාඹ ඇතුන් සමාන උකුස්සන්ගෙන් ගැවසීගත්තේය. මේ නරකයෙහි පව් කළ මිනිසුන් පැසෙන පරිදි කෙසේද?යත් මේ නරකයෙහි ගිනි වේගයෙන් පැසී මහහඬින් හඬ හඬා දුක්විඳින්නවුන් මේ කපුටුවෝ හඬවහඬවා තමන්ගේ ගවු දිග තුඩු ඇත ඇස් උදුරාගෙණ කති, උකුස්සෝ බඩවැල් ඇද කති, නැවත කම් බලයෙන් උපදිති, මොවුන් මෙසේ විඳිනා දුක් දැක නිමි මහරජානෝ මාතලිය, මොහු කුමන පව් කළ මිනිස්සුදැයි විචාළහ. මහරජ, මේ නිරිසත්හු තමන් මිනිස්පියලත් කල්හි නොගන්නා බඩුවේ අගය කළවුන් හා ගන්නා බඩුවේ අගය වඩවඩා ගත්තවුන් හා මහත් ලාස් තැළි පෙට්ටි තබාගෙණ මඳක්දීලා අධර්මයෙන් වෙළඳාම්කොට ඇවිද්දවුන් හා තරවියෙහි බොල් ලා දුන්නවුන් හා කුඩා ලාසෙන්දී මහ ලාසෙන් මන්නාගත්තවුන් හා නොදෙන දෙයක් දෙමිහයි කීය. ඇවිද්දවුවන් පැසෙන නරකය කීය.

ඒ නිරය අදිස්නා කොට පොකුරුපත් නම් නරකය දැක්වීය, ඒ නරකයෙහි දිග සාරසියයක් යොදුන, පුළුල සාරසියයක් යොදුන, ගැඹුර සාරසියයක් යොදුන මේ නරකය සිසාරා ගිනිගෙණ දිලියෙන නව යොදුන් බොල යපවුරෙන් කෂමවූයේය. මූදුනෙහි පියාලතලද ගිනිගෙණ දිලියෙන නව යොදුන්

බොල පියන් පතින් ක්‍ෂෙම වූයේය. මේ නරකයෙහි වසන කිනිතුල් කෙණෙකුත්ගේ මහත කියත්. දෙගව් පමණ බඳ ඇත්තාහ. ගව් පමණ දළ ඇත්තාහ. ගව් දිග කකුල් ඇත්තාහ. මෙසේ වූ කිනිතුල්ලන්ගෙන් ගැවසීගත්තේය. මේ නරකයෙහි පැසෙන අකුසල් කළවුන් මේ සත්තු ඇට තහර බිඳ කති, නැවත නැවත කම් බලයෙන් උපදිති. ඔවුන් මෙසේ විඳිනා දුක් දක නිමි මහ රජානෝ මාතලිය, මොහු කුමන පව් කළ මිනිසුන්දැයි විචාළහ. මහරජ, මේ නිරිසතුන් තමන් මිනිස්පියලත් කල්හි සගුන් සිල්වතුන්ට ආක්‍රොශපරිභව බිණූ සත්ත්වයන් හා සඞසහෙද කියා ඕවුනාවුන් කෙරෙහි බිඳවූවන් හා මව්පියන් නැදිමයිලන් බැබුන් දක උනස්නෙ හිඳ යථායුක්තිකොට බිණූවවුන් පැසෙන නරකයයි කීය.

ඒ නිරය අදිස්නා කොට, වෙරළ නම් නිරය දැක්විය. ඒ නරකය දිග පණස් යොදුන, පුළුල පණස් යොදුන, ගැඹුර පණස් යොදුන, මේ නරකය සිසාරා ගිනිගෙණ දිලිසෙන නවයොදුන් බොල යපවුරෙන් ක්‍ෂෙමවූයේය. මුදුනෙහි පියාලතලද ගිනිගෙණ දිලියෙන නව යොදුන් බොල යපියන්පතින් ක්‍ෂෙම වූයේ ය. මේ නරකයෙහි රත් සුදු කඹුරු බලුකෙණකුත්ගේ මහත කියත්. යොදුන් දිග බඳ ඇත්තාහ. ගව් දිග පා ඇත්තාහ, ගව් දිග දළ ඇත්තාහ, මේ නරකයෙහි පැසෙන අකුසල් කළවුන්ගේ උස කියත් යොදුන් පමණ ඇත්තාහ, මෙසේවූ උසඇති පව්කලවුන් මේ බල්ලෝ ඔබාගෙණ හඬව හඬවා සල්ව සල්වා ඇට තහර බිඳ කති, නැවත කම් ලබයෙන් උපදිති, මොවුන් මෙසේ විඳිනා දුක් දක නිමි මහ රජානෝ මාතලිය, මොහු කුමන පව් කළ මිනිස්සුදැයි විචාළහ. මහරජ, මේ නිරිසතුන් තමන් මිනිස්පියලත් කල්හි බල්ලන් වඩාගෙණ ගොස් මුගටි උරුලෑ කලවැදි සිව්පාවුන් මරුවන් හා ගෝණුන් ඌරන් මුවන් විද බල්ලන් හැරගෙණ ලුහුබඳවා මැරුවවුන් හා කරක් කෙමින් අතගු බිලීකටු ගෙණ කුඩමැස්සන් මැරුවවුන් පැසෙන නරකයයි කීය.

ඒ නිරය දිස්සා කොට අළුකුඹු නම් නරකය දැක්විය. ඒ නරකය දිග පණස් යොදුන, පුළුල පණස් යොදුන, ගැඹුර පණස් යොදුන, මේ නරකය සිසරා ගිනිගෙණ දිලියෙන නව යොදුන් බොල යපවුරෙන් ක්‍ෂෙමවූයේය. මුදුනෙහි පියාලතලද නව යොදුන් බොල යපියන්පතින් ක්‍ෂෙමවූයේය. මේ නරකය පාතාලයේ සිට මුවවිට දක්වා අළුයෙන් පිරුණේය. මේ නරකයෙහි අකුසල් කළවුන් පැසෙන පරිදි කෙසේද? යත් මේ නරකයෙහි ගින්නෙන් දා විරි විරී සුන් සුන්ව අළුයට පාතාලයේ ගැලී ඇට තහර මස් විරි විරී නැතිව ගොසින් නැවත කම්බලයෙන් උපදිති, මොවුන් මෙසේ විඳිනා දුක්දක නිමි මහරජානෝ මාතලිය මොහු කුමන අකුසල් කළ මිනිස්සුදැයි විචාළහ. මහරජ, මේ නිරිසතුන් තමන් මිනිස්පියලත් කල්හි පොහොද තොටමන් රදවුන් හා කම්මල් මෙහෙකලවුන් හා ඔසප්වෙලා ඔසප් වූ බව නොකියා සවාමියා හා කැවිව ළැගිමාගමුන් හා මාගම ඔසප් බව දන ඇලයේ ලැග සිටි පිරිමියා හා බෙහෙත් තබා දරුගැබ් එලවූවන් හා දරුවන් එලන්ට බෙහෙත් දුන්නවුන් පැසෙන නරකයයි කීය.

ඒ නරකය අදිස්නාකොට ඉඹුල්වන නම් නරකය දක්විය. ඒ නරකයෙහි දිග සැටයොදුන, පුළුල සැටයොදුන, ගැඹුර සැටයොදුන, ඒ නරකය සිසාරා ගිනිගෙණ දිලියෙන තවයොදුන් බොල යපවුරෙන් කෂෙමවූයේය, මුදුනෙහි පියාලනලද ගිනිගෙණ දිලියෙන තවයොදුන් බොල යපියන්පතින් කෂෙමවූයේය, යොදුන් උස ඇති ඉඹුල්වනයෙන් යුක්තය, ඒ ඉඹුල්ගස් එක් පිටකින් ගිනිගෙණ දිලියෙන සොළොසඟුල් දිග කටු බිම බලා තිබෙති, එක් පිටෙක කටු උඩබලා තිබෙති, මෙසේ දෙපොළ සිටි කටු ගිනි බුර බුරා තිබෙති, මේ නරකයෙහි සිටිනා යමපලුන්ගේ මහත කියත්, යොදුන් උස ඇත්තාහ, ගව් දිග බඳ ඇත්තාහ, ගව් දිග දළවත් දළිරුවුළු ඇත්තාහ, ගැල්සක් හා ඇස් ඇත්තාහ, මෙසේවූ යමපලුන් අත ගිනිගෙණ දිලියෙන තාඹ තල්කද සා යකඩ යකුළුය, මේ නරකයෙහි පැසෙන අකුසල් කළ ගැණු පිරිමින්ගේ උස යෙල ගව් පමණය, ඔවුන් පැසෙන පරිදි කෙසේද?යත් මහහඬින් හඬව හඬවා, දෙපත්ල දක්වා ගිනිගෙණ දිලියෙන ආභරණ පලඳවති, මෙසේ පලැඳ වූ ආභරණයේ ගින්නෙන් දා මහහඬින් හඬ හඬා සිටියදී ගැහැණිය පිට යමපල්හු යකඩ යකුළින් පන්සියයක් පහර ගසා බිම බලා බුර බුරා තිබෙන කටු පෙළින් උඩ නන්වත්, සොළසඟුල් පමණ කටු හැනි හැනී මහහඬින් හඬ හඬා ඇට නහර සුන්සුන්ව බිඳිබිඳී කැඩිකැඩී විරිවිරී ලෙයින් තෙත්ව ගව්වක් උඩනැඟී මහහඬින් හඬහඬා කම්බලයෙන් ගියක් කියාලයි, ඈ කෙරෙහි ගත් ප්‍රේමයෙන් ගිනිගත් ආභරණ පැලඳනෙන හඬමින් සිටි පුරුෂයා මහ හඬින් හඬව හඬවා ගීහඬ අසා උඩබලා සිටියාවූ යමපල්හු පන්සියයක් පහර ගසා බිම බලා තිබූ කටුපෙළින් මරා උඩ නංවති එසේමවූ කටුයේ ඇනි ඇනී බිඳි බිඳී මහහඬින් හඬ හඬා කැඩි කැඩී විරි විරී සුන් සුන්ව නැවත ලෙයින් තෙත්ව ඉපදීමෙන් මාගම සිටි තැනට ආසන්නවත් මේ කටුයේ ඇනි ඇනී සුන් සුන්ව උපදිමින් බිමට බසිති, බිමසිටි යමපල්හු තාඹ තල්කද සා යකඩ යමුගුරු බාලා පන්සියයක් පාරගසා බිමබලා තිබූ කටුපෙළින් උඩට නංවා ලති, ගිනිගෙණ දිලියෙන පලඳනා පලඳවති. යමපලුන්ගෙන් නොයෙක් ගැහැට විඳ තැගී බැස මෙසේ දුක් විඳින්නවුන් දුටු නිමි මහරජානෝ භයින් තැතිගෙණ වෙව්ලාගොස් මාතලිය! මෙසේවූ කටුයේ ඇනි ඇනී කැඩි කැඩී බිඳි බිඳී සුන් සුන්ව දුක්විඳින්නෝ කුමන පව්කළ මිනිස්සුද?යි විචාළහ. එබස් අසා මාතලී දෙව්පුත් මහරජ මේ තිරිසතුන් තමන් මිනිස් පිය ලත් කල්හි සිය සැමියා උපයනු කා ඇඳපැලඳ වසාවාව පරපුරුෂයන් හා කැටිව බැඳුනු මාගම හා තමාගේ මාගම අතින් පොෂ්‍යවිඳ ඇට දෙවෙනිව බැහැර මාගම කෙරේ බැඳී ඇවිදි පුරුෂයා ඇවිත් පැසෙන නරකයයි කීය. මේ නරකයේ දුක්විඳින්නවුන් ගැලවෙන්නේ කොතෙක් කලකින්ද?යි විචාළහ. එබස් අසා මාතලී දෙව්පුත් කියන්නේ දහසක් අවුරුද්දෙන් අඟලක් වඩනා පොළොව ආකාශයට සත්ගව්වක් උස වඩනාතුරු පැසී ඒ ඉඹුල්වන නරකයෙන් ගොඩ දූක එක්සිය සතිසක් තිරයෙහි පැසී ගොඩ දූක කුසල් නැති පන්සියයක් ජාතියේ නපුංසකව උපදිතියී කීය.

ඒ නිරය අදිස්නාකොට කිහිරඟුරු නම් නරකය දක්විය. ඒ නරකය දිග සත්සියයක් යොදුන, පුළුල සත්සියයක් යොදුන, ගැඹුර සත්සියයක් යොදුන, ඒ නරකය සිසාරා ගිනිගෙණ දිලියෙන තවයොදුන් බොල යපවුරෙන්

ක්‍ෂෙමවූයේය, මුදුනෙහි පියාලතලද ගිනිගෙණ දිලියෙන නවයොදුන් බොල යපියන්පතින් ක්‍ෂෙමවූයේය, මේ නරකය යොදුන් උස ඇති කොන්තමුණ වැනි සූක්‍ෂමවූ කටුයෙන් ගැවසීගත්තේය, මේ නරකයේ නැගෙන ගිනි මුදුනෙහි පියාලතලද නවයොදුන් බොල යපියන්පතින් මත්තෙහි සියක් යොදුන් දුරවද ඇවිල නැගෙයි, මේ නරකයේ අකුසල් කළවුන් පැසෙන පරිදි කෙසේද? යත් බාග අකුසල් කළෝ ගිනිගෙණ දිලියෙන තගුල් වියදණ්ඩක් ගැටබැන් සහලක් කැවිටක් ඉස තබාගෙණ මහහඬින් හඬා මේ කටුකයෙන් ඇනි ඇනී පැසෙති, බාග අකුසල් කළෝ ගිනිගත් රුකක් ඉස තබාගෙන පැසෙති, බාග අකුසල් කළෝ මහහඬින් හඬ හඬා දිව දෙතුන් පොට කොට ඉස තබාගෙණ පැසෙති, බාග අකුසල් කළෝ ගිනිගත් යකඩ කඩක් ඉස තබාගෙණ පැසෙති, මොවුන් මෙසේ විඳිනා දුක් දක නිමි මහරජානෝ මාතලිය! මොහු කුමන අකුසල් කළ මිනිස්සුදැ?යි විචාළහ. මහරජ! මේ නිරිසත්හු තමන් මිනිස්පිය ලත් කල්හි වේලා පත්වා සීසෑවුන් හා දිව ඇද කා මළවුන් හා සුණු සිරියල් කා මළවුන් හා කර වැල්ලා මළවුන් පැසෙන නරකයයි කීය.

ඒ නිරය අදිස්නාකොට රෞරව නම් මහනරකය දැක්විය. ඒ නරක යෙහි දිග දහසක් යොදුන, පුළුල දහසක් යොදුන, ගැඹුර දහසක් යොදුන, මේ නරකය සිසාර ගිනිගෙණ දිලියෙන නවයොදුන් බොල යපයන්පතින් ක්‍ෂෙම වූයේය. මේ නරකයෙහි සිටින යමපලුන්ගේ උස යොදුන් පමණ ඇත්තාහ. ගව්දිග නියපොතු ඇත්තාහ, ගව්දිග දළිරුවුළු ඇත්තාහ, ගැල්සක් සා ඇස් ඇත්තාහ. ගව්දිග රකුසු දළ ඇත්තාහ, අසුරියන් බැම ඇත්තාහ, මෙසේවූ යමපලුන් අත නුවර මහදොර සා වැයක් හා තාඹ තල් කද සා මිට ඇති පත් කොවේරයක් ගෙණ සිටිති, මේ නරකයෙහි පැසෙන අකුසල් කළවුන්ගේ උස යොදුන් පමණ ඇත්තාහ, මොවුන් ගන්නා දුක් කෙසේද? යත් ඉස සිට දෙපත්ල දක්වා සසිති, ගිනිගත් කළු හුය ගසති, පොරෝ ගෙණ පොලුගසති, ඉරති, පලති, කම්බලයෙන් උපදිති, මොවුන් මෙසේ විඳිනා දුක් දැක නිමි මහරජානෝ මාතලිය! මොහු කුමන පව්කළ මිනිස්සුදැ?යි විචාළහ. මහරජ! මේ නිරිසතුන් තමන් මිනිස්පිය ලත් කල්හි සිත්තම් ඉගෙන ලෝභයෙන් දී මන් ගන්නා පිණිස නිකසළ පිළිම කැලල්කොට ඉඳුරා සිතියම් නොකොට වඩා බරපැන් ගත්තවුන් හා පෙතිපිළිම අරගෙණ විකොට කෑවුන් හා කුසල් කරම්හයි කියා බොරුයෙන් දනාගේ බත්කඩ සිඟාගෙණ කෑවුන් හා සොරා පෙණී අනුන්ගේ රන් රිදී මසුරන් ආදිය හා වී සාල් ගෙරි ගව එළු කුකුළු මිනිසුන් ඇන්නෑයේ උදුරාගෙන පොහොසත්ව රැකෙම්හයි සිතා ගත්තවුන් පැසෙන නරකයයි කීය.

ඒ නිරය අදිස්නාකොට පදුම නම් නරකය දැක්විය. ඒ නිරයේ දිග දහසක් යොදුන, පුළුල දහසක් යොදුන, ගැඹුර දහසක් යොදුන, ඒ නිරය සිසාරා ගිනිගෙණ දිලියෙන නවයොදුන් බොල යපවුරෙන් ක්‍ෂෙමවූයේය, මුදුනෙහි පියාලතලද ගිනිගෙණ දිලියෙන නවයොදුන් බොල යපියන්පතින් ක්‍ෂෙම වූයේය, මේ නරකයෙහි තඹ දිය රසදිය සේ කකියා කකියා තිබෙයි, මේ නරකයෙහි වසන කුරුවනු කෙණෙකුන් ගේ මහත කියත්, දිග සියක්

යොදුන්, කකුල් සියයක් යොදුන, මේ නරකයෙහි තල ඇටක් එලා ලන අවසර නැතිව පැසෙන අකුසල් කළ මේ සත්හු උනුන් වටලා ඇට තහර බිඳ සල්ව සල්වා හඬව හඬවා ඇද කති, සුන් සුන් කොට කති, නැවත කම් බලයෙන් උපදිති, මොවුන් මෙසේ විඳිනා දුක් දැක නිමි මහරජානෝ මාතලිය! මොහු කුමන පව් කළ මිනිස්සුදැ?යි විචාළහ මහරජ! මේ තිරිසනුන් තමන් මිනිස්පිය ලත් කල්හි කකුළුවන් ඉල බෙල්ලන් මැරුවන් හා මලවසන සතුන්ට වස මැඬ මැරුවන් හා දරකැව සැමිකැව ඉසකපාලව ඇන එලාලවයි හැඬුවවුන් හා කේලාම් කියා ඔවුනොවුන් බිඳවූවන් පැසෙන නරකයයි කීය.

මෙසේ ඔහුපත් ගෙණහැර එක්සිය සතිස් නරකය නොබලනතුරු සක්දෙව් රජු හා සතරවරම් රජු හා සදෙව්ලොව වැසි දෙවියන් හා හැම දෙවියෝම සුදම් දෙව් සභායෙහි රැස්ව හිඳ නිමි මහ රජානෝද මාතලී දෙව්පුත්ද ලස්වූය. මහරජ. බ්‍රහ්ම දෙව්පුතු කැඳවා උත්කරා යවූව මැනවයි සක්දෙව් රජහට කිවූය. ඒ අසා සක්දෙව්රජ බ්‍රහ්ම දෙව්පුතු කැඳවා නිමි මහ රජානෝ ලස්වූව, උන් කැඳවාගෙණ එවයි කීය. ඒ අසා බ්‍රහ්ම දෙව්පුත් මියුලු නුවර වැද නොදැක නරකය බලා ගොස් දැක මහරජානෙනි! නුඹ අතින් බණ අසන්ට දේව සමාගම රැස්ව ඉඳ නුඹ ලස්වූ හෙයින් කැඳවා මා එවූය, සතික වැඩිය මැනවයි කීය. එබස් අසා නිමි මහ රජානෝ මැනවයි ගිවිස මාතලිය! රථය දෙව්ලොව බලා පදුවවයි කීහ.

එබස් අසා මාතලී දෙව්පුත් දෙව්ලොව බලා රථය පැද පලමුකොට බීරණී නම් දෙව්දුවගේ විමන දැක්විය. ඒ ප්‍රාසාදය මැවුනු නියා කෙසේද? යත්, වැම් සතරතින් නිමියාහ, දූව මරා මිණියෙන් නිමියාහ, උළුසෙවෙනි සත්රුවනින් නිමියාහ, පේකඩ සත්රුවනින් නිමියාහ, භිත්ති ඉඳුනිල් මිණි යෙන් නිමියාහ, මේ ප්‍රාසාදයෙහි පත්සියයක් ගබඩාය, එකි එකීගබඩා කෙළ ලක්‍ෂයක් වටනාහ, එකි එකී ගබඩායෙහි කෙළක් වටනා යහන් දවස දවස දැසමන් මල් යාලක් අතුරති, ඒ මල් වසා අසූ කෝටියක් වටා දිවදුහුලක් අතුරති, නොයෙක් ගඳ විලවුන් ගෙණ කෙළක් වටනා යාන රත්සුණු යාලක් අතුරති, අනූකෝටියක් වටනා දිවදුහුලකින් රත්සුණු වසා අනූකෝටියක් වටනා දිවදුහුලක් හැඳ දිව්‍යාභරණ පැලඳ සොළොස් දහසක් සුරහුන්දරීන් පිරිවරා හුන් දෙව්දුවගේ විමානය දැක නිමි මහරජානෝ මාතලිය! මොහු කුමන පින්කොට අවුත් මෙසේවූ දිව්‍යප්‍රාසාදයෙක්හි හිඳ සුව විඳිද්දැ?යි කීහ. එබස් අසා මාතලි දෙව්පුත් කියන්නේ මේ දෙව්දූ කසීරට බරණැස් නුවර සුදත්ත නම් බමුණාගේ මිඬිය, කොසොල් හා බරණැස් දෙරට වැසියන් ගඳ දුම් මල් පහන් ගෙණ දෙව්රම් වෙහෙර බණ අසන්නට යන්නවුන් දැක ඒ සුදත්ත නම් බමුණුතෙමේද බණ අසන්නට යන උපාසක වරුන් හා කැටිව දෙව්රම් වෙහෙරට ගොස් කසුප් සම්මා සම්බුදුරජානන්වහන්සේ අතින් බණ අසා බණෙහි පැහැද කෝටි අනූවක් දෙනා සෝවාන් මග පිහිටියා දැක සුදත්ත නම් බමුණුතෙමේද සෝවාන් ඵලෙහි පිහිටා බණෙහි පැහැද තමා හැඳගෙණ ගිය උතුරුසළුව පුදා වැඳ මහත්වූ සතුටු සොම්නසින් දන් දෙමියි මහ පෙම් ඇතිව ගෙට අවුත් තමාගේ අඹු බැමිණිය කැඳවා කියන්නේ කසුප් සම්මා සම්බුදුරජානන්වහන්සේට මනාකොට දනක් දෙමියි ඊට දන් ඉදිකරවයි කීහ.

එබස් අසා බැමිණි කියන්නී ඒ මුඩු මහණුන්ගේ තෙපුල් ගෙණ තෙපි මාගේ නෙයි වස්තුව වියදම් කරහුදැයි රෑනැතිව දන් නොපිස කිව. ඒ අසා අඹුවට රෑනැතිව තමාගේ එක්සිය විසි වයස් ගිය මෑනියන් කැඳවා මෑනියන්වහන්ස! දන් ඉදිකළ මැනවයි කීය. එබස් අසා ඒ මැහැලිත් නතන නතනා රෑනැතිව කියන්නී තොපගේ උපයනු කා නුවවිදිනා අඹුවත් දන් නොපිසින කල මම කුමට පිසම්දැයි කියා එතන නොසිට පලාගියාහ. මුන් දෙදෙනා රෑනැතිව දන් නොපිසම්හයි කියන්ම තමාගේ බීරණී නම් දැසිය කැඳවා කියන්නේ කෙල්ල! තී අදහිම්කොට නිදහස් කෙරෙමි, බණ අසා පැහැද දන් දෙම් කියා ආමි, අද පටන් දවසකට අටමස්සක් හැරගෙණ දවස්පතා සාල් මාළු උපකරණ ගෙණ දන් පිසවයි කීය.

එබස් අසා බීරණී නම දැසී සතුටුව සොම්නසින් පැහැද කියන්නී යහපත මම දන් පිසමි දන් දුන්නෙහි පින් ඔබටය, අන් කුසල් මටය, කියා සතුටුව කසුප් සම්මා සම්බුදුරජාතන් වහන්සේට දන් පිසමියි කී හෙයින් නිදහස් පත්කඩ ලැබ සිහා වැඩි සද්ධෙයන් වහන්සේට පසගපිහිටුවා වැඳ හොජනශාලාව මනාකොට හැමද ගොම පිරිබඩගෙණ ඊමත්තෙහි සඳුන් පිරිබඩගෙණ නා සපු දුනුකේ දෙඉද්ද දෑසමන් ආදීවූ සුවඳ මල් පුදා සරහා පණවතලද ආසනයෙහි වඩා හිඳුවා ආගන්තුකව ආ දරුකෙණෙකුන් දුටු කෙණෙහි වැදූ මවක් යම්සේ සතුටු වේද එපරිද්දෙන්ම නිරන්තරයෙන් ප්‍රේම වඩා දෙවියන්ට නිර්මිත කළ භෝජනයක් මෙන් ආදර සිතින් වළඳවන්නීය. මෙම නියායෙන් දවසකට අටමස්සක් ගෙණ සාල් මාලු විටියල සපයා තබා තොමෝ ඉස් සෝධා නහා සුදුපිරුවටක් හැඳ දන් පිසන හෙයින් ගෙයි ගොම පිරිබඩගෙණ උඩුවියන් බැඳ සුචි පවිත්‍රව දන් පිසන්නීය, සමහර දවසෙක තමාගෙනුත් දන් පිස දෙන්නීය, තොමෝද නිරන්තරයෙන් පඤ්චශීලයද පොහොය අෂ්ටාඞ්ගශීලයද අඛණ්ඩකොට රක්‍ෂා කරන්නීය, මෙසේ දෙන්නාවූ දාන ඵලය හා ශීලානුභාවයෙනුදු ස්වාමියාට කීකරුව දන් පිසූ කුශලයෙනුදු මේ දිව්‍ය ප්‍රාසාදයෙහි දිවසැපත් විඳිතියි කීය.

මෙසේ බීරණී නම් දිව්‍යස්ත්‍රියගේ සම්පත් හා කළ පින් කියා ඉදිරියට රථය පදින්නේ සෝන නම් දිව්‍යපුත්‍රයාගේ රන් මාලිගා සත දැක්වීය. රජ්ජුරුවෝද දිව්‍යපුත්‍රයාගේ සම්පත් දැක ඔහු කළ පින් විචාළහ. මාතලී දෙව්පුත් කියන්නේ මහරජ! මේ දිව්‍යපුත්‍රයා යටගිය දවස කසුප් සම්මා සම්බුදු රජාතන් වහන්සේ සමයෙහි කසීරට එක්තරා නියම්ගමෙක්හි සෝන නම් සිටුව උපන් සමයෙහි සදන්හල් කරවා නොයෙක් යාචකයන්ට දන් දුන්නේය. භික්‍ෂුසඞ්ඝයා වහන්සේ උදෙසා ලැගුම් ගෙවල් සතක් කරවා ඒ ලැගුම් ගෙවල ලගිනා භික්‍ෂුන්වහන්සේට සිව්පසයෙන් උපස්ථාන කෙළේය. නිරන්තරයෙන් පඤ්චශීලය රක්‍ෂා කෙළේය. පොහොය අෂ්ටාංගශීලය රක්‍ෂා කෙළේය. මෙසේ කළාවූ දාන පරිත්‍යාගය හා ශීල රක්‍ෂණයෙහි ආනුභාව යෙන් ඒ ආත්ම භාවයෙන් චුතව මේ දිව්‍යලෝකයෙහි ලහිරු මඬලක් මෙන් බබලන්නාවූ දිව්‍ය විමානයෙහි සැට ගැලක් පුරාලන ආභරණයෙන් සැරහී දිව්‍ය නාටකස්ත්‍රීන් විසින් පිරිවරණ ලදුව දිව සැපත් විඳිතියි කීය.

මෙසේ සෝන නම් දිව්‍ය පුත්‍රයාගේ පිත්පල කියා රථය ඉදිරියට පැද සියගණන් රත්රුවන් වැම් ඇති නොයෙක් සියගණන් කුළු ගෙවල් ඇති පලන ලෙලදෙන රත් රසු දූල් හා තගනලද රත්රිදීමය ධවජ පතාකා ඇති පස්විසි යොදුන් උස ඇති ස්ඵටික මාණික්‍යමයවූ දිව්‍යවිමානයක් හා තා සපු දුනුකේ දෙඉද්ද දූසමත් මූරුවා යනාදීවූ නොයෙක් සුගන්ධ පුෂ්ප පංක්තීන් සැදුනු උයන්හි සිත්කළුවූ පස්පියුමෙන් සැදුම්ලද පොකුණු හා නැටීම් ගීකීම් ආදියෙහි දක්ෂවූ දිව්‍ය ස්ත්‍රීන් විසින් ගැවසීගත්තාවූ සුරවිමන දූක නිම් මහරජාතෝ මාතලිය, මොහු කුමන පින්කොට මෙහි සුව විඳිද්දූයි කීය.

එබස් අසා මාතලි දෙව්පුත් කියන්නේ මහරජ! මේ දෙබිහින්න තමන් මිනිස් පියලත් කල්හි කාශ්මීර ගන්ධාර දෙරට වසන චූල්ලසුභද්‍රා මහාසුභද්‍රා යන නම් ඇති දෙබිහිති කෙණෙක්ව එරට මැද රජමහවත සම අවරියන් වන පස දණෙඩන් ගඳකිළියක් කරවා තණින් සොයවා ඇඳ කළ හල් පහන් පැදුරු පාත් කඳු කොතලා ගිතිකබල් පත්කඩ බිහිකඩ ආදිය ලවා එතතට වැඩි රහත් පුහුදුන් සඟුන් වඩා හිඳුවා සිව්පසයෙන් උපස්ථාන කොට වස් අන්තයෙහි රහත් සඟනට ලක්‍ෂයක් වටනා අටපිරිකරක්ද පුහු දුන් සඟනට දහසක් වටනා අටපිරිකරද දන්දී තමන්ගේ ආයු පමණින් මිනිස්ලොව හිඳ එයින් සැව ඇවිත් මේ දිව්‍ය ප්‍රාසාදයෙහි සුව විඳිතියි කීය.

ඉක්බිති කාශ්මීර නම් දෙව්පුතුන්ගේ විමන දූක්විය. ඒ දෙව්පුතුන් ගේ විමන නිමිතියාව කෙසේද? යත් හිරුකොත් මිණියෙන් ටැම් නිමවා සඳ කොත් මිණියෙන් දූව විලලුබැඳ දූරගම්ණියෙන් මඩුලුබැඳ කොතමිණියෙන් ගොතැස් බැඳ මරා මිණියෙන් පැලන්නිමා සතරතින් පෝච්චු නිමවා නිල් මිනියෙන් සෙවෙනි නිමවා භිත්ති ඉඳුනිල්මිණියෙන් නිමවා දෙරබා සතරතින් තිමවා තිල්මිණියෙන් පාකවුළු තිමවා නීල්මිණියෙන් බිම්කොට මුතු සුණු දෙලොස් යාලකින් ගේ පිරිබඩගෙණ රාජ වත්තයෙන් වත්කොට අනුකෙළක් වටනා සෙල් වියන් බඳවා ඒ වියන්පිට රත්තරු රිදීතරු කිංකිණික ජාලයෙන් මුතුදූල් එල්වා මේ ප්‍රාසාදයෙහි දහසක් ගබඩාය, එකී එකී ගබඩායෙහි අනුකෙළක් වටනා දහසක් යහන දෙලොස් යොදුන් දිවදුහුලක් හැඳ දිව්‍යාභරණ පැලඳ දහසක් සුර සුන්දරීන් පිරිවරා සිටිති. දවසකට රන් සුණු දෙලොස් යාලකින් ඇඟ ඔප්ලනලද දහසක් දෙනය දහසක් ගබඩාවල දහසක් මිණිදඬු වැට පහන්ය, මේ ප්‍රාසාදයෙහි මුදුනේ රන්කොත දෙලොස් යොදුන් උසය, ඒ කොත තන්හි තන්හි එබු මැණික් ලක්‍ෂයෙක, මේ ප්‍රාසාදය සිසාරා සත්රුවනින් පවුරක් හා නිල්මිණියෙන් පවුරක් හා රිදියෙන් පවුරක් හා වෛඩූර්‍ය්‍යයෙන් පවුරක් හා ඇතුළුව පස් පවුරකින් කෙෂමවූයේය. මේ ප්‍රාසාදය සිසාරා නඳුනුයනයේ උයන් සතලිසෙක. සඳද්දහනලා හා සමවූ පොකුණු දෙලොසෙක, සත කනකමය පිය ගැටය, මේ ප්‍රාසාදයෙහි කෙළක් වටනා යහනෙහි යාලක් දූසමත් අතුට ඊමත්තෙහි වටනා දිවදුහුලක් වසා දෙලොස් දහසක් නළුතාටකයන් පිරිවරා දෙලොස් යොදුන් දිවදුහුලක් හැඳ සැටගැලක් දිව්‍යාභරණ පැලඳ

දෙපෝ මැද නැගි පුන්සඳක්සේ උන් දෙව්පුතුන්ගේ විමන දැක කුල්මත්ව කුමන පින්කම්කොට මෙසේවූ දිව්‍ය සම්පත් ලදින් සුව විඳිදැයි විචාළහ.

එබස් අසා මාතලී දෙව්පුත් කියන්නේ මහරජානෙනි! මේ දෙව්පුත් අතීතයෙහි දඹදිව්තෙලෙහි තෙසැතිපුර නම් දොළොස් යොදුන් නුවරෙක සිටුව උපන් කල්හි පියුමතුරා නම් බුදුරජානන් වහන්සේට විහාරයක් කරවා අනුකෙළලක්‍ෂයක් සඟනට සතතයෙන් විසිදහසක් අවුරුදු දන්දී බුදුපාමොක් මහසඟනටද දොළොස් වාරයෙක දන් වතින් දන්දී අටපිරිකරද දන්දී කණපිළු ව්‍යාධින්ව අවුරුදු පතා දන්දී වෙදවෙදැඹගයෙහි පාරගත බමුණන්ට සැට දහසක් දෙනාට දොළොස් වාරයෙක රන්දී සුවාසූ දහසක් හවුරුදු සිටු සැපත වළඳා සත්විටෙක නෙවළා සතරන්පත ලියවා සත්රුවන් බඳවා ඇණ පියන් ලවා සුවාසූදහසක් වටනා වස්තෙන් වසා සතරන් පොත්දෙණ කරවා ඒ දෙණ සුවඳතෙල් දැසමන් කුසුම් පුරා නෙවළා පොත් දෙණට වඩා සුවඳ තෙලින් පහන් පූජාකරවා මහදනහට පින්දී ආයු පමණින් නරලොව සැපත් වළඳා ඉන් සැව අවුත් මේ දිව්‍ය ප්‍රාසාදයෙහි සුව විඳ සිළුමිණිසෑය වඳිනට යන කල නොයෙක් තළුනාටකයෝ දොළොස් දහසක්දෙන ඔඩ්ඩි පිල් සතළොස් යොදනෙක ගෙණ සිටිත්, රන්ධජ රිදී ධජ රන්කළස රිදීකළසගෙණ දොළොස් යොදනෙක පැතිර සිටිති, නො යෙක් ආභරණ පැළඳ සුරසුන්දරීහු දොළොස් යොදනෙක පැතිර සිටිති, මෙසේ නොයෙක් ඓශ්වර්‍ය්‍යයෙන් පිරිවරාගෙණ දොළොස් යොදනෙක රන් සේසත් ඉසට කරකවා සිළුමිණිසෑය වැඳ පියුමතුරා නම් බුදුරජානන් වහන්සේගේ අවදියෙහි පටන් මේකප බුදුවූ කකුසඳ, කොණාගමන, කාශ්‍යප, ගෞතම යන සතර බුදුන්ගේ දවස මෙසේ සුවවිඳ අනාගතයෙහි බුදුවන මෛත්‍රී බුදුන් බුදුව අසූදහසක් අවුරුදු බුදුලෙස් පෑ කල්හි කරණලද බුඩකෘත්‍යය දැක අතුරුදන් නොවනතුරු සතරනින් තිස් යොදුන් ඇගෑයක් කොට සිරුර දා තුන්යොදුන් නුවරවාසීන් එතැන සිට බුදුකිසබලා මත්තෙහි සක්විතිජව සදහසක් යොදුන් දඹදිවට නායක වෙතියි මහරරජ යි කීය.

ඒ විමන නොරකොට දුනු මුඩු පුතුන් සතරදෙනාගේ විමන් දැක්විය. මූන් සතරදෙනාගේ විමන් නිමි නියාව කෙසේද? යන් මිණි පබළුයෙන් වැම් පිහිටුවා ඉඳුනිල්මිණියෙන් දූව වලලු බැඳ දැරඟ මිණියෙන් දූව වලලු නංවා සතරනින් ලී නිමවා හිරුකොත් මිණියෙන් සෙවෙනි නිමවා භිත්ති සත් රුවනින් නිමවා මුතුසුන්නෙන් බිම නිමවා මෙසේ නිමි ප්‍රාසාදයෙහි සාර දහසක් ගබඩාය එකි එකී ගබඩායෙහි කෙළක් වටනා සාරදහසක් යහන, එකි එකී යහනෙහි අසූකෙළක් වටනා දිවදුහුලක් අතුට අනූකෙළක් වටනා සෙල් වියන් බැඳ මෙසේ සාරදහසක් ගබඩායෙහි සාරදහසක් සුරසුන්දරීහුය, ඒ දෙවපුත්සතරදෙනාගේ එකි එකී යහන අනූකෝටියක් වටනේය, යාල යාල දැසමන් අතුරති, දැරගමිණිවැට ලක්‍ෂයෙක, සැටයාලක් ගඳවිලවුන්ගණිති, සතිස් යාලක් සතරන් සුන්නෙන් ඇඟ ඔප්ලාලති, සැටගැලක් ආභරණ

පලඳිති, අනුකෙළක් වටනා දිවදුහුල් අඳිති, සතරදෙනාගේ දිවපිරිස් සැට යොදනක් තැන පැතිර සිටිති, දෙළොස් යොදනෙක දිව බෙරගසා සිටිති, සතරදෙනා දිව්‍යඓශ්වර්‍ය්‍ය විඳිමින්සිට මෙතෙ බෝසතුන් වඩිත්ට හා සිළුමිණි සෑය වඳිත්තටද යනකල සැටයොදනෙක දිව පිරිස් සිටිති' දිවබෙර දෙළොස් යොදනෙක ගසා සිටිති, රන්ධජ රිදීධජ රත්කඹ රිදීකඹ පබළුකඹ ගෙණ සැටයොදනෙක සිටති, චාමර පිල් සත්සලා සැටයොදනෙක සිටිති. රත් සේසත් දෙළොස් යොදනෙක ගෙණ සිටිති, මෙසේ නොයෙක් ඓශ්වර්‍ය්‍ය යෙන් ගොස් වැදයෙති, මොවුන් සතරදෙනාගේ ප්‍රාසාදසතරද සඳුන් දහනාල හා සමානවූ පෙකුණු සොළසෙක, නඳුනුයන හා සමවූ උයන් සාරසිය යෙක, චිත්‍රා සුභද්‍රා, නන්ද, සුධර්මා යයි මෙසේ නොයෙක් ඓශ්වර්‍ය්‍ය විඳිනා දෙව්පුතුන් සතරදෙනාගේ දිවසැපත් දුක නිමි මහරජානෝ මාතලියා මේ දෙව්පුත්හු සතරදෙන කුමන කුමන පින්කොට මෙසේ සුව විඳිද්දැයි විචාළහ.

එබස් අසා මාතලී දෙව්පුත් කියන්නේ මහරජානෙනි! අතීතයෙහි දිවකුරු සම්මාසම්බුදුරජානන් වහන්සේ දවසැ මැදුම් පියසැ මේ සතර දෙනාම දුනුමුඩු කුලයෙහි ඉපද තමන් වළඳන රට සතරදෙනා සැළා කොටගෙණ සම්මා සම්බුදුරජානන් වහන්සේට සත්රුවන්මයවූ දෙළොස් යොදුන් පමණ සිවු මුහුණින් තුන්ගව්වක් පමණවූ සතරපායක් කරවා එහි පෙත් මං තනා සතර මලුවේ සත්රුවන් අතුරුවා කිහිකඩ පත්කඩ කලි හල් පාත්කඳු පාත්තෙල් කොතලා ගිතිකබල් ඇතුළුවූ නොයෙක් දෑ ලවා සෙනසුන් පිළිගන්වා අනවැසි බුදුන් ඇතුළුවූ කෙළලක්‍ෂයක් මහසඟනට සිව්පසයෙන් දන්දී දහඟ වටනා අටපිරිකර දන්දී ලක්‍ෂයක් රහත් සඟනට අනූදහසක් අවුරුදු නිති දන්දී දවස්පතා පන්සිල් රැක රැක බුදුන්ගේ බණ අසා පැහැද තමන් තමන්ගේ රට ඇතිනාක් බොහෝ දෙනාට පන්සිල් හා පොහොය අටසිල් ගන්නාලෙස සමාදන් කරවා මෙසේ දහැමින් වැස නරලොව ආයු පමණින් සැපත් වළඳා ඉන් සැව අවුත් දිවකුරු බුදුන් දවස පටන් මෙම නියායෙන් සැපත් වළඳා කසුප් සම්මා සම්බුදුන් දවස දඹදිව වෙස් පුර නම් නුවර එක්කෙණෙක් රජවෙති, එක්කෙණෙක් අනන නම් පුරයෙහි රජවෙති, එක්කෙණෙක් මතු ගෞතම නම් බුදුන් පිරිනිවි කල සිරි ලක්දිව පඬුවස්දෙව් නම් රජව ඉපද අටතුරාසියක් වැවූ බඳවා දවස්පතා කුසල්කොට අනුරාධ නම් පුරය කරවා සම්පත් වළඳා සැව අවුත් තැවතත් මේ ප්‍රාසාදයෙහි සුවවිඳිනේය. එක්කෙණෙක් මනරට පැළලුප් නුවර තමාගේ මයිල්කුමර රජව සම්පත් වළඳා සැව අවුත් තැවතත් මේ ප්‍රාසාදයෙහි සුව විඳිනේයයි කීය.

ඒ විමන නොරකොට නෙසැති දෙව්පුතුන්ගේ විමන දැක්විය. ඒ ප්‍රාසාදය නිමි නියාව කෙසේද? යත් වැම් ඉඳුනිල්මිණියෙන් නිමියාහ, දූව වලලු දැරගම්මිණියෙන් නිමියාහ, මඬුලුකොත මිණියෙන් නිමියාහ, ගොනැස් ඉඳු නිල් මිණියෙන් නිමියාහ සෙවෙනී සත්රුවනින් නිමියාහ. භිත්ති වෛඩූර්‍ය්‍ය යෙන් නිමියාහ, මෙසේ නිමි ප්‍රාසාදයෙහි දහසක් ගබඩාය, කෙළ ලක්‍ෂයක් වටනා යහනාය, මේ ප්‍රාසාදයේ දිග යොදනෙක, පුළුල යොදනෙක, උස යොදනෙක, මේ ප්‍රාසාදයෙහි විදුරු එබූ කවුළු දෙර ලක්‍ෂයෙක, නිසවතු සඳකැන් මිණියෙන් නිමියාහ, මේ ප්‍රාසාදයෙහි නත්භි නත්ගී සිංහ ව්‍යාඝ්‍ර

රූ හා ඇත් ගිජුලිහිණි කොස්ලිහිණි ජීවඤ්ජීවක ලිහිණි ගිරා මොණර ඇත් අස් මේ ආදී රූ සතරනින් නිමියාහ. මෙසේ නිමි ප්‍රාසාදයෙහි සතර දෙස රන් තොරණ රිදී තොරණ මරාමිණි තොරණ වීදුරු තොරණ ආදී නොයෙක් තොරණින් යොදුන් යොදුන් ගැවසීගෙණ සිටියාහ. මේ ප්‍රාසාදයෙහි සිඛ විද්‍යාධරයන්ගේ ගිගුම් පඤ්ගතුරු රුවූ හඬ කලක් සෙයින් ශබ්ද පවත්වා තළුවෝ ගඳ විලවුන් ගණිති ඒ සුවඳ විලවුන් ගත් දිව කුසුම් සුවඳ බඹලොව එක්තිස්තලය පැතුරුණේය. මේ ප්‍රාසාදය සිසාරා සිවුරු අටසියයක් යොදුන පාකුළුවල වැම් දහස් සුවහස් ගැවසී ගත්තාහ. තඳුන් උයන් හා සමවූ සියයක් උයන සැටදහසක් මිණිදඹුවැට පහන කෝටි අනූවක් වටනා දිවදුහුලක් අදිනේය. කෙළක් සුර සුඳුරින් හා කෙළක් අඟනන් හා කෙළක් නළුනාටකයන් පිරිවරාගෙණ දසදහසක් ශ්‍රීයහන් ඇතිව සැප විඳිනා දෙවපුතුන් දැක නිමි මහරජානෝ මාතලිය මේ දෙව්පුත් කුමන පින්කොට අවුත් මෙසේ සුව විඳිද්දැයි විචාළහ.

එබස් අසා මාතලී දෙවුපුත් කියන්නේ මහරජානෙනි මේ දෙව්පුත් අතීතයෙහි දඹදිව්තෙලෙහි තෙසැතිපුර නම් දෙළොස් යොදුන් නුවරෙක මහාධන සිටුව උපන් කල්හි පියමතුරා නම් බුදුරජානන් වහන්සේට විහාරයක් කරවාදී කෙළලක්ෂයක් රහත් සඟනට සතරපසයෙන් දසදහසක් අවුරුදු දන්දී බුදුපාමොක් රහත් පුහුදුල් සඟනට දෙළොස් වාරයෙක ලක්‍ෂ වටනා අටපිරිකර දන්දී කත පිළු ව්‍යාධීන්ට අවුරුදු පතා දන්දී වෙද වෙදඟයෙහි පාරගත බමුණන් සැටදහසකට දෙළොස් වාරයෙක දන්දී සුවාසූදහසක් අවුරුදු සිටු සම්පත් වළඳ සත් විඬෙක තෙවළා සතරන්පත ලියවා සත්රුවන් බඳවා ඇත පියන් පත්ලවා සුවහස් වටනා සතරන් පොත්දෙණ කරවා ඒ දෙණ දෑසමන් කුසුම් පුරා තෙවළා පොත්දෙණට වඩා නොයෙක් සුවඳ තෙලින් පුරා ගිනි පහන් පූජාකරවා මහදනහට පින්දී ආයු පමණින් තරලොව සැපත් වළඳ ඉන් සැව අවුත් මේ දිව්‍ය ප්‍රාසාදයෙහි සුව විඳිතියි කීය. මෙසේවූ දිව්‍ය ප්‍රාසාදයෙහි සුව විඳිමින් සිට සිළුමිණිසෑය වඳින්ට යන කල්හි සිඛ විද්‍යාධරයෝ දෙළොස් යොදනෙක සිටිති ඔඩ්ඩි පිල්සත් ගෙණ දෙළොස් යොදනෙක සිටිති. නොයෙක් පඤ්චාඞ්ග හෙරීගෙණ දෙළොස් යොදනෙක සිටිති. මෙසේ නොයෙක් ඓශ්වර්‍ය්‍යයෙන් ගොස් සිළුමිණිසෑය වැඳ පියමතුරා නම් බුදුන් සමයෙහි පටන් මෑත භද්‍රකල්පයෙහි බුදුවූ කකුසඳ, කොණාගමන, කාශ්‍යප, ගෞතම යන සතර බුදුන් දවසින් අනාගතයෙහි බුදුවන මෙතේ බුදුන් බුදුව අසූදහස් අවුරුදු බුඩ රාජ්‍යයකොට හැමසතුන් නිරන්තරයෙන් නහානිරුතාක් මහපියුමෙන් සඳවා නාලොව සිට තරලොව ආදිකොට කරණ ලද බුඩ කෘත්‍යයෙන් අනාගතාන නොවනතුරු තිස්යොදුන් රුවන් ඇඟෑයක් කොට සිරුරු එයට වඩා තුන් ලෝවාසීන් එතැනට රුස්වූ කල්හි එතන සිට බුඩකෘත්‍යයන් කොට මත් තෙහි සක්විති රාජ්‍යයට පැමිණ දසදහසක් යොදුන් දඹදිවට නායක වෙතියි මහරජයි කීය.

ඒ විමන තොරකොට අටතික මඹුලු නම් දෙව්පුතු හා කුමාර මඹුලු නම් දෙව්පුතු යන දෙදෙනාගේ විමන් දක්විය. මුන් දෙදෙනාගේ ප්‍රාසාදය

නිමි තියාව කෙසේද? යත් සතර මුහුණින් අටසියයක් යොදුනෙහි සිදුවූ විදුරු ටැඹින් නිමියාහ. දූව වලලු දූරගම්ණියෙන් නිමියාහ. දොර ලී දොරබා සඳකැත් මිණියෙන් නිමියාහ. මඩුලු ඉඳුනිල් මිණියෙන් නිමියාහ. ගොනැස් සතරණින් නිමියාහ, ලී ඉඳුනිල් මිණියෙන් නිමියාහ, භිත්ති දූරග මිණියෙන් නිමියාහ. මෙසේ නිමි ප්‍රාසාදය පන්සියයක් යොදුනක දිලිසෙයි අසුර ලොව කුම්භාණ්ඩයන් සටතට ආකල මේ ප්‍රාසාදය දකිමින්ම මේ ප්‍රාසාදයේ දෙව් පිරිස් රැස්ව සිටිති කියා බියෙන් බලා පලායන්නාහ. මෙසේවූ ප්‍රාසාදයෙහි දොළොස් යොදනක් තැන පඤ්චවර්ණ රත් තොරණින් රිදී තොරණින් සැරසුනේ ශක්‍රයන්ගේ ප්‍රාසාදය වැන්න එකී එකී ප්‍රාසාදයේ කෙළක් සුර සුන්දරීහු සිටිති, සුවාසූ යාලක් සතරන් සුත්තෙන් යහන් අතුට ඊමත්තේ කෙලලක්ෂයක් වටනා දිව දුහුලක් අතුට මෙසේවූ යහන් මත්තේ උන් දෙව්පුතුන් දෙදෙනා දොළොස් දහසක් නළුනාටකයෝ පිරිවරා සිටිති, සිළුමිණිසැය වඳින්ව යනකල නොයෙක් ආභරණ පැලඳ දිව පිරිස් සැව යොදනෙක සිටිති, නොයෙක් සුර සුන්දරීහු සැට යොදනෙක පැතිර සිටිති, සිඛවිද්‍යාධරයෝ සැටයොදනෙක සිටිති, මෙසේ නොයෙක් ඓශ්වර්යයෙන් සුව විඳිනාවූ දෙව්පුතුන් දෙදෙනාගේ විමන් දූක නිමි මහ රජානෝ සතුටු සොම්නස්ව මාතලිය! විදුරුගල් කුළක් සේ අප ඉදිරියේ පෙණෙන්නේ කෙසේවූ දෙව්පුතුන්ගේ විමන්දූයි විචාළහ.

එබස් අසා මාතලී දෙව්පුත් කියන්නේ මහරජානෙනි! මේ දෙපුතුන් දෙදෙනා දඹදිව අටතික මඩුලු නම් නුවර සිටුකුලයෙක ඉපද දෙදෙනාගේ අසූකෝටියක් පමණ ධන ඇත්තේ එක්සියවිසි යොදනක් තැනට නොයෙක් තැනට ගොස් වෙළඳාම්කොට උනුනොවන සම්පත් දූක උනුන් හා කථා කොට උනුන්ගේ සම්පත් විචාරා බලා කියන්නාහු පෙර කළ පිනින් පිරිසිදු කුලයෙක ඉපද මෙතෙක් සම්පත් ලදුම්හ. මෙසේවූ සම්පත් තබා පර ලොව ගියොත් නපුරැයි කියා එසේවූ සැපත් කොණ්ඩඤ්ඤ නම් බුදුරජාතන් වහන්සේටද ගඳකිළියක් කරවම්හයි කථාකොට එනුවර රජ්ජුරුවන්ට සුවහස්කෝටි වස්තුදී විහාරයට බිමගෙණ අගල වටකොට බිඳ පවුරක් බඳවා මෙතෙක් ධන අප කැටිව ගෙණගිය මැනවයි කියා මොහොතක් අවදියට විහාරයක් කරවන්නාහු සත්රුවන්මය කොට කරවා රාත්‍රිස්ථාන දිවාස්ථාන කරවා පොහොමලු කරවා පෙත් මං කරවා මලුයේ සතරදෙසෙහි අශ්‍ව රූ සිංහ රූ සතරන්කර කරවා මෙහි රන්කලස රිදීකලස තබා අගල දහසක් වටනා ගෝසි සඳුනෙන් පිරිබඩගන්වා රජුමලුව සඬා පද්ම දෙදෙනා ලවා ගඳකිළියට වඩනා මහ සත්රුවන් අතුරවා කොණ්ඩඤ්ඤ නම් බුදුරජාතන් වහන්සේ වඩා හිඳුවා සුවහස් සඟනටද බුදුරජාතන් වහන්සේටද සිව්පස යෙන් දන්දී සුවහස් වටනා අටපිරිකර දී තිබඳයෙන් තමන්ගේ ආයු පමණින් අසූදහසක් අවුරුදු දන්දී සිල් රැක භාවනා කොට සෙනෙහැති පෙම්බර දෙමව්පියන් දරුවන්ට කරණ ප්‍රේමයක් සෙයින් මිනිස් අමිනිස් තිරිසනුන් කෙරෙහි පෙම් ඇතිව අසූදහසක් හවුරුදු දිවසැපතට හේතුවූ පින්කොට දූන් මෙසේ සුවවිඳිතියි කීය.

ඒ විමන තොරකොට සුමඞගලා නම් දෙව්දුවගේ විමන දූක්විය. ඒ දෙව්දුවගේ විමන නිමිතියාව කෙසේද? යත් මරකත රජත වර්ණ මිණියෙන්

ටැම් හිඳුවා මරාමිණියෙන් දූව වලලු බැඳ ගෝසිසඳුනෙන් සැපනිපත් ඔබා විදුරෙන් කොබෝගෙඩි බැඳ ගොනැස් සතරතින් නිමවා පා කවුළු නිල්මිණියෙන් නිමවා සෙවෙනි දූරග මිණියෙන් නිමවා නිල්මිණියෙන් භිත්ති නිමවා පළල විසියොදුනක් හා උස පන්තිස් යොදුනක්වූ ප්‍රාසාදය සත්රුවනින් නිමවා ගබඩාවල කෝටිවටනා දහස් යහන් උඩ අනූලක්‍ෂයක් වටනා සළුවක් බැඳ කෙළලක්‍ෂයක් සුරසුන්දරීන් පිරිවරා සිටිනා දොළොස් දහසක් දෙනා ගඳ විලවුන් ගන්වති, දොළොස්යාලක් රත්සුන්නෙන් ඇඟ ඔප්ලවා වෙස්වුණු මහරජ හටසේ නිති වීණාගායනා කෙරෙති. සදද්දහතලා හා සරි පොකුණු සොළොසෙක, සත්රුවනින් පියගැට ලක්‍ෂයෙක, දඹුවැට පහන් ලක්‍ෂයෙක, මෙසේ නොයෙක් ඉසුරෙන් යුක්තව හුන් දෙව්දුවගේ විමන දුක නිමි මහ රජානෝ මාතලිය! මේ දෙව් දූ කුමන පින්කොට අවුදින් මෙසේවූ දිවසැප විඳීදූයි විචාළාහ.

එබස් අසා මාතලී දෙව්පුත් කියන්නේ මහරජ! මේ දෙව්දූ අතීත යෙහි තණ්හඞ්කර බුදුරජානන් වහන්සේ සමයෙහි පැදුම් පියෙසැ සුමඞ්ගල නම් ගමෙක සුමන නම් දූරියක්ව නමා සත්හැවිරිදිකල සතතයෙන් පන් සිල් රැක පොහොය අටසිල් රැක බුදුන් කෙරෙන් බණ අසා බණෙහි පැහැද මවුපියන් දෙදෙනා ප්‍රධාන කොට ඇති තමාගේ කුලයෙහි මහලු නෑයන් වැඳ පුදා නුවර වැස්සන් ලවා ගුණ කියවා වෙසෙයි, මවුපිය දෙදෙනා සතළිස් කෝටියක් ධන ඇත්තාහු එතෙක් වස්තු ඇතිව පින්නොකොට පරලොව ගියාහ. වැඩිමහලු නෑයෝ සම්පත් උතුන් නොකා සියල්ලවුන් කෙරේ ඈ මෛත්‍රී ඇති නියාත් පින්කිරීමෙහි උත්සාහ ඇති නියාත් දූන තොපගේ දෙමව්පියන්ගේ වස්තු ගෙණ දන් පින් කරවයි කීහ.

එසඳ කුමාරිකාව දෙමව්පියන්ගේ නුනුවණකම් සිතා මම මේ වස්තු දූන පරිත්‍යාගකොට සදිව්‍ය සම්පත් විඳිමියි සිතා මල් ගොණවූ පින් පැන් මඩුකරවා එහි ලැගි බමුණන් ආදීවූ යාචකයන්ට දන්දී ඒ පිරිමසත්ව පරිවාර සලස්වා ඇල්පැන් ගොණවූ ඇතී නැන පොකුණු බඳවා නිති සකුරු විලඳ පත්කඩ ඇතිකොට තබා ගඳදුම්මල් ඇතිකරවා දොළොස් වාරයෙක සියලු අටපිරිකර බෙහෙත්බඩු දන් දී කණ පිළු බිහිරි කුෂ්ට නොයෙක් රෝගීන්ට දන්දී මෙම නියායෙන් බොහෝ කුසල් රැස්කොට සතළිස් දහසක් අවුරුදු බඹසරවස් රැක නිති තුණුරුවන් මෙනෙහිකොට කුසල්කොට ඇතිතාක් ජනයන්ට දන්දී සතළිස් දහසක් අවුරුදු කුසල්කොට එයින් සැව අවුත් මේ දිව්‍ය ප්‍රාසාදයෙහි සුවවිඳිතියි කීය. මෙසේ දෙව් දූ තණ්හඞ්කර බුදුරජානන් වහන්සේගේ සමයේ පටන් මෙතේ බුදුරජාණන් වහන්සේ දක්වා දිව්‍ය සම්පත් වළඳා මෙතේ බුදුරජානන් කෙරෙහි පැහැද එයින් මත්තෙහි බුදුරජානන් වහන්සේට දොළොස්මාල් පායක් කරවා මෙම නියායෙන් තුන්පායක් කරවා පිළිගන්වා සසුන් වැද මහණව සාර දහසක් අවුරුදු මහණදම් පුරා රහත්ව නිවන් දකිති මහරජ! කීය.

එසඳ දෙව සමාගමයට බණ අසන්ට රැස්වූ දෙවියෝ කියන්නාහු නිමි මහරජානන් ගෙනෙන්ට ගිය මාතලී දෙව්පුත්ද බ්‍රහ්මදෙව්පුත්ද ලස් වූය. ඔවුන් යුහුව කැඳවාගෙණ එනලෙසට දෙව්පුතකු යවූව මැනවයි

සක්දෙව් රජහට කීහ. එබස් අසා සක්දෙව්රජ නිමි මහරජානන් කැඳවා යවූ මාතලී දෙව්පුත් ලස්වූ බැවින් උන් කැඳවාංයවූ බ්‍රහ්ම දෙව්පුත්ද ලස්වූ යයි තුන්වැනිව කුරු දෙව්පුත් යවූහ. ඒ දෙව්පුත් ඒසේම ගොස් නිමි මහ රජහට යුහුව වැඩිය මැනවැයි දැන්වීය. එබස් අසා මාතලී දෙව්පුත් රථය පැදගෙණ ගොස් සක්දෙව් රජහට වාසස්ථානවූ දසදහසක් යොදුන් දෙව් පුරය හා සුධර්මා නම් දිව්‍ය සභාව හා සුදර්ශන නම් රුවන් දොරටුව දැක්වීය. එතැන් සිට සියල්ල එක්කොට දක්වන්නේ දසදහසක් සක්වළ රුවන් මහමෙරද සතරමහා සාගරයද මරා මුහුදද වෛඩූර්ය මූහුද පැ දසදහසක් සක්වළද සත්කුළ පර්වතද සදත්දහතාළාද ගං හෝ කෙත්වත් මහවැවුද පැ සතරවරම් රජුන්ගේ සතරමහ නුවරද ත්‍රිකූට මධ්‍යයෙහි දසදහසක් යොදුන් අසුරපුරයද මෙරපල්ලේ සුවාසූදහසක් සක්වළ හිමවූ ගල්ගුහාවද පැ අසුරයන්ගේ සිත්කළු වූ පළොල් රුකද පැ දෙව්ලෝ වැසියන්ගේ අනේක සුවහස් විමන් පැ සුධර්මා, චිත්‍රා, සුජාතා, නන්දා යන සතරදෙනාගේ විමන් දැක්විය. නඳුන් උයන් පැ චිත්‍රලතා වනය පැ හැම බුදුවරයන් වහන්සේ විජම් බණ දෙසන පරසතු රුකමුල මැවුන පාණ්ඩුකම්බල ශෛලාසනයද පැ අටවිසි නකත සම්බන්ධවූ තරු යන ශතියද හිර සඳ දෙදෙනාගේ විමන්ද සියක් යොදුන් උස ඇති මහදඹගසදැයි මෙසේ නොයෙක් වස්තු ඇති විලස් වෙත් වෙන්කොට පාමින් සිටියදී සුදම් දෙව්පුතු යවූහ,

එසඳ තිබූ තැන් පසුව බලම්හයි සැටයොදුන් සුදර්ශන මහා වීථියට බැස සුදම් දෙව්සභාවට නික්මුණුසේක. එසඳ බ්‍රහ්ම විෂ්ණු ශක්‍රාදි දෙවියෝ එක්ව බෝධිසත්ත්වයන් බුදුවූ කළ පූජාකරන්නාසේ චිත්‍රකූට දොරටුයෙහි පටන් සුදම් දෙව්සභාව දක්වා රන්කළස රිදීකළස පබළු කළසයෙන්ද රන්ධජ රිදීධජ පතාකායෙන් ද පෙළ නන්වා සක්දෙව් රජහු උයන්කෙළියට නික්මුණ කල්හි පැදුම් සක්වළ මුවවිටෙහි තමාගේ සෙනග එවා රිදී මුවා අසිපත් අතලූ කෙළ සුවහස් ගාන්ධර්වයන් පිරිවරා කෙළ ලක්ෂයක් රිදී දඹු වැවට පහන් ඇතිව ශ්වේතාභරණ පැලඳ දිව අසකු නැගී ධෘතරාෂ්ට්‍ර නම් වරම් දෙව්රජ පැදුම් දෙසෙහි අරක්ගණිති. දකුණු සක්වළ මුවවිටෙහි තමාගේ සෙනග එවා මිණිමුවා අසිපත් අතලූ කීපමණ කුම්භාණ්ඩයන් සමග මිණිදඹුවැට පහන් ඇතිව කණකාභරණයෙන් සැදී මිණිමුවා අසකු නැගී විරූළ්හක නම් වරම් දෙව්රජ දකුණු සක්වළ අරක්ගණිති, පැළ සක්වළ මෝවිටෙහි තමාගේ සේනාව යවා පබළුමුවා අසිපත් අතලූ කීපමණ නාග භටයන් හා සමග මිණිදඹුවැට පහන් ඇතිව පබළුමය ආභරණයෙන් සැරසී පබළු පැ වැනි දිව අසකු නැගී විරූපාක්ෂ නම් වරම් දෙව්රජ පැල දෙසෙහි අරක් ගණිති, උතුරු සක්වළ මුවවිටෙහි තමාගේ සෙනග ගෙණ කනකමය අසිපත් අතලූ එතෙක් යක්ෂභටයන් පිරිවරා කීපමණ මිණිදඹුවැට පහන් ඇතිව කණකාභරණයෙන් සැදී දිව අසකු නැගී කුවෙර නම් වරම් දෙව්රජ සවණීපාය නම් පර්වතයට නැගී අරක්ගන්නි. සුධර්මා නම් ගන්ධර්ව පුත්‍රයෙක් සර්වගන්ධ නම් බෙරයක් අතලා සැටදහසක් හෙරීන් පිරිවරා සැටයොදනෙක රඟ මඩුලු බැඳ සිටියි, ගාන්ධර්ව නම් දෙව්පුත් වෛඩූර්ය කළස තබා උඩසෙල් වියන් බඳවා රන්තරු රිදීතරු කිංකිණිකජාලා මුතුදැල් එල්වා දෙපස නොයෙක් සුවහස් ධජපෙළ නන්වා කඩුපුල් සුරභි කිණිහිරි දැසමන් දෙඉද්ද පරසතු කොබෝලීල මදුරා මානෙල්මල් ඉසිමින් සඬපද්ම දෙදෙනා ලවා

සත්රුවන් අතුරුවා ගණ සාල් ඉස්වා අසූතුන්කෙළක් සුරසුන්දරීන් ලවා පටහ වීණා කංසා මීහිගු මෘදඞග අනොවා ගඳවිලවුන් ගත්වා ගඳදියෙන් නාවා දිව්සළු හඳවා දිව ආභරණ පලඳවා දිව දුහුලින් හිස සිසාරා ශක්‍රයෝ තමා පලන් ආභරණ පලඳවා ගවු පමණ වොටුනු පලඳවා චාමර සලවා රත්ශේසත් කරවා සුධර්මා, සුජාතා, නන්දා, චිත්‍රා යන අගමෙහෙසුන් සතර දෙනා හා අඩුතුන් කෙළක් දිව්‍ය ස්ත්‍රීන් හා එක්තිස්තල වාසී බඹුන් අතින් පූජාසත්කාර ලබන බුදුන් වැඩහිඳ ධර්මදෙශනා කරණලද දිගසැටයොදුන් පුළුල පණස්යොදුන් බොලපසළොස් යොදුන් බඳුවද පෙත්තක පැහැ ඇති පාණ්ඩුකම්බල ශෛලාසනයට නිමි මහරජානන් වැඩූහ.

සුවාසූදහසක් යොදුන් මහාසාගරය ඇලලුම් සෙයින් මහාසාගරය ඔදවඩනා කලක් මෙන් රැස්වූ දෙවියන්ට තිදසපුර දෙවියන්ගේ ආයුෂයෙන් සතියක් දිවා රාත්‍රියෙහි බණ දෙසූහ. ඒ මිනිස්ලොව ආයුගණනා යෙන් අනූ ලක්‍ෂයක් අවුරුදු සංජීව නරකයෙහි පැසෙන පව්කළවුන්ගේ ආයුෂට එක් පැයෙක් වෙයි. මෙසේ සතියක් බණ දෙශනාකළ කල්හි දෙවියෝ සතුටු වූහ. සක්දෙව්රජද සතුටුව තමාගේ ශක්‍රසම්පත් සරිසේ දෙකක්කොට බෙදාදී පාණ්ඩුකම්බල ආසනයද සරිසේ කළුහුය ගසා බෙදාදී දිව්‍යසම්පත් වළඳා වැඩහුන මැනවයි පැවරූහ, නිමි මහරජානෝ දිවසැපත් උදෙසා කියන්නාහු මෙහි රැඳුනහොත් මාගේ දානාදී පාරමිතාවන් පිරිහීමට අකාරණය, එබැවින් මනුෂ්‍ය ලොකයට යනු කැමැත්තෙමි කියා සක්දෙව්රජ අතින් සමුගෙණ නන්දා නම් උයනට වැඩියාය.

එසඳ සක්දෙව්රජ මාතලී දෙව්පුත්‍ර කැඳවාලා කියන්නේ නිමි මහ රජානන් පෙරසේම මිනිස්ලොවට ගෙණගොස් ඇරලාපියවයි කීය. නිමි මහ රජානෝ දිව්‍ය බ්‍රහ්මාදි දෙවියන්ට පින්දී අවවාදකොට සමුදී මාතලී දෙව්පුත්‍ර ගෙණෙන ලද වෛජයන්ත නම් රථයට නැංගාහ. ඒ රථයට නැගී බෝසතුන් ගෙණවුත් මූවදෙව් නම් උයන්හිලා දෙව්ලොව ගියේය. එපවත් සත්වෙනි මුනුබුරු රජු අසා උයන සරහා තමාගේ සිව්රඟගෙණ උයනට ගොස් නිමි මහරජානන් දැක වැඳ නැගීසිට ස්වාමීනි! තුඹවහන්සේගේ රාජ්‍යය රක්‍ෂා කළ මැනවැයි ආරාධනා කළහ නිමි මහරජානන් ලෝවැස්සන්ට අකොප්‍යව දශරාජ ධර්මයෙන් රාජ්‍යය කරණ කල්හි මගුල් කපුවාට මෙසේ කීහ. යම් දවසෙක මා හිස නරකෙසක් දිටිනම් මට කියවයි කීහ. මෙසේ කල්යාමකින් නරකෙසක් පෙණුනුසඳ සුවඳ දියෙන් අත්දෙව රන් අඬුවෙන් නරකෙස උදුරා පෑයේය, එකල නිමි මහරජානෝ-

"පාතුභූත දෙවදූතා – පබ්බජ්ජා සමයො මම
ඉදානෙව අගාරස්මා – නපොධසැසැනුහොමහං"

යනාදීන් කියා මගුල්කපුවාට ගම්වරදී ජ්‍යෙෂ්ඨ පුත්‍රයාට මා කළ පිළිවෙළ නොවරදවා රකුවයි අවවාදදී නික්මුණාහ. එසඳ ජ්‍යෙෂ්ඨ පුත්‍රතෙම නෙත්පුරා කඳුළුගෙණ මූවපුරා වැලපෙමින් යන කරුණු කම්දෝහෝයි උව සරව අතින් මුවවසා තුඹ පැවිදිවන කරණු කිම්දෝහෝයි පුළුවුත්හු එසඳ නිමි මහරජානෝ තෙපිදු මෙසේම සුවාසූදහසක් හවුරුදු රජකොට සුවාසූ දහසක් හවුරුදු බ්‍රහ්මවිහරණයෙන් දවස්යවා පින්පුරවයි අවවාදදී මූවදෙව් නම් උයන්හි තපස් වැද සුවාසූදහසක් හවුරුදු නිරන්තර බ්‍රහ්ම විහරණයෙන් දවස් යවා ධ්‍යානභාවනා කොට බඹලොව ගියාහ.

උහුද නිමිමහරජානන් දුන් පිළිවෙළ නොවරදවා රජකොට හිස නර කෙස් දුටු සඳ මඟුල්කපුවාට ගම්වර දී දෙටුපුත්හට රාජ්‍යය දී මා කළ පිළිවෙළ නොවරදවයි අවවාද දී එමතෙක් අවුරුදු බඹසරවස් රැක ධ්‍යානභාවනා කොට බඹලොව ගියාහ. මෙම නියායෙන් බෝසතුන් කළ පිළිවෙළ නොවරදවා කොට දහසක් රජුන් බඹලොව උපන් කල්හි පසුව රජපුත් පිළිවෙළ වරදවා දත්හල් ගිනිලා සහුන් වැසියන් සී වැසියන් කොට රා බී මත්ව දුස්සීලව අකුසල් කොට නරකයට යන බව දන බඹලොව සැපත් හැර එයින් සැව අවුත් මේ නුවණ නැති රජහු දෙව්ලොව නොගිය මැනවැයි සිතා ඒ රජු නිසා අගබිසව බඩ පිළිසඳගෙන දසඑකඩමසක් පුරා මෙස මූබයකින් බස්නා පුන්සඳ මඬලක් සෙයින් බිහිව වැඩී සුවාසූදහසක් අවුරුදු කුමාරකෙළි කෙළ සුවාසූදහසක් අවුරුදු යුව රජකම් කොට තමන් පිය රජහට බණකියා සොවාන් කොට පෙරසෙයින්ම දන් දෙවා නිබඳ පන්සිල් රැක පොහොය අටසිල් රැක බඹසරවස් රැක භාවනා කොට බඹලොව උපදනාවන් කළනයි වදාරා මේ නිමිජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි නිමි මහරජව උපන්නේ නම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

530
ඛණ්ඩහාල ජාතකය

තවද එක් සමයෙක්හි විචිතොපචිත පාරමිතා සම්භාරයෙන් සිඩවූ සර්වඥතඥාන යෙන් ලෞකික ලොකොත්තර භෙද භින්න සකල ධර්මසමූහය යථා ස්වභාව ප්‍රතිවෙධ ලක්‍ෂණ ඥානයෙන් මනාකොට දන්නාවූ තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ රජානන්වහන්සේ රජගහනුවර නිසා ගිජුකුළු පව්වෙහි වසනසේක් දෙවදත්ත ස්ථවිරයන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ අනුපිය නම් නුවර නිසා මල්ලරජුන්ගේ අනුපිය නම් නියම්ගම වසන කල්හි ප්‍රසිඩ ප්‍රසිඩවූ ශාක්‍ය කුමාරවරු සර්වඥයන්වහන්සේ සමීපයෙහි මහණවන්නාහුය. එසමයෙහි මහානාම නම් ශාක්‍ය කුමාරයන් හා අනුරුඩ නම් ශාක්‍ය කුමාරයෝ සහෝදර දෙබෑයෝය. ඔවුන් දෙදෙනා අතරෙන් අනුරුඩ නම් ශාක්‍ය කුමාරයෝ ඉතා සිව්මැල්ලෝය, උන්ට ප්‍රාසාද තුනෙක් වන්නේය, එක් ප්‍රාසාදයෙක් හෙමන්ත කාලයෙහි විසීමට සුදුසු වන්නේය, එකෙක් ග්‍රීෂ්ම කාලයට සුදුසු වන්නේය, එකෙක් වර්ෂා කාලයට සුදුසු වන්නේය, ඒ අනුරුඩ ශාක්‍යකුමාරයෝ වර්ෂා ඍතුවට සුදුසු ප්‍රාසාදයෙහි වර්ෂා සාරමස පුරුෂයන් නැතිව ස්ත්‍රීන් විසින් පවත්වන ලද ආතත විතතාදීවූ පඤ්චාංගික තූර්‍ය්‍යනාදයෙන් සිත් අලවමින් මතුමාලෙන් යටමාලයට නොබැස දිවසැපත් විඳිනා දිව්‍යකුමාරයකු මෙන් මහත්වූ ශ්‍රී විභූතීන් අනුභව කෙරෙමින් වාසය කරන්නාහ.

එකල්හි මහානාම නම් ශාක්‍ය රජ්ජුරුවෝ සිතන්නෝ දූත් වූකලී ප්‍රසිද්ධ ප්‍රසිද්ධවූ ශාක්‍යකුමාරවරු බුදුරජාණන්වහන්සේ සමීපයෙහි මහණවන්නාහුය. අපගේ කුලයෙන් මහණවූ කිසිකෙනෙක් නැත, එසේ හෙයින් මම්වත් අනුරුද්ධ කුමාරයන්වත් අප දෙදෙනාගෙන් එක්කෙණෙකුන් මහණවූවොතින් යහපත් වන්නේයයි සිතා ඒ මහානාම ශාක්‍ය රජ්ජුරුවෝ අනුරුද්ධ නම් ශාක්‍ය කුමාරයන් සමීපයට ගොස් මෙසේ කිවුය. මල අනුරුද්ධ කුමාරයෙනි, දූත් ප්‍රසිද්ධ ප්‍රසිද්ධවූ ශාක්‍යරාජකුමාරවරු සර්වඥයන්වහන්සේ සමීපයෙහි මහණ වන්නාහ. අපගෙන් ගොස් බුදුන් සමීපයෙහි මහණවූ කිසි කෙණෙක් නැත්තාහ. එසේ හෙයින් තෙපි හෝ මහණවව මම හෝ මහණ වෙමියි කිවුය. එබස් ඇසූ අනුරුද්ධ කුමාරයෝ කියන්නෝ බෑයන්වහන්ස, මම ඉතා සිවුමැල්ලෙමි, එසේ හෙයින් මම ගිහිගෙයි ආලය හැර ශාසනයෙහි මහණව මහණදම් පුරන්නට අසමර්ථයෙමි, නුඹවහන්සේ මහණවූව මැනවැයි කිවුය. එකල මහානාම නම් ශාක්‍යරජ්ජුරුවෝ, එසේ වීනම් මල, මෙසේ එව මම තොපට ගිහිගෙයි වසන්නවුන් විසින් කළමනා කර්මාන්ත ප්‍රකාශකොට කියමි. ඒ මා කියන්නාවූ වචනය අසව.

පළමුකොට කුඹුරු සෑවිය යුත්තේය, කුඹුරු සාවා වැපිරිය යුත්තේය. වපුරා වප්පැන් කපා අල යුත්තේය, වප්පැන් කපා අලවා නැවත කීප සතියකින් කුඹුරෙහි දිය බැන්ද යුත්තේය, දිය බැඳ ක්‍රමයෙන් ගොයම් අටගත් කල්හි නෙලිය යුත්තේය. නෙලා ඉක්බිති ගොයම් පැසීගිය කල්හි ගොයම් දැවිය යුත්තේය, ගොයම් දවා ඉක්බිති කොළලැවිය යුත්තේය, කොළලවා ඉක්බිති කඳුකළ යුත්තේය, කඳු කරවා ඉක්බිති කලවිට කොළ නැගිය යුත්තේය, කොළ නංවා ඉක්බිති මැඩවිය යුත්තේය. මඩවා ඉක්බිති පිදුරු වැඩිය යුත්තේය, පිදුරු වඩා ඉක්බිති රඩුගසා අල යුත්තේය, රඩුගසා ඉක්බිති සුළඟට පෑ පෑස්ස යුත්තේය, පැස ඉක්බිති වී මැන මෙතෙකැයි නියම දැන කොටුගුලට ගෙන්වා ලැවිය යුත්තේය, වී කොටුගුල ලවා ඉක්බිති නැගෙන අවුරුද්දෙහිත් මෙසේම කළ යුත්තේය, මෙසේම කළ යුතුයයි කියා කර්මාන්ත නොගෙවෙන්නේය, කර්මාන්තයෙහි කෙළවරෙක් නොපෙණෙන්නේයයි කිවුය.

එබස් ඇසූ අනුරුද්ධ කුමාරයන් විසින් බෑයන්වහන්ස, කවර කලෙක්හි කර්මාන්ත ගෙවේද? කවර කලෙක්හි කර්මාන්තයෙහි කෙළවරක් පෙණේද? කවර කලෙක්හි අපි උපයා කැවිල්ලෙහි නිරුත්සාහව පඤ්චකාමය අනුභව කෙරෙමින් සතුටුව වාසය කරමෝදැයි කී කල්හි, මල, අනුරුද්ධ කුමාරයෙනි, ජීවත්වනතෙක් එක දවසකත් කර්මාන්ත නොගෙවයි. කර්මාන්තයෙහි කෙළවරක් නොපෙණෙයි. කර්මාන්තයෙහි කෙළවරක් නැතිව තිබියදීම දෙමවුපියෝද මුතුන්මිත්තෝද මිය පරලොව ගියාහුයයි මහානාම ශාක්‍ය රජ්ජුරුවෝ අනුරුද්ධ කුමාරයන්ට කිවුය. එබස් ඇසූ අනුරුද්ධ කුමාරයෝ එසේ වීනම් බෑයන්වහන්ස, නුඹවහන්සේ ගිහිගෙයි වැස සම්පත් අනුභවකළ මැනව, මම බුදුරජාණන්වහන්සේ සමීපයෙහි මහණව මහණදම් පුරමියි කිවුය.

ඉක්බිත්තෙන් අනුරුද්ධ ශාක්‍ය කුමාරයෝ මෑනියන් සමීපයට ගොස් කියන්නෝ මෑනියන්වහන්ස, මම ගිහිගෙන් ගොස් ශාසනයෙහි මහණව මහණ

දම් පුරණු කැමැත්තෙමි. මහණවීමට මට අනුදත මැනවැයි කීවුය. මෙසේ කීකල්හි අනුරුඬ නම් ශාක්‍ය කුමාරයන්ගේ මෑනියෝ කුමාරයන්ට මෙසේ කීවුය. පුත, තෙපි දෙබෑයෝ නම් මට ඉතා ප්‍රියය, සිත්කලුය, මනවඩන්නාහ, තොප දෙදෙනා මළ විටෙක මුත් සෙසු සැටියේ වෙන් වන්නා නො කැමැත්තෙමි. එසේ හෙයින් තොප දෙදෙනා ජීවත්ව ඉන්දදී මහණවන්ට කුමක් පිණිස අනුදනිම්දැයි කීවුය, දෙවැනිවත් තුන්වැනිවත් අනුරුඬ කුමාරයෝ මෑනියන්ට කියත්තෝ මෑනියන්වහන්ස, මම ශාසනයෙහි මහණවනු කැමැත්තෙමි, මට මහණවීමට අනුදත මැනවැයි කීවුය. මෙසේ කී කල්හි අනුරඬ කුමාරයන්ගේ මෑනියෝ පුත, තෙපි දෙබෑයෝ නම් මට ඉතා ප්‍රියයහ, මනවඩන්නාහ, මරණින් විනා කැමති පරිද්දෙන් වෙන්නොවෙමි, තොප දෙදෙනා ජීවත්ය ඉන්දදී කුමක්නිසා මහණවීමට අනුදනිම්දැයි මහණ වීමෙහි අනභිප්‍රාය කීවුය.

එසමයෙහි භද්දිය නම් ශාක්‍ය රජ්ජුරුවෝ සියලු ශාක්‍ය රජදරුවන්ට ප්‍රධානව රාජ්‍යය කරන්නාහ. ඒ භද්දිය නම් ශාක්‍ය රජදරුවෝ අනුරුඬ නම් ශාක්‍ය කුමාරයන් හා යහලුව වෙසෙති. ඉක්බිත්තෙන් අනුරුඬ කුමාරයන්ගේ මෑනියෝ සිතන්නෝ මේ භද්දිය නම් ශාක්‍ය රජ්ජුරුවෝ සියලු රජදරුවන්ට නායකව රාජ්‍යය කෙරෙති. උභ තුමූ මුන්ට යහලුව වෙසෙති. ඒ රජ්ජුරුවෝ රාජ්‍යශ්‍රී හැර ගිහිගෙන් නික්ම ශාසනයෙහි මහණවන්ට උත්සාහ නො කෙරෙතියි සිතා අනුරුඬ කුමාරයන්ට කියන්නෝ, පුත, අනුරුඬ කුමාරයෙනි, භද්දිය රජ්ජුරුවෝ නම් රාජ්‍යශ්‍රී හැර මහණවෙත් නම් තෙපිත් උන් හා සමග ගොස් ශාසනයෙහි මහණව මහණදම් පුරවයි කීවුය.

එකල්හි අනුරුඬ කුමාරයෝ භද්දිය නම් ශාක්‍යරජු කරා ගොස් රජ්ජුරුවන්වහන්ස, මාගේ මහණවීම තුඹවහන්සේ පිළිබඳ දැයි කීවුය. එබස් අසා භද්දිය රජ්ජුරුවෝ සබඳ අනුරුඬ කුමාරයෙනි, තොපගේ මහණවීම ඉදින් මා පිළිබඳවීනම් රාජ්‍යශ්‍රී හැර මම මහණවනු නොකැමැත්තෙමි, එසේ හෙයින් මහණවීමට තොප හා මා එක්වීමෙක් නැත. තොපගේ මහණවීම මා පිළිබඳ නොවෙයි, මා මහණවෙති නොසිතා තෙපි සැපසේ ගොස් මහණවවයි කීවුය. දෙවැනිවත් තුන්වැනිවත් අනුරුඬ නම් ශාක්‍යකුමාරයෝ භද්දිය ශාක්‍ය රජ්ජුරුවන්ට කියන්නෝ සබඳ භද්දිය ශාක්‍ය රජ්ජුරුවන් වහන්ස, වැඩිය මැනව, අපි දෙදෙන රාජ්‍යශ්‍රී හැර ගිහිගෙන් නික්ම ශාසනයෙහි මහණව මහණදම් පුරම්හයි කීවුය. එකල භද්දිය නම් ශාක්‍ය රජ්ජුරුවෝ සබඳ අනුරුඬ කුමාරයෙනි මම මහණවිය නොහෙමි. මා විසින් තොපට කරන්නට නිසි සෙසු යම් කාරියෙක් ඇත්නම් එය කරන්නට පිළිවන. මම මහණවිය නොහෙමි, තෙපි මහණවවයි කීවුය. එබස් අසා අනුරුඬ කුමාරයෝ කියන්නෝ, රජ්ජුරුවන්වහන්ස, මෑනියන්වහන්සේ මට කියනසේක් ඉදින් පුත අනුරුඬ කුමාරයෙනි, භද්දිය නම් ශාක්‍ය රජ්ජුරුවන්වහන්සේ මහණවනසේක්වීනම් තෙපි උන්වහන්සේ හා සමග මහණවවයි මට කීසේකැයි කීවුය. එබස් ඇසූ භද්දිය රජ්ජුරුවෝ කියන්නෝ සබඳ අනුරුඬ කුමාරයෙනි, තොපගේ මහණවීම මා පිළිබඳයයි තොපගේ මෑනියන් විසින් කියන ලද්දේ වීනම් මහණවීමට තොප හා මා එක්වීමෙක් නැත තොපගේ මහණවීම මා පිළිබඳයයි

නොසිතා සැපතේ ගොස් මහණවවයි කිවූය. නැවතද දෙවැනිවත් තුන්වැනිවත් අනුරුඩ කුමාරයෝ කියන්නෝ් සවාමීනි, භද්දිය රජ්ජුරුවන්වහන්ස, වැඩිය මැනව, අපි දෙදෙනම ගොස් ශාසනයෙහි මහණව මහණදම් පුරම්හයි කිවූය.

එසමයෙහි මනුෂ්‍යයෝ සත්‍යවාදීහ. එසේ හෙයිත් භද්දිය නම් ශාක්‍ය රජ්ජුරුවෝ අනුරුඩ කුමාරයන්ට කියන්නෝ සබඳ අනුරුඩ කුමාරයෙනි, එසේ වීනම් සත් අවුරුද්දක් බලව සත් අවුරුද්දක් ගියකල දෙදෙනම එක්ව ගොස් මහණ වම්හයි කිවූය. එවිට අනුරුඩ කුමාරයෝ රජ්ජුරුවන්වහන්ස, සත් අවුරුද්දක් කල් ඉතා බොහෝය. සත් අවුරුද්දක් බලා ඉඳිනට නොපිළිවනැයි කීහ. එසේ වීනම් සාවුරුද්දක් බලව, පස් අවුරුද්දක් සතර අවුරුද්දක් තුන් අවුරුද්දක් දෑවුරුද්දක් අවුරුද්දක් බලව, අවුරුද්දක් ගියකල දෙදෙනම ගොස් මහණවම්හයි භද්දිය රජ්ජුරුවෝ කිවූය. අනුරුඩ කුමාරයෝ සබඳ රජ්ජුරුවන්වහන්ස, අවුරුද්දක් කල් ඉතා බොහෝය. අවුරුද්දක් බලා ඉඳිනට නොපිළිවනැයි කීහ. එසේ වීනම් සබඳ අනුරුඩ කුමාරයෙනි, සත්මසක් බලව, සත්මසක් ගියකල දෙදෙනම ගොස් මහණවම්හයි කිවූය. රජ්ජුරුවන්වහන්ස, සත්මසක් කල් ඉතා බොහෝය, සත්මසක් ඉවසා ඉඳිනට නොපිළිවනැයි අනුරුඩ කුමාරයෝ කීහ. එසේ වීනම් සමසක් බලව, නවද පස්මසක් සාරමසක් තුන්මසක් දෙමසක් දෙපෝයක් බලව, දෙපෝයක් කල්ගිය කල්හි දෙදෙනම ගොස් මහණවම්හයි කීහ. සබඳ රජ්ජුරුවන්වහන්ස, දෙපෝයක් කල් ඉතා බොහෝය. දෙපෝයක් කල් බලා ඉඳිනට මට නො පිළිවනැයි කිවූය. එසේ වීනම් යහළු අනුරුඩ කුමාරයෙනි, යම් පමණ කලකින් දරුවන් හා මල්බෑයන්ට රාජ්‍යය පාවාදී අවවාදානුශාසනා කෙරෙත් නම් එපමණවූ සතියක් කල් ඉවසුවයි කිවූය. අනුරුඩ කුමාරයෝ එබසට සතුටුව සබඳ භද්දිය රජ්ජුරුවන්වහන්ස සතියක් නම් බොහෝ කලෙක් නොවෙයි. එපමණ කල් ඉවසන්නෙම් වේදැයි කිවූය.

ඉක්බිත්තෙන් භද්දිය ශාක්‍ය රජ්ජුරුවෝය, අනුරුඩ කුමාරයෝය ආනන්ද කුමාරයෝය, භගු කුමාරයෝය, කිම්බිල කුමාරයෝය, දෙවදත්ත කුමාරයෝය යන මොහු සදෙන උපාලි නම් කපුවා හා සමග පෙරයම්සේ සිවුරඟ සෙනඟ හා සමග උයනට උද්‍යාන ක්‍රීඩාවට යෙත්නම් එපරිද්දෙන්ම සිවුරඟ සෙනඟ හා සමග මහණ වන්නට නික්මුණාහ. ඔහු ඈම්දෙන දුරට ගොස් සේනාව රඳවා අන් රාජ්‍ය සීමාවකට පැමිණ තමන් පලන් පලන් ආභරණ ගලවා උතුරු සළුව පොදියක් කොට බැඳ උපාලි නම් කපුවාට කියන්නාහු එම්බා උපාලිය, මේ ආභරණ භාණ්ඩය ඇරගෙන නැවත නුවරට පලායව තට ජීවිතානතය දක්වා රැකෙනට මෙපමණෙක්ම සෑහෙන්නේයයි කිවූය.

ඉක්බිත්තෙන් උපාලි නම් කපුවා ආභරණ පොදිය ඇරගෙණ පෙරලා එන්නට සිටි තැනැත්තවුව මෙසේවූ සිතිවිල්ලෙක් විය. ශාක්‍ය රජදරුවෝ නම් ඉතාම චණ්ඩයෝය, පරුෂයෝය, මේ කපුවා කුමාරවරුන් මරා පියා ආභරණ ගලවා පොදිය බැඳගෙණ නුවරට පලා ආයයි නුවර රැඳුන රජදරුවන්

වහන්සේ මා මරාපියන්වත් නිසිසේක. එසේ හෙයින් මෙබඳු වූ ශාක්‍ය කුමාර වරු පවා මහ සම්පත් හා ගිහිගෙයි ඇළුම් හැර නික්ම මහණ වෙති, මට වූ කලී කියනුම කිම්දැයි උපාලි නම් කපුවා ආභරණ පොදිය මුදා සියලු ආභරණම ගසක එල්වා මේ ආභරණ මා විසින් දෙන ලද්දේමය. යම් කෙනෙක් දුටුහු නම් උඟ තුමූ ඇරගණිත්වයි කියා ඒ භද්දිය රජ්ජුරුවන් ප්‍රධාන කොට ඇති ශාක්‍ය කුමාරවරුන් සමීපයට ගියේය. ඒ රාජකුමාරවරු උපාලි නම් කපුවා දුරින්ම එන්නහු දැක සමීපයට පැමිණි කල්හි කියන්නාහු සගය උපාලි නම් කපුව! කුමක් නිසා අප සමීපයට පෙරලා ආයෙහිදැයි කීහ. එකල්හි මගුල් කපුවා කියන්නේ, සවාමීනි! නුවරට නික්මෙන්නට සිටි මම සිතන්නෙම් ශාක්‍ය රජදරුවෝ නම් චණ්ඩයෝය, පරුෂයෝය, මෙතෙක් කුමාරවරුන් මරාපියා ආභරණ ගලවා පොදිය බැඳගෙණ පලා ආයයි නුවර උන් රජදරුවන්වහන්සේ මා මරාපියන්වත් නිසිසේක. එසේහෙයින් මෙබඳු වූ ශාක්‍ය රජදරුවන්වහන්සේ පවා රාජ්‍යශ්‍රී හැර ගිහිගෙන් නික්ම මහණ වන සේක. මට වූකලී කියනුම කවරේදැයි සිතා සවාමිපුත්‍රයානෙනි! මම ඒ ආභරණ පොදිය මුදා සියලු ආභරණම ගසක එල්වා යම්කෙනෙක් දුටුහු නම් උඟ තුමූ ඇර ගණිත්වයි මා විසින් දෙනලදමැයි කියා එතැන සිටම වැලක පෙරලා නුඹ වහන්සේලා සමීපයට ආම් කීහ. එබස් අසා රාජකුමාරවරු කියන්නෝ, සගය උපාලි නම් කපුව! ශාක්‍ය රජදරුවෝ නම් ඉතා චණ්ඩයෝය, මේ තෙමේ කුමැරවරුන් මරාපියා ආභරණ ගලවා පොදිය බැඳගෙණ පලා ආයයි මරවා පියන්නට නිස්සෝයයි සිතා නැවත අප සමීපයට ආවාවූ තා විසින් කළසේ ඉතාම යහපත් වන්නේයයි කියා ඒ ශාක්‍ය කුමාරවරු උපාලි නම් කපුවා කැඳවාගෙණ බුදුරජානන්වහන්සේ සමීපයට ගොස් නමස්කාර කොට එකත් පස්ව හිඳ මෙසේ කීහ. සවාමීනි! අපි ශාක්‍යයෝ නම් ඉතා මානීයහ, එසේ හෙයින් සවාමීනි මේ උපාලි නම් කපුවා අපට බොහෝ දවසක් මෙහෙකරුව සිටියේය, ඔහු පළමුව මහණකොට වදාළ මැනව, ඔහු මහණවූ කල්හි අප ඔහට අභිවාදන පච්චුපට්ඨාන අඤ්ජලිකම් සාමීචිකම් කරම්හ. එසේ කල්හි අපගේ ශාක්‍ය මානය මැඩී යන්නේයයි කීහ. එකල්හි සර්වඥයන්වහන්සේ උපාලි නම් කපුවා පළමුවෙන් මහණ කොට පසුව රාජකුමාරවරුන් සදෙනා මහණ කරවූසේක.

ඉක්බිත්තෙන් ආයුෂ්මත් වූ භද්දිය ස්ථවිරයන්වහන්සේ එම වස් සාර මස ඇතුළත පූර්වේනිවාසානුස්මෘති ඥානය, දිව්‍යචක්ෂුරභිඥානයා, ආශ්‍රවක්ෂයකර ඥානයයි කියන ලද ත්‍රිවිද්‍යාව සාක්ෂාත් කළසේක. ආයුෂ්මත් වූ අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ දිවැස් ඉපද වූ සේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ ශ්‍රොතාපත්ති ඵලය සාක්ෂාත් කළසේක. දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ ලෞකික වූ ඉර්ධිය ඉපද වූ සේක. එසමයෙහි ආයුෂ්මත් වූ භද්දිය ස්ථවිරයන් වහන්සේ ආරණ්‍යය, වෘක්ෂමූලය, ජනවිවෙක ස්ථානයයි කියනලද මේ හැම තැනට පැමිණ ඉතා සැපය, ඉතා සැපය යි එක්වන් උදන් අනනසේක. එකල බොහෝ භික්ෂූන් වහන්සේ බුදුරජානන් වහන්සේ සමීපයට ගොස් දන්වන සේක්, සවාමීනි! මේ ආයුෂ්මත්වූ භද්දිය ස්ථවිරයන්වහන්සේ ආරණ්‍යයට වෘක්ෂ මූලයට ශූන්‍යාගාරයට පැමිණ අහො සුඛං, අහො සුඛං යි එක්වන් ප්‍රීතිවාක්‍ය

පවත්වති, ස්වාමීනි! ඒකාන්තයෙන් මේ ආයුෂ්මත්වූ භද්දිය ස්ථවිරයන් වහන්සේ ශාසනයෙහි ඇළුම් නැතිව හෝ බ්‍රහ්මචරියාවස් රකිති, නොහොත් පළමු තමන් අනුභව කළ රාජ්‍ය ශ්‍රී සැපයට සලකමින් ආරණ්‍ය වෘක්ෂමූල ශූන්‍යාගාරයට පැමිණ ඉතා සැපය, ඉතා සැපය යි එක්වන් උදන් අනති සිතම්හ යි දැන්වූසේක.

ඉක්බිත්තෙන් බුදුරජාණන්වහන්සේ එබස් අසා ඒ භික්ෂූහු කැඳවා මහණ! තෙපි මෙසේ මා කී නියාව කියා භද්දිය ස්ථවිරයන් කරා ගොස් ඇවැත්වූ භද්දිය ස්ථවිරයන් වහන්ස! බුදුරජාණන් වහන්සේ නුඹවහන්සේ කැඳවනසේකැයි කියා කැඳවාගෙණ එවයි වදාළසේක. යහපත ස්වාමීනි කියා ඒ භික්ෂූහු බුදුරජාණන් වහන්සේට ප්‍රතිවචන දී භද්දිය ස්ථවිරයන් වහන්සේ කරා ගොස් ඇවැත්වූ භද්දිය ස්ථවිරයන් වහන්ස! බුදුහු නුඹවහන්සේ කැඳවන සේකැයි කීවුය. එසේද ඇවැත්නි! කියා ආයුෂ්මත්වූ භද්දිය ස්ථවිරයන් වහන්සේ ඒ භික්ෂූන්ට ප්‍රතිවචන දී බුදුරජාණන්වහන්සේ කරා ගොස් නමස්කාර කොට එකත්පස්ව හුන්සේක. එකල්හි බුදුහු භද්දියෙනි! සැබෑද? තා අරණ්‍ය වෘක්ෂමූල ශූන්‍යාගාරයට පැමිණ ඉතා සැපය, ඉතා සැපය යි එක්වන් උදන් අනනනුදැ?යි විචාළසේක. එසේය ස්වාමීනි! යි දැන්වූ කල්හි භද්දියෙනි! තෙපි කවර අර්ථ කොට්ඨාසයක් සලකා ආරණ්‍ය වෘක්ෂමූලය ශූන්‍යාගාරයට පැමිණ ‘අහෝ සුඛං, අහෝ සුඛං’ යි එක්වන් ප්‍රීතිවාක්‍යය පවත්වන්ට වූ දැයි නැවතත් විචාළසේක.

ස්වාමීනි! පෙර මා රාජ්‍යශ්‍රී අනුභව කරණ කල ඇතුළුවූ අන්තඃපුරයෙහි රැකවලුන් ඉතා තර වන්නේය, අන්තඃපුරයෙහි පිටත රැකවලුන් ඉතා තර වන්නේය, ඇතුළු නුවර රැකවලුන් ඉතා තර වන්නේය. පිටි නුවර රැකවලුත් ඉතා තර වන්නේය, ඇතුළු ජනපදයෙහි රැකවලුත් ඉතා තර වන්නේය, ස්වාමීනි! එසේ බලවත්වූ රැකවලින් රක්ෂිත ගොපිතව ප්‍රාසාදයෙහි මතුමහල් තෙලෙහි වසන්නෙම් භයපත්ව උද්වෙග ඇතිව සාංකා සහිතව නැතිගෙණ වෙසෙමි. දැන් වූ කලී ස්වාමීනි! මට අරණ්‍ය වෘක්ෂමූල ශූන්‍යාගාරයට පැමිණියෙම් නිර්භිතව උද්වෙග නැතිව සාංකා නැතිව අනුත්තිසා ජීවත් වන්නෙම් වෙනෙහි වසන්නාවූ මෘග පක්ෂි ජාතීන් මෙන් කිසිවෙක්හි අභිලාසයෙක් නැතිව නිර්භීතව වෙසෙමි. ස්වාමීනි! මම මේ අර්ථ කොට්ඨාසය සලකා ආරණ්‍ය වෘක්ෂමූල ශූන්‍යාගාරයට පමිණ ‘අහෝ සුඛං, අහෝ සුඛං’ යි එක්වන් ප්‍රීතිවාක්‍ය පවත්වමි යි දැන්වූසේක.

ඉක්බිත්තෙන් බුදුරජාණන් වහන්සේ උන්වහන්සේට ප්‍රශංසා කරණ සේක්, යමක්හුගේ සන්තානයෙහි ක්‍රොධ මානාදී අකුශල ධර්මයෝ නැද්ද ශාස්වත දෘෂ්ටි උච්ඡෙද දෘෂ්ටි සංඛ්‍යාතවූ භවාභවය ඉක්ම සිටියේද පහවූ භය සොක ඇතිහෙයින් සන්තුෂ්ටවූ සිත් ඇති ඒ උත්තම පුරුෂයා දෙවතාවෝත් හැමවේලෙහිම රක්ෂා ඇත්තෝ වේදැයි මෙසේ භද්දිය ස්ථවිරයන් වහන්සේට ප්‍රශංසා කොට ඒ අනුපිය නම් නියම් ගමින් නික්ම කොසඹෑ නුවරට වැඩ කොසඹෑ නුවර නිසා ඝොසිතාරාමයෙහි වැඩවසන සේක. එකල්හි දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ එක් දවසක් තමන්වහන්සේට කවර නම් කෙණෙකුන්

පහදවා ලාභසත්කාර උපදවන්නෙහෝයි සිතනසේක්, මේ රජාසත් කුමාරයෝ බාලයෝය, මතු ඇතිවන තැනැත්තෝය. එසේහෙයින් මේ අජාසත් කුමාරයන් පහදවාගෙණ ලාභ සත්කාර ඉපද වූයෙම් වීම් තම් යහපත් වන්නේයයි සිතා පාසිවුරු තැන්පත් කොට තබා රජගහනුවරට ගොස් එහි විසූසේක.

ඉක්බිති ඒ දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රමණ රූපය අන්තර්ධාන කොට බාල කුමාර රුවක් මවා සර්ප මෙඛලාවක් පැලඳ අජාසත් කුමාරයන්ගේ ඇකයෙහි පෙණීගියසේක. ඒ අජාසත් කුමාරයෝ භයපත් වූහ. උන් භයපත් වූ නියාව දැන දෙවදත්ත ස්ථවිරයන්වහන්සේ කුමාරයෙනි! තෙපි මට බවුදැ?යි කීසේක. එසේමය බම් තෙපි කවුරුදැ?යි විචාළහ. මම දෙවදත්ත ස්ථවිරයෙම්, කී කල්හි ස්වාමීනි! ඉදින් නුඹවහන්සේ වීනම් මේ කුමාර රූපය අන්තර්ධාන කොට ශ්‍රමණ රූපයෙන් අභිමුඛයෙහි සිටිය මැනවැයි කීහ. එකල්හි දෙව්දත් තෙරුන්වහන්සේ කුමාර රූපය අතුරුදහන් කොට පාසිවුරු ධරා ශ්‍රමණ රූපයෙන් අජාසත් කුමාරයන්ගේ අභිමුඛයෙහි සිටිසේක. එකල්හි අජාසත් කුමාරයෝ දෙව්දත් තෙරුන් වහන්සේගේ මේ ඉර්ධි ප්‍රාතිහාර්‍ය්‍යයී පැ දවස සිට උදෑසන පන්සියයක් රථ පිරිවරා උපස්ථානයට යෙති, බත්වලුන් පන්සියයක් නිරන්තරයෙන් දියයුතු කොට තැබවූහ.

ඉක්බිත්තෙන් මෙබඳුවූ ලාභසත්කාරයෙන් හා කීර්තියෙන් මඩනා ලද්දාවූ සිත් ඇති ඒ දෙවදත්ත ස්ථවිරයන් වහන්සේට මමත් භික්ෂුසඞ්ඝයා පරිහරණය කෙරෙමියි මෙබඳු පාපාධ්‍යාසයෙක් උපන්නේය. ඒ සිතූ සිත හා සමගම ඉර්ධියෙන් පිරිහුණුසේක. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේට උපස්ථායකවූ කකුධ නම් කොලිය පුත්‍රයෙක් කාලක්‍රියා කොට එක්තරා මනොමය වූ දිව්‍යනිකායෙක උපන්නේ මුගලන් මහතෙරුන් වහන්සේ කරා අවුත් මෙසේ කීහ. ස්වාමීනි! දෙව්දත් තෙරුන්වහන්සේ (ලාභසත්කාරයෙන් මඩනා ලද සිත් ඇති තැනැත්තන්වහන්සේ)ට මම භික්ෂුසඞ්ඝයා පරිහරණය කෙරෙම් යි මෙබඳු වූ පාපාධ්‍යාසයෙක් උපන, ඒ සිතූ සිත හා සමගම ස්වාමීනි! දෙව්දත් තෙරුන්වහන්සේ ඉර්ධියෙන් පිරිහුණුසේක් වේ දැයි මුගලන් මහ තෙරුන්වහන්සේ වැඳ පැදකුණුකොට එතැන්හිම අතුරුදන් විය.

ඉක්බිත්තෙන් මුගලන් මහතෙරුන් වහන්සේ සර්වඥයන් වහන්සේ සමීපයට ගොස් වැඳ එකත්පස්ව ඉඳ දන්වනසේක් ස්වාමීනි! මට උපස්ථායක වූ කකුධ නම් කොලී පුත්‍රයා එක්තරා මනොමය වූ දිව්‍ය නිකායෙක උපන් තැනැත්තේ මා සමීපයට අවුත් කියන්නේ, ස්වාමීනි! දෙව්දත් මහතෙරුන් වහන්සේ (මානයෙන් මඩනාලද තැනැත්තන්වහන්සේ)ට මමත් භික්ෂුසඞ්ඝයා පරිහරණය කෙරෙම් යි මෙබඳු වූ පාපධ්‍යාසයෙක් උපන, එසේ සිතූ සිත හා සමග ඉර්ධියෙන් පිරිහුනසේක් වේදැයි කියා, ස්වාමීනි! ඒ කකුධ නම් දිව්‍ය පුත්‍රයා මා වැඳ පැදකුණු කොට එතැන්හිම අතුරුදන් වීයයි දන්වූසේක. එබස් අසා සර්වඥයන්වහන්සේ වදාරණසේක්, මෞද්ගල්‍යායන ස්ථවිරයෙනි! ඒ කකුධ නම් දිව්‍යපුත්‍රයා පරසිත් දැන යම් බසක් කී නම් ඔහු කී බස සත්‍යයම

වත්නේයයි වදාළසේක. මුගලන් මහතෙරුන්වහන්සේත්, ස්වාමීනි! කකුධ නම් දිව්‍යපුත්‍රයා යමක් කී නම් ඔහු කී බස් විෂම වත්නේ අන් පරිද්දෙකින් නොවන්නේයයි දැන්වූසේක. එකල්හි සර්‍වඥයන්වහන්සේ මෞද්ගල්‍යායන ස්ථවිරයෙනි! මේ බස රැකපියව, අන් කිසි කෙනෙකුන්ටත් නොකිය, ඒ තුච්ඡ පුරුෂයා තමා කළ ආකාරියෙන් තෙමේම ප්‍රකාශවන්නේ වේ දැයි වදාළසේක.

ඉක්බිත්තෙන්භාග්‍යවත්වූ බුදුරාජානන් වහන්සේ නොයෙක් කාරණා වදාරා කොසඹෑනුවරින් නික්ම රජගහනුවරට වැඩ රජගහනුවර නිසා වෙළුවනාරාමයෙහි වැඩවසනසේක. එකල්හි බොහෝ භික්ෂූන්වහන්සේ සර්‍වඥයන් වහන්සේ කරා පැමිණ දන්වනසේක, ස්වාමීනි! දෙව්දත් තෙරුන්වහන්සේට අජාසත් කුමාරයෝ පන්සියයක් රථයෙන් පිරිවරණ ලදුව සරහා පිළියෙළ කරණ ලද උතුම්වූ රථයකට පැනනැගී උදෑසන සවස උපස්ථානයට යෙති. බත් වසුන් පන්සියයකුත් නිරන්තරයෙන් දෙන කොට තැබවූයයි දැන්වූසේක. එකල්හි සර්‍වඥයන්වහන්සේක්, වදාරණසේක්, මහණෙනි! දෙවදත්ත ස්ථවිරයන් ඒ ලාභසත්කාර සිලෝකයා නිසා අවැඩක් විනා වැඩෙක් නැත. මහණෙනි! යම්සේ චණ්ඩ වූ බලුකු කුරුවකුගේ නාසාපුටයෙහි තබාලුව බතක් බිඳපු නම් එකල්හි ඒ බලුකුකුරුවා වඩ වඩාලා ඉතාම චණ්ඩව මිනී කා ඇවිදීද, එපරිද්දෙන්ම දෙවදත්ත ස්ථවිරයන්ට අජාසත් කුමාරයෝ පන්සියයක් රථ පිරිවරා ගොස් උදෑසන සවස උපස්ථාන කෙරෙත්නම් පන්සියයක් බත්වසුන් නිරන්තර යෙන් තබා දෙත්නම් ලාභසත්කාරය නිසා දෙවදත්ත ස්ථවිරයන්ට අවැඩෙක් විනා වැඩෙක් නොපැමිණෙන්නේය, මහණෙනි! දෙවදත්ත ස්ථවිරයන්ට ආත්ම වධය පිණිස එළඳයක ලාභසත්කාරාදිය පහළ විය. විනාශය පිණිස දෙවදත්ත ස්ථවිරයන්ට සිලෝකය පහළවිය. මහණෙනි! යම්සේ කදලි වෘක්ෂය ආත්ම වධය පිණිස එලදයක වේද, පරිහානිය පිරිස එලදයක වේද, යම්සේ හුණගස් ආත්මවධය පිණිස එලගණිද, පරිහානිය පිණිස එලගණිද, යම්සේ බටගස් ආත්මවධය පිණිස එලගණිද, පරිහානිය පිණිස එලගණිද, යම්සේ අජානීය වෙළඹ ආත්මවධය පිණිස ගැබ්ගණිද, පරිහානිය පිණිස ගැබ්ගණිද, මහණෙනි! එපරිද්දෙන්ම ආත්මවධය සඳහා දෙවදත්ත ස්ථවිරයන්ට ලාභ සත්කාර හා කීර්ති උපන, බලවත්වූ විනාශය සඳහා දෙවදත්ත ස්ථවිරයන්ට ලාභසත්කාර හා කීර්ති උපනැයි වදාළසේක.

ඉක්බිත්තෙන් සර්‍වඥයන්වහන්සේ සිව්වණක් පර්ෂත් පිරිවරා සරාජික පර්ෂත් මධ්‍යයේ වැඩහිඳ ධර්මදෙශනා කරණසේක. එකල්හි දෙව්දත් මහ තෙරුන්වහන්සේ හුනස්නෙන් නැගී මනාකොට හැඳ පොරවා සර්‍වඥයන් වහන්සේට නමස්කාර කොට දෙහොත් මුදුනෙහි බැඳ කියන්නාහු ස්වාමීනි! දැන් බුදුරාජානන් වහන්සේ වෘඩව ගියසේක, පශ්චිම වයසට පැමිණිසේක. එසේ හෙයින් සර්‍වඥයන් වහන්සේ භික්ෂුසඞ්ඝයා පරිහරණය කිරීමෙහි මන්දෝත්සාහව දෘෂටධර්ම සැපය අනුභව කෙරෙමින් වාසය කරණසේක්වයි මට භික්ෂු සඞ්ඝයා වහන්සේ ඇරපියන සේක්වයි මම භික්ෂු සඞ්ඝයා පරිහරණය කෙරෙමියි කීසේක. එකල්හි සර්‍වඥයන්වහන්සේ දෙවදත්ත යෙනි! නොකැමැත්තෙමි භික්ෂු සඞ්ඝයා පරිහරණය කරන්නට නොපට

අභිප්‍රායනොවෙයි වදාළසේක. දෙවැනිවත් තුන්වැනිවත් දෙව්දත් තෙරුන් වහන්සේ මම භික්ෂුසංඝයා පරිහරණය කෙරෙමියි කීසේක. සර්වඥයන්වහන්සේ නොකැමැත්තෙමියි වදාරා දෙවදත්තයෙනි, ශරිපුත්‍ර මෞද්ගල්‍යායන දෙදෙනාට පවා භික්ෂුසඞ්ඝයා පරිහරණය කරන්නට පවා නොදෙමි. තොපසේවූ චණ්ඩාල ගුණ ඇති ලාමක සත්ත්වයන්ට කුමක් නිසා පාවාදෙම්දැයි වදාළසේක. එකල දෙව්දත් තෙරුන්වහන්සේ සරාජික පර්ෂද් මධ්‍යයෙහිදී බුදුරජානන් වහන්සේ මට චණ්ඩාල වාදයෙන් නිග්‍රහකළසේක. සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ උත්තම කොට තැබූසේකැයි කිපී නොසතුටුවූ සිත් ඇතිව බුදුරජානන් වහන්සේට වැඳ පැදකුණුකොට ගියසේක. මෙසේ දෙවදත්ත සථවිරයන්ගේ මේ ජන්මයෙහි පළමුවන වෛර බැඳීමවිය.

ඉක්බිත්තෙන් දෙව්දත් තෙරුන්වහන්සේ අජාසත් කුමාරයන් කරා ගොස් කියනසේක් කුමාරයෙනි, පෙර මිනුෂ්‍යයෝ දීර්ඝායුෂ්කයෝය. දැන් මනුෂ්‍යයෝ මන්දායුෂ්කයෝය. එසේහෙයින් තෙපි කුමාරව සිටමම රාජ්‍ය ශ්‍රී නොලැබ කාලක්‍රියා කෙළේ නම් කාරණා නොවෙයි, තෙපි රජ්ජුරුවන් මරා රජවව, මම බුදුන් මරා බුදුවෙමියි කීසේක, එකල්හි අජාසත් කුමාරයෝ ආයුෂ්මත්වූ දෙවදත්ත සථවිරයන්වහන්සේ මහත්වූ ඉර්ධ්‍යානුභාව ඇතිසේක. එසේ හෙයින් දැන විනා නොදැන නොකියන සේකැයි කලවේ සිරියක් බැඳගෙණ වසා පියලි ඇඳ දෙවන දවල් බබා ඉඟි කොරුව ඇත මැත බල බලා සැක ඇතිව තැතිගෙණ වහ වහා අන්තඃපුරයට වන්නාහු රැකවලසිටි මිනුෂ්‍යයෝ දැක අල්වාගෙණ පරීක්ෂා කරන්නාහු කලවේ බැඳි සිරිය දැක කුමාරයන් වහන්ස! කුමක් කරණු කැමතිසේක්දැයි කීවූය. සගයෙනි! පියානන්වහන්සේ මරණු කැමැත්තෙමියි කීසේක. පියානන්වහන්සේ මරන්නට ප්‍රයෝගකොට උත්සාහකරවූයෝ කවුදැයි විචාළ කල්හි දෙවදත්ත සථවිරයන් වහන්සේ නියොග කළසේකැයි කිවුය. එබස් ඇසූ සමහර අමාත්‍යකෙණෙක් අජාසත් කුමාරයනුත් දෙව්දත් තෙරුන්වහන්සේත් සියලු භික්ෂූන්වහන්සේත් මැරිය යුතුයයි මන්ත්‍රණය කළහ. සමහර අමාත්‍යකෙණෙක් භික්ෂූන්වහන්සේ නොමැරිය යුතුය, භික්ෂූන්වහන්සේ කළ අපරාධයෙක් නැත, අජාසත් කුමාරයනුත් දෙව්දත් තෙරුන්වහන්සේත් මැරිය යුතුයයි කිවුය. සමහර අමාත්‍යකෙණෙක් අජාසත් කුමාරයනුත් දෙව්දත් තෙරුන්වහන්සේත් භික්ෂූන් වහන්සේත් නොමැරිය යුතුය, රජ්ජුරුවන් වහන්සේට මෙපවත් දන්වම්හ, අපවූකල යමක් කීසේක් නම් එලෙස කරම්හයි කිවුය.

ඉක්බිත්තෙන් අමාත්‍යයෝ අජාසත් කුමාරයන් ඇරගෙණ බිම්සර රජ්ජුරුවන් කරාගොස් එපවත් දැන්වූහ. රජ්ජුරුවෝ සගයෙනි! තොප හැම මහාමාත්‍යයන් විසින් කෙසේ මන්ත්‍රණය කරණ ලදදැයි විචාළෝය, සමහර අමාත්‍ය කෙණෙක් කුමාරයනුත් දෙව්දත් තෙරුන්වහන්සේත් භික්ෂුසඞ්ඝයා වහන්සේත් මැරිය යුතුයයි මන්ත්‍රණය කළහ. සමහර අමාත්‍ය කෙණෙක් භික්ෂුවහන්සේ කළ අපරාධයෙක් නැත එසේහෙයින් උන්වහන්සේලා නොමැරිය යුතුය කුමාරයනුත් දෙව්දත් තෙරුන්වහන්සේත් මැරිය යුතුයයි කිවුය. සමහර අමාත්‍ය කෙණෙක් කුමාරයනුත් දෙව්දත් තෙරුන්වහන්සේත් භික්ෂු සඞ්ඝයා වහන්සේත් නොමැරිය යුතුය, රජ්ජුරුවන් වහන්සේට දන්වම්හ, දැන්වූකල යමක් කීවොත් එලෙස කරම්හයි මන්ත්‍රණය කළාහුයයි කීහ.

එබස් ඇසූ බිම්සර රජ්ජුරුවෝ කියත්තෝ සගයෙනි! බුදුහුත් ධර්මයත් සඞ්ඝයාත් කුමක් කෙරෙත්ද? බුදුරජානන්වහන්සේ විසින් පළමුව දෙවදත්ත ස්ථවිරයන් වහන්සේට රජගහනුවරදී ප්‍රකාශනීය කර්මය කරණ ලද්දේය. පළමු දෙවදත්ත ස්ථවිරයන් වහන්සේගේ අන් ප්‍රකෘතියෙක, දැන් අන් ප්‍රකෘතියෙක, දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ කයින් වචනින් යම් කිසි අක්‍රියාවක් කළෝ නම් ඒ අක්‍රියාවෙන් බුදුහුත් ධර්මයත් සඞ්ඝයාත් නොදැක්ක යුත්තේය. දෙවදත්ත ස්ථවිරයෝම ඒ අක්‍රියාවෙන් ප්‍රකාශව දැක්කයුත්තෝයයි බුදුරජානන් වහන්සේ විසින් දෙව්දත් මහතෙරුන් වහන්සේට පළමුව රජගහනුවරදී ප්‍රකාශනීය කර්මය කරණ ලද්දේයයි කියා යම් මහාමාත්‍ය කෙණෙක් කුමාරයනුත් දෙව්දත් තෙරුන්වහන්සේත් භික්ෂු සංඝයා වහන්සේත් මැරිය යුතුයයි කිවුද සමහර භික්ෂූන්වහන්සේ කළ අපරාධයෙක් නැත, කුමාරයනුත් දෙව්දත් තෙරුන් වහන්සේත් මැරියයුත්යයි කිවුද? ඔවුන් හැමදෙනා යටත් තනතුරෙහි තුබූහ. යම් අමාත්‍යකෙණෙක් කුමාරයනුත් නොමැරිය යුතුය දෙව්දත් තෙරුන් වහන්සේත් නොමැරිය යුතුය භික්ෂුසංඝයා වහන්සේත් නොමැරිය යුතුය. රජ්ජුරුවන් වහන්සේට දන්වම්හ. දැන්වූකල යමක් කී සේක් වීනම් එලෙස කරම්හම්හයි කිවු නමුත් හැමදෙන උසස් තනතුරෙහි තුබූහ.

ඉක්බිති බිම්සර රජ්ජුරුවෝ අජාසත් කුමාරයන් සමීපයට කැඳවා කුමාරයෙනි! කුමක් නිසා තෙපි මා මරණු කැමැත්තහුදැයි විචාළහ. රාජ්‍යය නිසා නුඹ වහන්සේ මරණු කැමැත්තෙමි කී කල්හි ඉදින් තෙපි මා රාජ්‍යය නිසා මරණු කැමැත්තහු වීනම් මේ තොපගේ රාජ්‍යය වේදැයි කියා අජාසත් කුමාරයන්ට රාජ්‍යය පාවාදුන්හ. ඉක්බිත්තෙන් අජාසත් කුමාරයෝ රාජ්‍යයට පැමිණ සෝවාන් ඵලයෙහි පිහිටියාවූ ධර්මිෂ්ඨවූ පියරජ්ජුරුවන් යටිපත්ලේ කේඳි වත්කොට ලුණු ඇඹුල් ගල්වා බලවත් වේදනාවෙන් පීඩිත කොට බත් වැද්ද නොදී ආහාරක්ෂයින් ජීවිතක්ෂයට පැමිණවූහ. මෙසේ දෙව්දත් තෙරුන්වහන්සේ අජාසත් කුමාරයන්ට නොයෙක් උපාය කියා සෝවාන්ව සිටි බිම්සර රජ්ජුරුවන් මරවා අජාසත් රජ්ජුරුවන් කරා ගොස් මහරජ්ජුරුවෙනි තොපගේ මතදෙළු මුදුන් පැමිණියේයයි කීසේක. ස්වාමීනි නුඹවහන්සේගේ මතදෙළ කවරේදැයි විචාළ කල්හි බුදුන් මරා මම බුදුවන්නා කැමැත්තෙමි මේ මාගේ මතදෙළයයි කීසේක. එසේකල අප විසින් මීට කළමනා කිම්දැයි කී කල්හි දුනුවායන් රැස්කරවයි කීසේක. යහපත ස්වාමීනී කියා අජාසත් රජ්ජුරුවෝ අක්ෂණවෙධි ධනුර්ධයන්ගෙන් පන්සියයක් රැස්කරවා ඒ පන්සියයක් දෙනාගෙන් එක්තිස්දෙනෙකු තෝරාගෙණ දෙව්දත් තෙරුන්වහන්සේ කීවා කරවයි කියා දෙවදත්තස්ථවිරයන් සමීපයට යවූහ. ඒ තෙරුන්වහන්සේ දුනුවායන් එක්තිස්දෙනා අතරෙන් ප්‍රධාන දුනුවායා සමීපයට කැඳවා උපාසකය! ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ගිජ්ඣකූට පර්වතයෙහි වසනසේක. අසවල් වේලේ දිවාස්ථානයෙහි සක්මන් කරණ සේක තෝ එතැනට ගොස් ඒ බුදුන් විෂපෙවූ හීයකින් විද ජීවිතක්ෂයට පමුණුවා අසවල් මගින් එවයි කියා යවා නැවත අතික් දෙදෙනෙකුට කියන සේක් තෙපි දෙදෙන සිටි මගින් එක් පුරුෂයෙක් එයි තෙපි දෙදෙනා ඔහු

මරා අසවල් මගින් එවයි කියා එමග දෙදෙනෙකු සිටුවූසේක. තවද කියනසේක් තෙපි සතර දෙනා සිටි මගින් පුරුෂයන් දෙදෙනකු එති, තෙපි ඔවුන් මරා අසවල් මගින් එවයි කියා එමග සතරදෙනෙකු සිටුවූසේක. තෙපි අටදෙන සිටි මගින් පුරුෂයෝ සතරදෙනෙක් එති, තෙපි ඔවුන් මරා අසවල් මගින් එවයි කියා එමග අටදෙනෙකු සිටවූසේක. තවද තෙපි සොළොස්දෙන මගින් පුරුෂයෝ අටදෙනෙක් එති, තෙපි ඔවුන් මරා අසවල් මගින් එවයි කියා එමග සොළොස්දෙනෙකු සිටුවූසේක දෙව්දත් තෙරුන් වහන්සේ එලෙස කුමක් පිණිස කරවූසේක්ද? යත් තමන්වහන්සේ කළ අකාරිය කිසිකෙනෙකුන්ටත් නොහඟවා සඟවන පිණිස කළසේක.

ඉක්බිත්තෙන් ඒ නායක දුනුවායා කඩුව වම්උරෙහි බැඳ එල්වාගෙණ සියවුරු පිට බැඳගෙණ මැඩනහු දුන්න අතින්ගෙණ සර්වඥයන් වහන්සේ සමීපයට ගොස් බුදුන් විදිමියි සිතා දුන්නෙහි දුනුදිය නගා ඊය ඉඳුවාගෙණ ඇද අසුර ගලවත්තට අසමර්ථවිය, සකල ශරීරය තවද යතකලා මිරිකන්නාක් පරිද්දෙන් බලවත්වූ වේදනාවට පැමිණියේය, ඒ දුනුවායා දුන්න උරයපුරා ඇදගෙණ සිහියම ඇදළුවාක්මෙන් මරණභයින් තැතිගෙණ නිශ්චලව සිටියේය. එකල්හි සර්වඥය වහන්සේ ඔහු දැක මධුරස්වර විහිදුවා තෝ නොබව පුරුෂය මෙසේ එවයි වදාළසේක. එකෙණෙහි දුනුවායා ආයුදය බිම දමා බුදුරජානන් වහන්සේගේ අෂ්ටෝත්තරශත මඞ්ගල ලක්ෂණයෙන් විරාජමානවූ ශ්‍රීපාද පද්මයෙහි වැටිහිඳ ස්වාමීනි! අඥනවූ මෝහීවූ කාරණාකාරණා සලකාගත නොහෙන්නාවූ මා දෝෂය මැඩපවත්නේය, එසේ දෝෂිවූ මම නුඹවහන්සේගේ ගුණ නොදත්තෙම් නුවණ නැති දෙව්දත් තෙරුන්වහන්සේගේ බසින් නුඹවහන්සේ මරන්ට ආමි. එසේහෙයින් ස්වාමීනි! සාපරාධවූ මාගේ දෝෂය නොසලකා මට ක්ෂමාකොට වදාරන්නේ යහපතැයි කියා ක්ෂමාකරවා එකත්පස්ව හුන්නේය. එකල්හි සර්වඥයන්වහන්සේ ඕහට දුක්ඛ සමුදය නිරෝධමාර්ගයයි කියනලද චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශ කිරීමෙන් ධර්මදේශනා කොට සෝවාන් පෙලෙහි පිහිටුවා උපාසකය දෙව්දත් තෙරුන් කී මගින් නොගොස් අනික් මඟකින් යවයි කියා යවූසේක. ඔහු යවා සක්මනින් බැස එක්තරා රුක්මුල වැඩහුන්සේක.

ඉක්බිත්තෙන් ඒ නායක දුනුවායා නොආ හෙයින් අන්‍ය දුනුවායෝ දෙදෙන මොහු කල්යවන්නට කාරණා කිමෙක්දැයි පෙරමගට යන්නාහු දශබලධාරිවූ බුදුරජානන්වහන්සේ දැක සමීපයට ගොස් වැඳ එකත්පස්ව හුන්නේය, සර්වඥයන් වහන්සේ ඔවුන් දෙදෙනාටත් චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශ කොට ධර්මදෙසා සෝවාන්පෙලෙහි පිහිටුවා උපාසකවරුනි! දෙව්දත් තෙරුන් කී මගින් නොයව් අන්‍ය මඟකින් යව්යයි කියා යවූ සේක. මේ උපායෙන් අන්‍යවූ සතරදෙනාත් අටදෙනාත් සොළොස්දෙනාත් අවුත් උන් කල්හි චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශකොට දම්දෙසා සෝවාන් පෙලෙහි පිහිටුවා අනික් මඟකින් යවූසේක. ඉක්බිත්තෙන් පළමුකොට ආවාවූ දුනුවායා දෙව්දත් මහතෙරුන් වහන්සේ කරා පැමිණ ස්වාමීනි! මම සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ජීවිතක්ෂයට පමුණුවන්නට අසමර්ථවීමි. ඒ බුදුරජානන්වහන්සේ මහත්වූ ඍද්ධි ඇතිසේක, මහත්වූ ආනුභාව ඇතිසේකැයි කීවුය. මෙසේ කියා

නැවත බුදුන් කරා ගොස් බුදුරජාණන් වහන්සේ නිසා අපගේ ජීවිතය ලබන ලදැයි හැමදෙනම සර්වඥයන් වහන්සේ සමීපයෙහි මහණව අර්හත්ඵලයට පැමිණියාහුය. මේ ප්‍රවෘත්තිය භික්ෂුසංඝයා වහන්සේ කෙරෙහි ප්‍රකාශවිය. භික්ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව හිඳ ඇවැත්නි! දෙවදත්ත ස්ථවිරයෝ එකම සර්වඥයන් වහන්සේ කෙරෙහි වයිර සිතින් බොහෝදෙනා මරවන්ට උත්සාහ කළෝය. ඔහු හැමදෙනම සර්වඥයන්වහන්සේ නිසාම දිවිලද්දෝවේදැයි මෙසේවූ කථාවක් උපදවා උන්සේක.

එකල්හි සර්වඥයන් වහන්සේ තුන්තරා ගමනින් එක්තරා ගමනකින් ධම්සභා මණ්ඩපයට වැඩ පණවනලද බුද්ධාසන මස්තකයෙහි යුගන්ධර මුදුනෙහි දිලියෙන්නාවූ ළඳිරු මඩලක් මෙන් දිලිහි දිලිහී වැඩහිඳ මහණෙනි! මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උන්නුදැයි කිනම් කථාවකින් තොපට අඩාල වීදැයි විචාළකල ස්වාමීනි, තුඹවහන්සේ විසින් නොකියන්නට වදාරණ ලද්දාවූ රාජකථා චොරකථාදීවූ එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. දෙවදත්තස්ථවිරයන් එකම සර්වඥයන් වහන්සේ කෙරෙහි ඛඩාඝාතයෙන් බොහෝදෙනා නසවන්නට උත්සාහකළ නියාවත් ඔහු හැම දෙනා සර්වඥයන්වහන්සේ නිසා දිවිලත් නියාවත් කිය කියා උනුම්හයි දැන්වූ කල්හි මහණෙනි, දැන්මතු නොවෙයි. පෙරත් දෙවදත්තස්ථවිරයෝ තනි මා නිසා මා කෙරෙහි වයිර සිතින් බොහෝදෙනා මරන්නට උත්සාහකළෝ වේදැයි වදාරා මුණවත් නොබැණ වැඩවුන් කල්හි ඒ භික්ෂූන්වහන්සේ නිසා බොහෝ දෙනා මරවන්නට උත්සාහකළ නියාව අප හැමට ප්‍රකාශය. අතීතයෙහි එකම නැහැත්තන් වහන්සේ නිසා බොහෝදෙනා මරවන්නට උත්සාහ කළ නියාව භවයෙන් පටිච්ඡන්න හෙයින් අප්‍රකාශය ප්‍රකාශකොට වදාළෝත් යහපතැයි ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේ ද? යත්,

ඉකුත්වගිය දවස බරණැස්නුවර පුෂ්පවතී නම් නුවරෙක් විය. ඒ නුවර වශවර්තති නම් රජ්ජුරු කෙණෙකුන්ගේ පුත්‍රවූ ඒකරාජ නම් රජ්ජුරු කෙණෙක් රාජ්‍යය කරන්නාහ, ඒකරාජ නම් රජ්ජුරුවන්ගේ පුත්‍රවූ චන්‍ද්‍රකුමාර නම් රාජකුමාර කෙණෙක් යුවරජකම් කරන්නාහ. ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයෙක් පුරෝහිත තනතුරෙහි සිට ඒ රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නේය. ඒ රජ්ජුරුවෝ ඔහු නුවණැති එකෙකැයි සිතා විනිශ්චය මණ්ඩලයේ හිඳ සියළු සත්වයන්ගේ යුක්ති අයුක්ති විචාරණ ලෙස අධිකරණයට නායක කළෝය. ඒ ඛණ්ඩාල නම් පුරෝහිතයා අල්ලස්ම ධනකොට ඇත්තේය. සියල්ලවුන්ගෙන් අල්ලස්ගෙණ අහිමියන් හිමිකෙරෙයි හිමියන් අහිමි කෙරෙයි,

ඉක්බිත්තෙන් එක්දවසක් යුක්තියෙන් පැරදී එක්පුරුෂයෙක් අධිකරණ ශාලාවෙන් මුරගාගෙණ නික්මෙන්නේ රාජසේවයට යන්නාවූ චන්ද්‍රකුමාරයන්ගේ දෙපය මැද වැතිර ගියේය. එකල්හි ඒ කුමාරයෝ පින්වත්වූ පුරුෂය, මේ කිමෙක්දැයි කීවුය, ස්වාමීනි, ඛණ්ඩහාල නම් බමුණා විනිශ්චය

මණ්ඩලයෙහි කොල්ලකන්නේ මම ඔහු විසින් අත්ලස් ගෙණ පරාජයට පමුණුවන ලදිමි කීය. එකල්හි කුමාරයෝ තෝ නොබවයි ඔහු අස්වසා විනිශ්චය මණ්ඩලයට කැඳවාගෙණ ගොස් යුක්ති විචාරා හිමිතැනැත්තහු හිමිකළාහ. ඒ දැක මහජනයා මහහඬින් සාධුකාරනාද පැවැත්වූය. රජ්ජුරුවෝ ඒ සාධුකාරනාදය අසා මේ කිනම් ශබ්දයෙක්දැයි විචාරා චන්ද්‍රකුමාරයන් විසින් ඛණ්ඩාල නම් බ්‍රාහ්මණයා නපුරුකොට විචාරණ ලද්දාවූ යුක්තිය මනාකොට විචාළ හෙයින් එතැන්හි පැවැත්වූ මේ සාධුකාර ශබ්දයයි කීහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ එපවත් අසා කුමාරයන් අවුත් වැඳලා සිටි තැනැත්තාට පුත! තොප විසින් එක් යුක්තියක් විචාරා පසිඳනා ලදදැයි විචාළහ. එසේය ස්වාමීනි කී කල්හි එසේවීනම් පුත මෙතැන් පටන් තෙපිම යුක්ති විචාරවයි විනිශ්චය මණ්ඩලයට නායකකොට තුබූහ. එතැන් පටන් ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයාට යුක්තියෙන් විඳිනා අය නැතිව ගියේය, එහෙමේ මුත් නිසා වේද මට යුක්තියෙන් විඳිනා අය නැතිවූයේයයි කුමාරයන් කෙරෙහි ආඝාත බැඳ තොරතුරක් දෙෂයක්ම බලා ඇවිදිනේය, ඒ එකරාජ නම් රජ්ජුරුවෝ මුග්ධ ප්‍රශ්නයෝය, ඒ රජ්ජුරුවෝ එක් දවසක් අළුයම් වේලේ ස්වප්නයක් දක්නාහු මනාකොට සරසනලද දොරටු ඇති සක්රුවන්මයවූ පවුරු ඇති සැට යොදුන් පමණ ස්වර්ණ මහාවීථි ඇති දහසක් යොදුන් උසඇති වෛජයන්ත ප්‍රාසාදාදීවූ ප්‍රාසාද පංතියෙන් හෙබියාවූ නන්‍දනවන චිත්‍රලතාවනාදීවූ නොයෙක් උද්‍යාන පරම්පරායෙන් සිත්කළුවූ නන්‍දා නම් පුෂ්පකරණිය ප්‍රධාන කොට ඇති නොයෙක් සියගණන් පුෂ්පකරණීයන් සිත් අලවන්නාවූ දෙතිස් දිව්‍ය පුත්‍රයන් ප්‍රධාන කොට ඇති ලක්‍ෂ කෙළ ගණන් දිව්‍යපුත්‍රයන්ගෙන් ගැවසී ගත්තාවූ තව්තිසාභවනය ස්වප්නයෙන් දැක ඒ ත්‍රයත්‍රිංශත් දිව්‍යලෝකයට යනු කැමතිව ආචාර්‍ය්‍යවූ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා උදෑසනම රාජසේවයට ආකල්හි ඔහු අතින් දිව්‍යලොකයට යායුතු මාර්‍ගය විචාරා ඔහු විසින් කියනලද මාර්‍ගයෙන් දිව්‍යලොකයට යෙමියි සිතුවාහුය. ඒ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයාත් උදෑසනම රජගෙට ගොස් රජ්ජුරුවන් විචාරන්නේ ස්වාමීනි! රාත්‍රියෙහි සැපසේ සෙය්‍යාව කළසේක්දැයි විචාළේය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ඕහට ඉඳිනා අස්නක් දෙවා එහි ඉඳුවා ප්‍රශ්නයක් විචාළෝය. තවද පුෂ්පවතී නම් රාජධානියෙහි වසන්නාවූ ප්‍රාණඝාතාදී රෞද්‍ර ක්‍රියා ඇති ඒ එකරාජ නම් රජ්ජුරුවෝ බ්‍රාහ්මණයා බන්ධුකොට ඇත්තේ මූඪවූ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා අතින් ස්වර්‍ගමාර්‍ගය විචාරන්නාහු පුරෝහිත බ්‍රාහ්මණය! තෝ සුචරිත ධර්‍මය හා ආචාර විනය දන්මෙහි දක්‍ෂයෙහිය, එසේහෙයින් මනුෂ්‍යයෝ කුසල්කොට මේ මනුෂ්‍ය ලෝකයෙන් ස්වර්‍ගලෝකයට යම් පරිද්දෙකින් යෙත්නම් එබඳුවූ සුගතියට යන්නාවූ මාර්‍ගය මට විශෙෂයෙන් ප්‍රකාශකොට කියවයි කීහ. ලොව්තුරා සම්‍යක් සම්බුදුවරයන් වහන්සේවත් ඒ සර්‍වඥයන් වහන්සේ නැතිකල්හි බොධිසත්ත්ව වරයන් වහන්සේ සමීපයට ගොස් විචාළයුතුවූ මහාර්‍ඝවූ මේ ප්‍රශ්නය රජ්ජුරුවෝ යම්සේ සතියක් මංමුළාවූ පුරුෂයක් අතික් පුරුෂයකු අතින් මංවිචාරාද ් පරිද්දෙන්ම ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා (කිසි කාරණා කාරණක් නොදන්නා අඥානවූ තැනැත්තහු) අතින් විචාළෝය, එකල්හි

කණ්ඩහාල නම් බ්‍රාහ්මණයා මේ මාගේ පසමිතුරා පිටුදකිනා කලක් නියා වේදැයි සිතා දූත් චන්ද්‍රකුමාරයන් ජීවිතක්‍ෂයට පමුණුවා මාගේ මනදෙළ පුරමියි සතුටුවූ සිත් ඇතිව රජ්ජුරුවන්ට ආමන්ත්‍රණය කොට කියන්නේ රජ්ජුරුවන් වහන්ස, මේ ලොකයෙහි සත්ත්වයෝ අතිදුනයදී නොමැරිය යුත්තවුන් මරා මෙබඳුවූ කුසල්කොට සවර්ගලොකයට යන්නාහුය නුඹවහන්සේද එබඳුවූ කුසල්කොට සවර්ගලොකයට වැඩිය මැනවයි කීය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ඔහු අතින් විචාරන්නාහු මේ සත්වලොකයෙහි අතිදුනය නම් කවරේද? නොමැරියයුත්තෝ නම් කවුරුද? ඒ කාරණය මට කියා යාගත් කරම්හ, දනුත් දෙම්හ, එසේහෙයින් අතිදුනයෙහි විශෙෂ මට තෝරා කියවයි කීවුය. එබස් ඇසූ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේට ද පිය පුත්‍රයන් සතර දෙනකු හා ප්‍රිය දූන් සතරදෙනකු හා අග්‍රමහෙසිකාවූ ප්‍රිය භාර්‍ය්‍යාවන් හා සිටුවරුන් හා සර්‍වාඩගයෙන් ධවලවූ වෘෂභරාජයන් හා මගුලසුන් හා සමග අවශෙෂවූ සියලු ඇත් අස් ආදීන් ගෙනුත් සතර සතරදෙනකු හා මෙසේ සර්‍වචතුෂ්කයකින් යාගකටයුත්තේය, මේ සියල්ලවුන්ගේ කඩුවෙන් ඉස් කපා තලියේ ලේවත්කොට ඒ වත්කළාවූ ලේ තලියෙන් යාගාවටයේ බහා යාග කරන්නාවූ රජ්ජුරුවෝ ශරීරය හා සමග දිව්‍යලෝකයට යන්නෝවේද? මහරජ්ජුරුවන් වහන්ස, තවද ශ්‍රමණ බ්‍රාහ්මණයන් හා දුගී මගී යාචකයන්ට බත්පිළි පමණක් දීම දන නම් වෙයි මේ පුත්‍රදාරාදීන් මරා ඔවුන්ගේ ගල ලොහිතයෙන් යාග කිරීම අතිදන නම්වෙයි කියා මෙසේ ඒ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා මෙසේ දිව්‍යලොකයට යන්නට රජ්ජුරුවන් විසින් මං විචාරණ ලද්දේ නරකයට යන්නට මං කීයේය, තවද අනෙකප්‍රකාරයෙන් කාරණා කියා රජ්ජුරුවන් ගිවිස්සාගත්තේය, මෙසේ ඒ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා ඉදින් චන්ද්‍ර කුමාරයන් තනි තැනැත්තවුන්ම ඇල්වූයේ වීනම් වයිරයෙන් ඇල්වූවකොට සිතති සිතා ඒ කුමාරයන් බොහෝදෙනා අතරේ ලා ඔවුන් හා සමග මරන්නට සෙදූහේය, මෙසේ කථාකරන්නාවූ රජ්ජුරුවන් හා පුරෝහිත බ්‍රාහ්මණයාගේ බස් අසා අන්තඃපුරවාසී ජනයෝ භයින් තැතිගෙණ එකපැහැර මහහඬින් හඬන්නට පටන්ගත්හ, තවද මේ වචනය අසා අන්තඃපුරයෙහි අවශෙෂ රාජකුමරුවන් හා රාජකුමාරිකාවන් හා අග්‍රමහෙසිකාවෝ එක පැහැර සියලු රාජභවනය එකඝොෂා කෙරෙමින් මහහඬින් හැඬූවාය. සියලු රාජ කුලය කල්පාන්ත මාරුතයෙන් පැහැර එළනලද්දවූ සල්වනයක් මෙන් විය, ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා රජ්ජුරුවන්ට කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස! කිමෙක්ද? යාගකරන්නට එනසේක්ද? නොඑනසේක් දැයි විචාළේය.

එබස් ඇසූ රජ්ජුරුවෝ ආචාර්‍ය්‍යයෙනි! කුමක් කියව්ද? යාගකොට දිව්‍යලොකයට යන්නෙම්වේදැයි කීවුය; ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා කියන්නේ මහරජ්ජුරුවන්වහන්ස! භීරුකවූ දුර්වලවූ අධ්‍යාශ ඇති පසුතැවිලියට පැමිණෙන්නාවූ සත්ත්වයෝ යාග කරන්නට අසමර්ථවෙති, එසේහෙයින් නුඹ වහන්සේ එබඳු සත්ත්වයන්සේ නොව මෙතැනට සියල්ලම රැස්කරවුව, මැනව, මම යාගාවාටයට කළමනා කර්මාන්ත කෙරෙමියි කියා තමාට සෑහෙන පමණක්

සේනාව හා මෙහෙකරුවන් ගෙණ නුවරින් නික්ම යාගාවාටය සමතලා කරවා වටින් වැට කරවූයේය. ධාර්මිකවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෙක්වත් අවුත් වැලකූයේ වීනම් කාරණා නොවන්නේයයි යාගාවාටය වැටකරවීම සිරිතෙකැයි කියා පුරුතතයෙහි බ්‍රාහ්මණයන් විසින් තබන ලද්දේය, රජ්ජුරුවෝත් රාජපුරුෂයන් කැඳවා කියන්නෝ එම්බා දරුවෙනි! මම මාගේ දූදරුවන් හා බිසෝවරුන් මරා යාගකොට දිව්‍යලෝකයටයෙමි. එසේ හෙයින් තෙපි හැම ගොස් ඒ පුත්‍රදූරාදීන්ට කියා සියල්ලවුන්ම මෙතැනට කැඳවාගෙණ එවයි කියා පළමුකොට පුත්‍රයන් සතරදෙනම කැඳවාගෙණ අවුත් එක්තැනෙක්හි රැස්කොට සිටුවයි කිවූය.

එබස් ඇසූ රාජපුරුෂයෝ පළමුකොට චන්ද්‍රකුමාරයන් සමීපයට ගොස් කියන්නාහු කුමාරයන්වහන්ස නුඹවහන්සේ මරා නුඹවහන්සේගේ පිය රජ්ජුරුවන් වහන්සේ දිව්‍යලොකයට යනු කැමතිව නුඹවහන්සේ අල්වන පිණිස අප එවූ සේකැයි කීහ. කවුරුන්ගේ බසින් මා අල්වන්නට එවූසේක්දැයි චන්ද්‍රකුමාරයන් විචාළ කල්හි ඛණ්ඩහාලනම් බ්‍රාහ්මණයාගේ බසිනැයි කීහ ඒ බ්‍රාහ්මණයා මාව අල්වාද? නොහොත් සෙස්සනුත් අල්වා මරවාදැයි චන්ද්‍රකුමාරයෝ විචාළෝය, රාජපුරෂයෝ කින්නෝ සෙස්සනුත් අල්වන්නේය. සර්වචතුෂ්ක නම් යාගයක් කරවනු කැමැත්තෝයයි කීහ. එකල්හි චන්ද්‍ර කුමාරයෝ සිතන්නෝ ඒ බමුණාට සෙස්සවුන් හා වයිරයෙක් නැත. විනිශ්චය මණ්ඩලයෙහි අත්ලස් කන්නට නොලබමි සිතා මා එක නැතැත්තහු කෙරේ වයිරයෙන් බොහෝදෙනා මරවන්නේය. පියානන් වහන්සේ ඉදිත් දැකපිම් නම් සියලු සත්ත්වයන් මරණින් ගැලවීම මට භාරයයි කියා ඉක්බිත්තෙන් ඔවුන් හැමදෙනාවම පියාණන්වහන්සේ කීවා කරවයි කිවූය. ඒ එසඳ රාජපුරුෂයෝ කුමාරයන් අස්වාගෙණ ගොස් රාජාංගනයෙහි එකත්පසෙක සිටුවා අන්‍යවූ සූර්‍ය කුමාරයෝය, භද්දසේන කුමාරයෝය, සූර කුමාරයෝය යන තුන්බෑයනුත් ගෙණවුත් චන්ද්‍රකුමාරයන් සමීපයෙහිම සිටුවා සවාමීනි! කුමාරවරුන් සතරදෙනාව ගෙණආම්හයි කියා රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ ඔවුන්ගේ බස් අසා දරුවෙනි, දැන්මාගේ දූන් සතරදෙනා ගෙණත් කුමාරවරුන් සතරදෙනා සමීපයෙහිම සිටුවයි විධාන කරන්නාහු උපසෙනිය, කොකිලය, මුදුනාය, චන්ද්‍රකුමාරිය, කුමාරිකාවරුන් කැඳවාගෙණ යන්නට එවූසේකැයි කියා කැඳවාගෙණ අවුත් එක්තැනෙක රැස්කොට සිටුවවයි කිවූය. ඒ රාජපුරුෂයෝත් එසේම කරම්හයි රජ්ජුරුවන්ට ප්‍රතිවචනදී ඒ කුමාරිකා වරුන් සමීපයට ගොස් ඔවුන් සතරදෙනා අඬමින් වලපමින් සිටියදීම කැඳව, ගෙණ අවුත් මල්බෑයන් සමීපයෙහිම සිටුවූහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ තමන්ගේ ප්‍රියභාර්‍යාවූ බිසෝවරුන් අල්වා ගෙණ එන පිණිස නියෝගකරන්නෝ මාගේ අග්‍රමහේසිකාදීවූ විජයා නම් බිසවුන්ද, එරාපති නම් බිසවුන්ද, සුකෙසී නම් බිසවුන්ද, සුනන්ද නම් බිසවුන්ද යන උතුම්වූ සුසැටක් සත්‍රීලක්‍ෂණයෙන් යුක්තවූ මේ බිසෝවරුන්

සතරදෙනාට රජ්ජුරුවන් වහන්සේ යාග නිසා කැඳවනසේකැයි කියා කැඳවා ගෙණ අවුත් එක්තැනක රුස්කොට සිටුවයි කිවුය. ඒ රාජපුරුෂයෝ ඒ සතර දෙනාත් කැඳවාගෙණ අවුත් කුමාරවරුන් සමීපයෙහිම සිටවූවාහුය. ඉක්බිතිත්තෙන් රජ්ජුරුවෝ සිටුවරුන් සතරදෙනා කැඳවාගෙණ එන්නට නියෝග කරන්නාහු පූණ්මුඛය, භද්දිය, සිංහාලය, වන්දියය, යන සිටුවරු සතර දෙනාට රජ්ජුරුවන් වහන්සේ යාග නිසා කැඳවනසේකැයි කියා කැඳවාගෙණ අවුත් එක් තැනක සිටුවවයි කීහ, එබස් ඇසූ රාජපුරුෂයෝ ගොස් සිටුවරුන් සතරදෙනාත් ගෙණවුත් කුමාරවරුන් සමීපයෙහිම සිටුවූහ. තවද රජ්ජුරුවන්ගේ දූදරුවන් හා බිසෝවරුන් ඇල්වූ කල්හි සියලු නුවරවාසීවූ සත්ත්වයෝ කිසිවක් නොකීහ. සිටුවරු සතරදෙනා වනාහි ඥාති සම්බන්ධයෙන් බොහෝ දෙනා එක්ව සිටියහ, එසේහෙයින් සිටුවරුන් ඇල්වූ කල්හි සියලු නුවර වාසී සත්ත්වයෝ ඇලලීගොස් රජ්ජුරුවන් වහන්සේ විසින් මේ සිටුවරුන් මැරිය නොදෙම්හයි කියා සිටුවරුන් පිරිවරා ඒ සිටු පුත්‍රයන් සතරදෙනාගේ බන්ධුවර්ගයා හා සමගම රජගෙට ගියාහුය. ඉක්බිත්තෙන් සිටුවරුන් සතර දෙනා තැයන් විසින් පිරිවරණ ලදුව රජ්ජුරුවන් අතින් තමන් ජීවදානය ඉල්වන්නාහු රජ්ජුරුවන් වහන්ස, අප හැමදෙනාගේ ඉසකේ කපා මුදුනේ කුඩුම්බි තබා නුඹවහන්සේට අපි ගැතිකල මැනව, අපි නුඹවහන්සේට ගැතිමේ කරම්හ, නොහොත් එසේ නොඅදහනසේක් වී නම් අටලොස් මහාසේනින් රුස්කරවා ඔවුන් මධ්‍යයෙහි ක්‍රයපත්‍රය ලවා ගැතිකොට ඇස්වුව මැනව, අපි නුඹවහන්සේට ගැති නියාව ප්‍රතිඥා කරම්හයි කීහ, මෙසේ සිටුවරුන් සතර දෙනා යාචඥකොටත් ජීවිතදානය ලැබගන්නට අසමර්ථවූහ, එකල්හි රාජපුරුෂයෝ සිටුවරුන්ගේ බන්ධු වර්ගයා හා අවශෙෂ ජනසමූහයා තළා මරා ඉවත්කොට සිටුවරුන් සතරදෙනා අල්වාගෙණ ගොස් කුමාරවරුන් සමීපයෙහි සිටුවූහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ඇතුන් අසුන් ආදීන් ගෙණෙන පිණිස විධාන කරන්නාහු අභයඞ්කර නම් හස්තිය, රාජගිරිය, අචවුනය, වරුණදන්තය, යන හස්තීන් සතරදෙනා යාගය නිසා වහා ගෙණෙව්, තවද කෙසීනම් අශ්වය, සුරමුඛය, පූණ්මුඛය, විනදකය, යන මේ අශ්වයින් සතරදෙනා යාගය සඳහා වහා ගෙණව, තවද මාගේ ගවයන්ට උතුම්වූ ප්‍රධාන වෘෂභයන්ද අවශෙෂවූ චතුෂ්පාද සමූහයන්ද වහා ගෙණඑව්, මෙසේ ගෙණවුත් සර්ව චතුෂ්ක වශයෙන් යාගාවාටය සමීපයෙහි සියල්ලවුන්ම සිටුවව්, එසේ කල්හි සර්වචතුෂ්ක යාගය නම් යාගවිධිය කරම්හ, යාචක බ්‍රාහ්මණයන්ට දනුත් දෙම්හ, මෙසේ මා විසින් කියනලද සියලු වස්තූන් යුහුව සපයා මාගේ යාගසිද්ධිය කරව්යයි විධාන කළාහුය, තවද රජ්ජුරුවෝ කියන්නෝ මාගේ යාගයවූ කලී සෙට ඉර නැගි කල්හි උදුසන්හිම කෙරෙම් එසේ හෙයින් අද මේ එක රාත්‍රියෙහි පඤ්ච කාම ගුණයෙන් සිත් අලවන්නට කුමරුවන්ට කියව්, අද මේ පශ්චිම රාත්‍රියයයි කියව්, අවශෙෂවූ ඌරන්, මුවන්, ගෝනන්, එළුවන්, ආදීවූ චතුෂ්පදීන් හා කුකුළන්, මොණරුවන්, වලිකුකුළන්, විලිකුකුළන්, ආදීවූ පක්ෂිජාතීහුන් යාගයට සුදුසුවූ අවශෙෂ යාගොපකරණන් වහා රුස්කරවා සෙට උදුසන හිරු නැගි කල්හි යාගය කරම්හයි කීහ. ඒ එකරාජ නම් රජ්ජුරුවන්ගේ දෙමවුපියෝ එකලට ජීවත්ව උන්නාහුය. එසේහෙයින් මනුෂ්‍යයෝ ගොස්

කියන්නාහු තුඹවහන්සේගේ පුත්‍රදාරාවන් මරා යාගකරණු කැමතිසේක්දැයි දෙමව්පියන්ගෙන් විචාළෝය. එබස් අසා ඒ එකරාජ රජ්ජුරුවන්ගේ මැතියෝ කියන්නාහු දරුවෙනි, කුමක් කියවුදැයි කියා දැතින් ලය වසාගෙණ අඬමින් වලපමින් අවුත් සැබෑද පුත, දරුවන් හා බිසෝවරුන් ජීවිත විනාශයට යාග යක් කරවුදැයි විචාළෝය. එබස් ඇසූ රජ්ජුරුවෝ කියන්නෝ මැතියන්වහන්ස, මට ඉතා ප්‍රියවූ චන්ද්‍රකුමාරයන් මරන්නට පාවාදුන්විටම අවශෙෂ දූදරුවන් හා බිසෝවරුන් යාගයටම හරණ ලද්දාහුය. එසේහෙයින් එවැනි දරුවන් හා යාගකොට මේ මනුෂ්‍ය ශරීරයෙන්ම මනාවූ ගති ඇති ස්වර්ගලොකයට යන්නෙම් වේදැයි කිවුය.

ඉක්බිත්තෙන් මැතියෝ පුතනුවන්ට කියන්නාහු පුතනුවන්වහන්ස, දරුවන් මරා කරන්නාවූ මේ යාගය හෙතුකොටගෙණ දිව්‍යලෝකසම්පත්තිය වන්නේයයි යම් කෙණෙක් කිවුනම් එබස අදහා නොගණුව, මේ දරුවන් මරා කරන්නාවූ යාගය නම් සතර අපායට මාර්ගය, දිව්‍යලෝකයට මාර්ගයක් නොවෙයි, තවද කොණ්ඩඤ්ඤ ගොත්‍රයෙහි උපන්නාවූ පුත, තොපට මම කියමි. වර්තමාන කාලයෙහි පවත්නාවූ මේ සියලු සත්වයන්ට පාණිප්‍රහාරාදීවූ කිසි හිංසාවක් පීඩාවක් නොකොට මහොඝයක් පරිද්දෙන් මහදන්දෙව, මෙසේ දන්දීම සප්තකාම ස්වර්ගයට යන්නට මාර්ගය වන්නේය, මෙබඳුවූ පුත්‍රයාගෙන් ස්වර්ග ලොකොත්පත්තියට මාර්ගයෙක් උපායෙක් නොපෙණෙන්නේයයි කිවුය. එබස් ඇසූ රජ්ජුරුවෝ කියන්නාහු මැතියන්වහන්ස, චන්ද්‍රකුමාරයන් සූර්‍ය්‍යකුමාර යන් ප්‍රධානකොට ඇති මේ පුත්‍රදාරාවන් මරන්නාවූ මම ඛණ්ඩහාල නම් පුරෝ හිත බ්‍රාහ්මණයා මට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකොටුමට අවාසිව සිටිහෙයින් ඔහුගේ බසින් මරවමි මාගේ අභිප්‍රායෙන් සිතින් සිතාගෙණ මරවන්නෙම් නොවෙමි, ස්නෙහයෙන් දුරුකොටපිය නොහැක්කාවූ පුත්‍රදාරවන් සමග යාග කොට මේ මනුෂ්‍ය ශරීරයෙන් දිව්‍යලෝකයට යෙමි කිවුය.

ඉක්බිත්තෙන් ඒ රජ්ජුරුවන්ගේ මෑණියෝ තමන්ගේ බස් ගිවිස්සාගත නොහී අඬා වැලප ගියාහුය. පිය රජ්ජුරුවෝ එපවත් අසා අවුත් පුතනුවන්ට කියන්නෝ පුත තෙපි චන්ද්‍රකුමාරයන් ප්‍රධානකොට ඇති දූදරවන් මරා යාග කරව්දැයි විචාළෝය. එකල්හි රජ්ජුරුවෝ කියන්නාහු පියානන් වහන්ස, චන්ද්‍රකුමාරයන් පවා මරන්නට දුන්විට අවශෙෂවූ මාගේ පුත්‍රදාරාදීහුත් පාවා දෙනලද්දාහුමය. මෙවැනි දරුවන් හා සමග යාගකොට මම දිව්‍යලොකයට යනු කැමැත්තෙමි කීහ, එකල්හි පිය රජ්ජුරුවෝ පුතනුවන්ට කියන්නෝ පුත, දරුවන් මරා යාගකොට දිව්‍යලෝකයට යෙතියි යම් කෙණෙක් කිවුනම් ඒ බස අදහා නොගණුව, මේ තෙමේ නරකයට මාර්ගය ස්වර්ගයට මාර්ගයක් නොවෙයි, එසේහෙයින් කොණ්ඩඤ්ඤ ගොත්‍රයෙහි උපන්නාවූ පුත, වර්තමාන කාලයෙහි උපන්නාවූ සියලු සත්වයට පාණිප්‍රහාරාදීවූ කිසි හිංසාවක් පීඩාවක් නොකොට මහවතුරක් මඩිනා පරිද්දෙන් මහදන් දෙව, සප්තවිධ කාමස්වර්ගයෙහි උපදනට මෙම (හෙතු) වන්නේය, පුත්‍රයාගෙන් ස්වර්ගලොකොත්පත්තියෙක් නොවන්නේයයි කීහ. එබස් අසා එකරාජ රජ්ජුරුවෝ කියන්නාහු පියානන් වහන්ස, පුත්‍රදාරාදීන් මරා යාගය කරන්නාවූ මම මාගේ අභිප්‍රායයෙන් සිතින්

සිතා කරවන්නෙම් නොවෙමි, ඛණ්ඩහාල නම් පුරෝහිත බ්‍රාහ්මණයාගේ වචනයෙන් කරවන්නෙමි, ස්නෙහයෙන් දුරුකොටපිය නොහැක්කාවූ මෙබඳු දරුවන් හා සමග යාග කොට ස්වර්ගලොකයට යෙමි කීවුය.

ඉක්බිත්තෙන් පියරජ්ජුරුවෝ පුතනුවන්ට කියන්නාහු කොණ්ඩඤ්ඤ ගොත්‍රයෙහි උපන්නාවූ පුත්‍රය, සියළු සත්ත්වයන්ට හිංසා පීඩාදියක් නොකොට මහදන් දෙව තොපගේ ප්‍රිය පුත්‍රයන් විසින් පිරිවරණලද්දුව මේ සියලු කාසීරට හා මෙයින් වෙන්ව සිටියාවූ ඒ ඒ ජනපදයන්ද පරිපාලනය කරවයි කීවුය. ඒ පිය රජ්ජුරුවෝත් මෙතෙක් කාරණා කියාත් තමන්ගේ බස් විශ්වාසගත නුහුනුවාහුය. එකල්හි චන්ද්‍රකුමාරයෝ සිතන්නෝ මෙපෙක් දෙනාට දුක් උපන්නේ මා එකනැතැත්තනු නිසාය, එසේහෙයින් මපියානන් වහන්සේට කියා මෙතෙක්දෙනා මරණ දුකින් මුදවම් සිතා පියානන් හා සමග කථා කරන්නාහු පියරජ්ජුරුවන් වහන්ස, අප නොමැරුව මැනව, ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයාට අප හැමදෙනාම ගැතිකොට පාවාදුන මැනව, නොහොත් එසේ කරණුකැමතිසේක් වී නම් මහ ඇකිල්ලෙන් මඝනලද්දුව ඇත් ඉලන්ති දැමූවෝ නම් යහපත, අස් ඉලන්ති දැමූවෝ නම් යහපත, තවද රජ්ජුරුවන් වහන්ස, අප නිකරුණේ නොමැරුව මැනව, නුඹවහන්සේ යමෙක්හට අප ගැතිකොට දෙනු කැමතිසේක් වීනම් ඕහට අප කැමති පරිද්දෙන් ගැතිකොට පාවාදුන මැනව, තවද දෙවයන්වහන්ස, ඉදින් අපගේ කිසි දොෂයක් ඇත්තම් රටින් හෝ නෙරපුව මැනවයි කියා හැඬූහ. චන්ද්‍රකුමාරයන්ගේ අනෙකප්‍රකාරවූ මේ වාක්විලාපය අසා රජ්ජුරුවෝ ලය පැලී යන්නාක් මෙන් දැස කඳුළු පුරාගෙන අඬමින් මාගේ දරුවන් කිසිකෙණෙකුන් විසින් මරන්නට නොලැබෙයි. මට දිව්‍යලෝකයෙන් ප්‍රයෝජන නැතෙයි කියා ඒ චන්ද්‍රකුමාරයන් ප්‍රධානකොට ඇති සියල්ලවුන් මුදන්නට විධාන කළහ.

තවද රජ්ජුරුවෝ කියන්නාහු තමන්ගේ ජීවත්වීම කැමතිව බැගෑපත්ව අඬන්නාවූ මේ දරුවෝ අපට සෝදුක් උපදවන්නාහුය. එහෙයින් දූන් මරණයට පැමිණි මේ රාජකුමාරවරුන් ඇරපියව දරුවන් මරා කරණ යාගයෙන් මට ප්‍රයෝජන නැත, ඉදින් දිව්‍යලෝකසම්පත්තිය සිඬවේ නමුත් මම නොකමැත්තෙමි කීහ. රජ්ජුරුවන්වහන්සේගේ මේ කථාව අසා රාජ කුමාවරුන් සතරදෙනා ප්‍රධානකොට පක්ෂීන් කෙළවරකොට ඇති සියලු ප්‍රාණී සමූහයා හැරපුවාහුය. එකල ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයන් යාගාවාටයෙහි කර්මාන්ත විධාන කරන්නේය, ඕහට එක් පුරුෂයෙක් කියන්නේ කොල, දුෂ්ට ඛණ්ඩහාලය, රජ්ජුරුවන්වහන්සේ දරුවන් මුදවා ඇරවූසේක, දූන්වූකලි තෝ තාගේ දරුවන් මරා ඔවුන් ගලලොහිතයෙන් යාගකරවයි කීහ. එබස් ඇසූ ඛණ්ඩහාලයා රජ්ජුරුවන් විසින් කවර අකාරියෙක් කරණලද්දයි කියා වේගයෙන් ගොස් රජ්ජුරුවන්ට කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස, මේ යාගය නම් දෙය නුඹවහන්සේ වැනි හීරුක ජාති ඇති රජවරුන් විසින් නොකට හැක්කේය. දුකසේ මුත් නුඹවහන්සේ වැනි රජදරුවන්ට මෙබඳුවූ යාගය සම්භනොවන්නේයයි පළමුකොට මා විසින් කියන ලද්දේය. එසේද වුවත් මෙසේ මහෝත්සාහයෙන් සැපයූ මේ උක්තප්‍රකාර යාගයට දූන් කුමක් පිණිස බාධාකරණසේක්ද මහරජ්ජුරුවන්වහන්ස, යාගයට ව්‍යාකූල නොකළ

මැනවයි කීය. තවද මහරජ්ජුරුවන් වහන්ස, යම් පමණ සත්ත්වකෙනෙක් යාග කෙරෙද්ද? අනුන් ලවා යාග කරවද්ද? නැවත අනුන් ලවා කරවන්නාවූ යාග අනුමෝදන් වෙද්ද? ඒ සියලු සත්ත්වයෝම ස්වර්ගලෝකයට යන්නාහ. මේසේ යාග කරන්නාවූ සත්ත්වයන් විසින් කරණලද යාගය මෙබඳු අනුසස් ඇත්තේය. එසේහෙයින් නුඹවහන්සේ දූන් මෙබඳුවූ යාගයකට කුමක් නිසා බාධාකරණසේක්ද? රජ්ජුරුවන් වහන්ස ව්‍යාකූල නොකළ මැනවයි කීය.

ඉක්බිත්තෙන් ඒ චන්ද්‍රකුමාරයෝ පියරජ්ජුරුවන්ට කාරණා කියා අඟවන්නාහු මහරජ්ජුරුවන් වහන්ස, ඉදින් මා මැරිය යුත්තේවීනම් (මීට පළමු) මා උපන් කල්හිම මේ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා අතින් මේ කුමාරයන්ට වන අන්තරාය කවරේදැයි නුඹවහන්සේ විසින් විචාරණ ලදහ. අපගේ ලක්ෂණ බලා දෙවයන් වහන්ස, නුඹවහන්සේගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණෙති. කුමාරයන්ට අතරෙහි වන අන්තරායෙක් නැතයි අපගේ නැයන් මධ්‍යයෙහි එදවස් වැළි කුමක් පිණිස කීද? මොහු බොරු කියා වයිරයෙන් මරවන බවට මෙම කාරණා නොවේද? එසේහෙයින් මොහුගේ කථායෙහි පූර්වාපර සම්බන්ධයක් නැත, නිස්කාරණයෙන් යාග පිණිස අප හැම දූන් මරවන්නට උත්සාහ කරන්නේවේද? එසේම නුඹවහන්සේම අප මරන්නට සිතනකල පළමු අප බාල්‍ය අවස්ථාවෙහිම නුඹවහන්සේ සිය අතින් මරන්නක්වත් අනුන් ලවා මරවන්නක්වත් නොකරවූයේ ඇයිද? දූන් වූකලී අප තරුණසම්හ.යෞවනයට පැමිණියම්හ, පුත්‍රදාරාවන් ඇතිව ප්‍රථම වයසෙහි පිහිටියම්හ. මෙසේ මේ අවස්ථාව වන තුරුත් නුඹවහන්සේට ද්‍රොහීනූනම්හ, පියානන්වහන්ස, මෙසේ නිරපරාධවූ අප කුමක් පිණිස මරවනසේක්ද? තවද රජ්ජුරුවන් වහන්ස, අප සතර බෑයන් මාණික්‍යමයවූ සන්නාහයෙන් සන්නද්ධව ඇතුන් අසුන් පිටට පැන නැගී සතුරු සෙනග ඇවිත් නුවර වටලා සිටි කල්හි අප වැනි දරුවන් ඒ සතුරන් හා එක්ව යුද්ධකරන්නට පටන්ගත් කල්හි අපගේ බලපරාක්‍රමය නුඹ වහන්සේගේ ප්‍රිය චක්ෂුසින් බලා වදාළ මැනව. දරුවන් නැති රජදරුවෝ තම් අනාථ අසරණයෝය, එසේහෙයින් මෙබඳු ශෞර්‍ය්‍යවීර්‍ය්‍ය හා වික්‍රම ඇති සතරබෑයෝ යාගයක් නිසා නිකරුණේ මරාපියන්ට නිස්සමෝද? රජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේ නුවණ නැති නැනැත්තන් වහන්සේ නිසා විනා නුවණැති රජදරු කෙණෙක් වීනම් අප වැන්නවුන් මරවාපියද්ද? තවද පියානන් වහන්ස පසල් දනව්ව කිපි කලෙකවත් වල් සොරුන් නැගිකලවත් අප වැනි ශෞර්‍ය්‍යවීර්‍ය්‍ය ඇති දරුවන් ඒ පසමිතුරන් අල්වා මරණ පිණිස යැවිය යුතු නොවේද? එසේ අප ශෞර්‍ය්‍යවීර්‍ය්‍ය ඇත්තමෝවී නමුත් නිකරුණේ අස්ථානයේ නසින්ට සිටියමෝවේද? තවද රජ්ජුරුවන් වහන්ස, යම්සේ තිරශ්චීනවූ පක්ෂිජාතියෙක් කැදලි බැඳගෙණ වෘක්ෂ පර්වතලතා ආදියෙහි වාසයකෙරෙද්ද? එසේවූ පක්ෂීන්ට පවා දරුවෝ ප්‍රියවන්නාහ. එසේදවුවත් නුඹවහන්සේ දූන් අප මරවන්නට උත්සාහ කරණ සේක් වේද? නිකරුණේ අප මරවන්නට උත්සාහ නොකළ මැනවයි කිවුය. මහරජ්ජුරුවන්වහන්ස ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා මා මරන්නේයයි කියන්නාවූ කිසිවෙක්හුගේ බස් අදහා නොගත මැනව ඒ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා එකාන්තයෙන් සැකයක් නැතිව මා මරා

නුඹවහන්සේ මාසේම මරවන්නේය. ඊට සැකයක් නොකල මැනව, තවද මහරජ්ජුරුවන් වහන්ස, ඒ බ්‍රාහ්මණයාට උතුම්වූ ගම් නියම්ගම්වර හා අනුභව කටයුතුවූ උපභොග පරිභොගවස්තු නුඹවහන්සේ උපකාරකොට දෙනසේක, තවද අග්‍රොදකය අග්‍රපිණ්ඩයද ලබන හෙයින් දක්ෂිණෙය්‍ය පුද්ගල වන්නේය, මේ රජදරු කෙණෙකුන් වහන්සේගේ ගෙයක් ගෙයක් පාසා වැද ආහාර නානා වර්ගාදියක් අනුභව කෙරෙද්ද? මහරජ්ජුරුවන් වහන්ස, එබඳුවූ ආහාරපාන වර්ගාදිය දීමෙන් උපකාරවූ ඒ රජදරුවන් වහන්සේට හා අමාත්‍යාදිවූ සියලු සත්ත්වයන්ට පවා මේ බමුණුගැහැවියෝ ද්‍රොහිවනු කැමැත්තාහ. එසේහෙයින් මහරජ්ජුරුවන් වහන්ස, බමුණෝ නම් බොහෝසේම කෙළෙහිගුණ නොදත් තෝය, එසේවූ අකෘතඥවූ බමුණාගේ බසින් අප වැනි දරුවන් නොමරාපුව මැනව. තවද රජ්ජුරුවන් වහන්ස, නිරපරාධවූ අප නිකරුණේ නොමැරුව මැනව. ඉදින් කැමතිසේක්වීනම් ඛණ්ඩහාල බ්‍රාහ්මණයාටම අප ගැතිකොට පාවා දුන මැනව, නැවත ඔහට දස්කොට දෙනු නොකැමතිසේක් වීනම් නුඹ වහන්සේ හා ඒ බමුණා හා දෙදෙනාගේ සිතනැතියන තෙක් මහ ඇකිල්ලෙන් වසනලදුව ඇතුන් අසුන් හා රක්ෂාකරන්නම්හ, ඊටත් අප ගජියක් ඇතැයි නොසිතුව මැනව; තවද රජ්ජුරුවන් වහන්ස, නිරපරාධවූ අප නිකරුණේ නොමැරුව මැනව, ඉදින් කැමතිසේක් වීනම් ඛණ්ඩහාල බ්‍රාහ්මණයාට ගැති කොට පාවා දුනමැනව, එසේ නොකමැතිසේක් වීනම් මහදමින් මසනලදුව ඇත්බෙටි අස්බෙටි ආදිය හෝ දමම්හ, නොහොත් අප ඒ ඛණ්ඩහාල බ්‍රාහ්මණයා හැර සෙසුයම් කෙණෙකුට පාවා දෙනු කැමතිසේක් වීනම් එසේ දුන මැනව, නැවත අපරටින් හෝ නෙරපුව මැනව, එසේ රටින් නගනලද්දවූ අපි කබල්ගත් අත් ඇතිව දිළිඳුව දොරදොර සිඟාකා ඇවිදුම්හ. ඊටත් අපට කුලගජියක් නැත්තාහ, මිත්‍රද්‍රොහීවූ ඒ බ්‍රාහ්මණයාගේ බසින් නිහතමානීවූ සෞරවියසී ඇත්තාවූ මෙලෝ පරලෝ වැඩසාදදීලන්ට නිසිවූ පරිපාලනය කරන්නට සමර්ථවූ අපබඳුවූ දරුවන් නිකරුණේ නරකාදිවූ සතර අපායට මංවූ යාගයක්නිසා නොමරාපුව මැනවැයි කීහ.

එකල්හි එකරාජ රජ්ජුරුවෝ චන්ද්‍රකුමාරයන්ගේ මේ වාක්විලාපය අසා කියන්නාහු නොයෙක් කාරණා කියා වලපන්නාවූ දරුවෝ තමන්ගේ ජීවිතාශා යෙන් දිවිරක්නා කැමතිව අඬති. උන්ගේ ඇඬීමෙන් මා සිතට බොහෝ දුක් උපදවන්නේය, එසේහෙයින් දූන් දූන් මේ කුමාරවරුන් මුදා හැරපියව පුත්‍ර යාගයෙන් ඉදින් දිව්‍යලොකාත්පත්තිය සිඩවේ. නමුත් මට ඉන් ප්‍රයෝජන නැතැයි කියා නැවත මුදවාපුව, නැවත ඛණ්ඩහාල බ්‍රාහ්මණයා අවුත් කියන්නේ රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ වැනි භීරුකජාති ඇති රජදරුවන් විසින් මේ පුත්‍රයාගය නොකටහැක්කේය, නොලැබිය හැක්කේයයි පළමු මා විසින් කියනලද එසේදවුවත් අප දුකසේ සරාලූ මේ යාගයට දූන් බාධා නොකල මැනව. තවද රජ්ජුරුවන්වහන්ස, යම් කෙනෙක් තුමූ යාග කෙරෙද්ද? අනුන් ලවා කවරද්ද? කළාවූ යාගය අනුමෝදන්වෙද්ද? ඒ සියලු සත්ත්වයෝම සවර්ගලොකයට යන්න හුය. එසේහෙයින් යාගකරන්නාවූ සත්ත්වයන්ට මේ පුත්‍රදරුදිවූ යාගය නම් මෙබඳුවූ මහත්ඵල මහානිශංස වන්නේයයි කියා නැවත කුමාරවරුන් අල්වා බැන්දවූයේය,

එකල චන්ද්‍රකුමාරයෝ රජ්ජුරුවන් ගිවිස්වන පිණිස කීයන්නෝ මහරජ්ජුරුවන් වහන්ස! ඉදින් දරුවන් මරා යාගකොට සත්ත්වයෝ මෙලොවින් පරලොවට යන්නාහු වීනම් ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා තෙමේම පළමුකොට යාගකෙරේවයි ඔහු යාගකොට පුත්‍රදාරාවන් හා සමග ගොස් දෙව්ලොව උපන් කල්හි නුඹවහන්සේ පසුව යාගකළ මැනව, රජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේ මධුර රස ඇති භොජනයක් ලැබ පළමුකොට අනුන් ලවා වළඳවා පසුව අනුභව කරණසේක, එසේවූ නුඹවහන්සේ පුත්‍ර මරණය පරීක්ෂා නොකොට යාගකරන්නට කාරණා කවරේද?

තවද රජ්ජුරුවන් වහන්ස! පුත්‍රයාගය කොට සත්ත්වයෝ ඉදින් මිය පරලොකයට යෙත් නම් ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා තමාගේ පුත්‍රදාරාවන් මරායාග කෙරේවයි දරුවන් මරා යාගකොට දෙව්ලොව උපදිතියි දන්නාවූ මේ ඛණ්ඩහාල බ්‍රාහ්මණයා තමාගේ මල්බෑයනුත් පුත්‍රදාරාවන් ආදීවූ අවශෙෂ බන්ධුවර්ගයාත් තමාත් කුමක් පිණිස පළමුකොට නොමරවාද, ඉදින් අනුන් මරා සත්ත්වයෝ දිව්‍යලොකයට යෙත්නම් මොහු තමා මරා බ්‍රහ්මලොකයට යායුතු වන්නේය. එසේ හෙයින් යාගයෙහි ගුණ දන්නාවූ මොහු විසින් අනුන් නොමරා තමාම මැරියයුත්තේය, මේ වූකලී එසේ නොකොට මා මරවන්නේය, මහරජ්ජුරුවන්වහන්ස! මේ කාරණයෙනුත් මේ බමුණා විනිශ්චයෙන් අල්ලස් කන්නට නොලබමියි මා කෙරෙහි ගත් වෛරයෙන් පුත්‍රයාගය පිටලා මා මරවන්නට උත්සාහ කරණ නියාව නුවණැතිසේක් වීනම් නුඹවහන්සේ දැනගග මැනවැයි කීහ. තවද රජ්ජුරුවන්වහන්ස! යම් කෙණෙක් මෙසේ යාගකෙරෙත් නම් කරවත් නම් අනුමෝදන් වෙත්නම් ඒ සියලු සත්ත්වයෝම ඒකාන්තයෙන් සැකයක් නැතිව නරකයටම යෙති, යාගකරන්නාවූ සත්ත්වයන්ට මේ දරුවන් මරා කරන්නාවූ යාගය නම් මෙබඳු මහත් දොෂ ඇත්තේයයි කීහ.

කුමාරයෝ මෙතෙක්ද කියාත් පියානන්ට තමන්ගේ බස් නංවා (ගිවිස්වා) ගතනොහී රජ්ජුරුවන් පිරිවරා සිටියාවූ පෞර උදෙසා කියන්නාහු ගෘහසවාමිවූ සත්‍රිත් හා අවශෙෂ ගෘහපතීහු රජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේගේ ලෙහි දූ දරුවන් නොමැරුව මැනවැයි කියා රජ්ජුරුවන් වහන්සේ සමීපයට නොස් කුමක් හෙයින් නොකියද්ද? හැමකල්හිම මාගේ පිය රජ්ජුරුවන් වහන්සේට මෙලොවින් පරලොවින් වැඩ කැමැත්තෙමි, අවැඩක් නොකැමැත්තෙමි, උන්වහන්සේ ජනපදයටත් හැමකල්හිම වැඩක් මිනා අවැඩක් නොකැමැත්තෙමි, අප අතින් අල්ලස් ගන්නුය, ඓශ්වර්‍ය්‍ය මදයෙන් මත්ව මරා තලා අපට බොහෝ පීඩා කළෝයයි මා සමග කලහයක් වයිරයක් කළාවූ කිසි සත්ත්වයන්ටත් වැඩක් කැමැත්තාවූ මා මූතුමූ මෙවැනි ගුණයෙන් සමන් විතයෝයයි පියානන් වහන්සේ සමීපයට ගොස් දනවුවාසී සත්ත්වයෝ කුමක් පිණිස නොදන්වත්දැයි කිවුය, මෙසේ කී කල්හිත් කිසි සත්ත්වයෙකුට බසක් බැණගනු නොහැකි වූයේය.

ඉක්බිත්තෙන් චන්ද්‍රකුමාරයෝ තමන්ගේ භාර්‍ය්‍යාවන් රජ්ජුරුවන්ගේ භාර්‍ය්‍යාවන්ට යාච්ඤාකරන්නට විධාන කරන්නාහු පින්වත්වූ ගෘහිණීවරුනි, පියානන් වහන්සේටත් ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයන්ටත් මෙපවත් ගොස් කියාව දෙවියන්වහන්ස, සිංහ සමානවූ සෞර වීර්‍ය්‍ය ඇති කිසිවක් හටත් ද්‍රෝහී නොවන්නාවූ සියලු ලෝකවාසීන් විසින් ප්‍රාර්ථිතවූ මේ කුමාරවරුන් නිකරුණේ නොමැරුව මැනවැයි මෙසේ ගොස් යාච්ඤා කරව්යයි කීහ. එබස් ඇසූ චන්ද්‍රකුමාරයන්ගේ බිසෝවරු ගොස් රජ්ජුරුවන්ට යාච්ඤාකොට කිවූය, එසේ කීවත් රජ්ජුරුවෝ උන්ගේ මුහුණු පමණකුත් නොබැලූවාහ. ඉක්බිත්තෙන් රාජකුමාරයෝ අනාථ අසරණව කිසිකෙණෙකුන්ගේ පිටිවහල් බස් පමණකුත් නොලදින් අඬන්නාවූ මම වූකලී සොම්මාර කුලයේවත් කඹුරු කුලයේවත් කුලුපොතු කුලයේවත් ඉදින් උපන්නෙම් වීම්නම් යහපත් වන්නේය. එසේ වීනම් පියානන් වහන්සේ අද මා යාග නිසාත් නොමරවන සේක් වේදැයි කියා ඇඬූහ. මෙසේද කියා නැවත තමන්ගේ බිසෝවරුන් රජ්ජුරුවන්ට යාච්ඤා කරන්නට නියෝග කොට යවන්නෝ පින්වත්වූ මාගේ සියලු අන්තඃපුර ස්ත්‍රීනි, තෙපි හැම මපියානන්වහන්සේගේත් ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයාගේත් පතුල් පිට අඬා වැටී කියනකල දෙවියන්වහන්ස, චන්ද්‍ර කුමාරයන් වහන්සේ හා අප නුඹවහන්සේට කළ අපරාධයෙක් නොදකුම්හ, ඉදින් චන්ද්‍රකුමාරයන්ගේ දොෂයෙක් ඇත්නම් උන්ට ක්‍ෂමාකරවයි කියා මෙසේ යාච්ඤාකොට මරණින් මුදන්නට නිසි බසක් කියවයි විධාන කළහ. ඉක්පිති චන්ද්‍රකුමාරයන්ගේ නැගනිවූ සෙල කුමාරි නම් නැගනියෝ සෝදුක් ඉවසාගත නොහී පියරජ්ජුරුවන් වහන්සේගේ දෙපත්ලෙහි වැටී අඬන්නී පියානන් වහන්ස, මෙලෝ පරලෝ නොදන්නා නුවණ නැති බමුණාගේ බසින් මාගේ එක කුස ඔත් මල් බෑයන් නිකරුණේ යාග පිණිස මරා කුමක් නිසා යන සේක්දැයි බැගෑපත්ව ඇඬූය. රජ්ජුරුවෝ ඒ කුමාරිකාවගේ බසුත් බසෙකැයි නොගත්තාහ.

ඉක්බිති ඒ චන්ද්‍රකුමාරයන්ගේ පුත්‍රවූ වාසුල නම් කුමාරයෝම පියානන් දුකට පැමිණියා දැක මම මුත්තනුවන් වහන්සේට යාච්ඤාකොට මපියානන් වහන්සේගේ ජීවිතදානය දෙවමැයි රජ්ජුරුවන්ගේ දෙපයේ වැටගී අඬන්නෝ දෙවියන්වහන්ස, අපි තවම බාලයම්හ, යෞවනයට නො පැමිණියම්හ, මෙබඳුවූ අප කෙරෙහි අනුකම්පායෙනුත් අපගේ පියානන් වහන්සේ නොමැරුව මැනවැයි කියා මුත්තනු රජ්ජුරුවන් අභිමුඛයෙහිම ඇත් මැත් බල බලා පෙරළී පෙරළී ඇඬූහ. රජ්ජුරුවෝ ඒ වාසුල නම් කුමාරයන්ගේ බැගෑ අඬ අසා ළය පැළීයන්නාක් මෙන් සෝකයට පැමිණ දෑස කඳුළු පුරා තුමූ කුමාරයන් වැළඳගෙන පුත, තෙපි අස්වැසිලි ලබව, තොපගේ පියානන් අරවම්යි කීහ. නැවද රජ්ජුරුවෝ කියන්නෝ වාසුල නම් කුමාරයෙනි, ඒ තොපගේ පියානන් සමීපයට ගොස් අස්වසාලව, අමාත්‍යයෙනි, අන්තඃපුරයේ අඬන්නාවූ සියල්ලන්ම අස්වසාලව, මේ කුමාරයෝ මට අපමණවූ සෝක දුක් උපදවති, එසේ හෙයින් මේ කුමාරවරුන් හැරපියව, දරුවන් මරා කරන්නාවූ යාගයෙන් මට ප්‍රයෝජන නැතැයි නැවත බන්ධනයෙන් මිදවූහ.

එකල ඛණ්ඩහාල බමුණා වහා අවුත් කියන්නේ දේවයන්වහන්ස, නුඹවහන්සේ වැනි භීරුක ජාති ඇති රජදරුවන් විසින් මෙබඳු උතුම් යාගයක් කොටගත නොහැක්කේ යයි පළමු මම නුඹවහන්සේට කීයෙම් වේද? එසේද වුවත් අප විසින් දුකසේ සරහාගත් මේ යාගයට අතරේ බාධාවක් නොකළ මැනව, යමෙක් යාග කෙරෙත් නම් කරවත් නම් අනුමෝදන් වෙත්නම් ඒ සියල්ලෝම ස්වර්ගලෝකයට යන්නාහ. එසේ හෙයින් යාග කරන්නාවූ සත්ත්වයන්ට දරුවන් මරා කරන්නාවූ යාගයෙහි අනුසස් මෙබඳු වන්නේයයි කියා ගිවිස්විය. ඒ රජ්ජුරුවෝත් තමන් නුවණ නැති බැවින් නැවත ඒ පුරෝහිත බ්‍රාහ්මණයාගේ බසින් දරුවන් අල්වා බැඳගන්නට විධාන කළෝය. එකල ඛණ්ඩහාල බ්‍රාහ්මණයා සිතන්නේ මේ රජ්ජුරුවන්වහන්සේ මෘදු සිත් ඇතිසේක. විටෙක අල්වා බඳින්නට විධාන කරණසේක. විටෙක බැඳගත්තවුන් අරින්නට කියනසේක. එසේ හෙයින් නැවත දරුවන්ගේ බසින් චන්ද්‍ර කුමාරයන් ප්‍රධානකොට ඇති සියල්ලවුන් මුදා අරවාපුසේක් වීනම් කාරණා නොවන්නේය උන්ගේ බස් ගිවිස්නට පළමුවම යාගාවාටයට ඇරගෙන යෙමි සිතා ඉක්බිත්තෙන් ඒ රජ්ජුරුවන් යාගාවාටයට යන පිණිස උත්සාහකොට කියන්නාවූ ඛණ්ඩහාල බ්‍රාහ්මණ තෙමේ මහරජ්ජුරුවන් වහන්ස! හස්ති රත්නාදිවූ සියලු රත්නයෙන් යාගය දූත් සරහා නිමවනලද එසේහෙයින් එකරාජ රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේගේ අලංකෘතවූ ප්‍රාසාදයෙන් අමාත්‍ය මණ්ලයා පිරිවරා මැනට නික්මුණ මැනව, යාගකොට නුඹවහන්සේ ස්වර්ගලෝකයට ගොස් රූප ශබ්දාදිවූ පඤ්චකාමයෙන් සතුටුවනසේක් වේද, එසේ හෙයින් ලස් නොව වහා නික්මුණ මැනවැයි කීය.

ඉක්බින්තෙන් බෝධිසත්ත්වයන් ඇරගෙණ යාගාවාටයට යන්නට පටන් ගත් කල්හි බෝධිසත්ත්වයන්ගේ අන්තඃපුර ස්ත්‍රීහු එක්වම නික්මුණාහ. තවද ඒ චන්ද්‍රකුමාරයන්ගේ සත්සියයක් බමණ ලදුරිවූ යෞවනයෙහි පිහිටියාවූ ඒ පුරස්ත්‍රීහු ඉසකෙස් උනා පිටිකර හෙළා අනෙකප්‍රකාරවූ වාක්විලාපයෙන් හඬමින් චන්ද්‍රකුමාරයන් අනුව නික්මුණාහ. තවද සෝකයෙන් අඬමින් නික්මුණාහ. තවද සෝකයෙන් අඬමින් නික්මුණාවූ කම්මුත්තන් සේවතුන් හා අන්‍යවූ පුරස්ත්‍රීහුද නන්දනොද්‍යානයෙහි චුතවන දිව්‍යපුත්‍රයන් පිරිවරා යන්නාවූ දිව්‍යාඞ්ගනාවන් මෙන් ඉසකේ උනා පිටිකර හෙළා අනෙක ප්‍රකාරවූ වාක්විලාපයෙන් හඬමින් චන්ද්‍රකුමාරයන් සමග නික්මුණාහ. (මෙතැන් පටන් අන්තඃපුර ස්ත්‍රීන්ගේ වාක්විලාපය වන්නේය.)

තවද කසීදෙශයෙහි උපන් පිරිසුදුවූ සළු හඳනාවූ ස්වර්ණකුණ්ඩලාභරණයෙන් කණ පලඳින්නාවූ කළුවැල් හා සඳුන් විලවුන් ගල්වන ලද ශරීර ඇති චන්ද්‍ර සූර්ය්‍ය කුමාරයන් දෙදෙනා එකරාජ රජ්ජුරුවන් වහන්සේගේ යාගයට දූත් ගෙණ යන්නට සිටියෝ වේද, තවද අනෙකප්‍රකාරවූ වස්ත්‍රාභරණ සඳුන් විලවුන් ආදියෙන් සැරහුනාවූ චන්ද්‍ර සූර්ය්‍ය කුමාර දෙදෙනා එකරාජ රජ්ජුරුවන් වහන්සේගේ යාගයට මැතියන්වහන්සේගේ ලෙහි සෝක උපදවා කුමාරවරුන් දෙදෙනා ගෙණයන්ට සිටියෝවේද, මාංශරසයෙන් යුක්තවූ සුවඳ ඇල්

සාලේ බත් අනුභව කළාවූ කපුවන් හා කිළියන් විසින් රත්සුත්තෙන් උලා සුවඳ පැනින් මනාකොට නහවන ලද්දාවූ මාණික්‍යමයවූ කුණ්ඩලාභරණ පලඳින්නාවූ චන්ද්‍ර සූර්‍ය්‍ය කුමාරයන් දෙදෙනා එකරාජ රජ්ජුරුවන් වහන්සේගේ යාගයට දූන් ගෙණයන්නට සිටියෝවේද, තවද මීට පූර්භාගයෙහි උත්තමවූ අලංකෘතවූ ගන්ධහස්තීන්ගේ කුම්භයෙහි රාවූතාභරණයෙන් සැරහී හිඳ උද්‍යාන ක්‍රීඩාදියට යම් කුමාර කෙණෙක් යෙද්ද එසේම චන්ද්‍ර සූර්‍ය්‍ය කුමාරයන් දෙදෙනා දූන් පයින් නික්මුණෝ වේද, මීට පූර්භාගයෙහි රාවූතාභරණයෙන් සැරහී අලංකෘතවූ උත්තම අශ්වයන් විසින් පිරිවරණලදුව උද්‍යානක්‍රීඩාදියට යම් ඒ රාජකුමාරවරූ පෙර යෙද්ද, එසේවූ චන්ද්‍ර සූර්‍ය්‍ය කුමාරයන් දෙදෙනා අද එකලාව පයින් යන්නෝ වෙද, උතුම්වූ රථාලංකාරයෙන් සරසන ලද්දාවූ උතුම් රථ මධ්‍යයෙහි පණවනලද රාජාසන මස්තකයෙහි හිඳ සියගණන් රථ පිරිවරා උද්‍යාන ක්‍රීඩාදියට යම් ඒ රාජකුමාර කෙණෙක් යෙත්නම් එසේවූචන්ද්‍ර සූර්‍ය්‍ය කුමාරයෝ දෙදෙන දූන් උදකලාව පයින් නික්මුණෝ වේද, පෙර යම් රාජ කුමාරකෙණෙක් තපනීය රසරත්තාලොකයෙන් දිලියෙන්නාවූ රත්සදින් සදනලද යම් අශ්වකෙනෙකුන් හා සමග ගම් නියම්ගම් රාජධානි හා ගෘහොද්‍යාන වනොද්‍යානාදීවූ ඒ ඒ ස්ථානයන්ට නික්මුණාහු වෙද්ද, එසේවූ චන්ද්‍ර සූර්‍ය්‍යා කුමාරයෝ දෙදෙන දූන් පයින් නික්මුණෝ වේදැයි අනෙකප්‍රකාරවූ වාක් විලාපයෙන් හැඬූහ. මෙසේ අන්තඃපුර ස්ත්‍රීන් අඬමින් වලපමින් සිටියදීම බොධිසත්වයන් නුවරින් පිටත්කළහ. සියලු නුවරවාසී සත්වයෝ ඇලලී ගොස් නුවරින් නික්මෙන්නට පටන් ගත්හ. මහජනයෝ නික්මෙන්නට පටන්ගත් කල්හි යන්නට වාසල්දොර නොසෑහෙන්නේය, එකල්හි ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා ඉතා බොහෝවූ ජනයා දූක කවුරු දනිද්ද, කුමකින් කුමක් වේදැයි සිතා වාසල් දොර වස්වා අගුළු ලැවූයේය.

එකල්හි මහජනයෝ නික්මෙන්නට අවසර නොලැබ ඇතුළුනුවර වාසල් දොර සමීපයෙහි එක් උයනෙක් ඇත, ඒ උයන සමීපයෙහි සිට මහහඬින් හැඬූවාහුය. ඒ මහජනයාගේ හඬින් පක්ෂි සමූහයා ඇලලී ගොස් අඬා ආකාශයට පැනනැංගාහ. එකල මහජනයෝ ඒ ඒ පක්ෂීන්ට ආමන්ත්‍රණය කොට අඬන්නාහු ලිහිණියෙනි, ඉදින් තෙපි මස් කැමැත්තාහු වීනම් පුෂ්පවතී නම් රාජධානියට පූර්දිග්භාගයෙන් ගියකල්හි යාගාවාටයෙක් ඇත, ඒ යාගාවාටයෙහි එකරාජනම් රජ්ජුරුවෝ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයාගෙන් මුළාවූසේක් තමන්වහන්සේගේ දරුවන් සතරදෙනා ගෙණ යාගකරණසේක, ඉදින් තෙපි මස් කැමැත්තාහු වීනම් එතැනට ගොස් කැමති පරිද්දෙන් මස් අනුභව කරව, තවද ලිහිණියෙනි, ඉදින් තෙපි මස් කැමැත්තාහු වීනම් පුෂ්වතී නම් රාජධානියට පූර්දික් භාගයෙන් ගියකල යාගාවාටයෙක් ඇත, එතැන රජ්ජුරුවන් වහන්සේ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයාගේ වචනයෙන් මූඪවූසේක් අග්‍රමහෙෂිකාවරුන් සතරදෙනෙකු ගෙණ යාගකරණ සේක, එසේම දූ දරුවන් සතරදෙනෙකු හා සිටුවරුන් සතරදෙනෙකුද ඇතුන් සතරදෙනෙකු හා අසුන් සතරදෙනෙකුද වෘෂභයන් සතරදෙනෙකු හා එළුවන් සතර දෙනෙකු දූයි මෙසේ හස්ත්‍යාදීවූ හැම වස්තුවෙන් සතර සතර ගෙණ යාග කරන්නෝය, එසේ හෙයින් තෙපි මස් කැමැත්තාහු වීනම් එතැනට ගොස් කැමති පරිද්දෙන් අනුභව කරවයි මෙසේ අනෙකප්‍රකාරයෙන් වාක්විලාපය කියා ඇඬූහ.

මෙසේ මහජනයෝ ඒ උයන සමීපයෙහි සිට අඬා මහබෝසතාණන් විසූ ස්ථානයට ගොස් ප්‍රාසාදය පැදකුණු කෙරෙමින් අන්තඃපුර කූටාගාර උද්‍යානාදිය බල බලා අඬන්නාහු මෙසේද කියා ඇඬූහ. මේ ඒ චන්ද්‍ර කුමාර යන්ගේ ප්‍රාසාදය මේ අතිරම්‍යවූ උත්තම ස්ත්‍රීන්ගේ ආකීර්ණවූ අන්තඃපුරයය, මෙබඳුවූ ප්‍රාසාද වස්තු හා අන්තඃපුරය හැර චන්ද්‍රකුමාරාදීවූ අපගේ ස්වාමි පුත්‍රයෝ සතරදෙන දූත් මරණ පිණිස ගෙණයන ලද්දාහු වෙද්ද? තවද චන්ද්‍ර කුමාරයන්ගේ ස්වර්ණමයවූ පුෂ්පදාමයෙන් ගැවසීගත්තාවූ අතිරම්‍යවූ මේ කූටාගාර භවනය වන්නේය. මෙබඳුවූ කූටාගාරය හැර චන්ද්‍රකුමාරාදීවූ අප ගේ ඒ ස්වාමිපුත්‍රයෝ සතරදෙන දූත් යාග නිසා මරන්නට ගෙණයන ලද්දාහු වෙද්ද? තවද ඇම කල්හිම මල් පිපී සිටියාවූ අති රම්‍යවූ චන්ද්‍රකුමාරයන්ගේ මේ කිනිහිරි වනය වන්නේය. හැම කල්හිම මල් පිපී සිටියාවූ අති රම්‍යවූ මේ හෝපලු වනය වන්නේය, හැම කල්හිම මල් පිපී සිටියාවූ අති රම්‍යවූ මේ පළොල් වනය වන්නේය, හැම කල්හිම මල් පිපී සිටියාවූ ඉතා සිත් කලුවූ මේ අඹඋයන වන්නේය. මෙබඳුවූ උද්‍යානාදිය හැර චන්ද්‍රකුමාරාදී අපගේ ස්වාමිපුත්‍රයෝ සතරදෙන දූත් යාග නිසා මරණු ලබන්නෝ වේද, තවද ඒ චන්ද්‍රකුමාරයන්ගේ රත් නෙළුම් හා නෙල නෙළුම් වලින් ගැවසීගත්තාවූ මේ පුෂ්කරණිය වන්නීය. මෙසේ ස්වර්ණ කර්මාන්තයෙන් විසිතුරු කරණ ලද්දාවූ ඒ චන්ද්‍රකුමාරයන් ජලක්‍රීඩාව කරන්නාවූ නවුකාව මෝනොමෝ වන්නීය මේ චන්ද්‍ර කුමාරයන්ගේ සමාන රාජ කුමාරවරුන් හා සමග ඇත මෑත දිව පැන වැලිකෙළනාවූ ඇති රම්‍යවූ වැලිතලා පංක්ති වන්නේය. මෙබඳුවූ පුෂ්කරණී ආදිය හැර චන්ද්‍රකුමාරාදීවූ අපගේ ස්වාමිපුත්‍රයෝ සතරදෙන දූත් යාග නිසා නිකරුණේ මරණු ලබන්නාහු වෙද්දැයි මෙසේ අනෙක ප්‍රකාරයෙන් වාක්විලාප කොට ඒ ඒ තැන සිට අඬා නැවත ඇත්හල් ආදිය කරා ගොස් අඬන්නාහු මේ චන්ද්‍ර කුමාරයන් වහන්සේගේ ඓරාවණ නම් හස්තියායයි කියන ලද ශක්ති සම්පන්නවූ වටමටවූ නාදළ ඇති මඞගල හස්තිරත්නය වන්නේය, තවද ඒ චන්ද්‍රකුමාරයන් වහන්සේගේ එකඛුරයයි කියන ලද බඳ කුර ඇති මේ උතුම්වූ මඞගල අශ්වරත්නය වන්නේය. තවද ගමන්ගත් කල්හි සැළලිහිණි යන්ගේ හඬමෙන් මධුර නාද පවත්නාවූ සුන්දරවූ සප්තරත්නයෙන් විචිත්‍රවූ යම් රථයෙක්හි හිඳ යන්නාවූ ස්වාමිපුත්‍රයෝ නන්දනෝද්‍යානයෙහි ක්‍රීඩාවට යන්නාවූ දේවතාවන්මෙන් ඉතා හෙබියෝද, මේ චන්ද්‍රකුමාරයන්ගේ මගුලසුන් යොදන ලද ඒ රථය වන්නේය. මෙබඳුවූ හස්තිරත්නාදිය හැර ඒ චන්ද්‍ර කුමාරාදීවූ අපගේ ස්වාමිපුත්‍රයෝ සතරදෙන දූත් යාග නිසා නිකරුණේ මරන්නට ගෙණයන්නාහු වේද, රන්වන්වූ ශරීර ඇති ජාතියෙන් ඔවුනොවුන් හා සමානවූ අනින්දිතවූ අංග ප්‍රත්‍යඞග ඇති රත්සඳුන් විලවුන් ගල්වනලද ශරීරයෙන් යුක්තවූ මෙබඳු පුත්‍රයන් සතරදෙනා ගෙණ බමුණාගේ බසින් මූලාවූ එකරාජ රජ්ජුරුවන්වහන්සේ කෙසේ නම් පුත්‍රයාගය කරණසේක්ද එසේම රන්වන්වූ ශරීර ඇති ජාතියෙන් ඔවුනොවුන් හා සමානවූ අනින්දිතවූ අඞග ප්‍රත්‍යඞග ඇති රත්සඳුන් විලවුන් ගල්වන ලද ශරීරයෙන් යුක්තවූ දූවරුන් සතරදෙනද, සිවුවරුන් සතරදෙනෙකුදැයි මෙසේ සියලු වස්තුයෙන් සතරක් සතරක් ගෙන බමුණාගේ බසින් මූලාවූ එකරාජ රජ්ජුරුවන්

වහන්සේ කෙසේ නම් යාග කරණසේක්ද, යම් ගම් නියම්ගම් රාජධානියෙක් මනුෂ්‍ය විහරණයෙන් ශූන්‍යව මහවල්වේද, එපරිද්දෙන්ම මේ පුෂ්පවතී නම් රාජධානියත් ප්‍රසිද්ධවූ මේ චන්ද්‍ර රාජකුමාරාදීන්ගේ අභාවයෙන් මහවල් වන්නේයයි කියා නුවරින් පිටත්ව ගතනොහී ඇතුළු නුවරම ඒ ඒ ප්‍රසිද්ධ ස්ථානයන්හි ඇවිද මෙබඳුවූ වාක් විලාපයෙන් මහජනයෝ ඇඬූහ.

මහබෝසතාණන් අවශෙෂ බන්ධුවර්ගයා හා සමග යාගාවාටයට ගෙණ යන ලද්හ. එකල්හි මහබෝසතාණන්ගේ මෑණියෝවූ ගෞතම දෙවි තොමෝ දෙවයන්වහන්ස, මේ දරුවන්ට ජීවිතදානය දුන මැනවැයි කියා රජ්ජුරු වන්ගේ දෙපත් ලඟ වැටී ඈත මෑත පෙරළී පෙරළී අඬන්නී මෙසේ කීවාය. රජ්ජුරුවන්වහන්ස, අභිවෘද්ධියකට නොපැමිණ දුකින් පීඩිතවූයෙම් ඒ ඒ තැන වැටී ඈත මෑත පෙරළීමෙන් පස් වැකුණාවූ ගාත්‍රා ඇතිව ඇසිල්ලකින් විසිරුණී ඇවිදිමි. ඉදින් මාගේ ඇසක් මැනිවූ උතුම්වූ චන්ද්‍ර කුමාරයන් ඒකාන්තයෙන් මැරූනම් මා දිවි නොහබමි. ඒකාන්තයෙන් මාගේ දෙවැනි ඇසක් වැනි උතුම්වූ සූර්‍ය්‍ය කුමාරයන් ඉදින් මැරූ නම් එවිටම මා දිවි නොහ බමි, කියා ඇඬීය. මෙසේ මහබෝසතාණන්ගේ මෑණියෝ අනෙක ප්‍රකාර යෙන් විලාප කියා අඬාත් රජ්ජුරුවන්ගෙන් අස්වැසීමකට සුදුසුවූ කිසි බසක් නොලැබ මාගේ පුතනුවෙනි නොප හැමදෙනාට කිසි ගියෝ වත. නොප හැමදෙන බැණ නොනැගී ඉදිනේ එසේ හෙයින් වේද? කුමක් නිසා මපුතනුවන් ගෙණ යන ගමන නොනැවැත්වූදැයි චන්ද්‍ර කුමාරයන්ගේ බිසෝවරුන් සතරදෙනා වැළඳගෙණ අඬමින් මෙසේ කීවුය සඬියා නම් බිසවූද, ඔපරකබිනා නම් බිසවූද, පොකබරකබිනා නම් බිසවූද, ගංගිකා නම් බිසවූද, යන බිසෝවරුන් සතර දෙන චන්ද්‍ර සූර්‍ය්‍ය කුමාරයන් දෙදෙනා අභිමුඛ යෙහි සිට ගී කියා නටමින් ඔවුනොවුන්ට ප්‍රිය තෙපුල් බණන්නාහු කවර කාරණයකින් මා දරුවන් තමන් කෙරෙහි පස්කම් ගුණයෙන් නොඇලවූ දෝහෝ නොහොත් නැටීමෙන් ගී කීමෙන් හා පිය තෙපුල් බිණීමෙන් මුත් සතරදෙනා හා සමවූ අන්‍යවූ ස්ත්‍රී කෙණෙක් මේ මුළු දඹදිව නැත. එවැනිවූ බිසෝවරුවන් සතරදෙනා මා දරුවන් තමන් කෙරෙහි පස්කම් ගුණයෙන් නොඇලවා කුමකට උකටලී කළෝදෝහෝයි මෙසේ විලාප කියා හැඬූහ නවත මහබෝසතාණන්ගේ මෑනියෝ යෙහෙළනියන් සතරදෙනා වැළඳගෙණ මෙසේ අනෙකප්‍රකාරයෙන් වාක්විලාප කොට හඬා අනිකක් කියා කොට ගන්නට නිස්සෙක් නොදුක ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයාට හවන්නට පටන් ගත්හ.

දුෂ්ටවූ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණය, මපුතනුවන් චන්ද්‍රකුමාරයන් මරන් නට යාගාවාටයට ගෙණ ගිය කල්හි මාගේ ලෙහි යම් දරුගින්නෙක් උපන්නේ නම් ඒ මාගේ හෘදයශොකය බමුණ තා මව කරා පැමිණේවා, මා කුසෙන් නැගී දළ ගිනි තා මව විහිදුවාවා, නවද බමුණ, මා දරුවන් චන්ද්‍ර කුමාරයන් හා සූර්‍ය්‍යකුමාරයන්ම මරන්නට යාගාවාටයට ගෙණගිය කල්හි මා ළෙන් නැගී යම් දරු ගින්නෙක් ඇත්නම් ඒ මාගේ දරු ගිනි බමුණ! තාම විහිදුවාවා, මාලෙන් නැගි යම් ශොකාග්නියෙක් ඇත්නම් ඒ මාගේ දරු ශොකාග්නිය තාගේ භාර්‍ය්‍යාව කරා පැමිණේවා, මා කුසෙන් නැගි ශොකාග්නිය තාගේ

භාගසීව විදුවාවා, තවද බමුණ නිරපරාධවූ සිංහ සමානවූ බලපරාක්‍රම ඇති රාජකුමාරවරුන් යමෙක් මැරවීතම් එසේ රෞද්‍ර ක්‍රියා ඇති තාගේ මවූ තමා දරුවන් නොදකීවා, තමාගේ සවාමිපුත් නොදකීවා, තවද බමුණ! මුළු ලෝ වාසීන් විසින් පැතිය යුතුවූ මහත්වූ සෞර වීයසී ඇති මේ රාජකුමාරවරුන්, යමෙක් මැරවීතම් එබඳු චණ්ඩ පරුෂ ගුණයෙන් යුත්වූ භාගේ මවූ තමා දරුවන් නොදකීවා, තමාගේ වල්ලභයාත් නොදකීවායි, මෙසේ අනෙක ප්‍රකාරයෙන් අක්‍රොෂ කළහ.

ඉක්බිත්තෙන් මහබෝසතානෝ යාගාවාටය සමීපයෙහි සිට පිය රජ්ජුරුවන්ට යාචඤා කරන්නාහු මහරජ්ජුරුවන්වහන්ස! නිරපරාධවූ අප නිකරුණේ නොමැරුව මැනව, එසේම නුඹවහන්සේගේ සිත නොතැමේ නම් මේ ඛණ්ඩහාල බ්‍රාහ්මණයාට අප දස්කොට පාවා දුන මැනව, එසේ දස් කරණු නොකැමැතිසේක් නම් නුඹවහන්සේගේ සිත මොළොක්වන තෙක් මහදමින් මසතලදුව ඇත්හල කම්කොට ඇතුන් අසුන් රකුම්හ. එසේ කරණු නොකැ මැතිසේක් වීනම් පත්නම්කොට ඇත්බෙටි අස්බෙටි දමම්හ. තවද මහ රජ්ජුරුවන්වහන්ස! නිකරුණේ නිරපරාධවූ අප නොමැරුව මැනව, ඉදින් නුඹ වහන්සේගේ සිත අප කෙරෙහි ඉතාම කලකිරී ගියේ නම් තම මේ ඛණ්ඩහාල බ්‍රාහ්මණයාට අප දස්කොට පාවාදුන මැනව එසේ නොකොට අන්‍යවූ යම් කිසිවක්හට ගැතිකොට දෙනු කැමතිසේක් වීනම් ඔහට ක්‍රයපත්‍රය ලියා අප දස් කොට දුන මැනව, අප රටින් හෝ නහාපුව මැනව, එසේ රටින් නෙරනා ලද්දාවූ අපි කබල් ගත් ඇතිව දිළිඳුව දොර දොර සිඟා කා ඇවිදුමෝ නම් එයත් යහපත් වන්නේය. තවද මහරජ්ජුරුවන්වහන්ස! දරුවන් කැමැත්තාවූ දිළිඳු ස්ත්‍රීහු බොහෝ පිදේනි වස්තු ගෙණ ගොස් පුද දරුවන් පතා ප්‍රසිඬ වූ දෙවාලයවල පේව වැදනෝනාහ. සමහර ස්ත්‍රී කෙණෙකුන්ට උපන්නාවූ දොළ නොලැබ ගර්භය වියලී නස්නේය, සමහර ස්ත්‍රී කෙණෙක් ලද්දාවූ දොළ අනුභව නොකොට හැර දරුවන් නොලබති. අපගේ මෑනියන් වහන්සේ වූකලී තමන්වහන්සේට අභිප්‍රාවූ දොළ ලදින් ඒ අනුභව කොටම උපන්නාවූ ගර්භය නොනසා අප වදා වඩා වඩිතය කළසේක. එසේවූ දුකසේලත් අපි කුමක් නිසා නිකරුණේ යාග පිණිස මරවනසේක් වේද? මහරජ්ජුරුවන් වහන්ස! අපට දරුවෝ උපදින්වයි කියා සමහර ස්ත්‍රී කෙණෙක් ප්‍රාර්ථනා කරත්තාහ. සමහර ස්ත්‍රී කෙණෙක් අපගේ දරුවන්ගෙන් දරුවෝ උපදිත්වයි මෙසේ ආශා කරත්තාහ, මෙසේ පුත්‍ර ප්‍රතිලාභය දුක් වූවත් නුඹවහන්සේ දූන් නිෂ්කාරණයේ යාග නිසා අප මරවනසේක් වේද? තවද පියානන් වහන්ස! මෙසේ දෙවතාරාධනයෙන් ස්ත්‍රීහු දූදරුවන් ලබන්නාහ. එබැවින් නුඹවහන්සේ තමා මෙසේ දුකසේ ලද දරුවන් වූ අප යාග පිණිස නොමැරුව මැනව, බැගෑව ලද්දාවූ දරුවන් යාග නිසා අපගේ මෑනියන් වහන්සේ කෙරෙන් වියෝ නොකල මැනවැයි මහත්වූ සොක දුඃඛයෙන් ඇඬූහ.

මෙසේ ඒ මහබෝසතානෝ මෙතෙක් කාරණා කියා හඬාත් පියානන් සමීපයෙන් කිසි බසක් පමණවත් නොලැබ මෑනියන් පාපිට වැටී වැදහෙව අඬන්නෝ මෑනියන්වහන්ස! නුඹවහන්සේ චන්ද්‍රකුමාරයන්ගේ මූත්‍රාදිය දූම්මෙන් බොහෝ දුක්ගෙන වැඩුසේක්, එසේවැඩු පුතනුවන් දූන් ඇසිල්ලකින්

නොලබනසේක් වේද? එසේ හෙයින් නුඹවහන්සේගේ දෙපා වඳිමින්ම පියානන්වහන්සේ අප මරා යාගකොට මෙයින් මියපරලොව ගොස් ප්‍රමාණාතික්‍රාන්තවූ සම්පත්තින් සමෘද්ධවූ දිව්‍යලෝකොත්පත්තිය ලබනසේක්වා, තවද මෑනියන්වහන්ස! නුඹවහන්සේ කෙරෙන් අපගේ වියොගවීම වන බැවින් මං වැළඳගෙණ සිඹ සනහවා, ඉක්බිති මා වදනට නුඹවහන්සේගේ දෙපතුල් දුන මැනව, නුඹවහන්සේගේ දෙපය වැඳ ඉක්බිති රජ්ජුරුවන්වහන්සේගේ යාගය පිණිස නුඹවහන්සේ කෙරෙන් වියෝ වන්නෙම් වේද, තවද නුඹවහන්සේගේ ළයට සෝදුකක් උපදවා මහජනයාගේ ළයටත් සෝදුකක් උපදවා එකරාජ රජ්ජුරුවන්වහන්සේ යාග නිසා නුඹවහන්සේ ප්‍රධානකොට ඇති සියලු මහ ජනයා කෙරෙන් වියෝ වන්නෙම් වේදැයි මෙසේ නොයෙක් පරිද්දෙන් වාක්විලාපකොට ඇඬූහ.

ඉක්බිත්තෙන් චන්ද්‍රකුමාරයන්ගේ මෑනියෝ වනස කියා අඬන්නාහු පුත චන්ද්‍රකුමාරයෙනි! මේ තොපගේ අන්තිම අවසථාව වන බැවින් පද්මපත්‍රවෙඨන නම් ප්‍රසාධනයෙන් නලළ හා කන්සක වැටී හුනු කෙසකලාපය සකස් කොට නගානෙණ බඳුවද සපුමල් පෙත්තෙන් මුසුකොට නොතන ලද වර්ණගන්ධ සම්පන්නවූ අන්තිමවූ මේ සුවඳ මල්දමින්ද පද්මපත්‍රවෙඨන නම් මල් සෝලුව බැඳි තැන් පටන් අලංකාර පිණිස මත්තේ සියලු කෙස්වැටිය වටකොට වෙළා බැඳ ගණුව, මෙලෙස මල්සෝලුයෙන් කෙසේ වෙළා බැඳීම තොපගේ පිය මුතුන් ආදීවූ පුරාතන රජදරුවන් කොට ගෙණ එන චාරිත්‍රයෙක් වන්නේය. පුත චන්ද්‍රකුමාරයෙනි! යම් රක්ත චන්දන විලෙපනයකින් මනාකොට සකල ශරීරයෙහි ගල්වන ලදුව මෙතැනට රුස්වූ රාජ පර්ෂත් මධ්‍යයෙහි සැරහී සිටු නම් එබඳුවූ රත්සඳුන් විලවුන් ගෙණ සැරහෙව, මේ විලවුන් ගෙණ සැරහීමෙන් දෙවන සැරහීමෙක් ඉදිරියේ තොපට නැත්තේවේද, තවද පුත! තොපට මරණය සමීපව සිටි බැවින් මොලොක්වූ ලක්‍ෂ අගන කසීසළු හැඳගණුව, යම් කාශික වස්ත්‍රයක් මනාකොට හැඳ මේ රාජ පර්ෂත් මධ්‍යයෙහි සැරහී සිටු නම් එසේවූ කාශික වස්ත්‍රයක් හැඳ සැරහෙව මේ සළු හැඳ සැරහී දෙවන සැරහීමෙක් ඉදිරියේ තොපට නැත්තේ වේද, තවද පුත! යම් හස්තාභරණයකින් සැරහුනාවූ තෙපි මේ රාජ පර්ෂත් මධ්‍යයෙහි විශෙෂයෙන් සැරහී සිටු නම් එසේවූ උත්තමවූ අනර්ඝ මුක්තාමාණික්‍යයෙන් හා ජාම්බොනද සවණියෙන් යොදා කරන ලද භුජාභරණයෙන් පැළඳ සැරහෙව, මේ භුජාභරණයෙන් සැරහීමෙන් දෙවන සැරහීමෙක් තොපට ඉදිරියේ නැත්තේ වේදැයි මෙසේ අනෙකප්‍රකාරයෙන් වාක්විලාප කොට ඇඬූය.

ඉක්බිත්තෙන් ඒ චන්ද්‍රකුමාරයන්ගේ චන්ද්‍රා නම් අගමෙහෙසුන් බිසවූ රජ්ජුරුවන්ගේ දෙපත්ලෙහි වැටී නෙව අඬන්නී ජනෙශ්වරවූ පෘථිවීශ්වර වූ ජනපද සවාමීවූ මේ එකරාජ රජ්ජුරුවන්වහන්සේ දරුවන් විෂයෙහි දෙමවුපියන්ට මහත්ව උපදවන්නාවූ පුත්‍රස්නේහය නූපදවූසේකැයි සිතම්හයි කියා ඇඬිය ඒ චන්ද්‍රාදෙවීන්ගේ බස් අසා එකරාජ රජ්ජුරුවෝ කියන්නාහු චන්ද්‍රාදෙවිනි! දරුවන් මනකල් තොපට මතුනොවෙයි. මටත් මනකල්හුමය, එසේම මාගේ ආත්මයය මට ඉතා ප්‍රියය, සෙහෙළිවූ තෙපි හැම දෙනාත් මට ප්‍රියයහ, මාගේ බිසෝවරුද මට ඉතා ප්‍රියයහ, එසේවුවත් දිව්‍යලෝකය ප්‍රාර්ථනා කරන්නාවූ මම ඒ දිව්‍යලොකොත්පත්ති කාරණයෙන් මාගේ දරුවන්

ආදීවූ මෙතෙක් දෙනා මරම් මරන්නේ මුත් ශොකයක් නොකෙරෙමි. මොහු හැම්දෙනාම මා හා සමග දිව්‍යලොකයෙහි එක්ව වෙසෙති. තෙපි ඊට සැකයක් නොකරවයි කීහ. එකල්හි චන්ද්‍රාදේවී කියන්නී දේවයන්වහන්ස! මාගේ ස්වාමිපුත්‍රයානන්වහන්සේ මරන්නට පළමුකොට මා මැරුව මැනව, මා බල බලා සිටියදී මාහිමියානන් මරා මට සෝකදුක් දී මා ලය නොපැළව මැනව, මහරජ්ජුරුවන්වහන්ස! නුඹවහන්සේගේ පුත්‍රවූ චන්ද්‍රකුමාරයෝ සර්වාභරණයෙන් සැරහී සිටි හෙයින් ඉතා හොබනි, දුටුවන් සිත් පහදවති, ඉතා සිවුමැල්ලෝය. මඳකුත් දුක්ගත නොහෙති, එබඳුවූ පුතනුවන් කුමක් නිසා නිකරුණේ මරණයේක්ද? තවද මහරජ්ජුරුවන්වහන්ස! ඉදින් නුඹවහන්සේ නොවළක්වා මරණසේක් වී නම මාහිමියානන්ට පළමුකොට මා මැරුව මැනව, එසේ කල්හි චන්ද්‍රකුමාරයන් හා එක්ව ගොස් දිව්‍යලෝකයෙහි උපදිමි. නුඹවහන්සේ යාග විධි සඞ්ඛ්‍යාත බොහෝ කුසල් කළ මැනව අපි දෙදෙන වූකලී එක්විට මරණ ලද්දමෝ වී නම් දිව්‍යලෝකයට ගොස් මතුත් එක්ව සුව විඳිනමෝ වේද, දේවයන්වහන්ස, අපගේ ස්වර්ගලොකොත්පත්තියට බාධා නොකළ මැනවැයි කීවාය. එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු චන්ද්‍රාවෙනි, තොපට මරණය නොකමැතිවව, සොකාතුරවත් නොහඬව, දිගු පුළුල් නිල් නුවන් ඇති තැනැත්තිය තොපගේ ස්වාමිවූ චන්ද්‍රකුමාරයන් මල්බෑයෝ බොහෝ වන්නාහ, චන්ද්‍ර කුමාරයන් යාග නිසා මැරූ කල්හි චන්ද්‍රකුමාරයන්ගේ මල්බෑයෝ තොප පඤ්චකාමයෙන් පිණවන්නාහ, තොපි ශොකාතුරව නොහඬවයි කිවූය, මෙලෙස කී කල්හි චන්ද්‍රාදෙවී තොමෝ තමන්ගේ දෙඅත ලෙහි සපා ගත්තීය. මෙසේ ලෙහි අත් ගසා තැවත අඬන්නාවූ චන්ද්‍රාවෝ මට ජීවිතයෙන් කම් නැත විෂයක් කා ජීවිතක්ෂයට පැමිණෙමි චන්ද්‍ර කුමාරයන් නැති රට හිඳ මා දිවි නොතබමි, තවද දෙවයන්වහන්සෙ! නුඹවහන්සේගේ ලෙහි ද දරුවන් නොමැරුව, චන්ද්‍ර කුමාරයන් නොමැරුව මැනවයි යම් කෙණෙක් පැරුත්ත පමණකුත් නොකියත් නම් එසේ හෙයින් මේ රජ්ජුරුවන්වහන්සේ එබඳුවූ විශ්වාසයන් හා අමාත්‍යයන් හා යහළුවන් හා නෑයන් නැතැයි සිතමි එසේ නැති හෙයින් වේද චන්ද්‍ර කුමාරයන් නොමැරුව මැනවැයි නොකියන්නේය, ඇත්නම් කියන්නෝම වේද, තවද රජ්ජුරුවන්වහන්ස! නුඹවහන්සේ නිසා උපන් මේ දරුවන් නොමරවා මාගේ මේ වාසුල කුමාරයන් ආදිවූ සෙසු දරුවෝ මල්දම් පැළන්දවූ කෙයුරාභරණ පැළැන්දවූ දරුවන් ගෙණ දිව්‍යලොකොත්පත්තිය පිණිස යාග කළ මැනව, මා දරුවන් මරාවත් මාහිමියන් නොමරා හැරපුව මැනව, තවද මහ රජ්ජුරුවන්වහන්ස! මා කඩ කඩ කොට කපා සියයක් කොටස් කොට එක් තැනෙක තබා සත්තැනෙකත් යාග කළ මැනව, නිරපරාධවූ සිංහ සමාන සෞරවීර්‍යයී ඇති සියලු ලෝවැස්සන් විසින් ප්‍රාර්ථිතයවූ නුඹවහන්සේගේ ප්‍රධාන පුත්‍රවූ මේ චන්කුමාරයන් නිකරුණේ නොමැරුව මැනවැයි කියා ඇඬූය, මෙසේ චන්ද්‍රා නම් බිසව් එකරාජ රජ්ජුරුවන් සමීපයෙහි සිට නොයෙක් දෑ කියා අඬා අස්වැසීමකට තිසි බසක් පමණකුත් නොලදින් මහබෝසතානන් සමීපයට ගොස් අඬා අඬා සිටියාහ.

ඉක්බිත්තෙන් මහබෝසතානෝ චන්ද්‍රා නම් බිසවුන්ට කියන්නෝ චන්ද්‍රාවෙනි! මා ජීවත්ව සැපසේ ඉන්නාකල තොපව මා විසින් ඒ ඒ ලද

බොලඳ ප්‍රිය තෙපුල් බිණූ කල්හි ඒ ඒ කර්ණරසායනවූ ප්‍රිය කථා කී කල්හි මාහැඟි වූ මුක්තා මාණික්‍යාදිවූ රත්නයෙන් විසිතුරු කොට කරණ ලද නොයෙක් ආභරණ දෙනලද, දූන්වූකලී තොපට දෙන්නාවූ මේ අන්තිම වස්තු පරිත්‍යාගය, එසේ හෙයින් දූන් මට ප්‍රියවූ චන්ද්‍රාවෙනි! තොපට මා පැලඳ සිටියාවූ මේ ආභරණ දූන් ගලවාදෙමි. මා දුටුවාසේම ආභරණ පැලඳගෙණ හැම වේලෙහිම මා සිහිකොට හිඳුවයි කීහ. එබස් ඇසූ චන්ද්‍රාදෙවී තොමෝ වඩ වඩා අඬන්නට පටන්ගත්තීය, මීට පූර්වභාගයෙහි යම් රාජකුමාරකෙණෙකුන්ගේ ස්කන්ධයෙහි ප්‍රබුද්ධ සුගන්ධ කුසුමදාමයන් හා ගෙතීමෙන් විචිත්‍රවූ සුගන්ධ කුසුමදාමයෝ පෙරළි පෙරළී පවතිද්ද, දූන්වූකලී ඒ රාජ කුමාරයන්ගේ ස්කන්ධයෙහි විෂපීතවූ අති තීක්ෂණවූ මුවහත් ඇති ඛඩ්ගපත්‍රයන් පවත්නේ වේද තව නොබෝ කලකින් මේ රාජකුමාරවරුන්ගේ කර කඩුපත් වැටෙන්නේය, එසේ වුවත් මාගේ හදවත තව දක්වා නොපැළෙඹි, එසේ හෙයින් මාගේ ලය වූකලී ශවර බන්ධනයෙකින් යුක්තවූයේ වන, මෙබඳු වූවන්ගේ මරණ බල බලා සිටියදීම මා ලය නොපැලෙන්නේ ලෙහි ගලක් ලා මැසූ හෙයින් වන්ද, තවද පිරිසිදුවූ කසීසළු හැඳ සවර්ණ කුණ්ඩලාභරණයෙන් පැලඳ රත් සඳුන් විලවුන් ගල්වා සැරහී සිටියාවූ දුටුදුටුවන් සිත් පිණවන්නාවූ චන්ද්‍ර සූර්‍ය්‍ය කුමාරයෝ දෙදෙන ඒකරාජ රජ්ජුරුවන්වහන්සේගේ යාගයට මැතියන් වහන්සේටත් මටත් මා දරුවන්ටත් මහජනයාටත් ශෝක උපදවා නොබෝ කලකින් ගෙණයනු ලබන්නෝ වේද, තවද උතුම්වූ රසමසවුලෙන් යුක්තවූ තුන්අවුරුදු ගිය සුවඳ ඇල්සාසේ බත් අනුභව කරන්නාවූ කපුවන් හා කිලිගුන් විසින් රන්සුත්නෙත් උලා සුවඳ පැන් සොළොස් කළයකින් නාවා අනෙකප්‍රකාරවූ රාජභෝජනයෙන් සරහා මාණික්‍යමය කුණ්ඩලාභරණයෙන් පලඳනා ලද්දාවූ සකල ශරීරය රත්සඳුන් විලවුන් ගල්වා චම්පක නවමල්ලිකාදීවූ උතුම් විසිතුරු මල්දම් මල්සෝලුයෙන් මුදුන් මල්කඩ හා කර්ණාවතංසයෙන් විශෙෂයෙන් සැරහුනාවූ චන්ද්‍ර සූර්‍ය්‍ය කුමාර දෙදෙන ඒකරාජ රජ්ජුරුවන් වහන්සේ යාගයට දෙමවුපිය දෙදෙනාටත් නගුන් මල්බෑයන්ටත් මටත් මා දරුවන්ටත් සෙසු මහජනයාටත් මහත් දුක්උපදවා ලය කකියවා නොබෝ කලකින් ගෙණ යනු ලබන්නෝ වේදැයි මෙසේ අනෙක ප්‍රකාර වාක්විලාප කියා ඇඬිය. මෙසේ චන්ද්‍රනම් බිසවුන් හඬමින් වැලපෙමින් සිටියදීම යාගාවාටයෙහි කර්මාන්තකොට නිමවූහ. ඉක්බිත්තෙන් චන්ද්‍රකුමාරයන් ගෙණ ගොස් කර නමා මරන්නට ඉඳවූහ. එකල ඛණ්ඩහාල බ්‍රාහ්මණයා රන්තලිය කුමාරයන් සමීපයෙහි තබා කඩුව ඇරගෙණ කුමාරයන්ගේ බොටුව කපා ගලලොහිතයෙන් තලිය පුරා තලියෙන් ලේ ගෙණ ගොස් යාගාවාටයෙහි වත්කොට යාග කිරීමෙන් මතුදෙළ පුරමියි සිතා සිටිකල මහබෝසතානන් වහන්සේගේ භාර්‍ය්‍යාවූ චන්ද්‍රාදෙවී සිතන්නී ඉතින් පිළිසරණෙක් නැත මාගේ සත්‍යක්‍රියා බලයෙන් ස්වාමිපුත්‍රයානන් වහන්සේ සවස්ථයක් කෙරෙමියි සිත සිතා දෙහොත් මුදුනෙහි තබා දසඇඟ වඩිමින් පර්ෂත් අතරතුරෙන් ඇවිත් සත්‍යක්‍රියා කළාය. ඒ අර්ථය ප්‍රකාශ කරන්නාවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ බුදුව වැඩහිඳ මේ ගාථාව වදාළසේක.

සබ්බස්මිං උපක්ඛටස්මිං-නිසින්නෙ චන්දියා යඤ්ඤත්ථාය
පඤ්චාල රාජධීතා-පඤ්ජලිකා සබ්බපරිස මනුපරියායි

තව්ද සත්‍යක්‍රියා කරන්නාවූ චන්ද්‍රා නම් බිසව් තොමෝ යම් සබවස කින් මේ ඛණ්ඩහාල නම් බ්‍රහ්මණයා ඒකාන්තයෙන් පව්වූ කම් කෙරෙද්ද, නුවණ නැත්තේද, ඔහු පාපිෂ්ට බවත් අඥාන බවත් සත්‍යද ඒ සත්‍යක්‍රියායෙන් මාගේ ස්වාමිපුත්‍රානන්වහන්සේ හා සමග එක්වෙමියි, තවද මේ සත්ත්ව ලෝකයෙහි යම් අමනුෂ්‍ය කෙණෙක් ඇද්ද, යම්බඳුවූ දෙව සඞ්ඛ්‍යාතවූ යක්ෂ කෙණෙක් ඇද්ද, අභිවෘද්ධියට පැමිණ සිටි සත්ත්ව සංඛ්‍යාතවූ යම් අමනුෂ්‍ය කෙණෙක් ඇද්ද, දූන් අභිවෘද්ධියට පැමිණෙන්නාවූ සත්ත්වකෙණෙක් ඇද්ද, ඔහු හැමදෙනම දූන් මට මෙහෙවර කෙරෙත්වයි, මාගේ ස්වාමිපුත්‍රයානන් වහන්සේ හා සමග දූන් මම එක්වෙම්වයි, තවද මෙතැනට ආවාවූ යම් දෙවතාවන් හා යක්ෂ රාක්ෂස භූත ප්‍රෙත පිසාචයන් හා අවශෙෂවූ සත්ත්ව කෙණෙක් ඇත්නම් සියලු සත්ත්වයෙනි! තොපට මම කියමි, මාගේ බස් අසව, මම පිහිටක් සොයමි, අනාථ අසරණයෙමි, මා රැකගණිව්, මම තොපට ආරාධනා කෙරෙමි, මාගේ ස්වාමීහු කෙරෙන් මම නොපිරිහෙම්වයි තොප හැමදෙනාගේ ආඥයෙන් හා බලයෙන් මහිමයෙන් මාගේ ස්වාමිපුත්‍රයානන් වහන්සේ මරා පියා නොදී ගලවා හැරපියව’යි මෙසේ සත්‍යක්‍රියා කොට දෙවතොපඞ්ඩානය කළහ. එකල්හි ශක්‍රදෙවෙන්ද්‍රයෝ ඒ චන්ද්‍රා දෙවීන් මෙසේ අනෙකප්‍රකාරයෙන් අඬන්නාවූ අඩ අසා එපවත් දූන ගිනිගෙණ දිලියෙන්නාවූ යකුලක් ඇරගෙණ ගොස් රජ්ජුරුවන් නැති ගන්වා චන්ද්‍ර කුමාරයන් ප්‍රධාන කොට ඇති සියලු සත්ත්වයන් බන්ධනයෙන් මුදවා මරණයෙන් ගැලවූහ.

එහෙයින් වදාළහ, බුදුහු-

‘‘තං සුත්වා අමනුස්සො අයකූටං පරිබ්භමෙත්වා භයමස්ස ජනයන්තො රාජානං ඉදමබ්‍රවි’’යි

තවද ශක්‍රදෙවෙන්ද්‍රයෝ රජ්ජුරුවන්ට කියන්නාහු රාජ මූග්ධය! රාජ කණ්හය! දූන් මූකලී දූනෙන කාරණා සලකා මම තාගේ හිස්මුදුන මේ ගිනි ගෙණ දිලියෙන යකුලින් යම්තාක්කල් තලා නොබිඳිම් නම් ඊට පළමුකොට නිරාපරාධවූ සිංහ සමානවූ සෞර වීර්‍ය ඇති තාගේ ප්‍රධාන පුත්‍රයා නොමරා යුහුව හැරපියව, තවද රාජමූග්ධය, ස්වර්ගලොකොත්පත්තිය කැමැත්තවුන් විසින් නිරපරාධවූ සිටුවරුන් හා දූදරුවන් හා භාර්‍යාවෝ යාග නිසා මරණු ලබන්නාහු තා විසින් කොහිදී කවර කලෙක දක්නා ලද්දාහුදූයි මෙසේ ශක්‍ර දෙවෙන්ද්‍රයෝ රජ්ජුරුවන්ට අක්‍රොශ පරිභව බැණ අනෙකප්‍රකාරයෙන් භය ගැන්වූහ. එකල්හි ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ උක්තප්‍රකාර බස් අසා ඒ පාපීවූ එකරාජ රජ්ජුරුවන් හා ඛණ්ඩහාල බ්‍රාහ්මණයාද යන දෙදෙන මේ අදෘෂ්ට පූර්වවූ ශක්‍රදෙවෙන්ද්‍රයන් දූක තුමූ දෙදෙන නිෂ්පාපීන් මෙන් බන්ධන ගතවූ සියලු සත්ත්වයන් එකෙණෙහිම බන්ධනයෙන් මිදූහ.

මෙසේ හස්ති අශ්වාදීවූ සියලු සත්වයන් බන්ධනයෙන් මිදූ කල්හි එදවස් ඒ යාගාස්ථානයෙහි යම් පමණ මනුෂ්‍ය කෙණෙක් රැස්වූ නම් ඒ සියලු මනුෂ්‍ය යෝම එකපැහැර ඔල්වරහඬ ගයමින් කොලාහල කෙරෙමින් ඛණ්ඩහාල බ්‍රහ්මණයාට මෙම වධයයි එකී එකී කැටක් ගසා එතැන්හිම මරා ජීවිත ක්‍ෂයට පැමිණවූහ. මෙසේ මහජනයා ඒ ඛණ්ඩහාල බ්‍රාහ්මණයා මරා

රජ්ජුරුවන් මරන්නට පටන්ගත් කල්හි මහබෝසතාණෝ පියාණන් වැලඳ ගෙණ මැරිය නුදුන්නාහ. මහජනයෝ කියන්නාහු මේ පවිටු වූ රජ්ජුරුවන් වහන්සේට ජීවිතදානය පමණක් නුඹවහන්සේ නිසා දෙම්හ. රාජ්ජයත් නොදෙම්හ, මේ නුවර විසිය නොදෙම්හ, චණ්ඩාලකොට පිටිනුවර වසම්හයි කියා රාජවේසය හරවා කසාකඩක් හඳවා කසාරෙද්දකින් හිස වෙලා චණ්ඩාල කොට චණ්ඩාල ග්‍රාමයෙහි ලැවූහ, (අකුසල් කොට සවගී ලොකයෙහි උපදින්නට නොපිළිවන් බැවින් යම් පමණ සත්ත්ව කෙණෙක් ඒ පශුඝාත යාගය කොළෝ නම් කරවූ නම් අනුමෝදන්වූ නම් ඒ සියලු සත්ත්වයෝම අවීචි මහ නිරය ආදීවූ සතර අපායෙහි උපදනාහුය) තවද මෙසේ සියලු ජනයා බන්ධනයෙන් මිදී සතුටු වූ කල්හි එතනට රැස්වූ මහජනයෝ අමාත්‍ය මණ්ඩලයා හා සමග කථාකොට ඒ කලකණ්ණි වූ ඛණ්ඩහාල බ්‍රහ්මණයා හා රජ්ජුරුවන් හා දෙදෙනාම දුරුකොට චන්ද්‍ර කුමාර නම්වූ මහබෝසතාණන්ට අභිෂෙක කොට රාජ්ජ්‍යයෙහි පිහිටුවම්හයි කියා රාජ්‍යාභිෂෙකයට සුදුසුවූ උපකරණ හා සමාන වූ උතුම්වූ ප්‍රාසාදයේ මතුමහල් තෙලෙහි ශ්‍රීයහන් මස්තකයේ හිඳුවා රාජ්ජ්‍යයෙහි පිහිටුවූහ. මෙසේ මහබෝසතාණන් රාජ්‍යයෙහි පිහිටවූ කල්හි එතැනට රැස්වූ රාජ පර්ෂත් හා රාජ්‍යකන්‍යාවෝත් දිව්‍යපර්ෂත් හා දිව්‍යාඞ්ගනාවෝත් වෙන වෙනම සතුටුව අභිෂෙක ජය වත්කරන්නාවූ සවණී සඞ්ඛය රජත සඞ්ඛය ශ්වෙත සඞ්ඛයයි කියනලද ත්‍රිවිධවූ සඞ්ඛයන් රාජ පර්ෂත් හා රාජ කන්‍යාවෝ අභිෂෙක ජලය වත්කළහ. දෙදෙව්ලොව දෙවියන්ට අධිපති ශක්‍රදෙවේන්ද්‍රයෝ විජයුත්තර සඞ්ඛය ගෙණ දිව්‍ය පර්ෂත් හා සමග අභිෂෙක ජලය වත්කළහ, ඒ ශක්‍රදෙවේන්ද්‍රයන්ගේ අග්‍රමහෙසිකා වූ සුජාතා නම් දිව්‍යාඞ්ගනා තොමෝ කකුටපාදිනී නම් දිව්‍යාංගනාව හා සමග අභිෂෙක ජලය වත්කළාය. තවද ඒ මහබෝසතාණන්ගේ අභිෂෙක මංගල්‍යයෙහි රක්ත නීල ශ්වෙතාදිවූ පැහැ ඇති වස්ත්‍රයෙන් ධජ නංවා ආකාශයට උතුරු සළු දමා නටවමින් විශෙෂයෙන් සන්තුෂ්ටව අපගේ චන්ද්‍රකුමාරයන් වහන්සේ බන්ධනයෙන් යම්සේ මිදුනසේක්ද, එපරිද්දෙන්ම සියලු සත්ත්වයෝත් අන්දු බන්ධන සඞ්ඛලික බන්ධනාදීයෙන් මිදෙත්වයි කියා කුල්මත්ව හඬගසා මහජනයෝ නුවර සන්තොෂ හෙරිනාද පැවැත්වූහ.

එසේ හෙයින් වදාළහ බුදුහු:-

සබ්බෙසු විප්පමුත්තෙසු-බහු ආනන්දිතො අහු
සුතන්දිප්පවෙසි නගරෙ-බන්ධන මොක්ඛො අහොසිති

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ පියාණන්ට වැටුප් වියදම් තබා දුන්හ. නුවර වැස්සෝ වූකලී උන් චණ්ඩාල ග්‍රාමයෙහි ලූ බැවින් ඇතුළු නුවරට වැද්ද නොදෙති. වැටුප් වියදම් නිමා ගිය විට මහබෝසතාණන් උයන්කෙළි ආදියට නික්මුණු කල්හි මහබෝසතාණන් කරා ගොස් මම නුඹ වහන්සේගේ පියාණෝයයි නොකියා දෙහොත් මුදුනෙහි වැඳ ස්වාමීනි! බොහෝ කලක් ජීවත්වුව මැනවැයි කියති, කුමකින් ප්‍රයෝජනදැයි විචාළ කල බත්පිළි ආදිය නැති නියාව කියති, එකල මහබොසතාණෝ ඒ සැඬොල්වූ පියරජ්ජුරුවන්ට වැටුප් වියදම දෙන්නාහ. මෙසේ ඒ මහබෝසතාණෝ

දශරාජධර්මයන් අකොප්‍ය කොට රාජ්‍යය කෙරෙමින් ජීවිතාන්තයෙහි සහ පිරිවරින් ගොස් දිව්‍යලෝකයෙහි උපන්නාහ, ශාස්තෲවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි! දැන් මතු නොවෙයි, පෙරත් මේ දෙවදත්ත ස්ථවිරයෝ තති මා නිසා බොහෝ දෙනා මරන්නට උත්සාහ කළෝ වේදැයි වදාරා පූර්වාපරසන්ධි ගලපා මේ ඛණ්ඩහාල ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ඛණ්ඩහාල බ්‍රාහ්මණයා නම් දැන් මේ දෙවදත්ත ස්ථවිරය, ගෞතම දේවී නම් මහාමායා දේවීය, චන්ද්‍රාදේවීනම් නම් බිම්බා දේවීය, වාසුල කුමාරයෝ නම් රාහුල කුමාරයෝය, සෙල කුමාරී නම් උත්පලවර්ණ මහා ස්ථවිරීය, වාමංගෝත්‍රවූ ශූරකුමාරයෝ නම් මහාකාශ්‍යප ස්ථවිරයෝය, භද්‍රසෙන කුමාරයෝ නම් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයෝය, සූයයීකුමාරයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, එසමයෙහි චන්ද්‍රාරජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ රජවූ මම්ම වෙම්දැයි තමන්ගහන්සේ දක්වා වදාළසේක.

531
මහානාරද කාශ්‍යප ජාතකය

තවද එක් සමයෙක්හි ත්‍රිභුවන වන්දනීයවූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ රජගහනුවර නිසා ලට්ඨිවනෝද්‍යානයෙහි වසනසේක් උරුවෙල කාශ්‍යප දමනය අරභයා මේ ජාතකය වදාළසේක.

යම් සමයෙක්හි ශාස්තෲවූ බුදුරජාණන්වහන්සේ පවත්වනලද දම්සක් පැවතුත් සූත්‍රදේශනා ඇතිසේක් උරුවේල කාශ්‍යපාදී තුන්බෑ ජටිලයන් දහසක්දෙනා විසින් පිරිවරණලදුව ලට්ඨිවනෝද්‍යානයට වැඩිසේක්ද, එසමයෙහි ඒක්ෂණයෙහි විසිදහසක් පමණ බ්‍රාහ්මණ ගෘහපතීන් හා සමග අවුත් දශබලධාරීවූ බුදුරජාණන්වහන්සේට නමස්කාර කොට උන්නාවූ මගධෛශ්වරවූ බිම්සර රජ්ජුරුවන්ගේ පර්ෂද් අතරෙහි බ්‍රාහ්මණ ගෘහපතීන්ට සාංකාවෙක් උපදනේ කිමෙක්ද? උරුවෙල කාශ්‍යපයෝ ශ්‍රමණ භවත් ගෞතමයන් සමීපයෙහි බඹසරවස් රකිද්දෝ හෝ නොහොත් ශ්‍රමණ භවත් ගෞතමයෝ උරුවෙල කාශ්‍යපයන් සමීපයෙහි බඹසරවත් රකිද්දෝහෝයි මෙසේවූ සැකයෙක් උපන. එකල්හි භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්සේ උරුවෙල කාශ්‍යපයන් මා සමීපයෙහි මහණවූ නියාව ප්‍රකාශ කෙරමියි සිතා එපවත් වදාරණසේක් කෘශවූ ශරීර ඇති තාපසවරුන්ට අවවාද දෙන්නාවූ උරුවෙල් දනව් වැසිවූ කාශ්‍යපය, කවර අරමුණක් දැක ගිනිදෙවියාට කරන්නාවූ පූජාව ඇරපුද? මේ කාරණය තා අතින් විචාරමි. කියව තාගේ වහ්නි පූජාව කුමකැයි දුරුකරණ ලදදැයි උරුවෙල කාශ්‍යප ස්ථවිරයන්වහන්සේ අතින් විචාළ සේක. එකල්හි තෙරුන්වහන්සේන් බුදුරජාණන්වහන්සේගේ අභිප්‍රාය දැන

ගිනිදෙවියාට කරණලද පූජාව හල නියාව වදාරණසේක් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍යයයි කියනලද පඤ්චකාමයන්ද නැවත මේ පඤ්චකාමයට වස්තුවූ ස්ත්‍රීන්ද යාග කාරක බ්‍රාහ්මණයෝ යාගයයි කියති. ස්කන්ධොපධි ක්ලෙශොපධි ආදීන් කෙරෙහිද උක්තප්‍රකාරවූ මේ සියල්ල ස්වාමීනි, කිළුටෙකැයි දැන යම් කාරණයකින් වෙසෙම්ද? ඒ කාරණයෙක දුතයෙහිත් නොඇලිනිම්. යාගයෙහිත් නොඇලිනිම්යි මෙසේ කියා තමන් වහන්සේගේ ශ්‍රාවක බව ප්‍රකාශකරණ පිණිස සර්වඥයන් වහන්සේගේ පතුල්පිට හිස තබා ස්වාමීනි තුඹවහන්සේ මට ශාස්තෘසේක. මම තුඹවහන්සේගේ ශ්‍රාවකයෙම් කියා එක්තලෙක දෙතලෙක තුන්තලෙකැයි යනාදීන් සත්තලක් පමණ සත්විටෙක ආකාශයට පැනනැගී බැස බුදුරජාතන් වහන්සේට නමස්කාර කොට එකත්පස්ව උන්සේක. ඒ ප්‍රාතිහාර්‍ය්‍ය දැක මහජනයෝ කියන්නාහු සර්වඥයන්වහන්සේ නම් ඉතා මහත්වූ ආනුභාව ඇතිසේක මෙසේ බල ප්‍රාප්තිවූ දෘෂ්ටි ඇති මා නොරෙහිමුත් අනිත්කෙණෙකුන් කෙරෙහි රහත් ගුණ ගුණයෙක් නැතැයි මෙසේ රහත්කම් තමා කෙරෙහිම තබා දක්නාවූ උරුවෙල කාශ්‍යපයෝ පවා දෘෂ්ටි ජාලා බිඳ සර්වඥයන්වහන්සේ විසින් දමනයෙහි ලන ලද්දෝවේදැයි බුදුරජාතන් වහන්සේගේ ගුණ කිය කියාම උන්හ. එකල්හි සර්වඥයන්වහන්සේ ඒ පර්ෂදට ආමන්ත්‍රණය කොට එම්බා සත්වයෙනි, දැන් සර්වඥබවට පැමිණියාවූ මා විසින් මොහු දමනයෙහිලීම ආශ්චර්‍ය්‍ය නොවන්නේය. පෙර රාග ද්වෙෂාදීවූ ක්ලෙශයන්ගෙන් උත්සන්න කාලයෙහිත් මම නාරද නම් බ්‍රාහ්මණව ඉපිද මොහුගේ දෘෂ්ටිජාලය බිඳ සන්තාන ගතවූ ක්ලෙශ නමැති විෂ විනාශ කොළෙම්වේදැයිවදාරා මුවෙන් නොබැණ වැඩ උන් කල්හි ඒ පර්ෂත් විසින් ස්වාමීනි, දැන් මේ උරුවෙල කාශ්‍යපයන්ගේ දෘෂ්ටි ජාලය බිඳ දමනයෙහි ලූ නියාව අප සියල්ලවුන්ටම ප්‍රකාශය, අතීතයෙහි සරාගී කාලයෙහි නාරද නම් බ්‍රාහ්මණව මූන්ගේ දෘෂ්ජාලය බිඳ දමනයෙහි ලූ නියාව අන්‍ය භවයෙන් පිළිසන් හෙයින් අප හැමට ප්‍රකාශව නොදනෙයි. එය ප්‍රකාශකොට වදාළහොත් යෙහෙකැයි ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේ ද? යත්

යිටගිය දවස විදෙහරට මියුලු නුවර අංගාති නම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරන්නෙහිය. ඒ රජ්ජුරුවෝ ධාර්මිෂ්ඨය, දශරාජධර්මයෙන් අකොප්‍යකොට රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවන්ගේ රුජාතම් දියනි කෙණෙක් වූහ. ඒ කුමාරිකා විශිෂ්ඨවූ රූ ඇත්තීය. දුටුදුටුවන්ට ප්‍රසාද එළවන්නීය. කප්ලක්ෂයක් මුළුල්ලෙහි පතනලද ප්‍රාර්ථනා ඇත්තීය. මහ කුසල් ඇත්තුය, මෙබඳු කුමාරිකා තොමෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් කිසවුන් කුස පිළිසිඳගෙණ දසඑකඩමසකින් මව්කුසින් බිහිව වැඩිවිය පැමිණ නුවණැතිවූවාය, ඒ රජ්රුවන්ගේ අවශෙෂවූ සොළොස් දහසක් පමණ පුරඟනාවෝ වඳවූහ, එසේහෙයින් ඒ කුමාරිකා තොමෝ රජ්ජුරුවන්ට ඉතා ප්‍රියවන්නීය, සිත්කළුය, මනවඩන්නීය, ඒ අඞගාති නම් රජ්ජුරුවෝ කුමාරිකාවන්ට නොයෙක්සුවද මල් පිරූ මල් කරඬු පස්විස්සක් හා කසී

කොසල දෙශයෙහි උපන්නාවූ සියුම් වූ වස්ත්‍රයත් පරිවාර ස්ත්‍රීන් අනාථ පාංචාදී මෙයින් තමන්ගේ තුනු සරහන්වයි කියා දවසක් පාසා යවත්නා, නිරන්තරයෙන් මගේ දියනියෝ දුගී මගී යාචකයන්ට කැමති පරිද්දෙන් සැපසේ දන් දෙවයි කියා දහසක් දහසක් වස්ත්‍ර යවත්නාහ. ඒ අඹගාති නම් රජ්ජුරුවන්ගේ වූකලී විජයය, සුමනය, අලාතය යන අමාත්‍යයෝ තුන්දෙනෙක් වූහ, ඒ රජ්ජුරුවෝ පිපි ඇඹුලමල් ඇති ඉල්මස මැදි පොහෝ දිනයෙහි උළෙලව උත්සව කෙළි පවත්නා කල්හි නුවරත් අන්තඃපුරයත් දිව්‍යපුරයක් මෙන් සැරහූ කල්හි සුවඳපැන් සොළොස් කළයකින් ඉස්සෝධා නහා සකල ශරීරයෙහි සුවඳ විලවුන් ගල්වා සර්වාභරණයෙන් සැරහී රාත්‍රි භොජනය මේ නිමවා හරණලද සිව්මැදුරු කවුළු ඇති ප්‍රාසාදයේ මතු මහල්තලයෙහි අමාත්‍ය සමූහයා විසින් පිරිවරණ ලදුව අභ්‍ර, මහික, ධූම, රජ, රාහුය යන පඤ්චොපක්ලෙශයෙන් විනිර්මුක්තවූ නිර්මලවූ ආකාශතලයට නැඟෙන්නාවූ චන්ද්‍රමණ්ඩලය දැක පින්වත්වූ අමාත්‍යයෙනි, චන්ද්‍රමරීචියෙන් පහවූ අන්ධකාර ඇති මේ රාත්‍රිය ඉතා සිත්කළුය, චන්ද්‍ර කාන්තියෙන් අපගතාන්ධකාරවූ නිර්දොෂවූ රාත්‍රිය ඉතා ප්‍රසාද එළවන්නීය, එසේහෙයින් අද මේ රාත්‍රියෙහි කවර රතියකින් සිත් අලවමෝදැයි අමාත්‍යයන් අතින් විචාළහ. ඒ රජ්ජුරුවන් විසින් විචාරණ ලද්දාවූ අමාත්‍යයෝ තුන්දෙනම තමන්ගේ අදහස් වූ පරිද්දෙන් කීහ.

ඉක්බිත්තෙන් ඒ තුන්දෙනා අතුරෙන් අලාත නම් සෙනෙවිරද්දු රජ්ජුරුවන්ට කියන්නෝ දේවයන්වහන්ස! නුඹවහන්සේට සඞ්ඛ්‍යා වශයෙන් බොහෝවූ හස්ති අශ්ව ගව මහිෂාදීවූ වාහන ඇතිසේක. සුවර්ණරජත මාණික්‍යාදීවූ අප්‍රමාණ ධනයෙන් යුක්තවූ සේක. එසේම ප්‍රමාණාතික්‍රාන්තවූ බලකාය ඇතිසේක. එසේහෙයින් තුටු පහටු සිත් ඇති හස්ත්‍යශ්වාදී වාහන ඇති මහ සෙනඟ හා සියළු සේනාව යුධයට සරසම්හ, අප්‍රමාණ බලකායෙන් යුක්තව සඞ්ග්‍රාමයට නික්මෙම්හ. මහරජ්ජුරුවන් වහන්ස, යම් සතුරුවූ කෙණෙක් නුඹවහන්සේගේ වසඟයට නොපැමිණියේ වී නම් නුඹවහන්සේගේ ආඥායෙහි නොපවතිත් නම් ඒ සියළු සතුරන් අප වසඟකරම්හ, යම් කෙණෙක් අප විසින් ජය නොගන්නා ලද්දෝවීනම් ඔවුන් යුධයෙන් ජය ගණුම්හ. මේ මාගේ අදහස වන්නේයයි කීහ. රජ්ජුරුවෝ ඒ අලාත නම් සෙනෙවිරදුන්ගේ බසට සතුටුවීමක්වත් වැලකීමක්වත් නොකළහ. රජ්ජුරුවෝ අලාතනම් සෙනෙවිරදුන්ගේ බසට සතුටුවීමෙක්වත් වැලකීමෙක්වත් නොකළ නියාව දැන මේ රජ්ජුරුවන්වහන්සේ යුධයෙහි අදහස්ඇතිකෙණෙකුන්වහන්සේ නොවෙති, එසේ හෙයින් මම මුන්වහන්සේ සිත් ගෙණ පඤ්චකාම ගුණයෙහි ඇල්ම ප්‍රකාශ කෙරෙමියි සිතා සුමන නම් සෙනෙවිරද්දු මෙසේ කීහ. මහරජ්ජුරුවන්වහන්ස, සියලු පසමිතුරෝ නුඹවහන්සේගේ වසඟයට පැමිණියාහ. පසල්දනව් වාසීන් යුධ නොකිරීමෙන් තබන ලද කඩු ඇත්තාහ. තවද පතිතවූ මානධජ ඇතිව නුඹවහන්සේට යටත්ව අනුව පවත්නාහ. අද වූකලී උතුම්වූ මඟුල් දවසෙක. මෙසේවූ උත්සව දිනයෙහි යුධධ්‍යාසයෙක් මට අභිප්‍රාය නොවන්නේය. එසේ හෙයින් මහරජ්ජුරුවන්වහන්ස, මනොඥවූ රසමසවුලෙන් යුක්තවූ ආහාර හා අනෙකප්‍රකාරවූ පානවර්ගී හා අනෙක වර්ගයෙහිවූ කනදෑ නුඹවහන්සේට යුහුව එළඹවා ඒ උතුම්වූ ආහාර පානවර්ග අනුභවකොට පඤ්චකාමයට

හෙතුවූ නැටීම් ගීකීම් සිත්කළුවූ බෙරවැයීම් ආදියෙහි සිත් ඇලවූව මැනව, මේ මාගේ අභිප්‍රායයි කීවුය. රජ්ජුරුවෝ සුමන නම් සෙනෙවිරදුන්ගේ බසටත් සතුටුවීමක්වත් වැලකීමක්වත් නොකළාහ ඉක්බිත්තෙන් විජය නම් සෙනෙවිරද්දු සිතන්නෝ මේ රජ්ජුරුවන්වහන්සේ මොවුන් දෙදෙනාගේ බස් අසා මුවෙන් නොබැණම සිටිසේක. නුවණැත්තෝ නම් බස් ඇසීමෙහි ලොල්වන්නාහ. එසේහෙයින් මුන්වහන්සේට ධර්මශ්‍රවණය වර්ණනා කෙරෙමියි සිතා මහරජ්ජුරුවන් වහන්ස, සියලු රූපාදී පඤ්ච කාමයෙන් සතුටු කරවන්නට ඒ කාමය දුර්ලභ නොවන්නේය කාමය නම් හැම කල්හිම ලැබෙන දෙයෙක. එසේහෙයින් මේ පඤ්චකාමයෙන් සතුටුවීම මා සිත් නොවද්දී. බොහෝ ඇසූ පිරූ තැන් ඇති පාලි අර්ථ හා පාලිධර්මය දන්නාවූ යම් කෙණෙකුන්වහන්සේ අපට අද උපන් සැක දුරුකෙරෙත්නම් සමිත පාපිවූ එබඳු ශ්‍රමණකෙණෙකුන් කරා හෝ බාහිත පාපිවූ එබඳු බ්‍රාහ්මණ කෙණෙකුන් කරා හෝ එළඹෙම්හයි කීවුය; මෙසේ විජය නම් අමාත්‍යයාගේ බස් අසා අඞ්ගාති නම් රජ්ජුරුවෝ කියන්නෝ මේ විජය නම් අමාත්‍යයෝ ගම්බඳුවූ කාරණයක් කියා නම් එම කාරණය මටත් අභිප්‍රාය වන්නේයයි කීහ. බොහෝ ඇසූ පිරූ තැන් ඇති පාලිඅර්ථ හා පාලිධර්මය දන්නාවූ ඍෂිකෙනෙක් අද පටන් උපන් සැක දුරුකෙරෙත් නම් සමිත පාපිවූ එබඳු ශ්‍රමණක්හු කරා හෝ බාහිත පාපිවූ බ්‍රාහ්මණයක්හු කරා හෝ එළඹෙම්හ. මේ සභායෙහි ඉන්නාවූ තෙපි හැමදෙන එක්ව සිතා කාරණයක් කියා බලව්, කවර ප්‍රාඥයක්හු කරා එළඹෙමෝද, අර්ථ ධර්ම දන්නාවූ කවර ඍෂිකෙණෙක් අද අපට උපන් සැක දුරුකෙරේදැයි කීහ, වැදූරට වාසීවූ අඞ්ගාති නම් රජ්ජුරුවන්ගේ මේ වූතතප්‍රකාර වචනය අසා අලාත නම් සෙනෙවිරද්දු කියන්නෝ මහරජ්ජුරුවන්වහන්ස, මේ මෘගදාය නම් උද්‍යානයෙහි නිර්වීකරණයෙහි ප්‍රසිඬවූ නිගණ්ඨාජීවකයෙක් ඇත. කාශ්‍යප ගොත්‍රයෙහි උපන්නාවූ ඒ ගුණ නම් ආජීවක තෙමේ බහුශ්‍රැතය, මධුරි කථා ඇත්තේය. ගණාචාර්‍ය්‍යය. එසේහෙයින් මහරජ්ජුරුවන්වහන්ස, ඒ නිගණ්ඨජීවකයා කරා එළඹෙම්හ. ඒ ආජීවකතෙමේ අපගේ සැක දුරුකරන්නේයයි ඒ අලාත නම් සෙනෙවිරද්දු තමාගේ කුලූපගවූ ඒ ගුණ නම් ආජීවකයා රාජෝද්‍යානයෙහි වසන්නේය, මොහු දූත් රාජකුලූපග කෙරෙමියි සිතා රජ්ජුරුවන්ට මෙපවත් කීවුය.

එකල්හි අලාත නම් සෙනෙවිරදුන්ගේ බස් අසා අඞ්ගාති නම් රජ්ජුරුවෝ රථාචාර්‍ය්‍යාට නියෝග කරන්නාහු රථාචාර්‍ය්‍යය, මිගදාය නම්වූ උයනට යනු කැමත්තම්හ. එසේහෙයින් අජානීය සෙන්ධවයන් යොදන ලද උතුම්වූ රථයක් මේ රාජාඞ්ගනයෙහි ගෙණනැර තබවයි නියොගකළහ. මෙසේ අඞ්ගාති රජ්ජුරුවෝ පසළොස්වක් මැදිපොහෝ දවස් ප්‍රථමයාමයෙහි පිපි කුමුදු මල් ඇති වර්‍ෂා සාරමස් පශ්චිම දිනයවූ ඉල්මස මැදි පොහෝ දවස් අමාත්‍යයන් සන්ථාගාරශාලාවට රැස්කරවා නුවණැත්තාවූ ශ්‍රවණධාරණයෙන් සමෘද්ධවූ සමිත පූර්වාඞ්ගමවූ කථා රස ඇති සථානොචිත ප්‍රඥා ඇති විජයය, සුමනය, අලාතය යන මේ අමාත්‍යයන් අතරෙන් එකී එකී අමාත්‍යයක්හු අතින් පිය කථා ශ්‍රවණයෙහි අභිප්‍රායෙන් වෙන වෙනම විචාරන්නා තොප හැමදෙනාගේ අභිප්‍රාවන් වෙන වෙනම මට කියව්. අද

පිපි ඇඹුලමල් ඇති ඉල්මස මැදිපොහෝ දවසය, ශුක්ලපක්ෂ නිශ්‍රිතවූ චන්ද්‍රයාත් තැංගේය. එසේහෙයින් රාත්‍ර්‍යන්ධකාරයත් ඒ චන්ද්‍රයා විසින් නසන ලද්දේය. මෙබඳුවූ අද මේ රාත්‍රියෙහි මේ හෙමන්ත ඍතුයේ කවර ඇල්මකින් යුක්තව වසමෝද්‍දයි විචාළහ. එබස් අසා අලාතසේනාධිපතීහු කියත්තෝ දේවයන්වහන්ස සේනාව සන්නද්ධකොට යුද්ධකිරීමෙන් සියලු සතුරන් ජයගණුම්හයි කීහ. සුමන සෙනෙවිරද්දු කියන්නෝ රජ්ජුරුවන් වහන්ස, රසමසවුලෙන් යුක්තවූ ආහාර පාන වගී අනුභවකොට පඤ්ච කාමය අනුභව කරම්හයි කිවූය. විජය නම් සෙනෙවිරද්දු කියන්නෝ බහුශ්‍රැත ඍෂිකෙණෙකුන් සමීපයට ගොස් අප සිතට උපන් සැකදුරු කරම්හයි කිවූය. ඒ විජය නම් සෙනෙවිරදුන්ගේ බස් අසා මුවන් තොපි කීවාම අභිප්‍රායවන්නේය. ඍෂිකෙණෙකුන් දක අප සිතට උපන් සැක අඬගාති නම් රජ්ජුරුවෝ කීහ.

එබස් අසා අලාත නම් සෙනෙවිරද්දු ගුණ නම් ආජීවකයාගේ ගුණ කිවූය. එකල්හි රජ්ජුරුවෝ එසේවීනම් ගුණ නම් ආජීවකයා දක්නා පිණිස මිගදායට යනු සඳහා රථයාතාවක් සරහාගෙණ එවයි මෙසේ යට කියනලද පරිදි විධාන කළහ. එකල්හි දළම්යවූ කොතුරු පේකඩ ඇති රිදීමයවූ වෙහෙරිපත් ඇති පිරිසිදුවූ මටසිලුටුවූ රථ පිරිවරකොට ඇති ධවල බැවින් රාත්‍රියෙහි චන්ද්‍රයා වැනිවූ රථයක් ඒ අඬගාති නම් රජ්ජුරුවන්ට යොදා අතිලවිය පවත් හා සමානවූ ජවඇති මනාව හික්මුනාවූ කරබැඳි රන් මාලා ඇති තලමල් වැනිවූ පැහැ ඇති සෙන්ධවජාතියෙහි උපන්නාවූ අශ්වයෝ සතරදෙනෙක් ඒ රථයෙහි ගෙණ යොදන ලද්දාහුය. තවද ඒ රථයෙහි නගනලද ඡත්‍රයත් ධවලය, රථයතෙමේත් ධවලය, රථයෙහි යොදනලද අශ්වයෝත් ධවලයහ, හිඳ සලන්නාවූ වල්විදුනාක් ධවලයහ. වැදූරට වාසිවූ ඒ අඬගාති නම් රජ්ජුරුවෝ අමාත්‍යමණ්ඩලයා හා සමග අලඞ්කෘතවූ මෙබඳුවූ රථයේහිඳ යන්නාවූ අහස ගමන්ගන්න පුන්සඳක්මෙන් එදවස් වෙසෙසින් හෙබියහ. එසේවූ බොහෝවූ පතුළු අක් බඳුවූ අග් ඇති කඩුගත්තාවූ ශක්ති සම්පන්නවූ අපූන් තැංගාවූ ප්‍රාඥවූ යොධපුරුෂයෝ ඒ රාජේන්ද්‍රවූ අඬගාති නම් රජ්ජුරුවන් අනුව සම්මැටගෙණ ගියහ. එකල්හි ඒ රජ්ජුරුවෝ ඇසිල්ලකින්ම මෘගදාය නම්වූ උද්‍යානයට ගොස් නැගී ගිය රථයානයෙන් බිමටබැස පයින්ම ගුණ නම් ආජීවකයා සමීපයට අමාත්‍යයන් හා සමග එළඹියහ, ඒ මුවදෙව් නම් උයන්හි පළඹුව ගොස් ඔහු හා කථා කෙරෙමින් උන්නාවූ බ්‍රාහ්මණ ගෘහපතීන් හා යම් රාජකුමාර කෙණෙක්වූ නම් ඔහු හැමදෙන රජ්ජුරුවන්ගේ සේවකයන් විසින් උත්සාරණය කොට දුරුවව, හුනස්නෙන් නැගෙව්, යනාදීන් අවකාශ නොකරණලද ඒ උද්‍යාන භූමියට මහත්වූ පෙළහරින් ආ රජ්ජුරුවෝ ඒ බ්‍රාහ්මණ ගෘහපතීන් දක අප පසුව ආ හෙයින් අපගේම දෝෂවේද, එසේ හෙයින් තෙපි හැමදෙන නොසෙල්වී හුනස්නේම හිඳුවයි අවසර දුන්හ. මෙසේ ඒ අඬගාති නම් රජ්රුවෝ නොයෙක් දෙනාගෙන් ව්‍යතිමිශ්‍ර වූ පෂිදින් පිරිවරණ ලදුව පිළිසඳර කථාකරවනු පිණිස එකත්පස්ව උන්හ.

ඒ කෙසේ ද? යත්,

ඒ උයනට ගිය ඉක්බිත්තෙන් අඞ්ගාති නම් රජ්ජුරුවෝ මොලොක්වූ විසිතුරු ඇතිරි අතුළ සුවඵස්පහස්ඇති වස්ත්‍රාභරණ අතුළ මොලොක්වූ බිස්සෙහි ආජීවකයාහට එකත්පස්ව උන්හ. රජ්ජුරුවෝ මෙසේ විසිතුරුවූ සම්බිස්ස මත්තේ හිඳ සතුටුවියයුතු කථාකළහ. ඒ ප්‍රියකථාවකොට උන් ඉක්බිති සිහි කටයුතුවූ සුවදුක් කථාකරන්නාහු වහන්ස, කිමෙක්ද? තුඹගේ ශරීරය සතර පසයෙන් පෙළෙන්නේද? ශරීරයෙහි වාතයන්ගේ විෂමත්වයෙක් නැද්ද? ඒ ඒ ස්ථානයෙහි මූළු මූළුව සිට වාතයෝ තුඹගේ ශරීරය නොපෙළාද? කිමෙක්ද? තුඹගේ ජීවිකාවෘත්තිය නිදුකින් වේද? යැපෙන පමණ ආහාර ලැබේද? ඉරියවු පෙළෙන බලවත්වූ රොගයෙක් නැද්ද? තුඹගේ ඇස් නො පිරිහිණිදැයි රජ්ජුරුවෝ මෙසේ සුවදුක් විචාළහ. ඉක්බිත්තෙන් ගුණ නම් ආජීවකයා රජ්ජුරුවන් හා සමග කථාකරන්නේ මහරජ්ජුරුවෙනි, එසේය මාගේ ශරීරය සතරපසයෙන් නොපෙළෙන්නේය. වාතයන්ගේ විෂම වෙළීමක් නැත්තේය. නිදුක්වූ ජීවිකාවෘත්තිය ඇත්තෙමි· කෙණෙසි අහරින් යැපෙමි. විෂම පෙළෙන වාත කෙණෙකුත් නැත. ජීවිකාවෘත්තියත් නිදු කින්ම වන්නේය. යැපෙන පමණ ආහාරත් ලැබෙයි, ඉරියවු පෙළෙන රොගයකුත් නැත, චක්ෂුරාදීවූ ඉන්ද්‍රියයෝත් නොපිරිහුණහයි මෙසේ ඒ ගුණ නම් ආජීවක තෙමේ ආචාර විනයෙහි ඇලුම් ඇත්තාවූ ඒ අඞ්ගාති නම් රජ්ජුරුවන් සමග ප්‍රියකථායෙන් සතුටුව නැවත පිළිසඳර කථාකරන්නේ වැදූරට වාසීවූ අඞ්ගාති නම් රජ්ජුරුවෙනි තොප තින් විචාරමි, කිමෙක්ද? පසල්දනව් වාසීහු තොප මැඩ නොපවත්වද්ද? තොපගේ යෙදිය යුතුවූ ගව මහිෂාදීන්ට රොග නැද්ද? හස්ත්‍යශ්වාදීවූ වාහනයෝ උසුලද්ද? කිමෙක්ද? තොපගේ ශරීරයට පීඩාකරන්නාවූ බලවත්වූ ව්‍යාධියෙක් නැද්දැයි විචාළේය. එකල්හි කුශලධම්යන් කැමැත්තාවූ රාජෝත්තමවූ ඒ අඞ්ගාති නම් රජ් ජුරුවෝ ගුණ නම් ආජීවකයා විසින් නැවත පිළිසඳර කථාකරණ ලද්දේ ඊට අනතුරුව පෘලි අර්‍ථ හා ඓහලෞකික පරලෞකික අර්‍ථද, පාළිධම්ය හා දශකුශල ධර්‍මයද, කාරණා යුක්තියද, මේ මතු කියන පරිද්දෙන් විචාළහ. කාශ්‍යප ගොත්‍රයෙහි උපන්නාවූ ගුණාජීවකයෙනි, මේ ලෝකයෙහි සත්‍වයෝ දෙමව්පියන් කෙරෙහි කෙසේ දැහැමින් හැසිරෙද්ද? අනුශාසිකවූ ආචාර්‍යයන් කෙරෙහි කෙසේ දැහැමින් හැසිරෙද්ද? පුත්‍රදාරාවන් කෙරෙහි කෙසේ දැහැමින් හැසිරෙද්ද? ඥනවෘඬයන් තපොවෘඬයන් වයොවෘඬයන් කෙරෙහි කෙසේ දැහැමින් හැසිරෙද්ද? මහණ බමුණන් කෙරෙහි කෙසේ හැසිරෙද්ද? සේනාව කෙරෙහිකෙසේ දැහැමින් හැසිරෙද්ද?දනව්වාසීන් කෙරෙහි කෙසේ දැහැමින් හැසිරෙද්ද? මේ සියල්ලවුන් කෙරෙහි කෙසේ දැහැමින් හැසිර සත්‍වයෝ පරලෝ සඞ්ඛ්‍යාතවූ සුගතියට යෙද්ද? අධර්‍මසමාදානයෙහි පිහිටියාවූ සමහර සත්‍වකෙණෙක් නරකය හා අවශෙෂ අපායන්හි අධඃ ශීර්‍ෂව කෙසේ හෙද්ද මට මෙහෙයවූ පරිද්දෙන් කියා හගවයි කීහ. ලොව්තුරා බුදුන් පසේ බුදුන් බුදුසව්වන් මහබොධිසත්‍වයන් අතරෙන් පූර්‍වපූර්‍වවූ මහතුන් නුපන් කල්හි පශ්චිම පශ්චිමවූ මහතුන් අතින් විචාළයුතුවූ මහානුභාව සම්පන්නවූ මේ මේ ප්‍රශ්නය රජ්ජුරුවෝ කිසිවක් නොදන්නාවූ නග්නභාවය අනුභව කරන් නාවූ නිශ්‍රීකවූ කාලකණ්ණිවූ අඥනවූ සිත කිසිත් ගුණයක් නැත්තාවූ

තමින් ගුණ නම්වූ ආජීවකයා අතින් විචාළහ. මෙසේ රජ්ජුරුවන් විසින් විචාරණ ලද්දාවූ ප්‍රශ්නය ඒ ගුණ නම් පව්ටූ නිවටා ප්‍රස්තාවට සුදුසුවූ විසජ්ජනයක් නොකොට සමග තණ කන්නාවූ ගොනකු නොලු පිටින් ගසා ඉවත් කරන්නාවූ මෝල ගොනකු මෙන්ද, අනුභව කරන්නට පුරා එළවූ බත්තලියක කසළ ලන්නාක්හු මෙන්ද, අසව මහ රජ්ජුරුවෙනි, කියා අවකාශ කරවාගෙණ තමාගේ මිථ්‍යාවාදයට පටන්ගත්තේය.

ඒ කෙසේ ද? යත්,

වැදූරට වාසවූ අඞගාති නම් රජ්ජුරුවන්ගේ බස් අසා කාශ්‍යප ගොත්‍ර උපන්නාවූ ගුණ නම් ආජීවකයා මහරජ්ජුරුවෙනි, මාගේ සැබෑවූ අතුවජවූ කාරණය තත්වූ පරිද්දෙන් අසවයි කියා අවසරගෙණ කියන්නේ මහරජ්ජුරුවෙනි, කරණලද්දාවූ කලණවූ හෝ පව්ටුවූ හෝ කුශලාකුශල ධර්මයාගේ ඉෂ්ටානිෂ්ට විපාකයෙක් නැත, පරලොවකුත් නැත, ඒ පරලොව නැති හෙයින්ම පරලොවින් මෙලොවට ආයේ කවරේද? මෙලෝවට අා එකකුත් නැත, මහ රජ්ජුරුවෙනි! ස්ත්‍රී පුරුෂවූ මූතුන් මිත්තෝත් නැත' ඔවුන් නැති හෙයින් මව්පියෝ කොයින්ද අනුශාසකවූ ආචාර්‍ය්‍යවරයෝද නැත, ඔවුන් නැති හෙයින් අවවාද අනුශාසනායෙන් නොදමුනාවූ සත්ත්වයන් කවරෙක් දමනයෙහිලාද? මේ ලෝකයෙහි සත්ත්වයෝ විශෙෂයෙන්ම සමයහ. හීන මධ්‍යමෝත්කෘෂ්ට ය යන විභාගයෙක් නැත, එසේ හෙයින් කුලදෙටුවන් පුදන්නාහු නැත, බලයෙක්වත් වීර්‍ය්‍යයෙක්වත් සත්ත්වයන්ම නැත, එසේ හෙයින් උත්ථානවීර්‍ය්‍යයෙන් යුක්තවූ පුරුෂාකාරයෙක් කොයින්ද? එබඳු පුරුෂාකාරයෙක් නැතමය, නැවත අනුව යන්නාවූ ගැල්වන යම්සේද එපරිද්දෙන්ම සත්ත්වයෝ නියම් අනුව පවත්නාහ. අහරෙහි කුශලයෙක් පිරිසිඳුවීමක් නැතිව චතුරාශීතිකල්ප ප්‍රමාණවූ කාලයක්ම අනුව පවත්නාහ තවද මහරජ්ජුරුවෙනි, මේ ලොකවාසි සත්ත්වයා තමා විසින් ලද මනාවස්තුවම ලබන්නේය. එසේ ලැබෙන කල දනයෙහි විපාකයෙක් කොයින්ද දනයෙහි විපාකයෙක් නැත, දනයෙහි විපාකයෙක් නැති කල්හි දන්දෙන්නාවූ සත්ත්වතෙමේ තමා වසඟව දන් දෙන්නේ නොවෙයි, තමා ශක්තියෙනුත් දන් දෙන්නේ නොවෙයි, වැලි කුමක් නිසා දන් දේද යත්, දනඵල ඇතැයි යන බසින් දන් දෙන්නාවූ අන්ධබාල පාප ජනයන් දැක මෙහි දන විපාකයෙක් ඇද්දෝහෝයි සිතා දන් දෙන බවමුත් තෙමේ තමාට වසඟව තමාගේ ශක්තීන් අදහා දෙන්නේ නොවෙයි, අන්නපානාදිවූ දනය දියයුතුයයි පණවනලද නුවණැත්තවුන් විසින් පිළිගන්නාලද එසේහෙයින් තමා වසඟයෙහි නො වන්නාහු නුවණැත්තම්හයි මා නියාව සිතන්නාවූ සමහර අඥාන සත්ත්වකෙණෙක් පණ්ඩිතයන්ට දන්දෙන්නාහුය.

මෙසේ දනයෙහි නිෂ්ඵල බව වර්ණනාකොට පාපයෙහි නිෂ්ඵල බව වර්ණනා කරණ පිණිස කාරණා කියන්නේ මහරජ්ජුරුවෙනි! ශාස්වතවූ වක්‍ෂය මානවූ මේ සමූහයෝ සත්දෙනෙක ඔහු කවරහුද? ආපොධාතුවය, තෙජොධාතුවය, වායොධාතුය, පෘථිවිධාතුය, සුඛය, දුක්ඛය, ජීවය, යන සප්ත සමූහයෝ කිසිවක්හු විසින් ශස්ත්‍රාදීයෙන් නොකැපිය හැක්කාහ. මුද්ගරාදී කිසිවකින් කොපකොට තැළිය නොහැක්කාහ, මේ වුක්තප්‍රකාරවූ සත්ත්ව

සමූහයන් නසන්නෙක් නැද්ද, ඒ සත්ත්ව සමූහයන් නසන්නෙක්වත් දන් නෙක්වත් නැද්ද, නැවත යමෙක් නසනු ලැබේ නම් එබඳුවූ කිසිවෙක් නැද්ද, මෙබඳුවූ සත්ත්වසමූහයන්ගේ විනාශය පිණිස කිසිවෙක් ශස්ත්‍රාදියක් එසේ වී නම් ඒ ශස්ත්‍රයෝ සත්ත්ව සමූහයන්ගේ අතරෙන් ඉක්මයන්නාහ. පෘථිවිධාත්වාදී වුවවුත් තමන් තමන්ගේ විෂයට වන්කල්හි ගැසූ ශස්ත්‍රාදී ප්‍රහාරයන් සිස්ව ඉක්ම යන්නේය. යම් සත්ත්වයෙක් මෙරමාගේ ඉස අල්වාගෙණ තීක්ෂණවූ ඛඩ්ග පත්‍රයෙන් කපන්නේ වී නම් ඒ සත්ත්වයාට ඒ අකුශලයෙහි විපාකයෙක් කොයින්ද, පෘථිවිධාතුව පොළොවට වැදයන්නේය අපො ධාතුව ජලයට වැදයන්නේය. තෙජෝ ධාතුව වහ්නියට වැද යන් නේය. වායො ධාතුව පවනට වැද යන්නේය. සුඛය දුකඛය, ජීවය යන තුන්දෙන අහසට පැන නැගෙයි. එළවූ ශස්ත්‍රාදිය (ශරීරයට වැද්දනොදී) සිස්ව නැගී යන්නේය. එසේහෙයින් ශස්ත්‍රාදීන් කිසිවක්හට විනාශයක් නැත්තේයයි කියා මේ කාරණයෙන් අකුශලයෙහි විපාක නැතැයි ගණුව තවද මහරජ්ජුරුවෙනි, මේ සියලු සත්ත්වයෝ මේ පොළොව එකමස්විටක් කොටත් චතුරාශීති කල්ප ප්‍රමාණවූ මේතෙක්කල් මුළුල්ලෙහි සසර ඇවි දිනාහුම සසර දුකින් මිදෙන්නාහ. සංසාරය හැර සත්ත්වයන් ශුඞකරන්නට සමර්ථවූ අන්කිසිවෙක් නැත. හැමදෙනම ඒ සසරින් ශුඞවූ දුකින්මිදී නිවන් දක්නාහ, වුක්තප්‍රකාරවූ ඒ සුවාසූකල්පය අසම්ප්‍රාප්ත කල්හි සීලසංයම යෙන් යුක්තව පිරිසිදුවූ සිල් රක්කේ වී නමුත් අතරෙහි ශුඞවූ දුකින් නො මිදෙන්නේය. දනාදී වශයෙන් බොහෝවූ දශ කුශල ධර්මයෙහි හැසිරත් කියතලද මෙසුවාසූ කප අසම්පූර්ණ කල්හි සුඩව දුකින් නොමිදෙන්නේය, තවද ප්‍රාණාතිපාතාදී වශයෙන් බොහෝවූ දශ අකුශල ධර්මය කළත් ඒ චතුරාශීති මහා කල්පය ඉක්ම නොවන්නේය. මේ ලෝකවාසී සත්ත්වයෝ දනශීලාදී අනෙකප්‍රකාර කුශලධර්මයෙහි නියුක්තවූවාහු වීනමුත් සුවාසූකප සම්පූර්ණ නොවී නම් ඒ තාක්කල් ශුඞ නොපවත්නාහ. ජීවිතාන්තය දක්වා ප්‍රාණවධාදීවූ නොයෙක් අකුශල් කළත් නියමිතවූ ඒ කාලය ඉක්ම නො පැවත සුවාසූකල්පය සම්පූර්ණවූ තැනදීම ශුඞවන්නාහ. සුවාසූ කල්පයෙහිදී අපගේ සංසාරශුඞිය ක්‍රමයෙන්ම වන්නේය. ආදියෙහි පටන් ඒ කල්පාන්තය දක්වා අතරෙහි විච්ඡෙදයක් නොව මෙය පිළිවෙළින් වන්නේය. එපමණ කලක් ඉක්මුනු කලමුත් අතරෙහි ශුඞවූ සසරින් මිදී නිවන් දකිමෙක් නම් නොවන්නේය. වෙරළ ඉක්ම නොපවත්නාවූ සාගරයමෙන් චතුරාශීති මහා කල්පය ඉක්ම නොපවතුම්හ. එතැනදී ශුඞව සසරින් මිදී නිවන් දකුම්හයි කිය. මෙසේ ගුණ නම් ආජීවකයා සුවාසූ කපකින් ඔබ්බට නො යම්හයි ගත් බලවත් මිථ්‍යාදෘෂ්ටිය ඇති හෙයින් උච්ඡෙදවාදීවූයේ තමාගේ ශක්තියෙක් සවකීයවූ වාදය නිරවශෙෂකොට කිවුය.

එකල්හි කාශ්‍යප ගොත්‍රයෙහි උපන්නාවූ මේ ගුණ නම් පව්ටු නිවටාගේ උක්තප්‍රකාර මේ තෙපුල් අසා අලාත නම් සෙනාපතිතෙමේ කියන්නේ පින්වත්වූ ආජීවකයෙනි, තෙපි යම්ලෙසක් කිවුනම් මටත් එයම අභිප්‍රා වන්නේය. මමත් මා ඇවිදින්නාවූ පූර්‍වජාති සිහිකෙරෙමි. මම වූකලී පෙර දරුණුවූ ගෙරින් මරු ජීවත්වන්නාවූ පිඞ්ගල නම් එක් ඝාතවකයෙක් වීමි. එකල වස්ත්‍රාභරණ ධනධාන්‍යාදියෙන් පිරුණාවූ මේ බරණැස් නුවරදීම මා විසින් බොහෝ පව්කම් කරණ ලදහ. ඌරෝය, එළුවෝය යනාදී නොයෙක් ප්‍රාණීහු මා විසින් මරණ ලදහ. එසේ හෙයින් බොහෝ ප්‍රාණීන් මරු ජීවත්ව ජීවිතාන්තයෙහි බරණැස් නුවරින් චුතවූයෙම් මේ මියුලු නුවර ධනධාන්‍යයෙන් සමෘද්ධවූ සෙනෙවිරත් කුලයෙහි උපන්මි. ගිය ජාතියෙහි දරුණු පව්කම් කළාවූ මම යම්හෙයකින් නරකයට නොගියෙම්ද? එසේහෙයින් අකුශලයෙහි විපාක නැතැයි අදහමි කීය. ඒ අලාත නම් සේනාපතිතෙමේ කාශ්‍යප සර්‍වඥයන් වහන්සේගේ ධාතු පිහිටුවා කරණලද සණරත් දාගැබට අනොජා මල්දමකින් පූජාකොට මිය යන වේලෙහි තමාගේ පා පානුභාවය වූ පරිද්දෙන් අන්‍යවූ අකුශලකර්‍මයන් දමනලදුව සංසාර සාගරයෙහි ඇවිදිනේ එක් අකුශල කර්‍ම යක්හුගේ විපාකයෙන් ගොඝාතක කුලයෙහි ඉපද බොහෝවූ පව් කෙළේය. ඉක්බිත්තෙන් ඔහට මරණාසන්න කාලයෙහි අළුයෙන් සැඟවී තුබූ ගිනිපුපුරක් මෙන් මෙතෙක් කල් මුළුල්ලෙහි සැඟවී සිටියාවූ ඒ කුශල කර්‍මය අවසර දුන්නේය. ඒ සෙනාපති තෙමේ දාගැබට අනොජා මල්දමින් කරණලද පූජා සඞ්ඛ්‍යාතවූ කුශලානුභාවයෙන් මේ සෙනෙවිරත් කුලයෙහි ඉපද මහත්වූ ශ්‍රී විභූතියට පැමිණියේය. ජාතිස්මරණ ඥානයෙන් සිහිකරන්නේ මේ අත්බවට පළමු අත් බැවින් මත්තෙහි සිහිකරන්නට අසමර්‍ථවූයේ ගොඝාතක කර්‍මයකොට මෙහි උපන්මි යන සංඥාවෙන් ඒ ගුණ නම් අජීවකයාගේ මිථ්‍යාවාදයට වහල්ව පින්වත්වූ අජීවකයෙනි, තෙපි යමක් කීවු නම් මටත් ප්‍රියවන්නේය. යනාදීවූ මේ තෙපුල් කීයේය.

ඉක්බිත්තෙන් ඒ මිථිලා නම් රාජධානියෙහි දිළිඳුවූ බැගෑවූ බීජක නම් දාසයෙක් විය. ඒ තෙමේ පේවස් වසන්නේ ගුණ නම් නිවටා සමීපයට එක්තරා අවවාදයක් අසන පිණිස ගියේය. එකල ඒ දාසයා කාශ්‍යප ගොත්‍ර ඇති ගුණ නම් ආජීවකයාගේත් අලාත සෙනාපතිහුගේත් උක්තප්‍රකාර තෙපුල් අසා එකෙණෙහි සුසුම් ලන්නේ අඬමින් කඳුළු පෙරීය. එකල්හි අඞ්ගාති නම් රජ්ජුරුවෝ අඬන්නාවූ බීජක නම් දාසයා දැක විචාරන්නාහු සබඳ තා කුමක් නිසා මියුඹු හුරුලමින් අඬන්නෙහිද? තා විසින් කුමක් අසන ලදද? කුමක් දක්නා ලදද? කායික චෛතසිකවූ කවර දුක්ඛ වෙදනාවකට පැමිණියෙහිද? අඬන්නාවූ කාරණය මට කියාලවයි කීහ, එසඳ අඞ්ගාති නම් රජ්ජුරුවන්ගේ වචනය අසා බීජක නම් දාසයා කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස, මට කායික චෛතසික දුක්ඛවෙදනායෙක් නැත. මාගේ තෙපුල් ඇසුව මැනව. මම වූකලී පූර්‍වජාතියෙහි දාන සංවිභාගයෙහි ඇලුම් ඇත්තේවූයෙමි. පිරිසිදුවූ කාය වාක් මනඃ කර්‍මයෙන් බමුණන් හා ශොවින් විසින් සම්භාවිතවූයෙමි. පූජ්‍යවූයෙමි. මා විසින් කරණලද සවල්ප මාත්‍රයවූ අකුශල කර්‍මයකුත් නැත. රජ්ජුරුවන් වහන්ස, එතකුදුවුවත් මම ඒ ජාතියෙන් චුතව මේ මියුලු නුවර දිළිඳුවූ බැගෑවූ දාසියක

කුස උපන්මි. යම් තැනෙක උපන්නෙම්ද? එම උපන් තැනම ඉතා දිළිඳුව දුකසේ ජීවත්වෙමි. මෙසේ දිළිඳු වූයෙම් වී නමුත් කුශලකර්ම විෂයෙහි කායවාක් මනඃ යන තුනම සමකොට පැවැත්වීමෙහි පිහිටියෙමි. එකල යමෙක් මාගෙන් ආහාරාදි කිසිවක් කැමැත්තේ වී නම් ඔහට මා කන බත් දෙකොටසක් කොට එක් කොටසක් ශුබවූ චෙතනායෙන් දුනිමි. තුදුස්වක් පොහොයෙහිත් පසළොස්වක් පොහොයෙහිත් හැමකල්හිම පෙහෙවස් විසූයෙමි. තවද සත්ත්ව යන්ට පීඩාවකුත් නොකෙළෙමි. සොරකමුත් දුරුකෙළෙමි අලාත නම් සෙනෙවිරදුන්වහන්සේ යම් අකුශල කර්මයෙක නිස්ඵල බව කීසේක්ද? මමත් (ඒ සෙනෙවිරදුන්වහන්සේගේ බස් අසා) මනාකොට පුරුදු කළාවූ උක්ත ප්‍රකාර-දානාදිවූ කුශලකර්ම සියල්ලම නිස්ඵල වන්නේයයි හඟිමි.

මහරජ්ජුරුවන් වහන්ස, මා විසූ පෙහෙවසුත් ප්‍රයෝජන නැතැයි සිතමි. එසේහෙයින් රජ්ජුරුවන් වහන්ස, දූ කෙළියෙහි නොහික්මුනාවූ දූ සොඬෙකු මෙන් මම ඒකාන්තයෙන්ම පරාජයක්ම ගනිමි. හික්මුනාවූ ලිහිණි වැද්දෙකු මෙන් අලාත නම් සෙනෙවිරදුන්වහන්සේ කර්මය නිෂ්ඵල බැවින් ජයගත්සේක. මහ රජ්ජුරුවන් වහන්ස, යම් උපායකින් සුගතියට යෙම් නම් එසේවූ උපායක් දූත් මම නොදක්මි. මේ ගුණ අජීවකයාගේ බස් අසා කුශලකර්මයෙහි විපාක නැතැයි දත්තෙම්ද? එසේ හෙයින් දූත් මම හඬමි කීය, ඒ බීජක නම් දාසයා වූකලී කාශ්‍යප සම්‍යක්සම්බුද්ධයන්වහන්සේ සමයෙහි වල ගිය ගොනෙකු සොයන්නේ මංමුළාවූ එක් භික්ෂුකෙනෙකුන් වහන්සේ විසින් මග විචාළ කල්හි මූවෙන් නොබැණ සිට නැවතද උන්වහන්සේ විසින් මග විචාරණ ලද්දේ කිපී ශ්‍රමණ කොල්ලෝ නම් මුබරියෝ වේද? (තාපසයකු විය යුතුයයි) ශ්‍රමණවූ හෙයින් වේද? තා අතිමුබරි වූයේයයි කීය. ඒ අකුශල කර්මය එසමයෙහි විපාක නොදී අළුයෙන් සැඟවුනාවූ ගිනි පුපුරක් මෙන් මරණාසන්න කාලයෙහි අන් කර්මයක් එළඹීය. ඒ කර්මයවූ පරිද්දෙන් ඒ පුරුෂ තෙමේ සසර ඇවිදිනේ කුසල්වූ එම් කර්මයෙන් සාකෙත නුවර උක්තප්‍රකාරවූ සිටුපුත්‍රව ඉපද දානාදිවූ පින්කම් කෙළේය. ඔහු ඒ සිටුපුත්‍රව කළාවූ කුශලකර්මය වූකලී පෘථිවියෙන් සැඟවුනාවූ නිධානයක් මෙන් සිටියේ අවසරයක් ලැබ මතු විපාක දෙන්නේය. භික්ෂූන්වහන්සේට ආක්‍රොශ කරන්නාවූ ඔහු විසින් කළ යම් අකුශල කර්මයෙක් ඇත්නම් ඒ අකුශල කර්මය ඔහට මෙකියන (දාසව උපන්) ආත්මභාවයෙහි විපාක දින. ඒ බීජකයා ජාතිස්මරණ ඥානයෙන් තත්වූ පරිද්දෙන් සිහිකොට ගතනොහී අන්‍යවූ අකුශල කර්ම විපාකයෙන් කෙල්ල බඩ උපන්මි යන සංඥාවෙන් "දානාදිවූ සුචරිතයෙහි විපාක නැත." යනාදිවූ මේ කාරණා කීයේය.

ඉක්බිත්තෙන් ගුණ නම් නිවටාගේ හා අලාත නම් සෙනාධිපතිහුගේ බස් ඇසූ අනතුරුව බීජක නම් දාසයාගේද බස් අසා දැඩිකොට මිථ්‍යාදෘෂ්ටි ගෙණ අඞ්ගාති රජ්ජුරුවෝ කියන්නෝ දිව්‍යලෝකොත්පත්තියට උපායෙක් නැත. එසේහෙයින් චතුරාශීති කල්ප ප්‍රමාණවූ කාලයම බලා, ඒ කල්පයම සත්ත්වයන් ශුධ කරන්නේය. සැපයෙක්වත් දුකෙක්වත් ඇත්නම් එය නියත සඞ්ඛ්‍යාතවූ චතුරාශීතිකල්ප ප්‍රමාණ කාලය මුළුල්ලෙහිම ලැබෙලා, එසේහෙයින් බීජකය, අප හැමදෙනාට සංසාරයෙන් ශුද්ධිය වන්නේය. නියතවූ ඒ සුවාසූකප නො

පැමිණි කල්හි අතරතුරෙහි දිව්‍යලෝකයට යමි. තෝ ඉක්මන් නොව, මමත් පූර්‍වයෙහි ශක්තිවත්තවූයෙම් බමුණන් හා ගොවීන්ට අත් පා මෙහෙවර කිරීම් වැදීම් පිදීම් ආදීවූ උපසර්‍ගයෙහි නියුක්තවූයෙම් විනිශ්චය ස්ථානයෙහිද රාජ කටයුතු විචාරන්නෙම් අධිකරණයෙහිද යුක්ති බණන්නෙම් ඒ කාර්‍ය්‍යයෙහි නියුක්තවූ එතෙක් කල් මුළුල්ලෙහි උතුම්වූ පඤ්චකාමරතියෙන් පිරිහුණෙමියි මෙසේ බීජක නම් දාසයාගේ බසට අනුව බස් කීහ. මෙසේද කියා වහන්ස කාශ්‍යපයෙනි, අපි මෙතෙක් කල් මුළුල්ලෙහි ප්‍රමාදව උනුම්හ. දැන් වූකලී ආචාර්‍ය්‍ය කෙණෙක් ලබන ලද්දෙමු එතැන් පටන් කාමරතියම අනුභව කරම්හ. එසේහෙයින් නුඹවහන්සේ සමීපයෙහි සිටීමෙන් මෙයින් මත්තෙහි බණ ඇසීමක් ප්‍රපඤ්ච වන්නේය. එසේහෙයින් නුඹ සිටිනු මැනව, අපි යම්හයි නමත් ගමන් පිළිවිස්නාවූ රජ්ජුරුවෝ වහන්ස, යන එන අන්තරමගකදී ඉදින් අප දෙදෙනාගේ එක්වීමෙක් වීනම් එතැනදී නැවතත් දක්නමෝ වේද? ඉදින් එසේ අතරමගකදී දැක්මෙක් නොවී නම් (නකා පනකා) නුඹ දැක්මට ඊමෙන් අපට වන කුශල ඵලය කවරේදැයි කීහ. මෙසේ කියා අඞ්ගාති නම් රජ්ජුරුවෝ රථයට පැනනැගී තමන්ගේ භවනයවූ චන්ද්‍රක නම් ප්‍රාසාදතලයටම පෙරළා ගියහ. පළමු මහත්වූ පෙළහරින් ගුණාජීවකයා සමීපයට ගිය රජ්ජුරුවෝ ඔහු වැඳලා හිඳ ප්‍රශ්න විචාළහ. පෙරළා යන තැනැත්තෝ වූකලී නොවැඳම ගියහ. ගුණාජීවකයා තමාගේ නුගුණ කී බැවින් රජ්ජුරුවන්ගෙන් වැඳීම් පමණකුත් නොලැබ ආහාරාදීවූ සත්කාරයක් කුමකැයි ලබාද? නොලද්දේමය. රජ්ජුරුවෝත් ඒ රාත්‍රිය ඉකුත්කොට දෙවන දවස් අමාත්‍යයන් රැස්කරවා මට පඤ්චකාම ගුණය එළවව් මම මෙතැන් පටන් පඤ්චකාම සැපම අනුභව කෙරෙමි. අනික් රාජකටයුත්තෙක් නොකිය යුතුයි, රාජකටයුතු අසවල් අසවල් අමාත්‍යයා කෙරේවයි කියා විධානකොට තුමූ පඤ්චකාමය අනුභව කිරීමෙහිම නිරතවූහ. බමුණු ගැහැවියන්ට අත්පා මෙහෙකිරීම් ආදීවූ කිසි කාර්‍ය්‍යයෙක්හි ව්‍යාපෘත නොවූහ.

අඞ්ගාති නම් රජ්ජුරුවෝ පඤ්චකාමයෙහි ඇලුනු තැන් පටන් තුදුස් දවසක් ගිය කල රජ්ජුරුවන්ගේ ලෙහි දා දරුවූ ප්‍රියවූ රුජා නම් රාජකුමාරි කාවෝ පියරජ්ජුරුවන් සමීපයට යනු කැමතිව කිරිමව්ට කියන්නාහු සෙට පස ළොස්වක් පොහෝ දවසය, එසේහෙයින් වැදූරට වාසීන්ට ඊශ්වරවූ මාගේ පිය රජ්ජුරුවන් වහන්සේ සමීපයට යනු කැමැත්තෙමි. මා යුහුව්ම සර්‍වාභරණ යෙන් සරහව, මාගේ යෙහෙළිවූ පන්සියයක් කුමාරිකාවරුනුත් නානා වර්‍ණපුෂ්ප වස්ත්‍රාභරණයෙන් ඔවුනොවුන් සරහව, මාගේ පන්සියයක් පරිවාර කුමාරිකා වනුත් නානා වර්‍ණපුෂ්ප වස්ත්‍රාදීන් ඔවුනොවුන් සම නොකොට සරහවයි කීවුය. එකල්හි රුජා නම් රාජකන්‍යාවට චම්පක නවමාලිකාදීවූ අනෙකප්‍රකාර සුගන්ධ කුසුමයන් හා මාහැඟිවූ සඳුන් විලවුන් හා මුතු මැණික් ආදියෙන් විශෙෂකොට කරණලද ආභරණ හා සෙසු බොහෝ රන්රුවන් හා නොයෙක් පැහැයෙන් යුත් පිළි ඒ කුමාරිකාව සුවඳ පැනින් නහා සැරහෙන පිණිස එළවූහ. සිත් කළුවූ ශරීර වර්‍ණ ඇති ඒ රුජා නම් රාජකන්‍යාව බොහෝ පරිවාර ස්ත්‍රීන් පිරිවරා සවර්‍ණවයවූ භද්‍රපීඨයෙහි උන් කල්හි දිව්‍යප්සරාවන් පිරිවැරූ සුජාතා නම් අසුර කන්‍යාව මෙන් විශෙෂයෙන් හෙබියහ. පෙර ඒ රුජා නම් රාජ කුමාරිකාවෝ තුදුස්වක් පොහොයෙහි පන්සියයක් කුමාරිකාවරුන් විසින්

පිරිවරණ ලදුව කිරි මව් සමූහයා කැඳවාගෙණ මහත්වූ ශ්‍රී විලාශයෙන් තමන්ගේ සත්මාලක් ඇති රතිවඪ්න නම් ප්‍රාසාදයෙන් බැස පිය රජ්ජුරුවන් දක්නා සඳහා චන්ද්‍රක නම් ප්‍රාසාදයට යන්නාහ. එකල පිය රජ්ජුරුවෝ කුමාරිකාවන් දැක සතුටුවූ සිත් ඇතිව මහත්වූ සත්කාර සම්මානකොට යවන්නාහු දුවනියනි දන් දෙවයි කියා දහසක් දී යවන්නාහ. ඒ රාජකුමාරිකාවෝ ඒ දහස ගෙණ තමන්ගේ ප්‍රාසාදයට ගොස් දෙවන දවස් පෙහෙවස් වැස දුගී මගී යාචකයන් හා ගුණ කියා ඉල්වන වන්දිභට්ටයන් ආදිවූ නුවර සියලු යාචකයන්ට මහදන් දෙන්නාහ. රජ්ජුරුවන් විසින් ඒ රුජා නම් කුමාරිකාවන්ට එක් ජනපදය කුත් දෙනලද්දේය. ඒ ජනපදයෙන් ලත් අයපඬුරින් දන්පින් ආදිවූ සියලු කාර්‍ය්‍යී කරන්නාහ. එවදවස් වූකලී රජ්ජුරුවන් වහන්සේ ගුණ නම් නිවට ආජීවකයා නිසා මිථ්‍යාදෘෂ්ටි ගන්නාලදින් සියලු නුවර එක කොලාහලවිය. රුජාවන්ගේ කිරිමව් එපවත් අසා ගොස් කියන්නී ආර්‍ය්‍යාවන්වහන්ස, නුඹ වහන්සේගේ පිය රජ්ජුරුවන් වහන්සේ ගුණාජීවකගේ කථා අසා මිථ්‍යා දෘෂ්ටි ගත්සේක. උන්වහන්සේ සතර වාසල්දොර දන්හල් බිඳවා අනුන් අයිතිවූ ස්ත්‍රීන් හා කුමාරිකාවරුන් බලාත්කාරයෙන් ගෙන්වනසේක. රාජ්‍යය නොවිචාරණසේක. කාමයෙන් මත්වූසේකැයි කීවාය. ඒ රුජා නම් රාජ කුමාරිකාවෝ කිරිමව් කී මේ බස් අසා නොසතුටු සිත් ඇතිව මපියානන් වහන්සේ මෙබඳුවූ පහවූ කුශල ධර්‍මයන් ඇති නිර්ලජ්ජීවූ නග්නභාවය අනුභව කරන්නාවූ සිත කිසිත් ගුණයක් නැති ගුණ නම් නිවටා කරා ගොස් ප්‍රශ්න විචාරණසේක. ධාර්මිකවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් හා කර්‍ම හා කර්‍මඵල ඇතැයි කියන්නාවූ ධර්‍මවාදීන් කරා ගොස් විචාල කල නපුරුද, එසේහෙයින් මූන් වහන්සේ ඉතා අඥානසේක. දූන් වූකලී මා හැර අනික් කෙණෙක් මපියානන් වහන්සේ මිථ්‍යාදෘෂ්ටින් ගලවා සම්‍යක් දෘෂ්ටියයි පිහිටුවන්නට සමර්ථයෝ නැත. මම වූකලී අතීතයෙන් සත් ජාතියක් හා අනාගතයෙන් සත් ජාතිය කැයි මෙසේ තුදුස් ජාතියක් ජාතිස්මරණඥානයෙන් සිහි කෙරෙමි. එසේ හෙයින් පෙර මා විසින් කල පාපකර්‍මය කියා අකුශල ඵලය මපියානන් වහන්සේට දක්වමි. ඉදින් අදම ගියෙම් වී නම් එකල්හි මපියානන් වහන්සේ මැනියෙනි, පෙර දෙපෝයෙන් දෙපෝයට මා සමීපයට එන්නෙහිය. අද වූකලී කුමක්නිසා ශූන්‍යව අවුදූ?යි කියනසේක. එතැන්හිදී ඉදින් මම නුඹ වහන්සේ විසින් මිථ්‍යාදෘෂ්ටි ගන්නාලදූයි යනු අසා ආමි, කීයෙම් වීම් නම් මාගේ බස්ගරුකොට නොගන්නාසේක. එසේහෙයින් අද නොගොස් අදට තුදුස් වැනි දවස් අවතුදුස්වක් දින කිසිවක් නොදන්නියක මෙන් පෙර යන සැටියෙන්ම ගොස් එන වේලෙහි දන්දෙන පිණිස දහසක් ඉල්වමි. එවිට මාගේ පියානන් වහන්සේ මිථ්‍යාදෘෂ්ටි ගත් නියාව කියනසේක. එකල මම උන්වහන්සේට මාගේ බලයෙන් නොයෙක් කාරණා කියා මිථ්‍යාදෘෂ්ට අරවමියි සිතූහ. එසේ සිතා තුදුස්වැනි දවස් පියානන් සමීපයට යනු කැමතිව තමන්ගේ යෙහෙලිවූ පන්සියයක් කුමාරිකාවරුන් හැම්දෙනම අනෙක ප්‍රකාරවූ නොයෙක් ආභරණයෙන් හා නොයෙක් පැහැ ඇති පුෂ්ප වස්ත්‍ර සුගන්ධානුලෙපනයෙන් එක්කෙණෙකුන් හා සමනොකොට වෙන වෙනම විශෙෂකොට සැරහිගෙණ එන්නට කියා ඒ රුජා නම් කුමාරිකාවෝ ගොස් සුවඳ පැන් සොලොස් කලයකින් නහා සර්‍වාභරණයෙන් සැරහී පිය රජ්ජුරුවන් සමීපයටදන්දෙන පිණිස දහසක් වස්ත්‍ර ඉල්වාගෙණ එන්නට ගොස් චන්ද්‍රක නම්වූ ප්‍රාසාදයේ

මතුමහල් තලයට මේඝගර්භයක් ඇතුළට වන්නාවූ සියරැළි විදුලියක් මෙන් සර්වාභරණයෙන් සැරහුනාවූ පන්සියයක් යෙහෙළියන් හා සමග වන්නාහුය.

මෙසේ රජ්ජුරුවන් සමීපයට ගොස් ආචාර විතයෙහි ඇලුනාවූ ඒ රුජා නම් කුමාරිකාවෝ රජ්ජුරුවන්ට නමස්කාර කොට සප්තරත්නයෙන් විචිත්‍රවූ සුවර්ණමයවූ භද්‍රපීඨයෙක්හි එකත්පස්ව උන්හ. එකල වෑදූරට්ඨවාසීවූ අඞ්ගාති රජ්ජුරුවෝ දෙවියන්ගේ සමාගමයෙක් බඳුවූ අලඞ්කාරවූ ස්ත්‍රී සමාගමය දැක යෙහෙළි සමූහයාගේ මධ්‍යවර්තිවූ රුජා නම් රාජකන්‍යාවට මෙසේ කිවුය. දරුව රුජාවෙනි, ගෘහොද්‍යානයෙහි පිහිටියාවූ නන්‍ද නම් පුෂ්කරණිය හා සමානවූ මා විසින් දෙනලද ඒ පොකුණෙහි ජලක්‍රීඩාව කෙරෙමින් එසේම මා විසින් කරවා දුන් වෛජයන්ත ප්‍රසාදය වැනි රති වර්ධනනම් ප්‍රසාදයෙහි කිමෙක්ද? ඇලී වසව්ද? නොයෙක් වර්ගයෙහිවූ කනබොන දෑ තොපට හැම දවස්ම එළවද්ද? තොපට මම දවස් පතා මල් කරඬු පස්විස්සක් යවමි. අනේකප්‍රකාරවූ සුගන්ධ කුසුමයන් රැස්කොට ගොතා මේ පරිවාර ස්ත්‍රීහු ක්‍රීඩාරතියෙහි ඇලුනාවූ ඒ මල් ගෙණා විගසම යහපත්කොට ඔවුනොවුන් පරදවන්නවුන්මෙන් තොපට වෙන වෙනම මල්ගෙවල් මල්ගබ්, මලසුන්, මල්යහන් කෙරෙද්ද? මෙලෝ වැසි ස්ත්‍රීහු මූඛය ඔප නගන්නාහු දුෂ්ට රුධිරය හා වේසන් නල කෑලල කුරුලෑ ආදිය නසන පිණිස පළමුකොට අබකල්කයෙන් මුහුණ උලන්නාහ. ඉක්බිති රුධිරය සමකරුණු සඳහා සිනිඳුවූ මැටි කල්කයන් උලන්නාහ. නැවත ඡවිප්‍රසන්න කරණු පිණිස තිලකල්කයෙන් උලන්නාහ. එසේහෙයින් තෙපිත් ලුණු සුන් නෙත් හා මැටිකසා තිලකල්කයෙන් සොබවන මුහුණු ඇති නැතැත්තියෝය. එසේවූ මුහුණු ඇති නැතැත්තියෙනි, තොපට කවර වස්තුවකින් විකල්පයෙක් අරුමයෙක් ඇද්ද? ඌනවූ වස්තුයෙක් ඇත්නම් සියල්ලම වහා ගෙණවුත් තොපට දෙමි. තවද ලෝකයෙහි චන්ද්‍රයාට වඩා ලැබගත නොහැක්කාවූ වස්තුයෙක් නැත. ඉදින් තෙපි එය මට වුවමනායයි කියා අභිප්‍රාය ඇතිවූ චන්ද්‍රයා සමානවූ වස්තුයෙහිත් ඇලුම්කොට කියව්නම් ඒ නොලැබගතහැක්කාවූ වස්තුත් තොපට අඩුනොකොට සපයා දෙමි කීය. ඒ අඞ්ගාති රජ්ජුරුවන්ගේ බස් අසා රුජා නම් රාජකන්‍යා තොමෝ පිය රජ්ජුරුවන්ට කියන්නී මහරජ්ජුරුවන් වහන්ස, පෘථිවීශ්වරවූ නුඹවහන්සේ සමීපයෙන් මෙකී සියල්ලම ලැබෙන්නේය. එසේහෙයින් ඉන් අඩුවෙක් නැත. සෙට පසළොස්වක් පොහෝ දවසය. මා දන් දෙන දවසය, දන් දෙන පිණිස මසුරන් දහසක් දුනමැනව, සියලු යාචකයන්ට පෙර මා දී එන ලෙසින් දන්දෙනු කැමැත්තෙමි'යි කීවාය.

එබස් අසා අඞ්ගාති රජ්ජුරුවෝ කියන්නෝ 'වැඩනැත්තාවූ නිෂ්ඵලවූ දන්දීමෙහි හා උපෝසථවාසයෙහි නියුක්තවූ තොප විසින් බොහෝ වස්තු නිෂ්කාරණයේ නසන ලද පෙහෙවස් විසීමෙන් නිරන්තරයෙන් යම් ආහාරපාන වර්ගයක් තෙපි අනුභව නොකරව් නම් ඒ අන්නපාන අනුභව නොකිරීම චතුරශීති කල්ප ප්‍රමාණය කාලය නියත වශයෙන් තොප විසින් අනුභව නොකොට යුත්තේමය. පව්කළත් පින් කළත් හැම සත්වයන්ටම චතුරශීතිකල්පය ඉක්මුනු කල්හි ශුද්ධවන හෙයින් පෙහෙවස් වැස බත් කන්නාහවත් නොකන්නාහවත් පින් නැතැ,යි පළමු නොඉල්වාම මැනියෙනි, දන් දෙවයි කියා දියනියන්ට මසුරන් දහසක් දී යවන අඞ්ගාති රජ්ජුරුවෝ එදවස් යාචකයකුකොට ඉල්වමින්

සිටියදීත් මිථ්‍යාදෘෂ්ටි ගත් බැවින් දියතියන්ට මසුරන් දහස නොදී මේ යථොක්ත කාරණා කීහ. තවද රජ්ජුරුවෝ දියතියන්ට කාරණා කියන්නාහු රුජාවෙනි, අකුශල කර්මබලයෙන් දාසත්වයට පැමිණි මේ බීජකයාද මෘගදාය නම් උද්‍යානයෙහිදී එදවස් ගුණාජීවකයා විසින් ''නත්ථි ධම්මස්ස චරිතස්සඵලං කල්‍යාණං පාපකං'' යනාදීන් කියනලද මිථ්‍යාවචනය අසා එකෙණෙහි මියුඹුහුරුල මින් අඩඅඩා කඳුළුපෙරීයහිද බීජකයාත් පෙරකුසල්කොට ඒ කුසලවිපාකයෙන් කෙල්ලබඩ උපන්නේයයි බීජක වස්තුවත් ඒ රාජකුමාරිකාවන්ට උදාහරණ කොට ගෙණහැර දැක්වූහ. තවද රජ්ජුරුවෝ කියන්නෝ සොඳුර, ගුණාචාරීන් විසින් ''මෙලෝ නැත, පරලෝනැත, මව් නැත, පියා නැත, කර්ම නැත. කර්මඵල නැත, උපදනා කෙණෙකුත් නැත, මියයන කෙණෙකුත් නැත' ලෝකයෙහි සත්පථයෙහි ගියාවූ සුචරිත ධර්මයෙහි පිළිපදනාවූ මහණ බමුණු කෙණකුත් නැතැයි, කියන ලදහ, එසේහෙයින් පරලොව ඇති කල්හි මෙලොවකුත් වියයුතුය. පරලොව මුලින්ම නැත. මව්පියන් ඇති කල්හි දූදරුවෝ ඇතිවන්නාහ. මව්පියන් මුලින්ම නැත. ධර්මය ඇති කල්හි ධාර්මිකවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇතිවන්නාහ. ධර්මය මුලින්ම නැත. එසේහෙයින් දන්දීමෙන් සිල්රැකීමෙන් පෙහෙවස් විසීමෙන් ප්‍රයෝජන නැත. මෙසේ පරලොවත් මවුපියනුත් ධර්මයත් මහණබමුණනුත් කුශලාකුශල විපාකයත් නැතිකල දන්දීම් සිල්රැකීම් ආදියෙන් හා පෙහෙවස් විසීමෙන් බත්පැන් නොකා නොබී තොපගේ ශරීරයට කුමකට දුක් දෙව්ද? එසේහෙයින් රුජාවෙනි, යම්තාක් තෙපි ජීවත්ව ඉඳු නම් ඒතාක් කල් මුළුල්ලෙහි පෙහෙවස් විසීමෙන් ප්‍රයෝජන නැත. රාත්‍රිභොජනය අනුභව නොකරම් නොසිතා හැම දවස්ම රාත්‍රිභෝජනය අනුභව කරවයි අවවාද කළහ.

එබස් අසා සිත්කළුවූ ශරීරවර්ණ ඇති රුජානම්වූ කුමාරිකා තොමෝ අතීතයෙන් සත්ජාතියක් දැකීම් වශයෙන් පූර්ව ධර්මයත් හා අනාගතයෙන් සත් ජාතියක් දැකීම් වශයෙන් අනාගත ධර්මයත් තත්වූ පරිද්දෙන් දන්නී පියරජ්ජුරුවන් මිථ්‍යාදෘෂ්ටියෙන් මුදවනු කැමතිව මේ මතු කියන කාරණය කියන්නී මහරජ්ජුරුවන් වහන්ස, යම් පුද්ගලයෙක් යම්සේ අඥානයන් සෙවුනේ වීනම් ඒ පුද්ගලයාත් අඥාන බවට පැමිණෙන්නේයයි මා විසින් මීට පළමු අසනා ලද්දේමය. දූත් වූකලී මා විසින් ප්‍රත්‍යක්ෂ කොට ඇස් හමුයේ දක්නාලද, මංමූළා එකක්හු කරා පැමිණි මංමූළා එකෙක් මූළාවන්නාසේ දෘෂ්ටිමූඪයා කරා පැමිණි දෘෂ්ටිමූඪවූ තැනැත්තේ මතු මත්තෙහි මූළා බවට පැමිණේද? එපරිද්දෙන්ම මහරජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ ජාතිගොත්‍ර කුල ප්‍රදෙශ ඓශ්වර්‍ය්‍ය ප්‍රඥා යන මෙයින් හීනවූ අලාත සේනාපතීහු විසින් හා අතිශයින් හීනවූ බීජක නම් දාසයා විසින් ග්‍රාමදාරකයක්හු වැනිවූ නිර්ලජ්ජ අඥබාල මේ නිවටා කරා පැමිණ මූළාවීම ඔවුන්දෙදෙනාට සුදුසුය. එසේ මූළාවීම ඒ හැහැවියන්ට සුදුසු බව මුත් දෙවයන්වහන්ස, නුඹවහන්සේ වැනි ප්‍රාඥවීශ්වරවූ රජදරුවන්ට සුදුසු නොවන්නේයයි මෙසේ අලාත බීජක දෙදෙනාට නින්දාකොට පියරජ්ජුරුවන් දෘෂ්ටියෙන් ගලවනු පිණිස උසස්කොට වර්ණනා කරන්නාවූ රුජාවෝ මෙසේ කිවුය. මහ රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ දසවාස දසකුසල, පවිත්‍රවාස, යොනිසොමනස්කාර, සාකච්ඡා යන මේ සියල්ලෙන් ලබනලද ප්‍රඥායෙන් සමන්විතයේක. ඒ කාරණයෙන් අචලවූ ධෛර්‍ය්‍ය ගුණ

ඇතිසේක. අචල හෙයින්ම අත්‍යන්ත කාරණා කාරණ දන්මෙහි සමර්ථසේක. එබඳුවූ නුඹවහන්සේ මේ අඥානයන් හා සමව මෙලොව පරලොව වරදන හෙයින් ගිනවූ මේ මිථ්‍යාදෘෂ්ටියට කෙසේ පැමිණිසේක්ද? තවද රජ්ජුරුවන් වහන්ස සංසාර මාර්ගයෙන් සත්වයෝ ඉදින් ශුඬවෙත් නම් ගුණ නිවටාගේ ප්‍රව්‍රජ්‍යාව ව්‍යර්ථවන්නේය. කුශලාකුශල කර්මයක් හුගේ සිඬියක් නැතිව හුදෙක් සංසාරමය සත්වයන් ශුඬකරන්නේවීනම් ප්‍රව්‍රජ්‍යායෙන් කම් නැති බැවින් රාත්‍රිභාගයෙහි ඇවිලෙන්නාවූ ගිනි දක ඒ ගින්නෙන් දන්නාවූ දුක් නොදන ගින්නෙහි වැටී මහ දුකට පැමිණෙන්නාහු පලහැටියකුසේ මේ ගුණ නම් නිවටා පඤ්චකාමය හැර මොහයෙන් මූඪව ආශ්වාද රහිතවූ ප්‍රව්‍රජ්‍යා වෙශයෙන් ගත් මේ නග්න වෙශයට නොපැමිණෙන්නේය. යම්හෙයකින් තෙමේ නග්නවූ ප්‍රව්‍රජ්‍යා වේශයෙන් යුක්තව වෙසේද? මේ කාරණයෙන් සංසාරය සත්වයන් ශුඬ නොකරන්නේය. කර්මය සත්වයන් ශුඬකරන්නේය. තවද කර්තව්‍යාකර්තව්‍ය නොදන්නාවූ බොහෝ ජනයෝ සංසාරයෙන් මා ශුඬවන්නේයයි කිසිවක්හුගේ බස් නොගෙණ දෘඪග්‍රාහ වශයෙන් පළමුකොට වන්නාවූ කුශලාකුශ කර්මයන්ගේ ඵල නැතැයි ගත්හෙයින් කර්මය හා කර්මඵලය නසන්නාහ. මෙසේ ඔවුන් පූර්වයෙහි ගත්තාවූ ඒ පරාජය ග්‍රාහය වරදවා ගන්නා ලද්දේමය. මෙසේ මිථ්‍යාදෘෂ්ටිය හෙතුකොට ගෙණ දෙලොවින් වන අර්ථයක් මෙන් (ඒ පරාජය ග්‍රාහය) ගෙණ සිටියාවූ අඥානවූ සත්වයෝ බිලියක් ගැලසිටි මත්ස්‍යයකු ඒ බිලියෙන් දුකසේවත් නොගැලවිය හැක්කාසේ ඒ මිථ්‍යාදෘෂ්ටියෙන් දුකසේවත් නොගැලවිය හැක්කාහ. තවද මහරජ්ජුරුවන් වහන්ස, මේ සත්වලෝකයෙහි සමහර පණ්ඩිත කෙණෙක් උපමාවෙනුත් අර්ථ දැනගන්නාහ. එසේහෙයින් නුඹ වහන්සේට වැඩ පිණිස උපමා දක්වමි. රජ්ජුරුවෙනි, වෙළෙඳුන්ගේ නැවක් අපමණවූ බර ගෙණ, යන්නේ ඉතා බර බැවින් අධිකවූ වස්තුභාරය ගෙණ සාගරයෙහි සම්සේ ගැලේද? ඒ අධික භාරය හෙතුකොටගෙණ සාගරවාසී දනය නර කරන්නාවූ නැව මෙන් මේ ලෝකවාසී සත්වයා අකුශල කර්මය මදින්මද රැස්කරන්නේ ඒ අධිකවූ පාපභාරය හෙතුකොටගෙණ අටමහා නරකය හා දෙතිස් ඔසුපත් නරකය හා ලොකාන්තරික නරකයෙහි ගැලෙන්නේය පෘථිවීශ්වරවූ රජ්ජුරුවන් වහන්ස, මේ අලාත සෙනාපතිහුගේ නරකයට පමුණුවන්නාවූ පාප භාරය රාසි කරණ වශයෙන් තව නොපිරුණේය, යම් අකුශල කර්මයක් නිසා ඒ තෙමේ දුර්ගතියට යන්නේවීනම් ඒ පාපය දැන් රැස්කරමින් සිටිනේය. පෘථිවීශ්වරවූ රජ්ජුරුවන්වහන්ස, මේ අලාත සෙනෙවිරදුන්ගේ පූර්වජාතියෙහි කාශ්‍යප සර්වඥයන්වහන්සේගේ චෛත්‍යයෙහි අනෝජාවෙන් රැස්කරණ ලද්දාවූ යම් කුශලයෙක් ඇද්ද? වැලිදු අලාතනම් සෙනාපති තෙමේ මෙලොවෙහි යම් සැපයෙක් ලබාද?, මෙබඳුවූ ඓශ්වර්‍ය්‍යය ඒ වුක්තප්‍රකාරවූ කුශල කර්මයාගේ විපාකය වන්නේය ගොඝාතක කර්මයාගේ විපාකයෙන් නොවන්නේය. පාපකර්මය නම් ඉෂට නොවන්නේමය. තවද ඒ

අලාතනම් සෙනෙවිරදුන්ගේ යථොක්තවූ කුසලය දූත් ක්‍ෂය වන්නේය. ඒ අකුශල කර්‍මයෙහි ඇලී කුශලදුරුකොට අපායගාමීවූ අකුශලමාර්‍ගයට දිවන්නේය. එසේහෙයින් පළමු කළ පුෂ්පපූජාව සඞ්ඛ්‍යාතවූ කුශලයෙන් සෙනෙවිරත් නතතුරු ලැබ සම්පත් අනුභව කෙරෙයි. ඒ කුශලය මේ ජාතියෙන්ම ගෙවීයන්නේය. දූත් අකුසල් කරණකොට නරකයෙහි වැටී මහදුක් අනුභව කරන්නේය. වස්තු ධරණ පිණිස ගන්වතලද උතුරු ඇති මතාකොට අල්වා නොගන්නා ලද්දාවූ තරාදිය බඩු තැගු කල්හි යම්සේ බිමට බසීද ? තැවත භාරය ඇරවූ කල්හි තරාදියේ හිස යම්සේ උඩ බලා නැගේද? ඒ බඩු හළ තරාදිය උඩ නැගෙන්නාසේම සත්ත්ව තෙම දූත ශීලාදීවූ කුශලධර්‍මය මඩින්මද රැස් කරන්නේය. අකුශල භාරය බහා තබා අකුශල කර්‍මය නමැති හිස් නගාස්වර්‍ගයෙහි උපදනේය. ඒ බීජක නම් දූසයාද මධුරවූ විපාක ඇති කුශල කර්‍මයෙහි විපාකයෙන් මිතු දිව්‍යලෝකයෙහි මහසම්පත් අනුභව කරන්නේය. දූත්වූකලී ඒ බීජක නම් දූසයා දරිද්‍රතාදීවූ යම් දුකෙක් තමා දකිනම් (විඳිනම්) ඒ දුක පූර්‍ව ජාතියෙහි භික්‍ෂුකෙණකුන් වහන්සේට ආක්‍රොෂ කරන්නාහු විසින් කරණ ලද අකුශල කර්‍මයෙන් පැමිණි දුක්ඛය වන්නේය. එතෙමේ දූත් දූසත්ත්වයට පැමිණ අක්‍රොශ විපාකයෙන් උපන්නාවූ දුක්ඛය අනුභව කරන්නේය. තවද රජ්ජුරුවන් වහන්ස, මේ බීජකයාගේ පූර්‍වජාතියෙහි කරණලද අකුශලය දූත් දුක්ඛ විපාක අනුභව කිරීමෙන් ගෙවී යන්නේය, ආචාර විනයෙහි ඇලුනාවූ නුඹවහන්සේවූකලී අශ්‍රීකවූ නග්නවූ මේ ගුණ නම් තිවටා කරා පැමිණ අපායගාමීවූ අකුසල් කර්‍ම නමැති අසත්පථයෙ නොගිය මැනවැයි ඒ රුජා නම් කුමාරිකාවෝ පියරජ්ජුරුවන්ට අවවාද කළහ.

තවද පිය රජ්ජුරුවන්ට පාපමිත්‍රයන් සේවනය කිරීමෙහි දොෂ හා කල්‍යාණ මිත්‍රයන් සේවනය කිරීමෙහි ගුණ දක්වන්නාවූ රාජකුමාරිකාවෝ මෙසේ කීහ. මහරජ්ජුරුවෙනි, සත්පුරුෂවූ හෝ අසත්පුරුෂවූ හෝ සිල්වත්වූ හෝ දුස්සීලවූ හෝ යමෙක් යමෙක් සත්ත්ව තෙමේ සේවනය කරන්නේ වීනම් එබඳුවූ පුරුෂයාගේ වසඟයට යන්නේය. ඔහු පව් කරණ කල්හි තෙමේත් පව් කරන්නේය. ඔහු පින් කරණ කල්හි තෙමේත් පින් කරන්නේය. තවද මේ ලෝකයෙහි සත්ත්වයෙක් යම්බඳුවූ පුරුෂයක්හු තමා මිත්‍ර කරගන්නේ නම් යම්බඳුවූ පුරුෂයක්හු කරා එක්වන් එළඹෙන්නේ නම් ඒ සත්ත්වයාත් එබඳුම වන්නේය. සහවාසය නම් තමා වැන්නක් කරන්නේ පාප මිත්‍රයා පාපයන් හා සෙවුනේ තමා කරා එළඹෙන්නාවූ පාපයන් හා එක්නොවූ මෙරමා තමා හා එකාධ්‍යාශ කිරීමෙන් පාපයන් එක්කරන්නේය. උක්තප්‍රකාරවූ ඒ පාපමිත්‍රයා පාපයන් හා එක්ව නොසෙවුනාවූ මෙරමා තමා හා එකාධ්‍යාශ කිරීමෙන් පාපයන් හා එක්කරණ පරිදි කුමක් මෙන්ද? යත් හලාහල විෂපෙවූ එක්සරයක් හියවුරෙහි බොහෝ සර අතරෙහි ලූකල ඒ සර මුළුල්

ලම විෂ මිශ්‍ර වන්නාක් මෙන් වන්නේය. එසේහෙයින් සංසර්ගී පාපයෙහි භය ඇත්තාවූ ප්‍රඥාවන්තවූ සත්ත්ව තෙමේ පාප මිත්‍රයන් හා යහළු නොවන්නේය. තවද රජ්ජුරුවන් වහන්ස, යම් පුරුෂයෙක් පූතිමාංශයක් තණ කැරැල්ලකින් වසා බැත්දේ වීනම් එකල්හි ඒ තණකැරැල්ල මාංස බන්ධනයෙන් දුර්ගන්ධව වහනය කරන්නේය. අඥානයන් හා එක්වීමත් පෙර දුර්ගන්ධනුවූ කුසතෘණය මාංශ හා එක්කිරීමෙන් දුර්ගන්ධ කළාසේම අඥාන සත්ත්වයන් කරා සම්ප්‍රාප්තවූ සාධු ජනයෝත් ප්‍රාණාතිපාතාදීවූ අසාධුජන ක්‍රියායෙහි එක්කිරීමෙන් අපාය භාග් වන්නාහ.

තවද යම් පුරුෂයෙක් තුවරලා හා සෙසු සපු දුනුකේ ආදීවූ යම්කිසි සුවඳ බඩුවක් යම්කිසි පත්‍රයකින් වසා බැන්දේ වීනම් ඒ වසා බැඳි පත්‍රයත් සුවඳ වහනය කරන්නේය. අෂ්ටලෝක ධර්මයෙන් අකම්පය ස්වභාව ඇත්තාවූ ප්‍රාඥයන් සේවනය කිරීමත් සුවඳ බඩු වසාබැඳි පත්‍රපුටය මෙන් ප්‍රාඥයෝ තමන් කරා සම්ප්‍රාප්තවූ සත්පුරුෂ ජනයන් දාන සීලාදීවූ සාධු ක්‍රියායෙහි එක්කිරීමෙන් ස්වර්ග ලොකයට පමුණුවන්නාහ. යම් හෙයකින් තුවරලා වසා බැඳි පත්‍රපුටය සුවඳ බඩු වේද? ඒ කාරණයෙන් තමාගේ පණ්ඩිතස්වභාවය දැන පණ්ඩිතවරුන් කරා එළඹීමෙන් මෙන් මමත් පණ්ඩිතවෙමියි මෙසේ තමාගේ ප්‍රාඥ බව දැන තමහට වැඩකැමැත්තාවූ ප්‍රාඥ පුරුෂතෙමේ දෙලොව වරදන්නාවූ අසත්පුරුෂයන් කිසිකලෙකත් නොසෙවුනේය. දෙලොවින්ම වැඩ සාධාදෙන්නාවූ සත්පුරුෂයන් එක්වන් සෙවුනේය. (කුමක් හෙයින්දයත්? අසත්පුරුෂයෝ දෙවදත්තාදීන් මෙන් තමන් හා එක්වූවන් නරකයට පමුණුවන්නාහ. සත්පුරුෂයෝ ශාරිපුත්‍රස්ථවිරාදීන් තමන් හා එක්වූවන් සුගතියට පමුණුවනාක් මෙන් සුගතියට පමුණුවන්නාහ.) එසේහෙයින් මහරජ්ජුරුවන් වහන්ස, සර්වප්‍රකාරයෙන්ම අසත්පුරුෂයන් දුරුකොට සත්පුරුෂයන් හා එක්ව කුසල් කොට ස්වර්ගලොකොත්පත්තිය කළමැනවැයි මෙසේ ඒ රුජා නම් රාජකුමාරිකාවෝ පිය රජ්ජුරුවන්ට අවවාද කළහ.

මෙසේ ඒ රාජකුමාරිකාවෝ පිය රජ්ජුරුවන්ට ධර්මදෙශනා කොට අතීතයෙහි තමන් අනුභව කළාවූ දුක් දක්වන්නාහු මෙසේ කීවුය. මහරජ්ජුරුවන් වහන්ස, මෙලොව ඇත, පරලොව ඇත, කර්ම ඇත, කර්මඵල ඇත, සංසාරය සත්ත්වයන් ශුද්ධකරන්නට අසමර්ථ වන්නේය. තමන් විසින් කරණලද කුශල කර්මයෙන්ම සත්ත්වයෝ ශුද්ධවන්නාහ. අලාත සෙනාපති හා බීජක නම් දාසයා හා දෙදෙන එක ජාතියක් සිහිකෙරෙති. එසේ හෙයින් උදක් ජාතිස්මරණ ඥානය ඇත්තෝ ඔහු දෙදෙනා නොවෙති, මමත් අතීතයෙන් සත්ජාතියක්ම ඇවිද්දාවූ ජාති සිහිකෙරෙමි. අනාගතයෙහිත් මෙයින් චුතව යායුතුවූ සත් ජාතියක් දනිමි. තවද ජනප්‍රධානවූ මහරජ්ජුරුවන් වහන්ස, අතීතයෙහි මාගේ යම් සත්වැනි ජාතියෙක්වීද? ඒ සත්වැනි ජාතියෙහි මගධරට රජගහනුවර තරහල් පුත්‍රයෙක්වීමි. තරහල් පුත්‍රව උපන්නාවූ මම පාපමිත්‍රයකු කරා පැමිණ බොහෝ

කුසල් කෙළෙමි. එසේම පාපමිත්‍රයන් හා එක්ව පරස්ත්‍රීන් සෙවනය කරන් නමෝ අජරාමරයන් මෙන් ඒ ඒ තැන ධූතීව ඇවිද්දම්හ. ඒ ජාතියෙහි මා විසින් කළාවූ ඒ පරදාරකර්මය අළුයෙන් සැඟවුනු ගින්නක් මෙන් භවයෙන්ප්‍රච්ඡන්නව නිධානකොට තබනලද වස්තුවක්සේ අවකාශයක් ලත් කල්හි මතු විපාක දෙනුව සිටියේය. නැවත අන් පාපකර්මයක් හෙතුකොටගෙණ වංග නම් රට උපන්මි. තවද මහරජ්ජුරුවන් වහන්ස, කොසඹෑනුවර සප්තවිධ ධ්‍යානයෙන් සමෘද්ධවූ වස්ත්‍රාභරණයෙන් පිරුණාවූ නිධානකොට තබන ලද බොහෝ වස්තුඇති සිටුකුලයෙක සත්කාර ගරුකාර කොට සියල්ලවුන් විසින් පුදනලද එකම පුත්‍රයෙක්වීමි. කොසඹෑනුවරදී මධුරවිපාකවූ කුශලකර්මයෙහි ඇලුනාවූ ප්‍රාඥවූ ශ්‍රවණ ධාරණයෙන් සමන්විතවූ ගුණ ඇති මිත්‍රයෙකු සෙවනය කෙළෙමි. මහ රජ්ජුරුවන් වහන්ස, ඒ කල්‍යාණ මිත්‍රයා දන ශීලාදීවූ කුශලකර්මයෙහි මා පිහිටුවිය. තුදුස්වක් පොහොයෙහිද පසළොස්වක් පොහොයෙහිද නිතර පෙහෙවස් විසීමි. එකල මා කළාවූ ඒ කුශලකර්මයාදිය දක්නාතුරු කරණලද නිධානයක් මෙන් මතු විපාක දෙනුව. භවයෙන් සැඟවී සිටියේය, ඊට අනතුරුව මගධරටදී පර දූරකර්ම සඞ්ඛ්‍යාතවූ යම් අකුශල කර්මයක් කරණලද්දේවීනම් ඒ පරදාර කර්මයාගේ විපාකය හලාහල විෂ සහිත භොජනයක් අනුභවකොට සිටියාවූ සත්ත්වයෙක් හට ඒ කර්කශවූ හලාහලවිෂය පසුව කිපෙන්නාක් මෙන් කාලාන්තරයකින් විපාක දීම් වශයෙන් මා කරා පැමිණියේය.

තවද මහරජ්ජුරුවන් වහන්ස, කොසඹෑ නුවර සිටුකුලයෙන් චුතව මම භයානකවූ රෞරව නරකයෙහි මා කළාවූ ඒ පරදාර කර්මය හෙතුකොටගෙණ බොහෝ කලක් පැසුනෙමි. ඒ දුක් සිහිකරන්නාවූ මම සිතට සැපයක් නො ලබමි. මෙසේ මා සිතට භය උපදනේය, ඒ රෞරව නරකයෙහි ආයු පමණින් බොහෝකලක් දුක්විඳ ඒ දුක් ගෙවා රෞරව නරකයෙන් චුතව කණ්ණිට නම් රට බීජොද්ධරණය කරණලදුව ශක්තිසම්පන්නවූ එක්තරා එළුවෙක් වීමියි. මෙසේ තමන් අතීතයෙහි අනුභව කළාවූ දුක් දක්වන්නෝ ඒ එළුවා වූකලී ශක්තිසම්පන්නවූ බැවින් පිටට නැගී ඔහු ලවා උසුලවාගෙණ යන්නාහ. යානා වෙහිත් යොදන්නාහ. එපවත් දක්නාවූ රාජකුමාරිකාවෝ මෙසේ කීහ. මහ රජ්ජුරුවන් වහන්ස, රාජපුත්‍රයන් හා අමාත්‍ය පුත්‍රයෝ මා පිටට නැගත් රථයෙහි යොදාගෙණත් මා ලවා උසුලවා ගෙණ යන්නාහ. ඒ කවර කර්මවිපාකයෙක්ද? යත් මා පූර්ව ජන්මයෙහි කරණලද පරදාර සෙවන සංඛ්‍යාතවූ අකුශල කර්මයාගේ විපාකය වන්නේය. රෞරව නරකයෙහි උත්පත්තියත් එළුව උපන් කල කළ බීජොද්ධරණයත් පිටින් ඉසිලීමත් රථ හා ගැල් ආදියෙහි යෙදීමත් යන මේ සියල්ලම පරස්ත්‍රීන් සෙවනයෙහි විපාක වන්නේය. ඒ එළු යෝනියෙන් චුතව අවුන් ආරණ්‍යයෙහි වානර යොනියෙක පිළිසිඳගන්නේය. එකල්හි වානරපොතකයා උපන් දවස්ම වානරෙන්ද්‍රයාට දැක්වූහ. යූථපතිවූ වානරයා මාගේ පුතු මෙහි ගෙණවයි සමීපයට ගෙන්වා වැළඳගන්නා එකක්හු මෙන් නරකොට මැඩ අල්වාගෙණ වානර පොතකයා අඩව අඩවා දතින් ඩැහැ බීජොද්ධරණය කෙළේය. එපවත් දක්නාවූ රාජකුමාරිකාවෝ මෙසේ කිවුය. මහ රජ්ජුරුවන් වහන්ස, මම ඒ එළුයෝනියෙන් චුතවූයෙම් මහවනයෙහි වානරව

උපන්මි. එකල්හි තෙජස් ඇත්තාවූ ප්‍රධාන වාතරයා විසින් දතින් ඩැහැ උපුටා පියතලද ඵලය ඇත්තෙම්වීමි. එකල්හි බීජොඞරණයට පැමිණීමත් පූර්‍වජන්මයේ කළ පරදාරකර්‍මයාගේ විපාකයෙන් වූයේයයි කීහ.

ඉක්බිත්තෙන් අනාගතවූත් ජාති දක්වන්නාවූ රාජකුමාරිකාවෝ මෙසේ කීහ. රජ්ජුරුවන් වහන්ස, ඒ වාතරයොනියෙන් චුතවූ මම සවර්‍ණ නම් රට ගොන්ව උපනිමි. එසේ ගොන්ව ඉපද වසු අවස්ථාවෙහි මඩනාලද ඵලය ඇත් තෙම් ජවබල සම්පන්නවීමි. එසේ හෙයින් බොහෝකල් මා විසින් ඉතා බරවූ රථ යානා අදනා ලදිමි. එබඳුවූ බර ඉසිලීමත් පූර්‍වජන්මයෙහි කළ පරදාරකර්‍ම යෙහි විපාකයෙන්ම වන්නේය, තවද රජ්ජුරුවන් වහන්ස, ඒ ගවයොනි යෙන්චුතවූ මම වැදුරට ධනධාන්‍යාදියෙන් සමෘද්ධවූ සිටුකුලයක උපනිමි. එබඳුවූ සමෘද්ධ කුලයෙහි ඉපද දුලීහවූ මනුෂ්‍යාත්තභවයකුත්ලැබ නොගැණී නොපිරිමිව නපුංසකව උපනිමි. ඒ ඉපදීමත් පූර්‍වයෙහි කළ පරදාර කර්‍මයාගේ විපාකයෙන් වන්නේය. තවද මහරජ්ජුරුවන් වහන්ස, ඒ නපුංසකාත්ම භාවයෙන් චුතවූ මම තව්තිසා භවනයෙහි නන්‍දනොද්‍යානයෙහි කැමති කැමති ආත්මභාව මවාගත් නව සමණීවූ දිව්‍යාප්සරාවක්ව උපනිමි. එසේ උපන්නාවූ මම විසිතුරු දිව්‍ය වස්ත්‍රාභරණ ඇත්තෙම් බහා පලඳනාලද මිණිකොඩොල් ඇත්තෙම් නැටීම් ගී කීම් ආදියෙහි දක්‍ෂව අපමණවූ දිව්‍යානුභාවයෙන් යුක්තව ශක්‍රදෙවෙන්ද්‍රයන් වහන්සේට අගමෙහෙසුන්වීමි. මහරජ්ජුරුවන් වහන්ස. තවුතිසා භවනයෙහි සිටියාවූ මම මේ යථොක්තවූ ජාතීන් සිහි කෙළෙමි. මෙයින් චුතවූ අනාගත යෙහි යම් අනික් ජාතියට යන්නෙම්ද? එසේ අනාගතවූ සත්ජාතියකුත් සිහි කෙළෙමි. ඒ මගධරට සවර්‍ණකාර පුත්‍රව කළාවූ පරදාරකර්‍මය නරකය එළු වඳුරු ගොන්, නපුංසකාදී මෙතෙක් ජාතියෙහි උපදවා දුක් විඳුවා ඒ අකුශලකර්‍මය ක්‍ෂයවූ පසු කොසැඹෑ නුවරදී කළාවූ දාන සීලාදී සුචරිත කර්‍මය මෙතෙක් කල් තිබී දැන තමාගේ කලට අවුත් විපාක දෙන්නට සිටියේය. මේ මියුලු නුවරින් චුතව මම දිව්‍ය මනුෂ්‍ය සංඛ්‍යාතවූ සුගතියෙහි චුතිප්‍රතිසන්ධි වශයෙන් ඇවිදිමි.

මහරජ්ජුරුවන් වහන්ස, වැදුරට නපුංසකව උපන් ජාතිය, දෙව්ලොව දිව්‍යස්ත්‍රීව උපන් ජාතිය, මේ මියුලු නුවර උපන් ජාතියයි මෙසේ සත් ජාතියක් ඇත්තෙමි. සතතයෙන් දිව්‍ය මනුෂ්‍යයන් විසින් කරණලද පූජාසත්කාරයෙන් සම්භාවනා ලදිමි. දිව්‍යලෝකයෙහි උපන් පස් ගතියය, මේ මියුලුනුවර උපන් ගතියයයි මෙසේ සජාතියෙක ස්ත්‍රීභාවයෙන් නොමිදුනෙමි. මහරජ්ජුරුවන් වහන්ස, මෙයින් චුතව මත්තෙහි සත් ජාතියෙක දිව්‍යලොකයෙහි මහත්වූ ඉර්ධ්‍යානුභාව ඇති දිව්‍යපුත්‍රව උපදනෙමි. මා ඒ නන්‍දනොද්‍යානයෙන් චුතව මේ මනුෂ්‍යලොකයෙහි උපන් නිසාව කොඳුන අද දක්වා කඳුකොට මාගේ පරිවාර ස්ත්‍රීහු මා නිසා මල් ගොතන්නාහුය. යම් දිව්‍යපුත්‍රයෙක් ගසින් වැටෙන මල් අත එළවාගණී නම් ඒජවන නම් දිව්‍යපුත්‍රයා ඒ අතරතුර ජාතියෙහි මාගේ ස්වාමිපුත්‍ර වන්නේය. මහ රජ්ජුරුවන් වහන්ස, දූන් මට යම් මේ සොළොස් අවුරුද්දක් ඇත්නම් ඒ සොළොස් අවුරුද්ද දිව්‍යලොකයට මඳ ඇසිල්ලෙක් වන් නේය. මනුෂ්‍ය ලෝකයෙහි අවුරුදු සියයක් (තව්තිසා) දිව්‍යලෝකයට එක දව

සෙක් වන්නේය. මෙසේ මෙබඳු ආයුෂයෙන් යුක්තවූ අසඞ්ඛ්‍ය ජාතියෙකවූවත් කුශලාකුශල කර්මය මෙකී පරිද්දෙන් සත්ත්වයන් අනුව යන්නේය. විපාක දීමුත් කුශලාකුල කර්මය අතරෙහි නොනස්නේයයි කීහ.

ඒ රුජා නම් කුමාරිකාවෝ වූකලී (දිව්‍යලොකයෙහි දිව්‍යස්ත්‍රීව උපන් කල) දිව්‍යලෝකයෙහි සිට මම මෙබඳුවූ දිව්‍යලොකයකට කොයිසිට ආයෙම්දෝ හෝයි බලන්නාහු වැදෑරට මහාභොග කුලයෙහි නපුංසකාත්ම භාවයෙන් චුතව ඒ දිව්‍යලොකයෙහි උපන් බව දුටහ. ඉක්බිති කවර කුශල කර්මයකින් මෙබඳු සිත් කළුවූ ස්ථානයෙක උපන්නෙම් දෝහෝයි බලන්නාහු කොසඹෑ නුවර සිටු කුලයෙහි ඉපද කළාවූ දනාදිවූ කුශලකර්මය දැක ඒ කුශලකර්ම විපාකයෙන් මෙතැන්හි උපනිම්යි දුටහ. අනතුරවූ නපුංසකාත්ම භාවයෙහි උපන්නෙම් කොයි සිට ආයෙම්දෝහෝයි බලන්නාහු සවණ්ණරට ගවයොනියෙහි ඉපද දුක් අනුභව කළ නියාව දුටහ. ඉක්බිති අනතුරු ජාතිය සිහිකරන්නාහු වානර යොනියෙහි ඉපද බීජොත්පාටනය කළ නියා දුටහ. ඊට අනතුරුව සිහි කරන්නාහු සණ්ණාව රට එළුයොනියෙහි ඉපද බීජොත්පාටන ලත් නියාව දුටහ. ඊට අනතුරුව සිහි කරන්නාහු රෞරව නරකයෙහි උපන් නියාව දුටහ. නරකයෙහිත් තිරිසන් යොනියෙහිත් ඉපද ඉනුභව කළාවූ දුක් සිහිකරන්නාවූ තැනැත්තන්හට භය උපන, ඉක්බිති කවර අකුශල කර්මයකින් මෙබඳුවූ දුක් අනුභව කෙළෙම්දෝහෝයි සවැනි ජාතිය බලන්නාහු ඒ ජාතියෙහි කොසැඹෑ නුවරදී කරණලද කුශලකර්මය දැක සත්වැනි ජාතිය බලන්නාහු මගධ රට පාපමිත්‍රයා නිසා කරණලද පරදාරකර්මය දැක මේ මහත් දුක් මා විසින් අනු භව කරණලදැයි දත්හ. ඉක්බිත්තෙන් එයින් චුතව අනාගතයෙහි කොයි උප දිම්දෝහෝයි බලන්නාහු එහි ආයු පමණින් සිට නැවත ශක්‍රදෙවේන්ද්‍රයන්ටම අගමෙහෙසුන්ව උපදිම්යි දත්හ. මෙසේ නැවත බලන්නාහු තුන්වැනි ආත්ම භාවයෙහිත් ශක්‍රදෙවේන්ද්‍රයන්ටම අගමෙහෙසුන්ව උපදිම්යි දත්හ. සතරවැනි ජාතියෙහිත් එසේම දත්හ. තවද පස්වැනි ජාතියෙහි වූකලී එම දිව්‍යලොක යෙහි ජවන නම් පුත්‍රයාහට අගමෙහෙසුන් වෙම්යි දත්හ. සවැනි ජාතියෙහි අඞ්ගාති රජ්ජුරුවන්ගේ අග්‍රමහෙසිකාවන් කුස උපදිම්යි දත්හ. ඒ උපන් ජාති යෙහි මට රුජාවෝයයි නමෙක් වන්නේයයි දැන ඊට අනතුරුව කොයි උපදිම් දෝහෝයි බලන්නාහු සත්වැනි ජාතියෙහි මියුලු නුවරින් චුතව තව්තිසා භවන යෙහි මහත්වූ ඉර්ඞ්‍යානුභාව ඇති දිව්‍යපුත්‍රව ඉපද ස්ත්‍රීභාවයෙනුත් මිදෙම්යි දත්හ. එසේ දැන කුමාරිකාවෝ රජ්ජුරුවන්ට කියන්නාහු දිව්‍යලෝකයෙහි සිටියාවූ මම අතීතයෙන් සත් ජාතියක් හා අනාගතයෙන් සත් ජාතියක් සිහි කෙළෙම් කියා නැවත රජ්ජුරුවන් වහන්ස, දෘෂ්ටධර්මවෙද්‍ය කර්මය එම ආත්ම භවයෙහි විපාක දෙන්නේය. උපපද්‍යවෙද්‍යකර්මය අනතුරු ආත්මභාවයෙහි විපාක දෙන්නේය. අපරාපර්‍ය්‍යවෙද්‍යකර්මය වූකලී විපාක නොදී අතරෙහි නොනස්නේය. මම පරදාරකර්මය විපාකයෙන් නරකයෙහිත් තිරිසන් යොනි යෙහිත් ඉපද මහදුක් අනුභව කෙළෙම්. මේ කාරණයෙනුත් පරලොව හා කුශලාකුශල කර්මයෙහි විපාක ඇතිනියාව දනමැනව ඉදින් නුඹවහන්සේ ගුණ ජීවකයාගේ බස් ගෙණ පරදාර කර්මය කළසේක් වීනම් මා විසින් අනුභව කරණ ලද දුක් හා සමානවූ දුක් අනුභව කරණසේක. එසේ හෙයින් එබන්දක් නො කළ මැනවයි ඒ රුජා නම් කුමාරිකාවෝ අඞ්ගාති රජ්ජුරුවන්ට අවවාද කළහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවන්ට ධර්මදෙශනා කරන්නාවූ කුමාරිකාවෝ මෙසේ කිවුය, යම් ස්ත්‍රී පුරුෂ කෙණෙක් උපනුපන් ජාතියෙහි පිරිමිවන කැමැත්තෝවූනම් ඒ ස්ත්‍රී හෝ පුරුෂයා හෝ දෙපා ඇති එකක්හු මඩවල හාත් තාක් මෙන් පරස්ත්‍රීන් පරපුරුෂයන් දුරුකරන්නේය. යම් ස්ත්‍රියක් උපනුපන් ජාතියෙහි පුරුෂවනු කැමැත්තී නම් සුජාතා නම් අසුරකන්‍යාව ප්‍රධානකොට ඇති අවශෙෂ දිව්‍යාඞ්ගනාවන් ශක්‍රදෙවෙන්ද්‍රයන්ට උපස්ථාන කරන්නාක් මෙන් තමන්ගේ ස්වාමිපුත්‍රයාට අනවරතයෙන් සකසා අත් පා මෙහෙවර කරන්නේය. යම් සත්වයෙක් දිව්‍යවූ උපභොග පරිභොග වස්තු හා දිව්‍යවූ ආයුෂ හා දිව්‍යවූ යසස් හා දිව්‍යවූ පංචකාම සැප කැමැත්තේ වීනම් පණිවා ආදීවූ පව්කම් දුරින් දුරුකොට ත්‍රිවිධවූ සුචරිත ධර්මයෙහි සකසා හැසිරෙන්නේය. නුවණැත්තාවූ ස්ත්‍රියක්වත් පුරුෂයෙක්වත් කායින් සිඬවන ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාරයයි කියනලද ත්‍රිවිධවූ අකුශල ධර්මයෙහිද තෙපු ලෙන් සිඬවන මෘෂාවාද, පිසුනාවාච, ඵරුෂාවාච, සම්ඵප්‍රලාපයයි කියනලද චතුර්විධ අකුශල ධර්මයෙහිද, මනසින් සිඬවන අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි යයි කියනලද ත්‍රිවිධ අකුශල ධර්මයෙහිදැයි මෙසේ දශඅකුශල ධර්මයෙහි විරමණ වශයෙන් අප්‍රමාද වීනම් මහරජ්ජුරුවන් වහන්ස! එය ස්ත්‍රී පුරුෂවූ තමනට වැඩ පිණිස වන්නේය. තවද මහරජ්ජුරුවන් වහන්ස! මේ ලෝකයෙහි යම් සත්වකෙණෙක් පරිවාර සම්පත් ඇත්තෝද සත්කාරයෙන් සම්පූර්ණවූ අවශෙෂ සියලු සම්පත් ඇත්තෝද ඒ සත්වයන් විසින් පූර්වජාතියෙහි සැක නැතිව කුසල් කරණලදහ. එහෙයින් මේ සත්වයෝ වුක්තප්‍රකාර සියලු සම්පත් ලබන්නාහ, වර්ණසංස්ථාන ජාත්‍යාදීන් වශයෙන් නානාප්‍රකාරවූ සියලු සත්වයෝ තමන් තමන් කළ කුශලකර්මයාගේ විපාකම අනුභව කරන්නාහ. මව්පියන් විසින් කළ කුශල් දූදරුවන්ට විපාක නොදෙන්නාහ, දූදරුවන් කළ කුශල් මවුපියන්ට විපාක නොදෙන්නාහ. අවශෙෂවූ නඟුන් මල් බෑබුන් ආදීන් විසින් කළ කුසල් තමන් තමන්ට මුත් අවශෙෂයන්ට විපාක නොදෙන්නාහ. එබැවින් මහරජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේත් සිතාබැලුව මැනව දිව්‍යාඞ්ගනාවන් හා සමානවූ සර්වාභරණයෙන් අලංකෘතවූ රන්දලින් වැසුනාවූ නුඹවහන්සේගේ මේ සොළොස්දහසක් පමණ පුරාඞ්ගනාවන් හා ධනධාන්‍ය යශොකීර්ති පරිවාර සම්පත් ආදීවූ මේ ඓශ්වර්ය සම්පත් කිසිවෙක්හි නිර පෙක්ෂකව නිදුසීමෙන් ලබන ලද්දේදෝ හෝ මංපැහැරීම් උමං බිඳීම් ආදීවූ අනෙකප්‍රකාර පාපයන් කොට ලබන ලද්දේදෝ හෝ දානසීලාදීවූ දශකුශල කර්මයන් කොට ලබන ලද්දේහෝයි නුඹවහන්සේත් සිතාබැලුව මැනවැයි කියා මනාවූ ව්‍රතසමාදන ඇති රුජා නම් කුමාරිකාවෝ මෙබඳුවූ මධුර වචන යෙන් අඞ්ගාති නම් පියරජ්ජුරුවන් සතුටු කළාහ. මංමුළා එකක්හට මං කියන්නාක්හු මෙන් දෘෂ්ටිමූඪවූ තමන්ගේ පියරජ්ජුරුවන්ට සුගතිමාර්ගය කියා සුචරිත ධර්මය හා නොයෙක් කාරණා දක්වා කීහ.

මෙසේ ඒ රුජා නම් කුමාරිකාවෝ පෙරවරු පටන් සකල රාත්‍රියෙහි පියරජ්ජුරුවන්ට ධර්මදෙශනා කොට දෙවයන්වහන්ස! මිථ්‍යාදෘෂ්ටි ඇති ගුණ නම් තිවවාගේ බස් නොගත මැනව. මෙලෝ ඇත, පරලෝ ඇත, කර්ම ඇත,

කම්ඵල ඇත, මව් ඇත, පියා ඇත, කළාවූ කුශලාකුශලයෙහි විපාක ඇතැයි කියන්නාවූ මෙබඳු කල්‍යාණ මිත්‍රයක්හුගේ බස් ගතමැනව, නොතොටින් එතර නොවූවමැනවැයි කීහ. මෙසේ නොයෙක් කාරණා කියාද පියානන් මිථ්‍යාදෘෂ්ටියෙන් අරවන්නට නොපොහොසත්වූහ. අඞ්ගාතිරජ්ජුරුවෝද දුවනියන්ගේ බස් අසා සතුටුවූහ. දෙමව්පියෝ වනාහි ප්‍රියවූ දරුවන් විසින් කියන ලද වචනයෙහි සතුටුවෙති, ඒ ගත්තාවූ දෘෂ්ටි නොහරිති. ඒ මියුලුනුවරද රුජා නම් රාජ ධීතාවෝ පියරජ්ජුරුවන් වහන්සේට ධර්මදෙශනා කොට මිථ්‍යා දෘෂ්ටි අරවත්ලයි එකකොලාහලවිය. නුවණැත්තාවූ රාජකන්‍යාවන් වහන්සේ අද දවස් පියානන්වහන්සේ මිථ්‍යාදෘෂ්ටියෙන් මුදා නුවරවාසීන්ට සෙතක් කරණසේකැයි මහජනයා සන්තොෂයට පැමිණියෝය. ඒ රාජකුමාරිකාවෝද පියරජ්ජුරුවන් ගිවිස්වාගත නොහෙන තැනැත්තෝ කරමින් සිටි උත්සාහය නොහැරම යම්කිසි උපායකින් මාගේ පියානන්වහන්සේට සැපයක් කෙරෙම්යි දෙහොත් මුදුනෙහි තබා සතරදිගය, සතර අනුදිගය ආකාශය, පාතාල යයි කියනලද දසදිග වැඳ මේ ලෝකයෙහි ලොව රක්නාවූ ධාර්මිකවූ ශ්‍රමණ බ්‍රාහ්මණාදීහුද, ලෝකපාල දේවතාවෝද, ශක්‍රාදී දේවතාවෝද, බ්‍රහ්මයෝද යන සියල්ලෝම ඇත, ඔහු හැමදෙනම අවුත් තමන්ගේ බලයෙන් මාගේ පියානන් වහන්සේගේ මිථ්‍යාදෘෂ්ටි අරවන්නට උත්සාහ කෙරෙත්වයි උන්වහන්සේගේ ශීල සමාධ්‍යාදී ගුණයක් නැතත් මාගේ ශීලසමාධි ගුණයෙන්ද මාගේ ශක්තියෙන්ද මාගේ සත්‍ය වචනයෙන්ද මේ සියල්ල හේතුකොටගෙණ අද හැම දෙවියෝම මෙතනට අවුත් මුන්වහන්සේගේ මිථ්‍යාදෘෂ්ටිය හරවා සියලු ලෝකයාහට සැපයක් කෙරෙත්වයි කියා නමස්කාර කළහ.

එකල්හි මහබෝසතානෝ නාරද නම් මහබ්‍රහ්මව ඉපද උන්හ, ඒ මහ බෝසතානෝ තමන්ගේ මෛත්‍රී භාවනායෙහි ආනුභාවයෙන්ද සියලු සත්ත්වයන් කෙරෙහි කරණලද දයායෙන්ද සියලු සත්ත්වයන්ට වඩා මහත් බැවින්ද දන මානාදිවූ සුචරිත කිරීමෙන් මොනවට පිළිපන්නාවූද ප්‍රාණඝාතාදී අකුසල් කිරීමෙන් නපුරුකොට පිළිපන්නාවූද සත්ත්වයන් දක්නා පිණිස කලින් කල මනුෂ්‍ය ලෝකය බලන්නාහ එදවස්ද ඒ නාරද නම් මහාබ්‍රහ්මයානෝ මනුෂ්‍යලෝකය බලන්නාහු ඒ රුජා නම් රාජකන්‍යාව පියානන්ගේ මිථ්‍යාදෘෂ්ටි හරවන පිණිස ලොව රක්නාවූ දේවතාවන්ට නමස්කාර කරණ නියාව දැක මා හැර අනෙකකු මේ රජ්ජුරුවන්ගේ මිථ්‍යදෘෂ්ටි හරවන්නට සමර්ථයෙක් නැතැයි සිතා අද මා විසින් රාජකුමාරිකාවන්ට සංග්‍රහද රජ්ජුරුවන්ට හා පිරිවර ජන යන්ට සවස්ති භාවද කොට ඊම සුදුසුයයි නිශ්චයකොට කවර වේශයක් ගෙණ යෙම්දෝහෝයි සිතා මනුෂ්‍යයන්ට ප්‍රව්‍රජිතයෝ ප්‍රියද වෙති, ගරුකට යුතුද වෙති, ඇදහියයුතු වචනයන් ඇත්තාහුද වෙති. ඒ කාරණයෙන් ප්‍රව්‍රජිත වේශයක් මවාගෙණ යෙමියි සනිටුහන්කොට ප්‍රසාදවහවූ රන්වන්වූ ශරීර ඇති මනුෂ්‍යාත්මභාවයක් මවාගෙණ මනොඥවූ ජටාමඬුල්ලක් බැඳගෙණ ජටාව අතරෙහි රන් ඉද්දක් බහා ඇතුළත්වූ ඉද්ද මත්තෙහි මොණර පිල් තනා රන්වූ පවුලක් හැඳ රත්තරුවෙන් විසිතුරු කරණලද රිදීමයවූ අඳුන් දිවිසමක්

එකාංශකොට බහා මුතුමයවූ සාල්ලෙක්හි තබතලද සුවර්ණමයවූ භික්ෂාභාජන යෙක්හි රත්කෙණ්ඩියක්ද තුන්තැනකින් වක්වූ කදබැඳ මුතුමයවූ සාල්ලෙක්හි තබතලද පබළුමයවූ කමඩලාවක්ද ඇරගෙණ මෙබඳුවූ තාපස වේශයෙන් උප ලක්ෂිතව ආකාශතලයෙහි චන්ද්‍ර දිව්‍යපුත්‍රයා මෙන් බබලමින් ආකාශයෙන් අවුත් මොනවට සරහන ලද්දාවූ චන්ද්‍රක ප්‍රාසාදයාගේ මතුමහල්තලයට වැද අඞ්ගාති රජ්ජුරුවන්ට අභිමුඛව හිඳ ආකාශයෙ සිටියාහ. ඒ අර්ථය ප්‍රකාශ කරන්නාවූ ලොව්තුරා සර්වඥයන් වහන්සේ මෙසේ වදාළසේක.

එම්බා මහණෙනි, ඉක්බිත්තෙන් නාරද නම් බොධිසත්ත්වයෝ බ්‍රහ්ම ලොකයෙන් (ජම්බුවීපය අපෙක්ෂා කොට) මනුෂ්‍ය ලොකයට අවුත් ගුණ නම් ආජීවකයාගේ සමීපයෙන් ගන්නාලද මිථ්‍යාදෘෂ්ටි ඇති අඞ්ගාති නම් රජ්ජුරු වන් කෙරෙහි අනුකම්පායෙන් අවුත් අමාත්‍ය සමූහයා විසින් පිරිවරණ ලදුව උන්නාවූ ඒ රජ්ජුරුවන්ගේ ඉදිරියෙහි ඒ ප්‍රාසාදය සමීපයෙහි පියවර නො පෙණෙන්නා ස්ථානයෙහි පියවර දක්ව දක්වා ආකාශයෙහි සිටියාහ. එතනට පැමිණියාවූ ඒ නාරද තපස්වීන් රුජා නම් කුමාරිකාවෝ දූක දූන් මා කෙරෙහි අනුග්‍රහයෙන් මාගේ පියානන් කෙරෙහි කරුණායෙන් එක් දිව්‍යරාජයෙක් ආයේවතැයි සුලහින් නැමෙන ලද රන්කෙහෙල් කඳක් පරිද්දෙන් නම්නව නාරද මහාබ්‍රහ්මයන් පසඟපිහිටුවා වැන්දාහ. අඞ්ගාති රජ්ජුරුවෝ ඒ මහා බ්‍රහ්මයානන් දූක බ්‍රහ්ම තෙජසින් මඩනා ලද්දාහු තමන් උන්නාවූ අස්නෙහි ඉඳිනට අපොහොසත්ව බැස බිම සිට ඒ බ්‍රහ්මයානන් ආ තැන්ද නාමගෝත්‍ර යද විචාරන්නාහු දිව්‍යරාජයෙකුට බඳුවූ ශරීරවර්ණ ඇති චන්ද්‍ර දිව්‍යපුත්‍රයා මෙන් ආලොක කෙරෙමින් මා සමීපයෙහි සංචාරණය කරන්නාවූ තෙපි මෙත නට කොයි සිට අවුද? විචාරණ ලද්දාවූ මට තොපගේ නාමගොත්‍රය කියව, මනුෂ්‍ය ලොකවාසීහු තොප කවුරුතැයි දනිද්දූයි විචාළහ.

ඉක්බිත්තෙන් නාරද නම් බ්‍රහ්මයානෝ මේ රජ්ජුරුවෝ පරලොවෙක් නැතැයි හඟනාහ. ඔහට පරලොව දක්වා කියමියි සිතා කියන්නෝ මම වනාහි දූන් දිව්‍යලොකයෙන් මෙතනට ආමි. චන්ද්‍ර දිය්‍යපුත්‍රයා පරිද්දෙන් බබලමින් මේ ස්ථානයෙහි හැසිරෙමින් තොප විසින් විචාරණ ලද්දාවූ මම මාගේ නාම ගොත්‍රය කියමි. මා මහානාරද කාශ්‍යපයෝයයි සත්ත්වයෝ දනිතියි කීවූය. ඉක් බිත්තෙන් රජ්ජුරුවෝ පරලොව පසුවත් විචාරමි, මෙසා මහත් ආනුභාවයක් ඇතිව ආකාශයෙහි ඇවිදින්නට සමර්ථවූ ඉර්ධිකාරණා පළමුකොට විචාරමියි සිතා මෙලෙසින් විචාළහ. එම්බා නාරද නම් තපස්වීනි, තොපගේ යම්බඳුවූ ශරීරවර්ණයක්වේද? එයත් ආකාශයෙහි සිටීමත් ඇවිදීමත් එකාන්තයෙන් ඉතා ආශ්චර්‍ය්‍යය, මේ කාරණය තොප අතින් විචාරමි. තොප මෙබඳුවූ ඉර්ධි යට කවර කාරණයක් මුල්කොටගෙණ පැමිණියෝදූයි විචාළහ. නාරද තාපස යානෝ කියන්නෝ එම්බා රජ්ජුරුවෙනි, වාක්සත්‍යයද ත්‍රිවිධවූ සුචරිත ධර්මය හා කිසුණුපිරියම් නිමිත්තකොට පැමිණෙන්නාවූ ප්‍රථම ධ්‍යානාදි ධ්‍යාන ධර්ම යද චක්ෂුරාදි පඤ්චෙන්ද්‍රියයන්ගේ මනාකොට පිහිටුවීමද තමාගේ ක්ලෙශ පරිත්‍යාගය හා දානමානාදි දෙය්‍යධර්ම පරිත්‍යාගයද යන බුඩාදි මහොත්තමයන්

විසින් පුරුදු කරණලද මේ පුරාතන ගුණධර්‍මයෝ අප විසින් පූර්‍ව ජාතියෙහි (සම්පූර්‍ණ) කරණලදහ. මේ යථොක්තවූ කුශල ධර්‍මයන් මොනවට සෙවුනා ලද්දාවූ සත්ත්වයන් විසින් දිව්‍යමයවූ ශරීරවර්‍ණද ආකාශයෙන් කැමති දිගකට යන්නට නිසිවූ ඉර්ධිද ලබන්නාහයි කිවුය. රජ්ජුරුවෝ ඒ නාරද තපස්වීන් මෙලෙස ධර්‍මෝ පේත කථා කියමින් සිටියදීත් මිථ්‍යාදෘෂ්ටිය තමා තරකොට ගන්නාලද බව හේතුකොටගෙණ පරලොවක් නොඅදහන්නාහු කුශලයන්ගේ විපාකයෙක් ඇද්දෝහෝයි නැද්දෝහෝයි විචාරන්නාහු මෙසේ කීවාහ. කුසල්කිරීම මහත්ඵල මහානිශංස ඇතිබව තොප විසින් ආශ්‍රයකොට කියනලද, ඉදින් ඒ කුශලකරණය යම්පරිද්දෙකින් කිවුද? ඒ කාරණය තොප අතින්විචාරමි. මනාව ප්‍රකාශකොට කියාලවයි කීහ. නාරද තාපසයෝ කියන්නෝ මේ මියුලුනුවරට නාථකවූ රජ්ජුරුවෙනි, විචාළ යුතුවූ යම්කිසි ප්‍රශ්නයෙක් ඇත්තම් තොප විසින් යම් සැකයක් කරණලද්දේ වීනම් ඒ සියල්ලම විචාරව ඊට කාරණා කිමෙක්දැ?යි මාගේ නුවණින්ද ඒ කුශධර්‍මයන්ගේ උත්පත්ති කාරණයෙන්ද තොප ගිවිස්වා සැක නැති බවට පමුණුවාලමියි කීවාහුය. නැවත රජ්ජුරුවෝ කියන්නෝ නාරද තාපසයෙනි, තෙපි බොරුවක් නොකියා කියව, මේ ලෝකයෙහි යම් සත්ත්වයක්හු විසින් දෙවියෝ ඇත, මව්පියෝ ඇත, මෙලොව ඇත, පරලොව ඇත, කර්‍ම ඇත, කර්‍මඵල ඇතැයි කියන ඒ සියල්ලම තොප අතින් විචාරමි. ඒ ප්‍රකාශකොට කියාලවයි කීවාහ. නාරද තාපසයෝ කියන්නෝ රජ්ජුරුවෙනි, දෙවියෝත් ඇත, මව්පියෝත් ඇත, මෙලොවත් ඇත, පරලොවත් ඇත, සුකෘත දුෂ්කෘත කර්‍මයන්ගේ විපාකයත් ඇතැයි මෙලොව පරලොව දන්නා යම් සත්ත්වයෙක් කීයේ වීනම් ඒ ඇත්තාමය, වස්තුකාම ක්ලේශකාමයෙහි ගිජුවූ මොහයෙන් මුළාවූ සත්ත්වයන්ට මෙලොවත් පරලොවත් වන්නාවූ විපාක නොදනෙතියි කීවාහ.

ඉක්බිත්තෙන් නාරද තාපසයන් කී බස් අසා හාසයකොට කියන්නාවූ රජ්ජුරුවෝ නාරද තාපසයෙනි, මළාවූ සත්ත්වයන්ට පරලෙව්හි වසන්නාවූ ස්ථානයක් ඇතැයිකියා තෙපි අදහව් නම් මෙලොවදී මට කහවණු පන්සියයක් නයට දෙව, තොපට පරලොවදී පොලී හා සමග කහවණු දහසක් දෙමියි කීහ. ඉක්බන්තෙන් මහබෝසතානෝ පර්‍ෂත් මධ්‍යයෙහි ඒ රජ්ජුරුවන්ට නිග්‍රහ කොට කියන්නාවූ 'ඉදින් අප මේ තෙමේ සිල්වතැයි කියාද සබවසක්ම කියන්නේයයි කියාද ධාර්‍මික ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට මේ අවස්ථාවෙහි මෙසේවූ දෙය්‍ය ධර්‍මය පරිත්‍යාගකොට මෙසේවූ ප්‍රයෝජනයෙක් වන්නේයයි දතුමෝ නම් මොවුන්ට පොලිය කහවණු පන්සියයක් දෙමහ. තෙපි වනාහි සහසික ක්‍රියාවක් කරන්නාහ. මිථ්‍යාදෘෂ්ටිගෙණ දන්හල් විදා දුශීමගී යාචකයන් පලවා පරදාරාදීවූ නොයෙක් අකුසල් කොට මෙයින් චුතව නරකයෙහි උපදුව මෙසේ රෞද්‍ර ක්‍රියාකොට නරකයෙහි වැස දුක් විඳිනාවූ තොප කරා ගොස් කවරෙක් කහවණු දහස මට දෙවයි කියා ඉල්වන්නේවේද? තවද මහරජ්ජුරුවෙනි, මූන්ට මෙසේවූ පරිත්‍යාගයක් කොට මෙබඳු දෙයක් ලැබෙන්නේයයි දැනගන්නාවූ සැබෑ බසක්ම කියන සුළුවූ සිල්වත්වූ උට්ඨාන වීර්‍යයෙන් යුක්තවූ ශ්‍රමණ බ්‍රාහ්මණාදී උත්තමයන් විසින්

හරි තමන්ගේ ප්‍රයෝජනයෙහි සලසාගෙණ වස්තු උපදවාගෙණ අප සනාතක දෙය දෙවැනිව ගෙණහැර දෙන්නේයයි වස්තු ඇත්තෝ තුමූම සම්පත්තීන් පවරති. එසේවූ සථානයට දුන්දෙය ලැබෙත්තේයයි කිවුය. මෙසේ රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් විසින් මැඩ කියන ලද්දේ කීසිවකුත් නොවැට හෙන්නෝ මූවෙන් නොබැණ හුන්නාහ. මහජනයා තුටු පහටුව දිව්‍යවූ තපස්වීන්වහන්සේ මහත්වූ සෘද්ධි ඇතිසේක, මහත්වූ ආනුභාව ඇතිසේක, අද දවස් රජ්ජුරුවන් වහන්සේගේ මිථ්‍යාදෘෂ්ටි අරවනසේකැයි සියලු මියුලුනුවර එක කොලාහලවිය. මහබෝසතාතන්ගේ ආනුභාවයෙන් සත්යොදුන් පමණ මියුලුනුවර මුළුල්ලෙහි ඔවුන්ගේ ධර්‍මදෙශනාව නැසූ කෙණෙක් නම් නැත.

ඉක්බිත්තෙන් මහබෝසතානෝ මේ රජ්ජුරුවෝ ඉනා නරකොට මිථ්‍යාදෘෂ්ටි ගත්හ. නරක භයින් මොහු තැතිගන්වා මිථ්‍යාදෘෂ්ටි හරවා නැවත දිව්‍යලොක සම්පත්තිය දක්වා අස්වසමි සිතා මහරජ්ජුරුවෙනි! ඉදින් තෙපි තොප ගත් ලබ්ධිය නොහරණාහු වී නම් මෙපරිද්දෙන් අපමණවූ දුක් ඇති නරකයට යන්නාහුදැයි කිගා නිරය ප්‍රතිබඩවූ කථාවට පටන් ගත්හ. රජ්ජුරුවෙනි! මෙලොවින් ඒ නරකයට ගියාවූ තෙපි ලෝතුඩු ඇති කපුටු සමූහයා විසින්ද තුඩින් විද ඇද කඩා කන ලද ගාත්‍රා ඇතිව වැහෙන්නාවූ රුධිර ඇතිව මෙලෙසින් ඒ නරකයෙහි පැසෙන්නාවූ සත්ත්වයන් දක්නාහ. මෙලෙසින් නරකයෙහි පැසෙන්නාවූ තොප අතින් නරකයට ගොස් කවර නම් සත්වයෙක් මිස්සෙන් දහසක් මට දුන මැනවැයි ඉල්වන්නේ දැයි කීහ. ඒ කාලාපකාල නම් නරකය වර්‍ණනා කොට ඉදින් මේ නරකයෙහි උපදනේ වී නම් ලොකාන්තරික නරකයෙහි උපදනෙහියයි ඒ නරකයෙහි දෙස් දක්වනු පිණිස කියන්නෝ මහරජ්ජුරුවෙනි! ලොකාන්තරික නරකයෙහි නිර්‍ණයෝ උපදනාහ, ඒ නරකයෙහි චක්‍ෂුර්විඥානයාගේ උත්පත්තිය වලකන්නාවූ ඝනවූ අන්ධකාර ඇත්තේය. දරුණුවූ ස්වභාව ඇත්තේය. එහි චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනාත් ආලොක කොටගත නොහෙන්නාහ. රෑ දවලය යන විභාගයක් නොදන්නේය. එබඳුවූ සථානයට ගොස් වස්තු කැමැත්තාවූ කවර නම් සත්ත්වයෙක් මාගේකහවණු දහස දෙවයි කියා ඉල්වන්නේද? ඒ රජහට ලොකාන්තරික නරකය විස්තර හෙයින් වර්‍ණනා කොට මහරජ! මිථ්‍යාදෘෂ්ටිය නොහරනාවූ තෙපි උදක් මේ නරකයෙහිම දුක් විඳිනාහු නොවෙති. අතික් නරකයකත් දුක් විඳිනාහයි දක්වන්නාහු මෙසේ කීහ. එම්බා රජ්ජුරුවෙනි! මෙලොවින් චුතව පරලොවට පැමිණියාවූ සත්ත්වයන් කබුරුවන් පැහැ ඇත්තාවූද සමවන් පැහැ ඇත්තාවූද තර කැවුනාවූ ශරීර ඇත්තාවූද මහත් බල ඇත්තාවූද සුනඛයෝ දෙදෙනෙක් ගිනිගෙණ දිලියෙන්නාවූ යකඩමය දළවලින් ඔවුනොවුන් ඇද ඇද සුණුවිසුණු කොට කන්නාහ. තවද නරකයෙහි වසන්නාවූ සත්ත්වයාද දරුණුවූ ව්‍යාඝ්‍රයන් විසින්ද චණ්ඩ මෘගයන් විසින්ද සිඳිනා ලද්දාවූ ගාත්‍රා ඇතිව වැහෙන්නාවූ රුධිරයන් ඇතිව දුක් විඳින්නේය. එසේ පැසෙන්නාවූ තොප

අතින් පරලොවදී කවර නම් සත්ත්වයෙක් කහවණු දහස ඉල්වත්තේද? තවද රජ්ජුරුවෙනි, පූර්වජාතියෙහි අකුසල් කළාවූ කාලාපකාල නම් නරක යෙහි උපන්නාවූ පසමිතුරුවූ කාලාපකාල නම් නිරයපාලයෝ ගිනිගෙණ දිලියෙන්නාවූ ඊතලවලින්ද මොනවට සතගාත ලද්දාවූ මුවහත් ඇති අඩයටි වලින්ද දෙසිදුරුකොට අනින්නාහු වෙති. තවද රජ්ජුරුවෙනි, නිරය පාලයෝ වටකොටගෙණ නෙරයික සත්ත්වයන් ඇන දෙසිදුරු කරන්නාහ.

මෙසේ ජ්වලිතායුධයෙන් හැන විද බොහෝ දුකට පමුණුවන ලද්දාවූ නරකයෙහි වහ්නිජ්වාලා අතරෙහි දුක් ඉවසාගත නොහී ඔබ මොබ දිවන්නාහු ඇලයෙහින් බඩෙහින් ශරකුනත මුද්ගරාදියෙන් පහරණු ලබන්නාහු ප්‍රහුත තප්ත ජ්වලිතායුධයෙන් පළනලද බඩ ඇති තොප ඒ දුක් ඉවසාගත නොහී සැලෙමින් වෙවුලමින් දුක් විඳිනා තැනට ගොස් ඔබදී නයට දුන් කහවණු පන්සියය පොලී වැඩී ගියේය. එසේ හෙයින් පොලී හා සමග මස්සෙන් දහස දුන මැනවැයි නරකදුක් බලා නොබා සිටී කවර කෙණෙක් තොප අතින් නය ඉල්වද්ද? තවද රජ්ජුරුවෙනි, ඒ නරකයෙහි අඩයටිය, ශරය, තොමරය, හෙල්ලය යන අනෙකප්‍රකාරවූ ආයුධ නමැති වැසි නගා වසින්නේය, නැවත දරුණුවූ පව්කම් කළ නිරිසතුන් මුදුනෙහි ගිනිගෙණ දිලියෙන්නාවූ කිහිරඟුරු මෙන් ගිනිඅඟුරු ඉසි දිලියෙන්නාවූ ගිනිසළා ඇති නොයෙක් ආයුධයෝ දුමමින් දිලියෙමින් ගුගුරමින් අහසින් අවුත් නෙරයික සත්ත්වයන්ට භය උපදවමින් ඇන විද බොහෝ දුක් උපදවන්නාහ. වැසි වස්නා කල්හි සෙනගසන හඬමෙන් ගිනිගෙණ දිලියෙන්නාවූ ගල්කුළු සමූහ නමැති වර්‍ෂාත් දුමමින් දිලියෙමින් ගුගුරමින් අවුත් ඒ නෙරයික සත්ත්වයන්ගේ මුදුනෙහි වස්නේය. තවද ඒ නරකයෙහි ඉතා ඉවසිය නොහැකි ගිනිරැස් වැනිවූ හුණු පවන් හමන්නේය. එසේහෙයින් ඒ නරකයෙහි සවල්පවූත් සැපයෙක් සිතට කිසිවිටෙකත් නැත්තේය. මෙබඳුවූ ආසවාදයක් නැති නරක යෙහි දුක් කම්කටුලු විඳීමෙන් දුක්පත්වැ සැඟවී යන්නට සුදුසු ස්ථානයක් නොලැබ ගිනීගත් යපොළොව ඒ ඒ තැන දිව ඇවිදිනාවූ තොප සමීපයට පළාගොස් වහන්ස! මාගේ මස්සෙන් දහස දුන මැනවැයි නරක දුකට නොබාසිට කවර නම් කෙණෙක් නය ඉල්වද්ද? තවද මහ රජ්ජුරුවෙනි! ගිනිගෙණ දිලියෙන්නාවූ ඒ ඒ රථයෙහි වාරයෙන් වාරය යොදාගෙණ ගිනිගෙණ දිලියෙන්නාවූ වැව්වින් පහරණ ලදුව ගිනිගෙණ දිලියෙන්නාවූ නවයොදුන් බොල ඇති යපොළොව වහ්නිජ්වලා අතරෙහි අදපසින් ගිනිමැඩගෙණ ඒ දුක් ඉවසාගත නොහී ඈත් මෑත් බලා දිවන්නාවූ තොප සමීපයට ගොස් කහවණු දහස දුනමැනවැයි නය ඉල්වන්නෝ කවුරුද? තවද රජ්ජුරුවෙනි ඉතා තියුණුවූ කර මුවහතින් ගැවසී ගත්තාවූ හාත්පසින් ගිනිගෙණ දිලියෙන්නාවූ දුක්ම හා සමග අපමණ භය උපදවන්නාවූ නැඟීමෙන් බැසීමෙන් කයට පීඩා දෙන්නාවූ එබඳුවූ ඒ අයපර්වතයට යමපලුන් විසින් පහරණ ලදුව නැඟී බැස දුක් විඳිනා කල්හි තොපගේ සර්වාඞ්ගයෙහි මිස්ලොඹුවේ තබා සැත්බානාලද මස් කැටියක් මෙන් ඒ කරමුවහතින් කැපී සුණු විසුණුවන්නේය. මෙසේ ගිනිගෙණ දිලියෙන්නාවූ කරමුවහතින් කැපී ලේ පෙර පෙරා අනෙකවාරයෙහි අය පර්වතයට නැඟී බැස දුක් වන්නාවූ

තොප සමීපයට ගොස් පොලී හා සමග මිස්සෙන් දහස දුනමැනවැයි මෙබඳුවූ දුක් බල බලා සිට කවර කෙණෙක් තොප අතින් ණය ඉල්වද්ද? තවද මහරජ්ජුරුවෙනි, හාත්පසින් ගිනිගෙණ දිලිසෙන්නාවූ අඟුරු රැස යමපලුන් විසින් පහරණ ලදුව තැගී විශෙෂයෙන් දැවාවූ ශරීර ඇතිව බැගෑව අසරණව දුන් ඉස තබා වලප්නාවූ තොප සමීපයට ගොස් පරලොවදී කහවණු දහස දුනමැනවැයි කවුරු නය ඉල්වද්ද? තවද රජ්ජුරුවෙනි, ඉතා තීක්ෂණවූ නිරිසතුන්ගේ වෙර ලේ බොන්නාවූ මෙබඳු ගිනිගත් සොළසාඟුල් කටුයෙන් ගැවසී ගත්තාවූ අයොමයවූ හිඹුල් රුක් තිල්වලා කුලන් මෙන් උස්ව සිටියාහ. පරස්ත්‍රී පරපුරුෂ සේවන වශයෙන් ලොභ යෙන් අන්‍යොන්‍ය රඤ්ජනය කළාවූ ස්ත්‍රී පුරුෂයෝ ගිනිගෙණ දිලියෙන තෙප ගත් අත් ඇති යමපලුන් විසින් මරා මෙහෙයන ලද්දාහු ඒ හිඹුල් රුකට හඬමින් වලපමින් නොකැමැතිව නැගෙන්නාහ. මෙබඳුවූ කොළ හිඹුල් නරකයට යමපලුන් විසින් තොපමරා නගන ලද කල්හි සොළසඟුල් කටුයෙන් තොප බලන්නාවූ සත්ත්වයන්ට පෙණෙන්නේය. තැවත සම් මස් නහර තැලීමෙන් හේ සකල ශරීරය කැපී පැළී ලෙහෙයෙන් රුදිරනක් පෙරවියාක් මෙන් ඉඳීම පූයාගත් හෙයින් පිපී ගියාක් වැනීවූ දුකබ වෙදනාවෙන් පීඩිතවූ ශරීර ඇතිව ක්‍ෂණ ක්‍ෂණයෙහි සුසුම් ලමින් මහ දුක් අනුභව කරන්නාවූ මෙසේවූ පූර්‍ව ජාතියෙහි කළ අකුශල කර්‍ම නමැති බල වත්වූ අපරාධ ඇති තොප ඒ කොළහිඹුල් රුකට නැගී දුක් අනුභව කරණ තැනැත්තන් සමීපයට ගොස් නය ඉල්ලන්නෝ කවුරුද? තවද රජ් ජුරුවෙනි, අයොමයවූ අති තීක්ෂණවූ නෙරයික සත්ත්වයන්ගේ ශරීරයෙහි රුධිර පානය කරන්නාවූ ගිනිගෙණ දිලියෙන ඛඩ්ගපත්‍රයෙන් ගැවසී ගත්තාවූ අසිපත්‍ර වෘක්ෂයෝ තිල්වලාකුලක්මෙන් උස්ව සිටිනාහ. මෙබඳුවූ අසිපත්‍ර වෘක්ෂයට යමපලුන් විසින් තොප මරා නැගූ කල්හි තීක්ෂණවූ ඛඩ්ගපත්‍රයෙන් කන් නාසා ආදිය කැපී සකල ශරීරයෙන් ලේ පෙර පෙරා මහදුක් විඳිනා තැනට ගොස් පරලොවදී මාගේ කහවණු දහස දුන මැනවැයි කවුරු තොබා තොබා සිට නය ඉල්වද්ද?

ඉක්බිත්තෙන් මෙසේ හස්ත පාදාදිය ඡෙදනයෙන් මහත්වූ දුක් ඇති අසිපත්‍ර නරකයෙන් මෑත්වූ තොබෝ කලකින්ම ගිනිගෙණ දිලියෙන ලෝදියෙන් පිරි බස්නාවූ වෙතරණී නම් ගංගායෙහි යමපලුන් විසින් මරාගෙණ ගොස් හෙළූ කල්හි එහි වැටී මහදුක් අනුභව කරන්නාවූ තොප සමීපයට ගොස් නය ඉල්වන්නෝ කවුරුද? තවද රජ්ජුරුවෙනි, ඒ පරුෂවූ ක්‍ෂාරොදකයෙන් යුක්තවූ ගිනිගෙණ දිලියෙන්නාවූ හැසිය බැලිය වැද්ද නොහෙන හෙයින් දුදුළුවූ සියුම්වූ මුවහත් ඇති යපොකුරු පතින් ගැවසී ගත්තාවූ ඒ වෙතරණී නම් නදිය තියුණු මුවහත් ඇති යපොකුරුපත් පවත් වැහෙන්නේය. කිසි පිහිටක් නැත්තාවූ වූක්තප්‍රකාරවූ ඒ වෙතරණී නම් ගංගා ජලයෙහි පොකුරුපතින් කැපෙන ලද ශරීර ඇතිව ලේ පෙර පෙරා කර්‍මබලයෙන් කලෙක උඩුගඟටද කලෙක යටිගඟටද ඇද ගෙණගොස් මෙසේ නොයෙක් පරිද්දෙන් දුක්විඳිනාවූ තොප සමීපයට ගොස් කහවණු දහස දුනමැනවැයි පරලොවදී කවුරු නය ඉල්වද්දැයි මෙසේ මුඛ

බෝසතාණන් විසින් කියන ලද මේ නරක කථාව අසා අඞ්ගාති රජ්ජුරුවෝ භයින් ත්‍රස්තව මහබෝසතාණන් පිහිට කොට කියන්නාහු ස්වාමීන්වහන්ස! කර්මඵල දක්වීම වශයෙන් නුඹවහන්සේ විසින් කියන ලද්දාවූ මේ යථොක්තවූ කාරණා අසා කපනලද රුකක්මෙන් භය ගෙණ වෙවුලමින් මූලාවූ සිත් ඇත්තෙමි. දිග් ව්‍යවස්ථාවක් කොටගත නොහෙමි. මා කවර දිනක කොතැනක සිටි බවත් මට නොදැනෙන්නේය. මා කළ පාප භීතීන් තැවෙමි. මට මහත්වූ නරක භය උපන. එසේහෙයින් මෙතැනදී නුඹවහන්සේ විනා මට අන් පිහිටෙක් නැත. මතු මත්තෙහි මා සිතට් දුක් නූපදවා මා සිත සැනසුව මැනව, තවද ස්වාමීන්වහන්ස! ඇඟ හිස ගිණිගත් කල්හි ගඟ මැදකට වත් කලක් මෙන්ද, ගංගායෙහිත් සමුද්‍රායෙහිත් නැව් බිඳී තරඞ්ග වේග යෙන් ඈත් මෑත් බලා ගසා දමන ලදුව පිහිට නොලබන්නාවූ සත්ත්වයන්හට දිවයිනක් මෙන්ද, ඝනාන්ධකාරයෙහි ඇවිදිනාවූ සත්ත්වයන්හට ප්‍රදීපයක් මෙන්ද, නුඹවහන්සේම පිහිට වනසේක. තවද මහාර්ෂීන් වහන්ස! නුඹ වහන්සේ මට ඓහලෞකික පාරලෞකික අර්ථයෙන් හා දශකුශල ධර්මයෙන් අනුශාසනා කළ මැනව, මා විසින් ගිය දවස අකුශල කර්මයෙහි යෙදීම් වශයෙන් අපරාධ කරණලද, එසේහෙයින් ස්වාමීන්වහන්ස! යම්සේ මම නුඹ වහන්සේ විසින් කියනලද අනෙකප්‍රකාරවූ දුක් කර්මකටුලු ඇති නරකයෙහි ගොස් නොහෙන්නේ වී නම් එපරිද්දෙන් මට කුශල මාර්ගය සකස්කොට කිව මැනවැයි කීහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ ඒ අඞ්ගාති රජ්ජුරුවන්ට කුශල මාර්ගය කියනු සඳහා කුශල මාර්ගයෙහි මනාව පිළිපන්නාවූ පුරාතන රජ දරුවන් උදාහරණ වශයෙන් ගෙණහැර දක්වන්නාහු මෙසේ කීහ. මහ රජ්ජුරුවෙනි! ධෘතරාෂ්ට්‍ර නම් රජ්ජුරුවෝය. විශ්වමිත්‍ර නම් රජ්ජුරුවෝය. යාමතග්ගි නම් රජ්ජුරුවෝය, අට්ඨක නම් රජ්ජුරුවෝය, සිනතර නම් රජ්ජුරුවෝය, යන මේ රජදරුවන් පස්දෙනා හා මොවුන් කෙරෙන් අන්‍යවූ රජදරු කෙණෙක් ඇද්ද, සියලු රජදරුවෝම මහණ බමුණන්ට අන්පා මෙහෙ කොට යම්සේ සම්පත්තියට පැමිණියෝද, එපරිද්දෙන්ම තෙපින් පණිවා ආදීවූ අධර්මසමාදානය දුරුකොට ත්‍රිවිධවූ සුචරිත ධර්මයෙහි හැසිරෙව, තවද පෘථිවීශ්වරවූ මහරජ්ජුරුවෙනි! තොපගේ ප්‍රාසාදයෙහිත් ඇතුළු නුවරත් පිටි නුවරත් ගම් නියම්ගම් දනව් ආදියෙහිත් ආහාරපාන වශී ගත් අත් ඇති පුරුෂයන් කවරෙක් සය ඇත්තෝද? කවරෙක් පිපාස ඇත්තෝද? කවරෙක් සුවඳ විලවුන් ගල්වාද? නොයෙක් පැහැයෙන් යුක්තවූ වස්ත්‍ර ගන්නාහු කවරෙක් හිඳිද්දැයි අනෙකප්‍රකාරවූ රත්නාභරණයන් කවරක් පලඳිද්දැයි මෙසේ කියා අඬගා ඇවිදුවන්වයි මාර්ගයෙහි යන්නාවූ සත්ත්වයන්ගේ කවර කෙණෙකුන්ට කුඩයෙන් ප්‍රයෝජන ඇද්ද? මොලොක් වූ මිනොඩුවූ වහනින් කවුරුන්ට ප්‍රයෝජන ඇද්දැයි මෙසේ මෙසේ උදාසන සවස තොපගේ මාලිගාවෙහිත් ඇතුළු නුවරත් පිටිනුවරත් ගම් නියම්ගම් දනවූ ආදිවූ නොයෙක් තැනැත් සිට මෙසේ කියා අඬගාන්වයි, තවද මහ රජ්ජුරුවෙනි! තොපට උපස්ථායකවූ අධිකාර සෙනෙවිරත්, ඈපා, මාපා, මණ්ඩලීය යන පඤ්ච ප්‍රධාන මණ්ඩලීන් හා අවශෙෂවූ රාජසේවකයන් අතරෙන් ජරාජීර්ණවූ අමාත්‍යාදීන් හා රාජපුරුෂයන්ද, එසේම ජරාප්‍රාප්තවූ ගෙරිමීමූන්ට හා හස්ත්‍යශ්වාදීන්ද, පළමු පරිද්දෙන් ඒ ඒ රාජකාර්‍යයෙහි

නොයොදව, තුරුණු අවස්ථාවෙහි තමන් සියලු කාර්‍ය්‍ය කරන්නට සමර්ථ හෙයින් ඒ ඒ කාර්‍ය්‍යය නොපිරිහෙළා කරන්නට තරුණ අමාත්‍යාදීහු සමර්ථ වෙති. ජරාවට පැමිණි කල්හි පෙරසේ රාජකාර්‍ය්‍යය නොපිරිහෙළා දුර්වල හෙයින් කොට ගත නොහෙති. හෙරිමීමුන් හා ඇතුන් අසුන් ආදිවූ තිරශ්චීන සත්ත්වයෝ ජරාවට පැමිණි කල්හි පළමු පරිද්දෙන් රථසකටාදිවූ හෑරෙද් වහනය කොට කර්මාන්ත කරන්නට අසමර්ථයහ, ඔවුන් අතුරෙන් එකකුත් පළමු පරිද්දෙන් කර්මාන්තයෙහි නොයොදව, ජරාවට පැමිණි කල්හි ඔහු තමන් දුර්වල හෙයින් බර ඉසිලීම සී සෑම් ආදිවූ නොයෙක් කර්මාන්තකොට ගන්නට අසමර්ථයහ, තවද තොපගේ අමාත්‍යාදීන් අතුරෙන් යමෙක් පෙර බලීව තොපට අනුන් විසින් කොට ගත නොහැක්කාවූ උපකාරයක් කෙළේ වීනම් නොකටහැකි රාජකාර්‍ය්‍යයක් කෙළේ වී නම් ඕහට මහත්වූ පෙරහර තබා දී බත්ගම් දී ගෙවල් දැසි දස ගවමහීෂාදීන් දීමෙන් මහත්වූ උපකාර කරවා අසත්පුරුෂයෝ වූකලී තමන්ට උපකාර කළවුන්ට උන් සමර්ථවූ අවස්ථායෙහිම උපකාර කොට සම්මාන ලබන්නාහ, උන් අසමර්ථ අවස්ථායෙහි මූණදී බැණ නැගීමක්වත් ඇස් ලා බැලීමක්වත් නොකරන්නාහ. සත්පුරුෂයෝ වූකලී උපකාර කළවුන්ට සමර්ථ අවස්ථායෙහිත් අසමර්ථ අවස්ථායෙහිත් වෙනසක් නැතිව එකාකාරයෙන්ම ප්‍රත්‍යුපකාර කොට මහ පෙරහර දී සත්කාර සම්මාන කරන්නාහ, මහරජ්ජුරුවෙනි! එසේ හෙයින් තෙපිත් සත්පුරුෂ ධර්මයෙහි පිහිටා තොපට උපකාරී වූවන්ට ප්‍රත්‍යුපකාර කොට මහත් වූ ඓශ්වර්‍ය්‍ය දීමෙන් හා සත්කාර සම්මාන කිරීමෙන් සම්භාවනා කිරීමෙන් ජීවිතාන්තය දක්වා ඒකාත්මික කොට රකුවයි මෙසේ මහබෝසතානෝ අඹගාති රජ්ජුරුවන්ට අවවාද අනුශාසනා කොට දාන ශීල භාවනා කථාවත් කිරීමෙන් සවර්ග මාර්ගය අඳුන්වා ධර්මදේශනා කරන්නාහු මෙසේ කීහ.

මහරජ්ජුරුවෙනි! මේ ශරීරය දෙවියකු මරකු බඹකු ඊශ්වරයකු විෂ්ණු ආදි දෙවතාවකු විසින් මවන ලද්දේ නොවෙයි. මුතු මැණික් රන් රිදී පබළු ආදි දශවිධ රත්නයෙන් උපන්නේත් නොවෙයි. රත් සඳුන් හෙළ සඳුන් ආදියෙන් උපන්නේත් නොවෙයි. රත්පියුම් හෙළපියුම් ඇඹුල ඉපුල හෙල්මැලි ආදිවූ පුෂ්ප වර්ගයෙන් උපන්නේත් නොවෙයි. මැලි කුමකින් උපන්නේදයත්? “කෙසින්, ලොමින්, නියෙන්, දතින්, සමින්, මසින්, නහරින්, ඇටින්, ඇටමිදුලෙන්, වකුගඩුයෙන්, හදවතින්, අක්මාවෙන්, දලබුවෙන්, බඩදිවින්, පපුතැණින්, අතුනෙන්, අතුනුබහනින්, නොපැසුනු අහරින්, පැසුනු අහරින්, හිස්මුලින්, පිතින්, සෙමින්, පුයායෙන්, ලේයෙන්, සෝදියෙන්, මේතෙලින්, කඳුලෙන්, වසාතෙලින්, කෙළින්, සොටුයෙන්, සඳමිදුලෙන්, වටන්දියෙනැ”යි මේ දෙතිස් කුණපයෙන් උපන්නේය. නැවත රූපස්කන්ධය, වෙදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධය’යි කියන ලද පඤ්චස්කන්ධයෙන් උපන්නේය. මෙහි රූපස්කන්ධය නම්, ස්තබ්ධලක්ෂණවූ පෘථිවිධාතුවය, ද්‍රවත්‍වලක්ෂණවූ ආපොධාතුවය, උෂ්ණලක්ෂණවූ තෙජො ධාතුවය, සමුදීර්ණ ලක්ෂණවූ වායො ධාතුවය යන මේ භූත රූපයෝ සතරදෙන, මේ සතරමහා භූතයන් නිසා පවත්නාවූ සූවිසි උපාදාතරූපයන්ගෙන් චක්ෂුප්‍රසාදය, ශ්‍රොත

ප්‍රසාදය, ඝ්‍රාණප්‍රසාදය , ජිව්හා ප්‍රසාදය, කාය ප්‍රසාදය යන මේ ප්‍රසාද රූපයෝ පස්දෙනය, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන මේ විෂය රූපයෝ පස්දෙනය, ස්ත්‍රීභාව පුරුෂභාවයයි කියනලද භාවරූපය, හෘදය වස්තුවයයි කියනලද හෘදය රූපය, ජීවිතෙන්ද්‍රිය යයි කියනලද ජීවිතරූපය, කබලීකාරාහාර යයි කියනලද ආහාර (ඕජා) රූපය, ආකාශධාතු යයි කියනලද පරිච්ඡේද රූපය, කාය විඥප්ති වාක්විඥප්ති සඞ්ඛ්‍යාතවූ විඥප්තිරූපය, ලඝුමෘදුකර්මන්‍ය බවයයි කියනලද ත්‍රිවිධ රූපයන්ගේ වැඩීමය, පැවැත්මය, ජරාවය, භඞ්ග යයි කියනලද මේ චතුර්විධවූ ලක්ෂණරූපයයි මෙසේ උපාදාන රූපයෝ සූවිස්සක් භූතරූපාදී වූ කර්මරූපයන් අටළොස් දෙනෙකු හා ආකාශධාත්වාදීවූ අකර්මජරූපයන් දශදෙනෙකු හා සමග මේ අටවිසි රූපය රූපස්කන්ධ නම් වෙයි, සුඛවේදනාවය, දුක්ඛවේදනාවය, උපෙක්ෂා වේදනාවය, සෞමනස් වේදනාවය, දෞර්මනස් වේදනාවයයි කියන ලද පඤ්චවිධ වූ වේදනාව වේදනාස්කන්ධ නම් වෙයි. වස්තු හැඳිනගන්නා පිණිස ලකුණු කිරීමක් මෙන් අරමුණු අඳුනන ආකාරයෙන් පවත්නාවූ සංඥාව සංඥාස්කන්ධ නම් වෙයි. වේදනා සංඥා දෙකින් අවශේෂවූ චේතනාවය, ස්පර්ශය, මනස් කාරය, අධිමෝක්ෂය, ශ්‍රද්ධාවය, ස්මෘතිය, හිරිය, ඔත්තප්පය, අලෝභය, අද්වේෂය, අමෝහය, තත්‍රමධ්‍යස්ථාවය, කායප්‍රශ්‍රබ්ධි චිත්තමෘදුතා දෙදෙනාය; කායකර්මන්‍යතා චිත්තකර්මන්‍යතා දෙදෙනාය, කායප්‍රාගුණ්‍යතා චිත්තප්‍රාගුණ්‍යතා දෙදෙනාය, කායඍජුතා චිත්තඍජුතා දෙදෙනාය, කරුණාවය, මුදිතාවය, සම්‍යක් භාවය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, ලෝභය ද්වේෂය, මෝහය, මිථ්‍යාදෘෂ්ටිය, ඖද්ධත්‍යය, අහිරිකය, අනපත්‍රපාය, සංශය, මානය, ඊර්ෂ්‍යාවය, මාත්සර්‍ය්‍යය, පශ්චාත්තාපය, ථීනය, මිද්ධය යන යන මේ චෛතසික ධර්මයෝ පනස්දෙන සංස්කාරස්කන්ධ නම්වෙයි. (එකොත්පාද එකනිරෝධ එකාලම්බන එකවස්තුකව උපදනාවූ චෛතසික ධර්මයන් පණස් දෙනාට ප්‍රධානව උපදනාවූ) විෂය විජානන ලක්ෂණයෙන් එකවිධවූ කුශලා කුශල අව්‍යාකෘත වශයෙන් ත්‍රිවිධවූ කාමාවචර, රූපාවචර, අරූපාවචර, ලෝකොත්තර වශයෙන් චතුර්විධවූ වේදනා සංඥාන සංස්කාරාදී භෙදයෙන් එකුනානුවක් පමණවූ චිත්තය විඥානස්කන්ධ නම්වෙයි.

මෙසේ දක්වන ලද රූපස්කන්ධය, වේදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධයයි කියනලද පඤ්චස්කන්ධයෙන් මේ ශරීරය උපන්නේ වෙයි. මෙසේ දෙතිස් කුණප කොට්ඨාසයෙන් හා පඤ්චස් කන්ධයෙන් උපන්නාවූ තොපගේ මේ කය රථයෙකැයි දක්නාලද්දේ වෙවා මෙබඳුවූ මේ ශරීරය රථයක් කොට සිතා ගණුව, සවහා රථයෙහි රථාචාර්‍ය්‍යයා මෙන් තොපගේ මේ කාය නමැති රථයෙහි පහළවූ ථිනමිද්ධ ඇති බැවින් මන සඞ්ඛ්‍යාතවූ කුශලචිත්ත නමැති රථාචාර්‍ය්‍යයා ඇත්තේය. මේ තොපගේ සවහා රථයෙහි අකුරමෙන් තොපගේ මේ කාය නමැති රථයෙහි මෛත්‍රී නමැති විශෙෂ කර්මාන්ත කොට නිමවන ලද අකුරකින් සමන්විත වන්නේය, පියවි රථයෙහි රථපරිවාර මෙන් කාය නමැති රථයෙහි දානසංවිභාග නමැති රථ පරිවාර ඇත්තේය. පියවි රථයෙහි නිම්වලලූමෙන් මේ ශරීරය

නමැති රථයෙහින් සත්පුරුෂ පියොවින් ගමන් කිරීම සඞ්ඛ්‍යාතවූ පාද නමැති නිම්වලලු ඇත්තේය. පියවි රථයෙහි වෙහෙළිපත් මෙන් මේ කාය නමැති රථයෙහි මෙරමාහට පාණිප්‍රහාරයෙන් හිංසා නොකොට සත්පුරුෂ පියොවින් අත දික්කිරීම වක්කිරීමයයි කියනලද හස්තසංයම නමැති වෙහෙළිපත් ඇත්තේය, පියවි රථයෙහි නොගැසී පැපසේ ගමන්කරණ පිණිස ඒ ඒ තැන රථ සන්ධියෙහි ලන වඳුන් තෙල් මෙන් කාය නමැති රථයෙහි කුසින් ගිනි නොනැගෙන පිණිස පමණ දන ආහාර අනුභව කිරීමයයි කියනලද කුක්ෂි සංයම නමැති වඳුන්තෙල් ඇත්තේය. සවභා රථය නොගැසී යන කල්හි නොහඬන්නාක්මෙන් තොපගේ මේ කාය නමැති රථයෙහි බොහෝ කොට නොදෙඩා පමණ දන බස් කීමයයි කියනලද වාක් සංයම නමැති නොගැසීම් හා නොහැඬීම් ඇත්තේය. පියවි රථයෙහි වටකොට එල්වන. ලද සවර්ණ කිංකිණිකාජාලා ආදී රථාභරණයෙන් මෙන් තොපගේ ශරීර නමැති රථයෙහි බොරු නොකියා සත්‍ය වචන කීම් නමැති සම්පූර්ණවූ රථාභරණයත් ඇත්තේය. සවභා රථයෙහි සන්ධිමුඛාදීන්ගේ මනාව සිල්පිටැද ගෙණ පිහිටීමක්මෙන් කාය නමැති රථයෙහි මටසිළුටුවූ නිර්දෙෂවූ රථාඞ්ගයන් ඇත්තේය. සවභා රථයෙහි ඒ ඒ රථසන්ධි නොයිගිලෙන පිණිස ලන ලද බදම්ලාටුවක් මෙන් කාය නමැති රථයෙහි පමණ දන යුක්ත‍ප්‍රාප්තවූ බස්කීම් නමැති සන්ධි බඳන ලහටු ඇත්තේය, පියවි රථයෙහි සැරහීම් පිණිස බඳනාලද ධජ පතාකාදී රථාලංකාර මෙන් කාය නමැති රථයෙහි කම්ඵල ඇදහීම් සවභාවකොට ඇති ශ්‍රද්ධාව හා වස්තු පරිත්‍යාග චෙතනා ලක්ෂණවූ අලොභ නමැති සුන්දරවූ රථාලංකාරයන් ඇත්තේය. පියවි රථයෙහි උභය පාර්ශ්වයෙහි කිඹුල්තලුමෙන් කාය නමැති රථයෙහි සිල්වතුන්ට කිඹුල්තලු ඇත්තේය. සවභා රථයෙහි රිය හිස මෙන් කාය නමැති රථයෙහි අපරුෂවූ මෘදු සවභාව සඞ්ඛ්‍යාතවූ නොදැඩි බැව් නමැති නම්තවූ රියහිස ඇත්තේය. පියවි රථයෙහි රියහිස බැඳ අල්වාගෙණ සිටිනා රැහැන මෙන් කාය නමැති රථයෙහි අඛණ්ඩවූ පඤ්චශීලය හා චක්ෂුරින්ද්‍රියාදීන්ගේ නානාලම්බනග්‍රහණය කොට ඒ ඒ අත දිවිය නොදී අකුලවා ගැන්මයයි කියනලද සීලසංවර නමැති ගෙණ සිඳිනා රැහැණ ඇත්තේය. පියවි රථයෙහි ගල් මුල් ආදීයෙහි නොපැකිල යාමෙන් කාය නමැති රථයෙහි වෙෂ කටයුතු වස්තුයෙහි වෙෂ නොකිරීම නමැති නොපැකිලීම් ඇත්තේය. පියවි රථයෙහි නගන ලද ධවලච්ඡත්‍රය මෙන් තොපගේ ශරීර නමැති රථයෙහි දශකුසලධර්ම නමැති නගන ලද ධවලච්ඡත්‍ර ඇත්තේය. සවභා රථයෙහි වැතිර හිඳිනා පිටාටුව මෙන් කාය නමැති රථයෙහි අපසන්නිශ්‍රිතවූ බහුශ්‍රුත භාව නමැති වැතිර හිඳිනා පිටාටු ඇත්තේය, සවභා රථයෙහි පණවනලද පර්‍ය්‍යංක සංඛ්‍යාතවූ සිංහාසනයක් මෙන් කාය නමැති රථයෙහි ලාභය, අලාභය, අයසය, නින්දාය, පසංසාය, සුඛය දුක්ඛයයි, කියනලද අෂ්ටලොක ධර්මයෙහි අකම්පා සවභාවයෙන් පිහිටියාවූ අවික්ෂිප්තතාභාවයට පැමිණියාවූ සිත් නමැති විසිතුරු ඇතිරිලි අතුරණලද රාජපර්‍ය්‍යංකයෙන් සමන්විතය, පියවි රථයෙහි ඇත ආදීවූ සියලු දැරුසම්භාරය ගැට ආදිය නැතිවීමෙන් නිස්කලංකවූ හර ඇතිවූයේම කැමතිවිය යුත්තේය. එසේකල ඒ රථය දීර්ඝ මාර්ගයෙහි ගමන් කිරීමට සමර්ථ වන්නේවේද, එපරිද්දෙන්ම කාය නමැති රථයත් මේ දන් දෙන්නට කල මේ සිල් රක්ෂාකරන්නට කල, මේ

මේ පෙහෙවස් රක්‍ෂාකරන්නට කලැයි මෙසේ කල් දූන කරණලද පිරිසිදුවූ දානාදීවූ කුශල චිත්තරණ නමැති සාරත්‍ථයෙන් යුක්තවෙයි. සවහා රථයෙහි රියහිස නොහෙනු සඳහා කොකු ගත්වා හෝ දඹු අවුලා හෝ තබත්තාහ. එපරිද්දෙන්ම කාය නමැති රථයෙහි නානාලම්බනවූ සිත් නමැති රියහිස නොහෙනු සඳහා ප්‍රඥ නමැති දඹු කොකු අවුලා තිබීම ඇත්තේය. පියවි රථයෙහි යොදනලද සෛන්‍ධව අශ්වයෝ සැපසේ රථය ඇදගෙණ යන්නාහ. එපරිද්දෙන්ම කාය නමැති රථය නුවණැත්තන්ගේ අවවාදයෙහි පවත්නා බවය කියනලද යටත්ව පැවතීම නමැති මොළොක්වූ වියරුහැණින් බඳනා ලද පඤ්චෙන්ද්‍රිය සංඛ්‍යාත අස්හු සැපසේ යෙති. සවහා රථයෙහි අසුන් කර යොදන ලද සැහැල්ලුවූ වියදඬු මෙන් කාය නමැති රථයෙහි අධික මාතම නොකිරීමයයි කියනලද සැහැල්ලුවූ වියදණ්ඩෙන් යුක්තවෙයි, පියවි රථයෙහි දළකඩමයවූ මහත්වූ පෝරු අතුළ කල්හි බලන්නා වූ සත්ත්වයන්ට ඒ රථය ප්‍රසාදවහව සැරසී සිටීද, එපරිද්දෙන්ම කාය නමැති රථයත් කුශලධර්ම් විෂයෙහි නොපසු බැස පවත්නාවූ සිත් නමැති මහත්වූ පෝරු ඇතිවෙයි. සවහා රථයෙහි විෂමවූ ගල් බොරළු හා රජස් නැගෙන්නාවූ මාර්ගයෙන් යන්නේ රජසින් ගැවසීගත් හෙයින් නොහොබීද, සමතලා වූ රජස් ධූලි නැගෙන්නාවූ මාර්ගයෙන් යන්නේම බලන්නාවූ සත්ත්වයන්ට ප්‍රසාදවහව විශෙෂයෙන් හොබීද, එපරිද්දෙන්ම තොපගේ කාය නමැති රථයත් උදාසීන වෘඩයන්ගේ සේවනය නොකිරීමෙන් සමතලා වූ සෘජුවූ මාර්ගයෙහි පිළිපැද පැවතීමෙන් නසනලද කෙලෙස් නමැති රජස් ඇතිවෙයි. පියවි රථයෙහි යොදනලද අසුන් සන්කරණ කැවිටක්මෙන් කාය නමැති රථයෙහි ප්‍රතිෂ්ඨිතභාව සාධකවූ ආලම්බනවූ ස්මරණය කරන්නාවූ ස්මෘතියම කැවිට වන්නේය. සවහා රථයෙහි ඒ ඒ රථසන්ධි බඳනා පිණිස මනාකොට අඹරා තබනලද රැහැණ මෙන් කාය නමැති රථයෙහි නොසිඳී අතුරු නැතිව පවත්නාවූ වීර්‍ය්‍ය සංඛ්‍යාත ධෛර්‍ය්‍ය හා හිත ප්‍රතිපත්තියෙහි යුක්ත බවයයි කියන ලද යොගය මනාකොට අඹරණලද සවිරවූ රැහැණවෙයි. පියවි රථය නොහික්මුනාවූ අශ්වයන් යොදනලද්දේ අමාර්ගයෙහි දිවේද, මොනවට දමනයෙහි ලීමෙන් හික්මුණාවූ සෛන්‍ධවයන් යොදනලද්දේ සෘජුවූ මහවතට දිවේද එපරිද්දෙන්ම චිත්ත සංක්ලේශ නමැති විෂ විනාශ කිරීමෙන් මනාකොට දමනයෙහි ලනලද්දේ අකුශල ධර්ම් නමැති අසත්පථය හැර කුශලධර්ම් නමැති සන්මාර්ගයෙහි යන්නේය, එසේහෙයින් මොනවට දමනයෙහි ලන ලද්දාවූ ආචාරසම්පන්නවූ චිත්තය තොපගේ කාය නමැති රථයට සෛන්ධව කෘත්‍යය සිඬ කෙරෙයි සවහා රථය සෘජුවූ මහාමාවතින් ක්‍ෂෙමභූමියට පැමිණේද? එපරිද්දෙන්ම අප්‍රාප්ත වස්තුයෙහි ඉච්ඡාවය, ප්‍රාප්ත වස්තුයෙහි ලොභය, යන මේ ඉච්ඡා ලොභ දෙකකුත් සිතවූ අපාය මාර්ගය නම් වන්නේය. දශ අකුශල කර්‍මපථ මාර්ගය හා සම්‍යක් දෘෂ්ටි ආදීවූ අෂ්ටාංගික මාර්ගය වශයෙන් පවත්නාවූ ශීලසංයමය තෙමේ සෘජු ප්‍රශස්තවූ සුගතියට මාර්ගය නම්වන්නේය. එසේහෙයින් තොපගේකාය නමැති රථය නිර්භයවූ ක්‍ෂෙමභූමි නමැති සුගතියට පමුණුවන්නට දශකුශල මාර්ගය හා (ආර්‍ය්‍ය) අෂ්ටාංගික මාර්ගය රජමඟවනෙක්වෙයි. පියවි රථය ඇදගෙණ අමාර්ගයෙහි දිවන්නා වූ අශ්වයන් ගසා වලකා රජමහවතට පමුණුවන්නාවූ කැවිටක් මෙන් රූපය

ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශය යන පඤ්චකාම ගුණයෙහි ඇල්මකොට මෙසේ අමාර්ගප්‍රතිපන්නව දිවයන්නාවූ තොපගේ ශරීර නමැති රථයෙහි යොදනලද ලොභාදිවූ අකුශලකර්ම නමැති අශ්වයන් ගසා නවතාලන්ට ආලම්බනයෙහි යථා ස්වභාව ප්‍රතිවේධ කරන්නාවූ උතුම්වූ තොපගේ ප්‍රඥාවම (කැවිටකෘත්‍යය) ප්‍රභාකෘත්‍යය සිද්ධකෙරෙයි. තවද ඒ උතුම්වූ ප්‍රඥාව තොපගේ ශරීර නමැති රථය අකුශලකර්ම නමැති අමාර්ගයෙන් වළකා සෘජුවූ මාර්ගයට පමුණුවා ලන්නේය. ස්වභා රථයට රථාචාර්‍ය්‍යයකු ඇති කල්හිම හොබීද? ඒ රථාචාර්‍ය්‍යයාම රථය පැදගෙණ ගොස් කැමැති තැනකට පමුණුවා අභිමතාර්ථය සිද්ධකෙරේද? එපරිද්දෙන්ම තොපගේ මේ දෙහ නමැති රථයට අන්‍යවූ රථාචාර්‍ය්‍යයෙක් නොමැත්තේ තොපගේ ආත්මයම රථාචාර්‍ය්‍යව සිට කාය නමැති රථය සුගති සංඛ්‍යාතවූ ඊප්සිත ස්ථානයට පමුණුවා ඉෂ්ටාර්ථ ප්‍රසවය කෙරෙයි. මහ රජ්ජුරුවෙනි, ඉදින් මේ උක්තප්‍රකාර ශරීරය නමැති රථවාහනයෙන් යන්නාවූ යමෙක්හට කායචාරාදීන් සමව හැසිරීම හා නොසිඳී පවත්නාවූ වීර්‍ය්‍යය ස්ථිරව පවත්නේවීනම් යම් හෙයකින් මේ කාය නමැති රථයත් ඔහට ප්‍රාර්ථනා කරණලද සියලු සම්පත් සාධා දෙන්නේය. එසේ හෙයින් මෙබඳු කාය රථයෙන් යන්නාවූ තෙපි එකාන්තයෙන් කිසිකලෙකත් නරකාදිවූ සතර අපායට නොගොස් චාතුර්මහාරාජිකාදිවූ සදිව්‍යලොකයෙහි ඉපිද අපමණවූ දිව්‍යසැපත් අනුභවකොට කෙළවර නිර්වාණ සම්පත්තියටත් පැමිණෙන්නේය. මෙසේ ඒ මහබෝසතානෝ අඞ්ගාති රජ්ජුරුවන්ගේ ශරීරය රථොපමායෙන් වර්ණනාකොට කුසල මාර්ගය හඟවා රජ්ජුරුවන් සතුටු කරවූහ.

තවද මහබෝසතානෝ රජ්ජුරුවන්ට කාරණා කියන්නාහු:-

ආචික්ඛ මෙ නාරද සුඛිමග්ගං
යථා අහං නො නිරයං පතෙය්‍යං

මෙසේ මහරජ්ජුරුවෙනි, තෙපි යම් වචනයක් මට කීව් නම් ඒ තොප කී වචනයට මා විසින් අනෙක ප්‍රකාරයෙන් කාරණා කියා හඟවනලදැයි මෙසේ ඒ රජ්ජුරුවන්ට ධර්මදෙශනා කොට මිථ්‍යාදෘෂ්ටිය හරවා ශීලයෙහි පිහිටුවා මෙතැන් පටන් පාපයන් දුරුකොට කල්‍යාණ මිත්‍රයන් සෙවනය කරව, නිරන්තරයෙන් දානාදිවූ දශකුශල ධර්මයෙහි හැසිරීමෙන් හා දශරාජධර්මයෙන් අකොප්‍ය කොට රාජ්‍යය කිරීමෙන් අප්‍රමාදව වාසය කරවයි කියා අඞ්ගාති නම් රජ්ජුරුවන්ට අවවාද කොට රුජානම් රාජකුමාරිකාවගේ ගුණ වර්ණනා කොට රාජපර්ෂදටත් රජ්ජුරුවන්ගේ අන්තඃපුර ස්ත්‍රීන්ටත් අවවාද කොට ඒ රජ්ජුරුවන් ප්‍රධාන කොට ඇති සියල්ලවුන් බල බලා සිටියදී මහත්වූ සෘද්ධ්‍යානුභාවයෙන් බ්‍රහ්මලොකයට ගියාහ.

ශාස්තෲවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි, දැන් මතුනොවෙයි. පෙරත් මා විසින් දෘෂ්ටිජාලය බිඳ උරුවෙල කාශ්‍යප ස්ථවිරයෝ දමනයෙහි ලනලද්දේම වේදැයි වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ මහා නාරද කාශ්‍යප ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි අලාතසෙනාපති නම් දූත් දෙවදත්තස්ථවිරයෝය, සුනාම සෙනෙවිරද්දු නම් භද්දිය ස්ථවිරයෝය, විජය සෙනෙවිරද්දු නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, බීජකයා නම් මෞද්ගල්‍යායන ස්ථවිරයෝය, ගුණාජීවකයා නම් සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රය, රාජකුමාරිකාව නම් ධර්‍මභාණ්ඩාගාරිකවූ ආනන්ද ස්ථවිරයෝය, පාපදෘෂ්ටිගත් අඞ්ගාති රජ්ජුරුවෝ නම් උරුවෙල කාශ්‍යප ස්ථවිරයෝය, එසමයෙහි බ්‍රහ්මලෝකයෙන් අවුත් අඞ්ගාති රජ්ජුරුවන්ගේ දෘෂ්ටිජාලය බිඳ රජ්ජුරුවන් හා සියලු රාජපර්‍ෂදට අවවාදානුශාසනා කොට ස්වර්ගලොකොත්පත්තිය කරවූ නාරද මහාබ්‍රහ්මවූයෙම් ත්‍රිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

532
භූරිදත්ත ජාතකය

එක් සමයෙක්හි ශාක්‍යකුල ප්‍රධානවූ ත්‍රිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවන මහාවිහාරයෙහි වාසයකරණසේක් පෙහෙවස් විසූ උපාසකවරුන් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේ ද? යත්,

ඒ උපාසකවරු පොහෝ දවස් උදෑසනම පෙහෙවස් ඉටා දන්දී වළඳා ඉක්බිති ගඳදුම්මල් පහන් ආදිය ගත් අත් ඇතිව ජේතවන විහාරයට ගොස් බණ අසන වේලෙහි එකත්පස්ව උන්නාහුය. එකල්හි බුදුරජාණන් වහන්සේ ධර්‍මසභා මණ්ඩපයට වැඩ පණවනලද බුද්ධාසන මස්තකයෙහි යුගන්‍ධර මුදුනෙහි සහස්‍රරශ්මීන් බබලන්නාවූ බාලාර්ක මණ්ඩලය මෙන් නීලපීතලෝහිතාවදාත මඤ්ජෙෂ්ට ප්‍රභාස්වරයයි කියනලද ෂඩ්වර්‍ණ සන බුඩරශ්මිමාලාවන් විහිදුවමින් දිලිහි දිලිහී වැඩහිඳ භික්ෂුසඞ්ඝයා වහන්සේ බලා වදාළසේක. භික්ෂූන් වහන්සේ ප්‍රධානකොට ඇති සිවුවණක් පර්‍ෂත් අතුරෙන් යම් කෙණෙකු අරභයා ධර්‍ම කථාවෙක් උපදී නම් ඔවුන් හා සමඟ සර්‍වඥයන්වහන්සේ කථාකරණසේක. එසේ හෙයින් අද උපාසකවරුන් අරභයා පූර්‍වචරිත ප්‍රතිසංයුක්තවූ ධර්‍මකථා වෙක් උපදනේයයි දැන උපාසකවරුන් හා සමග කථාකරණසේක් උපාසක වරුනි, පෙහෙවස් විසූදැයි විචාරා එසේය ස්වාමීන්වහන්සැයි දූන්වූ කල්හි යහපත උපාසකවරුනි, පෙහෙවස් වසන්නාවූ තොප හැම විසින් කළසේ ඉතා යහපත් වන්නේය, එතකුදුවුවත් තෙපි හැම මා බඳුවූ අවවාදදායකවූ සර්‍වඥකෙණෙකුන් ලැබ පෙහෙවස් වසන්නාහුවූ නම් ඒ තෙමේ ආශ්චර්‍ය්‍ය නොවන්නේය, පුරාතනයෙහි නුවණැත්තෝ අවවාද දායකවූ කිසිම ආචාර්‍ය්‍යවරකෙණෙකුන් නැතිව මහත්වූ යසස් හැර පෙහෙවස් විසුවෝම වේදැයි වදාරා මුවෙන් නොබැණ වැඩ උන් කල්හි ඒ උපාසකවරුන් විසින් ස්වාමීනි, දූන් අප බොහෝදෙනා පෙහෙවස් රක්ෂාකරණ නියාව සියල්ලන්ටම ප්‍රකාශය, අතීතයෙහි නුවණැත්තෝ අවවාද දායකවූ කිසිම ආචාර්‍ය්‍යවර කෙණෙකුන් නැතිව ස්වබුද්ධීන් කල්පනාකොට මහත්වූ යසස් හැර උපෝෂථ ශීලය රක්ෂාකළ නියාව භවාන්තර ප්‍රච්ඡන්න හෙයින්

අප්‍රකාශය, ඒ ප්‍රකාශ කොට වදාළහොත් යෙහෙකැයි ආරාධිතවූ බුදුහු ඉකුත් වත් දක්වා වදාළසේක.

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් දැහැමින් රාජ්‍යය කරන්නාහු පුතනුවන්ට යුවරජ තනතුරු දී උන්ගේ මහත්වූ යශපිරිවර දැක මාගේ රාජ්‍යය ඇරගණිද්දෝහෝයි උපන් තාවූ සැකයෙන් පුත, තෙපි මේ නුවරින් නික්ම යම් තැනක් තොපට අභිප්‍රාය වීනම් එතැන්හි වැස මාගේ ඇවෑමෙන් අවුත් කුලසන්තකවූ රාජ්‍යය ගණුවයි කීහ. ඒ රාජකුමාරයෝ යහපත ස්වාමීනි, කියා පියරජ්ජුරුවන්ට ප්‍රතිවචනදී වැඳ සමුගෙණ නුවරින් නික්ම ක්‍රමයෙන් යමුනා නම් ගඞ්ගාවට ගොස් යමුනාවටත් සමුද්‍රයටත් පර්වතයටත් අතරෙහි පන්සලක් කොට ගෙණ වනමුල් වනඵලාඵල අනුභව කෙරෙමින් වාසය කරන්නාහ. එසමයෙහි සමුද්‍රයෙහි පිහිටියාවූ නාගභවනයෙහි වසන්නාවූ මළාවූ වල්ලභයන් ඇති එක් නාගමානවිකාවක් අන්‍යවූවන්ගේ සම්පත් හා යසස් බලා කෙලෙස් නිසා නාගභවනයෙන් නික්ම සමුද්‍රතීරයෙහි ඇවිදිනී රාජකුමාරයන්ගේ පියවර සටහන් දැක පදානුසාරයෙන් ගොස් ඒ පන්සලදුටු, එකල්හි රාජකුමාරයෝ ඵලාඵලයට ගියාහ. ඒ නාගමානවිකා පන්සලට වැද දඬුමැස්සත් සෙසු තවුස්පිරිකරත් දැක සිතන්නී මේ එක් තපස්වීකෙණෙක් වසන තැනක් වන, එසේ හෙයින් ඒ තපස්වී සැදැහැයෙන් පැවිදිවූයේ දෝහෝ නොහොත් රටින් නගන ලදුව පැවිදිවූයේ දෝහෝයි පරීක්ෂාකරමි. ඉදින් සැදැහැයෙන් පැවිදිවූයේ නම් නෛෂ්ක්‍රම්‍යයෙහි ආලය ඇත්තෝ වීනම් මා විසින් සරසනලද යහන නොඉවසති, ඉදින් පඤ්චකාමයෙහි ඇලුනෝ වීනම් සැදැහැයෙන් මහණනුවූනම් මාගේ යහනෙහි සැතපෙති, එකල්හි ඒ තපස්වීන් මට ස්වාමිකොට මෙහිම වෙසෙමි සිතා ඒ නාගමානවිකා නාගභවනයට ගොස් දිවමල් හා දිව සුවඳ ගෙණවුත් මල්යහන් සරහා පන්සල මුළුල්ලෙහි සුවඳ මල් තනා සුවඳමල් විසුරුවා පන්සල සරහා නාගභවනයට ගියාහ. රාජකුමාරයෝ සවස් වේලෙහි අවුත් පන්සලට වන් තැනැත්තෝ ඒ ක්‍රියාව දැක මේ යහන කවුරුන් විසින් සරසනලද්දේ දෝහෝයි සිතමින් ඵලාඵල අනුභවකොට මල්සුවඳත් ඉතා යහපත් නිසාය, එකාන්තයෙන් යහපත් කොම යහනත් පනවණලද්දේයයි සිතා සැදැහැයෙන් පැවිදිනුවූ බැවින් සොම්නසට පැමිණ සුවඳමල් යහනේ වැදහොත් තැනැත්තෝ කාමයෙන් මත්ව නිදා දෙවැනි දවස් හිරු නැගී කල්හි නැගීසිට පන්සල නොහැමද ඵලාඵලයට ගියාහ. එකෙණෙහි නාගමානවිකාවෝ අවුත් යානේ මිරිකී මලාතිකවූමල් දැක මේ තාපසයෝ පඤ්චකාමයෙහි ඇලුනාහුය සැදැහැයෙන් පැවිදිනුවූහ, එසේ හෙයින් මේ තපස්වීන් වසඟකොට ගන්නට පිළිවන් වන්නේයයි දැන පරණ මල් හෙණ හැරදමා අලුත්මල් ගෙණ අවුත් යහනත් සරහා පන්සලත් සරහා සක්මන මල්විසුරුවා නාගභවනයට ගියාය.

ඒ තපස්වී එදවසුත් මල්උයනේ සැතපී දෙවැනි දවස් මේ පන්සල කවර කෙණෙක් සරනද්දෝහෝයි සිතා ඵලාඵලයට නොගොස් පන්සලට නුදුරුතැන සැඟවී සිටියාහ. නාගමානවිකාවත් බොහෝ සුවඳමල් ගෙණ අසපුවට ගියාහ. රාජකුමාරයෝ උතුම්වූ රූපශ්‍රී ඇති නාගමානවිකාව දැක පිළිබඳවූ සිත් ඇතිව තුමන්වහන්සේ නොදන්වාම සිට ඒ නාගමානවිකාවත් පන්සලට වැද යහන

සරසන්නට පටන්ගත් කල්හි ගෙට වැද තෝ කවරෙක්හිදැ?යි විචාළේය. ස්වාමීනි, මම නාගමානවිකාවක්මි කී කල්හි සස්වාමිකයෙහිද අස්වාමිකයෙහිදැ?යි විචාළේය. ස්වාමීනි, මම අස්වාමිකයෙමි වැන්දඹුවෙමි කියා තෙපි වූකලි කවර කෙණෙක්දැයි විචාළීය. මම බරණැස් රජ්ජුරුවන්ගේ පුත්‍රවූ බ්‍රහ්මදත්ත කුමාරයෙමි කියා තෝ වූකලී නාගභවනය හැර කුමක් පිණිස ඇවිදිනෙහිදැයි කිවුය. ස්වාමීනි, මම නාගභවනයෙහි සස්වාමිකවූ නාගමානවිකාවන්ගේ යසස් බලා කෙලෙස් නිසා උකටලීව එයින් නික්ම වල්ලභයක්හු සොයමින් ඇවිදිමි කිව. මමත් සැදැහැයෙන් මහණ නොවීමි, මපියානන් වහන්සේ නුවරින් නෙරපූ හෙයින් මෙතැනට අවුත්වෙසෙමි, තෝ සැකයක් නොකරව මා තිට ස්වාමිවෙමි. දෙදෙනම මෙතන සමගව වසම්හයි රාජකුමාරයෝ කීහ ඒ නාගමානවිකා රාජකුමාරයන්ගේ බස් අසා යහපතැයි පිළිගෙණ එතැන්පටන් ඔවුහු දෙදෙනම එතැනම සමගව විසූහ. ඒ නාගමානවිකා තමන්ගේ ආනුභාවයෙන් මාහැඟිවූ ගෙයක් මවා මහාර්ඝවූ පර්‍ය්‍යඞ්කයක් ගෙනවුත් යහන් පැනවූහ. එතැන් පටන් රාජකුමාරයෝ වනමුල් වනඵලාඵල අනුභව නොකොට දිව්‍යවූ ආහාරපාන වර්ගයම අනුභව කළාහ. ඉක්බිත්තෙන් කල්යාමකින් නාගමානවිකා දරුගැබක් ලැබ කුමාර කෙණෙකුන් වැදූහ, ඒ කුමාරයාට "සාගර බ්‍රහ්මදත්තයෝ"යයි නම් තුබූහ. ඒ රාජකුමාරයන් පියවර නගා ඇවිදින කල්හි නාගමානවිකා කුමාරිකාවක් වැදූය, ඒ කුමාරිකාවට සමුද්‍රතීරයෙහි උපන් බැවින් "සමුද්‍රජාවෝ"යි නම් තුබූහ.

එකල්හි බරණැස් නුවරක වසන්නාවූ එක් වනචරකයෙක් එතැනට පැමිණ සුවදුක් කථාකොට ඒ රාජකුමාරයන් ඇඳිනගෙණ කීපදවසක් එතැන්හිම වැස දේවයන්වහන්ස, මම නුඹවහන්සේ මෙතන වසන නියාව රජ්ජුරුවන් වහන්සේට දන්වමි කියා එතැනින් නික්ම නුවරට ගියේය. එකල්හි රජ්ජුරුවෝ කාලක්‍රියා කළාහ. අමාත්‍යයෝ රජ්ජුරුවන්ට කළමනා ආදාහන කෘත්‍යකොට සත්වැනි දවස් කථාකරන්නාහු රාජ්‍යය නම් අරාජකව නොසිටි බෙත්තේය, රාජකුමාරයන්වහන්සේ වසන තැනක්වත් ඇති නැතිනියාවක්වත් නොදනුම්හ, පුස්රථය හැර රජ්ජුරු කෙණෙකුන් ගණුම්හයි මන්ත්‍රණය කළාහ. එකණෙහි වනවරකයා නුවරට පැමිණ ඒ කථාව අසා අමාත්‍යයන් සමීපයට ගොස් කියන්නේ මම රාජකුමාරයන් වහන්සේ සමීපයේ තුන්සතර දවසක් වැස ආමි කීය. එබස් අසා අමාත්‍යයෝ ඕහට සත්කාර සම්මානකොට ඒ වනවරකයා මාර්ග නායක කෙරෙමින් කුමාරයන් වසන තැනට ගොස් කරණලද පිළිසඳර කථා ඇතිව රජ්ජුරුවන් කළුරියකළ නියාව කියා දේවයන්වහන්ස රාජ්‍යය පිළිපද්ද මැනවයි කීහ. ඒ රාජකුමාරයෝ නාගමානවිකාවන්ගේ අභිප්‍රාව දනිමියි සිතා ඈ කරා ගොස් සොඳුර, මගේ පියානන් වහන්සේ ඉකුත්වූසේක අමාත්‍යයෝ මට දළපුඩුසේසත් නංවන්නට ආහ යමූ සොඳුර, දෙදෙනම දෙළොස් යොදුන් පමණ ඇති බරණැස්නුවර රාජ්‍යය ගණුම්හ. සොළොස් දහසක් පමණ පුරාංගනාවන්ට ප්‍රධාන වන්නෙහි වේදැයි කීහ. එකල්හි නාගමානවිකාවෝ යන්නට නොපිළිවනැයි කිව, කුමක්නිසාදැ?යි කීකල්හි අපි උග්‍රවූ විෂ තේජස් ඇත්තම්හ. ක්ෂණ කෝපියම්හ සවල්පමාත්‍රවූවත් දෙෂයට කිපෙන සුලුවම්හ, සපත්නි රොෂය නම් ඉතා බැරෑරුම් දෙයක, එසේහෙයින් මම ඉදින්

කිසිවක් දැකවත් අසාවත් කිපී බැලීතම් රඬුම්වක් මෙන් සියල්ලෝම සුණුවිසුණුව විසිරයෙති. මේ කාරණයෙන් මා යන්ට නොපිළිවනැයි කීව.

රාජකුමාරයෝ දෙවැනි දවසුත් යාච්ඤාකොට කීවාහුය. ඉක්බිත්තෙන් ඒ නාගමානවිකා රාජකුමාරයන්ට කියන්නී මම වූකලී කිසිම කාරණයෙකින් නොයෙමි. මේ මාගේ පුත්‍රයෝ නාගකුමාරයෝ නොවෙති, තොප නිසා උපන් හෙයින් මනුෂ්‍යජාති ඇත්තාහ, ඉදින් මා කෙරෙහි තොපගේ ස්නෙහයෙක් ඇත්තම් මේ දරුවන් කෙරෙහි ඒ පෙම්කොට අප්‍රමාදවව, මේ දරුවෝ වූකලී දියබිඳුවවින් උපන්හ, එසේහෙයින් ඉතා සිව්මැලියෝය, මාගීයෙහි ගෙණයනකල අව් සුලඟින් මිරිකී මිය ගියෝතම් කාරණා නොවෙයි, එසේ හෙයින් එක් ඔරුවක් කනවා පැන්පුරා මේ දරුවන් ඒ ඔරුවෙලා දියකෙළි කෙළවමින් ගෙණගොස් නුවරට ගියකල්හිත් තොපගේ ගෘහොද්‍යානයෙහිම පොකුණක් කනවා එහි හැමවේලෙහිම ජලක්‍රීඩා කරවව, එසේකළ කල්හි මේ දරුවන්ට කිසි පීඩාවෙක් නොවන්නේයයි කීවාය. මෙසේද කියා රාජ කුමාරයන් වැඳ පැදකුණුකොට දරුවන් වැළඳ සිඹ සනහා ලෙහි ඔවාගෙණ ඉස්මුදුන සිඹ රාජකුමාරයන්ට පාවාදී අඬාවැලප එතැන්හිම අතුරුදන්ව නාගභවනයට ගියාය, ඒ රාජකුමාරයෝත් දෙම්නසට පැමිණ දැස කඳුළු පුරාගෙණ පත්සලින් නික්ම දැස කඳුළු පිස අමාත්‍යයන් කරා ගියෝය. එකල්හි අමාත්‍යයෝ කුමාරයන්ට රාජ්‍යය පාවාදී එතැන්හිදීම අභිෂෙක කොට දේවයන් වහන්ස, අපගේ නුවරට යම්හයි කීහ. එසේවීතම් වහා ඔරුවක් කනවා ගැලකට නගා පැන්පුරවා දියපිට වණීගන්ධයෙන් යුක්තවූ නොයෙක් මල් විසුරුවව, මාගේ දරුවෝ දියබිඳුවවින් උපන්හ. එසේ හෙයින් දරුවෝ ඒ නැවින් දියකෙළි කෙළිමින් සැපසේ යන්නෝ වේදැයි කිවූය. අමාත්‍යයෝ එපරිද්දෙන්ම කළහ රජ්ජුරුවෝ බරණැස් නුවරට පැමිණ සරහා පිළියෙළ කරණ ලද නුවරට වැද සොළොස් දහසක් පමණ පුරවනිතාවන් හා අමාත්‍යයන් විසින් පිරිවරනලදුව ප්‍රාසාදයේ මතුමහල්තලයෙහි ශ්‍රීයහන් මස්තකයේ හිඳ සතියක් මුළුල්ලෙහි මහත්වූ සුරාපානය කොට දරුවන් කෙළනා පිණිස පොකුණු කැනවූහ. දරුවෝ එහි නිරන්තරයෙන් දියකෙළි කෙළනාහ.

ඉක්බිත්තෙන් එක් දවසක් පොකුණට සොරොව්වෙන් පැන් වදනා කල්හි එක් කැස්බෙක් පොකුණ ඇතුළට වැද නික්මෙන්නට නිසි මගක් නොදක්නේ පොකුණ පත්ලේ වැදහෙව දරුවන් කෙළනා කල්හි දියෙන් නැගී ඉස් මැත්කොට ඒ දරුවන් බලා නැවත දීයෙහිම ගැලීගියේය. ඒ රාජකුමාරවරු කැස්බෑ දැක භයින් ත්‍රස්තව පියානන් සමීපයට ගොස් පියානන් වහන්ස, පොකුණේ එක් යක්‍ෂයෙක් අප භයගන්නේයයි කීහ. එබස් ඇසූ රජ්ජුරුවෝ යව ඔහු අල්වවයි රාජපුරුෂයන්ට විධානකළෝය. ඒ රාජපුරුෂයෝ ගොස් දැලක් දමා කැස්බා බඳාගෙණ රජ්ජුරුවන්ට දැක්වූහ. කුමාරවරු ඔහු දැක පියානන් වහන්ස, මේ යක්‍ෂයාය කියා අඬගැසූහ; රජ්ජුරුවෝ පුත්‍රස්නෙහයෙන් කැස්බාට කිපුනව මොහු ඇරගෙණ ගොස් වධකොට මරවයි නියෝග කළහ. එතැන්හි සමහර කෙණෙක් කියන්නෝ මේ රාජද්‍රොහියාය, එසේහෙයින් මොහු වනලා මෝලින් කොටා සුණුකොට දමන්නට වටනේයයි කීහ. සමහර කෙණෙක් කියන්නාහු මොහු තුන්පාකයකින් පිස කන්නට වටු

නේයයි කීහ. සමහරකෙණෙක් කියන්නාහු අඟුරෙහි පා පල අඟුරුමස් කන්නට වටනේයයි කීහ. සමහර කෙණෙක් මොහු තමාගේ ඉදුබු කබලින් පල හන්නට වටනේයයි කීහ. එකල්හි උදකභීරුකවූ අමාත්‍යයෙක් කියනතේ මොහු යමුනා නම් ගංගාවෙහි මහත්වූ සලාවැටුමකට දමන්නට වටනේය, එසේ කල්හි මේ තෙමේ එහි මහත් විනාශයට පැමිණෙන්නේය, මෝහට මීට වඩනාවූ අනික් වධයෙක් නැතැයි කීය. එකල්හි කැස්බා ඒ අමාත්‍යයාගේ බස් අසා ඉදිබු කබලින් ඉස මැත්කොට කියන්නේ එම්බල පින්වත්වූ පුරුෂය, මා විසින් තට කෙසේවූ අපරාධයක් කරණලදද? මෙබඳුවූ දුක් කම්කටුලු කුමක්නිසා මට නියෝග කෙරෙහිද? මා විසින් පළමු මේ සියල්ලවුත් කී වධ ඉවසන්නට පිළිවන මේ තා විසින් කියන ලද්දාවූ වධය ඉතා චණ්ඩය, එසේහෙයින් ඒ වධය මම ඉවසාගත නොහෙමි, මෙබන්දක් මට නොකියවල කීහ. එබස් අසා රජ්ජුරුවෝ මෝහට ඒ වධ ඉවසන්නට, පිළිවන මේ තා විසින් කියනලද්දාවූ වධය ඉතා චණ්ඩය ඒ වධයම කරන්නට වටනේයයි කියා යමුනා නම් ගංගාවෙහි සලාවැටුමට දම්මවූය.

ඒ කැස්බ එසේ දමනලද්දේ නාගභවනයට ගියේය. ඒකල්හි ඔහු ඒ ජලප්‍රවාහයෙහි කෙළනා ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්ගේ පුත්‍රවූ නාගමානවකයෝ දැක මේ කොල්ලා අල්ලවයි කීය. එකල්හි කැස්බා සිතන්නේ මම බරණැස් රජ්ජුරුවන් වහන්සේ අතින් මිදී මෙබඳුවූ චණ්ඩපරුෂවූ නයින් අතට පැමිණියෙමි, කවර උපායෙකින් මූන් අතින් මිදී යෙම්දෝහෝයි සිතා එතෙමේ මේ උපාය යහපත්වන්නේයයි බොරුවක් ගොතාගෙණ කියන්නේ තෙපි හැම ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් වහන්සේ සනතකව සිට කුමක්නිසා මෙසේ කියව්ද? මම චිත්‍රචූල නම් කැස්බෙක්මි, බරණැස් රජ්ජුරුවන් වහන්සේගේ දූතයෙමි, ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් වහන්සේ සමීපයට මෙහෙවර ආමි, අපගේ රජ්ජුරුවන් වහන්සේ ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් වහන්සේට තමන්වහන්සේගේ දූ කුමාරිකාවන් දෙනු කැමතිව මා එවූසේක. ඒ නාරජ්ජුරුවන් වහන්සේට මා දක්වවයි කීවූය.

ඒ නාගමානවකයෝ සතුටුව ඒ කැස්බා ඇරගෙණ රජ්ජුරුවන් වහන්සේ සමීපයට ගොස් එපවත් දැන්වූහ, රජ්ජුරුවෝ ඔහු මෙසේ ගෙණෙවයි සමීපයට ගෙන්වා දැක නොසතුටුවූ සිත් ඇතිව මෙබඳුවූ ලාමක ශරීර ඇත්තාවූ සත්ත්වයෝ දූතමෙහෙවර කරන්නට අසමර්ථයෝයයි කීහ. එබස් අසා කැස්බා කියන්නේ කිමෙක්ද? රජ්ජුරුවන් වහන්ස, රජදරුවන්ගේ දූතයෝ තම් තල් පොල්සේ උස්වියයුතුද? ශරීරය කුඩාවුවත් මහත්වුවත් ඒ පමණ නොවෙයි, ගියතැන කාර්‍ය්‍ය සිද්ධකිරීමට පමණ වන්නේවේද? තවද රජ්ජුරුවන් වහන්ස, අපගේ රජ්ජුරුවන් වහන්සේගේ බොහෝ දූතයෝ වන්නාහ, ගොඩ දූත මෙහෙවර මනුෂ්‍යයෝ කෙරෙති, අවකාශයෙහි දූත මෙහෙවර පක්ෂීහු කෙරෙති, දියෙහි දූතමෙහෙවර මම කෙරෙමි. මම චූකලී "චිත්‍රචූලයා"යයි නම් තනතුරු ලැබ රජ වල්ලභව සිටි කෙණෙක්මි. එසේ හෙයින් මට නින්දාපරිභව නොකරවයි කියා තමාගේ ගුණ වණ්නා කෙළේය. එකල්හි ඔහු අතින් ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවෝ විචාරන්නෝ කවර කාරණයෙකින් රජ්ජුරුවන් වහන්සේ තා එවූසේක් දැයි විචාළෝය, මහ රජ්ජුරුවන් වහන්ස, අපගේ රජ්ජුරුවන් වහන්සේ මට

කීයතසේක් සියලු දඹදිව රජදරුවන් වහන්සේලා හා සමග මා විසින් මිත්‍රධර්මම කරණලදී. නොකෙළේ නම් ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් හා සමගමය අපගේ “සමුද්‍රජාවෝ” නම් දියනියන් පාවාදීමෙන් ඒ නාරජ්ජුරුවන් හා මිත්‍රධර්මය තර කොටගන්නට උවමැනවැයි කීසේක. එසේ හෙයින් දූත් ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජු රුවන් වහන්ස, මා හා සමග පෂීත් එවා නකත් දවස් නියමකොට රාජකුමාරි කාවන් වහන්සේ පාවාගත මැනවැයි කීය. ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවෝ එබ සට සතුටුව ඔහට සත්කාර කොට ඒ කැස්බා හා සමග නාගමානවකයන් සතර දෙනෙකු යවන්නෝ යව රජ්ජුරුවන්ගේ බස් අසා දවස් නියමකොට ගෙණ එවයි කියා යැවූය, ඒ නාගමානවකයෝ සතරදෙන යහපත සවාමීනි, කියා කැස්බා ඇරගෙණ නාගභවනයෙන් නික්මුනාහ එකල්හි කැස්බා යමුනාවටත් බරණැස් නුවරවත් අතරේ එක් පියුම් විලක් දැක එක් උපායෙකින් පලායෙමි සිතා කියන්නේ පින්වත්වූ නාගමානවකයෙනි. අපගේ රජ්ජුරුවන් වහන්සේත් උන් වහන්සේගේ දූදරුවෝත් මා දියෙහි ඇවිදිනා තැනැත්තවූ රජගෙට ගියකල දැකලාම අපට ඇඹුල උපුල නෙළුම්මල් දෙව, නෙළුඹල හා නෙළුම්දූලි දෙවයි ඉල්වනසේක. එසේ හෙයින් මම උන්වහන්සේලා නිසා නෙළුම්මල් ආදිය කඩා ගන්නා කැමැත්තෙමි. මා මෙතැනටම ඇරල නුදුටත් පෙරාතුකොටම තෙපි හැම රජ්ජුරුවන් වහන්සේ සමීපයට යව එතැන්හිදී මා දක්නෝවේදැයි කිවූය ඒ නගමානවකයෝ ඔහුගේ බස් අසා අදහා එතැන්හිදීම කැස්බා විලට ඇරපූහ ඒ කැස්බා එතැන්හිම එක් තැනක සැඟවින, නාගමානවකයෝත් ඔහු නොදැක රජ්ජුරුවන් වහන්සේ සමීපයට ගියේවනැයි සිතා මානවක වෙශයෙන් රජ්ජු රුවන් වහන්සේ සමීපයට ගියාහ. රජ්ජුරුවෝ පිළිසඳර කථාකොට කොයි සිට අවුදැයි විචාළෝය, ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් සමීපයෙහි සිට ආම්හ. මහ රජ්ජුරුවන් වහන්සැයි කීකල්හි කුමක්නිසා අවුදැයි කීහ. මහ රජ්ජුරු වන් වහන්ස, අපි උන්වහන්සේගේ දූතයම්හ, ධ්‍රතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් වහන්සේ නුඹවහන්සේගේ සුව දුක් විචාළසේක. තවද තමන් වහන්සේගේ නාගභවනයෙහි මුක්තාමාණික්‍යාදී යම්කිසි රත්නයෙක් ඇත්නම් ඒ සියලු රත් නයම නුඹවහන්සේට පඩුරුකොට දී එවනසේක, කැමතිසේක් වීනම් ඒ සියලු රත්නාදිය ගනමැනව, නුඹවහන්සේගේ දූවූ සමුද්‍රජාවන් අපගේ රජ්ජුරුවන් වහන්සේට පාදපරිචාරිකා කොට දූනමැනවැයි කීහ, එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු අප විසින් කිසිකලකත් නයින් හා විවාහයක් කළ විරූ නැත. අපි මනුෂ්‍යජාති ඇතිව සිට තිරශ්චීනයන් හා සමග නුසුදුසුවූ විවාහබන්ධනය කෙසේ නම් කරමෝදැයි කීහ. එබස් අසා නාගමානවකයෝ කියන්නෝ ඉදින් නුඹ වහන්සේට ධ්‍රතරාෂ්ට්‍රනම් නාරජ්ජුරුවන් වහන්සේ හා සමග සම්බන්ධය නුසුදුසු වීනම් එසේ කල කුමක් නිසා නුඹවහන්සේගේ සේවකවූ චිත්‍රචූල නම් කැස්බා සමුද්‍රජා නම් රාජකුමාරිකාවන් දෙමියි අපගේ නා රජ්ජුරුවන් වහන්සේ සමීප යට දූතමෙහෙවර එවූසේක්ද? එසේ එවාලා දූත් හිඳ අපගේ රජ්ජුරුවන්වහන්

සේට පරිභව කරන්නාවූ නුඹවහන්සේට කළමනා කටයුතු අපි දනුම්හ, අපි නයි නියාව නොදන්නාසේක්දැයි කියා රජ්ජුරුවන් භයගැන්වූහ. නවද ජනෙශ්වරවූ රජ්ජුරුවන් වහන්ස, ඒකාන්තයෙන් නුඹවහන්සේගේ ජීවිත යත් රාජ්‍යයත් හරණ ලද්දමය මේබඳුවූ මහානුභාව සම්පන්න නයින් කිපී කල්හි නුඹවහන්සේ බඳු ආනුභාව රහිතවූ රජදරුවෝ ජීවත්ව ගත නොහෙති අතර තුරෙහිම විනාශයට පැමිණෙති, එසේ හෙයින් රජ්ජුරුවන් වහන්ස, මනුෂ්‍ය ජාතිව සිට ආනුභාව මහිමයක් නැතිව මහානුභාව සම්පන්නවූ සෘද්ධිමත්වූ වරුණ නම් නාරජ්ජුරුවන් වහන්සේගේ ප්‍රිය පුත්‍රවූ යමුනා නම් ගංගාවෙට උපන්නාවූ ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් වහන්සේට කුමක් පිණිස නින්ද කොට කියනසේක්ද? එසේ කීම නුඹවහන්සේට සුදුසු නොවෙයි කීහ.

ඉක්බිත්තෙන් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එබස් අසා කියන්නෝ මහත්වූ යශපිරිවර ඇත්තාවූ ඒ ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන්ට මම නින්දකොට නො කියම්. ධෘතරාෂ්ට්‍ර නා රජ්ජුරුවෝ පන්සියයක් යොදුන් පමණ ඇති නාග භවනයෙහි බොහෝ නයින්ට නායක සහ එසේ මහානුභාව සම්පන්නව සිටියෝ වී නමුත් සර්පජාති ඇති බැවින් මාගේ දියනියන්ට නුසුදුස්සෝය. වෛදෙහ රාජපුත්‍රයාත් මාගේ දියනියෝ සමුද්‍රජාවෝත් දෙදෙනම විශිෂ්ටවූ ජාති ඇත්තාහ. ඔහු දෙදෙන ඔවුනොවුන් හා සංවාසයට සුදුස්සෝය මණ්ඩූක භක්ෂණය කරන්නාවූ සර්පයන්ට මාගේ දියනියෝ සමුද්‍රජාවෝ සුදුසු නො වෙතියි කීහ.

එකල්හි නාගමානවකයෝ ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එතැන්හිදීම නාසාවාතයෙන් මරණු කැමතිවත් නැවත අප දවස් නියමකරණු පිණිස එවූ වන්ට මූන් මරා යාම සුදුසු නොවෙයි. ගොස් රජ්ජුරුවන් වහන්සේට කියා මූන්ට නියම් දනුම්හයි සිතා නාගමානවකයෝ එතැන්හිම පොළෝ කිමිද ගොස් නාලොවට වැද ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් විසින් කිමෙක්ද? දරුවෙනි, තොප විසින් රාජකුමාරිකාවෝ ලබන ලද්දැයි විචාළ කල්හි ඔහු සතරදෙන කිපී දෙවයන්වහන්ස, අපි නිස්කාරණයේ කුමක් පිණිස ඒ ඒ තැනට යවනසේක්ද? ඉදින් මරණු කැමතිසේක් වී නම් මෙතැන්හිදීම මරවාපුව මැනව, ඒ රජ්ජුරුවෝ නුඹවහන්සේට අක්‍රොශපරිභව දී බෙණෙති. තමන්ගේ දියනියන් ජාතිමදයෙන් උසස් කොට කියති කියා ඒ රජ්ජුරුවන් කී දෙයත් නොකී දෙයත් කියා නා රජ්ජුරුවන්ට කෝප ඉපදවූහ. එකල්හි නා රජ්ජුරුවෝ තමන්ගේ පර්ෂත් රැස්කරවන්ට විධාන කරන්නාහු මෙර පත්ලෙහි වසන්නාවූ කම්බලස්සතර නම්වූ මාගේ මවූ පක්ෂයෙහි නයින් හා අවශෙෂවූත් සතරද්ගය සතර අනුදිගයයි අටදිග්හි වසන්නාවූ යම් පමණ මා කීවා කරන්නාවූ නාගපර්ෂ දෙක ඇත්නම් ඒ සියලු නාගපර්ෂදට ගොස් කියව, වහා රැස්කරවයි විධාන කළහ. ඉක්බිත්තෙන් ඒ සියලු නාගපර්ෂත්ම වහ වහා රැස්ව නාරජ්ජුරුවන් සමීපයට අවුත් දේවයන්වහන්ස. කුමක් කරමෝද? කව රක්හු නාසාවාතයන් පැහැර භස්මකරමෝද? යි කී කල්හි රාජකුමාරිකාවන්

කෙරෙහි පිළිබඳවූ සිත් ඇති බැවින් උන්ට නාශයක් නොකමැතිව කියත්තෝ බරණැස් නුවරට යව ගොසින් තෙපි හැමදෙන කවුරුන්ට කිසිත් පීඩාවක් නොකරවයි කීහ. එකල්හි නා රජ්ජුරුවන්ට නාගයෝ කියත්තෝ ඉදින් කිසි මනුෂ්‍යයෙක් නොමැරිය යුත්තේ වීනම් ඒ බරණැස් නුවරට ගොස් කුමක් කරමෝදැයි කීහ.

ඉක්බිත්තෙන් නාරජ්ජුරුවෝ නයින්ට තෙපි හැමත් මේ මේ දේ කරවා මමත් මෙතම් දෙයක් කරමි කියත්තාහු ප්‍රාසාදයෙහිත් අවශෙෂ මනුෂ්‍යයන්ගේ ගෙවලත් පොකුණෙහිත් වීථියෙහිත් වීථිචතුස්කයෙහිත් වෘක්ෂයෙහිත් තොරණෙයෙහිත් මහත්වූ ශරීර මවාගෙණ එලෙව. මෙපමණක් විනා කිසි සත්ත්වකෙණෙකුන්ට විනාශයක් නොකරව. තවද මෙසේ එලෙත්තාවූ තෙපි හැම ප්‍රාසාදග්‍රයෙහි වූකලී ඇඳපුටු යහන් වියන් උඩත් ගබඩා ඇතුළෙහිත් මහත්වූ ශරීර මවාගෙණ මහත්වූ පෙණකොට කඹුරුසම් මඩනා කලක් මෙන් සූ සූ යන අනුකරණ ශබ්දපවත්වමින් එලෙව, නොප හැමවූකලී බාලදරුවෝය, වෘඩයෝය. ගර්භිණීහුය, සමුද්‍රජාවෝය යන සතරපක්ෂයට නොදක්වව, මමත් සණ්ඩගයෙන් ධවලවූ මහත්වූ නාගශරීරයක් මවාගෙණ ගොස් ඉතා මහත්වූ කශීපුරය සත්දරණ පටකින් වටලාගෙණ මහත්වූ පෙණ ගභීයකින් නුවර වසා එකාන්ධකාරකොට කශීපුරවාසීන්ට භය උපදවමින් සූ සූ යන අනුකරණ ශබ්ද පවත්වා වැදහෝම්යි කීහ.

ඒ නාරජ්ජුරුවන්ගේ බස් අසා රක්ත නීල ශ්වෙතාවූ නොයෙක් පැහැ ඇති නාගවෙස් මවා මධ්‍යම රාත්‍රිවේලෙහි නුවරටවැද ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරු වන් විසින් කියනලද ක්‍රමයෙන් ඒ සියලු නාගයෝ කිසිකෙණෙකුන්ටත් හිංසාවක් පීඩාවක් නොකොට ප්‍රාසාදයෙහිත් සෙසු ගෙවලත් පොකුණෙහිත් වීථියෙහිත් සතරමංසන්ධියෙහිත් ගස් උඩත් තොරණයෙහිත් මනුෂ්‍යයන්ගේ සංචාරයෙහිත් එලෙන්නට පටන්ගත්හ. දූනව ආවාවූ නාගමානවකයෝ සතරදෙන රජ්ජුරුවන්ගේ යහනෙහි පාසතර වෙලාගෙණ හිස්මුදුනට මහත්වූ පෙණගබ්කොට තුඩින් තුඩින් හිසට ඇන කට දල්වා සුස්ම සුස්මා සිටියාහ. ධෘත රාෂ්ට්‍රනම් නාරජ්රුවෝත් පළමු තමන් කී සැටියේම නුවර සත්දරණකින් වෙලා කලකටක් වැසූකලක් මෙන් පරිද්දෙන් පෙණගභීය වසා එකාන්ධකාර කොට සුස්මමින් මහජනයාට භය ඉපදවූහ. මහජනයෝ රාත්‍රිපිබිද යම් යම් තැනෙක අතක්වත් පයක්වත් දික්කළෝ නම් ඒ ඒ තැන සර්පයින් පිටම අතපය තබා සර්පයෙක සර්පයෙකැයි මුරගෑසූහ. යම් ගෙයක පහන් ඇවිලේනම් ඒ ගෙවල ස්ත්‍රීහු පිබිද උඩබලන්නාහු ගොණැස් ආදියෙහි එලෙන්නාවූ නයින් දැක බොහෝ දෙන එකපැහැර අඩන්නට පටන්ගත්හ.

තවද පාන්ව ගිය කල්හි නයින්ගේ ආශ්වාස ප්‍රාශ්වාසයෙන් සියලු නුවරත්මාළිගාත් උපුටපියන කලක් මෙන් වූකල්හි භයින් ත්‍රස්තවූ මනුෂ්‍යයෝ නාරජ්ජුරුවෙනි කුමක්නිසා අප හැමට පීඩාකරව්දැයි කිවුය. නොපගේ රජ්ජුරුවන් වහන්සේගේ දියනියන් දෙම්හයි ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් සවමීපයට දූතයන් යවා නැවත උන්වහන්සේගේ දූතයන් අවුත් දූනමැනවැයි

අපගේ නාරජ්ජුරුවන් වහන්සේට අක්‍රොශ පරිභව කළසේක. ඉදින් අපගේ නාරජ්ජුරුවන් වහන්සේට දියනියන් දුන්සේක් වීනම් ඇරපියම්හ. නුදුන් සේක් වීනම් සියලු නුවරවාසීන්ගේ දිවිනැත්තේවේදැයි කීකල්හි එසේවීනම් අපට අවසර දුනමැනව, අපි හැම ගොස් රජ්ජුරුවන් වහන්සේට යාච්ඤා කරම්හයි කියා යාච්ඤාකොට අවසර ලැබගෙණ මාලිගාදොරට ගොස් මහහඬින් හැඬූහ රජ්ජුරුවන්ගේ බිසෝවරුත් තමන් තමන්ගේ ගබඩාවලම වැදහෙව දියනියන් ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්ට දුනමැනවයි එකපැහැර ඇඬූහ. ඒ නාගමානවකයෝ සතරදෙනත් දුනමැනවයි කියා රජ්ජුරුවන්ගේ හිස් තමන්ගේ තුඩින් පැහැර පැහැර සිටියහ.

ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ වැදහොත් තැනැත්තෝම නුවරවාසීන් හා බිසෝවරුන් අඬන අඬන් අසා නාගමානවකයන් සතරදෙනා විසින් හයගැන්වූ බැවිනුත් මරණභයින් භයපත්ව මාගේ දියනියන් සමුද්‍රජාවන් ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්ට දෙමි දෙමියි තුන්විටක් කීහ. එබස් අසා සියලුම නාරජදරුවෝ ගවුවක් පමණතැන් පසුබාගෙණ දිව්‍යපුරයක් මෙන් එක් නුවරක් මවා ඒ නුවර සිට දියනිය එවුව මැනවයි පඬුරු යැවූහ. රජ්ජුරුවෝ උන් ගෙණගිය පඬුරු ගෙණ තෙපි හැම යව මම දියනියන් අමාත්‍යයන් අතට පාවාදී එවමියි නාගමානවකයන් යවා දියනියන් සමීපයට කැඳවා ප්‍රාසාදයේ මතුමහල්තලයට ගෙණ ගොස් සිවුමැදුරු කවුළුව හැර කියන්නෝ මැනියෙනි, මේ සරහා පිළියෙළ කරණ ලද නුවර දුටුවාද? ඒ නුවර එක් රජ්ජුරුකෙනෙකුන්ට අගමෙහෙසුන්වව, නුවර දුරුනොවෙයි. සිතට දුකක් උපන්විටම පෙරළා එන්නටත් පිළිවන, එසේ හෙයින් තොප ඒ නුවරට යායුතුයයි ගිවිස්සා ඉස්සෝධා නාවා සර්වාභරණයෙන් සරහා මනාව සරසන ලද යානාවෙක හිඳවා අමාත්‍යයන් අතට පාවාදී යවූය එකල්හි අමාත්‍යයෝද සමුද්‍රජාවන් ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්ට පාවාදී බොහෝ සම්පත්ගෙණ පෙරළා නුවරට ආහ. රාජකුමාරිකාවන් ප්‍රාසාදයේ මතුමහල් තලයට ගෙණගොස් සරසනලද දිව්‍යයහනෙක සැතැප්පූහ. එකෙණෙහිම නාගමානවිකාවෝ කුරුන් කුරුන් වෙස්ගෙණ මනුෂ්‍ය පරිවාරිකාවන් මෙන් පිරිවරාගත්හ. රාජකුමාරිකාවෝ දිව්‍යයහනේ හොත් පමණකින්ම දිව්‍යපහස්විඳ නිදන්නට පටන්ගත්හ. ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවෝ එකල්හි සමුද්‍රජාවන් ගෙණ නාගපර්ෂත් හා එතැන්ම අනතර්ධානව නාගභවනයෙහි පහළවූහ. ඒ රාජකුමාරිකාවෝ පිබිද සරහනලද දිව්‍යයහනත් අනෘවූ රත්රිදී මැණික්මයවූ ප්‍රාසාදදියත් උද්‍යාන පුෂ්කරණීන් සරහනලද දිව්‍යපුරයක් වැනිවූ නාගභවනයත් දැක කුරුන් කුරුන් ආදීවූ පරිවාර ස්ත්‍රීන් අතින් විචාරන්නාහු මේ නුවර ඉතා සැරහී තිබෙන්නේය. අපගේ නුවරසේ නොවෙයි, මේ කාගේ නුවරෙක්දැයි විචාළෝය. එකල්හි පරිවාරස්ත්‍රීහු කියන්නෝ දේවීන්වහන්ස, නුඹ වහන්සේගේ ස්වාමිපුත්‍රයානන් වහන්සේ සන්තක නුවර වන්නේය. මඳපින් ඇත්තාවූ සත්ත්වයෝ මෙබඳු සම්පත් නොලබති, නුඹවහන්සේ මහපින් ඇති බැවින් මේසා මහත්වූ ඓශ්වර්‍ය්‍ය හා සම්පත් ලබනලදැයි කීහ.

ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවෝත් පන්සියයක් යොදුන් පමණවූ නාගභවනයෙහි බෙරලවන්නාවූ යමෙක් සමුද්‍රජාවන්ට සපිවේශයක් දක්වූයේ වීනම් ඔහට රාජදණ්ඩවන්නේයයි බෙරලැවූහ. එසේ හෙයින් එකකුත්

සමුද්‍රජාවන්ට සන්නිවේශයක් දක්වන්නට අසමර්ථවිය, සමුද්‍රජාවෝ මනුෂ්‍ය ලෝකය යන සංඥාවෙන් මෙසේ ඒ නාගභවනයෙහි ඒ නාරජ්ජුරුවන් හා සතුටුව ප්‍රිය සංවාසයෙන් විසූහ.

ඉක්බිත්තෙන් ඒ සමුද්‍රජාවෝ මැතනාගයෙහි ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් නිසා දරුගැබියක් ලැබ පුතනුකෙණෙකුන් වැදූහ. ඒ කුමාරයන්ට ප්‍රියවූ දකුම් ඇති බැවින් සුදර්ශන කුමාරයෝයයි නම් තුබූහ. නැවත අනික් පුතනුකෙණෙකුන් වැදූහ. උන්ට දත්ත කුමාරයෝයයි නම් තැබූහ. ඒ කුමාරයෝ වනාහි බෝධිසත්වයෝය, නැවත එක් පුතනුකෙණෙකුන් වැදූහ. උන්ට සුභෝග කුමාරයෝයයි නම් තැබූහ. නැවත එක් පුතනුකෙණෙකුන් වැදූය, උන්ට අරිට්ඨ කුමාරයෝයයි නම් තුබූහ. මෙසේ ඒ සමුද්‍රජාවෝ පුතුන් සතරදෙනෙකු වදත් නාගභවනය නියාව නොදන්නාහ. ඉක්බිත්තෙන් එක්දවසක් අරිට්ඨ කුමාරයන්ගේ නාගමානවිකාවෝ කියන්නෝ තොපගේ මෑනියෝ මනුෂ්‍යස්ත්‍රිය, නාගමානවිකාවක් නොවෙයි කීහ. එබස් අසා අරිට්ඨ කුමාරයෝ පරීක්ෂාකෙරෙමියි සිතා එක්දවසක් කිරිබොමින් ඉඳ සන්නිවේශයක් මවා නගුටින් මෑනියන්ගේ පිටිපතුලට ඇනලූය. එකල්හි මෑනියෝ ඔහුගේ සර්පශරීරය දැක භයින් ත්‍රස්තව මහත්කොට අඬගසා ඔහු බිමට දමන තැනැත්තෝ නියෙන් ඔහුගේ ඇස ඇන සිල්කළහ. ඇසින් ලේ වැගිරෙන්නට පටන්ගත, රජ්ජුරුවෝ සමුද්‍රජාවන් අඬ ගැසූ අඬ අසා සමුද්‍රජාවෝ කුමක්නිසා අඬගැසූදැයි විචාරා අරිට්ඨ කුමාරයන් විසින් කරනලද ක්‍රියාව අසා අනුව, ඒ කොල්ලා අල්ලාගෙණ ජීවිතක්ෂයට පමුණුවයි කියා තැතිගන්වමින් සමීපයට අවුය, එකල්හි රාජකුමාරිකාවෝ කුමාරයන්ට කිපී නියාව දැක පුත්‍රස්නෙහයෙන් කියන්නෝ දේවයන්වහන්ස, මගේ පුතවනුන්ගේ ඇස තැසීගියේය. උන්ට ක්ෂමාකළ මැනවයි කීවූය. රජ්ජුරුවෝ එබස් අසා මුන් මෙසේ කියනකල කුමක් කරන්නට පිළිවන්දැයි ඉවසූය. එදවස් මේ නාගභවනයයි සමුද්‍රජාවෝ දන්න. එතැන් පටන් අරිට්ඨ කුමාරයෝ කාණාඅරිට්ඨ කුමාරයෝයයි මෙනමින් ප්‍රසිද්ධවූහ. දරුවෝ සතර දෙන ක්‍රමයෙන් වැඩිවිය පැමිණ විඥ බවට පැමිණියාහ.

ඉක්බිත්තෙන් ඒ සතරබෑයන්ට පිය රජ්ජුරුවෝ යොදුන් සියයක් යොදුන් සියයක් පමණකොට රාජ්‍යය දුන්හ. මහත්වූ යශපරිවාර වූයේය. සොළොස් දහසක් සොළොස් දහසක් පමණ නාගකන්‍යාවෝ පිරිවරවූහ. පිය රජ්ජුරුවන්ට යොදුන් සියයක් පමණ රාජ්‍යය වූයේය. තුන්බෑයෝ මසක් පාසා දෙමව්පියන් දක්නට එන්නාහ මහබෝසතානෝ වූකලී අඩමසින් අඩමස දෙමවුපියන් දක්නට එන්නාහ. නාගභවනයෙහි උපන්නාවූ ප්‍රශ්නයෙක් ඇත්නම් මහබෝසතානෝම විසඳා කියන්නාහ. පිය රජ්ජුරුවන් හා සමග විරූපාක්ෂ නම් වරම් මහරජ්ජුරුවන් සමීපයටත් උපස්ථානයට යන්නාහ. ඒ රජ්ජුරුවන් සමීපයෙහි උපන් ප්‍රශ්නයෙක් ඇත්තමුත් මහබෝසතානෝම විසඳා කියන්නාහ.

ඉක්බිත්තෙන් එක් දවසක් විරූපාක්ෂ නම් වරම් මහරජ්ජුරුවන් නාගපර්ෂත් හා සමග ත්‍රයත්ත්‍රිංශත් දිව්‍යලොකයට ගොස් සක්දෙව් රජ්ජුරුවන් පිරිවරා උන්කල්හි දෙවියන් අතරෙහි ප්‍රශ්නයක් උපන්නේය. ඒ ප්‍රශ්නය

කියන්නට සමර්ථවූ එකද කෙණෙක් නුවූයේය. උතුම්වූ පයඞ්ඛයට නැගී හිඳ මහාබෝධිසත්ත්වයෝම ප්‍රශ්නය විසර්ජනය කළහ. එකල්හි බෝධිසත්ත්වයන්ට ශක්‍රදේවේන්ද්‍රයෝ දිව්‍යසුවඳමල් ආදියෙන් පූජාකොට දතතායෙනි, තෙපි පොළොව හා සමාන මහත්වූ විපුලවූ ප්‍රඥාවෙන් යුක්තයහ. එසේහෙයින් මෙතැන් පටන් භූරිදත්ත නම් වේවයි භූරිදත්ත කුමාරයෝයයි මහබෝසතානන්යයි නම් තුබූහ. එතෙන් පටන් මහබෝසතානෝ ශක්‍රදෙවේන්ද්‍රයන්ට උපස්ථානයට යන තැනැත්තෝ අලඞ්කෘතවූ වෛජයන්ත ප්‍රසාදය හා ඉතා සිත්කළුවූ හාව භාව ලීලාකටාක්ෂක මන්දස්මිතයෙන් යුක්තවූ දිව්‍යාප්සරාවනුත් අතිමනොරවූ ශක්‍රසම්පත්තියත් දූක දිව්‍යලොකොත්පත්තියෙහි තෘෂ්ණාවනොකොට මට මේ මණ්ඩූක භක්ෂණය කරන්නාවූ ආත්මභාවයෙන් ප්‍රයෝජන කිම්ද? නාගභවනයට ගොස් දෙමව්පියන් අතින් විචාරන්නාහු මෑනියන්වහන්ස, පියානන් වහන්ස, මම පෙහෙවස් රැක දිව්‍යලොකයෙහි උපදනා කැමැත්තෙම්, එහෙයින් මට පෙහෙවස් රක්ෂාකිරීමට අවසර දුනමැනවැයි කීහ. එබස් ඇසූ දෙමව්පියෝ යහපත පුත, පෙහෙවස් රකුව පෙහෙවස් රක්ෂාකරන්නාහු තෙපි මෙතැනින් ඔබ්බට නොගොස් මේ නාගභවනයෙහි ශූන්‍ය විමානයක හිඳ පෙහෙවස් රකුව නාගභවනයෙන් ඔබ්බට ගියාවූ නයින්ට ගුරුළුන් හා මනුෂ්‍යාදීන්ගෙන් මහත්වූ භය උපදවන්නේයයි කීය. මහබෝසතානෝ යහපතැයි පිළිගෙණ ඒ නාග භවනයෙහිම ශූන්‍යවිමාන ආරාමෝද්‍යානයෙහි වැස පෙහෙවස් රක්ෂාකරන්නාහ. එකල්හි බෝධිසත්ත්වයන් ආතතවිතතාදීවූ පඤ්චාඞ්ගික තූර්‍ය්‍යනාද ගත් අත් ඇති නාගකන්‍යාවෝ පිරිවරාගත්හ. මහබෝසතානෝ මෙහි වසන්නාවූ මට උපොෂථ කර්මය මස්තකප්‍රාප්ත නොවන්නේය. මනුෂ්‍යපථයට ගොස් උපොෂථ ශීලය රක්ෂාකරමි සිතා වලකන්නාහු යන භයින් දෙමවුපියන්ට නොකියාම තමන්ගේ භාර්‍ය්‍යාවූ නාගකන්‍යාවට කියා සොඳුර, මම මනුෂ්‍යලොකයට ගොස් යමුනා නම් ගංතෙර මහත්වූ නුගගසක් ඇත, නුදුරුතැන තුඹසක් මත්තෙ දරණවැල ලාගෙණ චතුරඞ්ගසමන්නාගතවූ උපොෂථශීලය ඉටා වැදහෙව පෙහෙවස් රක්ෂාකරමි. මා සියලු රාත්‍රියෙහි වැදහෙව පෙහෙවස් රක්ෂාකළකල්හි අරුණුනැගෙන වේලෙහි මා තොපගෙන් දශදෙනෙක් දශදෙනෙක් වාරයෙන් වාරයට තූර්‍ය්‍යභාණ්ඩගත් අත් ඇතිව මා සමීපයට අවුත් මා ගඳින් මලින් පුදා නටා ගී කියා කැඳවාගෙණ නාගභවනයට එවයි කියා ඒ යමුනා නම් ගංතෙර පිහිටි නුගගස සමීපයට ගොස් තුඹස මත්තෙහි දරණවැල ලාගෙණ යමෙක් මාගේ සම් මස් ඇට ලේ කැමැත්තේ වීනම් ඒ තෙමේ සම් ආදිය ගෙණ යේවයි කියා සියුඅඟින් යුක්තවූ පෙහෙවස් ඉටා නගුලිසක් පමණ ශරීර මවා වැදහෙව පෙහෙවස් රක්ෂාකළහ. අරුණු නැගෙමින් සිටියදීම නාගමානවිකාවෝ ගොස් මහබෝසතානන් කී සැටියේම පිළිපැද නාගභවනයට ගෙණයන්නාහ. මෙසේ මේ ප්‍රකාරයෙන් පෙහෙවස් රක්ෂාකරන්නා ඒ බෝසතානන්ට බොහෝ කලක් ඉකුත්වූයේය.

එසමයෙහි බරණැස්නුවර වහසල් දොර ගම්වැසිවූ එක් බමුණෙක් සොමදත්ත නම් පුතකු හා සමග වනයට ගොස් උගුල් ඇටවීමය යතුරු දුනු තිබීමය යහුල්බැඳීමය, මළඑලීමය, දූල්දූම්මය යනාදියෙන් මුවන් මර මරා මස්කදින් ගෙණවුත් විකුට ජීවත්වන්නේය. ඒ තෙමේ එක් දවසක් ගොයෙකු පමණකුත් නොලැබ පුතාට කියන්නේ පුත, සෝමදත්තයෙනි ඉදින් හිස් අතින් ගියෙමු නම් තොපගේ මෑනියෝ කිපෙති. එසේ හෙයින් යම්කිසි

වක් ඇරගෙණ යම්හයි කියා බෝධිසත්ත්වයන් වැදහොත් තුඹසට අභිමුඛව ගොස් පැන් බොන්නට යමුනාවට බස්නාවූ මුවන්ගේ පිරිවර සවහත් දැක පුත, මුවන් යන්නාවූ මඟෙක් පෙණෙන්නේය. එසේ හෙයින් තෙපි ඉවත්වෙලා සිටුව. මම පැන් බොන්නට අවාවූ මුවා විදිමියි දුන්න ගෙණ මුවන්ගේ ඊම බලමින් එක් ගසක් මුල සිටියේය. එකල්හි එක් මුවෙක් සවස්වේලෙහි පැන් බොන්නට ආයේය. වැදි බමුණා මුවා දැක විද්දේය. මුවා සරප්‍රහාරය ලදින් එතැන්හි නොවැටී සැරවේගයෙන් තැතිගන්වන ලද්දේ ලේ වගුරුව වගුරුවා දිවනත්තේය. දෙපුතුපියෝ ඔහු පස්සෙහි ලුහුබඳවාගෙන ගොස් හුනුතැනදීම සමගසා මස්කොට මස් ඇරගෙණ වනයෙන් නික්ම හිරු හස්තයට යන වේලෙහි නිග්‍රොධවෘක්‍ෂ සමීපයට පැමිණ දූත් වේලා නොවෙයි, යන්නට නොපිළිවන, මෙතැන්හි වසම්හයි කියා මස් එක් තැනෙක තබා ගස උඩ නැගී වෙලෙප් අතරෙහි වැදහොත්තාහ. බමුණා අලුයම් වේලෙහි පිබිද මුවන්ගේ අඩ අසන පිණිස කණ තමාලා වැදහොත්තේය. එකෙණෙහි නාගමාණවිකාවෝ අවුත් මහ බෝසතාණන්ට මල් අස්නක් පැනවූහ. මහබෝනාණෝ සර්පවෙශය අන්තර්ධාන කොට දිව්‍ය ශරීරයක් මවා සර්වාභරණයෙන් සැරහී ශක්‍රදෙවේන්ද්‍ර ලීලායෙන් පුෂ්පාසන මස්තකයෙහි උන්නාහුය.

නාගමානවිකාවොත් මහබෝසතාණන්ට සුවඳ මල් ආදියෙන් පූජාකොට දී බෙර ගසා නටන්නට ගී කියන්නට පටන්ගත්හ. එකල්හි වැදි බමුණා ඒ හෙරිතූර්ය්‍ය ශබ්දය අසා මේතෙමේ කවරෙක්දෝහෝයි ඔහුගේ ප්‍රවෘත්තිය දනිම්හයි සිතා එම්බල පුතැයි කියාත් පුතා පොබයාගතනොහී වත්නාට මෙතෙමේ හෝනේමය, මේතෙමේ මිරිකුනේවන, මමම යෙමි. සිතා වෘක්‍ෂයෙන් බැස මහබෝධිසත්ත්වයන් සමීපයට ගියේය. නාගමානවිකාවෝ බමුණා දැක තූර්ය්‍ය භාණ්ඩයන් සමග පොළොව කිමිද නාගභවනයටම ගියාහුය, මහබොධිසත්ත්වයෝ එකලාවූහ. එකල්හි බමුණා බෝධිසත්ත්වයන් සමීපයෙහි සිට විචාරන්නේ සුවඳමල් ආදියෙන් පූජාකරණලද මේ වන මධ්‍යයෙහි රත්වූ ඇස් ඇතිව විශාලවූ වක්‍ෂස්ථල ඇතිව උතුම්වූ රූපශොභාවෙන් බබලන්නාවූ තෙපි කවුරුද සවර්ණ කෙයුරාභරණයෙන් බබලන්නාවූ මනා වස්ත්‍ර අඳනා ස්ත්‍රීහු දසදෙනෙක් තොප පිරිවරා තොපට නමස්කාර කොට සිටිති. ඔවුන් කවුරුද? තවද දිගී නීයවූ මහත්වූ බාහු ඇති මේ වන මධ්‍යයෙහි ගිතෙල් වත්කල වන්නිස්කන්ධයක් මෙන් විශෙෂයෙන් දිලියෙන්නාවූ ශරීර ඇතිව සියලු වනය එකාලොක කොට බබුළුවමින් මේ පුෂ්පාසන මස්තකයෙහි ඉඳිනාවූ තෙපි කෙසේවූ කෙණෙක්ද? මහානුභාව සම්පන්නවූ එක්තරා දිව්‍යපුත්‍රකෙණෙක්ද? නොහොත් ආනුභාව ඇති නාගරජ කෙණෙක්ද? තොපගේ සවරූපය මට නත්වූ පරිද්දෙන් කියවයි කීහ. එබස් අසා මහබොසතාණෝ ඉදින් මම ශක්‍රාදීන් අතරෙන් එක්තරා එකෙකි කීම්නම් මේ බමුණා මා කී බස් අදහන්නේමය එනකුදුවූවත් අද මා විසින් සැබෑ බසක්ම කියන්නට වටනේයයි සිතා තමන් නාගරාජ නියාව කියන්නාහු මම මහත්වූ සෘධ්‍යානුභාව ඇතිවූ උග්‍රවූ විෂතේජස් ඇත්තාවූ අන්‍ය සත්ත්ව කෙණෙකුන් විසින් මැඩපැවැත්විය නොහැක්කාවූ නාගරාජයෙක්මි. ඉදින් මම කිපී වස්ත්‍රාභරණ ධනධාන්‍යාදීන් සමෘද්ධවූ ජනපදයක්වී නමුත් දෂ්ට කෙළෙම් නම් පොළොව මගේ දළ වැදගත් පමණකින් පොළොව් හා සමග මාගේ උග්‍රවූ විෂතෙජසින් සියලු ජනපදය භෂ්මවන්නේය. මාගේ මෑනියෝ සමුද්‍රජා නම් බිසවූය. මාගේ පියාණෝ ධෘතරාෂ්ට්‍ර නම් රජ්ජුරුවෝය. මම මාගේ බෑයන්

සුදර්ශන රජ්ජුරුවන්ට මල්ව සිටියෙමි. පන්සියයක් යොදුන් පමණ ඇති නාගභවනයෙහි දිව්‍ය නාගරාජයෝ මා භූරිදත්ත නම් නාරජ්ජුරුවෝයයි දනිති කීය. මෙසේද කියා මහබෝසතාණෝ සිතන්නාහු මේ බමුණා චණ්ඩය, පුරුෂය, අහිකුණ්ඨිකයන්ට කියා මාගේ උපෝෂථශීලයට අන්තරා කරන්ට නිසිය, එසේ හෙයින් මොහු නාගභවනයට ගෙණගොස් මහත්වූ යසස් දී මාගේ උපෝෂථ ශීලය බොහෝකලක් පැවැත්වූයේ වීනම් යහපත් වන්නේයයි සිතූහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ මෙසේ සිතා ඔහට කියන්නාහු බමුණ තට මහත්වූ යසස් දෙමි සිත්කලුවූ නාගභවනයට වර, මා හා සමග නාගභවනයට යම්හයි කීහ. එබස් අසා බමුණා කියන්නේ ස්වාමීනි, මාගේ පුත්‍රයෙක් ඇත ඔහු එතොත් යෙමි කීහ. එකල්හි මහබෝසතාණෝ යව බමුණ, තාගේ පුත්‍රයා කැඳවාගෙණ එවයි කියා තමන්ගේ වාසස්ථානය කියන්නාහු ඉතා ගැඹුරුවූ හැමකල්හිම කරකැවෙන්නාවූ සළුවැටුම් ඇති භයානකවූ යම් මේ ගඞ්ගාවෙක් දුටුයේවීනම් මේ සත්පුරුෂ ප්‍රමාණවූ මාගේ දිව්‍යවූ වාසස්ථානය වන්නේය. තවද බ්‍රාහ්මණය උභය තීරයෙහි වනලැහැප්වල වසන්නාවූ මොණරුන් හා කොස්ලිහිණියන් විසින් රැව්පිළිරැව් දෙන්නාවූ නිල්වූ ජලතලා ඇති යමුනා නම් ගඞ්ගාව මේ මධ්‍යයෙහි වැහෙන්නේය. එබඳුවූ යමුනා නම් ගඞ්ගාවෙහි පිහිටියාවූ ආචාරශීලයෙන් යුක්තවූවන් වසන්නාවූ සාන්තවූ ක්‍ෂේමභූමියට නා නිර්භීතව වැද වාසය කරවයි කීහ. එබස් ඇසූ බමුණා ගොස් තමාගේ පුත්‍රයාට එපවත් කියා ඔහු කැඳවාගෙණ ආයේය. මහබෝසතාණෝ ඔවුන් දෙදෙනාම කැඳවාගෙණ යමුනා නම් ගංතෙරට ගොස් එතැන්හි සිට කියන්නාහු බමුණ, තෝ තාගේ පුත්‍රයා හා සමග අපගේ නාගභවනයට පැමිණ මා සන්තකවූ වස්තුකාම ක්ලේශකාමයෙන් පුදනලදුව ඒ නාගභවනයෙහි සැපසේ වසවයි කීහ. මෙසේ කියා මහබෝසතාණෝ දෙපුතුපියන් තමන්ගේ ආනුභාවයෙන් නාගභවනයට ගෙණගියාහ. ඔවුන් දෙදෙනාට ඒ නාගභවනයෙහිදී දිව්‍යාත්මභාවය පහළ වූයේය. එකල්හි ඔවුන්ට මහබෝසතාණෝ මහත්වූ දිව්‍ය සම්පත්දී සාරසියයක් සාරසියයක් නාගකන්‍යාවන් පාවාදුන්හ. ඔහු දෙදෙන ඒ නාගභවනයෙහි වැස මහා සම්පත් අනුභව කළාහුය. මහබෝසතාණෝත් අප්‍රමාදව උපෝෂථ ශීලය රක්‍ෂා කරන්නාහු දෙපෝයෙන් දෙපෝයෙහි දෙමව්පියන් සමීපයට උපස්ථානයට ගොස් බණකථා කියන්නාහු එතැන සිට බමුණා සමීපයට ගොස් සුවදුක් විචාරා යමකින් තට ප්‍රයෝජන වීනම් ඒ මට කියව, උකටලී නොව සිත් අලවා වසවයි කියා සෝමදත්තයා හා පිළිසඳර කථාකොට තමන් වසන තැනට යන්නාහ.

තෙසාද බ්‍රාහ්මණයා අවුරුද්දක් එමණ කල් නාගභවනයෙහි වැස පින් මඳ හෙයින් උකටලීව මනුෂ්‍යලෝකයටයනු කැමතිවිය. සිත්කලුවූ නාගභවනය නරකයක් මෙන්ද, අලඞ්කෘතවූ ප්‍රාසාදය බන්ධනාගාරයක් මෙන්ද, සර්වාභරණයෙන් සැරහුනාවූ නාගකන්‍යාවන් යක්‍ෂණියන් මෙන්ද වැටහුනාහුය. එකල්හි ඒ බ්‍රාහ්මණයා සිතන්නේ මම උකටලී වීමි. සෝමදත්තයන්ගේ සිත් පරීක්‍ෂා කෙරෙමියි ඔහු සමීපයට ගොස් කියන්නේ කිමෙක්ද? දරුව, උකටලී නොව මේ නාගභවනයෙහි වසන්නෙහිදැයි කීය. එබස් අසා සෝමදත්තයා කියන්නේ

කුම්ක්නිසා උකටලිවෙම්ද? මා උකටලිවූයේ නැත. පියාතන් වහන්ස, නුඹ වහන්සේ වූකලි මේ නාගභවනයෙහි කළකිරීගියසේක්දැයි විචාළේය. එසේය, පුතැයි කීකල්හි කුමක්නිසාදැයි විචාළේය. තොපගේ මෑනියන් හා මල්බෑයන් නොදක්මෙන, වරෝ පුත සෝමදත්තයෙනි, යම්හයි කීහ. එබස් අසා සෝමදත්තයා නොයෙමි කීය. නැවත නැවත පියානන්ගේ යාච්ඤාවෙන් යහපතැයි ගිවිස්සේය. එකල්හි නෙසාද බ්‍රාහ්මණයා සිතන්නේ මාගේ දරුවන්ගේ අභිප්‍රාවත් මම දැන ගතිමි. ඉදින් මම භූරිදත්ත නම් රජ්ජුරුවන්ට මේ නාගභවනයෙහි කළකිරීගියෙමියි කියේවීනම් මට වඩ වඩා ලාභ යසපිරිවර දෙති. එසේ කල්හි මාගේ ගමන නොවන්නේය, එක් උපායකින්ම ඒ නාරජ්ජුරුවන්ගේ සම්පත්තිය වර්ණනාකොට නෙපි මෙබඳුවූ සම්පත් හැර කුමක්නිසා මනුෂ්‍යලෝකයට ගොස් පෙහෙවස් වසව්දැයි විචාරා ස්වර්ගලෝකොත්පත්තිය නිසායයි කීකල්හි නෙපි වූකලි මෙබඳුවූ සම්පත් හැර ස්වර්ගලෝකොත්පත්තිය නිසා මනුෂ්‍යලෝකයට ගොස් පෙහෙවස් රක්‍ෂාකරව්ද? කිමෙක්ද? අපි අනුන්ගේ වෘත්තියෙන් ජීවත්වමෝද? මමත් මනුෂ්‍යලෝකයට ගොස් නෑයන් දැක පැවිදිව මහණදම් කෙරෙමියි නාරජ්ජුරුවන් ගිවිස්වා ගණිමි. එකල්හි මට නාරජ්ජුරුවෝ ගමන් අනුදනිති සිතා එක්දවසක් මහබෝධිසත්ත්වයන් ගොස් කිමෙක්ද? බමුණ, උකටලී නොව වෙසෙද්දැයි විචාළකල්හි නුඹවහන්සේ සමීපයෙහි අපට දෙන වස්තුයෙන් කිසි අඩුවක් නැතැයි කියා ගමන් පිළිබඳ කිසිවක්ම නොකියා පළමු කොට ඒ මහබෝසතානන්ගේ සම්පත් වර්ණනාකරන්නේ මෙසේ වර්ණනා කෙළේය. පින්වත්වූ භූරිදත්ත නම් නාරජ්ජුරුවෙනි, තොපගේ මේ නාගභවනයෙහි හාත්පසින් සියලු දිශාභාගයෙහි පෘථිවිය රත්රිදී මුතුමැණික් වැල්ලෙන් ගැවසී ගත්තේය. ඉතා සමතලාය, බොහෝ තුවරලාගසින් සමන්විතය, රත්වන්වූ රතිඳුගොච්චන් විසින් ගැවසීගත්තේ උතුම්වූ නිල් පැහැඇති ගිතණ වර්ණයෙන් ගැවසීගත්තේය. සිත්කලුවූ වනඝටයෙන් හොබනේය. තවද සිත්කලුවූ හංසයන් විසින් ගත් ගඳ ස්වරයෙන් නාද පවත්වන ලද්දාවූ වගුළ පියුම් පෙත්නෙත් ගැවසීගත් ජලතලා ඇති තොපගේ කුශල සමෘද්ධියෙන් මනාව නිර්මිතවූ පුෂ්කරණීහු තැන තැන ස්ථානයෙහි බබලන්නාවූ සත්ත්වයන් පිණවමින් සැදී සිටියහ.

තවද තොප වසන්නාවූ ප්‍රාසාදයෙහි අටැස් කොට කරණලද වෛඩූර්‍ය්‍යමයවූ සියලු ස්ථම්භයෝ වන්නාහ. ඒ වෛඩූර්‍ය්‍යමයවූ ටැඹින් දහසක් වැම්ඇති තොප වසන්නාවූ ප්‍රාසාදයෝ නාගකන්‍යාවන් විසින් පිරුණාවූ විශෙෂයෙන් බබලන්නාහ. තවද ඉතා විශාලවූ සාන්තවූ රම්‍යවූ බොහෝ සැපයෙන් යුක්තවූ එබඳුවූ විමානයෙහි තොපගේ දිව්‍යවූ කුශලානුභාවයෙන් උපන් යම් හෙයකින් දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ යසස් සමෘද්ධියක් වැනිවූ තොපගේ මේ මහත්වූ ශ්‍රී සමෘද්ධියවීද? එසේහෙයින් තොප මේ රක්‍ෂාකරන්නාවූ උපෝෂථ ශීලයෙන් ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ වෛජයන්ත ප්‍රාසාදය හා මහත්වූ ශ්‍රී සෘද්ධිය ප්‍රාර්ථනා නොකෙරෙති සිතමි. ශක්‍රසම්පතට වඩා උතතරීතරවූ අතිත් මහත් තනතුරක් ප්‍රාර්ථනාකෙරෙති සිතමි කීය. එබස් අසා මහබෝසතානෝ බමුණ, නෝ එසේ නොකිය, ඒ ශක්‍රදෙවෙන්ද්‍රයන් වහන්සේගේ යසස් බැලූකලට අපගේ යශස මහමෙර සමීපයෙහි තුබූ අබැටක්සේ වැටහෙන්නේය. අප ශක්‍රදෙවෙන්ද්‍රයන් වහන්සේගේ සේවකයන් පමණකුත් නොවටනම්හයි කියා තවද කියන්නාහු බමුණ, ආනුභාවසම්පන්නවූ ඒ ශක්‍රදෙවෙන්ද්‍රයන් වහන්සේගේ යසස් නම් තුන්සතර දවසකින් පස්දවසකින්

මෙතෙකැයි කියා කියන්නා තබා සිතින් සිතාත් නිමවා දක්ක නොහැක්කේය, ඒ ශක්‍රදෙවෙන්ද්‍රයන් වහන්සේ තබා යම් සතරවරම් මහරජදරුකෙණෙක් උන් වහන්සේ පිරිවරත් නම් ඒ ශක්‍රදෙවෙන්ද්‍රයන් වහන්සේ නායක කොට පිරිවරා ඇවිදින්නාවූ පඤ්චකාමය තමන් වසඟයෙහි පවත්නාවූ සතරවරම් මහරජදරුවන්ගේ යසසටත් අප තිරිසනුන්ගේ යසස සොළොස්වන කොටඨාසයෙන් කොටඨාසයකුත් නොඅගනේවේදැයි කීහ. මෙසේද කියා ශක්‍රදෙවෙන්ද්‍රයන් වහන්සේගේ විමානය තාගේ වචනය අසා සිහිකෙරෙමි. මම වූකලී වෛජන්ත ප්‍රසාදය ප්‍රාර්ථනා කරන්නෙම් උපෝෂථශීලය රක්‍ෂාකරමියි ඒ තමන්ගේ ප්‍රාර්ථනාව කියන්නාහු සැපයෙහි පිහිටියාවූ ඒ දෙවතාවන්ගේ වෛජන්ත ප්‍රසාදදීවූ මහත්වූ ශ්‍රී සමෘද්ධිය ප්‍රාර්ථනා කොට පෙහෙවස් ඉටා තුඹස මත්තේ වෙසෙමි කීහ. එබස් අසා බමුණා දූත් මම අවසරයක් ලදිමියි සොම්නසට පැමිණ ගමනට අවසර ඉල්වන්නේය. නාරජ්ජුරුවන් වහන්ස, මම මස් විකොට ජීවත්වනු සඳහා මුවන් පරීක්‍ෂාකොට ඇවිදිනෙමි, මාගේ දරුවන් හා සමග මේ වනයට වනිමි. එසේ වනයට වන්නාවූ මා මළ බවත් උන් බවත් මාගේ නෑයෝ නොදනිති. එසේ හෙයින් කසීරජ්ජුරුවන්ගේ දියනියන්ගේ පුත්වූ මහත්වූ යශපිරිවර ඇති භූරිදත්ත නම් නාරජ්ජුරුවෙනි, තොපට මම කියමි. ඉදින් තොප අපට අවසර දුන්නු නම් අපගේ නෑයන් දක්නමෝවේදැයි කීය. ඉක්බිත්තෙන් මහබෝසතාණෝ කියන්නා බ්‍රාහ්මණය, මෙබඳුවූ වස්තු කාම ක්ලෙශකාමයෙන් මනුෂ්‍ය ලොකයෙහි සුලභ නොවන්නේය. එසේහෙන් තෝ මා සමීපයෙහි වෙසේ නම් එසේ විසීම ඒකාන්තයෙන් යහපත් වන්නේය. ඉදින් තා පඤ්චකාමයෙන් පුදනලදුව මා සමීපයෙහි වසන්නට නොකැමැත්තෙහි වීනම් මම තට අවසර දෙමි සැපසේ ගොස් තාගේ නෑයන් දැක සිත් සිතුවූකරවයි කීහ.

මෙසේ කියා මහබෝසතාණෝ සිතන්නෝ මේ තෙමේ මා නිසා ජීවත් වේනම් මා පෙහෙවස් රක්‍ෂාකොට තුඹසමත්තේ වැදහෝනා නියාව කිසි කෙණෙකුන්ටත් නොකියන්නේවේද? එසේ හෙයින් මෝහට ඉෂ්ටාර්ථප්‍රසවය කරන්නාවූ අනඝි මැණිකක් දෙමි සිතා ඔහට මැණික දෙන්නාහු එම්බල නොසාද බ්‍රාහ්මණය, යම් කිසිවෙක් මේ දිව්‍යමයවූ මාණික්‍යරත්නය දරන්නේ වීනම් මේ මාණික්‍යානුභාවයෙන් එතෙමේ වස්තුවත් ගවමහිසාදීන් හා දූදරුවනුත් අන්‍යවූ යම්කිසි ඓශ්වර්යයක් කැමැත්තේ වීනම් ඒ සියල්ලත් ලබන්නේය. රෝදුක් නැතිව සුඛිතමුදිත වන්නේය. එබඳුවූ ආනුභාව සම්පන්නවූ මේ මාණික්‍යරත්නය ඇරගෙණ ගොස් තාගේ පුත්‍රාදාරාදීන් පොෂ්‍යයකොට සැපසේ ජීවත්වෙයි කීහ. ඉක්බිත්තෙන් බමුණා කියන්නේ භූරිදත්ත නම් නාරජ්ජුරුවෙනි, තොපගේ බස නිරවද්‍යය සැබෑමය එබසට උත්තරයක් නොකියමි. සතුටුවෙමි. එතකුදුවූවත් මම වූකලී ජරාවට පැමිණියෙමි, එසේ හෙයින් පැවිදිවෙමි, පඤ්චකාමය ප්‍රාර්ථනා නොකෙරෙමි. එසේවූ මට මැණිකෙන් ප්‍රයෝජන කිම්දැයි කීය. එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු බමුණ, බ්‍රහ්මචර්‍ය්‍යාවාසය නම් ඉතා දුෂ්කරදෙයෙක, එහි නොඇලුන තැනැත්තහුට බ්‍රහ්මචර්‍ය්‍යාව හඹගවන්නේ, එකල්හි ගිහිවූනට සම්පත්තීන් ප්‍රයෝජනයක් පෙණී ගියේවීනම් එබඳුවූ අවස්ථායෙහි සැකයක් නැතිව තෝ මා සමීපයෙහි වර, එකල්හි මම තට බොහෝ සම්පත් දෙන්නෙම්වේදැයි කීහ. එබස් අසා බමුණා කියන්නේ භූරිදත්ත නම් නාරජ්ජුරුවෙනි, තොප කීබස් සැබෑමය, ඊට මා උත්තරයක් නොකියා සන්තුෂ්ටවෙමි, ඉදින් මට වස්තුයෙන් ප්‍රයෝජනයෙක් පෙණීගියේවීනම් එදවස් තොප සමීපයට නැවතත් එන්නෙම්වේදැයි කීහ.

ඉක්බිත්තෙන් මහබෝසතානෝ ඒ බමුණා නාගභවනයෙහි වසන්නට අභිප්‍රාය නැති නියාව දැන නාගමානවකයන් කැඳවා මේ බමුණන් ගෙණගොස් මනුෂ්‍ය ලොකයෙහි ලාපියවයි කිවුය. එබස් අසා නාගමානවකයෝ සතර දෙනෙක් බොධිසත්ත්වයන්ගේ නියෝගයෙන් ඒ බමුණන් යමුනා නම් ගඞ්ගාවෙන් උඩනගා බරණැස් නුවරට යන්නාවූ මාර්‍ගයෙහි සිටුවූහ. මෙසේ ඔවුන් දෙදෙනා මාර්‍ගයෙහි සිටුවා තෙපි හැම යවයි කියා නාගමානවකයෝ සතර දෙන නාගභවනයට පෙරළා ආවාහුය. නෙසාද බ්‍රාහ්මණයාත් පුත සොමදත්ත යෙනි, මෙතැනදී මුවෙකු විද්දම්හ. මෙතැනදී ඌරෙකු විද්දම්හයි පුත්‍රයාට කියන්නේ අතරමග පොකුණක් දැක පුත සොමදත්තයෙනි, නාම්හයි කීහ. යහපත පියානන් වහන්සැයි කී කල්හි දෙදෙනම දිව්‍යාභරණ හා දිව්‍යවස්ත්‍ර ගලවා අකුලා පොදියක් කොට පොකුණු තෙර තබා දියට බැස නාන්නට පටන්ගත්හ. එකෙණෙහි ඒ දිව්‍යවූ වස්ත්‍රාභරණ අන්තර්ධානව නාගභවනයට ගියේය. පළමු ඔවුන් දෙදෙනා නාගභවනයට යන දවස් ඇඳගෙණ ගිය කළු දලිරෙදි දෙකම ඔවුන් දෙදෙනාගේ ඇඟ වැළඳගත්තේය. දුනු ඊදඬු හා තෙප් හා මස්කපන කැති ආදිය ගත් අත් ඇතිව පළමු පරිද්දෙන්ම වැදි වෙසින් සිටියාහ. එකල සොමදත්තයා පියානන් වහන්ස, තුඹවහන්සේ විසින් අපි නසන ලද්දමෝවේදැයි හඬා වලප්නට පටන්ගත, එකල්හි පියා කියන්නේ පුත, තෙපි සැකයක් නොකරව, වල මුවෝ ඇත්නම් වලින් මුවන් මරා ජීවත් වම්හයි කියා පුතු අස්වැසීය.

සොමදත්තයාගේ මව් ඔවුන් දෙදෙනා එන නියාව අසා පෙරමගට ගොස් කැඳවාගෙණ ගෙට අවුත් බත් පැන් අනුභව කරවා සන්තර්පණය කළාය. වැදි බමුණ බත් අනුභවකොට නිදන්නට පටන්ගත්තේය, එකල්හි සොම දත්තයන්ගේ මව් පුතා අතින් විචාරන්නී පුත සොමදත්තයෙනි, මෙතෙක්කල් කොයි ගියාදැයි විචාළීය. මෑනියෙනි, භූරිදත්ත නාරජ්ජුරුවන් වහන්සේ විසින් නාගභවනයට ගෙණයන ලද්දමෝ එහි බොහෝ දවසක් වැස කලකිරී ඔබ සිට ආම්හයි කිය. කිමෙක්ද? තොප විසින් යම් රත්නයෙක් නොගෙණෙන ලදදැයි කීකල්හි මෑනියන් වහන්ස, නොගෙණාම්හයි කීය. කිමෙක්ද? තොපට භූරිදත්ත නම් නා රජ්ජුරුවන් වහන්සේ විසින් කිසිවක් නොදෙන ලදදෑ?යි විචාළ කල්හි මෑනියන්වහන්ස, භූරිදත්ත නම් නාරජ්ජුරුවන්වහන්සේ විසින් මපියානන් වහන්සේට කැමති කැමති වස්තු සදදීලන්නාවූ අනර්ඝවූ මාණික්‍ය යක් දෙනලද මුත්වහන්සේ විසින් මැණික නොගත්තාලදැයි කීය. කුමක් නිසාදැයි විචාළකල්හි පැවිදිවෙමි කියා මැණික නොගත්සේකැයි කීය. එබස් අසා සොමදත්තයන්ගේ මව් මෙතෙක්කල් මුලුල්ලේ දරුවන් මට භාරකොටලා ගොස් නාගභවනයේ වැස දැන් තෙපි පැවිදිවව්දැයි කිපී වී බදිනා සැන්දෙන් පිටදැ මඩ්‍යයේ තළා කොල දුෂ්ටවූ බමුණ, පැවිදිවෙමි කියා මාණික්‍ය රත්නය නොගත්තාවූ තෝ එසේකලැ පැවිදි නොවී කුමක් නියා දැන් මෙතනට අයිද? මගේ ගෙයින් නික්මෙවයි කියා තැතිගැන්වූය. එකල්හි බමුණු කියන්නේ සොඳුර, තෙපි මට නොක්පෙව. වලමුවෝ ඇත්නම් ඒ මුවන්මරා මම තොපත් තොපගේ දරුවනුත් පොෂ්‍යය කෙරෙමියි කියා පුතු හා සමග වනයට ගොස් පළමු පරිද්දෙන්ම සතුන්මරා ජීවිකාවෘත්තිය කෙළේය.

එසමයෙහි දක්ෂිණ මහා සමුද්‍රයෙහි දික්හිඹුලේ වසන්නාවූ එක් ගරුඩ පක්ෂියෙක් පක්ෂමාරුතයෙන් මුහුදදිය දෙබෑකොට එක් නාගරාජයෙක් හිස බැහැගත්තේය. එසමයෙහි ගරුඩයෝ නයින් අල්වන්ට නොදනිති. ඒ ගරුඩ පක්ෂියා වූකලී නාගරාජයාගේ හිස බැහැගෙණ දෙබෑව ගිය දිය එක්වන්නට පළමුකොට උඩ ඔසවා එල්වාගෙණ හිමාලය වනමස්තකයෙන් නික්මුණේය. එකල්හි කසීරට වාසීවූ එක් බමුණෙක් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමාලය වන ප්‍රදෙශයෙහි පන්සලක් කොටගෙණ වසන්නේය. ඒ තපස්වීන්ගේ සක්මන් කෙළවර මහත්වූ නුගගසක් ඇත. ඒ තපස්වී ඒ නුගගස මුල දිවාවිහාරය කොට වෙසෙති. එකල්හි ගරුඩරාජයා නුගගස මත්තෙන් නාගරාජයා එල්වාගෙණ යන්නේ නාගරාජයා එලෙන තැනැත්තේ ගැලවෙන පිණිස නඟුට නුගගසට වෙළාගත්තේය. ගරුඩ පක්ෂියා ඔහු නුගගස වෙළාගත් නියාව නොදැනම මහත්වූ ශක්ති ඇති බැවින් ආකාශයෙහි පක්ෂප්‍රහාරය කොට නික්මුණේය. නුගගස මුල් හා සමග උපුටා පැනනැංගේය. ගරුඩයා නා රජ්ජුරුවන් දික්හිඹුල් වනයට ගෙණගොස් තුඩින් පැහැර බඩපලා නාගරුධිරය අනුභවකොට ශරීරය සමුද්‍ර මස්තකයෙහි හෙළුයේය. නුගගස නාගරජයා හා සමග සමුද්‍ර මස්තකයෙහි වැටෙන්නේ පවත්වැදගෙණ මහත්වූ ශබ්ද පැවැත්වූයේය, එකල්හි නුගගස වැටෙන්නා දැක මේ නුගගස මා විසින් කොතැනකින් උපුටාගෙණ එන ලද්දෙහෝයි සිතා තාපසයන්ගේ සක්මන් කෙළවර සිටි මේ නුගගස වන්නේයයි තත්ත්‍ව හෙයින් දැන මේ නුගගස මේ තපස්වීන් වහන්සේට බොහෝ උපකාරව සිටියේය. එසේහෙයින් මා විසින් අකුශලයෙක් රැස්කරණ ලද්දේහෝ නොහොත් රැස්නොකරණ ලද්දේහෝයි ඒ තපස්වීන් අතින්ම වීචාරා දනිමියි සිතා තරුණ මානවක වෙශයක් මවාගෙණ ඒ තපස්වීන් සමීපයට ගියේය. එකෙණෙහි තාපසයෝ ඒ නුගගස ඉදිරීගිය තැන සමතලා කරන්නාහ. ගරුඩරාජයා තාපසයන් වැඳ එකත්පස්ව ඉඳ නොදන්නා කෙණෙකුන් මෙන් ස්වාමීනි, මේ කුමක් පිහිටි තැනෙක්දැයි විචාළේය. එකෙණෙහි තාපසයෝ කියන්නෝ එක් ගරුඩ රාජයෙක් ගොදුරු පිණිස නුගගස වෙළප නඟුටින් වෙළාගත් නයකුගත් කල්හි තම මහත් බල ඇති බැවින් දිවගෙණ ගියේය, එකල්හි මෙතැන්හි සිටි නුගගස උපුටා ගියේය. මේ නුගගස උපුටා ගිය තැනැයි කීහ. කිමෙක්ද? ස්වාමීනි, ඒ ගුරුළාට අකුසල් වේද්දැයි විචාළේය. තපස්වී කියන්නේ ඉදින් ඒ තෙමේ නුගගස ඉදිරියෙහි නොදනී නම් එබඳුවූ සිත් නැති බැවින් අකුසල් නොවෙයි කීය. ස්වමීනි, නාගරාජයාට වූකලී අකුසල් ඇද්ද? නැද්දැයි විචාළේය. තපස්වී කියන්නේ ඒ නාගරාජයා මේ ගස නසම්යි වෙළාගත්තේ නොවෙයි. තමා ගැලවෙන පිණිස වෙළාගත්තේය. එසේහෙයින් ඔහටත් අකුශලයෙක් නැතැයි කීහ. ඒ ගරුඩරාජයා තපස්වීන්ට සතුටුව ස්වාමීනි, මම ඒ ගරුඩ රාජයාවෙමි, නුඹවහන්සේගේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි විශෙෂයෙන් සතුටුවීමි. නුඹවහන්සේ වනයෙහි වසනසේක. මම සජීයන් අල්වන්නට සුදුසුවූ ආලම්බන මන්ත්‍රයක් දනිමි. මේ මන්ත්‍රය ඉතා අනඝය, මම නුඹවහන්සේට ඒ මන්ත්‍රය දෙමි පිළිගනු මැනවැයි කීහ. තපස්වී මන්ත්‍රයෙන් ප්‍රයෙජන නැතැයි කීය. ගරුඩරාජයා තපස්වීන්ට නැවත නැවත යාච්ඤාකොට ගිවිස්වාගෙන මන්ත්‍රය දී ඖෂධයක් කියා ගියේය.

එකල්හි බරණැස් නුවර එක් දිළිඳු බමුණෙක් බොහෝ තය ගෙන තය දීගත නොහී තය වැද්දන් විසින් තුඩ වැඩී බස් බණනලද්දේ ඉවසාගතනොහී මට මෙහි විසීමෙන් ප්‍රයෝජන කිම්ද? වනයට වැද මියයාම උතුමැයි සිතා නුවරින් නික්ම ක්‍රමයෙන් අවුත් ඒ තපස්වීන්ගේ පන්සලට වැද තාපසයන් තමාගේ මනාවූ වත් පිළිවෙත් ආදියෙන් සිත්ගෙණ සිටියේය. එකල්හි තාපසයෝ මේ බමුණා මට ඉතා උපකාරිය එසේහෙයින් ගරුඩරාජයා විසින් දෙන ලද දිව්‍යමන්ත්‍රය මොහුට දෙම් සිතා බමුණ, මම ආලම්බන නම් මන්ත්‍රයක් දනිමි. ඒ මන්ත්‍රය තට දෙමි, තෝ ඒ මන්ත්‍රය ඇරගණුවයි කියා ස්වාමීනි, මට මන්ත්‍රයෙන් ප්‍රයෝජන නැත, නොකැමැත්තෙමියි කී කල්හි නැවත නැවත නිමන්ත්‍රණය කොට ගිවිස්වාගෙණ මන්ත්‍රය දුන්නාහුය. ඒ මන්ත්‍රයට සුදුසුවූ ඖෂධයන් මන්ත්‍ර විධින් සියල්ලම කීහ. බමුණා මා විසින් ජීවත්වන්නට උපායෙක් ලබනලදැයි සතුටුව කීපදවසක් එතැන්හිම වැස ස්වාමීනි, මට රුජාවෙක් පැහැර පීඩාකරන්නේයයි ව්‍යාජයක් කියාගෙණ තාපසයන් විසින් පල කියා හරණලද්දේ තපස්වීන් වැද ක්ෂමාකරවාගෙණ වනයෙන් නික්ම ක්‍රමයෙන් යමුනා නම් ගංතෙරට පැමිණ ඒ මන්ත්‍රය පිරිවමින් මහාමාවතින් යන්නේය. එකල්හි භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේ පරිවාරිකාවූ දහසක් පමණ නාගමානවිකාවෝ ඊප්සිතාර්ථසිද්ධිය කරන්නාවූ මාණික්‍ය රත්නය ගෙණ නාගභවනයෙන් නික්ම යමුනා නම් ගංතෙර වැලිගොඩ මත්තෙහි තබා ඒ මාණික්‍යාලෝකයෙන් සකල රාත්‍රියෙහි ජලක්‍රීඩා කොට අරුණෝද්ගමන වේලෙහි සම්භාරණයෙන් සැරහී මාණික්‍යරත්නය පිරිවරාගෙණ තමන්ට මාණික්‍යශ්‍රී දක්වමින් උන්හ. බමුණාත් මන්ත්‍රය පිරිවමින්ට එතැනට පැමිණියේය. ඒ නාගමානවිකාවෝ මන්ත්‍රය පිරිවන අඩ අසාලාම මොහු ගරුඩ රාජයක්හු වියයුතුයයි භයින් ත්‍රස්තව ඒ මාණික්‍ය රත්නය නොගෙණ පොළොව කිම්ද නාගභවනයට ගියාහ. බමුණා මාණික්‍යරත්නය දැක දැන්ම මාගේ මන්ත්‍රයෙහි ඵල සමෘද්ධියවීයයි සතුටු සිත් ඇතිව ඒ මාණික්‍යරත්නය ගෙණ නික්මුණේය.

එකල් වැදි බමුණා සොමදත්ත නම් තමාගේ පුතු හා සමග මුවින්මරණ පිණිස වනයට වැද ඇවිදිනේ අත තුබූ මාණික්‍යරත්නය දැක පුතුට කියන්නේ පුත, මේ මැණික අපට භූරිදත්ත නාරජ්ජුරුවන් වහන්සේ දුන් මැණික නොවේදැයි කීය. එසේය පියානන් වහන්ස, මේ ඒ මැණිකයයි කීය. එසේවීනම් මේ බමුණාට මේ මැණිකෙහි නුගුණ කියා මොහු වඤ්චාකොට මේ මාණික්‍යරත්නය ගණුම්හයි කීය. එකල්හි සොමදත්තයා කියන්නේ පියානන්වහන්ස, නුඹවහන්සේ පළමු භූරිදත්ත නාරජ්ජුරුවන් වහන්සේ මැණික දෙන ගමනේ නොගත්සේක. දැන් වූකලී මේ බමුණා නුඹවහන්සේම වඤ්චාකරන්නේය. මුවෙන් නොබැණ දුනමැනවැයි කීය. එකල්හි නෙසාද බ්‍රාහ්මණයා කියන්නේ වන්නාට පුත, ඔහුගේත් මාගේත් වංචාකරන්ට නිසි නොනිසි බව දන්නවාදැයි කියා ආලම්බනයා හා සමග කථාකරන්නේ අභිවෘද්ධිකරවූ අභිමතාර්ථ සාදා දෙන්නාවූ සිත්කලුවූ රත්නයන් අතුරෙන් උතුම්වූ සම්භාරයෙන් සම්පූර්ණවූ ලක්ෂණ සම්පන්නවූ මේ මැණික ඇරගෙණ එන්නාවූ තොප කොයිදී මේ මැණික ලදදැයි විචාළේය. ඉක්බිත්තෙන් එබස් අසා ආලම්බනයා කියන්නේ බ්‍රාහ්මණය, මම අද උදාසනම මහමාවත යන්නෙම් රත්වූ ඇස් ඇති දහසක් පමණ නාගමානවිකාවන් විසින් භාත්පසින් පිරිවරණ ලද මේ මැණික ලදිමි. මා දැක ඔහු හැම

දෙතම නැතිගෙණ මේ මැණික හැර පලාගියෝයයි කීහ. එබස් අසා වැදි බමුණා ඔහු වක්‍රෝවාකාරණු කැමතිව මාණික්‍යරත්නයෙහි අවර්ණප්‍රකාශකොට තමා ගන්නා කැමැතිව කියන්නේ යමෙක් මේ මාණික්‍ය රත්නයට උපචාර කරන්නට තමාගේ ජීවිතයක් මෙන්ම මානය කරන්නට පුදන්නට මනාකොට තබන්නට දන්නේවී නම් ඔහට (මේ මාණික්‍යරත්නය මනාකොට උපචාර කිරීම් පිදීම් ධැරීම් මානය කිරීම් තිබීම් වශයෙන් සම්භාවනා කරණලද්දේ) සියලු ඉෂ්ටාර්ථ ප්‍රසවය කරන්නේය.

තවද මේ මාණික්‍යරත්නය උපචාර විපන්නාවූ සත්ත්වයා විසින් තිබීමෙන් වත් ධාරීමෙන්වත් නුනුවණින් නිරාදරව පරිහරණය කරණ ලද්දේවීනම් ඔහට විනාශයට මෙයම සැහෙන්නේය. එසේහෙයින් මේ මාණික්‍යරත්නයට උපචාර කොට සම්භාවනා කරන්නට සමර්ථවූ සත්ත්වතෙමේ මේ මැණික ධරන්නට සුදුසු වන්නේය. අපගේ ගෙයි බොහෝ මැණික් ඇත, එසේහෙයින් අපි මේ අනර්ඝවූ මැණිකට කළමනා විධිවිධාන දනුම්හ. මම නට මැණික් සියයක් දෙමි, තෝ ඒ ඇරගෙණ මට මේ මාණික්‍යරත්නය දෙවයි කීයේය. එසේ කී පමණක් විනා වැදි බමුණාගේ ගෙයි එක රත්නයෙකුත් නැත්තේය. ඒ බමුණා වූකලී ඒ මැණික කැමති කැමති වස්තු සිඩකොට දෙන නියාව දන්නේය. එසේහෙයින් ඒ බමුණු සිතන්නේ ඉස්සෝද, නහා මැණිකට පැන් ඉස මට මැණික් සියයක් දෙවයි කියමි. එකල්හි මේ මැණික තමාගේ ආනුභාවයෙන් මැණික් සියයක් දෙන්නේය. මම ඒ මැණික් සියය මෝහට දෙමි සිතා නිර්භීතව මැණික් සිය යක් ඇරගෙණ මේ මැණික මට දීපියවයි කීයේය. එකල්හි ආලම්බනයා කියන්නේ මේ මැණික මාගෙන් කිසිකෙණෙකුන් විසින් ගව මහිෂාදී වස්තුයෙන් වත් රන්රුවන් ආදියෙන්වත් විකිණිය යුතු නොවෙයි. මාගේ මේ මැණික ලක්ෂණ සම්පන්නය, එසේ හෙයින් කිසි වස්තුවකට මිළ කොට විකිණිය යුතු නොවෙයි කීය. එබස් අසා වැදි බමුණු කියන්නේ බමුණ තා විසින් ගෙරි හරක් හා රන්රුවන් ආදියට මිළකොට මේ මැණික ඉදින් නොදියයුතු වීනම් මේ මැණික කවර වස්තුවකට මිළකොට දියයුතුද? ඒ මට කියවයි කීය. එපවත් ආසා ආලම්බනයා කියන්නේ බමුණ, යමෙක් තේජස්වූ අත්‍යවූ සත්ත්වයකු විසින් මැඩ පැවැත්ත නොහැක්කාවූ නාගරාජයකු වසන තැනක් මට කියේවීනම් ඔහට මම ප්‍රභාසමෘඩියෙන් බබළන්නාවූ මේ මැණික දෙමැයි කීහ. එබස් අසා නෙසාද බ්‍රාහ්මණයා කියන්නේ බ්‍රාහ්මණ වෙශයෙන් ආවිදින්නාවූ තෝ පක්ෂී න්ට නායකවූ ගරුඩරාජයෙක්ද? ගරුඩරාජයකු හෙයින්ද? හොවරයට සුදුසුවූ නයකු වසන තැන විචාරන්නේ, තා ගුරුළකු වියයුතුයයි සිතමි කීහ. එකල්හි ආලම්බනයා කියන්නේ මම ගරුඩරාජයෙක් නොවෙමි. ගරුඩරාජයන් මා දුටු විරූවත් නැත, සර්පයන් මර්දනය කිරීම් ඇති ආලම්බන නම්වූ විෂ වෛද්‍යචාරීවූ බ්‍රාහ්මණයෙකැයි ලෝවැස්සෝ මා දනිති කීය. එබස් අසා වැදි බමුණා කියන්නේ ආලම්බනය තාගේ කවර බලයෙක් ඇද්ද? තාගේ කවර ශිල්පයෙක් ඇද්ද? තෝ කවරෙක් උපසථම්භක කොට එළඹ සර්පයින් කෙරෙහි නිරාදරවන්නෙහිදැයි කීය. එකල්හි ආලම්බනයා තමාගේ ශක්තිය ප්‍රකාශකොට කියන්නේ කෞශික ගොත්‍ර ඇති පැවිදිවූ බොහෝකල් ඇති වල්හි වසන්නා එක් ඍෂිකෙණෙකුන් වහන්සේට ගරුඩරාජයෙක් නිරුත්තරවූ උතුම්වූ විෂමන්ත්‍රයක් කීය. භාවනාභි යෝගයෙන් වඩනලද සිත් ඇති හිමාලය පර්වතප්‍රාන්තයෙහි වසන්නාවූ ඒ තපස් වීන්ට රෑ දවල් නොපමාව සකස්කොට උපස්ථාන කෙළෙමි, එකල්හි මා විසින්

සිත්හෙණ අත්පා මෙහෙවර කරණ ලද්දාවූ උතුම්වූ ශීලව්‍රත සමාදානයෙන් හා බ්‍රහ්මචර්‍ය්‍යයෙන් යුක්තවූ තපස්වීන්වහන්සේ තමන්වහන්සේගේ අභිප්‍රායෙන්ම මා විසින් කරණලද යාච්ඤාවක් නැ කිව දිව්‍යවූ ආලම්බන මන්ත්‍රයක් උගන්වා ඖෂධ කියා ඊට නිසි විධිවිධානත් කීසේක. මම ඒ මන්ත්‍රය උපසම්පහකොට ඒ මන්ත්‍රානුභාවයෙන් සර්පයන්ට නොබමි. විෂ බාන්නට සමර්ථවූ සත්ත්වයන්ට මම ආචාර්‍ය්‍යයෙමි. ලොකයෙහි සත්ත්වයෝ ආලම්බන නම් විෂවෛද්‍යාචාර්‍ය්‍යයයි මා දනිති කීය.

එබස් අසා නෙසාද බමුණා සිතන්නේ මේ ආලම්බනයා යමෙක් මෝහට නයකු දක්වූයේ වීනම් ඕහට මාණික්‍යරත්නය දෙන්නේය. එසේහෙයින් මෝහට භූරිදත්ත නම් නා රජ්ජුරුවන් දක්වා මැණික ඇරගණිම් සිතා ඉක්බිත්තෙන් පුතු හා සමග කථාකරන්නේ පුත සොමදත්තයෙනි, මේ මැණික බමුණා අතින් ඇරගණුමෝද? තොප සිතටත් යහපතැයි වැටහෙන්නේ නම් පරීක්ෂා කොට කියව, තමා කරා පැමිණි ශ්‍රීකාන්තාව දණ්ඩෙන් ගසා දුරු කරන්නට කාරණා නොවන්නේද? එසේ හෙයින් මේ අතසීවූ මැණික ඇරගණුමෝදැයි කීය. එබස් අසා සොමදත්තයා කියන්නේ බමුණානන් වහන්ස, ඒ භූරිදත්ත නම් නාරජ්ජුරුවන් වහන්සේ නාගභවනයට පැමිණියාවූ නුඹ වහන්සේට දිව්‍යවූ වස්තුකාම ක්ලෙශකාමයෙන් සත්කාර සම්මාන කළසේක. එසේ හෙයින් සත්පුරුෂවූ නාරජ්ජුරුවන් වහන්සේට නුඹවහන්සේ කුමක් නිසා මොහයෙන් ද්‍රොහ කරන්නට සිතනසේක්ද? ඉදින් පියානන් වහන්ස නුඹවහන්සේ වස්තු කැමතිසේක්වීනම් භූරිදත්තනම් නාරජ්ජුරුවන් වහන්සේ දෙනසේක, උන්වහන්සේ සමීපයට ගොස් ඉල්වුව මැනව. එකල්හි නුඹවහන්සේට උන්වහන්සේ බොහෝ වස්තු දෙනසේක් වේදැයි කීය. එබස් අසා වැදි බමුණා කියන්නේ පුත සොමදත්තයෙනි තෙපි ඉතා බාලය, එසේහෙයින් ලොකව්‍යවහාර නොදනුව, මම මුකළ හෙයින් සියලු ලොකප්‍රවෘත්ති දනිමි, යමක් අතට පැමිණියේ නම් වත් භාජනයට පැමිණියේ නම් වත් ඉදිරියෙහි තබන ලද්දේ වීනම්වත් අනුභව කරන්නට උතුම් වන්නේය. දුර තුබූ දෙයින් ප්‍රයෝජන නැත. එසේ හෙයින් පුත සොමදත්තයෙනි, තමා කරා පැමිණි ශ්‍රීකාන්තාව ගසා දුරුකරන්නාමෙන් හස්තප්‍රාප්තවූ මේ මාණික්‍යරත්නය ඇරනොගෙණ ඉවත්කොටපීම කාරණා නොවෙයි කීය. එකල්හි සොමදත්තය, කියන්නේ පියානන්වහන්ස යමෙක් මිත්‍රද්‍රොහිකම් කෙළේ වීනම් ඒ සත්ත්ව තෙමේ රෞද්‍රවූ නරකයෙහි පැසෙන්නේය. නවද මිත්‍රද්‍රොහීවූ සත්ත්වයා ජීවත්වහින්දදීම පොළොව පැළී විවරව නරකයට ගෙණයන්නේය. නවද මිත්‍රද්‍රොහීවූ අසත්පුරුෂ ගුණ ඇති තමාහට වන වැඩ නසන්නාවූ සත්ත්ව තෙමේ ඉදින් ජීවත්ව හුන්නේවී නමුත් බත් පැන් නොලැබ වියලී මනුෂ්‍ය ප්‍රේත වන්නේය. එසේහෙයින් නුඹවහන්සේ එබඳුවූ මිත්‍රද්‍රොහී කම් නොකළ මැනව, ඉදින් වස්තු කැමතිසේක් වීනම් භූරිදත්ත නම් නරජ්ජුරුවන් වහන්සේ නුඹවහන්සේට වස්තු දෙනසේක. ඉදින් නුඹවහන්සේ මා කීවා නොකොට අසත්පුරුෂ කම්කළසේක් වීනම් ඒ පාපය නොබෝ කලකින්ම නුඹවහන්සේට විපාක දේයයි සිතමි කීය. එබස් අසා බමුණා කියන්නේ පුත සොමදත්තයෙනි, තෙපි බාලයව, එසේහෙයින් තොප දන්නා කාර්‍ය්‍යයක් නැත මම වූකලී සියලු යහපත නපුර දනිමි, මා කියන්නක් අසව, මේලොකයෙහි බ්‍රාහ්මණයෝ නම් යම්කිසි අකුශල කර්මයක් කොට පියා

යාග කර්මයෙන් පාප ප්‍රවාහයම කොට පිරිසිදුවෙති. එසේ හෙයින් අපිත් යාග කොට පියම්හ. එකල්හි කළාවූ අකුශල කර්මයෙන් මිදී යන්නමෝ වේදැයි කීය. එකල්හි සොමදත්තයා කියන්නේ පියාණන් වහන්ස, මෙසේ පාප කාරීවූ මෙලෝ පරලෝ නොදන්නාවූ නුඹවහන්සේ හා සමග අද මම එක පියවරක් පමණකුත් නොයමි. එබැවින් දූත්ම පලායෙමි කීය. මෙසේද කියා නුවණැති මාණවකයා පියාණන් සිතට තමාගේ වචනය නංවාගත නොහී මහත්වූ ශබ්දයෙන් දෙවකොට්ඨායතනයකොට මෙබඳුවූ පාපකාරීවූ තැනැත්තන් හා සමග නොයමි කියා පියාණන් බල බලා සිටියදීම පලාගොස් හිමාලය වනයට වැද පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුණු ධ්‍යාන යෙන් ගොස් බ්‍රහ්මලොකයෙහි උපන්නේය.

ඉක්බින්තෙන් නෙසාද බ්‍රාහ්මණයා සොමදත්තයා තමන්ගේ ගෙය හැර කොයි යේදැයි සිතමින් ආලම්බනයා සමීපයට ගොස් ඔහු මදක් නො සතුටුවූ සිත්තියාව දැක ආලම්බනය, නෝ සැකයක් නොකරව, තට භූරිදත්ත නම් නාරජ්ජුරුවන් දක්වමියි කියා ඔහු කැඳවාගෙණ නාරජ්ජුරුවන් පෙහෙවස් රක්‍ෂාකරණ තැනට ගොස් තුඹස මත්තේ දරණවැල ලාගෙණ වැදහොත්තාවූ නාරජ්ජුරුවන් දැක නුදුරු තැනක සිට අත දික්කොට කියන්නේ එම්බල බමුණ, තෙල නා මහරජ්ජුරුවන් අල්ලාගෙණ තාගේ මැණික මට දීපියව, තවද යම් නා රජ්ජුරු කෙණෙකුන්ගේ රතිඳුගොව්වන් පිටපෑ සමාන රතුවූ හිස් ඇද්ද? නොකොට පොළතලඳ පුළුන්පිඩක් වැනිවූ ධවලවූ ශරීර ඇද්ද? එබඳුවූ රූපසොභා ඇති මේ නා රජ්ජුරුවෝ තුඹස මත්තේ වැදඹවති, බමුණ, නා ඒ නා රජ්ජුරුවන් අල්වාගණුවයි කීහ. එකල්හි මහබෝසතාණෝ ඇස දල්වා බලා වැදිබමුණා දැක මේ තෙමේ මාගේ උපෝසථ ශීලයට අන්තරාය කරන්නේයයි සිතා මොවුහු නාග භවනයට ගෙණ ගොස් මහා සම්පත්තියෙහි පිහිටුවීම්, මා විසින් දුන් මැණික එදවස් නොගත්තේය, දූත්වූකල් අභිකුණ්ඨික බ්‍රාහ්මණයකු ගෙණ ආයේය. ඉදින් මම මේ මිත්‍ර ද්‍රොහියාට කිපී ගියෙම් නම් මාගේ ශීලය බ[illegible]වන්නේය. මා විසින් පළමු චතුරාඞ්ගයකින් යුක්තවූ උපෝෂථ ශීලය ඉටනටද, එසේ හෙයින් ඒ තෙමේ සිටිතැනම සිටිවයි ආලම්බනයා වූකලී මා කඩ කඩ කොට කපා නමුත් අඟුරේලා පලහ නමුත් උල අමුනා නමුත් ඕහට මම කිපී විෂධූමයක්වත් විෂ වහ්නියක්වත් හැර පීඩාවක් නොකෙරෙමියි සිතා ඉදින් මම මොවුන් දෙදෙනා කිපී බලාපුයෙම්වීම් නම් විෂතෙජසින් රඹුම්ටක් මෙන් සුණුවිසුණු වන්නාහුය. එසේ කල්හි මාගේ උපෝෂථ ශීලය බිඳෙන්නේයයි ඇස පියාගෙණ අධිෂ්ඨාන පාරමිතාව පෙරදූරිකොට දරණවැල අස්සේ ඉස තබාගෙණ නිශ්චලව වැදහොත් තාහුය. එකල්හි නෙසාද බ්‍රාහ්මණයාත් පින්වත්වූ ආලම්බනය, මේ නාරජ්ජුරු වන් අල්වාගෙණ මැණික මට දීපියවයි කීය. ආලම්බනයා නාරජ්ජුරුවන් දැක ලාම සතුටුවූ සිත් ඇතිව මැණික කීසිවක්කොටත් නොසිතා නිරාසාව බමුණ, මේ මැණික ඇරගණිවයි කියා බමුණා අතට මැණික දැමුයේය. ඒ මැණික ඔහු අතින් ගිලිහී බිම වැටුණ, වැටුණ පමණකින්ම පොළොවට වැද නාගභවනයට ගියේය. වැදි බමුණා මාණික්‍යරත්නයෙන භූරිදත්ත නම් නා රජ්ජුරුවන් හා මිත්‍රධර්මයෙන,පුත්‍රයාගෙනැයි තුනින්ම පිරිහී සිතන්නේ කිසි පිහිටක් නැතිවීම්, මාගේ දරුවන්ගේ බස් නොගිවිස්සෙමියි හඬමින් වැලපෙමින් තමාගේ ගෙට

ගියේය. ආලම්බනයාත් දිව්‍යඖෂධයෙන් තමාගේ ශරීරය වකාගෙණ මදක් අනුභවකොට ශරීරාභ්‍යන්තරයත් පරිභාවිතා කොට දිව්‍යමන්ත්‍රය පිරුවමින් බොධිසත්ත්වයන් කරා ගොස් නගුටගසා අල්වගෙණ ඇද හිස තරකොට මිරිකා මින් මුඛය අල්වා ඖෂධසපා බොධිසත්ත්වයන්ගේ මුඛයෙහි කෙළවත් කෙළේය. පවිත්‍රශීලිවූ නාරජ්ජුරුවෝ ශීලභෙද හයින් කිපී ඇස දල්වාවත් නොබැලූහ. එකල්හි අහිගුණ්ඨික බ්‍රාහ්මණයා මහබෝසතානන් ඖෂධයෙන් මත්කොට නගුට අල්වා ඉස යටිකුරුකොට තලා අනුභවකළ ගොදුරු වමාරවා බිම දිග වැදහොවා සාල්බිස්සක් මිරිකන කලක් මෙන් දෑතින් මැඩ්ඩේය, එකල්හි සකල ශරීරයෙහි ඇට සුණුවිසුණුව යත්තාක් මෙන්විය නැවත අහිගුණ්ඨික බ්‍රාහ්මණයා නගුට අල්වාගෙණ රදව් පිළි අපුලන්නාක් මෙන් බිම අපුල්ලාපිය, මහ බෝසතාණෝ මෙබඳු දුක් අනුභව කරන්නාහු කිසිවිටෙකත් බමුණාට නොකිපි යෝය, මෙසේ අහිගුණ්ඨික බ්‍රාහ්මණයා මහබෝසතානන් දුඊලකොට වැලින් පෙට්ටියක් වියාගෙණ මහබෝසතානන් පෙට්ටියෙහි ලන්නට පටන්ගත. ශරීරය මහත් බැවින් ඒ පෙට්ටියේ නොවදන්නේය. එකල්හි බොධිසත්ත්වයන්ට විළුඹින් ඇන ඇන දමා පෙලාවට ඇරගෙණ එක් ගමකට ගොස් ගම මධ්‍යයෙහි පෙලාව තබා නයින්ගේ නැටුම් දක්නා කැමැති කෙණෙක් එත්වයි කියා හඬ ගෑයේය. එකල්හි සියලු ගම්වැස්සෝ එනැනට රැස්වූහ. එකෙණෙහි ආලම්බනයා මහ නා රජ්ජුරුවෙනි, පෙලායෙන් නික්මෙවයි කීය එකල්හි මහබෝසතාණෝ සිතන්නාහු අදමා පණින් සතුටුකොට කෙළින්නට වටනේය. එසේ කල්හි ආලම්බනයා බොහෝ වස්තු ලැබ සතුටුවූව මා හැරපියන්නේය, එසේ හෙයින් මේ අහිකුණ්ඨිකයා මා ලවා යමක් යමක් කරවනු කැමැත්තේ වීනම් ඒ ඒ දෙය කෙරෙමියි සිතූහ. එකල්හි අහිකුණ්ඨිකයා නා රජ්ජුරුවන් පෙලායෙන් පිටත්කොට මහත්වෙවයි කීය. මහබෝසතාණෝ එබස් අසා මහත්වූය, නැවත කුඩාවෙවයි කීය. බෝධිසත්ත්වයෝ එකල්හි කුඩාවූය. නැවත වට වෙවයි කීය. බොධිසත්ත්වයෝ වටව ගියෝය. සතරැස්ව අටැස්ව සොළොසැස් වෙවයි කියා බොධිසත්ත්වයෝ එපරිද්දෙන්ම කොළෝය. නැවත බිම හා සමග එබීයවයි කීයුය. එකල්හි බොධිසත්ත්යෝ කිසිකෙණෙකුන්ටත් නොපෙණෙන්නාක්මෙන් බිමඇලී ගියෝය. නැවත පෙණ එකක් මවාගණිව් දෙකක් තුනක් සතරක් පසක් සයක් සතක් අටක් නවයක් දශයක් විස්සක් තිසක් සතළිසක් පණසක් පමණ මවාගණුවයි කීය. එකල්හි බෝසතාණෝ පණසක් පමණ පෙණ මැවූය. නැවත සියයක් පමණ මවයි කීය. සියයක් පමණ මැවූය. නැවත උස්වයව, මිටිවයව, පෙණෙන්නාවූද නොපෙණෙන්නාවූද ශරීර ඇතිව යව, පෙණෙන්නා අඪශරීර ඇතිවයව, නිල්වයව රන්වන්වයව, රත්වයව සුදුව යව, මදටවන්ව ගිනිදූල් හරුව, දියකදහරුව, දුම්කඳ හරුවයි, කීකල්හි මේ මේ ආකාරයෙන් ඒ අහිගුණ්ඨික බ්‍රාහ්මණයා විසින් කී නොකී ආත්මභාව මවා නැටුම් දැක්වූය. ඒ දැක සමහරමනුෂ්‍යකෙණෙක් කඳුලුධරාගත නුහුනුවාහ. මනුෂ්‍යයෝ සතුටුව බොහෝ රත්‍රන් හා වස්ත්‍රාභරණාදිය දුන්න. මෙසේ ඒ බමුණා ඒ ගමනම ලක්‍ෂයක් පමණවස්තුව ලද්දේය. ඒ අහිගුණ්ඨික බ්‍රාහ්මණයා මහබෝසතානන් අල්වන ගමනේදී එකාන්තයෙන්ම දහසක් වස්තු ලැබ මොහු හැරපියමි සිතූ නැනැත්තේ එතෙක් වස්තු ලැබත් මේ කුඩා ගම්වලදීම මවිසින් මෙතෙක් වස්තු ලබනලද නුවරවාසීන්ට නැටවූ කල්හි කොපමණ බොහෝවූ වසතු නොලැබේදැයි වසතු ලොභයෙන් මහබොධිසත්ත්වයන් නොහැරි

යේය. ඒ බමුණා ඒ ගමදීම කුටුම්බසණ්ඨාපනයකොට සත්රුවන්මයවූ පෙලාවක් කරවා එහි මහබෝසතාණන් ලාගෙණ සරහා පිළියෙළ කරණලද සැපවූ යානාවකට නැගී මහාපෙරහරින් නික්ම බොධිසත්ත්වයන් නුවර වාසල් දෙර ගම් සතර ප්‍රධානකොට ඇති ඒ ඒ තැන මසක් පමණ කල් කෙළවූයේය. පසළොස්වක් දිනයේ වනාහි අද නුඹවහන්සේට කෙළවමියි රජ්ජුරුවන්ට දන්වා යැවූයේය. එකල්හි රජ්ජුරුවෝ නුවර බෙරලවා මහජනයා රැස්කර වූයේය. රාජඞ්ගනයෙහි මහජනයෝ ඇඳපිට ඇඳ තබා මැසිපිට මැසිබැඳ නැටුම් බලන පිණිස ඒ මැසි ආදියට පැනනැංගාහ.

ඉක්බිත්තෙන් ආලම්බනයා විසින් මහබෝසතාණන් ඇල්වූ දවස්ම බොධිසත්ත්වයන්ගේ මෑනියෝ සවප්නයක් දක්නා නැතැත්තෝ රත් ඇස් ඇති කළුවූ පුරුෂයකු කඩුවක් ගෙණ තමන් අත කපා ලේ පෙර පෙරාගෙණ යන්නා දුටහ. මෙසේ දැක සමුද්‍රජාවෝ භයින් තැතිගෙණ නැගී සිට දකුණත අතගා බලා සවප්නයක් නියාව දත්තුය.

එකල්හි සමුද්‍රජාවන්ට සිතෙත්තේ මවිසින් කර්කශවූදුසවප්නයක් දක්නා ලද එසේහෙයින් දරුවන් සතර දෙනාවන් ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් වහන්සේවවත් මටවත් උපද්‍රවයෙක් වියයුතුයයි සිතිත. එතකුදුවුවත් මහ බෝසතාණන් උදෙසාම අධිකකොට සිතිවිලි ගෙණ ශොකකළහ. කුමක් නිසාදයත්? අවශෙෂයෝ තමන්ගේ නාගභවනයෙහි වෙසෙති. මහාබොධි සත්ත්වයෝ වූකලී සිල් රක්‍ෂාකිරීමෙහි බලවත්වූ අදහස් ඇති බැවින් මනුෂ්‍ය ලොකයට ගොස් පෙහෙවස් රක්‍ෂාකෙරෙති. එසේ හෙයින් මාගේ පුතනුවන් අහිගුණ්ඩිකයෙක්වත් ගරුඩයෙක්වත් අල්වාගණිද්දෑහෝයි බොධිසත්ත්වයන් ගැණම අධිකතර කොට සිතිවිලි කළහ. ඉක්බිත්තෙන් දෙපෝයක් ඉකුත්වූ කල්හි මාගේ පුතනුවෝ අඩමසක් ඉකුත්වූකල මා හැර වසන්නට පළමු අසමර්ථවෙති එසේ හෙයින් ඒකාන්තයෙන්ම උන්ට කිසි භයක් උපන්නේ වනැයි දොම්නස්වූහ.

තවද මසක් ඉකුත්වූ කල්හි සමුද්‍රජාවන්ගේ ඇසින් කඳුළු නොවැගිරෙණ වේලෙක් නම් නැත. ලය වියලී ගියේය. හැඬීමෙන් දෑස් රත්ව ගියේය. ඒ සමුද්‍රජාවෝ භූරිදත්ත නම් නා රජ්ජුරුවන් ගැණ ශොක කරමින් තමන් දකින් නට ආවාවූ සුදර්ශන නම් නා රජ්ජුරුවන් හා සමග කිසි කථාවක් නොකළාහ එකල්හි ඒ නාරජ්ජුරුවෝ සිතන්නෝ මාගේ මෑනියන් වහන්සේ මා පෙර ආ කල සතුටුවූ වනසේක. සුවදුක් කථාකරණසේක. අද වූකලී දොම්නසට පැමිණි සේක. මීට කාරණා කවරේදැයි සිතා ඉක්බිත්තෙන් මෑනියන් අතින් ඒ කාර ණය විචාරන්නාහු මෙසේ කීහ මෑනියන් වහන්ස, පළමු නුඹවහන්සෙ දක් නට මා ආ කල්හි මා හා සමග සතුටුව කථාකරණසේක. එසේවූ නුඹවහන්සේ මහත් යශපිරිවරින් සමෘද්ධව ආවාවූ මා දැක දැන් කථා නොකරනසේක. දැන් නුඹවහන්සේගේ චක්‍ෂුරාදී ඉන්ද්‍රියයෝත් ප්‍රසන්න නොවෙති. රත් කැඩපතක් හා සමාන මුඛයත් කෘෂ්ණ වර්ණව ගියේය. තවද මෑනියන් වහන්ස, අතින් මිරි කනලද පද්මයෙක් යම්සේ මලානිකවයේද එමෙන් නුඹවහන්සේත් මලානිකව නිශ්ශොභාවිය. මෙබඳුවූ මහත්වූ ශ්‍රී සමෘද්ධ නුඹවහන්සේ දක්නා පිණිස ආවාවූ මා සමග පළමු පරිද්දෙන් සතුටුව කථා නොකරනේ කුමක් නිසාදැයි කීවුය. ඒ සමුද්‍රජාවෝ සුදර්ශන නම් නා රජ්ජුරුවන් විසින් මෙසේ කී කල්හිද බසක් බැණ නොනැංගාහ. එකල්හි සුදර්ශන නම් නා රජ්ජුරුවෝ සිතන්නෝ කිසි කෙණෙකුන් විසින් අක්‍රොශ පරිභවයෙක් මුන්වහන්සේට කරණ ලද්දෑහෝයි

සිතා ඉක්බිත්තෙන් එපවත් විචාරන්නාහු මෑනියන්වහන්ස, පෙරනුඹවහන්සේ මා ආකල සතුටුව සුවදුක් කථාකරණසේක. එසේවූ නුඹවහන්සේ දූන් මා හා කථානොකරණසේක. නුඹවහන්සේගේ මුඛයත් මලානිකව ගියේය. කිමෙක්ද? නුඹවහන්සේට ආක්‍රොශ පරිභව බිණීමෙන් පීඩාවක් කළ කෙණෙක් ඇද්ද? නොහොත් නුඹවහන්සේගේ ශරීරයට බලවත්වූ වේදනාවෙක් ඇද්ද? ඒ මට තත්වූ පරිද්දෙන් කිව මැනවයි කිවුය. එකල්හි නා රජ්ජුරුවන්ට සමුද්‍රජාවෝ තමන් නොසතුටුවූ කාරණය කියන්නාහු පුත සුදශීනයෙනි, මීට මසකින් යට සවප්නයක් දක්නෙමි එක කළුවූ රත් ඇස් ඇති පුරුෂයෙක් මාගේ දකුණත කපාගෙණ ලේ පෙර පෙරා මා අඬමින් සිටියදීම පලාගියේය. මම ඒ සවප්නය යම් දවසක දිටිම් නම් එදවස් පටන් අද දක්වාම මසක් දෑතුරෙහි රාත්‍රී දිනයෙහි මාගේ සිතට සැපයෙක් නම් නැත්තේයි කිවුය. මෙසේද කියා පුත ‘මාගේ ප්‍රිය පුත්‍රවූ තොපගේ මලනුවන් නොදකිමි. උන්ට භයෙක් උපන්නේවනැයි සිතමි කියා අඬන්නාවූ මෑනියෝ මෙසේ කියා ඇඬූහ. මනාවූ හාව භාව ලීලාකටාක්‍ෂ මන්දස්මිතයෙන් යුක්තවූ සර්‍වාභරණයන් පැලැන්දෑවූ උතුම්වූ රූපශොභා ඇති සොළොස්දහසක් පමණ නාගමානවිකාවෝ යම් නා රජ්ජුරුකෙණෙකුන් පිරිවරා ඇවිද සිත් ඇලවූද, එසේවූ භූරිදත්ත නම් නාරජ්ජුරුවන් අද මම නොදක්නෙම් වේද? තවද පෙර යම් නාරජ්ජුරු කෙණෙකුන් උතුම් ඛඞ්ගපත්‍රයන් ධරන්නාවූ සවර්ණාලඞකාරයෙන් සැරසුනු බැවින් සුපිපි කිණිහිරිමල් වනයක් මෙන් බබලන්නාවූ නාගමානවකයෝ පිරිවරා ඇවිද්දෝද? එසේවූ භූරිදත්ත නම් නාරජ්ජුරුවන් අද මම නොදක්නෙම්වේද? තවද පුත සුදශීනයෙනි, එබැවින් දූන් භූරිදත්ත නම් නා රජ්ජුරුවන්ගේ මාලිගාවට ගොස් ධර්‍මයෙහි පිහිටියාවූ සිල්වත්වූ තොපගේ බෑයන් භූරිදත්ත නම් නාරජ්ජුරුවන් දකුම්හයි කියා සුදශීන නම් නා රජ්ජුරුවන්ගේත් තමන්ගේත් පර්ෂත් හා සමග භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේ මාලිගාවට ගියෝය.

එකල්හි භූරිදත්ත නම් නා රජ්ජුරුවන්ගේ බිසවූ නාගමානවිකාවෝ බොධිසත්ත්වයන් පෙහෙවස් රක්‍ෂාකරන්නාවූ තුඹස මත්තේ නොදූක මෑනියන් වහන්සේගේ ගෙයිවනැයි නොසොයා නිශ්ශංකාව වැද උන්හ. තවද ඒ නාග මානවිකාවෝ අපගේ සමුද්‍රජාවන් වහන්සේ පුතනුවන් නොදූක එනසේක්ලයි අසා පෙර ගමන්කොට ආයකාවන් වහන්ස, නුඹවහන්සේ පුතනුවන්වහන්සේ නොදක්නේ දූන් අදට මසෙක. මළ බවත් උන්බවත් නොදනුම්හයි මහහඬින් හඬා දෙපත්ලෙහි වැටීහුනන. එකල්හි භූරිදත්ත නම් නා රජ්ජුරවන්ගේ මෑනියෝ යෙහෙලියන් හා සමග විපිමධ්‍යයෙහිදී අඬා වැලප ඔවුන් කැඳවාගෙණ භූරිදත්ත නම් නා රජ්ජුරුවන්ගේ ප්‍රාසාදයට නැගී පුතනුවන්ගේ යහනත් සිංහාසනයත් බලා අඬන්නාහු මෙසේ කියා ඇඬූහ. සිස්වූ කැදූල්ලෙක දරුමළ ලිහිණියක් යම්සේ බොහෝකලක් ශොකදුඃඛයෙන් තැවෙද්ද? එපරිද්දෙන්ම භූරිදත්ත නම් නා රජ්ජුරුවන් නොදක්නාවූ මම බොහෝකලක් ශොකදුඃඛයෙන් තැවී නොසැනහෙමි, පැන්සිඳීගිය මඩවළෙක පියා වගුළ සක්වාලිහිණියෙක් මසුන් නැතිව යම්සේ ශොකගෙණ ඉඳීද? එපරිද්දෙන් භූරිදත්ත නම් නා රජ්ජුරුවන් නොදක්නාවූ මම බොහෝකලක් ශොකාග්නියෙන් පැළඹී සැනහීම

කට නොපැමිණියෙමි. කඹුරන්ගේ උදුන යම්සේ ඇතුළෙන්ම දද පිටතින් නොදද එපරිද්දෙන්ම භූරිදත්ත නම් තාරජ්ජුරුවන් නොදක්නාවූ මම ශොකාග්නියෙන් ඇතුළෙන්ම දවයි කියා මෙසේ භූරිදත්ත නම් නා රජ්ජුරුවන්ගේ මෑනියන් අඬන්නට පටන්ගත් කල්හි උන් හා සමග අවශෙෂයන් ඇඬීමෙන් භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේ මාළිගාව සමුද්‍ර ඝෝෂාවක් මෙන් එකනින් ඝොෂාවිය. එකද සත්ත්වයෙක් සිටියේ සිටපියන්නටද අසමර්ථවිය. සියලු රාජභවනය යුගාන්ත මාරුතයෙන් පැහැර එළුතලද සල්වනයක් මෙන් විය. එකල්හි අරිෂ්ටය, සුභගය යන දෙබෑයෝත් දෙමවුපියන්ට උපස්ථානයට යන්නාහු ඒ විලාප ශබ්දය අසා භූරිදත්ත නම් නා රජ්ජුරුවන්ගේ මාළිගාවට වැද මෑනියන් අස්වසන්නාහු මෑණියන් වහන්ස, ශොක නොකළ මැනව, අස්වැසිලි ලද මැනව, ලොකයෙහි සත්ත්වයෝ චුති උත්පත්ති දෙක සවභාව කොට ඇත්තාහ. මේ චුතිඋත්පත්ති දෙකින් මිදුනාවූ එකද සත්ත්වයෙක් නැත්තේය. එසේ හෙයින් තුඹවහන්සේ ශෝක නොකළ මැනවයි කීහ. එබස් අසා සමුද්‍රජාවෝ කියන්නෝ දරුවෙනි, මේ ලොකයෙහි සත්ත්වයෝ උපදිති මියති චුති උත්පත්ති දෙකින් නොමිදුනු නියාව මමත් දනිමි. එතකුදුවුවත් භූරිදත්ත නම් නා රජ්ජුරුවන් නොදක්නාවූ මම ශොකයෙන් මඩනා ලදිමි. තවද සුදශීන නම් නාරජ්ජුරුවෙනි දූත් දූතගනුව ඉදින් අද මේ රාත්‍රියෙහි භූරිදත්ත නම් නා රජ්ජුරුවන් නුදුටුයෙම් නම් මා දිවි නොතිබෙයි කිවුය. එබස් අසා පුත්‍රයෝ කියන්නාහු මෑනියන් වහන්ස, අස්වැසුන මැනව, ශොක නොකළ මැනව, බෑයානන් වහන්සේ සොයා ඒ ඒ දිග ගොස් නොබෝකලකින් උන්වහන්සේ මෙතැනට ගෙණෙම්හ. තවද ගිරිදුර්ගය ගම් නියම්ගම් රාජධානිය යන මේ සියලුතැන ඇවිද බෑයානන් වහන්සේ දූක කැඳවාගෙණ එම්හ. දසකරාත්‍රියකින් මෙපිට බෑයානන් වහන්සේ ගෙණවුත් පා ලන නියාව දුටමැනවැයි කීහ.

ඉක්බිත්තෙන් සුදශීන නම් නා රජ්ජුරුවෝ සිතන්නෝ ඉදින් අපි තුන් දෙනම එක්දිගකට ගියමෝ නම් ප්‍රපඤ්ච වන්නේය. එසේ හෙයින් තුන්දෙන තුන් අතකට යන්නට වටනේය. එක්කෙණෙකුන් දිව්‍යලොකයටත් එක්කෙණෙකුන් හිමාලය වනයටත් එක්කෙණෙකුන් මනුෂ්‍යලොකයටත් යායුතුය. ඉදින් කාණාරිෂ්ටයෝ මනුෂ්‍යලොකයට ගියෝතම් යම් තැනකදී භූරිදත්ත නම් නා රජ්ජුරුවන් දුටුහුතම් ඒ ගමත් නියම්ගමත් දවා අළුමිටක් කොට එති. කර්කශයෝය. චණ්ඩපරුෂයෝය, එසේ හෙයින් උන් මනුෂ්‍යලෝකයට යවන්නට නොපිළිවන් වන්නේයයි සිතා මල අරිෂ්ටයෙනි, තෙපි දිව්‍යලොකයට යව, ඉදින් දෙවතාවන් විසින් බණ අසනු කැමතිව භූරිදත්ත නම් නාරජ්ජුරුවෝ දිව්‍ය ලොකයට කැඳවාගෙණ යනලද්දෝ වීනම් ඒ දිව්‍යලෝකයෙන් උන් කැඳවාගෙණ එවයි අරිෂ්ටයන් දිව්‍යලොකයට යැවූහ. සුභගයන්ට කියන්නෝ මල සුභගයෙනි, තෙපි හිමාලය වනයට ගොස් පඤ්ච මහාගඞ්ගායෙහි භූරිදත්ත නම් නා රජ්ජුරුවන් පරීක්ෂා කොට එවයි. හිමාලයවනයට සුභගයන් යැවූහ. තුමූ වනාහි මනුෂ්‍යලොකයට යනු කැමතිව සිතන්නෝ ඉදින් මම මානවක වෙශය කින් ගියෙම් වීම් නම් මනුෂ්‍යයෝ මා දූක ඇකිළෙති. මා විසින් තාපස වෙශය කින් යන්නට වටනේය. මනුෂ්‍යයන්ට වූකලී ප්‍රව්‍රජිතයෝ ප්‍රියවන්නාහ, සිත් කළු වන්නාහයි සිතා ඒ සුදශීන නම් නාරජ්ජුරුවෝ තාපස වෙශයක් මවාගෙණ

මැතියන් වැඳ නික්මුනාහ. මහබෝසතාතන්ට වූකලී අච්චිමුඛී නම් වෙත මවුන් නැගනී කෙනෙක් ඇත, ඒ නැගනියන්ට බොධිසත්ත්වයන් කෙරෙහි බලවත්වූ ස්නෙහය වන්නේය. එසේ හෙයින් ඒ වෙත මවුන් දරුවූ නැගනියෝ සුදර්ශන නාරජ්ජුරුවන් දැක කියන්නෝ බෑයන්වහන්ස, ශොකයෙන් බොහෝසේ මිරිකෙමි, මමත් නුඹවහන්සේ හා යෙමි කිවුය. මැනියෙනි, මා හා සමග යන්නට නොපිළිවන, මම ප්‍රව්‍රජ්‍යා වෙශයකින් යෙමි කිවුය. එසේවීනම් මම කුඩා මැඩිපැටියක මෙන් නුඹවහන්සේගේ දළඹුල්ල අස්සේ වැදහෙවයෙමි කිවුය. එසේ වීනම් එවයි කීකල්හි නාගමානවිකා තොමෝ මැඩිපැටියකවෙස් මවාගෙණ තපස්වීන්ගේ ජටාව අස්සේ වැදහොත්තේය. සුදර්ශන නම් නාරජ්ජුරුවෝ මුල පටන් විචාරා බලා පරීක්ෂා කොටගෙණ යෙමි සිතා බොධිසත්ත්වයන්ගේ බිසෝවරුන් අතින් බොධිසත්වයන් පෙහෙවස් රක්ෂාකළතැන් විචාරා පළමුකොට ගොස් ආලම්බනයා විසින් බොධිසත්ත්වයන් අල්වාගත් තැන ලේ හා වැලිත් පෙළාව කළ තැනුත් දැක භූරිදත්ත නම් නාරජ්ජුරුවන් අහිගුණ්ඩික බ්‍රාහ්මණයකු විසින් අල්වාගන්නා ලද්දේ වනැයි දැන උපන්නාවූ බලවත්වූ ශොක ඇතිව කඳුලු පිරුණාවූ දෑසින් යුක්තව ආලම්බනයා ගියාවූ මාර්ගයෙන්ම පළමුකොට කෙළවූ ගමට ගොස් මනුෂ්‍යයන් අතින් විචාරන්නෝ මෙබඳුවූ නා රජ්ජුරු කෙණෙකුන් ගෙණවුත් කිසිවෙක් මේ ගමදී කෙළවූදැයි විචාළාහ. අහිගුණ්ඩික බ්‍රාහ්මණයකු විසින් මීට මසකින් මත්තේ මෙගමදී කෙළවනලදැයි කී කල්හි කිසිවක් ඔහු විසින් ලබනලදදැයි විචාළෝය. එසේය, මෙගමින් ලක්ෂයක් වස්තු ලබන ලදැයි කීහ. දැන් කොයි ගියෝදැයි විචාළ කල්හි අසවල් ගමට ගියෝයයි කීහ.

ඒ සුදර්ශන නම් නා රජ්ජුරුවෝ එතැන් පටන් විචාරමින් ක්‍රමයෙන් යන නැනැත්තෝ රජ්ජුරුවන්ගේ මාලිගාදොරට ගියාහුය. එකෙණෙහි ආලම්බනයාත් ඉස්සෝධා නහා සකල ශරීරයෙහි සුවඳවිලවුන් ගල්වා පටකඩක් ඇඳ රන් පෙළාව ගෙන්වාගෙණ මාලිගාදොරටම ගියේය. එකල්හි මහජනයෝ රැස්වූහ. රජ්ජුරුවන්ට ඉදිනා අසුන් පණවනලද රජ්ජුරුවෝ මාලිගා ඇතුළේම සිට කියන්නෝ මම දූත් එමි. නා රජ්ජුරුවන් අහිගුණ්ඩික බ්‍රාහ්මණයාට කෙළවන්ට කියවයි කියා යැවූහ. එකල්හි ආලම්බනයා විසිතුරු ඇතිරියක් මත්තේ රන්පෙළාව තබා හැර මෙහි එව නා රජ්ජුරුවෙනියි කීය. එකෙණෙහිම සුදර්ශන නම් නා රජ්ජුරුවෝ පිරිස් කෙළවර සිටියාහ. මහබෝසතානෝ පෙළායෙන් ඉස මැත්කොට ඒ සියලු පර්ෂත් බැලූය, නාගයෝ තටත්තට පටන්ගන්නා අවසථාවෙහි කාරණා දෙකකින් පක්ෂීන් බලන්නාහු ගරුඬයන්ගේ උපද්‍රවයක්වත් නැයින්වත් දක්නා පිණිස බලන්නාහ. ඒ නාගයෝ ගුරුළුන් දැක භයින් නැති ගෙණ නොනටන්නාහ, නෑයින් දැක ලජ්ජාවෙන් නොනටන්නාහ. මහබෝසතානෝ වූකලී පෙළයෙන් ඉස මැත්කොට ඒ සියලු පක්ෂීන් අතරෙහි සිටියාවූ බෑයන් දැක දෑස කඳුලු පුරාගෙණ පෙළායෙන් නික්ම බෑයන් සමීපයට ගියාහ. මහජනයෝ නාරජ්ජුරුවන් එන්නා දැක භයින් ත්‍රසථව ඉවත්ව ගියහ. උදකලාව සුදර්ශන නම් නා රජ්ජුරුවෝ සිටියාහ. මහබෝසතානෝ ගොස් ඒ තපස්වී නා රජ්ජුරුවන්ගේ පතුල්පිට හිස තබා ඇඬූහ, මහබෝසතානෝ අඬා වැලප පෙරළා ගොස් පෙළාවට වන්හ. ආලම්බනයා මේ නාරජ්ජුරුවන් විසින් තාපසයෝ දෂ්ටකළෝවන, එසේ හෙයින් උන් අස්වසාලම්යි සිතා සමීපයට ගොස් කියන්නේ තපස්වීනි, මා අතින් මිදුනාවූ මේ නාරජ්ජුරුවෝ ගොස් තොපගේ දෙපත්ලේ වැටී උන්හ. කිමෙක්ද? තොප දෂ්ටනොකොළෝද? ඉදින් තොප දෂ්ටකොටපු නම් එකාන්තයෙන් විෂබෑම මට භාරවන්නේය. තොපි සැකයක් නොකරව, සැපසේ නොබා සිටුවයි කිවුය. එබස් අසා සුදර්ශන

නම් තපස්වී ආලම්බනයා සමග කථාකරණු කැමතිව කියන්නේ ආලම්බනය, තාගේ මේ තා රජ්ජුරුවෝ මට කිසි දුකක් කරන්නට අසමර්ථයහ. ඌතුමූ අද මා දෂ්ටකොට නොහෙති. ලොකයෙහි සජීයින් අල්වා කෙළවා කා ඇවිදිනාවූ යම් පමණ අහිගුණ්ඨික බ්‍රාහ්මණ කෙනෙක් ඇත්තෝ වී නම් ඒ සියල්ලෝම මට වැඩිය නොවෙති. මම උන් ඇමටම වැඩීමි, මට වඩනාවූ අහිගුණ්ඨිකයෙක් මේ දඹදිව තෙලෙහි නැතැයි කීහ. එකල්හි ආලම්බනයා මූතුමූ අසවල් කෙණෙකැයි නොදන කිපී කියන්නේ තපස්වී වෙශයෙන් අවුත් පඡීත් මධ්‍යයෙහි සිට තමා හා හරිසමානකොට වාසි කියන්නාවූ මේ තෙමේ කොයි සිට ආ එකෙක්ද? නුවණ නැති වියරුහුනු එකෙක්ද? මෙතැනට රැස්වූ සියලු පඡීත් මා කීවා අසන්වා, මාගේ ද්වේෂයෙක් නැත, මට නොකිපෙව මම මේ තා රජ්ජුරුවන් ලවා මොහු දෂ්ටකරවමියි කීය. එකල්හි සුදශීන නම් තා රජ්ජුරුවෝ ඔහට කියන්නාහු ආලම්බනය, තෝ මා තා රජ්ජුරුවන් ලවා දෂ්ටකරවූයෙහි වීතම් මම මාගේ මැඩිපැටවා ලවා තා දෂ්ටකරවමි, මේතැනට රැස්වූ පඡීත් හැමදෙනම මා කීවා අසන්වා අප දෙදෙනාගේ මේ යුඩයෙන් පන්දහසක් වස්තු ඔට්ටු තිබිය යුතුය. පැරදි කෙණෙකුන් දිනාගිය කෙණෙකුන්ට පන්දහසක් වස්තු දියයුතුයි කීහ. එබස් අසා ආලම්බනයා කියන්නේ තාපසයෙනි, මම වූකලී ප්‍රසිඬව ප්‍රභුව සිටිමි. තෝ වූකලී ඉතා දිළිඳුව සිටියෙහිය. එසේවූ තට ඇපවන්නෝ කවුරුද? ඔට්වූනැඹූ මිළ දෙන්නේ කවුරුද? ඇප හෝ ඔට්ටු ගෙවීම් සොයව්ද? මා තිබියයුතුවූ පරදුවත් එබඳු ඇපයෙක්වත් ඇත්නම් වහා තබමි, පන්දහස කින් මට ඔට්වුව තිබිය යුත්තේයයි කීහ. සුදශීනයෝ ඔහුගේ බස් අසා අප දෙදෙනා විසින් පන්දහසක් වස්තු පරදුකොට තිබියයුතුයයි කියා නිර්භීතව රජ්ජුරුවන්ගේ මාලිගාවට නැගී මයිලනුවන් සාගර බ්‍රහ්මදත්ත නම් රජු සමීපයෙහි සිට කියන්නෝ මහරජ්ජුරුවන් වහන්ස නුඹවහන්සේට වැඩෙක් වේවා මාකීව අසන්වා කීර්තියෙන් යුක්තවූ මහරජ්ජුරුවන් වහන්ස, පන්දහසක් වස්තුවට මට ඇපවූවමැනවැයි කීහ.එබස් ඇසූ සාගර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සිතන්නෝ මේ තාපසයෝ බොහෝ සම්පත් මා අතින් ඉල්වති, මීට කාරණා කිමෙක්ද්‍යෝ හෝයි සිතා කියන්නේ තපස්වීනි. කිමෙක්ද? තොප අතින් පියානන්වහන්සේ අරගෙණ කෑ නයෙක් ඇද්ද? නොහොත් තොපගෙන් මා ඇරගෙන කෑ නයෙක් ඇද්ද? අපගේ දෙපක්ෂයෙහි ඇත්තන් ගත් දුන් නයෙක් නැතිව තිබියදී කුමක් නිසා තෙපි මෙසේ බොහෝ වස්තු මා අතින් ඉල්වව්දැයි කීහ, මෙසේ කී කල්හි සුදශීන නම් තා රජ්ජුරුවෝ මේ ආලම්බනයා තා රජ්ජුරුවන් ඇරගෙණ මා දෂ්ටකරවා ජයගණීම් කියයි, මම මාගේ මැඩිපැටවා ගෙන බ්‍රාහ්මණයා දෂ්ට කරවා ජයගණීමියි රජ්ජුරුවන්ට කියන්නෝ අභිවෘඩිකරවූ මහරජ්ජුරුවන් වහන්ස, දූන් නුඹවහන්සේ ක්ෂත්‍රිය සමූහයා පිරිවරා ඒ අප දෙදෙනාගේ යුඩය දක්නා පිණිස රාජාඞගනයට වැඩවදාළ මැනව, අප දෙදෙනාගේ යුඩයෙහි ඉදින් අහිගුණ්ඨික බ්‍රාහ්මණයා පැරද ගියේවී නම් මට පන්දහසක් වස්තු දෙන්නේය, ඉදින් මම පැරද ගියේවීනම් මම ඔහට පන්දහසක් දෙමි. එසේ හෙයින් නුඹවහන්සේගේ අතින් ඔට්ටු තබන්නට බොහෝවස්තු ඉල්වමි. නුඹවහන්සේ නොලස්ව වහා දුනමැනව, අප දෙදෙනාගේ යුඩය දක්නා පිණිස වැඩියමැන වයි කිවුය. රජ්ජුරුවෝ එබස් අසා එසේවීනම් යම්හයි කියා තාපසයන් හා සමග නික්මුණාහ. ඒ රජ්ජුරුවන් දක ආලම්බනයා සිතන්නේ මේ තාපසයෝ ගිය ඇසිල්ලෙහිම රජ්ජුරුවන් කැඳවාගෙණ අවුය, එසේ හෙයින් මුන් රාජකුලූපග කෙණෙකුන් වියයුතුයයි භයපත්ව ඒ තපස්වීන්ට අනුවතී

තය කොට කියන්නේ තාපසයෙනි, මාගේ ශිල්ප විද්‍යායෙන් තෙපි ඉක්ම නො පවතියි විෂවිද්‍යායෙන් තෙපි මහත්ව සිටියව, තොප හා සමාන කෙනෙක් නැත, එසේවූවත් මාගේ මහානුභාවසම්පන්නවූ මේ නාරජ්ජුරුවන් කිසිවක් කොටත් නොසිතව, උන් දියබරණකු කොටත් නොසිතා නිරාදරව පවත්නා හෙයින් එපමණකට තොපට කාරණා කියමි කීය.

ඉක්බිත්තෙන් සුදශීනයෝ කියන්යෝ අහිගුණ්ඨික බ්‍රාහ්මණය, මමත් විෂවිද්‍යායෙන්නා මැඩ නොපවත්වමි, එතකුදුවූවත් මේ විෂ නැත්තාවූ නාරජ් ජුරුවන් ඇරගෙණ ලොකවාසී සත්ත්වයන් අතිශයින් වඤ්චාකොට ඇවිදිනෙහිය මේ නාරජ්ජුරුවන් විෂනැතිතියාව මා දන්නාසේ මේ ලෝවැස්සෝ දනිත්තම් තොපට අක්සුණු පමණකුත් නොලැබෙත්තේය. බමුණ තව මුන් කෙළවීමෙන් වස්තු කොයින් ලැබේද? වස්තුවෙක යන දෙයක් කැලම නොලබන්නෙහිවේදැයි කිවුය. එකල්හි ඒ තපස්වීන්ට අහිගුණ්ඨික බ්‍රාහ්මණයා කිපී කියන්නේ තිය සහිතවූ සාකීශවූ අඳුන් දිවිසම් අඳනාවූ ජටාධරවූ කිසිසැරගිමක් නැත්තාවූ අඹවූ තෝ මේ පර්ෂත් මධ්‍යයට අවුත් මෙසේ උග්‍රවූ විෂතේජස් ඇත්තාවූ මාගේ මේ නාරජ්ජුරුවන් විෂ නැත්තේයයි නින්දාකොට කියන්නෙහිය. එසේ වී නම් දැන් තෙපි උග්‍රවූ විෂතෙජසින් සම්පූර්ණවූ මේ නාරජ්ජුරුවන් සමීපයට ගොස් උන් විෂ නැති නියාව පරීක්ෂාකොට බලව, ඉදින් තෝ ඒ නාජ්ජුරුවන් සමීපයට නිර්භීතව ගියෙහි නම් ඇසිල්ලකින් ඒ නාරජ්ජුරුවෝ තා අළුමිටක් මෙන් කරතියි කීය.

ඉක්බිත්තෙන් ඒ අහිගුණ්ඨික බ්‍රාහ්මණයා හා සමග කෙළනාවූ සුදශීන නම් තපස්වී මෙසේ කීහ. අහිගුණ්ඨිකය, ඉදින් ගැරඬියකු දියබරණකු පණු වුල්ලකු පමණවත් විෂනැති රත්වූ හිස් ඇති මේ නාගරාජයාගේ විෂයෙක් කිසිත් නැත්තේයයි කීහ. එකල්හි ආලම්බනයා සුදශීනයන්ට කියන්නේ තපස්වීනි, මේ ලෝකයෙහි දායකයෝ දන්දී සවර්ගලොකයට යන්නාහුයයි කියා නික්ලේශීවූ කායවාක් සංයමය ඇත්තාවූ තපස්විවරයන්ගෙන් මා විසින් අසන ලදමය. එසේහෙයින් තොප විසින් ශ්‍රමණ බ්‍රාහ්මණයන් විෂයෙහි දියයුතු කිසි වක් ඇත්තම් ඒ සියල්ල ජීවත්ව ඉන්දදීම දීපියව, මළකල දැන් දෙන්නට නො පිළිවන්වේද? මේ නාගරාජයා මහත්වූ සෘධ්‍යනුභාව ඇත්තේය. තේජස්විය, ලාමකවූ සත්ත්වකෙණෙකුන් විසින් මැඩපැවැත්වීය නොහැක්කේය. එසේ හෙයින් ඔහු ලවා තා දෂ්ටකරවමි. ඒ තෙමේ තා විෂතෙජසින් භෂ්ම කරන් තේයයි කීය. එබස් ඇසූ සුදශීනයෝ කියන්නෝ මේ ලෝකයෙහි දායකයෝ දන්දී සවර්ගලොකයට යන්නාහයි කාය වාක් සංයමය ඇත්තාවූ තපස්විවරයන් ගෙන් මා විසිනුත් පළමු අසනලදමය, එසේහෙයින් ඉදින් තාගේ දියයුතු වස්තු වෙක් ඇත්තම් ජීවත්ව හින්දදීම දිපියව, මළකල තට දන්දෙන්නට නොපිළි වන්වේද? මේ අච්චිමුඛී නම් මැඩිපැටි තොමෝ උග්‍රවූ විෂතෙජසින් සම්පූර්ණය, ඇය ලවා තා දෂටකරවමි. ඕතොමෝ තා දෂ්ටකොට භෂ්මකරන්නිය. තවද ඒ අච්චිමුඛ තොමෝ ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් වහන්සේගේ දූවූ වෙන මවුන් දරුවූ මාගේ නැගනියෝය. උග්‍රවූ විෂතෙජසින් යුක්තයෝය. උන්ගේ විෂයෙහි උග්‍රබව ඇසිල්ලකින් දක්නෙහිවේදැයි කීහ. මෙසේද කියා මැනියෙනි මාගේ ජටා අතරෙන් නික්ම අත්ලෙහි පිහිවාවයි මහජනයා මධ්‍යයෙහිදීම නැග තියන් කැඳවා අත දිගුකොට ලූය. එකෙණෙහි අච්චිමුඛී නම් මැඩිපැටි ඒ

තපස්වීන් බැණවූ අඩ අසා දළමඹුලු අස්සෙහි වැදහොත් තෑතැත්ති තුන් විටෙක මැඩි හඩ හඩා නික්ම දසරුණෙහි හිඳ පැනගොස් අත්ලේ හිඳ විෂබින්දු තුනක් තපස්වීන්ගේ අත්ලෙහි හෙළා නැවත ඒ තපස්වීන්ගේ දළමඹුලු අස්ස ටම වන, එකල්හි සුදර්ශනයෝ විෂය අත්ලෙන් හෙණ සිට මේ ජනපදය විශෙෂ යෙන්ම නස්නේයයි තුන්විටක් කීහ. උන්ගේ ශබ්දය දොළොස් යොදුන් පමණ ඇති බරණැස්නුවර වසා සිටියේය. එකල්හි රජ්ජුරුවෝ කුමක්නිසා ජනපදය නසීදැයි විචාළේය. සුදර්ශනයෝ කියන්නෝ මහරජ්ජුරුවන් වහන්ස, මේ විෂය ඉසපියන තැනක් නොදක්මි කීවුය. දරුව, පොළොව මහත මේ පොළොවෙහි ඉස පියවයි කීකල්හි නොපිළිවන මහරජ්ජුරුවන් වහන්සැයි කියා රජ්ජුරු වන්ගේ බස් වලකා කියන්නාවූ සුදර්ශනයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් වහන්ස, මා කියන්නක් අසා දනමැනව, ඉදින් මම මේ විෂය බිමට දමීම්නම් බිම හටගත් තාවූ තෘණලතා හා ඖෂධවෘක්ෂයෝ සැකයක් නැතිව ඒකාන්තයෙන් වියලී යන්නාහ. එසේහෙයින් පොළවට දමන්නට නොපිළිවනැයි කීවුය. එබස් අසා බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කියන්නෝ එසේවීනම් දරුව, උඩ ආකාශයට දමවයි කීහ. එබස් අසා සුදර්ශනයෝ ආකාශයටත් දමන්නට නොපිළිවනැයි දක්වා කියන්නාහු බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් වහන්ස, මා කියන්නක් අසා වදාළ මැනව, ඉදින් මම මේ විෂය ආකාශයට දමීම්නම් සත්අවුරුද්දක් මුලුල්ලෙහි වැසි නොවස්නේය. යවත්පිරිසෙයින් හිමබින්දුවක් විවරත් බිම නොවැටෙන්නේයයි කීවුය, එසේවීනම් මේ විෂය දියෙහි ඉසපියවයි කී කල්හි දියෙහි ඉසපියන්න ටත් නොපිළිවනැයි දක්වන්නාවූ සුදර්ශනයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් වහන්ස, මා කියන්නක් ඇසුව මැනව, ඉදින් මේ විෂබින්දු තුන දියේ ඉසපුයෙම් වීම්නම් දියෙහි හටගත්තාවූ මත්කැස්බන් ආදීවූ යම් පමණ ප්‍රාණී කෙනෙක් ඇත්නම් ඒ සියල්ලෝම නසින්නාහුය. එසේහෙයින් දියටත් දමන්නට නොපිළිවනැයි කීහ, එකල්හි රජ්ජුරුවෝ සුදර්ශනයන්ට කියන්නෝ දරුව, අපි කිසිවක් නො දනුම්හ. අපගේ රට යම්සේ නොනසී නම් ඒ නොනැසීමට සුදුසු උපාය තෙපිම දනුවයි කීහ. එබස් අසා සුදර්ශනයෝ කියන්නෝ මහරජ්ජුරුවන් වහන්ස, මේ සථානයෙහි පිළිවෙළින් වළවල් තුනක් කැනවූව මැනවැයි කීහ. රජ්ජුරුවෝත් එපරිද්දෙන්ම කැනවූය. සුදර්ශනයෝ මධ්‍යයේ වළ අනෙකප්‍රකාරවූ භෛෂජ්‍ය යෙන් පිරවූය. දෙවැනි වළ ගොමයෙන් පිරවූය, තුන්වැනිවළ ඖෂධයෙන් පිරවූය. ඉක්බිත්තෙන් සුදර්ශනයෝ විෂබින්දු මධ්‍යයේ වළ ලූහ. එකෙණෙහිම දුම්නැගී ගිනිදැල් උඩ නැංගේය. ඒ වන්නිජාලාව ගොස් ගොම්පිරූ වළ වැද ඖෂධ නිමවා නිවීකියේය. ආලම්බනයා ඒ වළට නුදුරුවූ තැන සිටියේය එකල්හි ඔහුගේ ඇගේ විෂ උෂ්ණය වැදගෙන සකල ශරීරයෙහි ඡවිය ඉපිළ ගෙණ ගියේය. එකල්හි ඒතෙම සෙවතකුෂ්ට ඇති එකක්හු මෙත්වී මරණභයින් භයපත්ව නා රජ්ජුරුවන් හරිමි කියා තුන්විටක් හඩගෑසීය. ඒ හඩ අසා මහ බෝසතතෝ රත්රන් පෙළායෙන් නික්ම සර්වාභරණයෙන් සැරහුනාවූ දිව්‍යාත් භාවය මවාගෙණ ශක්‍රදෙවෙන්ද්‍ර විලාසයෙන් සිටියහ. සුදර්ශනයෝත් අච්චිමුඛීත් එතැනම සිටියහ.

ඉක්බිත්තෙන් සුදශීනයෝ රජ්ජුරුවන්ට කියන්නාහු මහරජ්ජුරුවන් වහන්ස, අප අඳුනනසේක්ද? අපි කාගේ දරුවෝදැයි විචාළෝය. නොදනිමියි කී කල්හි අප වූකලි නුඹවහන්සේ නාඳුනනසේක්ද? කසී රජ්ජුරුවන්ගේ දූවූ සමුද්‍රජාවන්වහන්සේ ධෘතරාෂ්ට්‍රනම් නාරජ්ජුරුවන්ට දුන් නියාව දන්නාසේක්දැයි විචාළෝය. එසේය දනිමි, ඌ මාගේ බාලනැගනියෝවේදැයි කිවුය. එබස් අසා සුදශීනයෝ අප සමුද්‍රජාවන්වහන්සේගේ දරුවෝය, නුඹවහන්සේ අපගේ මයිල නුවන් වහන්සේයයි කිවුය. එකල්හි රජ්ජුරුවෝ එබස් අසා ඔවුන් තුන්දෙනා වැළඳගෙණ ඉසසිඹ සනසා අඬා වැලප ප්‍රාසාදයෙහි මතුමහල්තලයට ගෙණගොස් මහත්වූ සත්කාරකොට භූරිදත්ත නම් නා රජ්ජුරුවන් හා සමග පිළිසඳර කථා කොට විචාරන්නාහු දරුව, නොප මෙබඳුවූ උග්‍රවූ විෂතෙජස් ඇති නැනැත්තේ ආලම්බනයා කෙසේ අල්වාගත්තේදැයි විචාළේය. මහබෝසතාණෝ ඒ සියලු ප්‍රවෘත්ති විස්තර හෙයින් කියා මහ රජ්ජුරුවන් වහන්ස, රජදරුරවන්වහන්සේ නම් මේ ක්‍රමයෙන් රාජ්‍යය කරන්ට වටනේයයි මයිල් රජ්ජුරුවන්ට ධර්මදෙශනා කළහ. එකල්හි මයිලනුවන්ට සුදශීනයෝ කියන්නෝ මයිලනුවන් වහන්ස, මාගේ මැනියන්වහන්සේ භූරිදත්තනම් නාරජ්ජුරුවන් නොදැක ශෝකදුක් ඉවසා පීඩිතව වසනසේක. එසේ හෙයින් අපි බැහැර කල්යවන්නට නොපිළිවනැයි කීහ. එබස් අසා සාගර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කියන්නාහු යහපත දරුවෙනි, නොපි හැම යව. මම වූකලී මාගේ නැගනියන් දක්නා කැමැත්තෙමි. කෙසේ උන් දකිම්දැයි විචාළෝය. මයිලනුවන් වහන්ස, අපගේ මුත්තනුවන්වූ කසී රජ්ජුරුවන් වහන්සේ කොයිදැයි සුදශීනයෝ කී කල්හි දරුව, මාගේ නැගනියන් ඇර විසිය නොහී මපියානන් වහන්සේ රාජ්‍ය හැර පැවිදිව අසවල් වන ලැහැබ වසන සේකැයි කිවුය. එබස් අසා සුදශීනයෝ කියන්නෝ මයිලනුවන් වහන්ස, මාගේ මැනියන් වහන්සේ නුඹවහන්සේත් මුත්තනුවන් වහන්සේත් දක්නා කැමතිසේක. නුඹවහන්සේ අසවල් දවස්ම මාගේ මුත්තනුවන්වහන්සේ සමීපයට වැඩිය මැනව, අපි හැම මැනියන්වහන්සේ හා කැටිව මාගේ මුත්තනුවන්වහන්සේගේ පන්සලට එම්හ. එතැන්හිදී නුඹවහන්සේ අපගේ මැනියන් වහන්සේ දක්නාසේක්වේදැයි මෙසේ මයිලනුවන්ට දවස් නියමකොට මාළිගාවෙන් බටහ. රජ්ජුරුවෝ බෑණන් යවා හඬා වැලප වැලැක්කාහුය, ඔහු තුන්දෙනාත් පොළොව කිමිද නාගභවනයට ගියහ. මහබෝසතාණන් නාගභවනයට පැමිණි කල්හි සියලු නාගභවනය මහනඬින් එකකොළාහල විය. ඒ මහබෝසතාණෝ මසක් මුළුල්ලෙහි පොළොවේ වැදහෙව බොහෝ පීඩිතවූ බැවින් ගිලන්ව වැදහොත්තාහුය මහබෝසතාණන් සමීපයට විචාරන්නට යන එන්නාවූ නයින්ගේ පමණක් නැත, මහබෝසතාණෝ ඒ නයින් හා සමග කථා කරන්නාහු ආයාසයට පැමිණෙති කාණාරිට්ඨයෝ දිව්‍යලොකයට ගොස් මහබෝසතාණන් නොදැක පළමුව නාගභවනයට අවුය. එකල්හි මේ නෙමේ වණ්ඩය පරුෂය නාගපක්ෂීද වලකාලන්නට සමර්ථයයි මහබෝසතාණන් සැතපුන තැන දෙරකඩ රැකවල් සිටවූහ. සුභගයෝත් සියලු හිමාලවනය පරීක්ෂාකොට ඉක්බිත්තෙන් මහාසමුද්‍රයත් අවශෙෂ ගඞ්ගාවනුත් පරීක්ෂාකොටයමුනා නම් ගඞ්ගාව පරීක්ෂා කරමින් එමින් සිටියහ. එකල්හි නෙසාද බ්‍රාහ්මණයාත් ආලම්බනයා කුෂ්ඨරෝගීවූවහු දැක සිතන්නේ ආලම්බනයා භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ට පීඩාකෙට ශ්වෙතකුෂ්ටයෙන් විරූපීවිය. මම වූකලී මට බොහෝ උපකාර

කළාවූ ඒ භූරිදත්ත නම් නාරජ්ජුරුවන් මාණික්‍යයෙහි ලෝභයෙන් අභිගුණ්ඨික බ්‍රාහ්මණයාට දුක්වීමි. ඒ අකුශලකර්මය මා කරා එන්නේය. යම්තාක් ඒ පාපය මා කරා නොඑත්නම් ඊට පළමුකොට මම යමුනානම් ගංගාවටගොස් පයාග තීර්ථයෙහි පාපප්‍රවාහනය කෙරෙමියි සිතා ඒ යමුනාවටගොස් මාවිසින් භූරිදත්ත නම් නාරජ්ජුරුවන් විෂයෙහි මිත්‍රද්‍රෝහකර්ම කරණලද, ඒ අකුශලකර්මයනොබ ශුද්ධකොට දියෙහි යවාපියමියි කියා යමුනා නම් ගංගාවේ පයාගතීර්ථයෙහි ගැලිගැලී ඉල්පෙමින් සිටියේය. එසමයෙහි සුභගයෝ එතැනට පැමිණි තැනැත්තෝ ඔහුගේ ඒ වචනය අසා මේ පාපකාරීවූ පුරුෂයා ඒසා මහත්වූ යශපිරිවර දුන්නාවූ මාගේ බෑයන්වහන්සේ මැණිකක්නිසා ආලම්බනයාටදක් වනලද එසේහෙයින් ඔහුගේ දිවිනොදෙම්ල නගුටින් ඔහුගේ දෙපය වෙළා ඇදගෙණ දියට ගිල්වා අශ්වාසප්‍රාශ්වාසය නැතිකොට මඳක් ලිහිල්කොළෝය. ඒ තෙමේ එකල්හි ඉස එසවීය. නැවතත් ඔහු ඇද දියෙහි ගැලූයේය. මෙසේ නොයෙක්වර ඒ සුභගයන් විසින් දියෙහි ගිල්වා පීඩාවට පමුණුවනලද්දාවූ වැදිබමුණු ඉසඔසවා කියන්නේ පාපප්‍රවාහනය කිරීමෙහි සමර්ථයයි ලෝවැස්සන් විසින් දන්නාලද පයාගතීර්ථයෙහි සිටියාවූ මෙබඳුවූ ජලස්නානය කරන්නාවූ මේ යමුනා නම් ගංගාවේ දියයටවැද කවර සත්වයෙක් මා අනුභවකරන්ට අල්වාගත්දැයි බැගෑපත්ව කීය. එකල්හි ඔහට සුභගයෝ කියන්නාහු නෙසාද බ්‍රාහ්මණය, ලෝකාධිපතිවූ මහත්වූ යශපිරිවර ඇති යම් ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරු කෙණෙකුන් වහන්සේ බරණැස්නුවර හාත්පසින් වෙළා මූදුනෙහි පෙණගහීයෙන් වසා සියලු සත්වයන්හට භය ඉපදවූසේක්ද? මම ඒ නාගාධිපතිවූ ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්වහන්සේගේ පුත්‍රයෙමි බමුණ, මා සුභග නම් නාරජ්ජුරුවෝයයි ලොකවාසී සත්වයෝ දනිති කීහ. එකල්හි වැදි බමුණා සිතන්නේ මූතුමූ භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේ බෑයෝය. එසේහෙයින් මාගේ දිවිනොහබන්නේය. මම මුන්ගේත් දෙමවුපියන්ගේත් ගුණ කීමෙන් සිත මොළොක්කොට මුන්ගෙන් මාගේ ජීවිතය ඉල්වාගත්තෙම් වීම්නම් යහපත් වන්නේයයි සිතා මෙසේ කීය. සුභගයෙනි, ඉදින් තෙපි දීර්ඝායුෂක බැවින් අමරනම්වූ නාගයන්ට අධිපතිවූ කසී රජ්ජුරුවන් වහන්සේගේ දියනියන්ගේ පුත්‍රවූ නම් තොපගේ ප්‍රියවූ ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවෝ මහෙශාක්‍යවූ දිව්‍යනාගරාජයන් අතරෙන් එක්තරා කෙණෙක්වීනම් තොපගේ මෑනියෝ මනුෂ්‍යලොකයෙහි කාශිකොසල දෙරටට අධිපතිවූ සාගරජ්ජුරුවන් වහන්සේගේ රූපාග්‍රප්‍රාප්තවූ දියනිකෙණෙක් වීනම් මෙබඳුවූවන්ගේ දරුමුනුබුරුව සිටියාවූ කෙණෙක් බමුණන්ගේ දාසයකු දියෙහි ගලා මරන්නට සුදුසු නොවෙති. එසේ හෙයින් තොප වැනිවූ උත්තමයන්ට මා මැරීම කාරණා නොවෙති. කියා සුභගයන්ගේ වංශය උසස් කරමින් වර්ණනාකොට තමහට ජීවිතදානය ඉල්වූයේය. එකල්හි ඔහට සුභගයෝ කොළ දුෂ්ට බමුණ, තෝ මා වඤ්චා කොට මිදෙමියි නොසිතව, තාගේ දිවිනොදෙමියි කියා ඔහු විසින් කළාවූ ක්‍රියාව ප්‍රකාශ කොට කියන්නාහු බ්‍රාහ්මණය, තෝ ගසකට බඩදීගෙණ සිට පැන් බොන්නට යමුනා නම් ගඞ්ගාවට ආවාවූ එක්මුවකු විදපුයෙහිය. ඒ විදිනලද්දාවූ මුවා ශර වේගයෙන් නැතිගන්වන ලද්දේ දුරට දිවගෙණ ගොස් එක්තැනක හුනුයේය. එසේ හුනුවාවූ මුවා දක ආරණ්‍ය සංඛ්‍යාතවූ මහවනයෙහිදී මස් කොටගෙණ මස් කදත් ඇරගෙණ සවස්වේලෙහි ගිරවුන් සහ සැළලිහිණියන්

විසින් රුවූ පිළිරුවූ දෙනලද්දාවූ මිහිරිවූ කොවුල්හඬ ඇති ජලනිශ්‍රිතවූ භූමි යෙහි හටගත් බැවින් නිරන්තරයෙන් නිලිගෙණ සිටිතාවූ රතිඳුගොව්වන් විසින් ගැවසීගත්තාවූ රම්‍යවූ හීතණවනයෙන් යුක්තවූ භූමිප්‍රදේශයක් ඇති පරිණත ඵලයෙන් පිගුවත්වූ සියගණන් අරළු සමූහයෙන් ගැවසීගත්තාවූ නුගගසක් සමීපයට පැමිණියෙහිය. ඒ නුගගසමුල සිටියාවූ සෑඩියෙන් හා යශපරිවාරයෙන් දිලියෙන්තාවූ ආනුභාව ඇති නාගකන්‍යාවන් විසින් පිරිවරණලද මාගේ බෑයන්වහන්සේ තට ප්‍රකාශව පෙණුනුසේක. එකල්හි උන්වහන්සේ තා දැක තමන්වහන්සේගේ ආනුභාවයෙන් නාගභවනයට කැඳවාගෙණ ගොස් වස්තුකාම ක්ලේශකාමයෙන් පිණවා බොහෝ දවසක් උපස්ථාන කළසේක. එසේ උපකාරව සිටියාවූ මාගේ බෑයන් වහන්සේට තෝ නිස්කාරණයේ මිත්‍රද්‍රෝහිකම් කොළෙහිය, ඒ තා විසින් කරණලද්දාවූ මිත්‍රද්‍රෝහ සංඛ්‍යාතවූ පාපකර්මය දුත් මෙතනට පැමිණ සිටියේය, එසේ හෙයින් තාගේ දිවි නොගලවමි; වනාම කරදික්කොට ලව, බෑයන්වහන්සේට කළාවූ මිත්‍රද්‍රෝහය සිහිකරන්නාවූ මම තාගේ හිස දූත් මෙතැනදීම කපා හෙලමියි කීහ. එකල්හි වැදිබමුණා සිතන්නේ මේ සුභගයෝ ඒකාන්තයෙන් මාගේ දිවි නොතබති, එසේහෙයින් යම්කිසි උපායක් කියා මුත් අතින් ගැලවෙන්නට සුදුසුවන්නේයයි සිතා කාරණයක් කියන්නේ සුභගයෙනි! මේ ලොකයෙහි බ්‍රාහ්මණයෝ නම් ඍග්වෙදය, යජුර්වේදය, සාමවෙදයයි කියනලද වෙදත්‍රය හදාරා වෙදමන්ත්‍ර පිරවීමෙහි සමර්ථයහ, සියලු සත්ත්වයන් විසින් දෙනලද්දාවූ දානය පිළිගන්නට යොග්‍ය බැවින් දක්ෂිණාර්හීයහ. නිරන්තරයෙන් තිල තණ්ඩුලමුද්ගාදියෙන් හා ඝෘත සර්පිආදියෙන් ගිනි දෙවියාට පූජාකරන්නාහ. එසේහෙයින් මේ තුන්කාරණයෙන් බ්‍රාහ්මණයෝ නොමැරිය යුත්තෝය, තොප විසින් බමුණන් මරන්නට නොපිළිවන්නේය, තෙපි කුමක් කියව්ද? ඉදින් යමෙක් බමුණකු මැරුයේවීනම් ඒ තෙමේ නරකයෙහි ඉපිද මහදුක් අනුභව කරන්නේයයි කීහ. එබස් අසා සුභගයෝ සංසයට පැමිණ මොහු නාගභවනයට ගෙණගොස් මල්බෑයන්විචාරා මෝහට කළමනා කාර්‍යය දන්නෙම් වේදැයි සිතා නාගභවනය වර්ණනා කරන් මල් බෑයන් වසන තැන් කියන්නාහු ධෘතරාෂ්ට්‍ර නම් නාගරජ්ජුරුවන් වහන්සේගේ යම් පුරයෙක් යමුනා නම් ගංගාවෙන් යට පිහිටියේද? යමුනාවට නුදුරු තැන සිටියාවූ හිමාලය වනය පැහැර සර්වාකාරයෙන් සවර්ණමය සුයර්‍යාලෝකයක් මෙන් හැමකල්හිම බබලාද, ඒ නාගභවන යෙහි පුරුෂ ශ්‍රේෂ්ඨවූ මාගේ සහෝදරවූ මල්බෑයෝ වසන්නාහ. එහි වසන්නාවූ මල්බෑයෝ මා විසින් තා එනතට ගෙණගියකල යමක් කී නම් බමුණ! තට එදවස් උත් කීවක් වන්නේවේද, ඉදින් තා සැබෑවක් කීයෙහි වීනම් තාගේ දිවි ඇත ඉදින් තා බොරු කීයෙහි වීනම් එතැන්හිදීම තාගේ හිස කපමි. මෙසේ ඕහට කියා බොටුව අල්වා දම දමා ආක්‍රෙශ පරිභව බැණ භයගන්වමින් මහබෝසතානන් වසන්නාවූ මාලිගාදොරවට ගෙණගියහ.

එකල්හි දොරටුපාලව හුන්නාවූ කාණාරිට්ඨයෝ මෙසේ ආක්‍රොශ පරිභව බැණ බොටුව අල්වා අදිමින් ගෙණෙන්නාවූ ඒ බ්‍රාහ්මණයා දැක පෙරමඟට ගොස් සුභගයෙනි! නොමරව, බමුණෝ නම් මහා බ්‍රහ්මයාගේ

දරුවෝය, ඉදින් මහාබ්‍රහ්මයා දත්තේ වීනම් මාගේ දරුවන් මරන්නට කාරණා කවරේදැයි කියා අපගේ සියලු නාගභවනය නසාපියන්නේය, ලොක යෙහි බ්‍රාහ්මණයෝ තම් ශ්‍රේෂ්ඨය, මහත්වූ ආනුභාව ඇත්තාහ. මම ඒ බමුණන්ගේ ආනුභාව මහත්වය දනිමි කීහ. (ඒ කාරණාරිට්ඨයෝ නම් අනතුරුව භවයෙහි යාගකළාවූ බ්‍රාහ්මණයෙක, එසේ හෙයින්) මෙසේ කියා පළමු අතීත ජාතියෙහි තමා මිථ්‍යාදෘෂ්ටි කළාවූ යාගයෙහි එල්බ බමුණා උසස්කොට සිතා ඒ මහජනයාට යාගකරණ සුලුව සුභගයන් හා නාග පර්ෂදට ආමන්ත්‍රණය කොට මෙසේ එව, යාගකාරක බ්‍රාහ්මණයන්ගේ ගුණ නොප හැමට වර්ණනාකරමියි කියා යාගයෙහි ගුණ වර්ණනාකරන්නට පටන්ගෙණ මෙසේ කීහ, සුභගයෙනි! මේ ලොකයෙහි යාගයත් වෙදයත් ලාමක නොවන්නේය. මහානුභාවසම්පන්න වන්නේය. ඒ වෙදය හා යාගයද අලාමකවූ බ්‍රාහ්මණයන් හා එක්වූ බැවින් බ්‍රාහ්මණයෝත් ලාමක නොවෙති. මහානුභාව සම්පන්නයෝමය, එසේ නින්දා නොකටයුතුවූ මහානු භාවසම්පන්නවූ බමුණන්ට නින්දා කරන්නාවූ සත්ත්වතෙමේ තමාගේ සම්පත්තියත් සත්පුරුෂ ධර්මයත් පණ්ඩිතත්වයත් හැරපියන්නේ. එසේ හෙයින් බමුණන්ට අගෞරවකිරීම් කාර්යයෙක් නොවෙයි කීහ. මේ කාරණය කියන කාණාරිට්ඨයෝ මොහු විසින් භූරිදත්ත නම් නාරජ්ජුරුවන් විෂ යෙහි මිත්‍රද්‍රොහකරණලදැයි බමුණාට කිසිබසක් නොකියනු කැමැතිව නාග පර්ෂත් හා සුභගයන් අස්වසා කීහ,

ඉක්බිත්තෙන් කාණාරිට්ඨයෝ නැවතත් සුභගයන්ට කාරණා කියන්නාහු සුභගයෙනි! මේ ලොකය කවුරුන් විසින් මවනලද්දේදැයි තෙපි දනු දැයි විචාරා නොදනිමි කී කල්හි බ්‍රාහ්මණයන්ගේ මුත්තනුවන්වූ මහාබ්‍රහ්මයා විසින් මේ ලෝකය නිර්මිතකරණලදැයි කීහ. තවද මහා බ්‍රහ්මයා බමුණන් ආදීවූ චතුර්වර්ණයන් මවා ආර්යවූ බ්‍රාහ්මණයන්ට කියන්නේ තෙපි හැම වෙද මන්ත්‍ර හදාරව, අන්කිසිවක් නොකරවයි සමමත කෙළේය. රජදරුවන්ට කියන්නේ තෙපි හැම පොළොව ජයගෙණ පෘථිවියට අනුශාසනාකරව, අන් කිසිවක් නොකරවයි කීය. වෙළඳුන්ට කියන්නේ තෙපි හැම කෘෂිවණික් ආදියම කරවා අන් කිසිවක් නොකරවයි කීය, ශුද්‍රයන්ට කියන්නේ තෙපි හා ක්ෂත්‍රියාදීවූ තුන්පක්ෂයෙහි ඇත්තන්ට අත් පා මෙහෙවර කොට උපස්ථාන කරව, අන් කිසිවක් නොකරවයි විධාන කෙළේය එතැන් පටන් වෙත වෙතම තමන් තමන්ගේ කුලප්‍රදෙශයට සුදුසු පරිද්දෙන් මහා බ්‍රහ්මයා විසින් කියනලද ක්‍රමයෙන්ම උත්තමවූ බ්‍රාහ්මණයෝ වෙදමන්ත්‍රම හදාළහ, රජදරුවෝ පෘථිවීශ්වරව ප්‍රජාපරිපාලනය කොට පොළෝ ජයගත්හ. වෙළෙන්දෝ සී සෑමෙන් හා වෙළඳාම් කිරීමෙන් ජීවත්වූහ. ශුද්‍රයෝ රජ දරුවන් ආදීවූ තුන්පක්ෂයෙහි ඇත්තන්ට අත් පා මෙහෙවර කළහ. මෙසේ ඒ මහාබ්‍රහ්මයා විසින් ලොකනිර්මාණය කරන්නාවූ අවස්ථාවෙහි චතුර්වර්ණ යන් අතරෙන් බ්‍රාහ්මණයන් ශ්‍රෙෂ්ඨ කොට තබනලදැයි පූර්වාචාරීවරයෝ කියති. එසේ හෙයින් බමුණෝ නම් මහත් ගුණ ඇත්තාහ. යමෙක් මේ බමුණන් කෙරෙහි සිත පහදවා දන්දුන්නේ වීනම් අන්තැනක ඔහට ප්‍රති සන්ධි වශයෙන් ග්‍රහණයෙක් නැත්තේය. දිව්‍යලොකයටම යන්නේයයි කියා බ්‍රාහ්මණ දානයෙහි විපාකය කියන්නෝ සුභගයෙනි! ධෘතරාෂ්ට්‍ර නම් දිව්‍ය

රජ්ජුරුවෝද, වරුණ නම් දිව්‍ය රජ්ජුරුවෝද; කුවේර නම් දිව්‍යරජ්ජුරුවෝද සෝම නම් දිව්‍යරජ්ජුරුවෝද, සුමන නම් දිව්‍යරජ්ජුරුවෝද චන්ද්‍ර දිව්‍යපුත්‍රයෝද, සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයෝද යන මේ සියලු දිව්‍යරජදරුවෝ අනේක ප්‍රකාරවූ යාගකොට නැවත වේද මන්ත්‍ර හදාරන්නාවූ බ්‍රාහ්මණයන්ට සියලු වස්තුකාම ක්ලේශකාමයන්ද පිණවා මෙබඳුවූ දිව්‍යෛශ්වර්‍ය්‍යයට පැමිණියහ. තවද සුභගයෙනි! භයඞ්කරවූ සේනා ඇති ශක්තිසම්පන්නවූ සහස්‍රබාහු අර්ජුන නම් රජ්ජුරුවෝ පන්සියයක් දුනුවායන්ගේ අත් දහසකින් ඇදලිය යුතුවූ දුනු පන්සියයක බල ඇති දුන්න ඇදීමෙන් සහශ්‍රබාහු අර්ජුන රජ්ජුරුවෝයයි මෙනමින් ප්‍රසිද්ධව පොළෝතෙලෙහි අසදෘශ වූ වික්‍රමයෙන් යුක්තවූවාහු රාජ්‍යශ්‍රී අනුභව කළෝද? එසේවූ බාහුවික්‍රම ඇති සහශ්‍රබාහු අර්ජුන රජ්ජුරුවෝ පවා එසමයෙහි බමුණන් වස්තුකාම ක්ලේශකාමයෙන් පිනවා ගිනිදෙවියාට පූජාකොට බ්‍රාහ්මණ දුතයෙන් හා වහ්නිපාරිචර්‍ය්‍යායෙන් දිව්‍යලෝකයෙහි උපන්න. එසේ හෙයින් මේ ලොකයෙහි බ්‍රාහ්මණයෝ නම් සියල්ලවුන්ටම ශ්‍රෙෂ්ඨයෝයයි කීහ.

තවද ඒ කාණාරිට්ඨයෝ මත්තෙහිත් බ්‍රාහ්මණයන්ම වර්ණනාකොට කියන්නාහු සුභගයෙනි! යම් පුරාතන බරණැස් රජ්ජුරුකෙනෙක් තමන්ගේ ශක්තිවූ පරිද්දෙන් ආහාරපානවර්ගයෙන් ප්‍රසන්නවූ සිත්ඇතිව බ්‍රාහ්මණයන් අනුභව කරවූද, ඒ බරණැස් රජ්ජුරුවෝ බ්‍රාහ්මණදුතය අනුමෝදන්ව මහේශාක්‍යවූ දිව්‍යරාජත්ව උපන්න. මෙසේ ඒ බ්‍රාහ්මණයෝ නම් අග්‍ර දක්ෂිණාර්හ වන්නාහයි කියා නැවත සුභගයන්ට මත්තෙහිත් කාරණා ගෙණහැර දක්වා කියන්නාහු කාණාරිට්ඨයෝ සුභගයෙනි! යටගිය දවස බරණැස්නුවර මුවලින්ද නම් එක් රජ්ජුරුකෙනෙක් බමුණන් කැඳවා ගෙන්වාගෙණ ස්වර්ග මාර්ගය විචාළෝය. එකල්හි බමුණෝ ඒ රජ්ජුරුවන්ට කියන්නෝ රජ්ජුරුවන්වහන්ස! බමුණන්ටත් බ්‍රාහ්මණ දෙවතාවාතන්ටත් සත්කාරකළ මැනවැයි කියා බ්‍රාහ්මණදෙවතාවා නම් කවරෙක්දැයි කීකල්හි ගිනිදෙවියාය, ඒ වහ්නි දේවතාවාය අලුත් ගිතෙලින් පිණවූව මැනවැයි කීහ. එබස් අසා මුවලින්ද නම් රජ්ජුරුවෝ බ්‍රහ්මලෝක ප්‍රමාණවූ දරුසම්භාරයක්වූවත් දවා භස්මකරණ හෙයින් බොහෝ භක්ෂණය කරන්නාවූ ස්වර්ණවර්ණවූ ශොභා ඇති බැවින් අලාමකවූ ප්‍රභාඇති ගිනිදෙවියාට එළගිතෙලින් පිණවන්නට සමර්ථවූහ. මෙසේ ඒ රජ්ජුරුවෝ ගිනිදෙවියාට යාගවිධි සංඛ්‍යාතවූ පූජාකොට දිව්‍යලෝකයට ගියෝවේදැයි කීහ. තවද සුභගයෙනි, යටගියදවස ප්‍රදීප නම් එක් රජ්ජුරුකෙනෙක් පන්සියයක් අවුරුදු රාජ්‍යශ්‍රී අනුභව කොට බ්‍රාහ්මණයන්ට සත්කාරකොට අපරියන්තවූ රථසේනාව හැර පැවිදිවූය, එසේවූ දහසක් අවුරුදු ජීවත්වන්නට තිසි වූ මහානුභාව සම්පන්නවූ ආරොහපරිණාහයෙන් හා උතුම්වූ රූපශොභායෙන්ද ප්‍රමාණාතික්‍රාන්තවූ සේනාවාහනාදීය ඇති ඒ ප්‍රදීප නම් රජ්ජුරුවෝ පවා බමුණන්ට පූජාකොට ස්වර්ගලොකයට ගියෝයයි කීහ, නැවත අන්‍යවූ උදාහරණයක් ගෙණහැර දක්වා කියන්නාවූ කාණාරිට්ඨයෝ තවද සුභගයෙනි, යටගිය දවස සාගර නම් එක් රජ්ජුරුකෙනෙක් මහාසමුද්‍රය අවසන් කොට ඇති මුළු දඹදිව ජයගෙණ බමුණන් අතින් ස්වර්ගමාර්ගය විචාරා ස්වර්ණමයවූ යාගස්ථම්භයක් ඉඳුවූව මැනවැයි කී කල්හි පසුඝාතනය පිණිස

සුන්දරවූ සුවර්ණමයවූ මහත්වූ යාගස්ථම්භයක් ඉඳුව එහි මෘග පක්ෂි ආදීන් බැඳ ඔවුන් මරා පශුඝාතනය කොට ගිනිදෙවියාටත් පූජාකොට බ්‍රාහ්මණයන්ටත් පූජාකොට මහේශාක්‍යවූ එක්තරා දිව්‍යරාජයෙක්ව උපන්නේ වේදැයි කීහ.

තවද පින්වත්වූ සුභගයෙනි, පංචමහා ගංගාවත් සමුද්‍රයත් කවර කෙණෙකුන් විසින් කරණලද්දේවේදැයි තෙපිදනුදැයි විචාරා මම කවුරුන් කළ බවත් නොදනිමියි කීකල්හි තොප දන්නේ කුමක්ද? තොපදන්නේ බමුණන් මරනසේමවේද? අතීතයෙහි අඟු නම් වූ යටිපත්ලේ ලොම් ඇති බරණැස් රජ්ජුරුවෝ බමුණන් අතින් දිව්‍යලොකයට යන්නට මං විචාරා ඔවුන් විසින් හිමාලය වනයට වැද බමුණන්ට සත්කාරකොට ගිනිදෙවියාටත් පූජා කළ මැනවැයි කීකල්හි ප්‍රමාණාතික්‍රාන්තවූ ගෙරිම්මුන් ඇරගෙණ හිමාලය වනයට වැද බමුණන්ට සිවුපසයෙන් උපස්ථාන කිරීමෙන් සත්කාර කොට ගින්නෙහි එළගිතෙල් වත්කොට ගිනිදෙවියාට පූජාකොළේය. එකල්හි බමුණන් අනුභව කොට ඉතිරි කිරි හා දී කුමක්කටයුතුදැයි විචාළ කල්හි දමාපියවයි කීහ. ඒ කිරි දී දෙකින් මඳ මඳ කිරක් දැමූතන්හි සුළුගංගාවිය, බොහෝ කිරි දැමූ තන්හි මහා ගංගාවිය. ඒ කිරිගොස් යම්තැනෙක රැස්ව මිදී සිටියේවීනම් ඒ මහා සමුද්‍රය නම්විය. මෙසේ ඒ අඟු රජ්ජුරුවෝ මෙබඳුවූ සත්කාරකොට බමුණන් විසින් කියනලද ක්‍රමයෙන් ගිනිදෙවියාට පූජාකොට ත්‍රයත්‍රිංශත් දිව්‍යලෝකයට ගියේවේදැයි මෙසේ මේ අතීත කථාවත් ගෙණහැර දක්වා කීහ.

තවද පින්වත්වූ සුභගයෙනි, දූත් ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ සෙනාපතිවූ මහත්වූ සෘද්ධ්‍යානුභාව ඇති මහත්වූ යශපිරිවර ඇති යම් දිව්‍යපුත්‍රයෙක් ඇද්ද? ඒ දිව්‍යපුත්‍රයාත් පෙර බරණැස්නුවර රජව ඉපද බමුණන් අතින් ස්වර්ගමාර්ගය විචාරා ඔවුන් විසින් හොම යාගයෙන් තමන්ගේ පාපමල ප්‍රවාහය කොට දිව්‍යලෝකයට යවයි කීකල්හි බමුණන්ට මහත්වූ සත්කාර සම්මාන කොට ඔවුන් විසින් කියනලද විධියෙන් හොමයාග කොට ඒ හොමයාගයෙන් තමන්ගේ පාපමල ප්‍රවාහකොට ඒ බරණැස් රජ්ජුරුවෝත් දූත් මේ ත්‍රයත්‍රිංශත් දිව්‍යලොකයෙහි ශක්‍රදෙවෙන්ද්‍රයන්ට සෙනාපතිව උපන්නයි මේ අතීත කථාවත් ගෙණහැර දක්වා කීහ.

තවද සුභගයෙනි, යම් මේ මහාබ්‍රහ්මයෙකු විසින් මෙලොවත් පර ලොවත් භගීරතී නම්වූ ගංගාවත් හිමාලය පර්වතයත් ගිජ්ඣකූට පර්වතයත් කරණලදද ඒ මහාබ්‍රහ්මයාත් බ්‍රහ්මොත්පත්තියෙන් පූර්වභාගයෙහි යම් කාලෙක බ්‍රාහ්මණ මානවකව උපන්නේද? එසමයෙහි ගිනිදෙවියාට පූජා කෙළේය. ගිනිදෙවියාට පූජාකොට මහත් වූ සෘද්ධ්‍යානුභාව ඇති මහත් වූ යශපිරිවර ඇති බ්‍රහ්මව ඉපද මෙලොව පරලොව ආදීවූ සියල්ල කෙළේය. එසේහෙයින් මේ බමුණෝ නම් මහත්වූ මහිම ඇත්තාහුයයි මේ අතීත කථාවත් ගෙණහැර දක්වා කිවුය.

තවද සුභග නම් නාරජ්ජුරුවන්වහන්ස, යටගිය දවස බරණැස්නුවර එක් රජ්ජුරුකෙණෙක් බමුණන් අතින් දෙව්ලෝ යන්නට මා විචාරා බමුණන්ට සත්කාරසම්මාන කළමැනවැයි කී කල්හි බමුණන්ට මහදන්දෙන්නට පටන්ගෙණ මාගේ දනයෙහි කුමක් නැද්දැයි විචාරා දෙවයන්වහන්ස,

සියල්ලම ඇත. බමුණන්ට ඉදිනට අසුන් පමණක් නොසැහෙන්නේයයි කීකල්හි උළුත් බැඳ ආසනකරවූහ. එසමයෙහි උළුත් බඳනාලද ආසන පීඨිකාවෝ බමුණන්ගේ ආනුභාවයෙන් වැඩී හිමාලය පර්වතය, ගිජ්ඣකූට පර්වතය, සුදර්ශන පර්වතය, නිසභ පර්වතය, කාකනෙරු පර්වතය යනාදි අනෙකාකාරවූ පර්වතව ගියාහ, තවද මේ පර්වතවලින් අන්‍යවූත් මහත්වූද කුඩාවූද යම් පර්වත කෙණෙක් ඇත්තම් ඒ සියලු පර්වතයෝමත් බමුණන්ගේ ආනුභාවයෙන් පර්වතවූහ. එසේහෙයින් මේ සියලු පර්වතයෝම පෙර යාග කරන්නාවූ බමුණන් විසින් තමන්ට ආසනනිසා උළුත් බඳවා පසුව තමන්ගේ ආනුභාවයෙන් වඩා පර්වත කළහයි පුරාතන ආචාර්‍ය්‍යවරයෝ කියති කීහ.

තවද ඒ සුභග නම් නාරජ්ජුරුවන්ට කියන්නෝ බැයන්වහන්ස නුඹ වහන්සේ මේ සමුද්‍රය කවර කාරණයෙකින් සමුද්‍රයවේද? කවර කාරණ යෙකින් නොපියහැකි ලවන ජලය වීදැයි දන්නා සේක්දැයි විචාරා නොදනිම් අරිට්ඨයෙනි කීකල්හි ඉක්බිත්තෙන් ඒ සුභගයන්ට තෙපි බමුණන් මරන්න වම දනුව සමුද්‍රාදිය ඇතිවූ නියාව නොදනුව, තොප නොදන්නා බැවින් මාගෙන් අසවයි කියා සමුද්‍රොත්පත්තිය කියන්නාහු සුභගයෙනි! අනුන් වෙද මන්ත්‍ර හදාරන්නාවූ තමා විසිනුත් හැම වේලෙහිම වෙදමන්ත්‍ර පිරවීම කරන්නාවූ තපනිශ්‍රිතවූ බ්‍රාහ්මණයාට මේ ලොකයෙහි සත්ත්වයෝ යොගියයි කියති, එසේවූ බමුණෙක් එක්දවසක් පාපප්‍රවාහ කෙරෙමියි කියා ගොඩසිට සමුද්‍රයෙන් පැන් ඇරගෙණ තමාගේ ඇඟට දම දමා ජලස්නානය කරන්නේය. එකල්හි ඒ බමුණා මෙසේ ජලස්නානය කරන්නාහු මහ රැළෙක් අවුත් ගසා හෙළා සමුද්‍රයට ඇරගෙණ ගොස් මුහුදුබත් කෙළේය, ඒ කාරණය මහා බ්‍රහ්මයා අසා සමුද්‍රය විසින් මාගේ පුත්‍රවූ බ්‍රාහ්මණයා මරණ ලද්දේයයි සමුද්‍රයට කිපී සමුද්‍ර ජලය නොපියහැකි ලවණ රස වේවයි කියා සාපකෙළේය. ඒ කාරණයෙන් මේ සමුද්‍රය පැන් නොපිය හැකිව ලවණ රස විය, එසේ හෙයින් මේ බමුණෝ නම් මෙබඳු මහත්වූ ආනුභාව මහිමයෙන් යුක්ත යෝයයි කියා නැවතත් බමුණන් හා යාගය උතුම්කොට කියන්නාහු සුභග යෙනි! පෙර බමුණන්ට ශක්‍රභවනයට පැමිණියාවූ ශක්‍රදෙවේන්‍ද්‍රයන් වහන් සේට කුශලක්ෂෙත්‍රවූ අග්‍රදක්ෂිණෙය්‍යවූ බොහෝ බමුණෝ පොළෝතෙලෙහි විද්‍යමානයහ. දූනුත් බ්‍රාහ්මණයෝ පූර්වදක්ෂිණ පශ්චිම උත්තරයයි කියනලද සතරදික්හි විද්‍යමාන වන්නාහ, ඒ වාසව සංඛ්‍යාතවූ ශක්‍රදෙවෙන්‍ද්‍රයන්වහන් සේම මහත්වූ ප්‍රීති සොම්නස් එළවන්නාහුය, එසේහෙයින් හැම කල්හි බමුණෝ නම් අග්‍රපුද්ගලයෝයයි බමුණනුත් යාගයත් වර්ණනාකොට කීවුය.

ඒ කාණාරිට්ඨයන්ගේ සියලු කථා අසා මහබෝසතානන්ට ගිලානුප ස්ථානයට ආවාවූ බෝසතානෝ නාගයෝ ඇත්තක්ම කියන්නේයයි මිථ්‍යා දෘෂ්ටි ගත්තාවූ ආකාරයට පැමිණියාහුය, එකල්හි මහබෝසතානෝ ගිලාන සෙය්‍යායෙන් වැදහොත් තැනත්තෝ ඒ කාණාරිට්ඨයන්ගේ සියලු කථා ප්‍රවෘත්තිය ඇසූහ, නාගයෝත් ගොස් මහබෝසතානන්ට එපවත් දැන්වූහ,

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ සිතන්නෝ මේ කාණාරිට්ඨයෝ මිථ්‍යා මාර්ගය වර්ණනා කෙරෙති. එසේහෙයින් උන්ගේ වාදය බිඳ නාගපර්ෂත් සම්‍යක්දෘෂ්ටි කෙරෙමියි ඒ මහබෝසතාණෝ යහනින් නැඟීසිට සර්වාභරණයෙන් සැරසී ශක්‍රදෙවේන්ද්‍ර ලීලායෙන් ධර්මාසන මස්තකයෙහි වැඩහිඳ සියලු නාගපර්ෂත් රැස්කරවා කාණාරිට්ඨයනුත් සමීපයට කැඳවා අරිට්ඨයෙනි! තෙපි නැත්තක් කියා වෙදයත් යාගයත් බ්‍රාහ්මණයනුත් වර්ණනාකරව, බ්‍රාහ්මණයන්ගේ වෙදවිධියෙන් යාගකිරීම නම් අතිශ්ටයයි ලෝවැස්සන් විසින් දන්නාලදහ, ඉන් ස්වර්ගලොකොත්පත්තිය නොමවළවන්නීය, ඒ තොපගේ වාදය අභූත නියාව බලවුයි කියා යාගවාද හෙදයට පටන්ගත්තාවූ මහබෝසතාණෝ මෙසේ කීවාහුය, මල කාණාරිට්ඨයෙනි! වෙද මන්ත්‍ර හැදෑරීම නම් නුවණැත්තාවූ සත්වයන්ට පරාජය සංඛ්‍යාතවූ අකුශලග්‍රහණය වන්නේය. අඥතවූ සත්ත්වයන්ට ජයසංඛ්‍යාතවූ කුශලග්‍රහණය වන්නේය. මේ වෙදමන්ත්‍ර නම් මිරිඟු ජලයක් වැන්නේය මහ අව්වෙහි පෙණෙන්නාවූ මිරිඟු ජලය දක මෘගයෝ බොන්නට නිසිවූ ජලයෙකැයි යන සංඥවෙන් සමීපයට දිවෙති, මෘගයන් සමීපයට දිවූයේ අවිද්‍යමානවූ වස්තුව හෙයින් නැතිවන්නේය. එපරිද්දෙන් මෙම වෙද මන්ත්‍රයත් යථාස්වභාව පරීක්ෂා නොකළ බැවින් යුක්තා යුක්ති නොදන්නාවූ අඥත සත්ත්වයෝ භූතසංඥයෙන් නිරවද්‍ය සංඥයෙන් ඇත්තෙක, යහපතැයි සිතා හදුරන්නාහ, මෙබඳුවූ වෙදමන්ත්‍ර සංඛ්‍යාතවූ මායා කොට්ඨාසය නුවණැත්තාවූ පුරුෂයා වංචාකොට ගත නොහෙන්නේය, නුවණැති සත්ත්වයෝ මේ වෙද මන්ත්‍රය ඇත්තෙකැයි කියාවත් ඉෂ්ටයයි කියාවත් දිව්‍යලොකොත්පත්තියට මාර්ගයෙකැයි කියාවත් නොගණිති, එසේ හෙයින් සර්වාකාරයෙන්ම වෙද මන්ත්‍රය නම් අභිවෘධිකර වස්තුයෙක් නොවේයයි කියා මා කීවා අදහා ගණුවයි කීහ.

තවද අරිට්ඨයෙනි, තමහට වන අභිවෘධිකරන්නාවූ මිත්‍රද්‍රොහීවූ ඒ සත්ත්වයාහට පිහිටවන්ට අසමර්ථවන්නේය. කායදුශ්චරිත මනො දුශ්චරිත යයි කියනලද ත්‍රිවිධවූ දුශ්චරිතයෙන් සදොෂවූ සිත් ඇති පාපකාරීවූ පුරුෂයා යම්සේ වහ්නිය කෙතෙක් දවසක් පුරුදු කළත් මඳ ප්‍රමාදයකින්ම සත්ත්වයා දහනය කෙරේද, එපරිද්දෙන්ම වෙද මන්ත්‍රයත් කෙතෙක් දවසක් හදුරා පිරුවා වාචොද්ගතකොට සිත්හී තබා පුරුදු කළත් ඉෂ්ටපලදායක නොවී නරකාදීවූ සතර අපායට පමුණුවන හෙයින් සත්ත්වයා පුරුදු කළාවූ වහ්නීයම දහනය කරන්නාක්මෙන් වෙදමන්ත්‍රයත් පුරුදු කළාවූ සත්ත්වයා රැකගත නොහෙන්නේය. තවද දෙබලවූ දිවින් රස දන්මෙහි සමර්ථ බැවින් 'ද්විරසඥඥ' යන නම් ඇති අරිට්ඨයෙනි, ඉදින් මේ ලොකයෙහි උපභොග පරිභොග වස්තු හා මුක්තාමාණික්‍යාදීවූ දශවිධ රත්නයන් ඇති මනුෂ්‍යයෝ තමන්ගේ යම් පමණ සම්පත්තියෙක් ඇත්තම් එපමණවූ සම්පත් හා සමග දර හා ධන මිශ්‍ර කොට ඉදින් ගින්නෙහි ලා දැවූවාහු වීනම් මෙසේ බ්‍රහ්මලොක ප්‍රමාණවූ දරු සම්භාරය හා සමග ඒ සත්ත්වයන් විසින් දවනු පිණිස ගින්නෙහි ලනලද්දාවූ සියලු වස්තු සම්භාරය දවා භෂ්මකරන්නට සමර්ථවූ අසදෘශවූ තෙජස් ඇති ඒ වහ්නීය තෘප්තියකට නොපැමිණෙන්නේය. මෙසේ තෘප්තියට නොපැමිණිය නැක්කාවූ ඒ වහ්නිය ගිතෙල් ආදිය වත්කිරීමෙන් තෘප්තියට පමුණුවන්නට කවරෙක් සමර්ථවේද? මල අරිට්ඨයෙනි, මෙසේ අතෘප්තිකරවූ සියලු ලොව ඇති වසතු සාරයනාක් දවා භෂ්මකරන්නට සමර්ථ හෙයින් බහුභක්ෂණවූ ඒවහ්නියපිණවා

කවර නම් සත්ත්වයෙක් දිව්‍යලොකයට යේද? එසේ හෙයින් තෙපි කියන්නාවූ කථායෙහි දෙෂ බලව, තවද අරිට්ඨයෙනි! යම්සේ කිරි විපරීත සවභාවයට පැමිණෙන්නේ දී මිදී දෙවනුව වෙඬරු හැඟීමටත් පැමිණේද, එපරිද්දෙන්ම වහ්නියත් පෙරළෙන්නාවූ සවභාව ඇත්තේත් ගිනිදඬු සැරීමෙන් මෙරමාගේ උත්සාහයෙන්ම උපදුනේය, මෙසේ අනුන්ගේ උත්සාහ යෙන් උපන්නාවූ අචෙතනිකවූ වහ්නියට තෙපි ගිනි දෙවියායයි කියයි. මෙසේ හෙයින් තෙපි කියේ තැත්තෙක්ම වේද? තවද අරිට්ඨයෙනි! වියලි දඬුයෙහිත් අමුදඬුයෙ ඇතුළේ තුබූ වහ්නිය ගිනිදඬුගත් අත් ඇති පුරුෂයෙකු ගිනිදඬු සවා ගිනි හෙලූ කල්හි මුත් සාමාත්‍යයෙන් බැලූකල පිවිත් සත්ත්වයන්ට නො පෙණෙන්නේය. එසේ හෙයින් ගිනි කැමැත්තාවූ පුරුෂයාගේ ගිනිදඬු සැරීම් ආදීවූ ක්‍රියාවක් නැතිව තෙමේ තමාගේ සවභාවයෙන් ගිනි නූපදනේය. ඉදින් වහ්නිශ අමුදණ්ඩහි ඇතුළේ තිබේ නම් මේ ලොකයෙහි වනයේ හටගත්තාවූ සියලු වෘක්ෂලතා ආදීහු ඇතුළෙහි තුබූ ගින්නෙන් තැවී වියලෙන්නාහ. අමුව නොසිටීයාහ. ඉදින් වියලි වෘක්ෂලතාවෝ ඇත්තම් ඒ සියලු වෘක්ෂලතාවෝ ඇතුළෙහි තුබූ ගින්නෙන් දිලිහීද හස්ම වන්නාහ. තවද අරිට්ඨයෙනි! මේ ලොකයෙහි සත්ත්වයෙක් ප්‍රතාපවත්වූ ධූමසිඛායෙන් යුක්තවූ වහ්නි දෙවතාවා දර හා තණ ගින්තේලීමෙන් අනුභව කරන්නේ ඉදින් කුසල් කරන්නෝ වීනම් අගුරු බැලයෝත් ලුණු පැන් කකාරා ලුණුකරන්නාවූ ලුණුකරුවෝත් බත් පිසන්නාවූ අරක්කැමියෝත් මිනී දවන්නාවූ සොහොන් ගොව්වෝයයි කියන ලද සුඩුප්පුලිත් බොහෝසේ දර දවන සෙයින් කුසල් කරන්නාහුමය. එසේ නොවී ඉදින් අඟුරු බැල ආදීවූ සත්ත්වයෝ දර දැමීමෙන් කුසල් නොකෙරෙත් නම් මන්ත්‍ර හදුරන්නාවූ බ්‍රාහ්මණයෝත් ගිතෙල් තලතෙල් ආදිය හා උඳු මුන් තලකලන් ආදිය ගින්නෙහිලා දවා ගිනිදෙවියාට පූජාකිරීමෙන් කුසල් නොකරන්නාහුය. මේ ලොකයෙහි අවශෙෂවූත් යම්කිසි සත්ත්වකෙණෙක් ඇත්තම් ඒ සියල්ලෝම ධූම්සිඛාවක්කොට ඇති තෙජස්වීවූ ගිනිදෙවියා දර ආදිය ලා දැවීමෙන් පිණ වන්නාහු ඒකාන්තයෙන් කුසල් නොකෙරෙත්මය. තවද අරිට්ඨයෙනි! තොපගේ වාදයෙහි ලෝවැස්සන් විසින් පිදිය යුතුයයි කියනලද ගිනිදෙවියා අමනොඥවූ ගන්ධ ඇති බොහෝදෙනාට අප්‍රියවූ ප්‍රතික්කූල ජිගුප්සා කටයුතුවූ දුර්ගන්ධවූ අභිකුණපාදීවූ යම් යම් කුණපයක් දුර්ගන්ධ බැවින් සත්ත්වයෝ දුරින් දුරු කෙරෙද්ද? එසේවූ දුගඳ පිළිකුල් ගෙරිකුණු මිනීකුණු ආදීවූ සියලු කුණපය මල අරිට්ඨයෙනි! කෙසේ නම් තොප විසින් ප්‍රශංසා කරණ ලද ගිනිදෙවියා පිළිකුල් නැතිව අනුභව කෙරේද? මේ ලොකයෙහි සමහර සත්ත්ව කෙණෙක් වහ්නිය දෙවතාවන් අතරෙන් එක්තරා දෙවතාවෙකැයි කියති. නුවණැති මෙලෙච්ඡ ජාතීහු සමහර සත්ත්ව කෙණෙක් ජලය දෙවතාවෙකැයි කියති. මෙසේ කියන්නාවූ ඒ සියලු සත්ත්වයෝම නැත්තක් විනා ඇත්තක් නොකියති ගිනි දෙවියෙක් නොවන්නේය. මෙසේ අතීන්ද්‍රිය ප්‍රතිබඩවූ අචෙතනිකවූ සියලු ලොකවාසීවූ සත්ත්වයාට බත්පිසීම ආදීවූ කර්මාන්ත කරන්නාවූ ගිනි දෙවියාට පූජාකොට අකුශල් කරන්නාවූ සත්ත්වයෝ කෙසේ නම් සවර්ගී ලොකයට යෙද්ද? එසේ හෙයින් වහ්නි දේවතාවායයි කියන්නාවූ තොපගේ බස බසෙක්ම නොවන්නේය.

තවද අරිට්ඨයෙනි, මේ ලෝකයෙහි ජීවිකාර්පිවූ සමහර බමුණු කෙණෙක් මහාබ්‍රහ්මයා සියලු ලෝකවාසී සත්ත්වයන් මැවපවත්නේය. සියලු ලෝකය ඔහු විසින් මවනලදැයි කියති. තැවත එම මහාබ්‍රහ්මයා ගිනි දෙවියාට පූජාකරන්නේ වීනම් ඒ මහාබ්‍රහ්මයා සියල්ලවුන් මැවපවත්නේ වීනම් එසේ කල කුමක් නිසා තෙමේ ස්වයම්භුව සිට අනික් කෙණකුන් විසින් නිර්මාණය නොකරණ ලද්දේ තමා විසින්ම මවනලද ගිනිදෙවියාට නමස්කාර කෙරේද? ඉදින් වැන්දේ නමුත් නොවැන්දේ නම් වන්නේය, මෙයින් තොපකී නියාව යහපත් නොවන්නේය.

තවද අරිට්ඨයෙනි, බමුණන්ගේ බස්නම් සිතාවට යුතුවන්නේය. නුවණැත්තන්ගේ සිතට වදනා බසෙක් නොවන්නේය. සර්වාකාරයෙන් අසත්‍ය වන්නේය, ගිනිදෙවියාට පූජා කිරීමෙන් ස්වර්ගලෝකොත්පත්තිය නොවන්නේය, මෙබඳුවූ මෘෂාවාද නමන්ට ලාභ සත්කාර නිසා මේ බ්‍රාහ්මණයෝ පුරාතනයෙහි ලොව පැතිරවූහ. තැවත ඒ බ්‍රාහ්මණයෝ මෙපමණකිනුත් ලාභ සත්කාර නොලබන හෙයින් සත්ත්වයන් එක්කොට යොදා ප්‍රාණවධයෙන් යුක්තවූ තමන්ගේ ලබ්ධි ධර්ම සංඛ්‍යාතවූ ශාන්ති ධර්මය යාගශාස්ත්‍රයෙකැයි තමන්ගේ ස්වබුද්ධීන් උපදවා ගොතාගත්හ. එසේ හෙයින් ප්‍රාණවධකොට කරන්නාවූ යාගය නම් දිව්‍යලෝකොත්පත්තියට මං නොවන හෙයින් බමුණන්ගේ බස් අසා අසත්‍ය නියාව මේ කාරණයෙන් දතුව. තවද අරිට්ඨයෙනි, බ්‍රාහ්මණයෝ වෙදමන්ත්‍රය හැදෑරීමෙන් හා රජ දරුවෝ පොළොව ජයගැණීමෙන් හා වෙළඳහු කෘෂිවණික් ආදිය කිරීමෙන්ද, ශුද්‍රයෝ ක්‍ෂත්‍රියාදී චතුර්වර්ණයන්ට මෙහෙවර කිරීමෙන්ද, වෙන වෙනම තමන් තමන්ගේ කුලප්‍රදෙශයට සුදුසුවූ පරිද්දෙන් හා බ්‍රාහ්මයා විසින් කියනලද ක්‍රමයෙන් ඒ ඒ කාර්‍ය්‍ය කිරීමට පැමිණියාහුයයි බ්‍රාහ්මණයන් විසින් කියන ලද්දවූ මේ වචනය ඉදින් සත්‍යවීනම් එසේ කල්හි පළමුව රාජවංශයෙහි නූපන් පුරුෂයෙක් රාජ්‍යයන් නොලබන්නේය. පළමු බ්‍රාහ්මණ වංශයෙහි නූපන් පුරුෂයෙක් වෙදමන්ත්‍රන් නූගන්නේය. වෙළඳුන් හැර අන්‍යවූ සත්ත්වයෙක් ගොවිතැනුත් නොකරන්නේය. ශුද්‍රයෝත් හැම කල්හිම අනුන්ට මෙහෙවර කිරීමෙන් නොමිදෙන්නාහුය, යම්හෙයකින් බමුණන් විසින් කියන ලද්දවූ මේ වචනය අභූතද, අසත්‍යද, නරයක් නැද්ද එසේ හෙයින් මේ බඩගැතිවූ බමුණු කොල්ලෝ නැත්ත ඇතිකොට බොරුම කියන්නාහුය, නුවණ මඳවූ සත්වයෝ බමුණන්ගේ ඒ අසත්‍ය වචන සත්‍ය වචන වශයෙන් අදහා ගණිති, කාරණා කාරණා දන්නාවූ නුවණැති සත්ත්වයෝ බමුණන්ගේ අසත්‍ය වචනකැයි අදහා ගණිති. කාරණා කරණා දන්නාවූ නුවණැති සත්ත්වයෝ බමුණන්ගේ අභූත වචන සදොෂයයි තමන්ගේ නුවණැසින්ම දක්නාහ.

තවද මල අරිට්ඨයෙනි, රජදරුවෝ වෙළඳුන්ගෙන් කරවූවයයි කියනලද (බදු) අයපඬුරු ගන්නාහ. බ්‍රාහ්මණයෝ ආයුධගෙණ සේවාකම් කොට ඇවිදිනාහුය, එසේහෙයින් බ්‍රහ්මයා විසින් තබනලද මර්‍ය්‍යාදාව බිඳ ඇලලීවෙන්ට විරුඩයට පැමිණියාවූ මෙබඳුවූ ලොව තොපගේ ඒ බ්‍රහ්මයා

විසින් මවනලද ලොවෙක්වීනම් ඔහු තබාලූ ප්‍රමාණවෘත්තිය හැමදවස්ම තුබුව මනාවේද? බ්‍රහ්මනිර්මිතයක් නොවන හෙයින් ලොවමවන දෙයෙක් නොවෙයි කියා දැනගණුව තවද අරිට්ඨයෙනි, ඉදින් යම් සත්ත්වකෙණෙක් අන්‍ය සත්ත්වයක්හු මරා නිවන්දකින්නම් මරණලද්දවූ සත්ත්වයාත් ස්වර්ගලොකයෙහි උපදින්නම් බමුණෝම බමුණන් මරත්වා, යම් කෙණෙක් බමුණන්ගේ වචනය ඇත්තෙකැයි අදහාගණිත්නම් ඒ තමන්ගේ බස් අදහාගන්නාවූ උපස්ථායකයන්ම බමුණෝ මරත්වා, බමුණෝ වූකලී බමුණන් හා තමන්ගේ බස් අදහන උපස්ථායකයන් නොමරා අනෙකප්‍රකාරවූ තිරිසතුන් මරවති, එසේහෙයින් බමුණන්ගේ බස් බොරු නියාව මේ කාරණයෙනුත් දනුව, තවද අරිට්ඨයෙනි, ගෙරිමීවුන් හූරන් ආදීවූ සත්ත්වයන් අතරෙන් කිසි සත්ත්වකෙණෙක් අප මරාපියවයි මැරූකල්හි අපි හැම ස්වර්ගලොකයට යම්හයි මරන්නට යාච්ඤාකොට කියන්නාවූ කිසිම ප්‍රාණිකෙණෙක් නැත, එතකුදුවුවත් බ්‍රාහ්මණයෝ යාග විධියකැයි සලකාගෙණ ජීවත්වනු කැමැත්තාවූ මෘගපක්ෂි ආදීවූ මේ සත්ත්වයන් සල්ව සල්වා මරන්නාහ.

තවද ඒ අඥානවූ බ්‍රාහ්මණයෝ සත්ත්වයෙනි, මේ යාගස්ථම්භයෙහි ගව මහිෂාදීන් බැන්දහු වීනම්, මේ යාගාවාටයෙහි මුක්තාමාණික්‍ය ශංඛ ශිලා ප්‍රවාල මසාරගල්ල රජත සුවර්ණයයි කියනලද දශවිධ රත්නය හා සාලිව්‍රිහාදිවූ සප්තවිධ ධාන්‍යයලු නම් තොප හැමට පරලෙව්හිදී මේ යාගස්ථම්භයට කරණලද සත්කාරයෙන් කැමති කැමැති වස්තු සාධාදීලන්නේය. අජරාමර බවත් කරන්නේයයි විසිතුරුවූ කාරණයෙන් නොයෙක් දෑ කියා සත්ත්වයන් මිථ්‍යාදෘෂ්ටි ගන්වන්නාහ. ඉදින් යාගස්ථම්භයෙහිවත් අමුදණ්ඩෙහිවත් වියලි දණ්ඩෙහිවත් මුතු මැණික් රන්රිදී ධනධාන්‍ය ඇත්නම් යාගස්ථම්භය දිව්‍යලෝකයෙහිදී ඉශ්වර්‍ය ප්‍රසවය කෙරේනම් බ්‍රාහමණ සමූහයා වෙන් වෙන්ව ගෙණ තුමූ තුමූම යාගකරන්නාහ. වස්තුව නිසාත් ස්වර්ගලොකොත්පත්තිය නිසාත් බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණ ජාතියෙන් අන්‍යවූ සත්ත්වයන් ලවා යාග නොකර වන්නාහ. යම්හෙයකින් තමන්ට වස්තු කැමතිව අනුන් ලවා යාග කරවද්ද? එසේහෙයින් මේ බමුණෝ නම් අසත්‍යවාදී සත්ත්වකෙණෙකැයි මේ කාරණයෙනුත් දැනගණුව ඉදින් ඒ බ්‍රාහ්මණයා සියලු ලොකවාසීන්ට ඉසුරුවත් නායකව සිටියේවීනම් බොහෝවූ සත්ත්වාඛ්‍යවූ ප්‍රජාවට අධිපතිව ලොකනිර්මාණය කෙළේවීනම් සියලු ලොකවාසීවූ සත්ත්වයන්ට කුමක්නිසා දුක්කෙරේද? කුමක්නිසා සැපකෙරේද? බ්‍රහ්මයා විසින්ම ලොකනිර්මාණය කළ පසු ලෝවැස්සන්ට හැමකල්හිම සැප විඳුවනවා මිස දුක් නොකළමනාවේද? ලෝකයෙහි දුකත් සැපත් දෙකම ඇති හෙයින් බ්‍රහ්ම නිර්මිතයක් නොකළ නියාව මේ කාරණයෙනුත් දනුව. ඉදින් බ්‍රහ්මයාම ලොක නිර්මාණයකොට දුක්සැප දෙක ඇති කෙළේවීනම් තොපගේ බ්‍රහ්මයා හා සමානවූ ලොකය විනාශයකරන්නාවූ සොරෙකු නැතැයි කියම්හ.

තවද අරිට්ඨයෙනි, ඉදින් මහාබ්‍රහ්මයා සියලු ලොකයට ඉසුරුමත්වීනම් ප්‍රජානායකවීනම් ප්‍රාණඝාතය අදත්තාදාන කාමමිථ්‍යාචාරය මෘෂාවාදය සුරාපානය මායාසාඨෙය්‍යස්ථම්භ සාරම්භ ඊර්ෂ්‍යා මාත්සර්‍ය මක්ඛපලාස මානාතිමාන මදප්‍රමාදය යන මේ අධර්ම හා එක්කොට ලෝවැස්සන් කුමක්නිසා යෙදීද? ඉදින්

අරිට්ඨයෙනි, මහාබ්‍රහ්මයා තෙමේ මේ ලොව ඇතිකෙළේතම් සියලු සත්ත්වයෝ බ්‍රහ්මයා නිසා ඇතිවූතම් ඒ බ්‍රහ්මයා දශකුශල ධර්මය ඇතිව තිබෙද්දී දශඅකුශල ධර්මයකුත් ඇතිකෙළේය. එසේහෙයින් ඔහු අධර්මිෂ්ඨයයි කියම්හ, තවද අරිට්ඨයෙනි. පණු පළඟැටියන් හා නයින් මඩුවන් හා මැසිමදුරුවන් ආදිවූ ක්ෂුද්‍රප්‍රාණීන් මරා ලොකයෙහි සත්ත්වයෝ පිරිසිදුවෙති, තිවන් දකිති කියා මෙසේ කියන්නාවූ අනාර්‍ය්‍ය ස්වරූපඇති මේ ධර්මයෝ කාම්බොජ රාජවාසීවූ සත්ත්වයනුත් තොපගේ බ්‍රහ්මයා මැව්වයි සිතම් කීහ.

මෙසේ මහබෝසතාණෝ කාණාරිට්ඨයන්ට වෙදමන්ත්‍රාදිය ඇත්තක් නොවන නියාව නොයෙක් පරිද්දෙන් කියා නැවතත් ප්‍රාණඝාතය කොට ස්වර්ග ලොකොත්පත්තිය වේ නම් මනුවනයෙහි වියලිදණ්ඩෙහිවත් අමු දණ්ඩෙහිවත් මුතු මැණික් රන්රිදී ධනධාන්‍යාදිය කොයින් ඇතිවේද? මෙසේ වස්තුව තමා අවිද්‍යමානකල දිව්‍යලොකයෙහිදී කැමති කැමැති වස්තු සාධාදිලන්නටත් අජරාමර කරන්නටත් යාගසම්භය කෙසේ සමර්ථවේද? එසේ හෙයින් බමුණන්ගේ බස් නම් සර්වප්‍රකාරයෙන්ම අසත්‍යවන්නේය. තවද අරිට්ඨයෙනි, මේ බමුණෝ නම් කෛරාටිකයහ, වඤ්චාගුණ ඇත්තාහ, නිෂ්කාරුණිකයහ, එබඳු වූ ගුණ ඇති ඒ බමුණෝ අඥානවූ ලෝවැස්සන් වඤ්චාකොට පෙළඹවාගෙණ සත්ත්ව යෙනි, තෙපි ගිනිහැරගෙණ ගිනිදෙවියාටත් පූජාකරව්, අපටත් වස්තුදෙව් මෙසේ කරණලද වන්නිහෝමයෙන් හා සම්පත්ති දානයෙන් සියලු වස්තුකාම ක්ලෙශ කාමයන් ලැබ සුඛිතමුදිතවන්නේයයි මෙසේ අනෙකප්‍රකාරවූ විසිතුරු කාරණ යෙන් නොයෙක්ද කියා සත්ත්වයන් මිථ්‍යාදෘෂ්ටි ගන් වන්නාහ.

තවද අරිට්ඨයෙනි, මේ බ්‍රාහ්මණයෝ රජ යුවරජ මහ ඇමතියන් ගෙණ ගිනිහල්ගෙට වැද ඒ යාගශාලායෙහිදී රජරජ මහාමාත්‍යාදීන්ට විසිතුරුවූ කාරණා කියා ඔවුන්ගේ කෙස් හා දැළිරැවුල් හා අත්නියන් කපා වෙදමන්ත්‍රය නිසා මේ මේ දෑ කටයුතුයයි කියන්නාහු වෙදයෙන් ඒ රජරජ මහාමාත්‍යාදීන් සන්තක ධනය නොයෙක් පරිද්දෙන් නසන්නාහුය. තවද අරිට්ඨයෙනි, ඒ බ්‍රාහ්මණයෝ කපුටු සමූහයා විසින් තනිතැනකදී වටලාගත් බකමූහුණකු මෙන් බොහෝදෙන එක්ව එක් ප්‍රධාන පුරුෂයකු වටලාගෙණ අනෙකප්‍රකාරවූ කුහක කම්කොට යාගවර්ණනා කිරීමෙන් වඤ්චාකොට ඔහු සන්තකවූ අනෙකප්‍රකාරවූ උතුම්වූ රසමසවුලෙන් යුක්තවූ භොජනය අනුභවකොට ඉක්බිත්තෙන් ඔහු ඉසකේ කපා මුඩුකොට ගිනිහල්ගෙයින් පිටත්කොට යාගාවාටයට ගෙණයන්නාහ. මෙසේ ඒ ප්‍රධාන පුරුෂයා බොහෝ ඒ ඒ වස්තුව හා එක්කොටගෙණ යොදා නොයෙක් කාරණාකියා ඔහු සන්තක විද්‍යමානවූ ධනය පැහැරගෙණ ඔහු පළමු නුදුටු දිව්‍යලොකය වර්ණනාකොට ගිනිදෙවියාට පූජාකිරීමෙන් හා යාග කිරීමෙන් මෙබඳුවූ දිව්‍යලොකයෙහි ඉපිද අජරාමරවෙති කියා ඔහුගේ සිත සතුටු කරන්නාහ. තවද අරිට්ඨයෙනි, මේ බ්‍රාහ්මණයෝ රජරුවන් විසින් මෙතෙක් මෙතෙක් අයපඬුරු ගණුවයි නියොගකරණලද රාජපුරුෂයන් මෙන්

යාගකරන්නාවූ පුරුෂයන් මෙන් යාගකරන්නාවූ පුරුෂයා සන්තක වස්තුව නොයෙක් කාරණා කියා යාගපිටම ලා පැහැර ගන්නාහ, එසේහෙයින් මේ බමුණෝ තම් නොබඳ කරවූ වරගත්තාවූ රාජපුරුෂයන් හා උමං බිඳීම් මංපැහැරීම් ආදිවූ සොරකම් කොට ජීවත්වන්නාවූ සොරුන් හා සමානයහ. නොකලම්නා කාර්‍ය්‍යය කරණ හෙයින් වධයට නිසියහ, යාගකරන්නවුන් සන්තක වස්තුව නොයෙක් පරිද්දෙන් පැහැරගෙණ යාගකොට ඒ සත්ත්වයන් දිව්‍යලොකයට නොපමුණුවා නරකාදීවූ සතර අපායට පමුණුවන හෙයින් අසත්පුරුෂයහ, එසේහෙයින් මල අරිට්ඨයෙනි, මේ ලොකයෙහි මෙබඳුවූ අසත්පුරුෂ ගුණ ඇති පවිටුවූ සොර බමුණන් නොමරණකල මරන්නේ කවුරුද?

තවද අරිට්ඨයෙනි, බමුණන් කියන්නාවූ මේ බොරුවකුත් අසා බලව ඒ බ්‍රාහ්මණයෝ යාගස්ථානයෙහි මහත්වූ කැලලීයක් ඉඳුවා මේ තෙමේ ශක්‍ර දෙවෙන්ද්‍රයන්ගේ දක්ෂිණ බාහුයයි කියා ඒ කැලලිය කපා පොලූගසන්නාහ, ඉදින් කැලලිය කැපීමෙන් ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ අත කැපී යන්නේය. යත මේ බමුණන්ගේ වචනය සත්‍ය වීනම් ශක්‍රදෙවෙන්ද්‍රයා අත කොටවූ තැනැත්තෝ බාහු බලයෙන් අසුරයන් හා යුඞකොට කෙසේ නම් සටනෙන් ජයගත්තුද? එසේහෙයින් බමුණන්ගේ බස් බොරු නියාව සිතව, තවද ඒ ශක්‍රදෙවෙන්ද්‍රයෝ නුසුන්නාවූ බාහු ඇත්තාහ, අන්‍ය සත්ත්වයන් විසින් නසාලිය නොහැක්කාහ. මහත්වූ උත්කෘෂ්ටවූ කුශලානුභාවයෙන් යුක්තයහ. එසේහෙයින් බමුණන්ගේ මේ වෙදමන්ත්‍රයෝ තම් ලොකයෙහි දෘෂ්ට ප්‍රත්‍යක්ෂවූ වඤ්චා කොට්ඨාශයෝ වන්නාහ. ඒ තුච්ඡවූ වෙදමන්ත්‍රයන් හා යුක්තවූ බමුණෝත් නිෂ්ඵලවූ වචන ඇත්තාහුය.

තවද අරිට්ඨයෙනි, කාලගිරි පර්‍වතය, හිමාලය පර්‍වතය, ගිජ්ඣකූට පර්‍වතය, සුශීත පර්‍වතය, නිසභ පර්‍වතය, කාකනෙරු පර්‍වතය යන මේ පර්‍වතයෝත් අන්‍යවූ මහා පර්‍වතයෝත් යාගකරන්නාවූ බමුණන් විසින් ආසන වශයෙන් බඳවනලද පර්‍වතයෝයයි යම් මේ වචනයක් කියව් නම් අප විසින් දක්නාලද මේ පර්‍වතයෝ නිශ්චලයහ, එකඝනයහ, ශෛලමය, උළින් බඳනාලද ආසන සඞ්ඛ්‍යාතවූ පර්‍වතයෝ චලිතයෝය, එකඝන නොවෙති, ශෛලමය නොවෙති. එසේහෙයින් උළින්බඳනාලද ආසනයෝ කල්යාමකින් පර්‍වතයෝ වන්නාහ, අයලොහ තාම්‍රලොහ, කන්සලොහ බට්ටලොහ හා රකුට ලොහත් නොවන්නාහ. යාග කාරක බ්‍රාහ්මණයෝ යාග වර්ණනා කරන්නාහු බරණැස් රජ්ජුරුවන් යාගකාරක බ්‍රාහ්මණයන් ඉදිනා ඉදිනා පිණ්ඩ උළින් බඳවනලද අසුන් බ්‍රාහ්මණයන්ගේ ආනුභාව යෙන් ක්‍රමයෙන් වැඩී පර්‍වතව ගියෝයයි කීහ. තවද වෙදමන්ත්‍ර හදරන්නාවූ තපශ්‍රීතවූ යාචකයෝගීවූ මන්ත්‍රයෙන් යුක්තවූ බ්‍රාහ්මණයා සමුද්‍රතීරයෙහි සිට ඇඟට පැන් දම දමා නානා තැනැත්තවුන් සමුද්‍රයෙන් රැළ අවුත් ගසාගෙණ ගොස් මුහුදුබත් කෙළේයයි එබස් අසා මහාබ්‍රහ්මයා කිපී මගේ දරුවන් මේ සමුද්‍රයෙන් නස්නට කාරණා කවරේද? එසේහෙයින් මේ සමුද්‍රජලය අන්‍ය සත්ත්වයන්ට නිෂ්ප්‍රයෝජනව ලවණරස වේවයි කියා සාපකෙළේයයි බමුණන් කියන්නාවූ මේ වචනය ඉදින් සත්‍යවීනම් සම්පූර්ණකොට උගන්නාලද වෙද මන්ත්‍ර ඇති බමුණාන් දහසක් දෙනා මන්ත්‍ර පිරුවමින් සිටියවුන් ගංගාජලය

ඇදගෙණ ගොස් තසාපිය. ඒ බ්‍රාහ්මණයන් දහසක්දෙනා කරකවා යටගලා ජීවිතක්‍ෂයට පමුණුවන්නට සමර්‍ථවූ ගඞ්ගාජලය ලවණරස නුවූයේ කුමක් නිසාද? එකබමුණකු නසාපුහෙයින් සමුද්‍රජලය ලවණරසවූයේ කුමක්නිසාද? කිමෙක්ද? තොපගේ මහා බ්‍රහ්මයා ගඞ්ගායෙහි ජලය ලවණරසකොට ගන්නට අසමර්‍ථද? සමුද්‍රජලයම ලවණරස කොට ගන්නට සමර්‍ථද? එසේ හෙයින් බමුණන්ගේ බසෙහි පූර්‍වාපර සන්ධියෙක්වත් නැති නියාව මින්ම දතුව.

තවද මනුෂ්‍යලොකයෙහි ලිං පොකුණු කනන්නාවූ මනුෂ්‍යයෝ තමන්ට කුසල් නිසා බොහෝසේ ඒ ඒ තැන ලිං පොකුණු කනති. ඒ ලිං පොකුණු ආදියෙහි බමුණෝ වැටී බොහෝසේ මියන්නාහ, එසේහෙයින් කල ලිං පොකුණු ආදියෙහි ජලයෝත් ලවණරස වුවමනා නොවේද? තවද අරිට්ඨයෙනි, ප්‍රථම කල්පයෙහි කවුරු කවුරුන්ට භාර්‍යාතම් වෙත්ද? එසමයෙහි ස්ත්‍රීලිඞ්ග නැත්තේය. පසුව වයංවය සමාපත්ති වශයෙන් දෙමවුපියෝ තම්වූහ. එසමයෙහි සත්ත්වයෝ මනොමයව උපන්නාහ. චිත්තයම මනුෂ්‍යයා ඉපදවිය යන මේ කාරණයෙනුත් ජාතියෙන් යටත්වූ කිසිවෙක් තම් නැත්තේය, එසමයෙහි ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදිවූ චාතුර්‍වර්‍ණ විභාගයකුත් නැත්තේය. එසේහෙයින් බ්‍රාහ්මණයෝම ජාතියෙන් ශ්‍රෙෂ්ඨයෝය, අවශෙෂයෝ ජාතියෙන් හීනයෝයයි යම් බසක් බමුණෝ කියත් තම් ඒ බස අභූතවන්නේය.

මෙසේ ක්‍ෂත්‍රියාදී විභාගයක් නැතිව පවත්වන්නාවූ මේ ලොකයෙහි පුරාතන ප්‍රවෘත්ති හැර පසුව තමන් විසින් සිතූ සිතූ ලෙස කරණලද ක්‍රියාවන්ගේ වශයෙන් ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණයෙක් තම් ලොකයෙහි සර්‍වාකාර යෙන් නැත්තේය. එසේහෙයින් සියලු බමුණෝ සිංහ ව්‍යාඝ්‍රාදිවූ තිරශ්චීන යන්ටත් වඩා හීනයෝය, මේ බමුණන්ගේ මනුෂ්‍යත්වය තම් ගවමහිෂාදීන් මෙන් දතයුත්තේය. කුමක් නිසාද? ඒ බමුණන් නුවණ නැති බැවින් ගෙරින්ගේ සටහන් අනිකෙක, බමුණන්ගේ අනිකෙකැයි ගෙරින් හා සමානය, ජාතිය සමනොවන්නේය, ප්‍රඥයෙන් ශෞර්‍ය්‍යවීර්‍ය්‍යයෙන් පුරුෂත්‍වයක් නැති බැවින් මනුෂ්‍යයන් තබා තිරශ්චීනවූ සිංහාදීන්වත් යටත්ව සිටි හෙයින් බමුණෝ තම් ගෙරින් හා සමානයෝමය.

තවද අරිට්ඨයෙනි, ඉදින් මහාබ්‍රහ්මයා දුන් බැවින් රජදරුවෝම මුළු පොළොව ජයගෙණ තමන් හා එක්ව ජීවත්වන්නාවූ අමාත්‍යයන්ගෙන් යුත්තයෝ තම් තමන් කීවා කරන්නාවූ පක්‍ෂීන් ඇත්තෝවීනම් එසේ කල්හි රජ්ජුරුවන්ට පක්‍ෂීන් හා සමඟ යුධකොට රාජ්‍යය දියයුතු තම් නොවෙයි, රජ්ජුරුවෝ තුමූ උදකලාවම සතුරු සමූහයා ජයගන්නාහුය. එසේ කල්හි යුධයෙන් දුක් නැති බැවින් ඒ රජ්ජුරුවන්ගේ ප්‍රජාව නිරන්තරයෙන් සැප විඳිනාහ. යම් හෙයකින් රජ්ජුරුවෝ උදකලාවම සතුරන් ජයගණිති, උන්ගේ ප්‍රජාව යුධ නොකොට නිරන්තරෙන් සැප විඳිති යන්නෙක් නැද්ද? එසේහෙයිනුත් බමුණන්ගේ බස් අභූතවන්නේය. තවද අරිට්ඨයෙනි, රාජනීතිය හා වෙද මන්ත්‍රය තමන්ගේ අඥනයෙන් හා අභිප්‍රාය පරිද්දෙන් මෙම කටයුතුයයි රජදරුවන් හා බමුණන් විසින් පවත්වනලද බැවින් අර්‍ථයෙන් මේ දෙකම සමවන්නේය, රාජ

නීතියෙහි අර්ථ රජදරුවෝත් වෙදමන්ත්‍රයෙහි අර්ථ බමුණෝත් නිශ්චය කොට ගතනොහී ආඥා වශයෙන්ම ගන්නාහු විප්‍රකාරවූ අර්ථයමචතුදු ක්‍ෂත්‍රිය ආදීවූ චතුර්වර්ණයෝවූහ. තමන්තමන් විසින් කරණලද ක්‍රියා විභාගයෙන්ම ඒ ඒ සත්ත්ව අතරෙන් සමහර කෙණෙක් ක්‍ෂත්‍රියවූහ. සමහර කෙණෙක් බ්‍රාහ්මණවූහ. සමහර කෙණෙක් වෛශ්‍යවූහ, සමහර කෙණෙක් ශුද්‍රවූහයි මේ විභාගය නුවණැත්තෝ කියති. එසේහෙයින් බ්‍රාහ්මණයෝම ශ්‍රෙෂ්ඨයෝයයි යන මේ වචනය අසත්‍ය වන්නේය.

තවද අරිට්ඨයෙනි, ඉදින් මහාබ්‍රහ්මයා විසින් බ්‍රාහ්මණයන්ටම වෙදමන් ත්‍රය දෙනලද්දේ විතම් සෙස්සත්ට නොදෙන ලද්දේවිනම් චණ්ඩාලපුත්‍රවූ මන්ත්‍ර පිරුවන තැනැත්තවුන්ගේ ඉස සත්කඩක්ව නොපැලෙන්නේ ඇයිද? යම්හෙයකින් ඔහුගේ හිස නොපැලේද? එසේහෙයින් මේ බමුණන් විසින් ආත්මවධය පිණිස මන්ත්‍ර කරණලද්දේය, ඒ පුරාතන බමුණන්ගේ මුසාවාදී බව ප්‍රකාශ නොකරන්නාහු තමන්ගේම ගුණ විනාශකරන්නෝ නම් වෙති. තවද මේ වෙදමන්ත්‍ර නම් මුසාවාදයෙන්ම සිතා කරණලද්දේය. ලාභයෙහි ගිජුවූ බ්‍රාහ්මණයන් විද්‍යමාන වස්තුයෙකැයි උගන්නාලද්දාවූ වෙදමන්ත්‍රය මසකු ගිලූ බිලියක්මෙන් ගලවාලිය නොහැක්කේය, කාව්‍යකාරක බ්‍රාහ්මණයෝ යමක් කියනු කැමැත්තෝ වීනම් ඒ දෙය බොරුයෙන් ගොතා බඳනාහ, එසේහෙයින් කාව්‍යකාරක බ්‍රාහ්මණයන්ගේ බස් අනුවයන්නේ ඒ අඥානයන්ගේ විපරීතග්‍රහණයෙහි පිහිටි හෙයින් අඥානවූ සත්ත්වයෝ තමන් නුවණමඳ හෙයින් ඒ වෙදමන්ත්‍රය ඇත්තෙකැයි අදහාගන්නාහ, තවද අරිට්ඨයෙනි, සිංහයන් ව්‍යාඝ්‍රයන් දිවියන් ආදීවූ ශක්තිසම්පන්න සත්ත්වයන්ගේ යම් පුරුෂත්වයෙක් ඇත්තම් ඒ පුරුෂත්වය බමුණන්ට නැත්තේය. ශක්තියෙන් යුක්ත ගැල් හිමෙන් සැඟවී නොපෙණෙන්නාවූ මාර්ගයක් මෙන් දුතගත නොහෙන්නාහ.

තවද අරිට්ඨයෙනි, රාජනීතිත් වෙදමන්ත්‍රත් ශබ්දාර්ථ හෙයින් සමාන වන්නේය. කුමක්නිසාද? බ්‍රාහ්මණයෝම ශ්‍රෙෂ්ඨයෝය, අන්‍යවූ ක්‍ෂත්‍රියාදීවූවන් හීනයෝයයි බමුණෝ කියන්නාහ. එසේහෙයින් ලාභය, අලාභය, අයශය යශසය, නින්දාය, ප්‍රශංසාය, සුඛය, දුඛය යන මේ අෂ්ටලොකධර්මය ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදීවූ චතුර්වර්ණයන්ගේ ස්වභාවධර්මයෙක අෂ්ටලොකධර්මයෙන් විනිර්මුක්තවූ එකද සත්ත්වයෙක් නම නැත්තේය. එසේහෙයින් බ්‍රාහ්මණයෝ සර්වසාධාරණවූ ලොකධර්මයෙන් නොමිදී සිට අපි හැම ශ්‍රෙෂ්ඨයම්හයි නැත්තක් කියන්නාහ. තවද අරිට්ඨයෙනි, මේ මනුෂ්‍ය ලොකයෙහි බොහෝ ශුද්‍රයෝ ධන ධාන්‍යාදීය නිසා අනෙකප්‍රකාරවූ කර්මාන්තයන් කෙරෙද්ද? එපරිද්දෙන්ම පොළෝ තෙලෙහි බොහෝ බ්‍රාහ්මණයොත් කෘෂි ගෝරක්‍ෂණාදීවූ කර්මාන්ත බොහෝසේ කරන්නාහ. එසේහෙයින් මේ බ්‍රාහ්මණයෝ ගොවීන් හා සමවන්නාහ. තවද නිරන්තරයෙන් කර්මාන්ත කිරීමෙහි උත්සාහවත්ව පඤ්චකාම කොට්ඨාශයෙන් යුක්ත වූවාහ, පොළෝතෙලෙහි විද්‍යමානවූ කෘෂිගොරක්‍ෂණාදීවූ සියලු කර්මාන්ත කරන්නාහුද, එසේහෙයින් මල අරිට්ඨයෙනි, ඒ අඥානවූ අන්ධවූ මොහවූ බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණ ධර්මයෙන් දුරින් දුරුවන්නාහ. පුරාතනවූ බ්‍රාහ්මණධර්මය දුන් සුතබ

යන් කෙරෙහි පෙනෙන්නේය, (යනාදීන් අභිධර්‍මපණ්ඩකයෙහි කියනලද ක්‍රම යෙන්ම දතයුතුවෙයි,) මෙසේ මහබෝසතාණෝ ඒ කාණාරිට්ඨයන්ගේ මිථ්‍යා වාදයන් බිඳ තමන්ගේ වාදයෙහි පිහිටුවූහ. ඒ මහබෝසතාණන්ගේ ධර්‍මකථා අසා නාගපර්‍ෂත් සොම්නසට පැමිණියාහ. මහබෝසතාණෝ තෙසාද බ්‍රාහ්මණ යාට ආක්‍රොශ පරිභව පමණකුත් කළතොදී නාගභවනයෙන් පිටත්කොට මනුෂ්‍ය ලොකයෙහි ලැවූහ.

සාගර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් පළමු තමන් නියමකළ දවස් නොයික් මවා හස්ති අශ්ව රථ පාබල සංඛ්‍යාතවූ චතුරංගිණී සෙනාවෙන් පිරිවරණ ලදුව තපස්වීව සිටි පිය රජ්ජුරුවන් සමීපයටගියහ. මහබෝසතාණෝ මයිලනුවන් හා මූත්තනුවන් දක්නට යෙමියි නාගභවනයෙහි බෙරහසුරුවා මහත්වූ ශ්‍රී සෞන්දර්‍යයෙන් යමුනා නම්වූ ගඞ්ගායෙන් උඩතැගී ඒ රාජ තපස්වීන්ගේ පන් සලට නික්මුණාහුය. ඒ බොධිසත්ත්වයන්ගේ අවශෙෂවූ මල්බෑයන් හා දෙමවු පියෝත් බොධිසත්ත්වයන් පසුපස්සේ නික්මුණාහ.

තවද සාගර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මහබෝසතාණන් බොහෝ පර්‍ෂත් පිරිවරා මහත්වූ ශ්‍රී විභූතීන් හා උතුම්වූ රූපශොභායෙන් යුක්තව එන තැනැත්තවුන් ඇඳිනගත නොහී පිය රජ්ජුරුවන් අතින් විචාරන්නාහු මෙසේ විචාළහ. රාජතපස්වීන් වහන්ස, මහබෙර, පණාබෙර, මිරිඟුබෙර, ගැටබෙර, පවහබෙර, හා සක්සින්නම් ආදීවූ හෙරිතූර්‍යනාද භාණ්ඩයන් ගසමින් පිඹිමින් රාජොත්ත මවූ ඒ රජ්ජුරුවන් සතුටුකරවමින් ගානා පිඹිනා අය ඉදිරියේ නික්මුණාහ. මොවුහු කවුරුන්ගේ ගසන්නෝද? පිඹිනනෝද? තවද තපස්වීන් වහන්ස, නලල් කෙළවර බඳනාලද නලල්පටියෙන් මෙසමුඛය බබලන්නාවූ විදුලියක් මෙන් මුඛය බබලවන්නේය. එබඳුවූ මුඛය කාගේ මුඛයෙක්ද? හියවුරු බැඳ දුන්න හා හීදඬු අතටගෙණ කඩුව උරයේ එල්ලා යුඬසන්නඬවූ තරුණ පුරුෂ යකු මෙන් මහත්වූ ශ්‍රී විභූතීන් බබලමින් එන්නාහ, මෙබඳුවූ පින්වත් මහිම ගුණයෙන් යුක්තවූ මූ කවුරුද? උදුනෙහි ලා කකියවනලද චාමීකර සවර්‍ණයක් වැනිවූද? ඇවිලෙන්නාවූ කිහිරඟුරු රැසක් වැනිවූද ප්‍රභාසහිතවූ මුඛය ලහිරු මඬලක් මෙන් බබලන්නේය. මෙබඳුවූ රූපශ්‍රීන් දිලියෙමින් එන්නාවූ මූ කෙබඳු කෙණෙක්ද? තවද තපස්වීන් වහන්ස, සිත්කළුවූ කුඩා ගොතැසින් යුක්ත කොට සරහනලද ජාම්බොනද සවර්‍ණමයවූ මේ ධවලාතපත්‍රය කාගේද? මෙබඳුවූ ධවලාතපත්‍රයෙන් සූර්‍යරශ්මීන් වළක්කමින් මහත්වූ ශ්‍රී විභූතියෙන් දිලියෙමින් එන්නාවූ මූ කවුරුද? තවද තපස්වීන්වහන්ස, ඇතයෙහි රන්මිට් හිඳුවාගෙණ උතුම්වූ වල්විදුනාවන් ගෙණ තෙල එන්නාවූ උත්තම පුරුෂයාගේ මස්තකයට අතවරනයෙන් සලන්නාහ, මෙබඳු චාමර සල්ව සල්වා එන්නාවූ මූ කෙසේවූ කෙණෙක්ද? සර්‍වරත්නයෙන් විචිත්‍රවූ තපනීය, සවර්‍ණයෙන් හා අනෙකප්‍රකාරවූ මාණික්‍යයෙන් කර්‍මාන්තකරණලද මිටි ඇති මෘදුවූ මොණරපිල් කළඹයේ තෙල එන්නාවූ මහාපුරුෂයාගේ මුඛය දෑලයෙහි සලන්නාහ. මෙබඳුවූ මියුරපිංජකලා පයන් සල්ව සල්වා එන්නාවූ මොහු කවුරුද? දිලියෙන්නාවූ කිහිරඟුරුසක්

හා සමානවූ උදුනෙහිලා කකියවනලද චාමීකර සුවර්ණමයවූ සිත්කළුවූ කුණ්ඩලාභරණයෝ දෙදෙන තෙල එන්නාවූ මහොත්තමයාගේ මූඛය දෙපසින් හොබවන්නාහ. මෙබඳුවූ මාණික්‍ය කුණ්ඩලාභරණයන් පැලඳගෙණ එන්නාවූ මොහු කවුරුද? තවද තපස්වීන් වහන්ස, සිනිඳුවූ මොලොක්වූ කෘෂ්ණ වර්ණවූ කෙසකලාපය පවනින් පහරණලද්දේ නිල්වූ අහසින් නැගි විදුලියක් වැනිවූ නලල් කෙලවර හොබවන්නේය, මෙබඳුවූ කෙශකලාපයෙන් යුක්තව එන්නාවූ මූ කවුරුද? තවද මේ එන්නාවූ පින්වත්හුගේ දිගුපුළුල් නිල්නුවන් ඇති මූඛය විශෙෂයෙන් හොබනේය. විශාල නෙත්‍ර ඇති මොහු කවුරුද? දිවිදළින් ඔප්නඟනලද රන් කැඩපතක් හා සමානවූ මේ පෙම්බර මුහුණ කාගේද? තවද මූඛයෙහි පිහිටියාවූ පිරිසිදුවූ සක්කැබලි පංක්තියක් හා සමානවූද කොඳකැකුළු සමානවූද දන්ත පංක්තීහු කථාකරන්නාවූ මේ පින්වත්හුගේ මූඛය හොබවන්නාහ. මෙබඳුවූ දන්ත පංක්තීන් හොබනාවූ මොහු කවුරුද? ලාක්ෂාරසයෙන් පුරවනලද රන් පියුම්ගැබක් හා සමානවූ සැපසේ වැඩුනාවූ මේ අතුල්තල පතුල්තල කාගේද? බිම්බඵලයක් හා සමානවූ අධරයුගලයෙන් යුක්තවූ මේ උත්තම පුරුෂයා දිවාභාගයෙහි සූර්‍ය්‍යමණ්ඩලයක් මෙන් බබලමින් එන්නේය. මෙබඳු රන් පියුම්පෙති වැනි අතුල්පතුල් හා අධරපල්ලවයෙන් සොභාමත්ව එන්නාවූ මූ කවුරුද? වසන්තකාලයෙහි හිමාලයවනයේ අගසිට මුල දක්වා පැළී පිපී ගියාවූ මල් ඇති මහ සල්රුකක් මෙන් ධවලවූ උතුරුසළුවක් පොරවා අසුර මථනයකොට ජය ගෙණ එන්නාවූ ශක්‍රදෙවෙන්‍ද්‍රයා මෙන් සියලු දික් බබළුවමින් එන්නාහ, මෙබඳු උතුරු සළුව පොරවා එන්නාවූ මොහු කවුරුද? රන්බුබුලෙන් ගැවසීගත්තාවූ කඩුමිටින් විසිතුරුවූ විදුලිය කලඹක් වැනිවූ කඩුව තිරිප්පුකොට පක්ෂීත්මඛ්‍යයේ බැස එති, තපස්වීන් වහන්ස, මෙබඳු ඛඩ්ගපත්‍රයක් ගෙණ යුඩයට නික්මුණු වරම්රජදරුවක්හු මෙන් එන්නාවූ මූතුමූ කෙසේවූ කෙණෙක්ද තවද තපස්වීන් වහන්ස, රත්කම්කරණ ලද සප්තරත්නයෙන් විචිත්‍රවූ මොනවට කොට නිමවන ලද විසිතුරුවූ කර්මාන්ත විශෙෂ ඇති වහන් පයින් ගලවා නුඹවහන්සේට නමස්කාරකොට සිටියාවූ මොහු කවුරුදැයි විචාළහ. මෙසේ සාගර බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විසින් විචාරණලද ඍද්ධිමත්වූ අභිඥලාභීවූ තාපසයෝ පුත, මොහු ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන්ගේ පුත්‍රවූ තොපගේ බෑනාවූ නාරජ්ජුරුවෝයයි කියන්නාහු ඍද්ධ්‍යානුභාව මහත්වූ යශපිරිවර ඇති මේ නාරජ්ජුරුවෝ නම් ධෘතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් නිසා සමුද්‍රජාවන්ගෙන් උපන්නාවූ තොපගේ බෑනනුවූ නාරජ්ජුරුවෝයයි කීහ.

මෙසේ දෙදෙනා කථාකරමින් සිටියදීම නාගපක්ෂීන් අවුත් තාපසයන්ගේ දෙපතුල් වැඳ එකත්පස්ව උන්නාහුය. සමුද්‍රජාවෝත් පිය රජ්ජුරුවන්ට නමස්කාරකොට අඬා වැලප නාගපක්ෂීන් හා සමග නාගභවනයට ගියාහ. සාගර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් රාජතපස්වීන් සමීපයෙහි කීපදවසක්වැස බරණැස් නුවරට ගියාහ. සමුද්‍රජාවෝ නාගභවනයේදීම සවර්ගස්ථවූහ. මහබෝසතාණෝ දිවි පමණින් සිල් රක්ෂාකොට පෙහෙවස් වැස ජීවිතාවසානයෙහි නාගපක්ෂීන් හා,

සමග ගොස් ස්වර්ගලොකයෙහි උපන්නාහ. ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදරා උපාසකවරුනි, මෙසේ පූර්වතනයෙහි නුවණැත්තෝ අබුද්ධොත්පාද කාලයෙහිත් එබඳුවූ නාගසම්පත්තිය හැර පෙහෙවස් විසුවෝමවේදැයි වදරා පූර්වාපර සන්ධි ගළපා මේ භූරිදත්ත ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි දෙමවුපියෝ නම් දැන් සුද්ධොදන රජ්ජුරුවන් හා මහාමායා දේවීය, නෙසාද බ්‍රාහ්මණයා නම් දෙවදත්ත ස්ථවිරයෝය, සොමදත්තයෝ නම් ආනන්දස්ථවිරයෝය, අච්චිමුඛී නම් උත්පලවර්ණී මහාස්ථවිරීය, සුදර්ශනයෝ නම් ශාරිපුත්‍රස්ථවිරයෝය, සුභගයෝ නම් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයෝය, කාණාරිට්ඨයෝ නම් සුනක්ඛත්ත නම් ලිච්ඡවි පුත්‍රය, එසමයෙහි ජීවිතය පරිත්‍යාග කොට පෙහෙවස් ඉටා උපෝෂථ ශීලය රක්ෂාකළාවූ භූරිදත්ත නාරජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

533
විධුර ජාතකය

තවද එක් සමයෙක්හි ජාතිකාන්තරයෙන් සත්ත්වයන් තරණයකොට නිර්වාණ ක්ෂෙමභූමියට පමුණුවන හෙයින් ශාස්තෘ නම්වූ බුදුරජාණන්වහන්සේ සුගන්ධ ද්‍රව්‍යයෙන් නිරන්තරවූ ජායුදක සම්පන්න රම්‍යභූමිභාග ඇති ජේතවන මහා විහාරයෙහි වැඩවසන සේක් සර්ව බුද්ධකෘත්‍ය කරණයෙහි විහඞ්ග ක්‍රියා ලක්ෂණ භවාන්තරගතවූ ප්‍රඥා පාරමිතාව අරභයා මේ ජාතකය වදාළසේක.

එක් දවසක් හිරු අස්තපර්වතගත වේලෙහි ශීලසමාධි ප්‍රඥාද්‍යනේක ප්‍රකාරගුණ ප්‍රතාපාලඞ්කෘත ශ්‍රීනිකේතනවරචාරු දේහශ්‍රීසාර විරාජිතාශේෂ දේශාන්ධකාර ප්‍රකීර්ණ සර්වඥ බුද්ධානුබුද්ධ තපොනිධාන මහාකාශ්‍යපස්ථවිර ප්‍රමුඛ භික්ෂූහු තමන් තමන් වහන්සේ වසන කූටාගාර පරිවෙණාදී රාත්‍රිස්ථාන දිවාස්ථානයෙන් අවුත් සංග්‍රාම භූමියකට නානා ස්ථානයෙන් සන්නද්ධව රැස් වන්නාවූ සුවිනීත යුද්ධක්ෂම යොධභටයන්සේ මණිකවචයෙන් සන්නද්ධ අලංකෘත ගන්ධහස්තීන්සේ සන්ධ්‍යාඝන ප්‍රභාබද්ධ සුවිශුද්ධ පාංශුකූල චීවරධරව බ්‍රහ්මාම්බරතරනාග නයනරසායනව අලඞ්කෘතවූ ධර්මසභායෙහි ශක්‍රාගමනය බලමින් සුධර්මා නම් දිව්‍යසභායෙහි රැස්ව උන් දිව්‍යසමූහයක්සේ බුද්ධාසනය පිරිවරාහිඳ සර්වඥයන් වහන්සේගේ ප්‍රඥාපාරමිතාව වර්ණනාකරණසේක්, ඇවැත්නි, සර්වඥයන්වහන්සේ මහත්වූ අර්ථධර්ම ඇති නිරුක්තිප්‍රතිභාන ශීල සමාධි ප්‍රඥා විමුක්තිඥාන දර්ශනස්කන්ධයෙන් හා මහත්වූ ස්ථානාස්ථාන විහාර සමාපත්ති ආර්යසත්‍ය ස්මෘතිප්‍රස්ථාන සම්‍යක්ප්‍රධාන ඍද්ධිපාද ඉන්ද්‍රියබල බොධ්‍යංග ආර්යමාර්ග ශ්‍රාමණ්‍යඵල අභිඥා නිර්වාණ ප්‍රතිවෙධ කළහෙයින් අගාධවූ අසාරවූ මහාසාගරයසේ අතිගම්භීරවූ දුරවගාහවූ සම්පූර්ණවූ මහත්වූ ඥාන ශක්ති ඇතිසේක.

විධුර ජාතකය

නානාප්‍රකාර ධාත්වායතන ප්‍රතීත්‍යසමුත්පාද ශූන්‍යතා අර්ථධර්ම නිරුක්ති ප්‍රතිභාන ශීලසමාධි ප්‍රඥාවිමුක්ති විමුක්තිඥානදර්ශනස්කන්ධාදියෙහි ප්‍රවෘත්තවූ ඥානගති ඇති හෙයින් නානාප්‍රකාර ප්‍රඥා ඇති සේක, හා සුබහුලවූ ප්‍රඥා ඇති සේක. අතීතානාගත ප්‍රත්‍යුත්පන්න අධ්‍යාත්මික බාහ්‍යඖදාරික සූක්ෂමහීන ප්‍රණීත දූර සන්තිකවූ රූපයන් හා සියලු වේදනා සංඥා සංස්කාර විඥාන යන පඤ්චස්කන්ධයෙහි අධිකවූ ජවන හංසගතියක් මෙන් අතීතාදි වශයෙන් ශීඝ්‍රව දිවන්නාවූ ඥානගති ඇති හෙයින් ජවන ප්‍රඥාවෙන් යුක්ත වනසේක උප්පන්න කාමවිතර්ක ව්‍යාපාදවිතර්ක විහිංසාවිතර්කයන් හා අවශේෂ අකුශල ධර්මයන් අනුත්පත්ති වශයෙන් ප්‍රහාණය කළ හෙයින් හා චතුර්විධ මාර්ග ශ්‍රාමණ්‍ය ඵල ප්‍රතිසම්භිදා පඤ්චාභිඥාවන් සාක්ෂාත් කළ හෙයින් හා ජීර්ණපර්ණ පුටයෙහි අස්ඛලිත ප්‍රවෘත්ත සංදීප්ත අයශ්ශූලයක් මෙන් සංස්කාර, විකාර, ලක්ෂණ නිර්වාණ ප්‍රඥප්ති යන පඤ්ච ප්‍රකාර ඥෙය්‍ය මණ්ඩලයෙහි ප්‍රවෘත්ත ඥානගති ඇති හෙයින් බුදුහු තීක්ෂණ ප්‍රඥා ඇතිසේක.

සියලු සංස්කාරයන් කෙරෙහි උද්වේග බහුලව උත්ත්‍රාස බහුලව උත්කණ්ඨා බහුලව අභින්නපූර්වවූ අප්‍රදාලිතපූර්වවූ ලෝභද්වේෂමෝහ ක්‍රෝධෝපනාහ මක්ෂපලාශ ඊර්ෂ්‍යාමාත්සර්ය මායාශාඨ්‍යස්තම්භ සාරම්භ මානාතිමාන මදප්‍රමාදාදිවූ සකල ක්ලේශයන් උන්මූලනය කොට විනිවිද ප්‍රදාලනය කොට පවත්නාවූ මහා වජ්‍රඥානයෙන් යුක්ත හෙයින් බුදුහු විනිවිද පවත්නාවූ ඥාන උත්තතිගති ඇතිසේක, තමන්වහන්සේගේ ප්‍රඥානුභාවයෙන් ක්ෂත්‍රිය පණ්ඩිතාදීන් ඥානයෙන් සකස්කොට සිතනලද සූක්ෂමවූ ප්‍රශ්නයන් විසර්ජනය කොට ඒ ක්ෂත්‍රියාදීන් දමනයෙහි ලා ඔවුන් සන්තානගතවූ ක්ලේශ නමැති විෂවිනාශ කොට ශරණ ශීලයෙහිත් පඤ්චශීලයෙහිත් පිහිටුවා නිර්වාණගාමීවූ මාර්ගයට පැමිණවූ සේකැයි මෙබඳු කථාවක් උපදවා වැඩහුන්සේක.

එකල්හි ලෝකස්වාමිවූ ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ස්වර්ණ සුරභිගන්ධ පුෂ්පෝපහාරාදියෙන් සමලංකෘත භූමිභාග ඇති සුගන්ධවූ ගන්ධකුටියෙහි වැඩ හුන්සේක් ධර්මසභායෙහි ප්‍රවෘත්තවූ කථාව දිව්කණින් අසා වදාරා ගඳකිළිපිරිවෙණින් නික්ම තුන්තරා ගමනින් එක්තරා ගමනකින් ධර්මසභා මණ්ඩපයට වැඩ පණවනලද බුද්ධාසන මස්තකයෙහි උදය සූර්යයා මෙන් වැඩ හුන්සේක් අනල්ප කල්පකෝටියක් මුළුල්ලෙහි පුරණලද වාක් සුචරිතානුභාවයෙන් සුගන්ධවූ චතුර් ජාතිකගන්ධ සම්පූර්ණවූ සුගන්ධකරණ්ඩයක් විවෘත කරන්නාක්හු මෙන් මනහරවූ මුඛ පද්මය විවෘතකොට සකල ධර්මසභාව එක පැහැර සුවඳ කෙරෙමින් මහණෙනි, දැන් මේ ධර්මසභායෙහි මා එන්නට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව රැස්ව උන්නහු දැයි මත්තෙහි දේශනාව ආරම්භකරණු පිණිස විචාරා නොපට නොනිමි කථාවක් ඇත්තම් ඒ මාගේ අනන්‍ය සාධාරණවූ සර්වඥතාඥානයෙන් නිමවා දෙමියි සිතා ආම්, කැමතිවූව විචාරවයි මෙසේ ශ්‍රාවක ප්‍රත්‍යේක බුද්ධයන්ට අසාධාරණවූ සර්වඥප්‍රවාරණයෙන් පැවරූ කල්හි තමන්වහන්සේගේ හෘදයට අමෘතාභිෂේකයක් බඳුවූ ප්‍රේමණීයවූ කර්ණරසායනවූ ස්වරයෙන් වදාළ තෙපුල් ඇසූ ඒ භික්ෂූහු ස්වාමීනි, තුඹවහන්සේ විසින් ප්‍රතික්ෂිප්තවූ රාජකථාදිවූ එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. තුඹවහන්සේගේ ප්‍රඥාපාරමිතාව වර්ණනා කොට කොට උනුම්හයි කී කල්හි, මහණෙනි, සර්වඥවරයෝ උතුම්වූ සම්‍යක් සම්බෝධියට පැමිණ

පරවාදීන් බිඳ ක්‍ෂත්‍රියාදීන් විනයනය කොළේය, යන යමෙක් ඇත්නම් ඒ තෙමේ ආශ්චර්‍ය්‍ය නොවන්නේය. පූර්ව ජන්මයෙන්ම සර්වඥතාඥානය ප්‍රතිවේධය නිසා පාරමිතා ධර්මයන් පුරන්නාවූ සර්වඥවරයෝ ප්‍රඥාවන්තයෝමය. පරවාදීන් මථනය කොළෝමය. ඒ එසේමය, මම වූකලී විධුර කුමාර කාලයෙහි සැටයොදුන් උස ඇති කාළගිර පර්වත මස්තකයේදී පූර්ණක නම් යක්‍ෂසේනාධිපතිහු මාගේ ප්‍රඥාබලයෙන්ම දමනයෙහි ලා ඔවුන් සන්තානගතවූ මානමර්දනය කිරීමෙන් ක්ලේශ නමැති විෂ විනාශ කොට ඔවුන්ගෙන් මම ජීවිත දානය ඇරගත්තෙම් වේදැයි වදරා ඒ ආශ්චර්‍ය්‍යය ශ්‍රවණයෙහි කෞතුහල සිත් ඇති භික්‍ෂූන් විසින් ආරාධිතවූ සම්‍යක් සම්බුදුරජානන් වහන්සේ එකාග්‍රවූ භික්‍ෂු පර්ෂද තමන් වහන්සේගේ ශබ්ද ශ්‍රවණයෙහි අභිලාෂ ඇති බව දැන හිමගර්භයක් ප්‍රදලනයකොට චන්ද්‍රබිම්බයක් ගෙණහැර පාන්නාක්හු මෙන්ද, කඩතුරාවක් පහකොට විචිත්‍රචිත්‍ර කර්මාන්තයක් දක්වන්නාක්හු මෙන්ද, භූමිගතවූ නිධිකුම්භයක් නගා පාන්නාක්හු මෙන්ද, මහා ජම්බුවෘක්‍ෂය මුල ගෙණ සලන්නාක්හු මෙන්ද, පොළෝතෙලෙහි ඕජස් පෙරළා ගෙණහැර පානා එකක්හු මෙන්ද, යොජන ප්‍රමාණවූ මධු පටලයක් චක්‍රයන්ත්‍රයෙන් පෙළා මධුපාන - කරවන්නක්හු මෙන්ද, චතුකුණ්ඩාපලක්‍ෂිතවූ ගෘහයෙක්හි ප්‍රදීප සහස්‍රයක් දල්වන්නාක්හු මෙන්ද, පාංශුප්‍රච්ඡන්න ජාතිරත්න මාණික්‍යයක් දක්වන්නාක්හු මෙන්ද, භස්ම ප්‍රච්ඡන්නවූ ජාතවේදයක් දක්වන්නාක්හු මෙන්ද, භවාන්තර ප්‍රච්ඡන්නවූ ප්‍රඥාපාරමිතාව ප්‍රකාශ කරන්නාහු සර්වඥයන්වහන්සේ අතීත කාලයෙහි ප්‍රවෘත්තවූ කථාස්වරූපය ගෙණහැර දක්වා වදාළසේක.

යටගිය දවස කුරුරට ඉඳිපත් නුවර ධනඤ්ජයකෞරව්‍ය නම්රජ්ජුරු කෙණෙකුන් දාන ප්‍රියවචන අර්ථචර්‍ය්‍යා සමානාත්මතායයි කියනලද සතර සංග්‍රහ වස්තුයෙන් ජනරඤ්ජනය කෙරෙමින් දශරාජධර්මයෙන් අකොප්‍ය කොට රාජ්‍යය කරණ කල්හි විධුරපණ්ඩිත නම් අමාත්‍යයෙක් ඒ රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නේය. ඒ විධුරපණ්ඩිත තෙමේ මිහිරිවූ කථා ඇත්තේය. මහාධර්මකථිකය, සියලු ජම්බුද්වීපයෙහි රජදරුවන්ට හස්ති කාන්තවීණා කොට ඒ ඒ රජදරුවන් තමන් තමන්ගේ රාජධානිවලට යා නොදී සර්වඥවිලාසයෙන් මහජනයාට ධර්මදෙශනා කරමින් මහත්වූ යසශ්‍රී සමෘද්ධියෙන් යුක්තව ඒ නුවර වාසය කරන්නේය.

එසමයෙහි බරණැස් නුවර ගිහි යහළුවූ බමුණු මහසල්කුලයෙහි උපන්නාවූ බ්‍රාහ්මණයෝ සතරදෙනෙක් කාමයෙහි ආදීනව දැක හිමාලය වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා වනමුල් වනඵලාඵල අනුභව කරමින් එහිම බොහෝකල් වැස ලුණු ඇඹුල් සෙවුනා පිණිස සැරිසරා ඇවිදිනාහු අඟුරට කාලචම්පා නම් නුවරට පැමිණ රාජෝද්‍යානයෙහි වැස දෙවැනි දවස් පිඬු සිඟා වන්හ.

ඒ නුවර යහළුවූ කෙළෙඹි පුත්‍රයෝ සතරදෙනෙක් ඒ තපස්වීවරයන් සතරදෙනාගේ සප්‍රාත තිසඬ්ඩදීවූ ඊයඝීපථයෙහි පැහැද නමස්කාරකොට භික්ෂාභාජන ගෙණ එකී එකී තපස්වී කෙණෙකුන් තමන් තමන්ගේ ගෙයිදී උතුම්වූ මධුරාහාරයෙන් වළඳවා ප්‍රතිඥා ගෙණ උයනෙහිම වැස්වූහ. තාපසවරු සතර දෙන කෙළෙඹි පුත්‍රයන් සතරදෙනාගේ ගෙයිදී වළඳා දිවා විහාර පිණිස එක් කෙණෙක් තව්තිසා භවනයට යන්නාහ. එක්කෙණෙක් නාගභවනයට යන්නාහ, එක්කෙණෙක් ගරුඩභවනයට යන්නාහ, එක්කෙණෙක් ධනඤ්ජය කොරව්‍ය නම් රජ්ජුරුවන්ගේ මිගාරුචි නම් උද්‍යානයට යන්නාහ. එවුන් සතරදෙනාගෙන් යම් කෙණෙක් දිව්‍යලොකයට ගොස් දිවාවිහාර කෙරෙත් නම් ඒ තපස්වී ශක්‍රදෙවෙන්ද්‍රයන් යශස් බලා තමන්ගේ උපස්ථායකයාහට එම වර්ණනා කරන්නාහ. යම් කෙණෙක් නාගභවනයට ගොස් දිවාවිහාර කෙරෙත් නම් ඒ තපස්වීනාරජ්ජුරුවන් සම්පත් බලා තමන්ගේ උපස්ථායකයාහට එම වර්ණනා කරන්නාහ. යම් කෙණෙක් ගරුඩ භවනයට ගොස් දිවාවිහාර කෙරෙත් නම් ඒ තපස්වී ගරුඩ රජ්ජුරුවන්ගේ ශ්‍රී විභූතිය බලා තමන්ගේ උපස්ථායකයාහට එම වර්ණනා කරන්නාහ. යම් කෙණෙක් කොරව්‍ය නම් රජ්ජුරුවන්ගේ උයනෙහි දිවවාවිහාර කෙරෙත් නම් ඒ තපස්වී ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන්ගේ ශ්‍රී සෞන්දර්‍ය්‍යය බලා තමන්ගේ උපස්ථායකයාහට එම වර්ණනා කරන්නාහ.

එබස් අසා කෙළෙඹි පුත්‍රයෝ සතර දෙනම ඒ ඒ තැන් පතා දානාදීවූ පින්කම්කොට අයුෂයාගේ කෙළවර එක්කෙණෙක් ශක්‍රදෙවෙන්ද්‍රව උපන්නාහ. එක්කෙණෙක් පුත්‍රදාරාවන් හා සමඟ නාගභවනයෙහි උපන්නාහ. එක්කෙණෙක් ගරුඩභවනයෙහි ගුරුළු රජව උපන්නාහ. එක්කෙණෙක් ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසව කුස පිළිසිඳ ගත්තාහ. ඒ තාපසයෝ සතර දෙන බ්‍රහ්මලොකයෙහි උපන්නාහ. කොරව්‍ය කුමාරයෝ මව්කුසින් බිව වැඩිවිය පැමිණ පියරජ්ජුරුවන් ඇවෑමෙන් රාජ්‍යයෙහි පිහිටා දැහැමෙන් රාජ්‍යය කළහ. දූ කෙළිය සැපත්කොට එහි සතුටුවන්නාහ. ඒ රජ්ජුරුවෝ විධුර පණ්ඩිතයන්ගේ අවවාදයෙහි පිහිටා දන්දෙති, සිල්රක්ෂා කෙරෙති, පෙහෙවස් වෙසෙති.

ඉක්බිත්තෙන් එක් දවසක් රජ්ජුරුවෝ උපොෂථ ශීලය සමාදන්ව විවෙකව වසමියි උයනට ගොස් සිත්කළුවූ තැනෙක හිඳ මහණදම් කළහ. ශක්‍රදෙවෙන්ද්‍රයෝත් තමා සමාදන්වූ පෙහෙවස් ඇත්තාවූ දිව්‍යලොකයෙහි පළිබොධවන්නේයයි මනුෂ්‍යලොකයෙහි මිගාරුචි නම් උයනට ගොස් සිත්කලුවූ තැනෙක ඉඳ මහණදම් කළහ. වරුණ නම් නාරජ්ජුරුවෝත් සමාදන්වූ පෙහෙවස් ඇත්තාහු නාගභවනයෙහි පළිබොධ වන්නේයයි එම උයනට ගොස් සිත් කලුවූ තැනෙක ඉඳ මහණදම් කළහ. ගරුඩ රජ්ජුරුවෝත් සමාදන්වූ පෙහෙවස් ඇතිව ගරුඩභවනයෙහි පළිබොධ වන්නේයයි එම උයනට ගොස් ඇලෙන තැනෙක හිඳ මහණදම් කළහ. ඔහු සතරදෙනම සවස් වේලෙහි තමන් තමන් උන් තැනින් නික්ම මගුල් පොකුණු තෙරදී එක්තැන්වූවාහු ඔවුනොවුන් දැක පූර්වස්නෙහ වශයෙන් සමඟ තුටු ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී එළවා මිහිරිවූ

සුවඳුක් කථාකොට ශක්‍රදෙවෙන්ද්‍රයෝ මඟුල් සලවට මත්තෙහි උන්නාහ. අන්‍යවූ තුන්දෙනාත් තමත් තමන් ඉඳිනට සුදුසුවූ තැන් බලා උන්හ.

එකල්හි ඔවුන් තුන්දෙනාට ශක්‍රදෙවෙන්ද්‍රයෝ කියන්නෝ අපි සතර දෙනාම රජදරුවෝය, අප සතරදෙනාගෙන් කවුරුන්ගේ ශීලය මහත්දැයි කීහ. එකල්හි ශක්‍රදෙවෙන්ද්‍රයානන්ට වරුණ නම් රජ්ජුරුවෝ කියන්නෝ තොප තුන්දෙනාගේ ශීලයට වඩා මාගේ ශීලය මහතැයි කීහ. ඊට කාරණා කවරේදැයි කීකල්හි මේ ගරුඩ රජ්ජුරුවෝ වූකලී උපන්නාවූත් නූපන්නාවූත් අප හැමදෙනාටම පසමිතුරුව සිටියාහ. මම මෙබඳු අප හැමගේ ජීවිතක්‍ෂය කරන්නාවූ පසමිතුරා දැක දැකත් කොප නොකෙරෙමි. මේ කාරණයෙන් මාගේ ශීලය මහතැයි කීයා තමන්ගේ ශීලයට ප්‍රශංසා කරන්නාහු මෙසේ කීහ ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් අතුරෙන් යම් සාධුජනයෙක් තෙමේ කෝප කටයුතුවූ පුද්ගලයා කෙරෙහි හා වෛශෝත්පත්තියට සුදුසු ඒ ඒ වස්තුයෙහි ක්‍ෂාන්ති වාදී තාපසයන් මෙන් කෝප කවරේද? නැවත නැවත සත්පුරුෂ තෙමේ කිසිකාලෙකත් නොකිපෙන්නේමය. වාසනා සහිතවූ ක්ලෙශ බලයෙන් ඉඳින් කිපුනේවී නමුත් සවසන්තානවර්තීවූ කෝපය බොධිරාජ කුමාරයන් මෙන් අනුන්ට පහළ නොකරේද? සත්ත්වලෝකයෙහි මෛත්‍රික්‍ෂමොපසමාධියෙන් යුක්තවූ එබඳු පුරුෂයා එකාන්තයෙන් ප්‍රාඥයෝ සමිත පාපයන් ඇති හෙයින් ශ්‍රමණයයි කියති. එසේ හෙයින් මෙකී ගුණයෝ මා කෙරෙහි ඇත්තාහ. එබැවින් මාගේ ශීලයම මහත් වන්නේයයි කීහ.

එබස් අසා ගරුඩ රජ්ජුරුවෝ කියන්නාහු මේ නා රජ්ජුරුවෝ මට අග්‍ර භොජනව සිටියහ. යම්හෙයකින් මම මෙබඳුවූ අග්‍රභොජනයද දැක දැකත් ක්‍ෂුධාව ඉවසාගෙණ ආහාරය නිසා පාපයක් නොකරෙම්ද? එසේ හෙයින් මාගේ ශීලය යහපත් වන්නේයයි කියා තමාගේ ශීලය වර්‍ණිනා කරන්නාහු යම් පුරුෂයෙක් තෙමේ සාකුස් ඇතිව ක්‍ෂුධා දුඃඛය ඉවසාද? ඉන්ද්‍රිය දමනයෙන් සමන්විතද, සීලසමාපත්ති තපතිඃශ්‍රිත වන්නේද? අහාරාදී ප්‍රතිග්‍රහණයෙහි මාත්‍රාඥව පමණින් යුක්තවූ ආහාර පානවශී අනුභව කෙරේද? ඉතා සාකුස් ඇත්තේවී නමුත් අනුභව කටයුතුවූ ආහාර පානාදිය නිසා දම් සෙනෙවි සැරයුත් මහතෙරුන් වහන්සේ මෙන්ම ලාමක ක්‍රියාවක් නො කෙරේද? සත්ත්වලොකයෙහි මෙබඳුවූ සම්‍යක් ආජීවයෙන් යුක්ත ඒ පුරුෂයා එකාන්තයෙන් ප්‍රාඥයෝ සමිතපාපයන් ඇති හෙයින් ශ්‍රමණයයි කියති. මම වූකලී ආහාරය නිසා පාපකර්‍මයක් නොකෙරෙමි. එසේ හෙයින් මාගේ ශීලය මහතැයි කීහ.

ඉක්බිත්තෙන් ශක්‍රදෙවෙන්ද්‍රයෝ කියන්නාහු මම වූකලී නොයෙක් සැපයට පිහිටවූ දිව්‍යලෝකසම්පත්තිය හැර සිල්රක්නා සඳහා මනුෂ්‍යලොකයට ආමි එසේ හෙයින් මාගේ ශීලය මහතැයි කියා තමන්ගේ ශීලය වර්‍ණිනා කරන් නාහු යම් සත්ත්වයෙක් සත්ත්වලොකයෙහි කායික වාචසික සියලු ක්‍රීඩාව හා දිව්‍ය පඤ්චකාම ගුණයෙහි ඇලුම් දුරුකොට සවල්පවූවත් බොරුවක් නොකියාද? ක්ලෙශොත්පත්තියට හෙතුවූ මාංසවිභූෂණය ඡවිවිභූෂණය යන මේ විවිධවූ විභූෂණයෙන් විරමණ වශයෙන් දුරුවේද? එහි අනුභව කටයුතුවූ ව්‍යඤ්ජන සහිතවූ ප්‍රණීතාහාරය මාංශවිභූෂණය නම් වෙයි. මල් සුවඳ හා වස්ත්‍රාභරණ

දිය ජිවි විභූෂණය නම් වෙයි යම් අකුශල චිත්තයකින් ඒ මාංශ විභූෂණය ජිවි විභූෂණය යන දෙක යම් සත්ත්වයෙක් කරත්නෝ වීනම් ඒ විභූෂණවය ඒ සත්ත්වයාගේ ක්ලෙශොත්පත්තියට කාරණා වන්නේය, එසේහෙයින් එබඳුවූ විභූෂණයෙන් දුරුවීද? අන්‍යොන්‍ය රඤ්ජන සවභාවවූ මෛථුනසෙවනයෙනුත් දුරුවීද, ක්‍රීඩාරති මෘෂාවාද විභූෂණ මෛථුනාදි අකුශල ධර්මයෙන් දුරුකිරීමෙන් යුක්තවූ මෙබඳුවූ පුරුෂයා ඒකාන්තයෙන් ප්‍රාඥයෝ සමිතපාපයන් ඇති හෙයින් ශ්‍රමණයයි කියති. මම චූකලි අද දිව්‍යප්සරාවන් හැර මෙතනට අවුත් මහණදම් කෙරෙමි. එසේහෙයින් මාගේ ශීලය මහතැයි කියා වර්ණනා කළහ.

එබස්අසා ධනඤ්ජය කෞරව්‍ය නම් රජ්ජුරුවෝ මම අද මහත්වූ අනෙක ප්‍රකාරවූ වස්තුකාමය හා සොළොස් දහසක් නාටක ස්ත්‍රීන්ගෙන් සම්පූර්ණවූ අන්තඃපුරය හැර මේ උද්‍යානයෙහි මහණදම් කෙරෙමි. එසේහෙයින් මාගේ ශීලය මහතැයි කියා තමන්ගේ ශීලය වර්ණනා කරන්නාහු මේ ලොකයෙහි යම් කෙණෙක් අනෙකප්‍රකාරවූ සියලු වස්තුකාමය හා එම වස්තුකාමය විෂයකොට පවත්නාවූ තෘෂ්ණා නැමැති සියලු ක්ලෙශ කාමය ඥාතතීරණ ප්‍රහාණ පරිඥා වශයෙන් දැක යථොක්තවූ වස්තුකාම ක්ලෙශකාමයන් හැර නිරපෙක්‍ෂව නැගියේද එවැන්නවුන්ට ප්‍රාඥයෝ ශ්‍රමණයයි කියති. මේ ස්කන්ධාදීන්ගේ සවභාවය දැන්ම ඥාතපරිඥා නම්වේ, පඤ්චස්කන්ධාදියෙහි නුගුණ පරීක්‍ෂා කොට තීරණය කිරීම පරිඥා නම්වේ, පඤ්චස්කන්ධයන්ගේ දෝෂ දැන ඡන්දරාගය දුරුකිරීම් ප්‍රහාණ පරිඥා නම්වේ. මෙබඳු ත්‍රිවිධවූ පරිඥායෙන් විශෙෂ වශයෙන් පිරිසිඳ දැන වස්තු කාමක්ලෙශකාමයන් හැර යම්කෙණෙක් නිරපෙක්‍ෂව නැගීයෙද්ද? එබඳුවූ මහොත්තමයන්ටත් ප්‍රාඥයෝ ශ්‍රමණයයි කියති. යම් සත්ත්වයෙක් කෝපත් නොවී ඉන්ද්‍රිය දමනයෙන් යුක්ත මිථ්‍යාවිතර්කාදීන්ගේ අභාවයෙන් අකම්ප්‍ය සවභාව ඇත්තේද? ධනධාන්‍යා දියෙහි මමය මාගේය යන තෘෂ්ණාව නැත්තේද පුත්‍රදාරාදීන් කෙරෙහි ඇල්මෙක් නැත්තේද? වස්තුකාමය දුරුකොට දහන ගුණයෙන් යුක්තවූ මෙබඳුවූ පුරුෂයා එකාන්තයෙන් ප්‍රාඥයෝ සමිතපාප ඇති හෙයින් ශ්‍රමණයයි කියති, අද මම මහත්වූ ඓශ්වර්ය හැර මේ උයනෙහි මහණ දම් කෙරෙමි. එහෙයින් මාගේ ශීලය මහත්යයි ඒ ධනඤ්ජය කෞරව්‍ය නම් රජ්ජුරුවෝ තමන්ගේ ශීලය වර්ණනා කළහ.

මෙසේ ඔහු හැමදෙනම තමන් තමන්ගේ ශීලයම මහතැයි වර්ණනා කොට ධනඤ්ජය කෞරව්‍ය නම් රජ්ජුරුවන් විචාරන්නාහු මහරජ්ජුරුවෙනි, යමෙක් අපගේ සිතට උපන්නාවූ සැකදුරුකරනෝ වීනම් එබඳුවූ කිසි පණ්ඩිතකෙණෙක් නොප සමීපයෙහි ඇද්දැයි විචාළහ. එසේය, රජදරුවෙනි, මට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාවූ ප්‍රාඥයෙන් තමන් හා සමධුරයක් ඇති කෙණෙකුන් ලොකයෙහි නැති හෙයින් අසමධුරවූ විධුර නම් පණ්ඩිත කෙණෙක් ඇත, ඒ පණ්ඩිතයෝ අප හැමදෙනාගේ ශඞ්කා දුරුකරන්නාහ. එසේහෙයින් උන් සමීපයට යම්හයි කෞරව්‍ය රජ්ජුරුවෝ කීහ. ඒ ශක්‍රාදී තුන්දෙනා රජ්ජුරුවන්ගේ බස් යහපතැයි ගිවිස්සාහ.

ඉක්බිත්තෙන් ඔහු සතරදෙනම උයනින් නික්ම ධර්‍මසභාවට ගොස් ධර්‍ම සභාව දිව්‍ය විමානයක් මෙන් මොනවට සරහා බොධිසත්ත්වයන් උතුම්වූ පර්‍ය්‍යඞ්ක මධ්‍යයෙහි හිඳුවා පිළිසඳර කථාකොට එකක්පස්ව උන්නාහු පණ්ඩිත යෙනි, අපට සංකාවෙක් උපන, අපගේ ඒ සංකාව දුරුකරවයි කියා විචාරන් නාවූ අලාමකවූ උතුම්වූ නුවණැත්තාවූ සියලු කාර්‍ය්‍යයෙහි නියුක්තවූ අමාත්‍යයා නන් අතින් සංකා කාරණයක් විචාරම්හ. ඒ කියව අපගේ ශීලවිවාද වශයෙන් ප්‍රවෘත්ත සංසව උපන්නාවූ විවාදයෙක් ඇත, ඒ සංකාව හා නැවත නැවත උපද නාවූ සැකය මෙබඳුවූ රාජ සමාගමය ඇත්තාවූ අද වජ්‍රායුධයෙන් මහමෙර කපන්නාක්හු මෙන් තීක්ෂණවූ ප්‍රඥ නමැති වජ්‍රායුධයෙන් සිඳ අපට උපන් සංකා දුරුකරව, අපි හැමදෙනම තොප කරණ කොටගෙණ අපට උපන්නාවූ සංසය අද දුරුකොට සැකනැතිවම්හයි කීහ.

මහබෝසතාණෝ ඔවුන්ගේ බස් අසා මහරජ්ජුරුවෙනි, තොප හැම දෙනාගේ ශීලය නිසා උපන්නාවූ විවාද කථාව යහපත් කොට කී නියාවත් නපුරුකොට කී නියාවත් කෙසේ දනිම්දැයි කියන්නාහු මෙසේ කීහ. ජන ප්‍රධානවූ රජදරුවෙනි, යම් ප්‍රාඥකෙණෙක් ශුභාශුභාර්‍ථ දක්නට සමර්‍ථවෙත්ද? ඒ ප්‍රාඥයෝ යුක්ත ප්‍රාප්ත කාලයෙහි ශීලවිවාදයක් කීකල්හි නුවණින් යෙදී ඒ ශුභාශුභ අර්‍ථයන් කියන්නාහ. දක්ෂවූත් ඒ ප්‍රාඥයෝ ප්‍රකාශකොට කියන ලද්දාවූ තොපගේ ශීලවිවාදයන්ගේ ශුභාශුභ අර්‍ථය ප්‍රකාශ කරන්නාහ, දක්ෂවූ ඒ ප්‍රාඥයෝ ප්‍රකාශකොට නොකියන ලද්දාවූ තොපගේ ඒ ශීලවිවාදයන්ගේ ශුභා ශුභ අර්‍ථය කෙසේනම් නුවණින් පරීක්‍ෂාකොට කියද්ද? එසේ හෙයින් මේ කාර ණයවූකලී මට කියව, රජදරුවෙනි, වරුණනම් නාරජ්ජුරුවෝ කෙසේ තමන්ගේ ශීලය උතුමැයි කියද්ද? විනතාවගේ පුත්‍රව ගුරුළු රජ්ජුරුවෝ කෙසේ කියද්ද? සක්දෙව් රජ්ජුරුවෝ කෙසේ කියද්ද? කුරුරට වාසීන්ට ශ්‍රෙෂ්ඨවූ ධනඤ්ජය කෞරව්‍ය රජ්ජුරුවෝ කෙසේ කියද්දැයි විචාළහ. එකල්හි මහබෝසතාණන්ට ඔහු හැමදෙන මෙසේ කීහ. පණ්ඩිතයෙනි, වරුණ නම් නාරජ්ජුරුවෝ කොප කටයුතුවූ පුද්ගලයා කෙරෙහි අවෙෂ සංඛ්‍යාතවූ අධිවාසන ක්‍ෂාන්තිය වර්ණනා කෙරෙති, විනතා නම් ගරුඩ මාතාවගේ පුත්වූ ගුරුළු රජ්ජුරුවෝ අල්පාහාර සංඛ්‍යාතවූ ආහාර හෙතු පාපයාගේ අකරණය කියති. ශක්‍රදෙවෙන්ද්‍රයෝ කෞරව්‍ය නම් රජ්ජුරුවෝ වස්තුකාම ක්ලෙශකාමයයි නිරපෙක්‍ෂබවයි කියන ලද නිෂ්පළිබොධයයි කියති. ඔවුන් සතරදෙනාගේ බස් අසා මහබෝසතාණෝ කියන්නාහු රාජෙන්ද්‍රයෙනි, තොපගේ මේ වුත්තප්‍රකාර සියලු ගුණයෝ තොප හැම්දෙනා විසින් කියනලදහ. කී නියා යහපත, මේ ශීල විවාදයෙහි නපුරු කොට කියනලද්දාවූ කිසිවෙක් නැත, තොප හැමදෙනම කී නියාව යහපත, ගැල්නැබෙහි මතාකොට සිටියාවූ දැව් පරිද්දෙන්ම මේ යථොක්තවූ ගුණයෝ යම් පුද්ගලයක්හු කෙරෙහි මොනවට පිහිටියාහුද, වුක්තප්‍රකාරවූ චතුර්විධ ගුණ ධර්‍මයෙන් සමන්විතවූ පුද්ගලයා ප්‍රාඥයෝ සමිත පාපයන් ඇතිහෙයින් ලොක යෙහි ශ්‍රමණයයි කියති, මෙසේ මහබෝසතාණෝ සතරදෙනාගේම ශීලය එක සරිකොට කීහ. එබස් අසා ශක්‍රාදීවූ සතරදෙන සතුටුව මහබෝසතාණන්ට

ස්තුතිකරන්නා පණ්ඩිතයෙනි, තොප සර්වසත්ත්වයන්ට උත්තමය, තොපටවඩා උත්තරීතර කෙනෙකුන් ලොකයෙහි නැතිහෙයින් නිරුත්තරය, සුචරිත ධර්මය හා ප්‍රවෙණිධර්මය රක්ෂාකරව, පාලිඅර්ථ හා පාලිධර්මය දනුව, සුන්දරවූ ප්‍රඥ ඇත්ත එසේහෙයින් වජ්‍රයක්සේ ඉතා තීක්ෂණවූ තොපගේ ප්‍රඥයෙන් අතිගුඪවූ මේ ප්‍රශ්නය මෙයට කාරණා මෙයයි විශාරවූ බුඩීන් තත්ත්වහෙයින් දූත නිශ්චලවූ ගුණ ඇති තෙපි අප සිතට උපන් සැක දුරුකළහ. කුමක්මෙන්දයත්? දල වඩුවකු ඇත්දළ කපන්නාක් මෙන් සංකාව හා තැවත තැවත උපදනා සංසය සිඳහැර සැක දුරුකළහයි මෙසේ ශක්‍රාදීවූ සතරදෙනම මහාබෝසතානන්ගේ ප්‍රශ්න විසර්ජනයෙන් සතුටුසිත් ඇතිව ස්තුතිකළහ. ඉක්බිත්තෙන් ඒ බෝධි සත්ත්වයන්ට ශක්‍රදෙවෙන්ද්‍රයෝ දිව්‍යදුහුලකින් පූජාකළහ. ගුරුළු රජ්ජුරුවෝ රත්මාලාවකින් පූජාකළහ. වරුණ නම් නාරජ්ජුරුවෝ කණ්ඨමාණික්‍යයෙන් පූජාකළහ. ධනඤ්ජය කෞරව්‍ය නම් රජ්ජුරුවෝ ගව සහශ්‍රයකින් පූජාකරන්නාහු පණ්ඩිතයෙනි, ගවයන් දහසක්ද ඒ ගවයන් දහස ප්‍රධානකොට ඇති තෑගෙන්ට සුදුසුවූ ඇතකුද අජානීය සෙන්ධව අශ්වයන් යොදනලද රථදහසක්ද ගම්වර සොළොසක්ද යන මේ වුක්තප්‍රකාර වස්තූන් තොපගේ මේ ප්‍රශ්න ව්‍යාකරණයෙන් සන්තුෂ්ටවූ මම සතුටුපඬුරුකොට තොපට දෙමි. කියා පූජා පිණිස දුන්හ.

ඉක්බිත්තෙන් ශක්‍රාදී සතරදෙන මහබෝසතානන්ට පූජාකොට තමන් තමන් වසන්නාවූ ස්ථානයන්ටම ගියහ. ඔවුන් සතරදෙන අතරෙන් නාරජ්ජුරුවන්ගේ භාර්‍ය්‍යාවවූ විමලා නම් බිසවු ඒ වරුණ නාරජ්ජුරුවන්ගේ කරපළඳනාවූ කණ්ඨමාණික්‍යය නොදුක නාරජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේගේ කණ්ඨමාණික්‍යය කොයිදැයි විචාළහ. එකල්හි වරුණ නම් නාරජ්ජුරුවෝ කියන්නාහු සොඳුර චන්ද්‍ර බ්‍රාහ්මණයාගේ පුත්‍රවූ විධුර පණ්ඩිතයන්ගේ ධර්ම කථාව අසා ප්‍රසන්නවූ සිත් ඇති මම කණ්ඨමාණික්‍යයෙන් පණ්ඩිතයන්ට පූජා කෙළෙමි. හුදක් මම් මතුනොවෙයි. ශක්‍රදෙවෙන්ද්‍රයෝත් පණ්ඩිතයන්ට දිව දුහුලකින් පූජාකළහ. ගරුඩ රජ්ජුරුවෝත් රත්මාලයෙන් පූජාකළහ. ධනඤ්ජය කෞරව්‍ය නම් රජ්ජුරුවෝ ගව සහස්‍රාදියෙන් පූජාකළහයි කීහ. එබස් අසා විමලාවෝ දෙවයන්වහන්ස, ඒ විධුරපණ්ඩිතයෝ ධර්මකථිකයෝ දැයි විචාළහ. නාරජ්ජුරුවෝ කියන්නාහු සොඳුර, කුමක්වේද? යි සියලු දඹදිව බුඩොත්පාදයක් මෙන් පැවැත්තේය. සියලු ජම්බුද්වීපයෙහි එසියයක් රාජධානියේ රජදරුවෝ ඒ පණ්ඩිතයන්ගේ මධුරවූ ධර්මකථායෙහි බැඳී හස්තික්‍රාන්ත වීණාසවරයෙහි බැඳී ලුබ්ධවූ මත්තහස්තීන් මෙන් තමන්ගේ රාජ්‍යවලට නොයන්නාහ. විධුර පණ්ඩිතයෝ මෙබඳු ධර්මකථා ඇත්තෝ යයි වර්ණනා කළහ. ඒ විමලා නම් බිසවු විධුර පණ්ඩිතයන්ගේ ගුණ කථා අසා උන්ගෙන් බණ අසනු කැමැත්තෙමි. එසේහෙයින් ඒ පණ්ඩිතයන් මෙතනට කැඳවාගෙණ අවමැනවයි ඉදින් කියෙම් වීම්නම් පණ්ඩිතයන් මා සමීපයට කැඳවාගෙණ නොඑන්නාහ. එසේ හෙයින් මම මට දෙළක් උපනැයි ගිලන් ආකාරයෙන් කෙළෙම් වීම්නම් යහපත් වන්නේයයි සිතා එපරිද්දෙන් කොට පරිවාර ස්ත්‍රීන්ට එපවත්කියා වැදහොත්තාහු නාරජ්ජුරුවෝ උපස්ථාන වේලායෙහි ඒ විමලාවන් කොයිදැයි පරිවාර ස්ත්‍රීන් අතින් විචාරා දෙවයන් වහන්ස, ගිලන්සේකැයි කී කල්හි ඒ විමලාවන් සමීපයට ගොස් යාන අස ඉඳ අත්ලෙන් ඇඟ පිරිමදිමින් මෙසේ කීය. විමලා

වෙනි, තෙපි පඬුපලාසවර්ණව (සුදුමැලිව) ගියව, අතිකෘශව සීන්ව ගියව, වැහැර අශක්තිව ගියව, තොපගේ වර්ණ රූපසංඛ්‍යාතවූ ශරීර ලාවණ්‍යය මීට පළමු නොවෙයි. පෙර තෙපි අනින්දිත අඞ්ගප්‍රත්‍යඞ්ග ඇතියව, දූත් වූකලී පෙරළී අමතොඳ මෙබඳුවූ ස්වභාවයට පැමිණිය, එසේහෙයින් මා විසින් විචාරණලද්දාවූ තෙපි මේ කාරණය කියව, තොපගේ ශරීරයට පීඩා කවරේද? රෝදුක් කවරේදැයි විචාළහ. එකල්හි විමලාවෝ නාරජ්ජුරුවන්ට තමන් ගිලන්ව වැදහොත් කාරණා කියන්නාහු ජනප්‍රධානවූ රජ්ජුරුවන් වහන්ස, සත්ත්වයන් කෙරෙහි ස්ත්‍රීන්ට දෙළතම් දෙයෙක් ස්වභාවයයි කියති. එසේහෙයින් නාගොත්තමයානක් වහන්ස, දැහැමෙන් සෙමන් එලවනලද විධුර පණ්ඩිතයන්ගේ හෘදමාංශය ප්‍රාර්ථනාකරමි ඒ හෘදමාංශය ලබන්නාවූ මම ජීවත්වෙමි. නොලබන්නාවූ මට මෙතැන්හිම මරණය වන්නේයයි කීහ. එබස් අසා නාරජ්ජුරුවෝ කියන්නාහු විමලාවෙනි, තෙපි කිසිවක්හු විසින් ලැබගත නොහැක්කාවූ සඳුට දෙළ ගතුව, එබඳුවූ හිරුටත් දෙළගතුව, එසේවූම සුළඟටත් දෙළගතුව, ප්‍රාර්ථනයෙන් අසාධ්‍යවූ අසමධුරවූ විධුර පණ්ඩිතයන් ගෙණෙන්නා තබා දැක්මක් දුලීභවන්නේය. සියලු දඹදිව් රජදරුවෝ ඒ විධුර පණ්ඩිතයන්ට ධාර්මිකවූ රක්ෂාවරණ ගුත්තියා එළවා ඇවිදිති කිසි සත්ත්වයෙක් ඒ පණ්ඩිතයන් දැකගත නොහෙන්නේය. එසේහෙයින් ඒ නොලැබිය හැක්කාවූ විධුර පණ්ඩියන් මේ නාගලෝකයට කවරතම් සූර පුරුෂයෙක් ඒ නුවර වාසීන් අභිභවා හැරගෙණ එන්නේදැයි කීහ. විමලාවෝ එබස් අසා විධුර පණ්ඩිතයන් නොලබන්නාවූ මට මෙතැන්හිම මරණය වන්නේවේදැයි කියා නාරජ්ජුරුවන්ට පිටිපා ඇලයෙන් පෙරළී සළුකොණින් මුහුණ වසාගෙණ වැද හොත්තාහුය.

එකල්හි නාරජ්ජුරුවෝ තමන් ශ්‍රීයහන් ගබඩාවට වැද යනන් මත්තේ උන්නාහු විමලාවෝ විධුර පණ්ඩිතයන්ගේ හෘදමාංශය ගෙන්වනුම කැමැත්තේ ඒ පණ්ඩිතයන්ගේ හෘදමාංශය නොලබන්නාවූ විමලාවන්ගේ දිවි නොතිබෙන්නේය. එසේහෙයින් උන්ගේ හදවත කෙසේ ලැබෙද්දොහෝයි සිතූහ. එකල්හි ඒ වරුණ නම් නාරජ්ජුරුවන්ගේ දූවූ ඉරන්දතී නම් නාග කන්‍යාතොමෝ සර්වාභරණයෙන් සැරහී මහත්වූ ශ්‍රීවිලාශයෙන් නාරජ්ජුරු වන්ට උපස්ථානයට අවුත් පිය රජ්ජුරුවන් වැද එකත්පස්ව සිටි තැනැත්තී චක්ෂුරාදී ඉන්ද්‍රියවිකාර දැක පියානන් වහන්ස, නුඹවහන්සේ ඉතා දෙම්නසට පැමිණියේක. ඊට කාරණා කිමෙක්දැයි විචාරන්නී මෙසේ කීවාය. පන්සිය යක් යොදුන් මාඤ්ජෙරික නාගභවනයට ඊශ්වරවූ නාරජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ ශොකාතුරව කුමක් සිතනසේක්ද? පෙර සෞම්‍යවූ නුඹවහන් සේගේ මේ මුහුණ දූත් පියුමක් මෙන් අතිශයින් මලානිකව ගියේය. පසමිතු රන් තවන්නාවූ නාරජ්ජුරුවන් වහන්ස, කුමක්නිසා දුර්මුඛවූ ස්වරූප ඇති සේක්ද? නුඹවහන්සේගේ කාර්‍ය්‍යයක් නිසාවීනම් ශොකනොකළ මැනවැයි කීවාය.

ඒ ඉරන්දතියගේ බස් අසා වරුණ නම් නාරජ්ජුරුවෝ තමන් ශොක කරන්නාවූ කාරණා කියන්නාහු පුත ඉරන්දතීනි, තොපගේ මැතියෝ අසමධුරවූ විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය පතති. ඒ විධුර පණ්ඩිතයන් ගෙණෙන්නා තබා දක්මද දුර්ලභවන්නේය. එසේ නොලැබියහැක්කාවූ විධුර පණ්ඩිතයන් මේ නාගලොකයට කවර නම් වීරපුරුෂයෙක් ඒ නුවරවාසීන් කැමැති කරවා ඇරගෙණ එන්නට සමර්ථදැයි කීහ. මෙසේ කියා ඉක්බිත්තෙන් නාරජ්ජුරුවෝ ඉරන්දතීට කියන්නාහු මැතියෙනි, මා සමීපයට විධුර පණ්ඩිතයන් ගෙණෙන්නට සමර්ථ එකෙක් නම් නැත. තොපි තොපගේ මැතියන්ට ජීවිත දානය දෙව, විධුර පණ්ඩිතයන් ඇරගෙණ එන්නට සමර්ථවූ සවාමි පුත්‍රයකු පරීක්ෂාකොට සොයා ගණුවයි විධානකරන්නා ඉරන්දතීනි, යම් ශූර පුරුෂයෙක් විධුර පණ්ඩිතයන් මේ නාගභවනයට තමාගේ කිසියම් බලයකින් ගෙණෙන්නේවීනම් එසේවූ ශෞර්‍යවීර්‍යය ඇති සවාමිපුත්‍රයෙකු පරීක්ෂාකොට සොයා ඇවිද බලාගණුවයි මෙසේ වරුණ නම් නාරජ්ජුරාවෝ ක්ලේශකාමයෙහි බලවත්ව ඇලුනු බැවින් දුවට කියන්නට නුසුදුසුවූ බස් කීහ. ඒ නාගමානවිකාවෝ පිය රජ්ජුරුවන්ගේ බස් අසා උන් අස්වසාලා මැතියන් සමීපයට ගොස් සර්වාභරණයෙන් සැරසී එක් චතුක්මල්රතක් එකාංශකොට බඳා එම රාත්‍රියෙහි දිය දෙබෑකොට නාගභවනයෙන් නික්ම හිමාලය වනප්‍රදෙශයෙහිවූ සමුද්‍රතීරයෙහි පිහිටියාවූ සැටයොදුන් උස ඇති එකඝනවූ කාළගිරි නම්වූ අඤ්ජනගිරි පර්වතයට ගොස් ක්ලේශකාමයෙන් තප්තව සවාමිපුත්‍රයෙකු සොයමින් ඇවිදිනීය. මෙසේ ඇවිදිනාවූ නාගමානවිකාතොමෝ හිමාලය වනයෙහි වර්ණ ගන්ධ රස සම්පන්නවූ යම් පුෂ්ප ජාති කෙණෙක් ඇත්නම් ඒ සියල්ල ගෙණවුත් සියලු පර්වතය මැණික් ඇඟෑයක්මෙන් සරහා පර්වත මස්තකයෙහි මල් ඇතිරියක් අතුට සිත්කලුවූ ආකාරයෙන් නට නටා මියුරු ගී ගායනා කෙරෙමින් මෙසේ කීව, කවර නම් ගාන්ධර්ව දිව්‍යපුත්‍රයෙක් කවර නම් රාක්ෂසයෙක් කවර නම් දිව්‍යනාගයෙක් කවර නම් කිම්පුරුෂයෙක් කවර නම් මනුෂ්‍යයෙක් මෙකී ගාන්ධර්වාදීන් අතරෙන් අභිමතාර්ථ සිද්ධකරන්නට සමර්ථවූ කවර නම් පණ්ඩිතයෙක් බොහෝකලක සිට දොළ උපන්නාවූ මාගේ මැතියන්ට විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය දීමෙන් මනදොළ පුරා මටත් සවාමීවන්නේදැයි කීව.

එකෙණෙහි වෙසවුණු රජ්ජුරුවන්ගේ බෑනනුවූ පූර්ණක නම් යක්ෂ සෙනාධිපතීතෙමේ තුන්ගව්වක් පමණ මනොමය සෛන්ධවයකු පිටට පැන නැගී කාළගිරිපර්වත මස්තකයෙන් රත්ගල් තලායෙහි යක්ෂ සමාගමයට යන්නේ ඒ ඉරන්දතී නම් නාගකන්‍යාවගේ ගීතිකා ශබ්දය අනතුරු ආත්මභාවයෙහි භාර්‍ය්‍යාවව ස්ත්‍රියගේ ගීතිකා ශබ්දය ඡවි ආදිය විනිවිදගෙණ ගොස් ඇටමිදුළු පැහැර සිටියේය. ඒ පූර්ණක නම් යක්ෂසෙනාධිපතියා ඉරන්දතී නම් නාගකන්‍යාව කෙරෙහි පිළිබඳ සිත් ඇතිව කරකැවී සෛන්ධවයා පිට හිඳම කියන්නේ සොඳුර, මම මාගේ ප්‍රඥයෙන් දැහැමින් සෙමින් විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශය ගෙණෙන්නට සමර්ථයෙමි. තී ශොකයක් නොසිතාවයි කියා ඈ අස්වසමින් මෙසේ කීය. අගර්භිතලොචනයන් ඇත්තාවූ නාගකන්‍යා තී අස්වැසිලි ලබව, බයකුත් නොසිතව, මම තිට සවාමිවෙමි. භ්‍රාතෘවෙමි. මාගේ ප්‍රඥව විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය ගෙණෙන්නට සමර්ථවෙයි, එසේ හෙයින් තී අස්වැසිලි ලබව, විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය ගෙණෙන්නට මා සමර්ථ හෙයින් තී මට භාර්‍ය්‍යාවන්නෙහිවේදැයි කීවේය.

ඉක්බිත්තෙන් යක්ෂසෙනාධිපතිහු මෙසේ කියා ඒ කන්‍යාව අසුපිට හිඳුවාගෙණ යෙම් සිතා පණ්ඩිත මස්තකයෙන් බැස ඒ නාගකන්‍යාව අල්වාගන්නට අත දික්කෙළේය. ඕතොමෝ තමාගේ අත අල්වාගත නොදී ඔහු දික්කළ අත තොමෝ අල්වාගෙණ අනුතුරු ජාතියෙහි සවාමිව ආවාවූ ඒ පූණ්ක නම් යක්ෂයා කෙරෙහි පූර්වජාතියෙන් වාසනාව ආවාවූ සිතින් යක්ෂයාට කියන්නී සවාමීනි, මම අනාථ අසරණ එකියක් නොවෙමි. මාගේ පියානෝ වරුණ නම් නාරජ්ජුරුවෝය. මෑනියෝ විමලා නම් බිසවුය. එසේහෙයින් මාගේ පියානන්වහන්සේ සමීපයට දෙන්නම යම්හ. අප දෙදෙනා ඔබ ගියකල්හි අපගේ පිය රජ්ජුරුවන් වහන්සේ තොප අප දෙදෙනාගේ ආවාහ විවාහ වශයෙන්වූ මේ මඞ්ගලාර්ථය කියනසේකැයි ඒ ඉරන්දතී නම් නාගකන්‍යාතොමෝ පූණ්ක නම් යක්ෂයාට කිව මෙසේ කියා නාගකන්‍යා තොමෝ සර්වාභරණයෙන් සැදී මනාවූ සළු හැඳ මල් පැලඳ සඳුන්විලවුන් ගල්වාගත්තී පූණ්කනම් යක්ෂයා අත අල්වාගෙණ පිය රජ්ජුරුවන් සමීපයට ගියාය. පූණ්ක නම් යක්ෂයාත් තමා ආ බව කියා යවා නා රජ්ජුරුවන් සමීපයට ගොස් ඉරන්දතී නම් නාගකන්‍යාව තමා හිමිකොට ඉල්වමින් මෙසේ කීය. නාගොත්තමයානන් වහන්ස, මාගේ තෙපුල් අසව, තොපගේ බන්ධුකුලයට සුදුසුවූ තොප දුව නිසා මා පඬුරු කොට දියයුතුවූ මේ වස්තුව ඇර ගණුව, මම තොපගේ දූවූ ඉරන්දතී මටම භාර්‍ය්‍යාකොට පතමි. තොපි ඉරන්දතිය හා මා හා අප දෙදෙනාගේ සමඟ බව කරව නාරජ්ජුරුවෙනි ඇතුන් සියයක්ද, අසුන් සියයක්ද, උත්තම අශ්වයන් යෙදූ රථසියයක්ද, යන මේ වුක්තප්‍රකාර වස්තූන් ඇරගණුව, තොපගේ දූවූ ඉරන්දතී නම් නාගකන්‍යාව මට භාර්‍ය්‍යාකොට පාවා දෙවයි කීහ.

ඉක්බිත්තෙන් ඕහට නාරජ්ජුරුවෝ කියන්නාහු පින්වත්වූ යක්ෂසෙනාධිපතිය, මම තට මාගේ දුව දෙම්මය, මඳක් තෝ ඉවසා මා කියන්නක් අසව, මල්බෑ ආදීවූ නෑයන් හා සබඳ ජනයන් ගෙන් මේ කටයුතුද? නොකටයුතුදැයි මෙසේ කර්තව්‍යාකර්තව්‍ය විචාරීම යම්තාක් කලකින් කරමෝ නම් ඒ තාක්කල් ඉක්මන් නොවී හැම්මෙව, ඊට කාරණා කවරේද? ස්ත්‍රීහු වනාහි ගිය තැන ඇලෙන්නාහුත් වෙති. නෑලෙන්නාහුත් වෙති. සවාමිකුලයට ගියාවූ ස්ත්‍රීන් අනභිරතියෙන් පීඩිතව නැවත දෙමව්පියන් කරා ආ කල්හි නෑයන් ආදීවූ ජනයෝ අප හා සමඟ කථාතොකොට කළාවූ කාර්‍ය්‍යය මෙබඳු වන්නේවේදැයි පැමිණි කාර්‍ය්‍යයක ස්වොත්සාහවත්ව නොබැදෙන්නාහ. එසේ කල්හි බන්ධූන් හා කථාතොකොට කරණලද කාර්‍ය්‍යය පසුතැවිලියට පමුණුවන්නේයයි කීහ. ඉක්බිත්තෙන් ඒ වරුණ නම් නා රජ්ජුරුවෝ පූණ්ක නම් යක්ෂයා පිටත රඳවා විමලා දෙවීන් වසන ප්‍රාසාදයට වැද භාර්‍ය්‍යාවවූ විමලා දෙවීන් සමීපයට කැඳවා කියන්නාහු මේ පූණ්ක නම් යක්ෂසෙනාධිපතියා අපගේ ඉරන්දතී නම් නාග කන්‍යාව ඉල්වන්නේය. මුතුමැණික් ආදීවූ බොහෝ වස්තු ලාභයළුෟ ගෙන් ඇරගෙණ අපගේ ප්‍රියවූ ඉරන්දතී නම් නාගකන්‍යාව ඕහට භාර්‍ය්‍යාවකොට පාවා දෙමෝද? විමලාවෙනියි විචාළහ.

එබස් අසා විමලාදේවී කියන්නී නා රජ්ජුරුවන් වහන්ස, අපගේ දූ වූ ඉරන්දතී තොමෝ ඒ මුක්තාමාණික්‍යාදිවූ වස්තු නිසාවත් අවශෙෂ සන්තොෂ කාරණයක් නිසාවත් ඔබට නොලැබෙන්නීය. වස්තු නිසා සන්තොෂකාරණා නිසා ඔබට අපේ ඉරන්දතිය නොදෙම්හ. ඉදින් විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශය ගෙණාවොත් ඉරන්දතිය පාවාදෙම්හ. නැත්නම් මෙයින් පිටත් අනික් වස්තුවකට අපගේ දුව පාවා නොදෙම්හයි කීවාය. විමලාවන්ගේ වාර්තානන්තරයෙන් ඒ වරුණනම් නාරජ්ජුරුවෝ විමලාවන් වසන ප්‍රාසාදයෙන් මැතව ඉක්ම පූර්ණක නම් යක්ෂයා කැඳවා විමලාවන් කී වාර්තාව කියන්නාහු යක්ෂ සෙනාධිපතිය, අපගේ දුව ඉරන්දතී තොමෝ මුක්තාමාණික්‍යාදී වස්තුවක් සන්තොෂ කාරණයක් නිසාවත් තොපට නොලැබෙන්නීය. ඉදින් විදුර පණ්ඩිතයන්ගේ දූහැමින් සෙමින් ලද්දූවූ හෘදය මාංශය මේ නාගභවනයට ගෙනෙන්නට තෙපි සමර්ථයෝ නම් මේ සන්තොෂ කාරණයෙන් තොපට කුමාරිකාව ලැබෙන්නීය. මෙයින් පිටත් අනික් වස්තුවක් ඔත්තෙහි නො පතම්හ. අපට වස්තු නමුත් සතුටු නමුත් විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය මය මෙයින් පිටත් අනික් වස්තුවකට අපගේ දුව පාවා නොදෙම්හයි කීහ.

එබස් අසා පූර්ණකයා කියන්නේ මේ සත්ත්වලොකයෙහි සමහර කෙණෙක් යමක්හු පණ්ඩිතයයි කියත් නම් ඔහු නැවත අනික් සමහර කෙණෙක් අඥනයයි කියති මේ ප්‍රඥවත් පුද්ගලයා කෙරෙහි ජනයෝ මෙසේ විරොධයක් කියති. නා රජ්ජුරුවෙනි, මේ කාරණය මටවූ පරිද්දෙන් කියව තෙපි කවුරුන් නම් පණ්ඩිතයයි කියවුදැයි විචාළේය. එබස් අසා නාරජ්ජුරුවෝ කියන්නාහු කුරුරටවාසීවූ ධනඤ්ජය කෞරව්‍ය නම් රජ්ජුරුවන්ගේ ප්‍රඥායෙන් යශසින් කීර්තියෙන් මුළුලොව සමයක්හු නැතිහෙයින් විධුර නම්වූ අමාත්‍යයෙක් ඇත ඉදින් තොප විසින් නමින් පුවතින් අසනලදවිරූ ඇත් නම් ඒ විධුර පණ්ඩිතයන් දූහැමින් සෙමින් ලැබ අප කරා ගෙණෙව, එසේ කල්හි අපගේ දූවූ ඉරන්දතීතොමෝ තොපට පාදපරිචාරිකා වන්නීයයි කීහ. ඒ පූර්ණක නම් යක්ෂසෙනාධිපතියා වරුණ නම් නාරජ්ජුරුවන්ගේ වුක්ත ප්‍රකාරවූ වාර්තාව අසා විශෙෂයෙන් ප්‍රීතිමත්වූයේ හුනස්නෙන් නැගී සිට එතැන්හිම සිටියේ තමාගේ උපසථායක පුරුෂයක්හට නියොග කරන්නේ අශ්වාලංකාරයෙන් සරහනලද කාරණා කාරණා දන්නා සෛන්ධව අශ්වයකු මේ තැනට ගෙණෙවයි නියොග කෙළේය. මෙසේ විධානකොට නැවත ඒ අශ්වයා වර්ණනා කරන්නේ සුවිශුද්ධවූ සුවර්ණමයවූ කන් සඟලක් ඇති පද්මරාග මාණික්‍යමයවූ කුර ඇති ජාම්බොනද ස්වර්ණයෙන් කරණ ලද්දූවූ උරසැන් මාලාව හා කරපලඳනා ග්‍රීවාභරණයන් ඇති මෙබඳුවූ සෛන්ධව අශ්වයෙකු මෙතැනට වහාම සරහා ගෙණෙවයි නියොග කෙළේය. ඒ පුරුෂයා එකෙණෙහිම ඒ මනොමයවූ සෛන්ධවයා සියලු අශ්වාලංකාරයෙන් සරහා එතැනටම ගෙණායේය. එකල්හි සර්වාභරණයෙන් හෙබියාවූ මණ්ඩන වශයෙන් සරහන ලද කෙස් හා දැලිරැවුල් ඇති පූර්ණක නම් යක්ෂ සෙනාධිපති තෙමේ දිව්‍ය සඞ්ඛ්‍යාතවූ ඉසිලිය යුත්තාවූත් උසුලන්නාවූ යාමට කාරණාවූ ඒ මනොමය සෛන්ධව අශ්වයා පිටට පැන නැගී වෙහාස සඞ්ඛ්‍යාතවූ ආකාශයෙන් ගියේය. ඒ පූර්ණක නම් යක්ෂසෙනාධිපතියා පඤ්චකාමරාගයෙන් ලොල් වූයේ ඉරන්දතී නම් නාගකන්‍යාව පතමින් ගොස් යක්ෂෙශ්වරවූ පරිවාර

සම්පත් ඇති වෛසාණ නම් රාජධානියට නායක ඒ කුවෙර නම් රජ්ජුරුවන්ට මෙසේ කීහ. මහරජ්ජුරුවන්වහන්ස, වරුණ නම් නාරජ්ජුරුවන්ගේ රාජභවනයෙහිවූ ප්‍රාසාදය හිරණ්‍ය සවර්ණ මුක්තා මාණික්‍යාදී අනෙකප්‍රකාරවූ අප්‍රමාණ වස්තුයෙන් සමෘද්ධ හෙයින් භොගවතී යයි කියාද සථාන ගමනාදි චතුර්විධ ඊර්‍යාපථයෙන් නිරන්තර වාසසථාන හෙයින් වාසයයි කියාද, සවර්ණ ප්‍රාකාරාදියෙන් පරික්ෂිප්ත හෙයින් හිරඤ්ඤවතීයයි කියාද කියනු ලැබෙයි. නැවත ඒ රජ්ජුරුවෝත් පුණ්‍යකර්මයෙන් නිර්මිතයහ. හාත්පසින් කනකමය විචිත්‍ර විශාල උත්තම භොග මණ්ඩලයෙන් සමන්විතය. අනෙක ප්‍රකාර විසිතුරුවූ කර්මාන්තයෙන් කොට නිමවනලද්දේය.

තවද මහරජ්ජුරුවන් වහන්ස, උත්පත්ති ක්ෂණයෙහි පරිපූර්ණායතන ඇති බැවින් ඕපපාතිකවූ මහත් ඍද්ධි ඇති වරුණ නම් නාරජ්ජුරුවෝ යම් නාගභවනයෙක වෙසෙත් නම් ඒ නාගභවනයෙහි ඔටුවන් කරසටහනින් කරණ ලද්දාවූ පද්මරාග මාණික්‍යමයවූ අට්ටාල හා මැසිරිගල්මයවූ අනෙක ප්‍රකාරවූ අට්ටාලයෝද ඇත, නැවත ඒ නාගභවනයෙහි රන් උළුයින් රුවන් උළුයින් සොයන ලද්දාවූ මාණික්‍යමයවූ අනෙකවිධවූ ප්‍රාසාදයෝද ඇත. තවද ඒ නාගභවනයෙහි අඹගස්, ඇසලගස්, දඹගස්, රුක්අත්තනගස්, දියමිදෙල්ල ගස්, දුනුකේ ගස්, වැටකේ ගස්, පියල්ගස්, එරහැන්දගස්, මීඅඹගස්, එරබදු ගස්, රත්නිකගස්, එළනිකගස්, සපුගස්, නාගස්, ගිරිතිල්ල, යොහොඹු, කළුගස් ආදී කුසුමිත ඵලිත ආදී වුක්තප්‍රකාර මේ වෘක්ෂයෝ අන්‍යොන්‍යාශක්ත ශාඛායෙන් ආකුලව්‍යාකුලව හිවි ගැවසී සිටියාහු වරුණ නම් නාරජ්ජුරුවන්ගේ භවනය හාත් පසින් හොබනාහ.

තවද ඒ නාරජ්ජුරුවන් වසන්නාවූ නාගභවනයෙහි ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ හිඳිගස් බොහෝ වන්නේය. ඒ ඉඳිරුක් රත්වන් මලින් හැම සෘතුයෙහි සතතයෙන් මල්ගෙණ සිටිනේය. ඒ වරුණ නම් නාරජ්ජුරුවන්ගේ කුමාර අවසථායෙහි පුරුදුවූ භාය්‍යාවක් ඇත, නිර්මලවූ අඞ්ගප්‍රත්‍යඞ්ග ඇති හෙයින් ඕ තොමෝ නමින් විමලා නම් වන්නීය රන්රූසක් බඳුම ශරීර ඇත්තේය, ලීලොපේත කළුවැල් දලුවක් මෙන් සෘජුව වැඩුනීය, කොසඹ ඵලයව බඳුවූ සව හන් ඇති තනපුඩු ඇත්තීය, මනකල් දැකුම් ඇත්තීය, රුවින් ලාක්ෂාරස මෙන් අතිරක්තවූ අතුල්තල පතුල් තලයක්හි සියුම් මහා ඡවි ඇත්තීය, මොලොක් කොමල රත් අතුල් පතුල් ඇත්තීය, වාසසථානයෙහි මූලපටන් ශාඛාග්‍රය දක්වා පිපී සිටි කිණිහිරි රුකක් වැන්නීය, තවුතිසා දිව්‍යපුරයෙහි ලීලොපෙතව හැසිරෙන්නාවූ දෙවඟනක වැන්නීය, මෙඝවලා අතරෙන් නික්මුණාවූ විදුලිය කළඹක් වැන්නිය, සිනා පෙරදැරිවූ තෙපුල් ඇති මෙබඳුවූ ශරීර සෞන්දර්‍යයී ඇති විමලා නම් නාගකන්‍යාතොමෝ හටගත් දොළ ඇත්තී විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංසය පතන්නීය, භූතෙශ්වරවූ වෙසවුණු මහරජ්ජුරුවන් වහන්ස, ඒ විධුර පණ්ඩිතයන්වහන්සේගේ හෘදය මාංශය මම ඔවුනට දෙමි. ඒ විමලාවන් හා වරුණ නම් නාරජ්ජුරුවන් හා දෙදෙන ඒ හෘදය මාංශය ලැබීමෙන් සතුටු වූවාහු තමා දුව ඉරන්දතී නම් නාගකන්‍යාව මට පාවා දෙන්නාහුයයි කීය. මෙසේ

පූර්ණක නම් යක්ෂසෙනාධිපති තෙමේ වෙසවුණු රජ්ජුරුවන් විසින් අනු නො දන්නා ලද්දේ යා නොහී ඒ රජ්ජුරුවන්ට තමා යන නියාව දන්වනු පිණිස මේ වුක්ත ප්‍රකාර නාගලොක වර්ණනාව කෙළේය. වෙසවුණු මහරජ්ජුරුවෝ වූකලී ඔහුගේ කථාව නොඅසා දිව්‍යපුත්‍රයන් දෙදෙනකුගේ විමත් යුක්තියක් පසිඳිනාහ, පූර්ණක නම් යක්ෂයා තමාගේ වචනය නොඇසූ නියාව දූත ජය ගන්නාවූ දිව්‍යපුත්‍රයා සමීපයෙහි සිටියේය. වෙසවුණු මහරජ්ජුරුවෝ යුක්ති විචාරා සනිටුහන් කොට පැරදී දිව්‍යපුත්‍රයා නොයවා නොපැරදී දිව්‍යපුත්‍රයාට කියන්නේ තා ගොස් තාගේ විමානයෙහි වසවයි කීහ. පූර්ණකයා තෝ පලායයි කී බස් හා සමඟ මාගේ මයිලනුවන් වහන්සේ විසින් මා යැවූ නියාව හැමදෙනම දනුවයි දිව්‍යපුත්‍රයන් කීපදෙනකු ශාක්ෂිකොට භූතෙශ්වරවූ යශ පිරිවර ඇත්තාවූ විසාණා නම් රාජධානියට රජවූ කුවේර නම් රජ්ජුරුවන්ට කියා හුනස්නෙන් නැගී එතැන්හිම සිටි පුරුෂ යක්ෂයක්හට නියොග කරන්නේ කනකමයවූ කන් සඟලක් ඇති පද්මරාග මාණික්‍යමයවූ කුර ඇති ජාම්බොනද සවර්ණයෙන් කරණ ලද්දාවූ උරසැත්මාලා ඇති කරපළඳනා අවශෙෂවූ අශ්වාභරණයන් ඇති මෙසේ මෙබඳුවූ අශ්වාලංකාරයෙන් සරහන ලද කාරණා කාරණා දන්නාවූ සෛන්ධව අශ්වයකු මෙතැනට ගෙණෙවයි නියොග කෙළේය.

ඉක්බිත්තෙන් සර්වාභරණයෙන් හෙබියාවූ මණ්ඩන වශයෙන් සරහා සිටුවනලද කෙස් හා දැළි රැවුල් ඇති පූර්ණක නම් යක්ෂ සෙනාධිපති තෙමේ දිව්‍යමයවූ තමා උසුලන්නාවූ යාමට කාරණාවූ වුක්ත ප්‍රකාර ඒ මනොමය සෛන්ධව අශ්වයා පිටට පැනනැගී වෙහාස සංඛ්‍යාතවූ ආකාශයෙන් ගියේය. පූර්ණක නම් යක්ෂයා ආකාශයේ යෙමින් සිට සිතන්නේ විධුර පණ්ඩිතයෝ මහත්වූ පිරිවර ඇත්තාහ. එසේ හෙයින් උන් අල්වා ගන්නට නොපිළිවන, ධනඤ්ජය කොරව්‍ය නම් රජ්ජුරුවෝ වූකලී දූකෙළියෙහි බලවත්වූ අභිලාෂ ඇත්තෝය, එසේ හෙයින් උන් හා කැටිව දූකෙළ ඒ රජ්ජුරුවන් දූකෙළියෙන් පරදවා මම ජයගෙණ විධුර පණ්ඩිතයන් ගණිමි. ඒ රජ්ජුරුවන්ගේ භාණ්ඩාගාරයේ බොහෝ රත් රුවන් ඇත. එසේ හෙයින් ඒ රජ්ජුරුවෝ මඳක් අගනා පරදු කොට තිබියයුතු වස්තුයෙන් දූ නොකෙළිති, මාහැඟි රත්නයක් ගෙණ යන්නට වටනේය. අන් රුවනක් රජ්ජුරුවෝ නොගණිති, රජගහ නුවර සමීපයෙහිවූ වෙපුල්ල පර්වතාභ්‍යන්තරයෙහි චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ පරිභොගයට සුදුසුවූ මාණික්‍ය රත්නයෙක් ඇත, ඒ මහානුභාව සම්පන්නවූ මාණික්‍ය රත්නය ගෙණ ඒ මැණිකෙන් රජ්ජුරුවන් පොළඹවා ගෙණ රජ්ජුරුවන් ජයගණිමි සිතා එපරිද්දෙන්ම කෙළේය.

ඉක්බිත්තෙන් අගු රජ්ජුරුවන්ගේ රාජ්‍යාර්පිවූ ශත්‍රුරජ්ජුරුවන් විසින් මැඩපිය නොහැක්කාවූ බොහෝ කනදෑ හා බොහෝ බත් ඇති සක්දෙව් රජහුගේ මෙරමුදුනෙහි මවනලද හෙයින් මසක්කසාර යයි කියනලද ශක්‍රභවනය වැනිවූ අතිරම්‍යවූ මෙබඳුවූ රජගහනුවරට ඒ පූර්ණක නම් යක්ෂසෙනාධිපති තෙමේ ඒ මනොමය සෛන්ධවයා පිටට පැන නැගී ගියේය. මොණරුන් කොස් ලිහිණින් කුරවිකෙවිල්ලන් ගිරවුන් ආදීවූ ලිහිණි සමූහයා විසින් රැවූ පිළිරුවූ දෙනලද්දාවූ මනොඥවූ හෙළිව තිබෙන්නාවූ රම්‍යවූ භූමිභාග ඇති සපු දුනුකේ

ආදිවූ නොයෙක් කුසුම් පතරින් ගැවසීගත් හිමාලය පර්වතය වැනිවූ පර්වතයන් අතරෙන් උස්වූ කිම්පුරුෂ කින්නරාඞ්ගනාවන් විසින් ගැවසීගත් මෙබඳුවූ වෙපුල්ල නම් පර්වතයට ඒ පූර්ණක නම් යක්‍ෂසේනාධිපති තෙමේ පැන නැංගේය, ඒ මාණික්‍ය රත්නය කුම්භීර නම් යක්‍ෂයෙක් කුම්භාණ්ඩයන් ලක්‍ෂයක්දෙනා විසින් පිරිවරණලදුව රක්නේය. ඒ යක්‍ෂයා වූකලී පූර්ණකයා විසින් කිපී බැලූ පමණකින්ම හයින් තැතිගෙණ පලාගොස් සක්වළගල මුදුනට පැමිණ වෙවුලමින් බල බලා සිටියේය. මෙසේ ඒ යක්‍ෂයා පලවා පූර්ණක නම් යක්‍ෂසේනාධිපතියා නභොමධ්‍යගතවූ සූර්‍ය්‍ය මණ්ඩලය මෙන් දිලියෙන්නාවූ පරිවාර මාණික්‍ය රත්න සමූහයෙන් සශ්‍රීකවූ මහානුභාව සම්පන්නවූ ඒ මාණික්‍ය රත්නය ආකාශයෙහි විදුලියක් මෙන් බබලන්නේය. ප්‍රභා විහිදුවන්නාවූ ජාතිමත්වූ සිතූ පැතූ කැමති වස්තු එලවන්නාවූ ඒ මාණික්‍ය රත්නය දුක මාහැඟිවූ සිතින් කැමති වස්තු එලවන හෙයින් මනෝහර නම්වූ මහත්වූ රත්නානුභාව ඇති ඒ මාණික්‍ය රත්නය මෙසේ ඇරගෙණ අලාමකවූ ශරීර වර්ණ ඇති ඒ පූර්ණක නම් යක්‍ෂතෙමේ ඒ මනෝමය සෛන්ධව අශ්වයා පිට්ට පැනනැඟී ආකාශයෙන් ගියේ කුරුරට ඉඳිපත් නුවරට ගොස් අශ්වපිටින් බැස අශ්ව නොපෙණෙන පරිද්දෙන් අදෘශ්‍යමානවූ කයින් සිටුවා රාජකෘත්‍ය ආදියෙහි සාමග්‍රිවූ නොයෙක් ජනයන්ගේ රැස්වීම් ඇති කුරුරට වාසී රජදරුවන්ගේ සභාවට ප්‍රසාදවහවූ මානවක වේශයකින් ගියේය. ගොසින් නිර්භීතව සිට රැස්ව උන් සියයක් රජදරුවන් ද්‍යූතක්‍රීඩාවට කැඳවා ගෙන්විය ඒ කෙසේද යත්? මේ රාජසමාගමයෙහි රජදරුවන් අතරෙන් කවර නම් රජෙක් මා සන්තකවූ මේ උත්තම රත්නය ජයගෙණ 'මම පරදවමි' කියන්නට සමර්ථද? මේ උත්තම ධනයෙන් අපි කවර කෙණෙකුන් පරදමෝද? දිනන්නමෝත් අසදෘශවූ උත්තම රත්නයෙන් අපි කවර කෙණෙකුන් ජයගණුමෝද? නැවත උතුම්වූ ධනයෙන් කවර රජ්ජුරු කෙණෙක් අප පරදවද්දැයි මෙසේ පූර්ණක නම් යක්‍ෂයා සතර පරිද්දෙන්ම විශෙෂයෙන් ධනඤ්ජය කෞරව්‍ය නම් රජ්ජුරුවන් උදෙසා මෙසේ කීහ.

ඉක්බිත්තෙන් ධනඤ්ජය කෞරව්‍ය රජ්ජුරුවෝ මා විසින් මට පළමු මෙසේ නිර්භීතව කියන්නාවූ එකක්හු දුටු විරූතැන් නැත, මේ තෙමේ කවරෙක්දෝහෝයි සිතා විචාරන්නාහු මෙසේ කීහ. මානවකය, තාගේ රටකොයිද? තාගේ මේ කියන්නාවූ බස් අපගේ කුරුරට වැසි පුරුෂයක්හුගේ තෙපුල් වැන්නේ නොවෙයි. අප හැමගේ ශරීරප්‍රභාවන් තාගේ ශරීරප්‍රභායෙන් මැඩ පැවැත්තෙහිය. එසේ හෙයින් තාගේ නෑයන්වූ පරිදි මට කියාලවයි කීහ. එබස් අසා පූර්ණකයා සිතන්නේ මේ රජ්ජුරුවන් වහන්සේ මා අතින් නම් විචාරණ සේක. පූර්ණකයයි කියා දාසයන්ට නමෙක් වන්නේය. ඉදින් මම පූර්ණකයයි කියෙම්වීම් නම් මේ තෙමේ එක් දාසයෙක් වන්නේය. එසේ හෙයින් තේජස්විව බුහුටි බැවින්ම මෙසේ කියන්නේය. මට නින්ද‍කොට හෙලාදක්නා සේක. එසේහෙයින් අනතුරුවූ අතීතාත්ම භාවයෙහි මාගේ නම් මුන්වහන්සේට කියමි සිතා මෙසේ කීය. ධනඤ්ජය නම් මහරජ්ජුරුවන් වහන්ස, මම කාත්‍යායන නම් මානවකයෙක්මි. අනූනයයි කියාත් ඤාතිමිත්‍රයෝ මා කැඳවත්නාහ. අනූන ශබ්දය පරිපූර්ණාර්ථය ප්‍රකාශකරණ හෙයින් අනන්තර ජාති

යෙහිවූ කාත්‍යායන නාමය කියා තමාගේ පූර්ණක නාමය අනූන ශබ්දයෙන් හගවා කියන්නේ රජ්ජුරුවන් වහන්ස, මාගේ නෑයන් හා අවශෙෂ බන්ධුහු අගුරට කාලචම්පා නුවර වසන්නාහ. ද්‍යූත ක්‍රීඩායෙහි අභිලාෂයෙන් මේ කුරුරටට පැමිණියෙමියි කීය. එකල්හි ඕහට රජ්ජුරුවෝ කියන්නාහු මානවකය, තෝ කෙළියෙහි පැරැද්දේවී නම් කුමක් දෙයිද? තාගේ කෙබඳු වස්තුවෙක් ඇද්දැයි විචාරන්නාහු මෙසේ කීහ. තා පරදන්නාවූ අක්‍ෂධූර්තී තෙමේ ගෙණෙවයි කියා යම් වස්තුවක් තා ලවා ගෙන්වා නම් එසේ ගෙණහැර දෙන්නට සුදුසුවූ තාගේ මුක්තා මාණික්‍යාදිවූ කවර රත්නය විශෙෂයෙක් ඇද්ද? රජ්ජුරුවන්ගේ වූකලී මුක්තමාණික්‍යාදිවූ අනෙකවිධ රත්නයෝ ඇත. ඒ තෝ එබඳු රත්න විශෙෂයක් නැති හෙයින් දිළිඳු වූයෙහිද? එසේ බොහෝ වස්තු ඇති රජදරුවන් කවර කාරණයකින් ද්‍යූතක්‍රීඩාව පිණිස කැඳවයි දැයි විචාළහ.

ඉක්බිත්තෙන් පූණ්ණකයා කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස, මාගේ මේ මාණික්‍යරත්නය මනසින් ප්‍රාර්ථිතවූ වස්තුව එළවන හෙයින් මනොහර නම. එසේම සිතූ පැතූ වස්තු එළවන්නාවූ මහත්වූ ආනුභාව ඇති මාණික්‍ය රත්නයද ශත්‍රුසන්තාපය කරන්නාවූ මේ අජානීය අශ්වරත්නයදැයි යන මේ වස්තු දෙක අක්‍ෂධූර්තීතෙමේ දූකෙළ මා පරදවා ඇරගන්නේය. දූකෙළ පැරදී කල්හි දියයුතු මාගේ වස්තු නම් මේ දෙකය; එහෙයින් කවුරුන් වුවත් මා හා සමග දූ කෙළ මා පරදවාපියා මේ වස්තු දෙක ඇරගණිති කීය. එබසට රජ්ජුරුවෝ කියන්නාහු මානවකය තාගේ තෙල එක මාණික්‍යරත්නය කවර අභිසිඬියක් කොට පියන්නට සමර්ථද? තෙල තාගේ එකම අජානීය සෛන්ධවයා කවර අභිවෘඬියක් කරන්නට සමර්ථද? මහ රජ්ජුරුවන් වහන්සේලාට වූකලී බොහෝවූ මාණික්‍යරත්නයෝත් ඇත පවන් හා සමානවූ ජව ඇති අජානීය සෛන්ධවයෝත් පමණ නැත්තාහයි කීහ. ඒ පූර්ණක නම් යක්‍ෂයා නැවතත් රජ්ජුරුවන්ගේ බස් අසා මහරජ්ජුරුවන්වහන්ස, කුමක් කියනසේක්ද? එකම අශ්වයා අසූත් දහසකටත් වඩා වටින්නේය. එකම මැණික මැණික් දහසකටත් වඩා වටින්නේය. සියලු අශ්වයෝ එක සාදෘශ්‍ය නොවෙති. එසේ හෙයින් මේ අශ්වයාගේ වූකලී ජව බැලුව මැනවැයි කියා අසුපිටට පැනනැගී පවුරසේ ඉසින් විහිදුවූයේය. සත්යොත්තක් පමණ ඉඳිපත්නුවර අශ්වයන් කරින්කර පහර වුන් සිසාළාක් මෙන් විය. ඉක්බිත්තෙන් අශ්වයා නොපෙණෙන්නේය. යක්‍ෂයාත් නොපෙණෙන්නේය. වට සිසාළ අලාත චක්‍රයක් මෙන් බඳවට සිසාළ රත් පට කඩම අතුරුනැතිව වට අයාලූවාක් මෙන් පෙණෙන්නේය. ඒ පූණ්ණක නම් යක්‍ෂයා අසුපිටින් බැස මහරජ්ජුරුවන් වහන්ස, අශ්වයාගේ ජව දුටුසේක්දැයි කීය. එසේය, දුටිමි කීකල්හි දූත් බැලුව මහරජ්ජුරුවන් වහන්ස,යි කියා අසු ඇතුළුනුවර ගෘහොද්‍යානයෙහි පොකුණපිට ජලමස්තකයෙහි විහිදුවිය. අශ්වයා කුරඅක් නොතෙමමින්ම දියපිට දිවගත ඉක්බිත්තෙන් ඔහු පොකුණෙහි පියුම් පත් මත්තේ ඇවිදුවා අත්ලෙන් අත්ල ගසා අත දික්කෙළේය. එකල්හි අශ්වයා අවුත් සතරකුරෙන් අත්ලෙහි සිටියේය. ඉක්බිත්තෙන් මහරජ්ජුරුවන්වහන්ස මෙබඳු අශ්වරත්නය පරදු තබන්නට වටනේදැයි කීකල්හි මානවකය, පරදු තබන්නට වටනේයයි කීහ. මහරජ්ජුරුවන් වහන්ස, අශ්වරත්නය වූකලී තව

තිබුන මැනව මාණික්‍යරත්නයාගේ ආනුභාව බැලුව මැනවයි කියා මාණික්‍ය රත්නයෙහි ආනුභාව ප්‍රකාශකොට දක්වන්නේ මෙසේ කීය. දෙපා ඇත්ත වුන්ට උතුම්වූ මහරජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ මාගේ මේ අභිමතාර්ථ සිඩිය කරන්නාවූ උතුම්වූ මාණික්‍යරත්නය බලා වදාළ මැනව. මේ මාණික්‍ය රත්නයෙහි සර්වාභරණයෙන් අලංකෘතවූ නානාප්‍රකාර ස්ත්‍රීරූපද, එසේම සර්වා භරණයෙන් අලංකෘතවූ අනෙකප්‍රකාර පුරුෂරූපද, නැවත මේ මාණික්‍යරත්න යෙහි නානාප්‍රකාර මෘගපක්ෂි සමූහයාගේ රූපද, මයුර චක්‍රවාකාදි අනෙකප්‍රකාර පක්ෂීන්ගේ රූපද, තක්ෂකපනන්දාදී අනෙකප්‍රකාර දිව්‍යනාගරාජයන්ගේ රූපද විශාල දෙහධාරීවූ නොයෙක් ගරුඩරාජයන්ගේ රූපද යන මේ ආශ්චර්‍ය්‍ය වස්තු මේ මාණික්‍ය රත්නයෙහි මවනලදුව පෙණෙන්නා බලා වදාළ මැනව, නැවත මහරජ්ජුරුවන් වහන්ස, අලංකෘතවූ අනෙකප්‍රකාර ඇත්ඇණිද, රථාලංකාර යන් අලංකෘතවූ රථඇණිද, එසේම අශ්වාලංකාරයෙන් අලංකෘතවූ අශ්ව යන්ද, සර්වාලංකාරයෙන් අලංකෘතවූ ශූරවූ පදාති යොධයන්ද, රක්ත නීල ශ්වෙතාදී භෙදයෙන් භින්නවූ නානාප්‍රකාරවූ ධජපංක්තිද යනු මේ වුක්තප්‍රකා රවූ සිවුරඟ සෙනඟද උත්තමවූ මේ මාණික්‍යරත්නයෙහි මවන ලදුව පෙණෙන්නා බලා වදාළමැනව මහරජ්ජුරුන් වහන්ස හස්ත්‍යාචාර්‍ය්‍යයන්ද අශ්වාචාර්‍ය්‍යයන්ද, රථාචාර්‍ය්‍යයන්ද, දක්ෂවූ පදාති යොධයන්ද සමූහවශයෙන් යුඩයට සැරහී දැන්ව බෙදී මුළුමුළුව සිටියාවූ මහසෙනඟද, බලා වදාළ මැනව. තව්ද මහරජ්ජුරුවන් වහන්ස, අනුප්‍රකාරයයි කියනලද පදනමින් යුක්තවූ අනන්තවූ ප්‍රකාරයෙන් හා තොරණින් සමන්විතවූ අතිමනොහරවූ නුවරද පරිශුද්ධවූ සතරමංසන්ධියද, නුවර ඒ ඒ ස්ථානයෙහි විචිත්‍රවූ භූමිභාගද මේ මාණික්‍යරත්නයෙහි පෙණෙන්නා බලා වදාළ මැනව, මහරජ්ජුරුවන්වහන්ස නුවර හිඳුවනලද්දාවූ එසික‍ස්තම්භද, අගුළුඉදිද, නුවරදොර කවුළුද, අට්ටාල දොරටුද යන මේ සියල්ල මේ මාණික්‍යරත්නයෙහි පෙණෙන්නා බලාවදාළ මැනව, මෙනෙකැයි විභාගකරණලද කොටස් හෙයින් පමණ කරණලද නො යෙක් ආපණිකජනයන් විසින් ආකීර්ණවූ නානාරත්නයෙන් සැදුම්ලද සල් පිල්ද ගෘහයන් හා ගෘහවස්තූන්ද ගෘහසන්ධි හා මැදින් විතිවිද නොයාහැකි කොවේද මැදින් කඩා යාහැකි මහවීපිද, නිර්මිතව පෙණෙන්නා බලාවදාළ මැනව, තවද මහරජ්ජුරුවන් වහන්ස, මත්ස්‍යමාංශාදියෙන් හා සුරාපාන යෙන් සමෘද්ධවූ රා ගෙවල්ද, එහි රත්න කුණ්ඩලාභරණාදියෙන් මණ්ඩිතව ආපානභූමිය හොබවමින් හුන්නාවූ රා සොඬුන්ද, මත්ස්‍යමාංශාදියෙන් හා සර්වොපකාරයෙන් සමෘද්ධවූ අගාණිද, ආහාරපානවර්ගයෙන් සමෘද්ධව තිබෙන් නාවූ මුළුතැන් ගෙවල්ද, වෙශ්‍යාස්ත්‍රීන්ද, යන මේ සියල්ල මේ මාණික්‍ය රත්නයෙහි නිර්මිතව පෙණෙන්නා බලා වදාළමැනව, තවද රජ්ජුරුවන් වහන්ස, මල්ගොතා පයිපුරාගෙණ ඒ ඒ තැන මල්විකුට ඇවිදිනා මාලාකාර යින්ද, පිළිපොඩි පිළිබැඳගෙණ ඇවිදිනාවූ රදවුන්ද, සුවඳ බඩු කරන්නාවූ ඔසදවටුවන්ද. නැවත පිළී විකුණන්නාවූ වෑපාරයන්ද අනෙකප්‍රකාර රත්නාභරණයන් කරන්නාවූ තරාලූන්ද, මැණික්සැට්ටරුන් හා ගල්වඩුවන්ද යන මේ සියල්ලවුන් මේ මාණික්‍යරත්ණයෙහි මවනලදුව පෙනෙන්නා බලා වදාළ මැනව, තවද මහරජ්ජුරුවන් වහන්ස, මාලු පිසන අරක්කැමියන් හා

බත්පිසන අරක්කැමියන්ද, නටන්නවුන් හා නටාංගීකියන්නවුන්ද. අත් ලාලා ගීකියන්නවුන් හා කළ බෙර ගසන්නවුන්ද, මහබෙර හා මිහිගු බෙරද, ශ්වෙත රජත කනකාදී නානාප්‍රකාරවූ සංඛ ද, පනාබෙර හා ඩැක් කිඳු, යන මේ සියලු බෙරගසන්නවුන් ද, නැටුම් හා මධුරස්වරයෙන් කියනලද ගීතිකාද, බෙරගැසීමෙන් ප්‍රතිරාව දෙන ආකාරද බලා වදාළමැනව, නවද මහරජ්ජුරුවන් වහන්ස! මේ මාණික්‍ය රත්නයෙහි කරණම් පනන්නාවුන්ද දැත්පොළා ගොස් මිටින් නෙරතුඅත්නා මල්ලවයන්ද ඉන්ද්‍රජාලපානා වුන්ද, හැඳ පැළඳ සුවඳ විලවුන්ගෙණ ජනමනොබන්ධනය කෙරෙමින් අන්තරවීථියේ ඇවිද නුවර හොබවන්නාවූ ස්ත්‍රී පුරුෂයන්ද, මළමිනී නගන් නාවූ සෝන් ගොව්වන්ද, දැළිරුවුල්කපා අන්දම් තබන කරණැවැමියන්ද. යන මේ සියල්ලවුන් මේ මාණික්‍යරත්නයෙහි නිර්මිතව පෙණෙන්නා බලා වදාළ මැනව, නවද රජ්ජුරුවන් වහන්ස! ස්ත්‍රී පුරුෂයන් විසින් ගැවසීගත් නාවූ ඇඳ මත්තෙහි ඇඳ බැන්දාවූ සළුන ඇති නෘත්‍ය මණ්ඩලයෝද පෙණෙන් නාහ. මෙබඳුවූ ආශ්චර්‍ය්‍ය විශෙෂය මේ මාණික්‍යරත්නයෙහි නිර්මිතව පෙණෙන්නා බලා වදාළ මැනව, නවද රජ්ජුරුවන්වහන්ස! මල්ලරංගයයි කියන ලද ආකාශ භූමියෙහි දැත් පොළා උනුන්ට වෙරවැදී නටා සිටියාවූ මේ මල්ලව භටයන්ද බැලුව මැනව, නැවත දිනාසිටි මල්ලවයන් ද, බිඳී පැරදී සිටි මල්ලවයන්ද බලා වදාළ මැනව. නවද රජ්ජුරුවන් වහන්ස! පර්‍වත ප්‍රාන්තයෙහි සිටිනා බොහෝවූ අනෙක ප්‍රාකාර සිවුපා සමූහයන් බලා වදාළ මැනව. කෙසේවූ අනෙකප්‍රකාර සිවුපා සමූහයන්දයත්? සිංහයන් හා ව්‍යාඝ්‍රයන්ද, වලසුන් හා කරබානා වලසුන්ද උඟරන් හා මූවන්ද, කොක්නා වුන් හා කැනහිලුන්ද, කගවිසණුන් හා ගවරුන්ද, වල්මීමුන් හා තිත්මුවන්ද රුරුමුවන් හා එනිමෘගයන්ද, මුවන් හා ගෝණුන්ද, පැහුරන් හා කාළ සිංහයන් ද කෙහෙල්මුවන් හා බොහෝවූ විසිතුරු මුවන් ද, වල්බවුන් හා සාවුන්ද, මීවින්නන් හා හුරුමීයන්දයි මෙසේ අනෙකප්‍රකාර සිවුපා සමූහ යන් විසින් ආකීර්ණව මේ මාණික්‍ය රත්නයෙහි නිර්මිතව පෙණෙන්නා බලා වදාළ මැනව, නවද මහරජ්ජුරුවන් වහන්ස! කිඹුලන් හා දැතිමෝරුන්ද, පැකිඹුලුන් හා මස්කාවුන්ද, කැස්බන් හා ඉදිබුවන්ද, පෙටියන් හා ලූල් මසුන්ද, වලසින් හා මුදුන්ද, සුංගන් හා රේමසුන්දයි මෙසේ ලැහැප් බැඳ අවිදිනා මස්කැලන් විසින් සෙවුනාලද රන්වැල්ලෙන් ගැවසීගත්නාවූ තීර ප්‍රදෙශ ඇති බස්නට සැපවූ තොට ඇති මෙබඳු නදීහු විප්‍රසන්නංයන් වහ නය කරන්නාහ. මෙසේ වුක්තප්‍රකාර මස්කැලන් විසින් ගහනවූ ගංගාවෝ මේ මාණික්‍යරත්නයෙහි පෙණෙන්නාහ, මහරජ්ජුරුවන් වහන්ස! මේ විස්තර බලා වදාළ මැනව, නවද රජ්ජුරුවන් වහන්ස! කෙතකී චම්පකාදී අනෙකප්‍රාකාර ද්‍රැම සමූහයන් විසින් ආකීර්ණවූ හංසචක්‍රවාකාදි අනෙක ප්‍රකාර පක්‍ෂි සමූහයන්ගෙන් ගහනවූ වෛඩූර්‍ය්‍ය මාණික්‍යමයවූ ගලතෙලෙහි පැහැර හඬන්නාවූ පක්‍ෂි සමූහයන් මේ මාණික්‍යරත්නයෙහි නිර්මිතව පෙණෙන්නා බලා වදාළ මැනව, නවද මහරජ්ජුරුවන් වහන්ස! මේ මාණික්‍යරත්නයෙහි නීර්‍ව්‍යාර වශයෙන් මනාකොට විභාග කරණ ලද්දාවූ සතරදික් ඇති නොයෙක් ලිහිණි සමූහයා විසින් ආකීර්ණවූ පිළිපොතු ඇති

මහමසුන් විසින් සෙවුනා ලද මෙබඳුවූ පුෂ්කරණීන්ද බලා වදාළ මැනව, තවද මහරජ්ජුරුවන් වහන්ස! හාත්පසින් කරදියවලල්ලෙන් ගැවසි ගත්තාවූ සාගරයම කුණ්ඩලාභරණ කොට හිමාලය වන රෙබායෙන් විශෙෂයෙන් නොබනාවූ මේ පෘථිවි මණ්ඩලයද බලා වදාළ මැනව, තවද මහරජ්ජුරුවන් වහන්ස! පූර්වදිග්භාගයෙන් පූර්වවිදෙහයද නැවත පශ්චිමදිග්භාගයෙහි අපරගොයානද, උතුරු දිග්භාගයෙහි උතුරුකුරු දිවයින හා දකුණු දිග්භාගයෙහි මේ ජම්බුද්වීපයද යන සතර මහා ද්වීපය මේ මාණික්‍යරත්නයෙහි නිර්මිතව පෙණෙන්නා බලා වදාළ මැනව, තවද මහරජ්ජුරුවන් වහන්ස! පූර්ව පශ්චිම දිග්භාගයන් බබළුවන්නාවූ මෙරගලවට ඇවිදිනාවූ චන්ද්‍රමණ්ඩලය හා සූර්‍ය්‍ය මණ්ඩලය යන මේ සඳ හිරු දෙදෙනාද, මහමෙරු පර්වතයේ හා හිමාලය පර්වතයද මහා සාගරයද යන සතරවරම් මහ රජදරුවන්ද, පුෂ්පාරාම ඵලාරාමායන් හා වනලැහැබ්ද, අත්ලගල් හා මනොඥ වූ කිඳුරන් විසින් ගැවසීගත්තාවූ ඉතා උස් ප්‍රාංශු පර්වතයද බොරළු දමුනුවනය හා චිත්‍රලතාවනයද මිශ්‍රක වනය හා නන්දනොද්‍යානයද වෛජයන්ත ප්‍රාසාදයද සුධර්මා නම් දිව්‍යසභාවද තවුතිසා දිව්‍යපුරයද සුපුෂ්පිතවූ පරසතු රුකද ඓරාවණ නම් හස්තිරාජයාද ආකාශයෙහි නැංගාවූ විදුලිය මෙන් නන්දනොද්‍යානයෙහි ලීලොපෙතව ඇවිදින්නාවූ දිව්‍යාඞ්ගනාවන් ද, දිව්‍යපුත්‍රයන් තමන් තමන්ගේ කටාක්ෂ විභ්‍රමයෙන් පොළඹවන්නාවූ දිව්‍යස්ත්‍රී ද නැවත දිව්‍යපුත්‍රයන් හාවභාවලීලායෙන් තමන් තමන් කෙරේ අලවන්නාවූ දිව්‍යස්ත්‍රීන් ද මේ මාණික්‍යරත්නයෙහි නිර්මිතව පෙණෙන්නා බලා වදාළ මැනව තවද මහරජ්ජුරුවන් වහන්ස! වෛරළුම්ණිමය පුවරු අතුළා වූ මනොඥවූ පැහැයෙන් දිලියෙන්නාවූ දහසකට අධිකවූ තවුතිසා දිව්‍යපුරයෙහි මෙබඳුවූ ප්‍රාසාදයන්ද චාතුර්මහාරාජිකය තාවතිංසය යාමය තුසීතය නිර්මාණරතිය පරනිර්මිතවසවර්තිය යන මේ සදිව්‍යලෝකයෙන්ද මේ මාණික්‍යරත්නයෙහි නිර්මිතව පෙණෙන්නා බැලුව මැනව. තවද පිරිසුදු අතිප්‍රසන්නවූ ජල ඇති ෂහල්මැල්ලෙන් හා රත්පියුම් හෙලපියුම් හා රතුපුල් නිලුපුල්මලින් ගැවසීගත් මෙබඳුවූ පුෂ්කරණීන්ද බලා වදාළ මැනව, තවද රජ්ජුරුවන් වහන්ස! මේ වුක්තප්‍රකාර මාණික්‍ය රත්නයෙහි සිත් අලවන්නා වූ සුදුඉරි දශයෙක නිල් ඉරි දශයෙක පිඟුවන් ඉරි විස්සෙක, කසාවන් ඉරි වීස්සෙක සාමවන් ඉරි තුදුසෙක රන්වන් ඉරි විස්සෙක එසේම රිදීමය ඉරි විස්සෙක රනිඳුගොච්වන් පිටපෑ හා සමානවූ වර්ණ ඇති මනොඥව පෙණෙන්නාවූ රත් ඉරි තිසෙක කළුඉරි සොළොසෙක, මඳටවන් ඉරි පස්විස්සෙක එකලූමඳට වන් ඉරි විස්සෙක, බඳුවද මලින් හා නිලුපුල්මලින් මුසුවූවාක් මෙන් විසිතුරුව සැදුම්ලද කළු ඉරි බඳුවදමලින් මිශ්‍රව යාමෙන් හොබනේය. මඳටවන් ඉරි නීල්මහනෙල් මලින් මිශ්‍රවයාමෙන් හොබනේය, ද්වීපදෙනනමවූ මහ රජ්ජුරුවන් වහන්ස! මෙසේ සියලු කාරණයෙන් හා සියලු අවයවයෙන් සමන්විතවූ ප්‍රභා විහිදෙන්නාවූ ශුභ කොට්ඨාසයයි කියනලද තිබියයුතු පරදුව බලා වදාළ මැනව. මහරජ්ජුරුවන් වහන්ස! යමෙක් ද්‍යූකෙළියෙන් පැරද වූයේවීනම් ඕහට මා දියයුතු වස්තු බලා වදාළමැනවැයි කීය. මෙසේ කියා පූර්ණක නම් යක්ෂ සෙනාධිපති තෙමේ මහ රජ්ජුරුවන් වහන්ස! මම ද්‍යූකෙළි ද්‍යූකෙළියෙන් පැරද්දේ වී නම් මේ මාණික්‍යරත්නය දෙමි. නුඹවහන්සේ කුමක් දෙනසේක්දැයි කීය. දරුව! මාගේ ශරීරයත් ධවලඡත්‍රයත් හැර

සෙසු මා සන්තක සියල්ල වඩිබිවවේයයි කිවූය. එබස් අසා පූණ්ණකයා එසේවීනම් මහරජ්ජුරුවන් වහන්ස! කල් නොයැවුව මැනව මේ මාණික්‍ය රත්නයෙහි නිර්මිත පෙණෙන්න බැලුව මැනව කීය. රජ්ජුරුවෝ එපවත් අසා අමාත්‍යයන්ට ද්‍යූතශාලාව සරසන්නට විධාන කළහ. එබස් ඇසූ අමාත්‍යයෝ වහා ද්‍යූතශාලාව සරහා රජ්ජුරුවන්ට උතුම්වූ කම්මාන්ත කරණ ලද ආස්තරණයක් හා අවශෙෂ රජදරුවන්වත් අසුන් පණවා පූණ්ණකයාටත් හිඳිනට සුදුසුවූ අස්නක් නියමකොට සලසා රජ්ජුරුවන්ට ද්‍යූත ක්‍රීඩාවට කල් දැන්වූහ.

ඉක්බිත්තෙන් පූණ්ණකයා රජ්ජුරුවන්ට කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස! ද්‍යූතශාලාවෙහි කළමනා කාර්‍ය්‍යය කොට නිමවනලද එහෙයින් අමාත්‍යයන් පිරිවරා දූකෙළනා ස්ථානයට වැඩියමැනව, නුඹවහන් සේගේ මෙබඳුවූ අභිමඞ්ගල සම්මතවූ මාණික්‍ය රත්නයෙක් භාණ්ඩාගාර යෙහි නැත මහ රජ්ජුරුවන් වහන්ස, කෙළනමෝ නම් දෙන්නම ධම්මයෙන්ම දිනම්හ. අධම්මයෙන් නොදිනම්හ. වැලි නුඹවහන්සේ මා විසින් ඉදින් දිනනලද සේක්වී නම් යුහුව නුඹවහන්සේ දෙමියි ප්‍රතිඥකළ වස්තුන් මට දුන මැනවැයි කීය. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ඔහට කියන්නෝ මාණවකය, මුන්වහන්සේ රජ්ජුරු කෙණෙකුන් වහන්සේ වේදැයි මාකෙරෙහි භයනොවව; අප දෙදෙනාගේ ජය පරාජය දැහැමින්ම වන්නේය. බලාත් කාරයෙන් නොවන්නේයයි කීහ. එබස් අසා පූණ්ණකයා කියන්නෝ අප දෙදෙනාගේ ජය දැහැමින්ම වන නියාව දත යුතුයයි රජ්ජුරුවන් සාක්ෂි කෙරෙමින් මෙසේ කීය. ප්‍රසිඬවූ පඤ්චාලදෙසයෙහි වසන්නාවූ රජ්ජුරුවන් වහන්සේද ශූරවූ සේනාව ඇති ශූරසෙනනම් රජ්ජුරුවන් වහන්සේද මච්ඡ නම් රට මච්ඡනම් රජ්ජුරුවන් වහන්සේද මද්‍රරට මද්‍රනම් රජ්ජුරුවන් වහන්සේද කෙකනම් දනව්ව හා සමග පවත්නාවූ කෙකා නම් රජ්ජුරුවන් වහන්සේද යන මේ රජදරුවන් අප දෙදෙනාගේ අවසඤ්ඤයෙන් කරණ ලබන්නාවූ ද්‍යූත යුඬය බලන්වා ජනසභායෙහි කිසිදෙයක් නොකරන්නෝ නොවෙති ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් දෙස්ගන්නේවන්මය. එසේ හෙයින් ඉදින් මෙ ද්‍යූත යුඬයෙහි කිසි අයුක්තියෙක් උපන නම් අපි නුදුටුම්හ නො ඇසුම් හයි කියන්නට සුදුසු නොවන්නේය. එසේ හෙයින් රාජසභාවෙහි උන් හැම රජදරුවන් වහන්සේම ඇසූ දුටු යුක්තිය පක්‍ෂපාත නොවී මඩ්‍යස්ථව කියයුතුයයි ඒ පූණ්ණකයා සභායෙහි රජදරුවන් මෙසේ දෙස් ගැන්විය.

ඉක්බිත්තෙන් ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ එක්සියයක් රාජ ධානියේ රජදරුවන් විසින් පිරිවරණ ලදුව පූණ්ණක නම් යක්‍ෂ සෙනාධිපතියා කැඳවා ගෙණගොස් ද්‍යූතශාලාවට වන්හ. සියලු රජදරුවෝ තමන් තමන්ට සුදුසු අසුන්වල හුන්හ, රජ්ජුරුවෝද දූ පෝරුවෙහි රන්පස ඇට තුබූහ, පූණ්ණකයා යුහුව කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස! පසඇටෙහි අය නම් මලියය, සාවටය, බහුලය, සන්තිභද්‍රය යනාදී විස්සක් අය ඇත, එබඳුවූ අයින් නුඹවහන්සේට අභිප්‍රාය අයක් ගනමැනවයි කීය. එබස් අසා රජ්ජු රුවෝ යහපතැයි ගිවිස බහුලනම් අය ගත්ග. පූණ්ණකයා සාවාට නම් අය ගත. එකල්හි රජ්ජුරුවෝ ඔහට කියන්නාහු එසේවීනම් දරුව මානවකය,

පස් ඇට දමවයි කිවූය. එබස් අසා මානවකයා කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස, පළමුකොට මට වාරය නොවන්නේය, නුඹවහන්සේ පළමුකොට පස ඇට දමුව මැනවැයි කීය. රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා යහපතැයි ගිවිස් සාහ. ඒ ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන්ගේ වූකලී තුන්වැනි ආත්මභාව යෙහි මැනියෝම ආරක්‍ෂා දෙවතාවූහ, එහේ හෙයින් දිව්‍යාඞ්ගනාවකගේ ආනුභාවයෙන් රජ්ජුරුවෝ දූකෙළියෙහි ජයගත්තාහ. එකල්හි ඒ දිව්‍යස්ත්‍රී දූ කෙළනා රජ්ජුරුවන්ට නුදුරුතැන සිටියාහ. රජ්ජුරුවෝ දිව්‍යස්ත්‍රිය සිහි කොට කළුවයස්සාරය තුකභාසය සතාදීන් අභිමත ද්‍යූතගීතිකාවක් කිය කියා පස ඇට අතින් සටා ආකාශයට දමූහ. එකල්හි පූණ්ණකයාගේ ආනුභාව යෙන් පසඇට රජ්ජුරුවන් පරදවමින් දූ පෝරුවේ වැටෙන්නට එන්නේය. රජ්ජුරුවෝද දූකෙළියෙහි දක්‍ෂ බැවින් තමන්ට ප්‍රයොග පසඇට බස්නා දැක දූ පෝරුවෙහි නොපියදී ආකාශයෙහිදීම ඇද අල්වාගෙණ තැවත පස ඇට ආකාශයට දමූහ. දෙවනුත් තමන්ට පරාජයට එන තියාව දැක පළමු පරිද්දෙන් ආකාශයෙහිදීම පසඇට ඇල්වූහ

ඉක්බිත්තෙන් පූණ්ණකයා සිතන්නේ මේ රජ්ජුරුවන්වහන්සේ මාබඳු යක්‍ෂයකු හා සමග දූ කෙළනාසේක් වැටෙන්නාවූ පසඇට දූපෝරුවෙහි හිය නොදී උඩසිස්පියදීම ගසා අල්වාගන්නාසේක. මීට කාරණා කිම්දෝ හෝයි සිතා ඒ පූණ්ණකයා කිපී එකක්හු මෙන් දිව්‍යස්ත්‍රිය මුහුණ බැලීය. එකල්හි ඒ දිව්‍යස්ත්‍රිය හයින් ත්‍රස්තව පලාගොස් සක්වළගල මුදුනට පැමිණ වෙවුල වෙවුලා සිටියාහ. රජ්ජුරුවෝ එපවත් නොදැන තුන්වැනිව ඒයෙහිත් පස ඇට දමා තමන්ට පරාජයව පස ඇට බස්නා තියාව දැන දැනත් පූණ්ණකයාගේ අනුභාවයෙන් අත දිගුකොට පස ඇට අල්වාගන්නට අසමර්ථ වූහ. එකල්හි ඒ පසඇට රජ්ජුරුවන් පරදවමින් දූ පෝරුවයෙහි වැටීහින, ඉක්බිත්තෙන් ඒ පූණ්ණකයා රජ්ජුරුවන් පැරදී තියාව දැක අතින් අතා, පොලා අත්පොළොසන්දී මහත්වූ ශබ්දයෙන් "ජයගතිමි, ජයගතිමි" කිය තුන්විටෙක හඬගැසූයේය. ඒ ශබ්දය සියලු දසදහසක් යොදුන් දඹදිව පැතිර සිටියේය. එකල්හි රජ්ජුරුවෝ පැරදී තැනැත්තෝ නොසතුටුවූ සිත් ඇතිවූහ.

ඉක්බිත්තෙන් පූණ්ණකයා රජ්ජුරුවන් නොසතුටුවූ තියාව දැන අස් වසා කියන්සේ මහරජ්ජුරුවන් වහන්ස, ජය පරාජය යන දෙක වියාී කරන්නාවූ දෙදෙනෙකු අතරෙන් එකකුහට වන්නේය. තුල්‍ය බව නොවන් නේය. එසේ හෙයින් පැරද්දෙමියි දොම්නස් නුවමැනව, ජනේන්ද්‍රවූ මහ රජ්ජුරුවන් වහන්ස, උතුම් ධනයෙන් දැන් පිරිහුනුසේක, එසේහෙයින් මා විසින් පරදවන ලද්දාවූ නුඹවහන්සේ මට වහා ජයපඬුරු දුනමැනවැයි කීය. එකල්හි ඔහට රජ්ජුරාවෝ ජයපඬුරු ගණුවයි කියන්නාහු කෘත්‍යාය නය, ඇතුන් අසුන් හා ගෙරිම්මුන්ද, මුක්තාමාණික්‍යාදිවූ දශවිධ රත්නයන් හා මාණික්‍යමයවූ කුණ්ඩලාභරයන්ද, පොළෝතෙලෙහි ධනයන් අතරෙන් උතුම්වූ මා සන්තක යම් අන්‍යවූ රත්නයෙක් ඇත්තම් ඒ සියල්ලද නා කැමති පරිද්දෙන් ඇරගණුව. එසේ ඇරගෙණ යම් මාගීයකින් යනු කැමැත් තේවීනම් ඒ මාගීයෙන් නික්මෙවයි කීහ. එබස් අසා පූණ්ණකයා කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස, ඇතුන් අසුන් හා ගෙරිම්වුන්ද, මුතු මැණික් ආදී වූ

දශවිධ රත්නයන් හා මාණික්‍ය කුණ්ඩලාභරණද පොළෝතෙලෙහි ධනයන් අතරෙන් උතුම්වූ නුඹවහන්සේ සන්තක අක්‍ෂවූ රත්නයෙක් ඇත්නම් ඒ යථොක්තවූ වස්තූද යන මේ සියල්ලට වඩා විධුර නම් අමාත්‍ය තෙමේ උතුම් වන්නේය. දූ කෙළ පරදවන්නාවූ මා විසින් විධුර පණ්ඩිතතෙමේ පරදවන ලද්දේය. එසේ හෙයින් ඔහු මට ජයපඬුරුකොට දුනමැනව, පොළෝතෙලෙහි යම් කිසි රත්නයෙක් ඇත්නම් ඒ සියලුම රත්නයම මා විසින් පරදවනලද, එසේවුවත් ඒ සියලු වස්තූන්ට වඩා උතුම්වූයේ නුඹ වහන්සේගේ අමාත්‍යරත්නය දූකෙළ නුඹවහන්සේ පරදවන්නාවූ මා විසින් ඔහු පැරදවීමි. ශරීරයත් සෙවතඡත්‍රයත් තබා ඉතිරි කිසියම් රත්නයෙක් ඇත්නම් දෙමියි පළමුව ප්‍රතිඥකළ බැවින් නුඹවහන්සේගේ ඒ අමාත්‍ය රත්නය මට දුන මැනවැයි කියා රත්නයෙහිම අනානගීතකොට ඉල්වූය, එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු පූර්ණකය! ඒ විධුර පණ්ඩිතයෝ මාගේ ආත්මය උදෙක් ආත්මය මතුත් නොවෙයි මට සරණය,. පිහිටය, රක්‍ෂාසථානය, නීල සථානය, පිළිසරණය, මාගේ ඒ අමාත්‍යතෙමේ සප්තවිධ රත්නයෙන් සමාන කොට හැක්කේය. ඒ අමාත්‍යතෙමේ මාගේ ජීවි ය හා සදෘශය, එසේහෙයින් පළමුකොට ආත්මය තබා සෙස්ස දෙමියි මා විසින් ප්‍රතිඥකළ බැවින් මේ පණ්ඩිතතෙමේ නම් මාගේ ආත්මයය එසේ හෙයින් ඔහු දෙන්නට නො පිළිවන් වේදැයි කීහ. එකල්හි පූර්ණකයා කියන්නේ මහ රජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේගේ හා මාගේ මේ කලහය බොහෝ කලක් පවත්නේය. එසේ හෙයින් ඒ පණ්ඩිතයන් සමීපයටම ගොස් විචාරම්හ. නුඹවහන්සේගේ ආත්මය ආත්මය නොවෙයි යන කාරණය ඒ පණ්ඩිතයෝම තුමූම අපට ප්‍රකාශ කෙරෙත්වයි ඒ පණ්ඩිතයෝ තුමූ යම්කාරණයක් කිවුනම් ඒ උන් කී කාරණාව අප දෙපක්‍ෂයටම බස්වේවයි කීය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ කියන්නාහු මානවකය! එකාන්තයෙන් තෝ සැබවක්ම කියන්නෙහිය, අධර්මයක් නොකියන්නෙහිය, තා කීවාසේ ඒ පණ්ඩිතයන් කී කාරණයක් ගෙණ සතුටුවම්හයි කීහ, මෙසේ කියා රජ්ජුරුවෝ එක්සියයක් රජදරුවනුත් පූර්ණකයාත් කැඳවාගෙණ සතුටුවූ සිත් ඇතිව වහ වහා ධර්ම සභාවට ගියහ, එකල්හි පණ්ඩිතයෝ ධර්මාසනයෙන් බැස රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටියාහ.

ඉක්බිත්තෙන් පූර්ණකයා මහබෝසතානන්ට ආමන්ත්‍රණය කොට කියන්නේ පණ්ඩිතයෙනි! තෙපි ධර්මයෙහි පිහිටියව, ජීවිතය නිසාවත් බොරු නොකියව, තොපගේ කීර්තිඝොෂාව සියලු ලොව පැතිර සිටියේය. මම වූකලී අද තොප ධර්මයෙහි පිහිටි නියාව දන්නා කැමැත්තම්හයි කීහ, මෙසේ කියා නැවත බොධිසත්වයන් අතින් එපවත් විචාරන්නේ පණ්ඩිත යෙනි! කුරුරට විධුර නම් අමාත්‍ය තෙමේ දශකුශල ධර්මයෙහි පිහිටසේ ජීවිතය විනාශවතුත් බොරුවක් නොකියන්නේය’යි දෙවතාවෝ මෙසේ කියති. එසේ කියන්නාවූ දෙවතාවෝ සැබෑවක් කියද්දෝහෝ නොහොත් බොරුවක් කියද්දෝ හෝ තෙපි වූකලී නොවලහා සැබෑවක්ම කියව. තෙපි රජ්ජුරුවන් වහන්සේගේ මිත්තතු කෙණෙක්ද? නොහොත් රජ්ජුරු වන් වහන්සේගේ නැකෙණෙක්ද? මේ සත්ව ලොකයෙහි විදුර යන මේ

ප්‍රඥප්තීය තොප කවර කෙණෙකුතැයි ප්‍රකාශ කෙරේද? තෙපි රජ්ජුරුවන් වහන්සේගේ ගැත්තනු කෙණෙක්ද නොහොත් ඉතා හිතකෙනෙක්ද? රජ්ජුරුවන්වහන්සේ හා සමකෙණෙක්ද? වහන්සේටත් වඩා අතහිකෙණෙක්ද? තොප බොරු නොකියතියි ලොකප්‍රසිඩ හෙයින් නොවලහා මට ඇතිසැටියම කියවයි කීය. එකල්හි මහබෝසතාණෝ සිතන්නාහු මේ මාණවකයා මා අතින් මෙසේ විචාරන්නේය. මම වූකලී රජ්ජුරුවන් වහන්සේගේ නෑකෙණෙක්මි කියාවත් රජ්ජුරුවන් වහන්සේට උත්තරීතරයෙමි කියාවත් රජ්ජුරුවන් වහන්සේට මා වත දෙයෙක් නැතැයි කියාවත් මොහු ගිවිස්සන්නට සමර්ථයෙමි. එසේවූවත් මේ ලොකයෙහි සත්‍යය සමානවූ පිහිටෙක් තවත් නැත්තේය. අද මා සැබැවක්ම කියන්නට සුදුසුවන්නේයයි සිතා මාණවකය! මම රජ්ජුරුවන් වහන්සේගේ නෑ එකකුත් නොවෙමි, රජ්ජුරුවන් වහන්සේට උත්තරීතර එකකුත් නොවෙමි. මේ ලොකයෙහි දාසයෝ සතර පක්ෂයෙක් ඇත, ඒ සතර පක්ෂයෙහි දාසයන් අතරෙන් මමත් එක් දාසයෙක්මියි දක්වන්නාහු මෙසේ කීහ. මාණවකය! මේ ලොකයෙහි සමහර කෙණෙක් ගෙයිදූ මිඩියක කුස ඔත්තාහු දාසවන්නාහ, සමහර කෙණෙක් වස්තුදී වික්‍රමකොට ගත්තාහු දාසවන්නාහ, සමහර කෙණෙක් තුමූම බත් කඩ නිසා සෙවක බවට පැමිණ දාසවන්නාහ, සමහර කෙණෙක් රාජ චොර භයින් ස්වාමි විෂයෙන් චුතකොට බලාත්කාරයෙන් පර විෂයට පමුණුවන ලද්දාහු දාසවන්නාහ, අන්වයාගත වහල, රන් දීගත් වහල, ස්වයං දාසභ්‍යයට සෙවක වහල, කොල්ලගත් වහල යන මේ වුක්ත ප්‍රකාර සතර පක්ෂයෙහි ඇත්තෝ සත්‍වයන්ගේ දාස වන්නාහ. එසේහෙයින් ඒකාන්තයෙන් මමත් චතුර්විධ දාසයොනියෙන් උපසථායකත්‍වයෙන් ස්වයං දාසභාවයට පැමිණි දාසයෙක්මි. රජ්ජුරුවන් වහන්සේට වැඩෙක් වූවත් අවැඩෙක් වූවත් බොරු කියන්නට නොපිළිවන, දුරට ගොසිනුත් මම දෙවියන් වහන්සේට ගැත්තෙමි මය, රජ්ජුරුවන් වහන්සේ ජය පඬුරට තබා තව මා දෙනසේක් අධර්මයෙන් නොව ධර්මයෙන් දෙනසේකැයි කීහ. එබස් අසා පූර්ණකයා අතිශයින් සන්තුෂ්ටවූ සිත් ඇතිව නැවතත් අත්පොළසන්දී කියන්නේ පළමු ද්‍යූත ක්‍රීඩාවෙන් ලද්දාවූ ජය මාගේ පළමුවැනි ජය වන්නේය. බොධිසත්‍වයන් අවිරොධකොට මැදහත්ව කී මේ ප්‍රශ්න ව්‍යාකරණය අද මාගේ දෙවැනි ජය වන්නේය. මා විසින් විචාරණ ලද්දාවූ විධුර පණ්ඩිතයෝ මේ ප්‍රශ්නය ප්‍රකාශ කොට කීහ. මේ රජ්ජුරුවන් වහන්සේ එකාන්තයෙන් අධර්ම ස්වරූප ඇතිව බොරු කියන පුළුසේක. විධුර පණ්ඩිතයන් විසින් ප්‍රශ්නය මනාකොට කියන ලද, මෙසේ සත්‍යවාදීවූ පණ්ඩිතයන් කවර කාරණයකින් මට නොදෙන සේක් ද යි කීය.

එබස් අසා රජ්ජුරුවෝ සිතන්නාහු මේ විධුර පණ්ඩිතයෝ මා බඳුවූ යශ පිරිවර දුන් එකක්හු මුහුණ නොබලා දූත් දුටු මාණවකයා මුහුණ බැලූ හයි මහබෝසතාණන්ට කිපී ඉදින් උතුම් දාසවූනම් ඇරගෙණ යවයි කියන් නාහු කාත්‍යායනය, මම දාසයෙමි රජ්ජුරුවන් වහන්සේගේ නෑ එකෙක් නොවෙමියි මේ පර්ෂත් මධ්‍යයෙහි සිට ඒ පණ්ඩිතයෝ ඉදින් අපට මේ ප්‍රශ් නය පළමුකොට කිවුනම් එසේ හෙයින් මුළුලොව රත්නයන් අතරෙන් උතුම්වූ මේ අමාත්‍ය රත්නය ඇරගෙණ යම් මාර්ගයකින් යනු කැමැත්තේ

වීතම් ඒ මාර්ගයෙන් නික්මෙවයි කීහ, මෙසේද කියා රජ්ජුරුවෝ සිතන්නාහු පණ්ඩිතයන් ඇරගෙණ මානවකයා කැමති පරිද්දෙන් යන්නේය. උන් ගියවේලේ පටන් මට මිහිරිවූ ධර්මකථාවන් දුර්ලභවන්නේය. එසේහෙයින් මූන් සිටි පූජ්‍යස්ථානයෙහිම සිටුවා ගෘහ වාස ප්‍රශ්නය විචාළෙම් වීනම් යහපත් වන්නේයයි සිතූහ. මෙසේ සිතා ඉක්බිත්තෙන් මහබෝසතාණන්ට කියන්නාහු පණ්ඩිතයෙනි! තොප ඇරගෙණ ගිය කල්හි මට මධුරවූ ධර්ම කථා දුර්ලභ වන්නේය, එසේ හෙයින් අලංකෘතවූ ධර්මාසනයේ හිඳ සකලලෝක පූජිතවූ උත්තමවූ තොපගේ පණ්ඩිත ස්ථානන්තරයෙහි හිඳ ගෘහ වාස ප්‍රශ්නය කියවයි කීහ. මහබෝසතාණෝ රජ්ජුරුවන් කී බස් යහපතැයි පිළිගෙණ සරහා පිළියෙළ කරණලද උතුම්වූ ධර්මාසන මස්තකයේ හිඳ රජ්ජුරුවන් විසින් ප්‍රශ්න විචාළ කල්හි තුමූ විසර්ජනය කළහ.

ඒ කෙසේද? යත්

විධුර පණ්ඩිතයෙනි! තමාසතු ගෙයි වසන්නාවූ ගෘහස්ථයාහට කවර ගුණයකින් යුක්තවූ කල සසරභය නැතිව විසිය හැකිද? නැවත ඒ ගෘහස්ථයාගේ දාන, ප්‍රිය වචන, අර්ථචර්‍ය්‍යා, සමානාත්මතා යන සතර සංග්‍රහවස්තු සංඛ්‍යාතවූ සංග්‍රහයවේද? සත්ත්වතෙමේ නිදුක් නිරොගිවූයේ කෙසේ වන්නේද? කෙසේ සත්‍යවාදීවේද මෙලොවින් පරලොවට ගොස් පරලොවෙහි කෙසේ ශොක නො කරේදැයි රජ්ජුරුවෝ විචාළහ, එකල්හි ඥානගතියෙන් ගති මත්වූ නිරන්තර ප්‍රවෘත්ත වීර්‍ය්‍යයෙන් ධෛර්‍ය්‍යවත්වූ විඥානයෙන් ස්මෘති මත්වූ සර්ව සූක්ෂම අර්ථ දක්නාවූ ඥානයෙන් අර්ථදර්ශීවූ පිරිසිඳ දන්නාවූ ඥානයෙන් සියලු ධර්මයන් තත්ත්වහෙයින් කියන්නාවූ ඒ විධුර පණ්ඩිතයෝ ධනඤ්ජය කෞරව්‍ය රජ්ජුරුවන්ට ධර්ම සභායෙහිදීම මේ වක්‍ෂ්‍යමාන ගෘහවාස ප්‍රශ්නය කීහ. පරස්ත්‍රී සෙවනය කරන්නාවූ පුරුෂයා සංවාසයෙන් සියලු ස්ත්‍රීන්ට සාධාරණ හෙයින් සාධාරණ නම් වෙයි. එසේ සාධාරණ නොව ස්වදාරාවන් විෂයෙහිම සන්තොෂ වීමෙන් අසාධාරණ වන්නේද, ප්‍රණීතාහාරයක් ලදින් අනුන්ට බෙදා නොදී උදකලාව ඉඳ අනුභව නොකරන්නේද. අනර්ථ නිශ්‍රිත ස්වර්ගමොක්‍ෂ වහ නොවන්නාවූ අනෛර්‍ය්‍යානික විතණ්ඩ සල්ලාප යයි කියනලද රාම සීතා භාරතාදී කථා සෙවනය නොකෙරේද, මෙසේ ප්‍රවෘත්තවූ මේ නිරර්ථක කථාව ප්‍රඥාද වර්ධනය නොකරන්නේය, එසේහෙයින් මෙබඳු කථා නොකිය යුත්තේය, තවද අඛණ්ඩ පඤ්චශීලයෙන් සමන්විත වන්නේද ගෘහවාස වෘත්තියෙන් හා රාජවෘත්තියෙන් සමන්විතද දාන, ශීලාදී කුශල ධර්මයෙහි ප්‍රසාද නොවේද, ස්ථානොචිත ප්‍රඥා ඇත්තේද ගුණවෘද්ධ වයොවෘද්ධයන් කෙරෙහි යටත්වූ පැවැතුම් ඇතිව අභිමානය නොකොට අවවාද අනුශාසනා පිළිගණීද තවද මසුරු නොවේද, කුශල ධර්මයෙහි මනාව ඇලුනේද නිකරුද, ප්‍රෙමණීයවූ මටසිලිටුවූ තෙපුල් ඇත්තේද, කායාදී චාරත්‍රයෙන් මොලොක් යමෙක්දාන ප්‍රියවචනාදීවූ යමකින් සතුටුවේනම් ඕහට ඉන් සංග්‍රහ කරන්නේද ශ්‍රමණ බ්‍රාහ්මණයන් හා කෘපණද්ධික යාචකාදීන්ට නොහැඳින බෙදාදී අනුභව කෙරේද මෙකල සාන්තට සුදුසුය, මෙකල වපුරන්නට සුදුසුය යනාදීන් මෙම කෘෂිකර්මාදීන්හි සියලු කෘත්‍ය විධානයෙන් සමන්විතද මහණ බමුණන් ගෙණ ගෙණා භාජන බත්පැන් පුරාදීමෙන් හැමකල්හි පිණවන්නේද, ප්‍රවේණී ධර්ම හා සුචරිතධර්මය කැමතිව නොහැර වූපරිද්දෙන් පිළිපදීද, බොහෝ ඇසූ පිරූතැන් ඇත්තේද, ධාර්මිකවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා එළඹ "කිං භන්තෙ සංවජ්ජං කිං අනවජ්ජං" යනාදීන් ප්‍රතිපත්ති පුළුවුස්නා සුළුවන්නේද, සිල්වත්වූ බොහෝ ඇසූ පිරූතැන් ඇත්තාවූන් සමීපයට

ගෞරව ඇතිව එක්වත් එළඹෙද, ගිහිගෙයි වසන්නාවූ මෙබඳු ගෘහස්ථයාට වුක්ත ප්‍රකාර ගුණාඞ්ගවලින් සමන්විතවූ කල්හි සසර භය නැතිව විසිය හැක්කේය. ඒ ගෘහස්ථයාගේ දාන, ප්‍රියවචන, අර්ථචර්‍ය්‍යා, සමානාත්මතා යන සතර සංග්‍රහ වස්තුයෙන් සංග්‍රහය යනාදී ගුණවලින් යුක්තවූයේම නිදුක් නිරොගි වන්නේය. සත්‍යවාදී පැවති කල්හි සත්‍යවාදී වන්නේය. මෙකී ගුණයෙන් යුක්තවූයේ මෙලොවින් පරලොව ගොස් ශොක නොකරන්නේයයි කීය. මෙසේ මහබෝසතාණෝ ගෘහවාස ප්‍රශ්නය කියා ධර්මාසනයෙන් බැස රජ්ජුරුවන්ට වැන්දාහ. රජ්ජුරුවෝත් මහබෝසතාණන්ට මහත් සත්කාරකොට ඒ සියයක් රජදරුවන් විසින් පිරිවරණ ලදුව තමන්ගේ මාලිගාවට ගියාහ. මහබෝසතාණෝ වූකලී ඒ තැනම රැඳී සිටියාහ. එකල්හි බෝධිසත්ත්වයන්ට පූර්ණකයා කියන්නේ විධුර පණ්ඩිතයෙනි තොපගේ රජ්ජුරුවන් විසින් නිරාලයව තොපි මට දෙන ලද්දාහ. එසේ හෙයින් දැන්ම වරෝ යම්හ. මට වැඩෙහි හැසිරෙන්නාවූ තොප විසින් තොපගේ ස්වාමිවූ රජ්ජුරුවන්ට වැඩෙහි හැසුරුණා නම් වෙයි මාත් තොපට මෙතැන් පටන් ඉසුරු බැවින් ඒ තොපගේ ස්වාමිහට කළ යම් අභිවෘද්ධියෙක් ඇත්නම් මටත් එලෙසම කරව, ස්වාමියාහට පක්ෂපාතවීම බුදු පසේබුදු මහ රහතුන් නොහැරකොට ආ ධර්මාර්ගයෙකැයි කීය. එබස් අසා විදුර පණ්ඩිතයෝ කියන්නාහු මානවකය! තා විසින් මම ලබන ලද්දේවෙමියි දනිමි, ලබන්නෙහිත් අනික් පරිද්දෙකින් ලදුයේ නොවෙයි. මට ඊශ්වරවූ රජ්ජුරුවන් වහන්සේ විසින් තට නිරාලයව දීපියන ලද්දෙමියි දනිමි. එතකුදුවුවත් යම් පමණ කලකින් අපගේ දූදරුවන් අවවාද අනුශාසනා කරමෝ නම් එපමණවූ තුන් දවසක් කල් තා අපගේ ගෙයි වස්වනු කැමැත්තම්හ. මම තට බොහෝ උපකාර කෙරෙමි රජ්ජුරුවන් වහන්සේගේ මුහුණ නොබලා ඇත්තක්ම කිමි, එසේ හෙයින් තා විසින් මම ලද්දෙමි. මම ඉදින් අනිකක් කීම්නම් තෝ මා ලැබගත නොහෙන්නේය. එසේ හෙයින් මා තට උපකාරී නියාව සලකාව තවද මා මහත් නියාවත් දැන මාගේ පුත්‍රදාරාවන්ට අවවාදානු ශාසනා කරණතෙක් තුන් දවසක් ඉවසා මාගේ ගෙයි වසවයි කීහ, එබස් අසා පූර්ණකයා සිතන්නේ පණ්ඩිතයෝ ඇත්තෙක්ම කීය මූත් මට උපකාරී නියාව ඇත්තමය, එසේ හෙයින් සතියක්වත් දෙපෝයක්වත් ඉවසන්නට වුව මැනවැයි ඉදින් කීවත් ඉවසීම යුතුමයයි සිතා කියන්නේ පණ්ඩිතයනි! යමක් තොපි කිවූ නම් ඒ සියල්ල එපරිද්දෙන්ම වේවයි තොප කී තුන්දවස තොපගේ ගෙයි වසම්හ, පින්වත්වූ තෙපි අදපටන් තුන්දවසක් ගෙයි කළමනා යම් කාර්‍ය්‍යවිධානයෙක් ඇත්නම් ඒ සියල්ල කරව තොප මා හා කැටිව ගිය කල්හි පසුව තොපගේ පුත්‍රදාරාවෝ යම් පරිද්දෙකින් සුවපත් වෙත් නම් එපරිද්දෙන් පින්වත්වූ තෙපි අද පටන් තුන් දවසක් පුත්‍රදාරාවන්ට අවවාදානු ශාසනා කරවයි කීය. මෙසේ කියා පූර්ණකයා මහබෝසතාණන් හා සමග උන්ගේ මාලිගාවට වන, තවද මහත්වූ උපභොග පරිභොග වස්තු ඇති ඒ පූර්ණක නම් යක්ෂසෙනාධිපතියා ආචාර්‍ය්‍යයන් කෙරෙන් උතුම්වූ බුද්ධාංකුරවූ ඒ විධුර පණ්ඩිතයන්ගේ තෙපුල් යහපතැයි පිළිගෙණ පණ්ඩිතයන් හා සමග ගියේය. ගොසින් හස්තීන් හා අජානීය සෛන්ධවයන්ගෙන් ගැවසී ගත්තාවූ ඒ මහබෝසතාණන්ගේ අන්තඃපුරය වන්නේය.

මහබෝසතාණන්ගේ වූකලී තුන් සෘතුවට කරනලද කොඤ්ච නම් ප්‍රාසාදය, මයූර නම් ප්‍රාසාදය, ප්‍රියකෙතු නම් ප්‍රාසාදයයි මෙසේ ප්‍රාසාදත්‍රයෙක් වන්නේය. ඒ තුන් ප්‍රාසාදයන් අතුරෙන් බොධිසත්ත්වයෝ තුමූ යම් ප්‍රාසාදයෙක්හි වෙසෙත් නම් එහි බොහෝ කනබොන දෑ හා බත්පැන් ඇත්තේය. එසේ ඇත්තාවූ සක්දෙව් රජ්ජුරුවන්වහන්සේගේ මෙර මුදුනෙහි පිහිටි ශක්‍රභවනය වැනිවූ අතිරම්‍ය ඒ ප්‍රාසාදයට පූර්ණකයා කැඳවාගෙණ ගියහ ගොස් අලඞ්කෘතවූ ප්‍රාසාදයාගේ සත්වැනි මාලෙහි ශ්‍රීයහන් ගබඩාවන් මතුමාලත් සරහා ශ්‍රීයහනක් පණවා සියලු ආහාර පානවර්ගී එලවා දිව්‍යාඞ්ගනාවන් සමානවූ පන්සියයක් ස්ත්‍රීන් මොහුට පාදපරිචාරිකා වෙත්වයි උකටලී නොව වසවයි කියා ඔහට පාවාදී තමන් වසන්නාවූ ස්ථානයටම ගියහ. ඒ බොධිසත්ත්වයන් ගියකල්හි තව්තිසා දිව්‍යලෝකයෙහි දිව්‍යප්සරාවන් මෙන් සර්වාභරණයෙන් අලඞ්කෘතවූ උත්තම ස්ත්‍රීහු ඒ අලඞ්කෘතවූ ප්‍රාසාදයෙහි නටන්නාහ, ගීකියන්නාහ, නැවත උතුම්වූ ගීතයෙන් ඔවුනොවුන් පරදවන්නාහ. ඉක්බිත්තෙන් ප්‍රවේණි ධර්ම හා සුචරිත ධර්මය රක්ෂාකරන්නාවූ ඒ විධුර පණ්ඩිතයෝ පූර්ණක නම් යක්ෂයා නෘත්‍යගීතවාදිතයෙහි දක්ෂවූ පන්සියයක් උත්තම ස්ත්‍රීන් හා එක්කොට ප්‍රණීතවූ අනෙකප්‍රකාරවූ ආහාරපාන වර්ගයෙන් පිණවා තමන්ට ප්‍රයෝජනාවූයක්ම සිතන්නාහු එකල්හි තමන්ගේ ප්‍රධාන අග්‍රමහෙෂිකාවන් සමීපයට ගියහ. මෙසේ ගොස් ඒ මහබෝසතාණෝ රත්සඳුන් විලවුන් ගත්තාවූ ජාම්බොනද සවර්ණ පුඤ්ජයක් වැනිවූ ඒ තමන්ගේ ප්‍රධාන බිසවුන්ට කියන්නාහු තාම්‍රනෙත්‍රයන් ඇත්තාවූ පින්වතිය! මෙසේ වර මා කියන්නක් අසව, මාගේ ධර්මපාල කුමාරයන් ප්‍රධානකොට ඇති පුතුන් හා දූන් මා සමීපයට කැඳවා ගෙණවයි කීහ. එකල්හි විධුර පණ්ඩිතයන්ගේ අනොජා නම් අගබිසවූ තොමෝ අප්‍රියවූ ඒ තමාගේ ස්වාමිහුගේ අති මධුරවූ නියොග වචනය අසා මා ගොස් දරුවන් කැඳවන්නට සුදුසු නොවන්නේය, එසේහෙයින් යෙහෙලිය සමීපයට අඬමින් වලපමින් ගොස් තාම්‍රවර්ණවූ නිය ඇති සුනිල් දිගුපුළුල් මනා ඇස් ඇති තමන්ගේ යෙහෙලියට කියන්නාහු නිලුපුල් මල්පැහැ මෙන් සමවන්වූ පැහැ ඇති චෙතාවෙනි! සමර්ථවූ ගුරුවූ සර්වාභරණයෙන් ප්‍රතිමණ්ඩිතවූ මාගේ දරුවන් මා සමීපයට කැඳවාගෙණ එවයි කීහ. එබස් අසා ඒ චෙතා නම් යෙහෙලි තොමෝ යහපතැයි ප්‍රතිවචනදී දරුවන් වසන ප්‍රාසාදයක් පාසා ඇවිද තොප හැමට අවවාදදෙනු කැමතිව පියානන්වහන්සේ කැඳවනසේක. මේ තොපගේ පියානන්වහන්සේගේ පශ්චිම දර්ශනය වන්නේයයි ඒ බොධිසත්ත්වයන්ගේ යහළු විශ්වාසයන් හා දූ දරුවන් රැස්කරවී ධර්මපාල කුමාරයෝ වූකලී ඒ වචනය අසමින් අඬමින් වලපමින් මලුන් පිරවරා පියානන් සමීපයට ගියාහ. මහබෝසතාණෝ ඒ දරුවන් දැක සිටියෙයේ සිටපිය නොහී කඳුළු පුරාගෙණ වැළඳ ඉස සිඹ සනහා ප්‍රධාන පුත්‍රවූ ධර්මපාල කුමාරයන් ඇසිල්ලක් ලෙහි වැදහොවා ලෙන් බහා සිටුවාගෙණ ශ්‍රීයහන් ගබඩාවෙන් නික්ම මතුමාල් තලයේ පර්‍යඞ්ක මධ්‍යයෙහි හිඳ පුත්‍රයන් දහසක්දෙනාට අවවාද දුන්හ.

ඒ කෙසේ ද? යත්,

ඉෂ්ටානිෂ්ටයෙයි අචලව නිර්විකාරවූ ප්‍රවේණි ධර්ම හා සුචරිත ධර්මය රක්ෂාකරන්නාවූ මහබෝසතාණෝද තමන් දක්නට ආවාවූ ධර්මපාල කුමාරා

දීවූ ඒ දරුවන් වැළඳගෙණ ඉස සිඹ සනහා ඉක්බිත්තෙන් ශ්‍රේෂ්ඨ වූ ධර්මපාල කුමාරයන් තමන් සමීපයට කැඳවා කියන්නාහු දරුවෙනි! රජ්ජුරුවන් වහන්සේ විසින් මේ මානවකයාට මා ජය වස්තුකොට දීපියන ලද්දෙමි එසේහෙයින් අද පටන් තුන්දවසක් මම මා සන්තක සැපයෙන් සුවපත්වෙමි. තුන්දවසින් මත්තේ සතරවැනි දවස් පටන් එකාන්තයෙන් ඒ මානවකයාට අයිතිවෙමි. ඒ තෙමේ මා හැරගෙණ යම් මාර්ගයකින් යනු කැමැත්තේවීනම් ඒ මාර්ගයෙන් යන්නේය. එසේහෙයින් මම තොපට රක්‍ෂාවක්කොට නොතබා කෙසේ නැගීයෙම්දැයි සිතා තොපට අනුශාසනාකරණ පිණිස ආමි, මිත්‍රයන්ට උපකාරකොට තමන්වහන්සේ කෙරෙහි ඇල්ම වන්නාවූ බොහෝ උපභොග පරිභොග වස්තූන් ඇති කුරුරට වසන්නාවූ ධනඤ්ජය කෞරව්‍ය රජ්ජුරුවන් වහන්සේ මීට පූර්වභාගයෙහි තොපගේ පියානෝ කවර අනුශාසනාවක් කොළෝද්දැයි ඉදින් තොප අතින් විචාළසේක්වීනම් අපගේ පියානන්වහන්සේ අපට මේනම් මේනම් අවවාද කීසේකැයි කියව්. දරුවෙනි! මා දුන් අවවාද රජ්ජුරුවන්වහන්සේට කීකල්හි තොප කෙරෙහි සතුටුවූව තොප හැමදෙනාම මා හා සමග සම ආසනව එකහස්නේ හිඳුවයි මේ රාජකුලයෙහි තොප කෙරෙන් අන්‍ය කවරනම් රජෙක් කවරනම් මනුෂ්‍යයෙක් මා හා සමග එක් හස්නේ හිඳිනට සුදුසුද, තෙපිම මෙසේ කියා රජ්ජුරුවන්වහන්සේ හා එක අස්නේ හිඳිනට කැඳවූසේක් වීනම් එසේ එකී රජ්ජුරුවන්වහන්සේට දෙහොත් නගා මුදුනෙහි බැඳගෙණසිට දරුවෙනි! තෙපි මෙසේ මෙසේ කියව්, මහරජ්ජුරුවන්වහන්ස! එසේ නොකියනු මැනව, නුඹවහන්සේ හා නැටිව අප එකාසනෙ ඉඳීම කාරණයෙක් නොවෙයි. අපගේ ප්‍රවෙණි ධර්මයකුත් නොවෙයි, මහරජ්ජුරුවන්වහන්ස! කෙශර සිංහරාජයක් හට හීන ජාති ඇති ජර සිගාලයෙක් කෙසේ සම අසුන් ඇතිවේද? යම්සේ ජරසිගාලතෙමේ මෘග රාජයන්හට සමානාසනික නොවේද? එපරිද්දෙන්ම අපිත් දේවයන් වහන්සේට සමානාසනික වන්නට සුදුසු නොවෙම්හයි මෙසේ රජ්ජුරුවන්වහන්සේට දන්වව්යයි මහබෝසතාණෝ ධර්මපාල කුමාරයන් ප්‍රධානකොට ඇතිපුත්‍රයන් දහසක් දෙනාට අවවාදානුශාසනා කළාහ. මහබෝසතාණන්ගේ මේ කථාව අසා දූදරුවන් හා ඥාති විශ්වාසයන් හා දාසි දස් ආදීහු සිටිසේ සිටිය නොහී මහ හඬින් හඬන්නට පටන්ගත්හ. එකල්හි මහබෝසතාණෝ ඔවුන් හැම දෙනාටම නොයෙක් කාරණා කියා ශිව්ස්සූහ.

ඉක්බිත්තෙන් විශ්වාසයන් හා නගුන් මල්බෑයන් ආදීවූ නෑයන් කෙරෙහි නොපසුබටවූ සිත් ඇති ඒ විධූර පණ්ඩිතයෝ සියලු බන්ධුවර්ගයා අඬා වැළප සමීපයට අවුත් මූවෙන් නොබැණ උත්කල්හි කියන්නාහු දරුවෙනි! මා කරා මෙසේ එව්, තෙපි කිසි සැකයක් නොකරව්, සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යයහ, යශස නම් විපත්තිය කෙළවරකොට ඇත්තේය. එතකුදුවුවත් තොපට රාජ වසතී නම්වූ යශස් ලැබීමට කාරණයක් කියමි. මේ කාරණය කින් රජකුලයට පැමිණ රජ්ජුරුවන්වහන්සේ සමීපයෙහි එක්වන් හැසිරෙන්නාවූ රාජපුරුෂතෙමේ ස්ථානාන්තරයට පැමිණ හස්ත්‍යශ්වාදි මහත් පිරිවර සම්පතවත් පැමිණේද, එසේවූ රාජපරිචයර්‍යාව කියමි. දරුවෙනි! මා සමීපයෙහි එකඟවූ සිත් ඇතිව මෙසේ අවුත් හිඳ අවික්‍ෂිප්තව අසවයි සර්වඥ විලාසයෙන් රාජවසතිය කියන්නට පටන්ගත්හ. කෙසේද? යත් දරුවෙනි!

රාජසේවයට පැමිණියාවූ අප්‍රකාශ ගුණ ඇති සත්ත්වතෙමේ රජදරුවන්ගෙන් සම්පත් නොලබන්නේය, ශෞර්‍ය වීර්‍ය්‍ය නැති පුරුෂයාත් සම්පත් නොලබන්නේය, නැවත නුවණ නැති පුරුෂයාත් සම්පත් නොලබන්නේය, රාජකාර්‍ය්‍යයෙහි ප්‍රමාද පුරුෂයාත් කිසිකලෙකත් සම්පත් නොලබන්නේය, යම් කලෙක රජ්ජුරුවන්වහන්සේ යම් සෙවකයකුගේ ආචාර සම්පත්තියෙන් ප්‍රඥාවත් කායබලයත් පවිත්‍ර ශීල බවත් අවශෙෂවූ යම්කිසි ගුණයක් ඇත්නම් එයත් නුඹවහෙයින් දත්සේක් වීනම් එකල්හි සියලු ගුණ නුඹහෙයින් දත්තාවූ කාරණයෙන් ඒ සේවකයා කෙරෙහි විශ්වාසීව ප්‍රෙම උපදවනසේක. එසේ ඒ සේවකයාහට සැඟවියයුතු යම් කිසි රහසක් ඇත්තමුත් නොවලහා කියනසේක. රජදරුවක් වහන්සේ තම් තමන්වහන්සේ කෙරෙහි බලවත් විශ්වාස ඇතැයි දත් යම්කෙණෙකුන්ට සිත ඇත්තක් නොවලහා කීයා දවසින් දවස බලවත් විශ්වාස ඇතිව ප්‍රේම උපදවනසේක. තවද දරුවෙනි! මනාකොට ගන්නා ලද්දාවූ සමවූ දඬු ඇති මනාකොට සමවූ බඩු දරන්නාවූ තරාදිය යම්සේ බිමට නොබසීද, උඩ නොනැගේද, එපරිද්දෙන්ම රාජසේවකයාත් රජ්ජුරුවන් වහන්සේ විසින් මෙනම් කටයුත්තක් කරවයි නියොග කරණ ලද්දේවීනම් ඡන්දාදීන් අගතියට නොගියේ කම්පානොවේද, චලිතනොවේද, මනාකොට ගන්නාලද වුක්තප්‍රකාර තරාදියමෙන් සියලු රාජකාර්‍ය්‍යයෙහි සමව පවතීද, එබඳුවූ රාජසේවකතෙමේ රජ්ජුරුවන් වහන්සේ සිත්ගෙණ රාජභවනයෙහි වසන්නේය. මෙපරිද්දෙන් රජ්ජුරුවන් වහන්සේට සියලු රාජකාර්‍ය්‍යය අචලව කරන්නට සමර්ථවීනම් හස්ති අශ්ව දාසි දාස ක්ෂෙත්‍ර භූමි ගව මහිෂාදිවූ බොහෝ සම්පත් ලැබ උතුම් ඝනරතුරමත් පැමිණෙන්නේය. නුවණැත්තාවූ රාජාමාත්‍ය තෙමේ දවල්වත් රාත්‍රියෙහිවත් රාජකාර්‍ය්‍යයෙහිලා මේනම් කටයුත්තක් කරවයි රජ්ජුරුවන් වහන්සේ විසින් නියොග කරණ ලද්දේ ඡන්දාද්‍යෙන් අගතියටනොගොස් කම්පාවේද, එසේවූ රාජසේවකතෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙණ රාජභවනයෙහි වසන්නේය. රාත්‍රියෙහිත් දිවාභාගයෙහිත් සියලු රාජකාර්‍ය්‍යයෙන් එක් රාජකාර්‍ය්‍යයකත් ප්‍රමාදයක් නැතිව විශෙෂකොට කෙරෙමියි උත්සාහ කරන්නේ වීනම් එසේවූ අමාත්‍ය තෙමේ ඡන්දයෙන්, ද්වෙෂයෙන්, භයින්, මොහයෙන්, කළමනා දෙයකොට අමාර්‍ගයෙහි අකාර්‍ය්‍යයෙහි නොයන බව හෙතුකොටගෙණ රජ්ජුරුවන් වහන්සේගේ සිත ඉඟි දැක කාර්‍ය්‍යකරණ හෙයින් රජ්ජුරුවන් වහන්සේට සමීප වාරීව වැස සම්පත් ආදිය හා තන් තනතුරු ලබන්නේය

තවද යම් ගමන් මාර්‍ගයෙක්වත් යම් රාජ වීථියෙක්වත් රජ්ජුරුවන් වහන්සේ වඩනට මනාකොට ධජපතාක කෙහෙල්තොරන් පුන්කලස් පංක්තියෙන් සරසනලද්දේ වීනම් එබඳු රජ්ජුරුවන් වහන්සේ වඩනට සුදුසුවූ රාජමාර්‍ගයකින්වත් රාජවීථියෙන්වත් රජ්ජුරුවන් වහන්සේ විසින් නෙපි මේ මාර්‍ගයෙන් රාජවීථියෙන් යවයි ඉදින් නියොගකලත් නුවණැත්තාවූ රාජාමාත්‍යාදීන් විසින් එබඳු රාජවීථියෙන් හා රාජමාර්‍ගයෙන් නොයායුත්තේය.

තවද දරුවෙනි රූපාදි පඤ්චකාමය අනුභව කිරීම කිසිකලෙකත් රජ්ජුරුවන් හා සමඟ අනුභව නොකටයුත්තේය. වැළි කෙසේ අනුභව කට යුතුදයත්? සියලු රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය යන පඤ්චකාමයෙහි රජ්ජුරුවන් වහන්සේට යටත්ව ඉතා හීනව අධර්මපක්ෂයක්සේ පඤ්චකාම සේවනය

කටයුත්තේය. යමෙක් මෙසේ කෙරේතම් එසේවූ රාජාමාත්‍යතෙමේ රජ්ජුරුවන් වහන්සේගේ අභිප්‍රාය ලෙස වාඤය කෙරෙමින් තමා බොහෝ යශ පිරිවර ලබන්නේය. තවද රජ්ජුරුවන් වහන්සේගේ සළු ඇඳීම් හා සමව පිළිනොහඳින්නේය. රජ්ජුරුවන් වහන්සේ මල් පලඳනාසේ මලුත් විලවුත් නොගල්වන්නේය. රජ්ජුරුවන්වහන්සේගේ ඉඳීම් සිටීම් ආදීවූ ආකෘතිය වත මාගේ ඉඳීම් සිටීම් ආදීවූ ආකෘතිය නොකරන්නේය. රජ්ජුරුවන් වහන්සේගේ බස් කිණීම ලෙස තමා බස් නොකියන්නේය. රජ්ජුරුවන් වහන්සේගේ ආකෘතිය හැර අනික් ආකෘතියක්ම කටයුත්තේය. රජදරුවන් වහන්සේගේම සමීප චාරීව වසනු කැමැත්තාවූ අමාත්‍යාදීන් විසින් මේ කීලෙස පැවත රජදරුවන් වහන්සේ සිත්ගෙණ යශ පිරිවර හා තන් තනතුරු ලැබගත යුත්තේය.

තවද දරුවෙනි! රජ්ජුරුවන් වහන්සේ අමාත්‍යයන් හා අන්තඃපුර ස්ත්‍රීන් විසින් පිරිවරණ ලදුව යම්කලෙක කෙළනාසේක් වීනම් එසේවූ ස්ථාන යෙහිදී නුවණැති අමාත්‍යයන් විසින් බිසෝවරුන් හා රාජකන්‍යාවන් හා අවශෙෂවූ අන්තඃපුර ස්ත්‍රීන් කෙරෙහි ස්නෙහ අභිප්‍රායෙන් විශ්වාස භාවයෙන් ඇසින් තරුලීම් බැමනැගීම් හස්තපාද චලනාදි යම්කිසි කායවිකාරයක් පුර ස්ත්‍රීන්ට නොනැගවිය යුත්තේය. තවද දරුවෙනි! යම් අමාත්‍යයෙක් උඩගු නොවේද, මණ්ඩනශීලීනොවේද, මුහුකළ නුවණ ඇත්තේද, එක්වන් රජ්ජුරුවන් වහන්සේගේ අඞ්ගප්‍රත්‍යඞ්ග හෝ පුරස්ත්‍රීන්ගේ අඞ්ගප්‍රත්‍යඞ්ග හෝ අනුරාග වශයෙන් නොලබන්නේද, අචලවූ සුප්‍රතිෂ්ඨිතවූ චිත්තසන්තානයෙන් සමන්විතද, එසේවූ නුවණැති අමාත්‍යතෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත් ගෙණ රාජභවනයෙහි වසන්නට සුදුසු වන්නේය.

තවද යම් අමාත්‍යයෙක් ඒ රජ්ජුරුවන් වහන්සේගේ පුරස්ත්‍රීන් හා එක්ව සිනාසී නොකෙළින්නේද, රහසිව ගොස් ඒ පුරස්ත්‍රීන් හා කථානොකෙරේද, ඒ රජ්ජුරුවන් වහන්සේගේ භාණ්ඩාරයෙන් මුතු මැණික් ආදි වස්ත්‍ර සොරා නොගණීද, එසේවූ අමාත්‍ය තෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙණ රාජභවනයෙහි වසන්නට සුදුසුවන්නේය. තවද යමෙක් නිද්‍රායෙහි බලවත් ඇලුම් නැත්තේද, බොහෝකොට නොනිදාද, පුරුෂමදය පිණිස රා නොබොන්නේද, ඒ රජ්ජුරුවන් වහන්සේගේ උද්‍යානාදීවූ අභය ස්ථානයෙහි මුවන් ආදීවූ සිවුපාවුන් නොමරන්නේද, ඒ සේවකතෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙණ රාජභවනයෙහි වසන්නට සුදුසු වන්නේය.

තවද යම් රාජසේවකයෙක් ඒ රජ්ජුරුවන් වහන්සේගේ විසිතුරුවූ පුටුවකටද, සිංහාසනයකටද, බඳවෙළුවකටද, උන්වහන්සේ නැගෙන මගුලැතු හා මගුලසු පිටටද, උන්වහන්සේ නැගෙන මගුල් රියටද රජ්ජුරුවන් වහන්සේගෙන් නැගෙන්නට සම්මතයක් ඇතක් නොනැගේද, එසේවූ රාජසේවකතෙමේ රජ්ජුරුවන්ගේ සිත් ගෙණ යශ පිරිවර ලබන්නට සුදුසු වන්නේය. තවද ස්ථානොචිත ප්‍රඥා ඇති පුරුෂ තෙමේ රජ්ජුරුවන් වහන්සේට ඉතා දුරත් ආසන්නයෙහිත් නොහිඳීද, නොසිටීද, ඒ රාජාමාත්‍යතෙමේ තමාගේ ස්වාමීවූ රජ්ජුරුවන් වහන්සේට පෙණෙන පරිද්දෙන් අභිමුඛයෙහිදු කුදු

මහත් බස් ඇසෙනතැන බල බලා ඒ රජ්ජුරුවන් වහන්සේට විෂය තැන සිටින්නේවීනම් රාජභවනයෙහි වැස සැපත් ලැබගන්නට සුදුසු වන්නේය.

තවද දරුවෙනි! එකාන්තයෙන් රජ්ජුරුවන් වහන්සේ තම් තමාට යහළුවත් නොවනසේක. යම් හෙයකින් විශ්වාසත් නොකටහැකිසේක. ජාතියෙන් වයසින් තමා හා සමානත් නොවනසේක. වීබූවක් විවර කසළ වැටි මෙන් ඇලලීගිය ඇසක් මෙන් රජදරුවන් වහන්සේ තම් යුහුව කිපෙනසුලු සේක, යම්සේ කසලක් සහිතවූ නෙත්‍රය තමාගේ ප්‍රකෘති අවස්ථාහැර එකෙණෙහිම බාෂ්පජලය වහනම කෙරේද, එපරින්දෙන්ම රජ්ජුරුවන්වහන්සේත් මඳ වරදක් වුවත් වහාම කිපී හස්ත පාද කර්ණ නාසාච්ඡේදනාදිවූ අනෙකප්‍රකාර වධබන්ධනය කරවනසේක. එසේහෙයින් රජ්ජුරුවන් විශ්වාස නොකොට හැක්කේය.

තවද සියුම් නුවණැති ඥනවන්තවූ පුරුෂතෙමේ බාලාවස්ථායෙහි කවා පොවා උලා නාවා නොයෙක් පරිද්දෙන් රජ්ජුරුවන් වහන්සේ පොෂ්‍යය කෙළෙමි. මේ කාරණයෙන් මම ප්‍රසිඬවෙමි, පූජ්‍ය වෙමි, රාජවල්ලභවෙමි. එහෙහෙයින් මා කීවක් නැගෙයි සිතා සම්භරණයෙන් සැරහී පෂීත් මධ්‍යයෙහි සිටියාවූ රජ්ජුරුවන් වහන්සේට කිපෙන්නට සුදුසුවූ පරුෂ වචනයක් එබඳු ස්ථානයෙහිදී අවවාද වසයෙනුත් කිසිකලෙකත් නොකියන්නේද, එසේවූ නුවණැති රාජසේවකතෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙණ තමනට සැපත් එලවාගන්නට සුදුසු වන්නේය.

තවද දරුවෙනි! රාජවල්ලභ හෙයින් කියා යවා වැදීමෙක් නැතැයි ලා හෙලා රජගෙට නොවැද එන්නට කියවයි රජ්ජුරුවන්වහන්සේගෙන් ලබන ලද අවසර ඇතිවම රජගෙට වැදීම ලබන්ද, දවසකට කීපවාරයක් ඇතුළු රජගෙට වදිනත් කියා යවා ලත් අවසරයෙන්ම ඇතුළු රජගෙට යම් රාජසේවකයෙක් වදීද, රජ්ජුරුවන් වහන්සේ කෙරෙහි විශ්වාස ඇත්තෙමියි නිර්ව්‍යවස්ථා නොවේද, ගිනි සමීපයෙහි සිටින්නක්හු මෙන් රජ්ජුරුවන් වහන්සේගේ සමීපයෙහි හැමවේලේම අප්‍රමාදව සිහි ඇතුව සිටින්නේවේද, එසේවූ රාජසේවක තෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙණ සැපත් ලබන්නේය.

තවද දරුවෙනි! රජ්ජුරුවන්වහන්සේගේ පුතනුකෙණෙකුන්ට හෝ මල් බෑ කෙණෙකුන්ට හෝ රාජසේවකයන් හා එක්ව කථාකොට ගම්දීමෙන් හෝ නියම්ගම් දීමෙන් හෝ රට දීමෙන් හෝ දනවූ දීමෙන් හෝ සංග්‍රහ කරණසේක්වීනම් එසේවූ ස්ථානයේදී නුවණැත්තාවූ රාජාමාත්‍යතෙමේ මුවෙන් නොබැණ උපෙක්ෂා වන්නේද, ගුණයක්වත් නුගුණයක්වත් නොකියන්නේද, මේ ගම් නියම්ගම් ආදිය අසවලාහට දෙමෝද? නොදෙමෝදැයි රජ්ජුරුවන් වහන්සේ සේවකයන් හා එක්ව කථාකළ කල්හි දරු මල්බෑ ආදීන් අතරෙන් අසවලුන්ට මෙබඳුවූ ගම්බිම් රටවල් දුන්කල යහතැයි කියාද, නොහොත් අසවලුන්ට දියයුතුය, අසලුන්ට නොදියයුතුය, යනාදී එහි යහපත නපුර නොකිය යුත්තේය, නැවත රජ්ජුරුවන් වහන්සේනේ හස්ත්‍යාචාර්‍යයන් අශ්වාචාර්‍යයන් රථාචාර්‍යයන් හා පාබල සේනාවගේ හස්ති ශිල්පාදිවූ ඒ ඒ ශිල්ප හා ශෞර්‍යවීර්‍යය ආදිවූ සමර්ථතා දැක සන්තුෂ්ටව ගම් දිවෙල් හා බොහෝ

බත්වැටුප් වඩා තබා දෙතසේක් වීනම් එසේවූ තැනසිට ඔවුන්ට බාධාන්තරායයමෙක් නොකරත්නේ වීනම් එසේවූ රාජසේවක තෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙණ රාජභවනයෙහි වැස සම්පත් ලබන්නේය.

තවද නුවණැත්තාවූ රාජමාත්‍යතෙමේ රජ්ජුරුවන් වහන්සේට කීකරුව අවනතව දුන්නක්මෙන් නැමේද, හුණපඳුරකින් මතුව වැඩිසිටි පවනින් වෙවුලන හුණ දණ්ඩමෙන් විශෙෂයෙන් රජ්ජුරුවන් වහන්සේට භයින් වෙවුලාද, රජ්ජුරුවන් වහන්සේට ප්‍රතිපක්‍ෂව නොපවත්නේද, එසේවූ රාජාමාත්‍ය තෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙණ සැපත් ලැබගන්නේද, තවද යම් රාජසේවකයෙක් මහොදරනොව දුනුම්වක් මෙන් කුඩාබඩ ඇත්තේද, නොහොත් මඳ පෂීන් ඇත්තේද, සථානොචිත ප්‍රඥ ඇතිවන්නේද, යම්සේ මත්ස්‍යයා දිවනැතිහෙයින් කථානොකෙරේද, එපරිද්දෙන්ම කේලාම් කීම් හා සම්ඵප්‍රලාපාදිවූ වාග්දුශ්චරිතයෙහි නොහැසිර මඳ කථා ඇති බැවින් දිව නැත්තෙක් මෙන්වේද, භොජනයෙහි පමණ දැන අනුභව කෙරේද, මුහුකළ නුවණ ඇත්තේද, ශෞරවියෂී ඇත්තේද, එසේවූ රාජසේවකතෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙණ සම්පත් ලැබගන්නේය.

තවද දරුවෙනි! තේජස් නැසීම දන්නාවූ සත්‍වතෙමේ අනවරතයෙන් ස්ත්‍රීන් කරා ගොස් සංවාසය නොකරන්නේය. නැවත නැවත ක්ලෙශරති වශයෙන් ප්‍රඥාඇති පුරුෂතෙමේ කාශස්වාසය, කායපීඩාව දුර්ලබවය, යනාදි මෙතෙක් රොගයට පැමිණෙන්නේය. ප්‍රමාණතික්‍රාන්ත මයසීෘද ඉක්මවා රජ්ජුරුවන්වහන්සේ සමීපයෙහි සිට බොහෝ කොට කථා නොකොට යුත්තේය. හැමකල්හිම මුවෙන් නොබැණ නොහිඳිය යුත්තේය. වැළි කුමක් කටයුත්තේදයත් නොවිසිරී පිඬුව පවත්තාවූ බොරුවෙන් අමිශ්‍රවූ පමණින් යුක්තවූ කථාකරන්නට බස් බණන්නාට සුදුසුවූ ප්‍රසථාව පැමිණි කල්හි එසේ කළයුත්තේය තවද වෛෂකටයුතු වස්තුයෙහි වෛෂ නොකෙරේද, අනුන් හා නොගැටේද, සැබෑබස පිහිටියේද, මට සිලුටුවූ තෙපුල් ඇත්තේද, කේලාම් නොකියාද, නිරර්ථක කථා නොකියාද; එසේවූ රාජසේවක තෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙණ රාජභවනයෙහි වැස සම්පත්ති ප්‍රතිලාභයට පැමිණෙන්නේය.

තවද යම් රාජසේවකයෙක් ආචාර සම්පන්නද, තමාගේ වංශයෙහි උගතයුතු ශිල්ප උගණ්ද, චක්‍ෂුරාදී සදෙර පොපියවීමත් නොකොට ඉන්ද්‍රිය දමනයෙන් යුක්තවේද, වසඟකරණ ලද ආත්ම ඇත්තේද, සම්පත් නිසා උඩගුකොට අවලසවභාව ඇත්තේද, මන්නැති බැවින් මොලොක්ද, කළමනා රාජකටයුත්තෙහි ප්‍රමාද නොවේද, පිරිසිදුවූ කාය වාක් මනඃ කර්ම ඇත්තේද, රාජුපසථානයෙහි දක්‍ෂද, එසේවූ රාජාමාත්‍ය තෙමේ රජ්ජුරුවන් වහන්සේ සිත්ගෙණ යසස් ලබන්නේය. තවද රහස් කිරීමෙන් හා අප්‍රකාශවූ රහස් නොවලහා කීම් ආදීවූ දූතක්‍රියායෙහිද නියුක්තකොට අන්‍ය රජදරුවන් විසින් තමාගේ රජ්ජුරුවන්වහන්සේ සමීපයට එවනලද දූතජනයා දුරුකරන්නේද උන් හා කිසි කථාවක් නොකරන්නේද, ඉදින් කරණු කැමැතිහොත් රජ්ජුරුවන් වහන්සේ සම්මුඛයෙහිම කථාකෙරේද, තමාට බොහෝ ඉසුරු දුන්

සමීපයෙහි වසන්නට නොසිතාද, කිසිසේත් අන් රජදරු කෙණෙකුන් මුඛයෙහි නොවේද, එසේවූ රාජාමාත්‍යතෙමේ රජදරුවන් වහන්සේ සිත ඉඟි දැන රාජභවනයෙහි වැස තමාව බොහෝ යස පිරිවර ලැබගන්නේය.

තවද දරුවෙනි! සිල්වත්වූ ඇසූ පිරූ තැන් ඇති සමිතපාපීවූ ශ්‍රමණයන් කරා හෝ බාහිත පාපීවූ බ්‍රාහ්මණයන් කරා හෝ නැවත නැවත ගෞරව යෙන් සකසා එළඹේද, එසේවූ රාජසේවකතෙමේ රජ්ජුරුවන් වහන්සේගෙන් ඉසුරු ලැබගන්නේය. තවද දරුවෙනි! සිල්වත්වූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා සකසා එළඹ පෙහෙවස් වෙසෙමින් උන් හා අනුව වෙසේද නැවත එබඳුවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් බතින් පැනින් කැමතිපරිද්දෙන් පිණවන්නේද, එසේවූ රාජසේවක තෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සමීපයෙන් යශස් ලැබගන්නේය.

තවද දරුවෙනි! නොපැකිල පවත්නාවූ ඥාන ඇති පුරුෂතෙමේ තම හට වැඩකැමැත්තේවීනම් බහුශ්‍රැතවූ සිල්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා එළඹ එක්වන් උපස්ථාන කරන්නේද ධාර්මිකවූ මහණබමුණන්ට තමාගේ කුලපරම්පරායෙන් දෙමින් එන දන්වැට නොපිරිහෙලන්නේද දන්දෙන කල්හි ආවාවූ යාචකයන් දැක ඔවුන්ගෙන් කිසිඑකකුන් නොනවත්වන්නේද කාරණාකාරණා පරීක්‍ෂාකරන්නාවූ ඥානයෙන් සමන්විතද අවිකලවූ බුද්ධීන් යුක්තද අනේකප්‍රකාර දාසකර්මකාරයන් යෙදුවමනා කෘෂිකර්මාදියෙහි නියොග කිරීමෙහි දක්‍ෂද, මේ දන්දෙන්ට කල, මේ සිල්රකින්ට කල, මේ පෙහෙවස් වසන්නට කලැයි මෙසේ දානාදියෙහි කල් දෙන්නේද, මේ සෑනා සමය, මේ වපුරණ සමය, මේ වෙළඳාම්කරණ සමය, මේ උපස්ථාන කරණ සමයයි මෙසේ කෘෂිකර්මාදියෙහි සමය දන්නේද, එසේවූ රාජසේවක තෙමේ රජ්ජුරුවන් වහන්සේ සිත්ගෙණ රාජභවනයෙහි වැස යසපිරිවර ලැබගන්නේය,

තවද දරුවෙනි! තමා විසින් කටයුතු කෘෂිවණික්කර්මාන්තාදියෙහි උට්ඨානවීර්‍ය්‍යය ඇත්තේද, සියලු කර්මාන්තාදියෙහි අප්‍රමාදද, ස්ථානොචිත ප්‍රඥා ඇත්තේද, මනාකොට කරණලද කර්මාන්ත ඇත්තේද, එසේවූ රාජසේවක තෙමේ රාජභවනයෙහි වසන්නට සුදුසුවන්නේය. තවද ඒ රජ්ජුරුවන් වහන්සේගේ කලවිටට දානශාලාදියට ගාලට කුඹුරට එක්වන් ගොස් යහපත තපුර විචාරා අඩුවැඩිය පිරිමසන සුලුද, මෙතෙකැයි අය දැන සියලු ධාන්‍ය යන් බඩසල් කොටුගුලු ආදියෙහි ලවා රැකවල් ලවා පරිහරණය කෙරේද, රජගෙයි පරිවාර ජනයා ගැණ මෙතෙකැයි පමණ දැන බත්මාළු පිසවාද, එසේවූ රාජසේවක තෙමේ රජ්ජුරුවන් වහන්සේ සිත්ගෙණ තමහට සම්පත් ලැබගන්නේය.

තවද දරුවෙනි! පඤ්චශීලාදියෙක්හි නොපිහිටියාවූ මෙබඳු පුතකු හෝ එකකුසේ හොත් මල්බෑයන් අතරෙන් එක්තරා එකකු හෝ සෙනෙවිරත් තනතුරු ආදීවූ එක්තරා තනතුරෙක නොපිහිටුවන්නේය. කුමක් හෙයින් ද? යත් ඒ අඥානවූ ශීලසංරක්‍ෂණාදිය නොකරන්නාවූ ඒ පුත්‍රභ්‍රාතෘහු අඹග සමාන නොවන්නාහ.

"අඞ්ගමෙතං මනුස්සානං—භාතා ලොකෙ පවුච්චති"

යනුහෙයින් ලෝකයෙහි මල්බෑයෝ නම් මනුෂ්‍යයන්ට අඞ්ග සමාන කාරණයෙන් අඞ්ග නම් වන්නාහ. එතකුදුවුවත් මේ දරුවන් හා මල්බෑයෝ වූකලී ශීලාචාරාදි කිසි ගුණයක් නැති හෙයින් අඞ්ග නම් වෙති. මූලාවූ සත්ත්වයෝ යම්සේ ශීලාචාරාදී කිසි ගුණයක් නැත්තාහුවෙද්ද, ඒ මූලාවූවන්. හා සමානවන්නාහ. එසේහෙයින් මේ පුත්‍රභ්‍රාතෲහු ආධිපත්‍යස්ථානයෙහි නොපිහිටියයුත්තාහ, ඔවුන්ට බත් හා පිළි පමණක් තමාගේ ගෙදෙරට අවුත් උන් විටෙක ප්‍රේතයන්ට දෙනදෙයක් මෙන් සාසවජාදන මාත්‍රයක්ම ලාහෙළා නිසරහරකොට දෙන්නේය, ආධිපත්‍යස්ථානයෙහි පිහිටුවියයුතු කෙසේ වූවන්ද? යත් පඤ්චශීලාදි එක්තරා ශීලයෙක්හි මනාකොට පිහිටියාවූ රාජකාර්‍ය්‍යයෙහි දක්‍ෂවූ උත්ථානවීර්‍ය්‍යයෙන් යුක්තවූ මෙළුවූ දාසයන් හා මෙහෙකරුවන්ද සේවායන්ද ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටුවන්නේය. නටුවාවූ පුත්‍රදාරාවන් ඇත්තාහටත් දිළිඳුවූ සත්ත්වයාහටත් රාජසේවය කිරීම බැරෑරුම් හෙයින් අති සීතය අති උෂ්ණයයි නොකියා රෑ දවල් නොකුසීතව නැගී සිට කෘෂිවණික් ආදීවූ කර්මාන්තයන් කරන්නේ උත්ථානවීර්‍ය්‍ය ඇත්තා නම්වෙයි. එබඳුවූ දාසකර්මකාරයන් හා සේවකයනුත් ශෛවර්‍ය්‍යයෙහි පිහිටුවිය යුත්තේය. තවද යම් සේවකයෙක් ආචාරශීල ඇත්තේද, ලොභී නොවේද, නැවත රජ්ජුරුවන් වහන්සේ කෙරෙහි ස්නෙහ ඇතුව වාසයකෙරේද, ඒ රජ්ජුරුවන්වහන්සේට සම්මුඛයෙහිත් පරාඞ්මුඛයෙහිත් හිතසිත් ඇත්තේද, එසේවූ රාජසේවක තෙමේ රාජභවනයෙහි වැස සැපත් ලබන්නට සුදුසු වන්නේය. තවද යම් රාජසේවකයෙක් ඒ රජ්ජුරුවන්වහන්සේගේ අභිප්‍රාය දනීද, නැවත ඒ රජ්ජුරුවන්වහන්සේගේ සිතට ව්‍යඞ්ගව පැවත අභිප්‍රාය දැන මෙහෙකෙරේද, ප්‍රතිපක්‍ෂ නොවී අනුකූලව පවතීද, එසේවූ රාජසේවක තෙමේ රජ්ජුරුවන් වහන්සේගෙන් සැපත් එළවාගන්නේය, තවද යම් රාජසේවකයෙක් රජ්ජුරුවන් වහන්සේගේ ඇඟ උලාද, ඉස්සෝධා නනවාද, නැඹුරුව යට බලා හෙලූ ඇසැතිව සිට පතුල් දෙවීද, පතුල් දෙවමින් සිට කර උඩුකුරුකොට රජ්ජුරුවන්වහන්සේගේ මුහුණ නොබලාද, ගෙයිදී නොයෙක් දබර කළ කල් හිත් නොකිපේද, එසේවූ රාජසේවක තෙමේ රජ්ජුරුවන්හෙන්සේගේ සිත් ගෙණ රාජභවනයෙහි වැස තමහට බොහෝ යශපිරිවර හා තන්තනතුරුලැබ පදසම්බවට පැමිණෙන්නේය. තමනට වැඩ කැමැත්තාවූ පුරුෂයෙක් පූර්ණ කුම්භයක් දැක ඇඳිලිබැඳ පැදකුණු කරන්නේය. කපුටුවකු දැක ඇඳිලිබැඳ පැදකුණු කරන්නේය. එසේ ඇඳිලිබැඳ පැදකුණුකරණ පුරුෂයාහට ඒ පූර්ණ ඝටය හෝ කාක ශෘගාලාදීහු කිසි අභිමතාර්ථයක් සිඬකරන්නාහු නොවෙති. එසේ හෙයින් සියළු සම්පත් සිඬකොට දෙන්නාවූ නුවණැත්තාවූ අචල ගුණ ඇති විපදයන්ටම උතුම්වූ රජ්ජුරුවන්වහන්සේට කවරකාරණයකින් අඤ්ජලීකර්මය නොකටයුතුද, සර්වප්‍රකාරයෙන්ම යටත්ව රජ්ජුරුවන් වහන්සේට නමස්කාර කටයුත්තේය. තවද යම් රජ්ජුරු කෙණෙකුන් වහන්සේ හෝනා හිඳිනා දෑ දෙනසේක්ද, හඳින්නට සුදුසු පිළිදෙනසේක්ද, ඇතුන් අසුන් රථ දෝලිකාතම් ආදීවූ යානවාහනදෙනසේක්ද, සැපසේ වසන්නට සුදුසුවූ ගෙවල් දෙනසේක්ද, සියලු සත්ත්වයන්ට මේඝය මෙන් හිරණ්‍ය සුවර්ණාදි අනෙකප්‍රකාර

උපභොග පරිභොග වස්තු නමැති වර්‍ෂා වස්වා සත්වයන්ගේ සිත් තෙමා සත හනුසේක්ද, එසේවූ රජ්ජුරුවන්වහන්සේ කවර කාරණයකින් නොවැන්ද යුතුද, වැන්ද යුතුය, පිදිය යුතුය, සිතින් ප්‍රෙමකටයුතුය; සම්මුඛ පරාම්මුඛයෙහි ගුණ කියයුතුත් නොයෙක් පරිද්දෙන් සිත්ගෙණ වීර්යයුතුත් මෙබඳුවූ රජ්ජුරුවන්වහන්සේගේම්ය එසේහෙයින් දරුවෙනි! යම් මේ රාජ විත්තියෙක් මා විසින් නිරවශෙෂකොට කියනලද්දේවීනම් ඒ මේ රාජවිත්ති නම් දෙය රාජසේවකයන් පරම්පරාවෙන් කොට එන හෙයින් යම්බඳුවූ මේ රාජවිත්තියෙහිවූ පරිද්දෙන් පවත්නාවූ පුරුෂතෙමේ යම් කාරණයකින් සිත් ගණිද, ඒ කාරණයෙන්ම ඒ ස්වාමිවූ රජහු සම්පයෙන් සත්කාරසම්මානයෙන් ප්‍රශංසාත් ලබන්නේයයි මෙසේ අසමධුරවූ විධුර පණ්ඩිතයෝ සර්‍වඥවිලාස යෙන් වුක්තප්‍රකාර කාරණා හිනාධ්‍යාශයෙන් කියා ධර්‍මපාලකුමාරයන් ප්‍රධාන කොට ඇති පුත්‍රයන් දහසක් දෙනාට ඉගැන්වූහ. පුත්‍රදාරාවන් හා යහළු විශ්වාසයන් ආදීවූ බොහෝදෙනාට අවවාද අනුශාසනා කරන්නටම ඒ බොධි සත්වයන්ට තුන්දවසක් ඉකුත්වූයේය.

ඉක්බිත්තෙන් මහබෝසතානෝ නියමකළ දවස් පිරුණු නිසාව දූන උදෑසනක්සේම අනෙකප්‍රකාරවූ රසමසවුලෙන් යුක්තවූ අග්‍රභෝජනය අනුභවකොට රජ්ජුරුවන්වහන්සේට දන්වා මානවකයා හා සමග යෙමියි සිතා බන්ධුවර්ගයා විසින් පිරිවරණලදුව රජභවනයට ගොස් රජ්ජුරුවන් වැඳ පැද කුණුකොට එකත්පස්ව සිට දෙහොත් මුදුනෙහි තබා මෙසේ කීහ. සතුරන් දමනයෙහි ලන්නාවූ මහරජ්ජුරුවන්වහන්ස! මේ මානවක තෙමේ තමාට හැඟුනක් කරණු කැමතිව මා ගෙණයන්නේය. එසේහෙයින් මාගේ නැයන්ට වැඩක් කියම් සිත්ලෙලා අසා වදාළමැනව. මාගේ මේ කුමාරාදීවූ දරුවන් කළ අපරාධයක් ඇත්නම් සිත නොතබා ඊට ක්‍ෂමාකොට දුකෙහි අත්නොහැර රැක වදාළ මැනව. මාගේ ගෙයි මුතු මැණික් ආදීවූ යම් ධනයෙක් ඇත් නම් ඒ සියලු ධනයක් නුඹවහන්සේ විසිනුත් අන් රජදරුවන් විසිනුත් මට දෙන ලද්දවූ ප්‍රමාණාතික්‍රාන්තවූ යම් අන්‍ය වස්තුයෙක් ඇත්නම් ඒ සියලු වස්තුවත් නුඹවහන්සේම සොරුන් සතුරන්ගෙන් උපද්‍රවයකුත් වැද්දනොදී රක්‍ෂාකළ මැනව, මා පලාගිය කල්හි මාගේ බන්ධු සමූහයෝ පසුව යම්සේ සැපයෙන් නොපිරිහෙත් නම් එපරිද්දෙන් උනුන් රැකවදාළ මැනව.

නම්ද යම්සේ බිම පැකිල ගිය පුරුෂයෙක් බිමම සරණකොට පිහිටාද, නුඹවහන්සේ පිහිට නොබලා මේ මානවකයා සත්නකයෙමියි කියනලද මාගේ මේ පැකිලීමක් එසේම වන්නේය, බිම පැකිල බිම සරණකොට ඇති පුරුෂයාමෙන් මමත් නුඹවහන්සේ කෙරේ පැකිල නුඹවහන්සේම සරණකොට ඇත්තෙමි. එසේ හෙයින් රජ්ජුරුවන්වහන්සේ කුමක් වන සේක්දැයි මානවකයා අතින් විචාළකල්හි නුඹවහන්සේ මූහුණ නොබලා සැබෑ බස රක්නා නිසා මම දසයෙමියි කියන්නා මාගේ යම් අපරාධයෙක් ඇත්නම් එ අපරාධය දක්මි. මෙතෙක්මුත් අනික් ඒනේ වරදෙක් නොදක්මි. ඒ මාගේ අපරාධයට ක්‍ෂමාකළ මැනව, මෙපමණ වරදෙක් සිත තබා පසුව මාගේ පුත්‍රදාරාවන්ට කිසි ගැහැටක් නොකළ මැනවැයි කීහ.

එබස් අසා ධනඤ්ජය කෞරව්‍ය රජ්ජුරුවෝ පණ්ඩිතයෙනි! තොපගේ ගමන මට අභිප්‍රාය නොවන්නේය එසේහෙයින් මානවකයා උපායෙන්ම කැඳවා ගෙන්වාගෙන මෙතැනදීම මරා සඟවාපියම්හ. ඒ මට අභිප්‍රාය වන්නේයයි ප්‍රකාශකොට කීහ. එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු දේවයන්වහන්ස! තුඹවහන්සේට එබඳුවූ අදහසක් නුසුදුසුවන්නේය. අනර්ථයෙහිත් අකුශලයෙහිත් තුඹවහන්සේගේ සිත නොපිහිටුවව මැනව, ආත්මාර්ථ පරාර්ථයෙහිත් දශකුශල ධර්මයෙහිත් යුක්තවූව මැනව, ප්‍රාණඝාතාදීවූ යම් අකුශලකර්මයක් කොට සත්වයෝ අජරාමර නොවෙද්ද? පසුව චුතියෙන් මත්තෙහි නරකයට යෙද්ද, එසේහෙයින් කුසල්නොවන්නාවූ ලාමක අකුශල ධර්මයන්ට නින්දාවේවයි මේ තෙමේ කාරණයකුත් නොවන්නේය කටයුත්ත කුදු නොවන්නේය. මරන්නවත් තලන්නවත් හිංසාකරන්නවත් ස්වාමි පුරුෂතෙමේ දාසයාට ඉසුරුමත් බැවින් සුදුසුවන්නේය. මේ කාරණයෙන් මට ඔහු කෙරෙහි ආඝාත මාත්‍රවූ කොපයකුත් නැත. දුන් තැන් පටන් ඔහු කුමක් කරනත් ඉවසන්නටම සුදුසුය. එසේහෙයින් මම මානවකයා හා කැටුව යෙමියි කීහ. මෙසේ කියා මහබෝසතාණෝ රජ්ජුරුවන් වැඳ අන්තඃපුර ස්ත්‍රීන්වත් රාජපිරිසටත් අවවාදකොට ඔවුන් අවවාද අසා හැම දෙනා සිටි පල සිටගතනොහී මහහඬින් හඬමින් සිටියදීම මාලිගාවෙන් නික්මුණාහ එකල්හි සියලු නුවරවාසීහු අපගේ පණ්ඩිතයන් වහන්සේ මානවකයා හා යන සේක්ල, එසේහෙයින් උන්වහන්සේ දක්නා පිණිස යම්හයි කියා ගොස් රාජාඞ්ගනයෙහිදීම බොධිසත්වයන් දුටුහ. මහබෝසතාණෝ ඔවුන් හැම දෙනා රඳවා තෙපි හැම්දෙන කිසි සැකයක් නොකරව සියලු සංස්කාරධර්මයෝම අනිත්‍යයෝම්ය. එසේහෙයින් දානශීලාදී කුශලධර්මයෙහි අප්‍රමාදව වාසයකරවයි කියා අවවාදකොට හැම්දෙනා රඳවා තමන්ගේ ගෙට අභිමුඛව නික්මුණාහ. එසඳ ධර්මපාල කුමාරයෝ මලුන් දහසක් පිරිවරා පියාතන්ට පෙර ගමන්කරම්හයි නික්මුණු තැනැත්තෝ ගෙදරදීම පියාතන්ට සම්මුඛ වූහ, මහබෝසතාණෝ ඒ ධර්මපාල කුමාරයන් වැළඳගෙණ ළෙහි හොවා සිත ඇති ශොක දුරුකොට ඉක්බිත්තෙන් කඳුළුපිරුණාවූ දෑසින් යුක්තව තමන් වසන මාලිගාවට ගොස් වන්හ. ඒ මහබෝසතාණන්ගේ ගෙයි පුත්තු දහසෙක, දූවරු දහසෙක, භාර්යාවෝ දහසෙක, කම්මිත්තෝ සත්සියයෙකැයි මේ සියල්ලන්ගෙනුත් අවශෙෂවූ ඥාතිමිත්‍රයන් හා දාසකර්මකාරයන් ගෙනුත් විධුර පණ්ඩිතයන්ගේ සියලු මාලිගාව යුගාන්ත මාරුතයෙන් පැහැර වගුරුවනලද සල්ගස් ඇති සල්වනයක් මෙන් අතුරු සිදුරු නැතිවිය.

තවද ඒ විධුර පණ්ඩිතයන්ගේ මාලිගායෙහි දහසක් පිරිමි පුතුන් හා දහසක් දූන් හා දෙවඟනන්වැනි දහසක් භාර්යාවන් හා සත්සියයක් කම්මිත්තන් හා අවශෙෂ දාසකර්මකාරබන්ධු මිත්‍රාදීවූ මෙනෙක්දෙන චණ්ඩමාරුතයෙන් පැහැර වගුරුවනලද සුපිපි සල්වනයක් මෙන් ශොකනමැති චණ්ඩවාතයෙන් ගසා බිම වගුරණලද්දාහු හඬමින් බිම ඇත මැත පෙරළෙන්නාහ, තවද ඒ විධුර පණ්ඩිතයන්ගේ මාලිගායෙහි වැපාරයන් හා බමුණෝද, හස්ත්‍යාචාර්යයන් හා අශ්වාචාර්යයන්ද, රථාචාර්යයන් හා පාබලසෙනාවද, රුස්වූදනවූවැස්සෝද, එසේම රුස්ව නියම්ගම්වැසි කෙළඹි ජනයෝද, ස්වාමිනි! අප කවර කාරණයකින් හැරයනසේක්දැයි දෙහොත් හිස තබා හැඬූහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ ඒ සියලු මහජනයා අස්වසා මිත්‍රයන් සේවායන් පුත්‍රදාරාවන් මල්බෑ ආදීවූන්ට ගෙයි කළමනා කටයුතු මේ මේයයි කර්මාන්ත විධානකොට ගෙයි රත්න කොෂ්ඨාගාරයෙහි තුබූ වස්තූද ඒ ඒ තැන පිහිටුවා නිධාන පත් ධනය එළවූවමනා තැන්දැයි මෙතෙක්දෑ කියා ඉක්බිත්තෙන් පූර්ණකයාට මෙසේ කීහ. කාත්‍යායනය! තෝ මාගේ ගෙයි තුන් දවසක් විසුයෙහිය. මා ගෙයි කළමනාකාර්‍ය්‍යී විධානත් කොට නිමවනලද මා විසින් පුත්‍රදාරාවන්ටත් අනුශාසනා කරණ ලද්දේය. එහෙයින් අභිප්‍රාය ලෙස කැමති පරිද්දෙන් මා ඇරගෙණ නික්මෙවයි කීහ. එබස් අසා පූර්ණකයා කියන්නේ ඉදින් විධුර නම් අමාත්‍යයානෙනි! තොපගේ පුත්‍රදාරාවන්ටත් තොප නිසා ජීවත්වන්නාවුන්ටත් ඉදින් අනුශාසනාකරණ ලද්දේ වී නම් එසේ දැන් වහා යනු කැමැත්තේවීනම් මෙසේ තැගීඑව, අපට අභිමුඛයෙහි යායුතුවූ මේ මාර්ගය ඉතා දුරවන්නේය. එසේහෙයින් මේ අජානීය සෛන්ධවයාගේ වාලධිය තොබා අල්වාගණුව, මේ තොපගේ සත්වලොකයෙහි කෙළවර දක්මවන්නේයයි ඒ පූර්ණකයා යටමාලයට නොබැස මතුමාලේසිටම ආකාශයෙන් යනු කැමතිව මෙසේ කීයේය. එකල්හි මහබෝසතාණෝ ඕහට කියන්නාහු මානවකය! කයින් වචසින් මනසින් කරණලද යම් අකුශල කර්මයක් නිසා සත්වතෙමේ දුගතියට යන්නේවීනම් එබඳුවූ මා විසින් කරණලද අකුශලකර්ම සංඛ්‍යාතවූ නපුරෙක් නැත එසේ නිවරදවූ මම කවර කාරණයකින් බම්දැයි මේ වචනය මහබෝසතාණෝ අජානීය සෛන්ධවයාගේ වාලධිය නිර්භීතව අල්වා ණුවයි මානවකයා කී බැවින් කීහ.

මෙසේ ඒ මහබෝසතාණෝ සිංහනාදකොට අසම්භීතවූ කෙශර සිංහ රාජයකු පරිද්දෙන් නිර්භීතව මා වහන්නාවූ මේ වස්ත්‍රය මාගේ අභිප්‍රායෙන් නොම්දේවයි කීයා අධිෂ්ඨාන පාරමිතාව පෙරදැරිකොට වස්ත්‍රය මිරිකා ඇඳ ගෙණ අසුගේ වාලධියපීරා දෙකක්කොටබෙදදැතින් තරකොට අල්වාගෙණ දෙපයින් අසුගේ කලවයවෙළා කොකුගසාගෙණ මානවකය! මාවිසින් අසුගේ වාලධිය අල්වාගන්නාලද, දැන්වූකලී තෝ කැමති පරිද්දකින් නික්මෙවයිකීහ. එසඳ පූර්ණකයා මනොමය සෛන්ධවයාට සන්කෙළේය. ඒ සෛන්ධවයා පණ්ඩිතයන් ඇරගෙණ ආකාශයෙහි දිවගත්තේය. එසඳ පූර්ණකයා සිතන්නේ දුරට නොගොස් විධුර පණ්ඩිතයන් හිමාලයවන ප්‍රදෙශයෙහි වෘක්ෂපර්වතවල ගසා තළා මරාපියා හෘදයමාංශය අරගෙණ මෘතකලෙබරය පර්වත අතරකට දමාපියා නාගභවනයට යෙමියිසිතා ඒ පූර්ණකයා වෘක්ෂ හා පර්වතන්නොවලහා ඒ වෘක්ෂ පර්වතමැදින්ම සෛන්ධවයා විහිදුවූයේය. මහබෝසතාණන්ගේ ආනුභාවයෙන් වෘක්ෂයන් පර්වතත් මහබෝධිසත්වයන්ගේ ශරීරය දෑලයෙහි රියනක් පමණතැන් ඉවත්වන්නේය. එසඳ පූර්ණකයා මෙලේද්‍යෙ නොමෙලේද්‍යෙහෝයි කරකැවී මහබෝසතාණන් මූණබලන්නේ රත්කැටපතක්මෙන් විශෙෂයෙන් ප්‍රසන්නවූ මුහුණ දැක මේ තෙමේ මෙසේ නොමියන්නේය. දැන් මහත්වූ වෙරම්බ වාතයෙන් සුණුවිසුණු කරමියි සිතා ක්‍රොධයෙන් මඩනාලදුව සත් වැනිවූ වාතස්කන්ධයට දිවගත්තේය. ඉක්බිත්තෙන් වෙරඹ වාතයෙනුත් මහබෝසතාණන්ට කිසි අන්තරායක් නුවූ නියාව දැක බොධිසත්වයන් ඇරගෙණ කාළගිරි නම් අඤ්ජන පර්වත මස්තකයට ගියේය.

මෙසේ ඒ පූර්ණකයා මහබෝසතාණන් ඇරගෙණ ගියසඳ පණ්ඩිත යන්ගේ පුත්‍රාදීහු පූර්ණකයා වසන තැනට ගොස් මහබෝසතාණන් නොදුක පාසුත්තවුන් මෙන් බිම වැටී ඇතමෑත පෙරළෙමින් මහහඬින් හැඬූහ. තවද දහසක් අන්තඃපුරස්ත්‍රීන් හා සත්සියයක් හා කම්මින්තෝ පූර්ණකනම් යක්ෂයා මානවක වේෂයෙන් අවුත් විධුර පණ්ඩිතයන් ඇරගෙණ යන්නේයයි දෙහොත් හිස තබා හැඬූහ. තවද අවශෙෂ පුරස්ත්‍රීන් හා රාජකුමාරවරුද වැපාරයන් හා බමුණෝද, හස්ත්‍යාවාහීයන් හා අශ්වවාහීයන් ආදීවූ පාබල සේනාවද රැස්වූ දනව්වැස්සන් හා එසේම රැස්වූ නියම්ගම් වැසි කෙළෙඹි ජනයෝද, පූර්ණකනම් යක්ෂයා මානවක වෙසින් අවුත් විධුර පණ්ඩිතයන් ඇරගෙණ යන්නේයයි දෙහොත් හිස තබා හැඬූහ, තවද ඒ මහබෝසතාණන්ගේ අන්තඃපුර ස්ත්‍රීන් ආදීවූ මුක්තප්‍රකාර බොහෝ ජනයෝ අපගේ විධුර පණ්ඩිතයන්වහන්සේ කොයිගියසේක්දෝහෝයි කියා මහබෝසතාණන් ඇරගෙණ ආකාශයෙන් යන්නා දැකත් මෙපරිද්දෙනුත් හඬා ඒ අන්තඃපුර ස්ත්‍රීන් හා පුත්‍රාදීවූ හැම්දෙනම සියලුනුවරවාසීන් හා සමග හඬමින් වලපමින් රජ්ජුරුවන්වහන්සේගේ මාලිගා දෙරකඩට ගියහ

එසඳ ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ මහත්වූ විලාප ශබ්දය අසාසියු මැදුරු කවුළුව හැර කුමක් නිසා අවුදුයි විචාළහ. එසඳ රජ්ජුරුවන්ට ඔහු හැමදෙනම කියන්නාහු දෙවයන්වහන්ස! මානවකයා වූකලි බ්‍රාහ්මණයෙක් නොවෙයි යක්ෂයෙක, බ්‍රාහ්මණවේශයෙන් අවුත් පණ්ඩිතයන් ඇරගෙණ ගියේය. ඒ පණ්ඩිතයන් නැතිව අපගේ ජීවත්වීමෙක් නැත. ඉදින් අදට සත්වැනි දවස් පණ්ඩිතයෝ නාවාහුවීනම් අපි හැම්දෙනම සියගණන් දහස් ගණන් ගැලින් දර ඇද කැටිකොට හැමදෙනම ගිනිවැද මියම්හයි කීහ. (සර්වඥයන්වහන්සේ පිරිණිවී කල්හිත් අපි ගිනිවැද මියම්හයි කී කෙණෙක් නැත) මහාබොධිසත්වයන් විසින් නුවර මහජනයා සිත්ගෙණ විසූ පරිදි ඉතා විස්මය නියාය ඉතා යාපත් නියායයි සිතා රජ්ජුරුවෝ ඔවුන් හැම්දෙනාගේ බස් අසා පණ්ඩිතයෝ මිහිරිවූ ධර්මකථා ඇත්තෝය. එසේහෙයින් මානවකයා ධර්මකථාවෙන් පොළඹා තමන්ගේ පාපිට හෙළාගෙණ නොබෝකලකින්ම කඳුළු මුසු මුහුණු ඇති මේ සියලුදෙනා සතුටුකරවමින් එන්නාහ. එසේ හෙයින් තෙපි හැමදෙනම ශොකනොකරවයි කියන්නාහු මහජනයෙනි! ඒ විධුර පණ්ඩිතයෝ විචාරණ ප්‍රඥායෙන් සමන්විතයෝය, අර්ථානර්ථ කාරණා කාරණා දක්වා බිණීමෙහි සමර්ථයෝය තීක්ෂණයෝය, ස්ථානෝචිත කාරණා දන්නාවූ ප්‍රඥායෙන් සමන්විතයෝය. එසේහෙයින් වහාම තමන් යක්ෂයා අතින් ගැලවීගෙණ මඳ දවසකින් තොප ඇස් හමුවට එන්නාහ. එසේහෙ යින් තොප හැම ශොක නොකරවයි මෙසේ නුවරවාසීන් ඇස්වැසූහ. එකල්හි නුවරවාසීහු විධුර පණ්ඩිතයෝ රජ්ජුරුවන්වහන්සේට කියා ගියෝවනැයි අස්වැසිලි ලත්හ. ඒ පූර්ණකතෙමේ මහාබොධිසත්වයන්වහන්සේ කාළගිරි පර්වත මස්තකයෙහි තබා සිතන්නේ මොහු ජීවත්වන කල්හි මට වැඩෙක්නම් නැත, මොහු මරා හෘදයමාංශය ගෙණ නාගභවනයට ගොස් විමලාවන්ටදී ඉරන්දතිය ගෙණ දිව්‍යලෝකයට යෙමියි සිතීය.

ඉක්බිත්තෙන් ඒ පූර්ණක නම් යක්‍ෂසෙනාධිපතිතෙමේ කාළගිරි පර්‍වත මස්තකයෙහි සිට සිතන්නේ ක්‍ෂණ ක්‍ෂණයෙහි නොමරම්හයි කියාත් මරමියි කියාත් බොහෝ සිතිවිලි උපදවන්නේය, එසේ හෙයින් කිසිසේත් මෝහට ජීවිතදානය යන සිතවිල්ලෙක් විවේක ඉපද ගියේ නමුත් ඒ කාරණා නො වන්නේය. මොහුගේ ජීවත් වීමෙන් නාගභවනයෙහිදී මට සවල්පමාත්‍රවූවත් කාර්‍ය්‍ය සිද්ධියෙක් නැත්තේය. එසේහෙයින් මොහු මෙතැනදීම මරා මොහුගේ හෘදයමාංශය ගෙණයෙමියි සතිටුහන් කෙළේය.

තවද සිතන්නේ මොහු සිය අතින් නොමරා භයංකාර රූපයක් මැවීමෙන් ජීවිතක්‍ෂයට පැමිණ වූයෙම් වීනම් යහපතැයි භයංකාරවූ රාක්‍ෂස රූපයක් මවා මහත්‍ කොට හඩගසමින් අවුත් ඒ බොධිසත්ත්වයන් හෙලා මුඛයෙන් දළහස්සේ ලාගෙණ කනු කැමැත්තක්හුමෙන් වූයේය. එසඳ මහබෝසතාණන් වහන්සේට ලොමුදැහැගැණීම පමණකුදු නුවූයේය, ඉක්බිත්තෙන් සිංහරූපයක් සා මහත්වූ හස්ති රූපයක් මවාගෙණ අවුත් සිංහදළින් විනිවිද මස් අනුභව කරන්නාක්හුමෙන්ද ඇත්දළින් ඇන දෙසිදුරු කොට ජීවිතක්‍ෂයට පමුණුවන්නාක්මෙන්ද භයංකාර දක්වා එසේත් නොවන්නාවූ බොධිසත්ත්වයන්ට එක්දඬු ඔරුවක් සා මහත් සර්‍පවෙශයක් මවා සුස්මමින් අවුත් සකල ශරීරය වෙළා හිස්මුදුනේ ඵණගර්භය තබා ගත්තේය, එතකුදුවූවත් ඒ බොධිසත්ත්වයන්ට තැතිගැණීම් පමණකුත් නුවූයේය. නැවත ඒ බොධිසත්ත්වයන් පර්‍වත මස්තකයෙහි සිට වැටී සුණුවිසුණු වන්නේයයි සිතා කල්පාන්ත මාරුතයක් හා සමානවූ මහපවනක් හැම්මවූයේය. ඒ මාරුතය බොධිසත්ත්වයන්වහන්සේගේ කෙසත් විවරකුත් සොලවාගත නුහුනුයේය, නැවත බොධිසත්ත්වයන් එසේම පර්‍වත මස්තකයෙහි තබා ඉදිගසක් අල්වා සොලවන මතැනක්හුමෙන් පර්‍වත ඔබමොබ පෙරළා සෙලවූයේය. එසේ කොටත් බොධිසත්ත්වයන් සිටි තැනින් කෙසගක් පමණකුත් සොළවාගත නුහුනුයේය.

ඉක්බිත්තෙන් ශබ්ද සන්ත්‍රාසයෙන් බොධිසත්ත්වයන්ගේ ලයපැළීම කෙරෙමියි සිතා පර්‍වතය ඇතුළට වැද පෘථිවියත් ආකාශයත් එකකින් නාද කරවමින් මහත් හඬ ගැසූයේය; එසේ කළත් බොධිසත්ත්වයන්ට කිසි චිත්ත සන්තාප මාත්‍රයකුත් නුවූයේය. මහාබෝධිසත්ත්වයෝ වූකලී යක්‍ෂ සිංහ හස්ති නාගරාජ වෙශයෙන් ආයෙත් මහවැසි මහසුළං හා පර්‍වත චලන දියකෙළත් පර්‍වත ඇතුළත වැද මහත් කොට අඬගැසූයෙත් ම පූර්‍ණීකයාමය, අනිකෙක් නොවෙයි කියා නියමකොට දත්හ, ඉක්බිත්තෙන් යක්‍ෂයා සිතන්නේ මම මොහු බාහිරොපක්‍රමයෙන් මරන්නට අසමර්ථයෙමියි සිය අතින්ම මොහු මරමියි මහාබොධිසත්ත්වයන් පර්‍වත මස්තකයෙහි තබා පර්‍වත ප්‍රාන්තයට ගොස් ඉන්ද්‍රනීල මාණික්‍යයක රත්පලස් හුයක් අවුනන්නාක්මෙන් ක්‍ෂණක්ෂණයෙහි ඊ ඊ පිට අඩගසමින් පර්‍වතය ඇතුළෙත්ම උඩ නැඟී මහබෝධිසත්ත්වයන් තර කොට අල්වාගෙණ ඉස යට කොට පය උඩුකුරු කොට නිරාලම්බවූ ආකාශයෙහි දැමූයේය. මෙසේ ඒ බෝධිසත්ත්වයන් සිස්වූ ආකාශයට දමා පසළොස් යොදනක් පමණ තැන් බටකල පර්‍වතය මුදුනෙහිම සිට තමාගේ ආනුභාවයෙන් අත දික්කොට අධඃශීර්‍ෂව බස්නාවූ බොධිසත්ත්වයන් දෙකකුල අල්වාගෙණ අධඃශීර්‍ෂකොටම ඔසවා මුඛයබලා නොමියේයයි දැන දෙවැනි වාරයකුත්

දැමීය. තිස්යොදනක් පමණතැන් බටකල එසේම ඔසවා මූණබලා කිසි උපද්‍රවයකට නොපැමිණි බොධිසත්වයන් දැක සිතන්නේ ඉදින් මේ තෙමේ දැනුත් සැටයොදුනක් පමණ තැනුත් බැස නොමියන්නේ වීනම් දෙකකුල පර්‍වත මුදුනෙහි ගසා මරමියි සිතීය

ඉක්බිත්තෙන් මෙසේ සිතා තුන්වැනිවාරයේ බොධිසත්වයන් අල්වා පර්‍වත මුදුනෙන් හෙලා සැටයොදනක් පමණතැන්ම හුනුකල තමාගේ ආනුභාවයෙන් අත දික්කොට දෙකකුල අල්වා ඉස්වීය. එසඳ මහාබෝධි සත්වයෝ සිතන්නාහු මේ තෙමේ මා පළමුකොට පසළොස් යොදනක් පමණ තැනින් හෙලීය, දෙවනිවාරයෙහිත් තිස්යොදනක් පමණ තැනින් හෙලීය, තුන්වානි වාරයේ සැටයොදනක් පමණ තැනින් හෙලීය, නැවත මා නො හෙලන්නේය. උඩ ඔසවාගත් පර්‍වත මුදුනෙහි ගසා මරන්නේය, යම් පමණ කලකින් ඔසවා පර්‍වත මුදුනෙහි නොගසන්නේ වීනම් ඊට පළමුකොට අධඃ ශීර්ෂව එල්ලී සිටම මා මරන්නාවූ කාරණය විචාරමියි සිතා භයක් චකිතයක් නැතිව පූර්ණක නම් යක්‍ෂසෙනාධිපතිහට මෙසේ කීවුය. එම්බල පූර්ණකය! තෝ රූපයෙන් උත්තමවූ රූපශ්‍රී ඇති දිව්‍යපුත්‍රයක්හු වැන්නෙහිය එතකුදු වුවත් කායවාක් සංයමාදී තාගේ කිසිම උත්තම ගුණයෙක් නැත්තේය, තවද කායචාරාදියෙන් අසඬුඬුතවූ පාපක්‍රියා කරන්නේය. එතකුදුවුවත් කායවාක් සංයමයත් ඇති එකක්හුමෙන් පෙණෙන්නේය; රෞද්‍රවූ කිසිම වැඩක් සිඬනොකරන්නාවූ ලාමක ක්‍රියාවක්ම කරමින් සිටියෙහිය, එසේ හෙයින් තාගේ සිත සවල්ප මාත්‍රවූත් කුශලයෙක් වේවයි කරුණා මෛත්‍රියෙක් වේවයි නැත්තේය! මෙබඳුවූ තෝ මා මේ ප්‍රපාතයෙහි හෙළා මරණු කැමැත් තෙහි වීනම් එසේ මාගේ මැරීමෙන් තට කවර ප්‍රයෝජනයෙක් ඇද්ද? අදවූ කලී තා මේ කරන්නාවූ කායකීය අමනුෂ්‍යකුගේ ක්‍රියාවක්මෙන් වන්නේය, නොවලහා මට කියව, තා යක්‍ෂයන් අතරෙන් කවර නිකායෙක උපන් යක්‍ෂයෙක් දැයි විචාළහ.

එසඳ පූර්ණක නම් යක්‍ෂයා කියන්නේ එම්බා විධුර පණ්ඩිතයෙනි! තොප විසින් අටවිසි යක්සෙනෙවියන් අතරෙන් පූර්ණක නම් යක්‍ෂසෙනාධි පතියෙක් ඇතැයි අසන ලද්දේ වීනම් එතෙමේ වෙසවුණු මහරජාණන්ගේ අමාත්‍ය වන්නේය, තවද නාගභවනයෙහි වාසය කරන්නාවූ වරුණනම් නාග රාජයෙක් ආරොහපරිනාහයෙන් යුක්තය දිවිදළින් ඔප් නැගූ කනක රූප යක්මෙන් ඉතා නිම්ලවූ ශරීරඡවි හා දශීනයවූ රූප සොභා ඇත්තේය. මහත්වූ කායබලයෙන්ද යුක්තය. ඔහුගේ අනූන දුව ලබන්නා කැමති වීම් ඔතොමෝ ඉරන්දතිනම් නාගකන්‍යාවය, අනුරෙන් පමණකට හැකි මධ්‍යම ප්‍රදෙශ ඇති ඉරන්දති නම් ඒ නාගකන්‍යාව ලබනු කැමතිව තොපට මෙතෙක් උපක්‍රමයන්කොට මරණු කැමැතිවීමි කීය. එබස් අසා මහා බොධි සත්වයෝ මේ ලෝකවාසී සත්වයෝ නිස්කාරණයේ ඇත්වනීබූ කායකීය නිබුසේ තිබැද්දී වරදවා ගැන්මෙන් නස්නාහ. නාගකන්‍යාව පතන්නාවූ මෝහට මාගේ මරණීන් කවර ප්‍රයෝජනයෙක් ඇද්ද එසේ හෙයින් මරණ කාරණා තත්වූ පරිද්දෙන් දැනගණිම් සි ා විචාරන්නාවූ බොධිසත්වයෙ යක්‍ෂය! තෝ

මුසා නොවෙව; මේ ලොකයෙහි බොහෝ සත්ත්වයෝ ආකායර්‍ය්‍ය කායර්‍ය්‍ය කොට කායර්‍ය්‍ය අකායර්‍ය්‍ය කොට ගෙණ තටත, හස්තපරිමිත මධ්‍යම ප්‍රදෙශ ඇති ඉරන්‍දතී නම් ඒ නාගකන්‍යාව නිසා මාගේ මරණින් තට කවර ප්‍රයෝජනයෙක් සිඬවේද? සබඳ! තෝ මා මැරීමෙහි කාරණා කියා බලව ඒ කාරණා අසනු කැමැත්තෙමියි කීහ.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයන්ට පූර්ණකයා මරණ කාරණා කියන්නේ විධුර පණ්ඩිතයෙනි! මහත්වූ ආනුභාව ඇති වරුණ නම් නාරජ්ජුරුවන්ගේ දූවූ නාගකන්‍යාව නිසා ඇවිද උන්ට මම ඥාති සම්බන්ධයක් කෙරෙමි. ඉරන්‍දතිය ඉල්වන්නාවූ මට මයිල්ව සිටියාවූ වරුණනම් නාරජ්ජුරුවෝ මා කාමයෙහි ලොල් නියාව දැක පූර්ණකය! තට මනාවූ රූපසොභා ඇති නිලුපුල්පෙති බඳුවූ ඇස් ඇති මඳ මඳ සිනා ඇති චන්‍දනාගරු ගල්වනලද ශරීර ඇති ඉරන්‍දතිය දෙම්මය. එතකුදුවුවත් තෝ ඉදින් විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශය දැහැමින් ලැබ මෙතනට ගෙණායෙහි වීනම් ඒ සතුටු පඬුරු නිසා ඉරන්‍දතිය තෝ ලබන්නෙහිය මෙයින් අන්‍යවූ කවර වස්තුවක්වත් අපි ප්‍රාර්ථනා නොකරම්හයි කීවුය. එසේහෙයින් විධුර පණ්ඩිතයෙනි! මා මුසාව කියන දෙයක් නැත. මාගේ බස් අසව. මා වරදවාත් කිසිම කායර්‍ය්‍යකුත් නැත, තොපගේ හෘදයමාංශය දැහැමින් ලද්දේ වීනම් ඒ නිසා ඉරන්‍දතිය නම් නාගකන්‍යාව බාධාවක් නැතිව මට දෙන්නාහුය. ඒ කාරණයෙන් මම තොපට වධකිරීමෙහි නියුක්තවීමි. තොපගේ මරණින් මට ප්‍රයෝජන නම් මේ කාරණය වන්නේය. මේ නරක ප්‍රපාතයෙහි තොප හෙලා මරා තොපගේ හෘදයමාංශය ඇරගෙණ යන අභිප්‍රාය ඇත්තෙමියි කීය.

ඒ පූර්ණකයාගේ බස් අසා මහබෝසතාණෝ සිතන්නාහු විමලාවන්ට මාගේ හෘදය මාංශයෙන් ප්‍රයෝජන නැත, වරුණ නම් නාරජ්ජුරුවෝ ධර්ම කථාව අසා කණ්ඨමාණික්‍යයෙන් පූජාකොට නාගභවනයට ගිය තැනැත්තන් විසින් මාගේ ධර්මකථික භාවය වර්ණනාකරණ ලද්දේ වන ඉක්බිත්තෙන් විමලාවන්ට මාගේ ධර්ම කථායෙහි දොළෙක් උපන්නේවන, වරුණ නම් නාරජ්ජුරුවන් විසින් වරදවා සිතාගෙණ පූර්ණකයාහට නියෝගකරණ ලද්දේවන. ඒ පූර්ණකයා තමා වරදවා සිතා ගැන්මෙන් මා මරන්නට මෙබඳුවූ දුකකට පැමිණවීය. මාගේ පණ්ඩිත බව හා ස්ථානොචිත ප්‍රඥායෙහි සමර්ථභාවය මොහු මරන්නට උත්සාහ කරණ වේලෙහි කුමක් කෙරේද? එබැවින් මානවකය! මමසාධුනර ධර්මය නම් දෙයක් දනිමි. යම්තාක් මම නොමියෙම්නම් ඊට පළමුකොට මා පර්වත මස්තකයෙහි ඉඳුවා සාධුනර ධර්මය අසා පසුව යමක් කැමැත්තෙහි වීනම් ඒ කරවයි කියා සාධුනර ධර්මය වර්ණනා කිරීමෙන් ජීවිත දානය ඉල්වා ගන්නෙම් වීනම් යහපතැයි ඒ බොධිසත්ත්වයෝ අධඃශීර්ෂව එලෙමින් මානවකයාට කියන්නාහු එම්බල කාත්‍යායනය! ඉදින් තට මාගේ හෘදමාංශයෙන් ප්‍රයෝජනය ඇත්නම් වහා මා මේ නරක ප්‍රපාතයෙන් උඩනගවා මේ ලොකයෙහි පවත්නා යම් කිසි සාධුනර ධර්ම කෙණෙක් ඇත්නම් ඒ සියල්ලම අද තට ප්‍රකාශකොට කියමියි කීහ. එබස් අසා පූර්ණක නම් යක්ෂසේනාධිපති තෙමේ විධුර පණ්ඩිතයන් විසින් දිව්‍ය මනුෂ්‍යයන්ට පළමුකොට නොකීවිරූ

ධර්මයෙක් වතැයි සිතා වහාම උඩතගා සාධුතර ධර්මය අසමියි මහබෝධි සත්ත්වයන් උඩ ඔසවා පර්වත මස්තකයෙහි හිඳුවා අස්වැසිලි ලැබ හුන්නාවූ අලාමකවූ ප්‍රඥා ඇති බෝධිසත්ත්වයන්ගේ මුහුණ බලා මෙසේ කීය. විධුර පණ්ඩිතයෙනි! තෙපි මා විසින් ප්‍රපාතයෙන් ගොඩනගතලදුව අද තොපගේ හෘදය මාංශයෙන් මට ප්‍රයෝජන ඇත. මේ ලොකයෙහි විද්‍යමාන යම්කිසි සාධුතර ධර්මයෙක් ඇද්ද, ඒ සියල්ල අද මට පහළ කරවයි කීහ. මහ බෝසතාණෝ එබස් අසා පූර්ණකය! මම තා විසින් ප්‍රපාතයෙන් ගොඩනගත ලද්දෙම්වෙමි. ඉදින් තට මාගේ හෘදය මාංශයෙන් ප්‍රයෝජන ඇත් නම් ලොකයෙහි විද්‍යමාන යම්කිසි සාධුතර ධර්මයෙක් ඇත්ද, ඒ සියල්ල අද තට ප්‍රකාශකොට කියමියි සිතා නැවත ඔහට කියන්නාහු එම්බල මානවකය! මම කිළුටුවූ ශරීර ඇත්තෙමි. එසේ හෙයින් ශරීර නිර්මලකොට ශ්‍රම දුක නිවා ජලස්නානය කරණු කැමැත්තෙමියි කීහ.

යක්ෂයා එබස් යහපතැයි ගිවිස නහනපැන් ගෙණවුත්දී බෝධිසත්ත්වයන් ස්නානය කළ කල්හි දිවපිළිද දිවමල් ආදියද, සර්වාභරණයන්ද ගෙණවුත්දින. එයින් සැරහී සිටිකල්හි දිව්‍ය භොජනය දුන්නේය, මහබෝධිසත්ත්වයෝ දිව්‍ය භොජනය අනුභවකොට ක්ෂුධා පිපාස දෙක නිවාගෙණ කාළගිරි පර්වත මස්තකය විශෙෂකොට සරහවා අස්නක් පණවා සරහනලද ආසන මස්තකයෙහි ඉඳ සර්වඥ විලාසයෙන් සාධුතර ධර්මය කියන්නාහු මානවකය! උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කරව තෙත්වූ අත නොදව, මිත්‍රද්‍රොහිකමක් කිසිකලෙකත් නොකරව, අසත් පුරුෂ සත්‍රීන්ගේ වසගයට පැමිණීමත් නොකරවයි කීහ. යක්ෂතෙමේ සංක්ෂෙපයෙන් කියනලද සාධුතර ධර්ම සතර දැනගත නොහී විස්තර වශයෙන් විචාරන්නේ විධුර පණ්ඩිතයෙනි! උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කරන්නේ කෙසේද? තෙත්වූ අත නොදවන්නේ කෙසේද? මිත්‍රද්‍රොහි නම් කවරෙක්වේද? අසත්පුරුෂ ස්ත්‍රීහු නම් කවුරුද? තත්වූ පරිද්දෙන් මේ සතර මට කියවයි කීහ.

එබස් අසා බෝධිසත්ත්වයෝ ඔහට කියන්නාහු මානවකය! යම් සත්ත්වයෙක් පෙර නුදුටුවිරූ විශ්වාසයක් නැති එක් දවසකුත් සමීපයෙහි නොවිසූ සත්ත්වයක්හු දැක බත් පැන් දෙන්නා තබා ඉඳිනට අස්නක්දී උපකාර කිරීම් පමණකිනුත් සිත සතුටු කරවා උපකාර කෙළේ නම් සත්පුරුෂකම් දන්නා සත්වතෙමේ පූර්වොපකාරීහට එකාන්තයෙන් වැඩ නිස්සක්ම කරන්නේය. නුවණැත්තාවූ සත්වයෝ පළමු උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කිරීම් බලවත්වූ සත්පුරුෂ ධර්මයකැයි කියති දිව්‍යරාජය! මේ පළමුවන සාධුතර ධර්මය වන්නේය. නැවත යමෙක් යමෙකුගේ ගෙයි එක රැයකුත් ලැග්ගේ වීනම් යම් තෙයකදී ආහාරපාන මාත්‍රයකුත් ලද්දේ වීනම් ඒ ගෘහස්වාමිවූ ලග්නා තැන් දී බත් පැන් දුන් සත්ත්වයාහට සත්පුරුෂ තෙමේ නපුරක් කරන්නා තබා සිතිනුත් නොසිතන්නේය. යමෙක් ඔහට නපුරක් සිතුයේ වීනම් ඒ මිත්‍රද්‍රොහියා නිරන්තරයෙන් අනුභව කිරීම නිසා සේදීමෙන් තෙත්වූ තමාගේ බත් කන අතම දැව්වාතම්වෙයි, මානවකය! මෙසේ තෙත්වූ අත නොදැවීම දෙවන සාධුතර ධර්මය වන්නේය. තවද මානවකය! යම් සත්ත්වයෙක් යම් රුකක්මුල පවත්ගත්වා ඉදීමක් හෝ සැතපීමක් හෝ කෙළේවීනම් ඒ වෘක්ෂයෙන් අත්තක්

වේවයි පතක් යව්වයි කිසිසේත් නොකඩන්නේය. කුමක් හෙයින්ද? යත් ඉදින් යමෙක් එසේ කෙළේ වීනම් පව්ටුවූ මිත්‍රද්‍රොහියෙක් වන්නේය. මෙසේ ඡායායෙහි ඉඳ ප්‍රයොජනවූත් සිත් පිත් නැති වෘක්‍ෂයේ අතුපත් කැඩීමෙන් මිත්‍රද්‍රොහී වන කල මනුෂ්‍යව සිට උපකාර කළවුන්ට ද්‍රෝහිව උන්ගේ යම් කිසි වස්තුවක් නසාපුවොත් මිත්‍රද්‍රොහී වන බව කියනුම කවරේද? එසේ හෙයින් සත්පුරුෂයන්ට අසත්පුරුෂව ද්‍රොහ නොකිරීම් තුන්වන සාධුනර ධර්‍මය වන්නේය. තවද මානවකය! යම් පුරුෂයෙක් මුක්තාමාණික්‍යාදී දශ විධ රත්නයෙන් සම්පූර්ණවූ මේ මුළුපොළොව පතිව්‍රතා ධර්‍මය රක්‍ෂාකෙරෙයි සිතා විශ්වාසීවූ ස්ත්‍රියකට දුන්නේවීනම් එසේ ඒ මුළු පොළොව දුන් පුරුෂයාත් ඕතොමෝ අසධර්‍මයට අවසරයක් ලද්දී නම් කළ උපකාරය නොසිතා ඒකාන්ත යෙන් ඉක්ම පවත්නීමය, එසේවූ අසත්පුරුෂ ගුණයෙන් හරිත පාපස්ත්‍රීන්ගේ වසඟයට කාමතෘෂ්ණායෙහි දන්නා සත්ත්වයෙක් කිසිසේත් නොපැමිණෙන්නේමය මේ ස්ත්‍රීන් නසාත් පව් නොකිරීම සතරවන සාධුනර ධර්‍මය වන්නේය. මාන වකය! මෙසේ යටකී පරිද්දෙන් උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කිරීමත් තෙත් අත නොදැවීමත්, මිත්‍රද්‍රොහී නොවීමත්, පාප ස්ත්‍රීන් වසඟයට නොපැමිණීමත් උතුම්වූ සාධුනර ධර්ම සතරකැයි විශෙෂයෙන් දූතගෙණ දිව්‍ය රාජවූ තෝ මෙබඳුවූ සාධුනර ධර්ම සතරින් යුක්තව අධර්‍මය දුරුකොට ධර්මයෙහි යෙදීම කරවයි අවවාද කළහ.

මෙසේ මහබෝසතානෝ යක්‍ෂයාට සතර සාධුනර ධර්‍මය සර්වඥ විලාස යෙන් විස්තර කොට කීහ. පූර්ණකයා ඒ ධර්‍මය අසමින්ම සිට සිතන්නේ මේ සතර කාරණයෙන්ම පණ්ඩිතයෝ තමන් ජීවිත දානය ඉල්වති මූ වූ කලී පෙර නුදුටුවිරූ කිසිම විශ්වාසයක් නැති මට බොහෝ සත්කාර සම්මාන කළෝය. මම මූන්ගේ මාලිගායෙහි වෙසෙමින් තුන්දවසක් මුළුල්ලෙහි දිව්‍ය ඓශ්වර්‍යයක් හා සමානවූ ඓශ්වර්‍යය අනුභවකෙළෙමි. මම මූන්ගේ මැරීම සංඛ්‍යාතවූ පාපකර්‍මය කරන්නෙම් ස්ත්‍රියක නිසාම කෙරෙමි. එසේහෙයින් සර්වප්‍රකාරයෙන්ම මම මිත්‍රද්‍රොහිව සිටියෙමි. ඉදින් මම පණ්ඩිතයන්ට අපරා ධයක් කෙළෙම් වීනම් සාධුනර ධර්‍මයෙහි නොපැවැත්තේ වෙමි. නාගමාන විකාවගෙන් මට ප්‍රයෝජන කිම්ද? ඉඳිපත් නුවර වාසීවූ සත්ත්වයන්ගේ කඳුළු මුසු මුහුණු සතුටුකරවමින් මොහු වහා ගෙණ ගොස් දම්සභා මණ්ඩපයෙහි ලාපියා එම්යි සිතා බොධිසත්ත්වයන් හා සමග කථාකරන්නේ විධුර පණ්ඩිත යෙනි මම තොපගේ ගෙයි තුන් දවසක්ම විසීමි. ආහාර පාන වර්‍ගාදියෙන් උපස්ථාන ලදිමි.

එසේහෙයින් තෙපි මට ඉෂ්ට මිත්‍රව සිටියව. මම තොප ඇරපියා යනු කැමැත්තෙමි. පොළොව හා සමාන උතුම් වූ නුවණැති බොධිසත්ත්වයෙනි! ඒකාන්තයෙන් තොපි තොපගේ මාළිගාවට සැක නැතිව පලායව, වරුණ නම් නා රජ්ජුරුවන්ගේ විමලා නම් නාගමානවිකාවට තොපගේ හෘදය මාංශ යෙන් වන්නාවූ ප්‍රයෝජනයත් නැතිවන්නේය. මටත් ඉරන්දතී නම් නාග

කන්‍යාවගේ ලැබීම නැතිවන්නේය, තොපි තොපගේ සුභාෂිතය නිසා මාගෙන්
අද සැපසේ මිදී ගියේවේදැයි ස්තුති කෙළේය. එසඳ මහ බෝසතාණෝ ඕහට
කියන්නාහු මානවකය! තෝ මාගේ ගෙට මා නොගෙණයව, නාග භවන
යට ගෙණ යව, නාගේ මයිල් වරුණ නම් නා රජහුටත් තටත් වැඩම
සිඩකරමි. මමත් ඒ දිව්‍ය නාගරාජයා හා ඔහුගේ නුදුටුවිරූ දිව්‍ය විමානය
ගියොත් දක්නෙම් වේද, එසේ හෙයින් වහා මා ඔබ ගෙණයවයි කීහ.
එබස් අසා පූර්ණකයා කියන්නේ පණ්ඩිතයෙනි යම් සත්වයෙක්හු දුටු කල
අවැඩෙක් සිඩවේනම් ඔහු දක්නට සුදුසු නොවන්නේයයි නුවණැත්තෝ
කියති. ප්‍රඥාවන්තවූ බොධිසත්වයෙනි, එසේ තිබියදී කවරකාරණයකින්
සතුරන්ගේ ගමට යන්නට සිතව්දැයි කීහ.

එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු මානවකය! මමත් එකාන්ත
යෙන් අමිත්‍ර සමාගමයට යාම නපුරැ නියාව දනිම්මය, නුවණැති සත්වයෙක්
සතුරන් දක්නට නුසුදුසුම වන්නේය. එතකුදුවුවත් මා විසින් කළ කිසි
අකුශලයෙක් නැත්තේය, එසේහෙයින් මරණ පැමිණියේවේදැයි මා ඊට භයක්
සාංකාවක් ඇතැයි නොසිතව, තවද දිව්‍යරාජය! මා විසින් නා බඳුවූ රළු
පරුෂවූ යක්ෂයෝ පවා ධර්මකථායෙන් පොලඹවා මොළොක් කරණලදහ. දූත්
තෝ නාගමානවිකාවගෙන් මට ප්‍රයෝජන නැත තොපි තොපගේ ගෙටම
පලායවයි කියමින් සිටියෙහිය. එසේ තිබියදී නාරජ්ජුරුවන්ගේ සිත මො
ළොක් කිරීමෙහි මට කවර බැරෑරුමෙක්ද වහා මා ඔබ ගෙණයවයි කීහ. එබස්
අසා පූර්ණකයා බොධිසත්වයන්ගේ වචනය යහපතැයි පිළිගෙණ විධුර පණ්ඩිත
යෙනි! යම්සේ වෙසමුණු මහරජ්ජුරුවෝ නලිනී නම් රාජධානියෙහි පඤ්චාං
ගික තූර්‍ය නාදයෙන් සිත් සතුටු කෙරෙමින් වෙසෙද්ද, එපරිද්දෙන් වරුණ
නම් නා රජ්ජුරුවෝ නැටීමෙන්ද ගී කීමෙන්ද සිත් සතුටු කොට යම් තැනෙක
වෙසෙත් නම් එසේවූ මහත්වූ මහිම ඇති නාග ලෝකයට මා හා සමග අවුත්
උන්ගේ ශ්‍රී විභූති විශෙෂකොට දකුව තවද ඒ නාගභවනය හා කන්‍යා සමූහයා
විසින් හැමවේලෙහිම සංචාරණය කරණලද්දේය, රෑ දවල් අතරක් නැතිව
ආතත විතතාදී පඤ්චාංගික තූර්‍යයන් ගත් අත් ඇති නා මෙනෙවියන් හැම
වේලෙහිම ක්‍රීඩා කරණ ලද්දේය. ගෙතූ නොගෙතූ නා සපු දුනුකේ සීනිද්ද
බෝලිද්ද දෑසමන් ආදිවූ නොයෙක් සුවඳ මලින් ගැවසී ගන්නේය. ආකාශ
යෙහි ගසන විදුලිය කලඹක්මෙන් ප්‍රාසාද කූටාගාර මණ්ඩපාදියෙහි ආලෝකය
දසදික් බබුළුවන්නේය. දිව්‍යවූ ආහාර පාන වර්ගයෙන් හා නැටීම් ගීකීම් බෙර
වැයීම් ආදියෙන් සිත් සතුටු කරවන්නේය. නැවත වස්ත්‍රාභරණාදියෙන් හා
පෙළහර පාදාංගුලී ආදීවූ ස්ත්‍රී ආභරණයෙන් සැරහුනාවූ නාග කන්‍යාවන්
ගෙනුත් බැබළී තිබෙන්නේයයි නාග භවනය විශෙෂයෙන් වර්ණනා කොට
කීයේය.

ඉක්බිත්තෙන් ඒ පූර්ණක නම් යක්ෂ සේනාධිපති තෙම කුරු රට
වාසීන්ගේ අමාත්‍ය ශ්‍රේෂ්ඨ වූ විධුර පණ්ඩිතයන් පශ්චිමාසනයෙහි හිඳුවාගෙණ
වරුණ නම් නාරජ්ජුරුවන්ගේ නාග භවනයට ගෙණ ගියේය. එසේ ගෙණ
යන ලද ඒ විධුර පණ්ඩිතයන් වහන්සේ මහත් වූ මහිම ඇති ඒ නාගභවනයට

පැමිණ පූර්ණක නම් යක්ෂ සේනාපතිහුගේ මනෝමය සෛන්ධවයා පිට පශ්චිමාසනයෙහි උන්නේය. ඒ පූර්ණකයා බෝධිසත්ත්වයන් පූර්වාසනයෙහි හිඳුවාගෙන යන ගමනේ පශ්චිමාසනයෙහි කුමක් පිණිස ඉඳවීද? යත් ඔහට මෙසේවූ සිතිවිල්ලෙක් උපන්නේය ඉදින් වරුණ නම් නාරජ්ජුරුවෝ පණ්ඩිතයන් දැක මොළොක් සිතක් ඇතිවූ නම් යහපත, ඉදින් මෘදු චිත්තයෙක් නූපන්නේ වීනම් ඒ නාරජහට නොපමා සෛන්ධවයා මත්තෙහි උන්නේ ඉන්ද දීම ඇරගෙණ යෙමියි පශ්චිමාසනයෙහි ඉඳවූයේය. වරුණ නම් නාරජ නමාහට බැහැනුවූ ඒ පූර්ණක නම් යක්ෂ සෙනාධිපතිහු දැක පළමුකොට කථාකරණුයේ පූර්ණකයෙනි! තෙපි විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශය සොයා මනුෂ්‍ය ලොකයට ගියාවද? අලාමකවූ ප්‍රඥා ඇති විධුර පණ්ඩිතයන් ඇරගෙණ එමියි කියා ගිය කාර්ය්‍යය සමෘද්ධකොට ගෙණ අවුදැයි විචාළේය. එසඳ පූර්ණකයා කියන්නේ වරුණ නම් නා රජ්ජුරුවෙනි! තෙපි යම් කෙණෙකුන් කැමතිවී නම ඒ පණ්ඩිතයෝ මෙතැනට අවුය. මා විසින් මේ ලොකප්‍රසිද්ධ දශකුශල ධර්මයෙහි යෙදී වාසය කරන්නාවූ ඒ විධුර පණ්ඩිතයෝ අත්තැනකින් ගෙණ එන ලද්දෝ නොවෙති. දැහැමින්ම ගෙණ එන ලදහ. දැන් වූකලී කුරවීක නාද පරයන්නාවූ මධුරස්වරයෙන් ධර්මදෙශනා කරන්නාවූ බොධිසත්ත්වයන් සම්මුඛ යෙහිම දකුව, සත්පුරුෂයන් හා එක ස්ථානයෙහි සමාගමය ඉතා සැප වන්නේයයි කීය. වරුණ නම් නා රජ බොධිසත්ත්වයන් දැක කියන්නේ විධුර පණ්ඩිතයෙනි! තෙපි නුදුටුවිරූ නාගභවනය දැක මරණ භයින් තැතිගෙණ මට නමස්කාර නොකරම් නම් මේ කාරණය නුවණැත්තන්ට සුදුසු කාර්ය්‍යයෙක් නොවෙයි කීය. මෙසේ නා රජ්ජුරුවන් වැඳුම් පිදුම් පතන තැනැත්තන්ට මහබෝසතාණෝ තෙපි මා විසින් වැන්දයුතු කෙණෙක් නොවෙයි නොකිය නමා නුවණැති බැවින් උපාය කෞශල්‍යඥානයෙන් මම වධප්‍රාප්තව සිටි බැවින් නොවඳිමි කියන්නාහු නා රජ්ජුරුවෙනි! නුදුටුවිරූ නාග භවනය දැක විස්මයට පැමිණියෙත් නැත සතුරන් සමීපයට පැමිණියෙම් වේදැයි භයින් ත්‍රස්තවූයෙත් නැත. බල එකක් කියමි, වධාර්හව සිටි පුරුෂයෙක් ස්වාමීව සිටි එකෙක් හට නමස්කාර නොකරන්නේය. වධයට යොග්‍යවූ පුරුෂයා ලවාද දණ්ඩනාදිය යොදවන්නට යොග්‍යව සිටි ස්වාමියාත් නමස්කාර නොකර වන්නේය. මා බඳුවූ ලෝකප්‍රසිද්ධ පණ්ඩිතයක් හට කිසි භයෙක්වත් චකිත යෙක්වත් නැත්තේය යම් සත්ත්වයෙක් යමක්හු මරණු කැමතිව සමීපයට ගෙන්වූ නම් ඒ වධාර්හවූ පුරුෂයා ස්වාමීව සිටි තැනැත්තහුම කෙසේ නම් වඳීද? ස්වාමීව සිටි තැනැත්තේ වධාර්හවූ පුරුෂයා ලවා කෙසේ නම් නමස්කාර ගණීද? මේ තෙමේ ලොක චාරිත්‍රයක්ව තිබියදී මේ අකාර්ය්‍යයෙක්ම වේද? තොප මා ගෙන්වූයේ මරණු නිසාවේද? එසේ හෙයින් ඒ තොප කුමක් නිසා වඳිම්දැයි කීහ. එබස් අසා නා රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ට ස්තුති කරන්නාහු අලාමකවූ ප්‍රඥා ඇති විධුර පණ්ඩිතයෙනි! තොප යමක් කිවූ නම් ඒ තොප කීයේ ඇත්තමය. වධාර්හවූ පුරුෂයා ලවා ස්වාමීව සිටියෙන් නමස්කාර නො කරන්නේය. වධාර්හවූ පුරුෂයා ලවා ස්වාමීව සිටියෙක් නමස්කාර නො කරන්නේය. යම් සත්ත්වයෙක් වධප්‍රාප්තව සිටියේ වීනම් ඒ තෙමේ කෙසේ නම් වඳීද? ඔහු ලවා කෙසේ නම් නමස්කාර කරවාගත හැකිද? මේ තෙමේ ලොකයෙහි ප්‍රසිද්ධව පවත්නා කාර්ය්‍යයෙක් වේදැයි අභීත සිංහනාද කළහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ නාරජ්ජුරුවන් හා සමග පිළිසඳර කථාකරන්නාහු නාරජ්ජුරුවෙනි! තොපගේ දිව්‍යවූ නාගසෘඬිය, දිව්‍යවූ ශරීර සෞභාවය, කායබලය, චෛතසික වීර්‍ය්‍යය, නාගභවනයෙහි උත්පත්තිය, සියලු ඓශ්වර්‍ය්‍යය, දිව්‍යවිමානය, යන මේ සියල්ල අශාශ්වතය ඒකාන්තයෙන් නොපවත්නේය. එසේද වුවත් තෙපි ඒකාන්තයෙන් කල්පස්ථායිව පවත්නා කොට සිතව්ය, නාරජ්ජුරුවෙනි! මෙබඳුවූ මේ ඓශ්වර්‍ය්‍යය කෙසේ ලදුද? තොප මේ නාග ඓශ්වර්‍ය්‍යය ලත් කාරණා තත්වූ පරිද්දෙන් නොවළහා මට කියව, තවද මේ සම්පත්තිය එක්තරා එක් කාරණයකින් ලබනලද්දේද? නොහොත් සෘතුවිපර්‍ය්‍යාශයකින් ලබන ලද්දේද? සිය අතින්ම කොට ගන්නා ලද්දේද? නොහොත් දෙවියක විසින් දෙනලද්දේද? යම් පරිද්දකින් මේ දිව්‍ය විමානාදීවූ ඓශ්වර්‍ය්‍යය තොප විසින් ලබන ලද්දේ වීනම් ඒ සියළු කාරණා තත්වූ පරිද්දෙන් නොවළහා මට කියවයි කීහ. එබස් අසා නා රජ්ජුරුවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! මා විසින් මේ නාග ඓශ්වර්‍ය්‍යය එක්කාරණ යකින් ලබන ලද්දේත් නොවෙයි සෘතුවිපර්‍ය්‍යාශයකින් ලබන ලද්දේත් නොවෙයි, සිය අතින් කරණ ලද්දේත් නොවෙයි, දෙවියන් විසින් දෙන ලද්දේත් නොවෙයි, වැලි කුමකින් ලබන ලද්දේද? අලාමකවූ නමා විසින් පූර්ව ජන්මයෙහි කරණලද කුශල කර්මයෙන්ම දිව්‍ය ප්‍රාසාදදීවූ සියලු නාග සම්පත්තිය ලබන ලද්දේයයි කීහ, එසඳ මහබෝසතාණෝ කියන්නාහු වරුණ නා රජ්ජුරුවෙනි! පූර්ව ජන්මයෙහි තොප විසින් කරණලද ව්‍රතසමාදානය කවරේද? දුන් දන් කවරේද? රැකි සිල් කවරේද? සෘඬි මහිමය, බලය, වීර්‍ය්‍යය, නාග ලෝකෝත්පත්තිය දිව්‍ය ප්‍රාසාදදීවූ නාග සම්පත්තිය, යන මේ සියල්ල පූර්ව ජන්මයෙහි කරණලද කවර සුචරිතයක්හුගේ විපාකයෙන් උපන්නේදැයි විචාළහ.

එසඳ නාරජ්ජුරුවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! මාහා මාගේ භාර්‍ය්‍යාවවූ විමලාවන් හා අපි දෙදෙන පෙර මනුෂ්‍ය ලෝකයෙහිදී බලවත් සැදැහැ ඇතිවූවම්හ. තුමූ නපුරක් සා යහපතක් දන් දෙන්නාහු දානපතීහු නම් වෙති තුමූ යහපතක් ප්‍රයෝජන විඳ අනුන්ටත් යහපතක් දන්දෙන්නාහු දානසහාය නම් වෙති. තුමූ යහපතක් ප්‍රයෝජන විඳ අනුන්ට නපුරක් දන් දෙන්නාහු දානදාස නම් වෙති. මෙබඳුවූ දානපතිය, දානසහායය, දාන දාසය, යන තුන්පක්ෂය අතරෙන් අපි දෙදෙන දානපති වූම්හ, එසමයෙහි මනුෂ්‍ය ලෝකයෙහිදී අපගේ ගෙය සියලු සත්ත්වයන්ට සතර මංසන්ධියක කරණලද ළිඳක් පොකුණක් විය. දුගී මගී යාචකයන් හා ශ්‍රමණ බ්‍රාහ්මණ යන්ටත් බොහෝ ආහාර පාන වර්ගාදිය දීමෙන් සිත් සතුටු කොට පිණවන ලදහ, තවද මනුෂ්‍යලෝකයෙහිදී ගෙතු නොගෙතු නා සපු දුනුකේ සීනිද්ද බෝලිද්ද දෑසමන් ආදීවූ නොයෙක් සුවඳ මල්ය, ජබාදු සඳුන් සාන්දු ආදීවූ නොයෙක් සුවඳය, ඇඟ උලන්නට සුදුසු කසා සුණු සඳුන් ආදීයය, පුදන්නට සුදුසු තෙල් කඩ කබල් ආදීයය, හෝනට ඉඳිනට සුදුසු ඇඳ පුටු තෙලීසම් පිඩාම් ආදීයය, සැපසේ සතර ඉරියව්වෙන් දවස් යවන්නට සුදුසු ලැගුම් ගෙවල්ය, අඳින්නට සුදුසු සළුසෝලි පිළිය. නැවත බජ්ජ භොජ්ජ ලෙය්‍ය පෙය්‍ය සංඛ්‍යාතවූ චතුර්විධ ආහාර වර්ගය, මධු මුද්‍රිකාදීවූ අෂ්ටවිධපානවර්ගය, යන මේ සියල්ල සකස්කොට ආදර ගෞරව ඇතිව දුගී මගී යාචකයන් හා ශ්‍රමණ බ්‍රාහ්මණාදි සියලු සත්ත්වයන්ටම මහ වතුරක් මඬනා කලක් පරිද්දෙන්

විශෙෂකොට දන් දුන්නම්හ. විධුර පණ්ඩිතයෙනි! මනුෂ්‍ය ලොකයෙහි අඟු රට කාලචම්පා නුවරදී මා විසින් මේ දානශීලාදීවූ සියලු කුශල ධර්මය කරණ ලද්දේය. සෘද්ධිය, ප්‍රතාපය, කායබලය, ඥානබලය, වෛසික වීර්‍ය්‍යය, නාග ලොකොත්පත්තිය දිව්‍ය ප්‍රාසාදාදි ශ්‍රී විභූතිය, යන සියල්ල පූර්වජන්මයෙහි කරණලද යථොක්ත සුචරිත විපාකයෙන්උපන්නේයයි කීහ. එබස් අසා මහ බෝසතාණෝ කියන්නාහු නා රජ්ජුරුවෙනි! තොප විසින් මේ සියලු නාග සම්පත්තියම කරණලද දාන ශීලාදී කුසල බලයෙන් ලබන ලද්දේවීනම් කුශල යෙහි විශෙෂත් කුශල ඵලයෙන් උපන් දිව්‍ය ඓශ්වර්‍ය්‍යයෙහි විශෙෂත් තොපම දත්තේවේද, එසේහෙයින් නැවත් මේ නාග භවනයෙහි වැස නා මෙනෙවි යන් හා සමග පඤ්චකාමරතියෙන් අභිරමනයකොට උද්‍යානවිමාන පුෂ්කරණී ආදීවූ සියලු ස්ථානයෙහි ඇවිද සිත්සේ නාග විභූතීන් අනුභව කරන්නට අභිප්‍රාය ඇත්තම් දානශීලාදී දශකුශල ධර්මයෙහි අප්‍රමාදව හැසිරෙවයි අවවාද කළහ.

එසඳ නා රජ්ජුරුවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! යම් උත්තම කෙණෙකුන්ට දන්දී මේ දිව්‍ය ඓශ්වර්‍ය්‍යය ලබමෝ නම් එබඳු ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙක් මේ නාග භවනයෙහි නැත්තාහ, එසේහෙයින් බොහෝ කලක් මෙහි වාසයකොට මේ නාග සම්පත්තිය අනුභව කරමෝ නම් ඊට සුදුසු කාරණා අපට කියාවයි කීහ. එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු නා රජ්ජුරුවෙනි! මේ නාග භවනයෙහි උපන් සාමාන්‍ය නාගමානවිකාවෝය, තොපගේ පුත්‍රදාරාවෝය, තොප නිසා ජීවත්වන සෙවක නාගමානවිකාවෝය, යන මේ සියලු සත්වයෝ මෙහි බොහෝ කොට ඇත, ඔවුන් විෂයෙහි තෙපි කයින් වචසින් මනසින් නිරන්තරයෙන් වෙෂයක් කොපයක් නොකරව, නා රජ්ජුරුවෙනි! මෙසේ තෙපි පුත්‍රාදීවූ සියලු සත්වයන් කෙරෙහි වෙෂයක් නූප දවා කාය වාක් මනඃ යන චාරත්‍රයෙන් හිතෙෂිව මෙත් සිත් උපදවා සතුටු සිතින් ලෙහිලා වඩන දරු කෙණෙකුන්මෙන් රක්ෂාකළාහු වූනම් මේ නාග ලොකයෙහි තොපට ප්‍රතිනියතවූ ආයුවශයෙන් දිව්‍ය සම්පත් විඳ මෙයින් මත්තේ චාතුර්මහාරාජිකාදී සදිව්‍යලොකයට මෙම කුශලධර්මයෙන්ම යන්නේ වේදැයි දානයටත් වඩා ඇසිල්ලෙක කරණලද මෛත්‍රී චිත්තමය බලවත් කුශලකර්මයක් වන්නේවේදැයි කීහ.

එසඳ නා රජ්ජුරුවෝ බොධිසත්වයන්ගේ ධර්ම කථාව අසා සන්තුෂ්ටව පණ්ඩිතයන් පිටත ප්‍රපඤ්චකොට රඳවන්නට නොපළිවන. විමලාවන්ට මූන් පා මුන්ගේ සුභාෂිතය අස්වා දොළ සන්සිඳුවා ධනඤ්ජයකොරව්‍ය රජ්ජුරුවන් සතුටුවන පරිද්දෙන් විධුර පණ්ඩිතයන් යවන්නට වටනේයයි සිතා බොධි සත්වයන්ට කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! තොපගෙන් වියෝව වසන්නාහු ඒ ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ ඒකාන්තයෙන්ම හැම වේලෙහිම ශොක කෙරෙති. නුවරවාසීන් හා සමග දුක් උසුලා පීඩිතව වසන රජ්ජුරුවෝ තොප නුවරට වහා ගියොත් තොප හා එක්ව සන්තුෂ්ටව කයින් වචසින් මන සින් සැප විඳින්නෝ වේදැයි කීහ. එබස් අසා මහබෝසතාණෝ රජ්ජුරුවන් වහන්සේට ස්තුති කරන්නාහු වරුණ නම් නා රජ්ජුරුවෙනි! මනාකොට පුරුදුකරණ ලද සුචරිත කොට්ඨාසය සිහිකරන්නාවූ තෙපි ඒකාන්තයෙන්

සත්පුරුෂවූ බුඩාදී මහොත්තමයන්ගේ ධර්මයක්ම කියව, මෙබඳුවූ ආපදාවකට පැමිණ භය ඉපද ති යදීත් අප බඳුවතැත්තන්ගේ ප්‍රඥා විශෙෂය පෙණුනේ වේදැයි කීහ.

එබස් අසා, නා රජ්ජුරුවෝ වඩ වඩා සතුටුව විධුර පණ්ඩිතයෙනි! තෙපි අපට කියවයි නිස්කාරණයේ කිසිකෙණෙකුන්ගේත් දීමක් නැතිව මොහු අතට පැමිණියාද? නොහොත් දූකෙළ ද්‍යූත ක්‍රීඩායෙහි පැරදී රජ්ජුරුවන් විසින් දෙන ලදුව ගෙණඑතලද්ද? මේ පූණ්ණියා විධුර පණ්ඩිතයන් ඇත්නැයෙත් නොගෙණාමි. දැහැමින්ම ගෙණාමි කියයි. එහෙහෙයින් තෙපි මොවුන් අතට පැමිණ කෙසේ අවුදැයි විචාළහ. එසඳ මහබෝසතානෝ කියන්නාහු රජ්ජුරුවෙනි! ඒ කුරුරට ඉඳිපත් නුවර ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝය යත යම් රජ්ජුරුකෙණෙක් වූනම් ඒ රජ්ජුරුවන් මේ පූණ්ණික නම් සෙනාධිපතියා දූකෙළ පැරදවීය. ද්‍යූත ක්‍රීඩායෙන් පැරදී රජ්ජුරුවෝ වඩිකියට සිලව්කොට මා මෝහට දුන්හ. එසේහෙයින් යුක්තියෙන්ම මා මොහු අතට පැමිණියෙමි. ඇන්නැයෙකින් මොහු අතට පැමිණියෙම් නොවෙමි කීහ. අෂ්ටලොක ධර්මයෙහි අකම්ප්‍යවූ ස්වරූප ඇති ඒ මහාබොධිසත්ත්වයන්ගේ ධර්මකථා සංඛ්‍යාත සුභාෂිතයන් අසා සතුටුව ඔදවැඩියාවූ සිත් ඇති වරුණ නම් නාරජ්ජුරුවෝ අලාමකවූ ප්‍රඥා ඇති මහාබොධිසත්ත්වයන් අත අල්වාගෙණ විමලා නම් නාගමානවිකාව සමීපයට ගියහ.

මෙසේ විමලාවන්ගේ මාළිගාවට වැද කියන්නාහු විමලාවෙනි! තෙපි යම් කෙණකුන් නිසා පඬුවන්ව සුදුමැලිවූ ශරීර ඇතිවූද, යම් කෙණකුන් නිසා දිව්‍යවූ ආහාර පාන වගී අනුභව කිරීමට අභිප්‍රාය නැතිවිද, දිව්‍යලොක මනුෂ්‍යලොක දෙක්හි යම්බඳු කෙණෙකුන්ගේ ගුණය පැතිර පැවැත්තේවීනම් එබඳු පැතිර පැවති ගුණයෙක් අනික් කිසිනෙණෙකුන්ට නැද්ද, යම් කෙණකුන් හෘදය මාංශය පිළිබඳව තොපට දොළ උපන්ද, සියලු ලොකවාසීවූ සත්ත්වයන් සන්තානගත ක්ලෙශ නමැති අඳුරු දුරුකොට දහම් නමැති අලොකය පතුරුවා සත්ත්වලොකය එකාලොක කරන්නාවූ විධුර පණ්ඩිතයෝ නම් මූ තුමූ වන්නාහ උන්ගේ මධුරවූ ධර්මකථාව අසා තොපට උපන් දොළ දුක් සන්හිඳුවා ගණුව, නැවත මූන්ගේ දර්‍ශනය ඉතා දුර්ලභ වන්නේයයි කීහ, පොළොව හා සමාන නුවණ ඇති විධුර පණ්ඩිතයන් දැක විමලා නම් නාගමාණවිකාවෝ දශනඛසමොධාන සමුජ්වලිතවූ දෙහොත් මුදුනේ තබා වැඳ හටගත්තාවූ බලවත් ප්‍රීති සෞමනස්‍යයෙන් යුක්තව කුරුරට වාසීන්ගේ අමාත්‍ය ශ්‍රෙෂ්ඨවූ බොධිසත්ත්වයන්ට මෙසේ කිවුය. විධුර පණ්ඩිතයෙනි! තොප නුදුටුවිරූ නාගභවනය දැක මරණ භයින් නැතිගෙණ මට නමස්කාර නොකරව් නම් මේ කාරණය නුවණැත්තන්ට සුදුසු කාරණයෙක් නොවෙයි කීහ. මෙසේ නාගමානවිකාවට (තමන්ගේ වැඳුම් පතන නැනැත්තියට) මහබෝසතානෝ තෙපි මා විසින් වැන්දයුතු කෙණෙක් නොවෙයි නොකීවාට තමන් නුවණැති බැවින් උපා කෞශල්‍ය ඥානයෙන් මමවධප්‍රාප්තව සිටි බැවින් නොවඳිමියි කියන්නාහු විමලාවෙනි! නුදුටුවිරූ නාග භවනය දුර විස්මයට පැමිණියෙත් නැත සතුරන් සමීපයට පැමිණියෙම් වේදැයි භයින් ත්‍රස්තවූයෙත් නැත, බල එකක් කියමි, වධාර්හවසිටි පුරුෂයෙක් සමීපව සිටි එකක්

හට නමස්ාර නොකරන්නේය. වඩයට යෝග්‍යවූ පුරුෂයාලවාද දණ්ඩන යොදවන්නට යෝග්‍යව සිටි සවාමියාත් නමස්කාර නොකරන්නේය. මා බඳුවූ ලොකප්‍රසිඬ පණ්ඩිතයක් හට කිසිවෙක්හි භයෙක් වකිතයෙක් නම් නැත්තේය. යම් සත්ත්වයෙක් යමක්හු මරණු කැමතිව සමීපයට ගෙන්වූයේ වීනම් ඒ වධාර්හවූ පුරුෂයා සවාමිව සිටි තැනැත්තහුට කෙසේනම් වදීද? සවාමිව සිටිතැනැත්තේ වධාර්හවූ පුරුෂයාලවා කෙසේනම් නමස්කාර කරවා ගණීද? මේතෙමේ ලොකචාරිත්‍රයක්ව තිබයදී අකාර්‍යයීයෙක්වේද? තොප මා ගෙන්වූයේ මරණු නිසාවේද? එසේහෙයින් මම තොප කුමක් නිසා වදීම්දැයි කීහ. එබස් අසා විමලාවෝ මහාබොධිසත්ත්වයන්ට ස්තුති කරන්නාහු අලාංම කවූ ප්‍රඥ ඇති විධුර පණ්ඩිතයෙනි! තොප යමක් කිවුනම් ඒ තොප කීයේ ඇත්තමය. වධාර්හවූ පුරුෂයා සවාමිහටත් නමස්කාර නොකරන්නේය. ඔහු ලවා සවාමිව සිටියෙත් නමස්කාර නොකරවන්නේය. යම් සත්ත්වයෙක් වධ ප්‍රාප්තව සිටියේ වීනම් ඒ තෙමේ කෙසේ නම් වදීද! ඔහු ලවා කෙසේනම් නමස් කාර කරවා ගතහැකිද? තෙමේ ලොකප්‍රසිඬව පවත්නා කාර්‍යයීයෙක්ම වේදැයි අසීත නාද කළහ.

ඉක්බිත්තෙන් මහබෝසතානෝ විමලාවන් සමග පිළිසඳර කථා කරන් නාහු විමලාවෙනි! තොපගේ දිව්‍යවූ නාග සෘඬිය, දිව්‍යවූ ශරීර සෝභාවය කායබලය, චෛතසිකවීර්‍යයීය, නාගභවනයෙහි උත්පත්තිය, සියලු ඓශ්ව ර්‍යයීය, දිව්‍යවිමානය, යන මේ සියල්ල ආශාසෙවනය එකාකාරයෙන් නොපවත් නේය එසේදවුවත් තෙපි එකාන්තයෙන් කල්පසථායිව පවත්නාකොට සිතව විමලාවෙනි! මෙබඳුවූ මේ ඓශ්වර්‍යයීය තෙපි කෙසේ ලදුද? තෙපි මේ නාග ඓශ්වර්‍යයීය ලත් කාරණා තත්වූ පරිද්දෙන් නොවලහා මට කියව, තවද මේ සම්පත්ති එක්තරා එක් කාරණයකින් ලබන ලද්දේද? නොහොත් සෘතු විපර්‍යයාශයකින් ලබන ලද්දේද? නොහොත් දෙවියන් විසින් දෙන ලද්දේද? නොවෙයි. වැලි කුමකින් ලබන ලද්දේද? අලාංමකවූ තමා විසින් පූර්‍ව ජන්ම යෙහි කරණලද කුශලකර්‍මයෙන්ම මේ දිව්‍ය ප්‍රාසාදාදීවූ සියලු නාග සම්පත්තිය ලබන ලද්දේයයි කිවුය. එසඳ මහබෝසතානෝ කියන්නාහු විමලාවෙනි! තෙපි මේ දිව සැපැත් ලබන්නට පූර්‍ව ජන්මයෙහි තොප විසින් කරණලද ව්‍රත සමාදානය කවරේද? දුන් දන් කවරේද? රැකි සිල් කවර්ද? සෘඬි මහිමය කවරේද? බලය, වීර්‍යයීය, නාගොත්පත්තිය, දිව්‍ය ප්‍රාසාදාදීවූ නාගසම්පත්තිය යන මේ සියල්ල පූර්‍ව ජන්මයෙහි කරණ ලද කවර සුචරිතයක්හුගේ විපාකයෙන් උපන්දැයි විචාළහ.

එසඳ විමලාවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! මා හා මාගේ සවාමි පුත්‍රවූ වරුණනම් නාරජ්ජුරුවෝද පෙරමනුෂ්‍ය ලොකයෙහිදී බලවත් සැදැහැ ඇතිවූම්හ. නපුරක් හා යහපත දන්දෙන්නාහු දානපතීහුනම් වෙති තුමූත් යහපතක් ප්‍රයෝජන විඳ අනුන්ටත් යහපතක් දෙන්නාහු දානසහාය නම් වෙති. තුමූ යහපතක් ප්‍රයෝජන විඳ අනුන්ට නපුරක් දෙන්නාහු දානදාස නම් වෙති. මෙබඳුවූ දානපතිය, දානසහායය, දානදාසය යන තුන් පක්ෂය

අතරෙන් අපි දෙදෙන දූතපතී වූම්හ. එසමයෙහි මනුෂ්‍ය ලොකයෙහිදී අපගේ ගෙය සියලු සත්ත්වයන්ට සතර මංසන්ධියෙක කරණලද ලිඳක් පොකුණක් මෙන් විය. දුගී මගී යාචකයන්ට හා ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ටත් බොහෝ ආහාර පාන වර්‍ගාදිය දීමෙන් සිත් සතුටුකොට පිණවණලදහ. තවද මනුෂ්‍ය ලොකයෙහිදී ගෙතු නොගෙතු නා සපු දුනුකේ සීනිද්ද බොලිද්ද දෑසමන් ආදිවූ නොයෙක් සුවඳ මල්ය, කස්තූරි කපුරු ලමඟ තකුල්ජබාදු සඳුන් සාන්ද්‍ර ආදිවූ නොයෙක් සුවඳය, ඇඟ උලන්නට සුදුසු කසාසුණු සඳුන් සුණු ආදියය, පහන් පුදන්නට සුදුසු තෙල් කඩ කබල් ආදියය, සැත පෙන්නට ඉඳිනට සුදුසු ඇඳ පුටු තෙලිසම් පිඩාම් ඇතිරි ආදියය, සැපසේ සතර ඉරියව්වෙන් දවස් යවන්නට සුදුසු ලැගුම් ගෙවල් ආදියය, ඉඳින්නට සුදුසුවූ නොයෙක් දෙසයෙන් ගෙණ එනලද උතුම් පිළිය, තැවත ඛාද්‍ය භොජ්‍ය ලෙය්‍ය පෙය්‍ය සංඛ්‍යාත චතුර්විධ ආහාර වර්‍ගය, මධුමුද්‍රිකාදි අෂ්ට විධ පාන වර්‍ගය, යන මේ සියල්ල සකස්කොට ආදර ගෞරව ඇතිව දුගී මගී යාචකයන් හා ශ්‍රමණ බ්‍රාහ්මණාදී සියලු සත්ත්වයන්ට මහ වතුරක් මඩනා කලක් පරද්දෙන් විශෙෂකොට දන් දුනුම්මහ. විධුර පණ්ඩිතයෙනි! මනුෂ්‍ය ලොකයෙහි අඟු රට කාලචම්පා නුවරදී මා විසින් මේ දන ශීලාදිවූ සියලු කුශල කම්ම කරණ ලද්දේය. සෘධි ප්‍රතාපය, කායබලය. චෛතසිකවීය්‍යීය, නාගලොකොත්පත්තියය, දිව්‍ය ප්‍රාසාදාදිවූ ශ්‍රී විභූති යන මේ සියල්ල පූර්‍ව ජන්මයෙහි කරණලද යථොක්තවූ සුචරිත විපාකයෙන් උපන්නේයයි කීවුය. එබස් අසා මහබෝසතානෝ කියන්නාහු විමලාවෙනි! තොප විසින් මේ සියලු නාග සම්පත්තිය පූර්‍වයෙහි කරණලද දන ශීලාදි කුසල කම්යෙන් ලබන ලද්දේ වීනම් කුසලයෙහි විශෙෂයත් කුශල ඵලයෙන් උපන් දිව්‍ය ඓශ්වය්‍යීයෙහි විශෙෂයත් තෙපිම දන්නවාද, එසේ හෙයින් තැවතත් මේ නාග භවනයෙහි වැස පඤ්චකාමරතියෙන් අභිරමනය කොට උද්‍යානවිමාන පුෂ්කරණී ආදී සියලු ස්ථානයෙහි ඇවිද සිත්සේ නාග විභූති අනුභවකරන්නට අභිප්‍රාය ඇත්නම් දන ශීලාදී දශ කුශල ධර්‍මයෙහි අප්‍රමාදව හැසිරෙවයි අවවාද කළහ. එසඳ විමලාවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! යම් උත්තම කෙණෙකුන්ට දන්දී මේ දිව්‍ය ඓශ්වය්‍යීය ලබමෝ නම් එබඳු ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙක් මේ නාග ලොකයෙහි නැත්නාහ. එසේහෙයින් තැවත බොහෝ දවසක් මෙහි වාසය කිරීමෙන් මේ නාග සම්පත්තිය අනුභවකරමෝ නම් ඊට සුදුසු කාරණා අපට කියවයි කීහ.

එබස් අසා මහබෝසතානෝ කියන්නාහු විමලාවෙනි! මේ නාගභවනයෙහි උපන් සාමාන්‍යය නාගමානවකයෝය, දූදරුවෝය, තොප නිසා ජීවත්වන සෙවක නාගමානවකයෝය, යන මේ සියලු සත්ත්වයෝ මෙහි බොහෝ කොට ඇත. ඔවුන් විෂයෙහි තෙපි කයින් වචසින් මනසින් නිරන්තරයෙන් වෛෂයක් කෝපයක් නොකරව, විමලාවෙනි! මෙසේ තෙපි පුත්‍රාදී සියලු සත්ත්වයන් කෙරෙහි වෛෂයක් කොපයක් නූපදවා කාය වාක් මනඃ යන චාරත්‍රයෙන් හිතෛෂීව මෙත් උපදවා සතුටු සිතින් ලෙහිලා වඩන දරුකෙණෙ

තුන් මෙන් රක්‍ෂාකොළේ වීනම් මේ නාගලොකයෙහි තොපට ප්‍රතිනියත ආයු වශයෙන් දිවසැපත් විඳ මෙයින් මත්තේ චාතුර්මහාරාජිකාදී සදිව්‍ය ලොකයටත් මෙම කුශල කර්මයෙන්ම යන්නේවේද, දානයටත් වඩා ඇසිල්ලෙක කරණ ලද මෛත්‍රී චිත්තයම බලවත් කුශලකර්මය වන්නේවේදැයි කීහ. නැවත විමලාවෝ බොධිසත්වයන්ට කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! තොපගෙන් වියෝව වන්නාවූ ඒ ධනඤ්ජය කෞරව්‍ය රජ්ජුරුවෝ ඒකාන්තයෙන් හැම වේලෙහිම ශොක කෙරෙති. නුවර වාසීන් සමග දුක් උසුලා පීඩිතව වසන රජුරුවෝ තොප නුවර වහා ගියොත් තොප හා එක්ව සන්තුෂ්ටව කයින් වචසින් මනසින් සැප විඳින්නෝ වේදැයි කීහ. එබස් අසා මහබෝසතාණෝ විමලාවන්ට ස්තුති කරන්නාහු විමලාවෙනි! මනාකොට පුරුදුකරණලද සුචරිත කොටඨාශය සිහිකරන්නාවූ තෙපි ඒකාන්තයෙන් සත්පුරුෂවූ බුද්ධාදි මහෝත්තමයන්ගේ ධර්මයක්ම කියව, මෙබඳුවූ ආපදාවකට පැමිණ භය තිබිය දීත් අපබඳුවූ නුවණැත්තවුන්ගේ ප්‍රඥාවිශෙෂය පෙණුනු නියාව දුටුවාදැයි කීහ

එබස් අසා විමලාවෝ වඩ වඩා සතුටුව විධුර පණ්ඩිතයෙනි! තෙපි අපට කියව, නිෂ්කාරණයේ කිසිකෙණෙකුන්ගේත් දීමක් නැතිව මොහු අතට පැමිණියේද? නොහොත් දූකෙළ ද්‍යූත ක්‍රීඩාවෙහි පැරදි රජ්ජුරුවන් විසින් දෙන ලදුව ගෙණ එන ලද්දේද? මේ පූර්ණකයා විධුර පණ්ඩිතයන් ඇන්නැයෙන් නොගෙණාමි දැහැමින්ම ගෙණාමි කියයි එසේ හෙයින් තෙපි මොහු අතට කෙසේ පැමිණියහුදැයි විචාළහ එසඳ මහබෝසතාණෝ කියන්නාහු විමලාවෙනි! කුරුරට ඉඳිපත් නුවර ධනඤ්ජය කෞරව්‍ය රජ්ජුරුවෝය යන මේ රජ්ජුරු කෙණෙක්වූ තම් ඒ රජ්ජුරුවන් මේ පූර්ණක නම් යක්‍ෂ සේනාධිපතියා දූකෙළ පැරදවීය ද්‍යූතක්‍රීඩාවෙන් පැරදි රජ්ජුරුවෝ වඩ්ඩියට සිලව්කොට මා මෝහට දුන්හ, එසේ හෙයින් යුක්තියෙන් මා මොහු අතට පැමිණියෙමි ඇන්නැවකින් මොහු අතට පැමිණියෙම් නොවෙමි කීහ, වරුණ නම් නාරජ්ජුරුවෝ මහා බොධිසත්වයන් අතින් යම් ප්‍රශ්නයක් විචාළෝ නම් විමලානම් නාගමානවිකාවන් මහා බොධිසත්වයන් අතින් එම ප්‍රශ්නයම විචාළාය, මහාබොධිසත්වයෝ වරුණ නම් නාරජ්ජුරුවන් ප්‍රශ්න විසර්ජනයෙන් යම්සේ සතුටුකරවූද, විමලානම් නාගමානවිකාවන් එපරිද්දෙන්ම ප්‍රශ්න විසර්ජනයෙන් බලවත්ව සතුටුවූ නියාව දැන සම්පාවක් භයක් චකිතයක් ලොමු දැහැගැන්මක් නැතිව වරුණනම් නාරජ්ජුරුවන්ට මෙසේ කීහ. වරුණනම් නාරජ්ජුරුවෙනි! මිත්‍ර ද්‍රොහිකමක් නොකෙරෙමියි තෙපි නොබව, කෙසේනම් මම මූන් මරාපියම්දැයි කියාත් නොසිතව, තොප සමීපයට මම්ම පැමිණ සිටියෙමි, මාගේ හෘදය මාංශයෙන් හා ශරීර මාංශයෙන් තොපටත් ප්‍රයෝජනයෙක් ඇත්නම් විඳ ගණුව ඉදින් තෙපි මූන් සමීපයෙන් මා විසින් ධර්මය අසන ලදැයි මා මරන්ට මැලිවීනම් මම්ම තොපගේ අදහස යම් පරිද්දෙකින් සමෘද්ධ වේනම් එපරිද්දෙන් මාගේ හෘදය මාංශය හා ශරීරමාංශය තොපට උදුරා දෙමි. ඒ ඇරගෙණ තොපගේ මනෝරථය සම්පූර්ණකොට ගණුවයි කීහ. එබස් අසා නාරජ්ජුරුවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙනි, නුවණැති සත්වයන්ගේ හෘදය මාංශය නම් ඒකාන්තයෙන් ප්‍රඥාවම වන්නේය. එසේ හෙයින් අපි වූකලී දූන් තොපගේ

උත්තම ප්‍රඥා විශෙෂයෙන් ධර්මයම හෘදය මාංශය නම් ඒ ප්‍රඥා ප්‍රකාශවූ ධර්මය නමැති හෘදය මාංශය අපි දෙදෙන ලැබ ප්‍රයෝජන විඳ අපගේ මනදොළ පුරා ගතුම්හ එහෙයින් අපගේ මනොරථය සම්පූර්ණ වූවාසේම මේ පූර්ණක නම් යක්‍ෂසෙනාධිපතියාත් ඉරන්‍දතීනම් නාගකන්‍යාව තමාගේ අභිප්‍රාය වූපරිද්දෙන්ම ලබාවයි අපිත් ඉරන්‍දතිය පූර්ණකයාහට දෙමෝය ඒ පූර්ණක නම් යක්‍ෂ සෙනාධිපතියාත් තොප අදම කුරුරට ඉඳිපත් නුවර වාසීවූ සත්වයන්ගේ සිත් සතුටු කරවාස්වකීය ස්ථානයට පමුණුවයි කීහ.

මෙසේ කියා වරුණ නම් නාරජ්ජුරුවෝ ඉරන්‍දතී නම් නාගකන්‍යාව පූර්ණක නම් යක්‍ෂ සෙනාධිපතියාහට පාවා දුන්හ. ඒ පූර්ණකයා ඉරන්‍දතිය ලැබ සතුටුව ඔදවැඩියාවූ සිත් ඇතිව ප්‍රීතියෙන් පිණා කුල්මත්ව කුරුරට වාසීන්ගේ අමාත්‍ය ශ්‍රෙෂ්ඨවූ බොධිසත්වයන්ට මෙසේ කීය. විධුර පණ්ඩිතයෙනි! තොප මෙසේ අභිප්‍රායානුකූලවූ පරිද්දෙන් මේ ඉරන්‍දතී නම් නාගකන්‍යාව මා සමග කෙළේ වීනම් එපරිද්දෙන්ම තොපත් තොපගේ රජ්ජුරුවන් ආදී නුවරවාසී බන්ධුවර්ගයා හා සමග සිත් සතුටුකරවම්, ඒ මතුනොවෙයි පණ්ඩිතයෙනි! මම තොපගේ උතුම්වූ ගුණයෙහි ප්‍රසන්නවූ තොපට සුදුසුවූ බලවත් සංග්‍රහයක් කරන්නා කැමැත්තෙමි, එසේ හෙයින් තොපට චක්‍රවර්ති රජ්ජුරුවන් ප්‍රයොජන විඳිනා මේ චින්තා මාණික්‍ය පඬුරුකොට දෙමි, අදම තොප ඉඳිපත් නුවර වාසීන්ගේ සිත්සතුටු කරවමින් මාළිගායෙහිලා යෙමියි කිවුය, එසඳ මහබෝසතානෝ ඔහට ස්තුති කරන්නාහු කාත්‍යායනය නාගේ මේ ප්‍රිය භාර්‍ය්‍යාව සමග මෛත්‍රිය අනෂ්ටව බොහෝ කලක් පවත්වයි ඉරන්‍දතිය ලැබීමෙන් සිතට උපන් බලවත් ප්‍රීති සෞමනස්‍යයෙන් හා තුටුපහටු ඔදවැඩි කුහුලින් යුක්තව මාණික්‍ය රත්නයත්දී මාත් ඉඳිපත් නුවරට පමුණුවයි කීහ. එබස් අසා පූර්ණක නම් යක්‍ෂසෙනාධිපති තෙමේ කුරුරට වාසීන්ගේ අමාත්‍ය ශ්‍රෙෂ්ඨවූ අලාමක ප්‍රඥා ඇති අසමධුරවූ විධුර පණ්ඩිතයන් දිව්‍ය මනොමය සෛන්ධවයාගේ පෙර කඩ ඉඳුවාගෙණ ඉඳිපත් නුවරට ඇසිල්ලකින් පැමිණ වූයේය. කෙසේ පැමිණ විදයත්? මනුෂ්‍යයක්හු සිතනම් දුරට නොයන්නේය. එතකුදුවූවත් දුරාලම්බන ග්‍රහණය කරණ සෙයින් දුරට ගියේයයි ලොක ව්‍යවහාර වශයෙන් කියනු ලැබෙයි එසේ හෙයින් සිත අරමුණු ගන්නාට පලමුකොට වනා ඒ මනොමය සෛන්ධවයාගේ ගමනවූයේය. සිතූ සිත හා සමග ගොස් ඉඳිපත් නුවර පෙණුනේය. ඒ පූර්ණක නම් යක්‍ෂසෙනාධිපතියා බොධිසත්වයන් අශ්‍ව පෙරකඩ ඉඳුවා ගෙණ යමින් සිට කියන්නේ විධුර පණ්ඩිතයෙනි! තෙල පෙණෙන්නේ තොපගේ ඉඳිපත් නුවර හා සිත්කළුවූ අඹ උයන් ආදී සියල්ලය ඒ නුවර දක සිත් සතුටුකරව, මමත් ඉරන්‍දතී නම් නාගකන්‍යාව හා සමග වීම් තෙපිත් තොපගේ වාසස්ථානයවූ ඉඳිපත්නුවරට පැමිණියේ වේදැයි ආශීර්වාද වචන කියමින් ස්තුතිකොට බොධිසත්වයන් ඉඳිපත්නුවර දම්සභා මණ්ඩපයෙහි සිටුවා තමාගේ වාසස්ථානයටම ගියේය. මහබොධිසත්වයන් නුවරට පැමිණෙන දවස් අලුයම් වේලෙහි ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ සවප්නයක් දුටහ. කෙසේවූ සවප්නයෙක්ද? යත්

රජ්ජුරුවන්ගේ මාලිගා දෙරකඩ සමීපයෙහි (ප්‍රඥ නමැති) කඳ ඇති (සිල් නමැති) අතුපතර ඇති (පස්ගෝරස නමැති) ඵල ඇති සියලු හස්ත්‍යශ්වාලංකාරාදීන් සැරසුනු හස්ති අශ්ව රථ පදාති සංඛ්‍යාත චතුරංගිනී සෙනාවෙන් ගැවසීගත් මහාවෘක්ෂයෙක් පිහිටියේය මහජනයා ඒ වෘක්ෂයට මහත්වූ පූජා සත්කාරදිය කොට දෙහොත් මුදුනේ තබා නමස්කාරකොට සිටියේය. එසඳ කෘෂ්ණවූ පුරුෂයෙක් රතක් ඇඳ රතක් පොරවා දෙකන රත්මල් ගන්වා කඩුවක් අතින් ගෙණ අවුත් මහජනයා භයගන්වා සියල්ලන් අඬමින් වැලපෙමින්ම සිටියදීම ඒ වෘක්ෂය මුලින් කපා ඇරගෙණගොස් නැවත ගෙණවුත් පළමු පිහිටියාවූ ස්ථානයෙහි පිහිටුවා ගියේය. රජ්ජුරුවෝ මේස්වප්නය දැක පරීක්ෂා කරන්නාහු මහාවෘක්ෂය වැනිවූයේ අනික් කිසිවෙක් නො වෙයි. විධුර පණ්ඩිතයෝය, මහජනයා අඬමින් වැලපෙමින් සිටියදී මුලින් සිඳ හැර ගෙණගිය පුරුෂයා වැනිවූයේ අනික් කිසිවෙක් නොවෙයි, පණ්ඩිතයන් ඇර ගෙණ ගිය මානවකයාය, ඒ වෘක්ෂය ගෙණවුත් යථා ස්ථානයෙහි පිහිටුවා ගිය එකක්හු මෙන් සෙට දවස් මානවකයා පණ්ඩිතයන් ගෙණවුත් දම්සභා මණ්ඩප දෙරකඩ සිටුවා යන්නේය, ඒ කාරණයෙන් අද අපි පණ්ඩිතයන් දකුම්හයි සහිටුහන්කොට සොම්නසට පැමිණ සියලු නුවර දිව්‍යපුරයක් මෙන් සරසා දම්සභාමණ්ඩපයත් සරහවා පිළියෙළ කරණලද රත්න මණ්ඩපයෙහි ධර්මාසනයක් පණවා එක්සියයක් රාජධානියේ රජදරුවන් හා අමාත්‍යමණ්ඩලයා හා නුවරවාසීන් ජනපද වාසීන් විසින් පිරිවරණලදුව අපි තෙපි හැමදෙනම විධුර පණ්ඩිතයන් දක්නේද, භයනොවවයි මහජනයා අස්වසමින් මහා බොධිසත්ත්වයන් එන පෙරමග බල බලා ධම්සභා මණ්ඩපයෙහි උන්හ, පූර්ණක යාත් පණ්ඩිතයන් අසුපිටින් බා ධම්සභා මණ්ඩපයෙහි දෙරකඩ පර්ෂද් මධ්‍යයෙහි සිටුවා ඉරන්දතිය ගෙණ අජානීය සෛන්ධවයා පිටට පැන නැගී ආකාශ මධ්‍යයෙන් තමාගේ දිව්‍යලොකායටම ගියේය.

ඉක්බිත්තෙන් මහබොධිසත්ත්වයන් දැක අතිශයින් සන්තුෂ්ටවූ සිත් ඇති ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ හුනස්නෙන් නැගී සිට දෑතින් බඳපලා අල්වා වැළඳගෙන මහජනයා මධ්‍යයෙහි භයක් සංකාවක් පසුබෑස්මක් නැතිව අත අල්වාගෙණ තමන්ට අභිමුඛකොට දම්සභා මණ්ඩපයෙහි සරහා පිළියෙල කරණලද ධම්සන මස්තකයෙහි ඉඳවූහ. මෙසේ ඉඳුවා බොධිසත්ත්වයන් සමග සතුටුව පිළිසඳර කථාකරන්නාවූ යම්සේ රථාචාය්‍යීයෙක් රථාලංකාරයෙන් සරහා පිළියෙල කරණලද රථයක් මනොමය සෛන්ධවයන් යොදා කැවිටක් ගෙණ සන්කෙරෙමින් තමාට අභිප්‍රාය ස්ථානයකට ගෙණ ගොස් පමුණුවාද, එපරිද්දෙන්ම තෙපි අපට කාරණයෙන් ඥානයෙන් අර්ථයෙන් ධම්යෙන් වැඩෙහි හැසිරීමෙන් මෙලෝ පරලෝ සැපයට පමුණුවන්නාහුය, කුරුරට වාසීවූ තොපගේ දර්ශනය හේතුකොටගෙණ බලවත් සන්තෝෂයට පැමිණෙති, මා විසින් විචාරණ ලද්දාවූ තෙපි නොවලහා කියව මේ මානවකයා අතින් තෙපි කෙසේ ගැලවුනාද? තෙපි ගලවා ඇරගෙණ යන්නාවූ මානවකයා සමීපයෙන් තොප කෙසේ ගැලවීගෙණ ගියේදැයි විචාළහ, එබස් අසා මහබෝසතානෝ කියන්නාහු ජනප්‍රධානවූ රජ්ජුරුවන්වහන්ස! මානවකයායයි නුඹවහන්සේ යමකුට කියනසේක් වීනම් ඒ තෙමේ මනුෂ්‍යයෙක් නොවෙයි නරවීර ශ්‍රේෂ්ඨවූ රජ්ජුරුවන්වහන්ස! නුඹවහන්සේ විසින් අටවිසි යක්සෙනෙවියන් කෙරෙහි

ඇතුළත්වූ පූර්ණක නම් යක්ෂයෙක් ඇතැයි ඉදින් අසන ලද්දේ වීනම් එතෙමේ වෙසමුණු රජ්ජුරුවන්ගේ අමාත්‍යයාය, නාගභවනයෙහි වසන්නාවූ වරුණ නම් නාරජ්ජුරුවෝ මහත්වූ ආරොහපරිනාහයෙන් හා උතුම්වූ රූපශොභායෙන් හා කායබලශ්‍රීයෙන් යුක්තයෝය, ඒ නාරජ්ජුරුවන්ගේ අනුජාත පුත්‍රවූ ඉරන්දතී පූර්ණකයා ලබනු කැමතිවිය. ඒ දුව ඉරන්දතීනම් නාගකන්‍යාවය අසුරෙන් පමණ කටහැකි මධ්‍යම ප්‍රදෙශ ඇති ඒ ඉරන්දතී නම් නාගකන්‍යා නිසා පූර්ණකයා මට මෙතෙක් ආයාස පැමිණ වූයේය.

තවද මහරජ්ජුරුවන්වහන්ස! ඇසුව මැනව, ඒ වරුණ නම් නාරජ්ජුරුවෝ චතුකොටික ප්‍රශ්නය විසර්ජනයෙන් ප්‍රසන්නවූ සිත් ඇතිව කණ්ඨ මාණික්‍යයෙන් මට පූජාකොට නාගලොකයට ගිය තැනැත්තෝ විමලා නම් නාගමානවිකාව විසින් තොපගේ කණ්ඨමාණික්‍ය කොයිද්දැයි විචාළ කල්හි මා ධර්මකථික නියාව වර්ණනා කොළෝය, විමලාවෝ මාගේ ධර්මකථාව අසනු කැමතිව මාගේ හෘදය මාංශයෙහි දොළ ඉපදවූය. නාරජ්ජුරුවෝ විමලාවන් කී බසෙහි අර්ථ දූනගත නොහී වරදවාගෙණ ඉරන්දතී නම් දුවනියට කියන්නාහු ඉරන්දතීනි! තොපගේ මෑනියෝ විමලාවෝ විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශයෙහි දොළ ඉපදවූය. උන්ගේ හෘදය මාංශය ගෙණෙන්ට සමර්ථවූ වල්ලභයක්හු සොයාගණුවයි කිවුය. එබස් අසා ඉරන්දතී වල්ලභයන් සොයන්නී වෙසවුණු මහරජ්ජුරුවන්ගේ බෑනාවූ පූර්ණකනම් යක්ෂසෙනාධිපතීහු දූක ඔහු තමා කෙරෙහි පිළිබඳ සිත් ඇති නියාව දූන පියරජ්ජුරුවන් සමීපයට කැඳවාගෙණ ගියාය, එසඳ ඒ වරුණනම් නාරජ්ජුරුවන්ගේ විධුර පණ්ඩිතයන් ගේ හෘදය මාංශය ගෙණෙන්ට සමර්ථවූයේ වීනම් ඉරන්දතිය ලැබෙන්නෙවේදැයි පූර්ණකයාට කිවුය එතෙමේ වෙපුල්ල පර්වතයෙන් චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ පරිභොගයට සුදුසුවූ චින්තාමාණික්‍යය ගෙණ නුඹවහන්සේ හා සමග දූකෙළ මා ලැබගෙණ තුන්දවසක් මාගේ ගෙයි වැස මා ලවා අශ්වයාගේ වාලධිය ගන්වා හිමාලය වනයෙහි ගසින්ගස ගලින්ගල ගසා මරන්නට සමර්ථ වූයේ සත්වැනි වාතස්කන්ධයේ වේරම්භමුඛයට පැනනැගී සැටයොදුන් උසඇති කාලගිරි පර්වත මස්තකයෙහි තබා සිංහ ව්‍යාඝ්‍රාදී නොයෙක් භයංකාර වෙස මවා භයගන්වා නැවත නැවත සැටයොදුන් කාලගිරි පර්වත මස්තකයෙන් වරක් දෙවරක් තුන් වරක් බිම හෙලාත් මරන්නට අසමර්ථව මා විසින් පූණ්ණකය තෝ මා මරන්නට උත්සාහ කරන්නේ කවර කාරණයක් නිසාදැයි විචාළකල්හි මරන්නාවූ කාරණය කීහ. එසඳ මම ඔහට සාධුනරධර්ම නම්වූ ධර්මදෙශාවක් කොළෙමි, ඒ ධර්මය අසා ප්‍රසන්නවූ සිත් ඇතිව නාගලොකයට නොගොස් මා මෙතැනට ගෙණ එනු කැමතිවිය එසඳ ඔහු ඇරගෙණ මම නාගභවනයට ගොස් නාරජ්ජුරුවන්ට විමලාවන්ට ධර්මදෙශනා කොළෙමි. සියලු නාග පර්ෂත් විශෙෂ යෙන්ම ප්‍රසන්න වූහ. නාරජ්ජුරුවෝ එහි මා සදවසක් විසූකල මගුල්කොට ඉරන්දතිය පූර්ණක යාට දුන්හ. එතෙමේ ඉරන්දතිය ලැබ ප්‍රසන්නවූ සිත්ඇතිව මට මාණික්‍යරත්න යෙන් පූජාකොට නාරජ්ජුරුවන් විසින් විධුර පණ්ඩිතයන් ඇරගෙණ ගොස් ඉඳිපත්නුවරට පමුණුවයි නියොග කරණ ලද්දේ මා මනොමය සෛන්ධවයා පිටට නංවා පූර්වස්ථානයෙහි ඉඳුවා තෙමේ ඒ මධ්‍යස්ථානයෙහි ඉඳ ඉරන්දතිය ඒ

පශ්චිම භාගයෙහි ඉඳුවා මෙතැනට ගෙණවුත් පක්ෂීන් මධ්‍යයෙහි අසු පිටින් බා ඉරන්දතිය ගෙණ තමාගේ දිව්‍යභවනයට ගියේය මෙසේ මහරජ්ජුරුවන්වහන්ස ඒ පූර්ණක නම් යක්ෂයා අසුරෙන් ගතහැකි වලඟ ඇති ඉරන්දතිය නිසා මා මරන්නට උත්සාහ කෙළේය, එසේ උත්සාහකළත් ඒ තෙමෙ මා නිසාම භාර්‍ය්‍යාවගේ සමාගමයට පැමිණියේය, මාගේ ධර්මදෙශනාව අසා ප්‍රසන්නවූ සිත් ඇති නාරජ්ජුරුවන් විසින් මමත් මාගේ නුවරට එන්නට අනුදන්නා ලදිමි. ඒ පූර්ණක නම් යක්ෂසෙනාධිපතිහුගෙන් ඉෂ්ටාර්ථ ප්‍රසවය කරන්නාවූ චක්‍රවර්ති රජදරුවන්ගේ පරිභොගයට යොග්‍යවූ මේ මාණික්‍ය රත්නය ලබනලද රජ්ජුරුවන්වහන්ස! මේ මාණික්‍යය ගනමැනවයි කියා චින්තාමාණික්‍යය රජ්ජුරුවන්ට දුන්හ. රජ්ජුරුවෝ අලුයම් වේලෙහි තමන් විසින් දුටු සවප්නය නුවර වාසීන්ට කියනු පිණිස පින්වත්වූ නුවරවාසිනි අද මා විසින් දක්නාලද සවප්නය අසවයි කියා හැමදෙනාටම ප්‍රකාශකොට කියන්නාහු පින්වත්වූ නුවර වාසීනි! මාගේ මාලිගා දොරකඩ මහත්වූ වෘක්ෂයෙක් අටගත, ඒ වෘක්ෂයෙහි ප්‍රඥා නමැති කඳක් හා සිල් නමැති ශාඛාවන්නේය, තවද ඒ වෘක්ෂය මෙලොව් පරලෝ වැඩ සාධාදීලන්නට සමර්ථය පස්ගෝරස නමැති ඵලයෙන් යුක්තය හත්ත්‍යශ්වාලංකාරයෙන් සැරසුනු ඇතුන් අසුන් විසින් ශැවසීගන්නේය. එබඳු වෘක්ෂයට මහජනයා නැටීම් ගීකීම් බෙරගැසීම් ආදී නොයෙක් පූජා සත්කාර කෙරෙමින් සිටියදීම එක් කලුම්නිසෙක් අවුත් එම වෘක්ෂය මුලින් සිඳ පිරිවරා සිටි මහසේනාව භයගන්නවා පලවා ඇරගෙණ ගියේය. නැවත වෘක්ෂය අවුත් අපගේ මාලිගා දොරකඩ සමීපයෙහිම පිහිටියේය. අපගේ මේ මහාවෘක්ෂයක් වැනි පණ්ඩිතයෝ සවස්ථානයට අවුත් මෙතන සිටියෝය. දැන්වූකලී තොප හැමදෙනම ප්‍රඥා වෘක්ෂ නමැති විධුරපණ්ඩියන්ට මහත්වූ පූජා සත්කාර කරව, තවද අප පින්වත්වූ අමාත්‍යයෙනි! මා නිසා ලබනලද යශසින් සතුටු සිත් ඇති යම් සත්වයෙක් ඇත්නම් ඒ සියල්ලෝම අද තමන් තමන් සන්තොෂය ප්‍රකාශ කෙරේයයි රත්රුවන් මුතු මැණික් වස්ත්‍රාභරණ ආහාරපාන වර්ගාදී බොහෝ පඬුරුගෙණ මේ ප්‍රඥාවෘක්ෂයට පූජා සත්කාර කරව.

තවද මාගේ විජිතයෙහි යටත්පිරිසෙන් කෙළනා පිණිස මැදිරි දම් ආදියෙන් බන්ධනගතවූ ගිරා මොණර සැළලිහිණි ආදී පක්ෂීන් හා හූරන් ගෝණන් මුවන් ආදී මෘග සමූහ කෙණෙක් ඇත්නම් ඒ සියල්ලවුන් බන්ධනයෙන් මුදත්වයි යම්සේ විධුර පණ්ඩිතයෝ යක්ෂනාග දෙපක්ෂයේ ඇත්තවුන්ගේ අතින් මරණ බන්ධනයෙන් මිදී අවුද, එපරිද්දෙන්ම මේ සියලු මෘග පක්ෂීනුත් අන්දුබන්ධනය, සඞ්ඛලිකබන්ධනය, යනාදියෙන් මුදත්වයි, මේ මස මුලුල්ලෙහි සී සාන නගුල් ගෙණ උඩ බඳවා නුවර බෙර හසුරුවා සියලු මනුෂ්‍යයෝ සර්වාභරණයෙන් සැරසී ඇඳ පැළඳ මහත්වූ ශ්‍රී විභූතීන් යුක්තව උත්සව කෙළි කෙළිත්වයි, බ්‍රාහ්මණයෝ රසමසවුලෙන් යුක්තවූ භොජනය තලු පැහැර පැහැර සිත්සේ අනුභව කෙරෙත්වයි සුරාපානයෙහි අභිප්‍රාය ඇති පුරුෂයෝ සුරාපාන ගෙණ තමන් තමන් කැමැති ආපනමණ්ඩලවල සැපසේ හිඳ ඔඩම් පුරා උතුරුව උතුරුවා මස් හා සමග සුරාපානය කෙරෙත්වයි, තවද සරහා පිළියෙලකරණලද මහත්වූ රාජවීථියේ තුන්මංසන්ධිනිසා සිටිනාසර්වාභරණයෙන් සැරසුනු වෙශ්‍යාස්ත්‍රීහු හැමවේලෙහිම ක්ලෙශ වසඟයෙන් පීඩිතවූ සිත් ඇත්තහු තමන් බඳු ක්ලෙශවසඟ සිත්ඇති ජනයන් අඬගා ඔවුන් හා

සමග පඤ්චකාමරතියෙන් අභිරමනය කෙරෙත්වයි, ආරක්ෂා මඳකොට කරණ ලද බැවින් තතුල් උඩ බැඳ මේ වෘක්ෂයට පූජාසත්කාර කරන්නාහු යම්සේ ඔවුනොවුන්ට පීඩා නොකෙරෙද්ද, එපරිද්දෙන් රාජ්‍යයෙහි අතුරු නැතිකොට රක්ෂාවරණ සංවිධානය කෙරෙත්වයි කීය, මෙසේ ධනඤ්ජය කෞරව්‍ය රජ්ජුරුවෝ ප්‍රීතිවාක්‍ය පවත්වා උදන් අනන කලක් පරිද්දෙන් සන්තොෂ වාක්‍ය පැවැත්වූහ.

මෙසේ රජ්ජුරුවන් විසින් නියොග කරණ කල්හි අන්තඃපුර ස්ත්‍රීන්ය; රාජකුමාරවරුවය, වෙළෙන්ද්‍රෙය, බමුණෝය, ඇතරුවෝය, අසරුවෝය, ඇණිනායකවරුය, රථාචාර්‍ය්‍යවරුය, පාබලසේනාවය, රැස්වූ දනව් වැස්සෝය, නියම්ගම් වැස්සෝය, යන මේ සියලු සත්ත්වයෝ මහත්වූ උත්සවක්‍රීඩා සරහා සියලු බන්ධනගත සත්ත්වයන් බන්ධනයෙන් මුදා හැර වස්ත්‍රාභරණ ආහාරපාන වර්‍ගාදි සියලු පඬුරු සරහා ගෙණ රජ්ජුරුවන් හා සමග බොධිසත්ත්වයන්ට මහ වතුරක් මඩනාකලක් පරිද්දෙන් එකපැහැර පඬුරුදී සම්භාවනාකළහ. බොධිසත්ත්වයන් දැක බොහෝ ජනයෝ ඔදවැඩියාවූ සිත් ඇතිව විශෙෂයෙන් ප්‍රසන්න වූහ. උත්සව ක්‍රීඩාව මසක් මුළුල්ලෙහි පැවැත්තේය, මහබෝධිසත්වයෝ බුද්ධ කෘත්‍යයක් සිඬකරන්නාක්මෙන් මහජනයාට ධර්‍මදෙශනාකොට අවවාදනුශාසනා කෙරෙමින් දිවි පමණින් සිට ආයු කෙළවර ගොස් ත්‍රයත්‍රිංශත් දිව්‍ය ලොකයෙහි උපන්හ. බොධිසත්ත්වයන්ගේ අවවාදයෙහි පිහිට රජ්ජුරුවන් ප්‍රධානකොට ඇති සියලු කුරුරට වාසී සත්ත්වයෝ දානාදී පින්කම්කොට ආයු කෙළවර ගොස් දිව්‍යලොකයෙහි උපන්හ.

ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ මේ ධර්‍මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි, දැන් මතුනොවෙයි පෙරත් සර්‍වඥයෝ ඥානබල සම්පන්නයෝය. උපායෙහි දක්ෂයෝමයයි වදාරා පූර්‍වාපරසන්ධිගළපා මේ විධුර ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි විධුර පණ්ඩිතයන්ගේ දෙමවුපියෝ නම් දැන් සුද්ධොදන රජ්ජුරුවන් හා මහාමායා දේවිය, ප්‍රධාන බිසව් නම් බිම්බාදෙවිය, ප්‍රධාන පුත්‍රයා නම් රාහුල කුමාරයාය, වරුණ නා රජ්ජුරුවෝ නම් ශරිපුත්‍ර ස්ථවිරයෝය, ගුරුළුරජ නම් මහාමෞද්ගල්‍යාන ස්ථවිරයෝය. ශක්‍රදෙවෙන්ද්‍ර නම් අනුරුද්ධ ස්ථවිරයෝය, ධනඤ්ජය කෞරව්‍ය රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය එසමයෙහි ප්‍රඥා විශෙෂයෙන් පූර්ණකයා වරුණ නම් නාරජ්ජුරුවන් විමලාවන් ඇතුළුවූවන්ගේ අභිමතාර්ථය සිඬකිරීමෙන් සිත් සතුටුකොට ඔවුන් හැම දෙනාගේ අනුඥනයෙන් සියනුවරට පැමිණ ධනඤ්ජය කෞරව්‍ය රජ්ජුරුවන් ප්‍රධානකොට ඇති සියලු නුවරවාසීන් සිත් සතුටුකරවා අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකොට සියල්ලවුන්ට ස්වර්ගසම්පත් සාදදුන් විධුර පණ්ඩිතයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේම්දැයි නමන්වහන්සේ දක්වා වදාළසේක.

විධුර ජාතකය නිමි,

534
උම්මග්ග ජාතකය

එක් සමයෙක්හි ශාක්‍යසිංහවූ සම්නන හඳුවූ අසමසමවූ ත්‍රෛලොක්‍ය තිලකවූ ත්‍රිභුවන චූඩාමාණික්‍යවූ කරුණා නිධානවූ මෛත්‍රී නිවාසවූ ප්‍රඥාවට වල්ලභවූ සාගරයේ අචින්ත්‍ය ගුණ ඇති මහ පොළොවසේ නිශ්චල ගුණ ඇති මහමේරුවසේ උස්වූ ගුණ ඇති දූරගම්ණක්සේ නිම්ලවූ ගුණ ඇති මාගේ ස්වාමිදරුවූ සම්මා සම්බුදුරජාතන් වහන්සේ ක්ෂීරසාගරයෙන් නැගී තරඞ්ග මාලාවසේ සුධාධවල ප්‍රාකාරවලයෙන් පරික්ෂිප්තවූ කනක රජතාදීන් හොබනාවූ විසිතුරු සැදුම්ලද මාලිගා ගෙවල් හා දොරටු ආදියෙන් යුක්තවූ සල් සපු නා පනා අඹ දෙඹ ආදීවූ ඵල පල්ලවයෙන් සඤ්ඡන්න තරුවරශතයෙන් හොබනා විසිතුරු උද්‍යානයෙන් හා පස්පියුමෙන් සැදුම්ලද නිම්ල ජල සම්පූර්ණ පුෂ්කරණී ශතයෙන් හොබනාවූ නානාභරණ විභූෂිත නරනාරී ගණාකීර්ණවූ සැවැත් නම් නුවර නිසා නඳුන්වනයට අපහාස කරන්නාක් වැනිවූ සියලු සිරිසරින් සාර චඞ්ක්‍රමණ පරිවේණාදි විහාර ශතයෙන් හොබනාවූ ජේතවන නම් උයන්හි මෛත්‍රී කරුණා මුදිතොපෙක්ෂා සඞ්ඛ්‍යාත සතර ආර්‍ය්‍ය 'විහාරයෙන් දවස් යවනසේක් තමන් වහන්සේගේ භවයෙන් සැඟවී තුබූ ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය වදාළසේක.

කෙසේද? යතහොත්

එක් දවසක් හිරු අස්තපර්වතගත වේලෙහි ශීලසමාධි ප්‍රඥාදි ගුණාඞ්ග සඞ්ගත ප්‍රවර භික්ෂු සඞ්ඝයා වහන්සේ තමන්වහන්සේ වසන රාත්‍රිස්ථානයෙන් අවුත් යුධභූමියකට රැස්වන්නාවූ සුවිනීත යොධමුලක්සේද මැණික් සන්නාහ සන්නද්ධවූ නානාලඞ්කාරයෙන් සැදුම්ලද ගඳැත්මුලක්සේද, එකවර සිංහ සමූහයක්සේද සඳැවලාබඳුවූ සුරක්තවර පවුල් පෙරව ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත කනක රජත මණිතාරකායෙන් විචිත්‍රවූ විතාන ඇති නානා ප්‍රභා සමුජ්වලිත අලංකෘත ධර්මසභායෙහි ශක්‍රගම්නය බලමින් සුධර්මා නම් දිව්‍යසභායෙහි රැස්ව උන් දිව්‍ය සමූහයාසේ ධර්මරාජන්වූ ධර්මාධිපතිවූ ධර්මස්වාමිවූ තිලෝ ගුරු බුදුරජාතන් වහන්සේ වඩනා පෙරමග බලබලා ධර්මාසනය පිරිවරා හිඳ බුදුන්ගේ නුවණ පැරුම් වර්ණනසේක් ඇවැත්නි! බුදුහු ශීලස්කන්ධාදියෙහි පවත්නා මහත්වූ නුවණ ගතියක් ඇතිසේක. මුහුදුපිට ඉසි සුවඳ තෙලක්මෙන් දතයුතුවූ සියලු ධර්මයන් කෙරෙහි පැතිර පවත්නාවූ නුවණ ගතියක් ඇතිසේක. මුදුපිට ඉසි සුවඳතෙලක්මෙන් දතයුතුවූ සියලුධර්මයන් කෙරෙහි තුෂ්ටි බහුලව පවත්නා නුවණ ගතියක් ඇතිසේක. සියලු ඥෙයමණ්ඩලයෙහි ජවන හංසගතියෙක්මෙන් දිවන්නාවූ නුවණගතියක් ඇතිසේක. අර්ථ ධර්ම නිරුක්ති ප්‍රතිභානාදියෙන් දිරාගය පරණලා පතෙක නොපැකිල යන්නාවූ දවසක් මුලුල්ලෙහි රත්කල යහුලක්මෙන් සියුම්ව දුවන්නාවූ නුවණ ගතියක් ඇතිසේක, අතුල්තෙලෙහි තුබූ දූරගම්ණක්සේ සියලු ධර්මයන් සම්ස්කාරයෙන් විනිවිද දක්නාවූ නුවණ ගතියක් ඇතිසේක. දෘෂ්ටිජලානුගත අන්‍යතීර්ථක ජනයන්ගේ ශාස්වතොච්ඡෙදාදි වාද මර්දනය කරණසේක. තමන්වහන්සේගේ අසාධාරණවූ විදුරුනුවණින් කූටදන්ත බ්‍රාහ්මණ, වෙරඤ්ජ බ්‍රාහ්මණාදීවූ අනෙක බ්‍රාහ්මණ ශතයන්ද, සභිය පරිබ්‍රාජක බාහිය පරිබ්‍රාජකාදි පරිබ්‍රාජක සමූහ

යන්ද, අංගුලිමාදීවූ චණ්ඩපරුෂවූ බොහෝ සොරුන්ද, ආලවකාදීවූ මනුෂ්‍ය මාංශ භක්‍ෂණයෙහි දක්‍ෂයන්ද, ඉසුරුමදයෙන් ප්‍රමාදව තුණුරුවන් කෙරෙහි ජනිත ප්‍රසාද විරහිතවූ ශක්‍රදෙවෙන්ද්‍රයා ආදීවූ දේවතාවන්ද, ශාස්වත දෘෂ්ටිජාලානුබද්ධව අමාගී ප්‍රතිපන්න බක බ්‍රාහ්මාදීවූ බ්‍රහ්මයන්ද, තමන්වහන්සේගේ අසාධාරණවූ සර්‍වඥ මහිමයෙන් ඔවුන්ගේ මාන මර්දනය කොට පාප නමැති විෂ විනාශකොට ස්වර්ගමොක්‍ෂ සම්පත් සාදදී වදාළසේක. තවද මේ බුදුරජානන් වහන්සේ විසින් කායචාරයෙන් සම්‍යක් ප්‍රතිපත්තීන් යුක්තකොට ප්‍රව්‍රජ්‍යාව සාධාදී බොහෝදෙන සතර මග සතර ඵලයට පමුණුවා වදාළසේක, ඇවැත්නි! මෙසේ බුදුහු වුත්තප්‍රකාර මහනුවණ ඇතිසේකැයි බුදුන්ගේ ශීල සමාධ්‍යාදි අනෙකප්‍රකාර ගුණ වර්ණනා කොට කොට දම්සභා මණ්ඩපයෙහි රැස්ව හුන්සේක.

ඉක්බිති සතරාමර ලොක චූඩා මණි මරීචි මඤ්ජරී පුඤ්ජ පූජිත චරණාම්බුජ ඇති ලොකස්වාමිවූ ලොකනායකවූ ජගදානන්ද ලොචනවූ මාගේ ස්වාමිදරුවානන්වහන්සේ දම්සභා මණ්ඩපයෙහි උපන් කථාස්වරූපය ගඳකිළි පිරිවෙණෙහි වැඩහුන්සේක් දිව්‍යකර්ණින් අසා වදුරා වරරුචිර ගන්ධකුටිවාසය මහාකරුණායෙන් දුරුකොට සමාපත්තීන් නැගී ලාක්‍ෂාරසයෙන් තෙත්වූ මුරුත මල්කලඹක් හා සමානවූ අඳනා සිවුර ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනයෙන් සංවිධානකොට හැඳ සන්ධ්‍යා ඝනවලායෙක ගසනලද සියරැලි විදුලියක් සමානවූ පටිධාතුන් වහන්සේ ඊමත්තේ බැඳ සතරන් දගැබක් රත්පලසකින් වසන්නාක්හු මෙන්ද, අටලොස්රියන් රන් ඇගැයකට පබළු දැලක් දමන්නාක්හු මෙන්ද චිත්‍රකූට පර්‍වතය වදමල්දමකින් වටකරන්නාක්හු මෙන්ද රත්ගල්මුදුනෙහි සුපක්ව ලාක්‍ෂාරස වත්කරන්නාක්හු මෙන්ද මෙරුමන්දරාදීන් එකපැහැර කම්පාකෙරෙමින් සුපක්ව විලිකුළින් නුගඵලයෙක පැහැබඳුවූ සුගත් මහ පාංශුකූල චීවරය පෙරව සුප්පතිට්ඨිත පාදතාදීවූ දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයන් කරණකොටගෙණ පිළිවෙළින් ගොනා තුඹු සූයඞ් මණ්ඩලයන් දෙතිස්දෙනෙකුගේද චන්ද්‍රමණ්ඩලයන් දෙතිස්දෙනකුගේද චක්‍රවර්තීන් දෙතිස්දෙනකුගේද මහාබ්‍රහ්මයන් දෙතිස්දෙනකුගේද, ශ්‍රීවිභූති අභිභවමින් අශීත්‍යනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා කෙතුමාලාලංකාරයෙන් පීරාජමානව අනන්ත කාලයක් මුලුල්ලෙහි පුරණලද සුචරිතානුභාවයෙන් තෙමේ තමාට අරණලද දොර ඇති ගඳකිළි පිරිවෙණින් මේඝකූටයකින් නික්මුණු හිරුමඬලක්සේද, වලාපටලයකින් නික්මුණු පුන්සඳ මඩක්සේද, රත්ගල් ගුහායෙකින් කෙසරු සළා විදහා නික්මුණු අභීත කෙශර සිංහරාජයකුසේද, නික්ම තමන්වහන්සේ ජාති ජාතියෙහි බුඩාදී නුවණැත්තන් සමීපයට නුකූසිතව එළඹි කුශල මහිමයෙන් පොළොව පලාගෙණ නැගී සත්බුමු මහ පියුම් මත්තෙහි අටතුරාශියක් මගුල්ලකුණෙන් සැදුම්ලද ශ්‍රීපාද යුගලය තබ තබා වියදඹු පමණෙක හෙලනලද්දාවූ නෙත්‍රකාන්තීන් මහීකාන්තාවට අමෘතාභිෂෙක දෙමින් අනන්තවූ බුඩ විලාෂයෙන් දම්සභා මණ්ඩපයට වැඩ නීලපීතාදි ෂඩ්වර්ණක් රසින් සකල ධම් සභාව එකපැහැර බබුළුවමින් සතරන් මාලිගාවෙක දිලියෙන ඉඳුනිල්මිණි කවුළු සඟලක් වැනිදෝහෝ නොහොත් රන් දගැබක්සේ බබලන මුහුණ නමැති පියුම් ගැබෙහි හැසිරෙණ බමරයුවලක් හා සමානවූ දිගු පුළුල් පස්පැ දිස්නා ඇස් සඟල විදහා සත් රුවන් නැවක් මෙන්ද පිපී වැනීගිය රත්පියුම් වනයක්දෝ නොහොත් රන්

උමමගග ජාතකය

දගැබක් වටකොට පුදනලද මල්කලඹක් හා සදෘශවූ සඞ්ඝරාජයන් බලා වදාරා මේ මහණ පිරිස දමුනු ඉදුරන් ඇත්තාහ; නිවුණාවූ චිත්තසන්තාන ඇත්තාහ, කයින් වචසින් මනසින් සත්පුන් ගුණ ඇත්තාහ; එහෙයින් මම් පළමුකොට කථාවක් කෙළෙම්නම් මට පෙරටුකොට බණනැගෙන මහණෙක් නැතැයි සිතාවදාරා අනල්පකල්පකෝටි ශතසහස්‍රයක් මුළුල්ලෙහිපුරණ ලද කායවාක් සුචරිතයෙන් එකසුගන්ධව තිබෙන මුඛපද්මය විදහා මහණෙනි! මා එන්නාට පූර්වයෙහි කවර නම් කථාවකින් යුක්තව උනුද? තොපට නොදූ නෙත කථාවක් තොප සිත උපන් සැකයෙක් ඇත්නම් ඒ මට කියව මම් මාගේ අසාධාරණවූ බුදුනුවණැසින් පිරිසිඳ දැන කියම්යි වදාරා ධර්මයට මුඛදී තුෂ්ණීම්භූතව වැඩ උන්සේක.

එවේලෙහි සංඝයාවහන්සේ ස්වාමීනි! බුදුන් විසින් නොකියන්නට වදාළ රාජකථා චෞරකථාදීවූ දෙතිස් කථාවෙන් යුක්තව නූන්නම්හ, බුදුන්ගේ සුවිශුද්ධවූ තීක්ෂණ ප්‍රඥා ගුණ රසාස්වාදයෙන් පිණ පිණා උන් නම්හයි කී කල්හි මහණෙනි! දැන් මතුනොවෙයි බුදුහු මහනුවණැත්තෝ වූයේ පූර්වයෙහිත් (සසර සිටිනා කල තුමූකළ නුවණෙහි සිට මෙම සර්වඥතා ඥානය සිද්ධකරණ පිණිස පාරමිධර්මයන් පුරා ඇවිදිනාකාලයෙහිත්) නුවණැත් තෝ වෙත්වයි වදාරා මුවෙන් නොබැණ වැඩහුන් කල්හි එක්කෙණෙකුන් වහන්සේ විසින් හැමදෙනා වහන්සේගේ අනුමතියෙන් සිවුරු සකස්කොට පෙරව ඇදිලි බැඳ සිට දන්වන්නාහු බුදුන් මහනුවණ ඇතියේ ප්‍රස්තුත හෙයින් ඇහෙයි, පූර්ව ජන්මයෙහි තුමූකළ නුවණෙහි සිට පාරමී ධර්මයන් පුරණ කල්හි මහ නුවණ ඇති පරිදි භවයෙන් සැඟවී තිබෙයි, එහෙයින් ස්වාමිදරුවානෙනි! අපට නොහැඟෙයි, වදාළහොත් යහපතැයි ආරාධනා කළ කල්හි කඩතුරාවක් පහකොට විචිත්‍ර චිත්‍ර කර්මාන්තයක් දක්වන්නාහු මෙන් අතීත කාල ප්‍රවෘත්තවූ කථාස්වරූපය ගෙණහැර දක්වා වදාළසේක.

හේ කෙසේ ද? යත්

යටගිය දවස මිථුලු නුවර වෛදෙහ නම් රජ්ජුරුකෙණකුන් රාජ්‍යය කරණ සමයෙහි උන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරණ සෙනකය, පුක්කුසය, කාවින්දය, දෙවින්දය, යන පණ්ඩිතවරු සතරදෙනෙක් වූහ. එසමයෙහි වෛදෙහ රජ්ජුරුවෝ පුරණලද පාරමිතා ඇති බුද්ධාංකුරවූ මහ බෝසතානන්වහන්සේ මව්කුස පිළිසිඳ ගන්නා දවස් අළුයම් වේලෙහි මෙබඳු ස්වප්නයක් දුටුහ. සෙණ්ඩුවාලුව ඇතුළෙහි සතර පවුරු කොන නාඹ තල් කඳ සා ගිනිකඳ සතරක් පවුරෙහි තලක්කට්ටුව උසටනැගී දිලියෙන්නේය. ඒ ගිනිකඳ සතරට මධ්‍යයෙහි කද්‍යෝපැණියකු සා ගිනි පුපුරක් නැගිලා එම ඇසිල්ලෙහි සතරකොන සිටි ගිනිකඳ සතරෙහි ආලෝක මැඩගෙණ බඹලොව උසට නැගී ආලෝක පතුරුවමින් දිලියෙන්නේය. යටත් පිරිසෙයින් බිම හුනු සර්ෂපමාත්‍රයකුදු පෙණෙන්නේය. සියලු දෙව් මිනිසුන් සහිත ලෝ වැස්සෝ ගඳින් මලින් පූජා කෙරෙමින් ඒ ගිනිදූල් ඇතුළේම වැද ඇවිදිනා හුය. එසේ ගිනිදූල් ඇතුළෙහිම ඇවිදිනා උන්ගේ ඇඟින් රෝමකුප මාත්‍රය කුදු හුණු නොවන්නේය.

වෛදෙහ රජ්ජුරුවෝ මේ සීනය දුටු වේලෙහි පටන් මරණ භයින් භය පත්ව නොනිදා නිඳ පහන්කළහ. උදෑසනක්සේ සෙනකාදී පණ්ඩිතවරු සතර දෙන රජගෙට ගොස් රජ්ජුරුවන්වැඳ රෑ දවස සුවසේ නිදිලත් සැටි විචාරා රජ්ජුරුවන් විසින් මට සුවයෙක් නම් කොයින්ද? මෙබඳු සීනයක් දීටිමි කීකල්හි පණ්ඩිතවරු සතරදෙනාගෙන් සෙනක පණ්ඩිතයෝ දෙවයන් වහන්ස නොබව මැනව, මේ තෙමේ මඞ්ගල සීනයය. එහෙයින් තුඹවහන්සේට වැඩෙක්වන්නේයයි කියා කවර කාරණයකින්දැයි රජ්ජුරුවන් කීකල්හි අප පණ්ඩිතවරුන් සතරදෙනාම අභිභවා අපගේ නුවණ යටකොට තුඹවහන් සේට අනික් පස්වන පණ්ඩිත කෙණෙක් උපදනාහ; අපසතරදෙනා මේ රාජා ඞ්ගනයෙහි සතර කොන තැගී ගිනිකඳු සතරක් වැන්නම්හ. මධ්‍යයෙහි නැගි ගිනි කඳමෙන් පස්වන පණ්ඩිතයෝ උපදනාහ, ඒ පණ්ඩිතයෝ සියලු දෙව් මිනිසුන් සහිත ලොකයෙහි අසමානවූ නුවණැත්තාහ; සියලු ගුණයෙන් අස දෘශයහයි කියා දූත්වූහ. දූත් කොයිද්දැයි රජ්ජුරුවන් කී කල්හි දෙවයන් වහන්ස! අද උන්ගේ මව් කුස පිළිසිඳගැන්ම හෝ මව් කුසින් බිහිවීම හෝ වන්නේයයි තමන්ගේ ශාස්ත්‍ර බලයෙන් දිවැසින් දුටු කෙණකුන්මෙන් සීන යෙහි අර්ථ රජ්ජුරුවන්ට කීහ.

රජ්ජුරුවෝ එදා පටන් ඒ වචනය සිහිකළහ. මියුලු නුවර වනාහි වාසල් සමීපයෙහි දකුණු යවමැදුම් ගමය, බටහිර යවමැදුම් ගමය, උතුරු යවමැදුම් ගමය, නැගෙනහිර යවමැදුම් ගමයයි නියම්ගම් සතරෙක් විය. ඒ ගම් සතරින් නැගෙනහිර යවමැදුම් ගම සිරිවඩ්ඪන නම් සිටාන කෙණෙක් වූහ. උන්ගේ ඇඹතියෝ සුමනා නම් දේවී කෙණෙක, මහබෝසතානන් වහන්සේ එදවස් රජ්ජුරුවන් සීනය දුටු වේලෙහි තව්තිසා දෙව්ලොවින් චුතව සිරිවඩ්ඪන සිටානන්ගේ සුමනා නම් දේවීන්කුස පිළිසිඳගත්සේක. අනි කුත් දිව්‍යපුත්‍රයෝ දහසක් ඒ දෙව්ලොවින් චුතව නැගෙනහිරි යවමැදුම් ගම බලා වැඩිමහළු සිටුවරුන්ගේ ගෙවල පිළිසිඳගත්හ.

සුමනා දේවීන් පිරිපුන් දසමසකින් අභිනව චන්ද්‍රරේඛාවසේ දෝහෝ නොහොත් සතරන් පිළිමයක් බඳුවූ රන්වන් පුතනු කෙණෙකුන් වැදූය. ඒ ඇසිල්ලෙහි සක්දෙව්රජාණෝ මිනිස්ලොව බලන්නාහු, මහබෝසතානන් වහන්සේ මව්කුසින් නික්මුණු බව දැන මේ බුඞ්ධාංකුරයානන් දෙව් මිනිසුන් සහිතලොකයෙහි ප්‍රසිඞ කොට ලන බව සුදුසුයයි සිතා උන්වහන්සේ මව් කුසින් බිහිවන වේලෙහි නොපෙණෙන ශරීර ඇතිව අවුත් ඔබ අත රන්වන් සඳුන් ගැටයක් තබාලා තමන් වසන ශක්‍ර භවනයටම ගියහ.

මහබෝසතානෝ ඒ සඳුන් ගැටය මිටින් ගත් සේක. මහබෝසතානන් වහන්සේ මව් කුසින් බිහිවන වේලෙහි මෑනියන්දැට මඳ විලි වේදනාවකුත් නොවී ඩබරාවකින් වෑහෙන දියත්තක් මෙන්ද ධර්මාසනයකින් බස්නා පඬි රුවනක් මෙන්ද, සුවයෙන් නික්මුණුසේක. මෑනියන්දෑ උන්වහන්සේ අත තුබූ සඳුන් ගැටය දැක පුතණ්ඩ! තොප අත කිම්දැයි කී දැය මෑනියන්වහන්ස! මහඖෂධයෙකැයි කියා දිව සඳුන් ගැටය මෑනියන්දෑ අත තබා වදාළසේක. ඖෂධය මෑනියන්දෑ අතටදී මෑනියන්වහන්ස! මේ ඖෂධය ඇරගෙණ යම්කිසි රෝගයකින් පීඩිත කෙණෙකුට දෙවුව මැනවැයි වදාළසේක.

මැතියන්දූත් තුටුපහටුව සිරිවඩ්ඪන සිටාතන්ට කීහ. ඒ සිටාතන්ට වනාගී සත් අවුරුද්දක් මුලුල්ලෙහි පහරණ ඉස රුජාවෙක් ඇත්තේය. තුමූ තුටුපහටුව මේ කුමාරයා මව් කුසින් බිහිවන්නේ මහෞෂධයක් අතින් ගෙන ආය, උපන් ඇසිල්ලෙහිම මැතියන් හා කථාකෙළේය. මෙබඳුවූ පින් ඇත්තහු විසින් දුන් මේ බෙහෙද මහත්වූ ආනුභාව ඇත්තේයයි සිතා බෙහෙද අතට ගෙණ සඳුන්සණ මඳක් ගනා තලළ ගැල්වූහ. සත් අවුරුද්දක් පබඩියෙන් පහළ ඉස රුජාව නෙළුම් පතෙක නොඇලී රුරාගෙණ යන දියත් තක්සේ ගියේය.

සිටාතෝ මහානුභාව ඇති ඖෂධයෙකැයි සොම්නසට පැමිණියහ. මහබෝසතානන්වහන්සේ මහෞෂධයක් අතින්ගෙණ මව්කුසින්බිහිවූ නියාව හැමතැනම ප්‍රසිඬවිය කාශශ්වසාදීසාවූ රොගයෙන් පීඩිත කිසි මිනිස්කෙණෙක් ඇද්ද, ඒ සියල්ලෝම සිරිවඩ්ඪන සිටාතන්ගේ ගෙට ගොස් මහෞෂධය ඉල්වති, සිටාතෝ ඒ සඳුන් ගැටය සඳුන් සණගහා කල්ක සුගක්ගෙණ පැනැ කලතා හැමදෙනාටම දෙත්නාහ. දිව්‍යමයවූ ඖෂධය ශරීරයෙහි වැකී පමණින්ම සියලු ව්‍යාධිහු සන්සිදෙත්නාහ. සන්හුන්නාවූ රොග ඇති මනුෂ්‍යයෝ සිරිවඩ්ඪන සිටාතන්ගේගෙහි ඖෂධය මහත්වූ ආනුභාව ඇත්තේයයි වණ්නාකෙරෙමින් යත්නාහ. මහබොසතානන්වහන්සේට නම් තබන දවස් පියාතෝ මාගේ පුතනුවන්ට මුතුන්මින්තන් ආදීන්ගේ නමින් ප්‍රයෝජන නැත මහෞෂධ නාමයම වේවයි කියා උන්වහන්සේට මහෞෂධකුමාරයෝයයි නම් තුබුහ. තවද ඒ සිටාතන්ට මාගේ පුතනුවෝ පින් ඇත්තෝය. එහෙයින් උදකලාව නූපදනාහ, මුන් හා සමඟ උපන් දරුවන් තවත් ඇතමැනවැයි මෙසේවූ සිතෙක් ඇතිවිය. මෙසේ සිතා තුමූ තමන්ගේ මිනිසුන් යවා ගම ගෙයක් පාසා බලවා එකදූ උපන් කුමාරවරුන් දහසක් දුටුබව අසා සිටාතෝ හැමදෙනාටම කුමාර පලඳනාදී කිරි මවුන් යවා මහ බෝසතානන්වහන්සේ හා සමග උපන්නන්ටත් සියලු මගුල් කළහ කුමාරවරුන් දහස සරහා දවස දවස මහබෝසතානන්වහන්සේ ලඟට ගෙණයන්නාහ. උන් හා එක්ව කෙළිමින් සත්හැවිරිදි කල්හි සතරන් පිළිමයක් මෙන් මනා රූ ඇතිවූසේක. ඉක්බිති කුමාරවරුන් හා කැටිව ගමමැදදී කෙළනා උන්වහන්සේගේ කෙළිමඬුලු ඇතුන් අසුන් වැසි ආදිය ආකල්හි මැකෙන්නේය. අව් සුලං දූඩි වේලෙහි කුමාරවරු මිරිකෙන්නාහ.

එක්දවසක් උන් කෙළිමින් සිටියදී නොකල් වැස්සෙක් නැගීය, වැසි නගන්නා දූක ඇත් සමාන බල ඇති මහබෝසතානන්වහන්සේ දුවමින් ගොස් ගේකට වන්සේක. සෙසු කුමාරවරු පසුපස්සේ දුවන්නාහු ඔවුනොවුන් පය පැකිල වැටී දන බිඳීම් ලේ ලීම් ආදියට පැමිණියෝය. මහබෝසතානන්වහන්සේ මෙතැනකෙළනට ගෙයක් කරවන බව සුදුසුය එසේවූ කල්හි නොමිරිකෙම්හයි සිතා ඒ කුමාරවරුන්ට මේ ස්ථානයෙහි සුලං අමන කල්හි වේවයි වැසි වස්නා කල්හිවේවයි අව් පහරණ කල්හි වේවයි නොමිරිකී ඉඳීනට සිටිනට වැදහෝනට යෝග්‍යකොට ගෙයක් කරවම්හ, එකී එකී මස්සක් බැගින් ගෙණෙවයි වදාළසේක. උයිත් වදාළ ලෙසම කළහ.

ඒ මසු දහස ගෙණ බොධිසත්වයන්වහන්සේ වඩු ආචාර්‍ය්‍යයකු ගෙන්වා මෙතැන ගෙයක් කරවයි මසුදහස දුන්සේක. වඩු ආචාර්‍ය්‍යයාත් යහපතැයි මසු දහසගෙණ බිම සමකරවා කණුගස්වා රැණ දික්කොට හෙලාලිය. බෙදන නියාව මහබෝසතාණන්වහන්සේගේ සිත්නොගත්තේය. බෝසතාණන් වහන්සේ වඩු ඇදුරාට රැණ ලන සැටිය වදාරණසේක් මේ ලෙස රැණ තොලා මතාකොට රැණ දික්කරවයි වදාළසේක. සවාමීනි! මේ මාගේ ශාස්ත්‍රය ඇති මටටමයයි රැණ එලිමි, මීට වඩා අනික් සැටියක් නොදනිමියි කීය. මෙපමණකුත් නොදන්නේ අප සිත්ගෙණ කෙසේ කෙරේදැයි වදරා මෙසේ රැණ ගෙණෙව රැණලා ගෙය බෙදාදීලමි, රැණ ගෙන්වා ගෙණ තමන්වහන්සේ දික්කළසේක, විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් රැණ එලාලූ කල්හිමෙන් ගෙය බෙදීගියේය, ඉක්බිති වඩුවා අතින් මෙසේ රැණ එලාලිය හෙයිදැයි විචාළසේක, නොපිලිවන සවාමීනි! යි වඩුවා කීය, මා කී සැටියේ ගෙය කලහැකිදැයි වදාළසේක, වදාළ ලෙසකට කළම්හයි කීය.

මහබෝසතාණන්වහන්සේ ඒ ශාලායෙහි යම්පරිද්දකින් දුක්පතුන් වසන තැන එක් ස්ථානයක වීද, එසේම දුක්පත් ගැණුන් වදන තිඹිරිගෙය එක් තැනක, ආගන්තුක මහණ බමුණන් වසන තැන, සෙසු ආගන්තුක මිනිසුන් වසන තැන, ආගන්තුක වෙළඳුන්ගේ බඩු තබන තැන, මෙපරිද්දෙන්ම සියලු ස්ථානයම පිටතින් දෙරකඩ තබා ශාලාවවිධානකොට කරවූසේක. එහිම කෙලිමඬුල්ලද විනිශ්චය ශාලාවද ධර්මසභාවද කරවූසේක. කිපදවසකින් නිමියාවූ ශාලායෙහි සිත්තරුන් ගෙන්වා තමන්වහන්සේ විධානකොට ඇලුම් කටයුතු සිත්තම් කරවූසේක. ඒ ශාලා තොමෝ සුධර්මා (නම් ශාලාව) හා සමානවූවාය, ඉක්බිති මෙපමණකින් මේ ගෙය හොබනේ නොවෙයි, පොකුණක් කරවනබව සුදුසුයයි පොකුණක් කණවමි. උළු වඩුවන් ගෙන්වා තමන් වහන්සේ මිලදී විධානකොට දහසක් වක් ඇති මනහර පිය ගැට පඞක්තින් යුක්තවූ සියයක්තොට ඇති පොකුණක් කරවූසේක. ඒ පුෂ්කරිණී තොමෝ පස්පියුමෙන් සැදුම් ලද්දීය, නන්ද නම් පොකුණමෙන් විය. තැවත ඒ පොකුණු තෙර අඹ දෙඹ නා පනා සපු දුනුකේ ඇසල පුවඟු ආදීවූ මල්පල් ලෙන් සැදී සිටිනා නොයෙක් ගස් රොපණය කරවා උයනක්ද නඳුන් උයන සා කරවූසේක. එම ශාලාව නිසාම ධාර්මික මහණ බමුණන්වද බැහැරින් අවුත් ඒ ශාලාවේ ලගින්නටද, එහි ලැග බැහැර යන්නන්වද, සෙසු දුක්පතුන් ආදීන්වද දන්වැටනැඹබවූහ. ඒ මහබෝසතාණන්වහන්සේගේ ක්‍රියාතොමෝ සියලු තන්හි පතළාය. බොහෝ මිනිසුන් ඒ සවරූපය අසා එතනට එළ ඹෙන්නාහ. මහබෝසතාණන්වහන්සේ ශාලායෙහි වැඩහිඳ ආ කෙණෙකුන්ට කළමනා යුක්ති අයුක්ති විචාරණසේක. මෙසේ මහබෝසතාණන්වහන්සේ බුදුන් ලොව පහළවූ කල්හිමෙන් පතළවූසේක.

එසමයෙහි වෛදෙහ රජ්ජුරුවෝ සීනය දුටු සත් අවුරුද්දක් ගියකල පණ්ඩිතවරුන් සතරදෙනා "අප අභිභවා පස්වැනි මහනුවණ ඇති පණ්ඩිත කෙණෙක් උපදනාහ"යි මට කීය, දැන් ඒ පණ්ඩිතයෝ කොයිදැයි සිහිකොට උන්වසන තැන් දනුවයි සතර වාසලින් ඇමතියන් සතර දෙනකු යැවූහ. සෙසු වාසල් තුනින් නික්මුණාවූ අමාත්‍යයෝ තුන්දෙන මහබෝසතාණන්

නුදුටුහු, නැගෙනහිර වාසලින් නික්මුණු අමාත්‍ය තෙමේ නැගෙනහිරි යවමැදුම් ගමට ගොස් බොධිසත්ත්වයන්වහන්සේ විසින් කරවනලද ශාලාදිය දැක නුවණැති කෙණකුත් මේ ගෙය තමන් හෝ කළ මැනව, අනුන්ලවා හෝ කරවුව මැනව, මේ ගෙය වඩුවෙකු විසින් කරණ ලදදැයි විචාළේය, මිනිස්සු කියන්නෝ මේ ගෙය වඩුවෙකු තමා නුවණ බලයකින් කළ දෙයක් නොවෙයි සිරිවඩ්ඪන සිටානන්ගේ පුතනුවූ මහෞෂධ පණ්ඩිතයන්ගේ විධානයෙන් උන් කී සැටියේ කරණලදැයි කීහ. ඒ පණ්ඩිතයෝ කී හැවිරිද්දෝදැයි විචාළේය, පිරිපුන් සත්හැවිරිදි සේකැයි කිවූය.

ඇමති තෙමේ රජ්ජුරුවන් සීතය දුටුද පටන් ගැණ සීතය දුටු නියාව සරිමය, සෙනක පණ්ඩිතයන්ට පස්වනුව පහළවන පණ්ඩිතයෝ නම් මූමයයි සනිටුහන්කොට රජ්ජුරුවන්ට දෙවයන්වහන්ස! නැගෙනහිරි යවමැදුම් ගම සිරිවඩ්ඪන සිටානන් පුතනුවෝ මහෞෂධ පණ්ඩිත නම් කෙණෙක් සත්හැවිරිදි වයස් ඇත්තාහු මෙබඳු ශාලාවක්ද, පොකුණක්ද, උයනක්ද, කරවූහ, මේ පණ්ඩිතයන් ගෙණෙම්ද නොගණෙම්දැයි මෙහෙවර කරන්නකු යැවීය. රජ්ජුරුවෝ එපවත් අසා සතුටු සිත් ඇතිව සෙනක පණ්ඩිතයන් ගෙන්වා එපවත් උන්ට කියා කිමෙක්ද සබඳ සෙනක පණ්ඩිතයෙනි! පණ්ඩිතයන් ගෙන්නමෝදැයි විචාළහ. ගුණමකුවූ ඒ සෙනකයා දෙවයෙනි! ගෙවල් ආදිය කරවාපීම පමණකින් පණ්ඩිත නම් නොවෙති, යම් කිසි කෙණෙක් ඒ කරවා පියන්නාහ. ඒ ඉතා සවල්පයයි කීය, වෛදේහ රජ්ජුරුවෝ උන්ගේ බස් අසා මෙයින් එක් කාරණයෙකැයි මූවෙන් නොබැණ එම ගමම හිඳ පණ්ඩිතයන් විමසවයි අමාත්‍යයාට කියා යැවූහ.

එබස් අසා ඇමති තෙමේ ඒ නියම්ගම වසන්නේ පණ්ඩිතයන්වහන්සේ පරීක්‍ෂා කෙළේය. මේ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ මත්තෙහි විමසූ පැන යන්හි සංක්‍ෂෙපයෙන් කී බසී.

මංසං ගොණො ගණ්ඨිසුත්තං පුත්තං ගොළ රථෙන ච
දණ්ඩො සීසං අහිචෙව කුක්කුටො මණි විජායනං
ඔදනං වාලුකංචාපි තළාකුය්‍යානමඋ ගද්‍රභො මණි.

එහි පළමුවෙනි මාංශ ප්‍රශ්නය කෙසේද? යත්—

එක් දවසක් බොධිසත්ත්වයන්වහන්සේ කෙළි මඩලට වඩනා වේලෙහි එක් උකුස්සෙක් අංගාතියේ මස් කොළොම්බුවකින් මස් වැදුල්ලක් ගසාගෙණ ආකාශයට පැනනැංගේය. දහසක් කුමාරවරු ඒ දැක මස්වැදුල්ල එලම්හයි උකුස්සා ලුහුබැඳගෙණ දිවන්නාහ. උකුස්සාත් ඇත් මැත් බලා පියාඹන්නේය. කුමාරවරු උඩ බලමින් උකුස්සා පසුපස්සෙහි දිවන්නාහු කැට ගල් ආදියෙහි පැකිල පීඩාවන්නාහ. ඉක්බිති මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ මේ මස් වැදුල්ල එලාපියම්දැයි ඒ කුමාරවරුන් විචාළසේක. එළෙව්ව මැනව ස්වාමීනියි කීහ. එසේ වීනම් බලවයි පණ්ඩිතයන්වහන්සේ උඩ නොබලාම පවනට බඳු වේගයෙන් දිව උකුස්සාගේ

ජායාව මැඩගෙණ අත්ලෙන් අත්ල ගසා මහත්වූ නාද කළසේක. ඒ මහතානන්වහන්සේගේ ආනුභාවයෙන් ඒ නාදය උකුස්සාගේ ලෙන් ඇනී පිටින් නැගෙන්නාසේ වූයේය, ඒ උකුසු භයපත්ව මස්වැදූල්ල හෙළීය. මහ බෝසතානන්වහන්සේ ඔහු ඒ මස් වැදූල්ල හෙළන්නාවූ ජායාව දුක බිමවැටිය නොදෙමැයි කියා අල්වා ගත්සේක. ඒ ආශ්චර්‍ය්‍යය දූක බොහෝදෙන ඔල්වරසන්දුන්නාහ, අත්පොළසන් දුන්නාහ, මහානාද කළහ, ඒ අමාත්‍යයා එපවත් දූත රජ්ජුරුවන්ට මහෞෂධ පණ්ඩිතයෝ මේ උපායෙන් උකුස්සා ගසා ගත් මස් වැදූල්ලක් එවූහ, දෙවයන්වහන්ස! මේ අරුමය දන්නාසේක් වයි කැඩපත් යැවීය, රජ්ජුරුවෝ එපවත් අසා සෙනක පණ්ඩිතයෙනි; කිමෙක්ද මහෞෂධ පණ්ඩිතයන් ගෙන්නමෝදැයි විචාළහ, සෙනක පණ්ඩිතයෝ උන් මේ නුවරට ආතැන් පටන් අපි හිරු දුටු කද්‍යෝපැණියන්සේ නිෂ්ප්‍රභ වම්හ, රජ්ජුරුවෝ අප ඇති බවත් නොදන්නාහ, එසේ හෙයින් උන් මෙයට ගෙණ එනු නුදුන මැනවැයි සිතා තමා ගුණමකු බැවින් දෙවයන් වහන්ස! මෙපමණකින්ම පණ්ඩිත නම් නොවෙත්මය, මේ ඉතාම අල්ප දෙයකැයි කීහ. රජ්ජුරුවෝ මධ්‍යස්ථව එහිම හිඳ විමසන්නේයයි නැවත හසුන් යැවූහ.

දෙවැනිවූ ගොන් ප්‍රශ්නය කෙසේද? යත්—

යවමැදුම්ගම වසන පුරුෂයෙක් වැසිදිය එළාලූකල සීසාමියි අසල් ගමකින් ගොන් ගෙයක් මිලයටගෙණ අවුත් තමාගේ ගෙයිම ලග්ගවා දෙවන දවස් තණ කවන පිණිස තණ බිමට ගෙණ ගොස් ගොණෙකු පිටඉඳ තණ කවමින් විඩාව ගොණු පිටින් බැස ගසක් මුල හිඳ නිදන්නට වන, ඒ ඇසිල්ලෙහි එක්සොරෙක් ගොන්ගෙය ඇරගෙණ නැගී ගියේය. ඒ පුරුෂයා පිබිද ගොස් ගොන්ගෙය නොදූක ඔබමොබ බලා ඇවිදිනේ ගොන් ගෙය ඇරගෙණ යන සොරා දූක වහා දිව ගොස් මාගේ ගොන් කොයි ගෙණයෙයිදූයි ඇසීය. සොරා කියන නැනැත්තේ මාගේ ගොන් මා කැමති තැනකට ගෙණයෙමියි කීය. උන් දෙන්නාගේ කලහය අසා බොහෝදෙන රැස්ව ගියාහ, පණ්ඩිතයන්වහන්සේ උන් දෙන්නා ඔබර කොට ගෙණ ශාලාව දොරකඩින් යන්නවුන්ගේ කලහශබ්දය අසා, දෙන්නාම ගෙන්වා උන් දෙන්නාගේ එන සැටියෙන්ම දූක මේ සොරාය මේ ගොන් හිමි නැනැත්තේමයි දන්නාසේකුදු කුමක් හෙයින් ඔබර කරව්දූයි විචාළසේක. ගොන් ඇති නැනැත්තහු පණ්ඩිතයන්වහන්ස! මම මේ ගෙන් ගෙය අසවල් ගම මෙනම් නැනැත්තහු අතින් මිලදී හැරගෙණ අවුත් රෑ ගෙයි ලග්ගවාලා උදෑසන තණ බිමට තණ කවන්නට ගෙණ ගියෙමි, එතැනදී මාගේ ප්‍රමාදයක් දූකලා මේ තෙමේ ගොන් ගෙය ඇරගෙණ පලා ගියේය. ඒ මම ඔබ බලන්නෙම් ගොන් දෙන්නා බැඳගෙණ යන මේ සොරා දූක ලුහුබැඳ අල්වා ගතිමි, අසවල් ගම ඇත්තෝ මේ ගොන්ගෙය ගත් නියාව දනිතියි කීය. සොරා කියන්නේ මේ මාගේ හදා වඩාගත් ගොන් ගෙයය, මේකා බොරු කියයි කීය. ඉක්බිති පණ්ඩිතයන්වහන්සේ ඔවුන් දෙන්නාගේම බස් අසා මම තොපට යුක්තිය දූහැමින්ම විනිශ්චයකොට දීලමි, මා කී යුක්තියෙහි සිටිව් දූයි විචාරා සිටුම්හයි කී කල්හි බොහෝ දෙනා ගෙන්වා යුක්තිය පසිදිනා බව සුදුසුයයි පලමුකොට සොරා කැඳවාලා තෝ මේ ගොන්ගෙය කුමක් කවාපොවා

පොවා වැඩිදැයි විචාළසේක. සොරා කියන්නේ උළුකැන් පොවා තලමුරුවට හා උඳු කවතලදැයි කීය, ඉක්බිති ගොන් ඇති තැනැත්තහු කැඳවා තෝ කුමක් කවා පොවා වැඩීදැයි විචාළ කල්හි ඒ කියන්නේ ස්වාමීනි මා දුක්පත් තැනැත්තහුට උළුකැන් හා තල ආදිය කොයින්ද? තණම කවතලදැයි කීය. පණ්ඩිතයන්වහන්සේ දෙන්නාගේ බස් අසා සභායෙහි උන්නවුන් ගිවිස්වා පුවඟු කොළ ගෙන්වාගෙණ කොටා පැන් මඩවා ගොණුන්ට පෙවූසේක. ගොණුන් තණම නැඟුහ, පණ්ඩිතයන්වහන්සේ බොහෝ දෙනාට මේ බලවයි පෑ තා සොරෙහිද නොසොරෙහිදැයි විචාළසේක. ඒ තෙමේ සොරෙමියි කීය, එසේවීනම් මෙතැන් පටන් සොරකම් නොකරවයි අවවාද කොට මෙබඳු නො කටයුත්තක් නොකරවයි වදාළසේක. බොධිසත්වයන් වහන්සේගේ පුරුෂයෝ වනාහි ඔහු එතැනින් පිටිපස්සට ගෙණ අතින් පයින් තළා දුර්වල කළහ, ඉක්බිති පණ්ඩිතයන්වහන්සේ ඔහු ගෙන්වා මේ ජන්මයෙහිම මේසා දුඃඛව පැමිණියෙහිය, පරලොව වනාහි නිරයාදියෙහි ඉපිද බොහෝ දුක් අනුභව කරන්නෙහිය, මෙතැන් පටන් සොරකම් නොකරවයි අවවාද කොට පන්සිල් දුන්සේක. අමාත්‍යයා එපවත් අසා තත්වය පෙර පරිද්දෙන් රජ්ජුරුවන්ට කියා යැවීය, රජ්ජුරුවෝ සෙනකයන් විචාරා දෙවයෙනි! ගොන් යුක්ති නම් යම් කිසි කෙණෙක් පසිඳපියති, තවද ඇම්මුන මැනවයි කී කල්හි රජ්ජුරුවෝ මධ්‍යස්ථව නැවත පෙර පරිද්දෙන්ම අමාත්‍යයාට කියා යැවූහ.

අමාත්‍යයා රජ්ජුරුවන්ට කියා යවන නියාවද රජ්ජුරුවෝ සෙනකයන් විචාරණ නියාවද, සෙනකයන් ඒ වලකන නියාවද රජ්ජුරුවෝ අමාත්‍යයාට කියා යවන නියාවද, හැම පැනෙහිම මෙම ලෙසයයි දතයුතු.

තවද තුන්වැනිවූ ගැටහු පලඳනාවේ විනිශ්චය කෙසේද? යත්—

එක් දුප්පත් ගැණියක් නීල පිතාදි නා නා වර්ණ හුයින් ගැට ගසා කරණලද ගැටහු පලඳනාවක් කරින් ගලවා කඩමන්නේ තබා පණ්ඩිතයන් වහන්සේ විසින් කරවනලද පොකුණෙන් නහන්නට වන, අතික් ලඳුරිය එකියක් බලා ඒ පලඳනාව දැක ලොභ උපදවා ඔසවාගෙණ මැනියෙනි! මේ පලඳනාව ඉතා හොබනේය, කවර කෙණකුන් විසින් කරණ ලද්දේද? මමත් මට මෙසේම පලඳනාවක් කෙරෙමි, කරපැලඳ පමණ බලාපියම්දැයි විචාරා වංකසිත් නැති ස්ත්‍රිය විසින් යහපත යෙහෙළනියනි පමණ දැන පියවයි කී කල්හි කර පැලඳ ගෙණ නැගී ගියාය, පලඳනාව ඇති තැනැත්තී දැකලා වහා ගොඩ නැගී කඩ ඇඳගෙණ ලුහුබැඳ ගොස් මාගේ පලඳනාව ඇරගෙණ කොයියේදැයි එකුරුතු පටගත, අනික් තැනැත්තී නොපගේ පලඳනාවක් මම නොගනිමි, මේ මා කරලන පලඳනාවයයි කීය, කලහය අසා බොහෝදෙනා රැස්වූහ. පණ්ඩිතයන්වහන්සේ කුමාරවරුන් හා සමග කෙළනාසේක් ඒ ගැණුන් දෙන්නා ඩබරකොට ශාලා දොරින් යන්නවුන්ගේ කලහ ශබ්දය අසා මේ කුමන අරගලයෙක්දැයි විචාරා දෙන්නාගේ කලහ කාරණා අසා දෙන්නාම ගෙන්වා එන සැටියෙන්ම මෝ සෙරය, මෝ පලඳනාව ඇති තැනැත්තී යයි දැන ඩබර කාරණා විචාරා මගේ යුක්තියෙහි සිටිව්දැයි විචාරා දෙන්නා

එසේය ස්වාමීනි! සිටුම්හයි කී කල්හි පළමුකොට සොර තැනැත්තිය අතින් තී මේ පලඳනාව පලඳිනෙහි කවර සුවඳක් ගැල්වීදැයි විචාළසේක. ඕ මම නිරන්තරයෙන් සබ්බසංහාරක නම් සුවඳක් ගල්වමියි කීව, සබ්බසංහාරක සුවඳ නම් සියලු සුවඳ එක්කොට කරණලද සුවඳය. ඉක්බිති පලඳනාව ඇති තැනැත්තිය විචාළ කල්හි ස්වාමීනි! මා දුක්පත් තැනැත්තියට සබ්බසංහාරක නම් සුවඳ කොයින්ද? නිරන්තරයෙන්ම පුවඟු මලෙහි සුවඳ කවමියි කීව, පණ්ඩිතයන්වහන්සේ පැන් තලියක් ගෙන්වාගෙණ ඒ පලඳනාව පැන් තලියෙහි ලවා ඔසද වටුවකු ගෙන්වා මේ තලියෙහි පැන් සිඹ අසවල් සුවඳයයි දැනැයි වදාළ සේක. ඔසද වටුවා පැන් සිඹහුදු පුවඟු මලෙහි සුවඳ තියාව දැන ගාථාවකින් සබ්බසංහාරක සුවඳෙක් මෙහි කොයින්ද? පුවඟු මලෙහි සුවඳ හමනේය, මේ ලඳුරි බාල ධූර්ත ස්ත්‍රී බොරු කිව මැහැලි තැනැත්තිය කීයේ සැබෑයයි කීය, මහබෝසතාතන්වහන්සේ ඒ කාරණාව බොහෝදෙනාට හඟවා තී සෙරෙහිද නොසෙරෙහිද කියා සෙරතියාව ගිවිස්වූ සේක. එතැන් පටන් මහබෝසතාතන් වහන්සේගේ පණ්ඩිතභාවය බොහෝ දෙනාට ප්‍රසිඬවිය.

සතර වැනිවූ හූ වැටියෙහි විනිශ්චය කෙසේද? යත්

කපුසේනක් රක්නා එක් ස්ත්‍රියක් කපුරක්නී තමාරක්නා සේනෙහි සවස පිපි කපු කඩාගෙණ සකස්කොට කඩා පොළා වලුකොට සිනි හූ කැට කැටි කොට ඒ හූ වැටිය ඉන තබාගෙණ ගමට එන්නී මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ විසින් කරවනලද පොකුණෙන් නහම්යි කඩ ගලවා ගොඩ තබා සඩ මත්තේ හූ වැටිය තබා නහන්නට දියට බට, අනික් ස්ත්‍රියක් හූ වැටිය දැක එහි ලොල් සිත් ඇතිව ඒ අතටගෙණ අහෝ! ඉතා යහපත හූයෙහි සීන් ඇත, නැගෙනියෙනි තොප විසින්ම කරණා ලදදැයි ආශ්වය්‍යීවත්ව බලන්නියක මෙන් ඉන තබාගෙණ නැගී ගියාය, පෙර ගැටහු පලඳනාසෙහි පරිද්දෙන්ම කලහ කොට කොට ශාලාව සම්පයෙන් යන දෙදෙනා ගෙන්වා විචාරා තමන්වහන්සේ කී යුක්තියෙහි සිටුම්හයි කී පසු බොධිසත්වයන් වහන්සේ තී මේ හූ වැටිය කරන්නී කුමක් ඇතුළේ ලා කළාදැයි සොර තැනැත්තිය විචාළසේක. සොර තැනැත්තිය කියන්නී ස්වාමීනි! කපු ඇටක් ඇතුළේ ලා වට කෙළෙමි කීව, ඇගේ බස් අසා හූ වැටිය ඇති තැනැත්තිය අතින් තී කුමක් ඇතුළේ ලා වටකළාදැයි විචාළසේක. ඕ තිඹිරි ඇටක් ඇතුළේ ලා වටකෙළෙමියි කීව, දෙන්නාගේ බස් අසා සභායෙහි උන්නවුන් ගිවිස්වා හූ වැටිය ගලවා ඇතුළේ තුබූ තිඹිරි ඇටය දැක ඈ සෙර බව ගිවිසවූසේක. බොහෝදෙනා යුක්තිය පසුන් නියාවට තුටූ පහටුව දහස් ගණන් සාධුකාර පැවැත්වූහ.

පස් වැනිවූ පුත්‍ර ප්‍රශ්නය කෙසේද? යත්—

එක් ස්ත්‍රියක් පුතකු වඩා ගෙණ පණ්ඩිතයන් වහන්සේගේ පොකුණට ගොස් ආදිකොට පුතු නහවා තමාගේ කඩමත්තේ හිඳුවා

තට බට ඇසිල්ලෙහි යකින්නියක් ඇගේ පුතු දක කනු කැමැතිව ගෑණු වෙසක් ගෙණ දරුවන් සමීපයට අවුත් යෙහෙළිය! මේ දරුවෝ ඉතා හොබනාහ, මූ තොපගේ දරුකෙණෙක්දැයි විචාරා එසේය යෙහෙළියතියි කීකල්හි ඕ දරුවන් ගෙණ මදක් කිරි පොවාලා වඩාගෙණ පලාගියාය මෑනියෝ තමන්ගේ දරුවන් ඇරගෙණ යන්නීය දක දිවගෙණ ගොස් මාගේ පුතු කොයි ගෙණයේදැයි අල්වාගත. යකින්නී කියන්නී තී කොයින් ලත් පුතෙක්ද? මූමාගේ පුතනුවෝයයි භයක් නැතිව කිව ඔව්හුදෙන්නා කලහ කෙරෙමින් ශාලාව දොරකඩින් යන්නාහ. මහබෝසතානන්වහන්සේ කලහ ශබ්දය අසා දෙන්නාම ගෙන්වා මේ කුමන ඩබරදැයි අසා ඇස් නොමරණ බැවින්ද ඔලිදැට දෙකක්සේ රත්ව තිබෙන බැවින්ද මේ යකින්නයයි දන මා කී යුක්තියක සිටිවුදැයි විචාරා එසේය සිටුම්හයි කීකල්හි බිම හිරක් අඳවා හිරමැද දරුවන් හොවා යකින්න ලවා දෑත හා මෑනියන් ලවා දෙපය ගන්වා දෙන්නා ඇදගණු වයි ඇදගත් එකකුටය පුතනුවෝයයි වදාළසේක. දෙන්නාම දරුවන් ඇද ගත්හ. දරුවෝ දෙන්නා විසින් අදිනා ලබන්නාහු දුකට පැමිණියහ. මෑනියෝ ලය පැලුනු කලක්මෙන් ශොකයට පැමිණ දරුවන් කෙරෙහි වැදුවන් ගේ ලය මොළොක්ද? නොහොත් නොවැදුවන්ගේ ලය මොළොක්දැයි අසා බොහෝ දෙනා පණ්ඩිතයන් වහන්ස! වැදුවන්ගේ ලය වේද මොළොක් වන්නේයයි කීවාහුය. ඒ අසා පණ්ඩිතයන්වහන්සේ කිමෙක්ද? දූන් දරුවන් වඩාගෙණ සිටි තැනැත්තී මෑනියනැයි වැටහේදැයි හැමදෙනාම විචාළසේක. හැමදෙනම දරුවන් හැර සිටි තැනැත්තෝ වෙත්ද පණ්ඩිතයන්වහන්ස! මෑනියෝ යයි කීහ. කිමෙක්ද? තෙපි හැම මේ දරුසෙර දනුදැයි විචාළ සේක. හැමදෙනම නොදනුම්හ පණ්ඩිතයන්වහන්සැයි කීකල්හි එම්බා! මෝ යකින්නක, දරුවන් කන පිණිස ගතැයි වදාළසේක. කෙසේදත් සේක්ද? පණ්ඩිතයන් වහන්සැයි කීහ. ඇසිපිය නොමරණ බැවින්ද, ඇස්දෙක රත් බැවින්ද, ඡායාවක් නැති බැවින්ද, කිසිකෙණෙකුන් කෙරෙහි සැකයක් නැති බැවින්ද, දයාවක් නැති බැවින්දැයි මෙතෙක් කාරණයෙනැයි වදාළසේක. ඉක්බිති මෙලෙස වදරා තී කවරෙක්හිදැයි යකින්න විචාළසේක. යකින්න කිම් සවාමීනි! කිව කුමක් පිණිස මේ කුමරුවා ගත්තෙහිදැයි විචාළසේක. කන පිණිසය සවාමීනි කිව නුවණ නැත්තිය පෙරත් තී අකුසල් කොට යකින්නව උපන්නෙහිවේද? දූන් වනාහි නැවතත් අකුසල් කරන්නෙහිවේද? අහහ නුවණ නැත්තිය කියා අවවාදකොට ඉක්බිති ඈ පන්සිල්හි පිහිටුවා යැවූසේක. කුමරුවාගේ මෑනියෝ බොහෝකලක් ජීවත්වුව මැනව සවාමීනියි මහබෝසතානන් වහන්සේට ස්තුති කොට පුතනුවන් වඩාගෙණ නැගී ගියහ.

සවැනිවූ කාලගොළ ප්‍රශ්නය කෙසේද? යත්-මිටි හෙයින් ගොළයයි කියාද කලුපැ ඇතිහෙයින් කාලයයි කියාද (කාලගොළයයි) ලබනලද නම්වූ එක් මිනිහෙක් වනාහී සත් අවුරුද්දක් කඹුට අඹුවක ලද, ඕ නමින් දික්තලා නම. ඒ පුරුෂයා එක් දවසක් තමාගේ අඹුව බණවා සොඳුර! දෙමවුපියන් බලාපියම්හ. කැවුම්පෙවුම් ඉදිකොටලවයි කියා ඈ විසින් මවුපියන්ගෙන් කායී කිම්ද? නොබණැයි ප්‍රතික්ෂෙපකරණලද්දේ තුන්වර

දක්වා කියා තුන්වැනි වාරයෙහි ගිවිස්වා කැවුම් පිසවාගෙණ පලාබත් ආදී මාගෝපකරණද කැවුම් ආදී දෙමවුපියන්ට ගෙණයායුතු පඬුරුද ඇරගෙණ ඒ අඹුව හා සමග මගට පිළිපන්නේ අතරමග පැතිර දියයන ඔයක් දිටී. නොගැඹුරුවත් ගඟ දියට ඔහුදෙදෙනාම බානාහ. එසේහෙයින් ඒ ගඟින් එතරව යාගත නොහෙන්නාහු ගංතෙර සිටියාහ. එවේලෙහි දීක්පිට්ඨියා යන නමක් ඇති එක් දුක්පත් පුරුෂයෙක් ඒ ගංතෙර ඇවිදිනේ උන් දෙන්නා සිටි තැනට පැමිණියේය. ඉක්බිති ඔහු දැක යහලු මේ ගඟ ගැඹුරු හෝ නැද්දැයි පිළිවිස්සහ. ඒ තෙමේ ඔව්හු දියට බන්නාහයි දැන මේ ඉතා ගැඹුරුය කිඹුලුන් හා දැතිමුවර ආදීවූ චණ්ඩ මත්ස්‍යයන්ගෙන් ගහනයයි කීය. එබස් අසා සබඳ! තෙපි කෙසේ එතරවව් දැයි විචාළහ. මේ ගඟ කිඹුලුන්හා දැතිමුවර ආදීවූ චණ්ඩ අය හා අප හා පුරුදුකම් ඇත. එහෙයින් අප නොකන්නාහයි කීහ. එසේවීනම් සබඳ! අපත් එතරකරවයි කීවුය. ඒ පුරුෂයාත් යහපතැයි ගිවිස්සේය. ඔහු ගිවිසිකල දෙමහල්ලෝ කන බොනදෑ ඔහට දුන්හ. ඒ පුරුෂයා කරණලද ආහාර කෘත්‍යය ඇත්තේ සබඳ කවුරුන් පළමුකොට ගෙණයෙම්දැයිවිචාළේය. එබස් අසා කාලගොළයා තොපගේබෑදෑනියන්දෑ පළමුකොට ගෙණයව, මා පසුව ගෙණයවයි කීය. ඒ පුරුෂයාත් යහපතැයි දීක්තල කර හිඳුවාගෙණ සියලුම මාගෝපකරණත් කැවුමුත් අරගෙණ ගඟට බැස මදක් තැන් ගොස් කෙළිල්ලෙන් බැස හිඳ හිඳ ගියේය. කාලගොළයා ගංතෙර සිටියේ මේ ඉතා ගැඹුරුය, මෙසේ උස්තැනැත්තවුට පවා මෙතෙක් දිය මාරුනොවන්නේය මානොපොවන්නේයයි සිතීය දීක්පිට්ඨියා දීක්තලගඟමැදට ගෙණගොස්සොඳුර! මම තොප රක්ෂාකෙරෙමි. හැඳපැලඳ දෙවඟනක්සේ කැමති පරිද්දෙන් සැරසී දැසිදස්සන්විසින් පිරිවරණ ලදුව ඇවිදුව තොපට මේ අඟුටු මිට්ටියා කුමන පොෂ්‍යයක් නමා දීලියහෙන්නේද? මාගේ බස් ගිවිසුවයි කීය. ඕතොමෝ දීක්පිට්ඨියා කී බස් අසාම සත්අවුරුද්දක් තමා නිසා ගෙයි කඹුටලත් තමාගේ සැමියාකෙරෙහි ස්නෙහසිඳ ඇසිල්ලෙම එකී දීක්පිට්ඨියා කෙරෙහි පිළිබඳ සිත් ඇතිව සවාමීනි! ඉදින් මා නොහරින්නෙහිවීනම් සන්තුෂ්ටවව කාලගොළයා හැරපියා තෝ එසේ සිටුවයි කියා ඔහු බලබලා සිටියදීම කැවුම් කකා යන්නට වන්හ. කාලගොළයාත් උන් දෙන්නාගේ ක්‍රියාව දැක මූන් දෙන්නා එක්ව ගෙණ මා ඇරපියා යෙති. ඇත්මැත් බලා දිවන්නේ මදක් දියට බැස හයින් ගොඩ නැගී නැවත උන්දෙන්නා කෙරෙහි කෝපයෙන් මියෙම්වා රුකෙම්වායි ගඟටපැන දියටබටුයේය. දිය මඳනියාව දැන ගඟින් එතරව දීක්පිට්ඨියා කරා පැමිණ කොලදුෂ්ටවූ සොර! මාගේ අඹුවන් කොයිගෙණයේදැයි විචාළේය. දීක්පිට්ඨියාද කොල අඟුටුමිට්ටිය! තට අඹුවෝ කොයින්ද? මේ මාගේ අඹුවයයි කියා කාලගොළයා කර අල්වා දමාලීය. කාලගොළයා ඒ දීක්තල අත අල්වාගෙණ තී නොසිට කොයියේද? සත් අවුරුද්දක් ගෙයි කඹුටලත් මාගේ අඹුවවේදැයි කියා දීක්පිට්ඨියා හා සමග කලහ කෙරෙමින් ශාලාව සමීපයෙන් යන්නේය. බොහෝදෙන කලහ ශබ්දය අසා රුස්වූහ. මහබෝසතානන් වහන්සේ මේ කුමන අරගලයෙක්දැයි උන්දෙන්නාම ගෙන්වා දෙන්න ගෙන්ම ඔවුනොවුන් කියන බස් අසා මා කී යුක්තියෙක සිටිවුදැයි කියා සිටුම් හයි කීකල්හි පළමුකොට දීක්පිට්ඨියා බණවා තෝ කිනම්දැයි විචාළසේක, දීක් පිට්ඨියා තම සවාමීනියි කීය. තාගේ අඹුවන්ගේ නම කිම්දැයි විචාළසේක, ඇගේ නම නොදන්නේ අනික් නමක් කීය. තාගේ මැතියෝ පියානෝ

කිතම්මුදූයි යන්නා මේ මේ නමැයි කීය. තාගේ අඹුවන්ගේ මැතියෝ පියාතෝ කිතම්මුදූයි විචාළසේක. ඒ නොදූත අනික්තමක් කීය. ඉක්බිත්තෙන් ඔහුගේ බස් සභායෙහි උත්තවුත් ගිවිස්වා ඔහු එතැනින් පිටත්කරවා කාලගොළයා ගෙණ පෙර පරිද්දෙන්ම හැමදෙනාගේම නම් විචාළසේක. ඒ වූ පරිද්දෙන්ම දන්නේ නොවරදවාම කීය. ඔහු එතැනින් පිටත් කරවා දික්තලගෙන්වා තී කිතම් දූයි විචාළසේක. ඕ මම් සවාමිනි! දික්තල නම් කිව. තිගේ සැමියා කිතම්දූයි විචාළසේක. ඕ සොරසැමියාගේ නම් නොදන්නී අනික් නමක් කිව. තිගේ මැතියෝ පියානෝ කිතම්මුදූයි විචාළසේක. සවාමිනි! අසවල් නම්මුයයි කිව. තිගේ සැමියා මවුපිය දෙන්නා කිතම්මුදූයි විචාළසේක. ඕ නන්දෙඩන්තියක මෙන් අනිකක් කිව මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ දික්පිටියා හා කාලගොළයා දෙන්නා ගෙන්වාගෙණ මැගේ බස් හා දික්පිටියාගේ බස් සමද? කාලගොළයාගේ බස් සමදූයි විචාළසේක. හැමදෙනම පණ්ඩිතයන් වහන්ස! කාලගොළයාගේ බස් හා සමයයි කීහ. ඉක්බිති මේ කාලගොළයා මැගේ සැමියාය, දික්පිටියා සොරසැමියායයි කියා ඔහු විචාරා සොරසැමියා තියාව ගිවිස්වූසේක.

සත්වැනි රථ ප්‍රශ්නය කෙසේද? යත්-එක් පුරුෂයෙක් රථයක ඉඳ මුහුණ සෝදන පිණිස නික්මුනේය. ඒ ඇසිල්ලෙහි සක් දෙව් මහරජානෝ මනුෂ්‍යලොකය බලන්නාහු මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ දූක මේ මහෞෂධ බුඩාංකුරයාගේ ප්‍රඥානුභාවය ප්‍රකාශ කෙරෙමියි සිතා මිනිස්වෙසින් අවුත් පුරුෂයා පදිමින් සිටි රථයෙහි පසුකඩ අල්ලාගෙණ යන්නාහුය රථයෙහි උන් පුරුෂයාකුඩෙනි! කුමන කටයුත්තක් නිසා අවුදූයි විචාරා තුඹදූ සමීපයෙහි සිටිනා නිසා ආමියි කීකල්හි යහපතැයි ගිවිස රථයෙන් බැස ශරීර කෘත්‍යය පිණිස ගියේය. ඒක්ෂණයෙහි ශක්‍රයෝ රථයට පැනනැගී වහවනා රථය පදනාහ. රථය ඇතිපුරුෂයා ශරීරකෘත්‍යයකොට නික්මුණේ රථය හැරගෙණ යන්නාවූ සක්දෙව් රජහු දූකායුහුව ගොස් සිටුව සිටුව මාගේ රථය කොයි ගෙණයේදූයි කියා තොපගේ රථය අනිකක් වන්නේය. මේ වනාහි මාගේ රථය වන්නේයයි කීකල්හි ඔහු හා සමග කලහ කෙරෙමින් ශාලාව දොරකඩට පැමිණියේය. පණ්ඩිතයන්වහන්සේ මේ කුමක්දූයි බැණ එන්නාවූ දෙන්නාම දූක කිසි භයක් නැති බැවින්ද ඇස්නොමරණ බැවින්ද මේ ශක්‍රයාය, මේ රථසවාමියායයි දන්සේක. එසේවුවද කලහකාරණා විචාරාමාගේ යුක්තියෙක සිටිව්දූයි විචාරා සිටුම්හයි කී කල්හි මම රථය පදවම්: තොප දෙන්නාම රථය පස්සෙන් ගණුව රථය ඇති තැනැත්තේ නොහරන්නේය. අනික් තැනැත්තේ හරණේයයි කියා තමන්ගේ පුරුෂයකුට රථය පදුවයි වදාළසේක. ඒ යුහුව රථය පදනට වන ඔව්හු දෙන්නන් රථය පස්සෙන් අල්ලාගෙණ යන්නාහ. රථ හිමි තැනැත්තේ මඳ තැනක් ගොස් රථය පස්සෙන් දිවිය නොහෙන්නේය. රථය හැරපියා සිටියේය. ශක්‍රයා රථය හා සමග දිවන්නේමය. පණ්ඩිතයන්වහන්සේ රථය පැදීම් නවත්වා මිනිසුන්ට මේ පුරුෂයා මඳක් ගොස් රථය හැරපියා සිටියේය. මේ වනාහි රථය හා සමග දිව රථය හා සමගම වැළැක්කේය. මොහුගේ ශරීරයෙහි ඩා බින්දුවක් පමණකුත් නැත. ඇනීමකුත් නැත්තේය. භයකුත් නැත්තේය. නොමරණලද ඇස් ඇත්තේය. මේ තෙමේ

සක්දෙව් රජයයි වදාළසේක. ඉක්බිත්තෙන් ඔබට තෝ දිව්‍ය රාජයෙහිදැයි විචාරා එසේයයි කීකල්හි කුමක් නිසා මේ මනුෂ්‍ය ලොකයට අවුදැයි විචාරා නුඹවහන්සේගේ නුවණ ප්‍රකාශකිරීම පිණිසය පණ්ඩිතයන්වහන්සැයි කීකල්හි එසේවීනම් මෙබන්දක් මතු නොකරවයි වදාරා අවවාද කළසේක. සක්දෙව්රජාතෝත් තමන්ගේ ශක්‍රභාවය දක්වමින් ආකාශයෙහි සිට නුඹ වහන්සේ විසින් රථ යුක්තිය යහපත්කොට පසිඳිනා ලදැයි පණ්ඩිතයන් වහන්සේට ස්තුතිකොට, තමන්වසන දිව්‍යලොකයටම ගියාහුය එදවස් වේදේහ රජ්ජුරුවන් විසින් පණ්ඩිතයන්ගේ නුවණ පරීක්ෂාකරවයි කියා නැගෙනහිර යවමැදුම්ගම සිටුවනලද ඒ ඇමති තෙමේ රජ්ජුරුවන් සමීපයට ගොස් දෙවයන්වහන්ස! මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ විසින් රථ යුක්තියෙක් මෙසේ පසිඳනලද, ඒ පණ්ඩිතයන් විසින් සක්දෙව්රජ පවා පරදවනලද, කුමක් හෙයින් පුරුෂවිශෙෂය නොදක්නාසේක්ද? දෙවයන්වහන්සැයි කීය. රජ්ජුරුවෝ සෙනක පණ්ඩිතයන් කිමෙක්ද පණ්තයෙනි! මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වා ගණුමෝද්දැයි විචාළහ. දෙවයන්වහන්ස! මෙපමණකින් පණ්ඩිත නම් නොවන්නාහ. තවත් බැලුව මැනවැයි පරීක්ෂාකොට පියා දන්නමෝ වේදැයි කීහ.

අටවැනිවූ කිහිරි දණ්ඩෙන් විමසූ ප්‍රශ්නය කෙසේද? යත්-ඉක්බිත්තෙන් එක් දවසක් පණ්ඩිතයන් විමසම්හයි කිහිරි දණ්ඩක් ගෙන්වා, එයින් වියතක් පමණගෙණ තන්තකාරයෙකුගෙන්නා සකස්කොට ලියවා නැගෙනහිරි යවමැදුම්ගම වසන පුරුෂයෝ නුවණැත්තෝල මේ කිහිරි දණ්ඩෙහි මේ අගය මේ මුලයයි දනිත්වයි, ඉදින් නොනිත්නම් දහසක් දඩයයි කියා යවූහ. ගම වැස්සෝ රැස්ව කිහිරි දණ්ඩෙහි අග මුල දැනගත නොහෙන්නාහු සිරිවඩ්ඩන සිටානන්ට කියසේත් මහෞෂධ පණ්ඩිතයෝ දැනගන්නාහ. උන් ගෙන්වා ගෙණ විචාරවයි කීවෝය. සිටානෝ ඒ පණ්ඩිතයන් කෙළිමඩලෙන් ගෙන්වා එපවත් කියා පුත! අපි හැම කිහිරි දණ්ඩෙහි අගමුල දැනගන්නට නොපොහොසතුම්හ. කිමෙක්ද? පුත තෙපි පොහොසතුදැයි විචාළහ. පියානන් කීබස් අසා පණ්ඩිතයන්වහන්සේ රජ්ජුරුවන්ට මේ කිහිරි දණ්ඩෙහි අගින් වේවයි මුලින් වේවයි ප්‍රයොජනයෙක් නැත. මා විමසනු පිණිස එවනලද්දේ වන්නේයයි සිතා ගෙණෙව කුඩාවරුනි! මම පොහොසත්මියි ගෙන්වාගෙණ කිහිරි දණ්ඩ අතින් අල්වාගෙණම මේ අගය මේ මුලයයි දැනත් බොහෝදෙන සිත් ගන්නා පිණිස පැන් තලියක් ගෙන්වා කිහිරි දණ්ඩ මැදින් හුලනුවකින් බැඳ හුලනුව අල්වාගෙණ කිහිරි දණ්ඩ දියපිට තබාලූසේක. මුල බරබැවින් පළමු කොට දියේ ගැලීන ඉක්බිත්තෙන් ගසෙහි මුල බරවේද? නොහොත් අග බරවේදැයි බොහෝදෙන විචාළසේක. හැමදෙනම පණ්ඩිතයන්වහන්ස මුල බරවේදැයි කීහ. එසේවීනම් කිහිරිදණ්ඩෙහි පළමුකොට ගැලුනු අත මුල යයි මේ සලකුණෙන් අගත් මුලත් වදාළසේක, ගම්වැස්සොද මේ අගය මේ මුලයයි රජ්ජුරුවන්ට කියා යැවූහ. රජ්ජුරුවෝ සතුටුව මේ අග මුල කවරෙක් දන්නේවේදැයි විචාරා සිරිවඩ්ඩන සිටානන් පුතනුවෝ, මහෞෂධ පණ්ඩිතයෝ යයි අසා සතුටුව කිමෙක්ද සෙනක මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වමෝද්දැයි විචාළහ. ඉවසුව මැනව දෙවයන්වහන්ස! අනික් උපායකිනුත් විමසම්හයි නැවතූහ.

නවවැනිවූ ගැණුඉසකින් හා පිරිමි ඉසකින් විමසූ ප්‍රශ්නය කෙසේ ද? යත්,

ඉක්බිත්තෙත් එක් දවසක් ගැණියකගේද, පිරිමියකුගේද හිස් දෙකක් ගෙන්වා මේ ගැණුහිසය මේ පිරිමිහිසයයි දනිත්වයි නොදන්නාහුනම් දහසක් දඩයයි නැගෙනහිරි යවමැදුම් ගම් වැස්සන්ට යැවූහ, ගම්වැස්සෝ විභාග නොදන්නාහු හිස්දෙක ගෙණ බෝසතාණන්වහන්සේ විචාළහ. උන්වහන් සේ හිස්දෙක දුටුලාම මේ ගැණුහිසය. මේ පිරිමිහිසයයි දත්සේක, පිරිමි හිස මැස්ම වක්නොව ඉදිවයන්නේය, ගැණු හිස මැස්ම වක්වන්නේය, කරකැවී යන්නේය. බෝසතාණන්වහන්සේ මේ ලකුණෙන් මේ ගැණු හිසය මේ පිරිමි හිසයයි ගම්වැස්සන්ට වදාළසේක. ගම්වැස්සෝ රජ්ජුරුවන්ට ඉස් දෙක තෝරා යවූහ, රජ්ජුරුවෝ විචාළතියාවද සෙනකපණ්ඩිතයන් වැලකූ තියාවද පෙරසේ මැයි.

දසවැනි වූ සර්පයින් දෙදෙනාගෙන් විමසූ ප්‍රශ්නය කෙසේ ද? යත්,

නැවත එක් දවසක් නයකු හා සැපින්නක ගෙන්වාගෙණ මේ සර්පයාය මෝ සැපින්නයයි දනිත්වායි නොදන්නාහු නම් දහසක් දඩයයි නැගෙනහිරි යවමැදුම් ගම් වැස්සන්ට යවූහ. ගම් වැස්සෝ නොදන්නාහු පණ්ඩිතයන් වහන්සේ දුටුලාම දැනගත්සේක. සර්පයාගේ නගුට මහත් වන්නේය, සැපින්නගේ නටුව සිහින් වන්නේය, සර්පයාගේ හිස මහත් වන්නේය, සැපින්නගේ හිස දික්වන්නේය. සර්පයාගේ ඇස් වටවන්නේය, මහත්වන් නේය. සැපින්නගේ ඇස් දික්ව කුඩා වන්නේය. සර්පයාගේ පෙණය හාත් පසින් සම්පූර්ණව තිබෙන්නේය, සැපින්නගේ පෙණය එක දිශාවකින් සැහැ පූවාසේ අර්ධව තිබෙන්නේහ, මේ සලකුණෙන් මේ සර්පයාය, මෝ සැපින්න වදාළසේක. සෙස්ස යට කියනලද්දාවූ ක්‍රමය මැයි.

එකොළොස්වැනිවූ කුකුලාගෙන් විමසූ ප්‍රශ්නය කෙසේ ද? යත්,

ඉක්බිත්තෙත් එක් දවසක් නැගෙනහිරි යවමැදුම් ගම් වැස්සෝ සර්වාඞ්ගයෙන් ධවලවූ, පය අං ඇති ඉස මොල්ලියක් ඇති කාලත්‍රය නොයික් මවා හඬන්නාවූ ගොණකු එවන්වයි ඉදින් නොඑවූ නම් දහසක් දඩයයි කියා යවූහ. ඒ ගම්වැස්සෝ ප්‍රශ්නයෙහි විභාග නොදන්නාහු පණ්ඩිතයන් වහන් සේ විචාළහ. පණ්ඩිතයන්වහන්සේ රජ්ජුරුවෝ තොප අතින් හැළිකුකුළකු ගෙන්වතියි වදාළසේක, කුකුළා වනාහි පය පොරකටු ඇති බැවින් පය අං ඇත්තේ නම; ඉස මල් ඇතිබැවින් ඉසාමොල්ලියක් ඇත්තේ නම, හ්‍රස්ව දීර්ඝ ප්ලුත යන තුන් කාලයට උච්චාරණ ශබ්දකොට හඬ නගන හෙයින් කාලත්‍රය නොයික්මවා හඬන්නේ නම්, එසේහෙයින් මෙබඳු කුකුළකු යවවයයි වදාළ සේක, ගම්වැස්සෝද එබඳු කුකුළකු යවූහ,

දොළොස්වැනිවූ මැණිකකින් විමසූ ප්‍රශ්නය කෙසේ ද? යත්,

ශක්‍රදෙවේන්ද්‍රයන් විසින් කුස රජ්ජුරුවන්ට දුන් මැණික තෙමේ අටතැනකින් වක්වූයේය, ඒ අටවක් මැණිකෙහි ශක්‍රයන් ඇවුනු පුරාතන හුය දිරාගොස් කැඩීගියේය, පරණහුය හැරපියා අලුත් හුයක් අවුනාලන්නට කිසිවෙක් නොපොහොසත්ය, එක් දවසක් මේ මැණිකෙහි පරණ දිරාගිය හුය ඇරපියා අලුත් ලනුවක් ලවත්වයි කියා නැගෙනහිරි යවමැදුම් ගම්වැස්සනට

වෙදෙහ රජ්ජුරුවෝ යවූහ, ගම්වැස්සෝ පරණහුය අරිත්තටත් අලුත් හුය ලත්නටත් නොහැක්කාහු තමන්ට නොපිළිවන් බව මහෞෂධ පණ්ඩිතයන් වහන්සේට කීවාහුය, පණ්ඩිතයන්වහන්සේ තෙපි නොසිතව මී ටිකක් ගෙන්වා ගණුවයි කියා ගෙන්වාගෙණ මැණිකෙහි දෙකෙලවර සිදුරෙහි මී බිංදු ගල්වා පලස් හුයින් ලනුවක් අඹරා ලනු අග මීයෙහි ගාලා මදක් මැණිකේ සිදුරට වද්දලා කුහුඹුවන් නික්මෙන බිලයෙක තබාලූසේක, කුහුඹුවෝ මීයෙහි ගඳින් බිලයෙන් නික්ම මැණිකෙහි දිරාගිය පරණහුය කාගෙණ පලස්හු අග ඩැගෙණ යටින් අදනාහු අනික් ඇලයෙන් පිටත්කොට පීහ. පණ්ඩිතයන් වහන්සේ මැණිකෙහි ලනුව ඇවිණීගිය බැව් දැනගෙණ රජ්ජුරුවන්ට දෙවයි කියා ගම්වැස්සන්ට මැණික දුන්සේක, ගම්වැස්සෝ රජ්ජුරුවන්ට යවූහ, රජ්ජුරුවෝ ලනුව ඇවුනු උපාය අසා සතුටුවූහ.

තෙලෙස් වැනි වූ විජායන ප්‍රශ්නකෙසේ ද? යත්,

එක්දවසක් වනාහි රජ්ජුරුවන්ගේ මගුල් ගොණු උදු බොහෝ කවා බඩ මහත්කොට හම් සකස්කොට සම්ඹගයෙහි තෙල් ගල්වා කසා නාවා නැගෙනහිරි යවමැදුම්ගම ඇත්තන්ට “තොපි නුවණැත්තෝල මේ රජ්ජුරු වන්ගේ මගුල්ගොණාය පිහිටි දරුගැබ් ඇත්තේය, මොහු වදවාපියා වස්සා සහිතකොට එවවූ, එසේ නොඑව්වොත් දහසක් දඩයයි කියා යවූහ. ගම්වැස් සෝ මේ ගොණු දරුවන් වදන්නට නොපිළිවන, කුමක් කරමෝද්‍ෙහෝයි පණ්ඩිතයන්වහන්සේ විචාළහ, උන්වහන්සේ සමාන පැනයකින් විසඳිය යුතුයයි සලකා රජ්ජුරුවන් හා සමග කියන්නට එක් බුහුටි පුරුෂයෙක් කැඳ වූහ, ඉක්බින්තෙන් මහබෝසතාණන්වහන්සේ එව, පින්වත් පුරුෂය! තෝ තාගේ ඉසකේ පිටමැද හෙලාගෙණ නොයෙක් පරිද්දෙන් මහවිලාප කියා හඬ හඬා රජගෙයි වාසලට යා සෙස්සවුන් විචාරණලදුයෙහි කිසිවක් නොකියා මහ රජ්ජුරුවන් විසින් ගෙන්වා හඬන කාරනා විචාරණලද්දෙහි දෙවයන් වහන්ස! මපියානෝ වදාගනනොහී අදට විලිපහරන්නේ සද්දවසය, මට පිළි සරණ වුවමැනව, වදන උපායෙක් වදාළමැනවයි කියා රජ්ජුරුවන් විසින් කිමෙක්ද? තා නන්දෙඩයිද? මේ කාරණයෙක් නොවෙයි පිරිමින් වදන්නාහු නැතැයි කීකල්හි දෙවයන්වහන්ස! එසේවීනම් නැගෙනහිරි යවමැදුම් ගම් වැස්සෝ කෙසේ මගුල්ගොණා වදවද්දයි විචාරවයි වදාළසේක, ඒ පුරුෂයාත් මහබෝසතාතන් වදාළ වචනය පිළිගෙණ වදාළ පරිද්දෙන්ම කෙළේය, රජ් ජුරුවෝ සමාන ප්‍රශ්නය කාවිසින් සිතනලදදැයි විචාරා මහෞෂධ පණ්ඩිතයන් විසිනැයි අසා සතුටුවූහ.

තුදුස්වැනි වූ පැසිබතින් විමසූ ප්‍රශ්නය කෙසේ ද? යත්,

එක්දවසක් පණ්ඩිතයන් විමසම්හයි කියා නැගෙනහිර යවමැදුම් ගම් වැස්සෝ අපට අටකාරණයකින් සමන්විතවූ පැසිබතක් පිස එවන්වයි පැසිබත කියන්නේ මේ අටකාරණයයි සාලිනුත් නොපිසුවමැනව, දියෙනුත් නොපිසුව මැනව, සැලියෙනුත් නොපිසුව මැනව, ගින්නෙනුත් නොපිසුව මැනව, දර උදුනලාත් නොපිසුව මැනව, මෙසේවූ පැසිබත ගැණියෙක අතත් නොඑවූව මැනව, පිරිමියෙකු අතත් නොඑවූව මැනව, මගෙකත් නොඑවූව මැනව, මේ අටකාරණයෙන් යුක්ත පැසිබත නොඑවුවහොත් දහසක් දඩයයි කියා යවූහ,

උන්වහන්සේ නොසිතවයි කියා නොසාල්නම් සුන්සාල් ගෙණ, නොදිය නම් පිනිදියගෙණ නොසැලියනම් අනික් බඳනක්ගෙණ නොඋදුනනම් අලුත් කණු ගසා නොගිනිනම් පියවිගිනි හැර දණ්ඩක්හෙලූ ගිනිගෙණ, නොදර නම් පරඬලාගෙණ, පැසිබත පිසවා අලුත් බඳනක ලා අස් ඔබා නොගැණු නොපිරිමි යකු නම් නපුංසකයෙකු ඉස තබාලා නොමගින් නම් මාවත පියා පිය කසරකින් රජ්ජුරුවන්ට යවයි කීසේක. රජ්ජුරුවෝ ප්‍රශ්නය කා විසින් විසඳනාලද දැයි විචාරා මහෞෂධ පණ්ඩිතයන් විසිනැයි අසා සතුටුවූහ.

පසළොස්වැනි වූ වැලියොතින් විමසූ ප්‍රශ්නය කෙසේ ද? යත්,

එක්දවසක් පණ්ඩිතයන් වහන්සේ විමසනු පිණිස, නැගෙනහිරි යව මැදුම් ගම වැස්සන්ට අස්නක් යවූහ. ඒ කෙසේවූ අස්නක්ද? යත්—රජ්ජුරුවෝ ඔච්ල්ලෙහි කෙළනා කැමැත්තෝය, පරණ වැලියොත කැඩීගියේය. එක් වැලියොතක් අඹරා එවත්වයි, නොඑවූ නම් දහසක් දඩයයි කියා යවූහ. ඒ අර්ථය නොදුත පණ්ඩිතයන්වහන්සේ විචාළහ. පණ්ඩිතයන්වහන්සේ මේ පැනයත් සමාන පැනයකින්ම විසඳිය යුතුයයි සිතා ගම්වැස්සෙනි! නොසිත වයි අස්වසා කීමෙහි බිණීමෙහි දක්ෂවූ පුරුෂයන් දෙතුන්දෙනෙකු බණවා යව ගොස් රජ්ජුරුවන්ට කියව දෙවයන්වහන්ස! ගම්වැස්සෝ ඒ වැලියොතෙහි සීන්වේවයි දළවේවයි පමණ නොදන්නාහ. පරණ වැලියොතින් වියතක් පමණ රැණ මාල්ලක් එව්වමැනව. ඒ වැලිරැණමාල්ල බලා ඊ සීන් දළ පම ණීන් වැලියොතක් අඹරන්නාහයි කියව, ඉදින් නොපට රජ්ජුරුවෝ අපගේ ගෙයි වැලියොතක් නම් කිසිකලෙකත් නොවූ විරූයයි කියත් නම් එසේ කී රජ්ජුරුවන්ට වැලි දෙවයන්වහන්ස! ඉදින් එසේවීනම් නැගෙනහිරි යව මැදුම් ගම්වැස්සෝ කෙසේ වැලියොතක් අඹරා එවද්දැයි කීයාලව''යි යවූසේක. ඒ පුරුෂයෝ මහබෝසතානන් වහන්සේ වදාළ ලෙසම කළහ. රජ්ජුරුවෝද ඒ අසා මේ සමාන පැනය කා විසින් සිතනලදදැයි විචාරා මහෞෂධ පණ්ඩිත යන් වහන්සේ විසිනැයි අසා සතුටුවූහ.

සොළොස්වැනි වූ පොකුණකින් විමසූ තටාක ප්‍රශ්නය කෙසේ ද? යත්,

එක්දවසක් රජ්ජුරුවෝ දියකෙළිනා කැමැත්තෝය. රක්ත, නීල ශ්වේතාදී පස්පියුමෙන් ගැවසීගත් පොකුණක් එවත්වයි එසේ නොඑවූ නම් දහසක් දඩය'යි නැගෙනහිරි යවමැදු ගම්වැස්සන්ට කියා යවූහ. ගම්වැස් සෝ එ අර්ථය නොදුත පණ්ඩිතයන්වහන්සේට දන්වූහ. උන්වහන්සේ මෙයින් සමාන ප්‍රශ්නයකින් විසඳිය හැක්කැ''යි සිතා මුබරි මිනිසුන් කීපදෙනෙකුන් කැඳවයි කියා ගෙණාකල්හි ඒ පුරුෂයන්ට මෙසේ කිවූය. තෙපි දියකෙළ ඇස් ඔලිඳඇටයේ රත්කොට තෙත් ඉසකේ ඇතිව අඳනාලද තෙත් පිළි ඇතිව මඩවැකුනු ශරීර ඇතිව වියදඹු කැටිව, බහන්, කැටමුගුරු ගත් අත් ඇතිව රජගෙයි වහසලටත් ගොස් වාසලෙහි සිටිබැව් රජ්ජුරුවන්ට කියා යවා රජ් ජුරුවන් විසින් එන්නේයයි කියනලද අවකාස ඇතිව රජගෙට වැද, දෙව යන්වහන්ස! නුඹවහන්සේ විසින් වනාහි නැගෙනහිරි යවමැදුම් ගම්වැස්සෝ පොකුණක් එවත්වයි කියා යවන ලද හෙයින් අපි නුඹවහන්සේට දියකෙළ නට සුදුසුවූ පස්පියුමෙන් සැදුනු පොකුණක් ඇරගෙණ ආම්හ. ඒ පොකුණ තමා වෙනෙහි වැසගත් බැවින් නුවර දූක අට්ටාල පවුරු පදනම් අගල හා

වාසල් ආදිය බලා වෙව්ලා භයින් බහන් සඩාගෙණ ගොස් වලටම ගියාය. අපි කැටමුගුරු ආදීන් මරාද තවතාගත නුහුනුම්හ නුඹවහන්සේ විසින් ගිය දවස වලිත්ලද පොකුණක් එව්ව මැනව, ඒ පොකුණ හා අපගේ පොකුණ එක්කොට යොදා ගෙණෙම්හයි කියා රජ්ජුරුවන් විසින් කිසිකලෙකත් මා විසින් පොකුණක් නොගෙන්වනලද විරූය, කිසිවක්හට මා විසින් එක්කොට යොදා ගෙණෙන පිණිස පොකුණක් නොයවනලද විරූයයි කී කල්හි ඉදින් දෙවයන්වහන්ස එසේවීනම් නැගෙනහිරි යවමැදුම් ගම්වැස්සෝ කෙසේ පොකුණක් ඔබවහන්සේට එවද්දූයි කියවයි යවූසේක. උයින් බෝසතානන්වහන්සේ වදාළ ලෙසම කළහ. රජ්ජුරුවෝ ඒ මිනිසුන් අතින් කවුරුන් විසින් මේ පැනය විමසන ලදදූයි විචාරා පණ්ඩිතයන් විසි'නැයි අසා සතුටුවූහ.

සතළොස්වැනි වූ උයනින් විමසූ ප්‍රශ්නය කෙසේ ද? යත්,

නැවත එක්දවසක් අපි උයන්කෙළි කෙළනා කැමැත්තම්හ. අපගේ උයන පරණව ගියේය. නැගෙනහිර යවමැදුම් ගම්වැස්සෝ චම්පකාශෝක වකුල තිලකාදීන් සුපුෂ්පිත තරුවරාකීණී අලුත් උයනක් එවත්වයි''යි කියා යවූහ. පණ්ඩිතයන්වහන්සේ මෙයින් පැනයකින් විසඳියයුතුය''යි ගම්වැස්සන් අස්වසා මුබරි මිනිසුන් කීපදෙනෙකුන් කැඳවා පෙර පොකුණට කියා යවූ පරිද්දෙන්ම කියා යවූසේක. එදවසුත් රජ්ජුරුවෝ සතුටුව සෙනක පණ්ඩිතයන්ට කියන්නාහු 'පණ්ඩිතයන් ගෙන්වාගණුමෝද'යි විචාළහ. එතෙමේ ලාභ මාත්සයර්‍යීනිසා මෙපමණකින්ම පණ්ඩිතනම් නොවෙති, ඇම්මූනවයි කීය.

ඒ සේනකයන්ගේ බස් අසා රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයෝ තුමූ වැලිකෙළියෙහි පටන් පසිඳු මාංශ ප්‍රශ්නය ආදීවූ ප්‍රශ්න සතීන්ම මාසින් ගත්තාහ, මෙබඳු උන්ගේ දැකීවූ පැන විසඳීමෙහිද අප විසින් යවනද්ලදවූ ප්‍රශ්න වලට සමානවූ ප්‍රශ්න චින්තයෙහිද උන්ගේ ප්‍රශ්නවිසර්ජනය බුදුකෙනෙකුන් වහන්සේගේ ප්‍රශ්න විසර්ජනයක් හා සමානය. සේනකයා මෙබඳු පණ්ඩිතයන් ගෙන්විය නොදෙයි සේනකයාගෙන් මට කායඊ කිම්දූයි ඒ මහෞෂධ පණ්ඩිතයන් ගෙණෙම්යි මහත්වූ හස්තහශ්වාදී පරිවාරයෙන් යුක්තව පණ්ඩිතයන් වහන්සේ වසන නැගෙනහිරි යවමැදුම් ගමට යන්නට නික්මුණාහ. මඟුලසු නැගීගෙණ යන්නාවූ රජ්ජුරුවන්ගේ මඟුලසුගේ පය පැකිලී වලක වැටී බිඳීගියේය. රජ්ජුරුවෝ එතැනම සිට නැවතී නුවරට වන්නාහ; ඉක්බිත්තොන් අතරමඟ සිට ආ වෛදෙහ රජ්ජුරුවන් සමීපයට සේනක පණ්ඩිතයෝ එළඹ දේවයන්වහන්ස! මහෞෂධ පණ්ඩිතයන් ගෙණෙන්නට යවමැදුම්ගමට වැඩිසේක්වේදූයි විචාළහ, එසේය පණ්ඩිතයෙනියි රජ්ජුරුවෝ කීහ, දෙවයන්වහන්ස! මා අවැඩකරුකොට දක්සේක. තවත් ඇම්මූන මැනවයි කියද්දීත් ඉතා ඉක්මන්ව ගොස් ආදීම යන ගමනේ මඟුලසුගේ පය බිඳී ගියෝ වේදූයි කීහ. රජ්ජුරුවෝ සේනක පණ්ඩිතයන් කී බස් අසා තුෂ්ණීම්භූතව නැවත එක්දවසක් සේනකයන් හා සමඟ කථාකරන්නේ සේනක පණ්ඩිතයෙනි! මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වමෝදූයි විචාළහ! එසේවීනම් දේවයන්වහන්ස! නුඹවහන්සේ නොගොස් පණ්ඩිතයෙනි, තොපගේ සමීපයට එන්නාවූ අපගේ මඟුලසුගේ පය බිඳී ගියේය, අශ්වතරයකු හෝ ශ්‍රෙෂ්ඨතරයකු එවයි මෙහෙවරකරන්නෙකු යවුවමැනව, ඉදින් අශ්වතරයකු එවත්නම් තුමූම එන්නාහ, ශ්‍රෙෂ්ඨතරයෙකු එත්නම් පියාණන්

එවන්නාහ. මේ තෙමේ අපට ප්‍රශ්නයෙක් වන්නේමයයි කීහ. රජ්ජුරුවෝ යහපතැයි ගිවිස සෙනකයන් කීලෙසම කියා මෙහෙවර කරන්නකු යවූහ.

පණ්ඩිතයන්වහන්සේ මෙහෙවර කරන්නහුගේ බස් අසා රජ්ජුරුවෝ මාද මපියානන්වහන්සේද දක්නාකැමැත්තෝයයි සිතා පියානන්වහන්සේ සමීපයට ගොස් වැඳලා පියානන්වහන්ස! රජ්ජුරුවෝ නුඹවහන්සේද මාද දක්නා කැමැත්තෝය, නුඹවහන්සේ පලමුකොට සිටුවරුන් දහසක්පිරිවරා වැඩිය මැනව, වඩනාසේක්ද සිසතින් නොගොස් අලුත් හෙලගිතෙල් පිරූ සඳුන් කරඬුවක් හැරගෙණ වැඩිය මැනව, රජ්ජුරුවෝ නුඹවහන්සේ හා සමග පිළිසඳර කථාකොට සුදුසු අස්නක් බලා හිඳුවයි කියති, නුඹවහන්සේ එබඳු අස්නක් පරීක්‍ෂාකොට හුන මැනව, නුඹවහන්සේ කථාකොට කොට හුන් වේලෙහි මම එමි, රජ්ජුරුවෝ මා හා සමගත් පිළිසඳර කථාකොට පණ්ඩිතයෙනි! සුදුසු අස්නක් බලා හිඳුවයි කියති. ඉක්බිත්තෙන් මම නුඹ වහන්සේගේ මූණ බලමි, ඒ සලකුණෙන් හුනස්නෙන් නැගී පුත මහෞෂධ පණ්ඩිතයෙනි! මේ අස්නේ හිඳුවයි වදාළ මැනව, එසේ කල්හි එක් පැන යෙක් වන්නේයයි වදාළසේක.

සිටානෝ යහපතැයි ගිවිස පුතනුවන්ද කී සැටියේම ගොස් තමන් වාසල සිටිබව රජ්ජුරුවන්ට කියා යවා එන්නේයයි කියා යවූකල්හි රජ ගෙට වැද රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටියහ. රජ්ජුරුවෝ සිටානන් හා සමග කථාකොට සිටානෙනි! තොප පුතනුවෝ මහෞෂධ පණ්ඩිතයෝ කොයිදැයි විචාළසේක. පස්සෙහි එති දෙවයන්වහන්සැයි කීහ. රජ්ජුරුවෝ එති යනු අසා සතුටු සිත් ඇතිව තොපට සුදුසු අස්නක් බලා හිඳුවයි කීහ. සිටානෝ තමන්ට සුදුසු අස්නක් බලා එකත්පස්ව හුන්නාහ. මහබෝසතා නන්වහන්සේද සර්‍වාලඞ්කාරයෙන් සැරහුනුසේක් කුමාරවරුන් දහස විසින් පිරිවරණලදුව සරහනලද උතුම් රථයක හිඳ නුවරට වදනාසේක් අගල පිට තණ කන එක් කොටළුවකු දැක ශක්ති සම්පන්න තරුණ පුරුෂයන්ට මේ කොටළුවා ලුහුබඳවාගෙණ ශම් පරිද්දෙකින් ශබ්දනොකෙරේද එපරිද්දෙන්ම ඔහුගේ මුඛය බන්ධනයකොට එක් පරක්කුවකින් කරතබා නොපෙන්නා ගෙණඑවයි වදාළසේක. ඒ මානවකයෝ බෝධිසත්වයන් වදාළ ලෙසම කළහ. බොධිසත්වයන්වහන්සේත් මහත් පිරිසින් යුක්තව ශක්‍රදෙවේන්ද්‍ර ලීලායෙන් නුවරට වන්සේක.

බොහෝදෙනා සිරිවඩ්ඪන සිටානන් පුතනුවෝ මහෞෂධ පණ්ඩිත යෝනම් මූල, උපන්නාහු බෙහෙත් ගුලියක් අතින්ගෙණ උපන්නෝ නම් මූල; විමසූ මෙතෙක් ප්‍රශ්නයන්ගේ අර්ථවිභාගය දත්තෝ හෙවත් පැන විසඳුවෝ මූල’යි මහබෝසතානන්වහන්සේට ස්තුතිකරන්නාහු තෘප්තියට නො පැමිණෙන්නාහ. පණ්ඩිතයන්වහන්සේ රජගෙයි වාසලට ගොස් තමන් වහන්සේ ආ පවත් දොරටුපාලයා අත කියා යවූසේක. රජ්ජුරුවෝ ඇසූ පමණින්ම තුටු පහටුව මපුතනුවෝ මහෞෂධ පණ්ඩිතයෝ වහා එත්වයි කීහ. මහබෝසතානෝ කුමරුන් දහස පිරිවරා පහයට නැග රජු වැඳ එකත් පසෙක සිටිසේක. රජ්ජුරුවෝ ඔහු දැක සොම්නසට පැමිණ මිහිරි කථා කොට පණ්ඩිතයෙනි! සුදුසු අස්නක් බලා හිඳුවයි කීහ. පණ්ඩිතයන්වහන්සේ

පියාතන්ද මූණ බැලූසේක. ඉක්බිත්තෙන් උන්වහන්සේගේ පියානෝ බැලූ සලකුණෙන් අස්තෙන් නැගී පණ්ඩිතයෙනි! මේ අස්නෝ හිඳුවයි කීහ. පණ්ඩිතයාණන්වහන්සේ ඒ අසමින් පියානන් හුන් අස්නෙහි වැඩහුන්සේක.

පියාතන් අස්තෙන් නගාපියා ඒ අස්නෙහි උන්නාවූ පණ්ඩිතයන් දැකලාම සේනක පුක්කුස කාවින්ද දෙවින්ද යන පණ්ඩිතවරු සතරදෙනද සෙසු නුවණැත්තාහුද අත්ලෙන් අත්ල ගසා මහත්කොට සිනාසී මේ නුවණ නැත්තාහු නුවණැත්තෝයයි කියති, ඒ තෙමේ පියානන් අස්තෙන් නගා පියා තෙමේ ඒ අස්නෙහි උන්නේය, මොහු නුවණැතැයි කීමනත්තට යුක්ති නොවන්නේයයි වෙනෙසූය. රජ්ජුරුවෝ දුර්මුඛවූහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණන්වහන්සේ දුර්මුඛව උන් රජ්ජුරුවන් වහන්සේට කිමෙක්ද දෙවයන්වහන්ය! කණස්සලු සේක්දැයි විචාළසේක. එසේය පණ්ඩිතයෙනි! කණස්සල්ලෙමි, තොපගේ ස්වරූප ඇසීමෙන් සිත් ගත දැක්මෙන් සිත් නොගැතැයි කීහ. මාගේ ස්වරූප ඇසීමෙන් සිත් ගත් තෙන් දැක්මෙන් සිත් නොගත්තෙන් කුමක් නිසා දැයි විචාළසේක, පියානන් අස්තෙන් නගා හුන් හෙයිනැයි කීහ. කිමෙක්ද දෙවයන්වහන්ස! තුඹවහන්සේ හැමතැන්හිම පුතුන්ට වඩා පියෝම උතුම්හයි කියනසේක්දැයි විචාළසේක. එසේය පණ්ඩිතයෙනි! කීහ. ඉක්බිත්තෙන් මහබෝසතාණෝ රජ්ජුරුවන්ට දෙවයන්වහන්ස! තුඹවහන්සේ විසින් අපට අශ්වතරයකු හෝ ශ්‍රේෂ්ඨතරයකු හෝ එවන්නේයයි අසුන් යවන ලද්දේ වේදැයි කියා හුනස්නෙන් නැගී කොටළුවා ගෙණා මානවකයන් මූණ බලා තොප විසින් ගන්නාලද කොටළුවා ගෙණෙවයි ගෙන්වාගෙණ රජ්ජුරුවන්ගේ පාමුල හොවාලා දෙවයන්වහන්ස මේ කොටළුවා කෙතෙක් අගීදැයි විචාළසේක, රජ්ජුරුවෝ ඉදින් උපකාර ඇත්තේ වීනම් අටමස්සක් අගනේයයි කීහ. මූ නිසා සෛන්ධවකුලයෙහි වෙළඹ බඩ උපන් අජානීය අශ්වයා කෙතෙක් අගීදැයි විචාළසේක. පණ්ඩිතයෙනි! අගය නැතැයි කීහ දෙවයන්වහන්ස! කුමක් හෙයින් එසේ කියන සේක්ද? තුඹවහන්සේ විසින් දූන් හැමතැන්හිම පුතුන්ට වඩා පියෝම උත්තම යහයි කියන ලද්දේවේද? ඉදින් ඒ සැබෑවීනම් තුඹවහන්සේගේ වාදයෙහි අජානීය අශ්වයාට වඩා කොටළුවා උතුම් වන්නේය, කිමෙක්ද දෙවයන් වහන්ස! තුඹවහන්සේගේ පණ්ඩිතවරු මෙපමණකුත් දැනගන්නට අසමර්ථව අත්ලෙන් අත්ල ගසා සෙන්නාහ තුඹවහන්සේගේ පණ්ඩිතවරුන්ගේ නුවණ විශේෂය ආශ්චර්යයීය, තුඹවහන්සේ කොයින් මුන් අත්පත්හා ලත්සේක්දැයි පණ්ඩිතවරුන් සතර දෙනාට පරිහව බැණ රජ්ජුරුවන්ට ගද්‍යහ ප්‍රශ්නයෙහි එම කාරණා ගාථාවකින් කියා දෙවයන්වහන්ස! පුතනුවන්නට වඩා පියානෝ උතුම් නම් මපියානන් තුඹවහන්සේට වැඩපසස්නා පිණිස ගතමැනව, ඉදින් පියන්ට වඩා පුත්‍රයෝ උත්තමයෝ නම් මා තුඹවහන්සේ සමීපයෙහි රඳවාගත මැනවයි වදාළසේක. රජ්ජුරුවෝ සොම්නස්වූහ සියලු රාජපර්ෂද් පණ්ඩිතයන් විසින් ප්‍රශ්න මනාකොට කියනලදැයි ඔල්වරහඬ ගසමින් සාධු කාර ශබ්ද පැවැත්වූහ. අසුරුසන්ද දහස් ගණන් පිළිඉස නැටීම්ද පැවැත්වූහ. සෙනකාදී පණ්ඩිතවරු සතරදෙන දුර්මුඛවූහ.

මවුපියන් ගුණ දන්නට බොධිසත්‍වයන් වහන්සේ හා සමාන කෙනෙක් නැත. වැලි උන්වහන්සේ කුමක් නිසා පියානන්වහන්සේ අස්නෙන් නඟා ඒ අස්නෙහි වැඩ උන්සේක්ද යත්? පියානන් දූට අවමානයක් පිණිස නොවෙයි, රජ්ජුරුවන් විසින් අශ්වතරයෙකු හෝ එවින්නේය, ශ්‍රෙෂ්ඨ තරයකු හෝ එවන්නේයයි අසුන් යවනලද හෙයින් ඒ පැනය විසඳන පිණිසත් තමන් වහන්සේත් නුවණැති බව අඟවන පිණිසත් සෙනකාදී පණ්ඩිතවරුන් සතර දෙනාගේ නුවණින් බැබළීම නැති කිරීම පිණිසත් මෙසේ කොළේයයි දතයුතු.

ගද්‍රභ ප්‍රශ්නයයි.

රජ්ජුරුවෝ ගද්‍රභ ප්‍රශ්නයාගේ විසර්ජනයෙහි සතුටුව සුවඳ පැන් පිරූ රන් කෙණ්ඩිකාව අතින්ගෙණ නැගෙනහිරි යවමැද්දුම්ගම පමුණුකොට අනුභවකරවයි සිටානන් අත පැන් වත්කොට සෙසු දහසක් සිටුවරු සිරි වඩ්ඪන සිටානන්ම සමමතවෙත්වයි කියා බෝසතානන් වහන්සේගේ මෑනී යන්දූට සිරිකන්තෝඩු තැලිවැල් පට්ටකාර පාසලඹ පාදජාලාදීවූ සියලුස්ත්‍රී ආභරණ යවා කොටළු පැනයෙහි පහන්ව මහබෝසතාණන්වහන්සේ දරු කොට වඩාගන්නා පිණිස මහසිටානන්ට සිටානෙනි! මහෞෂධ පණ්ඩිත යන් මට දරුකොට දෙවයි කීහ.

සිටානෝ දෙවයන්වහන්ස! දරුවෝ තවම ළදරුවෝය, අද දක්වාත් දරුවන් තුඩ කිරි සුවඳ අමයි, වැඩිගත්කල තුඹවහන්සේ සවමීපයෙහි වසන් නේයයි කීහ සිටානෙනි! මෙවක් පටන් පණ්ඩිතයන් කෙරෙහි ආලය හරුව, මූ අදපටන් මපුතනුවෝය, මම මාගේ පුතනුවන් රක්නට පොහොසත්මි, තෙපි යවයි සිටානන්ට ගමට යන්නට සමුදුන්හ. සිටානෝ රජ්ජුරුවන් වැඳ පුතනුවන් මහෞෂධ පණ්ඩිතයන් සිප ගෙලෙහි නොවාගෙණ ඉස සිඹ පුතනුවන්ට අවවාද දුන්හ, උන්වහන්සේ සිටානන් වැඳ පියානන්වහන්ස! නොසිතුව මැනවැයි කියා පියානන් යවූසේක. රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ ඇතුළතදී කව්ද? නොහොත් පිටතදී කව්දූයි විචාළහ. උන්වහන්සේ මාගේ පරිවාර බොහෝය, මා විසින් පිටපදී බත් අනුභව කිරීම සුදුසුයයි සිතා පිටතදී අනුභව කෙරෙමියි වදාළසේක. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ පණ්ඩිතයන්වහන්සේට සුදුසු ගෙයක්දී කුමාරවරුන් දහස ආදීකොට සියලු පරිවාරයට වියදම්දෙවා සියලු උපකරණ ගෙහිලා දෙවූහ, පණ්ඩිතයන්වහන්සේ එතැන් පටන් කොට රජ්ජුරුවන් සවමීපයෙහි අනු ශාසනා කෙරෙමින් සිටිසේක.

රජ්ජුරුවෝ පණ්ඩිතයන්වහන්සේ විමසනු කැමතිවූහ. එසේ කල්හි නුවර දකුණු වාසලට නුදුරුවූ තන්හි පොකුණුතෙර එක් තල්ගසක් උඩ කවුඩු කැදැල්ලෙක මිණිරුවනෙක් වූයේය. ඒ මැණිකෙහි ඡායාව පොකු ණෙහි පෙණෙන්නේය. පොකුණෙහි මැණිකකැයි රජ්ජුරුවන්ට දැන්වූහ රජ්ජුරුවෝ සෙනකයන් කැඳවා පොකුණෙහි මිණිරුවනෙක් පෙණේල, ඒ මැණික කෙසේ ගණුමෝදූයි විචාරා සෙනකයන් විසින් පැන් ඉස්සවා පියා

ගන්නා බව සුදුසුයයි කී කල්හි එසේවීනම් එලෙසම කරවයි සෙනකයන්ට භාරකළහ. සෙනකයෝත් බොහෝ මිනිසුන් රැස්කරවා පොකුණෙහි දියත් මඩත් අරවා බිම කනවා මැණික නුදුටුවාහ. නැවත පොකුණෙහි දියපිරී ගිය කල්හි මැණිකෙහි ඡායාව පෙණෙන්නේය. සෙනකයෝ නැවත නැවතත් එසේ කරවා මැණික නුදුටුවාහුමය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ කැඳවා පොකුණෙහි මැණිකෙක් පෙණෙන්නේය. සෙනකයෝ දියත් මඩත් අරවා බිම බිඳ මැණික නුදුටුවාහ. පොකුණෙහි දියපිරී ගිය කල නැවතත් පෙණෙයි. මෙය ගන්නට පොහොසතුදැයි විචාළසේක. උන්වහන්සේ දෙවයන්වහන්ස! ඒ බැරිනොවෙයි වැඩිය මැනව, නුඹවහන්සේට මැණික පාමියි වදාළසේක. රජ්ජුරුවෝ මැණික පාමියි කී බසින් සතුටුව අද පණ්ඩිතයන්ගේ නුවණෙහි බල දකුම්හයි කියා බොහෝදෙනා විසින් පිරිවරණ ලදුව පොකුණු තෙරට ගියහ, මහබෝසතාණෝ පොකුණුතෙර සිට මැණික බලන සේක්ම මේ මැණික පොකුණෙහි නොවෙයි, මේ තල්ගස උඩ වියයුතුයි දැන දෙවයන් වහන්ස! පොකුණෙහි මැණික නැතැයි කියා පෙණෙන්නේ මැණික නොවේ දැයි කීකල්හි පැන්තලියක් ගෙන්වා බැලුව මැනව, දෙවයන්වහන්ස මේ මැණික පොකුණෙහිම මතු පෙණෙන්නේ නොවෙයි, තලියෙහිත් පෙණෙන් නේයයි කියා රජ්ජුරුවන් විසින් පණ්ඩිතයෙනි! මැණික කොයි වියයුතු දැයි කී කල්හි දෙවයන්වහන්ස! පොකුණෙහි ඡායාවම පෙණෙන්නේය මැණික පොකුණෙහි නොවෙයි; මැණික වනාහි මේ තල්ගස උඩ කවුඩු කැදැල්ලේය මිනිසකු නංවා බාවාගත මැනවයි වදාළසේක. රජ්ජුරුවෝ බොධිසත්වයන් වහන්සේ වදාළ ලෙසම මිනිසකු නංවා මැණික බැවූහ පණ්ඩිතයන්වහන්සේ ඒ මැණික තමන් අතට ඇරගෙණ රජ්ජුරුවන් අත තුබූසේක බොහෝදෙන පණ්ඩිතයන්වහන්සේට සාධුකාර දී සෙනක පණ්ඩිතයන්ට බණන්නාහු මැණික තල්ගස උඩ තිබෙද්දී සෙනකයා දුන්නක් දමාගිය එකක්හු කළයෙහි අතගානාසේ ශක්තිමත් පුරුෂයන් ලවා පොකුණම බිඳවීය. නුවණැතිවනොත් මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ වියයුතුයයි මහබෝසතාණන්වහන්සේව ස්තුති කළහ. රජ්ජුරුවෝ බොධිසත්වයන්වහන්සේට සතුටුව තමන් කර පැලඳි රන් ලක්ෂයක් පුස්නා මුත්හරදී කුමාරවරුන් දහසට මුතුපට දුන්නාහ. රාජසෙවයට එනවිට මේ පැලඳගෙණ එන්නේයයි මහබෝසතාණන්වහන් සේටද කුමාරවරුන් දහසටද සම්මත කළහ.

මාංශ ප්‍රශ්නය ආදිවූ පැන දසනවය නිමි.

—— ० ——

නැවත එක් දවසක් රජ්ජුරුවෝ පණ්ඩිතයන් හා සමඟ උයනට ගියාහ. එදවස් එක් බොහොඩෙක් තොරණ අග වසන්නේය. ඒ තෙමේ රජ්ජුරුවන් එන්නවුන් දැක තොරණ අගින් බැස බිම වැද හොත්තේය. රජ්ජුරුවෝ ඒ බොහොඩාගේ ක්‍රියාව බලා මහෞෂධ පණ්ඩිතයෙනි! මේ බොහොඩා කුමක් කෙරේදැයි විචාළහ. දේවයන්වහන්ස! නුඹවහන්සේට සෙවය කරන්නේයයි වදාළසේක. රජ්ජුරුවෝ ඉදින් එසේවීනම් අපට කාරණ සෙවය සිස් නොවෙයි, ඕහට වස්තුවක් දෙවයි කීහ. බෝසතාණන්

වහන්සේ දෙවයන්වහන්ස! ඕහට වස්තුවෙන් ප්‍රයෝජන නැත, කැයුතු දූයක් ඇත්නම් පමණයයි වදාළසේක. මේ තෙමේ කුමක් කන්නේදැයි රජ්ජුරුවෝ කීහ. දෙවයන්වහන්ස! මස් අනුභව කරන්නේයයි වදාළසේක. කෙතෙක් දෙය ලැබ්බයුතුදැයි විචාළහ. දෙවයන්වහන්ස! වියැටසමාරක් පමණ රත්රන් පුස්නා මසැයි වදාළසේක. රජ්ජුරුවෝ එක් පුරුෂයකුට රජ්ජුරුවන් දෙන දෙයම වියැටසමාරක් පමණ තුසුදුසුයයි කියා මෝහට රත්රන් දෙවියැටසමාරක් අගනා මස් නිබදව ගෙණහැර දෙවයිකියා නියොග කළහ. ඒ පුරුෂයාත් යහපතැයි කියා එතැන් පටන් කොට රජ්ජුරුවන් විධානකළ ලෙසටම මස් ගෙණහැර බොහොඩාට දෙන්නේය.

ඒ පුරුෂයා එක් දවසක් උපොසථ දිනයෙහි රාජසමමත හෙයින් පණිවාකලවුත් නැතිකල්හි නුවර මුළුල්ලෙහි මස් සොයා නොලැබ එම දෙවි යැට සමාරක් පමණ රත්රන් මැදින් විද අමුණා බොහොඩාගේ කරේ බැන්දේය. ඉක්බිත්තෙන් ඒ බොහොඩාට රත්රන් දෙවියැට සමාර නිසා මාන යෙක් උපන්නේය. එදවස් රජ්ජුරුවෝ නැවත උයනට ගියහ. ඒ බොහොඩ තෙමේ රජ්ජුරුවන් එන්නවුත් දැක වස්තුව නිසා උපන් මානය කරණකොට ගෙණ වෙදෙහයෙනි! තොපිම නොව මහත් වස්තු ඇත්තෝ, මමත් වස්තු ඇත්තෙමියි රජ්ජුරුවන් හා සමග තමා සමකරන්නේ තොරණ අගින් නොබැස තොරණ අගම හිඳ හිස සලමින් වැදහොත්තේය. රජ්ජුරුවෝ ඔහුගේ ක්‍රියාව දැක මහෞෂධ පණ්ඩිතයෙනි! මේ තෙමේ පෙර දුටු පරිද්දෙන් අද නොබස්නේය. කවර කාරණයකින් ඒ තද මානය ඇතිවීදැයි ගාථාවකින් විචාළහ. පණ්ඩිතයන්වහන්සේ පොහෝදවස් පණිවා නොකිරීම නිමිත්තකොටගෙණ මස් නොලබන්නාවූ රාජපුරුෂයා විසින් තමා කර බැඳි රත්රන් දෙවියැට සමාර නිසා උපදනා මානය ඔහුට වියයුතුයයි දැන එම කාරණය ගාථාවකින් කියනසේක් නොලත්විරූ අඩීමාෂක සම්මතවූ වස්තුවක් ලදින් මේ තෙමේ මියුලු නුවර ගේකොට ඇත්තාවූ හෝ නොහොත් දාන ප්‍රියවචන අර්ථචර්‍ය්‍යා සමානාත්මතා සඞ්ඛ්‍යාත සතර සංග්‍රහ වස්තුවෙන් ජනයා සිත්ගත්තාවූ වෙදෙහරජ! තොපි තොප පමණට වස්තු ඇත්තාහ. මමත් මා පමණට වස්තු ඇත්තෙමි. එසේ හෙයින් තොපට මා අඩුකිමෙක්දැයි ඉක්ම සිතන්නේය. හෙළා දක්කේයයි මේ කකණ්ටක ප්‍රශ්නය විසඳා වදාළසේක. රජ්ජුරුවෝ කටුසු බොහොඩාට මස්ලන්ට නියමකළ පුරුෂයා ගෙන්වා පණ්ඩිතයන් කීවා සැබෑදැයි විචාළහ. ඒ වූ පරිද්දෙන්ම කීයේය. රජ්ජුරුවෝ කිසිකෙණෙකුන් නොවිචාරාම සියල්ල බුදුකෙණෙකුන්වහන්සේ විසින් දත් අදහසක් මෙන් පණ්ඩිතයන් විසින් බොහොඩාගේ අදහස දන්නා ලදැයි වඩ වඩා පැහැද පණ්ඩිතයන්වහන්සේට සතර වාසලින් නිමන සුන් වත් අය දුන්හ. බොහොඩාට වනාහි රජ්ජුරුවෝ කිපී තමන් තුබූ වෘත්තිය අරවන්නට වන්හ, පණ්ඩිතයන්වහන්සේ වනාහි තබාලූ වෘත්තිය හරවාපීම සුදුසු නොවන්නේයයි වැළකූසේක.

කකණ්ටක ප්‍රශ්නයයි.

ඉක්බිත්තෙන් මියුලුනුවර වැසි පිංගුත්තර නම් ලදරුවෙක් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාර්යයන් සමීපයෙහි ශිල්පඋගත්තේ වහාම උගත, ඒ තෙමේ උගත් ශිල්ප වත පොත් දී මම සමුගණිමියි ආචාර්යයන්ට කීය. ඒ ආචාර්යයන්ගේ කුලයෙහි වනාහි ඉදින් වැඩිවිය පැමිණි දියනිකෙණෙක් ඇත්නම් වැඩිමහලු අතවැස්සන්ට දියයුත්තාහයි පැවත එන වතෙක් ඇත. ඒ ආචාර්යයන්ගේ දෙවඟනක් හා සමානවූ විශිෂ්ටරූ ඇති එක් දියනිකොණෙක් ඇත්තාහ. ඉක්බිත්තෙන් ඒ දියනියන් පුත! තොපට දෙමි උන් හැරගෙණ යවයි ආචාර්යයෝ කීහ. මානවකයා වනාහි පින් නැත්තේය, කාලකණ්ණිය; කුමාරිකා තොමෝ මහපින් ඇත්තීය, ඔහට ඒ කුමාරිකාව දැක සිත නොඇලුනේය. ඒ මානවකයා කුමාරිකා නුරුස්නේම ආචාර්යයන්ගේ බස මරුත්තු නොකෙරෙමියි කියා ඉවසීය, බමුණානෝ මානවකයාට තමන්ගේ දියනියන් දුන්හ. ඒ තෙමේ රාත්‍රිභාගයෙහි සකස්කොට අතුරණලද ශ්‍රී යහනෙහි සැතපිත කුමාරිකා අවුත් ඇඳට නැගෙන්නාහාම මානවකයා තතනමින් ඇඳින් බැස බිමහෙව වැදහොත්තේය. ඒ කුමාරිකාද ඇඳින් බැස ඒ මානවකයා සමීපයට ගියාය එතැනින් නැගීසිට නැවත ඇඳට පැනනැංගේය, නැවත ඒ කුමාරිකාද ඇඳට නැංගාය ඒ තෙමේ නැවත ඇඳින් බටුයේය කාලකණ්ණියා නම් ශ්‍රීකාන්තාව හා සමඟ අහසව පොළොවසේ ලංනොවන්නේය. එසේහෙයින් කුමාරිකා යහනෙහිම සැතපුනීය, ඒ කලකණ්ණියා බිම වැදහොත්තේය. නැවත මෙසේ සතියක් දවස් යවා කුමාරිකා කෙරෙහි ස්නෙහ නැතිවත් ආචාර්යයන්ගේ බස මරුත්තු කොටගත නොහි හැරගෙණ ආචාර්යයන් වැඳ සමුගෙණ තමාගේ නුවරට නික්මුණේය. අතරමග පෙර පසු කථා පමණකුත් ඔවුනොවුන් හා නැත්තේය. නොකැමැතිවම ඔහු දෙදෙන මියුලුනුවරට පැමිණියාහ. පිංගුත්තර නම් මානවකයා නුවර සමීපයෙහි පලගත දිඹුල් ගසක් දැක සාදුකින් පීඩිත වූයේ ගසට නැගිලා දිඹුල් කඩාගෙණ කන්නට වන, කුමාරිකාවද සාදුකින් පෙළුනී මටත් දෙවයි කිව, හැයි නිට අත් පා නැද්ද තොමොත් ගසට නැගී දිඹුල් කඩාගෙණ කායි කීය. සාදුකට වඩා දුකක් නැති හෙයින් කුමාරිකා තොමෝම නැගී දිඹුල් කඩාගෙණ කන්නට වන, මානවකයාත් ඈ ගසට නැගි බව දැන වහ වහා ගසින් බැස ගසවට කටුගසලා කාලකණ්ණිය තොරෙන් මිදීනියි කියලා නුවරට නැගීගියේය. කුමාරිකා ගස මුල කටු හෙයින් බැස පියන්නට නොපිළිවන්ව උඩම හුන්නීය,

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ එදවස් දවල් උයන් කෙළි කෙළ සරහන ලද ඇතුපිට හිඳ සවස්වේලෙහි නුවරට වදන්නාහු දිඹුල් ගස හුන් කුමාරිකාව දැක පිළිබඳ සිත් ඇතිව පුරුෂයන් ඇත්ත නැත්ත විචාරා යවූහ. කුමාරිකාත් ස්වාමිනි! මගේ දෙවුපින්විසින් පාවාදෙනලද සමුණන්දෑ කෙනෙක් ඇත. ඒ සමුනාණෝම මේ ගසළඹ හිඳුවා හැරපියා පලාගියෝයයි කිව, විචාරන්නට ගිය අමාත්‍යයා එපවත් රජ්ජුරුවන්ට කීය. රජ්ජුරුවෝ ඒ අසා හිමියන් නැති වස්තුනම් රජ්ජුරුවන්ට පැමිණෙන්නේයයි කියා කුමාරිකාව ගසින් බස්වා ඇතුපිට නංවාගෙණ මාලිගාවට ගොස් රුවන් රැසක් පිට සිටුවා අගමෙහෙසුන් කළහ. බිසවු රජ්ජුරුවන්ට ප්‍රියයෝය, මනවඩති, දිඹුල්ගසදී දුටුබැවින් උදුම්බරාදේවීයයි ප්‍රසිඬවූහ. ඉක්බිත්තෙන් එක්දවසක් රජ්ජු

රුවෝ උයන් කෙළියට යන පිණිස වාසල් කඩ ගම්වැස්සන් ලවා මාගීය ඉදි කරවූහ. පිංගුත්තරයාද රාජ සම්මතයෙන් මෙහෙවර කරන්නේ කැසපට කවාගෙණ උදුල්ලකින් මග සසින්නට වන. මාගීය සරහා නොනිමතතුරු රජ්ජුරුවෝ උදුම්බරා දේවීන් හා සමග උතුම් රථයකට නැගී උයන් කෙළියට මහ පෙරහරින් නික්මුනාහ. උදුම්බරා දේවිද මග සසිමින්සිටි ඒ කාලකණ්ණියාදුක මෙබඳු සම්පත්තියක් ධරාගත නුහුනුයේයයි ඌ දිසාව බලමින් සිනාසුනාහ. රජ්ජුරුවෝ බිසවුන් සිනාසෙන්නා දුක කිපී කුමක් පිණිස සුනුහිදුයි විචාළහ. දේවයන්වහන්ස ! මේ මග සසිනා මිනිහා මා ආදියෙන් රක්‍ෂාකළ මිනි සාය, මා දිඹුල් ගසට නංවා මුල කටුගසා ගියේ මූය, මම මූබලා මෙබඳු ශ්‍රීයක් ධරාගත නුහුනුයේ මේ කාලකණ්ණියායි සිනාසිනිමියි කිව. රජ්ජුරුවෝ නී කියන්නේ බොරුය. අනික් පුරුෂයකු දුක නී සුනුයේ නී මරමියි කඩුව කොපුවෙන් ඇදගත්හ. බිසව් භයපත්ව දෙවයෙනි! යලි පණ්ඩිතවරුන් විචාල මැනවයි කීහ. රජ්ජුරුවෝ මෑ කී බස් අදහව්දුයි සේනකයන් විචාළහ සෙනකයෝත් නොඅදහමි දෙවයන්වහන්ස! කව්රෙක් නම් මේබඳු ගැණි යක් හැර පියා නැගීයේදුයි කීහ. බිසවු සේනකයන්ගේ බස් අසා වඩාලාම භයවූහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ සේනකයා කුමක් දනීද මහෞෂධ පණ්ඩිතයන් විචාරමී සිනා ගාථාවකින් පණ්ඩිතයන්වහන්සේ විචාරන්නාහු මහෞෂධ පණ්ඩිතයෙනි! ස්ත්‍රියක් තොමෝ අධික රූ ඇත්තිවූවද ආචාර ශීල යෙන්ද යුක්ත වූව, ඒ ස්ත්‍රිය පුරුෂයෙක් නොකමැත්තේල. තෙපි ඒ අද හව්දුයි විචාළහ. එබස් අසා දේවයිනි! මම අදහමි, පුරුෂයා දෛවය නැත්තේවීනම්, ශ්‍රීකාන්තාවද කාලකණ්ණියාද යන මොහු දෙදෙනා මුහුද එතර මෙතර සේද අහස හා පොළොවසේද එක්නොවන්නාහයි වදාළ සේක. රජ්ජුරුවෝ මහතානන් වදාළ කාරණය සිතාට නගා සත් හුන් සිත් ඇතිව පණ්ඩිතයන් වහන්සේට සතුටුව පණ්ඩිතයෙනි! ඉදින් තෙපි මෙතැන නැත්තාහුනම් අද මේ නුවණනැති සේනකයාගේ බස් ගෙණ මෙබඳු ගැණු රුවතක් නොලද්දේවෙමි. දූන් තොප නිසාය මේ බිසවුන් ලද්දේයයි කියා පණ්ඩිතයන්වහන්සේට මස්සෙන් දහසක් පූජාකළහ. ඉක්බිත්තෙන් බිසව් රජ්ජුරුවන් වැඳ දෙවයන්වහන්ස! පණ්ඩිතයන් නිසාය මා දිවිලද්දේ; මූන් මම මල්නතතුරෙහි තබන්නට වර ඉල්ලමියි කීහ. රජ්ජුරුවෝ යහපත දෙවිනි! තොප ඉල්වූ වරය දෙමි. ගණුවයි කීහ. දෙවයන්වහන්ස! මම අද පටන් මාගේ මලනුවන් හැරපියා කිසි මිහිරි රසයක් අනුභව නොකරමි. මෙතැන් පටන් වේලකවත් නොවේලකවත් වාසල් දොර හරවා පණ්ඩිත යන්ට මිහිරි රසයක් යවන්නට ලබන වරයක් ගණිමියි කීහ. යහපත සොඳුර ඒ වර ගණුවයි කියා රජ්ජුරුවෝ වර දුන්නාහ.

සිරිකාලකණ්ණි ප්‍රශ්නයයි

එක්දවසක් රජ්ජුරුවෝ දහවල් මෙහෙ නිමවා සඳල්ලෙහි සක්මන් කරන්නාහු සීමැදුරු කවුළුවෙන් එක් එළුවකු හා බල්ලකු මිත්‍රසන්ථවය කරන් නවුන් දුටුහු ඒ එළු වනාහි ඇත්හල ඇතුට ඉදිරියෙහි ලාලූ තණ නොකන තුරු කන්නේය. ඉක්බිත්තෙන් ඇත්හලයෝ ඔහු තණ කන්නා දුක මරා

පලාපිහ. අඬගසාගෙණ යන්නාවූ ඔහු දැක එක් ඇත්හලයෙක් ලුහුබැඳ ගොස් දණ්ඩකින් පිට අවුරා පහරක් ගැසීය. ඒ තෙමේ පිට තම තමා වෙදනාවෙන් වෙවුලමින් ගොස් රජගෙයි මහබිතික්කණ නිසා පිට පදතම වැදහොත්තේය. එදවස්ම රජ්ජුරුවන් මුළුතැන්ගෙයි ඇට හා මස් ආදීවූ දෙය කා වැඩි බල්ලෙක් අරක්කැමියා බත් මාලු පිස වසුත්කොට ගෙන් පිටත ඇඟ ඹාදිය සිඳිමින් සිටියදී, මත්ස්‍යමාංශයෙහි ගඣය ඉවසාගතනොහී මුළුතැන්ගෙට වැද වලත් වැසූ මලා ආදිය හෙලා මාංශ අනුභවකෙළේය. අරක්කැමියා වලත් හුනු හඬ අසා ඇතුළුගෙට වැද මාළු කමින් සිටි බල්ලා දැක දොර පියලා කාට මුගුරු ආදීන් තැළීය ඒ තෙමේ තමා කෑ මාළු තගාපියා හඬා ගෙණ දිවගත අරක්කැමියා ඔහු දිවගත් බව දැක ලුහුබැඳ දණ්ඩකින් පිට අවුරා ගැසීය. එයින් පිට තම තමා කොතෙක් ගැසුවත් පයක් වක්කිරීම බල්ලන්ගේ සවභාවයක් හෙයින් එක් පයක් ඔසවාගෙණ එළුවා වැදහොත් තැනටම ගියේය. ඉක්බිත්තෙන් එළුතෙමේ සබඳ! තෝ පිට තම තමා එන් නෙහි කිමෙක්ද තා පිට! රැජාවෙක් පහරිදූයි බල්ලා විචාළේය. හේ බල්ලාද තෝත් පිට තමාගෙණ වැදහොත්තෙහි කිමෙක්ද තොප පිට රැජාවෙක් පහරී දූයි එළුවා අතින් විචාළේය. එළුවා තමාගේ සවරූප බල්ලාට කීය. බලුත් එළුවාට තමාගේ සවරූප කීය. ඉක්බිත්තෙන් එළුවා බල්ලාට කිමෙක්ද? තෝ නැවත මුළුතැන්ගෙට යන්නට පොහොසත්දූයි විචාළේය. නොපො හොසතිමි. ගියොත් මාගේ දිවි නැතැයි කීය. තෝ වනාහි ඇත්හලට යන් නට පොහොසත්දූයි කීය. එළුවා මා විසිනුත් ඇත්හලට යන්නට නොපිළි වන. ගියොත් මාගේ දිවි නැතැයි කීය. ඔහු දෙන්නා කෙසේ අපි දෙන්නා ජීවත්වමෝද්දූයි උපායක් සිතූහ. ඉක්බිත්තෙන් එළුවා තෙමේ ඉදින් දෙන් නම සමගිවගත හෙමෝනම් එක් උපායෙක් ඇතැයි කියා බල්ලා විසින් එසේවීනම් කියවයි කී කල්හි සබඳ! තෝ මෙතැන්පටන් ඇත්හලට යා, බල් ලන් තණ නොකන හෙයින් මේ තණ නොකයි කියා ඇත්තලයෝ තා කෙරෙහි සැක නොකෙරෙති, තෝ සඟවා මට තණ කැරැල්ලක් ඩැහැගෙණ වුත් මහබිතික්කණෙහි තබව, මමත් මුළුතැන්ගෙට යෙමි. එළුවන් මස් නො කන හෙයින් මේ මස් නොකයි කියා අරක්කැමියා මාකෙරෙහි සැක නොකෙ රෙයි, මමත් තට මස් කන්නට ඩැගෙණ එමියි කීය. මේ උපාය තෙමේ අප දෙන්නා ජීවත්වීමට ඇතැයි දෙන්නම ගිවිස බලු ඇත්හලට ගොස් තණ කැරැල්ලක් ඩැගෙණ අවුත් මහබිතක්කණ පිට පදතම තබයි. එළුද මුළුතැන් ගෙට ගොස් මස් කැබෙල්ලක් මුවපුරා ඩැහැගෙණවුත් එහිම තබයි. මේ උපා යෙන් දෙන්නම මහබිතක්කණ පිට පදතම සැපසේ වෙසෙති.

රජ්ජුරුවෝ උන් දෙන්නාගේ මිත්‍ර ධර්මය දැක මා විසිනුත් නුදුටු විරූ කාරණයක් දක්නාලද මොහු දෙන්න ඔවුනොවුන්ට පසමිතුරුවත් සමඟව වාසය කෙරෙති. මේ කාරණය අල්වා පැනයක් කොට පණ්ඩිතවරුන් පස්දෙනා විචාරන්නෙමි. මේ පැනය නොදත් කෙණෙකුන් රටින් යවන්නෙමි. දත් කෙණෙකුන්ට මෙබඳු පණ්ඩිත කෙණෙක් නැතැයි උපකාර කරන්නෙමි. අද වෙලා මදව ගියේය. සෙට සේවයට ආකල විචාරන්නෙමියි සිතූහ. මෙසේ සිතා රජ්ජුරුවෝ අනික් දවස් පණ්ඩිතවරුන් සේවයට අවුත් උන් කල්හි ප්‍රශ්න විචාරන්නාහු ගාථාවක් කියා "මේ සත්වලෝකයෙහි යම් සත්වකෙන

කුන්ගේ විශ්වාසයෙක් කිසිකලෙකත් සත්පියවරකුත් පවා නොවූවිරූද, එසේ පසමිතුරවූ දෙදෙනෙක් සබඳවූහ. සබඳවත් අදහාගෙණ හෙවත් මිත්‍ර සන්ථවය කොට ඇවිදිනාහ. එයට කරුණු කිමෙක්දැයි කීහ, මෙසේද කියා නැවත "අද පෙරවරු වේලෙහි ඉදිත් මේ පැනය මට කියන්නට නොපොහො සත්හු වූ තම් තොප හැම දෙනම රටින් නෙරපමි, නුවණ නැත්තවුන්ගෙන් මට ප්‍රයොජන නැතැ"යි කීහ. සෙනකයෝ මුල් හස්නෙහි වැඩ හුන්හ. මහෞෂධ පණ්ඩිතයෝ කෙළවර හස්නෙහි වැඩහුන්සේක. උන්වහන්සේ ඒ පැනය පරීක්ෂාකෙරෙමින් අර්ථ නොදැක "මේ රජතෙමේ බොලඳ ගුණ ඇත්තේය, මේ පැනය සිතාගෙණ දැනගන්නට නොපොහොසත, ඔහු විසින් කිසිවක් දක්නා ලදැයි සිතා එක දවසකට අවසර ලබන්නෙම් වීනම් මේ පැනය දැන ගනිමි, සෙනකයෝ කිසි උපායකින් අද එක දවසක් පමණ රඳවා පියති"යි සිතුසේක.

සෙනකාදි පණ්ඩිතවරු සතරදෙනද අඳුරු ගබඩාවකට වන්නවුන් මෙන් කිසිවක් නුදුටුවහ. සෙනකයෝ මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රවෘත්ති කිමෙක්දෝහෝයි මහබෝසතානන් වහන්සේ දෙස බැලූහ, මහබෝසතානන් වහන්සේද සෙනකයන් දෙසබැලූසේක, සෙනකයෝ බොධිසත්වයන් වහන්සේ තමන්දෙස බැලූ ආකාරයෙන්ම උන්වහන්සේගේ සිත දැන පණ්ඩිතයන්ට පැනය නොවැටහුනුසේක. එසේහෙයින් එක්දවසකට අවසර ඉල්වන්නා කැමැත්තෝය. උන්ගේ මනදෙළ පුරවමි, රජ්ජුරුවන් හා සමග විශ්වාස යෙන් මහත්කොට සිතාසී දෙවයන්වහන්ස! අප ඇමදෙනා පැනය කියාගත නුහුනහොත් රටින් යවනසේක්ද? මේත් එක් පැනයක්යයි සිතන සේක්ද? අපි මේ පැනය කියන්නට නොපොහොසතුමෝ නොවම්හ, එතකුදුවුවත් මඳක් ගැටමුනු පැනයෙක, බොහෝදෙනාගේ මැදයෙහි අසන්නට නොපිළිවන, තනිව ඉඳ සිතා පසුව නුඹවහන්සේට කියම්හ, අපට දවසකට අවසරයක් දුන මැනවැ"යි මහබෝසතානන් සලකා ගාථා දෙකකින් කීහ. "මහජනයාගේ රැස්වීමෙහි ජනයාගේ දැඩි කොලාහලයෙන් එකපැහැර අරගල කළ කල්හි විසුරුණු සිත් ඇතියමෝ හෙවත් නානාලම්බනයෙහි පැවති සිත් ඇතියමෝ මේ පැනය කියන්නට නොපොහොසතුම්හ, ජන ප්‍රධානවූ රජ්ජුරුවන්වහන්ස! විවේකයට ගියාවූ එසේහෙයින්ම එකගවූ සිත් ඇති පණ්ඩිතවරු පස්දෙන එකී එකීදෙන වෙන වෙනම තනිව හිඳ පරීක්ෂාකොට ප්‍රශ්නාර්ථයන් සිතා පසුව කියති"යි කීහ. රජ්ජුරුවෝ සෙනකයන්ගේ බස් අසා නොසතුටුවූවද යහපතැයි සිතා පියා මේ පැනය කියනුනුහුණහොත් රටින් යවන්නෙමියි භය ගැන්වූහුමය. සෙනකාදී පණ්ඩිතවරු සතරදෙනද මාලිගාවෙන් බටහ. සේනක යෝ අනික් තුන්දෙනාට "රජ්ජුරුවෝ සියුම් පැනයක් විචාළහ, පැනය කිය නුහුනහොත් මහා අලාභවන්නේය, නෙපි තුන්දෙන සැප ආහාර අනුභවකොට මනාකොට පරීක්ෂාකාරිවවා"යි කියා තමන් තමන්ගේ ගෙට ගියාහ.

මහෞෂධ පණ්ඩිතයෝද හුනස්නෙන් නැඟී උදුම්බරා දේවීන් සමීපයට ගොස් "දේවීන්වහන්ස! අද වේවයි ඊයේ වේවයි රජ්ජුරුවෝ බොහෝ වේලාවක් කොතැන සිටියෝදැ"යි විචාළසේක. මලණ්ඩ! සීමැදුරු කවුළුවෙන් පිටත බලමින් තඹයෙහි සක්මන්කළහයි බිසව කීහ. ඉක්බිත්තෙන්

පණ්ඩිතයන්වහන්සේ රජ්ජුරුවන් විසින් මේ දිසාවෙන් කිසිවක් දක්නාලද වන්නේයයි සිතූසේක. ඒ සථානයට ගොස් පිටත බලා එළුවාගේ හා බල්ලාගේ ක්‍රියාව දැක මුන්දෙන්නා දැක රජ්ජුරුවන් විසින් පැනය සලකන ලදැයි සතුටුහන්කොට ගෙට වැඩිසේක. පුක්කුසාදීවූ අනික් තුන්දෙනත් ප්‍රශ්නයෙහි අර්ථ කල්පනාකොට කිසිවක් නොදැන සේනක පණ්ඩිතයන් සමීපයට ගියාහ. සේනකයෝත් තොප විසින් පැනයෙහි අර්ථ දක්නාලද්දැයි විචාළාහ. නොදක්නාලදැයි කීහ.

"මමත් නොයෙක් ලෙස සලකා පැනයෙහි අර්ථ නුදුටිමි"යි කීහ. තුන් දෙනම නුඹවහන්සේ පැනයෙහි අර්ථ නොදක්නා කල අපි කෙසේ දනුමෝදැයි කීහ. මෙසේ සේනකාදි සතරදෙනම ප්‍රශ්නයෙහි අර්ථ නොදැක රජ්ජුරුවන් සමීපයේදී එක දවසකට අවසර ලදුමෝ නම් සලකා ප්‍රශ්නය විසඳම්හයි සිංහනාද පාපියා ආම්හ. පැනය නොකී කල්හි රජ්ජුරුවෝ කිපෙති. කුමක් කරමෝද"යි සිතා උකටලීව පණ්ඩිතයෙනි! මේ පැනය අප විසින් හවුරුද්දක් ඉඳ සිතුවත් දක්නට නොපිළිවන. එසේ හෙයින් මහෞෂධ පණ්ඩිතයන් විසින් මේ පැනය ශතසහස්‍ර ගුණයෙන් සිතා නිමවනු ලැබෙයි. ගම්ව නොයිඳ උන් සමීපයට යම්හ"යි උන් සතරදෙනා ගොසින් තමන් අවුත් සිටිබව කියා යවා එන්නට කියවයි කීකල මාලිගාවට වැද සිහි කටයුතු සුවදුක් දොඩා එකත් පස්ව සිටියාහු මහෞෂධ පණ්ඩිතයෙනි! නුඹවහන්සේ විසින් පැනය සිතන ලද්දැයි මහබෝසතානන් විචාළහ.

උන්වහන්සේ මා පැනය නොසිතනකල මේ භුවනත්‍රයෙහි අනික් කවරෙක් සිතන්නේද? එසේය පැනය සිතනලදැයි වදාළසේක. පණ්ඩිතවරු සතරදෙන එසේ වීනම් අපටත් වදාළමැනවැයි කීහ. සියලු සතුන් කෙරෙහි පතළ කරුණායෙන් යුක්තවූ මහතානෝ "ඉදින් මම මුන් සතර දෙනාට පැනය නොකියෙම් නම් රජ්ජුරුවෝ මේ ජඩ කොල්ලන්ගෙන් කාය්‍යය කිම්දැයි මුන් සතරදෙනාම රටින් නෙරපණාහ. මෙවැනි පඬිරුවනෙක් නැතැයි මට සත්රුවනින් පූජාකරන්නාහ. එසේ වන්නාට ඒ මාගේ කරුණාවට තරම් නොවෙයි, මේ අඥානයෝ මා වැනි පණ්ඩිතකෙණකුන් ඇතිව ඉන්දදී නො නසින්වායි උන්කෙරෙහි පතළ කරුණායෙන් පැනය උන්ට කියමි"යි සිතා සේනකාදී පණ්ඩිතවරුන් මිටි අස්නෙහි හිඳුවා තමන් වහන්සේ දිශාවට සතරදෙන දොහොත් මුදුනේ තබා වැඳගෙණ ඉඳිනා නියායෙන් සමමතකොට රජ්ජුරුවන් දුටු නියාව නොහඟවා රජ්ජුරුවන් විචාළ කල මේ ලෙස කියවයි සතරදෙනාටම ගාථා සතරක් බැඳලා ඒ ගාථාවල අර්ථ නූගන්වා පාළිය පමණක්ම උගන්වාලා යැවූසේක. ඔහු සතරදෙනද "මහබෝසතානන් වහන්සේද දෙවන දවස් රාජසේවයට ගොස් රජ්ජුරුවන් දැක පණවනලද අසුන් මත්තෙහි උන්නාහ.

රජ්ජුරුවෝ සේනකයෙනි! පැනය දක්නාලද්දැයි සේනකපණ්ඩිතයන් විචාළහ. සේනකයෝ "දේවයන්වහන්ස! මා පැනය නොදක්නා කල අනික් කවරෙක් දකීද"යි වැඳූවත් ඉදිරියේ කොළොම්බු ලන්නාසේ බොධිසත්වයන් මධ්‍යයෙහි තමන්ගේ වියත්කම අඟවා එසේ වීනම් කියවයි රජ්ජුරුවන් කී කල්හි ඇසුව මැනව දේවයන්වහන්සැයි කියා පණ්ඩිතයන්වහන්සේ උගන් වාලු සැටියේම ගාථාව කීහ. එහි අර්ථ මෙසේ දතයුතු:--"ප්‍රසිද්ධ අමාත්‍ය

පුත්‍රයන්ටද රජදරුවන්ටද එළුමස් ප්‍රියය, මතවඩී, අමාත්‍යපුත්‍රාදීහු බලුමස් අනුභව නොකරන්නාහ. එසේවූ එළුවාගේ හා බල්ලාගේ සමගි සංඛ්‍යාත විශ්වාසයවී'' ගාථාව කී බව මුත් සේනක පණ්ඩිතයෝ අර්‍ථ නොදන්නාහ. රජ්ජුරුවෝ වනාහි තමන්ට ප්‍රත්‍යක්‍ෂ විසින් අර්‍ථ දන්නාහු සේනකයන් විසින් පැනය දක්නාලදය. පුක්කුසයන් විචාරමියි දෙවැනිව උන් පුක්කුසයන් විචාළහ. ඒ පුක්කුසයෝ රජ්ජුරුවන්ට ''කිමෙක්ද? මම පණ්ඩිත නොවෙම්දැ''යි උගත් සැටියේ ගාථාව කීහ. එහි අර්‍ථ මෙසේ දතයුතු:––අසුපිට ආස්තරණ සුව පිණිස එළුවාගේ සම් තගන්නාහ. එසේ ආස්තරණසුව කැමති ජනයෝ බල්ලන්ගේ සම අසුපිට නොවතුරන්නාහ. එසේද වුවත් එළුවාගේ හා බල්ලාගේ හා සමගි සමාගම සංඛ්‍යාත විශ්වාසය වී ඒ පුක්කුසපණ්ඩිතයා ගාථායෙහි අර්‍ථ නොදත්තේමය. රජ්ජුරුවෝ තමන්ට අර්‍ථය ප්‍රගුණ හෙයින් ''මුන් විසිනුත් පැනය දක්නාලද්දැ''යි සිතා තුන්වැනිව හුන් කාවින්‍ද පණ්ඩිතයන් විචාළහ. උයිත් තමන් උගත් ගාථාව කීය. ගාථායෙහි අර්‍ථ මෙසේ දතයුතු:– ''එළුතෙමේ ඇඹරී ගිය අං ඇත්තේය. බල්ලාගේ අං නොම ඇත්තේය. එළු තණ කන්නේය. බලු මස් කන්නේය. එසේ වුවත් එළුවාගේ හා බල්ලාගේ සමගි සඞ්ඛ්‍යාත විශ්වාසය වී'' රජ්ජුරුවෝ මුන් විසිනුත් පැනය දන්නේයයි, සතරවැනිව හුන් දෙවින්‍ද පණ්ඩිතයන් විචාළ. උයිත් තමන් උගත් ගාථාව කීහ. එහි අර්‍ථ මෙසේ දතයුතු;—''එළු තෙමේ තණ හා කොළ කන්නේය. බලු තෙමේ තණ කොළ නොකන්නේය. වැලි කුමක් කරන්නේද?යත් බලු තෙමේ සාවුන් හා බළලුන් කන්නේය. එසේද වුවත් එළුවාගේ හා බල්ලාගේ හා සමගි සමාගම සංඛ්‍යාත විශ්වාසය වී.''

මෙසේ සේනකාදී සතරදෙන තමන් තමන් උගත් ගාථා පමණක් කී කල්හි රජ්ජුරුවෝ තමන්ට අර්‍ථ ප්‍රකාශ හෙයින් ගාථාවල අර්‍ථ උන් අතින් නොවිචාරා පස්වැනිව හුන් අසරණ සරණ කරුණා නිධාන ජනමූර්තිවූ මහෞෂධ පණ්ඩිතයන් අතින් ''පණ්ඩිතයෙනි! තෙපි පැනය දනිව්දැ''යි විචාළහ. දෙවයන්වහන්ස! අවීචියෙහි පටන් භවාග්‍රය දක්වා මා විනා අනික් කවරෙක් මේ පැනය දනීදැ''යි සිංහනාද කළසේක. රජ්ජුරුවෝ එසේවීනම් කියවයි කීහ. ඇසුව මැනව දෙවයන්වහන්සැයි කියා එළුවාගේ හා බල්ලාගේ ක්‍රියාව තත්වූ පරිද්දෙන් දත් බව ප්‍රකාශ කරණසේක් ගාථා දෙකකින් කීසේක. ඒ ගාථාවල අභිප්‍රාව නම්:– පාඅටෙක් ඇති හෙවත් සතර පයෙහි අටකුරෙක් ඇති එළුතෙමේ මස්ගන්නා වේලෙහි කිසිකෙණෙකුන්ට නොපෙණී මේ බල්ලාට මස් ගෙණෙන්නේය. මේ බල්ලාද එළුවාට තණ ගෙණෙන්නේය බල්ලාගේද එළුවාගේද යන මොවුන් දෙදෙනාගේ ගොචර පිණිස ඔවුනොවුන්ව මෙහෙවර කරණ පෙරළිය ජනප්‍රධානවූ වෛදෙහ නම් රාජෝත්තම තෙමේ ප්‍රාසාදයෙහි සිටියේ ප්‍රත්‍යක්‍ෂකොට දිටීලයි වදාළසේක. රජ්ජුරුවෝද මහබෝසතාණන් නිසා සෙනකාදි පණ්ඩිතවරුත් සතරදෙන පැනය දන්බැව් නො දැන මේ පණ්ඩිතවරු පස්දෙනම තමන් තමන් නුවණ බලයෙන්ම පැනයෙහි අර්‍ථ දුටහයි සිතන්නාහු සොම්නස් වූවා ගාථා දෙකකින් ''මෙබඳු'' පණ්ඩිතවරහු යම්බඳුවූ මාගේ කුලයෙහි වෙද්ද, එසේ හෙයින් එකාන්තයෙන්

මට වූයේ බොහෝ ලාභයෙකැයි කීහ මෙසේ පණ්ඩිතවරුන්ගේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි සතුටුවූ මා විසින් උන්ට උපකාර කළමනා වේදැයි උපකාර කරන්නාහු “සුවිනිශ්චිත ප්‍රශ්න විසර්ජනය කරණකොටගෙණ වෙසෙසින්ම සතුටු සිත් ඇත්තෙමි. පණ්ඩිතවූ තොප හැමදෙනාටම අජානීය අශ්වයන් යෙදූ එකි එකී රථයක්ද වස්ත්‍රාභරණ ධන ධාන්‍යයෙන් සමෘධවූ එකි එකී ගම්වරක්ද දෙමි”යි කියා මෙකී සියල්ල පණ්ඩිතවරුන් පස්දෙනාට දෙවූහ.

එළක ප්‍රශ්නයයි.

උදුම්බරාදෙවී වනාහි සෙනකාදි පණ්ඩිතවරු සතරදෙනාම මහෞෂධ පණ්ඩිතයන් නිසා ප්‍රශ්නය දත්බව දැන “රජ්ජුරුවන්වහන්සේ මූං හා උඳු හා වෙනසක් නොකරන්නාක්හු මෙන් පස්දෙනාටම උපකාර සමසේ කළහ. මාගේ මලනුවන් මහෞෂධ පණ්ඩිතයන්ට විශෙෂකොට සත්කාර කරණ බව සුදුසුම වේදැ”යි රජ්ජුරුවන් සමීපයට ගොස් “දෙවයන්වහන්ස නුඹ වහන්සේට පැනය කා විසින් කියන ලද්දැ”යි විචාළහ. සොඳුර! පණ්ඩිතවරු පස්දෙනා විසිනැයි කීහ, දෙවයෙනි! සෙනකාදී පණ්ඩිතවරු සතරදෙන ඒ පැනය කා නිසා දත්හයි සිතූසේක්දැයි විචාළාහ. සොඳුර! නොදනිමියි කීහ. දෙවයන්වහන්ස! ඒ සෙනකාදී සතරදෙන කුමක් දනිද්ද? මහෞෂධ පණ්ඩිතයෝ වනාහි මේ අඥනයෝ නොනසිත්වයි සිතා පැනය ඉගැන්වූහ. නුඹවහන්සේ හැමදෙනාටම සමසමයේ උපකාර කළසේක. ඒ අයුක්තිය, මහෞෂධ පණ්ඩිතයන්ට වැඩියක් උපකාර කරණ බව සුදුසුය”යි කීහ. රජ්ජුරුවෝ තමන් නිසා පැනය දත්බව නොකිවූයයි මහෞෂධ පණ්ඩිතයන් වහන්සේට සතුටුව වඩා උපකාරයක් කරණු කැමැත්තෝ “වන්නාටය මපුතනුවන් එක් පැනයක් විචාරා ඒ පැනය කීකල මහත් සත්කාර කරන්නෙමි”යි සිතූහ.

මෙසේ සිතා ඊට සුදුසු පැනයක් සිතන්නාහු සිරිමන්ද ප්‍රශ්නය සිතූහ. ඒ ප්‍රශ්නය චින්තනයකොට එක්දවසක් පණ්ඩිතවරුන් පස්දෙනා සෙවයට අවුත් පිළිසඳර කථායෙන් සුවසේ උන්කල්හි සෙනකපණ්ඩිතයන්ට “සෙනක පණ්ඩිතයෙනි! පැනයක් විචාරමි”යි කීහ “දෙවයන්වහන්ස! විචාළ මැනවැ”යි කීහ රජ්ජුරුවෝ සිරිමන්ද ප්‍රශ්නයෙහි පළමුවන ගාථාවෙන් “නුවණ ඇති සම්පත් නැති හස්ත්‍යශ්වාදි පරිවාර සම්පත් ඇති නුවණ නැති මූන් දෙන්නා අතුරෙන් නුවණැත්තෝ කවුරුන් උතුමැයි කියද්ද? සෙනකයෙනි! එකෙක් පොළොව හා සමාන නුවණ ඇත්තේය, දිළිඳුය. එකෙක් පරිවාර සම්පත් ඇත්තේය, අඥනය. මූන් දෙන්නාගෙන් කවුරු උත්තමයයි තොපට වැටහේද? මේ කාරණය කියා බලව”යි කීහ. මේ පැනය වනාහි සෙනක පණ්ඩිතයන්ගේ පරම්පරාවෙන් පැවත ආයේය. එසේ හෙයින් ඒ සිරිමන්ද ප්‍රශ්නය වහාම රජ්ජුරුවන්ට කීහ කෙසේද?යත් “ජනප්‍රධාන රජ්ජුරුවෙනි! එකාන්තයෙන් නුවණැත්තෝද නුවණනැත්තෝද හස්ත්‍යශ්වාදි ශිල්පයෙන් යුක්තයෝද කිසි ශිල්පයක් නොදන්නාහුද ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදි උතුම් ජාතී ඇත්තාහුද යන සියල්ලෝම ජාතියෙන් හීන වුවත් සම්පත් ඇති තැනැත්

තවුව කී තොකී දෙය කොට සේවාව යවත් වත්තාහ. මේ කාරණය දැන මම කියමි, නුවණැති තැනැත්තේ යටත්මය, සම්පත් ඇති තැනැත්තේම උතුමැ''යි කීහ.

රජ්ජුරුවෝ සෙනකයාගේ බස් අසා පුක්කුසාදී තුන්දෙන නො විචාරාම පස්දෙනාට කෙළවර උන් මහෞෂධ පණ්ඩිතයන් වහන්සේට අලාමකවූ නුවණ ඇති සියලු ධර්මයන් සම්‍යකාරයෙන් දන්නාවූ මහෞෂධ පණ්ඩිතයෙනි! තොප විචාරමි, නුවණැති පරිවාර සම්පත් නැති නුවණ නැති පරිවාර සම්පත් ඇති මේ දෙදෙනා අතරෙන් නුවණැත්තෝ කා උතුමැයි කියද්ද? කියා බලව'' කීහ. ඉක්බිත්තෙන් මෙසේ විචාළ රජ්ජුරුවන්ට ඇසුව මැනව දෙවයන්වහන්සැයි ගාථාවකින් සථානාන්තරාදි කිසි ලාභයක් සම්පත්තියක් ලදින්ම මේ උතුමැයි සිතන්නාහු අඥාන තෙමේ පාණාතිපාතාදි පාපධර්මයන් කරන්නේය. එසේ හෙයින් මේ ලොව බලන්නේ ඓශ්වර්‍ය්‍ය මදයෙන් ප්‍රමාදව කළාවූ පාපකර්ම බලයෙන් නරකාදියෙහි අනන්ත දුඃඛයට භාගිවන්නේයයි මෙසේ උපෙක්‍ෂා පූර්ව්ඛගමවූ චින්තාවක් නැතිව පරලොව නො බලන්නේ දෙලොවෙහිම නෙවත් ඉසුරු මදයෙන් පච්කොට නරකාදියෙහි උපදනේ පරලොවද, නැවත එයින් චුතව දිළිඳු කුලයෙහි තොහොත් දුකට භාජනව උපදනේ මේ ලොවෙදැයි මෙසේ දෙලොවෙහිම නුවණ නැති තැනත්තේ පරජයක් ගන්නේය, නෙවත් විනාශයකට පැමිණෙන්නේය. මේ කාරණය දැක මම නුවණැත්තේම උතුම, යසසින් යුක්තවූ නුවණ නැති තැනැත්තේ උතුම් නොවෙයි කියමි''යි වදාළසේක.

මෙසේ බෝසතානන්වහන්සේ විසින් වදාළ කල්හි රජ්ජුරුවෝ සෙනකයන් මුහුණ බලා මහෞෂධ පණ්ඩිතයෝ නුවණැත්තහු උතුමැයි කියති, කෙබඳුද ආචාර්‍ය්‍යයෙනියි! කීහ. සෙනකයෝ ''දෙවයන්වහන්ස! මහෞෂධ පණ්ඩිතයෝ ලදරුවෝය, අද දක්වාත් උන්ගේ මුඛය කිරිසුවඳ අමයි, මේ බැල දරුවෝ කුමක් දනිද්දැයි කියා ගාථාවකින් කාරණයක් දක්වන්නාහු, ''මේ ශිල්පතෙමේ හෙවත් නුවණතෙමේ ධනධාන්‍යාදීවූ භොග සම්පත් සිඩ නොකරන්නේය, පුත්‍රාදීවූ නෑයෝද රූප සම්පත්තියද, ධන ධාන්‍යාදීවූ සම්පත් සිඩ නොකරන්නාහ, ඊට දෘෂ්ටාන්ත කවරේදැයි යනහොත්, කෙල තොලුවූ හෙවත් අනවරතයෙන් දෙතොළින් බස්නා කෙලධාරා ඇති රූප සම්පත්තියක් නැති හස්ත්‍යශ්වාදි පරිවාරයෙන් හා ධනධාන්‍යාදි සම්පත්තීන් යුක්තව සුවවිඳිනා මේ ගොළිමන්ද නම් සිටුහු ශ්‍රී කාන්තා සෙවුනීය, දෙවයන්වහන්ස! බලා වදාළ මැනව, මේ කාරණය දැක නුවණැතිවත් දිළිඳු තැනැත්තේ උතුම් නොවෙයි, නුවණ නැතිවත් ඉසුරුමත් තැනැත්තේම උතුමැයි මම කියමි'' කීහ.

ඒ ගොරිමන්ද සිටානෝ වනාහි කෙසේවූ කෙණෙක්ද?යත් ඒ මියුලු නුවරම අසුකෙළක් සම්පත් ඇති සිටාන කෙණෙක, උන්ගේ බැළියසුතු රූපයකුත් නැත්තේය, පුත්‍රකෙණකුත් නැත්තාහ, දියනි කෙණකුත් නැසිය කෙණකුත් නැත්තාහ, කිසි ශිල්පයකුත් නොදන්නාහ; බැණනැගි කල්හි ඒ ගොරිමන්ද සිටානන්ගේ දෙකොළින් කෙලධාරාවත් වැගිරෙන්නේය, එසේ

වැහෙන්නාවූ කෙලධාරාවන් දෙව්ගතන් සමාන රූ ඇති සර්වාලංකාරයෙන් සැරහුනු ගැණු දෙදෙනෙක් සුපිපි තිලුපුල් කලඹ් දෙකක් ගෙණ දෑලයෙහි සිට තිලුපුල් මලින් පිස මල් වීපියට දමත්තාහ. රා සොඬොහු රා හලට යන්නාහු තිලුපුලින් ප්‍රයෝජනයක් ඇති කල්හි ඒ ගොරිමඬ සිටානන්ගේ ගෙදොරට ගොස් "ස්වාමීනි ගොරිමඬ සිටානන්වහන්සැයි කියන්නාහ, ඒ සිටානෝ රා සොඬුන්ගේ බස් අසා සීමැදුරු කවුළුව සමීපයේ සිට කිමෙක්ද දරුවෙනි! කියන්නාහ. ඉක්බිත්තෙන් බැණ තැංගාවුන්ගේ දෙකොළින් කෙලධාරා වැහෙන්නේය. තිලුපුල් මල් ගත් අත් ඇතිව සැරහී දෑලයෙහි ගැණු දෙන්නා මලින් කෙලපිස මල් අතුරු වීපියට දමත්තාහ. රා සොඬහු ඒ මල් ගෙණ දියෙහි සලාපියා පැලඳගෙණ රා හලට වදනාහ. ඒ ගොරිමඬ සිටානෝ තම් මෙබඳු සම්පත් ඇත්තාහ. සෙනකයෝ මේ දෘෂ්ටාන්ත කොට රජ්ජුරුවන්ට කීහ.

සේනකයන් කී බස් අසා රජ්ජුරුවෝ පුත මහෞෂධ පණ්ඩිතයෙනි! යි කීහ. මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ "දෙවයන්වහන්ස! සෙනකයෝ කුමක් දනිද්ද? බත්හුලු වැගිරගිය තැන අවුලාකන කපුටුවකු වැන්නේය, ඉසහෙන මුගුරු නොබලා දී බොත්ට වන් බල්ලකු වැන්නේය, මෙලොව විඳගන්නා සම්පත්ම බලයි, ඉස වැටෙන අපා දුක් නමැති මහමුගුරු නොබලයි, ඇසුව මැනව දේවයන්වහන්සැයි ගාථාවකින් කාරණයක් දක්වනසේක් "නුවණ නැත්තේ සුවයක් ලදින් එහිම ඇලුනේ කුශල කර්මයෙහි පමාවන්නේය. ප්‍රමාද ප්‍රත්‍යයෙන් පව් කරන්නේය. ඥාතිව්‍යසනාදිවූ අනෙක ප්‍රකාරවූ දුකින් මඩනා ලද්දේ විශෙෂයෙන්ම මූලාබවට පැමිණෙන්නේය, අමුතු අමුතුව චක්‍රාකාරයෙන් පවත්නාවූ සුව දුකින් පීඩිතවූයේ ග්‍රීෂ්ම කාලයෙහි දියෙන් ගෙණ හැර අව්වෙහි ලූ මසකුමෙන් වෙව්ලන්නේය, මේ කාරණය දැක මම නුවණැත්තේම උතුම, ඉසුරුමත් නැනැත්තේ උතුම් නොවෙයි කියමි"යි වදාළසේක.

මහබෝසතානන්වහන්සේ වදාළ කාරණය අසා රජ්ජුරුවෝ කෙබඳුද ආචාර්‍යයීයෙනියි කීහ. සෙනක පණ්ඩිතයෝ "දෙවයන්වහන්ස! මූ කුමක් දනීද? මිනිස්සු සිටින්වා හෙවත් මිනිසුන් තබා වල හටගත් ගසක් ඵල සම්පන්නවීනම් එසේවූ ගසටම පක්ෂීහු එළඹෙන්නාහ"යි කියා ගාථාවකින් එම උපමාව දක්වන්නාහු "වල හටගත් මියුරු පක් ඇති වෘක්ෂයට අනෙක ප්‍රකාරවූ ශාරිකා ශකුනාදී ලිහිණියෝ හාත්පසින් යම්සේ අවුත් රැස්වෙද්ද, එපරිද්දෙන්ම පොහොසත් රත්රන් අමුරන් ආදී ධන සහිතවූ අවශෙෂ උපභොග පරිභොග වස්තු ඇති මෙබඳු පුරුෂයා බොහෝදෙන තමන්ට වැඩ පිණිස සෙවුනාහ. මේ කාරණය දැක මම නුවණැතිවත් දිළිඳු නැනැත්තේ උතුම් නොවෙයි, නුවණ නැතිවත් ශ්‍රීමත් නැනැත්තේම උතුමැයි කියමි"යි කීහ.

සෙනකයන් කී කාරණය අසා රජ්ජුරුවෝ කිමෙක්ද පුත මහෞෂධ පණ්ඩිතයෙනි! යි කීහ. මේ සෙනක පණ්ඩිතයෝ කුමක් දනිද්ද? ඇසුව මැනව දෙවයන්වහන්සැ"යි කාරණයක් දක්වනු නැනැත්තෝ ගාථාවකින්

“පවත්වතලද අනසක ඇති නුවණ නැත්තේ උතුම් නොවෙයි. කුමක් හෙයින්ද? යත් තාඩන බන්ධනාදී නොයෙක් දරුණුකමින් ජනයන්ට දුක්දී වස්තු ලබන්නේය. එසේවූ අඥානයා බලවත් පශ්චාත්තාප දුඃඛයෙන් අභිභූතව හඬන්නාම භයානකවූ නරකයට යම්පල්ලෝ නොකැමැතියේම අදනාහ, හෙවත් නරකයෙහි බොහෝ දුකට පැමිණෙන්නේය, මේ කාරණයද දැක මම දිළිඳු වුවත් නුවණැත්තේම උතුම, ඉසුරුමත් වුවත් නුවණ නැත්තේ උතුම් නොවෙයි කියමි”යි වදාළසේක.

නැවත රජ්ජුරුවන් විසින් කිමෙක්ද සෙනකයෙනියි කී කල්හි ගාථාවකින් කාරණයක් දක්වන්නාහු, “ඇල හෝ කඳුරැලි ආදි කිසි ජලාශය කෙණෙක් නිම්නව ගොස් ගඟට අඬා බසින්ද, ඔහු හැමදෙනම තමන් තමන්ගේ යථෝක්තවූ නොය, ඇල යනාදි නම්ගොත් හරණාහ, ඒ ඇල හෝ ආදීන්ගේ ප්‍රවෙශයට ආධාරත්වයෙන් ගංගාතොමෝ මහමුහුදට වදනා ලබන්නී ගංගාය යන ව්‍යවහාරය නැතිව ගොස් මුහුද හා එක්වීමෙන් මුහුදයයි යන ව්‍යවහාරයට යන්නේද? එපරිද්දෙන් ලෝවැස්සෝ තුමූ සම්පත් ඇත්තවුන්ම පිහිටකොට ඇත්තාහ. හෙවත් මහා නුවණැත්තෝද ඉසුරුමත් නැනැත්තවුන් කරා පැමිණ මුහුදටවන් ගඟක්සේ තෙජස් නැති හෙයින් ප්‍රසිඬව නො පෙණෙන්නේය, මේ කාරණය දැක මම නුවණැත්තේ උතුම් නො වෙයි ඉසුරුමත් නැනැත්තේම උතුමැයි කියමි”යි කීහ.

නැවත රජ්ජුරුවෝ කිමෙක්ද මහෞෂධ පණ්ඩිතයෙනි! කීහ. පණ්ඩිතයන්වහන්සේ “ඇසුව මැනව දෙවයන්වහන්සැයි කියා ගාථා දෙකකින් කාරණයක් වදාරණසේක් “මහත්වූ සාගරයෙක් උපමා කෙරෙද්ද, ඒ සාගරයට ගංගා යමුනා අචිරවතී ආදිවූ අනෙකප්‍රකාර ගං හෝ හැමකල්හිම මෙතෙක් ගඟ, මෙතෙක් නොය, යන ප්‍රමාණයක් නැතිව නොයෙක් දිගින් හඬා බසිද්ද, සමුද්‍ර සංඛ්‍යාත ඒ සාගරය තෙමේ අනවරතවූ සියදහස්ගණන් මහත්වූ රළ වෙග ඇත්තේ වෙරළ ඉක්මගන නොහී වෙරළම ගැසී බිඳේද, එපරිද්දෙන්ම නුවණ නැත්තහුගේ තෙපුල් නුවණැත්තහු ඉක්ම නො පවත්නේමය. යම්කිසි අර්ථානර්ථයෙක්හි උපන් සැකයෙක් ඇත්නම් ඉසුරුමත් හුද දිළිඳු වුවත් නුවණැත්තහු කරා පැමිණ විනිශ්චය කරන්නාහුය, මේ කාරණය දැක මම නුවණැත්තේ උතුම, ඉසුරුමත් නුවණනැත්තේ උතුම් නො වෙයි කියමි”යි වදාළසේක.

බෝසතාණන්වහන්සේ වදාළ කාරණය අසා රජ්ජුරුවෝ කිමෙක්ද සෙනකයෙනියි! කීහ. සෙනකයෝ “ඇසුව මැනව දෙවයන්වහන්සැයි ගාථාවකින් කාරණයක් දක්වන්නෝ “කායාදී සංයමයක් නැතිවත් යමෙක් පරිවාර සම්පත් ඇත්තේ වීනම් එබඳු ඉසුරුමත් පුරුෂතෙමේ මහපිරිස් පිරිවරා අධිකරණයෙහි හිඳ අනුන්ට පරලොවින් වැඩක්වන කාරණයක්වත්, අවැඩක්වන කාරණයක්වත් කියන්නේ වීනම් තෙජස් වී හෙයින් සභාමධ්‍යයෙහි ඔහුගේ බසම නැගෙන්නේය, ඉසුරුමත් නැනැත්තේ හිමියන් නොහිමිකිරීම් ආදිවූ අවැඩට පුදුසු බසකුදු කිවහොත් සභාවට ඇදහිය යුතු බව ශ්‍රී කාන්තාම කරන්නීය. ප්‍රඥාතොමෝ එසේ කොටලිය නොහෙන්නීය.

මේ කාරණයද දැක මම නුවණැත්තේ යටත්මය ශ්‍රීමත් තැනැත්තේම උතුමැයි කියමි''යි කීහ.

නැවත රජ්ජුරුවන් විසින් ''කිමෙක්ද පුත මහෞෂධ පණ්ඩිතයෙනි!'' කී කල්හි පණ්ඩිතයන්වහන්සේ ''මේ කෙලතොලු සෙනකයා කුමක් දනීද''යි වදාරා ගාථාවකින් කාරණයක් වදාරණසේක් ''මඳ නුවණැති බාල තෙමේ අනුන් නිසාවත් තමා නිසාවත් බොරු බෙණෙයි නම් හේ සභා මැද නින්දා ලබයි, පරලොව අපාය ගාමිද වෙයි. මේ කරුණින් බලා නුවණැත්තේම උතුම. නුවණ නැති ඉසුරුමත් තැනැත්තේ උතුම් නොවෙයි මම කියමි''යි වදාළසේක.

ඉක්බිත්තෙන් සෙනක පණ්ඩිතයෝ ගාථාවකින් කාරණයක් දක්වන් නාහු වී තැළියක් සාල්තැළියක් වෙල්හැල් තැළියක් පමණවත් නැති, අකක් මස්සක් පමණවත් වස්තුවක් නැති එසේහෙයින් වේලායෙන් වෙලාවට දුකසේ ජීවත්වන්නාවූ පොළොව සමානවූ නුවණැත්තේ සභාමධ්‍යයේ ඉඳ ඉඳින් කාරණයකුදු කියා නම් ඔහුගේ වචනය සභාවට නොනැගෙන්නේය. යමෙක් නුවණ නැතිවත් ඉසුරුමත් වීනම් ශ්‍රී ඔහු සෙවිනීය. එසේ හෙයින් ඉසුරුමත් තැනැත්තහු සම්මුඛයේ නුවණැත්තේ කඳෙපැණියෙක් මෙන් වැටහෙන්නේය, මේ කාරණය දැක මම ප්‍රඥාවන්ත තැනැත්තේ හීනමය, ඉසුරුමත් තැනැත්තේම උත්කෘෂ්ටයයි කියමි''යි කීහ.

නැවත රජ්ජුරුවන් විසින් කිමෙක්ද පුත මහෞෂධ පණ්ඩිතයෙනි! කී කල්හි පණ්ඩිතයන් වහන්සේ සෙනකයා කුමක් දනීද? මේ ලොව විඳ ගන්නා යශස බලයි, පරලොව අපාය දුක් නොබලයි, කියා ගාථාවකින් කාරණයක් දක්වනසේක්, උදාරවූ නුවණැත්තේ අනුන්ගේ බිඳීම පිණිස වේවයි බොරුවක් නොකියන්නේය. සබවස රක්නාවූ හෙතෙමේ මහපිරිස් මැද බොහෝදෙනා විසින් කී නියා යහපතැයි පිදිය යුතු වන්නේය. පරලෙව් හිදු සුභාෂිත කාරණයෙන් සුගතියටම යන්නේය. මේ කාරණයද දැක මම නුවණැත්තේම උතුම, නුවණ නැති ඉසුරුමත් තැනැත්තේ උතුම් නොවෙයි කියමි''යි වදාළසේක.

නැවත කෙසේදැයි විචාළ රජ්ජුරුවන්ට සෙනකයෝ ගාථාවකින් උත්තරයක් කියන්නෝ ''මහරජ! ඇසුව මැනව, ඇතුන් අසුන් ගවමහිෂාදි වස්තු හා මුතු මැණික් ආදිවූ රුවන්ද, මැණික්මය කුණ්ඩලාභරණ හා කතක කටක නූපුර යනාදී ආභරණයෝද, ඉසුරු කුලයෙහි උපන්නාවූ දෙවඟනන් හා සමාන වරඟනෝද; අවශෙෂ පරිවාර ජනයෝද යන සියල්ලෝම පොහොසත් තැනැත්තහුට උපභොග පරිභොග පිණිස වන්නාහ. නුවණ ඇතත් දුක්පත් තැනැත්තහුට එසේ වන්නාහු නොවෙති. මේ කාරණයෙනුත් නුවණැත්තේ උතුම් නොවෙයි. සම්පත් ඇත්තේම උතුමවෙයි කියමි''යි කීහ.

ඉක්බිත්තෙන් පණ්ඩිතයන් වහන්සේ වදාරණසේක් “මේ නුවණ නැති සෙනකයා කුමක් දනීද”යි එක් කාරණයක් ගෙණහැර දක්වන්නෝ ගාථාවකින් නොසලකා කරණලද මෙලොවින් පරලොවින් අනර්ථදායකවූ කටයුතුඇති අඥානවූ නෙපුල් ඇති මඳ නුවණැත්තහු දිරාගිය සැවයක් නිරාපෙක්ෂා කොට හැරපියා යන සර්පයෙකුමෙන් ශ්‍රී තොමෝ හරණීය තවද ඊට කාරණා කිමෙක්ද? යතහොත්; ප්‍රථම කල්පයෙහි අකුසල් නම් කලු බව සුදු බව නොදන්නා මිනිසුන්ට ආයු බොහෝ සමයෙහි දඹදිව චෙතිය නම් රජකෙණෙක් ඇතිවූහ. උන්ගේ ශරීරයෙන් සඳුන් සුවඳ හමන්නේය. මුඛයෙන් මහනෙල්මල් සුවඳ හමන්නේය. ආකාශයෙහි පලක් බැඳගෙණ ඉඳිනට සමර්ථ සෘද්ධි ඇත්තාහ. කාමාවචර දෙවියෝ සතරදෙනෙක් නිරන්තරයෙන් රෑ දවල් ආරක්ෂා ඇතිව රුකවල් ගෙණ සිටිනාහ. අනන්ත ඇතුන් අසුන් ආදීවූ සිවුරඟ සෙනඟින් යුක්තව දසදහසක් යොදුන් දඹදිවට අගරජ කරන්නාහ. එසේවූ ඒ චෙතිය රජ්ජුරුවන් කී බොරුවෙන් ශරීරයෙන් නික්මෙන චන්දන ගන්ධයද මුඛයෙන් නික්මෙන උත්පල ගන්ධයද නැතිව දුර්ගන්ධ හමන්නටවන. සතරදිග රුකවල්ගෙණ සිටි දෙවියෝ ඔහු හැරපියා නැගී ගියාහ. ආකාශයෙහි පලක් බැඳ සිටිනට සමර්ථ සෘද්ධි නැතිව බිමටම බටුවාහුය. කීවාවූ මුසාවාදය කාරණ කොටගෙණ ජීවමාන ශරීරයෙන්ම පොළොව විවරව අවීචියෙන් ගිනිදැල් අවුත් රත්පලසක් බඳුව වළඳිනා ලද්දාහු නරකයෙහි උපන්හ. සතරදිග දෙවියන් රුකවල් ගත් එබඳු ඔහුගේ සැපත පවා නුවණ නැතිව අපායට යනකල පිටිවහල් නොවී මුහුද එතරව මෙතෙරසේද, ආකාශයට පොළොවසේද නොලං විය. එසේහෙයින් මේ කාරණය දැක මම නුවණැත්තේම උතුම, නුවණ නැති තැනැත්තේ උතුම් නොවෙයි කියමි”යි වදාළසේක.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ කිමෙක්ද සෙනකයෙනි! යි කී කල්හි කිමෙක්ද දෙවයන්වහන්ස! මේ බාලදරුවෝ කුමක් දනිද්ද? තවත් මාකියන කාරණයක් ඇසුව මැනවැයි “පණ්ඩිතයන්වහන්සේ කරබාවම් හෙවත් කියන ලද උත්තරයක් ඇත්නම් නැති කෙරෙමි”යි සිතා ගාථාවකින් කාරණයක් දක්වන්නාහු දෙවයන්වහන්ස! නුවණින් නිරණය කටයුතුවූ කාරණයෙහිම සැක උපන්කල සෙනකාදී පණ්ඩිතවරුන් කැඳවයි අප හැම කැඳවා යවූ ඔබවහන්සේගේ සැකදුරලන මෙසේවූ ප්‍රඥසම්පන්නවූ අපි පණ්ඩිතවරු පස්දෙනම දෙදෙව්ලොව දෙවියන් පිරිවරා ඔවුන්ගේ ආනුභාව මැඩපවත්වන්නාවූ සක් දෙව් රජහුමෙන් කීර්ති හා තෙජසින් පරිවාර සම්පත්තීන් මැඩගෙණ පවත්නාසේක. ඉදින් නුවණැත්තවුන් උතුම්වූවහොත් අප අනුශාසනාව සිටිබැවින් ඔබවහන්සේ අපට යමක් වුවමනාවේද, එසේද නොවන හෙයින් මේ කාරණය දැක මම නුවණැත්තේ උතුම් නොවෙයි පරිවාර සම්පත් ඇති තැනැත්තේම උතුමැ”යි කියමි.

සෙනකයන් විසින් කියනලද දූන් මෙවූ කාරණයම අසා රජ්ජුරුවෝ සෙනකයන් විසින් ගෙණහැර දක්වන ලද්දාවූ මේ කාරණය ඉතාම සනපත මපුතනුවෝ මහෞෂධ පණ්ඩිතයෝ මේ සෙනකයාගේ වාදය බිඳ

අනික් කාරණයක් ගෙණහැර දක්වන්නට පොහොසත්හුද්දෙහෝ''යි සිතා මේ කිමෙක්ද? පණ්ඩිතයෙනි!යි කීහ. සෙනකයා තමන් විසින් මේ කාරණය ගෙණහැරදක්වූකල මහබෝසතාණන්වහන්සේ විතා ඒ වාදය බිඳින්නට සමර්ථ අනික් කෙණෙක්මුළු දඹදිව නැත්තාහ. එසේහෙයින් බෝධිසත්වයන් වහන්සේ තමන්වහන්සේගේ විදුරක් සමාන අසාධාරණවූ ප්‍රඥානුභාවයෙන් ඒ සෙනකපණ්ඩිතයන්ගේ වාදය බිඳිනාසේක්, ''දෙවයන්වහන්ස! මේ නුවණ නැති සෙනකයා කුමක් දනීද? මේ ලොව විඳගන්නාවූ යසස් බලයි නුවණෙහි අරුම නොදන්නේය, නුවණෙහි අරුම ඇසුව මැනව දෙවයන් වහන්සැ''යි කියා ගාථාවකින් කාරණා දක්වනසේක්, නුවණ ඇත්තන් විසින්ම පසිඳවිය යුතුවූ එබඳු කටයුත්තක් උපන් කල්හි නුවණ නැති ඉසුරුමත් තැනැත්තේ නුවණ ඇත්තවුට ගැත්තකු මෙන් පවත්නේය. නුවණැත්තේ ප්‍රඥයෙන් කටයුතුවූ සියුම්වූ යුක්ති ආදි ගැටමුනු කාරණාක් සැකහැර කියාද එබඳු කාරණයෙහි නුවණැත්තන් අවලොකනයකොට ගනනොහී ඒක්ෂණයෙහි කණගෙරි වල්වන්නාසේ මූළා බවට පැමිණෙන්නේය. මේ කාරණය දැක නුවණැත්තේම උතුම, සම්පත් ඇති නුවණැත්තේ උතුම් නොවෙයි කීහ. මෙරගල් මුදුනෙහි සත්රුවන් ගෙණහැර වගුරුවන්නාහු මෙන්ද? ආකාශයෙහි පුන්සඳ මඬල ඔසවා පාන්නාක්මෙන්ද උත්තර ගෙණහැර දක්වූසේක මෙසේ මහබෝසතාණන්වහන්සේ විසින් නුවණෙහි අරුම වදාළ කල්හි, ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ සෙනක පණ්ඩිතයන්ට කිමෙක්ද? සෙනකයෙනි! පෝසතු නම් උත්තරයක් කියව''යි කීහ.

සෙනකයාත් කොටුවෙහි පටවා තුබූ වී කා නිමවා කොටුපත්ල අතගා පියා රැකෙන මාන සිතන එකක්හු මෙන් උගත් උත්තර නිමවාපියා මත්තෙහි වැටහෙන උත්තරයක් නැත්තේ එසේහෙයින් කරබාගෙණ කොඳුර කොඳුරා සිතිවිල්ලේ හුන්නේය. ඉදින් ඒ සෙනකයෝ අනික් උත්තරයක් ගෙණහැර කිවුනම් ගාථා දහසකින්වත් මේ උම්මග්ග ජාතකය නොනිමෙන්නේය, ඒ සෙනකයන් කියනෙන උත්තරයක් නැතිකල්හි ගැඹුරු මහවතුරක් එකපැහැර නමන්නාක්හු මෙන්ම, ආකාශගංගාව පොළෝතලයට බහින්නාක්හු මෙන්ද, මහබෝසතාණන්වහන්සේ මත්තේ ප්‍රඥාවම වර්ණනාකරණසේක් ගාථාවකින් ''ඒකාන්තයෙන්ම බුදු පසේබුදු මහරහතුන් ආදීවූ නුවණැත්තවුන් විසින් නුවණ උතුමැයි පසස්නාලදී, යම් හෙයකින් නුවණ නැති මිනිසුන් සම්පතෙහි ඇලුනාහු නම් එහෙයින් ශ්‍රී කාන්තාව උතුමැයි කියති. මෙලොව පරලොව දන්නා නුවණින් වැඩිසිටියන්ට මේ යසස් නම් ගැරවිල් කුණක් හා සමානය, ප්‍රඥාව අසදෘශවූ සවරූප ඇත්තීය. එසේහෙයින් මහාසාගරයට වෙරළ ඉක්මගත නොහෙන්නාසේ ශ්‍රී කාන්තානොමෝ කිසිකලෙකත් ප්‍රඥාවන්තයා ඉක්මගත නොහෙන්නීය දෙවයන්වහන්සයැ''යි වදාළසේක.

ඒ අසා රජ්ජුරුවෝ මහබෝසතාණන්වහන්සේගේ ප්‍රශ්න විසර්ජනයෙන් සතුටුව බුදුකෙණකුන් පරිද්දෙන් අපට විසඳූ කීහ. ඒ තොපගේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි සතුටුවූ මම, ගෙරි දහසක්ද නැගෙන්නට උතුම් හස්ත්‍යලඞ්කාරයෙන් සරහන ලද්දාවූ සුශික්ෂිත හස්තිරාජයෙක්ද, ආජානීය

අසුන් යොදනලද රථාලඞ්කාරයෙන් සරහනලද රථ දහසක්ද, ධන ධාන්‍යයෙන් සමෘද්ධවූ එකී එකී ගමින් අවුරුද්දකට ලක්‍ෂයක් බැගින් අය නියම ගම් සොළොසක්ද යන මෙකී වස්තූන් තොපට දෙමි”යි කියා සියල්ල දෙවූහ.

සිරිමන්ද ප්‍රශ්නයයි

එතැන් පටන් කොට මහබෝසතාණන්වහන්සේගේ යශස කිරිමුහුද පරිද්දෙන් මහත්වූයේය. ඒ සියලුසමපත් බූතනියෝ උදුම්බරාදෙවීම විචාරත් බෝසතාණන්වහන්සේ සොළොස් හැවිරිදිවූ කල “මාගේ මලනුවෝ වැඩ මා ලවා ගත්හ, උන්ගේ යශසත් මහත, උන්ට සමාන කුලයකින් සරණ පාවා දෙන බව සුදුසුය’යි සිතූහ. මෙසේ සිතා එපවත් රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ ඒ අසා සොම්නස්ව “යහපත සොඳුර! එපවත් උන්ටකියව”යි කීහ. දේවීන් මහබෝසතාණන් වහන්සේට එපවත් දැන්වූහ. පණ්ඩිතයන් වහන්සේ විසින් යහපතැ’යි ගිවිසිකල්හි එසේවීනම් මලණ්ඩ! සුදුසුතැනකින් කුමාරිකාවක් ගෙණෙමෝදැ”යි කීහ. මහබෝසතාණන්වහන්සේ “ඉදින් මුන්වහන්සේලා විසින් ගෙන්වා පාවාදෙනලද කුමාරිකාවක් කිසිසේත් මට අභිප්‍රාය නොවන්නීය, එහෙයින් මම්ම පළමුකොට සුදුසු එකක් පරීක්‍ෂාකෙරෙමියි”යි සිතා දෙවීන්වහන්ස! කීපදවසක් රජ්ජුරුවන්වහන්සේට මා අසවල් කාර්‍ය්‍යයකට ගියයි නොකිව මැනව් එක් කුමාරිකාවක් පරීක්‍ෂාකොට මම අභිප්‍රාය එකක් ලදිම් නම් තුඹවහන්සේට දන්වාලමි”යි කීහ. බිසවුන් විසින් “යහපත මලණ්ඩ! එලෙසකරව”යි කී කල්හි මහබෝසතාණන් වහන්සේ බිසවු වැඳ තමන්වහන්සේගේ ගෙට ගොස් හිත මිත්‍රයන්ට එපවත් කියා එක්තරා වෙශයකින් සන්නාලි උපකරණගෙණ, උදකලාවම උතුරු වාසල් දොරින් නික්ම උතුරු යවමැදුම්ගමට වැඩීසේක.

එසමයෙහි වනාහි උතුරු යවමැදුම්ගම දුක්පත්ව සිටි පුරාතන සිටුකුලයෙක් විය. ඒ සිටුකුලයෙහි අමරාදෙවී නම් එකම දුවනිකෙණෙක් බැලූවන්ට ප්‍රියකරුවූ රූ ඇත්තාහ. සියලු ස්ත්‍රීලක්‍ෂණයෙන් සම්පන්නයහ, මහපින් ඇත්තාහ. ගැණු රුවට හොබවනලද ඇඳිරුකඩක් සමානයහ ඒ අමරාදෙවී තුමූ එදවස්ම හුළුකැන් පිසගෙණ පියාණන් සානතැනට යෙමියි නික්ම මහබෝසතාණන්වහන්සේ වඩනා මගට පිළිපන්හ. මහබෝසතාණන්වහන්සේ ඉදිරියට එන්නාවූ ඒ කුමාරිකාව දැක ස්ත්‍රීලක්‍ෂණයෙන් සමන්විත ස්ත්‍රියක ඉදින් ස්වාමීන් නැත්තීනම් “මෝ තොමෝ මට බිරින්දව සුදුසුය”යි සිතූසේක. ඒ අමරාදෙවීද මහබෝසතාණන් දැකලාම “ඉදින් මෙබඳු පුරුෂයක් හුගේ ගෙයි වූයෙමිනම් කුඩුම්බ සණ්ඨාපනය කරන්නට නෙවත් වස්තු රැස් කරන්නට පිළිවනැ”යි සිතූහ. ඉක්බිත්තෙන් මහබෝසතාණන්වහන්සේ ‘මැගේ සැමියන් ඇති නැතිබව නොදනිමි. එපවත් හස්තමුද්‍රායෙන් විචාරමි. ඉදින් මෝ නුවණැත්තී වීනම් හස්තමුද්‍රායෙන් විචාළ දැනගන්නීය”යි සිතා දුර සිටම ඇඟිලි හකුළුවා මිට කළසේක. ඒ අමරාදේවීන් “මේ පුරුෂයා මගෙන් සැමියන් ඇත්ත නැත්ත විචාරන්නේය”යි දැන අත්ල විදහාලූහ මහබෝසතාණන්වහන්සේ සරණ නුවූන බව දැන සමීපයට ගොස් සොඳුර! තෙපි කීනම්මුදැ”යි විචාළසේක. ස්වාමීනි! ගිය දවස වේවයි දැන් වේවයි මතු දවස වේවයී සමස්ත ලොකයෙහි යම් නමක් නැත්නම් මම

ඒ තම්''ව කීහ. ''සොඳුර! ලොව උපන් සතුන්ගෙන් නොමියන කෙනෙකුන් නැති හෙයින් ''අමරා'' නාමය නැත්තේය; තෙපි එනම්මුදු''යි විචාළසේක. එසේය සවාමීනි!යි කීහ. සොඳුර! කවුරුන්ට කැඳ ගෙණයව්දැයි විචාළසේක. පූර්වදෙවතාවන්ටයයි කීහ, පූර්ව දෙවතාවෝ නම් මව්පියෝය ''තොපගේ පියානන්ට කැඳ ගෙණයව්දු''යි විචාළසේක. සවාමීනි! එසේයයි කීහ තොපගේ පියානෝ කුමක් කෙරෙද්දැයි විචාළසේක. එකක් දෙකක් කෙරෙතියි කීහ. එකක් දෙකක් කිරීම නම් සීසෑමය, සී සාදැයි සොඳුර! වදාළසේක. සවාමීනි! එසේයයි කීහ, තොපගේ පියාණෝ කොතැනක සාද්දැයි විචාළසේක, ''යම් තැනකට එක වරක් ගිය කෙණෙක් නොඑද්ද, එතනය''යි කීහ. එකවිටක ගියකෙණෙකුගේ පසුව නොඑන තැන සුසානය, සොඳුර! සෝනක් සමීපයෙහි සාද්දු''යි විචාළසේක් එසේය සවාමීනි!යි කීහ, සොඳුර! අදම එව්දැයි විචාළසේක, ඉදින් ආවොත් නොඑම්, නාවොත් එම්'යි කීහ. ''සොඳුර! තොපගේ පියානෝ ගඟකින් එතරකර සාහි, එයට කාරණා කිමෙක්දැයි යතහොත්, ගඟදිය ආවොත් නොඑන නියාය, දිය නොආවොත් එන හෙයිනැ''යි වදාළසේක, එසේය සවාමීනි!යි කීහ.

මෙසේ මෙපමණක් පෙර පසු කථාකොට අමරාදේවී තුමූ හුළුකැන් පුව මැනව සවාමීනි!යි පැවරූහ, බෝසතානන්වහන්සේ ආදියෙන් කී පෙරළක්හ නොඉවසීම අවමගුලැ''යි සිතා යහපත බොම්යි වදාළසේක, අමරාදෙවී කැඳ සැළිය ඉසින් බා තුබූහ, මහබෝසතානන්වහන්සේ ''ඉදින් මණ්ඩිය නොදෙව අතට පැන් නොදීම කැඳ අතට දිනිනම් මෙතැනම හැරපියා යෙම්''යි සිතූසේක, ඒ අමරාදෙවී වනාහි මණ්ඩයෙන් පැන් ඇරගෙණ අවුත් අතවදීලා සිස් මණ්ඩය අත නොතබා බිම තබාලා සැබියේ කැඳ අලලා හුළුකැනින් මණ්ඩ පුරාලූහ, වැළිත් ඒ කැදෙහි හුළු මඳවූයේය, ඉක්බිති බෝසතානන් වහන්සේ ''කිමෙක්ද සොඳුර! හුළුකැන් ඉතාම බොල්වනැ''යි වදාළසේක. පැන් නොලද්දේය සවාමීනියි කීහ, ''තොපගේ කුඹුර පූදිනා අග දිය නොලදැයි සිතම්''යි වදාළසේක, අමරාදෙවීන් එසේය සවාමීනි කීහ, අමරාදේවී පියානන්ට හුළුකැන් තබා බෝසතානන්වහන්සේට හුළුකැන් පෙවූහ, උන්වහන්සේ හුළුකැන් අනුභවකොට අත කට සොධා සොඳුර! තොපගේ ගෙට යම්හ, අපට මග කියවයි වදාළසේක, අමරාදෙවී යහපතැයි කියා තමන්ගේ ගෙට මග කියන්නාහු ''මේ මිග ඔස්සේ ගොස් ඇතුළු ගමටවත් කල යම් තැනෙක හස්පුණු තබා විකුණන සල්පිලක්ද, ඉන් ඔබ්බට ගියකල කැඳ තබා ගෙණ විකුණන සල්පිලක්ද, ඉන් ඔබ්බව ගියකල පිපී සිටි කොබලීල ගසෙක්ද ඇත්තේය, ඒ ගස මුලට ගියකල යම් අතකින් අනුභවකරද්ද ඒ අත මග යන්නට කියම්. යම් අතකින් නොකද්ද, ඒ අත යන්නට නොකියම්, හෙවත් දකුණත මඟවැඩිය මැනව, වමත මග නොවැඩිය මැනව, ඒ මගය, හෙවත් යම්මැදුම් ගම අපගේ දෙමව්පියන්ගේ ගෙට මගය, මා සඟවා කී මග දැන වදාළ මැනවයි''යි කීහ.

ජනනපථ ප්‍රශ්නයයි.

මෙසේ ඒ අමරාදේවී තුමූ බොධිසත්වයන්වහන්සේට මඟ කියාලා පියානන්ට හුළුකැන් ඇරගෙණ නැගී ගියහ, මහබෝසතානන්වහන්සේත්

අමරාදේවීන් කී මඟින් උන්ගේ ගෙට වැඩිසේක, ඉක්බිත්තෙන් අමරාදෙවීන් මැතියෝ පණ්ඩිතයන්වහන්සේ දැක හිඳිනට අස්නක්දීලා පුතණ්ඩ! බොහො පරිද්දෙන් හුළුකැන් අතට වඩාලම්දැයි කීහ, මැතියන්වහන්ස! අපගේ තැගතියෝ, අමරාදේවී කැඳිත්තක් පෙවූහ''යි වදාළසේක, අමරාදේවීන්ගේ මැතියෝ මාගේ දියනියන් නිසා ආ කෙණෙක් වනැයි සිතූහ. මහබෝසතාණන්වහන්සේ උන් දුක්පත්තියාව දන්නාහුද ''මැතියන්වහන්ස! මම සන් තාලියෙක්මි, ගෙත්තම් කටයුතුවූ කිසිවක් ඇද්දැ''යි විචාළහ, පුතණ්ඩ! විද්ද යුතු කොට්ට මාවුලා ආදිය ඇත, ඒ විද්දගෙණ දී ලත්නට සුදුසු මිල යෙක් නැතැ''යි කීහ මැණියන්වහන්ස මිලයෙන් කාරියෙක් නැත, ගෙණෙව විද දීලම්''යි වදාළසේක. අමරාදෙවීන්ගේ මැතියෝ කඩරෙදි හැරගෙණ ගෙත්තම් කරණ පරිද්දෙන් දුන්හ, මහබෝසතාණන්වහන්සේ ගෙණා රෙදි හා වුවමනා වුවමනා දෙයද නිමවූසේක්මය, (පිණැත්තන් කරණ දෙය සිතුලෙසටම සමෘධ වන්නේය) ඉක්බිත්තෙන් බොධිසත්වයන්වහන්සේ අමරා දෙවීන්ගේ මැතියන්ට මැතියෙනි! වීථියක්පාසා අඩගාපියව'යි වදාළසේක. අමරාදෙවීන්ගේ මැතියෝ ගමමුළුල්ලේම අඩගැහ, මහබෝසතාණන්වහන්සේ ගම් ඇත්තන් ගෙණා ගෙණා කඩින් සන්නාලි මෙවරකොට එක දවසින්ම මසු දහසක් ලත්සේක, අමරාදෙවීන්ගේ මැතියෝද බොධිසත්වයන්වහන්සේට දවල් බත් පිස කවා පුතණ්ඩ රෑට සාල් කෙතෙක් ගරම්දැයි විචාළහ, මැති යන් වහන්ස! මේ ගෙට යම් පමණක් කත්තම් එපමණින්ම බත් පිසුවමැන වැයි වදාළසේක. අමරාදේවීන්ගේ මැතියෝන් බොහෝවූ රසමසවුලෙන් යුක්තකොට බත් පිසූහ. අමරාදේවීන් ඉසින් දරම්ටියක් හා හිනින් පලා හිතක් ඇරගෙණ වලින් අවුත් ඉදිරියේ දොර දරම්ටිය හෙළා පැලදොරින් ගෙට වන්නූය. උන්ගේ පියානෝ වනාහි ඇඳිරි ගැසී ගියකල ගෙට ආහ. බොධිසත්වයන්වහන්සේට අනේකප්‍රකාර අතගි රසයෙන් යුක්තවූ ආහාර අනු භවකරවූන, අමරාදෙවී මවුපිය දෙදෙන බත් කවා පසුව තුමූත් කා මවුපිය දෙදෙනා පය සොඩවා තෙල් ගල්වා මහබෝසතාණන්වහන්සේ පය සොඩවා තෙල් ගැල්වූහ, පණ්ඩිතයන්වහන්සේ අමරාදෙවීන් විමසනසේක් කීප දව සක් එහි විසූසේක.

ඉක්බිත්තෙන් එක්දවසක් උන් විමසනසේක් ''සොඳුර අමරාදෙවීනි! සාල් මනාවක් පමණ ඇරගෙණ ඉන්මට කැඳත් බතුත් අවුලුපතුත් පිසවයි වදාළසේක, අමරාදේවීන් ''එක සාල් මනාවෙන් මෙතෙක්ද කෙසේ පිසම්දැ''යි නොකියා යහපතැයි වදාළ බස ගිවිස ඒ සාල් මනාව පැස මූල් සාලින් බත්ද කඩසාලින් කැඳද සුන්සාලින් කැවුම්ද පිස ඊට සුදුසුවූ අවුලුපත් පිස, මහ බෝසතාණන්වහන්සේට අවුලු සහිත කැඳ දුන්හ. කැඳ කබලක් මුඛයට ගත් පමණකින්ම සියලු රස නහරවැල් පිණා සිටගත්හ, පණ්ඩිතයන් වහන්සේ උන් විමසන පිණිසම ''සොඳුර! තොප පිසමන් නොදන්නා කල කුමක් පිණිස මාගේ සාල් නසාපුදැයි කියා මුඛයට ගත් කැඳ කබල කාරා දමාපීසේක, අමරාදේවීන් නොකිපී කැඳ යහපත් නොවීනම් කැවුම් කැවමැනව සවාමීනී!යි කියා කැවුම් අතට දුන්හ. කැවුම් මුඛයෙහිතුබූ පමණකින්ම රස නහරවැල් පිණාගියේය. එසඳ එසේම කාරාදැමූසේක, ඊටත් නොකිපීම ''එසේවීනම් බත් අනුභව කළ මැනව''යි කියා බත් අත තිබූහ, එයින් ආලෝපනයක් මුඛයෙහි තබන්නාම සියලු රස නහරවැල් පිණා

ගියේය. බොධිසත්වයන්වහන්සේ ඒ බත්ද එසේම නාරාදමා “තොප පිස මන් නොදන්නාකල මා දුකසේ සොයාගත් දෙය කුමට නැසූදැ”යි කිපී කෙණ කුන්මෙන් තුන්වගයම එක්කොට අඹරාපියා අමරාදෙවීන් ඉස පටන් ඇඟ මුළුල්ලෙහි ගල්වා දෙර අව්වෙහි සිටින්නට වදාළසේක. අමරාදේවීන් ඒට මදකුත් නොකිපීම යහපත සවාමීනී’යි! දෙර අව්වෙහි හුන්නාහ. මහ බෝසතාතන්වහන්සේ අමරාදේවීන් මත් නැතිබව දැන සොඳුර! මෙහි එව”යි වදාළසේක. මෙසේ දෙවිටක් නොකැඳවන තුරු එක බසින්ම සමීපයට අවුය මහබෝසතානන්වහන්සේ නුවරින් එනසේක්ම මසු දහසක් හා එක් සීන් කඩක් බුලත්පයියෙහි ලාගෙණ වැඩිසේක. උන්වහන්සේ ඒ කඩමැත්කොට අමරාදේවීන් අත තබා “සොඳුර! තොපගේ යෙහෙළනියන් සමග ගොසින් නාපියා මේ කඩ ඇඳගෙණ එව”යි වදාළසේක. ඔයින් වදාළ ලෙස කළහ· පණ්ඩිතයන්වහන්සේ සන්නාලි කමින් උපයාගත් මසුරන්ද නුවර සිටගෙණ මසුරන්ද යන මේ සියල්ල අමරාදේවීන්ගේ මවුපිය දෙදෙනාට දීලා දෙමහල් ලන්ට ‘නුඹවහන්සේ රක්‍ෂාවට නොසිතුව මැනව”යි අස්වසා අමරාදේවීන් හැරගෙණ නුවරට ගොස් නවත් විමසන පිණිස දෙරටුපාලයාගේ ගෙයි හිඳුවා දෙරටුපාලයාගේ අඹුවට සවරූප කියාලා තමන්වහන්සේ ගෙට ගොස් පිරිමින් දෙදෙනෙකු කැඳවා “අසවල් ගෙයි ගෑණියෙක රඳවා ආමි, මේ මසු දහස ඇර ගෙණ ගොස් ඈ විමසව”යි මසු දහස දීයවූසේක. උයින් බොධිසත්වයන් වදාළ ලෙසම ගොසින් අමරාදෙවීන්ට මසු දහස දික්කොට විචාළහ. අමරාදෙවී මේ මසු දහස මාගේ සමනන්ගේ පයවසුත් නොඅගනේය”යි කියා උන් කී බස් නොගිවිස්සාහ. ඒ පුරුෂයෝ ගොස් පණ්ඩිතයන්වහන්සේට දැන්වූහ. ඉක්බිත්තෙන් බොධිසත්වයන්වහන්සේ ඒ පුරුෂයන් නැවත නැවත තුන්වරක් දක්වා යවා නොගිවිස්නා හෙයින් සතරවන වාරයෙහි එසේවීනම් ඈ අත අල්වා ඇදගෙණ එව”යි වදාළසේක. ඒ පුරුෂයෝ ගොස් නොකැමති පරිද්දෙන් ඇදගෙණ ගියහ.

අමරාදෙවී මහබෝසතානන්වහන්සේ සැපතෙහි සිටියවුත් හැඳින ගත නුහුනුවහ. මුහුණ බලා සිනාසුනාහ නැවත හඬාපීහ; පණ්ඩිතයන් වහන්සේ අමරාදෙවී සිනාසුනු කාරණයත් හැඬූ කාරණයත් විචාළසේක. ඉක්බිති බොධිසත්වයන්වහන්සේට අමරාදෙවී සවාමීනි! නුඹවහන්සේගේ මූණ බලා සිනාසෙන්නෙම් නුඹවහන්සේගේ දිව්‍ය සැපතක් හා සමානවූ සැපත් බලා මේ සම්පත් නොකාරණයෙනුත් ලදදෙයත් නොවෙයි. පූර්‍වජාති යෙහි පින්කම් කොට ලබනලද කුශලකර්‍මයාගේ විපාකය නොසිතියහැකි නිසායයි සිනා මායින් සිනාසුනිමි, හඬන්නෙම් වනාහි, දැන් එබස් පත ලැබෙයි කියා අනුන් විසින් රක්‍ෂිත ගොපිතවී සිටි ස්ත්‍රීන් කරා එළඹ හෙවත් පරදාරකර්‍මයකොට මතුනරකයට යන්නාහ’යි සිනා ඔබවහන්සේ කෙරෙහි දයා වෙන් හැඬීම්”යි කීහ. බොධිසත්වයන්වහන්සේ උන් පරීක්‍ෂාකොට පිරිසිදු අදහස් ඇතිබව දැන “යව මුන් මෙසේ මා නොගිවිස්සෙන් උන් ගෙණා තැනම ලාපියව”යි කීය, අමරාදෙවීන් යවා නැවත තමන්වහන්සේ සන්නාලි වෙස් ගෙණ එදා රෑ උන්දෑගේ ලඟට ගොස් සැතපීලා දෙවන දවස් උදෑසන

තක්හේ රජගෙට ගොස් උදුම්බරාදේවීන්ට සුදුසු කුමාරිකාවක් ගෙණා බව වදාළසේක. බිසවුන් රජ්ජුරුවන්ට එපවත් කියා අමරාදෙවී පාමුද්‍ර පාඩගත් පාසලඹ පාදජාලා ශිරොජාලා කණ්ණාභරණ ග්‍රීවාලංකාර කෙපෝවටු සිරිකත් ආදිවූ සියලු ස්ත්‍රී ආභරණයෙන් සරහා මහත් හීදෙළුයෙක හිඳුවාලා ඉක්බිති රජ්ජුරුවන්ගේ විධානයෙන් ඒසා මහත් සත් යොදුන් මියුලුනුවර නොයෙක් පරිද්දෙන් සරහා රත්ධජ නගා විසිතුරුකොට සරහා නිමවන ලද උතුම්වූ මංගල රථයෙක්හි වඩා “රථයෙහි දේවීන් උන්හොත් කැළි බවත් එළලි බවත් උස් බවත් මිටි බවත් රූ ඇති බවත් නැති බවත්. නුවර වාසීන්ට නොපෙණෙන්නේවේද්දැයි’ යි සිතා, දේවීන්ගේ රූපවිලාසය නුවරවාසී සියල්ලන්ම සුවසේ දක්නා පරිද්දෙන් රථයෙහි සිටුවා දෙවතාවන් හා සමග දිව්‍ය වීථියෙහි නමාගත් තරුණ දිව්‍යස්ත්‍රියක පරිද්දෙන් මහ පෙරහරින් මහ බෝසතාණන්ගේ ගෙට ගෙණවුත් සරණපාවා දී මගුල් කළහ රජ්ජුරුවෝ බොධිසත්‍වයන්ගේ සරණමගුලෙහි එකිඑකී වස්තුවෙන් දහස්ගණන් මිල වටනා පඬුරුයවූහ. වාසල් බලන්නවුන් ආදිකොට ගොපොල්ලන් දක්වාත් මියුලු නුවර වාසීන්ගෙන් පඬුරක් නොගෙණ ගිය එකද සත්‍වයෙක් නැත. අමරාදෙවීද රජ්ජුරුවන් යැවූ පඬුරු සමසේ දෙකක්කොට බෙදා එක් භාගයක් ගෙටගෙණ අනික් භාගය නැවත රජ්ජුරුවන්ට යවූදැය. මෙම ක්‍රමයෙන් උදුම්බරාදෙවීන් ඇතුළුවූ නුවරවාසීන් විසින් එවන ලද සියලු පඬුරු සරිසේ දෙකක්කොට බෙදා භාගයක් ගෙණ නැවත භාගයක් උන් උන්ට යවා ඒසා මියුලු නුවර වාසීන් හැමදෙනම එක දවසින්ම එක ඇසිල්ලෙන්ම සිත් ගත්හ. එවක් පටන් තුන්ලොවට ඇසක් වැනි මාගේ බොධිසත්වයන්වහන්සේ අමරාදේවීන් හා සමගිවාසයෙන් වාසය කරණසේක් රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළසේක.

ස්ත්‍රී ප්‍රශ්නයයි.

ඉක්බිති එක් දවසක් සෙනක පණ්ඩිතයෝ පුක්කුසාදි අනික් තුන්දෙනා තමන් සමීපයට අවුත් බණවා “පින්වත්නි! අපි ගොවියා පුතු මහෞෂධ පණ්ඩිතයාට නොසැම්හ, දූන් ගොවියා පුතු විසින් තමාට වඩා වියත් අඹුවක් ගෙණෙනලද කිසිවක් කියා රජ්ජුරුවන් කෙරේ උඹ බිඳුවාපුව මැනවැ”යි කීහ. ආචාර්‍යයන්වහන්ස! අපි කුමක් කරමෝද නුඹවහන්සේම ඊට සුදුසු කාරණා සිතුව මැනවැ”යි කීහ. “වන්නාටය, නොපි නොසිතව, උපායෙක්, ඇත, මම රජ්ජුරුවන්ගේ චූඩා මාණික්‍යය සොරා ගණිමි. පුක්කුසයෙනි! තෙපි රත් මාලාව ගෙණෙව, කාවින්දයෙනි! තෙපි රජ්ජුරුවන් පොරවන පලස ගෙණෙව, දෙවින්දයෙනි! තෙපි රන්මිරිවැඩි සඟල ගෙණෙව”යි කීය. මෙසේ ඔහු සතර දෙනම වඤ්චාවෙන් යටකී වස්තු සතර රජගෙන් පිටත්කොට ගත්හ. ඉක්බිත්තෙන් “බොහෝදෙන නොදැන්වා ගොවියාපුතු ගෙට යවම්හ”යි කියා සෙනකයෝ පළමුකොට තමන් ගත් මැණික මෝරුකළයක බහාලා කෙල්ලක අත තබා “මෝරු කළය අනික් කෙණකුන් ගණිතොත් නොදී, මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙයි ඉදින්ගණිත්නම් මිල නොගෙණ කළයෙන්ම දීපියා එව”යි කියලා යවූහ.

ඒ කෙලි පණ්ඩිතයන්වහන්සේගේ ගෙදොරට ගොස් මෝරු ගණුවයි කිය කියා දුරටත් නොගොස් ඒ දවටෙන්නේය, අමරාදෙවි දොර සිටි

තැනැත්තී ඒ කෙල්ලගේ ක්‍රියාව දැක මෝ අතික් තැනකට නොහොත් මෝරු ගනුවයි කිය කියා මෙතැනම දුවටෙත්නීය; එක් කාරණයෙක් වුවමැනවයි සිතා තමත් ගෙයි කෙල්ලන්ට ඉඟිකොට ඔබ්බටයවා තුමූම අම්ම! මෙසේ එව මෝරු ගණුම්හයි ඒ කෙල්ල බණවා ඈ තමන් සමීපයට ආකල්හි, තමන්ගේ කෙල්ලන් අඩගා ආදීම කියාලූ හෙයින් නොඇසූසේ තමන් සමීපයට නොඑන්නා "යව අපගේ කෙල්ලන් මෙතැනට බණවාලම්"යි ඈම යවා කළයෙහි අතලා ඇතුළෙහි තුබූ මැණික දැක ලඟව ආ කෙල්ලට 'මැතියෙනි! තෙපි කවුරුන් සමීපයෙහි සිට අවුදු'යි විචාරා සෙනකපණ්ඩිතයන්වහන්සේගේ කෙල්ලකිම්"යි කී කල්හි ඉක්බිති ඈගේද මවගේද නම් විචාරා එසේවීනම් මෝරු දෙවයි කියා "අම්ම! නුඹදු මෝරු ගන්නාකල මට මිලයෙන් කායයීය කිම්ද? කළයෙන්ම ගනමැනවැ"යි කී කල්හි එසේවීනම් යවයි කියා ඈ යවා අසවල් මස අසවල් දවස සෙනකාචාර්යයෝ තුමූ තමන්ගේ අසවල් කෙල්ල දුව අසවල් තැනැත්තීය අත රජ්ජුරුවන් වහන්සේගේ චූඩාමාණික්‍යය පණයම් පිණිස එවූහ"යි පතෙක ලියා ගත්හ.

පුක්කුස පණ්ඩිතයෝ රන් මාලාව සමන් මල් කරඬුවක ලාලා සෙනකාචාර්යයන් යැවූ ලෙසම යැවූහ. කාවින්ද පණ්ඩිතයෝ පලස පලා පැසෙක ලාලා යැවූහ. දෙවින්ද පණ්ඩිතයෝ රන්මිරිවැඩිසඟල පිදුරු කැරැල්ලක් ඇතුළේ ලාලා යැවූහ, අමරාදෙවී උන් හැමදෙනා යැවූ දෙය හැරගෙණ පතෙක වක දවස හා ගියවුන්ගේ නම් ලියා මහබෝසතානන්වහන්සේට සවරූප කියාලා තබා ලූහ. ඒ සෙනකාදී සතරදෙනම වස්තු සතර උපායෙන්ම බෝසතානන්ගේ ගෙට යවා රජගෙට ගොස් කිමෙක්ද? දෙවයන්වහන්ස! "ඔබවහන්සේගේ ආභරණවූ චූඩාමාණික්‍යය නොපලඳිනාසේක්දැ"යි විචාළහ. "පලඳිම් ගෙණෙව"යි කීහ. මැණික භාණ්ඩාගාරයේ සොයා නුදුටුවහ. සෙස්සත් එසේමය.

ඉක්බිත්තෙන් සෙනකාදී සතරදෙනම දෙවයන්වහන්ස! ඔබවහන්සේගේ ආභරණ මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙහිය, තුමූ එකී වස්තු පලඳින්නාහ දෙවයන්වහන්ස! ගොවියාපිත් නුඹවහන්සේට සතුරුයයි රජ්ජුරුවන් කෙරේ බෝසතානන් බිඳවූහ. ඉක්බිත්තෙන් එපවත් බෝසතානන්වහන්සේට වැඩ පසස්නා මිනිස්සු ගොස් කීහ, පණ්ඩිතයන්වහන්සේත් රජ්ජුරුවන් දැක ඒ සවරූප දතිමියි රාජසේවයට වැඩිසේක. රජ්ජුරුවෝ සෙනකාදී දුර්ජනයන්ගේ බස් අසා මහබෝසතානන් වහන්සේට කිපී "නොදකිම්, නුඹ අඩුන් කුමක් කෙරේදැ"යි තමන් දක්ක නුදුන්හ, පණ්ඩිතයන්වහන්සේ රජ්ජුරුවන් කිපී බව දැන තමන්වහන්සේගේ ගෙටම වැඩිසේක. රජ්ජුරුවෝ මහෞෂධයා ගණුවයි අණකළහ. බෝසතාණන්වහන්සේ තමන්වහන්සේට වැඩ පසස්නා මිනිසුන් අතින් එපවත් අසා "පලා යන්නට සුදුසු කලැයි"යි අමරාදේවින්ට සලකුණුදී අප්‍රසිද්ධ වෙශයෙන් නුවරින් නික්ම දකුණුයවමැදුම්ගමට ගොස් කුඹල් ගෙයක කුඹල් කම් කොට වසනසේක. නුවර මුලුල්ලෙහිත් 'මහෞෂධ පණ්ඩිතයෝ පලාගියහ'යි එක කොලාහලව ගියේය. සෙනකාදී

සතරදෙන පණ්ඩිතයන්වහන්සේ පලාගිය බව දූත කතන්සලු නොවන්නාහු කිමෙක්ද? අපිත් පණ්ඩිතවරු නොවමෝදැයි ඔවුනොවුන් නොදන්නාහු අමරාදේවීන්ට පත් යැවූහ. අමරාදේවී සෙනකාදී සතරදෙනම යැවූ පත් අතට ගෙණ අසවල් වේලාවට එන්නේයයි කියා යවා වෙන වෙනම උන් තමන් තමන්ට අවධි කළ වේලාවට ආ කල්හි අල්වාගෙන නොසැලෙන අන්දමට බන්දවලා ඉසකෙස් කප්පවා පරණ නානාගෙයක හොවාලා බොහෝ දුකට පමුණුවා පැදුරු මාලුවල හොවා වසා බන්දවා රජ්ජුරුවන්ට කියා යවා ඒ පණ්ඩිතවරුන් සතරදෙනා හා සමග වස්තු සතරක් ගෙන්වා ගෙණ ගොස් රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිට දේවයන්වහන්ස! මහෞෂධ පණ්ඩිතයෝ සොර නොවෙති, ඔබවහන්සේගේ භාණ්ඩාගාර සොරකම් කළෝ මේ කොල්ලෝ සතරදෙනාය, මුන් සතර දෙනාගෙන් සෙනකයා මැණික් සොරාය, පුක්කුසයා රන්මාලා සොරාය, කාවින්දයා පලස් සොරාය, දෙවින්දයා රන්මිරිවැඩි සොරාය, අසවල් මස අසවල් දවස අසවල් කෙල්ලගේ දුව අසවල් තැනැත්තිය අත මොව්හු සතරදෙන මෙකී වස්තු පණයම් පිණිස එවූහ, මේ මා ලියා තුබූ පත් බලා වදාළ මැනව, ඔබවහන්සේ සතු මෙකී වස්තු පාවාගත මැනව, මෙකී සොර කොල්ලනුත් පාවාගත මැනව දෙවයන්වහන්සැයි රජ්ජුරුවන් වැඳ ගෙට ගියාහ, රජ්ජුරුවෝ බෝසතානන් නැති ගිය බැවින් උන්වහන්සේ කෙරේ සැකයෙන්ද අනික් මන්ත්‍රී කෙණකුන් නැති බැවින්ද සෙනකාදි පණ්ඩිතවරු සතරදෙනාට කිසිවක් නොකියා 'තාපියා තොපගේ ගෙවලට යව්ව'යි කීහ.

ඉක්බිති රජ්ජුරුවන් දළපුඩු සේසත අධිගෘහිත දෙවතා දූ මහබෝ සතාණන්ගේ කුරවීක නාදයක් හා සමානවූ කටහඬ විහිදුවා වදාරන්නාවූ මිහිරි ධම් දෙශනායෙහි ශබ්ද නොඅසන්නී "කිමෙක්දෝහෝ"යි පරීක්ෂාකොට ඒ කාරණය දූත පණ්ඩිතයන් ගෙන්වන උපායක් කෙරෙමියි මධ්‍යම රාත්‍රියෙහි දළපුඩු සේසත් සිදුරෙහි සිට අඩ ශරීරයක් දක්වා දෙවතා ප්‍රශ්නයෙහි,

"හනති හත්ථෙහි පාදෙහි මු ඛව පරිසුම්භතී,
සවෙ රාජ පියො හොති කං තෙන මභිපස්සසී"

යනාදි ගාථා සතරකින් දක්වනලද ප්‍රශ්න සතරක් රජ්ජුරුවන්ගෙන් විචාළීය, රජ්ජුරුවෝ එහි අර්ථ නොදන්නාහු මම නොදනිමි. සෙනකාදි පණ්ඩිතවරුන් විචාරමියි එක් දවසකට අවසර ඉල්වාගෙණ දෙවන දවස් පණ්ඩිතවරු සතරදෙන එන්වයි අනුන් යවා පණ්ඩිතවරුන් විසින් අපි මුඩු හිස් ඇරගෙණ වීථියට බස්නට විළි ඇත්තම්හයි කී කල්හි පයි සතරක් විද්දවා යවා තෙල ඉසලාගෙණ එන්වයි කියා යැවූහ. ඒ ඉස්පයි ඇතිවූයේ එතැන් පටන් කොටල. පණ්ඩිතවරු ඉස්පයි ඉසලා අවුත් රජ්ජුරුවන් වැඳ පණවන ලද අසුන් මත්තෙහි හුන්හ. ඉක්බිති රජ්ජුරුවෝ සෙනකයෙනි! ඊයේ රෑ මධ්‍යම රාත්‍රි වේලෙහි දළපුඩු සේසත් වසන දෙව් දූ මා පැණ සතරක් විචාළීය, මම එහි අර්ථ නොදන්නෙම් පණ්ඩිතවරු විචාරමියි කීමි, ඒ පැනය මට කියවයි කියා "හනති හත්ථෙහි පාදෙහි" යනාදී පළමුවන ගාථාව කීහ, සෙනකයෝ

ගාථාව අසා "කිං හත්ථි කං හත්ථි"යි කියා කටව ආදෙයක් දෙඩා කිසිවක් දැනගත නුහුනුවහ, සෙස්සෝත් කිසිවක් කියාගත නොහී කරබාගත්හ

රජ්ජුරුවෝ දෙම්නස් වූහ, දෙවන දවස් රෑ දෙවතා දූ විසින් "පැන සතරෙහි අර්ථ දුටුදූ"යි විචාරණ ලද්දාහු මා විසින් පණ්ඩිතවරුන් සතරදෙනා විචාරණ ලදහ, උයින් එහි අර්ථ නොදත්හයි කීහ, දෙවතා දූ මුන් හැමදෙනම කුමක් දනිද්ද? මහෞෂධ පණ්ඩිතයන් විනා අනික් මේ පැනය කියන්නට සමර්ථ කෙණෙක් නම් නැත, ඉදින් මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වා මේ පැනය උන්ලවා නොකිය වූ නම් මේ දිලියෙන යකුළින් තොපගේ හිස සත් පලුවක් කොට බිඳ පියම්යි රජ්ජුරුවන් භයගන්වා රජ්ජුරුවෙනි! ගින්නෙන් ප්‍රයොජනයක් ඇති කල්හි කණමැදිරියන් පිඹින්නටද කිරෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි අඟ අල්වා දොනවද සුදුසු නොවන්නේයයි කියා ඛජ්ජොපණක ප්‍රශ්නයෙහි මේ මතු කියන කාරණා කීහ, ගිනි නැතිව ගිනි සොයා ඇවිදින පුරුෂයෙක් දිලියෙන්නාවූ කද්‍යොපැණියෙක් ගිනි පුපුරකැයි සිතා ඒ කද්‍යොපැණියා මත්තෙහි ගොම්වැරටි හා තණ රොඩු පොඩි පොඩි කොට ලා ලා කණමැදිරියා ගිනි පුපුරකැයි යන විපරීත සලකුණෙන් දෙදණ බිම ඇන ඇස් පිපිරෙණතුරු පිඹත් ගිනි දල්වාගත නොහේද, යමෙක් කිරි දොම්යි ලොටනන තබා අඟ අල්වාගෙණ දවසක් මුළුල්ලේ ඇදත් කිරි පිහිරකුත් දෙවගත නොහේද, එපරිද්දෙන් නුවණ නැති හෙයින් තිරිසනුන් හා සමානවූ තැනැත්තේ උපායවත් කමක් නැතිහෙයින් තමහට අභිවෘද්ධියක් නොලබන්නේය, පසමිතුරන්ට නිග්‍රහ කිරීමෙන්ද, සතුවයෝ නොයෙක් අවැඩට පැමිණෙන්නාක, සෙනාවට නායක අමාත්‍යයන්ගේ ලැබීමෙන්ද වැඩ පසස්නා මිත්‍රයන්ගේ උපදේශයන්ද රජ්ජුරුවෝත් රාජ්‍යයට පැමිණ සුවසේ වාසය කරන්නාහ, තොපසේ නුවණැති අමාත්‍යයන් පලවාපියා නොවසන්නාහ ගිනි තබා කද්‍යොපැණියන් පිඹින්නාසේද, ලොටතන තබා අඟ ගෙණ කිරි දොනාසේද, තරාදිය තබාලා අතින් කිරණසේද, මේ තියා ගැටමුසු පැන මහෞෂධ පණ්ඩිතයන් නොවිචාරා සෙනකාදිවූ පණ්ඩිතවරු විචාරන්නට ඒ කොල්ලෝ කුමක් දනිද්ද? ඌ හැම කද්‍යොපැණියන් හා සමවූහ, ඉදින් තොපගේ පණ රකිනා කැමැත්තෙහි නම් ගල් මුදුනෙක දිලියෙන මහ ගිනි කන්දසේ නුවණින් දිලියෙන්නාවූ මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වා විචාරා මට පැන සතරෙහි අර්ථ කියාලුව, එසේ නොකෙළෙහි නම් තොපගේ ජීවිතය නැතැයි රජ්ජුරුවන් භයගන්වා සැඟවී ගියාය.

ඛජ්ජොපණක ප්‍රශ්නයයි

ඉක්බිති රජ්ජුරුවෝ මරණ භයින් තැතිගෙණ දෙවන දවස් අමාත්‍යයන් සතරදෙනකු කැඳවාලා දරුවෙනි! තෙපි සතරදෙන රථ සතරක නැඟී නුවරසතර වාසලින් නික්ම යම් තැනකදී මපුතනුවන් මහෞෂධ පණ්ඩිතයන් දුටුහු නම් එතැනදීම උන්ට සත්කාරකොට වහා කැඳවාගෙණ එවයි කියා යැවූහ, උන්සතරදෙනා අතරෙන් (තුන්දෙනෙක් මහබෝසතානන් නුදුටුවහ,) දකුණු වාසලින් නික්මුණු අමාත්‍යයා වනාහි දකුණු යවමැදුම් ගම මහබෝසතානන් වහන්සේ මැටි ඇරගෙණ කුඹල් ආචාර්යයන්ට සක වටා මැටි

වැකුනු ඇඟිත්ම පිදුරු බිස්සෙක හිඳ මිටි මිටි කොට ගෙණ යව සාලේ බත් අනුභව කරන්නවුන් දුටුයේය. කුමක් පිණිස එබඳු දුකක්ගෙණ කුඹල් කර්මාන්තය කළ සේක්දැයි යතහොත්? මහෞෂධ පණ්ඩිතයෝ මහා නුවණැත්තෝය නිසැකයෙන් රාජ්‍යය ගන්නාහයි සැකයක් රජ්ජුරුවෝ කළෝ නම් කුඹල් කර්මාන්තකොට ජීවත්වනු අසා සැක නොවන්නාහයි සිතා මේ කාරණය පිණිස මෙබඳු දුකක් ගත්සේක. මහබෝසතාණන්වහන්සේ රජ්ජුරුවන්ගේ අමාත්‍යයා දැක තමන්වහන්සේ කැඳවා ආ බැව් දැන මාගේ සම්පත පෙර පරිද්දෙන්ම වන්නේය, අමරා දේවීන් විසින් ඉදිකරනලද අනගි රසමසවුලෙන් යුක්තවූ බත්ම අනුභව කෙරෙමියි සිතා අතින් ගත් බත්පිඩ හෙළා නැගී සිට අත කට සෝදාපියා සිටියේය. ඒ ඇසිල්ලෙහිම අමාත්‍යයා ළඟට ගියේය. ඒ වැළින් සෙනක පණ්ඩිතයන් ලබ්ධිගත් එකෙක, එහෙයින් මහබෝසතාණන්වහන් සේට පණ්ඩිතයෙනි! ඉසුරුමත් නැතැත්තේ උතුමැයි යම් බසක් ආචාර්‍ය්‍යයෝ කිවු නම් ඒ සෙනක ආචාර්‍ය්‍යයෝ කී බස සැබව, තොපගේ යසස පිරිහුණු කල්හි එබඳු නුවණ තොපට පිටිවහල් වන්නට නොපොහොසත්විය, දුන් මැටි වැකුනු ඇඟින් පිදුරු බිස්සෙක හිඳ මෙබඳු බතක් අනුභව කරව, ඉදින් තොපගේ වාදය සැබැවීනම් යසසින් පිරිහුණු තොපට තොපගේ නොපිරිහුණු වීර්‍ය්‍යයත් ස්මෘති ශක්තියත් උවමනාවේදැයි කීය.

ඉක්බිති මහබෝසතාණන් වහන්සේ නුවණ නැත්තව! මම මාගේ නුවණ බලයෙන් නැවත ඒ මාගේ පිරිහුණු සම්පත මුහුකුරවන්නෙම් මේ සැඟවෙනු මනා කාලයයි මේ පිළියමට මනා කාලයයි කල් නොකල් දැන රජ්ජුරුවන් කිපුනු කල සැඟවී ඇවිද සතුටුවූ කල එළි බැස පෙරපරිද්දෙන් විදි සම්පතෙහි පිහිටන පිණිස කුඹල් කර්මාන්තකොට මෙබඳු රසනැති යව සාලේ බත් අනුභවකරන්නෙම් වීර්‍ය්‍යකරණයට කල් දැන මාගේ නුවණින් පුරාතන සම්පතෙහි පිහිටා සැට යොදුන් රත්ගල් තලා මුදුනෙහි විභ්‍රමණය කරණ සිංහ රාජයක්හු මෙන් අසම්භීතව හැසිරෙන්නාවූ මා දකුවයි වදාළ සේක. නැවත අමාත්‍යයා රජ්ජුරුවන්ගේ සෙසන වසන දෙව්දූ රජ්ජුරුවන් පැන සතරක් විචාළිය, රජ්ජුරුවෝ සෙනකාදි පණ්ඩිතවරුන් සතරදෙනා විචාළහ. එක් කෙණකුත් ඒ පැනය කියාගත නුහුනුවහ. එසේහෙයින් රජ් ජුරුවෝ තොප සමීපයට එවූහයි කීහ, එසේකල නුවණයෙහි බල දුටුයෙහි වේද? එසේවිට ඉසුරු සැපත් පිටිවහල් නොවන්නේය, නුවණැති නැතැත්තේම පිටිවහල් වන්නේයයි මහබෝසතාණන් වහන්සේ නුවණෙහි ආනුභාව වර්ණනා කළසේක. අමාත්‍යයා පණ්ඩිතයන් දුටු තැනදී නහවාපියා හඳවාලා ගෙණෙවයි කියා රජ්ජුරුවන් කී විසින් දුන් පිළිසඟළුත් මසුරන් දහසත් මහබෝසතාණන් වහන්සේ අත තුබූයේය. කුඹලාණෝත් මා මෙහෙ ගත්තේ මහෞෂධ පණ්ඩිත යන් අතිනැයි සිතා බාගියහ, පණ්ඩිතයන්වහන්සේ නොබව ආචාර්‍ය්‍යයෙනි! තොපි මට බොහෝ උපකාරීව සිටියහයි අස්වසා කුඹලාණන්ට මසු දහස දී මැටිවැකුනු ඇඟින්ම රථයෙහි හිඳ සිත්සේ වනයෙහි ඇවිද වසන තැනට ගමන් ගත් හස්ති රාජයකු පරිද්දෙන් නුවරට වැඩිසේක, ඇමැතියා රජ්ජුරුවන්ට බෝසතාණන් වහන්සේ වැඩි නියාව කීය, පුත! පණ්ඩිතයෝ තොප විසින් කොයිදී දක්නා ලදදැයි කී කල්හි දේවයන්වහන්ස! දකුණු යවමැදුම් ගම

කුඹල්කම් කොට ජීව වෙති, ඔබවහන්සේ කැන්ද එවූහයි අසමින් නොනාම
මැටි වැකුනු ඇඟින් අවුයයි දූත්වීය, රජ්ජුරුවෝ ඉදින් මට පසම්තුරු වීතම්
සම්පතෙහි පිහිටා සෙනාව ඇතිකොටගෙණ ඇවිදිති, මූ මට සතුරු නො
වෙතියි සිතා මපුතනුවන් තමන්ගේ ගෙට ගොස් ඉස් සෝද නහා සර්වාලංකාර
යෙන් සැරහී මා දුන් පෙළහරින් දකින්නට එන්නට කියවයි කීහ. එබස් අසා
පණ්ඩිතයන්වහන්සේ ජ්ජුරුවන් කී ලෙසම සැරහී සිව්රඟ සෙනඟ පිරිවරා
විජයොත් මහපායෙන් සුදම් දෙව් සභාවට වඩනා සක්දෙව් රජාතන් පරිද්
දෙන් අවුත් රජ්ජුරුවන් විසින් එන්නේයයි කී කල්හි රජගෙට වැද රජ්ජුරු
වන් වැඳ එකත්පස්ව සේක. රජ්ජුරුවෝ බොධිසත්වයන් වහන්සේ හා සමග
සුව දුක් දෙඩා පණ්ඩිතයන් විමසන්නාහු සමහර කෙණෙක් ඉසුරු සම්පතෙහි
පිහිටා සිට මෙතෙක් සැපත් අපට ඇතැයි සම්පත් නිසා පණිවා ආදී පව් නො
කරන්නාහ, සමහර කෙණෙක් තමන්ට සැපත් දුන් උන්ට වැරැද්දෙයයි
අනුන් බණන පිණිස පව් නොකරන්නාහ, සමහර කෙණෙක් කිසිවක් කරන්නට
නොපොහොසත් හෙයින් පව් නොකරන්නාහ, සමහර කෙණෙක් නුවණ
නැතිව අමන්ත්‍රී හෙයින් පව් නොකරන්නාහ, තෙපි බොහෝවූ අර්ථ චින්තන
යෙහි දක්‍ෂව සිතුවහොත් දසදහසක් යොදුන් දඹදිව රජවරුන් මරා රාජ්‍යය
ගන්නට පොහොසත්ව කුමක් නිසා මට නොවරද්දුද? මා මරාපියා රාජ්‍යය
නොගතුදැයි කීහ.

එබස් අසා මහබෝසතානන්වහන්සේ නුවණැත්තෝ තමන්ට සුව
පිණිස පව්කම නොහැසිරෙන්නාහ, යසසින් පිරිහී කායික චෛතසික දුකින්
පෙළෙන ලදුවත් එක්කෙණකුන් කෙරෙහි සෙනෙහසයෙන් වේවයි උරණින්
වේවයි පැවත එන සුචරිත ධර්මය නොහරණාහයි වදාළසේක තැවතත් රජ්
ජුරුවෝ බොධිසත්වයන් විමසන පිණිස රාජ මායමක් කියන්නෝ මොලොක්වූ
හෝ දරුණුවූ හෝ යම්කිසි කාරණයකින් සත්වතෙමේ බැගෑබවට පැමිණ තමා
සම්පත පිහිටා සුව ආචාර ධර්මයෙහි හැරෙන්නේයයි කීහ. ඉක්බිති බොධි
සත්වයන්වහන්සේ එසේ කී රජ්ජුරුවන්ට ගසක් උපමාකොට දක්වනසේක්
යම් ගසක් මුල සෙවන සැනපී යමෙක් හුන්නේ වීනම් වේවයි වැදහොත්තේ
හෝ සිටියේ හෝ වීතම් ඒ සැතපුනු ගස අත්තක් වේවයි පතක් වේවයි සත්
පුරුෂ තැනැත්තේ නොබිඳින්නේය, ඉදින් බින්දේ වීතම් පවිටු මිත්‍රද්‍රොහියයි
වදාරා දෙවයන්වහන්ස! සැතපුනුරුක කොළ අත්තක් පමණ සඩාපි මාත්‍ර
යෙකින් මිත්‍රද්‍රොහි වනකල මපියානන්වහන්සේටද බොහෝ සැපත්දී මාත්
මේසා ඉසුරු සම්පතෙහි පිහිටුවා රකිමින් සිටි ඔබවහන්සේ කෙරේ වරදනා මම
කෙසේ නම් මිත්‍රද්‍රො නොවෙම්දැයි සියලු සැටියේම තමන්වහන්සේ මිත්‍රද්‍රොහි
නොවන බව වදාරා රජ්ජුරුවන්ගේ අපවාරයට චොදනා කාරණසේක් යම් පුරුෂ
යක්හු සමීපයෙන් යමෙක් තෙමේ සවල්පවූ කාරණයකුදු විචාරා දන්නේද,
යම් නුවණැති කෙණෙක් තුමූ යම්ක්හට උපන් සැකයකුත් දුරකෙරෙත්ද, ඌ
තුමූ සැක විචාරහන් තැනැත්තවුට පිහිටව සිටීමෙන් පිළිසරණ වන්නාහ,
සැක දුරුකිරීමෙන් ආචාර්‍ය්‍ය තනතුරෙහි සිටි නුවණැත්තවුන් හා සත්පුරුෂ
තැනැත්තේ විශ්වාසය නොහරන්නේයයි වදාරුදූන රජ්ජුරුවන්ටඅවවාදකරණ
සේක් රජ්ජුරුවන්වහන්ස! පස්කම්සුව අනුභව කරණ ගෘහස්ථතෙමේ කුසිත

වීනම් යහපත් නොවන්නේය, තමා විදිනා පස්කම් සැප තරකොටගත නො හෙන්නේය, කායාදී සත්හිඳීමක් නැති මහණද ඒ මහණ ධර්මය පුරාගත නො හෙන්නේය, එසේම යහපත අයහපත නොවිමසා සංග්‍රහ නිග්‍රහ කරන්නාවූ රජද යහපත් නොවෙයි යම් නුවණැත්තෙක් තෙමේ කොපවීනම් අමායෙහි වස බිංදුවක් හුනුවාසේ ඔහුගේ සන්තානයෙහි පිහිටි සියලු ගුණම නස්නා හෙයින් එයින් උතුම් නොවන්නේය, දෙවයන්වහන්ස! රජතෙමේ පරීක්ෂා කාරීව රාජ්‍යය කරන්නේය, අපරීක්ෂිතව රාජ්‍යය නොකරන්නේය පරීක්ෂිතව දශරාජධර්මයෙන් රාජ්‍ය කරන්නාවූ රජ්ජුරුවෝ යසස් පරිවාර ගුණ කීර්ති එකාන්තයෙන්ම වඩන්නාහුයයි වදාළසේක

භූරි ප්‍රශ්නයයි.

මෙසේ වදාළ කල්හි රජ්ජුරුවෝ මහබෝසතාණන්වහන්සේ තනතලද දළපුඩු සේසත් ඇති රජ අස්නෙහි වඩා හිඳුවා තුමූ මිටි අස්නෙහි හිඳ පණ්ඩිත යෙනි! සේසතෙහි වසන දෙව්දූ මාපැන සතරක් විචාළිය, මම ඒ පැන දනගත නුහුනුයෙමි, සෙනකාදි පණ්ඩිතවරුන් සතරදෙනාට කී නැන උත්වත් නො වැටහින, පුත! ඒ පැන මට කියවයි ආරාධනා කළහ. එදවස් මහබෝසතාණන් වහන්සේ සැට යොදුන් රත්ගල් මුදුනෙහි සිංහනාද කරණ අභීත කෙශර සිංහයකුසේ "දෙවයනි" සේසතෙහි වසන දෙවතාවා වේවයි චාතුර්මහාරාජිකා දීවූ සදිව්‍යලොකයෙහි දෙවතාවෝ වෙත්වයි, සොළොස් බඹතෙලෙහි බඹහු වෙත්වයි, යම්කිසි කෙණකුන් විසින් විචාරණ ලද්දාවූ පැන නියුණු මුවහත් ඇති කඩුවකින් ඇඹුල මල් මිටියක් කපා වගුරුවන බල ඇති පිරිමියක්හුමෙන් මාගේ නිර්මලවූ නුවණ නමැති කඩුවෙන් පිරිසිද කීයම්, කියව දෙවයෙනි! දෙව් දූ විචාළ පැනයයි සර්ඥ ප්‍රවාරණයක් පරිද්දෙන් වදාළසේක. (එදවස් මහබෝසතාණෝ සර්ඥ නොදත්තෝ නම් කෙසේද? මතු ලොව්තුරා බුදුව සියලු සතුන් සිත සැක දුරුකොට ධර්ම සිංහනාද කිරීමට මෙම දෘෂ්ටාන්ත නොවේද? වැලිකෙළියෙහිදී එතෙක් පැන විසඳු ඒ මහතාණන් වහන්සේට දූත් එක දෙවතාවකු විචාළ පැනයක් විසඳීම් නම් කවර අරුමයක් ද? ඉක්බිති රජ්ජුරුවෝ දෙවතා දුව විචාළ එලෙසම කියන්නාහු:-

"හනති හත්ථෙහි පාදෙහි මුඛඤ්ච පරිසුම්භති
සවෙ රාජ පියො හොති කං තෙන මභිපස්සසි"

යනුවෙන් දක්වන ලද පළමුවන පැනය කීහ

මහබෝසතාණන් වහන්සේට ගාථාව අසමින්ම ආකාශයේ නගාලූ පුන් සඳ මඬලක් මෙන් අර්ථාවබොධය විය. ඉක්බිති බොධිසත්ත්වයන්වහන්සේ අසව දෙවයෙනි වදුරා "යම්වේලෙක්හි මෑනියන්ගේ ඇකයෙහි හොත්තාවූ ළදරු කුමාරයා කිරි බී බඩ පුරාගෙණ සතුටුව මෑනියන් හා සමග කෙළනේ තමගේ ලා හෝපළු පත් සේ මොළකැටි අතින් මෑනියන්ට මරන්නේද, ඉසකේ ඇද

කඩන්නේද මිටින් මෑනියන් මූණ අන්නේද, එවේලෙහි වගුළ සඳ රැසින් ඔදවැඩි කිරමුහුද සේ ස්නෙහයෙන් ඔදවැඩියාවූ සිත් ඇති මෑනියෝ පුතනුවන්ට "සෙරගේ පුත! මා කුමට මරන්නේදැ"යි යනාදි ස්නෙහවශයෙන් කියා ස්නෙහ ධරාගන්නට අසමර්ථව දරුවන් ලෙහි ලාවා සිපගණිති, මෙසේ ඔරනිද තමන් මරා කෙළනා වේලෙහි මෑනියන්ට දරුවෝ ආදී ඇති ප්‍රෙමයට වඩාලාම ප්‍රිය වන්නාහ, පියානන්ටත් එසෙම ප්‍රිය වෙති" මෙසේ තහොමඩ්‍යයෙහි සූර්‍ය මණ්ඩලය ඔසවා පාන්නාක්හුමෙන් ප්‍රශ්නය පහළකොට වදාළසේක! ඒ ප්‍රශ්න විසර්ජනය අසා දෙවතා දූ දළපුඹු සේසත් විවරයෙන් මෑත්ව අඞ ශරීරයක් දක්වා "ප්‍රශ්නය වදාළ නියාව ඉතා යහපතැ"යි මිහිරි කටහඬින් ශබ්ද පවත්වා සත්රුවන් කරඬුවක් දිවමල් දිවසුවඳින් පුරා මහබෝසතානන් වහන්සේට පූජාකොට සැඟවී ගියාය.

රජ්ජුරුවෝ මහබෝසතානන්වහන්සේට ගඳින් මලින් පූජාකොට දෙවත පැනයට ආරාධනා කොට කියව දෙවයෙනියි වදාළ කල්හි:-

"අකොසතී යථාකාමං ආගමඤ්ච න ඉච්ඡති
සවෙ රාජ! පියො හොති කං තෙන මභිපස්සසි"

යන ගාථාවෙන් දෙවන පැනය කීහ.

ඉක්බිති රජ්ජුරුවන්ට බෝසතානන්වහන්සේ "රජ්ජුරුවෙනි! කකුල් දඩ ගොසින් කී දේ කවලන්නට සමර්ථ සත් හැවිරිදි පුතනුවන්ට කෙතට යව සල්පිලට යව කියා 'ඉදින් මට මේ මේ කැවුම් දුන්නේවිනම්යෙම්'යි කියන්නා එසේද පුතණ්ඩයි! උන් කැමැති කැමැති කැවුම් ඉදිකොට දුන්කල්හි ඒ කැවුම් කාලා තොපි සිහිල් සෙවනේ ගෙයි හිඳුව, මම තොපට පිටත ඇවිද මෙහෙවර කෙරෙම්දූයි කියා හස්ත විකාර මුඛ විකාරාදී නොයෙක් උහුළු පපා කී මෙහෙවරට නොගොසින් සිටිනා පුතනුවන්ට මෑනිතොමෝ කිපී මරන්නට දණ්ඩක් හැරගෙණ මා සන්තක දෙය කාලා කුඹුරේ කුරුල්ලන් පමණ එලවා පියන්නටත් නොයෙසිදූයි භයගැන්වූ කල වේගයෙන් දිවගත් පුතනුවන් ලුහුබැඳ අල්වාගන්නට අසමර්ථව සෝනට යේවයි බිල්ලට යේවයි සොරු නා කඩ කඩ කොට කපා පියත්වයි යනාදීන් කියා කැමැති පරිද්දෙන් කටනෙළනු පමණක් හැවිලි අවන්නී යමක් මුඛයෙන් බෙණේ නම් ඉන් සිඟින්නකුත් දරුවන්ට වන්නා නොකැමැත්තීය, ඒ කුමාරයා දවස මුළුල්ලෙහි කොල්ලන් හා එක්ව කෙළපියා සවස ගෙට වදනට නොපොහොසත් වූයේ නෑයන්ගේ ගෙට යන්නේය. මෑනියෝද දරුවෝ දූන් එන්නේහෝ දූන් එන්නේනෝයි පෙරමග බල බලා හිඳ සවස් වනතුරු නොඑන්නා දූක මා උරණ හෙයින් ගෙට එන්නට භය ඇතිව නොඑතියි සිත ශොකයෙන් පුරාගෙණ කඳුළු පිරුණු මුහුණින් යුක්තව නෑයන්ගේ ගෙවල් බලන්නාහු පුතනුවන් දූක වඩාගෙණ සිප සනහා පියා දූතින් තරකොට අල්වාගෙණ පුත! මා කී බසුත් සිත තබද්දූයි ආදී ඇති ප්‍රෙමයටත් වඩාලා ප්‍රෙම උපදවන්නාහ, මෙසේ දෙවයෙනි! දරුවෝ මෑනියන්ට කිසිකලෙකත් වඩාලාම ප්‍රිය වන්නාහයි දෙවන පැනය විසඳා වදාළ සේක. දෙවතා දූ පෙර පරිද්දෙන්ම සාධුකාර දී පූජා කළාය.

රජ්ජුරුවෝද පූජාකොට තුන්වන පැනයට ආරාධනාකොට කියම දෙවයෙනි! වදාළකල්හි:-

"අබ්භක්ඛාති අභූතේන අලිකේන අභිසාරයෙ
සවෙ රාජ ! පියො හොති කං තෙන මභිපස්සසි"

යන ගාථාවෙන් තුන්වන පැනය කීහ.

ඉක්බිති මහබෝසතානන් වහන්සේ දෙවයෙනි! යම් කලෙක අඹුසැමි දෙමහල්ලෝ රහසිගතව ලොකස්වාද රතියෙන් කෙළනාවූ ඔවුනොවුන්ව තොප මා කෙරෙහි මදකුත් ප්‍රේමයක් නැත; තොපගේ සිත බැහැරයයි මෙසේ ඔවුනොවුන්ට නැත්තක් කියද්ද, බොරුවෙන් චොදනා කෙරෙද්ද, එවේලෙහි ඔහු දෙමහල්ලෝ ඔවුනොවුන්ට අධිකව ප්‍රිය වන්නාහයි මෙසේ මේ ප්‍රශ්නයේ අර්ථ දනුවයි තුන්වන පැනය වදාළසේක. දෙවතා දූ පෙරසේම පූජාකළාය.

රජ්ජුරුවෝද පූජාකොට අනික් පැනයට ආරාධනාකොට කියව දෙවයෙනි! වදාළ කල්හි:-

"හරං අන්නඤ්ච පානඤ්ච වත්ථසේනාසනානිච
අඤ්ඤදත්ථු හරාසන්තා
තෙ වෙ පියගෙහානති රාජ ! කං තෙන මභිපස්සසි"

යන ගාථාවෙන් සතරවන පැනය කීහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවන්ට දෙවයෙනි! මේ පැනය තෙමෙ ධර්මිෂ්ඨවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සඳහාය, ඔවුන් තමන්ගේ ගෙදෙර සිඟා සිටි කල්හි තමන් විසින් පිළිගන්වනලද ආහාරාදිය පිළිගෙණ යන්නාවූද, ගොස් වළඳන් නාද දූක අපම සිගන්නාහ, අපම සන්තකවූ ආහාරාදිය ගෙණයන්නාහ. ගොස් අනුභව කරන්නාහයි ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන් විෂයෙහි වඩාලාම ප්‍රෙම ඇතිවන්නාහ, මෙසේ ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් සැදූහැති උපාසක කුලයෝ තමන් දෙන ලද්දාවූ සතරපසය දූක්කදී අනුභව කරණ කල්හි "අධිකයක්ම ප්‍රිය කරන්නාහ"යි සතරවන පැනය වදාළ කල්හි දෙවතා දූ පෙරපරිද්දෙන්ම පූජාකොට සාධුකාරදී සත්රුවන් පිරූ රුවන් කරඬුවක් ගණුව පණ්ඩිතයෙනි ! යි මහබෝසතානන් වහන්සේගේ ශ්‍රීපාද මූලයෙහි පූජාකළාය, රජ්ජුරුවෝද පැහැද සෙනෙවිරත් තනතුරු දුන්හ. එතැන් පටන් කොට මහබෝසතානන් වහන්සේගේ යසස මහත් වූයේය.

දෙවතා ප්‍රශ්නයයි.

තැවන සෙනකාදී සතරදෙන "ගොවියා පුතු වඩාලා මහත් යසසට පැමිණියේය, කුමක් කරමෝදූ"යි මන්ත්‍රණය කළහ. ඉක්බිත්තෙන් සෙනක පණ්ඩිතයෝ අනික් තුන්දෙනාට කියන්නාහු උඟ මහත් යසසට පැමිණියෙන්

කාර්‍ය්‍යය කිම්ද, රජ්ජුරුවන් කෙරෙහි බිඳුවා පියන්ට මා විසින් උපායක් දක්නාලද්දැයි කීහ, කුමන උපායෙක්ද ආචාර්‍ය්‍යයෙනි! යි කී කල්හි ගොවියා පුතු සමීපයට ගොස් රහස්නම් දෙය කාට කිවහොත් යහපත්දැයි විචාරම්හ. ඒ තෙමේ මහාමන්ත්‍රී හෙයින් කිසිවක් හට කිය නොහැක්කැයි ඉදින් කීයේ වීනම් ඉක්බිති ගොවියා පුතු දෙවයන්වහන්ස! ඔබවහන්සේට වරදනට සිටි නේවේදැයි බිඳුවාපියම්හයි කියා ඔව්හු සතරදෙනා සිංහරාජයකු සමීපයට යවන්නාවූ ජරපත් ශෘගාලයන් සතරදෙනකු පරිද්දෙන් පණ්ඩිතයන්වහන්සේගේ ගෙට ගොස් සුමදුක් දෙඩා පණ්ඩිතයෙනි! පැනයක් විචාරම්හයි කියා බොධිසත්ත්වයන්වහන්සේ විචාරවයි කී කල්හි සෙනකයෝ පණ්ඩිතයෙනි පුරුෂයා විසින් ආදිකොට කුමක්හි පිහිටිය යුතුදැයි විචාළහ, සබවසෙහි පිහිටිය යුතුයයි වදාළසේක. සබවස පිහිටියවුන් විසින් කුමක් කටයුතුදැයි විචාළහ, වස්තු සෙවිය යුතුයයි වදාළසේක. වස්තු උපයාගෙණ කුමක් කටයුතු දැයි පිළිවිත්සාහ, මන්ත්‍රණය උගත යුතුයයි වදාළසේක. පසු කුමක් කටයුතු දැයි පිළිවිත්සාහ, තමා සිත රහස් කටයුතු අනුන්ට නොකිය යුතුයයි වදාළසේක.

ඔව්හු සතරදෙන යහපත පණ්ඩිතයෙනි! යි සතුටු සිත් ඇතිව ගොවියා පුතු පිටුදකුම්හයි රජ්ජුරුවන් සමීපයට ගොස් දෙවයන්වහන්ස! ගොවියා පුත් ඔබවහන්සේට වරදනට සිටීයෙයයි කීහ, රජ්ජුරුවෝ මම තොපගේ බස් නොඅදහමි, ඌ තුමූ මට නොවරදිතියි නොගිවිස්සාහ, දෙවයන්වහන්ස! අප කී බස් නොඅදහනසේක් වීනම් උන් ඔබවහන්සේ දක්නට ආ කල පණ්ඩිතයෙනි! තමා සිත උපන් රහස් කටයුත්ත කාට කියයුතුදැයි උන් විචාළ මැනව. ඉදින් ඔබ වහන්සේට සතුරු නොවෙත් නම් අසවලුන්ට කියයුතුයයි කියති. ඉදින් ද්‍රොහි වෙත් නම් කිසිවක් හට නොකිය යුතුය, මනදෙළ පිරුණු කල කියයුතුයයි කියති. එවිට අප අදහාගෙණ සැක හළමැනවැයි කීහ, රජ්ජුරුවෝත් යහපතැයි උන් කීවා ගිවිස එක්දවසක් පණ්ඩිතවරුන් පස්දෙනා එක්ව අවුත් දැකලා උන් කල්හි රහස් කිය යුත්තක් විචාරන්නාහු පණ්ඩිත වරුන් පස්දෙනාත් එක්වූහ, ප්‍රශ්නයක් මට වැටහෙයි ප්‍රශ්නය හැම්දෙනම අසව, නින්ද කටයුතු හෝ ප්‍රශංසා කටයුතු හෝ රහසක් කවරක්හට කියන්නේද? රහස් කිවමනා කාටදැයි මෙසේ කී කල්හි සෙනකයෝ රජ්ජුරු වනුත් අප හා එක්කොට ගණුම්හයි සිතා පොළොවට ඉසුරුවූ රජ්ජුරුවන් වහන්ස! ඔබවහන්සේ අපට රක්‍ෂාසථානව සිටිසේක. අපගේ සියලු කාර්‍ය්‍ය භාරය උසුලා සිටිසේක. එසේ හෙයින් නුඹවහන්සේම ආදිකොට වදාළ මැනව ඔබවහන්සේගේ අදහස පරීක්‍ෂාකොට හෙවත් වදාළක් අසා පණ්ඩිතවරු පස්දෙනාත් කියන්නාහයි කීහ, ඒ අසා රජ්ජුරුවෝ තමන් කෙලෙස් වසඟ හෙයින් යම් ස්ත්‍රියක් නොමෝ ආචාර ශීලයෙන් යුක්තද, පුරුෂයන් කරා නොඑළඹෙන්නීද හෙවත් පතිව්‍රතා ධර්‍මය රක්‍ෂා කරන්නීද, පුරුෂයාගේ අදහස් දූත පවතීද, ප්‍රියද මනවඩන්නීද, එසේවූ තමාගේ අඹුවට නින්ද කටයුතු හෝ ප්‍රශංසා කටයුතු රහස් කියන්නේයයි කීහ.

ඉක්බිති සෙනකයෝත් “අප කෙරේ රජ්ජුරුවෝ ඇතුළත්වූහ”යි සතුටුව තමන් කළ කාරණයම ප්‍රකාශකරන්නාහු ‘යමෙක් තෙමේ දුකට පැමිණී ආතුරයාහට සරණව පිටිවහල්වේද, එසේවූ දුකෙහි නොහරණ තමා යහළුවාට රහස් කිය යුතුය”යි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ “පුක්කුසයෙනි! තොපට කෙසේ වැටහේද? රහස් කියයුතු කාටද”යි පුක්කුසයන් විචාළහ. පුක්කුසයෝ “දෙවයන්වහන්ස! යමෙක්තෙමේ තමාට වැඩිමහලුද, නොහොත් මැදිබව සිටියේද, නොහොත් කිස්දෙවුන්, ඉදින් එකකුසෙහි නොත් තැනැත්තේ ආචාර ශීලයෙන් යුක්තවීනම් තමාට පැමිණී සුවදුක් දෙකෙහි කණස්සලුව පසුබැස නොසිටිනම්, එසේවූ තමාගේ හිත කාමිවූ මලු වේවයි බෑයා වේවයි සහෝදරයාට රහස්කියයුතුය”යි කීය. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ කාවින්දයන් විචාළහ. කාවින්දයෝද, “දෙවයන්වහන්ස යම් පුත්‍රයෙක් තෙමේ පියානන්ට වහලෙක්සේ මෙහෙවර කොටගෙණ වංශයන් රක්‍ෂාකෙරේද, (අතිජාත අනුජාත අවජාත පුත්‍රයෝ තුන්දෙන නම් කවුරුදයි යනහොත්? පියානන්ට වඩා සැපත් රැස්කොටගෙණ ඨානාන්තරයට පැමිණෙන්නේ අතිජාත නම්වෙයි, පියා සන්තක වස්තුව නසා ධූතීව වසන්නේ, අවජාත නම්වෙයි. පියා සන්තක සම්පත් සපිරකොටගෙණ වංශයන් රක්‍ෂා කරන්නේ අනුජාත නම්වෙයි.) එසේවූ අනුජාත පුත්‍ර තෙමේ අලංමකවූ නුවණ ඇත්තේද, එවැනි තමා පුතුට රහස් කියයුතුය”යි කීහ. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ! දෙවින්දයා විචාළහ. දෙවින්දයෝ “දෙපා ඇත්තවුන්ට අධිපතිවූ රජ්ජුරුවෙනි! යම් මෑනිකෙණෙක් තුමූ ප්‍රෙමයෙන් යුක්තවූ සිතින් තමන් පුතනුවන්ට සියලු පොෂ්‍යය කෙරෙද්ද, එසේ හිතකාමීවූ මෑනියන්ට රහස් කියයුතුය”යි කීහ. සෙනකාදි පණ්ඩිතවරුන් සතරදෙන විචාරා රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන් විචාළහ. ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවෙනි! රහස් දෙය නම් නින්දා කටයුතුවත් කීම, ප්‍රශංසා කටයුතුවත් කීම, සැඟවීමම, උත්තමය රහස් ප්‍රකාශකිරීම නුවණැත්තන් විසින් ප්‍රශස්ත නොවන්නේය. තමා සිතූ දෙය මුදුන් නොපැමිණියේ වීනම් නුවණැති සාර පුරුෂතෙමේ ඒතාක් කල්ම කිසිකෙණෙකුන්ට ප්‍රකාශ නොකරන්නේය, ඒ සිතූ කටයුත්ත මුදුන් පැමිණියේවීනම් එවිට සභා මධ්‍යයෙහි කිසි සැකයක් නැතිව ප්‍රකාශකරන්නේයයි වදාළසේක. පණ්ඩිතයන්වහන්සේ විසින් මෙසේ වදාළ කල්හි රජ්ජුරුවෝ නොසතුටුවූහ.

ඉක්බිත්තෙන් සෙනකයෝ රජ්ජුරුවන් මූණ බැලූහ. රජ්ජුරුවෝත් සෙනකයන් මූණ බැලූහ. බෝසතානන් වහන්සේ උන් දෙන්නාගේ ක්‍රියාව දැකලා “මූන් සතරදෙනම දූසා කියා පළමුව රජ්ජුරුවන් කෙරේ මා බිඳුවාපී වන්න. පරීක්‍ෂාකරණ පිණිස ප්‍රශ්න විචාරණ ලද්දේවනැ”යි සිතූසේක. රජ්ජුරුවන් හා පණ්ඩිතයන් කථා කෙරෙමින් සිටියදීම හිරු හස්තයට ගියේය, රාජභවනයෙහිත් ඒ ඒ ස්ථානයෙහි වට විලක්කුවල පහනුත් තගහලද්දේය. පණ්ඩිතයන් වහන්සේ “රජ්ජුරුවන්ගේ කටයුතු නම් බැරිදෙයක, කුමක් වන බවත් නොදනෙයි, වහා මෙතැනින් නැගී යන බව සුදුසුය”යි හුනස්නෙන් නැගී රජ්ජුරුවන් වැඳ රාජභවනයෙන් නික්මෙනසේක්- ‘මූන් සතර දෙනාගෙන් එක්කෙණෙක් ‘යහළුවාට රහස්කීම, යහපත, එක්කෙනෙක් ‘මල් බෑයන්ට රහස් කීම යහපත’ එක්කෙණෙක් පුතනුවන්ට රහස් කීම යහපත’

එක් කෙණෙක් මැතියන්ම රහස්කීම යහපතැ'යි කීහ. මූන් විසින් තමන් තමන් කළ දෙයක්වත් දුටු දෙයක්වත් කියතියි සිතමි. එන්නාමය අදම ඒ තත්වයත් දනිමි''යි සනිටුහන් කෙරෙමින් ඔහු සතරදෙනම මෙතෙක් දවස් රජගෙන් නික්ම මාලිගා දොරකඩ එක් හඹු හොරුවක් මත්තේ හිඳ කළමනා කටයුතු බැණ තමන් තමන්ගේ ගෙවලට යන්නාහ. එසේ හෙයින් පණ්ඩිත යන් වහන්සේ "මූන්ගේ රහස් හඹු හොරුව යට වැද හොත්තොත් දතහැක් කැ''යි සිතා ඒ හඹුහොරුව තමන්වහන්සේගේ මිනිසුන් ලවා උසුලුවා උඩ තංවා යට සැතපෙතදෑ අතුරුවා හොරුව යට වැදහෙව තමන්වහන්සේගේ පුරුෂයන්ට "තෙපි මූවාව සිට පණ්ඩිත්වරුන් සතරදෙනා කථාකොට නැගී ගිය කල්හි අවුත් මා හැරගෙණ යව''යි සම්මත කළසේක. ඔව්හුත් "යහප තැ''යි මූවාව ගත්හ, සෙනකයෝ දෙවයන්වහන්ස! අප කීවත් නුඹවහන්සේ නොඅදහනසේක්වේද දූත් අප කීවා ශ්‍රී බුඩියට නැගේදෑ''යි කීහ රජ්ජු රුවෝ හෙදකාරීන්ගේ බස් ගෙණ පරීක්‍ෂා නොකොට භයින් ත්‍රස්තව "දූන් කුමක් කරමෝද? සෙනකයෙනි''යි විචාළහ. දෙවයන්වහන්ස! කල්නොය වාම කිසිකෙණෙකුත් නොදන්නා ලෙස ගොවියාපුතු මරවාපීම යහපතැ''යි කීහ. සෙනකයෙනි! තොප විනා මට අනිකෙක් තම් නැත, තෙපිම තොපගේ මිත්‍රයන් හැරගෙණ වාසල්කඩ ඇලි සිට ගොවියාපුතු උදෑසනම රාජසේවයට එමින් වාසල් ඇතුළුවූ විටම කඩුවෙන් ඉස කපාපියව''යි තමන්ගේ මගුල් කඩුව සෙනකයන් අතට දුන්හ. ඔව්හු සතරදෙනාත් යහපත දෙවයන් වහන්ස! භය නුවූව මැනව, අපි ගොවියා පුතු මරම්හ''යි කියා රජගෙන් නික්ම "අප විසින් පසමිතුරාගේ පිටුදක්නාලදූ''යි කියා හඹුහොරුවමත්තේ හුන්නාහ.

ඉක්බිත්තෙන් සෙනකයෝ "භොල! ගොවියා පුතු මරන්නේ කව රෙක්දූ''යි කීහ. අනික් තුන්දෙන "ආචාර්‍ය්‍යයන්වහන්ස! නුඹ වහන්සේම ගැසුව මැනව''යි ඔහුටම භාරකළහ, නැවත සෙනකයෝ ඉන් අනික් තුන් දෙනාට "තෙපි රහස් නම් අසවලුන්ට අසවලුන්ට කියයුතුය''යි කිවුය කිමෙක්ද? "තොප කළ දෙයක්ද? නොහොත් දුටු දෙයක්ද? ඇසූ දෙයක් දූයි විචාළහ, ආචාර්‍ය්‍යයන්වහන්ස! ඒ පසුකළ මැනව, නුඹ දූ රහස්කම් යහළු වැට කියයුතුය''යි යමක් වදාළසේක් වීනම් "ඒ නුඹ වහන්සේ කළ දෙයෙක්ද? නොහොත් දුටු දෙයෙක්ද? ඇසූ දෙයෙක්දූ''යි විචාළහ. සෙනකයෝ "තොප පට ප්‍රයෝජන කිම්දූ''යි කීහ. "කීවමැනව ආචාර්‍ය්‍යන්වහන්සැ''යි කීහ. මේ රහස් කවයුත්ත රජ්ජුරුවන් දතහොත් මාගේ දිවි නැතැ'යි කීහ. "නොබව මැනව ආචාර්‍ය්‍යයන්වහන්ස! මෙතැන නුඹ වහන්සේගේ රහස් ප්‍රකාශකරණ කෙණෙක් නැත. සැකනොකොට කීවමැනව''යි කීහ. සෙනක පණ්ඩිතයෝ හඹුහොරුවට නියපිටින් ගසා "මේ හොරුව යට ගොවියාපුත් ඇද්දෝහෝ''යි කීය. "ආචාර්‍ය්‍යයන්වහන්ස! ගොවියාපුත් තමාගේ ආශ්වර්‍ය්‍ය යෙන් මත්ව සුව විඳිනේ මෙබඳු අපවිත්‍ර තැනකට කුමට වදීද? නොවදීමය. නුඹවහන්සේ කීව මැනව''යි කීහ. සෙනකයෝ තමන්ගේ රහස් ප්‍රකාශ කරන්නාහු "මේ නුවර අසවල් වෛශ්‍යා දුව හඳුනව්දූ''යි කීහ එසේය හඳුනම්හ ආචාර්‍ය්‍යයෙනි''යි කීහ. "දූන් ඒ වෛශ්‍යා දූ පෙණේදූයි කීහ. නොපෙණෙයි ආචාර්‍ය්‍යයෙනි''යි කීහ. එසේවීනම් එම්බා! මම මගුල් සල්

උයන්හිදී ඈ හා සමග පුරුෂ කෘත්‍යය කොට හෙවත් සැතපී ඇගේ පලඳනා ලොභයෙන් ඈ මරාපියා ඇගේම සන්කඩින් ඒ ආභරණ පොදියක් කොට බැඳගෙණ අපගේ ගෙයි අසවල් මාලේ අසවල් ගබඩාවේ මුව අං කොක්කේ එල්වාලිමි, තව දක්වා ඉන් කිසිවක් අලෙවි කෙළෙ නැත. පරණව ගත්තා තුරු බලා ඉඳිමි, මෙබඳු රාජ අපරාධ කටයුත්ත මාගේ යහළුවකුට කීමි, උඹ කිසිකෙණෙකුන්ට නොකී විරූය. මේ කාරණයෙන් යහළුවාට රහස් කියයුතුය'යි කියෙමි''යි කීහ පණ්ඩිතයන්වහන්සේ සෙනකයන්ගේ රහස අසා සිත තබාගත්හ, පුක්කුසයෝද තමන් රහස ප්‍රකාශ කරන්නාහු 'එම්බා, මාගේ කලවයේ අසාධ්‍ය කිලාස කුෂ්ටයෙක් ඇත්තේය. මාගේ මලනුවෝ උදුසණක්සේම කිසිකෙනෙකුන් නොදන්වා ඒ කිලාසය නසට පැතින් සොඩා පියා බේත් ගල්වා මත්තෙහි මොලොක් කොට කඩරෙදී වසා බඳනාහ. රජ්ජුරුවෝ මා කෙරෙහි මොලොක් සිතින් මෙසේ එව පුක්කුසයෙනි!යි කැඳවාලා බොහෝසේම මාගේ කලවයෙහි ඉස තබාගෙන සැතපෙන්නාහ, ඉදින් නොකටයුතු දත්තුනම් මා මරාපියන්නාහ, ඒ රහස් මාගේ මලනුවන් විනා අනික් දන්නා කෙණෙක් නැත, ඒ කාරණය හෙතු කොටගෙණ රහස් නම් මල්බෑයන්ට කියයුතුයයි මා විසින් කියනලද්දූ''යි කීහ.

කාවින්දයෝද තමන්ගේ රහස් ප්‍රකාශකරන්නාහු "එම්බා! මා වරද අසව්, අව පසළොස්වක් දවස් නරදෙව නම් යක්ෂයෙක් මා ඇගට නැගෙන්නේය, ඒ යක්ෂයා නැගි කල්හි මම වියරු හුනු බල්ලකු පරිද්දෙන් හඬමි, මම ඒ යක්ෂ විකාරය මට ඇති තියාව මාගේ පුතනුවන්ට කීමි, උඹ මා ඇගට යක්ෂයා අවේශවූ බව දැන ඇතුළුගෙයි මා හුවැටි බැම්මෙන් බැඳ හොවාලා දොර පියාගෙණ ගෙන් පිටත්ව මා හඬන බලු හඬ කිසිකෙණෙකුන් නොඅසනු පිණිස දොර ළඟ රඟමඩුලු බන්දා අරගල කරන්නාහ, මේ කාරණය හෙතුකොටගෙණ රහස්නම් පුතනුවන්ට කියයුතුයයි මා කියේය''යි කීහ. ඉක්බිති තුන්දෙනම දෙවින්ද පණ්ඩිතයන් විචාළහ. උයිත් තමන්ගේ රහස් ප්‍රකාශ කරන්නාහු "එම්බා! ශක්‍රදෙවේන්ද්‍රයන් විසින් කුසරජ්ජුරුවන්ට දුන්නා වූ ශ්‍රී සම්පත් එලවන්නාවූ මාණික්‍යරත්නය රාජ පරම්පරාවෙන් පැවත අවුත් රජ්ජුරුවන් සන්තකව භාණ්ඩාගාරයේ තුබුවා මැණික් මට්කම් කරවන්නාවූ මා විසින් සොරා හැරගෙණ මාගේ මෑනියන්ට දෙනලද, මෑනියෝ කිසිකෙණෙකුන් නොදන්වා රජගෙට යන වේලෙහි ඒ මැණික මට දෙන්නාහ, මම ඒ මැණිකින් ශොභාව මූණට පතුරුවාගෙණ රජගෙට යෙමි, රජ්ජුරුවෝ නොප හැම්දෙනා හා කථා නොකොට පළමුකොට මා හා සුව දුක් දොඩන්නාහ, දවසක් පාසා අට කහවණුවක් හෝ සොළොස් කහවණුවක් හෝ දෙතිස් කහවනුවක් හෝ සූසැට කහවණුවක් හෝ මසුරන් වියදම් දෙන්නාහ. ඉදින් ඒ මිණිරුවන සොරාගත් බව රජ්ජුරුවෝ දත්තුනම් මාගේ දිවි නැත, මේ කාරණය හෙතුකොටගෙන 'රහස් නම් මෑනියන්ට කියයුතුය'යි මා කියේය''යි කීහ. බෝසතානන්වහන්සේ මේ හැම දෙනාගේම රහස් ප්‍රත්‍යක්ෂ කොට සිත තබාගත්සේක. ඔහු වනාහි තමන්ගේ බඩ පලා බඩවැල් පිටත් කරවන්නවුන් මෙන් රහස් ඔවුනොවුන්ට කියා හැම්දෙනම පමානොව උදෑසනම එව, ගොවියා පුතු මරම්හ'යි කියා හුන් තැනින් නැගී සිට තමන් තමන්ගේ ගෙවලට ගියාහ.

ඒ සෙනකාදී පණ්ඩිතවරුන් ගිය කල බෝධිසත්වයන් වහන්සේගේ පුරුෂයෝ අවුත් ඔරුව ඔසවා මහබෝසතාණන් ගෙණගියහ, උන්වහන්සේ ඉස් සෝධා නහා ගඳවිලවුන් ගෙණ සැරහී දිව්‍යභොජනයක් හා සමානවූ රස මසවුලෙන් යුක්ත ආහාරය අනුභවකොට "අද මාගේ බූනනියෝ උදුම්බරා දෙවි රජගෙන් මට සවරූප කියා අස්නක් එවති"යි දූන "රජගෙන් ආ කෙණ කුන් වහා ඇතුළුව ඇරගෙන මට පැලව'යි කියා ඇඳහිලි පුරුෂයකු වාසල සිටවූසේක මෙසේ විධානකොට විචිත්‍රාභරණයෙන් විභූෂිතවූ ශයන මස්තක යෙහි බ්‍රහ්ම කුමාර විලාසයෙන් සැතපුණුසේක. රජ්ජුරුවෝද ඒක්ෂණයෙහි ශ්‍රී යහනෙහි සැතපුණාහු පණ්ඩිතයන්වහන්සේගේ ගුණ සිහිකොට මහෞෂධ පණ්ඩිතයෝ සත්හැවිරිදි කල් පටන් මා හා සේවය කරන්නාහ, මට කිසි අවැඩක් නොකළහ. දෙවතා දූ විචාළ පැනයෙහි පණ්ඩිතයන් නැතහොත් මාගේ ජීවිතයද නැත්තේය වෛරී පසමිතුරන්ගේ බස්ගෙණ 'අසමානවූ නුවණැති මහෞෂධ පණ්ඩිතයන් මරව'යි කියා මගුල්කඩුව දුන්නාවූ මා විසින් කෙළේ අයුක්තියය. සෙට පටන් කොට එවැනි පණ්ඩිත රත්නයක් දක්නට නොලැබේය"යි ලය පැලීයන පරිද්දෙන් ශොක ඉපදවූහ. ශරීර යෙන් ඩා බිඳගත්තෝය. ශොකයෙන් මඩනා ලද්දාහු, චිත්තාස්වාදයක් නොලද්දාහ. උදුම්බරාදෙවි රජ්ජුරුවන් හා සමග එක යහනෙහි ඉඳ රජ්ජුරුවන් චිත්තාස්වාදයක් නොලැබ සැතපෙන්නා දැක "කිමෙක්දෝහෝ මාගෙන් කිසි වරදෙක් ඇද්දෝහෝ නොහොත් අනික් කිසි කාරණයෙක් රජ්ජුරුවන් සිතට උපන්දෝහෝ"යි විචාරන්නාහු "රජ්ජුරුවෙනි! තෙපි ඉතාම දොම්නස් වූව, තොපගේ සිතට නොනැගිලෙස මා කළ වරදෙක් නැත්තේය, අනික් කවුරුන් කළ වරදෙක් සිතටගෙණ දෝහෝ නොහොත් කවුරුන්ගේ විෂයෙහි තොපට ශොකයක් ඇතිවීද? ඒ මට කියව"යි කීහ ඉක්බිති රජ්ජුරුවෝ "සොඳුර! සෙනකාදි පණ්ඩිතවරු සතරදෙන මහෞෂධ පණ්ඩිතයෝ තොප මරාපියා රාජ්‍යය ගන්නට සිතති'යි මට කීහ. මා විසින් තත්වය පරීක්ෂා නොකොට 'එසේවීනම් උඟ මරාපියව'යි මගුල් කඩුව අතට දීලා පණ්ඩිතයන් මරන්නට විධාන කරණලද, ඒ කාරණය සලකන්නා මම 'මහෞෂධ පණ්ඩිතයන් මරණට පෙරතුකොට මට මරණයවීනම් යහපතැ'යි උන්ගේ වාක් විෂයාතික්‍රාන්ත ගුණ නුවණ සලකන්නෙම් 'එවැනී පණ්ඩිතරත්නයක් සෙට පටන් නොදකිමි'යි සිතා උපන් බොහෝ ශොකයෙන් දොම්නසිමි"යි කීහ. එබස් අසා උදුම්බරාදෙවීන්ට බෝධිසත්වයන්වහන්සේ විෂයෙහි පමීතයකින් මඩනාලද පරිද්දෙකින් ශොක උපන්නේය.

ඉක්බිති "උපායකින් රජ්ජුරුවන් අස්වසමි'යි සලකා 'රජ්ජුරුවන් නිදන්නට වන් කල්හි මාගේ මලනුවන්ට සවරූපකියා පත්‍රයවමියි සිතා "රජ්ජුරුවන් වහන්ස! ගොවියාපුතු මේසා මහත් ඓශ්වර්‍ය්‍යයක පිහිටුවා තෙපිමවද ඇතිකෙළෙහිය, තොප කෙරෙන්ම සෙනෙවිරත් ධූරයට පැමිණ දූන් තොප ටම වරදනට සිටියෝය, එම්බා! පසමිතුරෝ නම් කුඩා නොවෙති මැරිය යුත්තෝමය, තෙපි නොසිතව්ය"යි රජ්ජුරුවන් බිසව් වක්‍ෂවාවෙන් අස්වැසූහ. රජ්ජුරුවෝ බිසවුන් කී බසින් තුනී කරණලද ශොක ඇතිව නිදන්නට වන්හ. බිසව් රජ්ජුරුවන් නිදන නියාව දූන නැගී සිට ශ්‍රී යහන් ගබඩාවට වැද පතක් පත්හිඳක් ගෙණ "මහෞෂධ පණ්ඩිතයෙනි! සෙනකාදී පණ්ඩිතවරු

සතරදෙන රජ්ජුරුවන්ට දූසා කියා තොප බිඳුවාපීහ. රජ්ජුරුවෝ කිපී සෙට උදෑසනම රජගෙට එන වේලෙහී වාසලදී මරණ පරිද්දෙන් විධානකොට තමන්ගේ කඩුව සෙනකයාට දුන්හ. සෙට රජගෙට නොඑව, ඉදින් එව්තම් නුවර මුළුල්ල අත්පත්කොටගෙණ යුධයක් වීනමුත් කරණ පරිද්දෙන් බල ඇතිව එවයි පත ලියා අකුළුවා අන්ගලාවක් පලා ඇතුළේලා නොපෙණෙන ලෙස හුයකින් අග්ගලාව වෙළා සුවඳ කවා අලුත් සැලියක ලා අස්ඹා තමන්ට වැඩපසස්නා කම්මිත්තකොට "මේ ගෙන ගොස් මාගේ මලනුවන්ට දීඑව"යි කියා දුන්හ. කම්මින්තන් බිසව් කී ලෙසට කළාය. (රුකවල් ඇති තැන කෙසේ ගියාදැ'යි නොසිතිය යුතුය. රජ්ජුරුවන් විසින් බිසවුන්ට පළමුකොට කැමැති වේලක අමුත්තක් තොපගේ මලනුවන්ට යැව්ව රුකවල් තැනැ'යි වර දෙනලද, එසේ හෙයින් කිසිකෙණෙකුන් නොවැලකූහ). බෝධිසත්වයන්වහන්සේ බිසවුන් යැවූ පඬුරු සංඛ්‍යාත අග්ගලාව අතටගෙණ මා මේ පඬුරුගත් නිසාව බිසවුන්ට කියාලව'යි කියා කම්මිත්ත යවූසේක. ඔයින් රජගෙට අවුත් යැවූ දෙය පණ්ඩිතයන්වහන්සේට දුන් නියාව බිසවුන්ට කිව එවිට බිසව් ගොස් රජ්ජුරුවන් සමග සැතපුණාහ.

බෝසතාණන් වහන්සේද අග්ගලාව බිඳ ඇතුළෙහි තිබූ පත කියවා එපවත් තත්වූ පරිද්දෙන් දැන නුවර කළමනා කටයුතු මුළුල්ල විචාරා, යහනෙහි සැතපුණුසේක. සෙනකාදී සතර දෙන රාත්‍රිභාගය වඡ්ජීයක් මෙන් දික්කොට සිතන්නාහු 'කවර විටක පහන් වේද්දෝහෝ'යි වර්ජිත කරණලද නිදි ඇතිව උදෑසනක්සේම කඩුගත් අත් ඇතිව වාසල ඇලී රුක සිට පණ්ඩිතයන් වහන්සේ නොදැක දෙම්නස්ව බෝධිසත්වයන්වහන්සේගේ මුළු ලොව පතළ මෛත්‍රී නැමති චණ්ඩ වාතයෙන් උදුරා දමනලද්දාවූ වෘක්ෂ සතරක් මෙන් රජ්ජුරුවන් සමීපයට ගොස්, "කිමෙක්ද පණ්ඩිතවරුනි! තොප විසින් ගොවියා පුතු මරවනලදද්ද"යි කී කල්හි 'දෙවයන්වහන්ස! ගොවියා පුතු නුදුටිමුය"යි කීහ. මහබෝසතාණන්වහන්සේද හිරු නැගෙමින් සිටියදීම සත් යොදුන් මියුලුනුවර මුළුල්ලම තමන්වහන්සේ වශගකොට, ඒ ඒ ස්ථානයෙහි රුකවල් තරකොට ලවා බොහෝදෙනා විසින් පිරිවරන ලදුව සර්වාලංකාර යෙන් සරනලද උතුම් රථයාත්‍රාවකට නැගී මහත්වූ හස්ත්‍යාශ්වාදි පරිවාර යෙන් හා අනුපමවූ ශ්‍රී සෞභාග්‍යයෙන් උපලක්ෂිතව රජගෙයි වාසල කරා වැඩිසේක. රජ්ජුරුවෝ සීමැදුරු කවුළුව හැරපියා බොධිසත්වයන් වහන්සේ එන්නා බලා සිටියහ. ඉක්බිති මහ බෝසතාණන්වහන්සේ රථයෙන් බැස පියා එනනදීම රජ්ජුරුවන් වැඳිසේක. රජ්ජුරුවෝ ඉදින් පණ්ඩිතයෝ මට පසමිතුරුවෙත් නම් මා නොවඳනාහ'යි සිතූහ. මෙසේ සිතා ඉක් බිති 'මපුතනුවෝ වහා එත්ව'යි වහා කැඳවා යවා රාජාසනයෙහි හුන්හ. මහ බෝසතාණන්වහන්සේද ගොස් එකත්පස්ව හුන්හ. සෙනකාදී පණ්ඩිතවරු සතරදෙනත් එතැනම උන්හ.

ඉක්බිති රජ්ජුරුවෝ බෝධිසත්වයන්වහන්සේට කිසිවක්ම නොදන්නා කෙණෙකුන් මෙන් "පුත මහෞෂධපණ්ඩිතයෙනි! ඊයේ පෙර සන්ධ්‍යායෙහි ගියෙහිය, දැන් හිරු නැගී මෙතෙක් වේලෙන් අවුත් මා දුටුව, මා මෙසේ කුමට හළුවාද? කුමක් අසා තොපගේ සිතට කුමන සැකයෙක්විද? කවුරු

තොපව රජ්ජුරුවන් දක්මට නොඑවයි කුමන බසක් කිව්දැයි සවරූප අසන්නා කැමැත්තම්හ, එබැවින් තොප පමාවූ කාරණය කියව” විචාළහ. ඉක්බිති මහබෝසතාණන්වහන්සේ රජ්ජුරුවන්ට ‘දෙවයන්වහන්ස! ඔබවහන්සේ විසින් මට සතුරුවූ සේනකාදී සතරදෙනා බස්ගෙණ මා මරන්නට නියොග කරතලද්දේ වේද, එසේ හෙයින් නොආයෙමි”යි රජ්ජුරුවන්ට වොදනා කරණසේක් “ජනප්‍රධානවූ දෙවයන්වහන්ස! ඔබවහන්සේ විසින් ප්‍රඥසම්පන්න මහෞෂධපණ්ඩිතයෝ මැරිය යුත්තෝයයි වෛරීවූ සෙනකාදීන්ගේ බස්ගෙණ මා අපරීක්ෂිතව මරන්නට නියෝගකරණලද, යම් හෙයකින් ඊයේ මධ්‍යම රාත්‍රිවේලෙහි බිසවුන්වහන්සේට රහසිගතව කියතලදද, එබදුවූ නුඹවහන්සේගේ රහස් කටයුත්ත ප්‍රකාශකලවිට මා විසින් අසතලදැ”යි වදාලසේක. රජ්ජුරුවෝ ඒ අසාලාම ‘මා විසින් කියතලද රහස එවිට තමා මලුට කියා යවතලදැ”යි කිපී බිසවුන් මූණ බැලූහ.

රජ්ජුරුවන් බිසවුන්ට කිපී තියාව දැන, මහබෝසතාණන් වහන්සේ “දෙවයන්වහන්ස! බිසවුන් වහන්සේට කුමකට කිපෙතසේක්ද? මම අතීතානාගත වර්තමාන සංඛ්‍යාත කාලත්‍රයවර්තිවූ සියල්ලම දනිමි, දෙවයන්වහන්සේගේ රහස් වනාහී මට දේවින් විසින් කියතලද්දේවේවා ආචාර්‍ය්‍ය සෙනකයන්ගේ හා පුක්කුසාදීන්ගේ රහස් මට කාවිසින් කියතලදද? මම උන්ගේ රහසුත් දනිම්මය”යි කියා සෙනකයන්ගේ රහස් පලමුකොට වදාරණසේක් “දෙවයෙනි සෙනකයා මෙම නුවර අසවල් වෙශ්‍යා දුව මගුල් සල් උයනේදී මරාපියා ඈ පලන් ආභරණ ඇගේම හන්කඩින් පොදියක්කොට බැඳගෙන අවුත් තමාගේ ගෙයි අසවල් තැන තැබූයේය. ඉක්බිත්තෙන් තමා කල ලාමක පාපකර්‍මය තමාගේ එක් යහළුවකුට රහසිගතව කීය. ඒ රහසද මා විසින් අසතලද, මම දෙවයන්වහන්සේට සතුරු නොවෙමි. සෙනකයා සතුරාය, ඉදින් ඔබවහන්සේගේ පසමිතුරකුගෙන් කාර්‍ය්‍යයෙක් ඇත්නම් සෙනකයා අල්ලුව මැනව”යි වදාලසේක, රජ්ජුරුවෝ සෙනකයන් මූණ බලා ‘සැබෑද සෙනකයෙනි’යි විචාරා ‘සැබව දෙවයන්වහන්සැ’යි කී කල්හි ඔහු කරපය මස්වා සිරගෙයි ලන්නට විධාන කළහ.

පණ්ඩිතයන්වහන්සේද පුක්කුසයන්ගේ රහස් වදාරණසේක් දෙවයන් වහන්ස! මේ පුක්කුසයානම් රජ්ජුරුවන් කරා නොඑලඹිය යුතුවූ අසාධ්‍ය කුෂ්ඨරෝගයක් කලවයෙහි ඇති එකෙක ඒ කුෂ්ඨරොගය අතලන්නටත් පිළිකුල් වන්නේය. නුඹවහන්සේ පුක්කුසයාගේ කලව මොලොකැයි’යි බොහෝසේ ඔහුගේ කලවයෙහි ඉස තබාගෙණ සැතපෙනසේක ඒ මේ වණයෙහි බැඳි කඩරෙද්දෙහි මොලොකය දෙවයන්වහන්සැ”යි කියා “එසේ තමාගේ රහස මලුට කීයේය. ඒ රහස කියතකල මා විසින් අසතලද්දේය”යි වදාලසේක රජ්ජුරුවෝ පුක්කුසයන් මූණ බලා ‘සබෑද පුක්කුසය’යි විචාරා එසේය දේවයන්වහන්සැ’යි කී කල්හි උනුත් දගගෙයි ලැවූහ. පණ්ඩිතයන්වහන්සේ කාවින්දයාගේ රහස් වදාරණසේක් “දෙවයන්වහන්ස! යම් යක්ෂ විකාරයක් ඇතිවූ කල්හි සඹුතෙමේ වියරුහුනු බල්ලකුසේ හඬා ඇවිදීද, එසේවූ නපුරු සවභාව ඇති නරදෙවනම් යක්ෂයෙක් අව පසළොස්වක්හි මොහු ඇගට ආවේශවූ කල්හි සතර පා බිම ඔබාගෙණ ඇවිදින උන්මත්ත

සූනඛයකු මෙන් ගේ මුළුල්ලෙහි අඬා ඇවිදීද, ඒ යක්‍ෂ විකාරය තමාට ඇති නියාව තමාගේ පුතුට රහසේ කීයේය. ඔහු පුතුට ප්‍රකාශ කළ නියාව මා විසින් අසන ලද්දැ''යි වදාළසේක, රජ්ජුරුවෝ ''සැබෑද කාවින්ද්‍රය''යි විචාර ''සැබෑය'යි කී කල්හි උනුත් දඟගෙයි ලවූහ. පණ්ඩිතයන්වහන්සේ දෙවිඳුයාගේ රහස් ප්‍රකාශ කරණසේක් ''දෙවයන්වහන්ස! ප්‍රභාවතී බිසවුන් නිසා, ඒසා යුද්ධයක් සජ්ජිතකොට ආ රජ්ජුරුවන් සත්දෙනෙකු 'මම (සිංහස්වර) 'කුසරජය' යන වචන මාත්‍රයකින් පරාජයකොට ශත්‍රු සේනායෙහි කිසිකෙණකුන් ඇඟින් මැස්සකු බොන පමණක් ලේ පොදක් නොසොල්වා චණ්ඩ පවනකින් එක පැහැර වගුල තල් වනයක් පරිද්දෙන් විසංඝකොට හෙළ යුද්ධයේ ජයලත් නුඹවහන්සේගේ මී මුත්තනුවන් කුසරජ්ජුරුවන්වහන්සේට සන්තුෂ්ටව, ශක්‍රදෙවෙන්ද්‍රයන් විසින් දෙනලද්දාවූ මහත්වූ මංගල සම්මත අෂ්ටවංක මාණික්‍ය රත්නය ඔබ වහන්සේගේ භාණ්ඩාගාරයෙහි තුබුවා දූත් දෙවින්දයා අතට ගියේය. තමා මැණික සොරාගත් නියාව රහස්කොට මවට කීයේය උඹ මවට කී රහසක් මා විසින් අසනලද, දෙවයන්වහන්ස! මම ඔබවහන්සේට පසමිතුරු නොවෙමි, මෙකී පණ්ඩිතවරු සතර දෙන ඔබවහන්සේට පසමිතුරෝය, පසමිතුරන්ගෙන් ඔබවහන්සේට කාර්‍යයක් ඇත්නම් මෙකී පණ්ඩිතවරුන් සතරදෙනා අල්වාගෙණ කැමැත්තක් කළමැනව''යි වදාළසේක. රජ්ජුරුවෝ සැබෑද දෙවින්දයයි අසා සැබව කී කල්හි උනුත් දඟගෙයි ලවාපීහ.

මෙසේ සෙනාකාදී පණ්ඩිතවරු ''බොධිසත්වයන් වහන්සේ මරම්හ''යි හැමදෙනම සිරගෙට වන්හ. බොධිසත්වයන් වහන්සේද ''දෙවයන් වහන්ස තමන් සිත උපන් රහස් කටයුත්ත මුදුන් පැමිණියොත් මුත් අනුන්ට නොකියයුතුයයි කීයේ මේ නිසාය''යි කීසේක. ''අසම්ලුන්ට රහස්කීම යහපතැයි කීවාහු මහත් විනාශයට පැමිණියෝය''යි වදාරා මත්තෙහි ධර්මදෙශනා කරණසේක් මහරජ රහස් නම් දෙය සැඟවීමම යහපත, නුවණැත්තෝ 'රහස් ප්‍රකාශ කිරීම උතුමැ''යි නොකියත්නාහ. යම්තාක් තමා සිතූදෙය මුදුන් නොපැමිණියේ නම් ඒතාක්ම නිධානයක්මෙන් නුවතැත්තේ ඉවසන්නේය, නිෂ්පන්නවූ අර්‍ථ ඇත්තේ කැමති පරිද්දෙන් ප්‍රකාශ කරන්නේය, නවද දෙවයන්වහන්ස! විශෙෂයෙන්ම රහස් නොකිය යුත්තන් අසා වදාළ මැනව මේ ලෝකයෙහි ස්ත්‍රී තොමෝ හදවතක්සේ වේසේ නමුත් නුවණැත්තේ ගැහැණියන්ටත් රහස්නොකියන්නේය. යමෙක් ආමිෂයෙන්සිත්ගතයුතුනම් එසේවූ තැනැත්තවුටද, යමෙක් සතුරුව මිතුරකුසේ මුඛයෙන් එකක් බැණ සිතින් එකක්සිතානම් එසේවූ කූට සිත් ඇත්තාහටද, රහස් නොකියන්නේය. යම් අඥනයෙක් කිසිවක්හට ප්‍රකාශ නොකොටයුතු රහස් යමක්හට කීයේවීනම් ඔහු මරතත් ආක්‍රොශ පරිභව බණතත් දාසයකු බරිද්දෙන් තමා කී රහස් ප්‍රකාශකෙළේවීනම් නපුරැ'යි යනු සිතින් සියලු නිත්දාව ඉවසන්නේය තමා සිත උපන් රහස් යම්තාක් දෙනා දනිත්නම්, ඒ මන්ත්‍රණය කළා වූ එතෙක් දෙනා කෙරෙහි 'මූ විසින් ප්‍රකාශ වේද්දෝ'යි එතෙක් භය ඕහට උපන්නේය එසේ හෙයින් රහස් කිසිවක්හටත් නොකියන්නේය. දහවල් රහස් මන්ත්‍රණයක් කරණු කැමැත්තහොත් අවකාශයක් කරවාගෙණ හෙළිතැනදී මන්ත්‍රණය කරන්නේය. ඉදින් රෑ මන්ත්‍රණයක් කරණු කැමැත්හොත්

කත් සීමා නොයික්මවා උන්ගේ කණින් බැහැරව නෙප්ල නොයන ලෙස් සෙමෙන් ප්‍රකාශ කරන්නේය 'කුමක් හෙයින්දයි යතහොත් භිත්ති ප්‍රාකාරාදී ප්‍රච්ඡන්න ස්ථානයෙහි සිටි කෙණෙක් ඇත්තම් මන්ත්‍රණය අසන්නාහ. "එසේහෙයින් දෙවයන්වහන්ස! ඒ මන්ත්‍රණය හෙදවන්නේය"යි වදාළසේක

රජ්ජුරුවෝ මහබෝසතානන් වහන්සේගේ ධර්මකථාව අසා 'මොව්හු තුමූම රාජද්‍රෝහිව නිරපරාධවූ පණ්ඩිතයන් මට ද්‍රෝහි කරන්නාහයි කිපී යව කොල! මේ කොල්ලන් මරවරා නුවරින් පිටත්කොට වාසල්දොරසමීප යෙහි අගල් ඔස්සේ ගෙණගොස් හුල හෝ හිඳුවා ඉස්කප්පපියා අගලට නෝ දමාපියාව'යි නියම්කළහ. උන් පිටිතල හයා බැඳ සත්ථි සත්ථියෙහි සිටුවා කටු සැමිටියෙන් සියගනන් පහර ගස ගසා මරන්නට ගෙණයන වේලෙහි පණ්ඩිතයන්වහන්සේ 'දෙවයෙනි! මොව්හු තුමූ ඔබවහන්සේගේ පුරාතන අමාත්‍යයෝය, උන්ගේ වරද ක්‍ෂමාකළ මැනව'යි රජ්ජුරුවන්ට වදාළසේක, රජ්ජුරුවෝ 'යහපතැ'යි ගෙන්වා බොධිසත්‍වයන්වහන්සේටම දස්කොට පාවා දුන්හ. උන්වහන්සේ වනාහි පණ්ඩිතවරුන් එතනදීම නිදහස් කළසේක. එසේ වීතම් මාගේ විජිතයෙහි සිටිය නොහැක්කැ'යි රටින් නෙරනට නියෝගකළසේක, පණ්ඩිතයන් වහන්සේ 'නුවණ නැත්තන්ගේ වරද ක්‍ෂමාකළ මැනව'යි දිව්‍ය ඖෂධයකින් අසාධ්‍ය ව්‍යාධියක් සංසිඳුවන්නාක්මෙන් තමන් වහන්සේගේ වචනෞෂධයෙන් රජ්ජුරුවන්ගේ කොප ව්‍යාධිය සංහිඳුවා ක්‍ෂමාකරවා උන්ගේ තනතුරු පෙර පරිද්දෙන් දෙවා වදාළසේක, රජ්ජුරුවෝ 'පසමිතුරන් කෙරෙහිදු මුන්ගේ මෛත්‍රීය මෙබඳුය, සෙස්වුන් කෙරේ මෛත්‍රී කෙබඳු වන්නීදැ'යි පණ්ඩිතයන් වහන්සේට වැඩියක්ම සතුටුවූහ. එතැන් පටන් කොට සේනකාදි පණ්ඩිතවරු සතරදෙන දළ උදුරාපු සර්පයන් මෙන් වැඩියකුත් ප්‍රභූ ශක්තියක් නැතිව බොධිසත්වයන් වහන්සේට කිසිවක් කියන්නට අසමර්ථ වූහ.

පඤ්ච පණ්ඩිත ප්‍රශ්නයයි

පරඛණ්ඩ කථා නිමි.

එතැන් පටන් කොට පණ්ඩිතයන්වහන්සේම රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකරණසේක. උන්වහන්සේ රජ්ජුරුවන්ට ධවලච්ඡත්‍ර සමග රාජ්‍යය විචාරන්නෙම් නම් මමය. එසේහෙයින් මා විසින් නොපමා විය යුතුය'යි සිතා සත්යොදුන් මියුලුනුවර වටා ක්ෂීර සාගරයෙන් නැගී තරඞ්ග මාලාවක්සේ ධවලවූ අටළොස් රියන් පමණ උස මහා සීමා පවුරක් ලැවූසේක. ඒ පවුර ගාවා ඇතුළතින් තරය පිණිස මහා පදනමක්ද වට කොට සිංගණන් වාරි ගෙවල් හා වටබඳ වෙට්ටම්ද ලවා වාසලක් පාසා පිටත පුලිමුබම්ද ඒ ඒ ස්ථානයෙහි බලකොටුද කරවූසේක, සීමා පවුරු වටා පිට තින් සුංසුමාර මකරාදී චණ්ඩ මත්ස්‍යයන් විසින්ගහනවූ පඤ්චවිධ පද්මයෙන් සඤ්ඡන්න දිය පිරුණු අගලක්ද, ඒ වටා කලල් අගලක්ද, ඒ වටා පොළෝ

අගලෙක්දැයි තුන් අගලක් බිඳවූසේක. ඇතුළු ගෙවිල මූළුල්ල කටුකොහොල් ඇරවූසේක, ඒ ඒ ස්ථානයෙහි මහ පොකුණු බින්දවා එහි දිය පිරවූසේක. නුවර සියලු කොටු ගෙවල් වී පිරවූසේක, හිමාලයවන ප්‍රදේශයෙන් කුලුපග තාපසවරුන්ලවා අරුණුවන් මඩ හා ඇඹුල් බිජුවට ගෙන්වා තැබ්බූසේක. බොහෝ කලක් බෙරගසා වැලි බොර සිටි අගුඩ ඇල හෝ ආදිය සකස් කරවා වාරි මාර්ග සුණු මැටි කවා පිටි නුවරද සුන් බුන් තැන් පිළියම් කරවූ සේක. මේ කුමක් නිසාද යතහොත් මත්තෙහි සතුරන් විසින් වන භයවලකත පිණිසය. 'ඒ ඒ නුවරවලින් ආ වෙළඳුන් අතින් කොයිසිට අවුද්ද''යි විචාරා 'අසවල් රට සිට ආම්හ'යි කී කල "තොපගේ රජ්ජුරුවන්ට කුමක් ප්‍රියද්ද''යි විචාරා අසවල් දෙය ප්‍රියය' යනු අසා ඒ වෙළඳුන්ට කළම්නා සත්කාර කොට යා තමන් වහන්සේගේ එක්සියයක් යොධයන් බණවා, 'සබඳිනි! මාදුන් පඬුරු ගෙණ දඹදිව එක්සියයක් රාජධානියට ගොස් මේ පඬුරු තොපකෙරෙහි සෙත හස තබන පිණිස ඒ ඒ රජදරුවන්ටදීලා ඒ ඒ රජදරුවන්ටම සෙවාකම්කොට උන්ගේ කරන ක්‍රියාවක්වත් බණන මන්ත්‍රයක්වත් කියා එව එවා එහිම වසව්: මම තොපගේ අඹුදරුවන් රක්‍ෂා කෙරෙමි''යි කියා සමහර රජදරුකෙණකුන්ට මැණික්මය කුණ්ඩලාභරණද, සමහර රජකෙණකුන්ට විසිතුරු මගුල්කඩුද, සමහර රජදරුකෙණෙකුන්ට රන්මාලාද තමන්වහන්සේ නම අකුරු කොට යම් දවසක මාගේ කාර්‍යයෙහි නිෂ්ඨාවෙක්වේද, එදවස් මේ අකුරු බැලූ වන්ට පෙණේව''යි අධිෂ්ඨානකොට ඒ එක්සියයක් යොධයන් අත යැවූ සේක.

ඒ යෝධයෝ ඒ ඒ නුවරට ගොස් ඒ ඒ රජදරුවන්ට තම තමන් ගෙණගිය පඬුරුදී ඔබවහන්සේට සෙවාකම් කරන්නට ආම්හ'යි කියා රජදරුවන් විසින් 'කොයි සිට අවුද්ද'යි විචාරණ ලද්දාහු තමන් ආ නුවර තබා අනික් නුවරක්ම කියා රජ්ජුරුවන් විසින් 'යහපතැයි රඳවනලදුව සෙවාකම් කරන් නාහු ඒ ඒ රජදරුවන්ට ආත්ම සමානවූහ. එසමයෙහි එකබලරට ශඞ්ඛපාල රජ්ජුරුකෙණෙක් ආයුධ සන්නාහ සැපයීම කරන්නාහ, සෙනාව රැස්කරන් නාහ. ඒ රජ්ජුරුවන් සමීපයෙහි සිටි යොධයානෝ පණ්ඩිතයන් වහන්සේට "මේ රට රජ්ජුරුවෝ මෙසේවූ ප්‍රයෝගයක් කෙරෙති. කුමක් බවත් නොද නිමි. සුදුසු කෙණෙකුන් එවා තත්වය දනමැනව''යි කියා එවූහ. ඉක්බිති මහ බෝසතානන්වහන්සේ ගිරාපොතකයන් බණවා "සබඳ! ගොස් එකබලරට ශංඛපාල රජ්ජුරුවෝ මෙතම් ප්‍රයොගයක් කෙරෙති; ඒ දූතගෙණ දඹදිව මුළුල්ලෙහි ඇවිද ඒ ඒ රට පවත් දූතගෙන එව''යි කියා විලඳ කවා මීපැණි පොවා ශතපාක සහස්‍රපාක තෙලයෙන් දෙපියාහස්හ මැඩ, නැගෙනහිරි සීමැදුරු කවුළුව සමීපයෙහි සිට ගිරාපොතකයන් හළසේක. ගිරාපොතකයෝද එකබලරටට ගොස් ශංඛපාල රජ්ජුරුවන් සමීපයෙහි සිටී යොධයන් අතින් රජ්ජුරුවන්ගේ පවත් තත්වූපරිද්දෙන් දූත දඹදිව මුළුල්ල පරීක්‍ෂාකරන්නාහු කම්පිල්ලරට උත්තර පඤ්චාල නුවරට පැමිණියහ.

එසමයෙහි උත්තර පඤ්චාල නුවර චූලනී බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙක් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවන්ට කෙවට්ට නම් බමුණුකෙණෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාහ. උඟ නුමූ නුවණැත්තාහ වියත්හ.

ඒ කෙවට්ටාචාර්‍ය්‍ය තුමූ එක්දවසක් අලුයම් වේලෙහි පිබිද සුවඳ තෙලෙහි තගතලද පහන් ආලෝකයෙන් ගඬදම පුෂ්පදමාවලම්බිත නා නා වර්‍ණ විචිත්‍ර විතානොපලක්‍ෂිත අලඞ්කෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහු මහත්වූ සම්පත් දැක “මේ මාගේ යශස කවුරුන් සන්තකදෝහෝ”යි සිතන්නාහු ‘අනික් කෙණකුන් සන්තක නොවෙයි. චූලනී බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් සන්තකය; මෙබඳු සම්පත් දුන් රජ්ජුරුවන් සියලු දඹදිවට අගරජ කොළොත් යහපත, එසේ වුවහොත් මමත් අග්‍ර පුරෝහිතවන්නෙමි” සිතා උදෑසනක්සේම රජ්ජුරුවන් සමීපයට ගොස් රෑ දවස සුවයෙන් නිදිලත් පරිදි විචාරා “දේවයන්වහන්ස! කොටපියයුතු කථාවෙක් ඇතැ”යි කීහ. රජ්ජුරුවෝ ‘කියව ආචාර්‍ය්‍යයෙනි!’යි කීහ. දේවයන්වහන්ස! ඇතුළු නුවරදී රහස් කීයන්නට නොපිළිවන; මගුල් උයනට යම්හ”යි කීහ. රජ්ජුරුවෝ යහපත ආචාර්‍ය්‍යයෙනි!’යි කියා බමුණා හා සමග උයනට ගොස් සේනාව පිටත සිටුවා වට කොට රැකවල් ලවා බමුණානන් හා සමග ඇතුළු උයනට වැද මගුල් සලවට හුන්හ, ශිරා පණ්ඩිතයෝ මේ ක්‍රියාව දැක “මේ එක් කාරණයෙක් වුවමැනව, අද පණ්ඩිතයන්වහන්සේට කියයුතු කිසිවක් අසමි”යි උයනටවැද මගුල්සල්ගස කොළ අතර සැඟවී උන්හ. රජ්ජුරුවෝ බමුණානන්ට ‘කියයුතු රහස කියව ආචාර්‍ය්‍යයෙනි!’යි කීහ. “දේවයන්වහන්ස! ඔබවහන්සේගේ කණ මැනට තමාලුව මැනව; මේ මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණය වන්නේය, එහෙයින් ඔබවහන්සේගේ දෙකණ හා මාගේ දෙකණ හා මුත් අනික් කණකට නොයා යුතු වන්නේය. ඉදින් දේවයන්වහන්ස මා කීවා කරණසේක් නම් සියලු දඹදිවට ඔබවහන්සේ අගරජ කොට ලම්”යි කීහ. චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද මහත්වූ රාජ්‍ය ලොභයෙන් යුක්ත බැවින් බමුනාණන්ගේ බස් අසා සතුටුව “කියව ආචාර්‍ය්‍යයෙනි! තොප කීවක් කරමි”යි කීහ. “දේවයන්වහන්ස අපි සේනාව රැස්කොට පළමුකොට කුඩා නුවරක් වටකොට ගණුම්හ. මම කුරුබිලියෙන් ඇතුළු නුවරට වැද ඒ නුවර රජ්ජුරුවන්ට දේවයනි! තොප හා අප හා සටන්කොට කාර්‍ය්‍යයෙක් නැත, හුදෙක් අප නතුවව, තොපගේ රාජ්‍යය තොපටම වන්නේය. සටන් කොළෝ නම් අපගේ සේනා වාහන මහත් හෙයින් ඒකාන්තයෙන්ම පරදුව”යි කියමි, ඉදින් මා කී ලෙස නොකොළෝතම් සටන්කොට අල්වාගෙණ මරාපියා, උන්ගේ සේනාවන් හැරගෙණ අනික් නුවරකට යම්හ. ඒ නුවරත් එසේම සටන්කොටගෙණ ඉන් අනික් නුවරකැ”යි මෙම සැටියේම සියලු දඹදිව රාජ්‍යයගෙණ ජයපානය කරම්හ’යි කියා එක්සියයක් රජදරුවන් අපගේ නුවරට ගෙණවුත් උයනදී රා මණ්ඩලයක් සාදා උන් හැමදෙනා ‘රා බොන්නටය’යි රා මැඩිල්ලේ හිඳුවාලා විෂ යොදා කරණලද්දවූ රා අනුභවකරවා උන් හැමදෙනාම ජීවිතක්‍ෂයට පමුණුවා ගඟ දියට දමා එක්සියයක් රාජධානියෙහි රාජ්‍යය අත්පත්කොට ගණුම්හ. එසේ කල්හි නුඹවහන්සේ සියලු දඹදිවට අගරජ වන සේකැ”යි කීහ.

රජ්ජුරුවෝ “යහපත ආචාර්‍ය්‍යයෙනි! තොප කී ලෙසම කෙරෙමි”යි කීහ. “දේවයන්වහන්ස! මේ මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණය නම් වෙයි අනික් කෙණෙකුන් දත නොහැක්කේය. එසේ හෙයින් කල් නොයවා යහපත් තකතකින් වහා නික්මුණ මැනව”යි කීහ. “රජ්ජුරුවෝ යහපතැයි

ගිවිස්සාහ. ගිරාපොතකයෝ ඒ මන්ත්‍රණය අසා නිමවා උන්දෙදෙනා මන්ත්‍රණයකොට අනතයෙහි සාල්ලෙක ලාලා පානට බාත කෙණකුන්මෙන් කෙවට්ට බමුණා හිස වර්චස් පිඩක්හෙළා 'කිමෙක්ද'යි කටදල්වාගෙණ උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ තැවත වර්චස් පිඩක්හෙළා 'ක්‍රිත්' යන අනුකරණයෙන් හඬමින් කොළන්තෙන් උඩ නැගී "කෙවට්ටය! තෝ තාමාගේ මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණයයි සිතයිද? දැන්ම සකණකට ගියේය. නැවත අට කණකට ගොස් පසුව සියදහස් කණකට යන්නේය"යි කීය කොල! 'ගිරවා ගණුව ගණුව' කියදීම පවනටබඳුවූ වේගයෙන් පියාසරකොට ගෙණ මියුලු නුවරට ගොස්, මහෞෂධ පණ්ඩිතයන්වහන්සේගේ ප්‍රාසාදයට වන්හ.

ඒ ගිරා පණ්ඩිතයන්ගේ වතාහි මෙබඳු වතෙක් ඇත්තේය. ඉදින් කිසිතැනකින් ගෙණා අස්තක් පණ්ඩිතයන් වහන්සේට පමණක් කියයුතුවී නම් උන්වහන්සේගේ දසරුවට බස්නාහ, ඉදින් අමරාදේවිනුත් ඇසුවමනා වීනම් ඇකයෙහි ගොස් ඉඳිනාහ. ඉදින් බොහෝදෙනාත් ඇසුව මනාවීනම් බිමට බස්නාහ. එදවස් ගිරා පණ්ඩිතයෝ පණ්ඩිතයන්වහන්සේගේ දසරුවෙහි බැස උන්හ. ඒ සලකුණෙන් 'රහස බිණිය යුතුය'යි බොහෝදෙන ඉවත්වගියහ. පණ්ඩිතයන්වහන්සේ සුවපොතකයන් හැරගෙණ මතුමාල්තලයට නැගී 'සබඳ! තොපවිසින් කුමක් දක්නාලදද කුමක් අසනලදදැයි"යි විචාළසේක. ඉක්බිති ගිරාපණ්ඩිතයෝ බොධිසත්වයන්වහන්සේට "මම දෙවයෙනි! සියලු දඹදිව අනික් රජ්ජුරුකෙණෙකුන් සමීපයෙන් කිසිභයක් නුදුටිමි. උත්තර පඤ්චාල නුවර චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ කෙවට්ටනම් පුරෝහිතයානෝ රජ්ජුරුවන් උයනට ගෙණගොස් සතරකන් මන්ත්‍රණයක් කළහ. මම මගුල් සල්ගස කොළ අතර සැඟවී ඉඳ මන්ත්‍රණය අසා නිමවාගෙණ කෙවට්ට බමුණා කට වර්චස්පිඩක් එළාපියා ආමි'යි කියා සියලු තමන් දුටු දෙයත් ඇසූ දෙයත් පණ්ඩිතයන්ට දන්වූහ. උන්වහන්සේ විසින් රජ්ජුරුවෝ ගිවිස්සෝද'යි විචාළ කල්හි ගිවිස්නාලදය පණ්ඩිතයන් වහන්සැ'යි කීහ. පණ්ඩිතයන්වහන්සේ ගිරා පොතකයන්ට කළමනා සත්කාරකොට හෙවත් මීයෙන් ඇනු විලඳ කවා මීපැන් පොවා, බේත් තෙලින් පියාසගළ මැඩ මොළොක් ඇතිරිලි අතුරණලද රන් මැදිරියෙහි සතප්පා 'කෙවට්ටයා මා මහෞෂධ පණ්ඩිත බව නොදනිති"යි සිතම් දැන් ඔහු කළ මන්ත්‍රණය" මුදුන් පැමිණිය නොදෙම්"යි සිතා ඇතුළු නුවරනුත් දිළිඳුන් පිටත්කරවා පිටිනුවර ලැවූසේක. පිටරටින් දනව්වලින් සතර වාසල් නියම්ගම් සතරින් වස්ත්‍රාභරණ ධනධාන්‍ය දීන් සමෘඬවූ ඉසුරුමතුන් ගෙන්වා ඇතුළු නුවර වැස්වූසේක. බොහෝ ධන ධාන්‍ය රැස්කරවූසේක.

චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද කෙවට්ටයින්ගේ බස්ගෙණ හස්ත්‍යශ්වාදි සෙනග පිරිවරා ගොස් එක් කුඩා නුවරක් වටලා ගත්හ. කෙවට්ට බමුණා තමා යට කී සැටියේම කුරුබිලියෙන් ඇතුළු නුවරට වැද කාරණා කාරණා ඒ රජ්ජුරුවන්ට කියා තමන් වසඟකොට ගෙණ දෙසෙනාව එක්කොට ගෙණ අනික් නුවරක රජ්ජුරුවනැයි මෙසේ චූලනිබ්‍රහ්මදත්තරජ්ජුරුවෝ කෙවට්ටාචාර්‍ය්‍යයන්ගේ අවවාදයෙහි සිට ඒ වෙදෙහ රජ්ජුරුවන් තබා සෙසු සියලු

දඹදිව රජදරුවන් තමන් නතුකළහ. බොධිසත්වයන්වහන්සේ විසින් ඒ ඒ රජදරුවන් සමීපයෙහි සිටුවනලද පුරුෂයෝද බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විසින් ''අදවකට මෙතෙක් නුවර ගත්තාලදෑ''යි පණ්ඩිතයන්වහන්සේ නොපමාවන සේක්වයි''යි කියා නිරන්තරයෙන් හසුන් එවන්නාහ, උන්වහන්සේද ඒයොධයන්ට 'මම මෙහි පමාවක් නැත්තෙමි, තෙපි උකටලි නොව නොපමාව වසව්ය'යි කියායවනසේක. බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ සත්හවුරුදුසත්මස් සත්දවකින් වෙදෙහ රජ්ජුරුවන්ගේ රාජ්‍යය තබා සෙසු දඹදිව රාජ්‍යයන්ගෙණ කෙවට්ට බමුණන්ට ආචාර්යයෙනි! මියුලු නුවර වෙදෙහ රජ්ජුරුවන්ගේ රාජ්‍යය ගණුම්හ'යි 'දෙවයන්වහන්ස! මහෞෂධ පණ්ඩිතයන් වසන නුවර රාජ්‍යය ගන්නට නොපොසතුම්හ. ඒ පණ්ඩිතයෝ වනාහි මෙබඳු නුවණැත්තාහ. ඉතාම උපාය වනනයහ'යි මෙසේ ඒ කෙවට්ටබමුණු අචාර්යයෝ විස්තරකොට සඳමඬලෙහි අඳනා කෙණකුන් මෙන් මහබෝසතානන්වහන්සේගේ ගුණ රජ්ජුරුවන්ට කීහ. ඒ ආචාර්ය, වනාහි තුමූත් උපායවත්හුමය, එසේහෙයින් ''මියුලුනුවර රාජ්‍යය නම් ඉතා ස්වල්පය, සියලු දඹදිව රාජ්‍යය අපට සෑහෙයි. එක් රාජ්‍යයකින් අපට කාර්ය්‍ය කිම්දැ''යි උපායෙන් රජ්ජුරුවන් ගිවිස්සූහ, සෙසු රජදරුවෝ අපි මියුලුනුවර රාජ්‍යය ගෙණම ජයපානය බොම්හ'යි කියන්නාහ, කෙවට්ට ආචාර්යයෝ උනුන් කාරණා කියා වලකා ''වෙදෙහ රජුගේ රාජ්‍යයගෙණ කුමක් කරමෝද? ඒ රජ්ජුරුවෝත් අප නතුවෝමය, නවතුව''යි එක්සියයක් රජදරුවන් උපායෙන් ගිවිස්වූහ.

ඒ රජ්ජුරුවෝ කෙවට්ට නම් බමුණාගේ බස් අසා මියුලු නුවරට යන ගමන් නැවැත්තාහ. බෝසතානන්වහන්සේට ඔබවහන්සේගේ චරපුරුෂයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක්සියයක් රජදරුවන් පිරිවරා මියුලු නුවරට නොනික්මුණාහු නැවත තමන්ගේ නුවරටම නැගී ගියහ'යි හසුන් එවූහ. බෝධිසත්වයන්වහන්සේද ඒ පුරුෂයන්ට 'මෙතැන්පටන් කොට රජ්ජුරුවන් කරන ක්‍රියාවන් දැක එවන්ව'යි කියා නැවත අසුන් යැවූසේක, බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද කෙවට්ටයන් හා සමග ''විෂ මිශ්‍ර සුරාපානය අනුභව කරවා රජදරුවන් මැරීම් සංඛ්‍යාත ඒ කටයුත්ත දැන් කරම්හ''යි මන්ත්‍රණය කොට ''අපි ජයපානය බොම්හ'යි කියා මගුල් උයන නඳුන් උයනසේ සරහා දහස්ගණන් ඔඹම්වල විෂ මිශ්‍ර රා පුරා තබවා අනේකප්‍රකාර මසවුළු දැ ඒ ස්ථානයෙහි වළන් පුරා රැස්කොට තබවයි අමාත්‍යයන්ට විධාන කළහ. එපවත්ද පණ්ඩිතයන්වහන්සේට අනතස්සර පුරුෂයෝ කියා යැවූහු වනාහි විෂ යොදා රජදරුවන් මරනු කැමති නියාව නොදනිති. මහාබෝසතානන්වහන්සේ වනාහි ගිරාපොතකයන් අතින් ඇසූ බැවින් දන්නාසේක. එසේ හෙයින් උන්වහන්සේගේ අත්තස්සරයන්ට 'ජයපානය බොන දවස් නියමකොට කියා එවව්ය'යි නැවත අසුන් යවූසේක, ඒ යොධයෝ වදාළලෙසම දවස් නියම කොට යවූහ. ඒ අසා පණ්ඩිතයන් වහන්සේ ''මා බඳු පණ්ඩිත කෙණකුන් ජීවත්ව හින්දදීම මෙතෙක් රජදරුවන් මියයාම යුතු නොවන්නේය, උන්ට මා පිටිවහල්වුව මැනව''යි සිතා තමන්වහන්සේ හා එකදවස උපන් යොධයන් දහස බණවා සබඳිනි! චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ උයන සරසවා එක්සියයක් රජදරුවන් පිරිවරා සුරාපානය අනු

හවකරණු කැමැත්තෝල, තෙපි ඔබ ගොස් රජදරුවන්ට අසුන් පණවාලූකල කිසිකෙණකුත් නොහිඳිනාතුරුම චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හිඳිනට පැණවූ අස්නට ඉක්බිති පැණවූ මාහැඟි අස්නක් අපගේ රජ්ජුරුවන්ටය''යි ගෙණ ඒ රජ්ජුරුවන්ගේ සෙනාව විසින් "තෙපි කවුරුන්ගේ සෙනාවද''යි කීකල වේදෙහ රජ්ජුරුවන්ගේ සෙනාව වම්හ'යි කියව. කුමක්ද? අපි සත් හවුරුදු සත්මස් සත්දවසක් මුළුල්ලෙහි දඹදිව රාජ්‍යය ගත්තමෝ එක් දවසකුත් වෙදෙහ රජ්ජුරුකෙණෙකුත් නුදුටුම්හ; වෙදෙහ රජ්ජුරුවෝ නම් කවුරුද? යව උන්ට චූවමතා වීතම් කෙළවර අස්නක් ගණුව'යි තොප හා සමග කළහ කරන්නාහ. තෙපි බ්‍රහ්මදතත රජ්ජුරුවන් විනා අපගේ රජ්ජුරුවන්ට වැඩිතරම් කෙණෙක් නැතැයි කලහ වඩාගෙණ අපගේ රජ්ජුරුවන්ට අස්නක් පමණකුත් නොලබන්නමෝ දූත් තොපට රාත්පිය නොදෙම්හ. මස් අවුළු ආදියත් කෑ නොදෙම්හ'යි වාසි බෙණෙමින්, සිංහනාද ඇසූ මුවපොල්ලන් පරිද්දෙන් තොපගේ අභීත ශබ්දයෙන්ම උන් භයගත්වා යමුගුරු බාලා සියලු රා මස් පිරූ සැළවල් බිඳ තු තු කොටපියා වහා රා මස් අවුළු විසුරුවා නො කැහැකි පරිද්දෙන් කොට දිවීමෙන් ගොස් සේනා මධ්‍යයට වැද ශක්‍රපුරයට වන් අසුර භවයන් පරිද්දෙන් මහත් අරගලකොට අපි මියුලුනුවර මහෞෂධ පණ්ඩිතයන්ගේ යොධයම්හ, පිළිවන් නම් අප අල්වා ගණුව''යි තොප ගිය බව අගවා එව'යි කියා යොධයන් දහස බණවා යවූසේක. ඒ යෝධයෝත් බොධිසත්වයන්වහන්සේ වදාළ බස මුදුනෙන් පිළිගෙණ වැඳ සමුගෙණ දුනු මුගුරු අඩයටි පත්කොහොල් පාරාවළලූයයි යන පඤ්චායුධ සන්නාඩව උතුරු පසල් දනව්වට ගොස් නදුන් උයනමෙන් සරහනලද උයනට වැද, නගනලද දළපුඩු සේසත් ඇති එක්සියයක් රාජාසන ආදීවූ පිළියෙලකොට තබනලද ශ්‍රී විභූතීන් දුක මහබෝසතානන්වහන්සේ විසින් වදාරණලද ක්‍රමයෙන් සියල්ලකොට සෙනාව මධ්‍යයට වැද බොහෝදෙනා ක්ෂොභකොට තමන්ගේ මියලුනුවර බලා ගියහ රාජපුරුෂයාද එපවත් ඔවුන්ගේ රජදරුවන්ට දූන්වූහ.

චූලනී රජද එක්සියයක් රජදරුවන් මරණ පිණිස ශෞඩගිලා ඉදිකරණ ලද මෙබඳු සුරාපානයට මහෞෂධ පණ්ඩිතයන් විසින් බාධාකෙළේය''යි කිපුනාහ එක්සියයක් රජදරුවෝ අපට ජයපානය බීගත නුදුන්හ''යි කිපුනාහ. සෙනාවද 'අපි නොමිලයේ බොන සුරාපානය නොලද්දම්හ'යි කිපුනාහ බ්‍රහ්ම දතත රජ්ජුරාවෝද, එක්සියයක් රජදරුවන් බණවා "එව පින්වත්නි! මියුලු නුවර ගොස් වෙදෙහ රජ්ජුරුවන්ගේ ඉස කඩුවෙන් කපාපියා තල්පැන් පලක් මඩනාසේ දෙපයින් මැඩගෙණ හිඳ ජයපානය බොම්හ. සෙනාව ගමනට සැරහීගෙණ එන පරිද්දෙන් විධාන කරව'යි කියා නැවත රහසිගතව කෙවට්ට යන්ටද එපවත් කියා අපගේ මෙබඳු මන්ත්‍රණයන්ට බාධාකළාවූ පසමිතුරා ගණුම්හ. එක්සියයක් රජදරුවන් හා අටළොස් අක්ෂෞහිණියක් පමණ සෙනාව පිරිවරා ඒ මියුලු නුවරට යම්හ. අප හා කැටිව එව ආචාර්‍යයීයෙනි! යි කීහ. බමුණානෝ තමන් නුවණැති හෙයින් වෙදේහ රජ්ජුරුවන් "මහෞෂධ පණ්ඩිතයන්ද නිසා ගන්නට නොපිළිවන ගියොත් අපටම මහා ලජ්ජාවන්නීය, කාරණා කියා රජ්ජුරුවන් නවතම්යි සිතා රජ්ජුරුවන්ට "දෙවයෙනි! මේ වෙදෙහ රජුගේ බලයෙක් නොවෙයි, මහෞෂධ පණ්ඩිතයන්ගේ විධාන

යය, උග්‍ර තුමූ මහානුභාව ඇත්තාහ. ඒ මහෞෂධ පණ්ඩිතයන් විසින් රකිනා ලද මිථිලා නම් රාජධානිය සිංහයකු විසින් රක්නාලද රත්ගල් ගුහාවක් පරිද්දෙන් වෙන කිසිකෙණකුත් විසින් ගත්නට නොහැක්කේය. ගියොත් හුදක් අපටම ලජ්ජාවන්නීය. ඔබ ගමන නොකමැත්තෙමි'යි මෙසේ කීහ. රජ්ජුරුවෝ චනාභි රාජමානයෙන්ද ඉසුරු මදයෙන්ද මත්ව, දණ්ඩකින් පහළ සර්ප රාජයකුසේ කෝපයෙන් දිලිහි ඒ මහෞෂධයා කුමක් කරන්නේදැයි කියා එසේම අභිමාන පුරස්සරවූ එක්සියයක් රජදරුවන් පිරිවරා වෙරම්බ වාතයෙන් හැලලී ගිය මහා සාගරයසේ කොප නමැති වාතයෙන් ඇලලීගිය අටළොස් අක්ෂෞහිණියක් සෙනාවෙන් යුක්ත නික්මුණාහ. කෙවට්ටයෝද තමන්ගේ බස් රජ්ජුරුවනට සිතට නංවාගතනොහී 'රජ්ජුරුවන්ට පටහැනි වීම නම් යුතු නොවේව'යි සිතා රජ්ජුරුවන් හා සමග නික්මුණාහ.

බොධිසත්ත්වයන්වහන්සේ විසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ ජයපානය විධ්වංසනය කරන්නට එවන ලද්දාවූ දහසක් යොධයෝ තමන් අා කටයුතු සම්පාදනය කොට එකදවසින්ම රාත්‍රිය මුළුල්ලෙහි ගොස් මියුලුනුවරට පැමිණ තමන් කළ කටයුතු පණ්ඩිතයන්වහන්සේට දැන්වූහ. පළමු ඒ ඒ රජදරුවන් සමීපයට යවන ලද්දාවූ චරපුරුෂයෝද පණ්ඩිතයන්වහන්සේට චූලනී බ්‍රහ්ම දත්ත රජ්ජුරුවෝ ''වෙදෙහ රජ්ජුරුවන් ගණ්නම්හ''යි එක්සියයක් රජුන් පිරිවරා එන්නාහ, ''පණ්ඩිතයන්වහන්ස! පමා නොවන සේක්ව''යි හසුන් එවූහ, 'අද අසවල් තැන ලැගුම් ගන්නාහ, අද අසවල් තැන ලැගුම්ගන්නාහු අද චනාභි නුවරට එන්නාහ''යි පණ්ඩිතයන්වහන්සේට නිරන්තරයෙන් හසුන් එවන්නාහ. ඒ අසා මහබෝසතානන්වහන්සේ වඩ වඩාම කළමනා විධානයෙහි නොපමා වූසේක. වෙදෙහ රජ්ජුරුවෝ චනාභි 'චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මේ නුවර ගන්නට එත්ල'යි පරම්පරා ශබ්දයෙන් ඇසූහ.

ඉක්බිති බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ පෙර සන්ධ්‍යාසෙහිම ගන්නා ලද්දාවූ ලක්ෂගණන් දඬුවැට පහන් ආලොකයෙන් ගොස් සියලු සත්යොදුන් මියුලු නුවර පිරිවරා ගත්හ. කෙසේ වටකොළෝදයත්, පළමුකොට පොළෝ අගල වටා රත් සන්නාහලන ලද්දාවූ රත්සත් රත්පොරොදු ආදී හස්ත්‍යාලඞ්කාරයෙන් සරහන ලද්දාවූ සොඬ රුක ගන්නාලද මුගුරු ඇති ලොහ ප්‍රකාරවී නමුත් පිටින් ඇන සුණුවිසුණු කරන්නට සමර්ථ ශක්ති ඇති දෙකපොළය හා කොෂය යන තුන්තැනින් වැහෙන්නාවූ එක් මදයකින්ද, යථොක්ත ස්ථානතුන හා දෙකන් සිදුරු දෙඇස් සිදුරුයයි යනු සප්තස්ථානයෙන් වැහෙන්නාවූ එක් මදයෙකින්ද එම සප්තස්ථානය හා දෙනාසාපුටය ගුදමාගීය යන දශස්ථානයෙන් වැහෙන්නාවූ එක්මදයක්න් දැයි මෙසේ ගිලිහෙන තුන්මදයකින් යුක්තවූ සර්වාභරණයෙන් විභූෂිත ජය අකුසු හා තොමරාදි ආයුධගත් අත් ඇතිව පිට විදිනා ඇතරුවන් විසින් ගැවසීගත් ඒ ඒ රජ්ජුරුවන්ගේ කොප නමැති ගින්නෙන් නැගී දුම්කඳක්සේ, උස්වූ කන්තලින් කන්තල ගසා සිටුවනලද්දාවූ ඇත්වළල්ලකින්ද යුධයට ලන ලද්දාවූ සන්නාහ ඇති අශ්වාලඞ්කාරයෙන් සරහන ලද්දාවූ සින්ධු කාම්බොජයොනකාදි උත්තමදෙශයෙහි උපන්නාවූ නානා

හරණ ප්‍රතිමණ්ඩිතව සත්තාහ සත්තඹව පිට හිඳිනා අසරුවන් විසින් ගැවසීගත් ‘සතුරා හනුකොට ගණිම්’යි ඔදවැඩියාවූ රජ්ජුරුවන්ගේ සිත් නමැති ආකාශ ගඞ්ගායෙහි බිඳි බිඳී දිවන්නාවූ රළපහරසේ, යුඞයට පිඹිනාලද කාහල ශබ්දයෙන් සතුටුව පැන පැන සිටිනාවූ ග්‍රීවයෙන් ග්‍රීවය ගසා සිටුවන ලද්දාවූ අස් වළල්ලකින්ද, සිංහ ව්‍යාඝ්‍ර ආදී සම් අතුරණ ලද්දාවූ රථාලංකාරයෙන් සරහා නගනලද නානාවර්ණ ධ්වජ පංක්ති ඇති සෙන්ධවයන් යොදන ලද සර්වාලංකාරයෙන් සැරහී පිට බඳනාලද හියමුරු ඇති, නැගෙනලද ධනුර්ධරයන් විසින් උපලක්ෂිතවූ සේනා නමැති සමුද්‍රයෙන් නැංගාවූ තල්මස් කැලසේ, රියසකින් රියසක ගසා සිටුවනලද රථවළල්ලකින්ද ‘සිද්ධාර්ථ කුමාරයන් සමතිස් පැරුම් පුරා මුළුකොටගෙණ බොධිද්‍රුමයක් පිටිවහල් ලදින් සත්තිස් බොධිපාක්ෂික ධර්මසංඛ්‍යාත යොධයන් බලකොටගෙණ විදුරසුන් අරා බුදුවන්නට උන් වේලෙහි ජය ගැන්ම පිළිවන් හෝ වේවයි දුරතබාම අන්‍යතර ජාතියක අන්‍යතර යුඞයක්කොට බැලුව මැනව’’යි සිතා චූලනී රාජ ව්‍යාජයෙන් ආ වශවර්ති මාරයාගේ සිංහ මුඛ අශ්ව මුඛ ව්‍යාඝ්‍ර මුඛාදීවූ මුඛ මවා අසිසත්ති තොමර භෙණ්ඩිවාල කරවාලාදීවූ දීප්තිමත් නානාවිධ අවි ගණිමින්, අනෙකප්‍රකාර විකාර වේශයෙන් ආ දසබිම්බරක් මාරසේනාවසේ භයඞ්කාරවූ සේනායෙහි බාහුවෙන් බාහුව ගසා සිටුවන ලද්දාවූ යොධ වළල්ලකින්දැයි, මෙසේ සතර වළල්ලකින් ඒ සත්යොදුන් මියුලුනුවර වටලවා ඒ ඒ ස්ථානයෙහි බලඇණි සිටුවූහ.

මනුෂ්‍යයෝ ඔල්වරහඬ දෙන්නාවූ අත්පොළසන් දෙන්නාහු පනන්නාහු ‘වටලාගතුම්හ’ යන සමාධියෙන් නටමින් ගර්ජනාකරමින් සිටගත්හ. අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනායෙහි නගනලද මිණිවඩු වැටෙහි ලක්ෂ ගණන් පහන් ආලොකයෙන්ද එක්සියයක් රජදරුවන් හා හස්ත්‍යශ්වාදී සේනාව පලන් ආභරණයෙහි ආලොකයෙන්ද සියලු සත්යොදුන් මියුලුනුවර ඒ මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥා නමැති සූර්‍ය්‍යයා පහළව සත්වයන්ගේ මොහාන්ධකාර විගමනයෙන් හෙළිවූ කලක් පරිද්දෙන් ආලොකවිය. ඇතුන්ගේ කුඤ්චනාදයෙන්ද අසුන්ගේ හේෂාරවයෙන්ද, රථයෙහි චක්‍රනාදයෙන්ද, පාබල සෙනගෙහි ගර්ජනාවෙන්ද, සක්සින්නම් හර තනතිරියට ගැට පටහ බෙර පනාබෙර සක් රිදී සක් ආදීවූ පංචාංගික තූර්‍ය්‍යනාදයෙන්ද, පොළොව පැළීයන පරිද්දෙන් වූයේය. සෙනකාදීවූ පණ්ඩිතවරු සතරදෙන මහත්වූ කොලාහල ශබ්දය අසා කුමන අරගලයක් බවත් නොදන්නාහු වෛදෙහ රජ්ජුරුවන් සමීපයට ගොස් ‘‘දෙවයෙනි! මහත්වූ කොලාහල ශබ්දයෙක, අපි කුමක් බවත් නොදනුම්හ. කුමන අරගලයෙක්දැයි විමසුවහොත් යහපතැ’’යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ යළි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ආවාහුද්දෝ’යි සීමැදුරු කවුළුව හරවා පිටත බලන්නාහු උන් ආ බැව් දැන භයින් ත්‍රස්තව ඉතිකින් අපගේ දිවි නැත, බ්‍රහ්මදත්තයා තෙමේ දූත් දූන් අප හැම මරන්නේය’යි සෙනකාදීන් හාසමඟ කථාකරමින් හුන්හ.

මහබෝසතානන්වහන්සේ වනාහි චූලනී රජ්ජුරුවන් ආ බව දැන සිංහයකුමෙන් කිසිභයක් නැතිව නුවර මුළුල්ලෙහි රැකවල් සකස්කොට එවා ‘‘රාජාදීහු භයින් දිළිහී ඉඳිති, මා උන් අස්වාසාලුව මැනව’’යි මතුමාලයට

නැගී රජ්ජුරුවන් වැඩ එකත්පස්ව සිටිසේක. රජ්ජුරුවෝ මහබෝසතානන් වහන්සේ දුකා ලබනලද අස්වස් ඇතිව 'මපුතනුවන් මහෞෂධ පණ්ඩිතයන් විනා අනික් මා මේ දුකින් මුදන්නට සමර්ථ කෙණෙක් නම් නැතැ'යි සිතා පණ්ඩිතයන්වහන්සේ හා සමග කථාකරන්නාහු මහෞෂධ පණ්ඩිතයෙනි! පඤ්චාලදෙශ වාසිවූ බ්‍රහ්මදත්ත රජ තෙමේ එක්සියයක් රාජධානියෙහි සියලු අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව හා සමග ආයේය පඤ්චාල රාජධානී සන්තකවූ මේ සේනා තොමෝ මෙතෙකැ'යි පමණ නැත්තීය, ඉතා මහති වාරටවාලාදිවූ නොයෙක් කර්මාන්තයට පිටින්ගෙණ එන්නාවූ ධ්‍වජ පත්‍ර සංගෘ ලියම් වෙට්වම් ලෑලිආදිවූ දරුසම්භාරයන්ගෙණ ඇවිදිනාවූ වඩුසෙනගින්, යුක්තවූ සියලු සංග්‍රාමයෙහි දක්ෂවූ ඇතුන් අසුන් ආදිවූ බල සෙනග ඇත්තීය ගහන බැවින් තමා අතරව වන්නවුන් නොපෙණෙන පරිද්දෙන් පය බිම ගැවිය නොදී උරපිටින් ගෙණයන්නීය හස්ති ශබ්දය, අශ්ව ශබ්දය, රථශබ්දය, වීණා ශබ්දය, මෘදඞ්ග ශබ්දය, ගීත ශබ්දය, තාල ශබ්දය, 'විඳුවගණුව අනුවය'යි මෙසේ දසවිධ ශබ්දයෙන් යුක්තවූය, ඇතුන් ආදිවූ සිවුරඟ සෙනගෙහි පවත්නා නාදය මුදුපරගානාහේ පවත්නා හෙයින් මූබලුව, ඔබ ගව යුඩකරව පමානොවව යනාදිවූ ඒ ඒ කටයුත්තෙහි නියොග වචන වාග්භෙදයෙන් දක්වන්නව නොපිළිවන් හෙයින් මෘදඞ්ග මද්දලාදිවූ නානාප්‍රකාර භෙරිශබ්ද යෙන් හා ශඞ්ඛ කාහල ශබ්දයෙන් හඟවන්නාවූ ඒ ඒ කටයුතු ඇත්තීය. සත් රුවනින් විසිතුරුවූ සන්නාහයෙන් හා ස්වර්ණජාල හස්ති කුන්ත විශෙෂයෙන්ද රාජ රාජ මහාමාත්‍යාදීන් පලඳන ලද්දාවූ කනක කටක රසන නූපුර තාඞ්ග වලය තිසරපට අවුල්හර උදරබන්ධන ගැවතිමුල්හර පස්රු පස් වලලු පෙරුස් එක්වැටි පාමුදු පාදජාලා පාඩගත් පාසලඹ පාදත්‍ර පාදභරණාදිවූ ශරීරාභරණ යෙන්ද හොබනීය, කනක රජතාදීන් විචිත්‍රවූ රක්ත නීලාදිවූ නානා වස්ත්‍ර යෙන් සමුජ්වලිත රථාදියෙහි නගනලද නානාප්‍රකාර ධවලච්ඡත්‍ර පංක්තියෙන් ගැවසීගත්තීය, ඇත්වාහන අස්වාහන රථවාහනයෙන් යුක්තය හස්ති ශිල්පය, අශ්ව ශිල්පය, රථශිල්පය, ධනුශ්ශිල්පය ආදිවූ අටළොස් මහා ශිල්පයෙහි කෙළ පැමිණියන් විසින් විශෙෂයෙන් සමෘධය මේ සෙනාතොමෝ සිංහ සමාන වික්‍රම ඇත්තීය, සුර යොධයන් විසින් සුප්‍රතිෂ්ඨිතය. මේ සෙනායෙහි පොළොව හා සමාන නුවණ ඇති රහස් මන්ත්‍රණ කරණ සුලුවූ හෙවත් දෙදවසක් තනිව හිඳ සිතුවහොත් මහලොව පෙරළන්නටද අහස හා පොළොව ගැවලන්නටද පොහොසත්වූ පණ්ඩිතවරු දසදෙනෙක් ඇත්තාහ. ඒ පණ්ඩිතවරුන්ට වඩා අධිකවූ ප්‍රඥ ඇති රජ්ජුරුවන්ගේමෑනියෝ තලතාදෙවි පණ්ඩිතවරුන් දසදෙනාට එකොළොස් වැනිව හිඳ චූලනී රජ්ජුරුවන්ගේ සෙනාවට අනුශාසනා කරන්නාහුය.

වැලිදු ඒ තලතාදෙවින්ගේ ප්‍රඥව කෙසේද යතහොත්,—එක්දවසක් මිනිසෙක් සාල් නැළියක්ද පලාබත් මුලක්ද මසුරන් දහසක්ද හැරගෙණ 'ගඟින් එතර යම්'යි ගඟ මැදට ගොස්, දිය සැඩ හෙයින් එතරව ගත නොහී එතර සිටි මිනිසුන්ට පින්වත්නි! මා අත සාල් නැළියක් හා බත් මුලක්ද මසුරන් දහසක්ද ඇත. මෙකී තුනින් මට යමක් රුචිනම් ඒ දෙමි, තොප ඇම දෙනා කෙරෙන් 'යම් කෙණෙක් මා එතරකල හෙයි .තම් උඹ මා එතර කෙරේව'යි මෙසේ කිය. ඉක්බිති ශක්ති සම්පන්න පුරුෂයෙක්

කච්චිය තරකොට හැඳගෙණ ගඟට බැස ඒ පුරුෂයා අත අල්වාගෙණ එතර කොට 'මට දියයුතු දෙය දෙව'යි කීය. ඒ තෙමේ 'සාල් නැළිය හෝ බත්මුල හෝ ගණුව'යි කීයේය. ඒ අසා දියෙන් එතරකළ පුරුෂයා ''මම මාගේ ජීවිතය නොසලකා තොප එතරකෙළෙම්. මට සාල්නැළිය හා බත්මුලින් ප්‍රයොජන නැත, මනු දහස දෙව'යි කීය. ඒ අසමින් යමක් මට රුචිවීනම් ඒ දෙන්නෙම් කීයෙම්, දූන් මට යමක් රුචිනම් ඒ දෙම්, කැමතනොත් ගණුවයි කීය. ඒ තෙමේ සමීපයෙහි සිටි එකෙකුට එපවත් කීය. එයිත් 'යමක් තමන්ට රුචිවීනම් ඒ තොපට දෙම් කියාවේද උත් කීයේ උත් දෙනු කැමති දෙයක් හැර ගණුවයි කීයේය. ඒ පුරුෂයා උත් කී බසත් නොසිට 'එසේ මා ගත්තේ නැතැ'යි ඔහු ඇරගෙණ අධිකරණ නායකයන්ට සවරූප කීය. අධිකරණයේ ඇත්තෝද දෙන්නාගේ බස් අසා 'උන් දූන් දෙයක් ගණුව'යි එලෙසම කීහ. ඒ පුරුෂයා අධිකරණ නායකයන්ගේ යුක්තියෙහි නොසිට රජ්ජුරුවන්ට දූන් විය. රජ්ජුරුවෝ අධිකරණ නායකයන් ගෙට ගෙන්වාගෙණ උන් මැදයේ දෙන්නාගේ බස් අසා එලෙසම කියා යුක්තිය පසිඳිනාසේ නොදන්නාහු තමාගේ ජීවිතයෙහි ආශාවක් නැතිව ගඟට බට තැනැත්තවුම පැරදවූහ. එවේලෙහි රජ්ජුරුවන්ගේ මැණියෝ තලතා දේවී තුමූ එතැනට නුදුරු තැනෙක හුන්නාහු රජ්ජුරුවන් යුක්තිය නපුරුකොට පනුත් බව දූන 'පුත! යුක්තිය සලකාපියා කියව'යි කීහ මැනියන්වහන්ස! මාදන්නේ මෙපමණක්මය, ඉදින් නුඹවහන්සේ අමුත්තක් දක්නාසේක් වූනම් පසිඳුව මැනව''යි කීහ තලතාදේවී 'යහපත යුක්තිය පසිඳිමියි කීයා ඒ දියෙන් යන්නට සිටි පුරුෂයා බණවා 'මෙසේ එව දරුව! තොප අත තුබූ සාල් නැළියත් බත් මූලත් මනු දූසත් තුණම පිළිවෙළින් බිම තබාලව'යි කියා පිළිවෙළින්ම තබවා තෝ 'දියෙන්යන්නෙහි මූවිකුමක් කීයෙහිදූයි විචාරා මෙලෙසම කීම් කී කල්හි 'එසේවීනම් තට රුචියක් හැරගෙණ යව'යි කීහ. ඒ තෙමේ මනු දූස අතට ගත, ඉක්බිති මඳතැනක් ගියකල බිසවු උඟ ගෙන්වා ''දරුව! මනු දූස තොපට අභිප්‍රායදූයි විචාරා එසේය කැමැත්තෙමියි කී කල ''දරුව! තොප විසින් මින් මට යමක් රුචිවීනම් ඒ දෙම්, මෝ හට කියනලද්ද? නොකියන ලද්ද''යි අසා 'කියනලද්දූයි දේවීන්වහන්ස! කී කල එසේ වීනම් මනු දූස මෝහට දෙවයි කීය. ඒ තෙමේ හඬමින් වලපලන් මනු දූස ඕ හට දුන්නේය. එවේලෙහි රජ්ජුරුවෝද අමාත්‍යයෝද සතුටුව සාධුකාර දුන්හ. එතැන්පටන් තලතා දේවීන්ගේ නුවණ දඹදිව මුළුඑල්ලෙහි පතළවීය. (මේ තිසාය චූලනී රජ්ජුරුවන්ගේ මැනියෝ තලතා දේවී එකොළොස්වනුව සෙනාවට අනුශාසනා කෙරෙති'යි කීයේ:–)

තැවත ඒ සෙනායෙහි පඤ්චාල රාජ්‍යයෙහි අනුභවූ පරිවාර සම්පත් ඇති බ්‍රහ්මදත්තයා විසින් හැරගත් රටවල් අයිති මරණභයින් තැතිගත් එක් සියයක් රජදරුවෝ මේ චූලනීරාජයා සමග යෙති, අටළොස් අක්ෂෞහිණියක් සෙනාවෙන් මේ මිථිලා නම් රාජධානිය වටලා පළමුව ඇත් පවුරෙක, දෙවැනිව අස් පවුරෙක, තුන්වැනිව රථ පවුරෙක, සතරවැනිව යොධ පවුරෙකැයි මෙසේ සතරවලල්ලක් හා අස්වලල්ලව අතරෙහි එක් වීථියෙක, අස්වලල්ලට හා රථවලල්ලව අතරෙන් එක් වීථියෙක, රථවලල්ලව හා බළ වලල්ලව අත

රෙහි එක් වීථියෙක, මෙසේ තුන්සන්ධියකින් වටකරණලද වෛදෙහරටවාසීන්ගේ මිථිලා නම් රාජධානිය හාත්පසින් කැන උඩ නගන කලක් පරිද්දෙන් පවුරු පදනම් බඳ දූන් දූන් සුණු විසුණු කරණු ලැබෙයි, මහෞෂධ පණ්ඩිතයෙනි! හාත්පසින් යම් බඳු සෙනාවක් පිරිවරණලදද, ඒ සෙනාවට මත්තෙහි පෙණෙන නොයෙක් සියදහස් ගණන් මිණිදඹුවැට පහන් කරණකොටගෙණ තරු වැලයෙන් ගහනවූ ආකාශය වැන්න, පණ්ඩිතයෙනි! අවීචියෙහි පටන් භවාග්‍රය දක්වා තොප හා සමාන නුවණැති කෙණෙක්නම් නැත, නුවණ නම් මෙසේවූ තැනට වේද, එහෙයින් තෙපිම දනුව මේ මහා සෙනාවෙන් අප ගැලවීමෙක් කෙසේ වේදැයි කීහ.

මෙසේ රජ්ජුරුවන් මරණ භයින් යුක්තව කියන්නාවූ බස් අසා මහබෝසතානන්වහන්සේ “මේ රජ්ජුරුවෝ ඉතාමරණභයින් භයපත්ව ගියාහ; රොගයෙන් පෙළෙන එකක් හට අවසථා පිළියමක් දන්නා වෙදකු මුත් අනිකෙක් පිළිසරණ නොවන්නාසේද, සාදුකින් පෙළෙනඑකකුට භොජනය මුත් අනිකක් පිළිසරණ නොවන්නාසේද, පිපාසා ඇති එකකුට පැන් පොවා මුත් ඒ පිපාසය නොසන්සිඳෙන්නාසේද, මේ රජ්ජුරුවන්ට මා මුත් අනික් පිළිසරනෙක් නැතැ”යි රජ්ජුරුවන් අස්වසාලම් සිතූසේක. ඉක්බිති රජ්ජුරුවන්ට බෝසතානන්වහන්සේ සැට ගොඩුන් රත්ශල්තලා මත්තකයෙහි නාදකරණ සිංහ රාජයකුමෙන් “නොබව මැනව දෙවයන්වහන්ස! රාජ්‍ය සුව අනුභව කළ මැනව, මම කැටක්ගෙණ කපුටු රැළක් පලවන එකක්හුමෙන්ද දුන්නක් අල්වාගෙණ වඳුරු මුළක් පලවන එකකු පරිද්දෙන්ද, මේ අටළොස් අක්ෂෞහිණියක් පමණ සෙනාව බඩබන්කඩ පමණකටත් අසවාමික කරවා තිගණ්ඨ සෙනාවක් පරිද්දෙන් ඉස් ලූ ලූ අත ලුහුබඳවා පියම්, එය මට භාරය, සටනෙකැ’යි සිතක් නොතබා භය නොගෙණ සුවසේ රාජ්‍ය ශ්‍රී අනුභව කළ මැනවැයි කීසේක. මෙසේ කියා රජ්ජුරුවන් අස්වසාලා මාළිගාවෙන් බැස නුවර බෙරලවා හැමදෙනාට වදාරණසේක් “පින්වත්නි! තෙපි හැම සතුරෝ වටලා ගත්තෝ වේදැයි නොසිතා මල් ගඳ විලවුන් හා අටළොස් වර්ගයේ කැවුම් හා රා මස් ආදි නොයෙක් අන්නපාන සපයා වස්ත්‍රාභරණයෙන් සැරහී උත්සවයට පටන්ගණුව, සමහරකෙණෙක් තොප තොපට සුදුසු පරිද්දෙන් බොව් නම් මහාපානයක් බොව, බෙර ගසව, ගී කියව, එළසන් ඔල්වරසන් අසුරුසන් දෙව, සියල්ලක් නැතිකෙණෙකුන්ට මාගෙන් දෙමි, මහෞෂධ පණ්ඩිතයෝනම් මමය, කිසිභයක් නොකරව, මාගේ ආනුභාව බලව”යි කියා අස්වසා වදාළසේක. ඒ බසින් නුවර වාසීහු සත් අවුරුද්දේ පටන් ඔබගේ බල තමන් ඇම ඉඳුරා ගන්නා හෙයින් කිසි භයක් නැතිව ශඞ්කා රහිතව නැටුම් ආදී සියල්ලෙන්ම මහතානන් වදාළ පරිද්දෙන් උත්සවයට පටන්ගත්හ, නුවර ඇතුළෙහි ගී කියන වයන අරගල පිඹින සිටි සතුරෝ අසන්නාහ, සතුරන්ගෙන් බොහෝදෙන කුරුබිලියෙන් ඇතුළුව නුවරට වදනාහ, සතුරුව විටෙක මුත් දුටුදුටුවන් නොඅල්වන්නාහ, එසේහෙයින් සතුරන්ගේ සංචාරය නොසිඳෙන්නේය, නුවරට වන්වන් මනුෂ්‍යයෝ උත්සවකෙළනාත් ජයපානය බොන්නාත් ජය කොලාහලයත් දක්නාහ, බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් ඇතුළුනුවර කොලාහල අසා සමීපයෙහි සිටියවුන්ට කියන්නාහු “පින්වත්නි! අට

ලොස් අක්ෂෞහිණියක් පමණ මේ සේනාව ගෙණවුත් තමන්ගේ නුවර වටලා ගත් තියාවට කිසි භයක්වත් තැතිගැන්මක්වත් නැත්තේය, සන්තොෂයෙන් යුක්තව පස්වණක් ප්‍රීතින් පිණා ගියවුන්සේ අත්පොළසන් දෙන්නාහ, එළුසන් දෙන්නාහ, ගී කියන්නාහ. බෙර ගසන්නාහ, කොල! කුමන ආශ්චර්‍ය්‍යයෙක්දැ''යි කීහ.

එසේ කී රජහට වරපුරුෂයෙක් බොරුවක් ගොතාගෙණ කියන්නේ දෙවයන්වහන්ස! මම කිසි කටයුත්තක් නිසා කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙම් සැනකෙළි කෙළනා ජනයන් දැක පින්වතුනි! සියළු දඹදිව රජදරුවන් සෙනා සහිතව අවුත් තොපගේ නුවර වටලාගෙණ සිටියදී තොප හැම මෙසේ ප්‍රමාදව වසන්නට කාරණා කිම්දැයි විචාළෙමි, ඔහු මට කියන්නාහු අපගේ රජ්ජුරුවන් කුමාරකල මෙසේවූ දෙලෙක්වීය, කෙසේදයත්, දසදහසක් යොදුන් දඹදිව රජුන් මුළුල්ලේ සෙනාව පිරිවරා අවුත් මා උන් නුවර පිරිවරා සිටිකල සැණකෙළි කෙළිම්යි දෙලෙක් උපන. ඒ දෙළ දූන් මුදුන් පැමිණියේය. එබැවින් සත්දවසක් සැණකෙළි කෙලව'යි නුවර බෙර ලවා තමන්වහන්සේගේ මාලිගාවේ මතු මහලේ අමාත්‍ය මණ්ඩලයා පිරිවරා හිඳ මහා සන්තොෂයකින් මත්ව ජයපානය බොනසේක් මේ රජ්ජුරුවන් හා සෙනාව ආ තියාව ඔබ තමා දන්නාසේක්දැ''යි කීහ. මම එබස් අසා රජකු බොළඳ තියායයි නින්දාකෙළෙමි කීය, බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එබස් අසා දණ්ඩෙන් ගසනලද ආශීර්විෂයක්හු මෙන් ක්‍රොධයෙන් දිලිහී කිපුනාහු 'කොල! වහා මේ නුවර ඒ ඒ දිගින් අගල මැඩ හස්වා පවුරු දොරටු අටලු වාසල් බලකොටු ආදිය බිඳ සුණු විසුණු කරමින් වහා නුවරට වැද ගැල්පුරා නෙණවුත් කොමඩු බානාසේ මහජනයන් ඉස් කපාගෙණ වෙදෙහ රජහු ඉසත් වහා ගෙණෙව''යි කීහ.

එබස් අසා බලසම්පන්න යෝධයෝ නොයෙක් ආයුධ ගත් අත් ඇතිව නුවර ගණ්හාමහයි පවුරු වාසල් සමීපයට ගියාහු බොධිසත්වයන්වහන්සේගේ යොධයන් විසින් දමනලද කලල් වැලි ආදියෙන් මහා විනාශයට පැමිණ බිඳිනා තබා පවුර සමීපයටත් යා නොහී නැවත යන්නාහ. ඉන් සමහර කෙණෙක් නොනැවත 'පවුරු බිඳුම්හ'යි වාසි කියා සාහසිකව ගොස් අගල බටුනම් අන්තරවිටාලවල විසෝ ඊ දඹුමුණ කොහොල් තොමර හෙණ්ඩියාලා දීන් දමා මහා විනාශයට පමුණුවන්නාහ බොධිසත්වයන්වහන්සේගේ යෝධයෝ බ්‍රහ්මදත්තයන්ගේ යොධයන්ට අතින් මුහුණින් උසුළු විසුළු පෑ නොයෙක් ප්‍රකාරයෙන් ආක්‍රොශ පරිභව බෙණෙමින් ගැකැට කරන්නාහ, මච්ඡ මාංශ හා කන බොන දෑ හා රා විත් ඔඩම් ආදිය පුරාගෙණ පිට්ත සිටියවුන්ට දික්කොට පුළුගන්වා නැවත තුමූම කන්නාහ, බොන්නාහ, මෙසේ සතුරන් කිපෙන තියායෙන් සක්මන් කරන්නාහ, බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යොධයෝ උන්ට කිසිවකුත් කොටගත නොහී ගෙඩී බැට කා අත පය හිස තලළලේ පිස පසු බල බලා දිවන්නාහු රජ්ජුරුවන් සමීපයට ගොස් "දේවයන්වහන්ස! සෘඩිමත් කෙණකුන් ආකාශයෙන් ගොසින් වදුත් මුත් මිනිසුන් විසින් මේ නුවර වදනා තබා සිතන්නටත් බැරිය''යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ නොසතුටුව සතර පස් දවසක් රඳා නුවරගන්නා උපායක්නොදක්නාහු

කෙවට්ටයා විචාළහ. ‘ආචාර්යයෙනි! නුවර ගන්නා තබා පවුර ළඟට යන්නවත් සමර්ථ එකද සත්වයෙක් නැත, කුමක් කරමෝදැ’යි කීහ. එබස් අසා බමුණා කියන්නේ “වන්නාටය, මහරජ! නුවර පැන් තම් පිටතින් වන්නේය. කීප දවසක් පැන් නවතාලන්නා පැන් නොලදින් ක්ලාන්තවූවාහු දොර හැර පලා යන්නාහ, එවිට අපි සිත්වූ පරිද්දෙන් සතුරන්ට කටයුතු කරම්හ’’යි කීය. ‘කොල! එයින් උපායෙකැ’යි එතැන්පටන් පැන් වැද්ද නොදෙන්නාහ. එපවත් බොධිසත්ත්වයන් වහන්සේගේ රජහු සමීපයෙහි සිට වර පුරුෂයෙක් පතෙකලියා ඊ දණ්ඩෙක බැඳ ඇතුළු නුවරට විදපීය.

බොධිසත්ත්වයන්වහන්සේද සතුරන් ආ දවස් විධානයක් කරණසේක් “යමෙක් ඊ දණ්ඩක ලියා විදපු පතක් දුටුයේවීනම් වහා ගෙණවුත් මට දෙව’’යි වදාළසේක. එබැවින් එක් පුරුෂයෙක් ඒ පත ගෙණවුත් දින. සවාමිදරුවානෝ ඒ බව දැන මේ කෙවට්ට මහල්ලා ඇතුළුවූ අඥාන ජඩයෝ මා නවම මහෞෂධ පණ්ඩිත බව නොදන්නා වන්හ’යි සිනා සැට රියන් උණ දණ්ඩක් ගෙන්වා සරියේ දෙකක් කොඩ පළා ඇතුළ පිට ගැට හරවා ශුඩකොට එක් කොට තබා සමින් වසා බඳවා පිට මැටි ගාවා තපස්වීන් ලවා හිමාලයෙන් ගෙන්වූ මැටි හා ඇඹුලු අල ගෙන්වා පොකුණු අස දියෙහි මැටි තබා මැටි පිට උණ දණ්ඩ සිටුවා ඇතුලේ පැන් පුරවාලූසේක. එක රැයින්ම පැලය නැගී උණ දණ්ඩ මුදුනෙන් රියනක් පමණ වැඩි මලෙක් පිපී සිටියේය. ඒ අභිමතාර්ථ සාධකවූ චින්තාමාණික්‍යයක් බඳුවූ මාගේ සවාමිදරුවූ බොධිසත්ත්වයන් වහන්සේ ඒ මල්දඬු මුලින් උදුරුවා මේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට දෙවයි තමන්වහන්සේගේ පුරුෂයන්ට දුන්සේක. ඔහු ඇඹුල දණ්ඩ වලල්ලේ ලා කොල! බ්‍රහ්මදත්තයන්ගේ පුරුෂයෙනි සයින් නොමිය තෙල මල කඩා ඉස පැලඳගෙණ ඇඹුල දඬු හුයාගෙණ බඩපුරා කාපියව’යි පවුරෙන් පිටත දමා ලූහ. එයින් බොධිසත්ත්වයන්වහන්සේගෙන්ම සිටි වරපුරුෂයෙක් හැරගෙණ රජ්ජුරුවන් සමීපයට ගොස් බැලූවමැනව දෙවයන්වහන්ස! මෙබඳු ඇඹුල මලක් හා මේ දිග ඇඹුල දණ්ඩක් දුටු විරුද? නැතැයි කීය. රජහු මැන බලව’යි කී හෙයින් වර පුරුෂයා මනන්නේ හැට රියන් දණ්ඩ අසූ රියන් කොට මැනපීය. නැවත රජහු “මේ කෙසේවූ තැනක ඇතිවී’’දැයි කී කල්හි ඉන්ම එකෙක් රජහු කටින් බස උදුරා ගන්නාසේ බොරුවක් ගොතාගෙණ කියන්නේ “දේවයන්වහන්ස! මම එක් දවසක් රා ටිකක් බීපියනු කැමතිව කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙමි නුවූර වාසීන් දියකෙළනා මහපොකුණක් දිටිමි, බොහෝ මනුෂ්‍යයෝ ඔරු අගුල් ආදියෙහි ඉඳගෙණ මල් කඩා දිය කෙළ ඇවිදිනාහ, මේ වූකලී ඒ පොකුණේ ගොඩ අස පිපී මලෙක ගැඹුරෙහි පිහිටි මලෙක්වීනම් සීයක් රියනටත් වඩා ඇත්තේ වේදැයි කීය. ඒ අසා “ආචාර්යයෙනි! පැන් නවතා මේ නුවර ගණුම්හයි නොසිතව, ඒ තොපගේ උපායෙක් නොවෙයි, ඒ හැරපියවයි කීහ එසේකල දෙවයන්වහන්ස! මෙවිට මා සිතු දෙය ඉතාම යහපත. නුවරට වී සාල් තම් පිටතින්ම වන්නේය. ඒ වී සාල් වැද්ද නොදෙම්හ, බතින් පීඩිතවූ මනුෂ්‍යයෝ දොරහැර පියන්නාහ. එවිට අල්වාගෙණ කැමැත්තක් කරවූහ’’යි කීහ, රජ්ජුරුවෝ ආචාර්යයෙනි! එසේවේවා’යි කීහ.

ඒ මන්ත්‍රණයත් පළමු පරිද්දෙන්පතකින් ම දූත, මේ තිවටවූකෙවට්ටයා මා නුවණැති තියාව නොදත්තා වතැ'යි කියා 'අනුප්‍රාකාරයයි කියන ලද පද නම මුදුනේ කලල් අතුරුවා ඊපිට වී ඉස්වාලූසේක. (බොධිසත්ත්වයන්ගේ අභිප්‍රාය හම් සිඹවන්නේය, එබැවින්) ඒ වී එක රැයින්ම පැල තැගී සත්යොදුන් මියුළු නුවර වට පවුර මුදුනෙහි ඉතා නිල්වලා සමූහයක්සේ අතිනීලව පෙණෙන්නට වන. ඒ දුටු රජ්ජුරුවෝ 'පවුර මුදුනේ ඉතා නිල්ව අර මේ පෙණෙන්නේ කිම්දැ'යි සිටියවුන් විචාළහ. වරපුරුෂයෙක් කියන්නේ ''දෙවයන්වහන්ස! ගොවියා පුත් මහෞෂධ පණ්ඩිතයා තමා ප්‍රඥා බලයෙන් මිතුවන්නාවූ භය දූත තමාගේ විඝාත වැටෙන්නාවූ මේ ජනපදයෙහි වී ටිකක් ඇතිවිද, එකහෙළා ගෙන්වාගෙණ මේසා මහත් නුවර හැම් දනාගේ කොටු ගෙවල් පුරවා ඉතිරි වී පවුර පිට හා වීථියේ ඒ ඒ ස්ථානයෙහි ලවාපීය, ඒ ඒ තාක් මුළුල්ල අව්වේ වියලී වැස්සේ තෙමී පැල තැගී ගොයම්වගියේය. මම එක්දවසක් කටයුත්තක් පිණිස කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙම්, ඇස තුබූ වීයෙන් වී මිටක් ඇරගෙණ ''කොල! ඉතා යහපත් වීයෙක, ඉන්නෙම් කියා වීථියට දමාපීම්, ඒ දූක එතැන සිටි ජනයෝ මා වෙහෙසන්නාහු 'ඉතාම බඩසාය සැටියෙක, කැමැත්තෙහි වීනම් තිලින් පොදියක් කොට බැඳගෙණ ගොස් පැහැරපියා පිසගෙණ බඩ පුරා කා තොම්යයි කීය. ඒ ඒ මා ඇල්ලූසේ 'ඉතා තපුරයි ලජ්ජාවට පැමිණියෙම්'යි කීය. ඒ අසා රජ කෙවට්ටයාට කියන්නේ 'වී තවතාලත් මේ නුවර ගතනොහැක්ක, තාගේ එයින් උපායෙක් නොවෙයි හැරපියව'යි කීය. දේවයන්වහන්ස! නොසිතා වදාළ මැනව, අතික් බලවත් මාගේ උපායෙක් ඇත. නුවර ඇතුළේ වලක් නැති හෙයින් දර නම් පිටතින්මුත් ගෙණා නොහැක්කේය. දර තවතාලා නුවර ඇරගණුම්හ'යි කීයේය. රජ්ජුරුවෝ ආචාර්යයෙනි! එසේ වේව'යි කීහ. ඒ මන්ත්‍රණයත් පෙරපරිද්දෙන්ම දූත වදූරා පවුරු පිටින් වී හා ගොයම් හරවා පිඨත පෙණෙන තියායෙන් දර රැස්කරවූසේක. පවුරේ උන් මනුෂ්‍යයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යෝධයන්ට සිනාසිසී වෙනෙසුන්නාහු කොල! දර නැතිව පිස කෑ නොහී සයින් පීඩිතව නොහිඳ නැති කෙණෙක් උළුකැන් බත් ආදිය පිස කව බොව'යි කියමින් 'තෙල ඇරගත්ව'යි මහත් මහත් දරකඳන් ඇඟට දමාලත්තාහ. සමහරු වැදගෙණ තැළී තැළී මහත් දුකට පැමිණෙන්නාහ, රජ්ජුරුවෝ දර රාශිය පෙණෙන්නා දූක 'තෙලෙ කිමෙක්දැයි විචාළහ. එතැක සිටි වර පුරුෂයන්ගෙන් එකෙක් ''ඇයි මහරජ නොදන්නාසේක්ද ගොවිසාපුත් මහෞෂධයා මිතුවන්නාවූ භය දූත වල දරක් තිබීද එකහෙළා අද්දූ ගෙණවුත් නුවර හෙයක් පානාගාර පැලදොරවල් පුරා ඉතිරිවන දර පවුර පිට රැස්කරවාපිය'යි කීය. රජ්ජුරුවෝ ඒ අසා කෙවට්ටය! මේ නුවර දර තවතාලත් ඇරගන්නට නොපිළිවන තාගේ එයින් උපායෙක් නොවෙ''යි ඇරපියව'යි කීහ; ඉතා ඇවිලි අවත්තාවූ තිවටවූ කෙවට්ටයා කියන්නේ ''මහරජ නොසිතා වදාළ මැනව, මාගේ බලවත් අතික් උපායෙක් ඇතැ''යි කීහ. ඒ අසා ආචාර්යයෙනි! උපාය නම් තමා කිම්ද? මම මේසා මහත්වූ තොපගේ උපායකින් වැඩකුත් තිමාවකුත් නුදුටිමි, මේ නුවර වෛදෙහ රජ්ජු අල්වාගන්නට නොපිළිවන, එබැවින් අපගේ නුවරටම යම්හ''යි කීහ.

තැවත අඳෑතවූ මහළු බමුණු කියන්නේ "දේවයන්වහන්ස! බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක්සියක් රජදරුවන් හා සමග ඒසා මහත් චතුරංගිනි සෙනාවත් ගෙන වේදෙහ රජු අල්වාගත නොහී පැරද පලාගියහ"යි අපට මහත් ලජ්ජාවන්නේය, එබැවින් නුවණැත් තෝනම් මහෞෂධ පණ්ඩිතයෝම මතු නොවෙති, මමත් මහා නුවණැත්තෙම් එක් ලෙසකින් ඔහු පරදවාපියම්හ"යි කිය, ආචාර්යයෙනි! ඒ ලෙස නම් තමා කිම්දැ'යි කීහ. ධර්ම යුද්ධ නම් දෙයක් කෙරෙම්'යි කිය; ධර්ම යුද්ධ නම් කිම්දැ"යි කීහ. මහරජ දෙසෙනාව සටන් නොකොට මැනව රජ්ජුරුවන් දෙදෙනාගේම පණ්ඩිතවරු දෙදෙන එක් තැනකට එද්ද, ඉන් එක්කෙණෙක් වැන්දවූ නම් වැඳි පක්ෂයේ රජහට පරාජය වන්නේය, වැඳුම් ලත් පක්ෂයේ රජහට ජයවන්නේය, එබැවින් ඒ මන්ත්‍රණය මහෞෂධ පණ්ඩිතයෝ නොදන්නාහ, මම ඉතා වැඩිමහල්ලෙමි මහෞෂධ පණ්ඩිතයෝ බාලයෝය, ආදරය දන්නා නුවණැති පණ්ඩිතයන් හෙයින් ඔහු මා දුටුකල සැක නැතිව වඳනාහ. එකෙවිලෙහි වේදෙහ රජ සැබවින් පරැද්ද,නම් වන්නේය, එසේ කොටත් වේදෙහ රජු පරදවාපියා නැඟී යම්හ. එසේකල අපට ලජ්ජා නොවන්නේය, ධර්ම යුද්ධ නම් මේය"යි කිය. පණ්ඩිතයන්වහන්සේ ඒ රහස් කථාවක් පෙර පරිද්දෙන්ම දූත වදුරු "ඉදින් කෙවට්ටයා මිනුත් මම පැරද්දෙමි නම් මාගේ කුමන පණ්ඩිතකමෙක්ද"යි සිතූසේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් 'ආචාර්යයෙනි! ඒ උපාය ඉතා යහපතැ'යි සෙට උදැසන දූහැමෙන් සෙමෙන් ධර්මයුද්ධය වන්නේය, පණ්ඩිතවරුන් දෙදෙනාගේ සමවූ ධර්මයෙන් ජය පරාජය වන්නේ. ඉදින් යමෙක් ධර්ම යුද්ධයට නොඑ නම් එයින් පැරද්ද නම් වන්නේය"යි පත ලියා කුරුබිලියෙන් වේදෙහ රජහට යැවූහ.

ඒ අසා වේදෙහ රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ද කැඳවා එපවත් කීහ. ඒ අසමින් සකල ජනානන්දකරවූ තිලෝගුරු බෝධිසත්ත්වයන් වහන්සේ "යහපත දේවයන්වහන්ස! සෙට උදෑසනම බස්නාහිර වාසලින් පිටත ධර්ම මඩ මණ්ඩලය සරසන්වා, ධර්ම යුද්ධ මණ්ඩලයට එන්වයි පත් යැව්ව මැනව"යි වදාළසේක, රජ්ජුරුවෝ ඒ අසා ආවාවූ දූතයා අතම හසුන් යැවූහ, බෝධිසත්ත්වයන්වහන්සේ දෙවන දවස් කෙවට්ටයාටම "පරාජය වේවයි කියා බස්නාහිර වාසලින් පිටත ධර්ම යුද්ධ මණ්ඩලය සැරහැවූසේක. එතකුදුවූවත් ඒ ඒ රජුන් කෙරෙහි සිටි චරපුරුෂයෝ එක්සියයක් දෙනා 'කවුරු දනද්ද කිම්දැ'යි බෝධිසත්ත්වයන්වහන්සේට ආරක්ෂා පිණිස කෙවට්ටයා පිරිවරා සිටගත්හ. බ්‍රහ්මදත්තයන් හා එක්සියයක් රජදරුවෝ ධර්ම යුද්ධ මණ්ඩලයට ගියාහු. පුරදිය වක යහපත් දවස් සඳ බලන්නට එකසිත්ව එක දිසාව බලන්නවුන් පරිද්දෙන් පැදුම්දිග බල බලා සිටියහ. එසේම තිවටවූ කෙවට්ටයාත් නැගෙනහිර දිසාව බල බලා 'කල් යේනු'යි කල් යේනුයි කිය කියා සිටියේය. තමන් පා පියුම් ලෝ මුදුන්කළ තිලෝගුරු බෝධිසත්ත්වයන්වහන්සේ එදවස් උදෑසන සොළොස් කළයක් සුවඳ පැනින් ඉස්සෝදා නහා ලක්ෂයක් වටිනා කසී සළු වක් හැඳ සර්වාභරණයෙන් විභූෂිතව, නොයෙක් රසයෙන් අග්‍රවූ අමරාදේවින් පිසන ලද භොජන අනුභවකොට මහත් පෙළහරින් වාසල් දොරකඩට ගොස් ආ නියා කියා යවා 'මපුතනුවෝ වහාඑත්ව'යි රජ්ජුරුවන් විසින් කී

කල්හි රජගෙට වැද රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිට කිමෙක්ද පුත මහෞෂධ පණ්ඩිතයෙනියි! රජ්ජුරුවන් කී කල්හි ධර්ම යුද්ධයට යෙමි'යි වදාළසේක. පුත මා විසින් කුමක් කළ මනාද'යි කීහ. දෙවයන්වහන්ස! කෙවට්ටයා මැණිකකින් වඤ්චාකරණු කැමැත්තෙමියි, එබැවින් අෂ්ටවඞ්ක මාණික්‍යරත්නය ලද මැනව'යි වදාළසේක. ''පුත! එයින් මට කියාද ගන්නේ ඇරගණුව'යි කී කල්හි ශක්‍රයන් පළමුන් තමන්වහන්සේට දුන් මාණික්‍යරත්නය ශ්‍රී හස්තයෙන් ගෙණ රජහු වැඳ මාලිගාවෙන් බට සේක.

තමන්වහන්සේ හා එකදවස උපන් යොධයන් දහස හා සිව්රඟ සෙනඟ පිරිවරා අනූදහසක් රත් වටනා හැළි අසුන් යොදනලද සර්වාලංකාරයෙන් සැරහූ රථයකට පැන නැගී දවල් මේතිමවත වේලාවට වාසල සමීපයට පැමිණිසේක. කෙවට්ටයෝද 'මහෞෂධ පණ්ඩිතයෝ දූත් එති දූත් එතියි මහබෝසතාණන් වහන්සේ එඩනා පෙරමඟ කර ඔසව ඔසවා බලාගෙණ සිටී මෙන් කොක් කරක්සේ දික්වූ කර ඇතිවූහ. මහබෝධිසත්ත්වයන්ගේ දිගනතරයෙහි පතළාවූ තේජස් පරිද්දෙන් පහරන්නාවූ හිරු රැසින් බා වැහෙන්නාවූ ශරීර ඇතිවූහ මහබෝසතාණන් වහන්සේද ඔදවැඩියාවූ සාගරය පරිද්දෙන් පොළොව මැඩපියන්නාසේ වීථිය පුරාගෙණ යන්නාවූ ඇත් අස් ආදීවූ පරිවාරයෙන් යුක්තව, අසම්භීතව වාසල් දොර හරවා නුවරින් නික්ම රථයෙන් බැස කෙසරු සලා විදහා කිළි පොළන්නාවූ සිංහරාජයකුසේ විජෘම්භණය කෙරෙමින් ධර්මයුද්ධ මණ්ඩලයට වැඩිසේක. එක්සියයක් රජදරුවෝ ඒ මහතානන් වහන්සේගේ රූපඓශ්වර්‍ය්‍යය දැක ''නුවණින් සියලු දඹදිව තමන්ට දෙවැනි කෙණකුන් නැති සිරිවඩ්ඪන සිටාණන් පුතනුවෝ මහෞෂධ පණ්ඩිතයෝ තම් මූලය''යි සමාධින් ඔල්වරහඬ සියගණන් පැවැත්වූහ. පණ්ඩිතයන් වහන්සේද, දෙදෙව්ලොව දෙවියන් පිරිවරා අසුර යුද්ධයට නික්මුණු සක්දෙව් රජහු පරිද්දෙන් උපමාවිෂයාතික්‍රාන්තවූ ශ්‍රී සෞභාග්‍යයෙන් යුක්තව ඒ අෂ්ටවංක මාණික්‍යරත්නය අතින්ගෙණ කෙවට්ටයන් ඉදිරියෙහි ලංව වැඩිසේක.

කෙවට්ට බමුණා මහබොසතාණන් වහන්සේ දූකලාම ඔබගේ තෙජසින් සිටි පළ සිටින්නට නොපෝසත්ව පෙර ගමන්කොට ''මහෞෂධ පණ්ඩිතයෙනි! අපි දෙන්නමෝම පණ්ඩිතවරු වම්හ, තොප නිසා අවුත් මෙතෙක් කල් මෙතන වසන අපට තෙපි අමුතු පඬුරක් පමණවත් නොඑවූ විරූය. කුමක් නිසාද මෙසේ සාදරයක් නොකෙළේය''යි කීය. එසේ කී කෙවට්ටයන්ට බෝසතාණන්වහන්සේ පණ්ඩිතයෙනි! තොපට සුදුසු පඬුරක් සොයන්නෙම් අද මිණිරුවන ලදිමි, හැරගණුව මෙබඳු මිණිරුවනෙක් මේ මූත් නැතැයි වදාළසේක. කෙවට්ටයෝ පණ්ඩිතයන්වහන්සේ අත දිලිසෙන මිණිරුවන දැක මේ පණ්ඩිතයෝ මට මිණිරුවනක් ගෙණාවන්නානයි සිතා 'එසේ වීනම් දෙව'යි අත දික් කළහ, බෝසතාණන් වහන්සේද ගණුවයි කියා අත දික්කොට අත ඇඟිලි අග මැණික එලාලූසේක. බමුණාතෝ බරවූ මිණිරුවන ඇඟිලි අගින් රඳවාගත නුහුනුවහ, මැණික පෙරළීගෙණ ගොස් බෝසතාණන් වහන්සේගේ පා මූල වැටී ගියේය. බමුණාතෝත් ලොභයෙන් 'මැණික ගණිමි'යි බොධිසත්ත්වයන්වහන්සේගේ ශ්‍රීපාද මූලයට නැඹුරුවූහ

ඒ දැක බෝසතාණන් වහන්සේ බමුණාතන් නැඹුරුවූ නැනැත්තවූ කර ඔසවා ගත නොදීම එක් අතකින් පිටිකර හා එක් අතකින් පිටිමුල තරයේ අල්වාගෙණ නැගී සිටුව ආචාර්‍ය්‍යයෙනි! නැගී සිටුව ආචාර්‍ය්‍යයෙනි! මම බාලයෙමි, තොපගේ මුනුබුරා තරමට ඇත්තෙමි මා නොවඳුව මා නොවඳුවයි කිය කියා බමුණා හා සමග තලළ පෙරළ පෙරළා කොරහැඩිබිම උලා රත් වදමලක්සේ ලේ හා පස්වකා නුවණ නැත්තව! තෝ මා අතින් වැඳුම් ගන්නට සිතයිද'යි බොටුව අල්වාගෙණ දමාලූසේක. තෙමේ ඉස්බක් පමණ නැත වැටී ගොස් නැගී සිට වැලි පිස පිස පලා ගියේය. මැණික වනාහි මහබෝසතානන්ගේ මිනිස්සුම ඇරගත්හ. නැගී සිටුව ආචාර්‍ය්‍යයෙනි, නැගී සිටුව ආචාර්‍ය්‍යයෙනියි, මා නොවඳුව මා නොවඳුවයි කියා මහබෝසතාණන් වහන්සේ බැණනැගී අඩ සියලු චතුරඞගිනී සේනායෙහි අරගල මැඩගෙණ සිටියේය. කෙවට්ට බමුණා විසින් මහෞෂධ පණ්ඩිතයන් වහන්සේගේ පා වඳනාලදැ'යි සියලු පණිත් කොක්සන් දිදී පිළි ඉස සිසාරා අත්පොළසන් දී කොලාහල කළහ. බ්‍රහ්මදත්තරජ්ජුරු වහන් හා එක්සියයක් රජදරුවන් ඇතුළුවූ හැමදෙනම කෙවට්ටයා මහෞෂධ පණ්ඩිතයන් පා පිට නැමුනා දුටුවාහුමය. නැවත කියන්නාහු 'අපගේ කෙවට්ට ආචාර්‍ය්‍යයන් විසින් මහෞෂධ පණ්ඩිතයෝ වඳනාලදහ. එබැවින් අප පැරැද්දම්හ. අපගේ ජීවිතය මෙවිට නොදෙන්නාහ'යි හයින් නැතිගෙණ තමන් තමන්ගේ අසුන්පිට නැගී උත්තරපංචාල නුවරට මූණලා නමාගත්හ.

ඒ යන්නවුන් දැක බෝධිසත්ත්වයන් වහන්සේගේ පිරිස එකපැහැර කොල, බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක්සියයක් රජුන් හා සෙනාව ඇරගෙණ බිඳී පලා යන්නාහ'යි මහත්කොට හඬ ගසා කොලාහල කළහ. ඒ අසා රජ දරුවෝ තාක් මූළුල්ල වඩ වඩා හයපත්ව බලා යන්නාහුමය, ඔවුනොවුන් නොබලා මහ සෙනාවක් බිඳී ගියහ බොධිසත්ත්වයන් වහන්සේගේ පිරිස ඒ දැකත් වඩ වඩා කොලාහල පැවැත්වූහ. කරුණා නිධානවූ මාගේ සවාමිදරුවා සේනාව පිරිවරා නුවරට වන්සේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා ඒසාමහත් සෙනා දොළොස් ගව්වක් නැන් බිඳී පලා ගියහ. ඉතා අලජ්ජිවූ දුෂටවූ කෙවට්ටයා අනු නැගී කටින් ලේ දම දමා තලළ ලේ පිස පිස දිවන්නේ සෙනාවට ආසන්නව අනු පිටම හිඳ 'පින්වත්නි' නොයව මම ගොවිපුතු නොවැන් දෙමි සිටු සිටුව'යි කිය එසේ කීවත් සේනාව නොරඳම දිවන්නාවූ මෙසේ කියන්නාහ. "කොල, පව්ටු දුෂ්ට අධර්මිෂ්ඨවූ නිකෘෂ්ට අනාචාර්‍ය්‍ය සවරූප ඇති අවලක්‍ෂණවූ අඥාන බමුණු මහල්ල, තෝඩම් යුඩකෙරෙම්'යි කියා ගොසින් තට මුණුබුරු තරමටත් නැති ඉතා බාල නැනැත්තන් වැඳපීය. මේ මනුෂ්‍ය ලොකයෙහි උපන් සත්ත්වයන්ගෙන් ජඩවූ යම් එකක්හු කළමනා යම් නොකටයුත්තක් ඇත්නම් ඒ සියල්ලෙන් තා විසිනුත් නොකළමනා දෙයක් ඇද්ද? 'ජඩය, මැත නොදෙඩා නොපිත් තාගේ පණ නොනසා යන අනෙක නැගීයා"යි යනාදින් කිය කියා ඔහුගේ බස් නමන් කණෙක නොසෙලාම ඕහට ආක්‍රොශ පරිභව බෙණෙමින් නොරඳම දිවන්නාහ.

එ බමුණා වහ වහාම දිවගෙණ ගොස් සෙනාව මැදට පැන මෙසේ කියා ලීය. "ඇයි කුමක් කියව්ද, "මම ගොවියා පුතු නොවැන්දෙමි, මම ගොවියාපුතු නොවැන්දෙමි" කොල, වදින කෙණෙක් තලළ දණ වැලම්ට

ලේ ලාගෙනත් වදිද්ද? මේ වැදීම් මාතකොට තොප අතින් ඇසීමි; ඒ ගොවියා පුත් මාණික්‍ය රත්නයකිත් මා වඤ්චාකොටපිය''යි නොයෙක් කාරණා කියා ගිවිස්වා තමා වසඟකොට එසේ බිඳී තුන යොදුනක් පලාගිය ඒසාමහත් සෙනාව රඳවා තැවත ගෙණවුත් පළමු පරිද්දෙන්ම වටලාගත.

බොධිසත්වයන් වහන්සේගේ ආනුභාවයෙන් තොසිතු හෙයින්මුත්, ඒ සෙනාව එකී එකී පස්මිටක්වත් කැමක්වත් දමුවේවිනම් අගල් තුන පුරා ගෙණ අටලොස් රියන් පවුර පිට තැවත එපමණ ගොඩකරත්තටත් වඩා ඇතිවන්නේය; ඒ එසේමැයි, තිලෝගුරු බුදුරජාතන්වහන්සේ ශ්‍රී මුඛ යෙන්ම "බොධිසත්තානං අධිප්පායා නාම ඉජ්ඣන්ති" (බෝසතුන්ගේ අද හස් නම් සිදුවෙති.) වදාළ බැවින් අභිමතාර්ථ සාධකවූ චින්තාමාණික්‍යයක් බඳුවූ මාගේ බොධිසත්වයන්වහන්සේගේ තේජසින්ම පස්මිටක්වත් කැටක්වත් නුවර දිසාවට දමන්නා තබා සිතිනුත් සිතූ එකද සත්වයෙක් නැත්තේය. සියල්ලෝම අවුත් තමන් උන්නාවූ සථානයෙහිම හිඳගත්හ.

බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ 'ආචාර්‍ය්‍යයෙනි! මෙවිට කුමක් කරමෝද්ද'යි කේවට්ටයා විචාළහ ඒ දුෂ්ටයා කියන්නේ 'දෙවයන්වහන්ස! කිසිකෙණකුන් මහ වාසලින් තබා කුරුබිලියෙනුත් පිටත්විය නොදෙම්හ එසේකල මනුෂ්‍යයෝ උකටලීව තුමූම දොර හැරපියන්නාහ. එවිට අපි අනායාසයෙන් සතුරන් අල්වාගෙණ කැමැත්තක් කරම්හ''යි කීය. ඒවූ නියාවත් බොධිසත්ව යන්වහන්සේගේ චරපුරුෂයෙක් පියදූ පතකින්ම දැන වදාරා 'මේ සතුරන් බොහෝ දවසක් මෙතැන විසීමෙන් අප හැමදෙනාගේම සිතට සැපයක් නැත්තේය, උපායකින්ම මුන් පලවාපියමි සිතා මණ්ත්‍රණයෙහි දක්ෂවූ උපා යවන් පුරුෂයක්හු පරීක්ෂාකරණසේක් අනුකේවට්ටයාය යන එකකු දැක ඔහට වදාරණසේක් 'අපගේ කටයුත්තෙක් ඇත. තොප විසින් සමෘධකොට දුන යහපතැයි වදාළසේක. ''ස්වාමීනි! කුමක් කෙරෙම්ද වදාළ මැනවැ'යි කීය. තෙපි මහ පවුරෙහි පදනම සිට අපගේ මිනිසුන්ගේ ප්‍රමාදයක් බලාලා, අතරතුරේ බ්‍රහ්මදත්තයන්ගේ පිරිස සිටියවුන්ට කැවුම් මච්ඡමාංශා දිය විසිකොට ''පින්වත්නි! මේ මේ දේ කව, උකටලී නොව කීපදවසක් රඳන්නට උත්සාහ කරව, නුවරවාසි සියල්ලෝම මැදිරියෙහි අසුවූ කුකුලන් පරිද්දෙන් ඉතා උකටලීව ගියහ. කීප දවසකින් තුමූම දොර හරින්නාහ. එවිට තෙපි වෙදෙහයාත් දුෂ්ටවූ ගොවියා පුතුත් අල්වා ගණිව්'යි කියව, මච්ඡ මාංශ කන බොන දෑ දීමෙන් ඔවුන් සිත්ගෙණ කියා ඇවිදුව, ඒ තොපගේ කථාව අපගේ මනුෂ්‍යයෝ අසා තොපට ආක්‍රොශ පරිභව බැණ තොප අල්වා ගෙණ උණ පත්තෙන් මරන්නාසේ පැලා ඉන් බාගෙණ ඉස පස්කොණ්ඩයක් බඳවා ඇඟ උළුසුණු හල්වා රත්මල් කනේරු මල්වඩම් කරලා කීප පාරක් ගසා පිට ගඩු නංවා පිටිතල හයාබැඳ පවුරපිට තගා සාල්ලෙක හිඳුවා යොත කින් පිටත බාවා බ්‍රහ්මදත්තයන්ගේ මිනිසුන්ට 'මන්ත්‍ර භෙදක සොරාය'යි කියා දක්වන්නාහ, බ්‍රහ්මදත්තයන්ගේ මිනිස්සු තොප ගෙණගොස් රජහට පානාහ, රජ්ජුරුවෝ 'තොපට මෙවැන්නක් කරන්ට තොපගේ අපරාධය කවරේද්ද'යි විචාළෝතම් තොප කියන කල මහරජතුමාගේ සම්පත් බොහෝය,

ගොවියා පුත් මහෞෂධයා මන්ත්‍ර හෙදක සොරා 'යි මට කිපී රජහට කියා මාගේ සම්පත් උදුරාගත, ඒ නිසා දූත් මම මාගේ සම්පත් නැසුවාවූ සොරාවූ ගොවියා පුතුගේ ඉස දෙවාපියන්ට සිතන්නෙමි, නුඹවහන්සේගේ සේනාව මේ නුවර සාධාගත නොගී උකටලීවන හෙයින් එහි ඉතාකනස්සලුව ඔවුන්ට අතරතුරේ කත බොන දැන්දෙමි; ඇතුළු නුවර අඩුවැඩියක් කියමි. ඒ දූත් මාගේ පරණ වෛරයත් සිත තබාගෙණ මට මෙසා මහත් ව්‍යසනයක් කරවිය. මේ සියල්ලම නුඹවහන්සේගේ මනුෂ්‍යයෝ දන්නාහ'යි කියා රජහු නොයෙක් පරිද්දෙන් ගිවිස්වා නොප කෙරේ නරව ඇදහිලිව ගත් කළ නැවත තෙපි මෙසේ කියව 'මහරජ මෙවිට මා ලත්පසු නොසිතා වදාළ මැනව දූත් වෛදෙහයාත් ගොවියා පුත් මහෞෂධයාත් දිවි නැත්තේය. මම මේ නුවර පවුර තර තැනුත් නොතර තැනුත් අසල මූවරුන් හා කිඹුලුන් ඇති තැනුත් නැතිතැනුත් ඉඳුරා දනිමි, නොබෝ දවසකින් නුවර ගෙණ දී ලන්නෙමි'යි කියව, ඉක්බිති රජ්ජුරුවෝ 'සැබව'යි ගිවිස නොපට බොහෝ සත්කාර කොට තමන්ගේ සේනාව නොපට පාවා දෙති, තෙපි ඒ සේනාව හා සටනට ගොස් චණ්ඩවූ කිඹුලන් හා මූවරුන් ඇති තෙතකට බාලව. කිඹුලන් හා මූවරුන්ගෙන් භයපත් වූවාහු සටන් තබා අගල සමීපයටවත් ලං නොවන්නාහ එවිට තෙපි අවුත් දෙවයන්වහන්ස! නුඹවහන්සේගේ මේ සේනාවෝ ගොවියා පුත් විසින් භින්නව ගියහ: කේවට්ටයා ඇතුළුව සියලු රජදරුවන් අතුරෙන් ඔහු අතින් අත්ලස් නොගත් එකද කෙණෙක් නැත්තාහ, හුදක් නුඹවහන්සේ පිරිවරා ඇවිදිනා බවමුත් මේ සියල්ලෝම ගොවියා පුත් සන්තකයහ, නුඹවහන්සේට හිතනම් මම්මය, මෙතෙක් දෙනා නුඹවහන්සේට වෛතස් කල මම තනිව කුමක් කොටලියහෙම්ද; ඉදින් මා නොඇදහන සේක්වීනම් සියලු රජදරුවෝ සජ්ජාභරණයෙන්සැරහී අවුත් මා දකිත්වයි නියෝගකළ මැනව"යි කියව; ඒ බසින් හැමදෙනම සැදී පැහැදී ආකල්හි "ගොවියා පුත් තමාගේ නම අකුරු ලියා දෙනලද වස්ත්‍රාභරණ කඩු ආදිය අකුරුබලා තෙල අදහාගත මැනව"යි කියව, ඔහු නොප කී පරිද්දෙන් 'රජදරුවන්ට එන්ට කියව'යි නියොග කොට ඔවුන් සැරැහී ආ කල්හි, නොපකී පරිද්දෙන් අකුරු දූක හයින් තැතිගෙණ බියගත්තාහු රජදරුවන්ට සමුදී යවා 'මෙවිට කුමක්කරමෝද ආචාරීනි'යි විචාරති, ඒ විචාළ රජහට නොප මෙසේ කියව 'මහරජ ගොවියා පුත් බොහෝ මායම් දන්නේය. ඉදින් කීපදවසක් මෙහෙන රැඳුනු සේක් නුඹවහන්සේගේ සියලු සෙනග තමා වසඟකොට ගෙණ නුඹවහන්සේ ජීවිතක්ෂයට පමුණුවයි, ප්‍රපඤ්ච නොකොට අදම මධ්‍යම රාත්‍රියෙහි අසුපිට හිඳගෙණ පලාඅම්හ යි සතුරන් අත මියන මරෙක් අපට නොවේව'යි මෙසේ කී කල්හි, රජ්ජුරුවෝ ගිවිස නොප කී ලෙස කරන්නාහ, තෙපි උන් තික් මෙත වේලා දූත, නැවත අපගේ මනුෂ්‍යයන්ට ඒ බව අඟවාලව'යි වදාළසේක.

ඒ අනුකේවට්ට බ්‍රාහ්මණයා 'පණ්ඩිතයන්වහන්ස! මා නිසා වැඩෙක් වේනම් නුඹවහන්සේ වදාළ ලෙසම කෙරෙමි' කීය. ඒසේවීනම් උන්ට පෙණෙන පරිද්දෙන් පහර කීපයක් ඉවසාපුව යහපතැ'යි වදාළසේක. 'පණ්ඩිතයන්වහන්ස! මාගේ ප්‍රාණයත් දූත් දෙපනක් නොනසා සම්බඩගය මුලුල්ල නුඹවහන්සේ කැමැත්තක් කරවුව මැනවැ"යි කීය. එවේලෙහි අනුකේවට්ටයාගේ අඹුදරුවන් පටන් උන් සන්තක කිසිකෙණෙකුන් නොවරදවා

සංග්‍රහකොට, අනුකේවට්ටයන් හිස පස් කොණ්ඩයක් බැඳ පෙණෙන ලෙස පහර කීපයක් ගසා ගඩු නගා සම්බගයෙහි උළු සුණු ගල්වා රත්මල් කණේරු මල්වඩම් කරලා මහා විප්‍රකාරයට පමුණුවා, සාල්ලෙක හිඳුවා ලනුවෙක බැඳ පිටනට බාවා බ්‍රහ්මදත්තයන්ගේ මනුෂ්‍යයන්ට දැක්වූවාහ. රජ්ජුරුවෝ අනුකේවට්ටයන් නොයෙක් පරිද්දෙන් විමසා අදහාගෙණ ඕහට ප්‍රසාද දී සේනාව පාවාදුන්හ. ඒ තෙම සේනාවගෙණ 'නුවර ගන්මි'යි ගොස් මෙන තින් බවකල නිරුපද්‍රවය, මෙතන පවුරත් දුර්වලය, මෙතන රැකවලුත් නැතැයි ගෙණගොස් පාවාලූ ඇසිල්ලක සාඩා කන තරම් වණ්ඩවූ කිඹුලුත් හා මුවරුත් ඇති බොටවලවම බාලයි, බටු බටුවන් ගසා කන්නාහ, අට්ටාලවල සිටියාහු හී මුණ කෝල් හෙණ්ඩිවාල තෝමරාදියෙන් දමා ඇන මහා විනාශයට පමුණු වන්නාහ සේනාව මහා ව්‍යසනයට පැමිණ නැවත ඒ දිසාවට යන්නා තබා බලන්ටත් අසමර්ථවූහ. අනුකේවට්ටයෝ රජහු සමීපයට ගොස් "මහරජ නුඹවහන්සේ නිසා සටන් කරණ කෙණෙක් නැත්තාහ. හැම ගොවියා පුතු ගෙන් අත්ලස් ගත්තාහ. මා බස් නොඅදහන සේක්වීනම්, රජදරුවන් සැරහී එන්ට කියා ගෙන්වා, හන් පලන් ආභරණාදිය අකුරු බලා සැකහල මැනවැ"යි කීහ.

රජ්ජුරුවෝ ඔහු කී පරිද්දෙන් හැම ගෙන්වා නොයෙක් ආභරණාදි යෙහි ලියා තුබූවා දැක "ඒකාන්තයෙන් හැමදෙනම අත්ලස් ගත්තෝ සැබෑ ය"යි අදහාගෙණ උන් හැම යවා ආචාරීනි! මෙවිට කුමක් කරමෝදැ'යි විචාරා දෙවයන්වහන්ස! මෙවිට අනික් කටහැකි දෙයක් නැත, ඉදින් ප්‍රපඤ්චකොට කල්යැවූසේක් වීනම්, ගොවියා පුත් නුඹවහන්සේ අල්වා ගන් නේය, වැලින් කේවට්ටයාත් තලළ වනයක්කොට ගෙණ ඇවිදිනා බව මූත් ඔහු විසිනුත් අත්ලස් ගත්තෙමය, ධර්මයුඩයෙහිදී අනඝීවූ මාණික්‍යරත්නයක් කාටත් නොදන්නා පරිද්දෙන් ඇරගෙණ නුඹවහන්සේ තුන් යොදුනක් පලාගියවුන් නැවත ගිවිස්වා ගෙණවුන් මේ මරළගුලේ ලාපිය එයින් නුඹ වහන්සේට ඒකාන්තයෙන්ම අහිතමය, එබැවින් එකරුයකුත් මෙතන රඳන් නා නොකැමැත්තෙමි, අද මධ්‍යම රාත්‍රියෙහි නැගීයන්නා කැමැත්තෙමි, මා විනා නුඹවහන්සේට මනා සිත් කෙණෙක් මේ සේනාවෙන් එකෙකුත් නැතැයි"යි කී කල්හි ඒ අසා වඩ වඩා හයින් තැතිගෙණ "එසේවීනම් ආචාරීනි තොපවිනා මට හිත කෙණෙක් නැත, තෙපිම අසකු සඳ ගමන නිලකරව"යි කීහ. අනුකේවට්ටයාත් රජහු ඒකාන්තයෙන් යනබව දැන "මහරජ නොබා වදළමැනවැ"යි අස්වසාලා, ඒක්ෂණයෙහි අවුත් චරපුරුෂයන්ට කියන්නේ "අද රජ්ජුරුවෝ පලායෙති කොල නිදාපියම්හයි නොසිතව"යි අවවාදකොට රජහට අසු සදන්නේ "යමිසේ රඳවන්ට කඩියාලම හයාලු කල නොරඳම ඉදිරියට දිවේද, එපරිද්දෙන් අවකල්පන සැදීමෙන් අසු සදලා, මධ්‍යම රාත්‍රි යෙහි අවුත් අසු සදලා ගෙණාපු වේලා දන මැනව, වහා නික්මුණ මැනවැය"යි කීය. රජ්ජුරුවෝද අසු නැගී පලාගියහ. අනුකේවට්ටයාත් අසකු නැගී රජු හා එක්ව යන්නා මෙසේ මදක් තැන් ගොසින්ලා රඳගියේය. අවකල් පන සැදීමෙන් සැදූ අසු රඳවන්ට හයාලුයේද නොරඳම ඉදිරියට දිවන්නේ බ්‍රහ්මදත්ත රජු හැරගෙණ පලා ගියේය.

අනුකේවට්ටයා සේනාව මැදට වැදලා චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ පැලහ''යි මහත්කොට හඬගසාලීය. චරපුරුෂයෝද තමතමන්ගේ අතවැසි පුරුෂයන් හා සමග මහත්කොට හඬගසා ශබ්දපැවත්වූහ. එක්සියයක් රජ දරුවෝ ඒ අසා සිතන්නාහු මහෞෂධ පණ්ඩිතයෝ වාසල් හරවා පිටත්වූවත්හ. මෙවිට අප හැමගේ ජීවිතය නැත්තේය''යි හයින් තැතිගෙණ උප භොග පරිභොග වස්තුවෙන් කිසිවක් නොගෙණ මිගුල් කඩු හා උතුරු සළු ආදිවූ වස්ත්‍රාභරණාදියවත් ආලය නොකොට තිගණ්ය සේනාවක්ගේ ඉස් ලූ ලූ අත උනුන් නොබලා දිවගත්හ. චරපුරුෂයෝ එවිටත් 'එක්සියයක් රජ දරුවෝ පැලහ''යි වඬ වඬා කෝලහල පැවැත්වූහ. ඒ අසා නුවර වාසල් අට්ටාල පවුරු පදනම් ආදියැ සිටියාහුද මහත්කොට කෝලාහල කළහ එවේලෙහි පිටත සිටි චරපුරුෂයෝ ඇතුළු නුවර මනුෂ්‍යයන් හා එකාපැහර ශබ්දපවත්වා කෝලහල කළහ. ඒ ගැසූ සියලු හඬ පොළොව පැලීයන්නාසේ වාත වේගයෙන් මහා සමුද්‍රය ඇලලී ගියාසේ ක්‍ෂොභව ගොස් පිටි නුවරත් ඇතුළු නුවරත් කෝලාහලයෙන් එකනින් නාද විය. අටලොස් අක්‍ෂොහිණී යක් පමණ මනුෂ්‍යයෝ සිතන්නාහු මහෞෂධ පණ්ඩිතයන් විසින් බ්‍රහ්ම දත්තරජ්ජුරුවන් හා එක්සියයක් රජදරුවෝ ඒකාන්තයෙන්ම 'අල්ලාගත් නා ලදහ'යි මරණ හයින් තැතිගත්තාහු කිසි සරණක්වත් පිටිවහලෙක්වත් ගැලවෙන්ට කිසි උපායක්වත් නොදන්නාහු සෙසු දෑ තබා හන්කඩටත් අසවාමිකව සියල්ලක්ම උන් උන් තැනම ඇරපියා පළමු පැලැවුන්ගේ ඉස් ලූ ලූ අත දිවගත්හ. ඒසා මහත් රාජ සේනාවක් කඳවුරු බැඳ හුන් තැන එකද මනුෂ්‍යයෙක් නැතිව සිස්වූයේය. චූලනී රජ්ජුරුවෝ එක්සියයක් රජ දරුවන් හා සමග බිඳි තමන්ගේ නුවරටම ගියහ.

රෑ පැවති කෝලාහලයෙන් ඇත් අස් ආදීහු කඹදම් ආදීන් කඩා බිඳ ගෙණ ගොස් වල් නැංගාහ, දෙවන දවස උදෑසන නුවර වාසල් හැර බලා ඇතුළු නුවරින් පිටත්ව, ඒ මහා විප්‍රකාර දැක අභිමතාර්ථසාධක චින්තාමාණි ක්‍යයක් බඳුවූ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේගේ සමීපයට ගොස් පණ්ඩිත යන් වහන්ස! මේ සම්පතට කුමක් කරමෝදැ'යි විචාළහ, ඔබවදාරණසේක් උන් ඇමදෙනා නොකමැතිකරවා උදුරාගත් දෙයක් නොවන පසු උන්නමන්ම ආලය නැතිව දමාපියා තිරාලයවතිය වස්තුහෙයින් සියල්ලම අප සන්තකවන් නේය, ඉතුත් රජදරුවන් සන්තකවස්තු අපගේ රජ්ජුරුවන්ටදෙව, සිටුවරුන් හා කේවට්ටයා සන්තක වස්තුනාක් මුළුල්ල අපට ගෙණෙව' සෙසු අටලොස් අක්‍ෂොහිණියක් පමණ මහාසේනාව සන්තක වස්තු මුළුල්ල නුවර වාසීහු ගණීත්වා''යි වදාළසේක. ඉත් මාහැඟි රන් රුවන් ආදි වස්තුවම අදනවුත්ට දෙපෝයක්ම ඉක්ම ගියේය. ඒ සාල් ආයුධ ආදීවූ අවශෙෂ වස්තු අදනවුත්ට සාරමසක් ඉක්මගියේය, බොධිසත්වයන්වහන්සේ අනුකේවට්ටයන්ට බොහෝ සත්කාර කළහ. වල ගිය ඇත් ආදීන් බඳවා ගෙන්වාගත්හ. එවක්පටන් මියුලු නුවර වාසීහුද දශවිධ රත්නයෙන් සමෘඬවූහ. බ්‍රහමදත්ත රජ්ජුරු වන් එක්සියයක් රජුන් හා එක්ව බිඳී ගොස් උත්තරපඤ්චාල නුවර විසන්න වුන්ට අවුරුද්දක් ඉකුත්ව ගියේය.

එක් දවසක් කේවට්ට මහලු බමුණු කැඩපතකින් තමා මුහුණ බැලූයේ, තලළ කබරව ද ගියාශේ වණ කැලල දැක "මේ අතිකෙක් නොවෙයි ගොවියාපුත් මහෞෂධයා අත කර්මාන්තය" ඔහු විසින් එක්සියයක් රජුන් හා මේ සේනාව මධ්‍යයෙහි මම ලජ්ජාවට පමුණුවන ලදිමි'යි දණ්ඩෙන් ගසන ලද අශිර්විෂයකු පරිද්දෙන් වඩනලද ක්‍රොධ ඇත්තේ කවර දවසෙක ඔහු පිටි දැකපියන්නෙම්දෝහෝ'යි සිතන්නේ ඒ වන්නා බලවත් උපායක් ඇත, අපගේ රජ්ජුරුවන් වහන්සේගේ පඤ්චාලචණ්ඩි කුමාරිකාවෝ දිව්‍යප්සරාවක්සේ උතුම් රූ ඇත්තාහ. සිව්සැටක් පමණ ස්ත්‍රී ලක්‍ෂණයෙන් යුක්තයහ, ඒ කුමාරිකාවන් වේදෙහ රජහට දෙම්හයි කියා රජු කාමයෙන් පොලඹවා බිලියක් ගිලූ මසකු ගොඩහත්තාශේ මහෞෂධ පණ්ඩිතයා හා සමග මේ නුවරට ගෙන්වා දෙන්නාම මරා ජයපානය බොම්හයි සනිටුහන්කොට සිතා නිමවා රජහු සමීපයට ගොස් දෙවයන්වහන්ස එක් රහස් කථා මන්ත්‍රණයක් ඇතැ'යි කීය. 'පලමු නාගේ මන්ත්‍රණය නිසා ඇගේ උතුරු සළුවටත් අස්වාමිකව දමාපියා ආම්හ; මේ මන්ත්‍රණයෙන් කුමක් කෙරෙයිද? මුවෙන් නොබැණැ'යි කිවූය. මහරජ මේ උපාය හා සමාන උපායෙක් නැතැ'යි කීය. 'එසේවීනම් කියව'යි කීය. 'මහරජ අපි දෙන්නාම නනිවිය යුතුය'යි කියා රජ්ජුරුවන් යහපතැ'යි කී කල ඔහු ඇරගෙණ මාලිගාවේ මතුමාලට නැගී 'මහරජ වෙදෙහරජු කාමයෙන් පොලඹවා ගොවියා පුතු සමග මේ නුවරට ගෙන්වා ජීවිතක්‍ෂයට පමුණුවාපියම්හ'යි කීය. ඒ වන්නා තොප කීවා ඉතාම යහපත, කවර උපායකින් පොලඹවා මේ නුවරට ගෙන්වමෝදැ'යි කීහ. මහරජ නුඹවහන්සේගේ දියනියෝ පංචාලචණ්ඩි කුමාරිකාවෝ උතුම් රූ ඇත්තාහ; ඒ ලක්‍ෂණ සම්පත්තවූ කුමාරිකාවගේ රූප විලාසය කවීන් ලවා ගී බඳවා කාව්‍යකරවා ඒ කාව්‍ය මියුලුනුවර ගායනාවකරවා මෙබඳු ස්ත්‍රී රත්නයක් නොබලත්නාවූ වෙදෙහරජුහට රාජ්‍යයෙන් ප්‍රයෝජනකිම්දැ'යි රූපශ්‍රී ඇසූ පමණකින් ඔහු සංසගීයෙහි බැඳුනු කල ඔම්ම ඔබ ගොස් දවස් නියම දැන තැකැත්ලා එන්නෙමි; ඒ රජු හා දවස් නියමකොට මා ආ කල්හි බිලියක් ගිලූ මසකුසේ ගොවියා පුතු හා සමග මේ නුවරට එන්නේය, එවිට උන් දෙන්නා අල්වාගෙණ මරා ජීවිතක්‍ෂයට පමුණුවාපියම්හ"යි කීය. රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා ගිවිස ඉතා සතුටුව 'ආචාරිණි ඒ උපාය ඉතා යහපතැ'යි කියා 'තොප කී ලෙසම කෙරෙමි'යි ගිවිස්සාහ.

මේ දෙදෙනාගේ රහස් කථාව චූලනී රජ්ජුරුවන්ගේ යාන බලන එක් සැළලිහිණියක් සකස්කොට අසා සිත තබාගත, ඉක්බිති රජ්ජුරුවෝ යහපත්කොට අදාල කාව්‍යකාරයන් ගෙන්වා ඒ වූ නියාව කියා බොහෝ වස්තුදී ඔවුන්ට දුවනියන් පෙන්වා 'කුඩාචරුණී මේ කුමාරිකාවගේ රූපශ්‍රී වර්ණනා කෙරෙමින් මුන් නිසා කාව්‍ය කරව්ය'යි කීය. ඒ කාව්‍යකාරයෝ කර්ණරසායන කොට අති මනොහර කොට ගී බැඳ රජහු ඇස්වූහ. එදවස් රජ්ජුරුවෝ බොහෝ ප්‍රසාදදුන්හ, කවීන් අතින් විද්දත් නායකයෝ ඉගෙණ බොහෝදෙනා මධ්‍යයෙහි ගායනා කළහ. ඒ ගීතිකා ඇසූ ඇසූවන්ට කර්ණ රසායනය, මෙසේ කාව්‍ය ගීතිකා බොහෝදෙනා අතරේ ප්‍රසිඩවූ කල්හි රජ්ජුරුවෝ ගී කියන්නවුන් කැඳවා කියන්නාහු "දරුවෙනි තෙපි කොස් ලිහි යන් අල්වාගෙණ රූ ගස්උඩ ඉඳ ගීතිකාවන් කියා අළුයම් වේලෙහි

උන් කර කයිතාලම් බැඳ උන් ආකාශයට හැරපියා කාත් නොදන්වා බැස පියව''යි කීහ. ඒ කුමක් පිණිසද යත්, බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ දුවනියන්ගේ රූපවිලාසය දෙවතාවෝ පවා කියන්නාහ'යි දඹදිව ප්‍රසිඩවන පිණිස කරවූහයි දතයුතුය.

නැවත රජ්ජුරුවෝ කවීන් කැඳවා ''කුඩාවරුණී දූත් නොපි කියන කල මෙවැනි රූ ඇති කුමාරිකාවන් දඹදිව අතික් රජක්හට තරම් නොවෙයි. මිථුලු නුවර වෛදෙහ රජහටම තරමැයි වෛදෙහ රජ්ජුරුවන්ගේ රාජශ්‍රී හා කුමාරිකාවන්ගේ රූපවණ්නාව හා එක්කොට ගී බැඳ කාව්‍යකරව්''යයි කීහ, ඔවුහු ගී බැඳ රජ්ජුරුවන් ඇස්වූහ. රජ්ජුරුවෝ ගායකයන්ට බොහෝ ප්‍රසාද දී ''දරුවෙනි මිථුලු නුවරට ගොස් මේ උපායෙන්ම ගායනා කරව්ය'යි කියා යැවූහ. ඔව්හු එතැන් පටන් වන් වන් තැන ගායනා කෙරෙමින් සාරසියයක් ගව් ගෙවා මිථුලු නුවරට පැමිණ බොහෝදෙනා රැස්වූ සභායෙහි ගායනාකළහ. ඒ අසා බොහෝ ජනයෝ ඔල්වරහඩ දහස්ගණන් පවත්වා මහා සන්තොෂයෙන් වස්තු දුන්හ. ඒ ගායකයෝ රෑ ගස්වලද හිඳ ගායනාකොට අළුයම් වේලෙහි කොස්ලිහිණියන් කර කංසුතාලම් බැඳ ආකාශයට හැර බස්නාහ. ආකාශයෙහි ඒ කංසුතාලම් හඬ අසා චූලනී රජ්ජුරුවන් දුවනියන්ගේ රූපවණ්නාව දෙවතාවෝ පවා කියන්නාහ'යි නුවර මහත්වූ කෝලාහල විය. වෛදෙහ රජ්ජුරුවෝ ඒ අසා ගායන කාරයන් කැඳවා තමන්ගේ රජගෙයිදී බොහෝදෙනා මධ්‍යයෙහි කියවා බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ තමන්ගේ මෙබඳු රූපශ්‍රීන් විරාජමානවූ දුවනියන් මට සරණ දෙත්ල'යි මහත්වූ සොම්නසට පැමිණ නාටකයන්ට බොහෝවූ ප්‍රසාද දී මහත්වූ සත්කාර කළහ. ඔහු නැවත අවුත් ඒ බව චූලනී රජ්ජුරුවන්ට කීහ. ඊට අනතුරුව කෙවට්ට බමුණු කියන්නේ 'මහරජ දූත් මම ගොස් නැකැත් ලාලා දවස් නියමකොට එම්'යි කීහ. 'යහපත ආචාරිණි! කුමක් ලදමනාදැ'යි කීහ. යම්තම් පඬුරක් ලදමැනවැ'යි කීය. යහපත ගනුව'යි කියා මාහැඟි පඬුරු දෙවූහ. ඒ බමුණු මහපිරිවරින් ගොස් වෛදෙහ රජ්ජුරුවන්ගේ රටට පැමිණියේය. ඔහු එන ගමන අසා ''බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ තමන්ගේ දුවනියන් අපගේ රජ්ජුරුවන්ට සරණ දෙත්ල; රජදරුවන් දෙදෙනාගේ බන්ධුත්වයත් මිත්‍රකමත් යහපත් වන්නේය. කෙවට්ට බ්‍රාහ්මණයා නැකැත් ලාලන්ට එමින් සිටියේල''යි නුවර එකකෝලාහලවිය, එපවත් වෛදෙහ රජ්ජුරුවෝ ඇසූහ.

පරසිත් දන්නා බොධිසත්වයන්වහන්සේ එපවත් අසා සිතනසේක් ''මේ විවාහය කියා කෙවට්ටයා එන ගමන මට රුස්නේ නොවෙයි, එහි තත්ත්වය දැනපීම්නම් යහපතැ''යි සිතා චූලනී රජ්ජුරුවන් කෙරෙහි සිටිය චරපුරුෂයන්ට 'මේ මන්ත්‍රණය තත්වූ පරිද්දෙන් කියා එවන්න'යි කියා හසුන් යැවූසේක. නැවත ඔහු කියා එවන්නාහු ''අපිත් එහි තත්ත්වය නොදනුම්හ, කෙවට්ටයෝ රජ්ජුරුවන් හා මාළිගාවේ මතු මාලේ ශ්‍රී යහන් ගබඩාවේ හිඳ මන්ත්‍රණයක් කළහ. රජ්ජුරුවන්ගේ යහන බලන සැළලිහිණියක් ඇත. ඕ තොමෝ එහි තත්ත්වය ඉඳුරා දන්නීය''යි නැවත කියා යැවූහ. ඒ අසා බොධිසත්වයන්වහන්සේ සිතනසේක් 'යම්සේ සතුරන්ට අවකාශයක් නොපෙණේද

එබැවින් මා විසින් සුරක්‍ෂිතකොට රක්නාලද මේ නුවර මේ දුෂ්ටවූ කෙවට්ටයාට නොපාමී''යි සිතා නුවර මහවාසල පටන් රජගෙයි දොරකඩ දක්වාද එතැන්පටන් තමන්වහන්සේගේ දොරකඩ දක්වාද ඇතුළු වීථි මාර්‍ග දෙපාර්ශ්වයෙහි බට පැලලිබඳවා මුදුනෙහින් පැදුරු බඳවා සිත්කම් කරවා බිම සුදු වැලි ලවා පස්වණක් මල් ඉස්වා දෙපාර්ශවයෙහි පුන්කලස් හා මාරුක්මල් තබා කෙහෙල්ගස් බඳවා ධජ නංවා සරහාලූසේක. කෙවට්ටයාත් ඒ නුවරට වන්නේ නුවර ගෙවල් ආදිවූ දෙය ඉඳුරා නොදැක 'රජහු විසින් මා එන්නාවූ මගුල් පිණිස සරහන ලද්දේවනැ'යි සිතීය, ඒ බමුණු තමාට නුවර නොපානා පිණිස කළ නියාව නොදන්නේය. කෙවට්ටයාත් සරහනලද වීථියෙන් ගොස් රජ්ජුරුවන් දැක, ගෙණා පඬුරු පාවාදී මියුරු කථාකොට එකත්පස්ව හිඳ රජහු විසින් කරණලද සත්කාර සම්මානවිඳ තමා ආ කාරණය කියන්නේ ''මහරජ අපගේ රජ්ජුරුවන්වහන්සේ නුඹවහන්සේ හා ඥාති සම්බන්ධයෙන් අතිශයින් මිත්‍රමිත්‍රව හිඳිනා කැමතිසේක. අනර්ඝවූ රුවන් ආදිවූ පාක්කුඩම් එවූසේක. මිහිරිවූ ප්‍රිය තෙපුල් දන්නා දූතයෝ එරටින් මෙහි එත්වා යම් බසක් ප්‍රිය මනාපනම් එසේවූ මෘදු තෙපුල් කියත්වා, පඤ්චාලයෝද වේදෙහයෝද යන දෙපක්‍ෂ එක්වෙත්වා, මෙසේද කියා නැවත කියන්නේ ''යම් යම් බසෙක් සන්තොෂයට කාරණා වීනම් ඔවුනොවුන්ට එසේවූ ප්‍රිය තෙපුල් කියත්වා, කුමක් නිසාද යත්, පඤ්චාලදෙශයෙහි රජ්ජුරුවන් හා වෛදෙහ රජ්ජුරුවන් හා දෙදෙන ආවාහ විවාහයෙන් ඒකාන්තවූ ඔවුනොවුන් කෙරෙහි සතුටුව වසන්නාහ, එබැවින් අවමඞ්ගල්‍ය වචනයන් නොකිය මඞ්ගල්‍ය නිඃශ්‍රිතවූ බසක්ම කියත්වා''යි කියා නැවතකියන්නේ ''නැවතත් ඒ මතුනොවෙයි තමන්ගේ දූ රුවන හා උතුම් උතුම් මාහැඟි රුවන් එවනසේක, මෙවක්පටන් දෙරටින් ඔවුනොවුන්ට පාක්කුඩම් ගෙණ මිහිරිවූ ප්‍රිය තෙපුල් දන්නා දූතයෝ මොබින් ඔබ යෙත්වා, ඔබින් මොබ යෙත්වා, මේ දෙරට සම්බන්ධවූ නියාව කුමක්වැනිද යත්, ගංගානම් ගඟ දිය හා යමුනා නම් ගඟ දිය එක්වූ කලක් පරිද්දෙන් ඔවුනොවුන් එක්සිත්ව සමගිව සන්තොෂව වෙසෙත්වා''යි කිය මෙසේද කියා නැවත කියන්නේ 'අපගේ රජ්ජුරුවන්වහන්සේ අතික් මහා අමාත්‍යයකු එවනු කැමතිවත් අතික් කෙණෙක් මේ මඞ්ගල්‍ය වචනය සිත්ගෙණ ඉඳුරා කියාලන්නට අසමර්ථය''යි සිතා මට කියනසේක් 'ආචාරිණී නොපිම ගොස් මේ මගුල් කියා රජ්ජුරුවන් සන්තොෂකොට සතුටුකරවා කැඳවාගෙණ එව'යි කීසේක එබැවින් රාජොත්තමයානන්වහන්සේ වහා වැඩිය මැනව; ඔබ ගියාවූ නුඹවහන්සේට වැඩ දෙකක් වන්නේය. ඒ කවරේද යත්, ''අසමාන රූ ඇති කුමාරිකාවනුත් ලබනසේක, අපගේ රජ්ජුරුවන් හා සමග මෛත්‍රී සිතත් අධිකවන්නේය''යයි කීහ.

රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා සතුටුව 'උතුම්වූ රූ ඇති කුමාරිකාව ලැබෙය'යි ඇසූ බස් පමණකින්ම බැඳී ගොස් නැවත කියන්නාහු 'ආචාරිනි තොප හා මහෞෂධ පණ්ඩිතයන් හා දෙන්නා ධර්‍ම යුධයෙහි පළමු වාදයෙක් වූයේවේද, යව මපුතානුවන් දකුව, තොප දෙදෙනාම පණ්ඩිතවරුන් බැවින් ඔවුනොවුන් ක්‍ෂමාකරවා ප්‍රිය කථාකොට එව''යි කීහ. ඒ අසා කෙවට්ට නම් බමුණුතෙමෙ 'යහපත පණ්ඩිතයන් දකිම්'යි ඔබ දක්නා පිණිස යන්ට නමා ගත, බොධිසත්වයන්වහන්සේද එදවස් උදැසන 'ඒ පවිටා හා මා හා එක්ව

කථාවක් නොවේවා'යි සිතා උදෑසනම තමන්ගේ බසට කැප පිණිස එළඟී තෙල් සුහක් අනුභවකොට ගෙයි ගොම පිරිබඩ ගාවනයේක් දුගුල් බොල ඇති කොට ගාවා මිදුනු තෙල් කප්වල ගාවා බෝධිසත්වයන්වහන්සේ වැද හෝනා එක් පටු හැඳක් පමණක් තබා, සෙසු ඇඳ පුටු ආදිය ගෙන් පිටත්කර වූ සේක. නැවත සිටියවුන්ට විධානකරණසේක් "බමුණු මා හා කථාවට ආරම්භකළ කල බමුණු පණ්ඩිතයන්වහන්සේ හා නොදෙඩව, අද බෙහෙත් තෙලක් අනුභවකළ සේකැ'යි ඔහු නවතා මාත් දෙඩන්නට වන් කල්හි "ස්වාමිනී බෙහෙත් තෙලක් වැළඳුසේක්වේද නොදෙඩාවදැළ මැනවයි කිය වයි, විධාන කොට රතක් පොරවාගෙණ සත්වන දෙරටුවේ යටි මාලේ පටු හැඳ වැදහොත්සේක.

කේවට්ටයාත් පළමුවන දෙරකඩට අවුත් රැකවලුන්ට 'පණ්ඩිතයෝ කොයිද්දැ'යි කිය. සිටියෝ කියන්නෝ "බමුණ මහත්කොට නොදෙඩා අරගල නොකොට බැණ නොනැගී ගොලුවකුසේ කරබාගෙණ නැගී වර, අද අපගේ ස්වාමී බෙහෙත් තෙලක් වැළඳුසේක. එබැවින් මහත්කොට දෙඩීම් හා අරගල කිරීම් නොකැමැත්තේය"යි කීහ. බමුණු මුවෙන් නොබැණ කරබා ගෙණ සත්වන දෙරටුව ගෙවා බෝධිසත්වයන් සමීපයට ගියේය.

බෝධිසත්වසත්වහන්සේ ඒ ගිය බමුණා හා කථාවට ආරම්භ දක්වූ සේක. ළඟ සිටියාහු "ස්වාමිනි ඉතා සූක්‍ෂමවූ තෙලක් වළඳන ලද්දේවේද, එබැවින් මේ දුෂ්ටවූ බ්‍රාහ්මණයා හා කථාවෙන් ප්‍රයෝජන කිම්දැ"යි කියා නැව තූහ. කෙවට්ටයා බෝධිසත්වයන්වහන්සේ සමීපයෙහි හිඳිනා ආසනයක්වත් වැතිරගෙණ සිටිනා ආධාරයක්වත් බෝධිසත්වයන්වහන්සේගේ මිහිරි කථා මාත්‍රයක්වත් නොලදින් වැසි සමයෙහි ගවරපිරි ගෙවුදකට වන් ගොන් මාල් ලකුසේ බොල් ගොම ඇඟිලි අසුවලින් පලවා පලවා මිරි මිරීයේ ඒ පයින් ඒ පය ලාලා මිරිකමින් සිටියේය. ඒ සිටියාවූ බමුණා මූණ බලා එකෙක් තමාගේ තුවණ කසාලීය, එකෙක් තමාගේ බැම උඩනගාලීය, එකෙක් තමාගේ වැල මිට කසාලීය, බමුණු ඔවුන්ගේ මේ ක්‍රියාව දැක ඉඟිකරුව ඈත් මෑත් බලන් නේ 'පණ්ඩිතයෙනි! අපි යම්හ"යි කියා අනිකකු විසින් "කොල අරිටු බමුණ 'නොදෙඩව,යි කියදින් දෙඩ දෙඩාම සිටින්නෙහිද දූන් නොපගේ ඇට බැට පාලා පියම්හ"යි කී කල්හි හයින් ත්‍රස්තව නැවත පිටිපස්ස බැලීය ඉක්බිති එසේ බැලූ බමුණාට එකෙක් හුණපත්තෙන් පිට්ට පහරක් ගැසීය, එකෙක් 'යෙයිද නොයෙයිද්දැ'යි කියා කර අල්වාගෙණ දැමීය, එකෙක් දිවමින් ගොස් පිටමැද අතුල් පහරක් ගැසීය, ඒ තෙමේ දිවියෙකු කටින් ගැලවුනු මුව මාල්ලකු මෙන් හයින් තැතිගෙණ වෙව්ල වෙව්ලා දිවන්නේ දූකයේ ගොස් රජගෙට පැමිණියේය.

රජ්ජුරුවෝත් මපුතනුවෝ අද මාගේ විවාමගුල් අසා අතිසයින් සතුටු වන්නාහ, තවද පණ්ඩිතවරුන් දෙදෙනාගේ ධර්මයෙන් යුක්තවූ කථාවකුත් වන්නේය අද දෙදෙනා ඔවු නොවුන් ක්‍ෂමාකරවා ගන්නාහ, එබැවින් මට වූයේ මහත් ලාභයෙකැ"යි සිත සිතා උන්නාහ. එවේලෙහි ආන ආනා අවුත් එහනට වන් කෙවට්ටයා දැක දෙදෙනා ඔවුනොවුන් දැක කළ කථා සංසන්ද නය විචාරන්නාහු මේ ගාථාවෙන් කීහ.

කථන්නු කෙවට්ට මහොසධෙන - සමාගමො ආසි තදිඞසබ්‍රැහි,
කච්චි තෙ පටි නිජ්ඣතො - කච්චි තුට්ඨො මහොසධො.

මේ ගාථාවෙන් රජ්ජුරුවෝ කියන්නාහු "කිමෙක්ද කෙවට්ට පණ්ඩිත යෙනි, මහෞෂධ පණ්ඩිතයන් හා තොප හා එදවස් ධර්ම යුද්ධයෙහිදීවූ කණස් සල්ල හැර ක්ෂමාකරවා ගතුද? නැවත තොප දෙදෙනාගේ මිහිරි කථා කෙසේ වීද? තොපගේ රජ්ජුරුවන් කියා එවූ මගුල් විවාහය අසා මපුතානුවෝ සතුටු වූද? ඒ මට නොවළහා තත්වූ පරිද්දෙන් කියව"යි කීහ. ඒ අසා කෙවට්ටයා කියන්නේ මේ ගථාවෙන් කීය.

අනරියරූපො පුරිසො ජනන්ද - අසම්මොදකො ථද්ධො අසබ්භිරූපො
යථා මූගොව බධිරො - න කිඤ්චිත්ථං අභාසථ

"ජනප්‍රධාන රජ්ජුරුවන්වහන්ස! ඒ මහෞෂධ පණ්ඩිතයා තම් අනාර්‍ය්‍ය ස්වරූප ඇති සාධු ගුණයක් නැති තද එකෙක, ස්වභාවයෙන්ම ඉතා තද එකෙක, අසත්පුරුෂයෙක, ගොලුවකුගේ බසකුත් නොකීයේය, බීරකු මෙන් මාගෙන් බසකුත් නොඇසුයේය. ඒ පණ්ඩිතයා නුඹවහන්සේටම තරම, ඔහු තරම් දුර්ජනයෙක් මනුෂ්‍යයන් කෙරෙහි එකද කෙණෙක් නැතැයි සිතා දෙඩමළුවූ බමුණුමාලු තමා කවට ආවාක්ම කීයේය. තමා කෑ ගෙඩි බැට යෙහි තමකුත් නොකීයේය. "හත්දුරුවා කෑ බැටිතම් තමා මේය"යි සිතමි. එහෙයින් තමා ලත් අවමානය තමකුත් නොකියා මහතානන්ගේ නුගුණම කීය. රජ්ජුරුවෝ තුටුදනොවී විරුද්ධයකුදු නොකියා කෙවට්ටයා හා කැවිව ආවුන්ට බත් වියදම්දී තවාතැන් ලවා "යව ආචාරීනි සැතපී ගණුව"යි කීහ. ඔහු යවා ඉක්බිති රජ්ජුරුවන් "මපුතනුවෝ ඉතා නුවණැත්තාහ. ප්‍රිය තෙපුල් ඇත්තාවූ කෙණෙක, මේ බමුණා හා කථාවකුත් නොකළාහ, දූක සතුටුවූ පමණකුත් නොවූහ. කිමෙක්ද මොහු ආ ගමනේ මතු වන්නාවූ භයක් මපුත නුවන් දුටුදෝහෝයි සිතමි. එබැවින් මේ කේවට්ටයා ආගමන අපට වැඩක් හා අභිවෘද්ධියක් නිසා නොවෙයි, සරණ දෙම්හයි කාමයෙන් පොළඹවා ඔබ ගෙන්වාගෙණ මරණ පිණිස මා කැඳවා ආවහයි සිතමි, ඒ බව දූතලාවන, මපුතනුවන් ඔහුට කිසිවකුත් නොකීයේය"යි සිතා භයගෙණ හුන් කල්හි සෙනකාදී ප්‍රඥසමුද්‍රයෝ සතරදෙන ආහ.

සෙනකයාට රජ්ජුරුවෝ කියන්නාහු "කිමෙක්ද සෙනකය උත්තර පඤ්චාලයට ගොස් චූලනී රජ්ජුරුවන්ගේ දූවනියන් ගෙණමෝද ඒ ගමන තෙපි හැම කැමැත්තෝද්ද'යි විචාළහ. ඉක්බිති සෙනකයා කියන්නේ "මහරජ කුමක් කියනසේක්ද තමා කරා එන ශ්‍රියාකාන්තාව ගසාදුරුකරණ කෙණෙක් ඇද්ද ඉදින් ඔබවහන්සේ ඔබ ගොස් ඒ කුමාරිකාව ගෙණා සේක්වීනම් බ්‍රහ්ම දත්ත රජ්ජුරුවන් හැර සියලු දඹදිව නුඹවහන්සේ හා සමාන රජෙක් නැත් තේය. ඒ කුමක් පිණිසදයත්, නායක රජ්ජුරුවන්ගේ දූවනියන් රක්‍ෂා කරණහෙයිනි, තවද ඒ රජ්ජුරුවෝ සිතනකල සෙසු රජදරුවෝ තම් මාගේ සේවකයෝය. මා හා සමානයෝ තම් එකම වේදේහ රජ්ජුරුවෝය"යි සිතා දඹදිව සියලු ස්ත්‍රීන්ට් වඩනා රූ ඇති දූවනියන් නුඹවහන්සේට දෙන්නාහ, නුඹවහන්සේට වන්නේ මහ අභිවෘධියෙක, යම් කිසි කෙණෙක් නුවණ මදව

ඊට බාධා කෙරෙත් නම් ඊට කිසි සැකයක් නොකොට වැඩිය මැනව; අපිත් නුඹවහන්සේ හා ගියකල වස්ත්‍රාභරණ අන්නපානාදියෙන් සංග්‍රහය ලබන්නෙමු"යි කෙවට්ටයාට නොඅඩුවූ ගුණ ඇති ඉතා දෙඩමලුවූ ගුණමකු ස්වභාවයෙන් ඉතා ලොභීවූ සෙනක නම් බමුණු තෙමේ රජහු අතිශයින් පොළඹවා ගිවිස්නා පරිද්දෙන් සිනාට නඟා කීහ. පුක්කුසාදී සෙසු පණ්ඩිතවරුන් විචාළ කල්හි ඔහුත් එලෙසම කීවිය. ඔවුන් හා සමග කථාකරමින් උන්තැනට කෙවට්ටයා තමා හුන් තැනින් අවුත් මහරජ! අප රඳන්නට නොපිළිවන, යම්හ'යි කීහ. රජ්ජුරුවෝ ඔහට සත්කාර කොට යැවූහ.

බෝධිසත්වයන්වහන්සේ ඔහු ගිය බව දැන සැරහී රාජසේවයට අවුත් රජ්ජුරුවන් වැඳ එකත්පස්ව උන්සේක. රජ්ජුරුවෝ සිතන්නාහු මපුතනුවෝ මහා මන්ත්‍රීය, සියලු මන්ත්‍රණයෙහි පාරප්‍රාප්තය, අතීතානාගත ප්‍රත්‍යුත්පන්න යන තුන්කල්හි වන්නාහු අර්ථයන් පරොපදෙශ රහිතව ස්වයම්භූඥානයෙන් මනාකොට දන්නාහ. එබැවින් අප ඔබ යන ගමනේ යහපත නපුර මේ පණ්ඩිතයෝ දනිති"යි සිතා තමන් පළමු සිතූ ලෙසම නොරඳ රාගයෙන් මත්ව මොහයෙන් මූඪව විචාරන්නාවූ මේ ගාථාවෙන් කියත්.

ඡන්නං හි එකාවමතී සමෙති-යෙ පණ්ඩිතා උත්තම භූරිපත්තා;
යානං අයානං අථවාපි ඨානං-මහොසධොත්වම්පි මතිං කරොහි.

පුත මහෞෂධ පණ්ඩිතයෙනි! "සෙනකය, පුක්කුසය, කාවින්දය, දෙවින්දය, කෙවට්ටය, වෙදෙහය, යන අප සදෙනාගේ අදහස් උත්තර පඤ්චාල දේශයට බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ දුවනියන් ගෙණෙන්නට යාම යහපතැ"යි එක්වූතියාව ගඞ්ගොදකය යමුනොදකය හා වෙනසක් නැතිවූවාක් මෙන්ය. මහෞෂධ පණ්ඩිතයෙනි! තෙපිත් කියව, ඔබ යාමවත් නොගොස් රැඳීමවත් යහපත නපුර යන මේ දෙකින් එකක් තොපගේ සූක්ෂමවූ ප්‍රඥායෙන් මනාකොට සිතාලා කියව, "ඔබ සමෝද නොයමෝදැ"යි කීහ. ඒ අසා මහතානෝ සිතනසේක් "මේ රජ තමා නුවණ මඳ හෙයින් මූන් සතරදෙනාගේ බස් ගිවිස නුවණින් අඹව කාමයෙහි ගිජුව ඒකාන්තයෙන්ම යන්නේය, ගොස් මහා විනාශයට පැමිණෙන්නේය, ගමනෙහි දෙෂ කියා නවතින් නම් නවතාලමි"යි සිතා මහරජ! බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් පඤ්චප්‍රකාර බලයෙන් යුක්ත නියාව නොදන්නාසේක්ද? පළමුත් තමන් මේ නුවරට අවුත්පැරද පලාගිය හෙයින් ලජ්ජා පසිඳගන්නා පිණිස 'දුව සරණ දෙමි'යි ඔබ ගෙන්වා දූල මුවකු අසුවූ කල වැද්දකුසේ තමන් කැමැත්තක් කරති'යි සිතමි, තවද ඇම කෙරේ ගිජුවූ මත්ස්‍යයා යටතුබූ බිලිය නොදැකගැලපියා නස්නා පරිද්දෙන් කාමයෙහි ගිජුවූ ඉදින් පඤ්චාල දෙශයට ගියසේක් වීනම් ඒ බිලිය ගිලූ මත්ස්‍යයා පරිද්දෙන් වහා නස්නාසේක. තවද පත හසුවූ මුවකු පරිද්දෙන් මහත්වූ විනාශයට පැමිණෙනසේක. එබැවින් ඈත යන ගමන මම නොකැමැත්තෙමි"යි වදාරණසේක්:-

ජානාසි ඛොරාජ ! මහානුභාවො, මහබ්බලො චූලනි බ්‍රහ්මදත්තො
රාජාච තං ඉච්ඡති කාරණත්ථං, මිගං යථා ඔකචරෙන ලුද්දො

යථාපි මච්ඡො බලිසං වඞ්කං මංසෙන ඡාදිතං
කාමගිද්ධො න ජානාසි මච්ඡොව මරණමත්තනො

එවමෙව තුවං රාජ චූලනී යස්ස ධීතරී
කාමගිද්ධො න ජානාසි මච්ඡොව මරණමත්තනො.

සචෙ ගච්ඡසි පඤ්චාලං, ඛිප්පමත්තං ජහිස්සසි
මිගං පථානුපත්තංව, මහන්තං භයමෙස්සසි'යි-

ගාථා සතරකින් වදාළ කල්හි නුවණ නැති රජ එබස් අසා නුවණින් සලකා ගතනොහී 'තමන්ට හෙලා දෙඩුව'යි සිතා 'මේ තමාගේ දූසයකුත් කොට'' සිතා රජ්ජුරුවෝය'යි මඳකුත් නොතකා දඹදිවට අග්‍රවූ රජ්ජුරුවන් ''තමන්ගේ ලෙහිඳු දූවනියන් සරණ දෙමි''යි කියා තමන්ගේ දූතයන් එවූ නියාව දූත දූතම, මඟුලට නිසි එක බසකුත් නොකියා මා කෙලතොලු වකු සේද, බිලියක් ගිලූ මසකුසේද, පත හසුවූ මුවකුසේද, මහත්වූ භයට හා මරණයට පැමිණෙ''යි කියයි කිපී මඟුලට නිසි කථා දත්තෝ තම් සේන කාදී පණ්ඩිතවරු සතරදෙනා හා කෙවට්ට පණ්ඩිතයෝය; තා නිමුත්විට එලිගෙණ සීසා කන ගොවියා පුතු අතින් මේසා උතුම් මාංගලා වචන විචා ලාවූ අපිම නුවණ නැති කෙලතොල්ලම්හ''යි බොධිසත්වයන් වහන්සේට නොයෙක් පරිද්දෙන් නින්දා පරිභව බැණපියා ''මේ ගොවියා පුතු මෙතැ නින් පිටතටලව'යි නියොගකරත්තාහු ''මාගේ මේ නියා ස්ත්‍රීරත්න ලාභ යාගේ අන්තරායට සුදුසු බස් කීවාවූ මොහුගේ කර අල්වාගෙණ මාගේ විජිත යෙන් පිටත ලව''යි කීහ.

බොධිසත්‍වයන් වහන්සේ රජහු කිපී බව දැන සිතනසේක් ඉදින් මෙහි යමෙක් නුවණ නැති රජුගේ බස් ගෙණ මා අතවත් කරවත් ඇල්වූයේ වීනම් මා දිවිහිමියෙන් ලජ්ජාවට එම සෑහෙත්තේය; එබැවින් මම්ම යෙමි'යි සිතා හුනස්නෙන් නැඟී රජහුවැඳ තමන්වහන්සේගේ ගෙට ගියසේක. රජ්ජුරු වෝත් කිපී බස් කී බව මුත් බොධිසත්‍වයන් කෙරෙහි ගෞරවයෙන් එකක්හට තුලු ගසව පිටතට ලව'යි නොකීහ එසේ හෙයින් තම තමන් මූණ බලා එකක්හට නොකී හෙයින් බොධිසත්වයන් ලඟට ගිය එකද කෙණෙක් නැත් තාහ. ඒ එසේමැයි රජගෙයි වසන්නවුන් විසින් රජහු යමක්හට කිපී 'තුලු ගසව මරව පිටතට ලව'යි සාමාන්‍යයෙන් කී කල්හි සිටියවුන් එබස් අසා සිටි පියෙන් නොසිහිලි රජහු මුහුණ යටසිත් බල බලා සිටියවුන් අතක් නො සෙල්විය යුතුය. එකකු මුහුණ බලා කී කල ඒ නියොගලද්දූහු මුත් අනිකක්හු කිසිවකුත් නොකටයුතුය. ඒ නියෝගය ලද්දූහු තබා අනිකෙක් නොමේව රෙහි මේවර කෙළේ තම් අරුට කළමනා නිග්‍රහ වරදවා කළ නැනැත්තේ විඳගන්නේය, එබැවින් රජහු එකෙක්හට තෝරා නොකී හෙයින් බොධි සත්‍වයන් ලඟට ගොස් සෙසු නිග්‍රහ තබා 'පිටතට ගිය මැනව'යි යන බසක් පමණකුදු කී එකද සත්‍වයෙකුත් නැත්තේවිය.

ඉක්බිති බොධිසත්‍වයන් වහන්සේ සිතනසේක් ''රජ්ජුරුවෝ නුවණ නැතිව හිතයත් අහිතයත් නොදන කාමයෙහි ගිජුව බ්‍රහ්මදත්තයන්ගේ දූව ලබන්නෙමියයි සිතා මතු වන භය නොදන ගොස් මහ විනාශයට පැමි

ණෙන්නාහ; එබැවින් මට බොහෝ යශදායකවූ උපකාරව සිටි රජ්ජුරුවන්ගේ බස් සිත තිබීම මට තරම් නොවෙයි, මා විසින් මෝහට පිටිවහල් විය යුතුය”යි සිතා ‘පළමුකොට ගිරවාණන් යවා තත්ත්වය දැන පසුව මම යන්නෙමි’යි සිතා ඒ නුවරට ගිරවාණන් යවූසේක. (පණ්ඩිතයන්වහන්සේ ගිරවාණන් යවා තත්වූ පරිදි දත් නියාව බුදුව වැඩහිඳ වදාරණ මාගේ ස්වාමිදරුවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ:–

තතො ච සො අපක්කම්ම, වෙදෙහස්ස උපන්තිකා
අථ ආමන්තයි දූතං, මාඪරං සුවපණ්ඩිතං

එහි සම්ම! හරිපක්ඛ, වෙය්‍යාවච්චං කරොහි මෙ
අත්‍ථි පඤ්චාල රාජස්ස, සාළිකා සයනපාලිකා

තං පත්ථරෙන පුච්ඡස්සු, සා හි සබ්බස්ස කොවිදා
සා වෙ සබ්බං පජානාති, රඤ්ඤො ච කොසියස්ස ච.

ආමෙති සො පටිස්සුත්වා, මාඪරො සුවපණ්ඩිතො
අගමාසි හරිපක්ඛො, සාළිකාය උපන්තිකං

තතො ච සො ගන්ත්වාන, මාඪරො සුවපණ්ඩිතො
අථ අමන්තයි දූතො, සාළිකං මඤ්ජුභාණිකං

කච්චි සරෙ ඛමනීයං, කච්චි වෙස්ස අනාමයං
කච්චි තෙ මධුනා ලාජං, ලබ්භරෙ සුසරෙ තව.

කුසලඤ්චෙව මෙ සම්ම! අථො සම්ම අනාමයං
අථො මෙ මධුනා ලාජා, ලබ්භතෙ සුවපණ්ඩිත!

කුතො නු සම්ම! ආගම්ම, කස්ස වා පහිතො තුවං
න ච මේසි ඉතො පුබ්බෙ, දිට්ඨො වා යදි වා සුතො–යි.

මේ ගාථාවෙන් වදාරණසේක් එම්බා මහණෙනි! ඒ මහෞෂධ පණ්ඩිතයෝ වෛදෙහ රජුගෙන් උදහස් අසා තමාගේ ගෙට ගියාහු තමන් වැඩූ මාඪර ගොත්‍රයෙහි උපන් ගිරාපැටවානන් කැඳවා ඔහට දූත මෙහෙවර කියා යවන්නාහු ‘රන්වන්වූ පක්ෂවයක් ඇති සබඳ ගිරාපණ්ඩිතයෙනි! මෙසේ එව; තොප විසින් මට කළමනා මෙහෙවරක් ඇතැයි කීහ. ගිරවාණෝ එබස් අසමින් තමන් හුන් රන්මැදිරියෙන් පිටත්ව මහාසත්ත්වයාට පැමිණ තමන් දෙපියාමුදුනේ තබා වැඳ එකත්පස්ව සිට කී යම් මෙහෙවරක් කොට දීලමි, සැකනොකොට වදාළමැනව”යි කීහ. ඒ අසා පණ්ඩිතයන්වහන්සේ වදාරණසේක් මාඪර ගොත්‍රයෙහි උපන් ගිරා පැටවානෙනි! කෙවට්ට බ්‍රාහ්මණයා හා බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා දෙදෙනා ‘සරණ දෙම්හ’යි කළ කථාව රහස හෙයින් ‘සැබෑද බොරුදැ’යි රජහුගේ යහන බලන සැළලිහිණිය හා විශ්වාසව ඈ අතින් තත්වූ පරිද්දෙන් විචාරා දැනගෙණ වහා අවුත් මට කියව”යි කියාලා මී හා විළඳ කවා මී පැන් පොවා ශතපාක සහස්‍රපාක තෙලින් දෙපියා අතරමැඩීකල්හි ඉතා සියම්වූ නුවණැතිගිරවාණෝ අසාගත් මෙමෙහෙවර

ඉදුරා සිත තබාගෙණ මහතානත් තුන් විටක් පැදකුණුකොට වැඳලා මාලිගාවේ මතුමාලේ හරණලද සීමැදුරු කවුළුවෙන් නික්මුණාවූ වාතවේගයෙන් සිවිරට දිශාවට මූණලා නික්ම ගොස් එහි පවත් සිත තබාගෙණ සැළලිහිණිය සමීපයට ගියාහ. ඒ කෙසේද? යත් ගිරවාණෝ ගොසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මාලිගාවේ රන්කොත් කැරැල්ල මුදුනේ හුන්නාහු මධුරසවරයෙන් රාගනිශ්‍රිත අඬක් ඇඬූහ. ඒ කුමක් පිණිසද? යත් සැළලිහිණිය කවර මාලෙක කවර ගබඩාවෙක බවත් නොදනිමි. "මෙ මාගේ ශබ්දය අසා මට ප්‍රතිවචනදී නොමෝත් හඬයි, ඒ සලකුණෙන් ඈ සමීපයට යෙමි'යි සිතා ඇඬූහ. ඔයිත් ඒ ශබ්දය අසා ඒ රජහුගේ ශ්‍රියහන් සමීපයේ රන්මැදිරියේ උන් තැනැත්තී රාගයෙන් මත්වූ සිත් ඇත්තී පිට පිට තුන් අඬක් ඇඬීය. ගිරවාණෝ මදක් ගොසින් නැවත නැවත ශබ්දය අසා ඒ අනුසාරයෙන් ක්‍රමයෙන් ගොස් සීමැදුරු කවුළුවේ එළිපත පිට හිඳ ගෙයි මිනිසුන් ඇත්ත නැත්ත පරීක්ෂාකොට නැතිසේ දැක ඈ සමීපයට ගියාය.

මෙසේ කෙළේ කුමක් පිණිසද? යත් "මේ සත්වලෝකයෙහි ස්ත්‍රීන් නිසා ගොස් ඇත තොල්මිටි බිඳවාගෙණ මහා පීඩාවට පැමිණෙන්නාහු ඇත ඉඳින් මේ ගෙයි යමෙක් මා දුටුයේ වීනම් මටත් අවවාදයක් කෙළේනම් තපුරැ"යි සිතා එසේ පරීක්ෂා කළහ. නැවත සැළලිහිණිය සබඳ! මෙසේ අවුත් රන්මැදිරියේ හිඳිනා'යි කිව. කිමෙක්ද තොප මේ රන්මැදිරියේ වසන්නවුන්ට දොම්නසෙක් නැද්ද? මී හා විලඳ සුවසේ ලැබේ ද'යි විචාළහ, තොමෝත් කියන්නී 'මා මෙහි වසන්නියට ඉතා සැපය' දොම්නසෙකුත් නැත, විලඳ හා මී සුවසේ ලැබෙයි, යහළුව! තෙපි කොයිසිට අවුද? කවරකුගේ බසට හෝ ආයෙහිද'යි කිව ගිරවාණෝ ඈ කී බස් අසා ඉඳින් මම මියුලු නුවර සිට ආමි කීම් නම් තමා පණයේ තමුත් සමාගමක් නොවන්නේය'යි සිවිදේශයෙහි අරිෂ්ටපුරය සඳහන්කොට ඔබසිට ආමි කියා සිවිරජ්ජුරුවන් එව්වාකොට බොරුගොතාගෙණ කියන්නාහු;

අහොසිං සීවිරාජස්ස' පාසාදෙ සයන පාලකො
තතො සො ධම්මිකො රාජා, බද්ධෙ මොචෙසි බන්ධනා.

යන මේ ගාථාවෙන් 'සොඳුර! මම බැළිත් එසේ මෙසේ කෙණෙක් නොවෙමි, සිවි රජ්ජුරුවන්ගේ යහන බලන්නාවූ ගිරවෙකිමි, අපගේ රජ්ජුරුවෝ ඉතාධර්මිෂ්ඨ කෙණෙක, එසේ හෙයින් දඬගෙයි හිඳිනා මනුෂ්‍යයන්ද මැදිරිවල හිඳිනා පක්ෂීන්ද හරවනසේක්, මාත් රන්මැදිරියෙන් හැරිසේක. මම මා කැමති තැනක ඇවිද ගොදුරු කා අවුත් දවස් පතා මාගේ රන්මැදිරියේ වෙසෙමි, තොපසේම මැදිරියෙන් පිටත් නොවී ඇතුළු මැදිරියේ හිඳිනෙම් නොවෙමි"යි කීහ එසේ කී ගිරවාණන්ට සැළලිහිණි තමාට රන් මැදිරියෙහි ලා තුබූ විලඳ කවා මී පැන් පොවා අනතයෙහි කියන්නී 'සබඳ තෝ ඉතා දුරසිට ආයෙහිය, කුමක් පිණිස අවුදැ'යි කිව, ගිරවාණෝ ඈගේ! බස් අසා සිතන්නාහු මේ ලොව බොරුවක් නොකියා බොරු සිතාවක් නොකොට ස්ත්‍රීන් නම් සිත්ගත නොහැක්ක; එබැවින් බොරුවක් කියා ඈ තම්මාගෙණ රහස් විචාර ගණිමි, සිතා කියන්නාහු:-

තස්ස මෙකා දුතිකා'සි, සාළිකා මඤ්ජුභාණිකා
තං තත්‍ථ අවධි සෙනො, පෙක්ඛතො සුසරෙ මමං'සි.

මේ ගාථාවෙන් එම්බා සොඳුර, තොපගේ කුලෙහිම වූ මාගේ පළමු ඇඹෙනි කෙණෙක් වූවා, උයිත් එසේ මෙසේ කෙණෙක් නොවන්නාහ, පුරුෂ යන් සිත් ගන්නා තරම් ලඳ බොළඳ මිහිරි ප්‍රිය තෙපුල් දන්නාහ; මාගේ ඇසට රසාඤ්ජනයක් හා සමානවූ ඒ මාගේ භාර්‍ය්‍යාව මා බල බලා සිටියදීම මා ඇස් හමුවේ උකුස්සෙක් අල්වාගෙණ මරාපියා පලාගියේය''යි කීහ. එසේ කී කල්හි සැළලිහිණි විචාරන්නී තොපගේ අඹුවන් උකුස්සා කෙසේ මරාපියා ඇරගෙණ ගියේදැ''යි කීව. ගිරවාණෝ ඈ සිතට තැගෙන පරිද්දෙන් බොරු ගොතා කියන්නාහු ''එක් දවසක් අපගේ රජ්ජුරුවෝ දියකෙළියට යන්නාහු මාත් කැඳවූසේක මම මාගේ අඹුවත් කැඳවාගෙණ ගොසින් දියකෙළපියා සවස රජ්ජුරුවන් හා සමග අවුත් මාලිගාවට නැගී ඇඟදිය වියලා ගන්නා පිණිස මාගේ බිරින්ද කැඳවාගෙණ සීමැදුරු කවුළුවෙන් නික්මිලා පිටත කූටාගාර කුක්ෂියෙහි කොබෝ ගෙඩි වලල්ලෙහි උන්නෙමි, ඒ ඇසිල්ලෙහි උකුස්සෙක් කුළුගෙය ආසින් යන්නේ අප අල්වාගන්ට දිවිය, මම මරණ භයින් නැති ගෙණ වහා දිවපීමි, උන් දූරි ඇති හෙයින් බඩ බරව වහායානුහුනුවාහ; එවිට මා බල බලා සිටියදීම අල්වාගෙණ මරාපියා ඇරගෙණ ගියේය, උන් කෙරෙහි ශොකයෙන් හඬන්නාවූ මා දැක, අපගේ රජ්ජුරුවන් වහන්සේ ''සබඳ! කුමට හඬාදැ''යි විචාරා ඒ බව අසා 'සබඳ නොහඬව' අනික් බිරින්දක් සොයා යව'යි කීහ.

'එබසට මම කියන්නෙමි ''ස්ත්‍රීහු නම් බොහෝසේ අනාචාර ශීලිහුය' එසේ අනාචාර දුස්සීල එකියක ගෙණ ඊමට වඩා හුදකලාව විසීම 'යහපත'ය කීමි. එබසට කියනසේක් තොපගේ ඇඹෙනියන්ට ශතසහස්‍ර ගුණයෙන් වඩනා ශීලාචාර සම්පන්න සැළලිහිණියක් චූලනී රජ්ජුරුවන්ගේ යාන බලා ඉඳිනීය, ඕ ඉතා යහපත් එකක, තෙපි වහා ඔබ ගොස් ඇගේ අදහස් පරීක්‍ෂා කොට පියා යහපත ඉඳිමි'යි ගිවිස්සී, තම ඇගෙන් අවකාශයක් ලද්දා, නම් තෙපිත් කැමැත්තාහු තම වහා අවුත් කියව, මම්වත් බිසව්වත් ගොසින් මහපෙරහරින් ගෙණවුත් පාවාදෙන්නෙමි'යි කීයා තොප සමීපයට එවූසේක. මම තොප සරණ බණවා ආමි'යි කීහ. ඉක්බිති කියන්නාහු'' ඉඳින් තෙපි මා කැමැත්තා නම් අපි දෙන්නම සමඟ වාසයෙන් එක්සිත්ව සුවසේ වසම්හ'යි සිත ඇත්ත නොවලහා කියව''යි කීහ;

උන්ගේ බස් අසා සැළලිහිණි ඉතා මහත් සොම්නසට පැමිණ තමා සතුටු බව නොහඟවා නොකැමැත්තියක මෙන් හඟවන්නී–

සුවො'ව සුවිං කාමෙය්‍ය, සාළිකොපන සාළිකං
සුවස්ස සාළිකායච සංවාසො හොති කීදිසො–ති–

මේ ගාථාවෙන් කීහ:–

මෙහි අභිප්‍රායනම්...''ගිරාපණ්ඩිතයෙනි, කුමක්කියව්ද? ගිරවෙක් රක්‍ෂා කෙරේ නම් ගිරාදෙනුවක, සැළලිහිණියෙක් රක්‍ෂාකෙරේ නම් සැළලිහිණි

යක, ගිරවකු විසින් සැළලිහිණියක රක්‍ෂාකිරීම නම් කවර කලෙකවූ විරූ දෙයක්ද? එසේ දෙයක් මා ඇසූ විරූ දූත් නැතැ''යි කිව, ඒ අසා ගිරවාණෝ සිතත්නාහු ''දූරිය බැගැවුම් කියන බව මුත් මා නොකැමැති සැටිය නො වෙ''යි සිතින් ඉතා කැමැත්තීය නොයෙක් පරිද්දෙන් කාරණා ගිවිස්වාගත මැනව'යි සිතා කියත්නාහු.

යං යං කාමී කාමයති, අපිච ණ්ඩාලිකාමපි
සබ්බත්‍ථ සදිසො හොති, නත්‍ථිකාමෙ අසාදිසො

මේ ගාථාවෙන් කියත්නාහු ''එම්බල! යම් ස්ත්‍රියක් යම් පුරුෂයෙක් තෙමේ කැමැත්තේ වීනම් චණ්ඩාල වුවත් උත්තම වුවත් ඇමදෙනම පඤ්ච කාමයෙන් සමයහ, ඒ විෂයෙහි අඩු වැඩියක් නැත. මනුෂ්‍යයන් විෂයෙහි පවා නොයෙක් ජාති වෙන වෙන ඇතත් ප්‍රමාණ නම් කාම වෙනනාවමය''යි අඟවන්නාහු.

අත්‍ථි ජම්බාවතී නාම, මාහාසිවිස්ස රාජිනො
සා හරයී වාසුදෙවස්ස, කණ්හස්ස මහෙසි පියාසී.

මේ ගාථාවෙන් කීහ.

''යටගිය දවස වාරවතී නුවර රජකළ කෘෂ්ණ යන ගොත්‍රයෙහි උපන් දසබෑ රජ්ජුරුවන්ට වැඩිමාලු වාසුදෙව රජ්ජුරුවෝ නුවරින් නික්ම උයන් කෙළියට යන්නාහු චණ්ඩාල ග්‍රාමයෙන් තමාගේ යම් කටයුත්තක් නිසා නුවරට එමින් සිට මගින් ඉවත්ව සිටි අතසී රූ ඇති එක් කුමාරිකාවක් දැක පිළිබඳවූ අදහස් ඇතිව ඇගේ ජාති විචාරා චණ්ඩාලකුලයෙහිය'යි කීවත් බලවත් ප්‍රෙම ඇති බැවින් අස්වාමික බව අසා උයනට නොගොසින් ඇරගෙණ නැවත මාලිගාවට ගොසින් රුවන් රැසක් පිට සිටුවා සොළොස් දහසක් බිසෝවරුන්ට නායකකොට වොටුනු පලඳවා අගමෙහෙසුන් කළහ. ඒ බිසව රජහට සිවිනම් පුතකු වැදූහ. ඒ කුමර පියරජහු ඇවෑමෙන් වාරවතී නුවර රජ කෙළේයයි උදාහරණකොට එබඳු ක්‍ෂත්‍රිය කුලයෙහි උපන් රජ්ජුරුවෝ පවා චණ්ඩාල ස්ත්‍රියක් රක්‍ෂාකළහ. තොපත් අපත් තිරිසනුන් හෙයින් කවර වෙනසෙක්ද? අපට ප්‍රමාද නම් ඔවුනොවුන් කැමැති පමණෙක්මය''යි කියා නැවත අනික් කාරණයක් දක්වන්නාහු:-

රථවතී කිම්පුරිසී, සාපි වච්ඡං අකාමයි
මනුස්සා මිගියා සද්ධිං නත්‍ථි කාමෙ අසාදිසා-යි-

මේ ගාථාවෙන් කීහ.

මේ ගාථාවෙහි අභිප්‍රාය නම් යටගිය දවස එක් බමුණෙක් පඤ්චකාමයෙහි ආදීනව දැක තමාගේ බොහෝ සැපත් හැර හිමාලවනයට වැද තවුස් පැවිද්දෙන් මහණව පන්සලක් කොට වසන්නේය. එතැනට නුදුරු තැනෙක්හි එක් ගල්ගුහාවෙක බොහෝ කිඳුරෝ වසන්නාහ එතැනට නුදුරු තැනෙක මහ මකුළුවකුත් වසන්නේය, ඒ මකුළුවා කිඳුරුලෙන දොර දැලක් බැඳ උදැසන එකකු බැගින් කිඳුරන් ඉස්කඩා ලේ බොන්නේය. කිඳුරෝ

තම් ඉතා දුර්වල සත්වකෙණෙක. ස්වභාවයෙන් බෘතපුල්ලහ. මකුළුවා නම් රථසකක පමණ ඇති මහා විශාල එකෙක, කිඳුරෝ ඔහට කිසිවක් කොට ගතනොහී තාපසයන් සමීපයට ගොස් මිහිරි කථාකොට ආ කටයුතු විචාළ කල්හි “ස්වාමීනි, එක් මකුළුවෙක් අපගේ ජීවිතහරණය කෙරෙයි, නුඹවහන්සේ හැර අනික් පිටිවහලෙක් නැත. ඌ මරා අප ඇම දිවිරැක දී අප සුවපත් කළමැනවැ”යි කීහ. ඒ අසා තපස්වී “අප වැන්නෝත් ප්‍රාණවධ කෙරෙද්ද? මෙතැනින් පහව යා”යි අසුරගසා නෙරපීහ. එවිට කිඳුරෝ සිතන්නාහු “අපගේ රථවතී නම් කින්නරාඞ්ගනාව අස්වාමිකාය, ඈ සරහාලා ගෙණවුත් යාච්ඤා කරම්හ”යි තපස්වී ළඟට ගෙණවුත් මෑ නුඹවහන්සේට පාදපරිචාරිකා වේවා, අපගේ සතුරා මරා වදාළ මැනව’යි කීහ. තාපසයා ඈ කෙරේ පිළිබඳ සිත් ඇතිව ඈ සමග වැස අලුයම් වේලෙහි කිඳුරන්ගේ ලෙනදොර සැඟවී සිට ගොදුරට ආ මකුළුවා මුගුරකින් ගසා ජීවිතක්ෂයට පමුණුවාපිය. ඈ හා සමග වසන තාපස්වියා එහිම දූදරුවන් ලැබ බොහෝ දවස් වැස කාලක්‍රියා කෙළේය. ගිරවාණෝ මේ උදාහරණය ගෙණහැර දක්වා ‘එම්බල, ඒ තාපසයෝ මනුෂ්‍යව සිටි තිරිසන් කින්නරාඞ්ගනාව සමග විසූහ. අපි දෙපක්ෂයම පක්ෂි වම්හ, එබැවින් තොප හා අප හා සරණ මගුලට ප්‍රමාද නම් ඔවු නොවුන් කැමතිවීම ය”යි කීහ.

එවිට සැළලිහිණි ගිරවාණන්ගේ බස් අසා “ස්වාමීනි හැම දවස්ම සිත නම් එකලෙස තිබෙන්නේ නොවෙයි, ප්‍රිය විප්‍රයොගය ඉතා නොකැමැත්තෙමි, හෙවත් නුඹවහන්සේගෙන් මතු වියෝවීමෙක් ඇත; දැන්ම නැවැත්ත මැනව, පසුව වියෝවීම ඉතා නොකමැත්තෙමි”යි කීව. ගිරවාණෝ තමන් ඉතා නුවණැති හෙයින් හා ස්ත්‍රී මායමෙහි දක්ෂහෙයින් තවත් විමසනු පිණිස

හන්දබො’හං ගමිස්සාමි; සාළිකෙ මඤ්ජුභාණිකෙ
පච්චක්ඛානුපදං හෙතං, අතොමඤ්ඤසි නූන මං–යි

මේ ගාථාවෙන් කීහ.

මේ ගාථාව කියා තොප මෙසේම නොකමැතිව කියන හෙයින් අපි යම්හ, මෙතනට මා තනිව අවුත් යාච්ඤාකරණ හෙයින් තෙපි මා නිකම් එකකුයයි සිතුද? මම ඉතා රාජපූජ්‍යයෙමි. මට අඹුවොත් අරුමද? අනිකෙක් සොයාගනිමි. එබැවින් දැන්ම යෙමි’යි කීහ, සැළලිහිණිය, “දැන්මයෙමි කී බස් අසමින්ම ළය පැලීයන තරම් සොකයෙන් පීඩිතවන්නී; ඔහු දුටුවිටම උපන් ස්නෙහයෙන් හා කාමචෙතනාවෙන් සඹාඞගයෙහි දැහ වැදගන්නාසේ වියෝ ගින්නෙන් පැලහෙන්නී, තවත් තමාගේ ස්ත්‍රී මායමෙන් නොකැමැත්තියක මෙන් හඟවා නොයාදී රඳවන්නට උපමා මිශ්‍රකොට කියන්නී,

න සිරි තරමානස්ස, මාඨර සුවපණ්ඩිත,
ඉධෙව තාව අච්ඡස්සු, යාව රාජා න දක්ඛසි
සොස්ස සද්දං මුතිඞ්ගානං, ආනුභාවංච රාජිනො–යි.

මේ ගාථාවෙන් කීවාය:–

මෙහි අඹු නම්-ගිරා පණ්ඩිතයෙනි! යම්සේ සිත ඇත්තක් හඳුනගන්නා එකක්හු ඉක්මන් නොවිය යුතුය. ඉක්මන් නැනැත්තාවූට ශ්‍රීකාන්තා නො මෝම දුරුවන්නීය. එබැවින් අද මෙහිම රඳව, ගෘහවාසය නමුත් බිරින්දක් රක්‍ෂාකිරීම නමුත් ඉතා ඉක්මන්ව බැරිය, ඉක්මන්ව කළ දෙය ඔබින්නේ නොවෙයි, එබැවින් අද රෑ මෙහි රඳව, ඉදින් රාදූතා නම්, අපගේ රජ්ජුරු වන්ගේ මහත්වූ රාජඑෛශ්වය්‍යීය දැක උතුම්වූ රූ ඇති සර්වාභරණයෙන් සැදුනු නාටිකාඞ්ගනාවන් ලිය කිඳුරන් සවර හා සමානව කියන්නාවූ ගීතිකා ඇසුව මැනව, ඔවුන් විසින් වයනලද මෘදඞ්ග නාදයන් අසව, ඉක්මන් නොවී සැබවින් අද රාදූතා නම් වැඩෙක්මුත් අවැඩෙක් නැත්තේය. තොප ගේ යම් බිරින්දක් නැත, ඇති බිරින්ද උකුස්සා ගෙණගියැ'යි කිව. තොප ඉක්මන්වන්නේ ඇයිද? රාදූතා නම් තොපගේ අභිමතාර්‍ථය සිඬවන්නේය''යි බැහැවුම් වශයෙන් රඳන්නා කැමතිවම කිව.

ගිරවානෝ 'තොප මෙසේ කියන පසු රඳා යෙමි'යි කියා රාදූතාහු නොයෙක් අල්ලාපසල්ලාපයෙන් ඈ සිත් ගෙණ එදවස් සවස් වේලේ ලොකා ස්වාදරතියෙහි යෙදී සන්තුෂ්ටව ඔවුනොවුන්ට ප්‍රාණ සමවූහ. ඉක්බිති ගිරා පණ්ඩිතයෝ ''මෙවිට මෝ තමා සිතඇති යම්ම රහසක් මට නොවලහා කියයි. ප්‍රපඤ්ච නොකොට විචාරාගෙණ මෙතැනින්වහා නැගීයෙමි''යි සිතා සැළලිහි ණියැ'යි කීහ, ''කිමෙක්ද ස්වාමීනි'යි කිව. යමක් විචාරන්නා කැමැත්තෙමි කියව්දැ'යි කීහ. යහපත කිවමැනව, අද අපගේ මගුල් දිනය, පසු දවසේ කිව මැනව, ඉදින් මගුලට නිසි දෙයක් වීනම් අද කිව මැනව, අවමගුලක් වීනම් නොකීව මැනවැ'යි කීව. තෝ කුමක් කීයයිද? මීයේ මී වන්කළාසේ මගුල්පිට මගුලෙක මා කියන්නේය'යි කීහ. එසේනම් කිව මැනව''යි සැළ ලිහිණි කිව. ඉදින් අසන්නා කැමැත්තෙහි නම් කියම්''යි කියා කිමෙක්ද? බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ඉතා රූපශ්‍රීන් බබලන්නාවූ තමන්ගේ දුවනියන් තමන් වසඟට හිඳිනා එක්සියයක් රජදරුවන්ට නොදී, සතුරුවූ වෙදෙහ රජ්ජුරුවන්ට කුමක් පිණිස දෙද්දැ''යි කීහ.

සැළලිහිණි ගිරවාණන්ගේ බස් අසා ඉතා නොසතුටුව කියන්නී 'ස්වා මීනි! අපගේ ඊනියා මගුල් දවසේ මෙවැනි අවමගුලක් කුමක් නිසා කීයෙහි දැ'යි කිව. ගිරවානෝ කියන්නාහු ''මම මගුලැ'යි කියම්, තෙපි 'අවමගුලැ'යි කියව, අප දෙන්නාගේ බස් විපරීතවන්නේ කුමක්දැ'යි කීහ. 'ස්වාමීනි මෙසේවූ මගුල් දිනයෙහි කිවමනා දෙයෙක් නොවෙයි, නොකියම්'යි කිව 'සොඳුර' අවශ්‍යයෙන්ම මට කිවමැනව'යි කීහ. ස්වාමීනි! එසේවූ නොඇසිය යුත්තෙක් සමස්ත ලොකයෙහි නැත, එබැවින් කියන්නට නොපිළිවන, නොකි යමැ'යි කිව, 'එසේද, තොප සිත ඇති රහස් මට නොකියනකල තොපගේ හා මාගේ හා සමඟ වාසයෙන් ප්‍රයෝජන කිම්දැ,යි කීහ. සැළලිහිණි එබසට ශොකයෙන් පිරුණු ලය ඇත්තී 'එසේ නොකියෙම් නම් මා ඇරපියා පලා ගියෝනම් නපුරැ'යි සිතා 'එසේවීනම් කියම්, ඇසුව මැනව'යි කියන්නී බ්‍රහ්ම දත්ත රජ්ජුරුවන් හා වෙදෙහ රජ්ජුරුවන් හා දෙන්නාගේ විවාහ මගුලසේවූ මගුලෙක් තොපගේ සතුරන්ටත් නොවේව'යි කිව, ගිරවාණන් ඊට කාරණා කිම්දැයි කී කල්හි එහි තත්‍වය කියම්; ඇසුව මැනවැයි කියන්නී–

නෙදිසෝ තෙ අමිත්තානං, විවාහො හොතු මාඨර!
යථා පඤ්චාලරාජස්ස, වෙදෙහෙන භවිස්සති-යි.

යන්තෙන් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ දුවනියන් සරණ දෙම්හ''යි කියා වෙදෙහ රජ්ජුරුවන් හා මහෞෂධ පණ්ඩිතයන් හා දෙන්නා මායමින් මේ නුවරට ගෙන්වාගෙණ මරන්නාහ, ඉදින් අවුනම් උන්ට මර බාධා නැත. මිත්‍රකමට කරණ දෙයෙක් නොවෙයි, ඒමගුල නිසා වන්නාවූ අභිවෘද්ධියක් නැතැ''යි කීව. නැවත කියන්නී සරණ දෙන්නා තබා දුව ඇසටත් නොපානාහ. ''දෙන්නාම මරා ජයපානය බොන්නෙමු''යි කෙවට්ටයා හා රජ්ජුරුවන් හා දෙන්නා මා උත් ශ්‍රී යහන් ගබඩාවේ හිඳ රහස් මන්ත්‍රණය කොට දූන් කෙවට්ටයා රජු ගිවිස්වා ගෙණෙන්නට ගියේය'යි දෙන්නාගේ රහස් කථා වෙන් මදකුත් නොවරදවාම ගිරා පණ්ඩිතයන්ට කීව.

ඒ අසා 'කෙවට්ටයාගේ නුවණ ඉතා යහපත් නියායය, මේ උපායෙන් රජහු මේ නුවරට ගෙන්වා මරන්නට බැරි නොවෙයි, සිතූ නියා ඉතා යහපතැ'යි කෙවට්ටයාට කයිවාරු කොට 'අපගේ මේ නිසා මගුලේ අවමගුලක් කීමෙන් ප්‍රයෝජන කිම්ද? ඒ නොකිය'යි කියා නවතා, තමන් ආ කම් සැප යුතු බව දූත ඒ රාත්‍රියෙහි ඈ හා සමඟ දවස් යවා පාන්වූ කල්හි ''සොඳුර! මම සිවිරට ගොසින් 'මා සිත් වත් බිරින්දක් ලදිමි' මාගේ රජ්ජුරුවන්ට කියන්ට යෙමි. මට සත්දවසකට සමුදෙව, අටවෙනි දවස මහපෙරහරින් එන්නෙමි. මා එනතෙක් නෙපි මා කෙරේ ශොකයෙන් නොකා නොබී වැහැර නොගොස් උකටලී නොව සුවසේ ඉඳුව''යි කීහ. සැළලිහිණිය හිරවාණන් වියෝ දුක් ඉවසිය නොහී සමතන්ට උත්තර කීමෙහි අසමර්ථව යහපත සද්දව සකට අවකාශදෙමි, අටවැනිදා නායෙහිතම් ඒකාන්තයෙන්ම මා මළතැනට තුඹ එන්නෙහිය. සැබවින් මා කැමතහොත් සත්දවස ඇතුළත අවමැනව'යි කීව සොඳුර! කුමක් කියව්ද ඉදින් අටවැනිදා නොප නුදුටිම්තම් මාගේ ජීවිතයතමා ඇද්ද? දූරි ඇති අඹුව නොකලේ මියශාමත් හා අලුත් අඹුවන් රක්ෂාකළ සද් දවසකින් මළකළ මාගේ ලය ශලෙක්ද? නෙපි මා එන ගමන සැක නොකර ව'යි කියා සිතින් සිතන්නාවූ නෝ මියේවා රුකේවා' නීගෙන් මට ප්‍රයෝජන කිම්ද'යි මැදිරියෙන් නික්ම සිවිරටදිශාවට මුහුණලා මදක්හැන් ගොසින් නැවත මියුලුනුවරට ගොස් බොධිසත්ත්වයන් වහන්සේගේ උරයට බටහ. මහතානෝ මතුමහල්තලයට වඩාගෙණ විචාළ කල්හි සැළලිහිණිය කී කළ දෑ මූළුල්ල ආද්‍යන්ත නොවරදවාම කීහ, බොධිසත්ත්වයන්වහන්සේ මී හා විළඳ කවා මීපැන් පොවා ශතපාක සහස්‍රපාක තෙලින් දෙපියා අතර මැඩ කකුල් සන්ධි මිරිකා ඉතා සැපවූ රන් මැදිරියේ සැතැප්පූසේක, ඒ බව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන් වහන්සේ-

තතො ච බො සො ගන්ත්වාන මාඨරො සුවපණ්ඩිතො
මහොසධස්ස අක්ඛාසි, සාලියා වචනං ඉදං-යි-

මේ ගාථාවෙන් වදාරණසේක්-'එම්බා මහණෙනි! ඒ ගිරාතෙමේ සැළලිහිණියගෙන් රහස් කථා ගෙණවුත් මහෞෂධ පණ්ඩිතයන්ට කීයේවේදැ''යි වදාළසේක.

ගිරවානන්ගෙන් බස් අසා අනතුරුව බොධිසත්ත්වයන්වහන්සේ සිතන සේක් මේ රජ්ජුරුවෝ මා නොකැමැති කරවා ගොසින් මහා විනාශයට පැමිණෙන් නාහ. මෙවැනි යශෝදයකවූ රජ්ජුරුවන්ගේ බස් සිතනබා ඒ බව දූත පිටිව හල් නුවූන''යි දත්කෙණෙක් නින්ද කෙරෙති, මා වැනි පණ්ඩිතයකු ජීවත්ව ඉන්දදී මේ රජ කුමක් පිණිස නස්නේද, රජහට පළමුව ගොස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් දූක වෛදෙහ රජ්ජුරුවන්ට යහපත් නුවරක් කරවාලා ගව්වක් පමණ සුළු උමගක් හා දෙගව්වක් පමණ මහ උමගක් කරවාලා චූලනී රජ්ජුරුවන්ගේ දූවතියන් අපගේ රජ්ජුරුවන්ට අභිෂෙක කරවා දී, එක්සියයක් රජදරුවන් හා අටළොස් අක්ෂෞහිණියක් පමණ මහා සේනාව අප උත් නුවර වටලාගෙණ සිටියදී අපගේ රජ්ජුරුවන් රාහුමුඛයට වන් සඳමඬලක් පරිද්දෙන් ගලවාගෙණ එන ගමන මට භාරවන්නේය'යි සිතූසේක. මෙසේ සිතන්නාහු සවාමිදරුවානන්නේ ශරීරයෙහි පස්වණක් ප්‍රීති උපන්නේය. ප්‍රීති වේගයෙන් උදන් අනනසේක් ''යම් පුරුෂයෙක් යම් රජෙක්හුගෙන් සියලු සම්පත් ලදින් කිසිවකිනුත් අනූනව මහා ආඪ්‍යව වෙසේනම්, එසේවූ ප්‍රඥාසම්පන්න පුරුෂයා විසින් කාය වාග් මනඃ යන චාරිත්‍රයෙන්ම ඒ රජහට වැඩෙහි හැසිරිය යුතුය. ඔවුන්ගේ ආපදාවක් දුටු කල්හි ඉන් මුදාලන්නට ශක්ති ඇතිවත් ඊට පිටිවහල්නොවී නම් මිත්‍රද්‍රෝහියාය, එබැවින් රජහු නුවණ නැතිව නොදූන කියාපු යම්තම් බස් පමණක් සිත තබාගැන්ම මට තරම් නොවේ''යි සිතා සොළොස් කළසක් සුවඳ පැනින් ඉස් සෝධා නහා සම්භාරණයෙන් සැරහී මහ පෙරහරින් රජගෙට ගොස්, රජහු වැඳ එකත්පස්ව සිට ''කිමෙක්ද? මහරජ උත්තර පඤ්චාල දෙශයට යනසේක්මදැ''යි විචාළසේක.

''එසේය පුත යෙමි, පඤ්චාලචණ්ඩි කුමාරිකාව නොලබන්නාවූ මට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්ද? තෙපිත් මා අත්නොහැර කැටිව එව, ඔබ යාමෙන් වැඩදෙකෙක් වන්නේය. ස්ත්‍රීරත්නයත් ලබමි, රජ්ජුරුවන් හා නෑවීමෙන් ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රිසිතත් පිහිටන්නේය'යි කීහ. ඉක්බිති රජ්ජුරුවන් වහන්සේට පණ්ඩිතයෝ කියන්නාහු ''මහරජ, එසේවීනම් මම පළමුකොට ගොස් තුඹවහන්සේ හිඳිනා මාලිගා ආදි ගෙවල් තනවාලා යම් දවසෙක කියා එවීම් නම් එදා වැඩිය මැනවැ''යි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ ඒකාන්තයෙන් දරුවන් මා අත්නොහරණා සැපිය'යි ඉතා සතුටුවූ සිත් ඇතිව 'පුත! තොප පළමු යන්නවුන්ට කුමක් ලදමනාදැ'යි කීහ. 'බල වාහන ලද මැනවැ'යි කීහ. යම් පමණක් කැමැත්තානම් එපමණක් ගෙණ යව'යි කීහ. ඒ මහතානන්වහන්සේ ''සිරගෙවල රැකවල් ලා සිටිනා බල සම්පන්න යොධයන් මා හා කැටිව එව්ව මැනැවැ''යි වදාළසේක රජ්ජුරුවෝ කියන්නා ''මට කියන්නේ කිම්ද තොප කැමැත්තක් කරව''යි කීහ. ඒ මහතානෝ සිරගෙවල දොර හරවා ගිය ගිය තැන සිතූ සිතූ අභියක් සාදා දෙන් නව බල ඇති සූර වීර යොධයන් යදම් බිඳුවා පිටත්කරවාගෙණ, මට සේවය කරව'යි ප්‍රසාද දෙවා වඩු කම්බුරු සොම්මර චිත්‍රාකාරාදීවූ නොයෙක් කර්මාන්තයෙහි දක්ෂවූවන් අටළොස් කුලයක් හා වෑ පොරෝ උදලු යතුල් ආදීවූ වුවමනා බොහෝ උපකරණ භාණ්ඩ ගෙන්වාගෙණ මහ සේනාව පිරිවරා නික්මුණුසේක. බොධිසත්ත්වයන් වහන්සේ නික්මුණු නියාව ප්‍රකාශ කොට වදාරණ බුදුරජානන්වහන්සේ,

තතො ච පායාසි පුරෙ මහොසධො
පඤ්චාල රාජස්ස පුරං සුරම්මං
නිවෙසනානි මාපෙතුං, වෙදෙහස්ස යසස්සිනොති.

මේ ගාථාවෙන් වදාරණසේක් ''එම්බා මහණෙනි! ඒ මහෞෂධ පණ්ඩිත යෝ වෛදෙහ රජහට පළමු ගොස් නුවර හා ගෙවල් කරණ පිණිස බල වාහන ගෙණ නික්මුණෝවේදැ''යි වදාළසේක. බොධිසත්ත්වයන්වහන්සේ වඩ නාසේක් සතර ගව්වෙන් සතර ගව්වට එකී එකී ගමක් බැගින් ගම් කරවා ගමකට ඇමැත්තකු බැගින් සිටුවා මෙසේ විධානකරණසේක් 'තෙපි අපගේ රජ්ජුරුවන් පඤ්චාලචණ්ඩි කුමාරිකාවන් ඇරගෙණ එනකල, ඇත් අස් රථ ආදිවූ වාහන සරසා කැටිව අා දුර්වල වාහන රඳවාගෙණ තොපගේ වාහන වලට නංවා සතුරන්ට අසුවිය නොදී වහා මියුලු නුවරට යවා ලව'යි වදාළසේක.

මෙසේ මාර්ගසංවිධානයෙන් ගොස් ගංතෙරට පැමිණ ආනන්ද කුමාර යයි යන එකක්හු කැඳවා ''තෙපි තුන්සියයක් පමණ නැව් වඩුවන් ඇරගෙණ උඩු ගං බලා ගොස් හර ඇති දඬු කප්පවා තුන්සියයක් නැව් කරවා මාළිගා වාසල් දොරටු අට්ටාල ගෙවල් ආදිය කරවා ගන්නා ලෙස දාරු සම්භාර ඔබදීම ලඝු කොට සස්වා නැව් තුන්සියය පුරාගෙණ එව'යි විධාන කොට යවා තමන්වහන්සේ ගඟින් එතරව බැස පියවරසතින් ගණනසේක් ''මේ දෙගව් වක් පමණ තැන මහ උමඟවන්නේය. ඒ ඉක්බිති මෙතැන්හි අපගේ රජ්ජු රුවන් හිඳිනා නුවර වන්නේය. නැවත මෙතැන් පටන් රජගෙය දක්වා මේ ගව්වක් පමණ තැන සුළු උමඟ වන්නේය'යි සවකීය ප්‍රඥාවෙන්ම නියම දැන මහ පෙරහරින් නුවරට වන්සේක.

බොධිසත්ත්වයන් වහන්සේ එන නියාව චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ අසා 'මෙවිට මාගේ මනදොළ පිරෙන්නේය. එකාන්තයෙන්ම මාගේ සතුරන් පිටිදක්නෙමි, මහෞෂධයා ආකල වෛදෙහයාත් නොබෝ කලකින් එන් නේය, මෙවිට දෙන්නාම මරා ජයපානය බී සියලු දඹදිව එක්සත් කොට රජකරන්නෙමි'යි ඔදවැඩි සතුටුව ගියාහ. ජන නෙත්‍ර රසාඞ්ජනවූ ස්වාමි දරුවානන් නුවරට වදුත්ම අයම් විතරින් අටසාළිස් ගව්වක් පමණ ඇති ඒසා මහත් නුවර වාසී මනුෂ්‍යයෝ එකහෙලා ''මහෞෂධ පණ්ඩිතයෝ නම් මූල, එක්සියයක් රජුන් හා අටළොස් අක්ෂෞහිණියක් සේනාව කැටක් දමා කපුටු රැසක් නෙරපණාසේ ඉස්ලූලූ අත ලුහුබඳවාපුවෝ නම් මේ මහතානෝය. එදවස් සඳරැස්වන් කිරිමුහුදසේ ක්ෂොභව ගියේය.

මෙසේ ඒ නුවර වාසීන් තමන්වහන්සේගේ රූප දර්ශනයෙන් සන්තො ෂව බල බලා සියවිදීම රජගෙදරට ගොස් අා නියාව කියා යවා 'එන්නට කියව'යි කී කල්හි රජගෙට වැද රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටිසේක. එවිට රජ්ජුරුවෝ මියුරු කථාකොට 'පුත' රජ්ජුරුවෝ කවදා එද්දැ'යි කීහ. මා කියා යැවූ කලැය'යි වදාළසේක, ''තෙපි පළමු කුමක් පිණිස අවුදැ''යි කීහ. දෙවයන්වහන්ස! අපගේ රජ්ජුරුවන්ට මඟුලට මාළිගා නංවන්ට ආමි'යි

වදාළසේක. 'යහපතැ'යි කියා බෝධිසත්ත්වයන්වහන්සේ හා කැටිව ආ සෙනාවට බත්වියදම් දෙවා මහතාතන්ට මහත් සත්කාරකොට ඉදිනට යහපත් මාලිගාවක් දී 'පුත රජ්ජුරුවන් එනතෙක් උකටලී නොව අපටත් කළමනා දෙය කරවාලා සුවසේ ඉඳුව'යි කීහ. ඔබත් රජගෙට නැගෙනසේක්ම මතු මාලට නැගෙන හිණිපාමුල සිට මෙතැන්හි සුළුඋමඟ දෙරකඩය'යි සිතූසේක. නැවත ඔබට මෙසේවූ අදහසෙක් වූයේය. මේ රජ්ජුරුවෝ 'අපටත් කළමනා දෙය කරවා ලව'යි තුමූම කීහ. එබැවින් උමඟ කරණ කල මේ කිණ නොවැටෙන ලෙසක් කෙරෙමි''යි සිතා නැවත රජ්ජුරුවන්ට වදාරණසේක් ''මහරජ! මාලිගාවට නැගෙන්නෙම් හිණි පාමුල සිට මාලිගාවේ නව කර්මාන්ත බැලීමි. සෙසු මා දුටු තපුරෙක් නැත. නැගෙන හිණ යම්තම් වරදෙක් ඇත, කැමැති සේක් නම් ඊට තරම් දඹුපත් ලදිම් නම් නිකම් වඩුවකු තබා විශ්වකර්මයාත් 'තපුරැ'යි නොකියන ලෙස කරවාලම්'යි වදාළසේක. ''යහපත තොප කැමති ලෙස කරවාලව''යි දරුසම්භාර දෙවූහ. ඒ මහතාණෝ 'උමඟ දෙර මෙතැන වියයුතුය'යි සිතා ඉඳුරා සලකාගෙණ පරණ හිණ හරවා යම් තැනක උමඟ දෙර වේද, එතැන පස් නොවැගිරෙණ පරිද්දෙන් පෝරු අතුරුවා නිශ්චල කොට හිණ සිටුවාලූසේක. රජ්ජුරුවෝ මේ අන්තරාය නොදන්නාහු තමා කෙරේ ඉත සිතින්ම කෙරෙති'යි සිතූහ. ඒ පරණ හිණ ඔබ දුටු වරද නම් යටින් උමඟ බිඳින කල හිණ හිති නම් තපුරැ'යි යන මෙපමණෙක්මය.

මෙසේ එදවස් නව කර්මාන්තයෙන් දවස් යවා දෙවන දවස් රජ්ජුරුවන්ට කියනසේක් ''දෙවයන්වහන්ස! ඉදින් එක් නිලයක් ලදුමෝ නම් අපගේ රජ්ජුරුවන් හිඳිනා පරිද්දෙන් යහපත් කොට මාලිගා ආදිවූ ගෙවල් තංවාලන්නමෝ වේදැ''යි වදාළසේක යහපත පුත! මාගේ මාලිගාව හැර මේ නුවරින් යම් ගෙයක් කැමැත්තෙහි නම් ගණුව''යි කීහ. මහරජ! අප ආගන්තුකයම්හ, ඔබවහන්සේගේ බොහෝ වල්ලභයෝය, ඔව්හු තමන් තමන්ගේ ගෙවල් ගන්නාකල අප හා කලහ කරන්නාහ. උන්ට අපි කුමක් කරමුදැ''යි වදාළසේක. පණ්ඩිතයෙනි! තෙපි උන්ගේ බස් නොගිවිස තොප කැමති ගෙයක්ම ගන්ව'යි කීහ. ''දෙවයන්වහන්ස! ඔව්හු නැවත නැවතත් අවුත් ඔබවහන්සේට කියන්නාහුය, එයින් ඔබගේ සිතට සැපයෙක් නොවන්නේය, ඉදින් නුඹවහන්සේ කැමතිසේක් නම් අප ගෙය තිලකොට ගන්නාතෙක්ම අපගෙන්ම දෙරකඩ රැකවල් වීනම් කියන්නට ආවාහු වැද්ද නොදෙන්නාහු පලා යන්නාහ. එසේකල අපටත් නුඹවහන්සේගේ සිතටත් දෙම්නසෙක් නැත්තේය''යි වදාළසේක. රජ්ජුරුවෝත් ''ඉතා යහපත තොපගෙන්ම රැකවල් ලවාගන්ව''යි කීහ, බෝධිසත්ත්වයන්වහන්සේද හිණි ඉසය රජගෙයි දෙරකඩය යනමේ හැමතන්හිම රජගෙට කාත් වැද්ද නොදෙවයි තමන්වහන්සේගෙන්ම රැකවල් ලැවූසේක. පළමුකොට ගොස් ''රජ්ජුරුවන්ගේ මැතියන් තලතා දේවීන්ගෙ ගෙය බිඳුව''යි නියොග කළ සේක. ගියාවූ පුරුෂයෝ දෙරටුයෙහි පටන්' හික්ති පදනම ඇතුළුව උළු සුණු මැටි ආදීවූ දෙය බිඳහරණට පටන්ගත්හ. රාජමාතාවෝ එපවත් අසා වහ වහා ගෙන් අවුත් 'කොල! අපගේගෙය බිඳුනෝ කවුරුදැ'යි කීහ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ ගෙය බිඳුවා තමන්වහන්සේගේ රජ්ජුරුවන්ට මාලිගා තංවතසේකැ'යි කීහ. 'ඈයි දරුවෙනි! මේ ගෙයි හුන්කල කිම්දැ'යි කීහ. අපගේ

රජ්ජුරුවන්ගේ බොහෝ සේනාව හෙයින් මේ ගෙය ඉතා කුඩාය, "මහත් කොට මාලිගා කරවන්ටය'යි කීහ. එබසට බිසව් කිපී "කොල! තෙපි මා රජ්ජුරුවන්ගේ මැතියන් බව නොදන්නුද? දූත් මපුතනුවන්ට කියාලා තොපට කියවිදන්නෙම් වේදැයි කීහ. නුඹවහන්සේ කුමක් දෙඩන සේක්ද? අප රජ්ජුරුවන්ගේ බසින් බිඳුම්හ, ශක්ති ඇතිදැ වීනම් නවතා ගන්නාහ"යි කීහ. තොපට කියටි දෙන්නෙමි"යි කිපී රජගෙට කියන්නට ගියහ. දොරකඩ සිටි රැකවල්ලු 'නොවදුව'යි කියා නැවතූහ. "කුමක් කියව්ද? මම රජ්ජුරුවන්ගේ මැතියෙමි, මට පෙර රැකවලෙක් නැත, මා යා දෙව"යි කීහ. 'කාත් වැද්ද නොදෙව' තොපගේ රජ්ජුරුවන් විසින්ම කියනලද, තෝ මෙතන නො සිට පලායා"යි කීහ. බිසව් කිසිවක් කියන්නට නොපොහොසත්ව තමන්ගේ ගේ බිඳුනා බල බලා සිටියාහ. එසේ සිටියවුන් එකෙක් නැගී සිට මෙතැනින් යෙයිද? නොයෙයිදැ'යි බොටුව අල්වාගෙණ තරවා දමාලිය. ඒ මැහැලිවහන්සේ මුහුණින් හිපියා දුකසේ නැගී සිට සිතන්දැ "එකාන්තයෙන් රජ්ජුරුවන් කීයේ සැබෑ සැටිය, ඉන් මිසක් මට මෙසේ කරන්නට සමර්ථ එකෙක් ඇද්ද, පණ්ඩිතයන් සමීපයට යෙමි"යි සිතා ගොස් "පුත මහෞෂධ පණ්ඩිතයෙනි! මාගේ ගෙය කුමක් නිසා බිඳුවාදැ"යි කීහ. ඔබ උන් හා කැටිව එක බසකුත් නොකියා නොඇසූ කන්ව ඒ දිසාව නොබලා සිටිසේක. ළඟ සිටි පුරුෂයෝ "දෙවීන්දැ කියන්නේ කිම්දැ"යි කීහ. "දරුවෙනි, පණ්ඩිතයෝ මාගේ ගෙය කුමට බිඳුවද්දැ"යි කීහ. වෛදෙහරජ්ජුරුවන්ට මාලිගාකර වන්නාටය'යි කීහ. ඇයි දරුවෙනි, මේසා නුවර අතික් ගෙයක් නොලැබෙයි සිතව්ද? මාගේ මේ මසු ලක්‍ෂය ගෙණ අතික් තැනකින් ගෙයක් ගෙණ මාලිගා කරව"යි කීහ. ඒ එන්නා නුඹගේ මේ ලක්‍ෂය ඇරගෙණ ගෙය අරවාපියම්හ මෙනුවර අපොහොසත් කෙණකුත් මදවුව එසේහෙයින් අතික් ගෙයක් අල්වා ගත් කල උයින් අත්ලස් දෙන්නටම සිතති, එසේකල ගත් ගෙවල් අය් ලසටම අරණකල අප ගෙවල් ලබන්නේත් මාලිගා තනන්නේත් කෙසේද? වන්නාවය, නුඹවහන්සේ මෙසේම අඩා දෙඩා යාවකදුකොට අත්ලස්දී ගෙය අරවාගත් නියාව ඔබ්බට නොකියතොත් හැරපියම්හ"යි කීහ, "දරුවෙනි, කුමක් කියව්ද? රජ්ජුරුවන් මැතියෝ පවා අත්ලස්දී ගෙය හරවාගත්හ"යි කීකල මටත් ලජ්ජාවන්නේය, එබැවින් මා පණ තබා කාටත් නොකියන් නෙමි කීහ. ඔහු යහපතැ' බිසවුන් දුන් මසු ලක්‍ෂය ඇරගෙණ ගෙය බිස වුන්ටම අළහ. වැලිත් ඒ මසුරන් ලක්‍ෂය තම දූන් මේසමයෙහිදු තඹ ආදී පස් ලොයින් ගැසූ රතෙක් නොවන්නේය. ඒ රතට 'නීලකාෂීපණය'යි කියති ඉන් සතර අකෙක් මාෂ රත්තය සතර අකෙක් පස්ලෝය, එබැවින් ඒ බිසවුන් දුන් මසුරන් ලක්‍ෂයෙන් පණස් දෑසෙක් මාෂ රත්රතැ'යි දතයුතු.

ඒ ගෙය හැර එතැනින් ගොස් කෙවට්ටයාගේ ගේ බාගෙන පලමුපරිද් දෙන් දොරටුයෙහි පටන් බිඳිනට වන්හ. ඒ බමුණු පැත නැගී "ගොවියා පුත් තමාගේ නුවරදී එක්සියයක් රජදරුවන් හා සේනාව බල බලා සිටියදීම තමාට සතුරුව ගිය මෙනෙක් දෙනාගෙන් මාගේම බොටුව අල්ලාගෙණ බිම උලා තලළ මූණ ආදීවූ තැන් ලේ මඬුලු කොටපියා දූන් කබරව දැ ගියා සේ ලජ්ජාවට පමුණුවාපීය, නැවත විවාමගුල කියා ගියාවූ මා තමන්ගේ ගෙයිදී නතිකොට ගෙණ තමාගේ බලසම්පන්න පුරුෂයෙක් ලවා උණ පත්තෙන් මරවා පිටිකර ගස්වා මා නොමිය නියාවක් කොටපීය, ඒ මදින්ගේ දූන් මීට

අවුත් මේසා නුවරින් මාගේ ගෙය බිඳුවා මා උන්තැතින් නෙරණ මාන සො රෙයි, වන්නාටය, උගේ රජු නාවත් දෙන්නාටම කලමනා දෙය මූටකරවමි''යි තරව කිපී රජහට කියන්නට රජගෙයි දොරට අයේය, රැකවල සිටියාහු බමුණු මාල්ල! මැනතෝ'යි කියව කියවා තමාවල්ලහකමට, දොරකඩට ගියෝය. රැකවලුන් කොල නිකෘෂ්ට ගුණ ඇති දුෂ්ටවූ බමුණ! මැන තෝයි කියව කියවා එයිද්‍ද'යි එකෙක් නැගී සිට ගසන්නේ තමා පසගිල්ල බමුණා පිටිකර පෙණෙන පරිද්දෙන් ගසාගඩු නගාපිත. ඒ පාර ලදින් තුෂ්ණිම්භූතව ඉගි කරුව කකිය කකියා අතික් උත්තරයක් කියන්නට අසමර්ථව දියයුත්තක් නොදන්නේ මසු ලක්‍ෂයක් දී ගෙය අරවාගත. මේ උපායෙන් එදවස් සවස් වන දෑතුරේ සියලු නුවර ගෙවල් බිඳුවා නැවත හරණට ගත් අක්ලස් රන් එක් කොට නව කෝටියෙක් වන්නේය ඒ නව කෝටියෙන් සතරකොටි පණස් ලක්‍ෂයක් මාඝරනැයි දතයුතු.

නැවත බොධිසත්වයන්වහන්සේ නුවර මුළුල්ලෙහි ඇවිද රජගෙට වැඩි සේක. රජ්ජුරුවෝ 'පණ්ඩිතයෙනි! වසන තැනක් ලද්දැයි විචාළහ. ''මහරජ' නොදෙන කෙණෙක් නම් නැත. එසේවුවත් බොහෝ දවසක් වැදහුත් ගෙවල් ගන්නා කල මහත් දොම්නසින් කම්පිත වන්නාහ; උන් උන්ට ප්‍රිය විප්‍රයොග කිරීම අපට තරම් නොවෙයි, මේ නුවරින් පිටත ගංගාවටත් නුවරටත් මැද ගව්වක් පමණ මෙතම් තැන බිම අවකාශයෙක් ඇත, එතැන අපගේ රජ්ජුරු වන්ට ගෙවල් මාලිගා නගම්හ'යි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු ඇතුළු නුවරදී සටන් කරණකල සතුරන් දත නොහැක්කා, පිටතදීවීනම් වටලා ගෙණ සුවසේ සතුරන් මරා ජයගතහැක්කැ''යි සිතා සොම්නස්ව යහපත පුත! තොප සැලකූ තැනම නිලකරව''යි කීහ. මහරජ! අපි වන්නා ඒ සියල්ල කරම්හ. නුඹවහන්සේගේ මිනිසුන් ඒ දසාවට දර පලා ආදී යම් කිසිවක් පිණිස අපගේ නව කම්ාන්ත භූමියට නොයායුතුය' ගිය කෙණෙක් යම්සේ කලහයක් කෙරෙත්මය, එවේලෙහි නුඹවහන්සේගේ හා අපගේ සිතට සැප යෙක් නැත්තේය'යි වදාළසේක. ''යහපත පුත, මෑතින් ඒ දසාවට යන මිනි සුන්ගේ ගමන් නවතාලම්''යි කීහ දෙවයන්වහන්ස! අපගේ ඇත්තු දියකෙළි යට රුස්වන්නාහ, එක්වන්දියෙහිම කෙළනාහ. පැන් මඩවූකල 'මහෞෂධ පණ්ඩිතයන් ආවාක් පටන් පහන් පැනක් බී පියන්නට නොලබම්හ'යි නුවර වාසීහු කිපෙන්නම් එයින් ඉවසුව මැනවැ'යි වදාළසේක. පුතා තොපගේ ඇත්තු සුවසේ ගිම නිවා දිය කෙළින්ව'යි කියා නැවත රජ්ජුරුවෝ මහෞෂධ යන්ගේ නව කම්ාන්ත භූමියට මේ නුවරින් යම් කෙණෙක් ගියාහු නම් දහසක් දඩය''යි නුවර බෙර ලැවූහ.

බොධිසත්වයන්වහන්සේ රජහු වැඳ තමන්වහන්සේගේ පිරිවර හා සමග නුවරින් නික්ම තමන් විසින් නියමකරගත් තැන නුවර කරවන පිණිස ගොසින් ගහින් එතර 'ගඟුල්ගමුවය'යි ගමක් කරවා ඇත් අස් රථ ආදීවූ වාහනද ගෙරිසරක්ද එහි රඳවා නුවර කම්ාන්තයට විධාන කරණසේක් ''මෙතෙක් දෙන මේ මේ කරව මෙතෙක් දෙන මේ මේ කරව'යි කම්ාන්ත බෙදා උමග කම්ාන්තයට පටන්ගත් සේක. මහඋමග දොරකඩ ගංගායෙහි අසවිය. බලසම්පන්න දසදහසක් පමණ යෝධයෝ මහ උමග කනන්නාහ. මහත්වූ සම්පයිවලින් පස් පුරාගෙණවුත් ගඟදියෙහි ලන්නාහ, ලූලූ පස්

මූළුල්ල ඇත්තු මඩනාහ. එබැවින් ගඟ පැන් කැලඹී මඩවන්නේය. නුවර වාසීහු “මහෞෂධ පණ්ඩිතයන් ආවක් පවත් පහන් පැනක් බීපියන්නටත් නොලැබම්හ. ගඟ පැන් කැලඹී මඩවන්නේය, මීට කාරණා කවරේදැ’යි කියන්නාහු ඔවුන්ට මහනාතන්ගේ අනුචරයෝ “මහෞෂධ පණ්ඩිතයන්ගේ ඇත්තු දියකෙළනාහ, ඉන් ගඟපැන් මඩවන්නේය, මැඩ මැඩ මඩ මතුකරන්නාහ”යි කියහ, එබැවින් සැක නොකරන්නාහ.

(බොධිසත්වයන්ගේ අභිප්‍රාය නම් සිඩවන්නේය එසේහෙයින්) ඒ උමඟ ගලෙක්වත් මුලෙක්වත් නැතිව බිම්ගිලි අත්තඬාන විය. සුලු උමඟ දොරකඩ උපකාර නුවර වූයේය, සත්සියයක් පමණ යොධයෝ ඒ උමඟ කනන්නාහ. සම්පයිවලින් පස් ගෙණවුත් නුවර ලන්නාහ. ලූලූ පස් පැනින් මිරිකා අනා පවුරු බඳනාහ· ගෙවල් මැටි ආදී කර්මාන්ත හෝ කරන්නාහ. මහ උමඟට වදනා දොරකඩ එම නුවර වූයේය, උමඟ වනාහි අටළොස් රියන් උස ඇති යන්ත්‍රයෙන් යුක්ත දොරවලින් ගැවසී ගන්නේය. ඒ උමඟ මූළුල්ල එක ඇතයක් මිරිකා ලන්නා සියලු දොරවල් පිහී යන්නේය. අනික් ඇතයක් මිරිකා ලන්නා ඇරියන්නේය. ඒ උමඟ දෙපාර්ශ්වය උළින් බඳවා සුණු කර්මාන්ත කරවූසේක. මුදුනේ වියත් පෝරු අතුරුවා සකලා ගාවා මකුලෙත් අති ධවලව කරවූසේක, ඒ මහ උමඟ අසූ මහදොරක් හා සූසැටක් සුලු දොර වූයේය, ඒ මූළුල්ල යන්ත්‍රයෙන් යුක්ත වූයේය. ඒ උමඟ දෙපාර්ශ්වයෙහි නොයෙක් සිය දහස් ගණන් පාන් ගබඩාත් වූයේය. එයින් යන්ත්‍රයෙන් යුක්ත අගුලුම වූයේය, තවද උමඟ දෙපාර්ශ්වයෙහි එක්සියයක් රජ දරුවන්ට එක්සියයක් ශ්‍රී යහන් ගබඩාත් වූයේය. එයින් යන්ත්‍රයෙන් යුක්ත අගුලුම වූයේය. එකි එකී ගබඩායෙක්හි නොයෙක් පැයෙන් යුක්තවූ කොඳු පලස් ආදියෙන් අතුට සරහා තබතලද සැතපෙන මහ යානකුත් ඇත්තේය. තගතලද ධවලච්ඡත්‍ර ඇති එසේ සරහන ලද එකී එකී සිංහාසනයකුත් ඇත්තේය. ශ්‍රී යහන් ගබඩාවල මහ යහන් ලඟ උතුම් රූ ඇති දිව්‍යප්සරාවන් බඳු සර්වාභරණයෙන් සරහා සිටුවනලද පෙතැලි රූත් ඇත්තේය, ඒ පෙතැලි රූ නොදන්නවුන් අතින් පිරිමැදමුත් ඒ ‘අජීවය’යි නොදත හැක්කේය. තවද ඒ උමඟට දෙපාර්ශ්වයෙහි දක්ෂවූ චිත්‍රකාරයන් ලවා අති මනෝහරවූ සිත්තම් කරවන ලද්දේය ඒ සිත්කම් කවරේද? යත් ශක්‍ර විලාසය, මහමෙරු පර්වතය, සතරමහා සමුද්‍රය, සතර මහාද්වීපය, හිමාලය පර්වතය අනවතප්තවිලය, සිරිඹයල් අතලය, චන්ද්‍රබිම්බය, සූර්‍ය්‍යබිම්බය, චාතුර්මහාරාජිකාදි කාමාවචර සදිව්‍යලොකය, ෂොඩෂවිධ බ්‍රහ්මලොකය යනාදි ලොව විද්‍යමාන ආශ්චර්‍ය්‍යවත් දෙයන් උමඟ සිත්තම් කරවාලූසේක. එහි බිම බලා එල්වන සමානවූ සුදු වැලි ඉස්වා ඒ උඩුවියන තටු උඩ බලා කෙම්. බිම බලා එල්වන ලද සුපුෂ්පිතවූ පද්ම වනයක් පරිද්දෙන් අඳවාලූසේක. උමඟ දෙපාර්ශ්වයෙහි නොයෙක් බඩුපුරා තිබෙන සල්පිලින් සැදවූසේක. ඒ උමඟ ඒ ඒ ස්ථානයෙහි ගන්ධදුම පුෂ්පදුමයන් එල්වූසේක. ඒ උමඟ සුධර්මා නම් දිව්‍යසභාවසේ ඉතා අලංකාර විය.

පළමු යැවූ ආනන්ද නම් අමාත්‍යයා තුන්සියයක් වඩුවන් ලවා සැස නිමවන ලද දාරුසම්භාර නැව් තුන්සියයක් පුරා ගඟින් ගෙණවුත් බොධිසත්වයන් වහන්සේට කීය. බොධිසත්වයන් වහන්සේ දඹුපත් නුවරට බාගෙණ ‘තෙල

නැව් සඟවා තබා මා කියන දවසක ගෙණෙව'යි නික්මෙණ තොටි උඩු ගඟින් නුදුරුතැනෙක්හි සඟවා තැබ්බවූසේක. නැවත ඒ නුවර 'පැන් අගලය කලල් අගලය වියලි අගලය'යි අගල් තුණකුත් කැනවූසේක. තවද ඒ නුවරට අටළොස් රියන් උස පවුරුද පවුරට තරම් පදනමද වාසල් අට්ටාල බලකොටු කුරුබිලි ආදියද, රජගෙය ආදීවූ නොයෙක් ගෙවල් සමූහද, ඇත්හල් අස්හල් පැන් පොකුණු ආදියද, යන මේ සියල්ල නිමාවට පැමිණවූයේය. සුලු-මහ උමඟය ඒ සා මහත් බිම පිස කරවූ නුවරය යන මේ සියල්ල සාරමසකින් නිමවා ඉක්බිති බොධිසත්වයන්වහන්සේ රජ්ජුරුවන් කැඳවා දූතයන් යවූසේක. ඒ බව ප්‍රකාශකොට වදාරණ බුදුරජාතන් වහන්සේ:-

නිවෙසනානි මාපෙත්වා, වෙදෙහස්ස යසස්සිනො
අථස්ස පහිණි දූතං,
එහි දානි මහාරාජ! මාපිතං තෙ නිවෙසනං-ති.

මේ ගාථාවෙන් වදාරණසේක්:-''එම්බා මහණෙනි! මහෞෂධ පණ්ඩිතයෝ වෛදෙහ රජහට පළමුව ගොස් නුවර උමං රජ ගෙවල් ආදිය කරවා සාර මසකින් නිෂ්ඨාකොට වෛදෙහ රජු කැඳවා දූතයන් යවූහ''යි වදාළසේක.

පෙරමග බල බලා උන්නාසේ රජ්ජුරුවෝ දූතයාගේ බස් අසමින්ම සෙනාව පිරිවරා නික්මුණාහ. ඒ බව ප්‍රකාශකොට වදාරණ බුදුරජාතන්වහන්සේ

තතො ච රාජා පායාසි, සෙනාය චතුරඞ්ගියා
අනන්තවාහනං දට්ඨුං, ඵීතං කම්පිල්ලියං පුරං-ති

මේ ගාථාවෙන් ''එම්බා මහණෙනි! අටළොස් අක්ෂෞහිණියක් සඞ්ඛ්‍යාත ඒසා මහත් සතුරු සෙනාවක් හා එක් සියයක් රජුන් හුන්නාවූ උත්තර පඤ්චාල දේශයෙහි කම්පිල්ල නුවරට කාමයෙහි ගිජුවූ නුවණින් අඬවූ ඒ වෛදෙහ රජ මොහොයෙන් මුසව අඹානඹ දෙක ඉඳුරා සලකා ගත නොහී, චතුරංගිණී සෙනාව පිරිවරා නික්මුණේවේද''යි වදාළසේක:-ඉක්බිති රජ්ජුරුවෝ ක්‍රමයෙන් සාරසියයක් ගවුගෙවා ගොස් ගංතෙරට පැමිණියහ. ආ නියාම අසා බොධිසත්වයන්වහන්සේ රජ්ජුරුවන්ට පෙරගමන් කොට කැඳවා අවුත් තමන්වහන්සේ කරවූ නුවරට ගෙණගියසේක. රජ්ජුරුවෝ මාලිගාවට නැඟී අග්‍රවූ භොජනය අනුභවකොට මදක් සැතපී පස්වරු වේලේ තමන් ආ නියාම චූලනී රජ්ජුරුවන්ට කියා දූතයෙක් යැවූහ. ඒ බව වදාරණ බුදුරජාතන්වහන්සේ:-

තතො ච බො සො ගන්ත්වාන, බ්‍රහ්මදත්තස්ස පාහිණි,
ආගතොස්මි මහාරාජ තව පාදානි වන්දිතුං.

දදාහි'දානි මේ භරියං, නාරිං සබ්බඞ්ගසොභිනිං,
සුවණ්ණෙන පටිච්ඡන්නං, දාසීගණ පුරක්ඛතං-ති.

මේ ගාථා දෙකින්:–“එම්බා මහණෙනි! වෙදෙහ රජ බ්‍රහ්මදත්ත රජහට දූතයකු අතකියා යවන්නේ ‘මහරජ! නුඹවහන්සේගේ ශ්‍රීපාදය වඳනා පිණිස ආම්, සර්වාභරණයෙන් සරහනලද ශරීර ශොභා ඇති දාසි දස් සමූහයා විසින් පිරිවරණලද නුඹවහන්සේගේ දියණියන් මට බිරිඳකොට වහා එවුව මැනවැයි කියා යැව්වේ වේදූ’යි වදාළසේක. අඹුවන් කෙරේ ලොභයෙන් වදිම්’යි කී බවමුත් වේදෙහ රජ්ජුරුවෝ ඉතා වැඩිමහල්ලහ, චූලනී රජ්ජුරුවෝ වූකලී මුනුබුරු තරමටවත් නැත්තාහ. දූන් රක්ෂා කරණකල කෙසේ මහළු වූවත් කෙසේ පොහොසත් වූවත් වැන්දමනා හෙයින් එසේ තමාත් සිත් ගෙණ කුමාරිකාව ලැබ ගනිම් නම් යහපතැයි සිතා ක්ලෙශයන් විසින් මඩනාලද අදහසින් වැඳ යවූහ”යි දතයුතු.

වෙදෙහ රජ්ජුරුවන්ගෙන් ගිය දූතයාගේ බස් අසා චූලනීරජ්ජුරුවෝ මහත් සොම්නසට පැමිණ මෙව්ව මාගේ සතුරා කොයියේද, සෙට දෙන්නාගේ ඉස් කපාපියා පයින් මැඩගෙණ හිඳ ජයපානය බොම්මැ’යි සිතින් ක්‍රොධ උපදවා බසින් දූතයාට සතුටු අඟවා ඔහට ප්‍රසාදදී නැවත කියා යවන්නාහු

සාගතං තව වෙදෙහ අථොතෙ අදුරාගතං,
නක්ඛත්තඤ්ඤෙව පරිපුච්ඡ, අහං කඤ්ඤං දදාමි තෙ,
සුවණ්ණෙන පටිච්ඡන්නං, දාසිගණ පුරක්ඛතං–ති.

මේ ගාථාවෙන් කීහ:–

මේ ගාථාවෙහි අභිප්‍රාය නම් “වෙදෙහ රජ්ජුරුවෙනි! තමන් මීට අා ගමන නපුරු ගමනෙක් නොවෙයි, ඉතා යහපත් ගමනෙක, තොප විසින් විවාළ මනා නම් මඟුලට යොග්‍ය නක්ෂත්‍රයක්මය, සුවර්ණාලංකාරයෙන් සරහා නිමවනලද ශොභනා අවයව ඇති මාගේ දූවණියන් දාසි දස් සමූහයා විසින් පිරිවරණ ලදුව තොපට පාවා දෙමි”යි කියා යැවූහ. ඒ දූතයා ගොස් වෙදෙහ රජ්ජුරුවන්ට දෙවයන්වහන්ස! ඔබින් බාධාවෙක් නැත, මඟුලට හඳාළ නැකැත් වහා විචාළ මැනව, රජ්ජුරුවෝ දූවණියන් නුඹවහන්සේට පාවා දෙන්නාහ”යි කීහ. ඉක්බිති රජ “අදම නැකත් යහපතැයි දූතයා අත කියා යවීය’යි වදාරණ බුදුරජාණන්වහන්සේ:–

තථෙව රාජා වෙදෙහො, නක්ඛත්තං පරිපුච්ඡථ,
නක්ඛත්තං පරිපුච්ඡිත්වා, බ්‍රහ්මදත්තස්ස පාහිණි.

දදාහි දානි මෙ භරියං, නාරිං සබ්බඞ්ගසොභිනිං,
සුවණ්ණෙන පරිච්ඡන්නං, දාසිගණ පුරක්ඛතං–ති.

මේ ගාථා දෙකින්:–මහණෙනි! ඒ ඉක්මන් රජ අද නැකත් යහපත සියලු ස්ත්‍රී ලක්ෂණයෙන් ශොභනවූ දූවණියන් පරිවාර සහිතව වහා එව්ව මැනවැයි කියා යැවීය”යි වදාළසේක.

බ්‍රහ්මදත්ත රජ නැවත කියා යවන්නේ “සියලු බිසෝ පළඳනාවෙන් හොබනාවූ මාගේ දූවණියන් සියලු පිරිවර හා සමග මහ පෙළහරින් දූන්ම

එවම්, දත්ම එවම්''යි බොරු කියා ආ දූතයා යවා එක්සියයක් රජදරුවන්ට කියා යවන්නේ 'එදවස් මියුලු නුවරට ගියාසේ අටළොස් අක්ෂෞහිණී මහා සේනාව හා පඤ්චායුධ සන්නද්ධව උපකාරී නුවර බලා නික්මෙන්නට කියව, සතුරන් දෙන්නාගේ ඉස් කපා සෙට ජයපානය බොම්හ'යි කියා යැවීය. ඒ සියල්ලෝම රජහු කී පරිද්දෙන් චතුරංගිණී සේනාව ගෙණ නික්මුණාහුය. රජහු තුමූත් නික්මෙන්නාහු මෑතියන් තලතාදෙවින්ද්‍ද අගමෙහෙසුන් නන්දාදෙවින්ද්‍ද, පුතනුවන් පඤ්චාලචණ්ඩකුමාරයන්ද, දූවනියන්පඤ්චාල චණ්ඩි කුමාරිකාවන්ද, යන මේ සතරදෙනා මාළිගාවේ දෙවතමාලේ රඳවා සුරක්ෂිතකොට රැකවල් ලවා උපකාරී නුවරට ගියහ.

බොධිසත්ත්වයන් වහන්සේ වේදෙහ රජ්ජුරුවන් හා කැටිව ආ මහ සේනාවටත් බොහෝවූ සත්කාර කළසේක. ඉන් සමහර කෙණෙක් රා බොන්නාහ, සමහර කෙණෙක් මච්ඡ මාංශ කන්නාහ සමහර කෙණෙක් ඉක්මන්ව එන රජ්ජුරුවන් හා කැටිව එන්නාහු නොසැතපී දිව දිව ආහෙයින් ශ්‍රාන්තව නිදන්නාහ, වෙදෙහ රජ්ජුරුවෝද සෙනකාදී පණ්ඩිතවරුන් හා අමාත්‍ය මණ්ඩලයා පිරිවරා සරහතලද මාළිගාවේ මතු මහලේ ශ්‍රී යහන් මුදුනෙහි මිහිරි කථා කෙරෙමින් උන්නාහ.

එවේලේ චූලනී රජ්ජුරුවෝ එක්සියයක් රජදරුවන් හා අටළොස් අක්ෂෞහිණියකින් සංඛ්‍යාත සෙනාව ගෙණවුත් එදවස් මියුලු නුවර වටලුවාසේ තුන් සත්ධියකින් හා සතර වළල්ලකින් කිසිතැනකිනුත් සිදුරක් නොපෑ වටලාගත්හ'යි සනිටුහන් කොට සිටගත්හ.

අභිමතාර්ථසාධකවූ චින්තාමාණික්‍යයක් බඳුවූ මාගේ ස්වාමිදරුවූ ශ්‍රීමහා බොධිසත්ත්වයන්වහන්සේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවින් ආ බව දත සහජාත යොධයන් තුන්සියක් දෙනා තෝරාගෙණ ''තෙපි හැම සුළුඋමඟින් පලාගොස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මෑතියන්ද අගමෙහෙසුන් බිසවුන්ද දරුවන් දෙදෙනාද යන මේ සතරදෙනා මාළිගාවෙන් බාගෙණ එමඋමඟින් ගෙණවිත් මහඋමඟට බාලා ගෙණවුත් උමඟින් පිටත් නොකොට ඇතුළු උමඟම රඳවා ගෙණ අප එන තෙක් රැකවල් ගෙණසිට අප ආ කල උමඟින් පිටත්කොට මහාවිසල්මලුවේ සිටිව්ය''යි උන්ට වදාළසේක. යොධයෝ මහතානන්ගේ බස් මුදුනෙන් පිළිගෙණ සුළු උමඟින් පලාගොස් රජගෙයි හිණිපාමුල පණ්ඩිතයන් වහන්සේ විසින් අතුරණ ලද්දාවූ පෝරුවේ යටිපිටින් උගුලුවා තිලකර දෙර අගුළු ඇර උඩ නැගී හිණිපාමුලය හිණිඉසය මාළිගාවේ මෙතෙක් තැන්හි රැකවල සිටියවුන්ද, පිරිවරා සිටි කුරුන් කුදුන් ආදීන්ද අල්වාගෙණ දෑත් දෙපා එක්කොට තරව බැඳ බැණ නොහැඟෙන පරිද්දෙන් කට කඩරෙදි ඔබා මූවාව තිබෙන්නාවූ ඒ ඒ ස්ථානයෙහි කොකුවල එල්වා රජහට ඉදිකළාවූ රසමසු වූලෙන් යුක්තව සපයා තුබූ නොයෙක් වගීයේ අනඝීවූ කැවුම් ජාතීන්ක් මුළුල්ල

සමහරක් තුමූම අනුභවකොට පියා සමහරක් සුණුවිසුණුකොට පියා මාලිගාවේ මතුමාලට නැංගාහ. එදවස් තලතාදෙවි සෙසෙලතියක් හා මුනුබුරන් දෙන්නා හා සතරදෙන එක යහනකට නැගී ඔවුනොවුන් වැළඳගෙණ 'සටන් නම් චපල දෙයක කාවුරු දනිද්ද? ජය පරාජය නම් කාට වන්නේදැයි සිහිය හැකිද්ද'යි සිත සිතා වැද හොත්තාහ.

එවේලෙහි ගිය යෝධයෝ ඔවුන් උන් ගබඩාවෙහි දෙරකඩ සිට බැණවූහ, එබස් අසා තලතාදෙවි යහනින් නැගී සිට 'කිමෙක්ද දරුවෙනි! යි කියමින් දෙරකඩට ආහ. යෝධයෝ ඔවුන්ට කියන්නාහු 'දෙවීන්වහන්ස! අපගේ රජ්ජුරුවන්වහන්සේ වේදෙහ රජුත් මහෞෂධ පණ්ඩිතයාත් අල්වාගෙණ මරා පියා සියලු දඹදිව රාජ්‍යය එක්සත්කොට එක්සිසයක් රජුන් පිරිවරා මහ පෙලහරින් ජයපානය බොන්නාවූ ඒ මඟුලට නුඹ සතරදෙනාත් කැඳවා යන පිණිස අප එවූහ, වැඩිය මැනවැයි කීහ. එබස් අසමින් අතිශයින් සතුටුවූවාහු දෙර ඇර සතරදෙනා මාලිගාවෙන් බැස හිණිපාමුලට ගියාහ. යොධයෝ ඔවුන් ඇරගෙණ සුලු උමඟට වන්හ. එවිට රජදරුවෝ කියන්නාහු 'අපි මෙතෙක් කල් මෙහි වසන්නමෝ එක දවසකුත් මේ වීථියට නොබට විරුම්හ. මේ වීථිය කිනම්ද''යි කීහ. එබසට යෝධයෝ කියන්නාහු 'කුමක් කියන්නේද? මේ වීථියට ඇමදුම බට නොහැක්ක, මේ මඞගල වීථි නම අද ජයපානය බොන දවස් මගුල් හෙයින් රජ්ජුරුවෝ නුඹ සතරදෙනා මේ මගින් කැඳවා එවූහයි කීහ. එබස 'සැබව'යි ගිවිස උමඟ විස්තර බලමින් කෙළිමින් සෙමින් සෙමින් සන්තෝෂයෙන් යන්නාහ. යොධයන්ගෙන් සමහර කෙණෙක් රඳා නැවත රජගෙට ගොස් රුවන් ගබඩාවල දෙරවල් ඇත බිඳපියා තමන් තමන් ගෙණයන පමණ සාරවූ අනර්ඝවූ රුවන් පොදි බැඳගෙණ උමඟට බැස දෙර අගුළු ගෙණ පැලහ.

රජදරුවන් සතරදෙනා පළමු ගෙණගිය යෝධයෝ දිව්‍යපුරයක් මෙන් සරසන ලද මහ උමඟට බාගෙණ තමාගත්හ. ඔහු සතරදෙන සිහිනෙනුත් නුදුටුවිරූ ඒ විස්තර බලබලා රජ්ජුරුවන්ට මගුලටම කැළහයි සිතූහ. යෝධයෝ උන් සතරදෙනා උමඟින් පිටත් නොකොට ඇතුළු උමඟ සරහනලද එක් ශ්‍රීයහන් ගබඩාවෙක ඉඳුවා සමහර කෙණෙකුන් රැකවලු සිටුවා සමහර කෙණෙක් උන් ගෙණා බව බොධිසත්‍වයන් වහන්සේට ගොසින් කීහ. උන්ගේ බස් අසා ජනානන්දකරවූ මාගේ සවාමිදරුවානෝ ''එවිට මාගේ මනදෙළ මුදුන්පත්විය''යි ඔදවැඩී සතුටුව රජ්ජුරුවන් සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිටිසේක.

රජ්ජුරුවෝ ක්ලෙශයන් විසින් මඩනාලද අදහස් ඇතිව උන් බැවින් 'දුවණියන් දුන් එවනි දුන්එවනි'යි සිත සිතා උන්නාහු වහා හුනස්නෙන් නැගී සීමැදුරු කවුළුව හැර පවුරෙන් පිටත බලන්නාහු (මාගේ සවාමිදරුවූ තිලෝගුරු ශ්‍රී මහා බොධිසත්‍වයන් මතු බුදුවන කලත් තුන්ලෝ වාසින් කරන්නාවූ ප්‍රදීප පූජාවට පෙර නිමිති පානා කලක් පරිද්දෙන්) සවස පටන් දිලියෙන්නාවූ විලක්කු සියදහස් ගණනින් යුක්තවූ අනන්තපරිමාණ චතුරංගිණී මහබල සෙනාව නුවර වටලා සිටියවුන් දැක කිමෙක්ද්‍ෙහෝයි සිතා ලය ඉපිළ

අතිශයින් සැකව, සෙනකාදී ප්‍රඥාසම්පන්න පණ්ඩිතවරුන් හා සමග මන්ත්‍රණය කරන්නාහු 'ඇත් අස් රථ ආදීවූ සන්නාහ සන්නධවූ 'ගණුව මරව' යනාදී යුද්ධයෙහි කිවමනා බස් බණන්නාවූ සේනාව ශරදකාශයෙහි තාරකාවන් පරිද්දෙන් බබලන්නාවූ විලක්කු ආලෝකයෙන් මේ නුවර හිරු නැගී කලක් මෙන් අතිශයින් බබලා ගියේය. චූලනී රජ්ජුරුවෝ මරසෙනගක් පරිද්දෙන් මේසා සේනාවක් ගෙණාවාහු අප කෙරේ සතුටින් අවුද? නොහොත් රැගෙණව අවුද? පණ්ඩිතවරුණි! මේ කුමකැයි සිතත්ද'යි:-

හත්ථි අස්සා රථා පත්ති, සේනා තිට්ඨන්ති වම්මිතා,
උක්කා පදිත්තා ඣායන්ති, කිං නු මඤ්ඤන්ති පණ්ඩිතා-යි.

මේ ගාථාවෙන් කීහ.

ඒ අසා සේනක පණ්ඩිතයා කියන්නේ 'මහරජ! නොසිතා වදාළ මැනව බොහෝ විලක්කු ආලෝක පෙණෙයි නැවත වේලා නොවරදවා සරණ දෙන පරිද්දෙන් දුවතියන් හැරගෙණ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ආහයි සිතමි කීහ. නැවත පුක්කුසයා කියන්නේ "මහරජ! නුඹවහන්සේට සත්කාර පිණිස නොරට ආ හෙයින් රැකවල්ගෙණ සිටිනා නියාවච"යි කිය. ඒ අඥන පණ්ඩිතයෝ සතරදෙන යමක් සිතුවෝවීනම් තත් දොඩන්නවුන් මෙන් ඝාටට ආවාක්ම කීහ.

වෙදෙහ රජ්ජුරුවෝ "මේ මේ සථානයේ මෙතෙක් මෙතෙක් සේනාව බැගින් සිටුවා මේ සථානයෙහි සුරක්ෂිතකොට රැකවල් රකුව, පමානොවව, නොනිදව" යනාදීන් කියන්නාවූ බස්ද අසමින් සන්නහ සන්නධව යුද්ධයට සැරහී සිටින්නවුන්ද දැක, මරණ හයින් තැතිගෙණ බොධිසත්වයන් වහන්සේගේ බසක් ප්‍රාර්ථනාකරන්නාහු මෙසේ කියන්නාහ. ඇත් අස් රථ පදික යන අනන්තාපරිමාණවූ චතුරඞ්ගිණී සේනාව සන්නාහ සන්නධව සිටිතීය. ප්‍රමාණාතික්‍රාන්ත වූ විලක්කු ආලොකයෙන් එකොහාසවිය. මහෞෂධ පණ්ඩිතයෙනි! තෙපි මේ කුමකැ'යි සිතව්ද? මේ මේ සේනාව අපට කුමක් කරන්නීද"යි කීහ. එබස් අසා කල්පද්‍රැමයක් වැනි තිලෝගුරු බොධිසත්ව යන් වහන්සේ සිතනසේක් "මේ අඥනවූ රජු මඳක් පමණ ගින්නෙන් තවාලා පසුව මාගේ බල දක්වාලා අස්වසාලම්'යි සිතා වදාරණසේක් 'මහරජ අර්ථබල ආදීවූ පඤ්චප්‍රාකාර බලයෙන් අසමානවූ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ "වෙදෙහ රජ්ජුරුවෝ මේ නුවරට ඇවිත් පැමිණියෝය, දුකසේ මැත්කොට ගනිමහ. පලාගිය නම් නපුරු"යි අද මේ වේලෙහි පටන් තුන්යම් රාත්‍රියෙහි සුරක්ෂිතකොට රැකවල් ලවා රැකසිටි පාන්වූ කල නුඹවහන්සේ අල්වාගෙණ මරත්මය, මදකුත් දුවතියන් සරණ දෙන්නට හා හිතකමට ආ ගමනෙක් නොවේ"යි වදාළසේක.

එබස් අසමින්ම සේනකයා ආදීවූ සියල්ලෝම මරණහයින් තැතිගෙණ කිසිවකුත් කියන්නට අසමර්ථවූහ. රජහු උගුර වියලී කෙළසිඳීගියේය. ඇගින් ඩා සෙල්වී ගොසින් මරණ හයින් වලප්නාහු මෙසේ කියන්නාහ. මහෞෂධ

පණ්ඩිතයෙනි! ඉතා මෘදුවූ ලා දලුවක් පරිද්දෙන් මාගේ ලය වෙව්ලන්නේය. මුඛයෙහි කෙළ සිඳීගියේය. ගින්නෙන් පැලඟී ගිය එකක්හු අව්වේ ලූ කලක් පරිද්දෙන් මේ භයින් ගැලවීමක් නොදන්නේ සැනසිලි නොලබමි, තවද කඹුරන්නේ උදුනෙහි ගිනි ඇතුළෙන් දවන්නේය, පිටතට නොපෙණෙන්නේය, එපරිද්දෙන්ම මාගේ ලෙහි ගත් ගිනි හෘදය ඇතුළෙන් දන්නේය. පිටතට නොපෙණෙන්නේයයි කියා ඇඬූහ. බෝසතාණන්වහන්සේ රජුගේ බැගෑපත්ව වලප්නා හඬ අසා 'මේ නුවණින් අන්ධවූ රජ මා පළමු කීවා නොකෙළේය, මතු කීකරුවන ලෙස තවත් නිග්‍රහ කොට අඳුන්වාලමි'යි සිතා වදාරණසේක් "මහරජ! නුඹවහන්සේ කාමලෝභයෙන් අන්ධවූසේක් මෝහයෙන් මුළාවූ සිත් ඇතිව ගමන් පිවාළ තැන මාගේ ප්‍රඥාවෙන් මතු මේ තියා භයෙක් වන්නේයයි කියව කියවා ඒ 'නපුරු'යි නොගිවිස සේනකාදීන්ගේ බස් යහපතැ'යි ගිවිස, භින්න මන්ත්‍රණයෙන් මෙසා මහත්වූ භයකට පැමිණිසේක. ඒ මහාමන්ත්‍රීවූ සෙනකාදී පණ්ඩිතවරුන් සතරදෙනාගේ බසින් සරණ හිඳුවා රජ්ජුරුවන් හා නෑකම් සම්බන්ධය කළා ඉතා යහපත, නුඹවහන්සේගේ සිත භින්නකොට තුමූ ඇමත් 'ඉතකඩක් පිඩක් ලැබ ගණුම්හ'යි ලෝභ චේතනායෙන් කයිවාරුකොට ගෙණාවෝ මේ දුකින් ගලවා නොගණිද්ද? වන්නාවය උන් ගලවා ගන්නාත් දකිමි, උන්ගේ බලත් දක්නෙමි "වේදූ''යි වදාළසේක.

මෙසේද කියා 'මෙලොවින් පරලොවින් වැඩක්ම වන්නා කැමති සියල්ලෙන්ම උතුම් අමාත්‍යව සිටි මාගේ බස් නොගිවිස කාමයෙන් ඇලුනු සිත් ඇතිව යම් කිසිවක්හි ලෝභයෙන් මුවකු අවුත් දැඩි මලෙක බැඳුනාසේ පඤ්චාලචණ්ඩිකුමාරිකාව ලැබපියම්හ''යි යන ලෝභයෙන් අවුත් මරුමුවෙහි අසුවූසේක. එදවස්ම 'පඤ්චාල දෙශයට ගමන් යහපත්ද'යි විචාළ නුඹවහන්සේට මෙයම උපමාකොට කීයෙම් වේදූ'යි වදාළසේක. මෙසේද කියා නැවතත් වදාරණසේක් "ජනප්‍රධානවූ රජ්ජුරුවන්වහන්ස! අනාචාර ස්වරූප ඇති අසත් පුරුෂයා හා මිත්‍රධර්මයක් නොකළ මැනව, ඉදින් ඔහුගේබස් ගිවිස සරණසොයා ගිය සේක්වීනම් මෙලොවින් පරලොවින් වන වැඩක් නම් නැත දෙලොවින්ම ඔහට දුක්මවන්නේය'යි කියව කියවා මා කීවා නොකොට ඔහු කීවාම කළසේක්වේද? ඉදින් මා කීවා කළසේක් වීනම් අද මෙසා දුකෙක්වත් භයෙක්වත් නැත්තේවේදූ'යි වදාරා නැවත සිතනසේක් මේ රජහු මතුත් නොකීකරු නොවෙනලෙස තරකොට හික්මවා නිග්‍රහයට පමුණුවා පළමුකීවාම කියා භය හා ලජ්ජාවට පමුණුවම්'යි සිතා වදාරණසේක් 'මහරජ! එදවස් ගමන් නොගිය මැනවැ'යි කීවාවූ මට නුඹවහන්සේ කියනසේක් 'කෙවට්ට පණ්ඩිතයන් ආදීහු පණ්ඩිතවරුමය, රජගෙයි හසළයෝය රජ දරුවන්ගේ අදහස දන්නෝත් මගුලට තිසි බව දන්නෝත් උන්මය. මේ ගොවියා පුත් නිමුන් මිට එලීගෙණ සී සා කතයේ දන්නා බව මුත් රජගෙයි කාර්‍ය්‍යය හා මගුල් වැවහාර දනිද්ද'යි මට කිපී 'කොල! ගොවියා පුත් බොටුව අල්වාගෙණ මාගේ විජිතයෙන් ඇත ලව'යි වදාළසේක් නොවේද? එදවස් එසේ කී නුඹවහන්සේ දූන් එසේවූ ප්‍රඥා සමුද්‍රයන් සිටියදී මා ගොවියා පුතු අතින් ගැලවෙන උපාය විචාරන්නාසේ ඉතා නොයෙදෙන්නේය, මා අතින් උපාය විචාරණ නුඹවහන්සේමය, කෙළතොලු සේකුත් නුවණ නැති සේකුත්, මා දන්නේ සීසා කත

මාත පමණක්ය, උවමනාසේක් වීනම් සී සාත මාත විචාරගත මැනව, නුව ණැත්තෝත් පණ්ඩිතවරුත් මේ මරින් ගැලවෙන උපායදන්නෝත් සෙනකාදී පණ්ඩිතවරුය, නුඹවහන්සේ මට කිවමනා වීනම් එදවස් කීවාසේ කර අල්වා පිවත ලන්නට කිවමැනව, අටළොස් අක්ෂෞහිණී සංඛ්‍යාත මේ සේනාව අතරෙන් සෙනකාදීහු ගලවා ගණිත්වා, මම කුමක් දනිම්දැ''යි වදාළසේක.

ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු 'පණ්ඩිතයෝ පලමු මා කී අපරාධයම කියන්නාහ, මපුතනුවෝ මේ මතු වන්නාවූ භය තමන්ගේ ප්‍රඥ චක්ෂුසින් මනාකොට දුටුවාහ, එබැවින් මා තරවා නිග්‍රහයට පමණුවාලති, අතීත අනා ගත ප්‍රත්‍යුත්පන්න යන තුන් කල් දන්නාවූ වජ්‍ර බුද්ධිවූ ජනහිත නිරතවූ ඒ මාගේ පුතනුවෝ 'අනාගතයේ මෙබඳුවූ භයෙක් වන්නේය'යි දැන දැනත් සාර මසක් මුළුල්ලෙහි හිඳිනාහු නිකම් නොයිඳිනාහ, එකාන්තයෙන් ගැල වෙන උපායෙක් කෙරෙත්මය, එයිත් මා විසින් පරීක්ෂාකළ මැනවැ''යි සිතා, කියන්නාහු ''පුත මහෞෂධ පණ්ඩිතයෙනි! නුවණ නැතිව ගිය දවස කළ දැඩි කම් හා නොදන කියාපි බස් පමණක් සිතනබාගෙණ කිය කියා දුකට පැමිණි යන්ට නුවණැත්තෝ නිග්‍රහ නොකරන්නාහ, තෙපිත් මහත් වූ නුවණැත් තෝය, අනුවණින් කියාපි වරදම කියව, සතුරු සේනාවක් වටලාගත් කල්හි පිටි හිඳුවාගෙණ නැඟී යන්නට තරම් ජවසම්පන්න සඳ සිටියාවූ අසෙකුට තියුණු ගියකින් විඳුනා කලක් පරිද්දෙන් කුමට මා විඳුද? ඉදින් කියව් තම් ගැලවී නැඟී යන උපායක්වත් සතුරන්ට අසුනොවී නැඟී යන තැනක්වත් දනුනම් ඉන් මට අනුශාසනා කරව, ගිය දවස මා නුවණ නැතිව කියාපි කථා සිහිකොට තොපගේ වචන නමැති හියෙන් මා නොවිඳුව, තරකොට බැඳි හසු කැවිටින් විදිනාසේ මා නොවිඳුව ගැලවෙන උපායක් කියව, තොප හැර මට අනික් පිහිටවහලෙක් නැතැ''යි කියා හැඬුහ.

එබස් අසා කරුණාවට ආකරවූ සවාමිදරුවානෝ සිතනසේක් 'මේ රජහට මා විනා අනික් පිටවහලෙක් නැත්තේය. මේ රජ ඉතා අන්ධ බාලය, තමා නුවණ නැති හෙයින් පුරුෂ විශෙෂය මඳකුත් නොදන්නේය. තවත් මඳක් තවාලා පසුව අස්වසාලමි''යි වදාරණසේක්:–

> අතීතං මානුසං කම්මං, දුක්කරං දුරභිසම්භවං,
> න තං සක්කොමි මොචෙතුං, ත්වංපි ජානස්සු ඛත්තියා–ති

යන මේ ගාථාවෙන්:– 'මහරජ! මේ සා සේනාවක් වටලාගෙණ සිටි කල ඉන් මිදී යන තරම් උපායක් කොට ගැන්ම මනුෂ්‍යයන්ට ඉතා බැරි වන් නේය, මිනිසුන් කළමනා දෙයක් ඇත්තම් ඒ සියල්ල සතුරන් වටලා සිටි හෙයින් මනුෂ්‍යයන්ට අවිෂය, එයින් ඉක්ම ගියේය. දැන් මෙවිට ගැලවෙන උපායන් කරන්නා තබා සිතින් සිතන්ටවත් නොපිළිවන; දැන් කරණ උපාය කින් නුඹවහන්සේ ගලවාගන්ට මම අසමර්ථයෙමි, ''මහරජ! නුඹවහන් සේම ගැලවෙන උපායක් දනමැනවැ'යි වදාරණසේක්:–

සන්ති වෙහාසයා නාගා, ඉද්ධිමන්තො යසස්සිනො,
තෙපි ආදාය ගච්ඡෙය්‍යුං, යස්ස හොන්ති තථා විධා

සන්ති වෙහාසයා අස්සා, ඉද්ධිමන්තො යසස්සිනො,
තෙපි ආදාය ගච්ඡෙය්‍යුං, යස්ස හොන්ති තථා විධා.

සන්ති වෙහාසයා පක්ඛී, ඉද්ධිමන්තො යසස්සිනො,
තෙපි ආදාය ගච්ඡෙය්‍යුං, යස්ස හොන්ති තථා විධා,

සන්ති වෙහාසයා යක්ඛා, ඉද්ධිමන්තො යසස්සිනො,
තෙපි ආදාය ගච්ඡෙය්‍යුං, යස්ස හොන්ති තථා විධාති-ති.

මේ ගාථා සතරින්:- ''සමහර රජදරුවන්ගේ මෙසේවූ දුකෙහිදී ගලවා ආකාශයෙන් ඇරගෙණ යන්නාවූ උපොසථය ඡද්දන්තය යන සෘද්ධි සම්පන්න වූ ඇත් කෙණෙක් ඇත්තාහ. එසේවූ ඇත් කෙණෙක් නුඹවහන්සේට ඇත්නම් මේ දුකින් ගලවා අහසින් ගෙණයෙත්වා, නැවත සමහර රජ දරුවන්ගේ සෘද්ධිමත්වූ වලාහක අශ්වයෝ ඇත; එසේවූ අස් කෙණෙක් නුඹවහන්සේගේ ඇත්නම් උයිත් නුඹවහන්සේ ආකාශයෙන් ගෙණයෙත්වා, තවද සමහර රජදරු කෙණෙකුන්ගෙ ආකාශ චාරිවූ ගරුඩ වාහනයක් ඇත්තේය. තවද සමහර රජ්ජුදරුවන්ගේ එසේම පක්ෂිවාහනයක් ඇත්තේය. තවත් සෘද්ධිමත්වූ යක්ෂ කෙණෙක් ඇත්තාහ. එසේවූ වාහනයක් නුඹවහන්සේට ඇත්නම් මේ දුකින් ගලවා ගණිත්වා, මම ආකාශචාරිවූ ඇත් අස් පක්ෂි යක්ෂ ආදීන් පරිද්දෙන් නුඹවහන්සේ ආකාශයෙන් ගෙණගොස් මියුලු නුවරට ලාලන්නට අසමර්ථයෙමි''යි වදාළසේක. එබස් අසා රජ්ජුරුවෝ මුවෙන් තොබැණ උන්හ.

එවිට සෙනකයා සිතන්නේ 'රජ්ජුරුවන්ටත් අපටත් පණ්ඩිතයන් විනා අනික් කිසි සරණෙක් නැත්තේය. රජ්ජුරුවෝ වනාහි පණ්ඩිතයන්ගේ බස් අසා භයින් තැතිගෙණ කිසිවකුත් කියන්නට අසමර්ථයහ. මෙවිට මමත් තමා පණ්ඩිතයයි දතපත කියවා යාචකයකොට බලමි''යි සිතා කියන්නේ:-

අතීරදස්සි පුරිසො, මහන්තෙ උදකණ්ණවෙ
යත්ථ සො ලභතෙ ගාධං, තත්ථ සො වින්දතෙ සුඛං

එවං අම්හංච රඤ්ඤොච ත්වං පතිට්ඨා, මහොසධ!
ත්වං නොසි මන්තිනං සෙට්ඨො, අම්හෙ දුක්ඛා පමොචයා-ති-

මේ ගාථා දෙකින්:- යම්සේ සයුරෙක හුනු පුරුෂයෙක් දුකසේ ගොඩක් දුටුයේ නම් ගොඩ දුටු වෙලෙහි පටන් ඕහට මහාසැප වන්නේය. එපරිද්දෙන් අපටත් රජ්ජුරුවන්ටත් නුවණින් හා මන්ත්‍රීකමින් උතුම්සේක් නුඹවහන්සේවේද, එබැවින් මේ දුකින් මුදා අප ගලවාගත මැනවැ''යි කීය. එසේ කී සේනකයාට තරව භය උපදවා නිග්‍රහ කරණසේක්:-

අතීතං මානුසං කම්මං, දුක්කරං දුරභිසම්භවං,
තතං සක්කොමි මාවෙතුං, ත්වංපි ජානස්සු සෙනකා-ති.

මේ ගාථාවෙන්:-එම්බල අඥානය! එදවස් ''මේ ගමන් නොකැමැත්තේ''යි මා කියතුත් රජුට නොයෙක් කාරණා කියා උගත්වාගෙණ ආයෙහිත්තෝමය, ගෙණවුත් මෙසා දුකකට පමුණුවා මෙසා අනර්ථයක් යෙදුයෙහිත් තෝමය, එම් බල අසත්පුරුෂය! මනුෂ්‍යයන් විසින් ගැලවෙන්නට කටයුතු යම් උපදෙශයෙක් ඇත්නම් මෙපිට මේ ඇසිල්ලෙහි කරගන්නා තබා සිතන්නටත් නොපිළිවන, ඒ සියල්ලම ඉකුත්ව ගියේය. මා විසින් දූත් කොට සාදා ගතහැකි කිසිවකුත් නැත්තේය, මට නොපිළිවන, තෙපිත් පෙර 'අප මූත් තැතැ''යි බැහැවෙන පණ්ඩිතවරුවූහ, තොපගේ නුවණින් මිට උපායක් සිතා තෙපිත් ගැලවී රජ්ජුරුවනුත් ගලවා ගණුව''යි වදාළසේක. මෙසේද කියා නැවත 'තෙපි සපත් නම් ආකාශයෙන් ගෙණ ගොස් මියුලු නුවරට ලාපියව''යි වදාළසේක.

රජ්ජුරුවෝ ගැලවෙන්නට උපායක් සිතන්නාහු මරණ භයින් තැති ගෙණ බොධිසත්වයන් හා සමග කිසිවකුත් කියන්නට අසමර්ථව ''යම්සේ මේ සේනකයාත් පණ්ඩිතයයුවූව කිසිම උපායක් දනීනම් විචාරම්''යි සිතා සෙනකය! මේ උපත් භයින් ගැලවී යන්නට සුදුසු උපායක් දනීනම් කියව'යි

සුණොහි එතං වචනං පස්සසෙනං මහබ්භයං
සෙනකං දානි පුච්ඡාමි. කිං කිච්චං ඉධ මඤ්ඤසි-ති.

මේ ගාථාවෙන් වදාළ රජ්ජුරුවන්ට සේනකයා ''යම්සේ මසක් මංමුළාවූ එකෙක් සමසක් මංමුළාවූ එකකු අතින් මං විචාළේද, එපරිද්දෙන් මේ රජ්රුවෝ මා අතින් ගැලවෙන උපාය විචාරන්නාහ. යහපත් වුවත් නපුරුවූවත් මා කටට ආවක්ම කියම්''යි සිතා එක් උපායක් සලකාගෙණ කියන්නේ,

අග්ගිං දුවාරතො දෙම, ගණ්හාමසෙ විකන්තනං,
අඤ්ඤමඤ්ඤං වධිත්වාන, ඛිප්පං හෙස්සා ම ජීවිතං;
මානො රාජා බ්‍රහ්මදත්තො, චිරං දුක්ඛෙන මාරයි-ති.

මේ ගාථාවෙන් කීය:-

මේ ගාථාවෙන් අර්ථයනම් ''මහරජ! කරණසේක් වීනම් මා කියන උපාය යහපත, මේ අප හැම උන් මාලිගාවට අපි හැම වැදලා දෙර පිටතින් බන්දලා ගිනි ගස්වලා තියුණු මුවහත් ඇති කඩුවක් බැගින් තමකට එක එක කඩුව ගෙණ ඔවුනොවුන් කොටා මියම්හ; එසේ මළාවූ නුඹවහන්සේ හා අප හැම් දෙනාට සැරහූ මාලිගාව එක දර සෑයක් වන්නේය. බ්‍රහ්මදත්තයෝ අල්ව ගත්තු තම් ජන්මාන්තර වෛරි සෙයින් වධකොට බොහෝ දවසකින් දුක්දී මරන්නාහ; එබැවින් වහා මියයාම උත්තමය''යි කීහ.

ඒ අසා රජ්ජුරුවෝ 'තට හා තගේ අඹුදරුවන්ට මෙබඳු දරසෑයකුත් මෙසේ මරකුත් වේව'යි මට මෙවැනි මරක් නොවේව'යි කියා පුක්කුස ආදී තුන්දෙනා විචාළහ. ඔව්හුත් නුවණ නැතිව තමන් කටට ආවක්ම කීහ. එසේ හෙයින් කියන ලදී.

සුණොහි එතංවචනං, පසොතං මහබ්භයං
පුක්කුසං ‘දානි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසි-ති

මේ ගාථාව අසා පුක්කුසයා කියන්නේ “මහරජ! බ්‍රහ්මදත්තයෝ අල්වා ගත්තු නම් ජන්මාන්තර වෛරී හෙයින් නොයෙක් වධකොට චිරාත් කාලය කින් දුක් දී මරන්නාහ. කෙසේ කොටත් මරණ නොනවත්නා බැවින් අපි හැමදෙනම් උග්‍රවූ විෂයක් කාපියා වහා මියම්හ’’යි කීහ. උගේ බස් අසා නොසතුටුව “තාගේ අඹුදරුවන් හා සමග තෝ වස කා මියයව, මට මෙවැන්නක් නොකියව”යි කියා කාවින්දයා විචාළහ.

කාවින්දයාත් පණ්ඩිතයකු වූව, මින් ගැලවෙන්නට උපායක් දනී නම් කියව”යි

සුණොහි එතං වචනං, පසෙසතං මහබ්භයං,
කාවින්දං ‘දානි පුච්ඡාමි කිං කිච්චං ඉධ මඤ්ඤසි-ති.
මේ ගාථාවෙන් කීහ.

ඒ අසා කාවින්දයා කියන්නේ මහරජ! බ්‍රහ්මදත්ත රජතෙමේ අප අල්වා ගෙණ බොහෝ වධ කරවා මහා දුක්දී බොහෝ දවසකින් මරන්නේය; ඔහුද අතින් වධ විඳ මියන්නා නොබලාත් තමතමා ලනුවක් බැගින් ඇරගෙණ මාලි ගාවේ මතුමාලට නැගී සීමැදුරු කවුළුවෙන් පිටත කොබෝ ගෙඩි වලල්ලේ රැණ බැඳලා මළ ඉදිකොට කරලාගෙණ පැන මියම්හ. නොහොත් කර වැල් ලාගෙණ මියම්හ. නැත ගැඹුරු ප්‍රපාතයකට පැන පියා වහා මියම්හ”යි කීහ. ඒ අසා රජ්ජුරුවෝ එසේ කර වැල්ලාගෙණ මියයන මරෙක් තාගේ අඹුවන්ට හා තට වේව’යි ‘එසේවූ දෙයක් මට නොවේව’යි කියා “දෙවින්දය! මේ උපන් භය නොයිත් දුටුවෙහිවේද? ඉදින් නොයිත් උපායක් දනී නම් කියා බලව”යි,

සුණොහි එතං වචනං, පසෙසතං මහබ්භයං,
දෙවින්දං ‘දානි පුච්ඡාමි, කිං කිච්චං ඉධ, මඤ්ඤසි-ති.
මෙ ගාථාවෙන් කීහ.

මේ ගාථාව අසා ඒ පැන නැගී අතිකක් සොයා ගන්නට අසමර්ථව ‘සෙනක පණ්ඩිතයා කී ලෙසම කියම්’යි කියා “මහරජ! බ්‍රහ්මදත්තයා අල්වා ගති නම් තමා කැමති වධයක් කරවා බොහෝ දුක් දී කලාතුරකින් මරන්නේය. එසේ දුක් විඳ සතුරන් අත මියන්නා නොබලාත් මේ මාලිගාවේ දෙර පිටතින් වසා බත්දලා ගිනි ගස්වාලා තමතමාට කඩුවක් බැගින් ඇරගෙණ ඔවුනොවුන් කොටා මියම්හ, මෙ විසිතුරු මාලිගාව බ්‍රහ්මදත්තයාට ප්‍රයෝජනවත් නොවී අප හැමදෙනාට එකම දරසෑයක් වන්නේය. මේ විනා මා දන්නා අතික් උපායෙක් නැත, පොළොව පැකුළුනත්ට එම පොළොව පිහිට වන්නාසේ මේ දුකින් අප හැමදෙනා සුවසේ මුදාපියන් නම් කරුණා තිබානවූ ජන

හිත නිරතවූ මහෞෂධ ස්වාමීන්වහන්සේ විනා අපසේ නුවණින් අධියන්ට ඒ විෂය නොවෙයි, ඇවිලෙන ගිනි තබා කණමැදිරියන් පිඹින්නාසේ ප්‍රඥා නමැති වහ්නිස්කන්ධයෙන් සමස්ත ලොකය ඒකාලොක කර බබුළුවන මේ උත්තමයානන් සිටියදී අප හතරදෙනාසේ නුවණින් අධියන් අයින් ගැලවෙන උපාය විචාරන්නේ අපටත් වඩා නුවණ නැති නිසාද? කරණ යාච්ඤාවක් අපි හැම දෙනම පණ්ඩිතයන්වහන්සේට කරම්හ''යි මෙසේද කියා 'අපි හැමදෙනම බැගෑපත්ව හඬා දෙඩා ''අප ගලවාගත මැනවැ''යි යාච්ඤා කරම්හ, සතුරන් කෙරෙහිත් මිතුරන් කෙරෙහිත් සඳරැස් වන් කිරිමුහුදසේද සකකිරිවන් කළාසේද සමවූ මෛත්‍රී ඇති මේ උත්තමයානෝ තමන්ට විෂය වීනම් මෙතෙක් දෙනා අනාථ මරණින් මිය යා නොදෙන්නාහ, උන්වහන්සේත් තරව නොපිළිවනැ'යි කිවහොත් සේනක පණ්ඩිතයන් කී ලෙස දෙර බැඳ ගිනි ගස්වා උනුනුන් කොටා මියම්හ''යි කීය.

ඒ අසා රජ්ජුරුවෝ පෙර තමන් බොධිසත්ත්වයන්ට කළ කී අපරාධ සඳහන් කොට ඔබ හා සමග කිසිවකුත් කියන්නට අසමර්ථව මහතානන් අස අසා සිටියදී ඔබ ළය කම්පාවන පරිද්දෙන් බැගෑපත්ව හඬන්නාහු-

යථා කදලිනො සාරං, අනේවසං නාධිගච්ඡති,
එවං අනෙවසමානානං, පඤ්ඤං නාජ්ඣගමාමසෙ,

යථා සිම්බලිනො සාරං, අනේවසං නාධිගච්ඡති,
එවං අනේවසමානානං, පඤ්ඤං නාජ්ඣගමාමසෙ.

අදෙසෙ වත නො වුත්ථං, කුඤ්ජරානං වනොදකෙ,
සකාසෙදුම්මනුස්සානං, බාලානාම විජානතං.

උබ්බෙධති මෙ හදයං, මුඛං ච පරිසුස්සති,
නිබ්බුතිං නාධිගච්ඡාමි, අග්ගිදඩ්ඪොව ආතපෙ.

කම්මාරානං යථා උක්කා, අන්තො ඣායති නො බහි,
එවම්පි හදයං මය්හං, අන්තො ඣායති නො බහි-ති.

මේ ගාථාවන් කියා හැඬූහ.

මේ ගාථාවන්හි අභිප්‍රාය නම්- ''යම්සේ කෙහෙල්ගස් හර ඇතැයි වරදවා සිතාගත් නුවණ මඳ පුරුෂයෙක් සැපෙන යකඩයක් නැවතත් ගා මුවහත සියුම්කොටගෙණ මහත්වූ රම්භවනයකට වැද මහත් මහත් කෙහෙල් ගස් කපා බඩ දක්වා බිඹලු හැරත් එහි කිසි හරයක් නොදකීද, එපරිද්දෙන් මින් ගැලවෙන උපාය සොයන්නාවූ මම කිසි කෙනකුන් කෙරෙහුත් නුවණ නැමැති සාරයක් නොදුටුයෙමි. තවද ඉඹුල් හරයකින් ප්‍රයෝජන විදිනා කැමැති පුරුෂයෙක් කෙහෙල් හර සෙවූ පුරුෂයාසේ ඉඹුල් වනය කොටා එක ගස කත් හර නොදකීද, එපරිද්දෙන් මේ දුකින් ගැලවී ගන්නා උපායක් සොයන්නාවූ මම හර නැති ඉඹුල් රුකක්සේවූ මොවුන් හැමදෙනාගේ ප්‍රඥා නමැති

සාරයක් මඳකුත් දුටුවූද නැත්මි, පැන් නැති මහ වනයෙක්හි විසූ මහ ඇතෙක් ගිම් සමයෙහි සම්යෙන් පීඩිතවූවහුසේ දුකට පැමිණි කල්හි දුකින් මුදා ගලවා ගන්නට තරම්වූ උපායක් නොදන්නා අඥනයන් සමීපයේ අනේ මා විසූ තියාවත් ඉතා තපුරුය, දූත් මාගේ ලය සුලඟට වෙව්ලන්නාවූ ලඳ පල්ලව යක්සේ කම්පිතවන්නේය, කට කෙල සිඳී උගුර වියලී ගින්නෙන් තැවුනු එකක්හු අව්වේ ලූ කලක් පරිද්දෙන් කිසි අස්වැසිල්ලක් නොලබම්. තවද කඹුරු උදුනේ ගිනි ඇතුලෙන් දවයි. ඒ ගිනි පිටතට නොපෙණෙයි, එපරිද්දෙන් දූත් මාගේ ලෙහි මරණ ගිනි ඇතුලෙන් දවන්නේය. පිටතට නොපෙණෙන්නේය. මේපණ්ඩිතවරුන් අමාත්‍ය ධුරයෙහි නුවණට හා මන්ත්‍රීකමට තබා විසූ තියාව පැන් නැති මහ වනයෙහි ඇතු වීසුවාක් වැන්න, නුවණ නැති පුරුෂයා කෙහෙල් හර ඉඹුල්හර සෙව්වා වැන්න, ඒ නිරුදක වනයෙහි විසූ ඇත් උදකයෙන් පීඩිතවූසේ නොබෝ කලකින් සතුරන්ගේ හස්ත ප්‍රාප්තවේද, එපරිද්දෙන් නුවණ නැති පණ්ඩිතවරුන්ගෙන් එකකුත් මේ දුකින් මුදලන්නට සමර්ථ නොවේ''යි බැගෑපත්ව ඇඬුහ.

මෙසේ ඇසුවන් ලය කම්පාවන පරිද්දෙන් අඩන්නාවූ රජ්ජුරුවන්ගේ අදෝනා හඬ අසා සරණාගත වජ්‍රපඤ්ජරයක් වැනිවූ මාගේ සවාමිදරුවූ බෝධිසත්වයන් වහන්සේ ''මේ රජ මරණ භයින් ඉතා කලාන්තවීය සා පිපාසා ඇත්තවුන්ට අන්නපාන දෙක පිටිවහල් වන්නාසේ ගිලනුන්ට වෙදුන් පිටිවහල් වන්නාසේ මේ රජහටත් මා මුත් අනික් පිටිවහලෙක් නැත, මෙවිට මොහු අස්වසා නොලා තවත් තදවීතම් ශෝකයෙන් ලය පැලී ගිය නම් තපුර සාර මසක් මුළුල්ලේ මා ගත් දුක් නිෂ්ඵල වන්නේය. එබැවින් අස්වසාලම්''යි සිතා අස්වසා වදාලසේක, (ඒ බව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන්වහන්සේ

තතො සො පණ්ඩිතො ධීරො, අත්ථදස්සී මහොසධො,
වෙදෙහං දුක්ඛිතං දිස්වා, ඉදං වචනමබ්‍රවි–ති.

මේ ගාථාවෙන්–එම්බා මහණෙනි! ඒ රජතෙමේ මහෞෂධ පණ්ඩිතයෝ නොකමැති කර තමන් සරණ සොයා ගොස් හුන් උපකාරි නුවර බ්‍රහ්මදත්තයා එක් සියයක් රජුන් සහිතව මහ සේනාව ගෙණවුත් වටලාගත් කල්හි අඹුවන් තබා තමා ගැලවීගත නොහීම්දෙන උපාය විචාළේය, ඔහට මහෞෂධයන් ඔබ නොගිය මැනව, ගියහොත් මහා විනාශයට පැමිණෙන්නේය, නොයා හැක් කැයි කීම්. ඒ මං කටයුතු නොදනිති'යි වරදවා බැණ නිග්‍රහයෙන් පිටත ලවා ඔබ ගිය මැනව, ගියහොත් මහත් වැඩ වන්නේය'යි කියනලද සෙනකාදීන් බසින් නුඹවහන්සේ අා සේක්වේද, දූන් ඒ පණ්ඩිතවරුන් අතින් උපාය විචාරාගත මැනවැ''යි කී කල්හි සෙනකාදීවූ සතරදෙනාත් විචාරා උන් හැම දෙනා කියනලද මරණෝපාය අසා නොසතුටුව මහෞෂධ පණ්ඩිතයන්ට කිය නොහී භය ඇතිව උන්ට ඇසෙන පරිද්දෙන් අඩන්නාවූ වෛදෙහ රජු බස් අසා මෙවිට අස්වසා නොලිම් නම් ලය පැලී නැසීගියහොත් මා දිවා රෑ ගත් දුක් මුළුල්ලම ව්‍යර්ථ වන්නේය; තවද මතු බොහෝ වාදහස් මුළුල්ලෙහි සඳමඬල ඇන්දුසේ පෙණෙන්නාවූ මාගේ ප්‍රඥ විශෙෂය ජල රේඛාවක් පරිද්දෙන් තුච්ඡ වන්නේයයි සිතා රජහු අස්වසන්නාහු–

මාත්වං හායි මහාරජ! මාත්වං හායි රථෙසභ!
අහං ත්වං මොචයිස්සාමි රාහුගහිතං ව චන්දිමං.

මාත්වං හායි මහාරාජ! මාත්වං හායි රථෙසභ!
අහං ත්වං මොචයිස්සාමි රාහුගහිතංව සුරියං.

මාත්වං හායි මහාරාජ! මාත්වං හායි රථෙසභ!
අහං ත්වං මොචයිස්සාමි! පඞ්කෙ සත්තංව කුඤ්ජරං,

මාත්වං හායි මහාරාජ! මාත්වං හායි රථෙසභ!
අහං ත්වං මොචයිස්සාමී පෙළාබද්ධංව පන්නගං.

මාත්වං හායි මහාරජ! මාත්වං හායි රථෙසභ!
අහං ත්වං මොචයිස්සාමී මච්ඡෙ ජාලගතෙරිව.

මාත්වං හායි මහාරාජ! මාත්වං හායි රථෙසභ!
අහං ත්වං මොචයිස්සාමී සයොගගබලවාහනං

මාත්වං හායි මහාරාජ! මාත්වං හායි රථෙසභ!
අහං ත්වං මොචයිස්සාමී කාකසෙනංව ලෙඩ්ඩුනං.

අතීතානාගත ප්‍රත්‍යුත්පන්න යන කාලත්‍රය වර්තිවූ සියලු පදාර්ථයන් ස්වයම්භුඥානයෙන් පරොපදෙශ රහිතව තමන්ම දත් හෙයින් ඉතා නුවණැති වූ මහෞෂධ පණ්ඩිතයෝ වෛදෙහයන් මරණ භයින් පීඩිතව වලප්නවුන් මෙසේ කියා සන්හිඳුවමින් "මහරජ! නොබව මැනව, මේ එක්සියයක් රජුන් හා අටළොස් අක්ෂෞහිණී සංඛ්‍යාත සේනාව වටලාගෙණ සිටියදී රාහු මුඛයට වත් සඳමඬල ගලවාගන්නාසේ ගලවා ගණිමි. සූර්‍ය්‍යමණ්ඩලය ගලවාගන්නා සේ ගලවා ගණිමි. තවද මහ මඩෙහි එරීගිය ඇතක්හු ගොඩ ගන්නාසේ ගලවා ගණිමි. තවද මේ සේනාවෙන් කිසිකෙණකුන් නොදන්නා පරිද්දෙන් පෙළාවෙක හසුවූ නයකු ගලවා ගන්නාසේ බ්‍රහ්මදත්තරජ නමැති අහිකුණ්ඩික යාගේ සෙනා නමැති පෙළායෙහි හසුවූ වෛදෙහ නමැති නාගරාජයා ගලවා ගෙණ ගොස් මියුලු නුවර ලා ලන්නෙමි, තවද මැදිරියේ හසුවූ පක්ෂීන් ගලවා හරණසේ සුවසේ ගලවා ගණිමි. තවද දැල බැඳී මසුන් ගලවා ගන්නාසේ ගලවා ගනිමි. තවද මහරජ නොබව මැනව, නුඹවහන්සේ මතු නතිව ගලවා ගණිමියි නොසිතුව මැනව, නුඹවහන්සේ හා කැටිව අවාවූ ඇත් අස් රථ පදාත්‍යාදිවූ සෙනාවෙන් එකක්හටත් මේ සතුරාගෙන් කිසි උපද්‍රවයක් විය නොදී සුවසේ ගලවාගෙණ ගොස් මියුලු නුවර ලාලමි. තවද මහරජ! නොබව මැනව, ඉදින් සිතීම් තම් එක්සියයක් රජදරුවන් හා අටළොස් අක්ෂෞහිණී යක් පමණ රාජසෙනාව අතික් කෙණකුන්ගේ උපදෙශයක් හා යුධ ප්‍රයොග යක් නැතිව මාගේ ප්‍රඥා බලයෙන්ම කැටත් දමා කපුටු සමූහයක් පෙරනාසේ පලවා පියන්නටත් බැරි නොවන්නේය. නුඹවහන්සේ නොබවමැනව"යි අස්වසා වදාළසේක.

ඒ එසේමැයි-සෙස්සවුන්ගේ නුවණින් ප්‍රයෝජන කිම්ද? අමාත්‍යයෝ තමුත් නුවණැත්තෝ තමුත් මෙසේවූ දුකෙහිදී පිටිවහල්ව ඒ දුකින් මුදාලන්නාවූ උත්තමයෝ නොවෙද්ද? තවද බොධිසත්වයන්වහන්සේ වදාරණසේක් මහරජ! තුඹවහන්සේට පළමුව මම ආයෙම් කුමක් පිණිස ආහයි සිතුසේක්ද? මතු තුඹවහන්සේට මෙවැනි භයෙක් වන්නේයයි කියා ප්‍රඥා නැමැති දිවැසින් දුටුවාම මම නවතාලීමි, ඒත් නොනවත්නා හෙයින් ඒ බව දැන තුඹවහන්සේ නැසියාදී ඉඳීම මට තරම්නොවෙයි සිතා මට උදහස්වුවත් ඒ මා සිත නොතබා තුඹවහන්සේට පළමු අවුත් සාරමසක් මුළුල්ලෙහි මෙහි හිඳ කුමක් කළහයි සිතුසේක්ද? මහරජ! නොබව මැනව, මේ හයින් මුදා සුවසේ ගලවාගෙණ ගොස් මිථුලු නුවර ලාලමි''යි වදාළසේක, වෙදෙහ රජ්ජුරුවෝද බොධිසත්වයන් වහන්සේ ශඞකාරහිතව අභීත කෙශරසිංහරාජයකුසේ කිසි භයක් නැතිව කියන්නාවූ බස් අසා මෙවිට මාගේ ජීවිතය ලදිමී'යි අතිශයින් සතුටුව අස්වසාගත්හ. බොධිසත්වයන්වහන්සේ මෙසේ සිංහනාද කළ කල්හි සෙනකයා ආදීවූ බොහෝදෙන සතුටුව ගියහ. බොධිසත්වයන්වහන්සේ 'නොබව නොපහැමත් සුවසේ ගලවාගණිමි'යි කියන්ම සෙනකයා ආශ්චර්‍යයයට පැමිණියේ 'ස්වාමීනි! මේසා සේනාවක් අවුත් තුන් සත්ධියකින් හා සතර වලල්ලකින් යුක්තව අතුරු සිදුරු නැතිව වටලාගෙණ සිටියදී කවර උපායකින් ගලවාගෙණ යන සේක්ද'යි කීහ. එම්බල සෙනකය! මේ සතුරන් ලුහුබඳවා පියාවාසලින් පිටත්ව සතුරන් බල බලා සිටියදී යන්නෙම් වී තමුත් මට බැරි නොවෙයි, එතකුදුවුවත් උන්හැම නොදන්නා පරිද්දෙන් සරහනලද උමගින් ගෙණයෙමි''යි වදාසේක.

මෙසේද කියා 'සෙනකය! තෝ ගමනට සැරහීගණැයි වදාරා උමඟ දොර හරනට තමන්වහන්සේගේ යොධයන්ට විධාන කරණසේක්-

එථමානව උට්ඨෙථ මුඛං සොධෙථ සන්ධිනො,
වෙදෙහො සහමච්චෙහි උම්මඞ්ගෙන ගමිස්සති-ති.

යනුවෙන්-කුඩාවරුනි වහා නැගී ගොසින් උමඟ දොර හරිව් වෙදෙහ රජ්ජුරුවන්වහන්සේ අමාත්‍ය සමූහයා විසින් පිරිවරණලදුව උමගින් වඩනාසේකැ''යි වදාළසේක. ඔහු ගොසින් උමඟ දොර හැරපීහ. සියලු උමඟ සරහනලද සුධර්මා නම් දිව්‍ය සභාවසේ අති මනෝහරවීය. බොධිසත්වයන් වහන්සේගේ විධානයෙන් යොධයන් උමඟ දොර හළ නියාව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන්වහන්සේ-

කස්සතං වචනං සුත්වා පණ්ඩිතස්සානු කාරිනො
උම්මඞ්ග ද්වාරං විවරිංසු යන්ත යුත්තෙව අග්ගලෙ-ති

මේ ගාථාවෙන්-එම්බා මහණෙනි මහෞෂධ පණ්ඩිතයන්ගේ සුශික්ෂිත කිකරු යෝධයෝ ඒ පණ්ඩිතයන්ගේ තීක්ෂණවූ ප්‍රඥාවෙන් කරණලද උමඟ යන්ත්‍රයෙන් යුක්තවූ දොර අගුළු හැර ඒ බව බොධිසත්වයන්ට කීහ''යි වදාළසේක. ඒ බව අසා බොධිසත්වයන් වහන්සේ වැඩියමනා කාලැ'යි වෙදෙහ රජ්ජු

රුවන්ට දුන්වූ කල්හි රජ්ජුරුවෝ මාලිගාවෙන් බටහ. එවිට සෙනකයා එදවස් අමරාදෙවින් දූ නිසා තමා ලත් ඉස් පය්ය ඉසින් ගලවා කෝතමක් පාරවා හැඳ කඩ හකුළුවා තමා සිතවන් භය සේ පොට්ටනියත් එල්ලාගෙණ ඇත් මැත් බල බලා ඉගිකරුව සලෙයිකඩ ඉරා දණ වැලමිට තලල් ආදීවූ සර්‍ෆතයෙහි නො බැන්දයි නොසිතමි. මොහු මේ කරන්නාවූ විකාර මුළුල්ල බොධිසත්වයන් වහන්සේ දුක ‘නුවණ නැත්තව! තෙලෙ කුමක් කෙරෙ’යි දුයි වදාළසේක, පණ්ඩිතයන් වහන්ස! උමගින් යනකල තම් කෝතමක් හැඳගෙණ හත්පලන් වස්ත්‍රාභරණාදි සියලු අලංකාර හැර තබා දණ තමාගෙන වේදූ යන්නේ, එසේ හෙයින් මමත් උමගින් යන්නට සැරහෙම්’’යි කිය. ඔහට වදාරණසේක් ‘එම්බල සෙනකය! තෝ වැළින් උමගට වදනාකල දණ බිම ඔබා තැඹුරුවගෙණ ගොයකුසේ බඩගාමෙයම්’යි නොසිත, තෝ ඉදින් ඇතකු පිටින්වත් අසෙකු පිටින්වත් රථයකින්වත් යන්නා කැමැත්තෙහි වීනම් ඉන් කැමති වාහනයකට නැගීයව, මා විසින් කරණලද උමග උසින් අටළොස් රියනෙක ඉතා උස්වූ පළල්වූ වාසල් හා දොරටු ඇත්තේය. එබැවින් තෝ උමගින් යන්නට කෝතමක් නොහැඳ දණ කඩ නොබැඳ නා සැරසෙන යම් අලංකාරයකින් සැරහී කැමති වාහනයකට නැගී රජ්ජුරුවන්ට පළමු නික්මෙව’’යි වදාළසේක,

බොධිසත්වයන් වහන්සේ ඒ ඉතා භයපත්වූ සේනකයා පළමු යන්න ටත් රජ්ජුරුවන් මධ්‍යයෙහි යන්නටත් තිලකොටලා තමන් වහන්සේ පසුව ගමන් ගත්සේක. කුමක් නිසාදයත්, සෙනකයා සතුරන් දුක පාරව බා ගියේය. කිසිවකත් ආලය නොකොට පසු නොබලා දිවන්නේය. රජ්ජුරුවෝ තමන් සිහිනෙනුත් නුදුටුවිරූ විසිතුරු කොට සරහනලද උමග විස්තර බල වහා නොයන්නාහ එබැවින් තමන්වහන්සේ මහරජ! වහා වැඩිය මැනව’’යි කම්සත් යොට කොට යන පිණිස රජහට පසු වූසේකැ’යි දතයුතු. ඒ උමග ඇතුළේ මහජනයාට බොහෝ කැඳ බත් මාළු කනබොන දෑ මෙතෙකැයි පමණ නැතිවිය. එහි වන් මනුෂ්‍යයෝ කන්නාහු බොන්නාහු උමග විස්තර බලමින් මහත්වූ සන්තෝෂයෙන් යන්නාහු බොධිසත්වයන් වහන්සේ ‘මහරජ! වහා වැඩිය මැනව වහා වැඩිය මැනවැ’යි කම්සත් කෙරෙමින් රජහුගේ පස්සෙන් වඩනාසේක. රජ්ජුරුවෝ සුදම් දෙව් සභාවසේ ඉතා සිත්කළුවූ උමග බලමින් යන්නාහ. උමගින් යන පරිදි වදාරණ බුදුරජානන්වහන්සේ-

පුරතො සෙනකො යාති, පච්ඡතො ච මහොසධො
මජ්ඣෙ ච රාජා වෙදෙහො, අමච්චපරිවාරිතො-ති.

මේ ගාථාවෙන්-එම්බා මහණෙනි! එදවස් උමගින් යන ගමනේ සෙනකයා පළමුයෙයි, මහෞෂධ පණ්ඩිතයෝ පස්සෙහි යන්නාහ, දෙදෙනා මධ්‍යයෙහි වෙදෙහ රජ අමාත්‍ය මණ්ඩලයා පිරිවරා නික්මිණැ’’යි වදාළසේක.

රජ්ජුරුවන් හා පණ්ඩිතයන්වහන්සේ අා බව දුන රුකවල සිටි යොධයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මැතියන් ආදී රජදරුවන් සතරදෙනා

උමගින් පිටත් කොට මහ විසල් මලුවේ සිටුවාලූහ. රජ්ජුරුවෝත් බෝධි සත්වයන් හා සමග උමගින් පිටත්වූහ, ඔහු සතරදෙන බෝධිසත්වයන් දැක් රජ්ජුරුවනුත් දැක "ඒකාන්තයෙන් සතුරන් අත්පත්වූම්හ, අපගෙණාවන් පණ්ඩිතයන්ගේ යෝධයන් සැටිය"යි මරණ හයින් තැතිගෙණ මහ හඬින් හැඬූහ. ඔහු සතරදෙනා ඇඬූවේලෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් 'වෙදෙහ රජ පලාගියේ'යි යන ක්‍රොධයෙන් ඒ නුවරවට තුන්ගව්වක් මානයේ රැකවල් බලා අවුත් ගංතෙරට නුදුරු තැනෙක්හි සිටියාහු නිශ්ශබ්දව තුබූ මධ්‍යම රාත්‍රියෙහි ඒ හැඬූ ශබ්දය අසා නන්දාදෙවීන්ගේ කටහඬ වැන්නැ'යි කීම්තම් 'කොයින් නන්දාදෙවිය! ගිය යම්ම තැනෙක නන්දාදෙවි සඳහන් නොකොට ගිදින්ට දවසෙක් නැතැ"යි අනුන් කියන බසට ලජ්ජාවෙන් කවුරුවන්වත් නොකීහ. බෝධිසත්වයන්වහන්සේ මහවිසල් මලුවේදීම රුවන් රැසක් පිට සිටුවා පඤ්චාලචණ්ඩි කුමාරිකාවන් අභිෂෙකයට පමුණුවා රන් කෙණ්ඩියෙන් සුවඳ පැන් වත්කොට "මහරජ! නුඹවහන්සේ මේ කුමාරිකාවන් ගෙණ යන්නට අවුදින් මෙසා දුකට පැමිණිසේක. එබැවින් නුඹවහන්සේට අගමෙහෙසුන් වන්නීයයි වදාළසේක.

එවේලෙහි තුන්සියයක් නැව් ගෙණවුත් තොට තබාලූහ. රජ්ජුරුවෝ මහවිසල් මලුවෙන් ගොස් සරහනලද නැවකට නැංගාහ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මැනියන් ඇතුළුවූ රජදරුවෝ සතර දෙනාත් එම නැවට නැංගාහ. ඒ බව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන් වහන්සේ–

උම්මග්ගා නික්ඛමිත්වාන, වෙදෙහො නාව මාරුහි,
අභිරූළ්හංච තං ඤත්වා, අනුසාසි මහොසධො.

අයං තෙ සසුරො දෙව, අයං සස්සු ජනාධිප
යථා මාතු පටිපත්ති; එවං තෙ හොතු සස්සුයා.

යථාපි නියකො භාතා, සොදරියො එකමාතුකො,
එවා පඤ්චාල චණ්ඩො තෙ, දයිතබ්බො රථෙසභ.

අයං පඤ්චාල චණ්ඩිතො, රාජපුත්ති අභිජ්ඣිතා
කාමංකරොහි තෙ තාය, භරියා තෙ රථෙසභ–ති.

මේ ගාථාවන්ගෙන් වදාරණසේක්—එම්බා මහණෙනි! එදවස් වෙදෙහ රජ උමගින් පිටත්ව නැවට නැංගේය. ඔහට මහෞෂධ පණ්ඩිතයෝ "මහරජ! මේ පඤ්චාල චණ්ඩි කුමාරයෝ නම් සුහුරුබඩුනුවෝය, මේ නන්දාදෙවී නම් නුඹවහන්සේගේ නැන්දනියෝය, නැන්දනියන් කෙරෙහි වැදූ මෑනිකෙණෙකුන්ට කරණ ආදරයක් පරිද්දෙන් පිළිපැද්ද මැනව, නැවත පඤ්චාලචණ්ඩි කුමාරයෝ සුහුරු බඩුනුවෝයයි ආලිස්සත් නොකොට එක කුසින් උපන් මල් බෑකෙණකුන්ට පරිද්දෙන් දයා කටයුතුය. මේ පඤ්චාලචණ්ඩි කුමාරිකාවෝ නම් උභයකුල පරිශුද්ධ ක්‍ෂත්‍රිය කන්‍යාවෝය. උන් නුඹවහන්සේ කැමැති පරිද්දෙන් රාජෛශ්වර්‍ය්‍යයෙහි පිහිටුවා රක්‍ෂාකළ මැනවැ"යි කියා අවවාද කළහ'යි වදාළසේක.

මෙසේ අනුශාසනා කෙළේ කුමක් පිණිස ද? යත් සරණ දෙම්හයි මායමින් අප ගෙන්වාගෙණ මෙසා භයකට පමුණුවා ගැහැටකළ රජුගේ මව මරව් අඹුදරුවන් මරවයි මැරුයේවීනම් නපුරු''යි සිතාත් "දුවනියන්ට වඩා නන්දා දේවීන් අධික රූ ඇති හෙයින් අඹුවූ මුලාවූ රජ්ජුරුවෝ දුවනියන් තබා මෑනියන් කෙරේ ලොභ උපදවා නෑකම් වරදවාපිහුනම් නපුරුයි''යි සිතා පළමුකොට රජ්ජුරුවන් අතින් ප්‍රතිඥා ඇතිකරනත්හයිදතයුතු රජ්ජුරුවෝත් "පුත තොප කිලෙසින් කිසිවකුත් නොවරදවා කෙරෙමි''යි ඔබගේ අවවාද සිතින්ම පිළිගත්හ. එසේ අවවාද කරණසේක් රාජ මාතාවන් නලනාදේවීන්ගේ නමකුත් නොවදාළසේක. කුමක් පිණිසද? යත්, උන් මෑහැලි හෙයින්ම කිසිවකුත් නොවදාළසේක. මේ සියලු කථාව මහ බොධිසත්වයන් වහන්සේ ගංතෙරදී ගොඩසිටම වදාළසේක. ඉක්බිති රජ්ජුරුවෝ නැවින් වහා යනු කැමැතිව පුත! තෙපි ගොඩසිටම දෙඩව්ය, වහා නැවට නැගෙව, කුමක් පිණිස ගොඩ සිටුද? සතුරන් අතින් දුකසේ මිදුනම්හ, එබැවින් වහා නැගී යම්හ''යි:-

ආරුය්හ නාවං තරමානො, කින්නුතීරම්හි තිට්ඨසි,
කිච්ඡා මුත්තම්හ දුක්ඛතො, යාම 'දානි මහොසධා-ති.

මේ ගාථාවෙන් කීහ:-

ඒ අසා දෙවයන්වහන්ස! 'තුඹවහන්සේ හා එක්ව නැගී යාම යුක්ත නොවේ'යි කියා ගාථා දෙකකින් වදාරණසේක්:-

නෙස ධම්මො මහාරාජ, සො'හං සෙනාය නායකො,
සෙනඞ්ගං පරිහාපෙත්වා, අත්තානං පරිමොචයෙ,

නිවෙසනම්හි තෙ දෙව, සෙනඞ්ගං පරිහාපිතං,
දින්නං ච බ්‍රහ්මදත්තෙන, ආනයිස්සං රථෙ සහා-ති.

මහරජ සේනාවට නායක කෙණෙක් සේනාව සතුරන්ට අත්පත් වූ කල තමා දන්නා යම් උපායකින් ඒ සේනාව ගලවාගෙණ යාමක්වත් නොහොත් එක්ව නැසී යාමක්වත් නොකෙළේවීනම් උන්ගේ සේනා නායක කමින් ප්‍රයෝජන නැත්තේය. ඒ තමා ධර්මිෂ්ඨකමකුත් නොවන්නේය, දූන් මමත් සේනානායකව අවුත් සේනාව සතුරන් හස්තප්‍රාප්තව ඇතුළු නුවර සිටියදී (යෙම්ද) අප වැන්නෝත් තනිව දිවි රැකගැන්මක් කෙරෙද්ද? "මහ රජ තුඹවහන්සේ හා කැටිව සාරසියයක් ගව් ගෙවා ආ සේනාවන්ගෙන් සමහර කෙණෙක් මාර්ගයෙහි ගමනින් ශ්‍රාන්තව නිදන්නාහ. සමහර කෙණෙක් අන්නපානාදියෙන් සන්තුෂ්ටව මේ ගමන් තමා නොදන්නාහ. තවද මා හා කැටිව ආවුන්ගෙන් සාරමසක් මුළුල්ලෙහි උමඟ හා අගල පවුරු ආදී සියලු කර්මාන්තකොට රෑ පාන අනවරතයෙන් දුක්ගෙණ විඩා වූවාහු මේ එන නියාව උයින් නොදන්නාහ. එබැවින් උන් හැම මට උපකාරව සිටියන්ගෙන් එකකුත් ඇරපියා ඊම මට තරම් නොවෙයි, ඒ සියලු සේනාවම බ්‍රහ්මදත්ත රජුගෙන් ජයගෙණ උන් දුන් සේනාවක් පරිද්දෙන් නැවත ගැරගෙණ එමි. මහ රජ තුඹවහන්සේ අනන්තරාය මාර්ගයෙහි ඇසිල්ලකුත් නොරඳා වහා වැඩිය

මැනව, පළමු මාවිසින් නුඹවහන්සේට යොත්තකට ගමක් බැගින් ගම් කරවා ඉඩම් ලබා අතරමඟ ගම් සියයෙහිම වස්ත්‍රාභරණ අන්නපානයෙන් සමෘඩ කරවා ඇත් අශ් ආදී වාහන සරහා පිහිටුවන ලද, ගමින් ගමට පැමිණි කල කැටිව යන වාහනයෙන් දුර්වලයන් එහි රඳවා එහි තුබූ වාහනයකට නැගී වහා මියුලු නුවරටම වැඩිය මැනවැ''යි වදාළසේක.
ඒ අසා රජ්ජුරුවෝ:-

අප්පසෙනො මහාසෙනං, කථං විග්ගය්හ එස්සසි,
දුබ්බලො බලවන්තෙන, විහඤ්ඤිස්සති පණ්ඩිතා–ති.

මේ ගාථාවෙන් කීහ:-

මෙහි අභිප්‍රාය නම් පුත ''මහෞෂධ පණ්ඩිතයෙනි! තොපගේ සේනාව මඳවූව බ්‍රහ්මදත්තයන්ගේ මහා සේනාවය, කෙසේ ජයගණුද? බලවන්තයෝ දුර්වලයන් නසාපියා මහා විනාශයට පමුණුවාපියති''යි කීහ. ඒ අසා බෝධිසත්ත්වයන් වහන්සේ වදාරණසේක්:–

අප්පසොතොපි චෙ මන්තී, මහාසෙනං අමන්තිනං,
ජිනාති රාජ රාජානං, ආදිච්චො වොදයං තමං–ති.

මේ ගාථාවෙන් මහරජ! ඇසුව මැනව; මහා සේනාව ඇතිවත් අමන්ත්‍රී තැනැත්තාවූ අල්ප සේනාව ඇති මහා මන්ත්‍රියා ජයගන්නේමය, එබැවින් අමන්ත්‍රීවූ මහා සේනාව මහා මන්ත්‍රීවූ මම මාගේ ප්‍රඥ බලයෙන් ජය ගනිමි. තවද අමන්ත්‍රී කෙවට්ටයා ඇති මහා සේනාව සහිතවූ බ්‍රහ්මදත්තරජහු මහා මන්ත්‍රීවූ මා වැනි එක් ඇමතියෙක් ඇති මඳ සේනාව සහිතවූ නුඹවහන් සේ ජයගන්නාසේක. ඒ කුමක් වැනිදයත්? සමස්ත ලොකයෙහි එක පැතිර පවත්නාවූ මහා සනාන්ධකාරය ඉරුඋදකලකල්හි එක පැහැර දුරුව ආලොක වන්නේය. එබැවින් සේනාව මඳවූවත් ජයගන්නෙම් නම් මම්මය, නුඹ වහන්සේ සැක නොව වැඩිය මැනවැ''යි වදාරා රජ්ජුරුවන් වැඩ රැඳුනුසේක.

ඉක්බිති රජ්ජුරුවෝ 'සතුරන් අතින් මිදුනම්හ' සොයා ආ බිසවුනුත් ලදුම්හ, අපගේ මනදෙලන් මුදුන් පැමිණියේය'යි බෝධිසත්ත්වයන්ගේ ගුණ සිහිකොට උපන්නාවූ පස්වණක් ප්‍රීතින් පිණ පිණා ඔබගේ ගුණ සේනකයාට කියන්නාහු:–

සුසුඛං වත සංවාසො, පණ්ඩිතෙහිති සෙනක
පක්ඛිව පඤ්ජරෙ බද්ධෙ, මච්ඡෙ ජාලගතෙරිව
අමිත්ත හත්ථං ගතෙ, මොචයී නො මහොසධො–ති.

මේ ගාථාවෙන් සෙනකය! නුවණැත්තන් හා එක්ව විසීම ඉතා යහපත් වන්නේය, මෙලොවිනුත් පරලොවිනුත් සැපවන්නේය, මැදිරියෙහි බැඳි ලිහිණියන් සෙයින්ද දැල බැඳි මසුන් පරිද්දෙන්ද සතුරන්ට අත්පත්වූ අප

හැමදෙනාම මහෞෂධ පණ්ඩිතයෝ ගලවා හැරපීහ, එබැවින් නුවණැත්තවුන් හා එක්ව වීසීම උතුමැ''යි මුඛ නොසැහෙන පරිද්දෙන් කීහ. ඒ අසා සෙනක යෑත් තමා ඇතිතෙක් පටන් මහබෝසතානන්ගේ ගුණයක් කියන්නේ:-

එවමෙතං මහාරාජ, පණ්ඩිතාහි සුඛාවහා,
පක්ඛිව පඤ්ජරෙ බද්ධෙ, මච්ඡෙ ජාලගතෙරිව,
අමිත්ත හත්ථත්ථ ගතෙ, මොචයී නො මහොසධො-ති

මේ ගාථාවෙන්- ''මහරජ ඒ සැබව, ඉතා සැබෑමය. නුවණැත්තවුන් හා එක තැන විසීම ඉතා සැප වන්නේය. මැදිරියෙහි හසුවූ ලිහිණියන් සෙයින්ද දැලක බැඳි මසුන් පරිද්දෙන්ද සතුරන්ට අත්පත්වූ අප හැම මහෞෂධ පණ්ඩිතයෝ සුවසේ ගලවා ඇරපූහ''යි කීහ.

ඉක්බිති වෛදෙහ රජ්ජුරුවෝ ගඟින් එතර බැස බෝධිසත්ත්වයන් වහන්සේ විසින් යොදනෙන් යොදන සාරවනලද ගම්වලට පැමිණ ඔබ විසින්ම පළමු විධාන අසාගත් අමාත්‍යයන් සපයා එවනලද හස්ත්‍යශ්වාදී වාහන හා අන්නපානාදියෙන් හා නොයෙක් වගීයේ කැවුම් හා කන බොන දෙයින් සන්තුෂ්ටවව ගමන් විඩාවූ වාහන එහි රඳවා නව වාහනයන්ට නැගී යන්නාහු ගමින් ගමට පැමිණ මහතානන්ගේ විධාන පරිද්දෙන් මාගී විඩා සන්හිඳුවා නොපමාව යන්නාහු සාරසියගක් ගව් ගෙවා දෙවන දවස් පෙරවරු බතට මියුලු නුවරට වන්හ.

බෝධිසත්ත්වයන්වහන්සේ රජහු යවා උමඟ දෙරට වැඩ තමන්වහන්සේ උරෙහි එල්වා ගිය මගුල් කඩුව කොපුවෙන් මෑත්කොට උමං දෙර මහවිසල් මලුවේ වැලි පිරා යට සඟවා තබා උමඟින් ගොස් උපකාරි නුවරට වැද සොළොස් කළයක් සුවඳ පැනින් ඉස්සෝදා නහා නොයෙක් රසයෙන් අනර්ඝවූ භෝජනය අනුභවකොට යහන මත සැතපුනුසේක් මාගේ මනදෙළ මුදුන් පැමිණියේය''යි සිතා පස්වණක් ප්‍රීතීන් පිණ පිණා සුවසේ සැතපුණුසේක.

ඒ රාත්‍රිය පහන්වූ ඇසිල්ලෙහි චූලනී රජ්ජුරුවෝ සේනාව සටනට මෙහෙයන්නාහු නුවරට සම්පවූහ. (ඒ රජහු සේනාවට විධාන කෙරෙමින් සැරහී ආ නියාව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන්වහන්සේ-)

රක්ඛිත්වා අරුණං රත්තිං, චූලනියො මහබ්බලො,
උදෙන්ත අරුනුග්ගමහි, උපකාරිං උපාගමි.

ආරුය්හ පවරං නාගං, බලවන්තං සට්ඨිහායනං,
රාජා ආවොච පඤ්චාලො, චූලනීයො මහබ්බලො.

සන්නද්ධො මණිවම්මෙන, සරමාදාය පාණිනා,
පෙස්සියෙ අජ්ඣභාසිත්ථ, පුථු ගුම්බෙ සමාගතෙ-ති.

මේ ගාථාවෙන්:- එම්බා මහණෙනි! බලවාහන සහිතවූ බ්‍රහ්මදත්ත රජ තුන්යම් රාත්‍රියෙහි තුන් සන්ධියක් හා සතර වළල්ලකින් අතුරු සිදුරු නොපෑ ඒ ඒ ස්ථානයෙහි බල ඇණි සිටුවා තුමූ රුකමල් ලවා ඇවිද අරුණු

නැගී පහන්වන්නා හාම ඒ උපකාරී නුවරට ආයේය. තවද පඤ්චප්‍රකාර බල යෙන් යුක්තවූ බ්‍රහ්මදත්ත රජ සැට හවුරුද්දෙන් මද නැගි විහිදුනාවූ කන් පට තුන් තැනකින් පැළී තිබෙන්නාවූ සටන්හි ජය බිම් හඳුන්නාවූ ගිය ගිය තැන සතුරන් බිඳ ජයගන්නට සමර්ථවූ බල ඇති සළු ලක්ෂණ සම්පන්න සියලු හස්ත්‍යලඞ්කාරයෙන් සරහනලද උතුම් මඟුලැත්හු පිටට පැන නැගී මැණික් ඔබා කරණලද රන් සන්නාහ සන්නඬව හියක් තිසපිට ලා ධනුශ් ශිල්පයෙහි දක්ෂවූ සන්නාහ සන්නඬව අනෙක ප්‍රකාර යොධයන්ට මෙසේ විධාන කෙරෙමින් නුවරට සමීපවීය''යි වදාළසේක.

ඒ රජහු සේනාව මෙහෙයූ පරිදි කෙසේද? යත්

හත්ථාරොහෙ අනීකට්ඨෙ, රථිකෙ පත්තිකාරකෙ,
උපාසනම්හි කතහත්ථෙ, වාල වෙධෙ සමාගතෙ-ති.

මෙවිට චූලනී රජ්ජුරුවෝ වෛදෙහ රජ ජීවග්‍රහයෙන් අල්වා ගන්නට අාඥකරන්නාහු "ඇතුන් නැගෙන්නාවූද අසුන්නැගෙන්නාවූද රථනැගෙන් නාවූද පඤ්චායුධ සන්නඬව ආවාවූ මහා සේනාවද, ඉනුත් ධනුශ්ශිල්පයෙහි දක්ෂවූ කෘත හස්ත වූ එක්වන් කරණලද අභ්‍යාස ඇතූ එසේ හෙයින්ම කලු හස් ලොම කරබටුවක් බැඳ දඹු බස්නා මනාසේ දෙදණ්ඩක් හිඳුවා එහි සරස බැඳි වියලි දණ්ඩ බැඳ කරබටුව එල්වූ කළු හස් ලොම විදුලිය ආදීවූ යම් කිසි ආලෝකයකින් පලා විදපියන්නට සමර්ථවූ යොධයෝ මහා සන්නඬව එත්ව''යි කියාද, තවද චූලනී රජ්ජුරුවෝ "වෛදෙහ රජ තොමරා අල්වා ගන්මි''යි කියමින් සැට අවුරුද්දෙන් මදහෙන්නාවූ මටසිලුටුවූ දළ ඇති කුඤ්ජර කියනලද බලසම්පන්න යොධ ඇත් සමූහයෙන් සිය දහස් ගණන් මෙහෙයා මෙම වෛදෙහ රජු නිසා මහෞෂධ පණ්ඩිතයා විසින් කරණලද මේ උපකාරි නුවර අට්ලොස් රියන් පවුරු මිරිකාපියව''යි කියාද–"තවද බාල වස්සන්ගේ දත්සේ ඉතා සුදුවූ ?යුණුවූ මූවහත් ඇති විදිනාකල ඇටපලා විදපියන් මුත් මැනක නොරඳවන්නාවූ ධනුශ් ශිල්පයෙහි දක්ෂ යොධයෝ මහා වෂීවක් පරිද්දෙන් ශරවෂී වස්වත්වයි; තවද සෞරවියෂී ඇති අනෙක ප්‍රකාර විචිත්‍රවූ පඤ්චායුධ සන්නඬව සංග්‍රාමයෙහි එඩී පසු නොබලා ඉදිරියටම දිවන්නාවූ තමන් ඉදිරියෙහි ඇතුන් දුටත් දළ අල්වාගෙණ වෙවුල්වා පියන් නටත් සමර්ථවූ තරුණ යෝධයෝ වහා එත්ව'යි තවද ආයුධම බලකොට ඇත්තාවූ නොයෙක් බලවත් ආයුධ ගත්තාවූ සන්නාහ සන්නඬවූ සටනෙහි පිටිපා නොයන්නාවූ මාගේ යොධයන් අතින් වෛදෙහ රජ කෙසේ නම් මිදී පලායන්නේද? ඉදින් යම් කිසි භාග්‍යයෙකින් පක්ෂියෙකු පරිද්දෙන් ආකාශයෙන් යේ නමුත් මාගේ දුනුවා යෝධයෝ යා නොදෙන්නාහ:– තවද මාගේ තිස්දහසක් පමණ බලසම්පන්නවූ අසමාන යොධයෝ සංග්‍රාමයට සිස් අතින් ගියාහු වී නමුත් සතුරන් අත ආයුධම උදුරාගෙණ සතුරන් සාධාගන් නාහ; උන් සමාන එකකුත් දඹදිව එක් රජක්හු සම්පයෙහින් මාදකින්නේ නැත, එබඳුවූ යොධයන් ඇත්තෙම් මමය. උයින් සන්නාහ සන්නඬව වහා එත්වයි, තවද රන් සන්නාහයෙන් සරහන ලද බලසම්පන්න අසුන් පිට උන්

තාවූ මතාවූ දකුම් ඇති රාජකුමාරවරු වහා අසුන් මෙහෙයත්ව’යි තවද රත්වන් පිළි ඇඳ ස්වර්ණාලංකාරයෙන් සැරහී රත්වන් අඞ්ගරාග ගල්වා පඤ්චායුධ සන්නද්ධව රත්සැත් රත්පොරෝදු ආදී ස්වර්ණාලඞ්කාරයෙන් සරහනලද ඇතුන් නැගී නඳුන්වන උයන්හි දෙවතා සමූහයක්මෙන් අසමානවූ යෝධයෝ සිය දහස් ගණන් වහා එත්වයි, තවද පෙටියන් බඩ පැහැ සමාන වර්ණ ඇති සකස්කොට ධාරා තගනලද නුවණැති පුරුෂයන් විසින් සුවිනීත කොට තුන් සතහා නිමවනලද ඉදින් සුළඟින් මුවහතට සම්ප්‍රාප්තවූ පුළුන්රළ වුවත් කැපී සිඳී යන තරම්වූ තීක්ෂණවූ මුවහත් ඇති මධ්‍යාහ්නයෙහි සූර්‍ය්‍යමණ්ඩලය මෙන් බබලන්නාවූ යහපත්කොට කරණලද කඩු ගත්තාවූ (ඒ කෙසේවූ කඩු ජාතියෙක්ද? යත් ජාති වානේ කැටි පිහිරින් ගා සුණුකොට ඒ සුණු දඬමස් හා එක්කොට අනා ඒ මස් කොස් ලිහිණියන් කවා උන් ලූ වසුරු දවා වානේ ගෙණ නැවත දහනා පළමු පරිද්දෙන් ඒ පක්ෂීන් කවා එම පරිද්දෙන් සත් වාරයෙක කවා දවාගත් වානයෙන් කළ කඩු ජාතියෙකැයි දතයුතු) යෝධයෝ සතුරන්ට කොවරදවා පහර දෙන්නාවූ කොපුවෙන් අදනාලද කඩු ගෙණ වහා එත්වයි, තවද මාගේ අසමානවූ තිස්දහසක් පමණ පතාක යෝධයො වහා එත්වයි, (ඔහු කෙසේවූ යොධ කෙණෙක්ද? යත් යම්සේ මාරසේනාවක් බඳුවූ සතුරු සේනාවක් අගල පවුරු අට්ටාල බලකොටු වාසල් සහිතවූ අයොධ්‍ය පුරය හා සමාන එක් නුවරෙක උන්නාවූ නමුත් මේ මාගේ පතාක යෝධයෝ ඉන් පිටත සිටියාවූ එබඳු අවිෂය ස්ථානයෙහි සිටි සතුරන් සාධම්හ’යි සිතූ නම් පිටත සිටි තැනම සිට ආකාශයට කරණම් පැන එසේ උඩපිනූ කරණම්න්ම නැවතත් බිමනොහී නැවත නැවත කරණම් පනින්නාහු ආකාශයෙන් ගොස් අතතුබූ ආයුධයෙන් ඇතුළු නුවර උන් සතුරන් නිරවශෙෂයෙන් සාධා නැවත එපරිද්දෙන්ම කරණම් පැන පැන ආකාශයෙන් අවුත් තමන් පළමු සිටි තැන සිටිනට පෝසත්හ. ඒ යෝධයෝ ඉදින් ඇත් කඳ වී නමුත් තමන්ගේ කඩු වෙන් එක පහරින් මැදින් පොළඟසන්නට සමර්ථයහ) එම්බල වෙදෙහ කොල්ල! පළමු තාගේ ගොවියා පුතුගේ මන්ත්‍රී කමින් හා ඔහුගේ ප්‍රඥාන්විතභාවයෙන් ගැලවින. දූත් වූකලී තට මිදී යාමෙක් නම් කොයින්ද? දූත් තාගේ පණ්ඩිත යාගේ මන්ත්‍රීකමන් මින් ගැලවී මියුලු නුවරට යාමන් බලමි. දූත් තෝ කරප හෙළාගත් මසකු පරිද්දෙන් අසුවූයෙහි වේදූ’’යි කියා වෙදෙහ රජහට තතන මින් ‘දූත් අල්වමි දූත් අල්වමි’යි කියා වජ්‍රාඞ්කුවශයෙන් ඇතු මෙහෙයන්නාහු ගණුව, බිඳුව විදුව’යි කිය කියා සෙනග මෙහෙයමින් උපකාරී නුවර මැඩ වතුරක් ගලන්නාක් පරිද්දෙන් අවුත් වත්හ.

ඉක්බිති බොධිසත්වයන් වහන්සේගේ චරපුරුෂයෝ තමන් තමන්ගේ ආණ්ඩු පිරිස හා සමග ‘‘කවුරු දනිද්ද? ඉදින් පවුරු බිඳ නුවර මිරිකාගෙණ වදිත් නම් ඒ සියයක් රජුන් හා බ්‍රහ්මදත්තයන්ගේ ඉස්හෙසාලා අප ගේ පණ්ඩිතසවාමීන්ගේ පාපිට දමාලම්හ’’යි තමන් තමන් සිටින්නාවූ රජදරු වන් පිරිවරා ගත්හ. එවේලෙහි තුන් ලෝ තිලකවූ ත්‍රිලොකෙක ගුරුවූ පර ත ෘ මර්දනවූ ප්‍රතාප හා ගම්භීර ප්‍රඥා විශෙෂ ඇති සකල චක්‍රවාල ශසනා ගජ

මර්දනයට භාස්වර කෙශර සිංහරාජ වික්‍රම ඇති මාගේ ස්වාමිදරුවූ ශ්‍රී මහා බොධිසත්ත්වයන්වහන්සේ රූ සැපතුණු ශ්‍රී යහනින් නැගී සිට ශරීර කෘත්‍යය සපයා පෙරවරු බත කල්හබා අනුභවකොට, රත්පට රුවින්සොළු කණ් කුණ්ඩලාභරණ හාඬක නාගවඩම් සාදු කාප්පු මුතුපට පට්ටෝඩම් බාහු දණ්ඩි මිණිවලලු ගිගිරි වලලු මණි කයිවඩම් පස්රූ රුවන්වැලි රන්සවඩි පාද සංබලා පාදාභරණ පාසලම් පාද කිංකිණික පාදජාලා මේ ආදීවූ ආභරණ යෙන් සැරහී ලක්‍ෂයක් වටනා කසී සළුවක් ඇඳ ලක්‍ෂයක් වටිනා රත් පලසක් එකාංශකොට පොරවා සතරත්මය රුවන් කර්මාන්තයෙන් විසිතුරුවූ සෝලු ලියක් අතින් ගෙණ රන් මිරිවැඩි සඟලක් පයලා දෙවඟනන් පරදවන රූ ඇති සර්වාභරණයෙන් සැරහුනාවූ තරුණ ස්ත්‍රීන් දෙදෙනකු ලවා සුදු චාමර දෙකක් සල්වන සේක් සිත්කලුකොට සරහනලද තමන්වහන්සේගේ මාලිගාවේ සී මැදුරු කමුළුව හරවා චූලනී රජ්ජුරුවන්ට තමන්වහන්සේ පෙණෙන පරිද්දෙන් ශක්‍රදෙවේන්ද්‍ර ලීලාවෙන් ඇත් මැත් බල බලා සක්මන් කළසේක. චූලනී රජ්ජුරුවෝ ඒ මහතානන් වහන්සේගේ රූප ශ්‍රී බලා සිත පහදවාගත නොහී දූත්ම මොහු අල්වා ගණිමි’යි සිතා වහා ඇතු මෙහෙයන්නාහ.

ඒ දැක පණ්ඩිතයන් වහන්සේ සිතනසේක් “මේ රජ එකාන්තයෙන් වෙදෙහයා මා විසින් අසුකරණ ලදැයි සිතා වහ වහා ඇතු මෙහෙයමින් එන්නේමය, තමන්ගේ අඹුදරුවන් ඇරගෙණ අපගේ රජ්ජුරුවන් මියුලු නුවර ගිය නියාව “නොදන්නේයයි” සිතා ‘සකස්කොට ඔප් නැගූ රන් කැඩ පතෙක පැහැ සමානවූ මාගේ මුහුණ මේ රජුට දක්වාලා රජු හා සමග කථා කරමියි සිතා සීමැදුරු කවුළුවෙන් රජහු මුහුණ බලා මධුරස්වරයෙන් රජහු හා කථා කරණසේක් මෙසේ වදාරණසේක.

කින්නු සන්තරමානොව, නාගං පෙසෙසි කුඤ්ජරං,
පහට්ඨරූපො ආපතසි, ලද්ධත්‍ථොස්මීති මඤ්ඤසි

ඔහරෙතං ධනුං චාපං, ඛුරප්පං පටිසංහර,
ඔහරෙතං සුභං වම්මං, වෙළුරියමණි සන්ථතං–ති.

“ඇයි මහරජ! ඉක්මන් ඉක්මන්ව ඇතු මෙහෙයන සේක් තමාගේ අභිමතාර්‍ථය සිඬවීයයි සිතනසේක්ද? කිසි විටෙකත් එසේ නොසිතුව මැනව. මහරජ, නුඹවහන්සේ සිත ඇත්ත තබාපියා මෙවිට මා කීවක් කළමැනව, ඊයේ දවස් පස්වරු දුනුම්ට තරවා අල්වාගත් අත තව දක්වා මිට මිරිකා ගැන්මෙන් පිරිහී ගියයි සිතමි, එසේහෙයින් අත තිබූ තෙමල් මැඩහගු දුන් තෙන් කාර්‍ය්‍යය කිම්ද? දමා හෝ පුව මැනව, එසේ නැත අනිකකු අතට හෝ දෙවාපුව මැනව, තවද වෛඩූර්‍ය්‍ය මාණික්‍යමය කොට කරණලද ඉතා ශොභ මානවූ තෙල සන්නාහයත් ඊයේ පස්වරුම ලාගත් හෙයින් ශරීරය හිදී නුඹ වහන්සේට බොහෝ පීඩායයි සිතමි. නොහොත් ශරීරය පඬුවන් පැහැවීයයි සිතමි, තවද ඊයේම පස්වරු පටන් තුන්යම් රාත්‍රියෙහි නිදිමරා විඩාව ගිය සේක. තවද ඉර අව්කා සලාන්න නොවී නිදා නැගී නුඹවහන්සේගේ නුවරට ගොස් මාලිගාවේ සුවසේ සැතපී වදාළ මැනවැ”යි රජු හා කෙළනාසේ වෙහෙසූහ.

රජ්ජුරුවෝ ඔබගේ බස් අසා ''ගොවියා පිත් මා හා කෙළතේය''යි බෝධිසත්ත්වයන්වහන්සේට තර්ජනය කොට 'තට කළමනා දෑ දූත් දන්නෙම් වේද්ද'යි සැහෙත්තාහු.

පසන්න මුඛවණ්ණොසි, මිහිත පුබ්බං ච භාසසි,
හොතිබො මණෙ කාලෙ, තාදිසී වණ්ණසම්පදා–ති.

මේ ගාථාවෙන් කීහ.

මේ අභිප්‍රාය කෙසේද? යත් තාගේ මූඛය හෙවත් තාගේ මුහුණ ඔප් තැගූ කැඩපතක්සේ යහපත්ව බබලන්නේය, සිතා පෙරදුරිකොටම බස් කියයි, ඒ තට මතු නොවෙයි, සමහර කෙණකුත් මරණාසන්නයෙහි මෙබඳු මිහිරි බස් හා මූහුණ පැහැ ඇති වන්නේය, දූත් නොයික් නොබෝ කලකින් මියෙ'යි එබැවින් මෙබඳු රූපශ්‍රීන් බබලයි; දූත් දූත් තා මරා ඉස කපා ජය පානය බොමි 'යි කීහ මෙසේ රජහු බෝධිසත්ත්වයන් හා දෙඹන වේලෙහි මහතාතන්ගේ රූප ශොභාව දුටුවාවූ මහා සේනාව අපගේ රජ්ජුරුවන් හා මහෞෂධ පණ්ඩිතයන් හා දෙන්නා කථාවක් කෙරෙති, ඒ කුමක් බවක් නො දනුම්හ, කොල! අසන්නට යම්හ''යි එක්සියයක් රජුන් හා සේනාව රජහු සමීපයට ගියහ. මහතාතෝද රජහුගේ බස් අසා සිතනසේක් ''මේ රජ තවම මා මහෞෂධ පණ්ඩිත බව නොදනී, මම මා මරාගත නොදෙමි'යි වදූරණ සේක් ''මහරජ! යම් දවසක නුඹවහන්සේ හා කෙවට්ටයා හා දෙන්නා සිතින් එකක් සිතා බසින් එකක් කියා කළ මන්ත්‍රණයෙන් සිතින් සිතූවා නොවිය, බසින් කීවාම විය'යි ප්‍රකාශ කොට වදාරණසේක්:–

මොඝං තෙ ගජ්ජිතං රාජ,! භින්නමන්තොසි ඛත්තිය,
දුග්ගණ්හො හි තයා රාජ,! බලුඹෙක නෙවසින්ධවො.

තිණ්ණෝහි රාජා ගඞ්ගං, සාමච්චො සපරිජ්ජනො,
හංසරාජං යථාවකො, අනුජවං පපතිස්සති–ති.

මෙයින් වදාරා ''මහරජ! නුඹවහන්සේ හා කෙවට්ටයා හා දෙන්න මතු මාලේ තනිව ශ්‍රී යහන් ගබඩාවේ හිඳ රහස් මන්ත්‍රණයක් කළාහු අප දෙන්නා මුත් අනික් දන්නෝ නැතැ''යි සිතා කළ ඒ මන්ත්‍රණය මා නොදනිතියි සිතූ සේක්ද? එසේ නොසිතුව මැනව, ඒ මන්ත්‍රණය මට කියාලූ දෙයක්සේ ඉඳුරාම දනිමි, නුඹවහන්සේගේ මන්ත්‍රණය භින්නව ගියේය, වල විදි සැරයක්සේ ඉන් ප්‍රයෝජන නැත, එසේ හෙයින් අපගේ රජ්ජුරුවෝ තමන්ගේ නුවරට පලාගියහ, ඉදින් 'ලුහුබඳවා ගණිමි'යි සිතනසේක් වීනම් එයින් නොපිළිවන, අපගේ රජ්ජුරුවෝ ජාති සෛන්ධවයකු නැගී බලවත් අශ්වාචාර්‍යයකු වැන්නාහ, නුඹවහන්සේ කොටළුවකු නැගි ඉතා බාන සුළුවූ පුරුෂයකු වැන්නාහ, එසේ හෙයින් ලුහුබැඳ අල්වා ගන්නට නොපිළිවන, කෙවට්ටයා කොටළුවා වැන්න, නුඹවහන්සේ කොටළුවා නැගි පුරුෂයා වැනිසේක, මම අජානීය සෛන්ධවයා වැන්නෙමි, අපගේ රජ්ජුරුවෝ ඒ සෛන්ධවයා

තැගි පුරුෂයා වැන්නාහ''යි උපමා කොට වදාළසේක "මහරජ! වැළිත් අපගේ රජ්ජුරුවෝ ගඟින් එතරව යන්නාහු තනිව ගියාහු නොවෙති, සෙනා වාහන සහිතව අමාත්‍ය මණ්ඩලයා පිරිවරාගෙණ මහ පෙලහරින් වැඩිසේක. ඉදින් නුඹවහන්සේ ලුහුබඳවා අල්වා ගණිම්'යි සිතා දිවනසේක් වීනම් අල්වා ගත නොහී අතරමග නස්නාසේක. කුමක් මෙත්ද යත්, සුවණී හංසයකු ලුහුබඳවා දිවන කොකෙකු මෙනැ''යි කියා නැවතත් අසම්භීත කෙශර සිංහ රාජයකු පරිද්දෙන් උපමාවක් දක්වනසේක්:-

සිගාලා රත්තිං භාගසම්ං, ඵුල්ලං දිස්වාන කිංසුකං,
මංසපෙසිති මඤ්ඤනතා, පරිබ්බූළ්හා මිගාධමා.

විතිවත්තාසු රත්තිසු, උග්ගතසම්ං දිවාකරෙ
කිංසුකං ඵුල්ලිතං දිස්වා, ආසාවච්ඡින්නා මිගාදමා.

එවමෙව තුවං රාජ,! වෙදෙහං පරිවාරිය,
ආසච්ඡින්නා ගමිස්සසි, සිගාලා කිංසුබං යථා-ති.

මේ ගාථාවන්ගෙන් මහරජ! නුඹවහන්සේ මේ සා සේනාවක් ඇරගෙණ තුන්යම් රාත්‍රියෙහි නිදිමරා සිතු අර්ථයෙන් සවල්ප මාත්‍රයකුත් සාධාගත නුහුනු නියාව කුමක් වැනිද? යත් යම්සේ ගොදුරු සොයා ඇවිදිනා සිවල් මුළෙක් සුපුෂ්පිතවූ කැල වෘක්ෂයක චන්ද්‍රාලොකයෙන් වත් තාරකාලොකයෙන් වත් විද්‍යුල්ලතාදි යම් කිසි ආලෝකයකින් එල්ලෙන්නාවූ මල්කැන් දුටුවාහු 'මේ වූකලි එකාන්තයෙන් මස් වැදලිය'යි වරදවා සිතා ගන්තේ අනික් ගොදුරක් සොයා නොගොස් දඹමස් කම්හ'යි ගස් වටකොට හිඳ අරුණු නැගී පහන්වූ කල සුපුෂ්පිතවූ කැල මල් දැක ශෘගාලයෝ ඔවුනොවුන්ට 'කොල! මස් වැදලි නොවෙයි. කැලමල් කැන'යි නියමයෙන් දැන එහි ආලය හැරපියන්නේද, එපරිද්දෙන් මහරජ! නුඹවහන්සේ "වෙදෙහ රජ අසුකෙලෙම්'යි සිතා රාත්‍රිය මුළුල්ලෙහි නිදි මරා ඇවිද මෘගා ධමවූ කැනහිලුන් පරිද්දෙන් අපගේ රජ්ජුරු මින් කෙරෙහි ආලය හැර යනසේක් වේදැ''යි වදාළසේක.

රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් වහන්සේ කිසි චකිතයක් නැතිව නිර්භීතව කියන්නාවූ බස් අසා සිතන්නාහු, මේ ගොවියා පිත් බුහුටිව, රජහු පැලහ'යි කියන්නේය. 'මොහු විසින් රජහු යවාපූවෝ සැබෑ සැටිය'යි අතිශයින් කිපී 'පෙරත් අපි මේ ගොවියා පුතු නිසා මොහුගේ නුවරට ගියමෝ හත්කඩටත් උතුරු සළුවටත් අසවාමිකව දමාපියා ආම්හ, දැන් හස්තප්‍රාප්තවූ පසමිතුරා පලවාපියතලද, මූ තරම් අනර්ථකාරී එකෙක් නැත, රජ්ජුටත් මූටත් කලමනා ඉසසිදීම් ආදීවූ යම් වධයක් ඇත්නම්, මූ වම කෙරෙම්''යි විධාන කරන්නාහු "මේ මහෞෂධයා හස්තප්‍රාප්තව සතුරු වෙදෙහ රජු ගලවා යවාපීද, එසේ කලාවූ මොහුගේ දැන් දෙපා කන් නාසා කපා හරුව, ඇඟ මස් කපා ලියා ඵල අවුලා ගින්නේ ලා පලහාපියව, තව සිංහ ව්‍යාඝ්‍ර වෘෂභ මෘග ආදීන්ගේ සම බිමවනා වට කණු ගසා වියලන්නාහ, එපරිද්දෙන් මේ මහෞෂධයා බිම හොවා සතර අතට කණු ගසා වධකරව, තවද මොහු බිම හොවා තියුණු මුව හත් ඇති කඩුවෙන් කොටා පලා ව්‍යාඝ්‍ර මෘග සූකරාදීන්ගේ මාංශ පරිද්දෙන් ඉරා ලියා වධකරව්ය''යි කීහ.

මේ එක් රජකු තබා දසදහසක් සක්වළ රජදරුවෝ් එක්වත් මාගේ ස්වාමිදරුවානත්ට එවැන්නක් කරන්නට අසමර්‍ථයහ ඒ රජහුගේ බසමුත් කීවායින් කිසිවකුත් කළ නොහෙන්නාහ. බෝධිසත්වයන්වහන්සේ ඒ රජහුගේ හිස් බස් අසා වලාංයෙන් නික්මෙන සඳමඩලක්සේ දන්ත මරිචින් නිශ්චිත කොට හෙවත් මඳසිනා පහළ කොට වදාළසේක. ඒ රජහු කිපෙන් කිපෙන් මාගේ ස්වාමිදරුවානන් මූණ පෙම්වඩන නියාව කුමක් වැනිදයත් බ්‍රහ්මදත්ත රජහුගේ ඉතා රළුවූ ක්‍රොධ නැමැති හුන්නෙන් උලා ඔප්නැගූ රන්කැඩ පතක පැහැ සමානව වඩ වඩා ශොභමත්ව අතිශයින් බබළන්නට වන, එවිට සිතනසේක් “මේ නුවණ නැති රජ තමාගේ නැයන් අා ගිය අත් නොදන්න මට වධවිධාන කරන්නේය. මැනියනුත් අඹුදරුවනුත් ගෙන්වාගෙණ, මියුලු නුවරට යැවූ නියාව නොදන්න මට සැනෙන්නේය. මේ රජ මහා ඓශ්වර්‍යයෙහි පිහිටා සිටියේ මා කළදෙයක් කෙළේය’යි සිතා ක්‍රොධවශයෙන් අත තුබූ හීයෙන් විදපී නමුත් අන්කිසි උපක්‍රමයකින් නසාපි නමුත් නපුර, මේ රජහු ශොකයෙන් මූර්ඡාකරවා හුන් ඇතුපිටම විසංඥකරවා අතුරුවා පියා නැවත අස්වසාලම්’යි සිතා වදාරණ සේක්:-

සචෙ මෙ හත්ථ පාදංච, කණ්ණනාසංච ඡෙජ්ජසි,
එවං පඤ්චාල චණ්ඩස්ස, වෙදෙහො ඡෙදයිස්සති.

සචෙ මෙ හත්ථ පාදංච, කණ්ණනාසංච ඡෙජ්ජසි,
එවං පඤ්චාල චණ්ඩියා, වෙදෙහො ඡෙදයිස්සති.

සචෙ මෙ හත්ථ පාදංච, කණ්ණනාසංච ඡෙජ්ජසි.
එවං නන්දාය දෙවියා, වෙදෙහො ඡෙදයිස්සති.

සචෙ මෙ හත්ථ පාදංච, කණ්ණනාසංච ඡෙජ්ජසි,
එවං තෙ පුත්තදාරස්ස, වෙදෙහො ඡෙදයිස්සති.

සචෙ මංසංච පාතබ්බං, සූලෙකත්වා පචිස්සසි,
එවං පඤ්චාල චණ්ඩස්ස, වෙදෙහො පාචයිස්සති.

සචෙ මංසංච පාතබ්බං, සූලෙකත්වා පචිස්සසි,
එවං පඤ්චාල චණ්ඩියා, වෙදෙහො ඡෙදයිස්සති-ති.

මේ ආදී ගාථාවන්ගෙන් “මහරජ! ඉදින් නුඹවහන්සේ මාගේ අත් පා කන් නාසා කප්පවා වධ කරවූසේක් වීනම් නුඹවහන්සේ මට කරවූ වධ මුළුල්ල නුඹවහන්සේගේ පුතනුවන් දියනියන් නන්දාදෙවීන් නුඹවහන්සේ වැදූ මෑනියන් යන සතරදෙනාට අපගේ රජ්ජුරුවෝ් අත් පා කන් නාසා කප්පවා වධ කරන්නාහ. මහරජ මාගේ ඇඟ මස් ලියා උල අවුනා වධ කරවාපි දූ වීනම් අපගේ රජ්ජුරුවෝත් නුඹවහන්සේගේ නෑයන් සතරදෙනාට මට කළ වධයට දිවුණක් කරවන්නාහ. නැවද සිංහ ව්‍යාඝ්‍ර මෘග වෘෂභාදීන්ගේ සම් බිම වනා කණු ගසා වියලන්නාසේ මට වධ කරවාපිදූ වීනම් නුඹවහන්සේගේ නෑයන් සතරදෙනාටත් අපගේ රජ්ජුරුවෝ් නොයෙක් චිත්‍ර වධ කරවන්නාහ. නවද මහරජ සම්කරුවන් ලවා සම් සියක්පටින් සකස් කරවා

වැලඳගත්තාලද සත්තාහය තමහට බැහැරින් වදනා සැර ආදී උපද්‍රව නිවාරණය කොට ආත්ම රක්‍ෂාව පිණිස වත්නේද එපරිද්දෙන් මම මාගේ රජ්ජුරුවන්ට සම් සියක් පටින් කළ සත්තාහයක් පරිද්දෙන් ඉදිරිව සිට කිසි භයක් නොවැද්දදී සැප එළවම්’යි වදාළසේක.

මෙසේද කියා නැවත වදාරණසේක් “මහරජ! වැළිත් මේ නිකම් කියන දෙයෙකැ”යි නොසිතුව මැනව, නුඹවහසේගේ අඹුදරුවන් හා මැතියන් අපගේ රජ්ජුරුවන්ට පාවාදී මියුලු නුවරට යවන්නෙම්, ‘මහරජ! ඉදින් චූලනී රජ්ජුරුවෝ නුඹවහන්සේ තමන්ට සොරා යවාපියහ’යි මා අල්වාගෙණ කන් නාසා අත් පා කප්පවා වධකරවූ නම් කුමක් කරණසේක්දැයි කී හෙයින් මහෞෂධ පණ්ඩිතයෙනි! ඒ රජ සැබවින් තොපට වධයක් කෙළේ වීනම් ඒ තොපට කළ වධ මුළුල්ලම ඒ රජ තමා මනබල ඇති හෙයින් ඔහට කළ නොහෙතත් ඔහුගේ අඹුදරුවන් මැතියන් යන සතරදෙනාට, තොපට කළ වධයට දිවුණක්ම කරවමි”යි කියා ප්‍රතිඥා ගතිමියි කියා මහරජ! නුඹවහන්සේ මා එකතැනැත්තවුට එක් වධයක් කරවූසේක් වීනම් තන්දෑදෙවීන් හා දරුවන් දෙන්නා ඇතුළුවූ නැයන් සතරදෙනාටත් අපගේ රජ්ජුරුවෝ තමන්ට පිළිවන් වධ බන්ධන කරන්නාහ”යි වදාළසේක. මෙසේද කියා මහරජ! නුඹවහන්සේගේ ප්‍රඥා නැමැති තීයට මම සම් සියක් පටින් කළ සත්තාහයක්ව ඉදිරිව සිට මාගේ රජ්ජුරුවන්ට ඒ සැරයෙන් වන්නාවූ උපද්‍රව දුරුකොට සැපයක්ම එළවමි”යි වදාළසේක.

ඒ අසා චූලනී රජ්ජුරුවෝ සිතන්නාහු ‘මේ ගොවියා පිත් කුමක් කියාද, මම යම් වධයක් තමාට කරවමි කීමි නම් මේ තෙමේ තමාගේ රජ්ජුරුවෝ මාගේ අඹුදරුවන්ට කරවතියි කියයි මමු ඊයේ එන්නෙම් මාගේ අඹුදරුවන්ට සුරක්‍ෂිත කොට රැකවල් ලවාලා ආමි, ඒ නියාව නොදන්නා වන, නොබෝ කලකින් මේ මියයන්නේය, එබැවින් මරණ විකලයෙන් තන්දෙඩව”යි කියා මහනානන්ගේ බස් නොහැදහූහ.

පරසිත් දන්නා නුවණැති මාගේ බොධිසත්වයන්වහන්සේ රජු සිතුවා දැන “මේ රජ මා මරණ භයින් තන්දෙඩතී සිතයි, සැබැවින්ම අඹු දරුවන් මියුලු නුවරට යැවූ නියාව දන්වාලමි”යි සිතා වදාරණසේක් “මහරජ! මරණ භයින් තන්දෙඩතියි සිතූ බැවින් මාගේ බස් අදහන පිණිස තොපගේ අන්තඃපුරයට මිනිසුන් යවා මාලිගාව බැලවුවමැනව, තන්දෑදේවීන් හා දරුදෙදෙනා හා නුඹවන්සේගේ මැතියන් ඇතුළුවූ නැයන් සතරදෙනා සුළු උමඟින් බාගෙණවුත් වෙදෙහ රජ්ජුරුවන්ට පාවාදී මහ උමඟින් මියුලු නුවරට යවා පියනලද්දානු මෙතනට සාරයියාක් ගව් ගෙවා මියුලු නුවරට යන්නාහ”යි වදාළසේක.

එවිට රජ්ජුරුවෝ සිතන්නාහු “පණ්ඩිතයෝ ඉතාම තරව බුහුටිවම කියන්නාහ. මධ්‍යම රාත්‍රියෙහි ගංතෙර රැකවල් බලා ඇවිදින මා විසිනුත් තන්දෑදෙවීන්ගේ ශබ්දයක් සේම කටහඬකුත් අසනලදී මේ පණ්ඩිතයෝත් එසේ මෙසේ කෙණෙක් නොවන්නාහ, මූන් හා සමාන ප්‍රඥා ඇති කෙණෙක් කොයිත් නැත්තාහ, එබැවින් මූන්ගේ බස් තපුරැයි සිතා සැබෑ සැටියැ”යි උපන්නාවූ බලවත් ශොක ඇත්තාහු රාජධෛර්‍ය්‍යය උපදවාගෙණ නිශ්ශොකී

එකක්හුමෙන් එක් අමාත්‍යයකු කැඳවා මාලිගා බලවත්තාහු “එම්බා දරුව! මේ මහෞෂධ පණ්ඩිතයෝ කියත්තාහු” මාගේ අඹුදරුවත් ආදිවූ අවශ්‍ය බන්ධුන් සතරදෙනා උමඟින් ගෙන්වා තමා රජ්ජුරුවන්ට පාවාදී මිථුලුනුවරව යවාපීමි” කිවූය. උන්ගේ බස් සැබෑද බොරුද පරීක්ෂාකොට පියා වහා එව”යි

ඉංඝ අන්තොපුරං මය්හං, ගන්ත්වාන විචිනාථ තං,
යථා ඉමස්ස වචනං, සච්චං වා යදිවා මුසා-ති.

මේ ගාථාවෙන් කීහ:-

ඒ අසා අමාත්‍යයා සෙනාව පිරිවරා මාලිගාවට ගොස් දොර හැර රජ ගෙට වැද, ඒ රජගෙයි රුකවල සිටියවුන් අල්වා අත් පා බැඳ කව සඩරෙදි ඔබා හිතති කොකුවල එල්වපියා තුබු අන්තඃපුර රකින්නන්ද, කුදුන් කුරුන් ආදී වූවන්ද, බඳුන් බිඳ ඒ ඒ ස්ථානයෙහි විසුරුවාපියා තුබු කන බොන දෑද, රුවන් ගබඩාවල දොර හැර රුවන් උකාගත්තැන ඉසපියා තුබු රුවන් සමූහ යද, දොර හැර තුබු ශ්‍රී යහන් ගබඩාද, එසේම ඇරපියා තුබු සීමැදුරු කවුළු වෙන් ඇතුළට වැද උනුනුන් කටින් පූ උදුරා කන්නාවූ කාරුස්බැඳ ඇවිදිනාවූ කපුටුසමූහයන්ද, මුදුබඩ කෙවුලන් හැරපියාගිය සැඞිගමක්සේද, අමුසොහො නක්සේද, ඉතා නිශ්‍රීකවූ රාජභවනය බලාපියා ඇවිත් කියන්නේ:-

එවමෙතං මහාරාජ, යථා ආහ මහොසධො,
සුක්ඛදං අන්තොපුරං සබ්බං කාක පට්ටනකං යථා-ති.

මේ ගාථාවෙන්:-මහරජ! යම්සේ මහෞෂධ පණ්ඩිතයෝ කිවූද, උන් කීවායින් එක බසකුත් බොරුවෙක් නැත, ඒ සැබෑමය, පෙර තුඹවහන්සේගේ මාලිගාව දිව්පුරයක් වැන්නැයි සිතමි, එසේවූ රජගෙය දූන් මූදුතෙරබඩ කෙවුලන් ඇරපියා ගිය ගමෙක මස් ගඳට හැසිරෙන්නාවූ කාක සමූහයන් සෙයින් ඒ මාලිගාව කපුටු සමූහයන්ගෙන් අතුරු සිදුරු නැතිව තිබුයේය. ඒ රජගෙයි තුඹවහන්සේගේ අඹුදරුවෝත් මැතියෝත් මාදුටුවෝ නැත, ආගිය තැනක් ඇසූදැත් නැතැ”යි පණ්ඩිතයන් කීයේ සැබෑමය”යි කීහ. රජ්ජු රුවෝ නෑයන් සතරදෙනාගේ වියෝ දුකින් කම්පිතව වෙව්ලන්නාහු “මේ දුඃඛය ගොවියා පුතු නිසාම මට වූයේය යි දණ්ඩෙන් පහරලද ආශිර්විෂයකු පරිද්දෙන් බොධිසත්වයන් කෙරේ පළමු තරමටත් වඩා ක්‍රොධ ඉපදවූහ.

බොධිසත්වයන්වහන්සේ රජුගේ ආකාරයෙන්ම දූනලා සිතනසේක් “මේ රජ්ජුරුවෝ මහ යසස් හා කීර්ති හා පරිවාර ඇත්තාහ. යම්සේ ක්‍රොධ වශයෙන් තමාට මතු මා නිසා වන්නාවූ අභිවෘඬි නොසලකා රාජමානයෙන් “ඔවුන්ගෙන් මට ප්‍රයෝජනකිම්ද”යි නොසොයා මට හිංසාවක් කොළෝනම් නපුර නුවණ නම් මෙසේවූ තැනට වේද, උපායකින් මේ රජු මාකරා තමා ගත්මි”යි සිතා පාන්දෑදෙවීන් පෙර මේ රජු නුදුටු විරුකෙණකුත් මෙන් ඒ බිස වුන්ගේ රූපශ්‍රී වර්ණනා කෙළෙම්නම් බිසවුන් සඳහන්කරන්නාහුට ‘මේ මහෞ ෂධ පණ්ඩිතයන් මරාපීම් නම් එබඳු මාගේ ස්ත්‍රීරත්නය නොලබන්නෙමි, ඉදින් නොමැරීම් නම් ඒකාන්තයෙන් නෑයන් සතරදෙනා ලබන්නෙම්’යි සිතා තමන්ගේ බිසවුන් කෙරේ කළ ස්නෙහයෙන් මට කිසි අපරාධයක් නොකරන්

නාහ'යි සිතා තමන්වහන්සේගේ ආත්ම රක්‍ෂාව පිණිස මාලිගාවේ මතුමහලේ සිටිසේක්ම සන්ධ්‍යාවලාපටලයක් හස්සෙන් ගැසූ විදුලියක් පරිද්දෙන් පෙරට සිටියාවූ රත්පලස යටින් රත්වත්වූ ශ්‍රී හස්තය මැත් කොට ගෙණ නන්දාදෙවීන් ගිය මඟ මේයයි කියන්නාසේ උන්ගේ රූපය වර්ණනා කරණසේක් මෙසේ වදාරණසේක.

ඉතො ගතා මහාරාජ, නාරි සබ්බඞ්ගසොභනා,
කොසුම්භ ඵලක සුසොණි, හංසගග්ගර භාණිනී.

මහාරාජ! ඉතො නීතා, නාරී සබ්බංග සොභනා,
කොසෙය්‍යවසනා සාමා, ජාතරූප සුමේඛලා

සුරත්ත පාද කල්‍යාණී, සුවණ්ණමණි මෙඛලා,
පාරාපතක්ඛිසුතනු, බිම්බොට්ඨා තනුමජ්ඣිමා.

සුජාතාභුජලට්ඨීව, වෙල්ලිව තනුමජ්ඣිමා,
දීඝස්සා කෙසා අසිතා, ඊසකග්ග පවෙල්ලිතා.

සුජාතා මිගඡාපීව, හෙමන්තග්ගි සිඛාරිව,
නදීව ගිරිදුග්ගෙසු, සංඡන්නා ඛුද්දවෙළුභි.

නාගනාසූරු කල්‍යාණී, පඨමාතිම්බරූත්ථනී,
නෙවාතිදීඝානාරස්සා නලොමානාතිලොමසා–ති.

මේ ගාථාවෙන්:–වදාරා රජ්ජුරුවන්වහන්ස! සිවුසැටක් පමණ ස්ත්‍රී ලක්‍ෂණයෙන් විරාජමානවූ නන්දාදෙවී මෙසේ ගියාහ, කෙසේ ගියාද? යත්, උන් මාවිසින් උමඟකින් පිටත්කරවා වෙදෙහ රජ්ජුරුවන් හා කැටිව මියුලු නුවරටයවාපියනලද, තවද මහරජ! නුඹවහන්සේ ඒ බිසවුන් කෙසේවූරූඇති කෙණෙකුනැ''යි සිතනසේක්ද, උන්ගේ උපමා රහිතවූ රූපශ්‍රී විලාසය මා අතින් අසාගත මැනව, ගනරන් පෝරුවක් බඳුවූ ඉතා මටසිළුටුවූ ශ්‍රොණී ප්‍රදෙශ ඇත්තාහ, බාල හංස පොතකයන්ගේ ශබ්ද හා සමානවූ මිහිරිවූ ලද බොළඳ ප්‍රිය තෙපුල් දන්නාහ, කාශීදෙශයෙහි රන්කම් කළ තිසිරි පිළී ඇන්දහ. ස්වභාවයෙන් රන්වන් ශරීර ඇත්තාහ, ජාත රූපයෙන් කරණලද මිණි මෙවුල්දම් පැළැන්දාවූ සර්‍වාංගසුන්දරවූ ඒ නන්දාදෙවී මා විසින් මෙසේ යවා පියන ලදැ''යි වදාළසේක.

තවද අලතාපිරියම් කළාක් වැනිවූ රත්වන් පතුල් ඇත්තාහ, ලද මුව පොල්ලන්ගේ ඇස් හා සමානව, කණට රහස් කියන්නට ගියාක් වැනිව දික්ව කෘෂ්ණ මණ්ඩලයපරවියන්ගේ ඇස්මෙන් ඉතා වටව, නිලුපුල් පෙති පරද වන්නාවූ පස්පැ දිස්නා නෙත්‍ර ඇත්තාහ. මනාව විලිකුන් බිඹුවැලසේ රත්වූ අධරපල්ලව ඇත්තාහ, තවද දැහිගුල් පල්ලෙක්හි ගා වැද්දූසක් කැබලි පෙළක් සේ ශොභමානවූ දන්තපන්ති ඇත්තාහ, තවද මනාව හටගත් කලුවැල් ලතා වක් මෙන් ඉතා නිල්වූ දික්වූ සිනිඳුවූ අක් බඹුරුවූ කෙශකලාප ඇත්තාහ, තවද අභිනව මෘගාඞගනාවක්සේ ඉතා යහපත් බැලුම ඇත්තාහ, තවද හෙමන්ත කාලයෙහි ගිනිකඳක්සේ ඉතා පැහැපත්ව බබලන්නාහ. හෙවත් හෙමන්ත කාලයෙහි ගිනිකඳක් මෙන් බැලූ බැලූවන් ඇසට ඉතා ප්‍රිය වන්නාහ, (ඇයි ගිනි

කඳක් දකනත් ප්‍රිය වෙත්ද? යත්, ඒ මෙසේයයි දතයුතු, හිම සමයෙහි ගින්නක් දුටු කල්හි එහි අත තවාපියන්නට නොසිතන කෙණෙක් නැත්තාහ) එසේ පැහැපත්වූ වහ්නි රාශියක් මෙන් සියලු රූපශ්‍රීන් බබළන්නාවූ ඒ නන්දාදෙවීන් දුටුයේ නම් උන් ප්‍රාර්ථනා නොකරණ එකද පුරුෂයෙක් නැත, තවද පර්වත ප්‍රාන්තයෙන් හුණ ගඞ්ගාවක් දෙහිනතියෙන් දියට ගී එක පිට ගමන්ගෙන සිටි සිහින් තල කොළ සමූහයෙන් නොබනීද, එපරිද්දෙන්ම ඒ බිසවුන් ඇඟ තුනුවූ නොදික්වූ නිල්වූ එකඟී සිටියාවූ රෝම රාජියෙන් හෙබියාහ.

තවද නන්දාදෙවි ඡවිකල්‍යාණය, මාංශකල්‍යාණය වයඃකල්‍යාණය, දන්ත කල්‍යාණය, කෙශ කල්‍යාණය යන ඉතා ආශ්චර්‍ය්‍යවූ පඤ්චකල්‍යාණයෙන් යුක්තය. තවද ඉතා යහපත් සවර්ණ ඵලකයෙහි තබාලූ රන් තිඹිරි ඵලදෙකක් සේ ඉතා සනෙතාෂකරවූ දරුවන් කෙනෙක් ලදත් ආයුෂ කෙනෙක් ගියත් සොළොස් ඇවිරිද්දෙහි තන මෙන් ඉතා දැඩිවූ තන සඟල ඇත්තාහ. (ඒ බිසවුන්ගේ තන දැඩි නියාව කියන්නට කාරණ කිම්ද? යත් යම් ස්ත්‍රියක් දිව්‍යාඞ්ගනාවක්සේ යහපත්වූ රූ ඇති නමුත් එසේවූ ස්ත්‍රිය නඛාග්‍රයෙහි පටන් කෙශාග්‍රය දක්වාත් ඇගේ සර්වාංගයෙහි ඒ ඒ ස්ථානයෙහි සැරහුවම්නා විචිත්‍ර වූ නොයෙක් පලඳනාවෙන් අනූනව සැරහී සිටියා නමුත් ඇගේ තනය මොළොක් වීනම් පුරුෂයන් ඈකෙරෙහි කරන්නාවූ ස්නෙහ සුහන් තනයසේම මොළොක් වන්නේය. එබැවින් ‘බිසවුන්ගේ රුවත් සිත්කලුය, තනදෙකත් ඔවුන් දුටු පුරුෂයන්ගේ ස්නෙහය වඩනා පරිද්දෙන් ඉතා දැඩිය,) එසේවූ සිව් මැලි බිසව් මෙසේ මියුලු නුවර බලා ගියහ’යි ශ්‍රී හස්තය ඔසවා පෑ වදාළසේක.

මෙසේ ඒ මහතානන්වහන්සේ නන්දාදෙවීන්ගේ රූපශ්‍රී වර්ණනා කරත් කරත් චූලනී රජ්ජුරුවෝ නන්දාදෙවීන් පෙර තමන් නුදුටුවිරූ කෙණකුන් පරිද්දෙන් බලවත් ස්නෙහ ඉපදවූහ. රජහුගේ ස්නෙහය ආකාරයෙන් දැන වදුරා ‘මහරජ! මෙබඳු රූපත් බිසවුන් මිය යාමෙහි සතුටු සේක්ද? උන් මළ කල නුඹවහන්සේට කිසි අප්‍රයොජනයෙක්ම නැද්ද? තවත් උන් මළහොත් මට සන්තොෂකරය. කාරණා කිම්ද? යත් නුඹවහන්සේ මා මොබදී මරාපු නම් මාගේ රජ්ජුරුවෝ ඔබින් නන්දාදෙවීන් මරවා පියති. එකල නන්දා දෙවීන් මමත් දෙන්නා සමව යමරජ ළඟට යම්හ. ඉතා ධර්මිෂ්ඨවූ සම රජ අප දෙන්නා බලාපියා කියන කල පුරුෂයන්ගෙන් මහෞෂධ පණ්ඩිතයන් වැනි කෙණකුන් නැත, ස්ත්‍රීන්ගෙන් නන්දාදෙවීන් වැනි කෙණකුන් නැතැයි කියා නන්දාදෙවී මහෞෂධ පණ්ඩිතයන්ට නරම්හ, නන්දාදෙවි මටම පාවාදී පියන්නාහ, එබැවින් මා මියත් එබඳු ස්ත්‍රී රත්නයක් ලබන කල සෙසු කුමක් නම් මට සිඩ නොවේද? එබැවින් මා මියයාමෙහි කිසිහානියක් නැතැ’යි වදාළසේක. බොධිසත්වයන්වහන්සේ මෙපරිද්දෙන් නන්දාදෙවීන්ම වර්ණනා කළසේක. සෙස්සවුන්ගේ නමකුත් නොකීසේක, කුමක්නිසාද? යත් පුරුෂයෝ තම් තමන් ප්‍රිය භාර්‍ය්‍යාවන් කෙරෙහි මෙන් සෙස්සවුන් කෙරෙහි ස්නෙහ නැත්තාහ, ඒ නන්දාදෙවීන් සඳහන් කරන්නෝ දරුදෙන්නාත් සඳහන් කරන්මය’යි සිතා. නන්දාදෙවීන්ම වර්ණනා කළසේක. තලතාදෙවි මෑහැලි හෙයින් උන්ගේ නමකුත් නොවදාළසේක, ප්‍රඥාසම්පන්න ඒ මාගේ සවාමිදරුවානන් නුවණින් යෙදී මධුර සවරයෙන් වර්ණනා කරත් කරත්ම නන්දාදෙවි අවුත් තමා ඉදිරියේ පෙණීගියාසේ වැටහින,

එවිට රජ්ජුරුවෝ සිතන්නාහු 'මේ මහෞෂධ පණ්ඩිතයන් හැර අනික් කෙණෙක් නන්දාදේවීන් ගෙණවුත් මට දෙන්නට සමර්ථ නැතැ'යි සිතූහ. මෙසේ ඒ බිසවුන් සිතන්නාවූ රජහට බලවත් ශොක උපන්නේය. ඒ බව නමත් වහන්සේ දැන "මහරජ! නොසිතා වදාළ මැනව, නන්දාදේවීන් පුතනුවෝත් මැනියන්වහන්සේත් තුන්දෙනම එන්නාහ; උන් මීට එන්නට බාධා නම් මා නොයන පමණක්මය. මා ගිය විටම එන්නාහ"යි වදාළසේක. මෙසේද කියා නැවත වදාරණසේක. 'මහරජ මා ඉන්දදී මෙව්වරකට ශොකනොකළ මැනව, අස්වැසුන මැනවැ"යි රජහු අස්වසා වදාළසේක. එවිට රජ්ජුරුවෝ සිතන්නාහු ඉතා ආශ්චර්යය නියාය මම මාගේ නුවර සුරක්ෂිත කොට රැකවල් ලවා මහත්වූ බල ඇණි පිරිවරා අවුත් මේ නුවර මෙසේ රැකවල් ගෙණ සිටියදී මේ පණ්ඩිතයෝ නුවරින් නන්දාදේවීන් ඇතුළුව මාගේ නෑයන් සතරදෙනා කිසි කෙණකුන් නොදන්නා පරිද්දෙන් ගෙන්නාගෙණ වෙදෙහ රජුට පාවාදී අප හැම තමාහුන් මේ නුවර තුන්යම් රාත්‍රියෙහි නිදිමරා රැකවල් ගෙණ සිටියදී අපගෙන් කාත් නොදන්නා පරිද්දෙන් වෙදෙහ රජු හා සේනාව නුවරින් පිටත්කොට යවාපීය. දිව්‍යමායමක් දනිද්දෝ නොහොත් ඉන්ද්‍රජාලයක් දනිද්දෝහෝයි විචාරා බලමි"යි සිතා කියන්නාහු,

දිබ්බං අධියසෙ මායං, අකාසි චක්ඛුමොහනං,
යො මෙ අමිත්තං හත්ථගතං, වෙදෙහං පරිමොචයී-ති.

මේ ගාථාවෙන්:-මේ කිමෙක්ද පණ්ඩිතයෙනි! මෙසා රාජසේනාවක් වටලාගෙණ සිටියදී එසේ රැකවල උන් මාගේ නෑයන් සතරදෙනා ගෙන්වා මාගේ සතුරු වෙදෙහ රජුත් එක්කොට නුවරින් පිටත්කොට යවාපු නෙපි දිව්‍යමායමක් දනුද නොහොත් ඇසට ඉන්ද්‍රජාලයක් දනුදෝහෝ"යි විචාළහ, ඒ අසා මහසත්තෝ වදාරණසේක් "මහරජ! මම දිව්‍යමායමවුත් දනිමි, ඉන්ද්‍රජාලයත් නොදන්නෙම නොවෙමි, නුවණැත්තාහු දිව්‍ය මායම් උගෙන යම්සේ තමහට භයක් පැමිණිකල ඒ භයින් තුමූත් ගැලවී ආශ්‍රය කළවුනුත් ගලවත් නෝ වෙත්ය"යි වදාරන්නාහු:-

අධියනෙත මහාරාජ! දිබ්බමායිධ පණ්ඩිතා.
තෙ මොචයන්ති අත්තානං, නිස්සිතෙ මන්තිනො ජනෙ.

සන්ති මානව පුත්තා මෙ කුසලා සන්ධි ඡෙදකා,
තෙසං කතෙන මග්ගෙන, වෙදෙහො මිථිලං ගතො-ති.

මේ ගාථාවෙන්:-මහරජ! මා විසින් කළ මායමකුත් නැත. ඇසට ලූ ඉන්ද්‍රජාලයකුත් නැත, එසේකල කෙසේ ගියෝද? යත් උමං බිඳීමෙහි දක්ෂවූ මාගේ තරුණ යොධයන් විසින් දිව්‍යපුරයක්මෙන් විසිතුරුකොට සරහනලද උමඟකින් වෙදෙහ රජ්ජුරුවෝ නුඹවහන්සේගේ නෑයනුත් ඇරගෙණ මියුලු නුවරට පලාගියසේකැ"යි වදාළසේක.

ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු "එකකු දෙන්නකු පවා උමගින් යන කල මහා ව්‍යසනයෙන් දුකසේ පිටත්වන්නේය, මේ පණ්ඩිතයෝ සේනා සහිත රජ්ජුරුවන් උමගින් සුවසේ පැලහ"යි කියති, ඒ උමඟ කෙබඳුදෝ

හෝ"යි උමඟ දක්නා කැමතිවූහ. බෝධිසත්වයන්වහන්සේ රජ්ජුරුවන්ගේ ආකාරයෙන්ම "රජහු උමඟ දක්නා කැමැති සැටිය, උන්ගේ මනදෙළ පුරා උමඟ දක්වාපියමි"යි සිතා රජහට වදාරණසේක්:-

ඉඞ්ඝ පස්ස මහාරාජා ! උම්මග්ගං සාධු මාපිතං,
හත්ථීනමථ අස්සානං, රථානමථ පත්තිනං
ආලෝක භූතං තිට්ඨන්තං, උම්මග්ගං සාධු නිට්ඨිතං-ති.

මෙසේ වදාරා "මහරජ! මා විසින් කරණලද උමඟ චිත්‍රකාරයන් විසින් සරහා සිටුවනලද ඇතුන්ද, අසුන්ද එසේම රථාලඞ්කාරයෙන් සරහා සිටුවන ලද රථවාහනද, යුද්ධයට සැරසී සිටියාක්මෙන් සජීවයක් මූත් අජීවයයි වහා නොදත හැක්කාවූ නොයෙක් ආයුධ ගත් අත් ඇතිව සිටි මහත්වූ පාබල සේනාවද යන සියලු අලඞ්කාරයෙන් දිව්‍යසභාවක් මෙන් දස දහසක් සක්වල එකද තැනෙකත් මෙබඳු ආශ්චර්ය්‍යයක් නැත, එබඳු උමඟ බලා වදාළ මැන වැ"යි කියා නැවත වදාරණසේක්:-

මහරජ! මාගේ ප්‍රඥා නමැති චන්ද්‍රයා හා උපාය නමැති සූර්ය්‍යයා එක්ව නැංගාවූ පර්වතයෙහි සරහනලද උමඟ අසූවක් පමණ මහදොර ඇත්තේය, සියුසැටක් පමණ සුළුදොර ඇත්තේය, එක්සියයක් ශ්‍රී යහන් ගබඩා ඇත්තේය, නොයෙක් සියගණන් පහන් ගබඩා ඇත්තේය, මේ සියල්ලම දක්නා පිණිස වඤ්චාසිතක් නැතිව සතුටු සිතින් අවෛරීව අවමැනව, එක්සියයක් රජදරුවන් හා අමාත්‍ය මණ්ඩලයා පිරිවරා මේ උපකාරී නුවරට වැඩිය මැනව.

ඉදින් එසේ නොව වෛදෙහ රජහු ගියත් අඩියක් ලද්දේ පණ්ඩිතය"යි කීවාසේ මා කෙරේ මායමින් හිත් සිත් අහවා නොසතුටු ලෙසින් නුවරට වැද "දෙන්නාට කළමනා දෙය මූටම කෙරෙමි"යි සිතා මා අල්වාගන්නට මායම් සිතකින් ආසේක් වීනම් මේ එක දසදහසක් යොදුන් දඹදිව එක්සිය යක් රජුන් හා අටළොස් අක්ෂෞහිණී සංඛ්‍යාත චතුරංගිනී සේනාවක් තබා සෘද්ධිසම්පන්න චක්‍රවර්ති රජෙක් තමාගේ ආනුභාවයෙන් සතර මහා ද්වීපයෙහි සේනාව ඒ ඒ රජදරුවන් සහිතව ගෙණායේ වීනම් මාගේ එකද උපන් යොධයන්ගෙන් එක් යොදයෙක්ම ඒ සේනාව මරා ළුහුබඳවා ජයගෙණ මාරැක ගන්නට පොහොසත් වන්නේය, එබැවින් "මහරජ! මා කෙරේ පරණ වෛරයක් සිත ඇත්නම් එසේවූ දුර්මතයක් නොසිතා වහා වැඩිය මැනවැ"යි උපකාරී නුවර වාසල් හරවා වදාළසේක.

චූලනී රජ්ජුරුවෝ එක්සියයක් රජුන් හා අමාත්‍ය මණ්ඩලයා පිරිවරා උපකාරී නුවරට වන්හ, අභිමතාර්ථ සාධක චින්තා මාණික්‍යයක් බඳුවූ ජනනෙත්‍ර රසාඤ්ජනවූ මාගේ ස්වාමිදරුවූ තිලෝගුරු බෝධිසත්වයන්වහන්සේ ඇත් සේනාවක් මැදට නොබා නික්මුණුඅභීත කෙශර සිංහරාජයකුසේ මාලිගාවෙන් බැස රජ්ජුරුවන් වැඳ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ඇතුළුවූ එක්සියයක් රජ දරුවන් හා මහා සේනාව පිරිවරා උමඟට වන්සේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ රාජ මඞ්ගල්‍යයට සරහනලද මානැඟිවූ නුවරක් බඳුවූ ඉතා ආශ්චර්ය්‍යවත්වූ උමඟ දැක බෝධිසත්වයන්ගේ ගුණ කියන්නාහු "එම්බා රජදරුවෙනි! යම් රජක් හුගේ ජනපදයෙහිද, එක රටද එක නුවරටද, එක රජගෙයිද; මේ මහෞෂධ

පණ්ඩිතයන් වැනි කෙනෙක් වෙසෙත්නම් ඒ ජනපදයටත් ඒ රටටත් ඒ නුවරටත් ඒ රජුටත් ලාභයෙක් මුත් අලාභයෙක් නැත්තේය, එසේ හෙයින් පණ්ඩිතයන් හා සමග වසන්නාවූ වෛදේහ රජහට එසේම මහා ලාභයෙකැ''යි බෝධිසත්ත්වයන්ට ස්තුතිකරන්නාහු වෛදේහ රජු කෙරේ ව්‍යාජයෙන් "ඉදින් මහෞෂධ පණ්ඩිතයෝ මා සමීපයෙහිවත් මාගේ නුවරවත් මාගේ ජනපදයෙහිවත් මාගේ ආඥාපවත්නා රට දනව්වෙහිවත් වෙසෙත් නම් මටත් වන්නේ මහ වැඩක්මය, මහා අභිවෘද්ධියෙක්මය''යි මහ පසාරයෙන් කීහයි දතයුතු.

ඉක්බිති බෝධිසත්ත්වයන්වහන්සේ එක්සියයක් ශ්‍රී යහන්ගබඩා දැක්වූසේක, ඉන් එක් ගබඩාවෙක දොර හළ කල මුළු ගබඩාවලම දොර හැරෙන්නේය; එකත් පිහිකල මුළුදොර පිහීයන්නේය; මෙසේ ආශ්චර්‍ය්‍යවත්වූ උමග විස්තර බලමින් රජ්ජුරුවෝ පළමුව යන්නාහ, පණ්ඩිතයන්වහන්සේ පසුව යෙති, එක්සියයක් රජදරුවන් හා රජ්ජුරුවන්ගේ අගම්පඩි සෙනාව උමගට වන්නාහ; මහ උමග දෙගව්වක් පමණ ගෙවා ගෙණ ගොස් රජ්ජුරුවෝ උමං දොර එළිපතින් පිටත්වූහ, බෝධිසත්ත්වයන්වහන්සේ රජහු පිටත්වූ බව දැන, තමන්වහන්සේ පිටත්වනසේක් අතිකක්හු පිටත්විය නොදී උමග දොරපියනසේක් නොහගවා එක් ඇණයක් මැඩලූසේක, ඒ ඇසිල්ලෙහි අසූවක් මහ දොරය; සියුසැටක් සුලුදොරය, එක්සියයක් ශ්‍රී යහන් ගබඩාවල දොරය, සිය දහස් ගණන් පහන් ගබඩාවල දොරය යන සියලු දොරවල් එක්ෂණයෙහි පිහී අගුලුහී ගියේය; ඒ සියලුම උමග ලොකාන්තරික නරකය මෙන් අන්ධකාරව ගියේය. මහජනයා හයින් තැතිගෙණ ගියේය; උමග හසුවූවෝ ඔවුන්නොවුන්ගේ ශබ්දයමුත් 'මූ මූය'යි නොදන්නාහ. බෝධිසත්වයන්වහන්සේ ඊයේ මධ්‍යම රාත්‍රියෙහි සරණ පාවාදී වෛදේහ රජ්ජුරුවන් යවා නැවත උමගට වදිමින් තමන්වහන්සේගේ මගුල් කඩුව වැල්ලේ සඟවා තුබූසේක්ද, ඒ කඩුව තුබූ තැනින් එහා අතට ගෙන අටළොස් රියනක් පමණ තැන් ආකාශයට පැනනැගී බිමට බැස වමතින් රජහු අත අල්වාගෙණ කඩුව බොටුවට පෑ අමෝරා හය ගන්වා මහරජ! මේ සියලු දඹදිව රාජ්‍යය කාටද?'යි විචාළසේක.

රජ්ජුරුවෝ හයින් තැතිගෙණ 'පණ්ඩිතයෙනි! තොපටමය තොපටමය තොපටමය' තුන්වරක් කීය. "මා නොමරා මට අභය දෙව'යි කීහ එබසට බෝධිසත්ත්වයන්වහන්සේ වදාරණසේක් 'මහරජ! තොබව මැනව, තුඹවහන්සේ මරණ පිණිස කඩුව එසවූයෙම් නොවෙමි, මාගේ ප්‍රඥාවේ ආනුභාව දක්වන පිණිස කඩුව එසවීමි කියා රජ්පුරුවන් අතට කඩුව දුන්සේක් "මහරජ! ඉදින් මා මරණු කැමතිසේක් වීනම් මේ කඩුවෙන් දැන්ම මා මැරුව මැනව, නොමරණසේක් වීනම් අභය දුන මැනවැ''යි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ "මා විසින් තොපට අභය දෙනලද්දේය, තෙපි මා කෙරෙහි සැක නොකරවයි මතුත් ඔවුනොවුන්ට නො වරදනා ලෙස කඩුව ගෙණ සපථ කළහ. ඉක්බිති රජ්ජුරුවෝ කියන්නාහු 'පණ්ඩිතයෙනි! තොපගේ මෙබඳු ප්‍රඥා බල හා කාය බල ඇතිව කුමක් පිණිස රාජ්‍යය නොගණුද?'යි කීහ. මහරජ! "ඉදින් කැමැත්තෙම් නම් සියලු රජදරුවන් මරා රාජ්‍යය ගණිමි. අනුන් මරා යසස් ගැන්ම නුවණැත්තන් විසින් නින්දා කරණලද්දැ''යි වදාළසේක. රජ්ජුරුවෝ එබසට සතුටුව කියන්නාහු "පණ්ඩිතයෙනි! උමගට හසුවූ මහජනයා උමං දොර නොහරණෙන් වලප්නාහ, උමං දොර හැර ඒ සත්ත්වයන්ට ජීවිතදානයදෙව''යි කීහ.

සකල ජනානන්දකරවූ තිලෝගුරුවූ අනාථ නාථවූ කරුණානිධාන වූ (මාගේ) ස්වාමිදරුවානෝ එවේලෙහි දෙරහළසේක. සියලු උමඟ ඉරු නැංගා සේ එකාලොක විය. මහජනයා අස්වස් ලදින් සැපසේ සිටියහ. එක්සිය යක් රජදරුවෝ තමන් තමන්ගේ අගම්පඩි සේනාව හා සමග උමඟින් පිටත්ව බොධිසත්ත්වයන්වහන්සේ සිටිතැනට ගියහ. ඉක්බිති රජදරුවෝ කියන්නාහු "තොප නිසාම පණ්ඩිතයෙනි! අප ජීවිත ලද්දේ මඳ ඇසිල්ලකින් දෙර නොහළුවෝ නම් අප හැම උමඟ මළම්හ"යි කීහ. ස්වාමිදරුවානෝ වදාරණ සේක් 'දැන් මතු නොවෙයි තොප හැම මා නිසා රැකුණේ, පළමුත් රැකුණේ වේදැ"යි වදාළසේක. පළමු තමන් ඔබ නිසා රැකුණු නියාව නොදන්නා රජ දරුවෝ 'ඒ කවර කලකද? පණ්ඩිතයෙනි! යි කීහ. ස්වාමිදරුවානෝ උන් හැම ගිවිස්වා සලකුණු වදාරණසේක් "රජදරුවෙනි! අපගේ මියුලු නුවර තබා සියලු දඹදිවට රාජ්‍යයගෙණ මේ උත්තරපඤ්චාල නුවරට අවුත් මගුල් උයනදී 'ජයපානය බොම්හ'යි මන්ත්‍රණයකර රා මස් ආදී සියල්ලක් සැරහූ දවස් සිහි කරව්ය"යි වදාළසේක. එසේය පණ්ඩිතයෙනි! සිහි ඇතැ'යි කීහ, "එසේවීම් නම් මේ රජ්ජුරුවන් හා කෙවට්ටයා කළ නපුරු මන්ත්‍රණයකින් කෙවට්ටයාගේ බස් ගෙණ විෂ මිශ්‍ර රා හා මච්ඡ මාංශ කවා තොප හැම මරණ පිණිස කළාවූ මන්ත්‍රණය මම දැන මෙසේවූ පණ්ඩිතයකු ජීවත්ව ඉන්දදී මා බල බලා මේ රජදරුවෝ අනාථ මරණින් නොමියෙත්ව'යි සිතා මාගේ සහජාත යොධයන් එවා රා හා මච්ඡ මාංශ පිරූ ඒ සැළවල් බිඳුවා මොවුන් දෙදෙනාගේ මන්ත්‍රණය බිඳ තොප හැමදෙනාටම ජීවිතදානය දුන්නෙම්වේදැ"යි වදාළසේක.

ඒ රජදරුවෝ කලකිරුණු සිත්ඇතිව සැබෑද? මහරජ එසේ කෙළේ'යි කීහ. කෙවට්ටයාගේ බස් ගෙණ මා එසේ කෙළේ සැබෑය, බොරුවෙක් නො වෙයි, පණ්ඩිතයන් කී බස් සැබව'යි කීහ. ඒ රජදරුවෝ සැමදෙනම බොධි සත්ත්වයන් සිපගෙන 'පණ්ඩිතයෙනි, අප හැමදෙණාට පිහිටව සිටියෝ තොප මය, තොප නිසා අප දිවි ලද්දේය"යි තමන් තමන් පලන් ඔවුනු සහිතවූ සුසැට ආභරණයෙන් බොධිසත්ත්වයන්ට පූජාකළහ. ඒ පූජා විඳගෙණ සිට චූලනී රජ්ජුරුවන්ට උපන් කනස්සල්ල හරණසේක් "මහරජ! නොසිතුව මැනව, නුඹවහන්සේගේ වරදෙක් නොවෙයි. මේ වූ කැලී දුෂ්ටවූ කෙවට්ටයාගේ පාප මිත්‍ර සංසර්ගයෙන්වූ දෝෂයකි, මතු මෙවැන්නක් නොකරන්නෙම්'යි මේ රජ දරුවන් හැම ක්ෂමා කරණුමැනවැ"යි වදාළසේක, රජ්ජුරුවෝ කියන්නාහු "රජදරුවෙනි! මාගේ නුවණින් තොප හැමදෙනා කෙරෙහි ජන්මාන්තර වෛරයකින් මා කළ දෙයක් නොවෙයි, නෙල ඉතා දුර්ජනවූ ගුණමකු ලාමකවූ කෙළෙහි ගුණ නොදන්නාවූ අලජ්ජීවූ අනාචාරයී ස්වරූප ඇති අවලක්ෂණවූ කෙවට්ට නම් ජඩයා නිසා මා නොදැන කළ අපරාධය ක්ෂමා කරව, නැවත මා පණ තබා මෙවැන්නක් කරන්නේ නැතැ"යි ක්ෂමා කරවූහ. මෙසේ රජදරු වන් ඔවුනොවුන්ගේ වරද දෙසා හැම එක්සිත් වීමෙන් සමාගම්වූහ.

ඉක්බිති බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ බොහෝ කන බොන දෑ හා මල් ගඳ විලවුන් ගෙන්වා සියලු රජදරුවන් හා උත්තර පඤ්චාලය වෛදෙහය යන දෙරට සේනාව එක්ව සත් දවසක් උමඟ ඇතුළෙහි කෙළ ඉන් නැගී උපකාරි

නුවරට වැද බෝධිසත්ත්වයන්වහන්සේට බොහෝ සත්කාර සම්මාන කොට එක්සියයක් රජදරුවන් පිරිවරා මාලිගාවේ මතු මහල්තෙලෙහි හුන්නාහු බෝධිසත්ත්වයන් තමන් සමීපයෙහි රඳවනු කැමැතිව කියන්නාහු, “මහෞෂධ පණ්ඩිතයෙනි! දවස් පතා ජීවිත වෘත්තියට දෙනලද වියදම් ආදියද, ගම් බිම් ගව මහිස ඇත් අස් ආදී වාහන සමූහයද, මුතු මැණික් පබළු වෛඩූර්‍ය්‍ය මසාර ගල්ල ලෝහිතඞ්ක රජත සුවර්ණාදී දශවිධ රත්න සමූහයද දෙමි. ඒ ඒ දෙශයෙහි අනෙකප්‍රකාර වස්ත්‍රාභරණ සමූහයන්ද, දාසි දාස ආදීවූ නොයෙක් කර්මකාරයන්ගෙන්ද, මාගේ රාජාභිවෘද්ධියට දෙවෙනිකොට සිටුවාලමි; වෛදෙහ රජ්ජුරුවන් තබා දූත් වෘත්තියට හැමදෙසින්ම කිසිවකුත් නොවරදවා විගුණ කොට නොයෙක් පරිද්දෙන් ආඥාකොට දෙවාලමි, එකාදෙශයට නායකා වෛදෙහ රජ්ජුරුවන් තොප රැකලියහෙත කල දසදහසක් යොදුන් දඹදිවට නායකවූ මම රක්ක නොහෙම්ද? තවද තෙපි මියුලුනුවර එක වෛදෙහරජ්ජුරුවන්ට හා වෛදෙහ රටට සෙනෙවිරත්කම කරණ පමණක්වේද, මා සමීපයෙහි රැඳුනාවූ වීනම් දසදහසක් යොදුන් දඹදිවටත් එක්සියයක් රාජධානියෙහි එක්සියයක්දෙනාහට එක සෙනෙවිරද්දූය, රජදරුවන් මුළුල්ලට වඩා තොපගේ ආඥාවක් තෙජසත් ප්‍රඥාවත් කීර්තියත් සිටිනේය, ඉදින් මෙහි තෙපි රඳා උනුනම් එක්සියයක් රාජධානිවල අමාත්‍ය මණ්ඩලයා සහිතවූ මනුෂ්‍යයෝ තොප මුත් අප ඇතැයි කියා නොදන්නාහ. තවද අවශෙෂවූ මනුෂ්‍යයන් හා එක්සියයක් රජදරුවන් තබා මමත් තොප කීවා මුත් සිතින් සිතා කිසිවකුත් නොකරමි රඳව”යි කීහ.

රජුගේ සම්පත බෝධිසත්ත්වයන්වහන්සේ ප්‍රතික්ෂෙප කරණසේක් මෙසේ වදාරණසේක්. මහරජ! යම් පුරුෂයෙක් බොහෝ දවසක් බොහෝ සම්පත් දී භාර්තෲ සවාමිව රක්ෂාකළ රජක්හු සමීපයෙන් අනික් රජක්හු ඒ සම්පතට වඩා සැපත් දෙමි කියා ඒ චිරාත් කාලයක් මුළුල්ලෙහි රැකී රජහුහැර අමුතුම සැපත් දෙමි කී රජහුගේ සම්පත් නිසා එහි ලොභයෙන් ගියේ වීනම් ඔහට තමා විසිනුත් නින්දාමය, අනුන් විසිනුත් නින්දාමය”යි වදාළසේක. ඒ කෙසේද? යත්, තමා විසින් ලබන නින්දානම් මේ රජ්ජුරුවෝ තමහට සෙසු නෑසිය කමක් නැතිව සත් ඇවිරිද්දෙහි පටන් මා තමන් සමීපයෙන් රඳවා මා නිසාම මාගේ දෙමව්පියන්ට ඒසා මහත් උපකාරයකුත් කොට මා මේසා මහත් තනතුරෙක තබා මහා ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටුවා රකිමින් සිටියහ. ඒ රජහු අත්හැර වඩා සැපත්දෙමි, කියවයි මා කළදෑ නපුරැයි තමා තමාටම නින්දා කරන්නේය.

තමා බාල අවස්ථායෙහි පටන් කාරණා කාරණා උගන්වා සියලු සම්පත්තීන් සමෘද්ධකොට මේසා තනතුරෙක තබා රකිමින් සිටි රජහු හැර “සැපත් වඩා දෙමි”යි කී පමණින් මෙතෙක් දවස් කළ උපකාර ජල රෙඛාවක් පරිද්දෙන් කෙළේය. නැවත අන් රජහටත් මෙතෙක් වේදැයි අනුන්ගෙනුත් නින්දා ලබමි, අනුන්ගෙන් ලබන නින්දානම් මේය, මෙසේ දෙතැනින් නින්දායෙන් මට ගැලවීමෙක් නැත, එබැවින් මාගේ රජ්ජුරුවෝ යම්තාක් ජීවත්ව ඉඳිද්ද, ඒ තාක් කල් මුළුල්ලෙහිම වෛදෙහ රජ්ජුරුවන්ගේ මහෞෂධ පණ්ඩිතයෝය’යි කීවවුන් ලවා බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මහෞෂධ පණ්ඩිතයෝය’යි නොකියවමි, මියුලු නුවර මහෞෂධ පණ්ඩිතයෝය’යි කීවවුන් ලවා උත්තර පඤ්චාල

දෙශයෙහි මහෞෂධ පණ්ඩිතයෝය'යි නොකියවම්, මේ මා ගේ රජ්ජුරුවන් ජීවත්ව ඉන්දදී මා රඳන්නේ නැතැ''යි වදාළසේක.

නැවත රජ්ජුරුවෝ කියන්නාහු ''එසේවීනම් පණ්ඩිතයෙනි! තොපගේ රජ්ජුරුවන් සවගීසළවූ කල 'එම් කියා මට ප්‍රතිඥ දෙව''යි කීහ. මහරජ ජීවිතය තම් 'මහලුය බාලය'යි තීරණයෙක් නැත, එතකොට මම රැකී උනිම් තම් එම්'යි වදාළසේක. ඉක්බිති රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් වහන්සේට ප්‍රාමාණාතික්‍රාන්ත මහා සත්කාර කරවූහ. සත්දවසක් ඉකුත්වූ කල්හි මහාතානෝ ගමනට සමු ඉල්වූසේක. නැවත රජ්ජුරුවෝ ''පණ්ඩිතයෙනි! තොපට මේ මේ දෙය දෙමි ඒ ගෙනෙව''යි ප්‍රසාද කියන්නා-

දම්මි නික්ඛසහස්සං තෙ, ගාමාසීති ච කාසිසු,
දාසි සතානි චත්තාරි, දම්මි භරියා සතංච තෙ,
සබ්බසෙනඞ්ගමාදාය, සොත්ථිං ගච්ඡ මහොසධා-ති.

මේ ගාථාවෙන් කීහ:- මෙහි අභිප්‍රාය නම්, මහෞෂධ පණ්ඩිතයෙනි! තොපට නික් දහසක් දෙමි, හෙවත් රත් පස්විසි දහසක් දෙමි, තවද තොපගේ වෙදෙහ රටට ආසන්නවූ කාසි දෙශයෙන් එකි එකී ගමකින් අවුරුද්දට ලක්‍ෂයක් අය නිමන්නාවූ මෙසෙයින් අවුරුද්දකට අසූ ලක්‍ෂයක් නිමන උත්තම තරමේ සළුගම් අසූවක් දෙමි, තවද නොයෙක් බිසෝ පලඳනායෙහි සිටි කෙල්ලන් සාරසියයක් දෙමි, තවද නොයෙක් බිසෝ පලඳනාවෙන් සරහා නිමවනලද ශරීර ශොභා ඇති සවී ලක්‍ෂණ සම්පත්තවූ බිසෝවරුන් සියයක් බිරින්දන්කොට පාවාදෙමි, තවද මාගේ ඇත් අස් රථ පදාති සෙනාවෙන් තොපට නින්දේම ප්‍රසාද සෙනාවක් කොට දෙමි, තොපගේ සේනාවත් මගෙන් දුන් සේනාවත් ඇරගෙණ සුවසේ තොපගේ රටට යව''යි සමුදුන්හ.

ඉදින් නන්දා දේවීන් හා නැයන් සතරදෙනා වෙදෙහ රජ්ජුරුවෝ නේවත් නමුත් පණ්ඩිතයන් වහන්සේ තමන්ගේ යාච්ඤාවට රුඳුනු දෑ වීනම් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් චක්‍රරත්නය හස්තප්‍රාප්තවූ සක්විති රජක්හු මෙන් සතුටුවන්මුත්පිට මාගේ බිසවුන් හා නෑ කෙණෙක් ඇත්තේවේදැ''යි කියන්නා තබා සිතිනුත් නොසිතන්නාහ.

බොධිසත්වයන් වහන්සේ සමුදුන් රජ්ජුරුවන් අස්වසා වදාරණසේක් ''මහරජ! නුඹවහන්සේගේ නැයන් ''මාගේ නැයෝ සාරසියයක් ගව්ඉන් පිටත වේදැ'යි නොසිතුව මැනව, මම මාගේ රජ්ජුරුවන් නික්මෙන දවස්ම මෙසේවූ සම්මුතයක් කෙළෙම්, කෙසේද? යත්, මහරජ තොප නන්දාදේවීන් මව් තනතුරේ තබා දුට මැනව, පඤ්චාලචණ්ඩි කුමාරයන් මල්තනතුරේ තබා දුටමැනවැ'යි කියා පඤ්චාලචණ්ඩි කුමාරිකාවන් අභිෂෙකයට පමුණුවා සොළොස් දහසක් බිසෝවරුන්ට නායකකොට ඔවුනු පලඳවා රජහට පාවාදී යැවීම්, නුඹවහන්සේගේ නැයන් මැනියන් වහන්සේත් බිසවුන් වහන්සේත් පුතනුවන්දැත් මා ගිය නොබෝ දවසකින් වහා එවාලන්නෙමි''යි වදාළසේක.

“යහපත පණ්ඩිතයෙනි! කියා තමන්ගේ දුවනියන්ට දුනමනා දැයාද යට දැසි දස වස්ත්‍රාභරණ අලංකාර මුතු මැණික් ආදී දශවිධ රුවන් සමූහයද රත්නාලංකාරයෙන් සරහනලද ඇත් අස් රථ ආදීවූ වාහන සමූහයද, යන මේ දැයාද මුළුල්ල කිසිවෙකිනුත් අඩු නොකොට තමන්ගේ නායක නගතුරට හා ‘රජව මුත් මෙසේ දියහැකිද’යි කට කට කයිවාරු කාරණ පරිද්දෙන් නොයෙක් සම්පත් මුළුල්ල ‘මාගේ දුවනියන්ට දෙව’යි බොධිසත්ත්වයන්ට පාවාදී, බොධිසත්ත්වයන් හා කැටිව යන සේනාවට දියයුතු වියදම් ආදී සියල් ලට විධාන කරන්නාහු එහි නියුක්තයන්ට මෙසේ කියත්, කෙසේද? යත්,–

එම්බා සගයෙනි! වෙදෙහ රජ්ජුරුවන්ගේ සොළොස් දහසක් ඇත් ඇණිය, සොළොස් දහසක් අස් ඇණිය, සොළොස් දහසක් රථ ඇණිය, ඒ තරමට නොමඳවූ සේනාවය, යන සියල්ලෝම වෙදෙහ රජ්ජුරුවන් හා කැටිව පළමු පලාගියහ. පණ්ඩිතයන් කැටිව සිටියාහු බොහෝ දෙනෙක් නොවත් නාහ. උන් තමන්ට අගම්පතිව සිටින්නාහු, සොළොස් දහසක් ඇත් ඇණිය, සොළොස් දහසක් අස් ඇණිය, සොළොස් දහසක් රථ ඇණිය, ඒ තරමටම වඩා සිටිනාවූ මහාසේනාව, උන් උන්ට දෙන්නේ වැඩියෙක් නොවෙයි, උන් උන්ට පළමු දෙන තරම් පණ්ඩිතයන්ගේ වියදම් කැමියක අතින් නියම දැන පළමු උන්ගෙන් දෙන්නාට දෙන වියදම් දැන් එකකුට බැගින් සියල්ලන්ට දෙන වෘත්තිය උත්තමයන් කෙරේ පටන් අධමයන් දක්වා ඇතුන් පටන් ගවයන් දක්වා පළමු වියදම් කා සිටියවුන්ට කිසිවෙකිනුත් රහැණි නොක රවා අන්නපාන වස්ත්‍රාභරණ ආදීවූ සියල්ලකිනුත් අඩුනොකොට වඩා දෙවව්. එසේකල සාරසියයක් ගව් ගෙවා යන්නාහු මග සුවසේ නිදුකින් ක්ලාන්ත නොවී යන්නාහ”යි විධාන කළහ.

නැවත බොධිසත්ත්වයන් වහන්සේට සමු දෙන්නාහු මෙසේ කියත්–

හත්ථී අස්සා රථා පත්තී, ගවෙජ්වාදාය පණ්ඩිත!
පස්සතු තං මහාරාජා, වෙදෙහො මිථිලං ගතං ති–.

මෙයින් කියා “මහෞෂධ පණ්ඩිතයෙනි! ඇත් අස් රථ පදාති සේනාව පිරිවරා මහා සන්තොෂයෙන් අසුර විජයකොට ජයලත් ශක්‍රදෙවෙන්ද්‍රයා පරිද් දෙන් වහා නික්මෙව, තොප සුවසේ මියුලු නුවර ගියවුන් දකින්නට පුල පුලා උන් වෙදෙහ රජ්ජුරුවන් හා පෙරමග බල බලා ඉඳිනා නුවර වාසීහු තොප ගියවුන් දැක සතුටු වෙත්ව”යි කීහ. ඒ සියයක් රජදරුවෝ බොධි සත්ත්වයන් වහන්ත්සේට බොහෝ සත්කාර කොට බොහෝ පඬුරු දුන්හ.

ඒ ඒ රජදරුවන් අතරේ සිටි වරපුරුෂයෝ එක්සියයක් දෙන තමන් ගේ පඬුරු හා සමග අවුත් පණ්ඩිතයන් වහන්සේ පිරිවරා ගත්හ. ඒ මහතා ණන් වහන්සේ ප්‍රමාණාතික්‍රාන්තවූ නොහොත් මෙතෙකැයි පමණ නැත්තාවූ චතුරඞ්ගිනී සේනාවෙන් යම්සේ ගොඩ ගමන් ගත් මහා සමුද්‍රය පරිද්දෙන් නික්මුණුසේක, අතරමග සිට බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් දුන් සළුගම් අසුවෙකි අය ගෙණෙව’යි මිනිසුන් යවා තමන් වහන්සේගේ වෙදෙහ රටට සම්ප්‍රාප්ත වූසේක.

එදවස් 'උමඟින් යන්නට ය'යි කී බසින් දණ තලල වැළමිට කඬරෙදි බැඳ කෝතමක් හැඳ සැරහුනු ප්‍රඥා සමුද්‍රවූ ඉතා ගැටවා සේනකයා මතු වන්නා දැක, අතරමග එක් පුරුෂයකු සිටුවත්තේ මෙසේ කියා "එම්බා කුඬෙනි! චූලනී රජ්ජුරුවන් මෑත එන්තක් වත් අතික් කිසිකෙණෙකුන් මෑත එන්තක්වත් වහා අවුත් මට කියව"යි කියා සිටුවිය ඒ පුරුෂයා මියුලුනුවර දෙළොස් ගව්වකින් ඔබ්බේ වඩනා මහබෝසතාතන් වහන්සේ දැක 'මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ මහපෙළහරින් වඩිමින් සිටිසේකැ'යි අවුත් සෙනකයාට කීය, ඒ අසමින් සෙනකයා වහා රජගෙට ගොස් රජහට කීය, රජ්ජුරුවෝ පණ්ඩිතයන් වහන්සේ එන තියාව දැන මාළිගාවේ මතු මහලට නැගී සීමැදුරු කවුළුවෙන් පිටත බැලූකල්හි සෙනාව දැක කියන්නාහු අපගේ පණ්ඩිතයන්ගේ සෙනාව මඳය, උන් හැම තමා සොළොස් දහසක් ඇත් ඇණිය සොළොස් දහසක් අස් ඇණිය, සොළොස් දහසක් රථ ඇණිය, එපමණ තරම් සෙනාවට වඩා පාබල සෙනාවය, ඉතා භයානකයයි භයින් තැතිගෙණ සෙනකයා අතින් විචාරන්නාහු-

හත්ථී අස්සා රථාපත්ති, සෙනාසං දිස්සතෙ මහා,
චතුරඞ්ගිනී භිංසරූපං, කින්නු මඤ්ඤසි පණ්ඩිතා-ති.

මේ ගාථාවෙන්-ඇත්සේනාවය, අස්සේනාවය, රථසේනාවය, මෙතෙකැයි පමණ නැති පදාතිසේනාවය යන ඉතා භයානක ස්වරූප ඇත්තාවූ චතුරංගිනී මහා සෙනාව පෙණෙයි. සෙනකයෙනි! තෙපි උන් කවුරුනැයි සිතව්දැයි කීහ.

සෙනකයා රජහු සැකහරවා නත්වූ පරිද්දෙන් කියන්නේ "මහරජ! නොබා වදාළ මැනව, නුඹවහන්සේට උතුම් සන්තොෂයෙක් වන්නේය, ඊට කාරණා කීම්දයත්, එක්සියයක් රජදරුවන්ගේ සෙනාවය, බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ සෙනාවය, මියුලු නුවරින් ගිය සෙනාව"යි යන සෙනාවන් ඇතුළු වූ චතුරංගිනී සෙනාවන් පිරිවරා සුවසේ එනසේක්වේද, අපටයශදායකවූ අපගේ ලයක් වැනි අපගේ ඇසක් වැනි අපගේ ජීවිතයක් වැනි අපගේ ස්වාමිදරුවූ ජනානන්දකරවූ ලොකස්වාමීවූ තිලෝගුරුවූ තිලොක තිලකවූ ප්‍රඥා සම්පත්තවූ සරණාගත වජ්‍රපඤ්ජරවූ ප්‍රඥාප්‍රදීපවූ අපගේ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ වඩනාසේකැ"යි කීහ.

සෙනකය! කුමක් කියව්ද? පණ්ඩිතයන්ගේ සේනාව මඳය, මේ සේනාව එදවස් බ්‍රහ්මදත්තයන් ආ තියාව මෙන් මහා සේනාවෙකැ"යි කීහ. නැවත සෙනකයා කියන්නේ "මහරජ! නොසිතා වදාළ මැනව, අපගේ ස්වාමිදරුවා තන්ගේ ඉතා මිහිරි කර්ණරසායනයක් බඳුවූ ධර්මාන්විතවූ මධුර කථායෙහි බැඳුන රජ්ජුරුවන් විසින් ඔබ කෙරෙහි පැහැද ඔබට ප්‍රසාදයෙන් දුන් සේනාවය, සැක නොකොට වදාළ මැනවැ"යි කීය.

ඒ අසා රජ්ජුරුවෝ ඉතා සතුටුව නුවර බෙර ලවන්නාහු "මේ මාගේ සත්යොදුන් මියුලුනුවර දිව්‍යපුරයක්මෙන් සැරහා පණ්ඩිතයන්ට පෙරගමන් කෙරෙත්ව"යි කියා බෙරලැවූහ. නුවර වාසීහු දැක්මට පුල පුලා උන්නාහු එබස් අසමින්ම අටවිසි ගව්වක් පමණ ඒසා මහත් නුවර අසුර විජයකොට

ජයලත් එන ශක්‍රදෙවේන්ද්‍රයාට සරහා නිමවන ලද ශක්‍රභවනයක් මෙන් අති මනොහර කොට ධජ පතාකා පුන්කලස් කදලි තොරණ ආදියෙන් හා සුදුවැලි ලද පස්මල් ආදියෙන් විසිතුරුකොට සරහා; නුවර වාසීහු සර්වාභරණයෙන් සැරහී ස්වාමිදරුවානන්ට පෙර ගමන් කොට වඩාගෙණාහ. පණ්ඩිතයන් වහන්සේ ඒ නුවර වාසීහු ස්ත්‍රී පුරුෂයන්ගේ නෙත්‍ර සමූහයෙන් සතුටු කඳුලෙන් පුරා තුෂාරයෙන් අග්‍රවූ නිලුපුල් පෙතිසේ කෙරෙමින් ඇස් සිත් නිවා තමන්වහන්සේ පස්මසක් මුළුල්ලෙහි නුදුටුවන්ගේ ශොක සන්හිඳුවාලෙහි අමාදිය එව, ඇසට රසාඤ්ජන දෙන්නාක්හුමෙන් අනන්තයාසේ දහසක් මුඛ මවා ඉදින් කීවහොත් ඒ මහතානන්ගේ ශ්‍රී විලාසයෙන් ස්වල්පමාත්‍රයකුත් කියන්නට අසමර්ථවූ අනොපමෙයවූ ශ්‍රී විභූතීන් රජගෙට වැද රජ්ජුරුවන් දුටුසේක.

රජ්ජුරුවෝ බොධිසත්වයන් දැක ඛුද්දක ප්‍රීතිය, ඛණික ප්‍රීතිය උබ්බෙග ප්‍රීතිය, අවක්‍රාන්තික ප්‍රීතිය, ඵරණ ප්‍රීතිය යන පස්වණක් ප්‍රීතින් පිණා ගියාහු වහා හුනස්නෙන්නැගී ඉදිරියට අවුත් සිපගෙණ ඉසසිඹ සනහා නැවත ගොස් ආසනයේ ඉඳ, සිනිකටයුතුවූ මිහිරිකථා කොට උපමාවක් කියා බලමි සිතා–

යථා පෙතං සුසානස්මිං, ඡඩ්ඩෙත්වා චතුරො ජනා,
එවං කම්පිල්ලියෙ ත්වංච, ඡඩ්ඩයිත්වා ඉධාගථා

අථ ත්වං කෙන වණ්ණෙන, කෙන වාපන හෙතුනා
කෙන වා අත්ථජාතෙන, අත්තානං පරිමොචයි–ති–

මේ ගාථාවන්ගෙන්– එම්බා පණ්ඩිතයෙනි! යම්සේ මළ මිනිසකු සතර දෙනෙක් කුරාලයක ලා උසුලාගෙණ ගියාහු අමුසොහොනේ දමාපියා ඔහු කම්පල්ල දෙශයෙහි ලාපියා අපගේ පණගලවාගෙණා තොප කෙරේ කිසි අපෙක්ෂාවක් නැතිව නැගී ආම්හ, දැන් තෙපි කවර කාරණයකින් කවර උපායකින් කවර නුවණකින් කවර හෙතුවකින් තෙමේත් රැකී සෙනාවත් රැකගෙණ කෙසේ ගැලවී අවුදූ''යි විචාළහ,

ඒ අසා පණ්ඩිතයන් වහන්සේ–

අත්ථං අත්ථෙන වෙදෙහ! මන්තං මන්තෙන ඛත්තිය!
පරිවාරයිස්සං රාජානං, ජම්බුදීපංච සාගරෙ–ති–

මේ ගාථාවෙන් වදාරණසේක් "මහරජ! බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් සිතින් සිතූ යම් අර්ථයක් මාගේ තීක්ෂණවූ ප්‍රඥාවෙන් අතික් අර්ථයක් සිතා ඔහු සිතූ යම්ම අර්ථයක් ජය ගතිමි, ඒ රජ යම්මන්ත්‍රණයක් සිතුයේ නම්, ඔහුගේ මන්ත්‍රණය මාගේ මන්ත්‍රණයෙන්ම ජය ගතිමි, නවද මහරජ! දඹදිව පිරිවරා, සිටි සාගරය පරිද්දෙන් දඹදිවට අධිපතිවූ එක්සියයක් රජුන් හා සේනාව මාගේ ප්‍රඥා බලයෙන් මා පා පිටගස්වා මම චක්‍රවර්ති රජහුසේ සියලු රජුන් හා සෙනාව පිරිවරුයෙම් වේදූ''යි වදාළසේක.

මෙසේද කියා නැවතවදාරණසේක් "බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් සටනට සෙනාවැමෙහෙයු තැන් පටන් නුවරවාසල් හරණතුරු කී කළ දෙයක් නැවත උමගට වන් තැන් පටන් උමගින් රජු ගෙණගොස් මහවිසල් මලුවේදී කඩුව

සැඟවී තැන් දක්වාත් එතනදී සපතකොට රජුගේ යාච්ඤාවෙන් උමඟ අසුවූ රජුත් සහිත සේනාව දොර හැර මරණින් මුදා නැවතසත්දවසක් උමං කෙළි යෙන් දවස් යවා. ඉක්බිති රජදරුවන් හැමදෙන තමන්වහන්සේට දුන් පඬුරු හා නැවත බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් දුන් නොයෙක් ප්‍රසාද හා නැවත එම රජහු දුවනියන්ට දුන් දායාද හා නැවත චූලනී රජ්ජුරුවන් ඇතුළුවූ සියලු රජදරුවන් තමන්වහන්සේට දුන් ප්‍රසාදත් මේ මේය'යි වදාරණසේක්

දින්නං නික්ඛසහස්සං මෙ ගාමාසීතිච කාසිසු,
දාසිසතානි චත්තාරි, දින්නං භරියා සතංච මෙ
සබ්බසෙනඞ්ග මාදාය, සොත්ථිනාම්හි ඉධාගතො-ති.

මෙයින් වදාරා ''මාඝ රත්රන් පස්විසි දහසක් දුන්හ. සර්වාභරණයෙන් සැරසූ ශරීර ශොභා ඇති තන සිටි බාල කෙල්ලන් සාරසියයක් දුන්හ. නොයෙක් පලඳනාවෙන් සැදී බිසෝවරුන් සියයක් මට බිරින්දන් කොට පාවා දුන්හ අපගේ මේ වෛදෙහ රටට ආසන්න තමන්ගේ කාශිදෙශයෙන් ගමකින් අවුරුද්දකට ලක්‍ෂයක් බැගින් අය නිමන්නාවූ ගම් අසූවක් දුන්හ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා සියලු රජදරුවෝත් තමන්ගේ චතුරංගිනිසේනාව කෙරෙහි නිරපෙක්‍ෂව ප්‍රසාද සේනාවක් කොට මටම දුන්හ. ඒ සියලු සේනාව පිරිවරා උකටලියක් නැතිව මහා සන්තොෂයෙන් යුක්තව නැගී ආමි''යි වදාළසේක.

ඒ අසා ප්‍රීතින් පිණා ගිය රජ්ජුරුවෝ බොධිසත්වයන්ගේ ගුණ කියන්නාහු-

සුසුඛං වත සංවාසො, පණ්ඩිතෙහීති සෙනක!
පක්කීව පඤ්ජරෙ බද්ධෙ, මච්ඡෙ ජාලගතෙරිව,
අමිත්ත හත්ථත්ථගතෙ, මොචයි නො මහොසධො-ති.

මේ ගාථාවෙන්- ''සේනකය! නුවණැත්තන් හා එක්ව විසීම ඉතා යහපත් වන්නේය, ඉනුත් මේ මහෞෂධ පණ්ඩිතයන් හා එක රටක එක නුවරක එක තැනක යමෙක් වෙසෙත් නම් මෙලොව සොර සතුරු බියෙක් වත් පරලොව අපාය භයෙක් වත් නැත්තේය. ඊට කාරණා නෝම දුටුයෙහිවේද? අටළොස් අක්ෂෞහිණී සංඛ්‍යාත ඒසාමහත් සතුරු සේනාවක් මැද මැදිරියක බැඳි සියොතුන් සේද, දැල බැඳි මසුන් සේද, හසුවූ තොප දෙමූ රයක ගලවාගත් බව තොපටම දැනෙන්නේ වේද, එසේ හෙයින් නුවණැත්තවුන් හා එක්ව විසීම ඉතා යහපතැ''යි ගුණ වණීනා කළහ. සේනකයාත් රජහු බස මුදුනෙන් පිළිගෙණ සැබවැයි කියා තමා ඇතිවක් පටන් සම සිතින් බොධිසත්වයන්ගේ ගුණ කියන්නේ ''මහරජ! ඒ සැබව නුවණැති පණ්ඩිතවරු තම් මෙලොවිත් පරලොවිත් ඉෂ්ටයක් මුත් අනිෂ්ටයක් විය නොදෙන්නාහ, මැදිරියක බැඳි සියොතුන් සේද, දැල හසුවූ මසුන් පරිද්දෙන්ද, සතුරන්ට අත්පත්ව ජීවිත විනාශයට පැමිණ සිටියාවූ අප හැම දෙනා ගලවා සැපයෙහි පිහිටුවාලූසේක, සමස්තලොකයෙහි නුවණැත්තාවූ සියලු සත්වයන්ට ශත සහස්‍ර ගුණයෙන් වඩනාසේක්, අපගේ මේ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේය''යි තමාගේ මුව නොසෑහෙන පරිද්දෙන් චෙතනසක් නැතිව තම සිතින්ම ගුණ වණීනා කෙළේය.

ඉක්බිති රජ්ජුරුවෝ නුවර බෙර ලවත්තාහු "සත්දවසක් සැණකෙළි කෙළව යම් කෙනෙක් මට හිතයෝ නම්, ඒ සියල්ලෝම පණ්ඩිතයන්ට නොයෙක් පඬුරෙන් සත්කාර සම්මාන කෙරෙත්ව"යි විධාන කළහ. (ඒ බව ප්‍රකාශකොට වදාරණ බුදුරජාතන් වහන්සේ මෙසේ වදාරණසේක.

ඔරොධා ච කුමාරා ච, වෙසායනෝ ච බ්‍රාහ්මණා,
බහුං අන්නං ච පානංච, පණ්ඩිතස්සාභිහාරයුං,

හත්ථාරූහා අනීකට්ඨා, රථිකා පත්තිකාරකා,
බහුං අන්නං ච, පානංච, පණ්ඩිතස්සාභිහාරයුං.

සමාගතා ජානපදා, නෙගමා ච සමාගතා,
බහුං අන්නං ච පානං ච, පණ්ඩිතස්සාභිහාරයුං.

බහුජ්ජනො පසන්නොසි, දිස්වා පණ්ඩිතමාගතෙ,
පණ්ඩිතම්හි අනුප්පත්තෙ, චෙලුක්ඛෙපො අවත්තථා-ති.

මේ ගාථාවන්ගෙන්:-"එම්බා මහණෙනි! ඒ වෙදෙහ රජුගේ විධානයෙන් සියලු වීණාවාද්‍ය ඉතා සිත්කලුකොට ගායනා කළහ. තවද සාරසක් විජයසක් ජයතුරාසක් ආදීවූ පඤ්චප්‍රකාර සඞ්ඛනාද පැවැත්වූහ. ආතතය විතතය, විතතාතතය, ඝනය, ශුෂිරය යන පඤ්චාඞ්ගික තූර්‍ය්‍යනාද පැවැත්වූහ, නුවර වාසීන් හා ජනපද වාසීහු ස්වභාවයෙන්ම ස්වාමිදරුවානන්ට සත්කාර කරන්නට සිතන්නාහු බෙර අඬ අසමින් වඩ වඩා සන්තොෂව තමන් තමන්ගේ විභවානුරූපකොට මහත්වූ සත්කාර සම්මාන කළහ. උදුම්බරා නම් අගමෙහෙසුන් බිසව ඇතුළුව සොළොස් දහසක් බිසෝවරුද, රාජකුමාරයෝද, ව්‍යාපාරයෝද, බ්‍රාහ්මණයෝද, යන සියල්ලෝම කන බොන දෑ හා බොහෝ පඬුරු ගෙණගියහයි වදාළසේක. තවද ඇත් අස් රථාදී වාහන නැගෙන්නෝද, පාබල මහසේනාවද; ජනපද වාසීහුද, නියම්ගම් වැස්සෝද බොහෝ කන බොන දෑ පඬුරු ගෙණ පණ්ඩිතයන්ගේ ගෙට ගියාහ"යි වදාළසේක.

එක්සියයක් රජදරුවන් හුන් තැනට තමන්ගේ රටින් හාරසියයක් ගව් ගෙවා ගොස් තමන් මරන්නට වටලාගත් රජදරුවන් හා ඒසා මහත් චතුරඞ්ගිණී සේනාව තමන්ගේ ප්‍රඥා බලයෙන් තනිව ජයගෙණ උත්තර පඤ්චාල දෙශයෙන් මියුලු නුවරට ආ දවස් රැස්වූ බොහෝ ජනයෝ සුවසේ ආවාවූ පණ්ඩිතයන් දැක බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ඇතුළුවූ එක්සියයක් රජුන් ජය ගෙණ ආසේකැ"යි ඉතා ප්‍රසන්නව ඔදවැඩි සතුටුවූවාහු, ඒ පණ්ඩිතයන්ගේ කීර්තිය පැතිරෙන්නාක් පරිද්දෙන් සත්දවසක් මුළුල්ලෙහි පිළිහිස සිසාරා නොයෙක් කෙළියහ"යි වදාළසේක.

මෙසේ බොධිසත්වයන් වහන්සේ සත්දවසකින් සැණකෙළි අන්තවූ කල්හි රජගෙට ගොසින් "මහරජ ! චූලනීරජ්ජුරුවන්ගේ මෑනියන්ද, පුතනුවන්ද, බිසවුන්ද, වහා යැව්ව මැනවැ"යි වදාළසේක. "යහපත පුත මට කියන්නේ කිම්ද? යවාපියව"යි කීහ. බොධිසත්වයන්වහන්සේ තුන්දෙනාට වෙන වෙනම බොහෝ සත්කාර සම්මාන කොට එක්සියයක් රජදරුවන් හා බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් තමන්ට ප්‍රසාදයේ දුන් චතුරඞ්ගිනී මහසේනාවට

බොහෝ ප්‍රසාදදීමෙන් සත්කාර සම්මානකරවා ඒ මහා සේනාවත් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් තමන්ට පාවා දුන් බිසෝවරුන් සියයක් හා කම්මිත්තන් සාර සියයක්ද නන්දා දේවීන්ට පාවාදී, ප්‍රසාද සේනාවත් උන් ඇරලලා එන පරිද්දෙන් උන්ටම පාවාදී මහපෙළහරින් ගැවූසේක.

ඒ රජදරුවෝ තුන්දෙන අපමණවූ රජපෙළහරින් යන්නාහු සියක් යොදුන් මග ගෙවා උත්තර පඤ්චාල නුවරට පැමිණියහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මැතියන් විචාරන්නාහු "කීමෙක්ද මැතියන්වහන්ස ! වෙදෙහ රජ්ජුරුවෝ "සතුරාගේ මැතියෝය'යි මා කෙරේ කළ වෛරයෙන් නුඹ වහන්සේ කෙරෙහි නොසතුටුව විසුද? නොහොත් සංග්‍රහ කළෝද"යි කීහ.

දේවී කියන්නාහු පුතණ්ඩ ! 'කුමක් කියන්නේද? මා මව්තනතුරවත් වඩා දෙවනා තනතුරෙහි තබා දුටහ, නන්දා දේවීන් මව් තනතුරෙහි තබා දුටහ. බොහෝ සත්කාර සම්මානයෙන් බොහෝ ආචාර සමාචාරයෙන් සංග්‍රහ කළහයි මැහැලීවහන්සේ තමන් මුඛ නොසෑහෙන පරිද්දෙන් ගුණ කීහ, රජ්ජුරුවෝ එබස් අසා වඩ වඩා සන්තොෂයට පැමිණ බෑනනු වන්ට බොහෝ පාක්කුඩම් හා පඬුරු යැවූහ.

වෙදෙහ රජ්ජුරුවන් කළ සංග්‍රහ මැතියන් අතින් විචාරන්නටත් නන්දා දේවීන් අතින් නොවිචාරන්ටත් කාරණා කිම්ද යත්, නන්දා දේවී තරම් රූ ඇති කෙණෙක් මුළු දඹදිව අනික් තැනක ඇත්තේ නැත. මා සමීපයෙන් ගොස් සාරසියයක් ගව්වේ උන් නැනැත්තී මා කළ දෙයක් කෙළේය"යි සිතා මා කෙරෙහි ආදරයක් භයක් නැතිව අනාචාර සීලීව තමා සිත් පරිද්දෙන් වැසපු තම් විචාළකල නැත්තක් මුත් ඇත්තක් නොකියන්නීය, නැත්ලෙ තම් සෙහෙළියන්ට කුකුළන් හා බළලුන්සේ කෙණෙක; ඇත්තක් තබා නැත් තක් කියා බිඳුවන්නට කියන්නාහ, එසේහෙයින් බිසවුන් අතින් නොවිචාරා මැතියන් අතින් විචාළහයි දතයුතු එතැන්පටන් දෙපක්‍ෂයේ ඇත්තෝම ඔවුනොවුන් හා සමග එක්ව එක්ව විසූහ.

මහා උම්මග්ග කාණ්ඩය නිමි.

———:–:–———

දිය රකුසු පැනය.

පඤ්චාලචණ්ඩි බිසව් වෙදෙහ රජ්ජුරුවන්ට ප්‍රියව සිත්ගෙණ වසන්නාහු දෙවන හවුරුදු පුතනු කෙණෙකුන් වැදූහ. ඒ කුමාරයන් වැඩී දසහැවිරිදි කල වෙදෙහ රජ්ජුරුවෝ සවර්ගසථවූහ. බොධිසත්වයන්වහන්සේ දස හැවිරිදි කුමාරයන් ධවලච්ඡත්‍ර නංවා රාජ්‍යයෙහි පිහිටුවා දෙවයන්වහන්ස ! නුඹ වහන්සේගේ මුතුන් රජ්ජුරුවන් සමීපයට යෙමි"යි වදාළසේක, කුමාරයෝ "මා බාල නැනැත්තවූ ඇරපියා නොයෙව, මම තොප පිය තනතුරේ තබා රකිමි, සියල්ලෙන්ම ආදර කෙරෙමි"යි කීහ, ඒ අසා පඤ්චාලචණ්ඩි බිසව් කියන්නාහු "මාගේ මව්පියන් ඇතත් මට පිය තනතුරේ සිට මේ සාරසියයක්

ගව්වට මා සරණකර දුන් දෑත් නුඹදෑමය, ජන්මාන්තර වෛරී රජදරුවන් කිරඹසේ එක්කරවා අවෛරී කළ දෑත් නුඹදෑමය, එසේහෙයින් මටත් මපුත නුවන්ටත් අභිවෘද්ධි නුඹදෑමය, නුඹ මේ නුවරින් ගියකල අපට කිසි පිටි වහලෙක් නැත, නොහිය මැනව, දරුවන්ගේ පිය රජ්ජුරුවන් සිටියාසේ සියලු සම්පත් වළඳා රාජ්‍යය කළ මැනවයි''යි කීහ.

එබසට වදුරණසේක් ''එසේමය, එදවස් මා එන ගමනේ වේදෙහ රජ්ජුරුවන් මළ කල එන්නෙමි''යි නුඹවහන්සේගේ රජ්ජුරුවන්ට ප්‍රතිඥා දී එනලද, එසේ හෙයින් නොගොස් රඳන්නට නොපිළිවනැ''යි කියා මියුලු නුවර බොහෝ ජනයන් කරුණාවෙන් බැගෑව හඬමින් සිටියදී අමරාදේවීන්දෑ හා සහජාත යෝධයන් හා අවශෙෂවූ දූසි දස් ආදීන්ගෙන් කැපිව එනු කැමැත්තන් ඇරගෙණ නික්මුණුසේක් සියක් යොදුන් මග ගෙවා ගොස් උත්තර පඤ්චාල නුවරට පැමිණිසේක මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ එන සේකැ''යි චූලනී රජ්ජුරුවෝ අසා සතුටුව සේනාව පිරිවරා පෙර ගමන් කොට ඉදිරියට අවුත් මහපෙළහරින් ගෙණගොස් ඉදිනට මාහැඟි මාලිගාවක් දුන්හ, පළමුවෙන් සළගම් අසූව විනා අමුතුව දුන් කිසිවකුත් නැත්තේය. එසේවුවත් එහි කිසි කනස්සල්ලක් නොව කළමනා රාජසේවය පමානොව කරණසේක.

එසමයෙහි ඉතා නුවණැත්තාවූ කීමෙහි බිණීමෙහි දක්ෂ කාරණ කාරණා දන්නා ඉතා ධර්මිෂ්ඨවූ භෙරීනම් පරිබ්‍රාජිකා කෙණෙකුන්දෑ එක්වන් රජගෙයිදී වළඳා මඟුල් උයන ඉඳිනාසේක. මහෞෂධ පණ්ඩිතයෝ''යි යන කෙණෙක් රජ්ජුරුවන්ට සේවය කෙරෙත්ල, 'උන් හා සමාන කෙණෙක් නැත්ල'යි පරිබ්‍රාජිකාවන්දෑ තමින් අසා දන්නාසේක. ''මෙබඳුගුණ ඇති කෙණෙකුන්දෑ රජගෙයි වළඳනාසේකැ''යි බොධිසත්වයන් වහන්සේද අසා දන්නාසේක. එක දවසකුත් ඔවුණොවුන් දුටු විරූත් නැත්මය. තන්දෑ දේවීන් එදවස් උමඟින් සොරාගෙණ ගොස් මසක් වන ගණන් රජ්ජුරුවන් කෙරෙන් මා වියෝග කොට්පීහ''යි තමන්ගේ එපමණ ප්‍රිය වියොගකොට බොධිසත්වයන් කෙරෙහි නොපහන් නැතැත්තෝ වෛරයෙන් තුමූන් කිසිවකුත් කොටගත නට අසමර්ථව තමන්කෙරේ වල්ලභසත්‍රීන් පස්දෙනෙකුන්ට කියන්නාහු 'තෙපි හැම මහෞෂධ පණ්ඩිතයන්ගේ අපරාධයක් පරීක්ෂාකොට රජ්ජුරුවන්ට කියා බිඳුවාපියව''යි කීහ. ඔව්හු පස්දෙන මහතානන්ගේ වරදක් සොයන්නාහු ඔබ යන එන තැන අනුන්ට කිසිවකුත් නොහඟවා පරීක්ෂාකොට ඇවිදිනාහ. එක්දවසක් පරිබ්‍රාජිකාවන්දෑ රජ ගෙයිදී වළඳා තමන්වහන්සේගේ ආශ්‍රම යට වඩනාසේක් බොධිසත්වයන්දෑ රාජ සේවයට වඩනාවුන් (රාජාඞගනයෙහි) මිදුලෙහි දුටුසේක. මහතානෝ පරිබ්‍රාජිකාවන්දෑ වැඳලා සිටිසේක මූන් නුවණ පරීක්ෂා කෙරෙමි''යි සිතා ''බසින් කීවා කවුරු නොදනිද්ද හස්ත මුද්‍රා නම් බැරිදෙයෙක, එබැවින් හස්ත මුද්‍රාවෙන් ප්‍රශ්නයක් විචාරමි''යි සිතා ''කිමෙක්ද පණ්ඩිතයෙනි ! රජ්ජුරුවෝ තොප රටින් මෙරටම ගෙන්වාගෙණ අත විදා සම්පත් දී පියා සුවසේ රකිද්දූයි නොරකිත්දූ''යි සිතින් සිතා බසින් නොකියා අල්ල විදහා පෑ නියාය බොධිසත්වයන්දෑ සිතනසේක් ''මා අතින් හස්තමුද්‍රාවෙන් ප්‍රශ්න විසඳනසේක්වනැ''යි තමන්වහන්සේගේ ප්‍රඥා නමැති දිවැසින් දැන ඒ ප්‍රශ්න විසඳනසේක් තමන්වහන්සේගේ මිට අකුළුවා පෑ

සේක. කුමක් නිසාද යත්' "මා සමීපයට එව"යි ප්‍රතිඥා ගෙණ මාගේ රටින් මා ගෙන්වාගෙණ මිටින් තරවගත් දෙයක් අනුන්ට නොදෙන්නාසේ, අමුතු කිසිවකුත් මට නොදන්නාහ"යි සිතා අතින් ප්‍රශ්නය විසඳූ නියාය. පරිබ්‍රාජිකාවන්දෑ ඔබ දූතගත් නියාව දැන අත ඔසවා තමන්දෑගේ ඉස පිරිමැඩලූසේක. කුමක් නිසාද යත්, ඉදින් උකටලීවූ නම් අපසේ මහණව නොගණුදූයි හැඟවූයේ 'මා විසින් රකිනා බඩවල් බොහෝය, එබැවින් පැවිදි වන්නට නොපිළිවනැ"යි කී නියාය. මෙසේ ඒ පරිබ්‍රාජිකාවන්දෑ හස්තමුද්‍රාවෙන් ප්‍රශ්න විචාරා තමන්වහන්සේගේ ආවාසයටම වැඩිසේක. බොධිසත්වයන්දෑත් පරිබ්‍රාජිකාවන් වැඳ රාජ සේවයට ගියසේක.

තන්දෑදෙවීන්ගේ වල්ලභ ස්ත්‍රීහු රජගෙයි සීමැදුරු කවුළුවෙන් පිටත බැලුවාහු මේ ක්‍රියාව දැක, රජ්ජුරුවන් සමීපයට ගොස් දෙවයන්වහන්ස මහෞෂධ පණ්ඩිතයෝ පරිබ්‍රාජිකාවන් හා එක්ව නුඹවහන්සේ සතු රාජ්‍යය ප්‍රාර්ථනා කරන්නාහ, නොබෝ කලකින් නුඹවහන්සේ මරා රාජ්‍යය ගන්නාහ"යි බිඳුවාපීහ.

ඒ අසා රජ්ජුරුවෝ කියන්නාහු "කිමෙක්දෑ"යි තොප දුටු දෙයෙක්ද? ප්‍රත්‍යක්ෂකොට ඇසූ දෙයක්දෑ"යි කීහ. "අසා වදාළ මැනව, පරිබ්‍රාජිකාවන්දෑ ඊයේ රජගෙයිදී වළඳා යන්නවුන් දෑ රජගෙයි මිදුලේදී මහෞෂධ පණ්ඩිතයන් දැක බොහෝ දෙනා හෙයින් බසින් මන්ත්‍රණයට භය ඇතිව අතින් ඉඟිපාන්නාහු 'පණ්ඩිතයෙනි! තෙපි නුවණැති තැනැත්තවුන් වූව දඹදිව සියලු රාජ්‍යය අතුල් තලයක් මෙන්ද, නොහොත් කල මඩලක් මෙන්ද පාතාගෙණ රාජ්‍යය තොප අත්පත් කරන්නට නොපෝසත්දෑ'යි තමන්ගේ අත්ල විදහා උපමාකොට පෑදූය. පණ්ඩිතයෝත් ඒ දූතගෙණ 'කඩුව මිරිකා ගණිම් නම් කිහිප දවසකින් රජහු මරා රාජ්‍යය අත්පත්කොට ගණිමි, කඩුව ගන්නාලෙස මිට අකුළුවා පෑහ. පරිබ්‍රාජකාවෝ 'එසේ වීනම් රජහු ඉස කපා හැරපියව'යි තමන් ඉස පිරිමැඩලූහ. එවිට පණ්ඩිතයෝ ඉසට ගැසූ පහර මාගේ හයින් අතවැරදී මුදුනෙන් හිස පලාගියනම් තපුරැයි බඳ මැදින් පොලුකරමී"යි සිත තබා බඩ පිරිමැඩලීය, මහරජ! ඇසූ දෙයක් කුමට කියමෝද? අපි සියසින්ම දුටුහ"යි කියා නැවතත් කියන්නාහු "අප්‍රමාදව මහෞෂධ පණ්ඩිතයා මරාපුව මැනව"යි කීහ.

රජ්ජුරුවෝ උන්ගේ බස් අසා මෙසේ සිතූහ. පණ්ඩිතයන් විසින් මාකෙරේ වරදනට නොපිළිවන, පණ්ඩිතයන් කිවයි කියන කාර්‍ය්‍යය පරිබ්‍රාජිකාවන්දෑ අතින් විචාරා දැනපියම් සිතා දෙවන දවස් පරිබ්‍රාජිකාවන්දෑ වළඳා අන්තයෙහි උන්දෑ විචාරන්නාහු "කිමෙක්ද පණ්ඩිතයො දුටුවුදෑ"යි කීහ. මහරජ! ඊයේ රජගෙයි වළඳා යන්නමෝ අතරමගදී දුටුහ"යි කීසේක "උන් හා කළ කථාවෙක් ඇද්දෑ"යි කීහ. "මහරජ! උන් බසින් කී දෙයක් නැත, 'උහු නුවණැත්තාහ'යි යනු අසා "ඉදින් නුවණැත්තාහුවීනම් දැනගන්නාහ"යි සිතා පරීක්ෂා කරණ පිණිස හස්තමුද්‍රාවෙන් ප්‍රශ්නයක් විචාළමීහ, අප විචාළ ප්‍රශ්නය දැන අප සිත් පරිද්දෙන් විසඳුහයි ඒ වූ නියාශයෙන් වදාළසේක, 'ස්වාමීනි! පණ්ඩිතයෝ නුවණැත්තෝදෑ'යි කීහ. මහරජ! නුවණැත්තෝය

උන් හා සමාන කෙණෙක් එක තැණකත් නැත්තාහ''යි වණ්ණනාකළසේක, රජ්ජුරුවෝ පරිබ්‍රාජිකාවන්ගේ බස් අසා වැද පන්සලට යැවූහ.

උන්වහන්සේ ගිය ඉක්බිති බොධිසත්වයන්දූ අංසේක පරිබ්‍රාජිකාවන් විචාළ තයින්ම 'කළ කථා කිම්ද'යි කීහ. ඔබ මා හා බසින් කී දෙයක් නැ‍ා, හස්තමුද්‍රාවෙන් ප්‍රශ්නයක් විචාළසේක. ඔබ විචාළ ප්‍රශ්නය මමත් නොවරදවා හස්තමුද්‍රාවෙන්ම විසඳිමි''යි පරිබ්‍රාජිකාවන්දූ කී පරිද්දෙන් නොවරදවාම වදාළසේක.

එදවස් රජ්ජුරුවෝ මහතානන් කෙරෙහි පැහැද දසදහසක් යොදුන් දඹදිව මුළුල්ලට නායකකොට සෙනෙවිරත් ධුරය දී පටබැන්දූහ. ''සියලු රාජ්‍යය මුළුල්ල පණ්ඩිතයන් කීවක් කෙළේමය, මෙවක් පටන් උන් කීවක්ම කරන්නේය''යි යනාදීන් සියලු දඹදිව විධානම උන්වහන්සේට පාවා දුන්හ. හිමාලයෙන් හුනු පඤ්චමහා ගංගාවන් මහමුහුදට වදනා කලක් පරිද්දෙන් බොධිසත්වයන් වහන්සේගේ ගෙට සියලු සම්පත් හා ඓශ්වර්‍ය්‍යය මහමුහුදට වඩබා දියයේ ප්‍රමාණාතික්‍රාන්තව ඉතා බොහෝ විය.

රජහු තමන්වහන්සේට යසස් දුන් ඉක්බිති නුවණැති මහතානන් වහන්සේ මෙසේ සිතූසේක. කෙසේදයත්? ''රජ්ජුරුවෝ එකවිටම මෙසා මහත් තනතුරක් දී තමන් හැර මා මුත් සියලු සම්පත්තීන් ආඪ්‍යකෙනෙකුන් නැති නියාවට මෙසා මහත් ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටුවාලූහ; රජදරුවෝ යමක්හු කෙරෙහි වෛරවූ නම් පස්වරු තසත් තම් පෙරවරු බොහෝ සම්පත දෙන්නාහ; දූන් මටත් මෙතෙක් දවසක් කිසිවකුත් නොදී මහොඝයක්සේ මහත් සම්පත් එකපැහැර දීපීහ; රජ්ජුරුවන් මා කෙරෙහි ඉත සිතින් දුන් බවත් අහිත සිතින් දුන් බවත් නොදනිමි, සල් නොයවා එයින් දූනපීම් නම් යහපතැ''යි සිතා රජ්ජුරුවන්ගේ අදහස් තත්වූ පරිද්දෙන් දූන පියන්න අන්කෙණෙකුන්ට නොපිළිවන; හෙරි පරිබ්‍රාජිකාවන් වහන්සේ මහා නුවණැති සේක, උන්වහන්සේ එක් උපායකින් ඒ දූන පියන්නට තරම්සේකැ''යි බොහෝ සුවඳ මල් හා ගිලාන ප්‍රත්‍යයෙන් කිසිවකුත් ගෙන්වාගෙන පන්සලට ගොස් සුවඳින් මලින් පූජාකොට ''ස්වාමීනි! නුඹවහන්සේ මාගේ ගුණ කීවත් පටන් රජ්ජුරුවෝ තමන්හැර සම්පත්තීන් මාමුත් අතික් කෙණෙකුන් නැති නියාවට මහවතුරක් පරිද්දෙන් මාගේ මාලිගාව නොයෙක් අයුරින් සමෘඩ කොටපීහ, ඒ මා කෙරෙහි සමසිතින් දුන් බවත් මා නසාපියන සිතින් දුන් බවත් නොදනිමි, රජහු මා කෙරෙහි ඇති සමාධි ගුණය තත්වූ පරිද්දෙන් දූනපිය මැනව''යි වදාළසේක.

පරිබ්‍රාජිකාවන්දූත් 'යහපතැ'යි ගිවිස දෙවන දවස් රජගෙට යන ගම නේදීම '**දියරක්‍ෂු පැනය**'යි එක් ප්‍රශ්නයක් සිතා නැවත මෙසේ සිතනසේක් ''පණ්ඩිතයන් හා එක්ව කථාකළ වරපුරුෂයකුසේ නොව, උපායකින් ප්‍රශ්න විචාරා රජ්ජුරුවන්වහන්සේගේ හිත අහිත දෙක දූනපියම්හ''යි වළඳා අනන්තයෙහි රජ්ජුරුවන් ඇවිත් වැඳ උන්කල්හි පරිබ්‍රාජිකාවන්දූට මෙසේවූ අදහසෙක් වූයේය. කෙසේද යත්? ''ඉදින් මේ ප්‍රශ්නය බොහෝදෙනා මැදයෙහි විචාළෙම් නම් රජ්ජුරුවෝ පණ්ඩිතයන් කෙරෙහි වෛරීවූනම් බොහෝදෙන

මඛ්‍යයෙහිම වෛරී බව කිවුතම් යුත්ත නොවෙ''යි සිතා ''මහරජ තනිව රහස් කථාවක් කියනු කැමැත්තම්හ''යි වදාළසේක. රජ්ජුරුවෝ සමීපයෙහි මිනිසුන් පිටත්කරවූහ. එවිට පරිබ්‍රාජිකාවන්දෑ කියන්නේ 'මහරජ ! තොප අතින් ප්‍රශ්නයක් විචාරම්'යි වදාළසේක. විචාළමැනව ස්වාමීනි ! දනිම් නම් කියම්'යි කීහ. එවිට භෙරි නම් පරිබ්‍රාජිකාවෝ කියන්නාහු දියරකුසු පැනයෙහි පළමුවන ගාථාව වදාරණසේක්:-

සචෙ චො වූය්හමානානං, සත්තන්නං උදකණ්ණවෙ,
මනුස්සබලි මෙසානො, නාවං ගණ්හෙය්‍ය රක්ඛසො.
අනුපුබ්බං කථංහි දත්වා, මුඤ්චසි දකරක්ඛතො-ති.

මේ ගාථාවෙන් කීහ. ''එසේවීනම් මහරජ! තොපගේ වැදූ මෑනියන් තලතාදෙවිය, තොපගේ නායක බිසව් නන්දාදේවිය, තොපගේ එකකුස හොත් මලනුවෝ තීක්ෂණ මන්ත්‍රි කුමාරයෝය, තොපගේ යහළුවූ ධනුශෙඛර කුමාරයෝය, අග්‍රපුරෝහිත කේවට්ට බ්‍රාහමණයෝය, මහෞෂධ පණ්ඩිතයෝය, තෙපිය, යන මේ සත්දෙනා මහා සමුද්‍රයෙහි එක නැවකික් යන්නවුන් මිනිසුන් කා ඇවිදිනා උදක රාක්ෂයෙක් මිනිස් බිල්ලක් සොයා ඇවිදින්නේ, තොප සත්දෙනා නැගී යන්නාවූ නැව දැක මුහුද දිය දෙබෑකොට අවුත් නැව අල්වාගෙණ තොපට කියන කල 'මහරජ' මේ තොප හා කැටිව නැවෙන් යන සදෙනා පිළිවෙළින් දුනහොත්මුත් නැව නාරිම්'යි කී නම් ඒ සදෙනාගෙන් කවුරුත් පළමුව දෙව්ද? දෙවැනිව තුන් වැනිව සතර වැනිව පස්වැනිව දී කවුරුන් අනතකොට බිලිදී ඒ ජල රාක්ෂයා අතින් ගැලවෙව් දෑ''යි විචාළහ.

ඒ අසා රජ්ජුරුවෝ තමන් සිත වක්වා නැතිව අදහස්වූ පරිද්දෙන් කියන්නාහු:-

මාතරං පඨමං දජ්ජං, භරියං දත්වාන භාතරං,
තතො සහායං දත්වාන, පඤ්චමං දජ්ජං බ්‍රහමණං,
ඡට්ඨාහං දජ්ජ මත්තානං, නෙව දජ්ජං මහොසධං-ති.

මේ ගාථාවෙන් කීහ: මේ ගාථායෙහි අභිප්‍රාය නම් ''ස්වාමීනි ! සැබවින් ජල රාක්ෂයා නැව අල්වාගෙණ 'සදෙනාවම පිළිවෙළින් බිලි දී තෙපි ගැලවෙව'යි කී නම් ඔහට පළමුකොටම මාගේ මෑනියන් දෙමි, දෙවැනිව නන්දාදේවීන් දෙමි, තුන්වැනිව මලනුවන් දෙමි, සතරවැනිව මාගේ යහළුවා දෙමි, පස්වැනිව කෙවට්ටයා දෙමි, පස්දෙනාදී මහෞෂධ පණ්ඩිතයන් හා මා හා දෙන්නාම මතු සිටි කල්හි, තවත් බිලි ඉල්වාතම් පිළි පාරව හැඳගෙණ කැහැපට කවාගෙණ දසදහසක් යොදුන් දඹදිවට මා කරන්නාවූ රාජ්‍ය ශ්‍රී තොසිතා එම්බල ! මා කාපියව'යි කියා මහෞෂධ පණ්ඩිතයන් මා පිටිපස්සට දමාපියා ඒ රාක්ෂසයා කට දල්වාලූ කල්හි පණ්ඩිතයන් මාරුවෙහි ඔහු කටට පැන මම ඔහට බිලිවෙමි නමුත් මා පණ ඇතිව හිඳ මා ඇසින් බල බලා මාගේ ණ්ඩිතයන් රාක්ෂසයාට නොදෙම්මය''යි කීහ.

මේ ප්‍රශ්නය මෙතෙකින්ම නිමියේය. එතකුදු වුවත් “රජ්ජුරුවන් පණ්ඩිතයන් කෙරේ ඇති ඉත සිතත් මා විචාළ ප්‍රශ්නයත් මා ඇසූ පමණින්ම ප්‍රසිද්ධවන්නේ නොවේ; එබැවින් මුහුදු දිය පිට ඉසලූ තෙලිත්තක් මුළුල්ලෙහි විහිද යන පරිද්දෙන් කෙසේම් නම් සහපතැ”යි සිතා “මහරජහු! සමගින් මාළිගාවෙන් බැස ජනසමාගමය කරවා එතැනත් රජහු අතින් විචාරමි, රජ්ජුරුවෝ මට පළමු කී ලෙසම පස්දෙනා පිළිවෙළින්දී පණ්ඩිතයන් රකිමි”යි කියති; එතැන මම මැතියන් ආදී පස්දෙනාගේ ගුණ බොහෝදෙනා මැදයේ කියමි, පණ්ඩිතයන්ගේ නුගුණ කියමි, රජ්ජුරුවෝ උන් හැමදෙනා නුගුණ බොහෝකොට කියා පණ්ඩිතයන්ගේ ගුණ කියති. එසේ කල්හි බොධිසත්ව යන්ගේ ගුණ ආකාශයෙහි පූර්ණ චන්ද්‍රයා පරිද්දෙන් ප්‍රසිද්ධවන්නේය”යි සිතා “මහරජ! තොපගේ අන්තඃපුර වාසීන්ද, රාජකුමාරුවන්ද, මේසා මහත් නුවර ප්‍රසිද්ධ ජනයන් එකහෙළාරැස්කරවා රාජාඞ්ගනයෙහි මාහැඟි ආසනයක් පණවා විසිතුරු කරව”යි අනඝිවූ ආසන පණවා එහි උන් පරිබ්‍රාජිකාවන්ද රජහු අතින් පළමු තනිව විචාළ පරිද්දෙන් ප්‍රශ්න ආදියෙහි පටන් මැතියන් හා සවැනිව තමන් පිළිවෙළින් බිලිදී මහෞෂධ පණ්ඩිතයන් රකිම් මය, මා පණ තබා ඇසිල්ලකුත් මාගේ පණ්ඩිතයන් කෙරෙන් වියෝව විසිය නොහෙමි”යි කී කල්හි පරිබ්‍රාජිකාවන්දෑ කියනසේක්:-

මහරජ ! සිත එකක් තබා බසින් එකක් නොකියව; අප වැන්නන්ටත් මායම් කියද්ද ? තොප කියන්නේ කවුරුන් අදහාගන්නා බසෙක්ද ? ‘දිය රකුසා තැව අල්වාගත්කල වැදූ මැනියන් පටන් තොප සදෙනා පිළිවෙළින් බිලි දී පණ්ඩිතයන් රකිමි”යි කිව, බැලූ කල මහෞෂධ පණ්ඩිතයෝ තරම් තොපට සතුරෙක් නැත. වැදූ මවුන් නම් සත්වයන්ට උන් විනා උපකාරී කෙණෙකුන් නැත, ඉනුත් තොපගේ මැනියෝ සෙස්සවුන්ගේ මවුන්සේ අල්පවූ ගුණ ඇති කෙණෙක් නොවෙත්, තොපට බොහෝ උපකාරීවූව, එසේවූ ගුණ ඇති මැනියන් කුමක් පිණිස දෙව්දෑ”යි රජහට ප්‍රත්‍යක්ෂකොට දූනෙන පරිද්දෙන්:-

පොසෙතාගෙ ත ජනෙතති ච, දීඝ රත්තානුකම්පිකා,
සබ්බෙපි පදුට්ඨස්මිං, පණ්ඩිතා අත්ථදස්සිනී,
අඤ්ඤං උපනයං කත්වා, වධාතං පරිමොචයි.

තං තාදිං පාණදායිං, ඔරසං සබ්බධාරිණිං,
මාතරං කෙන දොසෙන, දජ්ජාසි දකරක්ඛනො-ති.

මෙසේ වදාළසේක:-මේ ගාථාවන්හි අර්ථ කෙසේද යත්, මේ චූලනී රජ්ජුරුවන්ගේ පියානන් සමයෙහි චූලනී කුමාරයන් බාල කල ඒ රජහු පිරිවරා සිටි ‘ජබබ’ නම් පුරෝහිත බමුණා හා මේ තලතාදෙවින් ලොකසවාදරතියෙන් සතුටුව සමගව වසන්නාහු විෂ මිශ්‍ර භොජනයකින් රජහු මරා බමුණාට ධව ලච්ඡත්‍ර නංවා ඔහට අගමෙහෙසුන්ව බමුණා රාජ්‍යකරණ සමයෙහි එක්දවසක් චූලනී කුමාරයන් ‘මැනියන් වහන්ස ! බඩසාය’යි කී කල්හි ඔහට සකුරු මී ආදී පැණියක් හා කැවුම් දෙවූහ. එහි මැස්සෝ පිරිවරා ගත්හ. කුමාරයෝ රන් තැටියෙන් මී බිඳු බිමහෙලා තැටියේ උන් මැස්සන් ගසා නෙරපූහ. ඒ

මැසි සමූහයා ගොසින් බිම මී බින්දුවල වසාගත්හ. එවේලෙහි කුමාරයෝ මැස්සන් තෙරා කැවුම් කා අත කට ශුඬ කොට කෙළියට ගියහ.

බමුණු මේ ක්‍රියාව දැක සිතන්නේ "මේ ඉස නොනැගීම තමා කන කැවුමේ මැස්සන් පලවා කැවුම් කෑය. ඉදින් නොනැසී වැඩිති නම් මට රාජ්‍යය නොදෙන්නේය. මොවුන් දැන්ම මරවාපියමි"යි සිතා එපවත් තලතා දෙවීන්ට කීහ. බිසව් කියන්නාහු දේවයන්වහන්ස ! මම තුඹ කෙරෙහි කළ ස්නෙහයෙන් මාගේ එවැනි රජ්ජුරුවන් පවා විෂ ලවා මරාපීමි. එබැවින් මට මුන්ගෙන් ප්‍රයෝජන කිම්ද? සැලනොකොට සොරා මරාපියම්හ"යි කීයා බමුණා අස්වසාලා ඉතා නුවණැති බිසව් උපායක් ක්‍ෂණයෙහි සිතා අරක් කැමියා කැඳවා "දරුව ! මපුතනුවෝ චූලනී කුමාරයෝත් තොපගේ පුතා ධනුශෙඛර කුමාරයෝත් එකදා උපන්හ; සමානවූ කුමාර පෙළහරින් වැඩියාහ. එබැවින් ඔවුනොවුන් ප්‍රාණය සමාන යහළුවහ; දැන් ජබබ නම් බ්‍රාහ්මණයා මපුතනුවන් මරණු කැමැත්තේය; තෙපි මා දරුවන් දිවි රැකදෙව"යි කීහ. යහපත දෙවීන්වහන්ස ! කුමක් කරම්දැ"යි කී කල්හි 'එසේවීනම් මාගේ පුතනුවෝ එක්වන් තොපගේ ගෙයිම වෙසෙත්වා, කවුරුනුත් සැක නොකරණ පරිද්දෙන් හා හැමදෙනාම දන්නා පරිද්දෙන් කීප දවසක් තුන්දෙනම තනිව මහමුළුතැන් ගෙයි වැදහෙව, චූලනී කුමාරයන් හා අරක්කැමියා හා පුතු ඇතුළුවූ තුන්දෙනා මුළුතැන්ගෙයිම දවස් යවන්නේ සැක නැතිවූ කල තොප වැදහොත් තැන එළුවන්ගේ ඇට ඇදලාපියා මිනිසුන් රැ නිදිගත් කල මුළුතැන්ගේ ගිනිලාපියා කිසිකෙනෙකුන්ටත් නොහඟවා මගේ පුතාත් තොපගේ පුතාත් හැරගෙණ මේ නුවරට ගලපැලැල්ලෙන් පලමු නික්ම පසල් දනව්වෙහි අනික් නුවරකට පලා ගොස් මපුතනුවන් රාජකුමාර බව නොහඟවා දිවි රැකදෙව"යි කීහ.

ඒ යහපතැ'යි ගිවිස්සේය. දේවී තුමූ මුතු මැණික් ආදීවූ රුවනින් යම්තාක් දෙයකුත් දුන්හ. ඒ අරක්කැමියා ආදී තුන්දෙනම මුළුතැන්ගේ ගිනිලා යන්නාහු ක්‍රමයෙන් ගොස් මදුරට සාගලපුර නුවරට වැද රජ්ජුරුවන් වැඳ තමන්ගේ ජාති ඇඟවූහ.

මදු රජ්ජුරුවෝ තමන්ගේ පරණ අරක්කැමියා ඇර ඔහුගේ මුළුතැන් ගේ රක්නා ධූරය ඕහට පාවා දුන්හ. කුමාරවරු දෙදෙන ඔහු සමගම එක්වන් රජගෙට යන්නාහුය. රජ්ජුරුවෝ 'කුමාරවරු කාගේ දරුවෝදැ"යි විචාළහ. මාගේ දරුවෝය'යි කී කල්හි "මේ එක්වැනිය මේ එක්වැනි නොවෙ'යි කී කල්හි 'මාගේ බිරින්දත් දෙන්නාගේ දරුවෝ දෙන්නාය, එබැවින් මේ මා වැනිය, මේ මැනියන් වැනියැයි කීය. එසේ කල් යත් යත් ඔව්හු යහළුව ගොස් මදුරජ්ජුරුවන්ගේ දුවනියන් හා එක්ව රජගෙයිම කෙළනාහ. නැවත චූලනී කුමාරයන් හා කුමාරිකාවන් හා දෙදෙන එක්වන් දැක්මෙන් ඔවුනොවුන් කෙරෙහි පිළිබඳවූ අදහස් ඇතිවූහ, කෙළිමඩලේදී චූලනී කුමාරයෝ තමන් කෙළනා පලස් හුවටත් ලනුවටත් කුමාරිකාවන් ලවා තෙලේ ගෙණෙව'යි යනාදීන් තමන් සිටි තැනට ගෙන්වන්නාහුය. සමහර විටෙක නොගෙණාව තරව ඔළුවේ ඇන ලන්නාහ. කුමාරයා තමාගේ රාජමානයෙන් තරව ගැසූ පහර සමහරවිට ස්නෙහයෙන් ඉවසා පියති. සමහරවිට ඉනාම රිදී යන්නා

ඉවසිය නොහී අත්ගහා හඬන්නාහ, ඒ අසා රජ්ජුරුවන් මාගේ දරුවන්ට ගැසුවෝ කවුරුදැ'යි කී කල කිරි මවු ගොස් විචාළකල, ඉදින් මම මේ මට ගැසුයේ යයි කීම නම් මපියානෝ ඹහට රාජාඥ කරවන්නාහ'යි සිතා ඔහු කෙරේ ස්නෙහයෙන් ඒ බව වළහා 'කුමක් කියව්ද? මා කවුරු මරද්ද? නිකම් අඬාපිමි'යි යට කරන්නීය.

නැවත එක් දවසක් මරන්නවුන් රජ්ජුරුවෝ තුමූම දැක මෙසේ සිතක් සිතූහ. 'මේ කුමාරයා මූ හා එක සැටියත් නොවෙයි. සුවර්ණ ප්‍රතිබිම්බයක්සේ බැලූ බැලූවන්ට ප්‍රසාද එලවන්නේය, 'මේ රජගෙයකැයිවත් රජ්ජුරුවන්ගේ දුවකැයිවත් මම නොරපින් ආම්යිවත් අරක්කැමියාගේ පුතෙකිම්'යි වත් කිසි භයක් නැති ගැන්මක් නැත්තේය. මට වළහා කී බව මුත් මේ අරක්කැමියාගේ පුතෙක් නොවෙයි සිතා එවක් පටන් විමසන්නාහ. කිරිමවු කුමාරිකාවන් කෙළනා තැනට කැවුම් ගෙණයන්නාහ, කුමාරිකාවෝ සෙසු බාල දරුවන්වත් බෙදා දෙන්නාහ සෙස්සෝ දික්කළ කැවුම් ගන්නාකල දණවක තමාගෙණ නැඹුරුව දෝතින් දික්කොට ඇරගෙණ කන්නාහ. චූලනී කුමාරයෝ කෙළිමින් සිට අතින් උදුරාගෙණ කන්නාහ. එයින් රජ්ජුරුවෝ තුමූම දුටහ.

නැවත එක් දවසක් චූලනී කුමාරයන් කෙළනා බමර දමාපූව, රජ්ජුරුවන්ගේ කුඩා යහනයට වැදගියේය. ඒ ගන්නා කුමාරයෝ තමන්ගේ රාජමානයෙන් 'මේ ප්‍රත්‍යන්ත රජුගේ ඇඳ යටට ඉස නැමීම් නම් ඔහු වැන්දුව අඩුදැ'යි අභිමානව දණ්ඩකින් මැත්කොට ගත, රජ්ජුරුවෝ ඒ ක්‍රියාවන් දැක ඒකාන්තයෙන් මේ අරක්කැමියාගේ පුතෙක් නොවෙ'යි සිතා අරක්කැමියා කැඳවා 'මේ කාගේ පුතෙක්දැ'යි විචාළහ, මාගේම පුතාය'යි කීය. එම්බල කාගේ පුතාත් නොපුතාත් මම දනිමි, බොරු නොකියා ඇති සැටියේ කියව, බොරු කීයෙහි නම් දන්නෙම් වේදැ''යි කඩුව අමෝරා භය ගැන්වූහ. ඒ මරණ භයින් තැතිගෙණ 'නතිව දන්වාලමි'යි කී කල්හි රජ්ජුරුවෝ මිනිසුන් දුරුකළහ, එවිට අභය ඉල්වාගෙණ මහලු චූලනී රජ්ජුරුවන් විෂබෙත් ලවා මැරූ තැන් පටන් රජහු විචාළ තැන් දක්වා තමන්කොට ආපවත් කථාවවූ පරිද්දෙන් නොවළහා කීය. රජ්ජුරුවෝ තත්වූ පරිද්දෙන් අසා දූන තමන්ගේ දුවනියන් බිසෝ පලඳනාවෙන් සරහා චූලනී කුමාරයන්ට පාවා දුන්හ. මේ චූලනී කුමාරයන් මදුරට විසූ නියාවය.

අරක්කැමියා හා කුමාරවරුන් ගිය දවස් "අරක්කැමියාත් පුතාත් චූලනී කුමාරයෝත් තුන්දෙන මුළුතැන්ගෙයි ගත් ගින්නෙන් දා මළහ''යි සියලු නුවර මුළුල්ලෙහි එකකෝලාහල විය. තලතාදෙවි එපවත් අසා බමුණාට කියන්නාහු ''නුඹ හා අප හා සිත ඇත්ත මුදුන්පත්විය. ඒ තුන්දෙනා එක ගෙයි දා මළහ''යි කීහ. බමුණු ඔදවැඩී සතුටු විය. ඒ තලතාදෙවී 'චූලනී කුමාරයන්ගේ ඇටය'යි එළු ඇට ගෙන්වා බමුණාට පෑ ගිවිස්සූහ. මේ නිසා පරිබ්‍රාජිකාවන්දැ අතික් උපක්‍රමයක් තමන්ගේ නුවණින් දක්වා 'තොප මරණින් මුදා රැක්කිය' කියා 'ඒසා අපමණ සැපක් දුන් එවැනි මෑනියන් කවර වරදකින් ජල රාක්ෂසයාට දෙවුදැ'යි කීහ.

ඒ අසා රජ්ජුරුවෝ කියන්නාහු "මාගේ මැතියන්දගේ ගුණ බොහෝ බවත් දනිමි, නුඹවහන්සේ වදාළ ගුණයට වඩා මා දන්නා නුගුණ බොහෝය"යි කියන්නාහු "ස්වාමීනි! උන්දෑ නුගුණ හැම කියන්නට නොපිළිවන, යම්තම් දෙයක් කියමි, අසා වදාළ මැනව.

දහරාවිය අලඞ්කාරං, ධාරෙති අපිලන්ධියං,
දොවාරිකෙ අණීකට්ඨෙ, අතිවෙලං පජග්ඝති.

තතොපි පටිරාජානං 'සයං දූතානි සාසති.
මාතරං තෙන දෙසෙන' දජ්ජාහං දකරක්ඛතො-ති.

තමන්දෑ ඉතා වයස්ගතව සිට බාල සත්‍රීන් පලඳනාවූ මිණි මෙවුල්දම් ආදී නොපැලඳියමනා පලඳනා පැලඳ මා අමාත්‍ය මණ්ඩලය පිරිවරා සිංහාසනා රූඪව උන් කල්හි බොහෝදෙනාට පෙණෙන පරිද්දෙන් සක්මන් කොට ඇවිදිනා දැය, පැලැන්දවූ මණිමෙඛලා දුමාදියෙහි ශබ්දය සියලු රජගෙය එකනිත් නාද කරමින් සිටිනේය, අමාත්‍යමණ්ඩලයා මැද උන් මම මුන්වහන්සේ පැලඳි ආභරණයෙහි ශබ්දය නිසා දූත ලැජ්ජාවෙන් කරබාමි, අමාත්‍ය සමූහයා ඔවුනොවුන් මුහුණ බලන්නාහ, තවත් නොකටි යුත්තක් බලා වදාළ මැනව, මුන්දගේ ඉඳුල් කන්නටත් තරම්නුවූ දෙරටුපාල කොල්ලන්ද ඇත් ගොව්වන් ආදීන්ද කැඳව කැඳවා බොහෝ වේලක් උන් හා සමග මහත් කොට සිනාසෙන දැය, මා සතු ප්‍රත්‍යන්ත රජදරුවන්ට මා යැව්වාකොට පත්ලියා යවනකල 'මාගේ මැතියන්දෑ මැහැලි නොවනදැය, සොළොස් ඇවිරිද්දෙහි සිටියන්ටත් මුන්දෑ වඩනදැය, මෙතම් රජ්ජුරුවෝ අවුත් තමන්ට බිරින්දකොට යෙත්ව'යි මට සොරා පත් යවනදැය, රජදරුවෝ පත්බලා පිඟා හයින් නැතිගෙණ නැවත මට පත් එවන කල "අප තමන්වහන්සේගේ සේවකයන්වුව, මෙසේ නොතරම් කටයුතු කියා එව්වේ ඇයිදැ"යි පත් එවන්නාහ, ඒ ගෙණා පත් සබයෙහි කියන්නට වන්කල ඉස් වද්දන තැනක් නැත්තාසේ මහ ලජ්ජාවෙන් පොළොව පැලී නොයනසේය"යි සිතමි. ස්වාමීනි! මේ වැරදි නිසා මැතියන් දිය රකුසාට දෙමි"යි කීහ.

මැතියන් මේ වරදින් ජලරාක්‍ෂසයාට දෙව, නොපගේ භාර්‍ය්‍යාවෝ නම් නොප ඉතා බාල අවස්ථායෙහි පටන් නොපට උන් තරම් ගුණ ඇති කෙණෙක් නොවීයයි නන්දාදෙවීන්ගේ ගුණ කියන මේ පරිබ්‍රාජිකාවන්දෑ—

ඉත්ථි ගුම්බස්ස පවරා, අච්චන්ත පියවාදිනි,
අනුග්ගතා සීලවතී, ඡායාව අනපායිනී.

අක්කොධනා පඤ්ඤවතී, පණ්ඩිතා අත්ථදස්සිනී,
උබ්බරිං කෙන දෙසෙන, දජ්ජාසි දකරක්ඛතො-ති.

මෙසින් කියා මහරජ! මේ නන්දාදෙවි නම් නොපගේ සොළොස් දහසක් බිසෝවරුන්ට නායකව පංචකල්‍යාණයෙන් හා සියලු රූපශ්‍රීන් විරාජමානව බාල්‍යයෙහි පටන් සවකියවූ ඡායාවක් පරිද්දෙන් නොප අත්නොහැර පවත්නිය උන්ගේ ගුණ කියන්නම් මදුරව සාගල නුවර නොප වසන සමයෙහි නොප

තළා මැරූ කල ගෙඩි කත්මුත් තොපගේ ආඥාව මරුත්තු නොකොට තොප කෙරේ ස්නෙහයෙන් දෙමව්පියන්ටත් නොකිවුය, මෙබඳු ගුණ ඇති තො කිපෙන සුලු ඉතා නුවණැති අභිප්‍රාය දත්තා තොප සිතූ පරිද්දෙන් වැස තොපගේ පිණැති දූදරුවන් වඩා රාජාභිවෘද්ධිය වඩා දුන් නන්දාදේවීන් කවර වරදකින් ජල රාක්‍ෂසයාට දෙව්ද''යි කීහ, රජ්ජුරුවෝ ඒ අසා උන්ගේ නුගුණ කියන්නාහු මෙයින් කීහ:-

බිඩ්ඩා රතිසමාපන්නං, අනත්ථ වසමාගතං,
සා මං සකානං, පුත්තානං, ආයාචං යාචතෙ ධනං,
සොහං දදාමි සාරත්තො බහුං උච්චාවචං ධනං,
සුදුච්චජං වජ්ජිත්වාන පච්ඡා සොචමෙ දුම්මනො,
උබ්බරිං තෙන දොසෙන, දජ්ජාමි දකරක්ඛතො-ති.

''ස්වාමිනි! මේ නන්දාදෙවී රහසිගතව ලොකස්වාද රතියෙන් සතුටුව මා තමා වසඟභාවයට පමුණුවා මාගේ සෙසු බිසෝවරුන්ට හා උන්ගෙන් උපන් දරුවන්ට මා විසින් ස්නෙහයෙන් කරවා පලඳවනලද නොඉල්විය යුතු පලඳනා මා අතින් ඉල්ව''යි මම ඒ දුන් කල මතු ඒ නිසා වන පසුතැවිලියෙක් ඇතැයි නොසිතා, කාම රාගයෙන් දවනලද අදහසින් ඇරගණුවයි ඉල්වූ පලඳනා උදුරා දෙමි, මෝ රජහු විසින් මට දෙනලද''යි දරුවන් හඬද්දී ඇරගෙණ 'දරුවන්ට දුන් පලඳනා උදුරා ගත්මි'යි අතිශයින් සතුටුවෙයි එකල බිසෝවරුන් හා දරුවෝ අවුත් 'මේ කීවා දුන්නෙත් ඇයිද? නැවත උදුරා ගත්තෙත් හැයි ද'යි සභාමෙව් උන් මට 'ඈ මැදහත් නිශාය'යි මැසිවිලි කියති, බාල දරුවන් අඬත් අඬත් මටත් ශොක උපදනේය, 'මං කළදෑ නපුරයි පසුතැවිලියට පැමිණ නැවත භාණ්ඩාගාරයෙන් ඇරගත්තාට දීවුණක් දීත් උන්හැම සංහිඳුවා ගත නොහෙමි' මේසා දොම්නසෙක් වන්නේ උන් නිසාවේද? මේ වරද මුල්කොට නන්දාදෙවීන් ජලරාක්‍ෂසයාට දෙමි'යි කීහ;

ඒ වත්තා මේ වරදින් බිසවුන් බිලිදෙව තොපගේ මලනුවෝ මහා උපකාරී වූහ, උන් කවර වරදින් රාක්‍ෂසයාට දෙව්දැයි කියනසේක්;—

යෙ නොචිතා ජානපදා 'ආනීතාව පටිග්ගහං,
ආගතා පර රජ්ජෙහ' අභිහට්ඨාය බහුං ධනං.

ධනුග්ගහානං පවරං, සූරංතිඛිණ මන්තිනං,
භාතරං කෙන දොසෙන, දජ්ජාසි දකරක්ඛතො-ති.

මෙයින් කියා ''මහරජ! තොප ස්වදෙශයෙන් ගොස් අන්‍ය දෙශයෙහි උපන්නවුන් තමන්ගේ උපායෙන් ගෙණවුත් සියලු සම්පත්තීන් සමෘද්ධවූ රාජ්‍යයෙහි පිහිටුවා ('නවද දස දහසක් යොදුන් දඹදිව දුනුවායන්ට අග්‍රවූ ඉතා වැරසැරවූ තීක්‍ෂණ මන්ත්‍රිවූ එකකුසින් උපන් මලනුවන් කවර වරදකින් බිලි දෙව්ද''යි විචාළසේක. ඒ තීක්‍ෂණ මන්ත්‍රීකුමාරයෝ නම් මෑනියන් තලතා දෙවීන් මාලු චූලනී රජ්ජුරුවන් විෂලවා මරා බමුණා හා එක්ව වසන කල උපන්හ. එසේ බවමුත් උපන්නේ මාලු චූලනී රජ්ජුරුවන්ට දාවය. ඒ බමුණු කුමාරයන් වැඩුනුකල කඩුවක් අතටදීලා ''මේ ඇරගෙණ එක්වත් මාලඟ සිටුව''යි කීහ. ඒ කුමාරයෝත් බමුණානෝ තමාගේ පියානෝයයි සිතා

සේවය කරන්නාහ. (එකලත් දූන්සේම වියරුවෝ ඇති වන්නාහ) එක් අමාත්‍ය යෙක් සෙමින් කියන්නේ "කුමාරයෙනි! තෙපි මූගේ පුත් කෙණෙකැ"යි නොසිතව, තොප මවුකුස වසන සමයෙහි තොප මවු මේ බමුණා පිණිස තොපි පියානත් මරා මෝහට ධවලච්ඡත්‍ර නංවා මොහු රාජ්‍යයෙහි පිහිටුවූහ, තොපි මහා චූලනි රජ්ජුරුවන්ගේ පුතනුවෝය"යි කීහ.

ඒ කුමාරයෝ දණ්ඩෙන් ගැසූ නයෙකුසේ කිපී 'එක් උපායකින් මේ බමුණා මරම්'යි සිතා රජගෙට ගොසින් වැද ඒ බමුණු තමන්ට දුන් කඩුව තමන් ළඟ සිටි එකක් හටදී අනිකක් හට කියන්නාහු "තෝ තෙලේ කඩුව මාගේ කඩුවය'යි වාදකොට කලහ කරව"යි කියා රජගෙට වන්හ. ඔහු දෙදෙන 'මේ මාගේ කඩුව උදුරා තට දුන්නේ කවුරුදැයි කලහ කළහ. කුමාරයෝ පළමු නොදන්නාවන්ව 'කොල! කුමන කලහයෙක් දැ'යි එකකු බලන්නට යවූහ. ඒ අවුත් 'නුඹවහන්සේගේ කඩුව අනිකෙක් තමාගේ කඩුව ය"යි උදුරා කලහ කෙරෙති'යි කීහ, බමුණා ඒ අසා 'කුමක් දැ'යි විචාළ කල්හි 'නුඹවහන්සේ මට දුන් කඩුව අනික් කෙණෙකුන්ගේ කඩුවයයි කීහ. කුමක් කියව්ද? මාගේ භාණ්ඩාගාරයෙහි සිය දහස් ගණන් කඩු තිබියදී තොප එක පුතනුවන්ට අනුන්ගේ කඩුවක් කුමකට දෙම්දැයි කීහ. "එසේ වීනම් නුඹ වහන්සේ මට දුන් කඩුව ඇඳින ගත හෙන සේක්ද? පරීක්ෂා කරණ පරිද්දෙන් ගෙන්වමෝද"යි කීහ. 'ඇයි පුත මා දුන් කඩුව මම නොහඳුනම්ද? වහා ගෙණෙව'යි කීහ. කුමාරයෝ කඩුව ගෙන්වා කොපුවෙන් මත්කොට 'බැලුව මැනවැ'යි කඩුව පාතා එකක්හු පරිද්දෙන් වමතින් කොපුව ගෙණ විදුලියක් ගැසූ ඇසිල්ලක්මෙන් එක පහරින්ම බමුණා හිස කපා තමන් පාපිට හෙළා ගත්හ. ඒ මළ බමුණා රජගෙන් පිටත්කොට ගෙය පවිත්‍ර කරවා කුමාරයන්ට ධවලච්ඡත්‍ර නංවා සිටි කල්හි මැතියෝ චූලනී කුමාරයාත් සාගල නුවර වසන නියාව කීහ. ඒ අසා තීක්ෂණ මන්ත්‍රී කුමාරයෝව තුරංගිණී සේනාව පිරිවරා ගොස් බැතන් ගෙණවුත් රාජ්‍යාභිෂේක කරවා රාජ්‍යයෙහි පිහිටුවූහ. ඒ කුමාරයෝ ක්ෂණයෙහි සිතා පියන බුඩි ඇත්තාහ, එයින් තීක්ෂණ මන්ත්‍රී කුමාරයෝයයි දඹදිව ප්‍රසිඩ වූහ. පරිබ්‍රාජිකාවන්දැ මෙවැනි කුමාරයන් කවර වරදකින් රාක්ෂසයාට දෙව්දැ'යි විචාළසේක.

ඒ අසා රජ්ජුරුවෝ මලනුවන්ගේ නුගුණ කියන්නාහු:-

මායොවීතා ජානපදා, ආනීතාව පටිග්ගහං,
ආහතං පර රජ්ජෙහි, අභිහට්ඨාය බහුං ධනං

ධනුග්ගහානං පවරො, සූරො තිඛිණ මනතිසො,
මියාසො සුඛිතො රාජා, අතිමඤ්ඤති දාරකො.

උපට්ඨානම්පි මෙ අය්‍යෙ, නසො එති යථාපුරෙ,
භාතරං තෙන දෙසෙන, දජ්ජාහං දකරක්ඛතො-ති

මේ ගාථා කියා "තිඹිනව වසන්නාහු මේනුවරට ගෙණවුත් තමන්ට පැමිණී රාජ්‍යයෙහි මහා අශ්වයෂ්ටියෙහි පිහිටුවාලීම් කියාත්, ඇඳුම් විදුමෙහිත් නද දුනු ඇදීමෙහිත් ධනුශ් ශිල්පයෙහිත් මට වැඩි දක්ෂ එකෙක් දසදහසක් යොදුන් දඹදිව නැතැයි කියාද, සෙස්ස තබා පෙර රාජසේවයට එන කල

බොහෝදෙනාට කල් තබා එන්නාහ, දූත් මෙම නියා අභිමානයෙන් කල් යවාත් එන්නේය, සමහර දවස් තමාම නොඑන්නේය, මේ වරද නිසා ජල රාක්ෂසයාට බිලිදෙමි''යි කීහ. මලනුවත් ඒ වරදින් දෙව, ධනුශෙඛර කුමාරයන්ගේ ගුණ කියනසේක්:-

එකරත්තං ච උභයො, ත්වාසි ධනුසෙඛරො,
උභොජාතෙත්ථ පඤ්චාලා සහ යා සුසමාවසා,
චරියායං අනුබන්ධිත්වා, එකදුක්ඛ සුඛොනව,
උස්සුක්කො ම ා දිවාරත්තං, සබ්බකිච්චෙසු ව්‍යාවටො,
සහායං කෙත දෙසෙත, දජ්ජාසි දකරක්ඛතො-ති.

මේ ගාථාවෙන් ''මහරජ! ධනුශෙඛරයානම් තද දුනු ඇදීම් ආදී ධනුශ්ශිල්පයෙහි ඉතා දක්ෂය' මේ පඤ්චාල නුවර තොප හා එක දවස් උපදනා තොපගේ ඡායාව පරිද්දෙන් සුව දුක් දෙක එක්ව විඳ ඇවිද ආය. තවද තොපගේ රාජ කෘතියෙහි රෑ දෙවෙහි අප්‍රමාදව වසන්නේය, එසේවූ බන්ධූන් හා සමාන යහළුවා කවර වරදකින් දියරකුසාට දෙව්දූ''යි කීහ. ඉක්බිති යහළුවාගේ නුගුණ කියන්නාවූ රජ්ජුරුවෝ:-

චරියායං අයං අය්‍යො, පජග්ඝිත්ථො මයා සහ,
අජ්ජාපි තෙන වණ්ණෙන, අතිවෙලං පජග්ඝති.

උබ්බරියාපි මෙ අය්‍යො, මන්තයාමි රහොගතො,
අනාමන්තොව පවිසති, පුබ්බෙඅප්පටිවෙදිතො.

ලද්ධාවාරො කතොකාසො, අහිරීකං අනාදරං,
සහායං තෙන දෙසෙන, දජ්ජාහං දකරක්ඛතො-ති.

මේ ගාථාවෙන් ''ස්වාමීනි! මාගේ යහළුවා කුමාර කල පටන් එක්ව කා බී සිට එක්ව හිඳ සිට කෙළ බොහෝ දවසක් මා කෙරෙහි භයරහිතව විසූ පමණකින් දූන් මා රජව මෙසා සම්පත පිහිටි කලත් පළමු පරිද්දෙන්ම මා කෙරෙහි ගෞරව ආදර නැත්තේය. තවද තමාට රැකවල් නැති හෙයින් කවර වේලකත් බිසවුන් හා රහස් කථාවක් කෙරෙම් නමුත් සිටි රැකවලුන් නැවතුවත් උන්ට පරුෂ බැණ උන් භයගත්වා නිර්භීතව තනිව උන් තැනට ගොස් වදනේය, අනාදර කරන්නේය, මා ඉදිරියෙහි අත්පොළා සෙන්නේය, මා දුක්පත් සමයසේ දූනුත් සිනන්නේය, පළමු කීයා නේවාම මා උන් යම්ම තැනකට වහා එන්නේය, මේ වරදින් යහළුවා දියරකුසාට දෙමියි''යි කීහ.

''ඒ අසා වන්නාට යහළුවා ඒ වරදින් දියරකුසාට දෙව, මේ කේවට්ට නම් පුරෝහිත බමුණු තොපට බොහෝ උපකාරීය''යි ඔහුගේ ගුණ කියන සේක්:-

කුසලො සබ්බ නිමිත්තානං, රුදඤ්ඤූ ආගතාගමො,
උප්පාදෙ සුපිනෙ යුත්තො, නිය්‍යානෙච පවෙසනෙ.

පණ්ඩො භුම්මන්තලික්ඛස්මිං, නක්ඛත්ත පද කොවිදෙ,
බ්‍රාහමණං කෙත දෙසෙන, දජ්ජාසි දකරක්ඛතො-ති.

මේ ගාථාවන්ගෙන් කීහ:-මේ ගාථාවන්හි අභිප්‍රාය නම්, “මහරජ! මේ කෙවට්ටයාතම් බසින්නොකියා අනුන් සිතූ දෙයක් තමා ඇසූ දුටු දෙයක් සේ ශාස්ත්‍ර බලයෙන්ම දන්නාවූ කීමෙහි බිණීමෙහි දක්‍ෂවූ රාජ නීති ආදී ලොකව්‍යවහාරයෙහි දක්‍ෂවූ දුටුවාවූ සවජනයෙහි වැඩ අවැඩ අතැඹුලසේ දන්නාවූ ගමනාගමනයෙහි අභිවෘද්ධි මේ යයි නොවරදවා දන්නාවූ චන්ද්‍රග්‍රහණ සූර්‍ය්‍යග්‍රහණ ආදිය තත්වූ පරිද්දෙන් නොවරදවා දන්නාවූ ඉදින් සිතීම්තම් අහස පොළොව දෙකගැටලන තරම් සියලු උපායෙහි දක්‍ෂවූ සිතූ අර්ථයක් සාධාගන්නා තරම් නුවණ මන්ත්‍රකමින් අග්‍රවූ කෙණෙක, ඒ බ්‍රාහ්මණයා කවර වරදකින් දියරකුසාට දෙව්දැ''යි කීහ. ඒ අසා බමුණාගේ වරද කියන්නාවූ රජ්ජුරුවෝ මේ ගාථාවෙන් කියත්:-

පරිසතම්පි මෙ අය්‍යෙ, උම්මිලීත්වා උදික්ඛතිති,
තස්මා අච්චගමුං ලුද්දං, දජ්ජාහං දකරක්ඛතො-ති.

මේ ගාථාවෙන් කීයේ “මේ අමාත්‍යමණ්ඩලයා පිරිවරා සිංහාසනාරූඪව උන්නෙම්, මේ තමාගේ බැම රැළියෙන් වැසී තිබෙන්නාවූ ඇටිකුළන් ඇස් මෙන් ඉතා රත්වූ ඇසින් බැමය නගාලා කිපී බලන එකකුමෙන් එක්වන් මා මුහුණ බලන්නේය. සිතෙන් දුටුවත් බාන තරම් මොහුගේ රූපවිලාසය හා කඩ දත් හා මූණ හා රත්වූ ඇස් ඇති මොහු රාක්‍ෂසයකු දුටුවාසේ ඉතා හයපත්ව දකින සේයයි සිතම්; එසේම විරූපවූ බැලුම් නපුරුවූ මේ බමුණා මෙසෙයින් දියරකුසාට දෙම්යි'යි කීහ.

ඒ අසා පරිබ්‍රාජිකාවන්දෑ “වැදූ මෑනියන් ආදීවූ පස්දෙනා රකුසාට බිල්ලට දී මේ සා රාජ්‍ය සම්පත්තියක් හා ශ්‍රී විභූති අලුයම දූමූ කෙළ පිඬක්සේ නොසිතා තොපගේ ජීවිතය මහෞෂධ පණ්ඩිතයන්ට දෙම්යිකිව, ඒ පණ්ඩිතයන්ගේ පෙර ගිය දවසවත් දූත්වත් මතු එන දවසවත් කවර ගුණයක් දැක එවැන්නක් කරව''යි රජ්ජුරුවන්ගේ යසස් හා කීර්ති වර්ණනා කරණ පරිබ්‍රාජිකාවන්දෑ:-

ස සමුද්ද පරියායං, මහිං සාගර කුණ්ඩලං,
වසුන්ධරං ආවසසී, අමච්ච පරිවාරිතො.

චාතුරන්තො මහාරට්ඨො, විජිතාවී මහබ්බලො,
පඨව්‍යා එකරාජාසී, යසො තෙ විපුලං ගතො.

සොළසිත්ථි සහස්සානි, ආමුත්තමණිකුණ්ඩලා,
නානාජනපදා නාරියො, දෙවකඤ්ඤූ සමාපහා.

එවං සබ්බඞ්ග සම්පන්නං, සබ්බකාම සමිද්ධිනං,
සුඛිතානං පියං දීඝං, ජීවිතං ආයු ඛත්තිය.

අථ ත්වං කෙන වණ්ණෙන, කෙන වා පන හෙතුනා,
පණ්ඩිතා අනුරක්ඛන්තො, පාණං චජසි දුච්චජං-ති.

මෙයින් කියා “මහරජ ! තෙපිවූකලී සතරදිගින් මුහුද දිය කෙළවර කොට ඇති දසදහසක් යොදුන් දඹදිවට අගරජව, තොපට සේවකවූ සෙසු රජදරුවන්ට අනුශාසනා කරව, අමාත්‍ය සමූහයා පිරිවරා බලවාහනයෙන්

යුක්තව සියල්ලවුන් ජයගතුව ශක්‍රදෙවේන්ද්‍රයාමෙන් යසස් හා කීර්ති ඇත්තව, තවද බහා පලඳනා ලද මාණික්‍ය කුණ්ඩලාභරණාදිවූ නොයෙක් බිසෝ පල දනාවෙන් විභූසිතවූ සොළොස් දහසක් පුරසත්‍රීන් විසින් පිරිවරණ ලදුව මෙසේවූ ජනපද ගම් නියම්ගම් රාජධානි ගෘහ උද්‍යාන ක්ෂෙත්‍ර වස්ත්‍රාභරණ අන්නපාන දාසි දස් පුත්‍රදාරා ගව මහිෂ රත්රුවන් ආදියෙන් හා ඇත් අස් රථ ඇලිකූතම් ආදියෙන් හා චතුරඞ්ගිණී සේනාව ආදී නොයෙක් බලවාහනයෙන් හා පඤ්චකාමයට නිවාසස්ථානයක් බඳු මේ නොපගේ ආත්ම සවභාවය නුවණැත්තවුන් විසින් ‘තමාගේ ජීවිතයසේ තමාට ප්‍රියවස්තුවෙක් නැතැ’යි වර්ණනාකරණ ලද්දේය, ඒ ආත්මය කුමක් නිසා මේ මහෞෂධ පණ්ඩිතයන් මාරුවේදී මනුෂ්‍යයන් විසින් නොකොට ගතහැකි නොසිතිය හැකි ප්‍රාණ පරිත්‍යාගය කරව්දැ’යි වදාළසේක.

ඉක්බිති රජ්ජුරුවෝ ස්වාමීනි! කුමක් වදාරණසේක්ද? පණ්ඩිතයන්ගේ ගුණ මා තබා දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයන් හා නාග සුපර්ණාදිවූ දෙවියෝද ඒ ඒ සක්වළ අනන්ත නම් නාගයෝද තමන් එකී එකී දෙනා දහසක් මුඛ මවා එකී එකී මුඛයකින් කී ගුණ අතික් මුඛයකින් නොකියා එකී එකී ‘මුඛයෙන් එකී එකී ගුණයෙක්ම කියත්නම් මහෞෂධ පණ්ඩිතයන්ගේ ගුණ තමන් තමන් ආයු පමණින් කියාත් උන් උන්ගේ ආයුෂය හෙවත් මුත් ගුණයෙහි නිමාවක්වත් කෙළවරක් දක්මක්වත් හැක්කකැයි නොසිතමි, එසේවූ ප්‍රමාණාතික්‍රාන්තගුණ හා නුවණ ඇති පණ්ඩිත කෙණෙක් මුත් විනා ගිය දවස උපන්නොත් නැත, එන දවස උපදින්නොත් නැත; මේ දවස උපදින්නොත් නැත; එබැවින් උන්ගේ අනල්පවූ ගුණයෙන් ස්වල්ප මාත්‍රයක් ඉදිකටු මලින් ආකාශය පානාසේ කියමි’යි කීය:–

යථාපි ආගතෙ අය්‍යා, මම හත්ථං මහොසධො,
නාභිජානාමි ධීරස්ස, අනුමත්තම්පි දුක්කටං.

සචෙ ච කිස්මි චි කාලෙ, මරණං මෙ පුරෙ සියා,
පුත්තෙ ච මෙ පපුත්තෙ ච, සුඛාපෙය්‍ය මහොසධො.

අනාගතං පච්චුප්පන්නං, සබ්බමත්ථං විපස්සති,
අනාපරාධකම්මන්තං, නෙව දජ්ජං මහොසධං–ති.

මේ ගාථාවන්ගෙන්:– ස්වාමීනි ! මේ මහෞෂධ පණ්ඩිතයන් මොබ ආවාක් පටන් අද මේ වෙලාව දක්වා ස්වල්ප මාත්‍රයක් පමණ මා නුරුස්නා වරදක් දුටුදෑ නැත, ඇසුදෑත් නැත, ඉදින් තමන්ට පළමු මාගේනම පිරි හුණුයේ වීනම් මාගේ දරුවන්ද මුණුබුරන්ද තමන්ගේ ප්‍රඥා බලයෙන් උන් හැමදෙනාටම කිසි දුකක් නොවැද්දදී සැපයෙහි පිහිටුවාලන්නාහ; තවද අතීතානාගත ප්‍රත්‍යුත්පන්න යන තුන් කල්හි පවත්නාවූ ඉෂ්ටානිෂ්ට අර්ථානර්ථ දෙක ලොවුතුරා සර්වඥකෙණෙකුන්මෙන් තමන්ගේ ප්‍රඥා බලයෙන් ඉදුරාම දන්නාහ; නිරාපරාධකාරි අසමධුරවූ පණ්ඩිතයන් මා පණ තබා මම රැකී උදක රාක්ෂයාට බිල්ලට නොදෙම්මයයි බොධිසත්වයන්ගේ ගුණ සඳ මඬල අඳනාසේ තමන් සිත්වූ පරිද්දෙන් නොසඟවා නොවළහා සියලු ජනයාට ඇසෙන පරිද්දෙන් කීහ.

රජහු සිත දෙවැලයක් නොකොට තමන් සිත්වූ පරිද්දෙන් නොවළහා කී කල්හි පරිබ්‍රාජිකාවන්ද ඒ සා මහා ජනසමාගමයෙහි රැස්වූ බොහෝ දෙනාහට ඇසෙන පරිද්දෙන් තවත් ඝරකොට ප්‍රසිද්ධවනලෙස කියනසේක්:-

ඉදං සුණොථ පඤ්චාලා, චූලනීයස්ස භාසිතං,
පණ්ඩිතං අනුරක්ඛන්තො, පාණං චජති දුච්චජං.

මාතු භරියාය භාතුච්ච, සඛිනො බ්‍රාහ්මණස්සච,
අත්තනොචාපි පංචාලො, ඡන්නං චජති ජීවිතං.

එවං මහිද්ධිකා පඤ්ඤා, නිපුණා සාධු චින්තනී,
දිට්ඨ ධම්ම හිතත්ථාය, සම්පරාය සුඛායචා-ති.

මේ ගාථාවන්ගෙන්:-''එම්බා පින්වත්නි! මා කියන්නක් අසව, චූලනී රජ්ජුරුවෝ තමන්ගේ වැදූ මෑනියන් ඇතුළුවූ අවශ්‍ය බන්ධූන් පස්දෙනාත් තුමූ තමන්ගේ ජීවිතයත් සදෙන ජලරාක්ෂසයාට බිලිදිවත් මේ මහෞෂධ පණ්ඩිතයන් රකිත්ල; ඒ බව පින්වත් වූ නුවර වාසී හැමදෙනම ඉඳුරා අසා සිත තබත්වා''යි කීහ.

මෙසේ ප්‍රඥා තොමෝ සිතූ සිතූ අර්ථසාධක බැවින් මහා සෘද්ධි ඇත්තීය, සියක්වර පැළූ ඇස් රෝම් අගක් සෙයින් ඉතා සියුම, ඓහ ලෞකික සකලාර්ථ ජාතය පිණිසත් එසේම පාරලෞකික සකලාර්ථය පිණිසත් අත්‍යන්තොපකාර බැවින් 'කෙවල ප්‍රශස්තය'යි සිතියයුත්තීය, කියා පරිබ්‍රාජිකාවන්ද සත්රුවන් මාලිගාවක මැණික් කොතක් පලඳවන්නාක්මෙන් බොධිසත්වයන් වහන්සේගේ ප්‍රඥාගුණ සමූහය තමන්වහන්සේගේ නුවණින් දෙශනාකොට කුළුගන්වා දියරකුසු පැනයෙන් මේ උම්මග්ග ජාතකය නිමවා වදාළසේක

මෙසේ ඒ මාගේ තිලෝගුරු බුදුරජාතන්වහන්සේ දුක්ඛ සත්‍යය සමුදය සත්‍යය, නිරොධ සත්‍යය, මාර්ග සත්‍යය, යන චතුරාර්ය සත්‍යය ප්‍රකාශකොට ධර්මශාලායෙහි රැස්වූ භික්ෂූන් වහන්සේ මධ්‍යයෙහි තමන් වහන්සේගේ ප්‍රඥා පාරමිතාව සඳමඬල අදනායේ දෙශනාකොට ජාතකය නිමවා වදාළසේක. ඒ ධර්මදෙශනාව බොහෝ දිව්‍ය මනුෂ්‍ය නාග සුපර්ණයන්ට අභිවෘද්ධ්‍යකවිය. මෙසේ ජාතකය නිමවා වදාරා අන්තයෙහි මහෞෂධ පණ්ඩිතයන් ආදිවූ එවකට ප්‍රසිද්ධයන් වෙන වෙනම තෝරා වදාරණ බුදුරජාණන් වහන්සේ:-

හෙරී උප්පල වණ්ණාසී, පිතා සුද්ධොදනො අහු,
මාතා ආසි මහාමායා, අමරා බිම්බ සුන්දරී.

සුවෙං අහොසි ආනන්දො, සාරිපුත්තොසි චූලනී,
මහොසධො ලොකනාථො, එවං ධාරෙථ ජාතකං-ති.

මේ ගාථාවන්ගෙන්:-එම්බා මහණෙනි! එසමයෙහි පරිබ්‍රාජිකාවන්ද නම් මාගේ සස්නෙහි උපුල්වන් මහාසථවිරීය, පණ්ඩිතයන්ගේ පියානෝ සිරි වඩන සිටානෝ නම් සුද්ධොදන මහරජ්ජුරුවෝය, පණ්ඩිතයන්ගේ මෑනියෝ සුමනාදෙවී නම් දූත් මහාමායාදෙවිය, පණ්ඩිතයන්ගේ බිරින්ද

අමරාදෙවී නම් දූත් මෙවක එක්ලක්ෂ සයානූදහසක් බිසෝවරුන්ට නායකව මපුතනුවන් රාහුල කුමාරයන් වැදූ යසොධරාදෙවිය, පණ්ඩිතයන්ට රහස් මෙවරකොට සියලු වැඩ සාධා දූත් ගිරවානෝ නම් මාගේ සස්නෙහි බුදුන්ට උපසථාන කරන්නවුන්ට අග්‍රවූ ධර්මභාණ්ඩාගාරිකවූ සිහි නුවණ ඇත්තවුන්ට අග්‍රවූ බුදුන් කෙරේ වල්ලභවූ මාගේ බුදුසසුන් නමැති ආකාශයෙහි පූර්ණචන්ද්‍රයා වැනිවූ මාගේම මල්වූ ජනානන්ද කරවූ ආනන්දසථවිරයෝය, එසමයෙහි පණ්ඩිතයන් හුන් නුවරට අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව ගෙනවූත් පැරද බිඳී පැලවූ චූලනී බ්‍රහ්මදත්ත රජතම් දූත් මට දකුණත් සව්වූ මානිතා නුවණැත්තවුන්ට අග්‍රවූ ශාරිපුත්‍ර සථවිරයෝය. එසමයෙහි සත් අවුරුද්දෙහි පටන් සෙනකය, පුක්කුසය, කාවින්දය, දෙවින්දය, කෙවට්ටය යන ප්‍රඥ සම්පන්න පණ්ඩිතවරුන් නුවණින් ජය ගත්තා වූ මහෞෂධ පණ්ඩිතයෝ තම් දූත් "ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

අටුවාහි-(කෙවට්ටො දෙවදත්තො'සි, චලනා චුල්ලනන්දිකා;
පඤ්චාලචණ්ඩි සුන්දර, දෙවිවාසි යසස්සිකා.

අම්බට්ඨො ආසි කාවින්දො, පොට්ඨපාදොසි පුක්කුසො;
පිලොතිකොච දෙවින්දො, සෙනකොවාසි සච්චකො.

දෙවී උදුම්බරා දිට්ඨමඞ්ගලී;
සාලිකා චාපි කුණ්ඩලී, වෙදෙහො ලාලුදායි-ති.)

උම්මග්ග ජාතකය නිමි.

———0———

535
වෙස්සන්තර ජාතකය

තවද එක් සමයෙක්හි කරුණාවට හේතුවූ දහමට ලයැති අසන්නවුන් කන්හි අමා තමන මධුරවූ ධර්මදෙශනා ඇති බැලූ බැලූවන් ඇස් නිමවන මනහර රූ ඇති සිතන්නවුන් සිත් නිමවන මනොඥ ගුණ ඇති දෙව් බඹ මුදුන්හි කෙළනා පාපියුම් ඇති ලොකස්වාමීවූ අද්වය වාදීවූ අතුල්‍යවාදීවූ අමෘතවාදීවූ විනයවාදීවූ විමුක්තිවාදීවූ ධර්මේශ්වරවූ ධර්මරාජින්වූ ධර්මාධිපතිවූ ධර්මලොචනවූ ධර්මාභරණවූ ධර්මාමෘතවූ ශාක්‍යසිංහවූ ශාක්‍යකෙතුවූ ශාක්‍යාධිපතිවූ ශාක්‍යකුල තිලකවූ කාරුණ්‍යමෞලි මාලාලංකෘතවූ සමන්තභද්‍රවූ පරදුඃඛ දුඃඛිතවූ අසරණ සරණ සරණාගත වජ්‍රපඤ්ජරවූ ත්‍රිභුවනචන්ද්‍රවූ ජගදානන්දලොචනවූ දෙවාති දෙවවූ ශක්‍රාති ශක්‍රවූ බ්‍රහ්මාති බ්‍රහ්මවූ වන්දනීයාභිවන්දනීයවූ පූජනීයාභිපූජනීයවූ දශබලධාරීවූ චතුර්වෛශාරද්‍ය විශාරදවූ ද්වාත්‍රිංසද්වර මහාපුරුෂ ලක්ෂණාශීත්‍යනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා කෙතුමාලාලංකාරයෙන් විරාජමානවූ අල්පෙච්ඡවූ සන්තුෂ්ටවූ අසංසෘෂ්ට විහරණ ඇත්තාවූ ආරබ්ධ වීර්‍ය්‍යවූ වචනක්ෂමවූ පාපචොදකවූ ශික්ෂාකාමීවූ ජිතෙන්ද්‍රියවූ ජිතක්ලෙශවූ ශීල සම්පන්නවූ සමාධි සම්පන්නවූ විමුක්ති සම්පන්නවූ සර්වඥසිද්ධි ප්‍රසවකාර

වෙස්සන්තර ජාතකය.

චින්තාමාණික්‍ය හද්‍රසට කල්පද්‍රුමය මාතවූ සසරට ප්‍රතිපක්‍ෂවූ නිවණ වදෙර හළුවාවූ සවර්ගයට නිණිපෙති පෙලක් බඳුවූ අපායට අකුල් හෙළූ වීයත් බැව්හි අගතැන්පත්වූ මුළුසක්වළ සතුන් දුල්වූ දුල්වූ ඇස්හි පෙණී යන්නාවූ සිතු සිතු සිත්හි ඇදීයන්නාවූ බැඳීයන්නාවූ ඇස් ලූ ලූ දිශාවට සියලු සම්පත දීලන්නාවූ තිලෝගුරු බුදුරජාතන්වහන්සේ කිඹුල්වත් නුවර නිසා නිග්‍රොධාරාමයෙහි වැඩවසනසේක් බන්ධුසමාගමයෙහි පොකුරු වැසි වැසීම අරභයා මේ ජාතකය වදාළසේක:—

හේ කෙසේද? යත්,

ලොකස්වාමීවූ බුදුරජාණන් වහන්සේ පස්මරුන් බිඳ සර්වඥ ගෙවා දූත බරණැස ඉසිපතන අරම්හිදී දම්සක් පවත්වා පිළිවෙළින් දහව් සැරිසරා වඩනාසේක් රජගහ නුවරට වැඩ හෙමන්ත සෘතුව එහි ගතකොට වසන්ත කාලය පැමිණි කල්හි උදායි තෙරුන් විසින් ගාථා සැටකින් මාර්ග වර්ණනාව කරණ ලද්දේ විසි දහසක් මහරහතන් පිරිවරා ඥාතිසංග්‍රහ පිණිස කිඹුල්වත් පුර නුවරට වැඩිසේක. එකල ශාක්‍ය රජදරුවෝ අපගේ නෑ උතුමාණන් දක්නෙමුයයි රැස්ව භාග්‍යවතුන් වහන්සේට වැඩවසන තැනක් විමසන්නාහු නිග්‍රොධ නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ උයන යහපතැයි සලකා එහි ගඳකිළි පිරිවෙන් සක්මන්මලු රාත්‍රිස්ථාන දිවාස්ථානාදිය කරවා සුවඳ මල් ආදිය ගත් අත් ඇතිව බුදුන් පෙරමගට යන්නාහු සියලු අලංකාරයෙන් සොභමානවූ නුවරවාසීවූ සොළසැවිරිදි සිටු කුමරුවන් පන්සියයක් හා සිටු කුමාරිකාවන් පන්සියයක් පළමුකොට යැවූහ. ඉක්බිති සොළොසැවිරිදි ශාක්‍යකුමරුවන් පන්සියයක් හා කුමාරිකාවන් පන්සියයක්ද පිටත්කොට ඔවුන්ට අනතුරුව තුමූද ගොස් සුවඳ මල් සුවඳ සුණු ආදියෙන් පූජාකරමින් බුදුරජාතන් වහන්සේ වැඩමවාගෙණ නිග්‍රොධාරාමයට ගියාහුය. බුදුරජාතෝ විසිදහසක් මහරහතන් පිරිවරා පණවනලද බුඩාසනයෙහි වැඩහුන්සේක. මානජාතිකවූ අභිමානයෙන් යුත් ඒ ශාක්‍ය රජදරුවෝ සිතන්නාහු සිඬාර්ථ කුමාරයෝ ඉතා බාලයහ. අපගේ කණිටු සොහොවුරුහ. අපගේ බෑනහ. අපගේ පුත්‍රයහ, අපගේ මුණුබුරුහ. යනාදීන් සිතා ලදරු කුමරුවන් ලඟට කැඳවා දරුවෙනි! තෙපි පෙරටුව පෙරටව සිට සිඬාර්ථ කුමාරයන් වඳිව්. අපි තොප හැමට පසුව ලා නොහඟවා වඳුම්හ මේ මඟ කාහටත් නොදන්වවයි උගන්වා ලූහ. එබස් අසා බුදුන්ට බාලවූ රජකුමරුවෝ පෙරටව සිට බුදුන් වැඳ මහලු නෑයන්ට අවකාශ නොදීම සිටගත්හ.

මෙසේ මහලු නෑයෝ තමන්වහන්සේ නොවැඳ සිටි කල්හි බුදුරජාතන් වහන්සේ ඔවුන්ගේ අදහස් දූත මේ නෑයෝ මොවුන්ගේ අභිමානයෙන් මා නොවඳනාහුය. එබැවින් ‘දූන්ම මොවුන්ගෙන් වැඳුම් ලබම්’යි සිතා වදූරා අභිඥාපාදක චතුර්ථධ්‍යානයට සමවැද අහස්කුසට පැනනැග ඒ නෑයන්ගේ හිස් මුදුන්හි පස් වගුරුවන්නාසේ ගණ්ඩඹ්බ නම් අඹරුක් මුල්හිදී යමාමහ පෙළහැර පැවාසේ පෙළහර පා වදාළසේක. ඒ ආශ්චර්‍ය්‍ය දුටු ශුඬොදන රජ්ජුරුවෝ පුතනුවන් වහන්සේගේ ශ්‍රීපාද මූලයට ගොස් මෙසේ සැලකල සේක. ස්වාමීනි! මම නුඹවහන්සේ උපන්දා කාලදෙවල නම් සෘෂින් වඳනට

එළවූ නුඹවහන්සේගේ ශ්‍රී පතුල් දෙක පෙරලා බමුණාගේ මස්තකයෙහි පිහිටියා දැක සතුටුව වැන්දෙමි. ඒ මාගේ පළමුවන වැඳීමය. තවද නුඹවහන්සේට පස්මස් වූකල වප්මඟුල්දා දඹගස මුලදී කළාවූ ප්‍රාතිහාර්‍ය්‍යය දැක සතුටුව වැන්දෙමි. ඒ මාගේ දෙවන වැඳීමය. දැන් මා විසින් පෙර නුදුටුවිරූ ආශ්චර්‍ය්‍යවූ පෙළහැර දැකද නුඹවහන්සේගේ ශ්‍රීපාදය වඳිමි. මේ මාගේ තුන්වන වැඳීමයයි කියා වැන්දාහ. සුදොවුන් මහරජානන් වැඳි කල්හි එකම රජදරුවෙකුත් නො වැඳ සිටීමට නොපෝසත්ව සියල්ලෝම වැන්දාහ.

මෙසේ තිලෝගුරු බුදුරජානන් වහන්සේ සියලු නෑයන් වන්දවා අහසින් බැස පණවනලද බුද්ධාසනයෙහි වැඩහුන්සේක. එකල සියලු බන්ධුහුම බිඳුනාවූ මත් ඇතිව එකඟවූ සිත් ඇතිව බුදුන් සමීපයෙහි හුන්නාහුය. ඉක්බිති අකාල මෙසයක් නැගී පොකුරුවැස්සක් වටුයේය ඒ වැස්සෙහි තඹවන් දිය රැව් දෙමින් පොළොවෙහි දිවෙයි ඉන් තෙමෙනු කැමැත්තෝ තෙමෙති. නොතෙමෙනු කැමැත්තන් සිරුරෙහි දියබින්දුවකුදු නොවැටෙයි ඒ ආශ්චර්‍ය්‍යය දැක විසිදහසක් භික්ෂූහු බුදුන්ගේ බන්ධුසමාගමයෙහි මෙබඳු පොකුරු වැස්සක් වටුයේ ඉතා ආශ්චර්‍ය්‍යයයි කථාවක් ඉපදවූවාහුය. බුදුරජානන්වහන්සේ ඒ කථාව අසා වදරා මහණෙනි! පොකුරුවැසි වටුයේ දැන් මතු නොවෙයි. පෙරත් මාගේ බන්ධුසමාගමයෙහි මහාමේඝය පොකුරුවැසි වටුයේම වේදැයි වදරා ඒ භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද ? යත්

යටගිය දවස දඹදිව සිවිරට ජයතුරා නම් නුවරෙක් විය. එනුවර මහ මුහුද මැද ඇවිද කෙළනන රළපන්තිසේ නිරන්තරයෙන් දිවන්නාවූ අශ්ව යන්ගේ හෙසාරවයෙන් හා එසේම නානාප්‍රකාර ස්වර්ණකම්බල අතුළාවූ නොයෙක් රථයන්හි චක්‍රනාදයෙන් හා හස්තීන්ගේ කුඤ්ච නාදයෙන් හා සඞ්ඛ නාදයෙන් එකනින්නාදවූ ස්ත්‍රීපුරුෂයන්ගේ නානාප්‍රකාර මඞ්ගලයන්හි ගසන නටන නොයෙක් නෘත්‍ය ගීතවාද්‍ය ප්‍රසඞ්ගයෙහි ගසනලද මිහිගුබෙර ආදීන්හි ගම්භීර නාදයෙන් ශ්‍රවණ රමණීයවූ ප්‍රවීණ වීණාකාරයන්ගේ වීණ ස්වරයෙන් හා සප්තස්වරයෙන්ද නානාප්‍රකාර වෙශ, හා භූෂණයෙන් යුක්තවූ සම්පත්තියෙන් අභිනන්දිතවූ විද්‍යායෙන් පරිශුද්ධව සරසුම්හි නැන් වැසිවූ ක්‍රීඩාවෙහි දක්‍ෂවූ අනතරඞ්ග වහිරඞ්ග කාර්‍ය්‍යයෙහි ප්‍රමාදයක් නැත්තාවූ ස්ත්‍රී පුරුෂයන්ගෙන් ගැවසී ගත්තාවූ නුවරෙක්විය. මෙසේ සියලු සම්පත්තියෙන් සමෘද්ධවූ ඒ ජයතුරා නුවර සිවි නම් මහරජෙක් රාජ්‍ය කරන්නේය. ඒ රජහට සඤ්ජය නම් පුත්‍රයෙක් උපන්නේය. ඒ සිවි රජතෙමේ පුත්‍රයා වැඩිවිය පැමිණි කල්හි ඔහට මද්දුරජ දූවූ ඵුසතී නම් රාජකන්‍යාව ගෙන්වා අග මෙහෙසුන් කොට රාජ්‍යය පාවාදුන්නේය. ඒ ඵුසතීදෙවී තොමෝ පූර්වයෙහි කරණලද මහපින් ඇත්තීය.

මෙයට එකානූවන කප ලොව පහළවූ විපස්සී නම් බුදුන් සමයෙහි මේ ඵුසතී දෙවීතොමෝ රාජධීතෘවක්ව ඉපද ඒ විපස්සී නම් බුදුරජානන්වහන් සේට සඳුන් සුණු පූජාවක් කොට මතු බුදුකෙණෙකුන්ට මවුවන්නෙමියි කරණ ලද ප්‍රාර්ථනා ඇත්තී එයින් චුතව දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා හැසිරෙමින් අවුත් පසු කලක සක්දෙව් රජහට අග්‍රමෙහෙෂිකාව උපන්නීය. ඉක්බිති ඈ

ඒ දෙව්ලොව ආයු ඇතිතාක් සිට පස් පෙරනිමිති පහළවූ කල්හි සක්දෙව්රජ ඇගේ ආයු ගෙවුන බැව් දැන ඈ කැඳවාගෙණ නඳුන්වනයට ගොස් එහි යහනක් සරසා එහි හොවා ඈට මෙසේ කීය. සොඳුර ඵුසතිදෙවිය! තට වරදසයක් දෙමි. ඒ ගණුවයි කියා වරදසය කියන්නේ:- පෘථිවියෙහි යම් වස්තුවෙක් තිට ප්‍රියද, ඒ ඒ ප්‍රියවූ වස්තුව දසකොටසක්කොට ගණුවයි කීයේය. ඒ දිව්‍ය ස්ත්‍රිය තමා දෙව්ලොවින් චුතවන බව නොදැන කියන්නී දෙව්රජ! ඔබහට නමස්කාර වේවා, මහාවෘක්ෂයක් පහකරණ මහපවනක් සෙයින් තොපගේ මේ දිව්‍යලෝක යෙන් මා පහකරන්නට මා විසින් කවර අකුශලයෙක් කරණ ලද්දේදැයි කිව. එසඳ සක්දෙව්රජ කියන්නේ තොප විසින් පවක් කරණ ලද්දේ නොවෙයි. මට තී අප්‍රියද නොවෙයි. තිගේ පින්ද ආයුෂද පිරිහිණ එසේ හෙයින් කීමියි කියා තී අප කෙරෙන් වියෝවීමෙක් වෙයි. එබැවින් මාගෙන් ඒ දසවරය ගණුවයි කීය.

එසඳ ඒ දෙව්දූ කියන්නී සියලු දෙවියන්ට අධිපතිවූ සක්දෙව් රජාණෙනි! නුඹවහන්සේ මට වරදෙනු කැමැත්තෙහි වීනම් ඒ වර දසය ගණිමි කියා වරදසය ඉල්වන්නී "මම මෙයින් චුතව ගොස් මිනිස්ලොව ඉපද සිවිරට සඳ මහ රජහට අගමෙහෙසුන්ව වෙසේවා, එක් හැවිරිදි මුවපොල්ලන්ගේ ඇස් මෙන් නිල්පුල්පෙති පැහැයෙන් යුත් ඇස් ඇතිවෙම්වා, දෙව්දුනු මෙන් අනි නීලවූ භෘලතා ඇතිවෙම්වා, ඵුසතිදෙවිය යන නමින්ම යුක්තවෙම්වා, සියලු දඹදිව දසදහසක් රජුන් විසින් පූජිතවන්නාවූ යශස්කීර්ති පිරිවර ඇති වෙම්වා අඹබධිරාදී සොළොස් යාචකයන්ගේ අධ්‍යාසයට යොග්‍යවූ ඉල්වූ දෙය නොමසුරුව දෙන්නාවූ ඉස් ඇස් ආදිය ඉල්වූකල නොපසුබැස දෙන්නාවූ උත්තමවූ ගුණයන්ගෙන් යුක්තවූ රූපයෙන් යශසින් සියලු සතුන්ට ප්‍රියවූ පුතකු කෙණකුන් ලබම්වා, තවද මා ගර්භණීවූ කල සමකොට ගා යෙදූ දුනු මිටක්සේ මාගේ මධ්‍යම ප්‍රදෙශය නුස්නොමහත් වේවා, මාගේ පයෝධරයෝ දෙදෙන හැම කල්හිම නොගී උඩබලා සිටිත්වා, මා හිස නර නොනැගේවා, සියලු සත්වයන්ට ප්‍රියවූ මනවඩන්නාවූ වර්ණවත්වූ සියුම් සිවි ඇතිවෙම්වා, රාජාපරාධකොට වධයට පැමිණියවුන් මරණින් ගලවමියි සිතූකල තමන්ගේ බලයෙන් මුදා හරින්නට සමර්ථ වෙම්වා, මොනරුන් කොස්ලිහිණියන් විසින් රුචිපිළි රුචි දෙනලද උත්තම ස්ත්‍රීන්ගෙන් ගැවසීගත් කුරුන් කුදුන් ලදරු වන් හා බලවතුන් අරක්කැමියන් කිළිගුන් විසින් වණනලද සත්රුවනෙන් විසිතුරු දොර කවුළුවෙන් හෙබියාවූ පසඟතුරු රුචින් යුතු රාජමන්දිර ඇති නොයෙක් මධුරාහාර පානයන් කව බොව යන ශොභායෙන් යුත් මහජනයා ඇති සියලු ගුණයෙන් සමෘද්ධවූ සිවිරට සඳමහරජහට අගමෙහෙසුන් වෙම්වා කියා ඒ ඵුසතිදෙවි මේ දසවරය ගත. එසඳ සක්දෙව්රජ කියන්නේ සර්වාංග යෙන් නොබනාවූ ඵුසතිදෙවිය! මා විසින් දුන්නාවූ දසවරය ගෙණ සඳමහ රජහුගේ සමීපයෙහි වසවයි සමුදින.

ඉක්බිති ඒ දිව්‍යස්ත්‍රී දෙව්ලොවින් සැව අවුත් මදුරා ක්ෂත්‍රිය කුලයෙහි උපන ඕතොමෝ සඳමඬල වැනි මුහුණ ඇත්තීය. නිලුපුල් පෙති වැනි නුවන් ඇත්තීය, කොඳ කැකුළු වැනි දත් ඇත්තීය, රන්වන්වූ ශරීර ඇත්තීය, මනාවූ වට පයොධර ඇත්තීය, යනාදීන් වර්ණනා කරත් කරත් කිය නිමවා ගත නොහැකි රූ ඇත්තීය. තාවයෞවනයෙන් යුක්තවූවාය. මහත්වූ ඓශ්වර්‍ය්‍යී

ඇත්තිය, සාරාසංඛ්‍ය කල්පලක්‍ෂයකින් මත්තෙහිදී බුදුකෙණෙකුන්ට මවූ වෙමියි පතා ආ මතු මහමායාදෙවී වන්නීය, එයින් ගොස් මාතෘ දිව්‍ය පුත්‍රව එහි සිට නිවන්පුර වදනවුන්ගේ ගුණ කාවුරු කියා නිමවා ගණිද්ද මෙලෙස ඒ රාජකුමාරිකාව දෙවහනකමෙන් වැඩිවිය පැමිණ වසන කල්හි සිවිමහ රජානෝ ඒ බිසවුන්ගේ රූප සොභා අසා මහත් පෙරහරින් ගෙන්වා පුත්‍රවූ සඤ්ජය කුමරහට අගමෙහෙසුන් කළහ.

මෙසේ ඒ දෙදෙන සුවසේ වසන සමයෙහි පිරූ පාරමිතා ඇති ලොවට ඇසක් වැනිවූ මතු බුදුවන මහතානෝ සියලු ලෝවැසියන් සසරින් මුදනු සඳහා දෙව්ලොවින් සැව අවුත් ඵුසති දේවීන් කුසපිළිසිඳගත් කෙණෙහිම සැටදහසක් පමණ කුමාරයෝ ඒ ඒ අමාත්‍යයන්ගේ ගෙවල ස්ත්‍රීන් කුස පිළිසිඳගණුත්ම දේවීන්ට මෙබඳු දොළෙක් උපන. දවස සලක්‍ෂයක් ධන වියදම් කොට සදන්හල් කරවා දිළිඳුවූ යාචකයන්ට දන් දෙනසේ දොළ උපන. සාව ඉපිද තමන් සමීපයට ආ යාචකයන්ට ගිනිමැදට පැන ඇඟමස් පලහා දුන්නාවූ සිවිරජව තමන් කරා ඇස් ඉල්වා ආ ශක්‍රබ්‍රාහ්මණයාට නිලුපුල් මල්සඟලක් වැනි තමන්වහන්සේගේ දෑස ලෝවැසියන් හඬව හඬවා තමා සිය අතින් උපුටා දුන්නාවූ මහතානන්වහන්සේ දසපාරමිතාව මුදුන් පත්ව සිව මෑනියන් කුස පිළිසිඳ ගත්තවුන්ට මෙසේවූ දොළෙක් උපදිති යනු කවර ආශ්වර්‍ය්‍යයෙක්ද? ඒ හිමියානන් මව්කුස පිළිසිඳගත් දවස් පටන් දඹදිව නොයෙක් රාජ්‍යයෙහි රජදරුවන් එවන රන්රුවන් ආදීවූ නොයෙක් පඬුරෙන් අතුරු නැතිවිය. එසඳ මහරජානෝ බිසවුන්ට උපන් දොළ අසා නුවර සදන්හල් කරවා දෙවීන් දොළ නිවා යචකයන් සින්නිවා දන්දෙන කල්හි ක්‍රමයෙන් දසමසක් පිරුණේය. එසඳ බිසවුන්ට නුවර පැදකුණු කරණ සිතෙක් උපන. සඳ මහරජානෝ එපවත් අසා අමාත්‍යයන් කැඳවා නුවර සදවන්නාහු කලුවැලි පියා සුදුවැල්ලෙන් තවරා දොර දොර කෙහෙල් තොරණ, රන් තොරණ, රිදී තොරණ, සත්රුවන් තොරණ, පිළිතොරණ, යනාදී තොරණ පඞ්ක්තීන් හා කෙහෙල් තැඹිලි ධජ පතාකාදීන් සදවා තැන තැන පුන්කලස් තිරිකුඩම් තබා ඒ පුන්කලස රන් පැන රිදීපැන තබා ඒ වටා පහන් නංවා මෙසේ සියලු නුවර දෙව්නුවරක්සේ සදවා මනහරකොට රථයක් සරහවා බිසවුන් එහි වඩා හිඳුවා මහත්වූ පෙළ හරින් රාජවීථියට බැස ගමන් ගත්හ. සඳට පළමු ගමන්ගත් තරුකැලන්මෙන් සැම මෙහෙතැන් පෙරටව අවුත් පිරිවරා ගත්හ. එසේම සිට සලන සුදුචාමර රන්චාමර රන්තල්වැට රිදීතල්වැටින් වසන්තයා සිය වෙසින් ආවයි සිතමි. සර සුන් විසින් ගත් සුදු සේසතින් එදා ඒ පුරය දෙව් පුරයක්ව ගියේයයි සිතමි. කිරිමුහුද ඔදවැඩි දුවන රළ පත්තිසේ එනුවර දිව සිටින අශ්ව සමූහ යෙන් හා හස්ත්‍යලංකාරයෙන් සැරහී සිටින පර්‍වත වැනි ඇත් සමූහයෙන් හා රිදීමයවූ පස්වණක් පැහැයෙන් දිලියෙන ධජපතාකයෙන් හා විසිතුරුවූ ඇතුන් අසුන් ගොන් අදනා මනහර රථපෙළින් හා සත්රුවන්මය ධජපතාකා පෙළින් හා රන්වන් කලස පෙළින් එනුවර බැලූ බැලූවන්ට අමෘතාඤ්ජනයක් වැන්නැයි සිතමි. ඒ සත්රුවන් මඩුයෙහි සිට නටන මනහර යොවුන්පත් ස්ත්‍රීහු නටාගෙණ එනකල දිව්‍යස්ත්‍රීන්ව කැඳවතියි සිතමි. රුකවල් බල බලා ඒ ඒ දිගින් දිවන කුරුන් පෙළින් හා නපුංසකයන් විසින් පිරිවරණ ලද දස මෙහෙ තැන් විසින් මනහර සෙබළුන් විසින් ගසනලද බලන් හඬින් හා ඒ ඒ

තැන මඩුලු බැඳ ගසනලද හෙරිතුයඝෝෂාදයෙන් හා අසුන්ගේ හේෂාරවයෙන් හා ඇතුන්ගේ කුංචනාදයෙන් හා ඒ ඒ දිගින් එන ඝොෂයෙන් හා මෙසේ මහත්වූ පෙලහරින් බිසවුන් නුවර පැදකුණු කරවමින් ව්‍යාපාර වීථියට වත්සඳ බිසවුන්ට විලිපහරන්ට පටන්ගත එපවත් ඇසූ සඳ මහරජානෝ එකෙණෙහිම විසිතුරු මඩුවක් කරවා වටතිර බඳවා රැකවල් ලැවූකල්හි ලොවට ඇසක් වැනිවූ යාචකයන්ට ධන රාශියක් බඳුවූ පිරූ පාරමිතා ඇති අප මහ බෝසතාණෝ මවුකුසින් බිහිවෙත්ම අත දිගුකරමින් මෑණියන්වහන්ස! දන් දෙන්නට පුදුස්සක් ඇද්දැයි කීහ. එබස් ඇසූ මෑණියෝ දහසින් බැඳි පියල් ලක් මහබෝසතානන් දික්කළ අත තබාලූහ. භුවනෙක සෙබරවූ වෙසතුරු කුමාරයන් කී තෙපුල් කවර නම් සත්වයෙකුගේ කණට අමා නොවෙද? කවර නම් සතෙක් මීට සතුරුවේද? කාට නම් අප්‍රියවේද?

ඒ ආශ්චර්‍ය්‍ය පුරුෂවූ මහතානන් උපන්දම ඔවුන් පූර්‍වයෙහි කළාවූ කුශල බලයෙන් කෛලාශකූටයසේ රිදී පර්‍වතයක්සේ අතිධවලවූ පණ්ඩර නම් මගුලැත්ගොච්චකු දෙවියෝ තමන්ගේ ආනුභාවයෙන් ඇත්හල ලා ගියහ. බොධිසත්වයන්ගේ පිය මහරජානෝ පුතනුවන්ට නම් තබන්නාහු චතුර්‍වේද යෙහි නිපුණ බමුණන් ගෙන්වා ව්‍යාපාර වීථියෙහි උපන් හෙයින් වෙස්සන්තර කුමාරයෝයයි නම් තැබූහ. ඉක්බිති රජ්ජුරුවෝ මෙවැනි උත්තම පුරුෂ යෙක් හුදකලාව නූපන්නේයයි ඇමතියන් කැඳවා සියලු නුවර පරීක්‍ෂා කරවා එකඳ උපන් කුමාරවරුන් සැටදහසක් දෙන ගෙන්වා පුතනුවන්ට පිරිවර කොට පාවා දුන්හ! අතිදීඝාදි දෝෂයන්ගෙන් තොර මිහිරිකිරි ඇති ලක්‍ෂණ සම්පන්න සූසැටක් කිරිමවුන් තෝරාගෙණ උන්ට සම්පත් තබා දුන්හ මෙසේ සැටදහසක් කුමාරවරුන් පිරිවරා කෙළනා බෝසතානන්වහන්සේ නැකත් තරුමැද බබලන පුන්සඳක්සේ කුමාරාභරණයෙන් සැදී රාජ්‍යශ්‍රීයෙන් දිලිහි දිලිහී වැඩෙන කල එක්හැවිරිදි අවස්ථායෙහි තමන් පලඳවාලූ ලක්‍ෂයක් වටිනා ආභරණ කිරිමවුන්ටම දන්දුන්හ. පියමහරජානෝ ඒ පලඳනා දන්දුන් බව අසා සතුටුව මාහැඟි පලඳනා යවා පලඳවති. බෝසතානෝ තමන් පැලඳවූ පලඳනා දන්ගන්නා සිඟන්නන් නැත්තෙන් නවවාරයක් කිරිමවුන්ටම දන් දුන්නාහ. එසේවුවද ලඳ බොළඳ වයසින් එක් ඇවිරිදිය මුවෙන් නොහළ කිරි සුවඳ ඇත්තේය. එසේ කල මෙවැනි දානාධ්‍යාශයෙක් මුළුලොව කවුරුන් කෙරේ ඇද්ද? මෙසේවූ අද්භූතයක් දුටුවිරුවෝ ඇද්ද? මෙවැනි ආශ්චර්‍ය්‍ය යක් ඇසූ විරුවෝ ඇද්ද? මෙසේ විස්මයක් කෙළෝ ඇද්ද? ඒ මහතානන් හා එක්වමෝවා එතුමා උපනුපන් තැන උපදුමෝවා මෙවැනි අදහසක් සියලු සතුන්ට වාසනාවේවා.

මෙසේ ලඳබොලඳව සිටදන්දීම කෙළිකොට සිතා දන් දෙන්නාහු අට ඇවිරිදිවූ කල වෙසතුරු කුමාරයෝ වෙසතුරු ප්‍රාසාදයෙහි ශ්‍රී යහන් මස්තක යෙහි පණවනලද අස්නෙහි පලක් බැඳ හිඳ සිතනයේක් මම දාන ක්‍රියායෙහි සුව නොවිඳ බොහෝ කලක් ඉක්ම ගියේය. ඒ දුන් අට අවුරුද්දක, තවද මෙසේම දවස් යේද්‍යෙහෝයි සිතන්නාහු මහවතුරක් මෙන් මා දෙන රන් රුවන් ආදීවූ දාන ප්‍රවාහය කැටකැබලිතිසේ මා සිත් නොපිණවයි ඉදින් යාචකයෝ ඇවිත් සිට මහරජ! ඔබගේ නිලුපුල් මල් සඟළක් වැනි ඇස් උපුටා දෙවයි කිවුනම් ඒ දිගු පුළුල් නීල් නුවන් දෙක තල් ලොඳ දෙකක්සේ

උපුටා අත තබාලමි. යාචකයෝ අවුත් මහරජ! ඔබගේ හෘදය මාංශය මට දෙවයි කීව් නම් තියුණු ශස්ත්‍රයෙන් ලය පියා හදවත දෙමි. එසේම යමෙක් ලේ ඉල්වූ නම් තෙලියත්හි ලා පෙළා ලේ දෙම්මය. යම් පුරුෂයෙක් ඉස දත් ඉල්වී නම් මාගේ මඟුල් කඩුවෙන් ඉස සිඳ දෙම්මිය යමෙක් අවුත් මට ගැතිමෙහෙවර කරවයි කීවූ නම් මුළු රට වාසීන්ට මා ගැති බව දනුවයි අස්වා කියා ගැතිමෙහෙ කෙරෙම්මියයි මෙසේ සිතත් සිතත් දෙලක්‍ෂ සතළිස් දහසක් යොදුන් ඝනකඩ බොල්මහපොළොව අනෙක ගර්ජනා කෙරෙමින් සතුටුව නටවන්ට වන. එක්ලක්‍ෂ අටසැට දහසක් යොදුන් උස ඇති මහමේරු පර්වතයද ඒ මහතානන්ගේ දානවේගනා බලයෙන් තමාගේ කුළු නැමති අත් ඔසවා නටන්නියක මෙන් නටන්නට වන. මහතානන්ගේ මහත්වූ දානාධ්‍යාශ බලන්නකු මෙන් ඒ සප්තකුල පර්වතයෝ කුල්මතින් නටමින් ඔවූ නොවූත් ඇඟ ගැසෙන්නට වන. මෙසේ මහපොළොව ගුගුරුවා දන්දෙන්නාවූ මහතාණෝ සඳුන්රුක අතු අග ලෙලෙන කළුවැල්ලියක්සේ තමන්ගේ රූපශ්‍රී ප්‍රඥා ලතායෙන් හොබවමින් ක්‍රමයෙන් වැඩි සොළොස් ඇවිරිදි වයසට පැමිණ සූසැට ශිල්පයෙහි හා අෂ්ටාදස විද්‍යායෙහි නිපුණවූහ.

එසමයෙහි පිය මහරජානෝ පුතනුවන්ගේ කීර්තිය හා යශ ශ්‍රී බලා ප්‍රීති නැමති සාගරයාගේ උත්පාතක වේශයෙන් මාගේ පුතනුවන්ගේ රාජ්‍යශ්‍රී මා ඇස් හමුයෙහි මාගේ නුවත් දරිද්‍රය හළ මැනවැයි සිතා චේතිය රට රජ්ජුරුවන්ගේ දූවූ සියලු ස්ත්‍රීන්ගේ රූපශ්‍රී එකතැන කැටිකොට මවාලූ රූපයක් බඳුවූ රූපශ්‍රීන් දිලියෙන්නාවූ මද්‍රිදෙවීන් ගෙන්වා මඟුල් පෙරහරින් මහ බෝසතානන්ට අගමෙහෙසුන් කොට පාවාදුන්හ. සඳමහරජානෝ පුතනුවන් වොටුනු පලඳවා තමන්ගේ රාජ්‍යශ්‍රීය පාවාදී පුතනුවන්ගේ රාජ්‍යශ්‍රී බල බලා සතුටු සොම්නසින් පිණ පිණා වසන කල්හී බොධිසත්වයෝද සිව්සඟරාවතින් හා දසරාජ ධර්මයෙන් නොවෙන්ව රාජ්‍යශ්‍රී විඳ සතතයෙන් මවුපිය දෙදෙනාව වැඳ පුදා උපස්ථාන කොට සියලු යාචකයන්ට සදන්හල් කරවා අනෙකප්‍රකාරයෙන් දන්දී වසන්නාහ. එසේ වසනකල පුතනුකෙණකුන් හා දියනිකෙණකුන් ලදින් චතුර්වේදයෙහි නිපුණ බමුණන් ගෙන්වා පුතනුවන්ට ජාලිය කුමාරයෝයයිද දියනියන්ට කෘෂ්ණජිනාවෝයයි නම් තබා මෙසේ සුවයෙන් රාජ්‍යශ්‍රී අනුභව කරන්නාහ. චේතිය රට රජ්ජුරුවන් හා ජයතුරා නුවර රජ්ජුරුවන් හා රටවැස්සන් හා සතුටුව දෙනුවර වැස්සෝ නොවෙනස්ව වසන කල්හි කාලිඟුරට වැසි නැතිව දුර්භික්‍ෂයක් ඇතිවිය. එරට මනුෂ්‍යයෝ ජීවත්වන්නට නොහැක්කාහු සොරකම් කරන්නට පටන් ගත්තාහුය. දුර්භික්‍ෂයෙන් පීඩිතවූ දනව් වැස්සෝ රාජාඞගනයෙහි රැස්ව මහත්වූ ශබ්ද පැවැත් වූවාහුය. රජ්ජුරුවෝ ඒ ශබ්දය අසා ඔවුන් කැඳවා දරුවෙනි! තෙපි කුමක් නිසා ඝොෂාකරවූදැයි ඇසූකල දේවයන්වහන්ස! වැසි නැත්තෙන් ජනපදය දුර්භික්‍ෂයට පත්විය. එහෙයින්ම සොරුන්ගෙන් පීඩාවට පත්වීයයි සැලකළාහුය. රජ්ජුරුවෝ එසේනම් දරුවෙනි! වැසි වස්වන්නෙමියි ඔවුන් යවා සිල්සමාදන්ව පෙහෙවස් වසන්නේද වැසිවස් වන්නට නොහැකිවූවාහුය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ නුවර වැසියන් කැඳවා දරුවෙනි! මම පෙහෙවස් වැස සීලසම්පන්නවද වැසිවස්වන්නට නොහැකිවිය. දූන් කුමක්

කරමෝදැයි ඇසූහ. ඇමැත්තෝ කියන්නාහු ඉල්ලූදෙයක් නැතැයි නොකියා දන්දෙන්නෝ වෙස්සන්තර රජ්ජුරුවෝය. උන්ට දෙවියන් විසින් දෙනලද සර්‍වාඞ්ගය ශ්වේතමය පණ්ඩර නම් වැසි වස්වා පියන තරම් මහානුභාව ඇති හැලි ඇතෙක් ඇත. ඒ ඇතු ගෙණාවොත් අපගේ රට වැසි වැස දුර්භික්ෂ භය සන්සිඳෙයි කීය. එසඳ රජ්ජුරුවෝ වෙදත්‍රයෙහි නිපුණවූ බමුණන් අටදෙනකු ගෙන්වා කියන්නාහු බ්‍රාහ්මණයෙනි! වෙස්සන්තර රජ්ජුරුවන්ගේ වැසි වස් වන ඇලි ඇතෙක් ඇත. තෙපි ගොස් ඔහු ඉල්වාගෙණ එවයි කීහ. බමුණෝ රජ්ජුරුවන්ගෙන් සමුගෙණ නොබෝ දවසකින් සිවිරටට වන්නාහ. බුඩාංකුරවූ ඒ වෙසතුරු මහරජානෝ එදවස් පෝය දන් දෙන්නට සතර දොර සතරදන්හල් විචාරන්නට යන්නාහු සුවඳපැනින් ඉස්සෝධා නහා සළු පෙරලා සළු හැඳ සුවඳ විලවුන් ගල්වා සුසැට ආභරණයෙන් සැරහී දෙවෙන්ද්‍ර ලීලායෙන් සිටි ඇතු සඳ ගෙණවයි කීහ. එවිට ඇතු සඳ ගෙණෙන්නෝ ඔහු සතරපය සාරලක්ෂයක් වටනා පලඳනායෙන් සඳ යටබඩ ලක්ෂයක් වටනා පලසකින් වසා පිට රුවන්දැල් මුතුදැල් කිකිනිදැල් මිණිරුස් පෙලින් හා මේ ආදී සත්රුවනින් ඇතුසඳ එලවූ සඳ රන් හිණින් ඇත්කුඹයට පැන නැගී දළපුඩුසේසත් හිසට කරවා සත්රුවන් වාසල්වලට රජ යුවරජ ඇමති මඬුලු පිරිවරා සියුරඟ සෙනග පිරිවරා ශක්‍රදෙවේන්ද්‍ර ලීලායෙන් නැගෙන හිර දිශායෙහි දන්හලට යන රජ්ජුරුවන් බමුණෝ දක දනට රැස්වූ සිඟන්නන් බොහෝදෙනා හෙයින් මෙහි රජ්ජුරුවන් දකීම උගනටයයි කියා දකුණුදිග දන්හලට යන මග උස් තැනක සිටියාහුය. රජ්ජුරුවෝ දකුණුදිග වාසල සමීපයෙහි සිටි බමුණන් අටදෙනා දක උන් සිටි දිසාවට ඇතුමෙහෙයූහ. බමුණෝ අටදෙනා අත්නගා සිට “ජයතු භවං වෙස්සනතර මහාරජ!”යි ආශිර්‍වාද කොට සිටියහ. රජ්ජුරුවෝ මේ බමුණෝ මඳ දෙයක් නොයිල්වතියි ඇතු ආසන්නකොට බමුණෙනි ! තොප කැමැත්තක් ගණුවයි කීහ. එකල බමුණෝ කියන්නාහු සියලු සත්වයන්ට මවුපියන් බඳුවූ රජ්ජුරුවෙනි! තොප නැගි තෙලෙ ඇතු අපට දන්දෙවයි කීහ.

එබස් ඇසූ මහබෝසතානෝ කියන්නාහු බමුණෙනි ! මාගේ ශරීර යෙන් භාගයක් නොඉල්වා නිලුපුල්වන් ඇස් උපුටා දෙවයි නොකියා ඇතුම ඉල්වතියි මදක් දොම්නස්ව යහපත බමුණෙනි ! තොප කැමති ඇතු තොපටම දන් දෙම්හයි සොම්නසින් පිණපිණා දන්දෙනු පිණිස නැවත ඇතු සරහ වන්නාහු ලක්ෂයක් වටිනා රන්පලසකින් පිට සදවා ලක්ෂයක් වටනා මුතු දැලය, ලක්ෂයක් වටිනා මිණිරුස්දම් පවලය, ලක්ෂයක් වටිනා රන්දැලය, ලක්ෂයක් වටිනා මැණික්දැලය එහි බඳිනා මිණිදෙක දෙලක්ෂයක් වටනේය. කණාභරණදෙක දෙලක්ෂයක් වටනේය. වටංසක තුණ තුන්ලක්ෂයක් වටනේය, යට බඩ සැඳූ පලස ලක්ෂයක් වටනේය, කුඹසැඳූ ආභරණය දෙලක්ෂ යක් අගනේය. දෙදළ සැඳූ ආභරණ දෙලක්ෂයක් අගනේය. සතරපය සැඳූ ආභරණ සාරලක්ෂයෙක. වාලධිය සැඳූ ආභරණ ලක්ෂයෙක. ගෙලෙහි මුතුදැල ලක්ෂයෙක. ඇතු නැගෙන හිණ ලක්ෂයෙක ඇතු බත් කවන රන්කටාරය ලක්ෂයෙක මෙසේ ඇතු සැඳූ ආභරණම සූවිසිලක්ෂයක් අගනේය, පිට මැණිකය, මුදුනෙහි මැණිකය, මුතුහරෙහි මැණිකය, අකුස්සෙහි මැණිකය, කණ්ඨය වෙළන මුතුහරෙහි මැණිකය, ඇත්කුඹයෙහි මැණිකය යන මේ

මැණික්සය අතසීය, (නොඅගනේය) මෙසේ අර්ඝාතර්ඝ සියලු ආභරණයෙන් ඇතු සඳ ඇත්වෙදුන් ඇත්රැවියන් ඇතුළුවූ පන්සියයක් කුල වාසීන්ද ඇතු නාවන කවන පොවන ඔහට සියලු කළමනා මෙහෙයට තිසි පරිවාර ජනයන්ද දී බමුණන්ට ප්‍රසාද දී සිත්ගෙණ රුවන්කෙණ්ඩියෙන් අතපැන් වත්කොට ඒකාන්තයෙන් ලොව්තුරා බුදුවෙම්වයි කියා ඇතු දන් දුන්හ. ඒ මඟතානත් ඇතු දන් දෙන්ම මහමෙර නැමී නමස්කාර කෙළේය. මහ පොළව සතුටුව ගුගුළේය.

ඉක්බිති ඒ බමුණෝ දකුණු දොරදී ඇතු ලදින් ඇතුපිටනැඟී මහජනා කිණිවූ රාජවීථියට බටහ. නුවර වාසී මහජනයෝ කියන්නාහු එම්බා බ්‍රාහ්මණ යෙනි! අපගේ ඇතු නැඟී තෙපි කොයි ගෙනණදූයි කීවාහුය. බමුණෝ කියන්නාහු වෙස්සන්තර මහරජහු විසින් අප ඇතු දෙන ලද්දේය. තෙපි කවරහුද? කෙසේ වලකව්දූයි හස්තවිකාර මුඛවිකාරාදි උසුලු විසුලු කොට බැණ ඇතු නැගී ගෙණ ගියහ. එකල රජ, බමුණු, වෙළඳ. ගොවි, ආදීන් හා අදිකාර සෙනෙවිරත් ඇපා මහා පඤ්චප්‍රධාන මණ්ඩලික ජනයෝද මූළු මූළුව ගෙණ තනනමින් පුපුරමින් දත්කමින් සියලු නුවර ඇලලී ගොස් කිපී වෙසසන්තර රජානන්ගේ පියානන් සඳමහරජානන් කරාගොස් හඬා වැලප සවාමීනි ! අප දන්වන්නක් ඇසුව මැනව, සුවිසිලක්ෂයක් ආභරණයෙන් සැදුනාවූ සියලු හස්ත්‍යලඞකාරයෙන් බබලන්නාවූ සඹාඹගය අතිධවලවූ වැසි වස්වාලන ආනුභාව ඇති දෙවියන් විසින් මිනිස්ලොවට දුන්නාවූ හස්ති ශ්‍රීයෙන් දිලිසෙන අපගේ ඇත්රුවන නුඹගේ පුතනුවෝ කලිඟුරටින් ආ බමුණන්ට දන්දෙමින් අප නැසූසේක, අනේ සවාමීනි ශ්‍රඩාව ඇතියා තම් තෙසු ඇතුන් දන්දී පිය නොහැකිද? නොයෙක් රත්රුවන් දී පිය නො හැකිද? මේසා දුර්ලභවූ මුළුලොවට වැඩ සිඩකරවූ ඇතු දන් දුන්නේ කුමටදූයි කියා කියා හඬන්නට පටන්ගත්තාහුය.

එකල්හි සඳමහරජානෝ නුවර වාසීන්ගේ රුහැනි බලවත කළ මනා කිම්දෝහෝයි සිතා බාලයන් විසින් නොකළමනාදෑ කළ කල උන්ව නොප කැමති දඬුවමක් කරවන්නමෝ වේදූයි කීහ. එවිට නගරවාසීහු මදක් සන්හිඳී කියන්නාහු වෙස්සන්තර රජ්ජුරුවන් දඟගෙයි ලනත් නොපිළිවන. දිවිගණුත් නොපිළිවන, අපගේ රටහිඳ අපනැසූ නැනැත්තන් රටින් දුරුකොට වඞකගරි නම් පර්වතයට යවන්නා කැමැතම්හ. අදම යැවුව මැනවයි කීහ. එසඳ මහරජානෝ කියන්නාහු දූත් මුත්ට මිහිරිකොට කියවා පසුව දුටුවක් කරම්හයි සිතා මහජනයාට කියන්නාහු අඹුදරුවන්ට සමූදී සෙට යන පරිද් දෙන් අකාවශ දෙවයි කීහ. ඒ ඇසූ නගරාසීහු සවාමීනි! නුඹවහන්සේට හැඟුනක් කළ මැනවයි වැඳ සමුගෙන නැගී ගියහ. එසඳ සඳමහරජානෝ මහා ශොකීව නුවර වාසීන් කිපුනු බව පුතනුවන්ට කියා යවන්නාහු ඝනනා නම් ඇමැත්තා යවූහ. ඒ ඇමති ගොස් දිව්‍යවිමානයක්මෙක් සැදුනු ප්‍රසාද යෙහි ඇමතියන් පිරිවරා ඇතු දන්දුන් සතුටූසාම්නසින් පිණ පිණා ශරත් කාලයෙහි නැගී පූර්ණචන්ද්‍රමණ්ඩලය පරිද්දෙන් වැඩහුන් වෙසතුරු මහරජා නන් දූක වැඳලා පියරජ්ජුරුවන් කියා එව් හසුන් කියවන්නට භයව ශ්‍රීපාදය වැඳ වැඳ හඬා නැගී නොසිටියේය. බෝධිසත්වයෝ අත අල්වා නගා සිටුවා නෝ නොබා කියවයි වදාළහ. ඇමතිතෙමෙ කියන්නේ සවාමීනි ! ඇලී ඇතු

දන්දුන්නයි නගරවාසීහු කිපී බොහෝදෙනා රැස්ව තුඹවහන්සේගේ පිය මහරජානන් ලඟට පැමිණ තුඹවහන්සේ මේ නුවරින් පහකොට සෙට වඞකගිරි නම් පර්වතයට යවන්නට සම්මත කළහයි කීහ.

එබස් අසා වෙස්සන්තර මහරජානෝ සිතා පහළ කොට වදාරන්නාහු මා අතින් ඇස් ඉල්වා එත් නම් මිනාමිය, මස් ඉල්වා එත් නම් මිනාමිය, ලේ ඉල්වා එත් නම් මිනාමිය, ඇඟින් අඞ්ගයක් ඉල්වූනම් මාගේ ශරීරය වෙන් වෙන් කොට දෙම්මය බාහිරවූ ඇතු දන් දුන්හයි වරද කොට සිවිරට වාසීහු රැගැනිවූ නම් මැනව, ඒ වංකගිරි ගමන මට මැනව, මා දෙන දන් නොනවත්වමි, දුක් බොහෝ ගැලවෙන්නට දුර්ලවූ සසරෙහි උපන්නන්ට දානඵල සුව මිස අනිත් සුවයෙක් නම් නැත, පින් නොකටයුතුයයි නගරවාසීහු කියත් නම් වනවාසයට යන බව ඉනා සිත්කලුය, නගරවාසීහු කීවා කරම්හ, උන් කීවා මුදුන්පත් වේවයි නගර වාසීහු බොහෝ කලක් ජීවත් වෙත්වයි ඇසිල්ලකුත් සියලු ජනයාට මාපිණිස කලකිරීමක් නොවේවයි වදාරා කත්තා නම් ඇමැත්ත බල එකක් කියමි, පියානන්වහන්සේට කියා නුවර වාසීන් කැමත්තහොත් සෙට සප්තශතක මහදන්දීපියා අන්දා වලට යනු කැමැත්තෙමි. එපවත් පියානන් වහන්සේට කියවයි වදාරා කාත්තා නම් අමාත්‍යයා යවා තමන් වහන්සේ ලඟ සිටි සෙනෙවිරදුන් කැඳවා කියන්නාහු, ඇතුන් සත්සියයක අසුන් සත්සියයක, රථ සත්සියයක, ස්ත්‍රීන් සත්සියයක, දෙනුන් සත්සියයක, දාසින් සත්සියයක, දාසයන් සත්සියයක, යනාදීන් සියල්ලෙන් සත්සියය බැගින්ද නානාප්‍රකාවූ ආහාර පානාදියද යන දියයුතු සියල්ලම පිළියෙල කරවයි අමාත්‍යයන්ට විධාන කොට හුනස්නෙන් නැගී සිංහවිලාසයෙන් මද්‍රිදෙවින් උන් බිසෝගෙට ගොස් ශ්‍රී යහන් මස්තකයෙහි වැඩහිඳ බිසවුන් කැඳවත් බිසව් අවුත් ශ්‍රීපාදය වැඳ සිටියාහ. එවිට රන්ලියක්සේ සිටි මද්‍රිදෙවින් කැඳවා කියන්නාහු බිසවුනි ! මාවිසින් දුන්නාවූද දෙමව්පියන්ගෙන් ගෙණාවාවූද නොයෙක් රන්රිදී මුතු මැණික් ආදි සියලු ධනය නිධාන්කොට තබවයි කීහ. බිසව් කියන්නාහු සවාමීනි ! තුඹවහන්සේ පෙර දන් දෙන්නට කියන බව මුත් නගා තියන්නට නොකියනසේක. දූන් කුමක් සඳහා මෙසේ කීසේක්දැයි පිළිවිස්සාහ. වෙස්සන්තර රජ්ජුරුවෝ කියන්නාහු සොඳුර! නගා තිබීම නම් දන්දීමය, දන් නොදෙන්නාහු විලිකුන් එලය වැළඳ ගත් දීමියන් වැන්නාහ තුමූද නොකති, අනුන් කෑ නොදෙති, එසේවූවාහු පරලොවට වස්තු තබා නොතබන්නාහු වෙති, එසේ හෙයින් නගා තබවයි කීයේ නම් දන් දෙනු. සඳහාමය, මනාවූ තපස්වීන් නමැති ක්ෂෙත්‍රයෙහි බිජුවට බොහෝ රොපනය කරන්නට කීයෙම් වේදැයි වදාළසේක. බිසව් කියන්නාහු තුඹ වහන්සේ සැමවේලෙහිම දන්දීමෙහි සිත් ඇති බව නොදන්නාසේද? එයට අමුතුව මෙවැනි බස් කියන්නට කාරණා කිම්දැයි කීහ.

එකල්හි වෙසතුරු මහරජානෝ කියන්නාහු සොඳුර ! අප ඇතු දන් දුන්හයි ද්වේෂකොට නගරවාසීහු කිපී අප මෙරට ඉන්නට නොදී වංකගිරි පර්වතයට යවන්නට සම්මත කළහ. එසේ හෙයින් අප වනයට යම්හ. අප ගිය හයි දළ සෝදුකින් නොතැවී සුවයේ ජීවත්ව දරුදෙදෙනා කෙරෙහි දයා ඇතිව තොප දිවිරැකුමෙහි සිහි ඇතිවම අප ගියකල තොප රක්ෂා කරණ

ස්වාමිකෙණෙකුන් ඇත. උන්ට කීකරුවව, අත්පා මෙහෙකරම, තවද දරු දෙබිහිත්තන් කෙරෙහි බියපත්වයි කීහ. එකල කාමරතියට අනඞ්ගයා බඳුවූ සරස්වතියට බ්‍රහ්මයා බඳුවූ වෙසතුරු රජ්ජුරුවන් වහන්සේ මෙසේ කියන්ම රූපශ්‍රීන් සියලු ස්ත්‍රීන් කෙරෙහි අග්‍රවූ මද්‍රි බිසව් ලෙන් නැගී සොකාග්නින් තැවෙමින් කඳුළු ඉසිමින් සුළඟින් වැනෙන්නාවූ රත්ලියක්සේ වැනෙමින් පිදෙමින් ළය අල්වාගෙණ ස්වාමීනි මේ කුමන බසෙක්ද? මෙසේ නොඉව සිය හැක්කක් මා කණ කුමට හිනිද ? තුඹවන්සේගෙන් වියෝව ජීවත් වීමට වඩා තුඹවහන්සේ හා කැටිව මියයාම උතුම්, මීතියා රාජශ්‍රීය කැටිව බෙදූ වළඳා තුඹවහන්සේ කෙරෙහි අගමෙහෙසුන් ශ්‍රීලදින් ඉද දූන් ඔබ වලට යාදී අපි මේ නුවර ඉත්තන් කෙරෙහි ඉඳුමෝදූයි කියා පළමුකොට මාගේ දෙදරුවන් වඩාගෙණ තුඹට පළමුකොට මා වලට යන නියාව නොදන්නේද? ස්වාමීනි ! කියමින් තමන් ලෙහි ඇවිලගත් ශොකයිනි ඒ මහනානත් හා කැටිවයෙම් යන සිත් නමැති විල්හි හලා නිවන්නාහු දූනනමැති සත්‍යක්‍රියා දෙෂයට කිපී නගරවාසීන් සිත්ගන්නට නොපිළිවන. තුඹවහන්සේ වනාන් තරයෙහි වැඩහිඳීම මැනවයි බිසවුන් වන වණීනාව කරන්නාහු:- රජ්ජුරුවන් වහන්ස ! ඒ හිමාලයෙහි මල් පිපී වැගිර ගියකල රමනීය මල් යහන්මැද හැලි කඳුරු හා මුළු බැඳ සිටිනා මුවදෙනුන් මැද මින් රැව් දිදී දිවෙන වෙහෙල මුවසැලන් දක්නාවූ අපට රාජ්‍යශ්‍රී සඳහන් නොවෙයි. ඒ ඒ තන්හි සෙබඩුන් මැද බැස නැටුම් ගත් මත්මොනරුන් දකුත් රාජ්‍යය සිහි නොවෙයි. ඇති මුළු පෙරටුව කොට සතහ සතහා යන මතැතුන් හා නොයෙක් මල් පල්ලෙන් ගැවසි ගත් හෝ වැල්ලේ සිට ලැහැප් බැඳ කෙළනා මස්සැලන් හා එසේම නොයෙක් වනමල් පැළඳ මඬුලු බැඳ ලීය ගී නගා ගායනා කරණ ලියකිඳුරන් මැද නැටුම්ගත් කිම්පුරුෂයන් දකුත් අපට රාජ්‍ය සඳහන් නොවෙයි. පිපී සිටි සල් පසු නා පනා සලල අගරු දෙව්දුරු නඳුන් සඳුන් ආදී නොයෙක් රුක් රජුන් දක්නාවූ අපට රාජ්‍යශ්‍රීය සඳහන් නොවෙයි. කවර නම් දුකෙක් සඳහන්වේද? වනමල් පැලදී රුක්සෙවනින් රුක්සෙවනට ගොස් කෙළෙනා දරුදෙබිහිත්තන්දකුත් අන්කවර නම් දුකෙක් සිහිවේද ස්වාමීනි ! තුඹ වහන්සේ පන්සල්හි වඩා හිඳුවා වනමුල් වන එල කඩාගෙණ ඊම මට භාරයයි යනාදීන් මද්‍රිබිසව් හිමවත වසන කෙණෙකුන් මෙන් හිමාලය වණීනාව කළහ.

එකල්හි ඵුසති දෙවිය පුත්‍රයාගේ මේ කටුකවූ හස්න අසා පුතනුවන් කෙරෙහි ගත් ශොකයෙන් හඬමින් කියන්නාහු සෙලින් ගී මියෙම්මය, දිව ඇද කා මියෙම්මය, වසකා මියෙම්මය, ගිනි වැද මියෙම්මය, මඳවරදකුත් නැති මාගේ පුතනුවන් දන්දුන් ද්‍රෙෂයට වනයට යවන් නම් මහරජ ! නොපගේ මේ නුවර යම් තැනක මී සැලූකල මැස්සන් පලායන් නාසේ සියල්ලන් සාධාරණව නැසී යන්නේවේද, තෙපි මපුතනුවන් නොවැලකූ නම් මා දිවි නොතිබෙයි කියා හඬන බිසවුන් දූක සඳමහරජානෝ ශොකයට පත්ව නගරවාසීන්ගේ ක්‍රොධ බලවත් හෙයින් තෙපි ශොක නොකරව මපුතනුවන් වනාන්තරයට යවම්, නොබෝදවසකින් වනයට යැවූ මපුතනුවන් නගර වාසීන් ලවා ගෙන්වා ගණිම් කියා ශොක සංසිඳවූහ වෙසැන්තර රජ්ජුරුවන් දුක්පත්වූවා දූක මම දුක්පත් බව නොලබමියි

කියන්නකු මෙන් හිරු සැඟවිත. මෙසේ එදා රාත්‍රිය ගෙවා දෙවන දවස් සෙනෙවිරද්දු අවුත් සප්තශතක මහාදානය සැරහූ බව දැන්වූහ.

එබස් අසා මහබෝසතාණෝ සිරුරුකිස නිමවා මේ නිමවා රජගෙයි රැකවල් හරවා සියලු යාචකයන් රජගෙයි මිදුලේ රැස්කරවා දාන සම්භාර කැටිකොට ලා සර්වාඞ්ගයෙහි සුවඳ පසඟුල් දෙමින් සර්වාලංකාරයෙන් සරහන ලද්දාවූ රත්ධජ නගනලද්දාවූ රන් දැලින් වසනලද්දාවූ ඇතුන් සත්සියයක් හා එසේම අසුන් සත්සියයක් හා අසුන් යොදා සිංහසම් ඔබා සත් රුවන් කර්මාන්තයෙන් නිමියාවූ රත්ධජ නගනලද්දාවූ රථ සත්සියයක් හා ගොන් සත්සියයක්ද මීදෙනුන් සත්සියයක්ද කිරිදෙනුන් සත්සියයක්ද සර්වාභරණයෙන් සරහන ලද්දාවූ දෙවඟනන් වැනි රාජකන්‍යාවන් සත්සියයක්ද, සුශික්ෂිතාචාර ඇති දැසින් සත්සියයක්ද, එසේම සර්වාභරණ විභූෂිතවූ දාසයන් සත්සියයක්ද, යනාදී නොයෙක් දෙය සත්සියය සත්සියය බැගින් සදවා රුවන් ගබඩාවල දොර හරවා තොප කැමති විචරක් වස්තු ගණුවයි නියොග කළහ. යාචකයෝද සුපිපි පියුම් වනයට වදනා බමරකැලන්සේ රන් රිදී මුතු මැණික් රන්තෝඩු සංබලා තිසර රුවන්තෝඩු රුවන් මුදු රුවන් වළලු ආදී වස්තු කැමති කැමතිසේ උකාගෙණ යන්නට වන්හ සමනරු පට කඩ පට්ටොලි දෙවාඞ්ග පිඩාම් සළු පිළී සම්වඩම් ගෙණයන්නෝ සියදහස් ගණන් පාදාඞ්ගුලි පාදකටක පස් පෙරහැර එක්වැටි පාමුදු රන් මිරිවැඩි හිසකෙස්වළලු දෙපට විද්‍යා අඟුල් දසරු බාහු මුතුලැල් මැණික් මාලා දම කනපසේව් කන්අගා තුලක මිණිඔටුනු ආදී සියලු පළඳනා යාචකයන්ට දන් දුන්හ.

මෙසේ මහබෝසතාණන්වහන්සේ සතසතු මහදන් දුන් කෙණෙහි මේ මහපොළොව ගුගුරුවා නැංග, මේරු පර්වතය සතුටුව නටන්නකුමෙන් නටන් නට වන සප්තකුල පර්වතයෝද හුයාපි වෙයගබඩක්සේ නැමී වැඳුම්ගත්හ. මද්‍රිදෙවීද තමාගේ පළඳනා හා ධන ධාන්‍ය සියලු යාචකයන්ට දන්දුන්නාහ. එදවස් දන්දුන් හෙයින් යානොහී දෙවන දවස් වෙස්සන්තර රජ්ජුරුවෝ අඹු දරුවන් කැඳවාගෙණ පියාණන් හා මෑණියන් සමීපයට ගොස් වැඳ සිටියාහ. බොධිසත්වයන්ගේ මෑණියෝ මද්‍රිදෙවීන්ට කියන්නාහු යෙහෙළනියෙනි! දන් දුන් දෝෂයට මපුතුන් වනයට යාදෙව, තෙපි නොයවයි කියා වනාන්තරයෙහි දුක් බොහෝය, ජාලිය කුමාරයන් හා කෘෂ්ණජිනාවන් හා තොප ගිය කල මහා ව්‍යසනය, දරුවන් රක්ෂාකිරීම ඉතාම දුෂ්කරයයි කීහ. මද්‍රිදෙවී කියන්නී මාගේ ස්වාමීන් හා වලවසන කල ගම් ඉන්නාට වඩා පහසුය. කැටිව ගිය කල ගෙයි ඉන්නා වැන්නැයි කීවාය.

එසඳ බොධිසත්වයෝ මද්‍රිදෙවී මුහුණබලා කියන්නාහු සොඳුර! වල වසනකල මහත්භය ඇත, හිමාලය වනයෙහි දුරපිඹුරෝය යන සතා වගී යක් නමන් දරණින් යොදුන් දෙයොදුන් වල් වටකොටගෙණ නමින් මුවට හසුවූ සිංහ ව්‍යාඝ්‍රයන් ඇතුන් දක්වා අල්වාගෙණ ගැල පියති. තමද සොඳුර! ඒ වනාන්තරයෙහි ගල්හි හිඳ සිංහනාද කරණ සිංහයන්ගේ හඬින් සාන් පැලී යන්නා වැන්න. ව්‍යාඝ්‍රයන්ගේ ගර්ජනාවෙන් ළය පැලී යන්නා වැන්න, ඒ වෙනෙහි යක්ෂ රාක්ෂ භූත ප්‍රේතයන්ගෙන් භය ඇත. සියලු ශරීරය අවැ

දක්වා බිඳ ලේබොන මදුරුවෝ ඉතා බොහෝය, ඇස්සෙනෙක දුට ගැලවී යා නොදෙන වලසුන් විසින් ගහනය, බොහෝකොට කීමෙන් කිම්ද? ඒ වෙනෙහි ස්ත්‍රීන් වාසය කරන්නට බැරිමයයි කීවාය. එබසට මද්‍රිදේවී කියන්නී. ස්වාමීනි! වදාළ හැම දුක්ගෙණ වෙසෙමි කීහ. එසඳ බොධිසත්වයෝ බාලදරුවන් කැටපාසාණ පිට නොඇවිදුව, සුවයහන්හි හොත්තවුන් ගල් යහන් පිට නොහොවා ධවල චාමරයෙන් පවන් විඳිනවුන් අව් සුළං ඇඟ නොගස්වා රසභොජනයෙන් මේ තිම්වූවන් ඵලා ඵල අනුභව නොකරවා මපියාතන් වහන්සේ කෙරෙහි ඉඳුවා එවයි කීහ. ස්වාමීනි! මම නුඹවහන්සේ නොදක නොහැම්මෙමි. දරුදෙදෙනා මා නොදක නොහැම්මෙතියි කීව. දෙමහල්ලන් කථා ඇසූ ඵුසති දෙවි නොමෝ වෙනෙහි ගොස් පුතනුවන් ගන්නා දුක් සිතමින් මහත් ශොකයෙන් තැවෙමින් හඬා පෙරළෙන්නට වන්නීය, සොළොස් දහසක් පුරඟනෝද නගරවාසීහුද ප්‍රචණ්ඩ වාතයෙන් එකපැහැර පොළොව පිට වැගිර ගිය මහ සල්වනයක්මෙන් එකපැහැර හඬා වැතිර ගියහ. එකෙණෙහි ඇමැත්තෝ මනහරකොට රථයක් සැදූ වඩනා කල් දූත්වූහ. එසඳ මද්‍රිදේවී සමනන්ට පළමුකොට දියනියන් වඩාගෙණ පුතවනුන් ඇඟිල්ල අල්වාගෙණ පලාගොස් රථයට පැන නැංගාය.

ඉක්බිති බොධිසත්වයෝ දෙමව්පියන් වැඳ සමුගෙන පුරස්ත්‍රීන්ට සමුදී සියලු ජන සමූහයාට අවවාදකෙරෙමින් ක්‍ෂමා කෙරෙමින් තමන් දුන් දන්හි පින් අනුමෝදන් කරවමින් මහජනයා හඩ හඬා සිටියදී රථය පැදගෙණ රජ වීථියට නික්මුණාහු ආ ආ වුන්ට පින්දී නෙපි හැමද පින් කරව්, සියලු සංස්කාර ධර්‍මයන් අනිත්‍යය දුඃඛ අනාත්මයසේ සිතාව්. සම්පත්නම් අලපත ඔත් දියත්නක්සේ අස්ථිරයයි සිතව්. මරණය තමා කරා එන බව සිහි කරව්. ඔවු නොවුන් හා විවාද නොකරව්. ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී කරව්. අප කී බිණූ දෙයට ක්‍ෂමා කරව් කීයා මෙසේවූ පිය නෙපුලෙන් අවවාද කොට නුවර වැස්සන්ට සමුදී නුවරින් පිටත්ව උතුරුදික් බලා වඩනට පටන් ගත්හ. මෙසේ වඩනා බුඩාංකුරවූ මහනානන් නුවර පෙරළා බලමියි සිතූ ක්‍ෂණයෙහි රථයක් ප්‍රමාණ පැන පොළොව බිඳී පෙරළා රථය නුවර දිශාවට නමාලීය. එසඳ බොධිසත්වයෝ තමන්ගේ දෙමව්පියන්ගේ ප්‍රාසාදදී පුරසම්පත් බලා සතුටුව මෙසේ වඩනා කල්හි බොධිසත්වයන්ගේ මැතියෝ සිතාන්නාහු මපුත නුවෝ වොටුනු මාලාදී රාජාභරණ හා ධාන්‍යාදිය අටළොස් වරෙක දන් දුන්හ. දූත් මද්‍රි දෙවීන් හා දෙදෙනා හුදකලාව වනයට යන්නාහ. ඒ යන ගමනේ දන්දෙන්වයි සිතා වස්ත්‍රාභරණයෙන් හා සත්රුවනින් දහසක් ගැල් පුරා යැවූහ. මැතියන් එවූ වස්තු බලා සතුටුව රථය සිඟන්නන් කරා පදවා වස්තු සිඟන්නන්ට දන්දෙවා වනාන්තරයට නික්මුණාහ.

එකල්හි වෙස්සන්තර රජ්ජුරුවෝ කොයිදූයි විචාරා බමුණෝ සතර දෙනෙක් අවුත් පිළිවිස වංකගිරියට යනු නිසා නික්මුණු බව අසා රුහැනිව අත සලා පියා “යන කල ගෙණනිය දෙයක් ඇද්ද”යි විචාරා රථය මුත් අනික් ගෙණ ගිය දෙයක් නැතයි අසා එසේදවුවත් යායුතුයයි දිවගෙණ ගොස් ඇස් හමුයෙහිවඩනා බොධිසත්වයන්දක පින්වත්වූ රජ්ජුරුවෙනි! සිටුවයි හඬගෑහ. බොධිසත්වයෝ ඒ හඬ අසා රථයනැවැත්තූහ. බමුණෝ ඉදිරියටගොස් ආශීර්වාද කොට සිටියහ. එවිට බොධිසත්වයෝ බමුණෙනි! කුමට ආවාහුදැයි විචාළහ.

බමුණෝ කියන්නාහු අප පින්මද හෙයින් ඔබ සප්තශතක මහාදානයට පැමිණ දන්ගන්නට නොහැකිවූම්හ. තෙල රථය අදනා අශ්වයන් අපට දුනමැනවැයි ඉල්වූහ. බෝධිසත්වයෝ සතුටුව මද්‍රිදෙවීන් හා දරුදෙබිහිත්තන් රථයෙන් බස්වා සෛන්ධවයන් සතරදෙන බමුණන්ට දන්දුන්හ. බමුණෝ බෝධිසත්වයන්ට ස්තුති කොට අසුන් රැගෙණ ගියහ. එසේ අශ්වයන් දුන්කල රථධුරය අහසෙහි සිටියේය. ශක්‍රදෙවේන්ද්‍ර තෙමේ ඒ දැක දිව්‍යපුත්‍රයන් සතරදෙනෙකු කැඳවා කියන්නේ වෙස්සන්තර රජ්ජුරුවෝ තපසට යන්නෝ රථාශ්වයින් බමුණන්ට දන්දී පයින්වඩිති. තොප ගොස් රථය අදුවයි නියෝග කෙළේය. දිව්‍යපුත්‍රයෝ සතරදෙන රෝහිත මෘගවෙස් මවාගෙණ රථයෙහි යෙදී රථය අදනා කල්හි අතික් බමුණෙක් පෙරසේම අවුත් කියන්නේ වෙස්සන්තර රජ්ජුරුවෙනි! සිටුවයි හඬගෑය. ඒ හඬ අසා මහතානෝ රථය නැවැත්වූහ. බමුණු ඇවිත් කියන්නේ රජ්ජුරුවෙනි! ඉතා වෘඩයෙමි, ගමන් විඩාසෙන් මිරිකුනෙමි, තෙල රථය දෙවයි කියා රජහට ආශීර්වාද කෙළේය. බෝධිසත්වයෝ සතුටුව අඹුදරුවන් රථයෙන් බස්වා බමුණාට රථය දන් දුන්හ. “බිසවුන් පයින් යා නොහෙති. දරුවෝද යා නොහෙති.” නොසිතා එද ඒ මහතානෝ රථය දන් දෙත්ම රථය අදිමින් සිටි දෙවියෝ අන්තර්ධානවූහ.

ඉක්බිති මද්‍රිදෙවි දරුදෙදෙන අත අල්වාගෙණ වනාන්තරයට නික්මුණාහ. බෝධිසත්වයෝ බිසවුන්ට කියන්නාහු සොඳුර! ජාලියකුමාරයන් මම වඩාගණිමි. කෘෂ්ණජිනාවන් තොප වඩාගණුවයි කියා දෙදෙන දරු දෙදෙනා වඩාගෙණ සෙල්බැහැවිල් කටුනරණ ගල් බොරළු මඩිමින් හුණුවැල්ල මඩිමින් ඇල දොළ වැද නාමින් ලියමලුයෙහි සිහිල් සෙවන සැතපෙමින් දෙදෙනා ඔවුනොවුන් සතුටුව සෙමින් තමන් දුන් දන් සිහි කෙරෙමින් සතුටු සතුටුව වඩනවුන් දුටු දුටුවන් විසින් ඔවුන් දෙදෙනාගේ සිව්මැලිකම් සිතමින් යන්නේ කොයිදැයි විචාළ කල වඞකගිරි පර්වතයට යයි කියති. ඒ අසා කම්පාව කඳුළු මුසු මුහුණින් යුක්තව හඬන්නාවූ ජනයාට අවවාද කෙරෙමින් වඩනා කල්හි මග දෙපස සිටි අඹ දඹ ජම්බීර නා පනා නාරං ආදී වෘක්ෂයන්හි එලාඑල දරුවෝ දැක ඊට ඇවිටිලිව දෙඅත් ඔසවා අම්ම! පියාණෙනි! කිය කියා හඬමින් යෙති. ඒ වෙස්සන්තර නම් බුඩාංකුරොත්තමයානන් වහන්සේගේ පුණ්‍යතේජානුභාවයෙන් වෘක්ෂයෝ තුමූම නැමී එලාඑල දරුවන් අත තිබෙයි. බෝසතානෝ දරුවන් කැමති කැමති දෑ දෙමින් පොකුණු පතැස් විල්තෙර සැතපෙමින් දෙවතානුභාවයෙන් තිස් යොදුන් මග ගෙවා එකදවසින්ම ගොස් චෙතියරට නගර ශාලාවට වන්හ (දෙවතාවෝ ලද බොලඳ සිව්මැලි කුමාරවරුන් කෙරෙහි අනුකම්පාවෙන් පෘථිවිය හ්‍රස්වකොට නැගූහ.) මද්‍රිදෙවි ශාලාව ඇමද බෝධිසත්වයන්ට ඉඳිනා අසුන් පණවා වඩා හිඳුවා පත්ලෙහි ධූලි පිස පියා දරුදෙදෙනා ඔවුන් ලඟ ඉඳුවා නගරවාසීන්ට පෙණුන මැනවයි සිතා බෝධිසත්වයන්ටද පෙණෙන පරිද්දෙන් නුදුරුව සිටියාහ. එසේ ඉන්නට කාරණා කිම්ද යත්?:- බෝධිසත්වයෝ තමන්ගේ නුවරට ආහෙයින් අපහැර ගියාදෝහෝයි සිතුවහොත් හෙතු නොවෙයි සිතා බෝධිසත්වයන්ට පෙණෙනසේ සිටියාහ.

එසේ සිටියාවූ බිසවුන් යන එන්නෝ දැක වැඳ නගරවාසීන්ට කීකල නගරවාසීහු රැස්ව චෙතිය රජ්ජුරුවන්ට කියායැවූහ. එකල චෙතිය රජ්ජුරු

වත් ඇතුළුවූ සැටදහසක් රජදරුවෝ අවුත් බොධිසත්වයන් පාපිට හඬා හුනහ. හඬා නැවත කියන්නාහු කිම්ද? මහරජ! ඔබට ලෙඩ දුක් නැද්ද? නුඹගේ පියානන් සඳමහ රජ්ජුරුවන්ට දුක් නැද්ද? නුවර වාසීන්ට පීඩා නැද්ද? මේ නම් කුමන විස්මයක්ද? කවරනම් විපත්තියක්ද? මෙසේවූ අනාථ ගමනෙක් කුමක් නිසා නොපටවීද? දෙවයෙනි! තෙපි නැගී ආ වාහන කොයිද්දැයි යනාදීන් විචාළහ. බෝසතානෝ කියන්නාහු මාගේ දෙමවුපියන් වද පීඩා නැත. වැළි එකක් කියමි. මාගේ කෛලාසකූටය වැනි සර්වාඞ්ගය අතිධවලවූ සුවිසිලක්ෂයක් පලඳනාවෙන් හොබනාවූ පරිවාර සහිත මාගේ පණ්ඩර නම් ඇළි ඇතු කාලිඟුරට වැසි බමුණන්ට දන්දුන්හයි සිවිරට ඇත්තෝ මපියානන්ටද මටද කිපී මා රටින් ගිය මැනවැයි කිවූය, එසේ හෙයින් ආමි කීහ. චේතිය රජ්ජුරුවෝ ඒ අසා ආයේ ඉතා යහපතැයි සතුටුව "සිවිරට ඇත්තන් සතුටුව ආරාධනකොට ගෙණයන තුරු අපගේ රට රජ කම් කළ මැනවැ"යි චේතියරජ්ජුරුවන් හා සැටදහසක් රජදරුවෝ තමන් තමන්ගේ රාජ්‍යයට ආරාධනා කළහ.

එකල්හි මහබෝසතානෝ කියන්නාහු තොපට රාජ්‍යය නොකරමි. "අප නෙරපූ රජ්ජුරුවන් උන් නවතාගෙණ රාජ්‍යය කරවති"යි සිවිරටවාසීහු තොප කෙරෙහි වෛර බැඳ උනුනුන් යුද්ධකොට දෙරට ඇත්තෝ විරොධ වෙති. එබැවින් එසේ නොකෙරෙමි. වංකගිරි පර්වතයට යන බව මැනව ඒ තාක් විසීමට සුදුසු තැනක් කියවයි කීහ විචාරා කියම්හ. රජගෙට වැඩිය මැනවැයි රජදරුවෝ කීහ. බෝසතානෝ රජගෙට නොයම්හයි කීකල ඇතුළුනුවරට නොවඩනාහෙයින් ඒ ශාලාවම දිව්‍යවිමානයක්සේ සරහා සැට දහසක් රජදරුවෝ ශාලාව වටකොට රැකවල් ගත්හ. බොධිසත්වයන් සුවඳ පැනින් නාවා සළු පෙරළා සළු හඳවා රස භොජනය වළඳවා සතුටුකළහ. බෝසතානෝ එදවස් රෑ එහි ලැග දෙවනදා වංකගිරි පර්වතයට යම්හයි කීසඳ රජ්ජුරුවෝ කියන්නාහු ඔබ වඩනාකල පෙරගමන් පසුගමන් කරන්නට බොහෝදෙන ඇත්තාහ. එබැවින් වල ගස්වා මග එළිකරණනෙක් වැඩහුන මැනවැයි වලකා සත් දවසක් එහිම රඳවා ගත්හ. මග එළිකළ කල වංක ගිරි පර්වතයට යම්හයි බොධිසත්වයෝ නිකුමුණාහ. එකල චේතිය රජ්ජුරු වන් හා සැටදහසක් රජදරුවෝ බොධිසත්වයන් සමග ගියාහ. එසේ ගොස් පසළොස් යොත්තක් මග ගෙවා පසළොස් යොත්තක් ඉදිරියෙහි තිබියදී මහවනය සමීපයෙහි සේනාධිපතියකු රැකවල් ලවා සිට දකුණත ඔසවා මග කියන්නාහු ස්වාමීනි! මෙතැන [illegible]ට ඉඳුරා දකුණු දික් බලා ගියකල නගා සිටුවූ නිල්වලාකුළක්සේ නෙල පෙණෙන්නේ එලා එලයෙන් විපුලවූ විපුල නම් පර්වතයය, ඒ පර්වතප්‍රාන්තයෙහි සිට බැලූ කල නොයෙක් සුගන්ධයෙන් යුක්තගන්ධමාදන පර්වතය පෙණෙන්නේය ඒ පර්වතය වට නදුන් සඳුන් කළුවැල් කිහිරි සපු පුවඟු දුනුකේ වැටකේ නා පතා සල් සලල අගුරු දෙව්දුරු ආදි නොයෙක් වෘක්ෂයෙන් ප්‍රතිමණ්ඩිතය, ඊ සැතපි තොප අඹුදරුවන් එලාඑල කවා ගිරිඋඹලෙන් බට සිහිල් පැන් බී ශරීරක්ලාන්ත නිවාගෙණ ඉන් ඔබ්බට වැඩිකල මනාවූ තොට පතර ඇති නොයෙක් මස්කැස්බන් විසින් ගැවසීගත් කෙතුමතී නම් මහා ගඟෙක් ඇති. ඒ දෙපාර්ශ්වයෙහි රිදීපටක් හයාලූවාසේ මනාවූ වැලිතලායෙහි වටින් හමන්නාවූ සිහිල් සුළඟ ඇඟ ගස්වා සැතපීගෙණ

වැද්දක්හු විසින් දුන් මී හා මස් වළඳා ඔහුගේ සහයයෙන් ඒ ගඟින් එතරව ඔහට රන් ඔටුන්න තදකර්ණ ලක්‍ෂයක් අගනා රත් ඉද්දදෙවා ඉත්ඔබ්බට වැඩිකල ඉන්ද්‍රනීල මාණික්‍යයක්සේ බබලන සානු නම් පර්වතයක් ඇත. ඒ පර්වත සිඛරයෙහි පිහිටි මහා නුගගසෙහි අමාඵල වැනි මධුර රස ඇති නුග ඵල අනුභවකොට ඒ ගසමුල සැතපී ඉන් ඔබ්බට වැඩිකල සතරගුල් උස ඇති රතිඳුගොච්චත් සහිත තිල්වූ මහත් ඊතණ වනයය, ඒ ගෙවා වඩතේ මුචලිඳ නම් විල්තෙරින් ගොස් පූර්වෝත්තර කොණයට (ඊසාන දෙසට) පැමිණ එක පදික මාර්ගයෙන් ගොස් වන ලැහැබට පැමිණිකල පස්පෑයෙන් යුත් පියුමෙන් හා වැල්ලෙන් ගැවසී ගත් තිල්වූ දියසළාසෙන් යුත් ඉඳුනිල්මිණි අතල පැරයු මී බී මත්බමරගණන් විසින් ගැවසීගත් හංසශ්‍රෙණීන්ගෙන් විරාජමානවූ සතරැස් පොකුණෙක් ඇත. ඒ දක ඒ පොකුණට දකුණු දිග බලා ගියකල නොයෙක් ඵලාඵලයෙන් ගැවසීගත් අවඹකවූ වංකගිරි පර්වතයය. ඒ පර්වතයේ පන්සල් කොට ගෙණ ධ්‍යාන සුවයෙන් දවස් යවමින් අඹුදරුවන් හා සමග වාසය කරවයි කියා නැවත සැටදහසක් රජදරුවෝ බොධිසත්වයන් වැඳ සමුගෙණ පෙරළා තම නුවර වලට ගියහ.

එදවස් ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ තමන්ගේ දහසක් නුවණැසලා මනුෂ්‍ය ලොකය බලන්නේ අප මහබෝසතාණන් සතසත මහදන් දී තපස්රක්නට වංකගිරිපර්වතයට නික්මුණු බව දක විශ්වකර්මී දිව්‍යපුත්‍රයා කැඳවා කියන්නේ වෙස්සන්තර රජ්ජුරුවෝ මද්‍රිඳෙවිද තපස් රක්නට වංකගිරි පර්වතයට යෙති. තෝ එහි ගොස් පන්සල් දෙකක් හා සක්මන් මලු දෙකක් හා නොයෙක් මල් වලින් ගැවසීගත් මල්ගස් හා කෙහෙල් වනයක් හා අඳුන් දිවිසම් රිටි සුඹුළු කෙණ්ඩි සැරයටි පැස් සුලු මලු සහුල් ආදීවූ දෙය මවා ‘‘තපස්කාරන්තවුනට කැපය’යි බිත්තියේ අකුරු ලියා පන්සලට නිස්ගව්වක් මානයේ වගුන් වලසුන් සිංහව්‍යාඝ්‍රයන් ආදී සිවුපාවුන් හා යක් බූ පිසසුන් හා භයානක ශබ්ද ඇති මෘග පක්ෂීන් පලවා හැර එවයි නියෝග කෙළේය. ඒ විස්කම් දෙව්පුත් සක්දෙව් රජහුගේ නියෝගය පරිද්දෙන් එකී සියල්ල නිර්මිතකොට තබා දෙව් ලොවටම ගියේය.

බොධිසත්වයෝ කී සලකුණෙන් යන්නෝ සැතපී හිඳිමින් සිටිමින් සතරැස් පොකුණකට ගොස් පොකුණ විස්තර බලා තෙපි මෙතැන සිටුවයි කියා මද්‍රිඳෙවි පොකුණු තෙර සිටුවා දකුණුදිග හසරක් දක ඒ හසරින් ගොස් විශ්වකර්මයා මැවූ පන්සල දක මහතානෝ ශක්‍රයා අප ආබව දන්නේ වනැයි සිතා තමන් වහන්සේ අත තිබූ රන්කඩුව තබා පන්සල ඇතුළට වැද බිත්තියේ තිබූ අකුර දක කියවා බලා තපසට කැප බැව් දන එහි හිඳ ජටා බැඳ හන්සළු ගලවා තබා වල්කලා හැඳ අඳුන් දිවිසම් පොරවා පාත්‍රය ගෙණ සැරයටියත් අතින්ගෙණ සක්මන් මලුයෙහි සක්මන් කෙරෙමින් සිටියාහ. මද්‍රිදෙවි බොධිසත්වයන් ලස්වූ හෙයින් සහරැස් පොකුණෙන් නික්ම බොධිසත්වයන් ගිය හසරින් ගොස් තපො විලාසයෙන් සිටි සමනන් දක ලය පැලී යන තරම් ශොකයෙන් හඩා බිම හී සවාමීනි පෙර සිව්රට ආදී දෙශයන්හි මිනිසුන් විසින් නුඹ සඳමහරජාතන් පුතනුවෝ වෙස්සන්තර රජ්ජුරුවෝයයි කථ කට නුඹගේ රූපශ්‍රී කියනු ඇසීමි මාගේ ඇසින්ද නුඹගේ ඒ රූපශ්‍රී දිටිමි. දුන්

මෙවැනි තවුස් වේශයක් දිටිමි. පෙර නුඹ රජ්ජුරුවෝයයි ප්‍රසිද්ධව දූත් තපස්වීයයි යන නම් විය. පෙර මිණිකොඬොලින් බබලන වොටුනු පලන් තෙල හිස දූත් දළමඹුල්ලට සුදුසුවිය. පෙර දළමුතුහර එකාවැල පලන් තෙල උරය දූන් මුවසම් ලන්නට සුදුසුවිය. පෙර කසී සළු හන් තෙල උකුළ දූන් තිය සහිත අඳුන් දිවිසම් ලන්නට සුදුසුවියයි මෙසේවූ වෙශයක් දකින්නට මාගේ දෑස තුබූ නිසාය. මෙසේවූ දෙයක් නුඹවහන්සේටත් වූයේ වන මෙවැනි විලාසයක් දුටු මා ලය හැම්මෙන නිසායයි හඬා වැලප ශොක සන්හිඳුවාගෙණ සමතන්වහන්සේ ගත් තවුස් වෙස් මාත් ගත මැනවැයි සිතා ජාලිය කුමාරයන් හා කෘෂ්ණජිනාවන් කැඳවාගෙණ අතික් පන්සලට වැද තමන්වහන්සේ හත් සළු ගලවා තබා අඳුන් දිවිසම් රිටි සුඹුළු වල් කලා ජටාධරව ජාලියකුමාරයන් හා කෘෂ්ණජිනාවන්ටද අඳුන් දිවිසම් රිටි සුඹුලු හඳවා හිස ජටා බඳවා තුන්පුතු මව් බෝසතානන් කරා ගොස් වැඳ නැඟී සිට වහන්ස! නුඹ අතින් මා ගන්නා වරයෙක් ඇතැයි වර ඉල්වන්නී, මම වනමුල් වන ඵලා ඵල ගෙණෙන්ට යෙමි. ඵලාඵල සොයායාදී පෙරවරු නුඹවහන්සේ දරුදෙදෙන රක්‍ෂාකළ මැනවැයි කීවාය. මහබෝසතානන්වහන්සේ යහපතැයි උන්ට වරදී කියන්නාහු මා විසින්ද තොපගෙන් ගන්නා වරයෙක් ඇත. වේලේමුත් නොවේලේ මාගේ පන්සලට නොවදුවයි කියා උන් අතින් වරලදින් මෙසේ වසන කල්හි මද්‍රිදෙවීන් වනමුල් වන ඵලාඵල ගෙණහැර බෝසතානන් වළඳවා අත්පා මෙහෙකොට සත්මසක් පිරුණුසඳ බොධිසත්ත්වයෝ තමන් අතින් දත්ගන්නවුන් නැත්තෙන් දුක්පත්ව පරහට සුවදෙන්නට උපන් මහතානෝ වන මුල් වන ඵලාඵල ඇද්ද නැද්දැයි සිතන්මුත් සෙස්සක් නොපතන්නාහ.

මෙසේ වසන සමයෙහි කාලිඟුරට දුන්නිවිට්ඨ නම් බමුණුගම ජූජක නම් බමුණෙක් බාල කල සිට සිඟන්නේ වෘඩ අවස්ථාව දක්වා සිඟාගෙණ කහවණු සියයක් ලදින් අනාථ එක් බමුණකු කෙරෙහි තබා ගොස් කල්යාමකින් අවුත් යහළුව මාගේ කහවණු දෙවයි කියා ඉල්විය ඒ බමුණු කියන්නේ යහළුව මා අනාථ විසින් තාගේ කහවණු විකුට කාපිමි. තාගේ කහවණු නියාවට මාගේ අමිත්තතාප නම් දුවනීය ගෙණයවයි දුවනියන් භාරකෙළේය, ඌගෙන් අතික් ලැබෙන දෙයක් නැත්තෙන් තමන් කාමදෘස බැවින් ඒ බැමිණිය තමන්ගේ ගෙදරට කැඳවාගෙණ ගොස් තමාට අඹු කෙළේය. ඒ බැමිණියද පූජකයා කෙරෙහි මහත් ගෞරවයෙන් උපසත්කාර කෙරෙමින් සිත්සේ වෙසෙයි එකල ඒ බමුණුගම සෙසු තරුණ බමුණෝ තමන් තමන්ගේ අඹුවන්ට රහැණිව කියන්නාහු ජරා දුබීල වෘඩ බමුණාට මෙවැනි තරුණ ස්ත්‍රියක් ඌ සිත්සේ මෙහෙවරකොට වෙසෙයි. තෙපි අපට මෙහෙවර කිරීමෙහි ප්‍රමාද වන්නේ කිම්දැයි කියා ගැහැට කෙරෙති.

එබස් ඇසූ බැමිණියෝ පූජකයාගේ හෘදයෙන් ඈ තොරකරම්හයි සම්මතකොටගෙණ එක් දවසක් අමිත්තතාප නම් බැමිණිය පැන්තොටදී දූක එගම සෙසු බැමිණියෝ කියන්නාහු එම්බල පව්කළ තැනැත්තිය! තී දත් හුනු තරමහල්ලකුට මෙහෙ කෙරෙහිද? මේ කඩදත් මහල්ලට තී පාවාදුන් තිගේ දෙමවුපියෝ තිට සතුරු වන්නාහ. තී උන්ට සතුරුවන නිසාය, තී අප්‍රිය වන නිසාය, තී පින් නොකළ තැනැත්තියක. තී ගිය ජාතියෙහි

තවවක් යාගයෙහි කපුටුවන්ට ලූ බත් පලමුකොට කෑ මහලු කපුටියක් වන, එසේ හෙයින්වද තී මේ තර මහල්ලාට අඹුවූයේ යෙහෙළිය! මෙසේවූ ජරා මහල්ලා හා එක්ව පඤ්චකාම විෂයෙහි කවර නම් ඇල්මක් ඇද්ද? උඟ කට දත් දල්වාගෙණ සිනාසෙන වේලෙහි තසිතට කවර නම් සමාධියෙක්ද? පිටක්සේ උගේ ශරීරයෙහි ගැටි කවර නම් සමාධියෙක් වේද? ගැරඬි සමක් වැනි ඇඟ රැලිඇති කඩදත් ඇති කෙලතොලු මහලු බමුණා හා තීගේ කවර නම් පඤ්චකාම සම්පත්තියෙක්ද? සොඳුර! තිගේ සොමලවූ ශරීරය මිරිකා ඒ බමුණු කතාටුවාට මෙහෙකොට දුක් නොගෙණ තී සේවූ අභිරූප ලදරු සැමියකු සොයාගණැයි කීහ. මෙසේ ඕ තමාහට පරිභව බණත්තාවූ ගැණුන් බලා හඬා වැලප මියුඹුරුලාලා පැනට ගිය කළය ගලේ ගසා බිඳපියා අත පොරවාගෙණ ගෙට අවුත් ජූජක නම් බමුණුගේ රැවුල තරයේ අල්වාගෙණ බමුණුමාල්ලාට තතනමින් බෙණෙමින් දත්කමින් බමුණුමාල්ල! යා සේ වූ කෙලතොල්ලන් කෙරෙහි උන් විපාක අදම ලදිමි. යහපත් සරණෙක මා ආයේ. අද මේ ගම දූරියෝ එක්ව ගෙණලා මාහිඹ බොල්කළහ. පැන් තොටදී මට උන් නොකළ පරිභවයෙක් නැත, තා කෙරෙහිද මෙසේවූ බස් අසන්නාට වඩා කරවල් ලාගෙණ මියයාම යහපත. සිරිගිකා මියයාම යහපත, එහා ගොස් දැසයකු හෝ ගෙණඑව, නැතහොත් තා කෙරෙහි නොසිද යෙමියි කීවාය.

එබස් අසා බමුණු තමා දත් වැගිර ගියත් අඹුසොඬ හෙයින් කී බසට කම්පාව කියතුයේ එම්බා සොඳුර තුඹ රැහැණී නොවව, මහලුවූ බැවින් දැස දැසීන් ලද්දේත් නොහැක. මෙවක් පටන් දරත් මම්ම ගෙණෙමි. දියත් මම්ම ගෙණෙමි. සෙසු කළමනා යම්මදෙයක් ඇත්නම් මම්ම කෙරෙමි. අද පටන් තෙපි මෙහෙ නොකරව, තෙපි ගෙය රැක ඉඳුවයි බැමිණිය අස්වසා කීහ. අහෝ බ්‍රාහ්මණය! සැමියන් අතින් මෙහෙ ගත්තා කුලයෙක මා උපන්නේ නැත. නපුරු බස් නොකියා දැසියක හෝ දැසයකු හෝ ගෙණ එවයි කීවුය. සොඳුර! දැසින් කෙසේ ලබම්දැයි කීය. අහෝ මහළු බමුණ! එච්චරකුත් නො දන්නෙහිද? තට උපායක් කියමි. මහා යසස් ඇති ගුණ සම්පන්නවූ වෙස්සන්තර රජ්ජුරුවෝ ඉච්ඡාදත් දෙති උත්ගෙන් වස්තුගෙණ අනාථයන් සුව විඳුනේය. දූත් ඒ උත්තමයා වංකගිරි පර්වතයෙහි තපස් කෙරෙති තෝ ඔබ ගොස් මට මෙහෙ කරණ වහලක් ගෙණෙයි නම් ඉදිමි. නැත්නම් මාගේ දෙමවුපියන් ගමට ගොස් මාසේම ලදරු දසුන් ඇති අනික් බමුණකු කෙරෙහි ඉදිමි. තා බල බලා සිටියදී උඟ හා මා හා කෙළනා කල මහල්ල තා! සිතට සුවයෙක් නම් නැතැයි කීහ. ඒ අසන්නාම බමුණා ලය ඉපිල හිත. ලය පැරුණු මහත් ශොකයෙන් මියුඹුරු හුරුලලා කියන්නේ සොඳුර මම ශක්ති නැත්තෙමි, වෘඬසෙමි, යා නොහෙමි වංකගිරි පර්වතය ඉතා දුරය, ගෙයි වහල් කළමනා යම් මෙහෙවරක් ඇත්නම් මම්ම කෙරෙමි. තෙපි ඊට අසමාධි නොවවයි කීය.

එබස් අසා බැමිණී කියන්නී තොපි සංග්‍රාම භූමියට නොවැදම පැරදි එකකු වැන්න, එම්බල ජඩ කඩදත් කොරසැඬි තඹවිටි කම්මැලිය මට කන්තලව් නොපිරුවා ගොස් වෙස්සන්තර රජ්ජුරුවන් අතින් කෙල්ලක කොල්ලකු ගෙණෙවයි කියා බමුණා වෙර මස් කයි ඉන්ද සිටිය නොදී ඇත

මැත ගැසෙමින් හවමින් බෙණෙමින් වෙසෙයි. බමුණු අඹුව කරණ ගැහැට විඳගන නොහී ඈ කෙරෙහි හයින් යහපත සොඳුර වහලක් ගෙණෙමියි ගිවිස අඹුවට වලින් දර ගෙණවුත් ගෙය පුරවා දිය ඇද වලන් පුරවා ගෙය සිහාරා වටකොට ඇට බත් බුලත් තබාලා ඈ විසින් සපයාදුන් අක්සුණු ආදී මගෝපකරණද ගෙණ ගමනට සැරහී සිට අඹුව පැදකුණු කොට තුන්විටක් වැඳලා පසුබැස සතර තැනක බැස හෙව වැඳ ඈ කෙරෙහි කළ හයින් හැකිල හැකිල පාත බැස සිපගෙණ තිකට ගෙණ සනහා ඇට කියන්නේ සොඳුර මම නොලස්ව එමි. නෙපි බය නොවවයි සමුගෙණ වහන්සඟලක් පසලා කුඩ මහල්ලක් ගෙණ කෙණ්ඩියකින් පැන් ගෙණ ගමනට ගත් උපකරණ පය්‍ය සාරට නගාගෙණ අඹු ලඳුරිකතුන් පෙරළි පෙරළි සිට බල බලා වංකගිරි පර්‍වත යට යන මඟට ගොස් මනදී සිතන්නේ සිවිරටට ගොස් තුඳුටිම් නම් පසු වංක ගිරි පර්‍වතයට යෙමි සිතා සිවිරටට ගොස් වෙස්සන්තර රජ්ජුරුවෝ කොයිදැයි විචාළේය.

නුවර වාසීහු ඒ අසා කිපී තවත් දන් ගැන්මෙහි තවතුද? අපගේ සවාමීන් රටින් යන පරිද්දෙන් කෙළෙහිය, තවත් කුමකට පිළිවිසීදැයි කිපී පොලු මුගුරු කැට පහණගෙණ ලුහුබඳවා ගත්හ. බමුණු වැටෙමින් පිරිහෙමින් නොල බොල් සිඳ බිඳගෙණ දත උතුවැලමිටි ලේ ලාගෙණ දිවතකල ලුහුබඳවා ගොස් උණපත්කකින් සම්පොත්ත උණපත්තේ ඇලියන පරිද්දෙන් පැහැර පියා බමුණ! මතු මේ නුවරට අයි නම් දන්නෙහි වේදැයි හයගැන්වූහ. බමුණු මරණහයින් දිවයිනෝ උතුරුදික් බලා ගමන් ගත. බමුණා මඟ නොහඳුනන හෙයින් දෙවතාවෝ බෝසතාණන්ගේ දානපාරමිතාව පුරණු සඳහා වංකගිරි පර්‍වතයට යන්නට මඟ පැහ. බමුණු ක්‍රමයෙන් වනාන්තරයට ගොස් ඉරමුදුන් වේලෙහි වෙතියපුත්‍ර නම් මුවවැද්දා සිටි රැකවලට වැද ඒ වැද්දාගේ කීන බල්ලෝ බමුණා දැක සිහාරා වටකොට ගත්හ. බමුණු හයින් මහ හඬින් හඬා සසලව තමාගේ තම්ණනම් අක්සුණුපසියත් කුඩයත් සැරයටියත් වහන් සඟලත් හෙලාපියා හිසකේ උදුරා දිවගෙණ ගොස් ගසකට නැඟීසිට හඬන්නේ පඤ්චමහා ගඞ්ගාවන්ට සප්තමහා සාගරය වැනිවූ වැසිලිකිණියන්ට මහාමේඝයක් බඳුවූ සනාන්ධකාරයට ප්‍රදීපාලෝකයක් බඳුවූ සොළොස්යාචකයන්ට කප්රුකක් වැනිවූ සිතූ සිතූ දෙය සිඩ කරදෙන චින්තාමාණික්‍යයක් බඳුවූ ගමන් විඩාවූවන්ට සිහිල් සෙවනක් බඳුවූ හැම සත්වයන්ට පින්පැන් ශාලාවක් බඳුවූ ඉල්වූ දෙයක් නැතැයි නොකියන්නාවූ පඤ්චමහා පද්මයෙන් පිරුණු පොකුණක් බඳුවූ සියලු සතුන්ටම හිතවත්වූ වෙස්සන්තර රජ්ජුරුවෝ කොයිදැයි හැඬීය.

ඒ වෙතිය පුත්‍ර නම් මුවවැදි තෙමේ බමුණාගේ හඬ අසා දිව අවුත් බමුණා දැක තමන්ගේ රාජ්‍යය හැරපියා මේ හිමයට ආ රජ්ජුරුවන් සොයා ආයේ කිසවුන්වත් ඉල්වා ආයේද්ධෝහෝයි කිපී පිටිතොල දත්කමින් වට පිට බලමින් අවුත් දුෂ්ට බමුණුමාල්ල! දූත් දූත් තා දිවි ගණිමියි දුන්න හයා විෂ පෙවූ හීය දුනුමුඩ ලා හයාගෙණ සොරබමුණ! දූත් තාගේ හෘදයමාංශය ලේ වම්ම වම්මා කපාගෙණ පත්ථසකුණයන්ට බිලි දෙමි. තා සල්ව සල්වා දූත් තාගේ බඩවැල් ඇරගෙණ පක්ෂීන්ට දෙමි. තාගේ පඤ්චමධුරමාංශයෙන් හා හෘදය ලෙනෙයෙන් දෙවියන්ට බිලි දෙමි. දූත් තාගේ ඇඟ මස් නෙල

බල්ලන්ට ලා කවමි. වහා ගසින් බසුවයි කීය, බමුණු මරණභයින් භයපත්ව අතික් වදනා තැනක් නැත්තෙන් මහහඬින් හඬා බොරුවක් කියා මා මුත් අතින් ගැලවුනමැනවැයි සිතා කියන්නේ මා එසේ මෙසේ මැරිය නොහැක්ක, මම සඳමහරජුගේ දූතයෙමි. මඳවරදකුත් නැත්තෙමි, මා දිවි නොගෙණ මඳ ඇසිල්ලක් මාගේබස් අසව, සඳමහරජජුරුවන් හා සිවිරට වැස්සන් හා සැදැහැයෙන් වෙස්සන්තර රජ්ජුරුවන් කරා ගියමැනවැයි කී හෙයින් එක්වින්ව බිස වූත් වලප්නාහෙයින් මව්පිය දෙදෙනාගේ ශොක බලවත් හෙයින් වඞකගිරි පර්වතයට ගොස් වෙස්සන්තර රජ්ජුරුවන්ගේ සුවදුක් හා සවරූප දක්නා පිණිස යවයි සඳමහරජ්ජුරුවන්ගේ මෙහෙවරින් ආමි කීය.

එබස් අසා වැදිපුත් සතුටුව යමයන්සේ වටලාගත් බල්ලන් ගස්වල බැඳ ජූජකබමුණා ගසින් බස්සවාගෙණ අගුරෙහි පැලහු මස් හා මිහිරි ආහාර කවා ගමන් ශ්‍රමදුහ නිවා සතප්පවා යන්තට නික්මුණුකල මඟට පිරුණාවූ මී ලබුවක් හා මුවමස් පිඩක් (පක්කමිගසත්‍ථිඤ්චා අගුරෙහි පැලහු මුවහානයක්ද, දී පසුගමන්කොට දකුණත ඔසවා බෝසත්‍ානන්වහන්සේ වසන දිශාවට මඟ කියන්නේ බමුණ! තෙල දියවලාකඩක්සේ පෙණෙන්නේ ගඳමහ පර්වතය, ඒ ගල්පසත කිහිරි කුඹුක් තුග ඇසටු කෙළිඳ ගිවුලු බෙලි අඹ දඹ බක්මී කෙහෙල් කටුඑරමිණිය තදුන් සඳුන් තා පතා සපු දුනුකේ සල් සලල අගරු දෙව් දුරු ආදී මල් පල්ලෙන් සැදුනේය. හැලි ගසා දිවන ගං හෝ ආදියෙන් ගැවසීගත් ලියකිඳුරන්ට කුරව් කෙවිල්ලන්ට ගෙයක් බඳුවූ සිත් කලුවූ ගල් කුලෙන් රමනීයවූ වනයෙන් එලාඑල කඩා කමින් හඬා වැගිරෙණ නෙයෙක් ඇලදෙලවල සිහිල් දියෙන් නාමින් පැන් බොමින් සැතපෙමින් එතැනින් ඔබ්බෙහි ගියකල පස්පියුමෙන් සැදුම්ලත් පොකුණෙක් ඇත. ඒ පොකුණේ නෙළුම්පත් පිට වගුළ මල්රෙනෙණුසේ ශකීරා පරයන පොකුරුමී කමින් ගොස් මග ලැඟ රාක්‍ෂයන් විසින් ගහනවූ විපුල නම් පර්තයක් ඇත ඒ පර්තයේ අච්චුත නම් තපස්වීකෙණෙක් ඇත ඒ තපස්වීන් වසන පන්සලට වැද සැපපී උන්ගෙන් මඟ පිළිවිස ගණුවයි සුලුවනය විස්තරකොට මඟ කීය. බමුණු උඟ කී පරිද්දෙන් ගොස් විපුල පර්තය සමීපයෙහි තපස්වීන් වසන පන්සලට ගොස් තපස්වීන් දුක සුවදුක් විචාරන්නේ සුවදුක් කෙසේද? මැසි මදුරුවන්ගෙන් දුක් නැද්ද? දිවියන් වගුන් වලසුන් සිංහයන්ගෙන් උපද්‍රව නැද්ද? එලා එල ලැබේදැයි විචාරා සිටියේය.

එකල තපස්වී කියන්නේ තා කී දේවලින් මට කිසි දුකෙක් නැත. එලාඑලාදියද ලැබෙයි කියා ඔහුගේ ගමන් ශ්‍රමදුහ නිවා එලා එල කවා සැතපී උන්කල බමුණ! මේ වනාන්තරයට කුමක් සඳහා අවුදැයි විචාළේය. බමුණු කියන්නේ වෙස්සන්තර රජ්ජුරුවන් කරා ආමි කීය. එවිට තාපස තෙමේ කියන්නේ රාජ්‍යයහැර විත් වනයෙහි තාපස්වෙසට වසන වෙස්සනතර රජහට ධන ධාන්‍යාදී භොග සම්පත්තියක් නැත. එබැවින් දුක්පත්වූ ඒ රජ්ජුරුවන් කරා තෙපි කුමක් නිසා යව්දැයි ඇසුයේය. බමුණු කියන්නේ තාපස යෙනී වස්තු සඳහා ආයෙම් නොවෙමි. වෙස්සනතර රජ්ජුරුවන් බාල කල උන් අකුරු කරවීමි. උන් මා නොදක්නෙන් දුන් සත්මසක් විය, බලාපියනු සඳහා ආමි කීය. මෙසේ කියා එදවස් එහිම ලැග පාන්වූ කල තපස්වී බොරු නොදන්නා හෙයින් මූ කීයේ සැබෑදෝහෝයි සිතා මඟ පාන්නේ බමුණ

මෙසේ ගියකල දකුණත් හසරින් වඞකගිරි පර්වතයට ගොස් සියුරැස් පොකුණට ගියකල ඒ පොකුණ පස්පියුමෙන් සැදුනේය, ඒ පොකුණ සිසාරා අඹ දඹ කීන කුඹුක් ආදී රුක්වලින් සජ්ජිතය, නිල්මහමෙ තැගි කල වලා කඩක් බබලන්නා වැන්න, එතැන සුළඟින් පැහැර කඳු බිඳී තිබෙන මල්හිස බඹරුන් පියාවලින් නිති වැගිරෙණ මල්මුවරදින් යුක්තය, මල්කෙසරු කඩා කටපුරා කා මත්ව කූල්නා කෙවිල්ලන් ඇති ඒ පර්වත සිඛරයෙහි ලිය ගී තගා නටන ලියකිඳුරන් ඇති ඒ ඒ දෙළවල ලියමඬුලුයෙහි රිසිසේ හැසි රෙණ විද්‍යාධරයන් ඇති, රන්ගිරිකුළු මුදුන මුළු මුළුව නටන මත් මොනර කැලන් ඇති, පර්වතොපමවූ නොයෙක් ඇත්කැළය, තොලින් තොල තබා ඔවුනොවුන් සනහ සනහා යන නොයෙක් මුවරැළය, ඒ ඒ තැන විලික්සව තිබෙන ඇත්දළ සා ගෙඩි ඇති කෙසෙල් වනයය, මාදියකළ සා ගෙඩි ඇති කොස්වනයය, විලිකෂව වැගිරෙණ මී අඹ වනයය, පුවක්දඹු සා දඹු ඇති උක් වනයය, බමුණ තා මේ වනයට වැද කැමති එලා එල අනු භව කෙරෙමින් සැනපෙමින් ගොස් වංකගිරි පර්වතය සමීපයෙහි පන්සලට වැද වෙසසන්තර රජ්ජුරුවන් දකුවයි කීහ. බමුණු ඒ අසා සතුටුව තුන්විටක් තපස්වීන් වැඳ සමුගෙණ කී කී ලකුණු බල බලා ගොස් සතරැස් පොකුණද වනයද දැක ඒ වනයෙහි එක් ගිරිගුහාවක් දැක බමුණු සිතන්නේ මේ වේලෙහි බිසවු වෙසතුරු රජ්ජුරුවන් වනමුල් එලා එල ගෙණහැර වළඳති. ස්ත්‍රීහු නම් දනට බාධා කරන්නාහුය, එහෙයින් කුමාරවරුන් දන් ලබාපියන්නට නොදෙති. එබැවින් මේ ගුහායෙහි අද ලැග සෙට උදැසන මද්‍රිදෙවි එලා එල සොයා ගියකල දරුවන් දන්ගණිමියිසිතා එදා රැ ඒ ගුහායෙහි ලැගුම්ගත්තේය.

එදවස් මද්‍රිදෙවී පාන්වන වේලෙහි නපුරු සවප්නයක් දැක භයපත්ව හිඳ සිතන්නී මේ මුළු පොළොව වෙසසන්තර රජ්ජුරුවන් හා සමාන සවප්න දන්නාහු නැතැයි සිතා බෝසතානන්වහන්සේගේ පන්සල මලුයෙහි පියවර සන්කොට සිටිකල බොධිසත්වයෝ දෙර කවුදැයි විචාළහ. වහන්ස මම යයි කීවාය දෙවීන් මා කරා නොවේලේ නොඑන්නට වර ලද්දෙම් වේදැයි කීහ. දෙවි කියන්නී සවාමීනී ක්ලේශ වශයෙන් අන්‍යතර සිතකින් ආයේ නොවෙමි. මා දුටු සවප්නය කියන්නට ආමි කිව. මහබෝසතානෝ කියවයි වදාළහ. මන්ද්‍රි දෙවි කියන්නී සවාමීනී එක් කලුම්නිසෙක් කසාපිළි දෙකක් හැඳ දෙකණ රත්මල් පැලඳගෙණ කඩුවක් ඉස සිසාරමින් මා කරා අවුත් මට නොයෙක් තුඩවැඩි සැත මා හිස ජටාව අල්වාගෙණ ඇද උඩුකුරුකොට බිම හෙළාගෙණ මා හඬව හඬවා මාගේ දැස උදුරාගෙණ දැතත් කපාගෙණ ළය පලා ලේ පෙර පෙරා හෘදයමාංශය උදුරාගෙණ ගියේ වතැයි කීවාය. බෝසතානෝ සීනය අසා සිතන්නාහු මාගේ සත්මසක් පිරිගීගියාවූ දාන පාරමිතාව සම්පූර්ණවෙයි සතුටුව දරුවන් දෙන්නා ගෙනයන්නට වනයට බමුණකු ආයේවනැයි සිතා බිසවුන්ට කියන්නාහු දෙවීනි නෙපි මියුරු ආහාර වළඳා සුව යහන්වල වැදහොව නොප දැන් එලාඑල වළඳා සුවයහන් නොලදින් දඹුමැස්සෙහි හෝනෙන් පෙණෙන සීනැයි කියා බිසවුන් සන්හිඳුවා යැවූදැය. පාන්වූකල මද්‍රිදෙවී මලුව හැමද දැහැටි පැන් තබා මල් පුදා දරු දෙදෙන කැඳවා වැළඳගෙණ මුණ තබා සිඹ සනහා දරුවෙනි මා රැ දුටු සීනය නපුර තෙල්බින්දුවක් සාත් යහපතෙක් නැත. නොප පියානන් ඇලයෙන් බැහැර

නොයව, කෙළිනා තැන බියපත්වවයි ඔවාදී බෝසතානන් කරා ගොස් වැඳ නැගීසිට සවාමීනි! මේ වනයේ මට තැයෝ නම් තුඹ හා මේ දරුදෙබිනින් නෝය, සවාමීනි! මම වන ඵලාඵල සොයා යෙමි. මම වනයට යන බවමුත් මාගේ දෙබිහිත්තන් කෙරෙහි අප්‍රමාද වුවමැනව, තුඹවහන්සේත් සිහි ඇතිව හුන මැනව, මා යන මුත් මාගේ ලය තුඹ බව දැන වදාළමැනවැයි කියා දරුදෙදෙනා පාවාදී මල්කරුව හා පෙට්ටිය ඇරගෙණ වනමුල් වන ඵලා ඵල සොයා යන්නී හඬමින් වලපමින් වනදෙවියනි! මාගේ දරුවන් රක්ෂාකරව්, මා කම්කිළියගේ එකලා කම්බලවයි දෙවියන්ට යදිමින් ගියාය.

බොධිසත්වයෝ බිසවුන් වලට යාදී සක්මන් මලුයෙහි කෙළවර බමුණා එන පෙරමග බල බලා උන්හ. දරුවෝ දෙදෙන බොධිසත්වයන් ඉදිරියේ වැලි කෙළ කෙළ උන්හ. ඉක්බිති බමුණු මද්‍රිදෙවීන් ඵලා ඵලයට යන වේලා යයි උන් වල සිට නොඑනතුරු ගොස් දරුවන් ඉල්වා ගණිමි සිතා පන්සලට ගියේය. බෝධිසත්වයෝ එන්නාවූ බමුණා දුරදීම දැක සත්මසක් මුළුල්ලෙහි බහා තබන ලද දනපාරමිතා නමැති ධුරය නගා සිටුවන්නට මෙන් එන කල්‍යාණ මිත්‍රයෙක, සුළුවනය පසළොස් යොදනක් හා මහ වනය පසළොස් යොදනක් ඇතුළුව තිස්යොදුන් මඟ හෙවා බමුණු නිකමට නොඑන්නේය, දරුවන් දන් ඉල්වා ආයේවනැයි සිතා සතුටුවූ නියාව දරුවන් කෙරෙහි කළ ප්‍රේමයටත් වැඩිව සිටියේය. මහබෝසතානෝ ජාලිය කුමාරයන් කැඳවා කියන්නාහු කුමාරයෙනි! පෙරමඟට ගොස් බමුණා අත කෙණ්ඩිය පිරිකර ඇරගෙණ තබවයි කියා ඉදිරියට යවූහ. ජාලිය කුමාරයෝ සතුටුව ගොස් කෙණ්ඩිකාවට අත දික්කළහ. බමුණු සිතන්නේ මූ වෙසසන්තර රජ්ජුරුවෝ මට දන්දෙන දරුවෝයයි සිතා දූන් මා මුන්ට මොළොක් වුවහොත් මතුවට මෙහෙ නොකෙරෙති. දූන්ම මුන් භයගන්වාලමි සිතා උරණව කුමාරයන් මුහුණ බැලීය, ජාලිය කුමාරයෝ භයගෙණ පලා අවුත් බොධිසත්වයන් ලඟට වන්හ. උන් පසු පස්සෙහි බමුණු ඇවිත් බොධිසත්වයන් දැක ස්තුති කොට අසන්නේ ශ්‍රී වන්තය! තොප ශරීරයට සැපදැ? මැසිමදුරුවන් සිංහව්‍යාඝ්‍රයන් යක්‍ෂ ප්‍රේතයන්ගෙන් දුක් නැද්ද? වනමුල් වන ඵලා ඵල ලැබේද? තපසට අනතරාය නැද්ද? දනට බාධා නැද්දැයි ඇසීය. ඒ අසා බොධිසත්වයෝ කියන්නාහු බමුණ! තා කී මෙතෙක් දෙයින් දුක්නැත, තපසට අනතරාය නැත, දනට බාධා නැත, පින්වත! තාගේ ශ්‍රමදැහ නිවා තෙල අඹ දඹ කෙහෙල් කටුඑරමිනිය, මීය රසවැත්ත, ඒ ඵලාඵල කා පැන් බී සැතපී ඉඳුවයි වදාළහ! බමුණු කී ලෙසම ඵලා ඵල කා පැන්බී සැතපී උන්කලට මහබෝසතානෝ තා ආ කාරුණු කිම්දැයි බමුණා විචාළහ. බමුණු කියන්නේ මහා පුරුෂයා යම්සේ පඤ්චමහා ගඞ්ගායෙහි ජලස්කන්ධය කෙතෙක්දෙන ඇද බීපුවත් සඳ කල්ම ක්‍ෂයනොවේද? එමෙන් ශ්‍රද්ධා ජලයෙන් පිරුණාවූ සියලු යාචකයන්ගේ සිත් පුරණ උත්තමයෙක්වූ තුඹවහන්සේ ලඟට අතික් වැඩි කටයුත්තකට ආයෙම් නොවෙමි, ඔබගේ දරුදෙදෙනා ඉල්වා ආමි කීය.

මෙකප බුදුවන්නට ලොවට වැඩක්ම සිතන්නාවූ ඒ මහතානන් වහන්සේ බමුණා කී බස් අසා දරුවන් මුහුණ බලා බමුණාගේද මුහුණ බලා

වලට ගිය බිසවුන් සිහිකොට සිත උපන් දළ සෝගිනි නිවා වදාරා දන්දීමෙහි එක් සිත් වූසේක. එදා එසේ නොසිතුයේ නම් මහබෝමැඩ වජ්‍රාසනයෙහි හිඳ මාර සෙනඟ ප්‍රලයකොට කෙසේ නම් බුදුවනසේක්ද? මෙසසර අවුලෙහි බැඳුනු සත්වයෝ කා මූණබලා ගැලවෙද්ද? මෙම සත්වයන් නිවන්පුර යවන්නෝ කවුරුද? එදා ඒ දරුවන් දන්දීමෙහි පසුබටවූ නම් බුදුවූ මහතානන් කරා මෙනෙයාලු ගිරිමෙඛලා නම් පරුෂ ඇත් ශ්‍රීපාදය වැඳ කෙසේ නම් හොවීද? ඝොරවූ යමහු වැනිවූ ආලවක නම් යක්ෂයා කුමකට බිඳී නැමී ශ්‍රී පාදය වැඳ හොවීද? එදා ඒ දරුවන් දන්දීමෙහි මසුරුවූනම් මිනීමරු අංගුලි මාලයා දූන්නමන්සන්නෙහි කුමට කුලගැතිවේද? දෙවදත්තසථවිරයන් හිසට පෙරලූ ගල පොලොවින් ගල්දෙකක් මැවී කුමකට පිළිගණිද? තවද මහමෙර සත්දරණපටකින් වෙලාගෙණ තමන්වහන්සේට කිපී විෂතේජසින් දිලියෙන් තාවූ නන්දොපනන්ද නම් නාගරාජයා කෙසේ නම් හික්මවනසේක්ද? ඒ දරුවන්ට ස්නෙහ ඇතිව දන්දීමෙහි පමාවූයේ නම් දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රදෙවේන්ද්‍රයෝ තමාගේ එක්සියවිසිරියන් ජයතුරාසක තුඩ පොපියන නෙක් කුමකට පිඹීද? බ්‍රහ්මතේජසින් දිලියෙන්නාවූ මහාබ්‍රහ්මයා සවාමිදරුවන්ගේ මස්තකයට තමාගේ ධවලවජත්‍රය ධරා කුමකට සිටීද; එදා ඒ දරුවන් නොදෙමියි බමුණු යැවූනම් පස්වාදහසක් කල් මුළුල්ලෙහි නිවන් පුර දෙරහැර තබා තමන් පිරිනිවන් පෑ දවස් ශ්‍රී ශරීරයෙන් දැගිය අසමින්වද වැළඳු පාත්‍රයටද පිටිවහල්වූ ශ්‍රී මහාබොධියටද තමන් වදහළ දහමටද වැඳපිඳූ සියලු මිනිසුන්ද දෙව්බඹුන්ද කෙසේනම් නිවන්පුර පිහිටුවනසේක්ද? එසේවී නම් මේ සියල්ලම නොසිදුවන්නේය, නොහැකිවන්නේය.

මෙසේ දරුවන් දන්දෙමියි එක්සිත්වූ මහබෝසතාණෝ "දරුදෙදෙන ඉල්වමි"යි කී බමුණාගේ බසට තමහට රාජ්‍යය පාවාදී වොටුනු පලඳවමියි කී බසකට සෙයින් සතුටුව කියන්නාහු බමුණ! තා මට පරලොව අමුත්තෙක. තාසේ මට මිත්‍රයෙක් නැත, සෙසු යාචකයෝ ඉල්වන් නම් ඇතකු හෝ ඉල්වති, අසකු හෝ ඉල්වති, රන්රුවන් හෝ ඉල්වති, මේ මහවලට අවුත් අනික් දෙයක් නොඉල්වා අපගේ දරුවන් ඉල්වූ බව ඉතා ඝනපත එය වැකීමක් සිහිනෙනුත් නොසිතමි, දරුවන් තට සමසිතින් පාවාදෙමි. බල එකක්කියමි. බමුණ! මේ ළඳ බොළඳ කුමාරයෝ කිසි දුකක් නොදිටු විරූය, දූත් මා දරුවන් දෙමි. උන් ගෙණගියෙහි වීතම් සා වීඩාවෙති. එසේහෙයින් බිසවුන් වල් ගොස් අවුදින් දරුවන් දෙදෙන නාවා වතමුල් එලා එල කවා වැළඳගෙණ ළඳ බොළඳ සුරතල් බස් අසා ඇවිලෙන ගිනි නිවා සැනහුන කල අද රෑ මෙහි ලැග සෙට දරුවන් දෙදෙනා ගෙණයව, තවද ඒ දරුවන්ගේ මෑනියෝ දරුවන් අපට පාවාදී එකලාව වල් ගියෝය. එලා එල ගෙණවුත් දරුදෙන්නා නුදුටු නම් උන් ලය පැලීයෙතියි සිතමි, මාගේ ඉෂ්ට මිත්‍රවූ බමුණ! තට ගැති වනලද මේ දරුවෝ දෙදෙන ඉතා සිව්මැලියෝය. රජකුමරුවෝ ගැති මෙහයේ නොහසළ විරූය තදින් මොලොකින් මෙහෙ උගන්වාගෙණ ගැති මෙහෙකම් ගණුවයි කියා අද මේ වේලාවට හැම්මෙවයි වදාළසේක.

එබස් ඇසූ බමුණු කියන්නේ රජ්ජුරුවෙනි! ස්ත්‍රීහු නම් දනට බාධා කරණ සුල්ලභ. ශුභකර්මාන්ත නොදනිති, අද මම මෙහි ලගිනට නොපොහෙ,

සත්මි. දරුවන් දන් දෙව් නම් මට කල්නොයවා දූන්ම දෙව, නොදෙවූ නම් මම නැගීයෙමියි කීය. එබස් අසා බොධිසත්වයෝ බමුණාට කියන්නාහු දරුවන් දෙමි කියලා නොදෙමි නොකියමි, දනට පසුබස්නා සිතකින් නොවෙයි බිසවුන් එතතුරු නොනැම්මෙහි නම් මේ සිව්මැලිදරුවන් මඟ තලව තලවා සතප සතපා අස්වසමින් කැඳවා ගෙණ සිව්රමට යව, ගොස් මා දරුවන් මුත් තනුවූ සඳමහරජ්ජුරුවන්ට මෙපවත් කීකල මපියානන්වහන්සේ අපකෙරේ කළ ප්‍රෙමයෙන් මුනුබුරන් දුටු සතුටින් ඔවුන්ගේ මිහිරිබස් අසමින් තට කෙලිකොල්ලන් හා බොහෝ වස්තු දෙතියි කීහ. එබස් අසා බමුණු ඉස සල සලා කියන්නේ යහපත, අප දිවි ගන්නට සිතූ නියාව, රජ්ජුරුවෙනි! නොප මේ උපාය කෙසේ උගතුද? මුනුබුරන් දුටු සඳමහරජ්ජුරුවෝ මට කියපී කියති, බමුණු! තෝ අප මුනුබුරන් ගැතිකොට ගෙණ එයිදූයි කියමින් අත් පා කන් නාසා කපා දිවි ගණිති, වහල් තබා දිවිරක ගණුත් යහපත, තෙපි දරුවන් දෙව්නම් දෙව, නොදෙව් නම් නොදෙව, තෙල බස් අප රකිත් හොත් නොකියවයි කීය. බමුණා කියන බස්ද පියරජ්ජුරුවන් වහන්සේ තම දෙබිහිත්තන් වහල්කොට දෙමියි කියන බස්ද අසමින් හයපත්ව සිටගත නොහී දිවියන් දූක මරණ හසින් දුවන මුව පොල්ලන් දෙන්නකුසේ ඉගිකරලා ඉගිල බමුණු ලුහුබඳවා එන්නේයයි ආපසු බලමින් දිවන්නාහු පන්සල පිටි පස්සේ වැද හයින් එතැනද සිටගතනොහී වනලැහැබකට වැද සැඟවුනාහු බැලුබැලූ දිශායෙහි බමුණා දිවඑන්නාසේ පෙණෙන්නේය, එතැනත් නොසිට අනේ නගණ්ඩ කුමක් කරමෝදූයි කියමින් කටුවැලින් හීරීගෙණ හඩා දිවන් නාහු සතරැස් පොකුණට වැද අපි ඔවුනොවුන් සැඟවුනු තැන් නොපාම්හයි දෙබින්න බැණගෙණ ඔවුනොවුන් ඇඟ එල්බගෙණ පොකුණ කරවටක් දියට බැස නෙළුම්පතින් හිස් වසාගෙණ සැඟවී සිට කන්දී සොල්මන් අස අසා මැනියන්දූ ඊයේ රෑ දුටු සීනය නපුරැයි කීදූය, මැනියෝ පියානන් හැර බැහැ රකට නොයවයි කිවුය, පියානන්ට අප බලන්නට පාවාදී ගියෝය, මැනියෝ අප වැලි කෙළිතියි සිතද්දෝ මෙවැනි දුක්වූ බව නොදනිද්දෝහෝ මේ වන දෙවියනි! තෙපි අප දෙදෙන රැක වනා දිව ගොස් මැනියන්ට කියව් මැනියන් දූක උන්දූ පිටහී හඩා පියා උන්දූ කීවා කරම්හයි මෙසේ බැගෑපත්ව හඩ හඩා වෙවුලමින් කරවටක් දියෙහි සැඟවී සිටියහ.

බොධිසත්වයෝ දරුවන් සැඟවුනු බව නොදූන බමුණාට දෙන්නට යයි දරුවන් කැඳවූහ දරුවන් නොබිණු හෙයින් බමුණු කියන්නේ වෙස්සන්තර රජ්ජුරුවෙනි! තොපගේ බොරු දන්නෝ මේ මේ මුළු රට නැත, තෙපි දරුවන්ට ඉඟි ලා ලා සඟවාලා නොදෙන්නාවනම හිඳ දරුවන් කැඳවාද! මේ තැන් වැසි දන්දෙන නොපසේවූ බොරු කෙණෙකුන් නුදුටුවිරුම්යි කීය. ඉක්බිති බෝධිසත්වයෝ බොරුකීවයි යන බසට ලජ්ජාව කියන්නාහු බමුණ, මම දන්සොඬ හෙයින්ද මැනියන් නුමූ දෙදෙන නොදක්නාහෙයින්ද නාගේ රළුකම් දූක හයපත්ව පැලාවන්නහ බමුණ නා මඳක් හැම්මෙවයි කියා නැගී සිට පන්සල පිටිපස්සට ගොස් වනලැහැබට බැස එහි නොදූක දරුවන්ගේ පියසලකුණෙන් පොකුණට ගොස් වන් බව දූනලා මෙකප බුදුවෙන සියලු පොළවට සානනි එළවන ඒ මහනානෝ ලය (දුක්) වාගෙණ හ..ගානාහු මපුතනුවෙනි!! ජාලිය කුමාරයෙනි! යි හඬගෑහ. (බුදුවෙන ජාතියෙහි රහල්

කුමරු වන මහපින් ඇති) ඒ ජාලිය කුමාරයෝ පියරජ්ජුරුවන් හඬ අසමින් බමුණා මා දිවි ගණිවා, මා නැති කෙරේවා මපියාතන්වහන්සේ හඬ ගෑ හඬ අසා නොසිටිම්යි සිතා පියාතෙති! කියමින් හිස වසාගෙණ සිටි නෙළුම්පත් දෑතින් පීරාගෙණ දිව අවුත් පියාතන් දකුණුපය ගෙණ හඬන්නට වන්හ. බොධිසත්වයෝ පුතනුවන්ගේ බැගෑපත් හඬඅසා කම්පාව සිතසංසිඳුවාගෙණ පුත! තොපගේ නැගනියෝ කොයිදැයි විචාළහ. ජාලිය කුමාරයෝ තොකී යම්හයි පලමු දෙන්න බැණනත් හෙයින් පියාතන්වහන්ස! භයින් පලායන මෘගජාතීහු උන්ට කියා පලායෙද්දැයි අපට වූ දෑ එබන්දක් වැන්නැයි කීහ. ඒ අසා බොධිසත්වයෝ මාගේ දියනියෙනි කෘෂ්ණජිනාවෙනි! යි හඬනෑහ. බුදුවන ජාතියෙහි තමන් සස්නෙහි උපුල්වන් මහාසෑවිරී යයි ප්‍රසිඬවන මහ පිණැති ඒ දියනියෝ පියාතන් හඬගෑ හඬ අසා බමුණා අප දිවිගණීත්වා මපියාතන්වහන්සේ හඬගෑ හඬ අසා සිටිම්දැයි සිතා හිස නෙළුම් පත් හැරපියා දෙව්දුවකමෙන් අවුත් බොධිසත්වයන් වම්පය වැළඳගෙණ හඬන්නට පටන්ගත්හ. දරුවන් දෙදෙන හඬාවගුළ කඳුළු බොධිසත්වයන්ගේ පිපි පියුම් වැනි දෙපත්ලෙහි වැගිරෙයි බෝසතානන්වහන්සේ දරුවන්ගේ දුක් බලා හඬන්නාවූ කඳුළු රන්පිටාටූ වැනි දරුදෙබින්නන් පිට වැගිරෙයි, මෙසේ බමුණාට දෙමියි සිතා හඬමින් හොත් දෙදරුවන් නගා සිටුවා ලෙහි හොවා හඬා සැනසී සිතන්නාහු මා හඬා ශොකවීමෙන් මුදුබව නොසැදෙයි, දරුවන් ගෙණ සිඹ සනහාපියා මනහරවූ මාගේ දරුවෙනි! මා දන්සොඬබව නොදනුද මේ සංසාරසාගරයට තොප පසුරුකොට ගෙණ මම සංසාරයෙන් එතරව ගොඩදකිම්. මම ගොඩදැක තොප ඇතුළු දෙව් බඹ මිනිසුන් සහිතලොකයා ගොඩ දක්වාලම්, දරුවෙනි! මාගේ දානපාරමිතාධ්‍යාසය මස්තකප්‍රාප්තකොට ලුව මැනවයි අස්වසාලමින් පුතණ්ඩ! තෙපි නිදහස්වෙනු කැමැත්තෙහි වීනම් බමුණාට (රන්) නික්දහසක් දෙමින් නිදහස්වුව මැනව, තොප නැගනියන් නිදහස්කොට ගන්නා කැමැත්තෙහිවීනම් බමුණුහට දැසයන් සියයක්ද දැසීන් සියයක්ද, ඇතුන් සියයක්ද, අසුන් සියයක්, වෘෂභයන් සියයක්ද (රන්) නිස්ක සියයක්ද යනාදියෙන් සියයක් බැගින් දී නිදහස්කොට ගණුවයි කියා දෙදෙනා වටිනා මිලකොට පන්සලට කැඳවාගෙණවුත් බමුණා කැඳවා කුමාර වරුන්ගේ අත්ගෙණ කෙණ්ඩිකාවෙන් බමුණා අත පැන් වත්කොට සිත්කලුවූ මේ දරුවන් දෙන්නා දන්දුන් පින්කමින් සව්නේගෙවා ලොව්තුරා සම්මා සම් බොධියට පැමිණෙම්වා"යි කියා (ප්‍රාර්ථනාකොට) දරුවන්ගේ අත් ගෙණ බමුණා අත තබා දන් දුන්හ.

මෙසේ දරුවන් දන් දෙත්ම ලය කකියවා හඬන පක්ෂපාත මිඩියකයේ මහපොළොව කම්පිතව නටන්නට වන මහමේරු පර්වතයද සප්තකූට පර්වතයෝද දරුවන් දන්දුන් ශොකයෙන් හඬන්නාසේ ඔවුනොවුන් ඇඟ ගැසමින් සතුටුව නටන්නට වන, සුවාසූදහසක් යොදුන් ගම්භීරසාගරය තමාගේ රළ නමැති අතින් සත්රුවන් ඉස ඉස සොම්නසින් සැලෙන්නටවන දෙවියෝ සතුටුව සාධුකාරදී මල්වැසි වැස්සූහ. මහබෝසතානෝ මා විසින් මනහර දනක් දුන්නෙමි. ඒ ඉතා ආශ්චර්‍යයයි ප්‍රීති උපදවා කුමරුවන් බලමින් සිටියාහ, ජූජක බමුණාද වනලැහැබට පිවිස දතින් වැලක් කඩා ගෙණවුත් ජාලිය කුමාරයන් දකුණත ගෙණ කුමරියගේ වමත හා එකට බැඳ එම

වැල් කෙලවරින් තලමින් ගෙණ ගියේය. ඒ දරුවන් සිරුරුවල ගැසූ ගැසූ තැන සම් ඉගිලී ලේ වැගිරෙයි, බෑයන්පිට ගැසූ පහර නැගනියෝ පිට ලවා ගණිති, නැගනියන් පිට ගැසූ පහර බෑයෝ පිටලවා ගණිති මෙසේ දරුවන් රැගෙණ යෙමින් සිටි බමුණා සෙලකින් බස්නේ සෙලින් පැකිල මූණින් වැටිහින.

බමුණා නොනැගී සිටින තෙක්ම දරුවෝ දෙදෙන ගැලවී දිවගෙණ අවුත් පන්සලට වැද බොධිසත්වයන් දෙපත්ලෙහි හිසනබාගෙණ හඬා කියන් නාහු සවාමීනි ! අම්ම නපුරු සීනයක් දැක නුඹවහන්සේට අපපාවාදී එකලාව වල් යන්නාහු කී බසට නුඹම දෙස් නොවේද? පියානෙනි ! සිහි නැද්ද ? අප නුදුටු අම්මාගේ ලය කෙසේ නම් වෑවේද? අම්මා ආකල උන් වැඳ අඬා අපගේ දුක් පාපියනතුරු අප රැකගන්න, අපි නුඹ ඇරපියා ගොස් හැම්මීය හෙමෝද? පියානෙනි ! ඒ අවලක්‍ෂණ බමුණාට අප දන්නොදී අතික් බමුණු කුට දෙන්න, මූගේ පා බකලය, නියපිරිතිය, යටට ගිලිහී ගිය පිණ්ඩිකා මාංශ ඇත්තේය, දික්වූ තොල් ඇත්තේය, කෙලනොලුය, දත්බොලුය, බිඳුනු නාස. ඇත්තේය, නඹවන් දූලිරුවුලු ඉසකේ ඇත්තේය, බඬමහතය, වමරුසිය බලල් ඇස්වැනී ඇස් ඇත්තේය, නැමුනු කන්කොරිය, ඇඟ රැළිගැසුනේය, කළු තල කැලලින් ගැවසුන සිරුරු ඇත්තේය, නැමුනු සිරුරු ඇත්තේය, යන එන කල හඬ නැගෙන අසම් සන්ධින් යුත් සිරුරු ඇත්තේය, අමනුෂ්‍යයෙක, (නොහොත් මිනිස් වෙසින් ආ යක්‍ෂයෙක,) මෙසේ අවලක්‍ෂණවූවකුට අප නොදෙන්න, නොවලකා අප දෙන්නාහු නම් මා දන් දෙන්න, මාගේ නැග නියෝ ඉතා සිව්මැලියෝය, තමන් මොලකැටි හෙයින් මිඩී මෙහෙ නොකළ හෙති, මම නැගනියන්ට වැඩිමහලු හෙයින් මම දුක්ගත හැක්කේවෙමි, උන් කරණ මෙහෙත් මම කෙරෙමි, කෘෂ්ණජිනාවෝ මිඩිවූකල සිවි මහා රාජවංශ යට පරිහවීය, නැගනියන් රැක මා උන්ට ගැතිකොට දුනමැනව, මෑනියන්ට මා දුන්බව කියා නැගනියන් පාලා බෑණ අස්වසා මෑනියන් රැක පියන්නැයි කියා හැඬුහ.

බොධිසත්වයෝ මෙතෙක් දෑ කියයුතු මුවෙන් නොබෑණ උන්හ. ජාලියකුමාරයෝ කියන්නාහු පියානන් වහන්ස! මෙතෙක් දෑ මා කියදීමුවෙන් නොබණනදෑය, නුඹවහන්සේ ලය ගලක්වූයේය, පසකින් වැසුනේ වන, මේ කුමන දෑකිසාමෙක්ද? මුවෙන් නොබෑණ ඉඳිනට කුමනවරදක් කෙළේදැයි කියමින් සිටිතැනට නිශ්‍රීකවූ ඒ බමුණු නරියා තමා හුනු තැනින් එලී එලී නැගී සිට දෙදෙන වැලිපිස ලේහුනුනැතින් වැගිරෙණ ලේ දකිමින් පිටිනොල් දත් කමින් යමයෙකුසේ අවුත් වැඳසිටියේය. දරුවෝ ඌ දැක භයපත්ව වෙවු ලන්නට පටන්ගත්හ. මෙසේ සිටි දරුවන් බොධිසත්වයන් බලබලා හින්දදී අල්වාගෙණ ගියහ. රාහු විසින් ගලනලද නොවැලක යන හිර සඳ මෙන් යමින් සිටි දරුවෝ පෙරළී පියානන් බලමින් පියුම් පෙති වැනි දෑත් ඉස් මුදුනේ තබා වඳිමින් අපගේ පිට වැගිරෙණ ලේ බලන්න, අප බැඳි බැම්ම බලන්න, පියානෙනි ! මුවෙන් නොබෑණ ඉඳිනේ මේ යකු අප කා මරාපියන

තුරුද? මෑනියන්ට කියනකල අප වැද සමුගත් බැව් කියන්න. අප සුවපත් බවද නැවත දුක්මක් නැති බවද කියන්නැයි මෙසේ කිය කියා හඬා යෙමින් සිටියාය.

බොධිසත්වයෝ දරුවන් දෙන්නාගේ බැගෑපත් හඬ අසා ලය කකියවා අනේ බමුණකු ඉතා දුඛ තියාය. මාගේ ඇස් හමුයෙහිදී මෙසේ දුඛව මරණ කල ඔබ්බෙහිදී තමා කැමැත්තෙක් නොකෙරේද, එතද අප දෙදෙනා ඔක් කොන් ආ දරුවෝ දුන් කඳු බැවිල් කටු බොරලු කෙසේ යෙද්දෝ හෝ සයින් විඩාවූ දරුවන් කවුරු සනසා කිරි පොවද්දෝ හෝ, පතුල් ඉදිමුන දරුවන් කවුරු සතපා ලද්දෝහෝ, සීත සුලං කා වෙව්ලනා දරුවන් කවුරු සතහා තලවා ගණිද්දෝහෝ, මෑනියන් තන මැද සැතපුනු දරුවන් අද රෑ කොතැනක වැදහෙව නිදද්දෝහෝ දරුවන් කෙරෙහි ස්නෙහයෙන් මා පිට හඬා හඬා පෙරළෙන්නාවූ බිසවුන් කෙසේ නම් අස්වසනෙම් දෝහෝයි සිතා මහත්වූ ශොකය ධරාගන්නට නොහැකිව බමුණා ලුහුබැඳ ජීවිතය විනාශකොට දරුවන් ගෙණෙමැයි සිතා නැවත ඒ ක්‍ෂණයෙහි සිතන්නාහු මනාකොට සිත් සතුටින් දන්දී තපස් කරන්නාහු සිත් කලකිරවා ගණිද්ද? පෙර උත්තමයෝද පළමුකොට දසපෙරුමන්ද, දස උපපෙරුමන්ද, දසපරමත් පෙරුමන්ද පුරා පඤ්චමහා පරිත්‍යාගකොට බුදුවූහ. මම්ද එසේ බුදුවෙමියි සිතා මහත්වූ ප්‍රඥා උපදවාගෙණ මා සිතුසේ ඉතා නපුරුය. බුදුබවට හේතුවූ පාරමිතා නමැති සාගරය පිහිනා ගොඩ දක්නා ළඳහා සිහිල් පොකුණෙක දියෙහි ගැලුනු පරිද් දෙන් මාගේ සිත් වියවුල් නොරෙම්දැයි සිතා එසිත් දුරුකොට මුළුලොව කිසිම සතකුට නුපුළුවන් මෙවැනි දරුවන් දන් දුනිමි. ඒකාන්තයෙන් මේ මා දුන් දානයෙන් ලොව්තුරා බුදුවෙම්වයි සතුටුව පන්සලින් නික්ම පන්සල් දොරකඩ පහන් පුවරුවෙක වැඩහුන්හ.

එවේලෙහි දරුදෙදෙන යමින් සිට තමන් සෙළ ඇවිදිනා වෘක්‍ෂ සෙව නලු දක ගස් සිදුරු ගල්ගුහා මැටියෙන් ඇඹු ඇතුන් අසුන් රථ ගොන් පෙතැල්ලන් ගිරවුන් වලිකුකුළන් කුරවි කෙවිල්ලන් වන මෘගයන් කිඳුරන් හා සතරැස් පොකුණු දක ගස් මුල් දක කියන්නාහු මනහරවූ මල් පිපී සිටිනා වෘක්‍ෂයෙනි! තොප හා පුරුදුව තොප මුල්හි වැලිකෙළ අදින් වියෝවූ අපි තොප වැඳ සමුගණුම්හ. පැහැයෙනුදුල වැලිතලායෙනි! අප දිය කෙළනා මනහර ගඟුල්හැල්ලෙනි! තොප අතින් සමුගෙණ මෙහෙයට යම්හ. මියුරු ගායනා හඬන කුරුවිකෙල්ලෙනි! අත්තල ගසගසා අප ඉදිරියේ නටා බස්නා ලියකියන්නරාවෙනි! අපගේ මෑනියන්ට අප වැඳ සමුගත් බව කියව්, අනේ මේ වනදෙවියනි! අප හා පුරුදු ඇත්තෙනි! අපගේ මෑනියන්ට අප අතුල් පතුල් ඉදිම යානොහෙන බව කියව, අප වීදිනා සුව කියව් අපගේ අම්මා එනොත් මේ මඟ ඔස්සේ දිවවයි කියා මෙසේ හඬමින් වලපමින් කැටිව කෙළනා වන මෘගයෙනි! සතරැස් පොකුණෙනි! අද තොපගෙන් වියෝවූම්හයි කියා සමුදී යෙමින් සිටියදෑය, අකුරු මිශ්‍ර මඟ ඔස්සේ දරුවන් මිරුකුනුබවට මඟදෙපාශීව යෙහි පිහිගත් වෘක්‍ෂ වලප්නා වැන්න. වන වෘක්‍ෂයෝ බොහෝ බරව පිපෙන මල් නමැති මුඛ විවෘතකොට මද්‍රිදෙවීන්ට දරුවන් ගියබව කියන්නාක් වැන්න. ඒ වෙනෙහි මෘගපක්‍ෂීහු දෙබිහින්නන් කෙරෙන් වියෝවූම්හයි ගර්ජනා කළහ.

ඉක්බිති වලට ගිය මද්‍රිදේවී සිතන්නී ඊයේ රෑ මම නපුරු සොප්නයක් දුටිමි. මාගේ දරුවෝ වහන්සේ ලඟින් පන්සලින් පිටත්වූයෝහෝයි ලය කකියවා වනමුල් වන එලාඑල ගෙණෙන සඳ අත යහුල වැටීයෙයි. පෙට්ටිය වැටීයෙයි, දකුණැස මස් සැලෙයි, දෙපස වෙව්ලයි, හෘදය කකියවයි, මේ පර්වතයේ දෙවියනි! මට කිමෙක් වේදෝහෝ මේ වනයෙහි නපුරු සීත පෙණෙන්නේ කුමකටදෝහෝයි ලය කකියවමින් පන්සලට එනසඳ ශක්‍ර දෙවෙන්ද්‍රතෙමේ දිව්‍යපුත්‍රයන් සතරදෙනෙකු කැඳවා කියන්නේ බොධිසත්වයෝ දරුවන් දන්දෙමින් සිටියහ. එතැනට බිසවු ගියෝනම් නපුරුය, තෙපි ගොස් සිංහ, ව්‍යාඝ්‍ර, වලස් වෙස් මවාගෙණ මග අවුරා වැද හොවයි සමමත කෙළේය, දෙවියෝද එසේම වෙස් මවාගෙණ මග අවුරා වැදඹන්හ බිසවු එන්නාහු භයංකර රූප දැක කියන්නාහු, මම යම් දවසෙක මේ මග යන එන කල මෙසේවූ සතුන් නුදුටු විරීමි. මුවන් මොණරුන් වලිකුකුළන් වඳුරන් දකුත්මුත් මෙසේවූ සතුන් නුදුටු විරීමි. මේ වනයෙහි වෘක්ෂදෙවතාවෙනි පර්වත යන්හි දෙවියනි! මොවුන් යවව, (රාමයන්ට සීතාවන්සේ) මාගේ සවාමීන්ට මම් පතිව්‍රතාවීනම් වහන්ස කුඩාවරුනි මගින් ඉවත්වයි මහත්කොට හඬ ගසා නොයන විසින් අතික් යන මගක් නැත්තෙන් පෙරමගට දරුවෝ අවුනම් නපුරුයිසිතා මම ඒ මගහොත් සතුන් විසින් නොඇහෙමියි ලයකකියවා තුමූම නැගී යද්දෝහෝයි සිට කියන්නාහු දරුවෙනී මම නොප නැසිය කොට වනාන්තරයට ආ වෙස්සන්තර රජ්ජුරුවන්ගේ අඹුවෙමි, නොපමුත් මාගේ නෑසියෝ නැත. මා නුදුටු දරුවෝ නොහැම්මෙති. රෑ නොවනතුරා මා නැගී යා දෙවයි කීහ. එසේ කිවද නොයන විසින් මහත්කොට හඬනගා අත්පොළසන්දී නොපට කුමන වරදක් කෙළෙම්දෝහොයි කීහ. පතිව්‍රතා වත් මෙසේ කියන්ම මෘගජාතිහු භය ඇතිව නිඳ, පුබඳුවූවන්සේ හඬා හිර බට බවුදුන නොපෙණී ගියහ.

මද්‍රිදේවි සඳරැසින් යුත් රාත්‍රියෙහි වනමුල් වන එලාඑල ගෙණවිත් දරුවන් මෙතන දකිම්දෝහෝයි සිතා එන මග නොදැක මා දරුවන්ට කුමක් වීදෝහෝයි සිට කියන්නී මාගේ දරුවන්ගේ මිහිරි බසක් මා කණ නොහිත, ලඳ බොළඳ බසක් නොඇසීමි. ලා සඳක් වැනි මුහුණු නුදුටුයෙමි. පෙර කෙළනා රුක්මුල් නොදක්නෙමි. ජාලියකුමාරයෝ පෙරමගට අවුත් අම්ම අඹ නැද්දැයි හින බලති. කෘෂ්ණජිනාවෝ අවුත් නනය ගණිති. මේ නුගමුල වැලි කැටිකොට කෙළෙනා නැතැයි බලමින් ගොස් පන්සලට වැද තෙනෙහි කිරි ඉසිමින් සියොලඟ වෙවුලමින් මුව වියලි ලයකකියවා වහන්සේ කෙරෙහි නැත්තුයි කොතැන නිදිගැන්වූදෝහෝයි යම් කිසි රුකක්මුල නිදිගණිද්දෝ හෝයි ඇත්කඳ ලිහිණියෝ ගෙණ ගියෝදෝහෝයි යක්ෂ භූතප්‍රෙතයෝ ගෙණ ගියෝදෝහෝයි ලඳ බොළඳ මියුරු බසක් කවර විටෙක ඇසියහෙම්දෝහෝයි ලඳ බොළඳ සිනාවක් කවර විටෙක ඇසියහෙම්දෝහෝයි මෑනියෙනි පියා නෙති කියන බසක් කවර විටෙක ඇසියහෙම්දෝයි හඬා වැලප බෝසතා නන් අතින් විචාරන්නී සවාමීනි දරුවන් සිඟන්නන්ට දන්දුන්නුදැයි විචළාය, බෝසතානෝ මුවෙන් නොබැණ වැඩහුන් හෙයින් බිසව් කියන්නාහු වහන්ස! දරුවන් නොදක්නා ශොක තබා නුඹවහන්සේ මුවෙන් නොබණන ශොකය බොහෝයයිකියා මෙසේ හඬතුදු එකබසකුත් නොකියාම වැඩහුන්හ.

ඉක්බිති බිසව් කියන්නාහු පෙර මේ වේලාවට ගින්දර ඇතිකොට හිඳනාදූය. අද මුවෙන්වත් නොබණනාදූය, මා එනතුරුත් දරුවන් රකිමියි මට වරදුන්දෑ වේද? දරු ස්නෙහයෙන් මා අඩා ඇවිදිනාතුරු නොබැණ වැඩහිඳිනා දූය. ඔබගේ දරුවන් කැඳවාල එලා එල වැළඳුව මැනව, නොබැණනාදූ නම් තුඹ කෙරෙන් මාගේ ජීවිතය නොරකෙරෙමියි කීහ.

එසඳ බොධිසත්වයෝ සිතන්නාහු මොහු දරුවන් කෙරෙහි ස්නෙහ බොහෝදූය, දූන් මා දරුවන් දුන්බව කීම්නම් තපුරකැයිසිතා කල්යවා කියන්නාහු, තෙපි වනමුල්වන එලාඑල පිණිස උදෑසනම ගොස් මෙවේලේ සඳපහනේ ආයෙහිද ? අද මා දරුවන්ට ස්නෙහ බොහෝවේද? තොප පඤ්චකල්‍යාණියෙන් යුත් රූප සම්පත්තියව, මේ වෙනෙහි වනවරකයෝද රුසිවරයෝද තාපසවරුද ඇත. මෙපමණවෙලා තොප කුමක් කෙළෙද්දූයි කවුරු දනිද්ද? ''මාගේ දරුවන්ගේ පවත් කෙසේද? සවාමිහුගේ පවත් කෙසේදූ''යි මෙපමණ සිතකුදු නුවූයේයයි තර්ජනයකොට කීහ.

එබස් අසා මද්‍රිදෙවී මාලස්වූහෙයින් නොබැණවුන්දෑවනැයි සිතා කියන්නී මම වේලේ ආමි, මේ වෙනෙහි පක්ෂි ආදීහු මහත්කොට හැඬූ හඬ අසා මා දරුවන්ට කුමක්වීදෝහෝයි ලය කකියවා එමින් සිටි සඳ මග සිංහ වලස් ආදී වෙස් ගත් තුන්දෙනෙක් මා එන්නනොදී මග අවුරා ඔත්හ. එසේ හෙයින් ලස්වීමි කීවාය, මෙසේ බිසවුන් කියතුදු නොබැණ ඉන්න විසින් ලය කකියවා වෙවුමින් හඩාගෙණ පන්සල පිටිපසටගොස් හඬගසන්නාහු මාගේ ලයක් වැනි ජාලිය කුමාරයෙනි ! සිව්මැලි ක්‍රිෂ්ණජිනාවෙනි ! තොප නාවන් තව් වලින් කසාගෙණාමි. මාගේ ලය වැනි කුමාරයෙනි ! මා කල් කිලිය කරා නොඑද්දූයි මහත්කොට හඬලා බසක් නොලදින් මාගේ දරුවන්ට නැස්මක් වනැයි නියතකොට සිතා රාත්‍රියෙහි මහාසෝදුකින් හඬා ඇවිදින්නාහු මාගේ දරුවන් කෙළනා පොකුණයයි පොකුණ බලා දරුවන් එක්ක කෙළනා මුව පොල්ලෝයයි මුවන් බලා දරුවන් කෙළනා රුක්මුලැයි රුක්මුල් බලා නො දැක එනතින් ඔබ්බට ගොස් මා දරුවන් සමග කෙළන නටන මොනරුනැයි මොනරුන් බලමින් දියනියන් ලස් වැනි කුරවි කෙවිල්ලෝයයි කුරවි කෙවිල් ලන් බලමින් මාගේ දියනියන් වැනි යහපත්වූ ඇස් ඇති මෘගාඞගනාවෝයයි රළෙහි යන මුවන් හා මුවදෙනුන් බලා දරුවන් හා එක්ව ඇවිදිනවුන් දකිමින් මා දරුවන් නොදක්මියි බිසවු මහහඬින්හඬා සීසන් නැතිව වැටී හි මඳ විගසින් සීසන් ලදින් මා දියනියන් කෙළනා කෙළිවලදූයි කෙළිවලන් බලමින් දියනියන් කෙළනා මැටි ගිරව්යයි ගරවුන් බලමින් බිම හී නොයෙක් වාරයේ හඬා රාත්‍රියෙහි ගලවන පහන ගැසි ඇලදෙල කඳු බැවිල් ගං හෝ මේ ආදී සථාන බල බලා වංකගිරි පර්තයෙහි පසළොස් ගවුවක් බඳ මානයේ හඳපානේ තුන්විටක් වටකොට බලා ඇවිද්දූහ. බිසවු බලා ඇවිද්දදී බොධිසත්වයෝ ඇසිපිය නොඔබා නිදිව්යෝව උන්හ. පහන්ව හිරු නැගෙමින් සිටි වේලෙහි මද්‍රිදෙවි බලලකුගත් කිකිළියක මෙන් වෙවුලා හඬා සීසන්න නැතිව හොත්හ.

බොධිසත්වයෝ මද්‍රිදෙවි හොත් විලස් බලා ලය කකියවා මේ වෙනෙහි මාගේ තෑ කෙණෙක් නැත, තෙපි වනාන්තරයෙහි මළදූයි කියා සිත් කැළඹි

ගොස් බෝසතාණෝ ශෝකපත්ව නුවණින් ශෝක දුරුකොට නෙළුම් පොකුණට ගොස් දිය ගෙණවුත් සත්මසක් විසූ බ්‍රහ්මචර්‍යයෙන් සත්‍යක්‍රියාකොට බ්‍රහ්මචර්‍යයෙහි ඇල්මක් නොකොට මද්‍රිදේවීන් හිස (දෙකලව) ඔර පිට තබා ගෙණ පියුමක් වැනි අත්ලෙන් ලය අතගසා මුහුණට දිය ඉස අතින් ලෙහි දිය ගසා සිතන්නාහු සිව්රට හෙව මියගියෝනම් මහත් රජපෙරහරින් දවන්නාහ, මා උදකලාව මේ වෙතෙහි කුමක් කෙරෙම්දැයි සිතා මහත්වූ ශෝකයෙන් තැවි තැවී උන්කලට බිසව් කල්යාමකින් සීසත්තලදින් ලජ්ජාව මහබෝසතානන් වැඳ විචාරන්නාහු වහන්ස ! මා දරුවෝ කොහිදැයි විචාළහ. බෝධිසත්වයෝ කියන්නාහු දේවීනි ! ඉතා වයෝවෘද්ධවූ බමුණෙක් සැටයොදුන් මඟ ගෙවා දන්පිණිස ආයේය, ඕහට දරුවන් දන් දුනිම් කීහ. එවිට මහපොළොව හඬා ගුගුලාය, සියලු දෙවියෝ සාධුකාර දුන්හ. මහාමේරු පර්වතයද සප්ත කුලපර්වතයෝද රැව්පිළිරැව්දිදී නටන්නටවන්හ. දේවීනි ! දානපාරමිතාවට යම් සිතක් නොසිත පින් අනුමෝදන්වවයි වදාළහ බිසවූ කියන්නාහු ස්වාමීනි! මට මෙසේ නොකියා හඬා ඇවිද්දදී නොබැණහුන්නදැයි කියමින් දෙහොත් මුදුනේ තබාගෙණ පින් අනුමෝදන් වෙමියි කියා සාධුකාරදී පින් අනුමෝදන්ව ගෙණ කියන්නාහු ස්වාමීනි දරුවන්ට වැඩියෙන් දහසින් ලක්‍ෂයක් බුදුබව උත්තමයයි සතුටුව සිත් සන්සිඳුවාගෙණ ස්වාමීනි මටම පින් දෙනදැද, මුළුලොව සතුන්වත් පින්කම් දුනමැනවයි පින්දෙවා සිත් ප්‍රසන්නකොට දානපාරමිතාව මුදුන්පත් කළහ. සියලු දෙවියෝ සතුටුව සාධුකාර දී පින් අනුමෝදන්ව මල්වැසි වැස්සුහ.

ඉක්බිත්තෙන් ශක්‍රදේවේන්ද්‍රතෙමේ සිතන්නේ බෝධිසත්වයෝ තමන්ගේ දරු දෙදෙනා බමුණාට දන්දුන්හ. බිසවුනුදු යම් කිසි හීන පුරුෂයක්හට දන් දුනහොත් නපුරයි සිතා දිව්‍ය ශරීරය හැරපියා මහලු බමුණු වෙසක් ගෙණ අවුදින් කියන්නේ ගමන් විඩායෙන් මිරිකුනෙමි, රජ්ජුරුවෙනි කොහැනක උන්නාදැයි කිය කියා අවුත් බෝසතාණන් දැක කියන්නේ රජ්ජුරුවෙනි ! ඔබගේ සුවදුක් කෙසේද? යැපෙන පමණ ආහාර ලැබේද ? වනමුල් ඵලා ඵල ලැබේද? මැසි මදුරු ආදීන්ගෙන් හා වන සිවුපාවුන් ගෙන් උපද්‍රව නැද්දැයි යනාදීන් පුළුවුත්හ. බෝධිසත්වයෝ කියන්නාහු, තා කී මේ හැම දෙයින් කිසි අඩුවෙක් උපද්‍රයෙක් නැත. ඒ සියල්ලම හොඳින් ලැබෙන්නේය. තා ආ කාර්‍යය කිමෙක්දැයි විචාළහ. බමුණු කියන්නේ රජ්ජුරුවෙනි! ඉතා වයෝවෘද්ධයෙමි. ගමන් විඩායෙන් මිරිකුනෙමි, තොප අතින් රන් රුවන් මුතු මැණික් ඉල්වා ආයෙමි නොවෙමි. මාගේ ගෙයි මෙහෙකරණ වාලක් නැත්තෙමි. තොපගේ බිසවුන් මෙහෙ කිරීමට ඉල්වා ආමි කීහ. බොධිසත්වයෝ කළමනා කිමෙක්දෝහෝයි සිතා බිසවු මුහුණ බැලූහ. බිසව් බොධිසත්වයන් සිතූ අභිප්‍රාය දැන කියන්නාහු, මව්පියෝ නම් ස්ත්‍රීන්ටද වෙනස්හ, තැයෝ නම් තමාගේ ස්වාමියා පින් සඳහා දෙත් මනාමය, වස්තු සඳහා දෙත් මනාමයයි (සතුටු වන්නාහ) ස්වාමීන්ට ඉන් වන දෝෂයෙක් නැත. නුඹවහන්සේ මට අධිපතිය, එබැවින් යමක්හට දැස බවට දෙනු කැමතිසේක් නම් එසේ දුන මැනව, යමක් හට (මසින් ප්‍රයෝජන නම්) මස් පිණිස දෙනු කැමතිසේක් නම් එසේ දුනමැනව, තවද නුඹවහන්සේට අභිමතයක් කළමැනවයි කීහ.

ඒසේ කී කල මහබෝසතාණෝ සතුටුව බ්‍රාහ්මණයා කැඳවා අත පැන් එව පියුමක් බඳුවූ බිසවුන්ගේ අතගෙණ ඒකාන්තයෙන්ම සම්‍යක් සම්බොධියට පැමිණ සියලු ලෝවැස්සන් නිවන්පුරයෙහි පිහිටුවාලිය හෙම්වයි පතාගෙණ බමුණාට දන් දුන්හ. මෙසේ බිසවුන් දන් දෙන්ම මහපොළොව සතුටුව ගුගුලාය, මේරුපර්වතය හා යුගන්ධරාදී සප්තකූට පර්වතයෝද සතුටුව නටමින් සාධුකාර දුන්හ. සදෙව්ලොව දෙවියෝද සතුටුව සාධුකාර දුන්හ. බමුණු කියන්නේ රජ්ජුරුවෙනි! තොප බිසවුන් මට දන් දුන් බැවින් බිසව් අප සන්තකයෝය, තොප සතු දෙයක්මුත් අනුන් සතුදෙය දන්දිය නොහැක්කේ වේදැයි කියා මා එතතෙක් බිසවුන් තොපට පාවාදිනිමි. තොපි මේ බිසවුන්ට සුදුස්සව, තොපට මූ සුදුස්සහයි බොධිසත්වයන්ට පාවාදී ශක්‍රදෙවේන්ද්‍ර බව හඟවා ශක්‍රවිලාසයෙන් සිට කියන්නේ රජ්ජුරුවෙනි! තොප දරුවන් දන්දුන් විටම දෙලක්ෂ සතළිස්දහසක් යොදුන් ඝනකඩ මහබොල් පොළොව මහහඬින් හඬා ගුගුලාය, එක්ලක්ෂ අටසැට දහසක් යොදුන් උස ඇති මහමේරු පර්වතයද සප්තකුල පර්වතයෝද සතුටුව නැටූම් ගත්හ. තලාටූ භූමාටූ දෙවියෝද සතුටුව නැටූම්ගත්හ. සදෙව්ලොව දෙවියෝද සොළොස් බඹතලෙහි මහාබ්‍රහ්මයෝද සතුටුව නැටූම් ගත්හ. සාධුකාර දුන්හ. එසේම තොපට **"ඒකාන්තයෙන් ලොව්තුරා බුද්ධත්වය සිද්ධවේව"යි** කියා තොපගේ දරුදෙදෙනා මුතුන් මිත්තන් කරා බමුණා ගෙණගියේය. අතික් සත්දවසකින් තොප කරා දරුවෝ එති. එබැවින් වරඅටක් ගණුවයි දිව්‍යාත්ම භාවයෙන් දිලියෙන්නේ ළහිරු මඬල මෙන් අහසෙහි සිට කීයේය.

සක්දෙව්රජාතන් කී වර අට ගත්තාවූ බෝසතාණෝ වරඉල්වන්නාහු එසේවීනම් ශක්‍රදෙවේන්ද්‍රයෙනි! මම මේ වනයෙන් ගොස් සවකීය ගෘහයට පැමිණිකල මාගේ පියතෙමේද මේ දූනය අනුමෝදන්ව මා කෙරෙහි සතුටුව රාජ්‍යයෙන් පවරණු ලබම්වා, කිසිවක්හටත් වධකිරීමට රුචි නොවූයේ රාජාපරාධ කළවුන්ට වධයෙන් මුදනු ලබම්වා ළදරු මහලු, මධ්‍යම යන (වයස්වූ) සියලුදෙනම මාගෙන් ජීවත්වනු ලබාවා, පරදාරකර්මයෙහි නොඇලුනේ සවකීය භාර්‍යාව හා සතුටුවූයේ ස්ත්‍රීන්ගේ වසඟයට නොපැමිණෙම්වා, තවද ශක්‍ර දෙවේන්ද්‍රය! දීර්ඝායුෂ්ක දූහැමෙන් සෙමෙන් ජීවත්වන්නාවූ පුත්‍රයෝ ලබම්වා මෙයින් චුතව ගොස් තුසීපුරයෙහි උපන්නේ විශෙෂවූ දිව්‍යාත්ම භාවය ඇති වෙම්වා, දන්දෙනකල වස්තුව ක්ෂය නුවූයේ දන්දී නො තැවෙන්නේ සිත පහදගණු ලබම්වා, ඒ තුසීපුරයෙන් සැව මිනිස් අත්බවට පැමිණියේ නැවත නූපදිනු ලබම්වා (නොහොත්) සර්වඥතාඥානයට පැමිණ කෙළවර නිවන් දකිනු ලබම්වායි වරගත්හ. මෙසේ එදවස් වරදී ශක්‍රදේවේන්ද්‍ර තෙමේ දෙව්ලොවටම ගියේය.

එකල ජූජක බමුණාද දරුදෙබිහිත්ත ගෙණ සැටයොදුන් මඟට පිළි පන්නේය, දෙවතාවෝ කුමරුවන් අරක්ගත්තාහුය, ජූජකයා හිරු හසනයට ගිය වේලෙහි දරුදෙදෙනා ගස්වල බැඳ බිම වැදහොවා තමන් වගුන් වලසුන් කෙරෙහි ගත් භයින් රුකකට නැගී කඳවෙළෙප් අතරෙහි නිදයි. එකෙණෙහි එක් දිව්‍යපුත්‍රයෙක් වෙස්සන්තර රජ්ජුරුවන්ගේ වෙශයෙන්ද එක් දෙව්දුවක් මද්‍රිදෙවින්ගේ වෙශයෙන්ද අවුත් කුමරුවන් මුදා සුවඳපැනින් නාවා පිළි හඳවා බත් අනුභව කරවා දිව යහනක හොවා බඩදීගෙණ

හෙව දරුවන් නිදිගත්වා පාන්වූකල කුමාරවරුන් පළමු බැඳලූ සැටියේම නොවා නොපෙණී තැගී ගියහ.

ඉක්බිති බමුණු පිබිද පියා පාන්වූ බව දැන ගසින් බැස පියා දරුවන් තමාගේ රටට ගෙණ යයිම් සිතන්නේ දෙවතානුභාවයෙන් කලිඟු රටට නො ගොස් ඔවුන්ගේ මුතුන් මිත්තන්ගේ රටවූ ජයතුරා නුවරට පැමිණියේය.

එදවස් වනාහි සඳමහරජානෝ සවප්නයක් දක්නෝ තමා මහාවිනිශ්චයෙහි යෙදී හුන්කල එක් පුරුෂයෙක් පියුම් දෙකක් ගෙණවුත් තමා අත තැබූයේය. රජ්ජුරුවෝ එයගෙණ දෙකණ පැලඳගත්හ. එහි රේණුගිලිගී රජ්ජුරුවන්ගේ උරයෙහි වැටුනේය, රජ්ජුරුවෝ පිබිද පියා චතුර්වේදයෙහි නිපුණ බමුණන් ගෙන්වා තමන් දුටු සවප්නය විචාළහ. බමුණෝ කියන්නාහු සවාමීනි! තොප සිත් ප්‍රියවන දරුදෙදෙනෙක් එන්නේ වනැයි කීවාහුය. රජ්ජුරුවෝ එබස් අසා සතුටුව උදැසන්හිම නොයෙක් අග්‍ර රසයෙන් යුක්තවූ භොජනය අනුභවකොට විනිශ්චායාසනයෙහි වැඩහුන්හ. දෙවතානුභාවයෙන් බමුණා දරුදෙදෙන ගෙණවුත් රාජාඞගනයෙහි සිටවූයේය. රජ්ජුරුවෝ ජාලිය කුමාරයන් හා කෘෂ්ණජිනාවන් ඇරගෙණ බමුණෙක් ආයේවනැයි යනු අසා බමුණා ගෙන්වා දරුවන් දෙදෙන දැක සතුටුව බමුණු මේ දරුවන් දෙදෙන කොයිසිට ගෙණායේදැයි විචාළහ.

ඉක්බිත්තෙන් බමුණා බොරුවක් කියා මං මූත්ගෙන් ගැලවුන මැන වැයි සිතා "අනික් රජකු නමක් කියමි" සිතා කට දල්වූ සඳ දෙවතානුභාවයෙන් වෙස්සන්තර රජ්ජුරුවෝ මට දුන්හයි කීය. ඉක්බිති මේ කවර රටක්දෝහෝයි බමුණු සිතන්නේ සඳමහරජානන්ගේ රට බව දැන මා දිවි නැත. කුමක් කෙරෙම්දෝහෝයි සිතා වෙවුලන්නට වන. සඳමහරජානෝ පුතනුවන් වෙතෙහි හිඳ දන් දුන් බව සිතා මනත්කොට හඬා කඳුළු පිස දරුවන් ආබව නගර වාසීන්ට කීහ. නුවර වාසීහු කියන්නාහු සවාමීනි! දරුවන් දන්දෙන කල ඒ උත්තමයාගේ ළය ගලෙක් වීදෝ යපතකින් වැසූදෝ බමුණු මාල්ලකුට මෙවැනි දරුවන් දන් දුන් ඒ ළය කෙසේ වාගෙණ උන්නේදෝ අපි ඔවුන් ඇළිඇතු දන්දුන්සේ නපුරයි රැහැනිව වංකගිරි පර්‍වත යට යැවුම්හ. දැන් මෙවැනි මනහර ළඳ බොළඳ සිවුමැලි දරුවන් දන්දුන්හ. මෙබඳු සිත් ඇති ඒ උත්තමයාගේ ගුණ දැන නුගුණ පහකොට ගොස් ඔහු ගෙණෙම්හයි කීහ. නුවරවාසීන්ගේ බස් අසා ජාලියකුමාරයෝ කියන්නාහු අප දන්දෙන පියානෝ බමුණා කෙරෙහි කාරුණාවෙන් දන්දුන් දැය. කෘෂ්ණජිනාවන් කී එක වචනය අසා එකෙණෙහි නඹවන් ඇසින් කඳුළු වගුරවා මහත්වූ ශොකයෙන් දන්දුන් දැය, මපියානන්වහන්සේ ඉතා නදයයි කුමට නින්දා කොළෝදැයි කීහ.

එබස් අසා නුවරවාසීහු සතුටුව සවාමිදරුවානෙනි සිව්මැලි කුමාරයන්වහන්ස! නුඹ පියානන්වහන්සේගේ අගුණ නොකීම්හ. ඒ උත්තමයා කිසිවකු විසින් නොකොට ගතහැකි නොපබඳු දරුවන් දන්දුන් නියා ඉතා බැරියයි ස්තුතිකළ බව මූත් නුගුණයකට නොකීම්හ, සවාමීනි! ඊට ක්‍ෂමා වුවමැනවයි කියා සිටියහ, එකල සඳමහරජානෝ ඇසින් කඳුළු ගෙණ කියන්නාහු මපුතුන්ගේ මනහර දරුවෙනි! මාගේ සිව්මැලි මුනුබුරෙනි!

මෙසේ අවුත් මාගේ ඇකයෙහි හිඳුවයි කීහ, ජාලියකුමාරයෝ මුත්තනුවන්ගේ බස් අසා කියන්නාහු බමුණන්ගේ ගැත්තෝත් රජදරුවන් ඔර හිඳිද්දුයි කීහ. එසඳ නගරවාසීහු මහා ශොකයට පත්වූහ. රජ්ජුරුවෝද වැලප ඉඳ කියන්නාහු ජාලියකුමාරයෙනි! තොප දනට දෙනකල තොපගේ පියාතෝ කෙතෙක් (මිල) අගයකොට දුන්නෝදැයි ඇසූහ, ජාලිය කුමාරයෝ කියන්නාහු දෙවයන්වහන්ස මා දත් දෙන්නාවූ පියාතෝ (තික්) දහසක් අගයකොට දුන්හ, නැගනියත් දන්දෙන්නාවූ පියාතෝ ඇත් අස් ආදි සියල් ලෙන් සියය සියය හා බරේ බර වස්තු අගයකොට දුන්හයි කීහ.

සඳමහරජාතෝ කුමාරයන්ගේ මිහිරි තෙපුල් අසා සතුටුව ජාලිය කුමාරයන්ට දහසක් දී කෘෂ්ණජිනාවන්ට උන්ගේ හාරයෙන් රන්රුවන් හා බොහෝ වස්තු හා සත්මහල් ප්‍රාසාදයක්ද බමුණාට දී දෙබිහිත්තන් ගලවා ගත්හ. බමුණාට දෙතලද පිරිවරද බොහෝවූහ. බමුණු ධනය තැන්පත් කොට තබා ඉස් සෝධා නහා අවුත් රජ්ජුරුවන් විසින් තමන්ට පිළියෙල කරණ පරිද්දෙන් පිළියෙල කරවා දුන් රසභෝජනය අනුභවකොට (තමහට දුන්) ප්‍රාසාදයට නැගී මහයහනෙහි හොත්තේය, රජ්ජුරුවෝ කුමරුවන් ඉස්සෝධා නහවා බත්කවා ජාලියකුමාරයන් රජ්ජුරුවන්ගේ ඇකයෙහි කෘෂ්ණජිනාවන් බිසවුන්ගේ ඇකයෙහිද හිඳුවාගෙණ සතුටු සතුටුව සිඹසනහා සඳමහරජ්ජුරුවෝ කියන්නාහු ජාලිය කුමාරයෙනි! තොපගේ මෑනියන් හා පියාතෝ සුවයෙන් වෙසෙද්ද? ලෙඩදුක් නැද්ද? මැසිමදුරුවන්ගෙන් හා සිංහ ව්‍යාඝ්‍රාදීන්ගෙන් පීඩා නැද්දැයි ඇසූහ. කුමාරයෝ කියන්නාහු මුත්තනුවන්වහන්ස! දෙදෙනම නිරෝගිව වසත්. කියනලද කිසිවකින් පීඩාවක් නැත්තේය, පියානන්වහන්සේ නුඹකෙරෙන් වියෝවූ දුකින් හා තපස් කිරීමෙන් දවස්හළ දූය මෑනියෝ ඵලාඵල පිණිස ගොස් අව්සුළඟින් පැහැර අතින් පිරිමැදීමෙන් මලානිකව ගිය පියුමක්මෙන් මලානිකවූ මුහුණු ඇතිව මහ වනයෙහි හැසිරීමෙන් බමරුන්ගේ කළුපැහැති කෙශකලාපය අතුපතර ඇලලීමෙන් තුනීව දෙකිසිල්ලෙන් වැහෙන ඔහදියෙන් කිළිටුවූ සිරුරු ඇතිව දවස්හළ දූයයි කියා නැවත මුත්තනුවන්ට චෝදනා කරන්නෝ සියලු සත්ව යන්වම තමන් තමන්ගේ දරුබිලිඳුන් ප්‍රිය වන්නාහ. නුඹවහන්සේ දරුවන්ට ප්‍රෙමකිරීම ඉතා මඳයයි කීහ. ඒ ලඳ බොළඳ බස් අසමින් රජ්ජුරුවන් හා නුවර වාසීහු මහත්වූ ශොකයට පැමිණියහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ කුමාරයන්ගේ බස් අසා සැබව කුඩෙනි! කිසිවරදක් නැති මපුතනුවන් නගරවාසීන්ගේ බස ගෙන නෙරපිමියි හඬා වැලප අමාත්‍යයන් කැඳවා කියන්නාහු වංකගිරිපර්වතයට යනු පිණිස සියුරඟ සෙනඟ පිළියෙල කරවයි කීහ, එවිට අමාත්‍යයෝ නුවර බෙර ලවන්නාහු මෙයින් සත්වැනි දවසෙහි වංකගිරි පර්වතයට යනු පිණිස යෝධයෝ සැටදහස ක් දෙන නානා වර්ණ වස්ත්‍ර හැඳ පැලඳ සන්නාහ සන්නධව ඇත් අස් රථ පදික යන සියුරඟ සෙනඟ පිරිවරාගෙණ දහස්ගණන් ඇතුන් අසුන් පිටට පැන නැගී එත්වයි අණබෙර ලැවූහ. ඉක්බිති රජ්ජුරුවෝ ජයතුරා නුවර පටන් වංකගිරි පර්වතය දක්වා අට ඉස්බක් පමණ පුළුල්වූ මාර්ගයද අලංකාර කර වයි නියොග කළහ. අමාත්‍යයෝ මඟ සරසන්නාහු කළුවැලි පියා සුදුවැල්ලෙන්

තව්රා කෙහෙල් තැඹිලි පුන්කලස ධජපතාකාදීයෙන් මග සරසා ලදපස්මල් ඉස මල් ගඳ විලවුන් ගල්වා උඩුවියන් බැඳ එහි මල්දම් එල්වා මල් ඇගෑ රුවන් ඇගෑ ආදියෙන් සරසා පිපාසිතවූවන්ට බොනු පිණිස රා මස් ආදිය තබ්බවා පඤ්චාංගික තූර්‍යඝෝෂායෙන් යුක්තකරවා මහ සැරසූහ. ජූජකයාද රාජ භොජනය පමණ ඉක්මවා අනුභව කිරීමෙන් දිරවාගත නොහැකිවූයේ එදවස් මධ්‍යම රාත්‍රියෙහි කළුරිය කෙළේය. රජ්ජුරුවෝ ඔහුගේ සිරුර මහත් පෙරහරින් ගෙණගොස් දවා බමුණාගේ නෑකෙණෙක් ඇත්නම් මේ වස්තු ගණිත්වයි නුවරබෙරලවා නෑකෙණෙකුන් නොදැක ඒ වස්තු රාජභාණ්ඩ ගාරයෙහිම තැබ්බවූහ.

ඉක්බිත්තෙන් සත්වැනි දවසෙහි සඳමහරජ්ජුරුවෝ සියලු සෙනඟ රැස්කරවා මහත් පිරිවරින් යුක්තව ජාලීයකුමාරයන් හා කෘෂ්ණජිනාවන් අතුපිට නංවාගෙණ මාර්ගනායක කොට තුමූ පසුවලා හිඳ ක්‍රමයෙන් ගොස් චෙතියරට්ට වන්හ. චෙතිය රජ්ජුරුවෝ දැක සතුටුව උපස්ථානකොට සියුරඟ සෙනඟ පිරිවරා සඳමහරජානන් හා එක්ව නික්මුණාහ. ඇතුන්ගේ කුඤ්චනාදයෙන් හා අසුන්ගේ හේසාරවයෙන් හා පඤ්චාංගික තූර්‍යඝෝෂාදියෙන් යුක්තව යන්නාහු සැටයොදුන් මහාමාර්ගය ගෙවා වෙස්සන්තර රජ්ජුරුවන් වසන්නාවූ වංකගිරි පර්වතප්‍රදෙශයට පැමිණියාහුය.

ඉක්බිති බොධිසත්වයෝ භෙරිතූර්‍යඝෝෂාවන් හා සංඛනාද හා ඇතුන්ගේ කුඤ්චනාද හා අසුන්ගේ හේසාරව හා රථයන්හි චක්‍රනාද හා මෙසේ මහත්වූ ඝෝෂා අසා මද්‍රීදෙවීට කියන්නාහු දෙවීනි! මපියාතන්වහන්සේ මහලු විසින් යම්කිසි සතුරු රජෙක් මපියාතන් මරා අප මෙහි වාසයකරණ බව දැන අප කරා එන්නේදෝහෝයි පරීක්ෂා කරවයි කීහ. මද්‍රීදෙවි වංකගිරි පර්වතයට නැගී බලා මහත්වූ සෙනාව දැක තමන්ගේ සෙනාව වියයුතුයයි සිතා ස්වාමීනි! නුඹවහන්සේට කවර නම් සතුරු කෙණෙක් ඇද්ද? නුඹ පියවර මැඩපියන සමකෙණෙක් ඇද්ද? ස්වාමීනි! එදවස් ශක්‍රදෙවෙන්ද්‍රයාකියන්නේ අපගේ දරුවන් මුතුන්මිත්තන් කරා ගොස්වන්හයි අනික් සත්දවසකින් නුඹවහන්සේ කරා එතියි කීයේය. නුඹපියානන්වහන්සේ එන ගමනෙක් වනැයි කියා දෙදෙනම තමන් තමන්ගේ පන්සල් දොරකඩට පැමිණ සිටියාහ.

ඉක්බිති සඳමහරජ්ජුරුවෝ තන්හි තන්හි ආරක්ෂා පිණිස ඇතුන් අසුන් ඇතුළු බලකාය හිඳුවා වංකගිරි පර්වතයට ආසන්නව ගොස් තමන් ඇඹෙනියන් ඵුසති දෙවීන් කැඳවා කියන්නාහු දෙවීනි! අප සියලු දෙනම එකවිට ගියකල්හි දරුවන් හා අප හා එකවිට දක්නා ශොක බොහෝය, පළමු මා ගොස් උන් දැක ශොක සන්සිඳිවූකල තොපි එවයි කියා රථයකට නැගී නික්ම ගොස් රථය මග රඳවා තුමූගොස් පන්සලට වැද කෙශරසිංහ යකුසේ වැඩහුන් බෝසතානන් දුටුහ. බොධිසත්වයෝ පියානන් දැක හුනස්නෙන් නැගී පෙරගමන්කොට බැසහෙව වැඳ වැඩිහිඳිනා අසුන්පණවා වැඩ හිඳවූහ. රජ්ජුරුවෝ බෝසතානන් සුවදුක් විචාරා හුන්කලට මද්‍රීදෙවි මයිලනුවන් දැක බැස හෙව වැඳ සුවදුක් විචාරා ස්වාමීනි! මා දරුවන් ගෙණගිය

බමුණු කොයිදී දුටුවූදැයි ඇසුවාය, සඳමහරජ්ජුරුවෝ කියන්නාහු යෙහෙළනි යෙනි! මාගේ රටදී දැක බමුණාට මිලදී ගලවා ගතිමියි කියත්ම බිසවුන්ට මහත්වූ සොම්නස් උපන.

ඉක්බිති බොධිසත්වයන්ගේ මෑනියෝ මහ පෙරහරින් යුක්තව බොධි සත්වයන් වසන පන්සලට වත්හ. බෝසතාණන් හා මද්‍රිදෙවී මෑනියන් වැඳ අසුන් පණවා වඩා හිඳුවා සුවදුක් විචාරා හුන්කලට ජාලිය කුමාරයන් හා කෘෂ්ණජිනාවන් ඇතුපිටනංවා පෙරටු කොටලා චෙතියරජ්ජුරුවන් ඇතුළුවූ රජදරවෝ යොධයන් හා හෙරිතූර්‍ය්‍ය සංඛනාදයෙන්ද යුක්තව මහසෙනග පිරිවරා එනකල මද්‍රීදෙවි කුමාරයන් දැක හඬා ගී පෙරමගට ගියහ. මෑනියන්දෑ දැක දරු දෙබිහිත්ත ඇතුපිටින් බැස මෑනියන් දෙපත්ලේ හිස තබා ගෙණ හඬන්නට වන්හ. බිසවුන් දෙතනයෙන් කිරිධාරා විහිද දෙබිහින්නන් හිස්තෙමී ගියේය බොධිසත්වයෝද දෙබිහිත්තන් දැක මහත්වූ ශොකමෙන් හඬා හුනහ. බොධිසත්වයන්ගේ මවුපිය දෙදෙනද මහත්වූ ශොකයෙන් සිසන්නතැතිව හඬා හුනහ. චෙතිය රජ්ජුරුවෝ ඇතුළුවූ රජදරුවෝ හඬා හුනහ. ඒ දැක බොධිසත්වයන් හා සහජාතවූ සැටදහසක් යොධයන් හා මහ සෙනග එකහෙලා මහපවතින් වැගිරගිය සල්වනයක්මෙන් මහහඬින් හඬා හුනහ. එකෙණෙහි මහාමෙරු පර්‍වතය ආදී පර්‍වතයෝ ගුගුළහ. මහමුහුද කල්පාන්ත මාරුතයෙන් ක්‍ෂොභවූ කලක් මෙන් කැලඹුනේය, කාමාවචර දිව්‍ය ලොකයන්හි එක කොලාහල විය.

එසඳ ශක්‍රදෙවේන්ද්‍රයෝ රජදරුවෝ සයදෙන පිරිස් සහිතව සිසන්න නැතිව හොන්නාහු දැක එකකුදු නැගිට කිසිවකුගේ සිරුරෙහි දියබින්දුවකුදු ඉසින්නට අසමර්ථ බව දැන පොකුරු වැස්සක් වස්වමියි සිතා ඒ ක්‍ෂත්‍රිය සමාගමයෙහි පොකුරු වැස්සක් වැස්වූහ. ඒ වැස්සෙන් තෙමෙනු කැමැත්තෝ තෙමෙති, නොතෙමෙනු කැමැත්තන්ගේ සිරුරෙහි දිය බින්දුවකුදු නොවැටෙයි. ඒ පොකුරු වැස්සෙන් තෙමී සියලු ජනයෝ සිසන්න ලදින් විස්මයපත් බවට පැමිණ වෙස්සන්තර රජ්ජුරුවන් ලඟට ගොස් කියන්නාහු ස්වාමීනි! නුඹවහන්සේගේ ගුණ නොදැන නුවරින් නගාපූම්හ. ඊට ක්‍ෂමාකොට අපගේ නුවරට අවුත් වොටුනු පැලඳ අප රක්‍ෂා කළ මැනවැයි යාච්ඤාකළහ. බොධිසත්වයෝ ඒ අසා රට වැසියෙනි! මට වොටුනු පලඳවන්නට තෙපි අදහස්නොකරවයි කියා නොගිවිස්සාහ. නුවරවාසීහු යාච්ඤාකොට නොගිවිස්නා බැව් දැන රජ්ජුරුවන්ට කියන්නාහු ස්වාමීනි! අපි කීවද නොගිවිස්නාදැය, නුඹවහන්සේ යාච්ඤාකළ මැනවැයි කීහ. ඉක්බිති සඳමහ රජ්ජුරුවෝ බොධිසත්වයන්ට කියන්නාහු පෙර මා කියමන්ගෙණ මෙවනායට ආවාද දැනුත් මා කියමන්ගෙණ වොටුනු පැලඳ රාජ්‍යයකරව, ගුරුන් කීවා කරණබව සත්පුරුෂයන්ට අයිති ධර්‍මයෙක. පුත්‍රයන් විසින් ජීවිත පරිත්‍යාගකොට නමුත් මවුපියන්ගේ ශොක දුරුකටයුතු වන්නේය, එබැවින් පුත්‍රය! තාපස වෙශය හැර රජවෙස් ගණුවයි කීහ.

බොධිසත්වයෝ දෙමවුපියන්ගේ බස් මැඩපීම සුදුසු නොවන්නේවේදැයි සිතා පියානන්ගේ ආරාධනාව පිළිගෙණ පන්සලට වැද වල්කලා අඳුන්දිවිසම් ආදී ඍෂි භාණ්ඩ බහා තබා පන්සලින් නික්ම ''මා හත්මසක් මගණදම්කොට

පාරමී ධර්‍මයන් කුළුගන්වන්නහු විසින් පොළොව කම්පාකරවනලද තැනය”යි සලකා පන්සලවට තුන්වරක් ප්‍රදක්ෂිණාකොට පසඟ පිහිටුවා වැඳ අවුත් සහජාත සැටදහසක් යොධයන් විසින් පිළියෙල කරණලද සුවඳ දියෙන් නහා සළු හැඳ සුසැට ආභරණයෙන් සැරහී වෙවුනු පැලඳ දෙවේන්‍ද්‍ර ලීලායෙන් සිටියාහ. සියලු ජනයා මහත්වූ සන්තෝෂයට පැමිණ මද්‍රිදෙවින්ද ඉස්සොධා නානවා දිව්‍යාඞ්ගනාවකමෙන් සරහා වෙවුනු පැලඳවූහ. එසඳ මහබෝසතාණන් බැලූ බැලූ තැන කම්පාවිය. සියලු තූර්‍ය්‍යයෝ මහත් ඝොෂා පැවැත්වූවාහුය, මහාසාගරය මේඝගර්ජනාවක් සෙයින් මහත් ශබ්ද පැවැත්විය. අමාත්‍යයෝ පණ්ඩර නම් ඇළි ඇතු සාදා ගෙණාහ. බොධිසත්වයෝ ඇතු දැක රැහැනිව සිතන්නාහු මපියාණන් වහන්සේ මා දන් දුන් ඇතු ගෙන්වා ගත්දෑ වනැයි සිතා ලජ්ජාවූහ. ඒ බව දත් නගරවාසීහු ස්වාමීනි! කලිඟුරට රජ්ජුරුවෝ තමන් රට වැසි වැස බත් බුලත් සුලභවූ හෙයින් තුමූම ඇතු එවාපූහ. ඇතුපිට නැඟී වදාළ මැනවැයි කීහ. බොධිසත්වයෝ ඇතුපිට නැඟී මහත් පෙරහරින් වංකගිරි පර්‍වතයෙන් නික්ම ඒ සමීපයෙහිවූ සඳමහ රජ්ජුරුවන්ගේ කඳවුරට පැමිණියහ. සඳමහරජාණෝද මසක් පමණ පිරිවර හා වනයෙහි කෙළ ඇවිද කඳවුරට පැමිණ වෙස්සන්තර රජ්ජුරුවන් හා සෙනා වාහන ගෙණ ජයතුරා නුවරට යන අලංකාරකොට පිළියෙළ කරණලද සැට යොදුන් මගට පිළිපන්නාහුය. මෙසේ මගට පිළිපන් රජ්ජුරුවෝ දෙමසකින් ඒ මග ගෙවා සර්‍වාලංකාර යෙන් සැරසූ ජයතුරා නුවරට පැමිණියහ. සියලු නුවර වාසීහු රුස්ව සතුටුව කෙළිමින් නටමින් පිළි හිස සිසාරමින් නොයෙක් කුහුලින් ආකුලව ඒ වෙසතුරු රජ්ජුරුවන් රජගෙට වඩාගෙණ ගියහ.

ඉක්බිති මේ නුවරමෙතැන් පටන් වෙස්සන්තර රජ්ජුරුවන්ගේ ආඥව යයි අණබෙර ලැවූවාහුය. ඒ වෙසතුරා මහරජාණෝ යටත් පිරිසෙයින් බළලුන් දක්වා සියලු සත්වයන් බන්ධනයෙන් මිදවූහ. ඒ රජ්ජුරුවෝ නුවරට පැමිණි දිනයෙහිම අලුයම් කාලයෙහි සිතන්නාහු පහන්වූ කල මා ආ බැව් අසා යාචකයෝ පැමිණෙති, ඔවුන්ට කුමක් දන් දෙන්නෙම් දැයි සිතූහ. එකෙණෙහි සක්දෙව් රජාණන්ගේ පඬුපුල් සලස්න තමන් නොකැමැතිසේ උණුසුම් වූයේය. හෙතෙමේ ආවර්ජනාකොට බලන්නේ ඒ කරුණු දැන රාජ නිවෙසනය හාත්පස කටිප්‍රදෙශය පමණ උසට ඝන වර්ෂාවක් මෙන් සත්රුවන් වර්ෂාවක් වැස්සවූයේය, සියලු ජයතුරා නුවරද දනක් පමණට සත්රුවන් වැසි වැස්වූයේය. දෙවැනි දවසෙහි බොධිසත්වයෝ නගරයෙහි ඒ ඒ ගෘහ සමීපයෙහි වට ධනය ඔවුන්ටම දෙවා අවශෙෂ ධනය භාණ්ඩගාරයෙහි රැස්කරවා දන් වැට තබවා සදන්හල් කරවා සියලු යාචකයන්ට දන්දෙමින් සියලු ජනයා කුසල්හි පිහිටුවමින් දශරාජධර්‍මය අකොප්‍ය කිරීමෙන් රාජ්‍යකොට ජීවිතයාගේ කෙළවර සහ පිරිවරින් ගොස් තුසීපුර උපන්හ. තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ගාථා දහසකින් ප්‍රතිමණ්ඩිතවූ මේ වෙස්සන්තර ජාතකය දක්වා වදාරා පූර්‍වාපර සන්ධි ගළපා ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ජූජක බමුණා නම් දැන් දෙවදත්ත ස්ථවිරයෝය, අමිත්ත තාප බැමිණි නම් චිංචමාණවිකාවෝය, චෙත්‍ර පුත්‍ර වැද්දා නම් ඡන්න අමාත්‍යයාය, අච්චුත තාපසයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, ශක්‍රයෝ නම්

අනුරුඬ මහා ස්ථවිරයෝය, සුදම්හ රජ්ජුරුවෝ නම් ශුද්ධෝදන රජ්ජුරුවෝය, ඵුසතිදෙවී නම් මහාමායා දේවීය, මද්‍රීදෙවි නම් යශෝධරා දේවීය, ජාලිය කුමාරයෝ නම් රාහුල ස්ථවිරයෝය, කෘෂ්ණාජිනාවෝ නම් උත්පලවණ්‍ණී මහා ස්ථවිරීය, සෙසු පිරිස් නම් බුදුපිරිසය, එකල වලට ගොස් සත්මසක් තපස් කොට නැවත රාජ්‍යයට අවුත් දශරාජ ධර්මයෙන් රාජ්‍යය කොට තුසිත දිව්‍ය ලොකයෙහි උපන්නාවූ වෙස්සන්තර රජ්ජුරුවෝ නම් ත්‍රිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වෙම්දැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

පන්සියපනස් ජාතක පොත

නි මි.

536
උම්මදන්ති ජාතකය

තවද බ්‍රහ්ම සුරාසුර තරලිපාලි නිසෙවිත ශ්‍රීචරණා රවින්දවනෙප ශොභිත සකල සත්වෙත පතල මහා කරුණා සීතල හෘදයාඛ්‍යාහ ත්‍රෛතල විශ්‍රැත විශදකීර්ති නිකරොපශොභිත සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන් වහන්සේ එක් සමයෙක්හි නෛකසුධිජන සන්නිවාස සකලශ්‍රීන් භ්‍රාජිතවූ අයුත් නොවන පැවැත්ම ඇති සැවැත්නුවර සමීපයෙහිවූ සවුරුකඳ බැවූ යුරු ගුණලදරින් නිවූ බැවිනුදුල ගුණැති සව්ගණ පිරිවරා පවුරු පදනමින් යුත් සව් සිරිදර දෙව්රම් වෙහෙර වැඩ වාසය කර වදාරණසේක් නමින් රටට ප්‍රකට නැති උකටලීවූ එක්තරා භික්ෂුවක් අරබයා මේ මින් උදන් වන උන්මදන්ති ජාතකය ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

ඒ උකටලී භික්ෂූන් වහන්සේ එක්දවසක් නොයෙක් ඉසුරු පැවැත්ම ඇති සැවැත්නුවර නොමඳුගුණෙන් පිඩුපිණිස හැසිරෙණසේක් කනක කටක නූපුරාදී සර්වාලංකාර විභූෂිත උත්තම ස්ත්‍රියක් ඇඳුරන්ව සිටි ඉඳුරන් බිඳ බලා ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇතිව දූෂිතවූ ඒ සිත නවත්වා ගත නොහී වහා විහාරයටම අවුත් එතැන් පටන් සල්ලවිද්ධයකුමෙන් රාගමරාගාතුරව හෙවත් රාග නමැති සල්ලයෙන් විදුනාලද හෙයින් රොගාතුරව දියපත්තන් නොවන බියපත්වන් මුවෙකුසේ කෘශව ඒ පෙළීමෙන් ඉපිලීගිය නහර ඇතිව වැඩුවන් අඩුවූ හෙයින් පඬුවත්වූ ශරීර ඇතිව ඒ ක්ෂණයෙන් ශාසනයෙහි ඇලුම් නැතිව එකම ඊර්යාපථයෙක්හි චිත්තාසවාද නොලබනසේක් අනාර්ය සිත් පත් බැවින් ආචාර්යවත් ආදිය හැර උපදෙස් ප්‍රශ්න කර්මස්ථානුයොගයෙන්ද විර[illegible]තව විසූසේක.

ඉක්බිති චිත්තාසවාද ලද විශ්වාස භික්ෂූහු විසින් ඇවැත්නි තෙපි පෙර පහන්වූ සොඳුරු ඉඳුරන් ඇත්තෙහි විශෙෂයෙන් ප්‍රසන්නවූ මුඛවර්ණ ඇත්තෙහිය. දැන් වනාහි එසේ නොවෙයි කවර කාරණයක් නිසා මෙසේවීදැයි විචාරණ ලදුව හෙතෙම එපවත් අපවත් නොකොටම ඇවැත්නී මම ශාසනයෙහි පැවැත්මට ඇලුම් නැත්තෙමියි කීසේක. ඉක්බිත්තෙන් ක්ලෙශ නිර්වාපණයෙහි දක්ෂවූ ඒ භික්ෂූහු සිත් නිවීමෙහි අදක්ෂ භික්ෂූහට ඇවැත්නි අසෙස්ගුණදර පසැස්හුගේ සස්නෙහි සතොස්ව අභිරමණය කරව සර්වාර්ථ සිද්ධිකර විශුද්ධවූ බුද්ධොත්පාදය නම් කප් අසංඛ්‍ය ගණනකින්නුදු ලැබගත නොහැකි වශයෙන් දුලීභය.

එසේම විශෙෂයෙන් සද්ධර්ම ශ්‍රවණයද මනුෂ්‍යාත්ම ප්‍රතිලාභයද ඉතා දුර්ලභය හේ තෙපි වනාහි දැන් දුර්ලභවූ මනුෂ්‍යාත්ම භාවය ලැබ අතුල්‍ය කෛවල්‍ය සංසාර දුඃඛයාගේ විනාස කිරීම ප්‍රාර්ථනා කරණු ලබන්නේ දෙඩුම් සහිත ඇඬුම් හා කඳුලු මුහුණු ඇතිව දුකින් පෙළෙන බන්ධුසමූහයා හැර සැදැහැයෙන් පැවිදිව කවර කාරණයක් නිසා ක්ලෙශ වසඟත්වයට පැමිණීයෙහිද ඒ රාගාදි ක්ලෙශයෝ නම් ගැඩවිලන් ආදීවූ ක්ෂුද්‍ර ප්‍රාණීන් පටන් සියලු

අශ්‍රැත ජනයන්ට සාධාරණයහ. ඔවුන්ට වස්තු වන්නේය. හේ රූප ශබ්දාදී පඤ්චවිධ කාම කොට්ඨාසයෝ පිනිබිඳක්හේ මඳවූ ආශ්වාද ඇත්තාහ. එයින් වන කටුක විපාකය මහමුහුදසේ බොහෝවූ කායික දුක්ඛය හා මානසික කොපායාසදෘයකහ. මෙහි ආදීනව කාමයෙහි ආදිනව ඉතා බෙහෙව යනාදී නොයෙක් පරිද්දෙන් කාමයෙහි ආදීනව ප්‍රකාශකොට දක්වා ඇවැත්නි තෙපි මෙබඳු නෛර්‍යාණික බුද්ධශාසනයෙහි පැවදිව කෙසේනම් මෙසේ අනර්‍ථදායකවූ ක්ලේශයන්ගේ වසඟයට පැමිණි සෙහිදැයි අවවාදකොට තමන්ගේ කථාව ගන්වාලන්ට තම අවවාදයෙහි පිහිටු වාලන්ට අසමර්ථ වූවාහු සර්වඥතාඥානාදි ප්‍රවිජ්ඣිත විබුධ ජනශිඛර කෙශර ප්‍රතිභාගවූ ශාස්තෘන්වහන්සේගේ සමීප යෙහි ධර්මසභාවට ඒ භික්ෂු කැඳවාගෙණ ගොස් නොලස්වම සතොස්ව බුදුන් වැඳ එකත් පස්ව උන්නාහුය

එකල සර්වඥයන්වහන්සේ කිමෙක්ද මහණෙනි නොකැමැතී පරිද්දෙන් භික්ෂුවක් කැඳවාගෙණ අවුදැයි විචාරා වදාළ කල්හි එසේය ස්වාමීනි මේ භික්ෂුව මෙවකට උකටලීව වසන්නේයයි සැලකළාහුය.

එකල්හි ත්‍රෛතල විශ්‍රැත විශද කීර්ති නිකරොපශොභිත සර්වඥ රාජොත්තමයානන් වහන්සේ සැබෑද මහණැයි විචාරා සැබව ස්වාමීනියි දැන්වූ කල්හි මහණ පෙර නුවණැත්තෝ රාජ්‍යානුශාසනා කරන්නාහු පවා ක්ලේශොත්පත්ත කල්හි ඒ උපන් කෙලෙසුන්ගේ වසඟත්වයට නොපැමිණෙන සඳෙස්වූ කෙලෙස් සිත් නවත්වා අයුත්තක් නොකොළෝ වේදැයි වදාරා තදනතුරුව ඒ කථාශ්‍රවණාභිලාෂිවූ ශීල සමාධි ප්‍රඥා විමුක්ති ඥාන දර්ශනාදී විවිධ ගුණ නිධි නිකෙතවූ අනීතිකර අතීතිකයෙහි විමති නැතිව නිති බැති සිතැති යතිජන යන්ගේ ආරාධනාව ගෙණ නිධානයක් පිධානය හැර දක්වන ප්‍රධානයක්හු මෙන් භව නමැති පිධානයෙන් වැසී තිබුනු ප්‍රණීතවූ අතීත කථාව නැමති නිධානය අතීතශ්‍රැත නමැති ප්‍රධානත්වය ඇත්තෙන් ගෙණහැර දක්වා වදාළසේක.

හේ කෙසේද? යත්

යම්වගිය දවස සිවිරට ශ්‍රෙෂ්ඨශ්‍රීන් තුෂ්ටවූ අරිෂ්ට නම් නුවර විශිෂ්ට ගුණධර අරිෂ්ච නම් රජතුමෙක් රාජ්‍යශ්‍රී අනුභව කරන්නේය. එසමයෙහි අප්පසාධිත සාධිත ගුණාධික බොධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් කුස පිළිසිඳ දසමාසාවසානයෙහි මව්කුසින් බිහිව ක්‍රමයෙන් වඩනා ඔහට සිවිකුමාරයෝයයි නම් තිබුවාහුය. නානා සිරිධර සේනාපති හුගේ භාර්‍යාවද පුත්‍රයෙක් වැදුවාය. ඔහට අභිපාරක කුමාරයෝයයි නම් කළාහුය. ඒ අරුමවූ එකම රුවක්වන් දෙකුමරුවන් වැලි කෙළියෙහි පටන් ඇලී සිතින් විශ්වාසව වඩනාහුය. සොළොස් හැවිරිදිව නෙක් සතරින් දිලි තක්ෂලා නුවරට ගොස් සමස්ත ශිල්පොද්ග්‍රහණය කොට නිමවා ස්වකීය නුවරටම ආවාහුය. එකල්හි පියමහරජානෝ එසේ සකල කලා නිමවා දූන සිය නුවර පත් කුමරුහට ප්‍රසන්නව රාජ්‍යය පාවා දුන්සේක. රාජාභිෂෙකලත් හෙතෙම අභිනාපතම් නයෙන් හිතෙෂිවූ අභිපාරකයන් සේනාපති ස්ථාන යෙහි තබවා අදහම් පහමින් දැහැමින් රජ කරණසේක. එසමයෙහි එම නුවර අසූකෙළක් පමණ ධනසම්පත් ඇති සිරිට තැන් වන කිරීට වච්ඡනම්

සිටානන්ට දියනි කෙණෙක් උපන්නේය. ඕතොමෝ අමන්‍ද සුන්‍දරොත්තම රූපධර ශෞභාග්‍ය ප්‍රාප්ත ශුභ ලක්‍ෂණාන්විතය, ඒ අමා රූසිරධර කුමරිකාවට නම් තබන දවස් උම්මාදන්තියයි නම් තිබුවාහුය.

ඕ තොමෝ සොළොස් වස්කලු ඉක්මවනලද මිනිස් වර්‍ණයෙන් දෙව ගණක් මෙන් සකලජන මනොනන්‍ද වන සුන්‍දර රූපයෙන් යුක්තවිය. කල්‍යාණාභිසංඛ්‍යාත විප්‍රකාර පෘථග්ජනයන් අතුරෙන් යම් යම් අන්‍ධ පෘථග්ජන කෙණෙක් ඈ දක්නාහුද ඔහු සවභාවයෙන් සිටගත නොහී රහමෙරෙන් උදම්වූවාහු මෙන් ක්ලේශ මදයෙන් මත්වන්නාහුය, එයින් ඈ දුක උමතු නොව සිහිඑලවා ගන්ට සමර්ථ කෙණෙක් නොවූයේය ඉක්බිත්තෙන් ඒ කුමාරිකාවගේ පියවූ කිරීටවච්ඡ නම් සිටානෝ රජ්ජුරුවන් කරා එළඹ දෙවයන් වහන්ස මාගේ ගෙයි ස්ත්‍රීරත්නයක් උපදනා ලද්දේය, නරෙන්ද්‍රයානන් වහන්සේටම සුදුසු ලක්‍ෂණ ශාස්ත්‍රයෙහි දක්‍ෂ ලක්‍ෂණපාඨකයන්ලවා ඒ කුමාරිකාව පරීක්‍ෂා කරවා නිසිවූ රිසි ලෙසක් කර වදාළ මැනවැයි කීහ. රජතෙම තුටුපහටුව යහපතැයි කියා ලක්‍ෂණ පාඨකයන් යවූහ. ඔවුන් සිටානන්ගේ මාලිගාවටගොස් කාරණලද සත්කාර සම්මාන ඇතිව අනායාසයෙන් පිළියෙල කළ පායාසය අනුභව කළාහුය, එකෙණෙහි උම්මාදන්ති නම් කුමාරිතොම සර්වාලංකාරයෙන් සැරහී ඔවුන්ගේ සමීපයට ගියාය.

ඒ බ්‍රාහ්මණයෝ ඒ කුමාරිකාව දුක සිහි එලවාගත නොහී ඒ කුමාරිකාවගේ ලක්‍ෂණ නමැති සුරාව නමන් ලොවන නමැති මුඛයෙන් තෘෂ්ණා නැමති පිපාසය නොසන්සිඳෙන තෙක් පානය කොට ක්ලෙශ නමැති මදයෙන් මත්ව තමන් බත් අනුභවකොට නොනිම් බව නොදන්නාහු සමහර කෙණෙක් බත් පිඩුගෙණ අනුභව කෙරෙම්යි යන සංඥාවෙන් හිසෙහි තිබුවාහුය, සමහරෙක් කිසිලි අතුරෙහිලුවාහුය, සමහරෙක් බත්පිඩු භිත්තියෙහි ගැසූවාහුය මෙසේ ඒ සියල්ලෝම අමුතුව උමතුභාවයටපැමිණියාහුය ඒ විප්‍රකාරය දුක කුමාරිකාව එවිට ඇවිරිව පවිටුවූ මොහු වනාහි මාගේ මේ ලක්‍ෂණ විමසන්නාහුදැයි කියා නොසතුටුව සිටියනට තරවටු කොට මොවුන් බොටුව අල්ලා දෙරටුවෙන් පිටතට දමවයි කියා ගෙන් නික්මවූහ. එවිට නිරීක්‍ෂණයමත් දක්‍ෂනොව අක්‍ෂමවූයෙන් අවලක්‍ෂණවූ ලක්‍ෂණ පාඨකයෝ කැලකිරීම් බවට පැමිණ රජගෙට ගොස් උම්මාදන්තිය කෙරෙහි නොසතුටුවාහු දෙවයන් වහන්ස ඒ ස්ත්‍රී බාලජන ලොලවන කාලකණ්ණියක නුඹවහන්සේට නුසුදුසුය ඈගෙන් කම් නැතැයි කීවාහුය, මහරජ්ජුරුවෝ ඔවුන්ගේ වචනය අදහා කාලකණ්ණියක්මැයි සිතා ඈ රජගෙට නොගෙන්වූසේක. ඕතොමෝ එපවත් අසා මම වනාහි කාලකණ්ණියෙකැයි සිතා රජ්ජුරුවන් විසින් නොගෙන්වන ලද්දේය. කාලකණ්ණීහු නම් මෙබඳු සවරූපයෝද මාවැන්නෝදැයි කියා යෙහෙක වියයුත්තක් වේවයි ඉදින් ඒ රජ්ජුරුවන් දක්නෙම් වීම් නම් තියසක් දනිම්යි සිතා ඔවුන් කෙරෙහි ආඝාත බැන්දය. ඉක්බිත්තෙන් ඈගේ පියානෝ අභිපාරකනම් සෙනාපතිහට ඒ කුමාරිකාව සරණපාවාදුන්හ. ඕතොමෝ ඒ සේනාපතිහට ප්‍රිය මනාප වූවාය, කවර කුසලයක්හුගේ විපාකයෙන් මෙසේ දුටුදුටුවන් තුටුපහටුව මනවඩන්නාවූ රූපයෙන් යුක්තවූවාදැයි යනහොත් රක්ත වස්ත්‍ර දානයක්හුගේ විපාකයෙන් වූයේය,

හේ කෙසේද? යත්

ඕතොමෝ යටගිය දවස බරණැස් නුවර එක්කරා දිළිඳු කුලයක ඉපිද වසන්නී පොරණසිට යුත් ලෙසට අත්නොහැර සිත්ලෙසට පැවැත්මෙන් එන උත්සව දවසෙක්හි කෘතපුණ්‍යයෙන් යුක්ත ස්ත්‍රීහු වණුක් මලින් රැඳු සිනිඳු වස්ත්‍රයන් හැඳ පැලඳ ලද බොළඳ බස් කියමින් තොස්ව කෙළෙනාහු දැක තොමෝත් එබඳු වස්ත්‍රයක්හැඳ කෙළනා කැමතිව එපවත් මවුපියන්ට කියා, ඔවුන් විසින් මැනියෙනි අපි දිළිඳුහෝය එබඳු රතුදිමුතු අමුතු වස්ත්‍රයක් අපට කොයින්දැයි කී කල්හි එසේ වීනම් මවුපියෙනි මා එක් ධනවත් කුලයෙක්හි අතලස්ව බැලමෙහෙ කිරීමට අනුදනුව ඔවුන් මාගේ ගුණ දැන සිත්ලෙසට අලුත් රත්වස්ත්‍ර දෙන්නාහුයයි කියා ඒ දෙමව්පියන් විසින් අනුදන්නා ලදුව එක් ධනාඪ්‍යකුලයක් කරා එළඹ වණුක්මලින් රැඳු වස්ත්‍රයක් හේතුකොට ගෙණ තොප වෙත බැලමෙහෙ කරම්හයි කීවාය.

එකල්හි ඔවුන් තී මෙහි තෙවසක් මෙහෙකම් කළකල්හි තීගේ ගුණ දැන එබඳු වස්ත්‍ර දෙම්හයි කීවාහුය. ඕතොමෝ යහපතැයි ගිවිස වෙහෙසව මෙහෙකිරීමට පටන්ගත එසේ මෙහෙ කරණ ඇගේ නොවලස් විසෙස් ගුණය දැන සතොස්ව තෙවස් නොපිරුණ කලම වණුක් මලින් රැඳු මටසිළුටු සතරත් සිනිඳු වස්ත්‍රයක් සමග මනත්වැඩි වෙනත් වස්ත්‍රයකුදු දී තීගේ විශ්වාසස්ත්‍රීන් හා සමග සතොස්ව ගොස් නොලස්ව ජලස්නානය කොට හැඳගණුවයි කියා ඈ යැවූවාහුය, ඕතොමෝ සහායිකාවන් හා සමග බුත්මන්නැතිව පුන් මතින් පැන් තොටටගොස් ගංතෙර තැන්පත්කොට සිත්ලෙසට අත්පත් රත්වස්ත්‍රය තබා ජලස්නානය කළාය. එකණෙහි සමස්ත ජන තොෂ්‍යවත විශෙෂ ගුණ ධර කාශ්‍යප සම්බුදුයන් වහන්සේගේ එක් ශ්‍රාවකයන් වහන්සේ නමක් පැහැර ගත් සිවුරු ඇතිව කොල අතු ඇඳ පෙරව ඒ ප්‍රදෙශයට පැමිණිසේක ඕතොමෝ උන්වහන්සේ දැක මේ පින්වතුන් වහන්සේ නොහැරම පැහැර ගත් නාලද සිවුරු ඇතිසේක, මම වනාහි පූර්වයෙහි වස්ත්‍රයක් නුදුන් බැවින් දැන් මට මේ දනාමැද හොබනා ලෙස අඳිනා පමණටද වස්ත්‍රයක් දුර්ලභ විය.

එහෙයින් දැන් මා විසින් අසම්පූර්ණ තුන් හවුරුද්දක් මෙහෙකොට යෙහෙන් ලබනලද මේ වස්ත්‍රය දෙකඩකොට පලා එක් කැබැල්ලක් ආර්‍ය්‍යයන් වහන්සේට පුදමි සිතා බියෙන්මෙන් පියෙන්ම දියෙන්වනා ගොඩනැගී තමන් පෙර ඇඳි වස්ත්‍රය ඇඳ හුදෙක් තුටුසිතින් මදක්කල් වැඩසිටිය මැනව ස්වාමීනියි කියා තෙරුන් වහන්සේ වැඳ වස්ත්‍රය මැදින් පලා දෙකඩකොට එක් කැබෙල්ලක් පූජාකළාය. ඒ ආර්‍ය්‍ය ගුණයෙහි වීර්‍ය්‍ය ඇති නසූර්‍ය්‍යවූ ආර්‍ය්‍යයන් වහන්සේද පිළිසන්වූ එක්තැනෙක සිට හැඳ පෙරව සිටි කොළඅතු ඉවතලා වස්ත්‍රයෙන් එක්කොණක්හැඳ එක්කොනක් පෙරව සමීපයට වැඩිසේක. ඉක්බිති ඒ වස්ත්‍රයාගේ ප්‍රභාවෙන් සකල ශරීරය අරුණතර තරුණාර්ක මණ්ඩලය මෙන් එකොද්භාසවිය ඕතොමෝ ඒ ප්‍රභාවත් ස්වභාවය දැක මේ ආර්‍ය්‍යයන් වහන්සේ පළමු නොහොබනේද, දැන්වනාහි තරුණ සූර්‍ය්‍යයාමෙන් ඉතා ප්‍රභා මත්සේක. මේ ද මුන්වහන්සේටම පුදුම්යි සිතා ඉතිරිවූ කැබැල්ලද උන්වහන් සේටම පුදා ස්වාමීනි මේ වස්ත්‍රදානමය කුසලය හෙතුකොට ගෙණ මම යම් තාක් සසර වසම්ද ඒතාක්කල් උත්තම රූපධර වෙම්වයි මා දුටු කිසි පුරුෂ

යෙක් සවසිය භාවයෙන් සිටින්ට නොහැකීවේවයි මට වඩනා අභිරූපවූ ලක්‍ෂණ සම්පන්න අනික් ස්ත්‍රියක් නොවේවයි කියා ප්‍රාර්ථනා කළාය.

ඒ සර්වඥයන්වහන්සේද අනුමෝදනාකොට වැඩිසේක, ඕතොමෝ එයින් චුතව එතැන් පටන් සව් සිරිනුදුල දෙව්ලොව සැරිසරා ඇවිදිනි එසම යෙහි අරිෂ්ටපුරයෙහි ඉපිද විශිෂ්ටවූ රූපශ්‍රීයකින් අභිප්‍රාප්තවූවායයි දතයුත්තේය. ඉක්බිත්තෙන් එමනුවර කාත්තිකා නම් නක්‍ෂත්‍ර ක්‍රීඩාවට කාලඝොෂා කළාහුය. එහෙයින් නුවර වාසීහු හිල්මස පෞර්ණමී දිනයෙහි ශ්‍රැතාව ලොකිනාමිත ජන නයන මනොන්මත්තවත සර්වාලංකාරයෙන් විභූෂිත කොට නුවර සැරහුවාහුය එකල අභිනාගුණ ප්‍රතිතාරබ්ධ අභිපාරක සෙනාපතිතෙම තමන්ගේ ආරක්‍ෂස්ථානයට යන්නාහු ඒ කුමාරිකාවට ආමන්ත්‍රණයකොට සොඳුර උන්මාදන්තිය නම්වූ හිල්මස රෑ කෙළෙනා උත්සවයෙහි නුවර ප්‍රදක්‍ෂිණා කරණ මහරාජොත්තමයානන්වහන්සේ පළමුකොට අපගේ මේ ගෘහද්වාරයට වඩිනාසේක එවිට ඒ ජනේන්ද්‍රවූ පෘථිවීන්ද්‍රයානට තොපගේ ශරීරය නොදක්වව ඒ නරේන්ද්‍රයානෝ තමුඳු තොප දැක සිහිය පිහිටුවා ගන්ට නොහැකි වන්නේයයි කියා ගියේය, ඕතොමෝ ගේ මම දන්නෙම් වේදැයි සිතා සෙනාපතීන් ගිය කල්හි ලේසියක් සිතා දැසියක් ඇතවා එළඹ කෙල්ල මහරජ්ජුරුවන්වහන්සේ මේ ගෘහද්වාරයට වැඩි කල්හි මට කියවයි නියොග කළාය.

ඉක්බිති පුණ්ඩරීක ඛණ්ඩමණ්ඩිත මාර්තණ්ඩ මණ්ඩලය අවර පත්කල්හි හෙවත් හිරු හස්තාංගත කල්හි අමන්‍ද කුන්‍ද නන්‍දන සම්පූර්ණ චන්ද්‍රමණ්ඩලය උද්ගත විය, එකල්හි සව්සිරින් දිලි දෙව්පුරයක්මෙන් නෙව්පරමිතා නෙකාලංකාරයෙන් අලංකෘතවූ නුවර සර්වදිශාභාගයෙහි ප්‍රදීපාලොකයෙන් එකොද්භාස වනකල්හි සර්වාලංකාරයෙන් ප්‍රතිමණ්ඩිතව මහරාජොත්තමතෙම ආජන්‍ය රථාවරූඪව අමිත තුතින් විතතව ඇමති මඩුළු පිරිවරණ ලදුව තරුගණ පිරිවැරූ පිවිතුරු මිතුරු මඟ ගමන්ගත් පිරුණු නරිඳුසේ එනුවර පැදකුණු කරණසේක් පළමුකොට එහිම විහිත අභිපාරක සෙනෙවිරදුන් ගෘහද්වාරය කරා එළඹුනුසේක. ඒ මාලීගාව වනාහි ගෛරික වර්ණධර ප්‍රාකාරයෙන් පරික්‍ෂිප්තය විවිධශ්‍රීන් භ්‍රාජිත සෞභාග්‍යප්‍රාප්ත දර්ශනීය ප්‍රසාදික වාරටටාලාදීන් සමලංකෘතය, එකණෙහි යට කියනලද නියොගලත් කෙල්ල කොල්ලව ගොස් අපවත් නොකොට එපවත් උන්මාදන්තියට කීවාය.

එවිට උන්මාදන්ති නම් කුමාරිකාතොම මිහිපල්ලහුගේ විපුල්සරි බැල්මෙහි තුල්තර ලොල්ව මල්කරඬුවක් ගෙන්වා ගෙණ කින්නරාඞ්ගනාවකගේ විලාසයෙන් ගොස් සීමැදුරු කවුළුව නිසා ඒ සමීපයෙහි සිටියාවූ ඕතොමෝ මහරජහට අභිමුඛව මල්දැමූවාය. මහරජ්ජුරුවෝද ඒ මල් දැමූවාවූ උන්මාදන්තිය දැක ක්ලෙශ මදයෙන් මත්ව සිහි එළවාගත නොහෙනසේක් මේ ප්‍රාසාදය අභිපාරකයන්ගේයයි යන පමණකුත් දැනගත නුහුනුසේක.

ඉක්බිති අමන්‍ද ගුණධර සුනන්‍ද නම් රථාචාර්‍යයාහට ආමන්ත්‍රණයකොට විචාරණසේක් එඹල සුනන්‍දනම් රථාචාර්‍යය රක්තෛෂ්ටිකාමය ප්‍රාකාරයෙන් ගුප්ත සිත්කලුවූ මේ ප්‍රාසාදය කවරක්හුගේද දුර අහස්හි දීලියෙන වන්තිසිඛා

වක්මෙන් දිලියෙන පර්‍ණාතාග්‍රයෙහි ජලමානානලජ්වාලාවක්සේද සීමැදුර කවුළුව සමීපයෙහි සිට බබලමින් කවරක්තොමෝ දෘශ්‍යමාන වන්නීද තවද සුතනදය බහා පලඳනාලද මිණි කුන්ඩලාදීන් මණ්ඩිතව සිටිනාලද මේ කුමාරිකා තොම කවරක්හුගේ දියනි කෙණෙක් වූවාද කවරක්හුගේ යෙහෙලියක්ද කවරක්හුගේ භාර්‍ය්‍යාවක්ද මැ කිසිකෙණෙකුන් විසින් අපරිගෘහිතද හෙවත් අස්වාමිකද නොහොත් මැට සවාමියෙක්හු ඇද්දැයි මෙසේ විචාරණලද මේ කාරණයෙන් වහා මට මෙහිදීම කියවයි කීයේය.

ඉක්බිතිව එසේ විචාළ රජහට විශෙෂයෙන් කියන්නාවූ ඒ රථාචාර්‍ය්‍ය තෙම සවාමීනි අමනද ජනේද්‍රවූ නරෙන්ද්‍රොත්තමයාණන් වහන්ස ඒ කුමාරිකා වගේ මව්පිය දෙපක්‍ෂයෙහි පටන් හේ මම දනිමි ඇගේ සවාමිපුරුෂයාද දනිමි, අමිත ගුණපාලවූ භූපාලොත්තමයන්වහන්ස නුඹවහන්සේ පිළිබඳවූ අර්‍ත්‍ථයෙහි දිවාරාත්‍රි දෙක්හි අප්‍රමාදව යම් ප්‍රසිඩවූ පුරුෂයෙක් වසන්නේද තවද ජනෙන්ද්‍රොත්තමයාණන් වහන්ස සවර්‍ණ රජතාදීන් සමෘඩවූ ක්‍ෂෞම කෞශෙය්‍යාදි වස්ත්‍රාලංකාරයෙන් සුවුල්ලිතවූ සර්‍ව සමෘඩීන් ඉතා ආඪ්‍යවූ අභිපාරකනම්වූ යම් එක්තරා අමාත්‍යයෙක් ඇද්ද මෝතොමෝ ඒ අභිපාරක නම්වූ අමාත්‍යයාගේ භාර්‍ය්‍යාවය නමින් උන්මාදනාතිනම් වන්නීය. මහ රජ්ජුරු වෙතැයි කීහ. ඒ අසා ඇට සොත්‍රාත්‍ර කරන්නාවූ මහරජ තෙමේ මේ අනතුරු දක්වන ක්‍රමයෙන් මෙසේ කීයේක.

කෙසේද ඉකාල කොළු එම්බල එම්බල මැගේ මවුපිය දෙදෙනා විසින් මැට මේ නම් කරණලද නියාව ඉතා යහපත හේ එසේමය යම් ලෙසකින්මා විසින් ඇ දක්නාලදද එපරිද්දෙන්ම මා දිසාව බලන්නාවූ ඒ උන්මාදනති මා උමතුකළායයි කීයේය. එවිට රජමන්උදන්කළ උම්මාදනතිය රජහුගේ කම්පිත භාවය දැන සීමැදුරුකවුළුව වසා තමන්ගේ ගබඩාවටම ගියාය. ඈකෙරෙහි සුරජවූ මහරජහට ඒ උන්මාදන්තිය දුටුතැන් පටන් නුවර පැදකුණුකිරීමෙහි සිතෙක් නොවීය එහෙයින් රජතෙම රථාචාර්‍ය්‍යානට ආමන්ත්‍රනය කොට යහලූ සුනන්දය ගමන පථයෙන් රථය නවත්වව මේ සැණකෙළිය අපට නුසුදුසුය. සුවිහිත කුසල් ඇති අභිපාරක සේනාපතීන්ටම සුදුසුය, රාජ්‍යයද ඔහටම සුදුසුයයි රථය නවත්වා ප්‍රාසාදාභිරූඪවශ්‍රීයහත් ගබඩාවට වැඩ ශ්‍රීයහත් මත්තෙහි සැතපී වාගත නොහැකි වෙගවත්වූ රාග නැමති මදයෙන් උමතු විලාප කියනසේක් නොමඳ කොඳවන නද කරණ සොඳ සිතිඳු මුදු සුදු සඳ රැසිතිදුල මැදිමහපොහෝදිනයෙහිවූ රාත්‍රියෙහිවනාහි වැද්දහු ලුද්දව විද්දසැරය වැද්ද නොදී බියෙන් දිවගොස් වනතුරටවැද දුරසිටකරනමා වැදිදිසාව බලන සරඟ අඟනකාට බඳුවූ ඇස් ඇති සිත්කලූ රත්පියුම් පත්වන් වනත් ලාවන් සොඳුරු විසිතුරු රුචිනුතුරු සිරුරු ඇති රත් සතපත්වන් පැහැ ඇති සුරත් කරතලින් මල්දමා මාදෙස බලමින් නොමඳුරු සීමැදුරු කවුළුව වෙත යම් කුමාරිකාවක් හුන්නෙහිද ඒ පරවි පාවන් රත්වන් සිත්කලුවූ සළුවක් හැඳ දිලියෙමින් හුන් ඇ දැක නැවත නැවතත් ඇගේ මුව මඩල බලන්නාවූ මම පෙරලෙසට පෙරදිගින් එක් සඳමඩලක්හුගේ නැගීමද අභිපාරක සෙනාපති හුගේ මන්දිරයෙහි එක් සඳමඩලක්හුගේ උදාවීමදැයි එසඳ දෙසඳක්හුගේ නැගීමවූ හෙයින් ඒ සැණදිනෙහි පුන්සඳවඹුලු දෙකක් උදාවීයයි සිතමි තවද ලොභ කට යුතුවූ ඕතොමෝ සොඳුරු මීයුරු ලීලාසහිත දිගුපුලුල් නයනගත රෝම

යෙන් අලංකාරවූ මෙබඳු නෙත් දල්වා ලොල්ව යම් ක්‍ෂණයක්හි මා බැලුවාද එකෙණෙහි සිරිමත්වූ හිමවත් පව්වෙහි සුසැදි සුපිපි වෙනෙහි විවිධාලංකාර යෙන් අලංකෘතව නානාසරැති වීණාව ගෙණ ඒ වීණානාදයෙන් තමන්ගේ ස්වර සංසන්‍දනය කෙරෙමින් ගායනාවෙන් ඉඳුරා කිඳුරාගේ සිත් ගන්නා කින්නරාඞ්ගනාවන් පරදවන කින්නරාංගනාවක් යම්සේද එමෙන් මාගේ සිතද ඒ සුන්‍දරවූ මන්දිරයෙහි විජෘම්භමානවූ උම්මාදනන්තිය ගත්තීය.

තවද එදවස්හි විපුල සවර්‍ණ වර්‍ණවූ තොමෝම බහා පලඳනාලද මණි කුණ්ඩලාදීන් ඇතිකොට එක්පට කොට හඳනාලද සිත්කලු රත්පිලි ඇතිව හෙවත් කොමල සුනීල ස්‌නිග්ධ කෙසපාසයෙන් හා නීලමේඝකූටාඞී දෘශ්‍යමාන සුන්දරේන්‍ද්‍රමණ්ඩලාකාර ලලාටාලංකෘත සුන්දර නිම්බපත්‍රාකාරෝහය භෘලතා යුපෙත ඉන්‍ද්‍රනීලේන්දීවර දල සදෘස විමල නයන යුගලාලංකෘත සුපුල්ලිත තිලකුසුම පෘථුලොත්තුංග නාසාපුටයෙන් හා බිම්බඵල ප්‍රතිභාග රක්තාභිරඤ්ජිත දන්තාවරණ ඇති සුන්දර කුන්දකුසුම කුඩ්මල සංකාස විෂර දසන පන්තීන් මණ්ඩිත චාරුතර චාරුවාරක කණ්ඨසන්නිභ රේඛත්‍රයාලංකෘත සුවෘත්ත සුසණ්ඨිත කණ්ඨයෙන් හා මෘදු රුචිරාසොක පල්ලවාතුල්‍ය තනුතර බාහුලතා ශ්‍රීධර සවර්‍ණ හංස යුගලාකාර චාරු පීණ පයොධර අස්මිත ජනලග්න කරමිත විලග්න ප්‍රදෙශාලංකෘත නිම්න තරංගිතචාර චිත්දෙත් ගත භ්‍රමරාවලී සාදෘශ්‍ය රොමවලී ශ්‍රීධර රණතාරණ වරවාරණ සරසන්නිභ චාරු කරොරුවත්ද දීප්තාංග ප්‍රත්‍යංග ඇති උත්තම ස්ත්‍රියක් තොමෝ එකෙණෙහි මාදෙස බලන්නී බියෙන් වනයට පැමිණ නැවත ආපසු වැද්දෑදෙස බලන භ්‍රාන්ත මෘගධෙනුවක්සේ මා බැලුවාද තවද තඹවන් නිය පෙලක් ඇති මනාවූ තුනුරුහ ඇති මොළොක්වූ බාහුයුග්මයක් ඇති උතුම්වූ සඳුන් සුවඳ ආදීන් ලිප්ත ශරීර ඇති ඒ ස්ත්‍රී තොමොම චතුර තර වඩුවකු විසින් මනාකොට කරණ ලද ජාල කවුළුවක් වැනි සුරත් වටැඟිලි පෙලක් ඇති එවැනි හස්තතලයෙන් දක්‍ෂ මාගම් ක්‍රියාවෙන් හිසපටන් වෙර අත්ගසා මා කවර කලෙක මා සතුටු කරන්නීද තවද තිරිව වච්ඡනම් සිටුහුගේ දියතිවූ වර්‍ණවත් සවර්‍ණමය උරසැදිනි සැඳුම්ලද හෙවත් රන්දැලින්වූ වක්‍ෂස්ථල පලඳනායෙන් අලංකෘතවූ සතුටින් මිරිත් ගතහැකි සිඟුවලඟ පෙදෙස් ඇති මත්මත් උන්මත් කළ ඒ උන්මාදන්ති තොමෝ වෙනෙහි ජාත මකරු මහරුසක් වැළඳ නැගි මාලුවා ලියක්මෙන් මොළොක්වූ බාහු යුග්ම ලතාවෙන් කවර දිනෙක වැළඳගෙණ මා තුටුපහ කරන්නීද තවද ලාක්‍ෂාරසයෙන් රත්වූ ඡවි ඇත්තාවූ නොනොත් ලාරසයෙන් නැවරූවක් බඳුවූ විමල් අතුල් පතුල් නියහා තොල්ය යන මෙහි රත්වූ ඡවි ඇති දියබුබුලු වැනි වටව පිරුණු පියයුරු ඇති සියුම්වත් ඇති පියුම් පෙත්තක් බඳුවූ ඡවි ඇති ඒ අමා රුසිරු ඇති කුමාරිකා තොමෝ යම්සේ සුරාවට ලොල්වූ රා සොඬෙක් එබඳු සොඩනැනැත්තක්හට පිරුණු රාවිතයක් එලවාද එමෙන් ඇගේ මූවෙක මුව තබා පුරා මුවම් බිමට ඒ තොමෝ කවරදා මුව එලවන්නීද තවද අනංගා සංග සර්‍වාංග මනොරම්‍යාරම්‍යව සිටිශාවූ ඒ උන්මාදන්තිය යම් කලෙක දිටීම්ද එතැන් පටන් මාගේ චිත්තයට ප්‍රධාන භාවයෙන් නූපන් හෙයින් සවකීය චිත්තයාගේ වසඟත්වයක් නැත්තේය.

මෝතොම අසවලියයි නොදන්නෙමි උමතු භාවයට පැමිණියෙමි නවද ඒ ආමුත්ත මණිකුණ්ඩලාභරණාලංකෘත උම්මාදන්තිය දැක එතැන් පටන් දහසකින් පැරදගිය එකක්හුමෙන් දිවාරාත්‍රි දෙක්හිම නිදි නොලබන්නෙමි ඉදින් මෙසේවූ හේමට ශක්‍රතෙමේ වරයක් දෙන්නේ වීනම් ඒ වරය මට ලැබේ නම් යෙහෙක. එක් රැයක් හෝ දෙරැයක් හෝ සිවි රජතෙමේ උම්මාදන්තිය හා ක්‍රීඩාකොට නොහොත් එක්ව අභිපාරකයන්සේ වේවයි යන මේ වරය දුන හොත් යෙහෙකැයි යනාදීන් විලාප කීසේක. එපවත් විවිධගුණ සාහික අභිපාරක සෙනෙවිරදුන්ට කියන්නාහු පවර එතුවරහු ස්වාමීනි නගර ප්‍රදක්ෂිණා කරන්නාවූ මහරාජෝත්තමයානන් වහන්සේ නුඹවහන්සේගේ මාළිගාවට ගොස් නොලස්වම නැවත වාසලට වැඩ ප්‍රාසාදාභිරූඪවූසේකැයි කීවාහුය.

එවිට මිහිපල්නට අභිතාපනයෙන් විහිතාරක්‍ෂා ඇති අභිපාරක සෙනෙවිරදු තමන්ගේ ගෙට ගොස් උම්මාදන්තිය කැඳවා කිමෙක්ද සොඳුර රජ්ජුරුවන් වහන්සේට තමන් දක්වූයෙහිද හෙවත් රජහට තෙපි පෙණුනු දැයි විචාළේය. ස්වාමීනි මහත්වූ උදරයක් ඇති දළවූ දළ ඇති රථයෙහි සිට ආවාවූ එක් පුරුෂයෙක් ඇත, මම ඔහු රජ්ජුරුවන් බවක් හෝ රජකයෙක් බවක් හෝ නොදන්නෙමි එක් ප්‍රධානයෙකැයි කීකල්හි ගවාක්‍ෂචාරයෙහි සිට මල් දැම්මෙමි, හෙතෙම එපමණකින්ම නැවතී ගියේයයි කීවාය. හේතෙම එපවත් අසා තී විසින් මම නසනලද්දේම වීයයි කියා දෙවෙනි දවස් උදෑසනම රජගෙට ගොස් විශෙෂ විලාස ශ්‍රීධර ශ්‍රීයහන් ගබඩාවෙහි දොරකඩ සිට උම්මාදන්තිය නිසා කියනලද රජ්ජුරුවන්ගේ විප්‍රවිලාප වචන අසා මේ වනාහි උම්මාදන්තිය කෙරෙහි පිළිබඳ සිත් උපන්නේය. ඈ නොලබන්නේ වීනම් මරණප්‍රාප්ත වන්නේයයි සිතා මුන්වහන්සේවද මටද අකරුණෙහි මෙ කරුණ ගැණ උරණ යන්ගෙන් පැමිණෙන දරුණු අගුණයෙනුදු මුදා මේ රජහුගේ ජීවිතය මා විසින් දෙන්ට වටනේයයි සිතිකොට තමන්ගේ නෙට ගොස් නෙක්දෙනා අතුරෙන් වික්මන් සහ ඉක්මන් නැති එක් මන්ත්‍රියෙක් නෙවත් තරවූ ඇදහිලි රහස් අන්හට නොකියන උපස්ථායකු කැඳවා කියන්නේ අරුමතර දරුව අසවල් ස්ථානයෙහි සිදුරුවූ චෛත්‍යවෘක්‍ෂයෙක් ඇත. නොප කිසිකෙණෙකුට නොදන් වවා ඉර බැසීගිය කල්හි එතැන්හි ගොස් අදෘශ්‍යව ගස් සිදුර ඇතුළෙහි රහස්ව ඉඳුවව මම ඒ ඒ තන්හි බලිකම්‍මාන්ත කරන්නෙම් ඒ ස්ථානයට පැමිණ දෙවියන් වැඳීමෙන් යාච්ඤා කෙරෙමි අයදින්නේද දිව්‍යරාජයාණන් වහන්ස අපමහ රජානෝ නුවර සැණකෙළි පවත්නා කල්හි එයට වැඩමවා සැණකෙළි නොකෙළම ශ්‍රීයහන් ගබඩාවට වැඩ විලාප කියමින් හිඳිනා ලද්දේය. අපි එහි කාරණා නොදනුම්හ, හෙවත් කුමකින් කුමක්වූ දෙයෙක්ද යන බවක් නොදන්නෙමුව, අප නරෙන්ද්‍රයානෝ ප්‍රෙමතායෙන් දෙවතාවන්ටද බොහෝ උපකාරීය ඉහාත්මයෙහි වන සව්සිරි සිතා ගෞරවතායෙන් අවුරුදුපතා දහසක් විසඳ නොමැළිව ඇලිසිතින් බලි පූජා කරණසේක,

එහෙයින් දිව්‍යරාජයන්වහන්ස මෙතම් දෙයක් නිසා නරනායකයානෝ විලාප කියන්නෝයයි යන නියමයක් වදාළ මැනව අපනරොත්තමයාහට ජීවිත දානය දුනමැනවයි කියා යාච්ඤාකෙරෙමි තෝ එකෙණෙහිම ශබ්දය පෙරළා සෙනාපතිය නොපගේ රජ්ජුරුවන්ට ව්‍යාධියෙක් නම් නැත, තාගේ භාර්‍ය්‍යාවූ

උම්මාදන්තිය කෙරෙහි පිළිබඳවූ සිතෙක් ඇත, එහෙයින් උමතුවිය. ඉදින් ඈ ලද්දේ නම් ජීවත් වන්නේය. නොලද්දේ නම් මිය යන්නේය, ඉදින් තෙපි ඒ රජහුගේ දිවි කැමැත්තෙහි නම් උම්මාදන්තිය ඔහට දෙවයි යන මේ වචනය තෝ කියවයි කියා මෙසේ උගන්වා ඔහු ඇරියේය. එසේ ඔහු ගොස් ඒ ගස් සිදුරෙහි හිඳ දෙවෙනි දවස්හි නැණවිශෙණ විදිත සෙනෙවිරදුන් විසින් ඒ ස්ථානයට ගොස් කී ලෙසින්ම ආයාචනා කරණ ලදුව හෙතෙම එසේම කීයේය.

එවිට සෙනෙවිරදු යහපතැයි කියා දෙවියන් වැඳ අමාත්‍යයන්ට දන්වා නගර ප්‍රවිෂ්ටව රාජමන්දිරාරූඪව ශ්‍රීයහන් ගබඩාවෙහි දොර අත ගැසුයේය. එවිට රජ්ජුරුවෝ සිහිඑලවා මේතෙම කවරෙක්දැයි විචාළසේක. මම දෙවයන් වහන්ස අභිපාරකයෙමියි කීහ. ඉක්බිත්තෙන් නරෙන්ද්‍රතෙම දොර හැරියේක. හේතෙම මාලිගාව ඇතුළට වැද රජ්ජුරුවන් වැඳ මෙසේ දක්වූයේය. ස්වාමිනි භූතපාල භූපාලොත්තමයානන්වහන්ස නුඹවහන්සේගේ විලාප කාරණය දැන ගන්නා පිණිස ඒ ඒ තැනට පැමිණ බලි පූජාකොට වෘක්ෂාධිපතිවූ දෙවියන් හෙවත් වෘක්ෂ දෙවතාවන්ට නමස්කාර කරන්නාවූ මට දෙවතාවෙක් තෙමේ මා කරා පැමිණ මේ කරුණ මෙසේ කීය, කෙසේද තොපගේ රජහුගේ සිත උම්මාදන්තිය කෙරෙහි රාගවසයෙන් බලවත්ව පිහිටියේය. ඈ ලදහොත් දිවි රැකෙයි නැතොත් නොරැකෙයි කීය.

එහෙයින් මම නුඹවහන්සේට ඒ උම්මාදන්තිය පරිචාරී කොට දෙමි හේ සුව අනුභව කර වදාළ මැනවයි කීහ. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ යහලු අභිපාරකය උම්මාදන්තිය කෙරෙහි පිළිබඳ සිතින් විලාප කියනලද බව දෙවියෝත් දන්නාහුදැයි විචාළසේක. එසේය දෙවයන් වහන්සැයි කීය. එවිට පුරාණ නරවරා විසිනුදුරා නොහැර පුරා මෙතෙහි තිරා දරින් දරා සුරැකි එරාජදහම් වරා දරින්දරා විසූ නරාධිපති තෙම ගම්ගම් සම් ලොකයා විසින් වනාහි මාගේ ලාමක භාවය දන්නා ලද්දේ දැයි ලජ්ජීධර්මයෙහි පිහිටා අනතුරු මෙසේ කියන සේක් යහලු පරහිත ගුණ සහිත අභිපාරක සේනාපතිය උම්මාදන්තිය හා සමග ක්ලෙශවශභයෙන් පරිචාරය කරන්නාවූ අභිරමනය කරන්නාවූ මම මාගේ කුශල කොට්ඨාසය නසන්නේය, ඈ හා සමග කෙලෙස් සිතින් හැසුරුණු පම ණකින්ම අජරාමරද නොවන්නෙමි, මහජනයෝද මාගේ ලාමකභාවය දන්නා හුය, එහෙයින් රජ්ජුරුවන් විසින් අයුත්තක් කරණලද්දේයයි නින්දා කරන්නාහුය තෙපිද භාර්‍යාව මටදී පසුව ප්‍රිය භාර්‍යාව නොදැක නාගේ සිතටද විශෙෂයෙන් විඝාත වන්නේය, දෞර්මනස් වන්නේය. එහෙයින් මට ඇගෙන් කම් නැතැයි කීයේය,

මෙතැන් පටන් දෙදෙනාගේ ඒ ගැණ වචන ප්‍රතිවචන ගාථාවී වන්නේය කෙසේද අමත්ද ගුණධර නරෙන්ද්‍රයානන් වහන්ස මම උදකලාවම ඒ උමමාදන්තිය කිසිකෙණෙකුන්ට නොදන්වා පිළිසන්ව ගෙණඑමි එහෙයින් නුඹවහන්සේද මාද හැර අන් සියල්ලෝම මේ කම්යාගේ කිරීමක් තබා කළ ආකාරමාත්‍රයකුදු නොමදන්නාහුය එහෙයින් ඈ නනිව රහසින් ගෙණැවිත් දෙමි එසේ යම් කරුණකින් නුඹවහන්සේට මා විසින් උමමාදන්තිය දෙනලද් දේද ඒ කරුණෙන් අකුසලයකුදු නොවෙයි එහෙයින් ඈ හා සමග අභිරමණය

කරන්නාහු තමන්වහන්සේගේ තෘෂ්ණාව පූරාගත මැනව මනොරථය සම්පූර්ණ කොට ගතමැනව එසේ මනදෙල පුරාගෙණ ඉඳින් එයින් කැමති සේක් විතම් නැවත මට පාවා දුනමැනවැයි කීයේය.

එවිට රජ්ජුරුවෝ යහලු අභිපාරකය යම් මනුෂ්‍යයෙක් අකුසල කර්මයක් කොට හෙතෙම පසුව මේ අකුසල කර්මය අන්කිසිවෙක් නොදනිත්වයි තොම දන්නාහුයයි සිතන්නේය. ඒ අකුසල් කරන්නාවූ තැනැත්තා එකෙණෙහිම ලෙව්හි විද්‍යමාන සර්ඥවරයෝද ප්‍රත්‍යෙක බුඩයෝද බුඩශ්‍රාවකයෝද විශුඩින්ද්‍රිය ධර සෘඩිවත්හුදැයි යන මුන්වහන්සේලා දන්නාහුමය, එසේහෙයින් අකුසල් කරන්නාහට රහසෙක් නම් නැත්තේය තවද අභිපාරකයෙනි මේ සර්පෘථිවි මණ්ඩලයෙහි ඒ උම්මාදන්තියට වඩනා තට ප්‍රියවූ අනිකෙක් නම් ලෙව්හි කවරෙක්ද අන් කවර මනුෂ්‍යයෙක් ඇ තට ප්‍රියබව තොම අදහාද අදහන් නේමය, එසේ ප්‍රියවූ භාර්‍ය්‍යාව මට දී ප්‍රියවූ උම්මාදන්තිය නොදක තාගේ සිතට විශෙෂයෙන් වෙහෙස වන්නේය, ඇගෙන් මට කම් නැතැයි කීසේක. එවිටද උත්තර කීමට මනාවිරක්තනොවූ සෙනෙවිරත්තෙම සුන්දර ගුණ ගණින්ද්‍රවූ ජනෙන්ද්‍රොත්තමයානන් වහන්ස ඒකාවත්ව ඒකාන්තයෙන් ඒ උම්මාදන්තිය මට ප්‍රියවන්නීය ඇ මට අප්‍රිය නොවෙයි එසේවීනමුදු භූරිපාල භූපාලොත්තමයානන් වහන්ස ඉඳින් නුඹවහන්සේ ඇ මෙහි නොගෙන්වන සේක්වීනම් යම්සේ සුසණ්ඨානාඞ්ගබලොපෙත අකුණ්ඨ කණ්ඨීරවෙන්ද්‍රතෙම ක්ලෙශපරිලාහොත්පන්න කල්හි සිංහධෙනුවකගේ වාසස්ථානවූ මැණික්ලෙන කරා යම්සේ එළඹේද එමෙන් ස්වාමීනි නුඹවහන්සේද ඒ උම්මාදන්තිය කරා ඇ වසන්නාවූ ස්ථානයට වැඩ වදාළ මැනව එසේ වැඩම්මවා එහිදී නුඹවහන් සේගේ ප්‍රාර්ථනාව සම්පූර්ණකර වදාළ මැනවයි කීයේය.

එවිට භූරිමෙධාධිපති ජනාධිපතිතෙම යහලු අභිපාරකයෙනී අවඥා නොකමැතිවූ ප්‍රඥාවන්තයෝ ආත්මදුඃඛයෙන් පෙළෙන ලද්දේවීනමුදු සුව විපාක දායකවූ කුශලකර්මය නොමහරින්නාහුය එසේ ප්‍රඥාවන්තයෝ තබා මොහයෙන් මුළාවූවාහුද සුවයෙන් හෝ මත්වූවාහුද අකුශලකර්මය මනාව නොකරන්නාහුයයි කීසේක. එවිටද පිහිතනොව සුහිතධර අභිපාරක සෙනෙ විරත්තෙම නිඛිල ජනාධිපතිවූ සිවිරාජොත්තමයන් වහන්ස නුඹවහන්සේ මාගේ විචිත්‍රශ්‍රීධර පිතෘන්වහන්සේද සුචිත්‍රගුණධර මාතෘන්වහන්සේද මාගේ රක්‍ෂාස්ථාන තමුදු ස්වාමීන්වහන්සේලා තමුදු ජ්‍යෙෂ්ඨයන්වහන්සේ තමුදු පොෂකයන් වහන්සේලා තමුදු දේවයන්වහන්සේලා තමුදු වන්නාහ. ඒ කාරණයෙන් ස්වාමීනි පුත්‍රදාරාවන් සහිතවූ මම නුඹවහන්සේගේ දාසයෙමි එහෙයින් කපටතෘපතිප්‍රකට මකුට භූතවූ සිවිමහාරාජොත්තමයානන් වහන්ස! තමන්වහන්සේගේ දාසිය පරිහරණය කරන්නාහට නින්දාවෙක් නම් නැත, සුවසේ අභිප්‍රායවූ පරිද්දෙන් නුඹවහන්සේගේ මනදෙල පූරා ගත මැනවයි කීය. එවිටද විවිධවිසුඩානෙක ගුණගණින්ද්‍රවූ නරෙන්ද්‍රයානෝ යහලු අභිපාරක යාණනි යමෙක් මම ඊශ්වරයෙමි සිතා අකුසල් කෙරේද එසේ කොටද දිව්‍ය මනුෂ්‍යයෝ මට කුමක් කීයද්දැයි උත්‍රස්ථ නොවේද අනුන් කෙරෙහි භය නො වේද හේතෙම මම ප්‍රධානයෙමි සිතා භය නොගෙණ කුසලය කරණ කොටගෙණ මරණ නැතිව දීර්ඝායුෂ්කව බොහෝ කලක් ජීවත්වන්නේත් නො, වෙයි මරණ ප්‍රාප්ත වන්නේය එපමණකුදු නොව දෙවියෝද මේ පාපිෂ්ටවූ

රජහුගෙන් කවර අර්ථයෙක්ද මොහුගේ කර වැලිකළ බැඳ මැරීම උතුම් වන්නේයයි ලාමක ඇසින් බලන්නාහුය හෙවත් මොහු ජීවත්ව හිඳීමට වඩා මොහුගේ මැරීම උතුමැයි සිතන්නාහුයයි කීසේක.

එවිටද ප්‍රඥාපූත්‍ය ගුණොපෙත අභිපාරක සේනාපති තෙම විචිත්‍රාතිපවිත්‍ර රාජ චර්මාලංකෘත ජනේශ්වරයන් වහන්ස අනුන් සන්තක දෙයක් ඒ වස්තු ස්වාමිවූ ඔවුන් විසින් ඉදින් දෙන ලද්දේද ඒ දානය යම් ප්‍රතිග්‍රාහක කෙණෙක් තමන්ගේ ප්‍රතිග්‍රාහක ධර්මයෙහි සිට පිළිගණිද්ද හේ එහි ප්‍රතිග්‍රාහක දායක යන දෙපක්ෂයෙහි සියල්ලෝම්තුෂ්ටජනක ඉෂ්ටඵල දායකවූ කුශල කර්ම යක් කරන්නාහු නම් වෙති. එබඳු දානය ප්‍රතිග්‍රාහකයන් විසින් එසේ පිළිගත් කල්හි ඒ දානයට දායක මහත් විපාකය දෙන්නේයයි කීයේය.

එකල ධීරතර වීරගුණවික්‍රමෛක මන්දිරායමාන සුන්දරනරේන්ද්‍රයානෝ යහලු අභිපාරකයෙනි මේ ගම්භීර සම්භෝර්ව් මණ්ඩලයෙහි හෙවත් මේ මුලුපොළවෙහි තට ඒ උම්මාදන්තියට වඩා ප්‍රියවූ අනිකෙක් නම් ලෙව්හි කවරෙක්ද අනික් කවර මනුෂ්‍යයෙක් ඈ තට ප්‍රිය බව නොම අදහාද අදහන්නේමය. එබඳු ප්‍රියවූ භාර්‍ය්‍යාව මට දී ප්‍රියවූ ඒ උම්මාදන්තිය නොදක තාගේ සිතට අතිසයින් වෙහෙස වන්නේය. එහෙයින් ඇගෙන් මට කම් නැතැයි කීසේක. එවිටත් යටත්ව හැවතත් චිත්පටුත්වයෙන් එහි තත්‍වය දත් අභිපාරක සේනාපතිතෙම ස්වාමීනි ධීරතර සාරගුණ භාරධාරිත ජනාධිපතීන් වහන්ස මොනොමෝ මට ඒකාන්තයෙන්ම ප්‍රියතරය පෘථිවි පාලෝත්තමයානන්වහන්ස ඈ මට අප්‍රිය නොවෙයි ප්‍රියවන්නීමය එසේදවුවත් ඒ උම්මාදන්තිය තුඹවහන්සේට දෙමි මා විසින් දෙනලද ඒ උම්මාදන්තිය හා සමග අභිරමනය කරන්නාවූ තමන්වහන්සේගේ මනදෙල පුරාගත මැනව, එසේ මනෝරථය පුරාගත් අනතුරු ඉදින් කැමැත්තෙහි තම් මටම පාවා දුන මැනවයි කීය. එකල්හිද තෙකල් අරුත් විකල් නොව විමල්ව දුනීමෙන් අතුල්‍යවූ නරේන්ද්‍රතෙම යහලු අභිපාරකයෙනි තමන් පිළිබඳ දුකින් පෙළෙන ලද යමෙක් ඒ දුක් මෙරමාගේ ශරීරයෙහි පිහිටුවන්නේ වේද හෙවත් තමන්ගේ ශරීරයෙන් පහකොට අනුන්ගේ ශරීරයෙහි බහන්නේවේද මෙර මාගේ සුවය ගෙණ තමාකෙරෙහි පිහිටුවන්නේ වේද තමාගේ දුක නැතිකර මියි කියා එසේම අනුන්ගේ සැපය උදුරාගෙණ අනුන් දුක්ඛිත කෙරේද තමා සුවපත් වෙමියි සිතා මෙරමාගේ සැප හුදෙක් නසාද එසේවූ ඒ පුද්ගලතෙම ධර්මය නොදන්නේය යමෙක් වනාහි සුවදුක් දෙක හුදෙක්මට යම්සේද අනුන්ටත් එසේමයයි කියා මෙසේ දනීද එසේ දනීතම් හෙතෙම ධර්මය දන්නේ නම් වන්නේයයි කියා යට ක්‍යනලද ක්‍රමයෙන් නැවතත් කීය එසේ තට ප්‍රියවූ උම්මා දන්තියගෙන් මට කම්නැතැයි කීසේක. එවරද ඉවර නොවන පවර නණැති ඒ සරතර ඒ අභිපාරක සෙනෙවිරත්තෙම අගතිගති ඇති කුමතිධර ජගතිපාල වාරණාසිධර විධාරනොදුර කෙශරීන්ද්‍රශ්‍රීධර ජනේන්ද්‍රයානන්වහන්ස ඈ මට ප්‍රියමනාපය ඒ බව් දූන වදාරණසේක්මය, ජනෙන්ද්‍රස්වාමීනි ඈ මට් අප්‍රිය නොවෙයි ප්‍රියවූ කාරණය කරණකොටගෙණ ප්‍රියඵල ප්‍රාර්ථනාකරන්නාවූ මම තුඹවහන්සේට ඒ උම්මාදනතිය දෙමි ජනෙන්ද්‍රයන් වහන්ස ප්‍රියවූ කැමති වස්තු දෙන දායකයෝ සසර සැරිසරන්නාහු ප්‍රිය දෙයක්ම ලබන්නාහුය.

එසේ හෙයින් පිළිගත මැනවයි කීය. එසේ විශෙෂ කොට කීව්ටද විවිධ ශ්‍රීන් භ්‍රාජිත නරේන්ද්‍රොත්තමයානෝ යහලු අභිපාරකයෙනි හේ මම ඒකාන්ත යෙන් කාමක්ලෙශයන් හෙතුකොටගෙණ අයුත්තක් කොට ආත්මවධයක් කෙළෙම් නම් මාගේ ආත්මයද වධයට පැමිණ වීමියි මට පසු විතකී උපදනේය හෙවත් කුකුස් උපදනේය. එහෙයින් මම අධර්මයෙන් කුශලකර්මය නසන්ට උත්සාහ නොකෙරෙමියි කීසේක. එවිටද නොනැවත නැවත උත්තර කීයා අභිපාරක සේනාපති තෙම අමිඥජන නන්දිතා නින්දිතොත්තුඞග විමලගුණ ධර ප්‍රවර නරවරෙශ්වරයානන් වහන්ස ඉදින් නුඹවහන්සේ ඒ උමමාදනතිය මාගේ සනනකයයි මෙසේ දැන වදාරන්නෙහි නෙවත් අනුන්සනනකයයි සිතා නොකැමති වන්නෙහි නම් නරවීරවූ ශ්‍රේෂ්ඨයානන් වහන්ස සර්ජනසමූහයා රැස්කරවා ඒ පිරිස්මධ්‍යයෙහිදී මේ උමමාදන්තිය මට අහිතය මාසන්තක නොවෙයි කියා හරින්නෙමි එසේ මා විසින් අනාලයව හරණලද ඉක්බිතිව ඒ අස්වාමිකවූ ඈ ගෙන්වා ගත මැනවයි කීහ. එකල්හිද විමල්කොට නිරුත්තරවූ උත්තර දෙසන මහරජානෝ යහලු අභිපාරකය ඉන් තෝ අපරාධයක් නො කරව අප රජදරුවන්ට හිතක්‍රියාවක්ම කරණ හෙයින් කන්නක නම්වූ තෝ ඈ කෙරෙහි කරණලද අහිත ක්‍රියාව හේතුකොටගෙණ හේ තට මහත්වූ අපවාදය කුදු වන්නේය. තොප අයුත්තකාරී එකෙකැයි කියා මේ නුවර කිසි කෙණෙක් හේතට විපක්ෂ වන්නේ නොවේද එහෙයින් තාගේ දූෂිතවූ ඒ සිත ඇර පියවයි කීසේක. එවිටද වියුමට නිවට නොරජුව උත්තර දෙන අභිපාරක සෙනෙවිරත් තෙම සාරතරවර්ණ පාලනයෙහි ලොල්වූ භූමිපාලොත්තමයානන් වහන්ස හුදෙක් අපවාද මතුකොට ඉදින් යම්කිසි කෙණෙක් මාගේ අභිමුඛයෙහිදීම මට නින්දා කරන්නේ හෝ ප්‍රශංසාකරන්නේ හෝ ගර්හාකරන්නේ හෝ දෙෂා රොපනය කරන්නේ හෝ වේද්ද ඒනින්දාප්‍රශංසාදි සියල්ලම මම සහනය කර ගන්නෙමි ඒ සියල්ලම මා කරා එන්වයි නුඹවහන්සේ ඈ ගෙන්වාගෙණ අභි ප්‍රායවූ පරිද්දෙන් සුවසේ මනෝරථය පුරාගත මැනවයි කීහ. එවිටද ජනෙන් ද්‍රෝත්තමයානෝ යහලු අභිපාරකය යමෙක්තෙම නින්දාවක් පැමිණිකල ඒ නින්දාවද නැවත එසේම ප්‍රශංසාවද එකලෙසින් නොගන්නේද එසේ මහාර්ඝ පූජාදියද නොගන්නේය එසේවූ පුරුෂයා කෙරෙන් ඓශ්වයර්‍ය සංඛ්‍යාතවූ ශ්‍රී කාන්තාවද ප්‍රඥාසංඛ්‍යාත ලක්ෂ්මියද යන දෙදෙන සර්වසර්වාකයෙන් නිර්ග්‍රන්ථව යන හෙවත් ගොඩනැතින් බැසී යන සුවෘෂ්ටි සංඛ්‍යාත ජලය පහවන්නේ යම් සේද එමෙන් ඒ දෙදෙනන් පහවයන්නේය නොපිහිටන්නේයයි කීසේක. එකලද විකලනොවූ අභිපාරකතෙම දෙවයන්වහන්ස ඒ උම්මාදන්තිය හරණ ලද මේ කාරණයෙන් වන්නාවූ සුවයෙක් හෝ දුකෙක් හෝ ධර්මයාගේ ඉක්ම පැවැත්තාවූ අකුසලයෙක් හෝ දෞර්මනසෙක් හෝ වේවයි හෙද මම නො පසුබට සිතින්ම පිළිගන්නෙමි.

යම්සේ මහාපෘථිවිය සර්වචර සංඛ්‍යාත ක්ෂිණාශ්‍රවයන්ගේද ත්‍රාස සංඛ්‍යාත පෘථක්ජනයන්ගේද කිසිවකුදු දෙෂාදෙෂ වශයෙන් යහපත නපුරයි නොගෙණ එකලෙසින් ඉවසන්නේද එමෙන් මම මේ සියල්ලම පිළිගන්නෙමියි ඉවසන්නෙමියි කීයේය එසඳ නරේන්ද්‍රයානෝ සබඳ අභිපාරකය යම් ධර්මයක් ඉක්මවීමෙන් පවත්නාවූ අකුසලයද එසේම චෛතසික දෞර්මනස්‍යද කායික

දුක්ඛයද අනුන්ට පැමිණීමට මම නොකැමැත්තෙමි මම උදකලාවම මේ දුක්ඛ හරය කරන්නෙමි මා කරා පමුණුවන්නෙමි හේද මම අනුන්ට කිසිතැවිල්ලක් නොකරන්නෙමි විනිශ්චය ධර්මය ප්‍රවේණි ධර්මය යන විවිධවූ සුචරිත ධර්ම යෙහි පිහිටා ඉවසන්නෙමි කීසේක. එවිටත් පැණවත්වූ අභිපාරකතෙම කාරු ණෙන්ද්‍රවූ ජනේන්ද්‍රයානන් වහන්ස මේ කුශල කර්මය නම් ස්වර්ගලෝක ප්‍රාප්ති යට සුදුසු වන්නේය. එසේ හෙයින් ඒ මාගේ කුසලයට නුඹවහන්සේ අන්තරා යක් නොම කොට වදාළ මැනව බ්‍රාහ්මණයින්ට යාගධනය දෙන රජක්හුමෙන් ප්‍රසන්නවම නුඹවහන්සේට මේ උම්මාදන්තිය දෙමි පිළිගත මැනවයි කීහ. එබසටද විසදසිරිධර නරොත්තමයානෝ යහලු කන්තය හෙවත් අභිපාරකය ඒකාන්තයෙන් තෙපි මට හිතෙසි එකෙක තෝ මාගේ මිත්‍රයෙක ඒ උම්මා දන්තියද මට සහායිකා ස්ත්‍රියක එහෙයින් තාගේ භාර්යාව ගෙන්වා ගන්නේ වීම්නම් දිව්‍යබ්‍රහ්මයෝද මට නින්දා කරන්නාහුය. එපමණකුදු නොවන්නේය. සියලු රටවාසීහු බැලුව මැනව පින්වත්නි විශ්වාසයාගේ භාර්යාව මේ රජහු විසින් ගෙන්වා ගෙයිලන ලද්දේයයි කියා නින්දා කරන්නාහුය වැලිදු සම්පරා යික අකුශලයකුදු වන්නේය, එහෙයින් ගර්හාව හා අකුශලය මට නොවේවයි කියා මෙසේ ප්‍රතික්ෂෙප කළසේක. එකලද විකල නොව නොපැකිළ ප්‍රතිවචන කියන්නාවූ සෙනෙවිරත්තෙම සතතාමිත මතින් විනත සිව්රොජොත්තමයා නන් වහන්ස මේ අධර්මයෙක් නොවෙයි යම් හෙයකින් නුඹවහන්සේට මා විසින් ඇකැමැත්තෙන් දෙන ලද්දේද එහෙයින් ගම්නියම්ගම් ජනපද වාසී සියල් ලෝම මේ අධර්මයෙකැයි නොකියන්නාහු වෙත්මය එහෙයින් මා විසින් නුඹ වහන්සේට ඒ උම්මාදන්තිය දෙනලද්දේය මහරාජොත්තමයානන් වහන්ස අභිලාෂවූ පරිද්දෙන් මනදෙල පුරාගෙණ එයින් කැමතිසේක් වීනම් නැවත මට හලමැනවයි කීහ. එවිටත් පැණවත් ජගත්පාලතෙම කියනුයේ කෘත්‍යකාරීවූ අභිපාරකයෙනි තෙපිමට ඒකාන්තයෙන් හිතෛසිවූයෙහිය මට දෘඪමිත්‍රවූයෙහිය එසේවුවත් බුඩාදී මහෝත්තමයන් විසින් ක්ෂාන්ති මෛත්‍රීභාවනා ශීලාචාර සංඛ්‍යාත ධර්මයෝ මනාකොට වර්ණිතා කරණ ලද්දේය එහෙයින් යම්සේ මහාසමුද්‍රය කිසිකලෙකත් වෙරල නොයික්මවාද එමෙන් මම සිල් නැමති වෙරළ නොයික්මවමි කීසේක. එසේ කීකලද නොනැවත ප්‍රතිවචන කියන් නාවූ අභිපාරකසේනාපතිතෙම ධීරතර වීරගුණභාර ධාරික මහරාජොත්තම යානන්වහන්ස නුඹවහන්සේ මා විසින් සත්කාරයට සුදුසු හෙයින් මට හිතානු කම්පි ආහුණෙය්‍යවූසේක. නුඹවහන්සේ මා ධරණ හෙයින් ධාතෘවූසේක. ඓශ්වර්ය්‍ය මුඛය විදහනය කරණ හෙයින් විධාතෘ නම් වනසේක. ඉච්ඡිතා නිච්ඡිත කාමයන්ගේ පාලනය කරණ හෙයින් මට කාමපාල නම් වනසේක. එසේ හෙයින් දේවයන් වහන්ස නුඹවහන්සේට දෙන ලද දෙය මට මහත් ඵල පිණිස වන්නේය.

එබැවින් ස්වාමීනි මාගේ ප්‍රාර්ථිතා හෙයින් දෙනලද මේ උම්මාදන්තිය පිළිගෙණ වදාළ මැනවයි යාච්ඤා කෙළේය. මෙසේ අභිපාරක නම් සෙනෙවිරත් තෙම නරොත්තමයාහට උමමාදන්තිය පිළිගත මැනවයි කියා දෙවන්නේය ජනෝත්තමතෙම මට මෑගෙන් ප්‍රයෝජන නැතැයි ප්‍රතික්ෂෙප කරන්නේය. මෙසේ දෙදෙනම අසූවියෙහි හුනු පක්ෂිපෙට්ටියක් පිටිපසින් පැහැර වනයෙහි

ලත්තාක්හු මෙන් භරණානුමය, එකල්හි අමිත නෘපති භමර නිකර නිෂෙවිත ශ්‍රී චරණාරවින්දවන්දෙපශොභිතවූ නරෙන්ද්‍රොත්තමයානෝ දූත් ඔහුගේ උත්තර වර්ජනය පිණිස තර්ජනය වසයෙන් මෙසේ කියනසේක් එම්බල කාන්ත පුත්‍රවූ හෙවත් හිතකෘත්‍යකාරී පුත්‍රවූ අභිපාරක සෙනාපතිය මීට පූර්වයෙහි තෝ මට ඒකාන්තයෙන් සර්වප්‍රකාරයෙන්ම ඒකාන්තයෙන්ම හිතවූ දෙයක්ම කෙළේය. අද වනාහි එසේවූ පක්ෂ්‍යනොව ප්‍රතිපක්ෂව බොහෝදේ කියන්නෙහිය. මෙසේවූ ප්‍රලාප වඩවඩා නොදොඩව මේ සත්වලොකයෙහි විපද සත්වයන් අතුරෙන් අතික් කවරෙක් නම් තට සුවසැලැත්තේද අතික් රජෙක් තාගේ භාර්‍ය්‍යාව කෙරෙහි මෙසේ පිළිබඳ සිත්වූයේ වීනම් ඇතුළු අරුණෙහි හෙවත් අරුණු නැගීමට පෙරටුව තාගේ හිස කප්පවා ඈ තමන්ගේ ගෙයින් ගෙන්වා ලන්නේය. මම වනාහි අකුසලයට භයින් එසේ නොකරමි. තා නොදොඩා හිඳුව තාගේ අඹුවගෙන් මට කම්නැතැයි කියා හසගැන්වූසේක..

හේතෙම ඒ අසා නැවත කිසිවකුත් කියන්ට අසමර්ථව රජ්ජුරුවන්ට ස්තුති කරන්නේ විවිධවිපක්ෂ ජන ශික්ෂිතාතිදක්ෂ විචක්ෂණීය සුන්දර බුද්ධි මන්දිරවූ මහරාජොත්තමයානන්වහන්ස නුඹවහන්සේ සකල ජම්බුද්වීපයෙහි ගම්භීර සර්වනරෙන්ද්‍රයන්ට ශ්‍රෙෂ්ට වනසේක නුඹවහන්සේම අනුත්තරවූ සර්ව ගුණයෙන් යුක්තහෙයින් නිරුත්තර වනසේක. විනිශ්චය ධර්මය ප්‍රවෙණි ධර්මය සුචරිත ධර්මය සංඛ්‍යාත ධර්මයන්ගේ ගොපන රක්ෂාවරණයෙන් යුක්ත හෙයින් ධර්මගුප්ත නම් වනසේක. නුඹවහන්සේම ඒ ධර්මය මනාකොට දත් බැවින් ධර්මවිදූ නම් වනසේක. නුඹවහන්සේම මනා ප්‍රඥා ඇති හෙයින් ප්‍රඥාවන්ත නමුදු වනසේක. නුඹවහන්සේ යම් ධර්මයක් රක්ෂා කරන්නෙහිද එයින්ම ගුප්තව චිරාත්කාලයක් මුළුල්ලෙහි කිසි කාය චිත්ත පීඩාවක් නැතිව සන්තොෂයෙන් ජීවත්වුව මැනව, එසේවූ සර්වධර්මපාලක ධර්මගුප්ත භූමිපාලොත්තමයානන් වහන්ස මටද ධර්මදෙශනාකර වදාළ මැනවයි ආරාධනා කෙළේය.

ඉක්බිත්තෙන් ඔහට ධර්මදෙශනා කරන්නාවූ සර්වාදිභ කුම්භ නිර්භෙදෘහි තකෙශරිභූතවූ මහාරාජොත්තමයානන්වහන්සේ එම්බල සුහිත ක්‍රියාසහිත අභිපාරකය යම්හෙයකින් කීමට සුදුසු තෝ මට බණ දෙසුව මැනවයි චොදනා කළේද එසේවීනම් විශෙෂයෙන් මාගේ වචනය නොස්ව අස්ව ප්‍රසිද්ධවූ විසුද්ධ ගුණධර බුද්ධාදී සත්පුරුෂොත්තමයන් විසින් සතතාසෙවිත නිසෙවිතවූ වර්ණධර ධර්මයම මම තට ප්‍රකටකොට දෙශනා කෙරෙමියි කියා වදාරණසේක් එම්බල අභිපාරක සෙනාපතිය සුනිශ්චයවූ විනිශ්චය ධර්මය ප්‍රවෙණි ධර්මය සුචරිතධර්මාදි සර්වධර්මයෙහි තොෂනය කරන්නාවූ හෙවත් ඇලෙන්නාවූ තාදෘශවූ හේතෙම ජීවිතය හරණේ නමුදු අකෘත්‍යයක් නොකරන්නේය එසේ හෙයින් එබඳුවූ රජතෙම යහපත් වන්නේය. එසේම විශුද්ධ සංඛ්‍යාත ප්‍රඥාසම්පන්න සත්වතෙමේද යහපත් වන්නේය. එසේම මිත්‍රද්‍රොහී නොවන්නාවූ නැනැත්තේද මනොඥ වන්නේය, එපරිද්දෙන්ම ප්‍රාණඝාතාදීවූ සර්ව අකුශල ධර්මයන්ගේ නොකිරීම සාන්දෘෂ්ටික සාම්පරායික පරමාර්ථ සංඛ්‍යාතවූ සර්වාර්ථ සිද්ධි සම්පාදනය කරණ හෙයින් සුවවන්නේය, තවද යහළුවූ අභිපාරකය යථොක්තවූ විවිධ ත්‍රිවිධ ධර්මයෙහි පිහිටියාවූ අක්‍රොධීවූ රජ්ජුරුවන්ගේ විජිතයෙහි වසන තොෂ්‍යවූ මනුෂ්‍යයෝ අවන නොවන සුවයෙන් හිඳිනාහුය, විශෙෂවූ දෙශනාශීර්ෂයෙන් හිඳී මමකීවත් ස්ථානචංක්‍රමණ සයන නිෂද්‍ය

සංඛ්‍යාත සවකීය ගෘහසංඛ්‍යාත පුත්‍රදාරා ඥාතිමිත්‍රාදීහු තමතමන්ගේ ගෙයි විපුල් විමල් සිහිල් සෙවනෙහි අධර්මබලිමර්දනාදි උපද්‍රවයක් නැතිව සැපසේ වසන්නාහුය.

තවද යහලු අභිපාරකය නරෙන්ද්‍රාදි යමෙක් යථොක්ත ධර්මයෙන් තීරණ ප්‍රඥාවෙන් නොදැන නොබලා චිත්තවශයීව කාරණලද කර්මයක් හෙවත් එබඳු ක්‍රියාවෙහි මම ඇලෙන්නේ නොවෙමි, යම් රජ දරුකෙණෙක් යටකීනලද ප්‍රකට කර්මයන් විශෙෂයෙන් දැන ඒ නොමඋඳුරා ඉඳුරා පුරාකරා තම් හෙවත් තියුණු නුවණින් පරීක්ෂාකාරීව තෙමේ කරන්නේ නම් ඔවුන්ගේ ක්‍රියායෙහි මම ඇලෙන්නෙමි, මේ අර්ථයාගේ සුබාවබොධනය පිණිස තෝ මාගේ මේ උපමාවය නොපමාව අසවයි ඇණව වදුරණසේක් යහලු අභිපාරකය යම්සේ ගවයන් අතරතොව එතරකරන්නාවූ යමෙක් ගඟට බැස්සූ ගවයන් අතුරෙන් පලමුව යන ප්‍රධාන ගවතෙමේ ඇදව යාද එසේ විධානයට සුදුසුවූ ප්‍රධාන ගවයා ඇදව පීනා යාමක් ඇතිකල්හි ඒ පස්සේ යන සෙස්සෝ සියල්ලම විශෙෂයෙන් ඇදව පීනා යන්නාහුමය, එපරිද්දෙන්ම අභිපාරකයෙහි මනුෂ්‍යයන් අතරෙන් යමෙක් විශිෂ්ට ශ්‍රෙෂ්ඨසම්මතවේද හෙවත් රාජ්‍යශ්‍රියට පැමිණේද එසේ රාජ්‍යයට පැමිණියාවූ හේතෙම අධර්මයෙහි හැසිරේද හෙවත් ඡන්දද්වෙෂ භය මොහ සංඛ්‍යාත සතර අගතියෙන් විගතනොව අසත්පුරුෂ ධර්මයෙහි හැසිරෙණ කල්හි විශෙෂයෙන්ම අවශෙෂ සත්වයෝ අධර්මයෙහි හැසිරෙන්නාහුය, ඉදින් මෙසේ රජ තමන් අධර්මිෂ්ඨවූ කල්හි සියලු රටවැස්සෝ දුකින් පෙළී වසන්නාහුය.

තවද එසේම ගවයින් එතරකරණ යම් ගොපල්ලෙකු ගඟට බැස්සූ ගවයන් අතුරෙන් දුරවව පෙරටුව ප්‍රධාන ගවයා සෘජුවම අතර නොනැමී එතරවේද එසේ පලමුව යන ප්‍රධාන ගවයා සෘජුවූ ගමනක් ඇති කල්හි පසුව යන සෙසු ගවයෝද සෘජුවම යන්නාහුය එපරිද්දෙන්ම යමෙක් මනුෂ්‍යයන් කෙරෙහි ශ්‍රෙෂ්ඨසම්මතවේද ඒ ප්‍රධානත්වයට පැමිණි රජතෙම දුගතිගති නියත සතර අගතියෙන් විරතව සුචරිත ධර්මයෙහි හැසිරේද අදහම්පහමින් දැහැමින් රජකෙරේද එකල්හි විකල්නොවූ සියලු සත්වයෝ විශෙෂයෙන් සුචරිත ධර්මයෙහි හැසිර වසන්නාහුය එසේ රජතෙම ඉදින් පහන් සිතින් දහම්හි හැසිරෙන්නේවීනම් සියලු රටවැස්සෝ රොස්නොව නොසව සුවයෙන්හෝනාහුය. හෙවත් සැපසේ වසන්නාහුය, තවද අභිපාරකය මම අධර්මයෙන් වසන්නාවූ දිව්‍යාත්මයද ප්‍රාර්ථනා නොකරමි. එසේම මේ සියල්ලම හෝ අධර්මයෙන් ජය ගැණීමටද මම නොකැමැතිවෙමි. තවද මනුෂ්‍යයන් අතුරෙහි විද්‍යමානවූ රත්නයෙක් ඇද්ද ගේ වසයෙන් යුත් ගවයන්ද නොලස්ව යන අශ්වයන්ද යනාදි විඤ්ඤාණක රත්නයන්ද හිරණ්‍ය සවර්ණාදි කාසිකවස්ත්‍රයන්ද සුන්දර ගන්ධයෙන් යුත් චන්දනාදි මනොඥවූ අවිඤ්ඤාණක රත්නයන්ද තවද පවනට බඳුවූ ජවනගති ඇති අශ්වයනුදු උත්තම රූපධර ස්ත්‍රීහුද නිත්‍යසත්වචිත්තාලය වන සතනම්වූ සප්තවිධ රත්නයද අන්‍යවූ සකල සම්පත්තිහුද හෙවත් චන්ද්‍ර සූර්‍ය දෙදෙනාගේ රශ්මීන් පරිවජන්නව සාලංකෘතවූචක්‍රවාටාභ්‍යන්තරයෙහි සප්ත රත්නයෙන් සමලංකෘත චක්‍රවර්ති රාජ්‍යය සම්පත්තියද හෙතුකොටගෙණ විෂමක්‍රියායෙහි නොහැසිරෙමි. මම වනාහි නිර්භිය ශිවින්ගේ මධ්‍යයෙහි තුෂ්ටි

ජනකව ජ්‍යෙෂ්ඨරජව උපන්නෙමි. එහෙයින් වික්‍රමධර චක්‍රවර්තිරාජ්‍යය කිරීමෙහිද තත්ක්‍රමය නොහරිමි හෙවත් අධර්මයක් නොකරමි.

තවද සිවිරාජ සංඛ්‍යාත පොරාණික රජදරුවන්ගේ ප්‍රවේණි ධර්මය හෙවත් සත්වයන් කුසල්හි පිහිටුවා දෙව්නුවර පමුණුවන්නාවූ එම අපවය වසයෙන් භාවිතා කරන්නාවූ හිත ක්‍රියාව හෙතුකොටගෙණ මුලු දඹදිව උද්ගතවූ ප්‍රකටවූ සමක්‍රියායෙන් රට පල්නා හෙයින් රඨපාල නම්වූ මාගේ පිතෘන් වහන්සේ ආදීවූ පොරණ වංසානුගත එම ධර්මයම අනවතරයෙන් සුරතව චින්තනය කෙරෙම් හෙවත් යුත්ලෙසින් සිත්හි කරමි, කාරණයෙන් චිත්ත වසඟ නොවෙමියි වදාළසේක.

මෙසේ ආධිපත්‍යය ඇති කෘත්‍යාධිකාරී මහබෝධිසත්වයන්වහන්සේගේ ධර්මදෘශක ධර්මකථා ශ්‍රවණයකොට ස්තුති කරන්නාවූ අභිපාරක සෙනෙවි රත්තෙම සර්වගුණනිධි නිකෙත විවිධ විමල විපුල සාරතර භූරිභාරධාරිත මහා රාජොත්තමයානන්වහන්ස තුඹවහන්සේ ඒකාන්තයෙන් ඒකාවන්ව හෙවත් සතතයෙන් විතතව සකල සත්තට හව්‍යවූ අව්‍යසනයක්ම යහපතක්ම කරන් නෙහිය, එසේහෙයින් තුඹවහන්සේවැනි මනොඥවූ ප්‍රාඥයන්ගේ රාජ්‍යශ්‍රීය කැරුම සත්වයන්ටම කැමති වන්නේය එබැවින් චිරාත්කාලයක් ජීවත්වුව මැනව, තවද නොමද ගුණ දරණ දෙවයන්වහන්ස තුඹවහන්සේ වදාළවූ යම් ධර්මයෙක් ඇද්ද ඒ ධර්මය මමද අනුමෝදන්වීමි, ඒ වදාළ ධර්මය එපරිද්දෙන්ම පිළිපැද වදාළමැනව එහි ප්‍රමාද නොමවුවමැනව ධර්මයෙහි නොහෙලාවූ සිතින් අගතියට පැමිණි ක්ෂත්‍රියතෙමේ සතුටින් කළ රටින් සහ ඉසුරෙන්ද චුතවන්නේයයි කියා නැවතත් එම ධර්මයෙහි නියොග කරන්නාහු මේ මතු කියන අර්ථඇති ගාථාදසයකින් අවවාද කෙළේය. එහි විස්තර වනාහි යට තෙසකුණ ජාතකයෙහි දක්වනලද ක්‍රමයෙන් දතයුත්තේය. මෙතැන්හිදු සංක්ෂෙප මාත්‍රයක් දක්වනුලැබේ.

කෙසේ ද? යත්

විසුද්ධවර්ණධර වසුන්ධරෙන්ද්‍රයානන්වහන්ස සර්වනියෙන් ගෞරව නැත්වූ මව්පියන් කෙරෙහි පැවතියයුතුවූ මාතෘපිතෘපස්ථාන සංඛ්‍යාත ධර්මයෙහි හැසිර වදාළ මැනව, මෙහිදී එසේ පහන්ව දහම්හි හැසිර කුසලය කරණකොට ගෙණ සවර්ගයට පැමිණෙන්නේය. තවද මහාරාජොත්තමයානන් වහන්ස එසේම පුත්‍රදාරාවන් කෙරෙහි ඒ ඒ කලටපැවැත්විය යුතුවූ ධර්මයෙහි හැසුරුණ මැනව, ඒවූසේම මහරජ්ජුරුවන් වහන්ස විචිත්‍රවූ පවිත්‍ර ගුණධර මිත්‍රාමාත්‍ය යන් කෙරෙහිද ධර්මයෙහි හැසුරුණ මැනව, තවද නරෙන්ද්‍රයානන් වහන්ස සවසර්වබලධර හස්තිවාහන අශ්වවාහනාදියෙන් හා නේබලැති සේනාව කෙරෙහිද පැවැත්වියයුතු සුදුසු ධර්මයෙහිද හැසිර වදාළමැනව, තවද විවිධ ගුණධර ධරණීපතීන්ද්‍රයානන් වහන්ස ග්‍රාමනිගම වාසීන් කෙරෙහිද එසේම ප්‍රකට රටවැස්සන් හා කරවුවරදෙන දනව් වැස්සන් කෙරෙහිද එපරිද්දෙන්ම ශ්‍රමණබ්‍රාහමණයන් කෙරෙහිද අපවත්නොකොට පවත්නන් හටනිසිවූ ධර්මයෙහිද මනාකොට හැසිරවදාළ මැනව, තවද පෘථුල යශධර පෘථුවීශ්වරයානන්වහන්ස ශික්ෂිතාශික්ෂිත මෘගපක්ෂීන් කෙරෙහි රිසිලෙස නිසිහු පරිද්දෙන් පැවැත්විය

යුතු ධර්මයෙහි හැසිර වදාළ මැනව, තවද විවිධ ගුණාධිපති ජනාධිපතීන් වහන්ස යථෝක්තවූ සර්වස්ථානයෙහිම සෞම්‍යදායකවූ ධර්මයෙහි හැසිර වදාළ මැනව, එසේවිසෙස්ම අයත්නයෙන් රැස්කරණ කුශලධර්මය උභයලෝක විභව ප්‍රදානයෙන් සුවඵලවත්තේය, එසේ මෙහිදී කුසලයෙහි හැසිර එමකුසලයන් හෙතුකොටගෙණ ස්වර්ගලෝක ප්‍රාප්තවන්නේය, එසේහෙයින් මහාරාජෝත්තමයානන් වහන්ස වික්‍රමාන්විත ශක්‍රදෙවේන්ද්‍රාදි සමස්ත දිව්‍යරාජසමූහයා සහ පහන් සිතින් දහම්හි තත්පරවූ සහම්පත්‍යාදි අශෙෂ බ්‍රහ්මරාජ සමූහයාද යන සියල්ලෝම මේ මනුෂ්‍ය ලොකයෙහිදීම මාතෘපිත්‍රෝපස්ථානාදි සර්වකුශල ධර්මයෙහි පිණා බැතින් මනාකොට හැසිර එසේ නොමලස්ව නොස්ව රැස් කරණලද කුශලධර්මය හෙතුකොටගෙණ තත්භව්‍ය දිව්‍යලොක බ්‍රහ්මලොක වලට පැමිණියාහුය.

එබැවින් සර්ව ධර්ම තිමිර නිකර නිධන තරුණාරුණ කිරණ ප්‍රභා භාසුර විභාකර ප්‍රතිභාගවූ ජනේන්ද්‍රෝත්තමයානන් වහන්ස යථෝක්තවූ සර්වකුශලධර්මයෙහි ස්මෘති විප්‍රවාසයයි කියනලද සර්වානර්ථ දායකවූ ප්‍රමාදවාපය දුරින්ම දුරුකොට ඓහලෞකිකාදි පරලෞකිකාදි සර්වාර්ථසිද්ධි සම්පාදනයට ඒකාන්ත නියතවූ විපුලතර මහිමධර කුශලධර්මයෙහි හැසිර වදාළ මැනවයි යනාදීන් අවවාද වශයෙන් ධර්මදෙශනා කළේය. මෙසේ විශෙෂයෙන් පිහිත දුසිරිතැති සුසිරිසහිත අභිපාරක සේනාපතීන්ද්‍රතෙම ගුණොත්ද්‍රොලීන්ද්‍ර ශ්‍රීධර නරේන්ද්‍රයන්ට කෙලෙස්පහන් දහම්දෙසූකල්හි කෙලෙස් වහා පැමුණුනු ගුණ ඇති මහාරාජෝත්තමයානෝ තන්දනම් මත්පිණවන තත්රුසිරෙන් සුපුත් කළ උම්මාදන්තිය කෙරෙහි පිළිබඳවූ සිත විනොදනය කළේයයි හෙවත් සිත නිවූයේයයි ත්‍රෛලොක විශෘත විශද කීර්තිශ්‍රීන් භ්‍රාජිතවූ ප්‍රශස්ත පුණ්‍යක්ෂේත්‍ර ශාස්තෘවූ සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජෝත්තමයානන් වහන්සේ මේ වර්ණසහ සම්දෙන ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා ප්‍රවරාර්‍ය්‍යභූත චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශකොට අපූර්වවූ මේ **උම්මාදන්ති ජාතකය** නිමවා වදාළසේක.

ඒ චතුරතර චතුරාර්‍ය්‍ය සත්‍යා වසානයෙහි නමින් අප්‍රකටවූ නොකට යුතු මෙතෙන් උකටලීවූ භික්ෂූන්වහන්සේ සෝවාන් පෙලෙහි පිහිටිසේක. එකල්හි සුනන්දනම් රථාචාර්‍ය්‍යයා නම් මෙකල්හි ආනන්දස්ථවිරයෝය, එකල්හි අභිපාරක සේනාපති නම් මෙකල ශාරිපුත්‍රස්ථවිරයෝය, එසමයෙහි උම්මාදන්තිය නම් මෙසමයෙහි උපුල්වන් මහාස්ථවිරිය, එසමයෙහි රජපිරිස් නම් මෙසමයෙහි බුදුපිරිස්මය, එසමයෙහි සිවිරාජෝත්තමයානෝ නම් දැන් සර්වඥතා ඥානය ප්‍රතිවෙධය කිරීමෙන් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

———0———

537
මහා බොධි ජාතකය

තවද එක්සමයෙක්හි විශදතර තොමද ගුණ ප්‍රබන්ධයෙන් භ්‍රාජිතවූ සමස්ත සත්වහු කුන්ද කාන්තානන්ද කර සුන්දරෝලින්දශ්‍රීන් විශෘත ශාස්තෘවූ ත්‍රිලෝගුරු බුදුරජානන් වහන්සේ නොයෙක් සිරින් දිමුත්වන වියත්දන අයත්වන පැවැත්ම ඇති සැවැත්නුවර සමීපයෙහිවූ විතතානෙක ලක්ෂණො

පෙත ජේතවන මහාවිහාරයෙහි වැඩවාසයකර වදාරණසේක් සවත්රස දහම් දෙසීමෙන් අවසන් සතට නිවන් සිරිදෙන තමන්වහන්සේගේ මනොඥවූ ප්‍රඥපරමිතාව අරභයා මේ මහාබොධි ජාතකය දක්වා වදාළසේක.

මෙහි වර්තමාන කථාව වනාහි මහා උම්මග්ග ජාතකයෙහි විස්තර වශයෙන් මතු ප්‍රකාශවන්නේය. එකල්හි වනාහි ත්‍රිභුවන විශ්‍රතවූ ශාස්තෘවූ බුදුරජාතන් වහන්සේ මහණෙනි යථාවාදී තථාකාරීවූ සර්‍වඥවරයෝ ප්‍රඥව පරවාද ප්‍රමර්දනය කළෝ දැන් මතු නොවෙති අතීතයෙහිත් පැණවත්ව පරවාද ප්‍රමථනය කළෝම වේදැයි වදාරා තදනන්තරුව උදානප්‍රයෝජන ඇති ඒ කථා ශ්‍රවණාභිලාෂීවූ විහතාවීන ශ්‍රීධර ප්‍රතිභාග විසුධාති ප්‍රසිඬ බුඬිශීලසමඩ්‍යාදී විවිධගුණධර තපොධනාරාධනාගෙණ අත්හුයත්වූවත් ඒ තන්වයෙන් යුත් ලෙසට සිත්මෙන් පැවැත්වියහැකි ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

ශේ කෙසේද? යත්

යටගිය දවස විතානය සිතස්වන ශ්‍රවණදන තොස්වන සනනසන රැස්වන පවර බරණැස් නුවර පැණවත් දන ගුණවත් බඹදත් නම් රජ තුමෙක් රජය කරණ කල්හි පොරණ සාලෙකසිව් හරණ දුසිරි ඇතිව දරණ නෙකගුණයෙන් පුරණලද පෙරුමන් ඇති අප මහබොධිසත්වයන් වහන්සේ කසීරට අසූකෙළක් ධන ඇති ලොක ප්‍රසිඬවූ බ්‍රාහ්මණ මහාසාර කුලයක ඉපිද අනුක්‍රමයෙන් වඩනා ඔහට මෙධාවිකාවූ බෝධිකුමාරයෝයයි නම් තිබූහ. හෙතෙම සිරින් එඩිතරව වැඩිවිය පැමිණ නෙක් සතරට එක්තැන්වූ

තක්සලා නුවරට ගොස් උගතමනා සිල්පයන් විගත නොකොට ඉගෙණ නිමවූ පසු එසේ උගන්නාලද අනල්ප ශිල්ප ඇති හෙතෙම එවිටම රටට අවුත් ගිහිගෙයි වසන්නාහු මෑත භාගයෙහි පංචකාම සම්පත් හැර සම්තජනාලයවූ හිමාලය වනප්‍රවිශ්ටව පරිබ්‍රාජක පැවිද්දෙන් පැවිදිව වනමුල් ඵලාහාර අනුභව යෙන් බොහෝ කලක් එහි වැස වස්සාන සෘතුයෙහි සමවතින්ම හිමවතින් බැස දනව් සැරිසරා වඩනාසේක් අනුක්‍රමයෙන් බරණ නුපුරුදු බරණැසට පැමිණ විවිධ තරුසණ්ඩ මණ්ඩිත ශ්‍රීන් විරාජිත රාජෝද්‍යානයෙහි වැස දෙවෙනි දවස්හි හිරුළුදය වේලෙහි පරිබ්‍රාජක සාරූප්‍යයෙන් පවර නුවර පිඩුසරණ සේක් රජ දොරට පැමිණියේය. එකල සීමැදුරුකවුළුව සමීපයෙහි නරෙන්ද්‍රතෙම ඒ පරිබ්‍රා ජකායන් දැක ඔබගේ සංයමනියමාදී උපසම ක්‍රියායෙහි පැහැද ඒ පරිබ්‍රාජක යන් වහන්සේ තමන්ගේ රාජමන්දිරයට වැඩමවා ගෙණ විරාජිත රාජපර්‍යඞ්කයෙහි වඩා හිඳුවා පොරණ පරිචය නැතත් දරණ ගුණරුස තොස්ව සරණවැද ලඟව හිඳ කරණලද ප්‍රතිසන්ථාර ඇතිව උදක් පැහැද මදක් දහම් කථා අසා නොයෙක් උතුම්රසඇති අහර පිළිගැන්වූ සේක. මහාසත්‍වසංඛ්‍යාත බොධිසත්‍ව යන් වහන්සේ දන් පිළිගෙණ විතත නැණින් සිතනසේක්, මේ විජනතැන් නොවන රජකුලයනම් බොහෝ ද්වේෂ සහ බොහෝ පසමිතුරන් ඇත්තේවන් නේය. කවරෙක්නම් මට අප්‍රකටව උපන් භයක් නිසනරණය කෙරේද හෙවත් මට උපන් භයින් මා එතර කෙරේදැයි විගසින් බැලූකල්හි උන්වහන්සේට නොමුව දුරව සිටි රාජවල්ලභවූ පිංගල වර්ණ එක් සුනඛයෙක් දැක මහත්වූ බත් පිඩක් ගෙණ ඔහට දෙනුකැමති ආකාර දැක්වූ සේක. රජ්ජුරුවෝ එපවත් දැන සුනඛයාට භාජනයක් සහ භෝජන ගෙන්වා ඒ බත්පිඩද එහි ලවා දෙවූ

සේක. මහබොධිසත්වයන් වහන්සේද එවිටම ඕහට සිත්ලෙසම බත්දෙවා බත් කිස නිමවූසේක. ඉක්බිති තුටුපහටු සිත් ඇති මහරාජොත්තමයානෝ මෙධාධික බොධිසත්ත්වයන්ගෙන් මනොඥවූ ප්‍රතිඥාව ගෙණ තමන්ගේ නුවරවූ අමිත ශ්‍රීන් භ්‍රාජිත රාජොද්‍යානයෙහි පන්සලක් කරවා පැවිදිකරවා දී උන්වහන්සේ එහි වැස්වූසේක.

එසේ වස්වා දවස දවස හිරුඋදයාදි වශයෙන් දෙතුන් වරක් උපස්ථානය වද වඩනාසේක. සාධිත ගුණාධිත බොධිසත්ත්වයන් වහන්සේ වළඳනකළ රජගෙට වැඩ රාජපර්‍ය්‍යංකයෙහිම වැඩහිඳිනාසේක. රාජබොජුන්ම වළඳනසේක. මෙසේ උදාරතර ආදර ගෞරව වශයෙන් සතොස්ව වසන්නාහට දෙළොස් වසක් ඉකුත්විය. එකල් කල්පනා අඩුවූ ඒ රජහට වනාහි උගැහැට වංචිත ගුණසඞ්ඛ්‍යයක් ඇති පඤ්චවිධ අමාත්‍යකෙණෙක් හෙවත් රාජනීති ලොකනීති ධර්මනීති ආදියෙහි විභාග ස්වභාවයක් නොදන්නා අමාත්‍යයෝ පස්දෙනෙක් අර්ථධර්මදෙකින් අනුශාසනා කරන්නාහුය. ඔවුන් අතුරෙහින් එකෙක් අහෙතුකවාදීය. එකෙක් ඊශ්වර කාරණවාදීය. එකෙක් පූර්වකෘතවාදීය. එකෙක් උච්ඡෙදවාදීය. එකෙක් ක්‍ෂත්‍රවිද්‍යා වාදීය. මෙසේ ඔවුන් පස්දෙන අතුරෙහි අහෙතුකවාදීතෙම මේ සත්ත්වයෝ සංසාරශුද්ධිකයහයි කියා මහජන සමූහයාට උගන්වන්නේය. සදහම් අනසවරවූ ඊශ්වර කාරණාදි තැනැත්තා මේ ලොව ඊශ්වරයා විසින් නිර්මිතයයි කියා උගන්වන්නේය. අපූර්වගුණයක් නැති පූර්වකෘතවාදී තැනැත්තා මේ සත්වයන්ට උපදනාවූ සුවෙක් හෝ දුකෙක් හෝ ඇත්නම් ඒ සියල්ල පෙර කරණලද කර්මය හෙතුකොටගෙණම උපදනේයයි උගන්වන්නේය. ගුණවිච්ඡෙදකවූ උච්ඡෙදවාදී තැනැත්තා මෙයින් මිය පරලොව යන්නාහු නම් නැත මෙලෝ වැසිතෙම දනාසාව සිඳවන්නේයයි උගන්වන්නේය. පවිත්‍රවචන නැති ක්‍ෂත්‍රවිද්‍යාවාදී තැනැත්තා සර්වහියෙන් ගරුව කටයුතුවූ මව්පියන්වත් මරා තමන්ගේ අර්ථයම කැමති වියයුතුයයි උගන්වන්නේය. මෙබඳු ප්‍රඥාවෙන් විරහිත ඒ අඥානයෝ පස්දෙන රජහුගේ විනිශ්චයෙහි නියුක්තවූවාහු අයුක්තියෙන්ම සිත්ලෙසින් අත්ලස් කන්ට පටන්ගෙණ අහිමියන් හිමිකිරීම් වශයෙන් අනර්ථ කරන්නාහුය. ඉක්බිති එක් දවසක් ඔවුන්ගේ කූටාධිකරණයෙන් පරදනලද නොයෙක් දෙනා අතුරෙන් එක් පුරුෂයෙක් නොමඩු ගුණෙන් පිඩු පිණිස රජගෙට වඩනා කරුණාධික බොධිසත්වයන් දැක වැඳවැටී තුබුහුටිව ගැහැටිගිය සිතින් යුක්තව සැලකරන්නේ ස්වාමිනි බොහෝ සත්නට වහාසෙත්දෙන මහාසත්වයන් වහන්ස! නුඹවහන්සේ රජගෙයි නිතර වළඳනු ලබන්නේ අවිනිශ්චිතවූ විනිශ්චයාමාත්‍යයෝ වස්තු ලොභයෙන් අත්ලස් ගෙණ ලොව විනාශය කාරණකළ කවරහෙයකින් ඒ නොබලා උපෙක්‍ෂාව හිඳිනාසේක්ද දන්වනාහි මේ අත්ලස්හී තොස්වූ පස්මහා ඇමතියන් විසින් කුළුරලූ අඩුකාරයින් අතින් අත්ලස් ගෙණ වස්තු ස්වාමීව වසන්නවූම අහිමි කරණලදුයි යනුවෙන් විලාප කියා හැඬීය. එහෙයින් ඔහු කෙරෙහි කරුණා වශයෙන් විනිශ්චයස්ථානයට එළඹ අගති පහමින් දැහැමින් ඒ නඩුව අනඩුවක් නැතිව විනිශ්චය කොට හිමි තැනැත්තහුම හිමිකළසේක, එවිට එහි සිටි බොහෝදෙනා ඔහෝ සාධු සාධුයි කියා එක පැහැර මහහඬින් සාධුකාර දුන්හ. රජ්ජුරුවෝ ඒ සුශබ්ද ශබ්දය අසා මේ කවර හඬෙක්දැයි විචාරා එපවත් අසා කරණලද බත්කිස ඇති බෝසත්නට නේසෙත් දෙන

බෝසතුන් කරා එළඹ ආසනනාව හිඳ ස්වාමීනි අද නුඹවහන්සේ නඩුවක් විසඳුයේක් දැයි විචාළ සේක, එසේය මහරජ යි කියෙත් ස්වාමීනි නුඹවහන් සේලා වැනි අඥානයන් ගවෙසීවූ හිපෙසීන් වහන්සේලා අඩුතැති නඩු විසඳන කල්හි බොහෝ දෙනාට වැඩවන්නේය.

එසේ හෙයින් මෙතැන්පටන් නුඹවහන්සේම නඩුවිනිශ්චයකාර වදාළ මැනවයි දන්වූසේක. එවිට විසුඬගුණාධික බොධිසත්වයන් වහන්සේ මහරජ අපිතම් එබඳු ක්‍රියායෙන් වර්ජිතව වසන ප්‍රව්‍රජිතයෝය. ඒ නඩුවිසඳීම අපගේ කර්මාන්තයෙක් නොවෙයි කියා ප්‍රතික්ෂෙප කළසේක. එවිටද ස්වාමීනි මහජනයා කෙරෙහි කරුණායෙන් කරන්ට වටනේය නුඹවහන්සේ දවස මුලුල්ලෙහිම විනිශ්චය නොමකළ වදාළමැනවයි උයනින් මෙහි වඩ නා නුඹවහන්සේ විනිශ්චයස්ථාන නම්වූ අධිකවිධි ඇති අධිකරණ ශාලාවට වැඩමවා උදයම නඩු සතරක් විසඳා වදාළ මැනව. වළඳා උයනට වඩනා කලද නඩුසතරක් විනිශ්චය කර වදාළ මැනව. මෙසේ කළ කල්හි මහජනයාට බොහෝ වැඩවන්නේයයි රජ්ජුරුවන් විසින් නැවත නැවතත් ආශංසිතකොට යාචඤාකරණු ලබන්නාවූ උන්වහන්සේද සිත් නොකැමතිවූවත් අත්නොහරණ සත්වකරුණාවෙන් යුත් බැවින් යහපතැයි පිළිගෙණ එපරිද්දෙන්ම කර වදාළසේක.

ඉක්බිත්තෙන් කූටවිනිශ්චයාමාත්‍යයෝ සිත්ලෙසින් ගත් අත්ලස් නො ලද්දාහුය. ඒ අමාත්‍යයෝද අත්ලස් නොලබන්නාහු දුකඛිතව දිළිඳුව මෙසේ සිතුවාහුය බොධිපරිබ්‍රාජකයන්ගේ විනිශ්චය කාලයපටන් අපිරිසිදු කිසිදෙයක් නොලබම්හ. එසේ හෙයින් ඒ පරිබ්‍රාජිකයා රජ්ජුරුවන්ට සතුරුයයි කියා රජහුගේ සමීපයෙහි සිටීමට අවකාශ නොදී බිඳුවා මරමුයයි කතිකා කොට ඔවුන් හැමදෙන නරාධිපයන් කරා එළඹ මහරාජොත්තමයාතන් වහන්ස බොධිපරිබ්‍රාජක තෙම නුඹවහන්සේට අනර්ථ කැමති කෙණෙක්යයි කීවාහුය, එවිට ඒ තොම අදහන්නාවූ රජ්ජුරුවන්වහන්සේ විසින් උන්වහන්සේ පස් කම්හි දෙස් දත්තෙන් එහි නොස් නොවන නවුස්වෙස්දරවූ විමල්වූ සිල්වත් කෙණෙක ප්‍රාඥයන්ට මනොඥවන ප්‍රඥයෙන් සමන්විතය. මෙසේ නොකරණ සේකැයි කියනලද කල්හිද දෙවයන්වහන්ස කුමක් වදාරණසේක්ද ඔහුවිසින් සියලු නුවරවාසීහු තමන්ගේ හස්තගත කරණලද්දේය හුදෙක් ඔබට නොවෙ නස්වූ මනස් ඇත්තෙන් අපි පස්දෙන පමණක් අත්පත්කොට ගන්ට නො හැකිවිය සෙස්සෙන් ඔහටම වීය ඉදින් අපගේ බස් නොගිවිස්නා සේක්නම් ඔහු මෙහි එනකල පිරිස්බලා වදාළමැනවයි කීවාහුය. එවිට යහපතැයි කියා සීමැදුරු කවුළුව සමීපයෙහි බලා වැඩසිටිනලද රජතෙම බොධිසත්වයන් හා සමග එන්නාවූ පිරිවර පිරිස්දැක තමන්ගේ අඥනත්වයෙන් යුක්තිකාර මනුෂ්‍ය යන් උන්වහන්සේගේ පිරිවරයයි සිතනු ලබන්නේ හෙවත් ඒ සිතා ඔබ කෙරෙහි බිඳී ඊට තිසි කූටාමාත්‍යයන් කැඳවා බණවා සොරමවගෙන් නිමිති අසන්නාසේ කුමක්කරමුදැයි විචාළහ එවිට ඒ අරිෂටවූ දුෂ්ටාමාත්‍යයෝ තූෂ්ටිව යකඩ තුඩුලු කොඩයන්සේ නොපැකිල ඔහු ඇල්ලූය මැනව ඔහු මරවාලුව මැනව රජ්ජුරුවන්වහන්සැයි දක්වූවාහුය එවිට රජ්ජුරුවෝ බලවත් අපරාධ යක් නොදක්නාලදුව ඔහු කෙසේ අල්වාලමුද මරමුවදැයි විචාළහ එසේ වීනම් දෙවයන්වහන්ස ඔහට කරණ ප්‍රකෘතිපරිහාරය හෙවත් උපස්ථානය පිරිහෙලා

ලූව්මැනව හේ පිරිහීම දක පරිබ්‍රාජකතෙම නුවණ ඇතිහෙයින් කිසිවක්හට නොකියා තෙමේම පලායත්තේයයි කීයෙන් රජතෙම යහපතැයි කියා පිළිවෙළින් ඔබට කරණ උපසථාන පිරිහෙවාලූයේක. කෙසේද පළමුවන දවස්හිම මනස්හී සතොස්බැව් සිස්වූවායේම සිස් පයසීඛකායෙහිම හිඳනා පරිද් දෙන් පැණවූහ උන්වහන්සේද සිස් පලඟ දකම නිරිඳුගේ සිත බිඳුනුබව දත උයනට නොලස්ව ගොස් එදවස්ම් යනු කැමතිව එසේවූවද ඒ බව විසයකොට ඒකාන්තයෙන් දත ෙමී සිතා නොවැඩිසේක. ඉක්බිති දෙවෙනි දවස්හි නැවතත් සිස්පලඟ පණවා රජහුගේ මූලුතැන් බතින් හා අතික් බතකුදු රැගෙණ මිශ්‍ර බතක් පිළිගැන්වූහ තුන්වෙනි දවස්හි උඩුමහලට ප්‍රවිෂ්ටවන්ට නොදී හිතිඉසම සිටුවා මුසුබත් දුන්නාහුය හෙතෙම ඒ ගෙණ උයනට ගොස් බත්කිස කළසේක සතරවෙනි දවස්හි යටමාලෙහිසිටුවා ඔබගුණ නොමඩුවූවත් උත්මත් අඩුවූයෙන් රසඅඩුවූ නිවුඩුබත් දුන්නාහුය ගෙදගෙණ උයනට ගොස් බත්කිස කළසේක නැවතද රජ්ජුරුවෝ සත්කාර පිරිහෙලූ කලද මහබොධි පරිබ්‍රාජකතෙම නොයන්නාහ කුමක්කරමුදැයි කියා අමාත්‍යයන් අතින් විචාළ සේක් දෙවයන්වහන්ස කුමක් වදරණසේක්ද අපිතන් දෙඩුමුද හේ තෙම වනාහි බත් පිණිස හැසිරෙන්නේ නොවෙයි සත්පිණිස හෙවත් රාජ්‍යයපිණිස හැසිරෙන්නේය ඉදින් බත් පිණිස හැසිරෙන්නේ නම් පළමු දවස්ම පලායන් නේයයි කීවාහුය දත් කුමක් කරමුදැයි විචාළකල්හි අන් කුමක් කරන්නෙහිද ඔහු සෙටම මරවා වදාළමැනව මහරජ්ජුරුවනියයි කීවාහුය ඒ මහරජ්ජුරුවෝ යහපතැයි ගිවිස ඔවුන්ගේම අතෙහි කඩුව තබා තෙපි සෙට සුලුදොරටත් මහ දොරටත් අතර සිට මාලිගාවට ඇතුල්වන්නාවූ ඔහුගේ හිස කපා කඩ කඩ කොට කිසිවක්හට නොදන්නා අසූචි වළෙක ලා හෙවත් නානාවළ හෙලා ජල ස්නානය කොට යවයි කීහ. එවිට ඔහුහුදු යහපතැයි පිළිගෙණ සෙට අවුත් රහසින් කරම්හයි ඔවුනොවුන් ගිවිස්වා තමතමන්ගේ ගෙවලටම ගියාහුය එසේ අඥනයෝ කිසිවෙක්හට නොදන්අා ඒ අනර්ථය කරමුයයි සිතූ පමණක් මූත් අකුසල් කරන්නාහට ලෙව්හි රහසෙක් නම් නැත්තේය

එයින් වදාළහ.

“නත්ථි ලොකෙ රහොනාම පාපකම්මංපකුබ්බතො
පස්සන්ති වන භූතානි තං බාලො මඤ්ඤති රහො”යි

ඉක්බිත්තෙන් සවස අනුභව කරණලද බත්ඇති නරෙන්ද්‍රතෙම ශ්‍රීයහන්හි සැතපී හිඳ මහබොධිසත්වයන්ගේ ගුණ සිහිකෙළේය. නැවත එපමණකින්ම ඒ රජහට සොක උපන්නේය. ශරීරයෙන් සෙවදජලමොචන වූවාහුය යහන් සක්හිපනස්වූ ආශ්වාදයක් නොලබනහෙයින් ඔබිනොබ පෙරලෙමින්සැලෙන්ට වන්හ ඉක්බිත්තෙන් ඒ වග නොදන් අගමෙහෙස්නද අවුත් ආසන්නව හොත්තීය හේ රජතෙම මෙහෙසිය හා සමග කථාපමණකුදු නොකළේය. ඉක් බිති ඕතොමෝ කිමෙක්ද මහාරාජොත්තමයානන් වහන්ස මානාකථාපමණකුදු නොකරණසේක මාගේ කිසි අපරාධයෙක් ඇද්දැයි විචාළීය. දෙවීනි තොප අපරාධයක් නැත එසේදවුවත් බල එකෙක් ඇත බොධිපරිබ්‍රාජකතෙම අපට පසමිතුරු වූයේයයි නොවිමසා ඔහු හිසවනසාලන පිණිස දෙස්සිතැති පස්මහ

ඇමතියන් කැමතිව ඇණවීම් ඔවුන් පස්දෙන සෙට පරිබ්‍රාජකයන් මරා කඩ කඩකොට කපා අසුචිවලෙක්හි හෙවත් නානවල හෙලන්නාහුය උන්වහන්සේ අපට වනාහි දොළොස් අවුරුද්දක් නොලස්වම අසෙසනීයෙන් විශෙෂවූ නිදොස් වන පසැය් දෙසුත් විලස්ගෙණ බොහෝ දහම් දෙසුයේය. ඔබගේ එකවරද කුදු මාවිසින් ප්‍රත්‍යක්‍ෂහෙයින් නුදුටුවිරුය. අනුන් කී වචනය අදහාගෙණ ඔහට වදකරණ පිණිස මාවිසින් අණවන ලද්දේය ඒ කාරණය හේතු කොට ගෙණ සොක කෙරෙම්යි කීසේක

ඉක්බිත්තෙන් ඕතොමෝ ඉදින් දෙවයන්වහන්සේ සේතෙම අපට සතුරු වූයේනම් ඔහු නැසීම කාරණකොටගෙණ කුමට සොක කරන්නෙහිද සතුරු නම් පුත්‍රයා නමුදු නසා තමන්ටම සුවබවෙක් කටයුතුය නොසිතුව මැනව දෙවයන්වහන්සැයි කියා අස්වසාලුවාය, හේ රජතෙම මෙහෙස්නගේ වචන යෙන් ලබනලද අස්වස් ඇතිව නිද්‍රාවට පැමිණිසේක. එකෙණෙහි කුලෙහි උපන් හෙයින් කොලෙය්‍යක නම්වූ පිඟුවන් සුනඛතෙම ඒ කථාව අසා සෙට මාගේ බලයෙන් ඒ පරිබ්‍රාජකයන් වහන්සේට ජීවිතදානය දෙන්ට වටනේ යයි සිතා අවෙනිව දෙවෙනිව දවස්හි උදයම ප්‍රාසාදයෙන් බැස මහදොර සමීපයට අවුත් මැලිසිතක් නැතිව එළිපත මත්තේ හිස තබා මහසත් එනමඟ බලබලා හොත්තේය. ඒ කුඩුරඩු ගුණවැඩූ කඩුගත් අත්ඇති කැමති වූ නොකමැති ඇමතියෝ පස්දෙනද එදවස් නොලස්වම උදයම අවුත් දොදොර අතුරෙහි නොහොත් දොරමුල්ලෙහි සැඟවී සිටියාහුය, බෝසතුන්ට නේසෙත් දෙන බෝසත්තුමාද කල්සලකා වල්කලා සිවුරු ඇඳ පෙරව පාත්‍රය ගෙණ උයනින් නික්ම රජගෙදොර කරා එළඹිසේක. ඉක්බිති සුනඛතෙම උන්වහන්සේ දැක ඔබට නමුව සිට මුවවිවරකොට සතර දළයන් දක්වා කිමෙක්ද වහන්ස දඹදිව්තලෙහි අන්හැනෙක්හී දන් නොලබන්නෙහිද අප රජතෙම තොපගේ මැරීම පිණිස කඩ්ගහස්ත පස්මහ ඇමතියන් දොදොර අතරෙහි හෙවත් දොර මුවාවෙහි සිටුවූයේය. තුඹ තල්ලින් මරණගෙණ වැඩිසේක්ය මෙතතින් වහා ඔබ්බකට වැඩියමැනවයි මහාශබ්දයෙන් හැඬීය. උන්වහන්සේ විකලනොව සකලසත්‍වයන්ගේ ශබ්දයන්හී අර්‍ථ දන්නාහෙයින් ඒ අර්‍ථය දැන එපමණක්න් නැවතී උයනට ගොස් වඩනා පිණිස පිරිකර ගත්සේක. එවිට සීමැදුරුකවුළුව සමීපයෙහි සිටි රජතෙම මහසත් එනබවද යනබවද දැක ඉදින් මේතෙම මට පසමිතුරුවීනම් උයනට ගොස් පිරිය් රැස්කොට සවන් කිරීම ගැණ සැරහීම එන්නේය, ඉදින් සතුරු නොවූයේනම් තමන්ගේ පිරිකර ගෙණ ගමනට සැර හෙන්නේයයි ඒතාක් ඔහුගේ ක්‍රියාව දැනගණිම්යි සිතා උයනට ගොස් නිදොස් වූ තමන්ගේ තවුස්පිරිකර ගෙණ යෙම්යි සිතා පන්සලින් නික්මෙන්නාහු සක්මන් කෙළවරදී දැක වැඳ එකත්පස්ව සිට මෙසේ කියනසේක් කිමෙක්ද සවාමීනි පෙර අපගේ මාලිගාවට වඩනා නුඹවහන්සේ නොමිතුරු කොටම කතුරු යටාදීන් හැමපිරිකර ගන්නාසේක්ද අද මෙවර වනාහි කවර කරුණක් හෙතුකොටගෙණ සැරයටිය අඳුන්දිවිසම කුඩය වහන්සඟළද මැටිපය් යද එල්වන දෙහෙටිල්ලද මැටිපාත්‍රයද සඹකාටියදැයි යන මේ සියලු පිරිකර වේලෙවී වෙලෙවි සවභාවයෙන් ගන්නෙහිය බ්‍රාහ්මණයාතන් වහන්ස මම මීට විස්මයවීම් කිමෙක්ද කවර දිගක් ප්‍රාර්‍ථනා කරන්නෙහිද කොතැන්හි වඩනා කැමතිසේක්දැයි කියා ගස දන්නාවුන්ට පත් නෙලා පාන්නාසේ විචාළසේක.

ඒ පසාරබස් අසා දිසානුදිසපතළ විසාරද නැණැති මහබෝසත්තෙම මේ රජ
තෙමේ තමන් විසින් කරණලද ශ්‍රේෂ්ඨජන තුෂ්ටනොවන අනිෂ්ටවූ දුෂ්ටකර්‍මය
මම නොදත්තෙමියි කියා සිතන්නේය. හේ මම දත්බව දන්වමියි සිතා මෙසේ
වදාරණසේක් මහරජ දූත් දෙළොස් අවුරුද්දක් තොප සමීපයෙහි වසන ලද්
දේය. එසේවූ මම තොපගේ මේ මැගුවලින් තුටුවන පිඟුවන් සුතබයා විසින්
මෙසේ මහහඬින් හඬනලද බවෙක් නොදත්තෙමි හේ මේ සුතබතෙම අද සුදු
දළ දක්වමින් දර්පිත වූවාක්මෙන් හඬන්නේය. ඒ කුමක් හෙයින්දයත් මාගේ
මැරීම පිණිස තොප ඇමතියන් පස්දෙනාට නියෝගකළ කාරණය දෙවීන්ට
කියන්නාවූ මමවන විගතශ්‍රද්ධාව ඇති තොපගේ වචනය අසා ඒ මංගලගුණ
ඇති පිංගල සුතබතෙම වහන්ස නුඹට දූත් අන්තන්හි දත්නොලැබේද රජ්ජු
රුවන් විසින් නුඹ මරණ පිණිස නියොග කරණලද්දේය. එහෙයින් මෙහි නො
වැඩිය මැනවයි කියා බිරුයේයයි වදාළසේක. ඉක්බිත්තෙන් මහරජතෙමේ
තමන්ගේ මෙෂයෙන් කළ දෙෂය නොමැලිව ඇලිව සිතින් පිළිගෙණ ක්‍ෂමා
කරවනසේක් බාහ්‍යකරණලද පාපයන් ඇත්තෙන් බ්‍රාහ්මණ නම්වූ ස්වාමීන්
වහන්ස නුඹවහන්සේ යම් දෙෂයක් යම්සේ වදාරන්නෙහිද හේ දෙෂය එපරිද්
දෙන්ම කරණලද්දේ විය. හේ මම පෙරට වඩා ඔබ කෙරෙහි විශෙෂයෙන් ප්‍රස
න්නයෙමි බ්‍රාහ්මණයානන්වහන්ස අන් තැනකට නොවැඩ මට වැඩ වැඩිවන
පිණිස වැඩසිට වදාළමැනවයි ආරාධනා කළේය. ඒ අසා මහසත්තෙම මහරජ
පණ්ඩිතයෝනම් තොපවැනි පරප්‍රත්‍යසංඛ්‍යාත අනුන් කීනාක්ම නොසොයා
ගැණුම්ඇති අපරීක්‍ෂාකාරීන් හා සමග නොවසන්නාහුයි කියා ඔහුගේ අනා
චාරය ප්‍රකාශකරණසේක් මහරජ පළමුවෙන්ම සන්තොෂවූ තොපගේ නිවෙස්
නෙහි මට සණීතිධවලොදන සංඛ්‍යාත සිනිල්ලම් සුදුසුබත් විය යමක් තොප
අනුභව කරන්නෙහිනම් ඒ මටද දෙවීය එයින් පසු හෙදකයන්ගේ වචනය
ගෙණ මා කෙරෙහි තොපගේ සුරක්තචිත්තය විරක්තවූකල්හි සබලසංඛ්‍යාත මිශ්‍ර
කාහාරවිය දූත්වනාගී සජීලොහිතවූ කුඩසහිත නිවුඩුබත්විය. එහෙයින් අප
නොකමැති තොපවෙතින් පහවම් යන්ට වටනේයයි තවද මහරජ පළමුවෙන්
මට අභ්‍යන්තර අසුන්විය නෙද විවිධාලඞ්කාරතොජ්වලිතානෙකමාලකොපසො
භිතසුන්දර මන්දිරයෙහිවූ උඩුමහල් තලයෙහි නගනලද ධවලච්ඡත්‍ර ඇති රාජ
පර්‍ය්‍යංකයෙහිම මා වඩාහිඳුවන ලද්දෙහිය, එයින් පසු මධ්‍යවූ සොපානමස්තක
යෙහිද එයිනුදු පසු නත්බාහිරවූ යටමහල්හිද අසුන් විය එහෙයින් යම් විටක
ඇවිට බෙල්ල අල්වායවයි කියා නිකුත්කිරීම නොවේද එසේ නෙරපීමට පළමු
කොට ඒ බව නිජබුද්ධියෙන් සිතාම මම යන්නෙම් වේදැයිවදාරා නැවත කාරණා
වසයෙනුදු දක්වනසේක් මහරජ මේ ලොකයෙහි නුවණැත්තෝ පැන් නැති
ලිඳ නොසෙව්නාසේ තමන්කෙරෙහි විගතශ්‍රද්ධාවෙන් යුක්ත තැනැත්තා නොම
සේවනය කරන්නේය ඉදින් පැන් නැති ලිඳකාරා පත් පුරුෂතෙම පැන් නො
දක්නේ ඒ ලිඳ මඩ නොඩළා යටකරන්නේය එසේ කැනන් පැනෙක් ඇත්
නමුදු මඩගඳින් යුක්තව අමනොඥ හෙයින් නොපියහැකි වන්නේය. එසේම
දුරුකරණලද ශ්‍රද්ධාභක්ති ඇති පුරුෂයා භජනය කිරීමෙන් ලත් ප්‍රත්‍යයක්
නමුදු අමනොඥ වන්නේය රුක්‍ෂද වන්නේය සවල්පද වන්නේය අමනාපද
වන්නේය තවද මහරජ උදකාර්ථී තැනැත්තහු විසින් සෙවුනාලද සිසිරොදක
පරිපූර්ණවූ ගම්භීර මහවිලක් සෙයින් ප්‍රතිෂ්ඨිත ශ්‍රද්ධා ඇති තැනැත්තහුම සෙව
නයකටයුතුවන්නේය. තවදමහරජ මේ ලෙව්හි තමන් භජනයකරණ පුරුෂ

යාම භජනයකරන්නේය තමන් භජනය නොකරණ අමිත්‍රයා නොම භජනය කරන්නේය යමෙක් තමන් භජනයකරණ හිතචිත්තයෙන් යුක්ත මිත්‍රයා භජනය නොකෙරේනම් හෙතෙම අසත්පුරුෂ සවභාවය ඇත්තේනම් වන්නේය. එසේ යම්පුද්ගලයෙක් තමන් හිතචිත්තයෙන් භජනය සෙවනයකරණ පුද්ගලයා වෘක්ෂාරූඪවූ ඒවෘක්ෂයාගේ උපකාර නොසිතා ශාඛාශ්‍රිතව හිඳ මඩඵලාදියෙහි තෙමේත් භජනය සේවනය නොකරේනම් ඒකාන්තයෙන් ඒ පුද්ගලතෙම ලොල්වූ සල්ව සල්වා කා නසන්නාවූ ශාඛාමෘගනම්වූ වඳුරෙක් යම්සේද එමෙන් ඔහුද මනුෂ්‍යාධම නම්වන්නේය මනුෂ්‍යපාපිෂ්ට නම් වන්නේය. එසේම පිළිකුල් නමුදු සමීපශ්චිම මනුෂ්‍ය නමුදුවන්නේය තවද මහරජ මිත්‍රයන්ගේ සමීපයෙහි අනවරත සංසර්ගයෙන්ද අතරතුරෙහි නොයාමෙන්ද නොහොත් අතරතුර බහුලව යාමෙන්ද අයුක්තප්‍රාප්ත කාලයෙහි අනුන්ගේ ප්‍රියවස්තු ඉල්වීමෙන්දැයි යන මේ විවිධක්‍රියාවෙන් ඒ මිත්‍රධර්මයෝ නසින්නාහුය මිත්‍රයෝ බිඳෙන්නාහුය. එසේ එක්වන් සංසර්ගාදීන් මිත්‍රධර්මයෝ බිඳෙද්ද එහෙයින් පවිත්‍ර කොට මිත්‍රධර්මය රක්‍ෂා කැමැත්තන් විසින් තමන්ගේ මිත්‍රයන් කරා අතරතුරෙහිද බහුලව නොගොස් චිරාත්කාලයක් ඉක්මවා එළඹිය යුතුය යුත්පත් කල්හි ඉල්වන්ට සුදුසු භාණ්ඩයක් ඉල්විය යුතුය එකල්හි මිත්‍රධර්මයෝ නොනස්නාහුය. තෙපිද මහරජ චිරසංගතිකවාසය හෙතුකොටගෙණ මා කෙරෙහි පැවැත්වූ මෙත්සිත් බින්දේය. තවද මහරජ බොහෝකලක් එක්තැන විසීම හෙතුකොටගෙණ ප්‍රිය තැනැත්තේ අප්‍රියවන්නේය. එසේහෙයින් මහරජ තොපට අපි යම්තාක් නැවතත් අප්‍රිය නොවමෝනම් ඒ වීමට පළමුකොට එපවත් තොපට දන්වා යම්හයි වදාළසේක. එවිට ඔබ කෙරේද දරණ පෙමැති නරනායකතෙම සවාමීනි වහා අධිගතගුණාධික මහාබෝධි පරිබ්‍රාජකයන් වහන්ස මෙසේ මාවිසින් සාංජලීව කරණලද යාච්ඤාව නොම පිළිගෙණ වදාරණසේක් වීනම් නුඹවහන්සේගේ පරිවාර සත්වසංඛ්‍යාත අපගේ වචනය ඉවසීමක් නොම කොට වදාරණසේක්වීනම් සවාමීනි හේ නුඹවහන්සේට සෙත් අයදිමි. නැවත මෙහි වඩනා ගමන සිදුවන ලෙසට නෙවත් අප නෙක්වරද ඉක්මවා එක්වරක් මෙහි වඩනා ලෙසට ප්‍රතිඥාවක් කර වදාළමැනවයි ආරාධනා කළහ. එකල බෝසත්තව තේරුත් කැමති බෝසත්තෙම ඉදින් මහරජ මෙසේ වෙන්ව යන්නාවූ අපට අන්තරායෙක් නොවීනම් දූනව ප්‍රකව රටවඩන මහරජ තොප දිවි අතුරුදන් නොවී ඉතුරුවීනම් බොහෝ අහොරාත්‍රියක්හුගේ ඇවෑමෙන් දක්නමෝද එසේවීනම් යහපතැයි මෙසේ වදාරා මිහිපල්හට අතුරුදහම් දෙසා කුසලධර්මයෙහි අප්‍රමාදවෙව මහරජයි වදාරා උයනින් එක් සුදුසු ස්ථානයෙක්හි පිඬුපිණිස හැසිර වළඳා ඉක්බිති ඒ වරදස්වන්නට බරණැස්නුවරින් නික්ම අනුක්‍රමයෙන් අනෞපවිත තපෞෂධ සොයන සද්ගණාභජන නේ පච්දුරු කරණව ප්‍රකොසලනැත් ඇති නේ පවු පෙලින් දිලි හිමව් පියසිම වැඩ නොබෝකලක් එහි වැස නැවත මිනිස්පථයට බැස එක් ප්‍රත්‍යන්තගමක් නිසා ගුණ මෙනෙහිලා වෙනෙහි විසූහ. ඒ පරිබ්‍රාජකයන් වහන්සේ වැඩිතැන් පටන් දැඩිකම්හි කඩින්ව එඩිමත්වූ ඒ අමාත්‍යයෝ නැවත නිශ්චයක් නැති විනිශ්චයෙහි පිහිටා හිඳ සිත්ලෙස අත්ලස් ගැණීමෙන් රට නසන්නාහු මෙසේ සිතුවාහුය. කෙසේදයත් අපි එහි නැතත් ධර්මිකයයි කීවාසේ ඉදින් මහාබෝධි පරිබ්‍රාජක තෙම එහිම නොනැවත නැවත මෙහි පැමිණියේනම් නොපදිවි නැත එහෙයින් ඔහුගේ මේ ගමන වැළැක්මට කුමක් කරමුදැයි මන්ත්‍රණය කරන්නාවූ ඔවුන්ට

නැවත මෙසේවූ සිතිවිල්ලක් විය. මේ සත්‍වයෝ ප්‍රතිබද්ධස්ථානයක් නම් හරනට නොහැක්කාහුය එහෙයින් ඔහුගේ ප්‍රතිබද්ධස්ථානය මෙහි කවරෙක්දැයි නොම අසා විමසන්නාහු රජහුගේ අගමෙහෙස්නයයි දැන එකාන්තයෙන් මේකාරණය විද්‍යමාන වන්නේය. මේ අගමෙහෙස්න නිසා හේතෙම මෙහි පැමිණෙන්නේය එහෙයින් ඔහුගේ ජීවිත පළමුකොට ඒ අගමෙහෙස්න රහස්නයකින් මරමුයයි කතිකා කොට මිහිපල්කරා එළඹ ඔහු පල්නට කරණදෙයක් මෙන් හඟවා රජ හට මෙසේ දැන්වූවාහුය. බෝධි සිරිදර දෙවයන් වහන්ස මේ දවස්හි නුවර සතොස්වූ එක්කථාවක් අසනු ලබන්නේය. කවරතම් කථාවෙක්දැයි යත හොත් අප පහාගිය මහාබොධි පරිබ්‍රාජකයන් හා අග්‍රමහෙසිකාවද යන දෙදෙන ඔවුනොවුන් අසුන් පිළිඅසුන් ඔබනොබ හරණාහුයයි දැන්වූවාහුය. කුමක්කොට හරණාහුදැයි පිළිවිසි කල මෙවුසාවිදත් තවුසාවිසින් වනාහි ඔබට අහිතෙසිවූ මහෙසියට තොප බෙලෙන් රජු මරා මට සේසත් දෙන්ට පෝසත්දැයි කියා එවන ලද්දේය ඒ වියහැකියයි දත් දෙවිය විසින් රජගේ මැරීමනම් සෑහුව මට භාරය ඒ නොමදහා වහා එන්වයි කියා ඕහට යවන ලද්දේයයි සැලකළාහුය. එවිට නානාධික නුවූ ජනාධිපතිතෙම නොනැවතම නැවත නැවතත් කියන් නාවූ ඔවුන්ගේ වචනය සැබවයි අදහා දැන් මීට කුමක් කටයුතුදැයි විචාරා ඒ නොවියයුත්ත සිදු දෙවිය මරන්ට වටනේයයි කටට ආවාක් කීකල්හි රජ තෙම අපරීක්ෂාකාරීවම එසේවීනම් ඈ නොපිම මරා කඩ කඩ කොට සිඳ අසුචි වළෙක ලවයි නියොග කළසේක. අමාත්‍යයෝද බිසවුන් මරා එපරිද්දෙන්ම කළාහුය. ඒ නිර්දෙෂවූ දෙවීන් මැරූබව මුලුනුවර පතළවිය. ඉක්බිත්තෙන් ඒ අග්‍රමහෙසිකාවගේ කුමාරයෝ සතරදෙන මේ රජහුවිසින් නිරුපරාධීවූ අපගේ මෑනියන්වහන්සේ මරවන ලද්දේයයි පියරජ්ජුරුවන්ට පසම්තුරුවූවාහුය. එහෙයින් රජ්ජුරුවෝද මහත් භයට පැමිණියහ එකල අවිකල විමල තුල් කරුණා ඇති අප මහබොධිසත්වයන් වහන්සේ පරම්පරාවෙන් එපවත් අසා මෙසේ සිතනසේක් මාද ඇර මේ පිතෘමරණාභිලාෂීව ශත්‍රුවූයෙන් ක්ෂමා කරවන්ට අමාරුව සිටිනා කුමාරුවන් සංසිඳුවා පියා පියානන් ක්ෂමා කරවන්නට සමර්ථයෙකෙණෙක් නම් නැත එහෙයින් රජ්ජුරුවන්ටද ජීවිත දානය දෙමි කුමාරවරුද පාපයෙන් මුදන්නෙමියි සිතා උන්වහන්සේ අවෙනි නොව දෙවෙනි දවස් අත්‍යනත කාරුණාවෙන් ප්‍රත්‍යනත ගමකට වැඩ මනුෂ්‍යයන් විසින් සොඳුරුකොට දෙනලද වඳුරුමස් වළඳා ඒ ඉඳුරාම මස් වැළඳූ වඳුරාගේ සම්ද ඉල්වාගෙණ පන්සල ගෙණගොස් දම් වැඩහල නිවටූන්ගේ මත් මඩනට සම්කඩ වියලාගෙණ එහි දුගීඞ්ධතාවය නැතිකොට හැඳපෙරව එකාන්ස කොට බහා ගත්සේක. කවර කාරණයක් නිසාදයත්? මේ වඳුරුමට බොහෝ උපකාරයයි මතු කියන්නට පැමිණෙන වචනයක් සඳහාය ඉක්බිති උන්වහන් සේ ඒ වලීර්මුඛ චර්මය ගෙණ වලින් නික්ම අනුක්‍රමයෙන් වරසිරින් බරවූ බරණැසට නොලස්ව ගොස් ඒ සුකුමාරවූ කුමාරවරු කරා නිරාසඞකව එළඹ වදාරණසේක් කුශලඝාතකවූ පිතෘඝාතක කර්මයනම් ඉතා දරුණුය හේ තොප විසින් නොකටයුතුය, අජරාමරසත්වයෙක් නම් නැත මම තෙපි ඔහුනොවුන් සාමග්‍රිකරවමි සිතා ආමි මාවිසින් නැවත එවනලද අස්නක් ඇතිකල එවයි කියා ව්‍යපසමනයට අමාරුව සිටි කුමාරවරුන්ට අවවාදකොට කුලුණු සිනා ලුනුවම ඇතුලුපුර උයනට පිවිස එහි අතර දමනයට වානර සම කරණකොට අතුට මඟුල් සල්වට මත්තෙහි වැඩඋන්සේක. ඉක්බිති වෙහෙස් ගුණධරවූ

තවුස් තුමන් දැක උද්‍යානපාලක තෙමේ බුහුමන් කොට යුහුවගොස් රජහට එපවත් සැලකෙළේය. රජතෙමේ ඒ අසා සංජාත සෞම්නස්‍ය ඇතිව එවිට දෞම්නස්‍යවත ඒ අමාත්‍යයන් ගෙණ එහි උයනට වැඩ සිහිපත්ව මහසත් වැඳ හිඳ මැලිනොව ඇලිසිතින් පිළිසඳර කථාකරන්ට පටන්ගත්හ. මහබෝධිසත්වයන් වහන්සේ ඒ රජහු හා සමග පිළිසඳර කථා නොකොට ඉන් පැමිණෙන වාදයට සොඳුරු ඇඳුර කඩක්ව තිබෙන වඳුරු සම්කඩම පිරිමැද මැදම උන්සේක.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ මහසත්හට මෙසේ කියනුයේ ස්වාමීනි නුඹවහන්සේලා මා නොවිචාරා සොඳුරු නොවන වඳුරු සම්ම පිරිමදිනසේක්ලාය කිමෙක්ද මේ වඳුරුසම නුඹවහන්සේලාට බොහෝ උපකාර තරද්දැයි විචාළාහ එසේය මහරජ මේ වඳුරා මට බොහෝ උපකාරය මම මොහුගේ පිටනැගී ඇවිද්දෙමි මොහු මට පැන්කල ගෙණවුත් දීලිය වසනතැන් හැමැත්දේය මොහු මට සතතයෙන් කටයුතුවූ ආභිසමාචාරික වත් පිළිවෙත් කෙළේය මම වනාහි මාගේ දුබීල සිත්බැවින් ඔහුගේ මස්කා සම්වියලාගෙණ අතුට හිඳිමි හෝම් මෙසේ මට බොහෝ උපකාරයයි කීසේක. මෙසේ උන්වහන්සේ ඔවුන්ගේ වාද බිඳින සඳහා වඳුරු සමෙහි වඳුරු වැවහාරයක් ආරොපනය කොට මේ පයසීාය නිසා මේ කථාව මෙසේ කීසේක කෙසේද උන්වහන්සේ වඳුරු සමෙහි වැඩ උන් විරූ බැවින් මොහුපිට ඉඳ ඇවිද්දෙමි යි කීසේක, එසම ඇතුගෙහි තබා පැන් ගෙණා විරූ බැවින් පැන්කල ගෙණෙණ ලද්දැයි කීසේක. ඒ චර්‍මයෙන් ශර්‍ම පිණිස බිම් හැමදි විරූබැවින් වසන තැන් හැමත්දේයයි කීසේක. තිපත්කල්හිද එසමින් පිට ඇක්මුනු කල්හි පාදදීස්ගේ ස්පර්‍ශවූ විරූබැවින්ද සතතයෙන් කටයුතු වත්පිළිවෙත් කළේයයි කීසේක සයින් පීඩිතකල ත්‍රිකොටි පරිශුඩතාවෙන් නිදෙස්ව ඔහුගේ මස් ලැබ වැළඳු බැවින් මම වනාහි මාගේ දුබීල සිත් බැවින් ඔහුගේ මස් අනුභව කෙළෙමියි කීසේක ඒ අසා ඔබ විසාරද බව නොදත් අමාත්‍යයෝ උන්වහන්සේ විසින් නොඉවසිය හැකි සයින් ප්‍රාණඝාත කරණලද්දැයි යන සිතින් පින්වත්නි දුත්වත් තෙපි මේ තපස්වියාගේ අපිස් කමක් හා සතොස් කමක් බලව මේ වනාහි වෙත පුරුදු තමනට කීකරු වඳුරා මරාකා දහම් රකිමියි සම්කඩ ගෙණ ඇවිදිනේය අහෝ මෙබඳු පොහෝතර බොහෝ ගුණ ඇති මනෝත්තමයෝ ලොවත් නව වෙතත් ඇද්දැයි කියා මහත්කොට සිත්ලෙසට අත්පොලසන් දී සිනාසිසී ඔල්වරහඬ දිදී බොහෝසේ නින්දාකළාහුය එවිට මහත්නැණදර අගපත් ගුණඇති මහසත්වයන් වහන්සේ විශෙෂ නොදැන එසේ කරන්නවුන් දැක මොවුන් තමන්ගේ මෙම වාදභෙදනය නිසා පසාරයෙන් සම්ගෙණ ආ බව නොදත්තාහුය ඒ සිත් ගන්වාලමියි සිතා දෘෂ්විජන විහඞ්ගගණ මධ්‍යගත ගරුඩරාජයෙකුසේ නිර්භීතව හිඳ පළමුකොට සහෙතුකවත් නැතැයි දත් අහෙතුකවාදියාට ඒ මන්ත්‍රණය කොට අවැත් විදි නොදත් ඇවැත්නී තෝ මට කවර හෙයකින් නින්දාකෙළෙහි දැයි විචාළසේක. එවිට හෙතෙම ඇවිට්ව ගැහැට්යක් නොවම කියට්ය කැයි සිතා පවිත්‍රනොවූ මිත්‍රද්‍රෝහී කර්‍මයාගේ හා පෞරාණාතඝාතක ප්‍රාණඝාත කර්‍මයාගේ හා සමාදනය කළහෙයිනැයි කීය. එකල අවිකල සකල ගුණධර මහබෝසත්තෙම යමෙක් තාගේම දෘෂ්ටියෙන් යුක්තව ඒ සැබෑවයි අදහ එසේ කරන්නේනම් ඔහු විසින් කවර දූසකෘතයක් රුස්කරණලද්දැයි කියා තවත්

ඔහුගේ වාදභෙදනය සඳහා කියනසේක් මන්බල නොදත් එබල අකෘතඥවූ අඥනය හෝ වනාහි මේ අහෙතුකවූ සත්වයන්ගේ කෙලෙසිල්ල පිණිස හෙතුයෙක් ප්‍රත්‍යයෙක් නැතැයි යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙහිය. මේ ලොකවාසීහු සංගතියද ස්වභාවයද කරණකොටගෙණ කෘෂ්ණාභිජාති ශුක්ලාභිජාත්‍යාදි වසයෙන් ෂට්විධවූ අභිජාතීන් සම්බන්ධිතවූ එම අභිජාතීන් කරා උපපත්ති වසයෙන් එළඹීමෙන් අනුව පවත්නාහු ඒ ඒ තන්හි සුඛදුක්ඛානුභව කෙරෙති නොකැමැත්තෙන් අකර්තව්‍යවූ අකුශලයද කර්තව්‍යවූ කුශලයද කෙරෙතියි කියන්නෙහිය. මේ තාගේ ලබ්ධිය හා තෙපුල් ඉදින් සත්‍යවීනම් එසේ ඇති කල්හි තමාගේ ස්වභාවයෙන්ම කුසලාකුසල දෙක පවත්නාකලද හේකරන්නාවූ සත්වයාද නොසිරිත්ම කුසල් අකුසල් දෙක කරණ කල්හිද මෙලොව කවරෙක් තම් පවිත් මුසුවේද හෙවත් අකුසල විපාක අනුභව කෙරේද එසේ නැතිව තමින් විසින් නොකරණලද අකුසල හේතුකොට අකුසල් විපාකානුභව කෙරේනම් අකුසලවිපාක නොවිඳින එකද සත්වයෙක් නම් ඇද්ද නැත්තේමය ඉදින් පින්වත් තාගේ ඒ අහෙතුකවාදිසංඛ්‍යාත අර්ථයද තදර්ථජෙකත සංගතිභාවයද යන ධර්මයද කල්‍යාණ වීනම් යහපත් වීනම් ලාමක නොවී නම්ද හෙවත් අහෙතුප්‍රත්‍යයෙන් සත්වයෝ කිළිටුවන්නෝය, කාරණයක් නැතිවම සුවදුක් විඳින්නෝයයි කියනලද පින්වත්වූ තාගේ වචනය සත්‍යවීනම් මා විසින් වඳුරා මනාකොට මරණලද්දේනම් වෙස් මෙහි මාගේ කවරදොෂයෙක්ද ඉදින් තෝ තාගේ විරෝධවූ වාදයාගේ අපරාධය දන්නේවීනම් ගර්හාවට අර්හත් නුවූ මට ගර්හා නොකරන්නේය. කුමක්හෙයින්දයත් හවත්වූ තාගේ වාදය එබඳුමය එහෙයින් දූත් තෝ මෙතෙම මාගේ වාදය පිළිපදින ලදැයි මා ප්‍රශංසා කරන්ට සුදුසුය. එසේවූකල තාගේ වාදයෙහි ලක්ෂණ පමණකුදු නොදන්නාහෙයින් මට ගර්හා කරන්නේයයි කීසේක.

මෙසේ ඒ වාදව්‍යපසමනයට පොහොසත් මහසත්‍වොත්තමයන්වහන්සේ සූකරමස් උෟකරගතම තබා සිදිනාසේ ඔහුගේ වාදයෙන් ඔහට නිග්‍රහකොට අප්‍රතිභාන කළසේක. එකල හේතෙමද විරාජිත රජපර්ෂත් මධ්‍යයෙහි මකුවූයේ පත්කඳව සිතිවිලි සිතමින් බිම්බලා හුන්නේය. ඉක්බිති කරුණාධික බොධිසත්වයන් වහන්සේ ඔහුගේ වාදබිඳ ගුණෛශ්වර නොවන ඊශ්වර කාරණ වාදීනු බණවා ඇවැත්ති ඉවත්නොව කියව තෝ මට කුමක්සත්ද, නිත්ද, කෙළෙහිදැයි විචාරාඉදින් ඊශ්වර නිර්මාණ වාදය සාරහෙයින් ගත්තෙහිදැයි වදාරණසේක් එබල ඊශ්වරවාදිකාය ඉදින් මහාබ්‍රහ්මයා හෝ අන්කිසි ඊශ්වරයෙක් හෝ තෝ කෘෂිකර්මයෙන් ජීවත්වෙව තොගේ රක්ෂාවෙන් ජීවත්වෙවයි මෙසේ සර්ව ලොකයාහට බණවා විචාරණය කරවන්නේ නම් ඓශ්වර්යයී ප්‍රභෙද සැපයද ඥාති විනාසාදී ව්‍යසන භාවයද අවශෙෂ කුශලාකුශල කර්මයන්ද මහාබ්‍රහ්මයාම සත්වාරූඪ වසයෙන් කෙරේනම් ඒ නියොගලත් පුරුෂතෙම ඒ පව්කරන්නේනම් නොවෙයි එහෙයින් ඒ පුරුෂයා නිර්දොෂකාරීය ඔබහට බ්‍රහ්මාවෙෂ වසයෙන්වූ ආනතන්ති පමණෙක්මය එබල මෙසේ ඇතිකල යම්පුරුෂයෙක් කිසි අකුසලයක් කෙරේනම් හේ ඊශ්වරසංඛ්‍යාත මහාබ්‍රහ්මයා විසින්ම කරණලද බැවින් බ්‍රහ්මයාම ඒ අකුසලයෙන් ලිම්පනයවන්නේය මුසුවන්නේය හෙවත් ඒ ඊශ්වරයෝම ඒ අකුසලවිපාක විඳිනාහ ඒ අකුසල් කළ සත්වයාට කිසි දෙෂයෙක් නැත්තේය. ඉදින් ඒ බ්‍රහ්මයාම සර්ව ලොකයාහට බණවා සියල්ලම

කරවන්නේයයි යනාදී තාගේ අභිධර්මදෙක යහපත් වීනම් ලාම්ක නොවී නම් මාවිසින් වඳුරා ඉඳුරා මනාකොට මරණලද්දේ නම්වෙයි එයින් මට කවර දෝෂයක් වෙයිද එහි දෝෂයෙක් ඇත්නම් තාගේ වාදයෙහිවූ නියාවට ඊශ්වර යාටමයයි යනාදීන් පෙරසේම සෙස්සද වඳුරා අඹගසින්ම පොලූගෙණ ගසා එමගස අඹ තෙලාහෙලන්නාගේ ඊශ්වරකරුණෙන්ම ඊශ්වරකාරණා වාදය බිඳ අපූර්වූ පූර්වකෘතවාදිකයා අභිභවනයට අභිමුඛකොට මනාවූ පැවැත්මක් ඇති ඇවැත්නි තෝ මට කවර හෙයකින් නින්දා කෙළෙහිද ඉදින් පූර්වකෘත වාදය සත්‍යකොට සිතුයෙහිදූයි කියා ඔහුගේ වාද බිඳින පිණිස දෙසනසේක් එඹල අමාත්‍යය ඉදින් පූර්වාත්මභාවයෙහි කරණලද කර්මයම හෙතුකොට ගෙණම ලොවැසිතෙම උසස්වූ යශස්ශ්‍රී ආදී සුවයට හා වධබන්ධනාදී දුක්ඛයටද පැමිණෙන්නේනම් ඔහු විසින් පෙර කරණලද අකුසල් නමැති හේ හේ තය දූන් මිඳිම් වසයෙන් යෙදී ඒ තයින් මිදෙන ලද්දේය මේ තාගේ වාදයෙහි ලක්ෂණය මෙහෙයවූ තාගේ වාදසැබෑ වීනම් මටද මේ ගොදුරුවූ වඳුරුතෙම පෙරගත් තය දී දූන් තයින් මිදුනේය කෙසේද පෙරජාතියෙහි මේ වඳුරා පරිබ්‍රාජකයෙක්ව ඔහු විසින් එකල ඒ වඳුරුව උපන්නාවූ මම මරා කන ලද්දෙම් වීම් එකල ඒ පරිබ්‍රාජිකතෙම මෙකල උවදුරු ඇති වඳුරු අත්බවට පැමිණියේය එකල්හි වඳුරුව මෙකල්හි පරිබ්‍රාජකත්‍වයට පැමිණි මා විසින් දූන් ඒ මේ වඳුරා ඉඳුරා මරා කනලද්දේ වන්නේය මෙහි අප දෙපක්ෂයෙන් කවුරු නම් අකුසලයෙන් ලිම්පනය වේද මුසුවෙමුද පලමු කරණලද මරණ ක්‍රියා සංඛ්‍යාත තයින් මිදුන පමණක් විනා අප උභයපක්ෂයට අකුසලයක් නැත්තේ වේදූයි යනාදී වසයෙන් පෙරකී සෙයින්ම සෙස්සද වදාළසේක. මෙසේ විසාරද මේධාවික බෝධිසත්වයන් වහන්සේ ඔහුගේ වාදවිච්ඡේදනය කොට උච්ඡේද වාදියාට ආමන්ත්‍රණය කොට ඇවැත්නි තෝ දෙනලද දානයාගේද කරණලද පූජාසත්කාරයාගේද ඵලවිපාක නැත්තේයයි යනාදීන් කියා ජලාබුජ සත්වයෝ පරලොවට නොපැමිණ මෙහිදීම විනාශ වන්නෝය පරලොව යන කෙනෙක් නැතැයි සිතනු කියනු ලබන්නාවූ තැනැත්තේ මට කවරහෙයකින් පරිහාස නය කෙළෙහිදූයි ගර්ජනා වශයෙන් තර්ජනය කොට ඔහුගේ අශුධික ලබ්ධිය ප්‍රකාශකොට කියනසේක් තෝ වනාහී පෘථිවි, ආපො, තෙජො, වායු යන සතරමහාභූතයන් ගෙන් ඉදින් සත්වයන්ගේ රූපස්කන්ධය උපදනේය. යමෙකින් රූපස්කන්ධය උපන්ද සත්වවිනාශ කාලයෙහි හෙවත් ප්‍රාණනිරුධවන කාල යෙහි ඒ පෘථිවි ආදිය කරා පැමිණෙන්නාහුය කියන්නෙහිය කෙසේදයත් මේ සතරමහාභූතයන් ආත්මකොටඇති පුරුෂතෙම යම්කලෙක්හි කාලක්‍රියා කරන්නේද එකල්හි පෘථිවි ධාතුව පෘථිවිය කරා යන්නේය. ආපො ජලය කරා යන්නේය. තෙජස වහ්නියකරා යන්නේය. වායො වායුවකරා යන්නේය. ඉඳුරන් ආකාශය කරා යන්නේය. ආසන්දිපංචමවූ පුරුෂයෝ හෙවත් ඇඳ පස්වෙනි කොට ඇති පුරුෂයෝ සතරදෙනෙක් ඒ මෘතශරීරය ගෙණ යන්නාහ යම්තාක් සොහොන දක්වා ගෙණගියාවූ සත්වයන්ගේ පියවර පෙණෙන්නේය. ආදහන කෘත්‍යයෙන් මත්තෙහි පරවී ඇට සෙයින් විත්ඇට පමණක් ශේෂව අලු කෙළවරකොට තිබෙන්නේය එහෙයින් මෙලොවින් පරලොවට යන කිසි කෙණෙක් නම් නැත්තේය ලොවම විනාසවන්නේය එබැවින් යම් කෙණෙක්

දෙනලද දානයාගේ විපාකයෙක් ඇතැයි යන යම් වචනයක් කියන්නේනම් හේ අඥානයෙන් විසින් පණවන ලද්දේ යම්කිසි කෙනෙක් ඇතැයි යන වාදයකුදු කියද්ද ඔවුන්ට මුසාවාද වන්නේය ඒ විලාපයෙක් නම්වන්නේය අඥානයොද ප්‍රාඥයොද මරණින් මත්තෙහි අත්තැනක උත්පත්තියෙක් නැතිව විනාස වන්නාහුය මරණින් මත්තෙහි සත්වයෝ නූපදනාහුයයි කියා තෝ මෙසේ දෘෂ්ටි පිහිටුවා ලූයෙහිය යලිදු මේ ලෝකයෙහි වසන සත්වතෙම මේ ලෙව්හිම ජීවත් වන්නේය. ජීවිතාවසානයෙහි පරලොවට නොපැමිණ නැතිවන්නේය. පර ලෙව්හි උපන්සත්වතෙම ගත්වසයෙන් මෙහිනොපැමිණ එහිදීම නැතිවන්නේය. විනාස වන්නේයයි කියා තෝ මෙසේ ප්‍රකාශකරන්නේය මෙසේ මේ ලොව යම් අඥානකෙණෙක් ඇද්ද සියල්ලෝම නැතිව ලෝනස්නා කල ලෙව්හි කව රෙක්නම් පවින් මුසුවේද පාප විපාක විඳීද ඉදින් තාගේ මේ වචනය සත්‍ය වී නම් වඳුරා මාවිසින් මනාකොට මරණලද්දේයයි යටකියනලද ක්‍රමයෙන්ම සෙස්සද වඳුරා ඔහුගේ වාදය බිඳ ශාස්ත්‍රවිඥවාදී තැනැත්තාහට ඒ තැනැත්ත හගවන පිණිස ආමන්ත්‍රණය කොට ඇවැත්නි තෝ මවුපියෝ තමුදු මරා තමා ගේ අර්ථයම සිඬ කටයුතුයයි යන මේ දෘෂ්ටිධජය නගාගෙණ ඇවිදිනු ලබන්න මා කවරහෙයකින් විලිපුල් නැතිව පිළිකුල් කොට තිත්ද කෙරෙහිදූයි වඳුරා ඔහුගේ වාද තියාද දක්වන සේක් එඹල දුබලය ලෙව්හි දුවිලවූ බාල සවභාව යෙන් යුක්තද අප පණ්ඩිතවරහුයයි අප පණ්ඩිතඬ පණ්ඩිතමානවූ ශාස්ත්‍රවිඥ වාරීහු ඉදින් තමහට ප්‍රයෝජනවත්වූ එබඳු කටයුත්තක් ඇතිකල්හිසව්තියෙන් ගවුරව කටයුතු මව්පියනුදු විපුල් මල්බෑ ආදී පුත්‍රදාරාවනුදු මරා තමන්ගේ අර්ථයම සිඬකටයුතුයයි කියන්නාහුය තෝද එසේවූ ඔවුන් අතුරෙන් පතරවූ එකෙකැයි මෙසේ ඔහුගේ අසුඬිකලබ්ධියෙහි පිහිටුවා ඒ කැටුවම තමන්වහන් සේ විසුඬිලබ්ධිය ප්‍රකාශකරණසේක් කොල ශාස්ත්‍රවිඥවාදී තැනැත්තකෘත්‍යා කෘත්‍ය විචාරයීඇති අපගේ ආචාර්‍යවරයෝ සම්පාදපජායාවෙක්හි හුන්නේ හෝ හෝනේ හෝ වේද්ද ඒ වෘක්‍ෂයාගේ ශාඛාපණියකුදු නොබින්ද යුත් තේය හෙවත් තමන්විසින් හිඳ ගෙවීම වසයෙන් පරිභොග කරණලද ජායා සම්පන්න වෘක්‍ෂයාගේ ශාඛාවක් හෝ පත්‍රයක් නොසිඳිය යුතුය කුමක් හෙයින්දයත් එසේ කළ හොත් මිත්‍රද්‍රොහී නම් වන්නේනේයයි කියා මෙසේ වණිනා කරන්නාහුය. තෝවූකලී ප්‍රයෝජනයක් පැමිණිකල්හි ඒ වෘක්‍ෂය සහමුලින්වත් උපුටාගතයුතුයයි කියන්නෙහිය එසේ කියනලද තාගේ ඒ වචනය සත්‍යවීනම් මටද එවිට මාශෝපකරණයකින් ප්‍රයෝජන ඇතිවූයේය. එහෙයින් මේ වඳුරා මාවිසින් නසන ලද්දේය එහි කවරදොෂයෙක්ද එහි දොෂ යක්සේ තට වැටහෙන්නේනම් හේ තාගේ වාදයෙහි දොෂය මාගේ දොෂයෙක් නොවෙයි යනාදීන් යටකී පරිද්දෙන් සෙස්සද වඳුරා ඔහුගේ වාදයද සිඳබිඳ හැර අනතුරු පිළිතුරු හිරුදුවූ කදෙකෘමින් සෙයින් ඔවුන් පස්දෙනාම නිෂ්ප්‍ර

හාවට පැමිණ අස්වූ කල්හි ඔවුන් පාලනය කොට හුන් භූපාලයන්ට ආමන්ත්‍රණය කොට මහරජ මෙරට විලොපනය කොට නසන ගරුසරු නැති සොරු පස්දෙනෙක් ගෙණ හැසිරෙත්තෙහිය අහෝ මෙබඳු අඥානයන්ගේ සංසර්ගය හෙතුකොටගෙණ ඉහලොකයෙහිද පරලොකයෙහිද මහත්වූ දුඃඛයට පැමිනෙන්නෙහියයි වදූරා රජ්ජුරුවන්ට බණදෙසනසේක් මහරජ මේ අහෙතුකවාදී පුරුෂයාද ඊශ්වරසංඛ්‍යාත මහාබ්‍රහ්මනිර්මිතයයි ගත් වාදියාද පූර්‍වකෘතවාදියාද උච්ඡෙදවාදියාද ශාස්ත්‍රවිද්‍යාවාදියාද යන අපණ්ඩිතව පණ්ඩිතමානීවූ අඥාන අසත්පුරුෂ දෘෂ්ටිගතිකයෝ පස්දෙන යම්බඳුවූ එබඳු දෘෂ්ටිඇති ඒ පුරුෂතෙම තෙමේත් පව්කරන්නේය. යමෙක් ඔහුගේ වචනය අදහාද හේ ඔවුනුදු ලවා අකුසල් කරවන්නේය. එහෙයින් මෙබඳු අසත්පුරුෂයන්ගේ සංසර්ගය ඉහ ලොක පරලොක දෙක්හි දුක්ම කෙළවරකොට ඇත්තේය මැදුම් කම්කටුල් ආදිවූ කර්‍මශවිපාකයෙක්ම ඇත්තේය ඒ එසේමය යලිදු මම අර්‍ථයාගේ සුප්‍රකාශය පිණිස "යානිකානිචි භිකඛවෙ භයානි උපපජ්ජනති සබබානි තානි භයානි බලතො උපපජ්ජනති නොපණ්ඩිතතො" යනාදීන් වදාළ බාලපණ්ඩිත සූත්‍රය ගෙණහැර දක්විය යුතුය යලිදු ගොධජාතක සංජීවජාතක අකීර්ති ජාතකයෙහුදු එම අර්‍ථය ප්‍රකාශ කටයුත්තේය. මෙසේ යටකී නියායෙන් වදූරා දූත් වනාහි පමාතොවද උපමාවසයෙනුදු දම්දෙසුම් වඩනසේක් මහරජ පෙර උරණ රූපයෙන් හෙවත් එළුවන් බඳු රුවින් එක්තරා බකනම්වූ යුගඳිවි යෙක් වීය ඔහුගේ නකුට පමණක් දිගය හේ ඌරුවූ ඌරුවතුරෙහි බහා බැලූ වත්ට එලුවන් බඳුව පෙණෙන්නේය. රූපයෙන් එලුවන් සමූහය කරා නිසැක වම එලඹෙන්නේය. එසේ පැමිණී එළුපැටියන්ද එළියන්ද එළුවන්ද මරා රුධිර පානයකොට සෙස්සන් භයපත් කරවා යම් කිසි තැනක් අභිප්‍රාය නම් එතැන්හි පැමිණෙන්නේය නොහොත් කැමති පරිද්දෙකින් යන්නේය එපරිද්දෙන්ම මෙලොව සමහර බ්‍රාහ්මණකෙණෙක් ලොව රවටන පිණිස කෙස්වැටි දවටා ජටාමඬුලු බැඳ වර්ජිත පාපයන්ගේ ප්‍රව්‍රජ්‍යාලිඞ්ගයෙන් තමන් ප්‍රවෘත්තිච්ඡාදනය කොටද සොඳුරු ගුණඇත්තාවූත් මෙන් අඟවා වංචා කරන්නාහුය කෙසේදයත් සමහරෙක් අපි නොකම්හයි කියාද සමහරෙක් අපි රිසිවූ කිසිවක් නොම අතුළ බිම හොවුම්හයි කියාද සමහරෙක් නොමැළිව මද විලියෙන් විලිවසාද සමහරෙක් අපි ඉක්මන් වූමුත් අක්පතුලෙන්ම ඇවිදිම්හයි කියා පැනපැන ඇවිදීමෙන්ද සමහරෙක් අපි සත්ගුණයටම පත්ලෙසටම සත් දිනකින් දසදිනකින් දෙපෝවරකින් කම්හයි කියාද සමහරෙක් අපි දම්රකු මට මන්තුවූකොට පැන්නොබොම්හයි කියාද සමහරෙක් රුස්කරණලද දුශ්කෘතාවාර ඇතිවම අපි දූත් මහතුන්වන රහතුන්යයි කියාද මෙසේ අදනාව සිට දනායන්ගේ රුවින් පිළිසන්කොට ගෙණ ප්‍රිය මධුර වචනයෙන් හිතකාමීන් මෙන්ව අවශ්‍යයෙන් මනුෂ්‍යයන් තමන්ගේ බකතපසින් වඤ්චාකරන්නාහුය එහෙයින් මහරජ මේවංචකවූ පංචවිධ දෘෂ්ටිගතිකයෝ වෙත්වයි අන්කිසිවෙක්

හෝ වෙත්වයි මෙබඳු ක්‍රියාදියෙන් යුක්තවන්නේ වීනම් ඒ සියල්ලෝම දෘෂ්ටිහු නම් වෙති එසේවූ මේ අපණ්ඩිත පණ්ඩිතමානිවූ ප්‍රඥාහීනවූ අඥානඅසත්පුරුෂයෝ තමනුදු නැවිලි නොවම පව්කරන්නෝය. සෙස්සනුදු ලවා පව්කරවන්නෝය එසේ හෙයින් එබඳු අසත්පුරුෂ සංසර්ගය දුක්කෙළවරකොට ඇතතේය මැඩුම් කම්කටුල් ආදීවූ කර්කශවූ විපාක ඇත්තේය. තවද මහරජ යම් කෙණෙක් ආර්යවූ වීර්යනැතැයි කියද්ද යම්කෙණෙක් හෙතුනැතැයි ගර්හාකෙරෙද්ද මෙරමාගේ ප්‍රයෝගයද නොහොත් තමාගේ ප්‍රයෝගය උපකාරප්‍රත්‍යුපකාර දෙකද යම් කෙණෙක් අසමාන වුවත් සමානකොට අසිස්වුවද සිස්යයි නැතැයි වර්ණනා කෙරෙද්ද එබඳුවූ යටකී ලක්ෂණ ඇති අසත්පුරුෂසංසර්ගය එහි කී පරිද්දෙන්ම කර්කශවූ විපාක ඇත්තේය තවද මහරජ ඉදින් ප්‍රඥාසම්පන්නවූ කායික චෛතසික වීර්යය නොවන්නේ වීනම් කල්‍යාණ පාපසංඛ්‍යාත ලක්ෂණාලක්ෂණ සම්පන්නවූ කර්මයක් නොවන්නේ වීනම් එසේ වීර්යකටයුන්තෙක් නැතිකල වඩුවෙක් හෝ අන්කිසි කෙණෙක් හෝ යයි ඒකාකාර ජනයන් රජතෙම වැටුප් වියදම් දී පොෂ්‍යය නොකරන්නේය ඔවුන් විසිනුදු රජ්ජුරුවන් පිළිබඳවූ සප්තභූමක ප්‍රාසාදාදීවූ වඩුකර්මාන්ත නොකරන්නාහුය කුමක්හෙයින්දයත් වීර්යයාගේද කර්මයාගේද අභාවයෙක් වීනම් එහෙයිනි මහරජ යම් හෙයකින් කායික චෛතසික වීර්ය හා ලක්ෂණාවලක්ෂණ කර්මාදි ක්‍රියාවන් ඇත්තේ වේද එහෙයින් නොමඩු සිප්දර වඩුවෝ අඩුනැතුව ප්‍රාසාදදීවූ වඩුකම් කරන්නාහුය. එහෙයින් නිජයසින් විජයප්‍රාප්ත රජතෙමද අඩුවක් නැතිවම වඩුවන් රක්නාසේක. තවද මහරජ ඉදින් සියක් වසක් මුළුල්ලෙහි සරුවූ වර්ෂාව නොවස්නේනම් පිනිබිඳකුදු නොවැටෙන්නේ නම් මේ ලොව නැතිවන්නේය. මේ ප්‍රජාසංඛ්‍යාත සත්වයෝ විනාසවන්නේය. එසේ නොව යම් හෙයකින් කලට සුදුසු වර්ෂාව වස්නේද තුෂිතානුස්පර්ශය වන්නේද එහෙයින් සශ්‍යජාතිහු විශෙෂ්‍යව පසස්නේය රජදරුවෝත් රටද ප්‍රකටව රක්ෂා කිරීමෙන් දිගුකලක් රාජ්‍යශ්‍රී අනුභව කරන්නෝයයි මෙසේ සාමාන්‍ය වශයෙන් බණවදාරා නැවතත් මහබෝසත්තෙම රජහට ගාථාසතරකින් බණ දෙසන සේක් තවද මෙබවද දනුව මහරජ යම්සේ ගවයන් එතරකරණ ගොපලුතෙම ලඟට ගොස් ගඟට බැස්වූ ගවයන් අතුරෙන් ප්‍රධාන ගවයා ඇදව යේද පළමු විධානලත් ඒ ප්‍රධාන ගවයා ඇදවයාමක් ඇතිකල්හි ඔහුපස්සේ නොළුතබා පීතන සෙසු සියල්ලෝද ඒ අඩකයෙන්ම වඩකව යන්නාහුය එපරිද්දෙන්ම මහරජ මනුෂ්‍යයන් අතුරෙහි යමෙක් විශිෂ්ටවූ ශ්‍රෙෂ්ඨ සම්මතවේද ඒ රාජ්‍ය ශ්‍රීයට පැමිණි හේතෙම විතරනොවන දෙස්ඇති සතර අගතියෙන් වීගතනොව අධර්මයෙන් හැසිරෙන්නේ වීනම් විශෙෂයෙන්ම අවශෙෂ සත්වයෝත් අධර්මයෙහි එකිතරව වැඩිකොට හැසිරෙන්නාහුය ඉදින් මෙසේ රජතෙම අධර්මිෂ්ටවූ කල්හි සියලුරට දුකින් හෝතේය වසන්නේය තවද මහරජ එසේම ගවයන් එතරකරණ යම් ගොපල්ලෙක් ගඟට බැස්වූ ගවයන් අතුරෙන් දුරටව

පෙරටව යන ප්‍රධාන ගවයා අතරතුරු නොමැදව එතරව යේද එසේ ප්‍රධාන ගවයා සෘජුව ගිය බවක් ඇතිකල්හිම ඔහුපස්සේ නොලුනබා පීනන සෙසු ඒ සියල්ලෝද ඒ ගුණයෙන් ප්‍රගුණව යත්තාහු එපරිද්දෙන්ම මහරජ මනුෂ්‍ය යන් කෙරෙහි යමෙක් ශ්‍රෙෂ්ඨසම්මත වේද ඉදින් හේතෙම දුගතිගති නියත සතර අගතියෙන් විගතව සුචරිතධර්මයෙහි හැසිරේද එකල්හි විකල්නොවූ සියල්සත්හුම විශෙෂයෙන් කුසල් දහම්හි හැසිරෙත්තාහුය එසේහෙයින් නිජ ගුණ අවිරවූ රජතෙම ඉදින් ධාර්මිකවූයේ වේද එකල සකල රටවැස්සෝම සුවසේ වසන්තාහුය තවද මහරජ යමෙක් මහත්වූ ප්‍රචුර ඵලහාරධාරිත මධු රාම්‍රවෘක්ෂයක්හුගේ නොපැසුනු අමුගෙඩි නෙලාද ඒ තෙම ඒ ආම්‍රඵලයාගේ පැසුනු ඉදුනු කල ඇතිරසයද නොදන්නේය බීජයද හෙවත් ඒ නුමූකල අඹ ඇටයද නොමැස්පෙන හෙයින් පැලනොවන හෙයින් විනසවන්නේය. එසේම මහරජ මධුරඵල හරිත මහාම්‍රවෘක්ෂොපමවූ ප්‍රකට රටයමෙක් අධර්මයෙන් අනු ශාසනා කරන්නේද හෙවත් සතර අගතිගමනින් යුක්තවූ අධර්මොප ශාසනා කෙරේද එසේ අධර්මානුශාසනා කරණ රජතෙම රටෙහි රස සංඛ්‍යාත ඔජස හෙවත් රසයයි දන්නා ලද දූහැමින් උපදනා අයපඬුරු ආදී සම්පත්තිරසය නොදන්නේය. එසේ නොදන් කල විකලවූ මනුෂ්‍යයෝ ගම්නියම්ගම් හැර දුරගොස් ප්‍රත්‍යන්ත පර්වත විසමස්ථාන භජනය කරන්නාහුය එහෙයින් ඔහුගේ රට සියලු අයඹුඛය විනාශ වන්නේය තවද මහපිණැත් මහරජ යමෙක් සොඳුරු මියුරු ඵලබර මහ අඹගසක්හුගේ පැසීගොස් ඉදීගිය අඹ නෙලන්නේ වේද හේතෙම ඒ අඹ අනුභවකල ඒ ඵලරසද මනාකොට දන්නේය බීජයද විනාශ නොවන්නේය එපරිද්දෙන්ම මහරජ මධුර මහාම්‍රවෘක්ෂොපම රට යමෙක් සධර්මාවහ ධර්මානුශාසනා කරන්නේ වේද හේතෙමේ සර්වජන ස්තොත්‍ර පූර්වාඞ්ගමව දෙනලද අයපඬුරු ආදිරසයද දන්නේය. ඒ රජධර්මපාල භූපාලොත්තමයාගේ ප්‍රකට රටද අසෙස ජනයන් විසින් අපාපී පාලනයෙන් පාලනය කරණ භූපාලොත්තමයානන් වහන්සේ චිරාත්කාලයක් මුලුල්ලෙහි සපිරිවරින් යුක් තව සුවසේ වාසයකරණ සේක්වයි යනාදි කරණලද ආශිර්වාද ඇතිව ඒ ගම් තර සර්වජන සමූහයාම නිත්‍ය සන්තොෂයෙන් දුරට නොගොස් ප්‍රකට රටම වසනහෙයින් විනාශ නොවන්නේය. තවද මහරජ යම් ජගත්පාලයෙක් තෙම අධර්මයෙන් ජනපදානුශාසනය කෙරේද හේ විරජ ගුණැති රජතෙම සියල්මුල් විමල් මල්හා විපුල් ඵලපත්‍ර සර්පි නවනීතාදීවූ ඖෂධයෙන් වලක්නේය. කෙ සේදයත් අධාර්මික රජහුගේ රට පෘථිවිය සරොජස්නොව නිරොජස් වන්නේය. හෙවත් හේ අධර්මාතප්ත භයින් සැඟවුනාක්මෙන් ඔජස් සංඛ්‍යාත පෘථිවිරසය පෘථිවියෙහි යට රියන් ගණනක් පාත බස්නේය එහෙයින් ඔජස් නැති වන් නේය. පෘථිවියගේ නිරොජත්වයෙන් ඖෂධජාතීන්ගේ බල මදවෙයි ඖෂධබල අඩුහෙයින් ඒ රොගව්‍යපසමනයට අසමර්ථ වන්නේය එහෙයින් ඒ ක්ෂත්‍රිය තෙම ඖෂධාදීන් විරුද්ධවූවානම් වෙයි තවද අදහව මහරජ එපරිද්දෙන්ම

නියම්ගම්වාසීවූ එහි පැලඹෙන කෙලෙඹියන් හිංසා පීඩා කරන්නේද ආපාන මුඛ ඵලප්‍රාප්තවූ හෙවත් දියෙහි ගොඩෙහි ක්‍රයවික්‍රයෙහි නියුක්තවූ යම් වෙළෙඳකෙණෙක් ඇද්ද ඔවුන්ට හිංසා කිරීම් වසයෙන් චංකවූ අන්‍යායෙන් සුංකදන වසයෙන්ද ෂට්භාගද සඟාගාදීවූ ප්‍රභෙද ඇති කරවුවර වසයෙන් අයුක්තෙන් ශකීරාම් ආදිය ගැණීමෙන් වෙළඳුන්ට හිංසාකරන්නාවූ අධාර්මික රජතෙම ධනධාන්‍යයෙන් පිරිහෙනු ලබන්නේ තුෂ්ටිජනක ඉෂ්ටකොෂ්ටාගාරාදියෙනුදු විරුඬවන්ණේය වලක්නේය තවද මහරජ ප්‍රහාරක්‍ෂෙත්‍රඥවූ හෙවත් එබ්ඹවූ යුඬභූමියෙහි ලා මේ සථානයෙහිදී විදිනට වටනේයයි මෙසේ උතුම් ප්‍රහාරයට ක්‍ෂෙත්‍ර දන්නාවූ ධනුග්‍රහයන් විරුඬවූ යුඬයෙහි කරණලද පරිශ්‍රම ඇත්තාවූ විදග්ධවූ ප්‍රසිඬ මහාමාත්‍යයන් හිංසාකරන්නාවූ කරවන්නාවූද එබඳු රජ්ජුරුවන් මේ තෙම තමන්ට බොහෝ උපකාරීවූ රාජ්‍යදායක මහාමාත්‍යයනුදු පවා හිංසා පීඩා කරවනසේක. එසේ කල අපට කුමක් නොකරණ සේක්දැයි කියා අවශෙෂ යොධාදිහුද හරණාහුය එහෙයින් මෙසේ බල යෙනුදු වලක්නේය. තවද නිගමාදීන් යම්සේ හිංසා කරණු ලැබේද එසේම ප්‍රඥවන්ත සංඥිත ක්‍රියා ඇති බ්‍රහ්ම චාරීවූ සෘෂිවරයන් ආක්‍රොශ ප්‍රහණාදීන් හිංසා කරන්නාවූ අධර්මචාරිවූ ඒ ක්‍ෂත්‍රියතෙම කරජකායයාගේ භෙදයෙන් මත්තෙහි අපාය දුග්ගති විනිපාත සංඛ්‍යාත නරකයටම පැමිණෙන්නේය සවර්ගයෙහි උපදනට නොහැකි වන්නේය එහෙයින් සවර්ගයෙනුදු වලැක්කා තම් වන්නේය තවද මේ බවද අසව අසව මහරජ ශර්මදායක ධර්මය නොදන අධර්මයෙහි පිහිටි යම් නරාධිපයෙක් තෙම තමන්ගේ බාහුජායාවෙහි වසතලද පවිත්‍ර පුත්‍රධීතෘන් හා මොනවට වැඩීගිය අද්‍රොහික සිල්වත්වූ අගමෙහෙසුන අපවිත්‍ර මිත්‍රප්‍රතිරූපකවූ සරුගරුනැති සොරුන්ගේ වචනය ගෙණ මරවන්නේ වේද හෙතෙම තමන්ගේ නරකොත්පත්තියට යුක්ත නිෂ්පාදනය කළාතම් වන්නේය හෙවත් අපායොත්පත්ති වන්නාවූ අකුසල සමූහයෙක් රැස්කළා තම් වන්නාහ මේම ආත්මභාවයේදී නොවන්නාවූවමනාවූ තමන්ගේ පුත්‍රයන් කෙරෙන්ද විරුඬවූවා තමුදු වන්නේයයි වදාළසේක. මෙසේ ඒ මහරජහට ඒ වඤ්චිත පක්‍ෂවිධ දෘෂ්ටිගතිකයන්ගේ කීම ගෙණ අග්‍රමහෙසිකා දෙවීන් මැරූබවද ඒ ගැණවූ පුත්‍රයන්ගේ විරුඬතාවයද සන්ධිමුඛ සොරා කෙස්වැටිය අල්වා ගන්නාක්හු මෙන් කීසේක මෙසේ විශෙෂවූ අශෙෂ ගුණධර බොධිසත්වයන් වහන්සේ ඒ අමාත්‍යයන්ට නිග්‍රහ පිණිසද අගමෙහෙසුන් දෙවිය මැරූබව ප්‍රකාශ කිරිම පිණිසද ධර්ම දෙශනාවෙන් පිළිවෙළින් කථාව ගෙණහැර දක්වා අවකාශකොට මෙසේ මේ සියලු කාරණයන් දැක්වූ සේක. රජ්ජුරුවෝ උන්වහන්සේගේ වචනය අසා තමන්ගේ අපරාධය ඇතිලෙසින්ම දන්සේක ඉක්බිත්තෙන් මහ බෝධිසත්වයන් වහන්සේ මහරජ මෙතැන් පටන් මෙබඳු අරිෂ්ඨවූ කුදිටුපවිටුන්ගේ කීමක් ගෙණ නැවත මෙබඳු දෙයක් නොකරවයි කියා අවවාද දෙනසේක් ප්‍රජාපාලකවූ මහරජ අධාර්මික අයබදු ගැණීම් වස

යෙන් පීඩා නොකිරීමෙන් ජනපදයෙහි ධර්මයෙන් හැසිරිය යුතුය සස්වාමික
යන් අස්වාමික නොකරන්නේ නියම්ගම්හි ධර්මයෙන් හැසිරිය යුතුය අස්ථාන
යෙහි කලාන්ත නොකරන්නෙ බලසංඛ්‍යාතවූ අමාත්‍ය මණ්ඩලාදීන් කෙරෙ
හිද දැහැමෙන් හැසිරිය යුතුය විවිධ වධබන්ධන අක්‍රොශපරිභව පරිහරණයෙන්
හා ඔවුන්ට නිත්‍යප්‍රත්‍ය නොදීමෙන් ඍෂිවරයන් හිංසා නොකට යුතුය
ධීතෘහු සුදුසුවූ ස්වාමිපුත්‍රස්ථානයෙහි පිහිටාලීමෙන් හා පුත්‍රයන් අනල්ප
සිල්පයෙහි හික්මවා මනාකොට පරිහරණය කිරීමෙන් හා ආචාර ගුණධර
භාර්‍යාවන්ට මසුරුනොව සියලු ඉසුරු දක්වා දීමෙන් හා අහංකාර වඩන
අලංකාර ප්‍රදාන සම්මානනාදි වසයෙන් මෙසේ පුත්‍රදාරාවන් කෙරෙහි මනාව
හැසිරිය යුතුය මහරජ මෙබඳු ගුණ ධර්මයෙන් යුක්තවූ රජතෙම තමාගේ
ප්‍රවෙණි ධර්මය නොබිඳ දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරන්නේ වීනම් රට
පාලනය කරන්නේ වීනම් අක්‍රොධීවූ එබඳුවීරාජිත ගුණැති නරාධිප තෙම
තමතමන්ගේ රාජතෙජසින් සාමන්ත රජදරුවන් තැති ගන්වා වෙවුල්වති
කෙසේද යම්සේ අසුර පරාජය කොට සිටි තැන් පටන් අසුරාධිප සංඛ්‍යාතවූ
සවික්‍රම ශ්‍රීධර ශක්‍රතෙමේ අසුරයන් වෙවුල්වාද එමෙන් තෙමේම තමන් රාජ
තේජසින් පිරිවර හා සාමාන්ත රජදරුවන් අසුරය නමැති අසුරයන් කම්පා
කෙරෙමින් සිත්සේ යුත්ලෙසට අත්පත්වූ රාජ්‍ය සුවය අවිකල සකල සත්ව
යන්ගේ චිත්තප්‍රමුදිත කිරීමෙන් චිරාත් කාලයක් යෙහෙන් අනුභවකොට
වසන්නේයයි වදාළසේක.

මෙසේ විවිධ විශුද්ධ ශීලධර්මවත සමාධ්‍යාදි ප්‍රසිද්ධගුණාධික මහබෝධි
සත්වයන් වහන්සේ විරොධාපරාධයට පත් නරාධිපයානන්ට පහන්වන ලෙසට
දහම් දෙසා ක්ෂමා කරවීමට අමාරුව සිට කුමාරවරයන් සතරදෙන කැඳවා
අපවාද නොවන ලෙසට අවවාද කොට මහරජ්ජුරුවන් විසින් කරණලද කර්මය
ප්‍රකාශකොට දියපත් වීමට පියරජ්ජුරුවන් ක්ෂමාකර ගණුවයි දනුමැති කම්දී
ක්ෂමා කරවා මහරජ මෙතැන් පටන් අපරීක්ෂාකාරීව පරිභෙදකයන්ගේ
වචනය ගෙණ මෙබඳු සාහසික කර්මයක් නොකළ මැනව තෙපිද අරුම පින්වත්
සුකුමාර කුමරුවෙකි පියරජ්ජුරුවන් කෙරෙහි ද්‍රොහී නොවවයි සියල්ලටම
අවවාද දුන්සේක. ඉක්බිත්තෙන් එක්සිත්ව ඒ මහරජානෝ මහබෝධි පරිබ්‍රා
ජකයන් වහන්සේට දන්වනුයේ ස්වාමීනි මම නුඹවහන්සේට හා දෙවීන්ට
විරොධාපරාධකම් කෙළේවීනම් මොවුන් නිසාය මොවුන්ගේ කථාව ගෙණ
මෙසේවූ අකුශලකර්මයක් කෙළෙමි එහෙයින් ස්වාමීනි මාගේ ගුණ විනාසකළ
මොවුන් පස්දෙන නොලස්වම මරමියි කීසේක. එවිට මහබෝසතානෝ මහ
රජ මනුෂ්‍ය ඝාතනය ඉතා දරුණුය එසේ හෙයින් මෙසේ කරන්ට නොලබන්
නෙහියයි වදාළසේක එසේවීනම් ස්වාමීනි මේ අරිටුවූ පවිටු කුදිටුවන්ගේ සිත්සේ
නොමැවිදිනා ලෙසට අත්පා සිඳුවමි කීසේක. මහරජ මේද නොලැබෙයි

වැඩළසේක එවිටද මහරජ්ජුරුවෝ යහපත සවාමීනියි පිළිගෙණ ඔවුන් පස් දෙන සියල්ලටම හොරාකොට එකක් එකක් හුගේ හිස පසක් පසක් කොණ්ඩා බැඳ ගර්ඳුල බන්ධන සංඛ්‍යාත සුහබස්පඳත යෙනුදු බැඳ හෙවත් බලු කතාවල් කරබැඳ ගොමදිය ඉසීමෙන් අවමන් කොට පාදයන් තෙද හරණ වද බෙර ගස්වා රටින් නෙරපූහ නැවත විවිධවිසුඩ මෙධාවික මහබොධිසත්වයන් වහන්සේද කීප දවසක් එහි වැස අප්‍රමාද වෙව මහරජයි රජ්ජුරුවන්ට අවවාද අනුශාසනාකොට නැවත නොනැවතම හිමවතටම ගොස් ඒ මනාවූ භාවනා කොට නානාගුණ නිධාන ධ්‍යානාභිඥ උපදවා දිවි කෙළවර දක්වා නෙක්වා සිරි දෙවන ශ්‍රෙෂ්ඨ විහාර සංඛ්‍යාත බ්‍රහ්ම විහාර භාවනාකොට බ්‍රහ්මලොකයටම ගියසේක. මෙසේ පවරවාදී හකුමහ නිර්හෙදුහිත අකුණ්ඨ කණ්ඨීරවේන්ද්‍ර ශ්‍රීවිශ්‍රුත ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණ හැර දක්වා වදාරා මහණෙනි දැන් මතු නොවෙයි පූර්වයෙහිත් අපූර්වූ සර්වඥ වරයෝ ප්‍රාඥයෝමය තරවා ගතවූ පරවාද ප්‍රමර්දනය කළෝම් වේදැයි වදාරා පූර්වාපර සන්ධි ගලපා මේ ඇසූ සත්නට මහාර්ථික නැනවඩන මහාබොධිජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ඒ වඤ්චිතවූ පඤ්චවිධ දෘෂ්ටිගතිකයෝනම් මෙසමයෙහි පූරණකාශ්‍යපය මක්ඛලී ගොසාලය කකුධ කාත්‍යායනය අජිත කෙසකම්බලය නිගණ්ඨනාථ පුත්‍රයයි යන මේ පස්දෙන වන්නේය. එකල පිංගල සුනඛයා නම් මෙකල මේ ධර්මභාණ්ඩාගාරික ආනන්ද සථවිරයෝය. එකල දසපාරමී ධර්මයන් පිරීමෙහි අධික ප්‍රඥාධික ඇති ධීතිමත් මහාබොධි පරිබ්‍රාජකයෝ නම් දැන් සකල ලොකසත්ව වර්ගයා විපුලතර භවකාන්තාරයෙන් එතරකොට අමෘත මහා නිර්වාණපුර ප්‍රවෙශ කිරීමට අසහාය සාත්ථුවාහයක් බඳුවූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක.

ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම

අත්හළ, අසරණ, අනාථ ළමයින් සියලු දෙනාටම කෙසේ වෙතත් සුළු පිරිසකට හෝ රැකවරණය ලබාදීමේ කාරුණික, පින්බර හැඟීමෙන්, තායිවානයේ ප්‍රධාන සංඝනායක ත්‍රිපිටකවේදී බෝදාගම චන්දිම නාහිමියන් විසින් බණ්ඩාරගම, වීදාගම අක්කර 13 ක පමණ නිසංසල, රමණීය බිම් පියසෙක ධර්ම චක්‍ර ළමා පදනම ඇරැඹිණි. මෙම ළමා නිවාසය ප්‍රධාන කොට දැනට කෝටි දෙකකට ආසන්න මිල මුදල් වැය කොට ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිවී ඇත. මෙහි ළමයින් 100 කට පමණ පහසුකම් සහිතව ජිවත් වීමට ළමා නේවාසිකාගාරයක්, කෑම ශාලාවක්, පුස්තකාලයක්, කියවීම් ශාලාවක්, මුළුතැන්ගෙයක් හා ශ්‍රවණාගාරයක් ද බොදු සිත් සතන් පහන් කරවන බුරුමයේ සිට වැඩම වූ ශ්‍රී ලංකාවේ දී අතිශය දුර්ලභව දිටිය හැකි කිරිගරුඬ සමාධි බුදු පිළිම වහන්සේ සහිත රමණීය බුදු මැදුරක් සහ පරිපාලන ඒකකයන්ද ගොඩනගා ඇත.

පුණ්‍යායතනයක් ලෙස පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කරන ලද, ධර්ම චක්‍ර ළමා පදනම යටතේ පාලනය වන පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ළමා නිවාසයක් වන මෙහි පළමු අදියර උදෙසා පිළිසරණ විය යුතු පිරිමි ළමයින් 50 ක් පමණ නේවාසික වීමට කටයුතු යොදා ඇති අතර පියවරින් පියවර ඉදිරියේදී ළමයින් 100 දක්වා බඳවා ගැනීමට අදහස් කර තිබේ. මෙම දරුවන්ගේ ආහාරපාන, ඇඳුම්, පැළඳුම්, සෞඛ්‍ය, ක්‍රීඩා හා සෞන්දර්ය කටයුතු සඳහා අවශ්‍ය සියලු පහසුකම් ආයතනය විසින් සපයා දී ඇත. ළමයින් පිළිබඳ සැබෑ සෙනෙහසින් හා සුරක්ෂිතව කටයුතු කළ හැකි අධීක්ෂණ මට්ටමේ උපදේශක මණ්ඩලයක් හා කාර්ය මණ්ඩලයක් මගින් ආයතනික වැඩසටහන් දෛනිකව ක්‍රියාත්මක කෙරේ.

පාසල් යන වයසේ පසුවන ළමයින් සියලු දෙනාම විධිමත් පාසල් අධ්‍යාපනයේ නියැලී සිටින අතර ඔවුන්ගේ දක්ෂතාව අනුව අනාගතයේදී වෘත්තිය පුහුණුවීම් ලබාදීමට හා උසස් අධ්‍යාපනය සඳහා යොමු කිරීමෙනුත්, පසුභාර වැඩසටහන් වලින් අහිමි සම්පත් පිළිබඳ පසුතැවිලි වීමට ඉඩ නොතබා උරුම සම්පතින් පුනර්ජිවනය ලබා රටට දැයට වැඩදායක දයාව, අනුකම්පාව අගයන ගුණගරුක විනීත පුරවැසියන් පිරිසක් බිහි කරලීම ආයතනයේ අපේක්ෂාවයි.

ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ පරමාර්ථ

- ශ්‍රී ලංකාවේ වරප්‍රසාද අඩු ළමයින්ගේ සමාජීය, අධ්‍යාපනික හා සංස්කෘතික වර්ධනය උදෙසා කටයුතු කිරීම.
- විශේෂයෙන්ම දිළිඳු, අනාථ සහ රෝගී තැනැත්තන්ට සහන. පෝෂ්‍යාහාර, ඇඳුම් පැළඳුම් හා නිවාස සැපයීම.
- සාමාන්‍ය ජනතාවගේ ශාරීරික. ආධ්‍යාත්මික සහ සමාජ සුභ සාධනය වැඩි දියුණු කිරීම.
- සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීමේ කාර්යය සඳහා කෙළින්ම හෝ වෙනත් සංවිධාන සමග සහයෝගිතාවයෙන් ආයතන පිහිටුවා පවත්වා ගෙන යාම.
- සංස්ථාවේ පරමාර්ථ හා සමාන පරමාර්ථ දරන, ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටවල පිහිටි වෙනත් ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යෑම.
- ජාතීන් අතර සමගිය, ජාත්‍යන්තර මිත්‍රත්වය හා අවබෝධය නංවාලීම. ප්‍රවර්ධනය කිරීම හා දිරි ගැන්වීම හා තරුණ තරුණියන් අතර විනය හා ආත්ම විශ්වාසය පිළිබඳ හැඟීමක් ඇති කිරීම.
- ථෙරවාදී බෞද්ධ දර්ශනය හා ජීවන මාර්ගය ආරක්ෂා කිරීම හා පතළ කිරීම.
- ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට වෘත්තීය හා අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම.
- තරුණ තරුණියන් ස්වයං රැකියාවල යෙදිය හැකි අන්දම පිළිබඳව ඔවුන් පුහුණු කිරීම සහ ප්‍රයෝජනවත් පුරවැසියන් වශයෙන් ස්ථාපනය වීම පිණිස ඔවුන්ට මුදලින් හෝ අන්‍යාකාරයකින් සහාය වීම.
- සංස්ථාවේ පරමාර්ථ වැඩි දියුණු කිරීමෙහිලා නිරතව සිටින භික්ෂූන් වහන්සේලාට, ස්වේච්ඡා සේවකයින්ට හා තරුණ තරුණියන්ට ශිෂ්‍යත්ව පිරිනැමීමෙන්. මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර කිරීම.
- සංස්ථාවේ පරමාර්ථ වැඩි දියුණු කිරීමෙහිලා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ. සාකච්ඡා, වැඩමුළු, පංති, විවාද, සම්මේලන හෝ වෙනත් කටයුතු ප්‍රවර්ධනය කිරීම. පිළියෙල කිරීම. සංවිධානය කිරීම හා පැවත්වීම.
- පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම හා සම්බන්ධ කවර හෝ අංශයකට අදාළව, උපමාන ප්‍රවර්ධනය කිරීම. භාර ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

ඉහත සඳහන් පරමාර්ථ මුදුන්පත් කර ගැනීම පිණිස අවශ්‍ය හිතකර හෝ ඒවාට ආනුශංගික වෙනත් සියලු ක්‍රියා කිරීම.

අනාගතය
දුර දක්නා නුවණින් ගොඩනංවමු
අපේක්ෂා මල් ඵල ගන්වමින්.

1. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්.
2. අසරණ දක්ෂ සිසුන් උදෙසා ශිෂ්‍යත්ව ක්‍රමයක්.
3. විදේශ භාෂා පුහුණු ඒකකයක්.
4. සිවුසැට කලා කුශලතා වර්ධනය කිරීමේ ව්‍යාපෘතියක්.
5. පෙර පාසලක්.
6. වැඩිහිටියන්ට රැකවරණය සැලසීමේ ආයතනයක්.
7. වෘත්තීය පුහුණු පාඨමාලාවක්.

"Wherever the Buddha's teachings have flourished,
either in cities or countrysides,
people would gain inconceivable benefits.
The land and people would be enveloped in peace.
The sun and moon will shine clear and bright.
Wind and rain would appear accordingly,
and there will be no disasters.
Nations would be prosperous
and there would be no use for soldiers or weapons.
People would abide by morality and accord with laws.
They would be courteous and humble,
and everyone would be content without injustices.
There would be no thefts or violence.
The strong would not dominate the weak
and everyone would get their fair share."

**※ THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL ※**

Taking Refuge with Bodhichitta

I go for refuge, until I am enlightened,
to the Buddha, the Dharma and the Sangha.
Through the merit I create by practicing giving and the other perfections,
may I quickly attain the state of Buddhahood for the benefit of all sentient beings.

The Prayers of the Bodhisattva

With the wish to free all beings,
I will always go for refuge
to the Buddha, Dharma and Sangha
till I reach full enlightenment.
Enthused by the compassion and wisdom,
Today, in Buddha's presence,
I generate the Mind of Enlightenment,
for the sake of all sentient beings.
For as long as space remains,
and as long as sentient being remain,
until then, may I too remain
to dispel the sufferings of all beings.

G R E A T   V O W

BODHISATTVA EARTH-TREASURY
(BODHISATTVA KSITIGARBHA)

" Unless Hells become empty,
I vow not to attain Buddhahood;
Till all have achieved the Ultimate Liberation,
I shall then consider my Enlightenment full !"

Bodhisattva Earth-Treasury is
entrusted as the Caretaker of the World until
Buddha Maitreya reincarnates on Earth
in 5.7 billion years.

Reciting the Holy Name:

NAMO BODHISATTVA EARTH-TREASURY

Karma-erasing Mantra:

OM BA LA MO LING TO NING SVAHA

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

✻ The Vows of Samantabhadra ✻

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

✻ The Vows of Samantabhadra Avatamsaka Sutra ✻

Praise of Amita Buddha

Amita Buddha,
The Lord with the greatest vows,
His mercy, compassion,
delight and abandonment immeasurable,
Between His eyebrows always emits white-curled radiance.
He delivers sentient beings so they may enter His
Western Pure Land of Ultimate Bliss,
Where the pond of eight-virtue water
grows lotuses of nine grades,
And where marvelous seven-jewelled trees form rows.
If the Tathagata's sacred epithets are propagated,
He will receive us and lead us to his
Western Pure Land of Ultimate Bliss.
If Amita Buddha's holy name is invoked and praised,
We all vow to go to his Western Pure Land of Ultimate Bliss.

Amida Buddha all in golden color,
With form, features and radiance unequalled,
White curls winding like the five Sumeru Mountains,
And purple eyes as clear as the four great seas.
In His aura are transformed Buddhas in countless millions,
And transformed Bodhisattvas, also, in limitless number;
Forty-eight vows He made to enlighten sentient beings.
And to enable all nine grades to reach the other shore.
Blessed be the Most Compassionate One
of the Western Pure Land of Ultimate Bliss,
Amita Buddha.

DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.

May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

NAMO AMITABHA

南無阿彌陀佛

【斯里蘭卡文：佛陀本生故事（下冊）】
財團法人佛陀教育基金會 印贈
台北市杭州南路一段五十五號十一樓
Printed and donated for free distribution by
The Corporate Body of the Buddha Educational Foundation
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org
This book is strictly for free distribution, it is not for sale.
නොමිලයේ බෙදාදීම පිණිසයි.
Printed in Taiwan
4,000 copies; June 2010
SR052-8657